# පිළිගැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් වෙත.

# පටුන

## (පළමු වන වෙළුම)


| | | පිටු අංක |
|---|---|---|
| 1. | පසුබිම | 01-05 |
| 2. | කොමිෂන් සභාවේ සංයුතිය | 06 |
| 3. | නිල කාලය | 07 |
| 4. | කාර්ය මණ්ඩලය | 08-11 |
| 5. | අධිකරණ බලය සහ කොමිෂන් සභා පරිශ්‍රය | 12-14 |
| 6. | පැමිණිලි භාර ගැනීම | 15 |
| 7. | මූලික විමර්ශන සහ සාක්ෂි විභාග | 16 |
| 8. | දූෂණ විරෝධී කමිටුව සහ එහි ලේකම් කාර්යාලය මගින් සිදු කළ පොදු දේපල අවභාවිතාව | 17-51 |
| 9. | සාක්ෂි සම්පින්ඩනය, නිර්දේශ සහ වගකිවයුතු පුද්ගලයින් | |
| I. | පැ.අංක - 01, 05/2020 අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ | 52-103 |
| II. | පැ.අංක - 002/2020 රියද් අද්මිරාල් ඩී.කේ.පී.දසනායක | 104-192 |
| III. | පැ.අංක - 003/2020 කමාන්ඩර් සුමිත් රණසිංහ | 193-226 |
| IV. | පැ.අංක - 80/2020 ලු/ ක ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි | 227-268 |

| | | |
|---|---|---|
| V. | පැ.අංක - 55/2020<br>ගාමිණී සෙනවිරත්න | 269-288 |
| VI. | පැ.අංක - 107/2020<br>කේ.පී.චමින්ද | 289-299 |
| VII. | පැ.අංක - 344/2020<br>කමාන්ඩර් එම්.එම්.ඩී.ඒ.මාපා | 300-319 |
| VIII. | පැ.අංක - 345/2020<br>ලු/ කමාන්ඩර් එස්.ඩී.එස්.එස්.දයානන්ද | 320-350 |
| IX. | පැ.අංක - 205/2020<br>වෛද්‍ය යද්දෙහිගේ දොන් නිහාල් ජයතිලක | 351-413 |
| X. | පැ.අංක - 289-290/2020<br>රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක | 414-455 |
| XI. | පැ.අංක - 316/2020<br>ආර්.පී.බන්දුල තිලකසිරි | 456-478 |
| XII. | පැ. අංක - 88/2020<br>ඩී.එස්.ජයවීර | 479-511 |
| XIII. | පැ.අංක - 319/2020<br>ඩබ්ලිව්.විමලසේන | 512-522 |
| XIV. | පැ.අංක - 816/2020<br>හේවා ගුණරත්න භාෂ්වර සේනාංක | 523-549 |
| XV. | පැ.අංක - 545/2020<br>පා.ම.නීතිඥ උදය ගම්මන්පිල | 550-572 |
| XVI. | පැ.අංක - 1963/2020<br>යෝෂිත කණිෂ්ක රාජපක්ෂ | 573-588 |

| | | |
|---|---|---|
| XVII. | පැ.අංක - 1964/2020<br>රොහාන් වැලිවිට | 589-607 |
| XVIII. | • පැ.අංක - 432/2020<br>ආචාර්ය නාලක හර්ෂජීව ගොඩහේව<br>• පැ.අංක - 433/2020<br>ධම්මික මන්ජිර පෙරේරා | 608-628 |
| XIX. | • පැ.අංක - 619/2020<br>නිශාන්ත ආසිරි ප්‍රනාන්දු<br>• පැ.අංක - 375/2020<br>එස්.කේ.කමින්ද හර්ෂජිත් | 629-649 |
| XX. | පැ.අංක - 04/2020<br>ගමගේ තිළිණ සජෝත  වින්සන්ට් | 650-703 |


## (දෙවන වෙළුම)


| | | |
|---|---|---|
| XXI. | පැ.අංක - 1969/2020<br>අරුමාදුර වින්සන්ට් ප්‍රේමලාල් සිල්වා | 704-720 |
| XXII. | පැ.අංක - 115/2020<br>ලලිත් අනුරුද්ධ ජයසිංහ | 721-860 |
| XXIII. | පැ.අංක - 238/2020<br>ප්‍රේම ආනන්ද උදලාගම | 861-870 |
| XXIV. | පැ.අංක - 885/2020<br>සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් | 871-892 |
| XXV. | පැ.අංක - 1116/2020<br>ජාලිය චිත්‍රාන් වික්‍රමසූරිය | 893-906 |
| XXVI. | පැ.අංක - 28/2020<br>කහදගමගේ මහින්දරත්න | 907-915 |

| | | |
|---|---|---|
| XXVII. | පැ.අංක - 1091-1092/2020<br>චන්ද්‍රපාල ලියනගේ | 916-931 |
| XXVIII. | පැ.අංක - 1131/2020<br>සනත් ප්‍රියන්ත දළුවත්ත | 932-940 |
| XXIX. | පැ.අංක - 141/2020<br>විමල් රූබසිංහ | 941-958 |
| XXX. | • පැ.අංක - 402/2020<br>ඩී.එම්.එස්.දිසානායක<br>• පැ.අංක - 206/2020<br>ඩී.එම්.සුජාතා දමන්ති ජයරත්න | 959-978 |
| XXXI. | පැ.අංක - 50/2020<br>නිශ්ශංක යාපා සේනාධිපති | 979-1063 |
| XXXII. | පැ.අංක - 1807/2020<br>මේජර් ජනරාල් පාලිත ප්‍රනාන්දු | 1064-1081 |
| XXXIII. | පැ.අංක - 431/2020<br>වික්ටර් සමරවීර | 1082-1092 |
| XXXIV. | පැ.අංක - 184/2020<br>රෝහිත බෝගොල්ලාගම | 1093-1114 |
| XXXV. | පැ.අංක - 007/2020<br>මෝසස් රංගජීව නෙවමාල් | 1115-1143 |
| XXXVI. | පැ.අංක - 12/2020<br>ළමාහේවගේ එමිල් රංජන් | 1144-1152 |
| XXXVII. | • පැ.අංක - 1081/2020<br>උදයංග වීරතුංග | 1153-1167 |

| | | |
|---|---|---|
| XXXVIII. | • පැ.අංක - 1080/2020<br>උදයංග වීරතුංග | 1168-1191 |
| XXXIX. | • පැ.අංක - 650/2020<br>ඥානලිංගම් ධනේෂ්වරී<br>• පැ.අංක - 34/2020<br>පී.එල්.අයි.පෙරේරා<br>• පැ.අංක - 269/2020<br>ජී.ඒ.මාලනි<br>• පැ.අංක - 403/2020<br>කේ.වී.රංජනි මල්කාන්ති | 1192-1204 |
| XL. | පැ.අංක - 1842/2020<br>සේපාල රත්නායක | 1205-1235 |
| XLI. | පැ.අංක - 427/2020<br>කුමුදුමාල් චන්දන පැල්පිට | 1236-1239 |
| XLII. | පැ.අංක - 1070/2020<br>එල්.එම්.තිස්ස විමලසේන | 1240-1249 |
| XLIII. | පැ.අංක - 1940/2020<br>නුගදූව විතානගේ කුමාර ජයකාන්ත | 1250-1255 |
| XLIV. | පැ.අංක - 77/2020<br>පී.කේ.ඩබ්.ආර්.එම්.ටී.බී.පිලපිටිය | 1256-1263 |
| XLV. | පැ.අංක - 18/2020<br>ලේකම් මුදියන්සේලාගේ මාලනී කුමාරි | 1264-1277 |
| XLVI. | පැ.අංක - 1941/2020<br>චමින්ද පුෂ්පකුමාර අතුලුවගේ | 1278-1292 |

| | | |
|---|---|---|
| XLVII. | පැ.අංක - 317/2020<br>එස්.එම්. චමින්ද ප්‍රසාද් සමරකෝන් | 1293-1428 |

## ( තෙවන වෙළුම)

| | | |
|---|---|---|
| XLVIII. | පැ.අංක - 856/2020<br>හෙට්ටිආරච්චිගේ උපාලි ගුණසේකර | 1429-1435 |
| XLIX. | පැ.අංක - 893/2020<br>එම්.එස්.පී. මල්ලවගේ | 1436-1448 |
| L. | පැ.අංක - 22/2020<br>කපිල ප්‍රියදර්ශන ආරියවංශ | 1449-1480 |
| LI. | පැ.අංක - 408/2020<br>උපාලි ලියනගේ | 1481-1485 |
| LII. | පැ.අංක - 615/2020<br>අංගොඩගේ දොන් සුමිත් චම්මික පෙරේරා | 1486-1494 |
| LIII. | පැ.අංක - 43/2020<br>ඉමදූවගේ ඉන්දික සම්පත් | 1495-1506 |
| LIV. | • පැ.අංක - 325/2020<br>ආර්.පී.ඩී.තාරක සෙනවිරත්න<br>• පැ.අංක - 326/2020<br>ජගත් පී.විජේවීර | 1507-1555 |
| LV. | පැ.අංක - 414/2020<br>පියදාස කුඩාබාලගේ | 1556-1579 |
| LVI. | පැ.අංක - 416/2020<br>කොක්කාවිට ලියනගේ ලසන්ත බණ්ඩාර | 1580-1601 |
| LVII. | පැ.අංක - 415/2020<br>ඩබ්ලිව. ඒ. එස්. ප්‍රසන්න නානායක්කාර | 1602-1620 |

LVIII. පැ.අංක - 29/2020 1621-1648

පී.ජී.ආර්. චිත්‍රානන්ද අබේරාජ් ගම්ලත්

LIX. පැ.අංක - 352/2020 1649-1672

එච්.කේ.ඩී.ඩබ්ලිව්. නීල් බණ්ඩාර හපුහින්න

LX. • පැ.අංක - 24/2020 1673-1821

ශම්මි අර්ජුන කුමාරරත්න

• පැ.අංක - 200/2020

ආර්.එම්.පී.කුමාර රාජපක්ෂ

• පැ.අංක - 198/2020

ඩබ්ලිව්.විනි ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන

• පැ.අංක - 196/2020

එස්.එම්.රවින්ද්‍ර රූපසේන

• පැ.අංක - 194/2020

වයි.එම්. චමින්ද කුමාර අබේරත්න

• පැ.අංක - 197/2020

එස්.එම්.කනිෂ්ක ගුණරත්න

• පැ.අංක - 199/2020

අයියසාමි බාලසුබ්‍රමනියම්

• පැ.අංක - 195/2020

ඩී.ජී.තරංග ප්‍රසාද් ගමගේ

• පැ.අංක - 104/2020

ටී.එරන්ද රදිෂ් පිරිස්

• පැ.අංක -239/2020

එස්.ජ්. හේමචන්ද්‍ර පෙරේරා

- පැ.අංක - 31/2020

  ටී.ටොෂිනාත් ප්‍රබෝධ සිරිවර්ධන

- පැ.අංක - 231/2020

  පී.පී.වසන්ත සුදේශ කුමාර උලුගෙදර

- පැ.අංක - 1052/2020

  වර්ණකුලසූරිය අනුර ජයලත්

- පැ.අංක - 347/2020

  තුවාන් නසාර් මුතාලිප්

LXI. • පැ.අංක - 204/202 1822-1941

  ඒ.එච්.ඒ.ලසන්ත විමලවීර

- පැ.අංක - 239/2020

  එස්.ඒ.හේමචන්ද්‍ර පෙරේරා

- පැ.අංක - 241/2020

  යූ. ප්‍රභාත් දුමින්ද විරරත්න

- පැ.අංක - 242/2020

  එම්.පී.නිශාන්ත කුමාර

- පැ.අංක - 253/2020

  එස්.එම්.චන්ද්‍රාබය ජයසූරිය

- පැ.අංක - 257/2020

  ජී.ඒ.චාමික සුමිත්

- පැ.අංක - 296/2020

  ජී.ඒ. ප්‍රියන්ත කුමාර සෝමසූරිය

- පැ.අංක - 297/2020

  එච්.එම්.නිශාන්ත ජයතිලක

- පැ.අංක - 353/2020

බණ්ඩාර දිසානායක බුලත්වත්ත

- පැ.අංක - 232/2020

  කේ.ඒ.ධම්මික අමල් කරුණාසේකර

- පැ.අංක - 203/2020

  රාජපක්ෂගේ ලලිත් රාජපක්ෂ

10. කොමිෂන් සභාවේ අවධානයට ලක්වූ පැමිණිලි

| | | |
|---|---|---|
| I. | පැ.අංක - 1885/2020<br>විලියම් විජේසිංහ ගමගේ | 1942-1949 |
| II. | පැ.අංක - 1968/2020<br>කිරුකුමාර් නඩේසන් | 1950-1956 |
| III. | පැ.අංක - 956/2020<br>ජේ.එම්. හද්‍රානි ජයවර්ධන | 1957-1967 |
| IV. | පැ.අංක - 571/2020<br>ජේ.ඒ.ආර්. ප්‍රදීප් ජයසූරිය | 1968-1972 |
| V. | පැ.අංක - 434/2020<br>ජේ.එම්.නිමල්සිරි ලක්ෂ්මන් | 1973-1977 |
| VI. | පැ.අංක - 1871/2020<br>විසිදාගමගේ අජිත් පුෂ්පකුමාර | 1978-1981 |
| VII. | පැ.අංක - 950/2020<br>කේ.එම්. ප්‍රියන්ත ගුණතිලක බණ්ඩාර | 1982-1986 |
| VIII. | පැ.අංක - 1141/2020<br>එම්.අන්සාර් ඉර්ෆාන් ෆකිර්ඩීන් | 1987-1992 |
| IX. | පැ.අංක - 1140/2020<br>සූරේෂ් චන්දන පල්ලේගම | 1993-1998 |
| X. | පැ.අංක - 60/2020 | 1999-2005 |

ඩී.එම්.අනුරාධ කාංචන බණ්ඩාර

XI. පැ.අංක - 555/2020 2006-2014

ඒ.ආර්.පී.ඩබ්.බී.දේදුනුපිටිය

XII. පැ.අංක - 551/2020 2015-2018

ඊ.සී.පී.ආර්.පතිරණ

XIII. පැ.අංක - 554/2020 2019-2026

වලහක මුදලිගේ සරත් පෙරේරා

XIV. පැ.අංක - 274/2020 2027-2030

ලැබුන හේවගේ රංජිත් සේපාල

XV. පැ.අංක - 1320/2020 2031-2035

දෝන නිශාන්තා කමනි හෙට්ටිආරච්චි

XVI. පැ.අංක - 567/2020 2036-2037

මර්වින් ප්‍රනාන්දු පුල්ලේ

XVII. පැ.අංක - 610/2020 2038-2039

අයිවන් ද සිල්වා

11. I . ඉල්ලා අස්කරගත් පැමිණිලි 2040

II . බහා තබන ලද පැමිණිලි 2041

III . නිශ්ප්‍රභා කරන ලද පැමිණිලි 2042

12. කොමිෂන් සභාවට ලැබී ඇති පැමිණිලි

පිළිබඳ සාරාංශය 2043

# 1. පසුබිම

ඉන්දියන් සාගරයේ මුතු ඇටයයි විරුදාවලිය ලත් මෙම මනරම් දිවයිනෙහි ඒකීයභාවය ඉතිහාසයේ විවිධ යුගයන්හි එල්ල වූ විදේශීය ආක්‍රමණ වලින් සහ දේශීය වශයෙන් පැනනැගුණු ආක්‍රමණික ස්වභාවයේ කැරලිවලින් සුනු විසුනු වී ගියේය. එවැනි සෑම අවස්ථාවකදීම යුගයේ වීරයන් පහළ වූ අතර ඔවුන් ආක්‍රමණිකයන් මෙන්ම දේශීය කැරලිකරුවන්ද පලවා හැර රටේ ඒකීයභාවය සුරක්ෂිත කිරීමට අභීතව සටන් කළහ. අවසන් වශයෙන් බ්‍රිතාන්‍ය ජාතිකයින් ශ්‍රී ලංකාව ඔවුන්ගේ යටත් විජිතයක් බවට පත්කරගෙන ශතවර්ෂාධික කාලයක් ගෙනගිය පාලනයෙන් රට මුදවා ගැනීමට මහත් අරගල සිදු කරමින් 1948 වර්ෂයේදී නිදහස ලබාගෙන ඒකීය රාජ්‍යයක් තුළ ලාංකික ජනතාවට සාමකාමී ලෙස ජීවත්වීමේ වරම ලබාදීමට මෙම දිවයිනේ බිහිවූ ජාතික වීරයින්ට අවකාශය ලැබිණි. එසේ වුවත් එසේ ලබාගත් නිදහසට 1971 වර්ෂයේ දියත් කළ ත්‍රස්තවාදී කැරැල්ලෙන් බරපතල හානි පැමිණුනි. එම ත්‍රස්තවාදී කැරැල්ලේ ගිනි පුපුරු නිවී යාමටත් ප්‍රථම 1975 වර්ෂයේදී යාපනයේ නගරාධිපති දොර අප්පා මහතාට වෙඩි තබමින් ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි ත්‍රස්තවාදීන් විසින් නැවතත් ශ්‍රී ලංකාවේ ඒකීය භාවයට සහ සාමකාමීත්වයට බාධා හා තර්ජන පමුණුවමින් සිවිල් වැසියන් ඝාතනය කරමින් රට දෙකඩ කර වෙනම පාලන තන්ත්‍රයක් ඇති කිරීම සඳහා ඇමරිකාව, එංගලන්තය ඇතුළු බටහිර රාජ්‍ය කීහිපයක ආශිර්වාදයෙන් යාපනය ප්‍රදේශය මුල්කරගෙන ලේ හලන බිහිසුණු අරගලයක් දියත් කළහ.

1975 වර්ෂයෙන් පසුව මෙරට පාලනය භාරගත් ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන, ජනාධිපති ආර්.ප්‍රේමදාස, ජනාධිපති ඩී.බී.විජේතුංග, ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ යන රාජ්‍ය නායකයින් මෙම ද්‍රවිඩ ඊලාම් ත්‍රස්තවාදී කැරැල්ල මැඩ පැවැත්වීමට අසමත් වූහ.

මෙම කාලය තුළදී මෙම ත්‍රස්තවාදී කැරැල්ල කොතෙක් දුරට වර්ධනය වූවා ද කිවහොත්, වර්ෂ 2005 වන විට ලංකාවේ පැරණිම රාජධානිය වූ අනුරාධපුරයෙන් ඔබ්බට යාපනය දෙසට සාමාන්‍ය පුද්ගලයෙකුට යාමට නොහැකි වන අන්දමට මෙම දිවයිනෙහි පාලන තන්ත්‍රය දෙකඩ වී ගොස් තිබුණි. අවුරුදු තිහකට වැඩි මෙම අඳුරු යුගය තුළ ද්‍රවිඩ ඊලාම් කොටි ත්‍රස්තවාදීන් බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ වූද ලෝක උරුමයක් වූද ශ්‍රී දළදා මාලිගාව, ශ්‍රී මහා බෝධිය ඇතුළු බෞද්ධ සිද්ධස්ථාන රැසක් විනාශයට පත්කර ලෙයින් තෙත් කළහ. ජනාධිපති රණසිංහ ප්‍රේමදාස ඇතුළු දේශපාලනඥයින්, සිවිල් පුරවැසියන්, ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් සහ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඇතුළු විශාල පිරිසක් ඝාතනය කළහ. කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ ඇතුළු මහජන දේපල බෝම්බ දමා වෙඩි තබා විනාශයට පත් කළහ. 2005 වර්ෂය ළඟා වන විට ශ්‍රී ලංකාව අරාජික තත්ත්වයක් කරා ළඟා වෙමින් තිබුණි.

මෙවන් අඳුරු යුගයක දී 2005 වර්ෂයේ පැවති ජනාධිපතිවරණය ජයග්‍රහණය කරමින් මහින්ද රාජපක්ෂ මැතිතුමා ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්වූ අතර එතුමාගේ ප්‍රධානත්වයෙන් නව රජයක් බිහි කර, ආරක්ෂක ලේකම්වරයා වශයෙන් පත්වූ වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ හමුදා

අත්දැකීම් උපයෝගී කරගෙන ත්‍රිවිධ හමුදාව සහ පොලිස් බලකාය මෙහෙයවමින් ද්‍රවිඩ ඊලාම් කොටි ත්‍රස්තවාදීන්ගේ යුද්ධයට එරෙහි මානුෂීය සටන නව මුහුණුවරකින් දියත් කරන ලදී. අවුරුදු කීපයක් පුරා සිදුකරන ලද බිහිසුණු සටන් වලින් පසුව 2009 වර්ෂයේ මැයි 19 වන දින ද්‍රවිඩ ඊලාම් කොටි ත්‍රස්තවාදීන් පලවා හරිමින් ශ්‍රී ලංකාව නැවතත් ඒකීය රාජ්‍යයක් බවට පත් කිරීමට මෙම වීරෝදාර නායකයින්ට සහ රණවිරුවන්ට හැකිවිය.

ද්‍රවිඩ ඊලාම් කොටි ත්‍රස්තවාදීන් පෝෂණය කළ බටහිර නායකයින්ට මෙම විජයග්‍රහණය ඔවුන්ගේ මනදොල සපුරන්නක් නොවීය. එබැවින්, ද්‍රවිඩ ඊලාම් යුද්දයේ අවසන් මානුෂීය සටනේදී යුධ අපරාධ සිදුකළ බවට අභූත චෝදනා, ඊලාම් යුද්දයේ සැබෑ විරුවන්ට එරෙහිව ද්‍රවිඩ ඩයස්පෝරාවෙන් පන්නරය ලත් බටහිර නායකයින් විසින් එල්ල කරන ලදී.

2015 ජනවාරි 8 වන දින පිහිටුවනු ලැබූ නව රජය මේ සඳහා සුදුසුම තෝතැන්න බවට තෝරාගත් බටහිර නායකයන් නව රජයේ සම අනුග්‍රාහකත්වය ඇතිව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සැසියේදී 30/1 යෝජනාවලිය සම්මත කරගන්නා ලදී. මෙම යෝජනාවලිය දඩමීමා කරගත් නව රජය තම සිතැඟි ඉටුකර ගැනීමේ අභිප්‍රාය ක්‍රියාත්මක කරමින් තම දේශපාලන සතුරන්ගෙන් පළිගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කල බවටත්, එසේම, මෙම පළිගැනීම් සිදු කිරීම සඳහා, අග්‍රාමාත්‍යවරයාගේ විෂයපථය යටතේ ක්‍රියාත්මක කෙරුණු දූෂණ විරෝධී කමිටුව නැමැති නිළ නොවන සංවිධානයක් පිහිටුවා එහි නිර්දේශයන්, ඒ සමගම පිහිටුවා ගත් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය නැමැති නිළ නොවන පොලිස් ඒකකයක් මගින් ද,

එසේම අල්ලස් හෝ දූෂණ චෝදනාව විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් විශේෂ විමර්ශනය ඒකකය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ද, ක්‍රියාත්මක කළ බවටත්, සඳහන් කරමින් පලිගැනීමට ලක්වූ පුද්ගලයන්ගෙන් පැමිණිලි ගලා එන්නට විය. ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඇතුළු  යුධ විරුවන්ට එරෙහිව අසත්‍ය නඩු පවරා ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කර  ඇමරිකාව, මහා බ්‍රිතාන්‍ය ඇතුළු බටහිර රාජ්‍ය නායකයින් සහ  එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම සතුටු කිරීමට නව රජය ක්‍රියා කරන බවට විවිධ මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධියේම චෝදනා එල්ල විය. යුධ නායකයින් හා රණවිරුවන් සිරගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙසට තමන්ට මෙම දේශපාලනඥයින් බලපෑම් කරන බවට  රාජ්‍ය තන්ත්‍රයේ  ඉහළ නිලතල දැරූ නිලධාරීන් ප්‍රසිද්ධියේම නව රජයට එරෙහිව චෝදනා කළහ.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය, පොලිස් විශේෂ විමර්ශන ඒකකය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මහජනයා විසින් සිදු කරනු ලබන සමහර පැමිණිලි නොසලකා හරින බවටත් දේශපාලන පළිගැනීම සඳහා රජයට අවශ්‍ය පැමිණිලි විභාග කර නඩු පැවරීම් සිදු කරන බවටත් චෝදනා එල්ල විය.

එබැවින් මෙම පැමිණිලි සහ චෝදනා පිළිබඳව පරීක්ෂණ කිරීමට සහ විමර්ශන සිදු කිරීමට 2019 නොවැම්බර් මස 16 වන දින පැවති ජනාධිපතිවරණයෙන් බලයට පැමිණි අතිගරු ජනාධිපති ගෝඨාභය

රාජපක්ෂ මැතිතුමා විසින් මෙම කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදී.

## 2. කොමිෂන් සභාවේ සංයුතිය

අතිගරු ජනාධිපතිතුමන් විසින් 2020 ජනවාරි මස 9 වෙනි දින අංක 2157/44 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කළ පරීක්ෂණ කොමිෂන් සභාවට පහත නම් සඳහන් කොමසාරිස්වරුන් තිදෙනා පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 අධිකාරිය) 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පත් කරන ලදී.

1. ගරු උපාලි අබේරත්න මැතිතුමා
   විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර

2. ගරු දයා චන්ද්‍රසිරි ජයතිලක මැතිතුමා
   විශ්‍රාමික අභියාචනාධිකරණ විනිශ්චයකාර

3. චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමා
   විශ්‍රාමික පොලිස්පති

ගරු උපාලි අබේරත්න මැතිතුමා උක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ඉහත කී අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් පත් කරන ලදී.

## 3. නිල කාලය

2020 ජනවාරි මස 22 වන දින අංක 2159/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත 2020 ජනවාරි මස 9 වන දින, අංක 2157/44 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ස්ථාපිත කළ මෙම කොමිෂන් සභාවේ අවසන් වාර්තාව 2020 ජනවාරි මස 9 වන දින සිට මාස හයක කාලසීමාවක් තුළ අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතු බවට නියම කරන ලදී. ඉන් පසුව කොමිෂන් සභාවේ නිල කාලය 2020 ජූලි මස 08 වන දින අංක 2183/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් 2020 නොවැම්බර් මස 09 වන දින දක්වා දීර්ඝ කරනු ලැබූ අතර නැවත වතාවක් 2020 නොවැම්බර් මස 09 වන දින අංක 2201/05 දරන ගැසට් පත්‍රයෙන් කොමිෂන් සභාවේ නිල කාලය 2020 නොවැම්බර් මස 25 වන දින දක්වා දීර්ඝ කරන ලදී.

## 4.I කාර්ය මණ්ඩලය

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 19(1) වගන්තිය යටතේ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පර්ල් කේ.වීරසිංහ මහත්මිය (විශ්‍රාමික ලේකම්) ජනාධිපති ලේකම් විසින් පත් කරන ලදී. ඒ අනුව කාර්ය මණ්ඩලය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය.

| | | | |
|---|---|---|---|
| I. | පර්ල් කේ.වීරසිංහ මහත්මිය | - | කොමිෂන් සභාවේ ලේකම් |
| II. | දක්ෂිත ශ්‍රී දේවපුර | - | නීති නිලධාරි |
| III. | ඩී.එන්.දික්කුඹුර මයා | - | පරිපාලන නිලධාරි |
| IV. | එස්.ඒ.රෝහණ මයා | - | භාෂණ පරිවර්තක |
| V. | ඒ.ඒ.ජී.අබේවර්ධන මයා | - | පරියේෂණ නිලධාරි |
| VI. | කේ.සී.මල්කාන්ති මිය | - | කළමනාකරණ සහකාර |
| VII. | පී.එස්.කලටුවගේ මිය | - | කළමනාකරණ සහකාර |
| VIII. | ඕ.පී.පී.පත්මා කුමාරි මිය | - | ලඝු ලේඛිකා |
| IX. | මාලා ප්‍රියන්ති සේනාධීර මිය | - | ලඝු ලේඛිකා |
| X. | කේ.ඩී.එස්.එස්. සෝමරත්න මිය | - | ලඝු ලේඛිකා |
| XI. | ඉන්ද්‍රානි බෝපගේ මිය | - | ලඝු ලේඛිකා |
| XII. | අනුලා රාමනායක මිය | - | ලඝු ලේඛිකා |
| XIII. | ග්‍රේටා මාලනි සේනාධීර මිය | - | ලඝු ලේඛිකා |

| | | | |
|---|---|---|---|
| XIV. | සරසි ඕෂධී අදිකාරම් මෙනෙවිය | - | ලඝු ලේඛිකා |
| XV. | ජී.ඒ.පී.මධුෂානි මෙනවිය | - | කළමනාකරණ සහකාර |
| XVI. | කේ.අයි.සෙව්වන්දි මිය | - | කළමනාකරණ සහකාර |
| XVII. | එම්.ඒ.එන්.ඒ.මුණසිංහ මයා | - | කාර්යාල කාර්ය සහායක |
| XVIII. | පී.ඩී.චන්ද්‍රසිංහ මයා | - | කාර්යාල කාර්ය සහායක |
| XIX. | එස්.එච්.කසුන් ලක්ෂාන් මයා | - | කාර්යාල කාර්ය සහායක |
| XX. | ආර්.ඒ.තසිඳු නිසංසල මයා | - | කාර්යාල කාර්ය සහායක |

## 4.II නීතිපති දෙපාර්තමේන්තුව

කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු වලට සහායවීමට නීතිපතිතුමා විසින් පහත නම් සඳහන් රජයේ නීතිඥ මණ්ඩලය පත් කරන ලදී.

I. අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ රොහාන්ත අබේසූරිය මහතා.

II. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ශානක විජේසිංහ මහතා.

III. රජයේ අධිනීතිඥ රන්දිමා ප්‍රනාන්දු මහත්මිය.

## 4.III පොලිස් විමර්ශන ඒකකය

කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා සහකාර පොලිස් අධිකාරිවරයෙකුගෙන් සමන්විත පොලිස් ඒකකයක් ස්ථාපිත කරන ලදී.

| | | | |
|---|---|---|---|
| I. | එන්.වී.ලෝරන්ස් මයා | - | සහකාර පොලිස් අධිකාරි |
| II. | ආර්.ඒ.ජී.ධම්මික මයා | - | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| III. | එන්.එම්.එස්.හේරත් මයා | - | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| IV. | ආර්.ජී.එල්.ඩබ්.රාජපක්ෂ මයා | - | පොලිස් පරීක්ෂක |
| V. | කේ.ඒ.සී.රණසිංහ මයා | - | උපපොලිස් පරීක්ෂක |
| VI. | ජී.පී.තෙබුලන්ද මිය | - | කා.පො.සැ. 679 |
| VII. | ඩී.ඩී.මාලා පුෂ්පකුමාරි මිය | - | කා.පො.සැ. 1384 |
| VIII. | ඩබ්.ඊ.ආර්. ප්‍රනාන්දු මයා | - | පො.සැ. 37846 |
| IX. | එම්.ඩී.සී.එච්.රණසිංහ මයා | - | පො.කො.66381 |
| X. | එච්.එම්.ඩී.ආර්.කුමාර මයා | - | පො.කො. 72037 |
| XI. | ආර්.එම්.එන්.රත්නායක මයා | - | පො.කො. 74136 |
| XII. | ජේ.ඒ.ඩී.සංජය මයා | - | පො.කො. 77982 |
| XIII. | ඩී.ඩී.ආර්.රුවන් කුමාර මයා | - | පො.කො. 86580 |
| XIV. | ඒ.ටී.සී.ඩී.අමදෝරු මයා | - | පො.කො.රි. 80589 |

## 5. අධිකරණ බලය සහ කොමිෂන් සභා පරිශ්‍රය

වර්ෂය 2020 ජනවාරි මස 22 වැනි දින අංක 2159 /16 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත වර්ෂ 2020 ජනවාරි මස 9 වැනි දින අංක 2157/44 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ස්ථාපිත කරන ලද මෙම කොමිෂන් සභාවට, වර්ෂ 2015 ජනවාරි මස 8 වන දිනයෙන් ආරම්භව වර්ෂ 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වන කාලසීමාව තුළ සිදුවියැයි කියනු ලබන දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීම සහ විශේෂයෙන්ම මතු දැක්වෙන කාරණා පිළිබඳව පරීක්ෂණ සහ සියලුම විමර්ශන පවත්වා අවසන් වාර්තාවක් හෝ අතුරු වාර්තාවක් ඉදිරිපත් කිරීමට බලය පවරා ඇත. එකී කාරණා වන්නේ :

(අ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් විමර්ශන ඒකකය හෝ ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, පරිපාලනය සම්බන්ධයෙන් අයථා ක්‍රියා අක්‍රමිකතා නැතහොත් ඊට අදාළ වන නිසි පිළිවෙත් ප්‍රතිමාන මාර්ගෝපදේශ කාර්ය පටිපාටීන් සහ ප්‍රශස්ත පරිචයන් නොසලකා හැරීමක් සිදු වී තිබේ ද යන වග;

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය හෝ ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්

කෙරුණු කිසියම් විමර්ශනයන් කෙරෙහි කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම අවහිර කිරීමක් හෝ වළක්වාලීමක් සිදු කිරීම හේතුකොටගෙන කිසියම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට සෘජුව හෝ ව්‍යංගයෙන් හානියක් අලාභයක් පීඩාවක් හෝ අනර්ථයක් සිදුව තිබේ ද යන වග;

(ඈ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය හෝ ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන පැවැත්වීමේ කාර්යය පවරනු ලැබූ කිසියම් නිලධාරීන් ඉහත කී දූෂණ විරෝධී ඒකකය ඇතුළු පාර්ශ්වයන් විසින් කෙරුණු අයුතු බලපෑම් යටතේ ක්‍රියා කර තිබේ ද යන වග;

(ඇ) ඉහත කී දූෂණ විරෝධී ඒකකය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය, ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය, ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාළව නැතහොත් කිසියම් වීථියක් පසු බැලීම හෝ යුක්තිය පසිඳලීමට අදාළව කිසියම් තැනැත්තෙක් දේශපාලනමය වශයෙන් පලිගැනීමට ලක් කිරීමේදී බලය අනිසි ලෙස යෙදවීමක් අවභාවිත කිරීම දූෂණ හෝ කිසියම් වංචනික ක්‍රියාවක් සිදු කර තිබේ ද යන වග;

(ඉ) 2015 ජනවාරි මස 8 වැනි දින ඇරඹී 2019 නොවැම්බර් මස 16 වන දින අවසන් වූ කාලසීමාව තුළදී උපාය ආයතන වෙත ඉදිරිපත් වී ඇති පැමිණිලි අතරින් මෙම අධිකාරි පත්‍රය සඳහන්

දූෂණ විරෝධී ඒකකය විසින් විමර්ශනයට භාජනය කළ යුත්තේ කවර තැනැත්තෙකු ද යන වග පළමුව තීරණය කොට අනතුරුව විමර්ශනය ආරම්භ කළේ යැයි සැලකෙන සියලු පැමිණිලි හා ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති ජාතික ආරක්ෂාවට බලපාන ලබන පැමිණිලි කවරේදැයි සොයා බලා, එකී තුන්වන පාර්ශවයේ බලපෑම් හේතුවෙන් නීතිය පසිඳලීමේදී හෝ යුක්තිය පසිඳලීමේදී යම් තැනැත්තෙකු අගතියට පත් වන්නේ යැයි සැලකෙන පරීක්ෂණ විමර්ශන හෝ නීති කටයුතු වලදී යුධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය හා රාජ්‍ය සේවය සම්බන්ධයෙන් ජාතික ආරක්ෂාව කෙරෙහි බලපාන පරීක්ෂණ විමර්ශන හෝ නීති කටයුතු වලදී අන් කවර හෝ ආකාරයකින් අගතියට පත් වී ඇතැයි සලකනු ලබන අවස්ථා වලදී එලෙස අගතියට පත් වීම හෝ ජාතික ආරක්ෂාවට හා රාජ්‍ය සේවාවන්ට අහිතකර බලපෑම් වැළැක්වීමට අවශ්‍ය ක්ෂණික පියවර ගැනීම;

සහ, මෙම අධිකාරි පත්‍රය ප්‍රකාර පරීක්ෂණයට භාජනය කරනු ලබන ඕනෑම කරුණක්/කරුණු පිළිබඳව නිර්දේශයන් කිරීම සඳහා මෙම කොමිෂන් සභාවට බලය පවරා ඇත.

කොමිෂන් සභා කාර්යාලය සහ සාක්ෂි විභාග කිරීමේ ශාලාව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ස්ථාපිත කොට පරීක්ෂණ සහ සියලුම විමර්ශන ආරම්භ කරන ලදී .

## 6. පැමිණිලි භාර ගැනීම

පරීක්ෂණ කොමිෂන් සභාව වෙත පැමිණිලි සහ තොරතුරු ඉදිරිපත් කරන ලෙසට මහජනතාව දැනුවත් කරමින් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ දැන්වීම් ප්‍රචාරය කරන ලදී. පැමිණිලි භාර ගැනීමේ අවසාන දිනය 2020 පෙබරවාරි මස 24 වන දින විය. එසේ වුවද කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි සංඛ්‍යාව සලකා බලා පැමිණිලි භාර ගැනීමේ අවසාන දිනය 2020 මාර්තු 06 වැනි දින දක්වා දීර්ඝ කරන ලදී. මේ අනුව අවසාන දිනය වනවිට පැමිණිලි එක්දාස් පන්සීයක් කොමිෂන් සභාව වෙත ලැබී තිබුණි. අවසාන දිනයෙන් පසුව ද ප්‍රමාදයට සාධාරණ හේතු දක්වා තිබූ පැමිණිලි බාරගෙන නියමිත පරිදි ක්‍රියාකිරීමට කොමිෂන් සභාව කටයුතු සම්පාදනය කරන ලදී. සියලුම පැමිණිලි නියමිත අංකය යටතේ ලියාපදිංචි කිරීමට විධිවිධාන යෙදිණි. මෙම සියලුම පැමිණිලි දේශපාලන පළිගැනීම් හේතුකොටගෙන පැනනැගුණු පැමිණිලි වුවත් ඉන් බොහෝ ප්‍රමාණයක් මෙම කොමිෂන් සභාවේ විෂය පථය තුළ විමර්ශනය සහ හෝ පරීක්ෂණය කළ නොහැකි පැමිණිලි බවට කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව අගමැතිතුමා විසින් පත්කරන ලද දේශපාලන පලිගැනීම් පිළිබඳ සොයාබැලීමේ කමිටුව වෙත එම පැමිණිලි යැවීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

# 7. මූලික විමර්ශන සහ සාක්ෂි විභාග

කොමිෂන් සභාව වෙත ලැබුණු සියලු පැමිණිලි පරීක්ෂාකර කොමිෂන් සභාවේ විෂය පථය තුළට වැටෙන බරපතළ ස්වභාවයේ දේශපාලන පලිගැනීම් වලින් පැන නැගුණු පැමිණිලි මූලික පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීම සඳහා කොමිෂන් සභාවේ පොලිස් ඒකකය වෙත යොමු කරන ලදී. මෙම පරීක්ෂණ තුළින් පැමිණිලිකරුවන්ගේ සහ ඔවුන්ගේ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීමත්, එම ප්‍රකාශ මත පැන නැගෙන ලේඛන සහ භාණ්ඩ සොයා ගැනීමත් සිදු කරන ලදී. මූලික පරීක්ෂණ වලින් පසුව පැමිණිලිකරුවන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විභාග කිරීම කොමිෂන් සභාව ඉදිරියේ සිදු කරන ලදී. විද්‍යුත් සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය උපකරණ සාක්ෂි විභාග කිරීමේ ශාලාව තුළ සවි කරන ලදී.

## 8. දූෂණ විරෝධී කමිටුව සහ එහි ලේකම් කාර්යාලය මගින් සිදු කළ පොදු දේපල අවභාවිතාව.

### සාක්ෂිකරු;

1. ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා

### වගකිවයුතු පුද්ගලයින්;

1. අගමැති රනිල් වික්‍රමසිංහ (සභාපති)
2. අමාත්‍ය මංගල සමරවීර
3. අමාත්‍ය පාඨලී චම්පික රණවක
4. අමාත්‍ය රාවුෆ් හකීම්
5. ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය නායක, සරත් ෆොන්සේකා
6. දෙමළ ජාතික සන්ධානය (TNA) නායක, ආර් සම්බන්ධන්
7. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ.සුමන්තිරන්
8. ජනතා විමුක්ති පෙරමුණේ නායක, අනුර කුමාර දිසානායක
9. නීතිඥ ජේ.සී.වැලිඅමුණ
10. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
11. මලික් සමරවික්‍රම
12. ආනන්ද විජයපාල
13. එස්.එස්.පී.ශානි අබේසේකර
14. ඒ.එස්.පී.ප්‍රේමශාන්ත
15. අයි.පී.නිහාල් අමරසිරි
16. ඩබ්ලිව්.ජේ.සී.සුජාතා කුමාරි

17. සී.අයි.වීරසේන
18. තුසිත් මුදලිගේ
19. ලාල් නානායක්කාර
20. අනුෂ කුමාරස්වාමි
21. දිනේෂ් පෙරේරා
22. හිටපු අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක

## තීරණය

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන රාජ්‍ය ව්‍යුහයට පටහැනිව පිහිටුවා ගත් ජාතික විධායක සභාවක් මගින් කැබිනට් මණ්ඩලයට නිර්දේශ කර පිහිටුවා ගත් දූෂණ විරෝධී කමිටුවක් මගින් එපරිදිම පිහිටුවා ගත් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය නැමැති නිල නොවන පොලිස් කොට්ඨාසයකට පැමිණිලි යොමු කරවා ගෙන දේශපාලන විරුද්ධවාදීන් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රඳවා තබා ගැනීමෙන් හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු කැබිනට් මණ්ඩලය විසින් "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා නීතියට අනුකූලව අවංකව ඉටු කරන බවටද ........ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවටද" යනුවෙන් ලබා දුන් දිවුරුම කඩ කර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරනු ලබයි.

2. කොමිෂන් සභාව ඉදිරියේ විමර්ශනය කළ පැමිණිලි වලින් ඉදිරිපත් වූ සාක්ෂි අනුව රජයේ සේවකයින් වන ඉහත නම්

සඳහන් වගඋත්තරකරුවන් විසින් ඉහත කී දූෂණ විරෝධී කමිටුව සහ එහි ලේකම් කාර්යාලය යන නිල නොවන සංවිධානයේ සේවය කිරීමෙන් හෝ සේවයට යෙදවීමෙන් අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇත.

3. ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් රාජ්‍ය නොවන සංවිධානයක කටයුතු කරමින් ඒ සඳහා රජයේ මුදල් වැටුප් වශයෙන් ලබා ගනිමින් පොදු දේපල පනතේ 05 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 386 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු  සපාරාධී සාවද්‍ය පරිහරණය කිරීමේ වරද සිදුකර ඇත.

4. ඉහත කී 22 වන වගඋත්තරකරු හිටපු අග්‍රාමත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරමින් අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂයෙන් රුපියල් මිලියන 33,714,807.59 ක මුදලක් එකී දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ වියදම් සඳහා ලබා දීමෙන් පොදු දේපල පනත යටතේ 05 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 389 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු සාපරාධී විශ්වාසය කඩ කිරීමේ වරද සිදු කර ඇත.

5. එකී රාජ්‍ය නොවන සංවිධානයක් වන දූෂණ මර්දන කමිටුවේ රැස්වීම් පැවැත්වීම සඳහා රාජ්‍ය ආයතනයක් වන අරලියගහ මන්දිරය පාවිච්චි කිරීමෙන් සහ පාවිච්චි කිරීමට ඉඩදීමෙන් ඉහත

කී වගඋත්තරකරුවන් විසින් පොදු දේපල අවභාවිතා කිරීමෙන් අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දූෂණය නැමැති වරද සිදු කර ඇත.

## නිර්දේශ

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දිවුරුම කඩ කිරීම සහ එමගින් ආණ්ඩුකම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීමේ වරද පිළිබඳව කරුණු විමර්ශනය කර දඬුවම් පැමිණවීම සඳහා දඬුවම් ලබාදීමට බලය ලත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් නොමැති බැවින් ඉහත සඳහන් තීරණ අංක 1හි දැක්වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන උල්ලංඝනය කිරීම් විමර්ශනය කර ඊට නියමිත දඬුවම් ලබා දීම සඳහා පාර්ලිමේන්තුවට නිර්දේශ ලබා දීමට බලය පැවැරෙන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීමට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

2. වගඋත්තරකරුවන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත්ව ඇති සාක්ෂි සහ ලේඛන අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට සහ නීතිපතිවරයා වෙත යැවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

2015 ජනවාරි 08 වන දින මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් පිහිටුවන ලද රජයේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් රනිල් වික්‍රමසිංහ

මහතා පත් කරන ලදුව ඔහුගේ ප්‍රධානත්වයෙන් කැබිනට් මණ්ඩලයක් ස්ථාපිත කරන ලදි.

2015 ජනවාරි මස 21 වන දින පවත්වන ලද නව රජයේ කැබිනට් මණ්ඩල රැස්වීමේ දී අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 15/0005/602/002 මගින් "වංචා හා දූෂණ විමර්ශනය සඳහා ඒකකය ස්ථාපිත කිරීම" යන මැයින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සහ විදුලි බල හා බලශක්ති අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 15/0003/615/002 මගින් "පසුගිය කාලයේ සිදුවී ඇති මහා පරිමාන දූෂණ සොයා බැලීම සඳහා විශේෂ කොමිෂන් සභා පත් කිරීම" යන අමාත්‍ය මණ්ඩල සංදේශය ද එකවර සලකා බලා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් යෝජනා කරන ලද පරිදි සහ ඔවුන්ගේ ජාතික විධායක සභාව විසින් සිදු කරන ලද නිර්දේශ සැලකිල්ලට ගනිමින් අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් තීරණ වලට එළැඹ ඇත.

(අ). පසුගිය රජය සමයේ සිදු වී ඇති මහා පරිමාන දූෂණ හා වංචා පිළිබඳව විමර්ශනය කිරීම ඒ සඳහා වගකිවයුත්තන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සහ අග්‍රාමාත්‍යවරයාගේ 2015.01.21 දිනැති සංදේශයේ ඇමුණුමෙහි දක්වා ඇති යෝජිත කෙටි කාලීන, දිගු කාලීන සහ සෙසු වැඩ සටහන් සැලකිල්ලට ගනිමින් එවැනි ක්‍රියා ඉදිරියේ දී නැවත ඇති වීම වැලැක්වීම පිණිස ගත යුතු පියවරයන් නිර්දේශ කිරීම සහ

එකී ඇමුණුමෙහි සාමාජිකත්වය යටතේ සඳහන් අයගෙන් සමන්විත දූෂණ විරෝධී කමිටුවක් ස්ථාපිත කිරීම.

(ආ). ඉහත (අ) හි සඳහන් දූෂණ විරෝධී කමිටුවට සහයවනු පිණිස රනිල් වික්‍රමසිංහ මහතාගේ 2015.01.21 දිනැති සංදේශයේ ඇමුණුමෙහි "අනු කමිටුව" යටතේ සඳහන අයගෙන් සැදුම්ලත් අනු කමිටුවක් පත් කිරීම.

(ඇ). ඉහත කී කැබිනට් සංදේශයේ ඇමුණුමේ පිටු අංක 03 හි ක්‍රියාමාර්ග යටතේ 1 සිට 5 දක්වා අවධාරණය කර ඇති කරුණු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිණිස එකී ඇමුණුමෙහි ක්ෂණික ප්‍රතිචාර කමිටුව යටතේ සඳහන් අයගෙන් සමන්විත ක්ෂණික ප්‍රතිචාර කමිටුවක් පත් කිරීම සහ

(ඈ). ඉහත කී අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇමුණුමේ අවසන් ඡේදයේ 1, 2 , 3 සහ 4 යටතේ සඳහන් වගකීම් එහි දක්වා ඇති අදාල තැනැත්තන් වෙත පැවරීම පිණිස අනුමැතිය ලබා දීම.

එසේම එකී කමිටුවල කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධාරීන්ගේ සහ විශේෂඥයන්ගේ සේවය ලබා ගැනීමට ද එක් එක් කමිටුවේ ලේකම්/ කැඳවුම්කරු වශයෙන් කටයුතු කිරීම පිණිස සුදුසු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් බඳවා ගැනීමට ද වැඩිදුරටත් තීරණය කර ඇත.

ඒ අනුව ජාතික විධායක සභාවේ අනුමැතිය ඇතිව ස්ථාපිත කරන ලද දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයින් වූයේ,

1) අගමැති රනිල් වික්‍රමසිංහ (සභාපති)

2) අමාත්‍ය මංගල සමරවීර
3) අමාත්‍ය පාඨලී චම්පික රණවක
4) අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ
5) අමාත්‍ය රාවුෆ් හකීම්
6) ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය නායක, සරත් ෆොන්සේකා
7) දෙමළ ජාතික සන්ධානය (TNA) නායක, ආර් සම්බන්ධන්
8) පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ.සුමන්තිරන්
9) ජනතා විමුක්ති පෙරමුණේ නායක, අනුර කුමාර දිසානායක
10) නීතිඥ ජේ.සී.වැලිඅමුණ
11) ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
12) මලික් සමරවික්‍රම
13) කමිටු ලේකම්

අනු කමිටුවේ සාමාජිකයින් වන්නේ,

1. අමාත්‍ය මංගල සමරවීර (සභාපති)
2. අමාත්‍ය අචාර්ය විජේදාස රාජපක්ෂ
3. නියෝජ්‍ය අමාත්‍ය එරාන් වික්‍රමරත්න
4. ජනතා විමුක්ති පෙරමුණේ නායක, අනුර කුමාර දිසානායක
5. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ.සුමන්තිරන්
6. නීතිඥ ජේ.සී.වැලිඅමුණ
7. මලික් සමරවික්‍රම

එකී කැබිනට් සංදේශයේ ඇමුණුම අනුව දූෂණ විරෝධි කමිටුවේ ව්‍යුහය අංශ 03 කින් සමන්විත වී ඇත. එනම්,

**දූෂණ විරෝධී කමිටුව**

**ACC (Anti-Corruption Committee)**

**(යෝජිත නම් ද සහිතව)**

↓

ක්ෂණික ප්‍රතිචාර කමිටුව
(Rapid Response Committee)

↓

අධ්‍යක්ෂ
ආනන්ද විජයපාල

↓

පොලීසිය
එස්.එස්.පී. ශානි අබේසේකර
ඒ.එස්.පී. ප්‍රේමශාන්ත
අයි.පී. නිහාල් අමරසිරි
ඩබ්ලිව්.ජේ.සී. සුජාතා කුමාරි
සී.අයි. වීරසේන
(Logistic Computer Transport)

අනුකමිටුව

↓

නීතිපති

↓

(රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ)
තුසිත් මුදලිගේ

↓

විශේෂඥ උපදේශකවරු
ලාල් නානායක්කාර
අනූෂා කුමාරස්වාමි
දිනේෂ් පෙරේරා

අධ්‍යක්ෂ (පරිපාලන)

↓

ලේකම් කාර්යාලය
අවශ්‍ය කාර්ය මණ්ඩලය
වාහන / දූරකථන

- ක්ෂණික ප්‍රතිචාර කමිටුව
- අනුකමිටුව
- අධ්‍යක්ෂ (පරිපාලන)

යන අංශ 03 මගින් ක්‍රියාත්මක කර ඇති ක්ෂණික ප්‍රතිචාර කමිටුවේ සාමාජිකයින් වූයේ,

1. ජනතා විමුක්ති පෙරමුණේ නායක, අනුර කුමාර දිසානායක (සම්බන්ධීකාරක)
2. තෝරාගත් අනුයුක්ත රාජ්‍ය නිලධාරීන්
3. තෝරාගත් අනුයුක්ත පොලිස් නිලධාරීන්
4. නීතිඥවරුන්
5. මූල්‍ය හා විගණන විශේෂඥයින්
6. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකාරකවරුන්
7. කමිටු ලේකම්

## අරමුණු සහ කාර්යභාරය

පසුගිය සමයේ සිදු වූ මහා පරිමාන වංචා සොයා බලා ඒවා හෙළිදරව් කිරීම හා වැරදි කරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ අනාගතයේ එබඳු සිදුවීම් ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය ප්‍රතිපාදන සැකසීම.

## වැඩසටහන

1. කෙටි කාලීන වැඩසටහන
2. දිගු කාලීන වැඩසටහන

## කෙටි කාලීන වැඩසටහන

1. ජනාධිපති මැතිවරණ සමයේ බෙදාහැරීම සඳහා ගෙනැවිත් දැනට ගබඩා කර ඇති භාණ්ඩ සොයා බලා ඒවා හෙළිදරව් කිරීම.
2. ඉඩම්, චංචල හා නිශ්චල දේපල දූෂිත ලෙස අත්පත් කර ගැනීම පිළිබඳව සොයා බලා ඒවා හෙළිදරව් කිරීම.

3. සේවක අර්ථ සාධක අරමුදල කොටස් වෙළඳ පොල වංචා හා දූෂණ පිළිබඳව සොයාබලා හෙළිදරව් කිරීම.

4. මහා පරිමාන දූෂණයන්ට හා ජාවාරම්කරුවන් ලෙස සැකකෙරෙන පුද්ගලයින්ගෙන් අවම වශයෙන් 15 දෙනෙකුගේ දූෂණ වංචා වත්කම් බැරකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

## ක්‍රියාමාර්ග

1. තොරතුරු ඒකරාශී කිරීමේ මූලස්ථානයක් පිහිටුවා මහා පරිමාන දූෂණ වංචා පිළිබඳව තොරතුරු දන්නේ නම් ඒ පිළිබඳව මූලස්ථානය වෙත දැනුම් දෙන ලෙස දුරකථන, ඊමේල්, ෆැක්ස්, තැපැල් ලිපින ප්‍රසිද්ධ කොට ප්‍රවෘත්ති හා දැන්වීම් ප්‍රචාරය මගින් මහජනයා වෙත දැනුම් දීම.

2. මූලස්ථානය වෙත ලැබෙන තොරතුරු ක්ෂණික ප්‍රතිචාර කමිටුව වෙත යොමු කර එම කමිටුව මගින් විමර්ශනය කිරීමට තීරණය කරන සිදුවීම් පිළිබඳව වහාම පරීක්ෂණ ආරම්භ කිරීම.

3. වැටලීම්, අත්අඩංගුවට ගැනීම්, ප්‍රශ්න කිරීම්, අධිකරණයට ඉදිරිපත් කිරීම් පිළිබඳව අවශ්‍ය පරිදි ජන මාධ්‍ය හරහා ප්‍රසිද්ධියට පත් කිරීම.

4. විමර්ශන කටයුතු නිම වන තෙක් අදාළ සැකකරුවන් රටින් පිටවීම වළක්වා ගැනීම සහ මේ වන විටත් විදේශගත වී ඇති සැකකරුවන් වෙතොත් ඒ අය නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

5. ක්ෂණික ප්‍රතිචාර කමිටුව (RRC) මගින් එම ක්‍රියාමාර්ග ගන්නා තෙක් මහජන මුදල් අපහරණය කරන ලද අවස්ථා ඒ පිළිබඳ චෝදනා (උදාහරණ: යාන වාහන, මන්දිර, දේපල) පිළිබඳව ජනමාධ්‍ය මගින් දෛනික ප්‍රසිද්ධියක් ලබා දීමට පියවර ගැනීම.

## දිගු කාලීන වැඩසටහන්

1. සොරකම් කර ශ්‍රී ලංකාවෙන් පිට කරන ලද මුදල් පිළිබඳව සොයා බලා ඒවා අත්පත් කර ගැනීම හා වැරදිකරුවන්ට දඬුවම් කිරීම.

2. අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයින් නිත්‍යානුකූලව ඉවත් කිරීම හා වඩා ශක්තිමත් අල්ලස් හා දූෂණ කොමිසමක් හඳුන්වා දීම.

3. ජාතික ප්‍රසම්පාදන කොමිසමක් පත් කිරීම හා එමගින් සියළුම ව්‍යාපෘතිවලට අනුමැතිය ලබා දීම සිදු කිරීම.

4. ජාතික විගණන පනත ඉදිරිපත් කිරීම.

5. ශ්‍රී ලංකාව අත්සන් කරන ලද එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.

## වෙනත් වැඩසටහන්

1. එල්.ටී.ටී.ඊ. ය වෙතින් අත්පත් කර ගන්නා ලද රත්‍රන් පිළිබඳව සොයා බැලීම සඳහා වෙනම විමර්ශන ඒකකයක් පිහිටුවීම.

2. මාධ්‍යවේදීන් ඝාතනය කිරීම පිළිබඳ සොයා බැලීමේ විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවීම. වාස් ගුණවර්ධන මගින් ඔහු දන්නා තොරතුරු 127 ප්‍රකාශයක් ලෙස ලබා ගැනීම.

3. කුමරන් පද්මනාදන් හෙවත් කේ.පී. අත්අඩංගුවට ගැනීම.

4. ජොන්ස්ටන් ප්‍රනාන්දු විසින් මරාගෙන මැරෙන ත්‍රස්තවාදියෙකු කොළඹට රැගෙන ඒම පිළිබඳව දැනට නවතා ඇති විමර්ශන නැවත ආරම්භ කිරීම.

5. සෑම අමාත්‍යාංශයකම සිදු වී ඇති දූෂණ, වංචා විමර්ශනය සඳහා අගමැති යටතේ වෙනම ඒකකයක් පිහිටුවා එමගින් තොරතුරු ලබා ගැනීම.

6. ප්‍රභූ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති නාම ලේඛනය ප්‍රදර්ශනය කිරීම හා වගකිව යුත්තන්ට නීතිය ක්‍රියාත්මක කිරීම.

7. අලි පැටවුන් නීති විරෝධීව ගෙන යාම සහ හමුදා කඳවුරුවලට ගෙනැවිත් දැමීම පිළිබඳව සොයා බැලීම.

8. මාර්ග සංවර්ධන අධිකාරිය සහ මහා මාර්ග ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදුවී ඇති දූෂණ හා වංචා පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

## වගකීම්

1. කොටස් වෙළඳපොළ හා සේවක අර්ථ සාධක අරමුදලේ වංචා හා දූෂණ පිළිබඳව සොයා බැලීම.
   තිලක් කරුණාරත්න මහතා, සහාය දිනේෂ් පෙරේරා මහතා

2. නැගෙනහිර පළාත ඇතුළුව අයථා අන්දමින් ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳව සොයා බැලීම.
   පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ.සුමන්තිරන් මහතා.

3. ශ්‍රී ලංකාවෙන් පිටකරන ලද මුදල් පිළිබඳව සොයා බැලීම හා නව අල්ලස් කොමිසමේ රාමුව ඉදිරිපත් කිරීම.
   ජේ.සී.වැලිඅමුණ මහතා

4. ක්ෂණික ප්‍රතිචාර කමිටුවට (RRC) සුදුසු නිලධාරීන් තෝරා ගැනීම.

පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා, ජේ.සී.වැලිඅමුණ මහත, දූෂණ විරෝධි කමිටුවේ ලේකම්.

## ක්ෂණික ප්‍රතිචාර කමිටුව

1. අධ්‍යක්ෂ - ආනන්ද විජයපාල
2. පොලිසිය - එස්.එස්.පී.ශානි අබේසේකර
   ඒ.එස්.පී.ප්‍රේමශාන්ත
   අයි.පී.නිහාල් අමරසිරි
   ඩබ්ලිව්.ජේ.සී.සුජාතා කුමාරි
   සී.අයි.වීරසේන

අනුකමිටුවේ සාමාජිකයින් වූයේ,

1. නීතිපති
2. රජයේ ජොෂ්ය නීතිඥ - තුසිත් මුදලිගේ
3. විශේෂඥ උපදේශකවරු - ලාල් නානායක්කාර
   අනුෂ කුමාරස්වාමි
   දිනේෂ් පෙරේරා

අධ්‍යක්ෂ පරිපාලන - ලේකම් කාර්යාලය, අවශ්‍ය කාර්ය මණ්ඩලය සහ වාහන / දූරකථන

ගැසට් පත්‍රයේ 04 වන ඡේදය අනුව දූෂණ විරෝධි කමිටුව විසින් පැමිණිලි යොමු කිරීම දෙයාකාර වේ. එනම් ,

1. පැමිණිලි විමර්ශනය සඳහා පොලිස්පතිවරයාට යොමු කිරීම.
2. විශේෂිත පැමිණිලි දූෂණ මර්දන කොමිසම විසින් සෘජුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත යොමු කිරීම.

දූෂණ විරෝධී කමිටුව සඳහා ලේකම් කාර්යාලයක් පිහිටු වීමටත් එකී ලේකම් කායීාලයට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමටත් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015.02.06 දින කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර ඇත. එම සන්දේශයේ සඳහන් අන්දමට 2015.02.05 වැනි දින රැස් වූ දූෂණ විරෝධී කමිටුව එම කමිටුවේ වැඩ කටයුතු සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවීමටත්, එකී දූෂණ විරෝධී කමිටුවට ලැබෙන පැමිණිලි පරීක්ෂා කිරීම සඳහා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයක් පිහිටුවීමටත් යෝජනා කර ඇත. ඒ අනුව ලේකම් කාර්යාලය සඳහා කාර්ය මණ්ඩලයක් කෙටිකාලීන පදනම යටතේ රාජ්‍ය සේවයෙන් හෝ පිටතින් බඳවා ගැනීමටත්, ලේකම් කාර්යාලයේ වැඩ කටයුතු සඳහා මිලියන 7.5 ක් මුදලක් ජනාධිපති කාර්යාලයේ ක්‍රියාකාරී වැය ශීර්ෂයෙන් ලබා ගැනීමටත් වැඩිදුරටත් යෝජනා කර ඇත. මෙම යෝජනා 2015.02.11 දින පවත්වන ලද කැබිනට් රැස්වීමේ දී අනුමත කර, නිල නොවන පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීම සඳහා පොලිස්පතිවරයා වෙත දැනුම් දීමක් සිදුකර ඇත. (316/2020 හි පැ.33 සහ පැ.33 අ)

අග්‍රාමාත්‍ය කාර්යලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී ඩබ්ලිව්.සරත් කුමාර මහතා 2015 වර්ෂයේ සිට අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙසට සේවය කරමින් සිට ඇත. ඔහු සදහන් කළ අන්දමට දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය 2015 වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට 2017 ජූනි මාසය දක්වා ක්‍රියාත්මකව තිබී ඇත. එම කාලසීමාව තුලදී දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ වැය බර අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් දරා ඇත. ඒ අනුව එම දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ සේවය කළ පුද්ගලයින්ට වැටුප්, වේතන, දූරකතන බිල්, විදුලිය, වාහන සහ ඉන්ධන අදි වියදම් සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ වැය ශීර්ෂයෙන් වියදම් දරා ඇත. ඒ අනුව 2015 වර්ෂයේ සිට 2017 ජූනි මාසය දක්වා රුපියල් මිලියන 33.7 වියදමක් දරා තිබෙන බවත්, එම මුදල අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් දරා තිබෙන බවත් ප්‍රධාන මූල්‍ය නිලධාරී සදහන් කළේය.

රුපියල් 33.7 වියදම සනාත කරන ලේඛන ඇතුළත් පිටු 31 කින් සමන්විත ගොනුවක් සාක්ෂිකාර සනත් කුමාරගේ සහතිකය යටතේ පැ.27 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදි. පැ.27 ලේඛනයෙහි 2015, 2016 සහ 2017 වර්ෂයට වියදම් දරන ලද ලේඛන වෙන වෙනම සකස් කර ඉදිරිපත් කර ඇත.

මේ අනුව අදාල වර්ෂ 03 සදහා දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ වියදම් සිදු කිරිම;

1. වැටුප් වේතන සහ දීමනා
2. දූරකතන
3. විදුලිය හා ජලය
4. අතිකාල සහ නිවාඩු දින වැටුප්

5. වාහන නඩත්තු
6. ඉන්ධන
7. ලිපි ද්‍රව්‍ය සහ වෙනත් වියදම් යන ශිර්ෂයන් යටතේ වියදම දරා ඇත.

ඒ අනුව:

1. 2015 වර්ෂය සදහා දරන ලද සම්පූර්ණ වියදම රු.13,432,283.01 මුදලක් ද
2. 2016 වර්ෂය සදහා දරන ලද සම්පූර්ණ වියදම රු.14,066,507.62 මුදලක් ද
3. 2017 වර්ෂය සදහා දරන ලද සම්පූර්ණ වියදම රු.6,216,016.96 මුදලක් ද වශයෙන් සම්පූර්ණ වියදම මිලියන 33,714,807.59 ක මුදලක් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් දරා ඇත.

මේ අනුව මුළු මනින්ම රාජ්‍ය නොවන සංවිධානයක වියදම අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් රජයේ මුදල් වලින් අනිත්‍යානුකුල ලෙස එකී වියදම පියවිම මගින් රජයේ මුදල් මිලියන 33,714,807.59 මුදලක අවභාවිතා කරමින් පොදු දේපල අවභාවිතා කිරිමේ වරද සිදු කර ඇත. මේ අනුව අග්‍රාමත්‍ය කාර්යාලයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් සමන් ඒකකනායක මහතා මෙම මුදල් අවභාවිතා කිරීම සදහා වගකිවයුතු පුද්ගලයාවේ.

මෙම දූෂණ මර්දන කමිටු කාර්යාලයේ සේවකයන් 44 දෙනෙකු සේවය කර ඇති අතර ඔවුන්ට ගෙවන ලද වැටුප් හා දීමනා වල මුළු එකතුව රුපියල් මිලියන 22,714,079.27 වේ. මෙම දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ සේවකයන් 44 දෙනා වෙනුවෙන් 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා ගෙවන ලද වැටුප් සහ දීමනා අඩංගු ලේඛන වල සම්පූර්ණ විස්තරයක් පිළිවෙලින් කොමිෂන් සභාව ඉදිරියේ විභාග වූ 205/2020 නඩුවේ දී පැ. 31 අ, ආ, ඇ, පැ.32 සහ පැ.33 1,2,3,4,5 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වශයෙන් වැඩ කළ ආනන්ද විජේපාල මහතා රාජ්‍ය සේවකයෙකු වශයෙන් වැඩ කරන අතරතුරම ද්විතික පදනම යටතේ රජයෙන් වැටුප් ලබන අතරම 50% ක දීමනාවක් ලබමින් මෙම නිල නොවන සංවිධානයෙන් ද වැටුප් ලබා ගෙන ඇත. ඒ අනුව ඔහුට මසටක රුපියල් 16,150.00 දීමනාවක් ද, ඉන්ධන ලීටර් අනුව ගෙවන දීමනාවක් ද, දුරකතන දීමනාව වශයෙන් රුපියල් 5000 ක් ද වශයෙන් මසටක රුපියල් 47,015.00 ක මුදලක් ලබා ගෙන ඇත. මේ අන්දමින් සියළුම සේවයකන් සම්බන්ධව කළ ගෙවීම් පිළිබඳ ලේඛන කොමිෂන් සභාව ඉදිරියේ විභාග වූ 205/2020 නඩුවේ දී පැ.30 (i, ii, iii, iv, v, vi, vii, viii, ix, x, xi, xii, xiii, xiv, xv ) සලකුණු කර ඉදිරිපත් කර ඇත.

උක්ත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පොලිස්පතිවරයා විසින් අති විශේෂ ගැසට් ප්‍රකාශනයක් මගින් 'ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ නව පොලිස් කොට්ඨාසයක් ස්ථාපිත කිරීම යන ශීර්ෂය යටතේ' මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවන ලද බවට ප්‍රසිද්ධ දැන්වීමක් කර ඇත.

මෙම නව පොලිස් කොට්ඨාසය පොලිස් ආඥාපනත 55 වගන්තිය යටතේ පිහිටුවන ලද බවට ගැසට් පත්‍රයෙහි දක්වා ඇත. පොලිස්පති එන්. කේ. ඉලංගකෝන් මහතා මෙම ගැසට් පත්‍රයට සාවද්‍ය තොරතුරු ඇතුළත් කර ඇති බව පැහැදිලිව පෙනී යයි. පොලිස්පතිවරයා අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් කර ඇති කරුණු එනම්; "අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවා ඇති අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් අනුකමිටුව මගින් ස්ථාපිත කර ඇති ලේකම් කාර්යාලය විසින් මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයාට යොමු කරන අතර ඊට අමතරව විශේෂිත පැමිණිලි කැබිනට් අනුකමිටුව මගින් සෘජුවම මෙම කොට්ඨාසය භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරනු ලැබේ" යනුවෙන් සඳහන් කර ඇති ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයකි. ඔහු සඳහන් කරන අන්දමේ එවැනි කැබිනට් අනු කමිටුවක් පත් කර නොමැති අතර කැබිනට් මණ්ඩල තීරණයෙහි සඳහන්ව ඇත්තේ දූෂණ විරෝධී කමිටුවක් සහ දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලයක් පිහිටුවීම පිළිබඳවය. මෙම ගැසට් නිවේදනයෙන් මහජනතාව බරපතළ ලෙස නොමග යැවීමක් පොලිස්පති ඉලංගකෝන් මහතා විසින් සිදුකර ඇත.

ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පිහිටුවන ලද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මෙරට පවතින නීතියට එකඟ නොවන නීති විරෝධි පොලිස් ඒකකයක් බවට හිටපු අග විනිසුරු සරත් නන්ද සිල්වා මැතිතුමා මව්බිම පත්‍රය හා සිදු කළ සාකච්ඡාවකදී ප්‍රකාශ කර ඇති අතර එම සාකච්ඡාව සනාථ කිරීම සඳහා 2018.06.17 වන දින මව්බිම පුවත් පතෙහි මුද්‍රනයක් මෙම කොමිෂන් සභාව ඉදිරියේ විභාග වූ 289-290/2020 දරණ නඩු විභාගයේදී පැ.14

වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම මාධ්‍ය සාකච්ඡාවේ දී අගවිනිසුරු සරත් නන්ද සිල්වා මැතිතුමා සිදු කළ ප්‍රකාශ කිහිපයක් පහත උපුටා දක්වා ඇත

මෙම දූෂණ විරෝධී කමිටුව සහ ලේකම් කාර්යාලය රාජ්‍ය ආයතනයක් නොවන අතර එය දේශපාලන විරුද්ධවාදීන්ගෙන් පලිගැනීම සඳහා පිහිටු වන ලද නිල නොවන දේශපාලන සංවිධානයකි. එය ලංකාවේ පවත්නා නීතියක් යටතේ ලියාපදිංචි කළ ආයතනයක් නොවේ. එයට නීතියෙන් පිළිගත් නිල නාමයක් හෝ නෛතික පුද්ගල භාවයක් නොමැත. එවැනි අනීත්‍යානුකූල සංවිධානයකට බලය ලබාදීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කෙරෙන කැබිනට් මණ්ඩලයට බලයක් නොමැත. එවැනි අනීත්‍යානුකූල දේශපාලන සංවිධානයක රැස්වීම් පැවැත්වීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ නිල නිවස වන අරලියගහ මන්දිරය යොදාගැනීම පොදු දේපළ අවභාවිතා කිරීමකි. මෙම කොමිෂන් සභාව ඉදිරියේ විමර්ශනය කරන ලද පැමිනිලි අංක 205/2020 නඩුවේදී ඉදිරිපත් කරන ලද පැ. 37 පැ. 38 පැ. 39 පැ. 40 පැ. 41 පැ. 42 සහ පැ 43 දරණ ලේඛන අනුව මෙම අනීතික දේශපාලන සංවිධානයේ රැස්වීම් පැවැත්වීම සඳහා අරලියගහ මන්දිරය යොදාගැනීමට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු දූෂණ විරෝධී කොමිටියේ සාමාජිකයින් කටයුතු කර ඇත. ඒ අනුව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රම වික්‍රමසිංහ මහතා ඇතුළු දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයින්, දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් පැවැත්වීම සඳහා අග්‍රාමාත්‍ය නිල නිවස වන අරලියගහ මන්දිරය යොදාගැනීමෙන් රාජ්‍ය දේපළ අවභාවිතා කර ඇති අතර ඒ

අනුව ඔවුන් අල්ලස් පනතේ 70 වගන්ති යටතේ දඩුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇත.

එසේම ජනාධිපති ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී වැය ශීර්ෂයෙන් මිලියන 7.5 ක මුදලක් එකී දූෂණ මර්දන කමිටුව සහ එහි ලේකම් කාර්යාලයට වැය කිරීම සඳහා ලබා ගත යුතු බවට හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඉහත කී කැබිනට් සංදේශයෙන් යෝජනා කර ඇත.

මෙම කිසිදු කමිටුවක් කිසියම් නෛතික ප්‍රතිපාදනයන් යටතේ හෝ පාර්ලිමේන්තුවේ සම්මත කළ පනතකින් හෝ කිසියම් ව්‍යවස්ථාවකින් ස්ථාපිත කළ කමිටු නොවීය. රාජ්‍ය තන්ත්‍රණය තුළ රාජ්‍ය බලය වර්ණාලේප ගැන්වූ මෙම රාජ්‍ය නොවන සංවිධානය විධායක හස්තයන් අනීතික ලෙස මෙහෙයවා ඇති බව බැලූ බැල්මටම පැහැදිලිවේ.

එය වඩාත් පැහැදිලිවන වඩාත් ප්‍රබල සාක්ෂියක් වන්නේ හිටපු අග්‍රාමාත්‍ය රනිල් මහතා විසින් ඉදිරිපත් කරන ලද 2015 ජනවාරි 21 වන දිනැති කැබිනට් සංදේශයේ සඳහන්ව ඇති අන්දමට **"ජාතික විධායක සභාවේ අනුමැතිය හා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත ස්ථාපිත කරන ලද දූෂණ විරෝධී කමිටුව"** යනුවෙන් සඳහන් කර කැබිනට් සංදේශය ඉදිරිපත් කර තිබ්මෙන් ද, එකී කැබිනට් සංදේශය කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීමේ දී එකී කැබිනට් තීරණය අඩංගු 205/2020 නඩුවේ දී ඉදිරිපත් කර ඇති පැ.13 වශයෙන් ඉදිරිපත් කර ඇති එකී කැබිනට් තීරණයේ දෙවන පිටුවෙහි **"මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ජාතික විධායක සභාව විසින් සිදු කරනු**

ලැබ ඇති නිර්දේශ සැලකිල්ලට ගනිමින් පහත සඳහන් පරිදි තීරණය කරන ලදී" යනුවෙන් ද සඳහන් කරමින් කැබිනට් මණ්ඩලය විසින් ද උක්ත සඳහන් දූෂණ මර්දන කමිටුව පිහිටුවීම සඳහා තීරණයට එළැඹීමේ දී, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රිකා සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්හි නොමැති ආයතනයක් වන ජාතික විධායක සභාව නැමැති ආයතනයේ තීරණ වලින් කැබිනට් මණ්ඩලය බැඳෙන අයුරින් ක්‍රියාකර ඇති බවට උක්ත සඳහන් කැබිනට් තීරණයෙන් මැනවින් නිරූපණයවේ.

මේ අනුව හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු කැබිනට් මණ්ඩලය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත නොකෙරුණු නිල නොවන සංවිධානයක් වන ජාතික විධායක සභාව මගින් රාජ්‍ය පාලනයට ප්‍රවේශවීමත් එමගින් දේශපාලන පළිගැනිම් වලට ප්‍රවේශවීමත් සිදු කරමින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන් උල්ලංඝනය කරමින් ක්‍රියාකර ඇති බව උක්ත කැබිනට් තීරණයෙන් පැහැදිලිවේ.

ඒ අනුව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු කැබිනට් මණ්ඩලය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සුරක්ෂිත කොට ආරක්ෂා කරන බවට ලබා දී ඇති දිවුරුම කඩ කරමින්, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය නැමැති නිල නොවන පොලිස් ඒකකයක් පිහිටුවාගෙන, දේශපාලන පළිගැනිම් සඳහා සකස් කළ පැමිණිලි එකී පොලිස් කොට්ඨාසය වෙත දූෂණ විරෝධී කොමිටිය මගින් යොමුකරවා ගෙන, එපිළිබඳව පරීක්ෂණ පවත්වා, දේශපාලන විරුද්ධවාදීන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කරමින්, ඔවුන් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රඳවා තබා ගනිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති ඔවුන්ගේ

මූලික අයිතිවාසිකම් කඩ කරමින්, ඔවුන්ට නිල නොවන දඬුවම් පැමිණවීම සිදු කර ඇත.

මෙහි ඊළඟ වැදගත් කාරණය වන්නේ අත්අඩංගුවට ගන්නා පුද්ගලයින් වරදකරු බවට අධිකරණය විසින් තීරණය කිරීමට ප්‍රථම දූෂණ මර්දන කමිටුවේ මෙහෙයවීම මත අත්අඩංගුවට ගත් පුද්ගලයින් හොරුන්, දූෂකයින් බවට හංවඩු ගසමින් මාධ්‍ය මගින් දිනපතා ප්‍රචාරය කිරීමට අදාළ නිළධාරීන් කණ්ඩායමක් යොදවා තිබීමය. ඒ බව පැ.13 දරණ කැබිනට් පත්‍රිකාවට අමුණා ඇති ඇමුණුමෙහි 13 වන පිටුවේ දැක්වෙන ක්‍රියාමාර්ග යටතේ ඇති (III) සහ (IV) අයිතමය අනුව, එනම්; (උපුටා ගැනිම)

> "3. වැටලීම්, අත්අඩංගුවට ගැනීම්, ප්‍රශ්න කිරීම්, අධිකරණයට ඉදිරිපත් කිරීම් පිළිබඳව අවශ්‍ය පරිදි ජනමාධ්‍ය හරහා ප්‍රසිද්ධියට පත් කිරීම.
>
> "5. ක්ෂණික ප්‍රතිචාර කමිටුව (RRC) මගින් එම ක්‍රියාමාර්ග ගන්නා තෙක් මහජන මුදල් අපහරණය කරන ලද අවස්ථා, ඒ පිළිබඳ චෝදනා (උදාහරණ: යාන වාහන, මන්දිර, දේපොළ) පිළිබඳව ජනමාධ්‍ය මගින් දෛනික ප්‍රසිද්ධියක් ලබාදීමට පියවර ගැනීම." (උපුටා ගැනිම අවසන්) පැහැදිලි වේ.

අමාත්‍ය මණ්ඩල පත්‍රිකවේ ඇමුණුමේහි දැක්වෙන් දූෂණ විරෝධී කමිටුවෙහි කෙටි කාලීන වැඩසටහන යටතේ සඳහන් කර ඇති "මහා පරිමාණ දූෂණයන්ට හා ජාවාරම්කරුවන් ලෙස සැකරෙන පුද්ගලයින් අවම වශයෙන් 15 දෙනෙකුගේ දූෂණ වංචා වත්කම් බැරකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම" යන වගන්ති අනුව

පැහැදිලි වන්නේ ඒ වන විටත් තෝරා ගනු ලැබූ පුද්ගලයන් 15 දෙනෙකු පිළිබඳව ඉහත කී මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් දූෂණ විරෝධි කොමිටිය බලාපොරොත්තුවෙන් සිටි බවය.

රජයේ ජ්‍යොෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා ද්විත්ත චරිත නිරූපණයක යෙදී ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත. පැමිණිකරු ඇතුළු සිව්දෙනාට එරෙහි නඩුව මහාධිකරණයේදී මෙහෙයවනු ලබන තුසිත් මුදලිගේ මහතා, දූෂණ විරෝධි කමිටුවේ අනු කමිටු සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කර ඇති බවට ඉහත කී පැ.13 පත්‍රිකාවේ 15 පිටුවේ "ඇ" වගුවෙහි සඳහන් කර ඇත. තුසිත් මුදලිගේ මහතා යටතේ විශේෂඥ උපදේශකවරු තිදෙනෙකු නම් කර ඇත. මේ අනුව වැටලීම් කිරීම, ප්‍රශ්න කිරීම, අත්අඩංගුවට ගැනීම, අධිකරණයට ඉදිරිපත් කිරීම් වලට අමතරව නඩු මෙහෙයවීමද තුසිත් මුදලිගේ මහතා විසින් සිදු කර ඇත.

උක්ත කැබිනට් සංදේශය අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කරනු ලබන කටයුතු වලට දිනපතා පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ලබා දීම කෙටිකාලීන වැඩ සටහන් යටතේ පෙළ ගස්වා ඇත. ඒ අනුව, අනු කමිටු වලට නම් කර සිටින රජයේ නිළධාරීන් එම කාර්යයෙහි නිරතව දිනපතා මාධ්‍ය ප්‍රචාරය සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීමෙහි නිරතව සිට ඇති බව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ සාක්ෂි විශ්ලේශනය කිරීමේදී පැහැදිලිව පෙනීයයි.

ආනන්ද විජේපාල මහතා දූෂණ විරෝධී කොමිටියේ අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කළ බව පිළිගත්තේය. ඔහු රාජ්‍ය ආයතනයක සේවය කරමින් සිටි බවත් අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා

විසින් ද්විතීය පදනම යටතේ වගඋත්තරකරු ස්ථාන මාරු කර දූෂණ විරෝධී කොමිටි ලේකම් කාර්යාලයට යවන ලද බවත් එය තමාගේ උවමනාවෙන් නොව සමන් ඒකනායක මහතා විසින් සිදුකළ නියමය අනුව ක්‍රියා කිරීමක් බවටත් සඳහන් කර ඇත. දූෂණ විරෝධී කොමිටියේ සේවය කිරීම වෙනුවෙන් ඔහු රජයේ මුදලින් වැටුප් ලබා ඇත. දූෂණ විරෝධී කොමිටිය රාජ්‍ය ආයතනයක් නොවන බැවින් එවැනි ආයතනයක සේවය කරමින් රජයේ මුදලින් වැටුප් ලැබීම රජයේ මුදල් අවභාවිතා කිරීමකි. ඒ අනුව ආනන්ද විජේපාල මහතා පොදු දේපල අවභාවිත කිරීම සිදුකර ඇත.

ඉහත කී කැබිනට් සංදේශයේ හා කැබිනට් තීරණයේ සඳහන් "ජාතික විධායක සභාව" යන සංවිධානය සහ "දූෂණ විරෝධී කමිටුව" යන රාජ්‍ය නොවන සංවිධනායක් මගින් රාජ්‍ය පාලනයට සම්බන්ධ කටයුතු සහ විශේෂයෙන්ම විරුද්ධ මතදැරු දේශපාලඥයින් දේශපාලන කරලියෙන් ඉවත් කිරීම උදෙසා ක්‍රියාත්මක කළ වැඩ සටහන පිළිබඳව සාක්ෂි ලබා ගැනීම සඳහා 2015.01.08 දින පිහිටවූ රජයේ අධිකරණ අමාත්‍යවරයා වූ ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා සාක්ෂියට කැඳවන ලදී.

ඔහු සඳහන් කළ අන්දමට 2015 ජනවාරි 08 පැවැත්වූ ජනාධිපතිවරණය පෙර විපක්ෂයේ සිටි පක්ෂ අතර වූ එකඟතාව මත රජයේ ආයතනවල හා දේශපාලඥයින් විසින් සිදු කළ දූෂණ හා අපරාධ සම්බන්ධයෙන් නීතිරීති සම්පාදනය කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට දූෂණ විරෝධි කමිටුවක් පත් කර තිබේ.

එසේ වුවත් මැතිවරණයෙන් පසුව නව ආණ්ඩුව යටතේ අග්‍රාමාත්‍යවරයා ඉදිරිපත් කළ කැබිනට් සංදේශයේ කැබිනට්

මණ්ඩලයට ඉහලින් සිටින ජාතික විධායක සභාව පිළිබඳව ප්‍රශ්නයක් පැන නැඟී ඇත. කැබිනට් පත්‍රිකාවේ ඇමුණුම අනුව පිහිටුවනු ලැබූ දූෂණ විරෝධී කමිටුව සහ අනු කමිටුවල සාක්ෂිකරුද ඇතුළත්ව සිටියත් කැබිනට් මණ්ඩලය තුළ ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව පිලිබඳව සාක්ෂිකරු සමඟ ගැටුමක් නිර්මාණය වී ඇත. එම අවි ගබඩාව සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු ආරක්ෂක නිළධාරීන් 03 ක් හෝ 04 ක් සමඟ ඇවන්ගාඩ් සභාපති ඇතුළු නිළධාරීන් රැසක් අත්අඩංගුවට ගැනීමට අමාත්‍යවරුන් ගණනාවක් විශාල උත්සායක් දැරීම කරන කොට ගෙන කැබිනට් මණ්ඩලය තුළදී සාක්ෂිකරු සමඟ ගැටුමක් නිර්මාණය වී තිබේ.

අධිකරණ අමාත්‍යවරයා ලෙසට ඒ පිළිබඳ සිදු කළ විමසීම් වලදී, ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව සම්බන්ධ ගිවිසුම නිත්‍යානුකූලව සිදුවී ඇති බවත්, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ හෝ පුපුරන ද්‍රව්‍ය ආඥාපනත යටතේ හෝ ගිණි අවි ආඥ පනත යටතේ හෝ වරදවල් හෙළිදරව් වී නොමැති බවටත් සාක්ෂිකරු දැනුම් දී ඇති අතර ඒ මත ගැටුම් උත්සන්නකාරී වී ඇත.

ඒ හේතුවෙන් සාක්ෂිකරු මෙම දූෂණ විරෝධී කමිටු රැස්වීම් හෝ අනු කමිටු රැස්වීම් වලට හෝ සහභාගී වී නැත. කෙසේ වෙතත් කැබිනට් පත්‍රිකාවේ දැක්වෙන අන්දමට මෙම ජාතික විධායක සභාව නැමැති නීතිගත නොකළ සංවිධානය කැබිනට් මණ්ඩලයටත් ඉහලින් ක්‍රියාත්මක වන ආයතනයක් ලෙසට සාක්ෂිකරුට පෙනී ගොස් ඇත.

අමාත්‍ය රාජිත සේනාරත්න, පාඨලී චම්පික රණවක, අමාත්‍ය අර්ජුන රණතුංග, අමාත්‍ය සරත් අමුණුගම, අමාත්‍ය සරත් ෆොන්සේකා එකතුව අපරාධය යුක්ති විනිශ්චය කොමිෂන් සභාව හා සමාන

සභාවක් පිහිටුවීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. මෙවැනි සභාවක් පිහිටුවීමෙන් වර්තමාන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නොමැති බවට පෙන්වා දුන් බවත්, අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය පාඨලි චම්පික රණවක, අමාත්‍ය මංගල සමරවීර, අමාත්‍ය රවි කරුණානායක, අමාත්‍ය අර්ජුන රණතුංග යන පිරිස ජනාධිපතිවරයාට සහ අග්‍රාමත්‍යවරයාට දැඩි දෝෂ දර්ශන එල්ල කරමින් බොහෝ අවස්ථා වලදී තර්ජනාත්මකව කථා කිරීමත් සිදු කර ඇත. මෙවැනි සභා පිහිටුවීම කළ නොහැකි බවට එවකට නීතිපති ද දැනුම් දී ඇත.

දැනටමත් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ ඇති ප්‍රතිපාදන නොසලකා ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඇති කර ඒ සඳහා දේශපාලන මැදිහත්වීම් සිදු කර මිනිසුන් තෝරා නඩු විසඳීමේ ක්‍රමය ඇති කිරීමට සාක්ෂිකරු විරුද්ධවී ඇති අතර ඉන් අධිකරණයේ ස්වාධීනත්වය නැතිවී අධිකරණ ක්‍රමය ගැන මහජනතා විශ්වාසය බිඳ වැටෙන බවටද සාක්ෂිකරු පෙන්වා දි ඇතත් ඒ පිළිබඳව සැලකිල්ලක් නොදක්වා 2015 ආණ්ඩුව ක්‍රියා කර ඇත. මෙම කරුණු පදනම් කරගෙන එවකට අග්‍රාමත්‍යවරයා සහ සාක්ෂිකරු දැඩි ලෙස දෝෂාරෝපණයට ලක්ව ඇත.

මෙම දූෂණ විරෝධී කමිටු කණ්ඩායම සතියකට වරක් අරලියගහ මන්දිරයේ රැස්ව ඇති අතර නීතිඥ ජේ.සී.වැලිඅමුණ මෙහි වගකීම භාරගෙන කටයුතු කර තිබේ. නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ , අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය පාඨලි චම්පික රණවක, අමාත්‍ය රවි කරුණානායක මෙම රැස්වීම් වලට නිරන්තරයෙන්ම සහභාගී වී ඇත. මෙවැනි රැස්වීම් වලට සතිපතා නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ සහභාගී වීම ඉතාම නරක පූර්වාදර්ශක් ලබා දෙන බවත්, එය නීතිපති

දෙපාර්තමේන්තුවේ හොඳ නමට කැළලක් බවත්, එමගින් තමන්ටද කැළලක් ඇතිවන බවත්, සාක්ෂිකරු කීහිප අවස්ථාවකදීම අග්‍රාමාත්‍යවරයාට පෙන්වා දී ඇත.

එසේම, සාක්ෂි වලින් තහවුරු වන අන්දමට නීතිපති දෙපාර්තමේන්තුවේ එවකට හිටපු සොලිසිටර් ජනරාල් සුහද ගම්ලත් මහතා, ජනාධිපතිතුමා සහ හමුදා ප්‍රධානීන් මෙන්ම අමාත්‍යවරු ගණනාවක් සහභාගී වූ රැස්වීමක දී පොලිස්පතිවරයාගෙන් හා සොලිසිටර් ජනරාල්වරයාගෙන් නම් වශයෙන් ප්‍රශ්න කර, එම පුද්ගලයිනගේ නඩුවල තත්ත්වය පිලිබඳව විමසීමක් සිදු කර ඇත. තවද නඩු ගොනු කරන දින පිළිබඳව මෙන්ම ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ යෝෂිත රාජපක්ෂ මහතාගේ ගණුදෙනු පිළිබඳව ද ප්‍රශ්න කිරීම සිදු කළ බවය. ඒ අවස්ථාවේ දී සොලිසිටර් ජනරාල් සුහද ගම්ලත් මහතා පැහැදිලිව ප්‍රකාශ කර ඇත්තේ, නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් තමන් පිටතදී කථා නොකරන බවත්, කාර්යාලීය කටයුතු කාර්යාලය තුළදී පමණක් සාකච්ඡා කරන බවත් ප්‍රකාශ කර ඇති අතර තවදුරටත් ඔහු සඳහන් කර ඇත්තේ තමා මෙතැන්ට පැමිණියේ සාකච්ඡාවට සම්බන්ධ වීමට පමණක් වන අතර දෙපාර්තමේන්තුවේ නඩු සම්බන්ධයෙන් කාටවත් උත්තර බැඳීමට තමා සුදානම් නොමැති බවය.

අරලියගහ මන්දිරයේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති තවත් රැස්වීමකට නීතිපතිතුමා විසින් නම් කර තිබු සොලිසිටර් ජනරාල් සහ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් වසන්ත නවරත්න බණ්ඩාර සහභාගි වී ඇත.

එසේම, දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් වාර වලට ජේ.සී.වැලිඅමුණ මහතා පැමිණ ඇත්තේ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා සමඟය. මෙය නිරීක්ෂණය කිරීමෙන් පසුව එම තත්ත්වය නරක පූර්වාදර්ශ ඇති කරන බවත්, එය වහාම නැවත්විය යුතු බවටත් සාක්ෂිකරු විසින් නීතිවරයාට දැනුම් දී ඇතත් එවැනි නැවතීමක් සිදුවී නැත.

දූෂණ විරෝධී කමිටුවේ මෙම ක්‍රියා කලාප ස්වාධීන පරීක්ෂණයකට සහ ස්වාධීන ව්‍යවස්ථාවට බාධාවක් බවත්, මූළු මනින්ම දේශපාලනිකරණය වූවක් බවත්, ඒ පෙළඹවීමෙන් ආණ්ඩුව පිහිටුවා සති 03 ක් යාමටත් ප්‍රථම තමන් සමඟ කැබිනට් මණ්ඩලයේ අනිකුත් සාමාජිකයින් බෙදී ක්‍රියා කළ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සාක්ෂි වලට අනුව, අග්‍රාමත්‍ය කාර්යාලයේ දී අග්‍රාමත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමකට සහභාගී වන ලෙසට සාක්ෂිකරුට දැනුම් දීම අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයට ගොස් ඇති අතර එම රැස්වීමට දූෂණ විරෝධී කමිටුවේ නිලධාරීන් ද පැමිණ ඇත. එහිදී සාකච්ඡා කර තීරණය කර ඇතත් ඇවන්ගාඩ් සිද්ධියට නියත වශයෙන්ම ගෝඨාභය රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගැනීමට මෙය ස්වර්ණමය අවස්ථාවක් බවත්, අවස්ථාව මඟහැරිය හොත් නැවත මෙවැනි අවස්ථාවක් නොලැබෙන බවට එතැනදී ප්‍රකාශ වී ඇත.

එහෙත් 2016 ජනවාරි 29 වන දින සාක්ෂිකරු ජනාධිපතිතුමා සමඟ උත්සවයකට සහභාගී වෙමින් සිටි අවස්ථාවේදී ලැබුණු දැනුම්දීමක් මත අග්‍රාමත්‍යවරයාගේ නිවසේ පිහිටි කාර්යාලයට ගොස් ඇති අතර , එහි පවත්වන ලද රැස්වීමකට අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය

පායලි චම්පික රණවක සහ සරත් විජේසූරිය, සමන් රත්නප්‍රිය, ජේ.සී.වැලිඅමුණ යන පිරිසද පොලිස්පති ඇතුළු පොලිස් නිලධාරීන්ද සහභාගී වී ඇත. පෙබරවාරි 4 වන දිනට පෙර යෝෂිත රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගන්නා ලෙසට එම රැස්වීමේ දී නියෝගයක ස්වරූපයෙන් පොලිස් නිලධාරීන්ට පවසා ඇත. ඒ අනුව ඊට දින දෙකකට පමණ පසුව යෝෂිත රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගෙන තිබේ.

මූල්‍ය අපරාධ කොට්ඨාසය නමින් පිහිටුවන ලද පොලිස් ඒකකයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවන ලද ලිපි ගොනු 92 ක් හෝ 93ක් සම්බන්ධයෙන් නීතිපති මගින් නඩු ඉදිරිපත් කරවීමට ක්‍රියා කරන ලෙසට සාක්ෂිකරුගෙන් සිදු කළ ඉල්ලීමකට යහපත් ප්‍රතිචාර නොලැබුණ බැවින්ද සාක්ෂිකරු දෝෂ දර්ශනයට ලක්ව තිබේ. විනිශ්චයකරුවන්ගේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ වැටුප් වැඩිකරවීම සඳහා සාක්ෂිකරු විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ අවස්ථාවේදී එයට අනිකුත් අමාත්‍යවරු සහයෝගය ලබා දී නොමැති අතර, නීතිපතිවරයා ගෙන්වා පාඩමක් උගන්වා වැටුප් වැඩිවීම ලබා දිය යුතු බවට එවකට මුදල් ඇමතිවරයා ප්‍රකාශ කර ඇත.

දූෂණ මර්දන කමිටුව නීත්‍යානුකූල ආයතනයක් නොවන අතර එය සම්පූර්ණයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුවට ගත යුතු බවට තීරණය දේශපාලනඥයින්ට ගැනීමට අවස්ථාව සලසන ලදී.

එම කාල සීමාව තුළ දී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාද, එම අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක මහතා ඇතුළු කණ්ඩායම රක්ෂිත බන්ධනාගාරගත කිරීම

පිළිබඳ තීරණ ගනු ලැබුවේ ආණ්ඩුවේ සිටි රාජපක්ෂ විරෝධී කණ්ඩායම වරින් වර මුණ ගැසී ගනු ලබන තීරණ මත පොලිස් නිළධාරීන්ටද ඒ අනුව ක්‍රියා කරන ලෙසට නියෝග දීමෙනි.

මෙම සියළු ක්‍රියාදාමයන්ට මුලික වී ඇත්තේ මහින්ද රාජපක්ෂ රජයේ සිටි රාජිත සේනාරත්න, පාඨලී චම්පික රණවක, මංගල සමරවීර පිරිස එම ආණ්ඩුව සමඟ වෛර බැඳගෙන ඉන් ඉවත් වී 2015 ජනවාරි 08 වන දින පිහිටවූ නව රජයට සම්බන්ධවෙමින් අමාත්‍ය පදවි ලබාගෙන ද්වේශසහගත පළිගැනීමේ චේතනාවෙන් ක්‍රියා කිරීමය. යෝෂිත රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කරද්දි එසේ නොකරන ලෙසට සාක්ෂිකරු එවකට ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ප්‍රමුඛ කමිටුවෙන් ඉල්ලීමක් කරමින් එසේ සිදු කිරිමට ප්‍රථම නීතිපතිගේ උපදෙස් ලබා ගන්නා ලෙසට පවසා ඇත. එම අවස්ථාවේදී නීතිපති උපදෙස් ලබා ගත් බවට පවසා ඇතත් සාක්ෂිකරු නීතිපතිගෙන් ඒ පිළිබඳව සිදු කළ විමසීමේදී උපදෙස් ලබා නොගත් බවට නීතිපති පවසා ඇත.

මේ අනුව පැහැදිලි ලෙසම මෙම ක්‍රියාදාමයන්හි අරමුණ වී ඇත්තේ යම් යම් බලපෑම් අමාත්‍යවරුන්ට සහ පුද්ගලයින්ට සහ ඔවුන්ගේ විශේෂත්ව වලට මඩගසා ඔවුන් ජනතාව අතර අප්‍රසාදයට පත් කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කිරීමය.

මෙම දූෂණ විරෝධී කමිටුවේ නීති ප්‍රශ්න හා නඩු ගැන කථා කිරීමට නීතිඥ ජේ.සී.වැලිඅමුණ සමඟ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ පැමිණ ඇත.

මෙම ක්‍රියාදාමයේ අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ කැබිනට් පත්‍රිකාවේ බලතල අභිබවා ගොස් හිතුමනාපයට, උවමනා විදියට (අවශ්‍යතාව පරිදි) එක් එක් පුද්ගලයින්ට විරුද්ධව ක්‍රියාකර ඔවුන් අත්අඩංගුවට ගැනීමය.

මෙම ක්‍රියාදාමයට මුල පිරිම සඳහා බලය ලබා දීමට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා, රාජිත සේනාරත්න සහ පාඨලී චම්පික රණවක තම අමාත්‍ය බලය පාවිච්චි කරමින් ඉදිරිපත් කළ පැ.13 දරණ කැබිනට් පත්‍රිකාවේ අඩංගු සැලසුම් හා ක්‍රියාමාර්ග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ නොවන අතර ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවට සාක්ෂිකරු සඳහන් කර ඇත. ඒ අනුව පැ.13 කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කළත් එහි අඩංගු කරුණු නීත්‍යානුකූල නොවන බැවින් ඒවා ක්‍රියාත්මක කළ නොහැකිය.

මහ බැංකුවේ අධිපති පත් කිරීම පිළිබඳව සහ ඇවන්ගාඩ් නැව පිළිබඳවත් සාක්ෂිකරුගේ මතයට එකඟ නොවන පිරිස මසක් ඇතුළත සාක්ෂිකරු එම ක්‍රියාවලියෙන් ඉවත් කර ඇති අතර සාක්ෂි ඇතිව හෝ නැතිව විරුද්ධමතවාදී දේශපාලඥයින් අත්අඩංගුවට ගත යුතුය යන මතයේ එම පිරිස සිට ඇත.

2015 පෙබරවාරි මාසයේ සිට 2017 ජූනි මාසය දක්වා කාල සීමාව තුළ දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්‍යාලයට දරන ලද වියදම සහ එහි වැඩ කරන ලද සේවකයන්ට සිදුකරනු ලැබූ වැටුප් ගෙවීම් පිළිබඳ වියදම් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා වෙන වෙනම සකස් කරන ලද වියදම් ලැයිස්තුවට අනුව දූෂණ මර්දන දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයේ වියදම් මිලියන 13.432283.01 කි. 2016 වර්ෂයේ වියදම මිලියන

14.066507.62කි. 2017 වර්ෂය සඳහා වියදම මිලියන 6216016.96 කි. එම වසර තුන සඳහා මුළු වියදම මිලියන 33714807.59 කි.

මේ අනුව රාජ්‍ය ආයතනයක් නොවන නිල නොවන පෞද්ගලික දේශපාලන පළිගැනීමේ සංවිධානයක කටයුතු කිරීම සඳහා රාජ්‍ය මුදල් රුපියල් 33714807.59 ක රජයේ මුදලක් වැයකර රාජ්‍ය මුදල් අවභාවිතා කරමින් පොදු දේපල සාපරාධී සාවද්‍ය පරිහරණය කර ඇත. දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයට ගෙවන ලද වියදම් දැක්වෙන ලේඛනය සහ ඊට අදාළ ඇමුණුම් පැ. 49 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලේඛන අනුව, රු. 33714807.59 ක මුදලක් ගෙවීම් අනුමත කර ගෙවා ඇත්තේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ගණකාධිකාරීවරයා විසිනි. මෙම රාජ්‍ය දේපල රජය සතු මුදල් අවභාවිතා කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීමේ වරදට දූෂණ මර්දන කොමිටියේ සාමාජිකයින් වගකිව යුතු වන අතර ඔවුන්ට එරෙහිව දන්ඩ නිති සංග්‍රහය යටතේ සහ පොදු දේපල නීතිය යටතේ නඩු පැවරිය යුතුවේ.

හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සාක්ෂියට කැඳවනු ලැබූ අතර වික්‍රමසිංහ මහතා විසින් මීට ඉහත දී 205/2020 නඩුවේදී දී ලබා දී ඇති සාක්ෂිය මෙම නඩුවට ආදේශ කර ගන්නා ලෙසට ඉල්ලීමක් කරනු ලදුව දෙපාර්ශ්වයේම කැමැත්ත මත එම සාක්ෂිය වර්තමාන නඩුවට ද ආදේශ කරගෙන ඇත. පැ. 24 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද් තීරණය දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලය පිහිටුවීම සඳහා ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශය අනුව කැබිනට් මණ්ඩලය විසින් 2015.01.21 වන දින සිදුකළ තීරණයන් බවට පිළිගෙන ඇත. ඒ අනුව කැබිනට් සංදේශයේ සඳහන්

සාමාජිකත්වය යටතේ දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමටත්, එම සංදේශයෙහි දැක්වෙන අනුකමිටුව යටතේ සඳහන් පුද්ගලයන්ගෙන් සැදුම්ලත් අනුකමිටුව පත් කිරීමටත්, එසේම සංදේශයෙහි දැක්වෙන ක්ෂණික ප්‍රතිචාර කමිටුව යටතේ සඳහන් අයගෙන් සමන්විත ක්ෂණික ප්‍රතිචාර කමිටුව පත් කිරීමටත් සහ සංදේශයේ ඇමුණුමේ අවසන් ඡේදයේ (1), (2), (3), (4) යටතේ සඳහන් වගකීම් එහි දක්වා ඇති අදාළ තැනැත්තන් වෙත පැවරීමටත් අනුමැතිය ලබා දී ඇත. එසේම එකී කමිටු වල ලේකම්වරු / කැඳවුම්කරුවන් පත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට දැනුම් දීමට ද තීරණය වී ඇත.

අමාත්‍යාංශවල සහ දෙපාර්තමේන්තුවල ඇති දූෂණ සහ වංචා කෙලින්ම දූෂණ විරෝධී කමිටුවට ඉදිරිපත් කිරීමටත්, දූෂණ විරෝධී කමිටුව විසින් සලකා බැලීමෙන් පසුව එම පැමිනිලි මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට යොමු කිරීමත් සිදුකර ඇත. මෙම ලිපිය ජනාධිපති නීතිඥ වැලිඅමුණ මහතා විසින් සකස් කර තිබී ඇති අතර එය අග්‍රාමාත්‍යවරයාට ලබා දී ඇත. රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළ අන්දමට සියලුම කමිටු වලට පුද්ගලයින් පත් පත්කිරීම සිදුකර ඇත්තේ වැලිඅමුණ මහතාය. එසේම 316 2020 නඩුවේ සලකුණු කර ඇති පැ.33 සහ පැ. 37 කැබිනට් තීරණ වලට අනුව දූෂණ විරෝධී කමිටුව සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවීම කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත.

කැබිනට් තීරණයට අනුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීමේ සඳහා පොලිස්පතිවරයාට දැනුම් දී ඇති අතර පොලිස් ආඥා පනතේ 55 වගන්තිය යටතේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීමට එකී වගන්තිය යටතේ බලයක් නොමැති බවට රනිල්

වික්‍රමසිංහ මහතා පිළිගෙන ඇත. පොලිස් ආඥා පනතේ 55 වගන්තිය යටතේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීමේ බලයක් නොමැති නම්, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවමින් පොලිස්පතිවරයා විසින් නිකුත් කර ඇති ගැසට් පත්‍රය නිත්‍යානුකූල නොවන බවද රනිල් මහතා පිළිගෙන ඇත.

දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයේ වියදම් පළමුව ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමට යෝජනා කළ නමුත් පසුව භාණ්ඩාගාරයෙන් කෙලින්ම අගමැති කාර්යාලයට ප්‍රේෂණය කර අගමැති කාර්යාලයෙන් මුදල් ලබාදීම සිදුකර ඇත.

කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිලි ගණනාවක දී ඉදිරිපත් වුණු එකී අමාත්‍ය මණ්ඩල සංදේශය සහ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, දූෂණ මර්දන කමිටුව, අනු කමිටුවකින්ද, නීතිපති සහ රජයේ ජ්‍යේෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතාද ඇතුළු පරීක්ෂකයින්ගේ සහ අධ්‍යක්ෂකවරයෙකුගෙන් සමන්විත වේ. මේ යටතේ තෝරාගත් පොලිස් නිලධාරීන් සහ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතාද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ රාජකාරියෙහි නියැලි ඇති බව එම දූෂණ මර්දන කමිටුවේ සංයුතිය අධ්‍යනය කිරීමේ දී පෙනි යයි.

මෙම දූෂණ විරෝධි කමිටුවට නිලධාරීන් තෝරා පත් කර ගැනීම ජාතික විධායක සභාව විසින් සිදූ කළ බව හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ සාක්ෂියකින් හෙළිදරව් වී ඇත.

24/11/2020

2020.11.24

## 9 .සාක්ෂි සම්පින්ඩනය නිරීක්ෂණ, නිර්දේශ සහ වගකිවයුතු පුද්ගලයින්

## 9 .I

පැමිණිලි අංකය - 01 – 2020

05 – 2020

පැමිණිලිකරු - අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කුමාර ජයදේව කරන්නාගොඩ.

ලිපිනය - නො:93/3, බැද්දගාන උතුර පාර, බැද්දගාන, පිට කෝට්ටේ.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින් වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂක ශානි අබේසේකර
2. සහකාර පොලිස් අධිකාරී ඩී.එස්. තිසේරා
3. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා
4. හිටපු නියෝජ්‍ය අමාත්‍ය රන්ජන් රාමනායක
5. හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න
6. හිටපු අමාත්‍ය ඩී.එම්. ස්වාමිනාදන්
7. හිටපු අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර
8. හිටපු නියෝජ්‍ය අමාත්‍ය අජිත් පී. පෙරේරා

9. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර
10. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්නෙවිරත්න
11. ජනාධිපති නීතිඥ ජේ.සී. වැලිඅමුණ.

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ මහතාට එරෙහිව කොළඹ කොටූව මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 732/09 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම, පැමිණිලිකරුට එරෙහිව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ පවරා ඇති 1448/2020 දරණ නඩුවේ අධිචෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම මගින් එකී අධිචෝදනා පත්‍රය නිශ්ප්‍රභා කර පැමිණිලිකරු සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. ඉහත නම් සඳහන් වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා

වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

2005 සැප්තැම්බර් මස 01 වන දින නාවික හමුදාපති වශයෙන් පත්වීම් ලබා ඇති පැමිණිලිකාර අද්මිරාල් කරන්නාගොඩ මහතා හතර වන ඊලාම් යුද්ධයේ සම්පූර්ණ කාල සීමාව තුළම නාවික හමුදාපතිධූරය හොබවා ඇත. හතර වන ඊලාම් යුද්ධය අවසන් වීමෙන් පසුව Admiral of the fleet නිලයට ජනාධිපතිතුමා විසින් උසස් කල වසන්ත කරන්නාගොඩ මහතා මෙම පැමිණිල්ලට අදාල කාල සීමාව වන 2009 මැයි මාසයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාපති විය.

හතර වන ඊලාම් යුද්ධය සිදු වුන කාලවකවානුවේ දී සාගරයෙන් දියත් කෙරුණු සතුරු ප්‍රහාර වලට මුහුණ දීම සඳහා අවශ්‍ය නාවික හමුදා ශක්තිය වර්ධනය කිරීමෙහිලා "ඇරෝ" නමින් කුඩා ප්‍රහාරක යාත්‍රා නාවික හමුදාව තුළදීම නිෂ්පාදනය කර "ඇරෝ" ප්‍රහාරක යාත්‍රා බලසනයක් පිහිටුවීමට පැමිණිලිකරු ක්‍රියාකර ඇත. එසේම කිලෝමීටර් 4000 පමණ දුරින් ජාත්‍යන්තර මුහුදු තීරයේ සංසරණය වූ

ආයුධ ගබඩා වශයෙන් ක්‍රියාත්මක වූ ඊලාම් නෞකා විනාශ කර දැමීමට පැමිණිලිකරු විසින් නාවික හමුදාව මෙහෙයවා ඇත.

මෙම කාලය තුළ පැමිණිලිකරු සිදු කළ සේවය වෙනුවෙන් වීර පදක්කම් සහ රණශුර පදක්කම් ලැබී ඇත. විශිෂ්ඨ සේවා විභූෂණ පදක්කම් මෙන්ම ඔහුගේ වසර 25 ක සේවය වෙනුවෙන් උත්තම සේවා පදක්කමද ලබා ගෙන ඇත.

එල්.ටී.ටී.ඊ සංවිධානය පරාජය කිරීමෙහිලා නාවික හමුදාව විසින් සිදු කරනු ලැබූ මෙහෙවර සම්බන්ධයෙන් විදේශීය ආරක්ෂක අංශ මගින් සහ ආරක්ෂක සඟරා මගින් හමුදාපති අද්මිරාල් කරන්නාගොඩ මහතා විසින් නාවික හමුදාව ජයග්‍රහනය කරා මෙහෙයවීම පිළිබඳ ප්‍රශංසා කරමින් ප්‍රකාශන නිකුත් කර ඇත. පැ. 1, 2, 3 සහ 4 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළ ලේඛනවල නාවික හමුදාව පිළිබඳව විශේෂ ප්‍රසංශාත්මක මුඛයෙන් වාර්තා පළ කර ඇත.

ලංකාවේ යුධ සාහිත්‍යයට යම් දායකත්වයක් ලබා දීමේ අරමුණ මෙන්ම හමුදාව අවසන් ද්‍රවිඩ ඊලාම් සටන මෙහෙය වූ ආකාරය පිළිබඳව ලංකාවේ තරුණ පරපුර දැනුවත් කිරීම උදෙසා මෙන්ම කළ නොහැක්කක් නොමැත යන න්‍යාය යථාර්තයක් බවට පත්කල පණිවිඩය ලාංකික ජනතාවට ලබාදීමත් යන පරමාර්ථ පෙරදැරි කරගෙන, අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා විසින් රචනා කරන ලද "අධිෂ්ඨානය" නැමැති ග්‍රන්ථයේ පිටපතක් පැ.33 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙවැනි තත්ත්වයක් තිබියදී නාවික හමුදාව අවඥාවට ලක් කරමින් ඉතා අනුවණ සහ පහත් තත්ත්වයේ ප්‍රකාශයක් යුධ හමුදාපති සරත්

ෆොන්සේකා විසින් බී.බී.සී සන්දේශය වැඩසටහනට නිකුත් කර තිබූ අතර එය 2009 අප්‍රේල් මස 21 දින සිරස රූපවාහිනී ප්‍රවෘත්ති මගින්ද විකාශනය කොට තිබුණි.

යුධ හමුදාපති සරත් ෆොන්සේකාගේ එම ප්‍රකාශයෙන් කියැවුණේ; "ප්‍රභාකරන්ට පැනලා යන්න ලැබෙන්නේ නැහැ. අපි හැම පැත්තකින්ම වට කරලා තියෙන්නෙ. පැනලා ගියොත් මුහුදෙන් තමයි." යන ප්‍රකාශයයි.

මෙවැනි ප්‍රකාශ මැද අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා 2009 මැයි මාසය වන විට මුලතිව් මුහුදු තීරයේ අන්තිම වර්ග කිලෝමීටර 8 තුළ කොටුවී සිටි එල්.ටී.ටී.ඊ නායකයන් සහ සෙසු සාමාජිකයන් සහ ලක්ෂයක් පමණ සාමාන්‍ය සිවිල් වැසියන්, ප්‍රාණ ඇපකරුවන් ලෙස බලෙන් රඳවාගෙන සිටි පුද්ගලයින් මුලතිව් මුහුදෙන් පැන යාම වැළැක්වීම සඳහා ආරක්ෂක වළලු හතරක් යොදමින් ඉතා වෙහෙසකාරී යුධ ක්‍රියාවලියක යෙදෙමින් සිට ඇත.

මෙම කාල සීමාවේදී මුලතිව් ප්‍රදේශයෙහි අව්වැසි නොබලා කුඩා යාත්‍රා වල රාජකාරියේ නිරත වී සිටි නාවිකයන්ගේ සුභසාධනය සහ මානසික තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් නාවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා නාවික හමුදා මූලස්ථානයේ නිලධාරීන්ද සමග පුල්මුඩේ සිට නයාරු දක්වා මුහුදේ "වේව්රයිඩර්" බෝට්ටු කිහිපයකින් මුහුදේ යාත්‍රා කර ඇත. නයාරු කලපුව අප්‍රේල් මුල් සතියේ දී පමණ නාවික හමුදාව විසින් කොටි ග්‍රහණයෙන් මුදවාගත් කලපුවකි. එසේම අවසන් සටන පැවතුනු නන්දිකඩාල් කලපුව ඉදිරිපිට මුහුදේ ඇරෝ සහ වේව්රයිඩර් බෝට්ටුවලින් පළවෙනි වළල්ලේ රාජකාරි කළ නිලධාරීන් සහ නාවිකයන් සමග

කතා කොට ඔවුන් දිරිමත් කිරීම සඳහා පළවෙනි වළල්ල වෙත අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා ගොස් ඇත.

යුධ හමුදාපති සරත් ෆොන්සේකා මහතා ඉතා තදබල ලෙස අද්මිරාල් කරන්නාගොඩ මහතා සමග ගැටුමක් නිර්මාණය කරගෙන තිබුණු බව පැ.33 ලේඛනය අනුව පෙනී යයි. අද්මිරාල් කරන්නාගොඩ මහතා බෝට්ටුවලින් ගොස් සටනේ නියැලෙන තම නාවික නිලධාරීන් දිරිමත් කිරීම පිළිබඳව යුධ හමුදාපති සරත් ෆොන්සේකා මහතා මාධ්‍ය සාකච්ඡාවල දී එම ක්‍රියාවන් හැල්ලුවට ලක් කිරීමක් සිදුකර ඇත. "සමහරු බෝට්ටුවල නැගිලා ටෙලිනාට්‍ය රඟපානවා" යනුවෙන් මාධ්‍ය සාකච්ඡාවල දී යුධ හමුදාපති සරත් ෆොන්සේකා මහතා ප්‍රකාශ කිරීම පැහැදිලි ලෙසම අද්මිරාල් කරන්නාගොඩ මහතාගේ දිරිගැන්වීමේ ක්‍රියාවන් හැල්ලුවට ලක් කිරීමකි. යුධ හමුදාපති සරත් ෆොන්සේකා මහතා එවැනි ප්‍රකාශ කිරීමට හේතුව වශයෙන් පැ.33 ලේඛනයේ අද්මිරාල් කරන්නාගොඩ මහතා මෙසේ සඳහන් කර ඇත;

> (උපුටා ගැනීම) "මගේ හැඟීම අනුව ඔහු එසේ ප්‍රකාශ කිරීමට ප්‍රධාන හේතුව නම් ඔහු කවදාවත් හමුදාපති ලෙස, විශේෂයෙන් 2006 අප්‍රේල් මස 26 වැනිදා යුධ හමුදා භූමියේදීම බෝම්බ ප්‍රහාරයකට හසු වූ පසු යුධ හමුදාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි ඇති කඳවුරුවලට හා අනු ඛණ්ඩ වලට නොගිය නිසා විය හැක. මාගේ මතකයේ හැටියට ඔහු ගියේ ගුවන් මගින් පලාලි කඳවුරටත් වව්නියා කඳවුරටත් පමණය. ගුවන් යානයේ සිට වෙඩි නොවදින රථ වලින් එම කඳවුරුවල රැස්වීම් කාමරයට ගොස් රැස්වීම් අවසන් වූ විගස නැවත ගුවන් මගින් කොළඹට පැමිණීම පුරුද්දක් කරගෙන තිබුණි. ඔහුව ගුවන් යානයෙන්

බසින විට පිළිගන්නා ආකාරයත්, රුස්වීමේ දර්ශනත් අඩංගු ප්‍රවෘත්තියක් එදිනම යුධ හමුදා මාධ්‍ය අංශය මගින් සෑම නාලිකාවකම ප්‍රචාරය කරන්නට යෙදිණි.”(උපුටා ගැනීම අවසන්)

හතර වන ඊළාම් යුද්ධය අවසන් වූ 2009 වර්ෂයේ මැයි මාසයට ආසන්න කාලයේ දී එනම් 2009 මැයි මස හෝ ඊට ආසන්න දිනයක සාක්ෂිකරුගේ නාවික සහායක ලෙස සේවය කළ කොමදෝරු උදය බණ්ඩාර විසින් පැමිණිලිකරුට සඳහන් කර ඇත්තේ ඔහුගේ ආරක්ෂක නිළධාරියෙක් වශයෙන් සේවය කළ ලුතිනන් කමාන්ඩර් සම්පත් මුණසිංහ නැමැති පුද්ගලයා ළමයින් 5 දෙනෙකු ත්‍රිකුණාමල කඳවුරේ රඳවාගෙන එකී ළමුන් 5 දෙනා මුදාහැරීමට මුදල් ඉල්ලන බවය. කොමදෝරු උදය බණ්ඩාරට එම තොරතුර ලබා දී ඇත්තේ එවකට බටලන්ද ආරක්ෂක විද්‍යාතනයේ සේවය කළ කපිතාන් ජේ.ඩී.රණසිංහ විසිනි. එම තොරතුර ලද විගසම, කොමදෝරු බණ්ඩාර ද සිටින අවස්ථාවේදීම සාක්ෂිකරු විසින් එකී සම්පත් මුණසිංහ නැමැත්තාව සාක්ෂිකරුගේ කාර්යාලයට කැඳවා එකී ළමුන් රඳවා ගැනීම පිළිබඳ ප්‍රශ්න කර ඇත. තමන් එලෙස රඳවා ගැනීමක් සිදු නොකළ බවට එම අවස්ථාවේදී එකී සම්පත් මුණසිංහ ප්‍රකාශ කර ඇත. බටලන්දට ගොස් කපිතාන් ජේ.ඩී.රණසිංහ මුණගැසී මෙම කරුණු විසඳා ගන්නා ලෙසට සාක්ෂිකරු සම්පත් මුණසිංහට ප්‍රකාශ කර තිබේ.

සම්පත් මුණසිංහ එලෙස පිටත්ව යාමෙන් අනතුරුව, දුරකථනයෙන් ත්‍රිකුණාමල නැගෙනහිර දිසාව භාරව කටයුතු කළ රියර් අද්මිරාල් සුසිත් වීරසේකර අමතා, මෙම සිද්ධිය පිළිබඳව ඔහු දැනුවත් කර, මෙම

පැමිණිල්ල පිළිබඳව පරීක්ෂා කිරීමට ඔහු යොදවා ඇත. ත්‍රිකුණාමලයේ සඳහන් කළ ස්ථානයේ එලෙස ළමුන් රඳවා ගැනීමක් නොමැති බවට පරීක්ෂණයෙන් පසුව සුසිත් වීරසේකර විසින් සාක්ෂිකරුට දන්වා ඇත.

එසේ වුවත් ඊට පැයකට පසු කපිතාන් ජේ.ඩී.රණසිංහ දුරකථනය මගින් සාක්ෂිකරු අමතමින් එම තොරතුරෙහි ලොකු සත්‍යතාවයක් තිබෙන බවත්, එසේ වුවත් එම තරුණයන් ත්‍රිකුණාමලයේ නොමැති බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. මේ අනුව රඳවාගෙන සිටිනු ලබන පුද්ගලයින් ත්‍රිකුණාමලයෙන් පිට වෙනත් ප්‍රදේශවල රඳවාගෙන සිටින්නේ දැයි සොයා බැලීමට නාවික අධ්‍යක්ෂක බුද්ධි තොරතුරු ගුරුගේට පැමිණිලිකරු විසින් දැනුම් දී ඇත.

මෙම කාල සීමාව තුළ සාක්ෂිකරු හතර වන ඊළාම් යුද්ධයෙහි පූර්ණකාලීනව නියැලී සිටි බැවින් ඔහුගේ පූර්ණ අවධානය, ප්‍රභාකරන් මුහුදෙන් පැණයාම වැලැක්වීම සඳහා යොදවා ඇත. මේ අයුරින් සක්‍රීය වශයෙන් එල්.ටී.ටී.ඊ යුද්ධයට දායකවී සිටී අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතාට සම්පත් මුණසිංහට එරෙහිව ලැබුන පැමිණිල්ල පිළිබඳව කටයුතු කිරීමට සිදුවූයේ ඔහු සඳහාන් කළ අනෙකුත් නිලධාරීන් මගින් බව පැහැදිලිය. කෙසේ වෙතත් එදිනම හෝ ඊට පසු දින නාවික අධ්‍යක්ෂක බුද්ධි තොරතුරු ප්‍රධානි කපිතාන් ගුරුගේ නැමැත්තාට මෙම පැමිණිල්ල පිළිබඳ සොයා බැලීමට සාක්ෂිකරු දැනුම් දී ඇත. ඊට අමතරව නාවික විනය ආරක්ෂක අංශයේ ප්‍රධානියා වන කපිතාන් හංවැල්ලට මෙම කරුණු පිළිබඳ සොයා බැලීමට සාක්ෂිකරු දැනුම් දී තිබේ.

මේ අනුව, ළමුන් 5 දෙනා පැහැරගෙන යාම පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා ගත හැකි සියළු ක්‍රියාමාර්ග ගැනීමට ඒ වන විටත් ඔහු

විසින් පියවර ගෙන ඇත. ඔහු සඳහන් කළේ කඳවුර භාර අණ්ඩපති සඳහන් කළ අන්දමට ත්‍රිකුණාමල කඳවුරේ අදාල ස්ථානයේ එලෙස ළමුන් රඳවා තැබීමක් සිදුකර නොමැති බවය.

සම්පත් මුණසිංහ නැමැත්තාගේ කාමරය සෝදිසි කිරීමේ අවශ්‍යතාව පැණ නැඟුන බැවින් කඳවුර භාර අණ්ඩපති හංවැල්ලට මෙම සිද්ධිය පිළිබඳව දැනුම් දී ඇත. සම්පත් මුණසිංහ වාසය කළ ත්‍රිකුණාමල කඳවුරේ පිහිටි ඔහුගේ කාමරය පරීක්ෂා කිරීමේ දී හැඳුනම්පත් 4ක්, බැංකු පාස් පොත් 4ක්, පාස්පොට් එකක්, ප්‍රොමිසරි නෝට්ස් සහ නාවික හමුදාවට අයත් නොවන ජීව උණ්ඩ විශාල ප්‍රමාණයක් සොයා ගෙන ඇති අතර ඒවා ලැයිස්තු ගත කර එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා දැනුවත් කර ඇත.

එසේම එවකට කොළඹ අපරාධ කොට්ඨාසයේ (CCD) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහතා මේ පිළිබඳව දැනුවත් කර ඇති අතර ඔහු මැයි 27 වන දින පමණ සාක්ෂිකරුගේ කාර්යාලයට පැමිණ මේ පිළිබඳ සොයා බලා ඇති අතර ඒ අනුව ලිඛිතව ඔහු දැනුවත් කරන ලෙසට සාක්ෂිකරුට දැනුම් දී ඇත. ඒ අනුව නාවික නීති අධ්‍යක්ෂක ලෙස කටයුතු කළ රියාර් අද්මිරාල් ශවේන්ද්‍ර ප්‍රනාන්දු විසින් 2009.05.28 දිනැති, පැ.6 දරණ, ලිපිය සකස් කර ඇති අතර ඒ සඳහා කපිතාන් හංවැල්ලගේ සහාය ලබා ගෙන ඇත. මෙම ලිපිය කොළඹ අපරාධ කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහතාට කපිතාන් හංවැල්ල මගින් භාර කර ඇත. සාක්ෂිකරු සඳහන් කළ අන්දමට සම්පත් මුණසිංහගේ කාමරයේ තිබී සොයා ගත් බැංකු පොත්වල මිලියන ගණනක මුදල් තිබී ඇත. සම්පත් මුණසිංහගේ පසුබිම හා සසඳන විට එවැනි විශාල

මුදල් ප්‍රමාණයක් කොහෙත්ම තිබිය නොහැකිය යන සැකය මත සාක්ෂිකරු ඉදිරි පරීක්ෂණ කටයුතු වලට පියවර ගෙන ඇත. මේ සම්බන්ධ ලිපි ගොනු දැනට නීතිපති දෙපාර්තමේන්තුව යවා ඇත. සම්පත් මුණසිංහගේ කාමරයේ තිබී සොයාගත් හැඳුනුම්පත් 4 සහ පාස්පෝට් එක නැති වූ තරුණයන්ට අදාල හැඳුනුම් පත් හෝ පාස්පෝට් නොවුන අතර ඒවා වෙනත් පුද්ගලයින්ට අයත් හැඳුනුම්පත් සහ පාස්පෝට් බවට හඳුනාගෙන ඇත.

කපිතාන් ජේ.ඩී.රණසිංහ විසින් අද්මිරාල් බණ්ඩාරගේ ජංගම දුරකථනයෙන් පණිවිඩයක් සාක්ෂිකරුට එවමින් අතුරුදහන්වූ පුද්ගලයින්ගේ නම් 5 ක් සඳහන් කර ඇත. එම නම් 5 සමග සම්පත් මුණසිංහගේ කාමරයේ තිබී සොයාගත් හැඳුනුම්පත් සහ ගමන් බලපත්‍රයේ සඳහන් නම් ගැලපී නැත.

ඒ අනුව පුද්ගලයින් 9 නව දෙනෙකුගේ විස්තර ලැබී ඇතත් නඩුවේ සැකකරුවන් 11 දෙනෙකු සිටි බැවින් ඉතිරි දෙදෙනා කෙසේ පැමිණියේදැයි සාක්ෂිකරු නොදනී.

2009 මැයි 28 වැනි දින නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහතා සමඟ පැමිණිලිකරු පවත්වනු ලැබූ සාකච්ඡාවෙන් පසුව 2009 මැයි 28 දින, පැ.6 දරණ, ලිපිය නියෝජ්‍ය පොලිස්පති අපරාධ වෙත යවමින්, සම්පත් මුණසිංහ විසින් ඔහුගේ වැටුපට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් රැස් කරගෙන ඇති බවටත්, ඒ අනුව එම මුදල් එසේ ඔහු රැස්කර ගත්තේ කෙසේද යන්න නාවික හමුදාව විසින් පරීක්ෂා කර ගෙන යනු ලබන බවත්, එසේම සම්පත් මුණසිංහ වෙන්කර ඇති කාමරය පරීක්ෂාකර බැලීමේදී ලිපියේ සඳහන් භාණ්ඩ හමු වී ඇති බවටත් දැනුම් දී ඇත. එනම්;

1. රුපියල් 760,000.00 ක වටිනාකමින් යුත්, 2009 ජනවාරි 31 දින දරණ ලංකා බැංකු චෙක්පත.
2. රුපියල් 500,000.00ක වටිනාකමින් යුත්, පියදාස රත්නායක නැමැත්තෙකු විසින් මද්දුමගේ දොන් වජිර ජයම්පති වෙනුවෙන් 2008 මැයි 27 වැනි දින නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව.
3. රුපියල් 400,000.00 ක වටිනාකමින් යුත් පියදාස රත්නායක විසින් ගම්ඇතිගේ හෙමින්ද උදය කුමාර නමින් 2008 ජනවාරි 20 වැනි දින දාතමින් යුක්තව නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව.
4. සම්පත් මුණසිංහගේ නමින් ඇති 002020330398 අංක දරණ හැටන් නැෂනල් පාස් පොත.
5. සම්පත් මූණසිංහගේ නමින් ඇති 002-080935-3SA අංක දරණ හැටන් නැෂනල් බැංකුවේ පාස් පොත.
6. සම්පත් මුණසිංහගේ නමින් ඇති ලංකා බැංකුවේ අංක 7960595 දරණ පාස් පොත.
7. සම්පත් මුණසිංහගේ නමින් ඇති කොමර්ෂල් බැංකුවේ අංක 8020019831 දරණ පාස් පොත.
8. ජංගම දුරකථන තුනක්.
9. 7.62 මිලී මීටර් වර්ගයේ පිස්තෝල පතුරම් 436 ක්.
10. මිලි මීටර් 09 පිස්තෝල පතුරම් 50 ක්.
11. කාලයේ ඉකුත් වී ගිය වර්තමාන නාවික හමුදාපතිගේ හැදුනුම්පතක් ඔහුගේ කැමැත්තෙන් තොරව තබා ගෙන තිබීම.

12. සම්පත් මුණසිංහට අයත් නොවන ජාතික හැඳුනුම්පත් හතරක්.
13. සම්පත් මුණසිංහට අයත් නොවන ගුවන් ගමන් බලපත්‍රයක්.
14. සම්පත් මුණසිංහට අයත් නොවන ලංකා බැංකුවේ ක්‍රෙඩිට් කාඩ් පතක්.

යන භාණ්ඩ සම්පත් මුණසිංහගේ කාමරය පරික්ෂා කිරීමේදී නාවික හමුදා නිලධාරීන් විසින් සොයාගෙන ඇත.

මෙම චෝදනා පදනම් කර ගෙන සම්පත් මුණසිංහ අනිවාර්ය නිවාඩු යවා ඇති අතර ඔහුගේ අනිවාර්ය නිවාඩු කාලසීමාව අවසන් වීමෙන් පසුව ඔහු නැවත සේවයට වාර්තා කර නොමැත. මේ අනුව සම්පත් මුණසිංහ අත්අඩංගුවට ගන්නා ලෙසට සාක්ෂිකරු විසින් මැයි මස 30 වන දින කොළඹ අපරාධ කොට්ඨාශයට දැනුම් දී ඇත. අනිවාර්ය නිවාඩු යවන ලද සම්පත් මුණසිංහ නැමැති නිලධාරියා එවකට යුධ හමුදාපති සරත් ෆොන්සේකා මහතාගේ ආරක්ෂකවරණය යටතේ සිටින බවට සාක්ෂිකරු දැනුවත් වී ඇති අතර එම තොරතුර ඔහු එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට දැනුම් දී ඇත. සම්පත් මුණසිංහ වහාම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) භාර දෙන ලෙස ආරක්ෂක ලේකම් රාජපක්ෂ මහතා යුධ හමුදාපති සරත් ෆොන්සේකාට නියෝග කර ඇත. ඒ අනුව ජුනි මස 10 වන දින සම්පත් මුණසිංහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇත. දින 7 ක් අනිවාර්ය නිවාඩු යැවීමෙන් පසු සම්පත් මුණසිංහ නැවත සේවයට වාර්තා නොකළ බැවින් ජුනි මස 10 වන දින වන විට ඔහු සේවය අතහැර ගිය පුද්ගලයෙකුසේ සලකා ඇත.

සම්පත් මුණසිංහ යටතේ සිටි නැවියන් කපිතාන් ගුරුගේ සහ කපිතාන් හංවැල්ල විසින් ප්‍රශ්න කිරීම් වලට භාජනය කර ඇත. ඒ අනුව, ප්‍රශ්න ගත පැහැර ගෙන යාමට ලක් වූ තරුණයන්, සම්පත් මුණසිංහ සහ ඔහු යටතේ වැඩ කළ පිරිසක් විසින් පැහැර ගෙන ගොස් ඇති බව එම ප්‍රශ්න කිරීම් වලදී අනාවරණය කර ගත් බවට කපිතාන් ගුරුගේ විසින් සාක්ෂිකරුට දැනුම් දී ඇත. ඒ අනුව එම සියළුම තොරතුරු කොළඹ අපරාධ කොට්ඨාසයට (CCD) ලබා දී පරීක්ෂණය සඳහා ඔවුන්ට සම්පූර්ණ සහයෝගය ලබා දෙන ලෙසට කපිතාන් ගුරුගේට සාක්ෂිකරු විසින් දැනුම් දී ඇති අතර ඒ අනුව නැවියන් දෙදෙනෙකුගේ ප්‍රකාශ ලබා දී ඇත.

2009 ජුනි මස 14 වන දින ත්‍රිකුණාමලයේ කොට් බේ (Cot Bay) නැමැති ස්ථානයේදී අමාත්‍ය ෆීලික්ස් පෙරේරා මහතා අද්මිරාල් කරන්නාගොඩ මහතා මුණ ගැසෙන අවස්ථාවේදී මෙම නැති වූ තරුණයන් 5 දෙනා සොයා ගැනීම සඳහා උදව් කරන ලෙසට ඉල්ලීමක් කර ඇත. එසේම එම ඉල්ලීම 2009 ජුනි 17 දින දරණ ලිපිය මගින් අද්මිරාල් කරන්නාගොඩ මහතා වෙත දැනුම් දී ඇත. ඒ වන විටත් අතුරුදන් වූ තරුණයන් 5 දෙනා සොයා ගැනීම සඳහා ගත හැකි සියලුම පියවර අද්මිරාල් කරන්නාගොඩ මහතා විසින් ගෙන ඇත. අද්මිරාල් කරන්නාගොඩ මහතා විසින් ගත හැකි සියලූ ක්ෂණික පියවර ගැනීම කරණ කොටගෙන ඒ වන විටත් සිද්ධියට වගකිවයුතු ප්‍රධාන පුද්ගලයා වන සම්පත් මුණසිංහ අපරාධ දෙපාර්තමේන්තුව අත්අඩංගුවට පත්ව තිබී ඇත.

මෙම සිද්ධියෙන් මාස 2කට පමණ පසුව සාක්ෂිකරුද හමුදාපතිධූරයෙන් විශ්‍රාම ගෙන ඇත. ඉන්පසු ඔහු වෙනත් රාජ්‍ය

ආයතනවල සේවයෙහි නිරතව සිට ඇති අතර මෙම සිද්ධිය පිළිබඳව ඉන් පසු සිදු වූ දෑ පිළිබඳ දැනුමක් සාක්ෂිකරුට නොතිබුණි.

ජපානයේ තානාපතිවරයා වශයෙන් සේවය කරමින් සිටි පැමිණිලිකරු, ඔහුගේ සේවා කාල සීමාව ඉකුත් වීමට ප්‍රථම, 2015 ජනවාරි 8 වන දින පිහිටවූ යහපාලන රජය විසින් ලංකාවට ගෙන්වාගෙන, 2009 වර්ෂයේදී සිදුවූ තරුණයන් අතුරුදන්වීමේ සිද්ධිය පිළිබඳව ප්‍රකාශයක් ලබාගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත. ජපානයේ සිට පැමිණීමෙන් පසුව ඔහු පුවත්පත්වල පළවූ වාර්තා වලින් ඔහු නිරීක්ෂණය කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පිරිසක්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් පිරිසක් ද සමඟ ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුර තුළ ඇති භූගත පතුරම් ගබඩාවක්, භූගත සිරමැදිරියක් යැයි පවසමින්, එය ගෝඨා කඳවුර යනුවෙන් නම් කරමින්, එය පරීක්ෂා කිරීම සඳහා ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරු භූමියට ප්‍රවේශ වී ඇති බවටය.

මේ සම්බන්ධයෙන් සාක්ෂි විභාගයේදී අසන ලද ප්‍රශ්නවලට ඔහු මෙසේ පිළිතුරු දී ඇත.

> (උපුටා ගැනීම) "ප්‍ර: එහෙම භූගත ස්ථානයක් තිබුණාද ත්‍රිකුණාමලේ?
>
> උ: නැහැ. ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුරේ තියෙනවා දෙවන ලෝක යුද්ධයේ බ්‍රිතාන්‍යයන් විසින් ඇමියුනේෂන් දාන්න හදපු භූගත ඒවා තියෙනවා. තව අතැරලා දාපු පරණ ගොඩනැගිලි කීපයක් තියෙනවා. කාල තුවක්කු තවමත් තියෙනවා. සමහර කාලතුවක්කු ඒ වාගේ පරණ ගොඩනැගිලි

පරණ ඇමියුනේෂන් ඩ්‍රම්ස් තවමත් තියෙනවා ත්‍රිකුණාමලේ. ඒක මම පත්තරෙන් දැක්කා. ඊට ඉස්සෙල්ලත් තව පත්තරයක දැක්කා. 2015 ඔක්තෝබර් මාසයේ ලංකාවේ විදේශ ඇමතිවරයා ගිහිල්ලා ජිනීවා වල අත්සන් කරලා තියෙනවා යෝජනාකරුවෙක් හැටියට ඇමරිකා එක්සත් ජනපදයත් එක්ක ලංකාවේ යුධ අපරාධ සිදු වෙලා තියෙනවා. ඒවා සොයන්න අවශ්‍යයයි කියලා. ඇමරිකාවත් එක්ක ලංකාවේ විදේශ ඇමතිවරයා ලංකාවේ පාර්ලිමේන්තුවේ හෝ ජනාධිපතිවරයාගේ හෝ ලංකාවේ කාගෙවත් අවසරයක් නොමැතිව ගිහිල්ලා අත්සන් කරලා තියෙනවා කියලත් මම දැනගත්තා. ඒකෙ අතුරු ප්‍රතිඵලයක් හැටියට තමයි මට තේරුණු හැටියට නොවැම්බර් මාසයේ එක්සත් ජාතීන්ගේ නියෝජිත කණ්ඩායමක් ඇවිල්ලා ත්‍රිකුණාමලේට ගිහිල්ලා මේ භූගත සිරමැදිරි ගෝඨා කඳවුරු කියන එක පරික්ෂා කරන්න ගිහිල්ලා තියෙන්නෙ. ඒ පරීක්ෂණයට ගිහිල්ලා තියෙන්නෙ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා. එයාට විශේෂ සහායක් දක්වලා තියෙනවා ලුතිනන් කමාන්ඩර් වෙලගෙදර කියන නිලධාරියා.

....................

ප්‍ර: ඔබට දැනගන්නා ලැබුණාද මොකක්ද එතන සිද්ධවුණේ කියලා?

උ: ඒක මම පසුව පුවත්පත් වලින් දැනගත්තා. ඒ ස්ථානයේ හෝ ඒ අවට තිබිලා ඇටකටු වගයක් හම්බ වෙලා තිබෙනවා. ඒවාට ප්‍රසිද්ධියක් දීලා තිබුණා මිනිස් ඇටකටු කියලා. මෙතන වධකාගාරයක් පවත්වාගෙන ගියා ගෝඨා කඳවුර කියලා. එතන

මිනිස් ඇටකටු හම්බවුණා. නමුත් පසුව ඩී.එන්.ඒ පරීක්ෂණ වලින් තහවුරු වුණා ඒක මැරිච්ච මීමින්නියකගේ පරණ ඇටකටු වගයක් කියලා."(උපුටා ගැනීම අවසන්)

මෙම සිද්ධි දාමය තුල ඇති පුදුම සහගත සිද්ධිය වන්නේ, ත්‍රිකුණාමලය නාවික හමුදා මූලස්ථානය තුල පිහිටා ඇති, දෙවන ලෝක යුද්ධයේදී භාවිතා කර අත්හරින ලද බන්කර්, පළමු වතාවට ගෝඨා කැම්ප් යනුවෙන් හඳුන්වමින් පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් 2015 පෙබරවාරි මස 26 වැනි දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පැවතුණු බී 732/ 09 නඩුවට වැඩිදුර වාර්තාවක් ගොනුකරමින්, ගෝඨා කැම්ප් ලෙස නම් කළ ස්ථානය පරීක්ෂාකර බැලීම සඳහා අධිකරණ නියෝගයක් ලබාගෙන ඇත. ඒ අනුව 2015 අප්‍රේල් මාසයේදී පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා එලෙස ගෝඨා කැම්ප් යනුවෙන් නම් කළ ත්‍රිකුණාමල නාවික හමුදා මූලස්ථානය තුළ පිහිටා ඇති එම ස්ථානය පරීක්ෂාකර බලා එය මුද්‍රා තබා ඇත. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් එසේ පරීක්ෂාකර බලා මුද්‍රා තබන ලද අවස්ථාවේ දී ඔහු විසින් ගෝඨා කැම්ප් යනුවෙන් නම් කළ ස්ථානය තුළ තිබී කිසිදු ඇටකටු විශේෂයක් හෝ සැකකටයුතු එවැනි ඇටකටු වැනි ද්‍රව්‍යයක් හෝ සොයාගෙන හෝ නිරීක්ෂනය කර නොමැත.

මෙම ගෝඨා කැම්ප් නැමැති ස්ථානය පිහිටා තිබී ඇත්තේ ත්‍රිකුණාමල හමුදා කඳවුර තුළ පිහිටා ඇති නාවික හා සාගරික අධ්‍යාපන පීඨයේ Tactical Area of Responsibility (TAOR) නැමැති ප්‍රදේශය තුළය. මෙම කලාපයේ දෙවැනි අණදෙන නිලධාරී වශයෙන් 2015 අප්‍රේල් මාසයේදී ක්‍රියා කර ඇත්තේ ලුතිනන් කමාන්ඩර් වෙලගෙදර වන අතර

ගෝඨා කැම්ප් යනුවෙන් සඳහන් ස්ථානය පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වාට පරීක්ෂාකර බැලීම සඳහා උදව් කර ඇත්තේද ලුතිනන් කොමාන්ඩර් වෙලගෙදර ය.

ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුරු භූමියේ තිබුණා යැයි කියනු ලැබූ වධකාගාරයක් සොයා ගිය ගමනේ දී සොයාගනු ලැබුවා යැයි කියනු ලබන ඇටකටු පිළිබඳව බී වාර්තාවක් අධිකරණයට ද ඉදිරිපත් කර ඇත. එම වාර්තාව පැ.8 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2016 සැප්තැම්බර් මස 30 වන දින දී පමණ පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා දුරකථනයෙන් සාක්ෂිකරු අමතමින් 2009 වසරේ දී සාක්ෂිකරු විසින් මෙම සිද්ධියට අදාලව යවන ලද ලිපියක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට අවශ්‍ය බවට දැනුම් දී ඇත. එවිට, තමාට ජනාධිපතිවරයාගේ අවසර නොමැතිව පැමිණීමට නොහැකි බව පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා මහතාට පවසා ඇත. ඉන් දින දෙකකට පමණ පසුව පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රවි සේනානායක විසින් අත්සන් තබන ලද ලිපියක් ද රැගෙන, සාක්ෂිකරුගේ නිවසට පැමිණ, ප්‍රකාශක් ලබා ගැනීමට අවශ්‍ය බවත් ඒ පිළිබඳව ජනාධිපතිතුමා දැනුවත් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව ඔක්තෝම්බර් මස 5 වන දින ප්‍රකාශක් ලබා දීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණි අවස්ථාවේ දී සාක්ෂිකරු විසින් යවන ලද ලිපියක සිංහල පරිවර්තනයක් ඔහුගේ ප්‍රකාශ ලෙසට සටහන් කර ගෙන ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරුගෙන් කටඋත්තරයක් ලබා ගැනීමට ඔහුව කැඳවනු ලැබූ අවස්ථාවේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අවසරයක් නොමැතිව

පැමිණිය නොහැකි බවට දැනුම් දුන් පසුව, නිශාන්ත සිල්වා ඉන් දින දෙකකට පසුව ලිපියක් ද රැගෙන පැමිණිලිකරුගේ නිවසට පැමිණ ජනාධිපතිතුමා මෙම කරුණු දන්නා බවටත්, එතුමාටද ලිපියේ කොපියක් ලබාදී ඇති බවටත්, එබැවින් ඔක්තෝබර් මස 5 සහ 6 දිනයන්හි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙසටත් දැනුම් දී ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ලය විමර්ශන අංශයේ ස්ථානාධිපති නිශාන්ත සිල්වා විසින් බී 732/09 දරණ නඩුවට, 2016 ජනවාරි මස 13 වැනි දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති උක්ත පැ.8 දරණ වැඩිදුර වාර්තාවේ ආරම්භයෙහි සඳහන් කර ඇත්තේ හිටපු නාවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා විසින් කොළඹ අපරාධ කොට්ඨාසය වෙත කර ඇති පැමිණිල්ල සම්බන්ධව වැඩිදුර විමර්ශනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරන බවය. වැඩිදුර වාර්තාවේ එසේ සඳහන් වුවත් වාර්තාවට අන්තර්ගත කරුණුවල සඳහන්ව ඇත්තේ හමුදාපති කරන්නාගොඩ මහතා විසින් සම්පත් මුණසිංහට එරෙහිව සිදු කරන ලද පැමිණිල්ල සම්බන්ධව සිදු කරනු ලැබූ විමර්ශන කටයුතු පිළිබඳ වැඩිදුර වාර්තාවක් නොව එකී පැමිණිල්ලට හාත්පසින්ම විරුද්ධ කරුණක් පිළිබඳව සිදු කරන පරීක්ෂණයක් ගැනය. එම බී වාර්තාවෙහි අඩංගු කරුණු විශ්ලේෂණාත්මකව පරීක්ෂාකර බැලීමේදී පැහැදිලිව පෙනී යන කරුණ වන්නේ; ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරේ පිහිටා තිබූ පුරාණ පතුරම් ගබඩා, සිරකුටි ලෙසට අර්ථ නිරූපණය කරමින්, ඒවා ගැසට් නොකරන ලද අනීත්‍යානුකූල සිරකුටි බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ම සකසන ලද අර්ථ

කථනයක් ඊට ලබා දෙමින්, එම සිරකුටි තුළ පැහැර ගත් ළමුන් රඳවාගෙන සිටි බවටත්, එම කර්තව්‍ය සඳහා හිටපු නාවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතාට දැනුමක් තිබූ බවට ඒත්තුගැන්වීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර, නිශාන්ත සිල්වා ඇතුළු පිරිස විසින් දරණ ලද උත්සාහයක ප්‍රතිඵල එම වැඩිදුර වාර්තාවෙහි අන්තර්ගතකර ඇති බවය.

උක්ත සඳහන් පැ.8 දරණ වැඩිදුර වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රථම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත 2015 පෙබරවාරි 26 වැනි දිනෙන් යුතුව බී 732/2009 නඩුවට ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාවෙන් පිළිගත නොහැකි කරුණු කිහිපයක් වාර්තා කර ඇත. මෙම වැඩිදුර වාර්තාව පැ.8A වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී වැඩිදුර වාර්තාවට අනුව ළමුන් අතුරුදහන්වීමේ සිද්ධියට අදාළ අගතියට පත් පාර්ශවකරුවන් විසින් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ හබයාස්කෝප්පුස් අයදුම්පත් කිහිපයක් පවරා පවත්වාගෙන යමින් තිබී ඇත. එම නඩු විමර්ශනය කෙරෙන අතර ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුර තුළ පිහිටා ඇති බවට කියනු ලබන ගෝඨා කඳවුර පරික්ෂා කිරීම සඳහා නියෝගයක් නිකුත් කරන ලෙසට, කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ එවකට ප්‍රධාන මහේස්ත්‍රාත් ගිහාන් පිලපිටිය මහතාගෙන් ආයාචනය කළ බවත්, එසේ වුවත් එවැනි නියෝගයක් ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගත නොහැකි බවත්, එබැවින් එම ඉල්ලීම කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයාට සිදු කර

නියෝගයක් ලබා ගන්නා ලෙසට උපදෙස් ලැබුණ බවටත් උක්ත සඳහන් පැ. 8A වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි අන්තර්ගත කර ඇත.

ප්‍රධාන මහේස්ත්‍රාත් ගිහාන් පිලපිටිය මහතා එවැනි උපදේශයක් ලබා දුන්නා යැයි නිශාන්ත සිල්වා එම බී වාර්තාවෙහි සඳහන් කළ කරුණු කිසිසේත් පිළිගත නොහැකි ය. හබයාස්කෝප්පුස් නඩුවක් විභාග කරමින් සිටි ප්‍රධාන මහේස්ත්‍රාත්වරයාට එවැනි නියෝගයක් නිකුත් කිරීමට පූර්ණ බලය ඇති බව ඔහු හොඳින්ම දනී. එසේම අනෙක් අතට එවැනි නියෝගයක් කොටුව මහේස්ත්‍රාත්වරයාට නිකුත් කිරීමට බලය ඇත්නම් ඒ හා සමානව බලයක් ප්‍රධාන මහේස්ත්‍රාත්වරයාට ද ඇති බැවින් ඔහුට ද එවැනි නියෝගයක් සිදු කළ හැකි බව ප්‍රධාන මහේස්ත්‍රාත් ගිහාන් පිලිපිටිය මහතා හොඳින්ම දන්නා බව කොමිෂන් සභාවට පැහැදිලිව පෙනී යයි. කරුණු සමස්ථයක් ලෙස සලකා බලන විට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් ඉදිරිපත් කරන ලද උක්ත සඳහන් වැඩිදුර වාර්තාවෙන් ඔහු උත්සාහ දරා ඇත්තේ ප්‍රධාන මහේස්ත්‍රාත් ගිහාන් පිලපිටිය මහතා මගින් ලබා ගැනීමට නොහැකි වූ යම් නියෝගයක් ව්‍යාජ කරුණු ඉදිරිපත් කිරීමක් තුළින් කොටුව මහේස්ත්‍රාත්වරයා මගින් ලබා ගැනීමට දරණ ලද කපටි උත්සාහයක් බවය.

ඔක්තොබර් 5 දින කටඋත්තරය ලබා දීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය අවස්ථාවේදී පැමිණිලිකරු කුමන්ත්‍රණකාරී ලෙස අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා විසින් සකස් කළ ප්‍රයෝගකාරී සැලැස්මක් හෙළිදරව් වී ඇති අතර ඒ පිළිබඳව

පැමිණිලිකරු සාක්ෂියේ දී මෙසේ සඳහන් කර ඇත; (උපුටා ගැනීම 2020.02.18.දින සක්ෂි සටහන් 38 පිටුව)

"එදින මගෙන් තවදුරටත් ඇහුවා ෆීලික්ස් පෙරේරා ඇමතිතුමාගේ ලිපිය ගැන. ඒ පිළිබඳවත් නිශාන්ත සිල්වා ඇසුවා. ඊට වඩා යමක් ඇසුවේ නැහැ ඒ පිළිබඳව එදින. එදින සවස අවසන් වෙනකොට නිශාන්ත සිල්වා මගෙන් ඇහුවා සර් මගේ දියණියගේ කොන්සට් එකක් තියෙනවා හෙට. ඒකට මට යන්න අවශ්‍යයි, ඒ නිසා මේක අනිද්දාට දාමුද කියලා. ඒ කියන්නේ 7 වෙනිදාට. මොකද මට එන්න කියලා ලියුමේ තිබුනේ 5 සහ 6 කියලා. ඒ අනුව 7 වෙනිදට දාමු කියලා. 7 වෙනිද කියන්නේ සිකුරාදා. මම කිව්වා ප්‍රශ්නයක් නැහැ මම ෆ්‍රී ඉන්නේ කියලා. එහෙම කියලා මම ගෙදර එනකොට මට මගේ මිතුරෙක්ගෙන් ලෝයර් කෙනෙක් ගෙන් මට දැනගන්න ලැබුණා අද්මිරාල්, අද්මිරාල්ව ඇරස්ට් කරන්න යනවා 7 වෙනිදාට. ඒකයි මේ කරලා තියෙන්නේ අද්මිරාල්ට විරුද්ධව චෝදනාවක්, මේගොල්ලෝ දාල තියනවා බී වාර්තාවක්. ලුතිනන් කමාන්ඩර් වෙලගෙදර කියන පුද්ගලයාට මම සහ තවත් හිටපු නාවික හමුදාපතිවරයෙකු වන අද්මිරාල් කොළඹගේ, ඩී.කේ.පී. දසනායක සහ සුමිත් රණසිංහ කියන මේ 4 දෙනාගේම නම් දාලා ලුතිනන් කමාන්ඩර් වෙලගෙදරට මරණීය තර්ජන කරලා තියෙනවා කියලා. එතකොට ලුතිනන් කමාන්ඩර් වෙලගෙදර මම දන්නේ නැහැ. ඒ වෙනකොට මේ නඩුවේ සාක්ෂි කාරයෙක් වෙලා තියෙනවා. සාක්ෂිකාරයෙකුට තර්ජනය කිරීම මම හිතන්නේ සමාව දෙන්න බැරි වරදක්

හැටියට සිකුරාදා දිනයේ මාව අත්අඩංගුවට ගන්න සූදානම් කරලා තියෙනවා. මේක මට කියපු ගමන් දැන් බ්‍රහස්පතින්දා ශ්‍රී වුන නිසා මම වහාම ලියුම් ලියලා ෆැක්ස් කලා අයි.ජී.ට පිටපත් දාලා ජනාධිපතිතුමාට, අගමැතිතුමාට, නීතිය හා සාමය භාර ඇමතිතුමාට, ආරක්ෂක ලේකම්තුමාට, නාවික හමුදාපති තුමාට, ඊළඟට නාවික හමුදාපති ලියුමක් ලිව්වා ඒ වගේම පිටපත් දාලා හැමෝටම මේක සම්පූර්ණ අසත්‍යයක් ඒක නිසා වෙලගෙදරට විරුද්ධව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට විරුද්ධව මේ වගේ බොරු ප්‍රකාශයක් කිරීම ගැන ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා. ඊට අමතරව උසස් නිලධාරීන් කීප දෙනෙකුට මම දුරකථනයෙන් දැනුවත් කළා මේ සිද්ධිය. (උපුටා ගැනීම අවසන්)

ලුතිනන් සම්පත් මුණසිංහට එරෙහි පැමිණිල්ල විභාග කිරීම සඳහා පැමිණිලිකරු විසින් ක්‍රියා කරනු ලැබූ අවධියේ දී ලුතිනන් වෙලගෙදර නැමැත්තා නාවික හමුදා කඳවුරක සේවය කළේ ද යන්න පැමිණිලිකරු නොදනී. එසේ වුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් පිරිසක් නාවික හමුදා කඳවුරේ තිබුනා යැයි කියනු ලැබූ ගෝඨා කඳවුර සොයන අවස්ථාවේදී මෙම වෙලගෙදර නැමැති නිලධාරියා ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුර තුළ පිහිටුවා තිබූ ස්වාධීන කඳවුරු තුනෙන් එක් කඳවුරක සේවය කරමින් සිට ඇත.

2009 වසරේ සිදුවූ ළමුන් අතුරුදන්වීමේ සිද්ධිය පිළිබඳව, පැමිණිලිකරුට ලැබී තිබුණු තොරතුරු සහ පැමිණිලිකරු විසින් පරීක්ෂණ පවත්වා රැස්කර ගත් තොරතුරු අනුව මෙම වෙලගෙදර

නැමැති නිලධාරියා ළමුන් අතුරුදන්වීමේ සිද්ධියට අදාළව කිසිදු කාරණයක් දන්නා පුද්ගලයකු නොවේ. එසේම ළමුන් නැති වීමේ සිද්ධිය සම්බන්ධයෙන් 2009 වසරේදී වෙලගෙදර නැමැති නිලධාරියාගෙන් කටඋත්තර ලබා ගැනීමක් ද සිදු කර නොමැත. කෙසේ වෙතත් පැමිණිලිකරුට එරෙහිව වෙලගෙදර නැමැති නිලධාරියා විසින් 2016 වර්ෂයේදී කටඋත්තරයක් ලබාදී ඇති බවට දැනගැනීමෙන් පසු ඒ පිළිබඳව 2016 වර්ෂයේ දී පමණ පැමිණිලිකරු සොයා බලා ඇත. කෙසේ වුවත් පැමිණිලිකරුගේ කටඋත්තරයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සටහන් කරගනු ලබන අවස්ථාවේදී වෙලගෙදර නැමැති නිලධාරියා පැමිණිලිකරුට එරෙහිව කටඋත්තරයක් ලබාදී ඇති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරුට කිසිදු දැනුම්දීමක් කර නොමැති අතර කටඋත්තරය ලබා ගන්නා අවස්ථාවේදී වෙලගෙදර නිලධාරියා පිළිබඳව කිසිදු ප්‍රශ්න කිරීමක් හෝ වෙලගෙදරට පැමිණිලිකරු විසින් සිදුකළ තර්ජනයක් පිළිබඳව ද කිසිදු ප්‍රශ්නයක් පැමිණිලිකරුගෙන් විමසා නොමැත.

යථා තත්ත්වය එසේ වුවත් පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද, පැ. 9 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති, 2016 සැප්තැම්බර් 27 වැනි දිනෙන් යුතුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පැවතුන බී 732/09 නඩුවට ඉදිරිපත් කල වැඩිදුර වාර්තාවෙහි, පැමිණිලිකරු විසින් ලුතිනන් කමාන්ඩර් වෙලගෙදරට සිදු කරන ලද තර්ජනයක් පිළිබඳව සඳහන් කර ඇත. එහි සඳහන් කර ඇති අන්දමට, ලුතිනන් කමාන්ඩර් වෙලගෙදර අවස්ථා කිහිපයක දී මෙම විමර්ශනයට අදාළව කරුණු

අනාවරණය කරමින් ප්‍රකාශ කිහිපයක් ලබා දී ඇති බවත්, එම හේතුව මත ඔහුගේ ජීවිතයට තර්ජන එල්ල වී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වකරුවන් ලෙස කමාන්ඩර් රණසිංහ, රියාර් අද්මිරාල් ඩී.කේ.පී.දසනායක, හිටපු නාවික හමුදාපති කරන්නාගොඩ සහ හිටපු නාවික හමුදාපති කොළඹගේ යන අයවලුන් බවටත් සඳහන් කර ඇත. මේ පිළිබඳව කරුණු සොයා බැලීමේදී 2016 වර්ෂයේ දී පැමිණිලිකරු විසින් වෙලගෙදර නම් නිලධාරියාට තර්ජනය කළ බවට පැමිණිල්ලක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සිදුකර ඇති බව දැනගෙන ඇත. එසේ වුවත් ඔක්තෝම්බර් 05 වන දින පැමිණිලිකරුගෙන් කට උත්තරයක් ලබා ගන්නා අවස්ථාවේදී වෙලගෙදරට සිදු කරනු ලැබූ තර්ජනයක් පිළිබඳව සිදු කළ පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු කිසිවක් විමසා නොමැත.

පැමිණිලිකරුගේ කටඋත්තරය සටහන් කර ගැනීමේ කටයුතු ඉතාමත් මන්දගාමී ලෙස සිදුවන බැවින් පැමිණිලිකරු ඒ පිළිබඳව විමසිලිමත් වී ඇති අතර, එම අවස්ථාවේදී මෙම විමර්ශන කටයුත්ත 05 වන දින අවසන් කළ නොහැකි බවටත්, 6 වන දින පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වාට පැමිණීමට නොහැකි බැවින් ඉදිරි කටයුතු 7 වන දින සිදු කරන බවටත්, ඒ සඳහා පැමිණිලිකරුගේ කැමැත්ත විමසීමක්ද සිදුකර ඇති බවටත් හෙළිදරව් විය.

මේ අනුව වෙලගෙදර නම් නිලධාරියා විසින් පැමිණිලිකරුට එරෙහිව ඉදිරිපත් කරන ලද අසත්‍ය පැමිණිල්ලක් පාදක කරගෙන පැමිණිලිකරුට එරෙහිව යම් ක්‍රියා මාර්ගයකට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සැරසෙන බවට දැනගත් පැමිණිලිකරු ඒ පිළිබඳව හමුදාපතිට, පොලිස්පතිට, අග්‍රාමාත්‍යවරයාට, ජනාධිපතිවරයාට, සහ

නීතිය හා සාමය ආරක්ෂා කරන අමාත්‍යවරයාට ලිඛිතව දැනුම් දී ඇත. මෙම ලිපි පැ.10 සහ පැ.11 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම දැනුම් දීමට අනුව අග්‍රාමාත්‍යවරයා විසින් නාවික හමුදාපතිවරයාට මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම සඳහා දැන්වීමක් සිදුකර ඇති අතර නාවික හමුදාපතිවරයා විසින් ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මෙම පැමිණිල්ල විභාග කිරීම සඳහා පත්කර ඇත. එම කමිටුවේ සභාපති ලෙස නාවික හමුදාවේ රියාර් අද්මිරාල් දිමුතු ගුණවර්ධන මහතා පත්කර ඇති අතර ගුවන් හමුදාවෙන් සහ පාබල හමුදාවෙන් කොමදෝරු තලයේ නිලධාරීන් දෙදෙනකු පත්කර ඇත. මෙම පරීක්ෂණ මණ්ඩලය පත් කිරීම පිළිබඳ පැ.12 සහ පැ.13 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

නාවුක හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා මෙම තරුණයන් එකොළොස්දෙනා අතුරුදන්වීම සම්බන්ධයෙන් මුල් පැමිණිල්ල කොළඹ අපරාධ කොට්ඨාශයට ඉදිරිපත් කරන විට ඒ සඳහා සාක්ෂි කරුවකු වශයෙන් ඉදිරිපත් වූ අලුත් ගෙදර උපුල් බණ්ඩාර සඳහන් කර ඇත්තේ එවකට හමුදාපතිවරයාගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වූ සම්පත් මුනාණසිංහ විසින් එම අතුරුදන් කිරීමේ සිද්ධිය සිදුකළ බවය. එසේ වුවත් නිශාන්ත සිල්වා ගේ අවශ්‍යතාවය මත උපුල් බණ්ඩාර තම කටඋත්තරය වෙනස් කරමින් අසත්‍ය ප්‍රකාශ සිදු කර ඇත.

ඒ අනුව පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂණ කටයුතු 2017 ජනවාරි මාසයේ යොදාගෙන ඇත. ඒ අතරතුර පරීක්ෂණයට දිනකට හෝ දෙකකට පෙර වෙලගෙදර නැමැති නිලධාරියා තම දේශපාලනික බලපෑම් යොදාගෙන මාස හයක කාලසීමාවක් සඳහා ඕස්ට්‍රේලියාව බලා පිටත්ව ගොස් ඇති අතර ඒ අනුව පරීක්ෂණ මණ්ඩලයට

වෙලගෙදර නිලධාරියාගේ අසත්‍ය පැමිණිල්ල පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට හැකියාවක් ලැබී නොමැත. මාස හයක කාලසීමාවක් සඳහා ඕස්ට්‍රේලියාව බලා ගිය වෙලගෙදර නැමැති නිලධාරියා නැවත ආපසු පැමිණ නැති අතර වෙලගෙදර ඔස්ට්‍රේලියාවේ දේශපාලන රැකවරණය ආයාචනය කර ඒ අනුව දේශපාලන රැකවරණ ලාභියකු ලෙසට ඔස්ට්‍රේලියාවේ ජීවත් වන බවට පැමිණිලිකරු 2019 වර්ෂයේදී සොයාගෙන ඇත.

මේ අනුව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති බී 732/09 දරණ නඩුවේ ප්‍රධාන සාක්ෂිකරු වන වෙලගෙදර දැන් ලංකාවෙන් පැන ගොස් ඇති එම නඩුව ඉදිරියට පවත්වාගෙන යා නොහැකිව පවතී.

මේ අයුරින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට 2016 වර්ෂයේදී සිදු කළ පළමුවන වෑයම අසාර්ථක වී ඇත. ඉන්පසුවද, පැමිණිලිකරු සඳහන් කළ අන්දමට තවත් අවස්ථා කීපයකදී ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විවිධ පරිශ්‍රමයන් දරා ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා 2017 වසරේ දී දෙවන වරටද උත්සාහ කර ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ දෙවන උත්සාහය සඳහා ක්‍රියාත්මක කර ඇත්තේ රියාර් අද්මිරාල් සින්නයියා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් ප්‍රකාශයක් උපයෝගී කර ගනිමින්ය. එම ප්‍රකාශයෙහි සින්නයියා සඳහන් කර ඇත්තේ ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ රඳවා ගැනීම් ස්ථානයක් පවත්වාගෙන ගිය බවත්, එහි සිටි සිරකරුවන් ඝාතනයට ලක් වුණු බවත්, එසේ ඝාතනයට ලක්වීම සම්බන්ධයෙන් වගකිව යුත්තේ

එවකට නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතාත්, එවකට ආඥාපති ඩී.කේ.පී දසනායක මහතාත්, කොමදෝරු උදය බණ්ඩාර මහතාත්, ආඥාපති සුමිත් රණසිංහ මහතාත් යන හතර දෙනා බවය.

සින්නයියා විසින් සිදු කරනු ලැබූ ප්‍රකාශයෙහි සඳහන් කරුණු සිදු වී ඇත්තේ ද 2009 වසරේ මැයි මාසයේ දී පමණය. ප්‍රශ්නගත සිද්ධිය සිදු වුණු කාලවකවානුවේදී රියාර් අද්මිරාල් සින්නයියා නාවික හා සමුද්‍ර විද්‍යාපීඨයේ අණදෙන නිලධාරියා වශයෙන් වෙනත් ස්ථානයක සේවය කර ඇත. ඔහුගේ අධීක්ෂණ නිලධාරියා වූ රියාර් අද්මිරාල් සුසිත් වීරසේකර මහතා සිද්ධිය සිදුවුණායැයි කියන හමුදා කඳවුරෙහි සේවය කර ඇත. එසේ වුවත් සිද්ධියට අදාළ ස්ථානයෙහි සිටි සුසිත් වීරසේකර මහතා සින්නයියා ප්‍රකාශ කරන අන්දමේ කිසිවක් දන්නා බවට ප්‍රකාශයක් කර නොමැත. සිද්ධිය සිදු වූ ස්ථානයේ නොසිටි සින්නයියා සිද්ධිය දුටු බවට සඳහන් කරමින් මෙම ප්‍රකාශය කර ඇති බව සාක්ෂිකරු වැඩිදුරටත් සඳහන් කළේය. රියාර් අද්මිරාල් සුසිත් වීරසේකර මහතා නියෝජ්‍ය ආඥාපති වශයෙන් සේවය කර ඇති අතර ඔහුගේ ප්‍රකාශයක්ද සමග වැඩිදුර වාර්තාවක් බී 732 නඩුවට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් ඉදිරිපත් කර ඇති අතර මෙම ප්‍රකාශයෙහි එවැනි කිසිදු කරුණක් සඳහන් කරන නොමැත.

රියාර් අද්මිරාල් සින්නයියාගේ ප්‍රකාශයෙන් අඩංගු කරුණු වලින් ප්‍රකාශිත සිද්ධිය සිදුවී ඇත්තේ 2009 මැයි මාසයේදීය මෙම කාලසීමාවේදී සින්නයියා නාවික සාගරික විද්‍යාපීඨයේ අණදෙන නිළධාරි වශයෙන් හා නියෝජ්‍ය නැගෙනහිර විධාන ලෙස කටයුතු කර ඇත. 2009 සිදු වූ සිද්ධියක් පිළිබඳව ප්‍රකාශ කරන්නේ 2016 වසරේ දීය. මෙතරම් කාලයක් තමා දන්නා ඝාතන සිද්ධියක් හෝ පැහැර

ගැනීමේ සිද්ධියක් පිළිබඳ කරුණු තම ප්‍රධානීන්ට හෝ වගකිව යුතු නිලධාරීන්ට ප්‍රකාශ නොකර සඟවා ගෙන සිටියේ කුමන අරමුණක් අරඹයා ද යන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සොයා බලා නොමැත. එසේම අනෙක් අතට අවුරුදු අටකට පසුව 2016 වර්ෂයේ දී, 2009 වසරේ සිදු වූ සිද්ධියක් හෙළිදරව් කරන්නේ කුමන අරමුණක් ඉටු කර ගැනීම පිණිස ද යන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සොයා බලා නොමැත.

මෙම අරමුණු සොයා යාමේදී සින්නයියාගේ නාවික හමුදා ඉතිහාසය කතාව වැදගත්වේ. 2011 වසරේදී පවුලේ උවමනාවක් උදෙසා ඔස්ට්‍රේලියාවට යාම අවශ්‍ය බව පවසමින් විශ්‍රාම යන සින්නයියා එසේ විශ්‍රාම යාමෙන් පසු 2011 වසරේ දීම ඇමරිකානු තානාපති කාර්යාලයේ රැකියාවක් භාරගෙන ඇත. විශ්‍රාම යන අවස්ථාවේදී රාජ්‍ය සේවකයෙකුට හිමි වන සියලු හිමිකම් වරප්‍රසාද සහ බදු රහිත මෝටර් රථ බලපත්‍රයද ලබාගෙන ඇත. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යන සින්නයියා 2015 වර්ෂයේ දී යහපාලන රජය බලයට පත් වූ අවස්ථාවේ දී, තමන් ද දේශපාලන වශයෙන් පලිගැනීමට ලක්වූ පුද්ගලයකු බව පවසමින් නැවත නාවික හමුදා සේවයට බැඳී ඇත. එසේ නාවුක හමුදාවට බැඳීමෙන් පසුව පැමිණිලිකාර වසන්ත කරන්නාගොඩ මහතාට එරෙහිව ප්‍රකාශයක් ලබාදී සාක්ෂි සපයා දීමෙන් සති තුනකට පසු සින්නයියා වයිස් අද්මිරාල්ධූරයට උසස් කර නාවික හමුදාපතිධූරය ලබා දී ඇත.

ට්‍රැවිස් සින්නයියාගේ ප්‍රකාශය සහ තවත් ප්‍රකාශ දෙකක් සහිතව 2017.08.10 දිනෙන් බී 732/09 දරණ නඩුවට ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තාවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්න්තුවේ පොලිස්

පරීක්ෂක නිශාන්ත සිල්වා නඩුවට අදාළ කරුණු වලට අමතරව තමන්ටද, මෙම පරීක්ෂණය හේතුවෙන් ජීවිත තර්ජනයක් ඇති බවට කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇත. මෙම බී වාර්තාව පැ.14 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.14 දරණ එම බී වාර්තාවෙහි සුසිත් වීරසේකර, එවකට හිටපු නැගෙනහිර නාවික විධානය, විසින් ලබාදෙන ලද ප්‍රකාශයක සම්පිණ්ඩනයක් ද ඇතුළත් කර ඇත. එම සම්පිණ්ඩනයෙහි දක්වා ඇත්තේ වීරසේකර මහතාට හමුදාපතිවරයාගේ දැනුම්දීමක් මත ත්‍රිකුණාමල කඳවුරේ පුද්ගලයින් රඳවා සිටීද යන්න පරීක්ෂා කළ බවත්, එහෙත් කිසිවකු නොසිටි බවත් පුද්ගලයින් පැහැරගෙන විත් රඳවාගෙන සිටීමක් පිළිබඳව ආඥාපති සුසිත් වීරසේකර විසින් දැනුම්දීමක් සිදුකර නොමැති බවත්ය.

එම කාලවකවානුවෙහි සින්නයියා සේවය කර ඇත්තේ නියෝජ්‍ය නැගෙනහිර විධානය ලෙසය. මේ අනුව මෙම සිද්ධියට අදාළ කාලසීමාවේදී ට්‍රැවිස් සින්නයියාගේ ප්‍රධානියා වූ නැගෙනහිර අඥාපති සුසිත් වීරසේකර මහතා නාවික හමුදාපතිගේ විධාන අනුව ස්ථාන පරීක්ෂාකර බලා එවැනි පුද්ගලයින් සිරකර රඳවා ගැනීමක් සිදුවී නොමැති බවට වාර්තා කරන විට කිසිවක් නොදත් සින්නයියා සිද්ධියෙන් අවුරුදු අටකට පසුව පුද්ගලයින් සිරකර රඳවා තැබීමක් සිදුවූ බවට තමන් පසුව දැනගත් බව ප්‍රකාශ කරන්නේ පැහැදිලි ලෙසම යටි අරමුණක් මුදුන්පත් කර ගැනීම සඳහාය. ට්‍රැවිස් සින්නයියාගේ යටි අරමුණ පැමිණිලිකරු තම සාක්ෂියේ දී මෙසේ විස්තර කර ඇත; (උපුටා ගැනීම 2020.02.18 දින සාක්ෂි - පිටුව 53)

"අනිවාර්යයෙන්ම එයාට වරදාන හා වරප්‍රසාද ලබාගන්න. එයාට නාවික හමුදාපති ධූරය පිරිනමනවා කියලා එවකට රජයේ මම දන්නවා මම නම කියන්න කැමති නැහැ ප්‍රබල ඇමතිවරයෙක් මම හිතනවා එයාට ගොඩක් උදව් කළා ඒකට. එයාගේ කීම උඩ තමයි ඒ ඇමැතිවරයා ජිනීවා හි සම්මත කරගන්නා ලද සමයෝජනාවේ කටයුතු සාර්ථක කර ගැනීමට රණවිරුවන් දඩයම් කර ගන්න විශාල දායකත්වයක් දුන්නා. ආණ්ඩුව වෙනස් වෙනකම් හිටියා 2019 නොවැම්බර් මාසයේ. එයා තමයි මෙයාව හමුදාපති කළේ. එයා හමුදාපති වෙච්ච දවසේ එයාගේ පුතා ගිහිල්ලා මෙයාගේ ඔෆිස් එකෙත් හිටියා හමුදාපති වෙන උත්සවයේ. මම දන්නෙ නැහැ ඒක කීම හරිද කියලා. ඕන නම් මට නම කියන්නත් පුළුවන්. මට සක් සුදක් සේ කියන්න බැහැ. එයාගේ පුතා ගිහිල්ලා ඔෆිස් එකේ හිටියා කියලා නම් මට කියන්න පුළුවන්. ඒක හැමෝම දන්නා කාරණාවක්." (උපුටා ගැනීම අවසන්)

2018 සැප්තැම්බර් මාසයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරු තුන්වන වතාවට අත්අඩංගුවට ගැනීමට උත්සාහ කර ඇත.

ට්‍රැවිස් සින්නයියාගේ අසත්‍ය ප්‍රකාශය මත පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දරනු ලැබූ ද්වේශසහගත ප්‍රයත්නය පිළිබඳව පැමිණිලි කරමින් ආරක්ෂක ලේකම් කපිල වෛද්‍යරත්න, නාවික හමුදාපති වයිස් අද්මිරාල් රවි විජේගුණරත්න සහ පොලිස්පති පූජිත් ජයසුන්දර වෙත යවමින් වහාම පරීක්ෂණයක් පවත්වන ලෙසට ඉල්ලීමක් කර ඇති අතර මෙම

ලිපිවල පිටපත් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ අමාත්‍ය සාගල රත්නායක මහතා වෙත යවා ඇත. මෙම ලිපිවල පිටපත් පැ.15, පැ. 16 සහ පැ. 17 වශයෙන් සලකුණු කර ඉදිරිපත්කර ඇත.

2018 සැප්තැම්බර් මාසයේ දී නැවත වතාවක් පැමිණිලිකරු අත් අඩංගුවට ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ද්වේෂසහගත ලෙස ප්‍රයත්නයක යෙදී ඇත. මේ සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අවුරුදු 4ක පමණ කාලයක් පැමිණිලිකරුගේ නාවික ලේකම් ලෙස කටයුතු කළ රියාර් අද්මිරාල් ෂෙමාල් ප්‍රනාන්දුගේ ප්‍රකාශයක් උපයෝගී කරගෙන ඇත. ෂෙමාල් ප්‍රනාන්දු 2018 සැප්තැම්බර් 18 හෝ 19 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් ප්‍රකාශයක් ලබා දෙමින් අමාත්‍ය ෆීලික්ස් පෙරේරාගේ ලිපිය අනුව පැමිණිලිකාර නාවික හමුදාපති කටයුතු කළා නම් මෙම තරුණයන් බේරා ගැනීමට තිබුණු බවට ප්‍රකාශ කර ඇත. ඒ අනුව නැවත කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පැවතුන බී 732/09 නඩුවට 2018.09.26 දිනින් වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරමින් එම ප්‍රකාශය අනුව කටයුතු කිරීමට ඉල්ලීමක් කර ඇත. මෙම වැඩිදුර වාර්තාව පැ.18 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2010 වර්ෂයේ දී ද එකී ෂෙමාල් ප්‍රනාන්දු විසින් ප්‍රකාශයක් ලබාදී ඇති අතර එකී ප්‍රකාශයෙහි කිසිදු අවස්ථාවක ෆීලික්ස් පෙරේරා අමාත්‍යවරයා වෙත කතා කළ බව හෝ අතුරුදහන් වූ ළමයි ගැන හෝ සඳහන් කර නොතිබුණා පමණක් නොව පැමිණිලිකරුට විරුද්ධව කිසිදු ප්‍රකාශයක් සිදුකර තිබුණේ ද නැත.

විවිධ අවස්ථාවන්හිදී විවිධ ප්‍රකාශ සටහන් කර ගනිමින් අවශ්‍ය අවස්ථාවන්හිදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර වාර්තා ඉදිරිපත් කරමින් පැමිණිලිකරුට එරෙහිව ඔහු අත්අඩංගුවට පත්වන අයුරින් ඉල්ලීම් සිදු කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා ක්‍රියාකර ඇත්තේ එසේ වැඩිදුර වාර්තාවලින් සඳහන් කරනු ලැබූ පැමිණිලිකරුට එරෙහි ප්‍රකාශ වලට පැමිණිලිකරුට පිළිතුරු සැපයීමට අවස්ථාවක් ලබා නොදී ඒක පාර්ශ්විකව ක්‍රියාකරමිනි. ෂෙමාල් ප්‍රනාන්දුගේ ප්‍රකාශය මත කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පැවතුණු බී 732/09 නඩුවට ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තා දෙකක් පැ.18 සහ පැ. 19 වශයෙන් ඉදිරිපත් කර ඇත.

2018 වර්ෂයේ දී ෂෙමාල් ප්‍රනාන්දු සිදු කළ ප්‍රකාශය සම්බන්ධයෙන් ද පරීක්ෂණයක් පවත්වන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනවිරත්න මහතාගෙන් සහ නීතිපතිවරයාගෙන් ඉල්ලා ඇතත් එකී ඉල්ලීම් වලට කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත.

තමන් සමග හොඳ මිත්‍රයෙක් වශයෙන් සිටි ෂෙමාල් ප්‍රනාන්දු මහතා මේ අයුරින් 2018 වර්ෂයේ දී තමන්ට එරෙහිව ප්‍රකාශයක් කරන්නට ඇත්තේ ඔහුට යහ පාලන රජයෙන් ලැබුණු වරදාන සහ වරප්‍රසාද හේතුවෙන් බවට තමන් විශ්වාස කරන බවත්, යහපාලන රජයෙන් ෂෙමාල් ප්‍රනාන්දු මහතාට රේගු අධ්‍යක්ෂක ජනරාල් පදවිය පිරිනමන ලද බවත් තමන්ට මෙතරම් හිතවත්ව සිටි ෂෙමාල් ප්‍රනාන්දු වෙනස් වීමට හේතුව මෙම තනතුරු ලාභ ප්‍රයෝජන බවත්, පැමිණිලිකරු සඳහන් කර ඇත.

එසේ වුවත් රේගු සේවකයින් විසින් ඊට එරෙහිව සිදු කරනු ලැබූ වැඩවර්ජනය හේතුවෙන් අධ්‍යක්ෂ ජනරාල් පදවිය භාර ගැනීමට ෂෙමාල් ප්‍රනාන්දුට නොහැකි විය.

ෂෙමාල් ප්‍රනාන්දු පැමිණිලිකරුගේ ළඟම හිතවත් මිත්‍රයකු බව සනාථ කරන ලේඛන ඉදිරිපත් කර ඇත. ඔහු විසින් 2018 අප්‍රේල් මාසය දක්වාම පැමිණිලිකරුට ඇති ඔහුගේ හිතවත්කම සනාථ කෙරෙන එස්.එම්.එස් පණිවිඩ එවා ඇත. එම පණිවිඩ කීපයක් අඩංගු ලේඛනයක් පැ. 20 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

තමන් අත්අඩංගුවට ගැනීමේ අවශ්‍යතාවය යහපාලන රජයට අවශ්‍ය වූයේ යුද්ධයට දායකත්වයක් දැක්වූ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරියෙකු ජිනීවා වලට ගෙනයාමත්, ඊටත් වඩා පැමිණිලිකරු හරහා එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා හෝ ඔහු හරහා එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ජිනීවා වලට ගෙනයාම සඳහා මෙම සිද්ධි වල පටලැවීමට ගනු ලැබූ උත්සාහයක ප්‍රතිඵලයක් හැටියට මෙම ක්‍රියාවන් පැමිණිලිකරු විස්තර කර ඇත.

උදාහරණයක් ලෙසට දක්වන ලද කරුණක් වූයේ සින්නයියා නාවික හමුදාපති වීමෙන් පසුව ඔහුගේ කාර්යාලයේ වැඩ බාර ගන්නා අවස්ථාවට රාජිත සේනාරත්න මහතාගේ පුත්‍රයා වූ චතුර සේනාරත්න මහතා සහභාගී වූ බවත්, ඔහු එම ස්ථානයේදී හැසුරුණේ සින්නයියා මහතාට නාවික හමුදාපති පදවිය ලබාදීමට මූලික වූයේ ඔහු බව ඒත්තු ගන්වන ආකාරයෙන් බවත්ය. නාවික හමුදාපති වැඩ භාරගන්නා අවස්ථාව පිළිබඳව ඉතිහාසය දෙස බලන විට ඉතිහාසයේ කිසිදු දවසක දේශපාලනඥයෙක් නාවික හමුදාපතිවරයා වැඩ භාර ගන්නා අවස්ථාවට සහභාගි වී නොමැති බව ද වැඩිදුරටත් සඳහන් කළේය.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම අනීත්‍යානුකූල ක්‍රියාවක් බවත්. ද්වේෂසහගත ක්‍රියාවක් බවත් එවැන්නක් සිදු කිරීමෙන් වළකින ලෙසටත්, අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය අසත්‍ය ප්‍රකාශ ලබාදුන් පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙසටත්, ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා ඇතුළු සියලුම අදාළ උසස් නිලධාරීන්ට සිදු කරනු ලැබූ ඉල්ලීම්වලට කිසිදු සාර්ථක ප්‍රතිචාරයක් ලැබී නොමැත.

පැමිණිලිකරුගේ එම ඉල්ලීම ද නොසලකා, නැවත වතාවක් ෂෙමාල් ප්‍රනාන්දුගේ ප්‍රකාශය මත පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා වූ සූදානමක් පවතින බවට 2019 පෙබරවාරි මාසයේදී දැනගන්නට ලැබී ඇත. මෙම අවස්ථාවේදී පැමිණිලිකරු මෙම අනීත්‍යානුකූල අත්අඩංගුවට ගැනීමේ සූදානමට එරෙහිව තමාගේ මූලික අයිතිවාසිකම් කඩවන බවට චෝදනා කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ මූලික අයිතිවාසිකම් කඩ කිරීමේ නඩුවක් පවරා ඇත. එකී නඩුව විභාග කිරීමෙන් අනතුරුව, අත්අඩංගුවට ගැනීමෙන් ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩවන බවටත්, එබැවින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම නීති විරෝධී බවටත්, තීරණය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2019 මාර්තු 07 වන දින තීන්දුවක් ප්‍රකාශයට පත් කර ඇත. අංක එස්.සී.(එෆ්.ආර්) 71 /2019 දරණ නඩුවේ තීන්දුව පැ.22 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මානව හිමිකම් කඩ කිරීම පිළිබඳ එම නඩුවේ වගඋත්තරකරුවන් ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා, අධ්‍යක්ෂක ශානි අබේසේකර, පොලිස්පති පූජිත් ජයසුන්දර, නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න සහ නීතිපති නම් කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පැමිණිලිකරුගේ මානව හිමිකම් කඩකිරීමේ පෙත්සම විභාග කරමින් පවතින අතරතුරේදීම එම පෙත්සමේ පළවන වගඋත්තරකරුවන් වශයෙන් නම් කර සිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් බී 732/09 නඩුවට තවත් වැඩිදුර වාර්තාවක් (පැ.23) 2019.02.26 දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. මෙම පැ.23 දරණ වැඩිදුර වාර්තාවෙහි අඩංගු කරුණු පැහැදිලි ලෙසම එකිනෙකට පරස්පර විරෝධීය. පැමිණිලිකරු සඳහන් කළ ලෙසටම කරුනු විකෘතිකර දක්වා ඇති බව පෙනේ.

මේ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ ප්‍රයත්නයන් කිසියම් රටාවකට සිදුවන බවට සාක්ෂි මඟින් අනාවරණය විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් සංවිධානයේ රැස්වීම් වාර පැවැත්වෙන ඒ ඒ වර්ෂයේ පෙබරවාරි මාර්තු හා සැප්තැම්බර් ඔක්තෝබර් මාසයන්හි පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ ප්‍රයත්නයන් ක්‍රියාවට නංවා ඇත.

ප්‍රධාන සැකකරු විසින් සිදු කරන ලද පුද්ගල පැහැර ගැනීම් සහ කප්පම් ගැනීම් පිළිබඳව හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතාට තමන් දැනුම් දුන් බවට රියාර් අද්මිරාල් උදය කීර්ති විජේබණ්ඩාර මහතා සඳහන් කළ බවට පැ.23 වාර්තාවේ 9 ඡේදයෙහි සඳහන් කර ඇතත් රියාර් අද්මිරාල් විජේබණ්ඩාර මහතා ඔහුගේ ප්‍රකාශයෙහි එවැනි ප්‍රකාශයක් සිදු කර නොමැති බවට කරුණු ඉදිරිපත්ව ඇත.

පැ.23 වැඩිදුර වාර්තාවේ, 11 වන ඡේදයේ නිශාන්ත සිල්වා සඳහන් කර ඇත්තේ, හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා විසින් මෙම ළමුන් පස් දෙනා පිළිබඳව මුල් අවස්ථාවේදීම නිසි

සැලකිල්ල හා අවධානයෙන් යුතුව ලද තොරතුරු පිළිබඳව සොයා බැලුවේ නම් මෙම තරුණයන් පස් දෙනා ඝාතනය වීමකින් තොරව බේරා ගැනීමට හැකියාවක් තිබූ බව නිශාන්ත සිල්වා සිදුකළ පරීක්ෂණවලදී අනාවරණය වූ බවය. නමුත්, සත්‍ය තත්ත්වය වූ පැමිණිලිකරුට සිද්ධිය වාර්තා කළ මුල් අවස්ථාවේදීම ඒ පිළිබඳව අදාල නිලධාරීන් යොදවා පරීක්ෂණ පවත්වා ඇති ආකාරය අධිකරණයට වාර්තා නොකර, නිශාන්ත සිල්වා, පැහැදිලි ලෙසම තමන්ගේ ද්වේශ සහගත යටි අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා එකොළොස් වැනි ඡේදයෙහි මෙවැනි ප්‍රකාශයක් අන්තර්ගත කර ඇති බව පැහැදිලියි.

කොමිෂන් සභාවට ඉදිරිපත් වී ඇති සාක්ෂි වලින් තහවුරු වී ඇති අන්දමට 2009 මැයි මාසයේ ඊලාම් යුද්ධයේ අවසන් අදියර මුලතිව් මුහුදු තීරයේ සිදුවන අතරතුරදී ප්‍රභාකරන් ඇතුළු කොටි ප්‍රධානීන් මුහුදින් පැන යාම වැළැක්වීම සඳහා පැමිණිලිකරු සක්‍රීය ලෙස යුද්ධයට දායක වී සිටි අවස්ථාවේදී, සාක්ෂිකරුගේ නාවික සහායක ලෙස සේවය කළ කොමදෝරු උදය බණ්ඩාර විසින් සඳහන් කර ඇත්තේ සාක්ෂිකරුගේ ආරක්ෂක නිළධාරියෙක් වශයෙන් සේවය කළ ලුතිනන් කොමාන්ඩර් සම්පත් මුණසිංහ නැමැති පුද්ගලයා ළමයින් 5 දෙනෙකු ත්‍රිකුණාමල කඳවුරේ රඳවාගෙන එකී ළමුන් 5 දෙනා මුදාහැරීමට මුදල් ඉල්ලන බවය. කොමදෝරු උදය බණ්ඩාරට එම තොරතුර ලබා දී ඇත්තේ එවකට බටලන්ද ආරක්ෂක විද්‍යාතනයේ සේවය කළ කපිතාන් ජේ.ඩී.රණසිංහ විසිනි. එම තොරතුර ලද විගසම, කොමදෝරු බණ්ඩාර ද සිටින අවස්ථාවේදීම

සාක්ෂිකරු විසින් එකී සම්පත් මුණසිංහ නැමැත්තාව සාක්ෂිකරුගේ කාර්යාලයට කැඳවා එකී ළමුන් රඳවා ගැනීම පිළිබඳ ප්‍රශ්න කර ඇත.

බටලන්ද ආරක්ෂක විද්‍යාතනයට ගොස් කපිතාන් ජේ.ඩී. රණසිංහගෙන් කරුණු පැහැදිලි කර ගන්නා ලෙසට පවසා සම්පත් මුණසිංහ ආපසු යැවීමෙන් පසුව, දුරකථනයෙන් ත්‍රිකුණාමල නැගෙනහිර දිසාව භාරව කටයුතු කළ රියාර් අද්මිරාල් සුසිත් වීරසේකර අමතා, මෙම සිද්ධිය පිළිබඳව ඔහු දැනුවත් කර, මෙම පැමිණිල්ල පිළිබඳව පරීක්ෂා කිරීමට ඔහු යොදවා ඇත. ත්‍රිකුණාමලයේ සඳහන් කළ ස්ථානයේ එලෙස ළමුන් රඳවා ගැනීමක් නොමැති බවට පරීක්ෂණයෙන් පසුව සුසිත් වීරසේකර විසින් සාක්ෂිකරුට දන්වා ඇත.

එදිනම හෝ ඊට පසු දින නාවික අධ්‍යක්ෂක බුද්ධි තොරතුරු ප්‍රධානී කපිතාන් ගුරුගේ නැමැත්තාට මෙම පැමිණිල්ල පිළිබඳ සොයා බැලීමට සාක්ෂිකරු දැනුම් දී ඇත. එසේම රඳවාගෙන සිටිනු ලබන පුද්ගලයින් ත්‍රිකුණාමලයෙන් පිට වෙනත් ප්‍රදේශවල රඳවාගෙන සිටින්නේ දැයි සොයා බැලීමට නාවික අධ්‍යක්ෂක බුද්ධි තොරතුරු ගුරුගේට දැනුම් දී ඇත. ඊට අමතරව නාවික විනය ආරක්ෂක අංශයේ ප්‍රධානියා වන කපිතාන් හංවැල්ලට මෙම කරුණු පිළිබඳ සොයා බැලීමට සාක්ෂිකරු දැනුම් දී තිබේ.

අතුරුදහන් වූ පිරිසේ එක් පුද්ගලයෙක් වන රජීව් නාගනාදන් නැමැත්තා, බන්දු කුමාර නැමැති නැවියෙකුගේ ජංගම දුරකථනයක් උපයෝගී කරගනිමින් අවසන් වරට 2009.04.24 වන දින තම පියා සහ මව සමග කතා කළ බවට දිවුරුම් ප්‍රකාශයක් රජීව් නාගනාදන්ගේ මව සහ පියා විසින් ඔවුන් ඉදිරිපත් කළ හබයාස්කෝප්පුස් නඩුවට ලබා දී ඇත. දිවුරුම් ප්‍රකාශයක් මත එසේ ප්‍රකාශ කර තිබියදීත්, පොලිස්

පරීක්ෂක නිශාන්ත සිල්වා උක්ත වැඩිදුර වාර්තාවෙහි සඳහන් කර ඇත්තේ අතුරුදහන් වූ නාගනාදන් 2009 අප්‍රේල් මස 1 වන දින සිට 2009 මැයි 21 දින දක්වා තම මව සහ පියා සමඟ කතා කර ඇති බවය.

මේ අනුව පැහැදිලි ලෙසම පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා පැ.23 දරණ වැඩිදුර වාර්තාවෙන් සත්‍ය කරුණ යටපත්කර, මුල් අවස්ථාවේදීම පැමිණිලිකරු සිද්ධිය පරීක්ෂණය සඳහා ගත් ක්‍රියාමාර්ග කිසිවක් සඳහන් නොකර, අධිකරණය නොමඟ යවන වාර්තාවක් ඉදිරිපත් කර පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට උත්සාහ දරා ඇත.

පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් මේ අන්දමේ අසත්‍ය ප්‍රකාශ ඇතුළත් වැඩිදුර වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කර අධිකරණය නොමඟ යවා පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට ගනු ලැබූ උත්සාහය, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමෙහි සඳහන් කරන ලදී. ඉන්පසුව 2019.10.09 දින තවත් වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරමින් ඊට පෙර වැඩිදුර වාර්තාවේ රජීව් නාගනාදන් තම මව සමග 2009 මැයි 21 වෙනි දින දක්වා දුරකථනයෙන් කථා කළ බවට සඳහන් වී ඇත්තේ යතුරුලියන දෝෂයකින් බවට සඳහන් කර ඇත. නිශාන්ත සිල්වාට යතුරුලියන දෝෂයක් සොයාගෙන එය අධිකරණය වෙත සැල කිරීමට අවුරුදු 8 ක කාලයක් ගතවී ඇත. මෙම වැඩිදුර වාර්තාව පැ. 24 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉන්පසුව නැවතත් බී 732/09 දරණ නඩුවට වැඩිදුර වාර්තාවක් 2019 ඔක්තෝම්බර් 15 වැනි දින ඉදිරිපත් කරමින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් නැවතත් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා

ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම සිදු කරනු ලබන්නේ කුමන කරුණු මත දැයි මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කරනු ලැබූ විට පැමිණිලිකරුට එරෙහිව අධි චෝදනා නගන බවට නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ නිලධාරිනියන් තමන්ට වාචිකව ප්‍රකාශ කළ බවට නිශාන්ත සිල්වා අධිකරණයට ප්‍රකාශ කර ඇත. එම ඉල්ලීම කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රතික්ෂේප කර ඇත. මෙම වැඩිදුර වාර්තාව පැ.25 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම 2019.10.15 දින ඉදිරිපත්කල වැඩිදුර වාර්තාවේ අවසන් ඡේදයෙන් අධිකරණයෙන් ඉල්ලා ඇත්තේ හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා 14 වන විත්තිකරු ලෙසට නම් කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බැවින් මෙම නඩුව 2019.09.23 වැනි දින අධිකරණයේ කැඳවන බැවින් එදිනට අධිකරණයේ පෙනී සිටීමට කරන්නාගොඩ මහතාට නොතීසි නිකුත් කරන ලෙසට්ය. මේ අන්දමින්, දින වල බරපතළ දෝෂ සහිතව නිශාන්ත සිල්වා විසින් වැඩිදුර වාර්තා ඉදිරිපත්කර කර තිබීම තුළින්ම, එවැනි වාර්තාවල ඔහු සඳහන් කර ඇති අනෙකුත් කරුණු ද මේ අන්දමින්ම බරපතළ දෝෂ සහිතව ඉදිරිපත් කර ඇති බව ඉතාමත් පැහැදිලිය .

ඉන්පසුව නැවතත් 2019 නොවැම්බර් 13 වන දින නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු සමග කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගොස් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. මූලික අයිතිවාසිකම් පෙත්සමේ නියෝගය පදනම් කර කරගෙන එම ඉල්ලීමද මහේස්ත්‍රාත්වරයා ප්‍රතික්ෂේප කර ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඔහුට නඩු පැවරීම සඳහා ඔහු වරදකට හසු කරවන ප්‍රකාශ යම් යම් පුද්ගලයන්ට බලපෑම්කර ඔවුන්ගෙන් ලබා ගැනීම සඳහා පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ක්‍රියා කර ඇත. නාවික හමුදාවෙහි සිටි කමාන්ඩර් මාපා නැමැති නිලධාරියා වෙනත් නඩුවකට අදාළව රක්ෂිත බන්ධනාගාරගතව සිට ඇති අතර ඔහු මෙම නඩුවටද සම්බන්ධ කර තිබී ඇත. අද්මිරාල් කරන්නාගොඩගේ නම සහ එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නම ඇතුල්කර ප්‍රකාශ ලබා දෙන ලෙසට කමාන්ඩර් මාපාට බලපෑම් කර ප්‍රකාශ ලබා ගැනීමටත් එසේ කළහොත් නිදහස ලබා දෙන බවට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා කමාන්ඩර් මාපාට පවසා ඇත. කපිතාන් මාපා විසින් දෙනු ලැබූ දිවුරුම් ප්‍රකාශයක් පැ. 27 ලෙස සැලකුණු කර ඉදිරිපත් කර ඇත.

නාවික හමුදාවේ නැවියෙකු වශයෙන් සේවයකල කේ.ඒ.ගාමිණී නැමැත්තෙකු අත්අඩංගුවට ගෙන ඉන්පසුව ඔහුගේ භාර්යාව වූ ප්‍රියන්ගනී නැමැත්තියට බලපෑම් කරමින් ඔවුන්ගේ පවුලටම ඔස්ට්‍රේලියාවට යාම සඳහා වීසා ලබා දෙන බවට පොරොන්දු වෙමින් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා ඇතුළත් කරමින් ප්‍රකාශ ලබා දෙන ලෙසට ඇයට බලපෑම් කර ඇත. නිශාන්ත සිල්වා විසින් සිදුකරන ලද මෙම බලපෑම් පිළිබඳව ප්‍රියන්ගනී නැමැත්තිය මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එම පැමිණිල්ලේ පිටපතක් පැ.29 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති මෙම පැමිණිල්ලේ වගඋත්තරකරුවන් ලෙසට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි

අබේසේකර, පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා, සහ ස්ථානාධිපති දමන පොලිස් ස්ථානය නම් කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරීන් වන පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා, පොලිස් සාජන් මෙන්ඩිස් සහ පොලිස් පරීක්ෂක රංජිත් මුණසිංහ යන නිලධාරීන් තිදෙනා විසින් කිසිදු හේතුවක් නොමැතිව තමන් අත්අඩංගුවට ගත් බවත්, එසේ අත්අඩංගුවට ගැනීමෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ බවට චෝදනා කරමින් ඕමන්ත මුදලිගේ දොන් ගාමිණී නැමැති පුද්ගලයෙකු ඉහතකී නිලධාරීන් තිදෙනාට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ තමන්ගේ මානව අයිතිවාසිකම් කඩ කිරීමේ නඩුවක් පවරා ඇත. මෙම නඩුව විමර්ශනය කිරීමෙන් අනතුරුව එකී නිලධාරීන් විසින් පෙත්සම්කරු වන ඕමන්ත මුදලිගේ දොන් ගාමිණී නැමැත්තාගේ මූලික අයිතිවාසිකම් කඩ කළ බවට තීන්දු කළ ශ්‍රේෂ්ඨාධිකරණය ඒ අනුව වන්දි ගෙවීමට නියම කර ඇත. එම නඩු තීන්දුව පැ.26 වශයෙන් මෙම නඩුවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරමින් සඳහන් කළේ පොලිස් පරික්ෂක නිශාන්ත සිල්වා ඇතුළු පිරිස් සෑම විටම පුද්ගලයින්ට බොරු නඩු පටලවමින් ඔවුන් අත්අංගුවට ගෙන් අසත්‍ය සාක්ෂි මත අසත්‍ය නඩු පැවරීමේ ක්‍රියාවලියක නිරත වෙමින් සිටි බවය.

එසේම නිශාන්ත සිල්වා සහ වෙලගෙදර යන දෙදෙනා එකතු වී නාවික හමුදාවට ඔත්තු සපයන ලද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ හිටපු ඔත්තුකරුවෙකු වන විජයකාන්තන් නැමැත්තා කොටුවේ ලෝටස් පාරේ යම් ස්ථානයකට ගෙන ගොස්, එහි කඩයක උඩ තට්ටුවේ ඔහු රඳවාගෙන, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකල බවට

පෙනෙන අයුරින් එකී විජයකාන්තන්ගෙන් ප්‍රකාශයක් පටිගත කර ඇත. එම ප්‍රකාශයට අන්තර්ගත කරවා ගෙන ඇත්තේ ත්‍රිකුණාමල කඳවුරේ විජයකාන්තන් සිටි අවස්ථාවේ දී පුද්ගලයින් එකොලොස් දෙනකු එම ස්ථානයේ සිටි බවත්, මෙම එකොළොස්දෙනා අතුරුදහන් වූ පුද්ගලයන් බවටත් ය. මේ සිදුවීමෙන් පසුව, විජයකාන්තන් නැමැත්තා මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් සිදුකරමින්, පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සහ වෙලගෙදර යන නිලධාරීන් දෙදෙනා විසින් බලපෑම් කර තමන්ගෙන් එම ප්‍රකාශය ලබාගත් බවටත්, මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ සඳහන් කර ඇත. එකී 127 වගන්තිය යටතේ සිදුකළ ප්‍රකාශය පැ.28 වශයෙන් සලකුණු කර ඉදිරිපත් ඇත. එම ප්‍රකාශයෙන් විජයකාන්තන් "තමන් එල්.ටී.ටී.ඊ සංවිධානයේ සාමාජිකයෙකු වශයෙන් සිට නාවික හමුදාවෙන් අත් අඩංගුවට ගැනීමෙන් පසුව ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරෙහි වාසය කළ බවත්, ඕස්ට්‍රේලියාවට පළා යන පුද්ගලයන් අල්ලා ගැනීම සඳහා ඔහුගේ උදව් ලබාගැනීමට කොළඹ බස් නැවතුම්පල අසලට පැමිණෙන ලෙසට වෙලගෙදර සර් ඔහුට දැනුම් දුන් බවත්, ඒ අනුව එම ස්ථානයට තමන් ගිය අවස්ථාවේදී වෙලගෙදර සර්, නිශාන්ත සිල්වා කියන සර් පෙන්වා ඔහු කියන ආකාරයට කටයුතු කරන ලෙසට දැනුම් දුන් බවත්, ඒ අනුව තමන් ඒ අසල කාමරයකට රැගෙන ගොස් ෆොටෝ 12 ක් පෙන්වා එහි සිටින පුද්ගලයින් හඳුනන බවටත්, එම පුද්ගලයින් තමන් සමග ත්‍රිකුණාමල හමුදා කඳවුරේ සිටි බවටත්, ප්‍රකාශ කරන ලෙසට වෙලගෙදර සර් සහ නිශාන්ත සිල්වා සර් තමන්ට කියා සිටි බවටත්" මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ ප්‍රකාශ කර ඇත.

බී 732/09 දරණ නඩුව සම්බන්ධයෙන් නාවික හමුදාවේ නැවියෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා කැඳවනු ලැබූ අවස්ථාවේදී පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් ඔහුට අවශ්‍ය ප්‍රකාශයක් ලබාගැනීම සඳහා එම නැවියාට තර්ජනය කරමින් පහරදීමක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් සිදුකල බවට පහරකෑමට ලක් වූ නැවියා විසින් සිදුකල පැමිණිල්ලක් මත නාවික හමුදාපති විසින් ඒ පිළිබඳව ආරක්ෂක ලේකම් වෙත දැනුම් දීමක් සිදු කරමින් පරීක්ෂණයක් පවත්වන ලෙසට ඉල්ලීමක් කර ඇති අතර, එයට පිළිතුරු සපයන ආරක්ෂක ලේකම්වරයා මින් ඉදිරියට එවැනි දේ සිදු නොවීමට වග බලා ගන්නා බවට නාවික හමුදාපතිවරයාට දැනුම්දීමක් කර ඇත. එම ලිපි දෙක පැ.30 සහ පැ.31 ක ලෙස සලකුනු කර ඉදිරිපත් කර ඇත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි වලට අනුව පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා දිගින් දිගටම 2016 වර්ෂයේ පටන් පැමිණිලිකරුගෙන් ප්‍රකාශ ලබා ගැනීමට උනන්දුවක් දක්වා නොමැති බව පැහැදිලිව පෙනී යයි. පැමිණිලිකරුගේ ප්‍රකාශයක් ලබා නොගෙන ඔහුට එරෙහිව සම්පාදනය කරනු ලබන ප්‍රකාශ පමණක් උපයෝගී කරගෙන පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය නියෝග අධිකරණයෙන් ලබා ගැනීමේ ඒකායන පරමාර්ථයෙන් අධිකරණය වෙත වාර්තා කිරීම නිශාන්ත සිල්වා දිගින් දිගටම පුරුද්දක් වශයෙන් සිදු කරගෙන පැමිණ ඇත. පැමිණිලිකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා එම නඩුවේ දී පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ඇතුළු පිරිසක් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම්

කඩකර ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරන තෙක්ම පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා පැමිණිලිකරුගෙන් කටඋත්තර ලබාගැනීම හිතාමතාම ද්වේශසහගත ලෙස ප්‍රතික්ෂේප කර ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා ක්‍රියා කර ඇති ආකාරයත් එසේම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා ක්‍රියා කරනු ලැබූ අවස්ථාවන් හා එම අවස්ථාවන්හි දී ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතු වලට මැදිහත් වීම සඳහා පැමිණි එක්සත් ජාතීන්ගේ නියෝජිත කණ්ඩායම් පිළිබඳ සලකා බලන විට පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම මුළුමනින්ම දේශපාලනමය අවශ්‍යතාවයක් විනා වෙනත් කිසිදු අවශ්‍යතාවයක් උදෙසා නොවන බව පැහැදිලිය.

අනිත්‍යානුකූල ලෙස පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය ප්‍රකාශ සහ වටපිටාව සකස් කිරීම මෙන්ම දේශපාලන අරමුණු ඉටුකර ගැනීම සඳහා පුද්ගලයින්ට අඩත්තේට්ටම් කර පහර දී ප්‍රකාශ ලබා ගැනීම, වරදාන සහ වරප්‍රසාද ලබා දෙන බවට සහ රජයේ සාක්ෂිකරුවන් කරන බවට සහතික ලබාදෙමින් හමුදා නිලධාරීන් අත්අඩංගුවට ගැනීම සඳහා අසත්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ මානව හිමිකම් කඩ කළ බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ද තීරණය කළ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ඇතුළු ඔහුගේ මුලු පවුලටම ස්විට්සර්ලන්තයට පැන යාම් සඳහා අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව සලසා දීම පැහැදිලි ලෙසම අනිත්‍යානුකූල දේශපාලන ක්‍රියාකාරකම් වලට උදව් කළ නිලධාරීන් බේරාගැනීමේ දේශපාලන වැයමකි.

හඬ පට සාක්ෂි වලට අනුව රංජන් රාමනායක හිටපු අමාත්‍යවරයා දේශපාලන අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමට සහ රාජ්‍ය බලය පවත්වා ගැනීම උදෙසා ද්‍රවිඩ ඩයස්පෝරාවේ ඕනෑ එපාකම් සහ

යුරෝපීය රාජ්‍යයන්හි ඕනෑ එපාකම් අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර සමග එකතුවී උසස් හමුදා සහ පොලිස් නිලදාරීන් අත්අඩංගුවට ගෙන ඔවුන් යුධ අපරාධ සිදු කළ පුද්ගලයින් ලෙසට නම් කර බන්ධනාගාරගත කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි සහ නඩු නිර්මාණය කර ඇත.

ලංකා රජය සම අනුග්‍රාහකත්වය දක්වන බවට එකඟ වෙමින් ජිනීවා වලදී, රජයේ කැමැත්ත නැතුව, එවකට විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා විසින් අත්සන් කරන ලද 30/1 යෝජනාවලියට අනුව, හමුදාවේ ඉහළම නිලධාරීන් කිහිපදෙනෙකු යුධ අපරාධ වලට සම්බන්ධ වූවා යැයි චෝදනා කරමින්, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ යුරෝපීය රාජ්‍යයන් සතුටු කිරීම සඳහා අත් අඩංගුවට ගැනීමේ තදබල අවශ්‍යතාවයක් යහපාලන රජයට තිබී ඇති අතර සම අනුග්‍රාහක වශයෙන් රජයේ පාර්ශවයෙන් ඉටු විය යුතු කාර්යයන් රජය ඉටු කරන බවට එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඒත්තු ගැන්වීම උදෙසා හමුදා නිලධාරීන් යුධ අපරාධකරුවන් ලෙසට නම් කර ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කර ඔවුන්ට දඬුවම් කිරීම සඳහා අවශ්‍ය නඩු සකස් කිරීම මූලික අරමුණ වී ඇත. මෙම අභිප්‍රාය මුදුන් පමුණුවා ගැනීම සඳහා රජයට උදව් කරන පුද්ගලයින් ආරක්ෂා කිරීම ද ඒ අයුරින්ම සිදු කර ඇති බව පසු ක්‍රියාකාරකම් වලින් පෙනී යයි.

යහපාලන රජය එවැනි අවශ්‍යතාවයකින් තදබල ලෙස පෙළෙමින් සිටින අවස්ථාවකදී 2019.02.28 දින ඇමරිකානු තානාපති සමන්තා පවර් නැමැති නිලධාරිනිය අමාත්‍ය මංගල සමරවීර මහතාගේ 30 අවුරුදු දේශපාලන ජීවිතය අලලා බණ්ඩාරනායක ජාත්‍යන්තර

සම්මන්ත්‍රණ ශාලාවේ සංවිධානය කර තිබූ උත්සවයේ ප්‍රධාන කථිකයා වශයෙන් සහභාගිවීමට ලංකාවට පැමිණ ඇත. ඔබාමා රජයේ තනාපතිනිය වූ සමන්තා පවර් 30/1 යෝජනාවලිය සකස් කිරීමේ කටයුතු වලට මූලික වී ඇත. සමන්තා පවර් ලංකාවේ නතර වී සිටින කාලය තුළ ඇය සතුටු කිරීමේ උපාය මාර්ගයක් වශයෙන් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ක්‍රියා කර ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිත බෙන් එමර්සන් 2017 වර්ෂයේ දී ලංකාවට පැමිණි අවස්ථාවේ දී නාවික හමුදාවේ අද්මිරාල් ඩී.කේ.පී. දසනායක මහතා අත්අඩංගුවට ගැනීමට නිශාන්ත සිල්වා ක්‍රියාකල ආකාරයටම, අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතාද අත්අඩංගුවට ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත. බෙන් එමර්සන් සංචාරය අවසානයේ දී පවත්වනු ලැබූ මාධ්‍ය සාකච්ඡාවේ දී සඳහන් කර ඇත්තේ හමුදාවේ උසස් නිලධාරියෙකු අත්අඩංගුවට ගැනීම ගැන ඔහු සතුටු වන බව ය. මෙම මාධ්‍ය සාකච්ඡාවේ පුවත්පත් වාර්තාවක් පැ.32 ක වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මේ අතරතුර 2016 මැයි මස 26 වන දින පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් වයිස් අද්මිරාල් එස්.එම්.බී. වීරසේකර මහතාගේ ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. වයිස් අද්මිරල් වීරසේකර මහතා ඔහුගේ මෙම ප්‍රකාශයෙන් සඳහන් කර ඇත්තේ අද්මිරාල් කරන්නාගොඩ මහතා නැති වූ තරුණයන් පස් දෙනා පිළිබඳව ඔහුගෙන් විමසූ බවත් ඔහු ඒ පිළිබඳව විමසා බලා නැති වූ තරුණයන් පස් දෙනා ත්‍රිකුනාමල නාවික හමුදාවේ කඳවුර තුළ නොමැති බවත් වාර්තා කළ බවත්ය.

රියර් අද්මිරාල්වරයෙකු වශයෙන් 2012 වසරේදී විශ්‍රාම ලැබූ එස්. එම්. බී. වීරසේකර මහතා එවකට රජයේ දේශපාලන පළිගැනීම්වලට ලක්වූ බවට පැමිණිලි කරමින් යහපාලන රජයෙන් නැවත නාවික හමුදා සේවයට 2016 වසරේදී එක් වන්නේ වයිස් අද්මිරාල්වරයෙකු වශයෙනි.

2019 මාර්තු 22 දින, පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් වයිස් අද්මිරාල් එස්.එම්.බී. වීරසේකර මහතාගේ දෙවන ප්‍රකාශයක්, අද්මිරාල් කරන්නාගොඩ මහතා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීමේ අදහසින්, වාර්තා ගත කර ඇත. වීරසේකර මහතාගේ මෙම දෙවන ප්‍රකාශය වාර්තාගත කිරීමට ප්‍රථම පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් 2019 මාර්තු 11, 13 සහ 19 දිනයන් හිදී අද්මිරාල් කරන්නාගොඩ මහතාගේ ප්‍රකාශය සටහන් කරගෙන ඇත. වීරසේකර මහතාගේ දෙවන ප්‍රකාශය අද්මිරාල් කරන්නාගොඩ මහතාගේ ප්‍රකාශය ලබා ගැනීමෙන් පසුව සිදු කිරීම තුළින්, වීරසේකර මහතාගේ දෙවන ප්‍රකාශයෙන් කරන්නාගොඩ මහතාට එරෙහිව නැගෙන නව චෝදනා වලට පිළිතුරු සැපයීමට කරන්නාගොඩ මහතාට අවස්ථාවක් ලබාදීම පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් ප්‍රයෝගකාරී ලෙස අවහිර කර ඇත.

වීරසේකර මහතාගෙන් දෙවැනි ප්‍රකාශයක් ලබා ගැනීමේ පරමාර්ථය වී ඇත්තේ 2017 ජුලි 28 වන දින රියර් අද්මිරල් සින්නයියා මහතාගෙන් ලබාගත් ප්‍රකාශය සනාථ කර ගැනීමක් බව පැහැදිළිය.

කපිතාන් උදය බණ්ඩාර සහ කපිතාන් ජේ.ජේ. රණසිංහ යන දෙදෙනාද 2009 ජුනි මස 16 හෝ 17 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් කටඋත්තර ලබා දී ඇත. කට උත්තර ලබා

ගැනීමෙන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පත් මුණසිංහ අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර ඔහු රක්ෂිත බන්ධනාගාරයට පත්කර තිබේ.

මෙම සිද්ධීන් සම්බන්ධයෙන් සත්‍යය තොරතුරු දැනගැනීම සඳහා දැනට මෙම නඩු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවේ පවත්නා ලිපිගොනු වල සඳහන් ලේඛන පරිශීලනය කර බැලුවොත් සත්‍ය තත්ත්වය අවබෝධ කරගත හැකි බවට සඳහන් කළ පැමිණිලිකරු ඒ සඳහා පහත සඳහන් ලිපි ගොනු කොමිෂන් සභාව වෙත ගෙන්වා ගැනීමට නීතිපතිවරයාට සිතාසි නිකුත් කරන ලෙසට ඉල්ලීමක් කළේය. ඒ අනුව;

1. C/267/209/CM
2. CR 1/238/2010
3. CR 1/267/2012

අංක දරන ලිපිගොනු සහ බී 732/2009 දරන මහේස්ත්‍රාත් අධිකරණයේ පවත්නා නඩුවට අදාළ අධිචෝදනා ලිපිගොනුව සහ චලන ලිපි ගොනුව 2020.02.20 දින ප.ව. 1.30 ට කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට නීතිපතිට සිතාසි නිකුත් කරන ලදී.

එසේ වුවත් එදිනටද ලිපි ගොනු ඉදිරිපත් කිරීමට නීතිපතිවරයා අසමත් වූ අතර සිතාසියේ තිබූ කිසියම් තාක්ෂණික දෝෂයක් මවාපාමින් ලිපිගොනු ඉදිරිපත් කිරීමට නොහැකිවූ හේතුව යුක්ති සහගත කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රියා කළේය. ඉන්පසුව මේ සඳහා නැවත දින ලබා දුන්නේ වී නමුත් තවමත් ලිපිගොනු ඉදිරිපත් කිරීමට නීතිපතිවරයා අසමත්ව සිටී.

මෙම කොමිෂන් සභාව විසින් නිකුත් කල සිතාසිය පරිදි මෙම පරීක්ෂණය සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය කෙරෙන ඉහත සඳහන් ලිපි ගොනු ඉදිරිපත් කරනවා වෙනුවට කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් සුමති ධර්මවර්ධන මහතා මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට අවශ්‍ය කෙරෙන සහාය ලබාදීම සඳහා නීතිපති විසින් පත් කර ඇති නීතිඥ මණ්ඩලයට පරිබාහිරව යමින් අතිරේක සොලිසිටර් ජනරාල් සුමති ධර්මවර්ධන මහතා කොමිෂන් සභාව හමුවේ x1 x2 වශයෙන් ලේඛන දෙකක් සමග ලිඛිත සැලකිරීමක් ඉදිරිපත් කරමින් නියෝගයක් ආයාචනය කර ඇත. මෙම සැල කිරීම් වල දැක්වෙන කරුණු මගින් නීතිපතිවරයා විසින් පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය දිය යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභා පනතේ දැක්වෙන විධි විධාන උල්ලංඝනය කිරීමක් සිදු කරන බවට කොමිෂන් සභාවට පැහැදිලිව පෙනී ගොස් ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ කණ්ඩායම සෑම අවස්ථාවකදීම උත්සාහ දරා ඇත්තේ සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන නාවික නිලධාරීන් දෙදෙනාගේ අධීක්ෂණ නිලධාරීයා ලෙස පැමිණිලිකරු ක්‍රියා කළ බවට අසත්‍ය කරුණු පාදක කරගෙන මාධ්‍ය ප්‍රචාර පවත්වා පැමිණිලිකරු හා නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමත් සහ එමගින් එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත චෝදනා එල්ල කිරීමය. මේ සඳහා සැලසුම් සහගතව සාක්ෂිකරුවන් සොයා ගෙන ඔවුන්ගේ ප්‍රකාශ විවිධ අවස්ථා වලදී ලබා ගෙන කෙසේ හෝ නඩුවක් නිර්මාණය කිරීමේ වැයමක් ශානි

අබේසේකර සහ නිශාන්ත ද සිල්වා ක්‍රියා කර ඇති බවට ඉදිරිපත් වී ඇති සාක්ෂි වලින් මැනවින් සනාථවේ.

පැමිනිලි අංක 2/2020 නඩුවේ පැමිණිලිකරු වන ඩී.කේ.පී. දසනායක මහතා ඔහුගේ සාක්ෂියේදී මෙසේ සඳහන් කර ඇත. (උපුටා ගැනීම 2020.07.3 -පිටු 27.28)

> "ස්වාමීනි වැරදි අකාරයට මා හට චෝදනා ගොනු කරලා මා වැරදිකරුවෙක් කරන්න උත්සාහ කිරීම පිලිබඳව එවකට පැවති රජය විසින් දේශපාලනිකව ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ මහතා හසු කිරීම සඳහා කෙනෙකු හැටියට සාක්ෂිකරුවෙකු හැටියට මා යොදගන්න උත්සාහ කලා. ඒ උත්සාහය ව්‍යාර්ථ වීම නිසා මා හට බොරු චෝදනා නගමින් මා හට නඩු පවරලා තියෙනවා."(උපුටා ගැනීම අවසන්)

කමාන්ඩර් සුමිත් රණසිංහ මහතා ඔහුගේ නඩුවේ (අංක 03/2020) සාක්ෂි දෙමින්; 2012 මාර්තු මස 02 වන දින නැවතත් පැමිණිලිකරු ශානි අබේසේකර විසින් කැඳවා ළමුන් 11 දෙනා අතුරුදහන් කිරීමට අදාලව විමසනදේට පමණක් පිළිතුරු සපයන ලෙසටත් විශේෂයෙන්ම ඊළම් යුද්ධය සම්බන්ධයෙන් එම ගන්සයිට් කඳවුර අශ්‍රිතව සිදු කළ බුද්ධි ක්‍රියාන්විත වලට එවකට නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අධික්ෂණය යටතේ එය සිදුවන බවත් ප්‍රකාශයක් ලබා දී ගෙදර යන ලෙසටත් එසේ නොවේ නම් රක්ෂිත බන්ධනාගාර ගත කරන බවටත් ශානි අබේසේකර පැමිණිලිකරුට පවසන ලද බවත්, අවුරුදු 30 ක යුද්ධය නිමා කළ දේශපාලන සහ යුධ නායකත්වය පවා

දීමට නොහැකි බව පවසා පැමිණිලිකරු එවැනි ප්‍රකාශක් ලබා දීම ප්‍රතික්ෂේප කළ බැවින් ඔහු අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කල බවත්, ශානි අබේසේකර සහ නිශාන්ත ද සිල්වා ඉතා පැහැදිලි ලෙසම කිසියම් දේශපාලන අරමුණක් ඉටු කර ගැනීම සඳහා තමන්ගෙන් මෙවැනි ප්‍රකාශයක් ලබා ගැනීමට උත්සාහ ගත් බවට තමන් පැමිණි නිගමනය රංජන් රාමනායක සහ නිශාන්ත සිල්වා අතර ඇති වූ දුරකථන සංවාදයක හඬ පටයකින් සනාථ වන බවටත් පවසමින්, එම හඬ පටිය පටිගත කළ සීඩී තැටියක් පැ.25 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළ අතර එය කොමිෂන් සභාවේ වාදනය කරවන ලදී.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.33 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

Chandra Fernando
24/11/2020

2020.11.24

9 .II

පැමිණිලි අංකය - 02 - 2020

පැමිණිලිකාර - දසනායක කංකානම්ලාගේ<br>පියරත්න දසනායක

ලිපිනය - නො:13එෆ්/1,හොරණ පාර<br>කැස්බෑව.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලියන්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. අ.ප.දෙ. හිටපු අධ්‍යක්ෂක ශානි අබේසේකර
2. සහකාර පොලිස් අධිකාරී ඩී එස් තිසේරා
3. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා
4. හිටපු නියෝජ්‍ය අමාත්‍ය රන්ජන් රාමනායක
5. හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න
6. හිටපු අමාත්‍ය ඩී එම් ස්වාමිනාදන්
7. හිටපු අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර
8. හිටපු නියෝජ්‍ය අමාත්‍ය අජිත් පී පෙරේරා
9. ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර
10. ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න

11. ජනාධිපති නීතිඥ ජේ සී වැලිඅමුණ.

## තීරණය

01. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති  සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර දසනායක කංකානම්ලාගේ පියරත්න දසනායක මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට  ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

02. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, පැමිණිලිකාර දසනායක කංකානම්ලාගේ පියරත්න දසනායක මහතාට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 732/2009 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර දසනායක කංකානම්ලාගේ පියරත්න දසනායක මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

03. පැමිණිලිකරුට එරෙහිව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ පවරා ඇති 1448/2020 දරණ නඩුවේ අධිචෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම මගින් එකී අධිචෝදනා පත්‍රය නිශ්ප්‍රභා කර

පැමිණිලිකර සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇත.

2. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇත.

3. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇත.

4. එබැවින් ඉහත නම් සඳහන් වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ බරපතළ හානි පූරනය කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි. ඒ අනුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්

පැමිණිලිකරුට අහිමි වූ ඔහුගේ රැකියාවේ සියලුම උසස්වීම් වරප්‍රසාද විදේශීය පුහුණුවීම් හිඟ වැටුප් සියල්ලම ඔහුට ලබා දීමත් ඔහු එවැනි රක්ෂිත බන්ධනාගාර ගත කිරීමකට පත් නොවූයේ නම් ඔහුට ඔහුගේ රැකියාවේ හිමිවන ස්ථානයට ඔහු පත් කිරීමත් මගින් පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිය හැකි බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරන අතරම එම සහනයන් ලබා දීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පැමිණිලිකරු වන රියාර් අද්මිරාල් ඩී.කේ.පී. දසනායක මහතා 1987 වර්ෂයේදී ශිෂ්‍ය භට නිලධාරියෙකු වශයෙන් නාවික හමුදාවට අනුයුක්ත වී ඇත. නාවික හමුදාවේ විවිධ අංශවල සේවයෙහි නිරතව සිටි ඔහුගේ සේවයට ජනාධිපති ප්‍රශංසාව ලබා ඇත. ඔහු තම දක්ෂතාවය උදෙසා රණ වික්‍රම, රණශූර, උත්තම සේවා සම්මාන පදක්කම් මෙන්ම දේශපුත්‍ර සම්මානය ද හිමිකරගත් නිලධාරියෙකි. 2009 මැයි මාසයේදී පැවැති අවසන් මානුෂික මෙහෙයුමේදී මුලතිව් මුහුදේ ආරක්ෂක වළල්ලේ අණදෙන නිලධාරියා වශයෙන් සටන අවසන් වෙන 2009 මැයි 19 දින දක්වා ආරක්ෂක වළලු හතරක අණදෙන නිලධාරියා ලෙසට කුඩා යාත්‍රාවන්, වේග ප්‍රහාරක යාත්‍රාවන්, ඩෝරා යාත්‍රාවන්, අධිවේගී යුධ නෞකාවන් සහ විශාල යුධ නෞකාවන් සඳහා අණදෙමින් කටයුතු කර ඇත.

ප්‍රභාකරන් මුහුදු මාර්ගයෙන් පැනය යාම වැළැක්වීම සඳහා මාස තුනහමාරක(3½) පමණ කාලයක් මුහුදු කොටින් සමග දරුණු සටන්

30 කට පමණ මුහුණ දී ඇත. මෙම කාලසීමාවේදී මුහුදු මාර්ගය ඔස්සේ පැන යාමට තැත් කළ මුහුදු කොටි නායක සූසෙයිගේ බිරිඳ සහ දරුවන් නිරුපද්‍රිතව බේරා ගැනීමට පැමිණිලිකරුට හැකිවී ඇත. එසේම බෝට්ටු 700 පමණ සහ 13000 පමණ පුද්ගල පිරිසක් බේරා ගැනීමට ද පැමිණිලිකරු ක්‍රියා කර ඇත.

නාවික හමුදාවේ සේවයට බැඳීමෙන් පසුව පැමිණිලිකරු විවිධ පාඨමාලා හදාරා ඇත. ශිෂ්‍ය භට සහ මාධ්‍ය නිළධාරී පුහුණුව, උප ලූතිනන් තාක්ෂණික පාඨමාලාව, දීර්ඝ අවි පාඨමාලාව, උප ලූතිනන් පාඨමාලාව, ලූතිනන් පාඨමාලාව , රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය, සංකීර්ණ අර්බුද කළමනාකරණය පිළිබඳ පාඨමාලාව, ආරක්ෂක සම්පත් කළමනාකරණ පාඨමාලාව, ආපදා කළමනාකරණ පාඨමාලාව, ඒකාබද්ධ මෙහෙයුම් සැලසුම් පාඨමාලාව, මිසයිල හා අවි නිලධාරී පාඨමාලාව, ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ ප්‍රතිපත්ති හා උපාය මාර්ග පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව ආදී පාඨමාලා හදාරා ඇත. පාසල් අවදියේ සිට මේ දක්වා පැමිණිලිකරු දක්වා ඇති දස්කම් සහ ලබා ඇති පදක්කම් දැක්වෙන කෙටි සටහනක් පැ.12 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2015 වර්ෂයේ රාජ්‍ය පෙරළිය සිදු වන අවස්ථාවේ දී පැමිණිලිකරු ඇමරිකා එක්සත් ජනපදයේ ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ ප්‍රතිපත්ති හා උපාය මාර්ග පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හදාරමින් සිට ඇත. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඇමරිකා එක්සත් ජනපදය මගින් ප්‍රථම වතාවට ශ්‍රී ලාංකිකයෙකුට ලබාදුන් අවස්ථාවද මෙය වී ඇත. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඔහු තෝරා ගෙන ඇත්තේ ඔහුගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව වන අතර එය

දේශපාලන පසුබිම මත සිදුකරනු ලැබූ තෝරා ගැනීමක් නොවීය. පාඨමාලාව හැදෑරීම සඳහා නාවික නිළධාරියෙක් නම් කරන ලෙසට ඇමරිකානු තානාපති කාර්යාලයෙන් සිදුකරනු ලැබූ දැන්වීමකින් පසුව නාවික හමුදාවේ ක්‍රියාපටිපාටීන්ට අනුව සිදුකරන ලද තේරීම් මණ්ඩලයක් මගින් සාක්ෂිකරු තෝරාගෙන ඇත.

පාඨමාලාව හැදෑරීම සඳහා තේරීම් මණ්ඩලය විසින් පැමිණිලිකරු තෝරා ගැනීමෙන් පසු එම තෝරා ගැනීම ආරක්ෂක අමාත්‍යාංශය මගින් අනුමත කර ඒ බව ඇමරිකානු තානාපති කාර්යාලය වෙත දන්වා ඇත. ඒ අනුව පුහුණුව සඳහා පිටත් වීමට අවශ්‍ය කාර්යයන් ඇමරිකානු එක්සත් ජනපද තානාපති කාර්යාලය මගින් සිදු කරනු ලැබ ඇත. මෙවැනි පාඨමාලාවක් හැදෑරීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද රාජ්‍යයට යන පුද්ගලයෙකු පිළිබඳව දැඩිව සොයා බලන අතර, ඔහු මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව කිසියම් හෝ චෝදනාවකට පාත්‍ර වී ඇත් ද යන්න පිළිබඳව සොයා බලනු ලැබේ. ඒ අනුව සාක්ෂිකරුට එරෙහිව එවැනි චෝදනා නොතිබුණ බැවින් ඔහුට ඇමරිකානු එක්සත් ජනපදයේ එම පාඨමාලාව හැදෑරීම සඳහා යාමට වීසා නිකුත් කර ඇත. එසේම ඔහුගේ පවුලේ උදවියට ඔහු සමග යාමට වීසා නිකුත් කර ඒ සඳහා අවශ්‍ය සියලු කටයුතු සූදානම් කර ඇත.

මෙම පාඨමාලාවේ කාලය අවුරුදු එක හමාරක් වන අතර මේ සඳහා වියදම දරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය, ඇමරිකානු එක්සත් ජනපදය සහ හමුදා පාඨමාලාව සඳහා සම්පූර්ණ වියදම ලක්ෂ අසූවක් පමණ වන අතර ඉන් ලක්ෂ 35 ක් පමණ වියදම දරන්නේ ශ්‍රී ලංකා රජය මගින් බවටද පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත. මේ අනුව පැමිණිලිකරු ඔහුගේ භාර්යාව සහ දියණියන් දෙදෙනා ද සමග

ඇමරිකා එක්සත් ජනපදය වෙත පිටත්ව ගොස් ඇත. ඇමරිකා එක්සත් ජනපදයෙහි පාසල් වලට තම දියණියන් දෙදෙනා අධ්‍යාපනය ලැබීම සඳහා ඇතුළත් කර ඇත.

පැමිණිලිකරු මෙලෙස ඔහුගේ පාඨමාලාව හදාරමින් සිටින කාලය තුළදී 2015 ජනවාරි මස අට වන දින සිදු වූ ආණ්ඩු පෙරළියත් සමග ඔහුට විරුද්ධව විවිධ චෝදනා නගමින් ඔහු ආපසු ලංකාවට ගෙන්වා ගැනීමට උත්සාහ කරන බවට පැමිණිලිකරුට දැනගැනීමට ලැබී ඇත. එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහ නාවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා විසින් මෙහෙයවනු ලැබුවා යැයි කියන සුදුවෑන් කල්ලියක් පිළිබඳ අසත්‍ය චෝදනා නගමින් පැමිණිලිකරු මෙම සුදු වෑන් කල්ලිය සඳහා උදව් උපකාර කළ බවට විවිධ අසත්‍ය චෝදනා නගමින් ඔහු ආපසු ලංකාවට ගෙන්වා ගැනීමට ප්‍රයත්න දරන බවට පැමිණිලිකරුට දැනගන්නට ලැබී ඇත. මෙම ක්‍රියාදාමය යම්කිසි දේශපාලන අවශ්‍යතාවයක් සඳහා පැමිණිලිකරු එකතු කිරීමට කරනු ලබන උත්සාහක ප්‍රතිඵලයක් ලෙසට පැමිණිලිකරුට හැඟී ගොස් ඇත.

2015.2.14 දින එවකට නාවික හමුදාපති ජයන්ත පෙරේරා පුද්ගලිකව දුරකථනයෙන් සාක්ෂිකරුට කථා කොට පුද්ගලයින් අතුරුදහන් වීම පිළිබඳව පරීක්ෂණ කටයුත්තක් සඳහා ප්‍රකාශයක් ලබාදීමට සාක්ෂිකරු නැවත ශ්‍රී ලංකාවට කැඳවීමට ආරක්ෂක මණ්ඩලයේ දී එවකට අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් දැනුම් දුන් බවට පැමිණිලිකරු පවසා ඇත. එසේම ලංකාවට ඔහු කඩිනමින් ගෙන්වා ගැනීම සඳහා ගුවන් ටිකට් පතක් සූදානම් කර ඇති බවටත් නැවත පාඨමාලාව හැදෑරීම සඳහා යාමට හැකි බවටත්, දැනුම්දෙමින්

ඉක්මණින් පැමිණෙන ලෙසට වැඩිදුරටත් නාවික හමුදාපතිවරයා පැමිණිලිකරුට දැනුම් දී ඇත.

මෙම දැනුම්දීම පරිදි පැමිණිලිකරු තනිවම එදිනම ඇමරිකා එක්සත් ජනපදයෙන් පිටත්වී ආපසු ශ්‍රී ලංකාවට 2015. 02.16 දින පැමිණ ඇත. දින 14 ක නිවාඩුවක් අනුමත කර ඇති බවටත්, ප්‍රකාශයක් ලබාදීමෙන් පසුව ඔහුට නැවත ඇමරිකා එක්සත් ජනපදය වෙත ගොස් පාඨමාලාව හැදෑරීමට හැකි බවටත් සාක්ෂිකරුට දන්වා තිබූ බැවින් ඔහු තම භාර්යාව සහ දියණියන් දෙදෙනා එක්සත් ජනපදයේ රඳවා තබා පැමිණ ඇත. ලංකාවට පැමිණි විගස පැමිණිලිකරු නාවික හමුදාපතිවරයා මුණගැසී ඇත. එම අවස්ථාවේදී හමුදාපතිවරයා සඳහන් කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට අවශ්‍යව ඇති බවත් ඒ සඳහා ඔහු ඉදිරිපත් කරන බවත්ය. ඒ අනුව 2015.02.19 දින පැමිණිලිකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශයේ ස්ථානාධිපති නිශාන්ත සිල්වා වෙත වාර්තා කරන ලෙසට පැමිණිලිකරුට දැනුම් දී ඇත.

2015 වර්ෂයේ මෙම කාලය ජිනීවා මානව හිමිකම් සමුළුව රැස් වන කාලය බවද පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය.

කෙසේ වෙතත් 2015.02.19 දින උදෑසන නාවික හමුදාපතිවරයා පැමිණිලිකරු අමතමින් එදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබාදීම සඳහා යාමට අවශ්‍ය නොවන බවත් ඒ සඳහා වෙනත් දිනයක් ලබා දෙන බවටත් ප්‍රකාශ කර ඇත.

එසේ වුවත් එදින වෙනත් විශේෂ සිදුවීමක් සිදුවී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශයේ ස්ථානාධිපති නිශාන්ත සිල්වා මහතා විසින් මෝසමක් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරමින් පැමිණිලිකරුට එරෙහිව විදේශ ගමන් තහනමක් පනවන ලෙසට සිදු කරනු ලැබූ ඉල්ලීමක් පරිදි අධිකරණය විසින් පැමිණිලිකරුට එරෙහිව විදේශ ගමන් තහනමක් පනවා ඇත. අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමේදී නිශාන්ත සිල්වා විසින් සාවද්‍ය කරුණු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත් පැමිණිලිකරුගේ පවුලේ උදවිය ඇමරිකාවේ සිටින බැවින් පැමිණිලිකරු යම් අවස්ථාවක රහසිගතව ඇමරිකාවට පැන යාමට ඉඩ ඇති බවට සාවද්‍ය කරුණු කියා පෑමක් සිදුකර ඇති බවට පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය. පැමිණිලිකරු සඳහන් කළේ ඔහුට ඒ වන විට ආපසු ඇමරිකා එක්සත් ජනපදයට යාම සඳහා ගුවන් ටිකට් පතක් නොතිබුන බවයි.

නිශාන්ත සිල්වා විසින් පැමිණිලිකරුට එරෙහිව මෙම ගුවන් ගමන් තහනම ලබාගෙන ඇත්තේ ඒ වන විටත් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ බී 732 /09 දරණ නඩුවට පාර්ශවකරුවෙකු ලෙසට අවශ්‍ය බවට කරුණු දක්වමිනි. එකී බී 732/09 දරණ නඩුවේ පැමිණිලිකරු වූයේ එවකට නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතාය. ඔහු විසින් එකී නඩුවට අදාළ පැමිණිල්ල ඉදිරිපත් කර තිබී ඇත්තේ 2009 මැයි මස 28 වන දින, ඔහුගේ පෞද්ගලික ආරක්ෂක ලෙස කටයුතු කළ ලුතිනන් කමාන්ඩර් සම්පත් මුණසිංහ නැමැති නිලධාරියාට විරුද්ධවය. එකී පැමිණිල්ලෙහි මෙම පැමිණිලිකාර දසනායකගේ මහතාගේ නම සඳහන්ව තිබී නොමැත. 2015

පෙබරවාරි 19 දින දක්වා කිසිදු බී වාර්තාවක පැමිණිලිකාර දසනායකගේ නම සඳහන්ව තිබී නොමැත. එසේ වුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවකට ස්ථානාධිපතිව සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් මුණසිංහ මහතාගෙන් විමර්ශන කටයුතු ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා භාර ගැනීමෙන් පසුව එනම් 2015.01.21 දින ප්‍රථම වතාවට නිශාන්ත සිල්වා විසින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් එහි පැමිණිලිකරුගේ නම අවශ්‍ය පුද්ගලයෙකු ලෙසට සඳහන් කර ඇත.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිල්ල විභාගවන අවස්ථාව වනවිට ඉහත කී නිශාන්ත ද සිල්වා අනවසරයෙන් රටෙන් බැහැරව ගොස් සිටින පුද්ගලයෙකු බවද පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය. එසේම 2015 ජනවාරි මස 8 වන දින පිහිටවූ යහ පාලන රජයේ විදේශ ඇමැතිවරයා වූ මංගල සමරවීර මහතා විසින් එවකට නාවික හමුදාපති ජයන්ත පෙරේරා මහතාට නියෝග කරමින් පැමිණිලිකරුට මෙම පාඨමාලාවට සහභාගි වීම සඳහා අවසර ලබා දුන්නේ කෙසේ ද යන්න පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට නියෝග කර ඇත. එකී නියෝගය පරිදි සිදුකළ පරීක්ෂණයෙන් පසුව සකස් කළ වාර්තාවට අනුව පැමිණිලිකරු ඉහත කී පාඨමාලාව සඳහා තෝරා ගැනීම නිසි ක්‍රමවේදයක් අනුගමනය කරමින් සිදුකළ බවට වාර්තා කර ඇත. ඒ සඳහා කිසිදු දේශපාලන බලපෑමක් එල්ල වී නොමැති බවටද වැඩිදුරටත් වාර්තාවේ සඳහන්ව ඇත.

2015-02-28 දින පැමිණිලිකරුගේ ප්‍රකාශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සටහන් කරගෙන ඇති නමුත් එම ප්‍රකාශය

පදනම් කරගෙන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉන් පසුව කිසිදු අවස්ථාවක බී වාර්තාවක් මගින් කරුණු ඉදිරිපත් කිරීමක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොමැත.

පැමිණිලිකරුට එරෙහිව පනවා තිබූ විදේශ ගමන් තහනම ඉවත් කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියා නොකළ බැවින් සාක්ෂිකරු විසින් පුද්ගලිකව නීතිඥවරයකු මාර්ගයෙන් අධිකරණයෙන් විදේශ ගමන් තහනම ඉවත් කරවා ගැනීමට ඉල්ලීමක් කර ඇත. මෙම ඉල්ලීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විරුද්ධත්වය දක්වා ඇති අතර ඒ අනුව මහේස්ත්‍රාත් අධිකරණය පැමිණිලිකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් පැමිණිලිකරු සඳහන් කළේ මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් එවකට කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා වූ තිළිණ ගමගේ මහතා සාක්ෂි දෙමින් ඔහුට නාවික හමුදාවේ උසස් නිලධාරීන්ට එරෙහිව ඇති නඩු සම්බන්ධයෙන් විවිධ බලපෑම් එල්ල වූ බවට ඔහු කොමිෂන් සභාව ඉදිරියේ සඳහන් කළ බව තමන්ට මාධ්‍ය ඔස්සේ දැන ගැනීමට ලැබුණු බවත් ඒ අනුව තමන්ට දැන් වැටහෙන පරිදි තමන් විසින් ඉදිරිපත් කළ තමාගේ විදේශ ගමන් තහනම ඉවත් කරවා ගැනීම සඳහා වූ ඉල්ලීම ද ඒ අයුරින්ම බලපෑම් මත ප්‍රතික්ෂේප වී ඇති බව තමන්ට දැන් වැටහෙන බවත්ය.

දසනායක මහතා අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවේදී එසේ අත්අඩංගුවට ගැනීම පිළිබඳව ප්‍රකාශයක් සටහන් කරගෙන ඇතත් ඉන්පසුව ඔහුගෙන් සැකකරුවකු වශයෙන් ඔහු නම් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන කිසිදු ප්‍රකාශයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

විසින් සටහන් කර නොගත් බවද, එතෙක් එවැනි ප්‍රකාශයක් සටහන් කරගෙන නොමැති බවද පැමිණිලිකරු සඳහන් කර ඇත.

මෙම තත්ත්වය මත නැවත පැමිණිලිකරුට තම පාඨමාලාව හැදෑරීම සඳහා ඇමරිකා එක්සත් ජනපදයට යාමට අවස්ථාවක් නොලැබෙන බව දැනගෙන ඇත. ලංකාවේ ඇමෙරිකානු තානාපති කාර්යාලය මගින් පැමිණිලිකරු කැඳවා ඔහුට නැවත මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අවස්ථාව තිබෙන බවත්, ඔහුගේ නඩු කටයුතු අවසන් කර ගැනීමෙන් පසු ඒ සඳහා ඉල්ලීමක් කරන ලෙසටත් දැනුම්දීමක් කර ඇත. එසේම ඔහුගේ භාර්යාව සහ දරුවන් දෙදෙනා ආපසු ලංකාවට ගෙන්වා ගන්නා ලෙසටද උපදෙස් ලැබී ඇත.

තමන් ආපසු ලංකාවට ගෙන්වා ගැනීම කරණ කොටගෙන ඇමරිකා එක්සත් ජනපදයේ සිටි තම භාර්යාව සහ දියණියන් දෙදෙනා බලවත් පීඩනයකට හසු වූ බවත්, තමන්ට ජීවත්වීම සඳහා ඇමරිකානු නාවික හමුදාවෙන් ලබාදී තිබූ නිවාසය පවා ආපසු ලබාගෙන තිබුන බවත් ඒ හේතුවෙන් තම භාර්යාවට සහ දියණියන් දෙදෙනාට එම ප්‍රදේශයේ වාසය කළ ශ්‍රී ලාංකිකයකුගේ නිවසේ රැඳී සිටීමට සිදු වූ බවත් මේ හේතුවෙන් තම දියණියන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වී ගිය බවටත් පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

ඇමරිකා එක්සත් ජනපදයේ පාඨමාලාවක් හැදෑරීම සඳහා පැමිණිලිකරු යාම සම්බන්ධයෙන් info sri lanka.com වෙබ් අඩවියේ පළකර තිබූ අසත්‍ය ප්‍රකාශයක් පැ.1 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

මෙම කාල සීමාව තුළ නාවික හමුදාවේ ඉහලම නිලධාරීන්ට ලැබිය යුතු ඉහළම පාඨමාලාව වන ජාතික ආරක්ෂක පාඨමාලාව හැදෑරීම සඳහා පැමිණිලිකරු සුදුසුකම් ලබා තිබුණේ වී නමුත් විදේශ ගමන් තහනම නිසා පැමිණිලිකරු තේරීම් මණ්ඩල මගින් ඇතුළත් කරගෙන නැත. ඔහුගේ වයස් සීමාව ඉක්මවා යාම හේතු කොටගෙන එවැනි වැදගත් පාඨමාලා පැමිණිලිකරුට අහිමිවී ගොස් ඇත. නාවික හමුදාපතිවරයාගෙන් ඉල්ලීම් සිදුකළත් විදේශ ගමන් තහනම කරණ කොටගෙන ඔහුට මෙම වරප්‍රසාද හිමිවී නොමැත .

විදේශ ගමන් තහනම ඉවත් කරවා ගැනීම සඳහා තුන්වන වතාවට ද පැමිණිලිකරු විසින් ඉල්ලීමක් සිදුකර ඇති අතර එකී ඉල්ලීම ද 2017.07.05 වන දින ප්‍රතික්ෂේප වී ඇත.

2009 වර්ෂයේ මැයි මාසයේදී අවසන් මානුෂීය මෙහෙයුමෙන් පසු ලෝක ප්‍රජාවේ යම් යම් කොටස් ලංකාවට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලය ලංකාවට එරෙහිව යම් යෝජනා සම්මත කර ගැනීමත් සිදු කරගෙන තිබුණි. 2015.01.08 දින තෙක් පැවති රජය එකී යෝජනා පිළිගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි.

එසේ වුවත් 2015.10.13 දින පැවති 30 වන සැසිවාරයේදී මානව හිමිකම් කවුන්සලය සම්මත කරගත් 30/1 යෝජනාව පිළිගැනීමට 2015 වර්ෂයේ ජනවාරි 8 වන දින පත්වුණ රජය ක්‍රියා කරන ලදී. මෙම යෝජනාව ඇමරිකාව ප්‍රමුඛ රාජ්‍යයන් කීපයක් එකතු වී සකස් කළ යෝජනාවලියකි . ඉහත කී 30/1 යෝජනාව පැ.2 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම 30/1 යෝජනාවලියට අනුග්‍රහකත්වය දක්වන බවට එවකට විදේශ ඇමැති මංගල සමරවීර මහතා එකඟ

වෙමින් අත්සන් තබා ඇත. එම යෝජනාවලිය අනුව ශ්‍රී ලංකා රජය කටයුතු කරන්නේ ද යන්න සොයා බැලීමට එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයෙකු වශයෙන් බෙන් එමර්සන් ලංකාවට පැමිණ ඇත.

බෙන් එමර්සන් ලංකාවට පැමිණෙන කාලය තුළදී පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකර ඇත. ඒ සඳහා නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීම ද සිදු කර ඇත. මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බී වාර්තා පරිශීලනය කිරීමේ දී ඒ බව මැනවින් තහවුරු වේ. කෙසේ වෙතත් අත්අඩංගුවට ගැනීම සඳහා නීතිපතිවරයා විසින් උපදෙස් ලබා දී නොමැත. පැමිණිලිකරු සඳහන් කළ අන්දමට ඔහුට අදාළ ලිපි ගොනුව නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඩිලාන් රත්නායක මහතාගේ අධීක්ෂණය යටතේ තිබී ඇත. ඩිලාන් රත්නායක මහතා පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමට උපදෙස් ලබා දී නොමැත. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට තරම් සාක්ෂි ප්‍රමාණවත් නොවන බවට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඩිලාන් රත්නායක මහතාගේ මතය වී ඇත. කරුණු එසේ වුවත් ඉන් පසු පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහේස්ත්‍රාත් අධිකරණයෙන් වරෙන්තු ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

ඉන් පසුව, නීතිපති විසින් අධීක්ෂණ නිලධාරියා වෙනස් කිරීමක් සිදුකර තිබේ. ඒ අනුව පැමිණිලිකරුට අදාළ ලිපි ගොනුව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඩිලාන් රත්නායක මහතාගෙන් ඉවත්කර එය

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ ජනක බණ්ඩාර මහතා වෙත යොමුකර ඇත.

2017.07.12 වන දින, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට අදාළව ඉදිරිපත් කර ඇති බී වාර්තාවලට අනුව අතුරුදහන් වූවා යැයි කියන පුද්ගලයෙකුගේ මවකගේ ප්‍රකාශයක් සහ නාවිකයන් කීපදෙනෙකුගේ ප්‍රකාශ හුවාදක්වමින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර තිබේ. සරෝජනී නාගනාදන්, මහේෂ් කුමාර, උපුල් බණ්ඩාර සහ කිත්සිරි එලෙස ප්‍රකාශ ලබාදුන් පුද්ගලයින්ය. මහේෂ් කුමාර නැමැති පුද්ගලයා නාවික හමුදාවේ බුද්ධි අංශයේ සේවය කළ පුද්ගලයෙකි. හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා විසින් 2009 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද පැමිණිල්ලට අදාළ නඩුවේ ප්‍රධාන විත්තිකරු වන සම්පත් මුණසිංහ යටතේ මෙම මහේෂ් කුමාර සේවය කර ඇත. මහේෂ් කුමාර විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සිදුකළ පළමුවන සහ දෙවන කටඋත්තරයන්හි පැමිණිලිකරුට එරෙහිව කිසිදු ප්‍රකාශයක් සිදුකර නොමැත. ඔහු තුන්වන වතාවට ලබාදෙන කටඋත්තරයේ පැමිණිලිකරුගේ නම සඳහන් කර ඇත. මහේෂ් කුමාර තම තුන්වන කටඋත්තරයේ සඳහන් කර ඇත්තේ පුද්ගලයන් එකොළොස් දෙනෙක් (11) අතුරුදහන් වීම පිළිබඳ වගකිවයුතු පුද්ගලයින් වන සුමිත් රණසිංහ සහ ප්‍රසාද් හෙට්ටිආරච්චි යන දෙදෙනා පැමිණිලිකරුගේ අධීක්ෂණය යටතේ සේවය කර ඇති බවය. ඒ අනුව පැමිණිලිකරු ඒ සඳහා ආධාර සහ අනුබල දීමක් සිදුකර ඇති බව මහේෂ් කුමාර ප්‍රකාශකර ඇත. පැමිණිලිකරු තම සාක්ෂියේදී පැහැදිලිවම සඳහන් කළේ ඉහත සඳහන් කළ සුමිත් රණසිංහ සහ ප්‍රසාද් හෙට්ටිආරච්චි

කිසිදු අවස්ථාවක තමන් යටතේ හෝ තමන්ගේ අධීක්ෂණය යටතේ සේවය නොකළ බවය. එබැවින් මෙම නිලධාරීන් දෙදෙනාගේම ප්‍රකාශ පිළිබඳව හමුදා මූලස්ථානයෙන් විමසීමක් සිදු කරන ලෙසට තමාගේ කටඋත්තරයෙන් ඉල්ලා සිටි බවද පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත. හමුදා මූලස්ථානයෙන් තමන්ගේ ඉල්ලීම පරිදි එසේ විමසීමක් කළේ නම් සුමිත් රණසිංහ සහ ප්‍රසාද් හෙට්ටිආරච්චි යන නිලධාරීන් දෙදෙනා රාජකාරිය කළේ කොහේද, ඔවුන්ගේ අධීක්ෂණ නිලධාරීන් කවුද, පැමිණිලිකරු අධීක්ෂණය කළ නිලධාරීන් කවුද, යන කරුණු කෙතෙක් දුරට නිවැරදි ද නැද්ද යන්න තහවුරු කර ගැනීමට හැකියාව තිබූ බවත් එවැනි විමර්ශනයක් කිරීම සඳහා පැමිණිලිකරුගේ අධීක්ෂණය නිලධාරීන් හැටියට සේවය කළ හිටපු නාවික හමුදාපතිවරුන් හතරදෙනෙකුගෙන් මේ පිළිබඳව විමසන ලෙසට පැමිණිලිකරු තම කටඋත්තරයෙන් ඉල්ලා සිටි බවත් සඳහන් කළේය.

පැමිණිලිකරු තමාගේ කටඋත්තරයෙන් එසේ ඉල්ලා සිටියේ වූ නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ නිළධාරියා වූ නිශාන්ත සිල්වා විසින් එම ඉල්ලීම පරිදි හමුදා මූලස්ථානයෙන් ඒ පිළිබඳව කිසිදු විමසීමක් සිදු කර නොමැත. එසේම නාවික හමුදාවේ අණ පරිපාලනය සිදුවන ආකාරය දැක්වෙන ලේඛනයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇතත් ඒ පිළිබඳව කිසිදු සැලකිල්ලක් දක්වා නොමැත. පැමිණිලිකරුගේ සේවා වාර්තාව පැ.3 වශයෙන්ද, නාවික හමුදාවේ අණදෙන ව්‍යුහය දැක්වෙන ලේඛනය පැ.4 වශයෙන් ද, නාවික හමුදා මූලස්ථානයේ පවතින මානව සම්පත් පද්ධතියෙන් ලබාගත් ලේඛණයේ සිංහල පරිවර්තනයක් පැ.5 වශයෙන්ද සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බී වාර්තාවේ දැක්වෙන සරෝජනී නාගනාදන්, මහේෂ් කුමාර, උපුල් බණ්ඩාර සහ කිත්සිරි යන පුද්ගලයින්ගේ කටඋත්තර වලට අමතරව බී වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව නාවික හමුදාවේ තුන්වන ජ්‍යෙෂ්ඨ නිළධාරියා වන රියාර් අද්මිරාල් ට්‍රැවිස් සින්නයියා මහතාගෙන්ද කටඋත්තරයක් ලබා ගෙන ඇත. ට්‍රැවිස් සින්නයියාගේ කටඋත්තරය 2017.08.02 දින මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. එම කටඋත්තරයේ සඳහන්ව ඇත්තේ මෙම පැමිණිල්ලට අදාළ සිද්ධිය සිදුවන කාල සීමාවේ නාවික හමුදාපති වශයෙන් කටයුතු කළ වසන්ත කරන්නාගොඩ මහතා යටතේ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ වධකාගාරයක් පවත්වාගෙන ගිය බවත්, එය පවත්වාගෙන ගියේ සුමිත් රණසිංහ නිලධාරියා විසින් බවත්, එම වධකාගාරය පැමිණිලිකරුගේ අනුදැනුම ඇතිව එම ස්ථානයේ පරිපාලන කටයුතු සිදුවුණු බවත්ය. ට්‍රැවිස් සින්නයියාගේ කටඋත්තරයේ පිටපතක් පැ. 6 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

2015 රාජ්‍ය පෙරළිය සිදු වන අවස්ථාවේ දී ට්‍රැවිස් සින්නයියා නාවික හමුදාවේ සේවයේ සිට නොමැත. එසේ වුවත් ඔහු 2015 නව රජය පත්වීමෙන් පසුව නාවික හමුදාවේ හමුදාපති ධූරයට පත්වී මාස දෙකක පමණ කාලයක් නාවික හමුදාපති වශයෙන් සේවය කර ඇත. 2015 ආණ්ඩු මාරුවත් සමග ට්‍රැවිස් සින්නයියා නැවත සේවයට පැමිණ ඇත්තේ ඔහු දේශපාලනික පළිගැනීමට ලක්වූ නිලධාරියෙක්ය යන අසත්‍ය ප්‍රකාශය සිදුකරමින් බවට පැමිණිලිකරු තම සාක්ෂියෙදී සඳහන් කළේය. එසේ නැවත සේවයට පැමිණි ට්‍රැවිස් සින්නයියා නාවික හමුදාවේ සියලු වරප්‍රසාද සහිතව නැවත සේවයට පැමිණ සියලු

උසස්වීම් ලබා මෙම පැ.6 ප්‍රකාශය සිදු කිරීමෙන් පසු දින 25ක පමණ කෙටි කාලයකින් නාවික හමුදාපති ධූරයට පත් වී ඇත.

ට්‍රැවිස් සින්නයියා නාවික හමුදාපති ධූරයට පත්වී ඇත්තේ සිය සේවයෙන් ඉල්ලා අස්වීමෙන් අවුරුදු හතර හමාරකට (4 1/2) පමණ පසුවය.

අලුතින් නාවික හමුදාපතිවරයෙකු පත් වූ පසුව ඔහු පිළිගැනීම සඳහා චාරිත්‍රානුකූලව උත්සවයක් පවත්වන බවත්, එම උත්සවය සඳහා දේශපාලඥයින් සහභාගි නොවන බවත්, එසේ වුවත් ට්‍රැවිස් සින්නයියා මහතා පිළිගැනීම සඳහා පවත්වනු ලැබූ චාරිත්‍රානුකූල උත්සවයට පාර්ලිමේන්තු මන්ත්‍රී චතුර සේනාරත්න මහතා සහභාගී වූ බවත් පැමිණිලිකරු සඳහන් කර ඇත. මෙම කරුණ සනාථ කරන ඡායාරූපයක් පැ.7 වශයෙන් සලකුණ කර ඉදිරිපත් කරන ලදී.

පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් අනතුරුව ඔහුට ඇප ඉල්ලා මහේස්ත්‍රාත් අධිකරණයට ඇප අයදුම්පතක් ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරුට සිදුවූ සියලු අසාධාරණයන් සඳහන් කරමින් ලේඛනයක් එම ඇප අයදුම්පත සමඟ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. එම ලේඛනය පැ.8 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

2017.08.02 දින ඉදිරිපත් කළ ද එම අයදුම් පත්‍රය ද මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධාන හේතුව වශයෙන් සලකා ඇත්තේ ට්‍රැවිස් සින්නයියාගේ ප්‍රකාශය බවත්, නියෝගයෙහි සඳහන් අන්දමට නාවිකයන් කෙසේ

කිච්චත් නාවික හමුදාවේ එවකට සිටි ජ්‍යෙෂ්ඨතම නිලධාරියා ඔහු වන බැවින් ට්‍රැවිස් සින්නයියාගේ ප්‍රකාශය අනුව මෙම නිලධාරියා ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ ගන් සයිට් යන ප්‍රදේශයේ පරිපාලන කටයුතු භාරව සිටි නිසා මෙය සුමිත් රණසිංහ කියන නිළධාරියා අධීක්ෂණය කිරීම පිළිබඳ කාරණයක් බවත්, ඒ අනුව 296 වගන්තියේ සඳහන් ආධාර අනුබල දීම සිදුකර ඇති බවත්, එබැවින් ඇප ලබාදීම ප්‍රතික්ෂේප කරන බවත්ය. එම අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ නියෝගය පැ.9 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ඉන් අනතුරුව පැමිණිලිකරු විසින් මහාධිකරණය වෙත ඇප අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එම අයදුම් පත්‍රය සලකා බලා මහාධිකරණය විසින් 2018.01.09 දින පැමිණිලිකරු ඇප මත මුදාහැර ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයෙකු වන බෙන් එමර්සන් ලංකාවට පැමිණි කාලසීමාවේදී පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදුවී ඇත. එසේම සංචාරය අවසානයේදී බෙන් එමර්සන් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් 30/1 යෝජනාවලියට සරිලන පරිදි ලංකා රජය විසින් ගෙන ඇති සාධනීය පියවර පිළිබඳව විස්තර කර ඇත. මේ අනුව එවකට යුධ හමුදාපති මහේෂ් සේනානායක විසින් සියලුම අපරාධ සිදු කළ පුද්ගලයින්ට නිසි දඬුවම් දෙන බව පැවසීමත්, පුද්ගල පැහැරගැනීමක් සම්බන්ධයෙන් නාවික හමුදාවේ ඉහළ නිලධාරීයෙක් අත්අඩංගුවට ගැනීමත් සඳහන් කර ඇත. බෙන් එමර්සන් විසින් සිදුකරන ලද ඉහත සඳහන් ප්‍රකාශය පැ.10 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළ අන්දමට සුමිත් රණසිංහ නැමැති නිලධාරියා අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත්තේ 2017.02.02 වෙනි දිනය. ඒ 2017.02.03 විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා ජිනීවා සමුළුව ඇමතීමට සමගාමීවය. මෙලෙස නාවික හමුදා නිළධාරීන් අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද්දේ ඉහත සඳහන් 30/1 යෝජනාවලියට සරිලන පරිදි ලංකා රජය විසින් පියවර ගන්නා බව ජිනීවා සමුළුවට විදහා දැක්වීම සඳහාය.

පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිතයෙකු ලංකාවට පැමිණෙන අවස්ථාවේදී ඔහුව සෑහීමට පත් කිරීම සඳහා නාවික හමුදාවේ නිලධාරීන් අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති බවය. 2017.10.23 දින ලංකාවට පැමිණි එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත Pobol de Grift නැමැති පුද්ගලයා ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුර නිරීක්ෂණයට ලක් කර ඇත. විදේශීය පුද්ගලයන් ලංකාවේ නාවික හමුදා කඳවුරක් ඔහුගේ නිරීක්ෂණයට ලක් කිරීම ලංකාවේ ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයක් බවද පැමිණිලිකරු සඳහන් කළේය. මෙම පරීක්ෂා කිරීම සිදුකර ඇත්තේ පැමිණිලිකරු අත්අඩංගුවේ රඳවා ගෙන සිටි අවස්ථාවේදීය. මේ අන්දමින් ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිතයෙකුගේ නිරීක්ෂණයට ලක් කිරීම සිදුකර ඇත්තේ ත්‍රිකුණාමලය හමුදා කඳවුර තුළ රාජ්‍ය අනුග්‍රහය සහිතව වධකාගාරයක් පවත්වාගෙන යන බවට ඉදිරිපත්ව ඇති කරුණු සනාථ කර ගැනීම සඳහාය. මෙම වධකාගාරය ගෝඨා කඳවුර නමින් නම් කර ඇති බවට එය පෙර රජයේ ආරක්ෂක ලේකම්වරයාගේ අනුග්‍රහය යටතේ පවත්වාගෙන ගිය බවටත්

චෝදනා කර ඇත. මෙම නිරීක්ෂණය තුළින් විශේෂ නියෝජිතයා අපේක්ෂා කර ඇත්තේ ලංකාව යුද අපරාධ සිදු කර ඇති බවට ඉදිරිපත්ව ඇති චෝදනාවට හසු කර ගැනීම සඳහාය. ලංකාවේ ජීවත් වන සියලුම ජාතීන්ට අයත් පුද්ගලයින්, ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, පොලිස් නිළධාරීන් ආදී විවිධ තරාතිරමේ පුද්ගලයින් අතුරුදහන්වීම සිදුවුවත් ලංකාවට පැමිණි විශේෂ නියෝජිතයින් සොයා බලා ඇත්තේ ද්‍රවිඩ ජාතිකයන් සහ ත්‍රාස්තවාදී සංවිධානයට සම්බන්ධව සිරගත වී සිටින පුද්ගලයන් මුදා ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ සකස් කිරීමට අවශ්‍ය කෙරෙන නිරීක්ෂණ පමණකි.

ඔවුන් එම කාලය තුළ සාකච්ඡා පවත්වා ඇත්තේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සිරකරුවන් සමග පමණි. පැමිණිලිකරු ද එම අවධියේ රක්ෂිත බන්ධනාගාරගතව සිටියත් ඔහු සමග ඉහත සඳහන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිතයින් කිසිදු අවස්ථාවක සාකච්ඡා පවත්වා නොමැත. රක්ෂිත බන්ධනාගාරගතව සිටි පැමිණිලිකරු ඇතුළු අනෙකුත් හමුදා නිලධාරීන්ගේ දුක්ගැනවිල්ල ඉදිරිපත් කිරීමට ඔවුන් එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයින්ගෙන් ඉල්ලා ඇති නමුත් ඒ සඳහා කිසිදු අවස්ථාවක් ලබා දී නොමැත.

පැමිණිලිකරුගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් නොලැබුණු බැවින් පැමිණිලිකරුගේ දියණිය එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයන් තිදෙනා වෙත පැමිණිල්ලක් භාර දීමට උත්සාහ දරා ඇත. එසේ වුවත් ඔවුන් එම පැමිණිල්ල භාර ගැනීම ප්‍රතික්ෂේප කර, පැමිණිලිකරුගේ දියණියට මුහුණ නොදී පිටුපස දොරින් පැන ගිය බවට පැමිණිලිකරු සඳහන් කළේය. ඉන්පසුව ලංකාවේ සිටින මානව හිමිකම්

කවුන්සලයේ කාන්තාවට එම පැමිණිල්ල භාර දී ඇති නමුත් අද වනතුර තුරු ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. එම පැමිණිල්ල පැ.11 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

34/1යෝජනාවලියේ වලංගු කාල සීමාව 2017 මාර්තු මස පැවති සැසිවාරයේදීත්, 40/1යෝජනාව මගින් ද 2019 මාර්තු මාසයේ පැවති සැසිවාරයේදී කාලය දීර්ඝ කර ඇත. 30/1 යෝජනාවට සම අනුග්‍රාහකත්වය දැක්වීමට එවකට සිටි රජයේ විදේශ අමාත්‍යවරයා වූ මංගල සමරවීර මහතා එකඟ වීමෙන් පසුව එම යෝජනාවලියේ අඩංගු කරුණු ඉටුකිරීම සඳහා පිහිටුවනු ලැබූ කමිටු සහ සිවිල් පුරවැසි කණ්ඩායම් සැදී පැහැදී සිටියහ. පාක්‍යසෝති සරවනමුත්තු, මනෝරි මුත්තෙට්ටුවේගම සහ ගාමිණී වියන්ගොඩ, ශාන්තා අභිමානසිංහම්, පී.සී.විරාජඩ් රහීම්, විශාඛා ධර්මාදාස, මහාචාර්ය දම්මිල සමරසිංහ, වෛද්‍ය ෆර්සානා හනීෆා, කේ.ඩබ්ලිව්. ජනරංජන, මහාචාර්ය දයා සෝමසුන්දරම්, මහාචාර්ය සිදුලේඛා මුනගුරු වැනි පිරිසක් මේ සඳහා වූ සූදානමින් සිටියහ.

2015 පත්වුණ නව රජය විසින් නිර්මාණය කරන ලද Consultation Transport නැමැති කමිටුවට පත් කරන ලද ඉහත සාමාජිකයන් විසින් 30/1 යෝජනාවලිය ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව සොයා බලා ඇත. එම කමිටුව විසින් ඒ පිළිබඳව වාර්තාවක් සකස් කර ඇත. පාක්‍යසෝති සරවනමුත්තු එම වාර්තාවට අත්සන් තබා ඇති එක පුද්ගලයෙකි. දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබාගැනීම සඳහා පත් කළ පරීක්ෂණ කොමිෂන් සභාවේ බලතල අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවරා ඇති

මූලික අයිතිවාසිකම් නඩුවේ පෙත්සම්කරුවකු වන්නේ ද මෙම පාක්‍යසෝති සරවනමුත්තුය.

පාක්‍යසෝති සරවනමුත්තු කමිටුව විසින් සකස් කරන ලද 2016.11.17 දින දරණ වාර්තාවෙහි ප්‍රධාන කරුණු හතරක් සඳහන් වෙයි. එනම්:-

1. අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාල පිහිටුවීම
2. අතුරුදහන්වූවන් පිළිබඳ වන්දි ගෙවීම සඳහා වූ කාර්යාලය
3. සත්‍ය සෙවීමේ කොමිසම
4. විශේෂ අධිකරණයක් සහිත අධිකරණ ක්‍රියාවලියක්

2015 වර්ෂයේ පිහිට වූ නව රජය ක්‍රියාකළ ආකාරය සලකා බලන විට පාක්‍යසෝති සරවනමුත්තු කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කර ඇති බව පෙනීයන බවට පැමිණිලිකරු සඳහන් කළේය. මෙම තත්ත්වය පැහැදිලි කරමින් පැමිණිලිකරු සඳහන් කළේ අතුරුදන්වූවන්ගේ කාර්යාලයක් පිහිටුවීම, වන්දි ගෙවීම සඳහා කටයුතු කිරීමට නීති සම්පාදනය කිරීම, ත්‍රිපුද්ගල මහාධිකරණය පිහිටුවා නඩු විභාග කිරීමට සැලැස්වීම ආදී කරුණු මගින් කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කළ බවට පෙනී යන බවද, මෙම වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව හිටපු ජනාධිපතිනිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය සංහිඳියාව පිළිබඳව කටයුතු කළ බවත් එහි නියෝජ්‍ය පුද්ගලයා වූයේ මනෝගනේෂන් මහතා බවත්ය. එසේම මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ලේකම් කාර්යාලයක් පිහිටුවා ඇති අතර මනෝ තිත්තවැල්ල මහතා එම කාර්යාලයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කර ඇත. ලේකම් කාර්යාලය අරලියගහ මන්දිරයේ

අග්‍රාමාත්‍යවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාකර ඇත. මෙම කාලවකවානුව තුළ අග්රාමාත්‍යවරයා රජයේ හමුදාවන් සඳහා දේශන පවත්වමින් ගොස් ඇති අතර ඒ සඳහා එක්සත් ජාතීන්ගේ නියෝජිතයින් ද සහභාගි වී ඇත. මෙලෙස හමුදාවන්ට දේශන පැවැත්වීමේ අරමුණ වී ඇත්තේ හමුදාවන් ප්‍රතිසංස්කරණයකට භාජන කිරීමය. ඒ අනුව හමුදාවේ කාණ්ඩ කීපයක්ම වසා දැමීමට හමුදාපති ජනරාල් මහේෂ් සේනානායක ක්‍රියාකර ඇත. බෙන් එමර්සන්ගේ චාරිකාව අවසානයේ දී සිදු කරන ලද මාධ්‍ය සාකච්ඡාවේදී රජය ක්‍රියාත්මක කළ සාධනීය පියවර සම්බන්ධයෙන් මෙන්ම හමුදාපති මහේෂ් සේනානායක පිළිබඳව ද ප්‍රකාශයක් කර ඇත.

ද්‍රවිඩ තරුණයන් එකොළොස්දෙනා අතුරුදහන්වීම සම්බන්ධයෙන් පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කර, සම්පත් මුණසිංහගේ කාමරයෙන් හැඳුනුම්පත් ලැබීමේ කාරණය මතු කරමින් ඔහු මේ පිළිබඳව සැක කටයුතු පුද්ගලයෙක් ද යන්න පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කර ඇත. සම්පත් මුණසිංහ ළඟ හැඳුනුම්පත් තිබීම හේතුකොටගෙන ඔහු පිළිබඳව සාධාරණ සැකයක් ඇති කර ගත හැකි බව පැමිණිලිකරු සඳහන් කර තිබේ. කෙසේ වෙතත් පැමිණිලිකරු අත් අඩංගුවට ගත් දිනයේ දී ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කර නොමැත. පසුව ප්‍රකාශයක් සටහන් කර ගන්නා බවට පවසමින් නිලධාරීන් ඉවත් වී ගොස් ඇත.

මේ පිළිබඳව පැමිණිලිකරුගේ නීතිඥ මහතා නගන ලද ප්‍රශ්නයකට පැමිණිලිකරු ලබාදුන් දීර්ඝ පිළිතුර පහත සඳහන් පරිදි වේ. උපුටා දැක්වීම. (2020.02.25 - පි/අ 66 වෙනි පිටුව බලන්න)

" ප්‍රශ්නය: මේ සිද්ධියට යම්කිසි පුද්ගලයින්ගේ නම් තමා තුළින් සටහන් කර ගැනීමට යම්කිසි නිලධාරියෙක් හෝ පුද්ගලයෙක් උත්සාහ දැරුවාද?

පිළිතුර : එහෙමයි මාව අත්අඩංගුවට ගත් දිනයේදී මගේ ප්‍රකාශය සටහන් කිරීම නවත්වලා මාව අත්අඩංගුවට අරගෙන පසුව ප්‍රකාශ සටහන් කරනවා කියලා ඔවුන් යන්න ගියා. ඊට පස්සේ මගේ බිරිඳටත් දරුවන්ටත් කියලා තිබුණා මේකට ඩී.කේ.පී. දසනායක වගකිව යුතු නැහැ. ඔහුට රජයේ සාක්ෂිකරුවෙක් වෙන්න කියන්න. අද්මිරාල් වසන්ත කරන්නාගොඩගේ උපදෙස් මත එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත වදකාගාරයක් ත්‍රිකුණාමලයේ පවත්වාගෙන ගියා කියලා ප්‍රකාශයක් දෙන්න කියලා. එවිට මාව රජයේ සාක්ෂි කාරයෙක් හැටියට නම් කරලා නිදහස් වෙන්න පුළුවන් කියලා. එහෙම කරලා මාධ්‍ය මගින් විශාල ප්‍රචාරණයක් අරගෙන ගියා හිටපු මාධ්‍ය ප්‍රකාශක නාවික හමුදා මාධ්‍ය ප්‍රකාශක මේකට සම්බන්ධයි කියලා මගේ චරිත සම්පූර්ණයෙන් ඝාතනය කරමින් මගේ දරුවන්ට මගේ බිරිඳට මගේ පවුලේ අයට සියල්ලටම මඩ ප්‍රචාරණයක් ගෙන ගියා. විශේෂයෙන් රාජ්‍ය මාධ්‍ය ලේක්හවුස්, රූපවාහිනී, අයි.ටී.එන්. ඇතුළු රාජ්‍ය මාධ්‍ය තුළ විශාල ප්‍රචාරණයක් ගෙන ගියා. සාකච්ඡා පැවැත්වූවා විශේෂයෙන් පාක්‍යසෝති සරවනමුත්තු, ගාමිණී වියන්ගොඩ, ඔවුන්ව මෙහෙය වූයේ ශාන් විජේතුංග. එන්.ජී.ඕ. ක්‍රියාකාරී සාමාජිකයෙක්. ජනරංජන ඔහුගේ පත්තරය තුළින් අදටත් අපට ප්‍රහාර එල්ල කරනවා. මේ යාන්ත්‍රනය

තියෙන කණ්ඩායමමම තමයි මේ මහා ප්‍රචාරණයක් ගෙන ගියේ. එහෙම කරලා මගේ මානසික තත්ත්වය පහත හෙළලා මගේ දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වෙන්න ඇරලා ඔවුන් උත්සාහ කලා මාස හයක් වැනි කාලයක් තුල මාව අත්අඩංගුවේ තියාගෙන ඉඳලා ඇප දෙන අවස්ථාවල නොයෙකුත් හේතු දක්වමින් අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමට කාලය අවශ්‍යයි නැත්නම් ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ ජනක බණ්ඩාර රට ගිහිල්ලා අධිකරණයේ විනිසුරුතුමා නිවාඩු ගිහිල්ලා එහෙම නැත්නම් අධිකරණයට ඇවිල්ලා ඉන්නවා නමුත් අද බෙන්ච් එකට එන්න වෙන්නේ නැහැ කියලා නොයෙකුත් අවස්ථාවල මගේ ඇපදීම සලකා බැලීම දිගින් දිගටම පස්සට දැම්මා. දාලා උත්සාහ කලේ මගේ මානසික මට්ටම පහත හෙළලා ඔවුන්ට අවශ්‍ය ප්‍රකාශය සටහන් කරගන්න කියලා මට හැඟෙනවා. මොකද ඔවුන්ට මගේ ප්‍රකාශය නැත්නම් ඕන වෙලාවක සටහන් කරගන්න තිබුනා මොකද අධිකරණ නියෝගයක් අවස්ථා දෙකකදී ලබාගෙන තිබියදී ඒ අවස්ථාවේ ලබාගන්නත් තිබුනා. එහෙම නොකර ඇපදෙන අවස්ථාව දක්වාවත් මගෙන් ප්‍රකාශයක් සටහන් කරගත්තේ නැහැ." (උපුටා ගැනීම අවසන්)

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුට ඇප දෙන අවස්ථාව දක්වා කිසිදු අවස්ථාවක ඔහුගේ ප්‍රකාශය සටහන් කර ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියා නොකිරීම ඉතාමත් පුදුම සහගතය. පැමිණිලිකරුගේ ප්‍රකාශයක් සටහන් කරගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒ අයුරින් දිගින් දිගටම ප්‍රමාද කරමින් සිටියේ වෙනත් අරමුණක් ඉටුකරගැනීම සඳහා සාක්ෂිකරු ඊට පොළඹවා

ගැනීම පිණිස බව පැමිණිලිකරුගේ සාක්ෂියෙන් පැහැදිලිව පෙනේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙම කාරණාය උදෙසා පැමිණිලිකරුගේ භාර්යාව සහ දරුවන් මගින් පැමිණිලිකරුට බලපෑම් කිරීමට පෙළඹී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අවශ්‍ය වූයේ ත්‍රිකුණාමලයේ ගෝඨා කඳවුර නමින් වධකාගාරයක් එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහ හිටපු නාවික හමුදාපතිපති වසන්ත කරන්නාගොඩ මහතාගේ මෙහෙයවීම යටතේ පවත්වාගෙන යන බව සනාථ කෙරෙන ප්‍රකාශයක් ලබා ගැනීමටය. පැමිණිලිකරු ඒ අන්දමේ ප්‍රකාශයක් ලබා දෙන්නේ නම් ඔහු නඩුවේ රජයේ සාක්ෂිකරුවකු කරන බවටද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ප්‍රකාශ කර ඇත. එසේ වුවත් තමන් එවැනි අසත්‍ය ප්‍රකාශයක් කිරීමට සූදානම් නොවූ බව පැමිණිලිකරු දිගින් දිගටම ප්‍රකාශකර සිටියේය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එවැනි ප්‍රකාශයක් පැමිණිලිකරුගෙන් ලබාගැනීමට උත්සහ දරා ඇත්තේ ට්‍රැවිස් සින්නයියා විසින් ලබාදුන් ප්‍රකාශය සනාථ වන අන්දමේ ප්‍රකාශයක් පැමිණිලිකරුගෙන් ලබාගැනීමටය.

මෙම අවස්ථාව වන විට පැමිණිලිකරුගේ භාර්යාව සහ දියණියන් දෙදෙනා බරපතල මානසික කම්පනයකට ලක්ව සිටි බවත් එම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔවුන්ට අවශ්‍ය කරන ප්‍රකාශයක් ලබාගැනීම සඳහා භාර්යාව සහ දියණියන් දෙදෙනා පොළඹවන ලද බවත් පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත. ඇප ලබා ගැනීම

සඳහා එවැනි අසත්‍ය ප්‍රකාශයක් කිරීමට තමන් සූදානම් නොවූ බවද පැමිණිලිකරු තම සාක්ෂියේ දී සඳහන් කර ඇත.

මෙම සාපරාධී කුමන්ත්‍රණය සිදුකර ඇත්තේ එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර, අධීක්ෂණ නිලධාරියා වූ සහකාර පොලිස් අධිකාරී තිසේරා, පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සහ පොලිස් පරීක්ෂක ඉලංගසිංහ යන සිවු දෙනාය.

පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේ, 2019 නොවැම්බර් මස පැවැති ජනාධිපතිවරණයෙන් පසුව බිහිවූ නව රජයේ විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා කැබිනට් මණ්ඩලයේද අනුමැතිය ඇතිව ඉහතින් සඳහන් කරන ලද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 30/1 යෝජනාවලියට ශ්‍රී ලංකාව සම අනුග්‍රාහකත්වය දරණ බවට සම්මුතියෙන් ඉවත්වන බවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පසුගිය සැසිවාරයේදී ප්‍රකාශ කරන ලදී. විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා සඳහන් කළ අන්දමට 2015 ඇති කරන ලද අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ රජය ඉහත කී 30/1 යෝජනාවලියට සම අනුග්‍රාහකත්වය දරණ බවට කැමැත්ත ප්‍රකාශ කර ඇත්තේ පාර්ලිමේන්තුවේ කරුණු දැක්වීමකින් තොරව සහ එවකට ජනාධිපතිවරයාගේ ද අනුමැතිය නොමැතිවය. මෙම 30/1 යෝජනාවලිය මගින් ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය, ආරක්ෂාව සහ ස්වෛරීභාවයට හානි සිදු වන බව පසුගිය වකවානුව තුළ සිදු වූ ක්‍රියාදාමයන් තුළින් පැහැදිලිව පෙනී යන බව ය.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදුවී ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිතයෙකු වන බෙන් එමර්සන් මහතා

ලංකාවේ චාරිකාව සිදුකරන අවස්ථාවේදීය. ඔහුගේ චාරිකාවේ අරමුණ වූයේ 30/1 යෝජනාවලියේ අඩංගු කරුණු ලංකාවේ ක්‍රියාත්මක කරන්නේ කෙසේද ? ඒ සඳහා අවශ්‍ය යාන්ත්‍රණය කෙබඳු ආකාරයේ යාන්ත්‍රණයක් ද ඒ සඳහා අවශ්‍ය මූලික පහසුකම් රජය සපයන්නේද යන්න සොයා බැලීමය. එසේම පැමිණිලිකරුට ඇප ලබාදීම සඳහා වූ ප්‍රමාදයට එක් හේතුවක් වූයේ Pobol de Grift නැමැති එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයකු ලංකාවේ සංචාරය කිරීමය. ඉන් පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිතයින් තිදෙනෙකුගෙන් සැදුම්ලත් කණ්ඩායමක් ලංකාවේ සංචාරය කර ඇත. එම ත්‍රිපුද්ගල කණ්ඩායම ලංකාවේ සංචාරය කිරීමට හේතුව වී ඇත්තේ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන් සොයා බැලීමය. ලංකාවේ සංචාරය කළ ත්‍රිපුද්ගල කණ්ඩායම එල්.ටී.ටී.ඊ. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම පිළිබඳ කරුණු සොයා බලා ඇත. එබැවින් පැමිණිලිකරුගේ දියණියද, පැමිණිලිකරු අත්තනෝමතික ලෙස සහ අසාධාරණ ලෙස අත්අඩංගුවට ගැනීම පිළිබඳව පැමිණිල්ලක් බාරදීමට ත්‍රිපුද්ගල කණ්ඩායම හමුවට ගොස් ඇත. ත්‍රිපුද්ගල කණ්ඩායම පැමිණිලිකරුගේ දියණියගෙන් සුවදුක් විමසා ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ද නැතහොත් ද්‍රවිඩ ද යන්න විමසා බලා ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ හෝ ද්‍රවිඩ නොවූ බැවින් ඇයගේ පැමිණිල්ල භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. පැමිණිලිකරුගේ දියණියගේ පැමිණිල්ල භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම මාධ්‍ය වල ප්‍රචාරය වී ඇත. 2017.12.24 දින මව්බිම පුවත්පතේ පළ කල ප්‍රවෘත්තියක් පැ.14 වශයෙන්ද එසේම 2017.12.24 දිවයින පුවත් පළ කරන ලද ප්‍රවෘත්තියක් පැ.15 වශයෙන්ද සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පැ.15 ලේඛනයේ දකුණු පැත්තේ ඡායාරූපයේ යටින් ඇති නාවික කොමදෝරු දසනායකගේ දියණියගේ ලියකියවිල්ලක් භාරගැනීම ප්‍රතික්ෂේප කළ අන්දම දැක්වෙන ඡායාරූපය පැ.15 (1) වශයෙන් ඉදිරිපත් කර ඇත. එසේම, එම ඡායාරූප පෙළේ වම් පසින් ඇති ඡායාරූපය පැ.15(2) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

30/1 යෝජනාවලියට එවකට සිටි රජය සම අනුග්‍රහකත්වය දරමින් එහි සඳහන් කරුණු ක්‍රියාවට නැංවීම උදෙසා රජය විසින් සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ ලේකම් කාර්යාලයක් අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ පිහිටුවන ලදී. එහි ලේකම්වරයා වූයේ මනෝ තිත්තවැල්ල මහතා ය. ඒ බව සනාථ කිරීම සඳහා ලේකම් මනෝ තිත්තවැල්ල මහතා විසින් එවකට ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ කරුණාසේන හෙට්ටිආරච්චි මහතා වෙත යවන ලද 2017.05.02 දින දරණ ලිපියක් පැ.16 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඉහත සඳහන් කළ ලේකම් කාර්යාලය අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ පිහිටා තිබෙන බව ලිපියේ ශීර්ෂයෙහි දැක්වේ. 30/1 යෝජනාවලියට සම අනුග්‍රහය තත්ත්වය දැරීමෙන් පසුව එහි කටයුතු රට තුළ ක්‍රියාත්මක වන ආකාරය සොයාබැලීම සඳහා පිහිටුවන ලද Consultation Tastes Fosts (CTF) කමිටුවේ සාමාජිකයින්ගේ විස්තරයක් ඇතුළත් වන්නා වූ ලේඛනයක් පැ.18 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේ තමා මහාධිකරණයට ඉදිරිපත් කළ ඇප අයදුම්පතෙහි තමාට සිදුවූ අසාධාරණය පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ප්‍රකාශ කර ඇති බවය. එම ඇප අයදුම් පත්‍රයෙහි පිටපත පැ.19 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන නිලධාරීන් දෙදෙනා

පැමිණිලිකරුගේ අධීක්ෂණය යටතේ නොසිටිය බව සනාථ කිරීම සඳහා ඔවුන් දෙදෙනා සාක්ෂි ලබාදීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට කැඳවීමට අපේක්ෂා කරන බවද පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත. එසේම සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන නිලධාරීන් දෙදෙනා පැමිණිලිකරුගේ අධීක්ෂණය යටතේ නොසිටි බව සනාථ කිරීම සඳහා සුමිත් රණසිංහ නිලධාරියාගේ සේවා වාර්තාව පැ.20 වශයෙන්ද හෙට්ටිආරච්චි යන නිලධාරියාගේ සේවා වාර්තාව පැ.21 වශයෙන්ද ඉදිරිපත් කරන ලදී.

පැ.20 සහ පැ.21 යන ලේඛන අනුව පැහැදිලිව පෙනී යන්නේ සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන නිලධාරීන් දෙදෙනා අදාළ කාල සීමාව තුළ පැමිණිලිකරුගේ අධීක්ෂණය යටතේ නොසිටි බවය. පැ.20 අනුව 2008.10.13 සිට 2009.09.28 දක්වා කාලසීමාව තුළ ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ ගොඩබිම් මෙහෙයුම් භාර නිලධාරියා හැටියට ආඥාපති නැගෙනහිර නාවික පෙදෙස යටතේ සුමිත් රණසිංහ සේවය කර ඇත. පැ.21 අනුව හෙට්ටිආරච්චි නැමැති නිලධාරියා 2008.06.19 සිට 2008.09.02 දින දක්වා ශ්‍රී ලංකා නාවික හමුදා ගජබා ආයතනය පිහිටා ඇති මන්නාරම් ප්‍රදේශයේ අතිරේක නිලධාරියෙක් වශයෙන් රාජකාරියෙහි නිරතව ඇති අතර ඉන්පසුව 2008.09.03 සිට 2009 03.27 දක්වා ශ්‍රී ලංකා නාවික නෞකා පරාක්‍රම පිහිටා ඇති කොළඹ පරිපාලන ප්‍රදේශයේ නිලධාරියෙක් හැටියට සේවය කර ඇත. එසේම, අනෙක් අතට මෙම කාලවකවානුව තුළ පැමිණිලිකරු මාධ්‍ය ප්‍රකාශක සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙහෙයුම්, වශයෙන් නාවික හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් මෙහෙයුම් යටතේ සේවය කර ඇත.

පැමිණිලිකරු සඳහන් කළ අන්දමට ඒ විට හමුදා සේවයෙන් ඉවත් වී සිටි ට්‍රැවිස් සින්නයියා විසින් පැමිණිලිකරුට එරෙහිව අසත්‍ය ප්‍රකාශයක් සිදුකර දින 25කට පසුව හමුදාපති වී මාස දෙකක පමණ කාලයකින් පසුව විශ්‍රාම ගොස් ඇත. තමන්ට එරෙහිව ද්වේෂ සහගත සහ අසත්‍ය ප්‍රකාශයක් සිදුකළ ට්‍රැවිස් සින්නයියා මීට පෙරද අසත්‍ය ප්‍රකාශ සිදු කර ඇති බවත්, ඔහු විශාල වංචාවන්ට සහභාගී වී ඇති බවත්, ස්වේච්ඡාවෙන් හමුදා සේවයෙන් ඉවත්වූ සින්නයියා පසුව දේශපාලන පලිගැනීම් වලට හසු වූ බවට ප්‍රකාශ කරමින් නැවත හමුදා සේවයට ඉහත දැක්වූ අයුරින් ඇතුල්වී ඇත. ඩෝරා යාත්‍රා සඳහා අවි මිලදී ගැනීමේදී ට්‍රැවිස් සින්නයියා විසින් බරපතළ දූෂණ සිදුකර ඇත. බ්‍රිතාන්‍ය රාජකීය හමුදාවෙන් ඉවත් කරනු ලැබූ 30 mm විශාල අවි මිලදී ගෙන ඇති අතර එම අවි සඳහා පතුරම් නොමැතිවීමෙන් අවි පාවිච්චි කිරීමට නොහැකිව ඉවත දමා ඇත. ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඇති අතර එම පරීක්ෂණයේ දී ඊට වගකිව යුතු පුද්ගලයා වශයෙන් ට්‍රැවිස් සින්නයියා නම් කර ඇත. මෙම පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් ලෙසට පැමිණිලිකරු සහ වසන්ත කරන්නාගොඩ මහතා ද කටයුතු කර ඇත. මේ හේතුවෙන් සින්නයියා පැමිණිලිකරු සහ වසන්ත කරන්නාගොඩ මහතා සමඟ බරපතළ අමනාපයකින් පසු වී ඇත. මෙම වංචාව සොයා බැලීම සඳහා ජනාධිපති පරික්ෂණ කොමිෂන් සභාවක් ද පත් කර ඇතත් එම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව විවෘත වී නොමැත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට ප්‍රථමයෙන් අශෝක මහේෂ් කුමාර නැමැති පුද්ගලයෙකුගෙන් කටඋත්තර කීපයක් ලබා ගෙන ඇත. 2016.09.14 දින දරණ කටඋත්තරය පැ.22 වශයෙන් සලකුණු

කර ඉදිරිපත් කරන ලදී. එසේම එකී මහේෂ් කුමාර විසින් 2017.03.01 දින ලබාදී ඇති කටඋත්තරය පැ.23 වශයෙන්ද 2018.12.12 වැනි දින ලබාදී ඇති කටඋත්තරය පැ.24 වශයෙන්ද 2018.12.20 වන දින ලබාදී ඇති කටඋත්තර පැ.25 වශයෙන්ද සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පැමිණිලිකරු සඳහන් කළ අන්දමට මහේෂ් කුමාර විසින් ලබාදී ඇති පැ.22 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළ 2016.09.14 දින කරන ලද ප්‍රකාශයෙහි ඔහු ඊට ප්‍රථම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කට උත්තරයක් ලබාදී ඇති බවට ප්‍රකාශ කර ඇත. නමුත් මෙම සිද්ධියට අදාළව දැනට කොළඹ මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිශ්චය සභාවක් ඉදිරියේ අධි චෝදනා පත්‍ර ගොනු කර ඇති මහාධිකරණ නඩු අංක 1448/2020 දරණ නඩුවේ චූදිතයෙකු වශයෙන් නම්කර ඇති පැමිණිලිකරුට ලබාදී ඇති සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ අතර ඉහත සඳහන් මහේෂ් කුමාරගේ ඉහත දින කරන ලද ප්‍රකාශය ලබා දී නොමැත. එබැවින් එම ප්‍රකාශය නීතිපති දෙපාර්තමේන්තුවෙන් පැමිණිලිකරුට ලබාගැනීමට මෙම කොමිෂන් සභාව මගින් කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත. පැමිණිලිකරු සඳහන් කළේ ඔහු විශ්වාස කරන අන්දමට මහේෂ් කුමාර විසින් 2016.09.14 දිනට කලින් ලබාදී ඇති ප්‍රකාශයෙහි පැමිණිලිකරු පිළිබඳව කිසිවක් සඳහන් නොවන බවය. එයට හේතුව වශයෙන් ඔහු සඳහන් කළේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බී වාර්තාවල මහේෂ් කුමාරගේ එවැනි ප්‍රකාශයක් පිළිබඳව සඳහන් නොවන බවය.

මීට පෙර සඳහන් කළ සරෝජනී පෙරේරා නැමැත්තියගෙන්ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රකාශ කිහිපයක් සටහන් කරගෙන ඇත. ඇය විසින් ලබා දී ඇති ප්‍රකාශ අතුරින් පළමු ප්‍රකාශය සිදුකර ඇත්තේ

2011.04.06 වන දිනදීය. එම ප්‍රකාශය පැ.26 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. සරෝජනී පෙරේරා විසින් පැ.26 ප්‍රකාශය සිදුකර ඇත්තේ බී 732/09 දරණ නඩුවට අදාළවය. ඉන්පසුව ඇය විසින් ඇයගේ දරුවා නැති වූ බවට සඳහන් කරමින් හබයාස්කෝපුස් අයදුම්පත්‍රයක් අභියාචනා අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. අංක 3/2011 දරණ හබයාස්කෝපුස් නඩුවේ සරෝජිනී පෙරේරා ඉදිරිපත් කළ පෙත්සම පැ.27 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම හබයාස්කෝපුස් නඩුවේ වගඋත්තරකරුවකු වශයෙන් පැමිණිලිකරු නම් කර නොමැති අතර, එම පැ.27 පෙත්සමෙහි සරෝජිනී පෙරේරාගේ දරුවා නැතිවීම සම්බන්ධයෙන් පැමිණිලිකරු වගකිව යුතු බවට කිසිදු සඳහනක් නොමැත.

සරෝජනී පෙරේරා සහ සරෝජනී නාගනාදන් යන දෙදෙනාම එකම පුද්ගලයකු බව ලබාදී ඇති ප්‍රකාශයන් පරිශීලනය කිරීමේදී පැහැදිලිව පෙනී යන බවද, සරෝජනී පෙරේරා සහ සරෝජනී නාගනාදන් නමින් පෙනී ඇත්තේ එකම තැනැත්තෙක් බවද පැමිණිලිකරු තම සාක්ෂියේ දී සඳහන් කර ඇත. සරෝජනී පෙරේරා, ගෝවින්දසාමි නාගනාදන් සමග විවාහ වීමෙන් පසුව සරෝජනී නාගනාදන් යන නම භාවිතා කර ඇති බව පෙනී යයි.

සරෝජනී පෙරේරා විසින් පවරනු ලැබූ හබයාස්කෝපුස් නඩුව පිළිබඳව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේදී පරීක්ෂණයක් පවත්වා ඇත. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ විශේෂ 1 / 2002 දරණ නඩුව යටතේ සාක්ෂි විභාග කිරීම සිදු කර ඇත. එම විශේෂ 1 / 2002 දරණ නඩුවේ සරෝජනී නාගනාදන් විසින් ලබාදී ඇති සාක්ෂිය පැ.28 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම

සාක්ෂි දීම සිදුකර ඇත්තේ 2012.06.13 වන දින දීය. එම සාක්ෂියේදී සරෝජනී නාගනාදන් නැතහොත් සරෝජනී පෙරේරා තමාගේ දරුවා අතුරුදන්වීමට අදාළව වගකිවයුතු පුද්ගලයන්ගේ නම් වශයෙන් සම්පත් මුණසිංහ සහ ලුතිනන් හෙට්ටිආරච්චි යන දෙදෙදෙනාගේ නම් සඳහන් කර ඇත. පැමිණිලිකරුගේ නම සඳහන් කර නැත. එසේම ඇයගේ දරුවාගේ අතුරුදන්වීමට පැමිණිලිකරු වගකිව යුතු බවට ඇයගේ සාක්ෂියෙහි කිසිදු ස්ථානයක සඳහන් කර නොමැත.

සරෝජනී නාගනාදන්ගේ පුතාගේ අතුරුදහන් වීමට පැමිණිලිකරු වගකිව යුතු බවට ඇය විසින් ප්‍රකාශයක් කර ඇත්තේ පැමිණිලිකරු ඇමරිකා එක්සත් ජනපදයේ සිට ලංකාවට කැඳවීමෙන් පසුව ය. එනම් පැමිණිලිකරු 2015.01.08 වන දින ලංකාවට පැමිණීමෙන් අනතුරුව ඔහුගේ නමද ඇතුළත් කර සරෝජනී නාගනාදන් විසිනි ප්‍රකාශයක් සිදුකර ඇති බව ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පෙනී යයි.

පැමිණිලිකරු මෙම සිද්ධියට සම්බන්ධ බවට ප්‍රකාශයක් කර ඇති තවත් පුද්ගලයකු වන්නේ නාවික හමුදා නිලධාරියෙකු වන කේ.සී. වෙලගෙදර ය. මෙම පුද්ගලයා වර්තමානයේ ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටින බවට පැමිණිලිකරු සඳහන් කළේය. පැමිණිලිකරු සඳහන් කළ අන්දමට මෙම වෙලගෙදර නැමැති නාවික නිලධාරියා යුධ අධිකරණයකින් වරදකරු වූ පුද්ගලයෙකි. දඬුවම ලිහිල් කර ගැනීම සඳහා ජනාධිපතිතුමා හරහා දේශපාලනික වශයෙන් කටයුතු කර ජනාධිපතිවරණයෙන් දින දෙකකට පෙර නාවික හමුදාවෙන් ඉවත්වීමට ඔහුට අවසර දී ඇත. 2015 රාජ්‍ය පෙරළියත් සමඟ වෙලගෙදර නැමැති මෙම නිලධාරියා යම් යම් තොරතුරු මාධ්‍ය ආයතන වලට සහ දේශපාලනඥයින්ට ලබා දී ඇත. පැමිණිලිකරු

වැඩිදුරටත් සඳහන් කළ අන්දමට මෙම වෙලගෙදර නැමැති නිලධාරියා 2013 වර්ෂයේදී නාවික හමුදාවේ සමුද්‍ර ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළේ ද එම නිලධාරියා වේ. ඔහුගේ රාජකාරි කාලසීමාව තුළ මුහුදු මාර්ගයෙන් මිනිසුන් රහසිගත හෝ ඔස්ට්‍රේලියාවට ගෙනයාම ඉතා ඉහළින්ම සිදුවී ඇත. 2013 වර්ෂයේදී බෝට්ටු 123 ක් පමණ එනම් ඉතිහාසයේ වැඩිම බෝට්ටු ප්‍රමාණයක් රහසිගතව මිනිසුන් ප්‍රවාහනය සඳහා යොදාගෙන ඇත. මෙම කාලවකවානුව තුළ පැමිණිලිකරු විනය ආරක්ෂා හැටියට සේවය කර ඇත. ඒ අනුව පැමිණිලිකරු මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඇත. වෙලගෙදර නැමැති නිලධාරියා නාවික හමුදාවේ අනුග්‍රහයද සහිතව ඕස්ට්‍රේලියාවට හොරෙන් මිනිසුන් ප්‍රවාහනය කර විශාල වශයෙන් මුදල් අයකර ගන්නා බවට මෙම පරීක්ෂණවලදී හෙළිදරව් වී ඇත. මෙම කාලසීමාව තුළදී වෙලගෙදර නැමැති නිලධාරියා මගේ පවුලේ සාමාජිකයින් ඕස්ට්‍රේලියාවට රැගෙන යාම සඳහා නාවික හමුදාවේ අවසරය ඉල්ලා ඇති අතර ඔහුට එරෙහිව පැවැති පරීක්ෂණ හේතුවෙන් පරීක්ෂණ අවසන් වන තෙක් එවැනි අවසරයක් ලබා දී නොමැත. එලෙස අවසර නොලැබීම කරණ කොටගෙන මෙම වෙලගෙදර නැමැති නිලධාරියා නාවික හමුදාවෙන් පැන ගොස් ඔහුගේ පවුලේ සාමාජිකයින් ඔස්ට්‍රේලියාවට රැගෙන ගොස් ඇත. පසු ඉන්පසු නැවත ලංකාවට පැමිණ ඇති අතර නාවික හමුදාවෙන් එම අවස්ථාවේදී ඔහු අත්අඩංගුවට ගෙන ඇත. ඉන් පසුව පවත්වනු ලැබූ යුධ අධිකරණ පරීක්ෂණයෙන් වෙලගෙදර නිලධාරියා වරදකරු වී ඇති අතර ඔහුට දඬුවම් පමුණුවා ඇත. ඉන්පසුව ඔහුට ජනාධිපති සමාව ලැබීමෙන් පසුව පැමිණිලිකරුට එරෙහි නඩුවේ ප්‍රධාන සාක්ෂිකරු බවට පත්වී ඇත. ඒ අනුව ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරේ වධකාගාරයක්

පවත්වාගෙන යන බවට වෙලගෙදර නිලධාරියා ප්‍රකාශයක් ලබාදෙමින් ඒ සඳහා පැමිණිලිකරු සහ වසන්ත කරන්නාගොඩ මහතා වගකිවයුතු බවට කල්ඉකුත්වූ ප්‍රකාශ කර ඇත. ඉන්පසුව 2019 නොවැම්බර් 14 දින පැවති ජනාධිපතිවරණයට දින දෙකකට කලින් රාජ්‍ය අනුග්‍රහයෙන් විශ්‍රාම ගොස් නැවත ඕස්ට්‍රේලියාවේ පදිංචියට පිටත්ව ගොස් ඇත. කේ.සී. වෙලගෙදර විසින් 2013.07.29 වන දින ලබා දී ඇති ප්‍රකාශය පැ.29 වශයෙන්ද, 2016.09.23 වන දින ලබා දී ඇති ප්‍රකාශය පැ.30 වශයෙන්ද,2019.01.04 දින ලබා දී ඇති ප්‍රකාශය පැ.31 වශයෙන්ද, 2019.01.02 දින ලබා දී ඇති ප්‍රකාශය පැ.32 වශයෙන්ද, සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකර ඇත්තේ ඉහත නම් සඳහන් කළ එනම් කේ.සී.වෙලගෙදර, ට්‍රැවිස් සින්නයියා, සරෝජනී නාගනාදන් නොහොත් සරෝජනී පෙරේරා, සහ අශෝක මහේෂ් කුමාර යන පුද්ගලයින් 4 දෙනාගේ ප්‍රකාශ මත බවට පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය. ඒ අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ B 732/09 දරණ නඩුවට පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරයට පත්කර ඇත.

නාවික හමුදා නිලධාරීන් මේ අන්දමින් අත්අඩංගුවට ගැනීම පිළිබඳව දේශීය සහ විදේශීය යාන්ත්‍රනයක් ක්‍රියාත්මක වන බවත්, මෙය සැලැස්මකට සිදුවන බවත්, ඒ සඳහා අන්තර්ජාතික වශයෙන් හා ජාතික වශයෙන් කණ්ඩායම් දෙකක් සූදානම්ව සිටින බවත්, මේ සඳහා ක්‍රියාත්මක වන දේශීය කණ්ඩායම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් ලැබෙන බවත්, ඒ වෙනුවෙන් විදේශීය පුද්ගලයින්ට

සරණාගතභාවය ලබාදීමත් දේශපාලන රැකවරණය සහ ආරක්ෂාව ලබාදීම සිදුවන බවත් පැමිණිලිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් සඳහන් කළේය. අන්තර්ජාතික වශයෙන් 30/1 යෝජනාවලිය සම්මත කිරීමත් දේශීය වශයෙන් එකී යෝජනාවලියට සම අනුග්‍රාහකත්වය දැක්වීමට 2015.01.08 වන දින පිහිටවූ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් රජය එකඟවීමත් ඒ අනුව දේශීය වශයෙන් රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණය සකස් කිරීමට අවශ්‍ය පසුබිම සහ වටපිටාව සකස් කිරීමත්, කිසියම් විශේෂ පිරිසක් තෝරාගෙන හඳුනාගෙන ඔවුන් යුධ අපරාධ වලට සම්බන්ධ බවට චෝදනා කරමින් ඔවුන් සිරගත කර ඊළාම් රාජ්‍යයක් පිහිටුවීම සඳහා ගෙනයන සටන සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් ඒ සඳහා 2015-01-08 පිහිටවූ රාජ්‍ය යාන්ත්‍රණයේ ඉහළ නිලධාරීන් සහ සමහර උසස් හමුදා නිලධාරීන් ඊට අනුබල සහ අනුග්‍රහය දැක්වීමත් සිදුවී ඇති බවද පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය. යුද්ධයෙන් පරාද වීමෙන් පසුව ඊළාම්වාදීන් Trans National Government of Tamil Elam යනුවෙන් රාජ්‍යයක් ප්‍රකාශයට පත්කර, එහි අග්‍රාමාත්‍යවරයෙකු, ඇමැතිවරුන් සහ මන්ත්‍රීවරුන් පත් කරගෙන එම රාජ්‍යය සඳහා භූමියක් ලබාගැනීමට දැන් ඔවුන් සටන් වදින බවද ප්‍රකාශ කළේය . ඔවුන්ගේ රාජ්‍ය සඳහා භූමියක් ලබා ගැනීමේ සටනට 2002 - 2004 වර්ෂයේ පැවැති රනිල් වික්‍රමසිංහ මහතාගේ රජය අවධියේ දී සාම ගිවිසුමක් අත්සන් කිරීම මගින් ISGA (Interim Self-government Authority) පාලනය ඔවුන්ට ලබාදී තිබූ බවත්, ඒ අනුව ඔවුන්ට ඔවුන්ගේම භූමියක්, මුදල්, බැංකු, අධ්‍යාපන ආයතන, පරිපාලන ආයතන, ගුවන් පථ, අධිකරණ ආදී සියලු ආයතන පිහිටුවා තිබූ බවත්, ඔවුන්ට අඩුවකට තිබුණේ ගුවන් පථයක් සහ වරායන් පමණක් බවත්,

ඒ අනුව ඉරණමඩු ගුවන් පථයක් ඉදිකර මුලතිව් මුහුදු තීරයේ වරායක් ඉදිකිරීම සඳහා මුහුදු තීරයක් ලබාදෙන ලෙසට රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාගේ රජයෙන් ඊළාම්වාදීන් ඉල්ලා සිටි බවත් සඳහන් කළේය. මුලතිව් මුහුදු තීරයේ අනවසරයෙන් ආයුධ ගොඩබාන අවස්ථාවේදී ප්‍රහාර එල්ල නොකරන ලෙසට 2002 - 2004 වකවානුවේ පැවති රනිල් වික්‍රමසිංහ මහතාගේ රජය දැනුම් දුන් බවත්, එසේ වුවත් එම දැන්වීම නොසලකා අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා සහ පැමිණිලිකරුගේ ප්‍රධානත්වයෙන් පහරදීම සිදුකල බවත් සඳහන් කළේය. එම කාල වකවානුවේදී නැගෙනහිර ආඥාපති ලෙස අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා සේවය කළ බවත් පැමිණිලිකරු නැගෙනහිර මෙහෙයුම් නිලධාරී හැටියට සේවය කළ බවත් වැඩිදුරටත් සඳහන් කළේය.

ඊළාම් රාජ්‍යයක් පිහිටුවීමේ අරමුණට බාධකයක් වූ  වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව තමන් ගෙන් ප්‍රකාශයක් ලබාගැනීමට උත්සාහ කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා, සහකාර පොලිස් අධිකාරී බී.එස්.තිසේරා සහ පොලිස් අධිකාරි ශානි අබේසේකර, තම භාර්යාව සහ දියණියන් දෙදෙනාට බලපෑම් කරමින් ඔවුන් මගින් තමන්ගෙන් ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව ප්‍රකාශයක් ලබාගැනීමට බලවත් ප්‍රයත්නයක් දැරූ බව ද සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය.

පැමිණිලිකරු පාඨමාලාවක් හැදෑරීම සඳහා 2014 වර්ෂයේදී තම භාර්යාව සහ දියණියන් දෙදෙනා ද සමඟ ඇමරිකා එක්සත් ජනපදයේ බලා ගොස් ඇත. 2015-01-08 දෙන සිදුවූ රාජ්‍ය මාරුවක් සමග එම

රජය විසින් පැමිණිලිකරු ඇමරිකා එක්සත් ජනපදය බලා පිටත් වූයේ කුමන ආකාරයකටද යන්න විමර්ශනය කර ඇති අතර නාවික හමුදාපතිවරයා විසින් වාර්තාවක් සකස්කර සපයා ඇත . ඒ අනුව එවකට නාවික හමුදාපති අද්මිරාල් ජයන්ත පෙරේරා විසින් විමසීමක් කර සකස් කරන ලද වාර්තාවක් ආරක්ෂක ලේකම්වරයා වෙත යවා ඇත. එම විමර්ශන වාර්තාව සමග යවන ලද 2015.02.13 දිනැති ආවරණ ලිපිය පැ.33 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. පැ.33 ලිපියෙහි නාවික හමුදාපතිවරයා සඳහන් කර ඇත්තේ ආරක්ෂක මණ්ඩලයේ 2015 පෙබරවාරි 11 වන දින සාකච්ඡා කළ පරිදි නාවික හමුදාපතිවරයාට ලබාදුන් නියෝග අනුව ඩී.කේ.පී දසනායක නැවත ලංකාවට ගෙන්වීමට කටයුතු කරන බවට දැනුම් දෙන බවය. එසේම වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ ඩී.කේ.පී. දසනායකගෙන් කටඋත්තරයක් ලබා ගැනීමට අවශ්‍ය බවත්, ඇමරිකානු තානාපති කාර්යාලයටත් මේ පිළිබඳව දැනුම් දී ඇති බවත්, ඇමරිකානු බලධාරීන් සමඟ මේ පිළිබඳව සාකච්ඡා කර ඇති බවත්ය. නමුත් ආවරණ ලිපිය සමග යවන ලද විමර්ශන වාර්තාවේ පිටපතක් පැමිණිලිකරුගේ පෞද්ගලික ලිපිගොනුවේ අන්තර්ගතව නොමැත.

එසේම හිටපු නාවික හමුදාපති ජයන්ත පෙරේරා විසින් 2015 මාර්තු 11 වැනි දින ආරක්ෂක ලේකම්වරයා වෙත යවන ලද ලිපියක් පැ. 34 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලිපියෙහි පැමිණිලිකරු ආපසු ලංකාවට කැඳවීම පිළිබඳව විස්තර මෙන්ම මෙම පාඨමාලාව හැදෑරීම සඳහා පැමිණිලිකරුට අවස්ථාව තිබෙන බවට ඇමරිකානු තානාපති කාර්යාලය විසින් සිදුකළ දැන්වීමක් පිළිබඳවද සටහන් කර ඇත.

සරෝජිනී පෙරේරා නොහොත් සරෝජනී නාගනාදන් විසින් 2013 අප්‍රේල් 05 දින සිදුකරන ලද ඇයගේ හතරවන ප්‍රකාශය පැ. 35 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඇය පළමුවන වතාවට ප්‍රකාශයක් සිදුකර ඇත්තේ 2011 අප්‍රේල් මස 6 වන දිනදීය. මේ අනුව සරෝජිනී නාගනාදන් විසින් හතරවන ප්‍රකාශය සිදුකර ඇත්තේ හබයාස්කෝප්පුස් නඩුව පැවරීමෙන් පසුවය. ඊට පෙර සිදු කරනු ලැබූ ප්‍රකාශවල අන්තර්ගත නොවූ කරුණු පැ.35 දරණ ප්‍රකාශයෙහි අන්තර්ගත වෙයි. ඒ අනුව පළමුවන වතාවට සරෝජිනී පෙරේරා නොහොත් සරෝජනී නාගනාදන් විසින් පැමිණිලිකරුගේ නම පැ.35 ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 732/ 09 දරණ නඩුවේ පරීක්ෂණ කටයුතු පොලිස් පරීක්ෂක රංජිත් මුණසිංහ මහතා විසින් සිදුකරන ලදී. 2015-01-08 දින ආණ්ඩු පෙරළියත් සමඟ මෙම පරීක්ෂණ කටයුතු පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා වෙත භාර කර ඇත. මෙම කරුණු සනාථ කිරීම සඳහා 2014-07-22 දින ගොනු කරන ලද බී වාර්තාව පැ.36 වශයෙන්ද 2015-01-21 ගොනු ලද බී වාර්තාව පැ.37 වශයෙන්ද සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉහත සඳහන් බී 732/ 09 නඩුව ආරම්භ කර ඇත්තේ එවකට නාවික හමුදාපති වශයෙන් කටයුතු කළ අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා විසින් 2009 මැයි 28 වන දින ලිඛිතව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරව සිටි නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් පදනම් කරගෙනය. එම පැමිණිල්ල පැ.38 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ප්‍රසාද් චන්දන හෙට්ටිආරච්චි නැමැති නිලධාරියාට නේවි සම්පත් යන අන්වර්ථ නාමය ආරූඪ කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකර ඇත. මෙය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අසත්‍ය ප්‍රකාශ ගොනු කිරීම උදෙසා ක්‍රියා කළ හොඳම අවස්ථාවක් බවය. අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා විසින් සිදුකරන ලද පැ.38 දරණ පළමුවන පැමිණිල්ලේවත් නේවි සම්පත් නැමැති නමක් ඇතුළත්ව නොතිබුණි. මුල් පැමිණිල්ල සිදුකරන ලද්දේ ලුතිනන් කමාන්ඩර් සම්පත් මුණසිංහ නැමැත්තාට එරෙහිවය. සාක්ෂිකරු සඳහන් කළේ ලුතිනන් කමාන්ඩර් සම්පත් මුණසිංහ පසු කලෙක නේවි සම්පත් යන අනවර්ථ නාමයෙන් හඳුන්වනු ලැබූ බවයි. සැබෑ කරුණු එසේ වුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නේවි සම්පත් යන අන්වර්ථ නාමය චන්දන හෙට්ටිආරච්චි නැමැති නාවික නිළධාරියාට ආරූඪ කර ඇත.

පැමිණිලිකරු සඳහන් කළේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පරීක්ෂණයෙන් සත්‍ය කරුණු වෙනස් කරන්න ගත් උත්සාහයකට හොඳ උදාහරණයක් වන්නේ මෙම නේවි සම්පත් යනුවෙන් හඳුන්වන්නේ සම්පත් මුණසිංහ බව හොඳාකාරව දැන දැනම එම නම හෙට්ටිආරච්චි නැමැති නිලධාරියාට ආරූඪ කිරීමට දැරූ උත්සාහයය. අපරාධ බොහෝමයක් නේවි සම්පත් නමින් යොමුවී තිබූ බවත්, මෙම නේවි සම්පත් යන අන්වර්ථ නාමය සම්පත් මුණසිංහට යොදා තිබුණේ වී නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නේවි සම්පත් යන අන්වර්ථ නාමය හෙට්ටිආරච්චි නැමැති නිළධාරියාට ආරූඪ කර තිබීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනත් ගමනක් යාම සඳහා දරන ලද උත්සාහයක් බවත්ය.

පැමිණිලිකරු අත්අඩංගුවේ තබා ගත යුතු ආකාරය කෙසේ විය යුතුද යන්න සාකච්ඡා කරන්න දූරකථන සංවාදයක පටිගතකල හඬපටයක් ඉදිරිපත් කරන ලදී. හඬපටයේ දැක්වෙන මෙම සංවාදය සිදුවී ඇත්තේ 2015-01-08 පිහිටුවන ලද රජයේ අමාත්‍යවරයෙකු වූ රංජන් රාමනායක සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර අතරය. පැමිණිලිකරු වැලිසර නාවික රෝහලට ඇතුළත් කර සිටින අවස්ථාවේදී ඔහු රෝහලෙන් ඉවත් කර වැලිකඩ බන්ධනාගාරය වෙත ගෙනයායුතු බවට රන්ජන් රාමනායක අමාත්‍යවරයා සහ ශානි අබේසේකර අතර සාකච්ඡා වී ඇත. මේ කුමන්ත්‍රණය අනුව වැලිසර නාවික රෝහලෙන් ඉවත්කර තමන් වැලිකඩ බන්ධනාගාරයට ගෙන ගොස් ඇති බව සඳහන් කළේය. එම හඬපටයේ සඳහන් වන අන්දමට ශානි අබේසේකර විසින් පැමිණිලිකරු සමහර අවස්ථාවලදී හඳුන්වා ඇත්තේ හිහන්නා යන නාමයෙනි. මෙය, ශානි අබේසේකර, පැමිණිලිකරුට එරෙහිව ද්වේශසහගත ලෙස ක්‍රියා කර ඇති බවට හොඳින්ම පෙන්වන හඬ පටයකි. එසේම, රංජන් රාමනායක සහ දැනට ලංකාවෙන් බැහැරව ගොස් සිටින පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා අතර ඇති වූ දූරකථන සංවාදයක පටිගතකල හඬ පටයක් ද පැමිණිලිකරු ඉදිරිපත් කර ඇත. පටිගත කළ මෙම හඬ පට පැ.39 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර ඇතුළු පිරිසකට එරෙහිව පවරා තිබූ අංක SCFR 81/2011 දරණ මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ නඩුවෙහි නඩු තීන්දුවේ පිටපතක් පැ.40 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම නඩුවේ පෙත්සම්කරු ඕමත්ත මුදලිගේ දොන් ගාමිණී නැමැත්තෙකි.

නිශාන්ත සිල්වා සහ ශානි අබේසේකර ඇතුළු පිරිස් පෙත්සම්කාර ඕමන්ත මුදලිගේ දොන් ගාමිණී නැමැත්තාගේ මූලික අයිතිවාසිකම් කඩකර ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර ඇත. මෙම නඩුවේ කරුණු වලට අනුව ඉහත කී ඕමන්ත මුදලිගේ දොන් ගාමිණී නැමැති පුද්ගලයාව අත්තනෝමතික ලෙස නිශාන්ත සිල්වා සහ ශානි අබේසේකර ඇතුළු පිරිස විසින් අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන ඇත. පැමිණිලිකරු සඳහන් කළේ තමන්ට එරෙහිව ක්‍රියාකළ නිශාන්ත සිල්වා සහ ශානි අබේසේකර ඇතුළු පිරිස මේ අන්දමේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම වලට වරදකරුවන් වූ පිරිසක් බවය.

පැමිණිලිකරු සැකකරුවකු බවට පත් කර ඇති නඩුවේ තොරතුරු තුන්වන පාර්ශවයකට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ඇතුළු පිරිස විසින් ලබාදී ඇති බවට පැමිණිලිකරු සඳහන් කළේය. මෙම තොරතුරු ලබා දීම සිදුකර ඇත්තේ අතුරුදහන් වූ පුද්ගලයින් 11 දෙනාගෙන් අයෙකු වන ත්‍යාගරාජා ජෙගන් නැමැති පුද්ගලයාගේ සහෝදරියක් ලෙස පෙනී සිටි ජෙයිනි ත්‍යාගරාජා නැමැත්තියටය. ඇය එය මෙම තොරතුරු ජිනීවා මානව හිමිකම් සමුළුවට රැගෙන ගොස් භාරදී ඇත. එහිදී ඇය සඳහන් කර ඇත්තේ තමාගේ සහෝදරයා සුදුවැන් කණ්ඩායම් වලින් පැමිණි පිරිසක් විසින් පැහැරගත් බවත්, පැහැර ගැනීම සිදු කළේ ඩී.කේ.පී. දසනායක ඇතුළු කණ්ඩායම බවත්, ඔවුන් මෙහෙයවන ලද්දේ එවකට නාවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ සහ එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් බවත් පැමිණිලි කර ඇත. මෙම කරුණු මාධ්‍යවල පළ වීමත් සමගම එම අසත්‍ය තොරතුරු පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙසට පැමිණිලිකරු පොලිස්පතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත.

පැමිණිලිකරු විසින් පොලිස්පතිවරයා වෙත යවන ලද 2018 දෙසැම්බර් 11 වැනි දින දරන ලිපිය පැ.41 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ජෙයිනි ත්‍යාගරාජා විසින් මානව හිමිකම් සමුළුවට ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව පුවත්පත් වල වාර්තා පළ වී ඇත. එම පුවත්පත් වාර්තාද පැ.41 ලිපියට අමුණා පොලිස්පතිවරයා වෙත යවා ඇත .එම වාර්තාවල පිටපත් පැ.41(A) සහ පැ. 41 (B) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

මෙම නඩුවේ පරීක්ෂණ කටයුතු ඉදිරියට පවත්වාගෙන යන බවට වැඩිදුර වාර්තා මගින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර තිබියදී හිටි හැටියෙම පරීක්ෂණ කටයුතු අවසන් බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තාවක් ඉදිරිපත් කර ඇත. 2019 නොවැම්බර් 01 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බී වාර්තාවක් මගින් මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරමින් ත්‍රිකුණාමලයේ ගන් සයිට් නැමැති ස්ථානයේ වෝහාරික පරීක්ෂණයක් සිදු කිරීමට දින 10 ක කාල සීමාවක් අවශ්‍ය බවට පවසමින් වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2019 නොවැම්බර් මස 02 වන දින සිට 2019 නොවැම්බර් මස 10 වන දින දක්වා කාලසීමාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍යව තිබී ඇත. එම බී වාර්තාව පැ.42 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉහත ඉල්ලීම පරිදි දින 10 ක කාල සීමාව අවසන් වීමට ප්‍රථම 2019 නොවැම්බර් මස 6 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නැවත වරක් වාර්තාවක් මහේස්ත්‍රාත්

අධිකරණයට ඉදිරිපත් කර ඇත. එම බී වාර්තාව පැ.43 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. පැ.43 දරණ බී වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වී ඇත්තේ MP-5 ගිනි අවියක් පරික්ෂා කිරීම සඳහා අවශ්‍ය නියෝග ලබා ගැනීමය. 2019 නොවැම්බර් 11 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරනු ලැබූ පරීක්ෂණ කටයුතුවල සම්පිණ්ඩණයක් ඇතුළත් වාර්තාවක් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. ඒ වනවිටත් නියෝග ලබාගෙන සිදුකරගෙන යනු ලබන පරීක්ෂණ අවසන් බවට මෙම වාර්තාවෙන් මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර නොමැත. එම වාර්තාව පැ.44 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරමි. කරුණු එසේ වුවත්,ඉන්පසුව, එදිනම එනම් 2019 නොවැම්බර් මස 11 වන දින දීම තවත් බී වාර්තාවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. එම දෙවන බී වාර්තාව පැ.45 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම දෙවෙනි බී වාර්තාවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කර ඇත්තේ නඩුවේ පරීක්ෂණ කටයුතු අවසන් කරන බවය. නීතිපතිවරයා විසින් පරීක්ෂණ කටයුතු අවසන් කළ බවට පැ.45 බී වාර්තාවේ සඳහන් වෙයි. කරුණු මෙසේ සිදුවන්නේ 2019 නොවැම්බර් මස 16 වන දින පැවති ජනාධිපතිවරණයට දින පහකට පෙරය.

මෙම කාල සීමාවේ නීතිපතිවරයා ලෙස කටයුතු කර ඇත්තේ දප්පුල ද ලිවේරා මහතාය. පැමිණිලිකරු සම්බන්ද නඩුව මෙහෙයවීමේ කටයුතු සිදුකර ඇත්තේ නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ ජනක බණ්ඩාර මහතා ය. නීතිපති දෙපාර්තමේන්තු තුළ දී

මෙම නිලධාරීන් හැර තවත් නිලධාරීන් පැමිණිලිකරුගේ නඩුවට අදාළ ලිපිගොනු පිළිබඳව ක්‍රියා කර ඇත. මෙම නඩුව සම්බන්ධයෙන් මුලින්ම නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු භාර වී තිබී ඇත්තේ නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් ශවීන්ද්‍ර ප්‍රනාන්දු මහතාට ය. ඉන්පසුව සුහද ගම්ලත් මහතාද, හරිප්‍රියා ජයසුන්දර මහත්මියද, ඉන්පසුව ඩිලාන් රත්නායක මහතාද කටයුතු කර ඇත. ජනක බණ්ඩාර මහතාට මෙම නඩුවට අදාළ ලිපිගොනුව ලැබී ඇත්තේ ඉන් පසුවය. නඩුවේ පරීක්ෂණ කටයුතු වේගවත්ව වෙනත් දිශාවක් බලා ක්‍රියාත්මක වන්නේ නඩුවේ ලිපිගොනුව දෙපාර්තමේන්තුවේ රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ ජනක බණ්ඩාර මහතාට ලැබීමෙන් පසුවය.

2019.11.11 වන දින වන විට මෙම නඩුවේ පරීක්ෂණ කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව විසින් අවසන් කර ඇති බවට බී වාර්තාවක් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් වී ඇති බව පැමිණිලිකරු දැන සිටියේ නැත. 2019.11.11 වන දින නීතිපතිවරයා විසින් ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චය මණ්ඩලයක් පත්කරන ලෙසට අග්‍රවිනිශ්චකාරතුමාගෙන් ඉල්ලීමක් සිදුකර තිබෙන බවට පැමිණිලිකරු දැනගෙන සිටියේ නැත.

කෙසේ වෙතත් 2019 නොවැම්බර් 13 වන දින මහේස්ත්‍රාත් අධිකරණයේදී නඩුව කැඳවූ අවස්ථාවේදී රජයේ නීතිඥවරු පැමිණ වසන්ත කරන්නාගොඩ මහතා අධිකරණයට ඉදිරිපත් කිරීමට නියෝගයක් ඉල්ලා ඇති අතර ඊට අතිරේකව පැමිණිලිකරු ඇතුළුව දැනට සේවයේ යෙදී සිටින නාවික හමුදා නිලධාරීන් පස් දෙනෙකුගේ සේවය අත්හිටුවීමටත් ඉල්ලීමක් කර ඇත. එසේම, පැමිණිලිකරු ද ඇතුළුව 14 හෝ 15 දෙනෙකුට එරෙහිව අධිචෝදනා පත්‍ර

මහාධිකරණය වෙත ගොනු කර ඇති බවට ප්‍රදර්ශනය කරන ලෙසටද ඉල්ලා ඇත. 2019 නොවැම්බර් 11 වෙනි දින ඉදිරිපත් කරන ලද බී වාර්තාවෙහි ඇතුළත්වූ "නීතිපතිවරයාගේ උපදෙස් මත පරීක්ෂණ අවසන් කරන ලදී" යන කොටස 2019 නොවැම්බර් 13 වන දින ඉදිරිපත් කරන බී වාර්තාවෙහි ඇතුළත් කර නොමැත. මෙම කොටස වෙනුවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අවසන් කරන ලදී, යනුවෙන් සංශෝධනය කර ඉදිරිපත් කර ඇත. 2019 නොවැම්බර් 13 දින ඉදිරිපත් කරන ලද වාර්තාව බී වාර්තාව පැ.46 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

එසේම කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 732/09 නඩුවේ 2019.11.01 වන දින සිට 2019.11.27 දින දක්වා කාර්ය සටහන්, 2019 නොවැම්බර් 6 වන දින සටහන්, සහ 2019 නොවැම්බර් 11වැනි දින කාර්ය සටහන් වල පිටපත් පැ.47 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

2019.11.13 දින බී 732/09 නඩුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවනු ලැබූ අවස්ථාවේදී නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටින ලද නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා ඉල්ලීමක් කරමින් හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතාට 2019 නොවැම්බර් 14 දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙසට නියම කරමින් නොතීසියක් නිකුත් කරන ලෙසට ඉල්ලීමක් කර ඇත. එසේ වුවත් මහේස්ත්‍රාත්වරයා විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත.

පැමිණිලිකරු ද ඇතුළුව නාවික හමුදා නිලධාරීන් පස් දෙනෙකුගේ සේවය අත්හිටුවන ලෙසට නීතිපතිවරයාගේ අත්සනින් නාවික

හමුදාපතිවරයාට පිටපතක් සහිතව ආරක්ෂක ලේකම්වරයාට යවන ලද ලිපියට පිළිතුරු ලිපියක් නාවික හමුදාපතිවරයා විසින් යවමින්, එලෙස වැඩතහනකට ලක්කිරීමට නීතිමය ප්‍රතිපාදන නොමැති බවට ආරක්ෂක ලේකම්වරයාට දැනුම් දී ඇත. ඉහත සඳහන්, නාවික හමුදාපති විසින් ආරක්ෂක ලේකම් වෙත 2019.11.20 වැනි දිනින් යුතුව යවන ලද ලිපියේ පිටපතක් පැ.48 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පැ.48 ලිපියට පාදක කරගත් ලිපි වශයෙන් එහි සඳහන් කර ඇත්තේ නීතිපතිවරයාගේ 2019.11.11 වැනි දින අංක CR1/267/2012, සහ නීතිපතිවරයා ගේ 2019.11.23 වෙනි දින CR1/267/2012 ලිපිය සහ ආරක්ෂක ලේකම් විසින් 2019.11.15 යවා ඇති MOD/LEG/04/AVD/02 ලිපිය වේ.

මේ අන්දමින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති බී 732/09 දරණ නඩුවට අදාළ පරීක්ෂණ කටයුතු ලහිලහියේ අවසන් කිරීම කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බවත්, 2019 නොවැම්බර් 16 වන දින ජනාධිපතිවරණය පැවැත්වීමට නියම කර තිබීම ප්‍රධාන හේතුව බවත් පැමිණිලිකරු සඳහන් කළේය.

පැමිණිලිකරුට එරෙහිව පුවත්පත්වල පළ කරන ලද වාර්තා කිහිපයක් පැ.49 සිට පැ. 61 i, ii, iii, පැ. 62 සිට පැ. 71 i, ii, iii වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරුට එරෙහිව පරීක්ෂණ පැවැත්වීමේදී පක්ෂග්‍රාහීව කටයුතු කිරීම පිළිබඳව කරුණු දැක්වීමක් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත සිදු කර ඇත. එම

ලිඛිත කරුණු දැක්වීම පැ.72 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම මෙම පැ.72 දරණ ලිඛිත කරුණු දැක්වීමට පිළිතුරු වශයෙන් අගතියට පත් පාර්ශවයේ නීතිඥවරුන් වන ජේ.සී. වැලිඅමුණ සහ ඔහුගේ නීතිඥයන් කණ්ඩායම විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ලිඛිත කරුණු දැක්වීම පැ.73 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ජේ.සී. වැලිඅමුණ මහතා 2019 නොවැම්බර් 16 දින පැවති ජනාධිපතිවරණයට මාස තුනකට පමණ ප්‍රථමයෙන් ඕස්ට්‍රේලියාවේ මහ කොමසාරිස්වරයා ලෙසට පත්වීමක් ලැබ ඕස්ට්‍රේලියාව බලා පිටත්ව ගොස් ඇත. තානාපති වශයෙන් ජේ.සී. වැලිඅමුණ මහතා සිදුකරන ලද පත්වීම අවසන් කර ආපසු ලංකාවට කැඳවා ඇතත් ඔහු ආපසු ලංකාවට පැමිණී නැත. රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවන ලද දූෂණ විරෝධී කමිටුව නැමැති අග්‍රාමාත්‍ය කාර්යාලය හා සම්බන්ධ කමිටුවේ සාමාජිකයෙකු ලෙසටද ජේ.සී. වැලිඅමුණ මහතා ක්‍රියා කර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කටයුතු සාධාරණීකරනය කිරීම සඳහා අධිකරණය ඉදිරියේ කරුනු දැක්වීම සිදු කර ඇති ජේ.සී. වැලිඅමුණ මහතා මෙම කුමන්ත්‍රණයේ කොටස්කරුවකු බවට පැමිණිලිකරු සඳහන් කළේය.

මෙලෙස පැමිණිලිකරු දේශපාලන පලිගැනීමකට ලක් කිරීම සම්බන්ධයෙන් කරුණු සැලකිරීමක් 2019.07.25 වැනි දිනෙන් යුතුව එවකට විපක්ෂ නායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් වෙතද ඉදිරිපත් කර ඇත. එම ලිපියේ පිටපතක් පැ.74 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

එසේම පැමිණිලිකරු විසින් 2018-12-24 දාතමින් ලිපියක් සාක්ෂිකරුවන් හා වින්දිතයින් ආරක්ෂා කිරීම පිළිබඳ ජාතික අධිකාරියේ සභාපති ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා වෙත යවා ඇත .එම ලිපියේ පිටපතක් පැ.75 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. පැ.75 ලිපිය යැවීමට හේතු වී ඇති කරුණු මෙසේයි; පැමිණිලිකරුට එරෙහිව ඉහත අංක දරණ නඩුවේ ප්‍රධාන සාක්ෂිකරු ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන සිට ඇත්තේ ලුතිනන් කමාන්ඩර් කේ. සී. වෙලගෙදර සහ අලුත් ගෙදර උපුල් බණ්ඩාර යන නිලධාරීන් දෙදෙනාය. අද්මිරාල් වසන්ත කරන්නාගොඩ, අද්මිරාල් ජයනාත් කොළඹගේ, ලුතිනන් කමාන්ඩර් සුමිත් රණසිංහ සහ පැමිණිලිකරු විසින් මෙම සාක්ෂිකරුවන් දෙදෙනාට මරණීය තර්ජන එල්ල කර ඇති බවට කේ. සී. වෙලගෙදර සහ අලුත්ගෙදර උපුල් බණ්ඩාර යන නිලධාරීන් දෙදෙනා විසින් සිදුකරනු ලැබූ පැමිණිල්ලක් මත අධිකරණයට බී වාර්තාවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වන ලෙසට පැමිණිලිකරු ඇතුළු පිරිස විසින් ඉල්ලීමක් නාවික හමුදාපතිවරයාගෙන් සිදුකර ඇත. එසේම මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පැමිණිලිකරු ඇතුළු පිරිස ඉල්ලා ඇතත් එවැනි පරීක්ෂණයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොමැත. කණිෂ්ඨ නිලධාරීන් විසින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට එරෙහිව අසත්‍ය චෝදනා නැගීම බරපතල වරදක් වන හෙයින් ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙසට පැමිණිලිකරු ඇතුළු පිරිස විසින් නාවික හමුදාපතිවරයාගෙන් ඉල්ලා ඇත. එසේම වසන්ත කරන්නාගොඩ මහතා විසින් පැමිණිල්ලක් අග්‍රාමාත්‍යවරයා වෙත

ඉදිරිපත් කරමින් පරීක්ෂණයක් පවත්වන ලෙසට ඉල්ලීමක් කර ඇත. මේ සඳහා ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගෙන් සැදුම්ලත් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබේ .එකී පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂණය ආරම්භ කිරීමට සූදානම් වන අවස්ථාවේදී වෙලගෙදර නිලධාරියා නාවික හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අවසරය ඇතුව නිවාඩුවක් ගත කිරීම සඳහා අවුරුද්දක කාල සීමාවකට ඕස්ට්‍රේලියාවට ගොස් ඇත.

පැමිණිලිකරුට ඇප ලබාදීමට විරුද්ධ වීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම පැමිණිල්ල ද එක් හේතුවක් කරගෙන ඇත. අසත්‍ය පැමිණිල්ල පිළිබඳව පරීක්ෂණයක් නොපැවත්වුන බැවින් පැමිණිලිකරු ඇතුළු පිරිස මේ පිළිබඳව අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වන ලෙසට ඉල්ලමින් සාක්ෂිකරුවන් හා වින්දිතයින් ආරක්ෂා කිරීම පිළිබඳ ජාතික අධිකාරියේ සභාපතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත. 2016-10-10 දින නාවික හමුදාපති හමුදාපතිවරයා වෙත සිදු කරනු ලැබූ ඉහත සඳහන් ඉල්ලීම පැ.76 සහ පැ.77 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ඉහත සඳහන් අසත්‍යය චෝදනාව පරීක්ෂණයක් පවත්වන ලෙසට 2018 දෙසැම්බර් 12 වැනි දින දෙවන වතාවට ද ඉල්ලීමක් පැමිණිලිකරුවන් විසින් සිදුකර ඇත. එම ඉල්ලීම පැ.81 සහ පැ.82 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පැමිණිලිකරුට එරෙහිව පවරා ඇති නඩුවට සම්බන්ධ ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ පිහිටි ගන් සයිට් නැමැති ස්ථානය දෙවන ලෝක යුධ සමයේ නිර්මාණය කරන ලද්දකි. මෙම ස්ථාන සකස් කර තිබී ඇත්තේ අවි ගබඩා කිරීම සඳහාය. ඊළාම් යුද්ධය පැවති සමයේ දී

නාවික හමුදාවේ ආරක්ෂාව සඳහාත්, ගුවන්යානා වලට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම සඳහාත් මෙම ගන් සයිට් නැමැති ස්ථානය ප්‍රයෝජනයට ගෙන ඇත. මෙම ස්ථානය ගෝඨා කඳවුර යනුවෙන් හඳුන්වා දීම සිදු කර ඇත්තේ ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයෙකු වන සුරේෂ් ප්‍රේමචන්ද්‍ර නැමැති මන්ත්‍රීවරයා විසින් 2015 පෙබරවාරි මාසයේදී. පාර්ලිමේන්තුවේ දී සහ ඉන් පසු මාධ්‍ය සාකච්ඡාවක් මගින් ද ප්‍රකාශ කර ඇත්තේ, 2015-01-16 සහ 2015.02.28 අතර කාලයකදීය. 2015 පෙබරවාරි මාසය වන විටත් එල්.ටී.ටී.ඊ. සංවිධානයට අයත් පවුල් හත්සියයක් පමණ මෙම ස්ථානයේ රඳවාගෙන සිටින බවටත්, එබැවින් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් වහාම මෙම ස්ථානය පරීක්ෂාවට ලක් කළ යුතු බවටත්, මෙම පිරිස් බේරා ගත යුතු බවටත්, මෙම පිරිස රඳවා ඇත්තේ ගෝඨා කඳවුර නමින් හඳුන්වන වදකාගාරයේ බවටත් පළමු වරට ප්‍රකාශ කර ඇත. ඉන්පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා මහේස්ත්‍රාත් අධිකරණයට ගොස් ගෝඨා කඳවුර නමින් වධකාගාරයක් ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ ඇති බවටත්, එම ස්ථානය පරීක්ෂාවට ලක් කළ යුතු බවටත්, එම ස්ථානයේ භූගත සිරමැදිරියක් පවත්වාගෙන යන බවටත්, කරුණු ඉදිරිපත් කරමින් එම ස්ථානය පරීක්ෂාවට ලක් කිරීමට නියෝගයක් ලබා ගෙන ඇත. මෙහි ඇති සුවිශේෂී බව නම් මෙම අවස්ථාව වන විට ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ ගන් සයිට් නැමැති ප්‍රදේශය භාරව තිබී ඇත්තේ නාවික හා සාගරික විද්‍යා පීඨය යන කඳවුරටය. එම කඳවුරේ දෙවනියා ලෙසට සේවය කර ඇත්තේ ඉහත සඳහන් කේ.සී.වෙලගෙදරය. ඔහු පැමිණිලිකරුට එරෙහි නඩුවේ ප්‍රධාන සාක්ෂිකරුය. ඔහුගේ මඟ පෙන්වීම යටතේ අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා විසින් මෙම ගන් සයිට් නැමැති ස්ථානය පරීක්ෂා කර ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිත පිරිසක් විසින් ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ පිහිටි ගන් සයිට් නැමැති ස්ථානය පළමුවරට පරීක්ෂා කරනු ලබන්නේ 2015 අප්‍රේල් මාසයේ දී පමණය. ඉන් පසුව නැවත වරක් 2015 සැප්තැම්බර් මාසේයේදී ජිනීවා සමුළුවේ සාකච්ඡා වාර වලට සමගාමීව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිත පිරිසක් විසින් ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුරේ පිහිටි ගන් සයිට් නැමැති ස්ථානය පරීක්ෂණයට භාජනය කරනු ලැබ ඇත. මෙම නියෝජිත පිරිස ගන් සයිට් වෙත රැගෙන යාමට මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් ලබාගෙන ඇත. මෙම අවස්ථාවේදීද නාවික හමුදා කේ. සී. වෙලගෙදර නැමැති නිලධාරියා එම ස්ථානයේ දෙවනියා වශයෙන් සේවය කර ඇති අතර ඔහු මෙම පරීක්ෂණයට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව සහ පහසුකම් ලබාදී ඇත. මෙම පිරිස සිදුකළ පරීක්ෂණයේදී එම ස්ථානයේ තිබී මිනිස් ඇටකටු වලට සමාන ඇටකටු සොයාගත් බවට විශාල මාධ්‍ය ප්‍රචාරයක් ලබා දී ඇත. මෙම මිනිස් ඇටකටු සොයා ගැනීමේ සිද්ධියේ පුදුම සහගත තත්ත්වය නම්, සොයාගත්තා යැයි කියනු ලබන මිනිස් ඇටකටු ඊට පෙර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා සහ ඉන්පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිත පිරිස විසින් පළමුවරට පරීක්ෂා කරනු ලැබූ අවස්ථාවලදී හමු නොවීම ය. ඉන්පසුව නාවික හා සාගරික විද්‍යාපීඨයේ පාවිච්චි කරමින් තිබූ සුදු වෑන් රථයක්ද අත් අඩංගුවට ගෙන ඇත. මෙම කරුණු තුළින්

ගොඩනගන ලද ස්ථාවරය වූයේ සුදු වෑන් රථ මගින් පැහැර ගන්නා ලද මිනිසුන් ගෝඨා කඳවුර තුළ දී ඝාතනය කර ඇති බවත්, එසේ ඝාතනය කළ මිනිසුන්ගේ ඇටකටු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිත පිරිස ගෝඨා කඳවුර පරීක්ෂා කරන අවස්ථාවේ දී සොයාගත් බවත් මාධ්‍යය මගින් පුළුල් ප්‍රචාර ලබා දී හුවා දැක්වීමය. පැ.49 පැ.50 පැ.53 පැ.54 පැ.55 පැ. 56 පැ.57 පැ.71 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද මාධ්‍ය වාර්තා වල එම ප්‍රචාරයන් අන්තර්ගත වේ. ඇටකටු සොයාගැනීම පිළිබඳව බී වාර්තාවක් අධිකරණයට නොවැම්බර් 26 වන දින ඉදිරිපත් කර ඇත. 2015 නොවැම්බර් 26 දින ඉදිරිපත් කර ඇති එම බී වාර්තාව පැ.83 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඉන්පසුව නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයට බී වාර්තාවක් ඉදිරිපත් කරමින් කරුණු දක්වා ලබාගත් නියෝගයක් මත ඉහත සඳහන් කළ පරිදි සොයාගත් මිනිස් ඇටකටු රස පරීක්ෂක වෙත යැවීම සඳහා කටයුතු කර ඇත.

රස පරීක්ෂක විසින් මෙම ඇටකටු පරීක්ෂා කර වාර්තාවක් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. රස පරීක්ෂකගේ එම වාර්තාවට අනුව සොයාගන්නා ලද ඇට කටු මිනිස් ඇටකටු නොව සත්ත්ව ඇටකටු බවත්, ඒවා මීමින්නෙක් වැනි කුඩා සතෙකුගේ ඇටකටු බවටත් වාර්තා කර ඇත.

මීමින්නෙක් වැනි කුඩා සතුන්ගේ ඇටකටු මිනිස් ඇටකටු ලෙසට හඳුනාගෙන ඒවා අධිකරණ නියෝග මගින් රස පරීක්ෂක වෙත යැවීමට තරම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා සහ ඔහුගේ අධීක්ෂණය නිලධාරීන් මන්දබුද්ධික වූයේ කුමන හේතුවක් මත ද යන්න ඔවුන් හොඳින් දන්නා කරුණක් විය හැකිය.

මෙම කරුණු තුළින් පැමිණිලිකරුට සිදුවී ඇති අගතිය සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂියේ දී සඳහන් කළේ 2014 සිට 2015 අවසානය දක්වා ඇමරිකාවේ දී තමන්ට හැදෑරීමට ලැබුණු අගනා පාඨමාලාව හැදෑරීම තමන්ට අහිමි කළ බවය. තමන්ට එරෙහිව පනවා ඇති විදේශ ගමන් තහනම තවමත් ක්‍රියාත්මකව පවත්නා බවත්, විදේශ වැඩමුළු සඳහා අනිකුත් ජ්‍යෙෂ්ඨ නිළධාරීන් විදේශගත වන නමුත් තමන්ට එම අවස්ථාව අහිමි වන බවත්, තමන්ගේ සම තත්ත්වයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හොබවන තනතුරු රාශියක් තමන්ට අහිමි වී ඇති බවත්, තමන්ට හිමි උසස්වීම් තමන්ට අහිමි වී ගොස් ඇති බවත් පැමිණිලිකරු සඳහන් කළේය.මේ වන විට නිලධාරීන් හතළිස්දෙනෙකු පැමිණිලිකරු අභිබවා උසස්වීම් ලබා ගෙන ඇති බවද, හමුදාව වැනි ස්ථානයක මේ අන්දමින් උසස්වීම් නොලැබී රාජකාරියේ නිරත වීමට සිදුවීම ඉතාම ගැටලුකාරී තත්ත්වයක් බවත්, පැමිණිලිකරු සඳහන් කර ඇත. මේ අන්දමින් උසස්වීම් නොලැබීම කරණ කොටගෙන තමන් සේවයෙන් විශ්‍රාම ගැන්වීම අත්හිටුවා ගැනීම සඳහා ජනාධිපතිතුමාගෙන් නිතර නිතර සේවා දිගුවක් ලබා ගැනීමට සිදු වූ බවත්, තමන්ට රියාර් අද්මිරාල් නිලයට උසස්වීම් නොලැබෙන බවත්, දිගින් දිගටම කරුණු කියාපෑමේ ප්‍රතිඵලයක් වශයෙන් 2019 වර්ෂයේදී එවකට සිටි ජනාධිපතිතුමා පැමිණිලිකරුගේ උසස්වීම් ලබාදීම නිර්දේශ කළ නමුත් තමන්ට උසස්වීම් නොලැබුණු බවත්, මෙම වසරේ ජනවාරි 13 වැනි දින තාවකාලිකව තමන්ට රියාර් අද්මිරාල්ධූරය ලැබුණ බවත් වැඩිදුරටත් සඳහන් කළේය. නිසි කලට වේලාවට තමන්ට රියාර් අද්මිරාල් ධූරය ලැබුනේ නම් දැනට සේවයේ සිටින රියාර් අද්මිරාල්වරුන් පහළොස් දෙනා අතරේ ඉහළ ස්ථානයක සිටීමට තමන්ට හැකියාව තිබුණු බවද පැමිණිලිකරු සඳහන් කළේය.

පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් විමර්ශනය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකරුට ලැබිය යුතු උසස්වීම් ලබාදෙන ලෙසට මානව හිමිකම් කොමිෂන් සභාව නිර්දේශ කර ඇති නමුත් ආරක්ෂක අමාත්‍යාංශය නීතිපති දෙපාර්තමේන්තුව විමසමින් උසස්වීම් ලබාදීම ප්‍රමාද කර ඇත. සංහිදියා යාන්ත්‍රණය යටතේ පිහිටුවන ලද අතුරුදන් කිරීමේ කමිටුව විසින් සිදුකරනු ලැබූ නිර්දේශයන් අනුව චෝදනා ලත් නිලධාරීන්ට උසස්වීම් ලබාදීම සිදු නොකළ හැකිය යන ස්ථාවරයක නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රියා කිරීම හේතුකොටගෙන පැමිණිලිකරුට උසස්වීම් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව බාධාවක් වී තිබී ඇත. අතුරුදන්වූවන්ගේ කාර්යාලයේ සභාපති සාලිය පීරිස් මහතා විසින් අත්සන් කර ජනාධිපතිතුමා වෙත යවන ලද ලිපියකින් පැමිණිලිකරුට ලැබිය යුතු උසස්වීම් අත්හිටුවන ලෙසට දැනුම් දීමක් සිදුකර ඇත. එම ලිපිය ජනාධිපති කාර්යාලයෙන් ලබාගෙන ඉදිරිපත් කිරීමට හැකියාව ඇති බවද පැමිණිලිකරු සඳහන් කළේය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලිකරු ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පැ.84 වශයෙන්ද, එම කොමිෂන් සභාව විසින් පැමිණිලිකරුගේ පැමිණිල්ල ලැබුණු බවට සිදුකළ දැනුම්දීම පැ.85 වශයෙන්ද, පැමිණිලිකරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ පැ.86 වශයෙන්ද, නාවික හමුදාවේ නිලධාරීන් උසස් කිරීමේ දී අදාළ වන්නාවූ රෙගුලාසි පැ.87 වශයෙන්ද, කඩිනම් උසස්වීම් ලබාදීමට අදාළ වන්නාවූ ලේඛනය පැ.88 වශයෙන්ද, අතුරුදන්වූවන්ගේ කාර්යාලය විසින් 2018 අගෝස්තු මස පිළියෙල කරන ලද වාර්තාවේ පිටපත පැ.89 වශයෙන්ද සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පැ.89 දරණ වාර්තාවේ පිටු අංක 16හි කේ අක්ෂරය යටතේ නිර්දේශ කර ඇත්තේ චෝදනාවන්ට ලක්වූවන්ට උසස්වීම්, මාරුවීම් සහ වැදගත් තනතුරු ලබාදීම අත්හිටුවිය යුතු බවය.

අතුරුදහන්වූවන්ගේ කාර්යාලයය office on missing persons පිහිටුවා ඇත්තේ 2016 අංක 14 දරණ පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද පනත මගිනි. එම පනතේ විධිවිධාන වලට අනුව ලංකාවේ ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ ස්ථානමාරුවීම්, උසස්වීම් සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් බලපෑම් කිරීමට හෝ ඔවුන්ගේ උපදෙස් ශ්‍රී ලංකා රජයට ලබාදීමට එම පනත තුළින් බලයක් ලබා දී නොමැත. එසේ වුවත් අතුරුදහන්වූවන්ගේ කාර්යාලය අතුරුදහන්වූවන් සෙවීමේ කාර්ය පසෙක තබා හමුදාවේ සිටින නිලධාරීන්ගේ උසස්වීම් සඳහා කෙලින්ම මැදිහත්වීමක් සිදුකර ඇති බව අතුරුදහන්වූවන්ගේ කාර්යාලයේ සභාපති සාලිය පීරිස් මහතා විසින් යවා ඇති ලිපියෙන් මනාව පැහැදිලි වේ.

2018 අප්‍රේල් මස 24 වැනි දින ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේදී විදේශ කටයුතු අමාත්‍ය රංජිත් මද්දුමබණ්ඩාර අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමක දී සිදු වූ සිදුවීමක් මාධ්‍ය වාර්තා ඉදිරිපත් කරමින් පැමිණිලිකරු විස්තර කර ඇත. එවකට නාවික හමුදාපති වයිස් අද්මිරාල් සිරිමෙවන් රණසිංහ මහතා හදිසියේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට 2018 අප්‍රේල් මස 24 දින කැඳවා ඇත. නාවික හමුදාපතිවරයා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට යනවිට අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර, නීතිඥ ජේ.සී. වැලිඅමුණ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර රැස් වී සිට ඇත. නාවික හමුදාපතිවරයා මෙම පිරිස ඉදිරියට ගිය පසු ඔවුන්

නාවික හමුදාපතිවරයාගෙන් ප්‍රශ්න කරමින් යෝෂිත රාජපක්ෂට නඩු පැවරුවේ නැත්තේ මන්ද? ඩී. කේ. පී. දසනායක නාවික හමුදාවේ රාජකාරිවලින් පහ කර නොදැම්මේ මන්ද? සේවය අත්හිටෙව්වේ නැත්තෙ මන්ද? වැනි කාරණා ප්‍රශ්නකර ඇත. එම සාකච්ඡාව අවසන් වීමෙන් පසුව නාවික හමුදාපතිවරයා විසින් පැමිණිලිකරු කැඳවා ඔහුට සාකච්ඡාවට භාජනය වූ කරුණු සඳහන් කරමින් පැමිණිලිකරු සේවය කළ ස්ථානයෙන් වෙනත් ස්ථානයකට මාරු කර ඇත. ඒ අනුව පැමිණිලිකරු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හමුදා සම්බන්ධීකාරක ලෙසට සේවා ස්ථාන මාරු කර ඇත. පැමිණිලිකරු වසර දෙකක් පමණ එම ස්ථානයේ සේවය කර ඇත. ඉහත සඳහන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ පැවැති සාකච්ඡාව පිළිබඳව මාධ්‍ය වාර්තාවක් 2018 අප්‍රේල් 30 වන දින The Island පුවත්පතේ පළ වී ඇත. එම වාර්තාව පැ.90 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ජනාධිපති නීතිඥ ජේ.සී. වැලිඅමුණ මහතා කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිලිකරු සහ අනිකුත් විත්තිකරුවන්ට එරෙහිව පැවති නඩුවේදී අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි ඇත. එලෙස අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීමින්ම රජයේ ඇමැතිවරු සමග ඉහත සඳහන් සාකච්ඡාවට සහභාගීවී පැමිණිලිකරු ස්ථාන මාරු කර යැවීමටද ක්‍රියා කර ඇත.

පැමිණිලිකරුද 2014 සැප්තැම්බර් 14 වැනි දින ඇමරිකාවට යාමට ප්‍රථම ඔහු පිළිබඳව සකස් කරන ලද වාර්තාවක් පරිශීලනය කිරීමෙන් අනතුරුව ඇමරිකාවට යාමට වීසා ලබාදී ඇත. මෙම කාලසීමාවේදී ට්‍රැවිස් සින්නයියා මහතා ඇමරිකානු තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක හැටියට සේවය කර ඇත. සින්නයියා හමුදා සේවයෙන්

ඉවත් වී ඇමරිකානු තානාපති කාර්යාලයට සම්බන්ධවී ඇමෙරිකානු රජයෙන් පඩි ලබාගන්නා නිලධාරියෙක් ලෙසට තානාපති කාර්යාලයෙහි සේවය කර ඇත. පැමිණිලිකරුට විරුද්ධව ක්‍රියා කිරීමට ට්‍රැවිස් සින්නයියාට අවශ්‍යතාවය තිබුණේ නම් තානාපති කාර්යාලයේ සිට ඔහුට පැමිණිලිකරු ඇමරිකාවට යන ගමන වළක්වාලීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට හැකියාව තිබුණු බව පැමිණිලිකරු සඳහන් කළේය. නමුත් පැමිණිලිකරුට එරෙහිව ට්‍රැවිස් සින්නයියා ක්‍රියා නොකළේ ඔහුට එවැනි අවශ්‍යතාවක් නොතිබුණු බැවින් බවත්, නමුත් පසු අවස්ථාවකදී සින්නයියා ඔහුට එරෙහිව කටයුතු කරන ලද්දේ වෙනත් පුද්ගලයින්ගේ අවශ්‍යතාවයක් උදෙසා විය හැකි බවටත් වැඩිදුරටත් සඳහන් කළේය. මේ සඳහා හොඳම උදාහරණය ඔහු පැමිණිලිකරුට එරෙහිව කට උත්තරයක් ලබා දීමෙන් දින විසිපහකට පසු නාවික හමුදාපතිවරයා වශයෙන් පත්වීමක් ලබාගැනීම බවද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය.

පැමිණිලිකරුගේ භාර්යාව වන සුදිරික්කු හැන්නැදිගේ චන්ද්‍රිකා සාක්ෂි දෙමින් වැලිසර නාවික හමුදා රෝහලේ දී තමන් මුහුණ පෑ සිද්ධිය විස්තර කර ඇත. ඇයගේ ස්වාමි පුරුෂයා වන පැමිණිලිකරු වැලිසර නාවික රෝහලේ රෝහල් ගතව සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන ඇත. 2017 ජුනි මාසයේ දී මෙම සිද්ධිය සිදුවී ඇත. තම ස්වාමිපුරුෂයා අත්අඩංගුවට ගැනීම පිළිබඳව ප්‍රවෘත්තිය ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශනයකින් දැනගැනීමෙන් අනතුරුව ඇය තම බාල දියණිය ද රැගෙන වැලිසර නාවික රෝහලට ගොස් ඇත. වැලිසර නාවික රෝහල් කාමරයේ සිටි ඇයගේ පුරුෂයා බැලීමට එම අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ

නිලධාරීන් ඇයට ඉඩ දී නොමැත. අපේ නේවි එකේ කට්ටිය ඉන්නවා තවත් කට්ටිය ඉන්නවා. යන්න දෙන්න බැහැ යනුවෙන් ඔවුන් ඇයට පවසා ඇත. මට මගේ මහත්තයා ඉන්න තැනට දරුවෝ දෙන්නත් එක්ක යන්න ඕනෑ යනුවෙන් ඇය පවසා ඇතත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් ඒ සඳහා ඇයට ඉඩ දී නොමැත. ඇය දියනියන් සමග රෝහල් කාමරයේ ඉදිරිපස සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ඇයව මුණ ගැසී කතාබස් කර ඇත. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා රාජකාරි හැඳුනුම්පත පෙන්වා ඇයට කථා කළ බැවින් ඇය සමග කතා කරන්නෙ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා බවට දැන ගෙන ඇත. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සහ පැමිණිලිකරුගේ බිරිඳ අතර සිදු වූ කතාබහ පිළිබඳව සාක්ෂි දෙමින් ඇය මෙසේ ප්‍රකාශ කර ඇත. (උපුටා දැක්වීම: 20.03.03 දින සටහන් 109, 110 පිටු)

> "දරුවොත් එක්ක අඬඅඬා ඉන්දැද්දි නිශාන්ත සිල්වා මම ළඟට ඇවිල්ල කිව්වා මැඩම්, මැඩම්ට පුළුවන් මේක වෙනස් කරන්න, සර්ට කියන්න මේකට සර්ව සම්බන්ධ කරපු අයගේ නම් කියන්න කියලා. ඊට පස්සේ අපේ සර්ට මෙහෙම කරදරයක් නැහැ. බබාලාට මෙහෙම දුක් වෙන්නත් ඕන නැහැ කියලා. ඊට පස්සේ මම ඇහුවා ඔයාලා කා ගැනද කියන්න, කියන්නේ කියලා. එතකොට කිව්වා මැඩම්, මේක ගෝඨාභය රාජපක්ෂ කියලා, කරන්නාගොඩ, සර්ට කියලා, සර් මේක කළා කියන්න කියලා තමයි කියන්න ඕන එතකොට ප්‍රශ්නය ඉවරයි කියලා. එතකොට මෙහෙම දුක් වෙන්න ඕන නැහැ . ඊට පස්සේ මම ඇහුවා නිශාන්ත ඔයා මොනවද මේ කියන්නේ, මගේ

මහත්තයා එහෙම පාවලා දෙන කෙනෙක් නෙවෙයි, බොරු කතා කියන එක්කෙනෙක් නෙවෙයි ඔයා කියන්නේ මගේ මහත්තයාට බොරු කියන්න කියලද කියන්නෙ කියලා මම නිශාන්තගෙන් ඇහුවා. නිශාන්ත කිව්වා නෑ මැඩම් ඔයාලා දුක් විඳිනවා බලන්න මටත් හරි දුකයි. මටත් ගැහැණු ලමයි තුන් දෙනෙක් ඉන්නවා. ඉතිං මෙච්චර කරදර දරුවන්ට දෙන්න ඕනේ නැහැනේ සර් ඇත්ත කිව්වා නම් කියලා. ඊට පස්සේ මම ඇහුවා නිශාන්ත ඔය ඇත්ත කියන්න කියන්නේ ඔයා කියන ඇත්තද කියලා. අපි කියන එකද ඇත්ත නැත්නම් ඔයා කියන එකද ඇත්ත කියල. ඊට පස්සේ මැඩම් මේක තේරුම් ගන්නේ නැහැනේ කිව්වට කිව්වා. ඊට පස්සේ මට තව ටිකක් තරහ ගිහිල්ලා මම කිව්වා සාමාන්‍යයෙන් නිශාන්ත හමුදාවල ඉන්නේ බොහොම නීතිගරුක කට්ටිය එක් එක්කෙනා කියන දේවල් කියන්න ලෑස්ති වෙච්ච කට්ටියක් නෙවෙයි කියලා. ඊට පස්සේ මැඩම්ට කතා කරලා වැඩක් නැහැ කියලා නිශාන්ත ගියා" (උපුටා ගැනීම අවසන්)

ඇය සඳහන් කළේ මානසිකව දැඩි ව්‍යාකූල තත්ත්වයකට පත්ව සිටින අවස්ථාවක නිශාන්ත සිල්වා පැමිණ මෙම යෝජනාව කළ බවය. මෙම යෝජනාව තමන් පිළි නොගැනීමත් ඒ අනුව ක්‍රියාකරමින් තමන්ගේ පුරුෂයා විසින් නිශාන්ත සිල්වාට අවශ්‍ය පරිදි කටඋත්තරයක් නොදීමත් නිසා අවසානයේ සිදුවූයේ තමන්ගේ පුරුෂයා සිරභාරයට පත් වීම බව සාක්ෂිකාරිය වැඩිදුරටත් සඳහන් කළේය. මේ හේතුවෙන් තමන්ට හා තම දියණියන් දෙදෙනාට සිදු වූ දුක්ගැහැට සම්බන්ධයෙන් 2017 ජූලි මස 18 වන දින එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

මහතා වෙත ලිපියක් මගින් තම දුක්ගැනවිලි ඉදිරිපත් කළ බවද ඇය සඳහන් කළාය. මෙම ලිපිය පැ.91 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එසේම 2017 අගෝස්තු මස 02 දින එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙතද ලිඛිතව දැනුම්දීමක් කර ඇත. එම ලිපිය පැ.92 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එසේම 2017.08.08 දින දරණ ලිපිය මගින් එවකට අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා වෙත ද  දුක්ගැනවිල්ල දැනුම් දී ඇත. එම ලිපිය  පැ.93 වශයෙන් ඉදිරිපත් කරන ලදී. එසේම  දෙවන වරටත්  මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත  2017 සැප්තැම්බර් මස 01  දිනින් යුතුව ඇය දුක් ගැනවිල්ල ඉදිරිපත් කර ඇත. එම ලිපිය පැ.94 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත. එසේම තම පුරුෂයාට අධිකරණය මගින් ඇප ලබාදීම ප්‍රමාද වීම කරණ කොටගෙන නැවත වතාවක් ඇයගේ දුක්ගැනවිල්ලක් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. 2017 නොවැම්බර් මස 07 දින දරණ එම ලිපිය පැ.95 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. 2018 දෙසැම්බර් මස 07 දින ශ්‍රී ලංකා  මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමිය වෙත සිදුකරනු ලැබූ කරුණු දැක්වීම පැ.96 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරගෙන යනු ලබන පරීක්ෂණ ස්වාධීන වෙනත් ස්වාධීන කණ්ඩායමකට පැවරීම සම්බන්ධ පැමිණිල්ල  2018-12-10 දින දරණ ලිපිය පැ. 98 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලිපිය ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබුණු බව සනාථ කරමින් කොමිෂන් සභාව විසින් සාක්ෂිකාරිය වෙත එවන ලද 2018 ජනවාරි 12 වන දින දරණ ලිපිය පැ.97 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. කණ්ඩායමකට පවරන ලෙසට ඉල්ලමින් ජාතික පොලිස්

කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තම ස්වාමිපුරුෂයාට එරෙහිව සිදු කරනු ලබන පරීක්ෂණ පක්ෂග්‍රාහීව සිදුකිරීම සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 24 වන දින ලංකාදීප පුවත්පත්ට දෙනු ලැබූ සාකච්ඡාවක් පැ.99 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැවසුවේ යැයි පවසමින් රූපවාහිනිය සහ පුවත්පත් බොහෝ විට තම පුරුෂයාට එරෙහිව බොරු චෝදනා අඩංගු තොරතුරු වාර්තා පළ කළ බවත්, පොලිස් මාධ්‍ය ප්‍රකාශ වලින් ද එවැනිම බොරු ප්‍රකාශ සිදුකළ බවත්, ඒ හේතුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පක්ෂග්‍රාහීව කටයුතු කරන බවට තමන් මතයකට එළඹුන බවත් ඇය වැඩිදුරටත් සඳහන් කළාය.

පැමිණිලිකරුගේ දියණිය වන ප්‍රතිභා මංජරී යශෝධරා දසනායක සාක්ෂි දෙමින් සඳහන් කළේ නාවික හමුදාවේ සේවය කරමින් සිටි තම පියා 2017 ජූලි 12 දින අත්අඩංගුවට ගනු ලැබූ බවය. එදින සවස් වරුවේ මෙම ප්‍රවෘත්තිය ඇසීමෙන් පසුව ඇය වැලිසර නාවික රෝහල වෙත ගොස් ඇත. සවස 6.30 ට 7.00 ට පමණ ඇය නාවික රෝහලට යන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ඇතුළු නිලධාරීන් විසින් තම පියාගෙන් කටඋත්තරයක් ලබා ගනිමින් සිටි බව ඇය සඳහන් කළේය. ඇය තම පියා සිටි ස්ථානයට යන විට ඇගේ මව් එම ස්ථානයට පැමිණ සිට නොමැත. ඇය සඳහන් කළේ පවුලේ සාමාජිකයන්ගෙන් එම ස්ථානයට පළමුවෙන්ම ගිය පුද්ගලයා තමන් බවය.

සාක්ෂිකාරිය වැලිසර නාවික රෝහලට ගොස් තම පියා නැවතී සිටි කාමරයට ගොස් ඇත. ඒ අවස්ථාවේදී කාමරය තුළට අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු පැමිණ ඇති අතර එසේ පැමිණියේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා යනුවෙන් සාක්ෂිකාරිය ගේ පියා, පැමිණි පුද්ගලයාව සාක්ෂිකාරියට හඳුන්වා දී ඇත. සාක්ෂිකාරිය වැලිසර නාවික රෝහලට ගිය පසුව ඇයගේ මව සහ නැගණිය ද රෝහලට පැමිණ ඇත. ඔවුන් තිදෙනා පැමිණිලිකරු රඳවා සිටි කාමරයෙන් පිට රැඳී සිටින අවස්ථාවේදී ඒ අසලට පැමිණි පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ඔවුන් තිදෙනා කැඳවා ඇයගේ මවට ප්‍රකාශ කළ කරුණු ඇය සාක්ෂියේ දී මෙසේ සඳහන් කර ඇත. (උපුටා ගැනීම - 2020.03.03- පි/අ 124)

"එයා නේවි කොරිඩෝ එකේ පැත්තකට අපි අඩගහලා අම්මවයි මාවයි නංගිවයි, අම්මාට කිව්වා, මෙහෙම තාත්තාව ගත්ත කාරණාව ගැන සඳහන් කරලා, තාත්තාව රජයේ සාක්ෂිකාරයෙක් කරන්න, තාත්තාට ඉහල අද්මිරාල් කරන්නාගොඩගෙන් සහ ගෝඨාභය රාජපක්ෂ හිටපු ආරක්ෂක ලේකම්තුමාගෙන් අනුබල ලැබිච්චි බව සඳහන් කරන්න, කියලා." (උපුටා ගැනීම අවසන්)

සාක්ෂිකාරිය සඳහන් කළේ තමන්ගේ මව නිශාන්ත සිල්වාට එම අවස්ථාවේදී බැන්න බවත් ඔහු සිදු කළ යෝජනාව පරිදි තමන්ගේ පියා කටඋත්තරයක් නොදුන් බවත් ඉන් පසුව තම පියාට මාස හයක පමණ කාලයක් සිරගතව සිටීමට සිදු වූ බවත්ය. යෝජනාවේ බරපතළකම එම අවස්ථාවේදී තමන්ට නොතේරුන බවත් නමුත් ඉන් පසුව සිදු වූ දේවල් අනුව යෝජනාවේ බරපතළකම තමන්ට තේරුම් ගිය බවත් ඇය වැඩිදුරටත් සඳහන් කළේය. ඒ පිළිබඳව ඇය තම

සාක්ෂියේ දී මෙසේ සඳහන් කර ඇත. (උපුටා ගැනීම - 2020.03.03.- පි/අ 125/126)

"වෛද්‍ය උපදෙස් මත තමයි තාත්තා නාවික රෝහලේ සිටියේ. ඊට පස්සේ තාත්තා නාවික රෝහලෙනුත් ඉවත් කරලා බන්ධනාගාර රෝහල වෙත දානවා. ඒ අවස්ථාවේදීවත් අපි ඒ අදහස වෙනස් කරයි කියන බලාපොරොත්තුවෙන් හිටියේ සහ අපි එවකට සිටිය ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්තයාව හම්බවෙන්න යනවා. ඔහුත් පිළිගන්තා මේකෙදි තාත්තා නිර්දෝෂී කියලා අපි ඉස්සරහම. එත් කරන්න පුළුවන් දෙයක් නැහැ කියලා එතුමා සඳහන් කරනවා. ජනාධිපතිතුමාට කරන්න පුළුවන් දෙයක් නැත්නම් මොකක්ද මේ රටේ තියන නීතිය කියලා අපට හිතෙනවා. එතුමා අපිට පොරොන්දු වෙනවා එතුමා රට ගිහින් ඇවිල්ලා තාත්තාට ඇප ලබා දෙනවා කියලා. ඒ ඇවිල්ලා මටයි, අම්මාටයි දිනයක් දෙනවා ඇවිල්ලා හම්බවෙන්න කියලා. අපි ඒ දවසට ගියාම එතුමා එතන තියෙන අනිත් දොරෙන් යනවා. ඒක එහෙම එතුමා දිගටම කරනවා. මම හිතන්නේ මමයි අම්මයි කීප අවස්ථාවක්ම යනවා. ගිහිල්ලා අපිට හම්බ වෙන්නෙ තව එක සැරයක්. ඒ කතා කරන්නේ තාත්තාට ඇප දෙන්න සූදානම් වුණාට පස්සේ. මොකද ඒ අතරතුර කාලයේ කීප වතාවක්ම ඇප ලබා ගන්න බැරුව යනවා. විනිසුරුතුමා එන්නෙ නැතුව සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයා එන්නේ නැතුව. එන දවසෙත් එක දවසක් ඇවිල්ලා කියනවා එයා අලුත් නිසා මේක පරිශීලනය කරන්න මාස 2 හෝ 3ක කාලයක් ලබා දෙන්න

කියලා. එහෙම වගේ ඉතා විහිළු කාරණා නිසා ඒක ඒ විදිහට කල් යනවා." (උපුටා ගැනීම අවසන්)

ඉන් පසුව සාක්ෂිකාරිය එක්සත් ජාතීන්ගේ සංවිධානය human rights commission එකේ arbitrators ලා තුන්දෙනෙකු හමුවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට උත්සාහ දරා ඇත. ඒ සම්බන්ධව ඇය සාක්ෂියේදී ප්‍රකාශ කල කරුනු පහත උපුටා දක්වා ඇත. (2020.03.03- පි/අ 126/127/128)

"මම හිතන්නේ සැප්තැම්බර් ඔක්තෝබර් අතරතුර කාලය තුළ, මට නිශ්චිතවම කාලය මතක නැහැ. 2017 සැප්තැම්බර් හෝ ඔක්තෝම්බර් කාලයේදී. මුලින්ම ඒක අපි දැනගත්ත ගමන්ම මමයි අම්මයි දෙන්නම එකතුවෙලා අපි එයාලාට කෝල් කරනවා. කෝල් කලාම එයාලා කියනවා ඊමේල් එකක් දාන්න කියනවා අවශ්‍ය කාරණා සඳහන් කරලා .ඒ අනුව ඒ කට්ටිය කියපු නියමිත පටිපාටිය අනුව ඊමේල් එකක් දානවා. එයාල එකටත් රෙස්පොන්ඩ් කරන්නේ නැහැ. ඊට පස්සේ අපිම අන්තිම දවසට ගිහින් හැන්ඩ්ඕවර් කරන්න පුළුවන් කියලා දැනගන්න හම්බ වෙනවා යූ එන් එකේ වැඩ කරන කෙනෙක්ගෙන් සහ මාධ්‍ය නියෝජිතයෙක් ගෙන්. ඒ අනුව අපි යනවා අවසන් දවසට එයාලගේ මාධ්‍ය සාකච්ඡාවට. ඒ කට්ටිය අපිව හම්බවෙන්න ප්‍රතික්ෂේප කරලා. ඒ කියන්නේ එතන ඉන්න යූ එන් එකේ කට්ටිය මගෙන් අහනවා මම මුලින්ම පැමිණිල්ලක් කරන්න ආවා කිව්වම රිසෙප්ෂන් එකේ ඉන්න ගර්ල් දෙනවා කතා කරන්න තව කෙනෙකුට එයාට වඩා හයරැන්ක් එකෙන් වැඩි කෙනෙකුට. එයා ඇවිල්ලා මගෙන්

අහනවා ඔයා එල්.ටී.ටී.ඊ. පැමිණිල්ලක්ද කරන්න ද ආවේ කියලා. නෑ එල්.ටී.ටී.ඊ. පැමිණිල්ලක් නොවෙයි මිලිටරි පැමිණිල්ලක් කිව්වම එතනින් එහාට තත්ත්වය වෙනස් වෙලා පච්ච කොටා ගත්ත කොන්ඩේ කපපු අමුතු ගැහැණු කෙනෙක් ඇවිල්ලා අම්මට ටිකක් නරක විදිහට කතා කරනවා. අපිව එතනින් යවන්න තමයි හදන්නේ. අපි ඉන්නේ බී.එම්.අයි.සී.එච් ලෝටර්ස් හෝල් එකේ ඉස්සරහ කොරිඩෝ එකේ. එතනින් අපිව ඉවත් කරලා අපිව එළියට දානවා. මේ අතරතුර තමයි පිටිපස්සෙ තියෙන දොරෙන් නියෝජිතයින්ව ඇතුලට ගන්නෙ. ඇතුලට අරගෙන ඊට පස්සේ අපිට දැනගන්න ලැබෙනවා ඒ කට්ටිය ඇතුලට ගියා කියලා. නැත්නම් අපි ඉඳගෙන ඉන්නවා ඉස්සරහ පැත්තෙන් එයි කියලා හිතාගෙන. ඊට පස්සෙ ආයි අපි ඇතුලට ගිහින් කතා කරන කොට තමයි දෙරණ මාධ්‍ය නියෝජිතවරිය එළියට එන්නේ. එයාට අපේ කතාව කිවුවට පස්සෙ සියලුම මාධ්‍ය නියෝජිතවරු ඔක්කොම එළියට එනවා අපේ කතාව අහන්න. ඇවිල්ලා එයාලා කියනවා එයාලත් එක්ක ගිහින් හරි බාරදෙන්න කිව්වම එතන යූ එන් එකේ කට්ටිය අපිට ඇතුළට යන්න දෙන්නෙම නැතුව ඉන්නවා. ඊට පස්සේ අපි යනකන් අර ආපු විශේෂ නියෝජිතවරු ඇතුළට වෙලා ඉන්නවා. එහෙම ගොඩක් වෙලා ඉඳලා ඉඳලා තමයි අපි යන්නේ. මොකද ඒ කට්ටිය එළියට එන්නේ නැති නිසා පැමිණිල්ල බාර දීලා." (උපුටා ගැනීම අවසන්)

සාක්ෂිකාරිය සඳහන් කළේ තමන්ගේ පියා අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම පිළිබඳව පැමිණිල්ල එක්සත් ජාතීන්ගේ

නියෝජිත පිරිසට භාරදීමට අවස්ථාවක් තමන්ට ලබා නොදුන් බවය. මේ අන්දමින් පැමිණිලිකාරියට අවස්ථාවක් ලබා නොදීම පිළිබඳ සිද්ධිය පිළිබඳ වාර්තා පුවත්පත්වල පළවී ඇත. මෙවැනි පුවත්පත් වාර්තාවක් ඡායාරූපද සමග පැ.14 සහ පැ.15 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති බවද සඳහන් කළේය. දැනටමත් පැ.11 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛනයට අමුණා ඇති 2017 දෙසැම්බර් 15 දින දරණ ලිපිය තමන් විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ත්‍රිපුද්ගල කමිටුවට පහරදීම සඳහා රැගෙන ගිය ලිපියේ පිටපතක් බව සඳහන් කළේය. එම ලිපිය පැ.100 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

සාක්ෂිකාරිය වැඩිදුරටත් සඳහන් කළේ අත්තනෝමතික ලෙස අත්අඩංගුට ගන්නා පුද්ගලයින් සොයා බැලීම සඳහා එක්සත් ජාතීන්ගේ ත්‍රිපුද්ගල නියෝජිත පිරිස පැමිණි බවට සඳහන් කලත් ඔවුන් සොයා බැලුවේ එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම පිළිබඳ කරුණු පමණක් බවත්, ඒ හැර හමුදා සාමාජිකයින් හෝ වෙනත් පුද්ගලයින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම පිළිබඳව කරුණු කිසිවක් ඔවුන් සොයා නොබැලූ බවත් ඒ පිළිබඳව පැමිණිලි භාර ගැනීමට ඔවුන් ක්‍රියා නොකළ බවත්ය.

විශ්‍රාමලත් නාවික හමුදාපති තිසර සුධීෂ්වර ගුණසේකර සමරසිංහ සඳහන් කළේ රියාර් අද්මිරාල් දසනායක මහතා නාවික හමුදා මෙහෙයුම් අංශයේ මාධ්‍ය ප්‍රකාශක වශයෙන් ද නියෝජ්‍ය අධ්‍යක්ෂක මෙහෙයුම් වශයෙන්ද සහ තවත් තනතුරු කිහිපයක් දරා ඇති බවය. එසේම මෙහෙයුම් අංශයේ අවශ්‍යතාවයන් මත දසනායක මහතා උතුරු ප්‍රදේශයේ සුවිශේෂී රාජකාරිවල ඉතාමත් වගකීම් ඇති රාජකාරි

කිහිපයක යොදා ඇත. මුහුදෙන් එන ත්‍රස්තවාදීන් ගැන සොයා බැලීමත් රේඩාර් පද්ධති ඇති නොකරන ලද ස්ථානවල එනම් වෙන්මලේ, වැල්වැටිතුරෙයි, මුලතිව් වැනි ප්‍රදේශවලට ක්‍රියාත්මකය මෙහෙයවන්න දසනායක මහතාට බාර කරන ලද බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

විශ්‍රාමික ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී අද්මිරාල් රවින්ද්‍ර චන්ද්‍රසිරි විජේගුණරත්න මහතා සඳහන් කළේ පැමිණිලිකාර රියාර් අද්මිරාල් දසනායක මහතා නාවික හමුදාවේ සිටින වීරත්වයෙන් වැඩිම නිලධාරියා බවය. මොහු රට වෙනුවෙන් කැපවීමෙන් රාජකාරි කළ නිලධාරියෙක් බවත්, විශේෂයෙන්ම ඔහු නියෝජ්‍ය නාවික මෙහෙයුම් නිලධාරි ලෙසට කැපවීමෙන් සහ වීරත්වයෙන් සේවය කළ බවත් සඳහන් කළේය. 2015 ජනවාරි 8 වන දින පිහිටුවන ලද අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ආණ්ඩුව යටතේ පවත්වාගෙන ගිය දූෂණ මර්දන කමිටුවේ සැසිවාර වලට තමා සහභාගී වී ඇති බවත්, ඒ අනුව 2018 අප්‍රේල් මස 24 වන දින එවකට නාවික හමුදාපතිව සිටි අද්මිරාල් සිරිමෙවන් රණසිංහ මහතා සමඟ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ පැවැති සැසිවාරයට සහභාගී වූ බව ප්‍රකාශ කළේය. එදින එම කමිටුවේ රැස්වීමට අමාත්‍ය රංජිත් මද්දුමබණ්ඩාර, දොස්තර රාජිත සේනාරත්න, අමාත්‍ය ස්වාමිනාදන්, අමාත්‍ය අජිත් පී.පෙරේරා, නීතිඥ ජේ.සී. වැලිඅමුණ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න සහ නියෝජ්‍ය පොලිස්පති රවී විද්‍යාලංකාර සහභාගී වී ඇත.

එදින සාකච්ඡාවට භාජනය වී ඇත්තේ නාවික හමුදාවේ එකොළොස් දෙනකු පැහැරගෙන යාමේ නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳවය.

පැමිණිලිකාර දසනායක මහතා සහ හමුදාපති රණසිංහ මහතා අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔවුන්ගේ රාජකාරිය අත්හිටුවීම නොකිරීම සම්බන්ධයෙන් මෙම සාකච්ඡාවේදී සාක්ෂිකරු දැඩි ලෙස දෝෂ දර්ශනයට ලක්කර ඇත. නාවික හමුදා රෙගුලාසි අනුව චෝදනා පත්‍රයක් භාර දෙන තෙක් නිලධාරියකුගේ සේවය අත්හිටුවීම සිදු කළ නොහැකි බවට සාක්ෂිකරු කමිටුවට දැනුම් දී ඇති අතර සාක්ෂිකරුට වඩා බොහෝ කනිෂ්ඨ නිලධාරීන් ඔහුට මේ සම්බන්ධයෙන් දෝෂාරෝපණය කිරීම පිළිබඳව ඔහු දැඩි ලෙස කලකිරීමට පත්වී ඇත. ලුතිනන් කමාන්ඩර් හෙට්ටිආරච්චි මහතාට එරෙහිව වරෙන්තුවක් නිකුත්ව තිබූ බවත්, ඔහු වරෙන්තුවට භාර නොවී සැඟවී සිටි බවත්. එසේ සැඟවී සිටින අවස්ථාවේදී ඔහුට ශ්‍රී ලංකාවෙන් බැහැරව යාමට ඩෝරා යාත්‍රාවක් සැපයූ බවට එම රැස්වීමේදී තමාට චෝදනා කළ බවත් සඳහන් කළේය. මෙය බරපතල චෝදනාවක් බැවින් ඔප්පු කරන ලෙසට තමන් එම අවස්ථාවේදී කමිටු නිළධාරීන්ට අභියෝග කළ බවත් එසේ වුවත් අද වන තෙක් තමන්ට එරෙහිව සිදුකළ චෝදනාව තහවුරු කර ගැනීමට එම නිලධාරීන්ට නොහැකි වූ බවත් වැඩිදුරටත් සඳහන් කළේය. ඊට පසු අවස්ථාවක කොළඹ කොටුවේදී හෙට්ටිආරච්චි මහතා අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔවුන්ට තත්ත්වය අවබෝධ වන්නට ඇති බව සාක්ෂිකරු වැඩිදුරටත් සඳහන් කළේය. දසනායක සහ රණසිංහ යන නිලධාරීන් දෙදෙනාට රැකවරණය සහ වරප්‍රසාද ලබා දී ඔවුන් බලා ගන්නා බවට ශානි අබේසේකර එම රැස්වීමේදී තමන්ට චෝදනා කළ බවද වැඩිදුරටත් සාක්ෂි සටහන් කර ඇත.

විශ්‍රාමලත් නාවික හමුදාපති සමරසිංහ ආරච්චිගේ මැක්ස්මිමස් ජයන්ත පෙරේරා සඳහන් කළ අන්දමට ඇමරිකානු නාවික හමුදාවේ පශ්චාත් උපාධි ආයතනයේ පාඨමාලාව හැදෑරීම සඳහා පැමිණිලිකාර දසනායක මහතා නිසි ක්‍රමවේදයක් භාවිතා කරමින් තෝරාගෙන ඇත. පාඨමාලාව සඳහා දසනායක මහතා නම් කිරීම තේරීම් මණ්ඩලයක් විසින් ඉටු කරන ලද්දක් බවත්, ඒ සඳහා පැවැති පරීක්ෂණයේදී දසනායක මහතා වැඩිම ලකුණු ලබාගෙන තිබූ බවත් ඒ අනුව ඔහු සුදුසුම පුද්ගලයා ලෙසට නම්කර රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත දැනුම් දුන් බවත් සඳහන් කළේය.

පාඨමාලාව සඳහා දසනායක මහතා නම් කිරීම අනුමත කරමින් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් නාවික හමුදාපතිට එවන ලද 2014 අගෝස්තු 08 දින ලිපිය පැ.101 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. දසනායක මහතා ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටි පුද්ගලයකු බැවින් ඔහුට හිමි වරප්‍රසාද බොහොමයක් සහ පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථා කිහිපයක් අහිමි වී ගිය බවත්, එබැවින් එම සියලු දේ කල්පනා කර මෙම පාඨමාලාව සඳහා දසනායක මහතා නම් කිරීම තේරීම් මණ්ඩලය විසින් සිදුකළ බවත් ඔහු සඳහන් කළේය.

පරීක්ෂණයක් සඳහා, පාඨමාලාවක් හැදෑරීම සඳහා ඇමරිකාවට ගොස් සිටි දසනායක මහතාගෙන් ප්‍රකාශයක් ලබාගැනීම සඳහා ඔහු ආපසු ලංකාවට කැඳවිය යුතු බවට 2015-02-11 දින පැවති ආරක්ෂක මණ්ඩලය රැස්වීමේදී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සාක්ෂිකරුට පවසා ඇත. දසනායක මහතා ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටි බැවින් ඔහු මෙවැනි පරීක්ෂණයක් සඳහා ප්‍රකාශයක් ලබා ගැනීමට

කැඳවීමෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බවට සාක්ෂිකරු එම අවස්ථාවේදී පවසා ඇතත් අග්‍රාමාත්‍යවරයා ඊට එකඟ නොවී දසනායක මහතා ආපසු කැඳවිය යුතුයි යන ස්ථාවරයේ සිට ඇත.

එම අවස්ථාවේදී අග්‍රාමාත්‍යවරයා සඳහන් කර ඇත්තේ දසනායක මහතාගෙන් කට උත්තරයක් ලබා ගෙන ඔහු පිරිසිදු කර නැවත පාඨමාලාව හැදෑරීම සඳහා ඔහුට ආපසු යාමට ඉඩ සලස්වන බවය.

සාක්ෂිකරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගෙන් ද මේ පිළිබඳව විමසා ඇතත් ජනාධිපතිතුමා සඳහන් කර ඇත්තේ අග්‍රාමාත්‍යවරයා එසේ පවසන්නේ නම් දසනායක මහතා ආපසු කැඳවීය යුතු බවය. සාක්ෂිකරු සඳහන් කළේ ආරක්ෂක මණ්ඩලයේ මෙම සාකච්ඡාව සිදුවන විටත් දසනායක මහතා ආපසු කැඳවීම පිළිබඳ කාරණය ලංකාවේ සිටින ඇමරිකානු ආරක්ෂක උපදේශක කර්නල් රෝස් සහ ඇමරිකාවේ ලංකා තානාපති ප්‍රසාද් කාරියවසම් මහතා දැනගෙන සිටි බවය. මෙම තත්ත්වය තුළින් පැහැදිලිව පෙනී යන්නේ දසනායක මහතාට එරෙහිව ක්‍රියා කිරීමට උනන්දු වූ දේශපාලනඥයා හෝ දේශපාලනඥයින් ආරක්ෂක මණ්ඩල රැස්වීමට ප්‍රථම දසනායක මහතා ඇමරිකාවේ සිට ලංකාවට ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබූ බවය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2015-02-13 වැනි දින දාතමින් ඒවා ඇති ලිපියෙන් දසනායක මහතා කටඋත්තරයක් ලබා ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත. එම ලිපිය පැ.102 වශයෙන් සලකුණු කරන ලදී. 2015.03.02 වන දින කටඋත්තරය ලබා ගන්නා බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

මුලදී සඳහන් කළත් ඉන්පසුව 2015-02-19 දිනයෙන් එවා ඇති පැ.103 වශයෙන් සලකුණු කරන ලද ලිපියෙන් සඳහන් කළේ කටඋත්තරය 2015 පෙබරවාරි 28 වන දින ලබාගන්නා බවය. දසනායක මහතා ලංකාවට පැමිණීමෙන් පසුව සාක්ෂිකරු විසින් ඒ බව දැනුම් දෙමින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද 2015 පෙබරවාරි 13 දින ලිපිය පැ.104 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත. දසනායක මහතා ලංකාවට පැමිණීම සම්බන්ධයෙන් ඇමෙරිකානු තානාපති කායීාලයේ රොබට් රොක්ස් විසින් 2015 පෙබරවාරි 13 දාතමින් එවන ලද ලිපිය පැ.105 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

චෝදනාව ඇත්තේ දසනායක මහතාට විරුද්ධව නොවන බැවින් ඔහුගෙන් කට උත්තරයක් ලබා ගෙන ඔහුට පාඨමාලාව හැදෑරීම සඳහා නැවත ඇමරිකාවට යාමට අවකාශය සලසන බවට අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළත් එය එසේ සිදු නොවුන අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දසනායක මහතාට එරෙහිව විදේශ ගමන් තහනමක් ද ලබාගෙන තිබූ බව සාක්ෂිකරු වැඩිදුරටත් සඳහන් කළේය. 2015-03-06 දාතමින් යුක්තව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති ඩී.ඩබ්ලිව්.ආර්.බී. සෙනෙවිරත්න මහතා විසින් එවන ලද ලිපියක් පැ.106 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

නියමිත කාල සීමාව තුළ දසනායක මහතා නැවත පාඨමාලාව හැදෑරීම සඳහා ඇමරිකාවට නොපැමිණි බැවින් ඔහු තවදුරටත් පාඨමාලාව හැදෑරීම තුළ තබා ගැනීමට නොහැකි බව දැනුම් දෙමින් ඇමරිකානු තානාපති කාර්යාලය මගින් එවන ලද පණිවිඩය පැ.107 වශයෙන්

සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම තත්ත්වය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට 2015 මාර්තු 11 වැනි දින පැ.108 දරණ ලිපියෙන් දැනුම් දී ඇත.

සාක්ෂිකාර රියර් අද්මිරාල් ඇන්තනි රොහාන් අමරසිංහ මහතා නාවික හමුදා සේවයෙන් 2014 නොවැම්බර් 17 දින විශ්‍රාම ගෙන ඇත. 2009.04.01 සිට 2009.08.05 දක්වා කාලසීමාව තුළ සාක්ෂිකාර රොහාන් අමරසිංහ මහතා නාවික හමුදාවේ මෙහෙයුම් අධ්‍යක්ෂක සහ අධ්‍යක්ෂක නාවික අවි වශයෙන් කටයුතු කර ඇත. මෙම කාල සීමාව තුළ ඔහු පැමිණිලිකාර දසනායක මහතාගේ අධීක්ෂණය නිලධාරියා වශයෙන් කටයුතු නොකළ බව ඔහු සඳහන් කළේය. අධ්‍යක්ෂක ජනරාල් මෙහෙයුම් යටතේ සේවය කළ බවත් ඒ හා සමානවම ඩී.කේ.පී. දසනායක මහතාද අධ්‍යක්ෂ ජනරාල් මෙහෙයුම් යටතේ සේවය කළ බවට තමාට මතකයක් ඇති බවත් ඔහු සඳහන් කළේය. එම කාලසීමාවේදී මෙහෙයුම් ලෙස කටයුතු කළේ අද්මිරාල් සමරසිංහ මහතා සහ ඊට පසු අද්මිරාල් ජයන්ත පෙරේරා මහතා කටයුතු කර ඇත.

සාක්ෂිකාර හෙට්ටිආරච්චි මුදියන්සේලාගේ ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයට බැඳී ඇත්තේ 1997 දෙසැම්බර් 15 වන දින දීය. 2008 වර්ෂය වන විට ඔහු නාවික හමුදාවේ ලුතිනන්වරයෙකු වශයෙන් සේවය කර ඇත. 2008 ජූලි 31 වන දින සිට 2009 මැයි 31 දක්වා ඔහු නාවික හමුදාවේ ගජබා රෙජිමේන්තුවට අනියුක්තව ලුතිනන්වරයෙකු වශයෙන් රාජකාරියෙහි යෙදී ඇත. ශ්‍රී ලංකා නාවික නෞකා ගජබා ආයතනය මන්නාරම ප්‍රදේශයේ ස්ථානගත කර තිබී ඇත. මෙම කාල සීමාවේදී එකී ආයතනයේ

සාක්ෂිකරුගේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් කටයුතු කළ පුද්ගලයාගේ නම මතකයේ නොමැති බවටත් මෙම නඩුවේ පැමිණිලිකාර ඩී.කේ.පී. දසනායක මහතා තමන්ගේ අධීක්ෂණ නිළධාරියා වශයෙන් එම අවදියෙදි කටයුතු නොකළ බවට සඳහන් කළේය. තමන්ට සම්පත් යනුවෙන් නමක් නොමැති බවත් එසේම නේවි සම්පත් යනුවෙන් අන්වර්ථ නාමයක් නොමැති බවත් සඳහන් කළ සාක්ෂිකරු එසේ වුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමන් අත්අඩංගුවට ගැනීමෙන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නේවි සම්පත් යනුවෙන් අන්වර්ථ නාමයක් තමන්ට බලහත්කාරයෙන් ආරූඪ කළ බවත් ඔහු සඳහන් කළේය.

තමන්ට නේවි සම්පත් යන අන්වර්ථ නාමය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් බලහත්කාරයෙන් ආරූඪ කිරීමට හේතු වූ කරුණු සාක්ෂිකරු විසින් මෙසේ පැහැදිලි කර ඇත. (උපුටා ගැනීම - 2020.03.13 දින සාක්ෂි - 52 පිටුව)

> "ප්‍රශ්නය: එතකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමා නේවි සම්පත් වශයෙන් හැඳින්වූවාට නේවි සම්පත් කියලා වෙනත් පුද්ගලයෙක් ඇත්තටම ඉන්නවද?
>
> උත්තරය: මා දන්නා තරමට එහෙම පුද්ගලයෙක් ඉන්නවා ස්වාමීනි, එක් අවස්ථාවකදී 2015 මාර්තු මස 15වන දින මාව අත්අඩංගුවට ගත්තා පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් මන්ත්‍රීවරයාගේ ඝාතනය සම්බන්ධයෙන්. ඒ අවස්ථාවේදී එහි සාක්ෂිකරු විජයවික්‍රම මනම්පේරිගේ සම්පත් ප්‍රීතිවිරාජ් කියන සාක්ෂිකරුගේ ප්‍රකාශයකින් අනාවරණය වුනා නේවි සම්පත්

යන අය විසින් ගංගාරාම පෙරහැර මාර්ගයේදී කළුපාට බෑග් එකක බහාලූ ගිනි අවියක් කළුපාට ඩිෆෙන්ඩර් රථයකින් ගෙනවිත් මා හට බාර දුන්නා කියන කාරණාව. පසුව එම නේවි සම්පත් ලෙස හැඳින්වුන මුනසිංහ ආරච්චිලාගේ දොන් නිලන්ත සම්පත් කියන නිලධාරියාවත් එම චෝදනාව සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වුණා. එම නිලධාරියා පසුව අධිකරණයේ දී සාක්ෂි සහිතව ඔප්පු කරනු ලැබුවා එම දිනයේ එම නිලධාරියා වෙනත් රාජකාරියක් සඳහා යාපනය ප්‍රදේශයට ගොස් සිටින බවට. ඒ සමගම ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයටයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරනු ලැබුවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට විරුද්ධව. එහිදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පෙනී ගියා ඔහු අතින් වරදක් සිදු නොවූ බව. එම නිසා ඔහුව එම නඩුවෙන් ඉවත් කරන්න. නැවතත් එම නඩුවේ සාක්ෂිකරු වුනු විජයවික්‍රම මනම්පේරිගේ සම්පත් ප්‍රීතිවිරාජ් කියන සාක්ෂිකරුගෙන් නැවත ප්‍රකාශයක් ගත්තා. එහිදී ඔහු හැඳින්වූයේ මුනසිංහ ආරච්චිලාගේ දොන් නිලන්ත සම්පත් මුනසිංහ යන අය නොව නේවි සම්පත් කියන්නේ හෙට්ටිආරච්චි වන මට බව. එදායින් පස්සෙ තමයි මම නේවි සම්පත් කියන නම මට යෙදුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්." (උපුටා ගැනීම අවසන්)

ඒ අනුව සාක්ෂිකරු සඳහන් කළේ සම්පත් මුණසිංහ යන නිලධාරියාව දීර්ඝ වශයෙන් නේවි සම්පත් යනුවෙන් හඳුන්වනු ලැබූ බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ ඕනෑ එපාකම් ඉෂ්ට කර

ගැනීම සඳහා එම නේවි සම්පත් යන නාමය සාක්ෂිකරු හැඳින්වීම සඳහා භාවිතා කිරීමට පෙළඹුණු බව ය.

ළමුන් 11 දෙන අතුරුදහන් කිරීම පිළිබඳ නඩුවට එවකට කොමදෝරු දසනායකගේ සම්බන්ධතාවයක් ඇති බවට සඳහන් කරන ලද එකම කරුණ වූයේ සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන නාවික නිළධාරීන් දෙදෙනාගේ අධීක්ෂණ නිලධාරීයා ලෙසට රාජකාරි නොකළ බවට දසනායක මහතා 2015.02.28 වන දින ප්‍රකාශයේ පැහැදිලිව සඳහන් කර ඇති අතර දසනායක මහතාගේ අධීක්ෂණ නිළධාරීයගේ ඒ බව සනාථ කර ගත හැකි බවත්ය.

එසේ වුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එවැනි තහවුරු කිරීමක් ලබා ගනිමින් විමර්ශනයේදී ක්‍රියා නොකළේ එසේ කළේ නම් තම දේශපාලන අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වනු ඇතිය යන අභිලාශය පෙරදැරි කරගෙනය. සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන නිළධාරීන් දෙදෙනා කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් දසනායක මහතා තමන්ගේ අධීක්ෂණ නිළධාරීයා වශයෙන් නොසිටි බවට ප්‍රකාශ කර ඇත.

එසේම එම කාල වකවානුවේ දසනායක මහතාගේ අධීක්ෂණ නිලධාරීයා වශයෙන් ක්‍රියා කළ නාවික නිලධාරීන් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිදෙමින් සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන නිලධාරීන්ගේ අධීක්ෂණ නිළධාරීයා නොවන බවට සාක්ෂි ලබා දී ඇත.

එසේම කොමිෂන් සභාවේ නියෝගය පරිදි සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන නිලධාරීන් දෙදෙනාගේ අධීක්ෂණ නිලධාරීන්ව

පෙන්නුනම් කරන නාවික හමුදාවේ ඉහළ නිලධාරීන්ගේ ව්‍යුහය දැක්වෙන ලේඛනයක් නාවික හමුදා මූලස්ථානයෙන් 2020.06.01 දාතමින් යුතුව කොමිෂන් සභාව වෙත එවා ඇත. මෙම ලේඛනය පැ.110 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව කමාන්ඩර් රණසිංහ සහ ලුතිනන් කමාන්ඩර් හෙට්ටිආරච්චි යන නිලධාරීන් දෙදෙනාගේ අධීක්ෂණ නිළධාරීයා ලෙසට අද්මිරාල් දසනායක මහතා රාජකාරි ඉටු නොකල බවත්, එම කාලවකවානුවේ කමාන්ඩර් රණසිංහ නැගෙනහිර බුද්ධි නිලධාරී ලෙසටත්, ලුතිනන් කමාන්ඩර් හෙට්ටිආරච්චි ගජබා සහ පරාක්‍රම ආයතනය, මන්නාරම සහ පැ.110 ලෙසට සලකුණු කර ඇති ඇමුණුම් (පැ.110 (අ),(ආ) සහ (ඇ) ) වල සවිස්තරාත්මකව දසනායක මහතා නාවික හමුදාවට බැඳුන දා සිට දරණ ලද තනතුරු, අනුයුක්තව සිටි ප්‍රදේශ සහ ප්‍රශ්නගත කාලසීමාවේ දී එනම් 2008.07.01 දින සිට 2009.05.31 දින දක්වා කාලසීමාව තුළ දරණ ලද තනතුරු, දින වකවානු සහ අනුයුක්ත ආයතන හා නෞකා පිළිබද වාර්තාවන් සහ කමාන්ඩර් රණසිංහ සහ ලුතිනන් කමාන්ඩර් හෙට්ටිආරච්චි යන දෙදෙනා ප්‍රශ්නගත කාලසීමාව තුළ දරණ ලද තනතුරු දින වකවානු සහ අනුයුක්ත කර සිටි ආයතන පිළිබද වාර්තාවක් ද ඇතුළත් කර ඇත.

කොළඹ ප්‍රදේශයේ රාජකාරි කළ බවටත් සඳහන් කර ඇත. එසේම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කර කාලසීමාවේ දී පොලිසියේ මාධ්‍ය ප්‍රකාශ විසින් නොයෙකුත් අවස්ථාවන් වල මාධ්‍ය වෙත ප්‍රකාශ නිකුත් කර තිබේ. අනිකුත් විවිධ මාධ්‍ය පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම දේශපාලනීකරණය කිරීමට උත්සාහ ගනිමින් සිටින අවස්ථාවක පොලිස් මාධ්‍ය ප්‍රකාශවරයා මාධ්‍යවලට

ඉදිරිපත්වෙමින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සාධාරනීකරණය කිරීමට හේතු ඉදිරිපත් කර ඇත.

මෙම හේතු දැක්වීමේ දී පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා විශේෂයෙන් සඳහන් කළේ දසනායක මහතා අධ්‍යක්ෂ මෙහෙයුම් හැටියට කටයුතු කළ බවය. නමුත් සත්‍ය තත්ත්වය වූයේ දසනායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙහෙයුම් හැටියට රාජකාරියෙහි නිරතව සිටිමත්, ඒ කාලවකවානුව වන විට අධ්‍යක්ෂ මෙහෙයුම් ලෙස රාජකාරි ඉටුකර ඇත්තේ නාවික හමුදාවේ එස්. රණසිංහ මහතා විසිනි. රණසිංහ මහතා කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් අධ්‍යක්ෂ මෙහෙයුම් ලෙස රාජකාරි ඉටු කළ බව පිළිගෙන ඇත.

එසේම මාධ්‍ය ප්‍රකාශක රුවන් ගුණවර්ධන තවදුරටත් ප්‍රකාශ කළේ දසනායක මහතා විසින් කණ්ඩායම් 02 ක් මෙහෙයවන ලද බවත්, එම කණ්ඩායම් 2 ක පාලනය කළේ කමාන්ඩර් සහ ලුතිනන් කමාන්ඩර් හෙට්ටිආරච්චි බවත්, ළමුන් පැහැර ගැනීමට මෙම දෙදෙනා සම්බන්ධව බව දසනායක මහතා දැන සිටි බවත්, ඒ සඳහා ඇති තරම් සාක්ෂි තිබෙන බැවින් දසනායක මහතා අත්අඩංගුවට ගත් බවත්ය. රුවන් ගුණවර්ධන මහතා මාධ්‍ය ප්‍රකාශක වශයෙන් සිදු කළ එම මාධ්‍ය ප්‍රකාශය අඩංගු සංයුක්ත තැටිය ස්වාධීන රූපවාහිනී සංස්ථාව විසින් ITN-DVD-43623 දරණ අංකය සහිත තැටිය පැ.111 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම තැටියේ අඩංගු ප්‍රවෘත්තිය 2017.07.16 වන දින සවස 6.30 ට සිදු කළ ප්‍රවෘත්ති ප්‍රකාශයේ අන්තර්ගතව ඇත.

මෙම තැටිය කොමිෂන් සභාව ඉදිරියේ වාදනය කරන ලදී. පොලිස් මාධ්‍ය ප්‍රකාශක රුවන් ගුණවර්ධන මහතා එක් අවස්ථාවක ප්‍රකාශ

කළේ පැමිණිලිකාර දසනායක අත්අඩංගුවට ගැනීම අධිකරණයෙන් වරෙන්තු නිකුත් කළ බවය. එය සාවද්‍ය පුවතකි. වරෙන්තු ඉල්ලා සිටි විට එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් අධිකරණය පැවසුවේ වරෙන්තු අවශ්‍ය නොවන බව අපරාධ නඩු සංග්‍රයේ ප්‍රතිපාදන අනුව ක්‍රියා කරන ලෙසටය.

දසනායක මහතාට හිමිවිය යුතු උසස්වීම් සහ ඔහුට ලැබුණ උසස්වීම් ස්ථිර කිරීම සඳහා නාවික හමුදාවේ සහ නීතිපති දෙපාර්තතෙම්න්තුවෙන් සම්පාදිත නිර්දේශ ලැබී තිබියදීත් එම උසස්වීම් සහ උසස්වීම්වල ස්ථිර කිරීම දසනායක මහතා වෙනුවෙන් ක්‍රියාත්මක වී නැත. දසනායක මහතාගේ උසස්වීම් නිර්දේශ කළ හැකි බවට නාවික හමුදාව විසින් සිදු කළ විමසීමකදී නීතිපති විසින් 2016.11.02 දින දාතමින් ලිපියක් නාවික හමුදාපති වෙත යොමු කර ඇත. එම ලිපිය පැ.112 වශයෙන් සලකුණු කර ඇත. එසේම 2016.04.29 වන දින නීතිපති අමතන ලද ලිපියක් පැ.112 (1) වශයෙන් ද, 2016.09.09 දිනින් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත යවන ලද ලිපියක් පැ.113 වශයෙන් ද, 2016.07.07 දින නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලිපියක් පැ.114 වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කර ඇත. තම උසස්වීම් හා උසස්වීම්වල ස්ථිර කිරීම් ලබා නොදීම පිළිබඳව පැමිණිලිකරු තම සාක්ෂියේ දී සඳහන් කර ඇත.(2020.07.03 - පිටු 17-18)

> "ස්වාමීනි මේකට පාදක වෙච්ච කරුණු පිළිබඳව කෙටි හැඳින්වීමක් කලොත් 2015.01.09 වැනිද රජය මාරු වුනා. 2015 පෙබරවාරි මස 16 මම ඇමෙරිකාවේ පාඨමාලාවක් හදාරමින්

සිටියදී ආපසු ශ්‍රී ලංකාවට කැඳෙව්වා. ඒ වන විට මම කොමදෝරු නිලයට උසස්වීම් සඳහා සුදුසුකම් ලබලා තිබුණේ. ඒ වනවිට ඇත්තටම මම උසස්වීම් ලැබිය යුතු නාවික පුද්ගලයෙක්. නමුත් කැඳවීමත් සමග මට උසස්වීම් දෙන්න බැහැ කියන මතයට නාවික හමුදාව පැමිණිලා තිබුණා. සී.අයි.ඩී.එකෙන් මගෙන් ප්‍රශ්න කරන්න තියෙනවා කියලා දැනුම් දීම නිසා. ඊට පස්සේ මට වඩා කනිෂ්ඨ නිලධාරින් අටදෙනෙක් උසස් කලා මට උසස්වීම් නොදී. එතකොට මම දිගින් දිගටම අභියාචනා ඉදිරිපත් කලා නාවික හමුදාපතිතුමාටත්, නාවික හමුදාපතිතුමාගේ උපදෙස් පරිදි පොලිස්පතිතුමාට, නීතිය හා සාමය පිලිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයාට, පොලිස් කොමිසටම, ගරු නීතිපතිතුමාට මා විසින් පෞද්ගලිකව ප්‍රසන්ට්ටේෂන් කලා. ඒ එක්කම නාවික හමුදාව මගින් ලිපි යැව්වා. මේකට කම්ප්ලේන් එකක් කලා. ඒ පිලිබඳ පරීක්ෂනණයකුත් පැවැත්වුනා. මා හට ගතහැකි සියළු ක්‍රියා මාර්ගයන් මම ඒ වෙලාවේ ගත්තා. ඒත් ඒ සියල්ලටම පිලිතුරු ලෙස තමා නාවික හමුදාවෙන් නීතිපතිවරයාගෙන් කරුනු විමසන්නෙත් ආරක්ෂක අමාත්‍යාංශයෙන් කරුණු විමසන්නෙත් නීතිය හා සාමය පිලිබඳ අමාත්‍යාංශයේ එයින් කරුණු විමසන්නෙත් පොලිස්පතිවරයාගෙන් ප්‍රතිචාරයක් ලැබුනේ නැහැ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙනුත් කිසිදු ප්‍රතිචාරයක් ලැබුනේ නැහැ. නීතිපතිවරයාගේ ඉහත සඳහන් කල ලිපියේ ඇත්තටම රිමයින්ඩරයක් යවන්න කලින් මේ ගැන විමසල ඒකට උත්තර නැති නිසා තමයි දෙවැනි වරට ඒ පිලිබඳව සිහිකැඳවිමක් යවන්නේ. ඊලඟට නීතිය හා සාමය පිලිබඳ

අමාත්‍යාංශය යහපත් ප්‍රතිචාරයක් දැක්වූවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විමසලා අවස්ථා දෙකකදී ලිපි දෙකක් ඉදිරිපත් කලා ඒ පරීක්ෂණය උසස්වීම් සඳහා ගැටළුවක් නොවන බවට. එම ලිපිදෙක තමයි මේ අවස්ථාවේ ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන්න පුළුවන් වෙන්නේ." (උපුටා ගැනීම අවසන්)

ඉන්පසුව 2016.10.26 වන දින තාවකාලික පදනම් මත පැමිණිලිකරු කොමදෝරු නිලයට උසස්වීමක් ලබා දී ඇතත් එය ඉන්පසු ස්ථිර කර නැත. පැමිණිලිකරුට දිගින් දිගටම අසාධාරණ සිදු වී ඇති අතර ඔහු ඒ පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කර ඇත. එම කොමිෂන් සභාව විසින් ඊට අදාළ සහ වගකිවයුතු පුද්ගලයින් කැඳවා පරීක්ෂණයක් පවත්වා පැමිණිලිකරුගේ උසස්වීම ලබා දී දිගින් දිගටම සිදු කෙරෙන පැමිණිලිකරුගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම වලක්වන ලෙසට නිර්දේශ කර ඇත. 2018.12.28 දිනින් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති පිටු දෙකකින් සමන්විත නිර්දේශය පැ.115 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එකී නිර්දේශ වලට අනුව පැමිණිලිකරුට ලබා දුන් කොමදෝරු නිළයට හිමි ජාතික ආරක්ෂාව පිළිබඳ පාඨමාලව හැදෑරීමටත්, එසේම නිසි ජ්‍යෙෂ්ඨත්වය ලබා දීමටත් නිර්දේශ කරමින් පියවර ගෙන වාර්තා කිරීමට දැනුම් දී ඇත.

මෙම අවස්ථාව වන විටත් පැමිණිලිකරුට පහළින් සිටි නිළධාරීන් 39 දෙනෙකු කොමදෝරු නිළයට පැමිණිලිකරු අභිබවා උසස්වීම් ලබා ඇත. 2020.01.13 පැමිණිලිකරු රියාර් අද්මිරාල් නිළයට උසස්වීම් ලබා දී ඇත. පැමිණිලිකරුට සාධාරණය ඉෂ්ඨවීමට නම් ඔහු රියාර් අද්මිරාල් ධූරයෙන් 2 වැනි හෝ 3 වැනි ස්ථානයට පත් විය යුතුය.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධානි ජනාධිපති නීතිඥ සාලිය පිරිස් මහතා විසින් 2019 ජනවාරි 17 වන දිනෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා වෙත යවන ලද ලිපියක් නාවික හමුදාව විසින් කොමිෂන් සභාව වෙත එවා ඇති ලිපි අතර තිබී සොයා ගෙන පැ.116 වශයෙන් ඉදිරිපත් කර ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළබඳ කාර්යාලය විසින් සිදු කළ පරීක්ෂණ මත සිදු කළ නිර්දේශ මගින් දක්වා ඇත්තේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන්ගේ උසස්වීම් පිළිබඳව සහ ඔවුන් එක් එක් තනතුරු වලට පත් කිරීම පිළිබඳවය. (පැ.116 බලන්න) එකී නිර්දේශ මගින් චෝදනා ලබා ඇති හමුදා නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීමටත්, උසස්වීම් ලබා නොදීමටත්, වැදගත් තනතුරු පිරිනැමීමෙන් වැළකීමටත් නිර්දේශ කර ඇත. පැමිණිලිකරුට මෙම කාලය තුළ උසස්වීම් නොලැබීමට හේතුව වී ඇත.

පැමිණිලිකරු සඳහන් කළේ වර්තමානයේදීවත් තමන්ට හිමි නිසි ජ්‍යෙෂ්ඨත්වය ලබා දී තමන්ට එරෙහිව නඟා ඇති බොරු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කරන ලෙසට ඉල්ලීමක් පැමිණිලිකරු පහත සඳහන් ප්‍රකාශයෙන් සිදු කර ඇත.

> (උපුටා ගැනීම) 2020.07.3 -පිටු 27.28)“ස්වාමීනි වැරදි අකාරයට මා හට චෝදනා ගොනු කරලා මා වැරදිකරුවෙක් කරන්න උත්සාහ කිරීම පිලිබඳව එවකට පැවති රජය විසින් දේශපාලනිකව ගෝඨාභය රාජපක්ෂ මහතා අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ මහතා හසු කිරීම සඳහා කෙනෙකු හැටියට සාක්ෂිකරුවෙකු හැටියට මා යොදගන්න උත්සාහ කලා. ඒ උත්සාහය ව්‍යාර්ථ වීම නිසා මා හට බොරු චෝදනා නගමින්

මා හට නඩු පවරලා තියෙනවා. ඉතින් මේ නඩු පැවරීමත්, මේ බොරු චෝදනා නැගීමත් නිසා මට ගොඩක් දේවල් පසුගිය වසර පහක පහමාරක කාලය තුල අහිමි වුනා. විශේෂයෙන්ම නාවික හමුදාවේ ඉතාමත්ම නොකැලැල් සේවයක් කරල නාවික හමුදාවට රටට විශාල සේවයක් කරලා නාවික හමුදාවේ ඉහල තනතුරු දරන්නට හැකියාවක් තිබ්ච්ච මට ඒ සියල්ලම අහිමිවෙලා තියෙනවා. විශේෂයෙන් නාවික හමුදාපති ධූරයට සුදුසුකම් තිබන මට ඒ ස්ථානයට යන්න හැකියාවක් නැතිවෙලා තියෙනවා මේ ජොෂ්ඨතා සහ මේ චෝදනා ප්‍රශ්න නිසා. මම ගරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ නැතිවෙච්ච දේවල් ගොඩක් ලබා දෙන්න අමාරුයි. ගතවෙලා ඉවරයි. නමුත් ඉදිරියේදිවත් මාගෙ නිසි ජොෂ්ඨතාවය ලබා දීලා නාවික හමූදාවට නැත්නම් රටට සේවයක් කරන්න අවස්ථාව සලසලා දෙන්න කියලා. මේ බොරු චෝදනා මත ගොනු කරලා තියෙන නඩු කටයුතු වලින් නිදොස් කොට නිදහස් කරලා දෙන්න කියලා තමයි මම ගරු කොමිෂන් සභාව වෙතින් ඉල්ලා සිටින්නේ ස්වාමීනි." (උපුටා ගැනීම අවසන්)

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ කණ්ඩායම සෑම අවස්ථාවකදීම උත්සාහ දරා ඇත්තේ සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන නාවික නිලධාරීන් දෙදෙනාගේ අධීක්ෂණ නිළධාරීයා ලෙස පැමිණිලිකරු ක්‍රියා කළ බවට අසත්‍ය කරුණූ පාදක කරගෙන මාධ්‍ය ප්‍රචාර පවත්වා පැමිණිලිකරු හා නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමත් සහ එමගින් එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ

මහතා වෙත චෝදනා එල්ල කිරීමය. මේ සඳහා සැලසුම් සහගතව සාක්ෂිකරුවන් සොයා ගෙන ඔවුන්ගේ ප්‍රකාශ විවිධ අවස්ථා වලදී ලබා ගෙන කෙසේ හෝ නඩුවක් නිර්මාණය කිරීමේ වැයමක් ශානි අබේසේකර සහ නිශාන්ත ද සිල්වා ක්‍රියා කර ඇති බවට ඉදිරිපත් වී ඇති සාක්ෂි වලින් මැනවින් සනාථවේ.

මෙම ළමුන් අතුරුදහන්වීමට සිද්ධියට පාදක වී ඇති කාලසීමාව යුද්ධයේ තීරණාත්මක අවසාන භාගය විය. මෙම මුළු කාල සීමාව ප්‍රභාකරන් මුහුදින් පැනයාම වැලැක්වීම සඳහා උපරිමයෙන් ක්‍රියා කළ කාලසීමාවක් වූ බැවින් පැමිණිලිකරු සහ හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා මුලතිව් මුහුදේ හමුදා මෙහෙයවමින් කාලය ගත කර ඇති නිසා ඔවුන්ට ගොඩ බිම සිදුවූ දේවල් පිළිබඳව සබැඳියාවක් තිබිය නොහැක. මෙම අතුරුදහන්වීම සිදුවී අදාළ කාලසීමාව පිළිබඳව සළකා බලන විට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මුලිතිව් මුහුදේ බිහිසුනු සටහන නියැලී සිටින විට ගොඩබිම සිටි කිසියම් කනිෂ්ඨ නිලධාරීන් කිහිපදෙනෙකු තම සිතුවිලි ක්‍රියාවට නැංවීමට සුදුසු කාලය තෝරාගෙන ක්‍රියා කර ඇති බව සාක්ෂි වලින් සනාතවේ.

ආරක්ෂක අමාත්‍යාංශයේ පවත්වානු ලද රැස්වීමකට එවකට නාවික හමුදාපති සිරිමෙවන් රණසිංහ මහතා සහ මාණ්ඩලික ප්‍රධානී රවි විජේගුණරත්න මහතා කැඳවා ඇත. එම රැස්වීමට පැමිණ සිටි පිරිස අතර අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර, අමාත්‍ය ස්වාමිනාදන්, අමාත්‍ය අජිත් පී පෙරේරා, නීතිඥ ජේ සී වැලිඅමුණ, ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර, ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර යන පුද්ගලයින්

සහභාගී වී ඇත. එම රැස්වීමේදී මෙම පුද්ගලයින්, මාණ්ඩලික ප්‍රධානී රවි විජේගුණරත්න මහතා සහ නාවික හමුදාපති සිරිමෙවන් රණසිංහ මහතා අමතමින්, නියෝගයක ස්වරූපයෙන් ඩී.කේ.පී. දසනායක මහතා හමුදා මූලස්ථානයෙන් වෙනත් ස්ථානයකට ස්ථාන මාරු කරන ලෙසට දැනුම් දී ඇත. ඒ අනුව දසනායක මහතා හමුදා මූලස්ථානයෙන් ස්ථාන මාරුකර දසනායක මහතාගේ සුදුසුකම් වලට නොගැලපෙන ස්ථානයකට ස්ථාන මාරු කර ඇත. මෙම ස්ථාන මාරු කිරීමට හේතු වූ කරුණු නාවික හමුදාපති සිරිමෙවන් රණසිංහ මහතා පැමිණිලිකරුට සඳහන් කර ඇති අතර අමාත්‍ය රාජිත සේනාරත්න මහතා ස්ථාන මාරු කිරීම් සිදුකරන ලෙසට දැනුම් දුන් බවට ද සඳහන් කර ඇත.

තරුණයින් එකොළොස් දෙනෙකු අතුරුදන් කිරීමේ සිද්ධියට දසනායක මහතා සම්බන්ධ බව පෙන්වීම සඳහා පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් අසත්‍ය සාක්ෂි නිර්මාණය කර ඇත. ඒ අනුව ඔහු අසත්‍ය ප්‍රකාශයක් අධිකරණය වෙත ඉදිරිපත් කරමින් ලුතිනන් කමාන්ඩර් රණසිංහ සහ ලුතිනන් කමාන්ඩර් හෙට්ටිආරච්චි යන නිලධාරීන් දෙදෙනා පැමිණිලිකරුගේ අධීක්ෂණය යටතේ සිටි නිලධාරීන් බවටත්, ඒ අනුව රණසිංහ මහතා සහ හෙට්ටිආරච්චි මහතා යටතේ සිටි නිලධාරීන් දෙදෙනෙකු විසින් දෙනු ලැබූ ප්‍රකාශයකින් ඒ බව හෙළි හෙළිදරව් වන බවටත් කරුණු ඉදිරිපත් කර ඇත. එසේ වුවත් සත්‍ය වශයෙන්ම කමාන්ඩර් රණසිංහ සහ කමාන්ඩර් හෙට්ටිආරච්චි නිලධාරීන් දෙදෙනා කිසිදු අවස්ථාවක පැමිණිලිකාර දසනායක මහතාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාකර නැත.

පැමිණිලිකරුගේ සාක්ෂියට අනුව දින විසි දෙකක කාලයක් නාවික හමුදාපතිධූරයේ රැඳී සිටි ට්‍රැවිස් සින්නයියා එම ධූරය දැරීමට පෙර ඇමරිකානු තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක වශයෙන් ක්‍රියා කර ඇත. ඔහු නාවික හමුදාපති ධූරයට පත් කරවා ගැනීම මගින් ඔහුගෙන් අසත්‍ය සාක්ෂියක් ලබාගෙන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහ නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් සිදුකර ඇත.

පැමිණිලිකරුට එරෙහිව සාක්ෂි ලබාදීම සඳහා කටඋත්තර ලබාගෙන ඇති මහේෂ් පෙරේරා නැමැති නාවික නිලධාරියා ද සඳහන් කර ඇත්තේ ඔහු කිසිදු අවස්ථාවක පැමිණිලිකරුට එරෙහිව අසත්‍ය සාක්ෂියක් ලබා දීමට අදහස් නොකරන බවත් එසේ වුවත් එසේ සිදු කිරීමට ඔහුට බලපෑම් කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාරයේ රඳවනවන බවට තර්ජනය කරමින් ඔහුගෙන් කටඋත්තරයක් ලබාගෙන ඇති බවත්, එසේ කටඋත්තර ලබා නොදුනහොත් ඔහු චූදිතයකු ලෙසට නම් කර නඩුවට ඉදිරිපත් කරන බවට තර්ජනය කළ හේතුවෙන් පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වාට අවශ්‍ය අයුරින් අසත්‍ය කට උත්තරයක් ලබා දී ඇති බවය.

උපුල් චමින්ද නැමැති පුද්ගලයෙකුගේ දුරකතනයකට පැමිණිලිකරුගේ සිම් කාඩ් පතක් ඇතුලත් කිරීම පිළිබඳව යම් ප්‍රශ්න කිරීමක් සිදුකර ඇත. එසේ වුවත් එම සිම් කාඩ්පතෙන් ලබාගත් දුරකථන ඇමතුම් කිසිවක් මෙම තරුණයන් එකොළොස් දෙනා අතුරුදන්වීමේ සිද්ධියට සම්බන්ධතාවයක් නොදක්වයි. මෙම දුරකථනය භාවිතා කරමින් පැමිණිලිකරු කප්පම් ගැනීමේ සිද්ධියකට

සම්බන්ධ කිරීමට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා උත්සාහ දරා ඇතත් එවැනි අපරාධයක් සඳහා පැමිණිලිකරුට එරෙහිව සාක්ෂි ඉදිරිපත්ව නැත.

එවකට නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා මෙම තරුණයන් එකොළොස්දෙනා අතුරුදන්වීම සම්බන්ධයෙන් මුල් පැමිණිල්ල කොළඹ අපරාධ කොට්ඨාසයට ඉදිරිපත් කරන විට ඒ සඳහා සාක්ෂිකරුවකු වශයෙන් ඉදිරිපත් වූ අලුත් ගෙදර උපුල් බණ්ඩාර සඳහන් කර ඇත්තේ එවකට හමුදාපතිවරයාගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වූ සම්පත් මුනණසිංහ විසින් එම අතුරුදන් කිරීමේ සිද්ධිය සිදුකළ බවය. එසේ වුවත් නිශාන්ත සිල්වා ගේ අවශ්‍යතාවය මත උපුල් බණ්ඩාර තම කටඋත්තරය වෙනස් කරමින් අසත්‍ය ප්‍රකාශ සිදු කර ඇත.

02, 07 සහ 08 වන වගඋත්තරකරුවන් වෙනුවෙන් පැමිණිලිකරු හරස් ප්‍රශ්න වලට භාජනය කර ඇත. එම හරස් ප්‍රශ්න ඇසීම තුළින් ඔවුන් පැහැදිලි ස්ථාවරයක් ගොඩනඟා නොමැති අතර පැමිණිලිකරුගේ පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු පිළිතුරු සැපයීමක් සිදුකර නොමැත. සෙසු වගඋත්තරකරුවන් වෙනුවෙන් හරස් ප්‍රශ්න විමසීමක් සිදු කර නොමැත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.116 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

Chandra Fernando
24/11/2020

2020. 11. 24

## 9 .III

පැමිණිලි අංකය - 03/2020

පැමිණිලිකරු - කමාන්ඩර් සුමිත් රණසිංහ

ලිපිනය - තලහගමුල වත්ත, මහරගම, ගිරිඋල්ල.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. අ.ප.දෙ. හිටපු අධ්‍යක්ෂක ශානි අබේසේකර
2. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා
3. හිටපු නියෝජ්‍ය අමාත්‍ය රන්ජන් රාමනායක
4. හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න
5. හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක
6. ලුතිනන් කොමාණ්ඩර් ක්‍රිශාන් චින්තක වෙළගෙදර
7. බලනැවි රන්හවඩි දූරලයාගේ ප්‍රියංකර
8. සුළු නිලධාරි රණතුංග මුදියන්සේලාගේ පුංචි බණ්ඩා රණතුංග

### තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර කමාන්ඩර් සුමිත් රණසිංහ මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත්

ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, පැමිණිලිකාර කමාන්ඩර් සුමිත් රණසිංහ මහතාට එරෙහිව කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 732/2009 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර කමාන්ඩර් සුමිත් රණසිංහ නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇත.

2. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇත.

3. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇත.

4. එබැවින් ඉහත නම් සඳහන් වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීම සුදුසු බවට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ බරපතළ හානි පූරනය කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි. ඒ අනුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුට අහිමි වූ ඔහුගේ රැකියාවේ සියලුම උසස්වීම් වරප්‍රසාද විදේශීය පුහුණුවීම් හිඟ වැටුප් සියල්ලම ඔහුට ලබා දීමත් ඔහු එවැනි රක්ෂිත බන්ධනාගාර ගත කිරීමකට පත් නොවූයේ නම් ඔහුට ඔහුගේ රැකියාවේ හිමිවන ස්ථානයට ඔහු පත් කිරීමත් මගින් පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිය හැකි බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරන අතරම එම සහනයන් ලබා දීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

නිලාවේලි නාවික හමුදා කඳවුර මගින් ද්‍රවිඩ ඊලාම් ත්‍රස්තවාදීන් මර්දනය කිරීම සඳහා විශේෂ මෙහෙයුම් ඒකකයක් ස්ථාපිත කර එම ඒකකයේ අණදෙන නිලධාරියා වශයෙන් නාවික හමුදාවේ බුද්ධි නිලධාරියකු වශයෙන් විවිධ තොරතුරු රැස්කිරීමේ රාජකාරිවල නිරත

වී සිටි පැමිණිලිකාර කමාන්ඩර් සුමිත් රණසිංහ පත්කර ඇත. නිලාවේලි හමුදා කඳවුර ස්ථාපිත කර තිබීමේ ප්‍රධාන පරමාර්ථය වී ඇත්තේ ත්‍රිකුණාමලය නාවික මූලස්ථානයට ගොඩබිමින් උතුරු දිසාවෙන් එල්ල වන ප්‍රහාර වැලැක්වීම සහ ඒ අයුරින්ම ත්‍රාස්තවාදීන්ට පෙරළා පහර දීමටය. පැමිණිලිකරු විශේෂ මෙහෙයුම් ඒකකයේ අණදෙන නිළධාරියා වශයෙන් ත්‍රාස්තවාදී ප්‍රහාර වලදී විශේෂ දස්කම් ප්‍රදර්ශනය කර ඇති අතර ඔහු විශේෂ බුද්ධි තොරතුරු රැස් කිරීමේ නිළධාරියෙකු වශයෙන්ද ක්‍රියා කර ඇත. පැමිණිලිකරු විසින් ත්‍රාස්තවාදීන්ට එරෙහිව දියත්කරන ලද ප්‍රබල ප්‍රහාරයක් පිළිබඳව තොරතුරු Diamond of the Silent Blue නැමැති කෘතියෙහි අන්තර්ගත කර ඇත. එකී කෘතිය පැ.1 වශයෙන්ද එකී කෘතියේ 201 වැනි පිටුවේ දැක්වෙන එම වාර්තාව පැ.1 (අ) වශයෙන්ද සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2001 මැයි 23 වැනි දින පැමිණිලිකරු ඇතුළු විශේෂ මෙහෙයුම් කණ්ඩායම් ගමන් ගත් බස් රථය ත්‍රිකුණාමලය තම්බල ගමේදී ක්ලේමෝර් බෝම්බ ප්‍රහාරයකට හසුවී බස් රථයේ ගමන් ගත් 17 දෙනකු මිය ගොස් ඇති අතර පැමිණිලිකරු ඉතාම බරපතල තුවාල ලබා ඇත. (පැ.2 සිට පැ. 6 දක්වා) මෙම ප්‍රහාරයෙන් ලද තුවාල සුව වීමෙන් පසුව පැමිණිලිකරු නැවතත් සක්‍රීය සේවයට වාර්තා කර ඇත.

ඉන් පසුව නාවික හමුදාව විසින් පිහිටුවනු ලබන ඔපරේෂන් "බ්ලැක් ෆෝකස්" ප්‍රහාරක බල ඇණියට අණදෙන නිළධාරියා වශයෙන් ක්‍රියා කල පැමිණිලිකරු මාණ්ඩලික බුද්ධි නිලධාරී ලෙස ද කටයුතු කර ඇත.

නීතිවිරෝධී අයුරින් බෝට්ටු මගින් ඕස්ට්‍රේලියාවට මිනිසුන් යැවීමේ ජාවාරම, 2011, 2012 වර්ෂවල තදින් ක්‍රියාත්මක වී ඇත. මෙම වර්ෂ දෙක ඇතුළතදී යාත්‍රා 123 ක් ඔස්ට්‍රේලියාව බලා ගොස් තිබූ අතර ඉන් 64 ක් අත්අඩංගුවට ගෙන ඇත. එම අත්අඩංගුවට ගත් යාත්‍රා 64 න් 23 ක් අත්අඩංගුවට ගෙන ඇත්තේ පැමිණිලිකරු විසිනි. එම වකවානුවේදී සංක්‍රමණිකයන් 1300 ක් අත්අඩංගුවට ගැනීමට සමත්වී ඇත.

මෙම කරුණු සනාථ කෙරෙන වාර්තාවක් පැ.9 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම කර්තව්‍යයේදී පැමිණිලිකරු විසින් සිදු කරනු ලැබූ සේවය අගයමින් නිකුත් කරන ලද ප්‍රශංසාත්මක ලිපි ගණනාවක් පැ.10 (1) සිට (6) දක්වා ලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම මහා පරිමාණ මිනිස් ජාවාරම පසුපස නාවික හමුදාව සිටින බවට විවිධ චෝදනා එල්ල වෙමින් තිබුණි. පැමිණිලිකරු එම චෝදනා පිළිබඳව ද සොයා බලා ඇත. ඒ අනුව ලබාගත් තොරතුරුවලින් හෙළිහෙළි වී ඇත්තේ 2011 සහ 2012 වසරවල දී නාවික හමුදාවේ මාණ්ඩලික නිලධාරී සාගර බුද්ධි (Staff Officer – Maritime Intelligence) ලෙස ත්‍රිකුණාමලය නාවික හමුදා මූලස්ථානයේ රාජකාරී කළ කේ.සී. වෙලගෙදර මෙම මිනිස් ජාවාරමට පිටුපස සිටින බවත් ඔහු මෙම මිනිස් ජාවාරම මෙහෙයවන බවත්ය.

එස්. ඒ. කුමාර සහ චන්ද්‍රසිංහ යන නාවික බුද්ධි නිලධාරීන් දෙදෙනා යොදවමින් මෙම මිනිස් ජාවාරම කේ.සී. වෙලගෙදර විසින් 2011 වසරට පෙර සිටම සිදුකර ගෙන එමින් සිටි බව හෙළිවී ඇත. මෙම මිනිස් ජාවාරම් සඳහා වී. බුවන්රාජ් නොහොත් කුරුන්ජි නැමැති සිවිල් පුද්ගලයා සම්බන්ධ වී ඇති අතර එස්. ඒ. කුමාර සහ චන්ද්‍රසිංහ යන

දෙදෙනා ලුතිනන් කමාන්ඩර් කේ.සී.වෙලගෙදර යටතේ මිනිස් ජාවාරම සිදු කර ඇත. මෙම පිරිස අධ්‍යක්ෂක මාණ්ඩලික බුද්ධි නිළධාරියාටත් රහසිගතව මෙම කර්තව්‍ය සිදු කර ගෙන ගොස් ඇත. වී.බුවන්රාජ් නොහොත් කුරුන්ජි නම් පුද්ගලයා විසින් ඕස්ට්‍රේලියාවට යන පිරිස් සූදානම් කර ඇත. එක් පුද්ගලයෙකුගෙන් රුපියල් ලක්ෂ 8 බැගින් ලබාගෙන 20 දෙනෙකු සූදානම් කරන බවට තොරතුරු අනාවරණය වී ඇත. යම් යම් අවස්ථාවල වෙලගෙදර වෑන් රථයකින් ත්‍රිකුණාමලයට පැමිණ එකතු කරනු ලද මුදල් ලබාගෙන ඇත. පැමිණිලිකරු මෙම තොරතුරු ලබාගෙන ඇත්තේ කුරුන්ජි නැමැති පුද්ගලයාගෙන් ප්‍රශ්න කිරීමෙනි.

ඉන්පසු 2012 දෙසැම්බර් මස ද නැවත එවැනි සිදුවීමක් සිදුවී ඇත. වෙලගෙදර යටතේ සේවය කළ බන්දුකුමාර නැමැති නාවික හටයා සාගර බුද්ධි ලෙස සේවය කරන අවස්ථාවේ ඔහුද මිනිස් ජාවාරමකට හසුවී ඇත. පැමිණිලිකරු නැගෙනහිර මාණ්ලික බුද්ධි ලෙස සේවය කරන අවස්ථාවේ දී ඕස්ට්‍රේලියාවට යාම සඳහා මිනිසුන් පටවන බවට තොරතුරක් ලැබී ඇති අතර, ඒ අනුව සිදු කළ වැටලීමකින් ඕස්ට්‍රේලියාට යැවීම සඳහා සුදානමින් සිටින මිනිසුන් 20 ක් හෝ 30 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඔවුන් ප්‍රශ්න කිරීමේ දී, මුදල් එස්.ඒ. කුමාරට ලබා දී ඇති බවට කරුණු අනාවරණය වී ඇත. ඒ අනුව රුපියල් ලක්ෂ 4, 5 සහ 8 වැනි මුදල් ප්‍රමාණයක් ලබා දී ඇති බවත් හෙළි වී ඇත. මුදල් භාරගත් බවට රිසිට්පත් නිකුත් කර ඇති අතර එම රිසිට්පත් ජේ.කේ.බී. කුමාර විසින් නිකුත් කර ඇත. එස්.ඒ.කුමාරට පෙරවැරදී තිබී ඇති බැවින් පරීක්ෂණයෙන් පසු ඔහු සේවයෙන් පහ කර ඇත.

එස්.ඒ.කුමාර අල්ලා දීමෙන් පසුව වෙලගෙදර පැමිණිලිකරුට කථා කර මෙවැනි දෙයක් සිදු කළේ කුමක් නිසාද යන්න විමසා ඇත. ඒ මත ඔවුන් දෙදෙනා අතර බහින් බස්වීමක් සිදු වී ඇති අතර මේ චෝදනා මත වෙලගෙදර පැමිණිලිකරු සමග අමනාපයෙන් පසුවී ඇත.

2012 වසරේ දී මෙම චෝදනා සම්බන්ධයෙන් වෙලගෙදර පරීක්ෂණ මණ්ඩලයක් හමුවට පමුණුවා ඇති අතර පරීක්ෂණයේ දී පැමිණිලිකරු මිනිස් ජාවාරම පිළිබඳ රැස් කළ තොරතුරු ඉදිරිපත් කර ඇත.

"නීති විරෝධි මිනිස් ජාවාරම, සම්බන්ධයෙන් නාවික හමුදා පුද්ගලයන් සතුව පවතින වැරදි වැටහීම සහ මාතර පොලිසිය මගින් සිදු කරන ලද පරීක්ෂණ සම්බන්ධයෙන් නාවික හමුදා මූලස්ථානය මගින් සිදු කරන ලද පරීක්ෂණ සම්බන්ධයෙන් සිදු වූ අසාධාරණය" යන මාතෘකාව යටතේ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වන ලද පරීක්ෂණයකදී පැමිණිලිකරු තමන් රැස්කරගත් බුද්ධි තොරතුරු ඉදිරිපත් කරමින් ලුතිනන් කර්නල් වෙලගෙදර විසින් සිදු කළ මහා මිනිස් ජාවාරම පිළිබඳව දින 5 ක් තිස්සේ සාක්ෂි ලබා දී ඇත. මෙම පරීක්ෂණ මණ්ඩලයේ සභාපති රියාර් අද්මිරාල් සේනාරත්න, සාමාජික කොමදෝරු කාශ්‍යප පෝල් සහ කැප්ටන් දසනායක යන අයගෙන් සමන්විත වී ඇත. කොමදෝරු කාශ්‍යප පෝල්ගේ ප්‍රකාශයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සටහන් කර ගෙන ඇත. කාශප්‍ය පෝල් ප්‍රකාශ කර ඇත්තේ ඔහු සාමාජිකත්වය දරණ මණ්ඩලයේ ලිපි ගොනුවක් නොව වෙනත් ලිපි ගොනුවක් බැවින් ඔහු එම ලිපි ගොනුවට අයත් පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන බව

කාශ්‍යප පෝල් තම ප්‍රකාශයෙහි සඳහන් කර ඇත. මෙම ප්‍රකාශය පැ.28 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් මුතූර් ප්‍රදේශය අල්ලා ගැනීම හේතු කොට ගෙන එම ප්‍රදේශය ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදා ගැනීම සඳහා මානුෂීය සටන ආරම්භ කර ඇත. නැගෙනහිර මුදා ගැනීමේ මානුෂීය සටන ආරම්භ කරන විට පැමිණිලිකරු ආඥාපති නැගෙනහිර යටතේ මාණ්ඩලික බුද්ධි නිලධාරී ලෙස රාජකාරි කර ඇත. මෙම වකවානුව තුළ නාවික හමුදාව සිදු කළ මුහුදු ක්‍රියාන්විත හා බුද්ධි ක්‍රියාන්විත වලදී ත්‍රස්තවාදීන් නාවික හමුදාවට භාර වී ඇත. ඒ වන විටත් සිදුවෙමින් පැවැති යුධ ක්‍රියාන්විත වලට ආධාර වන වැදගත් තොරතුරු මෙම භාරවූ ත්‍රස්තවාදීන් සතුව තිබී ඇත. එම භාරවූ ත්‍රස්තවාදීන් නාවික හමුදාව සමග එකතුවෙමින් ද්විත්ව ඔත්තුකරුවන් වශයෙන් කටයුතු කරමින් ත්‍රස්තවාදීන්ගේ තොරතුරු රැස් කර ඇත. මෙසේ භාරවී ඔත්කරුවන් ලෙස ක්‍රියාකළ ත්‍රස්තවාදීන් 50 දෙනෙකු පමණ සිට ඇති අතර ඔවුන් ආරක්ෂිතව සිටීම අත්‍යවශ්‍ය වු බැවින් ඔවුන් ත්‍රිකුණාමලය කඳවුරේ ගන්සයිට් නැමැති ප්‍රදේශයේ සිට ක්‍රියාත්මක වී ඇත. මෙම පිරිස ඔත්තුකරුවන් ලෙසට යුද්ධයට සෘජුවම දායක වී ඇත.

යුද්ධය අවසන්වීමෙන් පසුව ඔවුන් පුනරුත්තාපනය කර සමාජයට මුදාහැර ඇත. එම ත්‍රස්තවාදීන් පුනරුත්තාපනය කර සමාජයට මුදා හැරීමට අදාල ලේඛන පැ.17 සහ පැ. 18 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ත්‍රිකුනාමල නාවික හමුදා කඳවුරේ පිහි පිහිටි ගන්සයිට් නැමැති ප්‍රදේශය පෘතුගීසි, ලන්දේසී සහ බ්‍රිතාන්‍ය යුග වලදී කාලතුවක්කු ස්ථානගත කර තිබූ ප්‍රදේශයකි. ඒ අනුව එම තුවක්කු සඳහා භාවිතා

කෙරෙන විවිධ පතුරම් වර්ග ගබඩා කිරීම සඳහා එම ප්‍රදේශයේම භූගත ගබඩා සහ ආයුධ ගබඩා සකසා තිබී ඇත. ඒ හේතුව මත මෙම ප්‍රදේශය ගන්සයිට් යන නාමයෙන් හඳුන්වා තිබී ඇත. එම ගන්සයිට් ප්‍රදේශය පසු කලෙක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර සහ නිශාන්ත ද සිල්වා යන අය විසින් යහපාලන රජයේ අවශ්‍යතා පිරිමැසීම සඳහා ගෝඨා කඳවුරු යනුවෙන් 2015.02.26 වන දින පළමු වතාවට හඳුන්වා දී ඇත. පැමිණිලිකරු පැහැදිලිව සඳහන් කළේ මෙම ගන්සයිට් ප්‍රදේශයේ සිට හමුදා සේවයේ නිරත වූ ඔත්තුකරුවන් සංඛ්‍යාව 50 ක් බවත්, ඉන් 38 දෙනෙකු පුනරුත්තාපනය කර මුදාහැර ඇති බවත්, ඉතිර අය නාවික හමුදාවට තොරතුරු සපයන්නන් ලෙසට රාජකාරියේ යෙදී සිටින බවත්ය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උක්ත නිලධාරීන් විසින් ඔවුන්ගේ ගුප්ත අභිප්‍රායන් මුදුන් පමුණුවා ගැනීම සඳහා ගන්සයිට් ප්‍රදේශය ගෝඨා කඳවුර යනුවෙන් හඳුන්වා දීමෙන් පසු අන්වර්ථ නාමයන් ට වඩා කැමැත්තක් දක්වන විවිධ මාධ්‍ය ජාල හා වෙබ් අඩවි එම අන්වර්ථ නාමය පාවිච්චි කිරීම සිදුකළත් ඊට පෙර කිසිදු අවධියක කිසිදු පුද්ගලයෙකු එවැනි අන්වර්ථ නාමයකින් ගන්සයිට් ප්‍රදේශය හඳුන්වා තිබී නැත. එවැනි මාධ්‍ය වාර්තා කිහිපයක් පැ.19 (1) සිට පැ. 19 (5) දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බී.732/2009 දරණ වාර්තාවෙන් මහේස්ත්‍රාත් අධිකරණයෙන් පළමු වතාවට 2009.06.01 සහ 2009.06.03 දින කරුණු වාර්තා කර ඇත. මෙම බී වාර්තා දෙක පැ.21 සහ පැ.21 (අ) ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම වාර්තා වල මෙම ගන්සයිට් ප්‍රදේශය ඉහතකී අන්වර්ථ නාමයෙන්

හදුන්වා නැත. වසර 06 කට ආසන්න කාලයකට පසුව පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා 2015.02.26 දින බී.732/2009 නඩුවට ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාවෙන් පළමු වතාවට ගන්සයිට් ප්‍රදේශය ගෝඨා කඳවුර යනුවෙන් හඳුන්වා දී ඇත.

එම වැඩිදුර වාර්තාව ඉදිරිපත් කරමින් පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා අධිකරණයෙන් අයැද ඇත්තේ කොළඹින් පැහැර ගත් පිරිසක් ගන්සයිට් හෙවත් ගෝඨා කඳවුරේ රඳවා සිටින බවටත්, ළමුන් 11 දෙනෙකු පැහැර ගැනීමේ සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන ඒකකය විසින් 2013 වසරේ දී කටඋත්තර ලබා ගැනීම සඳහා පැමිණිලිකරු 2013.07.26, 2013.08.08, 2013.09.12, 2013.09.13, 2013.09.17, 2013.09.20 යන දිනයන්හි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත. ඉන්පසුව 2017.03.02 වන දින ශානි අබේසේකර සහ නිශාන්ත ද සිල්වා විසින් පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් ලබාගෙන 2017.03.03 වන දින අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

මෙම ගන්සයිට් නැමැති ප්‍රදේශය ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරේ නාවිකා හා සාගරික විද්‍යා පීඨය පිහිටා ඇති භූමි ප්‍රදේශය තුළ පිහිටි ටැක්ටිකල් එරියා ඔෆ් රෙස්පොන්සිබිලිටි (Tactical aria of responsibility) නැමැති ප්‍රදේශය තුළ පිහිටා ඇත. මෙහි කාලතුවක්කු අංගන 3ක් එකිනෙකට මීටර් 100ක පමණ පරතරක් සිටිනසේ පිහිටා ඇත.

මුල් අවස්ථාවේ දී විශේෂ විමර්ශන ඒකකය (SIU) මගින් පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති අතර ඉන් පසුව සමූහ මංකොල්ල විමර්ශන

අංශය මගින් පරීක්ෂණ සිදු කර බී 732/2009 නඩුවට වැඩිදුර වාර්තා 29 ක් ගොනු කර ඇත. මෙම වැඩිදුර වාර්තා පැ.22 (1) සිට පැ 22 (29) දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව මෙම ළමුන් 11 දෙනා පැහැර ගැනීමේ සිද්ධියට අදාළ විමර්ශනය ආරම්භ කර ඇත්තේ කොළඹ අපරාධ කොට්ඨාසය විසිනි. ඒ අනුව කොළඹ අපරාධ කොට්ඨාසය විසින් 2009.06.01 දින අංක 7බී 732/09 දරණ වාර්තාව මගින් මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇති අතර වැඩිදුර වාර්තාවක් 2009.06.03 දින ඉදිරිපත් කර ඇත. මෙම බී වාර්තා පැ.21 සහ පැ.21 (අ) ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඉන් පසුව පරීක්ෂණ කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන ඒකකය විසින් සිදු කර ඇති අතර 2014.07.22 දින වන විට විශේෂ විමර්ශන ඒකකයේ පොලිස් පරීක්ෂක රංජිත් මුණසිංහ විසින් වැඩිදුර වාර්තා 29 ක් බී 732/2009 නඩුවට ගොනු කර ඇත. මෙම වැඩිදුර වාර්තා 29 පැ.22 (1) සිට පැ.(29) දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2014.07.22 දිනෙන් පසුව ඊළඟ වාර්තාව ගොනු කර ඇත්තේ 2015.01.21 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශයේ ස්ථානාධිපති නිශාන්ත ද සිල්වා විසින් එයට යොදවන්නේ 2015.01.08 වන දින නව රජය බලයට පත්වීමෙන් පසුව මෙම පරීක්ෂණය විශේෂ විමර්ශන ඒකකයේ පොලිස් පරීක්ෂක රංජිත් මුණසිංහ මහතාගෙන් ඉවත් කර පරීක්ෂණ කටයුතු නිශාන්ත සිල්වාට භාර කිරීමය. ඒ අනුව පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා 2015.02.26 දින ගන්සයිට් ප්‍රදේශයට ගෝඨා කඳවුර

යන අන්වර්ථ නාමය ලබා දී ඇත. 2015.01.21 දින සිට 2015.02.19 දින වන විට නිශාන්ත සිල්වා විසින් වැඩිදුර වාර්තා 5 ක් අධිකරණයට ඉදිරිපත් කර ඇතත්, මෙම එක් වාර්තාවකවත් ගන්සයිට් ප්‍රදේශය ගෝයා කඳවුර යන අන්වර්ථ නාමයෙන් හඳුන්වා දී නොමැත. 2015.01.21 දින සිට 2015.02.19 වන දින දක්වා ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තා 5 පැ.23 (1) සිට පැ.23 (5) දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2017 වසරේ පැමිණිලිකරුගෙන් කටඋත්තර ලබා ගත් අවස්ථාවේ දී ද තමන්ට ළමුන් 11 දෙනා පැහැර ගැනීමට කිසිදු සම්බන්ධතාවයක් නොමැති බව ශානි අබේසේකරට සහ නිශාන්ත ද සිල්වාට ප්‍රකාශ කර ඇති අතර පැමිණිලිකරුගේ බල ප්‍රදේශය නැගෙනහිර නාවික බල ප්‍රදේශය බැවින් එවැනි පැහැර ගැනීමකට තමන්ට කිසිදු සම්බන්ධතායක් නොමැති බවට ප්‍රකාශ කර ඇත. ශානි අබේසේකර සහ නිශාන්ත ද සිල්වා ප්‍රශ්න කරමින් ප්‍රකාශ ලබා ගැනීමට උත්සාහ කළ අකාරය පැමිණිලිකරු නිරීක්ෂණය කර ඇති අතර ඔවුන්ගේ ප්‍රශ්න කිරීමේ රටාව අනුව ඔවුන් කිසියම් අයෙකුගේ සැගවුණු පරමාර්ථයක් ඉෂ්ඨ කර ගැනීම සඳහා ප්‍රශ්න කරන බවට පැමිණිලිකරුට අවබෝධ වී ඇත.

ගන්සයිට් ප්‍රදේශයේ සිදු කරන ලද සීමිත රහස් බුද්ධි ක්‍රියාවන්, ඒවා සිදු කළ ස්ථාන, ඒවා දැන සිටි පුද්ගලයින්, අධාරදුන් පුද්ගලයින් පිළිබඳව ශානි අබේසේකර සහ නිශාන්ත ද සිල්වා විසින් පැමිණිලිකරුගෙන් ගැඹුරින් ප්‍රශ්න කර ඇති අතර එම අවස්ථාවේ දී තමන් සතුව ජාතික ආරක්ෂාව වෙනුවෙන් සංවේදී හා සංකීර්ණ තොරතුරු රාශියක් ඇති බවත්, නාවික හමුදා මූලස්ථානයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අනු

දැනුම නැතිව ඒ පිළිබඳව ප්‍රකාශ කළ නොහැකි බවට පැමිණිලිකරු ඔවුන් දෙදෙනාට පවසා තිබේ. නිශාන්ත ද සිල්වා රටින් පැනගොස් ඇත්තේ එලෙස රැස්කර ගත් බුද්ධි තොරතුරු සමඟ බවද පසුව හෙළිවී ඇත. ඒ පිළිබඳව වාර්තා කර ඇති පුවත් පත් වාර්තා 04 ක් පැ.24 (1) සිට පැ.24 (4) දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2012 මාර්තු මස 02 වන දින නැවතත් පැමිණිලිකරු ශානි අබේසේකර විසින් කැඳවා ළමුන් 11 දෙනා අතුරුදහන් කිරීමට අදාලව විමසනදේට පමණක් පිළිතුරු සපනය ලෙසටත් විශේෂයෙන්ම ඊළම් යුද්ධය සම්බන්ධයෙන් එම ගන්සයිට් කඳවුර අශ්‍රිතව සිදු කළ බුද්ධි ක්‍රියාන්විත වලට එවකට නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අධික්ෂණය යටතේ එය සිදුවන බවත් ප්‍රකාශයක් ලබා දී ගෙදර යන ලෙසටත් එසේ නොවේ නම් රක්ෂිත බන්ධනාගාර ගත කරන බවටත් ශානි අබේසේකර පැමිණිලිකරුට පවසා ඇත. අවුරුදු 30 ක යුද්ධය නිමා කළ දේශපාලන සහ යුධ නායකත්වය පවා දීමට නොහැකි බව පවසා පැමිණිලිකරු එවැනි ප්‍රකාශක් ලබා දීම ප්‍රතික්ෂේප කළ බැවින් ඔහු අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. ශානි අබේසේකර සහ නිශාන්ත ද සිල්වා ඉතා පැහැදිලි ලෙසම කිසියම් දේශපාලන අරමුණක් ඉටු කර ගැනීම සඳහා තමන්ගෙන් මෙවැනි ප්‍රකාශයක් ලබා ගැනීමට උත්සාහ ගත් බවට තමන් පැමිණි නිගමනය රංජන් රාමනායක සහ නිශාන්ත සිල්වා අතර ඇති වූ දුරකථන සංවාදයක හඬ පටයකින් සනාථ වන බවට පවසමින් එම හඬ පටිය පටිගත කළ සිඩී තැටියක් පැ.25 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළ අතර එය කොමිෂන් සභාවේ වාදනය කරවන ලදී.

පැමිණිලිකරු බී 732/2009 නඩුවට ඉදිරිපත් කරමින් ගොනු කළ වැඩිදුර වාර්තාව පැ.26 ලෙස සලකුණු කරන ලදී. මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කළ පැමිණිල්ලක (04/2020) පැමිණිලිකරු වූ තිළිණ ගමගේ මහතා විසින් කොමිෂන් සභාව වෙත 2020.02.20 දින ලබාදුන් සාක්ෂි වල කොටසක් පැ.27(1) සහ පැ.27 (2) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පැමිණිකරු වැඩිදුරටත් සඳහන් කලේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් රංජන් රාමනායකට වැදගත් රහස්‍ය ලියවිල්ලක් භාර දී ඇති බවත්, නිශාන්ත සිල්වා දැන් ස්විස්ටර්ලන්තයට පැන ගොස් සිටින බවත්, ජාත්‍යන්තර දෙමළ ඩයස්පෝරාව එල්.ටී.ටී.ඊ. මතවාද ඉදිරියට ගෙන යාමට තදින්ම උත්සාහ කරන මෙවැනි කාල පරිච්ජේදයක එම බුද්ධි ලේඛන පාවිච්චි කරමින් එල්.ටී.ටී.ඊ. ජාත්‍යන්තර ජාලයට ලංකාවේ බුද්ධි අංශ අඩපණ කළ හැකි බවටත්, දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ බුද්ධි නිළධාරීන් 68 දෙනෙකු ප්‍රකාශ සටහන් කරගෙන ඇති බැවින් සහ ඔවුන්ගේ පෞද්ගලික විස්තර, ඇඟිළි සලකුණු ද සමග ලබා ගෙන ඇති බැවින් එම බුද්ධි නිලධාරීන්ගේ හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ගේ ජීවිත බරපතළ අවධානමකට මුහුණපා ඇති බවටත් සඳහන් කළේය.

පැමිණිලිකරු ඇතුළුව තවත් නාවික හමුදාවේ උසස් නිලධාරීන් කිහිපදෙනෙකුට එරෙහිව ළමුන් 11 දෙනෙකු අතුරුදහන් කළ බවට නඟන අසත්‍ය චෝදනාව පිටුපස ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් තිබෙන බවටත්, ඒ බවට ඉදිරිපත් කළ හැකි හොඳම සාක්ෂිය වන්නේ මෙම කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිලිකරුවෙකු වශයෙන් සාක්ෂි දී ඇති දැනට වැඩ තහනමට ලක්ව සිටින මහේස්ත්‍රාත් තිළිණ ගමගේ

මහතාගේ සාක්ෂිය බවටත් ප්‍රකාශ කරමින් තිළිණ ගමගේ මහතාගේ එම සාක්ෂි කණ්ඩය සාක්ෂි වශයෙන් මෙහෙයවන ලදී. තිළිණ ගමගේ මහතාගේ සාක්ෂියේ සඳහන් කරන අන්දමට මෙම ළමුන් 11 දෙනා අතුරුදහන් කිරීම පිළිබඳ නඩුව ඔහු ඉදිරියේ කැඳවනු ලැබූ අවස්ථාවේ දී බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයේ නිලධාරියෙකු විසින් මහේස්ත්‍රාත්වරයාට ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, මහේස්ත්‍රාත්වරයා එම නිලධාරියාට තදින්ම අවවාද කළ බවටත් සාක්ෂි ලබා දී ඇත.

2015 පෙබරවාරි මාසයේ දී ගන්සයිට් ප්‍රදේශයට ගෝඨ කඳවුර යන අන්වර්ථ නාමය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දීමෙන් පසුව 2015.11.12 දින බී 732/2009 නඩුවට වැඩිදුර වාර්තාවක් ගොනු කරමින් ගන්සයිට් ප්‍රදේශයට නිරීක්ෂණ කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූත පිරිසකට ඉඩ ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත. එම දූත පිරිසට විදේශීය ජාතිකයින් 6 දෙනෙකු සහ ශ්‍රී ලාංකිකයන් 02 නෙකු ඇතුලත්ව ඇත. ශ්‍රී ලාංකිකයන් දෙදෙනා නම්

1.එම්. සත්‍යමුර්ති

2. ඇන්ටනී ශ්‍රී විජේරත්න

යන පුද්ගලයින් දෙදෙනා වූ අතර විදේශීය ජාතිකයින් 06 දෙනා

1. Mr. Bernard Duhaime
2. Mr. Ariel Dulitzky
3. Mr. Tae Ung Balk
4. Mr. Ugo Cedrangolo

5. Mr. Gabriela Guzman

6. Mr. Pradeep Wagie

යන පුද්ගලයින් පැ.29 වැඩිදුර වාර්තාවේ සඳහන් කර ඇත්තේ "මෙතෙක් සිදු කරන ලද විමර්ශණ කටයුතු වලදී අනාවරණය වුයේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතාගේ පුද්ගලික ආරක්ෂක නිලධාරියා වූ හිටපු ලුතිනන් කමාන්ඩර් නිලන්ත සම්පත් මුණසිංහ යන අයගේ අධික්ෂණය යටතේ තිබූ ආරක්ෂක කණ්ඩායම විසින් සහ එම ආයතනයේ විශේෂ රාජකාරි සඳහා අනුයුක්තව සිටි ලුතිනන් කර්නල් හෙට්ටිආරච්චි මුදියන්සේලාගේ ප්‍රසාද් චන්දන හෙට්ටිආරච්චි විසින් මෙහෙය වූ විශේෂ බුද්ධි සාමාජිකයින් විසින්" ළමුන් 11 දෙනා පැහැර ගෙන ඇති බවයි. මේ අනුව අදාළ වරදට වගකිවයුතු ප්‍රධාන පුද්ගලයින් ලෙසට මෙම බී වාර්තාවේ දක්වා ඇත්තේ සුමිත් රණසිංහ සහ හෙට්ටිආරච්චි යන දෙදෙනා සහ ඔවුන් විසින් මෙහෙයවන විශේෂ බුද්ධි නිලධාරීන්වේ. නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ හෝ රියාර් අද්මිරාල් ඩී.කේ.පී.දසනායකගේ කිසිදු සම්බන්ධතායක් මෙමබී වාර්තාවෙන් සඳහන් කර නොමැත.

එක්සත් ජාතින්ගේ සංවිධානයේ නිලධාරීන් පිරිසක් ත්‍රිකුණාමල කඳවුර නිරීක්ෂණය කිරීමට ඉඩදීම තුළින් 30 අවුරුදු යුද්ධය නිමාකළ දේශපාලන නායකත්වය සහ යුධ නායකත්වය විසින් යුධ අපරාධ කළ බවට චෝදනා කර ඔවුන් සිරකර තැබීමේ මුලික අඩිතාලම ලෙසට මෙය සිදු කර ඇති බවට සාක්ෂි වලින් අනාවරණය වී ඇත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි විශ්ලේෂණය කිරීමේ දී පැහැදිලිව අනාවරණය වන්නේ පෘතුගීසි, ලන්දේසි යුග වලදී සැකසුණු කාලතුවක්කු

අංගනයක් සහ එහි ආයුධ ගබඩා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිරකඳවුරු බවට පරිවර්ථනය කර සැකසීමත්, ඉන්පසු එය වධකාගාරයක් බවට පරිවර්ථනය කිරීම සඳහා අවශ්‍ය පසුබිම සැකසීමට අවශ්‍ය කෙරෙන ඇටකටු හඳුන්වා දෙමින් එය මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමත්, එලෙස සැකසෙන ස්ථනා ජාත්‍යන්තර නියෝජිතයින්ගේ නිරීක්ෂණයට භාජනය කරමින් සිද්ධින් පෙළ ගැස්වීම බිහිසුණු කුමන්ත්‍රණකාරී ක්‍රියාදාමයක ආරම්භයක් සනිටුහන් කර ඇති බවයි.

එක්සත් ජාතින්ගේ සංවිධානයේ නියෝජිතයින් ත්‍රිකුණාමල භූගත අවි ගබඩා පරීක්ෂා කිරීමට අවසර ලබා ගත්තේ කෙසේද යන පැනය මත පුවත්පත් වල පළ කෙරුණු මාධ්‍ය වාර්තා 02 ක් පැ.30 සහ පැ.30 (අ) ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එක්සත් ජාතින්ගේ සංවිධානයේ නියෝජිතයින් විසින් සිදු කළ පරීක්ෂණ වලින් පසුව 2016.01.13 වන දිනෙන් වැඩිදුර වාර්තාවක් ගොනු කර ඇත. පැ.31 දරණ එම වැඩිදුර වාර්තාවේ 02 පිටුවේ පළමු ජේදයේ සඳහන් කර ඇත්තේ “ පෙර නඩු දිනයේදී, ගරු අධිකරණයෙන් ලබාගන්නා ලද නියෝග ප්‍රකාරව මා, ඇතුළු නිළධාරීන් කණ්ඩායමක් 2015.11.14 වන දින සිට 2015.11.18 දින දක්වා කාලය තුළ ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරෙහි නාවික හා සාගරික විද්‍යාපීඨයයේ පවත්වාගෙන යන ලද සන්සයිඩ් නැමැති භූගත සිරමැදිරි ප්‍රදේශය, IWS කුළුණු පිහිටි ස්ථානය, ශ්‍රී ලංකා නාවික තථාකාංගනය, SBS හෙවත් විශේෂ ප්‍රහාරක බලසන ආයතනය පිහිටි ස්ථාන වලට ගොස් විමර්ශන සිදු කරන ලදි ”යනුවෙනි. එනම් මෙම පරීක්ෂණයේ දී භූගත සිරමැදිරියක මතුපිට සිමෙන්ති පොළොව මත

තිබි කුඩා ප්‍රමාණයේ අස්ථි කොටස් කිහිපයක් නිරීක්ෂණය කර සොයා ගත් බවත්, ඒවා රස පරීක්ෂක වෙත යවා වාර්තාවක් ලබා ගැනීම සිටින බවත් සඳහන් කර ඇත.

පැහැර ගැනීමට ලක්වූ පුද්ගලයින් පරිහරණය කරන ලද දුරකථන අංක කිහිපයක් පැ.31 ලේඛනයෙහි සඳහන් කර ඇති අතර ඒ පිළිබඳව අදාළ දුරකථන සමාගමෙන් ඇමතුම් වාර්තාවක් ලබා ගැනීමට ද ඉල්ලා ඇත. එම වැඩිදුර වාර්තාවේ 4 වන පිටුවේ පැමිණිලිකරු එම දුරකථන අංක වල විස්තර සඳහන් කර ඇති අතර එම තොරතුරු අනුව එම දුරකථන අංක එකක්වත් පැහැරගත් පුද්ගලයින්ගේ නමට ඇති දුරකථන අංක නොවේ. එම අංක වෙනත් පුද්ගලයින්ගේ නම් වලින් ඇති දුරකථන අංක වේ. එම දුරකථන අංක පැහැරගත් පුද්ගලයින් හා සම්බන්ධ බව දැක්වීමට එකී වැඩිදුර වාර්තාවේ සඳහන් කර ඇති කාරණා පිළිගැනීමට ඉතා අසීරු, කිසිදු සනාථ කිරීමක් නැති මනඃකල්පිතයන් සේ දිස්වේ. පැ.31 වැඩිදුර වාර්තාවේ දක්වා ඇති කරුණු කිසිවක් සනාථ කෙරෙන කරුණු සොයාගත් බවට එහි සඳහන්ව නැත. එබැවින් පැ.31 හි අඩංගු කරුණු කිසිදු පුද්ගලයෙකුට එරෙහිව චෝදනා කිරීමට යොදා ගත නොහැකිය.

පැ.31 හි 4 වන පිටුවේ 2 වන ඡේදයේ සඳහන්කර ඇති රාජීව් නාගනාදන් 2009.04.02 සිට 2009.05.21 දක්වා 071-5538864 ජංගම දුරකථනය ඔස්සේ සබඳතා පවත්වා ඇති බවට සඳහන් කර ඇතත් එම කරුණු අසත්‍ය බවට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශයකින් සනාථ වී ඇත. එසේම පැ.31 හි දක්වා ඇති අන්දමට දුරකථන වාර්තා ලබා ගැනීමට ඩයලොග් සමාගමේ ප්‍රේමසිරි රත්නායක නිලධාරියා වෙත විස්තර නිකුත් කළ බවට සඳහන් කර

ඇතත් එසේ එවැනි විශේෂ පුද්ගලයෙකු නම් කර තෝරා ගත්තේ කුමන පදනමක් මතද යන්න බරපතල සැකයකට තුඩු දෙන කරුණකි. එම වාර්තාවේ දැක්වෙන් අනිකුත් දුරකථන අංකද, ඒ පිළිබද විස්තර අනුව ඒවාද තුන්වන පුද්ගලයෙකුට අයත් දුරකථන අංකවේ. ගන්සයිට් ප්‍රදේශයේ භූගත සිරමැදිරියේ සිමෙන්ති පොළව මත තිබී සොයාගත් බවට සඳහන් කළ ඇටකටු කුඩා වන සතෙකුගේ ඉහටිය ප්‍රදේශයෙන් ඇටකටු කැබලි බවට රස පරීක්ෂක වාර්තා කර ඇති බව පැ.33 වැඩිදුර වාර්තාවෙන් අධිකරණයට වාර්තා කර ඇත.

පැ.33 වැඩිදුර වාර්තාවේදී දුරකථන අංක කිසිවක් පරීක්ෂා කර සොයා ගත් බවට වාර්තා කර ඇතත් ඒවා තුන්වන පුද්ගලයෙකුට අයත් දුරකථන අංක වේ. එහි දක්වා ඇති වාහන සමඟ කිසිවෙකුගේ සම්බන්ධතාවයක් දැක්වෙන කිසිදු පිළිගත හැකි කරුණක් පැ.33 වාර්තාවේ අන්තර්ගතව නැත.

පැ.33 වැඩිදුර වාර්තාවේ 3 පිටුවේ අවසන් ඡේදයෙහි මෙසේ සඳහන් කර ඇත. "මා විසින් සිදුකරනු ලබන පුද්ගලයන් පැහැරගෙන ගොස් කප්පම් ලබාගැනීම සහ එසේ පැහැරගත් පුද්ගලයන් අතුරුදහන් කිරිමට සම්බන්ධ වු විමර්ශණයේ මෙතෙක් අනාවරණයවි ඇති තොරතුරු ඔස්සේ අඛණ්ඩව විමර්ශන කටයුතු සිදුකරමින් පවතින අතර, එහිදි අනාවරණය වු තොරතුරු අනුව පුද්ගලයින් 11 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් ශ්‍රී ලංකා නාවික හමුදා නෞකා පරක්‍රම ආයතනයේ රජකාරි කටයුතු කළ ලුතිනන් කර්මාන්ඩර් හෙට්ටිආරච්චි නිලධාරියා ඇතුළු කණ්ඩායම සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතාගේ ආරක්ෂක නිලධාරියාව සිටි ඔබතුමන්ගේ ගරු අධිකරණයේ පෙනි සිටින

සැකකරු හිටපු ලුතිනන් කර්මාන්ඩර් මුණසිංහ ආරච්චිගේ දොන් නිලන්ත සම්පත් මුණසිංහ යන අය යටතේ සිටි අවේක්ෂණ කණ්ඩායමේ සාමාජිකයන් විසින් පැහැරගෙන ගොස් ශ්‍රී ලංකා නාවික නෞකා පරක්‍රම ආයතනයේ පිට්ටු බම්බුව නමින් හඳුන්වනු ලබන ස්ථානයක නීති විරෝධී ලෙස රඳවා තබාගෙන ඇති බවට අනාවරණය වී ඇත.” මෙම සොයා ගත් කරුණු අනුව පැහැරගත් පුද්ගලයින් ත්‍රිකුණාමල කඳවුරේ ගන්සයිට් ප්‍රදේශයේ භූගත සිරමැදිරිවල සිරකර තබා ගෙන නොමැත.

යහපාලන රජය බලයට පත්වී දින තුනකට පසුව එනම් 2015.01.11 වන දින ළමුන් 11 දෙනෙකු පැහැර ගැනීමේ නඩුවේ ප්‍රධාන සාක්ෂිකරුවෙකු වූ ලුතිනන් කමාන්ඩර් වෙලගෙදර නේවි මැරිටයිම් ඇකඩමි කඳවුරේ විධායක නිලධාරියා ලෙසට පත්වීම් ලබා ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරට ගොස් ඇත. වෙලගෙදරගේ ජීවදත්ත ලේඛනය හා කාර්යභාර ලේඛනය පැ.34 සහ පැ.34 (අ) ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එක්සත් ජාතීන්ගේ නියෝජිත පිරිස ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරේ ඝන්සයිට් ප්‍රදේශය නිරීක්ෂණය කිරීම සඳහා රැගෙන යාමට ප්‍රථම සාක්ෂිකරුවන් 20 දෙනෙකුද රැගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා, පොලිස් පරීක්ෂක ඉලංගසිංහ සහ පොලිස් සැරයන්වරුන් දෙදෙනෙකු සහ කොස්තාපල්වරුන් තිදෙනෙකු සමඟ ස්ථාන පරීක්ෂණයකට ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරේ ගන්සයිට් ප්‍රදේශයට ගොස් 2015.04.21 සිට 2015.04.28 දක්වා කාලය තුළ එම ප්‍රදේශය පරීක්ෂා කර එම ප්‍රදේශයේ භූගත සිරමැදිර මුද්‍රා තබා පැමිණ ඇත. මෙම

කරුණු ඇතුළත් කරමින් වැඩිදුර වාර්තාවක් 2015.05.22 දිනෙන් අධිකරණයට ඉදිරිපත් කර ඇත. එම වැඩිදුර වාර්තාව පැ.35 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.35 වැඩිදුර වාර්තාවේ සඳහන් අන්දමට සාක්ෂිකරුවන් 18 දෙනෙකු විසින් ගන්සයිට් ස්ථානය භූගත සිරමැදිරි ලෙසට පෙන්වා දුන් බවට සඳහන් කර, සිරමැදිරිවල සිවිල් පුද්ගලයින් සිටිනවා දුටු බවට සඳහන් කර ඇතත්, ඔවුන් එසේ දුටු දිනයන් සඳහන් කර නොමැත. ඔවුන් සියලුදෙනා ගන්සයිට් ප්‍රදේශයට පැමිණි බවට සඳහන් කළත් ඔවුන් එසේ සිවිල් පුද්ගලයින් දුටුවායැයි සඳහන් කරන දිනයේ ඔවුන් ගන්සයිට් ප්‍රදේශයට පැමිණියේ කුමන කරුණක් නිසාද යන්න විමර්ශන නිලධාරීන් සොයා බලා නැත. එබැවින් මෙම සාක්ෂිකරුවන් විසින් පසු අවස්ථාවක විමර්ශන නිලධාරීන් සමඟ පමණක් ගොස් සිදු කළ ස්ථාන පරීක්ෂණය හඳුනා ගනිමින් කිසිසේත් අපක්ෂපාති සාක්ෂි ලෙසට පිළිගත නොහැකි අතර ඒවා පැහැදිලි ලෙසම සකස් කරන ලද සාක්ෂි ලෙසට විද්‍යාමනා වන අතර ඒ බව පැ.35 වැඩිදුර වාර්තාවෙහි තුන්වන පිටුවෙහි පළමු ඡේදයෙන් සනාථවේ. එහි පළමු ඡේදය මෙසේය. " ඉහත සාක්ෂිකරුවන් අතරින් 2015.04.22 දින සිට 2015.04.25 දින දක්වා ශ්‍රී ලංකා නාවික තටාකාංගනයේ ත්‍රිකුණාමළය කදවුරේ නාවික හා සාගරික විද්‍යාපීඨය පිහිටි ප්‍රදේශය තුල පිහිටුවා ඇති ගන්සයිට් නමින් හඳුන්වන භූගත සිරමැදිරි හා එම ප්‍රදේශය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති ප්‍රකාරයන් මත එම ස්ථාන නිරීක්ෂණය කර, සාක්ෂිකරුවන්ගේ නැවත ප්‍රකාශ සටහන් කර ගන්නා ලදි. එම සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල සාරාංශ ඔබතුමාගේ ගරු අවධානය සඳහා පහත පරිදි ඉදිරිපත් කරමි."

ඒ අනුව සාක්ෂිකරුවන් සමඟ ස්ථාන පරීක්ෂණයෙන් පසුව ඔවුන්ගේ කටඋත්තර නැවත ලියා ගැනීම තුළින් පැහැදිලි වන්නේ පරීක්ෂණ නිලධාරීන්ට අවශ්‍ය කරන ප්‍රකාශ සකස් කර සාක්ෂිකරුවන්ගෙන් ඊට අත්සන් ලබා ගෙන ඇති බවයි. එසේම සාක්ෂිකරුවන් සමඟ ගොස් ස්ථාන පරීක්ෂණයක් සිදු කර ඇත්තේ සිද්ධිය සිදු වී අවුරුදු 06 කට පසුවය.

එසේම වසර 06 කට පසුව සාක්ෂිකරුවන් යැයි කියාගත් පිරිසක් සමඟ ගොස් අපරාධ ස්ථානය පරීක්ෂා කළේ කුමන නීතියක් යටතේ ද යන්න වැඩිදුර වාර්තාව තුළින් පැහැදිලි කර නැත. ගන්සයිට් ප්‍රදේශය පරීක්ෂාවට ලක් කළ දින 07 ක කාලය තුළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ සාක්ෂිකරුවන් නවාතැන් ගත් ස්ථාන හා ආහාරපාන ගත් ස්ථාන කිසිවක් වැඩිදුර වාර්තාවේ සඳහන්ව නැත.

පැ.35 වාර්තාවේ සඳහන් අන්දමට භූගත සිරකඳවුරු මුද්‍රා තබා එම මුද්‍රා තැබූ සිරමැදිරි වල ආරක්ෂාව සැලසෙන ලෙසට කඳවුර භාර අණදෙන නිලධාරියා දැනුවත් කර ඇත. එලෙස මුද්‍රා තබා ඇති එක් සිරමැදිරියකින් ඊට මාස 07 කට පසුව ඇටකටු හමුවී ඇත. මේවා මිනිස් ඇටකටු බවට සැක කරන බවට දැවැන්ත ප්‍රචාරයක් ලබා දී ඇත. එසේ වුවත් ඩී.එන්.ඒ පරීක්ෂණයේ දී එම ඇටකටු කුඩා වන සතෙකුගේ ඉඟ ප්‍රදේශයේ ඇටකටු බවට තහවුරු වී ඇත.

එසේම තවත් අසත්‍ය කථාවක් බී වාර්තාවේ අවසන් පිටුවේ පහත සඳහන් අයුරින් සඳහන් කර ඇත; එනම් , “ මෙම විමර්ශනය සිදු කිරීමේදී සාක්ෂිකරු සාමාන්‍ය නැවි බී.එම්.විජේකාන්ත, යන අය විසින් ඔහු සිරගතකර සිටින ලද, ත්‍රිකුණාමළය ශ්‍රී ලංකා නාවික

තටාකාංගන කඳවුරු ප්‍රදේශයේ ඇති ගන්සයිට් නමින් හඳුන්වනු ලබන භූගත සිරකුටිය තුළ ඔහු සමඟ කෑගල්ලේ ශාන්ත සමරවීර සහ ඉබ්බාගමුවේ ප්‍රදීප් යන දෙදෙනෙකු සිටි බවට අනාවරණය කරන ලදී. කෑගල්ලේ ශාන්ත සමරවීර යන අය විසින් බී.එම්.විජේකාන්ත යන අය නිදහස්ව යන දිනයකදි ශාන්තගේ නිවසට ලබාදෙන ලෙසට දන්වමින් සබන් කොළයක ලියන ලද දුරකථන අංක හා නම් සහිත කොළයක් ලබාදී ඇති අතර, එය ඔහු විසින් මා වෙත විමර්ශන කටයුතු සඳහා භාරදි ඇත. මා විසින් ගන්සයිට් සිරකුටි නිරීක්ෂණය කිරීමේදී මා වෙත ලබාදෙන ලද ඉහත සඳහන් කොළයේ ඇති අත්අකුරු වලට සමාන අත්අකුරු සිරකුටියේ බිත්තියේ තිබී නිරීක්ෂණය වූ අතර, එම සිරමැදිරි මා විසින් මුද්‍රා තබන ලදී.” මේ අනුව ශාන්ත සමරවීර විසින් නම හා දුරකථන අංකය ලියා දුන් සබන් කොළය අවුරුදු 06 කට ආසන්න කාලයක් විජේකාන්ත විසින් ප්‍රවේශම් කර තබා ගෙන ඇත. එම සබන් කොළය මෙම ළමුන් අතුරුදහන් වීම පිළිබඳව මුලින්ම පරීක්ෂණ පැවැත්වූ නිලධාරීන්ට විජේකාන්ත විසින් ලබා දී නැත. මෙසේ නොදුන්නේ කුමන හේතුවක් නිසාද යන්න පැහැදිලි කර නැත. එසේම මෙම සබන් කොළය ප්‍රදර්ශන භාණ්ඩයක් වන බැවින් එය අධිකරණයට වහාම ඉදිරිපත් කළ යුතු වුවත් පැ.35 වැඩිදුර වාර්තාවෙන් එම සබන් කොළය පරීක්ෂණ පැවැත්වීමට අධිකරණ නියෝග ඉල්ලා නැත. එසේ සබන් කොළයේ අත්අකුරු වල අනන්‍යතාවය පරීක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සහ සැකකටයුතු ලේඛන පිළිඳව රෙජිස්ට්‍රාරයෙන් වාර්තාවක් කැඳවීමට අධිකරණයෙන් සුදුසු නියෝගයක් ලබා ගැනීමටත් ක්‍රියාකර නැත. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ඉතා බිහිසුනු කුමන්ත්‍රණයක නිරතව ඇති බව ඉහත කරුණු නිරීක්ෂණයේදී මැනවින් පැහැදිලි වේ.

මෙම ගන්සයිට් නැමැති ප්‍රදේශය අංක 1,2,3 වශයෙන් කොටස් 3 කින් සමන්විත වන අතර එයින් ගන්සයිට් 3 වන කොටසේ නාවික විද්‍යාපීඨය පිහිටා ඇත. නිශාන්ත ද සිල්වා සාක්ෂිකරුවන් සමඟ ගොස් ගන්සයිට් 1 සහ 2 ප්‍රදේශ පරීක්ෂාවට ලක් කර ඇත. පැමිණිලිකරු, ඔත්තුකරුවන් සමඟ ගොස් ගන්සයිට් 02 ස්ථානයේ රැදී සිටිමින් තම බුද්ධි කටයුතු මෙහෙයවීම සිදු කර ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසුව විශේෂ බුද්ධි අංශයේ රාජකාරි කළ එම්.ඒ.ටී.මෙන්ඩිස්, කේ.ගාමිණි, පී.වී.එස්.ජේ.කුමාර සහ හෙට්ටිනන්ද යන පිරිස අත්අඩංගුවට ගෙන ඇත.

පී.වී.එස්.ජේ.කුමාර නැමැති නාවිකයා අත්අඩංගුවට ගෙන ඇත්තේ 2019 ජනවාරි හෝ පෙබරවාරි මුල් කාලයේ දීය. මෙම කාල සීමාවේදී ඔහු ඉතා සංවේදි බුද්ධි රාජකාරියක නිරතව සිට ඇත. එබැවින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටීමට ඔහුට 2019 පෙබරවාරි මස 25 පසු දිනයක් ලබා දෙන ලෙසට 2019.02.03 ලිපියෙන් ඉල්ලා ඇත. ඒ අනුව පී.වී.එස්.ජේ.කුමාරට 2019.02.26 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙසට දන්වා ඇත. මෙම ලිපි පිළිවෙළින් පැ.36 සහ පැ.37 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇති අතර ඉන් පසුව ඔහු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. ඒ හේතුව නිසා කුමාර යෙදී සිටි සංවේදී බුද්ධි ක්‍රියාන්විතය නතර වී ඇත.

පී.වී.එස්.ජේ.කුමාර යෙදි සිටි බුද්ධි ක්‍රියාන්විතය බාධාවකින් තොරව ඉදිරියට ගෙන යාමට හැකි වූයේ නම් ඔවුන්ට වනාත විල්ලු වවුලතිව් පොලිස් නිලධාරින් දෙදෙනාට පහර දුන් මුස්ලිම් අන්තවාදීන් සොයා ගැනීමට හැකියාවක් නැති බවත්, ඒ අනුව සහරාන් සොයා ගෙන

පාස්කු ප්‍රහාරය වැලැක්වීමට හැකියාවක් තිබූ බවට පැමිණිලිකරු සඳහන් කළේය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබූ මෙම පරීක්ෂණ සම්බන්ධයෙන් දේශීය සහ විදේශීය බලපෑම් බෙහෙවින්ම තිබුණු බවට පැහැදිලි සාක්ෂි අනාවරණය වන බවට මෙම කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කර ඇති අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ මහතා සහ රියර් අද්මිරාල් ඩී.කේ.පී. දසනායක මහතා යන දෙදෙනා විසින් ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි වලදී සාක්ෂි දෙමින් සඳහන් කර ඇති බවත් ඒ අනුව පැමිණිලිකරු සම්බන්ධයෙන් ද ඒ අයුරින්ම දේශීය හා විදේශීය බලපෑම් හේතුකොටගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකර ඇති බව පැහැදිලි වන බවත් සඳහන් කළේය.

රියර් අද්මිරාල් ඩී.කේ.පී දසනායක මහතා ඔහුගේ සාක්ෂියේදී වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ මෙම නඩුවේ පැමිණිලිකාර සුමිත් රණසිංහ මහතා අත්අඩංගුවට ගැනීම හා සම්ගාමීව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාවේ වාර්ෂික සමුළුව පැවැත්වුණු බවත් එම සැසිවාරයට ශ්‍රී ලංකාව වෙනුවෙන් සහභාගි වූ නියෝජිතයින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 30/1 යෝජනාවලියේ සම අනුග්‍රහයකයන් වශයෙන් ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා සුමිත් රණසිංහ මහතා අත්අඩංගුවට ගෙන ඇති බවටත් ප්‍රකාශ කළේය. (පැ.39,පැ. 40)

ජෙයරාජන් නැමැති කාන්තාවක් ජිනීවා ගොස් වසන්ත කරන්නාගොඩ මහතාට සහ ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව පුද්ගල පැහැර ගැනීම් පිළිබඳව සිදු කරන අසත්‍ය චෝදනාවක් පැ. 41 දරන 2018

මාර්තු 21 වන දින පුවත්පතෙහි පළ වී ඇත. මින් පැහැදිලි වන්නේ පැහැදිලි ලෙසම ශ්‍රී ලාංකික ද්‍රවිඩ ජනයා මුළා කර ගෙන ජාත්‍යන්තරය ගෝඨාභය රාජපක්ෂ මහතාට සහ වසන්තක කරන්නාගොඩ මහතාට එරෙහිව දැඩි දේශපාලන පළි ගැනීමේ ව්‍යාපාරයක නිරත වී ඇති බවය. එහි වඩාත් ශෝචනීය පැත්ත වන්නේ එවැනි චෝදනා රටට එරෙහිව සිදු කරන විට ඒවාට පිළිතුරු දීමට 2015 පත්වූ නව රජයේ නිලධාරීන් ඉදිරිපත් නොවීමය. එයින් පැහැදිලි වන්නේ එම රජය පැහැදිලි ලෙසම දේශපාලන පළි ගැනීමක නිරත වී ඇති බවය.

එසේම පැ. 42 වශයෙන් ඉදිරිපත් කර ඇති දෙදහස් 2018 අප්‍රේල් පලවන ඉරිදා දිවයින පුවත්පතෙහි ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ත්, වසන්ත කරන්නා කරන්නාගොඩ මහතාගේ සහ ඩී.කේ.පී දසනායක මහතාගේ ඡායාරූප සහිතව පළ කර ඇති වාර්තාව ජෙයනි නැමැති කාන්තාවගේ අසත්‍ය ප්‍රකාශයක් මත පදනම් කර ඇත. මෙම ප්‍රකාශය සිදු කිරීම සඳහා අවශ්‍ය කරුණු ඇයට ලබාදී ඇත්තේ ඇය සඳහන් කරන අන්දමට නිශාන්ත සිල්වා ප්‍රමුඛ පොලිස් කණ්ඩායම විසිනි. එම පුවතේ වාර්තාකරු සඳහන් කරන අන්දමට ඇයට එම ප්‍රකාශය සිදු කිරීම සඳහා මානව හිමිකම් කවුන්සලය තුළදී ද්‍රවිඩ ඊලාම් ත්‍රස්තවාදීන්ගේ සහාය ලැබී ඇති අතර මෙම ප්‍රකාශය සිදු කිරීම සැලසුම් සහගතව සිදු කර ඇත.

පැ. 43 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද 2020.06.28 වන දින ඉරිදා දිවයින පුවත්පතෙහි සඳහන් වාර්තාවෙහි මෙසේ දැක්වේ; යස්මින් සූකා නැමැත්තෙක් එක්සත් ජාතීන්ගේ සාම සාධක බලකාය වෙත පැමිණිල්ලක් යවමින් ශ්‍රී ලංකා යුධ හමුදා භටයින් සාමසාධක භටයින් ලෙස ලබා ගැනීම අත් හිටවන ලෙසට ඉල්ලා ඇති අතර

චෝදනා ලත් හමුදා නිලධාරීන් සර්වලෝක නීතිය යටතේ අත්අඩංගුවට ගන්නැයි ඉල්ලීමක් කර ඇත. පොලිස් පර පරීක්ෂක නිශාන්ත සිල්වාට එරහිව වදහිංසා සිදු කිරීමේ චෝදනා එකී යස්මින් සූකා නැමැත්තා විසින් සිදු කර ඇතත් ඔහුට එරෙහිව සර්වලෝක නීතිය යටතේ අත්අඩංගුවට ගන්නැයි ඉල්ලීමක් සිදු නොකර නිශාන්ත සිල්වාට සූරිච් නුවර දේශපාලන රැකවරණය ලබා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දී ඇත.

මෙම වාර්තාවන් අනුව පැහැදිලි වන්නේ ගෝඨාභය රාජපක්ෂ මහතාටත් වසන්ත කරන්නාගොඩ මහතාටත් ඩී.කේ.පී. දසනායක මහතාට එරෙහිව ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා ජාත්‍යන්තරය තුළ බරපතළ කුමන්ත්‍රණ පැවති බවත් ජාත්‍යන්තරය විසින් දැඩි දේශපාලන බලපෑම් සිදුකර ඇති බවත් ය.

බී 732/2009 නඩුවට 2017.03.13 දින ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තාවෙහි වෙලගෙදර නම් නාවික නිලධාරියා විසින් සිදුකරන ලද ප්‍රකාශයක සම්පිණ්ඩනයක් දක්වා ඇත. ඒ අනුව ගාමිණී සහ මෙන්ඩිස් යන නාවික නිලධාරීන් දෙදෙනා පොලිතින් උර දෙකක තිබූ පාර්සල් දෙකක් ගන් සයිට් සිට ගෙන ගොස් ට්‍රක් රථයකට පටවනවා දුටු බවත් ඒවා මෘතශරීර විය හැකි බවටත් ප්‍රකාශයක් කර ඇත. එසේ වුවත්, ලුතිනන් කමාන්ඩර් වෙලගෙදර පැමිණිලිකරුගේ දෙවන නිලධාරියා ලෙසට ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරට පැමිණ ඇත්තේ 2009.03.25 වන දිනදීය. වෙලගෙදර රාජකාරියට වාර්තා කරන විට මෙන්ඩිස් උතුරු ප්‍රදේශයේ උතුරු විධානයේ ඩෙල්ෆ්ට් දූපතේ වසභ නැමැති නාවික හමුදා කඳවුරේ සේවය කරමින් සිට ඇත. මේ අනුව

පැමිණිලිකරුට එරෙහිව මිනීමැරුම් චෝදනා ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි වෙලගෙදර අසත්‍ය ප්‍රකාශයක් සිදුකර ඇත.

පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සහ රාජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මහතා අතර සිදුවුන සාකච්ඡාවක හඬපටයක් 45 (1) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඔහුගේ උසස් වීමට අදාළ ලේඛන රන්ජන් රාමනායක මහතාට ලබා දීමත් ඒ අනුව රන්ජන් රාමනායක මහතා විසින් එකොළොස් දෙනෙකු අතුරුදන් කිරීමේ සිද්ධියට අදාළ නඩුවේ පරීක්ෂණය පිළිබඳ විස්තර පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ගෙන් ලබා ගැනීමත් සිදුකර ඇත.

පැමිණිලිකරු පොලිස් අත්අඩංගුවට ගැනීමට එරෙහිව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඔහුගේ බිරිය විසින් ඉදිරිපත් කර ඇතත් එයට යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැත. (පැ.48) එසේ පැමිණිලිකරුගේ භාර්යාව සහ ඩී.කේ.පී. දසනායක මහතාගේ භාර්යාව යන දෙදෙනා විසින් නීතිය සහ සාමය ආරක්ෂා කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට පැමිණිල්ලක් සිදුකර ඇතත් එයට ද ප්‍රතිචාරයක් ලැබී නොමැත. (පැ. 49)

2017 දෙසැම්බර් මාසයේදී, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිත පිරිසක් ලංකාවේ සංචාරය කරමින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවේ තබා ගෙන සිටින පුද්ගලයින් පිළිබඳව පැමිණිලි බාර ගැනීමක් සිදු කර ඇතත් ඔවුන් පැණිලිකරු සම්බන්ධව ඉදිරිපත් කළ පැමිණිල්ල භාර ගෙන නොමැති අතර ද්‍රවිඩ ඊලාම් ත්‍රස්තවාදීන්ගේ පැමිණිලි පමණක් භාර ගැනීම සිදු කර ඇත.

මෙම කරුණු වලින් පැහැදිලි වන එකම ස්ථාවරය වන්නේ අවුරුදු තිහක කුරිරු යුද්ධය අවසන් කළ දේශපාලන සහ යුද නායකත්වය ජාත්‍යන්තර යුධ අධිකරණය ඉදිරියට ගෙනයාම සඳහා සිදුකරන ලද කුමන්ත්‍රණයක ප්‍රතිඵලයය.

නාවික නිලධාරි එම්.ඒ.ටී.මෙන්ඩිස් මහතාගේ සාක්ෂි වලට අනුව ඔහු P.186 (P 129) දරණ වෙරලා රක්ෂක යාත්‍රාවේ අණභාර නිලධාරී ලෙස 2008.07.03 සිට 2009.03.18 දක්වා කටයුතු කරමින් නැගෙනහිර නාවික විධානයේ ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරේ සේවය කර ඇත. 2009.03.12 වන දින වයඹ නාවික කඳවුරු ආයතනයට ලැබුණු ස්ථාන මාරුව අනුව එහි සේවයට වාර්තා කර ඇති අතර එකී නාවික හමුදා කඳවුර උතුරු නාවික විධානයට අයත් විය. යුද්ධය දරුණුවටම පැවති පැවැති බැවින් වයඹ නාවික හමුදා කඳවුරට යාමට දින කිහිපයක් ගතවිය. ස්ථාන මාරු ලේඛනය පැ.15 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මේ අනුව දින 03 ක් වැඩ භාර ගැනීමට නිවාඩු ඉල්ලා එම කටයුතු ඉටු කර ඉන්පසු දින 08ක නිවාඩුවක් ඉල්ලා එම අනුමැතිය ලැබ ඇති අතර ඒ සඳහා ද අනුමැතිය ලැබී ඇත. 2009.03.25 වන දින සවස 6.00ට යාමට සූදානම් වන ලෙසට උපදෙස් ලැබී ඇත. 2009.03.26 සිට 2009.05.26 දක්වා නාවික නිලධාරි එම්.ඒ.ටී.මෙන්ඩිස් මහතා වයඹ නාවික හමුදා කඳවුරේ සේවය කර ඇත. ගමනේ ඇති අති දුෂ්කරතාවය සහ භයානක කම හේතුවෙන් මෙම කාලය තුළ කිසිසේත්ම වෙනත් කඳවුරකට යා නොහැකි වී ඇත. ඉන්පසුව 2009.05.27 සිට 2009.06.27 වන දින දක්වා කාලය තුල පූනාව කඳවුරේ ශික්ෂා ආයතනයේ නායකත්ව පුහුණුවකට ගොස් ඇති අතර ඉන්පසුව ලැබුනු

උසස්වීම් මත පුන්කුඩතිව් දූපතේ පිහිටි කඳවුරට ගොස් මාස 07 ක පමණ කාලයක් එහි සේවය කර ඇත. 2009.03.17 සිට 2010.02.10 කාලය තුළ ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරට ගොස් නැත. එම කාලය තුළ ඔහු උතුරු විධානයේ සේවය කර ඇත. වසභ කඳවුරට මුදු දුර ප්‍රවාහනය නාවික සැතපුම් 32 ක් පමණ වේ.

මේ අනුව කපිතාන් වෙලගෙදර සඳහන් කළ අන්දමටට මෙන්ඩිස් නැමැති නිලධාරියාට ගන් සයිට් ස්ථානයේ සිට සඳහන් කළ දිනයේදී කලු පාට උර ගෙන ගොස් ට්‍රක් රථයකට දැමීමේ හැකියාවක් නොමැත.

සාක්ෂිකාර දිසානායක මුදියන්සේලාගේ සම්පත් බණ්ඩාර දිසානායක 1997 දී ආධුනික නාවිකයෙකු ලෙස සේවයට බැඳි 2009 දී නැගෙනහිර විධානය නැව් තටාක කඳවුරේ E.W.Shell ස්ථානයේ සේවය කර ඇත. එහි සිදු කර ඇත්තේ එල්.ටී.ටී.ඊ. පණිවිඩ හුවමාරු ග්‍රහණය කිරීමය. මෙම කාලයේ ලුතිනන් කමාන්ඩර් වෙලගෙදර යටතේ සේවය කර ඇත. පැ.55 ලෙසට සාක්ෂිකරුගේ සේවා වාර්තාව ඉදිරිපත් කර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශයක් ලබා දීමට 2013.08.23 වන දින කැඳවා ඇත. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණි පසු පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් ප්‍රශ්න කර ඇත. ඡායාරූපය පෙන්වා විමසා ඇති නමුත් ඔවුන් නොහඳුනන බවට ප්‍රකාශ කර ඇත. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විවිධ කරුණු විමසා ඇතත් සත්‍ය කරුණු වාර්තා ගත නොකර සාක්ෂිකරු නොපැවසූ දේ සටහන් කර ගෙන ඇත.

ඉන්පසු 2015 වර්ෂයේ 04 වන මස නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මුණ

ගැසී ඇත. ඉන්පසුව එදින වෑන් රථයකින් ත්‍රිකුණාමල ප්‍රදේශයට තවත් සිවිල් ඇඳුමින් සැරසුණු පිරිසක් සමග නිශාන්ත සිල්වා හා නාවික සෙබල වෑන් රථයකින් ගමන් කරන අතරතුර මත්පැන් ලබා දී ඇත. බෝතල් මිලදී ගෙන ඇත්තේ නිශාන්ත සිල්වා විසිනි. මත්පැන් බෝතල් 18 ක් පමන මිලදී ගෙන ඇත. ත්‍රිකුණාමලයට යන විට මත්පැන් පානය නිසා සිහිය හොදින් තිබී නැත. එදින නිවාඩු නිකේතනයක ගත කර පසු දින උදයේ 9.00ට පමණ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ඇතුළු කිහිපදෙනෙක් පැමිණ සාක්ෂිකරු ඇතුළු පිරිස ගන්සයිට් වෙත ගෙන ගොස් ප්‍රකාශ සටහන් කර ඉන්පසු ගන්සයිට් ප්‍රදේශයේ යම් යම් ස්ථාන වලට අත දිගු කර ගෙන සිටින ලෙසට පවසා ඡායාරූප ගෙන ඇත. බාත්රූම් එකක් ලෙසට සහ සිමෙන්තියෙන් සෑදූ කුටියක් දෙසට අත දිගු කරන ලෙසට දැනුම් දී ඡායාරූප ගෙන ඇත. ස්ථාන සාක්ෂිකරු මීට පෙර දැක නොමැත. කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 732/2009 දරණ වාර්තාවේ පැමිණිලිකරුගේ නම සඳහන් ඡේදයෙහි සාක්ෂිකරු ප්‍රකාශ කළ බවට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් එකී වැඩිදුර වාර්තා වේ සඳහන් කර ඇති කරුණු කිසිවක් ඔහු සඳහන් කළ කරුණු නොවන බවත් එවැනි කරුණු තමන් සඳහන් නොකළ බවත් සාක්ෂියේ දී ප්‍රකාශ කර ඇත. මෙම කොටස පැ. 57 (අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ අනුව පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා අසත්‍ය කරුණු කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කර ඇත.

වෙලගෙදර හා සුමිත් රණසිංහ අතර හොඳ සබඳතාවක් තිබී නැත. වෙලගෙදර සහ නිශාන්ත සිල්වා අතර සිදුවූ යම් යම් සංවාද ශ්‍රවනය කර ඇත.

එසේම 2015.05.22 වන දින ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාවේ සඳහන් සාක්ෂිකරු ප්‍රකාශ කළා යැයි සඳහන් කර ඇති කරුණු වන "ගන් සයිට් නමැති ස්ථානයේ ටකරං වලින් ආවරණය කර වැට තිබූ ස්ථානය සහ ගේට්ටුව ද පිහිටි ස්ථානය පෙන්වා සිටියා, ඒවා දැනට දක්නට නොමැ, ඒ තුළ රැඳවියන් සිටි බවට ප්‍රකාශ කළා", යන ප්‍රකාශය ඔහු ප්‍රකාශ නොකළ බවටත් එය පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් ඉදිරිපත් කර ඇති අසත්‍ය ප්‍රකාශයක් බවටත් ප්‍රකාශ කර ඇත. මෙම වැඩිදුර වාර්තාව සහ එම ප්‍රකාශය පැ.58 ලෙසට සහ පැ.58(අ) ලෙසට සලකුණු කර ඇත.

සාක්ෂිකාර අබේකෝන් මහතාට නාවික හමුදා මූලස්ථානයට ලැබුණු නිවේදනය 2013.08.16 වන දින පැ.09ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කරන ලෙසට සිදු කළ දැන්වීමට එදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇත. 2009 අප්‍රේල මස නාවික තටාංගනයේ රාජකාරි පැවරි ඇත. ඊට පෙර යුද්ධයට දායක වෙමින් උතුරු ප්‍රදේශයේ සේවය කර ඇත. සාක්ෂිකරු ගන්සයිට් ප්‍රදේශයට ගොස් නැත. ඔහු එම ප්‍රදේශයේ තැන නොදනී. සාක්ෂිකරු පහරදෙන ප්‍රමාණයට තර්ජනය කර ප්‍රකාශ ලබා ගැනීමට උත්සාහ දරා ඇත.

12 වන වගඋත්තරකරුගේ සාක්ෂියට අනුව ඔහු 2008 සිට 2011 දක්වා කාල සීමාව තුළ නාවික හමුදා තටාංගනයේ බුද්ධි අංශයේ විද්‍යුත් සංග්‍රාමක අංශයේ සේවය කර ඇත. 2013.01.03 වන දින මුල් ප්‍රකාශය ලබා දීමෙන් පසුව 2013.08.14 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණි ඇති අතර එහි 4 වන තට්ටුවට ගෙන ගොස් නිශාන්ත සිල්වා හමුවට පමුණුවා ඇත. එහිදී සාක්ෂිකරුට

බලපෑම්කර කටඋත්තර ලබා ගෙන ඇත. එසේම " උඹලාට තියෙන්නේ අපි කියන දේ කරන එක කරලා දාන්න විතරයි" " නැත්නම් රණසිංහ සමග ඇතුළට දමන බවටත්" තර්ජනය කර ඇත. නිශාන්ත සිල්වා ඡායාරූපයක් පෙන්වා එහි පැමිණිලිකරු සිටින බවට සඳහන් කර ප්‍රකාශයක් ලබා ගෙන ඇති අතර ප්‍රකාශය සටහන් කර ගන්නා අතරතුර ත්‍රිකුණාමල කඳවුරේ ඇති ගන්සයිට් ප්‍රදේශය පිළිබඳ සටහනක් නිශාන්ත සිල්වා සඳහන් කළ ආකාරයට එය චිත්‍රයට නගා ඇත. ප්‍රකාෂය ලබා ගැනිමෙන් පසුව කියවා බැලිමට අවස්ථාවක් නොදි එයට අත්සන ලබා ගෙන ඇත. එය පැ.35 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ එහි තමා නාවික හමුදාවට බැඳුනු දිනය හා සේවය කළ දිනය හැර අනෙකුත් සියළු කරුණු අසත්‍ය බවත්, මෙවැනි ප්‍රකාශ ඔහු විසින් නොකළ බවත්ය. ත්‍රිකුණාමල කඳවුර නිරීක්ෂණයට ගිය අවස්ථාවේ මත්පැන් පානය සඳහා අවශ්‍ය සියළු කළමනා සපයා ඇති අතර සාක්ෂිකරු ගන්සයිට් ප්‍රදේශයට ගෙන ගොස් විවිධ ඉදිරියව් වලට තබා ඡායාරූප ගෙන ඇත. තවද මෙම ස්ථානයට වෙලගෙදර මහතා ද පැමිණ සිට ඇත. මෙහිද නිශාන්ත සිල්වා ප්‍රකාශ කර ඇත්තේ "ෂූටින් වලට ගෙනයන්නේ නළුවෝ හැටියට රඟපාන්න පුළුවන් අය පමණක් බවට ප්‍රකාශ කර ඇත.

ආර්.ඩී.ප්‍රියංකරගේ (බලනැව්) සාක්ෂියට අනුව 2013.08.26 වන දින පළමු කටඋත්තරය ලබා දී ඇති අතර, පොලිස් පරික්ෂක නිශාන්ත සිල්වා ඔහුට තර්ජනය කරමින් ඔහුට අවශ්‍ය පරිදි එම කටඋත්තරය ලබා ගෙන ඇත. ඡායාරූප පෙන්වමින් ඒවා හඳුනා ගැනීමට බලපෑම් කර ඇති අතර සටහන් කරන ලද ප්‍රකාශය කියවා බැලීමට ඉඩ නොදී

අත්සන් කරවා ගෙන ඇත. පැ.46 ලේඛනයේ සඳහන් පරිදි ප්‍රකාශයක් සිදු නොකළ බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේය. ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ ගන්සයිට් ප්‍රදේශයට සාක්ෂිකරු රැගෙන ගොස් එහිදී ඔහුගේ කැමැත්තට එරෙහිව ඡායාරූප ගත කිරීම සිදු කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.58 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .IV

පැමිණිල්ලේ අංක - 80/2020

පැමිණිලිකරුගේ නම - හෙට්ටිආරච්චි මුදියන්සේලාගේ ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි

ලිපිනය - නො: 154/1 සී, වැන්නවත්ත, වැල්ලම්පිටිය.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලියන්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1) අ. ප. දෙ. අධ්‍යක්ෂ ශානි අබේසේකර
2) සහකාර පොලිස් අධිකාරී බී.එස්. තිසේරා
3) ඒ.ආර්.නිමලරාජා (නියාමක, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය)
4) ජී.එච්.පී.ඒ.නවරත්න(නියාමක,කොළඹරිමාන්ඩ් බන්ධනාගාරය)
5) ඩී.ඒ.සුරංග (නියාමක, මැගසින් බන්ධනාගාරය)
6) ඩබ්.පී.සී.ප්‍රනාන්දු (නියාමක, රිමාන්ඩ් බන්ධනාගාරය)
7) රංජිත් උදයසිරි (නියාමක, රිමාන්ඩ් බන්ධනාගාරය)
8) ආර්.ඩී.එල්.වික්‍රමසිංහ (විශ්‍රාමික ජේලර්)
9) ජේලර් සේසිරි ගුණසිංහ

තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර හෙට්ටිආරච්චි

මුදියන්සේලාගේ ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, පැමිණිලිකාර හෙට්ටිආරච්චි මුදියන්සේලාගේ ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි මහතාට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති අංක 7439/2/6 නඩුවේ සියලුම චෝදනා වලින නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. කොළඹ මහාධිකරණයේ පවරා ඇති HC(TAB)/1448 නඩුවේ අධිචෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකාර හෙට්ටිආරච්චි මුදියන්සේලාගේ ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇත.

2. එසේම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක කුමාරසිංහ පොලිස් අධිකාරි තිසේරා ඇතුළු නිලධාරීන් නඩරාජා රවිරාජ් ඝාතනයේ ප්‍රධාන සැකකරුවන් දෙදෙනා ඝාතනය චෝදනාවෙන් මිදී බේරි පළා යමාට ඉඩසැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇත.

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නමැති වරද සිදු කර ඇත.

4. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇත.

5. මෙම අනිත්‍යානුකූල අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාව සිදුකළ බන්ධනාගාර නිලධාරීන්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 336 වගන්තිය යටතේ චෝදනා ඉදිරිපත් කර නඩු පැවරිය යුතු බව කොමිෂන් සභාව ඒකමතිකව තීරනය කර ඇත.

6. එබැවින් ඉහත නම් සඳහන් වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

7. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ බරපතළ හානි පූරනය කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි. ඒ අනුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුට අහිමි වූ ඔහුගේ රැකියාවේ සියලුම උසස්වීම් වරප්‍රසාද විදේශීය පුහුණුවීම් හිඟ වැටුප් සියල්ලම ඔහුට ලබා දීමත් ඔහු එවැනි රක්ෂිත බන්ධනාගාර ගත කිරීමකට පත් නොවූයේ නම් ඔහුට ඔහුගේ රැකියාවේ හිමිවන ස්ථානයට ඔහු පත් කිරීමත් මගින් පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිය හැකි බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරන අතරම එම සහනයන් ලබා දීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

1997 වසරේදී කැඩෙට් නිලධාරියෙකු වශයෙන් නාවික හමුදාවට බැඳුනු හෙට්ටිආරච්චි මුදියන්සේලාගේ ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි 2015.03.15 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී නාවික හමුදාවේ ලුතිනන් කර්නල්වරයෙකු වශයෙන් රාජකාරියෙහි නිරතව සිට ඇත. 2000 වර්ෂයේ සිට දිවයිනේ උතුරු ප්‍රදේශයේ සේවය භාරව සිටි හෙට්ටිආරච්චි මහතා අනුකණ්ඩයක් භාර නිලධාරියෙකු වශයෙන් එල්.ටී.ටී.ඊ ග්‍රහණයෙන් එල්.ටී.ටී.ඊ. ග්‍රහණයෙන් මුදවා ගත් මන්ඩතිව් දූපතට ආරක්ෂාව සලසමින් රාජකාරියෙහි නිරතව සිට ඇත.

තිස්සමහාරාම නාවික අනුකණ්ඩයේ රැඳී සිටින අවස්ථාවේදී ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා 2015.03.15 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙසට දැන්වීමක් හෙට්ටිආරච්චි මහතාට ලැබී ඇත. ඒ අනුව ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණ ඇති අතර එහිදී පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් සහ ඔහුගේ ආරක්ෂක නිලධාරී ලොකුවැල්ල ලක්ෂ්මන් යන දෙදෙනා ඝාතනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකට හෙට්ටිආරච්චි මහතාගෙන් කටඋත්තරයක් ලබා ගන්නා බවට දැනුම් දී ඇත.

එදින සවස 07.00 පමණ ප්‍රකාශ සටහන් කර ගැනීමට සූදානම් වුන නිලධාරීන් තර්ජනාත්මකව "මේ වෙලාවේ බොරු කියන්න ලෑස්තිවෙන්න එපා මේක හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහ කරන්නාගොඩ මහතාගේ අනුදැනුම මත සිදුවෙච්ච දෙයක්" ලෙසත් තොරතුරු ලැබී තිබෙන බවට පවසමින් ඒ පිළිබඳව තොරුතුරු හෙළිදරව් කරන ලෙසට හෙට්ටිආරච්චි මහතාට දැනුම් දී ඇත.

තමන් එම සිද්ධිය පිළිබඳව කිසිවක් නොදන්නා බව, තමන් ඊට සම්බන්ධ නැති බවටත් පවසා ඇති අතර එම මොහොතෙදී රාත්‍රී 8.00 පමණ උප පොලිස් පරීක්ෂක අමරවංශ කියන නිලධාරියා විසින් හෙට්ටිආරච්චි මහතා ප්‍රධාන පොලිස් පරීක්ෂක බෝධිපක්ෂ වෙත රැගෙන ගොස් හෙට්ටිආරච්චි මහතා කිසිවක් නොපවසන බවට දැනුම් දීමෙන් පසුව ඔවුන් හෙට්ටිආරච්චි මහතා සහකාර පොලිස් අධිකාරි තිසේරා ළඟට ගෙන ගොස් ඇත. " දන්නේ නැහැ කියන්න විදියක් නැහැ ඔයගොල්ලෝ ඔක්කෝම දන්නවා මොනවත් කිව්වේ නැත්නම් මොනවද වෙන්නේ කියලා බලාගෙන ඉන්න පුලුවන් " යනුවෙන්

ප්‍රකාශ කරමින් හෙට්ටිආරච්චි මහතා අත්අඩංගුවට ගැනීමට තිසේරා දැනුම් දී ඇත. මෙම අවස්ථාවේ දී එම ස්ථානයේ උප පොලිස් පරීක්ෂක අමරවංශ, උප පොලිස් පරීක්ෂක පොල්වත්ත, පොලිස් පරීක්ෂක ජයසේකර සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක බෝධිපක්ෂ රැඳී සිට ඇත.

තමන් එම අවස්ථාවේදී රාජ්‍ය බුද්ධි අංශයට අනුයුක්තව සේවය කළ බවත්, තමන් ඒ පිළිබඳව කිසිවක් නොදන්නා බවත් පැමිණිලිකරු පවසා සිටියත් ඒ පිළිබඳව තැකීමක් නොකළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හිටපු ආරක්ෂක ලේකම් සහ නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා දැනුවත්ව සිද්ධිය සිදුවී ඇති බවට ඔවුන්ට සියළුම සාක්ෂි ලැබී ඇති බව තර්ජනාත්මකව පවසා ඇත.

අත්අඩංගුවට ගැනීමෙන් පසුව හෙට්ටිආරච්චි මහතාගේ භාර්යාවට දුරකථන ඇමතුමක් ලබා දී පහසු ඇඳුමක් රැගෙන එන ලෙසට දැනුම් දීමට හෙට්ටිආරච්චි මහතාට උපදෙස් දී ඇති අතර ඒ අනුව හෙට්ටිආරච්චි මහතාගේ භාර්යාව පැමිණ ඇඳුමක් ලබා දී ඔහු ඒ වන විටත් පැළඳ සිටි නිලඇඳුම රැගෙන ගොස් ඇත.

දින 23 ක කාලයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාමරයක රැඳවුම් නියෝග මත ගෙන සිටි පැමිණිලිකරුට මෙම කාලසීමාව පුරාම සඳහන් කර ඇත්තේ මෙම ඝාතන සිද්ධිය පිටුපස ගෝඨාභය රාජපක්ෂ හා නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ සිටින බවටත්, ඔවුන් එය දන්නා බවටත්, එබැවින් එලෙස කටඋත්තර ලබා දෙන ලෙසට පැමිණිලිකරුට බලපෑම් කර ඇත.

මාස තුනක රැඳවුම් නියෝග මත පැමිණිලිකරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ රඳවාගෙන සිටිනු ලැබුවත් දින 24 කට පසුව 2015.04.02 දින කොළඹ අංක 02 මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණිලිකරු ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. අදාළ රැඳවුම් නියෝගය පැ.03 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සනාථ කළ ලේඛනය පැ.01 වශයෙන් සලකුණු කර ඇත. එම ලේඛනයට අනුව අත්අඩංගුවට ගැනීමට හේතුව වශයෙන් සඳහන් කර ඇත්තේ දණ්ඩ නීති සංග්‍රහයේ 296 සහ 113 (අ) වගන්තිය යටතේ වරදක් සිදුකර ඇති බවට නිතිපතිතුමා විසින් දැනුම් දුන් බව සඳහන් කර ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනිමට අදාල සිද්ධිය සිදු වුන කාල සීමාවේ දී කොළඹ වරාය සම්බන්ධ බුද්ධි තොරතුරු එක්රැස් කිරීම සඳහා අනුයුක්ත කර තිබූ නාවික හමුදා අනුකණ්ඩයේ ප්‍රධානියා වශයෙන් රාජකාරියෙහි නිරතව සිට ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගත් දින වලදීම මේ සිද්ධිය සම්බන්ධයෙන් තවත් නාවික හමුදා නිලධාරීන් 03 කු වන පැමිණිලිකරු යටතේ සිටි නාවිකයන් දෙදෙනෙකු වන සුළු නිලධාරි දැලිවල ගෙදර ගාමිණී සෙනෙවිරත්න සහ පාලක ප්‍රධාන සුළු නිලධාරි කංකානම්ලාගේ ප්‍රදීප් චාමින්ද සහ ලුතිනන් කමාන්ඩර්වරයෙකු වූ සම්පත් මුණසිංහ යන තිදෙනා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන ඇති බව පැමිණිලිකරු එදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැසිකිලියට යන විට දැක තිබේ.

පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගත් බවට නාවික හමුදාව පැමිණිලිකරුගේ භාර්යාවට 2015.03.24 ලිපියෙන් නාවික හමුදාව පැමිණිලිකරුගේ භාර්යාවට යවා ඇත. එම ලිපියේ පිටපතක් පැ.02 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට අදාළ සිද්ධියට පිළිබඳව නඩුවේ ප්‍රධාන සාක්ෂිකරු පොලිස් නිලධාරි මනම්පේරි ප්‍රීති විරාජ් නැමැති පුද්ගලයා විය. මෙම මනම්පේරි ප්‍රීති විරාජ් ඔහුගේ ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ  නේවි සම්පත් නැමැති පුද්ගලයා ගංගාරාමයේ පිහිටි රාජ්‍ය බුද්ධි සේවයේ ගොඩනැගිල්ල අසලට කළුපාට ඩිෆෙන්ඩරයකින් ඇවිත් කළුපාට බෑග් එකක තිබූ අවියක් ලබා දී ඇති බවය. එම ප්‍රකාශ මත නිලන්ත සම්පත් මුණසිංහ නැමැති අය නේවි සම්පත් ලෙසට හඳුන්වා දී ඇති අතර ඒ අනුව නිලන්ත සම්පත් මුණසිංහ අත්අඩංගුවට ගෙන ඇත. පැමිණිලිකරු, නිලන්ත සම්පත් මුණසිංහ, සහ ගාමිණී සෙනෙවිරත්න යන තිදෙනා කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 02 අධිකරණයට ඉදිරිපත් කරමින් ගොනු කළ අංක 7439/2/6 දරණ බී වාර්තාව පැ.09 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම විත්තිකරුවන් තිදෙනාට අමතරව පලනිසාමි සුරේෂ්, විවේකනාදන් සිවකාන්තන් නොහොත් වරන් සහ සේවියර් රොයිස්ටර් හුසේන් යන තිදෙනා සැකකරුවන් වශයෙන් මෙම නඩුවට ඉදිරිපත් කර තිබී ඇත.

රජයේ සාක්ෂිකරු වශයෙන් ඉදිරිපත් කරන ලද සම්පත් ප්‍රීති විරාජ් නැමැති සාක්ෂිකරු විසින් ප්‍රකාශ 05 ක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇත. 2008.05.21 දින ලබා දුන් පළමු ප්‍රකාශය පැ.04 වශයෙන් ද, 2008.05.22 දින ලබා දුන් දෙවන ප්‍රකාශය පැ.05 වශයෙන් ද, 2015.02.26 දින ලබා දුන් තෙවන ප්‍රකාශය පැ.06

වශයෙන් ද, 2015.03.20 දින ලබා දුන් සිව්වන ප්‍රකාශය පැ.07 වශයෙන් ද, 2015.03.23 වන දින ලබා දුන් පස්වන ප්‍රකාශය පැ.08 වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කරන තිබේ.

ප්‍රීති විරාජ් ලබා දුන් ප්‍රකාශ වලට අනුව ඔහුට එරෙහිව මහාධිකරණ වල නඩු හතරක් ද, මහේස්ත්‍රාත් අධිකරණ වල පවරා ඇති නඩු ගණනාවක් ද ඇත. මෙම සිද්ධිය වන අවස්ථාවේදී ප්‍රීති විරාජ් නැමැති පුද්ගලයා එස්.එස්.පී. ජයවර්ධනගේ රියදුරු වශයෙන් සේවය කර ඇත. එසේම ඔහු නැගෙනහිර පළාතේ කරුණාගේ කණ්ඩායම සමඟ විවිධ අවස්ථාවල විවිධ ක්‍රියාන්විත වල යෙදී ඇත.

ප්‍රීති විරාජ් 2008 වර්ෂයේ ලබා දී ඇති පැ.04 සහ පැ.05 ප්‍රකාශවල රවිරාජ් මන්ත්‍රීවරයා ඝාතනය සම්බන්ධව කිසිවක් සඳහන් කර නැත. ඉන්පසුව ප්‍රථම වතාවට 2015.02.26 වන දින ලබා දුන් ප්‍රකාශයෙහි රවිරාජ් මන්ත්‍රීවරයාගේ ඝාතනය තමන් දන්නා බවට හා දුටු බවට පමණක් නොව ඝාතනයෙන් පසුව වෙඩික්කරු තම මෝටර් සයිකලයේ නංවාගෙන ගොස් ගංගාරාම බුද්ධි ගොඩනැගිල්ල අසල බස්සවා ඔහු අරලියගහ මන්දිරයට ගිය බවද ප්‍රකාශ කර ඇත.

මනම්පේරි ප්‍රීති විරාජ් නැමැති මෙම පොලිස් නිලධාරියාගේ ප්‍රකාශ සනාථ කෙරෙන වෙනත් කිසිදු ප්‍රකාශයක් නොමැත. බුද්ධි අංශ නිලධාරීන් වාසය කළ ගංගාරාමය අසල ගොඩනැගිල්ල අසලට ප්‍රීති විරාජ් රැගෙන ගිය සාමිගේ ප්‍රකාශයක්වත් ලබා ගැනීමට පරීක්ෂණ පැවැත්වූ නිලධාරීන් ක්‍රියා කර නැත. ඒ අනුව ප්‍රීති විරාජ් අවුරුදු 07 කට පසුව කරන කිසිදු විශ්වාසයක් තැබිය නොහැකි ප්‍රකාශයක් මත පමණක් පැමිණිලිකරුට නඟන චෝදනා ඔප්පු කළ නොහැක. පැමිණිලිකරු ඇතුළු 07 දෙනෙකුට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ

ලඝු නොවන නඩු විභාගයක් සඳහා මහාධිකරණයට යවා ඇත. මහාධිකරණයට ඉදිරිපත් කරන ලද ඇප අයදුම්පත සලකා බැලීමෙන් පසුව පැමිණිලිකරු ඇපමත මුදාහැර ඇත. මෙම ලේඛනය පැ.11 වශයෙන් සලකුණු කර ඇත.

කොළඹ මහාධිකරණයේ අංක 07 මහාධිකරණයේ 2016.07.15 වන දින පැමිණිලිකරු ඇපමත මුදාහැරීමට නියෝග කර ඇති අතර ඒ අනුව ඇප නියෝගය කියවා පහදා දීම සඳහා නඩුව මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවනු ලැබූ අවස්ථාවේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ නීතිපති දෙපාර්තමේන්තු ක්‍රියා කර ඇති අකාරය පුදුම සහගතය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නීතිපති දෙපාර්තමේන්තුවේ ලිපියක් ඉදිරිපත් කරමින් ඇප නියෝගයට එරෙහිව ප්‍රතිශෝධන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරන බවට පවසමින් පැමිණිලිකරු ඇපමත මුදා නොහරින ලෙසට ඉල්ලීමක් සිදු කර ඇත. එසේ වුවත් ඒ වන විටත් ඔවුන් ප්‍රතිශෝධන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර නොතිබූ බව සැලකිල්ලට ගෙන පැමිණිලිකරු ඇපමත මුදාහැරීමට මහේස්ත්‍රාත්වරයා අධිකරණයේදී නියෝග කර ඇත. මහාධිකරණ ඇප නියෝගය පැ.10 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මහාධිකරණ නියෝගය පරිදි නියම කරනු ලැබූ ඇප මහේස්ත්‍රාත් අධිකරණයේදී ඉදිරිපත් කරන ලද ඇප මහේස්ත්‍රාත් අධිකරණයේදී ඉදිරිපත් කර ඇපකරයට අත්සන් තැබීමෙන් පසුව පැමිණිලිකරු අධිකරණයෙන් එළියට පැමිණෙනවාත් සමඟම බන්ධනාගාර නිලධාරීන් පැමිණ මහාධිකරණ අංක 01 හි නීතිපති දෙපාර්තමේන්තුව විසින් ගොනු කර ඇති මෝෂන් පත්‍රයකට

පැමිණිලිකරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය බවට සඳහන් කරමින් මහාධිකරණයට ඉදිරිපත් කිරීමට පැමිණිලිකරු රැගෙන ගොස් ඇති අතර ඉන්පසුව මහාධිකරණයේ නීතිපති දෙපාර්තමේන්තුව කරුණු දක්වමින් අධිචෝදනා පත්‍ර භාරදීම ඊට පසු දිනයේ දී සිදු කරන බැවින් පැමිණිලිකරු ඇපමත මුදා නොහැර රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට ඉල්ලා ඇත. ඒ අනුව අංක 01 මහාධිකරණ විනිසුරු විසින් පැමිණිලිකරු නැවත රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. මේ අනුව 2016.07.15 වන දින අංක 09 මහාධිකරණ නියෝගය පරිදි රුපියල් ලක්ෂ 2 ක පුද්ගල ඇපයක් සහ රුපියල් ලක්ෂ 25 ක පුද්ගල ඇප දෙකක් ඉදිරිපත් කර අත්සන් තැබූ පැමිණිලිකරුට, ඇප නියම කළ එම නඩුවට නැවත කිසිදු ඇප කොන්දේසියක් කඩ නොකර ඒ මොහොතේම රක්ෂිත බන්ධනාගාර ගතවීමට සිදු වී ඇත. මෙම ක්‍රියා කලාපය පැමිණිලිකරුට එරෙහිව සිදු කෙරෙන කිසියම් කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බව ඉතාමත් පැහැදිලිය. පැමිණිලිකරු නැවතත් බන්ධනාගාර ගත කිරීමට අවශ්‍ය කරන ක්‍රමයන් සම්පාදනය කිරීම මුළුමනින්ම ද්වේශ සහගය. අංක 09 මහාධිකරණ විනිසුරු විසින් පැමිණිලිකරුට ඇප නියම කිරීමේ දී පැහැදිලිව සඳහන් කළේ 2016.06.15 වන දිනයෙන් ඔබ්බට පැමිණිලිකරු තවදුරටත් රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීමට නෛතික ප්‍රතිපාදන නොමැති බවය.

මේ අනුව මෙවැනි නෛතික පසුබිමක් මත අධිචෝදනා පත්‍ර භාර දුන්නේය යන පදනම මත පැමිණිලිකරුට ඔහු ඒ වන විටත් අත්සන් කර තිබූ ඇපමත මුදා නොහැරීම නෛතික ප්‍රතිපාදන පැහැදිලි ලෙසම උල්ලංඝනය කිරීමකි.

අධිචෝදනා පත්‍රය භාරදීමෙන් පසුව චූදිතයෙකු රක්ෂිත බන්ධනාගාර ගත කළ යුතු බවට නියම කෙරෙනු නෛතික විධි විධාන අනුගමනය කළ යුතු වන්නේ චූදිත ඇපමත මුදාහැරිය යුතුය යන විධානයට සම්බන්ධවය. එබැවින් පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයට පත් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව යුහුසුළු වීම තුලින් නීතිපති දෙපාර්තමේන්තුවේ අපක්ෂපාති භාවය මුළුමනින්ම බිඳී ගොස් ඇත.

එසේම පැමිණිලිකරු යථාපරිදි ඇපතබා අදාළ ලේඛන අත්සන් කර අධිකරණයෙන් එළියට පැමිණෙන අවස්ථාව වන විට පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට බන්ධනාගාර නිලධාරීන්ට කිසිදු නීතිමය බලයක් හෝ හැකියාවක් නොමැත. එසේ පැමිණිලිකරු බන්ධනාගාර නිලධාරීන්ගේ භාරයට ගෙන ඇති අතර ඔවුන් එම අනීතික ක්‍රියාවට වගකිව යුතුය.

මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණි ලඝු නොවන පරීක්ෂණයේදී පැමිණිලිකරුට එරෙහිව මෙහෙයවන ලද එකම සාක්ෂිකරුවූයේ පොලිස් කොස්තාපල් විජේවික්‍රම මනම්පේරි සම්පත් ප්‍රීති විරාජ් නැමැති සාක්ෂිකරුය. වැඩතහනමට ලක්ව සිටින එම ප්‍රීති විරාජ් නැමැති සාක්ෂිකරුට එරෙහිව අධිකරණයේ නඩු 6 ක් විභාග වෙමින් පවතී. ඒ අනුව ඔහුට විරුද්ධව පහත නඩු පවරා විභාග වෙමින් පවතී. එනම්,

1. කොළඹ මහාධිකරණ නඩු අංක 6826/2013, 2009 වර්ෂයේ දී රුපියල් 950739/= සහල් ප්‍රමාණයක් සහ රුපියල් 25,000/= ක මුදල්, ජංගම දුරකථනයක් කොල්ලකෑම පිළිබඳ නඩුව පැ.14 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2. කොළඹ මහාධිකරණයේ විභාග වන අංක HC/4302/2008 නඩුව පැ.15 ලෙස ඉදිරිපත් කර ඇත. 2006 වර්ෂයේ දී නඩරාජා ස්කන්ධරාජා නොහොත් සීනි මුදලාලි පැහැරගෙන ගොස් රුපියල් ලක්ෂ 60 ක මුදලක් කප්පම් ලබා ගැනීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවරා ඇති නඩුව.

3. ඇඹිලිපිටිය මහාධිකරණයේ විභාග වන අංක 49/2017 නඩුව 2009 වර්ෂයේ රුපියල් 763,000/= ක් වටිනා හාල් මිටි තොගයක් කොල්ල කෑම සම්බන්ධ නඩුව පැ.16 ලෙසට ඉදිරිපත් කර ඇත.

4. ඇඹිලිපිටිය මහාධිකරණයේ විභාග වන අංක HC/76/2013 නඩුව පැ.17 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඇඹිලිපිටිය මොරකැටිය මාර්ගයේ දෙකේ කණුව අසල දී එම්.ඩී.චාමර රුක්ෂාන් නැමිති අයට අයත් රුපියල් 810,000/= වටිනා හාල් මිටි තොගයක් කොල්ලකෑම පිළිබඳ නඩුව.

5. හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින අංක MC/13/933 දරණ නඩුව කළු ගල්වලක වැටුප්

කොල්ලකෑම සම්බන්ධයෙන් පවරා ඇත. එම චෝදනා පත්‍රය පැ.18 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

6. මොණරාගල මහාධිකරණයේ විභාග වන අංක HC/79/2014 දරණ නඩුව, 2013 වර්ෂයේ දී උඩවල ප්‍රදේශයේ ගංජා කිලෝ 106 ග්‍රෑම් 150 ක් ජාවාරම් කිරීමේ චෝදනාවක් යටතේ විභාග වන නඩුව. මෙය පැ.19 ලෙස සලකුණු කර ඉදිරපත් කර ඇත.

සම්පත් ප්‍රීති විරාජ් නැමැත්තා සාක්ෂි විභාගයේ දී තමන්ට එරෙහිව ඉහත සඳහන් නඩු ඒ ඒ අධිකරණවල පවතින බවට පිළිගනිමින් සිදු කළ සාක්ෂි කණ්ඩය පැ.20 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ අන්දමින් චෝදනා ලැබ මහාධිකරණය හා මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ චූදිතයෙකු වශයෙන් පෙනී සිටින විජේවික්‍රම මනම්පේරිගේ සම්පත් ප්‍රීති විරාජ් නැමැති පුද්ගලයා පැමිණිලිකරුට එරෙහිව සාක්ෂිකරුවෙකු වශයෙන් යොදා ගැනීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 256/(1) වගන්තිය ප්‍රකාරව කොන්දේසි සහිතව සමාව ලබාදීමේ බලපත්‍රය පැ.13 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. ප්‍රීති විරාජ් නැමැති අයට එරෙහිව මොනරාගල මහාධිකරණයේ පැවැති නඩුව වරද පිළිගැනීම මගින් අවසන් කර ඇත. එසේ එම නඩුවේ වරද පිළිගනිමින් අවසන් කිරීමට හේතුව වශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු බැහැර කළ නොහැකිය. එම අවස්ථාව වන විට නඩුව විභාග කර තීන්දුව ප්‍රකාශයට ආසන්නව තිබී ඇත. ඒ අනුව එසේ තීන්දුවක් ප්‍රකාශ කර ප්‍රීති විරාජ් නැමැත්තාට දඬුවම් පමුණුවා සිර

දඬුවමක් ලබා දුන්නේ නම් ඔහු පැමිණිකරුට එරෙහි නඩුවේ සාක්ෂිකරුවෙකු ලෙස යොදා ගැනීම සඳහා සමාවක් දීමට නොහැකි තත්ත්වයක් උදාවනු ඇත. එබැවින් ප්‍රීති විරාජ්ට සිරදඬුවමක් නොමැතිව චෝදනාවට වැරදිකරු බව ප්‍රකාශ කර දඩයකින් අවසන් කර ගැනීමට පැමිණිල්ල යුහුසුලුව ක්‍රියා කර ඇති බව ඉදිරිපත් වී ඇති සාක්ෂි තුළින් පැහැදිලිවේ.

පැමිණිලිකරු ඇතුළු 06 දෙනෙකුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරන ලද නඩුව ජූරි සභාවක් ඉදිරියේ විභාගයට ගැනීමට නීතිමය හැකියාවක් නැති බවට අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ සුමන්තිරන් මහතා ද, රජයේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය මහතා ද කරනු දක්වා ඇතත් මහාධිකරණය විත්තිකරුවන්ට ලබා දී ඇති නෛතික අයිතින් සුරක්ෂිත කරමින් නියෝගයක් ලබා දී ඇති අතර ඒ අනුව ජූරි සභාවක් ඉදිරියේ නඩුව විභාග කර, ජූරි සභාවේ ඒකමතික තීරණය අනුව සියළුම චෝදනා වලින් සියළුම විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කර ඇත. මහාධිකරණ නඩුවේ පිටපත පැ.21 වශයෙන් ද, කාර්ය සටහන් පැ.21 (අ) වශයෙන් ද 2016.10.27 දින නියෝගය පැ. 39 ලෙසටද සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම නියෝගයට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනා පැ. 40 පැ. 41 සහ පැ. 42 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු ඇතුළු 06 දෙනාට මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා නැඟිමේදී නීතිපති දෙපාර්තමේන්තුතව ක්‍රියා කළේ කුමන අභිමාතාර්ථයක් මුදුන් පමුණුවා ගැනීමට ද යන ප්‍රශ්නය මතුවේ. එයට හේතුව වන්නේ අධිචෝදනා පත්‍රයේ අඩංගු චෝදනා 05 න් චෝදනා

03 ක් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේත්, චෝදනා 02 ක් දණ්ඩ නීති සංග්‍රහය යටතේත් ගොනු කර තිබීමය. නඩරාජා රවිරාජ් මන්ත්‍රීවරයාට වෙඩිතබා ඝාතනය කිරිම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ ගැනෙන වරදක් වන්නේ කුමන කරුණු නිසාද යන්න සිතා ගැනීමටවත් අපහසුය. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ අධිචෝදනා නැඟිමට එකම හේතුව හෙට්ටිආරච්චි මහතා ඇපමත මුදාහැරිම වැලැක්වීමේ අමානුෂික දූෂ්‍ය චේතනාවය.

නඩරාජා රවිරාජ් මන්ත්‍රීවරයා ඝාතනය පිළිබඳව මුල්ම බී වාර්තාව 2006.11.10 වන දින ඉදිරිපත් කර ඇත. ඉන්පසුව සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන අවුරුද්දකට පමණ පසුව මුදාහැර ඇත. ඉන්පසුව 2008 වර්ෂයේදී සම්පත් ප්‍රීති විරාජ් නැමැති පොලිස් කොස්තාපල්වරයාගේ ප්‍රකාශ 02 ක් (පැ.04 සහ පැ.05) සටහන් කර ඇත. එම එක් ප්‍රකාශයකවත් පැමිණිලිකරු හෝ ඔහු සමඟ අත්අඩංගුවට පත් අය පිළිබඳව ප්‍රීති විරාජ් කිසිවක් සඳහන් කර නොමැත.

ඉන්පසුව 2015 රජය වෙනස්විමෙන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නැවත නව මුහුණුවරකින් පරීක්ෂණ ආරම්භ කර ඇත. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්පත් ප්‍රීති විරාජ් නැමැත්තාගේ නිවසට ගොස් ප්‍රකාශයක් සටහන් කර ගෙන ඇත. ප්‍රකාශ ලබා ගැනීමේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අනුගමනය කරන පිළිවෙත වන අවශ්‍ය පුද්ගලයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රකාශ ලබා ගැනීමේ පිළිවෙත කඩ කරමින් ප්‍රීති විරාජ්ගේ නිවසට ගොස් ඔහුගේ තුන්වන ප්‍රකාශය ලබා ගෙන ඇත.

මංකොල්ලකෑමේ නඩු 05 කට සහ ගංජා කිලෝ 106 ක් ජාවාරම් කිරීමේ නඩුවල චූදිතයෙකු වූ ප්‍රීති විරාජ්ගේ තුන්වන කටඋත්තරය ලබා ගැනීමට ඔහුගේ නිවසට යාමට තරම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නිවට නියාළු වූයේ කිනම් බලපෑමකින්ද යන්න වටහා ගැනීමට සාක්ෂි වලින් ඉදිරිපත් වන හේතු හොඳින්ම ප්‍රමාණවත්වේ.

රවිරාජ් මන්ත්‍රීවරයා ඝාතන නඩුවේ මුල් අවස්ථාවේ දී අපරාධ පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සහායට ස්කොට්ලන්ඩ් යාඩ් පොලිස්සියේ ද සහාය ලැබී ඇත. ස්කොට්ලන්ඩ් යාඩ් පොලිස් නිලධාරීන් පැමිණ පරීක්ෂණ පවත්වා ඇතත් සැකකරුවන් හඳුනා ගැනීමට ඔවුන් ද සමත් වී නැත. එසේ වුවත් ඝාතකයා වෙඩි තැබීම සඳහා කළුපාට බෑග් එකකින් ගිනි අවියක් අරගෙන වෙඩිතබා ඇති බවට ස්කොට්ලන්ඩ් යාඩ් පොලිස් වාර්තා වලද සඳහන් වී ඇත. තුවක්කුවක් අරගෙන වෙඩිතබන අවස්ථාවේදී ඝාතකයාගේ අත තුවාල වී රුධිරය වහනය වී ඇත. ස්කොට්ලන්ඩ් යාඩ් පොලිසිය එම රුධිර සාම්පල් ලබාගෙන එම රුධිරයේ ඩී.එන්.ඒ. සාම්පල් සකස් කර ඇති අතර, මෙම ඝාතනය සම්බන්ධයෙන් ඉදිරියේ දී අත්අඩංගුවට ගන්නා පුද්ගලයා නිවැරදිව හඳුනා ගැනීම සඳහා ඔහුගේ ඩී.එන්.ඒ සාම්පල් ලබාගෙන ඔවුන් දැනුවත් කරන ලෙසටත් ඒ අනුව ඩී.එන්.ඒ ගලපා ඝාතකයා නිවැරදිව හඳුනා ගැනීමට හැකි බවටත් ස්කොට්ලන්ඩ් යාඩ් පොලිසිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත් කර තිබේ. පැ.22 වාර්තාවෙන් එය මැනවින් පැහැදිලි කර ඇත. එසේ වුවත් පැමිණිලිකරු ඇතුව පිරිස අත්අඩංගුවට ගත් පසුව ඩී.එන්. එය සසඳා බැලීම සඳහා 2015 අප්‍රේල් මාසයේදී රුධිර සාම්පල් ලබා ගෙන ඇතත්

ඒ පිළිබඳව සැසඳීමක් කිරීමට ස්කොට්ලන්ඩ් යාඩ් පොලිසිය දැනුවත් කර නැත. පැමිණිලිකරුගේ ඩී.එන්.ඒ සාම්පල් පැ.23 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එසේ වුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්ත්මේන්තුවේ පරීක්ෂණ නිලධාරීන් වූ උප පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක අමරවංශ පැමිණිලිකරුගේ ඩී.එන්.ඒ සැසඳීම උවමනාවෙන්ම මගහැර ඇත. ඩී.එන්.ඒ. වාර්තාවට අදාළව කොළඹ මහාධිකරනයේ අංක HC/8331/16 නඩුවේ ඊට අදාළ සාක්ෂි කණ්ඩය ඇතුළත් කොටස පැ.24 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ප්‍රීති විරාජ් නැමැති සාක්ෂිකරුගේ තුන්වන ප්‍රකාශයේ ඔහු කීහිප අවස්ථාවකදීම සඳහන් කර ඇත්තේ සෙනෙවි නැමැත්තා කළුපාට බෑග් එකකින් ගිනි අවිය ගෙන වෙඩිතබනවා ඔහු දුටු බවත්, ඔහුගේ අත තුවාල වී ලේගලනව දුටු බවටත්ය. එසේ ප්‍රකාශ කර තිබියදීත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ නිලධාරීන් වූ උප පොලිස් පරීක්ෂක ජනානන්ද ද, උප පොලිස් පරීක්ෂක අමරවංශ යන නිලධාරීන් උවමනාවෙන්ම ඩී.එන්.ඒ සාම්පල් ස්කොට්ලන්ඩ් යාඩ් පොලිසියේ රඳවා ඇති සාම්පල් හා සසඳා බැලීමට ක්‍රියා කර නැත.

එවැනි තත්ත්වයක් තුළ අඩු තරමින් නීතිපති දෙපාර්තමේන්තුව හෝ ඩී.එන්.ඒ. වාර්තා සසඳා බැලීමට උපදෙස් දී නොමැත. ප්‍රීති විරාජ් නැමැත්තා ඔහුගේ ප්‍රකාශයෙහි වැඩිදුරටත් සඳහන් කර ඇති අන්දමට කළුපාට ඩිෆෙන්ඩර් රථයකින් පැමිණ අරලියගහ මන්දිරය අසළින් කළුපාට බෑග් එකක දමා ගිනි අවියක් බාර දෙනවා දුටු බවට සඳහන් කර ඇත. ප්‍රීති විරාජ්ගේ මෙම ප්‍රකාශය 2015.06.02 දින පැය 13.15 ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔහු කොළඹ නව මැගසින් බන්ධනාගාරයට ගෙනවිත් සටහන් කර ගෙන ඇත. මෙම

ප්‍රකාශයෙහි පිටපතක් පැ.25 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.25 දරණ ප්‍රකාශය ලබා ගැනීමේ දී ප්‍රීති විරාජ් නැමැති පුද්ගලයාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක කුමාරසිංහ විසින් පහත සඳහන් ප්‍රශ්නය අසා ඇති අතර ඊට පිළිතුරු ලබා දී තිබේ. එකී ප්‍රශ්නය සහ පිළිතුර පහත සඳහන් වේ.

> "ප්‍රශ්ණය : ප්‍රීතිවිරාජ් ඔබ පොලිසියට කටඋත්තර කිහිපයක් ලබා දී තිබෙනවා. ගරු මහේස්ත්‍රාත්තුමියට ප්‍රකාශයක් ලබා දී තිබෙනවා. ඊට අමතරව ලඝු නොවන නඩු විභාගයට ගෙන හරස් ප්‍රශ්ණ වලට භාජනය කර තිබෙනවා ඒ අවස්ථාවේදී ඔබ විසින් නේවි සම්පත් නැමැති පුද්ගලයෙකු ගැන කියා තිබෙනවා. ඒ නේවි සම්පත් නමින් ඔබ හඳුන්වන පුද්ගලයා මෙම රවිරාජ් ඝාතන සිද්ධියට අදාළව කුමන ස්වරූපයේ ක්‍රියාවක් සිදුකර ඇත්තේද,
>
> පිළිතුර : මම කිසිවක් පුද්ගලිකව දන්නේ නැත. මම ප්‍රකාශ කෙරුවේ සාම නම් පුද්ගලයා මට ප්‍රකාශ කළ දේවල් පමනකි. ඒ හැර පුද්ගලිකව කිසිම දෙයක් නේවි සම්පත් පිලිබඳව නොදනිමි. නේවි සම්පත් කියන පුද්ගලයා මා කලින් හඳුනන්නෙ නැහැ. මට කීමට ඇත්තේ මෙපමණයි."

ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරන ලද නඩුවේ දී ඔහු ඔප්පු කර පෙන්වා දී ඇත්තේ ප්‍රශ්න ගත දිනයේ දී ඔහු එවකට ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා, අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහභාගී වූ කන්කසන්තුරේ වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යාපනයනට ගොස් සිටි බවය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම සාක්ෂි නිර්මාණය කරමින් සහ ඝාතන සිද්ධියක් ප්‍රතිනිර්මාණය කරමින් ක්‍රියා කර ඇත්තේ නඩරාජ රවිරාජ් මන්ත්‍රීවරයාගේ ඝාතනය පිළිබඳව දැනුමක් අරලියගහ මන්දිරයට ආදේශ කිරීමට බව පැහැදිලිය. 2015 මුල් මාසවල පළ වූ මාධ්‍ය වාර්තා වල සඳහන් කර ඇත්තේ සාක්ෂි තිබියදීත් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා අත්අඩංගුවට නොගන්නේ ඇයි යන ප්‍රශ්නයය. මේ අනුව ආරක්ෂක ලේකම්වරයා ප්‍රමුඛ හමුදා නිලධාරීන් පිරිසක් පොලිස් අත්අඩංගුවට ගෙන සාක්ෂි නිර්මාණය කර ඒ මත ගොතන ලද නඩු ඔවුන්ට එරෙහිව පවරා ඔවුන් සිරගත කිරීමේ කූඨ කුමන්ත්‍රණයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු වෙමින් තිබුණ බව මෙම සාක්ෂි අනුව පැහැදිලිවේ.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ මෙන්ම මහාධිකරණය ඉදිරියේදී ද ඉදිරිපත් වී ඇති සාක්ෂි වලට අනුව නඩරාජා රවිරාජ් ඝාතනයේ ප්‍රධාන සාක්ෂිකරු කළුපාට බෑගයකින් ගිනි අවිය රැගෙන මන්ත්‍රීවරයාට වෙඩිතබා එම සිද්ධියෙන් අතට සිදුවූ තුවාලයෙන් ලේ ගලමින් දුවගෙනවිත් ප්‍රීති විරාජ්ගේ මෝටර් සයිකලයට නැඟ ඇත. ඉන්පසුව ඝාතකයා අපරාධ ස්ථානයෙන් ඉවත් කර ගෙන ගොස් ඇත්තේ ප්‍රීතිවිරාජ් නැමැති පුද්ගලයා මේ අනුව මන්ත්‍රීවරයා ඝාතනය කිරීමේ සිද්ධියට ප්‍රධාන සැකකරුවන් දෙදෙනා වන්නේ මන්ත්‍රීවරයාට වෙඩිතැබූ පුද්ගලයා සහ ඔහු රැගෙන අපරාධ ස්ථානයෙන් මෝටර් සයිකලයකින් පළා ගිය ප්‍රීතිවිරාජ් යන දෙදෙනාය. වෙඩි තැබූ පුද්ගලයා සෙනෙවි නැමැති බුද්ධි නිලධාරියා (දැලිවල ගෙදර ගාමිණී

සෙනෙවිරත්න) බවට ප්‍රීති විරාජ් ප්‍රකාශ කළත් එම කරුණ ඔප්පු කිරීම සඳහා තිබූ හොඳම සාක්ෂිය වන ඩී.එන්.ඒ.සාම්පල් ගැලපීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හිතාමතාම මඟහැර ඇත. ඒ හැර වෙනත් සාක්ෂි කිසිවක් නැත. ඒ අනුව මහාධිකරණ නඩුවට බලපාන අකාරයෙන් සාක්ෂි නිර්මාණය කර පටලවන ලද සෙනෙවි සහ පැමිණිලිකරු ඇතුළු පිරිස නඩුවෙන් නිදහස් වී ඇත. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදු කළ පුඟුප්සාජනක ක්‍රියාවන් කරන කොට ගෙන සත්‍ය වශයෙන්ම එවැනි ඝාතනයක ප්‍රධාන සැකකරුවන් දෙදෙනාගෙන් එක් අයෙක් වන ප්‍රීතිවිරාජ් නඩුවෙන් සමාව ලබා නිදහස් වී ඇත.

මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක කුමාරසිංහ පොලිස් අධිකාරි තිසේරා ඇතුළු නිලධාරීන් නඩරාජා රවිරාජ් ඝාතනයේ ප්‍රධාන සැකකරුවන් දෙදෙනා ඝාතනය චෝදනාවෙන් මිදී බේරී පළා යාමට ඉඩසැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සහ අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රී රවිරාජ් ඝාතනය, රසීම් තාජුඩීන් ඝාතනය, ප්‍රදීප් එක්නැලිගොඩ ඝාතනය කළ බවට චෝදනා, ළමුන් 11 දෙනෙකු පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීමේ සිද්ධිය ආදී අපරාධ පිළිබඳව සිද්ධීන් 2015 ජනාධිපතිවරණ වේදිකාවල ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ මැතිවරණ සටන වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ප්‍රසිද්ධ මාතෘකා

අතරින් කිහිපයකි. මේවා පිළිබඳ ප්‍රබල මාධ්‍ය ප්‍රචාරනයක් ගෙනගිය අතර එමගින් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයට සහ එහි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු ඉහළ පෙළේ හමුදා සහ පොලිස් නිලධාරීන්ට බරපතල මනුෂ්‍ය ඝාතන චෝදනා එල්ල කෙරෙනි. 2015 ජනවාරි මස 08 වන දින පිහිටුවන ලද රජය විසින් පළමුවෙන්ම අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයා වූයේ මෙම පැමිණිලිකාර හෙට්ටිආරච්චි මහතාය. 2015.03.15 වන දින ඔහු අත්අඩංගුවට ගෙන ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැමිණිලිකරුගේ නම වෙනස් කිරීමේ මෙහෙයුමක යෙදී ඇත. ප්‍රීතිවිරාජ් නැමැති පුද්ගලයා ඔහුගේ ප්‍රකාශය සිදු කිරිමේ දී "නේවි සම්පත්" යන නමින් යම් පුද්ගලයෙකු හඳුන්වා දී ඇත. එම නම ඔස්සේ යමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නාවික හමුදා නිලධාරියෙකු වූ ලුතිනන් කමාන්ඩර් මුනසිංහ ආරච්චිලාගේ දොන් නිලන්ත සම්පත් මුනසිංහ අත්අඩංගුවට ගෙන ඇත. එසේ වුවත් මෙම සිද්ධිය සිදු වූ දින ඔහු යාපනයේ සිටි බවට ඔප්පු කළ බැවින් ඔහු මුදාහැරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සිදුවිය. ඉන්පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයට ඉදිරිපත් කළ වැඩිදුර වාර්තාවක පැමිණිකරුගේ නම හෙට්ටිආරච්චි මුදියන්සේලාගේ දොන් ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි නොහොත් නේවි සම්පත් යනුවෙන් හඳුන්වා ඇත. එසේ කිරීම තුළින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැමිණිලිකරු මානසිකව දූෂණය කර ඇත. මේ සම්බන්ධ මාධ්‍ය ප්‍රකාශ පැ.26 (අ), පැ.26 (ආ), පැ.26 (ඇ), පැ.26 (ඈ), පැ.26 (ඉ), පැ.26 (ඊ), පැ.26 (උ) සහ පැ.27 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.27 මාධ්‍ය වාර්තාව අනුව නේවි සම්පත් යන

අන්වර්ථ නාමය භාවිතා කර ඇත්තේ මුනසිංහ ආරච්චිලාගේ දොන් නිලන්ත සම්පත් මුනසිංහ යන පුද්ගලයා වේ.

පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් පැමිණිලිකරුගේ මානව අයිතිවාසිකම් කඩ කර ඇති බවට චෝදනා නඟමින් නීතිපතිවරයාට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක මුලාචාරි ගෙදර ප්‍රේමතිලක අමරවංශ යන අයට එරෙහිව පැමිණිල්ලක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. එම පැමිණිල්ලේ පිටපතක් පැ.27 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

නඩරාජ රවිරාජ් මන්ත්‍රීවරයා ඝාතන නඩුවෙන් පැමිණිලිකරු නිදහස්ව 2016.12.24 දින රක්ෂිත බන්ධනාගාරයෙන් නිදහස් වී පැමිණ ඇති අතර 2017.01.09 දින සිට නැවත නාවික හමුදා සේවයේ පිහිටුවා ඇත. ඒ අනුව කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ නාවික නෞකා පරාක්‍රම ආයතනයේ රාජකාරියේ නිරතව සිටින විට නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙසට දැන්වීමක් 2017.03.01 වන දින නාවික හමුදාපති මගින් පැමිණිලිකරුට ලැබී ඇති අතර 2017.03.02 වන දින ප්‍රකාශයක් ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙස එමගින් දැනුම් දී ඇත. නැවත වතාවක් ප්‍රකාශයක් ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඔහුට දැනුම් දෙනු ලැබුණේ කුමන කරුණක් අරබයා ද යන්න පැමිණිලිකරු පරීක්ෂා කර ඇති අතර දැනුම්දීම කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවත්නා බී 732/2009 නඩුව සම්බන්ධයෙන් බවට පැමිණිලිකරුට කරුණු අනාවරණය වී

ඇත. බී 732/2009 නඩුව ඉදිරිපත් කරන ලද 2018.02.22 දින දරණ පැ.29 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම වැඩිදුර වාර්තාව අනුව බී 732/2009 දරණ බී වාර්තාව 2009.06.09 වන දින නාවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා විසින් කොළඹ අපරාධ කොට්ඨාසය සිදු කරනු ලැබු පැමිණිල්ලක් මත අපරාධ කොට්ඨාසය විසින් පරීක්ෂණය සිදු කරන බවට වාර්තා කර ඇත.

එකී පැ.29 දරණ වැඩිදුර වාර්තාවේ දෙවන පිටුවේ 3 සහ 4 ඡේදයන්හි මෙසේ සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම)"03. මෙම විමර්ශනයට අදාලව අත්අඩංගුවට ගැනීමට සිටින සැකකරුවෙකු වන හෙට්ටිආරච්චි මුදියන්සේලාගේ චන්දන ප්‍රසාද් හෙට්ටිආරච්චි නොහොත් නේවි සම්පත් අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් මාධ්‍ය ඒකකය මගින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කර ඇත. ඒ සම්බන්ධයෙන් සාර්ථක තොරතුරක් මෙතෙක් නොලැබුණි. තවදුරටත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ සැකකරුගේ තොරතුරු පල කිරීමට කටයුතු කරමි.
>
> 04. අත්අඩංගුවට ගැනීමට සිටින සැකකරු ලුතිනන් කමාන්ඩර් හෙට්ටිආරච්චි මුදියන්සේලාගේ චන්දන ප්‍රසාද් හෙට්ටිආරච්චි යන අයට ප්‍රකාශයක් ලබාදීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙසට 2017.03.03 වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගේ අත්සනින් හිටපු නාවික හමුදාපති වයිස් අද්මිරාල් ආර්.සී.විජේගුනරත්න මහතා වෙත ලිපියක් යොමු කරන ලදී. නමුත් ඔහු නොපැමිණි බැවින් 2017.03.23 වන දින

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගේ අත්සනින් යුතුව ලිපියක් මගින් පෙර කී නාවික හමුදාපතිතුමා වෙත 2017.03.31 වන දින සැකකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙසට දැනුම්දී ඇත. මේ වනතෙක ඔහු මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු නොකරන ලදී." (උපුටා ගැනීම අවසන්)

එහි 4 වන ඡේදයේ සඳහන් වන්නේ පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන නොතිසිය 2017.03.03 වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ අත්සනින් නිකුත් කර ඇති බවකි. මෙසේ වුවත් පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැමිණිය යුතු දිනය එහි සඳහන් කර නැත. කරුනු එසේ තිබියදී 4 වන ඡේදයේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ පැමිණිලිකරු නොපැමිණි බැවින් 2017.03.23 වන දින නැවත නොතිසියක් නිකුත් කර 2017.03.31 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටීමට දැනුම් දී ඇත. පැමිණිකරු පැමිණිය යුතු දිනය සඳහන් නොවන මෙවැනි නොමග යවන නොතිසියක් යවමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණය දැනුවත් කර ඇත්තේ පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණීම මඟ හරින පුද්ගලයෙකු ලෙසට හඳුන්වමිනි.

පැ.29 දරණ වැඩිදුර වාර්තාවෙන් කරුණු ඉදිරිපත් කර ඇත්තේ ඊට අවුරුද්දකට පමණ පෙර සිදුවූ සිදුවීමක් පිළිබඳ වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට කරුණු වාර්තා කිරීමට අවුරුද්දක කාලයක් ගතවීම පිළිබඳව හේතු සඳහන් කර නැත. මෙම

අවුරුද්දක ප්‍රමාදය තුළින් පැහැදිලිව පෙනී යන්නේ එම වැඩිදුර වාර්තාව දැක්වෙන්නේ සත්‍ය තත්ත්වයක් නොවන බවයි.

පැමිණිලිකරුට 2017.03.01 නිවේදනය ලැබීමෙන් පසුව ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අදාළ දිනට පෙනී නොසිටින බවට තීන්දුවක් ගෙන ඇත. අවුරුදු 02 ක කාලයක් අභූත, අසත්‍ය චෝදනාවකට රක්ෂිත බන්ධනාගාර ගතව සිටීමෙන් පසු නැවත මාස 1½ කට පසු නැවතත් චෝදනා එල්ල කර පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සූදානම් වන බව නිගමනය කළ පැමිණිලිකරු ව්‍යාජ ගමන් බලපත්‍රයක් සකසා ගෙන මැලේසියාවට ගොස් එහි මාස 11 ක පමණ කාලයක් රැඳී සිට ඇත.

ඉන්පසුව 2008.02.07 වන දින නැවත ලංකාවට පැමිණෙන පැමිණිලිකරු 2018.08.13 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත ද සිල්වා විසින් අත්අඩංගුවට ගෙන බී 732/2009 දරණ සාක්ෂිකරුවෙකු වශයෙන් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. අත්අඩංගුවට ගැනීමේ කුවිතාන්සිය පැ.30 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. අවුරුදු 01 මාස 04 ක පමණ කාලයකට පසුව පැමිණිලිකරු මහාධිකරණය මගින් ඇපමත මුදාහැර ඇත. එම ඇප නියෝගය පැ.31 වශයෙන් ද, බී වාර්තාව පැ.32 වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කර ඇත. 2009.06.01 දින අධිකරණයට ඉදිරිපත් කරන ලද බී 732/2009 මුල් වාර්තාට අනුව අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා පැමිණිල්ල සිදු කර ඇත්තේ එවකට ඔහුගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියාව සිටි ලුතිනන් කමාන්ඩර් මුණසිංහ ආරච්චිලාගේ දොන්

නිලන්ත සම්පත් මුණසිංහ යන නිලධාරියාට විරුද්ධවය. එම පැමිණිල්ලට අනුව සම්පත් මුණසිංහ ලැගුම් ගෙන සිටි ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරේ පිහිටි කාමරයක තිබී හමුවූ සැකකටයුතු දේපළ හා ලේඛන සම්බන්ධ පරීක්ෂණ පවත්වන බවටත්, එකී සම්පත් මුණසිංහ නැමැති නිලධාරියා අත්අඩගුවට ගැනීම සඳහා නාවික හමුදාව සහ පොලිස්සිය එක්ව පරීක්ෂණ පවත්වාගෙන යනු ලබන බවත් අධිකරණයට කරුණු වාර්තා කර ඇත. එසේම නිලධාරියා සේවා ස්ථානයට නොදන්වා සේවා ස්ථානයෙන් බැහැරව ගොස් සිටි බවත්, එසේ බැහැරව යාම මත ඇති වූ සැකය හේතුවෙන් ඔහුගේ නිල කාරමය නාවික හමුදා නිලධාරීන් විසින් පරීක්ෂා කර ඇති බවත්, එම පරීක්ෂණයේ දී සැකකටයුතු ලියවිලි, හැදුනුම්පත්, විදේශ ගමන් බලපත්‍ර, චෙක්පත් ඇතුළු ලියකියවිලි රාශියක් සොයා ගත් බවටත්, ඒ අනුව ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලෙසට පොලිස්පතිතුමාට ලිඛිත පැමිණිල්ලක් සිදු කරනු ලදුව එම පැමිණිල්ල පොලිස්පතිතුමා විසින් නියෝජ්‍ය පොලිස්පති, අපරාධ හා සංවිධානාත්මක අපරාධ, වෙත කරන ලද දැනුම් දීම පරිදි නියෝජ්‍ය පොලිස්පති අපරාධ විසින් කොළඹ අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ පොලිස් අධිකාරි වාස් ගුණවර්ධන මහතා වෙත ලිඛිත දැනුම් දීමක් කර ඇති බවත්, ඒ අනුව අධ්‍යක්ෂක විසින් පොලිස් පරීක්ෂක කුලරත්න, උප පොලිස් පරීක්ෂක විජේරංජන ඇතුළු නිලධාරී කණ්ඩායම වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදු කර ගෙන යන බවටත් මෙම මුල් බී වාර්තාවෙන් අධිකරණයට වාර්තා කර ඇත.

මෙම පරීක්ෂණයට අදාලව පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් පැමිණිලිකරුගේ 2010, 2011 සහ 2012 වර්ෂ වලදී ප්‍රකාශ සටහන්

කර ගෙන ඇත. පැමිණිලිකරු විවාහක නිලධාරියෙකු වූ බැවින් ඔහුට ත්‍රිකුණාමල හමුදා කඳවුර තුළ නවාතැන් පහසුකම් නොලැබෙන අතර ඒ හේතුවෙන් ඔහු හමුදා කඳවුරට ඇතුළුවන හා පිටවන අවස්ථාවන්හිදී ඇඳුම් මාරු කර ගැනීමටත්, අහාර අනුභව කිරීමටත් සහ ඔහු නාවික හමුදාවට බැඳුනු 1987 වර්ෂයේ සිට හඳුනන සම්පත් මුණසිංහගේ අවිවාහක නිලධාරීන් වෙසෙන කාමරය ඔහුගේ ආරාධනයෙන් එකී අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමට පමණක් පාවිච්චි කර ඇති අතර ඒ හේතුවෙන් පොලිසිය පැමිණිලිකරුගෙන් කටඋත්තර ලබා ගැනීම සිදු කර ඇත. කෙසේ වෙතත් පැමිණිකරු මෙම කාමරය පාවිච්චි කර ඇත්තේ 2008.09.03 දින සිට ඔහු ස්ථාන මාරු ලැබ ගිය 2009.03.27 දින දක්වා වූ කාල සීමාව තුළ වීමත්, 2009.03.27 වන දින ඔහු ශ්‍රී ලංකා නාවික නෞකා පරාක්‍රම ආයතනයෙන් ඉවත්ව ගොස් 2019.03.28 වන දින ශ්‍රී ලංකා නාවික නෞකා පැරකුම්බා ආයතනයේ සේවයට වාර්තා කර ඇත. පැමිණිලිකරුගේ පැ.28 දරණ සේවා වාර්තාවේ මෙම සේවා වාතීාවේ මෙම මාරු පත්වීමට අදාළ කොටස පැ.28 (අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරුගෙන් කටඋත්තර ලබා ගැනීමට කැඳවා ඇත්තේ ප්‍රශ්න ගත කාමරයේ දොරේ සම්පත් මුණසිංහගේ නම සහ පැමිණිලිකරුගේ නම ද නාම පුවරුවෙහි ප්‍රදර්ශනය කර තිබීම හේතුවෙනි. පැමිණිලිකරු 2009.05.28 දින බී 732/2009 නඩුවට අදාළ පැමිණිල්ල සිදු කරන විටත් පැමිණිලිකරු ප්‍රශ්නගත කාමරයෙන් ඉවත්ව මාස 02 ක කාලයක් ඉකුත්ව ගොස් තිබී ඇත.

පැමිණිලිකරුගේ සාක්ෂිය අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔහුගෙන් ප්‍රශ්න කර ඇත්තේ ඔහු සේවය කළ 2008.09.03 දින සිට ස්ථාන මාරු ලැබ ගිය 2009.05.27 වන දින දක්වා කාලය තුළ ඔහු සිදු කළ රාජකාරි සම්බන්ධයෙන් පමණි. ළමුන් 11 දෙනෙකු පැහැරගෙන යාමේ සිද්ධියක් පිළිබඳව පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කර නොමැත. එසේම ළමුන් 11 දෙනෙකු පැහැර ගැනීමේ සිද්ධියක් පිළිබඳව පැමිණිලිකරුට එරෙහිව කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැත. කරුණු එසේ වුවත් 2009 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ පවත්වා ඇති අතර ඉන්පසුව කොළඹ ත්‍රිපුද්ගලය මහාධිකරණයක් ඉදිරියේ HC(TAB)/1448 අංක නඩුව ගොනු කර අධිචෝදනා පත්‍ර ඉදිරිපත් කර ඇත. චෝදනා 667 ක් යටතේ ගොනු කර ඇති එම අධිචෝදනා පත්‍රයේ පැමිණිලිකරුට එරෙහිව සාක්ෂි දීමට සාක්ෂිකරුවෙකු ලෙසට නාවික හමුදාවේ රාජකාරි කළ නිලධාරීන් සහ නාවිකයන් පමණක් ඇතුළත් කර ඇති අතර බාහිර ස්වාධීන සාක්ෂිකරුවන් නම් කර නොමැත. එසේ පැමිණිලිකරු යටතේ රාජකාරි කළ දෙදෙනෙකු වන නාවික සෙබළ SP 21500 කෝට්ටෙගොඩගේ දොන් ප්‍රගීත් නිශාන්ත කෝට්ටෙගොඩ අධිචෝදනා පත්‍රයේ අංක 47 වන සාක්ෂිකරු ලෙසටද, නායක නාවික සෙබළ XP318667 සෝමදාසගේ සමන් කුමාර සෝමදාස අධිචෝදනා පත්‍රයේ අංක 79 සාක්ෂිකරු ලෙසටද, ඇතුළත් කර ඇත. උක්ත අධිචෝදනා පත්‍රය පැ.33 ලෙසටත්, උක්ත සාක්ෂිකරුවන් දෙදෙනා පිළිවෙලින් පැ.33 (අ) සහ පැ.33 (ආ) ලෙසටත් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉහත සඳහන් කළ පැමිණිල්ලේ සාක්ෂි අංක 33 සහ 79 සාක්ෂිකරුවන් දෙදෙනා සඳහන් කර ඇත්තේ පැමිණිලිකරුගේ අනු දැනුම මත කොළඹ විවිධ ප්‍රදේශ වලින් පුද්ගලයින් 11 දෙනෙකු පැහැරගෙනවිත් නාවික හමුදා මුලස්ථානයේ පිහිටු බම්බුව යැයි හඳුන්වන ස්ථානයේ රැඳවුම් කඳවුරක් පවත්වාගෙන ගිය බවට යන ප්‍රකාශයන්ය. නාවික හමුදා මුලස්ථානය තුළ සිදුවන සියලුම ක්‍රියාදාමයන් අණදෙන නිලධාරීන්ගේ අවසරය හා දැනුම මත සිදුවන බවත්, සෑම කඳවුරකම ආරක්ෂකයින් සිටින බවත්, කඳවුර තුළ සිදුවන සියලු දේ පිළිබඳව සොයා බලා අණදෙන නිලධාරීන්ට වාර්තා කළයුතු බවටත්, ඒ අනුව එවැනි කරුණක් වාර්තා වී නොමැති බවටත් පැමිණිලිකරුගේ ස්ථාවරය විය. නාවික හමුදාවේ පරාක්‍රම ආයතනයේ එවකට අණදෙන නිලධාරියා වූ කපිතාන් කේ.ජේ.කුලරත්නගේ සාක්ෂි මේ සම්බන්ධ ස්ථාවරය තහවුරු කිරීමට මෙහෙයවීම සඳහා පැමිණිලිකරු ඉල්ලීමක් කර ඇත.

ඉහත කී සාක්ෂිකරුවන් දෙදෙනා පළමු වතාවට ප්‍රකාශයක් ලබා දී ඇත්තේ 2017 වර්ෂයේ දීය. ඔවුන් දෙදෙනා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් අධිකාරි ශානි අබේසේකර සහ පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා විසින් කැඳවා ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. එසේම 2019 වර්ෂයේ දී අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශය මහේස්ත්‍රාත්වරයාට ලබා දී ඇත. සාක්ෂි අංක 47 කෝට්ටෙගොඩගේ ප්‍රකාශය පැ.34 ලෙසටත්, සාක්ෂි අංක 79 සම්පත් කුමාරගේ ප්‍රකාශය පැ.35 ලෙසටත් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.34 සහ පැ.35 දරණ ප්‍රකාශ දෙකට සාක්ෂිමය වටිනාකමක් ලබා දිය හැකිද යන්න ඉදිරිපත් වී ඇති කරුණු අනුව සලකා බැලිය යුතුය. පැ.34 සහ පැ.35 ප්‍රකාශ සිදු කර ඇත්තේ පිළිවෙලින් 2019.01.21 සහ 2019.01.25 වන දිනයන් දෙකෙහිය.( පැ.34(අ) සහ පැ.35(අ) ) ඒ ප්‍රශ්නගත සිද්ධියට සිදුවී අවුරුදු 10 කට ආසන්න කාලයකට පසුවය. එම අවුරුදු 10 ක කාලය තුළ ප්‍රකාශ වල අඩංගු කරුණු ඊට පෙර හෙළිදරව් කිරීමට ඔවුන්ට කිසිදු බාධාවක් තිබුණු බවට සඳහන් කර නැත. එසේම එම ප්‍රකාශ බොහෝ ප්‍රමාදවී ඔවුන්ගේ පෙර ප්‍රකාශවලට පටහැනිව සිදු කළ ප්‍රකාශ බැවින් එම ප්‍රකාශවල ඇති සාක්ෂිමය අගය මුළුමනින්ම ගිලිහී යනු ඇත.

දෙවනුව, ප්‍රකාශ දෙකෙහි අඩංගු වැදගත් කරුණු එකිනෙකට පරස්පරය. පැ.35 ප්‍රකාශය සිදු කළ සමන් කුමාරට අනුව 2007 අවුරුද්දේ සාම්පුර්වල රාජකාරි කර ඇති අතර පැමිණිලිකරු මාරුවීම් ලබා ගිය පසු කෙටි කලකින් සමන් කුමාර සහ කෝට්ටේගොඩ ඇතුළු 4 දෙනෙකු මාරුවීම් ලැබ නාවික හමුදා මූලස්ථානයට පැමිණ ඇත. පැ.34 ප්‍රකාශක කෝට්ටේගොඩට අනුව 2008 වසරේ සාම්පූර් වල සිටින විට පැමිණිලිකාර හෙට්ටිආරච්චි LTTE පුද්ගලයන් සෙවීමට කොළඹ යන බවත්, කෝට්ටේගොඩ ඇතුළු පිරිස පැමිණෙන්නේ දැයි විමසා ඔවුන් ඊට කැමති වූ බැවින් කෝට්ටේගොඩ , සමන්කුමාර ඇතුළු 04 දෙනෙකු හෙට්ටිආරච්චි සමඟ කොළඹ පැමිණ ඩී.කේ.පී.දසනායක මහතාට ඔවුන් බාර කළ බවත්ය.

මේ අනුව පැ.34 ප්‍රකාශය පැ.35 ප්‍රකාශයට හාත්පසින්ම ප්‍රතිවිරුද්ධවේ. පැ.34 අනුව කෝට්ටේගොඩ කොළඹ පැමිණ ඇත්තේ 2008 වර්ෂයේදී බව පැහැදිලිය. එහි වෙනත් දින නොමැති අතර සඳහන් කාල පරාසය

අනුව 2008 වර්ෂයේ ඔහු හෙට්ටිආරච්චි සමඟ සාම්පූර්වල සිටි කොළඹට පැමිණ ඇත. එබැවින් පැ.34 සහ පැ.35 ප්‍රකාශ මුළුමනින්ම මානසික විප්‍රයෝගයකින් සිදු කළ ප්‍රකාශ බවට පැහැදිලිව පෙනී යන අතර එම එම ප්‍රකාශවල කිසිදු සාක්ෂිමය අගයක් නොමැත.

සාක්ෂිවලින් අනාවරණය වන පරිදි ඉහත සඳහන් සාක්ෂිකරුවන් එවැනි ප්‍රකාශ පැමිණිලිකරුට එරෙහිව ලබා දීමට හේතුව වී ඇත්තේ 2015.01.08 දින සිදුවූ ආණ්ඩු පෙරලිය සහ නව රජය බලයට පත්වීමත් සමඟ එම රජයේ දේශපාලන අරමුණු ඉටු කරලීම සඳහා ඊට පෙර පැවැති මහින්ද රාජපක්ෂ රජයේ ජනාධිපති, ආරක්ෂක ලේකම්, නාවික හමුදාපති ඇතුළු ඉහළ පෙළේ හමුදා සහ රජයේ නිලධාරීන් ඉලක්ක කර ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර, පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා ඇතුළු කණ්ඩායම විසින් අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් සිදු කරන ලද කූඨ වැඩ පිළිවෙල රාජ්‍ය අනුග්‍රයෙන්, අල්ලස් මතින් සහ විවිධ බලාපොරොත්තු ලබා දෙමින් ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙල අනුවය.

මෙම තත්ත්වය මැනවින් සනාථ කරන තවත් එක් සිද්ධියක් පිළිබඳව සාක්ෂි මෙම නඩුවේදී ඉදිරිපත් වී ඇත. ඒ අනුව පැමිණිලිකරු ඇප මත මුදවා හැරීම සඳහා නියෝගයක් අයදමින් පැමිණිලිකරුගේ භාර්යාව විසින් කොළඹ මහාධිකරණයට ඇප අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති අතර, එම ඇප අයදුම්පත්‍රය නීතිපතිවරයාගේ විරෝධතා හමුවේ ප්‍රතික්ෂේප කර ඇති අතර ඉන් පසුව දෙවන ඇප අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම සඳහා මිතුරෙකුගේ මාර්ගයෙන් නීතිඥ නිලාන් අමරකෝන් මහතා මුණගැසී ඇති අතර, ඒ සඳහා වඩා හොඳ සේවයක් ලබාදීමට යැයි පවසමින් නීතිඥ ආනන්ද හෙට්ටිආරච්චි මහතා මුණගැසීමට එක්

දිනක් රාත්‍රී 7.00ට පමණ පැමිණිලිකරුගේ බිරිඳ රැගෙන ගොස් ඇත. ආනන්ද හෙට්ටිආරච්චි මහතා මුණගැසීමෙන් පසු ඇප අයදුම සකස් කිරීමේ මුල් වටය අරම්භ කර ඒ සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකරගේ අදහස් හා උපකාර ඉල්ලමින් ආනන්ද හෙට්ටිආරච්චි මහතා ඔහුගේ දූරකතනයෙන් ශානි අබේසේකර අමතා ඔහු ප්‍රකාශ කරන දේ පැමිණිලිකරුගේ භාර්යාවට ශ්‍රවනයවීමට සැලැස්වීම සඳහා ආනන්ද හෙට්ටිආරච්චි මහතාගේ දූරකථනයේ ස්පීකර්වල ශබ්දය වැඩි කර ඇත. එම අවස්ථාවේ දී ශානි අබේසේකර ප්‍රකාශ කර ඇත්තේ "11 දෙනෙකු පැහැරගෙන ගොස් අතුරුදහන් කළ නඩුව සම්බන්ධයෙන් හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහ නාවික හමුදාපති කරන්නාගොඩ මහතාගේ දැනුවත්වීම මත සිදු කරන ලද ක්‍රියාවක් බවට ප්රකාශයක් ලබාදුනහොත් ඇප පිළිබඳව සලකා බලන බවටත්ය. මෙම කරුණු සනාථ කිරිම සඳහා පැමිණිලිකරුගේ බිරිඳ චතුරිකා සදීශානි සාක්ෂි ලබාදීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට කැඳවන ලදී.

ඉන්පසුව පැමිණිලිකරුගේ බිරිඳ බන්ධනාගාරයට ගොස් පැමිණිලිකරුට මෙම ස්ථාවරය දැනුම් දී ඇත. පැමිණිලිකරු එවැනි පවාදීමක් සිදු කිරීමට අසත්‍ය ප්‍රකාශ සිදු කිරීම සඳහා සුදානම් නොමැති බවට දැනුම් දෙන ලෙසට ප්‍රකාශ කර ඇත.

මෙම කරුණු තවදුරටත් සනාථ කරමින් දේශපාලන අවශ්‍යතාවයන් මත රණවිරුවන් දඩයම් කිරීමේ මෙහෙයුමක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නිරතව සිටින බවට 2020.01.15 වන දින දිවයින පුවත් පතෙහි පළකල මාධ්‍ය වාර්තාවක් පැ.36 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.36 මාධ්‍ය වාර්තාවේ මෙසේ සඳහන් වේ.

(උපුටා ගැනීම) “එය වූයේ අදාළ විමර්ශන සිදු කරන සී.අයි.ඩී.යේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනවිරත්න, හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර මෙන්ම නිශාන්ත සිල්වා කන්දප්පා, ඒ.එස්.පී. තිසේරා සහ විශේෂයෙන් මේ සියල්ලන්ගේ සුවච කීකරු කුක්කා සේ ඕනෑම කුජීත වැඩකට ඉදිරිපත් වූ සාජන් මෙන්ඩිස් ඇතුළු කල්ලිය පැහැදිලි ලෙසම උපන් බිමට එරෙහි කුමන්ත්‍රණයක යෙදී සිටින්නේ යැයි යන්නය.

සී.අයි.ඩී.යේ මෙකී කල්ලිය අම්බලන්ගොඩ රූකඩසේ නැටුවේ සංහිඳියාවේ සහ සහජීවනයේ නාමයෙන් ක්‍රියාත්මක වූ යහපාලන දෝහීත්වය සමඟ එක පෙළට ක්‍රියාත්මක වූ විජාතික කුමන්ත්‍රණකරුවන්ගේ සහ කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාවේ පදයට බවද අපි රටට හන්දුවා දුන්නෙමු. එදා ඒ අවනඩුව ඉදිරියට ගෙන යන්නට කිසිවෙකු නොසිටියේය. ශානි අබේසේකර ඇතුළු සීඅයිඩීයේ කුජීත කල්ලිය සිදු කරමින් සිටියේ මහා අප්‍රසන්න කුමන්ත්‍රණයක් බව ඇස් මනාපිට පෙනෙමින් තිබුණද මාධ්‍ය නිදහසට දණ්ඩනීති සංග්‍රහයෙන් පහර දුන් පාලන භීෂණය හමුවේ සියල්ලෝ නිහඬ වූහ.

දැනට හෙළවී ඇති හඬපට අනුව ලසන්ත ඝාතනය, තාජුඩීන් සිද්ධිය, කොටහේනේදී පුද්ගලයන් දෙදෙනෙකු පැහැරගත්තේ යැයි කියන සිද්ධිය ආදී ලෙසින් පසුගිය කාලයේ සී.අයි.ඩී.ය සිදු කළ කැකිල්ලේ විමර්ශන රැසක් සම්බන්ධයෙන් ශානී අබේසේකර රංජන් රාමනායක සමඟ කතාබහ කරන්නේය.

රංජන් රාමනායක මෙහිදි නිරන්තරයෙන් සිටින්නේ සියලු දෙනා පුළුවන් තරම් ඇතුළට දාපන් කියන තැන බව එකී හඬපටවලට සවන් දිමේදී පැහැදිලිවම පෙනී යන කරුණකි. ඒ අනුව බලන විට සී.අයි.ඩී.යෙ හයේ කල්ලිය පසුගිය කාලයේ සිදු කළ විමර්ශන සර්ව සාධාරණ ඒවා වූයේ නම් ශානි අබේසේකර ඒවා රංජන් රාමනායක සමඟ කතාබහ කරනු ලැබුවේ කුමකටද?

මෙසේ ක්‍රියාත්මක වූ ශානි අබේසේකර ඇතුළු කල්ලිය පසුගිය ජනාධිපතිවරණයට ඔන්න මෙන්න තිබියදී වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාව සිරගත කිරීමට දැඩි උත්සාහයක් ගනු ලැබුහ.

එසේ සහ වැල්ලවත්තේදී තරුණයන් පස්දෙනෙකු ඇතුළු පුද්ගලයින් එකළොස් දෙනකු පැහැර ගත්තේ යැයි කියන කතාව හමුවේ නාවික හමුදා බුද්ධි අංශ නිලධාරීන් පිරිස යළි බන්ධනාගාරගත කරවීමටද වෙහෙසුණේය.

එහිදි වත්මන් රියර් අද්මිරාල් ඩීකේපී දසනායක සහ හිටපු නාවික හමුදාපතිවරයකු වූ අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් ධූරයෙන් පිදුම් ලැබූ වසන්ත කරන්නාගොඩවද සිරගත කිරීම ශානි අබේසේකර ඇතුළු පිරිසගේ උත්සාහය විය." (උපුටා ගැනීම අවසන්)

එසේම බී.732/2020 වාර්තාව 2009.06.01 වන දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන්නේ එවකට නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා විසින් සිදු කරනු ලබන පැමිණිල්ලක් මත වන අතර ඒමත සැකකරු පහත නම් කරන

ලද සම්පත් මුණසිංහ නැමැති නිලධාරියාය. එසේ වුවත් 2015.01.08 දිනින් පසුව පොලිස් පරීක්ෂක නිශාන්තද සිල්වා විසින් මෙම පරීක්ෂණ මුළු මනින්ම කනපිට හරවා 2019 වර්ෂය වන විට පැමිණිලිකරු  විත්තිකරු කර තවත් නාවික හමුදා නිලධාරින් 47 දෙනෙකු විත්තිකරුවන් ලෙස එකතු කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර, සහකාර පොලිස් අධිකාරි තිසේරා සහ පොලිස් පරීක්ෂක නිශාන්ත  සිල්වා විසින් ක්‍රියා කරන ලද්දේ ඔවුන් මෙහෙයන ලද දේශිය හා විදේශිය දේශපාලන බලවේග බවට පැහැදිලි සාක්ෂි කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

මෙම දේශපාලන සම්බන්ධතාවය සනාථ කිරීම සඳහා 2015 රජයේ අමාත්‍යවරයෙකු වූ රංජන් රාමනායක සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර අතර සිදුවූ දුරකතන සංවාදයක් පටිගත කළ සිඩී තැටියක් පැ.37 ලෙස සලකුණු කර ඉදිරිපත් කළ අතර එම සිඩී තැටිය කොමිෂන් සභාව ඉදිරියේ වාදනය කරන ලදී. ළමුන් 11 දෙනෙකු අතුරුදහන් සිද්ධිය පිළිබඳව ඉදිරිපත් කළ බවට තොරතුරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් රංජන් රාමනායක මහතා විමසා ඇති අතර අදාළ ලිපිගොනු පිළිබඳව විමසිමක් කර ඇත.

එසේම පැමිණිලිකරු ජීවත්වන ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කර ඇති අතර එම ප්‍රශ්න කිරීම් වලින්  ගැලවීමට පැමිණිලිකරුගේ නම ඡන්ද හිමි නාම නාම ලේඛනයෙන් ඉවත් කර ඇත. පැමිණිලිකරු දැනටත් එම ග්‍රාම නිලධාරී වසමේ ජීවත්වන බවත්, එසේ වුවත් ඊට අදාළ ඉල්ලුම් පත්‍ර පුරවා දි තිබියදීත් තමාගේ නම ජන්දහිමි නාමලේඛනට ඇතුළත් කිරීම සිදු කළ නොහැකි බවට ග්‍රාම නිලධාරී පවසා ඇති බවද සාක්ෂි වලින්

අනාවරණය විය. මේ සම්බන්ධයෙන් සමන් ගමගේ නැමැති මාධ්‍යවේදියා පළ කරන ලද මාධ්‍ය වාර්තාවක් පැ.38 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම මාධ්‍ය වාර්තාට අනුව බන්ධනාගාර ගතව සිටින ලුතිනන් කමාන්ඩර් හෙට්ටිආරච්චි මහතාගේ සහ ඔහුගේ භාර්යාව වන චතුරිකා නදීශානි වීරවික්‍රම මහත්මියගේ නම් ඡන්දහිමි නාම ලේඛනයෙන් ඉවත් කිරීමට, අංක 507, වැල්ලම්පිටිය, වේසන වත්ත, ග්‍රාම නිලධාරීවරයා කටයුතු කර තිබෙන බවට වාර්තා වී ඇත.

පැමිණිලිකරුට විරුද්ධව සාක්ෂි ලබා දීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සාක්ෂිකරුවන් දෙදෙනෙකු දැනට විදේශ ගතව ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහායෙන් විදේශ ගතවුන බවට පැමිණිලිකරු සාක්ෂි දී ඇත. ඒ අනුව පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා ස්විට්සර්ලන්තයට පැන ගොස් ඇත.

පැමිණිලිකරුගේ භාර්යාව වන චතුරිකා නාදීශානි වීරවික්‍රම මහත්මියගේ සාක්ෂියට අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් පසුව ඔහු ඇපමත මුදවා ගැනීම සඳහා ලිලාන් අමරකෝන් නැමැති නීතිඥ මහතා මුණගැසී නීති උපදෙස් ලබාගෙන ඇත. එම නීතිඥ මහතා ඇයත් සමග කැළණියේ වාසය කරන ආනන්ද හෙට්ටිආරච්චි නැමැති නීතිඥ මහතා මුණ ගැසීමෙන් පසුව ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර සමග මෙම ඇප අයදුම් පිළිබඳව සිදු කළ සාකච්ඡාව ඇයට ඇසීමට සලස්වා ඇත. රවිරාජ් ඝාතනය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන සිටින හෙට්ටිආරච්චි මහතාට ඇප ලබා ගැනීම සඳහා ඇයගේ භාර්යාව පැමිණ සිටින බවට ආනන්ද හෙට්ටිආරච්චි

නීතිඥ මහතා ශානි අබේසේකර මහතාට පවසා ඇති අතර එම අවස්ථාවේදී ශානි අබේසේකර පවසා ඇත්තේ 11 දෙනකු පැහැරගැනීමේ නඩුවේ ප්‍රසාද් හෙට්ටිආරච්චි ඉන්නවා එම පැහැරගැනීම සහ ඝාතනය හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතාගේ උපදෙස් පරිදි ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අනුදැනුම ඇතුව සිද්ධ වුණු බවට ප්‍රකාශයක් ඇයගේ ස්වාමි පුරුෂයාගෙන් ලබාදෙන ලෙසට භාර්යාවට පවසන ලෙසට ශානි අබේසේකර මහතා ප්‍රකාශ කර ඇත.

එවැනි ප්‍රකාශයක් ලබාදීම පැමිණිලිකාර හෙට්ටිආරච්චි මහතා ප්‍රතික්ෂේප කර ඇත. ඒ වන විටත් ඉදිරිපත් කර තිබූ ඇප අයදුම් පත්‍රය විභාග කිරීමෙන් අනතුරුව මහාධිකරණය විසින් හෙට්ටිආරච්චි මහතා ඇප මත මුදා හැරීමේ නියෝගයක් සිදු කර ඇතත් එම ඇප අත්සන් කරනු ලැබූ දිනයේ දී නැවතත් ඔහු මහාධිකරණය වෙත රැගෙන ගොස් රක්ෂිත බන්ධනාගාරයට පත් කර ඇත.

ඇයගේ සහ ස්වාමි ස්වාමිපුරුෂයාගේ නම ඡන්ද හිමි නාම නාමලේඛනයෙන් ඉවත් කිරීම් කරණ කොටගෙන 2019 වසරේ චන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ද ඇයට අහිමිව ගොස් ඇත.

මහාධිකරණ නියෝගය මත මහේස්ත්‍රාත් අධිකරණයේ දී ඇප අත්සන් කළ පැමිණිලිකාර හෙට්ටිආරච්චි මහතා ඇප මත මුදා නොහැර අධිකරණ නියෝගයක් නොමැතිව නැවත බන්ධනාගාර නිලධාරීන් විසින් අත් අත්අඩංගුවට ගෙන මහාධිකරණය වෙත ගෙන යාම පිළිබඳව විමර්ශනය සඳහා බන්ධනාගාර අධිකාරි රොහාන් සමන්ත අලහප්පෙරුම මහතා කොමිෂන් සභාව ඉදිරියට කැඳවන ලදී.

2016.07.20 දින හෙට්ටිආරච්චි මහතා අත්සන් කිරීමෙන් පසුව නැවත බන්ධනාගාරය භාරයට ගැනීමට බලපත්‍රයක් බන්ධනාගාරය නිලධාරීන් සතුව තිබී නොමැති බවට අධිකාරිවරයා පිළිගත්තේය. හෙට්ටිආරච්චි මහතා බන්ධනාගාරය භාරයේ තබා ගැනීමට අධිකාරී බලයක් බලපත්‍රයක් ඉදිරිපත් කර ඇතත් එහි දින සඳහන් නොමැත. මේ අනුව යථාපරිදි මහාධිකරණ නියෝගය අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ දී ඇප අත්සන් කල හෙට්ටිආරච්චි මහතා බන්ධනාගාර නිලධාරීන් විසින් නීති විරෝධී ලෙස රඳවා තබා ගැනීමේ බලපත්‍රයක් නොමැතිව බන්ධනාගාර නිලධාරීන්ගේ භාරයට ගෙන මහාධිකරණය වෙත රැගෙන ගොස් තිබීම නීති විරෝධී ලෙස සිර කර තැබීමක් වේ .

කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 507 ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී රණසිංහගේ අසංක ජයලන්කා පෙරේරා සාක්ෂි දෙමින් පැමිණිලිකරුගේ සහ ඔහුගේ භාර්යාවගේ නම් ඡන්ද හිමි නාම නාමලේඛනයෙන් කපා දමා ඇති බවට පිළිගත්තේය.

දැනට පෞද්ගලික අංශයේ සේවය කරන හේරත් ඒකනායක මුදියන්සේලාගේ ජගත් චන්දන බණ්ඩාර නාවික හමුදාවේ සේවය කළ නාවික නිලධාරියෙකි. 2015 මාර්තු මස නැවත දිනයක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ කැඳවීමක් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිට ඇති අතර එහිදී ඔහු ප්‍රශ්න කිරීම් වලට භාජනය කර ඇත. මෙම සාක්ෂිකරුට තර්ජනය කරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහන් කරන අයුරින් ප්‍රකාශයක් ලබා ලබාගැනීමට උත්සාහ කර ඇත. හෙට්ටිආරච්චිට ලබාදී ඇති අන්වර්ථ නාමය නේවි සම්පත් යන නම බවට ප්‍රකාශ කරන ලෙසට සාක්ෂිකරුට බලපෑම් කරමින් ප්‍රකාශ කර

සාක්ෂිකරු සඳහන් නොකළ කරුණු ඇතුළත් ප්‍රකාශයක් යතුරු ලියනය කර එයට සාක්ෂිකරු ගෙන් අත්සන් ලබාගෙන ඇත. අත්සන් කිරීමට ප්‍රථම එම ප්‍රකාශය සාක්ෂිකරුට කියවා බැලීමට ඉඩ ලබා දී නොමැත. අමරවංශ නැමැති නිලධාරියා සාක්ෂිකරුගේ ප්‍රකාශය සටහන් කරගෙන ඔහු නිශාන්ත සිල්වා වෙත රැගෙන ගොස් ඇත. ඉන්පසුව 2016 දෙසැම්බර් මාසයේදී පමණ සාක්ෂිකරු මහාධිකරණය වෙත කැඳවා ඔහුගේ සාක්ෂි විභාග කිරීමක් සිදුකර ඇති අතර එහිදී ඔහු සඳහන් කර ඇත්තේ හෙට්ටිආරච්චි මහතා සම්පත් යනුවෙන් හඳුන්වන්නේ නැති බවය . මෙම සාක්ෂි ඛණ්ඩය පැ. 44 සහ පැ. 45 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. සාක්ෂි ලබාදී මහාධිකරණයෙන් එළියට පැමිණි අවස්ථාවේදී අමරවංශ මහතා සාක්ෂිකරුට බැන වදිමින් "තෝ බල්ලා අපි කියපු දේ හරියට කළේ නෑ තෝ ගැන අපි බලාගන්නම්" යනුවෙන් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකාර හෙට්ටිආරච්චි මහතාට මහාධිකරණයෙන් ඇප නියම කිරීමෙන් අනතුරුව ඇප නියෝගය කියවා දී ඇප ඉදිරිපත් කිරීමට සහ අත්සන් තැබීමට මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. හෙට්ටිආරච්චි මහතා මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙසට බන්ධනාගාරය වෙත නිකුත් කරනු ලැබූ නියෝගයේ සඳහන් වන්නේ හෙට්ටිආරච්චි මහතාට මහාධිකරණය ඉදිරියේ වෙනත් නඩු තිබේනම් එම නඩු වලට ඉදිරිපත් කිරීමෙන් පසුව ඇප අත්සන් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙසටය. එම නියෝගය පරිදි බන්ධනාගාරය නිලධාරීන් විසින් හෙට්ටිආරච්චි මහතා මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර ඇප අත්සන්

කිරීමේ කටයුතු එහි දී නිමාවට පත්කර, හෙට්ටිආරච්චි මහතා අධිකරණයෙන් නියම කළ ඇප නියෝගය මත මුදා හැර ඇත.

එසේ මුදා හැරීමෙන් පසුව අධිකරණ ශාලාවෙන් පිටවීමට යන අවස්ථාවේදී බන්ධනාගාර නිලධාරීන් විසින් නැවතත් හෙට්ටිආරච්චි මහතා අත්අඩංගුවට ගෙන කොළඹ මහාධිකරණය වෙත රැගෙන ගොස් ඇත. බන්ධනාගාර නිලධාරීන්ට මේ අයුරින් හෙට්ටිආරච්චි මහතා බන්ධනාගාර නිලධාරීන්ගේ භාරයට ගැනීමට කිසිදු වලංගු අධිකරණ නියෝගයක්යක් එම අවස්ථාවේ දී තිබී නොමැත.

බන්ධනාගාර නිලධාරීන් සිදුකළ අනීත්‍යානුකූල ක්‍රියාව පිළිබඳව කොමිෂන් සභාව විසින් විමර්ශනයක් සිදු කරනු ලැබූ අතර එහිදී අනාවරණය වූයේ වලංගු අධිකරණ නියෝගයක් නොමැතිව ඇප අත්සන් කර මුදා හරින ලද හෙට්ටිආරච්චි මහතා නැවතත් බන්ධනාගාර නිලධාරීන්ගේ භාරයට ගෙන මහාධිකරණය වෙත රැගෙන ගොස් ඇති බව ය.

මෙම අනිත්‍යානුකූල අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාව සිදුකළ බන්ධනාගාර නිලධාරීන්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 336 වගන්තිය යටතේ චෝදනා ඉදිරිපත් කර විමර්ශනයක් සිදුකළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරනය කර ඇත.

වගඋත්තරකාර තිසේරා සාක්ෂි ලබා දී ඇත. එසේ වුවත් ඔහුගේ සාක්ෂිය හරස් ප්‍රශ්න වලට භාජනය කිරීමට පැමිණිලිකරුවන්ට අවස්ථාව අහිමි වී ඇත. පැමිණිලිකරු අද දින කෝවිඩ් වසංගතය මත ඔහු ජීවත්වන ප්‍රදේශය වසා ඇති බැවින් ඔහුට කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිම නොහැකි වී ඇත. එබැවින් තිසේරා මහතාගේ

සාක්ෂියට සලකා බැලීම සිදු කළ යුතු වන්නේ හරස් ප්‍රශ්න වලට භාජනය කිරීමට අවස්ථාවක් ලබා දීමට කොමිෂන් සභා පාලනයෙන් තොර හේතුවක් මත නොහැකිවීම පදනම් කරගෙනය. එබැවින් මෙම හේතුන් මත මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට ඇති අවස්ථාව පාලනය කළ නොහැකි හේතුවක් මත පැමිණිල්ලට අහිමිවීම සලකා බලා මෙම සාක්ෂිය පැමිණිල්ලේ හරස් ප්‍රශ්න වලට භාජනය කරන තෙක් සලකා නොබැලීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.45 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

24/11/2020

2020.11.24

## 9 .V

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 55/2020 |
| පැමිණිලිකරු | - | දැලිවලගෙදර ගාමිණී සෙනවිරත්න |
| ලිපිනය | - | මාකෙහෙල්වල, අධිකාරිගේ වත්ත, මාකෙහෙල්වල, මාවනැල්ල. |

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින් වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. පො.අ. ශානී අබේසේකර
2. පොලිස් පරීක්ෂක බෝධි පක්ෂ
3. පොලිස් පරීක්ෂක අමරවංශ (මියගොස්)

තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති  සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර දැලිවලගෙදර ගාමිණී සෙනවිරත්න යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට  ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, දැලිවලගෙදර ගාමිණී සෙනවිරත්න මහතාට එරෙහිව කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 7439/2/6 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර දැලිවලගෙදර ගාමිණී සෙනවිරත්න නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම පැමිනිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC 8331/16 දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතුය.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නමැති වරද සිදු කර ඇති බැවින්ද,

නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිනිලිකරු රැඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකුඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

5. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

6. රැඳවුම් නියෝග වලට එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අත්සන් නොතැබුවේ නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් රැඳවුම් නියෝග ලෙසට කූඨ ලෙස හෝ අසත්‍ය ලෙස සකස් කළ රැඳවුම් නියෝග භාවිතා කරමින් පැමිණිලිකරු රැඳවුම් නියෝග මත තබා ගැනීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 452 සහ 453 වගන්ති සමග කියැවෙන 454 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇත.

7. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම්

සහනයක් ලබා දීම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

8. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

අධුනික නාවිකයෙකු වශයෙන් 1992 වසරේ නාවික හමුදාවට බැඳී ඇති පැමිණිලිකාර දැලිවල ගෙදර ගාමිණී සෙනවිරත්න ඉන් පසුව නාවික හමුදාවේ බුද්ධි අංශයට 1998 දී බැඳී ඇත. පැමිණිලිකරු කොළඹ, මන්නාරම සහ සාම සාධක භටයකු වශයෙන් හයිටි රාජ්‍යයේ ද සේවය කර ඇති පැමිණිලිකරු, එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශයට ගොස් බුද්ධි තොරතුරු රැගෙන ආ අයුරු පිළිබඳ විස්තර ඇතුළත් මාධ්‍ය වාර්තාව පැ. 1 (අ) වශයෙන් ද, 2010.01.16 වන දින අධි බලැති පුපුරන ද්‍රව්‍ය කිලෝ 1004 ක් සොයා ගැනීම පිළිබද වාර්තාව පැ. (1 ආ) වශයෙන්ද ඉදිරිපත් කර ඇත.

2015.03.15 වන දින අත්අඩංගුවට පත්ව ඇති පැමිණිලිකාර ගාමිණී සෙනවිරත්න 2015.01.15 දින මහේස්ත්‍රාත් අධිකරනයට ඉදිරිපත් කරන ලද බී 7439/2/6 වාර්තාව පැ. 02 ලෙස ඉදිරිපත් කර ඇත.

2006 වසරේ නඩරාජා රවිරාජ් මන්ත්‍රීවරයා ඝාතනය සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට පැමිණිලිකාර ගාමිණී සෙනවිරත්නව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත. එහිදි ගාමිණී සෙනවිරත්න දින 18 ක් රඳවාගෙන ප්‍රශ්න කර ඇත. ත්‍රස්තවාය වැලැක්විමේ පනත යටතේ රැඳවුම් නියෝග ලබාගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රදවා ගත් බවට සනාථ කෙරෙන කුවිතාන්සිය පැ.03 ලෙසට ඉදිරිපත් කර ඇත. උප පොලිස් පරීක්ෂක අමරවංශ සාක්ෂිකරුගෙන් කටඋත්තර ලබා ගෙන ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පැමිණිලිකරු රඳවා ගැනීම සඳහා රඳවා ගැනීමේ නියෝගයක් ලබාගත් බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ නිලධාරීන් විසින් පැමිණිලිකරුට ලබාදී ඇති එකී නියෝගයේ පිටපත පැ. 3 වශයෙන් සලකුණු කර ඇත. එකේ ලේඛනයෙහි ජනාධිපති සහ ආරක්ෂක අමාත්‍ය යන ස්ථානයෙහි තබා ඇති අත්සන එවකට ජනාධිපති සහ ආරක්ෂක අමාත්‍යවරයාගේ සැබෑ අත්සන ද යන ප්‍රශ්නය මීට පෙර මෙම කොමිෂන් සභාව ඉදිරියේ පැන නැගුන බැවින් එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ලේකම් උදය සෙනෙවිරත්න මහතා කොමිෂන් සභාව වෙත කැඳවා එම අත්සන් සහිත ලේඛන පෙන්වමින් ඒවා එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ අත්සන් හා සමාන වන්නේ දැයි විමසීමක් කරන ලදී. එම අවස්ථාවේදී ජනාධිපති ලේකම් උදය සෙනවිරත්න මහතා සඳහන් කළේ එසේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රැඳවුම් නියෝග සඳහා ලබාගෙන තිබූ ජනාධිපතිවරයාගේ අත්සන ලෙසට සඳහන් අක්ෂර ජනාධිපතිවරයාගේ සාමාන්‍ය අත්සනට වඩා බොහෝ සෙයින් වෙනස්

බවත් ජනාධිපතිවරයාගේ අත්සන ලෙස සඳහන් කළ නොහැකි බවටත් ප්‍රකාශ කර ඇත. මෙම නඩුවේ ඉදිරිපත් කර ඇති රැඳවුම් නියෝග වලද එවැනිම අපැහැදිලි අත්සනක් ජනාධිපති සහ ආරක්ෂක අමාත්‍ය යන ස්ථානයේ දක්නට ඇත. මේ අනුව එම අත්සනද සත්‍ය වශයෙන්ම ජනාධිපති සහ ආරක්ෂක අමාත්‍යවරයා වූ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ අත්සන හා සමාන නොවන බව උදය සෙනවිරත්න මහතාගේ සාක්ෂි අනුව පැහැදිලිය. එබැවින් පැමිණිලිකරු රැඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා තබා ගැනීම සඳහා බැලූ බැල්මට වලංගු රඳවාගැනීමේ නියෝගයක් තිබී නොමැති බව පෙනී යයි. එබැවින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහතකී පොලිස් නිලධාරීන් පැමිනිලිකරු අයුතු ලෙස සිරගත කර තිබීම මගින් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකිය වරදක් සිදුකර ඇත.

එසේම ජනාධිපති ලේකම් උදය සෙනවිරත්න මහතා සඳහන් කරන අන්දමට සහ කොමිෂන් සභාව නිරීක්ෂණය කළ අන්දමට ඉහත සඳහන් කළ රැඳවුම් නියෝග වලට එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අත්සන් නොතැබුවේ නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් රැඳවුම් නියෝග ලෙසට කූඨ ලෙස හෝ අසත්‍ය ලෙස සකස් කළ රැඳවුම් නියෝග භාවිතා කරමින් පැමිණිලිකරු රැඳවුම් නියෝග මත තබා ගැනීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 452 සහ 453 වගන්ති සමග කියැවෙන 454 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇත.

එසේම ඔහුට බලපෑම් කරමින් නඩරාජ රවි රාජ්ට වෙඩි තැබූ බවට පිළිගැනීමට පැමිණිලිකාර ගාමිණී සෙනවිරත්නට බලපෑම් කළ බවත්, එසේ කළ හොත් රජයේ සාක්ෂිකරුවෙකු කරන බවට ප්‍රකාශ කර ඇත.

2015.03.15 දින අත්අඩංගුවට ගෙන මිනීමරුවකුසේ රැගෙන ගොස් පැමිනිලිකරුගෙන් ප්‍රශ්න කර ඇත. "නඩරාජා රවි රාජ් මහතාට වෙඩි තැබුවේ උඹ. වෙඩි තබන අවස්තාවේදී උඹේ අත තුවාල වුණා. ඒක නිසා බොරු කියන්න හදන්න එපා. ඇත්ත කියල රජයේ සාක්ෂිකරුවෙකු වෙනවද නැත්නම් ගෙදර යන්නේ නැතුව මරණ දඬුවම් විදිනවා ද" යනුවෙන් එස්.අයි.අමරවංශ මහතා පැමිනිලිකරුගෙන් ප්‍රශ්න කර ඇති අතර ඩී.එන්.ඒ සාම්පල ලබාගැනීම සඳහා ලේ සාම්පල ලබා ගැනීමට අවශ්‍ය බවට දැනුම් දුන් අවස්ථාවේදී තමාගේ ඇඟේ ඕනෑම තැනකින් ලේ අරන් පරික්ෂා කරන ලෙසටත් පැමිණිලිකරු පවසා ඇත.

එස්.අයි. අමරවංශ මහතා ප්‍රකාශ කර ඇත්තේ ආරක්ෂක ලේකම්ව සිටි ගෝඨාභය රාජපක්ෂ මහතාගේ වුවමනාවට කරන්නාගොඩ මහතාට පවසා කරන්නාගොඩ මහතා විසින් පැමිණිලිකරුට පවසා රවිරාජ් මහතා ඝාතනය සිදුකළ බවය.

පැමිණිලිකාර ගාමිණී සෙනවිරත්නගෙන් ඔවුන් ඉල්ලා ඇත්තේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මෙහෙයවීම මත නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ මහතා පවසා පැමිණිලිකරු විසින් එය සිදු කළ බවට පිළිගන්නා ලෙසය.

රනිල් වික්‍රමසිංහ මහතා, ජෝන් අමරතුංග මහතා, සමන් රත්නප්‍රිය මහතා, සුමන්දිරන් මහතා නිතර දුරකථනයෙන් මේ පිළිබඳව විමසන බවත් අමරසිංහ මහතාට මෙය හිසරදයක් වී ඇති බවටත් එසේ හෙයින් ඔහු සඳහන් කරන ලෙසට ප්‍රකාශයක් ලබා දෙන ලෙසටත් පැමිණිලිකරුට තර්ජනය කරමින් පවසා ඇත.

පැමිණිලිකරුට එරෙහිව ඉදිරිපත් කළ 7439/2/6 වැඩිදුර වාර්තාවක් 2015.01.02 දින ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාව පැ.4 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. දින 18 ක් තුළ දවසට 3න් වරක් රැගෙන ගොස් ප්‍රශ්න කිරීම සිදු කළ අතර නොකළ වරදක් පිළිගැනීමට බල කළ සිටියේය. පසුව එම වරද පිළිනොගැනීම හේතුවෙන් පැමිණිලිකාර ගාමිණී සෙනවිරත්න මහතා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන බන්ධනාගාර ගතකර සිටින අවස්ථාවේදී මෙම නඩුවට සම්බන්ධ සම්පත් ප්‍රීතිවිරාජ් මනම්පේරි නැමැති පුද්ගලයා ද අත්අඩංගුවට ගත් බවට දැනගන්නට ලැබී ඇත.

මෙම ඝාතනය සම්බන්ධයෙන් හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පවත්වා ඇති නමුත් එහි දී කිසිවෙකුත් විසින් පැමිණිලිකරු හඳුනා ගෙන නැත. මෙහිදි හඳුනා ගැනීමේ පෙරෙට්ටුවට ආ පුද්ගලයා හිසේ සිට ආවරණය කර ඉදිරිපත් කර ඇත. ප්‍රීති විරාජ් නැමැත්තා රජයේ සාක්ෂිකරුවෙක් කර තිබී ඇත. එම ප්‍රිති විරාජ් නැමැති පුද්ගලයාට එරෙහිව නඩු 11 ක් තිබුන බවට ලංකාදීප පුවත් පතේ පළවී තිබූ වාර්තාවක් පැ.5 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම ප්‍රීති විරාජ් මනම්පේරි නැමැත්තාට එරෙහිව තිබූ නඩු අතර හාල් ලොරි දෙකක් මංකොල්ලකෑම පිටකොටුවේ සීනි මුදලාලි කෙනෙක් පැහැරගෙන ගොස් කප්පම් ගැනීම ගංජා කිලෝ 150ක් ප්‍රවාහනය කිරීම වැනි නඩු ද තිබී ඇත. මෙම ප්‍රීතිවිරාජ් මනම්පේරිය හිටපු පොලිස් කොස්තාපල්වරයෙකු වන අතර දැනට වැඩ තහනමට ලක්ව සිටී. පැ.5 වශයෙන් ඉදිරිපත් කළ 2010.12.06 දින ලංකාදීප පුවත්පතේ පලවී ඇති වාර්තාවට අනුව ඔහුට රට පුරාම උසාවිවල කොල්ල කෑම් නඩු, පුද්ගලයන් පැහැර ගැනීමේ නඩු, තර්ජනය කර මුදල් ලබා ගැනීමේ නඩු, ගංජා ප්‍රවාහන නඩු, තිබෙන බවට පිළිගෙන ඇති බව එම වාර්තාවේ සඳහන් වේ.

මහේස්ත්‍රාත් අධිකරණයේ ලඟු නොවන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව පැමිණිලිකරුට එරෙහිව මහාධිකරණයේ අංක HC 8331/16 දරණ අධිචෝදනා පත්‍රය ගොනු කර ඇත. චෝදනා පහකින් සමන්විත එකී අධිචෝදන පත්‍රයේ චෝදනා 2ක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේත් ඉතිරි චෝදනා 3 දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේත් ඉදිරිපත් කර ඇත. මහේස්ත්‍රාත් අධිකරණයේ ලඝු නොවන පරීක්ෂණය පවත්වන අවස්ථාවේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා ගොනු කර තිබී නොමැත.

පසුව අවස්ථාවක පැමිණිලිකරුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා කිරීමට හේතුව වී ඇත්තේ ඔහු ඇප මත නිදහස් වී යාම වලක්වා ලීමය.

මහාධිකරණයේ දී පැමිනිලිකරුට එරෙහිව සාක්ෂි ලබා දුන් ප්‍රධාන සාක්ෂිකරුවකු වූයේ ඉහත කී ප්‍රීති විරාජ් මනම්පේරි නැමැත්තාය. ඔහු පැමිණිලිකරුට විරුද්ධව සාක්ෂි ලබාදෙමින් 2006 වසරේදී කලූ පාට

බෑග් එකකට ටී 56 ගිනි අවියක් ඇතුල්කර රවීරාජ් මහතාට වෙඩි තබා, ඝාතකයා ප්‍රීති විරාජ්ගේ මෝටර් සයිකලයට නැගී ගංගාරාම ප්‍රදේශයට පලා ගිය බවත්, වෙඩි තබන අවස්ථාවේදී ඝාතකයාගේ අත තුවාල වූ බවත්ය.

මෙම සාක්ෂි කරණ කොටගෙන පැමිණිලිකරුගේ ලේ සාම්පල් ලබාගෙන ඩී.එන්.ඒ වාර්තා ලබාගෙන ඇත. එසේම, පරීක්ෂණය සඳහා පැමිනි ස්කොටලන්ඩ් යාඩ් පොලිසියද ඝාතකයාගේ ලේ සාම්පල් ලබාගෙන ඩී.එන්.ඒ සාම්පල ලබාගෙන ඇත. නිවැරදි ඝාතකයා සොයා ගැනීමට ඒ අන්දමින් ඩී.එන්.ඒ සාම්පල තිබුණද, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එකී ඝාතකයාගේ ඩී.එන්.ඒ සාම්පල සමඟ පැමිණිලිකරුගේ ඩී.එන්.ඒ සාම්පල සංසන්දනය කිරීම සඳහා කිසිදු අවස්ථාවක ක්‍රියා කර නැත. මෙයින් පැහැදිලිව පෙනී යන්නේ එසේ සංසන්දනයක් සිදු කලේ නම් ඝාතකයා පැමිණිලිකරු නොවන බවට පැහැදිලි වන අතර එමඟින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අරමුණු ව්‍යවර්ථ වන බැවින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එසේ ඩී.එන්.ඒ සාම්පල සංසන්දනය කිරීමට ක්‍රියාකර නොමැති බවය.

පැමිණිලිකරුට එරෙහි නඩුව විභාගයේදී ඇන්ජලෝ රෝයි නැමැති පුද්ගලයෙකුගේ සාක්ෂි මෙහෙයවා ඇත. කෙසේ වුවත් මෙම පුද්ගලයා පැමිණිලිකරු හඳුනාගැනීම පිණිස හඳුනාගැනීමේ පෙරෙට්ටුව ඉදිරිපත් කර නොමැත. ලඝු නොවන පරීක්ෂණයේදී සාක්ෂි දෙමින් වෙඩි තබන ලද පුද්ගලයාගේ හැඩරුව වශයෙන් ඇන්ජලෝ රෝයි සඳහන් කර ඇත්තේ වෙඩි තැබූ පුද්ගලයා අඩි 5 යි අඟල් 8 ක් පමණ උස පුෂ්ටිමත් ශරීරයක් ඇති කොණ්ඩය හොඳට

වැවුනු පුද්ගලයෙකු බවය. එම හැඩරුව පැමිණිලිකරුගේ හැඩරුවට හා හාත්පසින්ම වෙනස්ය. පැමිණිලිකරු කොණ්ඩය නැති තට්ටය පැදුනු පුද්ගලයෙකි. පැමිණිලිකරුගේ භාර්යාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා කොණ්ඩය යෑම සිදුවූයේ කවදා සිටද යන්න විමසා ඇත. එයට පිළිතුරු දෙමින් පැමිණිලිකරුගේ භාර්යාව විවාහ වන විටත් කොණ්ඩය නොතිබුණු බව ප්‍රකාශ කර ඇත. මේ හේතුව මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලිකරුගේ බිරිඳ ගෙන්වා පැමිණිලිකරුගේ හිසේ කොණ්ඩය යාම පටන් ගත්තේ 2006 වර්ෂයෙන් පසුව ලෙසට පවසන ලෙසට ඇයට බලකල බවට කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් ඇය ප්‍රකාශ කර ඇත.

මේ අනුව පැහැදිලිව පෙනී යන කරුණක් වන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණිලිකරුට එරෙහිව අසත්‍ය සාක්ෂි සකස් කිරීම සිදුකර ඇති බව ය.

ප්‍රීති විරාජ්ගෙන් අසන ලද ප්‍රශ්න කිරීම් වලදී ඔහුගේ 2008 වර්ෂයේ ප්‍රකාශ වලදී රවිරාජ් ඝාතනය සම්බන්ධයෙන් පැමිණිලිකරුගේ නම සඳහන් කර නැත. එනම් 2008 වර්ෂයේ පැමිණිලිකරුගේ නම ප්‍රකාශ නොකළ ප්‍රීති විරාජ් 2015 වර්ෂයේ දී එවැනි ප්‍රකාශයක් සිදු කර ඇත්තේ දේශපාලන වශයෙන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ යන දෙදෙනාගේ නම් යොදමින් ඔවුන් මෙම ඝාතනයට සම්බන්ධ කිරීමට සිදු කළ කුමන්ත්‍රණයක් වේ.

මෙලෙස සාක්ෂි නිර්මාණය කිරීමේ තවත් අවස්ථාවක් මහාධිකරණය ඉදිරියේ පැවති නඩු විභාගයේ දී හෙළිදරව් වී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු විසින් පැමිණිලිකරුගේ

ඡායාරූපයක් ලබාගෙන එය නඩුවේ 4 වන සාක්ෂිකරු වන ඇන්ජලෝ රෝයි නැමැති පුද්ගලයාගේ දුරකතනයට යවමින් පැමිණිලිකරු ඒ මාර්ගයෙන් හඳුනා ගන්නා ලෙසට දැනුම් දීමක් කර ඇත. එම සාක්ෂිකරු ඒ බව ජනාධිපති නීතිඥ රියෙන්සි අර්සකුලරත්න මහතාට දැනුම් දී ඇති අතර ඔහු විසින් ඒ බව පැමිණිලිකරු වෙනුවෙන් මහාධිකරණයේ පෙනී සිටි අනුජ ප්‍රේමරත්න මහතාට දැනුම් දී ඇත. මේ පිළිබඳව මහාධිකරණ විනිසුරු දැනුවත් කර ඇති අතර ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට විවෘත අධිකරණයේ දී අවවාද කර ඇත. ඒ පිළිබඳ 2016.12.10 දින දිවයින පුවත් පත් වාර්තාව පැ.08 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එහි සඳහන් අන්දමට,

> "අධිකරණය හමුවේ විභාග වන නඩරාජා රවිරාජ් ඝාතන නඩුවේ කටයුතුවලට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බලපෑම් කළ බවට යළිත් පැමිණිල්ලක් ලද හොත් අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව යටතේ එලෙස බලපෑම් කළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කරන්නේ"

යැයි මහාධිකරණ විනිසුරු සඳහන් කර ඇත.

පැමිණිලිකාර ගාමිණී සෙනවිරත්නට විරුද්ධව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවීම හේතුවෙන් ජූරි සභාවේ ඒකමතික තීරණය අනුව පැමිණිලිකරු නිදොස් කොට නිදහස් කර ඇත. එම මහාධිකරණ විනිසුරු විසින් ජූරි සභාව වෙත සිදුකරන ලද දේශනය පැ.09 වශයෙන්ද, නිදොස් කොට නිදහස් කිරීමේ තීන්දුව පැ.09(අ) වශයෙන්ද, සලකුණු කර ඉදිරිපත් කර ඇත.

කිසිදු සාක්ෂියක් නොමැති අවස්ථාවක, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක අමරවංශ, ස්ථානාධිපති සී අයි බෝධිපක්ෂ සහ එම කාලවකවානුවේ එහි සහකාර පොලිස් අධිකාරිවරයා විසින් අත්තනෝමතික සහ පක්ෂග්‍රාහී ලෙස පොලිස් පරීක්ෂණය සිදුකර, අසත්‍ය සාක්ෂි නිර්මාණය කර පැමිණිලිකරු, රවිරාජ් ඝාතන නඩුව සම්බන්ධයෙන් මාස 22 ක කාලයක් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට ද්වේෂ සහගත ලෙස කටයුතු කර ඇත. එබැවින් ඔවුන් ඊට වගකිව යුතුය.

මෙම රවිරාජ් ඝාතනය සම්බන්ධව සිදු කෙරුණු ලඝු නොවන පරීක්ෂණය මහේස්ත්‍රාත් තිළිණ ගමගේ මහතා ඉදිරියේ සිදු කර ඇත. රවිරාජ් ඝාතන නඩුවේ ලඝු නොවන පරීක්ෂණය මහේස්ත්‍රාත් තිළිණ ගමගේ මහතා මහතා විසින් සිදුකර තිබේ. මෙම පරීක්ෂණය පවත්වන කාල සීමාසීමාවේ දී තවත් එවැනිම දේශපාලන වැදගත්කමකින් යුත් නඩු කිහිපයක් මහේස්ත්‍රාත් තිළිණ ගමගේ මහතා ඉදිරියේ විභාගය මෙන් තිබී ඇත. මෙම නඩු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් තිළිණ ගමගේ මහතාට සිදුකල බලපෑම් පිළිබඳව කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් සඳහන් කළ කරුණු සමහරක් 2020.02.22 වන සෙනසුරාදා ලංකාදීප පුවත්පතෙහි (පැ. 10) පළ කර ඇත. එහි මෙසේ සඳහන් වේ;

> (උපුටා ගැනීම)"මා 2013 වර්ෂයේ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේද, ඊට පසු කලෙක කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ ද, කටයුතු කළ අවස්ථාවේ දී තිස්ස අත්තනායක මහතාට එරෙහි කූට ලේඛන නඩුව, පායලී චම්පික මහතා සම්බන්ධයෙන් තිබුණ ගල් අඟුරු ටෙන්ඩර් නඩුව, තරුණයන් 11 දෙනෙකු අතුරුදන් කර ඝාතනය කිරීමේ නඩුව, රවිරාජ්

ඝාතන නඩුව, රාජිත ඇමතිවරයාගේ දෙටුපුත්ගේ නඩුව සහ හිටපු ජනාධිපතිවරයෙකුට සම්බන්ධ නඩුවක් විභාග වෙමින් තිබුණා. එම නඩු තීන්දු වෙනස් කර යහපාලන ආණ්ඩුවට අවශ්‍ය තීන්දු ලබා දෙන ලෙස රාජිත සේනාරත්න, පාඨලී චම්පික රණවක සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා යන අය මට බලපෑම් කළා ඔවුන්ගේ උවමනාවන්ට අනුව කටයුතු නොකර අපක්ෂපාතී තීන්දු දුන්නා. ඒ නිසා යහපාලන ආණ්ඩුව මා සමග උරණ වුණා" (උපුටා ගැනීම අවසන්)

පැමිණිලිකාර ගාමිණී සෙනවිරත්න රක්ෂිත බන්ධනාගාර ගත කිරිමේ දී බන්ධනාගාරයේ ඔහු රඳවා තබා ඇත්තේ ප්‍රධාන පෙළේ එල්.ටී.ටී.ඊ. සැකකරුවන් රඳවා තබා ගන්නා අයි වාට්ටුවේය. මේ හේතුවෙන් පැමිණිලිකරුගේ ජීවිතයට තර්ජනයක් එල්ල වී ඇති අතර හමුදාවේ උසස් නිලධාරීන්ගේ මැදිහත්වීම මත පැමිණිලිකරු රජයේ සේවකයින් රඳවා සිටින වාට්ටුවට මාරු කර ඇත.

ප්‍රීති විරාජ් මනම්පේරි මහධිකරණයේ දෙන ලද සාක්ෂිවල කොටසක් පැ. 7 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එකී සාක්ෂි වලට අනුව රවිරාජ් ඝාතනය සම්බන්ධයෙන් කිසිදු සඳහන් කිරීමක් සිදු කර නොමැත. එහි මෙසේ දැක්වේ;

(උපුටා ගැනීම)"ප්‍ර : කරුණා පාර්ශවය කෙසේ හෝ තමුන්ගේ දැනුමට අනුව කරුණා පාර්ශවය විසින් කරන ලද වෙනත් වරදක් හෝ තමුන් කියන්නේ නැහැනේ. තමුන්ගේ දැනුමේ තිබෙන කාරුණා පාර්ශවය විසින් කරපු වෙනත් ඝාතකයක් ගැන කියන්නේ නැහැනේ. ඒක ගැන කිව්වත් මේක ගැන කිව්වත් දෙකම එකයිනේ?

උ : මේක මට පැහැදිලි වුනේ මේක මට කාටවත් කියන්න ඒපා කියලා පැහැදිලිව කිව්වා. මේ ඝාතනය ගැන මම කිව්වේ නැත්තේ මමත් මේකට සම්බන්ධ නිසා. මට පැහැදිලිව කිව්වා මේ ඝාතනය සම්බන්ධව කාටවත් කියන්න එපා කියලා. ඒ නිසා මේ ඝාතනය ගැන කිව්වේ නැත්තේ.

ප්‍ර : මේක ගැන කියන්න එපා කිව්වත් කිව්වා. නමුත් වෙනත් ඒවා ගැන කියන්න එපා කියලා කියල තිබුනේ නැති නිසා තමුන් කිව්වේ නැහැ?

උ : වෙනත් ඒවා කියන්නේ මොනව ගැනද.

ප්‍ර : 2008.05.22 වන දින 2005.12.24 වන දින මඩකලපුව ජෝෂප් පරරාජ සිංහ මහතාට වෙඩි තැබීම සදහා හා මෙම අයවලුනුන් සින්දූර් යනාදි වශයෙන් තමන් ප්‍රකාශ කලා?

උ : එහෙමයි.

ප්‍ර : ඒ තමුන් කාරුණා පාර්ශවයෙන් කරපු තවත් මිනි මැරුමක්?

උ : ඔව්.

ප්‍ර : තවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්?

උ : එහෙමයි

ප්‍ර : තමන් එකම පාර්ශවය කරපු පරරාජසිංහ මිනිමැරුම ගැන කියවන්න තමුන් බය නැහැ.

උ : ගරු උතුමාණනි, ඔය ජොෂප් පරරාජසිංහම්

ප්‍ර : බය වුනාද නැද්ද කියලා කියන්න?

උ : ඒක මට පැහැදිලි කරල කියන්න ඕනි. ඒ ගැන මට බොරුවක් වෙන්න අවශ්‍යතාවක් නැහැ. ජෝෂප් පරරාජසිංහ ඝාතනය ගැන මට සින්දුජන් කියන පුද්ගලයා තමයි කරුණා පාර්ශවයේ කිව්වේ. යම්කිසි පුද්ගලයෙක් කියපු දෙයක් තමයි මම කිව්වේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කියපු දෙයක් සාමාන්‍යයෙන් පිටස්තර පුද්ගලයෙකුට දැනගන්න වෙන්නේ නැහැ කිසිසේත්ම. ඒක නිසා ඒකට මම සම්බන්ධයක් නැති නිසා මම ඒක පැහැදිලිව කිව්වා ගරු මැතිතුමණි

ප්‍ර : ඒ හේතුව නිසා කරුණා පාර්ශවය එක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ මිනි මැරීම ගැන තමුන් 2008.05.22 වන දින ප්‍රකාශයක් කලා. නමුත් රවිරාජ් මහතාගේ ඝාතනය පිලිබඳව තමනු ප්‍රකාශ කලේ නැහැ?

උ : එහෙමයි

ප්‍ර : ඒ ප්‍රකාශයේ තමාට විය හැකි ශාරීරික පීඩාවන් වලට තිබෙන බිය නිසා?

උ : එහෙමයි" (උපුටා ගැනීම අවසන්)

පැමිණිලිකරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව ඔහු හඳුනා ගැනීම සඳහා පෙරට්ටුවක් පවත්වා ඇති අතර එකී පෙරෙට්ටුවට හැඩිගල්ලගේ නිලන්ත නිශාන්ත නාමල් සහ තල්දූවදූර රාලලාගේ අමිල චින්තන රණසිංහ යන සාක්ෂිකරුවන් දෙදෙනා පැමිනිලිකරු හඳුනා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අතර ඔවුන් දෙදෙනාටම පැමිණිලිකරු හඳුනා ගැනීමට නොහැකි වී ඇත. එසේම, ඇසින් දුටු එකම සාක්ෂිකරු ලෙසට මහාධිකරණයේ සාක්ෂි දුන්

ඇන්ජලෝ රෝයි නැමැති සාක්ෂිකරුටද මහාධිකරණයේදී පැමිණිලිකරු හඳුනා ගැනීමට නොහැකි වී ඇත. හඳුනා ගැනීමේ පෙරෙට්ටුවේ සටහන් පැ. 11 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එසේම රවිරාජ් ඝාතන නඩුවේ ලඝු නොවන පරීක්ෂණයේදී ප්‍රීති විරාජ් මනම්පේරි විසින් දෙන ලද සාක්ෂිය පිළිබඳව එවකට මහේස්ත්‍රාත් තිලින ගමගේ මහතා විසින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඔහුගේ පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි බණ්ඩයක් වර්තමාන නඩුවේ ලේඛනයක් වශයෙන් පැ.13 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.13 අනුවද මනම්පේරි ඉතාමත් දුර්වල සාක්ෂිකරුවකු වී ඇති අතර ඔහු අපරාධ නඩු ගණනාවක විත්තිකරුවෙකු ද වී ඇත.

DNA සාම්පල් ස්කොට්ලන්ඩ් යාඩ් යැවීම පිළිබඳව ප්‍රිති විරාජ්ගේ ප්‍රශ්න කිරීම් වලදී "ඒ කැපුම් තුවාලයේ ලේ ස්කොට්ලන්ඩ් යාඩ් එකට යැව්වා කියලා මම යෝජනා කරනවා" යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ඔහු එය ප්‍රතික්ෂේප කර ඇත. එම ලේඛනය පැ.12 වශයෙන් සලකුණ කර ඉදිරිපත් කර ඇත.

රවිරාජ් ඝාතනය සිදුවන අවස්ථාවවේදී එම ස්ථානයෙන් ගමන් කළ පාසල් සිසුවකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන්වා පැමිණිලිකරුගේ සහ හමුදාවේ අනෙක් දෙදෙනාගේ ඡායාරූප ඔහුට පෙන්වා වෙඩි තැබූ පුද්ගලයා මොවුන්දැයි පාසල් සිසුවාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විමසා ඇති අතර තමන් එම ඡායාරූපවල සිටින පුද්ගලයින් නුදුටු බවට පාසැල් සිසුවා පිළිතුරු දී ඇත. මෙම පාසැල් සිසුවාගේ ප්‍රකාශයක් වත් සටහන් කරගැනීම සිදු

නොකර ඔහු ආපසු යවා ඇත්තේ පැමිණිලිකරුවන්ට වාසිදායක සාක්ෂියක් එම පාසල් සිසුවාගෙන් ඉදිරිපත් වූ බැවිනි.

මේ අනුව පැමිණිලිකරුට වාසිදායක සාක්ෂි සියල්ලම සඟවා ඒවා හෙළිදරව් වීමට ඉඩ නොදී අසත්‍ය සාක්ෂි ඉදිරිපත් කරමින් පැමිණිලිකරු සහ අනිකුත් හමුදා නිලධාරීන් දෙදෙනා මත ඝාතනය සම්බන්ධ වගකීම පැවරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් චේතනාන්විතව ක්‍රියාකර ඇති බව පැහැදිලිව පෙනී යයි.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ විමර්ශනයට භාජනය කරන ලද 80/2020 නඩුවේ සාක්ෂි විභාගයේ දී පැ.39 වශයෙන් සලකුනුකර ඉදිරිපත් කරන ලද ලේඛනයක් මෙම නඩුවේ පැ.14 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පැ.39 සම්බන්ධයෙන් 80/2020 නඩුවේ ඉදිරිපත් වූ සාක්ෂි එකී නඩුවේදී මෙසේ ඇගයීමට ලක් කර ඇත;

> (උපුටා ගැනීම) "පැමිණිලිකරු ඇතුළු 06 දෙනෙකුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරන ලද නඩුව ජූරි සභාවක් ඉදිරියේ විභාගයට ගැනීමට නීතිමය හැකියාවක් නැති බවට අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ සුමන්තිරන් මහතා ද, රජයේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය මහතා ද කරනු දක්වා ඇතත් මහාධිකරණය විත්තිකරුවන්ට ලබා දී ඇති නෛතික අයිතීන් සුරක්ෂිත කරමින් නියෝගයක් ලබා දී ඇති අතර ඒ අනුව ජූරි සභාවක් ඉදිරියේ නඩුව විභාග කර, ජූරි සභාවේ එකමතික තීරණය අනුව සියළුම චෝදනා වලින් සියළුම විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කර ඇත.

මහාධිකරණ නඩුවේ පිටපත පැ.21 වශයෙන් ද, කාර්ය සටහන් පැ.21 (අ) වශයෙන් ද 2016.10.27 දින නියෝගය පැ. 39 ලෙසටද සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම නියෝගයට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනා පැ. 40 පැ. 41 සහ පැ. 42 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත." (උපුටා ගැනීම අවසන්)

පැමිනිලිකරු සහ අනිකුත් හමුදා නිලධාරීන් දෙදෙනා නිදොස් කොට නිදහස් කරමින් ප්‍රකාශයට පත් කරන ලද ජූරි සභාවේ ඒකමතික තීරණයට එරෙහිව අභියාචනා තුනක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව විසින් එක් අභියාචනයක් ද අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් අභියාචනා දෙකක් ද ඉදිරිපත් කර ඇත. මෙම සියලුම අභියාචනා වලින් එකම සහනයක්; එනම්, ජූරි සභාවේ ඒකමතික තීරණය ඉවත් කර ජූරි සභාවක් නොමැතිව නඩුව විභාගයට ගැනීමට ඉල්ලමින් පැමිණිලිකරු ඇතුළු පිරිසට නීතියෙන් ලැබී ඇති අයිතිවාසිකම් නැති කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව සහ අගතියට පත් පාර්ශ්වය ක්‍රියා කරමින් සිටී. මෙම අභියාචනා පැ. 15, පැ. 16 සහ පැ. 17 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරුගේ භාර්යාව වන ප්‍රියන්තා සමරවීර මහත්මියට අනුව, 2014.04.27 විශ්‍රාම ගැන්වීමෙන් පසුව, 2015.03.15 වන දින සාක්ෂිකාරියගේ ස්වාමිපුරුෂයාට නාවික හමුදා මූලස්ථානයට කැඳවීමක් ලැබ, ඔහු හමුදා මූලස්ථානයට වාර්තා කර ඇති අතර, ඉන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2015.03.15 වන දින ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව, එහිදී ඔහු අත්අඩංගුවට ගත් බවට, ඔහු

භාර්යාවට දැනුම් දී ඇත. තම ස්වාමිපුරුෂයා බැලීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණි අවස්ථාවේදී ඇයට පොලිස් පරීක්ෂක බෝධිපක්ෂ මුණගැසී ඇති අතර ඔහු සාක්ෂිකාරියගේ ස්වාමිපුරුෂයාගේ කොණ්ඩය ගියේ 2006 න් පසුව නේද යනුවෙන් විමසා ඇති අතර එයට පිළිතුරු දෙමින් ඔහුගේ කොණ්ඩය ගොස් ඇත්තේ විවාහයටත් පෙර සිට බවට ඇය පවසා ඇත. ඇය විවාහ වී ඇත්තේ 2003 වර්ෂයේ මැයි මාසයේ දීය.

රජයේ සාක්ෂිකරුවෙකු වී ස්වාමිපුරුෂයාගේ කොණ්ඩය ගියේ 2006 න් පසුව යැයි පවසන ලෙසට අමරවංශ නැමැති පොලිස් නිලධාරීයා ඇයට පවසා ඇත. ඇය මෙම තත්ත්වය පැමිණිලිකරුට පවසා ඇතත් එවැනි අසත්‍ය ප්‍රකාශ සිදුකල නොහැකි බවට පැමිණිලිකරු ඇයට ප්‍රකාශ කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.17 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .VI

පැමිණිලි අංකය - 107 / 2020

පැමිණිලිකරු - කංකානමලාගේ ප්‍රදීප් චමින්ද

ලිපිනය - නො: 543/ඒ, වැන්දල,
රුවන්වැල්ල.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින් වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. සහකාර පොලිස් අධිකාරි ශානි අබේසේකර,
2. පොලිස් පරීක්ෂක ජයසේකර
3. පොලිස් පරීක්ෂක අමරවංශ

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර කංකානමලාගේ ප්‍රදීප් චමින්ද මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, කංකානමලාගේ ප්‍රදීප් චමින්ද මහතා මහතාට එරෙහිව කොළඹ අලුත්කඩේ අංක 2 මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 7439/02/06 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර කංකානමලාගේ ප්‍රදීප් චමින්ද මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම පැමිණිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC 8331/16 දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිණිලිකරු රඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකුඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

5. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

6. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

7. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම

කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

2017 මාර්තු මස 15 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රාවිරාජ් මහතාගේ ඝාතනය පිළිබඳව ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා පැමිණිලිකරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත. මෙම ප්‍රශ්න කිරීමට අදාළ වූ රාවිරාජ් මහතාගේ ඝාතනය සිදුවී ඇත්තේ 2016 වසරේ වන අතර එකල පැමිණිලිකරු බුද්ධි අංශ නිලධාරියෙකු වශයෙන් සේවය කර ඇත. ඔහු සමග බුද්ධි අංශ නිලධාරින් 15 දෙනෙකු ගංගාරම පන්සල අසල නිවසක ලැඟුම් ගෙන සිට ඇත. පැමිණිලිකරු වසර 22 ක සේවා කාලයකින් පසු විශ්‍රාම ගොස් ඇත. ඔහුගේ සේවය ඇගයමින් නිකුත් කරන ලද ප්‍රසංශා ලිපි කිහිපයක් පැ.01, පැ.02, පැ.03 සහ පැ.04 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු විශ්‍රාම ගැනීමෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මිනීමැරුම් අංශය මගින් පැමිණිලිකරු කැඳවා ප්‍රකාශයක් ලබා ගෙන ඇතත් එම ප්‍රකාශය ස්වෙච්ඡාවෙන් සිදු කිරීමට ඉඩ ලබා දී නැත. කටඋත්තරය ලබා දීමට පැමිණි දිනයේදී පොලිස් පරීක්ෂක අමරවංශ විසින් පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ 04 වන තට්ටුවට රැගෙන ගොස් ඇති අතර එහිදි සහකාර පොලිස් අධිකාරි ශානි අබේසේකර, පොලිස් පරීක්ෂක

ජයසේකර සහ තවත් දෙදෙනෙකු ඉදිරියේ ප්‍රශ්න කිරීම සිදු කර ඇති අතර ශානි අබේසේකර මහතා

> "තමුන්ලා කරපු දේවල් ඔක්කෝම අපි දන්නවා, ඇත්ත කිව්වොත් බේරෙන්න පුළුවන් මේ වෙලාවේ බේරගන්න කවුරුත් නෑ. තමුන්ගේ බිරිඳ වත් අඩුගානේ මේ වෙලාවේ නෑ. නාවික හමුදාවේ ලොක්කන්ට මේ වෙලාවේ කරන්න පුළුවන් දෙයක් නෑ. ජනාධිපතිතුමයි, අගමැතිතුමයි, ජාත්‍යන්තරයි මේ ගැන උඹලා කළ දේවල මේ ගැන බලාගෙන ඉන්නේ"

යැයි පවසා 2006 වසරේ දී ඝාතනයට ලක් වුණු යාපනය දිස්ත්‍රික් මන්ත්‍රී නඩරාජා රවිරාජ් මහතාගේ ඝාතනය සම්බන්ධයෙන් පැමිණිලිකරු දන්නා කරුණු පවසන ලෙසට ප්‍රකාශ කර ඇති අතර ඝාතනය සම්බන්ධයෙන් නාවික හමුදාවේ සේවය කළ ලුතිනන් කමාන්ඩර් හෙට්ටිආරච්චි සහ ගාමිණී සෙනවිරත්නට එරෙහිව සාක්ෂි ලබා දෙන ලෙසට ඔවුන් බලකර ඇත. මේ අන්දමින් පැය එක හමාරක පමණ කාලයක් ශානි අබේසේකර මහතාගේ කාමරයේ රඳවාගෙන පැමිණිලිකරුට බලපෑම් කරමින් ප්‍රකාශයක් ලබාගැනීම උත්සාහ දරා ඇති අතර ඉන් පසුව පොලිස් පරීක්ෂක අමරවංශ මහතා සහ ජයසේකර මහතා විසින් ඇඹිලිකරු වෙන්ත් ස්ථානයකට රැගෙන ගොස් සවස 5.30 පමණ වනතුරු ඔහුගේ කටඋත්තරය සටහන් කරගෙන ඇත.

ඊට සති 02 කට පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලිකරු නැවත කැඳවා ඇති අතර පොලිස් පරීක්ෂක අමරවංශ පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කර ප්‍රකාශයක් ලබා ගෙන ඇත. එහිදි සඳහන් කර ඇත්තේ ගෝඨාභය රාජපක්ෂගේ සහ වසන්ත

කරන්නාගොඩගේ අනුදැනුම මත ඝාතනය සිදු කළ බවට ප්‍රකාශ කරන ලෙසට දැනුම් දී ඇත. පැමිණිලිකරු එදින ප්‍රකාශයක් ලබා දී නැත. එම ප්‍රකාශයෙන් පසුව ද ඔහු අත්අඩංගුවට නොගෙන බිරිඳ සමග සාකච්ඡා කොට එන ලෙසට දන්වා නිවසට පිටත් කර ඇත. එසේම එහිදී පොලිස් පරීක්ෂක අමරවංශ පවසා ඇත්තේ තමන් කැමැති රටකට තම බිරිඳ සමග යාමට අවස්ථාව සැලසෙන බවය.

ඉන්පසුව 2015 ජූලි මාසයේ දී තෙවන කැඳවීම ලැබී පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් ඇත. පොලිස් පරික්ෂක අමරවංශ විසින් පැමිණිලිකරු කාර්යාලයට රැගෙන ගොස් පැමිණිලිකරුගේ ස්ථාවරය සම්බන්ධයෙන් විමසා, පෙර කී යෝජනාවට කැමැති ද යනුවෙන් විමසා, බිය වීමට දෙයක් නැති බවත් අගමැතිතුමා සහ ජනාධිපතිතුමා මේ ගැන දැනුවත් කර ඇති බවත්, රජයේ සාක්ෂිකරුවෙකු විය හැකි බවටත්, පොලිස් පරීක්ෂක අමරවංශ මහතා ප්‍රකාශ කර ඇත. පෙර පරිදිම තමන්ට අසත්‍ය ප්‍රකාශය සිදු කළ නොහැකි බවට පවසමින් පැමිණිලිකරු පොලිස් පරීක්ෂක අමරවංශ මහතාගේ යෝජනාව ප්‍රතික්ෂේප කර ඇත. එදිනද, පැමිණිලිකරුගේ කටඋත්තරයක් සටහන් කර ගැනීමක් සිදු නොවී ඇති අතර පැමිණිලිකරු ආපසු නිවස බලා ගොස් ඇත.

ඉන්පසු නැවත 2015.10.28 වන දින, 4 වන වරටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත. එම ලේඛනය පැ.04 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව එදින උදේ 9.00ට පෙනී සිටි අවස්ථාවේ උප පොලිස් පරීක්ෂක අමරවංශ ප්‍රශ්න කර එදින සවස අත්අඩංගුවට ගෙන පසුදින තිළිණ ගමගේ මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. කොළඹ වැලිකඩ

බන්ධනාගාරයේ අයි (I) වාට්ටුවේ රඳවා තබා ඇත. මෙම වාට්ටුව පාතලය, එල්.ටී.ටී.ඊ. ආදි බරපතල ගණයේ සැකකරුවන් සිටි වාට්ටුවකි. ඇප ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. පැමිණිලිකරු අයි වාට්ටුවේ රඳවා තබා සිටි කාලසීමාවේදීම, ඊට පෙර අත්අඩංගුවට ගෙන සිටි ඔහුගේ අධීක්ෂණ නිලධාරියා වූ ප්‍රසාද් හෙට්ටිආරච්චි සහ ගාමිණී සෙනෙවිරත්න යන නාවික නිලධාරීන් දෙදෙනාද එම වාට්ටුවේ ම රඳවා තිබී ඇත. ඊට අමතරව සම්පත් ප්‍රිති විරාජ් නැමැති පුද්ගලයකු ද අත්අඩංගුවට ගෙන සිටින බවට පැමිණලිකරුට දැනගන්නට ලැබී ඇත. ඔවුන් රඳවා සිටි අයි (I) වාට්ටුවේදී ලැබුණු ජීවිත තර්ජන හේතුවෙන් සිදු කළ ඉල්ලීම් මත වෙනත් වාට්ටුවකට මාරු කර ඇත.

මහේස්ත්‍රාත් අධිකරණයේදී ලඝු නොවන පරීක්ෂණයක් පවත්වා ඇති අතර එකී පරීක්ෂණයේ සාක්ෂිකරුවකු වශයෙන් සම්පත් ප්‍රිති විරාජ් සාක්ෂි ලබාදී ඇත. ලඝු නොවන පරීක්ෂණයට සැකකරුවන් 06 දෙනෙකු නම් කර ඇත. රජයේ සාක්ෂිකරුවෙකු වූ ප්‍රිති විරාජ් විවිධ අපරාධ වලට චෝදනා ලැබ සිටි පුද්ගලයෙකි. ලංකාව පුරා විවිධ බරපතළ අපරාධ වල යෙදුන ප්‍රිති විරාජ් වැනි පුද්ගලයෙකු රජයේ සාක්ෂිකරුවෙකු බවට පත් කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියා කරන ආකාරය ඉතාමත් බරපතල තත්ත්වයකි. නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම කනගාටුදායක තත්ත්වය සලකා බැලිය යුතුව තිබුණි. නමුත් එසේ කර නොමැත. ප්‍රසාද් හෙට්ටිආරච්චි සහ ගාමිණී සෙනෙවිරත්න විසින් ඉදිරිපත් කර ඇති පැමිණිලි සම්බන්ධ විමර්ශනයේ දී ඉහත සඳහන් කළ ප්‍රීති විරාජ් සම්පත් නැමැති සාක්ෂිකරුගේ අපරාධ ක්‍රියා කලාපය පිළිබඳව සාක්ෂි විග්‍රහ කර දක්වා ඇත. (පැ. 5)

නඩරාජා රවිරාජ් ඝාතනයට යොදා ගැනුණු මෝටර් සයිකලය පැමිණිලිකරු කොටස් වලට කැපූ බවට ප්‍රිති විරාජ් ලබාදුන් සාක්ෂියේ දී ඔහුගේ පෙර ප්‍රකාශ වල ඒ පිළිබඳව සඳහන් නොකිරීම පිළිබඳව සාක්ෂි විභාගයේ දී පෙන්නුම් කරන ලද ඌනතාවයන් පිළිගෙන ඇත. මෙම සාක්ෂි කණ්ඩය පැ.06 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව සාක්ෂිකාර ප්‍රිති විරාජ් විසින් 2008.05.21, 2008.05.22, 2015.03.20, 2015.03.23, 2015.08.26 සහ 2016.06.02 යන දින වලදී සිදු කළ එකදු ප්‍රකාශයකවත් මෝටර් සයිකලය කැබලි වලට කපනවා දුටු බවට සඳහන් කර නැත. එම සාක්ෂි කණ්ඩය පිටු අංක 416/417 පැ.06 ලෙසට සලකුණු කර ඇත. 2008 වර්ෂයේ ප්‍රිති විරාජ් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් ප්‍රකාශ වල පැමිණිලිකරුට විරුද්ධව කිසිවක් සඳහන් කර නැත. ඔහු පැමිණිලිකරුට එරෙහිව ප්‍රකාශ කර ඇත්තේ 2015 යහපාලන රජය සමයේදීය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහත වගඋත්තරකරුවන් පැමිණිලිකරුව බලපෑමට යටත් කර ප්‍රකාශ ලබාගෙන ඇති බව පැහැදිලිය. ප්‍රිති විරාජ්ට සහන ලබා දී පැමිණිලිකරුට එරෙහිව සාක්ෂි නිර්මාණය කිරීමට ඔවුන් ක්‍රියා කර ඇති බව ද ඉතාමත් පැහැදිලිය.

පැමිණිලිකරු විසින් යතුරුපැදියක් කැබලි වලට කපනවා දුටු බවට සාක්ෂියක් නිර්මාණය කර තිබේ. මේ අන්දමින් කැබලිවලට කපනු ලැබූ යතුරු පැදියක කොටස් කිසිදු අවස්ථාවක වගඋත්තරකරුවන් සොයා ගෙන නැත. පැමිණිලිකරු මෙම මෝටර් සයිකලය කොටස් වලට කපනවා දුටු බවට ප්‍රීතිරාජ් තම සාක්ෂි දී සඳහන් කර ඇතත්, ඔහු විසින් සිදු කරනු ලැබූ 2008.05.22, 2015.03.20, 2015.03.22,

2015.08.26 සහ 2016.06.02, දිනයන්හි කට උත්තර වල මෝටර් සයිකලය කපනවා දුටු බවට සඳහන් කර නොමැති බවට මහාධිකරණ නඩු විභාගයේ දී පිළිගෙන ඇත (පැ 6)

රවිරාජ් ඝාතනයේ අපරාධකරුගේ ඩී.එන්.ඒ සාම්පලය තිබියදීත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහත නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් සැකකාර නාවික හමුදා නිලධාරීන්ගේ ඩී.එන්.ඒ සාම්පල සමඟ ඉහත කී අපරාධකරුගේ ඩී.එන්.ඒ සාම්පල සසඳා බැලීමට ඔවුන් ක්‍රියා නොකළේ පැහැදිලි ලෙසම නියම අපරාධකරුවන් නීතියේ රැහැනින් මුදවා හැර මෙම අහිංසක නාවික හමුදා නිලධාරින් එකී වරද සඳහා දංගෙඩියට යැවීම ඔවුන්ගේ ඒකායන අරමුණ වූ බව පැහැදිලිය.

අධිචෝදනා පත්‍රයේ චෝදනා 05 ක් ඇති අතර එයින් පළමු චෝදනා 3 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ද, ඉතිරි චෝදනා 2 ක දණ්ඩ නීති සංග්‍රහය යටතේ ද (පැ.08) ඉදිරිපත් කර ඇත. මේ අනුව තිස් අවුරුදු යුද්ධයෙන් රට බේරා ගැනීමට අනුපමේය මෙහෙවරක් කළ නාවික හමුදා නිලධාරීන් ත්‍රස්තවාදීන් ලෙස හංවඩු ගැසීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහත කී නිලධාරීන් ක්‍රියා කරමින් ඔවුන් ත්‍රස්තවාදී ක්‍රියාමාර්ග වලට ප්‍රවේශ වී ඇති බව ඉතාම පැහැදිලිව පෙනේ.

පැමිණිලිකරු සහ අනිත් නාවික හමුදා නිලධාරීන් දෙදෙනා රක්ෂිත බන්ධනාගාරයේ දීර්ඝ කාලයක් තබා ගැනීමේ තම මූලික අරමුණ ඉටු කර ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉතාමත් ද්වේශ සහගත අයුරින් තම නිල බලය යොදවමින් ත්‍රස්තවාදය

වැළැක්වීමේ පනත යටතේ සහ දණ්ඩ නීති සංග්‍රහය යටතේ එකම චෝදනාව පනත් දෙකකට ඇතුලත්කර අධිකරණයට කරුණු වාර්තා කර ඇත.

ජූරි සභාව අමතා මහාධිකරණ විනිසුරු සිදු කළ දේශනය පැ.09 ලෙසටද විත්තිකරුවන් නිදහස් කරමින් ප්‍රකාශයට පත් කළ තීන්දුවේ පිටපත පැ.10 ලෙසටද ඉදිරිපත් කර ඇත. නිදොස් කොට නිදහස් කිරීම පැ.10 ඒ වශයෙන් සලකුණු කර ඇත.

දණ්ඩ නීති සංග්‍රහය යටතේ නගන ලද 296 වගන්තිය යටතේ චෝදනාවට ජූරි සභාවක් ලබා දීමට අගතියට පත් පාර්ශ්වය සහ නීතිපති විරුද්ධවී ඇත. පසුව නිතිපතිවරයා ජූරි මනාපය ලබාදීමට එකඟ වී ඇති අතර අගතියට පත් පාර්ශය දිගින් දිගටම එයට විරුද්ධත්වය ප්‍රකාශ කර ඇත. ජූරි මනාපය සුවිශේෂී අයිතියක් වන අතර එය බැහැර කිරීමට කිසිදු පුද්ගලයෙකුට අයිතියක් නොමැත. එහි තවත් විශේෂත්වයක් වන්නේ ලඝු නොවන පරීක්ෂණයක් පවත්වන අවස්ථාවේදී ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ නඩු පැවරීමේ අවශ්‍යතාවක් පැන නැඟි ඇති බවට පැමිණිල්ල සඳහන් කර නොමැත. ඒ අනුව මෙම සුවිශේෂී තත්ත්වය ඉතා හදිසියෙන් පැන නැගී ඇත්තේ මහාධිකරණයට අධිචෝදනා ඉදිරිපත් කරන අවස්ථාවේදීය. කෙසේ වෙතත් මහාධිකරණ විනිසුරු ඉහත කී විරෝධතා ඉවත දමා ජූරි මනාපය පැමිණිලිකරුට ලබා දී ඇත. එම නියෝගය පැ. 09 ලෙසට ඉදිරිපත් කර ඇත. මහාධිකරණ නියෝගයට එරෙහිව අභියාචනා 03 ක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනා පැ.10, පැ.11 සහ පැ.12 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.14 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

24/11/2020

2020.11.24

9 .VII

පැමිණිලි අංකය - 344/2020

පැමිණිලිකරු - මාපා මුදියන්සේලාගේ ධම්මික අනිල් මාපා

ලිපිනය - නො:56, මේරි මාවත, මහබාග, රාගම.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා කන්දප්පා
2. පොලිස් පරීක්ෂක ඉලංගසිංහ
3. සහකාර පොලිස් අධිකාරී ශානි අබේසේකර

තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර මාපා මුදියන්සේලාගේ ධම්මික අනිල් යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

9 .IX

පැමිණිලි අංකය - 205/2020

පැමිණිලිකරු - වෛද්‍ය යද්දෙහිගේ දොන් නිහාල් ජයතිලක

ලිපිනය - නො:465/02, වැලිවිට පාර, මහදෙනිය, කඩුවෙල

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු ඇමති මංගල සමරවීර මහතා
2. හිටපු අමාත්‍ය පා. ම. පායලී චම්පික රණවක මහතා
3. හිටපු ඇමැති රවුෆ් හකීම් මහතා
4. හිටපු ඇමැති සරත් ෆොන්සේකා මහතා
5. දෙමළ සන්ධාන නායක ආර් සම්බන්ධන් මහතා
6. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහතා
7. ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක මහතා
8. නීතිඥ ජේ.සී. වැලිඅමුණ මහතා
9. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා
10. හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා
11. හිටපු නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර මහතා

12. පී.කේ. සේරසිංහ මහතා

13. අධ්‍යක්ෂ දූෂණ විරෝධී ලේකම් කාර්යාලය එම්.කේ. ආනන්ද විජේපාල මහතා

14. තිලක් සමරනායක මහතා

15. හේවහැටගේ සුමනපාල මහතා

16. නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ

17. හිටපු අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර යක්දෙහිගේ දොන් නිහාල් ජයතිලක මහතා සහ අනෙකුත් චූදිතයින් වූ බැසිල් රෝහණ රාජපක්ෂ මහතා, රත්නායක පල්ලියගුරුගේ බන්දුල තිලකසිරි මහතා, රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක මහතා ඇතුළු සිව්දෙනා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, වෛද්‍ය යද්දෙහිගේ

දොන් නිහාල් ජයතිලක මහතාට එරෙහිව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 9557/17 සහ බී 9556/15 දරන බී වාර්තා සහ එම බී වාර්තා වලට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර වෛද්‍ය යද්දෙහිගේ දොන් නිහාල් ජයතිලක මහතා ඇතුළු අනෙකුත් සියලුම චූදිතයින් නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති අංක 8222/16 දරන චෝදනා පත්‍රය නීතිපතිවරයා විසින් ඉල්ලා අස් කර ගැනීමටත් ඒ අනුව එකී අධිචෝදනා පත්‍රය නිෂ්ප්‍රභා කිරීම මගින් එහි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර වෛද්‍ය යක්දෙහිගේ දොන් නිහාල් ජයතිලක මහතා සහ අනෙකුත් චූදිතයින් වූ බැසිල් රෝහණ රාජපක්ෂ මහතා, රත්නායක පල්ලියගුරුගේ බන්දුල තිලකසිරි මහතා සහ රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නමැති වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද, නිසි කරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් උත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම පොලිස් නිලධාරීන්ට එරහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් ආඥා පනතේ විධිවිධාන යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

6. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ බරපතළ හානි පූරනය කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි. ඒ අනුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුට අහිමි වූ ඔහුගේ රැකියාවේ සියලුම උසස්වීම්

වරප්‍රසාද විදේශීය පුහුණුවීම් හිඟ වැටුප් සියල්ලම ඔහුට ලබා දීමත් ඔහු එවැනි රක්ෂිත බන්ධනාගාර ගත කිරීමකට පත් නොවූයේ නම් ඔහුට ඔහුගේ රැකියාවේ හිමිවන ස්ථානයට ඔහු පත් කිරීමත් මගින් පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිය හැකි බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරන අතරම එම සහනයන් ලබා දීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

වර්තමානයේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති වශයෙන් රාජකාරි ඉටු කරන පැමිණිලිකාර වෛද්‍ය නිහාල් ජයතිලක මහතා 2014.05.29 වන දින සිට 2015 ජනවාරි මස 09 වන දින තෙක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් රාජකාරි කර ඇත. 2015 ජනවාරි මස 08 වන දින නව රජය බලයට පැමිණීමත් සමග 2015.01.09 වන දින සිට පැමිණිලිකරුට එකී අමාත්‍යාංශ ලේකම් පදවිය අහිමිවී ගොස් ඇත. ඒ වන විට 57 වන වියේ පසුවූ පැමිණිලිකරුට වයස අවුරුදු 60 වන තෙක් සේවය කිරීමට නීතිමය හැකියාවක් තිබූ බැවින් ඔහුට රාජ්‍ය සේවයට වාර්තා කිරීම සඳහා සේවා ස්ථානයක් ලබා දෙන ලෙසට ඔහු නව ජනාධිපති ලේකම් පී.බී.අබේකෝන් මහතාගෙන් ඉල්ලීමක් කර ඇත. 2015.01.12 දිනැති එම ලිපිය පැ.01 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති අතර එම ඉල්ලීමට පිළිතුරක් පැමිණිලිකරුට ලැබී නොමැත.

පැ.01 ලිපියට පිළිතුරක් නොලද බැවින් නැවතත් 2015.01.20 දින දාතමින් යුත් ලිපියක් ජනාධිපති ලේකම් පී.බී. අබේකෝන් මහතා අමතමින් තමන් දැරූ ලේකම් පදවිය අහිමි වී ගොස් ඇති බැවින්

රාජකාරියට වාර්තා කිරීම සඳහා සේවා ස්ථානයක් ලබා දෙන ලෙසට දෙවන වරටත් පැමිණිලිකරු විසින් ඉල්ලීමක් කර ඇත. එම ලිපිය පැ.05 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.05 ලිපියටද පිළිතුරක් නොලද බැවින් 2015.04.01 දින ලිපියක් ජනාධිපති ලේකම් අබේකෝන් මහතා අමතමින් ලේකම් ව්‍යවස්ථාවේ විධි විධාන පරිදි තමන්ට විශ්‍රාම යාමට අනුමැතිය ලබා දෙන ලෙසට පැ.06 ලිපියෙන් ඉල්ලීමක් කර ඇත. තමන් 57 වන වියේ පසුවූ බැවින්ද, ඉදිරියේ රාජ්‍ය සේවයේ වැඩ කිරීමට නොලැබෙන බැවින්ද, වැටුපක් නොලැබෙන බැවින්ද, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට (FCID) කැඳවා කටඋත්තර ගන්නා බැවින්ද විශ්‍රාම යාම එකම විකල්පය බවට පැමිණිලිකරු තීරණය කර තිබේ.

පැමිණිලිකරු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් රාජකාරි කරන විට 2013 අංක 01 වගන්තිය යටතේ ස්ථාපිත කරන ලද "දිවි නැගුම" ක්‍රියාවට නංවන දිවිනැගුම දෙපාර්තමේන්තුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිබී ඇත. පනතේ ප්‍රතිපාදන අනුව දිවි නැගුම ක්‍රියාත්මක වූයේ දිවි නැගුම අධ්‍යක්ෂක ජනරාල්වරයා යටතේය.

2015 මාර්තු වන විට දිවි නැගුම දෙපාර්තමේන්තුවෙන් ක්‍රියාත්මක කෙරුණු ව්‍යපෘති වැඩ සටහන් දෙකක් පිළිබඳව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් පරීක්ෂණ පැවැත්වීම ආරම්භ කර, ඒ පිළිබඳව පරීක්ෂණයකට පැමිණිලිකරු කැඳවා තිබේ. එකී පරීක්ෂණයට භාජනය කර තිබූ ව්‍යාපෘති 02 ක් වූයේ;

1. දිවි නැගුම ව්‍යාපාරය ආරම්භ කර දිවි නැගුම දෙපාර්තමේන්තුව පිහිටුවන විට පනතට අනුව කැමැත්ත ප්‍රකාශ කරන සේවකයින්ට වන්දි ලබා ගෙන සේවයෙන් ඉවත් වීමට ලබාදුන් අවස්ථාව අනුව එසේ ඉවත් වන සේවකයින්ට ගෙවන ලද වන්දි සහ පාරිතෝෂිත පිළිබඳව පරීක්ෂණය.

2. දිවි නැගුම ප්‍රතිලාභින්ට නිවාස අලුත් වැඩියා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ඉසුරුමත් නිවහන ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂණය.

දිවි නැගුම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරනු ලැබුවේ ඒ වන විටත් පැවතුණු සමෘද්ධි සංවර්ධන අධිකාරිය, උඩරට සංවර්ධන අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය, සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව සහ ගැමි පුනරුත්තාපන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු හා අධිකාරි 05 ක් එකතු කර 2013 අංක 1 දරණ දිවි නැගුම පනත මගින්ය.

මේ අන්දමින් ආයතනය 05 ක් එකතු කිරීම කරණ කොට ගෙන එම ආයතන වල සිටි සේවකයින්ට විකල්ප 04 ක් සඳහා විශේෂ අවස්ථාවක් ලබාදී තිබේ. (පනතේ 44 ඊ වගන්තිය) එයින් එක් විකල්පයක් වුයේ වන්දි ලබාගෙන සේවයෙන් ඉවත්වීමේ විකල්පයත්, එසේ ඉවත්ව යන සේවකයින් අධිකාරියකට අයත් සේවකයෙක් නම් ඔහුට හෝ ඇයට තමන්ට නියමිත පාරිතෝෂිත මුදල ලබා ගැනීමේ හැකියාවද නීතියෙන් ලැබී තිබුණි.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවතුන දිවි නැගුම දෙපාර්තමේන්තුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ

අධීක්ෂණය සහ මුදල් රෙගුලාසි අනුව ලේකම්වරයාගේ කාර්යභාරය ඉටු කිරීම වැනි රාජකාරි වලට යටත් වුවත් දිවි නැගුම දෙපාර්තමේන්තුව පනත කියවා ඇති කළ දෙපාර්තමේන්තුවක් වූ බැවින් පනතට අනුව පත්වන දිවි නැගුමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පනතින් විශේෂ බලතල ලබා දී තිබූ බැවින් එම බලතල හා මැදිහත්වීමේ හැකියාවක් ලේකම්වරයාට නොතිබුණි.

දිවි නැගුම දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසුව එම පනත මගින් ලබා දී තිබූ වන්දි ලබාගෙන සේවයෙන් ඉවත්වීමේ අයිතිය ක්‍රියාත්මක කළ සේවකයින් 1588 දෙනෙකුට වන්දි සහ හිමිකම් ලබන පුද්ගලයින්ට පාරිතෝෂිත දීමනාව ගෙවීමේ අවශ්‍යතාවය පැන නැඟුණ බැවින් එම පුද්ගයින් 1588 දෙනාට වන්දි ගෙවීම සඳහා රුපියල් මිලියන 1700 ක මුදලක් ලබා දෙන ලෙසට දිවි නැගුම  දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගෙන් ඉල්ලා ඇත. මෙම ඉල්ලීම දිවි නැගුම අධ්‍යක්ෂ ජනරාල්වරයාට තනිව කළ නොහැකි බැවින් ඒ ඉල්ලීම දිවි නැගුම දෙපාර්තමේන්තුව අයත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වූ පැමිණිලිකරු මගින් ඉල්ලීම සිදු කරන ලදී. එම ඉල්ලීම පැ.07 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

දිවි නැගුම පනතේ 44 (ඉ) (1) වගන්තිය අනුව දිවි නැගුම දෙපාර්තමේන්තුවේ සේවයට කැමැත්ත පළ නොකර සේවයෙන් ඉවත්ව යන පුද්ගලියන්ට වන්දි සහ පාරිතෝෂිත ගෙවීමද, එසේම, දිවි නැගුම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහනය වීමට කැමැත්ත පළ කරන සේවකයින් 13419 සඳහා පනතේ 44 (ඉ)(iii) වගන්තිය අනුව මෙම සේවකයින්ගේ අතීත සේවා කාලය සලකා බලා ඔවුන්ට ගෙවිය යුතු පරිතෝෂිත මුදල ගෙවීම වෙනුවෙන්ද රුපියල් මිලියන 4360 ක මුදල

ලබා දෙන ලෙසට පැ.7 ලිපියෙන් දිවි නැගුම අධ්‍යක්ෂක ජනරාල්වරයා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගෙන් ඉල්ලා ඇත. මෙම ලිපිය පැමිණිලිකරු මගින් යොමු කර තිබූ බැවින් පැ.08 දරණ ආවරණ ලිපියද සමඟ අයවැය දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.

ඉන්පසුව නැවත වරක් දිවි නැගුම අධ්‍යක්ෂක ජනරාල් විසින් 2014.11.14 දිනැති ලිපිය පැමිණිලිකරු වෙත එවමින් රුපියල් මිලියන 1.739 ක මුදලක් ලබා දෙන ලෙසට හෝ එම මුදල ලබා දීම ප්‍රමාද වන්නේ නම් දිවි නැගුම දෙපාර්තමේන්තුවේ දිවි නැගුම අරමුදලින් මුදල් ගෙවා භාණ්ඩාගාර අත් මුදල් ලැබුණු පසු ප්‍රතිපූර්ණය කිරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අනුමැතිය ඉල්ලා ඇත. එම ලිපිය පැ.09 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉන්පසුව පැ.09 පදනම් කරගෙන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2014.11.17 දිනැති පැ.10 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති ලිපිය පැමිණිලිකරු විසින් යවමින් දිවි නැගුම අරමුදලින් අදාළ මුදල් ගෙවා ප්‍රතිපූර්ණය කිරීමට අනුමැතිය ඉල්ලා ඇත.

පැ.07, පැ.08, පැ.09, සහ පැ.10 ලිපි සඳහා සාර්ථක ප්‍රතිචාර නොලද බැවින් දිවි නැගුම පනතේ විධි විධාන අනුව වන්දි සහ පාරිතෝෂිත මුදල් ඉල්ලා සිටි පුද්ගලයින්ට ගෙවිය යුතුව තිබූ බැවින්ද, එම ගෙවීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පැමිණිලිකරු වෙත පැවරී තිබූ වගකීමෙන් මිදිය නොහැකි බැවින් ද, 2014.11.18 දිනැති ලිපිය මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු

කරමින් පැ.09 සහ පැ.10 ලිපි වල දැක්වෙන අයුරින් අදාළ ගෙවීම් සිදු කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.

එසේ මුදල් ලබා ගැනීම ප්‍රමාදවීම කරන කොට ගෙන දිවි නැගුම පනතේ 5 (ඊ) වගන්තිය අනුව ක්‍රියා කරමින් දිවි නැගුම බැංකු පද්ධතියේ මුදල් පාවිච්චි කර වන්දි හා පාරිතෝෂිත ගෙවීමටත්, අදාළ මුදල මහා භාණ්ඩගාරයට ලැබුණු පසු ගෙවන ලද මුදල ප්‍රතිපූර්ණය කිරීමටත් දිවි නැගුම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. මෙම තීරණය ගැනීම පැමිණිලිකරු විසින් සිදු කර නොමැත. එම තීරණය දිවි නැගුම දෙපාර්තමේන්තුව විසින් ගත් ප්‍රතිපත්තිමය තීරණයක් බැවින් පැමිණිලිකරු ඊට මැදිහත්වීමක් සිදු කර නැත. එසේම දිවි නැගුම බැංකු පද්ධතියේ ඇති මුදල් දිවි නැගුම ප්‍රතිලාභීන්ගේම මුදල් වන බැවින් ඒවා ඔවුන්ගේ අවශ්‍යතාවන් උදෙසා පාවිච්චි කිරීම තුළින් වරදක් සිදු නොවන බැවින් ද, එම මුදල් භාණ්ඩාගාර අක් මුදල් ලැබුණු පසුව ප්‍රතිපූර්ණය කරන බැවින් ද, ගණුදෙනුව සම්පූර්ණ නීත්‍යානුකූල වූ බැවින්ද පැමිණිලිකරු ඊට මැදිහත්වීමක් සිදු කර නොමැත.

පැමිණිලිකරු විසින් සිදු කරන ලද්දේ දිවි නැගුම අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද ලිපි අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම පමණි. ඒ මත මුදල් ලබා ගැනීමක් සිදු කර නැත. එසේ මුදල් ලබා ගැනීම වුවද එය සිදුවනුයේ දිවි නැගුම පනතේ විධි විධාන ක්‍රියාත්මකවීම හේතුවෙන් වන බැවින් එය පැමිණිලිකරුගේ වගකීම් පරාසයට ඇතුළත් නොවේ.

එසේම 2015 යහපලාන රජය පත්වීමෙන් පසුව නැවත සිදු කරන ලද ඉල්ලීමක් අනුව එම මුදල් වලින් කොටසක් මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කර ඇත.

මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට කැඳවීමෙන් පසුව පැමිණිලිකරු සතුව තිබූ මෙම ලිපි ලේඛන ඉදිරිපත් කර අදාළ ප්‍රශ්න ගත ක්‍රියාවේ නීත්‍යානුකූල භාවය පැමිණිලිකරු විසින් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට පැහැදිලි කර දී ඇත.

යථා තත්ත්වය එලෙස වුවත් මූල්‍ය අපරාධ කොට්ඨාසය වෙනත් අරමුණකින් ප්‍රශ්න කිරීම සිදු කරන බවට පැමිණිලිකරුට අවබෝධ වී ඇත. එයට හේතු වී ඇත්තේ පැමිණිලිකරුගේ ප්‍රකාශය සටහන් කර ගන්නා අවස්ථාවේදී නිතරම බැසිල් රාජපක්ෂ මහතා මේවාට සම්බන්ධ බවට සනාථ කර ගැනීම සඳහා සීමාව ඉක්මවා, ප්‍රකාශ සටහන් කර ගන්නා නිලධාරීන්, ක්‍රියා කරන බවට අවබෝධ කර ගෙන ඇත.

මෙම චෝදනාවට සම්බන්ධ කරගෙන සිටින දිවි නැගුම අධ්‍යක්ෂ ජනරාල් රණවක මහතා සහ දිවි නැගුම මූල්‍ය අධ්‍යක්ෂක බන්දුල තිලකසිරි මහතා කටඋත්තර දෙනු ලැබූ අවස්ථාවේදී ද මේ අන්දමින්ම බලපෑම් කිරීමට මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ කටඋත්තර ලබාගත් නිලධාරීන් ක්‍රියා කළ බවත් ඔවුන් නිතරම බැසිල් රාජපක්ෂ මහතා මෙම ගනුදෙනු වලට සම්බන්ධ කිරීමට කරුණු විමසූ බවටත් සාක්ෂිවලින් හෙළිදරව් වී ඇත.

මුදල් කෙසේ හෝ ගෙවන ලෙසට ඇමතිවරයා බලපෑමක් කළ බවට හෝ නැතහොත් නියෝග කළ බවට තත්ත්වයක් නිරූපනය කර ගැනීම සඳහා මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් දිගින් දිගටම ප්‍රශ්න කිරීම් සිදු කර ඇත. පැමිණිලිකරු විසින් සිදු කරනු ලබන්නේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පමණක් බවත්, මේ ගනු දෙනු සියල්ල දිවි නැගුම පනතේ විධි විධාන අනුව පැන නැඟුණු ගණුදෙනු බවත්, දිවි නැඟුම දෙපාර්තමේන්තුවට පනතෙන් එම බලතල ලැබී ඇති බවටත්, පැමිණිලිකරු මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට පැහැදිලි කර දී ඇතත් ඔවුන් තමන්ගේ අභිප්‍රාය ඉටු කර ගැනීම සඳහා 12 වතාවක් හෝ 15 වතාවක් පැමිණිලිකරු මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට කැඳවා ප්‍රශ්න කිරීම දිගින් දිගටම සිදු කර ඇත.

මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ සැබෑ මුහුණුවර මෙම කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර මහතා "සති අග අරුණ" නැමැති පුවත් පත් මාධ්‍යවේදියා හා පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී හෙළිදරව් කර ඇති බවට එකී පුවත් පතෙහි 2019.10.27 දින පුවත් ප්‍රකාශනයක් පැ.12 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරමින් සාක්ෂි ලබා දී ඇත. රවි වෛද්‍යාලංකාර මහතා එකී සාකච්ඡාවේදී පවසා ඇත්තේ " සතියකට වරක් රාජපක්ෂ කෙනෙක් අත්අඩංගුවට ගන්නා ලෙසට ඇමතිවරයෙක්" ඔහුට ප්‍රකාශ කළ බවය.

ඒ අනුව පැමිණිලිකරුට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය විසින් සාක්ෂි නිර්මාණය කරමින් සිදු කරනු ලබන ක්‍රියාවලිය පැහැදිලි ලෙසම දේශපාලන බලපෑම් මත පළිගැනීමේ ක්‍රියාවලියක තවත් පියවරක් බව පැහැදිලිය. මෙම තත්ත්වය සනාථ කරන තවත් ඉතා

ප්‍රබල සාධකයක් වන්නේ 2015 නව රජය බලයට පත්වීමත් සමඟ අග්‍රාමත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සහ අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා විසින් 2015 ජනවාරි 29 වන දින ඉදිරිපත් කරන කැබිනට් සංදේශ වලින් මහින්ද රාජපක්ෂ රජයේ දූෂණ සෙවීම සඳහා පත් කරන ලැබූ නිළ නොවන කමිටුවක් වන දූෂණ මර්දන කමිටුව සහ ඊට විධාන ලබාදෙන දේශපාලඥයින්ගෙන් ඔවුන්ට සහාය දැක්වූ සිවිල් සංවිධාන නියෝජිතයින්ගෙන් සැකසුනු නිළ නොවන ජාතික විධායක සභාව නැමැති සංවිධානය විසින් එම කටයුතු ක්‍රියාත්මක කිරීමය. මෙම කොමිෂන් සභාව ඉදිරියේ විභාග වන පැමිණිලි ගණනාවකදීම උක්ත සඳහන් කැබිනට් සංදේශය සහ කැබිනට් තීරණය ඒ ඒ පැමිණිලිවල පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කරමින් එහි සඳහන් නිළ නොවන සංවිධාන මගින් තෝරා ගත් පොලිස් නිළධාරීන් යොදවමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය මෙහෙයවමින් දේශපාලන පළිගැනීම් ඉතා බරපතල අන්දමින් සිදු කළ බවට සාක්ෂි ඉදිරිපත් කර ඇත. මෙම දේශපාලන පළිගැනීම් වල මුඛ්‍ය අර්ථය වූයේ රාජපක්ෂවරුන්ගෙන් පළිගැනීම සහ ඔවුන් දේශපාලන භූමියෙන් තුරන් කර දැමීම බව මෙම පැමිණිලි සමූහයේ සාක්ෂි පෙළ ගැස්වීමේදී ඉතාමත් හොඳින් පැහැදිලිවේ.

රාජපක්ෂවරුන් මුලිනුපුටා දැමීමේ ව්‍යාපාරයේ පුරෝගාමී දේශපාලඥයින් කිහිපදෙනෙකුගේ ද්වේශසහගත සහ අනීත්‍යානුකූල ක්‍රියාදාමයන් මත අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ද පීඩනයට හසුව තිබූ බව එම රජයේ අමාත්‍යවරයෙකු වූද දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයෙකු වූද ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා එවැනි එක් නඩුවකදී ලබාදුන් සාක්ෂි වලින් හෙළිදරව් වී ඇත.

පැ.13 දරණ කැබිනට් සංදේශය සහ ඒමත එළඹුනු තීරණය අනුව, දූෂණ මර්දන කමිටුව, අනු කමිටුවකින්ද, නීතිපති සහ රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතාද ඇතුළු පරීක්ෂකයින්ගේ සහ අධ්‍යක්ෂකවරයෙකුගෙන් සමන්විත වේ. මේ යටතේ තෝරාගත් පොලිස් නිලධාරීන් සහ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතාද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ රාජකාරියෙහි නියැලි ඇති බව එම දූෂණ මර්දන කමිටුවේ සංයුතිය අධ්‍යනය කිරීමේ දී පෙනී යයි.

මෙම නිල නොවන පළිගැනීමේ සංවිධානයට ඉන්පසු නිලධාරීන් තෝරා පත් කර ගැනීම නිල නොවන ජාතික විධායක සභාව විසින් සිදු කළ බව හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ සාක්ෂියකින් හෙළිදරව් වී ඇත.

මෙම කැබිනට් පත්‍රිකාව පැ.13 ලෙස ඉදිරිපත් කර ඇත. ඒ අනුව ජාතික විධායක සභාවේ අනුමැතිය ඇතිව ස්ථාපිත කරන ලද දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයින් වුයේ, (පැ.13 (ආ) අනුව)

1. අගමැති රනිල් වික්‍රමසිංහ (සභාපති)
2. අමාත්‍ය මංගල සමරවීර
3. අමාත්‍ය පාඨලී චම්පික රණවක
4. අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ
5. අමාත්‍ය රාවුෆ් හකීම්
6. ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය නායක, සරත් ෆොන්සේකා
7. දෙමළ ජාතික සන්ධානය (TNA) නායක, ආර් සම්බන්ධන්

8. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ.සුමන්තිරන්

9. ජනතා විමුක්ති පෙරමුණේ නායක, අනුර කුමාර දිසානායක

10. නීතිඥ ජේ.සී.වැලිඅමුණ

11. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න

12. මලික් සමරවික්‍රම

13. කමිටු ලේකම්

අනු කමිටුවේ සාමාජිකයින් වන්නේ,

1. අමාත්‍ය මංගල සමරවීර (සභාපති)

2. අමාත්‍ය අචාර්ය විජේදාස රාජපක්ෂ

3. නියෝජ්‍ය අමාත්‍ය එරාන් වික්‍රමරත්න

4. ජනතා විමුක්ති පෙරමුණෙ නායක, අනුර කුමාර දිසානායක

5. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ.සුමන්තිරන්

6. නීතිඥ ජේ.සී.වැලිඅමුණ

7. මලික් සමරවික්‍රම

එකී කැබිනට් පත්‍රිකාවේ පැ.13 (ඇ) ඇමුණුම අනුව දූෂණ විරෝධී කමිටුවේ ක්‍රියාකාරීත්වයට අංශ 03 ක් මගිනි. එනම්,

- ක්ෂණික ප්‍රතිචාර කමිටුව
- අනුකමිටුව
- අධ්‍යක්ෂ (පරිපාලන)

යන අංශ 03 මගින් ක්‍රියාත්මක කර ඇති ක්ෂණික ප්‍රතිචාර කමිටුවේ සාමාජිකයින් වූයේ,

1. අධ්‍යක්ෂ - ආනන්ද විජයපාල

2. පොලිසිය - එස්.එස්.පී.ශානි අබේසේකර

ඒ.එස්.පී.ප්‍රේමශාන්ත

අයි.පී.නිහාල් අමරසිරි

ඩබ්ලිව්.ජේ.සී.සුජාතා කුමාරි

සී.අයි.වීරසේන

අනුකමිටුවේ සාමාජිකයින් වූයේ,

1. නීතිපති

2. රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ - තුසිත් මුදලිගේ

3. විශේෂඥ උපදේශකවරු - ලාල් නානායක්කාර

අනුෂ කුමාරස්වාමි

දිනේෂ් පෙරේරා

අධ්‍යක්ෂ පරිපාලන අංශය ලේකම් කාර්යාලයකින්, අවශ්‍ය කාර්ය මණ්ඩලයකින් සහ වාහන / දුරකථන වලින් සමන්විත විය.

මෙම කිසිදු කමිටුවක් කිසියම් නෛතික ප්‍රතිපාදනයන් යටතේ හෝ පාර්ලිමේන්තුවේ සම්මත කළ පනතකින් හෝ කිසියම් ව්‍යවස්ථාවකින් ස්ථාපිත කළ කමිටු නොවීය. රාජ්‍ය තන්ත්‍රණය තුළ රාජ්‍ය බලය

වර්ණාලේප ගැන්වූ මෙම නිල නොවන සංවිධාන විධායක හස්තයන් අනීතික ලෙස මෙහෙයවා ඇති බව බැලූ බැල්මටම පැහැදිලිවේ.

මෙම සංවිධාන වල සාමාජිකයින් රාජ්‍ය මුදල් වලින් ගෙවීම් කර ඇති බවට සාක්ෂි අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය නිලධාරි සාක්ෂි දෙමින් සඳහන් කර ඇත. අදාල ගෙවීම් සනාථ කිරීම සඳහා දූෂණ විරෝධී ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට දීමනා රජයේ මුදලින් ගෙවන ලද බවට තහවුරු කෙරෙන වවුචර් පත් සහ වැටුප් ලේඛන මූල්‍ය නිලධාරි විසින් තම සාක්ෂියේ දී ඉදිරිපත් කර ඇත.මෙවැනි අනීතික සංවිධානයක හස්තයන් ලෙසට නීතිපතිවරයා සහ රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ සහ පොලිස් නිලධාරින් ක්‍රියා කිරීම නීතියෙන් අනුමත කළ නොහැකි, කනගාටුදායක තත්ත්වයකි.

නව රජය බලයට පැමිණි වහාම, 2015.02.28 වන දින තාවකාලික පදනමක් මත දිවි නැඟුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනාරාල් වශයෙන් පත් කරනු ලැබූ සුමනපාල පත්වීම ලැබීමෙන් දින දෙකකට පසුව, 2015.03.03 වන දින, මෙම පැමිණිලිකරුට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එසේ කටයුතු කළ සුමනපාලගේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සිදු කළ පත්වීම ස්ථිර කිරීමට කැබිනට් පත්‍රිකාවක් සජිත් ප්‍රේමදාස අමාත්‍යවරයා ඉදිරිපත් කර ඇතත් 2015.04.05 වන දින එම කැබිනට් පත්‍රිකාව ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව සුමනපාලට දිවි නැඟුම අධ්‍යක්ෂක ජනරාල්ධූරය අහිමි වී ඇත.

රාජ්‍ය සේවයේ ස්ථිරව නිරතව රාජකාරි කරමින් සිටි පැමිණිලිකරු දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත්වීම් ලබා ඇත්තේ දේශපාලන සුදුසුකම් මත නොව ඔහු රාජ්‍ය සේවයෙහි නිරතව

සිටි ජ්‍යේෂ්ඨ නිලධාරියෙකු වශයෙනි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එවැනි විධායක ශ්‍රේණියේ රාජ්‍ය නිලධාරීන් රාජ්‍ය සේවයෙන් ඉවත් කිරීම, මාරු කිරීම හෝ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධ සියළුම බලතල ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවටය. ඒ අනුව ස්ථාන මාරු කිරීම හෝ විනයානුකූල ක්‍රියා ගැනීම හෝ සේවය අවසන් කිරීම පිළිබඳ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුව තිබියදී අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා ඇත. කැබිනට් මණ්ඩලය ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කරමින් එකී කැබිනට් සංදේශයට අනුමැතිය ලබා දී ඇත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත සිදු කළ පැමිණිල්ල මත ආරම්භ කළ පරීක්ෂණයට අදාළ ගනු දෙනු සම්බන්ධයෙන් පැමිණිලිකරුගේ සෘජුදායකත්වයක් ඇත්තේ ලිපි කිහිපයක් යැවීම සම්බන්ධයෙන් පමණි.

මෙලෙස දින ගණනක් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට ගෙන්වා පැමිණිලිකරු ප්‍රශ්න කරමින් සිටින අතරතුරදී 2015.04.22 දින රාත්‍රී 11ට 12ට පමණ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පැමිණිලිකරු, අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා සහ කිත්සිරි රණවක මහතා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා රැගෙන ගොස් රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ 2015.04.22 දින උදේ 9.00 ට පමණ

පැමිණිලිකරු මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට ගොස් ඇතත් ඔහු අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ රාත්‍රී 10 ට 11 ට පමණය.

මෙම කාලයේදී කඩුවෙල මහේස්ත්‍රාත්වරයා ලෙස ධම්මික හේමපාල මහතා රාජකාරි කර ඇත. රංජන් රාමනායක ඇමතිවරයා සමග සිදු කළාය කියන ලැබූ පටිගත කළ දුරකථන සංවාද වල සිටි ධම්මික හේමපාල මහතා පිළිබඳව මාධ්‍ය මගින් ප්‍රචාරනය කෙරුණ දර්ශන තුළින් සාක්ෂි ඉදිරිපත් වී ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවට මූල්‍ය අපරාධ කොට්ඨාසය නිකුත් කළ රිසිට්පත පැ.14 වශයෙන් ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු ඇතුළු පිරිස කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී එම ස්ථානයට මාධ්‍යවේදීන් පැමිණ සිට ඇත. රාත්‍රී 11, 12 ට පමණ මෙම පිරිස කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන බවට මාධ්‍යට  දැනුම් දුන්නේ කිනම් පාර්ශවයක් ද යන ප්‍රශ්නය පැන නැගේ. මෙයට පිළිතුරු පැ.13 කැබිනට් සංදේශයේ ද සඳහන්ව ඇති බව එම කැබිනට් සංදේශය පරිශීලනය කිරීමේ දී පැහැදිලිවේ. උක්ත කැබිනට් සංදේශය අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කරනු ලබන කටයුතු වලට දිනපතා පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ලබා දීම කෙටිකාලීන වැඩ සටහන් යටතේ පෙළ ගස්වා ඇත. ඒ අනුව, අනු කමිටු වලට නම් කර සිටින රජයේ නිලධාරීන් එම කාර්යයෙහි නිරතව දිනපතා මාධ්‍ය ප්‍රචාරය සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීමෙහි නිරතව සිට ඇති බව උක්ත සාක්ෂි විශ්ලේශනය කිරීමේදී පැහැදිලිව පෙනීයයි.

පැමිණිලිකරු ඇතුළු තිදෙනා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන විට මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතා රාත්‍රී 11,

12ට පමණ අධිකරණයට පැමිණ සිට ඇත. මහේස්ත්‍රාත්වරයා එම වේලාවට අධිකරණයට පැමිණීමට අනිවාර්ය හේතුව වන්නේ මූලාා අපරාධ විමර්ශන ඒකකය විසින් ඔහුව පැහැදිලි ලෙස දැනුවත් කර තිබීම හේතුවෙනි. එය ඔහුගේ පැමිණීමෙන් සනාතවේ.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු නිකුත් කළ කුවිතාන්සිය අනුව 2015.04.22 දින ප.ව 15.00 ට අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත. මේ අනුව පැය 24 ක් සම්පූර්ණවීම සිදු වන්නේ 23.04.2015 දින ප.ව. 15.00 ටය. මේ අනුව මධ්‍යම රාත්‍රියේ පැමිණිලිකරු ඇතුළු පිරිස අධිකරණයට ඉදිරිපත් කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් පැන නොනඟී.

එසේම අනික් අතට 2015.04.22 දින පැමිණිලිකරු මූල්‍යා අපරාධ කොට්ඨාසයට පැමිණ ඇත්තේ පෙරවරු 9.00ට පමණය. පෙරවරු 9.00 සිට ප.ව.3.00 දක්වා කිසිදු කටයුත්තක් සිදුවී නොමැති අතර පැමිණිලිකරු නිකරුනේ කාලය ගත කර ඇත. පැමිණිලිකරු මූල්‍යා අපරාධ කොට්ඨාසයට පැමිණි වේලාවේ එනම් පෙ.ව. 9.00 ට ඔහු අත්අඩංගුවට ගත්තේ නම් මධ්‍යම රාත්‍රියේ ඔහු අධිකරණයට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟී.

මෙහි වැඩිදුරටත් සලකා බැලිය යුතු කරුණක් ඇත. පැමිණිලිකරු ඇතුළු තිදෙනා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට රැගෙන යනවිට බන්ධනාගාර බස් රථයක් නිලධාරීන් ද සමඟ කඩුවෙල අධිකරණ භූමියට පැමිණ තිබී ඇත. අධිකරණයට ගෙන ඒමටත් ප්‍රථම බන්ධනාගාර බස් රථ අධිකරණයට පැමිණ තිබීමෙන් පැහැදිලි වන්නේ පැමිණිලිකරු ඇතුළු පිරිස නිසැකවම රක්ෂිත බන්ධනාගාර ගත කරන බවට මූල්‍යා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් දැනගෙන සිට බවය. පැමිණිලිකරු ඇතුළු තිදෙනා ඉදිරිපත් කළ බී වාර්තාවට

අනුව සුවිශේෂී හේතූන් මත ඔවුන් ඇප මත මුදා හැරීමේ බලය මහේස්ත්‍රාත්වරයාට අදාළ පනතින් ම ලැබී ඇත. ඒ අනුව පැමිණිලිකරු ඇතුළු තිදෙනා ඇප මත මුදා හරින්නේ ද නැතහොත් රක්ෂිත බන්ධනාගාර ගත කරන්නේද යන්න ඉදිරිපත් කරන බී වාර්තා වේ ඇතුළත් කරුණු මත තීරණය කෙරේ. එවන් තත්ත්වයක් පැවති අවස්ථාවකදී ඔවුන් පැහැදිලි ලෙසම රක්ෂිත බන්ධනාගාර ගත කරන බවට දැනුම සහිතව බන්ධනාගාර බස් රථය කඩුවෙල අධිකරණ භූමියට රැගෙන එන ලෙසට බන්ධනාගාරයට දැනුම් දී ඇත්තේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් බව පැහැදිලිය. එසේනම් ඔවුන්ට පැමිණිලිකරු ඇතුළු තිදෙනා ස්ථිර වශයෙන්ම රක්ෂිත බන්ධනාගාර ගත කරන බවට මහේස්ත්‍රාත්වරයා සතුවූ දැනුම ඔවුන්ට ලැබුණේ කෙසේ ද යන ප්‍රශ්නය පැන නගී.

සාක්ෂි වලින් වැඩිදුරටත් හෙළිවී ඇති අන්දමට කඩුවෙල අධිකරණ භූමියට මාධ්‍යකරුවන් පැමිණ සිට ඇත. මේ අනුව පැමිණිලිකරු ඇතුළු පිරිස අධිකරණයට ඉදිරිපත් කිරීම පිළිබඳව පුළුල් මාධ්‍ය ප්‍රචාරනයක් ලබා දීමට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් ක්‍රියා කර ඇති බවද මැනවින් නිරූපණයවේ.

පැමිණිලිකරුට නීතිඥවරයෙකු සුදානම් කර ගැනීමටවත් අවස්ථාවක් නොලැබෙන ආකාරයට ඔවුන්ට කලින් නොදන්වා අධිකරණය වෙත රැගෙන ගිය මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් අනිත් අතට පූළුල් මාධ්‍ය ආවරනයක් ලබා දීමට මාධ්‍ය වලට පැමිණීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ඔවුන්ට කල්වේලා ඇතිව අධිකරණයට ඉදිරිපත් කරන වේලාව දැනුම් දීමට තරම් කාරුණික වී ඇත.

මේ අනුව පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට ඉතාමත් ලෙහෙසියෙන් දිවා කාලයේ පහසු වේලාවක් සකස් කර ගැනීමේ අවස්ථාවක් ඉතා හොඳින් පැවතුනද, දිවා කාලයේ පහසු වේලාව තෝරා ගැනීම වෙනුවට මධ්‍යම රාත්‍රියේ නිදි වර්ජිතව, මහේස්ත්‍රාත්වරයා ද අවධියෙන් තබමින්, බන්ධනාගාර නිලධාරීන් හා බන්ධනාගාර වාහන එම ස්ථානයට ගෙන්වා ගනිමින්, මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් රහපාන ලද ජවනිකාව දේශපාලන අවශ්‍යතාවන් ඉටු කරලීම උදෙසාම සිදු කරන ලද මෙහෙයුමක් බව පැහැදිලිය. පැමිණිලිකරු ඇතුළු පිරිස කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ 2015.03.03 දින අංක බී 9557/15 දරණ වාර්තාව පැ.15 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පොදු දේපල පනත යටතේ ගැනෙන වැරදි සිදු කර ඇති බවට බී වාර්තාවේ කරනු දක්වා ඇත. එසේ වුවත් පැ.06 සිට පැ.10 දක්වා ලේඛන අනුව පැහැදිලි ලෙසම භාණ්ඩාගාරයෙන් දිවි නැගුම දෙපාර්තමේන්තුවේ එම මුදල් ලැබී නැත. ඉල්ලා සිටි මුදල් නොලැබුණ බැවින් අදාළ ගෙවීම් සිදු කර ඇත්තේ දිවි නැඟුම බැංකු පද්ධතියෙන් ලබා ගත් මුදල් වලිනි. එම මුදල් පසුව ප්‍රතිපූර්ණය කර ඇත.

ලංකාව පුරා දිවි නැගුම බැංකු 1074 ක් පිහිටුවා ඇති අතර දිවි නැගුම ප්‍රතිලාභීන් 15 ලක්ෂයක් පමණ දිවයින පුරා විසිරී සිටී. මෙම සෑම ප්‍රතිලාභියෙක්ටම ගිණුමක් මෙම බැංකු 1074 න් එකක ඇත. රජයේ වෙනත් බැංකු මෙන් නොව දිවි නැගුම බැංකුවල සෑම ගිණුම් හිමියෙකුගේම කොටස් ඇත. එම කොටස් වලට ලාභාංශ ගෙවීම දිවි නැගුම ප්‍රතිලාභීන්ට සෑම මසකම ආධාර මුදලක් ලබා දෙනු ලබන අතර එම ආධාර මුදලින් රුපියල් 100 සිට 300 දක්වා වූ ප්‍රතිලාභියා

කැමති මුදලක් ප්‍රතිලාභීයාගේ ගිණුමෙහි තැන්පත් කළ යුතුවේ. ඒ අනුව ලක්ෂ 15 කට ආසන්න ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සෑම මසකම රුපියල් 100ත් 300ත් අතර මුදලක් දිවි නැගුම බැංකුවක ඇති ප්‍රතිලාභීයාගේ ගිණුමේ අනිවාර්යයෙන්ම තැන්පත් කරනු ලැබේ. දිවි නැගුම බැංකු මෙම මුදල් ආයෝජනය කිරීමෙන් හා වැඩි පොළී මුදලක් මත වෙනත් බැංකුවල තැන්පත් කිරීම තුළින් මාසිකව මිලියන ගණන් ලාභ උපයන අතර මෙම ලාභයෙන් කොටස් හිමියන්ට ලැබේ. මේ අනුව දිවි නැගුම බැංකු වල ඇති මුදල් රජයේ මුදල් නොවන අතර ඒවා කොටස් හිමියන්ගේ මුදල්වේ. දිවි නැගුම කොටස් හිමියන් යනු දිවි නැගුම ව්‍යාපෘතියෙන් සහනාධාර ලබන පුද්ගලයින්වේ.

සරල උදාහරණයකින් මෙය වඩාත් විහග්‍ර කර දක්වන්නේ නම්; රජයෙන් වැටුප් ලබන රාජ්‍ය සේවකයෙකුට වැටුප් ගෙවීම සඳහා භාවිතා කරනු ලබන්නේ රාජ්‍ය අරමුදල්ය. මෙසේ වුවත් රාජ්‍ය මුදල් වලින් සේවකයාට වැටුප් ගෙවූ පසුව එම මුදල් රජයට අයත් මුදලක් නොවන අතර ඒවා සේවකයාට අයත් ඔහුගේ පුද්ගලික මුදලක් බවට පත්වේ. එවිට එම මුදලේ හිමිකරු ඔහුය.

එපරිද්දෙන් රාජ්‍ය මුදල් වලට හිමිකම් ලබන පුද්ගලයින්ට සහනාධාරයක් ගෙවූ පසුව එම මුදලේ හිමිකම රජයට අහිමි වී හිමිකම සහනාධාරය ලබන්නාට මාරුවේ. ඒ අයුරින් දිවි නැගුම සහනාධාර ලබන පුද්ගලයින්ට ආපසු දිවි නැගුම බැංකුවල තැන්පත් කරනු ලබන්නේ ඔවුන්ට හිමි ඔවුන්ගේ පුද්ගලික මුදල් මිස රජයේ මුදල් නොවේ.

2013 අංක 1 දරණ දිවි නැඟුම පනතේ 44 (ආ) වගන්තිය අනුව සමෘද්ධි සංවර්ධන අධිකාරිය, උඩරට සංවර්ධන අධිකාරිය සහ දක්ෂිණ

සංවර්ධන අධිකාරියට අයත් සියළුම නිශ්චල හා චංචල දේපල එම අධිකාරිය පිහිටුවනු ලැබූ පනත් අවලංගු කිරීමේ හේතුවෙන් රජයට අයත් දේපලක් ලෙසට රජය සතු වනු ඇත. එසේ වුවත් සමෘද්ධි බැංකුවල තැන්පත් කර තිබූ මුදල් නිශ්චල හෝ චංචල දේපල නොවන බැවින් එම මුදල දිවි නැඟුම පනතේ 44 (ආ) වගන්තිය අනුව රජයේ මුදල් බවට පත් නොවේ.

දිවි නැගුම පනත චංචල දේපල අර්ථ නිරූපණය කර දක්වා නොමැත. අර්ථ නිරූපණ පනත ද චංචල දේපල අර්ථ නිරූපණය කර නොදක්වයි. පැමිණිලිකරුට එරෙහිව චෝදනා කිරීම සිදු කරනු ලබන්නේ දණ්ඩ නීති සංග්‍රහය හා පොදු දේපල පනත උපයෝගී කරගෙන බැවින් දණ්ඩ නීති සංග්‍රහයේ චංචල දේපල සඳහා ලබා දී ඇති අර්ථ නිරූපණයට ඒ අනුව අදාළ කර ගත යුතුවේ. දණ්ඩ නීති සංග්‍රහයේ 20 වගන්තිය අනුව "චංචල දේපල" යන වචන වලට ඉඩම් සහ පොළව සම්බන්ධවූ දේ හෝ පොළවට සම්බන්ධ වූ යමකට ස්ථිර ලෙස සවිකරනු ලැබූ දේ හැර සෑම අන්දමකම ද්‍රව්‍යමය දේපල ඇතුලත් ලෙස අදහස් කරනු ලැබේ" යනුවෙන් චංචල දේපල අර්ථ නිරූපණය කර ඇත.

ද්‍රව්‍යමය දේපල කාලය ඉකුත්වීම කරන කොට ගෙන දිරාපත් වීමට භාජනය වේ. ද්‍රව්‍යමය දේපල එසේ දිරාපත්වීම කරන කොට ගෙන එහි අගයද අඩුවන බැවින් එහි අගය තක්සේරු කිරීම සඳහා නෛතික විධි විධාන සහ රෙගුලාසි පනවා ඇත. එබැවින් මුදල් ද්‍රව්‍යමය දේපල ගනයට ඇතුල් නොවේ. එසේ හෙයින් මුදල් චංචල දේපල නොවේ.

දිවි නැඟුම පනතේ 44 (ආ) වගන්තියට අනුව, දිවිනැගුම පනතින් ඉවත් කරන ලද සමෘද්ධි සංවර්ධන අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය, සහ උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි වලට අයත්ව තිබූ සියලුම චංචල හා නිශ්චල දේපල රජයට පවරා දිය යුතු අතර එම දේපළ රජයේ දේපළක් ලෙසට සලකනු ලැබිය යුතුය; යනුවෙන් විධාන පනවා ඇත. එසේ වුවත් සමෘද්ධි සංවර්ධන බැංකු වල තැන්පත් කර තිබූ මුදල් රජය සතු විය යුතු බවට කිසිදු විධානයක් දිවිනැගුම පනතින් පනවා නොමැත. මේ අනුව දිවි නැඟුම පනතේ 44(ආ) වගන්තිය අනුව දිවි නැඟුම පනත බලයට පැමිණීමේ හේතුවෙන් සමෘද්ධි සංවර්ධන බැංකුවල තිබූ මුදල් රජයේ මුදල් බවට පත් නොවේ.

නීතිය ක්‍රියාත්මකවීම හේතුවෙන් ඉටු කිරීමට බැඳෙන නිත්‍යානුකූල රාජකාරියක් ඉටු කිරීම කරන කොට ගෙන පැමිණිලිකරු 2015 අප්‍රේල් මස 22 වන දින සිට 2015 ජූනි මස 17 වන දින තෙක් රක්ෂිත බන්ධනාගාර ගතව සිට ඇත. මෙම නඩුව තවමත් නොවිසඳුනු නඩුවක් ලෙසට කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවීමේ නඩු රෝලෙන් ඉවත් කර බහා තබා ඇත.

නඩුව අවිනිශ්චිතව එලෙස බහා තබා ඇති අතර ඇප කොන්දේසි කරන කොටගෙන සෑම මසකම අවසන් ඉරු දින කුරුදු වත්ත පොලිස් ස්ථානයට වාර්තා කිරීමේ අවිනිශ්චිත දඬුවම කාල සීමාවක් පැමිණිලිකරු ගෙවමින් සිටින අතර ඔහුගේ පෞද්ගලික නිදහස සහ අයිතිය අවහිර කරන ඇප කොන්දේසි මගින් පැමිණිලිකරුට විදේශ ගතවීම තහනම් කරමින් තමන් කැමති වේලාවක ඔහු කැමති දිසාවකට

ගමන් කිරීමට ඇති නිත්‍යානුකූල අයිතිය ද අහිමි කිරීමේ දඬුවමට පාත්‍රව පැමිණිලිකරු වර්තමානයේ එම දඬුවම ගෙවමින් සිටි.

කිසිම නෛතික පදනමක් නැති ඔප්පු කිරීමට නොහැකි චෝදනා සහිත නඩුවක ඇපය වශයෙන් රුපියල් ලක්ෂයක මුදලක් ඇප තබා ඇත. පැමිණිලිකරුගේ භාර්යාව ලෝක සෞඛ්‍ය සංවිධානයේ විශේෂඥ වෛද්‍යවරියක් වශයෙන් සේවය කරන අතර පැමිණිලිකරුට භාර්යාව බැලීමට යාමට ද නොහැකි වන පරිදි පැමිණිලිකරුට ඇපයෙන් දඬුවම් කර ඇත. එසේ පැමිණිලිකරුගේ ගුවන් ගමන් බලපත්‍රය අධිකරණය භාරයට ගෙන ඇත. ගුවන් ගමන් බලපත්‍රයක් අධිකරණය භාරයට ගැනීමට අධිකරණයට බලය දෙන කිසිදු නෛතික විධානයක් ශ්‍රී ලංකා නීතියේ නොමැත. ඒ අනුව පැමිණිලිකරුගේ ගුවන් ගමන් බලපත්‍රය අත්අඩංගුවට ගැනීමෙන් බලය ඉක්මවා ක්‍රියා කර ඇත. බහා තබන ලද නඩුවකට පැමිණිලිකරුගේ ගුවන් ගමන් තහනම තවමත් පවතී. නඩුව බහා තැබීමේ නියෝගය සිදුකරනු ලැබූ අවස්ථාවේදී, පැමිණිලිකරුගේ ගුවන් ගමන් බලපත්‍රය අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් කිසිදු නියෝගයක් සිදු නොකිරීම තුළින් පැමිණිලිකරුට බරපතල අගතියක් සිදු කර ඇත.

හදිසි අවශ්‍යතාවක් මත වුවද පැමිණිලිකරුට විදේශගත වීමට මේ හේතුවෙන් හැකියාවක් නොමැත. අනිත් අතට ඒ සඳහා නීතිඥවරුන්ට මුදල් ගෙවමින් අධිකරණය ඉදිරියේ ඉල්ලීම් සිදු කරමින් කාලය ගත කිරීමට පැමිණිලිකරුට සිදු කරලීම තුළින් මූල්‍ය දඬුවම් පමුණුවා ඇත.

උක්ත සඳහන් දිවි නැඟුම ප්‍රතිලාභීන්ට වන්දි හා පාරිතෝෂිත ගෙවීම පිළිබඳ නඩුවට අමතරව තවත් බී වාර්තවක් මගින් ඉසුරුමත් නිවහනක් ව්‍යාපෘතිය පිළිබඳ කරුණු වාර්තා කර ඇත. දිවි නැඟුම

ප්‍රතිලාභීන්ගේ නිවාස අළුත්වැඩියා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ඉසුරුමත් නිවහනක් ව්‍යාපෘතිය මගින් එම නිවාස වල සිදු කළ යුතු අළුත්වැඩියාවන් සොයා බලා එම අළුත්වැඩියාවන් සිදු කර ගැනීම සඳහා රු. 10,000/- ක මුදලක් ලබා දීමට කටයුතු සම්පාදනය කර ඇත. අළුත්වැඩියාව සඳහා යන වියදම තීරණය කිරීමේදී එම කාර්ය සඳහා ප්‍රතිලාභීන්ගේ ශ්‍රමය යොදවමින් සිදු කළයුතු විය. මෙම ව්‍යාපෘතිය ද දිවි නැඟුම පනතේ 5(ඕ) වගන්තියේ විධි විධාන පරිදි ආරම්භ කළ ව්‍යාපෘතියකි. දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කොට්ඨාස යටතේ යටිතල පහසුකම් වර්ධනය කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකය ගොඩ නැංවීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වී ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යතු බවට දිවි නැඟුම දෙපාර්තමේන්තුවෙන් තීරණය කර ඒ පිළිබඳව චක්‍ර ලේඛනයක්ද නිකුත් කර, දිවි නැඟුම පිළිබඳ අමාත්‍යවරයාද, එම අමාත්‍යාංශයේ ලේකම්වරයා වන පැමිණිලිකරුද, එම ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කර තිබී ඇත. ඒ අනුව දිවි නැඟුම දෙපාර්තමේන්තුව මගින් එම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම සඳහා පැමිණිලිකරුගේ අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය අනුමැතිය එයට ලබා දී තිබුණි.

අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය පිළිබඳව අධික්ෂණයක් කර ඇති අතර ඒ අනුව දිවි නැගුම පනත යටතේ මෙම ව්‍යාපෘතිය සිදු කළ යුතු ව්‍යාපෘතියක් බවට නිරීක්ෂණය වී ඇත. මේ අනුව ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට දිවි නැඟුම අධ්‍යක්ෂ ජනරාල් විසින් පැමිණිලිකාර ලේකම්වරයාගෙන් රුපියල් බිලියන 15 ක මුදලක් ලබා දෙන ලෙසට ඉල්ලා ඇත.

එසේ වුවත් භාණ්ඩාගාරයෙන් එම මුදල ලැබී නැති අතර දිවි නැගුම අරමුදල මගින් ව්‍යාපෘතිය සිදු කර ගෙන යාමට භාණ්ඩාගාරයෙන් උපදෙස් දී ඇත. එක් ප්‍රතිලාභියෙකුට ලබා දෙන රුපියල් 10,000/- ක මුදල රුපියල් 2500/- බැගින් වූ වාරික 4 කින් ගෙවීමට කටයුතු සම්පාදනය කර ඇති අතර ඒ අනුව පළමු වාරික මුදල ගෙවීම සඳහා පමණක් මුදල් අවශ්‍ය වී තිබුණි.

දිවි නැගුම අරමුදල් වලින් පළමු වාරිකය ගෙවීම කළමනාකරණය කිරීම කටයුතු සම්පාදනය නොකරන බැවින් එම මුදල් බැංකු පද්ධතියේ මුදල් වලින් ප්‍රතිලාභීන්ට ගෙවීම සිදු කළ බැවින් රාජ්‍ය මුදල් ඒ සඳහා භාවිතා කිරීමක් සිදු නොවීය.

මෙම මුදල් ගෙවීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ අංක බී 9556/15 දරණ වාර්තාවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කර ඇත්තේ මෙම මුදල් රාජ්‍ය මුදල් වශයෙනි. එම බී වාර්තාව පැ.18 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මේ අනුව මෙම මුදල් රජයේ මුදල් වශයෙන් කරුණු සඳහන් කරමින් මූල්‍ය අපරාධ පරීක්ෂණ විමර්ශන කොට්ඨාසය මගින් මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වරදවා දැක්වීමක් සිදු කර ඇත. මහේස්ත්‍රාත්වරයා විසින් නිවැරදි කරුණු විග්‍රයක් මත නීතිය අදේශ කිරිමක් සිදු කර නොමැති අතර මූල්‍ය අපරාධ කොට්ඨාසය සඳහන් කළ කරුණු අන්ධානුකරණයෙන් පිළිගෙන පැමිණිලිකරු ඇතුළු තිදෙනා පොදු දේපල පිළිබඳ නෛතික විධි විධාන අදාල කරමින් රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

මූලාය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පැ.18 බී වාර්තාවේ 4 වන ඡේදයේ මුළුමනින්ම සාවද්‍ය තොරතුරු ඇතුළත් කර ඇත. එහි 4 වන ඡේදයෙහි සඳහන් “මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිපියක් මගින් 2014.11.03 දින අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇති අතර එම ලිපියට අනුව 2014.11.07 වන දින අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ලිපියක් මගින් සියළුම ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටු සභාපතිවරුන් දැනුවත් කර ඇත. මෙම වැඩසටහනට අනුව පළමු අධියර වශයෙන් රුපියල් 2500/- සහනාධාරය 2014.11.17 සහ 18 දෙදින තුල ගෙවීමට උපදෙස් ලබාදී ඇති නමුත් මීට අදාළ ප්‍රතිපාදන වෙන්කරවා ගැනිම සඳහා මහා භාණ්ඩාගාරය වෙත මුල් වරට අමාත්‍යාංශ ලේකම් වෛද්‍ය වයි.ඩී.නිහාල් ජයතිලක මහතා ලිපියක් ඉදිරිපත් කර ඇත්තේ 2014.11.27 දිනය එම ලිපිය.”

ඔවුන් එහි සඳහන් කර ඇති මුල්වරට පැමිණිකරු විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත්තේ 2014.11.27 දින දිය යන කරුණු සම්පූර්ණම අසත්‍යයක් පැ.07, පැ.08, පැ.09, පැ.10 සහ පැ.11 අනුව 2014.11.18 වන විට පැමිණිලිකරු විසින් 4 වතාවක් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් සහ අයවැය අධියක්ෂ ජනරාල් අමතා ලිපියවා අවසන්ය.

එම පැ.18 බී වාර්තාවේ 05 වන ඡේදයෙහි මෙලෙස සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම) “ගෙවා ඇති සියලු මුදල් දිවි නැගුම ප්‍රජා මුල බැංකු පද්ධතිය සතු මුදල් වන අතර දිවි නැගුම ප්‍රජා මූලාය බැංකුව සතුව ඇත්තේ එම බැංකුවේ තැන්පත්කරුවන්ගේ මුදල් සහ එම මුදල් ආයෝජනය කිරීමෙන් ලබාගන්නා පොලි ආදයම බවයි. සියලුම බැංකු ශාඛා මෙම ව්‍යාපෘතිය සඳහා මුදල්

ලබාදීමට ඔවුන් වෙත එම ආයෝජනයන් වෙනුවෙන් ලැබීමට තිබූ නිත්‍යානුකූල පොලී අදායමද මේ වන විට අහිමි වී ඇත. එමෙන්ම මෙම මුදල් මෙකී කටයුතු සඳහා ලබාගන්නා බවට තැන්පත් කරුවන් හට කිසිදු දැනුම්දීමක් ද සිදුකර නැති බවයි." (උපුටා ගැනීම අවසන්)

එකී කොටසින් ඉතාමත් හොඳින් පැහැදිලි වන්නේ දිවි නැගුම ප්‍රජා මූල බැංකු පද්ධතියෙන් ලබාගෙන ඇති මුදල් රජයේ මුදල් නොව තැන්පත්කරුවන්ගේ මුදල් බවය. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ බී වාර්තාවේ 05 වන ඡේදයෙහි එලෙස සඳහන් කරන අතරම, ඉන්පසුව එම මුදල් රජයේ මුදල් බවට අසත්‍ය වාර්තාවක් ඇතුළත් කර ඇති බවය.

පැ.18 බී වාර්තාවේ 05 වන පිටුවේ 04 වන අංකය යටතේ සඳහන් කර ඇති ගුණරත්හාමි රත්නායක නැමැත්තා තම ප්‍රකාශයෙන් සඳහන් කර ඇත්තේ අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ දැඩි බලපෑම මත මෙවැනි කටයුතු සිදු කරන්නට සිදු වූ බව සඳහන් කර ඇත. කුමන කරුණක් සඳහන් කලද සත්‍ය වශයෙන්ම සිදු වී ඇත්තේ තැන්පත්කරුවන්ගේ මුදල් ඔවුන්ගේ අවශ්‍යතාවය උදෙසා අවශ්‍ය අවස්ථාවේදී කොටස් 04 කින් ලබා දීමට අවශ්‍ය වැඩ පිළිවෙල සකස් කර පළමු වාරිකය ගෙවීමට අවශ්‍ය මුදල් තැන්පත්කරුවන්ගේම මුදල් වලින් ලබා දීම පමණකි. එබැවින් එම ක්‍රියා මගින් කිසිදු අපරාධයක් හෝ සිවිල් වගකීමක් පැන නොනගී.

මෙවැනි පැහැදිලි තත්ත්වයක් නිර්මාණය වී තිබියදීත් නීතිපතිවරයා විසින් HC 8222/16 දරණ අධිචෝදනා පත්‍රය මගින් හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා සහ පැමිණිලිකරු ඇතුළු 04 දෙනෙකු

චූදිතයින් බවට පත් කරමින් කොළඹ මහාධිකරණයේ අධිචෝදනා ගොනු කර ඇත. මෙම අධිචෝදනා පත්‍රය පැ.19 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එම නඩුව දැනට විභාග වෙමින් පවතින අතර පැමිණිල්ලේ 22 වන සාක්ෂිකරු වූ පී.බී.ජයසුන්දර මහතාගේ සාක්ෂිය වල පිටපතක් පැ.20 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පී.බී.ජයසුන්දර මහතාගේ සාක්ෂි වලට අනුව පැ.07, පැ.08, පැ.09, පැ.10 සහ පැ.11 දරණ ලිපි වලින් පසුව රුපියල් 2500/- ක් බැගින් වූ පළමු වාරික මුදල ඉසුරුමත් නිවහනක් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන්ට ලබා දී ඇත. ඉන්පසුව වාරික ගෙවීමට සහ ගෙවන ලද වාරිකය ප්‍රතිපූර්ණය කිරීමට මුදල් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම පැමිණිලිකරු විසින් නිර්දේශ කරමින් ඉදිරිපත් කර ඇත. එසේවුවත් භාණ්ඩාගාරයෙන් එම මුදල් ලබා දීමක් සිදු කර නොමැත. සාක්ෂිකරු වැඩිදුරටත් සඳහන් කර ඇති අන්දමට මෙවැනි ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය අවශ්‍ය නොවේ. අනුමැතිය අවශ්‍ය වන්නේ භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන වලින් වියදම් කරන්නේ නම් පමණි. මෙම ව්‍යාපෘතිය පනතක් යටතේ පිහිටුවා ඇති දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් එහි අරමුදල් වලින් සිදු කර ඇති බැවින්ය. ඊට භාණ්ඩාගාරයේ අනුමැතිය අවශ්‍ය නොවේ. ඊට සමෘද්ධිය හෝ දිවි නැගුම අරමුදල් වල මුදල් තිබේ නම් එම මුදල් වලින් කරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීමට භාණ්ඩාගාරය බැඳි නැත.

පී.බී.ජයසුන්දර මහතා වැඩිදුරටත් සඳහන් කරන අන්දමට දිවි නැගුම බැංකු සංගම් වල තිබෙන මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ක්‍රියා

කිරීමේ අයිතිය ඇත්තේ එම බැංකුවල කළමනාකරණ මණ්ඩල වලට බවත්, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව දිවි නැගුම දෙපාර්තමේන්තුවට එම බැංකු වල මුදල් පනතේ පරමාර්ථයන් සඵල කිරීම සඳහා අවශ්‍ය ආකාරයට කළමනාකරණය කළ හැකි බවත්, බැංකුවේ මූල්‍ය ශක්තිය අනුව එනම් විශාල මුදලක් අදායම් උපදවන මාර්ග වල තිබේනම් එම මුදල් සුදුසු පරිදි ප්‍රතිලාභීන් අතර බෙදා දීම කළමනාකරණ මණ්ඩලය අපේක්ෂා කරන්නේ නම් දිවි නැගුම දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිලාභීන්ට මුදල් ලබා දීම සිදු කළ හැකිය.

මේ අනුව පැහැදිලි ලෙසට දිවි නැගුම ප්‍රජා මූල බැංකු පද්ධතිය තුළ තැන්පත්ව ඇති මුදල් රජයේ මුදල් නොව තැන්පත්කරුවන් වන ප්‍රතිලාභීන්ගේ මුදල් වේ. එම මුදල් දිවි නැගුම පනතේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම උදෙසා පාවිච්චි කිරීම නීත්‍යානුකූල ක්‍රියාවක් වන බැවින් එවැනි ක්‍රියා මගින් කිසිදු වරදක් නිරූපනය නොවේ. එම තත්ත්වය පැහැදිලිව පෙනෙන්නට තිබියදීත් එම නීත්‍යානුකූල තත්ත්වයට කිසිදු සැලකිල්ලක් නොදක්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරු සහ අනිකුත් තිදෙනා අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරිම සාවද්‍ය ක්‍රියාවක් වන අතර ඉන්පසුව ඔවුන්ට එරෙහිව අධිචෝදනා නැඟීම ද්වේශ සහගත නඩු පැවරීමක් (Malicious prosecution) වනු ඇත. එබැවින්, නීතිපති විසින්;

1. බැසිල් රෝහණ රාජපක්ෂ
2. රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක
3. යක්දෙහිගේ දොන් නිහාල් ජයතිලක

4. රත්නායක පල්ලියගුරුගේ බන්දුල තිලකසිරි

යන සිව්දෙනාට එරෙහිව මහාධිකරණයට ඉදිරිපත් කර ඇති අංක HC 8222/16 දරණ අධිචෝදනා පත්‍රය සාවද්‍ය කරුණු පදනම් කරගෙන ගොඩ නඟා ඇති බැවින් එම අධිචෝදනා පත්‍රය අවලංගු කර වහාම ඉල්ලා අස්කර ගත යුතුවේ.

දිවි නැගුම දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වන්නේ එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාය. ඒ අනුව පැමිණිලිකරුට ඒ පිළිබඳව වගකීමක් නොමැති තත්ත්වයක් පැහැදිලිවම නිර්මාණය වී තිබියදීත් පැමිණිලිකරුට එරෙහිව අධිචෝදනා නැඟීමට නීතිපතිවරයා පෙළඹුණේ කුමන හේතුවක් නිසාද? යන ප්‍රශ්නය පැන නඟී. පැමිණිලිකරු ඊට පිළිතුරු ලබා දෙමින් ප්‍රකාශ කළේ මේ අයුරින් කිසිදු සම්බන්ධතාවයක් පෙන්නුම් කිරීමට නොහැකිව තිබියදී පැමිණිලිකරු මෙම නඩුවට ඇතුලත් කළේ පැමිණිලිකරු අර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් නඩුවට එකතු කළ පසු ඒ මත පදනම්ව අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගැනීමට දේශපාලන බලපෑම් මත නිලධාරීන් එක්ව සිදු කළ කුමන්ත්‍රණයක් මත බවය.

මෙහි ඊළඟ වැදගත් කාරණය වන්නේ අත්අඩංගුවට ගන්නා පුද්ගලයින් වරදකරු බවට අධිකරණය විසින් තීරණය කිරීමට ප්‍රථම දූෂණ මර්දන කමිටුවේ මෙහෙයවීම මත අත්අඩංගුවට ගත් පුද්ගලයින් හොරුන්, දූෂකයින් බවට හංවඩු ගසමින් මාධ්‍ය මගින් දිනපතා ප්‍රචාරය කිරීමට අදාළ නිළධාරීන් කණ්ඩායමක් යොදවා තිබීමය. ඒ බව පැ.13 දරණ කැබිනට් පත්‍රිකාවට අමුණා ඇති ඇමුණුමෙහි 13 වන පිටුවේ දැක්වෙන ක්‍රියාමාර්ග යටතේ ඇති (III) සහ (IV) අයිතමය අනුව;

(උපුටා ගැනිම)"3. වැටලීම්, අත්අඩංගුවට ගැනීම්, ප්‍රශ්න කිරීම්, අධිකරණයට ඉදිරිපත් කිරීම් පිළිබඳව අවශ්‍ය පරිදි ජනමාධ්‍ය හරහා ප්‍රසිද්ධියට පත් කිරීම.

"5. ක්ෂණික ප්‍රතිචාර කමිටුව (RRC) මගින් එම ක්‍රියාමාර්ග ගන්නා තෙක් මහජන මුදල් අපහරණය කරන ලද අවස්ථා, ඒ පිළිබඳ චෝදනා (උදාහරණ: යාන වාහන, මන්දිර, දේපොළ) පිළිබඳව ජනමාධ්‍ය මගින් දෛනික ප්‍රසිද්ධියක් ලබාදීමට පියවර ගැනීම." (උපුටා ගැනිම අවසන්)

යනුවෙන් ඇත.

මේ අනුව දූෂණ මර්දන කමිටුව විසින් නිගමනය කරනු ලබන පුද්ගලයන් 15 දෙනෙකුට මෙම ඉරණම අත් වී ඇත. 2015 ජනවාරි මස නව රජය පත්වීමෙන් පසුව මාස 02 කට අඩු කාලසීමාවකදී එනම්, 2015.03.03 වන දින නව දිවි නැගුම අධ්‍යක්ෂ ජනරාල් සුමනපාල මහතා විසින් සිදු කළ පැමිණිල්ලක් මත පරීක්ෂණ ආරම්භ කිරීමෙන් පැහැදිලිව පෙනී යන්නේ පැමිණිලිකරු ඇතුළු 04 දෙනා ඉහත කී කැබිනට් පත්‍රිකාවේ ඇමුණුමේ 02 වන පිටුවෙහි දැක්වෙන "කෙටි කාලීන වැඩ සටහන යටතේ ඇති 4 වන අයිතමයෙන් දැක්වෙන 15 දෙනා අතර සිටි අයෙකු බවයි.

රජයේ ජ්‍යොෂ්ය අධිනිතිඥ තුසිත් මුදලිගේ මහතා ද්විත්ත චරිත නිරූපණයක යෙදී ඇති බවට පැමිණිලිකරු විසින් හඳුන්වා දී ඇත. එවැනි තත්ත්වයක් නිර්මාණය කෙරෙන පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වී ඇත. පැමිණිකරු ඇතුළු සිව්දෙනාට එරෙහි නඩුව මහාධිකරණයේදී මෙහෙයවනු ලබන තුසිත් මුදලිගේ මහතා, දූෂණ විරෝධි කමිටුවේ

අනු කමිටු සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කර ඇති බවට ඉහත කී පැ.13 පත්‍රිකාවේ 15 පිටුවේ "ඇ" වගුවෙහි සඳහන් කර ඇත. තුසිත් මුදලිගේ මහතා යටතේ විශේෂඥ උපදේශකවරු තිදෙනෙකු නම් කර ඇත. මේ අනුව වැටලීම් කිරීම, ප්‍රශ්න කිරීම, අත්අඩංගුවට ගැනීම, අධිකරණයට ඉදිරිපත් කිරීම් වලට අමතරව නඩු මෙහෙයවීමද තුසිත් මුදලිගේ මහතා විසින් සිදු කර ඇත.

මීට අමතරව බැසිල් රාජපක්ෂ මහතා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ අවශ්‍යතාවය මත ක්‍රියා කළ බවට පෙන්නුම් කරන සුවිශේෂී අවස්ථාවන් කිහිපයක් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් වී ඇත. පැමිණිලිකරු ඇතුළු පිරිස කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ 2015.04.23 දින රාත්‍රී 11.00 ට පමණය. ඒ වන විටත් මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතා අධිකරණ නිළ කාමරය තුළ රැඳී සිටිමින් ඇත. කඩුවෙල අධිකරණ භූමියේ බන්ධනාගාර බස් රථයක් නවතා තිබී ඇත. පැමිණිලිකරු ඇතුළු පිරිස ඉදිරිපත් කළ අවස්ථාවේදී ඔවුන් ඇප මත මුදා ගන්නා ලෙසට ඉල්ලා ඇතත් ඇප නියම කිරීමේ නියෝගයක් සිදු කර නොමැත. රක්ෂිත බන්ධනාර ගත කිරීමෙන් පසුව නැවත ඇප ඉල්ලීම් සිදු කර ඇතත් එම ඉල්ලීම් වලට ද නියෝගයක් සිදු නොකර කීහිප අවස්ථාවකම රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ නියෝගය දීර්ඝ කරමින් සිට 2015.05.27 වන දින ඇප ලබාදීම ප්‍රතික්ෂේප කිරීමේ නියෝගය සිදු කර ඇත. ඉන්පසු මහාධිකරණය විසින් 2015.06.15 වන දින ඇප මත මුදාහැරීමට නියෝග සිදු කර ඇත. එම නියෝගය පැ.21 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම ඇප නියෝගයේ 2 වන පිටුවේ 2 වන ඡේදයේ මෙසේ සඳහන් කර ඇත;

(උපුටා ගැනීම)“ අද දින මෙම නඩුවේ වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටින රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ මහතා විසින් ද කරුණු දක්වමින් කියා සිටින්නේ, මෙම නඩුවේ පෙත්සම්කරු අධිකරණය මඟ හැරීම, සාක්ෂිකරුවන් බලපෑම් කිරීම, නැවත නැවත වරදෙහි නියැලීම යනාදියෙහි යෙදිය හැකි බවට මේ දක්වා කරුණු අනාවරණය වී නොමැති බවත්, එහෙයින් එම කරුණු සැළකිල්ලට ගෙන ඇප දීම සම්බන්ධයෙන් විරෝධතායක් නොදක්වන බවටත් ය.”(උපුටා ගැනීම අවසන්)

මෙම කරුණු සුවිශේෂී කරුණු වුවත් මහේස්ත්‍රාත්වරයා විසින් සලකා නොබැලීම මගින් ඔහුගේ නියෝගය දෝෂ සහිත බවට නිගමනය කරමින් මහාධිකරණය විසින් ඇප නියම කර ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු කඩුවෙල මහේස්ත්රාත් ධම්මික හේමපාල මහතා ඉදිරියට මධ්‍යම රාත්‍රියේ 11 ට, 12 ට පමණ ඉදිරිපත් කර තිබේ. ධම්මික හේමපාල මහතා 2015 නව රජයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සහ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වූ රංජන් රාමනායක මහතා සමඟ පැවැත්වූ දුරකථන සංවාදයක හඬපටයක් තුළින් පැහැදිලිව පෙනී යන්නේ අධිකරණ ක්‍රියාවලියද දේශපාලන ඕනා එපාකම් මත සිදුවී ඇති බවය.

මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතා සහ රංජන් රාමනායක මහතා අතර සංවාදය ඇතුළත් හඬපටය පැ.22 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම නඩුව පැවරීමට අදාළ කරගත් සිද්ධිදාමය පුරාම පැමිණිලිකරු සිදු කර ඇත්තේ, මහාධිකරණ නඩුවේ 2 වන විත්තිකරු වන රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක මහතා විසින් පැමිණිලිකරු මගින් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්

සහ අයවැය අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද ලිපි නිර්දේශ කර යැවීම පමණකි. ඒ හැර ඔහු වෙනත් කිසිදු කටයුත්තකට සහභාගී වී නැත. එසේ වුවත් පැමිණිලිකරුගේ නිර්දෝෂීභාවයට ඇති කරුණු කිසිවක් නොසලකා ඔහු අත්අඩංගුවට ගෙන අවසානයේ විෂයභාර අමාත්‍යවරයා වූ බැසිල් රාජපක්ෂ මහතා නඩුවට සම්බන්ධ කරලීමය.

පැ.13 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශය හා කැබිනට් තීරණය පිළිබඳව කැබිනට් සංදේශයේ සඳහන් වූ "ජාතික විධායක සභාව" යන සංවිධානය සහ "දූෂණ විරෝධී කමිටුව" යන නීතිමය පදනමක් නොමැතිව පිහිටුවා ගත් නිල නොවන සංවිධානයක් මගින් රාජ්‍ය පාලනයට සම්බන්ධ කටයුතු සහ විශේෂයෙන්ම විරුද්ධ මත දැරූ දේශපාලඥයින් දේශපාලන කරලියෙන් ඉවත් කිරීම උදෙසා ක්‍රියාත්මක කළ වැඩ සටහන පිළිබඳව සාක්ෂි ලබා ගැනීම සඳහා 2015.01.08 දින පිහිටවූ රජයේ අධිකරණ අමාත්‍යවරයා වූ ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා සාක්ෂි ලබා දී ඇත.

ඔහු සඳහන් කළ අන්දමට 2015 ජනවාරි 08 පැවැත්වූ ජනාධිපතිවරණය පෙර විපක්ෂයේ සිටි පක්ෂ අතර වූ එකඟතාව මත රජයේ ආයතනවල හා දේශපාලඥයින් විසින් සිදු කළ දූෂණ හා අපරාධ සම්බන්ධයෙන් නීතිරීති සම්පාදනය කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට දූෂණ විරෝධි කමිටුවක් පත් කර තිබේ.

එසේ වුවත් මැතිවරණයෙන් පසුව නව ආණ්ඩුව යටතේ අග්‍රාමත්‍යවරයා ඉදිරිපත් කළ කැබිනට් සංදේශයේ කැබිනට් මණ්ඩලයට ඉහලින් සිටින ජාතික විධායක සභාව පිළිබඳව ප්‍රශ්නයක් පැන නැඟී ඇත. කැබිනට් පත්‍රිකාවේ ඇමුණුම අනුව පිහිටුවනු ලැබූ දූෂණ විරෝධී කමිටුව සහ අනු කමිටුවල සාක්ෂිකරුවන් ද ඇතුළත්ව

සිටියත් කැබිනට් මණ්ඩලය තුළ ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව පිළිබඳව සාක්ෂිකරු සමඟ ගැටුමක් නිර්මාණය වී ඇත. එම අවි ගබඩාව සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු ආරක්ෂක නිලධාරීන් 03 ක් හෝ 04 ක් සමඟ ඇවන්ගාඩ් සභාපති ඇතුළු නිලධාරීන් රැසක් අත්අඩංගුවට ගැනීමට අමාත්‍යවරුන් ගණනාවක් විශාල උත්සාහයක් දැරීම කරන කොට ගෙන කැබිනට් මණ්ඩලය තුළදී සාක්ෂිකරු සමඟ ගැටුමක් නිර්මාණය වී තිබේ.

අධිකරණ අමාත්‍යවරයා ලෙසට ඒ පිළිබඳ නියම තත්ත්වය විමසීම මෙන්ම එසේ කරනු ලෙසට බලපෑම් කිරීම ද සිදු වී ඇත. ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව සම්බන්ධ ගිවිසුම නීත්‍යානුකූලව සිදුවී ඇති බවත්, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ හෝ පුපුරන ද්‍රව්‍ය ආඥාපනත යටතේ හෝ ගිණි අවි ආඥා පනත යටතේ හෝ වරදවල් හෙළිදරව් වී නොමැති බවටත් සාක්ෂිකරු දැනුම් දී ඇති අතර ඒ මත ගැටුම් උත්සන්නකාරී වී ඇත.

ඒ හේතුවෙන් සාක්ෂිකරු මෙම දූෂණ විරෝධී කමිටු රැස්වීම් හෝ අනු කමිටු රැස්වීම් වලට හෝ සහභාගී වී නැත. කෙසේ වෙතත් කැබිනට් පත්‍රිකාවේ දැක්වෙන අන්දමට මෙම ජාතික විධායක සභාව නැමැති නිල නොවන සංවිධානය කැබිනට් මණ්ඩලයටත් ඉහළින් ක්‍රියාත්මකවන ආයතනයක් ලෙසට සාක්ෂිකරුට පෙනී ගොස් ඇත.

අමාත්‍ය රාජිත සේනාරත්න, පාඨලී චම්පික රණවක, අමාත්‍ය අර්ජුන රණතුංග, අමාත්‍ය සරත් අමුණුගම, අමාත්‍ය සරත් ෆොන්සේකා එකතුව අපරාධය යුක්ති විනිශ්චය කොමිෂන් සභාව හා සමාන සභාවක් පිහිටුවීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. මෙවැනි සභාවක් පිහිටුවීමෙන් වර්තමාන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නොමැති

බවට පෙන්වා දුන් බවත්, අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය පාඨලී චම්පික රණවක, අමාත්‍ය මංගල සමරවීර, අමාත්‍ය රවි කරුණානායක, අමාත්‍ය අර්ජුන රණතුංග යන පිරිස ජනාධිපතිවරයාට සහ අග්‍රාමාත්‍යවරයාට දැඩි දෝෂ දර්ශන එල්ල කරමින් බොහෝ අවස්ථා වලදී තර්ජනාත්මකව කථා කිරීමත් සිදු කර ඇත. මෙවැනි සභා පිහිටුවීම කළ නොහැකි බවට එවකට නීතිපති ද දැනුම් දී ඇත.

දැනටමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන නොසලකා ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඇති කර ඒ සඳහා දේශපාලන මැදිහත්වීම් සිදු කර මිනිසුන් තෝරා නඩු විසඳීමේ ක්‍රමය ඇති කිරීමට සාක්ෂිකරු විරුද්ධවී ඇති අතර ඉන් අධිකරණයේ ස්වාධීනත්වය නැතිවී අධිකරණ ක්‍රමය ගැන මහජනතා විශ්වාසය බිඳ වැටෙන බවටද සාක්ෂිකරු පෙන්වා දි ඇතත් ඒ පිළිබඳව සැලකිල්ලක් නොදක්වා 2015 ආණ්ඩුව ක්‍රියා කර ඇත. මෙම කරුණු පදනම් කරගෙන එවකට අග්‍රාමාත්‍යවරයා සහ සාක්ෂිකරු දැඩි ලෙස දෝෂාරෝපණයට ලක්ව ඇත.

මෙම දූෂණ විරෝධී කමිටු කණ්ඩායම සතියකට වරක් අරලියගහ මන්දිරයේ රැස්ව ඇති අතර නීතිඥ ජේ.සී.වැලිඅමුණ මෙහි වගකීම භාරගෙන කටයුතු කර තිබේ. නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ , අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය පාඨලී චම්පික රණවක, අමාත්‍ය රවි කරුණානායක මෙම රැස්වීම් වලට නිරන්තරයෙන්ම සහභාගී වී ඇත. මෙවැනි රැස්වීම් වලට සතිපතා නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ සහභාගී වීම ඉතාම නරක පූර්වාදර්ශක් ලබා දෙන බවත්, එය නීතිපති දෙපාර්තමේන්තුවේ හොඳ නමට කැළලක් බවත්, එමගින් තමන්ටද

කැළලක් ඇතිවන බවත්, සාක්ෂිකරු කීහිප අවස්ථාවකදීම අග්‍රාමාත්‍යවරයාට පෙන්වා දී ඇත.

එසේම, සාක්ෂි වලින් තහවුරු වන අන්දමට නීතිපති දෙපාර්තමේන්තුවේ එවකට හිටපු සොලිසිටර් ජනරාල් සුහද ගම්ලත් මහතා, ජනාධිපතිතුමා සහ හමුදා ප්‍රධානීන් මෙන්ම අමාත්‍යවරු ගණනාවක් සහභාගී වූ රැස්වීමක දී පොලිස්පතිවරයාගෙන් හා සොලිසිටර් ජනරාල්වරයාගෙන් නම් වශයෙන් ප්‍රශ්න කර, එම පුද්ගලයිනගේ නඩුවල තත්ත්වය පිලිබඳව විමසීමක් සිදු කර ඇත. තවද නඩු ගොනු කරන දින පිළිබඳව මෙන්ම ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ යෝෂිත රාජපක්ෂ මහතාගේ ගණුදෙනු පිළිබඳව ද ප්‍රශ්න කිරීම් සිදු කළ බවය. ඒ අවස්ථාවේ දී සොලිසිටර් ජනරාල් සුහද ගම්ලත් මහතා පැහැදිලිව ප්‍රකාශ කර ඇත්තේ, නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් තමන් පිටතදී කථා නොකරන බවත්, කාර්යාලීය කටයුතු කාර්යාලය තුළදී පමණක් සාකච්ඡා කරන බවත් ප්‍රකාශ කර ඇති අතර තවදුරටත් ඔහු සඳහන් කර ඇත්තේ තමා මෙතැන්ට පැමිණියේ සාකච්ඡාවට සම්බන්ධ වීමට පමණක් වන අතර දෙපාර්තමේන්තුවේ නඩු සම්බන්ධයෙන් කාටවත් උත්තර බැඳීමට තමා සුදානම් නොමැති බවය.

අරලියගහ මන්දිරයේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති තවත් රැස්වීමකට නීතිපතිතුමා විසින් නම් කර තිබූ සොලිසිටර් ජනරාල් සහ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් වසන්ත නවරත්න බණ්ඩාර සහභාගි වී ඇත.

එසේම, දූෂණ විරෝධි කමිටුවේ රැස්වීම් වාර වලට ජේ.සී.වැලිඅමුණ මහතා පැමිණ ඇත්තේ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා

සමඟය. මෙය නිරීක්ෂණය කිරීමෙන් පසුව එම තත්ත්වය නරක පූර්වාදර්ශ ඇති කරන බවත්, එය වහාම නැවත්විය යුතු බවටත් සාක්ෂිකරු විසින් නීතිවරයාට දැනුම් දී ඇතත් එවැනි නැවතීමක් සිදුවී නැත.

දූෂණ විරෝධී කමිටුවේ මෙම ක්‍රියා කලාප ස්වාධීන පරීක්ෂණයකට සහ ස්වාධීන ව්‍යවස්ථාවට බාධාවක් බවත්, මුළු මනින්ම දේශපාලනිකරණය වූවක් බවත්, ඒ පෙළඹවීමෙන් ආණ්ඩුව පිහිටුවා සති 03 ක් යාමටත් ප්‍රථම තමන් සමඟ කැබිනට් මණ්ඩලයේ අනිකුත් සාමාජිකයින් බෙදී ක්‍රියා කළ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සාක්ෂි වලට අනුව, අග්‍රාමත්‍ය කාර්යාලයේ දී අග්‍රාමත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමකට සහභාගී වන ලෙසට සාක්ෂිකරුට දැනුම් දීම අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයට ගොස් ඇති අතර එම රැස්වීමට දූෂණ විරෝධී කමිටුවේ නිලධාරීන් ද පැමිණ ඇත. එහිදි සාකච්ඡා කර තීරණය කර ඇතත් ඇවන්ගාඩ් සිද්ධියට නියත වශයෙන්ම ගෝඨාභය රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගැනීමට මෙය ස්වර්ණමය අවස්ථාවක් බවත්, අවස්ථාව මඟහැරිය හොත් නැවත මෙවැනි අවස්ථාවක් නොලැබෙන බවට එතැනදී ප්‍රකාශ වී ඇත.

එහෙත් 2016 ජනවාරි 29 වන දින සාක්ෂිකරු ජනාධිපතිතුමා සමඟ උත්සවයකට සහභාගී වෙමින් සිටි අවස්ථාවේදී ලැබුණු දැනුම්දීමක් මත අග්‍රාමත්‍යවරයාගේ නිවසේ පිහිටි කාර්යාලයට ගොස් ඇති අතර , එහි පවත්වන ලද රැස්වීමකට අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය පාඨලී චම්පික රණවක සහ සරත් විජේසූරිය, සමන් රත්නප්‍රිය, ජේ.සී.වැලිඅමුණ යන පිරිසද පොලිස්පති ඇතුළු පොලිස් නිලධාරීන්ද

සහභාගී වී ඇත. පෙබරවාරි 4 වන දිනට පෙර යෝෂිත රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගන්නා ලෙසට එම රැස්වීමේ දී නියෝගයක ස්වරූපයෙන් පොලිස් නිලධාරීන්ට පවසා ඇත. ඒ අනුව ඊට දින දෙකකට පමණ පසුව යෝෂිත රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගෙන තිබේ.

මූල්‍ය අපරාධ කොට්ඨාසය නමින් පිහිටුවන ලද පොලිස් ඒකකයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවන ලද ලිපි ගොනු 92 ක් හෝ 93 ක් සම්බන්ධයෙන් නීතිපති මගින් නඩු ඉදිරිපත් කරවීමට ක්‍රියා කරන ලෙසට සාක්ෂිකරුගෙන් සිදු කළ ඉල්ලීමකට යහපත් ප්‍රතිචාර නොලැබුණු බැවින්ද සාක්ෂිකරු දෝෂ දර්ශනයට ලක්ව තිබේ. විනිශ්චයකරුවන්ගේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ වැටුප් වැඩිකරවීම සඳහා සාක්ෂිකරු විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ අවස්ථාවේදී එයට අනිකුත් අමාත්‍යවරු සහයෝගය ලබා දී නොමැති අතර, නීතිපතිවරයා ගෙන්වා පාඩමක් උගන්වා වැටුප් වැඩිවීම ලබා දිය යුතු බවට එවකට මුදල් ඇමතිවරයා ප්‍රකාශ කර ඇත.

දූෂණ මර්දන කමිටුව නීත්‍යානුකූල ආයතනයක් නොවන අතර එය සම්පූර්ණයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුවට ගත යුතු බවට තීරණය දේශපාලනඥයින්ට ගැනීමට අවස්ථාව සලසන ලදී.

එම කාල සීමාව තුළ දී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාද, එම අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක මහතා ඇතුළු කණ්ඩායම රක්ෂිත බන්ධනාගාරගත කිරීම පිළිබඳ තීරණ ගනු ලැබුවේ ආණ්ඩුවේ සිටි රාජපක්ෂ විරෝධී

කණ්ඩායම වරින් වර මුණ ගැසී ගනු ලබන තීරණ මත පොලිස් නිලධාරීන්ටද ඒ අනුව ක්‍රියා කරන ලෙසට නියෝග දීමෙනි.

මෙම සියළු ක්‍රියාදාමයන්ට මූලික වී ඇත්තේ මහින්ද රාජපක්ෂ රජයේ සිටි රාජිත සේනාරත්න, පාඨලී චම්පික රණවක, මංගල සමරවීර පිරිස එම ආණ්ඩුව සමඟ වෛර බැඳගෙන ඉන් ඉවත් වී 2015 ජනවාරි 08 වන දින පිහිටවූ නව රජයට සම්බන්ධවෙමින් අමාත්‍ය පදවි ලබාගෙන ද්වේශසහගත පළිගැනීමේ චේතනාවෙන් ක්‍රියා කිරීමය. යෝෂිත රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කරද්දි එසේ නොකරන ලෙසට සාක්ෂිකරු එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ප්‍රමුඛ කමිටුවෙන් ඉල්ලීමක් කරමින් එසේ සිදු කිරිමට ප්‍රථම නීතිපතිගේ උපදෙස් ලබා ගන්නා ලෙසට පවසා ඇත. එම අවස්ථාවේදී නීතිපති උපදෙස් ලබා ගත් බවට පවසා ඇතත් සාක්ෂිකරු නීතිපතිගෙන් ඒ පිළිබඳව සිදු කළ විමසීමේදී උපදෙස් ලබා නොගත් බවට නීතිපති පවසා ඇත.

මේ අනුව පැහැදිලි ලෙසම මෙම ක්‍රියා දාමයන්හි අරමුණ වී ඇත්තේ යම් යම් බලපෑම් අමාත්‍යවරුන්ට සහ පුද්ගලයින්ට සහ ඔවුන්ගේ විශේෂත්ව වලට මඩගසා ඔවුන් ජනතාව අතර අප්‍රසාදයට පත් කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කිරීමය.

මෙම දූෂණ විරෝධී කමිටුවේ නීති ප්‍රශ්න හා නඩු ගැන කථා කිරීමට නීතිඥ ජේ.සී.වැලිඅමුණ සමඟ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ පැමිණ ඇත.

මෙම ක්‍රියාදාමයේ අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ කැබිනට් පත්‍රිකාවේ බලතල අභිබවා ගොස් හිතුමනාපයට, උවමනා විදියට (අවශ්‍යතාව

පරිදි) එක් එක් පුද්ගලයින්ට විරුද්ධව ක්‍රියාකර ඔවුන් අත්අඩංගුවට ගැනීමය.

මෙම ක්‍රියාදාමයට මුල පිරිම සඳහා බලය ලබා දීමට අග්‍රාමත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා, රාජිත සේනාරත්න සහ පාඨලී චම්පික රණවක තම අමාත්‍ය බලය පාවිච්චි කරමින් ඉදිරිපත් කළ පැ.13 දරණ කැබිනට් පත්‍රිකාවේ අඩංගු සැලසුම් හා ක්‍රියාමාර්ග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ නොවන අතර ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවට සාක්ෂිකරු සඳහන් කර ඇත. ඒ අනුව පැ.13 කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කළත් එහි අඩංගු කරුනු නීත්‍යානුකූල නොවන බැවින් ඒවා ක්‍රියාත්මක කළ නොහැකිය.

මහ බැංකුවේ අධිපති පත් කිරීම පිළිබඳව සහ ඇවන්ගාඩ් නැව පිළිබඳවත් සාක්ෂිකරුගේ මතයට එකඟ නොවන පිරිස මසක් ඇතුළත සාක්ෂිකරු එම ක්‍රියාවලියෙන් ඉවත් කර ඇති අතර සාක්ෂි ඇතිව හෝ නැතිව විරුද්ධමතවාදී දේශපාලඥයින් අත්අඩංගුවට ගත යුතුය යන මතයේ එම පිරිස සිට ඇත.

අග්‍රාමත්‍ය කාර්යලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී ඩබ්ලිව්.සරත් කුමාර මහතා 2015 වර්ෂයේ සිට අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි ලෙසට සේවය කරමින් සිට ඇත. ඔහු සඳහන් කළ අන්දමට දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය 2015 වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට 2017 ජුනි මාසය දක්වා ක්‍රියාත්මකව තිබී ඇත. එම කාලසීමාව තුලදී දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ වැය බර අග්‍රාමත්‍ය කාර්යාලය විසින් දරා ඇත. ඒ අනුව එම දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ සේවය කළ පුද්ගලයින්ට වැටුප්, වේතන, දුරකතන බිල්, විදුලිය, වාහන සහ ඉන්ධන අදි වියදම් සඳහා අග්‍රාමත්‍ය

කාර්යාලයේ වැය ශීර්ෂයෙන් වියදම් දරා ඇත. ඒ අනුව 2015 වර්ෂයේ සිට 2017 ජුනි මාසය දක්වා රුපියල් මිලියන 33.7 වියදමක් දරා තිබෙන බවත්, එම මුදල අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් දරා තිබෙන බවත් ප්‍රධාන මූල්‍ය නිලධාරි සඳහන් කළේය.

රුපියල් 33.7 වියදම සනාථ කරන ලේඛන ඇතුළත් පිටු 31 කින් සමන්විත ගොනුවක් සාක්ෂිකාර සනත් කුමාරගේ සහතිකය යටතේ පැ.27 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදි. පැ.27 ලේඛනයෙහි 2015, 2016 සහ 2017 වර්ෂයට වියදම් දරන ලද ලේඛන වෙන වෙනම සකස් කර ඉදිරිපත් කර ඇත.

මේ අනුව අදාල වර්ෂ 03 සඳහා දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ වියදම් සිදු කිරීම;

1. වැටුප් වේතන සහ දීමනා
2. දුරකතන
3. විදුලිය හා ජලය
4. අතිකාල සහ නිවාඩු දින වැටුප්
5. වාහන නඩත්තු
6. ඉන්ධන
7. ලිපි ද්‍රව්‍ය සහ වෙනත් වියදම් යන ශීර්ෂයන් යටතේ වියදම දරා ඇත.

ඒ අනුව:

1. 2015 වර්ෂය සදහා දරන ලද සම්පූර්ණ වියදම රු.13,432,283.01 මුදලක් ද

2. 2016 වර්ෂය සදහා දරන ලද සම්පූර්ණ වියදම රු.14,066,507.62 මුදලක් ද

3. 2017 වර්ෂය සදහා දරන ලද සම්පූර්ණ වියදම වශයෙන් රු.6,216,016.96 මුදලක් ද වශයෙන් සම්පූර්ණ වියදම මිලියන 33,714,807.59 ක මුදලක් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් දරා ඇත.

මේ අනුව මුළු මනින්ම රාජ්‍ය නොවන සංවිධානයක වියදම අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් රාජ්‍යයේ මුදල් වලින් අනිත්‍යානුකුල ලෙස එකී වියදම පියවීම රජයේ මුදල් මිලියන 33,714,807.59 මුදලක අවභාවිතා කරමින් පොදු දේපල අවභාවිතා කිරිමේ වරද සිදු කර ඇත. මේ අනුව අග්‍රාමත්‍ය කාර්යාලයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් සමන් ඒකකනායක මහතා මෙම මුදල් අවභාවිතා කිරීම සදහා වගකිවයුතු පුද්ගලයාවේ.

මෙම දූෂණ මර්දන කමිටු කාර්යාලයේ සේවකයන් 44 දෙනෙකු සේවය කර ඇති අතර ඔවුන්ට ගෙවන ලද වැටුප් හා දීමනා වල මුළු එකතුව රුපියල් මිලියන 22,714,079.27 වේ. මෙම දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ සේවකයන් 44 දෙනා වෙනුවෙන් 2015, 2016 සහ 2017 වර්ෂ සදහා ගෙවන ලද වැටුප් සහ දීමනා අඩංගු ලේඛන වල සම්පූර්ණ විස්තරයක් පිළිවෙලින් පැ. 31 අ, ආ, ඇ, පැ.32 සහ පැ.33 1,2,3,4,5 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වශයෙන වැඩ කළ ආනන්ද විජේපාල මහතා රාජ්‍ය සේවකයෙකු වශයෙන් වැඩ

කරන අතරතුරම ද්විතික පදනම යටතේ 50% දීමනාවක් ලබමින් මෙම නිල නොවන සංවිධානයෙන් ද වැටුප් ලබා ගෙන ඇත. ඒ අනුව ඔහුට මසටක රුපියල් 16,150.00 දීමනාවක් ද, ඉන්ධන ලීටර් අනුව ගෙවන දීමනාවක් ද, දුරකතන දීමනාව වශයෙන් රුපියල් 5000 ක් ද වශයෙන් මසටක රුපියල් 47,015.00 ක මුදලක් ලබා ගෙන ඇත. මේ අන්දමින් සියළුම සේවයකන් සම්බන්ධව කළ ගෙවීම් පිළිබඳ ලේඛන පැ.30 (i, ii, iii, iv, v, vi, vii, viii, ix, x, xi, xii, xiii, xiv, xv ) සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2015 ජනාධිපතිවරණයෙන් පසු පිහිටවනු ලැබූ රජයේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ සාක්ෂියට අනුව පැ. 13 දරන කැබිනට් සංදේශයේ සඳහන් ජාතික විධායක සභාව පවත්නා නීතියක් යටතේ ස්ථාපිත කරන ලද ආයතනයක් නොව එය 2015 ජනාධිපතිවරණය මුල්කරගෙන ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාට ආධාර දීම සඳහා විවිධ පක්ෂ, සිවිල් සංවිධාන සහ වෘත්තීය සමිති ගනනාවක් එකතුවෙන් සාදාගත් කොමිටියකි. මෙම ජාතික විධායක සභාව නැමැති සංවිධානය යථාපරිදි පනතකින් සංස්ථාගත කළ හෝ නැතහොත් සමාගම් නීතිය යටතේ ලියා පදිංචිකල සංවිධානයක් නොවේ. ජාතික විධායක සභාවේ රැස්වීම් ජනාධිපතිවරනයට පසුවද පවත්වා තීන්දු තීරණ ගැනීම සිදු කර ඇත.

හිටපු අග්‍රාමාත්‍යවරයාට අනුව පැ. 13 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළ කැබිනට් සංදේශයට යා කර ඇති ඇමුනුම් සහ ආකෘති සකස් කර ඉදිරිපත් කර ඇත්තේ ජාතික විධායක සභාව විසිනි. අදාල ඇමුණුම් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට භාර දී ඇත්තේ ජනාධිපති නීතිඥ වැලිඅමුණ මහතා විසිනි. හිටපු අග්‍රාමාත්‍යවරයා විසින් සිදු කර ඇත්තේ

එය කැබිනට් මණ්ඩලයට අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමය. ඒ අනුව කැබිනට් සන්දේශයේ සඳහන් දූෂණ විරෝධී කමිටුව පත් කිරීම "ජාතික විධායක සභාවේ අනුමැතිය හා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත ස්ථාපිත කරනු ලබන දූෂණ විරෝධී කමිටුව" යනුවෙන් සඳහන් කර ඇත. මුල් කාලයේදී දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් සඳහා අරලියගහ මන්දිරයේ කාමරයක් ලබාදී ඇති අතර ඉන්පසුව ඒ සඳහා මුදල් ලබාගෙන අරලියගහ මන්දිරය ආසන්නයේ වෙනම ස්ථානයක දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය පිහිටුවා තිබී ඇත. අනුර කුමාර දිසානායක මහතා ඇතුළු කණ්ඩායම මුල් කාලයේදී අරලිගහ මන්දිරයේ රැස්වීම් පවත්වා ඇත.

කැබිනට් සංදේශයෙහි සඳහන් ක්‍රියාමාර්ග යටතේ 3 සහ 5 අයිතමයන් හි සඳහන් මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබාදීම පිළිබඳ කරුණු මගින් ඒවා ව්‍යවස්ථාවට අනුකූලව සිදු නොකළහොත් එමගින් පුද්ගල අයිතිවාසිකම් කඩ වන බවට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් පිළිගෙන ඇත.

රනිල් වික්‍රමසිංහ මහතාගෙන් අසනලද ප්‍රශ්න කිහිපයකට ලබා දුන් පිළිතුරු 2020.09.04 දින සාක්ෂි සටහන් වල 44 වන පිටුවෙහි සඳහන්ව ඇති අතර එකී ප්‍රශ්න සහ පිළිතුරු කීපයක් මෙහි පහත උපුටා දක්වා ඇත;

(උපුටා ගැනිම)

"ප්‍ර: දැන් සක්ෂි දුන්නා එවෙලෙ හිටිය එක සාමාජිකයෙක්. එතුමා සඳහන් කළේ ඔබතුමා ඒකෙදි යම් යම්කිසි පීඩනයක්කට හසු වෙලා හිටියේ කියලා කීහිපදෙනෙකුගේ.

උ: විවිධ මත තිබුනා. අන්තිමට කිව්වා මම හොරු ඇල්ලුවේ නැහැ කියලා. මොනවා කරන්නද?

ප්‍ර: එතුමා කියපු කීපදෙනා දැන් ඔබතුමා අතහැරලා ගිහිල්ලා?

උ: සඳහන් කරපු එක්කෙනෙක් ගිහින්. අනෙක් අයත් ගිහින්. දැන් තනිවෙලා ඉන්නේ.

ප්‍ර: ඒ කීපදෙනාට අවශ්‍ය කම තිබුනේ රාජපක්ෂවරුන්ගෙන් පළිගන්න කියලා.

උ: සමහරු එක එක ඒව ගෙනාවා. කොහොමත් මම 2016 දී හිතුවා මේක විසුරුවා හරින්න කියල. 2018 දී විසුරුවා හැරියා. කැබිනට් පත්‍රිකාවක් තියෙනවා. කොමිටි ක්‍රියාත්මක වුනෙත් නැහැ. එනිසා 2016 අපි යෝජනා කළා මේක විසුරුවා හරින්න.

ප්‍ර: ඒ විසුරුවා හැරීම සිද්ධ වන විට මේ ජාතික සභාවේ තිබිච්ච ඒ මහා පරිමාණ දූෂණ හා වංචා කියන සෑම නඩුවකම රාජපක්ෂ කියන නම් තිබුන කෙනෙක් හිටියා නේද?

උ: හැම නඩුවේ ම හිටියේ නැහැ.”(උපුටා ගැනීම අවසන්)

රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළ අන්දමටට ක්ෂනික ප්‍රතිචාර කමිටුවට නිලධාරීන් තෝරා ගැනීම ප්‍රධාන වශයෙන් සිදු කර ඇත්තේ ජනාධිපති නීතිඥ ජේ.සී.වැලිඅමුණ මහතා විසිනි. රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා ජේ.සී.වැලිඅමුණ මහතා විසින් තෝරාගනු ලැබුවේ කුමන පදනමක් මතද යන්න ප්‍රකාශ කිරීමට

රනිල් වික්‍රමසිංහ මහතාට නොහැකි විය. රජයේ නිලධාරීන් වැඩියෙන් යොදවා නොගන්නා ලෙසට රනිල් වික්‍රමසිංහ මහතා උපදෙස් දී ඇත. වැලිඅමුණ මහතා එම අවස්ථාවල දී ප්‍රකාශ කර ඇත්තේ කරුණු සොයා ගැනීම සඳහා රජයේ නිලධාරීන් අවශ්‍ය බවට පොලිසියෙන් සඳහන් කර ඇති බවය.

දූෂණ මර්දන කමිටුවේ සේවය කළ පුද්ගලයින්ට වැටුප් හෝ දීමනා ගෙවීමක් රජයේ මුදලින් වලින් සිදු කර ඇද්ද යන්න පිළිබඳව නගන ලද ප්‍රශ්නයන්ට රනිල් වික්‍රමසිංහ මහතාගේ පිළිතුර වූයේ අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් එවැනි ගෙවීම් සිදුකර නොමැති බවය. එසේ වුවත් අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි සාක්ෂි දෙමින් දූෂණ මර්දන කොමිටියේ සේවය කළ පුද්ගලයින්ට සහ එම ස්ථානයට ද්විතීයක පදනමක් මත ගියා යැයි කියනු ලැබූ රාජ්‍ය නිලධාරීන්ට ද රජයේ මූදල් වලින් වැටුප් සහ දීමනා ගෙවීම් සිදුකර ඇති බවට සඳහන් කළේය. එම ගෙවීම් සනාථ කරන වැටුප් ලේඛන මූල්‍ය නිලධාරි විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

මෙම පැමිණිල්ලට වගඋත්තරකරුවකු වශයෙන් නම් කර සිටි හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතා සාක්ෂි දෙමින් සඳහන් කළේ ඔහුගේ නම දූෂණ මර්දන කමිටුවට ඇතුළත් කරන තිබීම ඔහු නොදැන සිටි බවය. දූෂණ මර්දන කමිටුව පිහිටුවීම පිළිබඳ කැබිනට් පත්‍රිකාව සාකච්ඡා කළ කැබිනට් රැස්වීමට ඔහු සහභාගි වූයේ ද යන්න පිළිබඳව මතකයක් ඔහුට නොතිබුණ අතර එම රැස්වීම් පිළිබඳ දැන්වීමක් ලැබුන බවක් ද ඔහුගේ මතකයේ නොවීය. ජාතික විධායක සභාව රැස්වීම් වලට තමන් සහභාගි වී නොමැති බවටත්, ජාතික විධායක සභාව මගින් යම් යම් ක්‍රියා සිදුව ඇත්නම් ඒ ගැන තමන් පුදුමයට

පත්වන බවත් එසේම එවැනි ආයතනයක් දේශපාලන සංවිධානයක් මිස කැබිනට් මණ්ඩලයෙන් පිහිටුවා ඇති ආයතනයක් නොවන බවටද ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත.

හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතාගේ සාක්ෂිය නිවැරදි සාක්ෂියක් නොවන බව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති ලිඛිත සාක්ෂි අනුව සනාථ වී ඇත. හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ සාක්ෂියට අනුව සෑම කැබිනට් සන්දේශයක්ම කැබිනට් අමාත්‍යවරුන් අතර බෙදා හැරීමත්, එම කැබිනට් සංදේශය පරිදි කැබිනට් මණ්ඩලය එළඹෙන තීරණය ඊට අදාළ කැබිනට් අමාත්‍යවරුන්, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙත දැනුම් දීමත් සිදු කෙරේ. ඒ අනුව දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමට අදාළ කැබිනට් සංදේශය සහ කැබිනට් තීරණය අනිකුත් අමාත්‍යවරුන්ට මෙන්ම මංගල සමරවීර අමාත්‍ය අමාත්‍යවරයා ද ලැබිය යුතුවේ.

දූෂණ විරෝධී කමිටුවේ රැස්වීමක් 2015.02.05 වන දින අරලියගහ මන්දිරයේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන්ත්යෙන් පවත්වා ඇති අතර එකී රැස්වීමට විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා සහභාගී වී ඇති බව පැ. 42 දරන එකී කමිටු රැස්වීමේ වාර්තාවෙන් සනාථ වී ඇත.

එසේම අරලියගහ මන්දිරයේ 2015.02.23 වන දින පවත්වා ඇති දූෂණ විරෝධී කමිටුවේ රැස්වීමට ද මංගල සමරවීර මහතා සහභාගී වී ඇති බව පැ. 40 දරණ පැමිණීමේ සටහන් පත්‍රයෙන් සනාථ වී ඇත.

හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඔහුගේ සාක්ෂිය දී සඳහන් කළේ කැබිනට් සංදේශය පිළිබඳව මෙන්ම කැබිනට් තීරණය ද ඊට

අදාළ සියලුම පාර්ශවයන්ට දැනුම්දීම අමාත්‍යාංශය මගින් සිදු කළ බවයි. කැබිනට් සංදේශ ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය අනුව අදාළ කැබිනට් සංදේශය කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කිරීමට ප්‍රථම සියලුම කැබිනට් අමාත්‍යවරුන්ට ලබාදෙන බවත් එම කැබිනට් සංදේශයට අනුමත කිරීමෙන් පසුව ඉන් බැඳෙන සියලුම පාර්ශවයන්ට කැබිනට් තීරණය පිළිබඳව දැනුම් දෙන බවත් එය අදාළ අමාත්‍යාංශයට පැවරෙන වගකීමක් බවත් හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඔහුගේ සාක්ෂියේ දී සඳහන් කර ඇත.

මෙම සාක්ෂි අනුව තමන්ට 2015-01-21 දින දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමේ කැබිනට් සංදේශය සහ කැබිනට් තීරණය නොලැබුණු බවට මංගල සමරවීර මහතා සිදුකරන ප්‍රකාශ කිසිසේත් පිළිගත නොහැකි ය.

අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලද රැස්වීම් වලට තමන් සහභාගී වී ඇති බවත් එම අවස්ථාවන්හිදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂ රවි වෛද්‍යාලංකාර මහතා පැමිණ ඉල්ලීම් කර ඇති බවත් සමහර අවස්ථාවලදී ඔවුන්ට අවශ්‍ය දේවල් මොනවාද යන්න පවසා ඇති බවත් සඳහන් කර ඇත.

දූෂණ විරෝධී කමිටුවට ලැබෙන පැමිණිලි උපදේශකවරුන් වෙත යොමුකර ඔවුන් ලබා දෙන වාර්තාව සමඟ ලිපි ගොනුව රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතාට යොමු කිරීමත්, රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා විසින් තීරණය කරනු ලබන පැමිණිලි පරීක්ෂණය සඳහා ඊට සුදුසු පොලිස් කොට්ඨාශය වෙත යොමු කිරීමත් 13 වන වගඋත්තරකාර ආනන්ද විජේපාල විසින් සිදු කර ඇත. අග්‍රාමාත්‍ය කාර්යාලයේ පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවේ ප්‍රගති

සමාලෝචන රැස්වීම් වලට සහභාගි වූ බව 13 වන වගඋත්තරකාර ආනන්ද විජයපාල සාක්ෂි විභාගයේදී පිළිගෙන ඇත. අරලියගහ මන්දිරයේ දී පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවෙ රැස්වීම් වලට ආනන්ද විජයපාල සහභාගි වී ඇති බව එම රැස්වීම් වාර්තා අනුව ඔප්පු වී ඇත. එම රැස්වීම්වලට සහභාගී වූවන්ගේ නාම ලේඛන කිහිපයක් පැ. 41 පැ. 37 පැ. 39 පැ. 40 පැ. 38 පැ.43 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.44 ලෙස ඉදිරිපත් කරන ලිපියේ 02 වන ඡේදය අනුව මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට එම පැමිණිල්ල සහිත ලිපි ගොනුව ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී පැමිණිලිකරු විසින් සිදු කරන ලද වැරදි මුදල් විශුද්ධිකරණ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි බවට ආනන්ද විජයපාල විසින් සඳහන් කර ඇත. මෙම ලිපියේ 02 වන ඡේදය 13 වන වගඋත්තරකරුගේ නිරීක්ෂණ හා පරීක්ෂණ මත පදනම් කර ඇත. පැ.14 ලේඛනය අවසානයේ සඳහන් කර ඇති වගකීම් කොටසෙහි 13 වන වගඋත්තරකරු ආනන්ද විජේපාල, ජේ.සී.වැලිඅමුණ සහ අනුර කුමාර දිසානායක මහතාට නිළධාරීන් තෝරා ගැනීමේ වගකීම පවරා ඇත.

මෙම නඩුවට අදාළ ලිපිගොනුව ආනන්ද විජේපාල විසින් ආවරණ ලිපියක් ද සමගින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට යවා ඇත. මූල්‍ය අපරාධ කොට්ඨාශයේ තිබී ඉදිරිපත් කරන ලද ලිපි ගොනුවක ආනන්ද විජේපාල විසින් යවන ලද උක්ත සඳහන් ආවරණ ලිපිය සහිත ලිපි ගොනුවද ගොනු කර ඇත. ආනන්ද විජයපාල විසින් යවන ලද එකී ආවරණ ලිපිය සමග වූ ලිපි ගොනුව පැ. 44(1) සිට පැ. 44(8) දක්වා සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලිපි ගොනු වේ පැ. 44 (1)

සිට පැ. 44 (8) දක්වා ලිපි අතර අංක සඳහන් නොවූ ලිපි ගණනාවක් ද විය. මෙම ලිපි සියල්ලම එකම ගොනුවක් සේ එකට බැඳ ආවරණ ලිපිය ද සමඟ යවා ඇති බැවින් එම ලිපි සියල්ලම එකී ආවරණ ලිපිය සමග යවන ලද ලිපි බව ඉතාමත් පැහැදිලිය. කරුණු එසේ නම් එසේ 44(1) සිට පැ. 44(8) දක්වා අංක කර ඇති ලිපි අතරට අංක රහිත ලිපි පැමිණියේ කෙසේද යන ප්‍රශ්නය පැන නැගී. මේ සඳහා පිළිතුරු ලබාදිය යුත්තේ ද ආනන්ද විජයපාල විසින් වුවත් ඔහු ඒ පිළිබඳව නොදන්නා බව සාක්ෂි යෙදී පවසා ඇත. මෙම කරුණු වලින් පැහැදිලි වන්නේ දූෂණ විරෝධී කොමිටිය හෝ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් අංක කරන ලද ලිපි ගලවා ඒ අතරට අංක රහිත දමා ඇති බවය. වගඋත්තරකරු මෙම කාලසීමාව තුළ සිදු කරන ලද සියළු ගෙවීම් පිළිබඳ ලේඛන පැ.33, පැ.33 (1), පැ.33 (2), පැ.33 (3), පැ.33(4) සහ පැ.33(5) ලෙසට සලකුණු කර ඇත.

11 වන වගඋත්තරකාර රවි වෛද්‍යාලංකාර සාක්ෂි දෙමින් ඉදිරිපත් කරන ලද 11ව4 ලෙසට සලකුනු කල ලේඛනය, මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් තොරතුරු සටහන් පොත වෙනුවට පාවිච්චි කරන අපරාධ පැඩය බව සඳහන් කලේය. එසේ වුවත් පැ. 11ව4 වැනි අපරාධ පැඩයක් පාවිච්චි කළ හැක්කේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ යම් විමර්ශන කාර්යාංශයකට පමණි. මෙහි මීට ඉහතදීද සඳහන් කර ඇති ආකාරයටයට ඉහත කී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය යථා පරිදි අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කර පිහිටුවන ලද පොලිස් ඒකකයක් නොවන බැවින් එකී මූල්‍ය අපරාධ කොට්ඨාසයට අපරාධ පැඩයක් හෝ

තොරතුරු වාර්තා පොතක් පාවිච්චි කිරීමේ නීත්‍යානුකූල හැකියාවක් නොමැත.

මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති පැමිණිලි අංක 1070 /2020 දරන පැමිණිල්ලට ලේඛනයක් වශයෙන් ඉදිරිපත් කර ඇති පැ. 19 දරණ සීඩී තැටියෙහි රවි වෛද්‍යාලංකාරගේ මාධ්‍ය සාකච්ඡාව අන්තර්ගතය .

රවි වෛද්‍යලංකාර මහතා විසින් සතිඅගඅරුණ පුවත්පතට ලබාදුන් මාධ්‍ය සාකච්ඡාවක වාර්තාවක්ද කොමිෂන් සභාව නඩු ගණනාවක්දීම ලේඛනයක් ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.  මෙම මාධ්‍ය වාර්තාව ආරම්භයේදීම සදහන් කර ඇත්තේ, ඝාතනයට ලක්වූ ලසන්ත වික්‍රමතුංග මහතාගේ දියණිය විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට යවන ලද ලිපියක ඇයගේ  පියාගේ ඝාතකයා සොයා ගැනීමට නොහැකි වූයේ රවි වෛද්‍යලංකාර වැනි දූෂිතයකු පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ප්‍රධානියා ලෙස පත් කිරීම නිසා බව සඳහන් කර ඇත.

ලසන්ත වික්‍රමතුංග මහතාගේ දියණිය රවි වෛද්‍යලංකාර මහතාට මේ අන්දමින් චෝදනා එල්ල කරන්නේ ඔහු විසින් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ප්‍රධාන ලෙසට ක්‍රියා කරණ අවධියේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් පැහැදිලි ලෙසම ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතකයන් නොවන බවට ඇයගේ දියණිය හොඳින්ම දැන සිටි නිසා විය යුතුය. ලසන්ත වික්‍රමතුංග මහතාගේ දියණිය සදහන් කරන ආකාරයෙන් පෙනී යන්නේ රවි වෛද්‍යලංකාර මහතා අත්අඩංගුවට ගත් හමුදා

නිලධාරීන් සාතකයන් නොවන බවත් නියම සාතකයන් අත්අඩංගුවට ගැනීමට රවී වෛද්‍යාලංකාර මහතා අසමත් වී ඇති බවත්ය.

මෙවැනි මාධ්‍ය හමු පවත්වා තිබූ රවී වෛද්‍යලංකාර මහතා දූෂණ විරෝධී කමිටුවක් තිබෙන බව නොදන්නා බවත් එවැනි කමිටුවක රැස්වීම් වලට තමන් කිසිදිනෙක සහභාගි නොවූ බවත්, සඳහන් කර ඇතත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති පහත සඳහන් ලේඛන අනුව රවී වෛද්‍යාලංකාර මහතාගේ එම සාක්ෂිය සම්පූර්ණ අසත්‍ය සාක්ෂියකි. අරලියගහ මන්දිරයේ පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් වලට රවී වෛද්‍යාලංකාර මහතා සහභාගී වූ බව පැ. 43 පැ. 38 පැ. 40 පැ. 39 පැ. 37 පැ 41 සහ පැ. 42 දරන එකී දූෂණ විරෝධී කමිටු රැස්වීම් වාර්තා වල පැමිණීමේ සටහන් වලින් සනාථ වෙයි.

දූෂණ විරෝධී කමිටුව නොදන්නා බවට මෙම කොමිෂන් සභාව ඉදිරියේ දිවුරා සාක්ෂි දුන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී වෛද්‍යලංකාර මහතා කෙතරම් අසත්‍යය ප්‍රකාශකයෙක් ද යන්න පැ. 43 ලේඛනයෙන් මනාව සනාථ වෙයි. 2015.03.16 වන දින ප.ව. 4.00 ට අරලියගහ මන්දිරයේ දී පවත්වන ලද දූෂණ විරෝධී කමිටු රැස්වීමේ වාර්තාවේ (පැ.43) පළමුවන අංකය යටතේ සඳහන් කර ඇත්තේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පරීක්ෂණය කරගෙන යනු ලබන දිවි නැගුම ව්‍යාපෘතිය සම්බන්ධවය. එහි සඳහන් අන්දමට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් දිවිනැගුම පිළිබඳව සිදුකරගෙන යනු ලබන පරීක්ෂණ වල වර්තමාන තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

විසින් සිදු කරන ලදී යනුවෙන් සඳහන් කර ඇත. එසේම වැඩිදුරටත් සඳහන් කර ඇති අන්දමටට 2015-03-17 වන අඟහරුවාදා වන විට පරීක්ෂණ අවසන් කළ හැකි බවත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම් තවමත් ප්‍රශ්න කිරීමට ඇති බවටත් රැස්වීමේ සාමාජිකයින් දැනුවත් කරමින් ප්‍රකාශ කර ඇත.

දූෂණ විරෝධී කමිටු රැස්වීමේදී මෙවැනි පැහැදිලි කිරීමක් සිදු කරන නියෝජ්‍ය පොලිස්පති රවී වෛද්‍යාලංකාර මහතා මෙම කොමිෂන් සභාව ඉදිරියේ දී දිවුරුම්ක් මත සාක්ෂි දෙමින් තමන් කිසි දිනෙක දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් වලට සහභාගි නොවූ බවත් දූෂණ විරෝධී කමිටුවක් තිබෙනවා නොදන්නා බවටත් මහා පරිමාණයේ අසත්‍ය ප්‍රකාශයක් සිදුකර ඇත.

පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් හිතාමතාම පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතා ඇතුළු පිරිස් අධිකරණ බලය නොමැති අධිකරණයක් වෙත රැගෙන ගොස් රක්ෂිත බන්ධනාගාර ගත කිරීම් සිදු කර ඇත. තමන් වෙත ලැබුණු පැමිණිල්ලක් මෙම විමර්ශනය කරන පොලිස් නිලධාරීන් පළමුවෙන්ම සොයා බලනුයේ තමන්ගේ පොලිස් බල වසම තුළ එම වරද සිදුකර ඇත්තේ ද? වරද සිදුකල ස්ථානය කුමක්ද? එකී වරද සිදු කළ ස්ථානය අයත් වන්නේ කුමන අධිකරණ බල ප්‍රදේශයකට ද? යන්නයි. දිවි නැගුම දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ කොළඹ බොරැල්ලේ කාසල් වීදියේය. කාසල් වීදිය අයත් වන්නේ මාලිගාකන්ද මහේස්ත්‍රාත් බල ප්‍රදේශයටය. 2015-01-08 ජනාධිපතිවරණයෙන් පසුව කිසියම් දිනකදී දිවිනැගුම දෙපාර්තමේන්තුව බත්තරමුල්ලේ සෙත්සිරිපායට ගෙනගොස් ඇත. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය

විසින් ආරම්භ කළ විමර්ශනයට අදාළ දිවිනැගුම දෙපාර්තමේන්තුවේ ඉසුරුමත් නිවහන ව්‍යාපෘතිය සහ වන්දි හා පාරිතෝෂික මුදල් ගෙවීම් සිදුකර ඇත්තේ 2014 වසරේ දී ය. මේ අනුව ඉතාමත් පැහැදිලි ලෙස දෙදහස් 2014 වසරේ දී දිවි නැගුම දෙපාර්තමේන්තුව කාසල් වීදියේ පිහිටා තිබී ඇති බැවින්, 2014 වර්ෂයේ සිදු කළ වරදකට නඩු පැවරිය යුත්තේ මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයයේ දී ය. කරුණු එතරම් පැහැදිලිව තිබියදීත් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතා ඇතුළු පිරිස කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය දක්වා ගෙන ගොස් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත්තේ රවී වෛද්‍යාලංකාර මහතා මූල්‍ය අපරාධ විමර්ෂන කොට්ඨාසයේ ප්‍රධානියා වශයෙන් ක්‍රියා කළ කාලය තුළදීය.

පොලිස්පතිවරයා ඔහුගෙන් පළිගත් බව සහ ඔහුට එරෙහිව විමර්ශන සිදු කල බව සඳහන් කළත් එවැනි විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමට රවී වෛද්‍යාලංකාරට නො හැකි විය. බලපෑම් කළ පුද්ගලයින් 11ව 8 ලෙස සලකුණු කළ (1070/2020 නඩුවේ පැ.19 ලෙස සලකුණු කළ) සීඩී තැටියෙන් පැහැදිලි කර ඇතත්, 2015 රජයේ අමාත්‍යවරුන් හෝ ඔවුන් හා සම්බන්ධතා ඇති පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමක් හෝ අධිකරණයට ඉදිරිපත් කිරීමක් සිදු කර නැත. වගඋත්තරකරු හරස් ප්‍රශ්න වලට උත්තර නොදීම මත ඔහු යම් යම් කරුණු සැඟවීමට උත්සාහ දර ඇත. දිවි නැගුම දෙපාර්තමේන්තුව නඩුවට අදාල කාලසීමාවේදී කාසල් වීදියේ පිහිටුවා තිබුණු බවට පිළිතුරු දීම පවා ප්‍රතික්ෂේප කර තිබීම තුලින් නිගමනය වන්නේ ඔහු පිළිතුරු දුන්නේ

නම් එමගින් වැරදි අධිකරණයකට කිසියම් දේශපාලන පරමාර්ථයක් උදෙසා හිතාමතාම ඉදිරිපත් කර ඇති බවය.

11 සඳහා වගඋත්තරකරු විසින් පැ.48 ලිපිය අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා වෙත යවමින් දූෂණ විරෝධී කමිටුවේ උපදේශකයින්ගේ සේවා කාලය දීර්ඝ කරන ලෙසට ඉල්ලීමක් සිදුකර ඇති අතර එහි පිටපතක් දූෂණ විරෝධී කමිටුවේ ලේකම් ආනන්ද විජයපාල වෙත යවා ඇත. එම ලිපිය යවන ලද බවට 11 වන වගඋත්තරකරු පිළිගෙන ඇති බැවින්, පැහැදිලි ලෙසම 11 වන වගඋත්තරකරු දූෂණ විරෝධී කමිටුවේ සාමාජික ලෙස ක්‍රියාකරමින් එකී ලිපිය යවා ඇති බව පැහැදිලිය. එසේම ජේ සී වැලිඅමුණ මහතා විසින් පැ.49 දරන විද්‍යුත් ලිපිය අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා වෙත යවමින් 11 වගඋත්තරකාර රවි වෛද්‍යාලංකාර මහතා හොංකොං බලා පිටත් කර යැවීමට අවශ්‍ය බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට ඉල්ලා ඇති අතර 18.11.2015 දිනැති පැ. 50 දරන ලිපිය සමන් ඒකනායක මහතා විසින් පොලිස්පතිවරයා වෙත යවමින් ඒ සඳහා ඔහුගේ අනුමතිය ඉල්ලා ඇත. 11 වන වගඋත්තරකරු විසින්, දිවි නැගුම ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සහකාර පොලිස් අධිකාරී සේරසිංහ මහතාට භාර කර ඇත.

මේ අනුව 11 වන වගඋත්තරකාර නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර මහතා දූෂණ විරෝධී කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන්ද, ඒ සමඟම මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ ප්‍රධානියා වශයෙන් ද, ක්‍රියාකර ඇති බව උක්ත සඳහන් සාක්ෂි වලින් ඔප්පු වී ඇත.

14 වන වගඋත්තරකරු සජිත් රත්නායක ඔහුගේ මූලික සාක්ෂියේ දී ඔහුට එරෙහිව ඉදිරිපත් කරන සාක්ෂි පිළිබඳව ප්‍රතිචාරයක් දක්වා නොමැත. මෙම නඩුවට අදාළ බී වාර්තාව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීම පිළිබඳව පැනනැගී ඇති අධිකරණ බලයට අදාළව ප්‍රශ්න නොකළ බවට සිදු කරන ප්‍රකාශ පිළිගත නොහැක.

7 වන වගඋත්තරකාර මලික් සමරවික්‍රම මහතා ඔහුගේ සාක්ෂියේදී සඳහන් කළේ ඔහු ද මෙම දූෂණ විරෝධී කමිටුව පිළිබඳව කිසිවක් නොදන්නා බවත් ඔහු කිසිදු දිනක දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් වලට සහභාගි වී නොමැති බවත්ය. මලික් සමරවික්‍රම මහතාද මෙම කොමිෂන් සභාව ඉදිරියේ දිවුරුමක් මත අසත්‍ය සාක්ෂි ලබා දී ඇත. පැ.37 ලේඛනය අනුව 201502.16 දින ප.ව.5.00 ට අරලියගහ මන්දිරයේ දී පවත්වා ඇති දූෂණ විරෝධී කමිටු රැස්වීමටද, පැ.40 අනුව 2015.02.23 දින මධ්‍යාහ්න 12.00 ට අරලියගහ මන්දිරයේ දී පවත්වා ඇති දූෂණ විරෝධී කමිටු රැස්වීමටද, පැ.41 අනුව 2015.02.09 දින ප.ව. 5.00 ට අරලියගහ මන්දිරයේදී පවත්වා ඇති දූෂණ විරෝධී කමිටු රැස්වීමටද, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක වශයෙන් මලික් සමරවික්‍රම මහතා සහභාගී වී ඇත.

2015 රජයේ විදුලිබල අමාත්‍යවරයා වූ පාඨලී චම්පික රණවක මහතා 2015 ජනවාරි 21 වැනි දින පැවති කැබිනට් මණ්ඩල රැස්වීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. දූෂණ විරෝධී පිහිටුවීම සඳහා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015 ජනවාරි 21 වෙනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශය සමඟ අමත්‍ය පාඨලී චම්පික

රණවක මහතාගේ කැබිනට් සංදේශය ද කැබිනට් මණ්ඩලය විසින් සලකා බලා දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමට තීරණය කර ඇත.

අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් සඳහන් කළේ ඔහු එම දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් වලට සහභාගී සහභාගී නොවූ බවත් එවැනි දූෂණ විරෝධී කමිටුවක් පිහිටුවා තිබෙන බව ඔහු නොදැන සිටි බවත්ය.

උක්ත සඳහන් කමිටුවක් නොදන්නා බව හෝ එහි රැස්වීම් වලට සහභාගී නොවූ බවට පාඨලී චම්පික රණවක මහතා සඳහන් කරන සාක්ෂි පිළිගත නොහැකිය. ඔහු කොමිෂන් සභාව ඉදිරියේ දිවුරුමක් මත අසත්‍ය සාක්ෂි ලබා දී ඇති බව පහත සඳහන් ලේඛන වලින් සනාථ වෙයි.

2015.02.16 වැනි දින පස්වරු 5.00 ට අරලියගහ මන්දිරයේ පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවේ රැස්වීමට අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා සහභාගි වී ඇති බව පැ.37 වශයෙන් ඉදිරිපත් කරන ලද එකී රැස්වීමේ පැමිණීමේ ලේඛනයෙන් සනාථ වෙයි.

එසේම 2015.03.02 වැනි දින මධ්‍යහ්න 12.30 ට ජනාධිපති ලේකම් කාර්යාලයේ පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවේ රැස්වීමට අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා සහභාගි වී ඇති බව පැ.38 ලෙස ලකුණුකර ඉදිරිපත් කර ඇති එකී රැස්වීමේ පැමිණීමේ ලේඛනයෙන් සනාථ වෙයි.

එසේම, 2015.02.23 වන දින මධ්‍යහ්න 12:00 ට අරලියගහ මන්දිරයේ දී පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවේ රැස්වීමට අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා සහ සහභාගී වී ඇති බව පැ.40 වශයෙන්

සලකුණු කර ඉදිරිපත් කරන ලද එකී රැස්වීමට අදාල පැමිණීමේ ලේඛනයෙන් සනාථ වෙයි.

හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඔහුගේ සාක්ෂිය දී සඳහන් කළේ කැබිනට් සංදේශය පිළිබඳව මෙන්ම කැබිනට් තීරණය ද ඊට අදාළ සියලුම පාර්ශවයන්ට දැනුම්දීම අමාත්‍යාංශය මගින් සිදු කළ බවයි. කැබිනට් සංදේශ ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය අනුව අදාළ කැබිනට් සංදේශය කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කිරීමට ප්‍රථම සියලුම කැබිනට් අමාත්‍යවරුන්ට ලබාදෙන බවත් එම කැබිනට් සංදේශයට අනුමත කිරීමෙන් පසුව ඉන් බැඳෙන සියලුම පාර්ශවයන්ට කැබිනට් තීරණය පිළිබඳව දැනුම් දෙන බවත් එය අදාළ අමාත්‍යාංශයට පැවරෙන වගකීමක් බවත් හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඔහුගේ සාක්ෂියේ දී සඳහන් කර ඇත.

මෙම සාක්ෂි අනුව තමන්ට 2015-01-21 දින දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමේ කැබිනට් සංදේශය සහ කැබිනට් තීරණය නොලැබුණු බවට එම වගඋත්තර කරුවන් තිදෙනා සිදුකරන ප්‍රකාශ කිසිසේත් පිළිගත නොහැකි ය.

ආනන්ද විජේපාල මහතා දූෂණ විරෝධී කොමිටියේ අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කළ බව පිළිගත්තේය. ඔහු රාජ්‍ය ආයතනයක සේවය කරමින් සිටි බවත් අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා විසින් ද්විතීය පදනම යටතේ වගඋත්තරකරු ස්ථාන මාරු කර දූෂණ විරෝධී කොමිටි ලේකම් කාර්යාලයට යවන ලද බවත් එය තමාගේ උවමනාවෙන් නොව සමන් ඒකනායක මහතා විසින් සිදුකළ නියමය අනුව ක්‍රියා කිරීමක් බවටත් සඳහන් කර ඇත. දූෂණ විරෝධී කොමිටියේ සේවය කිරීම වෙනුවෙන් ඔහු රජයේ මුදලින් වැටුප් ලබා

ඇත. දූෂණ විරෝධී කොමිටිය රාජ්‍ය ආයතනයක් නොවන බැවින් එවැනි ආයතනයක සේවය කරමින් රජයේ මුදලින් වැටුප් ලැබීම රජයේ මුදල් අවභාවිතා කිරීමකි. ඒ අනුව ආනන්ද විජේපාල මහතා රජයේ මුදල් අවභාවිත කිරීමත් සමන් ඒකනායක මහතා රජයේ මුදල් අවභාවිතා කිරීමට ආධාර සහ අනුබල දීමත් සිදුකර ඇත.

අනෙකුත් වගඋත්තරකරුවන්ට යථා පරිදි සිතාසි නිකුත් කර තිබියදීත් ඔවුන් සිතාසියට ප්‍රතිචාර දක්වමින් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී නොසිටි බැවින් එම වගඋත්තරකරුවන් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හරින ලද පුද්ගලයන් ලෙසට නම් කිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.50 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

Chandra Fernando
24/11/2020

24/11/2020

2020. 11. 24

9 .X

පැමිණිලි අංකය - 289 /2020

290/2020

පැමිණිලිකරු - රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක

ලිපිනය - අංක: 233/35, මැදලන්ද වත්ත, කලල්පිටිය, පස්යාල.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු ඇමති මංගල සමරවීර මහතා
2. හිටපු අමාත්‍ය පා. ම. පාඨලී චම්පික රණවක මහතා
3. හිටපු ඇමැති රවුෆ් හකීම් මහතා
4. හිටපු ඇමැති සරත් ෆොන්සේකා මහතා
5. දෙමළ සන්ධාන නායක ආර් සම්බන්ධන් මහතා
6. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහතා
7. ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක මහතා
8. නීතිඥ ජේ සී වැලිඅමුණ මහතා
9. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා
10. හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා
11. අධ්‍යක්ෂ දූ දූෂණ විරෝධී ලේකම් කාර්යාලය එම්.කේ. ආනන්ද විජේපාල මහතා

12. පී.කේ. සේරසිංහ මහතා

13. සජිත් රත්නායක මහතා

14. එස්.ඒ.එස්. ගුණවර්ධන මහතා

15. තිලක් සමරනායක මහතා

16. එස්. එම්. එම්. සාජික් මහතා

17. හේවහැටගේ සුමනපාල මහතා

18. නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ

19. හිටපු අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක මහතා සහ අනෙකුත් චූදිතයින් වූ බැසිල් රෝහණ රාජපක්ෂ මහතා, රත්නායක පල්ලියගුරුගේ බන්දුල තිලකසිරි මහතා සහ යක්දෙහිගේ දොන් නිහාල් ජයතිලක මහතා ඇතුළු සිව්දෙනා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක මහතාට එරෙහිව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති අංක බී 9556/15, බී 9557/15, බී 9579/15, සහ බී 44/15 දරන බී වාර්තාවන්හි සහ එම බී වාර්තාවලට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් සියලුම චූදිතයින් නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම කොළඹ මහා මහාධිකරණයේ පවරා ඇති HC 8570/16, HC 8546/16, HC 8222/16 දරන අධි චෝදනා පත්‍ර ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කළ යුතු බවටත් එම අධිචෝදනා පත්‍ර වලින් චෝදනා කර ඇති සියලුම විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කළ යුතු බවටත් කොමිෂන් සභාව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සැදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නමැති වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද, නිසි කරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් උත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ බරපතළ හානි පූරනය කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි. ඒ අනුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුට අහිමි වූ ඔහුගේ රැකියාවේ සියලුම උසස්වීම් වරප්‍රසාද විදේශීය පුහුණුවීම් හිඟ වැටුප් සියල්ලම ඔහුට ලබා දීමත් ඔහු එවැනි රක්ෂිත බන්ධනාගාර ගත කිරීමකට පත් නොවූයේ නම් ඔහුට ඔහුගේ රැකියාවේ හිමිවන ස්ථානයට ඔහු පත් කිරීමත් මගින් පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිය හැකි

බවට කොමිශන් සභාව ඒකමතිකව තීරණය කරන අතරම එම සහනයන් ලබා දීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

6. පැමිණිලිකරු අත්තනෝමතික ලෙස රක්ෂිත බන්ධනාගාර ගත කර තිබීමත්, නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගීකර කරගනිමින් ඔහු රැඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකූඩුවල රඳවාගෙන සිටීමෙන් සිදුකරන ලද හානිය වෙනුවෙන් යෝග්‍ය අයුරින් හානිපූරණ කිරීම.

7. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

8. පැමිණිලිකරුවන් නිවැරදි අධිකරණය වන මාළිගා කන්ද අධිකරණයට ඉදිරිපත් නොකර ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ කුමන්ත්‍රණය දියත් කිරීම සඳහා ඔවුන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට ක්‍රියාකළ පොලිස් නිලධාරීන්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහ පනත යටතේ සහ අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ නඩු පැවරීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

කළමනාකරණය සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකු වන පැමිණිලිකරු රාජ්‍ය සේවයට බැඳී ඉන්පසුව ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත්ව ඇත. ඉන්පසුව රාජ්‍ය අංශයේ විධායක ශ්‍රේණිවල විවිධ තනතුරු දරා 2014.03.24 වන දින දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් වී ඇත. පත්වීමේ ලිපිය සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය පැ.01 සහ පැ.02 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

දිවි නැගුම පනතේ විධි විධාන අනුව අධ්‍යක්ෂවරයා දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩල සභාපතිවරයා ලෙසට පැ. 03 දරණ ලිපිය මගින් එකී පත්වීම ප්‍රධානය කර ඇත. එලෙස දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් සේවය කරමින් සිටි පැමිණිලිකරු 2015.02.27 වන දින සේවයෙන් ඉවත් කර සුමනපාල නැමැති නිලධාරීයෙක් අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කර පැමිණිලිකරු සමෘද්ධි හා නිවාස අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලෙසට පත් කර ඇත.

සුමනපාල නැමැත්තාගේ පත්වීම එම අවස්ථාවේ විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරන ලැබුවත් එම පත්වීම කැබිනට් මණ්ඩලය විසින් අනුමත නොකිරීම හේතුවෙන් සුමනපාලගේ පත්වීම 2015 අප්‍රේල් මාසයේ දී අවසන් වී ඇත.

දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරය ඉහත සඳහන් අන්දමින් අහිමි වූ සුමනපාල මහතා අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ වැඩ භාර ගෙන දින 03 කට පසුව මාර්තු 03 වන දින දිවි නැගුම දෙපාර්තමේන්තුවේ මූල්‍ය අපරාධයක් සිදු වී ඇති බවට පැමිණිල්ලක් පැමිණිලිකරුට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය

යනුවෙන් 2015 නව රජය විසින් හඳුන්වාදෙන ලද නව පොලිස් ඒකකයකට පැමිණිල්ලක් සිදු කර ඇත.

මෙම මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය (Fanatical investigations Department) නිත්‍යානුකූල පොලිස් කොට්ඨාසයක් නොවන බවට ප්‍රකාශ කරන ලෙසට ඉල්ලා පවරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාගවෙමින් පවතින අතර වර්තමානයේ මෙම පොලිස් ඒකකය විසුරුවා හැර ඇත.

සුමනපාලගේ පැමිණිල්ලට අනුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පැමිණිලිකරුගෙන් පැමිණිල්ල සිදු කළ මාර්තු 03 වන දින සිට සිව් වතාවක් ප්‍රශ්න කර කටඋත්තර ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්න කිරීම සිදු කරනු ලැබ ඇත්තේ දිවි නැගුම දෙපාර්තමේන්තුවේ සහනාධාර ලාභීන්ට තම නිවාස අළුත් වැඩියා කිරීම සඳහා රුපියල් 10,000/- ක උපරිමයකට යටත්ව ක්‍රියාත්මක කළ "ඉසුරුමත් නිවාසක්" යන ව්‍යාපෘතිය පිළිබඳව සහ දිවි නැගුම දෙපාර්තමේන්තුව එම පනත මගින් පිහිටුවීමේ දී සිය කැමැත්තෙන් ඉවත් වී ගිය සේවකයින්ට වන්දි සහ පාරිතෝෂිත දීමනා ගෙවීම පිළිබඳවය.

2013 අංක 01 දරණ දිවි නැගුම පනත මගින් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරිමේ දී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, උඩරට සංවර්ධන අධිකාරිය, උඩරට ගැමි පුනරුත්තාපන දෙපාර්තමේන්තුව, සමෘද්ධි දෙපාර්තමේන්තුව යන ආයතන 05 අහෝසි කරනු ලැබීය. ඒ අනුව එලෙස අහෝසි කරන ලද ආයතන 05 හි සේවකයින්ට විකල්පයක් ලෙසට සිය කැමැත්තෙන් ඉල්ලා අස්වීමටත්, එසේ අස්වන්නේ නම් ඒ සඳහා වන්දි ගෙවීමටත් නෛතික විධි විධාන දිවි නැගුම පනතට

ඇතුළත් කර තිබුණි. එසේ අකමැති වන සේවකයින්ව දිවි නැගුම දෙපාර්තමේන්තුවේ සේවයට ඇතුල්වීමට හැකියාව තිබුණි.

මේ අනුව සිය කැමැත්තෙන් ඉවත් වන සේවකයින්ට වන්දි සහ පාරිතෝෂිත ගෙවීම දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුතුව තිබුණි. මෙම වන්දි සහ පාරිතෝෂිත මුදල් ගෙවීම් පිළිබඳව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිව්දෙනකුගෙන් ප්‍රශ්න කර ඇත.

එසේම, දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිවි නැගුම ලිත මුද්‍රනය කිරීම සිදු කිරීම සම්බන්ධයෙන් ද මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය විසින් ප්‍රශ්න කර ඇත. ඉදිරිපත් වී ඇති තොරතුරු අනුව මෙම ලිත 2001 වර්ෂයේ සිට සමෘද්ධි අධිකාරිය විසින් මුද්‍රනය කර ඇත.

ලිත සම්බන්ධයෙන් පැමිණිලිකරු ප්‍රශ්න කරනු ලැබූ අවස්ථාවේදීම, හිටපු අමාත්‍යාංශ ලේකම් නිහාල් ජයතිලක මහතාගෙන්ද, හිටපු අධ්‍යක්ෂ ජනරාල් බන්දුල තිලකසිරි මහතාගෙන්ද අප්‍රේල් මාසයේ දී පමන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගෙන් ද මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය ප්‍රශ්න කර ඇත.

2015 අප්‍රේල් මස 22 වන දින බැසිල් රාජපක්ෂ මහතා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට කැඳවා ඇති අතර එදිනම පැමිණිලිකරු සහ ලේකම් නිහාල් ජයතිලක මහතාගේ ප්‍රකාශ සටහන් කර ගෙන ඇත.

පැමිණිලිකරුගෙන් ප්‍රකාශ ලබා ගන්නා අවස්ථාවේදී පොලිස් සැරයන් සජිත් රත්නායක සහ උප පොලිස් පරීක්ෂක එස්.ඒ.එස්.ගුණවර්ධන යන නිළධාරීන් පැමිණිලිකරුට තර්ජනය කරමින් පොලිස් නිළධාරීන් ප්‍රකාශ කරන අන්දමට කටඋත්තරය ලබා දෙන ලෙසටත් එසේ

නොකළහොත් විශ්‍රාම වැටුප පවා නොමැතිව ගෙදර යාමට සිදු වන බවටත් පවසා බලපෑම් කරමින්, පොලිස් නිළධාරීන් සඳහන් කරන කටයුතු, ආර්ථික සංවර්ධන ඇමති ලෙස කටයුතු කළ බැසිල් රාජපක්ෂ මහතාගේ නියෝග මත පැමිණිලිකරු විසින් සිදු කළ බවට ප්‍රකාශ කරන ලෙසට තර්ජනාත්මක බලපෑම් සිදු කර ඇත.

පැමිණිලිකරු එවැනි ප්‍රකාශ ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති අතර අප්‍රේල් මස 22 වන දින පැමිණිලිකරු බැසිල් රාජපක්ෂ මහතා සහ නිහාල් ජයතිලක මහතා අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදු කළ බවට නිකුත් කළ කුවිතාන්සිය පැ.04 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත්තේ, දිවි නැගුම සහනාධාර ලාභීන්ට නිවාස අලුත් වැඩියාවට මුදල් ලබාදීම, දිවි නැගුම පනතේ විධි විධාන අනුව ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වන සේවකයින්ට වන්දි මුදල් ලබා දීම සහ දිවි නැගුම ලිත මුද්‍රනය කිරීම යන කරුණු තුන සම්බන්ධයෙන් අප්‍රේල් 22 වන දින, රාත්‍රි 10ට පමණ පැමිණිලිකරු ඇතුළු තිදෙනා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර එම අවස්ථාව වන විටත් කඩුවෙල මහේස්ත්‍රාත්වරයා අධිකරණ නිළ කාමරයේ තම කටයුතු සඳහා සූදානම්ව සිට ඇත. රාජ්‍ය මුදල් අවභාවිතා කිරීම යන චෝදනාව යටතේ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ පැමිණිලිකරු ඇතුළු තිදෙනා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. දින 59 ක් රක්ෂිත බන්ධනාගාර ගත කළ සීමාවකින් පසු පැමිණිලිකරු මහාධිකරණ ඇප නියෝගයක් මත මුදාහැර ඇත. මහාධිකරණ විනිශ්චයකාරතුමිය විසින් 2015.06.15 වන දින ඇප නියෝගයෙහි මෙසේ සඳහන් වේ.

(උපුටා ගැනීම) "අද දින මෙම නඩුවේ වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටින රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ මහතා විසින් ද කරුණු දක්වමින් කියා සිටින්නේ, මෙම නඩුවේ පෙත්සම්කරු අධිකරණය මඟ හැරීම, සාක්ෂිකරුවන්ට බලපෑම් කිරීම, නැවත නැවත වරදෙහි නියැලීම යනාදියෙහි යෙදිය හැකි බවට මේ දක්වා කරුණු අනාවරණය වී නොමැති බවත්, එහෙයින් එම කරුණු සැළකිල්ලට ගෙන ඇප දීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොදක්වන බවටත්ය. තවද මෙම නඩුවේ විමර්ශණ කටයුතු අවසන්ව ඇති බවට ද, ඉදිරිපත් වූ කරුණු අනුව මෙම පෙත්සම්කරු ඍජු මුල්‍යමය ප්‍රතිලාභයක් ලබා ගෙන ඇති බවට කරුණු අනාවරණය වී නොමැති බවට ද දන්වා සිටි.

ඉහත කී සියළු කරුණු මෙම නඩුවෙහි පෙත්සම්කරුට ඇප ලබා දීම සඳහා සුවිශේෂී කරුණු වුව ද, උගත් මහේස්ත්‍රාත් තුමා විසින් එම කරුණු සළකා බලා නොමැති බවට පෙනී යයි." (උපුටා ගැනීම අවසන්)

බී.9556/2015, බී. 9557/2015 සහ 9579/2015 දරණ නඩු වල ඇප නියෝග පැ.05, පැ.06 සහ පැ.07 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු ඇප මත මුදාහැරිමෙන් පසුව 2016 අප්‍රේල් මස හෝ මැයි මාසයේ දී පැමිණිලිකරු මූල්‍ය අපරාධ පරීක්ෂණ ඒකකයට නැවත කැඳවමින් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ GI බට මිලදී ගැනීමක් සම්බන්ධව ප්‍රශ්න කර ඒ අනුව මිලදී ගැනිම සිදු කළ බව පවසන ලෙසට බලකිරීමක් සිදු කර ඇත. උක්ත කරුණු සම්බන්ධයෙන් 2016.07.18 දින පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන

කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරිමෙන් පසුව රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. බී වාර්තාවේ චෝදනාව වශයෙන් දක්වා ඇත්තේ පළාත් පාලන ආයතන වලට දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව GI පයිප්ප ලබා දීම සඳහා මුදල් වියදම් කිරිමෙන් රජයේ මුදල් අවභාවිතා කළ බවය.

මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය මේ අන්දමින් කරුණු වාර්තා කළත් උක්ත ගනුදෙනුව දිවි නැගුම පනතේ 4 වන වගන්තිය යටතේ දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අරමුණු සහ 5 වන වගන්තිය යටතේ සඳහන් බලතල වලින් පැහැදිලි ලෙස ආවරණය කිරීමක් ලෙසට කිසිම අයුරකින් අර්ථකතනය කළ නොහැක.

GI පයිප්ප මිලදී ගැනීම සඳහා අනුගමනය කළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෝෂ සහගත බවට මූල්‍ය අපරාධ විර්ශන ඒකකය සඳහන් කර ඇතත් කුමන ක්‍රියා පිළිවෙතක දෝෂ සහගත ද යන්න සඳහන් කර නැත. එසේම එවැනි දෝෂ සහගත ස්ථාන තිබුනේනම් විගණනයේ දී සොයා ගනු ඇත. එසේ වුවත් එවැනි දෝෂ තිබුණු බවට විගණකාධිපතිවරයා වාර්තා කර නොමැත.

මෙම නඩුවට එදින මහේස්ත්‍රාත්වරයා විසින් පැමිණිලිකරු ඇප මත මුදා නොහැරීම කරන කොට ගෙන දින 21 ක් රක්ෂිත බන්ධනාගාරයේ සිට මහාධිකරණයෙන් ඇප ලැබීමෙන් පසුව ඇප මත මුදාහැර ඇත. පැමිණිලිකරු විසින් ඉටු කරන ලද රාජකාරි කටයුතු පිළිබඳව පැමිණිල්ලක් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට සිදුකර ඇත්තේ දූෂණ විරෝධි කමිටු ලේකම් කාර්යාලය විසිනි.

හිටපු අග්‍රාමත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015.01.25 දිනින් සහ එවකට විදුලි බල අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා විසින් 2015.01.25 වන දිනෙන් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ 02 ක් සලකා බැලීමෙන් පසුව මෙම දූෂණ මර්දන කමිටුව පිහිටුවීමට කැබිනට් මණ්ඩලය තීරණය කර ඇත.

එකී කැබිනට් සදේශය පැ.09 ලෙසටත් ඊට ඇති ඇමුණුම පැ.09 (අ) ලෙසටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය පැ.09 (ඇ) ලෙසටත් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරුට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට පැමිණිලි කර ඇත්තේ ඉහත විස්තර කරන ලදි. දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය විසිනි. ඒ සඳහා සකසා ගත් පොලිස් ඒකකය, එම පොලිස් ඒකකය ද නීත්‍යානුකූලව පිහිටවූ ඒකකයක් නොවන බැවින් පැමිණිලිකරු ඇතුළු තිදෙනාට එරෙහිව සිදු කරනු ලබන පරීක්ෂනය නීත්‍යානුකූල පරීක්ෂණයක් නොවේ.

2015 වර්ෂයේ දී පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කරනු ලැබූ කරුණු 05 න් එක් කරුණක්වුයේ ඉසුරුමත් නිවසක් යන ව්‍යාපෘතිය වේ.

"ඉසුරුමත් නිවසක්" ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා මුලින්ම සමීක්ෂණයක් සිදු කර, සිදු කළ යුතු අළුත් වැඩියාවන් මොනවාද හඳුනාගෙන ඇත. මෙම කර්තව්‍ය සඳහා සමෘද්ධි නිළධාරීන් යොදවා ඇති අතර ඔවුන්ගේ අධීක්ෂණ නිළධාරීන් ලෙසට සමෘද්ධි කළමනාකරුවන් ක්‍රියා කර ඇත. එලෙස ලබාගත් වාර්තා උපයෝගි කරගෙන ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභීන්ට පළමු වාරිකය ගෙවීම සඳහා

අවශ්‍ය කටයුතු සම්පාදනය කර අඩු ආදයම් ලාභී පවුල් ලෙස හඳුනාගත් ලක්ෂ 15 ක පමණ පිරිසකින් ලක්ෂ 13 පමණ පිරිසකට මෙම ඉසුරුමත් නිවසක් ව්‍යාපෘතිය යටතේ රුපියල් 10,000/- ක මුදලින් රුපියල් 2500 /- ක පළමු වාරිකය ගෙවා ඇත. මේ සඳහා අවශ්‍ය වූ මුදල රුපියල් මිලියන 2992 ක මුදලකි.

මෙම මුදල ලබා ගැනීම මහා භාණ්ඩාගාරය සමඟ ලිපි හුවමාරු කර ගෙන ඇති අතර සමෘද්ධි අරමුදලින් මුදල පියවා ගැනීමට උපදෙස් ලැබී ඇත. දිවි නැගුම පනතේ 25 වන වගන්තිය අනුව දිවි නැගුම ප්‍රජාමූල බැංකු 1074 ක් දිවයින පුරා ස්ථාපිත කර ඇති අතර දිවි නැගුම පනතේ 44(g) වගන්තිය අනුව, දිවි නැගුම පනත බලයට පැමිණෙන දිනට පූර්වයෙන් පැවැති සියළුම සමෘද්ධි බැංකු සමිති සහ සමෘද්ධි බැංකු සම්මේලන, නියමිත දිනයේ සිට පිළිවෙලින් දිවි නැගුම ප්‍රජාමූල බැංකු සහ දිවි නැඟුම ප්‍රජා මූල බැංකු සමිති ලෙස සැලකිය යුතුය.

දිවි නැගුම සහනාධාරලාභීන්ට රජය විසින් මාසිකව සහනාධාරයක් ගෙවනු ලබන අතර එම මුදලින් රුපියල් 100 ක් අනිවාර්යෙන් ඉතුරුම් ගිණුමකට ප්‍රතිලාභියාගේ නමින් විවෘත කළ ගිණුමක තැන්පත් වේ. මෙම අනිවාර්ය තැන්පතුව සිදු වන්නේ ප්‍රතිලාභීන්ට ලබා දෙන සහනාධාර මුදලින් බැවින්, රාජ්‍ය මුදල් සහනාධාරලාභීන්ට සහනාධාර ලෙස ගෙවූ පසුව එය ඔහුගේ පුද්ගලික මුදලක් වන අතර එම මුදල් එම පුද්ගලික මුදලින් සහ සිදු කරනු ලබන අනිවාර්ය ඉතුරු කිරීම රාජ්‍ය මුදල් නොව ඒ, ඒ, සහනාධාර ලාභාංශය පුද්ගලික මුදල් වනු ඇත.

දැනට පිහිටුවා ඇති දිවි නැගුම ප්‍රජා මූල සහනාධාරලාභී තැන්පත්කරුවන් අනිවාර්ය ඉතුරුම් ගිණුම් මතින් මෙම බැංකුවල රුපියල් බිලියන 70 ක පමණ මුදලක් තැන්පත්ව ඇති අතර එම මුදල්

සහනාධාරලාභීන්ගේ සුභ සාධනය වැඩ වලට යෙදවීමට එම මුදල් ආයෝජනය කර පොලි මුදල් සහනාධාරලාභීන්ගේ ගිණුම් වලට බැරවීමත් සිදු වේ.

පනතේ 28 වගන්තියේ දැක්වෙන දිවි නැගුම ප්‍රජාමූල බැංකු වල ක්‍රියාකාරිත්ය අනුව, දිවි නැගුම ප්‍රතිලාභීන් ඉතුරු කිරීමට පෙළඹවීම, ඔවුන්ට ණය ලබාදීම, මූල්‍ය පාලනය පිළිබඳව කිරීම, ඔවුන්ගේ පවුල් වල සුභ සාධනය ආදී කටයුතු සිදු කළ යුතු වේ.

මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීම අපහසුවූ බැවින් ඉසුරුමත් නිවසක් ව්‍යාපෘතිය යටතේ ලබා දීමට තීරණය කළ රුපියල් 10,000/- මුදලින් පළමු වාරිකය වූ රුපියල් 2500/- ක මුදල් දිවි නැගුම ප්‍රජා මූල බැංකු පද්ධතියේ මුදල් වලින් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ කොන්දේසියට යටත්ව ගෙවා ඇත.

එම මුදල් ගෙවීම රාජ්‍ය මුදල් අවභාවිතයක් ලෙසට නිරූපනය කරමින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පැමිණිලිකරු, හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා, අමාත්‍යාංශයේ ලේකම් නිහාල් ජයතිලක මහතා සහ මූල්‍ය නිළධාරි බන්දුල තිලකසිරි මහතා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව කොළඹ මහාධිකරණයේ අංක HC 8222/16 දරණ අධිචෝදනා පත්‍රය ගොනු කර ඇත. එම අධිචෝදනා පත්‍රය පැ.10 වශයෙන් සලකුණු කර ඇත.

එකී අධිචෝදනා පත්‍රයට අනුව රුපියල් මිලියන 3090 ක මුදලක් ඉසුරුමත් නිවහනක් නැමැති ව්‍යාපෘතිය යටතේ දිවි නැගුම සහනාධාරලාභීන්ට ගෙවා එම මුදල පිළිබඳව සාපරාධි විශ්වාසය කඩ කිරීමේ වරද සිදු කිරීමට අනුබල දීමේ කුමන්ත්‍රණය සිදු කළ බවට

දණ්ඩනීති සංග්‍රහයේ 113 (ආ) වගන්තිය සමඟ කියවිය යුතු පොදු දේපල පනතේ 5 (1) වගන්තියේ යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවට චෝදනා නඟා ඇත.

මෙම නඩුව දැනට විභාග වෙමින් පවතින අතර පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු ලෙස සාක්ෂි ලබාදුන් එවකට මුදල් අමාත්‍යාංශ ලේකම්වරයෙකු වන ආචාර්ය පී.බී.ජයසුන්දර මහතාගේ සාක්ෂියට අනුව දිවි නැගුම ප්‍රජා මූල බැංකු පද්ධතියේ ඇති තැන්පත් මුදල් සහනාධාරලාභීන්ගේ පුද්ගලික මුදල් මිස රජයේ මුදල් නොවන බවයි.

නියෝජ්‍ය විගණකාධිපති ඩබ්ලිව්.ජී.එන්.මැණිකේ මිය විසින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද 2020.02.20 වන දිනැති ලිපියෙන් සඳහන් කර ඇති පරිදි, දිවි නැගුම පනතේ 25 (3) වගන්තිය ප්‍රකාරව ප්‍රජාමූල බැංකු සංස්ථාපිත මණ්ඩල වන බැවින්, ප්‍රජාමූල බැංකු ගිණුම් විගණනයට නෛතික ප්‍රතිපාදන නොමැති බවට දැනුම් දී ඇත. මේ අනුව මෙම ලිපියෙන් ද සඳහන් කර ඇත්තේ දිවි නැගුම ප්‍රජාමූල බැංකුවල මුදල් රජයේ මුදල් නොවන බවයි.

පැමිණිලිකරු ඇතුළු සිව්දෙනා පිළිබඳව පරීක්ෂණ සිදුකල පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය, පොලිස් ආඥා පනතේ 55 වගන්තිය අනුව පිහිටුවන ලද බවට 2015.02.13 වන දින අංක 1901/2020 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පොලිස්පතිවරයා විසින් ප්‍රකාශයට පත් කර ඇත. එකී ගැසට් නිවේදනයේ 02 වන ඡේදයේ මෙසේ සඳහන් කර ඇත;

(උපුටා ගැනීම) " වංචා හා දූෂණ සඳහා ඒකකයක් ස්ථාපිත කිරීම මැයෙන් ගරු අමාත්‍ය තුමා විසින් 2015.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ශ්‍රී ලංකාවේ කවර ප්‍රදේශයක හෝ සිදු වී ඇති පහත සඳහන් අපරාධ මෙම විමර්ශනය කළ යුතු වේ.

i. මහා පරිමාණ මූල්‍යමය අපරාධ, දූෂණ හා විශාල ප්‍රමාණයේ අනවසර ව්‍යාපෘති.

ii. මහා පරිමාණයේ මහජන මුදල් හා දේපළවලට එරෙහි අපරාධ.

iii. ජාතික ආරක්ෂාව, රාජ්‍ය මූල්‍යය, සෞඛ්‍ය හා පරිසරයට එරෙහිව සිදුකර ඇති විශාල ප්‍රමාණයෙන් මූල්‍යය අපරාධ.

iv. නීති විරෝධි ආකාරයෙන් ධනවත් වීම සහ නිල බලය සීමාව ඉක්මවා පාවිච්චි කිරීම.

v. මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සහ නීති විරෝධී ගණුදෙනු පිළිබඳව විමර්ශනය කිරීම." (උපුටා ගැනීම අවසන්)

මෙම ගැසට් පත්‍රය පැ.13 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ගැසට් පත්‍රයේ 04 වන ඡේදයෙහි පොලිස්පතිවරයා අසත්‍ය ප්‍රකාශයක් සිදු කර ඇත.

(උපුටා ගැනීම) "04. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවා ඇති, අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු කැබිනට් අනු කමිටුව මගින් ස්ථාපිත කර ඇති ලේකම් කාර්යාලය විසින් මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයාට යොමු කරන අතර, ඊට අමතරව විශේෂිත පැමිණිලි කැබිනට්

අනුකම්ටුව මගින් සෘජුවම මෙම කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරනු ලැබේ. (උපුටා ගැනීම අවසන්)

ඉදිරිපත්ව ඇති මෙම සාක්ෂි අනුව එනම් පොලිස්පතිවරයාගේ නිවේදනය රැගත් පැ. 13 දරණ අති විශේෂ ගැසට් නිවේදනය සහ පැ.09 (අ) දරණ කැබිනට් සංදේශය සහ කැබිනට් තීරණය අනු පැහැදිලි වන්නේ නීතිමය පදනමක් නැති දූෂණ මර්දන කම්ටුව නැමැති දේශපාලන සංවිධානය විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි මෙම පැ.13 ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කළ පොලිස් ඒකකය මගින් විමර්ශනය කරනු ලබන බවය. මේ අනුව ඉතා පැහැදිලි ලෙසට පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය දේශපාලන අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා පිහිටුවා ඇති බව පැහැදිලිය.

පැ.09 (අ) දරණ කැබිනට් තීරණයට අදාළව පැ.09 (ඇ) 1 වශයෙන් සලකුණු කර ඇති දූෂණ විරෝධි කම්ටුවේ කොටසක් නීතිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති අතර ඒ සඳහා රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා. පත් කර ඇත. ඔවුන්ගේ විශේෂඥ උපදේශයිකයින් වශයෙන් රාජ්‍ය නිළධාරින්නොවන තිදෙනෙකු පත් කර ඇත.

මෙවැනි නීතිමය පදනමක් නොමැති දේශපාලන පරමාර්ථයකින් පිහිටුවන ලද දූෂණ විරෝධි කම්ටුවේ සාමාජිකත්වයක් නීතිපතිවරයා විසින් දැරීම කිනම් අයුරකින්වත් සාධාරණීකරණය කළ නොහැක. මුළුමනින් දේශපාලනීකරණ වූ කම්ටුව තුළ නීතිපතිවරයා තම රාජකාරිය ඉටු කරමින්, දූෂණ මර්දන කම්ටුව විසින් ලබා දෙන පැමිණිලි පිළිබඳව අධිචෝදනා නැගීමේ වැඩ පිළිවෙලක නිරතව සිට

ඇති බව ඉදිරිපත්ව ඇති මෙම පැමිණිලි ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය තුළින් පැහැදිලිවේ.

පොලිස්පතිවරයාගේ නිවේදනය සහිත අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළමු ඡේදයේ පැහැදිලිව දක්වා ඇත්තේ 2015.01.21 දින සහ 2015.02.12 වන දින කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය පරිදි පිහිටුවනු ලැබූ කැබිනට් අනු කමිටුව යනුවෙනි. එසේ වුවද මෙම කැබිනට් තීරණය අනුව පිහිටුවා ඇත්තේ දූෂණ විරෝධි කමිටුවකි. කිසිදු නෛතික පදනමක් නැති දූෂණ මර්දන කමිටුව කැබිනට් අනු කමිටුවක් ලෙසට අර්ථ ගන්වා පොලිස්පතිවරයා විසින් ඉහත කී ගැසට් නිවේදනය නිකුත් කිරීම මගින් බරපතල අන්දමින් මහජනතාව නොමඟ යවා ඇත.

ගැසට් පත්‍රයේ 04 වන ඡේදය අනුව දූෂණ විරෝධි කමිටුව විසින් පැමිණිලි යොමු කිරීම දෙයාකාර වේ. එනම් ,

3. පැමිණිලි විමර්ශනය සඳහා පොලිස්පතිවරයාට යොමු කිරීම.
4. විශේෂිත පැමිණිලි දූෂණ මර්දන කොමිසම විසින් ඍජුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත යොමු කිරීම.

මෙම පැමිණිලිකරු බැසිල් රාජපක්ෂ මහතා නිහාල් ජයතිලක මහතා සහ බන්දුල තිලකසිරි මහතා යන සිව් දෙනාට එරෙහිව පැමිණිලි උක්ත සඳහන් පැ.13 දරණ ගැසට් පත්‍රයෙන් ස්ථාපිත කරන ලද මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය වෙත යොමු කර ඇත.

ඉහත කී පැ.13 මගින් පිහිටුවන ලද මූල්‍ය අපරාධ ඒකකය මෙරට පවතින නීතියට එකඟ නොවන නීති විරෝධි පොලිස් ඒකකයක් බවට

හිටපු අග විනිසුරු සරත් නන්ද සිල්වා මැතිතුමා මව්බිම පත්‍රය හා සිදු කළ සාකච්ඡාවකදී ප්‍රකාශ කර ඇති අතර එම සාකච්ඡාව සනාථ කිරීම සඳහා 2018.06.17 වන දින මව්බිම පුවත් පතෙහි මුද්‍රනයක් පැ.14 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම මාධ්‍ය සාකච්ඡාවේ දී අගවිනිසුරු සරත් නන්ද සිල්වා මැතිතුමා සිදු කළ ප්‍රකාශ කිහිපයක් පහත උපුටා දක්වා ඇත.

(උපුටා ගැනීම)" අත්අඩංගුවට ගත් තැනැත්තා පැය 24 ක් ඇතුළත වාර්තාවක් සමඟ මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතුයි. මහෙස්ත්‍රාත් චෝදනාවක් ඉදිරිපත් කරලා නඩු විභාගයක් පවත්වනවා. අපරාධ දෙවර්ගයක් තිබෙනවා. මහෙස්ත්‍රාත්ට විසඳිය හැකි සාමාන්‍ය නඩු ලඝු නඩු විභාග ලෙස හඳුන්වනවා. බරපතළ අපරාධ මිනී මැරීම්, ස්ත්‍රී දූෂණ ආදිය ලඝු නොවන නඩු වශයෙන් හඳුන්වනවා. ඒවා මහෙස්ත්‍රාත් විසින් මූලික පරීක්ෂණ සිදුකර නීතිපතිට වාර්තාක් ඉදිරිපත් කරනවා. නීතිපති සාක්ෂි තිබෙනවා නම් මහාධිකරණයට අධි චෝදනා පත්‍රයක් යවනවා. මේක තමයි රටේ පවතින ගතානුගතික පිළිවෙත.

- ඔබ කියන්නේ හදන්නේ වර්තමාන ආණ්ඩුව මේ ක්‍රමයෙන් පිට පැන්නා කියන එකද?

ඔව්. මේ ක්‍රමයට අනුව දේශපාලනය විරුද්ධවාදීන්ට හිරිහැර කරන්න අමාරුයි. මේ ක්‍රමයට ගියොත් ඒ අයට නීතියේ පිළිසරණ ලැබෙනවා. මේ ආණ්ඩුවට ආවේ 2015 ජනවාරි 8 වැනිදානේ. ඔවුන් පෙබරවාරි 13 වැනිදා ගැසට් පත්‍රයක් නිකුත් කළා. මේ ගැසට් පත්‍රයට අනුව පොලිස්පති මූල්‍ය අපරාධ කොට්ඨාසය (FCID) කියලා අංශයක් පිහිටෙව්වා.

- එතකොට එෆ්.සී.අයි.ඩී. කියන්නේ පොලිස් ස්ථානයක් නොවෙයිද? මහජනයාට ඊට යම් පැමිණිල්ලක් කළ නොහැකිද?

FCID එක අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ ගැනෙන පොලිස් ස්ථානයක් නොවෙයි. අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ පොලිස් ස්ථානයක් පිහිටුවන්න පුළුවන් ආරක්ෂක ඇමැතිට විතරයි. මේක පොලිස් ස්ථානයක් නොවෙයි. ඒ අනුව FCID එකට කිසිම අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ. ආවරණයක් නැහැ

- එතකොට FCID එකට පැමිණිලි එන්නේ කොහොමද?

ඒකට පැමිණිලි එන ආකාරය මේ නියෝගයේ 4 වැනි ඡේදයේ සඳහන් කරලා තියෙනවා. අගමැතිගේ අනුග්‍රහයෙන් යුතු කමිටුවකින් එන පැමිණිලි තමයි FCID එක විභාග කරන්නේ. එතකොට සාමාන්‍ය පුද්ගලයෙක් පැමිණිල්ලක් කරනවා නම් එයා යන්න ඕන අගමැතිගේ කාර්යාලයට. අගමැති තමයි ඒ ගැන තීරණ ගන්නේ. මේ ක්‍රමය පැවැති ගතානුගතික නීතිමය රාමුවට පටහැනියි. අපරාධ නඩු විධාන සංග්‍රහයටත් විරුද්ධයි. මේ කාර්යාලය පිහිටෙව්වා අගමැතිගේ කාර්යාලය කිට්ටුව. හැබැයි දැන් ඒ බෝඩ් එක ගලවලා පැමිණිලි ඒකකය කියලා ගහලා තියෙනවා. අර බේරේ ලේක් එකේ අරලියගහ මන්දිරයට හැරෙන තැනමයි එක තිබුණේ.

- පොලිස්පතිට FCID එක වැනි ආයතනයක් පිහිටුවන්න නීතිමය පදනමක් තිබුණාද?

පොලිස්පති මේ ගැසට් එකේ දාල තියෙනවා පොලිස් ආඥාපනතේ 50 වැනි වගන්තිය යටතේ FCID එක පිහිටුවන බව. ඒ කියන්නේ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ නොවෙයි. පොලිස්පති හිතන්න ඇති අපි කවුරුවත් මේවා කියවන එකක් නැහැ කියලා. පොලිස් ආඥා පනතේ 50 වැනි වගන්තිය යටතේ පොලිස්පතිට බලය තිබෙන්නේ පොලිස් නිලධාරීන්ගේ නිල නිවාස වර්ගීකරණය කරන්න. ඊළඟට පොලිස් නිලධාරීන්ට විනය නීති පනවා ඒ විනය නීති කඩ කරන අයට රුපියල් 50 ක දඩයක් ගහන්න. වෙන බලයක් මේකේ නැහැ. අගමැතිත් නීතිඥයෙක් මේ වගේ නීති ලියවිල්ලක ගරු අගමැති කියලා යොදලා තියෙනවා මම දැකපු එකම අවස්ථාවත් මේක. මම කියන්නේ FCID එක පත් කරන ආකාරයම නීති විරෝධියි. මේ නීති විරෝධී ඒකකයට දැනට කෝටි ගණන් මුදල් වියදම් කරලා තියෙනවා. එයාලා කරන්නේ අපරාධ නඩු විධාන නීතිය යටතේ දේශපාලන විරුද්ධවාදීන් ලුහුබැඳ යෑම. හැබැයි මේ කිසිම එකක මුල් පැමිණිල්ලක් නැහැ. පොලිස් ස්ථානයක් නැහැ. මේකෙන් තමා අල්ලාගෙන යන්නේ."
(උපුටා ගැනීම අවසන්)

දිවි නැගුම ප්‍රතිලාභීන්ට ලබා දුන් මෙම මුදල් වලින් පැමිණිලිකරු ඇතුළු අනෙක් තිදෙනාට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොමැත. මෙම තත්ත්වය පැමිණිලිකරුගේ ඇප අයදුම පිළිබඳ පරීක්ෂණයේ දී රජයේ අධිනීතිඥ මහතා සිදු කළ ප්‍රකාශයකින් ඉතා හොඳින් තහවුරුවී ඇත. පැමිණිලිකරුට ඇප ලබා දීම සම්බන්ධයෙන් විරුද්ධ නොවීමට එක් හේතුවක් වශයෙන් රජයේ අධිනීතිඥවරයා සැල කර ඇත්තේ පැමිණිලිකරුට කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් නොලැබුණු බවය.

2015.04.22 දින නඩු අංක බී 9557/2015 යටතේ පැමිණිලිකරු කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර තිබේ. මෙම නඩු වාර්තා පැ.15 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම වාර්තාව ගොනු කරමින් පැමිණිලිකරුට එරෙහිව සාපරාධි සාවද්‍ය පරිහරණය පිළිබඳ චෝදනා නඟා ඇත.

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම කරන කොට ගෙන ස්වකැමැත්තෙන් ඉවත් වන සාමාජිකයන්ට වන්දි සහ පාරිතෝෂිත මුදල් ගෙවීම සිදු කළ යුතු විය. පවත්නා නීති අනුව සේවකයෙකු සේවයෙන් ඉවත් වන දිනයේ පාරිතෝෂිත මුදල ගෙවිය යුතු අතර එය නොගෙව්වහොත් මාසයක සහන කාලයක් නීතියෙන් ලබා දී ඇත. ඒ අනුව නියමිත දිමනා ගෙවීමට අපොහොසත් වුවහොත් ගෙවීමට නියමිත පාරිතෝෂිත මුදල මත ගණනය කෙරෙන අධිභාරයක් ගෙවීමට සිදුවේ.

ඒ අනුව ප්‍රමාදයකින් තොරව වන්දි හා පාරිතෝෂිත ගෙවීමට පැමිණිලිකරු කටයුතු කර ඇත. අදාල මුදල් ප්‍රමාණය මහාභාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇත. එය ලබා නොදීය හැකි බවට දැනුම් දීම කරන කොට ගෙන දිවි නැගුම ප්‍රජාමූල බැංකු පද්ධතියේ ඇති මුදල් වලින් ප්‍රතිපුරණය කිරීමේ කොන්දේසියට යටත්ව පාරිතෝෂිත ගෙවීමට පියවර ගෙන ඇත. එසේ නොකළේ නම් පාරිතෝෂිත ගෙවීම ප්‍රමාදය කරන කොට ගෙන රජයට විශාල අලාභයක් දැරීමට සිදු වන බැවින් පැමිණිලිකරු ඇතුළු පිරිස එම අවස්ථාවේදී ගත යුතු හොඳම තීරණය ගෙන ඇත. මෙම තීරණය සඳහා දිවි නැගුම පනතේ 07 වන වගන්තියේ විධි විධාන පරිදි ස්ථාපිත කළ ජාතික සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත.

මේ අන්දමින් පාරිතෝෂිත මුදල් ගෙවීම තුළින් සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීමේ වරද සිදුකර ඇති බවට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය බී 9557/2015 වාර්තාවෙන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇත. මෙම චෝදනාවට ද ඇප මත මුදාහැරීම ප්‍රතික්ෂේප කර ඇති කඩුවෙල මහේස්ත්‍රාත්වරයා විසින් පැමිණිලිකරු ඇතුළු සිව්දෙනා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති අතර ඉන් පසුව මහාධිකරණයෙන් ඇප ලබා ගෙන ඇත.

බී 9557/2015 වාර්තාව මගින් සිදු කළ චෝදනා සම්බන්ධයෙන් තවමත් නඩු පැවරීමක් සිදු කර නොමැති අතර කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින බී වාර්තාවද කැඳවීමකින් තොරව බහා තබා ඇත. ඒ හේතුවෙන් පැමිණිලිකරුට තබා ඇති රුපියල් ලක්ෂයක ඇපය සඳහා මුදල් අවුරුදු 05 ක පමණ තිස්සේ ආපසු ලබා ගැනීමට නොහැකිව නඩුවේ බැරට පවතී.

රජයට සිදුවීමට ගිය පාඩුව වළක්වන ලද නිළධාරියාට ලැබුණු තිළිණයන් එපරිදී වේ.

පැමිණිලිකරුගෙන් ප්‍රකාශ ලබා ගන්නා අවස්ථාවේ පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ පොලිස් නිළධාරීන් වූ

1. පොලිස් පරීක්ෂක සජිත් රත්නායක
2. පොලිස් සැරයන් එස්.ඒ.එස්.ගුණවර්ධන
3. පොලිස් කොස්තාපල් ජානක
4. සහකාර පොලිස් අධිකාරි සේරසිංහ

ඇතුළු පිරිසක් පැමිණිලිකරුට බලපෑම් සිදු කරමින් මෙම ගෙවීම් බැසිල් රාජපක්ෂ මහතාගේ බලපෑම් මත සිදු කරන ලද ගෙවීම් ලෙසට

කටඋත්තර මගින් ප්‍රකාශ කරන ලෙසට බලපෑම් කර ඇත. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය උත්සාහ දරා ඇත්තේ බැසිල් රාජපක්ෂ මහතා මේ සඳහා වගකිවයුතු පුද්ගලයා ලෙසට දඬුවම් පැමිණවීම තුළින් දේශපාලන පළිගැනීම් සිදු කිරීමට අවශ්‍ය ආධාර සහ අනුබලය ලබාදීමය.

පැමිණිලිකරුට එරෙහිව එදිනම ගොනු කළ බී.9579/2015 බී වාර්තාවේ සඳහන් චෝදනාවට පදනම් කර ඇත්තේ දිවි නැගුම දෙපාර්තමේන්තුවේ ලිත මුද්‍රනය කිරීමය. මෙම බී වාර්තාව පැ.16 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2013 අංක 01 වගන්තිය යටතේ පිහිටුවන ලද දිවි නැගුම දෙපාර්තමේන්තුව ඊට පෙර හැඳින්වූයේ සමෘද්ධි දෙපාර්තමේන්තුව යන නමිනි. සමෘද්ධි දෙපාර්තමේන්තුව 1995 වර්ෂයේ පමණ සිට පැමිණ ඇත. 2001 වර්ෂයේදී ද මෙම ලිත සමෘද්ධි දෙපාර්තමේන්තුව මගින් මුද්‍රනය කර ඇත. ගොවි ජනතාවට අමාත්‍යාංශයෙන් කෙරෙන විවිධ තොරතුරු මෙම ලිතෙන් අන්තර්ගත කර තිබී ඇත. මෙම ලිත මුද්‍රනය සඳහා මුල් කාලයේ සිටම රාජ්‍ය මුදල් භාවිතා කර ඇති අතර එපරිද්දෙන්ම 2015 ලිත මුද්‍රනය කිරීම ද සිදු ව ඇත.

ලිත මුද්‍රනයේ දී සිදු කළ වරද වශයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් සඳහන් කර ඇත්තේ ජනාධිපතිවරයාගේ රුව සහිතව ලිත මුද්‍රනය කිරීම පොදු දේපල අවභාවිතයක් බවය. ජනාධිපතිතුමාගේ රුව ලිතට ඇතුල් කිරීමට හේතුව වශයෙන් සාක්ෂි මගින් ඉදිරිපත් වී ඇත්තේ දිවි නැගුම ජාතික වැඩ සටහන 2014 මාර්තු, අප්‍රේල් කාල සීමාවේදී ලංකාවේ ඇති ග්‍රාම නිලධාරී වසම් 14089 යේම එකම වේලාවකදී ආරම්භ කළ බවත්, එය ජාතික වැඩ

සටනකින් වූ බැවින් එම වැඩ සටහන ආරම්භ කරන මොහොතේ දී ජනාධිපතිතුමා අරලියගහ මන්දිරයේ පොල් පැළයක් රෝපණය කළ අතර එම අවස්ථාවේදී ලබා ගත් ඡායාරූපයක් ලිතට ඇතුල් කර ඇති බවත්, 2014 වර්ෂයේ දී පොල් වගාව ප්‍රචලිත කිරීම ආරම්භ වූ බැවින් එම ඡායාරූපය පළ කිරීම මගින් පොල් වගාව ප්‍රචලිත කිරීම අපේක්ෂා කළ බවත්ය. කටඋත්තරය සටහන් කරගත් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ ජානක නැමැති පොලිස් නිලධාරියා ඔහුට උවමනා අන්දමට කටඋත්තරය සටහන් කර ගැනීම මගින් දේශපාලන අරමුණක් ඉටු කර ගැනීමට ප්‍රකාශක් ලබා ගැනීමට බලපෑම් කරමින් උත්සාහ කළ බවට අනාවරණය වී ඇත.

මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීයා මේ අන්දමේ ප්‍රකාශයක් පැමිණිලිකරුගෙන් ලබා ගැනීමට උත්සාහ කර ඇත්තේ අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාට එරෙහිව චෝදනා නැඟීමට බවට පැමිණිලිකරුට අවබෝධ වී ඇත.

මෙම චෝදනාව සම්බන්ධයෙන් පැමිණිලිකරු කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ දී  පැමිණිලිකරු ඇප මත මුදාහැරීමේ ඇප අයදුම ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව මහාධිකරණයට ඉදිරිපත් කළ ඇප නියෝගය පිළිබඳ ප්‍රතිශෝධන අයදුම් පත්‍රය පරීක්ෂණයේ දී රජයේ අධි නිතිඥවරයා පැමිණිලිකරු ඇප මත මුදාහැරීමට විරෝධයක් පළ කර නොමැති අතර ඔහු අධිරණයට කරුණු දක්වා ඇත්තේ එම ක්‍රියාව මගින් පැමිණිලිකරුට මූල්‍ය ප්‍රතිලාභයක් ලැබී නොමැති බවයි. මෙම කරුණු සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද පැ.06 දරණ ඇප නියෝගයේ 03 වන පිටුවේ දෙවන ඡේදයේ මහාධිකරණ විනිසුරු සඳහන් කර ඇත්තේ

(උපුටා ගැනීම) " අද දින මෙම නඩුවේ වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටින රජයේ ජොෂ්ඨ අධිනීතිඥ මහතා විසින් ද කරුණු දක්වමින් කියා සිටින්නේ, මෙම නඩුවේ පෙත්සම්කරු අධිකරණය මග හැරීම, සාක්ෂිකරුවන්ට බලපෑම් කිරීම, නැවත නැවත වරදෙහි නියැලීම යනාදියෙහි යෙදිය හැකි බවට මේ දක්වා කරුණු අනාවරණය වී නොමැති බවත්, එහෙයින් එම කරුණු සැලකිල්ලට ගෙන ඇප දීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොදක්වන බවටත්ය. තව ද මෙම නඩුවේ විමර්ෂන කටයුතු අවසන්ව ඇති බවට ද ඉදිරිපත් වූ කරුනු අනුව මෙම පෙත්සම්කරු ඍජු මුල්‍යාමය ප්‍රතිලාභයක් ලබා ගෙන ඇති බවට කරුණු අනාවරණය වී නොමැති බවට ද දක්වා සිටී." (උපුටා ගැනීම අවසන්) යනුවෙනි.

එසේම මහාධිකරණ විනිසුරු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ රජයේ ජොෂ්ඨ අධිනීතිඥ මහතා දැක්වූ කරුණු පැමිණිලිකරු ඇප මත මුදාහැරීම සඳහා සුවිශේෂී කරුණු බවටත්, එසේ වුවත් මහේස්ත්‍රාත්වරයා එම කරුණු සලකා නොමැතිව ඇප අයදුම් ප්‍රතික්ෂේප කිරීම දෝෂ සහගත බවත්ය.

පැමිණිලිකරු ඇප මත මුදාහැරීමට ප්‍රමාණවත් සුවිශේෂී කරුණු තිබියදීත් මහේස්ත්‍රාත්වරයා විසින් පැමිණිලිකරු ඇප මත මුදාහැරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඔහුට දින 59 ක් රක්ෂිත බන්ධනාගාරයේ සිටිමින් ඔහු නොකළ වරදකට දඩුවම් විදිමට සිදු වී ඇත.

ඉහත කී ලිත මුද්‍රනය කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතා විත්තිකරුවන් කරමින් නීතිපතිවරයා විසින් කොළඹ මහාධිකරණයේ අංක HC 8122 යටතේ අධිචෝදනා නඟනු ලැබුවත්

එම නඩුව පවත්වා ගෙන යාමට නොහැකිව ඉල්ලා අස්කර ගෙන ඇති අතර ඉන් පසුව නැවත වතාවක් කොළඹ මහාධිකරණයේ අංක HC 8570/2016 දරණ නඩුවෙන් චෝදනා 5 ක් යටතේ අධිචෝදනා නඟා ඇත. මෙම අධිචෝදනා පත්‍රය පැ.17 වශයෙන් ඉදිරිපත් කර ඇත.

2001 වර්ෂයේ සිට මෙම ලිත මුද්‍රනය කිරීම සිදු කර ඇති අතර සමෘද්ධි දෙපාර්තමේන්තුව අහෝසි කර දිවි නැගුම දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමෙන් පසුව එම ලිත මුද්‍රනය කිරීම දිගටම පවත්වාගෙන පැමිණ ඇත. එසේ මීට පෙර මුද්‍රනය කළ සමහර වර්ෂ වලදී රනිල් වික්‍රමසිංහ මහතාගේ ඡායාරූපය එලෙස ලිතට මුද්‍රනය කර පළ කර තිබේ. එය සනාථ කිරීම සඳහා රනිල් වික්‍රමසිංහ මහතාගේ ඡායාරූපය සහිත 2004 වර්ෂයේ දී පළ කරන ලද ලිත පැ.24 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම පදනම් රහිත කරුණු සහිත බී වාර්තා මගින් පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතා රක්ෂිත බන්ධනාගාර ගත කිරීම තුළින් පැහැදිලි වන්නේ පැ.09 ලෙස සලකුණු කර ඉදිරිපත් කළ කැබිනට් තීරණය දූෂණ විරෝධී කමිටුව ස්ථාපනය කෙරෙන ඇමුණුමේ කෙටි කාලීන වැඩසටහන් වල අංක 04 යටතේ දක්වා ඇති “ මහා පරිමාණ දූෂණයන්ට හා ජාවාරම්කරුවන් ලෙස සැක කෙරෙන පුද්ගලයන්ගෙන් අවම වශයෙන් 15 දෙනෙකුගේ දූෂණ වංචා, වත්කම් - බැරකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම” යන වැඩ සටහනේ 15 දෙනාගෙන් දෙදෙනෙකු, ලෙසට පැමිණිලිකරු හා බැසිල් රාජපක්ෂ මහතා ඇතුල් කිරීමට එකී අනීතික දූෂණ විරෝධී කමිටුව ක්‍රියා කර ඇති බවය.

දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් සේවය කළ රාජ්‍ය පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිළධාරියෙකු වූ, පැමිණිලිකරු එම තනතුරු වලින් ඉවත් කර අතිරේක ලේකම්වරයෙකු වශයෙන් පත් කිරීමට 2015 ජනවාරි මස 08 වන දින බලයට පත්වූ රජය ක්‍රියා කරමින් පැමිණිලිකරු තනතුරෙන් පහත හෙළමින් අනිත්‍යානුකූල දඬුවම් වලට පාත්‍ර කර ඇත.

පැමිණිලිකරුට එරෙහිව 03 වන බී වාර්තාව ඉදිරිපත් කර ඇත්තේ GI ගැල්වනයිස් බට 32976 ක් මිලදී ගෙන ඒවා ප්‍රාදේශිය සභා 58 ක් වෙත ඒවා ලබා දී එම බට අඩු අදායම්ලාභීන්ගේ විවිධ කටයුතු උදෙසා ප්‍රයෝජනයට ගැනීමට ලබා දීම සම්බන්ධයෙනි. ඒ අනුව අත්අඩංගුවට ගනු ලැබූ පැමිණිලිකරු 2016.07.18 වන දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. එම බී වාර්තාව පැ.18 ලෙසට ඉදිරිපත් කර ඇත.

මෙම GI පයිප්ප පළාත් පාලන ආයතන වලට ලබා දීම තුළින් අඩු අදායම් ලාභි පවුල් වල පොදු අවශ්‍යතාවයන් වන මළ ගෙවල්, මඟුල් ගෙවල්, පොදු උත්සව පවත්වන අවස්ථාවන්හිදි ඒ සඳහා රැස්වන පිරිසට සෙවණ ලබා දීම සඳහා තාවකාලිකව මඩු තනා ගැනීමට ලබා දීමෙන් එම අවශ්‍යතාවය ඉටු කිරීමෙන් පසු ආපසු ප්‍රාදේශිය සභාවට ලබා ගැනීමත් සිදු කර ඇත.

අඩු ආදයම්ලාභීන්ගේ පොදු අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා මෙම බට පළාත් පාලන ආයතන විසින් යොදා ගනු ලැබ ඇති අතර ඒවා කිසිවෙකුගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා යොදවා නැත. ඒ අනුව දිවි

නැගුම පනතේ මුඛ්‍ය අරමුණ ඉටුකරලීමට මෙම GI පයිප්ප පළාත් පාලන ආයතන වලට බෙදා දීම මගින් පැමිණිලිකරු ඇතුළු නිළදාරීන් විසින් සිදු කර ඇත. දිවි නැගුම පනතේ මෙයට අදාළ වගන්ති මෙසේ දැක්වේ,

4.(ඇ). ජාතික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ජනතාව ඒකරාශි කිරීම හා සවිබල ගැන්වීම;

4.(ඊ). ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම;

5.(ක). දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ කාර්යා සඳහා අමුද්‍රව්‍ය, උපකරණ , තාක්ෂණය සහ දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන මිල දී ගැනීම සහ ගබඩා කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒවා නිෂ්පාදකයන්ට සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම;

GI පයිප්ප මිළදී ගැනීමේ දී නිසි ප්‍රසම්පාදන ක්‍රියා පිළිවෙත අනුගමනය කර ඇත. GI පයිප්ප බට මිළදී ගැනීම් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දෝෂ ඇති බවට විගණන දෙපාර්තමේන්තුව විසින් සොයා ගෙන ඒ පිළිබඳව විගණන විමසීම් සිදු කර නොමැත.

මෙම චෝදනාවටද පැමිණිලිකරු සමඟ බැසිල් රාජපක්ෂ මහතා ද අත්අඩංගුවට ගෙන කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

GI පයිප්ප සම්බන්ධයෙන් කටඋත්තර ගැනීමට මූල්‍ය අපරාද විමර්ශන කොමිසම විසින් කැඳවනු ලැබූ පැමිණිලිකරුට අදාළ පොලිස්

නිලධාරීන් බලපෑම් කරමින් බැසිල් රාජපක්ෂ මහතාගේ වුවමනාවට GI පයිප්ප මිළදී ගැනිමේ ක්‍රියාවලිය සිදු කළ බවට ප්‍රකාශ ලබා දෙන ලෙසට බලකර ඇතත් පැමිණිලිකරු එම බලපෑම් වලට යට නොවී ඒවා ප්‍රතික්ෂේප කරමින් ක්‍රියා කර තිබේ. පැමිණිලිකරුට කිසිදු බලපෑමක් බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා සිදු නොකළ බවටත් තමන් එම සත්‍ය ප්‍රකාශ කරන බවටත් පැමිණිලිකරුට පැමිණි බලපෑම් හමුවේ ඔහු ප්‍රකාශ කර ඇත.

මෙම චෝදනාවට ඇප ලබා දීම කඩුවෙල මහේස්ත්‍රාත් විසින් ප්‍රතික්ෂේප කිරිම මත මහාධිකරණයෙන් එම ඇප ප්‍රතික්ෂේප කිරිමේ නියෝගය ප්‍රතිසම්පාදනයට ලක් කර ඒ අනුව සිදු කළ නියෝගය මත පැමිණිලිකරු ඇප මත මුදාහැර ඇත. එම මහාධිකරණ ඇප නියෝගය පැ.19 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

GI පයිප්ප පිළිබඳ චෝදනාවද පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතාට එරෙහිව අධිචෝදනා නඟා ඇත. එම අධිචෝදනා පත්‍රය පැ.20 ලෙසට ඉදිරිපත් කර ඇත. මෙම පැ.20 දරණ අධිචෝදනා පත්‍රය පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතාට භාරදුන් 2017.03.08 දින නැවත වතාවක් ඇප තැබීමට නියෝග කර ඇත. ඒ අනුව එදින; එනම් 2017.03.08 වන දින අධි චෝදනා පත්‍ර භාරදිමෙන් පසු පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතාට රුපියල් ලක්ෂ 20 බැගින් මුදල් ඇප සහ රුපියල් ලක්ෂ 100 බැගින් ශරීර ඇප නියෝග කර ඇත. මෙම ඇප නියෝගය පැ.21 වශයෙන් ඉදිරිපත් කර ඇත.

පැ.21 දරණ ඇප නියෝගය සිදු කරන අවස්ථාව වන විට පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතා විසින් ඊට පෙර පවරන ලද නඩු 02 ක් වෙනුවෙන් ද ඇප තබා තිබුණු අතර එම ඇප නියෝග දෙකෙහි කිසිදු

ඇප කොන්දේසියක් කඩ කළ බවට වාර්තා වී නොතිබුණි. එලෙස ඇප කොන්දේසි කඩ නොකර නිතිපතා අධිකරණයට පැමිණි පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතාට ඇප නියම කිරීම සඳහා කිසිදු සාධාරණ හේතුවක් පැන නොනැග තිබූ අවස්ථාවක පැ.20 දරණ අධිචෝදනා පත්‍රය භාර කළ අවස්ථාවේදී රුපියල් ලක්ෂ 20 ක් බැගින් මුදල් ඇප නියම කිරීම කිසිසේත් නිතියෙන් සාධාරනීකරණය කළ නොහැක.

අධිකරණය මගින් විත්තිකරුවෙකුට නියම කරන ඇපය ඔහුට ලබා දෙන දඬුවමක් නොවිය යුතුය යන තේමාව ඇප පිළිබඳව නීතියේ මූලික සිද්ධාන්තය වුවත් පැමිණිලිකරුට හා බැසිල් රාජපක්ෂ මහතාට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරනු ලැබූ නඩු වලදී එම සිද්ධාන්තය මුළු මනින්ම කෙළසීමට ලක් කර ඇත. ඇප නියම කිරීමේ දී එහි වටිනාකම තීරණය කිරීමට අධිකරණයට ලබා දී ඇති අභිමතානුසාරී බලය ක්‍රියාත්මක කිරීමේදී දෙපාර්ශවයටම කන්දිය යුතුය යන ස්වභාවික යුක්තියේ මූලධර්මය කඩ කර ඇති බව මෙම පැ.21 ඇප නියෝගයෙන් ප්‍රතිබිම්බනය වේ.

2013 අංක 01 දරණ දිවි නැගුම පනතේ විධි විධාන පරිදි අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට පියවර ගත් නිලධාරීන්ට සහ විෂය භාර අමාත්‍යවරයාට අත්කර දුන් බේදනිය ඉරණම මුළුමනින්ම අනිත්‍යානුකූල හේතූන් පදනම්කර නීතිය අමු අමුවේ උල්ලංඝනය කරමින් ඊට දායක වූ නිලධාරීන් ක්‍රියා කර ඇති ආකාරය, අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මානව අයිතින් යටතේ මෙන්ම, ඇප පනතේ සහ අදාල කර ඇති අනිකුත් පනත් යටතේ කිසිම අයුරකින්වත් සාධාරනීකරණය කල නොහැක.

පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතා කෙසේ හෝ රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ කූය අභිප්‍රාය මුදුන් පමුණුවා ගැනීම සඳහා පැමිණිලිකරු විසින් ඉටුකළ නිත්‍යානුකූල රාජකාරි කටයුතු 2006 අංක 5 මුදල් විශුද්ධි කරන පනතේ 03 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් බවට පැ.15 ලෙසට සලකුණු කළ කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරිපත් කර ඇති බී. 9557/15 දරණ වාර්තාවේ සහ ඉන්පසුව 2015.04.22 දින ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාවේ සඳහන් කිරිමට තරම් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ස්ථානාධිපති දූෂ්‍ය වූයේ පැහැදිලි ලෙසටම දේශපාලනමය වශයෙන් පළිගැනීමකට බවට නීරික්ෂණට එළඹීමට තවත් සාක්ෂි වුවමනා නොවේ.

මෙවන් පසුබිමක් මත, ඇප කොන්දේසි කඩනොකර අධිකරණයට පැමිණි පුද්ගලයෙකුට කිසිදු හේතුවක් ඉදිරිපත්ව නොතිබියදීත්, රුපියල් ලක්ෂ 20 ක් මුදල් ඇපයක් මහාධිකරණ විනිසුරුතුමාගේම මෙහෙයවීමෙන් නියම කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන නිර්දෝශි භාවයේ පූර්ව නිගමනය මුළුමනින්ම නොසලකා හැර ඇත.

දිවි නැගුම දෙපාර්තමේන්තුව පිහිටා තිබී ඇත්තේ බොරැල්ලේ කාසල් වීදියේය. අධි චෝදනා වලට පදනම් කරගෙන ඇති ගණුදෙනු හා ක්‍රියාකාරකම් සියල්ලම සිදු වී ඇත්තේ බොරැල්ල කාසල් වීදියේ පිහිටි දිවි නැගුම දෙපාර්තමේන්තුව තුළදීය. පැමිණිලිකරු සේවය කර ඇත්තේ අංක: 24/4, කාසල් විදීය, කොළඹ -08 පිහිටි දිවි නැගුම කාර්යාලයේය. දිවි නැගුම දෙපාර්තමේන්තුව පිහිටි කාසල් වීදිය බොරැල්ල පොලිස් බල ප්‍රදේශය තුළ පිහිටා තිබේ. බොරැල්ල පොලිස්

බල ප්‍රදේශය අයත්වනුයේ මාළිගා කන්ද මහේස්ත්‍රාත් අධිකරණ බල ප්‍රදේශයටය. ඒ අනුව පැමිණිලිකරු ඇතුළු පිරිසට එරෙහිව පවරන ලද නඩුව පිළිබඳව අධිකරණ බලය ඇත්තේ මාළිගා කන්ද මහේස්ත්‍රාත් අධිකරණයට වන බැවින් පැමිණිලිකරු ඇතුළු පිරිස ඉදිරිපත් කළ යුතුය තිබුණේ මාළිගා කන්ද මහේස්ත්‍රාත්වරයා වෙතටය.

කරුණු එසේ පැවතුනද, පැමිණිලිකරු ඇතුළු පිරිස රක්ෂිත බන්ධනාගාර ගත කිරිම සඳහා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන ගොස් ඇත. කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය ලැබෙන බවට ප්‍රකාශයක් තබා ඒ බව හැඟවෙන එකම වචනයක්වත් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පළමු වතාවට කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කළ 2015.03.12 වන දින අංක බී.9556/15 දරණ වාර්තාව (පැ.11) ඉන්පසුව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරමින් එකී බී.9556/15 දරණ වාර්තාවට ගොනු කළ වැඩිදුර වාර්තාවල හෝ විත්තිකරුවන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට 2015.04.22 වන දින ඉදිරිපත් කරමින් බී.9556/15 දරණ වාර්තාවට ගොනු කළ වැඩිදුර වාර්තාවේ හෝ සඳහන්ව නැත. එසේම ඒ අයුරින්ම පැමිණිලිකරු, බැසිල් රාජපක්ෂ මහතා සහ බන්දුල තිලකසිරි මහතා යන තිදෙනාට එරෙහිව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කළ බී. 9557/2020 දරණ නඩුවේ (පැ.15) හෝ බී.9579/15 දරණ නඩුවේ (පැ.16) හෝ කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ අධිකරණ බලය ලැබෙන බවට කිසිදු අවකාශයක් හෝ අඩුතරමින් ඒ බව හැඟවෙන එකම වචනයක්වත් එකී බී. වාර්තා වලට ඇතුළත් කර නොමැත.

අපරාධය සිදු වූ ස්ථානය පිළිබඳව කිසිදු සඳහනක් නොකරමින් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත උක්ත සඳහන් කළ පැ.11, පැ.15 හා පැ.16 දරණ බී වාර්තා මූලාා අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ඉදිරිපත් කළ එම බී වාර්තා වල සඳහන් වැරදි විභාග කිරීම සහ තමන්ට අධිකරණ බලය ලැබෙන්නේද යන කරුණු කඩුවෙල මහේස්ත්‍රාත්වරයා විසින් විත්තිකරුවන්ව රක්ෂිත බන්ධනාගාර ගත කරන අවස්ථාවේද සලකා නොබලමින් පැමිණිලිකරු, බැසිල් රාජපක්ෂ මහතා සහ බන්දුල තිලකසිරි මහතා රක්ෂිත බන්ධනාගාර ගත කිරීම දේශපාලන බලපෑම් මත සිදු කරන ලද ක්‍රියාවක්ය යන අනුමිතයට එළැඹිව මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති සාක්ෂි හොඳින්ම ප්‍රමාණවත් වේ.

ඉහත සඳහන් කළ පැ.11, පැ.15 සහ පැ.16 යන බී වාර්තා සහ වැඩිදුර වාර්තාවල විත්තිකරුවන්ට එරෙහිව නඟා ඇති චෝදනා වන රජයේ මුදල් සාපරාධී සාවද්‍ය පරිහණය සහ විශ්වාසය කඩ කිරීම සහ ඊට කුමන්ත්‍රණය කිරීම සහ අනුබලදීම යන වැරදි වලට දණ්ඩ නීති සංග්‍රහය යටතේ චෝදනා කරමින් සහ ඒ සමඟම 2016 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණ පනතේ 03 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් කර ඇති බවටද චෝදනා නැඟිම මගින් පනත් දෙකක් යටතේ  චෝදනා කිරීම, චෝදනා එකිනෙක කණපිට හැරවීමක් බඳු ක්‍රියාවකි

සාපරාධී සාවද්‍ය පරිහරණය සහ සාපරාධී විශ්වාසය කඩ කිරීම යන චෝදනා මුදල් විශුද්ධිකරණ පනතේ 03 වන වගන්තියේ යටතේ චෝදනා සමඟ එකට එකතු කළ නොහැකි එකිනෙකට  සට්ඨනය වන චෝදනා බැවින් එවැනි චෝදනා ඉදිරිපත් කිරීම තුළින්ම ඉහත කී බී

වාර්තාවට අන්තර්ගත කර ඇති කරුණු වල විශ්වසනීය භාවය මුළුමනින්ම බිඳ වැටේ. පැවතුන යථා තත්ත්වය එසේ වුවත් මගහැර විත්තිකරුවන් රක්ෂිත බන්ධනාගාර කිරීමට ක්‍රියා කර ඇත.

2020 ජනවාරි 16 වන දින රාත්‍රී 8.00ට ජාතික රූපවාහිනියේ ප්‍රවෘත්ති ප්‍රකාශයේ දී ප්‍රචාරය කරන ලද 2015 ජනවාරි මස 08 වන දින පත්වූ නව රජයේ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වූ රංජන් රාමනායක මහතා සහ කඩුවෙල මහේස්ත්‍රාත් ධම්මික හේමපාල අතර සිදු වූ දුරකතන සංවාදයේ පටිගත කළ කොටසක් කොමිෂන් සභාව ඉදිරියේ වාදනය කිරීමෙන් පසුව පැ.23 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඒ අනුව රාජ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා සම ධම්මික හේමපාල මහේස්ත්‍රාත්වරයා අතර ඉතා කිට්ටු සම්බන්ධතාවයක් තිබී ඇති බව පෙනී යයි.

මෙම කරුණු අනුව පැමිණිලිකරු, බැසිල් රාජපක්ෂ මහතා සහ බන්දුල තිලකසිරි මහතා බන්ධනාගාර ගත කිරීම පිටුපස පැහැදිලි ලෙසම දේශපාලන බලපෑම් තිබී ඇති බවට නිගමනය කළ හැක.

වගඋත්තරකරුවකු ලෙසට නම් කර සිටින අනුර කුමාර දිසානායක මහතා සාක්ෂි ලබාදී ඇත. ජනාධිපති ලේකම් කාර්යාලයේ 2015.03.02 පැවති දූෂණ මර්දන කමිටුවේ රැස්වීමට අනුර කුමාර දිසානායක මහතා සහභාගි වී ඇති බව එකී රැස්වීම්ට සහභාගි වූ පුද්ගලයින්ගේ නාම ලේඛනය (list of participants) අනුව තහවුරු වේ. එම ලේඛනය පැ.39 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2015.02.16 වන දින අරලියගහ මන්දිරයේ පැවති රැස්වීම රනිල් වික්‍රමසිංහ මහතා විසින් මෙහෙයවන ලද අතර රැස්වීමට පැමිණි පළමු

පුද්ගලයා ලෙසට අනුර කුමාර දිසානයක මහතාගේ නම සඳහන් වේ. එහි සඳහන් අන්දමට දූෂණ විරෝධි කමිටුව 2015.02.18 වන දින සිට ක්‍රියාත්මක වී ඇති අතර ඒ සඳහා ලේකම් කාර්යාලය සහ පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීම සිදුකර ඇත. (පැ.39)

ඊට පසුවද අනුර කුමාර දිසානායක මහතා 23.02.2015, 2015.02.16 සහ 2015.02.09 යන දිනයන්හිදී ද අනුර කුමාර දිසානායක මහතා දූෂණ විරෝධී කොමිටියේ රැස්වීම් වලට සහභාගි වී ඇති අතර ඔහුගේ සහභාගිත්වය පෙන්නුම් කරන ලේඛන පැ.40 පැ.41 සහ පැ.42 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත

අනුර කුමාර දිසානායක මහතා සඳහන් කරන කරුණු එනම් තමන් දූෂණ විරෝධි කමිටුවේ කැබිනට් පත්‍රිකාව නොදන්නා බවත් එහි රැස්වීම් වලට සහභාගි නොවූ බවටත්, එසේම එවැනි කමිටුවක් ගැන තමන් දැනුවත් නොකළ බවත්, යන සාක්ෂිය පිළිගත හැකි සාක්ෂියක් නොවන අතර එය පැහැදිලි වශයෙන්ම අසත්‍ය සාක්ෂියකි. අනුර කුමාර දිසානායක මහතා එසේ පැවසුවත්, ඔහු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ රැස්වීම් කිහිපයකටම සහභාගි වූ බව පිළිගෙන ඇත. 2015.03.16 දින පැවති දූශන විරෝධී කමිටු රැස්වීමේදී අතිශය රහසිගත ලේඛනයක් සහභාගී වූවන් අතර සංවරණය වී ඇත. එම ලේඛනයද දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් වාර්තාවක් වූ අතර එහි දිවිනැගුම පොලිස් පරීක්ෂණය පිලිබද කරුනු අන්තර්ගතව තිබී ඇත. එය පැ.43 ලෙසට ඉදිරිපත් කර ඇත. වෛද්‍ය නිහාල් ජයතිලක මහතාගේ පරීක්ෂණ ඉක්මනින් අවසන් කරන බවට සඳහන්ව ඇත.

දූෂණ විරෝධී කමිටුව පිළිබඳව තමන් කිසිවක් නොදන්නා බවට අනුර කුමාර දිසානායක මහතා ඔහුගේ සාක්ෂි යෙදී නැවත නැවත ප්‍රකාශ

කරන්නට යෙදුනත් ඔහු පැහැදිලි ලෙසම මෙම දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයෙකු බවටත්, එහි අනු කමිටුවේ සාමාජිකයකු බවටත්, ක්ෂණික ප්‍රතිචාර කමිටුවේ සම්බන්ධීකාරක ලෙසට කටයුතු කළ බවටත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත්පත් කළ 2015-01-21 දින කැබිනට් සංදේශයට අනුව සහ එකී සන්දේශ මත එදිනම කැබිනට් මණ්ඩලය විසින් එළඹුන කැබිනට් තීරණයට අනුව ඔප්පු වී ඇත. එසේම එම තත්වය, අනුර කුමාර දිසානායක මහා මහතා දූෂණ විරෝධී කමිටුවේ ද , අනුකමිටුවේ ද, ක්ෂණික ප්‍රතිචාර කමිටුවේ ද, ක්‍රියාකාරී සාමාජිකයකුව සිටි බව එම කමිටුවේ රැස්වීම් වලට සහභාගී වී ඇති අයුරින් එම කරුණු පැහැදිලිව ඔප්පු වී ඇත.

දූෂණ විරෝධී කොමිටිය ගැන කිසිවක් නොදන්නා බවටත් එමම කමිටුවේ රැස්වීම් වලට තමන් සහ සහභාගි වී  නොමැති බවටත් සාක්ෂි දෙමින් සඳහන් කලත් එම කරුණු ඔප්පු කල හැකි කිසිදු සාධකයක් ඔහු සතුව නොවීය.  කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව රවි වෛද්‍යාලංකාර මහතා ඉතාමත් සුපිරිසිදු ලෙස දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් වලට සහභාගි වී ඇති අතර මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කරනු ලබන පරීක්ෂණවල ප්‍රගතිය දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම්වලදී සමාලෝචනයට ලක් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති බවද සාක්ෂි මගින් සනාථ වී ඇත.

එසේම රවි වෛද්‍යලංකාර මහතා විසින් සති අග අරුණ පුවත්පතට ලබාදුන් මාධ්‍ය සාකච්ඡාව මෙන්ම හිරු රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශනය කළ ඔහුගේ මාධ්‍ය සාකච්ඡාව ද ඔහු විසින් සිදුකළ මාධ්‍ය සහ සාකච්ඡා බවත් එම සාකච්ඡාවලදී එම කරුණු හෙළි හෙළිදරව් කළ බවටත් පිළිගෙන ඇත.

දූෂණ චෝදනා පිළිබඳව පැමිණිලි ලැබී තිබියදීත් එම පැමිණිලි විභාග කර 2015 රජයේ අමාත්‍යවරුන් හෝ ඔවුන් හා සම්බන්ධතා ඇති පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමක් හෝ අධිකරණයට ඉදිරිපත් කිරීමක් සිදු කර නැත. වගඋත්තරකරු හරස් ප්‍රශ්න වලට උත්තර නොදීම මත ඔහු යම් යම් කරුණු සැඟවීමට උත්සාහ දර ඇත. දිවි නැගුම දෙපාර්තමේන්තුව මුල් කාලයේ දී කාසල් වීදියේ පිහිටුවා තිබුණු බවට පිළිතරු දීම පවා ප්‍රතික්ෂේප කර ඇත්තේ ඔහු පිළිතුරු දුන්නේ නම් එසේ පිළිතුරු දුන්නේ නම් එම පිළිතුර ඔහුගේ අවාසියට හේතුවන බවට ඔහු දැන සිටි බැවිනි..

205/2020 නඩුවේ පැ.40, පැ.42 සහ පැ.46 අනුව වගඋත්තරකරු දූෂණ විරෝධි කමිටුවේ රැස්වීම් වලට 11 වන වගඋත්තරකරු සහභාගි වී ඇත. ඔහු සාක්ෂි විභාගයේ එවැනි දූෂණ විරෝධි කමිටු රැස්වීම් වලට සහභාගි නොවූ බවට අසත්‍ය ප්‍රකාශ කර ඇති අතර ලේඛන මගින් ඔහු එම රැස්වීම් වලට සහභාගි වී ඇති බව පැහැදිලි වේ. පැ.37 අනුව ද පැ.39, පැ.38, සහ පැ.41 ලේඛන. 11 වන වගඋත්තරකරු නව දූෂණ විරෝධි කමිටු රැස්වීම් වලට සහභාගි වී ඇති බව පැහැදිලිය. පැ.49 දරණ ලේඛනයේ සඳහන් රැස්වීමට 11 වන වගඋත්තරකරු සහභාගි වී ඇත. එය දූෂණ විරෝධි කමිටුවට හා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සහභාගි වී 2015.05.12 වන දින රැස්වීමට සහභාගි වූ බවට සනාථ වේ. පැමිණුමේ ලේඛනය පැ.49 (අ) ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. 205/2020 නඩුවේ පවත්නා තත්ත්වය, පරීක්ෂණ අවසන් කරන දිනය 17/03/20 ලෙසත් දේශපාලන කණ්ඩායමක් ඉදිරිපිටදී ප්‍රකාශ කරමින් එකඟ වී ඇති බව පැ.43 ලේඛනයෙන් සනාථ වේ. 11 වන වගඋත්තරකරු එහි සඳහන්

කරුණු පැහැදිලිව සිදු කර ඇත. පැ.48 ලිපිය මගින් 11 වන වගඋත්තරකරු විසින් ඉල්ලීමක් අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකකනායක වෙත යවා ඇති අතර එහි පිටපතක් දූෂණ විරෝධී කමිටුවේ ලේඛම් ආනන්ද විජේපාලට යවා ඇත. 11 වන වගඋත්තරකරු එම ලිපිය පිළිගෙන ඇත. එකී ලිපිය වගඋත්තරකරු මගින් නිකුත් කිරීම තුලින්, වගඋත්තරකරු දූෂණ විරෝධී කමිටුවේ පුද්ගලයෙකු ලෙසට ක්‍රියා කර ඇති බව පැහැදිලිය. පැ.49 ලිපිය මගින් ද ඒ අයුරින්ම දූෂණ විරෝධී කමිටුවේ උපදේශකයින්ට අදාළව ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කර ගැනීමට ඉල්ලා ඇත. එමගින් ද සාක්ෂිකරු පැහැදිලි ලෙසම දූෂණ විරෝධී කොට්ඨාසයේ කටයුතු වලට සම්බන්ධ වී ඇත. පැ.49 දරන විද්‍යුත් ලිපිය අනුව ජේ.සී වැලිඅමුණ විසින් 11 වන වගඋත්තරකරු හොංකොං බලා යාම අවශ්‍ය බවට සමන් ඒකකනයක යවා ඇත. එදිනම එනම් 2015.11.18 වන දිනෙන් අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක පොලිස්පතිට යවමින් 11 වන වගඋත්තරකරු හොංකොං බලා යාමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඇත. මෙම ලිපිය පැ.50 ලෙසට ඉදිරිපත් කර ඇත. පැ.44 ලිපි ගොනුව අනුව 11 වන වගඋත්තරකරු විසින් දිවි නැගුම පරීක්ෂණය සහකාර පොලිස් අධිකාරි සේරසිංහට භාර කර ඇත. එසේ වුවත් ඊට අදාළ බී වාර්තාවට ඇතුළත් කර ඇත්තේ දූෂණ මර්දන කමිටුවේ අධ්‍යක්ෂ සුමනපාලගේ නමය. (පැ.18 බී වාර්තාවට අනුව 316/2020 පැ.40 ලේඛනය)

දූෂණ විරෝධී කමිටු රැස්වීම්වලදී පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කරනු ලබන පරීක්ෂණ කඩිනමින් සිදුකළ යුතු

බවට හා එකී පරීක්ෂණ වල සිදුවන ප්‍රමාදයන් පිළිබඳව නිතර විමසීම් සිදුකර ඇති බව වාර්තා අනුව පෙනී යයි.

14 වන වගඋත්තරකරු සජිත් රත්නායක සාක්ෂියෙන් ද ඔහුගේ නිර්දෝෂී භාවය ඉදිරිපත් කෙරෙන සාක්ෂි කිසිවක් ඉදිරිපත් වී නැත.

හිටපු ඇමති මංගල සමරවීර මහතා හිටපු අමාත්‍ය පා. ම. පාඨලී චම්පික රණවක මහතා හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා අධ්‍යක්ෂ දූෂණ විරෝධී ලේකම් කාර්යාලය එම්.කේ. ආනන්ද විජේපාල මහතා යන වග උත්තරකරුවන් 205/2020 නඩුවේදි ලබාදුන් සාක්ෂි මෙම නඩුවටද ආදේශ කර ගන්නා ලෙසට ඉල්ලීමක් කර ඇත. කොමිෂන් සභාව විසින් එම ඉල්ලීම පිළිගෙන එම වගඋත්තරකරුවන්ගේ සාක්ෂි මෙම නඩුවට ආදේශ කිරීමට තීරණය කර ඇත.

හිටපු ඇමති මංගල සමරවීර මහතා, හිටපු අමාත්‍ය පා.ම. පාඨලී චම්පික රණවක මහතා සහ හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා යන වගඋත්තකරුවන් තිදෙනාම සඳහන් කළේ ඔවුන් දූෂණ විරෝධී කමිටුව ගැන කිසිවක් නොදන්නා බවත් එම කමිටුවේ රැස්වීම් වලට ඔවුන් සහභාගී වී නොමැති බවත්ය. මෙම වගඋත්තරකරුවන්ගේ එම සාක්ෂිය කිසිසේත් පිළිගත නොහැකි ය.

දූෂණ විරෝධී කොමිටිය පිහිටුවීම සිදු කර ඇත්තේ මෙම වගඋත්තරකරුවන් තිදෙනා නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ නායක එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසිනි. 2015 ජනවාරි මස 21වන දින ඉදිරිපත් කල එම කැබිනට් පත්‍රිකාවට සමගාමීව එවකට විදුබල අමාත්‍යව සිටි පාඨලී චම්පික රණවක මහතා ද එකී දූෂණ විරෝධී කොමිටියට සමානකම් දක්වන කොමිෂන්

සභාවක් පත් කිරීම සඳහා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර ඇති අතර අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ කැබිනට් සංදේශයකත්, පාඨලී චම්පික රණවක අමාත්‍යවරයාගේ කැබිනට් සංදේශයකත් යන දෙකම 2015.01.21 දින කැබිනට් මණ්ඩලය විසින් සලකා බලා ඉහත කී දූෂණ විරෝධී කොමිටිය පිහිටුවීමේ තීරණයට එළැඹ ඇත.

එබැවින්, දූෂන විරෝධී කොමිටිය ගැන තමං නොදන්නා බවට වගඋත්තරකරුවන් මෙම කොමිෂන් සභාව ඉදිරියේ ලබා දෙන සාක්ෂිය කිසිසේත් පිළිගත නොහැකි අතර එය මුළුමනින්ම අසත්‍ය සාක්ෂියක් බවට කොමිෂන් සභාව තීරණය කරයි.

හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඔහුගේ සාක්ෂිය දී සඳහන් කළේ කැබිනට් සංදේශය පිළිබඳව මෙන්ම කැබිනට් තීරණය ද ඊට අදාළ සියලුම පාර්ශවයන්ට දැනුම්දීම අමාත්‍යාංශය මගින් සිදු කළ බවයි. කැබිනට් සංදේශ ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය අනුව අදාළ කැබිනට් සංදේශය කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කිරීමට ප්‍රථම සියලුම කැබිනට් අමාත්‍යවරුන්ට ලබාදෙන බවත් එම කැබිනට් සංදේශයට අනුමත කිරීමෙන් පසුව ඉන් බැඳෙන සියලුම පාර්ශවයන්ට කැබිනට් තීරණය පිළිබඳව දැනුම් දෙන බවත් එය අදාළ අමාත්‍යාංශයට පැවරෙන වගකීමක් බවත් හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඔහුගේ සාක්ෂියේ දී සඳහන් කර ඇත.

මෙම සාක්ෂි අනුව තමන්ට 2015-01-21 දින දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමේ කැබිනට් සංදේශය සහ කැබිනට් තීරණය නොලැබුණු බවට එම වගඋත්තරකරුවන් තිදෙනා සිදුකරන ප්‍රකාශ කිසිසේත් පිළිගත නොහැකි ය.

ආනන්ද විජේපාල මහතා දූෂණ විරෝධී කොමිටියේ අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කළ බව පිළිගත්තේය. ඔහු රාජ්‍ය ආයතනයක සේවය කරමින් සිටි බවත් අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා විසින් ද්විතීය පදනම යටතේ වගඋත්තරකරු ස්ථාන මාරු කර දූෂණ විරෝධී කොමිටි ලේකම් කාර්යාලයට යවන ලද බවත් එය තමාගේ උවමනාවෙන් නොව සමන් ඒකනායක මහතා විසින් සිදුකළ නියමය අනුව ක්‍රියා කිරීමක් බවටත් සඳහන් කර ඇත. දූෂණ විරෝධී කොමිටියේ සේවය කිරීම වෙනුවෙන් ඔහු රජයේ මුදලින් වැටුප් ලබා ඇත. දූෂණ විරෝධී කොමිටිය රාජ්‍ය ආයතනයක් නොවන බැවින් එවැනි ආයතනයක සේවය කරමින් රජයේ මුදලින් වැටුප් ලැබීම රජයේ මුදල් අවභාවිතා කිරීමකි. ඒ අනුව ආනන්ද විජේපාල මහතා රජයේ මුදල් අවභාවිත කිරීමත් සමන් ඒකනායක මහතා රජයේ මුදල් අවභාවිතා කිරීමට ආධාර සහ අනුබල දීමත් සිදුකර ඇත.

අනෙකුත් වගඋත්තරකරුවන්ට යථා පරිදි සිතාසි නිකුත් කර තිබියදීත් ඔවුන් සිතාසියට ප්‍රතිචාර දක්වමින් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී නොසිටි බැවින් එම වගඋත්තරකරුවන් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හරින ලද පුද්ගලයන් ලෙසට නම් කිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.50 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .XI

පැමිණිලි අංකය - 316/2020

පැමිණිලිකරු - රත්නායක පල්ලියගේ බන්දුල තිලකසිරි

ලිපිනය - අංක:37/1, කුරුදුහින්න, කෑගල්ල.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්; වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු ඇමති මංගල සමරවීර මහතා
2. හිටපු අමාත්‍ය පා. ම. පාඨලී චම්පික රණවක මහතා
3. හිටපු ඇමැති රවුෆ් හකීම් මහතා
4. හිටපු ඇමැති සරත් ෆොන්සේකා මහතා
5. දෙමළ සන්ධාන නායක ආර් සම්බන්ධන් මහතා
6. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම් ඒ සුමන්තිරන් මහතා
7. ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක මහතා
8. නීතිඥ ජේ සී වැලිඅමුණ මහතා
9. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා
10. හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා
11. එරාන් වික්‍රමරත්න
12. හිටපු නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර මහතා
13. ආර්. ටී. එස්. ඒ. රත්නායක
14. ගුණවර්ධන

15. කුමාරසිරි
16. කලුආරච්චි
17. පී.කේ. සේරසිංහ මහතා
18. අධ්‍යක්ෂ දූ දූෂණ විරෝධී ලේකම් කාර්යාලය එම්.කේ. ආනන්ද විජේපාල මහතා
19. තිලක් සමරනායක මහතා
20. හේවහැටගේ සුමනපාල මහතා
21. නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ
22. හිටපු අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර රත්නායක පල්ලියගුරුගේ බන්දුල තිලකසිරි මහතා සහ අනෙකුත් වූදිතයින් වූ බැසිල් රෝහණ රාජපක්ෂ මහතා, යක්දෙහිගේ දොන් නිහාල් ජයතිලක මහතා සහ රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක මහතා ඇතුළු සිව්දෙනා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත

2. එසේම, රත්නායක පල්ලියගේ බන්දුල තිලකසිරි මහතාට එරෙහිව කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 9557/17 සහ බී 9556/15 දරන බී වාර්තා සහ එම බී වාර්තා වලට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර රත්නායක පල්ලියගේ බන්දුල තිලකසිරි මහතා ඇතුළු අනෙකුත් සියලුම චූදිතයින් නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති අංක 8222/16 දරන චෝදනා පත්‍රය නීතිපතිවරයා විසින් ඉල්ලා අස් කර ගැනීමටත් ඒ අනුව එකී අධිචෝදනා පත්‍රය නිෂ්ප්‍රභා කිරීම මගින් එහි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර රත්නායක පල්ලියගුරුගේ බන්දුල තිලකසිරි මහතා සහ අනෙකුත් චූදිතයින් වූ බැසිල් රෝහණ රාජපක්ෂ මහතා, වෛද්‍ය යක්දෙහිගේ දොන් නිහාල් ජයතිලක මහතා සහ රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

01. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

02. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,

03. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද, නිසි කරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් උත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

04. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

05. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් ආඥා පනතේ විධිවිධාන යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

06. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ බරපතළ හානි පූරනය කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි. ඒ අනුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්

පැමිණිලිකරුට අහිමි වූ ඔහුගේ රැකියාවේ සියලුම උසස්වීම් වරප්‍රසාද විදේශීය පුහුණුවීම් හිඟ වැටුප් සියල්ලම ඔහුට ලබා දීමත් ඔහු එවැනි රක්ෂිත බන්ධනාගාර ගත කිරීමකට පත් නොවූයේ නම් ඔහුට ඔහුගේ රැකියාවේ හිමිවන ස්ථානයට ඔහු පත් කිරීමත් මගින් පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිය හැකි බවට කොමිශන් සභාව ඒකමතිකව තීරණය කරන අතරම එම සහනයන් ලබා දීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

1995 දෙසැම්බර් මස 18 වන දින රත්නායක පල්ලියගේ බන්දුල තිලකසිරි මහතා වෘත්තිය පුහුණු අධිකාරියේ සහකාර අධ්‍යක්ෂකවරයෙකු ලෙස රාජ්‍ය සේවයට බැඳී ඇත. පසුව පැමිණිලිකාර බන්දුල තිලකසිරි මහතා වෘත්තිය පුහුණු අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරටත්, ඉන් අනතුරුව අධ්‍යක්ෂ ජනරාල් තනතුරටත් පත්වීම් ලැබ ඇත. එම පත්වීම සනාථ කෙරෙන පත්වීම් ලිපි පිළිවෙලින් පැ.01, පැ.02 සහ පැ.03 වශයෙන් සළකුණු කර ඉදිරිපත් කර ඇත.

2008.02.11 වන දින පැමිණිලිකාර බන්දුල තිලකසිරි මහතා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් හා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කර ඇත. එම පත්වීමේ ලිපිය පැ.05 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඔහුට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ ක්‍රියා කිරීම සඳහා පැමිණිලිකරු මුදාහරිමින් වෘත්තිය සහ

කාර්මික පුහුණු අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය මගින් ලේකම්, ජාතිය ගොඩනැඟිමේ හා වතු යටිතල පසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයට යොමු කරන ලද ලිපි දින පිළිවෙලින් පැ.06 සහ පැ.06 (අ) ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව වෘත්තිය පුහුණු අධිකාරියේ සේවයෙන් මුදාහැරිම මත සමෘද්ධි අධිකාරියේ ඒකීය පදනම මත සේවය කිරීමෙන් ඔහුට වැටුප් වැඩිවීමක් සිදු වී නොමැති අතර ඔහුට පෙර ලද වැටුපටම තනතුර ලබා දී ඇත.

2009.08.06 වන දින ලේකම්, ජාතිය ගොඩනැඟිමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය මගින් ලේකම්, වෘත්තිය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය වෙත යවා ඇති ලිපියෙන් පැමිණිලිකාර බන්දුල තිලකසිරි මහතාට වසර 03 ක සේවා දිගුවක් ඉල්ලා ඇති අතර එම ඉල්ලීමට අනුව ඔහුට එම සේවා දිගුව ලබා දී ඇත. ඒ බව සනාථ කෙරෙන ලිපි පිළිවෙලින් පැ.07 සහ පැ.08 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉන්පසුව නැවත වතාවක් 2013.08.01 වන දින පැමිණිලිකාර තිලකසිරි මහතාව තවත් වසර 03 ක කාලයක් සඳහා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කිරීම දිර්ඝ කර ඇත. එම ලිපිය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් යොමු කර ඇති අතර එම ලිපිය පැ.08(අ) වශයෙන් සලකුණු කර ඇති අතර එහි සඳහන්ව ඇත්තේ; "2013.08.03 දින සිට දිවි නැගුම දෙපාර්තමේන්තුව පිහිටුවන තෙක් පත් කරන" බවය.

ඒ අනුව පැමිණිලිකාර තිලකසිරි මහතාගේ රාජකාරි විදේශ ගමන් බලපත්‍රය දීර්ඝ කර ගැනීමට ආගමන විගමන දෙපාර්තමේන්තුවට යොමු කරන ලද ලිපිය පැ.09 (අ) ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.10 වශයෙන් සලකුණු කර ඇති 2013.12.02 දිනැති ලේඛනය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සභාපති, ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය අමතා පැමිණිලිකාර තිලකසිරි මහතා දිවි නැගුම දෙපාර්තමේන්තුව පිහිටුවන තෙක් සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා පත් කළ බව දන්වා ඇත. ඒ අනුව 2013.12.02 දින ලිපිය පැමිණිලිකරු යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට ලිපියක් යොමු කරමින් ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂ තනතුරින් ඉල්ලා අස්වී ඇත. ඒ බව සනාථ කෙරෙන ලිපිය පැ.10 (අ) වශයෙන් ඉදිරිපත් කර ඇත.

2014.01.03 දින අංක1843/47 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් දිවි නැගුම පනත 2014.01.03 දින සිට බලාත්මක වන බවට නිකුත් කරනු ලැබූ නිවේදනය අනුව ඒ වන විටත් සකස් කර තිබූ පසුබිම මත 2014-01-03 දින සිට දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පැමිනිලිකරු රාජකාරි කටයුතු ආරම්භ කර ඇත. මෙම කරුණු සනාථ කිරීමට පැ. 14(අ) සිට පැ.14(ඉ) දක්වා ලේඛන ඉදිරිපත් කර ඇත.

දිවි නැඟුම පනතේ 8 වන වගන්තිය අනුව පනතේ අරමුණු කාර්යක්ශම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පරිපාලන දිස්ත්‍රික්ක

හයක් පිහිටුවමින් 2014 ජනවාරි 10 වන දින අංක 1844/69 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කර ඇති අතර ඒ අනුව කොළඹ කළුතර රත්නපුර ගාල්ල මාතර යන දිස්ත්‍රික්ක වලින් සමන්විත වන පළමුවන පරිපාලන කලාපයේ කලාප ප්‍රධානියා ලෙස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව පැමිණිලිකරු පත්කර තිබේ. මේ කරුණු සනාථ කිරීමට පැ.15 සහ පැ.15(අ) ලේඛන ඉදිරිපත් කර ඇත.

දිවිනැගුම දෙපාර්තමේන්තුව පරිපාලනය සඳහා අවශ්‍ය කෙරෙන නිලධාරි මණ්ඩලය සහ ඊට පත් කරන නිලධාරීන්ගේ සුදුසුකම් හා ඔවුන් පිහිටවිය යුතු වැටුප් තලයන් දක්වමින් දිවිනැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත යවන ලද 2014-03-31 දිනැති ලිපියක් පැ.16 ලෙස ඉදිරිපත් කර ඇත. ඒ අනුව අනිකුත් තනතුරු අතර ක්ෂුද්‍ර මූල්‍ය යන තනතුරු ද ඇති කර තිබේ.

දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරිපාලන කලාප ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරමින් අනුමැතිය ලබා ගෙන ඇත. අමාත්‍ය මණ්ඩල සංදේශය පැ.17 (අ) සහ තීරණය පැ.17 (ආ) වශයෙන් ඉදිරිපත් කර ඇත. එම සංදේශය ඉදිරිපත් කළ ලිපිය පැ.17 ලෙස ඉදිරිපත් කර ඇත. 2014.05.20 වන දින පැමිණිලිකරු දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) ලෙසට පත් කර ඇත. පත්වීම් ලිපිය පැ.18 වශයෙන් සලකුණු කර ඇත. පත්වීම පැමිණිලිකරු විසින් 2014.05.21 ලිපියෙන් භාරගත් බවට දැනුම් දී ඇත. එම ලිපිය පැ.18(අ) වශයෙන් සලකුණු කර ඇත. ඉන්පසුව 2014.08.13 දින ලිපියෙන් පැමිණිලිකරු දිවි නැගුම ප්‍රජාමූල බැංකු සහ දිවි නැගුම ප්‍රජාමූල බැංකු

සමිතිවල කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙක් වශයෙන් පනතේ (2013 අංක 1) 33 (2) (i) (ඇ) වගන්තිය යටතේ පත් කර ඇත. පත් කිරීමේ ලිපිය පැ.19 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දිවයිනෙන් බැහැරව ගිය අවස්ථා කිහිපයදී පැමිණිලිකරු වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් ලෙසට පැ.19(අ) සහ පැ.20 ලිපි මගින් පත් කර ඇත.

පැමිණිලිකාර බන්දුල තිලකසිරි මහතා ස්ථිරව දිවි නැගුම දෙපාර්තමේන්තුව අන්තර්ග්‍රහනය වීම පිළිබඳව හුවමාරු වී ඇති ලිපි පැ.21 සහ පැ.21 (අ) ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2015 ජනවාරි මස 08 වන දින නව රජය පිහිටුවීමත් සමඟ දිවි නැගුම දෙපාර්තමේන්තුව පිළිබඳව යම් යම් වෙනස්වීම්, යම් යම් ප්‍රකාශ නිකුත් කිරීම සහ නිළධාරීන්ගේ තනතුරු මාරුවීම් සිදු වී ඇත. ඒ අනුව පැමිණිලිකරු විසින් 2015.01.27 ලිපියෙන් ඔහු දරණ ලද තනතුරු වූ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර පිළිබඳව පැහැදිලි කිරීමක් නිවාස සහ සමෘද්ධි අමාත්‍යාංශයේ ලේකම්වරයාට දන්වමින් ඔහුට දිවි නැගුම දෙපාර්තමේන්තු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ධුරයෙහි සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමට අවස්ථාව ඉල්ලා ඇත. එම ලිපිය පැ.23 වශයෙන් සලකුණු කර ඇත.

පැමිණිලිකරු මෙම කාලයේ දී අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අමතරව දිවි නැගුම දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂ ලෙසද සේවය කර ඇත. මේ සම්බන්ධයෙන් යහපාලන රජයට පැමිණිලි ලැබී ඇත අතර ඒ පිළිබඳව විමර්ශන සිදු කර ඇත.

ඒ අනුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් දිවි නැගුම දෙපාර්තමේන්තුවට පැමිණ කරුණු සොයා බලා ඇත. ඊට අමතරව දූෂණ විරෝධී කමිටුව විසින් පරීක්ෂා කළ බවට සහ එම දූෂණ විරෝධී කමිටුවේ අධ්‍යක්ෂ විසින් මූල්‍ය අපරාධ කොට්ඨාසයට පැමිණිලිකර ඇති බවට ද කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බී වාර්තාව පරිශීලනය කිරීමේ පැමිණිලිකරු අවබෝධ කරගෙන ඇත.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඇති පැමිණිලි බොහෝමයක ආරම්භය වශයෙන් ඉදිරිපත්ව ඇති මෙම දූෂණ විරෝධී කමිටුව පිළිබඳ කැබිනට් සංදේශය සහ කැබිනට් තීරණය පැ.24 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම දූෂණ විරෝධී කමිටුව සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව මෙම වාර්තාවේ වෙනම පරිච්ඡේදයක සඳහන් කර ඇත.

2015 පෙබරවාරි වනතෙක් පැමිණිලිකරු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය ලෙසට රාජකාරි කටයුතු කරමින් සිට ඇති අතර 2015.02.24 දින නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපියෙන් පැමිණිලිකරුගේ සේවය අත්හිටුවා ඔහු සේවයෙන් පහ කර ඇත. එම ලිපිය පැ.25 ලෙස ඉදිරිපත් කර ඇත.

2015 රාජ්‍ය මාරුවෙන් පසුව දිවිනැගුම දෙපාර්තමේන්තුව අහෝසි කරන විට තිලකසිරි මහතා දරන ලද තනතුරද අහෝසි වී ගිය බවට සඳහන් කරමින් ඔහු සමෘද්ධි දෙපාර්තමේන්තුවේ දරන ලද අධ්‍යක්ෂ ජනරාල් තනතුරද ඔහුට අහිමි කර ඇත.

උක්ත සඳහන් කරුණු සමාලෝචනය කිරීමේදී පැහැදිලිව පෙනී යන්නේ තිලකසිරි මහතා සමෘද්ධි අධිකාරියේ දරන ලද අධ්‍යක්ෂ

ජනරාල් පදවිය ඔහුට අහිමි කිරීම පැහැදිලිවම දේශපාලන පළිගැනීමක් මත සිදු කර ඇති බව ය. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පදවිය තිලකසිරි මහතාට ලබාදීමට හැකියාවක් නොතිබුණේ නම් ඔහුට ඒ හා සමාන රැකියාවක් ලබා දීමේ නෛතික යුතුකම පත්වීම් බලධාරීන් සතුව තිබූ බැවින් ඔවුන් එසේ නොකිරීම තුළින් තිලකසිරි මහතාට බරපතළ අසාධාරණයක් සිදුකර ඇත. දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා විසින් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 2015.02.26 දිනැති ලිපියෙන් පැමිණිලිකාර තිලකසිරි මහතා සුදුසු තනතුරකට බඳවා ගන්නා ලෙසට කරුණු ඉතා හොඳින් පැහැදිලි කරමින් ඉල්ලීමක් කර ඇත. එකී ලිපියෙහි වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ;

(උපුටා ගැනීම පැ. 26 – 4 සහ 5 ඡේදයන්) “කලාප අංක 01 හි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආර්.පී.බී.තිලකසිරි මහතා මේ වනවිට වයස අවුරුදු 51 වන වියෙහි පසුවන අතර එම නිලධාරියාට තවදුරටත් රාජ්‍ය සේවයේ රාජකාරි කිරීමට ඇති හැකියාව හා ඔහුට අහිමි වූ වැඩබලන (ක්ෂුද්‍ර මූල්‍ය ) අධ්‍යක්ෂ තනතුර හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර ද සැලකිල්ලට ගෙන රාජ්‍ය සේවයේ සුදුසු තනතුරක් දැරීමට අවස්ථාව ලබාදීම සාධාරණ බව කාරුණිකව සඳහන් කරමි.

ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කලාප අංක 01 හි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කොට 2015.02.28 දිනෙන් එම තනතුර අහෝසිවීම මත ආර්.පී.බී.තිලකසිරි මහතාට 2015.03.01 දින සිට මෙම

දෙපාර්තමේන්තුවේ හෝ අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතනයක සුදුසු තනතුරක් ලබාදීමක්, අවසන් වරට වැටුප හා දීමනා මෙන්ම අනෙකුත් පහසුකම් ලබාදීමටත්, සුදුසු බව නිර්දේශ කොට අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි." (උපුටා ගැනීම අවසන්)

මෙම ලිපිය පැ.26 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉන්පසුව ඉහත කී පැ.26 ලිපිය පදනම් කර ගනිමින් පැමිණිලිකරු විසින් නැවතත් 2015.03.04 වන දින ලිපියෙන් පවතින තත්ත්වය පැහැදිලි කර පැමිණිලිකරු සුදුසු තනතුරක පිහිටුවන ලෙසට ඉල්ලා ඇත. ඉන්පසුව නිවාස සහ සමෘද්ධි අමාත්‍යාංශයේ ලේකම් විමලසිරි පෙරේරා විසින් 2015.03.16 ලිපියෙන් පැමිණිලිකරු සහාධිපත්‍ය කළමනාකරණ මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරි නීති යන තනතුරට ද්වීතිය පදනම මත මාස 06 ක කාලයකට පත් කර ඇත. මේ ලිපියෙන් පැහැදිලි වන කාරනය වන්නේ පැමිණිලිකරුගේ සේවා අත්හිටුවීම සිදු කළ නොහැකි බවත්, එසේ කිරීමෙන් වරදක් සිදු කර ඇති බවට ලේකම්වරයා අවබෝධ කර ගෙන තිබෙන බවත්ය. එසේම පැමිණිලිකරු තවමත් සේවයේ සිටින පුද්ගලයෙකු ලෙසට පිළිගනිමින් මෙම පැ.28 දරන ලිපිය නිකුත්කර බව එහි අන්තර්ගතය තුලින් පැහැදිලි වේ. ඒ අනුව පැමිණිලිකරු සේවයට වාර්තා කර ඇත. (පැ.28(අ) සහ පැ.28 (ආ) )

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හේවාහැටගේ සුමනපාල විසින් 2015.03.03 වෙනි දින සිදු කරන ලද පැමිණිල්ල විභාග කළ බවට වාර්තා කරමින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පොලිස් පරීක්ෂක සජිත් රත්නායක විසින් අංක බී

9556/15 දරන වාර්තාව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. එකී වාර්තාවේ දෙවන පිටුවේ පළමුවන ඡේදයෙහි සඳහන් කර ඇත්තේ "මෙම පැමිණිල්ල 2015.2.27 දින දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ එම්.කේ ආනන්ද විජේපාල මහතා විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නියෝජ්‍ය පොලිස්පති තුමා වෙත යොමු කර ඇත" යනුවෙනි. එකී බී වාර්තාවේ සඳහන් අන්දමට ඉසුරුමත් නිවහනක් නැමැති නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව සිදුකරන ලද ගෙවීම් පිළිබඳව පරීක්ෂණ පවත්වන බවටත් ඒ සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු පද්ධතියේ මුදල් ලබාගෙන ඇති බවටත් සඳහන් කරමින් මෙම ක්‍රියාවන් පොදු දේපළ පනත යටතේ සහ මුදල් විශුද්ධිකරණ පනත යටතේ දඬුවම් ලැබිය යුතු වරදවල් ලෙස සාවද්‍ය ලෙස අර්ථ ගන්වමින් පොලිස් පරීක්ෂක සජිත් රත්නායක මහතා අසත්‍ය නිගමන ඇතුළත් වාර්තාවක් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බව එම වාර්තාවේ අන්තර්ගතය පරිශීලනය කිරීමේදී පැහැදිලිව පෙනී යයි. මෙම බී වාර්තාව පැ. 31 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉසුරුමත් නිවහනක් නැමැති නිවාස ව්‍යාපෘතිය දිවිනැගුම දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කර ඇති බවටත් ඒ අනුව දිවි නැගුම සහනාධාර ලාභීන්ට නිවාස අලුත්වැඩියා කිරීම සඳහා සමීක්ෂණයක් මගින් ලබාගත් දත්තයන් අනුව සහනාධාර ලාභියෙකුට රුපියල් දහදාහක උපරිමයකට යටත්ව රුපියල් 2,500 බැගින් වූ වාරික හතරකින් මුදල් ගෙවීමට චක්‍රලේඛයක් මගින් උපදෙස් ලබාදී ඇති බවටත් මෙම මුදල ගෙවීමට දිවිනැගුම ප්‍රජා මූල බැංකු පද්ධතියේ මුදල්, මහා භාණ්ඩාගාරයෙන්

ප්‍රතිපූර්ණය කිරීමේ කොන්දේසිය මත යොදාගැනීමටත් කටයුතු සූදානම් කර ඇති බවට ඉහත කී පැ.31 දරන වාර්තාවේ සඳහන් කර ඇති පොලිස් පරීක්ෂක සජිත් රත්නායක මහතා, ඒ සමඟම මෙම මුදල වියදම් කිරීම මුදල් විශුද්ධිකරණ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් ලෙසට අසත්‍ය සහ නොමග යවන වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කරමින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයංශයේ හිටපු ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක මහතා, හිටපු දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල් ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා, සහ දිවිනැගුම ප්‍රජාමූල බැංකු අංශයේ අධ්‍යක්ෂක ආර්.පි.බී. තිලකසිරි මහතා සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණ පනත යටතේ ක්‍රියා කරන බවට වාර්තා කරමින් ඔවුන්ගේ විදේශ ගමන් තාවකාලිකව අත්හිටුවීමට නියෝගයක් ඉල්ලා ඇත.

එකී වාර්තාවේම සඳහන් කරුණු වලට අනුව ඉසුරුමත් නිවහනක් ව්‍යාපෘතිය සඳහා මුදල් වියදම් කිරීම පැහැදිලි ලෙසම විනිවිදභාවයෙන් යුතුව නීත්‍යානුකූලව සිදු කර ඇති බවට කරුනු පැහැදිලිව පෙනී තිබියදීත්, එම කරුණු බී වාර්තාවේ අන්තර්ගත කර තිබියදීත්, පොලිස් පරීක්ෂක සජිත් රත්නායක ඉතාමත් සාවද්‍ය සහ ද්වේශ සහගත අන්දමින් ක්‍රියාකර ඇති බව ඉතා පැහැදිලිව පෙනී යයි.

කඩුවෙල මහේස්ත්‍රාත්වරයා ද බී වාර්තාවේ සඳහන් කරුණු කිසිවක් තම මනසට නොගෙන පොලිස් පරීක්ෂක සජිත් රත්නායක මහතා සඳහන් කරන කරුණු මතම ක්‍රියා කරමින් ඔහුගේ වුවමනාවන් ඉටු කිරීම උදෙසා සැකකරුවන් වශයෙන් ඉදිරිපත් කරනු ලැබූ වෛද්‍ය නිහාල් ජයතිලක මහතා, රණවක මහතා, තිලකසිරි මහතා සහ බැසිල්

රාජපක්ෂ මහතා රක්ෂිත බන්ධනාගාරයට පත් කර ඇත. මෙය ඉතාමත් ඛේදනීය තත්ත්වයකි.

දූෂී බව තුරන් කිරීම උදෙසා සමාජ මෙහෙවරක නියැලුන පුද්ගලයින්ට සිපිරිගෙය අත්කර දීමට ද්වේශ සහගත අන්දමින් ක්‍රියා කළ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පොලිස් පරීක්ෂක සජිත් රත්නායක ඇතුළු පිරිස පොලිස් සේවයට නොමැකිය හැකි අපකීර්තිමත් කැලලක් සිදු කර ඇති බැවින් ඔවුන් තවදුරටත් පොලිස් සේවයේ තබාගැනීම සුදුසු නොවන බව කොමිෂන් සභාවේ මතය වේ.

එකී බී වාර්තාවේ සඳහන් සුමනපාල, 2015 රජය පිහිටුවීමෙන් පසු 2015 පෙබරවාරි මස 27 හෝ 28 දින දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කර තිබේ. ඔහු 2015 මාර්තු 03 දින මෙම පැමිණිලිකරු එරෙහිව පැමිණිල්ල සිදුකර ඇත. ගත වී ඇති සුළු කාලය අනුව සුමනපාලට දිවි නැගුම දෙපාර්තමේන්තුවේ ගනුදෙනු පිළිබඳව කිසිදු පැහැදිලි අවබෝධයක් තිබිය නොහැකි අතර පැමිණිල්ල ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කරුණු පැහැදිලි ලෙසම ඔහු අසා දැනගත් කරුණු මිස ඔහු සොයා දැනගත් කරුණු නොවේ. සුමනපාල අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සිදු කරනු ලැබූ පත්වීම කැබිනට් මණ්ඩලය විසින් අනුමත නොකිරීමේ හේතුවෙන් ඔහුට එම තනතුර ඉන් සුළු කාලයකට පසු අහිමි වී ඇත. (පැ. 32 සහ පැ 32(අ)

දිවි නැගුම දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසුව එම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහනය නොවී සිය කැමැත්තෙන් ඉල්ලා අස්වන සේවකයින්ට වන්දි සහ පාරිතෝෂික ගෙවීම සඳහා අවශ්‍ය මුදල් ලබාගෙන එම ගෙවීම් සිදුකිරීම සම්බන්ධයෙන් ද මූල්‍ය අපරාධ

විමර්ශන කොට්ඨාසය පරීක්ෂණයක් සිදුකර බී 9556/2015 (පැ. 45) දරණ වාර්තාව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර පැමිණිලිකරු ඇතුළු පිරිස 2015.04.23 දින අත්අඩංගුවට ගෙන කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරයට පත් කර ඇත. මේ සඳහා යොදා ගත් මුදල් පොදු දේපළ ලෙස අර්ථ ගැන්වීම උත්සාහ කලත්, දිවිනැගුම පනත යටතේ ප්‍රජා මූල බැංකු අවිච්ඡින්න පැවැත්මක් ඇති ඊට ආවේණික වූ නෛතික භාවය හිමි පොදු මුද්‍රාවකට උරුමකම් කියන සංස්ථාපිත මණ්ඩල වන බැවින් එහි දේපල පොදු දේපල බවට පත් නොවේ. පැ.46 වශයෙන් ඉදිරිපත් කර ඇති 2017.07.20 දින දරන නීතිපතිවරයාගේ ලිපියෙන්ද මෙම තත්ත්වය පැහැදිලි කර ඇත. මෙම මුදල් ගෙවීම සිදු කර ඇත්තේ භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ කොන්දේසියට යටත්වය. ඒ අනුව ගෙවීම මනා විනිවිදභාවයකින් යුතුව සිදු වී ඇත. එම කරුණු සමාලෝචනය කර බැලීමේ දී පැහැදිලිව පෙනී යන්නේ දිවි නැඟුම පනතේ නෛතික විධිවිධාන ක්‍රියාත්මක කරමින් තම රාජකාරිය නිසි අයුරින් ඉටු කළ පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කිරීමයි.

ඉදිරිපත් වූ කරුණු ස්වාධීනව සොයා නොබලා තමන් ඇතුළු පිරිස රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට පෙළඹුණු කඩුවෙල මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතා එසේ සිදු කරනු ලැබුවේ ඔහු යම් දේශපාලන බලපෑමකට හසුවී සිටි නිසා බවට තහවුරු කෙරෙන, ඔහු සහ රන්ජන් රාමනායක අතර සිදු කෙරෙන දුරකථන සංවාදයක පටිගත කළ තැටියක් (පැ. 48) ඉදිරිපත් කර ඇත.

දූෂණ විරෝධී කමිටුව සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවීමටත් එකී ලේකම් කායීාලයට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමටත් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015.02.06 දින කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර ඇත. එම සන්දේශයේ සඳහන් අන්දමට 2015.02.05 වැනි දින රැස් වූ දූෂණ විරෝධී කමිටුව එම කමිටුවේ වැඩ කටයුතු සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවීමටත්, එකී දූෂණ විරෝධී කමිටුවට ලැබෙන පැමිණිලි පරීක්ෂා කිරීම සඳහා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයක් පිහිටුවීමටත් යෝජනා කර ඇත. ඒ අනුව ලේකම් කාර්යාලය සඳහා කාර්ය මණ්ඩලයක් කෙටිකාලීන පදනම යටතේ රාජ්‍ය සේවයෙන් හෝ පිටතින් බඳවා ගැනීමටත්, ලේකම් කාර්යාලයේ වැඩ කටයුතු සඳහා මිලියන 7.5 ක් මුදලක් ජනාධිපති කාර්යාලයේ  ක්‍රියාකාරී වැය ශීර්ෂයෙන් ලබා ගැනීමටත් වැඩිදුරටත් යෝජනා කර ඇත. මෙම යෝජනා 2015.02.11 දින පවත්වන ලද කැබිනට් රැස්වීමේ දී අනුමත කරනු ලැබ, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීම සඳහා පොලිස්පතිවරයා වෙත දැනුම්දීමක් සිදුකර ඇත. ( පැ.33 සහ පැ.33 අ)

පැමිණිලිකාර  තිලකසිරි මහතා 2015.4.23 දෙන අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරනු ලැබුවත් ඔහුගේ කටඋත්තරය මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සටහන් කර ගත්තේ 2015.03.11 වන දිනදීය. මෙම දිනයට පෙර අවස්ථා දෙකකදී හෝ තුනක දී කටඋත්තර ලබාගැනීම සඳහා තිලකසිරි මහතා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත කැඳවා ප්‍රශ්න කිරීම සිදුකරන ලද අතර ඔවුනට අවශ්‍ය උත්තර නොලැබුණු බැවින් තිලකසිරි මහතාගේ කට උත්තර

සටහන් නොකර අවසන් වතාවට 2015.03.11 දින සටහන් කරගෙන ඇත.

2015 පෙබරවාරි මාසයේ සිට 2017 ජූනි මාසය දක්වා කාල සීමාව තුළ දූෂණ විරෝධී කමිටු ලේකම් කායීාලයට දරන ලද වියදම සහ එහි වැඩ කරන ලද සේවකයන්ට සිදුකරනු ලැබූ වැටුප් ගෙවීම් පිළිබඳ වියදම් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා වෙන වෙනම සකස් කරන ලද වියදම් ලැයිස්තුවට අනුව දූෂණ මර්දන දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයේ වියදම් මිලියන 13.432283.01 කි. 2016 වර්ෂයේ වියදම මිලියන 14.066507.62කි. 2017 වර්ෂය සඳහා වියදම මිලියන 6216016.96 කි. එම වසර තුන සඳහා මුළු වියදම මිලියන 33714807.59 කි.

දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයට ගෙවන ලද වියදම දැක්වෙන ලේඛනය සහ ඊට අදාළ ඇමුණුම් පැ.49 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලේඛන අනුව, රු.33714807.59 ක මුදලක් ගෙවීම අනුමත කර ගෙවා ඇත්තේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ගණකාධිකාරීවරයා විසිනි.

මේ අනුව රාජ්‍ය ආයතනයක් නොවන නිල නොවන පෞද්ගලික දේශපාලන පළි ගැනීමේ සංවිධානයක කටයුතු කිරීම සඳහා රාජ්‍ය මුදල් රුපියල් 33714807.59 ක රජයේ මුදලක් වැයකර රාජ්‍ය මුදල් අවභාවිතා කරමින් පොදු දේපල සාපරාධී සාවද්‍ය පරිහරණය කර ඇත. මෙම රාජ්‍ය දේපල රජය සතු මුදල් අවභාවිතා කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීමේ වරදට දූෂණ මර්දන කොමිටියේ සාමාජිකයින්

වගකිව යුතු වන අතර ඔවුන්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහය යටතේ සහ පොදු දේපල නීතිය යටතේ නඩු පැවරිය යුතුවේ.

ඒ අනුව පොලිස්පතිවරයාගේ විසින් අති විශේෂ ගැසට් ප්‍රකාශනයක් මගින් "ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ නව පොලිස් කොට්ඨාසයක් ස්ථාපිත කිරීම යන ශීර්ෂය යටතේ" මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවන ලද බවට ප්‍රසිද්ධ දැන්වීමක් කර ඇත.

මෙම නව පොලිස් කොට්ඨාසය පොලිස් ආඥා පනත 55 වගන්තිය යටතේ පිහිටුවන ලද බවට ගැසට් පත්‍රයෙහි දක්වා ඇත. පොලිස්පති එන්.කේ. ඉලංගකෝන් මහතා මෙම ගැසට් පත්‍රයට සාවද්‍ය තොරතුරු ඇතුළත් කර ඇති බව පැහැදිලිව පෙනී යයි. "අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවා ඇති අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් අනුකමිටුව මගින් ස්ථාපිත කර ඇති ලේකම් කාර්යාලය විසින් මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයාට යොමු කරන අතර ඊට අමතරව විශේෂිත පැමිණිලි කැබිනට් අනුකමිටුව මගින් සෘජුවම මෙම කොට්ඨාසය භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරනු ලැබේ" යනුවෙන් පොලිස්පතිවරයා අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් කර ඇති කරුණු සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයකි. එවැනි කැබිනට් අනු කමිටුවක් පත් කර නොමැති අතර කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද්දේ දූෂණ විරෝධී කමිටුවක් සහ දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලයක්ය. මෙම ගැසට් නිවේදනයෙන් මහජනතාව බරපතළ ලෙස නොමග යැවීමක් පොලිස්පති ඉලංගකෝන් මහතා විසින් සිදුකර ඇත.

හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සාක්ෂියට කැඳවනු ලැබූ අතර වික්‍රමසිංහ මහතා විසින් මීට ඉහත දී 205/2020 නඩුවේදී දී ලබා

දී ඇති සාක්ෂිය මෙම නඩුවට ආදේශ කර ගන්නා ලෙසට ඉල්ලීමක් කරනු ලදුව දෙපාර්ශවයේම කැමැත්ත මත එම සාක්ෂිය වර්තමාන නඩුවට ද ආදේශ කරගෙන ඇත. පැ.24 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද තීරණය දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලය පිහිටුවීම සඳහා ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශය අනුව කැබිනට් මණ්ඩලය විසින් 2015.01.21 වන දින සිදු කළ තීරණයන් බවට පිළිගෙන ඇත. ඒ අනුව කැබිනට් සදේශයේ සඳහන් සාමාජිකත්වය යටතේ දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමටත්, එම සංදේශයෙහි දැක්වෙන අනුකමිටුව යටතේ සඳහන් අයගෙන් සැදූම්ලත් අනුකමිටුව පත් කිරීමටත්, එසේම සන්දේශයෙහි දැක්වෙන ක්ෂණික ප්‍රතිචාර කමිටුව යටතේ සඳහන් අයගෙන් සමන්විත ක්ෂණික ප්‍රතිචාර කමිටුව පත් කිරීම සහ සංදේශයේ ඇමුණුමේ අවසන් ඡේදයේ (1), (2), (3), (4) යටතේ සඳහන් වගකීම එහි දක්වා ඇති අදාළ තැනැත්තන් වෙත පැවරීමටත් අනුමැතිය ලබා දී ඇත. එසේම එකී කමිටු වල ලේකම්වරු / කැඳවුම්කරුවන් පත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට දැනුම් දීමට ද තීරණය වී ඇත.

අමාත්‍යාංශවල සහ දෙපාර්තමේන්තුවල ඇති දූෂණ සහ වංචා කෙලින්ම දූෂණ විරෝධී කමිටුවට ඉදිරිපත් කිරීමටත්, දූෂණ විරෝධී කමිටුව විසින් සලකා බැලීමෙන් පසුව එම පැමිණිලි මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට යොමු කිරීමත් සිදුකර ඇත. මෙම ලිපිය ජනාධිපති නීතිඥ වැලිඅමුණ මහතා විසින් සකස් කර තිබී ඇති අතර එය අග්‍රාමාත්‍යවරයාට ලබා දී ඇත. රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළ අන්දමට සියලුම කමිටු වලට පුද්ගලයින් පත් කිරීම සිදුකර ඇත්තේ වැලිඅමුණ මහතාය. එසේම 316/ 2020 නඩුවේ සලකුණු කර

ඇති පැ.33 සහ පැ.37 කැබිනට් තීරණ වලට අනුව දූෂණ විරෝධී කමිටුව සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවීම කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත.

කැබිනට් තීරණයට අනුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීම සඳහා පොලිස්පතිවරයාට දැනුම් දී ඇති අතර පොලිස් ආඥා පනතේ 55 වගන්තිය යටතේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීමට එකී වගන්තිය යටතේ බලයක් නොමැති බවට රනිල් වික්‍රමසිංහ මහතා පිළිගෙන ඇත. පොලිස් ආඥා පනතේ 55 වගන්තිය යටතේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීමේ බලයක් නොමැති නම්, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවමින් පොලිස්පතිවරයා විසින් නිකුත් කර ඇති ගැසට් පත්‍රය නීත්‍යානුකූල නොවන බවද රනිල් මහතා පිළිගෙන ඇත.

දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයේ වියදම පළමුව ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමට යෝජනා කළ බවත් පසුව භාණ්ඩාගාරයෙන් කෙලින්ම අගමැති කාර්යාලය යටතේ යොදවා අගමැති කාර්යාලයෙන් මුදල් ලබාදීම සිදුකර ඇත.

සමෘද්ධි සංවර්ධන පරිපාලන නිලධාරී පහල ගෙදර උපුල් ජයශාන්තගේ සාක්ෂියට අනුව දිවිනැගුම පනත සම්මත වීමෙන් පසුව ඒ වන විට තිබූ අධිකාරීන් කිහිපයක් අහෝසි වී ගොස් දිවිනැගුම දෙපාර්තමේන්තුව බිහිවී ඇත. ඒ අනුව දිවි නැගුම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වන පුද්ගලයන් සහ ඉල්ලා අස්වී වන්දි සහ පාරිතෝෂික ලබා ගෙන ඉවත් වන පුද්ගලයින් සම්බන්ධයෙන් වන කටයුතු තවමත් සිදු වෙමින් පවතී. ඒ අනුව අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය

සම්පූර්ණ වී නොමැති බැවින් සියලුම නිලධාරීන්ට පත්වීමේ ලිපි තවමත් ලැබී නොමැති අතර පැමිණිලිකාර තිලකසිරිටද තවමත් විධිමත් පත්වීමේ ලිපියක් ලැබී නොමැත. මෙය නිලධාරියාගේ වරදක් නොව අන්තර්ග්‍රහණ ක්‍රියාවලියේ ඇති සංකීර්න බව නිසා සිදුව ඇති ප්‍රමාදයකි. දිවි නැඟුම පනතේ ප්‍රතිපාදන අනුව ද දෙපාර්තමේන්තුවට එකතු වන නිලධාරීන්ට අලුතින් විධිමත් පත්වීමේ ලිපියක් නිකුත් කළ යුතුව තිබේ.

රාජ්‍ය සේවකයෙකු සේවයෙන් පහ කිරීමේදී ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව ක්‍රියා කළ යුතු නමුත් බන්දුල තිලකසිරි මහතාගේ සේවය අවසන් කිරීමේ දී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියා කර නොමැත. අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තිලකසිරි මහතාගේ සේවය අවසන් කිරීම සිදුකර ඇත්තේ කලාප කාර්යාල අහෝසි කිරීමේ ගැසට් පත්‍රය පදනම් කරගෙනය. ඒ අනුව තිලකසිරි මහතාට රැකියාව අහිමිවීමෙන් අසාධාරණයක් සිදු වී ඇති බවට සාක්ෂිකරු සඳහන් කර ඇත.

වගඋත්තරකරුවකු වශයෙන් නම් කර ඇති අනුර කුමාර දිසානායක මහතා සාක්ෂි දෙමින් සඳහන් කළේ දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම්වලට ඔහු සහභාගී නොවූ බවය. අනුර කුමාර දිසානායක මහතා එසේ ප්‍රකාශ කළත් පැ.37, පැ.38, පැ.39, පැ.40, පැ.42 සහ පැ.43 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද දූෂණ විරෝධී කමිටු රැස්වීම් වලට සහභාගි වූ බවට සනාථ කරන පැමිණිමේ ලේඛන වල, ඔහු එම රැස්වීම් වලට සහභාගි වූ පුද්ගලයකු බව සනාථ කරන සටහන් ඇත. අනුර කුමාර දිසානායක මහතාට තම සාක්ෂියේ දී එම ලේඛන ප්‍රතික්ෂේප කිරීමේ හැකියාවක් නොතිබිණි.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.49 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

Chandra Fernando
24/11/2020

## 9 .XII

පැමිණිලි අංකය - 88/2020

පැමිණිලිකරු - දොන් සතරසිංහගේ ජයවීර මහතා

ලිපිනය - අංක 81 ඒ, පන්සල පාර, පන්නිපිටිය.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න මහතා
2. පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා
3. හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා
4. එච් එම් පී එල් ටී මුදලිගේ මහතා
5. ජනාධිපති නීතීඥ ජේ සී වැලිඅමුණ මහතා
6. එම් කේ ආනන්ද විජේපාල මහතා
7. රවි වෛද්‍යාලංකාර මහතා
8. එස්. එස්. එම්. සාජිත් මහතා
9. ප්‍රේමසිංහ මහතා
10. ඩබ්ලිව් ජී පී කේ වීරසිංහ මහතා
11. පොලිස් කොස්තාපල් 71033 රාජමන්ත්‍රී මහතා
12. පොලිස් කොස්තාපල් 78193 කේ ඩී ජී මධුශංක මහතා
13. ප්‍රේමරත්න මහතා
14. උප පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මහතා

15.මිහිර ලියනාරච්චි මහතා

16.ටී. නිල්මිනි රේණුකා මහත්මිය

17.උදාර වික්‍රමසිංහ මහතා

18.හිරාන් කුරේ මහතා

19.හේමා ධර්මවර්ධන මහත්මිය

20.ඩබ් ඒ ඩී චන්ද්‍රසිරි මහතා

21.රණසිංහගේ සේමසිංහ මහතා

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර දොන් සතරසිංහගේ ජයවීර මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.
2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, දොන් සතරසිංහගේ ජයවීර මහතා මහතාට එරෙහිව කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 2881/16 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර

දොන් සතරසිංහගේ ජයවීර මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම පැමිනිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC 50/2018 දරන අධිචෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම

නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම පොලිස් නිලධාරීන්ට එරහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

6. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් වශයෙන් සේවය කල මෙම පැමිණිලිකරු 2015 ජනවාරි 31 වන දින සේවයෙන් ඉවත්වී ඇත. පැමිණිලිකරු ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරන අවධියේ දී ඔහු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද ක්‍රියාකර ඇති අතර ඊට අමතරව සංචාරක ප්‍රවර්ධන අධිකාරිය, හෝටල් සහ කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ/සාමාජික හා සම්මන්ත්‍රණ කාර්යාංශයේ අධ්‍යක්ෂක

මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් නිළ බලයෙන් පත්ව සේවය කර ඇත.

ඔහුගේ කාලවකවානු තුළදී දේශිය සංචාරක ප්‍රවර්ධනය සඳහා වූ යෝජනාවක් 2014 ජුලි මස 14 දිනෙන් යුතුව ශ්‍රී ලංකා සංචරණ සුභ සාධක සංගමය විසින් ශ්‍රී ලංකා සංචාරක සංගමයේ සභාපති භාෂ්වර සේනානායක මහතා වෙත ඉදිරිපත් කරනු ලැබ එම ව්‍යාපෘතිය ඵලදායි ව්‍යාපෘතියක් ලෙසට ඔහු විසින් සටහනක් යොදා ඇත. පැ. 01 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛනයේ එකී ව්‍යාපෘති සැලැස්ම අංක 03.04.01 සහ 03.04.02 යටතේ දැක්වෙන අතර එය පැ. 1(අ) ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම සංචාරක ප්‍රවර්ධන සැලැස්ම ඉදිරිපත් කළ ශ්‍රී ලංකා සංචරණ සුභ සාධන සංගමය සියළු දේශපාලන පක්ෂ වලට අයත් පුද්ගලයින්ගෙන් සැදුම්ලත් සුභ සාධන සංගමයකි.

අදාළ ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රවර්ධන වැඩ සටහන් පවත්වන ස්ථාන සහ ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල් පිළිබඳ ඇස්තමේන්තුවක් (පැ.03) සුභ සාධක සංගමය විසින් 2014.07.15 වන දිනින් සංචාරක මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කර ඇති අතර එකී ලේඛනයෙන් ඉදිරිපත් කළ කරුණු සලකා බැලීමෙන් පසුව එහි දැක්වෙන ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙල සුදුසු තත්ත්වයක නොතිබුණු බැවින් එය ක්‍රියාත්මක නොකර සංශෝධිත වැඩ සටහනක් නැවත 2014.07.15 වන දිනෙන්ම සුභ සාධක සංගමය මගින් ඉදිරිපත් කර ඇති අතර එකී සංශෝධිත ප්‍රවර්ධන වැඩ සටහන් වලට පැමිණිලිකරුගේ ද එකඟත්වය ලබා දී ඇත. මේ අනුව පැ.04

ලේඛනයේ දැක්වෙන පරිදි ප්‍රවර්ධන වැඩ සටහන සහ ඇස්තමේන්තුගත මුදල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

ඉන්පසුව සුභ සාධක සංගමය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි ප්‍රවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු ගත මුදල සුභ සාධක සංගමය වෙත මුදාහරින ලෙසට 2014.09.02 වන දිනෙන් යුතුව ඉල්ලීමක් (පැ.05) කර ඇත. අදාළ වැඩ සටහන සිදු කිරිම සම්බන්ධව සහ මුදල් වැය කිරීම සම්බන්ධ පූර්ණ වගකීම සුභ සාධක සංගමය මගින් දරණ බවට සුභ සාධක සංගමයේ සභාපති, ලේකම් සහ භාණ්ඩගාරික විසින් සිදු කළ සහතිකයක් ද 2014.09.02 වන දින දරණ ඉල්ලීමට ඇතුළත්ව ඇත.

ඉදිරිපත් කරනු ලැබූ උක්ත සඳහන් සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ එම තීරණය (පැ.02) අනුව මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා පොදු කටයුතු සඳහා වියදම් වැය ශීර්ෂයෙන්, ඇස්තමේන්තුගත මුදල වන රුපියල් 5,738,075.00 ක මුදලක් ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. එදින අධ්‍යක්ෂ හිරාන් කුරේ දිවයිනෙන් බැහැරට ගොස් සිටි බැවින් ඔහුගේ අනුමැතිය 2014.09.13 වන දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලබා දී ඇත.

2005 අංක 38 දරණ සංචාරක පනතේ සංචාරක සංවර්ධන මණ්ඩලය දැනුවත් කර ඒ වෙනුවට සංචාරක උපදේශන කොමිසමක්,Tourism Advisory committee පිහිටුවන ලදි. එසේම පනතේ v, vi, vii සහ viii පරිච්ජේද මගින් පිළිවෙලින්;

1. සංචාරක උපදේශක කොමිසම. (Tourism Advisory committee)
2. ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය. (Sri Lanka Institute of Tourism and Hotel Management)
3. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය. (Sri Lanka Tourism Bureau)
4. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය. (Sri Lanka Convention Bureau)

පිහිටුවා ඇත.

මෙම ව්‍යාපෘතිය පිළිබඳ පූර්ණ වගකීම සුභ සාධක සංගමය භාරගන්නා බවට 2014.09.02 දින පැ.05 දරණ ලිපියෙන් දැනුම් දී ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි අදාළ රුපියල් 5,738,075 ක මුදලක් ශ්‍රී ලංකා සංචරණ සුභ සාධක සංගමය නමින් චෙක් පතක් මගින් මුදාහැර ඇත. එයට අදාළ ලේඛන පැ.05, පැ.06 සහ පැ.07 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2005 අංක 38 දරණ සංචරණ (Tourism Act) පනත පැ.17 ලෙසට ඉදිරිපත් කර ඇත. එකී පනතේ 3 වන වගන්තිය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අරමුණ දක්වා ඇති අතර මෙවැනි විසදුම් එකී අරමුණු වලින් ආවරණය වේ. 03 වන වගන්තියේ සඳහන් අරමුණු අනුව සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීම සඳහා බාහිර සංවිධාන සමඟ කටයුතු කිරීම සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු වේ. පනතේ (3C 5), (3H ) වගන්තියේ විධි විධාන පරිදි සංචාරක කර්මාන්තයට සම්බන්ධ ප්‍රවර්ධනය කිරීමේ

කටයුතු සහ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා පුද්ගලික අංශයේ පුද්ගලයින් සහ පුද්ගල සංවිධාන ධෛර්යමත් කිරීම සංචාරක අධිකාරිය විසින් සිදු කළ යුතු වේ. ඒ අනුව එවැනි ප්‍රවර්ධන කටයුතු සඳහා මුදල් වැය කිරීමට ශ්‍රී ලංකා සංචාරක අධිකාරියට සිදුවන බැවින් සංචාරක ප්‍රවර්ධනය වෙනුවෙන් පුද්ගලික සංවිධාන සහ තනි පුද්ගලයින් වෙනුවෙන් සිදු කරනු ලබන මුදල් වැය කිරීම් සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනයට අදාළ නීත්‍යානුකූල මුදල් වැය කිරීම් වනු ඇත.

මෙම මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු ක්‍රියා කර ඇත්තේ ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම වර්ෂයට අදාළව අනුමත කරන ලද මුදල ශ්‍රී ලංකා සංචරණ සුභ සාධක සංගමයට චෙක්පතක් මගින් මුදාහැරීම මගින් පමණි.

මුදල් ලබාදීමෙන් පසුව එම මුදල් වැය කළ ආකාරය පිළිබඳව විගණන පරීක්ෂණයක් සිදු කිරීමටද පැමිණිලිකරු ක්‍රියාකර ඇත. සුභ සාධක සංගමය මුදල් විදයම් කළ ආකාරය පිළිබඳව වවුචර් පත් ඉදිරිපත් කර ඇති අතර විගණන ක්‍රියාවලියේ දී මෙම ගණුදෙනු සියල්ල පරීක්ෂණයට ලක් කර ඇත. පැමිණිලිකරු කිසිදු ප්‍රතිලාභයක් ලැබූ බවට විගණනයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ සොයා ගෙන නොමැත.

ඉහත කී ප්‍රවර්ධන වැඩසටහනින් පසුව සුභ සාධක සංගමය සතුව ඉතිරිව පැවති රුපියල් 1341213/- ක මුදල ආපසු නොගෙවන ලෙසටත් මහා පරිමාන මූල්‍ය වංචා සිදුවී ඇති බවටත්, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පරීක්ෂණ පවත්වන බවටත් සුභ සාධක

සංගමයට දැනුම් දීමක් සිදු කර ඇති බවට සුභ සාධක සංගමය විසින් පැ.08 දරණ ලිපියෙන් දැනුම් දී ඇත.

2015 අප්‍රේල් මස 18 වන දින හෝ 16 කාලසීමාවේ දී ප්‍රවාහන අමාත්‍යංශයේ දී ප්‍රවාහන අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර මහතා පැමිණිලිකරු සමග සිදු කළ සාකච්ඡාවේදී සඳහන් කළ කරුණු පිළිබඳව පැමිණිලිකරු සාක්ෂියේදී මෙසේ සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම)“ 2015 අප්‍රේල් මස 18 හෝ 16 කාල සිමාවෙදි එවකට ප්‍රවාහන ඇමතිවරයා වශයෙන් කටයුතු කල රංජිත් මද්දුම බන්ඩාර ඇමතිතුමා මට කතා කරලා කිව්වා මෙහෙම සංචාරක සංවර්ධන මණ්ඩලය කියලා කිව්වේ මොකද ඒ ගොල්ලෝ මණ්ඩලය කියලා තවම පාවිච්චි කරන්නේ, ඇත්තටම දූෂණ විරෝධී ලේකම් කාර්යාලය කියලා ආනන්ද විජේපාල කියලා මහත්මයෙක්ගෙන් සකස් වෙච්ච ආයතනයක් තියෙනවා ඒ ආයතනයේ රැස්වීමක් තියෙන තැන කතා කරලා තියෙනවා. මේ රාජිත සේනාරත්න මහත්මයාත් මලික් සමරවික්‍රම මහත්මයාත් හිටියා කිව්වා. ඊට පස්සේ මට කිව්වා මෙහෙම එකක් තියෙනවා. මොකක්ද කියලා. මම කිව්වා මම දන්න තරමින් මම වැරැද්දක් කරලා නැහැ. ඕක වෙන්න බැහැ කියලා. ඒ ගමන මගෙන් එතුමා ඇහුවා පුද්ගලිකව රාජිත සේනාරත්න මහත්මයා මාත් එක්ක තරහක් තිබෙනවද කියලා. මගෙ අතින් වැරද්දක් වෙලා, නැහැ මම දන්නේ නැහැ කියලා. ඔයාට ප්‍රශ්නයක් නැහැ. ඒ ගොල්ලෝ කියන්නේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ප්‍රශ්නයක් තියෙන්නේ.” (උපුටා ගැනීම අවසන්)

රංජිත් මද්දුම බණ්ඩාර මහතා සඳහන් කළ රැස්වීමට පැමිණ සිටි අනිකුත් පිරිස අතර අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය මලික් සමරවික්‍රම, ආනන්ද විජයපාල, තුසිත් මුදලිගේ යන පුද්ගලයින්ද සහභාගී වී සිටි බවට අමාත්‍යවරයා ප්‍රකාශ කර ඇත.

එහිදි පැමිණිලිකරු අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර මහතාට පවසා ඇත්තේ අමාත්‍යවරයා ඉල්ලා සිටිනු ලැබුවත් ඔහු වැරදි ක්‍රියා නොකරන බවටත් කෙසේ වෙතත් බැසිල් රාජපක්ෂ මහතා එවැනි ඉල්ලීම් කිසිදිනක පැමිණිකරුට සිදු කර නොමැති බවටත්ය. එසේම මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු සහ සභාපතිවරයා අත්අංඩගුවට ගැනීමට නියමිත බවටත්, පැමිණිලිකරුට කටඋත්තරයක් ලබා දීමට සිදුවන බවටත්, එසේම බැසිල් රාජපක්ෂ මහතා ද අත්අඩංගුවට ගන්නා බවටත් අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර ප්‍රකාශ කර ඇත.

රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යවරයා තමාට කරුණු සඳහන් කරන අවස්ථාව වන විට පැමිණිලිකරු ප්‍රවාහන අමාත්‍යංශයේ ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ සභාපති ලෙසට සේවය කරමින් සිට ඇති අතර ඔහු එම සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපියක් බාර දී ඇත. ඉන් සතියකට පමණ පසුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ රාජමන්ත්‍රී නැමැති පොලිස් කොස්තාපල්වරයෙක් විසින් පැමිණිලිකරු මූල්‍ය අපරාධ කොට්ඨාසය වෙත කැඳවා ඇත. ඒ අනුව 2015.04.27 වන දින සහ 29 වන දින පැමිණිලිකරු මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට ගොස් රාජමන්ත්‍රී හමුවී ඇති අතර එහිදි ලබා දුන් ප්‍රකාශය පැ.09 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එම ප්‍රකාශය අවසානයේ දී පොලිස් කොස්තාපල් රාජමන්ත්‍රී විසින් පැමිණිලිකරුගෙන් අසන ලද ප්‍රශ්න සහ ඊට ලබා දුන් පිළිතුරු පිළිබඳව පැමිණිලිකරුගේ සාක්ෂියේ දී මෙසේ පවසා ඇත.

> (උපුටා ගැනීම)"ප්‍රකාශය අවසන් කොටසෙදි රාජමන්ත්‍රී කියන පොලිස් කොස්තාපල් මගෙන් ප්‍රශ්න ගණනාවක් ඇහුවා. එකක් ඇහුවා බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ ව්‍යාපෘතිය කරන්න කිව්වද කියලා. මම කිව්වා නැහැ මේක අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සාමාන්‍යයෙන් වෙච්ච ක්‍රියාදාමයක් කියලා. ඊට පස්සේ මගෙන් ඇහුවා නිහාල් ජයතිලක අපේ අමාත්‍යාංශයේ හිටිය ලේකම්තුමා එතුමා මේකට බලපෑමක් කලාද කියලා. ඒකෙදී මම ස්වාමීනි කිව්වා බලපෑමක් වුනේ නැහැ. මේක අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය විදියට ගිය ව්‍යාපෘතියක්. ඒ පාර එතුමා කිව්වා එහෙනම් ඒ.එස්.පී. අසංග බණ්ඩාර ගුණතිලක මහත්තයා ඉන්නවා එයා ගාවට යන්න ඕන කියලා." (උපුටා ගැනීම අවසන්)

මෙම ප්‍රකාශය ලබා ගැනීමෙන් පසුව කොස්තාපල් රාජමන්ත්‍රී විසින් පැමිණිලිකරු සහකාර පොලිස් අධිකාරි අසංග ගුණතිලක මහතා වෙත රැගෙන ගොස් ඇත.

පැමිණිලිකරුගේ ප්‍රකාශය සටහන් කිරීමේදී පැමිණිලිකරුට කිසිදු පුද්ගලයෙකු බලපෑම් නොකල බවටත්, බැසිල් රාජපක්ෂ මහතා හෝ සුභ සාධක සංගමයේ සභාපති හෝ ලේකම් හෝ වෙනත් පුද්ගලයින් කිසිදු බලපෑමක් සිදු නොකළ බවටත් පැමිණිලිකරු සඳහන් කර ඇතත්, රාජමන්ත්‍රී එම ප්‍රකාශය සටහන් කර නොමැත. 2015.04.29

වන දින පැමිණිලිකරු සිදු කළ එකී ප්‍රකාශය පැ.09 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ප්‍රකාශයන් සටහන් කිරීමෙන් පසුව රාජමන්ත්‍රී විසින් පැමිණිලිකරු සහකාර පොලිස් අධිකාරි අසංග බණ්ඩාර ගුණතිලක මහතා ඉදිරියට පමුණුවනු ලැබූ අවස්ථාවේ දී ඔහු පැමිණිලිකරු ප්‍රකාශ කළ දේ සාක්ෂියේදී මෙසේ පවසා ඇත.

(උපුටා ගැනීම)

"උ :අසංග බන්ඩාර ගුණතිලක. එතුමා කිව්වා ඔයාලට හිරේ යන්න වෙනවා මේකෙන් බේරෙන්න නම් කරන්න තියෙන්නේ බැසිල් රාජපක්ෂ මැතිතුමා කිව්වායි කියලා එහෙම ලියන්න කැමති ද කියලා මම කිව්වා නෑ මම අවුරුදු 42 ක් රාජ්‍ය සේවයේ හිටිය මුදල් රෙගුලාසි සකස් කරනකොටත් මම මේවා වෙලා තියෙනවා මේක කිසිම වැරැද්දක් මූල්‍ය රෙගුලාසි වලටවත් ආයතන සංග්‍රහයේ කිසිම එකකටවත් කිසිම වැරැද්දක් වෙලා නැහැ. බැසිල් රාජපක්ෂ මැතිතුමා මගේ නිල කාලය තුල ලිකර් පර්මිට් එකක් දෙන්නවත් මට කෝල් එකක් දීලා නෑ. ඇත්තටම මට කිසිම දවසක කෝල් එකක් දීලා නෑ වැරදි වැඩක් කරන්න කියලා ඒක හින්දා මට ඒක කරන්න බෑ. මම හිරේ ගියත් ඒක ප්‍රශ්නෙකුත් නෙමෙයි කියලා.

ප්‍ර : ඔබේ උත්තරය උනේ එකයි

උ : ඔව් මම කිව්වා අනික ඕක මටත් අපහාසයක් අවුරුදු හතලිස් ගානක් රජයේ සේවයේ ඉදලා රාජකාරිය

නොදැන මෙහෙම එකක් කවුරුත් කිව්ව කියන්න පුළුන් කමක් නෑ කියලා. එයා ඊට පස්සේ නැගිටලා හැබැයි ඒ වෙලාවේ මම කිව්වා ඔබතුමා ඔහොම ඉදගෙන ඉන්න මමත් ඉදගෙන ඉන්නේ ඒ උනාට මට හොදට හිතන්න පුළුවන් කියලා.

ප්‍ර : ඒ අවස්ථාවේ රාජමන්ත්‍රීත් ඔතන හිටයා ද?

උ : රාජමන්ත්‍රී හිටියේ අනිත් පැත්තේ

ප්‍ර : එතන කවුරු කවුරුද හිටියේ ඔය කතා කරන ස්ථානයේ?

උ : රාජමන්ත්‍රී හිටියා තව දෙන්නෙක් හිටියා මම දන්නේ නෑ නම් වශයෙන් පොලිස් නිලධාරින් දෙන්නෙක් හිටියා හිටගෙන. ඒ එස් පී අසංග බණ්ඩාර ගුණතිලක අර මම අරහෙම බෑ කිව්වට පස්සේ නැගිටලා ගියා ඔය තියෙන එකකට අත්සන් කරගන්න කියලා.” (උපුටා ගැනීම අවසන්)

සහකාර පොලිස් අධිකාරි අසංග බණ්ඩාර ගුණතිලක එම ස්ථානයෙන් නැගිට ඉවත්ව යාමෙන් අනතුරුව රාජමන්ත්‍රී නැවතත් පැමිණිලිකරුගෙන් ප්‍රකාශ වෙනස් කරන්නේ දැයි විමසා ඇති අතර, පැමිණිලිකරු එම ඉල්ලීමද ප්‍රතික්ෂේප කළ බැවින් ප්‍රකාශයට අත්සන ලබා ගෙන ඇත.

පැමිණිලිකරු ප්‍රකාශයට අත්සන් තබා අවසන් වන විට සහකාර පොලිස් අධිකාරි අසංග බණ්ඩාර එම ස්ථානයට පැමිණ නැවතත් අසුන්ගෙන ඇත. ඔහු කිසිවක් ප්‍රකාශ කර නොමැති අතර පැමිණිලිකරු ඔහුට ස්තුති කර එතැනින් පිටවී ඇත.

මෙම සිද්ධියෙන් පසුව 2015.07.17 වන දින පැමිණිලිකරු හොංකොං බලා යාමට ගුවන් තොටුපලට පැමිණි අවස්ථාවේදී ආගමන විගමන නිළධාරීන් පැමිණිලිකරුගෙන් නඩුවක් පිළිබඳව විමසීම් කර පැමිණිලිකරුට එරෙහිව විදේශ ගමන් තහනමක් පනවා ඇති බවට දැනුම් දුන් බැවින් පැමිණිලිකරුට විදේශ ගතවීමට නොහැකිවීම කරණ කොටගෙන පැමිණිලිකරු ආපසු පැමිණ ඇත. පැමිණිලිකරු මෙම ගමන සඳහා ලබා ගත් විසා බලපත්‍ර සහ සමුළුවේ ආරාධනා පත්‍ර පැ.25, පැ.26 සහ පැ.27 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරුගෙන් කටඋත්තර ලබා ගැනීමක් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කර තිබියදීත් පැමිණිලිකරුට කිසිදු දැනුම් දීමක් සිදු නොකර විදේශ ගමන් තහනමක් පනවා තිබීම තුළින් පැමිණිලිකරු ගුවන්තොටුපළෙදී බරපතල අර්බුදයකට මුහුණපා ඇත.

ආපසු නිවසට පැමිණීමෙන් පසු පැමිණිලිකරු පොලිස්පතිට පැමිණිලි කරමින් විමර්ශනය වෙනත් නිළධාරීන් මාර්ගයෙන් සිදු කිරීමට ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම පැ.10 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම ලිපියට පිළිතුරු ලැබී නැති අතර පැමිණිලිකරු ඒ පිළිබඳව ඉදිරි පියවර ගැනීමක් සිදු කර නොමැත.

පැමිණිලිකරු විසින් පැ.11 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද විගණන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලදුව එය පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත. එම විගණන වාර්තාවට අනුව ප්‍රශ්න ගත ව්‍යාපෘතිය නිසි ආකාරව ක්‍රියාත්මක කර ඇති බවටත්, සුභ සාධක සංගමය සතුව දැනට ඉතුරුව ඇති මුදල් නිවැරදිව සඳහන් කර ඇති බවටත් විගණන වාර්තාවෙහි දක්වා ඇත. එසේ වුවත් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ශ්‍රී ලංකා සංචරණ සුභ සාධක

සංගමය වෙත පනවන ලද තහනමක් අනුව එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව දැනට ඉතුරුව සුභ සාධක සංගමය සතුව පවත්නා මුදල් ආපසු භාර දීමට නොහැකිව එමගින් රජයට පාඩුවක් වෙමින් පවති. ඒ සඳහා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පිළිබඳව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිළධාරීන් 2016 පෙබරවාරි හෝ මාර්තු මාසයේ දී පමණ පැමිණිලිකරුගෙන් නැවත ප්‍රකාශයක් ලබා ගෙන ඇත. සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සකස් කිරීමේ දී එය නිවැරදි පත්‍රිකාවක් ලෙසට සකස් කිරීම සඳහා කිහිප වතාවක් කෙටුම්පත් කිරීමට සිදු වන බව පැමිණිලිකරුගේ සාක්ෂියෙන් අනාවරණය විය. මෙම කෙටුම්පත් වලින් කිසියම් පත්‍රිකාවක් පොලිස් විමර්ශන ඒකකයේ නිළධාරීන් ලබා ගෙන එය අනුමත කළ අධ්‍යක්ෂ පත්‍රිකාව ලෙසට සලකමින් පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කර තිබේ. ඒ අනුව පැමිණිලිකරු එසේ කිහිප වතාවක් කෙටුම්පත් කර නිවැරදි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සකස් කරන බවට පැහැදිලි කර දීමෙන් පසුව පොලිස් කොස්තාපල් රාජමන්ත්‍රි විසින් පසුව පැමිණිලිකරුගේ එම ප්‍රකාශය සටහන් කරගෙන ඇත. එම ප්‍රකාශය සටහන් කර ගැනීමෙන් පසුව පොලිස් කොස්තාපල් රාජමන්ත්‍රි විසින් පැමිණිලිකරු සහකාර පොලිස් අධිකාරි අසංග බණ්ඩාර ගුණතිලක මහතා වෙතට රැගෙන ගොස් ඇති අතර ඔහු එම තත්ත්වය සටහන් කරගෙන ඇත.

පසු අවස්ථාවකදී පොලිස් කොස්තාපල් රාජමන්ත්‍රි, සංචාරක අධිකාරියේ මානව සම්පත් අංශයේ අධ්‍යක්ෂවරයා වශයෙන් සේවය කළ මිහිර ලියනආරච්චි නැමැති නිළධාරියා සහ තවත් නිළධාරියෙකු සමග විගණන අංශයට ගොස් විගණකාධිකාරි කරුණාතිලක

මහතාගෙන් ඉහත ගණුදෙනුවට අදාළ මුදල් ගෙවීමේ වවුචරය ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇතත් කරුණාතිලක මහතා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. මෙවැනි ඉල්ලීමක් කිරීමට හේතු වී ඇත්තේ අදාළ ව්‍යාපෘතියේ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා සංචරණ සුභ සාධක සංගමය භාර ගන්නා බවට සහතික කළ ලිපියද එම වවුචරයට අමුණා තිබූ බැවින් එකී ලිපිය එම වවුචරයෙන් ඉවත් කිරීමට බවට කරුණු අනාවරණය වී ඇත. එවැනි අදහසක් ඔවුන් තුළ නොතිබුණේනම් මෙම වවුචරය නිසි ක්‍රියා මාර්ග අනුගමනය කරමින් අධිකරණ නියෝගයක මගින් ලබා ගැනීමට හොඳින්ම හැකියාව ඔවුන්ට තිබුණි. අධිකරණ නියෝගයක් මගින් එම වවුචරය ලබා ගන්නා ලෙසට විගණකාධිකාරි කරුණාතිලක මහතා ඔවුන්ට දැනුම් දී තිබුණත් පොලිස් කොස්තාපල් රාජමන්ත්‍රි එවැනි නීත්‍යානුකූල ක්‍රියා පිළිවෙතකට පිවිස නැත.

එකී මිහිර ලියනආරච්චි නැමැති පුද්ගලයා එක්සත් ජාතික පක්ෂයේ ජාතික සේවක සංගමයේ පිරිසක් ද රැගෙන 2015 ජනවාරි මස 31 වන දින පැමිණිලිකරුගේ නිළ කාමරයට පැමිණ පැමිණිලිකරුට එම කාමරයෙන් පිටවී යන ලෙසට බලපෑම් කර ඇත. එදින මිහිර ලියනආරච්චි සමග පැමිණි පිරිස අතර උදාන වික්‍රමසිංහ, පී.යූ.රත්නායක, සිරිවර්ධන , අමිතා ඔවිටිපහන, සිල්ප තිලක, මැරීන් මහත්මිය, ජයසිංහ මහතා, ප්‍රසාද් නැමැති පුද්ගලයා ද සිට ඇත.

පැමිණිලිකරුගේ සාක්ෂියට අනුව ඔහුගේ නිළ කාමරයට ඇතුළු වී ඔහු නෙරපා දැමීමට සිදු කළ ප්‍රයත්නයන් සහ පොලිස් කොස්තාපල් රාජමන්ත්‍රි සමග ගොස් විගණකාධිවරයාගෙන් මුදල් ගෙවූ වවුචරය ඉල්ලා සිටීමත් එකම ක්‍රියාදාමයක කොටස් වේ.

පරීක්ෂණ පවත්වනු ලැබූ මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය විසින් සංචාරක අධිකාරියේ සියළුම අධ්‍යක්ෂවරුන් අත්අඩංගුවට නොගැනීම පිළිබඳව පාර්ලිමේන්තුවේ දී ප්‍රශ්න නඟා ඇත. සමහර අධ්‍යක්ෂවරුන් අත්අඩංගුවට නොගැනීම සිදු වී ඇත්තේ රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා විසින් සිදු කළ දැන්වීමක් අනුවය. මේ සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුරකුමාර දිසානායක මහතා පාර්ලිමේන්තුවේ දී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ප්‍රශ්න කර පැමිණිලිකරු අත්අඩංගුවට නොගැනීම පිළිබඳව විමසීමක් සිදු කර ඇතත් අත්අඩංගුවට නොගත් අධ්‍යක්ෂවරුන් පිළිබඳව විමසීමක් සිදු කර නොමැත. මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයමින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ සේවය කරන තමාගේ මිතුරෙක් ද අත්අඩංගුවට ගත යුතු පිරිස අතර සිටින බවත් ඇය අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම්වරියක වශයෙන් සේවය කරන බවත් සඳහන් කළේය.

2016 වර්ෂයේ ජුලි මාසයේ දී පැමිණිලිකරුට වෘත්තිමය ලේඛනයක් (Professional Paper) ඉදිරිපත් කිරීම සඳහා විදේශ ගතවීමේ අවශ්‍යතාවය පැන නැඟුන බැවින් ඒ සඳහා විදේශ ගමන් තහනම තාවකාලිකව ඉවත් කර ගැනීම සඳහා අවසර ලබා ගැනීමට මෝශන් පත්‍රයක් කොටුව අධිකරණයට ඉදිරිපත් කර ඇත.

මෙම මෝශන් පත්‍රය තහවුරු කිරීම සඳහා පැමිණිලිරුගේ නීතිඥ මහතා සමග 2016.07.12 වන දින අධිකරණයේ පෙනී සිට ඇති අතර එදින පාර්ශවකරුවන්ට නොතිසි නිකුත් කරමින් මෝශන් පත්‍රය 2016.07.23 වන දින තහවුරු කිරීමට නියම කර ඇත. එදින මූල්‍ය

අපරාධ විමර්ශන ඒකකයට පෙනී සිටීම සඳහා නොතිසි නිකුත් කරන ලද නමුත් ඔවුන් පැමිණිලිකරුගේ ඉල්ලීම සම්බන්ධව කිසිදු වාර්තාවක් එදින ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව මෝශන් පත්‍රය තහවුරු කිරීම සඳහා නැවතත් 2016.08.23 වන දිනට මෝශන් පත්‍රය තහවුරු කිරීම සඳහා දින ලබා දී ඇතත් එදිනද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පැමිණිලිකරුගේ ඉල්ලීම පිළිබඳව ඔවුන්ගේ ස්ථාවරය දක්වමින් වාර්තාවක් ඉදිරිපත් කර නොමැත.

මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නිළධාරීන්ගේ මෙම පළිගැනීමේ ක්‍රියාදාමය කරන කොටගෙන පැමිණිලිකරු එකී කොට්ඨාසයේ නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර මහතා හමුවී තමාට විදේශ ගතවීමට ඇති අවශ්‍යතාවයත් ඒ සඳහා විදේශ ගමන් තහනම ඉවත් කරවා ගැනීමට සිදු කර ඇති ඉල්ලීමට ප්‍රතිචාර නොදැක්වීමත් පිළිබඳව දැනුම් දෙනු ලැබූ අවස්ථාවේ දී නියෝජ්‍ය පොලිස්පතිවරයා පැමිණිලිකරු අමතමින් බැසිල් අමාත්‍යවරයා නඩුවට පැටලවීමට අවශ්‍ය ප්‍රකාශ සිදු කරන ලෙසටත් ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ මහත්මයා තදින් සිටින බවටත් එබැවින් එසේ නොකළ හොත් විදේශ ගමන් තහනම ඉවත් කිරීමට සහයෝගය ලබා දිය නොහැකි බවටත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ නොකළ බැවින් විදේශ ගමන් තහනම ඉවත් කර නොමැති අතර පැමිණිලිකරු ඇතුළු පිරිස අත්අඩංගුවට ගැනීම සඳහා මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය නීතිපතිවරයාගේ උපදෙස් මත ක්‍රියාත්මක වන බවට පැමිණිලිකරුට දැන ගැනීමට ලැබී ඇත.

ඒ අතර අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ මිතුරෙකු යැයි සඳහන් කළ චන්ද්‍රා වික්‍රමසිංහ නැමැති පුද්ගලයෙකු පැමිණිලිකරු අමතමින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට සූදානම් පවතින බැවින් ඒ අනුව ඔහු රක්ෂිත බන්ධනාගාර ගතවන බැවින්ද විදේශ ගමන් තහනම තාවකාලිකව ඉවත් කර ගැනීම සඳහා පැමිණිලිකරු ඉදිරිපත් කළ මෝශන් පත්‍රය ඉල්ලා අස්කර ගන්නා ලෙසට දැනුම් දී ඇත. එම යෝජනාවට පැමිණිලිකරු එකඟවී නොමැති අතර විදේශ ගමන් තහනම ඉවත් කරවා ගැනීමේ ප්‍රයත්නයෙහි තමන් නිරත වන බවට පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

මෝශන් පත්‍රය තහවුරු කිරීම සඳහා නියමිතව තිබූ දිනයේ දී පැමිණිලිකරු මහේස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයට ඔහුගේ නීතිඥ වික්‍රමාරච්චි මහතා සමඟ පැමිණි අවස්ථාවේ දී මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ නිළධාරීන් වන පොලිස් පරීක්ෂක සාජිත් සහ සාජන් වීරසිංහ පැමිණිලිකරු අධිකරණ පරිශ්‍රය තුළදීම අත්අඩංගුවට ගැනිමට සූදානම් වී ඇතත් එය ව්‍යවර්ථ කරළීමට පැමිණිලිකරු සමත් වී ඇත. මෙම අත්අඩංගුවට ගැනීමට සූදානම් වීම මගින් පැමිණිලිකරුගේ මානව හිමිකම් උල්ලංඝනය කළ බවට චෝදනා කරමින් මානව හිමිකම් කඩ කිරීමේ නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇත. මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම පැ.13 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම අවස්ථාවේදී ඉහතකී නඩුව සම්බන්ධව සිටි ජනාධිපති නීතිඥ ජේ.සී.වැලිඅමුණ මහතා නඩුවට මැදිහත්වීම මත පැමිණිලිකරුගේ නීතිඥ මහතා එකී මැදිහත්වීම සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේ දී පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ අවශ්‍යතාවයක්

නොමැති බවට රජය වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා පවසා ඇත. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරන ලද මානව හිමිකම්කඩ කිරීමේ නඩුව නීතිපතිවරයාගේ උක්ත සඳහන් එකඟත්වය අනුව අවසන් කර ඇති අතර පැමිණිලිකරුට මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් වන ලෙසට නියමම කර ඇත.

මේ අනුව පැමිණිලිකරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉහතකී එකඟතාවය මත ඉදිරිපත් වී ඇතත් මහේස්ත්‍රාත් අධිකරණයේ දී පැමිණිලිකරු ඇපමත මුදාහැරීමක් සිදු කර නොමැති අතර ඔහු රක්ෂිත බන්ධනාගාරයට පත් කර ඇත. මේ අනුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය ක්‍රියාත්මක නොකර එය කඩ කිරිමක් සිදුකර ඇති බවට කරුණු ඉදිරිපත් වී ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පැ.31 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එසේ වුවත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ දී ඇති කර ගන්නා එකඟත්වය මත 2018.01.17 වන දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් අනිකුත් විත්තිකරුවන් එනම්, රණවක මහතා, හේමා ධර්මවර්ධන මහත්මිය, චන්ද්‍රා වික්‍රමසිංහ මහතා සහ මුදල් අමාත්‍යාංශයේ සේරසිංහ මහතා ඇපමත මුදාහැර ඇත. මෙහි ඇති සුවිශේෂිභාවය නම් එවකට අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම්වරියක් වශයෙන් සේවය කළ සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරියක වූ හේමා ධර්මවර්ධන මිය අධිකරණයට ඉදිරිපත්වීම සඳහා පස්වරු 01.00 ට පමණ පැමිණ ඇති අතර එදින පස්වරු 02.00 පමණ වන විට ඇය ඇපමත මුදාහැරීම ද සිදු කර ඇත. හේමා ධර්මවර්ධන මහත්මිය ඇපමත මුදාහැරීම සඳහා අදාළ කරගත් නීතිය මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මහත්මිය විසින් පැමිණිලිකරු ඇපමත මුදාහැරීම සඳහා

යොදා නොගැනීමත් ඒ වෙනුවට ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමත් මෙහි ඇති ඉහත කී සුවිශේෂීභාවයයි. මෙය පැහැදිලිවම දේශපාලන උවමනා පිරිමසා ගැනීම සඳහාම සිදු කළ රක්ෂිත බන්ධනාගාර ගත කිරීමක් බවට කරුණු සනාථ වන්නේ එකී පක්ෂපාතී ක්‍රියාකාරකම් තුළිනි.

පැමිණිලිකරුට සිදු කළ පළිගැනීම්වල තවත් එක් අවස්ථාවක් වන්නේ ඔහු 2018.03.13 වන දින විදේශ ගතවීම සඳහා ඔහුට පනවා තිබූ විදේශ ගමන් තහනම ඉවත් කිරීමට ඉල්ලීමක් සිදු කළ අවස්ථාවේ දී රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා එකී ඉල්ලීමට විරෝධතාවය දක්වමින් පැමිණිලිකරුට එරෙහිව මහාධිකරණයේ 2018.01.17 වන දින නඩු පවරන ලද බවට කරුණු දක්වා ඇති අතර ඒ අනුව පැමිණිලිකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. මහාධිකරණයට ඉදිරිපත් කරන ලද අධිචෝදනා පත්‍රයෙහි චෝදනා 03 ක් අන්තර්ගතව ඇති අතර පැමිණිලිකරුට එරෙහිව 01 සහ 03 චෝදනා නඟා ඇත.

- පළමුවන චෝදනාවෙන් රු.57,3807/= මුදල් සාපරාධී විශ්වාසය කඩ කිරීමට කුමන්ත්‍රණය සහ අනුබලදීම, සහ
- තෙවනවන චෝදනාවෙන් 388 වන වගන්තිය යටතේ පොදු දේපළ පනත අනුව වරදක් සිදු කර ඇති බවට චෝදනා නඟා ඇත.

චෝදනා පත්‍රයේ පිටපතක් පැ.16 ලෙසට සලකුණු කර ඇත. අධිචෝදනා පත්‍රයේ මෙවැනි චෝදනා නඟා ඇතත් පැමිණිලිකරුට එරෙහිව එවැනි චෝදනා නැඟීමට කරුණු කිසිවක් ඉදිරිපත්ව නැත. මුදල් වියදම් කිරීම පනතේ ප්‍රතිපාදන වලට එකඟව සහ අරමුණු වලට එකඟ සිදු කර ඇති බැවින් එවැනි වියදම් සාවද්‍ය පරිහරණය යටතේ

හෝ සපාරාධි විස්වාසය කඩකිරීම යටතේ චෝදනා නැඟීමට හැකි අවස්ථාවන් කිසිසේත් උදා නොකරයි.

එපමණක ද නොව මෙම වියදම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි පරිදි සලකා බලා අනුමත කර ඇති බැවින් එවැනි වියදම් උක්ත සඳහන් දණ්ඩ නීති සංග්‍රහ යටතේ වූ වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරදවල් සංස්ථාපනය නොකරයි. 2015 අංක 38 දරණ සංචාරක අධිකාරි පනතේ 03 (h) වගන්තිය යටතේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා පුද්ගලික අංශයේ සංගම් හෝ පුද්ගලයින් උනන්දු කරවීමත් සංචාරක කර්මාන්තයට සම්බන්ධ ප්‍රවර්ධනය කිරීමේ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් පනතේ අරමුණු තුළ ගැනෙන බැවින් උක්ත සඳහන් වියදම් එවැනි ක්‍රියාකාරකම් උදෙසා දරණ ලද වියදම් බැවින් එකී වියදම් පනතේ අරමුණු තුළ නීත්‍යානුකූලව සිදු කරන ලද වියදම් වේ.

ඉහත සඳහන් කළ ප්‍රවර්ධන වැඩ සටහන සඳහා ආහාර පිළියෙල කිරීමට අවශ්‍ය වූ බැවින් ඒ සඳහා හෝටල් කළමනාකරණ ආයතනයෙන් අරක්කැමියන් ගෙන්වා ගෙන ඇති අතර ඔවුන්ට ද ඒ සඳහා ගෙවීම් කර ඇත.

වියදම් මේ අන්දමින් නීතියට එකඟව සිදුව තිබියදීත් පැමිණිලිකරුට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ක්‍රියාකර ඇත්තේ කෙසේ හෝ මෙම චෝදනා සඳහා බැසිල් රාජපක්ෂ මහතා හසුකර ගැනීමේ මූලික අභිප්‍රාය මත බව එබැවින් තමන්ට බැසිල් රාජපක්ෂ මහතා ඒ සඳහා ඇතුළත් කරන ලෙසට මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නිළධාරීන් බලපෑම් කළ බවටත් සාක්ෂි වලින් හෙළිවී ඇත.

පනතේ 23 වන වගන්තියෙන් සංචාරක ප්‍රවර්ධක අරමුදලක් පිහිටුවා ඇති අතර එකී මුදල් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම උදෙසා පනතේ ප්‍රතිපාදන අනුව වැය කළ යුතුවේ. මෙම අරමුදලට ලැබෙන මුදල් පිළිබඳව පනතේ 23 (2) වගන්තියෙහි සහ පනතේ 24 වගන්තියෙහි සඳහන් කර ඇත. ඒ අනුව එකී අරමුදලට භාණ්ඩාගාරයෙන් රාජ්‍ය මුදල් ලැබෙන බවක් සඳහන්ව නැත. එබැවින් සංචාරක සංවර්ධන අරමුදලේ මුදල් පොදු දේපළ පනත යටතේ ගැනෙන දේපළක් ලෙසට නිර්වචනය කිරීමේ හැකියාවක් නොමැත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 අනු ව්‍යවස්ථාව සහ මුදල් රෙගුලාසි වල අංක 875 (පැ.23) අනුව පොදු දේපළ ලෙසට ගැනෙන්නේ ඒකාබද්ධ අරමුදලේ මුදල් පමණය. කිසියම් අරමුදලක් ව්‍යවස්ථාවකින් පිහිටුවන ලදුව ඒ යටතේ සම්පාදනය කරන ලද ප්‍රමාණවත් විශේෂ නීති හා රෙගුලාසි එම අරමුදලට හෝ එහි කටයුතුවලට අදාළ වෙතොත් එම අරමුදල ඒකාබද්ධ අරමුදලට අයත් නොවේ. එම මුදල් පොදු දේපල පනතට නොවැටේ.

මේ අනුව සංචාරක සංවර්ධනයේ අරමුදල් පොදු දේපළ ලෙසට නිර්වචනය කරමින් පැමිණිලිකරු දිර්ඝ කාලයක් රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම සඳහා උපාය මාර්ගයක් ලෙසට පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් භාවිතා කර ඇති බව පැහැදිලිය.

මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් වියදම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොලැබුණේ නම් මුදල් ගෙවීමේ වවුචරය අත්සන් කිරීම සඳහා පැමිණිලිකරුට අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් බලතල හිමි නොවේ. මුදල් රෙගුලාසි අංක137 සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 සිට 153 දක්වා වගන්ති අනුව පැමිණිලිකරු ක්‍රියාකර ඇති අතර ඔහු

සුභ සාධක සංගමයට නිකුත් කර ඇත්තේ රේඛනය කරන ලද සුභ සාධක සංගමය නමින් වූ චෙක් පතකි.

2015 මැතිවරණයෙන් පසුව පැමිණිලිකරුගේ නිළ කාමරයට පැමිණි සුභ සාධක සංගමයේ නිළධාරීන් සහ තවත් පිරිසක් පැමිණ තර්ජනය කර නිළ කාමරයෙන් ඔහු ඉවත් කිරීමට උත්සාහ දරා ඇත. සංචාරක සංවර්ධන අධිකාරියේ එවකට මානව සම්පත් කළමනාකරු වශයෙන් සේවය කළ මිහිර උදයංගන වික්‍රමසිංහ මෙම කණ්ඩායමේ ප්‍රමුඛයා වශයෙන් ක්‍රියා කර ඇති අතර ඔහුන් පැමිණිලිකරුට තර්ජනය කරන අවස්ථාව වන විටත් පැමිණිලිකරු තම සේවයෙන් ඉවත් වන බවට ලිපිය භාර දී අවසන්ය.

පැමිණිලිකරුට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ දූෂණ මර්දන කමිටුව විසිනි. මෙම බී වාර්තාව පැ.31 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම කොමිෂන් සභා වාර්තාවේ වෙනම පරිච්ඡේදයක සඳහන් වන දූෂණ විරෝධී කමිටුව සහ දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇති අතර එම කරුණු කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂි මත පදනම් කර ඇත. මෙම දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා ලෙසට ආනන්ද විජේපාල මහතා ක්‍රියාකර ඇති අතර රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා නීති උපදේශක ලෙසට ක්‍රියාකර ඇත. පැමිණිලිකරු දැනගෙන සිටි අන්දමට රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා මෙම දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ සේවය කර ඇත්තේ එහි සේවකයෙකු ලෙසය. ඔහුගේ සේවයට එම කාර්යාලය විසින් ගෙවීම් කර තිබේ.

මේ සම්බන්ධයෙන් දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයෙකු වූද, ක්ෂණික ප්‍රතිචාර කමිටුවේ සම්බන්ධීකාරක වූ ද ජනතා විමුක්ති පෙරමුණේ නායක වූද අනුර කුමාර දිසානායක මහතා පාර්ලිමේන්තුවේදී දූෂණ විරෝධී කමිටුවේ සභාපති රනිල් වික්‍රමසිංහ මහතාගෙන් පහත දැක්වෙන අයුරින් ප්‍රශ්න කිරීම තුළින් ඉතා හොඳින් පැහැදිලි වන්නේ දූෂණ විරෝධී කොමිටුවේ ක්‍රියාකාරකම් නිවැරදිව සිදු කරන බව සමාජයට පෙන්වීම සඳහා දරණ ලද කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙලක් බවය.

(උපුටා ගැනීම) "මා ලග තිබෙනවා ගරු අගමැතිතුමනි පසුගිය 18 වනදා නීතිපති දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ ප්‍රධානියා වෙත එවන ලද ලිපියක්. සංචාරක මණ්ඩලයට අදාල පරීක්ෂණ කටයුත්තක් අවසන් කොට නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කලාට පස්සේ නීතිපති දෙපාර්තමේන්තුව විසින් 06 දෙනෙකු ඔබතුමා දන්නවා මේ කියන 6 දෙනා ගෙන් එක්කෙනෙක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ වැඩ කරන නිලධාරිනියක් බව. අත් අඩංගුවට ගෙන ප්‍රකාශ සටහන් කොට, පොදු දේපල පනත යටතේ අධිකරණයට වහාම ඉදිරිපත් කොට ඒ පිලිබඳ වාර්තාවක් නීතිපතිවරයාට යොමු කරන්න කියලා. අතිරේක සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ මහතා අත්සන් කරපු ලිපියක් මා ලග තිබෙනවා. තුසිත් මුදලිගේ මහතා තමයි මේ කියන දූෂණ විරෝධී කමිටුවේ නීති උපදේශක වශයෙනුත් එතුමාගේ මූලික වැටුපෙන් 50% ක වැටුපක් ලබනවා. ඒ නිසා එතුමාට විශේෂ කොටසක් භාර වෙනවා. අත්සන් කරපු ලිපියක් මා ලග තියෙනවා. නිතිපති

දෙපාර්තමේන්තුවට ලිපි ගොනුව යවා ඔවුන් අත් අඩංගුවට ගෙන ප්‍රකාශ සටහන් කොට අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා පොදු දේපල පනත යටතේ නියෝගයක් ලබා දී තිබියදී තවමත් එම ක්‍රියාමාර්ගය නොගැනීමට හේතුව කවරේද කියලා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමති." (උපුටා ගැනීම අවසන්)

නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලැබී තිබියදීත් අත් අඩංගුවට ගන්නා අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් හේමා ධර්මවර්ධන මහත්මිය අධිකරණයට පෙනී සිටි දිනයේම පැයක් දෙකක් වැනි කාලයක් ඇතුළත ඇප පිට නිදහස් කර හැරීම මෙම කුමන්ත්‍රණයේම තවත් එක් චරිතාංගයකි. හේමා ධර්මවර්ධනට ලැබුණු මෙම සුවිශේෂී අනුග්‍රහය මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මහත්මිය විසින් පැමිණිලිකරුට දක්වා නොමැති අතර රක්ෂිත බන්ධනාගාර ගත නොකරන බවට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ එකඟත්වයට ඇතුළත්ව තිබියදීත් සහ මහේස්ත්‍රාත් අධිකරයේ දී රජයේ විරෝධතාවයක් නොමැතිව තිබියදීත් පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරිම සිදු කර ඇත.

මේ අනුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මහත්මිය අධිකරණ බලය ක්‍රියාමත්මක කිරීමේ දි පක්ෂග්‍රාහිව තම බලය ක්‍රියාත්මක කරමින් දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා එකම චෝදනාව උදෙසා එකම උපදෙස් පත්‍රිකාවේ සඳහන් චූදිතයින්ගෙන් හේමා ධර්මවර්ධන මහත්මිය ඇපමත මුදාහැරිමත් පැමිණිලිකරු ඇපමත මුදාහැරීම ප්‍රතික්ෂේප කරමින් රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

මේ අන්දමින් නීතිගරුකව අනපනත් වලට එකඟව රාජකාරි කල නිර්දෝෂී රජයේ නිලධාරින් දේශපාලන පළිගැනීම් වලට ලක් කරමින් නිලනොවන සංවිධානයක් වන දූෂණ විරෝධි කමිටුව ද නිල නොවන

පොලිස් කොට්ඨාසයක් වන මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ද යොදා ගනිමින් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ සම්ප්‍රදායට විරෝධය පල කරමින් වවුචර් අත්සන් කිරීමේ දී ප්‍රවේසම් විමටත් එවැනි අත්සන් නොකිරීමේ වැඩ පිළිවෙලකට ප්‍රවේශ විමටත් ක්‍රියාකර ඇත. මේ සම්බන්ධයෙන් ද තම කුමන්ත්‍රණකාරි වැඩ පිළිවෙල ක්‍රියාත්මක කළ අනුර කුමාර දිසානායක මහතා තමා සුදනා විමේ න්‍යාය යළිත්වරක් සමාජයට පෙන්වමින් පාර්ලිමේන්තුවේදි අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න කිරීමක් සිදු කර ඇත. මේ සම්බන්ධව පැමිණිලිකරු තම සාක්ෂියේදී මෙසේ සඳහන් කර තිබේ.

> “මේ සිද්ධියෙන් පසුව රජයේ නිලධාරීන් සියලු දෙනා තීරණ ගැනීමේදී ඉතාමත් පරිස්සම් වුනා වවුචරයක් අත්සන් කිරීමේදී පරීක්ෂාකාරී වුණා 2016 දෙසැම්බර් මාසයේ ගංවතුරක් ඇති වුණා මිනී පෙට්ටියේ වවුචරය අත්සන් කරන්න රජයේ නිලධාරීන් අකමැති වුනා. මොකද වවුචරයක් අත්සන් කළොත් හිරේ යන්න සිද්ධ වෙන නිසා. මෙම ප්‍රශ්නය අහන්නේ කමිටුවේ සභාපති ගෙන එම කමිටුවේ සාමාජිකයෙක් දෙපැත්තක රඟපානවා එතුමා කමිටුවේ සියලුම කටයුතු කරලා එතනට ගිහිල්ලා ප්‍රශ්නයක් අහනවා මේ රටේ ජනතාවට මතයක් ඇති කරන්න ඒකට උත්තර දෙනවා ඒ කමිටු මේ සභාපතිතුමා එතකොට ඒ ලියුම ලියන්නේ එයාගෙ මූලික වැටුපෙන් බාගයක් පඩි අරගන්න මහත්මයෙක් ඒ මහත්මයා නීතිපති දෙපාර්තමේන්තුවේ චරිතය තමයි රඟපාන්නේ”

2015 පැවැති ජනාධිපතිවරයෙන් පසුව පිහිටුවන ලද නව රජය යටතේ සේවය කරමින් සිටි සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරින්

පිරිසක් සහ සුභ සාධක සංගමයේ නිලධාරීන් පිරිසක් පැමිණිලිකරුගේ නිලකාමරයට පැමිණ ඔහුට තර්ජනය කිරීමක් සිදු කර ඇත. ඒ පිළිබඳව පැමිණිලිකරු තම සාක්ෂයේදී මෙසේ සඳහන් කර ඇත.

> "සංචාරක සංවර්ධන අධිකාරියේ එවකට මානව සම්පත් කළමනාකරු වශයෙන් සේවය කළ මිහිර උදයංගන ලියනආරච්චි කියන මහත්මයා, වැඩබලන අධ්‍යක්ෂක, එතුමා ප්‍රමුඛ කණ්ඩායමක්, උදයංගන වික්‍රමසිංහ, ඒ කණ්ඩායම මගේ කාමරේට ඇවිල්ලා කිව්වා අස්වෙන්න කියලා. ඒ වෙන කොට මම අස්වීම භාර දීල තිබුණේ. එය භාරදීමේ ප්‍රශ්නයක් තිබුණේ. එතකොට මිහිර මහතාගේ පුද්ගලික ලේකම් හැටියට කටයුතු කළේ සුභසාදක සංගමයේ භාණ්ඩාගාරික රේණුකා මෙනවිය. චෙක්පත්ට අදාල සියළුම මුදල් වියදම් කරලා ඇය තමයි මෙය රජයේ විගණන අංශයට යොමු කරන්න කටයුතු කළේ මම කිව්වාට පස්සේ. එතුමිය තමයි මේ කියන ලිපිගොනුව ඇත්තටම හැන්ඩ්ල් කළේ. කටයුතු කලේ. එම ලිපිගොනුවේ අංකය මම කියන්නම්. එච්.ආර්.බී.එම්.23 කියන ලිපිගොනුව. එම ලිපි ගොනුව මිහිරි ලියනආරච්චි මහතා ඇත්තටම අස්ථාන ගත කරලා තිබෙනවා. මොකද පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නිලධාරි මහත්වරුන්ට මම කිව්වා මේක අරගන්න මෙකේ ඇත්ත කතාවක් තිබෙනවා. අතිකාල දීමනා ඉල්ලුවාම මම ලිව්වා."

මේ සම්බන්ධයෙන් පසු අවස්ථාවකදී පැමිණිලිකරු විසින් විගණකාධිපති වෙත දැනුම් දීමක් සිදු කර ඇති අතර එකී ලිපියේ පිටපතක් පැ.30 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත.

මෙම රාජකාරියේදී පැමිණිලිකරු විසින් සිදු කර ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව වවුචරය අනුමත කිරීම පමණි. ඔහු මෙම රාජකාරි සිදු කර ඇත්තේ මුදල් රෙගුලාසි විධි විධාන 137 පරිදිය. එබැවින් පැමිණිලිකරු විසින් කිසිදු මූල්‍ය අපරාධයක් සිදු කර නොමැති බව ඉතාමත් පැහැදිලිය.

පැමිණිලිකරු කිසිදු වරදක් සිදුකර නොමැති බවට නඩුවට අදාල කරුණු තුලින් ඉතාමත් පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වී ඇතත්. පැමිණිලිකරුට ඔහුගේ වෘත්තිමය රාජකාරි කටයුතු ඉටුකර ගෙන යාමට අධිකරණය හරස්වී ඇත. පැ.33 දරණ ලේඛනයෙන් ලැබුණු ආරධනාව පරිදි පැමිණිලිකරු විදේශගත වීම සඳහා සූදානම් වූ අවස්ථාවේ දී මාර්තු මාසයේ මහාධිකරණයේ නඩු පවරන බවට පවසමින් පොලිස් කොස්තාපල් 71193 මධුසංක පැමිණිලිකරු විරෝධය පළ කර ඇත. එසේ වුවත් නඩුව මාර්තු මාසයේ දී නොකැඳවන ලද අතර නඩුව කැඳවා ඇත්තේ 2018 අප්‍රේල් මස 20 වන දිනදීය.

හතරවන වගඋත්තරකරු වශයෙන් නම් කරන ලද ආනන්ද විජේපාල මහතාගේ සාක්ෂියට අනුව ඔහු 2004 වර්ෂයේ අවසන් කාලයේ දී අනුර කුමාර දිසානායක මහතාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ ලේකම් වශයෙන් සේවය කර ඇත. 2020 වර්ෂයේ දී ජාතික ජනබලවේගය පක්ෂයෙන් ඡන්දය ඉල්ලා ඇත. පැ.35 (2) ලේඛනය අනුව 50% ක දිමනාව රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතාට ගෙවන ලෙසට වගඋත්තරකාර ආනන්ද විජේපාල නිර්දේශ කර ඇත. මෙම ලිපිය තුසිත් මුදලිගේ නීති උපදේශක ලෙස නම්කර ඇත. එසේ වුවත් නීතිපතිගේ ලිපියෙන් තුසිත් මුදලිගේ කාර්යාලීය කටයුතු වලට

මුදාහැර නැත. (පැ.31 (1) අනුව) ඒ අනුව නීතිපතිගේ නිර්දේශය නොසලකා තුසිත් මුදලිගේ දූෂණ මර්දන කමිටු කාර්යාල කටයුතු වල යෙදී ඇත.

2016.01.01 වන දින ලිපිය මගින් තුසිත් මුදලිගේ මහතා දූෂණ මර්දන කමිටුවේ ලේකම් කාර්යාලයේ උපදේශකයෙකු ලෙසට පත් කරමින් අතිරේක ලේකම් හේමා ධර්මවර්ධන විසින් පත් කිරීමේ ලිපිය යවා තිබේ. එම ලිපිය පැ.38 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම ලිපියේ පිටපතක් විගනාකාධිපතිට යවන බවට සඳහන් කර ලබා ගන්නා නාමවලිය විගනාකධිපති ඇතුල් කර ඇතත් ඔහුට පිටපතක් යවා නොමැති බවට පැ.38 පරිශීලනය කිරීමේ දී පැහැදිලි වේ.

අට වන වගඋත්තරකරු වෙනුවෙන් පැමිණිලිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමක් සිදු කර ඇත. බැසිල් රාජපක්ෂ මහතාගේ බලපෑම් මත පැමිණිලිකරු ක්‍රියාකළ බවට පවස ලෙසට පොලිස් අධිකාරි අසංග බණ්ඩාර ගුණතිලක මහතා බලපෑම් කළ බවට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ මූලික අයිතවාසිකම් පෙත්සම හෝ ඇප අයදුම්පත්‍රය මහේස්ත්‍රාත් අධිකරණයට හෝ නීතිපතිවරයාට හෝ පොලිස්පතිවරයාට සඳහන් කර නොමැති බවට යෝජනා කරමින් ඒවා ඌනතාවයන් ලෙස සැලකීමට ඉල්ලා ඇත. පැමිණිලිකරු ඊට පිළිතුරු වශයෙන් සඳහන් කළේ එම කරුණු තම නීතිඥවරයාට දැනුම් දුන් බවත්, එම කරුණු ඇතුළත් නොවීම තමාගේ වරදක් නොවන බවත් නීතිඥවරයා අදාළ ඉල්ලීමට ගැලපෙන කරුණු පමණක් ඉදිරිපත් කර ඇති බවත්ය.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ. 1 සිට පැ. 36 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකරුවන් කිහිපදෙනෙකුද කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දී ඇත.

හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා සහ අධ්‍යක්ෂ දූ දූෂණ විරෝධී ලේකම් කාර්යාලය එම්.කේ. ආනන්ද විජේපාල මහතා යන වග උත්තරකරුවන් 205/2020 නඩුවේදි ලබාදුන් සාක්ෂි මෙම නඩුවටද ආදේශ කර ගන්නා ලෙසට ඉල්ලීමක් කර ඇත. කොමිෂන් සභාව විසින් එම ඉල්ලීම පිළිගෙන එම වගඋත්තරකරුවන්ගේ සාක්ෂි මෙම නඩුවට ආදේශ කිරීමට තීරණය කර ඇත.

03 වන වගඋත්තරකාර මලික් සමරවික්‍රම මහතා ඔහුගේ සාක්ෂියේදී සඳහන් කළේ ඔහු ද මෙම දූෂණ විරෝධී කමිටුව පිළිබඳව කිසිවක් නොදන්නා බවත් ඔහු කිසිදු දිනක දූෂණ විරෝධී කමිටුවේ රැස්වීම් වලට සහභාගි වී නොමැති බවත්ය. මෙම වගඋත්තරකරුගේ එම සාක්ෂිය කිසිසේත් පිළිගත නොහැකි ය.

මලික් සමරවික්‍රම මහතාද මෙම කොමිෂන් සභාව ඉදිරියේ දිවුරුමක් මත අසත්‍ය සාක්ෂි ලබා දී ඇත. පැ. 37 ලේඛනය අනුව 201502.16 දින ප.ව. 5.00 ට අඅරලියගහ මන්දිරයේ දී පවත්වා ඇති දූෂණ විරෝධී කමිටු රැස්වීමටද, පැ. 40 අනුව 2015.02.23 දින මධ්‍යහ්න 12.00 ට අරලියගහ මන්දිරයේ දී පවත්වා ඇති දූෂණ විරෝධී කමිටු රැස්වීමටද, පැ. 41 අනුව 2015.02.09 දින ප.ව. 5.00 ට අරලියගහ මන්දිරයේදී පවත්වා ඇති දූෂණ විරෝධී කමිටු රැස්වීමටද, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ජ්‍යේෂ්ඨ උපදේශක වශයෙන් මලික් සමරවික්‍රම මහතා සහභාගී වී ඇත.

වගඋත්තරකරු ලෙසට නම් කරන ලද සහකාර පොලිස් අධිකාරී අසංග බණ්ඩාර ගුණතිලක වෙනුවෙන් පැමිණිලිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමක් සිදු කර ඇත. රාජමන්ත්‍රී විසින් පැමිණිලිකරු අසංක බණ්ඩාර ගුණතිලක වෙත පමුණුවනු ලැබූ අවස්ථාවේදී ඔහු විසින් "ඔයාලට හිරේ යන්න වෙනවා මේකෙන් බේරෙන්න නම් කරන්න තියෙන්නේ බැසිල් රාජපක්ෂ මහතා කිව්වයි කියලා එහෙම ලියන්න කැමතිද" කියලා යනුවෙන් අසංක බණ්ඩාර ගුණතිලක මහතා සඳහන් කළ ප්‍රකාශය පැමිණිලිකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද මානව හිමිකම් කඩකිරීමේ නඩුවට හෝ මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ පැමිණිල්ලේ හෝ මහාධිකරණයට ඉදිරිපත් කළ ඇප අයදුම් පත්‍රයේ හෝ සඳහන් නොකළ බවට පැමිණිලිකරු පිළිගත්තේය. ඒ අනුව අසංක බණ්ඩාර ගුණතිලක මහතා විසින් ඒ අන්දමේ ප්‍රකාශයක් කළ බවට පැමිණිලි කරු ප්‍රථම වතාවට ප්‍රකාශ කර ඇත්තේ මෙම කොමිෂන් සභාව ඉදිරියේ බවටද පිළිගැනීමක් කර ඇත. පැමිණිලිකරු විසින් සිදු කරනු ලබන ප්‍රකාශයකට අත්සන් ලබා ගන්නා ලෙසට රාජ මන්ත්‍රීට පවසමින් අසංක බණ්ඩාර ගුණතිලක මහතා තම පුටුවෙන් නැගිට එලියට ගිය බවත් පසුව එම ස්ථානයට පැමිණියේ ප්‍රකාශය අවසන් කර අත්සන් කිරීමෙන් පසුව බවත් එම අවස්ථාවේදී පැමිණිලිකරු අසංක ගුණතිලක මහතාට ස්තූති කළ බවත් සඳහන් කර ඇත. පැමිණිලිකරු එසේ ස්තූති කළ බවට සඳහන් කිරීම තුළින් පෙනී යන්නේ පැමිණිලිකරුට කැමති ප්‍රකාශයක් සිදු කර ගැනීමට ඉඩ දී අසංක බණ්ඩාර මහතා එම ස්ථානයෙන් ඉවත් වීම පිළිබඳව පැමිනිලිකරු සතුට ප්‍රකාශ කළ බවකි. ඒ අනුව මෙම සාක්ෂි සලකා බලන විට අසංක බණ්ඩාර ගුණතිලක මහතා බලපෑම් කළ

පුද්ගලයකු ලෙසට වගඋත්තරකරුවකු ලෙසට නම් කිරීම සුදුසු නොවන බවට කොමිෂන් සභාවට පෙනී යයි.

දූෂණ විරෝධී කමිටුවට ලැබෙන පැමිණිලි උපදේශකවරුන් වෙත යොමුකර ඔවුන් ලබා දෙන වාර්තාව සමඟ ලිපි ගොනුව රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතාට යොමු කිරීමත්, රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා විසින් තීරණය කරනු ලබන පැමිණිලි පරීක්ෂණය සඳහා ඊට සුදුසු පොලිස් කොට්ඨාශය වෙත යොමු කිරීමත් 13 වන වගඋත්තරකාර ආනන්ද විජේපාල විසින් සිදු කර ඇත. අග්‍රාමාත්‍ය කාර්යාලයේ පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගී වූ බව 13 වන වගඋත්තරකාර ආනන්ද විජයපාල සාක්ෂි විභාගයේදී පිළිගෙන ඇත. අරලියගහ මන්දිරයේ දී පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවෙ රැස්වීම් වලට ආනන්ද විජයපාල සහභාගි වී ඇති බව එම රැස්වීම් වාර්තා අනුව ඔප්පු වී ඇත. එම රැස්වීම්වලට සහභාගී වූවන්ගේ නාම ලේඛන කිහිපයක් පැ. 41 පැ. 37 පැ. 39 පැ. 40 පැ. 38 පැ.43 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

13 වන වගඋත්තරකරු ආනන්ද විජේපාල, ජේ.සී.වැලිඅමුණ සහ අනුර කුමාර දිසානායක මහතාට නිළධාරීන් තෝරා ගැනීමේ වගකීම පවරා ඇත. වගඋත්තරකරු විසින් මෙම කාලසීමාව තුළ සිදු කරන ලද සියළු ගෙවීම් පිළිබඳ ලේඛන පැ.33, පැ.33 (1), පැ.33 (2), පැ.33 (3), පැ.33(4) සහ පැ.33(5) ලෙසට සලකුණු කර ඇත.

24/11/2020

2020.11.24

## 9 .XIII

පැමිණිලි අංකය - 319/2020

පැමිණිලිකරු - ඩබ්ලිව්.විමලසේන

ලිපිනය - අංක: 05, මෝරුපොල, ගම්පහ.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. ආනන්ද විජේපාල
2. තුසිත් මුදලිගේ

### තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර ඩබ්ලිව්.විමලසේන මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, ඩබ්ලිව්.විමලසේන මහතාට එරෙහිව කොළඹ කොටුව

මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 629/15 දරන බී වාර්තාවෙහි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර ඩබ්ලිව්.විමලසේන මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
   නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිණිලිකරු රඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකූඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන

වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

5. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

6. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

2010 මැයි මාසයේදී අමාත්‍යාංශය නැවත ඇති කිරීම යටතේ අමාත්‍යාංශය කිහිපයක් එකතු කොට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවා ඇත. නව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිණිය 2011 වර්ෂයේ දී විශ්‍රාම යාමෙන් පසු ජ්‍යේෂ්ඨත්වයේ

පලමුවෙන්ම සිටි පැමිණිලිකරු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි ලෙස 2011.03.02 දින පත්වීම් ලැබ ඇත. එම පත්වීමට අදාළ ලිපිය පැ. 1 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ප්‍රධාන ගණකාධිකාරි ලෙස එම අමාත්‍යාංශය භාර අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා සමඟ වැඩ කිරීමට සිදු වී ඇත. ඒ අනුව පැමිණිලිකරු හා ඔහුගේ සහායක ගණකාධිවරුන් සමග රාජකාරි ගමන් බිමන් යාම සඳහා අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලබා දුන් ලේඛනය පැ.02 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. රාජකාරි කටයුත සඳහා අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා සමඟ යාම්ර්ම් සිදු කිරීම කරණ කොටගෙන සාක්ෂිකරු, රාජපක්ෂ හිතවාදියෙක් ලෙසට ලේබල් කිරීමක් සිදු වී ඇත. එය සාවද්‍ය ප්‍රචාරයක් වූ අතර පැමිණිලිකරු අමාත්‍යවරයා සමග සිදුකර ඇත්තේ රාජකාරි ගමන් බිමන් යාම පමණකි. 2013.12.31 වන දින පැමිණිලිකරු විශ්‍රාම ගෙන ඇති අතර ඉන්පසු ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මූල්‍ය පාලන උපදේශක ලෙස පත් කර ඇත. එම පත්වීම සංචාරක හා හෝටල් කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පත්‍රිකාවක් මඟින් පත්වීම අනුමත කර ඇත. එය පැ.3 සහ පැ. 4 පැ. 5 සහ පැ. 5(1) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2015.03.16 දින ලිපිය මඟින් සංචාරක හෝටල් කළමනාකරණ මණ්ඩලයේ සභාපති විසින් සකස් කළ ලිපියක් (පැ.6) මඟින් පැමිණිලිකරුගේ සේවය ඇගයීමක් සිදු කලේ වුවත් පැමිණිලිකරුට ඉන් ඔබ්බට සේවය කිරීමට ලැබී නැත. දේශපාලනමය වශයෙන් බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා සමග රාජකාරි කටයුතු කිරීම හේතුවෙන් නැවත සංචාරක හෝටල් කළමනාකරණ මණ්ඩලයේ

රැකියාව ලැබී නැත. ඒ අනුව 2018 දක්වා සේවය කිරීමට තිබූ සේවා කොන්ත්‍රාත්තුව අහිමි වී ඇත. ඒ අනුව 2015.03.06 දින සිට ලැබිය යුතුව තිබූ අවුරුදු 03 ක සේවා දිගුව කාර්ය සාධනය හොඳට තිබියදීත් ලැබී නැත.

2015 සිදු වූ ආණ්ඩු පෙරළියත් සමඟ දූෂණ මර්දන ලේකම් කාර්යාලය මගින් පැමිණිලිකරුට එරෙහිව 2015.03.17 දිනින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත යවන ලද නිර්නාමික පැමිණිල්ලක් අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයෙන් සිදු කල කැඳවීම අනුව 2018.03.07 වන දින වන විට පැමිණිලිකරු 04 වතාවක් (FCID) මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට ගොස් ඇත.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් 2018.04.09 දින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති අංක බී 629/15 වාර්තාව මගින් චෝදනා හතක් ගොනු කරමින් එහි සඳහන් පැමිණිලිකරු ඇතුළු පුද්ගලයන් 5 දෙනෙකු වන හාෂ්වර සේනාංක ගුණරත්න, දොන් සරත්චන්ද්‍ර ජයවීර, ඉර්ෂාඩ් රුමී ජවුෆර්, වතුකාරගේ විමලසේන, සහ චානුක වීරබණ්ඩාර යන 5 දෙනාට දණ්ඩ නීති සංග්‍රහයේ 186, 344 සමග කියවෙන 1982 අංක 12 දරන පොදු දේපල විෂයෙහිලා සිදු කරනු ලබන පොදු දේපළ පනතේ 5(1) වගන්තිය යටතේ ගැනෙන වරදවල් සිදුකර ඇති බවට වාර්තා කර ඇත. මෙම බී වාර්තාව පැ. 7 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එකී බී වාර්තාවේ සදහන් චෝදනා වලට අදාළව පහත සදහන් කරුණු 7 ක් දක්වා ඇත.

- ශ්‍රී ලංකා සංචරණ සුහසාධක සංගමයට සංචාරක සංවර්ධන අධිකාරියේ රාජකාරියක් වන ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2014.09.03 දිනැති වවුචරකින් රුපියල් 5,738,075/= ක මුදලක් ගෙවීම. ඊට අදාළව පැමිණිලිකරු ක්‍රියා කර නැත.

- සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් First Media Solutions Group (PVT) LTD නැමැති ආයතනයට ගෙවන ලද රුපියල් 42,349,200/= ක මුදලක් ගෙවීම. - පැමිණිලිකරු මෙහිදි සිදු කර ඇත්තේ මුදල් රෙගුලාසි පනතේ 139 යටතේ කටයුතු කිරීමට , 137 සහ 138 යටතේ ලියවිලි සහතික කිරිම සිදු කළ පසුව පැමිණිලිකර සිදු කළ ක්‍රියා මාර්ගය 139 න් දක්වා ඇත.

- සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් First Media Solutions Association නැමැති ආයතනය ගෙවන ලද රුපියල් 57,090.700/= ක මුදලක් ගෙවීම. - චෝදනවාද ඒ අයුරින්ම මුදල් රෙගුලාසි පනතේ 137 සහ 138 ට අදාළව කටයුතු කර ඇත. ඔහු ක්‍රියා කර ඇත්තේ 139 යටතේ පමණි.

- සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සමස්ත ලංකා පැවිදි සංවිධානයට ගෙවන ලද රුපියල් 5,000,000/= මුදලක් ගෙවීම. - මේ වැනි ගෙවිමක් එවැනි ආයතනයකට ගෙවිම් සිදු කර

නොමැත. වෙක්පතෙහි වෙනත් පුද්ගලයෙකුගේ අත්සනක් ඇත.

- ගම්පහ ඔරුතොට පාර පිහිටි ඇමතිවරයෙකුගේ කාර්යාලයට අහාර ද්‍රව්‍ය සැපයීම. - හෝටල් කළමනාකරණ ආයතනයෙන් නිකුත් කළ ඉන්වොයිස් පත්‍රයට අනුව අදාළ ආහාර වලට නියමිත ගෙවීම් සිදු කර ඇති අතර ගෙවීම් සිදු නොකර ආහාර ගත් බවට සාක්ෂි නොමැත. එසේම රජයේ මුදල් ඒ සඳහා වැය කළ බවට සාක්ෂි නොමැත. 02 වන චෝදනාවට අදාළව ඇති මෙම ලේඛනයේ පැමිණිලිකරුගේ අත්සන නැත. මුදල් රෙගුලාසි අංක 137,138 සහ 139 යටතේ කළ කිසිදු ලියවිල්ලක පැමිණිලිකරුගේ අත්සන තබා නොමැත. අදාළ වෙක්පත්වල පිටපත් පැ.8 (i), පැ.8 (ii), පැ.8 (iii) , පැ.8 (iv), පැ.8(v) සහ පැ.8 (vi) ලේඛනයේ පමණක් පැමිණිලිකරුගේ අත්සන මුදල් රෙගුලාසි 139 යටතේ සිදු කළ රාජකාරියක් සඳහා යොදා ඇත.

මුදල් රෙගුලාසි 137 සහ 138 යටතේ නිළධාරින් කටයුතු කළ යුතු ආකාරය දක්වන ලේඛනයක් පැ.9 හා එහි කොන්දේසි පැ.9 (1) ලෙස ඉදිරිපත් කර ඇත. එම කොන්දේසි පහතින් දක්වා ඇත.

(උපුටා ගැනීම)

"(අ ) සේවය හෝ සැපයීම සඳහා නිසි පරිදි බලය ලැබී ඇති බවට;

(ආ) මිල ගණන් ගාස්තු ප්‍රමාණයන් සාධාරණ සහ යුක්ති සහගත බවට කොන්ත්‍රාත්තුවකට හෝ අනුමැතිය මිල ගණන්වලට අනුකූල බවට;

(ඈ) ගණන් බැලීම නිවැරදි බවට;

(ඈ) සේවාවන් සතුටුදායක අන්දමින් සම්පූර්ණ කර ඇති බවට/ ද්‍රව්‍යයන් විස්තර හා සාම්පල් අනුව නිවැරදි ලෙස සපයා ඇති බවට පසු පිටෙහි සඳහන් ප්‍රකාර ලැබූ ද්‍රව්‍ය, තොග බඩු වට්ටෝරු පොතේ පිටුවල ඇතුළත් කොට ඇති බවට;

(ඉ) මෙම සේවාවන් සැපයීම සම්බන්ධයෙන් වෙනත් වවුචරයක්, ගෙවීම පිණිස සහතික කොට නැති බවට;

(ඊ) කරන ලද සේවාව/ සැපයීම හා අදාළ බිල් පත්‍රය/ ඉන්වොයිසිය වවුචරයට අමුණා ඇති බවට;

(උ ) මෙවැනි වියදම් අයවැය ලේඛනයට ඇතුළත් කර ඇති බවත්, එය ප්‍රවර්ධන කාර්යාංශය මුදල්වලින් දැරිය යුතු නිසා අය කිරීමක් බවටත් වගකිව යුතු වේ. " (උපුටා ගැනීම අවසන්)

පැමිණිලිකරුට මුදල් රෙගුලාසි 137 සහ 138 යටතේ මෙම රාජකාරි පිළිබඳව වගකීමක් පැවරි නැත.

පැමිණිලිකරුට විදේශ ගමන් තහනමක් බී වාර්තාවෙන් පනවා ඇති බව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂ අසංක බණ්ඩාර ගුණතිලක 2015.04.21 වන දින ලිපියක් පැමිණිලිකරුට යොමු කරමින් දන්වා ඇත. එම ලිපිය පැ.10 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මුදල් අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා පැමිණිලිකරු පත් කර ඇත. එම පත්වීමේ ලිපිය

පැ.11 ලෙස ඉදිරිපත් කර ඇත. මෙම තනතුර දිර්ඝ කාලයක් පුරප්පාඩුව තිබී ඇති අතර පසුව පැමිණිලිකරු එම තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇත.

පුවත්පත් දැන්වීමක් පළ කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු අල්ලස් කොමිසමට කැඳවා ඇත. 2014 මාර්තු මස පුවත්පත් දැන්වීම සිදු කරන විට පැමිණිලිකරු එම තනතුරෙහි කටයුතු කර නැත. පැමිණිලිකරු කටඋත්තර ගැනීමට අවස්ථා කීහිපයකදීම කැඳවා ඇත. ඉන්පසුව 25396/15 යටතේ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවරි නඩුවේ සාක්ෂිකරු ලෙසට පැමිණිලිකරු කැඳවා ඇත. පුවත්පත් වාර්තාවක් පළ කරමින් පැමිණිලිකරුට එරෙහිව අත්සන් චෝදනාවක් පළ කර ඇත. එම පුවත්පත් වාර්තාව පැ.12 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. එහි සඳහන්ව ඇත්තේ; බස්නාහිර පළාත් සභා මැතිවරණයට එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඉදිරිපත් වූ මන්ත්‍රී අපේක්ෂයන් ප්‍රවර්ධනයට රජයේ මුදලින් පුවත්පත් දැන්වීම් පළකර රජයට පාඩුවක් සිදු කිරීමේ චෝදනාවන්ට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ හිටපු සභාපතිවරයාට හා කළමනාකාර අධ්‍යක්ෂකවරයාට එරෙහිව නඩු පැවරු බවය.

පැ.13, පැ.14 සහ පැ.14 (1) යන ලේඛන ඉදිරිපත් කරමින් පැමිණිලිකරු පවසා සිටියේ තමාට මෙම නඩු සම්බන්ධයෙන් නීතිඥයින් හට ගෙවීමට සිදු වූ මුදල පිළිබඳවය.

පැමිණිලිකරුගේ කිර්ති නාමයට හානි කරන පුවත්පත් වාර්තා පළවිම ගැන සිළුමිණ රජයේ පුවත් පතේ වැරදි ප්‍රවෘත්ති වාර්තාවක් පළ කර ඇත. මෙය නිවැරදි කිරීමට පැමිණිලිකරු ඉල්ලීමක් කර ඇත. ඒ අනුව සිදු කළ නිවැරදි කිරීමද සිදු නොකර පළමු වාර්තාව සනාත කෙරෙන

ප්‍රකාශ පළ කර ඇත. එම වාර්තාව පැ.15 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු සැකකරුවෙකු කර ඇත්තේ බී වාර්තාවේ සඳහන් කර ඇති චෝදනා සම්බන්ධයෙනි. පැමිණිලිකරුගේ වගකීම වන්නේ අනුමත කර සහතික කර පැමිණිලිකරුවෙත එවන සියලු වවුචර් වලට ගෙවීමට කිරීමය. එම ගෙවීම් සිදු කිරීමේ අනුමැතිය අධ්‍යක්ෂවරයා විසින් ලබා දිය යුතුය. මෙම කාලසීමාවේ අධ්‍යක්ෂවරයා වශයෙන් රුමි ජවුෆර් ද අධ්‍යක්ෂ - අලෙවි වශයෙන් මධුභානි ද ක්‍රියා කර ඇති අතර ඔවුන් දෙදෙනාගේ අත්සනින් වවුචර් පැමිණිලිකරු වෙත ලැබී ඇත.

වගඋත්තරකරුවෙකු වශයෙන් නම් කර ඇති විරෝධි කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල එකී තනතුරට 2015.02.13 වන දින දරණ පත්වීමේ ලිපිය අනුව පත්වී ඇති අතර ඔහු 2017.06.30 වන දින ඉවත් වී ඇත. දූෂණ මර්දන ලේකම් කාර්යාලයට ලැබෙන පැමිණිලි සාමාන්‍ය තැපැලෙන්, ලි.ප.තැපැලෙන් සහ අතින් ගෙනවිත් භාරදීම මෙන්ම නිර්නාමිකව භාර දීම මගින්ද සිදු කර ඇත. ලැබෙන පැමිණිලි ලියාපදිංචි කර අංක යොදා උපදේශකවරයෙකු වෙත යොමු කර වාර්තා ලබා ගෙන එය අදාළ ස්ථානයට යොමු කිරීම ආනන්ද විජේපාල විසින් සිදු කර ඇත.

මෙම නඩුවේ පැමිණිලිකරුට එරෙහිව ඉදිරිපත් කර ඇති බී 629/15 වාර්තාවෙහි පැමිණිල්ල දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් කළ පැමිණිල්ලක් ලෙසට සඳහන්ව ඇතත් එය මුල් පැමිණිල්ල නොවේ. මුල් පැමිණිල්ල ලෙසට සඳහන්ව ඇත්තේ නිර්නාමික ලිඛිත පැමිණිල්ලක් දූෂණ මර්දන ලේකම් කාර්යාලයට ලැබුණු බවකි. එකී පැමිණිල්ල ලැබීමෙන් පසු එය ලියා පදිංචි කර

උපදේශකවරයෙකුට යොමු කර වාර්තාවක් ලබා ගෙන එම වාර්තාව පැමිණිල්ල හා ඇමුණුම් සමග තුසිත් මුදලිගේ මහතාට යොමු කර ඇත. තුසිත් මුදලිගේ මහතා එම වාර්තාව සලකා බලා ඒවා යොමු කරන විමර්ශන ඒකකය තිරණය කර එම විමර්ශන ඒකකයට යොමු කර ඇත. මෙම නඩුවට අදාළව වාර්තාවක් ලැබී ඇතත් එය සාක්ෂිකරුට ඉදිරිපත් කිරීමට හැකියාවක් නැත.

ආනන්ද විජේපාල සඳහන් කළ අන්දමට රජයේ ජොෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදිලිගේ මහතා තිරණය කරන පැමිණිලි පමණක් විමර්ශනය සඳහා යොමු කර ඇත.

පැ.06 වශයෙන් සලකුන කර ඉදිරිපත් කළ 2014 වසරේ සිට 2015 මාර්තු දක්වා කාලය තුළ පැමිණිලිකරුගේ සේවය අගය කරමින් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සභාපති කපිල යකන්දාවල මහතා විසින් ලබා දී ඇති සහතිකයේ පැමිණිලිකරුගේ සේවය ඉතා උසස් මට්ටමක පැවතුන බවට සහතික කරන අතරතුරදිම සේවය අවසන් කිරීමට පොලිසියට පැහැදිලි ලෙසම දේශපාලන බලපෑමක් මත සිදුවී ඇති බවට ඉතාමත් පැහැදිලිය. මෙම කාලසීමාව තුළදී සිදුවූ දේශපාලනික වෙනස මත පැමිණිලිකරු නැවත සේවයට නොපැමිණිය යුතුය යනුවෙන් මතවාදයක් ආයතනය තුළ ගොඩනංවා ඇත. ඊට ප්‍රධාන හේතුව ලෙසට අනාවරණය වී ඇත්තේ අදාළ ආයතනය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා බැසිල් රාජපක්ෂ මහතා වීමත්, අමාත්‍යවරයා සමග රාජකාරි කටයුතු කිරීමත් බවට කරුණු අනාවරණය වී ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහ පැ.01 සිට පැ.15 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .XIV

පැමිණිලි අංකය - 816 /2020

පැමිණිලිකරු - හේවා ගුණරත්න භාෂ්වර සේනාංක මහතා

ලිපිනය - නො: 3/7, ජයන්ති මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1) හිටපු අමාත්‍ය මංගල සමරවීර
2) හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක
3) හිටපු අමාත්‍ය රාවුෆ් හකීම්
4) හිටපු අමාත්‍ය සරත් ෆොන්සේකා
5) දෙමළ සන්ධාන නායක ආර්.සම්බන්ධන්
6) හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ.සුමන්තිරන් මහතා
7) ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක
8) නීතිඥ ජේ.සී.වැලිඅමුණ
9) ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
10) හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම
11) හිටපු අධ්‍යක්ෂ එම්.කේ. ආනන්ද විජේපාල දූෂණ විරෝධි ලේකම් කාර්යාලය
12) පොලිස් කොස්තාපල් රාජමන්ත්‍රී
13) සාජික් රත්නායක

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර හේවා ගුණරත්න භාෂ්වර සේනාංක යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, හේවා ගුණරත්න භාෂ්වර සේනාංක මහතාට එරෙහිව කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 2881/2016 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර හේවා ගුණරත්න භාෂ්වර සේනාංක නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම, හේවා ගුණරත්න භාෂ්වර සේනාංක සහ දොන් සතරසිංහ ජයවීර යන දෙදෙනාට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC 50/2018 දරන අධිචෝදනා පත්‍රය ඉල්ලා අස් කර ගැනීමත් එමගින් එකී අධිචෝදනා පත්‍රය නිෂ්ප්‍රභා කළ යුතු බවටත් කොමිෂන් සභාව ඒකමතිකව නිර්දේශ කරයි.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද, නිසි කරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් උත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

5. පැමිණිලිකරු අත්තනෝමතික ලෙස රක්ෂිත බන්ධනාගාර ගත කර තිබීමත්, නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගීකර කරගනිමින් ඔහු රැඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකුඩුවල රඳවාගෙන සිටීමෙන් සිදුකරන ලද හානිය වෙනුවෙන් යෝග්‍ය අයුරින් හානිපූරණ කිරීම.

6. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

7. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ බරපතළ හානි පූරනය කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි. ඒ අනුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුට අහිමි වූ ඔහුගේ රැකියාවේ සියලුම උසස්වීම් වරප්‍රසාද විදේශීය පුහුණුවීම් හිඟ වැටුප් සියල්ලම ඔහුට ලබා දීමත් ඔහු එවැනි රක්ෂිත බන්ධනාගාර ගත කිරීම්කට පත් නොවූයේ නම් ඔහුට ඔහුගේ රැකියාවේ හිමිවන ස්ථානයට ඔහු පත් කිරීමත් මගින් පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිය හැකි වික්‍රමසිංහ මහතාගේ බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරන අතරම එම සහනයන් ලබා දීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

8. අතිරේක ලේකම්වරයකු වූ හේමා ධර්මවර්ධන මිය අධිකරණයට ඉදිරිපත් කර පැයක පමණ කාලයක් තුළදී ඇප මත මුදා හැර ඇත. හේමා ධර්මවර්ධන මහත්මිය ඇප මත මුදා හැරීමට ක්‍රියාකරන කොටුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණ නියෝග පරිදි රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවට නීතිපතිවරයාගේ

පිළිගැනීම මත ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කර තිබියදී පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය පරිදි ක්‍රියා නොකිරීමෙන් කොටුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මිය ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කිරීමේ වරද සිදු කර ඇති බැවින් ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට වාර්තා කිරීම සුදුසු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත මගින් සංචාරක කර්මාන්තයට අදාළ ආයතන හතරක් නිර්මාණය කර ඇත. ඒ අනුව

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
3. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
4. ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය

යන ආයතන හතර පිහිටුවා ඇත. පැමිණිලිකරු, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති වශයෙන් ද, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපති වශයෙන්ද, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපති වශයෙන් ද, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ වැඩබලන සභාපති වශයෙන් ද, කටයුතු කර ඇති අතර සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන්ද කටයුතු කර ඇත.

පැමිණිලිකරු සහ දොන් සතරසිංහගේ ජයවීර යන දෙදෙනාට එරෙහිව කොළඹ මහාධිකරණයේ අංක HC 50/2018 දරන අධිචෝදනා පත්‍රය මගින් චෝදනා ගොනු කරමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතු රු. 5,738,075/ ක මුදලක් සාපරාධී විශ්වාසය කඩ කිරීමට සහ ඊට අනුබල දීමේ වරදට චෝදනා කරමින් පොදු දේපළ පනත යටතේ නඩු පවරා ඇත.

එසේම නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂකවරයාට 2016 මැයි මස 18 දින ඇති ලිපිය යවමින් පැමිණිලිකරු සහ දොන් සතරසිංහගේ ජයවීර ද ඇතුළුව හය දෙනෙකුට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති බී 629/2015 දරන නඩුවේ විත්තිකරුවන් හයදෙනා රු.5,738,075 ක මුදලක් සාපරාධී විශ්වාසය කඩ කිරීමේ වරද හෝ සාපරාධී සාවද්‍ය පරිහරණය සිදුකර ඇති බවට සඳහන් කරමින් එම පුද්ගලයන් අත්අඩංගුවට ගෙන ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර එහි පිටපත් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයාට එවන ලෙසට දැනුම් දී ඇත.

HC 50/2018 නඩුවේ අධිචෝදනා පත්‍රය පැ.17 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. චෝදනා 03 කින් සමන්විත අධිචෝදනා පත්‍රයේ පළමු චෝදනාවෙන් දෙදෙනාටමද , දෙවන චෝදනාව 02 වන චූදිතට එරෙහිවද, 03 වන චෝදනාව පැමිණිලිකරුට එරෙහිවද දැනට විභාග වෙමින් පවතී. චෝදනාවට අදාල රුපියල් 5,738,075/- ක මුදල සංචාරක ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල මුදලකි. මෙම මුදල සංචාරක සුබ සාධක සංගමය විසින්

ඉදිරිපත් කළ ව්‍යාපෘතියක් මත මුදාහල මුදලකි. සංචාරක කටයුතු පනතේ පරමාර්ථ වල දැක්වෙන ආකාරයට සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට සහ ඒ කර්මාන්තයට සම්බන්ධ ප්‍රවර්ධනාත්මක කටයුතු සහ පුහුණු කටයුතුවලට සහභාගි වීමට පෞද්ගලික අංශයේ තැනැත්තන් සහ පුද්ගල මණ්ඩල දිරිමත් කිරීම සිදු කළ හැකිය. එසේම පනතේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම පනතේ පරමාර්ථ අනුව සිදුකළ හැකිය.

ලංකාවේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම පිළිබඳව උපායමාර්ගික සැලැස්ම පිළිබඳව පාර්ලිමේන්තු කෝප් කමිටුවේ ද සාකච්ඡාවට ලක්වී ඇති අතර කෝප් කමිටු වාර්තාවේ මෙසේ දැක්වේ; " The Committee discussed about the tourist industry in Sri Lanka, and wanted the Bureau to take further steps to promote the industry among the local tourists" 2014.04.08 වන දින කෝප් කමිටු වාර්තාව අංක 12 - පැ.19, පැ.19 (අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2011 සිට 2016 දක්වා කාලසීමාව සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධන උපාය මාර්ග සැලස්මක් සකස් කර අනුමත කර ඇති අතර එකී සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධන උපාය මාර්ග සැලස්ම පැ.20 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2013 දී පවත්වන ලද දැයට කිරුළ වැඩ සටහන මගින් දේශීය සංවර්ධන ව්‍යාපාර වැඩි දියුණු කර ඇත. පැ.20, පැ.20 (අ) සහ පැ.21 ට අනුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සුභ සාධක සංගමය

විසින් වැඩ සටහන් ක්‍රියාත්මක කර සැහවුනු සංචාරකයන් පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන ලදී. 2013 වසරේ සිදු කල එම සමීක්ෂණ වාර්තාව පැ.22 ලෙස ඉදිරිපත් කර ඇත. ඉන්පසු අත් පත්‍රිකා බෙදා හැරීමක් සහ අත් පොතක් අම්පාර දිස්ත්‍රිකය මුල් කර ගෙන මුද්‍රනය කර ඇත. එම අත්පොත පැ.24 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.24 දරණ අත්පොතෙහි සම්බන්ධීකාරක ලෙස කටයුතු කර ඇති තැන්ත්තා සුභ සාධක සංගමයේ සංවිධායක ලෙස කටයුතු කළ පුද්ගලයා වේ. එකී අත් පොතෙහි අවසන් පිටුවේ එම අත් පොත සකස් කිරීම සඳහා සහයෝගය දුන් පුද්ගලයන් සඳහන් කර ඇත. සංගමයේ අයවැය ලේඛනය අනුව වියදම අන්තර්ගත කර ඇත. එය ආකාර සැලැස්ම අනුව ක්‍රියාකාරී සැලැස්ම අනුව 2014 වර්ෂය සඳහා මිලියන 5ක්ද, ජංගම වැඩ වැඩසටහන් සඳහා මිලියන 03 ක් ද වෙන්කර ඇත. එම ලේඛන පැ. 25 සහ පැ 25(අ) ලෙස ඉදිරිපත් කර ඇත.

ඒ අනුව සුභ සාධක සංගමය මගින් 2014.07.15 දිනැති ඉල්ලීම (පැ. 26) මගින් සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතියක් සකස් කර යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම ව්‍යාපෘතිය ඉදිරියට සිදුකරගෙන යාමට පැමිණිලිකරු සභාපති වශයෙන් අනුමතිය ලබා දී ඇත. සංචරක මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් එවැන්නක් පිළිබඳව තිබූ කතිකාවතක් සලකා බලා පැමිණිලිකරු මෙම ව්‍යාපෘතිය අනුමත කරමින් එය ඉදිරියේ දි සිදුකරගෙන යාමට අනුමැතිය ලබා දී ඇත.

මෙම ව්‍යාපෘති යෝජනාව ලැබීමෙන් පසුව පැමිණිලිකරු විසින් අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත්

කර ඇත. එකී අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවෙන් ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපෘති යෝජනාව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත. පැ. 28 දරණ එකී අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක 2014/06/01 ට පැමිණිලිකරු සහ අධ්‍යක්ෂක ජනරාල් ඩී.එස්. ජයවීර සමග අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික හේමා ධර්මවර්ධන, ආර් සේමසිංහ, ආර්.ඒ.ඒ.කේ රණවක, චන්ද්‍රා වික්‍රමසිංහ යන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් තම අනුමැතිය ලබාදී අත්සන් තබා ඇත.

2014.10.03 වන දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මෙම ව්‍යාපෘතිය නැවත සාකච්ඡා කර ඇති අතර එම රැස්වීමට සහභාගි වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික හිරාන් කුරේ මහතා ද ඊට අනුමැතිය ලබා දෙමින් පළමු අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ස්ථාපිත කර ඇත. මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පැ.29 ලෙස ඉදිරිපත් කර ඇත.

2015 ජනවාරි මස 08 රාජ්‍ය මාරුවෙන් පසුව පැමිණිලිකරුට එම තනතුරෙහි සේවය කිරීමට ඉඩ නොදී පැමිණිලිකරු බලහත්කාරයෙන් අයුක්ති සහගතව තනතුරෙන් ඉවත් කර ඇත. නවීන් දිසානායක, නන්දන ගුණතිලක සහ එක්සත් ජාතික පක්ෂයේ ජාතික සේවක සංගමයේ රොෂාන් යන දේශපාලඥයන් ඇතුළු පිරිස 2015 ජනවාරි මස 10 හෝ12 යන දිනවලදී පැමිණිලිකරුගේ කාර්යාලය කඩා වැදී බලහත්කාරයෙන් නිලධාරීන් පීඩනයට පත් ලක් කර ඇත. ඒ සඳහා පොලිස් නිළධාරීන්ද යොදවා ගෙන ඇත. එලෙස කාර්යාලයට කඩා වැදීම පිළිබඳව වෙබ් අඩවියක පළ කරන ලද ඡායාරූපයක් පැ.30 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. එහි දැක්වෙන අන්දමට සංචාරක මූලස්ථානය සීල් තබා ඇත.

2015.04.10 හෝ 12 යන දිනයකදි පෙර ලේකම් මුනසිංහ දැනුම් දී ඇත්තේ අප්‍රේල් මස 17 හෝ 18 දිනක අත්අඩංගුවට ගැනීමට යන බවත්, ඇය එය දැනගත්තේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිළධාරීන් ලේඛන ලබා ගැනීමට සංචාරක මණ්ඩලයට පැමිණි අවස්ථාවේදී සඳහන් කළ බැවින් බවත්ය.

පැමිණිලිකරු අප්‍රේල් මස 20 වන දින බරපතල ස්නායු රෝගයක් හේතුවෙන් ලංකා හොස්පිටල් නැමැති පෞද්ගලික රෝහලට ඇතුළත් වී ඇති අතර අසනීපයේ බරපතළ ස්වභාවය හේතු කොට ගෙන පැමිණිලිකරු ජාතික රෝහල ඇතුළත් කර ඇත. අදාළ වාර්තා පැ.31 හා පැ.31 (අ) ලෙසට ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු රෝහල් ගතව සිටින අවස්ථාවේදී මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නිළධාරීන් නිවසට කථා කර පැමිණිලිකරු සොයා ඇත. එසේ වුවත් ඒ වන විට බැසිල් රාජපක්ෂ මහතා රක්ෂිත බන්ධනාගාරගත කර සිටි බැවින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් මන්දගාමීව කටයුතු කර ඇත. ඒ අනුව ඇප ගැනීමේ අවධානම දිර්ඝ වී ඇත.

2015 අගෝස්තු මස විදේශ ගතවීම සඳහා සිදු කළ කටයුතු වලදී පැමිණිලිකරුට එරෙහිව විදේශ ගමන් තහනමක් ලබා ගෙන ඇති බව දැන ගන්නට ලැබී ඇති අතර පැමිණිලිකරු දැන සිට නැත. මේ අනුව සොයා බැලීමේ දී බී. 629/2015 දරණ නඩුව 2015.04.09 වන දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරමින් විදේශ ගමන් තහනම ලබා ගෙන ඇත. එකී බී වාර්තාවට අනුව දූෂණ මර්දන කොමිටුව මගින් ඉදිරිපත් කළ පැමිණිල්ලක් මත සිදු කළ කරුණු දැක්වීමක් මත විදේශ ගමන් තහනම නිකුත් කර ඇත. එහි දැක්වෙන කරුණු අසත්‍යවේ. එහි දක්වා ඇති "ඉදිරි විමර්ශන කටයුතු මගහරිමින්

විදේශ ගතවීමට ඉඩ ඇත" යන කොටස නිසි පරීක්ෂණයකින් තොරව අසත්‍ය ලෙස දක්වා ඇත.

එම බී වාර්තාව පැ.32 ලෙසත්, එහි දෙවන පිටුව පැ.32 (අ) ලෙසත්, විදේශ ගතවීම තහනම් කළ ඉල්ලීම (5 පිටුව) පැ.32 (ආ) ලෙසත් ලකුණු කර ඇත. මෙම පැ.32 (අ) හි කරුණු සැකවින් පහත දක්වා ඇත. එය,

එම මුදල පැමිණිලිකරුට ගෙවා නැත. සුභ සාධක සංගමයේ ලේකම්ගේ ලිපිය යොමු කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩල සාමූහික අනුමැතිය දීම යන ක්‍රියා දෙක පමනක් පැමිණිලිකරු විසින් සිදුකර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විරුද්ධ වුවා නම් එම මුදල අනුමත කිරීම සිදු නොවනු ඇත. ඒ අනුව පළමු අධ්‍යක්ෂ මණ්ඩල තිරණය හිරාන් කුරේගේ අත්සන නොතිබුණ ද ඔහුගේ කැමැත්ත ලැබී තිබුණි.

2015 මැයි මාසයේ දී පමණ පැමිනිලිකරුගේ කටඋත්තරය සටහන් කරගෙන ඇත. කටඋත්තර ලබාගැනීම සඳහා පැමිණිලිකරු දින ගණනාවක් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට කැඳවා ඇත. කට උත්තර ලබා ගැනීමේදී පැමිණිලිකරුට තර්ජනය කිරීම සහ බලපෑම් කිරීම සිදුකරමින් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරියාට අවශ්‍ය කටඋත්තරයක් ලබා ගැනීමට ප්‍රයත්න දරා ඇත. කටඋත්තරය ලබා ගන්නා අවස්ථාවේදී පැමිණිලිකරුට සඳහන් කර ඇත්තේ "මේ සංචාරක මන්ඩලයේ අය ඇවිල්ලා බොහොම නරක විදිහට අපිට කට උත්තර දීලා තියෙන්නේ." මූලික වශයෙන් දැඩිව කියා සිටියා "සංචාරක මණ්ඩලයේ නිලධාරීන් ඇවිල්ලා දැන් වතුර බේසමක් පුරෝලා ගිහිල්ලා තියෙන්නෙ. ඔබතුමා තීර්ණය කරන්න මේ නිකම් වතුර බේසම අරන් ඔබතුමා නා ගන්නවාද නැතිනම් ඇමතිවරයා

නාවලා ඔබතුමා බේරෙනවද කියලා, ඔබතුමා කල්පනා කරන්න කියලා" යනුවෙන් පැමිනිලිකරුට සඳහන් කර ඇත.

තුසිත් මුදලිගේ විසින් විත්තිකරු නම්කර අධ්‍යක්ෂ මූල්‍ය අපරාධ කොට්ඨාසයට යවන ලද පැ.33 දරන 2016.05.18 වැනි දින ලිපිය යවා ඇත. එහි අධ්‍යක්ෂ හිරාන් කුරේගේ නම සඳහන්ව නැත. නමුත් ඔහුද යෝජනාවට කැමැත්ත පළකර ඇත. එම පැ.33 පරිදි මූල්‍ය අපරාධ කොට්ඨාසය පැමිණිලිකරුට පැමිනෙන ලෙසට දැනුම් දී ඇතත් පසුව එය අවලංගු කර ඇත. එයට හේතුව වී ඇත්තේ සැකකරුවකු වශයෙන් නම් කළ එවකට අග්‍රාමාත්‍යමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් වශයෙන් රාජකාරිය කරමින් සිටි හේමා ධර්මවර්ධන මහත්මිය අධිකරණයට ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න සලකා බැලීම් සඳහා අවශ්‍ය කාලය ගැනීම වෙනුවෙනි. මෙම කාරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතා පාර්ලිමේන්තුවේදී අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න කර ඇති අතර ඒ සඳහා අග්‍රාමාත්‍යවරයා ලබාදී ඇති පිළිතුරු හැන්සාඩ් ගතව ඇත. එකී හැන්සාඩ් වාර්තාව පැ. 34 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ අනුව පැ.33 සඳහන් අත්අඩංගුවට ගැනිමට අදාළ පුද්ගලයින් නැවත සලකා බැලිමට අගමැති රනිල් වික්‍රමසිංහගේ අවශ්‍යතාවය මත යවා ඇත. මේ සම්බන්ධයෙන් අනුර දිසානායක විමසා ඇති පැනය මෙසේය.

> (උපුටා ගැනිම)" මා ළඟ තිබෙනවා ගරු අගමැතිතුමනි, පසු ගිය 18 වැනි දා නීතිපති දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ප්‍රධානියා වෙත එවන ලද ලිපියක්. සංචාරක මණ්ඩලයට අදාළ පරීක්ෂණ කටයුත්තක් අවසන්

කොට, නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළාට පස්සේ, නීතිපති දෙපාර්තමේන්තුව විසින් 06 දෙනෙකු ඔබතුමා දන්නවා මේ කියන 06 දෙනාගෙන් එක්කෙනෙක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ වැඩ කරන නිලධාරිතුමියක් බව අත්අඩංගුවට ගෙන, ප්‍රකාශ සටහන් කොට, පොදු දේපොළ පනත යටතේ අධිකරණයට වහාම ඉදිරිපත් කොට ඒ පිළිබඳ වාර්තාවක් නීතිපතිවරයාට යොමු කරන්න කියලා අතිරේක සොලිසිටර් ජනරාල් මුදලිගේ මහතා අත්සන් කරපු ලිපියක් මා ළඟ තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවට ලිපිගොනුව යවා ඔවුන් අත් අඩංගුවට ගෙන ප්‍රකාශ සටහන් කොට අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා පොදු දේපොළ පනත යටතේ නියෝගයක් ලබා දී තිබියදී, තවමත් එම ක්‍රියා මාර්ගය නොගැනීමට හේතුව කවරේද කියලා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතිය." (උපුටා ගැනිම අවසන්)

එම කොටස පැ.34(අ) ලෙස සලකුණ කර ඉදිරිපත් කර ඇත. අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ පිළිතුර පැ.34(ආ) ලෙස සලකුණු කර ඇත.

දූෂණ විරෝධි කමිටුවේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ආනන්ද විජේපාල අංක 6 න් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් 2020 මැතිවරණයට කුරුණෑගල මැතිවරණ කොට්ඨාසයන් මහමැතිවරනයට ඉදිරිපත් වි ඇත. ඊට අදාළ ලේඛනයක් පැ.35 ලෙස ඉදිරිපත් කර ඇත.

පැ. 33 අනුව කිසිවෙකුත් අධිකරනයට ඉදිරිපත් කර නොමැත. එහෙත් 23 වන දින නඩුව කැඳවිමක් කර ඇති අතර රණවක මහතා මූල්‍ය

අපරාධ විමර්ශන කොට්ඨාසයට මගින් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

පැමිණිලිකරුටද 23 වන දින මූල්‍ය අපරාධ කොට්ඨාසයට පැමිනෙන ලෙසට දැනුම් දී ඇතත් පසුව එය අවලංගු කර නොපැමිණෙන ලෙසට දැනුම් දී ඇත. මේ අන්දමින් එදින මූල්‍ය අපරාධ කොට්ඨාසයට කැඳවීම අවලංගු කර ඇත්තේ අතිරේක ලේකම් හේමා ධර්මවර්ධන ඉදිරිපත් නොකර සිටීමට සුදුසු හේතුවක් සෙවීමට බවට පැමිණිලිකරුට අවබෝධ වී ඇත. මේ අනුව තමන් පැහැදිලි ලෙස අත්අඩංගුවට ගන්නා බව අවබෝධ කරගත් පැමිණිලිකරු ශ්‍රේෂ්ඨාධිකරණයේ මානව හිමිකම් කඩකිරීමේ නඩුවක් ගොනු කර ඇති අතර තවත් කිහිප දෙනෙකු පෙත්සම් ඉදිරිපත් කර ඇත. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පැමිණිලිකරුගේ නිවස අසල පොලිස් නිළධාරීන් යොදවා ඔහු අනිසි හිංසනයකට ද ලක් කර ඇත.

හිමිකම් කඩකිරීමේ නඩුවේ තීන්දුව පැ.36 ලෙසට ඉදිරිපත් කර ඇත. එහි සඳහන්ව ඇත්තේ සෘජුව සඳහන් කළ ආකාරයට බන්ධනාගාර ගත කිරීමක් අවශ්‍ය නොවන බවය.

මානව හිමිකම් කඩකිරීමේ නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ කැඳවනු ලැබූ අවස්ථාවේදී රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා එකඟතාවයක් සිදුකරමින් පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින බවට සඳහන් කර ඇත. ඒ අනුව ඔහු මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටීමට එකඟ වෙමින් නඩුව අවසන් කර ඇත. පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීම සිදු නොකරන බවට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ එකඟතාවයකට පැමිණියත්, පැමිණිලිකරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් වූ

අවස්ථාවේ දී කොටුව මහේස්ත්‍රාත්වරිය ශ්‍රේෂ්ඨාධිකරණයේදී පාර්ශවකරුවන් ඇති කරගත් එකඟතාවය කඩකරමින් පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ නියෝගයක් සිදු සිදු කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය පරිදි ක්‍රියා නොකිරීමෙන් කොටුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මිය ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කිරීමේ වරද සිදු කර ඇත.

2016.07.21 වන දින චන්ද්‍රකා බණ්ඩාරනායක මිය දුමින්ද දිසානායක මගින් පැමිණිලිකරුට දැනුම් ඇති පරිදි එදින සවස 2 ත් 4 ත් අතර කාලය තුළදී ජනාධිපති මන්දිරය ඉදිරිපිට ක්ෂමා ආයතන කාර්යාලයේ දී හමුවීමට කළ දැනුම් දීමට අනුව ඔහු එතැනට ගොස් ඇත. එහිදී චන්ද්‍රිකා බණ්ඩාරනායක සඳහන් කර ඇත්තේ පැමිණිලිකරු බැසිල් රාජපක්ෂ සමග එකතුවී හොරකම් කර ඇති බවයි. තමන් එවැනි වසන් කිරීමක් හෝ වරදක් සිදු නොකළ බවට පැමිණිලිකරු සඳහන් කල විට දුරකතන ඇමතුමක් ගෙන වැලි යනුවෙන් ආමන්ත්‍රණය කර ජේ.සී. වැලි අමුණ එතැනට ගෙන්වාගෙන ඇත. ජේ.සී.වැලි අමුණ ප්‍රකාශ කර ඇත්තේ බැසිල් රාජපක්ෂ මහතා මෙම කරුණු වලට සම්බන්ධ බවට ප්‍රකාශ කර පැමිණිලිකරුට එරෙහිව නඩු කටයුතු වලින් නිදහස් වන ලෙසටය. පැමිණිලිකරු එම අවස්ථාවේ නිහඬව සිට ඇත එතැනින් පිටව යන අවස්ථාවේ ජේ.සී.වැලි අමුණ චන්ද්‍රිකාට පවසා ඇත්තේ " බැසිල්ට හිත හිත ඉන්න දෙන්න පුළුවන්" යනුවෙනි. මෙම අවස්ථාවේ දී බැසිල් රාජපක්ෂ මහතා පොදුජන පෙරමුණ නැමැති පක්ෂය බිහි කිරීමේ කාර්යයන්හි නියැලිව සිට ඇත.

පැමිණිලිකරු ඉන්පසු දුමින්ද දිසානායක සමග ආපසු පැමිණ තමන් ජේ.සී.වැලි අමුණගේ යෝජනාවට එකඟ නොවන බවට දුමින්ද

දිසානායකට පවසා ඇත. දුමින්ද දිසානායක සමඟ ආපසු එන ගමනේදී ගලධාරී හෝටලයේ දෙදෙනාගේ තේ පානයේ බිල්පත පැ.37 යනුවෙන් ද අදාළ ගණුදෙනුව පැ.37(අ) ලෙසට ද ඉදිරිපත් කර ඇත.

පැ. 38 දරන බී වාර්තා වේ 2016.11.28 දින සටහන් වල 47 පිටුවේ සඳහන් අන්දමට දෙවන සැකකරු වන රණසිංහ සේමසිංහ සහ තුන්වන සැකකරු ලෙස සඳහන් චන්දසිරි අධිකරණය වෙත ඉදිරිපත් කර එක් දිනකට රක්ෂිත බන්ධනාගාර ගත කර පසු දින ඇප මත මුදා හැර ඇත. (පැ. 38 අ, ආ, ඇ, ඈ) 2016.11.29 දින එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ අතිරේක ලේකම්වරයකු වූ හේමා ධර්මවර්ධන මිය අධිකරණයට ඉදිරිපත් කර පැයක පමණ කාලයක් තුළදී ඇප මත මුදා හැර ඇත. හේමා ධර්මවර්ධන මහත්මිය ඇප මත මුදා හැරීමට ක්‍රියාකරන කොටුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණ නියෝග පරිදි රක්ෂිත බන්ධනාගාර ගත නොකළ යුතු බවට නියෝග කර තිබූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මිය පැහැදිලි ලෙසම අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ දේශපාලන න්‍යාය ධර්මයන්ට එකඟව ක්‍රියාකර ඇති බව ඉතාමත් පැහැදිලිය. ඇයට ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට වඩා දේශපාලන බලය වැදගත් වී ඇති බව ඇය ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය කඩ කර ඇති ආකාරයෙන් ම පෙනී යයි. ඇයගේ මෙම නියෝගයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ බලයට අපහාසයක් සිදු වී ඇද්ද යන්න විමර්ශනය කිරීම සඳහා මෙම කරුණු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කිරීම සුදුසු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත. නඩු වාර්තාව පැ.38 වශයෙන්ද අදාළ සටහන් පැ.38 (අ), පැ.38 (ආ) සහ පැ.38 ලෙසට ද ඉදිරිපත් කර ඇත.

හේමා ධර්මවර්ධන ඇප මත මුදාහැර ඇති ලේඛන පැ.38 (ඉ), පැ.38(ඊ), පැ.38 (උ) සහ පැ.38 (ඌ) ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2016.11.28 වන දිනැති සටහනේ 47 පිටුවේ සඳහන් කර ඇති අන්දමට 02 වන සැකකරු ලෙසට රණසිංහද, 03 වන සැකකරු ලෙසට චන්ද්‍රසිරි ද ඉදිරිපත් කර ඇත. රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත්තේ එක් දිනකටය. ඉදිරිපත් කළ දිනය 2016.11.29 ලෙසට දක්වා තිබේ. එම සටහන් පැ.38 (ඇ), පැ.38 (ඈ) ලෙසට ලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.38 (ඒ) 88 වන පිටුවේ සඳහන් කර ඇති නියෝගය පරිදි 04 වන සැකකරු වන හේමා ධර්මවර්ධනට ඇප ලබා දුන් නියෝගයෙහි ඇය ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශයක දැක්වෙන අතර එහි අඩංගු කරුනු ඇපදීම සඳහා සලකා බලනු ලද බව සඳහන්ය. නියෝගයෙහි 90 වන පිටුවේ පළමු පරිච්ඡේදයේ මෙසේ සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම)“ මැයගේ මෙම තීරණය සියයට සියයක් නිවැරදි තීරණයක් බවට අවස්ථානුකූලව පෙනී නොගියද මැය මෙම තීරණයට එළඹීමට හේතු පාදක වූ කරුණු ඇය පැහැදිලි කිරීමක් කර නැත. එකී කරුණු මෙම වරදට සක්‍රියව දායක වූ අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියා කලාපය හා සලකා බැලීමේදී මැය මෙම වරදට සාපේක්ෂව අඩු දායකත්වයක් දක්වා ඇති බවට පෙන්වා දෙන්නාවූ ප්‍රබල සාධකයක් බව සඳහන් කල යුතුය. ”
> (උපුටා ගැනීම අවසන්)

71 පිටුවේ ඇති 4 වන සැකකරු ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශය 2016.04.28 වන දින පැ.38 (ඵ) ලෙසත් ලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ සියල්ල සිදු වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝගයක් ඒ වන විටත් සිදු කර තිබියදීය. (පැ.38)

පැමිණිලිකරු 2016.12.02 වන දින මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත්ව ඇත. අධ්‍යක්ෂ ජනරාල් ජයවිර මහතා ද එදින ඉදිරිපත්ව ඇත. පැ.38 ලේඛනයේ 53 වන පිටුවේ ජයවිර මහතා 05 වන විත්තිකරු ලෙසද, පැමිණිලිකරු 06 වන විත්තිකරු ලෙසද ඉදිරිපත් කර ඇත. එදිනම ඇප ලබා දීම මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රතික්ෂේප කර ඇත. එම සටහන පැ.38 (ඔ) ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මානව හිමිකම් තඩුවෙන් පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීම අවශ්‍ය නොවන බවට දැනුම් දී තිබියදීත් කොටුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මිය විසින් රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. කරුණු දැක්වීමෙන් පසු මහේස්ත්‍රාත්වරයා සිදු කළ නියෝගය 112 වන පිටුවේ දක්වා ඇත. 05 වන සැකකරු ජයවීර සහ 06 වන සැකකරු හාෂ්වර සේනාංකට ඇප ලබා දීම යටතේ 115 වන පිටුවේ මහේස්ත්‍රාත්වරිය විසින් මෙසේ සඳහන් කර ඇත;

> (උපුටා ගැනීම) " තවද මෙම සැකකරුවන් අධිකරණයට භාර වන බවට දුන් පොරොන්දුව (undertaking) සළකා ඔවුන් එසේ භාරවීමේදී රිමාන්ඩ් භාරයට පත් කිරීමට ඉල්ලීමක් කිරීමේ අවශ්‍යතාවයක් මතු නොවන බවට (there is no necessity to move for remand) නියෝජ්‍ය සොලිසිටර් ජනාල්වරයා පවසා

ඇති කරුණු ද මෙහිලා අදාල නොවන බව පැවසිය යුතුය. ඒ මන්දයත්, පොදු දේපළ විෂයයෙහිලා සිදු කරන වැරදි පිළිබඳ පනත යටතේ ඉදිරිපත් වන සැකකරුවෙකුට වරදේ වටිනාකම රු.25000/- ඉක්ම වන්නේ නම් එවැන්නෙකු නීතියේ විධිවිධාන අනුව අත්‍යාවශ්‍යයෙන්ම නඩුව අවසන් වන තුරු රක්ෂිත බන්ධනාගාරගත වන බැවිනි. පොදු දේපළ පනතේ 8(1) වගන්තියේ එන අතුරු විධානයේ ඒ බව සඳහන් කර ඇති අතර, එවැන්නෙකු ඇප මත මුදා හළ යුත්තේ, අසාමාන්‍ය කරුණු ඇත්තේ නම් පමණි. ඒ අනුව පැමිනිල්ල වෙනුවෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ පැමිණිල්ල වෙනුවෙන් නීතිපතිවරයා හෝ සැකකරුවන් රිමාන්ඩ් භාරයට පත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවට සඳහන් කළද, නොඑසේ නම් රිමාන්ඩ් කරන ලෙසට ඉල්ලීමක් නොකළද, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අනුවම ඔවුන් මගින් එක් සැකකරුවෙකුට ඇප ලබා දීමේදී සළකා බලා ඇති කරුණ සළකා බලමින් ඇප ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත. ඊට අමතරව භාෂ්වර සේනාංක යන සැකකරු හෘදයාබාධයකින් පෙළීමත් ඔහුගේ භාර්යාව මානසික ආතතිය යන රෝගය වැළදී තිබිම යන කරුණත් සුවිශේෂී කරුණක් ලෙසට සළකා බලන ලෙසට ඉල්ලා ඇත." (උපුටා ගැනිම අවසන්)

කොටුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණයට ද නීතිය උගන්වන තත්ත්වයකට පත්වී ඇති බව ඇයගේ නියෝගයේ ඉහත සඳහන් ඛණ්ඩය දෙස බැලීමේදී පෙනී යයි

එම කොටස පැ.38 (ට) ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. මහේස්ත්‍රාත්වරයා මෙම නියෝග කරන අවස්ථාව වන විට ඒ චෝදනාව මතම ඊට පෙර ඉදිරිපත් කළ මෙම හේමා ධර්මවර්ධ මහත්මිය ඇය විසින් ඇප මත මුදාහැර ඇත. එසේම මෙම පිරිස එකම වරදක් මත අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ නීතිපති උපදෙස් මතය. මහේස්ත්‍රාත් අධිකරණයේ දී කිසිවෙකු ඇප ලබා දීමට විරුද්ධ වී නැත. ඒ අනුව කොටුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මහත්මිය ද අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ දේශපාලන ග්‍රහණයට නතුව ක්‍රියා කර ඇති බව උක්ත කරුණු දෙස බැලීමේදී පැහැදිලිව පෙනී යයි. මහාධිකරණයේ ඇප නියෝගය පැ.34 ලෙසට ඉදිරිපත් කර ඇත.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හමුවී පැමිණිලිකරු අසාධාරණ ලෙස රක්ෂිත බන්ධනාගාර ගත කිරීම පිළිබඳව පවසා ඇත අතර එය බරපතල අසාධාරණ ක්‍රියාවක් බවය. ජනාධිපතිතුමා පවසා ඇති අතර මෙවැනි ක්‍රියා සිදු කරනු ලබන්නේ රජය පිහිටුවා ඇති දූෂණ මර්දන කොමිසම මගින් බවත් එම කොමිසමේ ජේ.සී. වැලි අමුණ මහතා මෙම කටයුතු සිදු කර රාජ්‍ය නොවන සංස්ථා වලින් මුදල් ලබා ගන්නා බවටත් පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ දී ජේ.සී. වැලි අමුණ මහතා යම් මුදලක් රාජ්‍ය නොවන සංවිධානයකින් ලබා ගන්නට ඇතැයි සිතන බවට පවසා ඇත. මේ අනුව ඉදිරියේ දී මේ ගැන සොයා බලා කටයුතු කරන බවට පවසා ඇතත් ඊට අවුරුද්දකට පමණ පසුව නැවත අත්අඩංගුවට ගැනීමට යන බවට පණිවිඩයක් පැමිණිලිකරුට ලැබී ඇත.

එබැවින් පැමිණිලිකරු මේ පිළිබඳව දුමින්ද දිසානායක මහතාට ද පවසා ඇති අතර ඔහු පොලිස්පති පුජිත ජයසුන්දර ගෙන් විමසා ඇත. පුජිත ජයසුන්දර ඊට ප්‍රතිචාර දක්වමින් පැමිණිලිකරුට 127 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කර දන්සැල් සිද්ධිය සිදු වූයේ බැසිල් රාජපක්ෂ මහතාගේ බලපෑම මත බවට ප්‍රකාශයක් කරන ලෙසට පවසා ඇත.

පැමිණිලිකරුට එරෙහිව නීතිපති විසින් නඟන ලද අධිචෝදනා මත දැනට කොළඹ අංක 06 මහාධිකරණයේ නඩුවක් විභාගවෙමින් පවතී. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට අවශ්‍යව තිබුණේ සංචාරක මණ්ඩලය හරහා බැසිල් රාජපක්ෂ මහතාට එරෙහිව නඩුවක් පැවරීමය. ඒ සඳහා පැමිණිලිකරු යොදා ගැනිමට උත්සාහ දරා ඇතත් එය අසාර්ථක වී ඇත.

සංචාරක මණ්ඩලය විසින් අනුග්‍රාහකත්වය දැක්වීම සාමාන්‍ය සිද්ධියකි. 2011 වර්ෂයේ දී සංචාරක මණ්ඩලය විසින් LAWASIA COMFERENS සමුළුවට ආහාර සැපයීම සඳහා අනුග්‍රාහකත්වය දක්වා ඇති බව පැ.41 ලේඛනය අනුව පෙනී යයි. ඒ අනුව ආහාර සැපයීම සංචාරක මණ්ඩලයේ අරමුණු වලට එකඟ ක්‍රියාවකි.

පැමිණිලිකරු සහ අධ්‍යක්ෂ ජනරාල් ජයවීරට එරෙහිව ඉදිරිපත් කර ඇති අධි චෝදනා පත්‍රයෙහි චෝදනා ඔප්පු කිරීම සඳහා පැමිණිල්ල විශ්වාසය තබන ප්‍රධාන සාක්ෂිකරුවන් වන්නේ සංචාරක මණ්ඩලයේ සුභ සාධක සංගමයේ සභාපති අරුන ශාන්ත පීරිස් සහ නිලධාරිනියක් වන නිල්මිනි රේනුකා ලේකම්වරයා වන විජය රණසිංහ සහ අධ්‍යක්ෂක උදාන වික්‍රමසිංහ යන පිරිස ය. ඉහත නම් ඉහත සඳහන් සියලුම සාක්ෂි කරුවන් ඔවුන්ගේ ප්‍රකාශවල සඳහන් කර ඇත්තේ

පැමිණිලිකරු සහ අධ්‍යක්ෂක ජනරාල් වරයාගේ ඉල්ලීම මත ඔවුන් මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වූ බවය. ඉහත නම් සඳහන් නිලධාරීන් එවැනි ප්‍රකාශ කිරීමට පෙළඹී ඇත්තේ පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රී සහ අනිකුත් නිලධාරීන්ගේ බලපෑම් මත බවට පැමිණිලිකරුට දැනගැනීමට ලැබී ඇත.

පැමිණිලිකරුට එරෙහිව විදේශ ගමන් තහනමක් ලබාගෙන ඇත්තේ ඔහුගේ කටඋත්තරයක් ලබා ගැනීමටත් ප්‍රථම ඔහුට කිසිදු දැනුම්දීමක් සිදු නොකරයි. මේ අන්දමින් පාර්ශවකරුවන්ට නොදන්නවා විදේශ ගමන් තහනම් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමත් එවැනි නියෝග මහේස්ත්‍රාත්වරුන් විසින් පාර්ශ්වකරුවන්ට නොදන්නවා එවැනි නියෝග නිකුත් කිරීමත් බරපතළ නෛතික ගැටලු ඇති කරන පාර්ශවකරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කරන අවස්ථාවන්ය. දේශපාලන ඕනෑ එපාකම් පිරිමසන පොලිස් නිලධාරීන්ගේ අතකොළු බවට මෙම මහේස්ත්‍රාත්වරුන් පත්වී සිටීම බරපතළ අන්දමින් නීතියේ අවගමනයක් පෙන්නුම් කරයි.

සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වැඩබලන සභාපති ලෙසට 2012 මැයි මස සිට 2015 ජනවාරි නව වැනි දින දක්වා පැමිණිලිකරු කටයුතු කර තිබේ. මෙම කාලය තුලදී දූෂණ සහ වංචා සිදු වූ බවට ප්‍රකාශ කරමින් දූෂණ විරෝධී කොමිටිය විසින් පැමිණිල්ලක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. ඒ අනුව පැමිණිලිකරුට සහ එවකට කළමනාකාර අධ්‍යක්ෂක රූමි ජවුෆෙර් යන දෙදෙනාට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය

අංක 25396/15 දරන නඩුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇත.

මෙම චෝදනා පත්‍රය මත මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව විභාග වෙමින් පවතින අවස්ථාවේදී, චෝදනා පත්‍රයට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් තිදෙනාගේම අනුමැතිය ලබා නොමැති බවට පැමිණිලිකරු විසින් විරෝධතාවයක් ගොඩනගා ඇත. එම විරෝධතාවයට මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාදුන් නියෝගයට එරෙහිව අභියාචනයක් මහාධිකරණය වෙත පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති අතර එකී අභියාචන තවමත් විභාග වෙමින් පවතී.

ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් විසින් පැමිණිලිකරු සහ තවත් කිහිප දෙනෙකුට එරෙහිව මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් පැමිණිලිකරු සහ කළමනාකාර අධ්‍යක්ෂක රූමි ජවුෆර් යන දෙ දෙදෙනා විසින් සංචාරක ප්‍රවර්ධන දැන්වීමක් පළ කරන බවට සඳහන් කරමින් අධ්‍යක්ෂක මංඩලයේ අනුමැතිය ලබාගෙන දේශපාලන පුවත්පත් දැන්වීමක් පළ කළ බවට චෝදනා කරමින් එමඟින් දූෂණ සහ ඒ සඳහා කුමන්ත්‍රණයය කළ බවට චෝදනා නගා ඇත .

ප්‍රශ්නගත සංචාරක ප්‍රවර්ධන දැන්වීම් පල පළකිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව රූමි ජවුෆර් සහ සාරංග තිලකසේන යන දෙදෙනා විසින් 2014.09.12 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇත. 2014.09.04 දිනැති මෙම අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව පැ. 46 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව සාරංගි තිලකසේන විසින් ඉදිරි ඉදිරිපත් කර ඇත්තේ තවත් තිදෙනකුගේ අත්සන සහිතවය. අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව සකස් කළ නිලධාරියාද, එම පත්‍රිකාව පරික්ෂා කළ නිලධාරියා ද එය ඉදිරිපත් කරන නිලධාරියා ද සාරංගී තිලකසේනට අමතරව අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවෙහි අත්සන් තබා ඇත. එසේම එකී දැන්වීම පළ කරන පුවත්පත් ආයතන පහක් ද අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවෙහිම නම් කර තිබී ඇත.

මෙම පුවත්පත් දැන්වීම අනුමත කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රමාණවත් විස්තර ඉදිරිපත් කර නොතිබූ බැවින් එම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී එකී අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව (පැ. 47) අනුමත නොකර පසුවට ඉදිරිපත් කිරීමට දැනුම් දී ඇත. 2014.09.12 වන දින පවත්වන ලද එකී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ වාර්තාව පැ. 48 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම වාර්තාවේ 6 වන පිටුවෙහි සඳහන්ව ඇති අන්දමට සාරංගී තිලකසේන විසින් ඉදිරිපත් කරන ලද 2017.05.09 දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අදාළ ලේඛන ද සමඟ යළි ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත, යනුවෙන් අධ්‍යක්ෂක මණ්ඩල වාර්තාවෙහි සඳහන්ව ඇත. අදාළ කොටස පැ. 47 (අ) ලෙස සලකුණු කර ඇත.

2014.09.30 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට සාරංගී සාරංගී තිලකසේන විසින් පෙර ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් කළ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව නැවත ඉදිරිපත් කර අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. එසේ වුවත් අපේක්ෂා කරන ලද ලේඛන එදින පවත්වන ලද අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට ඉදිරිපත්

කර නොතිබූ බැවින් එම ලේඛන ඉදිරි රැස්වීමට ඉදිරිපත් කරන ලෙසට ඇයට දැනුම් දී ඇත. අදාල දැන්වීම සඳහා අවශ්‍ය කෙරෙන artwork (පැ.50 ඇ) මෙම රැස්වීමට ඉදිරිපත් කර තිබී ඇත. මෙම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ වාර්තාව පැ. 49 ලෙසට ඉදිරිපත් කර ඇත. 2014.10.15 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට සාරංගි තිලකසේන විසින් පසුගිය රැස්වීමේදී දැනුම්දුන් පරිදි දැන්වීමට අදාල ලේඛන ඉදිරිපත් කර ඇත.

ඉහත සඳහන් සාක්ෂි වලින් මැනවින් පැහැදිලි වන කරුණ වන්නේ පැමිණිලිකරු ඉහත කී සංචාරක ප්‍රවර්ධන දැන්වීම පල කිරීම සඳහා කිසිදු අයුරකින් සම්බන්ධ වී හෝ සහයෝගය දැක්වීමක් හෝ උදව් වීමක් හෝ අනුබල දීමක් සිදු කර නොමැති බව ය. කරුණු එසේ වුවත් මෙම දැන්වීම් පැමිණිලිකරු විසින් නිර්මාණය කරන ලද බවට අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කර ඇත. මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව මූල්‍ය අපරාධ කොට්ඨාශය විසින් මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කරන කරුණු, සත්‍ය කරුණු, නොවන අතර ඒ හේතුවෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ නිළධාරීන් පැමිණිලිකරුට එරෙහිව අසත්‍ය සාක්ෂි නිර්මාණය කර නඩු දැමීම සඳහා ක්‍රියා කර ඇති බව පැහැදිලිව පෙනී යයි.

පැමිණිලි කාර්ය භාෂ්වරගේ කටඋත්තරය සටහන් කර ගැනීම පොලිස් පරීක්ෂක ලියනගේ විසින් සිදු සිදුකර ඇත. "සියලු දේ සොයා ගත්තා බෝලය අතට ආවම එය උඩට පාස් කරන්න ඕනෑ" යනුවෙන් පොලිස් පරීක්ෂක විජේසිරි ලියනගේ මහතා කටඋත්තර ලබා දීම සඳහා පැමිනි පැමිණිලිකරුට පවසා ඇත.

අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් අනුව ගෙවීම් සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීම, මාරු වීමේ පදනම පදනම මත (Rotation), අධ්‍යක්ෂකවරුන්ට පවරනු ලබන අතර ඒ අනුව එම කාල වකවානුව තුළදී සිදු කරනු ලබන ලක්ෂ පහකට වැඩි ගෙවීම් සඳහා පැමිණිලිකරුගේ අනුමැතිය ලබාගත් යුතු වුවත්, ලක්ෂ 5 කට වඩා වැඩි ප්‍රශ්නගත ගනුදෙනුව සම්බන්ධයෙන් පැමිණිලිකරුගේ අනුමැතිය ලබාගැනීමට ගෙවීම් සිදු කළ නිලධාරියා ක්‍රියාකර නැත. ඒ අනුව, ගෙවීම් කළ නිලධාරියා, අනුමතියෙන් තොරව සිදුකල එම ගෙවීම් සම්බන්ධයෙන්, වගකීමට බැඳී සිටී. බලය පැවරීමේ ලේඛනය පැ. 51 ලෙසටද ඊට අදාල අනිකුත් ලේඛන පැ. 51 (අ) සහ පැ. 51 (ආ) ලෙසද සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මෙම ඉතා වැදගත් කරුණ කෙරෙහි කිසිදු සැලකිල්ලක් නොදක්වමින් පැමිණිලිකරුම ඉලක්ක කරගෙන සහ පැමිණිලිකරු මගින් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා ඉලක්ක කරගෙන දේශපාලන අරමුණක් ඔස්සේ හඹා ගොස් ඇති බව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති සාක්ෂිවලින් සනාථ වී ඇත.

සාක්ෂිකරුවකු වශයෙන් කැඳවන ලද ශ්‍රී ලංකා සංචරන සුභ සාධක සංගමයේ ලේකම් ලෙස කටයුතු කරන සරත් රණසිංහ මහතා පොලිස් මූල්‍ය විමර්ශන ඒකකයට කැඳවා කටඋත්තරයක් ලබා ගැනීම සිදුකරන අවස්ථාවේ දී පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රී විසින් ඔහුට බලපෑම් සිදුකරමින් දන්සැල් දීම සම්බන්ධව බැසිල් රාජපක්ෂ හා භාෂ්වර ගුණරත්න එම කටයුත්ත සිදු කළ බවට කට උත්තර ලබා දෙන ලෙසට ප්‍රකාශ කර ඇත. පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රී කොතෙක්

දුරට දූෂණය වී තිබුණේ ද යන්න සලකා බැලුවහොත් ඔහු මෙම සංචාරක ප්‍රවර්ධන වැඩසටහන දන්සැල් දීමක් ලෙසට හඳුන්වා දීමට තරම් මානසික දූෂණයකට ලක්ව සිට ඇත. මෙය පැහැදිලි ලෙසම දේශපාලන න්‍යාය පත්‍රයක තවත් එක් ජවනිකාවකි. මෙම කට උත්තරය සඳහා සාක්ෂිකරුගේ අත්සන ලබා ගැනීමේ දී ඔහුට එම ප්‍රකාශය කියවා බැලීමට ඉඩ ලබා දී නොමැත.

සාක්ෂිකාර සරත් රණසිංහට අනුව මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා සංචරණ සුභ සාධක සංගමය විසින් සංචාරක ප්‍රවර්ධනය උදෙසා සිදුකළ වැඩ සටහනකි. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර වැයවන මුදල ඇස්තමේන්තු ගතකර සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කර, එහි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීමෙන් පසුව, අදාල මුදල් සුභ සාධක සංගමය වෙත මුදා හැරීම නීත්‍යානුකූලව සිදු කර තිබේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දිවයිනේ ප්‍රදේශ පහක් තෝරාගෙන ඇති අතර මෙම සාක්ෂිකරු මහනුවර ප්‍රදේශයේ පවත්වන ලද වැඩසටහනට සහභාගී වී ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ. 1 සිට පැ. 53 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

Chandi Fernando
24/11/2021

24/11/2020

2020.11.24

9 .XV

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 545/2020 |
| පැමිණිලිකරු | - | උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා |
| ලිපිනය | - | අංක: 448, කෝට්ටේ පාර,<br>පිටකෝට්ටේ. |

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු පොලිස්පති එන්.කේ. ඉලංගකෝන්,
2. හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර,
3. හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක,
4. ලසිත් ඉන්දීවර පෙරේරා,
5. කෙවින් කොඩිතුවක්කු,
6. පොලිස් අධිකාරී මෙවන් සිල්වා,
7. පොලිස් පරීක්ෂක ගුණතිලක,
8. බ්‍රයන් ෂැඩික් ,
9. ජැනට් ෂැඩික්,

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර උදය ප්‍රභාත් ගම්මන්පිල යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. උදය ප්‍රභාත් ගම්මන්පිල මහතාට එරෙහිව කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 2254/2015 දරන බී වාර්තාව සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තා ඉල්ලා අස්කරගැනීම සහ එහි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර උදය ප්‍රභාත් ගම්මන්පිල නිදොස් කොට නිදහස් කල යුතු බවට;

2. කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති අංක 8394/2016 සහ 8395/2016 දරන අධිචෝදනා පත්‍ර ඉල්ලා අස්කරගැනීම මගින් එකී අධිචෝදනා පත්‍ර වල දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර උදය ප්‍රභාත් ගම්මන්පිල නිදොස් කොට නිදහස් කල යුතු බවට;

3. i. ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

ii. අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,

iii. එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීම,

4. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

5. බ්‍රයන් ෂැඩික්ගේ කටඋත්තරයක් ගැනිමේ මුවාවෙන් රාජ්‍ය මුදල් අවභාවිතා කරමින් සහකාර පොලිස් අධිකාරි මෙවන් සිල්වා සහ පොලිස් පරීක්ෂක ගුණතිලක මහතා ඕස්ට්‍රේලියාව බලා ගොස් ආපසු පැමිණීම මගින් රාජ්‍ය මුදල් අවභාවිත කර දූෂණය නැමැති

වරද සිදු කර ඇති බැවින් අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇත.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

තම විදේශ අධ්‍යාපනය අවසන් කර 1994 දී ලංකාවට පැමිණෙන මෙම නඩුවේ පැමිණිලිකාර උදය ගම්මන්පිල මහතා ඕස්ට්‍රේලියා ලංකා සමූහ ව්‍යාපාරයයේ ආධුනික කළමනාකරුවෙක් ලෙස සේවයට බැඳී 1996 දී සමාගම් සමූහයේ අධ්‍යක්ෂක  සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරට පත්වී ඇත.

වර්ෂ 2000 දී ජාතික හෙළ උරුමය දේශපාලන පක්ෂය ආරම්භ කරන අවස්ථාවේදී එහි ආරම්භක සාමාජිකයෙකු වන උදය ගම්මන්පිල මහතා පසුව පක්ෂයේ ප්‍රචාරක ලේකම් සහ භාණ්ඩාගාරික ලෙස ද 2003 වසරේදී නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව පක්ෂයේ නීති උපදේශක ලෙස ද ඉන්පසුව පක්ෂයේ ප්‍රධාන නියෝජ්‍ය ලේකම් තනතුරුටද පත්වී ඇත. එම අවධියේදී  පාඨලී චම්පික රණවක මහතා පක්ෂයේ ප්‍රධාන ලේකම් විය.

2014 වර්ෂයේ ජනාධිපතිවරණයේ දී හෙළ උරුමය පක්ෂයේ සහයෝගය ලබා දිය යුත්තේ කුමන ජනාධිපති අපේක්ෂකයාට ද යන්න තීරණය කිරීමේදී උදය ගම්මන්පිල මහතා සහ පාඨලී චම්පික රණවක මහතා අතර මත ගැටුමක් ඇති වී පක්ෂය දෙකඩ වී ඇත.

එසේ දෙකඩ වීමෙන් පසු උදය ගම්මන්පිල මහතා ප්‍රමුඛ පාර්ශවය ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් පාඨලී චම්පික

රණවක මහතා ප්‍රමුඛ පාර්ශවය ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් සහයෝගය දීමට තීරණය කර ඒ අනුව ජනාධිපතිවරණ වේදිකාවට ප්‍රවේශ වී ඇත.

2015.01.08 වෙනි දින ජනාධිපතිවරණ පරාජයත් සමගම, උදය ගම්මන්පිල මහතාට දුරකතන මඟින් මරණ තර්ජන සිදු කරමින්, උදය ගම්මන්පිල මහතා පිහිටවූ පිවිතුරු හෙළ උරුමය අතහැර විදේශගතවන ලෙසටත් එසේ නොකළහොත් ඔහු සහ ඔහුගේ භාර්යාව මරා දමන බවටත් තර්ජනය කරමින් දුරකථන ඇමතුම් ලැබී ඇත. මෙම මරණ තර්ජන සම්බන්ධයෙන් බොරැල්ල පොලිස් ස්ථානයට පැමිණිළි කළද, ඒ සම්බන්ධව කිසිදු පරීක්ෂණයක් පවත්වා නොමැත. මෙම පැමිණිලි පැ. 3 සහ පැ. 4 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

1997 වර්ෂයේ දි කූඨ ලෙස සකස් කරන ලද ඇටර්නි බලපත්‍රයක් භාවිතා කර ඕස්ට්‍රේලියානු ජාතිකයෙකු වූ බ්‍රයන් ජොන් ෂැඩික් නම් පුද්ගලයෙකුට හිමි සමාගමේ කොටස් පැමිණිලිකරු විසින් 1997 සිට 2000 දක්වා කාල සීමාවේ දී විකුණන ලද බවට ඉහත සඳහන් බ්‍රයන් ෂැඩික්ගේ ඇටර්නි බාරකරු වශයෙන් පෙනී සිටි ලසිත් පෙරේරා විසින් 2015.06.17 වන දිනින් පොලිස්පති අමතා යවන ලද ලිපියක් මගින් පැමිණිලිකරුට එරෙහිව පැමිණිල්ලක් යොමු කර ඇත. එසේම තම පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා පැමිණිලි විභාග කිරිම පිළිබඳ කීර්තියක් උසුලන විශේෂ විමර්ශන ඒකකයට (SIU) තම පැමිණිල්ල විමර්ශනය සඳහා යොමු කරන ලෙසට ද ලියුම්කරු එකී ලිපියෙන් පොලිස්පතිගෙන් ඉල්ලා ඇත. ඒ අනුව පොලිස්පති විසින් එම

පැමිණිල්ල විමර්ශනය සඳහා වහාම විශේෂ විමර්ශන ඒකකයට යොමු කර තිබේ. පැ.05 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති එකී පැමිණිල්ලේ සඳහන් අන්දමට ආර්.පී.එල්.අයි. පෙරේරා නැමැති අයෙකු විසින් එම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ ඕස්ට්‍රේලියාවේ පදිංචි බ්‍රයන් ජෝන් ෂැඩික් නැමැති පුද්ගලයා විසින් ලබා දී තිබූ 2015.06.17 සහ අංක 1403 දරණ ඇටර්නි බලපත්‍රයේ ඇටර්නි බාරකරු ලෙසටය. එකී පැමිණිල්ල අනුව ඔහු මෙසේ සඳහන් කර ඇත.

(උපුටා ගැනීම) " මා විසින් 1995 දී පැන් ඒෂියා බැංකුවේ ඕස්ට්‍රේලියානු ඩොලර් ලක්ෂයක වටිනාකමකින් යුක්ත කොටස් (පුද්ගලික නිකුතුවේ කොටස් - (Private Placement) මිලදී ගන්නා ලදී. පසුව පැන් ඒෂියා බැංකුව වෙතින් කළ විමසීමකදී දැනගැනීමට ලැබුණේ උදය ගම්මන්පිල මහතා විසින් මෙම කොටස් විකුණා මුදල් ලබාගෙන ඇති බවයි. මා උදය ගම්මන්පිල මහතා වෙත ඇටෝර්නි බලපත්‍රයක් ලබාදී තිබුණේ මෙටල් රීසයිකල්ස්, කලම්බු ලිමිටඩ් ආයතනයේ දෛනික ක්‍රියාකාරකම් වලට මිස, මේ අයුරින් වංචාසහගත ලෙස කොටස් විකිණීමට නොවන අතර, මෙම කොටස් විකිණීම සඳහා ව්‍යාජ ඇටෝර්නි බලපත්‍රයක් උපයෝගී කරගෙන ඇත. මෙම කොටස් වල දැනට වටිනාකම ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 1.5 ක් වන අතර, මා හට සිදුවී ඇති පාඩුව, එනම් ඕස්ට්‍රේලියානු ඩෝලර් මිලියන 1.5 ක් වේ. මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් කඩිනම් පරීක්ෂණයක් පවත්වන මෙන් ඉල්ලා සිටිමි." (උපුටා ගැනීම අවසන්)

1995 වර්ෂයේ දී ලබා ගත්තා යැයි පවසන මෙම කොටස් විකිණීම පිළිබඳව පැමිණිලි කර ඇත්තේ 2015 වසරේ නව රජය බලයට පත්වීමෙන් පසුවය. කොටස් විකුනණු ලැබූ දිනය පිළිබඳව පැමිණිල්ලේ සඳහන් නොවේ.

බ්‍රයන් ෂැඩික් විසින් ඉහත කී ලසිත් පෙරේරා නැමැත්තාට ලබා දුන්නා යැයි පවසන අංක 1403 දරණ ඇටර්නි බලපත්‍රය ව්‍යාජ ඇටර්නි බලපත්‍රයක් බවට කොළඹ මහාධිකරණයේ විභාග වන 8394/2016 නඩුවේදී හෙළි වී ඇති බවට උදය ගම්මන්පිල මහතා සඳහන් කර ඇත.

පැ.05 දරණ පැමිණිල්ල සිදු කිරීමෙන් පසුව එකී ලසිත් පෙරේරා විසින් නැවතත් 2015.06.25 වන දින විශේෂ විමර්ශන ඒකකයට කටඋත්තරයක් ලබා දී ඇත. එකී පැ.7 දරණ කටඋත්තරය අනුව බ්‍රයන් ෂැඩික් නැමැත්තා මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීමට ලංකාවට පැමිණීමට අදහසක් නොමැති බවට සඳහන් කර ඇත. එසේම වැඩිදුරටත් මෙම ලසිත් පෙරේරා පවසා ඇත්තේ එම කොටස් මිලදී ගැනීම සම්බන්ධයෙන් ලියවිලි ඔහු සතුව නොමැති බවත්, බ්‍රයන් ෂැඩික් සතුවද එවැනි ලියවිලි නොමැති බවත්ය.

මේ අනුව දේපලවල හිමිකම හෝ අයිතිය සනාථ කරන ලියවිලි නොමැති බවට සඳහන් කර ඇති පැමිණිල්ලක් විභාග කිරීම සඳහා පොලිස්පතිවරයා එම පැමිණිල්ල විශේෂ විමර්ශන ඒකකයට යොමු කර ඇත. දේපලවල අයිතිය සනාථ කළ යුත්තේ පැමිණිලිකරු මිස විශේෂ විමර්ශන කොට්ඨාසය නොවේ. එබැවින් දේපලවල අයිතිය සනාත කරන තෙක් එම පැමිණිල්ල සත්‍ය හෝ අව්‍යාජ පැමිණිල්ලක් ලෙසට පිළිගත නොහැකිය. එවන් පසුබිමක් තුළ, බ්‍රයන් ෂැඩික්ගේ

අයිතිවාසිකම් තහවුරු කිරීමට ලේඛන නොමැතිව පැමිණිල්ලක් සිදු කරන ඇටර්නි බලකරු ලසිත් පෙරේරාගේ පැමිණිල්ලේ සඳහන් පෑන් ඒෂියා බැංකුවේ කොටස් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පියවර ගැනීම පැහැදිලි ලෙසම ඔවුන් පක්ෂග්‍රාහී ලෙස සහ ද්වේශසහගත ලෙස පොලිස් පරීක්ෂණයක් ආරම්භ කළ බවට ඇති හොඳම සාක්ෂියකි.

ලසිත් පෙරේරා විසින් ඉදිරිපත් කරන ලද සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය පැ.06 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී බලපත්‍රයේ 1403 යන ඉල්ලකම් සඳහන්ව ඇත. එම ඉල්ලකම් එහි අංකය බවට පැවසෙන වචනය එහි නොමැත. එකී ඇටර්නි බලපත්‍රය, මුල් ලේඛනයේ සත්‍ය පිටපතක් බවට සඳහන් කර ඇත. මේ අනුව ලසිත් පෙරේරා ඉදිරිපත් කර ඇති, ඇටර්නි බලපත්‍රය යැයි පවසන ලද ලේඛනය ඇටර්නි බලපත්‍රයක මුල් පිටපත නොවේ. අප රට තුල පවත්නා නීතින් අනුව ඇටර්නි බලපත්‍රයක මුල් පිටපත ඉදිරිපත් කිරිම තුළින් පමණක් වලංගු ඇටර්නි බලපත්‍රයක් ඇති බව සනාථ කළ හැකි අතර ඇටර්නි බලපත්‍රයක ඡායා පිටපතක් නීතිය ඉදිරියේ වලංගු ලේඛනයක් ලෙස පිළි නොගැනේ.

මෙම පැ.06 දරණ ලේඛනය මගින් පොලිස් ස්ථානයකට පැමිණිල්ලක් සිදු කර නඩුවක් පවත්වාගෙන යාම සඳහා විශේෂ බලයක් ලබා දී නොමැති බැවින් මෙම ඇටර්නි බලපත්‍රය මගින් බ්‍රයන් ෂැඩික්ගේ කොටස් පිළිබඳව පැමිණිල්ලක් පවරා ඒ මත නඩුවක් ගෙන යාමට ලසිත් පෙරේරාට බලයක් ලැබී නොමැත.

එසේම පැ.06 දරණ ඇටර්නි බලපත්‍රය ඕස්ට්‍රේලියාවේ දී අත්සන් කළ බවට පෙනී යන බැවින් එය ලංකාවේදී වංලගු ලේඛනයක් වීම සඳහා එම ලේඛනය, ශ්‍රී ලංකා තනාපති කාර්යාලීය සහතිකය සහිතව ඉදිරිපත් කර නොමැති බැවින් පැ.06 ලේඛනය පිළිගත හැකි ලේඛනයක් නොවේ. ඒ අනුව පැ.06 දරණ ඇටර්නි බලපත්‍රය කුමන ආකාරයකින් සලකා බලනු ලැබුවත් එය පිළිගත හැකි සත්‍ය ලේඛනයක් නොවේ.

මෙම ඇටර්නි බලපත්‍රයේ මුල් පිටුවේ පළමු ජේදයේ පැහැදිලිව සඳහන් කර ඇත්තේ මෙම පැ.06 දරණ ඇටර්නි බලපත්‍රය වලංගු වන්නේ ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් වලට පමණක් බවය. එහි වැඩිදුරටත් සඳහන්ව ඇත්තේ විදේශිය රටකට බලපාන අයුරින් එම ඇටර්නි බලපත්‍රය සකස් කළ යුතු නම් අදාළ විදේශිය රටේ නීතිය අනුව ඇටර්නි බලය සකස් විය යුතු බවය.

මේ අනුව ලසිත් පෙරේරා නැමැති පුද්ගලයා මුළුමනින්ම පිළිගත නොහැකි ව්‍යාජ ඇටර්නි බලපත්‍රයක් විශේෂ විමර්ශන ඒකකයට යොමු කර නීතිය ක්‍රියාත්මක කිරීමට සිදු කළ ඉල්ලීම මත ලසිත් පෙරේරාට එරෙහිව නීතිය ක්‍රියාත්මක කළ යුතුව තිබුණ ද සිදුවී ඇත්තේ උදය ගම්මන්පිල මහතාට එරෙහිව නීති විරෝධි අයුරින් අවනීතියක් ක්‍රියාත්මක කිරීමය.

ලසිත් පෙරේරාගේ පැමිණිල්ල ලැබීමෙන් පසුව බ්‍රයන් ෂැඩික්ගේ කටඋත්තරයක් ලියා ගැනීම සඳහා විශේෂ විමර්ශන ඒකකයේ පොලිස් නිලධාරින් වන අධ්‍යක්ෂ මෙවන් සිල්වා සහ පොලිස් පරීක්ෂක ගුණතිලක ඕස්ට්‍රේලියාව බලා පිටත්ව ගොස් බ්‍රයන් ෂැඩික්ගේ කට

උත්තරය 2015.12.04 වන දින සටහන් කර ගෙන ඇත. එසේ වුවත්, කොටස් මිලදී ගැනීම සඳහා ඕස්ට්‍රේලියාවේ සිට ලංකාවට මුදල් යැවූ ආකාරය තහවුරු කිරීම සඳහා තමන් ළඟ ලේඛන නොමැති බවට බ්‍රයන් ෂැඩික් එම ප්‍රකාශයේදී සඳහන් කර ඇත.

එසේම මෙම ප්‍රකාශය ලබා ගැනීමේ දී ඩිජිටල් නොමිනීස් සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් 1997.04.18 වන දින අත්සන් තබා උදය ගම්මන්පිල මහතාට දෙනු ලැබූ ඇටර්නි බලපත්‍රය පෙන්වා එහි අත්සන පිළිබඳව විමසා තිබේ. එහි තබා ඇති අත්සන ව්‍යාජ අත්සනක් බවට බ්‍රයන් ෂැඩික් පවසා ඇත. එසේම එකී ඇටර්නි බලපත්‍රයේ සාක්ෂිකරුවන් ලෙස අත්සන් තබා ඇති රෝස්මරි ස්මිත් මහත්මිය ඊට අවුරුදු 02 කට පමණ පෙර මිය ගොස් ඇති බවත් අනෙක් සාක්ෂිකරු වන ජුඩිත් ඩෝස් ඕස්ට්‍රේලියාවේ කිලෝමීටර් 6000 ක් පමණ දුරින් ජීවත් වන බවටත් පවසා එකී ඇටර්නි බලපත්‍රයේ සාක්ෂිකරුවන් පොලිස් නිලධාරීන්ව මුණගැස්වීම සිදු කර නොමැත. මේ අනුව උදය ගම්මන්පිල මහතාට දී ඇති ඇටර්නි බලපත්‍රයේ සාක්ෂිකරුවන්ගේ අත්සන් ඔවුන්ගේ නොවේ යැයි තහවුරු කිරීමට බ්‍රයන් ෂැඩික් අසමත් වී ඇත.

එකී ඩිජිටල් නොමිනීස් සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් 1997.04.18 වන දින අත්සන් තබා උදය ගම්මන්පිල මහතාට දෙනු ලැබූ ඇටර්නි බලපත්‍රය නිර්ව්‍යාජ ඇටර්නි බලපත්‍රයක් බවට තහවුරු කිරීම සඳහා පැමිණිලිකරු සාක්ෂි ඉදිරිපත් කර ඇත. එම කරුණු තහවුරු කිරීම සඳහා පැමිණිලිකරු විසින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු ඕස්ට්‍රේලියාවට ගොස් රෝස්මරි ස්මිත් නැමැති එකී සාක්ෂිකාරිය සොයාගෙන ඇයගෙන් ඉහත කී දිවුරුම් ප්‍රකාශයට ඇය

අත්සන් තැබූ බවත් බ්‍රයන් ෂැඩික් සහ ජූඩිත් ඩෝස් ද අත්සන් තැබූ බවටත් ප්‍රකාශයක් කරමින් දිවුරුම් ප්‍රකාශයක් ලබා දී ඇත.

ඩිජිටල් නොමිනීස් පුද්ගලික සමාගම විසින් උදය ගම්මන්පිල මහතාට ලබාදී ඇති 1997 අප්‍රේල් 18 වෙනි දින දරන ඇටර්නි බලපත්‍රයේ ඇති ඇයගේ අත්සන සහ අත් අකුරු ඇය හඳුනාගත් බවට රෝස්මරි ස්මිත් විසින්, ඇයගේ 2015 දෙසැම්බර් 01වෙනි දින දරන ව්‍යවස්ථාපිත ප්‍රකාශයෙන් සඳහන් කර ඇත. එසේම එම ඇටර්නි බලපත්‍රයේ ඇති බ්‍රයන් ෂැඩික්ගේ සහ ජැනට් ෂැඩික්ගේ අත්සන්ද, බ්‍රයන් ෂැඩික්ගේ ඉල්ලීම මත ජූඩිත් ඩෝස් තබා ඇති අත්සන ද හඳුනාගෙන ඇත. එසේම මෙම ඇටර්නි බලපත්‍රයට රෝස්මරි ස්මිත් අත්සන් තබන අවස්ථාවේ දී ඇය පර්ත් මෙටල් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක බ්‍රයන් ෂැඩික්ගේ ලේකම් සහ ගිණුම් තබන්නිය වශයෙන් සේවය කළ බවද, ඇය සඳහන් කර ඇත.

රෝස්මරි ස්මිත්ගේ මෙම දිවුරුම් ප්‍රකාෂයට අනුව, බ්‍රයන් ෂැඩික් තම කටඋත්තරයෙන්, රෝස්මරි ස්මිත් ගැන අසත්‍ය ප්‍රකාශ සිදු කර ඇති බවට සනාථ වේ. බ්‍රයන් ෂැඩික් තම 2015.12.04 වන දින කටඋත්තරයේ සඳහන් කර ඇත්තේ රෝස්මරි ස්මිත් ඊට අවුරුදු දෙකකට කට පෙර මිය ගොස් ඇති බවය.

බ්‍රයන් ෂැඩික්, ඔහුගේ  කටඋත්තරයෙන්, කොටස් මිලදී ගැනීම සහ ඔහුට පැන්එෂියා බැංකුවේ කොටස් තිබූ බවට සිදු කර ඇති ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අසත්‍ය බවට තහවුරු කෙරෙන සාක්ෂි පැමිණිලිකාර උදය ගම්මන්පිල මහතා විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. ලසිත් පෙරේරාගේ 2015.09.25 දිනැති කටඋත්තරයේ සඳහන්

අන්දමට බ්‍රයන් ෂැඩික්ගේ සුළු සමාගමක් වන ඩිජිටල් නොමිනීස් සමාගම විසින් කෝටි 02 ක් වටිනා පැන්එෂියා බැංකුවේ කොටස් 1955 වර්ෂයේ දී මිලදී ගෙන ඇති අතර එකී කොටස් ගම්මන්පිල මහතා විසින් ඉහත කී 1997.04.18 දිනැති අංක 167 දරණ පැ.12 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද ඇටර්නි බලපත්‍රය උපයෝගි කර ගෙන විකුණා ඇත.

ලසිත් පෙරේරාගේ උක්ත ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයක් බවට සනාථ කෙරෙන කරුනු හෙලිදරව් කරන පැ.13 දරණ දිවුරුම් ප්‍රකාශය උදය ගම්මන්පිල මහතා විසින් පොලිස් විශේෂ විමර්ශන ඒකකයට ලබා දී ඇත. ඔවුන් එම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු පිළිබඳව විමසා බැලීමට කිසිදු උනන්දුවක් දක්වා නොමැත. උදය ගම්මන්පිල මහතා ඉදිරිපත් කර ඇති එම දිවුරුම් ප්‍රකාශයේ සත්‍ය අසත්‍ය තාවය තහවුරු කිරීමට අවශ්‍ය පරීක්ෂණ සිදු නොකර ඒක පාක්ෂික පරීක්ෂණයක් පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් සිදු කර, කොටස් මිලදී ගැනීම සඳහා මුදල් යෙදවූ ආකාරයවත් පෙන්වාදීමට අසමත් වූ බ්‍රයන් ෂැඩික් විසින් ලබා දුන්නා යැයි කියන විදේශීය රටක ක්‍රියාත්මක කළ නොහැකි අසම්පූර්ණ ඇටර්නි බලපත්‍රයක ඡායා පිටපතක් උපයෝගි කර ගනිමින් ගම්මන්පිල මහතාට එරෙහිව ක්‍රියා කිරීමට පොලිස් විශේෂ විමර්ශන ඒකකයේ ඉහත කී නිලධාරීන් ක්‍රියා කර ඇත්තේ සම්පූර්ණයෙන්ම පක්ෂක්ග්‍රාහිව හා ද්වේශ සහගත ලෙස අසත්‍ය සාක්ෂි එක් රැස් කර ගනිමින් ගම්මන්පිල මහතා රක්ෂිත බන්ධනාගාර ගත කිරීම එකම අභිප්‍රාය බවට පත් කර ගෙනය.

1997.04.18 දිනැති ඇටර්නි බලපත්‍රයෙහි ඇති අත්සන තම අත්සන බවට රෝස්මරි ස්මිත් විසින් හඳුනාගෙන, තමන් සහ අනික් සාක්ෂිකාරිය වූ ජුඩිත් ඩෝස් ඉදිරියේ බ්‍රයන් ෂැඩික් සහ ඔහුගේ භාර්යාව වන ජැනට් ෂැඩික් එකී ඇටර්නි බලපත්‍රයට අත්සන් තැබූ බවට පැ.13 දරණ ව්‍යවස්ථාපිත ප්‍රකාශයෙන් රෝස්මරි ස්මිත් දිවුරා ප්‍රකාශ කර තිබියදීත් එම දිවුරුම් ප්‍රකාශය පිළිබඳව පොලිස් විශේෂ විමර්ශන ඒකකයේ ඉහත කී නිලධාරීන් කිසිදු සැලකිල්ලක් නොදක්වා කටයුතු කිරීම, එම පොලිස් නිලධාරීන් පක්ෂග්‍රාහීව, නිර්මාණය කළ අසත්‍ය සත්‍ය සාක්ෂි මත ක්‍රියා කර ඇති බවට ඉතා පැහැදිලිව පෙනී යයි.

මේ අනුව පැ.13 දරණ රෝස්මරි ස්මිත්ගේ ව්‍යවස්ථාපිත ප්‍රකාශයෙන් ඉදිරිපත් වන සත්‍ය සාක්ෂි සඟවමින් 2016.6.13 සහ 2016.06.16 වන බ්‍රහස්පතින්දා දිනයන් හිදි පැමිණිලිකරුගේ ප්‍රකාශයක් සටහන් කර ගනිමින් නීතිපති උපදෙස් මත 2016.06.18 වන සෙනසුරාද දින පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට එකී පොලිස් නිලධාරීන් චේතනාන්විතව ක්‍රියා කර ඇත.

රෝස්මරි ස්මිත්ගේ මෙම ව්‍යවස්ථාපිත ප්‍රකාශයෙහි ඇයගේ ලිපිනය, දූරකතන අංක පැහැදිලිව තිබියදීත් එකී දිවුරුම් ප්‍රකාශයේ නිරවද්‍යතාවය සොයා බලා ක්‍රියා කිරීමට මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ ඉහතකී නිලධාරීන් හිතාමතාම පැහැරහැරීම සහ/හෝ නොසලකා හැරීම, ඔවුන් බලපෑම් මත ද්වේශසහගත සහ

ඒකපාක්ෂිකව කටයුතු කළ බව මැනවින් පැහැදිලි කරන ක්‍රියාකාරකම් වේ.

පැ.13 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇති උක්ත නම් සඳහන් රෝස්මරි ස්මිත්ගේ දිවුරුම් ප්‍රකාශය මූලාශ අපරාධ කොට්ඨාසයට ලැබීමෙන් පසු ඔවුන් 2016.06.04 වන දින ලසිත් පෙරේරාගේ ප්‍රකාශයක් සටහන් කර ගනිමින් ඉහත කී පැ.13 දරණ ව්‍යවස්ථාපිත ප්‍රකාශය පිළිබඳව ප්‍රශ්න කර ඇත. ලසිත් පෙරේරා එම ප්‍රකාශයෙන් සඳහන් කර ඇති අන්දමට; ඔහු බ්‍රයන් ෂැඩික් සම්බන්ධ කරගෙන රෝස්මරි ස්මිත් විසින් ගම්මන්පිල මහතාට ලබා දී ඇති ඇටර්නි බලපත්‍රයට ඇය සාක්ෂිකරුවෙකු ලෙසට අත්සන් කළේද යන්න විමසනු ලැබූ බවත්, එම අවස්ථාවේදී බ්‍රයන් ෂැඩික් විසින් රෝස්මරි ස්මිත් සම්බන්ධ කරගෙන ඇයගෙන් ඒ පිළිබඳව විමසනු ලැබූ අවස්ථාවේදී, ඇය විසින් එය ප්‍රතික්ෂේප කර ඇති බවටත්, එසේම, ඇටර්නි බලපත්‍රයකට අත්සන් කල බවට උදය ගම්මන්පිල මහතාට ලිඛිතව හෝ වාචිකව දැනුම් දී තිබෙනවාදැයි විමසා සිටි විට, ඊට පිළිතුරු දෙමින් ඇය කිසිදු අවස්ථාවක සාක්ෂිකාරියක් ලෙසට අත්සන් කළ බවට උදය ගම්මන්පිල මහතාට ලිඛිතව හෝ වාචිකව දන්වා නැති බවටත් එසේ ප්‍රකාශ කරන්නේ නම් එය අසත්‍යක් බවටත් බ්‍රයන් ෂැඩික් තමන්ට දැනුම් දුන් බවට ප්‍රකාශ කරමින් ලසිත් පෙරේරා මෙම ප්‍රකාශයෙහි සඳහන් කර ඇත. මෙම ප්‍රකාශය පැ.15 වශයෙන් ඉදිරිපත් කර ඇත.

පැ.15 දරණ එකී ප්‍රකාශයේ සඳහන් වන කරුණු පැ.09 වශයෙන් ඉදිරිපත් කර ඇති 2015.12.04 දිනින් බ්‍රයන් ෂැඩික් විසින් මූලාශ

අපරාධ විමර්ශන කොට්ඨාසයේ ඉහතකී නිලධාරීන් දෙදෙනා ඕස්ට්‍රේලියාවට ගොස් ලබා ගත් ප්‍රකාශයේ රෝස්මරි ස්මිත් ගැන සඳහන් කර ඇති කරුණු හා එකිනෙකට මුළුමනින්ම පරස් පර විරෝධි වේ. එකී ප්‍රකාශයේ බ්‍රයන් ෂැඩික් ප්‍රකාශ කර ඇත්තේ රෝස්මරි ස්මිත් ඊට වසර 02 කට පමණ පෙර මියගොස් ඇති බවයි.

ඉහත සාක්ෂි ඇගැයීමේ දී ඉතා හොඳින් පැහැදිලි වන්නේ රෝස්මරි ස්මිත් විසින් සිදු කර ඇති පැ.13 දරණ ව්‍යාජ්ථාපිත ප්‍රකාශය අනුව රෝස්මරි ස්මිත් පිළිබඳව බ්‍රයන් ෂැඩික් සහ ලසිත් පෙරේරා යන දෙදෙනාම අසත්‍ය ප්‍රකාශ (ව්‍යවහාර භාෂාවේ ගල් පැළෙන බොරු) කර ඇති බවය.

මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ඉහතකී නිලධාරීන් ඔවුන්ගේ පරීක්ෂන වාර්තාව ලහි ලහියේ සකස් කර 2016.06.17 වන දින නීතිපතිවරයා වෙත යවන්නේත් නීතිපතිවරයාගේ ක්ෂණික උපදෙස් ලබා දීම මත 2016.06.18 වන දින පොලිස් විශේෂ විමර්ශන ඒකකය වෙත උදය ගම්මන්පිල මහතා අත්අඩංගුවට ගැනීමත් පැහැදිලි ලෙසම දැඩිලෙස පළිගැනීමේ ක්‍රියාවලියක තවත් පියවරකි. එසේ නොවන්නට ලසිත් පෙරේරා විසින් තුන්වැන්නෙකුගෙන් අසා දැනගත් සාක්ෂිය ගම්මන්පිල මහතා විසින් ඉදිරිපත් කළ රෝස්මරි ස්මිත්ගේ දිවුරුම් ප්‍රකාශයට වඩා විස්වාසයක් තැබීමට වෙනත් හේතුවක් නැත.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පැමිණිලිකාර ගම්මන්පිල මහතා 2016.06.18 වන දින අත්අඩංගුවට ගෙන බී 2254/2015 දරණ නඩුවට කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරිමෙන් පසුව රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති අතර දින 13 ක් රක්ෂිත

බන්ධනාගාරයේ සිටිමෙන් පසුව ඇපමත නිදහස් කර ඇත. පැමිණිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ 8394/2016 සහ 8395/2016 යනුවෙන් අධි චෝදනා පත්‍ර 2 ක් ඉදිරිපත් කර ඇත.

2015 රජයේ අමාත්‍යවරයෙකු වූ පාඨලී චම්පික රණවක ලේකම්ධූරය හොබවන ජාතික හෙළඋරුමය පක්ෂයෙන් කොළොන්නාව ආසනයට පත් කර තිබූ සංවිධායකවරයෙකු වූ කවීන් කොඩිතුවක්කු නැමැත්තා ඉහත කී අසත්‍ය කටඋත්තරය ලබා දුන් ලසිත් පෙරේරාගේ

ඥාති සහෝදරයෙකු බවට මහාධිකරණයේ විභාග වෙමින් පවතින අංක 8394/2016 නඩුවේ 2020.10.13 වන දින පැවැති නඩු විභාගයේ දී ලසිත් පෙරේරා විසින් පිළිගෙන ඇත.

පැමිණිලිකාර උදය ගම්මන්පිල මහතාට එරෙහිව දියත් කෙරෙන මෙම භයානක කුමන්ත්‍රණයේ තවත් එක් සන්දිස්ථානයක් හෙළිදරව් කෙරෙන, විද්‍යුත් තැපැලෙන් යවන ලද ලිපියක් සහ එම ලිපියේ ඇමුණුම පැ.21 සහ පැ.21 (අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.21 දරණ විද්‍යුත් තැපැල් පණිවිඩය 2015.08.30 වන දින පෙ.ව 11.24 ට කෙවින් කොඩිතුවක්කු විසින් බ්‍රයන් ෂැඩික් වෙත යවමින්, මාධ්‍ය හමුවක් සඳහා සකස් කළ බ්‍රයන් ෂැඩික්ගේ ප්‍රකාශයකට වෙනස් කම් කීපයක් කෙවින් කොඩිතුවක්කු විසින් සිදු කල බවටත්, එකී විද්‍යුත් ලිපියේ ඇමුණුමෙහි (පැ.21 (අ)) සඳහන් බ්‍රයන් ෂැඩික්ගේ මාධ්‍ය ප්‍රකාශය හොඳින් අධ්‍යනය කර ගම්මන්පිල මහතාට සම්පූර්ණ දෝෂාරෝපණය එල්ල කිරීමට වග බලාගන්නා ලෙසටත්, මාධ්‍ය හමුව හිල්ටන් හෝටලයේ පැවැත්වීමට සූදානම් කර

ඇති බවටත්, සියලුම මාධ්‍ය ආයතන සහභාගී වන බවටත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බ්‍රයන් ෂැඩික්ගේ කාමරයට පැමිණ ප්‍රකාශ සටහන් කර ගන්නා බවටත්, සියළුම ලේඛණ ඔවුන්ට භාර දෙන ලෙසටත්, දන්වා ඇත. එසේම බ්‍රයන් ෂැඩික්ට ලංකාවට පැමිණීමට අවශ්‍ය ගුවන් ටිකට්පත් ගාස්තුව සහ ඔහුගේ හෝටල් ගාස්තුව කෙවින් කොඩිතුවක්කු විසින් ගෙවා ඇති බවටත්, පොරොන්දු වූ පරිදි බ්‍රයන් ෂැඩික්ට ගෙවිය යුතු ගෙවීම මුදලින් බ්‍රයන් ෂැඩික් ලංකාවට පැමිණීමෙන් පසුව ගෙවන බවටත් දැනුම් දී ඇත. මෙම විද්‍යුත් තැපැල් පණිවිඩයෙන් පැහැදිලිව පෙනී යන්නේ හිල්ටන් හෝටලයේ පවත්වන මාධ්‍ය හමුවේ දී බ්‍රයන් ෂැඩික් විසින් උදය ගම්මන්පිල මහතාට එරෙහිව සිදු කරනු ලබන මාධ්‍ය ප්‍රකාශයට ඔහුගේ ගමන් වියදම් සහ නවාතැන් ගාස්තු සඳහා මුදලින් ගෙවීම් සිදු කර ඇති බවය.

මේ අන්දමින් වියදම් කර මුදල් ගෙවා බ්‍රයන් ෂැඩික් මගින් මාධ්‍ය හමුවේ දී සිදු කළ යුතු ප්‍රකාශය වන පැ.21 (අ) මගින් ගම්මන්පිල මහතාට එරෙහිව ගොඩනඟන අසත්‍ය චෝදනා පිළිබඳව ද්වේශ සහගත ප්‍රසිද්ධියක් ලබා දීම සිදු කර ඇත.

එසේම පැ.20 වශයෙන් ඉදිරිපත් කළ විද්‍යුත් ලිපියද බ්‍රයන් ෂැඩික් විසින් කෙවින් කොඩිතුවක්කුගේ විද්‍යුත් ලිපිනයට යවමින් දිවුරුම් ප්‍රකාශයක ස්වරූපයෙන් උදය ගම්මන්පිල මහතාට ඇටර්නි බලපත්‍රයට ලබාදුන් බවට ප්‍රකාශයක් කර ඇත. එසේම එහි අවසන් ඡේදයෙන් බ්‍රයන් ෂැඩික්ගේ 2015.05.13 දිනැති ව්‍යවස්ථාපිත ප්‍රකාශයෙහි අඩංගු කරුණු කියවා මතකයට ගන්නා ලෙසට ද ඉල්ලීමක් කර ඇත.

මේ අනුව බ්‍රයන් ෂැඩික් සහ කෙවින් කොඩිතුවක්කු අතර කිට්ටු සම්බන්ධතාවයක් තිබී ඇති අතර එකී සම්බන්ධතාවය මත ගම්මන්පිල මහතාට එරෙහිව අසත්‍ය චෝදනා නැඟීම සිදු කර ඇති බව ඉහත සාක්ෂි වලින් සනාථ වී ඇත.

මෙවන් පසුබිමක් තුළ වෙනත් ස්වාධීන සාක්ෂිකරුවන් සොයා ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීමකින් තොරව පරීක්ෂණ ලිපිගොනු නීතිපතිවරයා වෙත යවා අංක 8394/2016 සහ 8395/2016 දරන අධිචෝදනා පත්‍ර දෙක ගම්මන්පිල මහතාට එරෙහිව මහාධිකරණයේ ගොනු කර ඇත.

2015 ජනාධිපතිවරණ පරාජයෙන් පසුව විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් සිටිමින් විමල් වීරවංශ, දිනේෂ් ගුණවර්ධන සහ වාසුදේව නානායක්කාර මන්ත්‍රීවරුන් සමඟ මහින්ද සුළඟ නැමැති දේශපාලන ව්‍යාපාරය ඔස්සේ මහින්ද රාජපක්ෂ මහතා නැවත දේශපාලනයට ගෙන ඒම සඳහා දේශපාලන ව්‍යාපාරයක් ආරම්භ කළ බවත් මෙම දේශපාලන ව්‍යාපාරය එවකට රජයට  බරපතළ හිසරදයක් වූ බවත් ඒ හේතුවෙන් උදය ගම්මන්පිල මහතා දේශපාලන කරළියෙන් ඉවත් කරලීමේ අවශ්‍යතාවය දේශපාලන බලධාරීන්ට තිබුණු බවත් සාක්ෂි විභාගයේදී ඉදිරිපත් වී ඇත.

මේ අනුව නීතිපතිවරයා විසින් ලබා ලබාදෙන උපදෙස් පරිදි 2016.06.17 වන දින උදේ ගම්මන්පිලට මහතා කඩිමුඩියේ අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කරනු ලබන්නේ ඉහතින් සඳහන් කළ පරිදි ලසිත් පෙරේරා විසින් තුන් වැනි පුද්ගලයකු ගෙන් අසා දැන ගත් කරුණු අනුව රෝස්මරි ස්මිත් මහත්මිය උදය ගම්මන්පිල මහතාට

ලබාදී ඇති ඇටර්නි බලපත්‍රයට අත්සන් නොකළ බවට තමන්ට ප්‍රකාශ කළා යැයි  බ්‍රයන් ෂැඩික් විසින් සිදුකළා යයි සඳහන් කරනු ලැබූ කිසිසේත් විශ්වාස කළ නොහැකි ප්‍රකාශයක් මතය.

ගම්මන්පිල මහතා අත්අඩංගුවට ගැනීමෙන් පසුව  බී 2254/2015 දරන නඩුවට කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව දින 13 ක කාලසීමාවක් සඳහා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති අතර ඉන් පසුව ඇප මත මුදා හැර ඇත.

පෑන් ඒෂියා බැංකුවේ තමන්ට කොටස් හිමි නැති බවට බ්‍රයන් ෂැඩික් දැනගැනීමෙන් පසුව මහාධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දෙන අවස්ථාවේදී ඔහුගේ කටඋත්තරය තබා ඇති අත්සන නොහඳුනන බවට ප්‍රකාශ ඇත. බ්‍රයන් ෂැඩික්ගේ කටඋත්තරය ලබා ගැනීම සඳහා ඔස්ට්‍රේලියාව බලා ගිය  සහකාර පොලිස් අධිකාරී මෙවන් සිල්වා සහ පොලිස් පරීක්ෂක ගුණ ගුණතිලක යන දෙදෙනාට රාජ්‍ය මුදල් රුපියල් ලක්ෂ 15 කට ආසන්න මුදලක් වැයකර ඇත. මෙම වැය කිරීම සම්බන්ධව අපරාධ පරීක්ෂණය දෙපාර්තමේන්තුවෙන් කැඳවනු ලැබූ වාර්තා පැ. 31 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2015.02.12 වන දින ශ්‍රී ලංකාවෙන් ඔස්ට්‍රේලියාව බලා පිටව ගොස් 2015.12.08 වන දින ආපසු ශ්‍රී ලංකාව පැමිණ ඇති අතර ඔවුන් දෙදෙනාට දරණ ලද වියදම එක් අයෙකුට රුපියල් 7,20069 බැගින් දෙදෙනාටම 1440138 මුදලක් වැය කර ඇත. කටඋත්තරය ලබා ගැනීම සඳහා ඔස්ට්‍රේලියාවට ගොස් ලංකාවට පැමිණීමට දින 06 ක කාලයක් ගත කර ඇත. ලසිත් පෙරේරා විසින් සිදු කළ පැමිණිල්ල අසත්‍ය පැමිණිල්ලක් බව දැන දැනම සහ ඔහු විසින් ඉදිරිපත් කළ

ඇටර්නි බලපත්‍රය මුල්පිටපතක් වත් නොමැති ලංකාවේ වලංගු ඇටර්නි බලපත්‍රයක් නොවන බව දැන දැනම සහ පෑන් එෂියා බැංකුවේ බ්‍රයන් ෂැඩික්ට කොටස් තිබුණේද යන්නවත් සොයා නොබලා ඔහුගේ කටඋත්තරයක් ගැනිමේ මුවාවෙන් රාජ්‍ය මුදල් අවභාවිතා කරමින් සහකාර පොලිස් අධිකාරි මෙවන් සිල්වා සහ පොලිස් පරීක්ෂක ගුණතිලක මහතා ඔස්ට්‍රේලියාව බලා ගොස් ආපසු පැමිණීම මගින් රාජ්‍ය මුදල් අවභාවිත කර දූෂණය නැමැති වරද සිදු කර ඇත.

ඔස්ට්‍රේලියාව බලා යාමට ප්‍රථම මෙම නිලධාරීන් දෙදෙනා ශ්‍රී ලංකාව තුළ දී පෑන්ඒෂියා බැංකුව සහ අනිකුත් අදාල ආයතන නිසි ලෙස පරීක්ෂණයකට ලක් කළා නම් පෑන් ඒෂියා බැංකුවේ කොටස් නොමැති බවට ඔස්ට්‍රේලියාවට නොගොසින්ම සොයා ගැනීමට ඉතා හොඳින් හැකියාව තිබුණි. එසේ වුවත් රාජ්‍ය මුදල් වැය නොවන පහසු පරීක්ෂණ ක්‍රමය අනුගමනය නොකර ඔවුන් ඉතා අධික මුදලක් ගෙවා ඕස්ට්‍රේලියාව බලා ගොස් බ්‍රයන් ෂැඩික් නැමැත්තාට පෑන් ඒෂියා බැංකුවේ කොටස් නොමැති බවට කටඋත්තරයක් ලබාගෙන ආපසු පැමිණ ඇත.

පැමිණිලිකරුට එරෙහිව යම් අපරාධ නඩුකරයක් ගෙන යාමට නම් බ්‍රයන් ෂැඩික්ට පෑන් ඒෂියා බැංකුවේ කොටස් හිමි වී තිබිය යුතුමය. එබැවින් එම මූලික කරුණු ඕස්ට්‍රේලියාවට යාමට ප්‍රථම විමර්ශනයට ලක්කර පැහැදිලි කරගත යුතුව තිබුණි. එසේ වුවත් විශේෂ විමර්ශන ඒකකය එසේ සිදු නොකළේ එසේ සිදු කළා නම් පැමිණිලිකරු දේශපාලන වශයෙන් පලිගැනීමට ලක් කල නොහැකි වන බැවිනි. ඕස්ට්‍රේලියා ලංකා සමූහ ව්‍යාපාරයේ සම සභාපතිවරුන් ලෙස සහ

අධ්‍යක්ෂකවරුන් ලෙසට 1996 වර්ෂයේ සිට බ්‍රයන් ෂැඩික් සහ සිඩ්නි ජයසිංහ කටයුතු කර ඇත. මෙම කාලසීමාවේදී සීමිත ක්‍රියාකාරකම් කීපයක් සඳහා පමණක් ක්‍රියා කළ හැකි වන පරිදි ඩිජිටල් නොමිනී සමාගමේ ඇටර්නි බලකරු ලෙසට පැමිණිලිකරු පත්කරමින් ඇටර්නි බලපත්‍රයක් පැමිණිලිකාර උදය ගම්මන්පිල නමින් ලබා දී ඇත. ඉහත කී සමූහ ව්‍යාපාරයට අයත් මෙටල් රී සයික්ලින් සමාගමේ ප්‍රධාන කොටස් හිමියා වූයේද ඩිජිටල් නොමිනී සමාගමය. සිඩ්නි ජයසිංහට පැන් ඒෂියා බැංකුවේ වැඩි අයිතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවය උදෙසා වැඩි කොටස් ප්‍රමාණයක් ලබා ගැනීමට අවශ්‍ය වූයෙන් ඒ සඳහා කටයුතු කිරීමට ඩිජිටල් නොමිනී සමාගමේ ඇටර්නි බලකරු ලෙස පත් කරමින් පැමිණිලිකරුගේ නමින් ඇටර්නි බලපත්‍රයක් ලබා දී ඇත. එම ඇටෝර්නි බලපත්‍රය මගින් සිදු කල හැකි වූයේ පැන් ඒෂියා බැංකුවේ කොටස් මිලදී ගැනීමත් ඒවා විකිණීමත් පමණි. ඒ අනුව සිඩ්නි ජයසිංහගේ නමින් රු. මිලියන 2 ක කොටස් ප්‍රමාණයක් ද, ඇටර්නි බලපත්‍රය පාවිච්චි කරමින් ඩිජිටල් නොමිනී සමාගම නමින් රු. මිලියන 2.1 කොටස් ප්‍රමාණයක් ද පැමිණිලිකරු විසින් මිලදී ගෙන ඇත. රු. මිලියන 2.1 කොටස් මිලදී ගැනීම සඳහා පැමිණිකරු විසින් වනික් ඉන්කෝපරේෂන් සමාගමෙන් ණය මුදලක් ලබාගෙන ඇත. ඉන් පසු අවස්ථාවකදී මෙම සියලුම කොටස් විකුණා සිඩ්නි ජයසිංහගේ මුදල් සිඩ්නි ජයසිංහටත් වණික් ඉන්කෝපරේෂන් සමාගමේ ණය මුදල බේරීම සඳහා ඉතිරි මුදල ගෙවා පැන් ඒෂියා බැංකුවේ තිබූ කොටස් හිමිකාරීත්වය අවසන් කර ඇත. මෙම ගනුදෙනුවෙන් පැමිණිලිකරුට කිසිදු වාසියක් අත්වී නැති අතර සිදු කර ඇත්තේ නියෝජිතයා වශයෙන් සිඩ්නි ජයසිංහ වෙනුවෙන් කටයුතු

කිරීම පමණකි. මෙම කරුණු දිවුරුම් ප්‍රකාශයක් මගින් සිඩ්නි ජයසිංහ විසින් සනාථ කර ඇත.

පැමිණිලිකරු විසින් පිවිතුරු හෙළ උරුමය පිහිටුවාගෙන සිදුකරනු ලැබූ ක්‍රියා ක්‍රියාකාරකම් හේතුකොටගෙන පාඨලී චම්පික රණවක මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ජාතික හෙළ උරුමයේ දේශපාලන වැඩසටහන් වලට එකී කටයුතු බරපතළ අභියෝගයක් වී ඇත. ඒ අනුව ජාතික හෙළ උරුමයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මහතා එකී පක්ෂයේ කොළොන්නාව සංවිධායක කෙවින් කොඩිතුවක්කු සහ ඔහුගේ ඥාති සහෝදරයා වන ලසිත් පෙරේරා යොදාගනිමින් පැමිනිලිකරුට එරෙහිව ඔහු දේශපාලනයෙන් ඉවත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ බවත්, තමන් රක්ෂිත බන්ධනාගාරයට පත් කිරීමේ වැඩසටහන එහි ප්‍රතිඵලයක් බවත්, එබැවින් පාඨලී චම්පික රණවක ඇතුළු පිරිස මෙම දේශපාලන පළි ගැනීම සඳහා වගකිව යුතු බවටත් පැමිණිලිකරු සාක්ෂියේදී සඳහන් කර ඇත.

කිසිදු සාක්ෂියක් හෝ පිලිගැනීමේ හැකියාවක් නොමැති පැමිණිල්ලක් සහ කිසිදු නෛතික පිළිගැනීමක් නොමැති ඇටර්නි බල පත්‍රයක ඡායා පිටපතක් ඉදිරිපත් කළ පමණින්ම සහ ලසිත් පෙරේරා ඉල්ලා සිටි පමනින්ම විශේෂ විමර්ශනය ඒකකයට එම පැමිණිල්ල විභාග කිරීම සඳහා එවකට පොලිස්පති එන්.කේ. ඉලංගකෝන් මහතා විසින් යොමු කිරීම තුළින් මෙම දේශපාලන පළි ගැනීමේ ක්‍රියාදාමය තුළ සිටි තවත් පුද්ගලයකු ලෙසට එන්.කේ. ඉලංගකෝන් මහතා නම් කර ඇත. මෙහි ඇති විශේෂත්වය වන්නේ බ්‍රයන් ෂැඩික් වෙනුවෙන් ලසිත් පෙරේරා පැමිණිල්ල සිදුකර ඇත්තේ 2015.06.17 දින වන අතර ඉහත

කී ඇටර්නි බලපත්‍ර ඡායා පිටපතේ සඳහන් දිනය වන්නේ 2015.07.09 වන දින බැවින් පැමිණිල්ල කළ දිනයේ දී ඒ සඳහා ඇටර්නි බලපත්‍රයක ඡායා පිටපතක්වත් ලසිත් පෙරේරා සතුව නොතිබීමය. විශේෂ විමර්ශන ඒකකය මගින් විමර්ශනය සිදු කිරීම සඳහා පොලිස්පති එන්. කේ. ඉලංගකෝන් මහතා විසින් යොමු කර ඇත්තේ මේ අන්දමේ පැමිණිල්ලකි.

පැමිණිලිකරුට එරෙහිව අසත්‍ය පැමිණිල්ලක් ඉදිරිපත්කර ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කර ඔහුට එරෙහිව මහාධිකරණයේ නඩු පැවරීමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් ලෙසට ඉහත නම් සඳහන්කල පුද්ගලයින් වගඋත්තරකරුවන් ලෙසට නම්කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ. 1 සිට පැ. 32 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 .XVI

පැමිණිලි අංකය - 1963 / 2020

පැමිණිලිකරු - යෝෂිත කණිෂ්ක රාජපක්ෂ

ලිපිනය - කාල්ටන්, තංගල්ල.

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. රවි වෛද්‍යාලංකාර
2. මහේස්ත්‍රාත් ධම්මික හේමපාල
3. ආනන්ද විජේපාල

### තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර යෝෂිත කණිෂ්ක රාජපක්ෂ යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, යෝෂිත කණිෂ්ක රාජපක්ෂ මහතා  මහතාට එරෙහිව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 9823/2015 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින්ද, ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 828/2016 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර යෝෂිත කණිෂ්ක රාජපක්ෂ මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම  පැමිනිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC 8331/16 දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,

නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිනිලිකරු රඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකූඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

5. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

6. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

2015 ජනවාරි මස 08 වන දින පත් වූ නවරජය රාජපක්ෂ පවුලට එරෙහිව සංවිධානාත්මක සටනක් ගෙන ගොස් ඇත. නාවික හමුදා රග්බි කණ්ඩායමේ ක්‍රීඩකයෙකු වූ පැමිණිලිකරුට රග්බි පිටියට නොපැමිණෙන ලෙසට 2015.1.17 වන දින දැනුම්දීමක් සිදු කර ඇත. මේ කාලයේ දී පැමිණිලිකරුගේ පවුලේ සියළු සාමාජිකයින්ට මෙන්ම ඥාතින්ට එරෙහිවද මෙම කාලයේදී විවිධ පොලිස් පරීක්ෂණ ආරම්භ වී ඇත. සමාජ මාධ්‍ය ජාලාවල මෙන්ම රූපවාහිනී නාළිකාවලින් ද රාජපක්ෂ පවුල පිළිබඳ ප්‍රවෘත්ති විකාශනය වී ඇත. පැමිණිලිකරුට එරෙහිව පළමුවරට 2016.01.30 වන දින නාවික හමුදාවට සේවයට වාර්තා කළ අවස්ථාවේ උදැසන 5.00 ට පමණ ලැබුණු දුරකතන ඇමතුමකින් කටඋත්තරයක් ලබා ගැනීමට පැමිණෙන බවට සිදු කල දැනුම් දීමක් අනුව පොලිස් නිලධාරීන් 18 ක 20 ක පමණ කණ්ඩායමක් උදේ 8.00, 8.30ට පමණ පැමිණ, CSN නාළිකාව පිළිබඳ පරීක්ෂණයකට කටඋත්තර ලබා ගැනීමක් සිදු කර ඇත. පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කළ නිලධාරීන් පූර්ව නිගමන මත පිහිටා පැමිණිලිකරු CSN නාළිකාවේ හිමිකරු යන පදනම මත ප්‍රශ්න නඟා කටඋත්තරය ලබාගෙන ඇත. එම කටඋත්තරය සටහන් කර ඇත්තේ

සෙනසුරාද දිනයකදීය. සෙනසුරාදා අධිකරණය විවෘත කර තිබේදැයි පැමිණිලිකරු ප්‍රශ්න කල විට, "ඇරලා හරි දානවා" යනුවෙන් පොලිස් නිලධාරීන් ප්‍රකාෂ කර ඇත. ඉන්පසු පැමිණිලිකරු තම දූරකතනය ඉල්ලා ඇති අතර ඒ සඳහා නියෝගයක් අවශ්‍ය බවට පවසා පසුව නැවත නාවික නිලධාරීන්ගේ ඉල්ලීම මත දූරකතනය ලබා දී ඇත.

එදින සවස හයට හතට පමණ පැමිණිලිකරු කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන යන විටත් මහේස්ත්‍රාත් අධිකරණ භූමිය ජනයාගෙන් සහ මාධ්‍යවේදීන්ගෙන් පිරී ගොස් තිබී ඇත. රොහාන් වැලිවිට මහතා ද එම අවස්ථාවේදී අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා රැගෙනවිත් ඇත. ඒ වන විටත් මහේස්ත්‍රාත්වරයා තම නිල මැදිරියේ අසුන් ගෙන සිටී ඇත. පැමිණිලිකරු සහ රොහාන් වැලිවිට මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කරනු ලැබ, ඔවුන්ට එරෙහිව ඇති චෝදනා පොලිස් නිලධාරින් විසින් කියවා දෙනු ලැබූ අවස්ථාවේදී, මහේස්ත්‍රාත්වරයාගේ නිල දූරකථනයේ රිසීවරය, දූරකථනයෙන් ඉවත් කර මේසය මත තබා තිබෙනවා පැමිණිලිකරු නිරීක්ෂණය කර ඇත. දූරකථන රිසීවරය පොලිස් නිලධාරියා දෙසට විවෘත වන සේ තබා තිබීම කරණ කොටගෙන එම දූරකථනය, දූරකථන සංවාදයක ක්‍රියාත්මක අවධියේ පවතින බවට පැමිණිලිකරුට නිරීක්ෂණය වී ඇත.

ඇප මත මුදා හරින ලෙසට ඉල්ලමින් පැමිණිලිකරුගේ නීතිඥවරුන් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමින් පොලිස් නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි පැමිණිලිකරු 2016.02.11 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

මෙම බී වාර්තාවේ දෛනික සටහන් සහ 2016.01.30 දින නියෝගය පැ. 1, 2, සහ 3 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ. 3 දරන

2016.01.30 දිනැති නියෝග මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතා සඳහන් කර ඇත්තේ; "දෙපාර්ශවයේ කරුණු සලකා බලා සැකකරුවන් විමර්ශන සඳහා බාධා එල්ල කර ඇති බැවින් සහ විමර්ශන සඳහා සහයෝගය දක්වා නොමැති බැවින් සැකකරුවන් මුදා හැරිය හොත් ඉදිරි විමර්ශන සඳහා බාධා එල්ල වන තත්ත්වයක් උද්ගත වී ඇති බැවින් මේ අවස්ථාවේදී චූදිතයින් රක්ෂිත බන්ධනාගාර ගත කරමින්" යනුවෙනි. මහේස්ත්‍රාත්වරයා එසේ වාර්තා කර ඇතත් පැමිණිලිකරු පරීක්ෂණවලට බාධා කළ බවට පිළිගත් හැකි කිසිදු සාක්ෂියක්ද බී වාර්තාවෙහි දක්වා නොමැත. පැමිණිලිකරුගේ නීතිඥවරුන් මහේස්ත්‍රාත්වරයා හමුවේ ඉදිරිපත් කළ කිසිදු කරුණක් මහේස්ත්‍රාත්වරයා විසින් සලකා බලන ලද බවට පිළිබිඹු වෙන කරුණු කිසිවක් නියෝගයෙහි අන්තර්ගතව නොමැත.

2016.01.11 වන දින ඇප ප්‍රතික්ෂේප කරමින් සිදු කළ; පැ.4(අ) වශයෙන් සලකුණු කර ඇති ඇප නියෝගයෙහි; "තවද මෙම නඩුවේ වැඩිදුර වාර්තාවල දක්වන ලද කරුණු අනුව සැකකරුවන් අධිකරණ කටයුතු වලින් බැහැරව යාමේ අවදානමක් ඇති බවට කරුණු අනාවරණය නොවේ" යනුවෙන් සඳහන් කරමින් සැකකරුවන් ඇප මත මුදා හැරීම ප්‍රතික්ෂේප කර ඇත.

පැමිණිලිකරු ඇතුළු පිරිසට එරෙහිව උක්ත සඳහන් බී 9823/2020 වාර්තාවේ ආරම්භය 2015.04.16 දින බව පැ.02 දරණ කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණ වාර්තාවෙන් පැහැදිලි වේ. 2015.04.16 වන දින සිට 2016.01.29 වන දින දක්වා කාලය තුළදී මෙම දින දෙකද ඇතුළුව 21 වතාවක් නඩුව කැදවා විවිධ නියෝග මහේස්ත්‍රාත්වරයා විසින් සිදු

කර ඇතත් එකී නියෝග පැ.02 වාර්තාවේ විස්තර කර දක්වා නොමැත.

මෙම පැ.02 වාර්තාව 2016.01.30 වන දින කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවන ලද්දේ පැමිණිලිකරු ඇතුළු 05 දෙනෙකු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට සහ ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග ලබා ගැනීමට බව එදින සටහන අනුව පැහැදිලිය. ඒ අනුව පැමිණිලිකරු ඇතුළු ඉහත කී 05 දෙනා 2016.02.11 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඉන්පසුව පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ඉදිරිපත් කළ කරුණු මත ඔවුන් ඇප මත මුදාහැරීම කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරමින් දිගින් දිගටම රක්ෂිත බන්ධනාගාරයේ තබා ගෙන ඇත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි වලින් පැහැදිලි වන්නේ ඉහත කී 05 දෙනා ඇපමත මුදාහැරිමට මහේස්ත්‍රාත්වරයාට නෛතික බලය තිබියදීත්, පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිළධාරීන්ගේ කරුණු කියා පෑම වලට අනුගත වෙමින් මහේස්ත්‍රාත්වරයා එකී 05 දෙනාගේ අයිතිවාසිකම් වලට අගතියක් සිදු කරමින් ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති බවය. කඩුවෙල මහේස්ත්‍රාත් වශයෙන් එකී නියෝග ප්‍රකාශයට පත් කළ ධම්මික හේමපාල මහතා විසින් ඉහතකී 05 දෙනා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ දී නීතියේ රාමුවෙන් පිට පැන නීතිය උල්ලංඝනය කරමින් ක්‍රියා කර ඇති බවට මහාධිකරණය නිරීක්ෂණය කර ඇති බව පැ.04 දරණ මහාධිකරණ නියෝගයෙන් උපුටාගත් පහත දැක්වෙන කොටස් වලින් ඉතා හොඳින් පැහැදිලිවේ.

(උපුටාගැනීම) " මේ අනුව මා හට පෙනී යන්නේ පොලිසිය විසින් ඉදිරිපත් කර ඇති බී වාර්තාවලද අවස්ථාවෙන් අවස්ථාවට වෙනස් වන්නා වූත් තත්ත්වයක් ඇති බවයි"

"තවද ඉහත සඳහන් කරන ලද ආකාරයට පොලිස් වාර්තාවන් වලට අනුව මෙම සැකකරුවන් කුමන පනතක් යටතට වැටෙනවාද නැද්ද යන්න ද අවිනිශ්චිත තත්ත්වයවයක් පවතින බව මා හට පෙනී යයි. ඒ අනුව මෙවැනි තත්වයක් යටතේ මහේස්ත්‍රාත්තුමා විසින් පොදු දේපළ පනත යටතේ මෙම සැකකරුවන් රක්ෂණ බන්ධනාගාර ගත කිරීම මා හට පෙනී යනුයේ නීතියට පටහැනි බවයි"

"ෆාරුක්ගේ එදිරිව රේමන් (1996) 01 SLR 217 නඩුවේදී අමරසිංහ විනිශ්චයකාරතුමා සඳහන් කර ඇති අන්දමට “where a judge has abdicated his authority, for example by complying with or acceding to or acquiescing in proposals made by police officers and acting in concert with them consenting rather than assenting, he would not, in my opinion, be acting in judicially: it may be the act of an officer appointed to perform judicial duties and functions but it would not be a judicial act "

"ඒ අනුව එවැනි ලේඛනයක් යටතේ මහේස්ත්‍රාත්වරයෙකු යම්කිසි අයකු රක්ෂණ භාරයට පත් කරතොත් එය මෙම වගන්තියේ සඳහන් නීතියට පටහැනි කරුණක් වනු ඇත. එවැනි විටෙක පෙනී යන්නේ ඉහත සඳහන් නඩු තීන්දු දෙක සලකා

බැලීමේදී මහේස්ත්‍රාත්වරයා අධිකරණමය වශයෙන් ක්‍රියා කිරීමක් කර නොමැති බවයි " (උපුටා ගැනීම අවසන්)

මේ අනුව මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතා මෙම පැමිණිලිකරුවන් රක්ෂිත බන්ධනාගාර ගත කිරිම සඳහා ක්‍රියාකරනු ලැබූ ආකාරය සහ ඊට අදාල ක්‍රියාවන් අධිකරණමය ක්‍රියාවන් නොවන බවට පැහැදිලිය.

පැමිණිලිකරුට එරෙහිව කරන ලද සියළු පරීක්ෂණ දේශපාලන උවමනාවන් මත සිදු කර ඇති බවත්, මාධ්‍ය මගින් සිදු කෙරුණු වාර්තා පරිශීලනය කිරීමේදී පැහැදිලිව පෙනී යයි. රවි වෛද්‍යාලංකාර මහතා මාධ්‍ය හමුවලදී සඳහන් කර ඇති පරිදි රාජපක්ෂවරුන් අත්අඩංගුවට ගැනීමේ අවශ්‍යතාවය පැහැදිලිව සඳහන් කර ඇත. ඔහු මූල්‍ය අපරාධ විමර්ශන අංශයේ ප්‍රධානියා වශයෙන් පැ. 5 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද සති අග අරුණ පුවත්පත ට ලබා දෙන ලද මාධ්‍ය සාකච්ඡාවක දී රාජපක්ෂවරුන් අත්අඩංගුවට ගැනීමට එවකට රජයට තිබූ අවශ්‍යතාවය පැහැදිලි කර ඇත. 2019-10-27 ඉරිදා සති අග අරුණ පුවත්පත රවි වෛද්‍යාලංකාර මහතා ලබා දුන් මාධ්‍ය ප්‍රකාශයේ මෙසේ සඳහන් කර ඇත.

(උපුටා ගැනීම) "වරක් එක් ඇමතිවරයෙක් මට කිව්වා ඔවුන්ගේ දේශපාලන අනාගතයය රඳා පවතින්නේ මගේ අතේ කියලා. ඒ නිසා සතියකට වරක්වත් එක රාජපක්ෂ කෙනෙක්වත් ප්‍රශ්න කරලා අත්අඩංගුවට ගත යුතුයි කියලා කිව්වා. මේ නිසා මට මට හැඟී ගියා රාජපක්ෂ පවුල ගැන ලොකු බයක් වගේම ඔවුන්ගේ ඉදිරි දේශපාලන කටයුතු වැළැක්වීම මම හරහා කරගන්ට අවශ්‍යතාවක් තිබෙන බව."( උපුටා ගැනීම අවසන්)

නාවික හමුදා මුලස්ථානයෙන් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසුව එහි පිටුපස ගේට්ටුවෙන් අධිකරණය වෙත ගෙන ගොස් ඇත්තේ දැඩි ආරක්ෂාවක් මධ්‍යයේය. එය සංදර්ශනයක් ලෙසට පෙනිගිය බවත් මාධ්‍යට අඩබෙර ගැසීමක් ලෙසට පෙනි ගිය බවත් රටේ නායකයෙකුටවත් නොලැබෙන ආරක්ෂාවක් සහිතව අධිකරණයට ගෙන ගොස් ඇති බවටත් සාක්ෂි වලදී අනාවරණයය වී ඇත. මේ සම්බන්ධ පුවත්පත් වාර්තා පැ. 6(1) සිට පැ. 6(9) දක්වා සලකුනු කර ඉදිරිපත් කර ඇත. අන්තර්ජාලයේ වෙබ් අඩවි වලද යෝෂිත රාජපක්ෂ අත්අඩංගුවට ගැනීම ගැන දිර්ඝ මාධ්‍ය වාර්තා පල කර ඇත. එම සියළුම වාර්තාවන්හි පැමිණිලිකරුගේ පියා, මව හෝ සහෝදරයින්ගේ ඡායාරූපද පළ කිරීමට වග බලාගෙන ඇත.

(1964 /2020 පැමිණිල්ල පිළිබඳ පරික්ෂණයේදී ඉදිරිපත් කළ ලේඛනද ඊට අදාළ වන ප්‍රකාශයන්ද මෙම නඩුවට අදාළ කර ගැනිමට සිදු කළ ඉල්ලීමකට කොමිෂන් සභාව ඉඩ දී ඇත.)

සාක්ෂිකාර මේනක ලියනගේ මහතා 2012 අගභාගයේ දී පමණ CSN නාළිකාවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්වී 2015 වසර තෙක් එම තනතුරේ කටයුතු කර තිබේ. දෘෂ්‍යමාන සංසන්දනය පිළිබඳව සිංගප්පූරු විශ්ව විද්‍යාලයකින් උපාධියලත් සාක්ෂිකරු 2015 පිහිටවූ නව රජය මගින් පළිගැනීම් වලට ලක් කළ බවට කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. CSN නාළිකාව පිළිබඳව විවිධ චෝදනා නගමින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සාක්ෂිකරුගෙන් කටඋත්තර ලබා ගැනීමක් 2015 වසරේදී සිදු කර තිබේ. සුදන්ත ගුණවර්ධන නැමැති පොලිස් නිලධාරීයා කාල්විල් පෙදෙසට පැමිණ තර්ජනය කරමින් යෝෂිත රාජපක්ෂගේ නම පවසන

ලෙසටද, එසේ නොකළහොත් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කරන බවට ද, එවිට ඔහුගේ පවුලට කරදර සිදු වන බවටද තර්ජනය කරමින් කටඋත්තර ලබා ගැනීමට තැත් කර ඇත. එසේම, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය කාල්විල් පෙදෙසින් වැතම් වීදියට මාරු වූ පසුව, තවත් දිනයකදී කැඳවා, පැමිණිලිකරුගේ මාංචු ගලවා මේසය මතට විසි කර තර්ජනය කරමින් කටඋත්තර ලබා ගැනීමට තැත් කර ඇත.

මේ අන්දමින් කාල්විල් පෙදෙසට දෙවරක් ද, වැතැම් වීදියට පස් වරක් ද කැඳවා පැමිණිලිකරුගෙන් කටඋත්තර ගැනීම් සිදු කර ඇත. කටඋත්තර ලබා ගැනීමේදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් අසන ලද ප්‍රශ්න ඒ අයුරින්ම වාර්තාගත නොකර සාක්ෂිකරුගේ කටඋත්තරයට ගැලපෙන අයුරින් ප්‍රශ්නය වාර්තාගත කිරීම සිදුකර ඇත. ඒ අනුව යෝෂිත රාජපක්ෂ මහතා නඩුවකට පටල වීමට අවශ්‍ය කරන ප්‍රශ්න අසන ලද නමුත් එම ප්‍රශ්න වාර්තා ගත කර නොමැත.

කෙසේ වෙතත්, සාක්ෂිකරු අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් පත්කිරීම සිදුකර ඇත්තේ ඊට පෙර අධ්‍යක්ෂකවරයෙකුව සිටි දිනේෂ් ගුණවර්ධන මහතාගේ ඉල්ලා අස්වීම මත ඇති වූ පුරප්පාඩුව පිරවීමේ හේතුව කරණ කොටගෙන බැවින්ද, දිනේෂ් ගුණවර්ධන මහතා එවකට අමාත්‍ය රවි කරුණානායක මහතාගේ ඥාතියෙකුව සිටි බැවින් ද, සාක්ෂිකරු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ක්‍රියා නොකල බවට පොලිස් නිලධාරීන් සාක්ෂිකරුට පවසා ඇත.

කාර්යාලය පරික්ෂා කරන අවස්ථාවේදී සාක්ෂිකරු කාර්යාලයට කැඳවා එහි සීඩී තැටි තොගයක් තබාගෙන සිටි නිලධාරියෙකු ළඟට

කැඳවා ඔහු අත තිබූ එම සීඩී තැටි තොගය කාර්යාලය තුළින් සොයා ගත් බවට පවසන ලෙසට එම නිලධාරීන් සාක්ෂිකරුට පවසා ඇත. සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර තිබේ. සාක්ෂිකරු ප්‍රකාශ කළේ; පොලිස් නිලධාරීන් සැම විටම උත්සාහ කළේ මහින්ද රාජපක්ෂ මහතාගේ පුත් යෝෂිත රාජපක්ෂට එරෙහිව නඩුවක් පැවරීමට අවශ්‍ය කටඋත්තරයක් සාක්ෂිකරු ගෙන් ලබා ගැනීමට බව ය.

දින ගණනාවක් කට  උත්තර ලබාගැනීම සිදු කළත් ඒ සෑම දිනකම ප්‍රශ්න කර ඇත්තේ සාක්ෂිකරුට CSN නාලිකාවට ඇති සම්බන්ධතාවය සහ යෝෂිත රාජපක්ෂ මහතාට ඇති සම්බන්ධතාවය මෙන්ම යෝෂිත රාජපක්ෂ මහතාට එරෙහිව කට උත්තරයක් ලබා ගැනීමට අවශ්‍ය කෙරෙන කරුණු ලබා ගැනීමය. මේ සෑම දිනකම සාක්ෂිකරුට තර්ජනය කරමින් ඔහු බිය ගන්වමින් යෝෂිත රාජපක්ෂ ඊට අදාළ කර ගැනීමට දැඩි පරිශ්‍රමයක් පොලිස් නිලධාරීන් විසින් දරා ඇත.

නිශාන්ත රණතුංගගේ සාක්ෂියට අනුව 2013 වසරේ දී ඔහු CSN නාලිකාවේ ප්‍රධාන විධායක නිලධාරී ලෙසට පත්වී 2015 වසර පමණ වන තෙක් නාලිකාවේ සේවය කර ඇත. 2015 නව රජය පත්වීමෙන් පසුව CSN නාලිකාව පිළිබඳව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් හය වතාවක දී පමණ සාක්ෂිකාර රණතුංගගෙන් කටඋත්තර ලබාගෙන පසුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව සාක්ෂිකාර රණතුංග මහතා දින 48 ක පමණ කාලසීමාවක් රක්ෂිත බන්ධනාගාරගතව සිට ඇත. කටඋත්තර ලබා ගන්නා අවස්ථාවේදී නාලිකාවේ අයිතිය පිළිබඳ ප්‍රශ්න කර එම නාලිකාව රාජපක්ෂ පවුලට හිමිකම ඇති ලෙසට කටඋත්තර ලබා

ගැනීමට උත්සාහ කර තිබේ. ඒ අනුව යෝෂිත රාජපක්ෂ මහතා යම් අපරාධ නඩුවකට පැටලවීමටද එමඟින් රාජපක්ෂ පවුල දේශපාලන ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීමට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් ප්‍රයත්න දරා ඇත. යෝෂිත රාජපක්ෂ මහතා CSN නාලිකාවේ කළමනාකාරිත්වයට හෝ එම නාලිකාවේ හිමිකමට සම්බන්ධතාවයක් නොමැත. ඔහුට නාලිකාවේ කොටස් හිමි හිමිකාරිත්වයක් ද නොමැත. CSN නාලිකාව සංස්ථාගත සමාගමක් වන බැවින් එහි හිමිකරුවන්, කොටස් හිමියන් සහ ප්‍රාග්ධන හිමිකරුවන් සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය අධ්‍යයනය කිරීම මගින් සොයාගත හැකි වුවත් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පොලිස් නිලධාරීන් එවැනි ලිඛිත සාක්ෂි කෙරේ විශ්වාසය නොතබමින් පැමිණිලිකරුගෙන් ඒ වගට කටඋත්තර ලබා ගැනීමට සාවද්‍ය උත්සාහයක යෙදී ඇත. එසේ වුවත් එවැනි කිසිදු සාක්ෂියක් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් සොයාගෙන නොමැත.

එසේම ඩේසි ෆෙරස් මිත්තිනියට අයත් දේපළ පැමිණිලිකරුගේ දේපල බවට පවසා නඩු පැවරීමක් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ සිදුකර ඇත. 1964 සිට මිලදී ගත් ඉඩම එහි ඇති බැවින්, අංක 828/16 දරණ ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින නඩුව දේශපාලන පළිගැනීමක් උදෙසා පවරන ලද නඩුවක් බවට එකී නඩුවේ බී වාර්තාවේ සඳහන් පුද්ගලයින්ගේ ප්‍රකාශ තුලින් පෙනීයයි.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ. 1 සිට පැ. 32 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

01 වන වගඋත්තරකාර රවි වෛද්‍යාලංකාර සහ 05 වන වගඋත්තරකාර ආනන්ද විජේපාල මෙම කොමිෂන් සභාව ඉදිරියේ විභාගයට ගන්නා ලද පැමිණිලි අංක 205/2020 පිළිබඳ නඩුවේදී කොමිෂන් සභාව ඉදිරියේ ලබාදුන් සාක්ෂිය ඔවුන්ට එරෙහිව ඇති සියලු නඩු වලට ලබා දෙන සාක්ෂි ලෙසට ආදේශ කර ගැනීමට සිදු කල ඉල්ලීම පරිදි ඔවුන්ගේ සාක්ෂි මෙම නඩුවට ද ආදේශ කර ඇත.

පලවන වගඋත්තරකරු විසින් සති අග අරුණ පුවත් පතට (පැ. 5(අ) 1964/2020) ලබා දී ඇති මාධ්‍ය ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන ඇත. මෙම වාර්තාව කොමිෂන් සභාව ඉදිරියේ විමර්ශනයට ගන්නා ලද නඩු ගණනාවකදීම ලේඛනයක් ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම මාධ්‍ය වාර්තාව ආරම්භයේදීම සඳහන් කර ඇත්තේ, ඝාතනයට ලක්වූ ලසන්ත වික්‍රමතුංග මහතාගේ දියණිය විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට යවන ලද ලිපියක ඇයගේ පියාගේ ඝාතකයා සොයා ගැනීමට නොහැකි වූයේ රවි වෛද්‍යාලංකාර වැනි දූෂිතයකු පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ප්‍රධානියා ලෙස පත් කිරීම නිසා බව සඳහන් කර ඇත.

මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති පැමිණිලි අංක 1070/2020 දරන පැමිණිල්ලට ලේඛනයක් වශයෙන් ඉදිරිපත් කර ඇති පැ. 19 දරණ සීඩී තැටියෙහි රවි වෛද්‍යාලංකාරගේ මාධ්‍ය සාකච්ඡාව අන්තර්ගතය .

CSN නාලිකාවේ විකාශන බලපත්‍රය අවලංගු කිරිමට ඉල්ලා රවි වෛද්‍යාලංකාර විසින් මාධ්‍ය අමාත්‍යවරයාට ලිපියක් යවා ඇත.

දූෂණ විරෝධී කමිටුවට ලැබෙන පැමිණිලි උපදේශකවරුන් වෙත යොමුකර ඔවුන් ලබා දෙන වාර්තාව සමඟ ලිපි ගොනුව රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතාට යොමු කිරීමත්, ඔහු විසින් තීරණය කරනු ලබන පැමිණිලි පරීක්ෂණය සඳහා ඊට සුදුසු පොලිස් කොට්ඨාශය වෙත යොමු කිරීමත් 05 වන වගඋත්තරකාර ආනන්ද විජේපාල විසින් සිදු කර ඇත. අග්‍රාමාත්‍ය කාර්යාලයේ පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගි වූ බව 05 වන වගඋත්තරකාර ආනන්ද විජයපාල  සාක්ෂි විභාගයේදී පිළිගෙන ඇත. අරලියගහ මන්දිරයේ දී පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවෙ රැස්වීම් වලට ආනන්ද විජයපාල සහභාගි වී ඇති බව එම රැස්වීම් වාර්තා අනුව ඔප්පු වී ඇත.  එම රැස්වීම්වලට සහභාගී වූවන්ගේ නාම ලේඛන කිහිපයක් පැ. 41 පැ. 37 පැ. 39 පැ. 40 පැ. 38 පැ.43 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. (205/2020)

වගඋත්තරකරු මෙම කාලසීමාව තුළ සිදු කරන ලද සියළු ගෙවීම් පිළිබඳ ලේඛන පැ.33, පැ.33 (1), පැ.33 (2), පැ.33 (3), පැ.33(4) සහ පැ.33(5) ලෙසට සලකුණු කර ඇත. (205/2020)

මෙම නඩුවේ පැමිණිලිකරු සහ අංක 1964/2020 දරණ නඩුවේ පැමිණිලිකරු වන සුනිලාල් රොහාන් වැලිවිට මහතා ඇතුළු 05 දෙනෙකු රක්ෂිත බන්ධනාගාර ගත කෙරෙන නියෝගය සිදු කළ බී 9823/2015 නඩුවට පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය නිලධාරීන් අසත්‍ය කරුණු පදනම් කර ගෙන සත්‍ය කරුණු යටපත් කර දේශපාලන පළිගැනීමක් උදෙසා රාජපක්ෂ පවුලේ සාමාජිකයින් සහ ඔවුන්ගේ ඥාතින් හා මිතුරන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ පරමාර්ථයෙන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත රාත්‍රි කාලයේ

දී ඉදිරිපත් කළ බවත් පොලිස් නිලධාරීන් ද්වේශ සහගත ලෙස ක්‍රියා කරමින් ඉහත කී පිරිස රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීමට අවශ්‍ය කරුණු සම්පාදනය කළ බවටත් කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කල සාක්ෂි වලින් ඔප්පුවී ඇත.

මෙහෙයවන ලද සියලුම සාක්ෂි අනුව, කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව අසත්‍ය කරුණු පාදක කරගෙන ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් මත, දේශපාලන පළිගැනීම උදෙසා සිදු කළ පොලිස් විමර්ශන උපයෝගි කරගෙන, පැමිණිලිකරු රක්ෂිත බන්ධාගාර ගත කිරීමෙන්, පොලිස් නිලධාරින් විසින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීම සිදු කර ඇති අතර; එවැනි දේශපාලනික පළිගැනීමක් සිදු කිරීමට අවශ්‍ය කෙරෙන පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ නීති උපදේශක වගඋත්තරකාර තුසිත් මුදලිගේ සහ දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ, වගඋත්තරකාර ආනන්ද විජේපාල සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ වගඋත්තරකාර නිලධාරින් විසින්, ඔවුන් රාජ්‍ය සේවකයින් ලෙස රාජකාරි කරන අතරතුර නිල නොවන දේශපාලන සංවිධානයක සාමාජිකයින්ගේ ක්‍රියාකරුවන් වශයෙන් කටයුතු කරමින් පැමිණිලිකරුට අනිත්‍යානුකූල ලෙස හානි සහ අලාභ සිදු කළ බවට ඉදිරිපත් කල සාක්ෂි වලින් ඔප්පුවී ඇත.

Chandra Fernando
24/11/2020

24/11/2020

2020.11.24

## 9 .XVII

පැමිණිලි අංකය - 1964 / 2020

පැමිණිලිකරු - ඩබ්ලිව්.වී.ඩී.සුනිලාල් රොහාන් වැලිවිට

ලිපිනය - නො. 33, රෝහල පාර, ගලවිල වත්ත, හෝමාගම

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. රවි වෛද්‍යාලංකාර
2. පොලිස් පරීක්ෂක රණසිංහ
3. පොලිස් සැරයන් සුදන්ත ගුණවර්ධන
4. තුසිත් මුදලිගේ
5. දූෂණ විරෝධී ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල
6. පොලිස් පරීක්ෂක රණසිංහ
7. පොලිස් සැරයන් 25284 සුදිරික්කුගේ අජිත් සුදන්ත ගුණවර්ධන
8. උප පොලිස් පරීක්ෂක වීරසිංහ

### තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර ඩබ්ලිව්.වී.ඩී. සුනිලාල් රොහාන් වැලිවිට මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත

බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, ඩබ්ලිව්. වී. ඩී. සුනිලාල් රොහාන් වැලිවිට මහතා මහතාට එරෙහිව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 9823/2015 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර ඩබ්ලිව්.වී.ඩී. සුනිලාල් රොහාන් වැලිවිට මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම පැමිනිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC 8331/16 දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය

යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

5. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

6. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

1983 වර්ෂයේ දී වැඩ සටහන් නිෂ්පාදකවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවයට බැඳී ඇති පැමිණිලිකරු වසර 10 ක පමණ එහි සේවය කරන අවධියේ දී එවකට පාලනය සිදු කළ එක්සත් ජාතික පක්ෂ රජය විසින් පැමිණිලිකරු සේවයෙන් ඉවත් කර ඇත්තේ ඔහු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ජනාධිපතිවරණයේ දී රූපවාහිනී වැඩ සටහනක් පටිගත කළ බවට චෝදනා කරමින්ය. ඉන්පසු 2005 වර්ෂයේ දී මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති පදවියට පත්වීමෙන් පසු නැවතත් ජනාධිපති මාධ්‍ය ලේකම් ලෙසට සේවය ආරම්භ කර 2015 ජනවාරි මස 08 වන දින රනිල් වික්‍රමසිංහ මහතාගේ රජය පිහිටුවන තෙක් සේවය කර ඇත.

2015 ජනවාරි 08 වන දින සිට මහින්ද රාජපක්ෂ මහතා පරාජයවීමෙන් පසුව එතුමාගේ මාධ්‍ය ලේකම් වශයෙන් කටයුතු කර ඇත.

2015 නව රජය පිහිටුවීමෙන් පසුව පිහිටුවන ලද දූෂණ විරෝධී කමිටුවේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට සිදු කළ පැමිණිල්ලකින් කාල්ටන් ස්පෝර්ට්ස් නෙට්වර්ක්ස් ආයතනයේ අයතා ගනුදෙනු සහ රාජ්‍ය දේපළ අවභාවිතා කළ බවට චෝදනා කර ඇත.

කාල්ටන් ස්පෝර්ට්ස් නෙට්වර්ක්ස් (CSN) 2011.03.13 දින (පැ.04) ලියා පදිංචි කිරීමෙන් පසු පැමිණිලිකරු අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්වී ඇති අතර රජයේ සේවකයෙකු වශයෙන් රාජකාරි ඉටුකරමින් පෞද්ගලික ආයතනයක කටයුතු කළ නොහැකි බවට එවකට

ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාගේ දැනුම් දීම පරිදි වැලිවිට මහතා කාල්ටන් ස්පෝර්ට්ස් නෙට්වර්ක්ස් (CSN) නාළිකාව පිහිටුවීමෙන් දින 45 ට පසු ඉන් ඉවත් වී ඇත. මෙම කරුණු සනාථ කරන පෝරම 20 ලේඛනය පැ.05 වශයෙන් සකස් කර ඉදිරිපත් කර ඇත.

2015 නව රජය පත්වීමෙන් පසුව ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා මගින් ඉදිරිපත් කළ යෝජනාවකට අනුව ක්‍රීඩා නාළිකාවක විකාශන කුළුණු ගණන 07ට වැඩිනම් එවැනි නාළිකාවකින් රුපියල් බිලියනයක බද්ද මුදලක් ලබා ගැනීමට මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා ඉදිරිපත් කළ යෝජනාව පාර්ලීමේන්තුවේ සම්මත වීම කරණ කොට ගෙන එපමණ බද්ද මුදලක් ගෙවීමට CSN නාළිකාවට නොහැකිව එහි විකාශන කටයුතු අත්හිටුවා සේවකයින්ට වන්දි ගෙවා ඉවත් කර ඇත.

මෙම කාලයේ දී පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් එම CSN නාළිකාවේ නිලධාරීන් ගෙන්වා ප්‍රශ්න කිරීම සිදු කර එවැනි කැඳවීම සහ ප්‍රශ්න කිරිම සඳහා පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ලබා දීමට සලස්වා ඇත. මේ අනුව CSN නාළිකාවේ ප්‍රධාන විධායක නිළධාරි නිශාන්ත රණතුංග, පරිපාලන නිලධාරි ජනක රණතුංග සහ පැමිණිලිකරු මූල්‍ය විමර්ශන කොට්ඨාසයට කැඳවා ප්‍රශ්න කිරීම සිදු කර ඇත.

පැමිණිලිකරු පළමුවරට කැඳවූ දිනයේ දී පැය 4ක් 5ක් පමණ ප්‍රශ්න කිරීම් වලට භාජනය කර ඇති අතර ඉන්පසුව 25 වාතාවක් පමණ

මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ විමර්ශන ඒකක 03 ට කැඳවා ප්‍රශ්න කිරීම් සිදුකර කටඋත්තර ලබා ගෙන ඇත.

මෙලෙස කටඋත්තර ලබා ගැනීමට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට කැඳවනු ලැබූ පැමිණිලිකරුට පොලිස් පරීක්ෂක රණසිංහ විසින් බලපෑම් කරමින් යෝෂිත රාජපක්ෂ මහතා මුදල් ලබාදුන් බවටත්, CSN නාලිකාව යෝෂිත රාජපක්ෂ මහතාට අයත් නාලිකාවක් ලෙසටත් පවසන ලෙසට බලපෑම් කරමින් ප්‍රකාශ ලබා ගැනීමට උත්සාහ කර ඇත. යෝෂිත රාජපක්ෂ මහතා එවැනි මුදල් ලබාදීමක් සිදු නොකළ බවටත්, ඔහු CSN නාලිකාවේ හිමිකරු නොවන බවටත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත. එම ප්‍රකාශය සටහන් කර ගෙන නැත. 2015 වර්ෂයේ අවසන් කාලසීමාවේ දී CSN නාලිකාව සතුව තිබූ බාහිර විකාශන රථය පොලිස් භාරයට ගෙන තිබේ .

එසේම 2015.11.16, 2016.01.08 සහ 2016.04.19 වන දිනයන්හි දී පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිළධාරීන් CSN නාලිකාවේ කාර්යාලයට ඇතුල්වී එම කාර්යාලය පරීක්ෂා කර එහි තිබූ විවිධ කාර්යාලීය උපකරණ එම කාර්යාලයෙන් ඉවත් කර රැගෙන ගොස් ඇත. ඒ අනුව කාර්යාලයේ තිබූ පරිගනක 15 ක් පමණ, ලැප්ටොප් 10 ක් පමණ, ලිපි ලේඛන, ලේසර් , බිල් පොත් ආදි ද්‍රව්‍ය රැගෙන ගොස් ඇත. එම කරුණු සනාත කරණ වීඩියෝ දර්ශනයක් පැ.08 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම භාණ්ඩ අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය කෙරෙන ප්‍රකාශ ලබා ගැනීම සඳහා පැමිණිලිකරු පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට කැඳවන සෑම දිනකම අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් පැමිණිලිකරු ප්‍රකාශ කළේ යෝෂිත රාජපක්ෂ මහතා ඇතුළු එම පවුලේ හිටපු

ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු පවුලේ සාමාජිකයින් මෙම CSN නාලිකාවේ හිමිකරුවන් නොවන බවය. මෙසේ ප්‍රකාශ ලබා ගැනීම සඳහා පැමිණිලිකරු කැඳවනු ලැබූ අවස්ථාවලදී පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් තර්ජනය කරමින්, මුදල් විශුද්ධි කරණ පනත යටතේ 20 වසරක සිර දඬුවමක් ලබා දෙන බවට තර්ජනය කරමින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට අවශ්‍ය කළ අන්දමින් ඉහත සඳහන් කළ පරිදි ප්‍රකාශය ලබා ගැනීමට ප්‍රයත්න දරා ඇත. මේ අන්දමින් තර්ජනය කිරීම වැඩි වශයෙන් සිදු කර ඇත්තේ පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ පොලිස් සැරයන් 25284 සුදිරික්කුගේ අජිත් සුදන්ත ගුණවර්ධන, ප්‍රධාන පොලිස් පරීක්ෂක රණසිංහ සහ උප පොලිස් පරීක්ෂක වීරසිංහ නැමැති පොලිස් නිළධාරීන් වේ.

CSN නාලිකාව ආරම්භ කිරීම සඳහා පැමිණිලිකරු විසින් තම මුදල් ආයෝජනය කර ඇති අතර ඔහුගේ නිවසේ තිබූ ඔහු සතු රූපවාහිනි නිෂ්පාදන උපකරණ යොදා, පැමිණිලිකරුගේ පුද්ගලික කාර්ය මණ්ඩලය මගින් මෙම CSN නාලිකාව ආරම්භ කර ඇත. ඒ සඳහා රාජපක්ෂ පවුලේ මුදල් යොදවා නොමැත. CSN නාලිකාවේ සේවකයින් බවටත් එම නාලිකාවට සම්බන්ධව භාහිර ආයතන වල සේවකයින් ඇතුළු 100 දෙනෙකුගෙන් පමණ පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන  කොට්ඨාසය ප්‍රශ්න කිරීම සිදු කර කටඋත්තර ලබා ගෙන ඇතත් ඔවුන් බලාපොරොත්තු වූ ආකාරයේ ඉහත කී සම්බන්ධතායක් සොයා ගැනීමට ඔවුන් අපොහොසත් වී ඇත.

පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන ඒකකයෙන්

සිදු කරන ලැබූ දැනුම්දීමක් මත පැමිණිලිකරු අවස්ථා දෙකකදී අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට ඉදිරියට ගෙන්වා කටඋත්තර ලබාගෙන තිබේ. උක්ත සඳහන් පැමිණිල්ල පිළිබඳ මූලා‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට විසින් එලෙස පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතරතුර දී 2016.01.30 වන දින පැමිණිලිකරුට දුරකතන ඇමතුමක් ලබා දෙමින් එදින පෙ.ව.9.00 ට පොලිස් මූලා‍ය අපරාධ විමර්ශන ඒකකයේ පෙනී සිටින ලෙසට දැනුම් දීමක් කර තිබේ. කරුණු එසේ වුවත් එදින පෙ.ව. 7.00ට පමණ පොලිස් මූලා‍ය අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් පැමිණිලිකරු හෝමාගම පිහිටි නිවසට පැමිණ පැමිණිලිකරු සොයා ඇති අතර එබව පැමිණිලිකරුගේ භාර්යාව දුරකතනයෙන් පැමිණිලිකරුට දැනුම් දී ඇත. තමන් පෙ.ව. 09.00ට පොලිස් මූලා‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණෙන බවට දැනුම් දෙන ලෙසට භාර්යාවට දැනුම් දී ඇති අතර එම පණිවිඩය නොසලකා පැමිණිලිකරුගේ කාර්යාලයට ඔවුන් පැමිණෙන බවට එම දුරකතන ඇමතුමට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර පැමිණිලිකරුගේ කාර්යාලයට ගොස් පැමිණිලිකරු කාර්යාලයේ දී අත්අඩංගුවට ගැනීම සිදු කර තිබේ.

පොලිස් මූලා‍ය විමර්ශන කොට්ඨාසය 2015 වර්ෂයේ මුල් භාගයේ සිට කටඋත්තර ලබාදීම සඳහා පොලිස් මූලා‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට 25 වතාවකට වැඩි වාර ගණනක් පැමිණි පැමිණිලිකරුට ඔහු සිදු කළ දැනුම් දීම පරිදි 2016.01.30 වන දින පෙ.ව. 9.00 ට පොලිස් මූලා‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණීමට පෙර පෙ.ව. 7.00ට පමණ ඔහුගේ නිවසට ද ඉන්පසුව කාර්යාලයටද ගොස් අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත්තේ පැහැදිලි

ලෙසම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම පිළිබඳව පුළුල් ප්‍රචාරනයක් ලබා දිමේ පරමාර්ථයෙන් සහ එමෙන්ම කාර්යාලයේ දී අත්අඩංගුවට ගැනීම මගින් පැමිණිලිකරුට මානසිකව පීඩාවක් සිදු කිරීමේ චේතනාවෙන් බව, අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කල ආකාරයෙන් මනාව පැහැදිලි වේ.

පැමිණිලිකරු ඔහුගේ කාර්යාලයේ දී අත්අඩංගුවට ගැනීමට තුඩු දුන් හේතුන් හෝ චෝදනා පැහැදිලි කරදීමක් සිදු කර නොමැති අතර ඔහු අත්අඩංගුවට පත් බවට නිළ ලේඛනයක් ද පැමිණිලිකරුට නිකුත් කර නොමැත. පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට රැගෙන ගොස් ඇති අතර ඒ වන විටත් CSN නාළිකාවේ අධ්‍යක්ෂවරුන්ගෙන් ප්‍රධාන විධායක නිළධාරී නිශාන්ත රණතුංග මහතාත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික කවිෂාන් ප්‍රනාන්දු මහතාත් යන දෙදෙනා අත්අඩංගුවට ගෙන පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ රඳවාගෙන සිට ඇත.

එසේ වුවත් හිටපු අමාත්‍ය රවි කරුණානායක මහතාගේ ඥාති සහෝදරයෙකු වූද CSN නාළිකාවේ අධ්‍යක්ෂවරයෙකු වූද දිනේෂ් ජයවර්ධන මහතා පැමිණිලිකරුගේ ඉල්ලා අස්වීම මත පුරප්පාඩු වූ අධ්‍යක්ෂ ධූරයට පත්ව ඇතත් ඔහු අත්අඩංගුවට ගැනීමට පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පියවර ගෙන නැත. දිනේෂ් ජයවර්ධන මහතා 2011.01.01 වන දින අධ්‍යක්ෂවරයා වශයෙන් පත්වීම සනාථ කරන ලේඛනය පැ.06 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

CSN නාළිකාවේ අධ්‍යක්වරයෙකුව සිටි කවිෂාන් ප්‍රනාන්දු රිය අනතුරකින් තුවාල ලබා ඇවිදගත නොහැකිව සිටියදී පුටුවක තබා

වාඩිකරවා පුටුවද සමග උස්සාගෙන මූලා‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට ගෙනවිත් තිබේ.

පැමිණිලිකරුගෙන් නැවත කටඋත්තර ලබා ගැනීමකට පොලිස් නිළධාරීන් තැත් කර ඇතත් පැමිණිලිකරු එවැනි ප්‍රකාශයක් ලබා දීමට ප්‍රතික්ෂේප කළ බැවින් ඔහුගෙන් ඊට පෙර ලබාගත් කටඋත්තරයක් වෙනස් කර නැවත පරිගනක ආශ්‍රයෙන් මුද්‍රිත පිටපතක් ලබාගෙන පැමිණිලිකරුගේ අත්සන එයට ලබා ගෙන ඇත. ප.ව. 6.00ට පමණ පැමිණිලිකරු ඇතුළු පිරිස බස් රථයකින් ප්‍රධාන පොලිස් පරීක්ෂක රණසිංහ ඇතුළු කණ්ඩායමක් විසින් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට රැගෙන ගොස් ඇත. කඩුවෙල බලා ගමන් කරන අතරතුරදී විටින් විට ප්‍රධාන පොලිස් පරීක්ෂක රණසිංහගේ ජංගම දුරකතනයට දුරකතන ඇමතුම් 5 කට වඩා ලැබී ඇති අතර එම සෑම දුරකතන ඇමතුමකටම පිළිතුර දෙමින් ප්‍රධාන පොලිස් පරීක්ෂක රණසිංහ ප්‍රකාශ කර ඇත්තේ "බය වෙන්න එපා සර්, රිලීස් කරන්න දෙන්නේ නෑ, මම ඔක්කෝටම පේපර්ස් හදාගෙන ඉන්නේ" යනුවෙනි.

පැමිණිලිකරු ඇතුළු පිරිස කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට රැගෙන යන විට මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතා ඔහුගේ නිළ මැදිරියෙහි සිට ඇති අතර ජනයාගෙන් පිරුන කඩුවෙල අධිකරණ භූමියේ බන්ධනාගාර බස්රථයක් නවතා තිබී ඇත. රාත්‍රී කාලයේ අධිකරණ භූමියේ බස් රථයක් නවතා තිබීම තුළින් පැහැදිලි වන්නේ පැමිණිලිකරු ඇතුළු පිරිස අනිවාර්යෙන් රක්ෂිත බන්ධනාගාර ගත කරන බවට දැනගෙන සිටි පොලිස් මූලා‍ය අපරාධ පරීක්ෂණ කොට්ඨාසයේ නිලධාරීන් හෝ මහේස්ත්‍රාත්වරයා පැමිණිලිකරු ඇතුළු

පිරිස අධිකරණයට රැගෙන ඒමටත් පෙර බන්ධනාගාර බස් රථය ගෙන්වාගෙන ඇති බවය.

පැමිණිලිකරු ඇතුළු පිරිස මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කිරීමෙන් පසුව ඔවුන් ඇප මත මුදාහරින ලෙසට ඉල්ලීමක් ඔවුන්ගේ නීතිඥවරුන් විසින් සිදු කර ඇතත් එම ඉල්ලීම පිළිබඳව නියෝගයක් සිදු නොකර ඔවුන් දින 14 ක කාල සීමාවකට බන්ධනාගාර ගත කර ඇත.

කඩුවෙල මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පැමිණිලිකරු ඇතුළු පිරිස ඉදිරිපත් කරනු ලැබ, ඔවුන්ට එරෙහිව ඇති චෝදනා පොලිස් නිලධාරීන් විසින් කියවා දෙනු ලැබූ අවස්ථාවේදී, මහේස්ත්‍රාත්වරයාගේ නිල දුරකථනයේ රිසීවරය, දුරකථනයෙන් ඉවත් කර මේසය මත තබා තිබෙනවා පැමිණිලිකරු නිරීක්ෂණය කර ඇත. දුරකථන රිසීවරය පොලිස් නිලධාරියා දෙසට විවෘත වන සේ තබා තිබීම කරණ කොටගෙන එම දුරකථනය, දුරකථන සංවාදයක ක්‍රියාත්මක අවධියේ පවතින බවට පැමිණිලිකරුට නිරීක්ෂණය වී ඇත.

පැමිණිලිකරු ඇතුළු පිරිස විසින් CSN නාළිකාව ආරම්භ කිරීම සඳහා රජයේ දේපළ අවභාවිතා කර තිබෙන බවටත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමග දූෂිත ගනුදෙනු වලට ඇතුලත් වී ඇති බවටත් චෝදනා නගමින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති බවට රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි කාලයේ දී පැමිණිලිකරු දැනුවත් වී ඇත. ඇප ලබා දීමේ බලය මහේස්ත්‍රාත් අධිකරණය සතුව පැවතියද පැමිණිලිකරු ඇතුළු පිරිසට මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප නොලැබෙන බව අවබෝධ කරගෙන මහාධිකරණයෙන් ඇප අයදුම්

පත්‍රයක් ඉදිරිපත් කර දින 45 කට පසුව මහාධිකරණයට ඇප නියෝගය අනුව පැමිණිලිකරු ඇතුළු පිරිස ඇපමත මුදාහැර ඇත. එසේ වුවත් ඔවුන්ට එරෙහිව විදේශ ගමන් තහනමක් පනවන ලද අතර එය තවමත් බලාත්මකව තිබෙන බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත. කිසිදු පිළිගත හැකි හේතුවක් නොමැතිව පැමිණිලිකරුට එරෙහිව විදේශ ගමන් තහනමක් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ලබාගෙන ඇතත්, එකී තහනම ඉවත් කිරීමට පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ක්‍රියා කර නැත.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පොලිස් නිළධාරීන් ද්වේශ සහගත ලෙස පැමිණිලිකරුට එරෙහිව ක්‍රියාකළ බව මැනවින් සනාත කරන තවත් අවස්ථාවක් පැමිණිලිකරු සිංගප්පූරුවට ගමන් කළ අවස්ථාවේ සංස්ථාපනයවේ. මහාධිකරණයෙන් ලබා ගත් අවසරයක් මත තාවකාලිකව විදේශ ගමන් තහනම ඉවත් කරවා ගෙන ජාත්‍යන්තර ප්‍රදර්ශනයක් නැරඹීම සඳහා පැමිණිලිකරු සිංගප්පූරුවට ගුවන් තොටුපල වෙත පැමිණ ඇත. එම අවස්ථාවේ දී ශ්‍රී ලංකා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිංගප්පූරු ගුවන් තොටුපලට කරන ලද දැනුම් දීමක් මත පැමිණිලිකරුට සිංගප්පූරු ගුවන් තොටුපළින් පිටව යාමට ඉඩ නොදී ඔහු නැවත ශ්‍රී ලංකාවට පිටුවහල් කර ඇත. මෙම පුවතට මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරනයක් ලබා දෙමින් පැමිණිලිකරුගේ කීර්ති නාමයට බරපතල අන්දමින් හානි පැමිණවීමට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිළධාරීන් ක්‍රියා කර ඇත.

CSN නාළිකාව සතු චංචල දේපළ බොහෝමයක් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ඉවත්කර ගැනීමෙන් පසුව තිබූ සීමිත සම්පත් යොදා ගනිමින් සේවකයින් කිහිපදෙනෙකු මගින් නාළිකාවේ

විකාශනය කලයුතු පවත්වා ගෙනයමින් තිබු අවස්ථාවේදී 2016.10.24 වන දින එවකට ජන මාධ්‍ය අමාත්‍යාංශ ලේකම් නිමල් බෝපගේ මහතා විසින් CSN නාලිකාවේ විකාශනය බලපත්‍රය අවලංගු කර තිබේ. බලපත්‍රය අවලංගු කිරීමට එරෙහිව පැමිණිලිකරු අභියාචනාධිකරණයේ නඩු පවරා ඇති අතර පසු අවස්ථාවකදී නඩුව සමථයකට පත් කර ඇත.

CSN නාලිකාව දිගු කාලයක් විකාශනය නොකර තිබීම හේතුව මත නාලිකාව විකාශනය සඳහා යොදා ගැනුන බොහෝ උපකරණ අක්‍රිය තත්ත්වයට පත්වීමෙන් පැමිණිලිකරුට රුපියල් මිලියන 7000 ක පමණ අලාභයක් සිදුව ඇත. පැමිණිලිකරුගේ වසර 40 ක පමණ නොකැලැල් වෘත්තිමය ජීවිතයට බරපතල හානි සිදුව ඇත.

පැමිණිලිකරු ඇතුළු පිරිසට එරෙහිව මෙම අසත්‍ය සහ අභූත චෝදනා පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට යොමු කර ඇත්තේ දූෂණ විරෝධි ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විජේපාල විසින් මෙම දූෂණ විරෝධි කමිටුව නැමැති නෛතික පදනමක් නැති අනීතික සංවිධානය ගැන කොමිෂන් සභා වාර්තාවේ වෙනම පරිච්ඡේදයක කරුණු සටහන් කර ඇත. එහි සඳහන් කරුනු මෙම දූෂණ විරෝධි කමිටුවෙහි ක්‍රියාකාරකම් හේතුවෙන් පැන නැගුණු නඩුවකට අදාළ විය යුතු බවටද කොමිෂන් සභාව තිරණය කර ඇත.

2016.01.30 වන දින කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණිලිකරු ඇතුළු පිරිස කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේදී විශාල මාධ්‍යවේදින් පිරිසක් සහ බන්ධනාගාර බස් රථයක් උසාවි භූමිය තුළ තිබී ඇත. මහේස්ත්‍රාත්වරයාගේ නිළ කාමරයට ඇතුල් වුන අවස්ථාවේ දී මූල්‍ය

අපරාධ විමර්ශන නිලධාරියෙකු මහේස්ත්‍රාත්වරයාට කරුණු වාර්තා කර ඇති අතර ඔහුද සිවිල් ඇඳුමකින් සැරසී සිට ඇත. 2016.01.30 වන දින බී වාර්තාව පැ.15 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම වාර්තාවේ සඳහන් කර ඇත්තේ සාධාරණ සමාජයක් සඳහා වන පුරවැසියෙක් යනුවෙනි. එසේ වුවත් පැ.03 හි පැමිණිලිකරු වශයෙන් දක්වා ඇත්තේ දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය යනුවෙනි. පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පොලිස් සැරයන් අජිත් සුදන්ත ගුණවර්ධන විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාත කරන ලේඛනයක් මගින් මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇත. එහි 03 වන ඡේදයේ පැමිණිලිකරු ලෙසට දක්වා ඇත්තේ දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල යනුවෙනි. එම බී වාර්තාව පැ.16 ලෙසට සලකුණු කර ඇත. මේ අනුව පැමිණිලිකරු දෙයාකාරයකින් සඳහන් කර ඇත. මෙම දූෂණ විරෝධී කමිටුව පිළිබඳ වාර්තාවේ වෙනම පරිච්ඡේදයකින් සඳහන් කර ඇත. කැබිනට් සංදේශය පැ.27

මහාධිකරණයට ඉල්ලීම් කළ අවස්ථාවේ නීතිඥවරුන් ඇප ඉල්ලා ඇති අතර මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරි සේරසිංහ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට ඉල්ලා ඇත. මේ අවස්ථාවේදී මහේස්ත්‍රාත්වරයාගේ නිළ දූරකතනයේ රිසිවරය දූරකතනයෙන් ඉවත් කර සක්‍රීය ඇමතුමක තිබෙන ආකාරයෙන් මේසය උඩ තබා තිබී ඇති අතර උසාවි ශාලාව තුළ දැඩි කලබලකාරි තත්ත්වයක් තිබී ඇත.

මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය පැ.17 වශයෙන් සලකුණු ඉදිරිපත් කර ඇත. එහි 2016.01.30 වන දින නියෝගය මයූරා කුමාරි විසින්

සටහන් කරගත් බවට සඳහන්ව ඇතත් ඉදිරිපත් කර ඇති සාක්ෂි වලට අනුව එවැනි කාන්තාවක් එදින නිළ කාමරයේ සිටිමින් සටහන් ලබාගෙන නැත. එසේම, පැ.17 හි දැක්වෙන වේලාව ප.ව.4.00 වුවත්, පැමිණිලිකරු ඉදිරිපත් කර ඇත්තේ කළුවර වැටීමෙන් පසුව ප.ව. 6.00ට පසුවය. එම අවස්ථාවේදී මහේස්ත්‍රාත්වරයා නියෝගය කොළයක ලියා පොලිස් නිළධාරියා ලවා නියෝගය කියවා ප්‍රකාශ කර තිබේ. එසේ වුවත් එම අවස්ථාවේ සටහන් ලෙසට අධිකරණ කාර්යාලයෙන් නිකුත් කර ඇති පැ.17 දරණ නීති කෘත්‍ය සටහන් ඉහත සඳහන් අයුරින් මහේස්ත්‍රාත්වරයාගේ අත් අකුරින් සිදු කළ සටහනක් නොවන අතර එය පරිගනකයකින් සටහන් තබන ලද පිටු 03 කින් සමන්විත ලේඛනයකි. ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පැහැදිලි ලෙසම 2016.01.30 දින පැමිණිලිකරුවන් නිළ මැදිරියට ඉදිරිපත් කළ අවස්ථාවේ සටහන් යතුරු ලියන්නියක් හෝ පරිගනක ආධාරයෙන් සටහන් තැබීමක් සිදු කර නොමැති අතර මහේස්ත්‍රාත්වරයා තම අත් අකුරින් සටහන් තැබීම සිදු කර ඇත.

මේ අනුව පැ.17 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති නියෝගය පැහැදිලි ලෙසම පැමිණිලිකරු ඇතුළු පිරිස ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී මහේස්ත්‍රාත්වරයා තම අත් අකුරින් සටහන් කළ නියෝගය නොව ඉන් පසු අවස්ථාවකදී අදාල අවස්ථාව නිරූපණය වන අයුරින් සකස් කර පසුව නිකුත් කල නියෝගයක් බව මැනවින් පැහැදිලිය.

නීතිඥ ප්‍රේමනාත් දොළවත්ත මහතාද මේ පිළිබඳව දිවුරුම් ප්‍රකාශයකින් කරනු ඉදිරිපත් කර ඇත. මෙම දිවුරුම් ප්‍රකාශය පැ.18 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී දිවුරුම් ප්‍රකාශයට

අනුව එදින පැමිණිලිකරු ඇතුළු පිරිස කඩුවෙල මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතා ඉදිරියට පමුණුවා ලැබූ අවස්ථාවේදී නිල මැදිරිය තුළ භාෂන පරිවර්තකයකු හෝ සටහන් වාර්තාගත කිරීම සඳහා කිසිදු ලඝු ලේඛිකාවක් හෝ යතුරු ලේඛිකාවක් සිට නොමැත. මහේස්ත්‍රාත්වරයා තම අත් අකුරෙන් නියෝගය සටහන් කර, එම නියෝගය පොලිස් නිලධාරියා ලවා පැමිණිලිකරු ඇතුළු පැමිණ සිටි නීතිඥවරුන් ඉදිරියේ කියවා ඇත. එම නියෝගය දැන් නඩු වාර්තාවේ දක්නට නොමැත. එය නඩු වාර්තාවෙන් ඉවත් කර ඇති බව පෙනී යයි. ඒ වෙනුවට පැ. 17 දරන පසුව සකස් කර යතුරු ලියනය කල නියෝගයක් ඇතුළත් කර ඇති බව ද වැඩිදුරටත් පැහැදිලි වෙයි.

පැ.19 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති වීඩියෝ දර්ශනය අනුව ඉන්දියාවේ චෙන්නායි නගරයේ පිහිටි රූපවාහිනි මාධ්‍යවේදින් ද කඩුවෙල අධිකරණ භූමියේ සිටි බව පැහැදිලිය. වීඩියෝ දර්ශන තල අනුව පැමිණිලිකරු ඇතුළු පිරිස අධිකරණ භූමියෙන් රැගෙන යනවිට කළුවර වැටී ඇත. මේ අනුව ඔවුන් සවස 6.00 න් පසුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බවට ඉදිරිපත් කරන සාක්ෂිය පිළිගත යුතුය. අදාළ වීඩියෝ දර්ශන අඩංගු පෙන් ඩ්‍රයිව් එක පැ. 19 ලෙසට ලකුණු කර ඉදිරිපත් කර ඇත.

2016.02.11 දින ඇප නියෝගය ප්‍රකාශයට පත් කර ඇප ප්‍රතික්ෂේප කර ඇත. එකී නියෝගය පැ.20 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. රක්ෂිත බන්ධනාගාර ගතව සිටියදී පැමිණිලිකරුගෙන් කටඋත්තරයක් ලබා ගෙන ඇත.

පැමිණිලිකරුට විදේශ ගමන් තහනමක් පැනවීම මගින් ඇඩි හානි සිදු කර ඇත. පැමිණිලිකරු ජාත්‍යන්තර ප්‍රදර්ශනයක් සඳහා සිංගප්පූරුවට

පැමිණිලි අවස්ථාවේදී ගුවන් තොටුපල නිළධාරින් විසින් අත්අඩංගුවට ගෙන පසුව ලංකාවට පිටුවහල් කර ඇත. මෙම පිටුවහල් කිරීම පිළිබඳව පුළුල් මාධ්‍ය ප්‍රචාරනයක් ලබා දී ඇති අතර එමගින් පැමිණිලිකරුගේ කීර්තිනාමයට දැඩි හානි සිදු කර තිබේ. මීට අදාල ලේඛන පැ. 21(අ) සහ පැ. 21(ආ) ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ. 1 සිට පැ. 28 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

01 වන වගඋත්තරකාර රවි වෛද්‍යාලංකාර සහ 05 වන වගඋත්තරකාර ආනන්ද විජේපාල මෙම කොමිෂන් සභාව ඉදිරියේ විභාගයට ගන්නා ලද පැමිණිලි අංක 205/2020 පිළිබඳ නඩුවේදී කොමිෂන් සභාව ඉදිරියේ ලබාදුන් සාක්ෂිය ඔවුන්ට එරෙහිව ඇති සියලු නඩු වලට අදාලව ලබා දෙන සාක්ෂි ලෙසට පිළිගෙන එම නඩු වලට ආදේශ කර ගැනීමට සිදු කල ඉල්ලීම පරිදි ඔවුන්ගේ සාක්ෂි මෙම නඩුවට ද ආදේශ කර ඇත.

මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති පැමිණිලි අංක 1070/2020 දරන පැමිණිල්ලට ලේඛනයක් වශයෙන් ඉදිරිපත් කර ඇති පැ. 19 දරණ සීඩී තැටියෙහි රවි වෛද්‍යාලංකාරගේ මාධ්‍ය සාකච්ඡාව අන්තර්ගතය .

රවි වෛද්‍යාලංකාර මහතා විසින් සතිඅග අරුණ පුවත්පතට ලබාදුන් මාධ්‍ය සාකච්ඡාවක වාර්තාවක්ද කොමිෂන් සභාව ඉදිරියේ විමසුමට ලක් කළ නඩු ගණනාවක දීම ලේඛනයක් ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම මාධ්‍ය වාර්තාව ආරම්භයේදීම සඳහන් කර

ඇත්තේ, ඝාතනයට ලක්වූ ලසන්ත වික්‍රමතුංග මහතාගේ දියණිය විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට යවන ලද ලිපියක ඇයගේ පියාගේ ඝාතකයා සොයා ගැනීමට නොහැකි වූයේ රවි වෛද්‍යලංකාර වැනි දූෂිතයකු පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ප්‍රධානියා ලෙස පත් කිරීම නිසා බව සඳහන් කර ඇත.

CSN නාලිකාවේ විකාශන බලපත්‍රය අවලංගු කිරිමට ඉල්ලා රවි වෛද්‍යාලංකාර විසින් මාධ්‍ය අමාත්‍යවරයාට ලිපියක් යවා ඇත.

දූෂණ විරෝධී කමිටුවට ලැබෙන පැමිණිලි උපදේශකවරුන් වෙත යොමුකර ඔවුන් ලබා දෙන වාර්තාව සමඟ ලිපි ගොනුව රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතාට යොමු කිරීමත්, රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා විසින් තීරණය කරනු ලබන පැමිණිලි පරීක්ෂණය සඳහා ඊට සුදුසු පොලිස් කොට්ඨාශය වෙත යොමු කිරීමත් 05 වන වගඋත්තරකාර ආනන්ද විජේපාල විසින් සිදු කර ඇත. අග්‍රාමාත්‍ය කාර්යාලයේ පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගි වූ බව 05 වන වගඋත්තරකාර ආනන්ද විජයපාල  සාක්ෂි විභාගයේදී පිළිගෙන ඇත. අරලියගහ මන්දිරයේ දී පවත්වන ලද දූෂණ විරෝධී කමිටුවෙ රැස්වීම් වලට ආනන්ද විජයපාල සහභාගි වී ඇති බව එම රැස්වීම් වාර්තා අනුව ඔප්පු වී ඇත.  එම රැස්වීම්වලට සහභාගී වූවන්ගේ නාම ලේඛන කිහිපයක් පැ. 41 පැ. 37 පැ. 39 පැ. 40 පැ. 38 පැ.43 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. (205/2020)

වගඋත්තරකරු මෙම කාලසීමාව තුළ සිදු කරන ලද සියළු ගෙවීම් පිළිබඳ ලේඛන පැ.33, පැ.33 (1), පැ.33 (2), පැ.33 (3), පැ.33(4) සහ පැ.33(5) ලෙසට සලකුණු කර ඇත. (205/2020)

මෙහෙයවන ලද සියලුම සාක්ෂි අනුව, කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව අසත්‍ය කරුණු පාදක කරගෙන ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් මත, දේශපාලන පළිගැනීම් උදෙසා සිදු කළ පොලිස් විමර්ශන උපයෝගී කරගෙන, පැමිණිලිකරු රක්ෂිත බන්ධාගාර ගත කිරීමෙන්, පොලිස් නිළධාරීන් විසින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීම සිදු කර ඇති අතර; එවැනි දේශපාලනික පළිගැනීමක් සිදු කිරීමට අවශ්‍ය කෙරෙන පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ නීති උපදේශක වගඋත්තරකාර තුසිත් මුදලිගේ සහ දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ, වගඋත්තරකාර ආනන්ද විජේපාල සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ වගඋත්තරකාර නිළධාරීන් විසින්, ඔවුන් රාජ්‍ය සේවකයින් ලෙස රාජකාරි කරන අතරතුර නිළ නොවන දේශපාලන සංවිධානයක සාමාජිකයින්ගේ ක්‍රියාකරුවන් වශයෙන් කටයුතු කරමින් පැමිණිලිකරුට අනිත්‍යානුකූල ලෙස රුපියල් මිලියන 7000 ක පමණ අලාභයක් සිදු කළ බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

Chandra Fernando
24/11/2020

2020.11.24

9 .XVIII

(1)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 432 / 2020 |
| පැමිණිලිකරු | - | නාලක ගොඩහේවා |
| ලිපිනය | - | නො: 12/1, පාක් ටවර්,<br>හැව්ලොක් සිටි, කොළඹ 06. |

(2)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 433 / 2020 |
| පැමිණිලිකරු | - | ධම්මික මන්ජිර පෙරේරා |
| ලිපිනය | - | නො:178, සහන මාවත,<br>කඩවත පාර, රාගම |

පැමිණිලිකරුවන් දේශපාලන පළි ගැනීමේ ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු අමාත්‍ය මංගල සමරවීර
2. හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක
3. හිටපු අමාත්‍ය රවුෆ් හකීම්
4. ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධාන නායක සරත් පොන්සේකා
5. දෙමළ සන්ධාන නායක ආර්. සම්බන්ධන්

6. පා.ම. එම්.ඒ.සුමන්තිරන්

7. ජනාති විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක

8. නීතිඥ ජේ.සී.වැලිඅමුණ

9. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න

10. මලික් සමරවික්‍රම

11. තිලක් කරුණාරත්න

12. දිනේෂ් පෙරේරා

13. වජිර විජේගුණවර්ධන

14. අයන්ති ජයරත්න

15. සරත් කුලතුංග

16. (FCID) ලලිත්

17. තුෂාර ජයරත්න

18. අධ්‍යක්ෂ ආනන්ද විජේපාල

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර නාලක ගොඩහේවා මහතා සහ පැමිණිලිකාර ධම්මික මන්ජිර පෙරේරා මහතා මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට

කටයුතු කිරීමටත් එයට  ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, පැමිණිලිකාර නාලක ගොඩහේවා මහතාට සහ පැමිණිලිකාර ධම්මික මන්ජිර පෙරේරා මහතාට එරෙහිව කොළඹ අලුත්කඩේ අංක 3 මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 787/15 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර නාලක ගොඩහේවා මහතා සහ පැමිණිලිකාර ධම්මික මන්ජිර පෙරේරා මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවටත්,

3. කොළඹ මහා මහාධිකරණයේ පවරා ඇති අංක 8133/15 දරන නඩුවේ අධිචෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම මගින්  නිශ්ප්‍රභා කර පැමිණිලිකාර නාලක ගොඩහේවා මහතා සහ පැමිණිලිකාර ධම්මික මන්ජිර පෙරේරා මහතා නිදොස් කොට නිදහස් කළ යුතු බවටත් කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු පාඩු කිරීමේ

අදහසින් වරදක් ගැන අසත්‍ය චෝදනාවක් නැගීම යන වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නමැති වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද, නිසි කරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් උත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරුවන් රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ බරපතළ හානි පූරනය කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි. එසේම, රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුවන්ට අහිමි වූ ඔවුන්ගේ රැකියාවල සියලුම උසස්වීම් වරප්‍රසාද විදේශීය පුහුණුවීම් හිඟ වැටුප් සියල්ලම ඔහුට ලබා දීමත් ඔවුන් එවැනි රක්ෂිත බන්ධනාගාර ගත කිරීම්කට පත් නොවූයේ නම් ඔවුන්ගේ රැකියාවේ හිමිවන ස්ථානයට ඔහු පත්

කිරීමත් මගින් පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිය හැකි බවට කොමිශන් සභාව ඒකමතිකව තීරණය කරන අතරම එම සහනයන් ලබා දීම කොමිෂන් සභාව ඒකමතිකව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කළමනාකරණ පරීක්ෂණ තනතුරට 1994.01.01 දින සිට පත්වන (පැ.01) පැමිණිලිකරු ඉන්පසුව 2012.09.10 වන දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පදවියට (පැ.02) පත්වන අතර කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ප්‍රධානියා වශයෙන් සියළු පරිපාලන සහ නියාමන කටයුතු අධීක්ෂණය කිරීම සහ කොමිෂන් සභාවේ තිරණය ක්‍රියාවට නැංවීමේ රාජකාරි වල නිරතව ඇත.

තාරුණ්‍යට හෙටක් නැමැති සංවිධානයේ ලේකම් රොනි ඉබ්‍රාහිම් මහතා විසින් 2016.08.06 වන දිනැති ලිපිය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ආචාර්ය නාලක ගොඩහේවා මහතා (අංක: 432/2020 නඩුවේ පැමිණිලිකරු) වෙත යොමු කරමින්, දිවයිනේ සියලුම කොටස් වල තරුණ පිරිස් ආවරණය වන පරිදි ඔහුන්ගේ අධ්‍යාපනය, දැනුම සහ ජාතික සංවර්ධනය උදෙසා ඔවුන්ගේ ක්‍රියාකාරි දායකත්වය වර්ධනය කිරීම සඳහා කෙරෙන නිපුණතාවයෙන් හෙබි පිරිසක් උදෙසා සංවිධානය කල වැඩමුළු කිහිපයක් සඳහා රුපියල් මිලියන 05 ක මූල්‍ය දායකත්වයක් සපයන ලෙස ඉල්ලීමක් කර ඇත.

පැ.05 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළ මෙම ඉල්ලීමට අනුව තාරුණ්‍යට හෙටක් සංවිධානය පාසැල් සිසුන් ලක්ෂ 05 ක පමණ සාමාජිකයින් සහිත පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කරන ලද සංවිධානයකි. මෙම ඉල්ලීම ලැබීමෙන් පසුව සභාපති ආචාර්ය නාලක ගොඩහේවා මහතා එකී ඉල්ලීමෙහි " අපිට සහයෝගය දැක්විය හැකි ආකාරය කතිකාකර සිටී" යනුවෙන් සටහනක් තබා කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධම්මික මන්ජිර පෙරේරා (අංක :433/2020 නඩුවේ පැමිණිලිකරු) වෙත යොමු කර ඇත.

අවසන් වරට 2009 අංක 07 පනතින් සංශෝධිත 1987 අංක 36 දරණ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 12 වන වගන්තියේ දැක්වෙන අරමුණ අනුව තාරුණ්‍යට හෙටක් සංවිධානයේ ඉල්ලීම, කොමිෂන් සභා පනතේ අරමුණ තුළ ඉතා පැහැදිලි ලෙසම ගැනෙන බැවින් මෙම දායක මුදල සපයා දීම සඳහා අවශ්‍ය කෙරෙන නිර්දේශ සහ අනුමැතියන් ලබා දීම සඳහා සලකා බැලීමට එකී ඉල්ලීම කොමිෂන් සභාවේ අධ්‍යාපනික වැඩ කටයුතු සම්බන්ධ ප්‍රධානියා ලෙස රාජකාරිය ආවරණය කළ තුෂාර ජයරත්න මහතා සමග පැමිණිලිකාර ධම්මික මන්ජිර පෙරේරා සාකච්ජා කර ඔහුගේ එකඟතාවය මත රුපියල් මිලියන 03 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ජා කර තිරණයක් ගැනීමට කොමිෂන් පත්‍රයක් සකස් කර ඉදිරිපත් කර තිබේ. පැ.06 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති කොමිෂන් පත්‍රයට පැමිණිලිකරු සහ තුෂාර ජයරත්න අත්සන් කර ඇත.

මෙම කොමිෂන් පත්‍රයේ, සභාපති සහ කොමිෂන් සභා සාමාජිකයින් 08 දෙනෙකුගෙන් සැදුම්ලත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සලකා බලා, කොමිෂන් පත්‍රයෙන් නිර්දේශ කළ රුපියල්

මිලියන 03 ක් වෙනුවට තාරුණ්‍යට හෙටක් සංවිධානය විසින් ඉල්ලා සිටින ලද රුපියල් මිලියන 05 ක සම්පූර්ණ මුදලට ලබා දීමට තිරණය කරන ලද, අතර අදාළ වැඩ සටහන ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව පසු විපරමක් කිරීමටද තිරණය කර ඇත. එම ලේඛනය පැ.08 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

කොමිෂන් සභා තිරණය අනුව පැමිණිලිකාර සහකාර අධ්‍යක්ෂ ජනරාල් ධම්මික මන්ජිර පෙරේරා මහතා එම තිරණය මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර ඒ අනුව මුදල් සහ පරිපාලන අධ්‍යක්ෂිකා අයන්ති ජයරත්න මෙනවිය අදාළ රුපියල් මිලියන 5 ක මුදල මුදා හැරීම සඳහා චෙක්පත සකස් කිරිමට අවශ්‍ය විස්තර ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇති අතර ඒ අනුව 2013.08.14 දිනින් යුතු ලිපිය තාරුණ්‍යට හෙටක් සංවිධානයට යවමින් එකී ගිණුම් විස්තර ලබා ගෙන ඇත. එම ලේඛනය පැ.09 සහ පැ.10 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.07 දරණ ලේඛනයට අනුව මෙම රුපියල් මිලියන 05 ක සමඅනුග්‍රාහක මුදල ලබා දීම සාකච්ඡා කර තිරණය කළ 2013.08.13 දින පවත්වන ලද 320 වෙන කොමිෂන් සභා රැස්වීමට, සභාපති සමඟ සාමාජිකයින් 04 දෙනෙකු ද කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධම්මික පෙරේරා, ඒකාබද්ධ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ හර්ෂණ සූරියප්පෙරුම, නීති සහ බලාත්මක අධ්‍යක්ෂ අයන්ති අබේවික්‍රම, මුදල් සහ පරිපාලන අධ්‍යක්ෂ අයන්ති ජයරත්න සහ විධායක, මානව සම්පත් අශෝක දයාරත්න යන පිරිස ආරාධනයෙන් සහභාගි වී තිබේ. එකී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී,

රුපියල් මිලියන 05 ක මුදල තාරුණ්‍යට හෙටක් සංවිධානයට ලබා දීමට ඉහත කී කිසිදු පුද්ගලයෙකු විරුද්ධත්වය පළ කර නැත.

අයන්ති ජයරත්න මෙනවියගේ ඉල්ලීම පරිදි ධම්මික මන්පීර පෙරේරා මහතා විසින් අවශ්‍ය ගිණුම් විස්තර, තාරුණ්‍යට හෙටක් සංවිධානයෙන් ලබාගෙන අයන්ති ජයරත්න මෙනවිය වෙත යොමු කර ඇති අතර තාරුණ්‍යට හෙටක් සංවිධානය විසින් ඉල්ලා ඇති පරිදි ප්‍රිමියර් ස්පෝර්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය නමින් වවුචර්ය සකස් කර අයන්ති ජයරත්න විසින් අනුමත කර රුපියල් මිලියන 05 ක සකස් කළ චෙක්පත අත්සන සඳහා ඉදිරිපත් කරන තිබේ. ඒ අනුව පැමිණිලිකරු සහ සභාපති විසින් අත්සන් තබන ලද චෙක්පත තාරුණ්‍යට හෙටක් සංවිධානයට යවා ඇති අතර ඔවුන් එය ලැබුණු බවට පිළිගැනීමක් සිදු කර ඇත. ඉහතින් දැක්වූ කරුණු වලට අදාළ ලේඛන පැ.11, පැ.12, පැ.13, පැ.14 සහ පැ.15 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදි.

මෙම මුදල් වැය කරන ලද ආකාරය පිළිබඳව තාරුණ්‍යට හෙටක් සංවිධානය විසින් සහකාර අධ්‍යක්ෂ තුෂාර ජයරත්න මහතා වෙත පැ.16 සහ පැ.16 (අ) ලේඛනය මගින් දැනුම් දී ඇත.

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ලේඛන සහ සාක්ෂි අනුව සම අනුග්‍රාහකත්වය දැක්වීම සඳහා රුපියල් මිලියන 05 ක මුදලක් වැය කිරීමේදී නිසි ක්‍රමවේදය හා කාර්ය පටිපාටිය අනුගමනය කර ඇති බැවින් එකී කාර්ය පටිපාටිය තුළ වරදක් සිදුව ඇති බවට කිනම් අයුරකින් හෝ චෝදනාවක් නැඟීමේ හැකියාව නොමැත. සියලු කටයුතු විනිවිද භාවයෙන් සිදු කර ඇත. සිදුකළ වියදම ඊට අදාළ අනුමත වාර්ෂික වැය ශීර්ෂයෙන් ලබාගෙන ඇත. අනුග්‍රාහකත්වය

දක්වන ලද වැඩසටහන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ කොමිෂන් සභා පනතේ 12 වන වගන්තියේ පරමාර්ථ තුළට ගැනෙන වැඩ සටහනකි. එම පරමාර්ථ උදෙසා කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයට වෙන් කරන ලද මුදලින් රුපියල් මිලියන 05 ක වියදම දරා තිබේ.

2015 ජනවාරි මස 08 වන දින නව රජය පිහිටුවීමත් සමග ඉහත සඳහන් කළ මුදල් වැය කිරීම නීති විරෝධී බවට චෝදනා කරමින් පැමිණිලිකාර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති නාලක ගොඩහේවා මහතා යන දෙදෙනාට එරෙහිව පමණක් චෝදනා නඟමින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පරීක්ෂණ ආරම්භ කර ඇත. පැ.21 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද 2015.04.16 දිනැති අංක බී 787/15 දරණ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති වාර්තාවේ, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.වී.ඩබ්ලිව්.එම්.ආර්.ඩී.සෙනවිරත්න විසින් සඳහන් කර ඇති අන්දමට දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් 2015.04.07 දින එවන ලද වාර්තාවක් මත විමර්ශන ආරම්භ කර ඇති අතර එකී වාර්තාවේ සඳහන් කර ඇත්තේ "සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, තාරුණ්‍යට හෙටක්" සංවිධානයට රුපියල් ලක්ෂ 50 ක අනුග්‍රහයක් ලබා දී එමගින් රජයේ මුදල් අවභාවිතයේ යෙදවීමක් සිදු කර ඇති බවය.

මේ අනුව කිසිදු පුද්ගලයෙකුගෙන් ලද පැමිණිල්ලක් නොමැතිව දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ලෙසට සඳහන් කළ පුද්ගලයෙකුගේ වාර්තාමත මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපති සෙනවිරත්න මහතා විසින් පරීක්ෂණ ආරම්භ කර ඇත. මෙම

පරීක්ෂණ සඳහා පිළිගත හැකි පැමිණිල්ලක් නොතිබුණ බැවින් දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වශයෙන් පෙනී සිටි පුද්ගලයාගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට හෝ ඔහු කිනම් පුද්ගලයෙක්ද යන්න සොයා බැලීමට පරීක්ෂණ ආරම්භ කළ අවස්ථාවේ දී ස්ථානාධිපති සෙනවිරත්න මහතා ක්‍රියා කළ බවට උක්ත බී වාර්තාවේත් සඳහන් කර නැත. මේ අනුව අනන්‍යතාවයක් නොමැති පැමිණිලිකරුවෙකු නොමැති වාර්තාවක් සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපති සෙනවිරත්න මහතා වහා ක්‍රියාත්මක වී විමර්ශනය ආරම්භ කිරීම පැහැදිලි ලෙසම ඔහු කිසියම් බලපෑමක් සහ පෙළඹවීමක් මත ක්‍රියාත්මක වූ බවට ඉතා පැහැදිලි සාක්ෂියකි.

කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද ලිඛිත සහ වාචික සාක්ෂි අනුව මෙම දූෂණ මර්දන කමිටුව සහ එම කමිටුව ඊට අනුබද්ධිත අනිකුත් අනු කමිටු සහ ඒ කමිටු සහ අනු කමිටු වල සාමාජිකයින් සහ එකී කමිටු අනු කමිටු පිහිටුවීමට මුල් වූ ජාතික විධායක සභාව සහ එහි සාමාජිකත්වය මෙන්ම එකී රාජ්‍ය නොවන සංවිධානයට රජයේ සේවකයින් නම්කර ඔවුන්ට රාජ්‍ය මුදල් වලින් වැටුප් සහ දීමනා ගෙවමින් රුපියල් මිලියන ගණනක මුදල් වංචනික ලෙස අවභාවිතා කිරීම පිළිබඳව සකස් කරන ලද වාර්තාවක් මෙම වාර්තාවේ වෙනම පරිච්ඡේදයක වාර්තා ගත කර ඇති අතර, එම වාර්තාව දූෂණ විරෝධී කමිටුව පාර්ශවකරුවකු වන සෑම නඩුවක ම සාක්ෂියක් ලෙස භාවිතා කිරීමට කොමිෂන් සභාව පාර්ශවකරුවන්ගේ එකඟත්වයෙන් තීරණය කර ඇත.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කළ පරීක්ෂණයේ මවිතය දනවන සුළු කරුණ වන්නේ, රුපියල් මිලියන 05 ක මුදලක්

අනුමත කළ 320 දරණ විනිමය සහ සුරැකුම්පත් කොමිෂන් සභා රැස්වීමට (පැ.07) සහභාගි වුන කොමිෂන් සභා සාමාජිකයින් සහ ලේකම් කාර්යාල නිළධාරීන් වෙත කිසිදු වගකීමක් නොපැවරීමට වග බලා ගැනීම සහ මුදල් පිළිබඳව වගකීම දරණ සනකාධිකාරිවරුන් වගකීමෙන් මුදා හැරීමය.

රුපියල් මිලියන 05 ක මුදල් තාරුණ්‍යට හෙටක් සංවිධානයට ලබා දීම සභාපති නාලක ගොඩහේවා මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධම්මික මන්ජිර පෙරේරා මහතාගේ තනි ක්‍රියාවක් නොවේ. එය අධ්‍යක්ෂ මණ්ඩලයේ හා නිළධාරී මණ්ඩලයේ සාමූහික ක්‍රියාවක ප්‍රතිඵලයක් බව ඉදිරිපත් වී ඇති ලිඛිත හා වාචික සාක්ෂි මගින් ඔප්පු වී ඇත.

පැවතුන යථා තත්ත්වය එසේ වුවත් 2015 ජනවාරි මස 08 න් පසුව විනිමය කොමිෂන් සභාවේ සභාපතිධූරයට පත්වූ තිලක් කරුණාරත්න සහ වජිර විජේගුණවර්ධන ඇතුළු පිරිසක් විසින් දේශපාලන පළිගැනීම් වල යෙදෙමින් තමන්ගේ විරුද්ධවාදීන් පමණක් තෝරාගෙන ඔවුන්ට එරෙහිව රාජ්‍ය නොවන සංවිධානයක් වූ දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය මගින් අනිත්‍යානුකූල ලෙස පිහිටුවන ලැබූ මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය නැමැති පොලිස් ඒකකය යොදා ගනිමින් අනිත්‍යානුකූල ක්‍රියා පිළිවෙතකට ප්‍රවේශ වී ඇත.

2015 රජය යටතේ විනිමය කොමිෂන් සභාවේ සභාපති පදවියට පත් වූ තිලක් කරුණාරත්න මහතා ඊට පෙර 2012 ජූලි මාසයට පෙර කාලසීමාවේ දී ද විනිමය කොමිෂන් සභාවේ සභාපතිධූරයට පත්ව ඇත. එම කාලසීමාවේදී විනිමය කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා වශයෙන් පැමිණිලිකාර ධම්මික මන්ජිර පෙරේරා

මහතා ද සේවය කර තිබේ. මෙම කාලවකවානුවේදී සභාපති තිලක් කරුණාරත්න මහතාගේ වැරදි තිරණ හේතුවෙන් කොටස් වෙළඳපොළ බරපතල කඩා වැටිමකට ලක් වී ඇති අතර මෙම කඩා වැටීම කරුණාරත්න මහතාගේ වැරදි නිගමන හා තිරණ මත සිදුවී ඇති බවට එවකට ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ වූ පැමිණිලිකරු විසින් කරුණාරත්න මහතාට පෙන්වා දී ඇත. එසේම කොටස් වෙළඳපොළ සම්බන්ධයෙන් විනිමය කොමිෂන් සභාව විසින් ආයෝජනය සහ තැරැව්කරුවන් පිළිබඳව පවත්වන ලද පරීක්ෂණ වලදී කරුණාරත්න මහතා මැදිහත්වී ඇති අතර ඒ සම්බන්ධයෙන් ද විමර්ශන නිළධාරී වශයෙන් පැමිණිලිකරු විරුද්ධත්වය පළ කර ඇත. මේ කරුණු මත තිලක් කරුණාරත්න මහතා පැමිණිලිකරු සමග හිත් අමනාපයෙන් කාලය ගත කර තිබේ.

එසේම එවකට ජනාධිපතිතුමා විසින් මේ සම්බන්ධව පවත්වන ලද සාකච්ජාවකදි කොටස් වෙළඳ පොළ කඩාවැටීම පිළිබඳව ජනාධිපතිතුමා විසින් තිලක් කරුණාරත්න මහතාට දොස් පවරා ඇති අතර ඉන් පසුව ඔහු සභාපතිධූරයෙන් ඉවත් කර ඇත.

ඉන්පසුව නැවත 2015 දි සභාපති පදවියට පත්වන තිලක් කරුණාරත්න පැමිණිලිකරුගෙන් පළිගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබේ. මේ වන විට විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස පැමිණිලිකරු පත් කළ යුතු බවට කොමිෂන් සභා සමාජිකයින් විසින් තිරණය කර තිබි ඇති අතර එම තිරණය ක්‍රියාත්මක කරන ලෙසට පැමිණිලිකරු තිලක් කරුණාරත්න මහතාගෙන් ඉල්ලා ඇතත් ඔහු එම ලිපියට පිළිතුරු ලබා නොදෙමින් පැමිණිලිකරුට කොමිෂන් සභාවේ සේවයෙන් ඉල්ලා අස්වන ලෙසට බලපෑම් කර ඇත. එසේම

පැමිණිලිකරු පත් කිරිමට තිරණය කර තිබූ අධ්‍යක්ෂ ජනරාල් පදවියට තිලක් කරුණාරත්නගේ සමීපතමයෙකු වූ වජිර විජේගුණවර්ධන මහතා පත් කර ඇත.

තාරුණ්‍යට හෙටක් සංවිධානය සඳහා ලබා දුන් මුදල පිළිබඳව පැමිණිලිකරු සහ සභාපතිව සිටි නාලක ගොඩහේවා අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

තාරුණ්‍ය හෙටක් සංවිධානයට ලබා දුන් අනුග්‍රාහක මුදල පාවිච්චි කරමින් සිසු දරුවන් 11200 ක් පමණ පිරිසකට අධ්‍යාපනික වැඩ සටහන් සිදු කළ බව එකී සංවිධානය විසින් එවා ඇති පැ.16 සහ පැ.16 (අ) ලිපි මගින් විස්තර කර ඇත.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සිදු කළ පරීක්ෂණයට උප පොලිස් පරීක්ෂක ලලිත් විසින් කැඳවා ඇත්තේ පැමිණිලිකරු සහ නාලක ගොඩහේවා මහතා පමණකි. ඊට අදාළව කටයුතු කළ කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින් හෝ සහභාගි වූ නිළධාරීන් පරීක්ෂණය සඳහා නොකැඳවීම තුළින් පැහැදිලි වන්නේ යම් අරමුණක් උදෙසා පැමිණිලිකරු සහ නාලක ගොඩහේවා මහතා ඉලක්ක කර ගෙන පොලිස් පරීක්ෂණ පවත්වා ඇති බවය. පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතා සහ ආචාර්ය නාලක ගොඩහේවා මහතාගේ බලපෑම මත රුපියල් මිලියන 5 ක මුදල මුදාහැරිය බවට ප්‍රකාශ කරමින් කටඋත්තරයක් පැමිණිලිකරුගෙන් ලබා ගැනීමට උප පොලිස් පරීක්ෂක ලලිත් පැමිණිලිකරුට බලපෑම් කර ඇත. එවැනි ප්‍රකාශයක් ලබා ගැනීමට නොහැකි වූ බැවින් 2015.12.04 වන දින සවස 3.00 ට පමණ මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත

කර ඇති අතර පසු අවස්ථාවක මහාධිකරණයෙන් ඇප මත මුදාහැර ඇත.

මෙම නඩුව යන අතරතුරදීම කොමිෂන් සභාව විසින් චෝදනා ගොනු කර විනය පරීක්ෂණයක් විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ශිරාණි තිලකවර්ධන මහත්මිය මගින් පවත්වා ඇති අතර එකී පරීක්ෂණයෙන් පසුව සියලුම චෝදනා වලින් පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ එම තීරණය පැමිණිලිකරුට දැනුම් දීම කොමිෂන් සභාව විසින් සිදු කර නොමැති බවය. මෙම පරීක්ෂණ වාර්තාව පැ.24 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරුගේ සාක්ෂියට අනුව 2015 ජනවාරි මස පිහිටුවන ලද නව රජය යටතේ කොමිෂන් සභාවේ කටයුතු සිදු කරන ලද තිලක් කරුණාරත්න ඇතුළු පිරිසගෙන් පැමිණිලිකරුට දැඩි ලෙස හානි සිදු වී ඇත. විනය පරීක්ෂණයේ දී සියළු චෝදනා වලින් පැමිණිලිකරු නිදහස් වී ඇතත් ඔහුට ඒ තුළින් සාධාරණයක් ඉටුවී නොමැත. සභාපති වශයෙන් කටයුතු කළ ආචාර්ය ගොඩහේවා මහතා ද මෙම මුදල තාරුණ්‍යට හෙටක් සංවිධානයට ලබා දීම ඔහුගේ ඒකමතික තීරණයක් මත සිදු කර නොමැති බව මෙම සාක්ෂි අනුව පැහැදිලිය ආචාර්ය නාලක ගොඩහේවා දේශපාලඥයෙකු වශයෙන් 2015 පසු කාලසීමාවේ රජයේ නීති විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ ව්‍යාපාරයෙහි නිරතව සිට ඇත. මේ හේතුවෙන් විරුද්ධ දේශපාලන මතධාරීන් ආචාර්ය ගොඩහේවා මහතා නිහඬ කිරීමේ ප්‍රයත්නයේ යෙදී ඇත.

පැමිණිලිකාර ගොඩහේවා මහතා සහ පැමිණිලිකාර ධම්මික මන්ජිර පෙරේරා මහතාට එරෙහි නඩුවේ ප්‍රධාන සාක්ෂිකාරිය වූ එවකට

කොමිෂන් සභාවේ මුදල් අධ්‍යක්ෂිකා අයන්ති ජයරත්න මෙනවිය අධිකරණයේ සාක්ෂි දෙමින් සඳහන් කර ඇත්තේ " චෙක්පත අත්සන් කිරීමට සූදානම් කළත් ඇය එදින කොමිෂන් සභාවේ සිටියත්, චෙක්පත අත්සන් කිරීම සඳහා ඇය හිතාමතාම පැමිණිලිකරුවන් දෙදෙනා චෙක්පත අත්සන් කිරීමට තෝරා ගත් බවය."

අයන්ති ජයරත්න මහත්මියගේ මෙම ප්‍රකාශය තුළ පැහැදිලි ලෙසට ද්වේශය සහ කිසියම් දෙයකට පැමිණිලිකරුවන් දෙදෙනා හසුකරලීමේ චේතනාව ඇයට තිබී ඇත. තාරුණ්‍යට හෙටක් සංවිධානයට රුපියල් මිලියන 05 ක අනුග්‍රහයක් දැක්වීම තුළින් කිසිදු වරදක් සිදු කර නොමැති බවට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් ප්‍රකාශ කළ තීන්දුව සැඟවීම තුළින් මැනවින් පැහැදිලි වන්නේ තිලක් කරුණාරත්න ඇතුළු පිරිස පැමිණිලිකරුවන්ට එරෙහිව බරපතල දේශපාලන පළිගැනීමක නිරතව සිට ඇති බවකි.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාර ශිරාණි තිලකවර්ධන මහත්මිය විසින් පවත්වන ලද විනය පරීක්ෂණ වාර්තාව, තීරණය ද සමග 2017.03.31 වන දින ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනය විනිමය කොමිෂන් සභා වෙත භාරදී ඇත. එසේ වුවත් එකී තීරණය පැමිණිලිකරු වෙත දැනුම් දීමට කොමිෂන් සභාව කටයුතු කර නැත. අවුරුදු තුනකට වැඩි කාලයක් තීරණය පැමිණිලිකරුට දැනුම් නොදීමෙන් ඔහුට බරපතල අගතියක් සිදු කර ඇත. 2017.05.16, 2017.07.03 සහ 2017.07.26 දිනති ඉල්ලීම් මගින් පැමිනිලිකරු එකී තීරණය පිළිබඳ විමසා සිටියත් එයට ප්‍රතිචාර දැක්වීම කොමිෂන් සභාව නොසලකා හැර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාර ශිරාණි තිලකවර්ධන මහත්මිය විසින් පවත්වන ලද විනය පරීක්ෂණයෙන් පැමිණිලිකරුට එරෙහිව නගන ලද චෝදනා 12 න්ම පැමිනිලිකරු නිදොස් කොට නිදහස් කර ඇත. ඉක්මන් විනය පරි පරීක්ෂණ තීන්දුව මහාධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා පැමිණිලිකරුට ලැබුණේ නම් ඔහුට මහාධිකරණය ඉදිරියේ පැවැති නඩුව අවසන් කර ගැනීමේ හැකියාව හොඳින්ම තිබුණි.

එසේම එකී තීරණය ප්‍රකාරව පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීම සිදු කළ යුතුව තිබුණේ වී නමුත් අධ්‍යක්ෂක මණ්ඩලය එම වගකීම පැහැර හැර ඇත. එමගින්ද පැමිණිලිකරුට බරපතළ අගතියක් සිදු වී ඇත.

සම්පූර්ණ වැටුප් සහ දීමනා ගෙවීමට යටත් වූ අනිවාර්ය නිවාඩු යවා පැමිණිලිකරුට 2016.04.19 සිට අඩ වැටුප් ගෙවීම ආරම්භ කර ඇත. 2017.03.31 වන දින විනය තීන්දුව පරිදි පැමිණිලිකරු සියලුම චෝදනාවලින් නිදහස් කර තිබුණේ වී නමුත් 2018 සැප්තැම්බර් මස සිට වැටුප් ගෙවීම සම්පූර්ණයෙන්ම අත්හිටුවා ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ උක්ත තීරණය හේතුවෙන් පැමිණිලිකරු බරපතළ ආර්ථික අර්බුදයකට පත්වී ඇති අතර ඔහුගේ එදිනෙදා ජීවිතය ගෙන යාමට නොහැකි තත්ත්වයකට පැමිණිලිකරු පත්ව ඇත.කොමිෂන් සභාවේ මෙම ක්‍රියාව හේතුවෙන් පැමිණිලිකරු මූල්‍යමය හානියට පත් වනවාට අමතරව සමාජීය වශයෙන් ද බරපතළ අවමානයට ලක් වී ඇත.

2012 වර්ෂයේ දී කොටස් වෙළඳපොල කඩාවැටීම සම්බන්ධයෙන් එවකට ජනාධිපති සහ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින්

අරලියගහ මන්දිරයේදී විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක මණ්ඩලය ද ඇතුළු කොටස් වෙළඳපලට සම්බන්ද ආයෝජකයන් ද සමගින් රැස්වීමක් පවත්වා ඇති අතර එකී රැස්වීමේදී ජනාධිපතිතුමා විසින් එවකට සභාපතිව සිටි තිලක් කරුණාරත්න මහතා කොටස් වෙළෙඳ පොළේ කඩා වැටීමට වගකිව යුතු පුද්ගලයා ලෙස නම් කරමින් දෝෂදර්ශනයට ලක් කර ඇත. ඉන්පසුව තිලක් කරුණාරත්න මහතා විනිමය කොමිෂන් සභාවේ සභාපති ධූරයෙන් ඉවත් වී ඇත. එසේ ඉවත් වූ කරුණාරත්න මහතා 2015 නව ආණ්ඩුව බලයට පත්වීමත් සමඟ නැවත විනිමය කොමිෂන් සභාවේ සභාපති තනතුරට පත් කර තිබේ. 2012 වසරේ සිට පැමිණිලිකරු සමග අමනාපයෙන් සිටි තිලක් කරුණාරත්න මහතා පැමිණිලිකරුට එරෙහිව දේශපාලනමය වශයෙන් පලිගැනීමට ක්‍රියාත්මක වී ඇත.

විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් පදවියේ වැඩ බලමින් සිටියේ පැමිණිලිකරු එම පදවිය සඳහා ජ්‍යෙෂ්ඨත්වයෙන් සුදුසුම පුද්ගලයා බවට පත්ව සිටි බැවින් අධ්‍යක්ෂක ජනරාල් පදවිය සඳහා ඔහුගේ නම නිර්දේශකර අමාත්‍යවරයා වෙත යවා තිබුණේ වී නමුත් 2015 සභාපති පදවියට පත් තිලක් කරුණාරත්න මහතා එකී නිර්දේශය ආපසු ගෙන්වා පැමිණිලිකරුට එරෙහිව වර්තමාන පරීක්ෂණ ආරම්භ කර ඇත. පැමිණිලිකරුට ස්ථාන ගණනාවක් පහළින් සිටි වජිර විජේගුණවර්ධන මහතා අධ්‍යක්ෂක ජනරාල් පදවියට පත් කරවාගෙන පැමිණිලිකරුට එරෙහිව පළිගැනීමේ ක්‍රියාදාමය ඉදිරියට පවත්වාගෙන ගොස් ඇත.

මේ අනුව මූල්‍ය අපරාධ කොට්ඨාශය විසින් ආරම්භ කරන ලද පරීක්ෂණය ඉදිරියට පවත්වාගෙන යමින් පැමිණිලිකරු අවස්ථා

කීපයකදීම මූල්‍ය අපරාධ කොට්ඨාසයට කැඳවා ඔහුගේ ප්‍රකාශ වාර්තාගත කිරීම සිදු කර ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය ක්‍රියාකරන බවට හැඟී ගිය බැවින් ඔහු මූල්‍ය අපරාධ කොට්ඨාශයට එරෙහිව අත්අඩංගුවට ගැනීම වළක්වාලන ලෙසට ඉල්ලමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මානව හිමිකම් කඩකිරීමේ පෙත්සමක් ගොනු කර ඇත. පැ. 23 ලෙසට ඉදිරිපත් කර ඇති මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස ට දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයින් වන එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු එම කමිටුවේ සාමාජිකයින් නම් කර ඇත.

මූලික අයිතිවාසිකම් පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාගයට ගැනීමට ප්‍රථම මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් 2015.12.04 4 වන දින පැමිණිලිකාර ධම්මික පෙරේරා අත්අඩංගුවට ගෙන බී 787/15 දරණ නඩුව යටතේ කොළඹ කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට සලස්වා ඇත. ඉන්පසුව පැමිණිලිකාර ආචාර්ය නාලක ගොඩහේවා, පැමිණිලිකාර ධම්මික පෙරේරා සහ මොහොමඩ් ඊබ්‍රාහිම් යන තිදෙනා චූදිතයින් කර කොළඹ මහාධිකරණයේ අංක 8133/15 දරන අධිචෝදනා පත්‍රය (පැ. 22) ගොනු කර ඇත. රුපියල් ලක්ෂ 5 ක මුදල් ඇපයක් සහ මිලියන 4 ක ශරීර ඇප දෙකක් මත පැමිණිලිකරුවන් දෙදෙනා වෙන වෙනම අත්සන් තබන ලද ඇපකර මත මුදාහැර ඇති අතර මෙම නඩුව තවමත් මහාධිකරණයේ විභාගය අවසන් නොවී පවතී.

වගඋත්තරකාර වජිර විජේගුණවර්ධන මහතාගේ සාක්ෂියට අනුව ඔහු අධ්‍යක්ෂක ජනරාල් වශයෙන් පත්වීම් ලැබීමෙන් පසුව, 2010, 2011, 2012 වසරවල කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි පරීක්ෂාකර බලා

පැමිණිලිකාර ධම්මික පෙරේරාට එරෙහිව ලැබුණු පැමිණිලි පිළිබඳව වාර්තාවක් සකස් කර සභාපති තිලක් කරුණාරත්න මහතා වෙතට බාර කර ඇත. ඒ අනුව කමිටුවක් පිහිටුවා ධම්මික පෙරේරාට එරෙහිව පැමිණිලි විමර්ශනය කරවාගෙන එම කමිටුවේ නිගමනය අනුව ධම්මික පෙරේරා අනිවාර්ය නිවාඩු යවා ඇත. වගඋත්තරකරු සඳහන් කළේ ධම්මික පෙරේරාගේ වැඩ තහනම් කිරීම සිදුකරන ලද්දේ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව බවය. වගඋත්තරකරු ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව ක්‍රියා කළා යනුවෙන් සඳහන් කරන සාක්ෂිය අමූලික අසත්‍යයකි. ඔහු ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළානම් ඔහු විසින් සිදු කළ යුතුව තිබුණේ ශිරාණි තිලකවර්ධන මැතිණියගේ පරීක්ෂණ වාර්තාවේ නිගමන පරිදි පැමිණිලිකරු කිසිදු දඬුවමකින් තොරව හිග වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම ය. එසේ කරනවා වෙනුවට එම පරීක්ෂණ වාර්තාව සඟවා නැවතත් ඔවුන්ට හිතැති පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ගෙන එකී පරීක්ෂණ මණ්ඩලය මගින් ඔවුන්ට පක්ෂපාතී තීරණයක් ලබා ගැනීමට ක්‍රියා කර ඇති බව ඉහත සඳහන් පරීක්ෂණ කමිටුව පත් කිරීමට ක්‍රියා කළ ආකාරයෙන් පැහැදිලිව සනාථ වේ.

ශිරාණි තිලකවර්ධන මැතිණියගේ පරීක්ෂණ වාර්තාව සහ නිගමන පිළිගැනීමට තරම් ස්වාධීන සහ අපක්ෂපාතී මනසක් නොතිබුණු වගඋත්තරකරුවන් දෙදෙනා වන තිලක් කරුණාරත්න සහ විජේගුණවර්ධන ඉන් නොනැවතී තමන්ට හිතෛෂී පුද්ගලයෙකු වන උපේන්ද්‍ර වල්ගම්පාය මහතා පරීක්ෂණ නිලධාරියෙකු වශයෙන් පත්කර ඔවුන් බලාපොරොත්තු වූ ආකාරයේ පරීක්ෂණ වාර්තාවක් සහ ධම්මික පෙරේරා වරදකරු කරන නිගමන ලබාගෙන ඇත. මෙම

ක්‍රියාවලිය තුලින් පැහැදිලිවම විනිමය කොමිෂන් සභාව ද්වේශ සහගත අන්දමින් ක්‍රියා කරමින් ධම්මික පෙරේරා වරදකරු කර ඔහු සේවයෙන් පහ කිරීමේ අභිප්‍රායෙන් කටයුතු කර ඇති බව පැහැදිලිය. 11 වන වගඋත්තරකාර තිලක් කරුණාරත්න හැර වෙනත් කිසිදු අධ්‍යක්ෂක අධ්‍යක්ෂකවරයෙකු හෝ 13 වන වගඋත්තරකරු, පැමිණිලිකරුට එරෙහිව එවැනි චෝදනා ඇති බවට පැමිණිලි ඉදිරිපත් කර නැත.

ධම්මික පෙරේරා විසින් විෂමාචාර ක්‍රියා සිදු කළ බවට චෝදනා නැගෙන වර්ෂ ලෙසට ඉදිරිපත් කර ඇත්තේ 2010, 2011 සහ 2012 යන වර්ෂයන් ය. මෙම කාල වකවානුවේදී විනිමය හා සුරකුම්පත් කොමිෂන් සභාවේ සභාපති වූයේ 11 වන වගඋත්තරකරු වන තිලක් කරුණාරත්න මහතාය. 13 වන වගඋත්තරකරු වන විජේගුණවර්ධන මහතා ද එම කාලසීමාවේ කොමිෂන් සභාවේ සේවයේ යෙදී සිටි ඇත. එසේ වුවත් ඔවුන්ට දෙදෙනාටම පැමිණිලිකාර ධම්මික පෙරේරා විසින් සිදු කළ යැයි සඳහන් කර ඇති එවැනි විෂමාචාර ක්‍රියා හෝ දූෂණ කිසිවක් එම කාලයසීමාවේදී ඔවුන් දෙදෙනාට අවබෝධ වී නොමැත. ඔවුන් දෙදෙනාට එවැනි අවබෝධයක් ලැබෙන්නේ 2015 වේ රාජ්‍ය පෙරළියත් සමගය.

ශිරාණි තිලකවර්ධන මැතිණියගේ පරීක්ෂණ වාර්තාව සහ නිගමනයන් පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට සහ නීතිපතිවරයාට යැවීමට වගඋත්තරකරුවන් ක්‍රියා කර නොමැත. වගඋත්තරකරුවන් වන තිලක් කරුණාරත්න මහතා සහ විජේගුණවර්ධන මහතා අවංක සේවයක් සිදුකළා නම් එකී පරීක්ෂණ වාර්තාව නීතිපතිට සහ අදාළ පොලිස් කොට්ඨාසයට යැවිය යුතුව තිබුණි.

තුෂාර ජයරත්න මහතා සහ අයන්ති ජයරත්න මෙනවියට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්වීමට විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් වන 11 සහ 13 වගඋත්තරකරුවන් ක්‍රියාකර නැත. සාක්ෂිකාර ශිරානි තිලකවර්ධන මහතාගේ සාක්ෂියට අනුව තුෂාර ජයරත්න සහ අයන්ති ජයරත්න මෙනවිය ප්‍රශ්නගත චෝදනා වලට වගකිව යුතු බවට ඔවුන් පිළිගත් බවට සාක්ෂි දී ඇත. එවැනි පිළිගැනීමක් තිබියදීත් ඔවුන් දෙදෙනාට එරෙහිව 11 සහ 13 වගඋත්තරකරුවන් විසින් විනය පරීක්ෂණ පවත්වා නොමැත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ. 01 සිට පැ.36 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

Chandra Fernando
24/11/2020

24/11/2020

2020.11.24

9 .XIX

(1)

පැමිණිලි අංකය - 619/2020

පැමිණිලිකරු - වැඩෙනකොන්ඩ ආරච්චිගේ නිශාන්ත ආසිරි ප්‍රනාන්දු

ලිපිනය - 142/41, වලව්වත්ත, වෑකඩ, පානදුර.

(2)

පැමිණිලි අංකය - 375/2020

පැමිණිලිකරු - සෙල්ලකපු කමින්ද හර්ෂජිත් මහතා

ලිපිනය - 164/33, ලියන් සිල්වා මාවත, උතුරු තල්පිටිය, පානදුර.

පැමිණිලිකරුවන් දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. කිරාන් අතපත්තු
2. ආනන්ද විජේපාල
3. පොලිස් පරීක්ෂක ආර්.ඒ.සී.පී. රණසිංහ
4. පොලිස් පරීක්ෂක ඇන්ජලි

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර වැඩෙන කොන්ඩ ආරච්චිගේ නිශාන්ත ආසිරි ප්‍රනාන්දු සහ පැමිණිලිකාර සෙල්ලකපු කමින්ද හර්ෂජිත් යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, පැමිණිලිකාර වැඩෙන කොන්ඩ ආරච්චිගේ නිශාන්ත ආසිරි ප්‍රනාන්දු සහ පැමිණිලිකාර සෙල්ලකපු කමින්ද හර්ෂජිත් ට එරෙහිව කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 884/16 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර වැඩෙන කොන්ඩ ආරච්චිගේ නිශාන්ත ආසිරි ප්‍රනාන්දු සහ පැමිණිලිකාර සෙල්ලකපු කමින්ද හර්ෂජිත් නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම මිතලාවේ මහින්දානන්ද අලුත්ගමගේ මහතා සහ කච්චිකඩුගේ නලින් රුවන්ජීව ප්‍රනාන්දු යන අයට එරෙහිව

කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC/PTB/02/02/2019 දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර ඔවුන් එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දීම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

6. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

වරලත් ගණකාධිකාරිවරයෙකු වන 01 වන පැමිණිලිකරු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගණකාධිකාරි සහ ඉන් අනතුරුව නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරී කළමනාකරණ මුදල් වශයෙන් සේවය කරමින් සිට ඉන් ඉවත්ව සතොස ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යධිකාරී මුදල් තනතුරට 2013-05-02 පත්වී ඇත. (පැ. 2)

සතොස ආයතනයේ සේවය කළ අවධියේදී ඔහුගේ සේවය අගයමින් 2014.07.14 දින නිකුත් කරන ලද ලිපියක් පැ. 3 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2015 වසරේ ජනාධිපතිවරණයෙන් පසු සතොස ආයතනය නව රජයේ අමාත්‍ය ජයවික්‍රම පෙරේරා මහතාගේ අමාත්‍යාංශය යටතට පත්ව ඇත. එම කාලසීමාවේදී සතොස ආයතනයේ සභාපති ධූරයට පත්වූ කිරාන්

අතපත්තු පැමිණිලිකරුට අඩන්තේට්ටම් කිරීම ආරම්භ කර ඇත. හිටපු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාට සහ හිටපු සභාපති නලින් ප්‍රනාන්දු මහතාට විරුද්ධව ලිපිගොනුවක් පිළියෙල කරන ලෙසටත්, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයට පැමිණිලි කරන ලෙසටත්, බලකරමින් පැමිණිලිකරුට පීඩා කිරීමේ ක්‍රියාදාමයක සභාපති කිරාන් අතපත්තු නිරතව ඇත. පැමිණිලිකරු එලෙස පැමිණිලි නොකිරීමේ හේතුව මත පැමිණිලිකරු වෙනත් වරදවල් වලට පටලැවීම සඳහා පිළිගත් කාර්ය පටිපාටියට බැහැරව යමින් ඇතැම් සැපයුම්කරුවන්ට අත්තිකාරම් මුදල් ලබා දෙන ලෙසට සභාපති කිරාන් අතපත්තු විසින් බලපෑම් කර ඇත. එසේ සැපයුම්කරුවන්ට මුදල් නොගෙවන්නේ නම් අණ නොපිළිපැදීම, අකීකරු වීම, හේතුකොටගෙන රැකියාවෙන් ඉවත්ව යන ලෙසට තර්ජනය කර ඇත. රාජකාරිය සිදුකරගෙන යාමට ඉඩ නොදී, රාජකාරියට බාධා පමුණුවමින්, බලපෑම් කරමින් සිදු කරනු ලැබූ ක්‍රියාකලාපය මගින් තමන් දේශපාලනමය වශයෙන් පළිගැනීමේ ක්‍රියාවලියකට පාත්‍ර වී ඇති බවට පැමිණිලිකරුට අවබෝධ වී ඇත. පැමිණිලිකරු සහභාගි විය යුතු වැදගත් රැස්වීම් වලට පැමිණිලිකරු සහභාගි නොකරවාගෙන ඒ වෙනුවට වෙනත් කනිෂ්ට නිලධාරීන් එම කාර්යයන් වෙනුවෙන් සහභාගි කරවාගෙන පැමිනිලිකරුට සේවා ස්ථානය අතෘප්තියට පත් වන තත්ත්වයකට පත්කිරීමට සභාපතිවරයා ක්‍රියාකර ඇත.

හිටපු අමාත්‍ය ජෝන්ස්ටන් ප්‍රනාන්දු මහතා සහ හිටපු සභාපති නලින් ප්‍රනාන්දු මහතාට විරුද්ධව දූෂණ මර්දන කමිටු කාර්යාලයට පැමිණිලි නොකිරීමේ හේතුව මත පැමිණිලිකරුට සතොස ආයතනයෙන් ඉවත්වී යන ලෙසට නියෝග කරමින් තර්ජනය කිරීම සිදු කර ඇති

අතර ඒ හේතුකොටගෙන පැමිණිලිකරුට ලංකා සතොස ආයතනයේ රාජකාරි කරගත නොහැකි තරම් පීඩනයකට ඇද වැටී ඇත.

පැමිණිලිකරු සතොස ආයතනයේ සේවයෙන් අස් කරන බවටත්, ඔහුව පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය ලවා අත් අඩංගුවට ගෙන සිරගත කරන බවටත්, තර්ජනය කිරීම කරණ කොටගෙන පැමිණිලිකරු, තමන් අත්අඩංගුවට ගනීවී යැයි, බියට පත්ව ඇත .

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් අත්අඩංගුවට ගැනීමට සලස්වන බවට සිදු කළ තර්ජනය කිරීම මත බියට පත්වූ පැමිණිලිකරු ඔහුගේ සේවා ගිවිසුම අවසන් වීමට ප්‍රථම සේවයෙන් ඉවත් වීමට තීරණය කර ඒ සඳහා සේවා ගිවිසුම අවසන් වන දිනය තෙක් නිවාඩු ඉල්ලමින් 2015.04.10 දිනැති ලිපිය (පැ. 4 අ) බාර දී ඇත.

පැමිණිලිකරු සහ සතොස ආයතනය අතර පැවැති සේවා ගිවිසුම අනුව පැමිණිලිකරුට 2015.04.30 දිනය දක්වා සේවය කිරීමටත් ඉන්පසුව ඔහුගේ සේවා ගිවිසුම් දීර්ඝ කිරීමටත් ගිවිසුම් කොන්දේසි අනුව හැකියාව තිබුණේ වුවද පැමිණිලිකරුට සිදු වූ තර්ජන මත ඔහුගේ සේවා ගිවිසුම අවසන් කිරීමට සිදුවී ඇත.

පැමිණිලිකරු සතොස ආයතනයේ සේවය කරන අවධියේ දී 2014.11.07 දිනැති ලිපියකින් ක්‍රීඩා අමාත්‍යාංශයේ හිටපු ලේකම් මේජර් ජනරාල් නන්ද මල්ලවආරච්චි විසින්, ලංකා සතොස ආයතනයේ හිටපු සභාපති නලින් ප්‍රනාන්දු මහතාට ලිපියක් (පැ. 4) යොමු කරමින්, තෝරාගනු ලැබූ පාසල් සහ ක්‍රීඩා සමාජ අතර බෙදාදීම සඳහා උසස් ප්‍රමිතියෙන් යුත් කැරම් බෝර්ඩ් සහ දාම් බෝර්ඩ් දාහතර දාහක් (14,000) ක් බෙදාදීම සඳහා අවශ්‍ය කෙරෙන එම භාණ්ඩ ලංකා

සතොස ආයතනය මගින් තීරුබදු රහිතව ආනයනය කර දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත. මෙම භාණ්ඩ ආනයනය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ලබාදෙන බවටද ලිපියෙන් දැනුම් දී ඇත.

ඒ අනුව සතොස ආයතනයේ හිටපු සභාපති නලින් ප්‍රනාන්දු මහතා විසින් 2014.11.10 දිනැති ලිපිය (පැ. 5) මහා භාණ්ඩාගාරයේ හිටපු ලේකම් පී.බී. ජයසුන්දර මහතා වෙත යවමින්, එම භාණ්ඩ තීරුබදු රහිතව ආනයනය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත.

ඉන්පසුව සභාපති නලින් ප්‍රනාන්දු මහතා පැමිණිලිකරු අමතමින්, මෙම ගනුදෙනුව රජයේ දෙපාර්තමේන්තු දෙකක් අතර සිදුවන ගනුදෙනුවක් බැවින්, සතොස ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව, අදාල ක්‍රීඩා භාණ්ඩ ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කරන ලෙසට දැනුම් දීමක් කර ඇති අතර, ඒ අනුව පැමිණිලිකරු සහ සභාපති නලින් ප්‍රනාන්දු මහතාගේ අත්සන යටතේ ක්‍රීඩා භාන්ඩ ආනයනය කිරීම සඳහා ණයවර ලිපි (පැ.7) විවෘත කර ඇත.

ඒ අනුව ඉහත කී ක්‍රීඩාව භාණ්ඩ ලංකාවට ආනයනය කර ඇති අතර 2014.12.02 දින ලිපියෙන් මහා භාණ්ඩාගාරයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්, වරායට ගොඩබා ඇති එකී ක්‍රීඩා භාණ්ඩ තීරුබදු රහිතව නිදහස් කරගැනීමට අවශ්‍ය අනුමතිය ඉල්ලා ඇත. ඒ අනුව මහා භාණ්ඩාගාරයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් විසින් එකී ක්‍රීඩා භාණ්ඩ අවස්ථා පහකදී තීරු බදු සහන යටතේ ලබා ගැනීමට

අවසර ලබා දී ඇත. තීරුබදු සහනය ලබා දීමෙන්ම මෙම ගනුදෙනුව නිවැරදි ගනුදෙනුවක් බවට තහවුරු වී ඇත.

ලංකා සතොස ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ප්‍රසම්පාදන - අංජන නිශ්ශංක මහතා විසින් සහ සතොස ආයතනයේ නීති සහ මෙහෙයුම් උපදේශක විජේතිලක මහත්මිය විසින් ඉහත කී කැරම්බෝඩ් 14,000 සහ දාම් බෝඩ් 11,000 ආනයනය කිරීමට අදාළ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය ඉල්ලා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් (පැ. 8) 2014.12.17 දින ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2014.12.18 වන දින පවත්වන ලද අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී එකී අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අනුමත කර එම ක්‍රීඩා භාණ්ඩ ආනයනය කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව කැරම්බෝඩ් සඳහා ඇමරිකානු ඩොලර් 189,000 ක්ද, දාම් බෝඩ් සඳහා ඇමරිකානු ඩොලර් 88,000 (අසූ අට දාහක්) ද අනුමත කර ඇත.

වරායෙන් නිදහස් කරගන්නා ලද එකී ක්‍රීඩා භාණ්ඩ සතොස ආයතනය විසින් ක්‍රීඩා අමාත්‍යාංශයේ නිශාන්ත ගුණතිලක නැමැත්තාට 2015.01.06 වන දින භාර දී ඇත. (පැ. 8 අ) එසේම, එකී කැරම් බෝඩ් ආනයනය කිරීම වෙනුවෙන් සතොස ආයතනය විසින් දරන ලද වියදම වන රු. 36,453,553.06 ක මුදල සතොස ආයතනයට ගෙවන ලෙසට ඉල්ලමින් ලිපියක් (පැ. 8අ) ක්‍රීඩා අමාත්‍යාංශයේ හිටපු ලේකම් නන්ද මල්ලවආරච්චි මහතා වෙත යවා ඇත.

එකඟ වූ අයුරින් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් එකී මුදල සතොස ආයතනයට ගෙවීම පැහැර හරින ලද බැවින් පැමිණිලිකරු විසින් 2015.02.05 වන දින (පැ. 9) ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නැවත සිහි කැඳවීමක් යවමින් අදාළ මුදල ගෙවන ලෙස ඉල්ලීමක් කර

ඇත. එසේ වුවත් මේ ලිපියද නොසලකා හරිමින් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් එකී ගෙවීම් සිදු කිරීම පැහැර හැර ඇත.

මේ සම්බන්ධයෙන් සතොස නව නව සභාපති වූ කිරාන් අතපත්තු විසින් 2015.03.31 දිනැති ලිපිය (පැ. 10) පැමිණිලිකාර ආසිරි ප්‍රනාන්දු වෙත යොමු කරමින්, මෙම කැරම් බෝඩ් ආනයනය කිරීම සඳහා සතොස ආයතනය විසින් දරන ලද වියදම ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කර නොමැති බැවින්, ඒ සම්බන්ධයෙන් දූෂණ මර්දන කමිටු ලේකම් කාර්‍යාලයට ලැබුණු පැමිණිල්ලක් අනුව විමර්ශනයක් පවත්වන බැවින් එම කැරම් බෝඩ් සහ දාම් බෝඩ් මිලදී ගැනීම සඳහා මුදල් වැය කිරීමට සතොස ආයතනයේ සේවය කළ සභාපතිවරයාගේ විධිමත් අනුමැතියක් පැමිණිලිකරු විසින් ලබා ගත්තේද? යන වග දින 3 ක් ඇතුළත දැනුම් දෙන ලෙසට පැමිණිලිකරුට දන්වා ඇත.

එකී විමසීමේ ලිපියට පැමිණිලිකරු විසින් පිළිතුරු සපයමින් (පැ. 11), තමන් කැරම් බෝර්ඩ් සහ දාම් බෝඩ් ආනයනය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වී නැති බවටත්, ඒ සඳහා වැය වූ රු.36,453,553.06 ක මුදල මහජන බැංකුවේ ණයවර ලිපි මගින් ගෙවා ඇති බවටත්, හිටපු සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම ගනුදෙනු අනුමත කර ඇති බවටත් දැනුම් දී ඇත.

මෙම පිළිතුර යවා දින අටක පමණ කාලයකින් පසුව පැමිණිලිකරු ඔහුගේ සේවයෙන් ඉල්ලා අස් වී ඇති අතර ඉන්පසුව මූල්‍ය අපරාධ කොට්ඨාසය මගින් බී 884/2015 දරණ නඩුව (පැ. 12) කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරමින් පැමිණිලිකරු විදෙස්ගත වීමට උත්සාහ දරන බවට අධිකරණයට කරුණු වාර්තා කර පැමිණිලිකරුගේ විදෙස් ගමන් තහනම් කිරීමේ නියෝගයක්

ලබාගෙන ඇත. එකී විදෙස් ගමන් තහනම් නියෝගය අද දිනටත් බලයේ පවතී.

මෙම කැරම්බෝඩ් සහ දාම් බෝඩ් ආනයනය කිරීමේ නඩුවට දැන් සැකකරුවන් ලෙසට ඉදිරිපත් කර ඇත්තේ මහින්දානන්ද අලූත්ගමගේ අමාත්‍යවරයා සහ හිටපු සභාපති නලින් ප්‍රනාන්දු මහතා බවත් තමන් එම නඩුවෙහි සැකකරුවකු නොවන බවත් එසේ වුවත් තමන්ගේ විදෙස් ගමන් තහනම් බලයේ පවතින බවත් පැමිනිලිකරු සඳහන් කර ඇත.

කරුණු එසේ වුවත්, සභාපති කිරාන් අතපත්තු විසින් පුවත් ගුවන් විදුලිය සහ රූපවාහිනිය ඔස්සේ ජනමාධ්‍ය මගින් පැමිණිලිකරුට නින්දා අපහාස කරමින් රුපියල් මිලියන 39ක් පාඩුවක් කල සාමාන්‍යාධිකාරිවරයාගේ ගුවන් තහනම යනුවෙන් පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් දෙමින් තමන්ට සමාජයට මුහුණ දීමට නොහැකි ආකාරයට මාධ්‍ය ප්‍රචාර කිරාන් අතපත්තු විසින් සිදුකරන බවට පැමිණිලිකරු චෝදනා කර ඇත. (පැ. 13)

රුපියල් මිලියන 39 ක් වූ ක්‍රීඩා භාණ්ඩ වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍ය අමාත්‍යාංශය ලබාදිය යුතු මුදල් ලංකා සතොස වෙත ප්‍රතිපූර්ණය නොකිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු වගකිව යුතු බවට චෝදනා කරමින් සහ තවත් චෝදනා කිහිපයක් ගොනු කරමින් පැමිණිලිකරු වෙත 2015.05.08 දිනති චෝදනා පත්‍රයක් තැපැල් මාර්ගයෙන් සභාපති කිරාන් අතපත්තු විසින් යොමු කර ඇත. මෙම චෝදනා පත්‍රයට දෙදහස් 2015.05.27 දිනින් යුක්තව පැමිණිලිකරු විසින් පිළිතුරු සපයා තිබේ. එකී චෝදනා පත්‍රය සහ පිලිතුරු ප්‍රකාශය පැ. 14 සහ පැ. 15 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු සඳහන් කරන අන්දමට මෙම කාල වකවානුවේ දී සතොස ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා ක්‍රියා කර ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අංජන නිශ්ශංක මහතාය. පැමිණිලිකරුට ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව කිසිදු වගකීමක් පැවරී තිබූ නොමැත.

පැමිණිලිකරුගේ සාක්ෂියට අනුව සහ ඉදිරිපත් කර ඇති ලේඛන අනුව කැරම් බෝර්ඩ් සහ දාම් බෝඩ් ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කර ඇත්තේ අධ්‍යක්ෂක මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්වය. ඉන් පසුව ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අනුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙම ආනයන කටයුත්ත අනුමත කර ඇති අතර ඒ සඳහා ණයවර ලිපි

විවෘත කිරීමද අනුමත කර ඇත. මේ අනුව, කැරම් බෝර්ඩ් සහ දාම් බෝඩ් ආනයනය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත පැමිණිලිකරු ක්‍රියාකර තිබේ.

මෙම ආනයනය සම්බන්ධයෙන් දැනට අධිකරණය ඉදිරියේ විභාග වන නඩු කටයුත්තේ පැමිණිලිකරු චූදිතයකු නොවන බවට සඳහන් කර ඇති අතර ඉදිරිපත් කර ඇති චූදිතයින් දෙදෙනා වන්නේ අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා සහ හිටපු සභාපති නලීන් ප්‍රනාන්දු යන දෙදෙනාය.

පැමිණිලිකරු තම සාක්ෂියේ දී සඳහන් කළේ; අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ සහ හිටපු සභාපති නලින් ප්‍රනාන්දු මහතාගේ නම් ඇතුළත් කරමින් දූෂණ මර්දන කමිටු ලේකම් කායීාලයට පැමිණිලි කරන ලෙසට පැමිණිලිකරුට බලපෑම් කරමින් සහ බලකරමින් කිරාන් අතපත්තු ක්‍රියා කිරීම තුළින් ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාට සහ

හිටපු සභාපති නලින් ප්‍රනාන්දු මහතාට එරෙහිව ද්වේශ සහගත ලෙස පැමිණිලි කර නඩු පැවරීම සඳහා ක්‍රියාකිරීමට කිරාන් අතපත්තු මහතා ක්‍රියා කල බවය. එසේම වැඩිදුරටත් පැමිණිලිකරු සඳහන් කළේ තමන් හිටපු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාට සහ හිටපු සභාපති නලින් ප්‍රනාන්දු මහතාට විරුද්ධව දූෂණ මර්දන කමිටු කාර්යාලයට පැමිණිලි කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් කිසිදු හේතුවක් නොමැතිව ඔහුට සතොස ආයතනයෙන් අස් වී යන ලෙසට කිරාන් අතපත්තු නියෝග කරමින් තර්ජනය කළ බව ය.

පැමිණිලිකරුගේ සාක්ෂියට අනුව කැරම් බෝඩ් සහ දාම් බෝඩ් ආනයනය කිරීම පිළිබඳ කටයුත්තට අමාත්‍යය මහින්දානන්ද අලුත්ගමගේ මහතා සහභාගී වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත. ඔහු එම කාල වකවානුවේදී සතොස ආයතනයට සම්බන්ධ කිසිදු කටයුත්තක නිරත වී සිටි බවට පැමිණිලිකරුගේ සාක්ෂියෙන් හෙළිදරවු වී නොමැත. එසේම 2015 නව රජය බලයට පත්වීමෙන් පසු සතොස ආයතනයේ සභාපති පදවියට පත්වූ කිරාන් අතපත්තු විසින් නිකුත් කර ඇති ලිපි ලේඛන අනුව ද මහින්දානන්ද අලුත්ගමගේ මහතා කිසිදු ගනුදෙනුවකට සම්බන්ධ වී ඇති බවක් වාර්තා කර නොමැත. මෙම ආනයන කටයුත්තට අමාත්‍යවරයාගේ බලපෑම් තිබූ බවටද කිසිදු සාක්ෂියක් සභාපති කිරාන් අතපත්තු මහතාගේ ලේඛනවලින් ඉදිරිපත් නොවේ. පැ. 10 දරන ලිපියෙන් නව සභාපති කිරාන් අතපත්තු මහතා විමසා ඇත්තේද ගනුදෙනුව සඳහා හිටපු සභාපතිවරයාගේ විධිමත් අනුමැතිය ලබා ගත්තේ ද යන්න පමණකි.

එබැවින් පැමිණිලිකරුට එරෙහිව සහ සතොස ආයතනයට කිසිදු සම්බන්ධතාවයක් නොතිබුණ මහින්දානන්ද අලුත්ගමගේ මහතාට

එරෙහිව මෙම ගනුදෙනුව සම්බන්දයෙන් නඩු පැවරීමට කිසිදු හැකියාවක් ඇති බවක් කොමිෂන් සභාවට නිරීක්ෂණය නොවේ.

එසේම අනිත් අතට කැරම් බෝඩ් සහ දාම්බෝඩ් ආනයනය කිරීම සම්බන්ධ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇති බැවින් සභාපති නලින් ප්‍රනාන්දු මහතාට එරෙහිව නඩු පැවරීමේ හැකියාවක් නැත. සභාපති නලින් ප්‍රනාන්දු මහතා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව පිළියෙල කිරීමවත් සිදු කරනු නොමැත. සතොස අධ්‍යක්ෂක මණ්ඩලයට මෙවැනි යෝජනා සම්මත කිරීම සඳහා බලය ඇති බැවින් එම අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව සම්මත කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ බලයෙන් පිට ක්‍රියාවක් නොවේ. උක්ත අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව සම්මත කිරීම නීති විරෝධී ක්‍රියාවක් බවට යමකු සඳහන් කරන්නේ නම් ඒ සඳහා සම්පූර්ණ අධ්‍යක්ෂක මණ්ඩලයම වගකිව යුතුය. සභාපතිවරයා පමණක් වගකීමට බැඳී අනිකුත් අධ්‍යක්ෂකවරු වගකීමෙන් මිදෙන නීතියක් ලංකාව තුළ නොමැත. එබැවින් දේශපාලනික ගුප්ත අරමුනු ඉටුකර ගනීම උදෙසා මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යවරයා සහ සභාපතිවරයා පමණක් තෝරා ගෙන නඩු පැවරීම පැහැදිලි ලෙසම පලිගැනීමේ ක්‍රියාවකි.

කරුණු මෙසේ හෙයින් අධිකරණයේ නඩු පැවරීම සඳහා පැමිණිලිකරු හෝ මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යවරයා හෝ හිටපු සභාපතිවරයා හෝ ඔවුන් තිදෙනාම හෝ තිදෙනාගෙන් එක් අයකු හෝ තෝරා ගැනීමක් සිදු කළ නොහැකි අතර යම් වරදක් සිදු කර ඇත්නම් ඒ සඳහා ආනයනය කිරීමේ කටයුත්තට අනුමැතිය ලබාදුන් මුළු අධ්‍යක්ෂක මණ්ඩලයම අධිකරණය ඉදිරියට ගෙන ආ යුතුයි.

මූලාය අපරාධ කොට්ඨාසය විසින් අධ්‍යක්ෂක මණ්ඩලයට එරෙහිව නඩු පවරා නොමැත්තේ, අධ්‍යක්ෂක මණ්ඩලය වරදක් නොකල බවට, මූලාය අපරාධ කොට්ඨාසය විසින් මතයකට පැමිණීම තුලින් බැවින්, ඒ මතය අනුව පැමිණිලිකරු, අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ සහ සභාපති නලින් ප්‍රනාන්දු යන තිදෙනා ද ඒ අයුරින්ම නිදහස් විය යුතුය.

මේ අනුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ බී 884 /16 දරන බී වාර්තාවේ සඳහන් අන්දමට රුපියල් මිලියන 39 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ ක්‍රීඩා වාර්තාවේ සඳහන් අන්දමට ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා ලංකා සතොස ආයතනය මගින් තීරුබදු රහිතව ආනයනය කර ලංකා සතොස ආයතනයට රුපියල් මිලියන 39 ක මුදල් වංචාවක් සිදු කිරීම පිළිබඳව දූෂණ මර්දන කමිටු කාර්යාලයේ අධ්‍යක්ෂක විසින් සිදු කල පැමිණිල්ලක් මත මූලාය අපරාධ කොට්ඨාසය විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ ඉහත සඳහන් බී වාර්තා වේ සැකකරු ලෙසට පැමිණිලිකරුගේ නම් ඇතුළත් කරමින් සහ ඔහුගේ විදේශ ගමන් තහනම් කිරීමට නියෝගයක් ඉල්ලා සිටීමෙන් මූලාය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ස්ථානාධිපතිවරයා සහ සතොස සභාපති කිරාන් අතපත්තු මහතාද, දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක ආනන්ද විජයපාල ද, පටු දේශපාලන අරමුණු ඉටුකර ගැනීම සඳහා කුමන්ත්‍රණකාරී ලෙස ක්‍රියා කර ඇති බවට පැහැදිලිව පෙනී යයි. එසේම, වැඩිදුරටත්, ඉන් පසු අවස්ථාවකදී, සතොස ආයතනයට කිසිදු සම්බන්ධයක් ඇති බවට දැක්වෙන සාක්ෂි ඉදිරිපත් නොකර අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතාගේ නමද, එසේම, අධ්‍යක්ෂක මණ්ඩලය අත්හැර, හිටපු සභාපති නලින් ප්‍රනාන්දු මහතා පමණක් වගකීමට හසුකර වන

අයුරින් පසු අවස්ථාවක දී වැඩිදුර වාර්තාවලට ඔවුන් දෙදෙනාගේ නම් ඇතුළත් කර නඩු පැවරීම සඳහා ක්‍රියාකිරීමට කටයුතු කිරීමෙන්ද, පටු දේශපාලන අරමුණු ඉටුකර ගැනීමේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා කුමන්ත්‍රණය කර, නඩු පැවරීමේ ක්‍රියාවලියේ යෙදී ඇති බවට කොමිෂන් සභාවට පෙනී ගොස් ඇත.

මේ අනුව මෙම දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලිය සඳහා වගකිව යුතු පුද්ගලයන් ලෙසට සතොස නව සභාපතිවරයා වශයෙන් පත්වූ කිරාන් අතපත්තු ද, දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක ආනන්ද විජේපාල ද වගකිව යුතු බවට සාක්ෂි වලින් හෙළිදරව් වී ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ. 1 සිට පැ. 15 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

02 වන පැමිනිලිකාර සෙල්ලකපු කමින්ද හර්ෂජිත් මහතාගේ සාක්ෂියට අනුව නොවැම්බර් මැද සතියේ කන්ටේනර් රියදුරන් පැමිණ පැමිණිලිකරු මුණගැසී ක්‍රීඩා භාණ්ඩ භාරදීමට ඇති බවට සඳහන් කිරිම හේතුවෙන් එම භාණ්ඩ භාරගැනීම පිළිබඳව නියෝජ්‍ය සාමාන්‍යධිකාරී - මිලදී ගැනීම් - නිශ්ශංක මහතා විමසනු ලැබූ අවස්ථාවේදී එම ක්‍රීඩා භාණ්ඩ ක්‍රීඩා අමාත්‍යාංශයට ගෙන්වා ඇති භාණ්ඩ බවත් ඒවා ගබඩාව ඉදිරිපිට විජේවර්ධන මාවතේ නවතා ඇති ලොරි වල පටවා ඇති බවටත් දැනුම් දී ඇත. එදින සවස නිශාන්ත ගුණසේකර නමැති ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු පැමිණ එම භාණ්ඩ ඔහු භාරයට ගැනීමට ඉල්ලා සිටි බැවින්, නැවත නිශ්ශංක මහතාගෙන් විමසනු ලැබූ විට, පැමිණි පුද්ගලයාට භාණ්ඩ භාර දී එම ලේඛන නිශ්ශංක මහාතට එවන ලෙසට දන්වා ඇත.

ඒ අනුව ක්‍රීඩා දෙපාර්තමේන්තුවෙන් පැමිණි පුද්ගලයා වන නිශාන්ත ගුණසේකර භාණ්ඩ ලැයිස්තුවක් සකස් කර අත්සන් තබා භාණ්ඩ භාරගෙන පැමිණිලිකරුට එම ලැයිස්තුව භාර දී ඇති අතර පැමිණිලිකරු එම ලේඛන අංජන නිශාන්තට යවා ඇත.

2014 නොවැම්බර් මුල සිට 2014 දෙසැම්බර් මුල දක්වා කාලය තුළ කන්ටේනර් 17 ක් පැමිණ ඇති අතර පැමිණිලිකරු අවස්ථා දෙකකදී එම භාණ්ඩ වලට අදාළ ලැයිස්තු භාර ගෙන ඇත.

මෙම කාලය මැතිවරණයට ආසන්නව තිබු කාල වකවානුවකි. පැමිණිලිකරු ගබඩා භාරකරු ලෙස අමාත්‍ය ජෝන්ස්ටන් ප්‍රනාන්දු සමඟ සමීපව කටයුතු කර ඇති අතර ඒ හේතුවෙන් පැමිණිලිකරුට ජොනිගේ බට්ටා වැනි අන්වර්ථ නාමයක් ලැබී ඇත.

2015 නව රජය පත්වීමෙන් පසුව සතොස ආයතනය අමාත්‍ය ජයවික්‍රම පෙරේරා මහතා යටතට පත්විය. එහි සභාපතිවරයා වශයෙන් කිරාන් අත්පත්තු පත් කර ඇති අතර පැමිණිලිකාර කමින්ද හර්ෂජිත් 2015 මැයි මස ජ්‍යෙෂ්ඨ විධායක මෙහෙයුම් යන තනතුරු නාමය සහිතව ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශය වෙත ස්ථානමාරු කර ඇත. ඒ බව සනාථ කෙරෙන ලේඛනය පැ.05 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව පැමිණිලිකරු 2015.05.17 වන දින ප්‍රධාන කාර්යාලයේ රාජකාරි වාර්තා කර ඇත.

2015.05.19 වන දින පැමිණිලිකරුව මූල්‍ය අපරාද විමර්ශන කොට්ඨාසයට කැඳවා ප්‍රකාශයක් සටහන් කර ගැනීමට පැමිණිලිකරු පැමිණි අවස්ථාවේදී, ඒකක 04 හි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රණසිංහ මුණගැසී ඇත. එහි දී “ මු තමා මිනිහා” යනුවෙන්

ප්‍රකාශ කර වෙනත් නිලධාරියෙකුට ප්‍රකාශ සටහන් කර ගැනීමට භාර කර ඇත. එම අවස්ථාවේ දී ඔවුන් පැමිණිලිකරුට ප්‍රකාශ කර ඇත්තේ "තෝ වගේ හාල්මැස්සන් අවශ්‍ය නැහැ තෝර මෝරු අවශ්‍ය" බව සඳහන් කරමින් මහින්දානන්ද අළුත්ගමගේ මහතා ඊට සම්බන්ධ බවට කටඋත්තර ලබා දෙන ලෙස බලපෑම් කර ඇත. එදින කටඋත්තර ලබා නොගෙන පසු දින නැවත පෙනී සිටින බවට දන්වා ඇති අතර එදින නිශාන්ත ගුණසේකර නැමැත්තා ද කැඳවා තිබී ඇත. පැමිණිලිකරු සහ නිශාන්ත ගුණසේකර යන දෙදෙනාට නැවත එදින තර්ජනය කර ප්‍රකාශ සටහන් නොකර ආපසු නිවසට යවා ඇති අතර පසු දින ද නැවත කැඳවා ඇත.

එදින පුබුදු ප්‍රදීපා නැමැති ආයතන සහායික සහ හර්ෂ මුදුන්කොටුව නැමැති වෙළඳ සහායකයා ද කැඳවා තිබී ඇති අතර වරාය අධිකාරියේ නිදහස් සේවක සංගමයේ ලේකම් වැලිගම ද කැඳවා තිබී ඇත. එදින පැමිණිලිකරුගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන ඇති අතර සටහන් කර ගත් ප්‍රකාශය කියවා බැලීමට ඉඩ නොදී පැමිණිලිකරුගේ අත්සන ලබා ගෙන ඇත. එදින සවස 6.00 ට පමණ පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන, එදිනම කොල්ලුපිටිය පොලිස් ස්ථානයට භාර දී ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගත්බව සනාථ කෙරෙන කුවිතාන්සිය පැ.06 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පසු දින නැවත කොල්ලුපිටිය පොලිස් ස්ථානයේ සිට මූල්‍ය අපරාධ කොට්ඨාසයට ගෙනවිත් පොලිස් පරීක්ෂක ඇන්ජලී විසින් නැවත ප්‍රකාශයක් ලබා ගෙන ඇත. එදින ලබා ගත් ප්‍රකාශයද කියවා බැලීමට පැමිණිලිකරුට අවස්ථාව ලබා නොදී ඇති අතර එම ප්‍රකාශයද නොකියවා පැමිණිලිකරුට අත්සන් කිරීමට සිදු වී ඇත.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ඒකක 4 ස්ථානාධිපති විසින් 2015.04.27 දිනින් බී 884/15 දරණ වාර්තාව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. එම බී වාර්තාවට අනුව පැමිණිලිකරුට එරෙහිව පැමිණිල්ලක් සිදු කර ඇත්තේ අංක 101, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ 03 ලිපිනයෙහි පිහිටුවා ඇති දූෂණ මර්ධන කමිටු කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් 2015.04.21 වන දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට ලිපියක් මගින් වන අතර එහි සඳහන් පරිදි ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 386, 389, 403 හා 454 සමග කියවෙන 459 යටතේ දඬුවම් ලැබිය හැකි වරදවල් සිදු කර ඇති බවට චෝදනා පැමිණිලිකරුට එරෙහිව නඟා ඇත. එම වාර්තාව පැ.09 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉන්පසුව 2015.05.22 දිනෙන් යුතුව බී 884/15 දරන මුල් බී වාර්තාවට වැඩිදුර වාර්තාවක් ගොනු කර ඇත. එකී වැඩිදුර වාර්තාවට අනුව පැමිණිලිකරු වශයෙන් සඳහන් කර ඇත්තේ අංක 108, යෝර්ක් වීදිය, කොළඹ 01 ලංකා සතොස ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර විගණක සුමනසිරි ඇපාගේ යනුවෙනි. මෙම බී වාර්තාව 7 වශයෙන් සලකුණු කර ඉදිරිපත්කර ඇත.

ඒ අනුව පැ. 07 බී වාර්තාවට සහ පැ. 09 බී වාර්තාවට අනුව පුද්ගලයින් දෙදෙනෙකු පැමිණිලිකරු වශයෙන් සඳහන් කර ඇත.

පැ. 7 බී වාර්තාවේ පැමිණිලිකරු වන සුමනසිරි ඇපාගේ විසින් පැමිණිලිකරුගේ නිවසට ලියා පදිංචි තැපැලෙන් එවන ලද ලිපියක් පැ.08 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී පැ.08 ලිපියට අනුව සුමනසිරි ඇපාගේ සඳහන් කර ඇත්තේ "මා විසින් FCID එකට කරපු පැමිණිල්ලක් නිසා ඔබ මෙම ගැටළුවට මැදිවූ බවට" යනුවෙන්

සඳහන් කර ඇති අතර එහිදි ඔහු "මවිසින් නොකරන ලද පැමිණිල්ලක් නිසා" යනුවෙන් ද සඳහන් කර ඇත. පැ. 8 ලිපියෙන් සුමනසිරි ඇපාගේ උත්සාහ කර ඇත්තේ ඔහු එවැනි පැමිණිල්ලක් මූලා‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට සිදු නොකළ බව පැමිණිලිකරුට දැන්වීමටය.

පැමිණිලිකරු 2015.05.22 වන දින අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු දින 35 ක් රක්ෂිත බන්ධනාගාරගතව සිට ඇති අතර ඉන් පසුව අධිකරණය මගින් ඇප මත මුදාහැර ඇත. එසේ මුදාහැරීම සිදු කර ඇත්තේ සතොස ආයතනය රජයේ ආයතනයක් ලෙස නොසැලකෙන බැවින් එම භාණ්ඩ සඳහා ගෙවූ මුදල් පොදු දේපල නොවන බවටත් අධිකරණය සලකා ඇති බැවිනි. එම ඇප නියෝගය පැ.10 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉන් පසුව පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්ෂණයක් සඳහා 2015.05.14 දින දරන චෝදනා පත්‍රයක් භාර කර ඇති අතර එකී චෝදනා පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ මූලික විමර්ශනයක් ද නොමැතිවය. එම චෝදනා පත්‍රය පැ.11 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු දිගින් දිගටම මූලික විමර්ශන පවත්වන ලෙසට ඉල්ලා ඇති අතර එසේ මූලික පරීක්ෂණයක් සිදු නොකර නැවත 2015.12.24 වන දින පැ.13 දරණ සංශෝධිත චෝදනා පත්‍රයක් භාර කර ඇත. කිරාන් අතපත්තු විසින් ඒක පුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් පත් කර විනය පරීක්ෂණයක් පවත්වා ඇතත් එහි තීරණය පැමිණිලිකරුට දැනුම් දී නැත. පැමිණිලිකරු විසින් සතොස ආයතනයේ සභාපති අමතන ලද ලිපිය පැ.14 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරුට කිසිදු පිළිතුරක් ලැබී නැති බැවින් ඔහු කම්කරු විනිශ්චය සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එකී පැමිණිල්ල පැ.16 ලෙසට ඉදිරිපත් කර ඇත. මෙම පැමිණිල්ල කම්කරු විනිශ්චය සභාවේ සාකච්ඡාවට ලක් කළ අවස්ථාවේ දී සතොස ආයතනය විසින් පැ.17 දරණ සේවය අත්හිටුවීමේ නියෝගය ලබා දී ඇත. ඉන්පසුව පැමිණිලිකරු නැවත පැමිණිල්ලක් කම්කරු විනිශ්චය සභාවට යොමු කර ඇති අතර එම පැමිණිල්ල විභාග කිරීමෙන් පසු ප්‍රකාශ කළ නියෝගය අනුව පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමට නියෝග කර ඇති අතර ඊට එරෙහිව අභියාචනයක් සතොස ආයතනය විසින් ඉදිරිපත් කර එය විභාග වෙමින් පවතී. කම්කරු විනිශ්චය සභාවේ නියෝගය පැ.18 ලෙසට ඉදිරිපත් කර ඇත.

මෙම ක්‍රියාවන් කරන කොට ගෙන පැමිණිලිකරු ඉතාමත් අසහනකාරී තත්ත්වයකට පත්ව ඇති අතර රැකියාව නොමැතිව ඉතාමත් අසීරු තත්ත්වයකට පත්ව ඇත. තවද පැමිණිලිකරු සම්බන්ධයෙන් පුවත්පත් වල පළ වූ වාර්තාවක් පැ.19 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙය හැර ඉදිරිපත් කරන ලද පැ. 7 සහ පැ. 9 දරණ බී වාර්තා වල පැමිණිලිකරුට එරෙහිව කිසිදු සාක්ෂියක් හෝ කිසිදු සාක්ෂිකරුවෙකුගේ නමක් ඉදිරිපත් කර නොමැත. පැමිණිලිකරු සඳහන් කලේ මහින්දානන්ද අලුත්ගමගේ මහතාගේ නම පොලිස් නිලධාරීන් සඳහන් කළ ආකාරයට ප්‍රකාශ කළේ නම් ඔහුට මේ අන්දමින් රක්ෂිත බන්ධනාගාර ගත වීමට සිදු නොවන බවයි.

මූල්‍ය විමර්ශන කොට්ඨාසයේ ඒකක අංක 4 ස්ථානාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පැ.7 සහ පැ.9 බී වාර්තාවල පැමිණිලිකරුට එරෙහිව පොදු දේපළ පනත යටතේ චෝදනා නැගීම සඳහා උපදෙස්

සොයන බවට සඳහන් කර ඇතත් මහේස්ත්‍රාත්වරයා ඇප නියම කිරීමේදී සඳහන් කර ඇත්තේ ඉදිරිපත් වී ඇති කරුණු අනුව අදාළ දේපළ පොදු දේපල පනතට නොවැටෙන බවය. සතොස ආයතනය පුද්ගලික ආයතනයක් බැවින් එහි දේපල පොදු දේපල ලෙසට සැලකිය නොහැකි බවට තීරණය කර ඇත.

ප්‍රශ්න ගත භාණ්ඩ සතොස ආයතනය විසින් ආනයනය කර ඇත්තේ ක්‍රීඩා අමාත්‍යාංශයට ලබාදීමට වන අතර එම භාණ්ඩ එපරිදි සතොස ආයතනය විසින් ක්‍රීඩා අමාත්‍යාංශයට භාරදී ඇත. එබැවින් එම භාණ්ඩ සම්බන්ධයෙන් සාවද්‍ය පරිහරණය හෝ එවැනි පරිහරණයක සේයාවක්වත් දක්නට නොමැත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ. 1 සිට පැ. 19 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020.11.24

## 9 .XX

පැමිණිලි අංක - 04/2020

පැමිණිලිකාර - පොල්පාගොඩ ගමගේ තිළිණ සජෝත වින්සන්ට්

ලිපිනය - නො: 376, ගොඩිගමුව, මහරගම

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින් වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. SIU විශේෂ විමර්ශනය ඒකකයේ ස්ථානාධිපති සාගර කරසිංහආරච්චි
2. පොලිස් සැරයන් 59622 විජේසිංහ

### තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර පොල්පාගොඩ ගමගේ තිළිණ සජෝත වින්සන්ට් යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, පොල්පාගොඩ ගමගේ තිළිණ සජෝත වින්සන්ට් මහතාට එරෙහිව බී නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 1912/16 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර පොල්පාගොඩ ගමගේ තිළිණ සජෝත වින්සන්ට් නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම පැමිණිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC 555/2019 දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

6. දේශපාලන පළිගැනීමකට ලක්ව අසත්‍ය චෝදනා මත මහාධිකරණය ඉදිරියේ විත්තිකරුවකු කරන ලද පැමිණිලිකාර පොල්පාගොඩ ගමගේ තිළිණ සජෝත වින්සන්ට් මහතාට අහිමි කරන ලද රැකියාව සහ ඔහුගේ රැකියාව අහිමි කළ දිනයේ සිට ඔහුට හිමි විය යුතුව තිබූ හිඟ වැටුප්. උසස්වීම් සහ චේතනාදීකයන් නැවත ලබා දී ඔහුගේ රැකියාවේ ඔහු මෙම අවස්ථාව වන විට හිමිකම් ලබන ස්ථානයෙහි නැවත පිහිටුවීම සලකා බැලීම සුදුසු බව.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පොල්පාගොඩ ගමගේ තිළිණ සජෝත වින්සන්ට් මහතා විසින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු ශ්‍රී ලංකා අධිකරණ සේවයේ මහේස්ත්‍රාත්වරයෙකු වශයෙන් සේවය කරමින් සිටියදී ඔහු විසින් මිලදීගෙන ඇති දැඩි කළ අලියෙකු සම්බන්ධයෙන් මෙම පැමිණිල්ලට අදාළ ප්‍රශ්නය පැන නැගී ඇත. මෙම පැමිණිල්ල පිළිබඳ විමර්ශනයේ දී පැමිණිලිකරු වන පොල්පාගොඩ ගමගේ තිළිණ සජෝත වින්සන්ට් මහතාගේ සාක්ෂිය ද ඇතුළුව සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ සාක්ෂි මෙහෙයවා ඇත.

පැමිණිලිකරු සාක්ෂි දෙමින් සඳහන් කළේ ඔහු නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව ශ්‍රී ලංකා අධිකරණ සේවයේ අධිකරණ නිලධාරියෙකු ලෙසට 2008 අගෝස්තු පළවන දින සිට සේවයට බැඳුණු බවය. ඔහු මහේස්ත්‍රාත්වරයෙකු වශයෙන් පත්වීමේ ලිපිය පැ.1 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඔහු අධිකරණ සේවයේ ස්ථිර කිරීමේ ලිපිය පැ.2 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඔහු මෙසේ මහේස්ත්‍රාත්වරයෙකු වශයෙන් සේවයේ යෙදෙමින් සිටියදී 2016 ජුනි 8 වන දින ඔහුගේ සේවය අත්හිටුවා ඇත. සේවය අත්හිටුවීමේ ලිපිය පැ.3 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

තමන්ගේ සේවය අත්හිටුවීමට අදාළ කරුණු පැමිණිලිකරු මෙසේ විස්තර කර ඇත. පැමිණිලිකරු 2013 වර්ෂයේදී කොටුව මහේස්ත්‍රාත්වරයා ලෙස සේවය කර ඇත. එසේ සේවය කරමින් සිටින අතරතුර 2015 ජනවාරි මස 8 වන දින ජනාධිපතිවරණයෙන් පසුව

නව රජයක් පිහිටුවීම සිදු වී තිබේ. 2015 ජනාධිපතිවරණයෙන් පසුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේදී ආන්දෝලනාත්මක නඩු ගණනාවක් විභාගයට ගැනීම සිදුවී ඇත. ඉන් පළමු වන නඩුව තිස්ස අත්තනායක මහතාට එරෙහිව පවරන ලද බී 2618/14 දරණ කූඨ ලේඛන සම්බන්ධ නඩුවය. තිස්ස අත්තනායක මහතා අත්අඩංගුවට ගෙන කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම අවස්ථාවේදී රාජකාරි ආවරනය කළ වැඩබලන මහේස්ත්‍රාත්වරයා විසින් තිස්ස අත්තනායක මහතා දින දහයකට රක්ෂිත බන්ධනාගාරයට පත් කර ඇත. එම දින දහයෙන් පසුව එම නඩුව පැමිණිලිකරු ඉදිරියේ කැඳවනු ලැබූ අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශයේ ස්ථානාධිපති සහ තවත් විමර්ශන නිලධාරියෙකුත්, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයෙකු පැමිණ ඔහුගේ නිල මැදිරියේ දී ඔහු මුණගැසී තිස්ස අත්තනායක මහතාට ඇප ලබා නොදෙන ලෙසට ඔහුගෙන් ඉල්ලීමක් කර ඇත. 2015 ජනවාරි 9 සහ මාර්තු 20 අතර දිනයක දී මෙම සිදුවීම සිදු වූ බව පැමිණිලිකරු සඳහන් කළේය. පැමිණිලිකරුගේ නිල මැදිරියට පැමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරියා පැමිණිලිකරුට සඳහන් කර ඇත්තේ 2015 නව රජයේ අගමැති රනිල් වික්‍රමසිංහ මහතා මෙම නඩුවට විශේෂ උනන්දුවක් දක්වන බවත් එබැවින් තිස්ස අත්තනායක මහතා රක්ෂිත බන්ධනාගාරයේ තබන ලෙසටය. එවැනි විශේෂ උනන්දුවක් තමන්ට නොමැති බව පැමිණිලිකරු විමර්ශන නිලධාරියාට පවසමින් මෙම නඩුව විවෘත අධිකරණයේදී කැඳවා කරුණු විමසා තිස්ස අත්තනායක මහතා ඇප මත මුදා හැර ඇත.

මෙලෙස තිස්ස අත්තනායක මහතා ඇප මත මුදා හැරීමෙන් පසුව එදින රාත්‍රියේ සහ ඊට පසු දින රජයේ ජනමාධ්‍යවල තිස්ස අත්තනායක මහතා ඇප මත මුදා හැරීම සඳහා සිදුකරනු ලැබූ නියෝගය පිළිබඳව විවේචනයන් සිදුවී ඇත. 2015 රජයට සම්බන්ධ දේශපාලඥයින් වන රාජිත සේනාරත්න, චම්පික රණවක සහ සිවිල් සංවිධාන නියෝජිතයින් වන දඹර අමිල හිමි, උලපනේ සුමංගල හිමි වැනි ස්වාමීන් වහන්සේලා ද පුරවැසි බලය නැමැති සංවිධානයේ සමන් රත්නප්‍රිය වැනි පුද්ගලයින් ද තිස්ස අත්තනායක මහතා ඇප මත මුදා හැරීමේ නියෝගය විවේචනය කරමින් සාකච්ඡා පවත්වා ඇති අතර පුවත්පත් සහ මාධ්‍ය සාකච්ඡා පවත්වමින් පැමිණිලිකරු දැඩි විවේචනයකට ලක්කර ඇත.

ඉහත සඳහන් නඩුවට දින කිහිපයකට පසුව චම්පික රණවක අමාත්‍යවරයාගේ පැමිණිල්ලක් මත b 452/2015 දරණ නඩුව පැමිණිලිකරු ඉදිරියේ කැඳවා ඇත. මෙම නඩුවේ සැකකරුවන් ලෙස එවකට ගල් අඟුරු සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය නම් කර තිබී ඇත. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනුලැබූ තීරණයක් මත ගල් අඟුරු සමාගමට විශාල අලාභයක් සිදුවී ඇති බැවින් පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි රජයේ අධිනීතිඥවරයා අධිකරණයෙන් ඉල්ලා ඇත්තේ ගල් අඟුරු සමාගම ලබා ඇති අලාභයට එහි අධ්‍යක්ෂක මණ්ඩලය වගකිව යුතු බවත්, ගල් අඟුරු සමාගම රජයේ ආයතනයක් බැවින් පාඩු වී ඇති මුදල රජයේ මුදල් වන නිසා පොදු දේපළ පනත යටතේ අධ්‍යක්ෂක මණ්ඩලය ඇප මත මුදාහැර නොහැකි බැවින් රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙසටය. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු තම සාක්ෂියේදී සඳහන් කළේ තමන් ඉදිරිපත් කරනු ලැබූ කරුණු හොඳින්

සලකා බැලූ බවත්, අධිකරණයට ඉදිරිපත් කරතිබූ අධ්‍යක්ෂක මණ්ඩලයේ එක් සාමාජිකයෙක් ඊට අවුරුද්දකට පෙර අධ්‍යක්ෂක මණ්ඩලයෙන් ඉල්ලා අස්වී තිබූ බවත්, ඔහු වයෝවෘද්ධ පුද්ගලයකු බවත්, එසේම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගෙන තිබූ තීරණය කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව ගෙන තිබූ තීරණයක් බවත්, එම වකවානුවේදී විෂයභාර අමාත්‍යවරයා වූයේ චම්පික රණවක මහතා බවත්, පාඨලී චම්පික රණවක අමාත්‍යවරයා මුලසුන දරණ රැස්වීමක් කැඳවා තිබූ බවත්, තමන් විෂයභාර අමාත්‍යවරයා බැවින් අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් ඒ සඳහා අවශ්‍ය නොවන බවත් සඳහන් කරමින් අමාත්‍යවරයා විසින් ශණුදෙනුව ක්‍රියාත්මක කර ඇති බවත්ය. මෙම තත්ත්වය සලකා බලා තමන් අධ්‍යක්ෂක මණ්ඩලය ඇප මත මුදා හැරීම සඳහා නියෝග කළ බව පැමිණිලිකරු සඳහන් කළේය. මෙම ඇප නියෝගය සිදු කිරීමෙන් පසුවද පෙර පරිදිම රජයේ මාධ්‍ය වල සහ බාහිර මාධ්‍ය  සාකච්ඡා පවත්වමින් තමන් දැඩි ලෙස විවේචනයට භාජනය කළ බව ද පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය.

මීට අමතරව කොටුව මහේස්ත්‍රාත් අධිකරණය තවත් එවැනිම ආන්දෝලනාත්මක නඩුවක් වූ බී 732/09  නඩුවේ කරුණු අනුව, නාවික හමුදා නිලධාරීන් විසින් ළමුන් එකොළොස් දෙනෙක් පැහැරගෙන ගොස් අතුරුදන් කර ඇත. මෙම නඩුවේ විමර්ශන භාර නිලධාරියා වූයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මහතාය. ඔහු වරින් වර විවිධ බී වාර්තා ඉදිරිපත් කරමින් නාවික හමුදාවේ උසස් නිලධාරීන්ට එරෙහිව කිසිදු ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව විවිධ නියෝග ආයාචනය කර ඇත. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වාට අවශ්‍යව තිබී ඇත්තේ විවිධ

චෝදනා නගමින් නාවික හමුදාවේ උසස් නිලධාරීන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීම සඳහා අධිකරණයෙන් නියෝග ලබා ගැනීමය. එසේ වුවත් පැමිණිලිකරු පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වාගේ අවශ්‍යතාවයට නියෝග නිකුත් කිරීම සඳහා ක්‍රියා කර නොමැත. පැමිණිලිකරු සඳහන් කළේ මෙම නඩුව අධිකරණයේ කැඳවනු ලැබූ අවස්ථාවේදී විදේශ දූත මණ්ඩල සාමාජිකයින් අධිකරණයේ අසුන්ගෙන සිටි බවත් රාජ්‍ය නොවන සංවිධානවල පිරිස් පැමිණ අධිකරණය ඉදිරියේ බලපෑම් කරන අයුරින් පිකටින් ව්‍යාපාරයක යෙදී සිටි බවත්ය.

පැහැරගත් ළමුන්ගේ දෙමව්පියන් යැයි කියා ගනු ලැබූ ද්‍රවිඩ ජාතික පිරිසක්ද මෙම පිකටින් වලට සම්බන්ධව දැන්වීම් පුවරු ඔසවාගෙන සිට ඇත. ඊට අමතරව එවකට එංගලන්ත තානාපතිවරයා පැමිණිලිකරු වෙත ලිඛිතව ලිපියක් ඒවමින් මෙම නඩුවේ කටයුතු කළ ආකාරය සම්බන්දයෙන් ඔහුට දැනුම් දීමක් සිදු කර ඇත.

තමන්ට ලැබුණ එම ලිපිය බැහැර කරමින් එම අවස්ථාවේදී පැමිණිලිකරු විවෘත අධිකරණයේදී තමන්ට එම ලිපිය රැගෙන ආ පුද්ගලයා අමතමින් "මේක එංගලන්තයේ කොලනියක් නොවෙයි තමුන්ලට ඕන විදියට නඩු අහන්න මේක ස්වාධීන අධිකරණයක් තියෙන රටක්" යනුවෙන් ප්‍රකාශ කර ඇත. මෙම සිද්ධියෙන් පසුවද පැමිණිලිකරුට එරෙහිව රජයේ මාධ්‍ය වල සහ බාහිර මාධ්‍ය සාකච්ඡා පවත්වමින් පැමිණිලිකරු විවේචනයට ලක් කර ඇත.

මෙම නඩු තුනෙන් පසුව පාර්ලිමේන්තුව තුළ විශේෂයෙන් පී හැරිසන්, පාඨලී චම්පික රණවක, සහ රාජිත සේනාරත්න යන ඇමතිවරුන්ට සිවිල් සංවිධානවල නියෝජිතයින්ද, ලංකාදීප පුවත්පත සහ රාවය

පුවත්පත පුද්ගලික මට්ටමින් පැමිණිලිකරු විවේචනය කරමින් ඔහුට අභූත චෝදනා නගමින් ඔහු සහ ඔහුගේ පවුලේ අය අපහසුතාවයට පත් කළ බව පැමිණිලිකරු සඳහන් කළේය.

මෙම නඩු තුනෙහි නියෝගයන් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව 2015.03.22 දින පැමිණිලිකරු අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයට ස්ථාන මාරු කර ඇත. එවකට අග්‍රවිනිශ්චයකාර ශ්‍රී පවන් මැතිතුමා පැමිණිලිකරු අග්‍ර විනිශ්චකාර නිල මැදිරියට කැඳවා මෙසේ ප්‍රකාශ කර ඇත;

> (උපුටා ගැනීම) "තිළිණ ඔයා මේ ආණ්ඩුවෙන් ඉදිරිපත් කරන සැකකරුවන්ට ඇප දෙනවා කියලා ලොකු බලපෑමක් තියෙනවා රජයෙන්. රජයේ ඇමැතිවරු කිහිප දෙනෙක්ම මට මේ සම්බන්දව කතා කළා ඔයාව මෙතැනින් ඉවත් කරන්න කියලා. තිළිණ කැමති සේවා ස්ථානයක් කියන්න" (උපුටා ගැනීම අවසන්).

ඉන්පසුව පැමිණිලිකරු අග්‍රවිනිශ්චයකාර තුමාගේ නිල මැදිරියෙන් පැමිණ ඇත. ඉන්පසු අවස්ථාවක ඔහු නැවත කැඳවා "තිළිණව දුර දාන්න බැහැ දුර සේවය කරල තියෙනවා මීට පෙර" යනුවෙන් ඔහුට ප්‍රකාශ කර ඇත.

විනිසුරු චන්ද්‍රා ඒකනායක මැතිණිය සමග අපි කතා කළා. එතුමියට මම යෝජනා කළේ තිළිණට වඩා කණිෂ්ඨ අය අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේ ඉන්නවා ඒ නිසා තිළිණ අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයෙන් උසාවියට එන්න වැඩ කරන්න කියලා. ඒ අනුව 2015 මාර්තු විසිවෙනි දින තරුණ ස්ථානමාරු ලිපිය පරිදි

පැමිණිලිකරු ද 2015-04-01 දින සිට අලූත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයෙහි සේවයට වාර්තා කර ඇත.

අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 9 දරණ උසාවියේ පැමිණිලිකරු සේවය ආරම්භ කර ඇත. එම කාලසීමාවේදී අංක 9 අධිකරණයේ එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට කාන්තාවක් විසින් එල්ල කරන ලද චෝදනා සම්බන්ධ කර ගත් නඩුවක් පැවතී ඇති අතර එම නඩුව සම්බන්ධව සහකාර පොලිස් අධිකාරී ගුණතිලක, අයි.ටී.එන් රූපවාහිනියේ සුධර්මන් රදලියගොඩ, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හිටපු නිලධාරීන් ඇතුළු පුද්ගලයින් ගණනාවක් රක්ෂිත බන්ධනාගාරයේ පසු වී ඇත. පැමිණිලිකරු අංක 9 මහේස්ත්‍රාත් අධිකරණයේ සේවය ආරම්භ කිරීමෙන් පසු ඔහු ඉදිරියේ මෙම නඩුව කැඳවනු ලැබූ අවස්ථාවේදී කරුණු විමසා බලා රක්ෂිත බන්ධනාගාරගතව සිටි පිරිස් ඇප මත මුදා හැරීමට නියෝග කර ඇත. මෙම නඩුව ඉන් පසු අවස්ථාවක අභියාචනාධිකරණයේදී සමථයකට පත්ව ඇත.

ඉන්පසුව අමාත්‍ය රාජිත සේනාරත්න මහතාගේ පුතෙකු විසින් බාලවයස්කාර දැරියක පැහැරගෙන ගොස් රඳවාගෙන තබාගෙන සිටින බවට සිදු කරන ලද පැමිණිල්ලක් මත පවරනු ලැබූ නඩුවක් පැමිණිලිකරු ඉදිරියේ අංක 9 මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවා ඇත. පැහැරගැනීමට ලක්වූ දැරියගේ දෙමාපියන් විසින් සිදුකළ පැමිණිල්ලක් මත මෙම නඩුව ආරම්භ වී ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් පරිවාස නිලධාරී වාර්තාවක් කැඳවන ලෙසට පැමිණිලිකරු නියෝග කර ඇත. ඉන්පසු දිනයේ අධිකරණය ඉදිරියේ පෙනී සිටි පරිවාස නිලධාරිනිය, තමන්ට වාර්තාව සකස් කිරීම සඳහා

දැරිය මුණගැසීමට යාමට ඉඩ ලබා නොදෙන බවත්, අමාත්‍ය රාජිත සේනාරත්න මහතා තර්ජනය කරන බවත්, එබැවින් පරිවාස වාර්තාවක් අධිකරණය වෙත ලබා දුනහොත් තමන්ට ඉන් ප්‍රශ්නයක් ඇති වන බවත් මහේස්ත්‍රාත්වරයාට ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරු සඳහන් කළේ ඊට පසුදින එම පරිවාස නිලධාරිනිය වෙනත් ස්ථානයකට සේවා ස්ථාන මාරු කර තිබූ බවය. ඊට අමතරව අමාත්‍ය රාජිත සේනාරත්න මහතා මාධ්‍ය මගින් තමන්ට තර්ජනය කළ බවද පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

පැමිණිලිකරු සඳහන් කළේ දින කීපයක් තිස්සේ මෙම නඩුව පදනම් කරගෙන තමන්ට එල්ල කළ පීඩනය, ව්‍යංග තර්ජන සහ ඔහුට එරෙහිව ඉදිරිපත් කළ අභූත චෝදනා මෙන්ම නීතිඥවරුන් අධිකරණය ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් හැසිරුණු ආකාරය අනුව තවදුරටත් මෙම නඩුව තමන් ඉදිරියේ විභාග කිරීම සම්බන්ධයෙන් බියක් ඇති වුණු බවය. ඒ අනුව මෙම නඩුව ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත යවනු ලැබූ බව ඔහු වැඩිදුරටත් සඳහන් කළේය.

අංක 9 මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ ලඝු නොවන නඩු වල පරීක්ෂණ සිදු කෙරුණු බැවින් මන්ත්‍රී රවිරාජ් ඝාතන නඩුවේ මූලික සාක්ෂි විභාගය ද පැමිණිලිකරු ඉදිරියේ සිදුවී ඇත. මෙම නඩුවේ අංකය බී. 7439/9/16 වේ. මෙම නඩුවේදී ද නාවික හමුදා නිලධාරීන් කිහිපදෙනෙකු චූදිතයින් ලෙසට නම් කර තිබී ඇත. මෙම නඩුවේ සාක්ෂි ඉතා දුර්වල මට්ටමක තිබී ඇති අතර රජයේ ප්‍රධාන සාක්ෂිකරු මනම්පේරි ඉතා දුර්වල සාක්ෂිකරුවකු වූ බවත්, ඔහු ප්‍රථමයෙන් ප්‍රකාශ තුනක් ලබාදී තිබූ බවත්, එම ප්‍රකාශ තුනම එකිනෙකට පටහැනි බවත්, සම්පූර්ණයෙන්ම පරස්පර බවත්, එබැවින් එවැනි දුර්වල සාක්ෂි

අපරාධ චෝදනාවක් සඳහා ප්‍රමාණවත් නොවන බවත්, ප්‍රධාන සාක්ෂිකරුවන් වශයෙන් කැඳවන ලද ප්‍රීතිරාජ් මනම්පේරි නැමැත්තා හිටපු පොලිස් නිලධාරියෙකු බවත්, ඔහුට එරෙහිව බරපතළ අපරාධ රැසකට අධිචෝදනා දහයකට වඩා ගොඩනගා ඉදිරිපත් කර තිබූ බවත්, මංකොල්ලකෑම්, ගංජා ළඟ තබා ගැනීම වැනි අපරාධ නඩු වල විත්තිකරුවෙකුව සිටි බවත් ඒ හේතුවෙන් සාක්ෂිකරුගේ සාක්ෂිය ප්‍රමාණවත් නොවූ බවත් පැමිණිලිකරු සඳහන් කළේය. මෙම නඩුවේ විමර්ශනය තමන් ඉදිරියේ පවත්නා අවස්ථාවේදීද පෙර පරිදිම අලුත්කඩේ උසාවි සංකීර්ණය ඉදිරිපිට දැන්වීම් පුවරු ඔසවාගෙන තමන්ට එරෙහිව පිකටින් ව්‍යාපාරයක් පැවතුණු බවත් රවිරාජ් ඝාතනයේ මහ මිනීමරුවන් ටික නිදහස් කිරිමට සූදානම් වන බවට සිවිල් සංවිධාන නියෝජිතයින් තමන්ට එරෙහිව අභූත චෝදනා නගන ලද බවත් සඳහන් කළේය.

මෙම සිද්ධීන් වලින් පසුව පැමිණිලිකරු හොර අලියෙක් ළඟ තබාගෙන සිටින බවට චෝදනා එල්ල කරමින්, ඔහුට මෙම නඩුව ඇසීමට නොහැකි තත්ත්වයක් උදා කළ බවත්, කෙසේ වෙතත් තමන් රවිරාජ් ඝාතන නඩුව පිළිබඳ වැඩිදුර විභාගය මහාධිකරණයට තැබූ බවත් සඳහන් කළේය.

අලියා ළඟ තබා ගැනීමේ සිද්ධිය පිළිබඳ කරුණු අධිකරණය වෙත බී 23073/15 දරණ වාර්තාව මගින් ඉදිරිපත් කරන ලදී. මෙම නඩුවට අදාල අලි පොත නැතිවීම පිළිබඳව නඩුවේ මුල් පැමිණිලිකරු වූයේ වනජීවී අමාත්‍ය වසන්ත සේනානායක මහතාය . ඔහු විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් පදනම් කරගෙන පරීක්ෂණ ආරම්භ කර කරුණු උක්ත බී වාර්තාව මගින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත

වාර්තා කර ඇත. කැලෙන් අල්ලාගත් සැකසහිත අලි 55 දෙනෙකු පමණ සිටින බවට ලැයිස්තුවක් සමග මෙම බී වාර්තාවේ සඳහන් කර ඇත. එම ලේඛනය පැ. 4 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම බී වාර්තාවේ පැමිණිලිකරු සම්බන්ධ ප්‍රශ්න සහගත අලියා ගැන සඳහනක් නොමැති වුවත් ඔහුගෙන් ප්‍රකාශයක් ලබාගැනීමට අවශ්‍ය බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කළ බැවින් තමන්ගේ නිල මැදිරියට පැමිණි නිලධාරීන් ප්‍රකාශයක් සටහන් කරගත් බව සඳහන් කළේය. ඉන් අනතුරුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව උත්සාහ දරණ බවටත්, පැමිණිලිකරු තම නිල රථයෙන් අධිකරණයට පැමිණිමේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔහු අත්අඩංගුවට ගැනීමට උත්සාහ කරන බවටත් තොරතුරු අනාවරණය වී ඇත. මේ පිළිබඳව එවකට ප්‍රධාන මහේස්ත්‍රාත්වරයෙකුව කටයුතු කළ ගිහාන් පිලපිටිය මහතා ද පැමිණිලිකරුට ඒ පිළිබඳව දැනුම් දී ඇත. (2020.02.20 - පිටු අංක 23)

මේ සම්බන්ධයෙන් තමන්ට එරෙහිව සැලසුම් සහගත ලෙස පාර්ලිමේන්තුවෙත්, ජනමාධ්‍ය වලත් විවේචන සහ පහර ගැසීම් සිදුකළ බවත්, තමාගේ නඩුව සම්බන්ධයෙන් නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් දිලිප පීරිස් මහතා  අධිකරණයට ඉදිරිපත් කරන කරුණු ඊට පෙර දින මාධ්‍ය වල පළ වූ බවත්  පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය. ඉන්පසුව බී 1912/16 වාර්තාව නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරමින් කරුණු වාර්තා කර ඇත.  මෙම ලේඛනය පැ.5 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

මෙලෙස කරුණු වාර්තා කිරීමෙන් පසුව පැමිණිලිකරුගේ අලියාගේ මුල් හිමිකරු වන චන්ද්‍රරත්න යටවර සහ වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනකු සැකකරුවන් ලෙස මුලින්ම නම් කර ඇත. මුල්ම බී වාර්තාවේ පැමිණිලිකරුගේ නම සඳහන් කර තිබී නොමැති අතර ඉන්පසුව ඉදිරිපත් කළ දෙවැනි බී වාර්තාවෙන් පැමිණිලිකරු සැකකරුවෙකු ලෙසට නම් කර තිබි ඇත. පැමිණිලිකරු සැකකරුවෙකු ලෙසට බී වාර්තාවෙන් නම් කිරීමත් සමග ඔහු ස්වෙච්ඡාවෙන්ම අධිකරණයට ඉදිරිපත්වී කරුණු ඉදිරිපත් කර ඇප මත මුදාහැරීමට අධිකරණ නියෝග ලබාගෙන ඇත.

පැමිණිලිකරුගේ අලියාගේ මුල් හිමිකරු වන චන්ද්‍රරත්න යටවර මෙම අලියා මුලින්ම 2012 මාර්තු 27 වන දින ලියාපදිංචි කර ඔහුගේ නමට බලපත්‍ර අංක 334 ලබාගෙන ඇත. චන්ද්‍රරත්න යටවර මහතා නමින් නිකුත් කරන ලද අංක 334 අලියෙකු ළඟ තබා ගැනීමේ බලපත්‍රය පැ.6 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. වාර්ෂික බලපත්‍රය පැ.7 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම අලියා යටවර නමින් ලියාපදිංචි කිරීම සඳහා අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇත්තේ 2008 නොවැම්බර් මස 12 වන දින දීය. එම අයදුම් පත්‍රය අනුව පැ.6 සහ 7 දරණ ලියාපදිංචි කිරීමේ සහතිකය සහ වාර්ෂික බලපත්‍රය නිකුත් කර ඇත.

යටවර මහතා අලියා ලියාපදිංචි කරන අවධියේදී පැමිණිලිකරු ඔහු දැන හඳුනාගෙන තිබී නොමැත. පැමිණිලිකරුගේ පවුලේ අය පිනට දහමට ලැදි අය බවත්, මහරගම බෙල්ලන්විල රජ මහා විහාරස්ථානයේ සහ කෝට්ටේ රජ මහා විහාරස්ථානයේ ද, පිළියන්දල ධර්ම ශාස්ත්‍රෝදය පිරිවෙන හා සම්බන්ධකම් තිබූ බවත්, එම පන්සල්

වල සිදු කෙරෙන පෙරහැර වලට විශේෂ දායකත්වයක් දැරූ බවත්, එම පෙරහැර වලට රැගෙන එන අලි ඇතුන් තමන්ගේ නිවාස භූමියේ රඳවා කෑම බීම ලබාදුන් බවත්, විශේෂයෙන් බෙල්ලන්විල රජ මහා විහාරස්ථානයේ වාර්ෂික පෙරහැරේ දළදා කරඬුව වැඩමවීම සඳහා ගෙන්වනු ලබන නැදුම්ගමුවේ ඇතා තම නිවාස භූමියේ රඳවා කෑම බීම ලබා දුන් බවත් සඳහන් කළේය. තම පවුලේ අය එවැනි බෞද්ධාගමික පසුබිමක් වටපිටාවක් මත ජීවත් වූ බැවින් පෙරහැරවල ගෙන යාම සඳහා අලියෙකු ඇති කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර අලියෙකු මිලදී ගත් බවත් ඔහු සඳහන් කළේය.

නඩුවට සම්බන්ධ මෙම අලියා මිලදී ගැනීම සඳහා චන්ද්‍රරත්න යටවර මහතා හඳුන්වා දුන්නේ කෝට්ටේ සාම ශ්‍රී ධර්ම මහා සංඝ සභාවේ අතිගරු අනුනායක බ්‍රාහ්මණගම රතනසිරි අනු නායක හාමුදුරුවන් විසින් බවත්, ඒ අනුව පසු අවස්ථාවක යටවර මහතා පැමිණිලිකරු මුණගැසී ඔහු සතු බලපත්‍ර දෙක පැමිණිලිකරුට ලබාදී ඇති අතර පැමිණිලිකරු එම බලපත්‍ර බත්තරමුල්ලේ පිහිටි වනජීවී දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂාකර බලා, ඒවා නිවැරදි ලේඛන බවට වනජීවී දෙපාර්තමේන්තුවෙන් අනුමත කිරීමෙන් පසුව අලියා මිලදී ගැනීම සඳහා පැමිණිලිකරු ක්‍රියා කළ බවත් සඳහන් කළේය.

චන්ද්‍රරත්න යටවර මහතා විසින් ඔහුගේ නමින් බලපත්‍රය ලබාගැනීම සඳහා මුල්වරට ඉදිරිපත් කරන ලද ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය සහ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය පැ.8 සහ පැ.9 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පැමිණිලිකරු විසින් අලියා මිලදී ගැනීමෙන් පසුව අලියා පැමිණිලිකරුගේ නමින් ලියාපදිංචි කිරීම සඳහා සහ වාර්ෂික බලපත්‍රය

ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. අලියා මිලදී ගත් කුවිතාන්සිය සමග පැමිණිලිකරු නමින් අලියා ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත්‍රය, දිවුරුම් පෙත්සමක් ද සමග වනජීවී දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. එම දිවුරුම් ප්‍රකාශය පැ.10 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. 2012 ජූලි මස 22 දින රුපියල් ලක්ෂ 30 ක මුදලකට පැමිණිලිකරු විසින් අලියා මිලදී ගෙන ඇත. අලියා පැමිණිලිකරු නමින් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ ලේඛනය පැ.11 වශයෙන්ද බලපත්‍රය පැ.12 වශයෙන්ද සලකුණු කොට ඉදිරිපත් කර ඇත.

2012 ජූලි මස 22 දින අලියා මිලදීගත් කුවිතාන්සිය ද සමග මුල් හිමිකරු වන යටවර මහතාගේ දිවුරුම් ප්‍රකාශයක් සහ පැමිණිලිකරුගේ නමින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර දෙකක් සමග අලියා පැමිණිලිකරුගේ නමින් ලියාපදිංචි කිරීමට අදාළ ලේඛන වනජීවී දෙපාර්තමේන්තුවට බාර දී ඇත. පැමිණිලිකරුගේ අයදුම්පත් වනජීවී දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂාකර බලනු ලබන අවස්ථාවේදී ඔවුන් අලියා ලියාපදිංචි කිරීමට අදාළ පැරණි ලේඛනද පරීක්ෂාකර බලා ඇත. එසේ පරීක්ෂාකර බලනු ලබන අවස්ථාවේදී අලියා ලියාපදිංචි කිරීමට අදාළව 2008 නොවැම්බර් මාසයේ යටවර මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ මුල් ලේඛන සමග ඉදිරිපත් කර තිබූ ග්‍රාම නිලධාරී සහතිකය ව්‍යාජ ග්‍රාම නිලධාරී සහතිකයක් බවට හඳුනාගෙන ඇත. ඒ අනුව 2012.10.26 වන දින වනජීවී දෙපාර්තමේන්තුව විසින් චන්ද්‍රරත්න යටවර මහතා නමින් නිකුත් කරන ලද අලියෙකු ළඟ තබා ගැනීමේ බලපත්‍රය දෝෂ සහගත යන පදනම මත අවලංගු කර ඇත. මේ සම්බන්ධයෙන් වනජීවී

දෙපාර්තමේන්තුව විසින් චන්ද්‍රරත්න යටවර මහතා වෙත එවන ලද ලිපියක් පැ.13 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු මෙම අලියා 2012 ජූලි මාසයේදී මිලදීගෙන තිබීමත්, එසේ මිලදී ගනු ලැබූ අවස්ථාවේදී මෙම අලියා ලියාපදිංචි කර තිබීමත්, ලියාපදිංචි කිරීමෙන් අනතුරුව වාර්ෂික බලපත්‍රයක් නිකුත් කර තිබීමත්, එම බලපත්‍රය මත පිහිටා පැමිණිලිකරු විසින් අලියා මිලදීගෙන තිබීමත්, අලියා මිලදී ගැනීමට ප්‍රථම බලපත්‍ර නිර්ව්‍යාජ බලපත්‍රද යන්න පැමිණිලිකරු විසින් වනජීවී දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂා කරවාගෙන තිබීමත්, ඒවා වනජීවී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බලපත්‍ර බවට සහතිකයක් පැමිණිලිකරුට ලබාදී තිබීමත්, ඒ මත විශ්වාසය තබා පැමිණිලිකරු විසින් අලියා මිලදී ගැනීම සිදු කර තිබීමත්, ඒ හේතුවෙන්ම පැමිණිලිකරු නිර්ව්‍යාජ ගැනුම්කරුවෙකු වීමත්, යන කරුණු කිසිවක් බලපත්‍රය අවලංගු කිරීමට ප්‍රථම වනජීවී දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් විසින් සලකා බලා නොමැත.

බලපත්‍රය අවලංගු කිරීමෙන් පසුව චන්ද්‍රරත්න යටවර මහතා විසින් 2012 නොවැම්බර් 20 දින වන සත්ත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ ආඥා පනතේ 56 (2) වගන්තිය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා වෙත සහ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනා ඉදිරිපත් කර ඇත. එම අභියාචනා දෙක පැ.14 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කරන ලදී.

පැමිණිලිකරු සඳහන් කළ අන්දමට අලි ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් තිබී නොමැත. ඔහු වැඩිදුරටත් සඳහන් කළේ අලි ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා පනතේ ප්‍රතිපාදන තිබුණේ වී නමුත්

හීලෑ අලි ඇතුන් ලියාපදිංචි නොකර පන්සල්වල දේවාලවල සහ පුද්ගලික අයිතියට සිටි බවත් ඊට අමතරව රජයේ අයිතිය යටතේ සත්වෝද්‍යානවල සිටි බවත්, ඒ අනුව අලි ඇතුන් ලියාපදිංචි කිරීම ක්‍රමවත් කිරීම සඳහා ලේඛන නොමැතිනම් දැනටමත් ලියාපදිංචි කර නොමැතිනම් අයදුම් පත්‍ර දෙකක් සමඟ දිවුරුම් පෙත්සමක් සහ අලියාගේ පින්තූරයක් ඉදිරිපත් කලයුතු බවත් අලියා ලියාපදිංචි කළ හැකි බවටත් ඒ අනුව ලියාපදිංචි කිරීම සිදු කළ බවත් ය. පනත අනුව අලි ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා රෙගුලාසි පනවා ඇත්තේ 1991 මැයි 14 දිනැති අංක 62/4 දරණ ගැසට් පත්‍රය මගිනි.

මෙම ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසිවල අලි ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කළ යුතු වූ ආකාරය, ඉදිරිපත් කළ යුතු ලේඛන, සහ ගාස්තු ආදිය ගැන සඳහන්ව ඇත.

පැමිණිලිකරුට එරෙහිව මහාධිකරණයේ අධිචෝදනා ගොනුක කර ඇත්තේද මෙම ගැසට් පත්‍රය මුල්කරගෙන ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රතිපාදන උල්ලංඝනය කිරීම පදනම් කරගෙනය. එසේ වුවත් මෙම ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි පාර්ලිමේන්තුව මගින් තවමත් අනුමත කර නැත. පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් නොකරන ගැසට් පත්‍රයේ පමණක් පළ කෙරුණු රෙගුලාසි උල්ලංඝනය කිරීම මත මහාධිකරණය ඉදිරියේ හෝ වෙනත් අධිකරණයක අධිචෝදනා හෝ චෝදනා ගොනු කළ හැකිද යන ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් පැන නැගේ. මෙම ගැසට් පත්‍රය පැ.15 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

එසේම චන්ද්‍රරත්න යටවර මහතා විසින් තවත් අභියාචනයක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. එම අභියාචනය පැ.16 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත.

චන්ද්‍රරත්න යටවර මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ පැමිණිලි විභාග කිරීම සඳහා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වූ එච්. එම්. ජී. එන්. කේ. කලුහෙන්දිවල මහතා පත් කර ඇත. ඔහු විසින් මෙම කාරණායට අදාළ සියලු පාර්ශවයන් කැඳවා ඔවුන්ගේ සාක්ෂි විභාග කර විමර්ශන වාර්තාවක් පිළියෙල කර නිර්දේශ ඉදිරිපත් කර ඇත. මෙම විමර්ශන වාර්තාව පැ.17 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී විමර්ශන වාර්තාවේ සඳහන් නිර්දේශ වලට අලියෙකු ලියාපදිංචි කිරීම සඳහා ඊට අදාල රෙගුලාසි ඇතුළත් යැයි සඳහන් කරන ගැසට් පත්‍රය අනුව අවශ්‍ය නොකෙරේ. ඒ අනුව පැමිණිලිකරු නිර්ව්‍යාජ ගැණුම්කරුවකු බැවින් ඔහු නමින් බලපත්‍රය නිකුත් කළ යුතු බවට ඉහත කී විමර්ශන නිළධාරීය නිර්දේශ කර ඇත.

කලුහෙන්දිවල මහතා විසින් සකස් කරන ලද පැ.17 දරණ විමර්ශන වාර්තාව අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමුකර ඇත. ලේකම්වම්වරයා විසින් නිර්දේශ කර එවකට එම අමාත්‍යාංශයේ කටයුතු භාරව සිටි අමාත්‍ය එස්.එම්. චන්ද්‍රසේන මහතා වෙත යොමුකර ඇත. චන්ද්‍රසේන අමාත්‍යවරයාද එම වාර්තාව අනුමත කර ඇත. වනජීවී අඥා පනතේ 56 වගන්තියේ (4) අනුව විමර්ශන වාර්තාව නිර්දේශ අමාත්‍යවරයා විසින් අනුමත කළ පසු එම නිර්දේශ අවසාන හා තීරණාත්මක වන්නේය. අමාත්‍යවරයා විසින් ඉහත කී නිර්දේශ අනුමත කිරීමේ ලේඛනය පැ.18 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර

ඇත. එහි අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශ සහ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතුළත් වේ.

විමර්ශනය වාර්තාවේ නිර්දේශවලට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබීමෙන් පසුව තමන්ගේ අලියා ලියාපදිංචි කර වාර්ෂික බලපත්‍රය ලබා ලබාගැනීම සඳහා නැවත ඉල්ලීමක් පැමිණිලිකරු විසින් වනජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2014-09-02 දින ඉදිරිපත් කර ඇත. මෙම ලේඛනය පැ.19 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. පැමිණිලිකරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් වනජීවී අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් ඉදිරියේදී කටයුතු පියවර ගන්නා බවට 2014 සැප්තැම්බර් 5 වන දින ලිපියෙන් දැනුම් දී ඇත. එම ලිපිය පැ.20 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කරන ලදී.

පැමිණිලිකරු විසින් මිලදී ගනු ලැබූ අලියා සඳහා වාර්ෂික බලපත්‍රය ලබා ගැනීමට පැමිණිලිකරු මේ අන්දමින් ක්‍රියා කර ඇතත් ඔහුගේ නමින් බලපත්‍රය නිකුත් කිරීම සිදුකර නොමැත.

අලියා මිලදී ගැනීමෙන් පසුව පැමිණිලිකරුගේ භාරයේ අලියා නොසිටියත් ඒ පිළිබඳ පරීක්ෂණ වලට සහාය දීම සඳහා අලියා වනජීවී දෙපාර්තමේන්තුවට භාරදීමට පැමිණිලිකරු කටයුතු කර ඇත.

මෙම නඩුව නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවනු ලැබූ අවස්ථාවේදී නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ දිලීප පීරිස් මහතා තමන්ට අගෞරව වන අයුරින් මහේස්ත්‍රාත් අධිකරණයේදී හිතාමතාම ප්‍රකාශයක් සිදුකළ බවත් මාගේ ගම් ප්‍රදේශය වන රාගම ප්‍රදේශයේ පිහිටි නුගේගොඩ මහේස්ත්‍රාත්

අධිකරණයටයේදී ගම්වාසීන් රැස්ව සිටියදී තමන් හැල්ලුවට ලක්වන ආකාරයේ ප්‍රකාශ සිදු කළ බවත් පැමිණිලිකරු සාක්ෂිය දී සඳහන් කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මුල් ස්ථාවරය වී ඇත්තේ චන්ද්‍රරත්න යටවර නැමැති පුද්ගලයෙක් නොමැති බවය. එසේ වුවත් පසුව චන්ද්‍රරත්න යටවර මහතා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔහුට විවිධ තර්ජන හා බලපෑම් එල්ල කරමින් ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. ඊට පසු දින යටවර මහතා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 2 අධිකරණ ශාලාවට ඉදිරිපත් කළ පසුව සාක්ෂි ආඥාපනතේ 127 වගන්තිය යටතේ ගැනෙන පාපොච්චාරණයක් සිදු කර ඇත. පැමිණිලිකරු සඳහන් කළ අන්දමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍යවී තිබුණේ චන්ද්‍රරත්න යටවර රජයේ සාක්ෂිකරුවෙකු වශයෙන් සලකා පැමිණිලිකරු නඩුවේ චූදිතයා වශයෙන් නම් කිරීමය. කෙසේ වුවත් චන්ද්‍රරත්න යටවර මහතා ඉන්පසුව බී/23073/1/15 නඩුවට සහ නීතිපතිවරයා වෙත දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔහුගෙන් ප්‍රකාශ සටහන් කර ගත් ආකාරය සහ ඔහුට බලපෑම් සිදු කළ ආකාරය සහ ඔහුගේ කටඋත්තරය ලබා ගත් ආකාරය සඳහන් කරමින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. යටවර මහතාගේ එම දිවුරුම් ප්‍රකාශය පැ.21 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු සඳහන් කළේ ඔහු නඩුවේ සැකකරුවකු වශයෙන් නම් කලත් අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් ඔහුට ප්‍රශ්නයක් සිදු

නොවූ බවත් ඔහු තවදුරටත් අධිකරණ සේවයේ රාජකාරි සිදුකල බවත්ය.

කෙසේ වෙතත් පැමිණිලිකරුගේ සේවය අත්හිටුවීම සඳහා රජයේ අධිනීතිඥ දිලීප පීරිස් මහතා ක්‍රියා කළ ආකාරය පිළිබඳව පැමිණිලිකරු තමන්ගේ සාක්ෂියෙදී මෙසේ ප්‍රකාශ කර ඇත;

> (උපුටා ගැනීම) "මම සේවයේ හිටියේ. ඊට පස්සේ දිලීප පීරිස් මහතා, මට ඒකත් දැනුම් දුන්නේ එවකට අගවිනිසුරු කේ ශ්‍රී පවන් මැතිතුමා, පුද්ගලිකව මට කතාකරලා කිව්වා දිලීප පීරිස් දිගින් දිගටම මේකට බලපෑම් කරනවා මට ළඟ දාතම දින තුනක් ලිපි තුනක් එවලා තියෙනවා අගවිනිසුරුට තිළිණ ගමගේට එරෙහිව අපි අධිචෝදනා ගොනු කරනවා. තිළිණ ගමගේ අත්අඩංගුවට ගන්න යන්නේ, ඒ නිසා මොහුට විරුද්ධව අධිකරණ සේවා කොමිෂන් සභාවට ක්‍රියාමාර්ග ගන්න කියලා තර්ජනාත්මක ආකාරයෙන් අගවිනිසුරුතුමාට දැනුම් දීලා තිබ්බා. ඒ එක්කම, මේ දිලීප පීරිස් අගවිනිසුරු තුමාට යවන ලිපියේ කරුණුම ඊට පෙර දින ඒ දවස් වල ජන මාධ්‍යයේ යනවා. අර මම පෙර නම් සඳහන් කළ ඇමතිවරු ටික කියනවා ඒ කතාවම, ඒ කතාවම රාවය පත්‍රයේ ලංකාදීප පත්රයේ යනවා. සිවිල් සංවිධාන නියෝජිතයෝ පුවත්පත් සාකච්ඡා තියලා ඒ ටිකම කියනවා. රාවය පත්‍රයේ විතරක් ස්වාමීනි headline මට මතක විදිහට දහතුනක් විතර ගියා. ලංකාදීප කීපයක් පළවුණා. දැන් අර රජයේ නීතිඥයයි, CID එකෙයි කතා ඊට පෙර දින යනවා ජනමාධ්‍යයේ සහ අර පුවත්පත් සාකච්ඡා වල. එතකොට හොරකම් වශයෙන් මේගොල්ලෝ අගවිනිසුරුතුමාට යැව්වා

රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින්ගේ පුවත්පත් සාකච්ඡාවක දී අගවිනිසුරුවරයා මට විරුද්ධව ක්‍රියාමාර්ග නොගන්නේ මම අගවිනිසුරුතුමාට ඉඩමක් දීලා තියෙනවලු. මම එතුමාට ඉඩම් දෙන්න උවමනා නැහැ. එතුමා සමග මම එහෙම සම්බන්ධයක් ඇත්තේ නැහැ. මේ කියන්නේ එහෙමත් අර බය කරලා, තර්ජනය කරලා, අපහාස කරලා. තමන්ට ඕන තැනට මේ විමර්ශනය කර ගන්න තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවූයේ." (උපුටා ගැනීම අවසන්)

පැමිණිලිකරු නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ 1912 /16 නඩුවට ඉදිරිපත් වීමෙන් පසුව ඇප මත මුදාහැර ඇත. පැමිණිලිකරු ඇප මත මුදා හැරීමේ නියෝගය මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කිරීමෙන් පසුව පෙරකී දේශපාලඥයන් සිවිල් සංවිධානවල නියෝජිතයින් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ දිලීප පීරිස් මහතා නුගේගොඩ මහේස්ත්‍රාත්වරයාට අභූත චෝදනා එල්ල කළ බව පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය. නුගේගොඩ මහේස්ත්‍රාත්වරයාගේ නිලමැදිරියේ පැමිණිලිකරු සැඟවී සිටි බවටත්, මහේස්ත්‍රාත්වරයාගේ පුද්ගලික හැඳුනුම් මත ඇප ලබාදීම සිදු කළ බවටත් චෝදනා එල්ල කර ඇත. එහි ප්‍රතිඵලයක් වූයේ කෙටි දවසකින් නුගේගොඩ මහේස්ත්‍රාත්වරයා නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයෙන් ස්ථාන මාරු කර ඇත. එසේම එහෙම ඇප මත මුදා හැරීමේ නියෝගයට එරෙහිව ප්‍රතිශෝධන අයදුම්පත්‍රයක් මහාධිකරණය වෙත ඉදිරිපත් කිරීමට ද රජයේ අධිනීතිඥ දිලීප පීරිස්

මහතා සහ SIU විශේෂ විමර්ශනය ඒකකයේ ස්ථානාධිපති සාගර කරසිංහආරච්චි ක්‍රියාකර ඇත.

මෙම සිද්ධියට අදාළව පැමිණිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ අංක 555/2019 නඩුවෙන් අධි චෝදනා පත්‍ර ගොනු කර ඇත. එම අධිචෝදනා පත්‍රයේ පිටපතක් පැ.22 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම නඩුව දැන් විභාග වෙමින් පවතින බවත්, සාක්ෂිකරුවන් දොළොස් දෙනෙකු පමණ කැඳවා සාක්ෂි විභාග සිදුකර ඇති බවත්, තවත් සාක්ෂි කීපයකින් පසුව නඩුව අවසන් කිරීමට නියමිත බවත්, සාමාන්‍ය මහාධිකරණයක තිබුණත් විශේෂ උනන්දුවක් ගෙන අඩුම තරමේ සතියට දවසක් වැටෙන්නට සමහර දවස් වලට සතියට දවස් දෙකක් කැඳවමින් කඩිනමින් කොළඹ අංක 3 දරණ මහාධිකරණය ඉදිරියේ නඩුව විභාග වන බවද පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය. කොළඹ අංක 3 මහාධිකරණයේ විනිශ්චකාරතුමා ඉදිරියේ තමන්ගේ නඩුව විභාග කිරීමෙන් තමන්ට අගතියක් වන බවට සඳහන් කරමින් නඩු විභාගය කොළඹ වෙනත් මහාධිකරණයකට මාරු කරන ලෙසට ඉල්ලා පැමිණිලිකරු විසින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ පෙත්සමක් අභියාචනාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. අභියාචනාධිකරණයේ එම නියෝගයේ පිටපතක් පැ. 23 වශයෙන් සලකුණු කර ඇත ඉදිරිපත් කර ඇත.

මහාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින නඩුවට ඉදිරිපත් කරනු ලබන සාක්ෂිවල ස්වභාවයද සාක්ෂිකරු, පැමිණිලිකරු තම සාක්ෂියේදී සඳහන් කර ඇත. නියෝජ්‍ය විගණකාධිපති අඹන්වල මහතා විසින් ඉදිරිපත් කරන ලද අලි පිළිබඳ විගණන වාර්තාව ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවට අනුකූල නොවන බවත් එම විගණන වාර්තාව සකස් කිරීම සඳහා විගණකාධිපති විසින් නියෝගයක් සිදු කර නොමැති බවත්, විගණන වාර්තාව විගණකාධිපති විසින් අත්සන් කර නොමැති බවත්, එබඳු, නිත්‍යානුකූල සාක්ෂි නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ දිලීප පීරිස් මහතා විසින් ඉදිරිපත් කරමින් තමන්ට විරුද්ධව පවරා ඇති නඩුව ඉදිරියට ගෙනයාම මහාධිකරණය ඉදිරියේ සිදුවන බවත් පැමිණිලිකරු තම සාක්ෂියෙදී වැඩිදුරටත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු අධිකරණ සේවයෙන් ඉවත් කිරීම සඳහා සිදුකරගෙන ගිය කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙළ පැහැදිලි කරමින් පැමිණිලිකරු සඳහන් කළේ තමන්ට විරුද්ධව පුරවැසි සංවිධානය නමින් සංවිධානයක සාමාජිකයින් දෙදෙනෙක් වන මහාචාර්ය ශ්‍රීයානි රණසිංහ සහ නීතිඥ කපිල දාබරේ යන දෙදෙනා විසින් අත්සන් තබන ලද 2016 පෙබරවාරි 11 දිනින් අග්‍රවිනිශ්චයකාර තුමා වෙත යවන ලද පෙත්සමක් පැ.24 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පැමිණිලිකරුගේ සේවය අත්හිටුවා දැනට අවුරුදු හතරක් පමණ ගත වී ඇති බවත්, මෙම කාලය තුළ ඔහුට වඩා කනිෂ්ඨ නිලධාරීන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වශයෙන් උසස්වීම් ලබා ඇති බවත්, තමාට එරෙහිව ඇත්තේ මූල්‍ය චෝදනාවක් නොව අලියෙකු මිලට ගෙන හදා ගැනීම පිළිබඳව චෝදනාවක් බවත්, තමා නිර්ව්‍යාජ ගැණුම්කරුවකු බැවින් තමන් වරදක් සිදුකර නොමැති බවත්, එබැවින් තමන්ට හිමි උසස්වීම් ලබා ගෙන නැවත සේවයේ පිහිටුවීම සඳහා නිර්දේශ කරන ලෙසටත්, එසේම අලියා තමන් වෙතට මුදාහරින ලෙසටත්, තමන් නමින් බලපත්‍රය නිකුත් කරන ලෙසට නියෝගයක් සිදු කරන ලෙසටත් ඉල්ලීමක් කර ඇත. දැනට තමන්ගේ අලියා කෑම හිඟව දුක් විඳිමින්

පින්නවල අලි අනාථාගාරයේ කාලය ගත කරන බවත්, ඔහුගේ කකුලකට දම්වැල් දැමීම කරණ කොටගෙන කකුලක් කැඩී ගොස් ඇති බවත්, ඒ සඳහා අලියාට ප්‍රතිකාර අවශ්‍ය බවත්, සත්ත්ව හිංසාවට පින්නවල අලි අනාථාගාරයේ අදාල පුද්ගලයින්ට විරුද්ධව නීති මගින් ක්‍රියා කිරීමට පියවර ගන්නා ලෙසටත් පැමිණිලිකරු වැඩිදුරටත් ඉල්ලා ඇත.

එසේම, ද්වේශසහගත ලෙස විමර්ශනය සිදු කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරී නුවන් අසංග, විශේෂ විමර්ශන අංශයේ පොලිස් ස්ථානාධිපති සාගර කරසිංහආරච්චි, මෙම විමර්ශනය සිදු කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න ඇතුළු නිලධාරින්ට එරෙහිව ක්‍රියා කරන ලෙසට පැමිණිලිකරු වැඩිදුරටත් ඉල්ලා සිටියේය.

පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වෙනුවෙන් සාක්ෂි දීම සඳහා පැමිණි මහලු ගොඩගේ ජයලත් පෙරේරා පැ.15 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද ගැසට් පත්‍රය සම්බන්ධයෙන් සාක්ෂි දී ඇත. 1991.05.14 දිනැති 662/04 දරණ ගැසට් පත්‍රය වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ අමාත්‍යවරයාට පවරා ඇති බලතල ප්‍රකාරව රෙගුලාසි සාදමින් ප්‍රසිද්ධ කරන ලද අති විශේෂ ගැසට් පත්‍රයක් බව සඳහන් කළේය. පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ලැබුණු සිතාසිය පරිදි ඉහත සඳහන් ගැසට් පත්‍රය පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ගැසට් පත්‍රයක් ද යන්න සොයා බලන ලද බවත්, පාර්ලිමේන්තුව තුළ ඇති සුචිගත කිරීමේ අංශයේ සියලුම දේවල්, වාර්තා, පරිශීලනය කළ බවත්, ලිපි ලේඛන පරීක්ෂා කළ බවත්, පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාව පරීක්ෂා කල

බවත්, එම පරීක්ෂාව තුළ ඉහත සඳහන් ගැසට් පත්‍රය පාර්ලිමේන්තුව විසින් අනුමත කළ ගැසට් පත්‍රයක් බවට කරුණු අනාවරණය නොවූ බවත්, ඒ අනුව ගැසට් පත්‍රය පාර්ලිමේන්තුව මගින් අනුමත කළ ගැසට් පත්‍රයක් නොවන බවත් සඳහන් කළේය.

වනජීවී දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා නිලධාරී අත්කුඩා ලියනගේ රාසංගසිරි සාක්ෂි දෙමින් ඉහත කී අලියාට අදාළ ලිපි ගොනුව ඉදිරිපත් කර ඇත. එකී ලිපි ගොනුවට අනුව පැ.6 වශයෙන් ඉදිරිපත් කරන ලද අංක 334 දරණ ඉහත කී අලියාට අදාල බලපත්‍රය 2012.3.27 දාතමින් යුක්තව චන්ද්‍රරත්න යටවර මහතා නමින් නිකුත් කර ඇත. එම අලියා ලියාපදිංචි කර ඇත්තේ 2012 මාර්තු 27 වන දින දීය. පැ.7 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද 2012.03.27 වාර්ෂික බලපත්‍රයද චන්ද්‍රරත්න යටවර මහතා නමින් නිකුත් කර ඇත. අලියා ලියාපදිංචි කිරිම සහ වාර්ෂික බලපත්‍රය නිකුත් කිරිම 2012 මාර්තු 27 දින දාතමින් යුක්තව සිදු වී ඇතත්, අලියා ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම චන්ද්‍රරත්න යටවර මහතා විසින් ඉදිරිපත් කර ඇත්තේ 2008.11.12 දින දීය. අලියෙකු ලියාපදිංචි කිරීම සඳහා වෙනම ඉල්ලීමක්ද ඉන්පසුව වාර්ෂික බලපත්‍රය සඳහා වෙනම ඉල්ලීමක්ද වශයෙන් ඉල්ලීම් දෙකක් සිදු කළ යුතු බව සාක්ෂිකරු සඳහන් කළේය.

පැ.8, පැ.9 සහ පැ.10 ලේඛන පිළිගනිමින් සාක්ෂිකරු සඳහන් කළේය. අවසන්වරට අලියා ලියාපදිංචි කර බලපත්‍රය නිකුත් කිරීම 2012.03.27 වන දින සිදුවී ඇත. පැමිණිලිකරුවන පොල්පාගොඩ ගමගේ තිළිණ සජෝත වින්සන්ට් විසින් 2012 ජූලි 22 දිනින් යුතුව අලියෙකු ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එම

ලේඛනය පැ.11 වශයෙන් ඉදිරිපත් කර ඇත. පැ.11 වශයෙන් ඉදිරිපත් කර ඇති අලියෙකු ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීම අදාළ වන්නේ ද චන්ද්‍රරත්න යටවර මහතාගේ නමින් ලියාපදිංචි අංක 334 දරණ අලියා වෙනුවෙන්ම බවටද ලිපිගොනුව අනුව සාක්ෂිකරු පිළිගත්තේය. එම ඉල්ලීම සම්බන්ධයෙන් වන ජීවී දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර ඇතත් බලපත්‍රය නිකුත් කිරීම සිදු වී නොමැත. පැ.11 අයදුම් පත්‍රය අනුව අලියා ලියාපදිංචි නොකිරීම හේතුවෙන් පැමිණිලිකරු විසින් අභියාචනයක් ඉදිරිපත් කරමින් අලියා ලියාපදිංචි කිරීම නැවත සලකා බැලීමට ඉල්ලා ඇත. පැ.14 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති අභියාචනය පැමිණිලිකරු ඉදිරිපත් කළ එම අභියාචනය බවට ලිපි ගොනු අනුව සාක්ෂිකරු පිළිගෙන ඇත. මෙම අභියාචනය විමර්ශනය කිරීම සඳහා ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ විමර්ශන නිලධාරී කලුහෙන්දිවල මහතා පත් කර තිබේ. කලුහෙන්දිවල මහතා විසින් පැ.17 විමර්ශන වාර්තාව නිර්දේශ සහිතව ඉදිරිපත් කර ඇත. සාක්ෂිකරුට අනුව නිර්දේශවල මෙසේ සඳහන්ව ඇත.

> (උපුටා ගැනීම) " චන්ද්‍රරත්න යටවර මහතාට අයත් මෙම අලියා විකුණා ඇති ටී.ජී.එස්.ටී. වින්සන් මහතාට වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (469 වන අධිකාරිය) 22 වන වගන්තියේ (4) අනුව බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි." (උපුටා ගැනීම අවසන්)

විමර්ශන නිලධාරියාගේ මෙම නිර්දේශයට අමාත්‍යවරයාගේ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති අතර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් බලපත්‍රය නිකුත් කිරීමේ කාර්යය සඳහා

අධ්‍යක්ෂක ජනරාල් වෙත යොමුකර ඇත. පැ.17 මෙම තත්ත්වය පැහැදිලි වන බව සාක්ෂිකරු පිළිගත්තේය. පැ.18 අනුව, නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් බලපත්‍රය නිකුත් කිරීම අනුමත කර ඇත්තේ 2013 ජනවාරි මස 21 වන දින දීය. එසේ වුවත් පැමිණිලිකරු නමින් බලපත්‍රය නිකුත් කිරීමට අදාළ බලධාරීන් වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා පියවර ගෙන නොමැත. බලපත්‍රය තමාගේ නමින් නිකුත් නොකිරීම කරණ කොට ගෙන 2014.09.02 වෙනි දින පැමිණිලිකරු විසින් නැවත ඉල්ලීමක් සිදුකර ඇත.

පැ.19 වශයෙන් ඉදිරිපත් කර ඇති උක්ත ඉල්ලීමට අදාළව වනජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2014.09.05 දිනැති ලිපියෙන් පිළිතුරු සපයා ඇත. පැ.20 වශයෙන් දැනටමත් ලකුණු කර ඇති එම ලිපියෙහි අධ්‍යක්ෂක ජනරාල්වරයා මෙසේ සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම) "අංක 334 යටතේ ලියාපදිංචි කර ඇති අලියාගේ හිමිකාරීත්වය ඔබගේ නමට පවරා ගැනීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කර ඇති ලේඛන මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බව ද ඔබගේ ඉල්ලීම සම්බන්ධයෙන් ඉදිරියේදී පියවර ගැනීමට කටයුතු කරන බව ද කාරුණිකව දන්වා සිටිමි." (උපුටා ගැනීම අවසන්)

අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ මෙම දැන්වීම පරිදි ඉන්පසුව කටයුතු සිදු වී නොමැති අතර අලියා පැමිණිලිකරු නමින් ලියාපදිංචි වී නොමැත. සාක්ෂිකරු සඳහන් කළේ ඉන් පසුව 2015 පෙබරවාරි මාසයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අලි ඇතුන් පිළිබඳව සිදුකරනු

ලැබූ විමර්ශනයක් සම්බන්ධයෙන් මෙම ලිපිගොනු ලබාගෙන ඇති බවය.

අලියා සම්බන්ධ බලපත්‍රය පැමිණිලිකරු වෙත නිකුත් කරන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2014 සැප්තැම්බර් මාසයේදී දැන්වීමෙන් පසුව බලපත්‍රය නිකුත් කිරීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව පියවර නොගත්තේ කුමන හේතුවක් පදනම් කරගෙනද යන්න සාක්ෂිකරු පැහැදිලි කළේ නැත. අලියා ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ග්‍රාම නිලධාරි සහතිකය ව්‍යාජ සහතිකයක්ය යන පදනම මත අලියා ලියාපදිංචි කිරීම අත්හිටුවා විමර්ශනය කිරීමෙන් අනතුරුව විමර්ශනය නිලධාරියා විසින් බලපත්රය පැමිණිලිකරුට නිකුත් කිරීමට නිර්දේශ කර ඇති අතර, එම නිර්දේශය නියෝජ්‍ය අමාත්‍යවරයා සහ අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත. එසේ අනුමත කර තිබියදීත් බලපත්‍රය නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු නොකිරීම පිළිබඳව සාක්ෂිකරුට කිසිදු පැහැදිලි කිරීමක් සිදුකිරීමට හැකියාවක් නොතිබිණි.

අලි ඇතුන් ලියාපදිංචි කිරීමට අදාල 1991 මැයි 14 දිනැති අංක 662/4 ගැසට් පත්‍රය පිළිබඳ සාක්ෂිකරුට දැනුමක් ඇති බවත්, එම ගැසට් පත්‍රයට අනුව අලි ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයක් අවශ්‍ය නොවන බවත් සඳහන් කළේය. අලි ඇතුන් ලියාපදිංචි කිරීමට අදාළව වනජීවී දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරනු ලබන සාක්ෂිකරුගේ භාරයේ කොමිෂන් සභාව ඉදිරියට ගෙන එන ලද ලිපි ගොනුව පැ.25 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

2015 පෙබරවාරි මාසයේ අංක 334 දරණ අලියා සම්බන්ධයෙන් ලිපිගොනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවනු ලැබූ අවස්ථාවේ දී අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කර ඇත්තේ නාගහමුල්ල නැමැති නිලධාරියා. 2017 වර්ෂයේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් වූ ශානි අබේසේකර යටතේ සහකාර පොලිස් අධිකාරි නුවන් අසංග සහ පොලිස් පරීක්ෂක සාගර කරසිංහආරච්චි විසින් පරීක්ෂණ මෙහෙයවා ඇත.

ඉදිරිපත් වී ඇති කරුණු වලට අනුව චන්ද්‍රරත්න යටවර මහතා විසින් අලියා මිලදී ගනු ලබන්නේ ද 2008 වර්ෂයේදී ය. අලියා මිලදී ගැනීමෙන් පසු ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති නමුත් ලියාපදිංචි කිරීම සිදුකර ඇත්තේ 2012 මාර්තු 27 වන දින දීය. පැමිණිලිකරු අලියා මිලදී ගෙන ඇත්තේ 2012 ජූලි 22 වන දින දීය. ඒ අනුව අලියා පැමිණිලිකරු නමින් ලියාපදිංචි කරවා ගැනීම සඳහා 2012 ජූලි 22 වන දින අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරුගේ නමින් අලියා ලියාපදිංචි කිරීම සඳහා ලේඛන සලකා බලන අවස්ථාවේදී යටවර මහතා විසින් මුල් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ ලේඛන අතර තිබූ ග්‍රාම නිලධාරී සහතිකය ව්‍යාජ සහතිකයක්ය යන පදනම මුල් කරගෙන යටවර මහතාට නිකුත් කර තිබූ අලියා තබාගැනීමේ බලපත්‍රය අවලංගු කර ඇත. මේ සම්බන්ධයෙන් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව යටවර මහතා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ විෂයභාර අමාත්‍යවරයාට අභියාචනා කර ඇත. එම අව්‍යාජ අභියාචනයට අනුව විමර්ශනය කිරීම සඳහා අමාත්‍යාංශයේ නිලධාරියෙකු වන කලුහෙන්දිවල මහතා පත් කර ඇත. එම විමර්ශනයේදී කලුහෙන්දිවල මහතාගේ නිර්දේශය

වූයේ අලි ඇතුන් ලියාපදිංචි කිරීමට අදාළව නිකුත් කරන ලද ගැසට් පත්‍රය ග්‍රාම නිලධාරී සහතිකයක් ලබාදීම අවශ්‍ය නොවන බැවින්ද, පැමිණිලිකාර තිළිණ ගමගේ මහතා නිර්ව්‍යාජ ගැණුම්කරුවෙකු බැවින්ද වලංගු කරන ලද බලපත්‍රය බලාත්මක කළ යුතු බවය. මෙම නිර්දේශය අමාත්‍යාංශය ලේකම්වරයා අනුමත කර ඇති අතර විෂය භාර අමාත්‍යවරයා විසින් ද අනුමත කර ඇත. ඒ අනුව කලුහෙන්දිවල මහතාගේ විමර්ශනයේ නිර්දේශ අවසාන හා තීරණාත්මක වේ. ඒ අනුව කටයුතු කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටී. කරුණු එසේ වුවත් බලපත්‍රය නිකුත් කිරීමට අදාළ අධිකාරිය වූ වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලපත්‍රය නිකුත් කිරීම සිදු කර නොමැත. බලපත්‍රය පැමිණිලිකරුගේ නමින් නිකුත් කරන බවට වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා පැමිණිලිකරුට දැන්වීමක් සිදුකර ඇතත් බලපත්‍රය නිකුත් කිරීම සිදු කර නොමැත.

පැමිණිලිකරුට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ ආරම්භ කර ඇත්තේ මෙවැනි නීත්‍යානුකූල සහ අවසාන හා තීරණාත්මක පසුබිමක් නිර්මාණය වී තිබියදී ය.

අලියා ලියාපදිංචි කිරීම සඳහා යටවර මහතා ඉදිරිපත් කළ අයදුම් පත්‍රය සමග ග්‍රාම නිලධාරී සහතිකයක් ඉදිරිපත් නොකළ බව යටවර මහතා පැහැදිලිව ප්‍රකාශ කර ඇත. වනජීවී දෙපාර්තමේන්තුව යටවර මහතාගේ ඉල්ලීම සලකා බලා ඇත්තේ එම ඉල්ලීම ඉදිරිපත් කර අවුරුදු හතරකට පමණ පසුවය. එවන් පසුබිමක් මත ව්‍යාජ ග්‍රාම නිලධාරී සහතිකය යටවර මහතාගේ ලේඛන තුළට ඇතුල්වූයේ කෙසේද ද යන්න පැහැදිලි කිරීමට අමාත්‍යාංශ නිලධාරීන්ට හැකියාවක් නොමැත. අලියෙකු ලියාපදිංචි කිරීම සඳහා අවුරුදු හතරක

පමණ කාලසීමාවක් ගත කළේ කුමන හේතුවක් පදනම් කරගෙනද යන්න අමාත්‍යාංශය පැහැදිලි කළ යුතුය. යටවර මහතා නමින් 2012 වර්ෂයේදී බලපත්‍රය නිකුත් කරන විට මෙම ප්‍රශ්නයට අදාළ ග්‍රාම නිලධාරී සහතිකය ව්‍යාජ සහතිකයක් බව අමාත්‍යාංශයේ නිලධාරීන්ට සොයා ගැනීමට නොහැකි වූයේ කුමන හේතුවක් මතද යන්නට හේතු නැත. ග්‍රාම නිලධාරි සහතිකයක වලංගු කාල සීමාව මාස 6 ක් වුවත් වනජීවී දෙපාර්තමේන්තුව අවුරුදු හතරකට පසුවත් ඉදිරිපත් කර තිබූ ග්‍රාම නිලධාරි සහතිකය පිළිගෙන අලියා ලියාපදිංචි කර යටවර මහතා නමින් අලියා වෙනුවෙන් බලපත්‍රය නිකුත් කර ඇත.

ග්‍රාම නිලධාරී සහතිකය ව්‍යාජ සහතිකයක්ය යන පදනම ප්‍රථමවරට වනජීවී දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇත්තේ පැමිණිලිකරු විසින් අලියා තමාගේ නමින් ලියාපදිංචි කිරීමට සිදු කළ ඉල්ලීම සලකා බලනු ලබන අවස්ථාවේ දීය. පැමිණිලිකරුගේ නමින් අලියා ලියාපදිංචි කිරීම සලකා බලන විට යටවර මහතා, එනම් අලියාගේ මුල් හිමිකරු, නමින් ලියාපදිංචි කිරීමට අදාල කරගත් ලේඛන සලකා බැලීමට වනජීවී දෙපාර්තමේන්තුව පෙළඹුණේ කුමන හේතුවක් පදනම් කරගෙනද? ගුප්ත කරුණු මෙසේ හෙයින්, වනජීවී අමාත්‍යාංශයේ මෙම අශෝභන ක්‍රියා පිළිවෙත කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළක පැහැදිලි සලකුණු ඉදිරිපත් කරයි.

චන්ද්‍රරත්න යටවර මහතා විසින් 2008 නොවැම්බර් මස 12 වන දින අලියෙකු තමා නමින් ලියාපදිංචි කිරීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් සිදු කරන විට පැමිණිලිකරු සේවය කරමින් සිට ඇත්තේ කන්තලේ මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා වශයෙන්ය. එම කාලසීමාවේදී පැමිණිලිකරුට

අලියකු තමන් සතු කරගැනීම සඳහා කිසිදු අදහසක් තිබී නොමැති අතර යටවර මහතා හඳුනා ගෙන සිට නැත. යටවර මහතා දැක නොමැත. ඔහු ගැන අසා නොමැත.

එවන් පසුබිමක් මත පැමිණිලිකරුට එරෙහිව මහාධිකරණයේ ගොනු කර ඇති පැ.22 දරණ අධිචෝදනා පත්‍රයට අනුව, 2008 වර්ෂයේදී අලියකු ලියාපදිංචි කිරීම සඳහා යටවර මහතා සමඟ පැමිණිලිකරු කුමන්ත්‍රණය කළ බවට අධිචෝදනා නගා තිබීම විහිළුවකි. 2008 නොවැම්බර් 12 වැනි දින යටවර මහතා විසින් අලියා ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන විට එම ඉල්ලුම් පත්‍රය සකස් කිරීමට හෝ එම ඉල්ලුම් පත්‍රය වෙනුවෙන් ලේඛණ ඉදිරිපත් කිරීමට පැමිණිලිකරු යම් උදව්වක් හෝ අනුබලයක් දුන් බවට කිසිදු පුද්ගලයකු පැමිණිලිකරුට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කටඋත්තර ලබාදී නැත. අඩු තරමින් යටවර මහතා සහ පැමිණිලිකරු, එකිනෙකා දන්නා හඳුනන පුද්ගලයන්ව සිටි බවට ප්‍රකාශ කෙරෙන කටඋත්තරයක්වත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සතුව නැත. චන්ද්‍රරත්න යටවර මහතා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සිදුකළ ප්‍රකාශය පැ. 22(අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමාට තර්ජනය කර බියට පත්කර පැ.22(අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළ ප්‍රකාශය ලබා ගත්තේ කුමන ආකාරයකටද යන්න පැහැදිලි කරමින් චන්ද්‍රරත්න යටවර මහතා විසින් ඉදිරිපත් කළ 2016.02.27 දිවුරුම් ප්‍රකාශය පැ.21 වශයෙන් ඉදිරිපත් කර ඇත.

එම දිවුරුම් ප්‍රකාශයේ 3 සිට 14 දක්වා ඡේදයන් පහත උපුටා දක්වා ඇත.

“3. ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කොළඹ, ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී /23073/1/15 දරණ නඩුව සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබාදීම සඳහා 2016.02.24 දින මා කොළඹ, කොටුව පිහිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය බව මම ප්‍රකාශ කරමි.

4. මා පෙරවරු 8.30 ට පමණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය අතර එහිදී එහි නිලධාරීන් පස්වරු 12.00 පමණ වන තෙක් මාගෙන් කිසිදු ප්‍රකාශයක් සටහන් කර නොගෙන මා රඳවා තබාගෙන සිටියදී, ඒ අතරතුර කාලයේ විවිධ නිලධාරීන් පැමිණ පොළොවේ අඩි හප්පා, මේසයට ගසා මා බියට පත්වන ආකාරයට හැසිරෙමින්, මා අත්අඩංගුවට ගෙන ඇති බවත්, මා අලි හොරකම් කරන්නකු බවත් ප්‍රකාශ කොට, මා තුළ දැඩි බියක් ඇති කරවන ආකාරයට කටයුතු කරන ලද බව ප්‍රකාශ කර සිටිමි.

5. ඉන් අනතුරුව මෙම නඩුව සම්බන්ධ ගනුදෙනුවට අදාළ සියලූ කරුණු මා විසින් ප්‍රකාශ කරන ලද අතර මාගේ ප්‍රකාශය සටහන් කරගත් නිලධාරියා එම ප්‍රකාශය මට කියවා තේරුම්කර දීමෙන් හෝ එකී ප්‍රකාශය කියවීමට මට අවස්ථාව ලබා දීමෙන් තොරව එම ප්‍රකාශයට තැන් කිහිපයකම මාගේ අත්සන් ලබාගත් බවත් මම ප්‍රකාශ කර සිටිමි.

6. ඉන් අනතුරුව තවත් නිලධාරියෙක් පැමිණ මට ඇසෙනසේ "මෙයා අද නයිට් පාක්ද?" කියා තවත් නිලධාරියෙකුගෙන් ඇසූ අතර, මා රඳවා තබා ගනු ඇති බවට එයින් මා තවත් බියට පත්වූ බව ප්‍රකාශ කරමි.

7. ඉන් අනතුරුව පසු දිනය වූ 2016.02.25 වන දින ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙස මා හට විමර්ශන කටයුතු වල යෙදෙන නිලධාරීන් විසින් දැනුම් දුන් අතර පස්වරු 6 ට පමණ මට පිටත්ව යාමට අවසර දෙන ලදී.

8. ඒ අනුව මා හට කළ දැනුම් දීමට අනුව මා 2016.02.25 දින ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ බව ප්‍රකාශ කරමි.

9. එහිදී මගෙන් කැමැත්ත නොවිමසා හිස් කොළ කිහිපයකට අත්සන් ලබාගත් අතර මාගේ කැමැත්ත නොවිමසා මාගේ ඡායාරූපද ගන්නා ලද බවද ප්‍රකාශ කර සිටිමි.

10. අනතුරුව මා අධ්‍යක්ෂ යනුවෙන් හැඳින්වූ 6 වන මහලේ සිටි උසස් නිලධාරියෙකුගේ කාමරයට රැගෙන ගිය අතර, "දැන් උසාවියට ගොස් ප්‍රකාශයක් ලබාදෙන ලෙස" අධ්‍යක්ෂක මහතා මා හට දැනුම් දුන් බව ප්‍රකාශ කරමි.

11. ඉන් අනතුරුව විමර්ශන නිලධාරීන් විසින් මා ජීප් රථයක නංවාගෙන උසාවියට රැගෙන ගිය අතර, ඒ අතරතුර දී එම නිලධාරීන්ගේ බල කිරීමක් මත උසාවියට මෙම ප්‍රකාශය ලබා නොදෙන බවත්, මාගේ කළ බව ප්‍රකාශ කර සිටිමි.

12. එසේම ඒ අවස්ථාවේ දී නීතිඥ නියෝජනයක් ලබා ගැනීමට ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මා හට අවස්ථාව ලබා නොදුන් බවද ප්‍රකාශ කර සිටිමි.

13. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් මා හට කියන ලද දේවල් සහ ඔවුන්ගේ හැසිරීම් හේතුවෙන් මා තුළ ඒ වන විට මා අත්අඩංගුවට ගෙන, රිමාන්ඩ්බාරයට පමුණුවනු ඇති බවට ඇති වී තිබූ බිය නිසාම මා ....... අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් කියන පරිදි කටයුතු කරන බවට එකඟ වූ බව ප්‍රකාශ කරමි.

14. මා ප්‍රකාශ කරන්නේ මා අත්අඩංගුවට ගෙන, රිමාන්ඩ් බාරයට පමුණුවනු ඇති බවට ඇති වී තිබූ බිය නිසාම සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් මා වෙත එල්ල කරන ලද දැඩි පීඩනය හේතු කොට ගෙන ගරු මහේස්ත්‍රාත්තුමාගේ නිල මැදිරියේදී ප්‍රකාශයක් ලබාදෙන විට මා දැඩි ව්‍යාකූල තත්ත්වයකින් සහ දැඩි මානසික පීඩනයකින් සිටි බවත්, මා තුළ නිදහස් මනසක් නොතිබූ බවත් ප්‍රකාශ කරමි.”

චන්ද්‍රරත්න යටවර මහතා මෙම දිවුරුම් ප්‍රකාශය ලබා දී ඇත්තේ ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැ.22(අ) ප්‍රකාශය සිදුකළ 2016.02.24 වැනි දිනට දින තුනකට පසුව ය. පැමිණිලිකරු සාක්ෂියේ දී සඳහන් කළ අන්දමට චන්ද්‍රරත්න යටවර මහතා 2016.02.24 දින සිදුකළ එම ප්‍රකාශයේ සඳහන් කරුණු හැර පැමිණිලිකරුට එරෙහිව වෙනත් කිසිදු සාක්ෂියක් නොමැත.

පැ.22(අ) දරණ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යටවර මහතා සිදුකළා යැයි කියනු ලැබූ ප්‍රකාශයෙහි අන්තර්ගතව ඇත්තේ යටවර මහතාට කිසිදු අවස්ථාවක අලි ඇතුන් නොසිටි බවත්, මහරගම පන්සලේ රතනසිරි හාමුදුරුවන්ගේ අවශ්‍යතාවය මත යටවර මහතා හිස් කොළ කීපයකට අත්සන් කර ඇති බවත්, යටවර මහතා කිසිදු අවස්ථාවක අලියෙකු රුපියල් ලක්ෂ තිහකට තිළිණ ගමගේ මහතාට විකුණා නොමැති බවත්, කිසිදු අවස්ථාවක අලියෙකු තමාගේ නමින් ලියාපදිංචි කිරීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නොමැති බවත්, දිවුරුම් ප්‍රකාශයකට අත්සන් නොකළ බවත්, වනජීවී දෙපාර්තමේන්තුවේ ලේකම්වරයාට ලිපියක් නොයැවූ බවත්, පශු වෛද්‍යවරයකු වෙත ඇතින්නක් හා පැටවකු ඉදිරිපත් නොකළ බවත්, කලුහෙන්දිවල නැමැති මහතෙකු ඉදිරියේ සාක්ෂි ලබා නොදුන් බවත්, බලපත්‍රය නැවත බලාත්මක කිරීමට ඉල්ලීමක් නොකළ බවත්, ජනාධිපතිතුමා වෙත ලිපියක් ඉදිරිපත් නොකළ බවත්ය. කෙසේ වෙතත් ඉහත සඳහන් සෑම ලිපියකම සහ ලේඛනකම ඇති අත්සන් සහ දිනය තමන් යොදා ඇති බවට යටවර මහතා පිළිගෙන ඇත. මෙම ප්‍රකාශය පොලිස් සැරයන් 59622 විජේසිංහ නැමැති නිලධාරියකු විසින් සටහන් කරගෙන ඇති බවට සඳහන් කර ඇත.

අලියා සම්බන්ධ නිවැරදි තත්ත්වය පැ.21 දරණ දිවුරුම් ප්‍රකාශයේ යටවර මහතා සඳහන් කර ඇත. ඒ අනුව, පූජ්‍ය බ්‍රාහ්මණගම රතනසිරි හාමුදුරුවන්ට අයත්ව සිටි ‘කපුරී’ නැමැති ඇතින්නට දාව උපන් අලි පැටවා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බලපත්‍ර අංක 334 යටතේ තමාගේ නමින් ලියාපදිංචි කර තිබූ බවත්, අලියා ලියාපදිංචි

කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් සහ වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් 2008.11.12 වන දින තමාගේ අත්සනින් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ බවත්, එම අලි පැටවා 2012.07.22 දින රුපියල් ලක්ෂ 30 ක මුදලකට මහරගම ගොඩිගමුව අංක 376 හි පදිංචි පී.ජී.ටී.එස්. වින්සන්ට් මහතාට විකුණූ බවත්, අලියා විකිණීමට අදාල කුවිතාන්සිය අත්සන් කර ගැනුම්කරුට ලබාදුන් බවත්, එම කරුණු තහවුරු කරමින් 2012.08.18 දින දරණ දිවුරුම් ප්‍රකාශයක් ලබාදුන් බවත්, 2012.10.26 වැනි දින ලිපියක් මගින් මෙම අලි පැටවාට අදාළව යටවර මහතා නමින් නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කළ බවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැන්වූ බවත්, බලපත්‍රය අවලංගු කිරීමෙන් පසුව වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 56 වගන්තිය ප්‍රකාරව 2012.12.20 දින විෂයභාර අමාත්‍යවරයා වෙතද 2012.11.05 දින වැඩ බලන වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වෙතද 2012.11.20 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙතද 2012.11.09 දින ජනාධිපතිතුමා වෙතද අභියාචනා ඉදිරිපත් කළ බවත් එකී අභියාචනා අනුව අමාත්‍යාංශය විසින් කලුහෙන්දිවල නැමැති අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු යටතේ විමර්ශනයක් ආරම්භ කරන ලද බවත්, යටවර මහතාගෙන් ප්‍රකාශයක් සටහන් කරගත් බවත්, එකී විමර්ශනය මගින් ලියාපදිංචි අංක 334 දරණ අලි පැටවා සම්බන්ධව අවලංගු කරන ලද බලපත්‍රය නැවත ලබා දෙන ලෙස එවකට වනජීවී විෂයභාර අමාත්‍යවරයා විසින් නිර්දේශ කර බලාත්මක කර තිබුණු බවත්, නිර්දේශය සහ බලාත්මක කිරීම වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 56(4) වගන්තිය ප්‍රකාර අවසානාත්මක හා තීරනාත්මක වන බවත් ප්‍රකාශ කර ඇත .

යටවර මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටියදී ඔහු විසින් මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ගැනෙන ප්‍රකාශයක් සිදු කර ඇත. තමන්ට එවැනි ප්‍රකාශයක් කිරීමට අවශ්‍ය බවට පැ.22 (අ) ප්‍රකාශයෙහි යටවර මහතා සඳහන් කර ඇත.

අලියා ලියාපදිංචි කිරීම පිළිබඳ කතාවේ ප්‍රධානම සහ එකම සාධකය හැටියට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සොයාගෙන ඇත්තේ ව්‍යාජ ග්‍රාම සේවක සහතිකයක් ඉදිරිපත් කර අලියා ලියාපදිංචි කළාය යන කරුණු පමණි. මෙම ග්‍රාම සේවා සහතිකය ඉදිරිපත් කර ඇත්තේ ද 2008 වර්ෂයේදී ය. අලියා ලියාපදිංචි කිරීම පිණිස මෙම ග්‍රාම සේවක සහතිකය වනජීවී දෙපාර්තමේන්තුව විසින් සලකා බලා ඇත්තේ 2012 වර්ෂයේ, ව්‍යාජ යැයි කියනු ලැබූ ග්‍රාම සේවා සහතිකය ඉදිරිපත් කර අවුරුදු 4 කට පසුවය. මෙපමණ කාලසීමාවක් යටවර මහතා අලියා ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ අයදුම් පත්‍රය සහ ඊට අමුණා තිබූ ලේඛන වනජීවී දෙපාර්තුමේන්තුව විසින් සලකා නොබැලුවේ මන්ද යන කාරණයට පිළිතුරු ඉදිරිපත් වී නොමැත.

ව්‍යාජ ග්‍රාමසේවක සහතිකයක් පිළිබඳ ජවනිකාව කරලියට පැමිණෙන්නේ තිලිණ ගමගේ මහතා නමින් අලියා ලියාපදිංචි කිරීම සඳහා ඔහු විසින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදීය. ගමගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද, අලියා ලියාපදිංචි කිරීම සඳහා වූ ලිපි ලේඛන සලකා බලනු ලබන අවස්ථාවේදී, යටවර මහතා විසින් ඉදිරිපත් කර තිබූ, ඒ වනවිටත් වනජීවී දෙපාර්තමේන්තුව විසින් සලකා බලා තිබූ, ලිපි ලේඛන, නැවත සලකා බැලීමට වනජීවී දෙපාර්තමේන්තුව ක්‍රියා කළේ කුමන කරුණක් මුල් කරගෙන ද යන්න

පැහැදිලි කෙරෙන කිසිදු ලිපි ලේඛනයක් වනජීවී දෙපාර්තමේන්තුවේ ලිපිගොනුවල නොමැත.

වනජීවී දෙපාර්තමේන්තුවට මේ අන්දමින් ක්‍රියා කිරීමට කිසිදු නීතිමය ප්‍රතිපාදන නොමැත. අලි ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය කෙරෙන නෛතික ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මගින් සකසා නොමැත. එසේම පාර්ලිමේන්තුව විසින් කිසිදු අවස්ථාවක අනුමත නොකල, අලි ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා යැයි කියනු ලබන, රෙගුලාසි අඩංගු ගැසට් පත්‍රයෙහි ද අලියකු ලියාපදිංචි කිරීම සඳහා ග්‍රාම සේවා සහතිකයක් අවශ්‍ය බවට දැක්වෙන රෙගුලාසියක් අන්තර්ගතව නොමැත. එසේම, යටවර මහතා අලියා ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ලේඛන සමඟ ග්‍රාම සේවා සහතිකයක් ඉදිරිපත් කළ බවටද සාක්ෂි නොමැත. එවන් පසුබිමක් තුළ වනජීවී දෙපාර්තමේන්තුව අනිත්‍යානුකූල ලෙස ක්‍රියාකරමින් යටවර මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ ලේඛන දෝෂ සහගත බවට ප්‍රථම වතාවට 2012.10.26 දින දැනුම් දී ඇත.

ඉදිරිපත් වී ඇති ඉහතින් දක්වන ලද කරුණු අනුව, අවුරුදු හතරකට පසුව දෙවන ලියාපදිංචිය සිදු කරන අවස්ථාවේදී යටවර මහතා ඉදිරිපත් කළ පළමු ලියාපදිංචිය සඳහා වූ ලේඛන ගොන්නෙහි තිබුනා යැයි කියන ලද ව්‍යාජ ග්‍රාමසේවක සහතිකයක් පදනම් කරගෙන ඒ වන විටත් ලියාපදිංචි කර සිටි අලියකුගේ බලපත්‍රය අවලංගු කර දැමීමට වන ජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ක්‍රියා කිරීම පැහැදිලිවම කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළකි.

මේ සඳහා හොඳම උදාහරණය වශයෙන් පැමිණිලිකරු සඳහන් කළේ දැනට ලියාපදිංචි නොකළ අලි 17 දෙනකු සිටින බවත් අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුව එවැනි අලි 17 දෙනෙකු සිටින බවට වාර්තාවක් බී 23073 දරණ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවට ගොනු කළ බවත්, එසේම උදාහරණයක් හැටියට ගංගාරාම පන්සලේ සිටින අලියා මෙම පෙරකී නඩුවේ සැකකටයුතු අලියෙක් බවත්, එසේ වුවත් එම අලියා වනජීවී දෙපාර්තමේන්තුව භාරයට ගෙන නොමැති අතර අලියා ළඟ තබාගත් පුද්ගලයින්ට එරෙහිව නඩු පවරා නොමැති බවත්ය.

පැමිණිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති නඩුවේ අධි චෝදනා පත්‍රයේ පිටපතක් පැ.22 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. පැ.22 දරණ අධිචෝදනා පත්‍රය අධිචෝදනා 25 කින් සමන්විත වේ. අධිචෝදනා පත්‍රයේ අංක 01, 05, 09, 13, 17, 19, 20, 21 සහ 22 අධිචෝදනා පැමිණිලිකරුට එරෙහිව නගන ලද චෝදනාවන්ය. අධිචෝදනා පත්‍රයේ 10 වන චෝදනාවෙන් පළවන විත්තිකරු වන යටවර මහතාට චෝදනා කර ඇත්තේ කූඨ ලෙස සාදනු ලැබූ ලේඛනයක් එනම් ග්‍රාම නිලධාරි චන්ද්‍රසේනගේ අත්සන සහ නිල මුද්‍රාව සහිතව 2008.11.06 දිනැති ග්‍රාම නිලධාරී සහතිකයක් වනජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් උදේනි වික්‍රමසිංහ යන අයට ඉදිරිපත් කිරීම සඳහා පැමිණිලිකරු විසින් චන්ද්‍රරත්න යටවර මහතාට අනුබල දුන් බවත්, අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් එකී වරද සිදු කළ බවටත්, අධිචෝදනා පත්‍රයේ දහතුන්වන චෝදනාවෙන් පැමිණිලිකරුට අනුබලදීමේ වරද සඳහා චෝදනා නගා ඇත. ප්‍රශ්නගත ග්‍රාම නිලධාරී සහතිකය චන්ද්‍රරත්න යටවර මහතා විසින් ඉදිරිපත් කළ බවට අඩු තරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යටවර මහතාගෙන් 2016.02.24 දින ලබාගත් ඉහත කී පැ.22(අ)

ප්‍රකාශයේවත් සඳහන් කර නැත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන් 59622 විජේසිංහ විසින් පැ.22(අ) ප්‍රකාශය වාර්තා ගත කර ඇත. මෙම පොලිස් නිලධාරියා යටවර මහතාගෙන් විවිධ ප්‍රශ්න නගමින් ප්‍රකාශය සටහන් කරගෙන ඇත. විවිධ ලේඛන යටවර මහතා සකස් කළේ ද ඒවාට ඔහුගේ අත්සන් තැබුවේ ද යන්න ප්‍රශ්න කර ඇත. අලියා සම්බන්ධවද විවිධ ප්‍රශ්න නගා පිළිතුරු ලබාගෙන ඇත. එසේ වුවත් ප්‍රශ්නගත දිවුරුම් ප්‍රකාශය ගැන එකදු වචනයක්වත් මෙම පොලිස් නිලධාරියා යටවර මහතාගෙන් විමසා නැත.

ග්‍රාම නිලධාරී සහතිකයේ සඳහන් දිනය වන 2008.11.06 වන දින වන විට පැමිණිලිකරු කන්තලේ මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා වශයෙන් සේවය කර ඇති බව සාක්ෂිවලින් සනාථ වී ඇත. එම කාල වකවානුවේ පැමිණිලිකරු චන්ද්‍රරත්න යටවර මහතා දැන හඳුනාගෙන තිබී නොමැත. එසේම එම කාලවකවානුවේ දී පැමිණිලිකරුට අලියකු ඇති කිරීම සඳහා අවශ්‍යතාවයක් තිබී නොමැත. එසේම යටවර මහතාට එකී චෝදිත ලේඛන සකස් කිරීම සඳහා පැමිණිලිකරු අනුබල දුන් බවට අඩු තරමින් යටවර මහතාට තර්ජනයකර, බියට පත්කර ලබාගත් ඔහුගේ පැ.22(අ) ප්‍රකාශයෙහිවත් සඳහන් කර නැත. වනජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් උදේනි වික්‍රමසිංහට යටවර මහතා විසින් ව්‍යාජ ග්‍රාම නිලධාරී සහතිකයක් ඉදිරිපත් කළ බවට උදේනි වික්‍රමසිංහ හෝ වෙනත් පුද්ගලයෙකු ප්‍රකාශ කර නැත. මේ අනුව පැමිණිලිකරුට එරෙහිව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති අවස්ථාවක, අනුබලදීමේ වරද යටතේ පැමිණිලිකරුට එරෙහිව නීතිපතිවරයා විසින් අධි චෝදනා

පත්‍රයේ 13 වන චෝදනාව ඉදිරිපත් කිරීම නීතිපතිවරයාට ලබා දී ඇති අභිමතය අනිසි ලෙස භාවිතා කිරීමකි.

අධිචෝදනා පත්‍රයේ 17 වන චෝදනාවෙන් දක්වා ඇත්තේ ඉහත සඳහන් ග්‍රාම නිලධාරී සහතිකය ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන තබා ඉදිරිපත් කරමින් කූඨ ලේඛනයක් සකස් කළ බවය. දාහත්වන චෝදනාවෙන් එකී සහතිකය සකස් කිරීම සඳහා යටවර මහතාට පැමිණිලිකරු විසින් අනුබල දුන් බවට නැවත චෝදනා නගා ඇත. ඉහතින් සඳහන් කරනු ලැබූ හේතූන් මතම පැමිණිලිකරුට එරෙහිව 17 වන චෝදනාව ඒ ආකාරයෙන් ඉදිරිපත් කිරීමට නීතිපතිවරයා සතුව කිසිදු සාක්ෂියක් නොමැත.

අලියා තමාගේ නමින් ලියාපදිංචි කිරීම සඳහා චන්ද්‍රරත්න යටවර මහතා විසින් 2008 වර්ෂයේ දී ඉදිරිපත් කළ අයදුම් පත්‍රය ඊට අවුරුදු හතරකට පසුව සලකා බලා 2012.03.27 වන දින අලියා අංක 334 යටතේ ලියාපදිංචි කර එදිනම චන්ද්‍රරත්න මහතාගේ නමින් බලපත්‍රයක් නිකුත් කර ඇත. බලපත්‍රයක් මත තමාගේ භාරයේ සිටි ලියාපදිංචි අංක 334 දරණ අලියා යටවර මහතා විසිනි 2012 ජූලි 22 වන දින පැමිණිලිකරුට විකුණා ඇත. බලපත්‍රයක් මත තමාගේ භාරයේ සිටි අලියා විකුණා දැමීමට චන්ද්‍රරත්න මහතාට හිමිකම් ඇති බවට වනජීවී අධ්‍යක්ෂ ජනරාල් උදේනි වික්‍රමසිංහ මහතා තම සාක්ෂි යෙදී පිළිගෙන ඇත. ඒ අනුව යටවර මහතා විසින් ඉහත අංක 334 දරණ අලියා තිළිණ ගමගේ මහතාට 2012 ජූලි 22 වන දින විකුණන ලද බවට තම දෙපාර්තමේන්තුවට වාර්තා වී ඇති බව උදේනි වික්‍රමසිංහ මහත්මිය ඊට අදාළ ලිපි ගොනු පරීක්ෂා කර බලා පිළිගෙන ඇත. එසේම 2012 ජූලි 22 වන දිනම තිළිණ ගමගේ මහතා විසින්

ඉහත අංක 334 දරණ අලියා තමා මිලදී ගත් බවත් අලියා තමාගේ නමින් ලියාපදිංචි කර වාර්ෂික බලපත්‍රය තමාගේ නමින් නිකුත් කරන ලෙසට ඉල්ලා අයදුම්පත්‍ර ඉදිරිපත් කර තිබූ බවත් ඒ අනුව උදේනි වික්‍රමසිංහ මහත්මිය පිළිගෙන ඇත. තිළිණ ගමගේ මහතා ලියාපදිංචි අංක 334 දරන අලියා තම නමින් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කල අයදුම්පත්‍රය සමඟ යටවර මහතා විසින් ලබාදුන් ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත් සහ වාර්ෂික බලපත්‍රයද මිලදී ගැනීමේ කුවිතාන්සිය ද විකුණුම්කරු විසින් ලියාපදිංචිය වෙනස් කරන ලෙසට දැන්වූ ලිපිය ද ඇතුළුව සම්පූර්ණ කරන ලද අයදුම් පතක් ඉදිරිපත් කර තිබූ බවට උදේනි වික්‍රමසිංහ මහත්මිය පිළිගෙන ඇත. පැ.25 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරනු ලැබූ මහාධිකරණය ඉදිරියේ මෙහෙයවන වික්‍රමසිංහ මහත්මියගේ සාක්ෂිවලින් ද මෙම කරුණු සනාථ වී ඇත.

විකුණුම් කුවිතාන්සිය පිළිගැනීමට නොහැකි බවටත් එය දිවුරුම් පෙත්සමක් මගින් සනාථ කරන ලෙසටත් වනජීවී දෙපාර්තමේන්තුව විසින් තිළිණ ගමගේ මහතාට දැනුම් දී ඇති අතර ඒ අනුව තිළිණ ගමගේ මහතා සහ යටවර මහතා යන දෙදෙනා විසින්ම දිවුරුම් ප්‍රකාශ දෙකක් මගින් විකුණුම් කුවිතාන්සිය සනාථකර 2012 අගෝස්තු 18 දින වනජීවී දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත.

සිද්ධියට අදාළ කරුණු මෙතරම් පැහැදිලිව තිබියදීත් නීතිපතිවරයා විසින් අධිචෝදනා පත්‍රයේ 19, 20, 21 සහ 22 චෝදනා පැමිණිලිකරුට එරෙහිව නගා ඇත්තේ අලියා මිලදී ගත් වහාම වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයාට නොදැන්වීමත්, බලපත්‍රයක් නොමැතිව අලියකු ළඟ තබා ගැනීමත් සහ සොරකම් කරනු ලැබූ දේපළක් බවට

විශ්වාස කිරීමට හේතු ඇති පොදු දේපලක් වන අලියකු ළඟ තබා ගැනීමත් යන කරුනු පදනම් කරගෙනය.

පැමිණිලිකරු වන තිළිණ ගමගේ මහතාට එරෙහිව වරදක් හෙළිදරව් කරන කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති අවස්ථාවක මෙවැනි අධිචෝදනා පත්‍රයක් මහාධිකරණය ඉදිරියේ ඉදිරිපත් කිරීම තුළින් පැහැදිලිව පෙනී යන කරුණු වන්නේ යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා ද්වේෂසහගත ලෙස පැමිණිලිකරුට එරෙහිව චෝදනා ගොනු කර ඇති බවය.

ප්‍රශ්නගත අලියා ලියාපදිංචි කිරීම සඳහා මුල්වරට චන්ද්‍රරත්න යටවර මහතා විසින් 2008 නොවැම්බර් 12 වැනි දින වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ දිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය පැ.8 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ සමගම වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයද චන්ද්‍රරත්න යටවර විසින් 2008.11.12 වැනි දිනම ඉදිරිපත් කර ඇත. වාර්ෂික බලපත්‍රය ලබා ගැනීම සඳහා වූ එම ඉල්ලුම්පත්‍රය පැ.9 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.9 දරණ ඉල්ලුම් පත්‍රයෙහි 11 අංකය යටතේ - සන්තකයේ තබා ගැනීමට ඉල්ලුම්කරුට ඇති අයිතිය (ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන්න) - යන කොළඹ යටතේ අත් අකුරින් සඳහන් කර ඇත්තේ කසුරි නැමැති ඇතින්නට දාව උපන් පැටියෙක් මව් ඇතින්න මියගොස් ඇත. මව් ඇතින්න ලියා පදිංචි කර නොමැත. " යනුවෙනි.

චන්ද්‍රරත්න යටවර මහතා 2008 නොවැම්බර් මස 12 වන දින සිදු කරනු ලැබූ ඉහත සඳහන් ඉල්ලීමට වනජීවී දෙපාර්තමේන්තුව ප්‍රතිචාර දක්වා ඇත්තේ 2012 මාර්තු මස 27 දින දීය. වනජීවී

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වික්‍රමසිංහ මහතාගේ අලියා ලියාපදිංචි කිරීමේ සහතිකයක් සහ වාර්ෂික බලපත්‍රයක් 2012 මාර්තු මස 27 දින දාතමින් යුක්තව නිකුත් කර ඇත. එකී ලියාපදිංචි කිරීමේ සහතිකය පැ.6 වශයෙන්ද, වාර්ෂික බලපත්‍රය පැ.7 වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කර ඇත. යතුරු ලියනය කර ඇති පැ.7 දරන ඉහත සඳහන් වාර්ෂික බලපත්‍රයේ 11 අයිතමය යටතේ 'තම සන්තකයේ තබා ගැනීමට ඉල්ලුම්කරුට ඇති අයිතිය - (ඉදිරිපත් කරන සාක්ෂි සඳහන් කරන්න) - යන කොළඹ යටතේ වනජීවී දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර ඇත්තේ දිවුරුම් ප්‍රකාශය, ග්‍රාම නිලධාරි සහතිකය යනුවෙනි. චන්ද්‍රරත්න යටවර මහතා විසින් ඉදිරිපත් කරන ලද පැ.9 දරණ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයේ 11 අයිතමයට ඔහු සඳහන් කර ඇති විස්තරය වෙනුවට වෙනත් ලේඛන දෙකක් වනජීවී දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරන ලද පැ.7 දරණ බලපත්‍රයෙහි සඳහන් කර ඇත. යටවර මහතා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ බවට ඔහුගේ පැ.9 දරණ ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන නොමැත.

මේ අනුව යටවර මහතා අලියා ලියාපදිංචි කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ බවට කිසිදු සාක්ෂියක් නොමැති අවස්ථාවක වනජීවී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ වාර්ෂික බලපත්‍රයේ 11 අයිතමය යටතේ දිවුරුම් ප්‍රකාශය සහ ග්‍රාම නිලධාරී සහතිකය යනුවෙන් සඳහන් කළේ කුමන කරුණු පදනම් කරගෙනද යන්න වන ජීවී දෙපාර්තමේන්තුව පැහැදිලි කර නැත.

මෙම කාල සීමාව තුළ වනජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කළ උදේනි වික්‍රමසිංහ තමාගේ සාක්ෂියෙන්

සඳහන් කළේ අලි ලියාපදිංචි කිරීමට අදාළ ගැසට් පත්‍රයෙහි අලියකු ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛනවලට ග්‍රාම නිලධාරී සහතිකයක් ඇතුළත්ව නැති බවය. අලි ලියාපදිංචි කිරීම සිදු කරනු ලබන්නේ 1991 මැයි 14 වන දින අංක 662/4 දරණ ගැසට් පත්‍රයෙහි අඩංගු විධිවිධාන අනුව බවත් එම විධිවිධාන අනුව සහතිකයක් ග්‍රාම නිලධාරි සහතිකය අලියෙකු ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නොවන බවත් උදේනි වික්‍රමසිංහ පිළිගෙන ඇත. එසේම ඉහත සඳහන් කළ ගැසට්පත් හි අඩංගු රෙගුලාසි පාර්ලිමේන්තුව මගින් අනුමත කර නොමැති බවද වැඩිදුරටත් පිළිගෙන ඇත.

ප්‍රශ්නගත ග්‍රාමසේවක සහතිකය පිළිබඳව පරීක්ෂාකර බැලූ අඩවි වන ආරක්ෂක නිලධාරී වීරසිංහ මහතා එම ග්‍රාම නිලධාරී සහතිකයෙහි අන්තර්ගත ග්‍රාම නිලධාරියාගේ අත්සන සහ ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන දැන් අත්සන් දෙකෙහි නිවැරදිතාවය තහවුරු කරගැනීම සඳහා එම අත්සන් පරික්ෂා කිරීමට රස පරීක්ෂක වෙත යැවිය යුතු බවට නිර්දේශ කර ඇත. එසේ වුවත් එම අත්සන් රස පරීක්ෂක වෙත යවා නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සඳහා ක්‍රියාකිරීමට වනජීවී දෙපාර්තමේන්තුව ක්‍රියාකර නැත. මේ අනුව ඉදිරිපත් වී ඇති ග්‍රාම නිලධාරී සහතිකයෙන් නිරවද්‍යතාවය සනාථ කර ගැනීම සඳහා ක්‍රියාකිරීමට වනජීවී අධ්‍යක්ෂ ජනරාල් අසමත් වී ඇත.

අඩවි වන ආරක්ෂක නිර්දේශ කළ පරිදි අත්සන් වල නිරවද්‍යතාවය රස පරීක්ෂක මගින් සනාථ කර ගන්නවා වෙනුවට මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කලුහෙන්දිවල මහතා පත් කර ඇත. ඔහුගේ විමර්ශන වාර්තාවෙහි ද නිර්දේශ කර ඇත්තේ චන්ද්‍රරත්න යටවර මහතාට අංක 334 ලියාපදිංචි අංකය යටතේ නිකුත් කර

අවලංගු කරන ලද අලි බලපත්‍රය නැවත බලාත්මක කළ යුතු බවය. උදේනි වික්‍රමසිංහ මහතා සඳහන් කළේ මෙම නිර්දේශ ලැබෙන විට තමන් වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙන් ඉවත් වී අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත් වී සිටි බවය.

කලුහෙන්දිවල මහතාගේ විමර්ශන වාර්තාව නිර්දේශ සමග ඉදිරිපත් කර ඇති අතර එම නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී සලකා බලන ලද සාක්ෂි සහ ලේඛන 12ක් එම විමර්ශන වාර්තාවේ අන්තර්ගත කර ඇත. එම ලේඛන 12 අතර මව් ඇතින්න සහ ඇගේ පැටවා වන ප්‍රශ්නගත අලියාට ප්‍රතිකාර කරන ලද පශු වෛද්‍ය ජගත් පුෂ්ප කුමාර ජයසේකර මහතාගේ 2012 නොවැම්බර් මස 18 දිනැති ලිපිය, මව් ඇතින්න සහ ඇගේ පැටවා වන ප්‍රශ්නගත අලියා රැක බලාගත් ඇත්ගොව්වාගේ දිවුරුම් ප්‍රකාශය, හෝමාගම ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිත මීගොඩ ගැහැනුවල අංක 447/ සී ග්‍රාම නිලධාරී සහතිකය නොදුන් බවට චන්ද්‍රරත්න යටවර මහතාගේ දිවුරුම් ප්‍රකාශය සහ පැමිණිලිකරුට අලියා විකුණූ කුවිතාන්සිය සහ දිවුරුම් ප්‍රකාශය, පැමිණිලිකරු නමින් ලියාපදිංචි කර වාර්ෂික බලපත්‍රය ලබා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය ද අන්තර්ගත වේ.

කලුහෙන්දිවල මහතා විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර සාක්ෂි විභාග කර ඉදිරිපත් කරනු ලැබූ ලේඛන පරීක්ෂාකර බලා සකස් කරන ලද විමර්ශන වාර්තාවේ නිගමනය පහත සඳහන් පරිදි වේ. "මෙම අලියා පිළිබඳව ඉදිරිපත් කර ඇති 2012 නොවැම්බර් මස 18 දිනැති පශු වෛද්‍ය වාර්තාව ඇත්ගොව්වාගේ 2012 නොවැම්බර් මස 12 දිනැති දිවුරුම් ප්‍රකාශය හා ගොනු අංක 7 හි ඇති චන්ද්‍රරත්න යටවර මහතාගේ 2008 නොවැම්බර් මස 10 දිනැති දිවුරුම් ප්‍රකාශය ද

සැලකිල්ලට ගැනීමේදී දැනට ටී. ජී. එස්. ටී. වින්සන් මහතාට විකුණා ඇති අලියා කපුරි නැමැති ඇතින්නට දාව උපන් බව නිගමනය කරමි.

පැ.17 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති කලුහෙන්දිවල මහතාගේ ඉහත කී විමර්ශන වාර්තාවේ මේ නිර්දේශ හතරක් දක්වා ඇත. එම නිර්දේශ පහත උපුටා දක්වා ඇත.

(උපුටා ගැනීම)

"නිර්දේශ.

1. වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනතේ පනතට හා එක් දහස් 1991 මැයි 14 දිනැති අංක 662/4 විශේෂ ගැසට් පත්‍රයේ නියෝගවලට අනුව අදාළ ලිපි ලේඛන මොහු විසින් ඉදිරිපත් කර ඇති බැවින් චන්ද්‍රරත්න යටවර මහතාගේ අංක 334 දරන අලියාට ලබා දී ඇති අවලංගු කරන බලපත්‍රය බලාත්මක කිරීම.

2. එසේ අවලංගු කරන ලද බල පත්‍රයක් බලාත්මක කිරීම කළ යුත්තේ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (469 වන අධිකාරය) 56 වගන්තියේ (4) අනුව කටයුතු කළ යුතුය.

3. චන්ද්‍රරත්න යටවර මහතාට අයත් මෙම අලියා විකුණා ඇති ටී.ජී.එස්.ටී. වින්සන් මහතාට වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (469 වන අධිකාරිය) 22 වගන්තියේ (4) අනුව බල පත්‍රයක් නිකුත් කිරීම.

4. මෙම අලියා ලියාපදිංචි කිරීමේ දී ගොනුවේ පිටු අංක 6 හි ඇති හෝමාගම ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිත මීගොඩ

ගැහැනුවල අංක 447/සී ග්‍රාම නිලධාරී සහතිකය චන්ද්‍රරත්න යටවර මහතා ලබා නොදුන් බවට ලබාදී ඇති 2012.11.08 දිනැති දිවුරුම් ප්‍රකාශය අනුව මෙම ලිපිය ගොනුවට ලැබීම සම්බන්ධයෙන් කරුණු සොයා බලා ගොනුව සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරීන්ට අවශ්‍ය පිය පියවර ගැනීම.”

(උපුටා ගැනීම අවසන්)

මෙම පරීක්ෂණ වාර්තාව තමන් වෙත ලැබෙන විට තමන් වනජීවී දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂකධූරයෙන් ඉවත්ව වනජීවී දෙපාර්තමේන්තුවේ වනජීවී අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් රාජකාරිය ඉටුකරමින් සිටි බවත් ඒ අනුව කලුහෙන්දිවල මහතාගේ ඉහත කී වාර්තාව නිර්දේශද සමඟ පියවර ගැනීම සඳහා ඒ වන විට වනජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් රාජකාරිය ඉටුකළ රත්නායක මහතා වෙත යොමුක කළ බව ප්‍රකාශ කළේය.

එම ලිපිය පැ.25(1) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.25(1) ලිපිය ලැබීමෙන් පසුව වනජීවී අධ්‍යක්ෂක ජනරාල් විසින් පැ.18 දරණ ලිපිය අමාත්‍යාංශයේ ලේකම් උදේනි වික්‍රමසිංහ වෙත යවා ඇත. එම ලිපිය ලැබීමෙන් පසුව උදේනි වික්‍රමසිංහ විසින් අදාල ලිපිය අනුමැතිය සඳහා නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. නියෝජ්‍ය  අමාත්‍යවරයා විසින් බලපත්‍රය නිකුත් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන අනුමැතිය එම ලිපියට ලබා දී ඇත. ඒ අන්දමින් අවශ්‍ය නීතිමය කටයුතු සිදුවී තිබියදීත් අලියාගේ බලපත්‍රය පැමිණිලිකරුට නිකුත් කර නොමැත. අදාළ ලිපි ගොනුව වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා භාරයේ තිබූ බැවින් තමන්ට ලේකම් වශයෙන් එම කටයුතු සොයා බැලීමට අවකාශයක් නොතිබුණ බව ද අවශ්‍ය

අනුමැතිය නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ලබාදී තිබූ බැවින් බලපත්‍රය පැමිණිලිකරු වෙත නිකුත් නොකර සිටීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හේතුවක් නොතිබුණ බව ද උදේනි වික්‍රමසිංහ මහතා වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

2012 දෙසැම්බර් මාසයේ සිට 2015 නොවැම්බර් මාසය දක්වා වන ජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කළ හිටි බණ්ඩාරලෑ දයාවන් රත්නායක මහතා සාක්ෂි දෙමින් එවකට අමාත්‍යාංශ ලේකම්ව සිටි උදේනි වික්‍රමසිංහ මහතා විසින් එවන ලද පැ. 25(1) ලේඛනය තමන් වෙත ලැබුණු බවත් ලේඛනයෙහි "උක්ත කරුණට අදාලව අමාත්‍යාංශයේ විමර්ශන අංශය විසින් සිදු කරන ලද වාර්තා නිර්දේශයන් ඇතුළත් පිටු අංක 01 සිට 06 දක්වා වූ අදාළ ඇමුණුම් සහිත මූලික විමර්ශන වාර්තාව මේ සමග එවමි මේ මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කර ඔබ ඒ පිළිබඳව ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි" යනුවෙන් සඳහන්ව තිබූ බවත්, ඒ අනුව ගෙවීම් විමර්ශන වාර්තාවේ එකී විමර්ශන වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ඉල්ලා ලිපියක් අමාත්‍යාංශය ලේකම් වෙත යැවූ බවත් සඳහන් කළේය.

පැ. 25 (4) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් ලිපියෙහි රත්නායක මහතා මෙසේ සඳහන් කර ඇත." අංක 334 යටතේ ලියාපදිංචි කර ඇති අලියාට ලබාදී ඇති බල පත්‍රය බලාත්මක කිරීම මාගේ සමාංක 2012 .10.26 දිනැති ලිපිය මගින් 334 යටතේ ලියා පදිංචි අලියාගේ බලපත්‍රය අවලංගු කරන ලදී. නමුත් ඒ පිළිබඳ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ

(විමර්ශන) විසින් විමර්ශනය කරන ලදුව එම විමර්ශනයෙන් අනාවරණය වූ කරුණු පදනම් කරගෙන එකී අලියා සඳහා වූ බලපත්‍රය නැවත බලාත්මක කිරීම නිර්දේශ කර ඇත. වන සත්ත්ව ආරක්ෂණ පනතේ අධිකාරිය 56 වගන්තිය (4) අනුව බලපත්‍රය නැවත බලාත්මක කිරීම සඳහා විෂය භාර ඇමතිතුමාගේ අවසරය ලබාගත යුතු බැවින් එම අවසරය මා වෙත ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි"

එසේම පැමිණිලිකරු වන වින්සන්ට් මහතා විසින් එවන ලද අලියා තමා නමින් ලියාපදිංචි කිරීම සඳහා වූ අයදුම්පත්‍රය ද ලැබුණු බව සාක්ෂිකාර රත්නායක මහතා පිළිගෙන ඇත. එම අයදුම්පත්‍රය ලැබීමෙන් පසුව ඊට පිළිතුරු ලිපියක් යවමින් "අංක 334 යටතේ ලියාපදිංචි කර ඇති අලියාගේ හිමිකාරීත්වය ඔබගේ නමට පවරා ගැනීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කර ඇති ලේඛන මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බවද ඒ ඉල්ලීම සඳහා ඉදිරියේදී පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි" යනුවෙන් දැනුම්දීමක් කර ඇත.

විමර්ශන වාර්තාව අනුව අංක 334 දරණ අලියාට බලපත්‍රය නිකුත් කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබුණු බැවින් බලපත්‍රය නිකුත් කිරීම සඳහා ලිපි ගොනුව කාර්යාලයේ නීති අංශය වෙත 2013 ජනවාරි මස විසි 24 වන දින යොමු කළ බවද සාක්ෂිකරු වැඩිදුරටත් සඳහන් කළේය.

සාක්ෂිකාර අසරප්පුලිගේ සිරිදත්තා චාන්දනී විල්සන් සඳහන් කළේ මෙම කාල සීමාවේදී විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබූ විගණන විමසුම් වලට පිළිතුරු දෙමින් කාලය ඒ සඳහා ගත කළ

බැවින් අලියා ලියාපදිංචි කිරීමේ බලපත්‍රය නිකුත් කිරීම ප්‍රමාද වූ බවය.

ඉහත සාක්ෂි  සනාථ කිරිම සඳහ පැ.1 සිට පැ. 29 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

Chamila Fernando
24/11/2020

24/11/2020

2020.11.24

# පිළිගැන්වීම

ශ්‍රී ලංකා  ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් වෙත.

# පටුන

## (දෙවන වෙළුම)


| | | පිටු අංක |
|---|---|---|
| XXI. | පැ.අංක - 1969/2020<br>අරුමාදුර වින්සන්ට් ප්‍රේමලාල් සිල්වා | 704-720 |
| XXII. | පැ.අංක - 115/2020<br>ලලිත් අනුරුද්ධ ජයසිංහ | 721-860 |
| XXIII. | පැ.අංක - 238/2020<br>ප්‍රේම ආනන්ද උදලාගම | 861-870 |
| XXIV. | පැ.අංක - 885/2020<br>සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් | 871-892 |
| XXV. | පැ.අංක - 1116/2020<br>ජාලිය චිත්‍රාන් වික්‍රමසූරිය | 893-906 |
| XXVI. | පැ.අංක - 28/2020<br>කහදගමගේ මහින්දරත්න | 907-915 |
| XXVII. | පැ.අංක - 1091-1092/2020<br>චන්ද්‍රපාල ලියනගේ | 916-931 |
| XXVIII. | පැ.අංක - 1131/2020<br>සනත් ප්‍රියන්ත දළුවත්ත | 932-940 |
| XXIX. | පැ.අංක - 141/2020<br>විමල් රූබසිංහ | 941-958 |
| XXX. | • පැ.අංක - 402/2020<br>ඩී.එම්.එස්.දිසානායක | 959-978 |

• පැ.අංක - 206/2020
ඩී.එම්.සුජාතා දමන්ති ජයරත්න
XXXI. පැ.අංක - 50/2020 979-1063
නිශ්ශංක යාපා සේනාධිපති
XXXII. පැ.අංක - 1807/2020 1064-1081
මේජර් ජනරාල් පාලිත ප්‍රනාන්දු
XXXIII. පැ.අංක - 431/2020 1082-1092
වික්ටර් සමරවීර
XXXIV. පැ.අංක - 184/2020 1093-1114
රෝහිත බෝගොල්ලාගම
XXXV. පැ.අංක - 007/2020 1115-1143
මෝසස් රංගජීව නෙවමාල්
XXXVI. පැ.අංක - 12/2020 1144-1152
ළමාහේවගේ එමිල් රංජන්
XXXVII. • පැ.අංක - 1081/2020 1153-1167
උදයංග වීරතුංග
XXXVIII. • පැ.අංක - 1080/2020 1168-1191
උදයංග වීරතුංග
XXXIX. • පැ.අංක - 650/2020 1192-1204
ඥානලිංගම් ධනේෂ්වරී
• පැ.අංක - 34/2020
පී.එල්.අයි.පෙරේරා
• පැ.අංක - 269/2020
ජී.ඒ.මාලනි

- පැ.අංක - 403/2020

  කේ.වී.රංජනි මල්කාන්ති

XL. පැ.අංක - 1842/2020 1205-1235

සේපාල රත්නායක

XLI. පැ.අංක - 427/2020 1236-1239

කුමුදුමාල් චන්දන පැල්පිට

XLII. පැ.අංක - 1070/2020 1240-1249

එල්.එම්.තිස්ස විමලසේන

XLIII. පැ.අංක - 1940/2020 1250-1255

නුගදූව විතානගේ කුමාර ජයකාන්ත

XLIV. පැ.අංක - 77/2020 1256-1263

පී.කේ.ඩබ්.ආර්.එම්.ටී.බී.පිලපිටිය

XLV. පැ.අංක - 18/2020 1264-1277

ලේකම් මුදියන්සේලාගේ මාලනී කුමාරි

XLVI. පැ.අංක - 1941/2020 1278-1292

චමින්ද පුෂ්පකුමාර අතුලුවගේ

XLVII. පැ.අංක - 317/2020 1293-1428

එස්.එම්. චමින්ද ප්‍රසාද් සමරකෝන්


## (පළමු වන වෙළුම)


1. පසුබිම 01-05
2. කොමිෂන් සභාවේ සංයුතිය 06
3. නිල කාලය 07
4. කාර්ය මණ්ඩලය 08-11
5. අධිකරණ බලය සහ කොමිෂන් සභා පරිශ්‍රය 12-14

6. පැමිණිලි භාර ගැනීම 15

7. මූලික විමර්ශන සහ සාක්ෂි විභාග 16

8. දූෂණ විරෝධි කමිටුව සහ එහි ලේකම් කාර්යාලය මගින් සිදු කළ පොදු දේපල අවභාවිතාව 17-51

9. සාක්ෂි සම්පින්ඩනය, නිර්දේශ සහ වගකිවයුතු පුද්ගලයින්

I. පැ.අංක - 01, 05/2020 52-103

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ

II. පැ.අංක - 002/2020 104-192

රියද් අද්මිරාල් ඩී.කේ.පී.දසනායක

III. පැ.අංක - 003/2020 193-226

කමාන්ඩර් සුමිත් රණසිංහ

IV. පැ.අංක - 80/2020 227-268

ලු/ ක ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි

V. පැ.අංක - 55/2020 269-288

ගාමිණී සෙනවිරත්න

VI. පැ.අංක - 107/2020 289-299

කේ.පී.චමින්ද

VII. පැ.අංක - 344/2020 300-319

කමාන්ඩර් එම්.එම්.ඩී.ඒ.මාපා

VIII. පැ.අංක - 345/2020 320-350

ලු/ කමාන්ඩර් එස්.ඩී.එස්.එස්.දයානන්ද

IX. පැ.අංක - 205/2020 351-413

වෛද්‍ය යද්දෙහිගේ දොන් නිහාල් ජයතිලක

X. පැ.අංක - 289-290/2020 414-455

රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක

XI. පැ.අංක - 316/2020 456-478

ආර්.ජී.බන්දුල තිලකසිරි

XII. පැ. අංක - 88/2020 479-511

ඩී.එස්.ජයවීර

XIII. පැ.අංක - 319/2020 512-522

ඩබ්ලිව්.විමලසේන

XIV. පැ.අංක - 816/2020 523-549

හේවා ගුණරත්න හාෂ්වර සේනාංක

XV. පැ.අංක - 545/2020 550-572

පා.ම.නීතිඥ උදය ගම්මන්පිල

XVI. පැ.අංක - 1963/2020 573-588

යෝෂිත කණිෂ්ක රාජපක්ෂ

XVII. පැ.අංක - 1964/2020 589-607

රොහාන් වැලිවිට

XVIII. • පැ.අංක - 432/2020 608-628

ආචාර්ය නාලක හර්ෂජීව ගොඩහේව

• පැ.අංක - 433/2020

ධම්මික මන්ජිර පෙරේරා

XIX. • පැ.අංක - 619/2020 629-649

නිශාන්ත ආසිරි ප්‍රනාන්දු

• පැ.අංක - 375/2020

එස්.කේ.කමින්ද හර්ෂජිත්

XX. පැ.අංක - 04/2020 650-703

ගමගේ තිළිණ සජෝත වින්සන්ට්

## ( තෙවන වෙළුම)


XLVIII. පැ.අංක - 856/2020 1429-1435

හෙට්ටිආරච්චිගේ උපාලි ගුණසේකර

XLIX. පැ.අංක - 893/2020 1436-1448

එම්.එස්.පී. මල්ලවගේ

L. පැ.අංක - 22/2020 1449-1480

කපිල ප්‍රියදර්ශන ආරියවංශ

LI. පැ.අංක - 408/2020 1481-1485

උපාලි ලියනගේ

LII. පැ.අංක - 615/2020 1486-1494

අංගොඩගේ දොන් සුමිත් වම්මික පෙරේරා

LIII. පැ.අංක - 43/2020 1495-1506

ඉමදූවගේ ඉන්දික සම්පත්

LIV.
- පැ.අංක - 325/2020 1507-1555

  ආර්.පී.ඩී.තාරක සෙනවිරත්න

- පැ.අංක - 326/2020

  ජගත් පී.විජේවීර

LV. පැ.අංක - 414/2020 1556-1579

පියදාස කුඩාබාලගේ

LVI. පැ.අංක - 416/2020 1580-1601

කොක්කාවිට ලියනගේ ලසන්ත බණ්ඩාර

LVII. පැ.අංක - 415/2020 1602-1620

ඩබ්ලිව. ඒ. එස්. ප්‍රසන්න නානායක්කාර

LVIII. පැ.අංක - 29/2020 1621-1648

පී.ජී.ආර්. චිත්‍රානන්ද අබේරාජ් ගම්ලත්

LIX. පැ.අංක - 352/2020 1649-1672

එච්.කේ.ඩී.ඩබ්ලිව්. නීල් බණ්ඩාර හපුහින්න

LX. • පැ.අංක - 24/2020 1673-1821

ශම්මි අර්ජුන කුමාරරත්න

• පැ.අංක - 200/2020

ආර්.එම්.පී.කුමාර රාජපක්ෂ

• පැ.අංක - 198/2020

ඩබ්ලිව්.විනි ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන

• පැ.අංක - 196/2020

එස්.එම්.රවින්ද්‍ර රූපසේන

• පැ.අංක - 194/2020

වයි.එම්. චමින්ද කුමාර අබේරත්න

• පැ.අංක - 197/2020

එස්.එම්.කනිෂ්ක ගුණරත්න

• පැ.අංක - 199/2020

අයියසාමි බාලසුබ්‍රමනියම්

• පැ.අංක - 195/2020

ඩී.ජී.තරංග ප්‍රසාද් ගමගේ

• පැ.අංක - 104/2020

ටී.එරන්ද රදිෂ් පිරිස්

• පැ.අංක -239/2020

එස්.ඒ. හේමචන්ද්‍ර පෙරේරා

• පැ.අංක - 31/2020

ටී.ටොෂිනාත් ප්‍රබෝධ සිරිවර්ධන

• පැ.අංක - 231/2020

පී.පී.වසන්ත සුදේශ කුමාර උලුගෙදර

- පැ.අංක - 1052/2020

වර්ණකුලසූරිය අනුර ජයලත්

- පැ.අංක - 347/2020

තුවාන් නසාර් මුතාලිප්

LXI. • පැ.අංක - 204/202 1822-1941

ඒ.එච්.ඒ.ලසන්ත විමලවීර

- පැ.අංක - 239/2020

එස්.ඒ.හේමචන්ද්‍ර පෙරේරා

- පැ.අංක - 241/2020

යූ. ප්‍රභාත් දුමින්ද විරරත්න

- පැ.අංක - 242/2020

එම්.පී.නිශාන්ත කුමාර

- පැ.අංක - 253/2020

එස්.එම්.චන්ද්‍රාබය ජයසූරිය

- පැ.අංක - 257/2020

ජී.ඒ.චාමික සුමිත්

- පැ.අංක - 296/2020

ජී.ඒ. ප්‍රියන්ත කුමාර සෝමසූරිය

- පැ.අංක - 297/2020

එච්.එම්.නිශාන්ත ජයතිලක

- පැ.අංක - 353/2020

බණ්ඩාර දිසානායක බුලත්වත්ත

- පැ.අංක - 232/2020

කේ.ඒ.ධම්මික අමල් කරුණාසේකර

- පැ.අංක - 203/2020

  රාජපක්ෂගේ ලලිත් රාජපක්ෂ

10.කොමිෂන් සභාවේ අවධානයට ලක්වූ පැමිණිලි

I. පැ.අංක - 1885/2020 1942-1949

විලියම් විජේසිංහ ගමගේ

II. පැ.අංක - 1968/2020 1950-1956

කිරුකුමාර් නඩේසන්

III. පැ.අංක - 956/2020 1957-1967

ජේ.එම්. හද්‍රානි ජයවර්ධන

IV. පැ.අංක - 571/2020 1968-1972

ජේ.ඒ.ආර්. ප්‍රදීප් ජයසූරිය

V. පැ.අංක - 434/2020 1973-1977

ජේ.එම්.නිමල්සිරි ලක්ෂ්මන්

VI. පැ.අංක - 1871/2020 1978-1981

විසිදාගමගේ අජිත් පුෂ්පකුමාර

VII. පැ.අංක - 950/2020 1982-1986

කේ.එම්. ප්‍රියන්ත ගුණතිලක බණ්ඩාර

VIII. පැ.අංක - 1141/2020 1987-1992

එම්.අන්සාර් ඉර්ෆාන් ෆකිර්ඩීන්

IX. පැ.අංක - 1140/2020 1993-1998

සුරේෂ් චන්දන පල්ලේගම

X. පැ.අංක - 60/2020 1999-2005

ඩී.එම්.අනුරාධ කාංචන බණ්ඩාර

XI. පැ.අංක - 555/2020 2006-2014

ඒ.ආර්.පී.ඩබ්.බී.දේදුනුපිටිය

XII. පැ.අංක - 551/2020 2015-2018

ඊ.සී.පී.ආර්.පතිරණ

XIII. පැ.අංක - 554/2020 2019-2026

වලහක මුදලිගේ සරත් පෙරේරා

XIV. පැ.අංක - 274/2020 2027-2030

ලැබුන හේවගේ රංජිත් සේපාල

XV. පැ.අංක - 1320/2020 2031-2035

දෝන නිශාන්තා කමනි හෙට්ටිආරච්චි

XVI. පැ.අංක - 567/2020 2036-2037

මර්වින් ප්‍රනාන්දු පුල්ලේ

XVII. පැ.අංක - 610/2020 2038-2039

අයිවන් ද සිල්වා

11.I . ඉල්ලා අස්කරගත් පැමිණිලි 2040

II . බහා තබන ලද පැමිණිලි 2041

III . නිශ්ප්‍රභා කරන ලද පැමිණිලි 2042

12.කොමිෂන් සභාවට ලැබී ඇති පැමිණිලි

පිළිබඳ සාරාංශය 2043

## 9 .XXI

පැමිණිලි අංකය - 1969/2020

පැමිණිලිකරු - අරුමාදුර වින්සන්ට් ප්‍රේමලාල් සිල්වා

ලිපිනය - අංක 40/ පෙරේරා මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. රංජන් රාමනායක
2. පද්මිණී රණවක මහත්මිය
3. ශානි අබේසේකර

### තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර අරුමාදුර ලෝරන්ස් රෙමෙලෝ දුමින්ද සිල්වා සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය කිරීමේ වරදට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහුට මරණ දඬුවම සහ සිර දඬුවම් පැනවීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. එබැවින්, එකී අරුමාදුර ලෝරන්ස් රෙමෙලෝ දූමින්ද සිල්වා මහතාට එරෙහිව කොළඹ මහාධිකරණයෙහි ගොනු කරන ලද HC 7781/15 දරන නඩුවේ අධිචෝදනා පත්‍රයෙහි දැක්වෙන සියලුම චෝදනාවලින් එකී අරුමාදුර ලෝරන්ස් රෙමෙලෝ දූමින්ද සිල්වා නිදොස් කොට නිදහස් කල යුතුව තිබූ බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේ වුවත්, එකී අරුමාදුර ලෝරන්ස් රෙමෙලෝ දූමින්ද සිල්වාට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC 8331/16 දරන අධි චෝදනා පත්‍රයේ සඳහන් වරද වලට එකී දූමින්ද සිල්වා වරදකරු කර මහාධිකරණය විසින් මරණ දඬුවම් සහ සිර දඬුවම් නියම කර, එකී දඬුවම් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවේ දී, මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කෙරුණ නව සාක්ෂි මහාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් නොකිරීමෙන් යුක්තිය අවගමනය වී ඇති හෙයින්, 11 වන විත්තිකාර අරුමාදුර ලෝරන්ස් රෙමෙලෝ දූමින්ද සිල්වා වරදකරු කිරීම පිළිබඳ නඩු තීන්දුව, පුළුල් විනිශ්චය මණ්ඩලයක් මගින් අධිකරණ සමාලෝචනයක් සඳහා (Judicial Review) නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව නිර්දේශ කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය

යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිණිලිකරු රැඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකූඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

5. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

6. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම්

සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණ නඩු අංක HC 7781/15 දරන නඩුවේ 11 වන විත්තිකරු වන අරුමාදුර ලෝරන්ස් රෙමෙලෝ දුමින්ද සිල්වා, පැමිණිලිකරුගේ පුතකු වන අතර දැනට එකී නඩුවේ චෝදනා වලට වරදකරු වී මරණ දඬුවමට නියමිතව වැලිකඩ බන්ධනාගාරයේ සිටී.

2016.09.08 දිනැති උක්ත ත්‍රිපුද්ගල මහාධිකරණ නඩු තීන්දුව බෙදුණු නඩු තීන්දුවක් වන අතර එහි සභාපති ශිරාන් ගුණරත්න විනිශ්චකාරතුමාගේ තීන්දුවෙන් අධිචෝදනා පත්‍රයේ නම් සදහන් සියලුම විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කර ඇති අතර සෙසු විනිසුරු දෙපල වන පද්මිනී රනවක මහත්මියගේ සහ එම්. සී. බී. එස්. මොරායස් මහතාගේ තීන්දුවෙන් 11 වන විත්තිකරු වන දුමින්ද සිල්වා, මනුෂ්‍ය ඝාතන චෝදනාවට වරදකරු කර මරණ දඬුවම නියම කර ඇත.

මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල පිළිබඳ විමර්ශනයේ දී ප්‍රේමලාල් ද සිල්වා මහතා සාක්ෂි දෙමින් ඔහුගේ

දිවුරුම් ප්‍රකාශයක් පැ.1 වශයෙන්ද, ඔහුගේ පැමිණිල්ල පැ.2 වශයෙන්ද සලකුණු කර ඉදිරිපත් කරමින් එහි සඳහන් කරුණු සනාථ කරමින් දිවුරුමක් මත සාක්ෂියක් ලබා දී ඇත.

මෙම තීන්දුවෙන් අගතියට පත් එකොළොස් වන විත්තිකරු වන දුමින්ද සිල්වා සහ අනෙකුත් විත්තිකරුවන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලද අතර 2018.10.11 දිනති ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් අභියාචකයින් 17 වන චෝදනාවෙන් නිදහස් කරන ලද අතර අනිකුත් චෝදනා සම්බන්ධයෙන් අභියාචනය නිෂ්ප්‍රභා කරමින් මහාධිකරණය විසින් නියම කරන ලද මරණ දඬුවම ස්ථිර කර ඇත.

පැමිණිලිකරු මෙම කොමිෂන් සභාව ඉදිරියේ ලබාදුන් සාක්ෂියට අනුව ඉහත නඩු තීන්දුව සහ ඊට ප්‍රථම පැවති විමර්ශනයත් දේශපාලන වශයෙන් ඔහුගේ පුත්‍රයාට විරුද්ධ පාර්ශ්වයන් විසින් ඔහුගේ පුත්‍රයා වරදකරු කිරීමේ අභිලාෂයෙන් අසත්‍ය සාක්ෂි නිර්මාණය කර එකී විමර්ශනය සහ නඩු විභාගය පැවැත්වීමට කටයුතු කර ඇති අතර ඒ හේතුවෙන් ඒවා පක්ෂග්‍රාහී වී ඇති අතර, ඒ බවට පුවත්පත්, සමාජ මාධ්‍ය ජාලා මෙන්ම අනිකුත් මාධ්‍ය වලින්ද ඒ පිළිබඳව ප්‍රචාරයක් ලබා දී ඇත.

මෙම අපරාධය පිළිබඳ විමර්ශනයේ දී මෙන්ම ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැවති නඩු විභාගයේ දී ද ඉදිරිපත් වී ඇති සාක්ෂිවලට අනුව පැමිණිලිකරුගේ පුත්‍රයාට මුලින්ම වෙඩි පහර ලැබී ඇති අතර එකී වෙඩි පහර ඔහුගේ පුත්‍රයාගේ නලලට වැදී එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු තුවාල ලබා අප්‍රාණිකව බිම ඇද වැටී ඇත. ඒ අනුව තුවාල ලත් තම පුත්‍රයා ජයවර්ධන මහ රෝහලට රැගෙන ගොස් ප්‍රතිකාර ලබා දී ඉන්

පසුව වැඩිදුර ප්‍රතිකාර සඳහා සිංගප්පූරුවේ මවුන්ට් එළිසබෙත් රෝහලට රැගෙන ගොස් ඇත.

මෙම වෙඩි හුවමාරුවේදී පළමුව වෙඩි වැදී ඇත්තේ පැමිණිලිකරුගේ පුත්‍රයා වන දුමින්ද සිල්වාට බවත් ඔහු එම වෙඩි පහරවලින් බිම ඇද වැටී ඇති බවත් නීතිපතිවරයාද ශ්‍රේෂ්ඨාධිකරණයේදී පිළිගෙන ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් තමාගේ පුත්‍රයාට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාධාරණ පරීක්ෂණයක් පවත්වා නොමැති බවට පැමිණිලිකරු චෝදනා කළේය.

මෙම මනුෂ්‍ය ඝාතන සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරනයේ ලඝු නොවන පරීක්ෂණයක් පවත්වා ඇත. ලඝු නොවන පරීක්ෂණය අවසානයේ දී නීතිපතිවරයා විසින් 11 වන විත්තිකාර දුමින්ද සිල්වා ඇතුළු විත්තිකරුවන්ට එරෙහිව කොළඹ මහාධිකරණය අධි චෝදනා ගොනු කර ඇත. මෙම අධිචෝදනා පත්‍රය කොළඹ මහා මහාධිකරණයේ අංක 1 මහාධිකරණය ශාලාවේ එවකට මහාධිකරණ විනිශ්චකාර දේවිකා තෙන්නකෝන් මහත්මිය ඉදිරියේ කැඳවන ලදුව දුමින්ද සිල්වා හැර මහාධිකරණය ඉදිරියේ පෙනී සිටි විත්තිකරුවන් ඇප මත මුදා හැරීමත් 11 වන විත්තිකරු ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය නියෝග නිකුත් කරමින් නඩුව ඉදිරි දිනට කල් තැබීමත් සිදුකර ඇත. ඉන්පසුවත් මහාධිකරණ විනිශ්චකාර දේවිකා තෙන්නකෝන් මහත්මිය ඉදිරියේ මෙම නඩුව අවස්ථා ගණනාවක දීම කැඳවා අවශ්‍ය නියෝග නිකුත් කරමින් තිබී ඇත.

එලෙස මහාධිකරණය ඉදිරියේ පවතිමින් තිබූ නඩුව එකවරම ත්‍රිපුද්ගල මහාධිකරණයක් වෙත ඉදිරිපත් කිරීම සඳහා නීතිපතිවරයා විසින්

සිදුකරන ලද ඉල්ලීමක් පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා විසින් අවශ්‍ය නියෝග නිකුත් කර ඇති අතර ඒ අනුව ත්‍රිපුද්ගල මහාධිකරණයක් පත්කර එකී මහාධිකරණ මණ්ඩලය ඉදිරියේ මෙම නඩුව වැඩිදුර ඉදිරි කටයුතු සඳහා කැඳවා විභාගකිරීම සිදු කර ඇත.

පැමිණිලිකරු සාක්ෂියේ දී සඳහන් කළේ මහාධිකරණ විනිශ්චයකාර දේවිකා තෙන්නකෝන් මහත්මිය ඉදිරියේ විභාග වෙමින් පැවති නඩුව ඇයගෙන් ඉවත්කර මහාධිකරණ මණ්ඩලයක් ඉදිරියේ විභාග කිරීම සඳහා අවශ්‍ය කෙරෙන කරුණු කිසිවක් එම අවස්ථා වනවිට මෙම නඩුව මගින් නිර්මාණය වී නොතිබුණ බවය. ඒ වන විටත් මෙම නඩුවේ ලඝු නොවන පරීක්ෂණයක් මහේස්ත්‍රාත් අධිකරණය විසින් පවත්වා තිබුණ බැවින් ත්‍රිපුද්ගල මහාධිකරණයක් පත් කිරීමේ අවශ්‍යතාවයක් නඩුවේ මුල් අවස්ථාවේදී පැනනැගී තිබී නොමැත. එක් විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ විභාග කිරීම පිණිස අධිචෝදනා පත්‍රයක් නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත යොමු කිරීම තුළින් වඩාත් තහවුරු වන්නේ, නීතිපතිවරයා කිසිදු අවස්ථාවක මෙම නඩුව ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඉදිරියේ විභාග කිරීම අවශ්‍ය බවට කල්පනා කර නොතිබුණා පමණක් නොව මෙම නඩුව ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඉදිරියේ විභාග කිරීම සඳහා අවශ්‍ය කරුණු කිසිවක් නිර්මාණය වී නොතිබුණ බවත්ය. එසේම, මෙම අවස්ථාව වන විට මෙම අපරාධය සිදුවී අවුරුදු හතරකට ආසන්න කාල සීමාවක් ගතවී තිබූ බැවින්ද ත්‍රිපුද්ගල මහාධිකරණයක් පත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නො නගී.

එම අවස්ථාවේදී ත්‍රිපුද්ගල මහාධිකරණය පත්කිරීම තුළින් සිදු වූ එකම කාරණය වූයේ එතෙක් නඩුව විභාග කරමින් සිටි මහාධිකරණ

විනිශ්චකාර දේවිකා තෙන්නකෝන් මහත්මිය එම නඩුව විභාගයෙන් ඉවත් කර වෙනත් විනිශ්චකාරවරුන් තිදෙනෙකුට නඩු විභාගය බාර කිරීම පමණකි.

මේ අන්දමින් එක්වරම ලඟි ලඟියේ නඩුව ඒ වන විටත් මහාධිකරණ විනිශ්චකාරවරයෙක් ඉදිරියෙහි විභාගයට නියම කිරීම සඳහා පියවර ගනිමින් තිබූ අවස්ථාවක ත්‍රිපුද්ගල මහාධිකරණයක් පත් කිරීම සඳහා නීතිපතිවරයා විසින් මීට ප්‍රථම මෙලෙස ඉල්ලුම් කරන ලද අවස්ථා තිබුණේද යන්න කොමිෂන් සභාව විසින් අතිරේක සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය මහතාගෙන් විමසන ලදුව ඔහු සඳහන් කළේ ඔහුගේ මතකයට අනුව මෙවැනි පත්කිරීමක් සඳහා ඉල්ලීමක් නීතිපතිවරයා විසින් මීට පෙර හෝ මින් පසුව සිදු කර නොමැති බවය. සාමාන්‍යයෙන් ත්‍රිපුද්ගල මහා මහාධිකරණයක් ඉදිරියේ නඩුවක් විභාග කිරීම සඳහා නීතිපතිවරයා විසින් ඉල්ලීමක් සිදු කරනු ලබන්නේ එකී සිද්ධිය පිළිබඳව පොලිස් පරීක්ෂණ පවත්වන කාලසීමාව තුළදීය.

දුමින්ද සිල්වා ඇතුළු පිරිස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන ඇති බවට කරුණු වාර්තා කර ඇති නමුත් අධි චෝදනා පත්‍රයෙහි ත්‍රස්තවාදය වැළැක්වීම පනත යටතේ කිසිදු අධි චෝදනාවක් විත්තිකරුවන්ට එරෙහිව ගොඩනඟා නොමැත. ඒ අනුව පොලිස් නිලධාරින් චේතනාන්විතව, ද්වේශසහගත ලෙස ක්‍රියා කරමින් 11 වන විත්තිකරුව ඇතුළු පිරිස රක්ෂිත බන්ධනාගාරයේ දීර්ඝ කාලයක් තබා ගැනීම උදෙසාම අසත්‍ය ලෙස අධිකරණයට කරුණු වාර්තා කරමින් අධිකරණය නොමඟ යවමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වැරදි කර ඇති බවට කරුණු වාර්තා කර ඇත.

ඒ වන විටත් නඩුව විභාග කිරීම සඳහා ක්‍රියා කරමින් සිටි මහාධිකරණ විනිසුරු දේවිකා තෙන්නකෝන් මහත්මිය ඉවත්කර වෙනත් විනිශ්චයකාරවරුන් පත්කිරීමට හේතුවූ කරුණු නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සොයා ගනු ලැබූ දූරකථන සංවාද ඇතුළත් හඬපට තුළින් හෙළිදරව් වී ඇත. මෙම හඬ පට ඇතුළත් සීඩී තැටි කොමිෂන් සභාව ඉදිරියේ සිදුකරනු ලැබූ විමර්ශනවලදී පැමිණිලිකරු විසින් පැ. 13 පැ. 16 සිට පැ.22 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ. 13, පැ, 16 සිට පැ. 22 දක්වා හඬ පට වලට සම්බන්ධ වී ඇති පුද්ගලයන් තිදෙනා වන්නේ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයෙකු වන, බහුතරයේ තීන්දුව ලියා ප්‍රකාශයට පත් කළ මහාධිකරණ විනිසුරු පද්මිණී රණවක මහත්මිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරී ශානි අබේසේකර මහතා සහ එවකට අමාත්‍යවරයකු වූ රංජන් රාමනායක මහතා යන තිදෙනාය.

මෙම දූරකථන සංවාද පටිගත කිරීම අමාත්‍ය රංජන් රාමනායක මහතා විසින් සිදුකර ඇති බවට, ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයට මෙම හඬ පට ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී, රංජන් රාමනායක මහතා විසින් පිළිගෙන ඇත. මෙම දූරකථන සංවාද වල දී මහාධිකරණ විනිසුරු පද්මිණී රණවක මහත්මිය අමාත්‍ය රංජන් රාමනායක මහතා සහ සහකාර පොලිස් අධිකාරී ශානි අබේසේකර මහතා අතර නිරන්තරයෙන්ම මහාධිකරණ විනිශ්චය මණ්ඩලය ඉදිරියේ විභාග වුණු 11 වන විත්තිකාර දුමින්ද සිල්වා පිළිබඳ නඩුව කතාබහට ලක්වී ඇත. එම නඩුවේ පවත්නා තත්වයන් එම නඩුවේ තීන්දුව පිළිබඳව

මෙම පුද්ගලයින් සාකච්ඡා කර ඇත. රන්න්ජන් රාමනායක මහතා බලාපොරොත්තු වන ආකාරයට තීන්දුවක් ප්‍රකාශ කරන බවට මහාධිකරණ විනිශ්චකාර පද්මිණී රණවක මහත්මිය රන්ජන් රාමනායක මහතාට ප්‍රකාශ කර ඇත .

පැ.13 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළ, 2016.10.04 වන දින රාත්‍රී 10.59 ට ආරම්භ වූ දුරකථන සංවාදය, මහාධිකරණ විනිසුරු පද්මිණී රණවක සහ රන්ජන් රාමනායක අතර සිදුවන දුරකථන සංවාදයකි. මෙම දුරකථන සංවාදය විනාඩි 18 තත්පර 38 ක කාලයක් පැවතී ඇත. එම දුරකථන සංවාදයේදී මහාධිකරණ විනිසුරු පද්මිණී රණවක මෙසේ සඳහන් කර ඇත; "දැන් මේ කේස් එකත් AG, දුමින්දගේ එක ඉස්සෙල්ලා මට දැම්මෙ, ඊට පස්සේ ඒ කේස් එක වෙන කෙනෙක් ගත්තා. මං අන්න ඔයාගෙ නඩුවක් ගත්තා කියලා මගේ දාපු එක ගත්තා. පස්සේ AG කරපු වැඩේ ට්‍රයල් ඇට් බාර් එකක් ඉල්ලුවා. එතකොට දාලා මාව ආයි දැම්ම මේකට. අපේ නම්බර්ස් පිළිවෙලට යන්නේ. ඒ ගොල්ලන් බලලා දාලා තියෙන්නෙ මට වැටෙන්න. අරයට ගියානම් ඉවරයි වැඩේ. මට සාමාන්‍යයෙන් දාන්නෙ නෑ එක එක ඒවා, බලලා දාන්නෙ "

පැ. 16 දරන හඬ පටයේ සංවාදය 2016.05.10 දින ප.ව. 12.46 ට ආරම්භ වී විනාඩි 21.27ක කාලයක් රංජන් රාමනායක සහ ශානි අබේසේකර අතර පවත්වා ඇත. එම හඬපටයේ මෙසේ මෙසේ ප්‍රකාශ කර ඇත.

> "රන්ජන්: මේ බාර්ස් එක දැක්කා මොකද වෙන්නේ අවුලක් නැනේ නඩුව ඉවරයි නේ

ශානි: නෑ නෑ කිසි අවුලක් නෑ නමයක් යනවා සර්

රන්ජන්: ආ එතකොට මේ මේ බය වෙන්න දෙයක් නෑ නේ තීන්දුව නේද

ශානි: නෑ නෑ සර් කිසිසේත්ම බය වෙන්න දෙයක් නෑ ...... වගේ ඒක හරි"

පැ.17 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද හඬ පටය 2016.07.14 වෙනි දින රාත්‍රී 9.33 ට රංජන් රාමනායක සහ පද්මිණී රණවක අතර ඇතිවූ දුරකතන සංවාදයකි. එම සංවාදය මෙසේ සඳහන් වේ.

"රන්ජන්: මම ගෙදර ඉන්නේ... මම විතරයි ඉන්නේ මේ... මේ.. මම බොහොම ගෞරවයෙන් කතා කරන්නේ රටම බලන් ඉන්නවා ඔබතුමියලාගේ මේ.. මේ.. මම අද පත්තරේ දැකලා කතා කරේ දැනුත් ටීවී එකේ ගියා.. මේ.. මේ... අර නඩු තීන්දුව ගැන ලොකු සාධාරණයක් වෙයි කියලා රටම බලාපොරොත්තුවෙන් ඉන්නවා. බොහොම ස්තුතියි මේ.. මේ... විනිසුරු මඩුල්ලේ ඔබතුමිය ඉන්නවා කියන එක ලොකු. සතුටක්.

පද්මිනී: හරි හරි

රන්ජන්: හහ් .... හ.... හොඳ දෙයක් වෙයි කියලා බලාපොරොත්තුවෙන් ඉන්නවා

පද්මිනි: හරි හරි

රන්ජන් : දෙවි පිහිට ලැබේවා කියලා .... ශක්තිය ලැබේවා කියලා කියන්නයි කතා කරේ"

පැ. 18 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති හඬ පටය 2016.07. 25 වැනි දින 12.12 ට රංජන් රාමනායක සහ ශානි අබේසේකර අතර ඇතිවූ දුරකථන සංවාදයේ මෙසේ ප්‍රකාශ කර ඇත;

"ශානි: සර් වදින්නම් අර නඩුවේ සිද්ධිය ගැන කිසිම කෙනෙකුට කතා කරන්න එපා. ලොකු ප්‍රශ්නයක් වෙනවා, බුදු අම්මේ වැඳලා කියන්නම්, සර් කිසිම තැනකට සෑර්ගේ කටවත් අරින්න එපා, දැන් හොඳම තත්වයකට ඇවිල්ලා තියෙන්නෙ. ඔය සර් කතා කරපු එකක් ලොකුවට පත්තු වෙලා යන්න හදන්නේ. අපි ඒක බැලන්ස් කර ගන්නම්

.......................................

ශානි: ඒ දවස්ව වල තිබ්බා එහෙම එකක්. දැන් මං කියන්නම්, දැන් නම් කිසි කෙනෙක්, කිසිම කෙනෙක් එක්ක මේ ගැන කතා කරන්න එපා, මං සර්ට සර්ගෙ ගෙදර ඇවිල්ල කුලී වැඩ කරන්නම් මේ නඩුව දිනන්න ඕන හින්දා

රන්ජන් : මට අපි දෙන්නගෙම අපි දෙන්නගෙම ඉලක්කය. .......

රන්ජන් : දැන් ඔයාගෙත් ටාගට් එක දූමින්දව යවන එක. මගෙත් ටාගට් එක දූමින්දව යවන එක. භාරතගේ වයිෆ්ගෙන් ටාගට් එක දූමින්දව යවන එක. හිරුණිකාගෙ ටාගට් එකත් දූමින්දව යවන එක.

.......................................

රන්ජන් : ඒ කියන්නේ දැන් මම දන්නවා ජජ් කෙනෙක්ට කතා කරන්න තරම් ධෛර්යයක් නෑ නේ වෙන මං වගේ පිස්සෙක්ට මිසක් ..... දැන් ඇත්තම පිස්සු වැඩක් නේ .. ජීවිතේට මිනිහෙක් ජජ් එක්කෙනෙක්ට කතා කරන්නේ කෙලින්ම හිර යන වැඩක් නේ මෙයා .... මම ඔය කරාට පිස්සුවට. ඒ කියන්නේ මෙලෝ මිනිහෙක් මිනී මැරුම් නඩුවකට ජජ් කෙනෙක්ට කතා කරනවද"

පැ, 19 දරන දුරකථන සංවාදය 2016.09.07 දින, එනම් දුමින්ද සිල්වාගේ නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට පෙර දින පස්වරු 05.57ට රංජන් රාමනායක සහ ශානි අබේසේකර අතර ආරම්භවී විනාඩි හතරක කාලයක් පුරා පැවතී ඇත. එම සංවාදය මෙසේය:

"රංජන්ට: හෙට අපිට ගුඩ් නිව්ස් එකක් එයිද බෑඩ් නිව්ස් එකක් එයිද

ශානි: ගුඩ් නිව්ස් එකක් එනවා සර්, අනිවාර්යෙන්ම, එනවා නේද උසාවි,

රන්ජන්: අනේ ඒක ඔයා ආයි වෙනස් කරන්න එපා. ආයි අපේ හිත් කඩන්න එපා.

ශානි: නෑ නෑ සර්, ඩෙෆිනිට් ඒක ආයි, ඒක ආයිත් කිසි දෙයක් නෑ, හැබැයි මැද එක්කෙනා නිදහස් වෙන්න ලියන්නෙ.

රන්ජන්: මැද එක්කෙනා කියන්නේ,

ශානි: චෙයාර්මන්

රන්ජන්: යනවමනේ, ඔව්. ඔව්, තදටම එයි නේද, පද්මිණී, පද්මිනී, හරිනේ,

ශානි: ඔව් හරි හරි ඒ ඔක්කොම හරි"

පැ.21 වශයෙන් කර ඉදිරිපත් කර ඇත්තේ 2017.09.12 වැනි දින 14.56 රංජන් රාමනායක පද්මිණී රණවක යන දෙදෙනා එවකට ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා සමග පවත්වන ලද දූරකතථන සංවාදයක පටිගත කිරීමකි. එම සංවාදය විනාඩි 2 යි තත්පර 53 ක කාලයක් පැවතී ඇත. මෙම දූරකථන ඇමතුම ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාට රන්ජන් රාමනායක මහතාගේ දූරකථනයෙන් ලබාගෙන ඒ සමගම රන්ජන් රාමනායක මහතාගේ දූරකථනයෙන් පද්මිණී රණවක මහත්මිය සම්බන්ධ කරගෙන, ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා සමඟ කතා කිරීමට අවස්ථාව සලසා දී ඇත. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සමඟ කතා කරන මුළු කාලය පුරාම පද්මිනී රණවක ඇයට අභියාචනාධිකරණයේ විනිශ්චකාර පදවියක් දෙන ලෙසට ආයාචනය කරමින් ජනාධිපතිවරයාට ඇවිටිලි කර ඇත. ඇයට අභියාචනාධිකරණයේ විනිසුරු පත්වීමක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලෙසට ඇය සඳහන් කරන්නේ ඇය දුමින්දගේ නඩු තීන්දුව ලබා දුන් බවත් එසේම චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියගේ බෝම්බ නඩුව විමසුනු ලැබූ බවත් ය.

පැ.20 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති සීඩී තැටියේ අඩංගු දුර දූරකථන සංවාදය 2016.09.12 දින රාත්‍රී 10.41 ට රංජන් රාමනායක සහ ශානි අබේසේකර අතර සිදු වූ සංවාදයයකි. එකී සංවාදය විනාඩි 13 ක කාලයක් පුරා පැවතී ඇත. මෙම දූරකතන සංවාදය සිදුවන්නේ දුමින්ද සිල්වා සම්බන්ධ නඩු තීන්දුව ප්‍රකාශයට පත් කළ දිනයේදීය.

මෙම දුරකථන සංවාදයේ දී රංජන් රාමනායක, ඉතාමත් අපහාසාත්මක වදන් පාවිච්චි කරමින් දුමින්ද සිල්වා නඩුවේ අඩු පක්ෂයේ දී තීරණය ලියන ලද මහාධිකරණ විනිසුරු ශිරාන් ගුණරත්න මහතාට පරිභව කර ඇත. එසේම ඔහුට උසස්වීම් නොදිය යුතු බවටත් පරිභව කිරීම දිගටම සිදු කළ යුතු බවටත් සඳහන් කර ඇත. එසේම පද්මිණී රණවක මහත්මිය වැට උඩ සිටි බවටත් ඉන්පෙක්ෂන් එක නොදුන්නේ නම් මෙම තීන්දුව නොලැබෙන බවටත්, නිල මැදිරියේ දී මොරායස් සමග රණ්ඩු වී මෙම තීන්දුවට පැමිණි බව තමන් දන්නා බවටත් ශානි අබේසේකර පවසා ඇත.

පැ.22 වශයෙන් සලකුණ කර ඉදිරිපත් කරන ලද සීඩී තැටියේ අඩංගු දුරකථන සංවාදය සිදුවී ඇත්තේ 2018.04.18 දින රාත්‍රී 8.26 ටය. විනාඩි 18.54 ක කාලයක් පුරා පවතින මෙම දුරකථන සංවාදය රංජන් රාමනායක සහ පද්මිණී රණවක අතර සිදුවී ඇත. අලුත් අවුරුද්දට සුබ පැතීම සඳහා දුරකථන ඇමතුමක් දෙන ලකුණ බවට සඳහන් කරන පද්මිණී රාමනායක මහත්මිය විනිශ්චයකාරවරුන් පිළිබඳව විවිධ කතා ප්‍රකාශ කරමින් සහ පද්මිණී රණවක මහත්මිය ට යම් තනතුරක් ලබා ගැනීමේ පිළිබඳව සාකච්ඡා කර ඇත.

පැ. 23 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති 2020-01-21 දින දිවයින ඉරිදා සංග්‍රහයේ මුල් පිටුවේ සඳහන් කළ වාර්තාවට අනුව; දුරකථනයෙන් රන්ජන් සමඟ කතා කළා; උසස්වීම් ලබා ගන්නත් උදව් ඉල්ලුවා; විනිසුරු පද්මිණී හඬ පට පිළිගනී; යනුවෙන් සඳහන් කර ඇත.

පැ. 26 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද 2020 ජනවාරි 12 වැනි දින දරන දිවයින ඉරිදා සංග්‍රහයෙහි මුල් පිටුවේ සිරස්තලය

වශයෙන් යොදා ඇත්තේ දුමින්ද එල්ලන්නැයි හිටපු අගවිනිසුරු ප්‍රියසාද් ඩෙප්ට ඇමතිවරු දෙදෙනෙක් තර්ජනය කරලා යන වාර්තාවය.

පැ. 24 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද පුවත්පත් වාර්තාවේ අඩංගු කරුණු මෙම කොමිෂන් සභාව ඉදිරියේ යුද හමුදා බුද්ධි නිලධාරී කණිෂ්ක ගුණරත්න මහතා, තම නඩුවේ සාක්ෂි දෙමින් සඳහන් කළ කරුණු බවත් එහිදී දුමින්ද ගෝඨාභයට කඩේ ගියා වැඩියි. ඌටත් ගේම සෙට් කළේ අපි යනුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක අපහාසාත්මකව සඳහන් කළ බවත් සඳහන් කර ඇත.

එසේම පැ. 25 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද 2020 සැප්තැම්බර් 28 වන දින මව්බිම පුවත්පතේ සඳහන් වාර්තාවට අනුව මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදුන් මාණ්ඩලික ප්‍රධානී මේජර් ජනරාල් අමල් කරුණාසේකර මහතා සඳහන් කළ අන්දමට ශානි ප්‍රමුඛ සී.අයි.ඩී නිලධාරීන් ද්වේශ සහගත ලෙස දුමින්ද සිල්වා එල්ලුම් ගස් යැවීම සඳහා රාජකාරියෙන් එහා ගොස් කටයුතු කර තිබෙනවා යනුවෙන් සාක්ෂි ලබාදුන් බවට ප්‍රකාශයක් වාර්තා ගත කර ඇති පුවත්පත් කොටස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මේ අනුව කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් සාක්ෂි සමස්තයක් ලෙස විශ්ලේෂණය කර බැලීමේදී පැහැදිලිව පෙනී යන්නේ දුමින්ද සිල්වා මහතා අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුට එරෙහිව නඩු පැවරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ විවිධ කුමන්ත්‍රණ පැවැති බවටත්, දුමින්ද සිල්වා, මනුෂ්‍ය ඝාතනය සිදුකිරීමේ වරදට වරදකරු කරවීම සඳහා අවශ්‍ය සාක්ෂි නිර්මාණය කිරීම අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ දී ශානි අබේසේකර විසින් සිදු කර ඇති බවටත් කරුණු ඉතා හොඳින් අනාවරණය වේ.

මාණ්ඩලික ප්‍රධානි මේජර් ජනරාල් අමල් කරුණාසේකර මහතා ඔහුගේ පැමිණිල්ල පිළිබඳව සාක්ෂි දෙන අවස්ථාවේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර තමන්ට තර්ජනය කරමින් ඔහු දුමින්ද සිල්වා එල්ලුම් ගස් යවන ලද ආකාරයට අමල් කරුණාසේකර මහතා සම්බන්ධයෙන් ද ක්‍රියා කළ හැකි බවට තර්ජනාත්මකව පවසා ඇත.

යුද හමුදා බුද්ධි නිලධාරි කණිෂ්ක ගුණරත්න මහතාගේ පැමිණිල්ල පිළිබඳ සාක්ෂි භාගයේ දී කණිෂ්ක ගුණරත්න මහතා සාක්ෂි දෙමින් ශානි අබේසේකර ඒ අන්දමින් තමන්ට තර්ජනය කළ බවට ඔහු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදී ඇත. SI ප්‍රේමතිලක මහතා ඔහුගේ සාක්ෂි යෙදී ඒ බව සනාථ කරමින් සාක්ෂි ලබාදී ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ. 1 සිට පැ 26 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020.11.24

2020/11/24

9 . XXII

පැමිණිලි අංක - 115 / 2020

පැමිණිලිකරු - ලලිත් අනුරුද්ධ ජයසිංහ

ලිපිනය - නො: 297/12, සෙනවිරත්න මාවත, එඬේරමුල්ල, වත්තල.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. වෛද්‍ය විජේමාන්න මොහොට්ටිගේ දෝන තුසිතා ප්‍රශක්ති මහත්මිය.
2. සහකාර පොලිස් අධිකාරි කේ.කේ.කේ. ගුණසේකර.
3. පොලිස් අධිකාරී ශානි අබේසේකර,
4. පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා,
5. සහකාර පොලිස් අධිකාරි බී.එස්. තිසේරා,

තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් පසුව, පැමිණිලිකාර ලලිත් අනුරුද්ධ ජයසිංහ යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට

කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, ලලිත් අනුරුද්ධ ජයසිංහ මහතාට එරෙහිව පැල්මඩුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 757/2017 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර ලලිත් අනුරුද්ධ ජයසිංහ නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම පැමිණිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HCR 215/2017 දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතුය.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් අධිකාරි ශානි අබේසේකර ඇතුළු නිලධාරීන් පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට අත් අඩංගුවෙන් මිදී බේරී පළා යමාට ඉඩසැලැස්වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇත.

3. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

4. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,

නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

5. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

6. වහාම ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකරු නැවත ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පදවියෙහි හිඟ වැටුප් සහිතව පිහිටුවා, අහිමිවී ගිය සියළුම උසස්වීම්, වැටුප් වර්ධක සහ අනෙකුත් සියළු වරප්‍රසාද ලබා දීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

7. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

8. මේ අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළායැයි යන චෝදනාවක් නැගීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම ජයසිංහ මහතාට පාඩු කිරීමේ අදහසින් ඔහුට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීම සඳහා ජයසිංහ මහතාට එරෙහිව බොරු චෝදනා නගමින් තුසිතා විජේමාන්න මහත්මිය අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා මගින් පොලිස්පතිවරයාට බලපෑම් කර ක්‍රියාකරමින් දණ්ඩ නීති සංග්‍රහයේ 208 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකියි වරදක් සිදුකර ඇත.

9. එසේම සහකාර පොලිස් අධිකාරී කේ.කේ.කේ. ගුණසේකර විසින් තුසිතා විජේමාන්න මහත්මියට ඉහත සඳහන් චෝදනාවට අදාළ වරද සිදු කිරීම සඳහා තුසිතා විජේමාන්න මහත්මියට ආධාර සහ අනුබල දී ඇති බැවින් එසේ ආධාර සහ අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලලිත් ජයසිංහ මහතාට එරෙහිව රත්නපුර මහා මහාධිකරණයේ නඩු පවරා ඇති බැවින්ද, ලලිත් ජයසිංහ මහතාගේ දීර්ඝකාලීන සේවය අත් හිටුවීම සඳහා එමඟින් ක්‍රියා කර ඇති බැවින්ද, සහකාර පොලිස් අධිකාරී කේ කේ කේ තිසේරා විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග

කියවිය යුතු 208 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකර ඇත.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

දැනට වැඩ තහනම්ව සිටින ඌව පළාත සහ මධ්‍යම පළාත භාරව සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් අනුරුද්ධ ජයසිංහ මහතා විසින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් දේශපාලන බලපෑම් කරණ කොටගෙන තම සේවය අත්හිටුවා, තමන්ට එරෙහිව මහාධිකරණය ඉදිරියේ අසත්‍ය චෝදනා මත  නඩු පවරන ලද බවට තම පැමිණිල්ලෙන් මෙම කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත. 1987 අගෝස්තු මස පළවෙනි දින සහකාර පොලිස් අධිකාරිවරයෙකු වශයෙන් පොලිස් සේවයට බැඳී ඇති පැමිණිලිකාර ජයසිංහ මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පදවිය දක්වා පැමිණි ගමන් මග ඔහුගේ සාක්ෂි විභාගයේ දී සවිස්තරාත්මකව දක්වා ඇත.

ගලිගමුව සබරගමුව සහ ඌව පළාත භාරව සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් අනුරුද්ධ ජයසිංහ මහතා 2015 නව රජය බලයට පත්වීමත් සමඟම 2015 ජනවාරි මස 25 වැනි දින හදිසියේම උතුරු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් ස්ථාන මාරු ලැබ ඇත. මෙම ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා පැමිණිලිකරුට පවසා ඇත්තේ ඒ වන විට උතුරු පළාත භාරව සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පූජිත ජයසුන්දර මහතා බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙසට ස්ථාන මාරු කර ඇති බැවින්, පැමිණිලිකරුට උතුරු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙසට වැඩ භාර ගන්නා ලෙසටය. ඒ වන විට බස්නාහිර

පළාත භාරව රාජකාරි කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහතා බස්නාහිර පළාතෙන් ඉවත්කර පොලිස් මූලස්ථානයේ රාජකාරිය සඳහා ස්ථාන මාරු කර තිබී ඇත. ස්ථාන මාරු කිරීමේ ක්‍රියාදාමය පැහැදිලි ලෙසම පූජිත ජයසුන්දර මහතා බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙසට පත් කිරීම නව රජයේ අරමුණවී තිබී ඇති බව පැහැදිලිය. ස්ථාන මාරු ලිපිය පැ.1 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු උතුරු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් සේවය කරමින් සිටින අවස්ථාවේදී 2015 මාර්තු මස 19 දින කොළඹ පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකයට ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා පැමිණෙන ලෙසට පැමිණිලිකරුට දැනුම්දීමක් කර ඇත. පැමිණිලිකරු සබරගමු පළාතේ රාජකාරි කරද්දි දේශපාලන කටයුතු සම්බන්ධව යෙදුණු බවට පැමිණිල්ලේ සඳහන්ව ඇති බැවින්, ඒ පිළිබඳව විභාගයක් පවත්වන බැවින්, ඒ සඳහා ප්‍රකාශයක් ලබා ගැනීමට පැමිණිලිකරු කැඳවනු ලැබූ බව විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ පොලිස් අධිකාරි මෙවන් සිල්වා පැමිණිලිකරුට එම අවස්ථාවේදී ප්‍රකාශ කර ඇත. තමන්ට එරෙහිව පැමිණිලි කරනු ලැබූ පුද්ගලයා කවුරුන්ද යන්න විමසනු ලැබූ අවස්ථාවේදී ඔහුට ලිපියක් පෙන්වා ඇති අතර එකී ලිපියේ සබරගමු පළාත් විපක්ෂ නායක කාර්යාලය යනුවෙන් සඳහන් කර තිබූ බවත්, එම ලිපිය අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට ආමන්ත්‍රණය කර තිබූ බවත්, එම ලිපියේ කතෘ වශයෙන් සබරගමු පළාතේ විපක්ෂ නායිකා තුසිතා විජේමාන්න අත්සන් කර තිබූ බවත් පැමිණිලිකරු සඳහන් කළේය. විපක්ෂ නායිකා තුසිතා විජයමාන්න සබරගමු පළාතේ එක්සත් ජාතික

පක්ෂයේ ආසන සංවිධායකවරිය වශයෙන් ක්‍රියා කර ඇත. 2015-01-23 තුසිතා විජයමාන්න විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙත යවා ඇති ලිපිය පැ.2 ලෙස සලකුණු කර ඇත.

පැ . 2 ලිපියේ මෙසේ සඳහන් කර ඇත.

"2015.01.23

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය,

අංක 58, අර්නස්ට් ද සිල්වා මාවත කොළඹ 8.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සබරගමුව පළාත භාර ලලිත් ජයසිංහ නිලධාරියාගේ රාජකාරී පක්ෂග්‍රාහී ලෙස සහ දූෂිත ලෙස ඉටු කිරීම සම්බන්ධව

මැතිතුමණි,

2015 ජනාධිපතිවරණයේදි සබරගමුව පළාතේ සිදුවූ බියගැන්වීම්, පහරදීම්, තුවාල සිදුකිරීම්, මිනීමැරීම්, ඇතුළු අපරාධ සහ දූෂිත ක්‍රියාවන් පිළිබඳව පාක්ෂිකයන් හා විරුද්ධ පක්ෂයේ සිට මෙවර ජනාධිපතිවරණයේදි අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත සහය දක්වන ලද මහජනයා මාවෙත ලබාදෙන ලද තොරතුරු අනුව මෙම තත්වය උදාවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ඉහත සඳහන් නිලධාරියාගේ ක්‍රියා කලාපය බව පෙනීයයි.

මැතිවරණ සමයේ සිදුවූ එකම මනුෂ්‍ය ඝාතනය සිදුවූයේ සබරගමුව පළාතේ කහවත්ත පොලිස් වසමේ දීය. රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රාදේශිය සභා සභාපති, උප සභාපති මන්ත්‍රීන් මෙම

නිලධාරීයා සමඟ සම්බන්ධ වී අදාල ප්‍රචන්ඩ ක්‍රියා ඇති කිරීම ඉතාමත්ම කණගාටු තත්වයක් බවට වාර්තා විය.

කහවත්ත ප්‍රදේශයේ සිදුවූ මිනී මැරුමෙන් පසු එවකට නියෝජ්‍ය අමාත්‍ය වරයෙකු මෙම ඝාතනයේ සැකකරුවෙකු වී ඇති බවට අනාවරණය වී තිබියදිත් කහවත්ත පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ සිට ජොෂ්ඨ නිලධාරීන් දක්වා මොහු විසින් බලපෑම් සිදුකර නියෝජ්‍ය අමාත්‍යවරයාගේ නම අධිකරණයට කරුණු වාර්තා කිරීමේ දි ඇතුලත් නොකරන ලෙසටත්, අමාත්‍යවරයා අත්අඩංගුවට නොගැනිමට බලපෑම් සිදු කරමින් අත්අඩංගුවට ගැනීමට පෙර 2015.01.08 වන දින පැවති ඡන්ද දින මෙම අයට තම ඡන්දය පාවිච්චි කිරීම සඳහා අවශ්‍ය කටයුතු හා ආරක්ෂාව සලසා දෙමින් බලපෑම් කළ බව මා වෙත දැනගන්නට ලැබුණි.

ඊට අමතරව 2015.01.05 වන දින රඹුක්කන පොලිස් ස්ථානය තුළදී තම ආරක්ෂාව හා රැකවරණය පතා පොලිස් ස්ථානය වෙත දිවගොස් ආරක්ෂාව පතන ලද පුද්ගලයෙකුව පොලිස් ස්ථානය තුළදී කපා කොට තුවාල සිදු කළ අතර, මෙහිදි සිද්ධියට අදාල සැකකරුවන් දේශපාලන මැදිහත්විම මත හා මෙම නිලධාරීයාගේ හිතවත්කම මත හා ලබාදෙන  උපදෙස් අනුව පොලිස් ස්ථානයට පැමිණිලිකර තවදුරටත් මෙම පරීක්ෂණ කටයුතු අඩාල කිරීමට බලපෑම් කරන ලද බව දැන ගැනීමට ලැබුණි.

මැතිවරණ ප්‍රචාරක ක්‍රියා අවසන් කර තිබියදි යටියන්තොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආසන සංවිධායකවරයා විසින් නීති විරෝධී ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් පවත්වාගෙන යමින් ශබ්ද විකාශණ යන්ත්‍ර යොදාගෙන

සිදු කරන ලද නීති විරෝධි ප්‍රචාරක කටයුතු සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට යාමේ දී යටින්තොට පොලිස් ස්ථානයේ නිලධාරීන්ට තම රාජකාරී බලය යොදා ගනිමින් නිලධාරීන්ට විවිධ බලපෑම් සිදු කර නීතිය ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදුන් බවද දැන ගැනීමට ඇත.

තවද මෙම නිලධාරියා මැතිවරණ කටයුතු සඳහා සහ දූෂිත මැණික් ජවාරම් කටයුතු සඳහා රහසිගත ලෙස වෙනම පුද්ගලික ජංගම දුරකථනයක් මේ සඳහා භාවිතා කරන ලද බවටත් පශ්චාත් මැතිවරණ සමයේදී මොහුගේ හිතවත් ප්‍රාදේශිය දේශපාලනඥයින් මෙම නිලධාරියා වෙත දුරකථනයෙන් දැනුම් දුන් සැනින් මොහුගේ අණින් අදාල පොලිස් බල ප්‍රදේශ තුළ නීතිය සාධාරණව ඉටු නොවුණු බවත් අදාල පොලිස් ස්ථානවල නිලධාරීන්ට තර්ජනාත්මකව කටයුතු කර ක්‍රියා කරනු ලද බව අනාවරණය වී ඇත.

මෙම නිලධාරියා සබරගමුව පළාත තුළ රාජකාරී කරන ලද ආකාරය අනුව ඉදිරියේ දී පවත්වන මැතිවරණයේදී අපක්ෂපාති ලෙස රාජකාරි ඉටු කරයිද යන්න පිළිබඳ කිසිදු විශ්වාසයක් තැබිය නොහැක මේ හේතුන් නිසාවෙන් මේ පිළිබඳව පරීක්ෂණයෙක් සිදු කර සාධාරණ මැතිවරණයකට යාමට අවශ්‍ය පසුබිම සලසා දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ස්තූතියි.

වෛද්‍ය තුසිතා විජේමාන්න

සබරගමුව පළාත් සභාවේ විපක්ෂ නායිකා"

ඉහතින් උපුටා දැක්වූ ලිපිය අනුව පෙනී යන්නේ විපක්ෂ නායිකා තුසිතා විජේමාන්න අසා දැනගත් කරුණු මත පදනම්ව පැමිණිලිකරුට එරෙහිව චෝදනා ඉදිරිපත් කර ඇති බවත්, කිසිදු අවස්ථාවක එම ලිපියේ සඳහන් සිද්ධීන් කිසිවක් සිදුවනවා ඇය නුදුටු බවත්ය. මෙම ලිපිය ලැබීමෙන් පසුව අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් 2015 ජනවාරි මස 23 වැනි දිනම පොලිස්පතිවරයා වෙත ලිපියක් යවමින් පැමිණිලිකරුගේ මැදිහත්වීමෙන් සිදුවී ඇති මැතිවරණ අයහපත් ක්‍රියා සම්බන්ධයෙන් වන පැමිණිල්ල පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙසට දැනුම්දීමක් කර ඇත. එම ලිපිය පැ.3 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.2 දරණ මෙම ලිපිය 2015-01-23 දින සවස පහට භාරදී ඇති බව එම ලිපියේ 5 pm යනුවෙන් සඳහන්ව තිබීමෙන් පෙනී යයි.

පැ.3 දරණ ලිපිය ලැබීමෙන් පසුව එම ලිපිය විශේෂ විමර්ශන ඒකකයේ මෙවන් සිල්වා වෙත පොලිස්පතිවරයා විසින් යොමුකර ඇති අතර එහි සඳහන් චෝදනා පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙසට නියෝගයක් කර ඇත.

පැමිණිලිකරුට ස්ථාන මාරු ලැබී ඇත්තේ මෙම පැ.2 දරණ ලිපිය ලැබීමෙන් පසුව බව ලිපියේ දාතම අනුව පෙනී යයි. සබරගමු පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් සේවය කළ මුළු කාලය තුළ දීම තමන්ට එරෙහිව කිසිදු පැමිණිල්ලක් සිදුකර කර නොතිබුණ බවත්, සිදුකළ එකම පැමිණිල්ල මැතිවරණයට පසු මෙම තුසිතා විජයමාන්න විසින් සිදු කරන ලද පැමිණිල්ල බව පැමිණිලිකරු සඳහන් කළේය.

විශේෂ විමර්ශන ඒකකයට පොලිස්පතිවරයාගේ නියෝගය සමඟ පැමිණිල්ල ලැබීමෙන් පසුව එය විමර්ශනය කිරීම සඳහා සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා වෙතට පොලිස් අධිකාරි මෙවන් සිල්වා විසින් යොමු කර ඇත. ඒ අනුව සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා රුවන්වැල්ලේ පිහිටි එක්සත් ජාතික පක්ෂ කාර්යාලයට ගොස් එතැන සිට තුසිතා විජේමාන්නට දුරකථන ඇමතුමක් ලබා දී ඇයව රුවන්වැල්ලේ city medical නැමැති ස්ථානයට කැඳවාගෙන ගොස් ඇගේ කටඋත්තරය ලබා ගෙන ඇත. ඇයගේ කටඋත්තරය රුවන්වැල්ල පොලිස් ස්ථානයේදී ලබානොගෙන city medical නැමැති ස්ථානයට ඇයව කැඳවාගෙන ගොස් ඇයගේ කටඋත්තරය සටහන් කර ගැනීමට හේතුව එම නිලධාරියා විසින් එම කටඋත්තරයේ සඳහන් කර නොමැත. මෙම කටඋත්තරය පැ.4 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඇයගේ කටඋත්තරයේ මෙසේ සඳහන් කර ඇත.

> ( උපුටා ගැනීම) "මෙම ආකාරයට පොලිසිය ක්‍රියා කිරිමට හේතුව ප්‍රධාන අමාත්‍යවරයාගේ බලපෑම හා සබරගමුව පලාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ බලපෑම බව කිව හැකිය. තවද රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත පොලිස් වසමේ සිදුවූ වෙඩි තැබීමේ සිද්ධියට අදාලව නිසි විමර්ශන සිදු නොකරන ලද බවට සහ එම සිද්ධියට අදාල අධිකරනයට කරුනු වාර්තා කිරීම හා සැකකරුවන්ගේ නම් ඇතුළත් නොකරන ලෙසට සබරගමු පලාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා බලපෑම් කරන ලද බවට ද දැන ගන්න ලැබුනා. ඒ පිලිබඳ විස්තර තලතා අතුකෝරාල මහත්මියගේ

පුද්ගලික ලේකම් උපුල් යන අයගෙන් තොරතුරු ලබාගත හැකිය ."( උපුටා ගැනීම අවසන්)

තුසිතා විජේමාන්නගේ පැ.4 දරණ කටඋත්තරය අනුව පැහැදිලිව පෙනී යන්නේ ඇය පැමිණිලි කර ඇත්තේ තමන් පැහැදිලිව නොදන්නා එසේ වුවත් තමන්ට යම් යම් පුද්ගලයින් ප්‍රකාශ කළ කරුණු අඩංගු පැමිණිල්ලක් බවය. එම පැමිණිල්ලේ අඩංගු කරුණුවල නිරවද්‍යතාවය ඇයට සනාථ කළ හැකි බවක් කටඋත්තරයෙන් නොපෙනෙයි. ඇය සඳහන් කරන මනුෂ්‍ය ඝාතනයට අදාළ කරුණු තලතා අතුකෝරාළ මහත්මියගේ ලේකම් උපුල් නැමැත්තා සඳහන් කළ කරුණුය. උපුල් නැමැත්තා තමා දන්නා කරුණු පොලිස් ස්ථානයට හෝ එසේ නැතහොත් තමන්ගේ ප්‍රධානියා වූ තලතා අතුකෝරාළ මහත්මියට හෝ නොපවසා තුසිතා විජේමාන්නට පවසන්නට යෙදුණේ කුමන හේතුවක් මතද යන්න තුසිතා විජේමාන්න මහත්මියගේ කටඋත්තරයේ සඳහන් නොවේ. සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා තුසිතා විජේමාන්න මහත්මියගෙන් ඒ පිළිබඳව ප්‍රශ්න කර නොමැත. මනුෂ්‍ය ඝාතනයට අදාළ චෝදනාව සම්බන්ධ පැමිණිල්ල ප්‍රවාදක සාක්ෂි මත පදනම්ව ඇති අවස්ථාවක ඒ පිළිබඳ විමර්ශනයේ යෙදුනු සහකාර පොලිස් අධිකාරිවරයා විසින් ඒ පිළිබඳව ප්‍රශ්න කර සත්‍ය සොයා ගවේෂණයක යෙදිය යුතුව තිබුණේ වූ නමුත් ඔහු එසේ කළ බවක් කටඋත්තරයෙන් නොපෙනේ.

අධිකරණ අමාත්‍යවරිය වූ තලතා අතුකෝරාළ මහත්මිය පසු අවස්ථාවක සිදුකළ ප්‍රකාශයකින් ඇය පැමිණිලිකරු සම්බන්ධයෙන් ද්වේශසහගත අයුරින් කටයුතු කරන බවට පැමිණිලිකරු අවබෝධ කරගෙන ඇත. පැමිණිලිකරු දැඩි දෝෂ දර්ශනයට ලක් කරමින්

අමාත්‍ය තලතා අතුකෝරාළ මහත්මිය විසින් සිදු කරනු ලැබූ රූපවාහිනී මාධ්‍ය ප්‍රකාශයක පිටපතක් පැ.5 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම වීඩියෝ දර්ශනයෙහි අදාළ කොටස පැ.5 (අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම පැමිණිලිකරුට එරෙහිව මහාධිකරණය ඉදිරියේ නඩු පැවරීම සිදු කරනු ලබන්නේ තලතා අතුකෝරාළ මහත්මිය විසින් පවත්වනු ලැබූ රූපවාහිනී ප්‍රකාශ වලින් පසුවය. මෙම අවස්ථාව වන විට තලතා අතුකෝරාළ මහත්මිය 2015 පිහිටුවන ලද යහ පාලන රජයේ අධිකරණ අමාත්‍යවරිය ලෙස කටයුතු කර ඇත. අමාත්‍යවරිය මෙම ප්‍රකාශය සිදු කරනු ලැබූ අවස්ථා වනවිට පැමිණිලිකරුට එරෙහිව කිසිදු පරීක්ෂණයක් හෝ විනය පරීක්ෂණයක් සිදුකර නොමැතිව තිබී ඇති අතර අඩු තරමින් පැමිණිලිකරුගෙන් නිදහසට කරුණු විමසීමක් ද සිදු කර තිබී නොමැත. මෙම තත්ත්වය මත පැමිණිලිකරු සඳහන් කළේ අමාත්‍ය තලතා අතුකෝරාළ මහත්මිය ඇගේ උක්ත රූපවාහිනි ප්‍රකාශය මගින් පරීක්ෂණයක් පැවැත්වීමටත්, තමන්ව සැකකරුවෙකු බවට පත් කිරීමටත් උත්සාහ දරා ඇති බව පැහැදිලිව පෙනීයන බව සඳහන් කළේය.

විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ මෙවන් සිල්වා මහතාගේ නියමය පරිදි සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා විසින් තුසිතා විජයමාන්න විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පිළිබඳව පරීක්ෂණයක් සිදුකර ඇත. ගුණසේකර මහතා විසින් සිදුකරන ලද එම පරීක්ෂණය අපරාධ චෝදනාවක් පිළිබඳව සිදු කරනු ලැබූ පරීක්ෂණයක් නොවන බවත්, විශේෂ විමර්ශන ඒකකයට අපරාධ චෝදනා පිළිබඳව විමර්ශනය කිරීම සඳහා බලයක් නොමැති බවත්,

අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා විශේෂ විමර්ශන ඒකකයට ආරක්ෂක අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී නොමැති බවත් පැමිණිලිකරු සඳහන් කළේය. පොලිස්පති චක්‍රලේඛ අනුව පොලිස් නිලධාරීන්ට විරුද්ධව විනය සම්බන්ධ පරීක්ෂණ කටයුතු කිරීම සඳහා පමණක් විශේෂ විමර්ශන ඒකකයට බලය ලැබී ඇති බව සඳහන් කළේය. එසේම, මෙම විනය පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් පොලිස් දෙපාර්තමේන්තුවෙන් තමන්ට චෝදනා පත්‍ර තුනක් භාරදුන් බවත්, එම චෝදනා පත්‍ර තුන සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අවසන් බවත්, එම එක චෝදනා පත්‍රයක් මත හෝ විධිමත් විනය පරීක්ෂණයක් මෙතෙක් ආරම්භ කරන නොමැති බවත්, එම චෝදනා පත්‍ර තුනම 2017 වසරේදී තමන්ට බාර දුන් බවත් පැමිණිලිකරු සඳහන් කළේය.

සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා විසින් සිදු කරනු ලැබූ විමර්ශනය අඩංගු වාර්තාව පැ.6 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම පැ.6 ලේඛනයේ මුල් පිටුවේ පරීක්ෂණය ආරම්භ කිරීමට ප්‍රථම ගුණසේකර මහතා මෙසේ සඳහන් කර ඇත.

> ( උපුටා ගැනීම) “මෙය එස්.අයි.යූ 19/2015 යටතේ ලේඛන ගත කර විමර්ශන සිදුකරන ලද අතර විමර්ශනයේදී පොලිස් නිලධාරීන් 30 දෙනෙකුගේද, සිවිල් වැසියන් 27 දෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කර අවශ්‍ය ලේඛන භාරයට ගෙන විමර්ශනයක් සිදුකර ඇත.” (උපුටා ගැනීම අවසන්)

එම පරීක්ෂණය අවසානයේ දී ගුණසේකර මහතා තම නිගමනය යටතේ මෙසේ සඳහන් කර ඇත.

(උපුටා ගැනීම) "ඉහත සනාථ වී ඇති චෝදනා සම්බන්ධයෙන් පහත පරිදි දෙපාර්තමේන්තු නියෝග ඒ 07 බී පරිශිෂ්ඨයේ විනය සංග්‍රහයේ ගැනෙන පහත වැරදි යටතේ චෝදනා ගොණු කල හැකි බව නිගමනය කරමි." (උපුටා ගැනීම අවසන්)

සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද පැ.6 දරණ විමර්ශන වාර්තාව පදනම් කරගෙන විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂක මෙවන් සිල්වා විසින් පොලිස්පතිවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව පැ.7 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත. එම වාර්තාව සමග කෙටුම්පත් කරන ලද චෝදනා පත්‍ර සහ උද්ධෘත ගොනු පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. එසේම නීතිමය පියවර ගැනීමට උද්ධෘත ගොනු නීතිපති වෙත යවා උපදෙස් ලබාගෙන අවශ්‍ය කටයුතු කිරීම සඳහා පොලිස්පතිවරයාගේ අනුමැතිය ලබා දෙන ලෙසටද ඉල්ලීමක් කර ඇත.

මේ අනුව සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා විසින් පැමිණිලිකාර ජෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා සහ තවත් පොලිස් නිලධාරීන් කීහිපදෙනෙකුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා චෝදනා ගොනු කිරීමට අවශ්‍ය මූලික පරීක්ෂණයේ උද්ධෘත ගොනු නීතිපති වෙත යවා උපදෙස් ලබාගෙන ඉදිරි පියවර ගැනීම සඳහා විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂක මෙවන් සිල්වා මහතා කටයුතු කර ඇති බව පැහැදිලිව පෙනී යයි.

ඉහත සඳහන් කරන ලද පැ.2 සිට පැ. 6 දක්වා ලේඛන පරිශීලනය කිරීමේදී පැහැදිලිව පෙනී යන්නේ නීතිපතිවරයා වෙත විනය පරීක්ෂණයක් සඳහා වෙනම මූලික පරීක්ෂණයක ගොනු උද්ධෘත

නීතිපතිවරයා වෙත යැවීම දක්වා ක්‍රියාපටිපාටිය ආරම්භ වී ඇත්තේ විපක්ෂ නායිකා තුසිතා විජයමාන්න විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙත භාරදෙන ලද ඉහත සඳහන් පැ.2 ලිපිය කරණ කොට ගෙනය.

පැමිණිලිකරු සඳහන් කළ අන්දමට විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ මෙවන් සිල්වා විසින් පොලිසියට යවන වාර්තාව සහ ඊට සමගාමීව නීතිපතිවරයා වෙත යවන ලද උද්ධෘත පදනම් කරගෙන ඔහුට විරුද්ධව රත්නපුර මහාධිකරණයේ නඩු පවරා ඇත. මේ අනුව රත්නපුර මහාධිකරණයේ නඩු පැවරීමට මූලික වූයේ සබරගමුව පළාත් සභාවේ විපක්ෂ නායිකා තුසිතා විජේමාන්න මහත්මිය විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට භාර දෙන ලද පැ.2 ලිපිය මතය. මේ හැර රත්නපුර මහාධිකරණයේ පැමිණිලිකරුට එරෙහිව අධිචෝදනා ගොනු කිරීමට සහ එසේම යාපනයේ මහාධිකරණයේ පැමිණිලිකරුට එරෙහිව අධිචෝදනා ගොනු කිරීමට ඉහත සඳහන් විපක්ෂ නායිකා තුසිතා විජේමාන්නගේ ලිපිය හැර වෙනත් කිසිදු ස්වාධීන පැමිණිල්ලක් නොතිබුණ බවය.

සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා විසින් පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්ෂණය සඳහා වූ මූලික පරීක්ෂණය ආරම්භ කරන ලද්දේ පැමිණිලිකරු වැරදිකරු යන පූර්ව නිගමනයට පැමිණීමෙන් පසුව බවත්, තමාට පක්ෂව තිබූ සාක්ෂි සියල්ල යටපත් කර ගොතන ලද සාක්ෂි මත විමර්ශනය පවත්වා නිගමනයකට එළඹ ඇති බව විමර්ශන ගොනුව පරිශීලනය කිරීමේදී පෙනී යන බව පැමිණිලිකරු සඳහන් කළේය.

පැමිණිලිකරුට එරෙහි මෙම මූලික පරීක්ෂණය පහත සඳහන් චෝදනා තුන මත විමර්ශනය කර ඇත.

1. කහවත්ත පොලිස් වසමේ සිදුවූ වෙඩි තැබීමේ සිද්ධියේ දී හිටපු නියෝජ්‍ය අමාත්‍ය ප්‍රේමලාල් ජයසේකර මහතාගේ නම බී වාර්තාවට ඇතුළත් නොකරන ලෙසට පැමිණිලිකරු විසින් කහවත්ත පොලිස් ස්ථාන ස්ථානාධිපතිට බලපෑම් කළ බවට චෝදනාව.

2. 2015 ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙන් පවත්වනු ලැබූ නීති විරෝධී රැස්වීමක් නැවැත්වීමට කටයුතු කළ යටියන්තොට පොලිස් ස්ථානාධිපතිට පැමිණිලිකරු විසින් බැණ තර්ජනය කළ බවට චෝදනාව.

3. නීති විරෝධී පෝස්ටර් සහ කටවුට් ඉවත් කරමින් සිටි නිලධාරීන්ට බැණ තර්ජනය කළ බවට චෝදනාව.

රත්නපුර මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා නගා ඇත්තේ ප්‍රේමලාල් ජයසේකර මහතාගේ නම බී වාර්තාවට ඇතුළත් නොකරන ලෙසට කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයාට බලපෑම් කළ බවට අධිචෝදනාවකි. අධිචෝදනාවේ මූලික හරය එසේ වුවත් සත්‍ය වශයෙන්ම ප්‍රේමලාල් ජයසේකර මහතාගේ නම බී වාර්තාවට ඇතුළත් කර තිබී ඇත. ඒ අනුව ප්‍රේමලාල් ජයසේකර මහතාගේ නම බී වාර්තාවෙන් ඉවත් කිරීමක් සිදුවී නොමැත.

ප්රේමලාල් ජයසේකර මහතාගේ නම බී වාර්තාවට ඇතුළත් නොකරන ලෙසට පැමිණිලිකරු බලපෑම් කළ බවට මුල්ම තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ තුසිතා විජේමාන්න විසින් අග්‍රමාත්‍ය රනිල්

වික්‍රමසිංහ මහතා වෙත යවන ලද පැ.2 දරණ ලිපියෙනි. මේ හැර ඇය සඳහන් කරන අන්දමේ බලපෑමකට හෝ බල කිරීමකට ලක් වූ පුද්ගලයෙකු විසින් එවැනි පැමිණිල්ලක් සිදු කළ බවට සාක්ෂි ඉදිරිපත්ව නැත. සිද්ධියට අදාළ කාලසීමාව තුළ කහවත්ත පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වශයෙන් සේවය කල පොලිස් පරීක්ෂක ලලිත් පුෂ්පකුමාර රාජමන්ත්‍රී මහතාට, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා විසින් එවැනි බලපෑමක් සිදුකළ බවට පුෂ්පකුමාර මහතා පැමිණිල්ලක් ඉදිරිපත් කර නැති අතර අඩු තරමින් ඔහුගේ සාක්කු සටහන් පොතේ හෝ පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොතෙහි ඒ පිළිබඳව කිසිදු සටහනක් යොදා නැත.

මේ අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා විසින් ප්‍රකාශ කරන ලද බවට සඳහන් මෙම ප්‍රකාශය වචනයට පමණක් සීමා වූ ප්‍රකාශයකි. ඒ පිළිබඳව ලිඛිත සාක්ෂි කිසිවක් නොමැත. ලලිත් ජයසිංහ මහතා එවැනි ප්‍රකාශයක් සිදු කළේ නම් එය ලේඛනගත කිරීම පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රී විසින් සිදුකළ යුතුව තිබූ නමුත් ඔහු විසින් ඒ පිළිබඳව නිල ලේඛනයක සටහන් තබා නොමැත. ඉදිරිපත් වී ඇති අනෙකුත් සියලුම සාක්ෂි අසා දැනගත් සාක්ෂි වන අතර එම සෑම සාක්ෂියක්ම පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රීගෙන් උත්පාදනය වී ඇත.

පැමිණිලිකරුට එරෙහිව ප්‍රකාශයක් ලබා දුන් කහවත්ත පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ ප්‍රකාශය ලබා ගැනීමේ දී ඔහුගෙන් නිසියාකාරව ප්‍රශ්න කිරීමක් සහකාර පොලිස් අධිකාරී කේ.කේ.කේ ගුණසේකර මහතා සිදුකර නොමැත. නියෝජ්‍ය පොලිස්පති ජයසිංහ මහතා කහවත්ත ස්ථානාධිපතිවරයාට යමක් ප්‍රකාශ කළේ නම් ඒ බව ඔහුගේ සාක්කු සටහන් පොතේ හෝ පොලිස් ස්ථානයේ ඇති

තොරතුරු වාර්තා පොතෙහි සඳහන් නොකළේ කුමන කරුණක් නිසාද යන්න සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා තවමත් පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් ප්‍රශ්න කර නොමැත.

පොලිස් ආඥා පනතේ 55 වන වගන්තිය යටතේ පොලිස්පතිවරයා විසින් සාදනු ලැබූ නියෝග ඒ 16 (v) පොලිස් නිලධාරියෙකු විසින් නඩත්තු කළ යුතු සාක්කු සටහන් පොත පිළිබඳව විධිවිධාන අන්තර්ගතව ඇත. ඒ 16(v) අනු නියෝගයෙහි සඳහන්ව ඇති අන්දමට කෙනෙකුගේ  රාජකාරි කටයුතුවලදී මතුවන සෑම කරුණක් ගැනම සාක්කු සටහන් පොතේ සටහන් ලිවිය යුතුයි. ඒ  16 නියෝගය පැ.8 වශයෙන්ද (v) පස්වන අනු නියෝගය පැ. 8 (අ) වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා පොලිස් ස්ථානාධිපතිවරයාට බලපෑම් කළේ නම් ඔහු ඒ පිළිබඳව නොපමාව තම සාක්කු සටහන් පොතෙහි සටහන් තබනු නොඅනුමානය. නමුත් එවැනි සටහන් පොලිස් ස්ථානාධිපතිවරයා විසින් තම සාක්කු සටහන් පොතෙහි සටහන් නොතැබීමෙන් පෙනී යන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයාට පැමිණිල්ලේ සඳහන් අන්දමින් බලපෑම් කළාය යන කරුණ පිළිගැනීමට කරුණු ඉදිරිපත්ව නොමැති බවය. බලපෑමට ලක් වූ පුද්ගලයා තමා බලපෑමකට යටවූ බවට සඳහන් නොකරන්නේ නම් එවැනි  චෝදනාවක් කිසිසේත් ඔප්පු කළ නොහැකි ය.

එසේම පොලිස්පතිවරයා විසින් නිකුත් කර ඇති ඒ 17 දරණ නියෝගයේ අනු නියෝගයට අනුව පොලිස් ස්ථානයක සිදුවන සෑම සිද්ධියක් පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් තොරතුරු පොතේ සටහන්

කළ යුතුය.ඒ අනුව කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයා එම නියෝගය අනුව කටයුතු කළා නම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජයසිංහ මහතා පොලිස් ස්ථානාධිපතිවරයාට සිදුකළ බලපෑම ද තොරතුරු පොතේ සටහන් කළ යුතුව තිබුණි. එසේ වුවත් එවැනි සටහන් තැබීමක් නොමැතිකමින් පෙනී යන්නේ එවැනි බලපෑමක් කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයා වෙත ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජයසිංහ මහතා මගින් සිදු වී නොමැති බවයි. ඒ 17 දරණ පොලිස්පති නියෝගය පැ.9 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජයසිංහ මහතා තමන්ට බලපෑමක් කළ බවට කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයා පළමු වතාවට ප්‍රකාශ කරන්නේ විනය පරීක්ෂණය පවත්වන ලද නිලධාරියා ඉදිරියේදීය. මෙම විනය පරීක්ෂණය ආරම්භ වන්නේ සබරගමු පළාතේ විපක්ෂ නායිකා තුසිතා විජේමාන්න විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙත යොමු කළ පැමිණිල්ලකට අනුව බව අමතක නොකළ යුතුය.

විනය පරීක්ෂණය පැවැත්වූ සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා මෙම අත්‍යවශ්‍ය කරුණට තම අවධානය යොමු කර නොමැත. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජයසිංහ මහතා තමන්ට බලපෑමක් කළ බවට විනය පරීක්ෂණයේදී පොලිස් ස්ථානාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවේදී එම ප්‍රකාශය පිළිගැනීමට අවශ්‍ය කෙරෙන තහවුරු කිරීමේ සාධක එනම්, සාක්කි සටහන් පොතෙහි සහ තොරතුරු වාර්තා පොතෙහි ඒ 16 සහ ඒ 17 නියෝග පරිදි සටහන් තැබුවේද? එසේ සටහන් නොතැබුවේ නම් එසේ සටහන් නොතැබුවේ මන්ද? යන කරුණු කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් ප්‍රශ්න

කර නොමැත. පොලිස් ආඥා පනතේ 55 වන වගන්තිය අනුව පොලිස්පති නියෝග ක්‍රියා නොකිරීම සහ හෝ එම නියෝග කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට සඳහන් කර ඇති බැවින් කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයා පොලිස්පති නියෝග පරිදි ක්‍රියා කර තිබුණේද යන්න සොයා බැලිය යුතුව තිබුණි. එසේ වුවත් සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා එම යුතුකම තම විනය පරීක්ෂණයේ දී ඉටුකර නොමැත.

මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා ස්වාධීන විනය පරීක්ෂණයක් පැවැත්වූ බවට පිළිගැනීමට ඉවහල් වන කරුණු මුළුමනින්ම මඟ හැර ඇති බවය.

සාක්ෂි වශයෙන් ඉදිරිපත් වී ඇති ලේඛන අනුව, විශේෂ විමර්ශන ඒකකයට අපරාධ විමර්ශනය කර විමර්ශන වාර්තා පදනම් කරගෙන සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඔවුන්ට එරෙහිව නඩු පැවරීම, නඩු පැවරීම සඳහා විමර්ශන උද්ධෘත නීතිපතිවරයා වෙත යොමු කිරීමට බලයක් නොමැත. ඒ මක්නිසාද යත්, විශේෂ විමර්ශන ඒකකය, ව්‍යවස්ථාපිත අණ පනත් අනුව ස්ථාපිත කළ පොලිස් විමර්ශන ඒකකයක් නොවන බැවිනි. 1975 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ දෙවන වගන්තියේ අර්ථ නිරූපණය අනුව “පොලිස් ස්ථානය” යන්නෙන්, පොලිස් ස්ථානයක් යයි ආරක්ෂක කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ප්‍රකාශිත යම් ස්ථානයක් අදහස් වන අතර, ජංගම පොලිස් මුරපොල, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ යම් විමර්ශන කාර්යාංශයක් ද ඊට ඇතුළත් වේ."

උක්ත සඳහන් පොලිස් විශේෂ විමර්ශන ඒකකය ස්ථාපිත කරන ලද 1980 සැප්තැම්බර් 17 දින දරණ පොලිස් ගැසට් පත්‍රය (පැ.12) අනුව එම විශේෂ විමර්ශන ඒකකය පිහිටුවා ඇත්තේ පොලිස් නිලධාරීන්ට එරෙහිව ලැබෙන බරපතළ චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහාය.

1988 සැප්තැම්බර් 2 දින දරණ පොලිස්පති චක්‍රලේඛ අංක 755 (පැ.10) අනුව පොලිස් විශේෂ විමර්ශන ඒකකය පිහිටුවීමේ පරමාර්ථයන් වී ඇත්තේ පොලිස් දෙපාර්තමේන්තුවේ විනය උසස් මට්ටමකට ගෙන ඒමත්, ඕනෑම තරාතිරමක පොලිස් නිලධාරීන්ට එරෙහිව විනය පරීක්ෂණ පවත්වන බවට මහජනයා තුළ උපරිම විශ්වාසය ගොඩනැගීමත්, පොලිස් පරීක්ෂණවල කාර්යක්ෂමතාවය අපක්ෂපාතීත්වය සහ ස්වාධීනත්වය වෘර්තීය මට්ටමට ගෙන ඒමත්ය.

උක්ත සඳහන් පොලිස් විශේෂ විමර්ශන ඒකකය පිහිටුවීම සම්බන්ධයෙන් පොලිස්පති විසින් 2003 අගෝස්තු මස 28 වැනි දින දාතමින් යුක්තව නිකුත් කරන ලද නිවේදනයක් 2003 සැප්තැම්බර් 19 දින 1306/27දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පතෙහි පළ කර ඇත. මෙම ගැසට් නිවේදනය පැ.11 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම ගැසට් නිවේදනය පහත උපුටා දක්වා ඇත.

(උපුටා ගැනීම)

" විශේෂ විමර්ශන ඒකක කොට්ඨාශ පිහිටුවීම.

1980 සැප්තැම්බර් මස සිට විශේෂ ඒකකය (කොට්ඨාශය) පිහිටුවා ඇති අතර මෙම ඒකකය මගින් පෞද්ගලිකවත්, සාමුහිකවත් පොලිස්

නිලධාරීන්ට විරුද්ධව ලැබෙන චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කිරීමෙන් පොලිස් නිලධාරීන්ගේ විනයගරුක භාවය ආරක්ෂා කර ගැනීම හා නීතියට පටහැනිව ක්‍රියා කරනු ලබන නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීම සිදුකරනු ලැබේ.

02. මෙම ඒකකයේ ලිපිනය - විශේෂ විමර්ශන ඒකකය
අතුරුමහල,
නව මහලේකම් ගොඩනැගිල්ල
කොළඹ 07 වේ

03. මෙම ඒකකයෙ දුරකථන අංකය -01 – 449852
-01 – 421111-දිගුව 226
වේ.

04. මෙම ඒකකය බාරව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වරයෙකු ක්‍රියා කරන අතර පාලන අංශයක් සහිතව විමර්ශන ඒකක 04 ක් ඇත.

05. මෙම අංශය මගින් පහත සදහන් රාජකාරි ඉටු කරනු ලබයි.

i. පොලිස්පති හෝ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන හෝ විසින් කරනු ලබන නියෝග මත පොලිස් නිලධාරීන් හට එරෙහිව පවත්නා පැමිණිලි විමර්ශනය කිරීම.

ii. මානවහිමිකම් කොමිෂන් සභාව වෙතින්, පණිවිඩ මාර්ගයෙන් සහ අධ්‍යක්ෂ/ නෛතික අංශය මගින් මෙන්ම පොලිස් කොමිෂන් සභාව මගින් ද යොමු කොට ඇති පොලිස් නිලධාරීන්ට එරෙහිව

පවත්නා වධහිංසා පැමිණවීම් පිළිබඳ සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ සිද්ධීන් විමර්ශණය කිරීම.

iii. පොලිස්පති විසින් හෝ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන විසින් කරනු ලබන නියෝග මත රහස්‍ය පරීක්ෂණ මෙහෙයවීම.

iv. සංවිධාන කල අපරාධ හා දූෂණ ක්‍රියා සහ සංවිධානය කල නීති විරෝධී කාර්යයන් ද ප්‍රාදේශීය පොලිසියන්හි අනුග්‍රහය ආරක්ෂාව සහ එක්ව ක්‍රියා කිරීම් ද සහිතව සිදුවන බැව් අනාවරණය වූ අවස්ථාවන්හිදී එකී සිද්ධීන් පිළිබඳ විමර්ශන සඳහා අවශ්‍ය රහස් තොරතුරු එක්රැස් කර ගැනීම. විමර්ශන මෙහෙයවීම සහ ඒ සම්බන්ධ මෙහෙයවීම් කටයුතු කිරීම.

06. අදාල කරුණු සියලු දෙනාගේ දැන ගැනීම පිණිස පළකෙරේ.

ටී.ඒ.ආනන්ද රාජා
පොලිස්පති

2003 අගෝස්තු මස 28 වැනි දින.
පොලිස් මූලස්ථානය
කොළඹ 01"
(උපුටා ගැනීම අවසන්)

උක්ත සඳහන් චක්‍රලේඛ සහ ගැසට් නිවේදන අනුව පැහැදිලිව පෙනී යන කරුණ වන්නේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය අපරාධ පරීක්ෂණය කිරීම සඳහා පිහිටුවන ලද ඒකකයක් නොව පොලිස් නිළධාරීන්ගේ විනය පරීක්ෂණය සඳහා පිහිටුවන ලද ඒකකයක් බවය.

පොලිස් විශේෂ විමර්ශන ඒකකය අපරාධ විමර්ශනය කෙරෙන පොලිස් ඒකකයක් ලෙසට 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ දෙවැනි වගන්තිය අර්ථ නිරූපණය ඇතුළත ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ප්‍රකාශයට පත් කර නොමැත.

රජයේ අධිනීතිඥ මහතා විසින් ඉදිරිපත් කරන ලද X 2 සහ X 3 දරණ ගැසට් පත්‍ර මගින් ද මෙම තත්ත්වය වඩාත් තහවුරු වී ඇත. X 2 ගැසට් පත්‍රය මගින් පොලිස් විශේෂ විමර්ශනය ඒකකයෙහි අංශ දෙකක් විවෘත කර ඇත. එක් අංශයක් පොලිසියට එරෙහිව පැමිණිලි විභාග කිරීමට දෙවන අංශය අපරාධ පරීක්ෂණ සිදු කිරීමට ද වශයෙන් වෙන් කර ඇති බව ගැසට් පත්‍රයෙන් පෙනී යයි. X 2 ගැසට් පත්‍රයෙහි මෙසේ සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම) "අපරාධ පරීක්ෂණ නිලධාරීන් නිල ඇඳුමින් රාජකාරි කරනු ඇත. ඔවුන් රැගෙන එනු ලබන සැකකරුවන් අදාළ පොලිස් ස්ථාන වලින් නීත්‍යානුකූල භාරගත යුතුය. නඩු බඩු ද එලෙස ම භාරගත යුතුය. සැකකරුවකු පොලිස් විශේෂ විමර්ශන ඒකකයට රැගෙන ඒම නොකළ යුතුය...."(උපුටා ගැනීම අවසන්)

කිසිදු සැකකරුවෙකු විශේෂ විමර්ශන ඒකකය වෙත ගෙන ඒම සිදු නොකළ යුතු බවට විධිවිධාන පැනවීමෙන් පැහැදිලිව පෙනී යන කරුණ වන්නේ පොලිස් විශේෂ විමර්ශනය ඒකකයට සැකකරුවන් අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන පරීක්ෂණ පවත්වා අපරාධ පරීක්ෂණයක් සිදු කිරීමට බලයක් නොමැති බව පොලිස්පතිවරයා හොඳින්ම දැන සිටි බවයි.

එසේම ඒ අයුරින්ම 2010 අගෝස්තු 19 වැනි දින නිකුත් කළ X 3 දරණ පොලිස්පති චක්‍රලේඛයෙන්ද ඒ බව මනාව පැහැදිලි වේ. එම චක්‍රලේඛයේත් අධිකරණ කටයුතු යන අනු ශීර්ෂය යටතේ මෙසේ සඳහන් කර ඇත.

(උපුටා ගැනීම) "පොලිස් විශේෂ විමර්ශන ඒකකය වෙත සැකකරුවන් රැගෙන ඒම නොකළ යුතුය. සියලුම විමර්ශන කටයුතු අදාළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් පොලිස්පතිවරුන්, නියෝජ්‍ය පොලිස්පතිවරුන් කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් සහකාර පොලිස් අධිකාරිවරුන්ගේ කාර්යාලවල සිට සිදු කරන්න ප්‍රශ්න කිරීම අවසන් වූ පසු අදාළ පොලිස් ස්ථානවල උපසිර වෙත සැකකරුවන් නීත්‍යානුකූල ලෙස බාර දෙන්න. එම කාර්යාලය දුර බැහැර ඇතිනම් පමණක් අදාළ පොලිස් ස්ථානයේ සිට ප්‍රශ්න කරන්න. සැකකරුවන් භාර දීම නඩු බඩු භාර දීම පිළිබඳව සටහන් අදාළ පොලිස් ස්ථානවල යොදවන්න. නමුත් විමර්ශන සටහන් සියල්ල මෙහි තොරතුරු පොත්වල ඇලවිය යුතුය." (උපුටා ගැනීම අවසන්)

පොලිස්පතිවරයාගේ මෙම උපදෙස් වලින් ද පැහැදිලිව පෙනී යන්නේ විශේෂ විමර්ශන ඒකකය වෙත සැකකරුවන් ගෙනවිත් ප්‍රශ්න කර, සැකකරුවන් සහ ඔවුන්ගේ නඩු බඩු විශේෂ විමර්ශන ඒකකය භාරයේ තබාගෙන අපරාධ පරීක්ෂණ සිදු කිරීමට විශේෂ විමර්ශන ඒකකයට නීතිමය හැකියාවක් නොතිබුණ බවය.

එපමණක්ද නොව අධිකරණ කටයුතු සම්බන්ධ තවත් බරපතළ උපදේශයක් පොලිස්පතිවරයා ලබා දී ඇත. එනම් "සැකකරුවන්ගෙන් ප්‍රශ්නකිරීම් අවසන් වූ පසු අදාළ පොලිස් ස්ථානවල උපසේවක වෙත

සැකකරුවන් නිත්‍යානුකූල ලෙස බාර දෙන්න" යනුවෙන් පනවා ඇති නියෝගයයි. මෙහි අර්ථය තවත් බරපතළ බව පෙනේ. සැකකරුවන් නිත්‍යානුකූල ලෙස උප සේවයට බාරදෙන ලෙසට නියෝග කර ඇත්තේ සැකකරුවන් එතෙක් අනිත්‍යානුකූල භාරයක සිටි නිසා ද යන ප්‍රශ්නය පැන නගී. මෙවැනි නියෝගයක් පැනවීමට මූලික හේතුව වන්නේ විශේෂ විමර්ශන ඒකකයට අපරාධ පරීක්ෂණය සඳහා බලතල නොතිබුණ බැවින් බවට ඉතාමත් පැහැදිලිය.

පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේ මෙම තත්ත්වය යටතේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය තමන්ට එරෙහිව අපරාධ නඩු පරීක්ෂණයක් බවත්, ඔවුන් විනය පරීක්ෂණයක් සඳහා අවශ්‍ය පරීක්ෂණ කටයුතු සිදු කළ බවත්ය. විශේෂ විමර්ශන ඒකකය විසින් සිදුකරන ලද්දේ විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා වූ විමර්ශනයක් බවට හෙළිදරව් වන කරුණු විශේෂ විමර්ශන ඒකකය විසින් පරීක්ෂණය අතරතුර දී සිදුකරන ලද කාර්යයන් තුළින්ම පැහැදිලි වේ. එනම්; පරීක්ෂණයේදී ලේඛනගත සාක්ෂියක් වශයෙන් දූරකථන විස්තර වාර්තාවක් එකතු කර ඇති බවත්, එම දූරකථන විස්තර වාර්තාව අධිකරණයට කරුණු වාර්තා කිරීමක් තුළින් ලබාගත් නියෝගයක් මත ලබා නොගත් බවත්, එම ලේඛනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබා ගෙන ඇති බවත්, එසේ වුවත් පැමිණිලිකරුට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් නොපැවැත්වූ බවත්, විශේෂ විමර්ශන ඒකකයට එවැනි හැකියාවක් හෝ බලයක් තිබුණේ නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් දූරකථන වාර්තාව ලබා නොගෙන ඔවුන්ට කෙලින්ම එම දූරකථන වාර්තාව ලබා ගැනීමට හැකියාව තිබූ බවත්,

විශේෂ විමර්ශන ඒකකයට අපරාධ විමර්ශනය කිරීමේ බලය ලැබී තිබුණේ නම් බී වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කිරීම තුළින් දුරකථන වාර්තාව ලබා ගැනීම සඳහා නියෝගයක් ලබාගෙන එම කර්තව්‍ය සිදුකිරීමට හැකියාව තිබූ බවත්, එවැනි ක්‍රියාමාර්ගයකට විශේෂ විමර්ශන ඒකකය ප්‍රවේශ නොවූයේ ඔවුන්ට අපරාධ විමර්ශනය කිරීම සඳහා බලයක් නොතිබුණු බැවින් බවය.

සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා විසින් පවත්වනු ලැබූ පරීක්ෂණය පිළිබඳව කරුණු අධිකරණයට වාර්තා කිරීමක් සිදු කර නොමැත. පරීක්ෂණය පිළිබඳ කරුණු අධිකරණයට වාර්තා නොකිරීම තුළින් පැහැදිලි වන කරුණ වන්නේ සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා පැවැත්වූ පරීක්ෂණය අපරාධ පරීක්ෂණයක් නොවන බවයි. එය වෙනත් කිසියම් කාර්යයක් සඳහා පැවැත්වූ පරීක්ෂණයක් බව ඉන් මනාව පැහැදිලි වේ.

සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා සිදුකල පරීක්ෂණ වාර්තාව පදනම් කරගෙන එම වාර්තාව නීතිපතිවරයා වෙත යොමුකර උපදෙස් ලබාගෙන නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා නිර්දේශයක් ඇතුළත් කරමින්, විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ මෙවන් සිල්වා, ගුණසේකර මහතාගේ පරීක්ෂණ වාර්තාව පොලිස්පතිවරයා වෙත යවා ඇත. පැමිණිලිකරුට අනුව සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතාගේ උක්ත සඳහන් විනය පරීක්ෂණයක් සඳහා වූ මූලික පරීක්ෂණ වාර්තාව හැර වෙනත් අපරාධ පරීක්ෂණයක වාර්තා නීතිපතිවරයා වෙත යවා නොමැත. එසේම අපරාධ නඩුවක් පැවරීම සඳහා අවශ්‍ය වෙන පරීක්ෂණයක් පවත්වා එම වාර්තා තමන් වෙත

ඉදිරිපත් කරන ලෙසට නීතිපතිවරයා විසින් උපදෙස් දීමක්ද සිදු කර නොමැත.

විපක්ෂ නායිකා තුසිතා විජේමාන්න පැමිණිලිකරුට එරෙහිව සිදු කරනු ලැබූ පැමිණිල්ල කෙළින්ම පොලිස්පතිවරයාට සිදු නොකර අග්‍රාමාත්‍යවරයාට එම පැමිණිල්ල යොමුකර අග්‍රාමාත්‍යවරයා මගින් පොලිස්පති වෙත පැමිණිලිකරුට එරෙහිව පැමිණිල්ල ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා තුසිතා විජේමාන්නගෙන් විමසා නොමැත. එසේම ඒ අයුරින්ම ප්‍රේමලාල් ජයසේකරගේ නම බී වාර්තාවට ඇතුළත් නොකරන ලෙසට පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රීට පැමිණිලිකරු බලපෑම් කළ බවට වූ කාරණය තුසිතා විජේමාන්නට දැනුම් දුන්නේ කුමන කරුණක් අරබයා ද යන්න තම පරීක්ෂණයේ දී සහකාර පොලිස් අධිකාරී ගුණසේකර, පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රීගෙන් විමසා නොමැත.

එසේම පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රීට එවැනි බලපෑමක් සිදු කළේ නම්, එම කරුණු පොලිස්පති චක්‍රලේඛ ඒ 16 සහ ඒ 17 අනුව සටහන් නොතැබුවේ කුමන කරුණක් නිසාද යන්න සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රීගෙන් ප්‍රකාශය සටහන් කර ගන්නා අවස්ථාවේදී විමසා නොමැත. මේ අනුව සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතාගේ විමර්ශනය අපරාධ පරීක්ෂණයකට නොගැලපෙන අයුරින් සිදු කළ අසම්පූර්ණ පරීක්ෂණයකි.

සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතාගේ පරීක්ෂණයේ අසම්පූර්ණ භාවය විදහා දක්වන තවත් කරුණක් පැමිණිලිකරු හෙළිදරව් කර ඇත. එනම්, 2015.02.24 දින පැය 13.30ට රත්නපුර

සහකාර පොලිස් අධිකාරී කාර්යාලයේදී සහකාර පොලිස් අධිකාරි ඒකනායක පතිරණගේ තිලකරත්නගේ කටඋත්තරය පරිගණකය මගින් සටහන් කරගෙන ඇත. මෙම කටඋත්තරය දිගු කටඋත්තරයකි. එසේම එදිනම පැය 14.00 ට ගුණසේකර මහතා රුවන්වැල්ලේ city medical ස්ථානයේදී තුසිතා විජේමාන්නගේ කටඋත්තරය සටහන් කරගෙන ඇත. මේ අනුව 13.30ට පිටු හතරක දිගු කටඋත්තරයක් සටහන් කර ගැනීම ආරම්භ කරන සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා, ඊට විනාඩි 30 පසුව පැය 14.00 ට තුසිතා විජේමාන්නගේ කටඋත්තරය සටහන් කර ගැනීම ආරම්භ කර ඇත. කටඋත්තර සටහන් කරගැනීම සිදු කළ ස්ථාන දෙක අතර ඇති දුර ප්‍රමාණය සලකා බලන විට මෙම වේලාවන් තුළ මෙම කටඋත්තර සටහන් කර ගැනීම සිදුකළ නොහැකි බවට පැමිණිලිකරු සඳහන් කළේය. ඉහත සඳහන් කටඋත්තර දෙක පැ. 14 සහ පැ. 4 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.14 සහ පැ.4 වශයෙන් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් කළ කටඋත්තර 2 විමර්ශනය කර බැලීමේදී එම කටඋත්තර 2හි සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා විසින්ම සටහන් කරගත් බවට කරුණු අනාවරණය නොවේ.

පැ.14 වශයෙන් සලකුණු කළ කටඋත්තරය 2015.02.24 දින පැය 13.30 ට සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා සටහන් කර ගැනීම සිදු කර ඇත්තේ රත්නපුර සහකාර පොලිස් අධිකාරී 3 ගේ කාර්යාලයේදීය. එම කටඋත්තරය පොලිස් කොස්තාපල් 20641 ක්‍රිස්ටි ඩේවිඩ් නැමැති නිලධාරියා ලවා පරිගණකයෙන් යතුරු ලියනය කරවාගෙන සටහන් කරගෙන ඇත. එම කටඋත්තරය සටහන් කිරීම

ආරම්භ කර ඇත්තේ; “සහකාර පොලිස් අධිකාරි කේ.කේ.කේ. ගුණසේකර වන මා විසින් පො.කො. 20641 ඩේවිඩ් නිලධාරියා ලවා පරිඝණකයෙන් යතුරු ලියනය කරවමි” යනුවෙන් සටහන් තබමිනි.

කෙසේ වුවත් එදිනම ඊට විනාඩි තිහකට පසුව පැය 14ට තුසිතා විජේමාන්නගේ කටඋත්තරය සටහන් කිරීම ආරම්භ කරන සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතා පැ.4 දරණ තුසිතා විජේමාන්නගේ කටඋත්තරය සටහන් කර ගැනීම ආරම්භ කරන්නේ; “සහකාර පොලිස් අධිකාරි කිංස්ලි ගුණසේකර වන මා උ.පො.ප.අබේකෝන්, උ.පො.ප. කාරියවසම් සමග එස්.අයි.යූ 19/2015 දරණ විමර්ශනයට අදාළව පරීක්ෂණය සඳහා මෙහි පැමිනියා. රුවන්වැල්ල එක්සත් ජාතික පක්ෂ කාර්යාලයෙන් සබරගමුව විපක්ෂනායක වශයෙන් කටයුතු කරන වෛද්‍ය තුසිතා විජේමාන්න මහත්මියගේ ජංගම දුරකතනයට කතා කර අප පැමිනි කාරනය දැනුම් දුන් අතර ඒ අනුව එම මහත්මිය මෙම ස්ථානයට පැමිනියා. 2015 ජනාධිපතිවරණයට අදාළ කාලසීමාවේ දී කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක වල එක්සත් ජාතික පාක්ෂිකයන්ට සිදුවූ හිරිහැර පිළිබඳව එතුමිය විසින් ගරු අග්‍රාමත්‍යතුමා වෙත ඉදිරිපත් කරන ලද ලිපියට අනුව පොලිස්පතිතුමාගේ නියමයෙන් සිදු කරන විමර්ශනයට අදාලව ප්‍රකාශයන් ලබා ගැනීමට බව එතුමියට පහදා දී ප්‍රකාශය පහත සඳහන් කරමි” යනුවෙන් සටහන් තබමිනි.

පැ.14 දරණ කටඋත්තරයේ සහකාර පොලිස් අධිකාරී කේ.කේ.කේ. ගුණසේකර යනුවෙන් සඳහන් කරන ගුණසේකර මහතා, පැ.4 දරණ කටඋත්තරයේ සඳහන් කර ඇත්තේ සහකාර පොලිස් අධිකාරී කිංස්ලි ගුණසේකර යනුවෙනි. පැ.4 දරණ කටඋත්තරය පරිගණකය මගින්

සටහන් තබා නොමැති අතර එය යතුරු ලියනය කර ඇත. යතුරු ලියනය කිරීම සඳහා ප්‍රකාශය අයි.අයි.බී. තොරතුරු පොතෙන් උපුටාගෙන ඇති බව යතුරු ලේඛිකා සන්ධ්‍යා සහතික කර ඇත.

කෙසේ වුවත් පැ.14 දරණ කටඋත්තරය ඉහත කී අයි.අයි.බී. තොරතුරු පොතෙන් උපුටා ගත් ප්‍රකාශයක් බවට සඳහන් නොවේ. පැ.14 ප්‍රකාශයෙහි සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතාගේ අත්සන දක්නට ඇතත් පැ.4 ප්‍රකාශයේ එලෙස ගුණසේකර මහතාගේ අත්සන් දක්නට නොමැත .

පැ.14 ප්‍රකාශයේ අවසානයේ සහතික කරන ස්ථානයෙහි සහකාර පොලිස් අධිකාරී කේ.කේ.කේ. ගුණසේකර යනුවෙන් සඳහන් කර ඇතත් පැ.4 ප්‍රකාශයෙහි අවසානයේ සහතිකයේ සඳහන් කර ඇත්තේ සහකාර පොලිස් අධිකාරි කිංස්ලි ගුණසේකර යනුවෙනි.

එසේම පැ.4 දරණ තුසිතා විජේමාන්නගේ ප්‍රකාශය සටහන් කිරීමේදී පොලිස් අධිකාරිවරයා එම කටඋත්තරය ලියා ගැනීම ආරම්භ කර ඇත්තේ "2015.02.24 දින පැය 14.00 ට රුවන්වැල්ලේ සිටි මෙඩිකල්හිදීය. සහකාර පොලිස් අධිකාරී ගුණසේකර වන මා උ.පො.ප.අබේකෝන්, උ.පො.ප.කාරියවසම් සමඟ එස්අයියූ 19/2015 දරන විමර්ශනයට අදාලව පරීක්ෂණය සඳහා මෙහි පැමිනියා" යනුවෙන් සඳහන් කරමින්.

නමුත් පැ.14 දරණ සහකාර පොලිස් අධිකාරී ඒකනායක පතිරගේ තිලකරත්නගේ ප්‍රකාශය සටහන් කිරීමේදී ඉහත පැ. 4 දරණ ප්‍රකාශය ආරම්භ කරන්න අයුරින් ආරම්භ කර නොමැති අතර, එය ආරම්භ කර ඇත්තේ "2015.02.24 වන දින පැය 13.30 ට රත්නපුරය සහකාර

පොලිස් අධිකාරී III කාර්යාලයේදී පොලිස්පති තුමා විසින් විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ වෙත විමර්ශනය සඳහා ලබාදී ඇති SIU/19/2015 දරණ විමර්ශනයට අදාලව කහවත්ත පොලිස් වසමේ දී 2015.01.15 වන දින 2015 ජනාධිපතිවරණයට පොදු අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වූ ............ " යනුවෙන් පැ. 4 ප්‍රකාශයට සපුරා වෙනස් ආකාරයක ආරම්භයක් ලබා ගනිමිනි.

එසේම පැ.4 දරණ ප්‍රකාශය තුසිතා විජේමාන්නගෙන් ලබා ගැනීමට හේතුව වශයෙන් සඳහන් කර ඇත්තේ "2015 ජනාධිපතිවරණයට අදාල කාල සීමාවේදී කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක වල එක්සත් ජාතික පාක්ෂිකයන්ට සිදුවූ හිරිහැර පිළිබඳව එතුමිය විසින් ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන ලද ලිපියට අනුව පොලිස්පතිතුමාගේ නියමයෙන් සිදු කරන විමර්ශනයට අදාළව ප්‍රකාශයක් ලබාගැනීම" බවය. එසේ වුවත් තුසිතා විජේමාන්න විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට යවා ඇති ලිපියෙහි සඳහන් කර ඇත්තේ 2015 ජනාධිපතිවරණයේදී සබරගමුව පළාතේ සිදු වූ බියගැන්වීම්, පහරදීම්, තුවාල සිදුකිරීම්, ප්‍රදේශයේ සිදුවූ මිනීමැරුමක් පිළිබඳව කරුණු අධිකරණයට වාර්තා කිරීමේ දී නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සැකකරුවකු බවට අනාවරණය වී තිබියදීත් කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයාගේ සිට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දක්වා මොහු විසින් බලපෑම් කර නියෝජ්‍ය අමාත්‍යවරයාගේ නම අධිකරණයට වාර්තා කිරීමේ දී ඇතුළත් නොකරන ලෙස බලපෑම් කළ බවය.

මේ අනුව ඉහත සඳහන් කරුණු සලකා බැලීමේදී පැහැදිලිව පෙනී යන්නේ සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා විසින් සටහන්

කරගත්තා යැයි කියනු ලබන පැ. 14 සහ පැ. 4 යන ප්‍රකාශයන් දෙකම හෝ ඉන් එකක් සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා විසින් සටහන් කරගෙන නොමැති අතර දෙකම හෝ ඉන් එකක් වෙනකෙකු විසින් සටහන් කරගෙන සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා විසින් සටහන් කළ බවට සහතික යොදා ඇති බවය.

මෙම කරුණු සිදුවී ඇති ආකාරය සලකා බලන විට එළඹිය හැකි නිගමනය වන්නේ සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා විසින් සිදු කරනු ලැබූ විනය පරීක්ෂණයක් සඳහා වූ මූලික පරීක්ෂණය නිසි අයුරින් සිදුකර නොමැති බවය.

එබැවින් මෙවැනි අසම්පූර්ණ විමර්ශනයක් පවත්වා රැස්කරගත් තොරතුරු සහ ප්‍රකාශ ආධාරයෙන් අපරාධ නඩුකරයක් පැමිණිලිකරුට එරෙහිව ආරම්භ කිරීම සඳහා එම විමර්ශන ගොනු නීතිපතිවරයාට ඒවීම තුළින් පැමිණිලිකරුට බලවත් අසාධාරණයක් අයුක්තියක් මෙන්ම නීතියේ රාමුව තුළ නිසි පරිදි යුක්තිය ඉටු වීමක් සිදු වී නොමැත.

මෙම සිද්ධියට ප්‍රථම 2014 වර්ෂයේදී, පැමිණිලිකාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා විසින් කහවත්ත පොලිස් ස්ථානාධිපති රාජමන්ත්‍රී මහතාට එරෙහිව විනය නියෝගයක් සිදු කර ඇත.

එම විනය නියෝගයට පසුබිම් වූයේ කහවත්ත පොලිස් වසමට පානදුර වලාන දූෂණ මර්දන කොට්ඨාශයෙන් පැමිණ පොලිස් ස්ථානයේ සිට කිලෝමීටර් තුනක් දුරින් පවත්වාගෙන ගිය මහා පරිමාණ නීති විරෝධී මත්පැන් පෙරන ස්ථානයක වැටලීම සිදු කර ඒ සඳහා නඩු පැවරීමට

කහවත්ත පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රදේශයේ තිබූ නීති විරෝධී මත්පැන් පෙරන ස්ථාන නැවැත්වීමට කටයුතු නොකිරීම, මහජනයාගේ විශ්වාසය දිනා ගැනීමට කටයුතු නොකිරීමත් සහ පිට ස්ථාන වලින් පැමිණ පළාතේ තිබෙන නීති විරෝධී මත්පැන් නඩු සම්බන්ධව ක්‍රියා කිරීමට සිදුවීම සම්බන්ධයෙන්, පැමිණිලිකරු විසින් කහවත්ත පොලිස් ස්ථානයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ලලිත් පුෂ්පකුමාර රාජමන්ත්‍රීට අවවාද පත්‍රිකාවක් නිකුත් කර තිබේ. අවවාද පත්‍රිකාව පොලිස් මූලස්ථානයේ ඇති ස්ථානාධිපති රාජමන්ත්‍රීගේ පුද්ගලික ලිපි ගොනුවට, විනය හා කල්ක්‍රියා කොට්ඨාශය සහ තවත් ස්ථාන කිහිපයක ගොනු වී ඇත. අවවාද පත්‍රිකාව 2014.12.25 වැනි දින පැමිණිලිකරු විසින් නිකුත් කර ඇත. එම අවවාද පත්‍රිකාව පැ.15 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම සිද්ධියට තමන් සමග අමනාපයෙන් සිටි කහවත්ත පොලිස් ස්ථානාධිපති රාජමන්ත්‍රී තුසිතා විජේමාන්න විසින් සිදු කරනු ලැබූ පැමිණිල්ල සම්බන්ධයෙන් තමන්ට බලපෑම් කළ බවට සඳහන් කරමින් තමන්ගෙන් පලිගැනීම සඳහා කටඋත්තරයක් ලබාදී ඇති බවට පෙනී යන බව පැමිණිලිකරු සඳහන් කළේය.

මෙම කරුණු දෙස බලන විට පෙනී යන්නේ පැමිණිලිකරු විසින් කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයාට බලපෑම් සිදුකළා නම් එවැනි කරුණක් දේශපාලනඥයෙක් වන විපක්ෂ නායිකා තුසිතා විජේමාන්නට පැවසුවේ කුමන නීතිමය පසුබිමක් මතද යන්න විමසිය යුතුය. කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයා විසින් සිදු කළ යුතුව තිබුණේ දේශපාලන බලධාරීන්ට තමාගේ සිත් තැවුල පැවසීම නොව

නීතියෙන් ඔහුට ලැබී ඇති ක්‍රියාමාර්ග ගැනීමය. පළමුව කළ යුතුව තිබුණේ තුසිතා විජේමාන්නට මෙම සිද්ධිය පැවසීම නොව පොලිස්පති චක්‍රලේඛ රෙගුලාසි ඒ 16 සහ ඒ17 නියෝග පරිදි නියමිත සටහන් පොත් වල එම බලපෑම් කිරීම පිළිබඳව සටහන් තැබීමය. නමුත් පොලිස් ස්ථානාධිපති රාජමන්ත්‍රී මහතා තමන් බැඳී සිටින නීතිමය රාමුව තුල ක්‍රියා කර නොමැත. ඔහු එසේ නොකළේ පැමිණිලිකරු එවැනි බලපෑමක් නොකල බැවින්ය; යන අනුමිතියට පැමිණීමට ඉදිරිපත් වී ඇති කරුණු හොඳින්ම ප්‍රමාණවත්ය.

පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්ෂණයක් ආරම්භ කිරීමට තුඩු දුන් සිද්ධිය සිදුවීමෙන් අවුරුදු 2යි, මාස 9කට පමණ පසුව අංක බී.757/2017 වාර්තාව මගින් පළමු වතාවට සිද්ධිය පිළිබඳව කරුණු පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කර ඇත. මෙම බී වාර්තාව පැ.16 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.16 දරණ බී වාර්තාව ආරම්භ කර ඇත්තේ මෙසේය;

> (උපුටා ගැනීම) “ මෙසේ සබරගමුව පළාත් සභාවේ විපක්ෂනායිකා, පළාත් සභා මන්ත්‍රී දොස්තර විජේමාන්න මොහොට්ටිගේ ඉන්ද්‍රා තුසිතා ප්‍රශක්ති මහත්මිය විසින් 2015 වසරේ පැවති ජනාධිපතිවරණය පැවැත්වීමට පෙර සබරගමුව පළාතේ රඹුක්කන, යටියන්තොට, කහවත්ත යන පොලිස් බල ප්‍රදේශ වල ඇති වු සිද්ධීන් කිහිපයකදි සබරගමුව පළාත භාරව සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් අනුරුද්ධ ජයසිංහ මහතා පක්ෂග්‍රාහිව කටයුතු කළ බවට 2015.01.23 වන දින ගරු අග්‍රාමාත්‍ය තුමා වෙත ඉදිරිපත් කරන ලද ලිපියක් පොලිස්පති තුමා වෙත යොමු කිරීමෙන් පසුව විමර්ශන සිදු කරන ලෙසට

පොලිස්පති තුමා විසින් කර ඇති නියෝග පරිදි පොලිස් විශේෂ විමර්ශන ඒකකයේ සහකාර පොලිස් අධිකාරි කේ.කේ.කේ.ගුණසේකර මහතාගේ මූලිකත්වයෙන් විමර්ශනයක් සිදු කරන ලදි." (උපුටා ගැනීම අවසන්)

පැ.16 බී වාර්තාවේ 3 පිටුවේ 2 වන ඡේදයහි මෙසේ දක්වා ඇත.

(උපුටා ගැනීම) "මෙම අපරාධය සම්බන්ධයෙන් කහවත්ත පොලිස් ස්ථානය මගින් ගරු අධිකරණය වෙත කරුණු වාර්ථා කිරිමට යාමේදි සිදුව ඇති බවට සදහන් කර ඇති කරුණ සම්බන්ධයෙන් සොයා බැලිම සදහා මුලින් ලියුම්කාරිය වන විජේමාන්න මොහොට්ටිගේ ඉන්ද්‍රා තුසිතා ප්‍රශක්ති, පළාත් සභා මන්ත්‍රී, විපක්ෂ නායිකා, මැදගොඩ, අම්තිරිගලගේ ප්‍රකාශයක් ලබාගත් අතර, එහිදි තමා සබරගමුව පළාත් සභා විපක්ෂ නායිකාව ලෙස කටයුතු කරන බවද, 2015 ජනාධිපතිවරණය සදහා සංවිධාන කටයුතු සිදු කළ බවද, සබරගමුව පළාතේ කෑගල්ල, රත්නපුර පළාත් වල එජාප සංවිධායකවරුන් පාක්ෂිකයන් විසින් දන්වන ලද තොරතුරු වන ආසන වල සංවිධාන කටයුතු සිදු කිරිමේදි මැතිවරණ ප්‍රචාරක රැළි සහ අනෙකුත් කටයුතු වලදි නිසි පොලිස් ආරක්ෂාවක් ලබාදිම එවකට සබරගමුව පළාත භාර ජ්‍යො.නි.පො.ප. ලලිත් ජයසිංහ මහතා විසින් වැලැක්වූ බවද, කහවත්ත ප්‍රදේශයේ වෙඩි තැබීමේ සිද්ධියට අදාලව අධිකරණයට කරුණු වාර්තා කිරිමේදි සැකකරුවන්ගේ නම් ඇතුළත් නොකරන ලෙසට ජ්‍යො.නි.පො.ප. ලලිත් ජයසිංහ මහතා බලපෑම් කළ බවට තලතා අතුකෝරල මහත්මියගේ පුද්ගලික ලේකම් දැනුම් දුන් බවද, ඒ

අනුව තමා මෙම සිද්ධිය පිළිබඳව 2015.01.23 වන දින විමර්ශනයක් පැවැත්විමට සඳහා ලිපියක් යොමු කළ බව සඳහන් කර ඇත.'' (උපුටා ගැනීම අවසන්)

ගුණසේකර මහතා අධිකරණයට වාර්තා කර ඇති අන්දමට සහ තුසිතා විජේමාන්න තම ප්‍රකාශයේ දී සඳහන් කර ඇති අන්දමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජයසිංහ මහතා බලපෑම් කළ බවට ඇයට දැනුම් දී ඇත්තේ තලතා අතුකෝරාළ මහත්මියගේ පුද්ගලික ලේකම් විසින් බවත්, මේ අනුව තමන් 2015 ජනවාරි 23 වැනි දින පැ.2 ලිපියෙන් විමර්ශනයක් පැවැත්වීම සඳහා කරුණු යොමු කළ බවත් ප්‍රකාශ කර ඇත. සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතාට සිදු කළ ප්‍රකාශ තුසිතා විජයමාන්න මහත්මිය සඳහන් කර ඇතත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට යවන ලද ඉහත සඳහන් 2015 ජනවාරි 23 වැනි දින ලිපියේ තලතා අතුකෝරාළ මහත්මියගේ පුද්ගලික ලේකම් මෙම සිද්ධිය ඇයට දැනුම් දුන් බව සඳහන් කර නොමැත. පැ.2 ලිපියේ සඳහන් කර ඇත්තේ ඇයට දැන ගැනීමට ලැබුණු බව මිස එම තොරතුර ඇයට දැන ගැනීමට ලැබුණු ආකාරය නොවේ.

පොලිස්පති එන්.කේ. ඉලංගකෝන් මහතාගේ ප්‍රකාශයක්ද පොලිස් අධිකාරී කේ.කේ.කේ.ගුණසේකර මහතා විසින් ලබාගෙන ඇති බව බී වාර්තාව පරිශීලනය කිරීමේදී පෙනී යයි. ගුණසේකර මහතා තම සාක්ෂියේ දී සඳහන් කළේ මෙම පැ.2 ලිපිය පොලිස්පතිවරයාට ලැබීමෙන් පසුව පොලිස්පතිවරයා විසින් වාචිකව විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ මෙවන් සිල්වාට පරීක්ෂණයක් පැවැත්වීම සඳහා උපදෙස් දුන් බවත්, ඒ අනුව පරීක්ෂණයක් පැවැත්වීම ආරම්භ කළ බවත්ය. එසේ වුවත් පොලිස්පතිවරයා ඒ අන්දමින් විශේෂ විමර්ශන

ඒකකයේ අධ්‍යක්ෂ මෙවන් සිල්වාට පරීක්ෂණයක් පැවැත්වීම සඳහා වාචිකව උපදෙස් දුන් බවක් ඔහුගේ ප්‍රකාශයේ සඳහන් කර නොමැත. අඩු තරමින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් පොලිස්පතිවරයාට වෙත යොමු කරන ලද තුසිතා විජේමාන්නගේ පැ.2 ලිපිය ගැනවත් ඔහු තම ප්‍රකාශයේ සඳහන් කර නොමැත.

තලතා අතුකෝරාළ මහත්මියගේ පුද්ගලික ලේකම් එම තොරතුරු තලතා අතුකෝරාළ මහත්මියට නොදන්වා තුසිතා විජේමාන්නට දැනුම් දුන්නේ කුමන හේතුවක් මත ද යන ප්‍රශ්නය පැන නගී. සහකාර පොලිස් අධිකාරිවරයා මෙම සැඟවුණු කුමන්ත්‍රනය කුමක්ද යන්න සොයා බලා නොමැත. මේ අනුව තුසිතා විජයමාන්නගේ පැ.2 ලිපියේ අන්තර්ගත කරුණු පිළිබඳව ඉතා ප්‍රබල සැකයක් මතුවේ.

එසේම අනෙක් අතට විපක්ෂ නායක තුසිතා විජේමාන්නට ලැබුණු තොරතුරු සත්‍ය නම් ඒ මත කෙළින්ම තම පැමිණිල්ල පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් නොකර එම පැමිණිල්ල අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා මගින් ඉදිරි ඉදිරිපත් කලේ කුමන කරුණු මුදුන් පමුණුවා ගැනීමට ද යන්න පිළිබඳව තුසිතා විජේමාන්නගෙන් ගුණසේකර මහතා ප්‍රශ්න කර නැත. එවැනි ක්‍රියා ක්‍රියාමාර්ගයකට සිතා විජයමාන්න ප්‍රවේශ වී ඇත්තේ පැ. 2 දරන ලිපියේ සඳහන් කරුණු සත්‍ය කරුණු නොවන බව ඇය හොඳින්ම දැන සිටි බැවින් දේශපාලන අවශ්‍යතා මත ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් පලිගැනීමට, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා මගින් පොලිස්පතිවරයා වෙත බලපෑම් සිදු කර ඒ මගින් ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට දඬුවම් පමුණුවා තම අදහස් මුදුන් පමුණුවා ගැනීමටය.

නියෝජ්‍ය පොලිස්පති කිරින්දගේ ස්ටීවන් බර්ටි රොහාන් ඩයස්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කිරිගම්පමුණුවගේ පාලිත ප්‍රනාන්දු, සහකාර පොලිස් අධිකාරි ඒකනායක පතිරගේ තිලකරත්න, ප්‍රධාන පොලිස් පරීක්ෂක පොලිස් ස්ථාන ස්ථානාධිපති ලලිත් පුෂ්පකුමාර රාජමන්ත්‍රී සහ පොලිස් කොස්තාපල් 55445 සුසිල් ප්‍රේමරත්න යන පොලිස් නිලධාරීන් සහකාර පොලිස් අධිකාරි ගුණසේකර මහතාට ලබා දුන්නා යැයි කියනු ලබන ප්‍රකාශවල අන්තර්ගතව ඇති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා සඳහන් කළා යැයි කියනු ලබන කරුණු ඔවුන්ගේ සාක්කු සටහන් පොත්වල හෝ පොලිස්ථානයේ තොරතුරු සටහන් පොත්වල සඳහන් නොකර පළමු වතාවට සහකාර පොලිස් අධිකාරිවරයාට සිදුකරන කටඋත්තරයේ සඳහන් කිරීම ඔවුන්ගේ ප්‍රකාශවල විශ්වසනීයත්වයට ප්‍රබල සැකයක් මතුකරන කරුණු වේ. ඔවුන් සියලු දෙනාම පවසා ඇත්තේ ඔවුන් අසා දැනගත් තොරතුරක් මිස ඔවුන්ට සෘජුවම ඇසුනු හෝ ඔවුන් දුටු තොරතුරක් හෝ සිද්ධියක් නොවේ.

විශේෂ විමර්ශන ඒකකයේ සහකාර පොලිස් අධිකාරී ගුණසේකර මහතා විසින් සිදුකරන ලද විනය පරීක්ෂණයක් සඳහා වූ මූලික පරීක්ෂණයේදී සටහන් කර ගන්නා ලද කටඋත්තර, උද්ධෘත වශයෙන් සකස් කර අධිචෝදනා නැගීම සඳහා නීතිපතිවරයා වෙත යවා ඇත. එම වාර්තාව පදනම් කරගෙන නීතිපතිවරයා විසින් රත්නපුර මහාධිකරණයේ අංක HCR/215/2017 නඩුව පවරා ඇත. එම නඩුවේ අධිචෝදනා පත්‍රයේ පිටපතක් පැ.17 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. කහවත්ත පොලිස් ස්ථානයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ලලිත් පුෂ්පකුමාර රාජමන්ත්‍රී යන නිලධාරියාට බලපෑම් කිරීමෙන්

දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් කර ඇති බවට චෝදනා නගා ඇත.

මෙ හි ඉහත දී දක්වා ඇති ලෙසට පැමිණිලිකරුගේ වාසියට ඇති කිසිදු කරුණක් විමර්ශනයට භාජනය කර නොමැත. ප්‍රවාදක සාක්ෂි සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂිකරුවන්ගේ කටඋත්තර කිසිවක් සටහන් කර ගෙන නොමැත. තුසිතා විජේමාන්නට පැමිණිල්ල සිදු කිරීම සඳහා තොරතුරු සපයන ලද පුද්ගලයන් කිසිවෙකුගේවත් කටඋත්තර සටහන් කරගෙන නොමැත. තලතා අතුකෝරාළගේ පුද්ගලික ලේකම් තමා දන්නා කරුණු, තලතා අතුකෝරාළට නොපවසා තුසිතා විජේමාන්නට පැවසීමට තුඩු දුන් හේතු මොනවාද යන්න කිසිවක් විමර්ශනය කර සොයා බලා නොමැත.

පැ.16 දරණ බී වාර්තාවේ සඳහන් අන්දමට සහකාර පොලිස් අධිකාරි ඒකනායක පතිරගේ තිලකරත්න තම ප්‍රකාශයෙහි සඳහන් කර ඇත්තේ "පසුව ස්ථානාධිපතිට සබරගමුව පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා දුරකතනයෙන් කතා කර යමක් පවසා සිටීමෙන් පසු' මට ඒ කියන විදිහට කරන්න බැරි නිසා මේක දාලා මම යනවා' කියා ස්ථානාධිපතිවරයා තමා සමග පවසා සිටි බවද, තමා එම අවස්ථාවේදී ඔහුට කියා සිටියේ' මම උඹ එක්ක ඉන්නවා උඹ හරි දේ කරපන්" යනුවෙනි. මහේස්ත්‍රාත් අධිකරණයට බී වාර්තාවක් මගින් ඉදිරිපත් කර ඇති එම සාක්ෂි කාණ්ඩය අනුව පැහැදිලිව පෙනී යන්නේ සහකාර පොලිස් අධිකාරී තිලකරත්නට පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රි විසින් කිසිදු අවස්ථාවක ජ්‍යෙෂ්ඨ පොලිස්

අධිකාරි ජයසිංහ මහතා තමන්ට බලපෑම් කළ බවට ප්‍රකාශ කර නොමැති බවය.

බී වාර්තාවෙහි සඳහන් කර ඇති අන්දමට සහකාර පොලිස් අධිකාරි තිලකරත්න ප්‍රකාශ කර ඇත්තේ “මම උඹ එක්ක ඉන්නවා උඹ හරි දේ කරපන්” යනුවෙනි. එසේ වුවත් කාන්තා පොලිස් කොස්තාපල් 1437 මද්දුම පටබැඳිගේ චමලි ශිරෝමණි නැමැත්තියගේ ප්‍රකාශයට අනුව, සහකාර පොලිස් අධිකාරී තිලකරත්න මහතා පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රීට පවසා ඇත්තේ “රාජමන්ත්‍රී ඔයා බය නැතුව හරි දේ කරන්න ඔයාට මම ඉන්නවා, ගෙදර ගියත් ප්‍රශ්නයක් නැහැ. බී වාර්තාවට නියෝජ්‍ය අමාත්‍ය ප්‍රේමලාල් ජයසේකර මහතාගේ නම ඇතුලත් කරන්න” යනුවෙනි.

එසේ වුවත් මෙම පරීක්ෂණ වාර්තාවේ සඳහන් කිසිදු පොලිස් නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා, පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රීට පැවසුවා යැයි සඳහන් කරන ප්‍රකාශ කිසිවක් ඔවුන්ගේ සාක්කු සටහන් පොත් වල හෝ තොරතුරු සටහන් පොතේ සටහන් කර නොමැත.

පොලිස්පති වෙත එවන ලද අග්‍රාමත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ පැමිණිල්ල විශේෂ විමර්ශන ඒකකයට යොමු කිරීමෙන් පසුව එම රාජකාරිය බාර කෙරෙන ගුණසේකර මහතා පරීක්ෂණය සඳහා 2015 පෙබරවාරි 23 වන දින පිටත්ව ගොස් රාත්‍රී 9.20 ට පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රීගේ ප්‍රකාශය පළමුව වාර්තා ගත කර ඇත. සිද්ධිය සම්බන්ධ පැමිණිල්ල ලැබී ඇත්තේ තුසිතා විජේමාන්න විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා මගින් යොමු කරන ලද පැමිණිල්ලක් මත වුවත්

පැමිණිලිකරුගේ ප්‍රකාශයක් පළමුව සටහන් කර ගැනීමට ගුණසේකර මහතා ක්‍රියාකර නැත.

එසේම, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා විසින් තමන්ට බලපෑම් කළ බවට පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රී මහතා විසින් පැමිණිල්ලක් සිදු කර නොමැත. එසේ තිබියදීත් ගුණසේකර මහතා පළමුව සටහන් කර ගෙන ඇත්තේ රාජමන්ත්‍රීගේ කටඋත්තරය වේ. තමන්ට බලපෑම් කළ බවට පැමිණිල්ලක් උසස් නිලධාරියෙකුට හෝ පොලිස්පතිවරයාට යොමු නොකළේ කිනම් හේතුවක් මත ද යන්න පිළිබඳව ගුණසේකර මහතා පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රීගෙන් විමසිමක් සිදු කර නොමැත. එසේම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජයසිංහ මහතා තමන්ට බලපෑම් කළ බවට තම සාක්කු සටහන් පොතේ හෝ පොලිස් ස්ථානයේ ඇති තොරතුරු සටහන් පොතෙහි සටහන් තැබිමක් පොලිස් පරීක්ෂක රාජමන්ත්‍රී විසින් සිදු කර නොමැත.

එසේම, 2015.01.05 වන දින කහවත්ත ප්‍රදේශයේ සිදුවූ වෙඩි තැබීම සම්බන්ධයෙන් 2015.01.05 දින කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයා විසින් පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බී වාර්තාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයාට සැකකරුවකු මුදාහැරීම සඳහා බලපෑම් කළ බවට කිසිදු සඳහනක් කර නොමැත. එම බී වාර්තාව පැ. 64 වශයෙන් සලකුණු කර ඉදිරිපත්කර ඇත.

එසේම කහවත්ත පොලිස් ස්ථානාධිපතිවරයා විසින් 2015-02-09 දින පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ දිවුරුම් ප්‍රකාශයේද කහවත්ත පොලිස් ස්ථානාධිපති ලලිත් පුෂ්පකුමාර

රාජමන්ත්‍රී මහතා තමන්ට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා සැකකරුවකු මුදාහැරීම සඳහා බලපෑම් කළ බවට සඳහන් කර නොමැත. මෙම දිවුරුම් ප්‍රකාශය පැ.65 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් ජයසිංහ මහතා අත්අඩංගුවට ගෙන පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව ඔහු ඇප මත මුදාහැරීම සඳහා විරුද්ධතවයක් නොමැති බවට සහකාර පොලිස් අධිකාර ගුණසේකර මහතා විසින් ප්‍රකාශ කර ඇත. ඇප ලබා දීමට විරුද්ධත්වයක් නොමැති බවට ප්රකාශ කිරීම සම්බන්ධයෙන් පොලිස්පති පූජිත ජයසුන්දර මහතා ගුණසේකර මහතාගෙන් විමසීමක් කර ඇති බව හෙළිවිය. මෙම විමසීම් තුළින් පෙනී යන්නේ ජයසිංහ මහතා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ අවශ්‍යතාවයක් පොලිස්පති පූජිත ජයසුන්දරට තිබී ඇති බවය.

මේ අනුව, විනය පරීක්ෂණය සඳහා වූ මූලික පරීක්ෂණයේ විමර්ශන සටහන් හා කටඋත්තර සලකා බලන විට, පැමිණිලිකරුට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ චෝදනාවක් ගොනු කළ නොහැකි අතර අඩු තරමින් විනය පරීක්ෂණයක් සඳහා චෝදනාවක් ගොනු කිරීමටවත් ඉදිරිපත් වී ඇති සාක්ෂි ප්‍රමාණවත් නොමැත. අපරාධ චෝදනාවක් නැගීම සඳහා අවශ්‍ය පුළුල් පරීක්ෂණයක් සිදු නොකර පැමිණිලිකරුට එරෙහිව මහාධිකරණයේ අධිචෝදනා නැගීම තුළින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇත.

එබැවින් රත්නපුර කහවත්තේ දී සිදු වූ සිදුවීම් අලලා පැමිණිලිකරුට එරෙහිව රත්නපුර මහාධිකරණයේ නඩු පැවරීම මුළුමනින්ම දේශපාලනමය වශයෙන් පැමිණිලිකරුගෙන් උදවු ලබා ගැනීමට

නොහැකිවීම කරණකොටගෙන පැමිණිලිකරුගෙන් පලි ගැනීම සඳහා ඔහුට එරෙහිව දියත් කරන ලද කුමන්ත්‍රණයක ප්‍රතිඵලයකි. එබැවින්, මෙම ගොතන ලද නඩුවට පහත නම් සඳහන් පුද්ගලයන්යින් වගකිව යුතු බවට මෙම කොමිෂන් සභාව තීරණය කරයි.

දෙවෙනි සිද්ධිය:

පැමිණිලිකරු උතුරු පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස සේවය කරද්දී යාපනය කොට්ඨාසයේ කයිට්ස් පොලිස් වසමේ 2015.05.15 වන දින සිදුවූ විද්‍යා නැමැති පාසල් දැරිය දූෂණය කර ඝාතනය කිරීම සම්බන්ධ නඩුවේ සැකකරුවෙකු නීත්‍යානුකූල භාරයෙන් මුදාහැරීම පිළිබඳ සිද්ධියක් සම්බන්ධව විමර්ශනයට ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා 2017.07.15 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරු කැඳවමින් 2017.07.14 දින නිකුත් කරන ලද නොතීසිය පැ.19 වශයෙන් ඉදිරිපත් කර ඇත. එම නොතීසියට අනුව එම විමර්ශනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශය මගින් සිදුකරනු ලබන බව දන්වා ඇත.

අපරාධය සිදුවී අවුරුදු 2කට පසුව මේ ආකාරයෙන් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශයට කැඳවා ප්‍රකාශයක් ලබා ගැනීමට යම් විශේෂ හේතුවක් බලපා ඇති බවට පැමිණිලිකරු සඳහන් කළේය. ඔහු මධ්‍යම පළාතේ සේවය කරන අවස්ථාවේදී, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් සහ ප්‍රතිත්‍රස්ත කටයුතු සම්බන්ධ විශේෂ නියෝජිත බෙන් එමර්සන් නැමැත්තා ශ්‍රී ලංකාවට 2017. 7.10 දින පැමිණ ඇති බවත්, ශ්‍රී ලංකාවේ එම මාසයේ 14 වන දින දක්වා ඔහු රැඳී සිටින බවත්, ඒ අනුව

එවකට පැවැති යහ පාලන රජයේ සහයෝගය මත එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් නියෝජිතයෙක් පැමිණි අවස්ථාවල දී සාමාන්‍යයෙන් සිදුවන කාර්යයක් වන ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ උසස් නිලධාරියෙකු අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බන්ධනාගාර ගත කිරීමේ ක්‍රියාවලියේ තවත් එක් අවස්ථාවක් ලෙස මෙය තමන්ට පෙනී ගිය බව පැමිණිලිකරු සඳහන් කළේය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් හා ප්‍රතිත්‍රස්ත ඒකකයේ නියෝජිතයෙකු වන බෙන් එමර්සන් මහතා ලංකාවට පැමිණි බව සනාථ කෙරෙන ලේඛනයක් පැ.20 වශයෙන් ඉදිරිපත් කර ඇත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව, පැමිණිලිකරු රක්ෂණ බන්ධනාගාර ගත කිරීමට කටයුතු කරන ලද්දේ එම අවස්ථාවේ ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදීමට පැමිණ සිටි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් සහ ප්‍රතිත්‍රස්ත කටයුතු පිළිබඳ කොමසාරිස්වරයෙකු වූ බෙන් එමර්සන් නැමැත්තා සතුටට පත් කිරීම සඳහා බවය. විශේෂයෙන් මෙම දිනයේ දී ලලිත් ජයසිංහ මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන ලද්දේ නීතිපතිවරයාගෙන් ලැබෙන ලද ෆැක්ස් පණිවිඩයක් මත ක්‍රියා කරමින් බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කියා සිටින ලද මුත් එදින එම ෆැක්ස් පණිවිඩය ලද බවට පෙන්වා දීම සඳහා කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන ලද ෆැක්ස් පණිවිඩ ලැබීම පිළිබඳ රෙජිස්ට්‍රරයේ අදාළ පණිවිඩය පිළිබඳ සටහන් තබා ඇත්තේ ඊට පෙර එම රූල් කිහිපයෙහි තබන ලද සටහන් ටිපෙක්ස් කර මකා දමා එම ටිපෙක්ස් මතය.

මෙම ලේඛනයේ ප්‍රශ්නයට අදාළ පිටු දෙක හැර අනිකුත් සියලුම පිටු වල රතු තීන්තෙන් රූල් ගසා කොටස් 12 කට වෙන්කර එම වෙන්

කරන ලද කොටස් වල ශීර්ෂ යොදා ඒ යටතේ ෆැක්ස් පණිවිඩ පිළිබඳ සටහන් යෙදීම සිදු කර ඇත. එසේ වුවත් ප්‍රශ්නගත ෆැක්ස් පණිවිඩය ඇතුළත් කර ඇති පිටු දෙකෙහි ඒ අන්දමින් රතු තීන්තෙන් රූල් ගසා කොටස් වෙන්කර ශීර්ෂ යටතේ සටහන් තැබීමක් සිදු කර නොතිබිනි. ඒ අනුව පැහැදිලි ලෙසම මෙම ප්‍රශ්නගත ෆැක්ස් පණිවිඩය සටහන් තැබීම පිළිබඳව සාක්ෂි සැඟවීමක් පැහැදිලි ලෙසම සිදු කර ඇත. සෑම ෆැක්ස් පණිවුඩයක්ම ලබා ගත් තැනැත්තාගේ අත්සන දක්නට ලැබුණත් මෙම ප්‍රශ්නගත ෆැක්ස් පණිවිඩය ලබා ගත් තැනැත්තාගේ අත්සන තිබිණි. මේ අනුව සාක්ෂි සඟවා ලලිත් ජයසිංහ මහතා පිළිබඳ පරීක්ෂණය නිවැරදි සහ යාවත්කාලීන බව පෙන්වීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තිසේරා ප්‍රමුඛ පරීක්ෂණ කණ්ඩායම අනීත්‍යානුකූල සහ ද්වේශ සහගත ලෙස ක්‍රියා කර ඇත.

පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේ මීට ඉහතදී ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලයේ ප්‍රධානියා වන හුසෙන් කුමරු ලංකාවට පැමිණි අවස්ථාවේදී ද ඊට සමගාමීව ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ නිලධාරීන් රාශියක් අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බන්ධනාගාර ගත කළ බවය.

මේ අනුව කට උත්තරයක් ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙසට දැන්වීමක් කරමින් 2017.07.14 දින ජයසිංහ මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන්වාගෙන පසුව 15 වැනි දින ඔහු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශයට කැඳවන අවස්ථාව වන විට එම අංශයේ

ස්ථානාධිපති වශයෙන් පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා කටයුතු කර ඇති අතර එම අංශයේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් ශානි අබේසේකර ක්‍රියා කර ඇත. එදින පැමිණිලිකරුගෙන් ලබාගත් කටඋත්තරය පැ.21 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව ඇතුළත පැමිණිලිකරුට එරෙහිව පරීක්ෂණ තුනක් පවත්වා ඇත. එක් පරීක්ෂණයක් අපරාධ වාර්තා කොට්ඨාසය මගින් ද, තවත් පරීක්ෂණයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ද, තවත් විනය පරීක්ෂණයක් විශේෂ විමර්ශනය ඒකකය මගින් ද සිදු කර ඇත.

පොලිස්පති එන්.කේ.ඉලංගකෝන් මහතා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති උතුරු පළාත් වෙත යවන ලද පැ.22 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද 2015.05.23 දින ලිපිය අනුව, 2015.05.13 වැනි දින සිදු වූ සිවලෝගනාදන් විද්‍යා නැමැති පාසල් සිසුවිය ඝාතනය කිරීමේ සිද්ධිය සහ ඉන්පසු 2015.05.18 සහ 19 දින යාපනය නගරයේ හටගත් නොසන්සුන්කාරී තත්ත්වය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විමර්ශන කණ්ඩායම් තුනක් පත් කර ඇත. ඒ අනුව;

1. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2015.05.13 දින සිවයෝගනාදන් විද්‍යා නැමැති පාසැල් සිසුවිය දූෂණය කොට ඝාතනය කිරීමේ සිද්ධිය විමර්ශනය කිරීමද,

2. කොළඹ අපරාධ කොට්ඨාසය මගින් 2015.05.19 දින යාපනය අධිකරණ සංකීර්ණයට පහරදීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය කිරීමද,

3 . විශේෂ විමර්ශනය ඒකකය විසින් 2015.05.19 දින යාපනය අධිකරණ සංකීර්ණයට එල්ල වූ ප්‍රහාරය වැළැක්වීමට අසමත් වීම පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට ද, පොලිස් කණ්ඩායම් තුනක් පත්කර ඇත.

පැ.22 ලේඛනය අනුව පැහැදිලිව පෙනී යන්නේ සැකකරු පළා යාම සම්බන්ධයෙන් නැතහොත් අත්අඩංගුවට නොගෙන මුදා හැරීම පිළිබඳව වූ කරුණු සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පරීක්ෂණ කණ්ඩායමක් පත් කර නොමැති බවය. මේ අනුව පැමිණිලිකරුට එරෙහිව අධිචෝදනා නැගීමට තුඩු දුන් සැකකරුවෙකු අත්අඩංගුවට නොගෙන මුදාහැරීම පිළිබඳ කාරණය කිසිදු පොලිස් කණ්ඩායමක් විසින් විමර්ශනයට ලක් කර නොමැත.

පොලිස්පතිවරයා විසින් පැ.22 දරණ ලිපිය අනුව, අපරාධය පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා කොළඹ අපරාධ කොට්ඨාශයට භාර කර ඇති අතර විශේෂ විමර්ශන ඒකකයට භාර කර ඇත්තේ විනය පරීක්ෂණයක් පිළිබඳව අවශ්‍ය මූලික පරීක්ෂණයක් පැවැත්වීමය.

පැමිණිලිකරු රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටියදී සැකකරුවෙකු නීත්‍යානුකූලව අත්අඩංගුවට නොගෙන පළා යාමට ආධාර කළ බවට චෝදනාවක් සහ යාපනය අධිකරණයට පහරදීම වැළැක්වීමට කටයුතු කළේ නැත යන චෝදනාව යටතේ පොලිස් දෙපාර්තමේන්තු නියෝග අනුව පැමිණිලිකරුට එරෙහිව චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත. මෙම චෝදනා පත්‍රයට අනුව පැමිණිලිකරුට එහිදී පරීක්ෂණය පැවැත්වීම සඳහා නියෝජ්‍ය පොලිස්පති එල්.කේ.ඩබ්ලිව්.කේ. සිල්වා මහතා පත් කර ඇත. එම චෝදනා පත්‍රයේ අඩංගු චෝදනා 12

විමර්ශනය කිරීමට නොහැකිය යන නිගමනයට පැමිණි නියෝජ්‍ය පොලිස්පති සිල්වා මහතා විමර්ශන වාර්තාව තමාගේ නිගමනය ද සමඟ පොලිස්පතිවරයා වෙත යවා ඇත. නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ නිගමනය සහිත මෙම කරුණු පොලිස් කොමිෂන් සභාව විසින් සලකා බලා ඇති අතර, ඒ අනුව පැ.23 දරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිපියෙන්, නැවත විමර්ශනයක් සිදු කර චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දෙමින් මුල් චෝදනා පත්‍රය පරිදි කටයුතු කිරීම ප්‍රතික්ෂේප ඇත.

ඒ අනුව පැමිණිලිකරුට එරෙහිව නගා තිබූ චෝදනා දෙකම එනම්; අත්අඩංගුවට නොගෙන සැකකරුවෙකුට පලා යාමට සැලැස්සූ බවට නගන ලද චෝදනාවත්, දෙවන චෝදනාව වන යාපනය අධිකරණය අසල ඇති වූ නොසන්සුන්තාවය පාලනය කිරීමට අසමත් වූ බවට වන චෝදනාවත් ඉල්ලා අස් කරගෙන ඇති අතර, ඉන්පසුව පැමිණිලිකරුට එරෙහිව එම චෝදනා සම්බන්ධයෙන් නැවත විමර්ශනයක් පැවැත්වීම පොලිස් දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොමැත. ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව මාස දෙකක් තුළ මූලික පරීක්ෂණය පවත්වා අවසන් කළ යුතු වුවත් අවුරුද්දකට ආසන්න කාලයක් ගතව ඇතත් පැමිණිලිකරුට එරෙහිව පරීක්ෂණයක් පවත්වා නොමැත.

පවත්නා කරුණු එසේ වුවත්, මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් නැමැති සැකකරුවෙකුට පලා යාමට ඉඩදීම යන චෝදනාව යටතේ යාපනය මහාධිකරණයේ පැමිණිලිකරුට එරෙහිව අධිචෝදනා ගොනු කර ඇත. එම අධිචෝදනා පත්‍රයේ පිටපතක් පැ. 24 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම අධිචෝදනා පත්‍රයට අනුව මහලිංගම් ශෂිකුමාර් නැමැති අයව නීත්‍යානුකූල අඩුවමින් ආවරණය

කර ගැනීමේ අදහසින් ඔහුට පොලිස් අත්අඩංගුවෙන් මිදී යාමට උපකාර කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්ති යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් සහ එම වරදට වූදිතට ආධාර අනුබල දුන් බවට චෝදනා කරමින් දණ්ඩ නීති සංග්‍රහයේ 102 සමග කියවන 209 වගන්තිය යටතේ චෝදනාවක්ද ඇතුළත් කරමින් පැමිණිලිකරුට චෝදනා කර ඇත.

යාපනය මහාධිකරණයේ පවරා ඇති අංක 2681/2019 නඩුවේ පළවන විත්තිකරු ලෙස පැමිණිලිකාර ලලිත් ජයසිංහ මහතා ද, දෙවන විත්තිකරු ලෙසට පොලිස් පරීක්ෂක සුන්දරේස්වරන් ශ්‍රී ගජන් ද නම් කර ඇත. පැමිණිලිකාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහට එරෙහිව නගා ඇති චෝදනාව නීත්‍යානුකූල දඬුවමින් ආවරණය කර ගැනීමේ අදහසින් පොලිස් අත්අඩංගුවෙන් මිදී යාමට උපකාර කිරීමය. දෙවන විත්තිකාර ශ්‍රී ගජන් එරෙහිව නගා ඇති චෝදනාව වන්නේ පළමුවන චෝදනාවේ සඳහන් වරද සිදු කිරීමට පළමුවන විත්තිකාර ලලිත් ජයසිංහට ආධාර අනුබල දීමය.

ඉදිරිපත් වී ඇති කරුණු අනුව සැකකරු අවසාන වශයෙන් රැඳී සිටියේ පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් භාරයේය. සැකකරු පළා ගොස් ඇත්තේ පොලිස් පරීක්ෂක ගජන්ගේ භාරයේ සිටින අවස්ථාවේදීය. මේ අනුව සැකකරු අත්අඩංගුවේන් මිදී යාම පිළිබඳව කරුණු හොඳින් දන්නා පුද්ගලයා වන්නේ පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ය. එසේ වුවත් පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ගෙන් ප්‍රකාශයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙවන තෙක් සටහන් කරගෙන නොමැත. ගජන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන සිටි අවස්ථාවේදීවත් ඔහුගේ ප්‍රකාශයක් සටහන් කරගෙන නොමැත.

එසේම සිද්ධියට අදාළ මහලිංගම් ශෂිකුමාර්ට පළා යාමට ඉඩ සලසන ලද්දේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාගේ ඍජු හෝ වක්‍ර නියෝගයක් මත බවට පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් ඒ 16 සහ ඒ 17 පොලිස්පති රෙගුලාසි අනුව තම සාක්කු සටහන් පොතෙහි හෝ තොරතුරු වාර්තා පොතේ සටහන් කර නොමැත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් ගජන්ට එවැනි නියෝගයක් ලබාදුන් බවට අඩු තරමින් අධිචෝදනා පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති වෙනත් පොලිස් නිලධාරියෙකුගේ ප්‍රකාශයකින්වත් සනාථ වන බවට සඳහන් කර නොමැත.

මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් නැමැත්තා අත්අඩංගුවට ගෙන ඔහුට අත්අඩංගුවෙන් මිදී යාමට අවකාශය සැලසීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයා පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් බවට අවබෝධ කරගත් පොලිස් දෙපාර්තමේන්තුව ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කර, ඒ අනුව 2015.10.31 දින දාතමින් යුක්තව චෝදනා පත්‍රයක් පොලිස් පරීක්ෂක ගජන්ට එරෙහිව නිකුත් කර ඇත. මෙම චෝදනා පත්‍රය චෝදනා හයකින් යුක්ත වේ. චෝදනා 6 ම නම් කර ඇත්තේ මහලිංගම් ශෂිකුමාර් හෙවත් සුවිස් කුමාර් අත්අඩංගුවට නොගෙන ඔහුට අත් අත්අඩංගුවෙන් මිදී පළා යාමට අවකාශය සැලසීම සම්බන්ධයෙනි. 1 සහ 3 චෝදනා අපකීර්තිදායක හැසිරීම සම්බන්ධයෙන් ද, 2, 4, 5 සහ 6 චෝදනා රාජකාරිය පැහැරහැරීම සම්බන්ධයෙන් ද ගොඩනඟා ඇත. මෙම චෝදනා පත්‍රය පැ.25 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

රාජකාරිය පැහැරහැරීම සම්බන්ධ චෝදනා වල සඳහන් කර ඇත්තේ මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් 2015.05.18 වන දින

පොලිස් භාරයට ගෙන යාපනය පොලිස් ස්ථානය වෙත රැගෙන පැමිණියද සැකකරු සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් සිදු නොකර මුදාහැරීම, දෙවනුව සැකකරු 2015.05.18 වන දින යාපනය පොලිස් ස්ථානය වෙත රැගෙනවිත් නිත්‍යානුකූලව අත්අඩංගුවට ගත් බවට තොරතුරු පොතේ සටහන් නොයෙදීම, එසේම සැකකරු 2015.05.10 වන දින යාපනය පොලිස් ස්ථානයට රැගෙනවිත් නීත්‍යනුකූලව අත්අඩංගුවට ගත් බවට තොරතුරු සටහන් සටහන් නොයෙදවීමෙන් පොලිස් දෙපාර්තමේන්තු විනය සංග්‍රහයේ දැක්වෙන, මාගේ රාජකාරිය වශයෙන් යම් කරුණක් රපෝර්තු නොකර හැරීම යන වරදට සහ යම් "රාජකාරි ලිපි ලේඛනයක හෝ පොතක අවශ්‍ය සටහන් නොලියා හැරීම" යන චෝදනාවන් යටතේය. (පැ 25)

මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ පරීක්ෂණ සහ විමර්ශන වලින් පසුව සුවිස් කුමාර් නැමැති සැකකරු අත්අඩංගුවට ගෙන අත්අඩංගුවෙන් මිදී පලා යාමට ඉඩ සැලැස්වීම සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් වගකිව යුතු පුද්ගලයා පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් ලෙසට හඳුනාගෙන ඇති අතර, ඒ අනුව ඔහුට විරුද්ධව විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා චෝදනා පත්‍රයක් භාර කර ඇති බවය.

එපමණක්ද නොව මෙම චෝදනා පත්‍රය පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් වෙත භාර කිරීමෙන් පැහැදිලි වන තවත් කරුණක් වන්නේ පැ. 22 දරණ 2015.05.23 දින දරණ පොලිස්පතිවරයාගේ ලිපිය මගින් පත් කරන ලද විමර්ශන කණ්ඩායම් තුනෙන්, 3 වන කණ්ඩායම වන විශේෂ විමර්ශන ඒකකය විසින් පවත්වනු ලැබූ පරීක්ෂණයෙන් පසුව

පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් වෙත මෙම චෝදනා පත්‍රය භාර කර ඇති බවය.

එසේම වඩාත් පැහැදිලි වන කරුණ වන්නේ විශේෂ විමර්ශන ඒකකය මගින් සිදුකරනු ලැබූ පරීක්ෂණවලින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට එරෙහිව චෝදනා නැගීමට තරම් සාක්ෂි විශේෂ විමර්ශන ඒකකය සතුව නොතිබුණු බවය.

පැමිණිල්ලේ සාක්ෂි වලට අනුව, 2017.07.07 වන දින පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් විදේශ ගතවීමට කටුනායක ගුවන්තොටුපළට පැමිණි අවස්ථාවේදී අපරාධ විමර්ශන කොට්ඨාසයේ සමූහ මංකොල්ල අංශයේ ස්ථානාධිපති නිශාන්ත සිල්වාගේ උපදෙස් මත ඔහුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ බණ්ඩාරනායක ගුවන් තොටුපළ ඒකකයේ සිටින නිලධාරීන් විසින් නවත්වාගෙන ප්‍රශ්න කර ඇත. පසුව ඒ පිළිබඳව පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වාට දැනුම් දී ඇති අතර නිශාන්ත ද සිල්වා පොලිස් අධිකාරි තිසේරා මහතාගෙන් උපදෙස් ලබා ගෙන උප පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් නැමැති නිලධාරියා දෙපාර්තමේන්තුව මගින් විදේශ ගතවීමට අවසර අරන් තිබේ නම් ඔහුට විදේශගත වීමට ඉඩ දෙන ලෙසටත් එසේ නැත්නම් කැමැත්තක් කරන ලෙසටත් උපදෙස් දී ඇත. පසුව ගුවන්තොටුපළ ඒකකයේ පොලිස් නිලධාරීන් ශ්‍රී ගජන් මුදා හැර ඇත. එම අවස්ථාවේදී ඔහුගෙන් කටඋත්තරයක් සටහන් කර ගැනීමට පොලිස් නිලධාරීන් ක්‍රියා නොකළේ කුමන හේතුවක් මතද යන ප්‍රශ්නය පැන නැගී ඇත. ශ්‍රී ගජන්ගේ කටඋත්තරයක් සටහන් කරගත්තා නම් ඔහුගෙන් සැකකරු පළා යාම පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට හොඳින්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හැකියාව තිබුණි. නමුත්

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හිතාමතාම හෝ වෙනත් බලපෑමක් මත පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ගේ කටඋත්තරය සටහන් කර ගැනීම මග හැර ඇත. ඔහුගේ කටඋත්තරයක් සාක්ෂියක් ලෙස යාපනය මහාධිකරණයේදී ඉදිරිපත් කරන බවට අධිචෝදනා පත්‍රයේ සඳහනක් නොමැත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ පැමිණිලිකරු මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ බලය තිබුණා යැයි සඳහන් කරන කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන ගොස් ඇත. මහේස්ත්‍රාත් අධිකරණය වෙත යන ගමනේදී යාපනය සහ කයිට්ස් අතර පැමිණිලිකරු රැගෙන ගිය වාහනය පාරෙන් පිට පැන බෝක්කුවක ගැටී කීපයක් කඩා ගෙන ගොස් බෝක්කුව උඩ හෙලක් බඳු ස්ථානයක ගැට්ටේ නතර වී ඇත. මෙම අනතුරින් පැමිණිලිකරුගේ වම් දණහිස තුවාල වී බෙල්ලෙ දැඩි වේදනාවක් හටගෙන ඇත. පැමිණිලිකරු එවැනි ආබාධිත තත්ත්වයකට පත්ව තිබියදීත් පැමිණිලිකරුගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොදක්වා, ඔහුට සිදුවූ තුවාල පිළිබඳව ද කිසිදු විමසීමක් නොකර, වෙනත් වාහනයක පැමිණිලිකරු නංවාගෙන කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන ගොස් ඇත. මෙවන් අවස්ථාවකදීත් මෙම නිලධාරීන් ක්‍රියා කර ඇත්තේ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සකස් කර ඇති ආචාර ධර්ම පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොදක්වමිනි.

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලද පොලිස් ආචාරධර්ම පද්ධතිය සහ පොලිස් නිලධාරීන් වෙත පොලිස්පති විසින්

නිකුත් කරන ලද ලිපිය පැ.26 සහ පැ.27 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු නිර්දෝෂී පුද්ගලයෙකු බවට කරුණු මෙතරම් පැහැදිලිව තිබියදීත් පැමිණිලිකරු වැරදිකරු යන පූර්ව නිගමනය මත පිහිටා පොලිස් අධිකාරී ශානි අබේසේකර, සහකාර පොලිස් අධිකාරි තිසේරා සහ පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා යන නිලධාරීන් කටයුතු කර ඇත.

එපමණක්ද නොව 2017.07.15 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දී ලලිත් ජයසිංහ මහතාගෙන් ප්‍රකාශය සටහන් කරනු ලබන අවස්ථාවේදී එම ස්ථානයට පැමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවකට අධ්‍යක්ෂ සුගත් නාගහමුල්ල, සමූහ මංකොල්ල අංශයේ ප්‍රධානියා වශයෙන් සිටි පොලිස් අධිකාරී ශානි අබේසේකර යන නිලධාරීන් පැමිණිලිකරු ඉදිරියට පැමිණ "සර්, අපි මේ කරන්නේ අපට ඉහළින් ආපු උපදෙස් අනුවයි" යනුවෙන් ප්‍රකාශ කර ඇත.

ඔවුන් එම ප්‍රකාශය සිදු කළ අයුරින් පැමිණිලිකරුට හැඟී ගියේ ඔවුන් සිදු කරන්නේ යමෙකුගේ දේශපාලන අවශ්‍යතාවයක් ක්‍රියාවට නංවන බවය. එසේම පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේ තමන්ට විරුද්ධව සාක්ෂි ගොතමින් පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා විසින් සිදු කරන ලද පරීක්ෂණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සහ නියෝජ්‍ය පොලිස්පතිවරයා නොදැක්කා වගේ සිටීමෙන් ඔවුන්ද තමන්ට එරෙහිව සාක්ෂි ගෙතීමට ආධාර සහ අනුබල දී ඇති බවය.

ඉන්පසුව රවි සෙනෙවිරත්න මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් පත් වූ බවත්, එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාව සිටි සුගත් නාගහමුල්ල මහතා නියෝජ්‍ය පොලිස්පති තනතුරට පත් කර පසුව ඔහුද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් පත්වූ බවත් මෙම සියලුදෙනාට ලැබුණු උසස්වීම් තමන්ට එරෙහිව දේශපාලන අවශ්‍යතාවය උදෙසා සිදුකළ පරීක්ෂණවල ප්‍රතිඵල වශයෙන් ලැබුණු උසස්වීම් බවත් පැමිණිලිකරු සඳහන් කළේය.

රිය අනතුර හේතුවෙන් ලද තුවාල වලට වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන ලෙසට පැමිණිලිකරු පොලිස් අධිකාරි තිසේරාගෙන් ඉල්ලා ඇතත් ඔහු එය නෑසුනා මෙන් සිට ඇත. පොලිස් නිලධාරීන් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම පද්ධතියේ 29 වගන්තියෙහි සඳහන් කර ඇති තම අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ සෞඛ්‍ය සම්බන්ධයෙන් සොයා බැලිය යුතු අතර, අවශ්‍ය සෑම අවස්ථාවකදීම වෛද්‍යාධාර ලබාදීමට වහා පියවර ගත යුතුය යන ආචාරධර්මය පොලිස් අධිකාරි තිසේරා කඩ කර ඇත.

පොලිස් නිලධාරීන් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම පද්ධතියේ 28 වගන්තියෙහි සඳහන් වන යම් සැකකරුවෙකු වැරදිකරුවෙකුය යන පූර්ව නිගමනයකින් යුතුව ක්‍රියාකිරීම නිලධාරියකු විසින් සිදු නොකළ යුතුය යන ආචාරධර්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් කළ පොලිස් නිලධාරීන් විසින් කඩ කර ඇත.

මෙම රිය අනතුර පිළිබඳව ලබාගත් ඡායාරූප කිහිපයක් පැ.28 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට

ගෙන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයා වෙත රැගෙන යන විටත් මහේස්ත්‍රාත්වරයා වැඩබලන මහේස්ත්‍රාත්වරයාට වැඩකටයුතු භාරකර අධිකරණ බල ප්‍රදේශයෙන් නික්ම ගොස් ඇති බවත්, පොලිස් අධිකාරි තිසේරා මැනැවින්ම දැන සිටි බව කයිට්ස් පොලිස් ස්ථානාධිපතිගේ සාක්ෂියෙන් ද තහවුරු වී ඇත. වැඩබලන මහේස්ත්‍රාත්වරයා පදිංචිව සිට ඇත්තේ යාපනය නල්ලූර් කෝවිල අසලය. මේ බව කයිට්ස් පොලිස් ස්ථාන භාර ස්ථානාධිපති විසින් පොලිස් අධිකාරි තිසේරා හට දැනුම් දී ඇත. එලෙස පොලිස් අධිකාරි තිසේරා දැනුවත්ව සිටියදීත් ඔහු පැමිණිලිකරු රැගෙන යාපනයේ සිට කයිට්ස් බලා පිටත්ව ගොස් ඇති අතර එම ගමනේ දී මෙම රිය අනතුර සිදු වී ඇත. එදින රාත්‍රී 7.00ට පමණ පොලිස් ස්ථානාධිපති විසින් පොලිස් අධිකාරි තිසේරා මහතාට සඳහන් කර ඇත්තේ මහේස්ත්‍රාත්වරයා කයිට්ස් පොලිස් වසමෙන් බැහැරව ගොස් ඇති බැවින් නියෝජ්‍ය පොලිස්පතිවරයා රැගෙන නොඑන ලෙසටත්, ඔහු පසු දින උදේ රැගෙන එන ලෙසටත්ය.

මෙම රිය අනතුර සිදු වීමෙන් පසුව පැමිණිලිකරු හැර වාහනය තුළ සිටි අනිකුත් සියලු දෙනාම වාහනයෙන් බැස ඉවතට ගොස් ඇත. රිය අනතුරින් තුවාල ලත් පැමිණිලිකරු පමණක් වාහනය තුළ සිට ඇත. ඒ අවස්ථාවේදී එම ස්ථානයට පැමිණි ඔවුන්ගෙන් කිසිවෙකු වාහනයේ ඉන්ධන ටැංකියෙන් ඉන්ධන පිටවනවා දැක ඇත. ඒ සමඟම තෙල් යනවා වාහනය ගිණිගනියි ඉක්මනට ඇතුළේ ඉන්න එක්කෙනාව ගන්න කියලා යමෙකු කෑගසනවා පැමිණිලිකරුට ඇසී ඇත. එම ශබ්දය ඇසීමත් සමග වාහනය තුළ සිටි පැමිණිලිකරු වාහනයෙන් බැසීම සඳහා දොර ළඟට පැමිණ බැසීමට උත්සාහ කර ඇත. එම

අවස්ථාවේදී ආරක්ෂාවට පැමිණ සිටි විශේෂ කාර්ය බලකායේ සෙබළුන් සර් බහින්න එපා කාණුවට වැටෙයි අපි ගන්නම් යනුවෙන් පවසා පැමිණිලිකරු එළියට ගෙන ඇත.

පැ.5 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද සංයුක්ත තැටියේ අඩංගු සම්මුඛ සාකච්ඡාවට තලතා අතුකෝරාළ මහත්මිය සහභාගී වන විට ඇය අධිකරණ අමාත්‍යවරිය වශයෙන් රාජකාරි කරමින් සිට ඇත. එම සාකච්ඡාවේ දී සඳහන් කර ඇත්තේ මුල් අවස්ථාවේදී ඔවුන් මෙම සිද්ධියට නියෝජ්‍ය පොලිස්පති සම්බන්ධ බවට දැන ගෙන නොසිටි නමුත් පසුව නියෝජ්‍ය පොලිස්පති ජයසිංහ මහතා ඊට සම්බන්ධ බව දැනගත් බවත්ය. තලතා අතුකෝරාළ මහත්මියගේ මෙම ප්‍රකාශය පැමිණිලිකරුට එරෙහිව සාක්ෂි ගෙතූ බවට කරුණු පැහැදිලි කෙරෙන තවත් සාක්ෂියක් බවත් පැමිණිලිකරු සඳහන් කළේය.

නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරා යාපනය කිලිනොච්චිය දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් රාජකාරි කරන විට 2015.05.25 වන දින ඔහුගේ කට උත්තරයක් විශේෂ විමර්ෂන ඒකකයේ උප පොලිස් පරීක්ෂක පියදාස විසින් සටහන් කරගෙන ඇත. මෙම කටඋත්තරයෙහි නියෝජ්‍ය පොලිස්පති සඳහන් කර ඇත්තේ; "ශෂී කුමාර් නැමැති අයගේ සහෝදරයෙක්ද අත්අඩංගුවට ගෙන තිබුණා. මෙම ශෂී කුමාර් ද මෙම අපරාධයට සම්බන්ධ බවට ගම්මුන් විසින් සැක කර තිබුණා. පොලිසියේ පරීක්ෂණවලදී දැනගැනීමට ලැබුණා මොහු මෙම අපරාධයට සම්බන්ධ නොමැති නමුත් මොහුට ගම්මු පහර දී තුවාල වී සිටි බැවින්, ප්‍රදේශයේ එම අවස්ථාවේ පැවැති වාතාවරණය මත ඔහුගේ ආරක්ෂාව මත යාපනය පොලිස් නිලධාරීන් විසින් ඔහුව යාපනය පොලිස්

ස්ථානයට රැගෙනවිත් ඔහුගේ තුවාල හේතුවෙන් රෝහල් ගත වීම සඳහා වෛද්‍ය පෝරමයක් ද දී රෝහලට යාමට උපදෙස් දී ඇත. ඔහු රෝහලට යන්නේ නැතුව කොළඹ වැල්ලවත්තට ගොස් සිටියදී වැල්ලවත්ත පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන බන්ධනාගාර ගත කර ඇත" යනුවෙනි. මෙම කටඋත්තරය පැ.30 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට 2015.06.15 දින ඉදිරිපත් කළ අංක බී 116/ 15 දරණ වාර්තාව පැ. 29 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම බී වාර්තාවේ 9 වන සැකකරු ලෙස නම් කර ඇත්තේ මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර්ය. මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් ඇතුළු අනෙකුත් පිරිස අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන බව බී වාර්තාවේ සඳහන් කර ඇත. මේ අනුව පැහැදිලි වන්නේ මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවෙන් මිදී පලා යාමෙන් පසුව නැවත අත්අඩංගුවට ගෙන පැ. 29 දරණ බී වාර්තාවෙන් කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවය.

එසේ වුවත්, පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් විසින් මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවට ගත් බව හෝ ඉන්පසු ඔහු අත්අඩංගුවෙන් පලා ගිය බවත්, පසුව නැවත සුවිස් කුමාර් අත්අඩංගුවට ගත් බවත්, එසේ අත්අඩංගුවෙන් මිදී පලා යාම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා ආධාර සහ අනුබල දුන් බවත්, පැ.29 දරණ බී වාර්තාවෙහි සටහන් කර නැත. පැ.29 වාර්තාවෙහි එවැනි සඳහනක් නොමැති වීමෙන් පෙනී යන්නේ පැ.29 දරණ බී වාර්තාව ඉදිරිපත් කරන විටත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා

මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවෙන් මිදී පළා යාම සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයෙකු වශයෙන් නොසිටි බවයි.

යාපනය සහ කිලිනොච්චිය දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරා විසින් සිදු කළ ප්‍රකාශයක සම්පිණ්ඩනයක්ද පැ. 29 බී වාර්තාවේ 2 වැනි පිටුවේ ඇතුලත්කර ඇත. එම ප්‍රකාශයෙහි ඔහු සඳහන් කර ඇත්තේ "2015.05.28 දින ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමා විසින් ලබාදෙන ලද උපදෙස් පරිදි පුන්කුඩතිව් ප්‍රදේශයට යාමට පැමිණි විශ්වවිද්‍යාල නීති පීඨයේ පීඨාධිපති තමිල්මාරන් නැමැත්තා සමග එම ප්‍රදේශයට යාමට උප පොලිස් පරීක්ෂකවරයකු සහ කොස්තාපල්වරුන් දෙදෙනෙකු ලබාදුන් බවත් එම ගමනින් පසු ඔවුන් විසින් රැගෙන ආ සශි කුමාර් යන අය දැරියගේ ඝාතනය සම්බන්ධයෙන් අවශ්‍ය නොවන බවට ලැබුණු තොරතුරු මත ඔහු පිටත් කර හැරි බවත් කියා සිටී" යනුවෙනි. ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාගේ උපදෙස් මත සශි කුමාර් මුදා මුදා හැරිය බවට නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරා සඳහන් කළ බවක් බී වාර්තාවෙහි සටහන් කර නැත. එම කොටස පැ. 29( අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් එදිරිසිංහ මහතා විසින්, පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට සිදු කළායි කියනු ලබන බලපෑම් පිළිබඳව කිසිවක් නියෝජ්‍ය පොලිස්පති මෙම කටඋත්තරයෙන් සඳහන් කර නොමැත. මෙම කටඋත්තරය යාපනය මහාධිකරණයේ පවරන ලද අංක 215 /2017 නඩුවේ සාක්ෂියක් ලෙසට ඉදිරිපත් කර නැත.

එසේම, මෙම අවස්ථාව වන විටත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා මේ සම්බන්ධයෙන් සැකකටයුතු පුද්ගලයෙකු බවට

සදහන් කෙරෙන කිසිදු ප්‍රකාශයක් පරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සටහන් කර නොතිබිණි.

නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරා ඉන්පසුව ද තවත් කටඋත්තර දෙකක් ලබා දී ඇති අතර එම කටඋත්තර දෙකෙහිද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට බලපෑම් කළ බවට සඳහන් කර නොමැත.

නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරා මහේස්ත්‍රාත්වරයාගේ නිල කාමරයේදී මහේස්ත්‍රාත්වරයාට ප්‍රකාශයක් ලබා දී ඇත .එම ප්‍රකාශය ද යාපනය මහාධිකරණයේ පවරා ඇති 215/2017 නඩුවේ සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කර නොමැත. එසේම, එම ප්‍රකාශය සටහන් කරගත් කයිට්ස් මහේස්ත්‍රාත්වරයා සාක්ෂිකරුවෙකු වශයෙන්ද නම් කර නොමැත.

එසේ වුවත් නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරා 2017.07.07 දින සිදුකරන ප්‍රකාශයෙහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට බලපෑම් කළ බව සඳහන් කර ඇත. එම කටඋත්තරය පමණක් යාපනය මහාධිකරණයේ පවත්නා නඩුවේ සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර, බී.එස්.තිසේරා සහ නිශාන්ත ද සිල්වා යන නිලධාරීන් විසින් නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරා විසින් ලබාදී ඇති මුල් කටඋත්තර තුනම ඉවත දමා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා බලපෑම් කළ බවට සඳහන් කරන නියෝජ්‍ය පොලිස්පති ගමගේ ලාල් කුමාර මහතාගේ හතරවන කටඋත්තරය

යාපනය මහාධිකරණයේ පවත්නා 215/2017 නඩුවට මේ අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවටත්, නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරාට මේ අන්දමින් තමාගේ හතරවන කටඋත්තරයේ දී පැමිණිලිකරු පටලවමින් කටඋත්තරයක් දීමට සිදුව ඇත්තේ අධිකරණ අමාත්‍ය තලතා අතුකෝරාළ මහත්මියගේ බලපෑම් මත බවටත් සාක්ෂිකරු සඳහන් කළේය.

මේ අන්දමින් නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරා අසත්‍ය චෝදනාවක් පැමිණිලිකරුහට ඉදිරිපත් කිරීමට හේතු වී ඇත්තේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අවශ්‍යතාවයක් අනුව සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට තිබූ දේශපාලන බලපෑම් මත බවත්, විශේෂයෙන් එවකට අධිකරණ අමාත්‍ය තලතා අතුකෝරාළ මහත්මියගේ බලපෑම් මත කළ බවට තමන් විශ්වාස කරන බවත් පැමිණිලිකරු සඳහන් කළේය.

මේ අනුව නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් විසින් සිදු කර ඇති මුල් ප්‍රකාශ 3 හි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා බලපෑම් කළ බවට කිසිදු සඳහනක් සිදුකර නොමැත. විමර්ශනය සිදු කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙම කරුණු පිළිබඳව හිතාමතාම කිසිදු සැලකිල්ලක් නොදක්වා පසුව ලබාගත් කටඋත්තරය පමණක් ඉදිරිපත් කර ඇත. මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරීන් වන;

සහකාර පොලිස් අධිකාරී කේ.කේ.කේ ගුණසේකර,

පොලිස් අධිකාරී ශානි අබේසේකර,

පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා,

සහකාර පොලිස් අධිකාරී බී.එස්. තිසේරා,

යන පොලිස් නිලධාරීන්, පැමිණිලිකරු අත්අඩංගුවටගෙන රක්ෂිත බන්ධනාගාර ගත කරමින්, පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩකර ඔහුගේ රැකියාව අහිමි කළ නිලධාරීන් ලෙසට මෙම සිද්ධියට වගකිව යුතු පුද්ගලයින් ලෙස නම් කර ඇත.

පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් යාපනය කොට්ඨාශයේ නොවිසඳුණු අපරාධ ඒකකයේ පොලිස් ස්ථානාධිපතිවරයා වශයෙන් මෙම සිද්ධිය වන අවස්ථාව වනවිට රාජකාරිය කර ඇත. මෙම පොලිස් ඒකකයේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් ක්‍රියා කර ඇත්තේ පොලිස් අධිකාරී වීරසේකර මහතාය. මෙම ඒකකයට අදාළ විධිවිධාන අඩංගු පොලිස්පති චක්‍රලේඛය පැ.31 වශයෙන් ද චක්‍රලේඛයේ අදාළ කොටස පැ.31(අ) යන්න වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් 2017 ජූලි 18 වන දින කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අංක බී.181 /2017 දරණ (පැ.32) බී වාර්තාවෙන් කරුණු දක්වා ඇත්තේ පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් සේවයට නොදන්වා විදේශ ගතවීමට සූදානම් වන බවය. එම බී වාර්තාවේ මෙසේ සඳහන් කර ඇත;

> (උපුටා ගැනීම)" වැල්වැටිතුරේ පොලිස් ස්ථානයේ සේවය කළ උ.පො.ප.ශ්‍රී ගජන් සේවයට නොදන්වා නීත්‍යානුකූල අත්අඩංගුවෙන් මිදී විදේශගතවීමට සැරසෙන බවට මා වෙත ලැබුණු තොරතුරක් අනුව, මා ඒ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ගුවන්තොටුපල ඒකකය වෙත ඔහුගේ

ජාතික හැඳුනුම්පත් අංකය ලබා දී ඔහු විදේශගත වීමට පැමිණිය හොත් මා දැනුවත් කරන ලෙසට දන්වා සිටින ලදී. මාහට ලද තොරතුර සත්‍ය තොරතුරක් බවට සනාථ වූයේ, 2017.07.07 වන දින රාත්‍රියේ යූ.එල්. 125 දරන ගුවන් යානයෙන් ඉන්දියාව බලා පිටව යාමට පැමිණි අතර, ඒසම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතා දැනුවත් කර ඇති අතර, ඔහු විදේශගත වන්නේ රාජකාරි ස්ථානයට හා රාජ්‍ය සේවකයෙකු වශයෙන් නිසි ක්‍රමවේදය කරද යන්න පිළිබඳව විමසා සිටීමේදී, ඔහු කිසිවක් පිළිතුරු නොදී ඇති අතර, ඉන්පසු ඔහුට අවශ්‍ය නම් විදේශගතවීම ඔහුගේ කැමැත්ත මත සිදුකරන ලෙසට දැනුම්දී ඇත. නමුත් ඔහු එකී ගමන නොගොස් ඇති බව පසුව ආරංචි විය." (උපුටා ගැනීම අවසන්)

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් ඉහත බී වාර්තාවට ඇතුළත් කර ඇති කරුණු අනුව පැහැදිලිව පෙනී යන්නේ බී වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර සිටම පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් අත්අඩංගුවට ගැනීමේ අවශ්‍යතාවය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහත නිලධාරීන් හොඳින්ම දැන් සිටි බවය. එවැනි හොඳාකාර දැනුමක් එකී නිලධාරීන් සතුව තිබියදීත් ඔවුන් ජුලි 7 වන දින ගුවන් තොටුපළේ දී ශ්‍රී ගජන් අත්අඩංගුවට නොගෙන ඔහුට මනාප පරිදි යාමට ඉඩ සලසා ඇත. මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල අංශයේ ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් අපරාධයක් සඳහා අවශ්‍ය පුද්ගලයෙකු ලෙසට නම් කර සිටි, ශ්‍රී ගජන් කටුනායක ගුවන් තොටුපලේ දී අත්අඩංගුවට නොගත්තේ කුමන හේතුවක් මතද යන්න

ඔවුන් හොඳින්ම දන්නා කරුණකි. පැමිණිලිකරු සඳහන් කළ ආකාරයට සුවිස් කුමාර් නැමැත්තාට පොලිස් අත්අඩංගුවෙන් මිදී පලා යාමට ඉඩ සැලැස්වීමෙහි මූලිකයා ශ්‍රී ගජන් වෙයි. ඒ අනුව ශ්‍රී ගජන් අත්අඩංගුවට ගත්තා නම්, සුවිස් කුමාර් අත්අඩංගුවට නොගෙන අත්අඩංගුවෙන් මිදී පලා යාමට ඉඩ සැලැස්වීම සම්බන්ද සත්‍ය කරුණු හෙළිදරව් වනු ඇත. එසේ සත්‍ය කරුණු හෙළිදරව්වේ නම් පැමිණිලිකරුට එරෙහිව කිසිදු පැමිණිල්ලක් ගොනු කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නොහැකි වනු ඇත. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ චේතනාව මුදුන් පමුණුවා ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල අංශයේ ස්ථානාධිපති ඇතුළු අනෙකුත් නිලධාරීන් පිරිස් ශ්‍රී ගජන් අත්අඩංගුවට නොගෙන ඔහුට ගුවන්තොටුපලින් අත්අඩංගුවෙන් මිදී පලා යාමට ඉඩ සලස්වා ඉන්පසුව මහේස්ත්‍රාත් අධිකරණයට බී වාර්තාවක් ඉදිරිපත් කරමින් ශ්‍රී ගජන් අත්අඩංගුවට ගැනීම සඳහාත්, ඔහු ගුවන් තොටුපලින් පිටත්ව යන්නේ නම් එය වැළැක්වීම සඳහාත්, නියෝග ඉල්ලා සිටීම, සුවිස් කුමාර් අත්අඩංගුවෙන් මිදී පලා යාම සඳහා බලපෑම්කළ හා උදව් කළ පුද්ගලයින් වසන් කර, සත්‍ය කරුණු විකෘති කර, පැමිණිලිකරු මත වරද පැටවීම උදෙසාම සිදුකළ ක්‍රියාදාමයක් බව මනාව පැහැදිලි වේ.

පැමිණිලිකාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා රක්ෂිත බන්ධනාගාර ගත වූයේ බී වාර්තාව අනුව පැහැදිලි ලෙසම සුවිස් කුමාර් නැමැත්තාට නීත්‍යානුකූල අත්අඩංගුවෙන් මිදී පලා යාමට ඉඩදීම සම්බන්ධයෙන් ආධාර අනුබලදීම යන චෝදනාව යටතේය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැමිණිලිකරුට එරෙහිව චෝදනා

කරන අන්දමට ඔහු පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට බලපෑම් කරමින් සුවිස් කුමාර්ට අත්අඩංගුවෙන් මිදී පලා යාමට ඉඩ සලස්වා ඇත. පැමිණිලිකරු පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට බලපෑම් කළේ නම් එය හොඳින්ම දන්නා පුද්ගලයා පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් බව පැහැදිලිය.

කරුණු එසේ පැහැදිලිව තිබියදීත් 2017.07.07 වන දින දී කටුනායක ගුවන් තොටුපලේ දී ශ්‍රී ගජන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු භාරයට ගෙනත් අත්අඩංගුවට නොගෙන මුදාහැරියේ කුමන හේතුවක් මතද ? (පැ.32 අ)

ඒ අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් කළ නිලධාරීන් මෙම අපරාධයේ විගකීමට ඔවුන් පාත්‍රවන ප්‍රශ්නායට පැහැදිලි පිළිතුරු මෙම කොමිෂන් සභාවට ලබා දිය යුතුය.

මෙම තත්ත්වය තවදුරටත් පැහැදිලි කරන්නේ නම්; කටුනායක ගුවන් තොටුපොළේ දී ශ්‍රී ගජන් අත්අඩංගුවට ගන්නා මොහොත වන විට සුවිස් කුමාර් අත්අඩංගුවෙන් මිදී පලා යාම පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙමින් තිබී ඇත. සුවිස් කුමාර් අත්අඩංගුවෙන් මිදී පලා යාම සිදු වූයේ ශ්‍රී ගජන්ගේ භාරයේ සිටියදීය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එම තත්ත්වය පැහැදිලිව දැන සිටිය දීත්, කටුනායක ගුවන් තොටුපලේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු භාරයට ගත් ශ්‍රී ගජන් අත්අඩංගුවට නොගෙන ඔහුට අවශ්‍ය ලෙස විදේශගත වීමට ඉඩ සලසමින් ඔහුව මුදා හැර ඇත.

මේ අනුව සුවිස් කුමාර් අත්අඩංගුවෙන් මිදී පලා යාමට ආධාර හා අනුබල දීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා

අපරාධ චෝදනාවකට පාත්‍ර නොවිය යුතු අතර, සුවිස් කුමාර්ට අත්අඩංගුවෙන් මිදී පලා යාම සඳහා ආධාර උපකාර කළ, ඉහත නම් කළ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරී තිසේරා ඇතුළු නිලධාරීන් ලලිත් ජයසිංහ මහතා මුහුණපා ඇති අපරාධ චෝදනාවට මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ලැබිය යුතුය.

2017.07.07 වන දින කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දී ශ්‍රී ගජන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත්තා නම් සහ ඉන්පසු ඔහුගේ කටඋත්තරයක් නිසි පරිදි ලියා ගත්තා නම්, 2017.07.14 දින පැමිණිලිකාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා අත්අඩංගුවට ගැනීම කිසිසේත් අවශ්‍ය නොවන බවට ඔවුන්ට හොඳින්ම අවබෝධ වනු ඇත. ඔවුන් එසේ නොකළේ පැහැදිලි ලෙසම දේශපාලන බලපෑම් කරණ කොටගෙන ඔවුන් දේශපාලන මතිමතාන්තර වලින් සහ පළිගැනීමේ නොනිත් ආශාවලින් මත් වී සිටි බැවිනි.

මුළ පටන්ම පැමිණිලිකරු නිර්දෝෂී පුද්ගලයකු බවටත්, ඔහු තමාගේ රාජකාරී සීමාවෙන් ඔබ්බට පිය නගා නොතිබුණ බවටත්, ඉතා පැහැදිලි කරුණු ගොඩනැගී තිබුණි. මේ කාරණා කිසිවක් සැලකිල්ලට නොගත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් නිලධාරීන් පැමිණිලිකරුට එරෙහිව අසත්‍ය කරුණු පදනම් කරගෙන දේශපාලන අවශ්‍යතාවයන් උදෙසා චෝදනා එල්ල කරන්නට අවශ්‍ය ඔවුන් සිතින් මවාගත් ද්වේෂ සහගත පසුබිමක් සකස් කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටිය බව ඉදිරිපත් වී ඇති කරුණු අනුව දැන් ඉතාමත් පැහැදිලිය.

කරුණු මේ අන්දමින් මනා පැහැදිලි වූ බැවින් පැමිණිලිකරුට එරෙහිව යාපනය මහාධිකරණයේ පවරා තිබූ HC 2681/2017 නඩුවෙ අධිචෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම සඳහා ක්‍රියා කරන ලෙස ඉල්ලමින් පැමිණිලිකරුගේ නීතිඥවරුන් නීතිපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. මෙම ඉල්ලීම පැ.33 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු නිර්දෝෂී පුද්ගලයෙකු බවටත් ඔහු මෙවැනි අනිත්‍යානුකූල නීති විරෝධී අපරාධමය චෝදනාවකට නැඹුරුතාවයක් දක්වන සිද්ධියකට සම්බන්ධ වී නොමැති බවටත් කරුණු පැහැදිලිව මෙම පැ.33 දරණ ඉල්ලීමෙහි සඳහන් කර ඇත. මෙම ඉල්ලීමට නීතිපතිවරයා මෙම මොහොත වනතුරුත් ප්‍රතිචාරයක් දක්වා නොතිබීම ඉතාමත් කනගාටුවට කරුණකි. කරුණු සලකා බලා චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමේ නිගමනයකට එළැඹීමට නීතිපතිවරායට ලබාදී ඇති අභිමතය නිවැරදි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නීතිපතිවරයා අපොහොසත් වී ඇතුවා පමණක් නොව නිර්දෝෂී බවට කරුණු පැහැදිලිකර දී තිබියදීත් ඒ පිළිබඳව නැවත සැලකිල්ලෙන් සලකා බැලීමට ද නීතිපතිවරයා අසමත් වී ඇත. පැ.33 දරණ ලිපියට ප්‍රතිචාර දැක්වීමට නීතිපතිවරයා අපොහොසත්වීම තුළින් ඔහුගේ දඩබ්බර ක්‍රියාකලාපයක් පිළිඹිබු වන අතර එවැනි ක්‍රියාකලාපයකට නීතිපතිවරයා ප්‍රවේශ වූයේ දේශපාලන හේතූන් මත බවට අනුමිතියකට ප්‍රවේශවීමට එම කරුණු හොඳින්ම ප්‍රමාණවත් ය.

පැමිණිලිකරුට එරෙහිව මහාධිකරණ වල නඩු පැවරීම කිසියම් ක්‍රමෝපායකට අනුව යම් අවශ්‍යතාවයන් පිරිමසා ගැනීම සඳහා සිදු කරන්නක් බවට පැහැදිලි වන තවත් කරුණක් වන්නේ රත්නපුර මහාධිකරණයේ මෙන්ම යාපනය මහාධිකරණයේ දී ද පැමිණිලිකරුට

එරෙහිව චෝදනා ගොනු කරන්නේ ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ වන චෝදනාව සම්බන්ධයෙන් වීම හේතුවෙනි.

යාපනය දිසාවේ නොවිසඳුණු අපරාධ ඒකකය පිහිටා ඇත්තේද යාපනය මූලස්ථාන පොලිස් ස්ථානය තුළමය. පොලිස් අධිකාරී කාර්යාලය සහ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය පිහිටා ඇත්තේද යාපනය මූලස්ථාන පොලිස් ස්ථානයට ඉදිරිපසින් පාරේ විරුද්ධ පැත්තේය. එසේ වුවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය පිහිටා ඇත්තේ යාපනයට කිලෝමීටර 20 ක් පමණ දුරින් පිහිටි කන්කසන්තුරේ ප්‍රදේශයේ අධි ආරක්ෂිත කලාපය තුළය. ඉහත සඳහන් මූලස්ථාන පොලිස් ස්ථානය සහ පොලිස් කාර්යාලවල පිහිටීම පෙන්වන ගූගල් සේවයෙන් ලබාගත් සිතියමක් පැ.39 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය සහ යාපනය මූලස්ථාන පොලිස් පරීක්ෂක කාර්යාලය අතර දුර ප්‍රමාණය කිලෝමීටර් 20ක පමණ දුරක් එබැවින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් හා සම්බන්ධ වූයේ නම් එය සිදුවිය යුත්තේ දුරකථන මාර්ග ඔස්සේය. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කරන පරිදි ශ්‍රී ගජන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් දුරකථන මාර්ග ඔස්සේ කිසියම් බලපෑමක් සිදු කළේ නම් ඒ සඳහා කල යුතු සුදුසුම දේ විය යුතුව තිබුණේ දුරකථනයෙන් ලබාගත් එම දුරකථනයට ලැබුණු ඇමතුම් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් අදාල දුරකථන සමාගමෙන් ලබා ගත යුතු වීමයි. කරුණු එසේ වුවත් ශ්‍රී ගජන් අත්අඩංගුවට නොගැනීම තුළින් ඔහු පාවිච්චි කළ දුරකථනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා

ගැනීමට නොහැකි වී ඇති අතර ඒ අනුව එම දුරකතනයට ලැබුණු ඇමතුම් සහ දුරකථනයෙන් ලබාගත් ඇමතුම් පිළිබඳ වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇත.

මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් පොලිස් අත්අඩංගුවේ සිටින අවස්ථාවේදී ඔහුට තුවාල සිදුවී තිබීම කරණ කොටගෙන ඒ පිළිබඳව නියෝජ්‍ය පොලිස්පතිවරයා පැමිණිලිකාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අමතා මේ බව සඳහන් කර ඇත. එම සිද්ධිය කරණ කොටගෙන ශ්‍රී ගජන්ට දුරකථන ඇමතුමක් පැමිණිලිකරු විසින් ලබා දීමට හේතු වූ කරුණු පැමිණිලිකරු තම සාක්ෂියේ දී මෙසේ පැහැදිලි කර ඇත. (උපුටා ගැනීම - 2020.05.20 වැනි දින සාක්ෂි සටහන් පිටු 50,51 බලන්න)

" ප්‍ර: ඔබේ දුරකථනයෙන් ශ්‍රී ගජන්ගේ දුරකථනයට ඇමතුම් ලබා ගෙන නැද්ද ඒ රාජකාරි කාලය තුළ.

උ: ඒ රාජකාරි කාලය තුළ තියෙනවා ස්වාමීනි මම නියෝජ්‍ය පොලිස් පොලිස්පති පොලිස්පතිවරයා මට කිව්වා කතා කරලා මෙම සැකකරුව මෙම අපරාධයට අවශ්‍ය නැහැ මෙම සැකකරුව අවශ්‍ය නැහැ මොකද කරන්නේ කියලා. මම ඇහුවා කවුද ප්‍රශ්න කළේ කියලා. එතකොට කිව්වා ශ්‍රී ගජන් කියලා. එවිට මා ඔහුට කිව්වෙ තවත් නිලධාරියෙක් යොදවන්න ඔහුගෙන් ප්‍රශ්න කරන්න ඊට පස්සේ නියෝජ්‍ය පොලිස්පතිවරයා මට කිව්වා ඒක නෙවෙයි තියෙන ප්‍රශ්නේ මෙයාගේ තුවාල තියෙනවා මෙයාව පොලිසියේ අපිට තියාගන්න බැහැ කියලා. මම කිව්වා තියාගන්න බැරිනම් පොලිස් නිලධාරීන්

දෙන්නෙක්ගේ භාරයේ මොහුව රෝහල් ගත කරන්න ඒ එක්කම ජී.එච්.ටී. එකක් අරගෙන යන්න නැත්නම් පොලිසියෙන් පහර දුන්න කියලා මේගොල්ලෝ කියනවා. වෛද්‍යවරයාට පෙන්නලා ඒ වාර්තා ඔක්කොම අරන් යන්න කියලා. ඊට පස්සේ එහෙම කිව්වට පස්සේ යාපනය පොලිසියේ සිට රෝහලට යන්න පුළුවන් විනාඩි 5 ක් 6 ක් ඇතුළත. ඒ තරම් ආසන්නයේ තියෙන්නේ. යන්න පුළුවන් කාලයක් අල්ලලා මම ශ්‍රී ගජන්ගෙන් කතා කරලා ඇහුවා සැකකරුව රෝහල්ගත කළා ද කියලා. නෑ සර් අපි මේ ගෙනියන්න ලෑස්ති වෙනවා කියලා, කියන කොට පොලිසියේ ලොකු සද්දයක් ඇහුනා. කෑකෝ ගහන සද්දයක්. මේ ඔහු ගෙනියන්න ලෑස්ති වෙනවා කිව්වා."
(උපුටා ගැනීම අවසන්)

ජ්‍යෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ උපදෙස් පිළිනොපැදීමට නියෝජ්‍ය පොලිස්පති කුමාර ලාල් පෙරේරාට සහ ශ්‍රී ගජන්ට පැහැදිලි හේතුවක් තිබී ඇත. එනම්, 2017.12.05 වන වන දින පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාර ලාල් පෙරේරා කයිට්ස් මහේස්ත්‍රාත් ඒ එම් එම් රියාස් මහතා ඉදිරිපිට ඉදිරිපත්කරනු ලැබූ අවස්ථාවේදී නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ ප්‍රකාශයක් කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුව විසින් එම ප්‍රකාශය X වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා මෙසේ ප්‍රකාශ කර ඇත.

(උපුටා ගැනීම) "මම එම අවස්ථාවේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සමඟ දුරකථනයෙන් කතා කළා. උප පොලිස්

පරීක්ෂක ශ්‍රී ගජං ඇතුළු විමර්ශනය කළ කණ්ඩායමම විද්‍යා ඝාතනය සිද්ධිය සම්බන්ධයෙන් සශි කුමාර් යන අය සම්බන්ධ නැති බව සඳහන් කළ බව පැවසුවා. තවද උප පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් සශි කුමර්ගේ හිසට පහරදී තුවාලයක් තිබෙන බව පැවසුවා මෙම තොරතුරුත් මා ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාටත් පැවසුවා. එම අවස්ථාවේදී ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා මා හට සශි කුමාර් යන අයගෙන් කට උත්තර සටහන් කරගෙන වෛද්‍ය පිරික්සන පත්‍රයක් නිකුත් කර රෝහලට යවන ලෙස පවසා සිටියා. මට සශි කුමාර් අත්අඩංගුවට ගන්නා ලෙස කියා සිටියේ නැත. (උපුටා ගැනීම අවසන්)

ඔහුගේ එම ප්‍රකාශයට අනුව ශ්‍රී ගජන් සිදුකළ පහරදීමකින් සශි කුමාර්ගේ හිසට තුවාල සිදුවී ඇත. එම තුවාල හේතුවෙන් සශි කුමාර් රෝහල් ගත කරානම් වෛද්‍යවරුන් මාර්ගයෙන් පොලිස් පහරදීමක් පිළිබඳ චෝදනා සඳහා පිළිතුරු දීමට ශ්‍රී ගජන්ට සහ නියෝජ්‍ය පොලිස්පතිවරයාට සිදුවනු ඇත. එම චෝදනාවෙන් ගැලවීමට ජොයෂ්ඨ නියෝජ්‍ය පොලිය්පතිවරයා දුන් උපදෙය් පිළිනොපදිමින් ශෂී කුමාර්හට රෝහල් පතක් නිකුත් කර ඔහු ඥාතීන්ට භාර කර ඇත. තමිල් මාරන් සමග ගොස් අත්අඩංගුවටට ගත් ස්විස් කුමාර් ශ්‍රී ගජන්ගේ භාරයේ සිටියදී තුවාල සිදු වූ බව හෙළිවුවහොත් ඔහුට එම වගකීමෙන් ගැලවීමට නොහැකි වන බැවින් අත්අඩංගුවේ සිටි සශි කුමාර් මුදා හැරීමට නියෝජ්‍ය පොලිස්පතිවරයා සහ ශ්‍රී ගජන් ක්‍රියා කර, ඒ පිළිබඳව වගකීමෙන් ගැලවීමට සශි කුමාර් අත්අඩංගුවට ගන්නා ලෙස ජොයෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කියා සිටියේ නැත

යනුවෙන් සඳහන් කර ඇති බව පැහැදිලිය. සහකාර පොලිස් අධිකාරි තිසේරා ඇතුළු පිරිස මෙම සාක්ෂි හෙළිදරව් නොකර සඟවා ඇත. ඒ අනුව සාක්ෂි සැඟවීමේ වරදට සහකාර පොලිස් අධිකාරි තිසේරා ඇතුළු පිරිස වගකිව යුතුය.

ශ්‍රී ගජන් මුදාහැරීම පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට පැමිණිලිකරු අපොහොසත් වීම පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් පැමිණිලිකරු සඳහන් කළේ මූලික වශයෙන්ම ශ්‍රී ගජන් අත්අඩංගුවෙන් මුදා හැරිය බවට කිසිවෙකුත් එදින තමන්ට නොපැවසූ බවත්, තමන් එය දැනගත්තේ පසුදින තමිල් මාරන් සහභාගි වූ රැස්වීමක දී ජනතාව අතර ඇතිවූ නොසන්සුන්තාවයකින් පසුව බවත්, එසේම ශ්‍රී ගජන් සිටියේ යාපනය නියෝජ්‍ය පොලිස්පති යටතේ බැවින්, ඒ අනුව පරීක්ෂණයක් පැවැත්වීම ආරම්භ කළ යුත්තේ නියෝජ්‍ය පොලිස්පති විසින් බවත්, එසේම එදින පැවැත්වූ රැස්වීම කරණ කොටගෙන මධ්‍යම රාත්‍රිය වනතෙක් රාජකාරියෙහි යෙදී සිටි බැවින් විමර්ශනයක් සඳහා නියෝගයක් කිරීමට හැකියාවක් නොලැබුන බවත්ය. ඊට පසු දින පැවති සර්ව ආගමික සමුළුවක් සඳහා පැමිණි නියෝජිතයින්ගේ ආරක්ෂාව සැලසීමට පැමිණිලිකරුට ගුවන් තොටුපළට මෙන්ම පසුව යාපනය බලා පිටත්ව ගොස් නොසන්සුන්තාව පිළිබඳ කටයුතුවල නිරත වීමට ද සිදුව තිබී ඇත. ඉන්පසු එදින සවස්වරුවේ 3 ට පමණ පූජිත ජයසුන්දර මහතා යාපනයට පැමිණ ඇති අතර ඔහු ප්‍රකාශ කර ඇත්තේ මෙම සිද්ධිය පිළිබඳව සී.අයි.ඩී සහ සී.සී.ඩී. මගින් පරීක්ෂණ පවත්වන බවත්, විනය පරීක්ෂණය විශේෂ විමර්ශන ඒකකය මගින් පවත්වන බවත්, එබැවින් සිද්ධිය සම්බන්ධ පරීක්ෂණ වලින් වැළකී සිටින ලෙස පොලිස්පතිවරයා උපදෙස් දුන් බවත්ය. ඒ අනුව

පැමිණිලිකරුට සිද්ධිය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට නොහැකි වී ඇත.

2015.05.19 වැනි දින සහ 2015.05.20 වැනි දින පැමිණිලිකරුට රාජකාරි බහුල වූ බවත්, ඔහුට එදින ගුවන්තොටුපළට යාමේ රාජකාරිය පිළිබඳව කරුණු සනාථ කිරීම සඳහා පොලිස්පතිවරයා විසින් ඔහු වෙත එවන ලද ලිපියක් පැ. 40 වශයෙන්ද සලකුණු කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් පාවිච්චි කළ දූරකථනයක් අත්අඩංගුවට ගෙන එම දූරකථනයෙන් ලබාගත් සහ ලැබුන ඇමතුම් පිළිබඳ වාර්තාවක් අදාළ දූරකථන සමාගමෙන් ලබා ගත්තේ නම් පැහැදිලි ලෙසම ශ්‍රී ගජන්ගේ දූරකතනයට බලපෑම් කරමින් කතා කළේ කවුරුන්ද යන වග පහසුවෙන් සොයා ගැනීමට හැකිවන බව පැමිණිලිකරු සඳහන් කළේය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ගජන්ගේ දූරකථන ඇමතුම් පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට හෝ එම දූරකථනය අත්අඩංගුවට ගැනීම සිදු නොකිරීමට හේතු වූයේ එසේ කළා නම් එම දූරකථනයට දේශපාලනඥයින් හා වෙන පුද්ගලයින් කතා කළ බව සහ බලපෑම් කළ බව එමඟින් තහවුරු වන බැවින් නිසා බවට පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය.

මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් පොලිස් අත්අඩංගුවෙන් මිදී පළා යාම පිළිබඳ කරුණට සම්බන්ධ තවත් දේශපාලන චරිතයක් සිටින බවත් ඒ අන් කවරෙකුවත් නොව එක්සත් ජාතික පක්ෂ රජයේ නියෝජ්‍ය අමාත්‍යවරියක් වූ විජයකලා මහේෂ්වරන් බවත් 2015-05-17 දින මහජනයා විසින් මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවට ගෙන

රඳවාගෙන සිටිය දී විජයකලා මහේෂ්වරන් අමාත්‍යවරිය විසින් මහලිංගම් ශෂිකුමාර් මුදාගෙන ඔහුට යාමට ඉඩ හළ බවත්, ඒ අනුව මහලිංගම් ශෂිකුමාර් ශ්‍රී ගජන්ගේ භාරයෙන් මුදාහැරීමට ඇය ද බලපෑම් කළ පුද්ගලයෙකු විය හැකියි බවත්, සඳහන් කළ පැමිණිලිකරු විජයකලා මහේශ්වරන් නියෝජ්‍ය අමාත්‍යවරිය මෙම සිද්ධියට සම්බන්ධ වන ආකාරය දැක්වෙන සංයුක්ත තැටියක් පැ.42 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළේය.

විජයකලා මහේෂ්වරන් නියෝජ්‍ය අමාත්‍යවරියගේ ආරක්ෂක නිලධාරියෙකු වන පොලිස් කොස්තාපල් 9958 අමරජීව විසින් 2017.09.03 දිනින් ලබාදුන් ප්‍රකාශයක් කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයේ බී181/2017 දරණ නඩුවට ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශයේ සඳහන් අන්දමට මහලිංගම් ශෂිකුමාර් නැමැති පුද්ගලයා වේලනි ප්‍රදේශයේ මිනිස්සු අල්ලාගෙන ඉන්නවා ඇවිල්ලා වහාම ඇරස්ට් කරන්න යනුවෙන් මූ.පො.ප මහතාට කිව්ව බවයි. නියෝජ්‍ය අමාත්‍යවරිය දැනුම් දී ඇතත්, ඒ අනුව මූ.පො.ප මහතා මහලිංගම් ශෂිකුමාර් ඇරස්ට් කළේ ද?, නියෝජ්‍ය අමාත්‍යවරිය මූ.පො.ප මහතාට මහලිංගම් ශෂිකුමාර් ඇරස්ට් කරන ලෙසට දැනුම් දුන්නේද?, යන කරුණු සනාථ කර ගැනීම සඳහා මූ.පො.ප මහතාගේ ප්‍රකාශයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන නොමැත.

කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ උක්ත සඳහන්දී බී 181/2017 වාර්තාව පැ.41 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

විජයකලා මහේෂ්වරන් නියෝජ්‍ය අමාත්‍යවරිය විසින් 2015 මැයි 25 වන දින මව්බිම පුවත්පතට (පැ 43) සිදුකල ප්‍රකාශයකින් ඇය

පැමිණිලිකරු මත වරදක් පැටවීමට උත්සාහ දරා ඇත. එම ප්‍රකාශයෙහි මෙසේ සඳහන් වේ;

> (උපුටා ගැනීම) "කුරිකට්ටුවාන්, කයිට්ස් පොලිසිවලට දුරකතනයෙන් දැනුම් දුන්නා. 119 කතා කළා කවුරුවත් ආවේ නැහැ. ඔවුන්ට එන්න වාහන නැහැ කියලා කිව්වා. මිනිසුන් ළග තිබුණු වාහනවලින් ගිහිල්ලා පොලිසිය එක්ක එන්න හැදුවත් පොලිසිය ආවේ නැහැ. උතුරු පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගෙන් අවසර නොලැබුණු නිසා එන්න බැහැයි කියලා කිව්වා. පොලිසිය ආවේ නැති නිසා මේ සැකකරුට දිගටම පහරදුන් නිසා ඔහුගේ ශරීරයෙන් ලේ ආවා. කොහොමහරි ඒ සැකකරුගේ ඥාති පිරිසක් ඇවිල්ලා ඉතා අමාරුවෙන් ඔහු ගෙනියන්න කටයුතු කළා" (පැ.43 අ) (උපුටා ගැනීම අවසන්)

විජයකලා මහේෂ්වරන් නියෝජ්‍ය අමාත්‍යවරියගේ මෙම ප්‍රකාශය අනුව පැහැදිලි වන්නේ ඇයගේ ආරක්ෂක නිලධාරී පොලිස් කොස්තාපල් 9958 අමරජීව සඳහන් කරන අන්දමට ඇය මූ.පො.ප මහතාට දුරකථනයෙන් කතා කර මහලිංගම් ශෂිකුමාර් ඇරස්ට් කරන්න යනුවෙන් ප්‍රකාශ කළ බවට සඳහන් කරමින් පොලිස් කොස්තාපල් ලබාදුන් ප්‍රකාශය අසත්‍යය ප්රකාශයක් බවය.

එසේම අනෙක් අතට මේ අන්දමින් මහජනතාවගෙන් පහරකෑමට ලක් වූ පුද්ගලයකු රෝහල් ගත කිරීම සඳහා එම ස්ථානයට යාමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අවසරයක් පොලිස් නිලධාරීන් විසින් ලබා ගැනීම කිසිසේත් අවශ්‍ය නොවේ. එවැනි සිද්ධියක් පිළිබඳව පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබුණු වහාම ඒ පිළිබඳව ක්‍රියා කිරීමේ පූර්ණ බලය පොලිස් ස්ථානය භාර පොලිස්

ස්ථානාධිපතිවරයාට ඇත. ඔවුන් එසේ ක්‍රියා නොකරන්නේ නම් රාජකාරිය පැහැර හැරීමේ වරදට ඔවුන් වරදකරුවන් වනු ඇත.

මේ අනුව මෙම මතභේදාත්මක කරුණු සහ ප්‍රකාශ සනාථ කර ගැනීම සඳහා අදාල මූ.පො.ප මහතාගේ ප්‍රකාශයක් ලබාගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියානොකළේ; එසේ කළේ නම් පොලිස් කොස්තාපල්වරයාගේ ප්‍රකාශය අසත්‍යයක් බවට පත්වන වන බැවිනි.

මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ, එක්සත් ජාතික පක්ෂ රජයේ නියෝජ්‍ය අමාත්‍යවරියක වූ විජයකලා මහේෂ්වරන්ද පැමිණිලිකරු කෙරෙහි ද්වේශ සහගත අයුරින් ක්‍රියා කර ඇති බවය.

නියෝජ්‍ය අමාත්‍ය විජයකලා මහේෂ්වරන් විසින් එම ස්ථානයට ගොස් මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් බේරා ගැනීම පිළිබඳව එවකට හිටපු අධිකරණ හා විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍ය තලතා අතුකෝරාළ මහත්මිය ද, 2014 ඔක්තෝබර් මස 8 වැනි ඉරිදා ලංකාදීප පත්‍රයට ප්‍රකාශයක් ලබාදී ඇත. මෙම මාධ්‍ය ප්‍රකාශයට සම්බන්ධ මාධ්‍යවේදියා විසින් තලතා අතුකෝරාළ මහත්මියගෙන් විමසා ඇත්තේ යාපනයේ විද්‍යා දැරියගේ ඝාතනයේ ප්‍රධාන විත්තිකරු ආරක්ෂා කිරීමට එක්සත් ජාතික පක්ෂයේ රාජ්‍ය ඇමතිවරිය වූ විජයකලා මහේෂ්වරන් කටයුතු කළා කියලා චෝදනා එල්ලවී ඇති බවය. එම ප්‍රශ්නයට පිළිතුරු දෙමින් අමාත්‍ය තලතා අතුකෝරාළ මහත්මිය සඳහන් කර ඇත්තේ "එතුමිය ඇවිත් ඒ පුද්ගලයාව ආරක්ෂාව නොකළා නම් නඩුව එතනින් ඉවරයිනේ. එතුමිය හරියටම කටයුතු කළ නිසා ඒ පුද්ගලයාට දඬුවම් දෙන්න අධිකරණයට පුළුවන්

වුණා" යනුවෙනි. මෙම පුවත්පත් ප්‍රකාශය පැ.44 සහ පැ.44 (අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

අධිකරණ අමාත්‍ය තලතා අතුකෝරාළ මහත්මියගේ එම ප්‍රකාශය අනුව පැහැදිලිව පෙනී යන්නේ පොලිසියට අවශ්‍යව සිටි මහාලිංගම් ශෂිකුමාර් නැමැති විත්තිකරුට පළා යාමට ඉඩ හැරීම විජයකලා මහේෂ්වරන් මහත්මිය කටයුතු කළ අවස්ථාවේදී සිදුකළ යුතුව තිබූ දෙයක් බවය. මේ අනුව එක්සත් ජාතික පක්ෂ රජයේ නියෝජ්‍ය අමාත්‍ය විජයකලා මහේෂ්වරන්ට සහ අධිකරණ අමාත්‍ය තලතා අතුකෝරාළ මහත්මිය යන දෙදෙනාටම මහලිංගම් ශෂිකුමාර් නැමැත්තා අත්අඩංගුවට ගැනීමට වඩා ඔහුව නීතියේ ග්‍රහණයෙන් මුදා හැරීමට වැඩි බරක් දී කටයුතු කර ඇති බව පෙනේ. කරුණු එසේ නම්, විජයකලා මහේෂ්වරන් මහත්මිය සහ තලතා අතුකෝරාළ මහත්මියට සෘජුවම මෙම පරීක්ෂණය භාරව කටයුතු කළ පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට දුරකථනයෙන් කථා කිරීමේ හැකියාව හොඳින්ම තිබුණි. ඒ අනුව දුරකථන ඇමතුම පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට ලබාදුන්නේ ද යන්න සොයා බැලීමට ශ්‍රී ගජන්ගේ දුරකථනයට ලැබුණු හා දුරකථනයෙන් ලබාගත් ඇමතුම් පිළිබඳ වාර්තාවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා ගත යුතුව තිබුණි.

පැමිණිලිකරු සඳහන් කළේ රත්නපුර මහාධිකරණයේ දී පැමිණිලිකරුට එරෙහිව ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්ති යටතේ පවරන ලද නඩුව වැඩිදුරටත් තහවුරු කිරීමේ පරමාර්ථයෙන් යාපනය මහාධිකරණයේ දී ද ඒ හා සමානවම දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ නඩු පැවරීමට දේශපාලන බලධාරීන් අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුව උපයෝගීකර ගනිමින් ක්‍රියාත්මක වී ඇති බව ය.

මේ අනුව;

1. තුසිතා විජයමාන්න මහත්මිය හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී,
2. කේ.කේ.කේ.ගුණසේකර මහතා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
3. ශානි අබේසේකර මහතා හිටපු පොලිස් අධිකාරී
4 නිශාන්ත ද සිල්වා මහතා පොලිස් පරීක්ෂක
5. ඩී.එස්. තිසේරා මහතා සහකාර පොලිස් අධිකාරී

යන පුද්ගලයින් සම්බන්ධව විමර්ශනයේදී වගකිවයුතු පුද්ගලයන් ලෙස නම් කර නොතිසි නිකුත් කර ඇත.

2016.02.08 වැනි දින කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ වාර්තාව පැ.47 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. බී වාර්තාවේ සඳහන් වන අන්දමට විද්‍යා ඝාතන නඩුවට අදාළ මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් ඇතුළු සැකකරුවන් නවදෙනා සම්බන්ධයෙන්ම දුරකථන වාර්තා ලබාගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් සමූහ මංකොල්ල විමර්ශන අංශයේ නිශාන්ත ද සිල්වා කටයුතු කර තිබෙන බව එම බී වාර්තාවෙන් මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කර ඇත.

කරුණු එසේ වුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2016.02.08 වෙනි දින කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත්

කරන ලද බී116 /15 දරණ බී වාර්තාවේ 5 සහ 6 ඡේද වලින් මෙසේ සඳහන් කර ඇත.

(උපුටා ගැනීම) "05. එබැවින්, අපරාධය සිදුවූ කාලසීමාව තුල අපරාධය ස්ථානයේ සහ ඒ අසල ක්‍රියාත්මක වූ සියළුම ජංගම දුරකතන අංකයන් සම්බන්ධ විස්තර වාර්තාවන්, දුරකතන කුළුනු විස්තර අනුව ලබාගෙන ඇති අතර. ඒ සම්බන්ධව දිර්ඝ ලෙස විශ්ලේෂණ සිදුකරමින් පවතින බව ගරු අධිකරණයට වාර්තා කරමි.

06. මෙම ස්ත්‍රී දූෂණයට අදාළ විඩියෝ ගතකිරීම යලි ප්‍රති උද්පාදනයක් කර ලබාගැනිම හැකිද යන්න වැඩිදුරටත් සොයා බැලීම සඳහා එම භාණ්ඩ කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටි පරිගණක හදිසි ප්‍රතිචාර සංසධය වෙත (CERT ආයතනය) වෙත භාරදී ඇත. එම වාර්තාව මෙතෙක් ලැබි නොමැත."( උපුටා ගැනීම අවසන්) මෙම බී වාර්තාව පැ.54 වශයෙන්ද, 5 සහ 6 චේද 54(අ) සහ 54(ආ) වශයෙන්ද, සලකුණු කර ඉදිරිපත් කර ඇත.(උපුටා ගැනීම අවසන්)

කයිට්ස් පොලිස් ස්ථානය පටන් ඉහළට සියලුම නිලධාරීන් දැනගෙන සිටි කරුණක් වූයේ මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර්ට එරෙහිව මෙම අපරාධය සම්බන්ධයෙන් සාක්ෂි නොතිබුණ බවය. මහලිංගම් ශෂිකුමාර් අවස්ථා දෙකකදීම අත්අඩංගුවට නොගෙන මුදාහැරීමට හේතුවූ කරුණු වශයෙන් සටහන් කර ඇත්තේ මහලිංගම් ශෂිකුමාර්ට එරෙහිව මෙම අපරාධයට ඔහු සම්බන්ධ කිරීමට සාක්ෂි නොමැති බවය. පොලිස් අත්අඩංගුවේ සිටියදීත් පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් විසින් මහලිංගම් ශෂිකුමාර් මුදා හරින්නේ ද එබැවිනි.

ඔවුන් එසේ වුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බී වාර්තාවෙන් පවසා ඇත්තේ තමිල් මාරන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට සිදු කළ දැනුම්දීමක් අනුව මහලිංගම් ශෂිකුමාර් මෙම අපරාධයට සම්බන්ධ බවට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා දැන සිටි බවය. මෙම අපරාධය සම්බන්ධයෙන් කිසියම් දැනුමක් තිබුණේ නම් ඒ පිළිබඳව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහට පමණක් ඔහු ප්‍රකාශ කර ඉන් පහළ අනිකුත් කිසිදු පොලිස් නිලධාරියකුට ඒබව ප්‍රකාශ නොකළේ කුමන හේතුවක් මත ද යන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තමිල් මාරන්ගෙන් ප්‍රශ්නකර ඒ සඳහා පිළිතුරු ලබාගෙන නොමැත. තමිල් මාරන්, තමා දන්නා කරුණු පරීක්ෂණ පවත්වන කයිට්ස් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට නොපවසා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට පමණක් පැවසීම තුළින් තමිල් මාරන් අපේක්ෂා කළ ස්ථාවරය කුමක්ද යන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සොයා බැලිය යුතුව තිබූ නමුත් ඔවුන් එසේ කර නොමැත.

2015-05-19 දින යාපනයේ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ දී පැමිණිලිකරු, නියෝජ්‍ය පොලිස් පොලිස්පති ගමගේ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී යාපනය, උප පොලිස් පරීක්ෂක ඉරාන්, මෙම විමර්ශනය භාර නිලධාරී උප පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්, සිටින අවස්ථාවක කරුණු පැහැදිලි කරමින් තමිල් මාරන් මෙම කරුණු සඳහන් කර ඇත. ඒ අනුව තමිල් මාරන් පැවසූ කරුණු පිළිබඳව පොලිස් නිලධාරීන්ට අවබෝධයක් තිබුණු බවත් එබැවින් නියෝජ්‍ය පොලිස්පතිවරයාට මෙම කරුණු නැවත දැන්වීමේ අවශ්‍යතාවයක්

පැන නොනැගුන බවටත් ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා සඳහන් කර ඇත.

නියෝජ්‍ය පොලිස්පති කුමාර ලාල් ගමගේ මහතා ඔහුගේ මුල් ප්‍රකාශවල සහ මහේස්ත්‍රාත්වරයාට ලබාදුන් ප්‍රකාශයෙහි මහලිංගම් ශෂිකුමාර් පළා යාම සම්බන්ධයෙන් ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා එම කාරණයට සම්බන්ධ බවට ප්‍රකාශ නොකිරීම තුළින්ම ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ මෙම සාක්ෂිය තහවුරු වේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් 2016.06.01 දින කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද බී.116/15 දරණ වාර්තාවෙහි දෙවැනි ඡේදයේ මෙසේ සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම) "කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ හිටපු පීඨාධිපති වි.තමිල් මාරන් යන අය 2015.05.17 දිනට ආසන්න දිනයක දුරකථනය මගින් යාපනය ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් අනුරුද්ධ ජයසිංහ මහතාට දුරකථනයෙන් කථාකර විද්‍යා දැරිය ඝාතනයේ ප්‍රධාන සැකකරු අල්ලා දිය හැකි බවත්, ඒ සඳහා සිවිල් ඇඳුමෙන් සැරසුන කන්ඩායමක් තමා වෙත ලබාදෙන ලෙස දන්වා ඇත. ඒ අනුව 2015.05.17 වන දින උතුරු පළාත් භාර ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරයාගේ උපදෙස් මත නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් යාපනය මූ.පො.ප.වරයා වෙත දෙන ලද දැනුම්දීමක් මත උ.පො.ප ශ්‍රී ගජන් සමඟ පො.කො. 62655 අශෝක නිළධාරියාව සිවිල් ඇඳුමෙන් අවි රහිතව තමිල් මාරන් වෙත ලබාදී ඇත. ඉන් පසු

ඔහුගේ දියණිය සහ තවත් කාන්තාවක් සමඟ පුංකුඩතිව් ප්‍රදේශයට ගොස් මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් යන අයව සොය ගෙන උ.පො.ප.ශ්‍රී ගජන් භාරයට පත් කර යාපනය පොලිස් ස්ථානයට රැගෙනවිත් ඇත. ශ්‍රී ගජන් විසින් උසස් පොලිස් නිළධාරින්ගෙන් ලද උපදෙස් මත ක්‍රියා කරමින් පෙරදින මහලිංගම් ශෂිකුමාර්ට ප්‍රදේශවාසීන් විසින් පහරදීමෙන් ඇතිවී තිබූ සුළුතුවාල හේතුවෙන් ඔහුගේ පැමිණිල්ල සටහන් කර, රෝහල් පතක් නිකුත් කර මහලිංගම් ශෂිකුමාර් සමඟ රැගෙන එන ලද ඔහුගේ බිරිද, දියණිය සහ බිරිදගේ අම්මා සමඟ මුදාහැර ඇත.'' (උපුටා ගැනීම අවසන්)

මේ අනුව විද්‍යා දැරිය දූෂණය කර ඝාතනය කර දැමීමේ නඩුවේ ප්‍රධාන සැකකරු වන මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් සැඟවී සිටි ස්ථානය තමිල් මාරන් හොඳින් දැන සිටි අතර ඔහු අල්ලා දීමට ද ඔහු ඉදිරිපත් වී ඇත. ඒ අනුව පොලිස් පරීක්ෂක ඇතුළු කණ්ඩායමට මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවට ගැනීම සඳහා තමිල් මාරන් උදව් උපකාර කර ඇත. බී වාර්තාවේ දෙවන ඡේදය අනුව මහලිංගම් ශෂිකුමාර් ස්ත්‍රී දූෂණයකට හා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ නඩුවක ප්‍රධාන සැකකරු විය. ඒ බව ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ද හොඳින්ම දැන සිටියේය. ස්ත්‍රී දූෂණය හා මනුෂ්‍ය ඝාතනයක සැකකරුවෙකු අත්අඩංගුවට ගත් පසුව පොලිස් ස්ථානය මගින් මුදාහැරිය නොහැකි බව පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් ඉතා හොඳින් දන්නා කරුණකි. එබැවින් එවැනි සැකකරුවෙකු පිළිබඳව ඉදිරියට ක්‍රියාත්මක කළ යුත්තේ කෙබඳු ආකාරයකට ද යන්න ඔහුගේ උසස් නිලධාරීන්ගෙන් විමසා අසා දැනගත යුතු

කරුණක් නොවේ. ඒ මක්නිසාදයත් එම අවස්ථාව වන විටත් ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් තමිල් මාරන්ගේ දැනුම්දීම පරිදි මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය කරන උපදෙස් සහ නියෝග, නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත නිකුත් කර තිබූ බැවිනි. ශ්‍රී ගජන්ට වැඩිදුරටත් උපදෙස් අවශ්‍ය වූයේ නම් ඒ පිළිබඳව ඔහුට උපදෙස් දීමට රාජකාරිමය වශයෙන් වගකීමෙන් බැඳී සිටින ඔහුගේ ආසන්නතම උසස් නිලධාරියා වන ප්‍රදේශය භාර සහකාර පොලිස් අධිකාරිවරයාගෙන් එය විමසිය යුතුය.

පොලිස් රාජකාරියෙහි යථා ස්වරූපය එය වුවත් ඉහත සඳහන් බී වාර්තාවේ 6 වන ඡේදයට අනුව සිදුවී ඇත්තේ ඊට ප්‍රතිවිරුද්ධ ක්‍රියා පිළිවෙතකි. මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවට ගැනීමෙන් පසු පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් වාර්තා කර ඇත්තේ තමා ආසන්නතම උසස් නිලධාරීන්ට නොව තමාට බොහෝසේ ඉහළින් සිටි නියෝජ්‍ය පොලිස්පති ලාල් ගමගේ මහතාටය. ඒ අනුව මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවට ගැනීමේ කරුණු වාර්තා කිරීමේදී පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් තමා ආසන්නතම උසස් නිලධාරියා වන සහකාර පොලිස් අධිකාරිවරයාද, ඉන්පසු උසස් නිලධාරියා වන පොලිස් අධිකාරිවරයාද සහ ඉන්පසු උසස් නිලධාරියා වන ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරිවරයා යන තිදෙනාම මගහැර නියෝජ්‍ය පොලිස්පති ලාල් ගමගේ වෙත කෙලින්ම කරුණු වාර්තා කිරීමට පෙළඹී ඇත. මෙවැනි ක්‍රියා පිළිවෙතකට ප්‍රවේශවීමට පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට බලපෑ හේතූන් මොනවාද යන්න පැහැදිලි කළ හැක්කේ පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් හෝ නියෝජ්‍ය පොලිස්පති ලාල් ගමගේ යන දෙදෙනාගෙන් එක් අයෙකුට පමණි.

මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් විද්‍යා ශිෂ්‍යාව ඝාතනය හා දූෂණය පිළිබඳ නඩුවට සම්බන්ධ සැකකරුවෙකු බවට තමිල් මාරන් දැනගත්තේ කෙසේද යන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තම විමර්ශනයේදී සොයා බලා නැත. මෙම දූෂණය සහ ඝාතනය පිළිබඳව තමන් දන්නා කරුණු පොලිස් පරීක්ෂණය පවත්වන අදාළ පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන්ට නොපවසා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාටම පැවැසීමට තමිල් මාරන්ට හේතුවූ කරුණු මොනවාද යන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තම විමර්ශනයේදී සොයා බලා නොමැත.

යම් පුද්ගලයෙකු පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීමේදී බලය පාවිච්චි කිරීම පිළිබඳ විධිවිධාන අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 32 වගන්තියේ සඳහන් වන අතර ඊට අමතරව පොලිස් ආඥා පනතේ 65 වගන්තියෙහි අන්තර්ගතවේ.

පොලිස් ආඥා පනතේ 60 සහ 65 වගන්තිය අනුව අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයෙකු පොලිස් ස්ථානයට රැගෙන ගොස් පොලිස් ස්ථානාධිපතිවරයාගේ භාරයට පත් කළ යුතුය. මීට අමතරව පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඒ 20 දරණ නියෝග මාලාවෙහි ද අත්අඩංගුවට ගැනීම පිළිබඳව යම් යම් විධිවිධාන සඳහන් කර ඇත. ඒ 20 පොලිස් නියෝගය පැ.49 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. නියෝග මාලාවේ 2 (iii) සහ (iv) නියෝගවල මෙසේ සඳහන් වේ.

> (උපුටා ගැනීම) "(iii). සිර භාරයට ගත් කිසිම තැනැත්තකු ඔහුගේම බැදුම්කරයක් පිට හෝ ඇප පිට හෝ මහේස්ත්‍රාත්වරයකු ලියවිල්ලකින් දුන් විශේෂ නියෝගයක්

යටතේ හෝ මිස කිසි විටෙකත් නිදහස් නොකළ යුතුය. ශරීර ඇපයක් හෝ ඇපකරුවකු සහිත ඇපයක් අනවශ්‍ය යයි සලකන තන්හි, කාර්යභාර නිලධාරියාගේ විශේෂ නියෝග ලබා ගත යුතුය.

(iv) වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත් සහ/හෝ නිදහස් කළ සෑම කෙනෙකුම එසේ සිරභාරයට ගත් බව සහ/හෝ නිදහස් කළ බව කාර්ය භාර නිලධාරියා විසින් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාට දැනුම් දිය යුතුය."(උපුටා ගැනීම අවසන්.)

මේ අනුව පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් මහලිංගම් ශෂිකුමාර් තමා අත්අඩංගුවට ගැනීමෙන් පසුව පොලිස් රෙගුලාසි ඒ 20 යටතේ ක්‍රියා කර නොමැති බව ඉතාමත් පැහැදිලිව පෙනී යයි. එවන් පසු පසුබිමක් තුළ පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ට එරෙහිව ඉහළ පොලිස් නිලධාරීන් කිසිදු අයුරකින් ඒ 20 නියෝග කඩ කිරීම පිළිබඳව ක්‍රියා මාර්ග ගෙන නොමැත. ඔවුන් ඒ වෙනුවට සිදු කර ඇත්තේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට දඬුවම් පැමිණ වීම පමණකි.

එසේම, පැ.49 ලෙස සලකුණු කළ ඒ 20 නියෝග මාලාවේ 4(ඒ) නියෝගය මෙසේය.

(උපුටා ගැනීම)

"4. සෝදිසි කිරීම. (ඒ) සිරභාරයට ගත් සෑම කෙනකුම එසේ සිරභාරයට ගත් වහාම සෝදිසි කළ යුතුය. පොලිස් ස්ථානයකට පැමිණි පසු එම තැනැත්තා නැවතා සෝදිසි කළ යුතුය. ඒ අනුව, සටහන් පොතේ ද තොරතුරු පොතේ ද යෝග්‍ය සටහන් ලිවිය

යුතුය. සිර කාමරයේ දැමීමට පළමු, තුවාල ආදියක් වේ නම් ඒ ගැන සටහනක් තොරතුරු කොතේ ලිවිය යුතුය. සිරභාරයේ සිටින තැනැත්තා වෛද්‍ය නිලධාරියකු හමුවීමට කැමැත්තේ ද නැතහොත් තම ශරීරයේ ඇති යම් තුවාලයක් සම්බන්දයෙන් ප්‍රකාශයක් කිරීමට කැමැත්තේ ද යන වග ඔහුගෙන් විමසිය යුතුය. ඉදින් ඔහු වෛද්‍ය නිලධාරියකු හමුවීමට හෝ ප්‍රකාශයක් කිරීමට හෝ කැමැත්තේ නම්, කාරණයට ගැලපෙන පරිදි වෛද්‍ය නිලධාරියකු ලබා ගැනීමට හෝ ඔහුගේ ප්‍රකාශය සටහන් කිරීමට හෝ වහාම කටයුතු පිළියෙල කළ යුතුය."(උපුටා ගැනීම අවසන්.)

මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවට ගැනීමෙන් පසුව පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් උක්ත 04 වන නියෝගය පරිදි ක්‍රියා කර නොමැති අතර ඒ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සොයා බලා නොමැත.

එපරිද්දෙන්ම තමන්ගේ ඉහළ නිලධාරියෙකු වැරදි නියෝගයක් සිදු කරන්නේ නම් එය පිළිනොපැදීමට ආයතන සංග්‍රහයේ විධිවිධාන වලින් පහළ නිලධාරියෙකු බැඳී සිටී. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ශ්‍රී ගජන්ට වැරදි නියෝගයක් ලබා දුන්නේ නම් කළ යුතුව තිබුණේ එම වැරදි නියෝග නිකුත් කිරීම පිළිබඳව සටහනක් තොරතුරු වාර්තා පොතේ හෝ තම සාක්කු සටහන් පොතේ සටහන් කිරීමයි. ආයතන සංග්‍රහයේ දෙවන වෙළුම 27 වන පරිච්ඡේදයෙහි 8:3, 8:4 වගන්තිවලින් මේ බව මනාව පැහැදිලි කර ඇත. ආයතන සංග්‍රහයේ එකී වගන්ති පැ.49 (අ) සහ පැ. 49 (ආ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති අතර එම වගන්ති පහත උපුටා දක්වා ඇත.

“ 8 : 3 උක්ත 8:1 උප වගන්තියේ සඳහන් විධිවිධානයන් උල්ලංඝනය කරනු ලැබුවේ කිසියම් නිලධරයකුගේ හෝ බලධරයකුගේ හෝ වෙනත් පාර්ශ්වයක හෝ බලපෑමක් නිසා යන්න කිසිදු නිලධරයකුට තම නිදහසට කරුණක් ලෙස ඉදිරිපත් කළ නොහැකි වන්නේය.

8 : 4 කිසියම් නීතියකට හෝ ව්‍යවස්ථාවකට හෝ අනුකූලව, අමාත්‍ය මණ්ඩලය විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ අමාත්‍යාංශයක ලේකම්වරයකු විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයකු විසින් හෝ බලය පවරනු ලැබ ඇති රජයේ නිලධරයකුට ඉහත 8:1 උප වගන්තියෙහි සඳහන් විධිවිධානයන් උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන ලෙසට කිසියම් රජයේ නිලධරයකු විසින් නියෝග කිරීම හෝ අනිසි බලපෑම් කිරීම හෝ මෙහෙයවීම හෝ කර ඇති විටෙක, එසේ කරන ලද නිලධරයා පළමුවන උපලේඛනය යටතට වැටෙන බරපතල විෂමාචාරයක් කරන ලද සේ සලකා නියමිත විනය බලධරයා විසින් ඔහුට විරුද්ධව වහාම විනයානුකූලව පියවර ගතයුතු වන්නේය.” (උපුටා ගැනීම අවසන්.)

මේ අනුව ශ්‍රී ගජන්ට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා විසින් වැරදි නියෝගයක් ලබාදී හෝ බලපෑමක් සිදු කළේ නම් ඒ පිළිබඳව ජයසිංහ මහතාට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා තමා ලද තොරතුරු සටහන් කර තැබීම ශ්‍රී ගජන් විසින් කළ යුතුව තිබුණු නමුත් එවැනි සටහනක් නොතිබීම තුළින් පෙනී යන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඒ අයුරින් බලපෑමක් කිරීමක් හෝ වැරදි නියෝග ලබා දීමක් සිදු කර නොමැති බවය.

මෙම කරුණු ඔස්සේ තම පරීක්ෂණය දියත් කරනවා වෙනුවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා ඇතුළු අනිකුත් නිලධාරී පිරිස් සිදුකර ඇත්තේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා කෙසේ හෝ විද්‍යා සාතනයේ යම් සිද්ධියකට සම්බන්ධ කර ඔහු  අධිකරණය ඉදිරියට ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම පමණි.

නුවරඑළිය සහකාර පොලිස් අධිකාරී දේවනාරායනගේ රවීන්ද්‍ර සම්පත් ධර්මදාස මහතා 2017.07.15 වන සෙනසුරාදා දින වන විට කයිට්ස් පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක වශයෙන් රාජකාරිය කරමින් සිටි ඇත. එදින සවස 7.15 ට පමණ ඔහුගේ ජංගම දුරකථන අංක 07185991833 දුරකථනයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවකට සහකාර පොලිස් අධිකාරී තිසේරා මහතා ඔහුගේ 0718591770 දුරකථනයට අමතමින්, එවකට මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස කටයුතු කළ ලලිත් ජයසිංහ මහතා අත්අඩංගුවට ගෙන කයිට්ස් අධිකරණයට ඉදිරිපත් කිරීමට රැගෙන එන බවට දැන්වීමක් කර ඇත. ඉන්පසු සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතා නැවතත් පොලිස් පරීක්ෂක ධර්මදාස මහතාගේ ඉහත අංක දරණ දුරකථනයට 2017.07.16 දින පැය 04.23 ට දුරකථන ඇමතුමක් ලබා දෙමින් සැකකරුවන් රැගෙන පැමිණි වාහනය අනතුරකට ලක් වූ බව දැනුම් දී ඇත.

මෙම පණිවිඩය ලැබීමෙන් පසුව පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා පොලිස් සැරයන් 22470, පොලිස් කොස්තාපල් 12642, පොලිස් කොස්තාපල් 8927 සහ පොලිස් කොස්තාපල් රියදුරු 19156, WP KO 0254 දරණ ජීප් රථය අනතුර සිදුවූ ස්ථානයට ගොස් ඇත.

2017.07.15 වන දින සවස 7.00ත් 7.30ත් අතර කාලය තුළදී කයිට්ස් මහේස්ත්‍රාත්වරයා කයිට්ස් පොලිස් ස්ථානය අසලට පැමිණ වැඩ බලන මහේස්ත්‍රාත් සබේෂන් මහතාට වැඩ බාර දී තම සේවා කලාපයෙන් පිටතට යන බවට පොලිස් පරීක්ෂක ධර්මදාස මහතාට දැනුම් දී ඉදිරිපත් කරන සැකකරුවකු නල්ලූර් වල සිටින වැඩබලන මහේස්ත්‍රාත් සබේෂන් මහතාට ඉදිරිපත් කරන ලෙසට දැනුම් දී ඇත.

මහේස්ත්‍රාත්වරයා කයිට්ස් වල නොමැති බවට වූ එම පණිවිඩය සහ ඒ වෙනුවට නල්ලූර් වල සිටින සබේෂන් මහතා මහේස්ත්‍රාත්වරයා වෙනුවෙන් වැඩ බලන රාජකාරිය ඉටු කරන බවටත් වූ පණිවිඩය එම අවස්ථාවේදීම සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතාට දැනුම් දී ඇත. වැඩබලන මහේස්ත්‍රාත් සබේෂන් මහතා වාසය කර ඇත්තේ නල්ලූර් කෝවිල පසුපස පිහිටි ඔහුගේ නිවසේ බවටත්, එම නිවසේ සිට කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට කිලෝමීටර 20ක පමණ දුර ප්‍රමාණයක් ඇති බවටත් පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා සිය සාක්ෂියේ දී සඳහන් කළේය.

මහේස්ත්‍රාත්වරයා කයිට්ස් වල නොමැති බවට පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා විසින් සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතාට ඒ අයුරින් දැනුම් දී තිබියදීත් ඒවග නොසලකා සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතා වැඩබලන මහේස්ත්‍රාත් සබේෂන් මහතා වාසය කළ නල්ලූර් නිවාසය ද පසු කර කයිට්ස් බලා පැමිණ ඇත.

වාහන අනතුරු පිළිබඳව පවත්වනු ලැබූ පරීක්ෂණයේ දී දැනගත් කරුණු අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා රැගත් වාහනය 2017.07.15 දින පැය 16.00 ට කොළඹින් පිටත් වී ඇත. ඒ අනුව සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතා කයිට්ස් දක්වා

පැමිණීමට පැය 12 ක කාලයක් ගත කර ඇත. පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා සඳහන් කළේ වාහනයකට මෙම ගමන සඳහා ගතවන කාලය සාමාන්‍යයෙන් පැය 8 ක් පමණ බවය. අන්තර්ජාලයෙහි ඇති ගූගල් සේවයෙන් ලබාගත් සිතියමක ආධාරයෙන් පැමිණිලිකරු පෙන්වා සිටියේ කොළඹ සිට කයිට්ස් බලා යන ගමනකට ගතවන කාලය පැය 7 විනාඩි 48 ක් බව ය. ගූගල් සිතියම පැ.50 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

අනතුරට ලක්වූ WPGA 8296 බෙන්ස් වෑන් රථය බෝක්කුවේ කණු දෙකක් කඩා ගෙන ගිහින් බොක්කුව උඩ නතර වී තිබූ බවත්, වාහනය සාමාන්‍ය වේගයට වඩා වැඩි වේගයකින් පදවා ඇති බවටත්, නිරීක්ෂණය වූ බව පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා සඳහන් කළේය. රියදුරු සඳහන් කරන අන්දමට ඉදිරි වම් රෝදය අශ්‍රිත තිරිංග පද්ධතියේ හටගත් යම් කාර්මික දෝෂ තත්ත්වයක් නිසා අනතුර සිදුවිය හැකි බවට රස පරීක්ෂක වාර්තා කර ඇත.

කයිට්ස් මහේස්ත්‍රාත්වරයා ඒ වන විටත් වැඩබලන මහේස්ත්‍රාත් සබේෂන් මහතාට රාජකාරිය භාරදී කයිට්ස් ප්‍රදේශයෙන් ඉවත්ව ගොස් ඇති බවට ඒ වන විටත් පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා විසින් සහකාර පොලිස් අධිකාරි තිසේරාට දැනුම් දී තිබී ඇත. මහේස්ත්‍රාත්වරයා කයිට්ස් වල නොමැති බවටත් වැඩබලන මහේස්ත්‍රාත්වරයා යාපනය නල්ලූර් අසල නල්ලූර් කෝවිල පසුපස නිවසේ පදිංචිව සිටින බවටත් දැනුම් දී තිබියදීත් කයිට්ස් බලා යන්නේ කුමන හේතුවක් මත ද යන්න පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා විසින් පොලිස් අධිකාරි තිසේරා ගෙන් විමසා නැත.

එවැනි පසුබිමක් මත වැඩබලන මහේස්ත්‍රාත්වරයා සිටි යාපනය නල්ලූර් පසු කර ඊට කිලෝමීටර් 20 පමණ දුරින් පිටිහි කයිට්ස් මහේස්ත්‍රාත්වෙත යැමත් යන කරුණු සලකා බලන විට රාත්‍රියේදී සිදුවූ රිය අනතුර කිසියම් සැකසහිත බවක් විද්‍යාමාන කරයි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට මෙම අනතුරින් තුවාල සිදුවී තිබේද යන්න පොලිස් පරීක්ෂක ධර්මදාස විසින් සහකාර පොලිස් අධිකාරි තිසේරාගෙන් විමසනු ලැබූ අවස්ථාවේදී ලලිත් ජයසිංහ මහතාට අනතුරෙන් තුවාල නොමැති බවට සහකාර පොලිස් අධිකාරි තිසේරා පවසා ඇත. ඉන් අනතුරුව ලලිත් ජයසිංහ මහතාගෙන් විමසනු ලැබූ විට විශාල ලොකු ආබාධ නොමැති බවට ලලිත් ජයසිංහ මහතා පැවසූ බව පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා පැවසුවේය. ලලිත් ජයසිංහ මහතාගේ එම ප්‍රකාශයෙන් ගම්‍ය වන්නේ ඔහුට මෙම අනතුරෙන් තුවාල සිදුවී ඇති බවයි.

කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගිය පොලිස් පරීක්ෂක තිසේරා ඇතුළු කණ්ඩායම ආපසු නල්ලූර් වලට පැමිණ වැඩබලන මහේස්ත්‍රාත්වරයාට පැමිණිලිකාර ලලිත් ජයසිංහ මහතා ඉදිරිපත් කර ඇත.

පොලිස් පරීක්ෂක ධර්මදාස මහතාගේ දැනුම්දීම පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා යාපනයේ නල්ලූර් කෝවිල් පසුපස නිවසේ පදිංචිව සිටි වැඩබලන මහේස්ත්‍රාත් සබේෂන් මහතාට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා ඉදිරිපත් කළේ නම් මෙම රිය අනතුරට මුහුණ පෑමට ලලිත් ජයසිංහ මහතාට සිදුවන්නේ නැත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජයසිංහ මහතා කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා රැගෙන ගිය වාහනය අනතුරකට භාජනය වූ බව තමන් පොලිස් මූලස්ථානයට, අධ්‍යක්ෂක තොරතුරු කාමරයට, මාධ්‍ය ප්‍රකාශකට සහ තමන්ගේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ සිට පහළට සියළුම උසස් නිලධාරින්ට දැනුම්දුන් බව පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා සඳහන් කළත් හිරු ප්‍රවෘත්ති සේවය ඔස්සේ පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කර ඇත්තේ තමන්ට එවැනි දැනුම් දීමක් නොලැබුණු බවය. මෙම ප්‍රකාශය අඩංගු 2017.07.16 වන දින පස්වරු 6.55 ට ප්‍රචාරය වන හිරු ප්‍රවෘත්ති අඩංගු සංයුක්ත තැටිය පැ. 51 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම රිය අනතුරට මුහුණ පෑ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට රිය අනතුරින් තුවාල සිදු නොවුණ බවට ලලිත් ජයසිංහ මහතා තමන්ට ප්‍රකාශ කළ බව පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා ඔහුගේ සාක්ෂියේ දී ප්‍රකාශ කළත්, එම ප්‍රකාශය සනාථ කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාගේ ප්‍රකාශයක් පොලිස් පරීක්ෂක ධර්මදාස විසින් සටහන් කරගෙන නැත. ලලිත් ජයසිංහ මහතා මෙම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් සඳහන් කළේ ඔහුට මෙම රිය අනතුරින් තුවාල සිදු වුණ බවත්, අත්අඩංගුවට ගත් පුද්ගලයෙක් ලෙසට පොලිස් නිලධාරීන් භාරයේ සිටි තමන්ට අවශ්‍ය නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට නීතියෙන් බැඳී සිටින සහකාර පොලිස් අධිකාරි තිසේරා ඇතුළු ඔහුගේ පිරිස ඒ සඳහා ක්‍රියාත්මක නොවුණු බවත්ය.

නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගතකර දින 14 කට පසුව රක්ෂිත බන්ධනාගාර

කාලය දීර්ඝ කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී පොලිස් පරීක්ෂක ධර්මදාස මහතාද අධිකරණයේ සිට ඇති අතර ලලිත් ජයසිංහ මහතා බෙල්ලට කොලරයක් පැළඳ සිටිනවා දැක ඇත. එම අවස්ථාවේදී පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා ලලිත් ජයසිංහ මහතා ළඟට ගොස් ආචාර කොට වෛද්‍ය වාර්තාවක් ඇත්නම් ඉදිරිපත් කිරීම සඳහා එය තමන්ට ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත. ඒ අනුව රිය අනතුරේදී ලලිත් ජයසිංහ මහතාට තුවාල සිදුවී ඇති බවට පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා එදින තහවුරු කරගෙන ඇත.

මේ අනුව රිය අනතුර සිදුවූ අවස්ථාවේදී අත්අඩංගුවේ සිටි සැකකරුවෙකු වන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට සහකාර පොලිස් අධිකාරී තිසේරා හිතාමතාම මග හැර ඇත.

එවකට කයිට්ස් පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා වැඩිදුරටත් තම සාක්ෂියෙහි සඳහන් කළේ රිය අනතුර පිළිබඳව තමන්ට විමර්ශනය පැවැත්වීමට නිසි කාල වේලාව ලබා නොදී තමාගේ වාහනයට රිය අනතුරට භාජනය වූ ලලිත් ජයසිංහ මහතා නංවාගෙන සහකාර පොලිස් අධිකාරී තිසේරා මහතා කටඋත්තරයක්ද ලබා නොදී එතනින් පිටව ගිය බවය. සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතාගේ මෙම ක්‍රියාව හේතුකොට ගෙන මෙම රිය අනතුර පිළිබඳව පරීක්ෂණ පවත්වන පොලිස් පරීක්ෂක ධර්මදාස මහතාට ලලිත් ජයසිංහ මහතාගේ කටඋත්තරය ද රිය අනතුර සිදුවන අවස්ථාවේදී ලලිත් ජයසිංහ මහතා භාරව ගමන් කළ සහකාර පොලිස් අධිකාරි තිසේරා

ඇතුළු අනිකුත් පොලිස් නිලධාරීන්ගේ ද කටඋත්තර ලියා ගැනීමට නොහැකි වී ඇත.

මේ අනුව රිය අනතුරක් පිළිබඳව පරීක්ෂණ පැවැත්වූ පොලිස් පරීක්ෂක ධර්මදාස මහතාගේ රාජකාරිය නිසි අයුරින් ඉටු කර යුක්තිය ඉෂ්ට කිරීම සඳහා කරුණු අධිකරණය වෙත වාර්තා කිරීමට තිබූ ඉඩ ප්‍රස්ථාව නීති විරෝධී ලෙස හා බලහත්කාරී ලෙස සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතා වලක්වා ඇත.

දාවුත් ලෙබ්බේ මොහොමඩ් නිස්තාර් යාපනය බලා යන පිරිස පසුපසින් යාමට ගමන් අරඹා ඇත්තේ ලලිත් ජයසිංහ මහතාගේ භාර්යාවගේ ඉල්ලීමක් පරිදි ය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලලිත් ජයසිංහ මහතා අත්අඩංගුවට ගෙන යාපනය උසාවියට රැගෙන යන බවත්, එබැවින් ඔහුට ඇප ලබා ගැනීමේ කටයුතු හා ඇපකරුවන් වශයෙන් ඉදිරිපත්වීමේ අවශ්‍යතාව උදෙසා ලලිත් ජයසිංහ මහතා රැගෙන යන පිරිස් පසුපසින් යාපනයට යන ලෙසටත් ලලිත් ජයසිංහ මහතාගේ භාර්යාව ඔවුන්ගේ නිවස අසල පදිංචි මොහොමඩ් නිස්තාර්ගෙන් ඉල්ලීමක් කර ඇත.

එම පණිවිඩය ලැබෙන විට මම නුවර සිටියේ. මම යාළුවන් දෙදෙනකු ද සමඟ වව්නියාවට පැමිණ වව්නියාවේදී ලලිත් ජයසිංහ මහතා රැගෙන ගිය වාහන සමග ඊට පිටුපසින් දාවනය කරමින් යාපනය බලා ගොස් ඇත. විශේෂ කාර්ය බළකායේ නිලධාරීන්ගේ උපදෙස් මත ජයසිංහ මහතා රැගෙන ගිය වාහන වලට තරමක් පසුපසින් ධාවනය කර ඇත. ලලිත් ජයසිංහ මහතා රැගෙන ගිය වාහනය අනතුරුට ලක්වීමෙන් පසුව එම ස්ථානයට පැමිණි මොහොමඩ් නිස්තාර් අනතුරට පත් වාහනයේ ඉන්ධන ටැංකියට

අලාභ හානි තිබෙනවා දැක රථය ගිනි ගනී ජයසිංහ මහතා එළියට ගන්න යනුවෙන් විශේෂ කාර්ය බලකා නිළධාරීන්ගෙන් ඉල්ලා ඇත.

ලලිත් ජයසිංහ මහතා වාහනයෙන් එළියට ගැනීමෙන් පසුව නිස්තාර් ඔහු ළඟට ගොස් තුවාල තිබේදැයි විමසා ඇති අතර එම අවස්ථාවේදී බෙල්ල පොඩ්ඩක් වැදුණ බවටත් කකුලේ තුවාලයක් ඇති බවටත් පවසා ඇත. කලිසම් කකුල උස්සා බලන විට කකුලේ තුවාලයක් තිබෙනවා නිස්තාර් නිරීක්ෂණය කර ඇත. එසේ වුවත් ලලිත් ජයසිංහ මහතා රැගෙන ගිය පොලිස් නිලධාරීන් ඔහුට සිදු වූ එම තුවාල සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට උනන්දු වී හෝ උත්සාහ කර නොමැත. එසේම එතැනට පැමිණි කයිට්ස් පොලිස් ස්ථානයේ නිලධාරීන් මහේස්ත්‍රාත්වරයා නොමැති බවට පවසනවා නිස්තාර්ට ශ්‍රවණය වී ඇත. එසේ වුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලලිත් ජයසිංහ මහතා රැගෙන කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට ගොස් නැවත ආපසු වැඩ බලන මහෙස්ත්‍රාත්වරයා වාසය කළ යාපනය නල්ලූර්හි පිහිටි ඔහුගේ නිවාසයට පැමිණ ලලිත් ජයසිංහ මහතා වැඩබලන මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කර ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාගේ රාජකාරි වැඩ තහනම් කිරීම පිළිබඳ කාරණයේදී ජාතික පොලිස් කොමිෂන් සභාව මානව හිමිකම් උල්ලංඝනය වන අයුරින් ක්‍රියාකර ඇති බවට ජයසිංහ මහතා වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් කරන ලදී.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ හිටපු ලේකම් නාවලගේ ආරියදාස කුරේ මහතා සාක්ෂියේදී සඳහන් කළේ පොලිස්පතිවරයාගේ නිර්දේශයක් මත ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ

මහතාගේ වැඩ තහනම් කිරීමක් සිදුකළ බවය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂිවලින් ස්ථාපිත කළ ස්ථාවරය වූයේ ජාතික පොලිස් කොමිෂන් සභාව ලලිත් ජයසිංහ මහතාගේ වැඩ තහනම් කිරීමට ගත් තීරණය ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ප්‍රතිවිරුද්ධ බවත්, රෙගුලාසි වලින් ලලිත් ජයසිංහ මහතාට ලැබිය යුතු සහන ලබා නොදී නීති විරෝධී ලෙස ඔහුගේ වැඩ තහනම් කිරීම සිදු කර ඇති බවත්ය.

මේ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ලලිත් ජයසිංහ මහතාගේ රාජකාරි වැඩ තහනම් කිරීමට තීරණය ගන්නා අවස්ථාවේදී ඔවුන් විසින් සලකා බැලිය යුතුව තිබූ රාජ්‍ය සේවකයින්ගේ විනය ක්‍රියාමාර්ග වලට අදාළ ආයතන සංග්‍රහයේ විධිවිධාන සලකා නොබලා අත්තනෝමතික ලෙස හා ද්වේශ සහගත ලෙස පොලිස්පතිවරයාගේ සහ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශ මත ක්‍රියා කරමින් තමන්ගේ රාජකාරි වැඩ තහනම් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව ස්වාධීනව ක්‍රියා නොකර උසස් නිලධාරීන්ගේ ඉල්ලීමට එකඟ වෙමින් පාක්ෂික තීන්දුවකට එළඹ ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී තිබේ.

ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ 48 වන පරිච්ඡේදයේ 27:7 වගන්තිය මෙසේ විධිවිධාන පනවා ඇත.

> (උපුටා ගැනීම) "රජයේ නිලධරයකුට විරුද්ධව අධිකරණ කටයුතු ආරම්භ කිරීමේ එක් පියවරක් වශයෙන් අදාළ නිලධරයා පොලිස් හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයකු හෝ විසින් අත් අඩංගුවට ගෙන ඇති අවස්ථාවක දී හෝ අධිකරණය ඉදිරියේ නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට පෙර රක්ෂිත බන්ධනාගාර

ගතකොට ඇති අවස්ථාවක දී හෝ එම නිලධරයාට එම කාලය ආවරණය වන පරිදි අනිවාර්ය නිවාඩු ලබාදිය යුත්තේ ය." (පැ. 45) (උපුටා ගැනීම අවසන්)

එම පරිච්ඡේදයේම 31 වගන්තිය වැඩ තහනම් කිරීමට අදාළ විධිවිධාන දැක්වේ. (පැ.46) ඒ අනුව 31:1 වගන්තියේ දැක්වෙන විෂමාචාරයන් පහළොවෙන් එකක් හෝ කිහිපයක් සිදුවී ඇත්නම් එවැනි අවස්ථාවකදී නිලධාරියෙකුගේ වැඩ තහනම් කිරීම සිදුකළ හැකිය. 31:1 වගන්තියෙහි විධිවිධාන කිහිපයක මෙසේ දක්වා ඇත;

"31:3. උක්ත 31:1 උපවගන්තිය ප්‍රකාරව යම් රාජ්‍ය නිලධරයකුගේ රාජකාරි වැඩ තහනම් කිරීමට තීරණයක් ගනු ලබන බලධරයකු විසින් එසේ ගනු ලැබූ තීරණයට පදනම් කොටගත් හේතූන් පැහැදිළිවත් හා නිශ්චිතවත් අදාළ ලිපි ගොනුවෙහි සටහන් කර තැබිය යුතු වන්නේය."

"31:4. සාමාන්‍යයෙන් රජයේ නිලධරයකුගේ වැඩ තහනම් කිරීම ඔහුට විරුද්ධව එල්ල වූ චෝදනා සම්බන්ධයෙන් කරනු ලැබූ මූලික විමර්ශනයකින් අනාවරණය වූ කරුණු මත සිදුවිය යුතුය."

"31:16. යම් නිලධරයකුගේ රාජකාරි වැඩ ඉහත සඳහන් උප වගන්තිවලින් නියම කර ඇති පරිදි තහනම් කළ නොහැකි වන්නා වූ, එහෙත් මූලික විමර්ශනයේ හෝ විධිමත් විනය ක්‍රියා පටිපාටියේ හෝ යහපත් තකා එම නිලධරයා ඔහුගේ නිල කාර්යයන්හි නියුක්ත නොවිය යුතු තත්ත්වයේ පවතින්නා වූ අවස්ථාවක දී එම නිලධරයා අදාළ අමාත්‍යාංශය තුළ ස්ථාන මාරුකිරීම හෝ යම් ආයතනයකට අනුයුක්ත කිරීම හෝ

ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ විධිවිධාන පරිදි ඔහු අනිවාර්යය නිවාඩු පිට තැබීම හෝ කළයුතු වන්නේය."

ඉහතින් දැක්වූ විධිවිධාන වල සඳහන් අයුරින් ලලිත් ජයසිංහ මහතාගේ රාජකාරි වැඩ තහනම් කිරීමට අදාළ කිසිදු කටයුත්තක් සිදු වී නොමැති බවට ලේකම් ආරියදාස කුරේ මහතාට පිළිගැනීමට සිදු විය. මේ අනුව සලකා බලන විට ජාතික පොලිස් කොමිෂන් සභාව පැමිණිලිකාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ වැඩ තහනම් කිරීමට තීරණය කිරීම ආයතන සංග්‍රහයේ විධිවිධාන වලින් සාධාරණීකරනය කළ නොහැකි අතර ආයතන සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් පොලිස් කොමිෂන් සභාව විසින් සිදුකර ඇත.

රාජ්‍ය නිලධාරියකුගේ වැඩ තහනම් කිරීමට අදාළ ආයතන සංග්‍රහයේ 27:8 සහ 27:9 වගන්ති පහත උපුටා දක්වා ඇත;

> "27:8 .පොලිස් දෙපාර්තමේන්තුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයකු හෝ විසින් අත්අඩංගුවට ගනු ලැබූ රජයේ නිලධරයකු එම අත් අඩංගුවෙන් නිදහස් කරනු ලැබ ඇති විටක දී ඔහු නැවත සේවයේ පිහිටුවිය යුතුය. එසේ වුව ද එම නැවත සේවයේ පිහිටුවීම මගින් විනය බලධරයා විසින් පැවැත්වීමට නියමිතව ඇති විධිමත් විනය පරීක්ෂණයට බාධාවක් ඇති වන්නේ නම් අදාළ චූදිත නිලධරයා නැවත සේවයේ නොපිහිටුවා ඔහුගේ වැඩ තහනම් කළ යුතුය.
>
> 27:9. නඩු පැවැරීමට පෙරාතුව රක්ෂිත බන්ධනාගාර ගතකොට ඇති නිලධරයකු ඇප පිට නිදහස් කර ඇති අවස්ථාවකදී එම නිලධරයා නැවත රාජ්‍ය සේවයේ පිහිටුවීම රජයේ සේවයේ

යහපතට අහිතකර නොවන්නේ යැයි විනය බලධරයා නිගමනය කරන අවස්ථාවක දී ඔහු නැවත සේවයේ පිහිටුවිය යුතුය. ඔහු නැවත සේවයේ පිහිටුවීම රජයේ සේවයේ යහපතට අහිතකර වන්නේ යයි විනය බලධරයා සෑහීමකට පත්වන්නේ නම් ඔහු තවදුරටත් අනිවාර්ය නිවාඩු මත තැබිය යුත්තේය. එසේම නිලධරයාට විරුද්ධව විධිමත් විනය ක්‍රියා පටිපාටියක් ආරම්භ කිරීමට විනය බලධරයා තීරණය කර ඇති අවස්ථාවක දී සේවයේ පිහිටුවීම එසේ පවත්වනු ලැබීමට අපේක්ෂිත විධිමත් විනය ක්‍රියා පටිපාටියට බාධාවක් වන්නේ නම් අවස්ථාවෝචිත පරිදි ඔහුගේ වැඩ තහනම් කළ යුතුය." (උපුටා ගැනීම අවසන්)

ඉහත වගන්තිවල සඳහන් අන්දමට විනය බලධරයා විසින් රාජ්‍ය සේවකයාගේ වැඩ තහනම් කිරීම සඳහා පියවර ගන්නේ නම් ඒ සඳහා හේතූන් දැක්වීම අවශ්‍ය කෙරේ. එම වගන්ති යටතේ හේතු නොදක්වා වැඩ තහනම් කිරීමේ හිමිකමක් විනය බලධරයාට නොලැබේ. නෛතික තත්ත්වය එසේ වුවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාගේ වැඩ තහනම් කිරීමේ දී ජාතික පොලිස් කොමිෂන් සභාව ඉහත වගන්තිවල දැක්වෙන අයුරින් වැඩ තහනම් කිරීම සඳහා ඔවුන් පෙළඹීමට හේතු වූ කරුණු කිසිවක් සඳහන් කර නැත.

ආයතන සංග්‍රහයේ XLVIII සහ 27:8 සහ 27:9 වගන්ති යටතේ ක්‍රියා කරමින් රාජ්‍ය සේවකයින්ගේ වැඩ තහනම් කිරීමට ක්‍රියා කළ හැක්කේ විනය බලධරයා විසින් එකී රාජ්‍ය සේවකයාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා අවස්ථාවකදී පමණි. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ජයසිංහ මහතාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා බවට සඳහන් කර ඇතත් අද වන තෙක් විනය ක්‍රියාමාර්ග සඳහා වූ විනය

පරීක්ෂණයක් පවත්වා අවසන් කර නොමැත. ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 27:8 සහ 27:9 උප වගන්ති අනුව යම් විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීම මාස දෙකක් ඇතුළත අවසන් කළ යුතු බවට විධිවිධාන පනවා ඇත. එසේ වුවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වන බවට සඳහන් කර ඇතත් එය ආයතන සංග්‍රහයේ ඉහතින් දැක්වූ විධිවිධාන වලින් නියම කර ඇති පරිදි අදාළ කාලසීමාව තුළ අවසන් කර නැතුවා පමණක් නොව අඩු තරමින් අද වනතෙක් එවැනි විමර්ශනයක් සිදුකර අවසන් කර නොමැත.

ලලිත් ජයසිංහ මහතාගේ වැඩ තහනම් කිරීමේ නිගමයට ජාතික පොලිස් කොමිෂන් සභාව එළඹ ඇත්තේ පොලිස්පතිවරයාගේ සහ අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශයන් සැලකිල්ලට ගැනීමෙන් බවට ආරියදාස කුරේ මහතා සාක්ෂියේදී පිළිගෙන ඇත. වැඩතහනම් කිරීමේ ලිපියේ (පැ-35) දෙවන ඡේදයෙහි සඳහන් කර ඇත්තේ " ඉහත සිද්ධියට අදාලව පොලිස්පති හා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ හා එකඟ වෙමින් 2017.07.20 වන දින රැස්වූ ජාතික පොලිස් කොමිෂන් සභාව ඔබගේ රාජකාරි වැඩ තහනම් කිරීමට තිරණය කරන ලදී." යනුවෙනි. මේ සම්බන්ධයෙන් එවකට පොලිස්පති පූජිත ජයසුන්දර මහතාගේ සහභාගිත්වයෙන් යුත් ජාතික පොලිස් කොමිෂන් සභාවේ රැස්වීම් වාර දෙකකදී දිර්ඝ වශයෙන් සාකච්ඡා කර වැඩ තහනම් කිරීමේ තීරණයට ජාතික පොලිස් කොමිෂන් සභාව එළඹුන බවට ලේකම් ආරියදාස කුරේ මහතා සඳහන් කර ඇත. මෙම

සාක්ෂියෙන් පැහැදිලිව ගම්‍ය වන්නේ පොලිස් කොමිෂන් සභාවේ ලේකම්වරයා මෙන්ම පොලිස් කොමිෂන් සභාවද පොලිස්පතිවරයාගේ ලිපිය මත හා ඔහුගේ නිර්දේශ මත පිහිටා කටයුතු කර ඇති බවත්, ස්වාධීන ආයතනයක් ලෙසට ස්ථාපිත කර ඇති පොලිස් කොමිෂන් සභාව විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාගේ රාජකාරි වැඩ තහනම් කිරිම සම්බන්ධව ස්වාධීන තීරණයකට ප්‍රවේශ වී නොමැති බවත්ය.

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ලලිත් ජයසිංහ මහතාගේ රාජකාරි වැඩ තහනම් කිරීමට තීරණය කිරීමේ දී එම තීරණය ආයතන සංග්‍රහයේ 31 වන වගන්තියේ අනුවගන්ති පහළොවෙන් කුමන වගන්තියන් යටතේ ද යන්න සඳහන් කළ යුතුව තිබූ නමුත් එවැනි හේතුවක් සඳහන් කර නොතිබීම තුළින් ආයතන සංග්‍රහයේ උක්ත වගන්තියේ දැක්වෙන්නේ විධිවිධාන ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් උල්ලංඝනය කර ඇති බවට එහි ලේකම් ආරියදාස කුරේ මහතා පිළිගත්තේය. ලලිත් ජයසිංහ මහතාගේ වැඩ තහනම් කිරීමට තමා ඔහුට එරෙහිව මූලික විනය පරීක්ෂණයක් නොපැවත්වූ බව ද ලේකම් ආරියදාස කුරේ මහතා පිළිගෙන ඇත.

එසේම ආයතන සංග්‍රහයේ 27:7 වගන්තියෙහි සඳහන් වන "රජයේ නිලධරයකුට විරුද්ධව අධිකරණ කටයුතු ආරම්භ කිරීමේ එක් පියවරක් වශයෙන් අදාළ නිලධාරියා පොලිස් හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයකු හෝ විසින් අත් අඩංගුවට ගෙන ඇති අවස්ථාවක දී හෝ අධිකරණය ඉදිරියේ නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට පෙර රක්ෂිත බන්ධනාගාර ගතකොට ඇති අවස්ථාවක දී හෝ එම නිලධරයාට එම කාලය ආවරණය වන පරිදි අනිවාර්ය නිවාඩු

ලබාදිය යුත්තේ ය.” යන විධානාත්මක රෙගුලාසිය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සලකා නොබලා අත්තනෝමතික ලෙස ලලිත් ජයසිංහ මහතාගේ රාජකාරී වැඩ තහනම් කර ඇත.

එසේම අනික් අතට ලලිත් ජයසිංහ මහතා වෙත එවන ලද වැඩ තහනම් කිරීමේ ලිපියේ පළමු ඡේදයේ පොලිස්පතිවරයා නිර්දේශ කළ කරුණ හැටියට සඳහන් කර ඇත්තේ ලලිත් ජයසිංහ මහතා සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා නීතිපතිවරයා විසින් අධිකරණයේ නඩු දමා ලලිත් ජයසිංහ මහතා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති බවය. ඒ අනුව මෙම කරුණු පැහැදිලිවම 27:7 වගන්තියේ සඳහන් වන කරුණු හා සම්පූර්ණයෙන්ම සමාන වේ. එසේ නම් එවැනි අවස්ථාවකදී ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පැහැදිලි ලෙසම කළ යුතුව තිබුණේ 27:7 වගන්තියේ සඳහන් අයුරින් ලලිත් ජයසිංහ මහතා අනිවාර්ය නිවාඩු යැවීමය.

පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් පසුව ඔහුගේ වැඩ තහනම් කිරීමක් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සිදු කර ඇත. එසේ වුවත් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සැකපිට අත්අඩංගුවට ගත් රජයේ නිලධාරීන්ගේ සේවය අත්හිටුවීම ආයතන සංග්‍රහය යටතේ සිදුකළ නොහැකි අතර සිදුකළ හැක්කේ එවැනි නිලධාරියෙකු අනිවාර්ය නිවාඩු යැවීමය. මේ අනුව ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන වලට පටහැනිව පැමිණිලිකරුගේ සේවය අත්හිටුවීම ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සිදුකර ඇත.

අධිකරණය මඟින් පැමිණිලිකරු ඇප මත මුදාහැරීමෙන් අනතුරුව නැවත සේවයේ පිහිටුවන ලෙසට පැමිණිලිකරු විසින් සිදු කරනු ලැබූ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති අතර සිදු කර ඇත්තේ පැමිණිලිකරුට

එරෙහිව අසත්‍ය කරුණු පදනම් කරගෙන මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ඉදිරිපත් කිරීමය. පැමිණිලිකරුගේ වැඩ තහනම් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් එළඹුණු තීරණය පොලිස්පති පූජිත් ජයසුන්දර විසින් 2017.07.21 වැනි දින ලිපියෙන් පැමිණිලිකරුට දැනුම් දී ඇත. එම ලිපිය පැ.34 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් එන්.ආරියදාස කුරේ විසින් පැමිණිලිකරුට එවා ඇති 2017.07.21 දිනැති ලිපියෙන් (පැ.35) පැමිණිලිකරුට දැනුම් දී ඇත්තේ විද්‍යා ශිෂ්‍යාව ඝාතනය කිරීමේ වරදට සම්බන්ධ පරීක්ෂණ කටයුතුවල දී උතුරු පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් කටයුතු කරමින් සිටි පැමිණිලිකරු ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ වරදක් සිදුකර ඇති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති බැවින්ද, එම සිද්ධියට අදාළව පොලිස්පති හා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ හා එකඟ වෙමින් 2017.07.20 දින රැස්වූ ජාතික පොලිස් කොමිෂන් සභාව පැමිණිලිකරුගේ රාජකාරි වැඩ තහනම් කිරීමට තීරණය කරන ලද බවය.

මෙවැනි අවස්ථාවකදී රජයේ නිලධාරියකුගේ රාජකාරිමය වැඩ තහනම් කිරීමට නීතිමය හැකියාවක් නොමැති බවට පෙන්වා දිය හැකි හොඳම උදාහරණය වන්නේ අපරාධමය චෝදනාවකට රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලැබූ පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාගේ වැඩ තහනම් නොකර ඔහු අනිවාර්ය නිවාඩු යැවීම තුළිනි.

පැමිණිලිකරුගේ රාජකාරී වැඩ තහනම් කිරීමෙන් පසුව 2017 ඔක්තෝබර් මස 9 වැනි දින පැමිණිලිකරු විසින්, ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙසට ඉල්ලීමක් කරමින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය පැ.36 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම අභියාචනයට පැමිණිලිකරුට පිළිතුරු නොලැබුණු බැවින්, පැමිණිලිකරු දෙවනවරටත් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය පැ.37 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.37 දරණ මෙම අභියාචනයෙන් පැමිණිලිකරු ඉල්ලා සිටියේ වෙනත් රජයේ සේවකයෙකුට මෙන්ම පැමිණිලිකරුහට ද බලපාන ආයතන සංග්‍රහයේ දෙවැනි කාණ්ඩයේ 27 ඡේදය ප්‍රතිපාදන අනුව කටයුතු සිදු විය යුතු බවට අවධාරණය කර දැනුම් දෙමිනි.

පැ.37 අභියාචනය ඉදිරිපත් කිරීමෙන් පසුව පැමිණිලිකරුට එරෙහිව රත්නපුර මහාධිකරණයේ අධිචෝදනා ඉදිරිපත් කෙරිණි. එසේම පැමිණිලිකරුගේ රාජකාරි වැඩ තහනම් කිරීම ඉවත්කර ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙසට කරනු ලැබූ ඉල්ලීමද ප්‍රතික්ෂේප කළ බවට, 2010.11.25 දිනැති පැ.38 ලිපියෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් විසින් දැනුම් දෙන ලදී. එම ලිපියෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්වරයා දැනුම්දී ඇත්තේ 2019.10.17 වැනි දින රැස්වූ ජාතික පොලිස් කොමිෂන් සභාව පොලිස්පතිගේ හා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ හා එකඟ වෙමින් ආයතන සංග්‍රහයේ 27;10:02 වගන්තියේ (සංශෝධිත) ප්‍රතිපාදන මත, විනය ක්‍රියාමාර්ග හා අධිකරණ කටයුතු අවසන් වන තෙක් පැමිණිලිකරු නැවත සේවයේ නොපිහිටුවීමට තීරණය කරන ලද බවය. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් එළඹ ඇති මෙම තීරණය ආයතන

සංග්‍රහයේ විධිවිධානවලට පැහැදිලිවම පටහැනිය. ආයතන සංග්‍රහයේ 27:08 වගන්තියට අනුව රජයේ සේවකයෙක් අත්අඩංගුවට ගෙන ඇප මත නිදහස් කළ විට වහා සේවයෙහි පිහිටුවිය යුතු බවට එම වගන්තියේ විධිවිධාන වලින් දැක්වේ. එසේ වුවත් ජාතික පොලිස් කොමිෂන් සභාව එවැනි නිගමනයකට එළඹ නැත. ජාතික පොලිස් කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන තුළ ස්වාධීන ආයතනයක් ලෙසට ක්‍රියාත්මකවූවා නම්, පොලිස්පතිවරයාගේ සහ ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශ හා එකඟ වෙමින් කොමිෂන් සභාව ක්‍රියා කිරීමේ අවශ්‍යතාවක් පැන නොනගී. ජාතික පොලිස් කොමිෂන් සභාවේ එම ක්‍රියා කලාපය පැහැදිලි ලෙසම දේශපාලන අවශ්‍යතාවක් උදෙසා එළැඹුණු නිගමනයක් බව පැහැදිලිය.

ලලිත් ජයසිංහ මහතාගේ රාජකාරි වැඩ තහනම් කිරීමෙන් පසුව විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික පරීක්ෂණ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පවත්වා නොමැති බව ලේකම් කුරේ මහතා පිළිගෙන ඇත. ඔහු සඳහන් කළේ පොලිස්පතිවරයා නිර්දේශ ඉදිරිපත් කරන විට ඔහු දන්නා අන්දමට පොලිස්පතිවරයා විසින් විශේෂ විමර්ශන ඒකකය (SIU) හරහා චෝදනා පත්‍රයක් කෙටුම්පත් කර එවන බවත්, එවිට විශේෂ විමර්ශන ඒකකය එක්තරා විදිහකට මූලික පරීක්ෂණයක් පවත්වන බවත්, ලේකම්වරයා සඳහන් කළේ ය. ලේකම්වරයාගේ මෙම ප්‍රකාශය තුළින් පැහැදිලි වන තවත් කරුණක් වන්නේ විශේෂ විමර්ශන ඒකකය (SIU) මගින් සිදු කරනු ලබන්නේ අපරාධ පරීක්ෂණ නොව විනය පරීක්ෂණ බවය.

බන්ධනාගාරය තුළ ඇතිවූ කැරැල්ලක් මැඩලීමේ දී සිදු වූ මරණ සම්බන්ධයෙන් පවරන ලද අපරාධ නඩුවක චෝදනා ලැබ සිටි මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ සේවයේ යෙදී සිටි පොලිස් පරීක්ෂක මෝසස් රංගජීව නෙවමාල් නැමැති නිලධාරියා බන්ධනාගාර ගත කිරීමේ හේතුවෙන් රාජකාරි වැඩ තහනමට ලක්ව සිට ඇත. එම නිලධාරියා නැවත ඇප මත මුදා හැරීමෙන් පසුව ඔහු නැවත සේවයෙහි පිහිටුවන්නට ජාතික පොලිස් කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර ඇත. ඊට ප්‍රතිචාර වශයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව ක්‍රියා කරමින් රංගජීව මහතා, විධිමත් විනය පරීක්ෂණයකට හා අධිකරණ ක්‍රියාවලිකට යටත්ව සහ හිඟ වැටුප් ගෙවීම විනය පරීක්ෂණ ක්‍රියාවලියෙන් පසුව තීරණය කිරීමේ කොන්දේසි වලට යටත්ව නැවත සේවයෙහි පිහිටුවා ඇත. මෙම නිලධාරියා නැවත සේවයේ පිහිටුවීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව සිදුකළ තීරණය දැනුම් දුන් 2019.12.26 දිනැති ලිපිය පැ.53 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මේ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ පොලිස් පරීක්ෂක නෙවමාල් රංගජීව මහතා නැවත සේවයේ පිහිටුවීම සඳහා තීරණය කිරීමේදී අනුගමනය කළ ක්‍රියා පිළිවෙත ලලිත් ජයසිංහ මහතා නැවත සේවයේ පිහිටු වන ලෙසට ඉල්ලා සිදුකරනු ලැබූ ඉල්ලීමේදී නොසලකා හැර ඇති අතර, අඩු තරමින් ඉදිරිපත් කළ අභියාචනාවත් සලකා නොබැලීම තුළින් ජාතික පොලිස් කොමිෂන් සභාව දෙයාකාරයකට ක්‍රියාකර ඇත. ලලිත් ජයසිංහ මහතා නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිදු කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කර විනය පරීක්ෂණයක් නොපවත්වා අද වන

තෙක් වැටුප් රහිතව රාජකාරි විරහිතව ලලිත් ජයසිංහ මහතාට ලබා ගැනීමට ඇති ආසන්නතම උසස්වීම වන පොලිස්පති පදවිය ලැබීමට සුදුසු තත්ත්වයක සිටින ජයසිංහ මහතාට හිමි උසස් වීම නොලැබෙන අයුරින් ජාතික පොලිස් කොමිෂන් සභාව කටයුතු කිරීම එක සමානව සැලකීමේ මූලික හිමිකම කඩ කිරීමකි.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ හිටපු ලේකම් කුරේ මහතා පැවසුවේ ලලිත් ජයසිංහ මහතාගේ වැඩ තහනම් කිරීම 2017 වර්ෂයේ සිදු කර මේ දක්වා විධිමත් විනය පරීක්ෂණයක් සිදු නොකිරීම ඉතාමත් ලොකු අභාග්‍ය සම්පන්න තත්ත්වයක් බවය.

පැමිණිලිකාර ලලිත් ජයසිංහ මහතාට එරෙහිව මෙම පරීක්ෂණ ආරම්භ කෙරෙන්නේ තුසිතා විජේමාන්න විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙත භාරදෙනු ලැබූ පැමිණිල්ලක් අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ සහකාර ධූරය දැරූ කේ.පී. දයාරත්න නැමැති විශේෂ සහායක විසින් පොලිස්පතිවරයා වෙත යොමු කිරීම මගිනි. අග්‍රාමාත්‍ය කාර්යාලයේ ව්‍යුහය දැක්වෙන ලේඛනයක් අන්තර් ජාලය ඔස්සේ ලබාගෙන පැ.58 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව පොලිස්පතිවරයා වෙත ලිපිය යොමු කළ කේ.පී. දයාරත්න නැමැත්තා රාජ්‍ය නිලධාරියෙකු නොවේ. ඔහු දේශපාලන පත්වීමක් ලැබූ පුද්ගලයෙකි. මේ අනුව පැහැදිලි ලෙසම දේශපාලන හස්තයක් විසින් පැමිණිලිකාර ලලිත් ජයසිංහට එරෙහිව පරීක්ෂණයක් ආරම්භ කරන ලෙසට දැන්වීම කර ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට එරෙහිව පවත්වනු ලැබූ එක් විනය පරීක්ෂණයකින් ඔහු නිදොස් කොට නිදහස් කර ඇති බවට ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2020.06.09

දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. එම ලිපිය පැ. 62 වශයෙන් සලකුණු කර ඇත.

තුසිතා විජේමාන්නගේ පැමිණිල්ලට අනුව ලලිත් ජයසිංහ මහතාට එරෙහිව විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබී ඇත. එයින් එක් විනය පරීක්ෂණයකින් ලලිත් ජය ජයසිංහ මහතා නිදොස් කොට නිදහස් කර ඇතත් අනෙක් විනය පරීක්ෂණ දෙක තවමත් කිසිදු පියවරක් නොගෙන අයාලේ යමින් පවතී.

2019.09.30 දිනින් යුතුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/ 2019 මගින් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සිදු කරන ලද සංශෝධනයන්ට (පැ.63) අනුව "යම් රජයේ නිලධරයෙකු යම් තනතුරකට අදාළ උසස් කිරීමේ විභාගයකට හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයකට හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකට පෙනී සිටීමට අවශ්‍ය සියලුම පූර්ව සුදුසුකම් සපුරා තිබිය දී වැඩ තහනම් කිරීම යන්න පමණක් ම පාදක කොට ගෙන අදාළ උසස් කිරීමේ විභාගයට හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයට හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකට පෙනී සිටීමට නුසුදුස්සකු නොවන්නේ ය." යනුවෙන් විධිවිධාන පනවා ඇත. මේ අනුව ලලිත් ජයසිංහ මහතා ඔහුගේ ඉදිරි උසස්වීම් සඳහා සලකා බැලීමට පූර්ණ සුදුසුකම් ලබා ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බී 116/15 වාර්තාවට වැඩිදුර වාර්තාවක් 2016.11.13 දින ඉදිරිපත් කර ඇත. එම වැඩිදුර බී වාර්තාව පැ.55 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම වැඩිදුර බී වාර්තාවේ අවසන් ඡේද 2 හි සඳහන් කර ඇත්තේ; "මෙම අපරාධය

සම්බන්ධව සිදුකරන ලද විමර්ශන කටයුතු අවසන් කර සැකකරුවන්ට විරුද්ධව නඩු පැවරීම සඳහා විමර්ශණ උධෘත යොමු අංක CR1/129/15 යටතේ 2016.07.11 වන දින නීතිපතිතුමා වෙත භාරදී ඇත. මෙතෙක් උපදෙස් ලැබී නොමැත. එබැවින්, නීතිපති උපදෙස් ලබාගෙන වාර්තා කිරිමට දිනයක් ලබාදෙන ලෙසත්, එතෙක් සැකකරුවන් සියළු දෙනා තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගතකරන ලෙසත්, ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.'' යනුවෙනි.

පැ.55 බී වාර්තාවේ සැකකරුවන් ලෙසට නම්කර ඇති ලැයිස්තුවෙහි ලලිත් ජයසිංහ මහතා සැකකරුවකු ලෙසට නම් කර නැත.

පැ.55 වැඩිදුර වාර්තාවේ පසු පිටෙහි සඳහන් කර ඇත්තේ; ''මෙම අපරාධය සිදුකිරීමෙන් පසු මෙම නඩුවේ 09 වෙනි සැකකරු මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් යන අය අපරාධයෙන් සිදුවී දින කීපයකට පසුව යම් රැකවරණයක් ලබාගැනීමේ අදහසින් පොලිස් නිළධාරීන්ට මුදල් ලබාදී ඇති බවට තොරතුරු ලැබී ඇත. එබැවින් පහත සඳහන් පුද්ගලයන්ගේ වත්කම් සහ බැංකු ගිණුම් පරික්ෂාකර විස්තර ලබා ගැනීමට අවශ්‍යව ඇත.... ...'' යනුවෙනි. එම පුද්ගලයින්ගේ නම් අතර ලලිත් ජයසිංහ මහතාගේ නමද සඳහන් කර ඇත.

ඒ අනුව 2016.11.13 දින ඉදිරිපත්කල පැ. 55 දරණ මෙම වැඩිදුර වාර්තාවෙන් ද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට විරුද්ධව මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් නැමැත්තාට පොලිස් අත් අඩංගුවෙන් මිදී පළා යාමට ආධාර හෝ අනුබල දීම පිළිබඳ චෝදනාවක් නගා නොමැත.

පැ.55 දරණ මෙම වැඩිදුර වාර්තාවෙ 3 වන ඡේදයෙහි සඳහන් කර ඇත්තේ "මෙම විමර්ශනයට අදාළව දැනට රක්ෂිත බන්ධනාගාර ගතව සිටින මෙම නඩුවේ 09 වැනි සැකකරු මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් යන අය අපරාධය සිදුකිරීමෙන් පසු කොළඹ ප්‍රදේශයට පලායාම සහ ඒ සඳහා ආධාර අනුබල දුන් පුද්ගලයින් සම්බන්ධව තවදුරටත් අනාවරණය කරගැනීමට අවශ්‍ය වී ඇත" යනුවෙන් පමණකි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකෙරුණු 19 වන සංශෝධනයෙන් පොලිස් කොමිෂන් සභාව නැවත ස්ථාපිත කර පිහිටුවීම සිදු කර ඇත. ඒ අනුව ජනාධිපතිතුමා විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් පත් කරනු ලැබ ඇත්තේ 2015-10-14 දිනදීය. මෙම කරුණු දැක්වෙන ජාතික පොලිස් කොමිෂන් සභා අන්තර්ජාල පිටුවෙන් ලබාගත් මුද්‍රිත පිටපතක් පැ.56 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ අනුව 2015 -10-14 දිනට ප්‍රථම පැවති තත්ත්වය වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු බලතල පවරනු ලැබූ ආකාරයට අදාළ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීමය. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.01.01 බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු බලතල පැවරීමක් සිදු කර ඇති අතර එම බලතල පැවරීම අනුව පොලිස්පතිවරයා විසින් නිකුත් කරනු ලැබූ 2327/2011 චක්‍රලේඛය පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගේ ස්ථාන මාරු කිරීම වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම සහ ආයතන

සංග්‍රහයේ XLIII වන පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ දක්වා ඇති වැරදි පිළිබඳ විනය පාලනය රාජ්‍ය ආරක්ෂක විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉටු කළ යුතු විය. මෙම චක්‍රලේය පැ.57 වශයෙන් ඉදිරිපත් කර ඇත.

මේ අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගේ විනය පාලනය කටයුතු රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට පවරා තිබූ බැවින් පොලිස්පතිවරයාට එම බලතල ක්‍රියාත්මක කිරීමට බලයක් නොමැත.

නියෝජ්‍ය පොලිස්පති ගමගේ කුමාරසිරි ලාල් පෙරේරා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශ තුනක් ද විශේෂ විමර්ශන ඒකකය වෙත තවත් ප්‍රකාශයක් ද සිදු කර ඇත. ඔහුගේ අවසාන ප්‍රකාශය සිදුකර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටය. ලාල් පෙරේරා මහතාගේ ප්‍රකාශ තුනෙහිම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් ජයසිංහ මහතා බලපෑම් කළ බවට කිසිදු සඳහනක් කර නොමැත. එවන් පසුබිමක මෙම අවසාන ප්‍රකාශය සටහන් කර ගැනීම සහකාර පොලිස් අධිකාරි එස්. තිසේරා විසින් සිදුකර ඇත. සිව්වන ප්‍රකාශය ලබා ගැනීමේදී එම ප්‍රකාශයට ප්‍රථම තවත් ප්‍රකාශ 3 ක් නියෝජ්‍ය පොලිස්පති ලාල් පෙරේරා විසින් සිදුකර ඇති බවට 4 වන ප්‍රකාශය සටහන් කරන අවස්ථාවේදී පොලිස් අධිකාරි තිසේරා විසින් ඒ බව එම ප්‍රකාශයේ සඳහන් කර නොමැත. මේ හේතුවෙන්, සහකාර පොලිස් අධිකාරි තිසේරා විසින් වාර්තා ගත කර ඇති ලාල් පෙරේරා මහතාගේ 4 වන ප්‍රකාශය බැලූ බැල්මට පෙනී යන්නේ ඔහුගේ පළමු ප්‍රකාශය ලෙසටය. මේ අනුව සහකාර පොලිස් අධිකාරි තිසේරා විසින් ලලිත් ජයසිංහ මහතාට අදාළ පරීක්ෂණ ලිපි ගොනුව ඒ අයුරින්

නීතිපතිවරයා වෙත යැවීමෙන්, නියෝජ්‍ය පොලිස්පති ලාල් පෙරේරා මහතා මීට පෙර ප්‍රකාශ තුනක් සිදුකර ඇති කාරණයත් එම ප්‍රකාශ තුනෙහිම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා බලපෑම් කළ බවට සඳහන් කර නොතිබීමත් යන කරුණු නීතිපතිවරයා විසින් අධිචෝදනා ඉදිරිපත් කිරීමට ප්‍රථම සලකා බැලීමට තිබූ ඉඩ ප්‍රස්ථාව ව්‍යාර්ථ කර ඇති අතර එමගින් සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතා නීතිපති දෙපාර්තමේන්තුව වෙත කරුණු වසන් කිරීමක් සිදුකර ඇත.

යාපනය නියෝජ්‍ය පොලිස්පති කුමාර ලාල් පෙරේරා මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් අත්අඩංගුවට ගැනීම සඳහා පිටත්ව ගොස් ඇත්තේ තමිල් මාරන් සමග ඔහුගේ වාහනයෙන් ය. සුදුසු තැනකට උතුරු පළාතේ පොලිසියේ විවිධ ව්‍යුහයන් අතර සම්බන්ධතාවය දක්වන ලේඛනයක් පැමිණිලි 70 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත . මේ අනුව ශ්‍රී ගජන් පොලිස් ස්ථානාධිපතිවරයා වශයෙන් රාජකාරි කළ අපරාධ විමර්ශන අංශය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිගේ සෘජු අධීක්ෂණය යටතේ ඇත. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් සිදු කරනු ලබන්නේ නියෝජ්‍ය පොලිස්පතිවරයා මගිනි.

තුසිතා විජේමාන්න මහත්මියට සහ හිටපු අමාත්‍ය තලතා අතුකෝරාල මහත්මියට පැමිණිලිකාර ලලිත් ජයසිංහට එරෙහිව ක්‍රියා කිරීමට ඔවුන්ට හේතු වූයේ ඔවුන්ගේ අවශ්‍යතාවයන් පරිදි පැමිණිලිකරුගෙන් කටයුතු සිද්ධ කරවා ගැනීමට නොහැකි වීමත් ඒ අනුව ඔවුන්ට අවශ්‍ය කටයුතු කරවා ගැනීම සඳහා හා ඔවුන්ට උපකාරීවන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු පත් කර ගැනීමේ අවශ්‍යතාවය ඔවුන්ට

තිබූ නිසා, පැමිණිලිකරු සඳහන් කළේ තමාට එරෙහිව නඩු පැවරීමේ ක්‍රියාවලිය පිටුපස විශේෂයෙන් තලතා අතුකෝරාළ හිටපු අමාත්‍යවරිය සිටින බවය. එක්සත් ජාතික පක්ෂ රජයේ අමාත්‍යවරුන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සහ පොලිස් අධිකාරී ශානි අබේසේකර සමග පවත්වන ලැබූ දුරකතන සංවාද පිළිබඳව සංයුක්ත තැටි සමාජ ජාලවලට මුදාහැරීමත් සමග මෙම කරුණු හෙළිදරව්වූ බව පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේ. ඒ අනුව එම කරුණ සනාථ කිරීම සඳහා හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වන රන්ජන් රාමනායක සමග අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා පවත්වන ලද දුරකතන සංවාදයක පටිගතකල සංයුක්ත තැටියක් පැ.71 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරමින් කොමිෂන් සභාව ඉදිරියේ වාදනය කරන ලදී.

එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා හිටපු නියෝජ්‍ය අමාත්‍ය රන්ජන් රාමනායක මහතා සමග පවත්වනු ලැබූ දුරකථන සංවාදයක සංයුක්ත තැටියද පැ.71 (අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. පැ.71 (ආ) දුරකථන සංවාදයේ දී විමර්ශනය කරන ලද නඩු සියල්ලෙහිම කරුණු රංජන රාමනායක මහතාට එවන බවට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සඳහන් කර ඇත.

මෙම කරුණු අනුව එක්සත් ජාතික පක්ෂ රජයේ මැති ඇමතිවරු එක් කණ්ඩායමක් ලෙසට එකතු වී ක්‍රියා කර ඇති බවක් පෙනෙන්නට තිබෙන බවත් තමාගේ නඩුවේ කරුණු ද ඒ අයුරින්ම අවශ්‍ය පුද්ගලයින්ට ලබාදීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ

නිලධාරීන් ක්‍රියාකර ඇති බවත් මෙම දුරකථන සංවාද වලින් පැහැදිලිව පෙනී යන බව පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

පැමිණිලිකාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාගේ පැමිණිල්ලේ සඳහන් චෝදනා වලට වගකිව යුතු පුද්ගලයන් ලෙසට නම් කරනු ලැබූ පුද්ගලයන් ගෙන් එක් පුද්ගලයෙකු වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරී බී.එස්.තිසේරා මහතාගේ සාක්ෂිය ඔහුගේ නීතිඥවරයා වන ඩේල් ගුණරත්න මහතා විසින් මෙහෙයවා ඇත.

තිසේරා මහතාගේ සාක්ෂියට අනුව 1987 වර්ෂයේදී උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් පොලිස් සේවයට බැඳුනු ඔහු, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 2010.06.07 දින ස්ථාන මාරු ලැබ පැමිණ ඇත. එදා සිට අද දක්වා ඔහු පොලිස් සේවයේ යෙදී සිටියදී සිදු කරනු ලැබූ සේවාව වෙනුවෙන් ලබන ද සහතික සහ ත්‍යාග 1වි සිට වි12 දක්වා සලකුනු කර ඉදිරිපත් කර ඇත.

මෙම සහතික ත්‍යාග කුමන පදනමක් මත වගඋත්තරකාර සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතාට ලබා දුන්නේද යන්න සනාථ කරන ලේඛන කිසිවක් නොමැත. ඇත්තේ සහතික සහ ත්‍යාග මුදල් වශයෙන් සඳහන් කර ඇති ලේඛන පමණි.

1වි සිට වි12 දක්වා වූ සහතික පත්‍ර සහ ත්‍යාගා ඉදිරිපත් කළ බැවින් ඒ පිළිබඳව සාක්ෂි වල දී ඉදිරිපත් වූ යම් කරුණු කිහිපයක් මෙහිදී සටහන් කිරීම මෙම ත්‍යාග වල යථා ස්වරූපය නිර්ණය කිරීමේ දී වැදගත් වේයැයි පෙනීයයි.

වගඋත්තරකාර තිසේරා මහතා සඳහන් කළ අන්දමටට කයිට්ස් පොලිස් වසමේ විද්‍යා දැරිය ඝාතනයේ දී පැහැරගෙන ගොස් ඝාතනය කිරීම සහ දූෂණය කිරීමට සම්බන්ධයෙන් කරන ලද යහපත් ක්‍රියාව වෙනුවෙන් පොලිස්පතිතුමා විසින් විශේෂ වැටුප් වර්ධකයක් සහ පොලිස්පති ප්‍රශංසාවක් පිරිනමා තිබෙන බවත් එය 2018.03.01 දිනයෙන් යුතුව සිදු කර ඇති බවත් එය සනාථ කිරීම සඳහා 1 වි 9 වශයෙන් එම සහතික ඉදිරිපත් කර ඇත.

ඔහුගේ සේවා කාලය තුළ දී ඔහුට එකතු අසාදු සටනක් පතක්වත් ලැබී නොමැති බවත්, මෙම කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට සිදුවීම දෛවයේ සරදමක් විය හැකියි බවට වගඋත්තරකරු සඳහන් කර ඇත.

2015.05.19 වගඋත්තරකරු තම නිවසේ සිටින විට එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කළ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නාගහමුල්ල මහතා දුරකථනයෙන් ඔහු අමතා හෙට දින යාපනයේ යාමට සූදානම්වෙන ලෙසත්, හොඳ ටීම් එකක් අරගෙන යන ලෙසටත් පවසා ඇත. කුමන කරුණක් නිසා යාපනයට යායුත්තේ ද යන්න තමන් විමසනු ලැබූ අවස්ථාවේදී අධ්‍යක්ෂකවරයා පවසා සිටියේ පාසල් ශිෂ්‍යයාවක් දූෂණය කර ඝාතනය කර ඇති බවත්, යාපනයේ නොසන්සුන්තාවයකට පත් වී ඇති බවත්, මේ පිළිබඳව පරීක්ෂණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සිදුකරන ලෙසට එවකට පොලිස්පති ඉලංගකෝන් මැතිතුමා දැනුම් දී ඇති බවත්, ඒ අනුව වගඋත්තරකරු මෙම පරීක්ෂණය සඳහා තෝරා ගත් බවත් අධ්‍යක්ෂක ඔහුට දැනුම් දී ඇත.

එම අවස්ථාවේදී තමා තෝරා ගත යුත්තේ කුමන නිලධාරීන් ද යන්න වගඋත්තරකරු අධ්‍යක්ෂකවරයා ගෙන් විමසා ඇති අතර සමූහ

මංකොල්ල අංශයේ නිශාන්ත ඇතුළු නිශාන්ත ටීම් එකක් ලෑස්ති කරගන්න යනුවෙන් අධ්‍යක්ෂවරයා පවසා ඇත.

එම අවස්ථාව වන විට අපරාධ පරීක්ෂණෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශය භාරව අධීක්ෂණ නිලධාරියා වශයෙන් ක්‍රියා කර ඇත්තේ පොලිස් අධිකාරී ශානි අබේසේකර මහතා බැවින් වගඋත්තරකරු තමාට ලැබුණු ප්‍රවෘත්තිය ශානි අබේසේකරට පවසා ඇති අතර ඒ අනුව පොලිස් පරීක්ෂක නිශාන්ත සමඟ 2015.05.20 වන දින යාපනයට ගොස් විද්‍යා ඝාතනය හා දූෂණය පිළිබඳ අපරාධය විමර්ශනය කිරීම භාරගත් බව සඳහන් කළේය.

ඒ අනුව මෙම විමර්ශනය සහකාර පොලිස් අධිකාරි තිසේරා ඇතුළු පිරිසට සිදු කරගෙන යාම සඳහා පොලිස්පතිවරයා විසින් සිදුකරනු ලැබූ 2015.05.23 දිනැති නියෝගය 1 වි 13 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම ලේඛනය පැ.22 ලෙසට සලකුණු කර ඉදිරිපත්කර ඇත. වගඋත්තරකරු සඳහන් කළේ පොලිස්පතිවරයාගේ ලිඛිත නියෝගය පසුව පැමිණි බවත් ඊට පෙර පොලිස්පතිවරයා විසින් පරීක්ෂණ පැවැත්වීම සඳහා වාචික නියෝගයක් ලබා දුන් බවත්ය. වගඋත්තරකරු එසේ සඳහන් කලත් පොලිස්පතිවරයා විසින් එවැනි වාචික නියෝගයක් නිකුත් කළ බව සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කළේ නැත.

විද්‍යා ඝාතන නඩුව ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඉදිරියේ විභාගයට ගැනීමෙන් පසුව විත්තිකරුවන් හත් දෙනෙකුට මරණ දඬුවම ද එක් විත්තිකරුවෙකු නිදහස් කර දැමීම ද අවසන් තීන්දුව වශයෙන් ප්‍රකාශිතව ඇත. පැමිණිල්ලටද අදාළ පුද්ගලයකු සහ විද්‍යා ඝාතන

නඩුවේ විත්තිකරුවකුද වන මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් නැමැත්තාටද මරණීය දණ්ඩනය හිමි වී ඇත.

විද්‍යා ඝාතන නඩුව ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින අවස්ථාවේදී නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් කුමාර රත්නම් මහතා විසින් 2017.07.14 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කරමින් මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් නැමැති සැකකරු අඩංගුවෙන් මිදී යාමට ඉඩ සැලැස්වීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා සහ උප පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන් යන දෙදෙනාට දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ අත්අඩංගුවට ගෙන අධිකරණය ඉදිරිපත් කර විමර්ශන ආරම්භ කරන ලෙසට දැනුම් දී ඇත. නීතිපතිවරයාගේ උක්ත සඳහන් ලිපිය 1 වි 14 වශයෙන් සලකුණු ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකාර සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතා මෙසේ සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම සාක්ෂි 50 පිටුව 2020.07.08) "2015.05.16 වන මැයි 10 වන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා විසින් යාපනයේ නියෝජ්‍ය පොලිස්පති ජී.කේ.පෙරේරා මහතාට නියෝගයක් කරනවා 2015.05.18 වන දින නීති පීඨයේ පීඨාධිපති කෙනෙක් එනවා ඕන් කියලා තියෙන්නෙ ඕන් එනවා දෙමළ දන්න නිලධාරියෙක් ලෑස්ති කරලා තියන්න කියලා. ඒ අනුව තමයි 2015.05.18 වන දින තමිල්මාරන් මහතාත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාත්, නියෝජ්‍ය පොලිස්පති යාපනය කාර්යාලයේ ඒ නිලධාරීන්

එක්ක සාකච්ඡා කරලා සුවිස් කුමාර් කියන පුද්ගලයා සම්බන්ධයෙන් තොරතුරු දෙන්න පුළුවන් රැගෙන එන්න පුලුවන් කියන එක මට පුන්කුඩුතිව් වලට ගිහිල්ලා මහලිංගම් ශෂිකුමාර් කියන පුද්ගලයාව රැගෙන එන්නේ. ඔවුන් යාමට පෙර පොලිස් පරීක්ෂක ඉරාන් විසින් එයා කයිට්ස් පොලිසියේ අපරාධ අංශයට අනුයුක්තව සිටින නිලධාරියා.”

“ස්වාමීනි ඊට පස්සේ සැකකරුව යාපනයට ගෙනාවට පස්සේ කොහොමහරි ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ උපදෙස් අනුව ඒ පුද්ගලයාගේ පැමිණිල්ලක් සටහන් කරලා ඒ කියන්නේ ඔහු පොලිසියට ආපු විදිහට පැමිණිල්ලක් සටහන් කරලා ඔහුගේ හිසේ තියෙනවා 2015-05-17 දින වේලනි වලදී ප්‍රදේශයේ මිනිස්සු මොහුව අල්ලලා පහර දීමක් කරනවා මේ විද්‍යා ඝාතනයට සැක කරලා. ඒ පහරදීම් වල සිරීම් තුවාල වගයක් තියෙනවා. ඒ තුවාල නිසා ඔහුට රෝහල් පතක් දීලා ඔහුව රෝහල්ට යවන්නේ නැහැ, GHT පතක් දීලා ඔහුව පොලිසියෙන් පිට කරනවා.”

“අනිවාර්යෙන්ම ස්වාමීනි 2015-05-19 දින පුන්කුඩිතිව් රැස්වීමේදී රැස්වීම් අතරමගදී තොරතුරක් ලැබෙනවා සුවිස් කුමාර කියන පුද්ගලයාව පලමුව ලැබෙන්නේ යාපනයෙන් මුදාහැරලා කියලා ඒ අවස්ථාවේදී සාමාන්‍ය වශයෙන් කැලඹීමක් ඇති වෙනවා ඒ රැස්වීමේදී. ඉන්පසුව නැවත තොරතුරක් ලැබෙනවා එතනදී වැල්ලවත්ත පොලිසියේ අත්අඩංගුවට පත්වෙලා ඉන්නවා කියලා. ඒ අවස්ථාවේදී මිනිස්සු ඔක්කොම ලොකුවට කැගැසීමක් ඇති කරනවා පොලිසියයි තමිල්මාරනුයි

මේ මුදල් අරගෙන තමයි මේ සැකකරුව පොලිසියෙන් යවලා තියෙන්නේ කියලා. ඒ වගේ ලොකු උද්ඝෝෂනයක් කරලා ඊට පස්සේ තමිල් මාරන්ට පහරදීමක් කරන්න සැලසෙනවා. ඊට පස්සේ කොහොමහරි ජ්‍යෙෂ්ඨ පොලිස්පතිතුමා ආමි එකයි නේවි එකයි STF එකේ නිලධාරීනුයි කැඳවලා කොහොමහරි එතැන ආරක්ෂාවක් සපයලා ඔහුව අරගෙන යන්න බැරි තත්ත්වයකට පත්වෙනවා. කොහොම හරි නාවික හමුදාව උපක්‍රමශීලීව වාහනයක දාගෙන නාවික හමුදා කඳවුරට ගිහිල්ලා එයත් එක්ක තව දෙන්නෙක් එනවා. ඔහුගේ රියදුරයි තව යමුනා කියලා කාන්තාවකුයි. ඒ කට්ටිය ඔක්කොම නාවික හමුදා කඳවුරට අරගෙන ගිහිල්ලා එදා රෑ එහේ ඉදලා පහුවදා ඒ කියා කියන්නේ 2015-05-20 දින මගේ මතකයේ හැටියට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ කන්කසන්තුරේ තියෙන බංගලාවට ඇවිල්ලා එදා එහේ ඉඳලා පසුවදා තමයි ආරක්ෂා සහිතව වවුනියාවට එනකම් ඔවුන් යොමු කරලා තිබුන බව තමයි විමර්ශනයේදී අනාවරණය වුණේ. "

සුරංගනා කතාවක් ලෙසට සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතා සඳහන් කළ ඉහත ප්‍රකාශ සනාථ කිරීම සඳහා කිසිදු ප්‍රකාශයක් හෝ ලේඛනයක් ඔහු ඉදිරිපත් කළේ නැත. ඔහුගේ සාක්ෂිය පැහැදිලි ලෙසම මුළුමනින්ම ඔහු විසින් අසා දැනගත් සාක්ෂියකිනුත් ඔබ්බට ගොස් ඇති බව පැහැදිලිය. එහි ඔහු දුටු හෝ ශ්‍රවණය කළ කිසිවක් සඳහන්ව නැත. යථා පරිදි සිදු කළ පරීක්ෂණයකින් පසුව නිසි පරිදි තහවුරු කරගත් සාක්ෂියක් බවට සනාථ කරන කිසිදු කරුණක් එහි අඩංගු නැත.

තිසේරාගේ සාක්ෂියෙදී සඳහන් වන අන්දමට තමිල් මාරන් ඉතා බරපතළ කාර්යභාරයක් සිදුකර ඇත. තමිල් මාරන් ක්‍රියාකර ඇත්තේ මහලිංගම් ශෂිකුමාර් අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාදාමයේ පුරෝගාමියා ලෙසටය. එසේ වුවත් එවැනි කාර්යභාරයක් ඉටුකළ තමිල් මාරන්ගේ ප්‍රකාශයක් තිසේරා විසින් සටහන් කරගෙන නොමැත. සිවිල් පුරවැසියෙකුවූ තමිල් මාරන් ඔහු නීති පීඨයේ පීඨාධිපති ලෙස ද හඳුන්වා දී ඇත. එවැනි පුද්ගලයකුට විද්‍යා සාතන නඩුවේ සැකකරුවෙකු ලෙසට නම් කරනු ලැබූ මහලිංගම් ශෂිකුමාර් නොහොත් සුවිස් කුමාර් සමග තිබූ සම්බන්ධය කෙබඳු ආකාරයක සම්බන්ධයක් ද යන්න තිසේරා විසින් පරීක්ෂා කර බලා තහවුරු කර ගෙන නැත. සුවිස් කුමාර් අත්අඩංගුවට පත් කිරීම සඳහා තමිල් මාරන් එතරම් වෙහෙසක් දැරුවේ ඔහුට තිබූ කෙබඳු ප්‍රයෝජනයක් මතද යන්න සහකාර පොලිස් අධිකාරි තිසේරා විසින් තමිල් මාරන්ගෙන් ප්‍රශ්නකර විමසා සොයා බලා නැත.

වගඋත්තරකරු සඳහන් කළ අන්දමට කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට කිලෝමීටර් තුනක් පමණ ආසන්න වෙද්දී ඔවුන් ගමන් ගත් වෑන් රථය බෝක්කුව අසලදී අනතුරට භාජනය වී ඇත. එම අවස්ථාවේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා බෙහෙවින්ම බියට පත්වී ඇති අතර කෑ ගසා ඇත. වගඋත්තරකරු එම අවස්ථාවේදී ඒ විගසම වාහනයෙන් බැස ඇත. ජයසිංහ මහතා වාහනයෙන් එළියට ගෙන නොමැති අතර ඔහු වාහනය තුළම රඳවා තිබී ඇත. වගඋත්තරකරු සඳහන් කළේ වාසනාවකට වාහනය එලෙස නතර වී තිබූ බවත් වාහනය පෙරලුනානම් ඔවුන්ට ලොකු ඩැමේජ් එකක් වෙන්නට ඉඩ තිබුණ බවත්ය. බෝක්කුව මත තිබූ කණු හතරක්

කැඩී ගොස් තිබූ බවත්, වාහනයේ ඉදිරිපස ටයරය පුපුරා ගොස් තිබූ බවත්, වාහනයට ගොඩක් ඩැමේජ් වෙලා තිබුණු බවත් වගඋත්තරකරු සඳහන් කළේය.

ඒ සමගම එස්.ටී.එෆ් වාහනය අනතුර සිදු වූ ස්ථානයට පැමිණ ඇති අතර අමරකෝන් නැමැති නිලධාරියෙකු පැමිණ "සර් මොකක් හරි ප්‍රශ්නයක්ද" යනුවෙන් තිසේරාගෙන් විමසා ඇත. "නැහැ නැහැ මුකුත් ප්‍රශ්නයක් නැහැ" යනුවෙන් පිළිතුරු දුන් පසුව එම නිලධාරියා නැවතත් "තුවාලද" යනුවෙන් විමසා ඇති අතර එවිට "තුවාල නැහැ " යනුවෙන් තිසේරා මහතා පිළිතුරු දී ඇත.

අනතුරට පත් වාහනයෙන් වහා බැසගත් වගඋත්තරකාර තිසේරා මහතා එම වාහනය තුළ තිබූ පොත්පත් එස්.ටී.එෆ් රථයට මාරු කිරීමට යුහුසුලුව ක්‍රියා කර ඇත. එසේම කයිට්ස් පොලිස් ස්ථානාධිපතිවරයාට දැනුම්දී ඔහු අනතුර සිදු වූ ස්ථානයට ගෙන්වාගෙන ස්ථානාධිපතිවරයාගේ වාහනයට ලලිත් ජයසිංහ මහතා නංවාගෙන කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණය බලා නැවත ගමන් ආරම්භ කර ඇත.

වගඋත්තරකාර තිසේරා මහතාගේ සාක්ෂි අනුව පැහැදිලිව පෙනී යන්නේ රිය අනතුරට පසුව ඔහු කඩිනමින් අනතුරුට පත් රිය තුළ තිබූ පොත්පත් වෙනත් රථයකට මාරු කර කයිට්ස් පොලිස් ස්ථානාධිපතිවරයාගේ රථයෙන් යුහුසුලුව ජයසිංහ මහතා ද රථයට නංවාගෙන කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණය බලා ගමන් ඇරඹීමය. ඒ අනුව වගඋත්තරකාර තිසේරා තම භාරයේ සිටි සැකකරුවකු වන ලලිත් ජයසිංහ මහතාට රිය අනතුරින් තුවාල සිදුවූයේ ද යන්න සොයා බලා ඒ සඳහා නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට උත්සුක වී නැත.

එසේම රිය අනතුරෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලලිත් ජයසිංහ මහතාගේ ශරීර අභ්‍යන්තර තුවාල සිදු වූයේද? ශරීර අභ්‍යන්තර ලේ වහනයක් සිදු වී ඇත්ද යන්න පරීක්ෂා කර ඒ සඳහා නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට ජයසිංහ මහතා වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් කිරීම පැහැර ඇත.

අත්අඩංගුවට ගත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා යාපනයට ගෙන යන අවස්ථාව වන විට යාපනය ප්‍රදේශය බෙහෙවින්ම කලබලකාරී තත්ත්වයක තිබී ඇත. වගඋත්තරකරු සඳහන් කළ අන්දමට සුවිස් කුමාර් මුදාහැරීම සම්බන්ධයෙන් යාපනය ප්‍රදේශයේ ලොකු ආන්දෝලනාත්මක සිදුවීමක් සිදුවී තිබී ඇත. යාපනය උසාවියට පහරදී අලාභහානි කර තිබී ඇත. පොලිසියට පහර දී තිබී ඇත. කයිට්ස් වල තිබූ සැකකරුවන්ගේ ගෙවල් ගිනි තබා ඇත. ජන ජීවිතය සම්පූර්ණයෙන්ම අඩාල වී තිබී ඇත. වගඋත්තරකරුගේ මතකයේ හැටියට 2015-05-20 දින සවස ඔහු යාපනයට යන විට යාපනයට ඇඳිරි නීතිය දමා තිබුණා මෙන් තිබී ඇත. එස්.ටී.එෆ් සහ පොලිසිය පමණක් පාරවල් වල සිට ඇත.

මෙවන් භයානක තත්ත්වයක් යාපනය ප්‍රදේශයේ පැවතියත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා කයිට්ස් මහේස්ත්‍රාත් උසාවිය වෙත මහේස්ත්‍රාත්වරයා කයිට්ස් බල ප්‍රදේශයේ නොමැති බව දැන දැනත් කයිට්ස් මහේස්ත්‍රාත් උසාවිය දක්වා ගමන් කර ඇත.

එසේම අනෙක් අතට මෙවන් කලබලකාරී අවස්ථාවකදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ආසන්නතම මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර සුදුසු නියෝගයක් ලබා ගන්නවා වෙනුවට අනාරක්ෂිත

ප්‍රදේශයකට වගඋත්තරකරු විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා රැගෙන ගියේ කුමන පරමාර්ථයක් උදෙසා ද යන්න දන්නේ ඔහු පමණි.

වගඋත්තරකාර තිසේරා මහතා යාපනයේ පැවතුන කලබලකාරී තත්ත්වය පිළිබඳව පුන පුනා සඳහන් කරමින් වැඩිදුරටත් මෙසේ ප්‍රකාශ කර ඇත. ඔහු සඳහන් කළ වචනයෙන්ම එම කරුණ සඳහන් කරන්නේ නම්; "යාපනය ප්‍රදේශයේ ඒ වනවිටත් සුවිස් කුමාර් මුදාහැරීම සම්බන්ධයෙන් ව්‍යාකූල තත්ත්වයක් තමයි තිබුනේ. මම කලින් සඳහන් කලා උසාවියට පහරදීලා, පොලිසියට පහරදීලා, ගෙවල් ගිනිතියලා ඒ වගේ ලොකු සිදුවීම් ගණනාවක් වෙලා තිබුනා ඒ වනවිට. එතකොට අපට යම් සැකයක් තිබුනා දැන් ලලිත් ජයසිංහ මහතාව අත්අඩංගුවට අරගෙන ඒ චෝදනා මත කයිට්ස් වලට යනකොට නැවතත් මේ වගේ සිදුවීම් ඇතිවෙන්න පුලුවන් එහෙම වුනොත් ලලිත් ජයසිංහ මහතාට යම් අනතුරක් වෙන්නත් පුලුවන් ඒක නිසා ඒ සැකය මත තමයි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා විශේෂ කාර්ය බලකාය කැඳවලා ඒ ආරක්ෂාවත් එක්ක අපි පිටත්වුනේ" .

මේ අනුව, විශේෂ කාර්ය බලකාය ද රැගෙන රාත්‍රී කාලයේ දී ජයසිංහ මහතා ද රැගෙන තිරිංග පද්ධතිය යථා පරිදි ක්‍රියා නොකරන වාහනයක ජයසිංහ මහතා නංවාගෙන ඔහුගේ ජීවිතයට හානියක් විය හැකි යැයි විශ්වාස කළ ප්‍රදේශයකට ජයසිංහ මහතා රැගෙන යාමට වගඋත්තරකාර තිසේරා ක්‍රියා කළේ කුමන කරුණක් නිසාද?

එසේම, ලලිත් ජයසිංහ මහතාගේ ජීවිතයට හානියක් විය හැකි කලබලකාරී පරිසරයක් යාපනයේ නිර්මාණය වී ඇති බවට තිසේරා එලෙස විස්තර කරමින්ම, ජයසිංහ මහතාගේ ජීවිතයට අනතුරක් වන

පරිද්දෙන් නීතියේ සඳහන් විධිවිධාන පරිදි ජයසිංහ මහතා අසන්නතම මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් නොකරමින් ජයසිංහ මහතාගේ ජීවිතයට හානි වන අන්දමේ අනතුරක ඔහු තබාගෙන යාපනය පසු කර කයිට්ස් දක්වා ඔහු රැගෙන ගියේ කුමන කරුණක් නිසාද? යන ප්‍රශ්න වගඋත්තරකාර තිසේරා විසින් නිරුත්තරව කොමිෂන් සභාව ඉදිරියේ ඉතිරි කර තබා ඇත.

සහකාර පොලිස් අධිකාරී තිසේරා පවසන පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සතුව ඇති හොඳම වාහනය වන බෙන්ස් රථයෙන් ජයසිංහ මහතා රැගෙන කොළඹින් පිටත් වූවත්, පැය 19.35 ට පමණ සීදූව ප්‍රදේශයේ දී එම වෑන් රථයේ ඉදිරිපස රෝදයක ශබ්දයක් ඇසී රිය නතර කර ඇත. ඉන්පසු ගරාජයකට ගෙනගොස් වාහනය පරීක්ෂා කර බලා ඇති අතර වාහනයේ රෝදයක තිරිංග තදවී ලිහිල් නොවන තත්ත්වයකට පත්ව තිබී ඇත. ඉන්පසු රෝදය ගලවා තෙල් දමා තදවී තිබූ තිරිංග බුරුල් කර නැවත ගමනාරම්භය කර ඇත.

මේ අනුව සැකකරුවකු වශයෙන් තම භාරයට ගත් ලලිත් ජයසිංහ මහතා රැගෙන යන වාහනයේ ඉදිරිපස රෝදයක තිරිංග අකාර්යක්ෂම වීම කරණ කොටගෙන, දිගු ගමනක යෙදෙන මෙම වාහනය එවැනි තිරිංග අකාර්යක්ෂම වීමක් හේතු කොටගෙන යම්කිසි අවස්ථාවක වාහනය අනතුරකට ලක් විය හැකි බවට දැනුමක් තිසේරාට නොතිබුනා යයි පිළිගැනීමට තරම් කරුණු කිසිවක් ඉදිරිපත්ව නොමැත. එසේම මෙවැනි තිරිංග අකාර්යක්ෂම වීම්වලට භාජනය වන වාහනයක් කිනම් අවස්ථාවක හෝ අනතුරකට ලක් විය හැකි බව වාහන පදවන ඕනෑම රියදුරෙකුගේ සාමාන්‍ය දැනුම් තුළ ඇති කරුණකි. රස පරීක්ෂකවරයාගේ වාර්තාව (1 වි 15) අනුව අනතුරට

හේතුව වාහනයේ තිරිංග අකාර්යක්ෂමවීමය. තිසේරා මහතාගේ මෙම සාක්ෂි සමස්තයක් වශයෙන් සලකා බලන විට තිරිංග අකාර්යක්ෂමවීමේ දෝෂයක් පැවති වාහනයක, එවැනි දෝෂයක් ඇති බව දැනම ලලිත් ජයසිංහ මහතා එම වාහනයේ නංවාගෙන යාපනය දක්වා ගමන් ඇරඹීම කුමන හේතුවක් මත සිදු කළේ ද යන්න පිළිබඳ දැනුම ඇත්තේ තිසේරා මහතාටම පමණකි. එම කරුණු කොමිෂන් සභාවට පැහැදිලි කළ යුතුව තිබූ කරුණු වුවත් ඔහු එවැනි පැහැදිලි කිරීමක් සිදු කර නොමැත.

කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණීමට පෙර පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් මහේස්ත්‍රාත්වරයා වෙත දුරකථනයෙන් කතා කර ලලිත් ජයසිංහ මහතා අත්අඩංගුවට ගත් බවත්, අධිකරණයට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව තිබෙන බවත්, දැනුම් දුන් අතර එම අවස්ථාවේදී මහේස්ත්‍රාත්වරයා 2017.07.16 දින නිවාඩු යන බවත් ඊට පෙර උදෑසන තෙක් සිටින බවත් ඊට පෙර රැගෙන එන ලෙසටත් දැනුම් දුන් බවට තිසේරා මහතා තම සාක්ෂියේදී සඳහන් කළේය.

කයිට්ස් පොලිස් ස්ථානාධිපති ධර්මදාස මහතා තම සක්ෂියෙදී සඳහන් කළේ 2017.07.15 වන දින සවස 7.00ත් 7.30ත් අතර කාලය තුළදී කයිට්ස් මහේස්ත්‍රාත්වරයා කයිට්ස් පොලිස් ස්ථානය අසලට පැමිණ වැඩ බලන මහේස්ත්‍රාත් සබේෂන් මහතාට වැඩ බාර දී තම සේවා කලාපයෙන් පිටතට යන බවට දැනුම් දී ඉදිරිපත් කරන සැකකරුවෙකු නල්ලූර් වල සිටින වැඩබලන මහේස්ත්‍රාත් සබේෂන් මහතාට ඉදිරිපත් කරන ලෙසටත්, ඒ අනුව මහේස්ත්‍රාත්වරයා කයිට්ස් වල නොමැති බවට වූ එම පණිවිඩය සහ ඒ වෙනුවට නල්ලූර් වල සිටින සබේෂන් මහතා මහේස්ත්‍රාත්වරයා වෙනුවෙන් වැඩ බලන රාජකාරිය ඉටු කරන

බවටත් වූ පණිවිඩය එම අවස්ථාවේදීම සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතාට දැනුම් දුන් බවය.

මහේස්ත්‍රාත්වරයා තම බල ප්‍රදේශයෙන් පිටතට ගොස් ඇති බැවින් වැඩබලන මහේස්ත්‍රාත් සබේසන් මහතා යාපනය නල්ලූර් කෝවිල් අසල නිවසේ වාසය කරන බවට පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා විසින් තිසේරා මහතාට දැනුම් දී තිබීම කරණකොටගෙන ලලිත් ජයසිංහ මහතා ඉදිරිපත් කළ යුතු වන්නේ යාපනය නල්ලූර් කෝවිල අසල පදිංචි වැඩබලන මහේස්ත්‍රාත් සබේසන් මහතාට බව යාපනය බලා යන ගමන පටන් ගන්නා අවස්ථාවේදීම තිසේරා හොඳින්ම දැන සිටියේය. එසේ වුවත් එවැනි දැනුමක් තිබියදී යාපනය නල්ලූර් කෝවිල් අසල පදිංචි වැඩබලන මහේස්ත්‍රාත්වරයා වෙත ලලිත් ජයසිංහ මහතා ඉදිරිපත් නොකර මහේස්ත්‍රාත්වරයා නොමැති කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට ලලිත් ජයසිංහ මහතාට ඉදිරිපත් කිරීම සඳහා තිසේරා රැගෙන ගොස් ඇත.

පැවතුණු කරුණු එසේ වුවත් තම සාක්ෂියේ දී තිසේරා මෙම කරුණු හෙළිදරව් කළේ නැත. කයිට්ස් මහේස්ත්‍රාත්වරයා නොමැති බව පොලිස් පරීක්ෂක ධර්මදාස විසින් දැනුම් දුන් බවට වූ කාරණය තිසේරා හෙළිදරව් කර නැත. රිය අනතුර සිදු වූයේ යාපනය පසුකර කයිට්ස් බලා යන ගමනේ දීය. මේ අනුව මහේස්ත්‍රාත්වරයා නොමැති බව දැන දැනත් කයිට්ස් ප්‍රදේශයට ලලිත් ජයසිංහ මහතා රැගෙන ගියේ කුමන කරුණක් අරභයා ද යන්න හොඳින්ම දන්නේ තිසේරා පමණි. එබැවින් තිසේරා විසින් මෙම බරපතළ සැකසහිත කාරනය පැහැදිලි කළ යුතුව තිබූ නමුත් එම පැහැදිලි කිරීම් තිසේරා විසින් මග හැර ඇත.

ලලිත් ජයසිංහ මහතා වැඩබලන මහේස්ත්‍රාත්වරයා ඉදිරියට ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී රිය අනතුරින් ඔහුගේ ඇඟ රිදෙන බවට ඔහු වැඩබලන මහේස්ත්‍රාත්වරයා ප්‍රකාශර ඇත. වැඩබලන මහේස්ත්‍රාත්වරයා ද්‍රවිඩ භාෂාවෙන් සටහන් තැබූ බවත් එබැවින් ලලිත් ජයසිංහ මහතා මහේස්ත්‍රාත්වරයට සිදුකළ ප්‍රකාශය ඔහු වාර්තා ගත කළේද යන්න දැන ගැනීමට හැකියාවක් නොමැති බවත් සඳහන් කළේය. මේ අනුව ලලිත් ජයසිංහ මහතා මහේස්ත්‍රාත්වරයාට රිය අනතුරින් තම ඇඟ රිදෙන බවට සඳහන් කළ ප්‍රකාශය තිසේරා මහතා ශ්‍රවණය කළ බැවින් ලලිත් ජයසිංහ මහතාට ප්‍රතිකාර ලබාදීම සඳහා සුදුසු ඉල්ලීමක් මහේස්ත්‍රාත්වරයාට සිදුකර ඒ අනුව ක්‍රියා කළ යුතුව තිබුණි තිබුණි. නමුත් තිසේරා මහතා එම අවස්ථාවේදීද තම නෛතික යුතුකම වූ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම පැහැරහැර ඇත.

රිය අනතුරෙන් ලත් තුවාල වලට ප්‍රතිකාර නොකිරීමත්, ලලිත් ජයසිංහ මහතාට නිසි පරිදි සැලකීමට අපොහොසත් වීමත් යන චෝදනා යටතේ ලලිත් ජයසිංහ මහතාගේ භාර්යාව විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කර ඇත. එම පැමිණිල්ල (1 වි 16) මානව හිමිකම් කොමිෂන් සභාවෙන් විමර්ශනය කර ඇත.

කටුනායක ගුවන් තොටුපලේ දී ශ්‍රී ගජන් අත්අඩංගුවට නොගැනීම පිළිබඳව කාරණය සම්බන්ධයෙන් තිසේරා මහතා මෙසේ සඳහන් කළේ ශ්‍රී ගජන්ට කටුනායක ගුවන්තොටුපලේ දී පොඩි බාධාවක් කළ බවය. ඒ හැර අත්අඩංගුවට ගැනීමක් සිදු කර නොමැත. ඒ වන විටත් ශ්‍රී ගජන් සැකකරුවකු ලෙසට හඳුන්වා පරීක්ෂණ පැවැත්වීම් ආරම්භ කර තිබී ඇත. ඔහු සඳහන් කළේ සැකකරුට පළායාමට යම් ආධාරයක් උපකාරයක් කළ බව තමන්ට එම පරීක්ෂණයේ දී නිරීක්ෂණය වූ

බවයි. සහකාර පොලිස් අධිකාරි තිසේරා විසින් කරුණු කෙසේ සඳහන් කළත්, ශ්‍රී ගජන් කටුනායක ගුවන් තොටුපලට පැමිණි පසුව කටුනායක ගුවන් තොටුපළින් දැනුම් දීම සිදු කරන්නේ තිසේරාටය. ගුවන්තොටුපලින් ඒ අයුරින් දැනුම්දීමක් තිසේරා වෙත සිදු කරන්නේ කුමන කරුණක් නිසාද යන්න පිළිබඳ දැනුම ඇත්තේ තිසේරාට පමණි. තිසේරා විසින් පැහැදිලි කිරීමක් සිදු නොකරන බැවින් පැමිණිය හැකි නිගමනය වන්නේ ශ්‍රී ගජන් ගුවන්තොටුපලින් විදේශ ගතවීමට පැමිණිය හොත් ඒ බව තමන්ට දැනුම් දෙන ලෙසට ඔහු විසින් ගුවන්තොටුපල දැනුවත් කර තිබූ බැවින් බවය. එබැවින් ශ්‍රී ගජන් විදේශගත වීම සඳහා ගුවන්තොටුපළට පැමිණි බවට තිසේරා මහතාට දැනුමෙන් දීමෙන් පසුව ඔහු විසින් ශ්‍රී ගජන් අත්අඩංගුවට නොගෙන මුදාහැරීම තුළින් පැහැදිලි වන්නේ ඔවුන්ගේ ඉලක්කය වී තිබුණේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා බවය.

එසේම ශ්‍රී ගජන් අත්අඩංගුවට නොගැනීමට තවත් ප්‍රබල හේතුවක් තිබී ඇත.

සැකකරුට පළායාමට ශ්‍රී ගජන් ආධාර උපකාර කළ බවට තමන්ට නිරීක්ෂණය වුණු බවට තිසේරා මහතා සඳහන් කළත් ඔහු ඒ බව නීතිපතිවරයාට දැනුම් දුන්නේ ද යන්න පිළිබඳව දැනුමක් නොමැති බවත් ඒ පිළිබඳව දැනුම ඇත්තේ විමර්ශන නිලධාරියාට බවත් පවසමින් තම වගකීමෙන් මිදීමේ උත්සාහයක යෙදී ඇත. මේ සම්බන්ධව අසන ලද ප්‍රශ්න වලින් මිදීමේ උත්සාහයක යෙදුණු තිසේරා මහතා එක් අවස්ථාවකදී සඳහන් කළේ නඩු පැවරීම සම්බන්ධයෙන් නීතිය නොදැන ඔහු ක්‍රියා කරන බවයි. කෙසේ වෙතත් අවසන් වශයෙන් ඔහු සඳහන් කළේ ශ්‍රී ගජන් කටුනායක ගුවන්

තොටුපළට පැමිණෙන අවස්ථාව වන විට ඔවුන් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ මේ සම්බන්ධයෙන් වරින්වර සිදු කළ සාකච්ඡාවල දී යම් විධියකට නිරීක්ෂණය වූ බවයි.

රිය අනතුරින් තුවාල ලබා සිටි ජයසිංහ මහතාට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා තිසේරා උනන්දු වී නොමැති අතර ඔහු තම රාජකාරිමය සහ නීතිමය යුතුකම් පැහැරහැර ඇත. මේ සම්බන්ධයෙන් ලලිත් ජයසිංහ මහතා තම සාක්ෂියෙහි සඳහන් කළේ "මම කිව්වා මට වෛද්‍ය ප්‍රතිකාර අරන් දෙන්න, වෛද්‍යවරයෙකු වෙත ගෙනියන්න, කියලා සහකාර පොලිස් අධිකාරී තිසේරා එය නෑසුනසේ හිටියා," යනුවෙනි. මේ සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරි තිසේරා එකිනෙකට පරස්පර විරෝධී සාක්ෂි දෙකක් ලබාදී ඇත.

ලලිත් ජයසිංහ මහතා වැඩබලන මහේස්ත්‍රාත්වරයා ඉදිරියට ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී සිදුකරන ලද කරුණු දැක්වීමක් පිළිබඳව සහකාර පොලිස් අධිකාරී තිසේරා 2020.07.08 දින ප.ව. 1.30 ට (4 පිටුව) තම සාක්ෂියේදී මෙසේ සඳහන් කර ඇත;

> "ඉන් පස්සේ මහත්මයා කතා කළා එවෙලෙ. ජයසිංහ මහත්තා කතා කරලා කිව්වා අනතුරක් වුණා. මගේ ඇඟ ටිකක් රිදෙනවා කියලා කිව්වා. ඒ එක්කම මහත්තයාගේ හිතවතුන් කට්ටියක් කිව්වා ඒ අනතුර වෙලාවේ ඡායාරූප ගත්තා. මම ඒකට බාධාවක් කරන්න ගියේ නැහැ. ඒ ඡායාරූප ජංගම දුරකථනවලින් වැඩබලන මහේස්ත්‍රාත්තුමාට පෙන්නුවා,"

සහකාර පොලිස් අධිකාරි තිසේරාගේ මෙම සාක්ෂියෙන් පැහැදිලිවන වන කරුණ වන්නේ ලලිත් ජයසිංහ මහතා කයිට්ස් බලා පැමිණෙන

ගමනේදී රිය අනතුරකට භාජනය වූ බවයි එය තහවුරු කිරීම සඳහා ඡායාරූප පෙන්වා ඇති බවත් ලලිත් ජයසිංහ මහතාගේ ඇඟ රිදෙන බවත්ය. ඊනැම අනතුරකදී අභ්‍යන්තර සහ බාහිර තුවාල දෙවර්ගයම සිදු වන බවත්, මෙම ඇඟ රිදීම අභ්‍යන්තර තුවාල අනුව සිදුවුවා යන්න සහකාර පොලිස් අධිකාරි තිසේරා ඔහුගේ පොලිස් රාජකාරි දිවියේ පළපුරුද්ද අනුව අනිවාර්යෙන්ම අවබෝධ කරගත යුතුය.

මෙයට ප්‍රතිවිරුද්ධ සාක්ෂියක් එදින එම වෙලාවේදීම තිසේරා මහතා ලබා දී ඇත. (30 පිටුව)

> (උපුටා ගැනිම)"මම මහත්තයගෙන් ඇහුවා තුවාල තියෙනවද කියලා. මහත්තයා අතින් අල්ලල බලලා කිව්වා එහෙම තුවාල කිසිවක් නැහැ කියලා. වාහනයෙන් බැස්සාට පස්සේ මම ඇහුවා සර් මුකුත් ප්‍රශ්නයක් තියෙනවද කියලා. නැහැ තිසේරා ප්‍රශ්නයක් නැහැ කියලා කිව්වා. එතකොට මහේස්ත්‍රාත්තුමාට එහෙම කම්ප්ලේන් එකක් කළෙත් නැහැ." (උපුටා ගැනිම අවසන්)

මේ අනුව රිය අනතුරින් ලලිත් ජයසිංහ මහතාට තුවාල සිදු වූ බවට වැඩබලන මහේස්ත්‍රාත්වරයාට පැමිණිලි නොකළ බවට සහකාර පොලිස් අධිකාරි තිසේරා මහතා මෙම කොමිෂන් සභාව ඉදිරියේ අසත්‍ය සාක්ෂියක් ලබා දී ඇත.

වැඩබලන මහේස්ත්‍රාත් සබේෂන් මහතා වාසය කර ඇත්තේ නල්ලූර් කෝවිල පසුපස පිහිටි ඔහුගේ නිවසේ බවටත්, එම නිවසේ සිට කයිට්ස් මහේස්ත්‍රාත් අධිකරණයට කිලෝමීටර 20ක පමණ දුර

ප්‍රමාණයක් ඇති බවටත් පොලිස් පරීක්ෂක ධර්මදාස මහතා සිය සාක්ෂියේ දී සඳහන් කළේය.

2020. 03.10 දින ලලිත් ජයසිංහ මහතාගේ සාක්ෂි සටහන් වල 35 , 36, 38.42, 43, 51 සහ 52 යන පිටුවල සඳහන් සාක්ෂි එසේ නොවන බවට  වගඋත්තරකාර තිසේරා මහතා තම සාක්ෂියේ දී සඳහන් කළත් එම කරුණු සනාථකිරීමට කිරීම සඳහා ඔහුගේ වාරිකා සටහන් වලට නොහැකි විය. තිසේරා මහතා පිළිතුරු වශයෙන් සඳහන් කළේ කිසිදු කරුණක්  ඔහුගේ සටහන් වල අන්තර් ගත වී නොතිබිනි. ඔහුගෙන් විමසන ලද ප්‍රශ්නවලට ඔහු ලබාදී ඇති පිළිතුරු මෙසේය; (2020.07.08. දින ප.ව. 1.30 පිටුව 33)

> "ප්‍ර: ජයසින්හගේ සාක්ෂි සටහන් කියවලා තමන් යම් පිළිතුරක් දුන්නනෙ
>
> උ: පිලිතුරක් දුන්න ස්වමීනි
>
> ප්‍ර: ඒවා මොකවත් තමන්ගෙ නෝට්ස්වල නෑ
>
> උ: නෝට්ස්වල නෑ ස්වාමීනි"

ලලිත් ජයසිංහ මහතා අත්අඩංගුවට ගැනීම පිටුපස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිත බෙන් එමර්සන් ලංකාවට පැමිණීම නිමිත්තක් වශයෙන් තිබූ බවට ජයසිංහ මහතා සඳහන් කර ඇත. වගඋත්තරකාර තිසේරා සඳහන් කළේ අත්අඩංගුවට ගැනීම සිදු කරන ලද්දේ නීතිපති විසින් ලබා දෙන ලද උපදෙස්  පරිදි බවය. නීතිපති උපදෙස් අඩංගු ලිපිය 1 වි 14 (පැ.22) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. නීතිපතිවරයාගේ 2020.07.14 දිනැති ලිපිය අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබී ඇති අතර තිසේරා ඇතුළු කණ්ඩායම 15 වන දින ලලිත් ජයසිංහ මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා අත්අඩංගුවට ගෙන ඇත. බෙන් එමර්සන් ලංකාවෙන් පිටව ගොස් ඇත්තේද එදිනය.

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබුණා යැයි කියන ෆැක්ස් පණිවිඩයේ නිවරද්‍ය තාවය තහවුරු කර ගැනීමකින් තොරව සහ නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු නිල ලිපිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලඟා වීමට ද ප්‍රථම ෆැක්ස් පණිවිඩය ලද මොහොතේම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහට එරෙහිව පරීක්ෂණ ආරම්භ කිරීමට පෙළඹෙන සහකාර පොලිස් අධිකාරි තිසේරා ඇතුළු පිරිස යාපනයට ලඟා වන අවස්ථාවේ දී එම ප්‍රදේශය විද්‍යා සාතනයේ සැකකරුවෙකු මුදා හැරීම සම්බන්ධයෙන් කලබල කාරි තත්ත්වයක පැවැති බවත් ගෙවල් ගිනි තැබීම් වැනි සිද්ධි ද හට ගෙන තිබු බවත්, මෙම තත්ත්වය තිසේරා ඇතුළු පිරිසට පරීක්ෂණ වහා ආරම්භ කිරීමට හේතුවූ කරුණු බවටත් සහකාර පොලිස් අධිකාරි තිසේරා සාක්ෂියේ දී සදහන් කර ඇත. ඒ අනුව ඔවුන් පැමිණි දිනයේ දීම ශ්‍රී ගජන්ගේ සහ ඔහු සමඟ කටයුතු කළ පොලිස් කොස්තාපල් අශෝකගේ කටඋත්තර සටහන් කර ඇත. මේ අනුව පැහැදිලි වන කරුණ වන්නේ තිසේරා ඇතුළු පිරිස මුලිකවම පරීක්ෂණ පවත්වා ඇත්තේ විද්‍යා සාතනයට සම්බන්ධ සැකකරුවෙකු වූ මහාලිංගම් ශෂිකුමාර් පොලිස් අත් අඩංගුවෙන් මුදා හැරීම පිළිබද කරුණ සම්බන්ධයෙනි. සැකකාර මහාලිංගම් ශෂි කුමාර් අත් අඩංගුවට ගැනීමට අධාර කළ තමිල් මාරන් සමග ශ්‍රී ගජන් සහ අශෝක යන නිළධාරින් දෙදෙනා ශෂි කුමාර් ජීවන විට පදිංචිව සිටි ප්‍රදේශයට

ගොස් ශෂි කුමාර් අත් අඩංගුවට ගැනීම සිදු කර ඇත. එසේ අත් අඩංගුවට ගත් ශෂි කුමාර් යාපනයේ පොලිස්ථානය වෙත ගෙන විත් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට අවශ්‍ය පියවර නොගෙන ජී.එච්.ටී පතක් ලියා ශෂි කුමාර් ඔහුගේ ඥාතින්ට භාර දී ඇත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා උපදෙස් ලබා දී ඇත්තේ ශෂි කුමාර් රෝහල් ගත කිරීමටය. එසේ වුවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ උපදෙස් පිළිනොපදමින් ශෂි කුමාර් ඥාතින්ට භාර දීම ශ්‍රී ගජන් විසින් සිදු කර ඇති අතර එසේ සිදු කරන ලද්දේ නියෝජ්‍ය පොලිස්පති ලාල් කුමාර ගමගේ මහතාගේ උපදෙස් පරිදි බව සඳහන් කර ඇත.

මේ අනුව ශෂි කුමාර් අවසන්වරට දකින විට පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ගේ භාරයේ සිටි බව අවිවාදාත්මකය. ඒ බව වගඋත්තරකාර සහකාර පොලිස් අධිකාරි තිසේරාද පිළිගනී.

ශ්‍රී ගජන්ගේ 2015.05.20 දින (පැ.37) ප්‍රකාශය අනුව යාපනය නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ පැවැති රැස්වීමට සියළුම උසස් පොලිස් නිළධාරීන් රැස්වී ඇත. එම රැස්වීමේ දී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා විර්ශනය සිදු කළ උප පොලිස් පරීක්ෂකවරයාගෙන විමර්ශන තොරතුරු විමසන විට තමන් ලඟ විස්තර ඇති බවට ශ්‍රී ගජන් පවසා ඇති අතර ශෂි කුමාර්ගේ ගමන් බලපත්‍ර අංකයද තමන් ලඟ ඇති බවට පවසා ඇත. එම අවස්ථාවේ දී ජ්‍යෙෂ්ඨ සහකාර පොලිස් අධිකාරි උපදෙස් දෙමින් ගුවන් තොටුපලට පණිවිඩයක් දී ශ්‍රී ගජන්ගේ විදේශ ගමන් නවතන ලෙසට උපදෙස් දී ඇත.

සත්‍ය කරුණු එසේ වුවත් තිසේරාගේ පරීක්ෂණ කණ්ඩායම සඳහන් කර ඇත්තේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ ශ්‍රී ගජන්ගේ ගුවන් ගමන් බලපත්‍ර අංකය සමඟ කටුනායක පොලිසියට දුරකථන පණිවිඩයක් ලබා දී ඇති බවය. පැ.73 සහ පැ.73 (අ) අනුව තිසේරාගේ මෙම ප්‍රකාශ අසත්‍යයකි.

සහකාර පොලිස් අධිකාරි තිසේරා සඳහන් කරන අන්දමට ඔවුන් පළමුව විද්‍යා සාතනය පිළිබඳ විමර්ශනය සිදු කර උද්ධෘත නීතිපති වෙත යවා ඇත. ඉන්පසු 14.07.2017 දින නීතිපතිගේ ෆැක්ස් පණිවිඩය යටතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට එරෙහිව දණ්ඩ නීති සංග්‍රයේ 209 වගන්තිය යටතේ චෝදනා ඉදිරිපත් කරන ලෙස නියම කර ඇති අතර ඒ අනුව 209 වන වගන්තිය යටතේ චෝදනා කිරීම සඳහා ඒ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා ඇත. ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රකාශ ඉන්පසුව සටහන් කරගෙන ඇත. එම පත්‍රය මත නියෝජ්‍ය පොලිස්පති ලාල් ගමගේ මහතාට සහ පොලිස් පරීක්ෂක ශ්‍රී ගජන්ගේ 02 වන හා 03 වන ප්‍රකාශ සටහන් කර ඉන්පසුව ගමගේ මහතාගේ 127 යටතේ මහේස්ත්‍රාත් ඉදිරිපිට ප්‍රකාශයද සටහන් කිරීම දක්වා ඉදිරියට ගොස් ඇත.

14.07.2017 දින නීතිපතිවරයාගේ ෆැක්ස් පණිවිඩය ලැබෙනෙ විට එක්සත් ජාතින්ගේ නියෝජිත බෙන් එමර්සන් ලංකාවේ සිට ඇති අතර ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරායත්, පොලිස්පතිවයාත්, නීතිපතිවරයාත් ඇතුළු ත්‍රිවිධ හමුදාවලට සම්බන්ධ නිළධාරීන් හමුවී සාකච්ජා පවත්වා ඇත. නීතිපතිවරයාගේ ෆැක්ස් පණිවිඩිය මෙම හමුවීම් වල ප්‍රතිඵලයක් ලෙසට සාක්ෂි මගින් කරුණු ඉදිරිපත් වී ඇත. මෙම තත්ත්වය මැනවින් සනාථ වන්නේ බෙන්

එමර්සන් ඔහුගේ මාධ්‍ය හමුවේදී නාවික හමුදාවේ කොමදෝරු ඩී.කේ.පී.දසනායක මහතා අත්අඩංගුවට ගෙන තිබෙන බවත්, ඒ ගැන තමන් සතුටු වන බවටත් ප්‍රකාශ කර තිබීමය. එසේම පසුගිය රජය (2015 ජනවාරි 08 වන දිනට පෙර) මේ පිළිබඳව ඔවුන් බලාපොරොත්තු වූ අයුරින් ක්‍රියා නොකිරීම පිළිබඳව 2015 ජනවාරි 08 දිනටපෙර රජයට චෝදනා කර ඇත.

31.05.2016 දින පැ.54 බී වාර්තාවේ සඳහන් කර ඇත්තේ මහජනතාව විසින් පහර දුන් මහලිංගම් ශෂී කුමාර් ප්‍රදේශයේ දේශපාලඥයෙක් මැදිහත් වී බේරාගෙන මුදාහැර තිබෙන බවය. කරුණු එසේ වාර්තා කර ඇතත් ඉන්පසු 03.09.2017 දින ඉදිරිපත් කර ඇති පැ.41 බී වාර්තාවේ සඳහන් කර ඇත්තේ විජයකලා මහේෂ්වරි ඇමතිවරිය මූ.පො.ප මහතාට කථා කර මේ පුද්ගලයා අත්අඩංගුවට ගන්නා ලෙසට දැනුම් දුන් බවට ඇමති ආරක්ෂක අංශයේ පොලිස් කොස්තාපල් නිශාන්ත අමරජීව ප්‍රකාශයක් ලබා දී ඇති බවය. මෙම අවස්ථා දෙක එකිනෙක පරස්පර විරෝධීවේ. එසේ වුවත් එම කරුණු සනාථ කිරීමට මූ.පො.ප ලබා දුන් දුරකථන ඇමතුම පිළිබඳව විස්තර හෝ මූ.පො.ප ගේ ප්‍රකාශයක් හෝ එම දුරකථන ඇමතුම ලබා ගත්තා යැයි කියනු ලැබූ පොලිස් කොස්තාපල් 44450 සිසිරගේ හෝ ප්‍රකාශයක් සටහන් කිරීමට තිසේරා ප්‍රමුඛ පරීක්ෂක කණ්ඩායම ක්‍රියා කර නැත.

මේ අනුව මහලිංගම් ශෂී කුමාර් පිළිබඳව ස්ථාවර 03 ක් ඉදිරිපත් වී ඇත.

1. මහලිංගම් ශෂී කුමාර් ඥාතින්ට මුදාහැර රැගෙන ගිය බව.

2. පහර දෙන අවස්ථාවේ දී ඇමති විජයකලා මහේෂ්වරන් විසින් ඔහු මුදාගත් බව.

3. මහලිංගම් ශෂී කුමාර් ඇරෙස්ට් කරන ලෙසට ඇමති විජයකලා මහේෂ්වරන්ගේ ආරක්ෂක නිළධාරීයා මූ.පො.ප ට දැනුම් දුන් පසු ඒ අනුව ඇරෙස්ට් කළාද, නැද්ද යන් වග.

මෙම සෑම ප්‍රශ්නයකටම සහකාර පොලිස් අධිකාරි තිසේරා පිළිතුරු නොදෙමින් සඳහන් කළේ තවන් අධීක්ෂණ නිළධාරියා බවත්, එම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීය යුතු වන්නේ විමර්ශන නිළධාරීයා වන නිශාන්ත ද සිල්වා බවත්ය.

විජයකලා මහේෂ්වරන්ගේ ආරක්ෂ නිළධාරියා විසින් මූ.පො.ප ට මහාලිංගම් ශෂි කුමාර් ඇරෙස්ට් කරන ලෙසට දැනුම් දීම අනුව මහාලිංගම් ශෂී කුමාර් විද්‍යා සාතන නඩුවේ සැකකරුවෙකු බව මූ.පො.ප දැන සිටි බව පැහැදිලිවේ. ඒ අනුව ශෂී කුමාර් ඇරෙස්ට් කළා ද නැද්ද යන්න තහවුරු කර ගැනීම මෙම පරීක්ෂණය වැදගත් පැන වලින් එකකි. මෙවන් තත්ත්වයක් තුළ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහට කිසිදු හැකියාවක් නොමැත.

පැ. 43, පැ.43 (අ) සහ පැ.44, පැ.44(අ) ලෙස ඉදිරිපත් කරඇති පිළිවෙළින් මව්බිම සහ ලංකාදීප පුවත් පත් වලට විජයකලා මහේෂ්වරන් සහ තලතා අතුකෝරාළ මහත්මිය වන දෙදෙනා විසින් මහලිංගම් ශෂී කුමාර් පිළිබඳව සඳහන් කර ඇති කරුණු අනුව පැහැදිලි ලෙසම දේශපාලන මැදිහත්වීමක් දක්නට ඇත. මහලිංගම් ශෂී කුමාර් පිළිබඳව සඳහන් කර ඇති කරුණු අනුව පැහැදිලි ලෙසම දේශපාලන මැදිහත් වීමක් දක්නට ඇත. මහලිංගම් ශෂී කුමාර්

ඇරෙස්ට් කරන ලෙසට මූ.පො.ප දුරකථනයෙන් දැනුම් දී ඉන්පසුව ඔහු අත්අඩංගුවට ගැනීමට පෙර ශෂී කුමාර් අල්ලාගෙන සිටි මිනිසුන්ගෙන් ඔහු නිදහස් කරගෙන ඉන්පසුව මුදාහැර ඇත.

රැස්ව සිටි පිරිස පහරදීමෙන් ශෂී කුමාර්ට තුවාල සිදුවී තිබූ බවට විජයකලා මහේෂ්වරන් ඇමතිවරිය සිදු කරන ප්‍රකාශය කිසිසෙත් පිළිගත නොහැක. ඒ කුමක් නිසාදයත් ඊට පසු දින ශ්‍රී ගජන් තමිල් මාරන් සමඟ ගොස් මහලිංගම් ශෂී කුමාර් අත්අඩංගුවට ගන්නා විට ඔහුට එවැනි පහරදීමකින් තුවාල සිදුවී තිබූ බවට පිළිගැනිමට සාක්ෂි නැත. නියෝජ්‍ය පොලිස්පති ලාල් ගමගේ මහේස්ත්‍රාත්වරයාට කළ ප්‍රකාශය අනුව මහලිංගම් ශෂී කුමාර්ගේ හිසට තුවාල සිදුවී ඇත්තේ ශ්‍රී ගජන් ඔහුගේ හිසට පහරදීම හේතුවෙනි.

පසුදින එකඟ වූ අයුරින් සාක්ෂිකාර පොලිස්පතිවරයා විසින් 2020.09.09 වන දින වාර්තාවක් ආරක්ෂක ලේකම්වරයාට යවා ඇත. මේ ලිපිය පිළිබඳව ලලිත් ජයසිංහ මහතා දැනුවත් කර නැත. ලලිත් ජයසිංහ මහතා විසින් එවන ලද ලිපියද ආරක්ෂක ලේකම්වරයාට යැවූ ලිපිය සමඟ යවා ඇත. පොලිස්පතිවරයා ආරක්ෂක ලේකම්වරයාට යවන ලද ලිපිය පැ.92 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත් පොලිස්පතිවරයා පැ.92 ලිපියේ නිර්දේශය ප්‍රතික්ෂේප කර ඇත. පොලිස්පතිවරයාගේ නිර්දේශ සහිතව රංගජීව වෙනුවෙන් ඉදිරිපත් කළ නිර්දේශය පරිදි ඔහු සේවයේ පිහිටුවා ඇත. ජයසිංහ මහතා ප්‍රසංශනිය සේවය කළ බවට පොලිස්පති නිර්දේශ සහිතව යවන ලද නිර්දේශය ප්‍රතික්ෂේප කර ඇත. මෙම ප්‍රතික්ෂේප කිරීමට හේතු පොලිස් කොමිෂන් සභාව විසින් 2020.09.13 වන දින ලිපියෙන්

දන්වා ඇත. එම ලිපිය පැ. 93 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ප්‍රියශාන්ත ජයකොඩි නැමැති හිටපු පොලිස් අධිකාරි මගින් නිළධාරියා ගම්පහ දිස්ත්‍රිකයේ මහර ආසනයට තරඟ කර ඡන්ද 309 ලබා ගත් අපේක්ෂකයෙක් බවට කරුණු පැ.94 සහ පැ.95 ලේඛන වලින් සනාත වේ. 2019.05.30 දින ලිපියෙන් සිදු කළ බව ප්‍රියශාන්ත ජයකොඩි නැවත සේවයේ පිහිටුවා, එදිනම සේවයෙන් විශ්‍රාම ගන්වා ඇත. එම ලිපිය පැ.96 ලෙසට ඉදිරිපත් කර ඇත. මෙම පොලිස් කොමිසම ස්වාධීන නොවන බවට මෙම කරුණු මැනවින් ප්‍රමාණවත්ය.

ඉහත සාක්ෂි සනාථ කිරිම පැ. 1 සිට පැ.96 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020 - 11. 24

24/11/2020
Chandra Fernando

## 9 .XXIII

පැමිණිලි අංකය - 238/2020

පැමිණිලිකරු - ප්‍රේම ආනන්ද උදලාගම

ලිපිනය - අංක 50/46, කිරුලගම, පලාපත්වල, මාතලේ.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. සහකාර පොලිස් අධිකාරී තිසේරා
2. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර ප්‍රේම ආනන්ද උදලාගම යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, ප්‍රේම ආනන්ද උදලාගම මහතාට ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 92/2009 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින්ද; ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 294/09 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින්ද, පැමිණිලිකාර ප්‍රේම ආනන්ද උදලාගම නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම පැමිනිලිකරුට එරෙහිව ගම්පහ මහාධිකරණයේ පවරා ඇති අංක HC 212/19 දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතුය.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

6. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

1987.12.22 දින පාබල හමුදාවේ රාජකාරියට සම්බන්ධ වී ඇති පැමිණිලිකරු 1990 වර්ෂයේ සිට ස්ථාන මාරුවක් ලැබ කොළඹ මුත්තයියා පාරේ පිහිටි බුද්ධි බලකා මූලස්ථාන කාර්යාලය වෙත රාජකාරිය සඳහා වාර්තා කර එතැන් පටන් බුද්ධි බලකා අංශයේ සේවයේ නිරතව 1990 ජූලි මාසයේදී ස්ථාන මාරුවක් ලැබ වව්නියාව කඳවුරේ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් පිළිබඳව බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ මෙහෙයුම් වල යෙදෙමින් උසස්වීම් ලැබ 2016 වසරේදී විශ්‍රාම ගොස් ඇත.

පැමිනිලිකරු මෙලෙස බුද්ධි සේවයේ යෙදෙමින් සිටින විට 2016.06.19 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල අංශයේ ස්ථාන ස්ථානාධිපති විසින් සිදු කරනු ලැබූ කැඳවීමකට අනුව කටඋත්තරයක් ලබාදීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් ඇති අතර එහිදී සහකාර පොලිස් අධිකාරි තිසේරා විසින් තම අනන්‍යතාවය පැමිණිලිකරුට හෙලිකරමින් පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන ලද්දේ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය පිළිබඳව ප්‍රකාශයක් ලබා ලබාගැනීමට බවට පැහැදිලි කර දී ඇත. ඉන් පසුව සුහදව කතා කරමින් ලසන්ත වික්‍රමතුංග ඝාතනය ගැන විමසීම් කර ඇති අතර ; "ඒ පිළිබඳව පැමිණිලිකරු බොහෝ තොරතුරු දන්නා බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දන්නා බවත් එබැවින් නිශාන්ත සමග ගොස් එම තොරතුරු ප්‍රකාශ කරන ලෙසටත්" තිසේරා පැමිණිලිකරුට පවසා නිශාන්ත සිල්වාට පැමිණිලිකරු භාරකර මෙම අවස්ථාව තිසේරා විසින් වීඩියෝ ගත කරනු දැක එසේ වීඩියෝ ගත කරන්නේ

මක්නිසාදැයි විමසන ලැබූ විට තමන් එසේ නොකරන බව තිසේරා පවසා ඇත.

පැමිණිලිකරුගේ ප්‍රකාශය සටහන් කිරීම පොලිස් පරීක්ෂක ජයවීර විසින් එදින හවස් වනතුරුම සිදුකර ඇති අතර, කටඋත්තරය වාර්තාගත කරන අවස්ථාවේ විටින් විට ජයවීර සටහන් කිරීම නවතා කටඋත්තරය සටහන් කරමින් සිටි ස්ථානයෙන් පිටතට ගොස් නැවත පැමිණ සටහන් කිරීම ආරම්භ කිරීම පැමිණිලිකරුගේ නිරීක්ෂණයට ලක් වී ඇත. ප්‍රකාශය සටහන් කිරීම එදින සවස දෙක පමණ වන තෙක් සිදුවී ඇති අතර ඉන් පසු පැමිණිලිකරු මුදාහැර ඇත. ඉන්පසුව අවස්ථා කිහිපයකදීම පැමිණිලිකරු කැඳවා ඇතත් කට උත්තර සටහන් කර ගැනීමක් සිදු කර නැත.

ඉන්පසුව, 2016.07.15 පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා නිශාන්ත සිල්වා විසින් පැමිණිලිකරුගේ කට උත්තරය සටහන් කර ගැනීම ආරම්භ කර ඇත. ඒ අනුව ලසන්ත වික්‍රමතුංග මහතාගේ රියදුරු පැහැරගෙන ගොස් තර්ජනය කිරීම සම්බන්ධව ප්‍රකශයක් එදින අලුයම 1.30 පමණ වන තෙක් සටහන් කරගෙන ඇත. එම අවස්ථාවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන්, ඔහුගේ රියදුරු පැහැර ගැනීම සම්බන්ධයෙන් දිගින් දිගටම ප්‍රශ්න කර ඇති අතර පැමිණිලිකරු ඒ කිසිවක් නොදන්නා බව පවසා ඇත.

රාත්‍රී 11, 12 පමණ වන විටත් නිශාන්ත සිල්වා බලාපොරොත්තු වූ පිළිතුර පැමිණිලිකරුගෙන් නොලැබුණු බැවින් ඔහු උස් හඬින් කෑ ගසමින්; "මෙම ඝාතනය සම්පූර්ණයෙන්ම කළේ ගෝඨාභය රාජපක්ෂ මහතා, මිග් ගනුදෙනුවේදී සිදුවූ වංචාව වහගන්න, තමුන්ලා වගේ බුද්ධි

අංශ සාමාජිකයෝ යොදාගෙන තමයි ඒක කළේ, මට ඒ ටික විතරක් කියන්න, තමුන්ට අවශ්‍ය ඕන දෙයක් කරලා දෙන්නම්," යනුවෙන් නිශාන්ත සිල්වා කෑගසමින් එම ස්ථානයෙන් පිටව ගොස් ඇත.

ඉන්පසුව රාත්‍රියේ 12.30 ට පමණ සහකාර පොලිස් අධිකාරි තිසේරා පැමිණ පැමිණිලිකරු ළඟින් වාඩි වී; "උදලාගම, ඔයා ලසන්ත ඝාතනයට කිසිදු සම්බන්ධතාවයක් නෑ කියලා මම දන්නවා, හැබැයි, ඒ සිදුවීමේ අගමුල හැම දෙයක්ම දන්න එකම පුද්ගලයා ඔයා බවට අපිට තොරතුරු ලැබිලා තියෙනවා, ඒ නිසා ඒ ටික කියන්න, අපි රහස්‍ය භාවයක් රකින්නම්, ඔයාට අවශ්‍ය දෙයක් තියෙනවනම් අපි ඒ ටිකක් කරලා දෙන්නම්, යනුවෙන් පවසා ඇත.

සහකාර පොලිස් අධිකාරි තිසේරාට හෝ නිශාන්ත සිල්වාට අවශ්‍ය කරන අන්දමේ කටඋත්තරයක් ලබාදීම පැමිණිලිකරු විසින් ප්‍රතික්ෂේප කළ බැවින් ඔහු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කර ඇත. පසුදින උදෑසන පමිනිලිකරු රෙද්දකින් ආවරණය කර ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගෙනගොස්, පහරදී මනුෂ්‍ය ඝාතනයක් සිදුකළ බවට චෝදනා කරමින්, බී වාර්තා අංක 92/2009 යටතේ ඉදිරිපත් කරමින් පොලිස් ස්ථානයේ රඳවා ගෙන ප්‍රශ්න කිරීම් සඳහා නියෝගයක් ලබාගෙන ඇත. ඉන්පසුව පැමිණිලිකරු ආපසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට රැගෙන එන අවස්ථාවේ දී ඔහුගෙන් බුද්ධි අංශයට අයත් සේෆ් හවුස් ගැන විමසමින් ප්‍රශ්න කරන ලද බැවින් ඒ වන විටත් වසා දමා ප්‍රයෝජනයට නොගෙන තිබූ safe house කීපයක් ගැන විස්තර පැමිණිලිකරු විසින් ලබා දී ඇත.

ඉන්පසුව නැවත අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කර පෙරටුවට ඉදිරිපත් කර ඇති අතර හඳුනා ගැනීමට ගෙනා සාක්ෂිකරු ද සම්පූර්ණයෙන් වසා හඳුනා ගැනීමට ඉඩ සලස්වා ඇත. මෙම පෙරෙට්ටුවේ දී පැමිණිලිකරු හඳුනාගෙන නැත. ඉන් පසුව, නැවත දින දාහතරකට රක්ෂිත බන්ධනාගාරයට පත්කිරීමෙන් පසු ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින බී 294 /09 දරණ නඩුව සඳහා මහේස්ත්‍රාත්වරයාගේ නිල මැදිරියට ඉදිරිපත් කර උපාලි තෙන්නකෝන් සහ ඔහුගේ භාර්යාවට 2009.01.23 දින පහර දුන් බවට සඳහන් චෝදනාවක් සඳහා හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් සඳහා ඉදිරිපත් කිරීමට රක්ෂිත බන්ධනාගාර ගත කරන ලදී.

ඇමරිකාවේ පදිංචිව සිටින උපාලි තෙන්නකෝන් සහ ඔහුගේ භාර්යාව හඳුනා ගැනීමේ පෙරෙට්ටුව සඳහා ලංකාවට ගෙන්වා ගැනීමට අවශ්‍ය බවට අංක 294/09 දරන බී වාර්ථතාවෙහි සඳහන්ව ඇත. ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති බී 294/09 දරන නඩුවට පෙරෙට්ටු දෙකක් පවත්වා ඇති අතර දෙවැනි හඳුනා ගැනීමේ පෙරෙට්ටුව දී සාක්ෂිකරුවන් දෙදෙනෙකු විසින් පැමිණිලිකරු හඳුනාගෙන ඇත.

පැමිණිලිකරු සඳහන් කළ අන්දමට ඔහු ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත්තේ ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කිරීම සඳහාය. එසේ වුවත් පසු අවස්ථාවකදී සොයා බලන විට ඔහු සත්‍ය වශයෙන්ම ඉදිරිපත් කර තිබී ඇත්තේ ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් නොව ලසන්ත වික්‍රමතුංග මහතාගේ රියදුරු පැහැරගෙන යාමේ චෝදනාව සම්බන්ධයෙන්ය. මේ අනුව පොලිස්

පරීක්ෂක නිශාන්ත සිල්වා අධිකරණය නොමග යවා පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කර තිබේ.

උපාලි තෙන්නකෝන් සහ ඔහුගේ භාර්යාවට පහර දීම සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් පැමිණිලිකරු චූදිතයකු කරමින් අධිචෝදනා පත්‍රයක් අංක 212/19 යටතේ ගම්පහ මහාධිකරණයට ඉදිරිපත් කර ඇති අතර නඩුව තවමත් පැමිණිලිකරුට එරෙහිව විභාග වෙමින් පවතී. ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති ඉහත අංක දරන නඩුවට හඳුනා හඳුනා ගැනීමේ පෙරෙට්ටුව සඳහා පැමිණිලිකරු ඉදිරිපත් කිරීමට ප්‍රථම, පැමිණිලිකරුගේ ඡායාරූපය ද සහිතව වාර්තාවක් ඊ නිව්ස් වෙබ් අඩවියේ පළ කර තිබී ඇත. ඒ අනුව හඳුනා ගැනීමේ පෙරෙට්ටුවට සිටින පැමිණිලිකරුගේ ඡායාරූපය ඇමෙරිකාවේ සිටි උපාලි තෙන්නකෝන් සහ ඔහුගේ භාර්යාවට හොඳින් දැක බලා ගැනීමේ පහසුව ඊ නිවුස් වෙබ් අඩවිය මගින් සලසා ඇත. මේ සම්බන්ධයෙන් අධිකරණයට අපහාස කිරීමේ වරද සඳහා ඊ නිවුස් වෙබ් අඩවිය හිමිකරුට එරෙහිව චෝදනාවක් ගම්පහ මහේස්ත්‍රාත්වරිය විසින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවටද පැමිණිලිකරුගේ සාක්ෂියෙන් හෙළිදරව් වී ඇත.

එවකට රජයේ අමාත්‍යවරයෙකුව සිටි රාජිත සේනාරත්න මහතාද පැමිණිලිකරුට එරෙහිව මෙම නඩු සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වේදිකාවක දී සිදුකළ ප්‍රකාශයක් ඇතුළත් හඬ පටයක් සහ වාර්තාක් පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

මේ අන්දමින් පැමිණිලිකරුට එරෙහිව චෝදනාකර රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ හේතුවෙන් පැමිනිලිකරුට යුද හමුදාවේ හිමිවීමට නියමිතව තිබූ තනතුරු සහ වැටුප් වර්ධක මෙන්ම ඔහුගේ

සේවය බන්ධ වීම කරණ කොටගෙන වැටුප් අහිමි වීමද සිදුවී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරි තිසේරා සහ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා ඇතුළු පිරිසගේ ක්‍රියාකලාපයන් නිසා පැමිණිලිකරුට මෙවැනි බේදනීය ඉරණමකට ගොදුරු වීමට සිදු වී ඇත.

පැමිණිලිකරුගේ සාක්ෂියට අනුව සහකාර පොලිස් අධිකාරි තිසේරා විසින් පැමිණිකරු වීඩියෝ ගත කිරීමක් සිදුකර ඇත. මේ අන්දමින් පැමිණිලිකරු වීඩියෝ ගත කිරීමක් සිදු කරන ලද්දේ හඳුනා ගැනීමේ පෙරෙට්ටුවේ සාක්ෂිකරුවන්ට හඳුනාගැනීමේ පහසුව උදෙසා පෙරෙට්ටුව පැවැත්වීමට පෙර පැමිණිලිකරුගේ ඡායාරූපය සාක්ෂිකරුවන්ට පෙන්වා හඳුනා ගැනීම පහසු කරවීම සඳහා විය යුතුය.

පැමිනිලිකරුගේ ප්‍රකාශය සටහන් කර ගැනීමේදී ඔහු අවස්ථා ගණනාවකදීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන්වා ප්‍රශ්න කර සමහර අවස්ථාවල දී ප්‍රකාශ සටහන් කිරීමත් සමහර අවස්ථාවල දී ප්‍රකාශ සටහන් නොකර ඔහු ආපසු යැවීමත් නිතර නිතර සිදු කර ඇත. අවශ්‍ය ප්‍රකාශය සටහන් කර ඇත්තේ බොහෝවිට අත්අඩංගුවට ගත් දවසේ අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර බව පැමිණිලිකරුගේ සාක්ෂි අනුව පෙනී යයි. මේ අනුව පැමිණිලිකරුගේ ප්‍රකාශය වාර්තාගත කිරීම සඳහා වාර ගණනාවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමේ පරමාර්ථය, පැහැදිලි ලෙසම පැමිණිලිකරුට බලපෑම් කරමින් සහකාර පොලිස් අධිකාරි තිසේරා සහ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වාට අවශ්‍ය කරන දේශපාලනික කටඋත්තරය ලබා ගැනීම උදෙසා විය යුතුය.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ. 1 සිට පැ. 14 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 .XXIV

පැමිණිලි අංකය - 885/20

පැමිණිලිකරු - සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්

ලිපිනය - මාරි අම්මාන් කෝවිල් වීදිය,

පේතාලෙයි,වාලච්චේන

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. පා.ම. සුමන්දිරන්
2. IP ජයසේකර
3. පොලිස් සැරයන් 27695 සිරිවර්ධන
4. ASP වික්‍රමසිංහ

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලේයාන් යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා

කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලේයාන් මහතාට එරෙහිව මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 1357/05 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලේයාන් නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම පැමිනිලිකරුට එරෙහිව මඩකලපුව මහාධිකරණයේ පවරා ඇති අංක HCD/3057/17 දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතුය.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නමැති වරද සිදු කර ඇති බැවින්ද,

නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිනිලිකරු රඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකූඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

5. එසේම පොලිස් නිලධාරීන්ට එරහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

6. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

7. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පැමිණිලිකාර සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් ටී.එම්.වී.පී පක්ෂයෙන් මඩකලපුවෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වී ඉන්පසු 2008.01.26 වෙනි දින ද්‍රවිඩ ජනතා විමුක්ති පක්ෂයට සම්බන්ධ වී ඇත. පැමිණිලිකරු 1991.02.04 වන දින සිට ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරමින් එකී සංවිධානයේ සැපයුම් අංශයේ යාපනය හා මඩකලපුව ප්‍රදේශවල සේවය කර ඇත. 2004න් පසු ඔහු එල්.ටී.ටී.ඊ සංවිධානයත් සමග ඇති කර ගත් මතවාදයක් හේතුවෙන් එම සංවිධානයෙන් ඉවත් වී ඇති අතර ඒ හේතුවෙන් ඔහු එල්.ටී.ටී.ඊ ඝාතන ලැයිස්තුවට ඇතුළත් වී ඇති අතර 2004 සිට 2007 දක්වා කාල සීමාව පැමිණිලිකරු ඉතාමත් අපහසුකාරි ලෙස ගෙවා දමා ඇත.

මතවාදයට හේතුව වූයේ උතුරු නැගෙනහිර එක් කිරීම එල්.ටී.ටී.ඊ සංවිධානයේ මතවාදය වුවත් පැමිණිලිකරු ඊට වෙනස් මතයක් දරමින් නැගෙනහිර ප්‍රදේශය වෙනස් පාලන ප්‍රදේශයක් වශයෙන් පවත්වාගෙන යාම සඳහා ක්‍රියා කිරීමය. මේ සඳහා පැමිණිලිකරුගේ මතවාදය ගරු කරන පිරිස් ඒකරාශි කර ගනිමින් සංවිධානය වීම පැමිණිලිකරු විසින් සිදු කර ඇත. මේ නිසා එල්.ටී.ටී.ඊ සංවිධානය

පැමිණිලිකරුගේ දේශපාලන සංවිධානයට එරෙහිව ක්‍රියා කරමින් එකී සංවිධානය විනාශ කරමින් එහි සාමාජිකයන් ඝාතනය කිරීමේ ක්‍රියාවලියකට ප්‍රවේශ වී ඇත. මේ හේතුවෙන් පැමිණිලිකරු එවකට රාජ්‍ය පාලනය ගෙන ගිය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ රජයට එකතු වී ත්‍රස්තවාදය තුරන් කිරීමේ ව්‍යාපාරයට සහය දී ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ දේශපාලන සංවිධානය විසින් මහින්ද රාජපක්ෂගේ රජයට ලබා දුන් බුද්ධි තොරතුරු මත ත්‍රස්තවාදින්ට එරෙහි සටන සාර්ථකව සිදු කර ගෙන යාමට රජයට අවකාශය ලැබී ඇති අතර මේ හේතුවෙන් පැමිණිලිකරු කොටි ත්‍රස්තවාදීන්ගේ දැඩි බලපෑමකට හා තර්ජනයකට ලක් වී ඇත.

2008 වර්ෂයේදී ටී.එම්.වී.පී පක්ෂය යථා පරිදි ලියාපදිංචි වී ඇති අතර 2009 වර්ෂයේදී පක්ෂයේ සභාපති වශයෙන් පත් වූ පලාත් පාලන මැතිවරණයෙන් නැගෙනහිර පලාත ජයග්‍රහණය ලබා මහ ඇමතිවරයා ලෙසට තේරී පත් වී මහින්ද රාජපක්ෂ රජය සමග සහයෝගයෙන් කටයුතු කර ඇත.

2012 මැතිවරණයේදී පැමිණිලිකරුගේ තත්වය වෙනස් වී ඔහු පලාත් සභා සභිකයෙකු බවට පත් වී ඇත. පලාත් සභාවේ සභිකයෙකු වශයෙන් සේවය කිරීමට අමතරව ජනාධිපති උපදේශකයෙකු වශයෙන් පත් කරනු ලැබ එම කටයුතු වලද නිරත වී ඇත.

2015.01.08 පිහිටවූ රජය සමයේදී ද පලාත් සභා මන්ත්‍රීවරයෙකු යටතේ කටයුතු කළ පැමිණිලිකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලද කැඳවීමක් මත එහි පෙනී සිට ඇති අතර පැමිණිලිකරුගේ යටගියාව සහ ඔහු වර්ථමාන තත්වයට පිවිසීම පිළිබඳව ප්‍රශ්න කිරීම් වලට භාජනය කර ඇත.

මැතිවරණ සමයේදී දෙමළ ජාතික සංවිධානය ප්‍රසිද්ධ වේදිකාවල පැමිණිලිකරුට එරෙහිව ප්‍රකාශ සිදු කරමින් ජනාධිපති මෛත්‍රීපාල බලයට පත් වුවහොත් ඔහු සිරගත කරන බවට ප්‍රකාශ නිකුත් කර තිබී ඇත.

මෙවන් පසුබිමක් තුළ 2015 අප්‍රේල් හෝ මැයි මාසයේදී පැමිණිලිකරු අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා ප්‍රශ්න කරමින් පෙර පැවති රජය ඔහුට මුදල් සහ තුවක්කු ලබා දුන්නේද යන්නත් වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සමග පැමිණිලිකරුට ඇති සම්බන්ධය කුමක්ද යන්නත් පිළිබඳව ප්‍රශ්න කර ඇති අතර මේ පිළිබඳව දැනගැනීමට අවශ්‍ය නම් එවකට හමුදාපති සරත් ෆොන්සේකාගෙන් විමසන ලෙසට පැමිණිලිකරු අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට පවසා ඇත. තමන් සිරගත කිරීම සඳහා අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව සූදානම් වන බවට පැමිණිලිකරුට අවබෝධ වී ඇත.

2015 ඔක්තෝබර් මාසයේදී අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් පැමිණිලිකරුගේ කාර්යාලය සහ නිවස පරික්ෂාවට ලක් කර ඇත. පැමිණිලිකරුගේ දේශපාලන ප්‍රවේශය සහ ඔහුගේ දේශපාලන ගමන් මග උතුරු නැගෙනහිර දේශපාලන කටයුතු වල නිරත වූ ටී.එන්.ඒ පක්ෂයට සහ දෙමළ ජාතික සන්ධානයට අභියෝගයක් වූ අතර කොටි සංවිධානයේ පරාජයත් ප්‍රභාකරන් මිය යාමත් යන කරුණු වලට පැමිණිලිකරු වග කිව යුතුයි යන විශ්වාසය දෙමළ සංවිධානය විසින් ගොඩ නගා පැමිණිලිකරු ඇතුළු පිරිස දෙමළ ද්‍රෝහීන් ලෙස හංවඩු ගැසීමටත් මෛත්‍රීපාල රජයට සහයෝගය දැක්වූ දෙමළ සන්ධානය කෙසේ හෝ පැමිණිලිකරු සිරගත කළ යුතුය යන

අදිටනින් ක්‍රියා කිරීමත් සිදු විය. මේ අතර පැමිණිලිකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබුණු දුරකථන ඇමතුමක් මත 2015.10.11 දින කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නීතිඥවරයකු මාර්ගයෙන් පෙනී සිට ඇත. ඉන් දවස් 03 කට පමණ පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කර ඇත. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට හේතුවක් පැහැදිලි කර දීමක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොමැත.

අංක බී39592/01/15 නඩුව යටතේ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පැමිණිලිකරු රැඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ තබාගෙන සිටින බවට පැමිණිලිකරු පළමු වන වතාවට අවබෝධ කරගෙන ඇත. පැමිණිලිකරු සඳහන් කළ අන්දමට රැඳවුම් නියෝග යටතේ තබාගෙන සිටින්නේ නම් ඒ පිළිබඳව දැන්වීමක් පැමිණිලිකරු හට ලබා දිය යුතු බවට නෛතික අවශ්‍යතාවයක් ඇතත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එකී නෛතික අවශ්‍යතාවය කඩ කර ඇත. පැමිණිලිකරුට අවබෝධ වූ අන්දමට ඔහු අධිකරණයට ඉදිරිපත් කරන තෙක් වූ කාල සීමාව සඳහා ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවා තබා ගැනීමට ජනාධිපතිතුමා විසින් නිකුත් කළ වලංගු රඳවා තබා ගැනීමේ බලපත්‍රයක් තිබී නොමැත.

පැ.1 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද 2015.10.14 දින දරණ 39592/1/15 බී වාර්තාවේ පැමිණිලිකරු රැඳවුම් නියෝග මත ඉදිරිපත් කරන බවට මහේස්ත්‍රාත්වරයාට කරුණු වාර්තා කළත්, බී වාර්තාවේ සඳහන් කර ඇත්තේ රැඳවුම් නියෝග දීර්ඝ කර ගැනීමට ඉල්ලීමක් කර

තිබෙන බවය. ඉන් අදහස් වන්නේ රඳවා තබා ගැනීම සඳහා නීතිමය අවසරය ලැබී නොමැති බවකි. රැඳවුම් නියෝග මත රඳවා තබා ගන්නා බවට සහතිකයක් පැමිණිලිකරුට නිකුත් නොකිරීමට හේතුව නීත්‍යානුකූලව එවැනි නියෝගයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන නොතිබීම බව පැහැදිලිය. ඉහත සඳහන් පැ.1 බී වාර්තාවේ අවසන් ඡේද දෙකෙහි මෙසේ සඳහන් කර ඇත.

(උපුටා ගැනිම) " ඉහත විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා ලබාගෙන ඇති පැය 72ක කාලය ප්‍රමාණවත් නොවන බැවින් ඉහත සැකකරු 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ වගන්ති 9(1) ප්‍රකාරව 2015.10.04 වන දින සිට ඉදිරියට දින 90ක පමණ කාලයක් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා තබාගෙන විමර්ශන සිදු කිරීම සඳහා රැඳවුම් නියෝග දීර්ඝ කර ගැනීමට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා වෙත ඉල්ලීම් කර ඇත. කඩිනමින් ඊට අදාළ නියෝග ලබා ගැනීමට කටයුතු කරන අතර ඉල්ලීම් කරන ලද ලිපිය මේ සමග ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරමි. අදාළ රැඳවුම් නියෝග අංකයන් ඉහත සඳහන් කර ඇත.

ඒ අනුව මෙම සැකකරු අද දින ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන අතර ඉල්ලුම් කිරීමට අදාළ රැඳවුම් නියෝග ලැබෙන තෙක් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා තබාගෙන ඉදිරි විමර්ශන කටයුතු සිදු කිරීමට අවසර ලබා දෙන මෙන් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලමි. ඉහත සැකකරුවන් තිදෙනාගේ රැඳවුම් නියෝග ලද වහාම මෝසමක් මගින් ගරු

අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි." (උපුටා ගැනිම අවසන්)

බී වාර්තාවේ උක්ත ඡේදයන් අනුව පැහැදිලිව පෙනී යන්නේ පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා තබා ගැනීම සඳහා නීත්‍යානුකූලව රැඳවුම් නියෝග නිකුත් කර නොතිබීම බවය.

පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාව වන විටත් මේ සම්බන්ධයෙන් තවත් දෙදෙනෙකුත් අත්අඩංගුවට ගෙන තිබී ඇත. 2005.10.07 වන දින පැ.2 වශයෙන් ඉදිරිපත් කර ඇති බී වාර්තාවට අනුව ඒ වන විටත් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට රැගෙන අධිකරණය වෙත ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කර ඇත. එකී වාර්තාවේ අවසන් ඡේදයේ සඳහන් කර ඇත්තේද රැඳවුම් නියෝග ලැබෙන තෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා තබාගෙන ඉදිරි විමර්ශන කටයුතු සිදු කිරීමට අධිකරණයේ අවසර ලබා දෙන ලෙසට සිදු කරනු ලබන ඉල්ලීමක් පිළිබඳවය.

දෙමළ ජාතික සංවිධානයේ මන්ත්‍රීවරයෙකු වූ ජෝෂප් පරරාජසිංහම් මහතා ඝාතනය කිරීමෙන් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බවට පසු අවස්ථාවකදී පැමිණිලිකරුට අවබෝධ වී ඇත. කොටි සංවිධානයේ මතය පාර්ලිමේන්තුවේ නියෝජනය කිරීම සඳහා පිහිටුවා තිබූ සංවිධාන වලින් එක් සංවිධානයක් වූයේ දෙමළ ජාතික සන්ධානයයි. ජෝෂප් පරරාජසිංහම් මහතාගේ මෘත දේහයට ඉහළම ගෞරවය ලබා දීමට කොටි සංවිධානය විසින් ක්‍රියා කර ඇති අතර 'උතුම් මානවයා' යන කොටි සංවිධානයේ ඉහළම ගෞරව නාමය ජෝෂප් පරරාජසිංහම් වෙත ලබා දී ඇති අතර කොටි සංවිධානයේ

නායක ප්‍රභාකරන් මෘත දේහයට ගෞරව දැක්වීම සඳහා පැමිණ ඇත. ජෝෂප් පරරාජසිංහම් මෘත දේහයට කොටි සංවිධාන නායක ප්‍රභාකරන් ගෞරව කරන අයුරු දැක්වෙන ඡායාරූප කීපයක් පැ.4 (i),(ii),(iii),(iv) වශයෙන් සලකුණු ඉදිරිපත් කර ඇත.

කොටි සංවිධානය විසින් සිදු කළ විවිධ ඝාතන හේතුවෙන් නැගෙනහිර පලාතේ ද්‍රවිඩ ජනයා විසින් කොටි සංවිධානය ප්‍රතික්ෂේප කර ඇත. පැමිණිලිකරු ඇතුළු 6000ක පමණ කොටි සංවිධානයේ සාමාජික පිරිසක් කොටි සංවිධානයෙන් කැඩී රජය සමග ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එකතු වීම මත කොටි සංවිධානය නැගෙනහිර ප්‍රදේශයෙන් ප්‍රබල පසුබෑමකට ලක් විය. කොටි සංවිධානයේ හොඳ සටන්කාමීන් නැගෙනහිර ප්‍රදේශයේ සිටි බැවින් මෙම තත්වය කොටි සංවිධානයට උදා වී ඇත. මේ හේතුවෙන් මුදල් සොයා ගැනීම අපහසු වීමත් එබැවින් අවි ආයුධ ලබා ගැනීම පිළිබඳව ගැටලුවකුත් පැන නැගුනු අතර ඒ හේතූන් පදනම් කරගෙන කොටි සංවිධානයෙන් ඉවත් වූ පිරිසේ නායකයන් ඝාතනය කිරීම සඳහා කොටි සංවිධානය ක්‍රියාත්මක වී ඇත. එම ඝාතන ක්‍රියාවලිය මගින් බිඳී ගිය කොටි සාමාජික පිරිස් ආපසු නැවත කොටි සංවිධානය වෙත යොමු කරවා ගැනීම අපහසු වූ බැවින්, අනුකම්පාව ඇති කරවීම තුළින් බිඳී ගිය කොටස් ඒකරාශී කර නැවත සංවිධානය කර ගැනීම පිණිස කොටි සංවිධානයේ ජ්‍යෙෂ්ඨ නායකයින් වන ජෝෂප් පරරාජසිංහම් වැනි පුද්ගලයින් කොටි සංවිධානය විසින්ම ඝාතනය කර එම ඝාතන වගකීම් බිඳී ගිය කොටි නායකයින් වෙත පවරා නැගෙනහිර ජනයාගේ අනුකම්පාව ලබා ගැනීමේ ක්‍රියාදාමයක කොටි සංවිධානය නිරතව ඇත.

පැ.5(i) සහ පැ.5(ii) දරණ බී වාර්තාවල පැමිණිලිකරුගේ නම හෝ ඔහුගේ කිසිදු සම්බන්ධයක් සඳහන්ව නොමැත. එකී වාර්තා ජෝෂප් පරරාජසිංහම් ඝාතනයට අදාළ බී වාර්තා වේ. එකී බී වාර්තා මුල් අවස්ථාවේදී වෙනත් අංකයකින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පවත්වාගෙන ගොස් ඇත්තේ රැඳවුම් නියෝග ලබා ගැනීමේ කාර්යය උදෙසා බව පෙනී යයි. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති උක්ත බී වාර්තාවට අදාළ නඩුව 2015.12.10 වෙනි දින වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරමින් අවසන් කර ඇත. එම වාර්තාව පැ.6 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.6 වාර්තාවේ අවසන් ඡේදයෙහි මෙසේ සඳහන් කර ඇත. " එබැවින් මෙම නඩු කටයුත්ත අද දින අවසන් කරන ලෙසත් එහි පිටපත් මඩකලපුව මහේස්ත්‍රාත් උසාවි නඩු අංක බී 1357/05 දරණ නඩුවට ගොනු කිරීම සඳහා යවන ලෙස රෙජිස්ට්‍රාර්වරයාට නියෝග කරන ලෙසත් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලමි."

පැමිණිලිකරු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත්තේ ඔහු නිරීක්ෂණය කිරීමේ කාර්යය සඳහා පමණක් බවට 2015.11.04 දිනැති පැ.7 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති බී වාර්තාවෙන් පෙනී යයි. එකී බී වාර්තාවේ අවසාන ඡේදයේ මෙසේ දැක්වේ. " 2015.10.14 දින ගරු අධිකරණයෙන් ලබා දෙන නියෝගය ප්‍රකාරව තෙවන සැකකරු වන සිවනේෂතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන් යන සැකකරු පමණක් ගරු අධිකරණයේ නිරීක්ෂණය සඳහා අද දින ඉදිරිපත් කරන අතර එම සැකකරු නැවත නිරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට වෙනත් දිනයක් ලබාදෙන මෙන්

අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලමි. මෙම සැකකරුගේ රැඳවුම් නියෝග කාලය 2016.01.13 වන දින දක්වා බලාත්මකව පවතී.”

2015.12.02 වන දින පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරගත කිරීමට අදාළ බී වාර්තාව පැ.9 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරුගෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රශ්න කිරීම් සිදු කර ඇත්තේ අයි.පී වික්‍රමසිංහ සහ පොලිස් සැරයන් 27695 සිරිවර්ධන විසිනි. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත පැමිණිලිකරු ඉදිරිපත් කරමින් රැඳවුම් නියෝග ලබාගෙන ඇති බවට අඟවමින් එහෙත් රැඳවුම් නියෝග නොමැතිව මහේස්ත්‍රාත්වරයාගේ නිරික්ෂණ සඳහා පැමිණිලිකරු ඉදිරිපත් කිරීම ප්‍රධාන පොලිස් පරික්ෂක විමලසිරි සහ පොලිස් පරික්ෂක ජයසේකර විසින් සිදු කර ඇති බව පැ.6 සහ පැ.7 ලේඛන වලින් සනාථ වේ.

මහාධිකරණයේදී අධි චෝදනා පත්‍ර බාර දෙන අවස්ථාවේදී 127 වගන්තිය යටතේ සිදු කළා යැයි කියනු ලබන ප්‍රකාශ දෙකක් පැමිණිලිකරුට ලබා දී ඇත. එම ප්‍රකාශ පැ.10 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. එහි සිංහල පරිවර්තනය පැ.11 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී ලේඛනයන්හි සඳහන්ව ඇති අන්දමට එම සැකකරුවන් දෙදෙනා ඉදිරිපත් කර ඇත්තේ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ අයි.පී ජයසේකර සහ පොලිස් පරික්ෂක සිරිවර්ධන විසිනි.

එම ප්‍රකාශයේ ආරම්භයේදී මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කළ පැහැදිලි කිරීම පැ.11අ යන්න වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත. මහේස්ත්‍රාත්වරයා එකී පැහැදිලි කිරීම් වල මෙසේ සඳහන් කර ඇත. “ “මෙම සැකකරුවන් ඉදිරිපත් කොට අදාළ සිද්ධිය සම්බන්ධයෙන්

තවදුරටත් පරික්ෂණ පැවැත්වෙමින් තිබෙන බවට පවසා සැකකරුවන් දෙදෙනා මා ඉදිරිපිට පාපොච්චාරණය ලබා දෙන ලෙස පවසා ඉදිරිපත් කරයි. මා ඔවුන්ගේ ප්‍රකාශය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වන වගන්තිය යටතේ අවධානයට ගෙන සැකකරුවන් දෙදෙනාටම චෝදනාව පිළිබඳව කරුණු පවසා එම දෙදෙනාගෙන් තමන් පාපොච්චාරණය දෙනවා දැයි අසා, එලෙස ඔබලා පවසන ප්‍රකාශය ඔබලාට විරුද්ධව හෝ පක්ෂව පරික්ෂණයේදී භාවිතා කළ හැකි බව පවසා ඔවුන්ව සිතා බලා තීරණයක් ගැනීම සඳහා බන්ධනාගාර නිලධාරින් වෙත භාර දුනිමි. ඉන්පසුව මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශය සටහන් කර ගැනීම සිදු කර ඇත.

පැ.10 සහ 11 දරණ ප්‍රකාශය සිදු කර ඇත්තේ එඩ්වින් සිල්වා ක්‍රිෂ්ණානන්දරාසා නැමති පුද්ගලයෙකු විසිනි. එම පුද්ගලයාගෙන් මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කළ ප්‍රශ්න කීපයක් සහ උත්තර කීපයක් පැ.11ආ, පැ.11ඇ, පැ.11ඉ යන්න ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.11අ යන්න පහත සඳහන් පරිදි වේ;

> "ප්‍ර: ඔබගෙන් පොලිසිය ප්‍රශ්න කරන විටදී ඔබට බියක් වගේ දැනුණාද?
>
> උ: ඔව්

පැ.11 ඇ යන්න පහත සඳහන් පරිදි වේ;

> ප්‍ර: ඔබ පැවසුවා පොලිසිය ප්‍රශ්න කරන විටදී ඔබට බියක් දැනුණා කියා. එසේ නම් ඇයි මෙම පාපොච්චාරණය කරන්නේ. පොලිසිය ඔබව කිසියම් පෙළඹවීමක් කළාද?

උ: ඔව්

පැ.11 ඉ යන්න පහත සඳහන් පරිදි වේ;

මහේස්ත්‍රාත්තුමා: ඇයි එලෙස පාපොච්චාරණය ලබා දීමට කැමති වන්නේ?

සැකකරු: මෙම ප්‍රශ්නයේදී මා සැකකරු ලෙස සිටින හෙයින් මෙයින් මා නිදහස් වියයුතු නිසා.

මේ අනුව ඉතාමත් පැහැදිලි ලෙසම පැමිණිලිකරුට නඩු විභාගයේදී යොදා ගන්නා ලද සාක්ෂි අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් වුවත් එම ප්‍රකාශය ස්වේච්ඡාවෙන් සිදු නොකළ බවට සනාථ කෙරෙන සාක්ෂි එම ප්‍රකාශය තුළින්ම ලැබී ඇත.

සැකකරුවෙකු ලෙස ඉදිරිපත් කළ ගුණසිංහ ආරච්චිලාගේ තරිඳු මධුශංක විසින්ද අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් සිදු කර ඇති අතර එකී ප්‍රකාශය වෙනත් මහේස්ත්‍රාත්වරයෙකු විසින් සටහන් කරගෙන ඇත. එම ප්‍රකාශය පැ.12 වශයෙන්ද එහි සිංහල පරිවර්තනය පැ.13 වශයෙන්ද සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.13 ප්‍රකාශයෙහි පැ.13අ යන්න සහ පැ.13ආ යන්න වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද කොටස් මෙහි පහත උපුටා දක්වා ඇත.

පැ.13අ යන්න ප්‍රකාශ කොටස මෙසේය.

" ඔවුන් මාව අත්අඩංගුවට ගෙන මා හට පහර දුන්හ. මෙය පිටතට පවසන්න එපා යැයි ඔවුන් කීහ. සාක්ෂි තිබෙන බව ඔවුන් පැවසූහ. මේ පිළිබඳව

අධිකරණයට පවසන්න යැයි ඔවුන් මා හට කීහ. වැලිකන්දේ සිට වෑන් රථයකින් හත් අට දෙනෙකු මඩකලපුව කඳවුරට පැමිණ සිටි බවත් ඉන් අනතුරුව දේවස්ථානයට ඔවුන් ගිය බවත්, ඉන් හතර දෙනෙකු බැස ඇතුලට ගොස් පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝෂප් පරරාජසිංහම් මහතාට වෙඩි තබා ඝාතනය කොට පිටතට ගිය බවත් තමා වෙඩි තැබීම සඳහා නොගිය බවත් හතර දෙනෙකු පමණක් වෙඩි තැබීම සඳහා ගිය බවත් හතර දෙනාම වෙඩි තබා පැමිණීමෙන් අනතුරුව යුධ හමුදා කඳවුරට ගිය බවත්, ඉන් අනතුරුව එහි ආහාර අනුභව කොට පසුව වැලිකන්ද යුධ හමුදා විමර්ශන කඳවුරට ගිය බවත් එහි සිටි යුධ හමුදාවේ දෙදෙනෙකු වැලිකන්ද කඳවුරින් තීවුච්චේනෙයි නැමති ග්‍රාමයට යන ලෙස පැවසූහ."

පැ.13ආ යන්නෙහි මෙසේ සඳහන් වේ.

"ඉන් අනතුරුව එම ග්‍රාමයට නොගොස් පිටත එක් කඩයක රැඳී සිටි බවත් පසුව පැය බාගයකට පසු ගමට යන ලෙස පැවසූ බවත් මා හට පැවසීය. මා මේ පිළිබඳව කිසිවක් නොදනිමි. මඩකලපුව බන්ධනාගාරයේ සිටින පිල්ලෙයාන් නැමැත්තාට මේ නඩුවට සම්බන්ධයක් ඇති බව අධිකරණයේ පවසන ලෙස සී.අයි.ඩී මා හට කීහ...... මා හට යුධ හමුදා විමර්ශන ඒකකයේ රැකියාවක් ලබා දෙන බවද සී.අයි.ඩී මා හට පවසන ලදී."

ඉහත සඳහන් කළ, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ලබා ගත්තා යැයි සඳහන් කළ පැමිණිලිකරුට එරෙහි නඩු විභාගයේදී යොදා ගෙන ඇති එකී සාක්ෂි වලින් ඉතා හොඳින් පැහැදිලි

වන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පුද්ගලයින් දෙදෙනෙකු යොදවා ඔවුන්ගෙන් ලබා ගත් අසත්‍ය ප්‍රකාශයන්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ලබා ගත් ප්‍රකාශ ලෙසට වර්ණ ගන්වමින් මහාධිකරණය ඉදිරියේ පැවති නඩු විභාගයට ඉදිරිපත් කර පැමිණිලිකරු ජෝෂප් පරරාජසිංහම් ඝාතනය සඳහා වගකිව යුතු පුද්ගලයා ලෙසට මහාධිකරණයට ඒත්තු යන ලෙස අසත්‍ය සාක්ෂි නිර්මාණය කර ඉදිරිපත් කර ඇති බවය.

මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණිලිකරුට එරෙහිව අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමෙහි යෙදී ඇත.

පැ.11 හි සඳහන් මෙම පාපොච්චාරණය ස්වකීය කැමැත්තෙන් ලබා දුන් පාපොච්චාරණයක් නොවන බැවින් මහාධිකරණ නීති කෘත්‍යයෙන් එම සාක්ෂි ඉවත් කිරීමට පැමිණිලිකරු, එකී නඩුවේ විත්තිකරු වශයෙන් ඉල්ලා ඇත. ඒ අනුව පැ.11 හි පාපොච්චාරණය ස්වේච්ඡාවෙන් සිදු කලේද නැද්ද යන්න සොයා බැලීම සඳහා අතුරු පරීක්ෂණයක් මහාධිකරණයේදී සිදු කර ඇත. එකී පරීක්ෂණයේ සාක්ෂිවල පරිවර්තනයේ පිටපතක් පැ.14 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් පැමිණිලිකරු සඳහන් කළේ එකී පපොච්චාරණය සටහන් කරගනු ලැබූ අවස්ථාවේදි එය මහේස්ත්‍රාත්වරයා විසින් සටහන් නොකල බවත් ලඝු ලේඛිකාවක් කැඳවනු ලදුව, පාපොච්චාරණය සිදු කරනු ලබන විට ලඝු ලේඛිකාව විසින් ලඝු ලේඛන භාෂාවෙන් පාපොච්චාරණය සටහන් කරගෙන ඇයගේ කාර්යාලය වෙත ගොස් යතුරු ලියනය කළ බවත්,

පාපොච්චාරණය සිදු කළ පුද්ගලයා ලඝු ලේඛිකාව සිටි ස්ථානයට ගොස් එකී ලේඛනයට අත්සන් කළ බවත්ය.

මේ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයගේ සාක්ෂියේ දී ඔහු සඳහන් කළ කරුණු එකිනෙකට නොගැලපෙන විස්වාස කළ නොහැකි කරුණු වේ. පැ. 15 ලේඛනයේ 25 වන පිටුවේ ඔහු සඳහන් කරන්නේ "කටඋත්තරය ලඝු ලේඛිකාව මගින් යතුරු ලියනය කර ගත් බවය" . එසේ ප්‍රකාශ කළ ද පැ.15 ලේඛනයේ 27 වන පිටුවේ මහේස්ත්‍රාත්වරයා සඳහන් කර ඇත්තේ "යතුරු ලියනය සහ ලඝු ලේඛනය එකම අවස්ථාවේ සිදු වූ බවය" . මහේස්ත්‍රාත්වරයා එය තවත් පැහැදිලි කරමින් මෙසේ සඳහන් කර ඇත. "ලඝු ලේඛනය මගින් අඩක් ලියා නතර කොට පරිගණකයේ යතුරු ලියනය කළා" .

මෙම සාක්ෂි කණ්ඩ දෙස බැලීමේ දි පැහැදිලිව පෙනී යන්නේ මහේස්ත්‍රාත්වරයා මුළුමනින්ම අසත්‍ය ප්‍රකාශයක් සිදු කළ බවය. එසේ නැතහොත් ඔහු මනෝවිකාරයෙන් නන්දොඩවන බවය. මහේස්ත්‍රාත්වරයා එසේ සඳහන් කළත්, ලඝු ලේඛනය සහ යතුරු ලියනය එකම අවස්ථාවක කළ නොහැකිය.

එසේම අනෙක් අතට ලඝු ලේඛනය අඩක් සිදු කර එය නැවත යතුරු ලියනය සිදු කළේ නම් එයද මනෝවිකාරයෙන් සිදු කරන ක්‍රියාවකි. ඒ මන්ද කිසි කරදරයක් නොමැතිව එක දිගටම යතුරු ලියනය කිරීමේ හැකියාව තිබෙන බැවිනි.

මෙම කරුණු සමස්ථයක් ලෙස විශ්ලේෂණය කිරීමේදී පිළිගත හැකි එකම සාක්ෂිය වන්නේ පැමිණිලිකරු සඳහන් කරන ලෙසට ලඝු ලේඛිකාව ලඝු ලේඛනය කර ඇයගේ කාමරයට ගෙන ගොස් එය

යතුරු ලියනය කර ඇය විසින් පාපොච්චාරණය සිදු කළ පුද්ගලයාගේ අත්සන ලබා ගත් බවය.

පාපොච්චාරණය සිදු කළ සැකකරුවන් දෙදෙනා බන්ධනාගාර නිලධාරින් මගින් ඉදිරිපත් කළ බවට මහේස්ත්‍රාත්වරයා තම සාක්ෂියේ දී සඳහන් කර ඇතත් ඔහුගේ සටහන් වල ඔහු යොදා ඇත්තේ " කොළඹ අපරාධ විමර්ශන අංශයට අයත් IP ජයසේකර, පොලිස් සැරයන් 27695 සිරිවර්ධන යන නිලධාරින් දෙදෙනා සැකකරුවන් රෙංගසාමි කනකනායගම් හා එඩ්වින් සිල්වා, ක්‍රිෂ්ණානන්දරාජා නොහොත් ප්‍රදිප් මාස්ටර් යන අයවලුන්ව එදින පස්වරු2.00 ට පමණ මාගේ නිල මැදිරියට ඉදිරිපත් කළා යනුවෙනි" .

මේ අනුව බන්ධානාගර නිලධාරින් මගින් සැකකරුවන් ඉදිරිපත් කළ බවට මහේස්ත්‍රාත්වරයා අසත්‍ය ප්‍රකාශයක් සිදු කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලැබූ සැකකරුවන් දෙදෙනා බියවී සිටි බවටත්, ඔවුන් හට යම්කිසි පෙළඹවීමක් සිදු කර තිබෙනවා දක්නට ලැබූ බවත්, එම අවස්ථාවේ දී එය මහේස්ත්‍රාත්වරයාට දැන ගන්නට ලැබුණු බවත්, මහේස්ත්‍රාත්වරයා තම සාක්ෂියේ දී සඳහන් කර ඇත.

මේ අනුව පැමිණිකරුට එරෙහිව ප්‍රධාන සාක්ෂි වශයෙන් භාවිතා කළ පාපොච්චාරණයන් ස්වේච්චාවෙන් සිදු කළ පාපොච්චාරණයන් බවට නඩු විභාගයේ දී ඉදිරිපත් වී ඇති සාක්ෂි මගින් ඔප්පු වී නැත.

සැකකරුවන් භාරව සිටි බන්ධනාගාර නිලධාරියා වශයෙන් සඳහන් කළ සාලිදීන් මොහම්මදු නාවාස් සාක්ෂි දෙමින් සඳහන් කළේ (පැ.19), නිල මැදිරියට OIC ඇතුළු පිරිසට පැමිණෙන ලෙසට,

මහේස්ත්‍රාත්වරයාගේ දැනුම් දීම මත අධිකරණයේ රාජකාරි කරන නිලධාරියෙකු මාර්ගයෙන් ඔවුන් වෙත කැඳවීම් නියෝගයක් ලැබුණු බවය.

සාක්ෂිකරු වැඩිදුරටත් සඳහන් කළේ මහේස්ත්‍රාත් නිල මැදිරිය වෙත අදාළ සැකකරුවන් දෙදෙනාව එම නිලධාරියා එනම්, සුදු කමිසයක් සහ කළු කලිසමක් පැළඳ සිටි නිලධාරිය විසින් කැටුව ඇතුළට යාමෙන් පසු අධිකරණයේ රාජකාරයේ නිරතව සිටි නිලධාරියෙකු, Prison පුද්ගලයින් කැටුව එන ලෙසට පැවසූ අවස්ථාවේ දී මා සහ මගේ සහයට සිටි නිලධාරියෙකු වන ඩිලක්ෂන් නැමැත්තා සමග මහේස්ත්‍රාත් නිල මැදිරියට ඇතුළු වූ බවය. මෙම සාක්ෂියෙන් පැහැදිලි වන්නේ සැකකරුවන් දෙදෙනා මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර ඇත්තේ බන්ධනාගාර නිලධාරින් විසින් නොවන බවය. බන්ධනාගාර නිලධාරින් නිල මැදිරියට පිවිස ඇත්තේ පසු අවස්ථාවක දීය. ඒ අනුව මෙම බන්ධනාගාර නිලධාරියාගේ සාක්ෂිය පෙර සාක්ෂි සනාථ කරයි.

මෙම බන්දනාගාර නිලධාරියාගේ සාක්ෂියෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ සැකකරුවන් මහේස්ත්‍රාත්වරයා විසින් විමසනු ලැබූ ප්‍රශ්න වලට පිළිතුරු ලබා දුන් බවත්, කාන්තා නිලධාරිනියක විසින් එය සටහන් කර ගත් බවත්ය. ඉන් පසුව 01 සහ 02 සැකකරුවන් රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙසට තමන්ට පැවසූ බවත්, සැකකරුවන් දෙදෙනා එක් කරගෙන ඉහල මාලයේ ටයිප් කරමින් සිටින ස්ථානයට ගොස් එය බැලීමෙන් පසුව අත්සන් තබන ලෙසට සාක්ෂිකරුට සහ සැකකරුවන් දෙදෙනාට මහේස්ත්‍රාත්වරයා දැනුම් දුන් බවත්ය.

ඉන්පසු සාක්ෂිකරු සැකකරුවන් දෙදෙනා සමග නිල මැදිරියේ සිට ඉහල මාලයට ගිය බවත්, නිල මැදිරියට පැමිණි කාන්තාවන් දෙදෙනා

ඉහල මාලයේ එරාවූර් සංචාරක අධිකරණය යන කොටසේ සිටි බවත්, ඔවුන් දෙදෙනා පරිගණක දෙකක වාඩි වී පරිගණකයේ යතුරු ලියනය කරමින් සිටි බවත්, විනාඩි 10 පමණ පසුව දෙවන සැකකරු ප්‍රදිප් මාස්ටර් කැඳවා පරිගණකයේ තිබුන දේ කියවා පෙන්වන්නම් එය හරිදි බලන්න කියා කාන්තා නිලධාරිනිය පැවසූ බවත්, සැකකරු එම ප්‍රකාශයට අත්සන් කළ බවත්, මහේස්ත්‍රාත්වරයා එම ස්ථානයට නොපැමිණි බවත් සාක්ෂියේ දී වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙම සාක්ෂියෙන් ද පැහැදිලිව පෙනී යන්නේ පාපොච්චාරණයන් සටහන් කර ගැනීම සම්බන්දයෙන් තමන් අනුගමනය කළා යැයි සාක්ෂියෙදී මහේස්ත්‍රාත්වරයා සඳහන් කළ කරුණු සියල්ලක්ම අසත්‍ය බවය.

ඒ අනුව මෙම පාපොච්චාරණ කිනම් අයුරකින්වත් සාක්ෂියක් වශයෙන් භාවිතා කළ හැකි නීත්‍යානුකූල ප්‍රකාශයක් ලෙසට පිළිගත නොහැකිය.

පැ.17 ලේඛනයට අනුව බන්ධනාගාර ජේලර් ඇන්ටනි ඩිලක්ෂන් සඳහන් කර ඇත්තේ ද, " විත්තිකරුවන්ව ඉදිරිපත් කළ CID ය ඔවුන් සමග කතා කරමින් සිටි බවය" .

මේ අනුව මෙම කරුණු සියල්ල සමස්ථයක් ලෙස ගෙන බැලීමේ දී පැමිණිලිකරු මනුෂ්‍ය ඝාතනයක වරදකරු කිරීමට ඉදිරිපත්ව ඇති ප්‍රධාන සාක්ෂි මුළුමනින්ම විශ්වාස කළ නොහැකි තත්ත්වයකට පත්ව ඇත. පාපොච්චාරණයන් දෙක ස්වේච්චාවෙන් කළ බවට සනාථ නොවන බැවින් එකී පාපොච්චාරණයන් පැමිණිලිකරුට එරෙහිව සාක්ෂි ලෙස මෙහෙයවිය නොහැකි බැවින් මහාධිකරණ

විනිශ්චයකාරවරයා එම සාක්ෂි මත පිහිටා පැමිණිලිකරු වරදකරු කිරීම ද නිත්‍යානුකූල නොවේ.

පාපොච්චාරණයන් සිදු කිරීමේ දී සැකකරුවන් දෙදෙනාට බලපෑම් සහ තර්ජන කිරීම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කළ බව ඉතාමත් පැහැදිලිය. එසේම සැකකරුවන් දෙදෙනා පාපොච්චාරණය සිදු කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලද්දේ බන්ධනාගාර නිලධාරීන් විසින් නොව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් බව ඉතාමත් පැහැදිලිව ඔප්පු වී ඇත. බන්ධනාගාර නිලධාරින් දෙදෙනා නාමිකව එම ස්ථානායේ පෙනී සිටිය බවද පැහැදිලිව ඔප්පු වී ඇත.

කරුණු මෙසේ හෙයින් පැමිණිලිකරු වරදකරු කිරීම සඳහා මහාධිකරණයේ දී ඉදිරිපත් වී ඇති සාක්ෂිවල ඉතාමත් ප්‍රබල සැකයන් මතුවී ඇති බැවින් එම සැකයේ වාසිය අනිවාර්යෙන්ම නඩුවේ විත්තිකරුවෙකු වන මෙම පැමිණිලිකාර සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තාන් ලැබිය යුතු අතර අපරාධ නීතියේ මූල ධර්ම අනුව සාධාරණ සැකයේ වාසිය ලැබීය යුතු බැවින් සිවනේසතුරෙ චන්ද්‍රකාන්තන් ඔහුට එරෙහිව ඉදිරිපත්ව සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස් විය යුතුය.

සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස්විය යුතු සිවනේසතුරෙ චන්ද්‍රකාන්තන් දැනටමත් අවුරුදු 05 කට ආසන්න කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතව සිටිමෙන් නීතිය ඉදිරියේ යුක්ති සහගත නොවන දඬුවමකට පාත්‍රාවි ඇති බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇත.

මේ අනුව දැනටමත් වරදකරුව සිටින සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලේයාන්ට යුක්තිය ඉටු කිරීම උදෙසා ඔහුට අඩුතරමින් ජනාධිපති සමාවක් ලබා දීම ඉතාමත් සුදුසු බවට මෙම කොමිෂන් සභාව ඒකමතිකව නිර්දේශ කරයි.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.01 සිට පැ.20 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .XXV

පැමිණිලි අංකය - 1116 / 2020

පැමිණිලිකරු - ජාලිය චිත්‍රාන් වික්‍රමසූරිය

ලිපිනය - නො:65/58, 1 වන පටුමග, කටුවාන පාර, හෝමාගම.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. ජනාධිපති නීතිඥ උපුල් ජයසූරිය
2. ප්‍රසාද් කාරියවසම්
3. සී.ඒ.එච්.එම්.විජේරත්න
4. රවිනාථ ආරියසිංහ
5. ප්‍රියාංග වික්‍රමසිංහ
6. පූජිත වික්‍රමසිංහ
7. රවී වෛද්‍යාලංකාර
8. පවිත්‍ර දයාරත්න
9. සංජීව ප්‍රනාන්දු

තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර ජාලිය චිත්‍රාන් වික්‍රමසූරිය යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, ජාලිය චිත්‍රාන් වික්‍රමසූරිය මහතාට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ බී 21/2016 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර ජාලිය චිත්‍රාන් වික්‍රමසූරිය නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි පැමිණිලිකරුට එරෙහිව ඇමරිකානු රජය විසින් පනවා ඇති විදේශ ගමන් තහනම ඉවත් කරලීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඊට අවශ්‍ය කෙරෙන නියෝග සහ හෝ නිවේදන ඇමරිකානු රජය වෙත යවා පැමිණිලිකරුට එරෙහිව ක්‍රියාත්මක වන එකී විදේශ ගමන් තහනම ඉවත් කරවා ගැනිම සඳහා ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය

වහාම ක්‍රියාත්මක විය යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරනු ලබයි.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,

   නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

5. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම

නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

6. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දීම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පැමිණිලිකාර ජාලිය චිත්‍රාන් වික්‍රමසූරිය ඇමරිකාවේ ජෝර්ජියා ප්‍රාන්තයේ, වියානා කොට්, මැක්ඩෝනා, යන ස්ථානයේ සිට ස්කයිප් තාක්ෂණයේ මෙම කොමිෂන් සභාව සමග සම්බන්ධවෙමින් ඔහුගේ සාක්ෂිය ලබා දී ඇත. පැමිණිලිකරුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඇමරිකාවේ ශ්‍රී ලංකා තානාපති රොඩ්නි පෙරේරා මහතා වොෂින්ටන් ඩී.සී වල සිට එම අවස්ථාවේදීම ස්කයිප් තාක්ෂණය ඔස්සේ කොමිෂන් සභාව සහ සම්බන්ධ විය.

2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පැමිණිලිකරු ඇමරිකාවේ ශ්‍රී ලංකා තානාපති ලෙස සේවය කර ඇති අතර එම කාල සීමාවේදී එල්.ටී.ටී.ඊ. ඩයස්පෝරාවේ ඇති වූ විරුද්ධවාදිකම්වලට එරෙහිව ක්‍රියාකිරීමෙහි නිරතව සිට ඇත. 2014 වසරේ නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන පැමිණිලිකරු නැවත ඔහුගේ ව්‍යාපාරික කටයුතු සඳහා 2016 නොවැම්බර් මස 16 වන දින ඇමරිකාව බලා පිටත්ව යාමට

ගුවන් තොටුපලට ගියත් මූල්‍ය අපරාධ කොට්ඨාසය මගින් විදේශ ගමන් තහනමක් පනවා තිබූ බැවින් ඔහුට ආපසු හැරී එමට සිදු වී ඇත. ඉන්පසුව 2016.11.17 වන දින පැමිණිලිකරු මූල්‍ය අපරාධ කොට්ඨාසය වෙත කැඳවා ප්‍රශ්න කර ඇත. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු සකස් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් පැ.03 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී දිවුරුම් ප්‍රකාශයේ පැමිණිලිකරු ඔහුට සිදුවූ අසාධාරණය විස්තර කර ඇත.

මූල්‍ය අපරාධ කොට්ඨාසයට කැඳවනු ලැබූ පැමිණිලිකරුට අන්තර්ජාලයේ ඊ නිවුස් යන නාමය යටතේ පළ වූ ලිපියක් පෙන්වා ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන බවත්, ඒ පිළිබඳ පැමිණිල්ලක් අරලියගහ මන්දිරයේ පිහිටා ඇති දූෂණ විරෝධී කාර්යාලය මගින් ජනාධිපති නීතිඥ උපුල් ජයසූරිය නැමැති පුද්ගලයෙකු මාර්ගයෙන් පරීක්ෂණය පැවැත්වීම සඳහා උපදෙස් දී ඇති බවත් දැනුම් දී ඇත. තමන්ට ඉහළින් ලැබෙන නියෝග මත ක්‍රියාකරන බවත් එබැවින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරින්ගෙන් ඒ පිළිබඳව විමසීම් නොකරන ලෙසටත් පැමිණිලිකරුට අවවාද කිරීමක් ද සිදු කර ඇත.

පැමිණිලිකරුගේ පවුලේ විස්තර ඔහු ඇමරිකාවේ ජීවත්ව සිටි කාලයේ දී ඔහු පිළිබඳ තොරතුරු එවකට ආරක්ෂක ලේකම් වාර්තමාන ජනාධිපතිතුමාගේ පුත්‍රයා සහ අනෙකුත් පවුලේ සමාජිකයින් පදිංචිව සිටින ස්ථාන, බැසිල් රාජපක්ෂ මහතාගේ පවුලේ විස්තර ආදිය පිළිබඳ විස්තර අසමින් පැමිණිලිකරුට අසත්‍ය චෝදනා නැඟූ බවත් එම චෝදනා ප්‍රතික්ෂේප කළ බවටත් සාක්ෂියේ දී වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙම ප්‍රශ්න කිරීම් වලට අමතරව වොෂින්ටන් නගරයෙන් තානාපති කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් මිලදී ගැනීමක් පිළිබඳව ද ප්‍රශ්න කර ඇත. මෙම මිලදී ගැනීම පැමිණිලිකරු විසින් සිදු කර ඇත්තේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත ක්‍රියාකරමින්ය. ඒ පිළිබඳව උපදෙස් ඇතුළත් කැබිනට් පත්‍රිකාවක් නිකුත් කර ඇති අතර මිලදී ගැනීම කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත. මේ පිළිබඳව පැමිණිලිකරු පැය ගණනාවක් ප්‍රශ්න කිරීමට ලක්කර ඇති අතර ඔහු  නිදිවර්ජිතව මෙම ප්‍රශ්න කිරීම් වලට පැය ගණනක් එක දිගට නිදිවර්ජිතව පිළිතුරු දීමෙන් පැමිණිලිකරු මානසික පීඩනයකට පත්ව ඇත. ප්‍රශ්න කිරීම් වලට මුහුණ දීම සඳහා පසුදින පැමිණීමට පැමිණිලිකරු අවස්ථාව ඉල්ලා ඇතත් සහකාර පොලිස් අධිකාරි පවිත්‍ර දයාරත්න එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත.

මෙම අවස්ථාවේ දී ලැබුණු දුරකතන ඇමතුමකින් පැමිණිලිකරු මධ්‍යම රාත්‍රිය තෙක් තබා ගෙන අත්අඩංගුවට ගන්නා ලෙසට උපදෙස් ලැබී ඇති අතර මධ්‍යම රාත්‍රියේ දී පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන බවට පැමිණිලිකරුට ඇගවීමක් කර ඇතත් පසු දින අධිකරණයට ඉදිරිපත් නොකර නැවත මූල්‍ය අපරාධ කොට්ඨාසයට ගෙනවිත් පැමිණිලිකරු නැවත පැය කිහිපයක ප්‍රශ්න කිරීම් වලට ලක්කර ප්‍රකාශය අවශ්‍ය පරිදි වෙනස් කර පැමිණිලිකරුගේ අත්සන ලබා ගෙන ඇත. පැමිණිලිකරු සඳහන් කළ අන්දමට මේ අවස්ථාව වන විට ඔහු නිදි නොමැතිව දින 02 ක කාලයක් පොලිස් ස්ථානයේ ගත කර ඇත.

ඒ අනුව ඇමරිකා එක්සත් ජනපදයේ නව තානාපති ගොඩනැගිල්ල මිලදී ගැනීමේ දි පැමිණිලිකරු රාජ්‍ය දේපල අවභාවිතා කිරීම සහ

සාදවා පරිහරණය කළ බවට මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ගොනු කළ බී වාර්තාවේ සඳහන්ව ඇත.

මෙම ගනුදෙනුවේ දී පැමිණිලිකරු විසින් යම් මුදලක් අවභාවිතා කළ බවට කරුණු කිසිවක් විගණන වාර්තා මගින් හෙළිවී නැත. 2016.11.17 වන දින මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයට පත් කර ඇත.

පැමිණිලිකරු සොයා දැනගත් අන්දමට ඔහුට එරෙහිව දූෂණ විරෝධී කමිටුවෙන් පැමිණිල්ලක් ලැබී නොමැති අතර උපුල් ජයසූරිය නැමැති පුද්ගලයෙකු විසින් එවන ලද පැමිණිල්ලක් මත මෙම පරීක්ෂණය ආරම්භ වී ඇත. ප්‍රශ්නයට භාජිත ගනුදෙනුව සම්බන්ධයෙන් සිදු කෙරෙනු විගණන විමසුම් අනුව මෙම ගනුදෙනුවෙන් රජයට කිසිදු පාඩුවක් හෝ අනර්ථයක් සිදු වී නොමැත. පැමිණිලිකරු සඳහන් කළ අන්දමට මෙම ගනුදෙනුව සඳහා පැමිණිලිකරුගේ සහයෝගය ලබා දී ඇතත් එය ක්‍රියාත්මක කර ඇත්තේ තානාපති කාර්යාලයේ පරිපාලන හා ගිණුම් අංශ නිලධාරීන් විසින් දේපල එජන්තවරයාගේ ඉල්ලීම අනුව මිලදී ගැනීමේ ගාස්තුව අඩු කර ගැනීම සඳහා සිදු කළ Non-disclosure agreement එකට අත්සන් කිරීමෙන් පසුවය. මෙම ගිවිසුම අත්සන් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයට ඩොලර් ලක්ෂ 02 ක ප්‍රමාණයක් ඉතුරු කර ගැනීමට ද හැකි වී ඇත. කෙසේ වෙතත් මෙම ගිවිසුමට අත්සන් කිරීම පවා පැමිණිලිකරු එකඟවී ඇත්තේ එවකට විදේශ සේවා අමාත්‍යාංශයේ ලේකම් වූ කරුණාරත්න අමුණුගම මහතාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුවය. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මෙම කරුණු කිසිවක් මහේස්ත්‍රාත් අධිකරණය වෙත

වාර්තා නොකිරීමෙන් අධිකරණය නොමග යැවීමක් සිදු කර ඇත. මුදල් ගෙවීම සඳහා තානාපති කාර්යාලයෙන් ගෙවන ලද චෙක්පතේ පිටපතක් පැ.05 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ඉහත සඳහන් කළ ගනුදෙනුවේ සැබෑ තත්ත්වය හෙළිදරව් නොකිරීම තුළින් පැමිණිලිකරුට මාස 04 ක පමණ කාලයක් රක්ෂිත බන්ධනාගාරයේ ගත කිරීමට ද සිදු වී ඇත. තානාපති කාර්යාලය තුළ කිසිදු මුදල් අවභාවිතයක් සිදු වී නොමැති බව පෙන්වීම සඳහා රජයේ විගණකාධිපති විසින් සකස් කරන ලද 2012, 2013, 2014 වර්ෂ වල වාර්ෂික ගිණුම් වාර්තාවන් ඉදිරිපත් කර ඇත.

මෙම කාලසීමාවේ දී පැමිණිලිකරුට ඇති වූ හෘර්ද රෝග තත්ත්වයන් කරණ කොට ගෙන හදිස්සි සැත්කම් සඳහා රෝහල්ගත වීමටද සිදු වී තිබේ. මෙම කාලසීමාවේ දී පැමිණිලිකරුගේ පුත්‍රයා පියාට සිදුවූ ඉරණම දැකීමෙන් ඔහු මානසික විශාධි තත්ත්වයට පත්ව මනෝවිකිත්සක ප්‍රතිකාර ලබා ගැනීමට සිදු වී ඇත. එම වාර්තා පැ.07 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

රක්ෂිත බන්ධනාගාරගතව සිට මාස 04 ක පසු පැමිණිලිකරු ඇපමත මුදාහැරිමක් සිදු කර ඇති අතර ඔහු අක්ෂි ශල්‍ය කර්මයකට ද භාජනය කර ඇත. ඔහුගේ ඇසේ පෙනීම සම්පූර්ණයෙන්ම නැතිවී ගොස් ඇත. පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරගතව සිටි කාලසීමාවේ දි අක්ෂි රෝගයට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට බන්ධනාගාර නිලධාරින් යුහුසුළු නොවීම කරණ කොට ගෙන මෙම තත්ත්වය උදාවී ඇත. තම ඇසේ පෙනීම ලබා ගැනීම සඳහා පැමිණිලිකරු ඇමරිකා එක්සත් ජනපදයේ ශල්‍ය කර්මයක් සඳහා පැමිණෙන ලෙසට දැනුම් දී ඇති ලිපියක් පැ.09

වශයෙන් ද විදේශ රටක ප්‍රතිකාර ගැනීම සඳහා නිර්දේශ කරන ලිපියක් පැ.08 වශයෙන් ද ඉදිරිපත් කර ඇත. තම අක්ෂි රෝගය සඳහා ප්‍රතිකාර ගැනීමට අධිකරණයෙන් අවසර ඉල්ලා ඇතත් මහේස්ත්‍රාත්වරයා එය ප්‍රතික්ෂේප කර ඇත.

අක්ෂි රෝග විශේෂඥයන්ගේ නිර්දේශිත ලිපි සමග දෙවන වතාවටත් තම අක්ෂි රෝගය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට විදේශගත වීම සඳහා දෙවන වතාවටත් අවසර ඉල්ලා ඇති අතර එම ඉල්ලීමට මහේස්ත්‍රාත්වරයා ඉඩ ලබා දී ඇත. මේ අනුව මූලාය අපරාධ කොට්ඨාසයේ වැරදි ක්‍රියාකලාප හේතුවෙන් ඉතා හදිස්සි අක්ෂි වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය රෝගයක් සඳහා ප්‍රතිකාර ලබා ගැනීම සති 3 ක පමණ කාලයක් ප්‍රමාදවීමෙන් පැමිණිලිකරුගේ එක් ඇසක පෙනීම මේ වන විට සම්පූර්ණයෙන්ම අහිමිව ගොස් ඇත.

ප්‍රතිකාර ලැබීම සඳහා ඇමරිකාවට ගිය පැමිණිලිකරුට ආපසු ලංකාවට පැමිණීමේ දී ඇමරිකානු බලධාරීන් ඉඩදී නොමැත. ඊට හේතු වශයෙන් ඇමරිකානු බලධාරීන් සඳහන් කර ඇත්තේ තානාපතිධූරයක් දරන නිලධරීන් හට නඩුපැවරීමට ඔවුන්ට බලයක් නොමැති වුවත්, ශ්‍රී ලංකා රජය පැමිණිලිකරුට එරෙහිව විමර්ශනයක් ආරම්භ කරන ලෙසට දැනුම් දී ඇති හෙයින් පැමිණිලිකරුට රටින් පිටවීමට අවසර නොදෙන ලෙසට ශ්‍රී ලංකා රජය මගින් තහනමක් පනවා ඇති බවය. ශ්‍රී ලංකාවේ දී පැමිණිලිකරුට එරෙහිව පරීක්ෂණ පවත්වාගෙන යනු ලබන චෝදනා වලටම ඇමරිකාවේ දීම එම චෝදනා යටතේදීම පරීක්ෂණයක් පැවැත්වීමට උපදෙස් ලබා දී ඇති බවත්, ඒ අනුව ඇමරිකාවේදීත් එවැනි පරීක්ෂණයක් පවත්වන බවය.

ඒ වන විට පැමිණිලිකරුගේ නෛතික තත්ත්වය කුමක්ද යන්න විමසීමක් සිදු කර ඇති අතර පැමිණිලිකරුට හිමි තානාපති විනිර්මුක්තිය හා වරප්‍රසාද ශ්‍රී ලංකා රජය මගින් ඉවත් කර නොමැති බවට දැනුම් දී ඇත. ඒ සම්බන්ධව සිදු කළ දැනුම්දීමට අදාළ ලිපිය පැ.13 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ හේතුවෙන් පැමිණිලිකරුට මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැති නඩුවට සහභාගිවීමට නොහැකිවී ඇත.

කරුණු කෙසේ වෙතත් විදේශ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම් ඔහුගේ අභිමතය පරිදි ආයතන සංග්‍රහයට පටහැනිව පිළිගත් ක්‍රියාපටිපාටි අනුව නොයමින් පැමිණිලිකරුගේ තානාපති විනිර්මුක්තිය හා වරප්‍රසාද ඉවත් කිරීම පැ.14 ලිපියෙන් සිදු කර ඇත. පැ.14 ලිපිය නිකුත් කර ඇත්තේ රාජ්‍ය මුද්‍රාව නොමැතිවය. රාජ්‍ය මුද්‍රාව දැමීමට පෙර රාජතාන්ත්‍රික ලිපියක් ඇමරිකානු නිලධාරීන්ට ලැබීම පිළිබඳව ඔවුන්ද මවිත වී ඇත. පැමිණිලිකරුගේ විනිර්මුක්තිය හා තානාපති වරප්‍රසාද අතීතයට බලපාන සේ ඉවත් කර ගැනීම තුළින් වියනා සම්මුතියට එරෙහිව ශ්‍රී ලංකා බලධාරීන් ක්‍රියාකර ඇත.

තානාපති බලතල පැවරීම හා ආපසු ලබා ගැනීම රාජ්‍ය නායකයා සතු ක්‍රියාවක් වුවත් 23.10.2017 දින නිකුත් කළ පැ.14 න් එකී ක්‍රියාව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සිදු කිරීම බරපතල නීති විරෝධි ක්‍රියාවකි.

පැමිණිලිකරු අධිකරණයෙන් ලබා ගත් අවසරයක් මත ඇමරිකා එක්සත් ජනපදයේ වෛද්‍ය ප්‍රතිකාර ලබන විට ඔහුට විරුද්ධව නඩු පවරන ලෙසට ශ්‍රී ලංකා රජය ඇමරිකානු බලධාරීන්ගෙන් ඉල්ලීමක් කර ඇත. පැමිණිලිකරු සඳහන් කළේ ශ්‍රී ලංකා බලධාරීන් වංක

සහයෝගයෙන් කටයුතු කර ඇති බවය. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ඇමරිකානු රජය විසින් විදේශ ගමන් තහනමක් පනවා ඇති බව දැන දැනම ඔවුන් කොටුව මහේස්ත්‍රාත්වරිය නොමග යවා එම මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී නොසිටීම මත පැමිණිලිකරුට එරෙහිව වරෙන්තු නිකුත් කරවා ගැනීම සඳහා ක්‍රියාකර ඇත.

ලංකාවේ අධිකරණය මගින් වරෙන්තු නිකුත් කර ඇති බැවින් ඒ සඳහා තමන් ලංකාවට යැවීමට පියවර ගන්නා ලෙසට එවකට වැඩ බලන තානාපති වශයෙන් සිටි ප්‍රියංගා වික්‍රමසිංහ නිලධාරිනියගෙන් පැමිණිලිකරු ඉල්ලා සිටිය මුත් ඇය එම ඉල්ලීම ඉටු කිරීම හිතාමතාම නොසලකා හැර ඇත.

පැමිණිලිකරුගේ ලංකාවේ සිලෝන් රෝයල් ටී ප්‍රයිවට් ලිමිඩට් ආයතනයේ කාර්යාලයට පැමිණි මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නිලධාරින් ඔහුගේ ලැප් ටොප් පරිගණකය රැගෙන යාම හේතුවෙන් ආයතනයේ කටයුතු මෙහෙයවීම ද අපහසු වී ඇත. පැමිණිලිකරුගේ බිරිඳට දුරකතනයෙන් අමතා නිවස පරික්ෂා කිරීමට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ක්‍රියාකර ඇත්තේ කාන්තා නිලධාරිනියක ද නොමැතිවය. පැමිණිලිකරුට ගිණුම් 72 ක් ඇති බවට පවසමින් එම ගිණුම් විස්තර ලබා ගැනීමට පැමිණිලිකරුගේ භාර්යාවට සහ පවුලේ සාමාජිකයින්ට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් බලපෑම් සහ හිරහැර කර තිබේ.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කළ මෙම සියළු කෙනෙහිලිකම් සාර්ථක නොවූ බැවින් ඔවුන් විදේශ කටයුතු අමාත්‍යාංශය ද උපයෝගි කරගෙන ඇමරිකා එක්සත් ජනපද අධිකරණයක් ඉදිරියේ අපරාධ නඩුවක් ගොනු කිරීම සඳහා

ක්‍රියාකරමින් ඒ සඳහා ඇමරිකානු බලධාරීන්ගේ ද සහයෝගය ලබා ගනිමින් පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකාවට එරෙහිව රණවිරුවන්ට සහ රාජ්‍ය නායකයන්ට එරෙහිව සිදු කරනු ලබන ප්‍රකාශයක් පැමිණිලිකරුගෙන් ලබා ගැනීමට උත්සාහ දරා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි ඇමරිකා එක්සත් ජනපදය විසින් කොළොම්බිය ප්‍රාන්තයේ දිස්ත්‍රික් උසාවියක පැමිණිලිකරුට එරෙහිව නඩු පවරා ඇත. පැමිණිලිකරු මෙම නඩුවට අදාලව තම නීතිඥයින් සමග සාකච්ඡා කළ ලිපියක් පැ.16 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එසේ වුවත් පැමිණිලිකරුගේ නීතිඥවරුන් ඉදිරිපත් කරන ලද කරුණු අනුව පැමිණිලිකරුගේ විනිර්මුක්තිය අවලංගු කිරිම සම්බන්ධව නෛතික භාවය ගැටළු සහගත බැවින් මෙම කරුණු ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ විසින් හෝ ජනාධිපතිවරයා විසින් නිකුත් කරනු ලබන නියෝගයකින් පසුව සලකා බැලීමට පාර්ශවයන් එකඟත්වයකට පැමිණ ඇත.

මේ අනුව පැමිණිලිකරුට හිමි තානාපති විනිර්මුක්තිය සහ වරප්‍රසාද හිතාමතාම ද්වේශ සහගතව ඉවත් කිරීමෙන් පැමිණිලිකරුට බලවත් අසාධාරණයක් සිදු කර ඔහුගෙන් පළිගැනීමක් සිදු කර ඇත. පැමිණිලිකරු මේ පිළිබඳව එවකට විදේශ අමාත්‍ය සරත් අමුණුගම මහතාට ලිපියකින් දැනුම් දී ඇත. එහි පිටපතක් පැ.17 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරුගේ විනිර්මුක්තිය සහ වරප්‍රසාද ඉවත් කිරීමට අදාළ ලේඛන ඉල්ලා සිටින ලද නමුත් ඒවා නොලැබුණ බැවින් තොරතුරු දැන ගැනීමේ පනතේ විධි විධාන යටතේ එම තොරතුර ඉල්ලා ඇති අතර, ඒ අනුව ජනාධිපති ලේකම් විසින් සිදු කරන ලද දැන්වීමකට

අනුව (පැ.18) ජනාධිපතිතුමා විසින් පැමිණිලිකරුගේ තානාපති විනිර්මුක්තිය හා වරප්‍රාසද අහිමි කිරිමට කිසිදු නියෝගයක් දී නොමැත.

මේ අනුව පැමිණිලිකරුගේ විනිර්මුක්තිය හා තානාපති වරප්‍රසාද ඉවත් කර ඇති බවට සිදු කළ ප්‍රචාරයන් මුළුමනින්ම අසත්‍ය ප්‍රචාර වේ.

පැමිණිලිකරු සඳහන් කල අන්දමට මේ අන්දමින් ඔහුට සහ ඔහුගේ පවුලේ අයට හිරිහැර කිරිමෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචානධිකරණයේ සහ මහාධිකරණයේ පැවැති නඩු වලට මේ වනවිට රුපියල් මිලියන 63 ක පමණ මුදලක් වියදම්ව ඇති බවයි. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පළිගැනීම් ක්‍රියාවලිය නිසා තම ඇසට සිදු වූ හානියට ප්‍රතිකාර ලබා ගැනීමට රුපියල් මිලියන 12 කට ආසන්නා මුදලක් වැය වූ බවත්, ඔහුගේ ව්‍යාපාර අඩපනවීමෙන් බරපතල මූල්‍ය අලාභ සිදු වූ බවත් සඳහන් කරමින් මෙම නීති විරෝධි ක්‍රියා සඳහා වගකිවයුතු පුද්ගලයින් ලෙසට ඉහත නම් සඳහන් පුද්ගලයින් නම් කර ඇත.

කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති බී 21/2016 දරණ නඩුව පැමිණිලිකරු විසින් කිසිදු වරදක් සිදු නොකර පවරා ඇති නඩුවක් බවත්, එබැවින් එම නඩුවෙන් තමන් නිදහස් කරන ලෙසටත් ආයාචනය කර ඇත. එසේම ශ්‍රී ලංකා රජය විසින් සිදු කරන ලද දැනුම් දීම අනුව පැමිණිලිකරුට ඇමරිකාවෙන් පිටවීමට තහනම් නියෝග පනවා ඇති බැවින් එය නිවැරදි කිරිම සඳහා ශ්‍රී ලංකා රජයේ නියෝග නිකුත් කරන ලෙසට ද පැමිණිලිකරු වැඩිදුරටත් ආයාචනය කරයි.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.01 සිට පැ.22 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 .XXVI

පැමිනිලි අංකය - 28/2020

සම්පූර්ණ නම - කහදගමගේ මහින්දරත්න
( මහින්ද කහදගමගේ)

ලිපිනය - නො. 31, වොක්ෂෝල් වීදිය, කොළඹ

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. පූජ්‍ය උඩවතැන්නේ සුමන හිමි,
2. පොලිස් පරීක්ෂක වනිගතුංග
3. උප පොලිස් පරීක්ෂක පියතිලක

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර කහදගමගේ මහින්දරත්න ( මහින්ද කහදගමගේ) යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, කහදගමගේ මහින්දරත්න ( මහින්ද කහදගමගේ) මහතාට එරෙහිව කොළඹ අලුත්කඩේ අංක 01 මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 20911/01/15 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර කහදගමගේ මහින්දරත්න (මහින්ද කහදගමගේ) නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නමැති වරද සිදු කර ඇති බැවින්ද,

නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. වගඋත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

5. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

6. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍ර ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

විවිධ බාධක කම්කටොලු මැද ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සම්මේලනය පිහිටුවා ගෙන ස්වයං රැකියාවල නිරත පුද්ගලයින්ට සහන ලබාදීමේ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කරමින් සිටි පැමිණිලිකරුට 2015-01-08 දින රජය පිහිටුවීමෙන් පසුව පොලිස් පරීක්ෂණවලට මුහුණපෑමටත්, රක්ෂිත බන්ධනාගාරයේ සිරගත වීමටත්, සිදුවී ඇත.

මාලිගාවත්ත ප්‍රදේශයේ පිහිටි බෝධිරාජාරාම මාවතේ බෝධිරාම විහාරාධිපති පූජ්‍ය ඌවතැන්නේ සුමන හිමියන් විසින් ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සමිති සාමාජිකයන්ගෙන් විවිධ ප්‍රමාණයේ මුදල් ලබාගත් බවට කරන ලද පැමිණිල්ලක් වෙනුවෙන් 2015.02.09 වෙනි දින කොළඹ වංචා විමර්ශන අංශයේ ස්ථානාධිපති වනිගතුංග මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් විසින් පැමිණිලිකරුගේ නිවසට පැමිණ පැමිණිලිකරුගෙන් නිවස පරික්ෂා කිරීමට අවශ්‍ය බව පවසා ඇත. මෙවැනි පරික්ෂා කිරීමකට විරෝධය පළ කර පැමිණිලිකරුගේ භාර්යාව ඒ සඳහා අධිකරණ නියෝගයක් තිබෙන්නේ දැයි විමසා ඇත. ඒ අවස්ථාවේදී පැමිණිලිකාරියගේ භාර්යාව බියවද්දා බලාත්කාරයෙන් නිවසට ඇතුළු වූ පොලිස් පරීක්ෂක වනිගතුංග ඇතුළු පිරිස් නිවස පරික්ෂා කළ බව භාර්යාව දුරකථන ඇමතුමකින් පැමිණිලිකරුට ඒ බව දැනුම් දී ඇත. එසේම එදින සවස 2.00 ට පමණ වංචා විමර්ශන අංශයට පැමිණෙන ලෙසට පැමිණිලිකරුට දැනුම් දුන් බවට ද භාර්යාව දැනුම් දී ඇත.

ඒ අනුව එදින සවස පොලිස් ස්ථානයට පැමිණිලිකරු පැමිණි අවස්ථාවේදී පොලිය් ස්ථානාධිපති වනිගතුංග මහතා විසින් පැමිණිලිකරුට පරුෂ වචනයෙන් බනිමින් "හොරා වරෙන් උඹගෙ ඔක්කොම විස්තර අපි සතුව තියෙනවා කෝ උඹ කප්පං ගත්ත මුදල" කියා විමසා ඇත.

බැසිල් ඇමතිතුමාගේ මුදල් සහ දේපල උඹ සතුව තිබෙනවා ද කියා විමසා උඹට තියෙන චෝදනාවෙන් නිදහස් වීම නම් බොරු බව පොලිස් පරීක්ෂකවරයා පවසා ඇත. පැමිණිලිකරු විසින් වංචා කර ඇතැයි කියන කෝටි සියයකට ආසන්න මුදලක් සම්බන්ධයෙන්

කටඋත්තරයක් සටහන් කර ගැනීමට පොලිස් සැරයන් කුමාර ක්‍රියා කර ඇත. මේ අනුව පැමිණිලිකරු විසින් අයථා මුදල් පරිහරණය සම්බන්ධයෙන් සහ සමිතියේ සාමාජික මුදල් සම්බන්ධයෙන් සහ ඒවා නිවැරදිව පරිහරණය කළා ද යන්න පිළිබඳව ප්‍රශ්න කර ඇති අතර සමිතියේ මුදල් සම්බන්ධයෙන් ලේකම් චානක අශෝක් හෙට්ටිආරච්චි සතුව සහ භාණ්ඩාගාරික ලක්ෂ්මේන්ද්‍ර කුමාර සතුව සියලු නිවැරදි තොරතුරු ලිපිගොනු ඇති බවට පැමිණිලිකරු පොලිස් සැරයන් කුමාරට පවසා ඇත. මෙම ප්‍රශ්න කිරීම එදින රාත්‍රී 10 පමණ වන තෙක් සිදුවී ඇති අතර එම කාලය තුළ පැමිණිලිකරුට පානය කිරීමට වතුර වීදුරුවක් හෝ ආහාර හෝ සපයා නොමැති අතර තමන්ට ලබා ගැනීමට අවස්ථාවක් ද ලබාදී නොමැත.

මෙම පැමිණිල්ල මාලිගාවත්තේ ඌවතැන්නේ සුමන හිමි විසින් පැමිණිලි කර තිබුණ ද ඊට සාක්ෂි ලෙස එන්. කේ. ස්වර්ණලතා සහ සුනිල් ජයවර්ධන යන සමිති සාමාජිකයන් දෙදෙනෙක් සම්බන්ධ කර තිබී ඇත. එසේ වුවත් ඌවතැන්නේ සුමන හිමි මෙම සමිතියේ සාමාජිකයෙකු නොවේ .

පැමිණිලිකරුගෙන් කට උත්තරය සටහන් කරගනු ලැබූ අවස්ථාවේදී පැමිණිලිකරුට එරෙහිව සිදුකර ඇති පැමිණිල්ල පෙන්වා නොමැත පොලිස් නිලධාරීන් ප්‍රකාශ කර ඇත්තේ පැමිනිල්ලෙන් නිදහස් වීමට නම් බැසිල් සතු දේපළ ඉඩම් මුදල් සම්බන්ධව දන්නා කරුණු කියාපන් යනුවෙනි

ප්‍රකාශය සටහන් කරගැනීමෙන් අනතුරුව එය පැමිණිලිකරුට කියවා බැලීමට ඉඩ නොදී පැමිණිලිකරුගෙන් එම ප්‍රකාශයට අත්සන් ලබාගෙන ඇත. සටහන් කර ඇත්තේ කුමක්දැයි නොදන්නා

ප්‍රකාශයකට පැමිණිලිකරු අත්සන් තබා ඇත. පැමිණිලිකරුගේ ප්‍රකාශය සටහන් කර ගන්නා අතරතුර පොලිස් පරීක්ෂකවරයාගේ ජංගම දුරකථනයට වරින් වර ඇමතුම් ලැබී ඇත. එම අවස්ථාවලදී පොලිස් පරීක්ෂක වනිගතුංග එම ඇමතුම් වලට පිළිතුරු දෙමින් හරි සර්, හරි ඇමතිතුමා, ඒ විදිහට කරන්නම්, යන ආකාරයට පිළිතුරු ලබා දී ඇත.

ප්‍රකාශය සටහන් කරගැනීමෙන් අනතුරුව වංචා විමර්ශන අංශයේ අධ්‍යක්ෂක උධිත පෙරේරා මහතාට ලඟට පැමිණිලිකරු රැගෙන ගොස් ඇති අතර තමන්ට කළ හැකි දෙයක් නොමැති බවටත් ඉහළින් එන නියෝග බවටත් අධ්‍යක්ෂවරයා පැමිණිලිකරුට ප්‍රකාශ කර ඇත.

ඉන්පසුව රාත්‍රී 11ට පමණ පැමිණිලිකරු මහේස්ත්‍රාත් ගිහාන් පිලපිටිය මහතා ඉදිරියට පමුණුවා ඇති අතර පැමිනිලිකරුගේ නීතිඥ මහතා විසින් පැමිණිලිකරු ඇපමත මුදා හැරීමට සිදු කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට මහේස්ත්‍රාත්වරයාගේ නිල නිවසට ගෙන එන අවස්ථාවේදී මාලිගාවත්තේ ඌවතැන්නේ සුමන හිමි ද සාක්ෂිකාර ස්වර්ණ ලතා හා සුනිල් ජයවර්ධන යන අය ද පැමිණ සිටිනවා පැමිණිලිකරු දැක ඇත.

පැ. 4 සහ පැ. 5 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති කොළඹ අලුත්කඩේ අංක 01 මහේස්ත්‍රාත් අධිකරණයේ බී 20911/01/15 වාර්තාවේ සඳහන් අන්දමට පැමිණිලිකරුට එරෙහිව ඇති පැමිණිල්ල නම් ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සමිතියේ සාමාජිකයන්ගෙන් විවිධ ප්‍රමාණය මුදල් ලබාගෙන වංචා කිරීම පිළිබඳ, පැමිනිල්ලකි.

පැ. 7 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති මහේස්ත්‍රාත් අධිකරණ ඇප නියෝගයට අදාළ වාර්තාවේ පැමිණිලිකරු ඇතුළුව තවත් දෙදෙනෙකුගේ නම් සඳහන්ව ඇත. පැමිනිලිකරු සඳහන් කළ අන්දමට එහි සඳහන් ලක්ශ්මේන්ද්‍ර කුමාර ද සිල්වා සහ අශෝක හෙට්ටිආරච්චි යන දෙදෙනා මෙම සංගමයේ ලේකම් හා භාණ්ඩාගාරික වේ.

පැ. 6 සහ පැ. 7 වශයෙන් ඉදිරිපත් කර ඇති මහේස්ත්‍රාත් අධිකරණයේ උක්ත සඳහන් බී වාර්තා වේ සටහන් වලට අනුව 2015.01.22 දින සිට 2015.02.2020 දක්වා නඩු වාර 06 ක් මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිල්ල කැඳවා ඇති අතර පරීක්ෂණ අවසන් නොමැති බවට පවසමින් පැමිණිලිකරු ඇතුළු අනිත් දෙදෙනාගේ රක්ෂිත බන්ධනාගාර ගත කරමින් කාල සීමා දීර්ඝ කිරීම සිදු කර ඇත. පැමිණිලිකරුට එරෙහිව පොදු දේපළ පනත යටතේ චෝදනා කිරීමට ඇති හැකියාව සොයා බැලීමටද, නීතිපති උපදෙස් පැතීමට ද දින ලබාදී ඇති බව පැ. 7 වාර්තා අනුව පෙනේ.

පැ. 8 බී වාර්තාවට අනුව 2015.04.21 දින රුපියල් ලක්ෂයක මුදල් ඇපයක්ද, රුපියල් පනස් ලක්ෂයක බැගින් ශරීර ඇප 04 ක්ද නියම කරමින් සහ විදේශ ගමන් තහනම් කරමින්, එසේම සෑම සඳුදා දිනකම පෙරවරු 9ත් 12ත් අතර අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත සියලුම සැකකරුවන් වාර්තා කිරීමේ කොන්දේසියට යටත්ව පැමිණිලිකරු ඇප මත මුදා හැර ඇත.

පැ. 9 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති බී වාර්තාවට අනුව 2020.02.12 වැනි දින පැමිණිලිකරු ඇතුළු අනිත් සැකකරුවන් දෙදෙනාට එරහිව නීති මගින් කටයුතු කිරීමට අදහස් නොකරන බවට

නීතිපති විසින් උපදෙස් ලබාදීම හේතුකොටගෙන නීතිමය පියවර නොගන්නා බවට සඳහන් කරමින් කරුණු වාර්තා කර ඇති බැවින් පැමිණිලිකරු ඇතුළු චූදිතයින් තිදෙනා ඉහත අංක දරන බී වාර්තාවේ සඳහන් චෝදනා වලින් මුදා හැර ඇත.

මේ අනුව ඉතා පැහැදිලි ලෙසම චෝදනාවක් නොමැතිවව පැමිණිලිකරුට එරෙහිව ඉදිරිපත් කරන ලද අසත්‍ය පැමිණිල්ලක් මත කොළඹ වංචා විමර්ශන අංශයේ එකක් අංක 7 හි ස්ථානාධිපති පොලිස් පරීක්ෂක වනිගතුංග සහ උප පොලිස් පරීක්ෂක පියතිලක විසිනි පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන වංචා විමර්ශන අංශයට රැගෙන ගොස් ඔහුට හිරිහැර තාඩන පීඩන කර ඔහුට බලපෑම් කර ඔහුට අඩන්තේට්ටම් කරමින් කටඋත්තර ලබාගෙන පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට ක්‍රියාකර ඇති අතර එමගින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩ කරමින් පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගතකර තබා ගැනීමේ ක්‍රියාවලිය 2015.02.09 දින සිට 2015.04.21 දක්වා ක්‍රියාත්මක කර ඇත.

එසේම, සීමාසහිත ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සමිතියේ සාමාජිකයකු නොවන, කොළඹ 10, මාලිගාකන්ද, බෝධිරාජ මාවත, ශ්‍රී බෝධිරාජාරාමයේ පූජ්‍ය ඌවතැන්නේ සුමන ස්ථවිර අසත්‍ය පැමිණිලිල්ලක් කොළඹ වංචා විමර්ශන අංශයට සිදු කර පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීම සඳහා ක්‍රියා කිරීමෙන් වරදක් සිදුකර ඇත.

මේ අනුව පැමිණිලිකරු බන්ධනාගාර ගත කිරීම සඳහා අසත්‍ය චෝදනා සිදු කරමින් ද එකී අසත්‍ය චෝදනා නිසි පරිදි විමර්ශනය නොකර පැමිණිලිකරු දීර්ඝ කාලයක් රක්ෂිත බන්ධනාගාරයේ තබා

ගැනීම සඳහා ක්‍රියා කිරීමෙන් ද පූජ්‍ය ඌවතැන්නේ සුමන හිමි, පොලිස් පරීක්ෂක වනිගතුංග සහ උප පොලිස් පරීක්ෂක පියතිලක පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ වරදට වගඋත්තරකරුවන් ලෙස ට නම් කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ. 1 සිට පැ. 9 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020.11.24

2020/11/24

## 9 .XXVII

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 1091/2020 |
| | | 1092/2020 |
| පැමිණිලිකරු | - | චන්ද්‍රපාල ලියනගේ |
| ලිපිනය | - | නො: 43/23 ඒ, පැපිලියාන මාවත, කොහුවල |

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. රොහාන් පෙරේරා
2. වික්‍රම් බස්නායක
3. අනුරසිරි හෙට්ටිආරච්චි
4. මහේෂ් රත්නායක
5. සමන් ප්‍රනාන්දු

### තීරණය

මේ අනුව 2015 ජනවාරි 9 දින රූපවාහිනී පරිශ්‍රයට අනිත්‍යානුකූල ලෙස ඇතුළු වී පැමිණිලිකාර චන්ද්‍රපාල ලියනගේ මහතාට තර්ජනය කර ඔහු රූපවාහිනී පරිශ්‍රයෙන් පලවා හැරීමෙන් දූෂණය නැමැති වරද සිදු කර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි.

## නිර්දේශ

අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින් ඒ සඳහා චෝදනා නැගීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ශුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවයේ යෙදී සිටි පැමිණිලිකාර චන්ද්‍රපාල ලියනගේ මහතා 1994 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට බැඳී ඉන්පසුව විවිධ තනතුර හොබවමින් වර්තමාන තනතුරට ලඟා වී ඇත. මෙම කරුණු සනාථ කිරීම සඳහා පැ.01, පැ.02, පැ.03, පැ.04, පැ.05, පැ.06, පැ.07, පැ.08 සහ පැ.09 වශයෙන් ලේඛන ඉදිරිපත් කර ඇත.

පැ.10 ලේඛනයට අනුව 2013.07.01 දින පැමිණිලිකරු රූපවාහිනි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් පදවියට පත් කර ඇත. ඒ අනුව පැමිණිලිකරු රූපවාහිනි සංස්ථාවේ දියුණුවට වැඩ කරමින් 2014 වසර වන විට රේටින්ස් 8.66 මට්ටමට ගෙන ඒමට සමත් වී ඇත. එසේ වුවත් 2015 නව රජය පැමිණිලිකරු සේවයෙන් ඉවත් කළ පසු 2017 වන විට රූපවාහිනි නාලිකාව රේටින්ස් වලින් 3.7 මට්ටමය පහළ බැස ඇත. එම තත්ත්වය පැහැදිලි කිරීම සඳහා පැ.11 ලේඛනය ඉදිරිපත් කර ඇත.

2014 වසරේ අවසාන භාගය වන විට රූපවාහිනි සංස්ථාව තුළ යම් යම් විරෝධතා මතු වී ජනාධිපතිවරණයට ආසන්නවත්ම එම විරෝධතා උත්සන්න වී ඇත. 2014 දෙසැම්බර් මාසයේ රූපවාහිනි සංස්ථාව ඉදිරිපිට විශාල උද්ඝෝෂණයක් සංවිධානය කර තිබේ. එම

උද්ඝෝෂණයේ පෙර ගමන්කරුවන් ලෙස අතුරලියේ රතන හිමියන් සහ නියෝජ්‍ය අමාත්‍ය කරුණාරත්න පරණ විතාන මහතා ක්‍රියා කර ඇති අතර රූපවාහිනී සංස්ථාවට සම්බන්ධ එක්සත් ජාතික පක්ෂයේ සහ ජනතා විමුක්ති පෙරමුණේ රේඛීය සමිති සාමාජිකයින් පසු කලක රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා ලෙස පත්වූ රවි ජයවර්ධන, ශාන්තිනි කෝන්ගහගේ සහ පාහියංගල හාමුදුරුවෝ වැනි පිරිසක්ද උද්ඝෝෂණය මෙහෙයවමින් සිට ඇත.

මෙම උද්ඝෝෂණය කරණකොට ගෙන රූපවාහිනී සේවයේ නිලධාරීන් අකර්මන්‍ය වී ඇති අතර 2014 වසර අවසන් වන විට බොහෝ ජ්‍යෙෂ්ඨ සහ නියෝජ්‍ය නිලධාරීන් ඉංජිනේරුවන් සහ අධ්‍යක්ෂවරුන් අක්‍රීය ස්වරූපයෙන් කටයුතු කර ඇත. ඒ කෙසේ වෙතත් පැමිණිලිකරු සංස්ථාවේ සභාපති විමල් රූබසිංහ මහතා සමඟ රූපවාහිනී ආයතනය කාර්යක්ෂමව ගෙන යාමට ක්‍රියා කර ඇත.

2015 ජනවාරි 08 වන දින මැතිවරණය පවත්වා අවසන්වීමත් සමඟම රූපවාහිනී සංස්ථා පරිශ්‍රය තුළ යම් යම් වෙනස් වීම් එදින මධ්‍යම රාත්‍රිය වන විට සිදු වී තිබේ. එදින රාත්‍රියේ මැතිවරණ ප්‍රතිඵල විකාශනය සිදු කර පසුදාට පහන් වී උදෑසන 8.00 පමණ වන විට පැමිණිලිකරු රූපවාහිනී සංස්ථා පරිශ්‍රයෙන් එළියට දැමීමට කණ්ඩායමක් පැමිණ ඇත. තමන් රූපවාහිනී පරිශ්‍රයෙන් ඉවත්වන බවට එම කණ්ඩායමට දැනුම් දී ඇත. මෙම කලබළකාරී තත්ත්වය පිළිබඳව පැමිණිලිකරුගෙන් දැනගත් පැමිණිලිකරුගේ මිතුරන් රූපවාහිනී සංස්ථාවට පැමිණ පැමිණිලිකරු එම ස්ථානයේ ඉවත් කර ගෙන පැමිණිලිකරුගේ නිවසට ගෙන ගොස් ඇත. එසේ වුවත් පැමිණිලිකරුගේ භාර්යාව සහ දරුවන් බොහෝසේ බියට පත්වී සිටි

බැවින් තම නිවසේ විසීම යෝග්‍ය නොවන බවට ඔහුගේ මිතුරන් පවසා ඇති බැවින් පැමිණිලිකරු තම භාර්යාව සහ දරුවන් සමඟ රැකවරණය පතා තම නිවසින් ඉවත්ව ගොස් හෝටලයක නවාතැන් ගෙන ඇත.

පැමිණිලිකරුගේ නිවසට තර්ජනාත්මක දුරකථන ඇමතුම් ලැබී ඇති අතර එසේ ඇමතුම් ලැබුණු සමහර දුරකථන අංක සංස්ථාවේ දුරකථන අංක බවට පැමිණිලිකරු හඳුනාගෙන ඇත. ජනතා විමුක්ති පෙරමුණේ හිටපු වෘත්තිය සමිති සභාපති අරුණසිරි සහ සභිකයන් වන වසන්ත කුමාර, කාංචන ආදීන් ඇතුළු පිරිසක් පැමිණ පැමිණිලිකරු රූපවාහිනී සංස්ථාවෙන් ඉවතට දැමීමට උත්සාහ කර ඇත. එම පිරිස අතර ෂර්ලි අනිල්, හේම අජිත්, ප්‍රින්ස් ලියනගේ, ටී.එම්.ජී. චන්ද්‍ර සේකර හිටපු අධ්‍යක්ෂ, සමන් රත්නායක ආදී පිරිස්ද ඒ අතර විය.

කරුණාරත්න පරණවිතාන 09 වැනි දින උදේ රූපවාහිනී සංස්ථාවට පැමිණ ඔවුන් ආයතනයේ පාලනය භාරගත යුතු බවට සඳහන් කර ඇත. ඒ වන විටත් ජනමාධ්‍ය අමාත්‍යවරයෙක් පත් කර සිට නොමැති අතර කිසිදු පත්වීමේ ලිපියක් නොමැති එම පිරිස රූපවාහිනී සංස්ථාවේ වැඩ කටයුතු සිදු කර ඇත.

රූපවාහිනී සංස්ථාවේ සභාපතිද එවැනිම ක්‍රියාවන් හා බලපෑම් වලට යටවී සිටින්නට ඇති බැවින් මෙම තත්ත්වය තමන්ට පමණක් නොව තමන්ගේ ප්‍රධාන විධායකවරයා, ප්‍රධාන ගනාකාධිවරයා සහ ප්‍රවෘත්ති අංශයේ නිළධාරීන් කොටු කරගෙන වැඩ කරන තත්ත්වයක් පවතින බව සාක්ෂිකරුට වැටහී ඇත.

රූපවාහිනී සංස්ථා භූමියට අනවසරයෙන් ඇතුල්වූවන් පාලනය කිරීමක් සිදුවී නැත. සංස්ථාවේ ආරක්ෂාවට හමුදා කණ්ඩායමක් තිබී ඇතත් අනවරයෙන් ඇතුල්වූවන් පාලනය වීමක් එම හමුදා බණ්ඩය මගින් සිදු වී ඇති බවක් සාක්ෂි අනුව නොපෙනේ.

සාක්ෂිකරුට ඇතිවී තිබූ බලපෑම් මත ඔහු කිහිප දිනක් නිහඬව සිට ඇත. සතියකට දෙකකට පමණ පසු සේවා ස්ථානයට වාර්තා කිරීම සඳහා පැමිණියද ඒ වන විට නිර්මාණය වී තිබූ තත්ත්වය මත ඔහුට ලිඛිත අවසරයක් නොමැතිව රූපවාහිනී පරිශ්‍රයට ඇතුල්වීමට හැකියාවක් තිබී නැත. ඒ හේතුව මත පැමිණිලිකරුට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තම පැරණි රැකියා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට ඉඩ සලසා දෙන ලෙසට ඒ වන විටත් නව ජන මාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත්ව සිටි කරුණාරත්න පරණවිතාන මහතාගෙන් ඉල්ලා ඇතත් එම ලිපියට පිළිතුරක් ලැබී නැත.

තමන්ට රැකියාවට පැමිණීමට අවස්ථාවට ලබා නොදීමට හේතුව තමන්ටද ඉක්මනින්ම අපරාධ චෝදනා වලට ලක්වීමට සිදු වන බවට පැමිණිලිකරුට අවබෝධ වී ඇත. ඒ වන විටත් රූපවාහිනිය, ගුවන් විදුලිය, ස්වාධීන රූපවාහිනිය, ලේක් හවුස් වැනි ආයතන මගින් බරපතල චෝදනා පිළිබඳව පිළිබඳව පුවත් විකාශය වෙමින් තිබී ඇත. රූපවාහිනී සංස්ථාවේ දූෂණ පිළිබඳව වාර්තාවක් සංස්ථාවේ නිලධාරීන් වූ චිකුම් බස්නායක, අරුණසිරි හෙට්ටිගේ, සමන් ප්‍රනාන්දු, සන්තුන් ලියනගේ යන පිරිස විසින් අල්ලස් දෙපාර්තමේන්තුවට ලබාදුන් දර්ශන රූපවාහිනිය මඟින් විකාශනය වී ඇත.

පැමිණිලිකරු දිගින් දිගටම තම රැකියාව නැවත ලබා ගැනීම සඳහා උත්සාහ දරමින් සිටින අතරතුර විපක්ෂනායක මගින් ද ඉල්ලීමක් කර ඇතත් එම සියළු උත්සාහයන් අසාර්ථක වී ඇත. විපක්ෂ නායක නිමල් සිරිපාලද සිල්වා මහතා විසින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් කරුණාරත්න පරණවිතානට යවන ලද ලිපිය පැ.13 ලෙස ඉදිරිපත් කර ඇත. එම ලිපියටද පිළිතුරු ලැබී නැත. එසේම උක්ත පැ.13 ලිපියට සමගාමීව එම ස්ථානමාරුවට අවශ්‍ය දත්තයන් සපයා පැමිණිලිකරු විසින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් කරුණාරත්න පරණවිතාන වෙත 2015.02.09 දින යවන ලද ලිපිය පැ.14 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර ඇත.

කරුණු එසේ පවතිද්දි අල්ලස් කොමිෂන් සභාව විසින් පැමිණිලිකරු කැඳවා ඇත.

මේ අතරතුර පැමිණිලිකරු විසින් නව රැකියාවක් ඉල්ලා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතාට 2015.09.14 දිනැති ලිපිය යවමින් ඉල්ලීමක් කර ඇත. එම ලිපිය පැ.15 වශයෙන් ඉදිරිපත් කර ඇත. එම ලිපියටද පිළිතුරු ලැබී නැත. ඉන්පසුව පැමිණිලිකරු විසින් කථානායකවරයාට ලිපියක් යවා ඉල්ලීමක් කර ඇති අතර එකී ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් නියෝජ්‍ය කථානයකතුමා විසින් ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතාට 2015.11.24 දිනැති ලිපිය යවමින් පැමිණිලිකරුගේ ඉල්ලීම සපුරන ලෙසට දැනුම් දී ඇත. එම ලිපිය පැ.11 වශයෙන් ඉදිරිපත් කර ඇත. එම ලිපියට ද අමාත්‍යවරයා ප්‍රතිචාර දක්වා නැත.

පැමිණිලිකරුගේ ස්ථිර සේවා ස්ථානය ජනමාධ්‍ය අමාත්‍යාංශය වූ බැවින්ද, ඔහු ද්විතියික පදනම මත අන් සෑම ස්ථානයකම සේවය කර

ඇති බැවින් ද එම ස්ථාන වල රැකියාව අහිමි වන විට ඔහුට ඒ හේතුවෙන් ඔහුගේ මුල් සේවා ස්ථානය ඔහුට හිමිවේ. කරුණු එසේ වුවත් පැමිණිලිකරුට තම මුල් සේවා ස්ථානයේ රැකියාව කරගෙන යාමට, කිසිදු ඉඩ ප්‍රස්තාවක් ලබා දී නැත.

මේ අතරතුර පැමිණිලිකරුට එරෙහිව අල්ලස් කොමිෂන් සභාව විසින් නඩු පවරන ලැබූ බැවින් රැකියාව ලබා ගැනීම සඳහා වෙහෙසෙනවා වෙනුවට නඩුවට මුහුණ දී ඉන් නිදහස් වීම සඳහා ක්‍රියාත්මක වී ඇත.

ඒ අතරතුර නියෝජ්‍ය කථානායකතුමාගේ ලිපියට පිළිතුරු ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මල්කාන්ති මිය විසින් 2015.12.11 දිනැති ලිපියක් එවමින් පෞද්ගලික් ලිපි ගොනුවට සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙන ලෙසට ඉඩදීමක් කර ඇති අතර පැමිණිලිකරු එම තොරතුරු සපයා ඇත.

මේ අතරතුර අල්ලස් කොමිසම විසින් පැමිණිලිකරුටත්, සභාපතිවරයාටත් සහ අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතාටත් එරෙහිව GI බට 600 ක් මිළදී ගැනීම සම්බන්ධයෙන් නඩු පවරා ඇත.

ඉන්පසුව නැවතත් අල්ලස් කොමිෂන් සභාවෙන් පැමිණිලිකරුව නැවත කැඳවා රූපවාහිනී සංස්ථාවට ලබාදි තිබූ දැන්වීම් පිළිබඳව ජාත්‍යන්තර රූපවාහිනී නාලිකාවක විකාශය කිරිම සම්බන්ධයෙන් ද, කොඩි කණු මිළ දී ගැනීමක් සම්බන්ධයෙන් ද ප්‍රශ්න කර ඇත.

ජනාධිපතිවරණ දැන්වීම් පිළිබඳව ප්‍රශ්න කරනු ලබන අවස්ථාවේදී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපතිවරණ දැන්වීම් සම්බන්ධව ප්‍රශ්න කිරීම් සිදු කර ඇත. එසේම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් මගින් සිදු කරනු ලැබූ පරීක්ෂණයකට පෙනී සිටින ලෙසටද

2017.06.02 ලිපියෙන් දැනුම් දී ඇත. එම ලිපිය අංක 1 වශයෙන් දක්වා ඇත්තේ මහින්ද රාජපක්ෂ මහතාට අයුතු වාසියක් සලසන ආකාරයේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම් පළකළ බවට චෝදනාවකි. එම චෝදනාවේ හරය වී ඇත්තේ මැතිවරණ මිළ දර්ශකය අනුව රු.196,326,838 ක මුදලකට ප්‍රචාරය කළ යුතුව තිබූ මැතිවරණ දැන්වීම් රු.58,173,482 ක මුදලකට ප්‍රචාරය කිරීම මඟින් රූපවාහිනී සංස්ථාවට රු.118,585,708 ක මුදලක අලාභයක් සිදු කිරිම මඟින් රාජ්‍ය දේපල සාවද්‍ය පරිහරණය සහ රාජ්‍ය සම්පත් අයුතු ලෙස යොදා ගැනීම පිළිබඳ චෝදනාවකි.

ඉදිරිපත් සාක්ෂි වලට අනුව මැතිවරණ මිළ දර්ශකය යනුවෙන් මිළ දර්ශකයක් රූපවාහිනී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබී නොමැති අතර එවැනි මිළ දර්ශකයක් රූපවාහිනී සංස්ථාව තුළදී තිබී නොමැත.

සාමාන්‍යයෙන් දැන්වීම් මිළ තීරණය කිරීම අලෙවි අංශයේ අධ්‍යක්ෂවරයා මඟින් රූපවාහිනී ආයතනයේ ඇති සාමාන්‍ය මිළ දර්ශක අනුව අලෙවි නිළධාරීන්, දැන්වීම් නියෝජිත ආයතන හෝ දැන්වීම්කරු සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව එකඟතාවයෙන් මිළ තීරණය කිරිම සිදු කරනු ලැබ ඇත.

කරුණු එසේ තිබියදී අල්ලස් කොමිෂන් සභාවේ පරීක්ෂණ නිළධාරීන් විසින් අලෙවි අධ්‍යක්ෂවරයාට බලපෑම් කර ඔහු මගින් මැතිවරණ මිළ දර්ශකය යනුවෙන් මිළ දර්ශකයක් සකස් කරවාගෙන ඒ මත සිදු කළ ගණනය කිරීම් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැතිවරණ දැන්වීම් වලට ආදේශ කර රුපියල් මිලියන 102 ක පාඩුවක් රජයට සිදු කළ

බවට ඉහත අයුරින් සකස් කළ ව්‍යාජ ලේඛනයක් අධාර කරගෙන චෝදනා නඟා ඇත.

එවකට ජනමාධ්‍ය අමාත්‍ය ලේකම්ගෙන් ඉල්ලීමක් කලද පැමිණිලිකරු නැවත ඔහු පැ.14 ලිපියෙන් කළ ඉල්ලීමට පිළිතුරු ලැබී නැත. එම ලිපිය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දර්ශන ගුණතිලක වෙත ලැබී ඇති බව පැමිණිලිකරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ගොනු කර ඇති පිටපතින් පැහැදිලිවේ. එම පිටපත පැ.14 (ආ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. විපක්ෂනායක කාර්යාලයේ සේවයට යාම සඳහා අවසර ඉල්ලා යවන ලද ලිපියද අමාත්‍යාංශ ලේකම්ට ලැබී ඇත. එම ලිපිය පැ.13(අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ද්විතීය පදනම මත සේවයට පැමිණ සිටි බැවින් තමාගේ මුල් සේවා ස්ථානයට රාජකාරිය සඳහා වාර්තා කිරීමට තමන්ට ඉඩ සලසා දෙන ලෙසට ඉල්ලමින් පැමිණිලිකරු විසින් යවන ලද ලිපි කීපයක් පැ. 15 පැ. 16 සහ පැ. 17 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

සංවිධානත්මක පිරිසක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගොස් පැමිණිලිකරුට එරෙහිව සිදු කරන ලද පැමිණිල්ලක දර්ශන රූපවාහිනිය ඔස්සේ පැමිණිලිකරු නරඹා ඇත. එම වීඩියෝ පටය පැ.21 වශයෙන් ඉදිරිපත් කර ඇත.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් 2015.03.28 දාතමින් යුක්තව පැමිණිලිකරුට යොමු කරන ලද ලිපියකින් එකී කොමිෂන් සභාව විසින් සිදුකරන විමර්ශනයක් සම්බන්ධව ආකෘතියක් අනුව පිළිතුරු සපයන ලෙසට පැමිණිලිකරුට නියම කර ඇත. එම ලිපිය පැ.18 ලෙසට සලකුණු කර ඉදිරිපත් කර

ඇත. මැතිවරණ මිල දර්ශකයට අනුව අය කළ යුතු මුදල යනුවෙන් සඳහන් කර ඇතත් එවැනි අනුමත මිළ දර්ශකයක් තිබී නොමැත. තිබී ඇත්තේ සම්මත මිළ දර්ශකයකි. එය පැ.19 ලෙස ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු සඳහන් කළේ මැතිවරණ මිල දර්ශකයක් නොතිබුණ නමුත් අලෙවි අධ්‍යක්ෂක විසින් මැතිවරණ මිල දර්ශකය යනුවෙන් මිල දර්ශකයක් සකස් කර ඒ අනුව ආකෘතිය පුරවා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යවා ඇති බවය. එය පැ.20 ලෙස ඉදිරිපත් කර ඇත. ඒ අනුව පැමිණිලිකාරයෙන් ප්‍රශ්න කිරීම සිදු කර ඇත. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගණනය කළ අන්දමට මහින්ද රාජපක්ෂ මහතාගෙන් අයවිය යුතු හිඟ මුදල එකී කොමිෂන් සභාවේ මිළ ගණනය කිරීම අනුව දක්වා ඇතත් සාක්ෂිකරු සොයා බැලූ අන්දමට එවැනි හිඟ මුදලක් තිබී නොමැත. එසේම 2016 අයවැය වාර්තාවේදි එලෙස මහින්ද රාජපක්ෂ මහතාගෙන් අය විය යුතු මුදලක් දක්වා නොමැත.

1. ජනාධිපතිවරණ දැන්වීම් හා අයාතනයේ වැඩ කටයුතු පිළිබඳව
2. කොඩි කණු 600 ක් මිළදී ගැනීම පිළිබඳව
3. රූපවාහිනි නාළිකාව විදේශගතව ක්‍රියා කිරීම සම්බන්ධයෙන්, චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ විකාශනය කිරිමේ ව්‍යාපෘතිය සම්බන්ධව,

විමර්ශනයක් ආරම්භ කර ඇත.

2014.12.04 දින කැබිනට් තීරණයට අනුව රූපවාහිනි නාලිකා සැටලයිට් තාක්ෂණය ඔස්සේ රූපවාහිනී විකාශනය ලොව පුරා ව්‍යාප්ත කිරීම ආරම්භ කිරීමට හේතුව 2014 දෙසැම්බර් 05 වැනි දින

රූපවාහිනී සංස්ථා මණ්ඩල පත්‍රිකාවේ පත්‍රිකා අංක 7595 (පැ.26) මෙසේ දක්වා ඇත.

> (උපුටා ගැනීම) "ශ්‍රී ලංකාවට එරෙහිව එල්.ටී.ටී.ඊ සංවිධානය සැටලයිට් තාක්ෂණය ඔස්සේ නාලිකා රැසක් පවත්වා ගෙන යමින් දැවැන්ත ප්‍රචාරක ජාලයක් ක්‍රියාත්මක කරයි. එසේ වුවත් මැදපෙරදිග යුරෝපය ඇතුළු ලොව පුරා විදේශගතව සිටින මිලියන තුනක් පමණ වන ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් හරවත් වැඩසටහන් ඉදිරිපත් කෙරෙන ශ්‍රී ලාංකික අනන්‍යතාවය ගෙනහැර පාන රූපවාහිනී නාලිකාවක් ක්‍රියාත්මක නොවේ. මේ නිසා විදේශගත ශ්‍රී ලාංකිකයන්ට රට සමග සම්බන්ධ වීමට ඇති අවස්ථාවක් මෙන්ම ශ්‍රී ලංකාව පිළිබඳව ජාත්‍යන්තරයට ගෙන යා හැකි සත්‍ය ප්‍රතිරූපය ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ද අහිමි වී යයි. එබැවින් විදේශගත වූ ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලාංකික ප්‍රතිරූපය ජාත්‍යන්තරය වෙත නිවැරදිව රැගෙන යාම සඳහා සැටලයිට් තාක්ෂණය හරහා රූපවාහිනී නාලිකාව පවත්වාගෙනයාම යුගයේ කඩිනම් අවශ්‍යතාවක් වී තිබේ." (උපුටා ගැනීම අවසන්)

පැ.24 වශයෙන් ඉදිරිපත් කළ ලිපියෙන් සහ ඊට අමුණා ඇති කැබිනට් තීරණයන් පැ.25 රූපවාහිනියේ සභාපති වෙත එවමින් ඒ අනුව නාලිකාව ඔස්සේ මහජනතාව දැනුවත් කරන ලෙසට ඉල්ලා ඇත. එම කැබිනට් තීරණය මගින් තීරණ 2 ක් ගෙන ඇත.

2014.12.03 දින දරණ කැබිනට් සංදේශය ජනමාධ්‍ය හා ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කල සංදේශයෙහි පහත කරුණු දක්වා ඇත. එනම්,

I. ශ්‍රී ලංකා ජාතික අනන්‍යතාව ලොවට ගෙන යාම හා විදේශගත ලාංකිකයන්ගේ දැනුම රසාස්වාදය ප්‍රවර්ධනය සඳහා ජාතික රූපවාහිනිය සැටලයිට් තාක්ෂණය ඔස්සේ රූපවාහිනී සේවාවක් පවත්වාගෙන යාම.

II. මෙම රූපවාහිනී නාලිකාව ඉතාලියේ හෝ යුරෝපයේ වෙනත් රටක ස්ථාපිත කරන මැදිරියක පවත්වාගෙන යාමටත් ඊට අවශ්‍ය උපකරණ තාවකාලිකව බදු පදනමක් මත ලබාගැනීමටත් රූපවාහිනී නාලිකාවේ කටයුතු පවත්වාගෙන යාමේ වගකීම රූපවාහිනී සංස්ථාව වෙත පැවරීම.

III. සැටලයිට් තාක්ෂණ පහසුකම, මැදිරියට හා උපකරණ ලබා ගැනීම, රූපවාහිනී විකාශන කටයුතු මෙහෙයවීම, කාර්ය මණ්ඩලය යෙදවීම සහ අනිකුත් වියදම් වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.මි. 200 ක්ද ඊටපසු සෑම වර්ෂයකදීම රු.මි.100ක් බැගින් රූපවාහිනී සංස්ථා වෙත ලබාදීම.

ඉන් පසුව රූපවාහිනි අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම කරුණු අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවකින් ඉදිරිපත් කර ඇත. එම පත්‍රිකාව පැ.26 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී පත්‍රිකාවේ සඳහන් කරුණු මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.12.09 වන දින ගත් තීරණය 2014.12.11 වන දිනින් සභාපති විසින් නිකුත් කර ඇත. පැ.27

ඒ අනුව වාණිජ ආයතන වෙත මේ පිළිබඳව දැනුම් දීමෙන් පසුව එම ව්‍යාපෘතියේ තිබූ වාණිජමය වටිනාකම අනුව අරමුදලක් රැස් කිරීමට

පැමිණිලිකරු සමත් වී ඇත. එම තොරතුරු අඩංගු ලේඛනය පැ.28 හා පැ.28 (අ) ලෙස ඉදිරිපත් කර ඇත.

මේ ව්‍යාපෘතිය පිළිබඳව තවදුරටත් කරුණු විමර්ශනයේ දී තවත් මුදල ඉපැයිය හැකි බවට අලෙවි අධ්‍යක්ෂ විසින් 2014.12.09 වන දින ලිපියෙන් දැනුම් දී ඇත. එම ලිපිය පැ.29 ලෙසට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නෝර්වා විෂන් ආයතනයට අයත් චන්ද්‍රිකා නාලිකාවක් ඔස්සේ සිදු කිරීමට තෝරා ගෙන ඇත. පැ. 30 ලිපියේ සඳහන් අන්දමට මෙම ව්‍යාපෘතියේ ඇති අත්‍යවශ්‍ය බව සහ හදිසි අවශ්‍යතාවය මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට නොහැකි වී ඇති බවට දැනුම් දී ඇත. නාලිකාවේ පරීක්ෂණ විකාශනය 2014.12.16 දින ආරම්භ කර ඇත. ඒ අනුව තෝරාගත් අයතනය සඳහා පරීක්ෂණ කටයුතු වලට 6.9 ක මුදලක් ගෙවීමට ඉල්ලා ඇති ලිපිය පැ.30 වශයෙන් ඉදිරිපත් කර ඇත.

නෝර්වා විෂන් ආයතනය එම ව්‍යාපෘතිය අදාළ රූපවාහිනියේ සැටලයිට් තාක්ෂණය ඔස්සේ ප්‍රචාරය කරනු ලබන බව දන්වා ඒ සඳහා අය වියයුතු මුදල දැනුම් දී ඇත. එම ලිපිය පැ.31 වශයෙන් ඉදිරිපත් කර ඇත.

මෙම කටයුතු පිළිවෙලට මැනවින් සිදු වී ඇති බවට අල්ලස් දෙපාර්තමේන්තුවට පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

එසේ වුවත් අල්ලස් දෙපාර්තමේන්තුව අංක 74173/1/17 දරණ නඩුව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇත. එම ගොනුවේ පිටපත පැ.32 වශයෙන් ඉදිරිපත් කර ඇත. ඊට අදාළ චෝදනා පත්‍රය පැ.32 සහ පැ. 33 ලෙසට ඉදිරිපත් කර ඇත. පැ. 32 සහ පැ. 33 දරණ

චෝදනා පත්‍ර අනුව ජාතික රූපවාහිනි නාලිකාවේ වැඩසටහන් චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ මැදපෙරදිග සහ යුරෝපා රටවල "වන් ශ්‍රී ලංකා" නැමැති නාලිකාව මගින් විකාශනය කිරීම සඳහා ඉතාලියේ ක්‍රියාත්මක වන "නෝවා විෂන් සැටලයිට් ආයතනය" වෙත ලබා දීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව හා නීත්‍යානුකූල ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව එම ආයතනයේ සේවාව ලබා ගැනීම මගින් ආණ්ඩුවට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩු සිදුවිය හැකි බව දැන දැනම එකී ආයතනයෙන් එම සේවාව ලබාගෙන ඇති බවට චෝදනා කර ඇත.

පැ 35 දරණ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව නෝවා විෂන් ආයතනය තෝරා ගැනීම අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් අනුව සිදු කර ඇත.

1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත අනුව ගිවිසුමක් යම් පුද්ගලික තැනැත්තකු සහ සංස්ථාව අතර වාචිකව ඇති කරගත හැකි ය. ඒ අනුව  නෝවා විෂන් ආයතනය සමඟ ඇතිකරගෙන ඇති ගිවිසුම ලිඛිත ගිවිසුමක් නොවීම තුළින් රූපවාහිනී සංස්ථාව පනතේ 24(1)(ඇ) වගන්තියේ විධිවිධාන අනුව වරදක් සිදුකර  කර නොමැත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් අනුව නෝවා විෂන් ආයතනයට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර වන් ශ්‍රී ලංකා  රූපවාහිනී නාලිකාව විකාශනය කිරීමට භාර දීමේ තීරණය ක්‍රියාත්මක වී ඇති බැවින් එහි වරදක් ඇත්නම් ඒ සඳහා සම්පූර්ණ අධ්‍යක්ෂක මණ්ඩලයම වගකිව යුතුය. එසේ වුවත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නඩු පැවරීම සඳහා තෝරා ගෙන ඇත්තේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා පමණි. අධ්‍යක්ෂක මණ්ඩලය

වගකීමෙන් නිදහස් කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත්තේ ඔවුන් විසින් වරදක් සිදු නොකළ නිසා විය යුතුයි. නඩු පැවරීමට තරම් වරදක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිදු කර නොමැති නම් සභාපතිවරයා සහ අධ්‍යක්ෂක ජනරාල්වරයා පමණක් තෝරා ගෙන නඩු පැවරීමක් සිදු කළ නොහැකිය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව නඩු පැවරීමේ දී එබඳු වගකීම බෙදීමක් සිදු කරන්නේ නම් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට එකඟ නොවේ. රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය සාමූහිකව එළඹුණු තීරණයෙහි යම් වරදක් ඇත්නම් ඒ සඳහා වගකීම මුළු අධ්‍යක්ෂක මණ්ඩලයටම පැවැරේ. එම වගකීම් බෙදීමකට ලක්කර තෝරා ගත් පුද්ගලයෙකුට පමණක් නඩු පැවරීම සිදුකළ නොහැකිය.

එවැනි නඩු පැවරීමක් පැහැදිලි ලෙසම දේශපාලන පලි ගැනීමේ ක්‍රියාවලිය උදෙසා සිදුකරන නඩු පැවරීමක් බවට පත්වේ. කරුණු එසේ හෙයින් අනිකුත් අධ්‍යක්ෂකවරුන්ට ලැබුණු සහනයම රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ද ලැබිය යුතු වේ.

GI බට 600 ක් මිලදී ගැනීමේ ක්‍රියාවලියට ප්‍රවේශ වී ඇත්තේ රූපවාහිනි සංස්ථාවට නිතරම භාණ්ඩ කුලියට ගැනීම අවසන් කොට සංස්ථාවට ස්ථාවර වත්කමක් පවත්වාගෙන යායුතුය යන අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම උදෙසාය.

මෙම අවස්ථාව වන විට රූපවාහින සංස්ථාවේ ප්‍රවර්ධන වැඩ සටහන් රැසක් ක්‍රියාත්මක වෙමින් තිබී ඇති අතර ඒ සඳහා ගමින් ගමට ගොස් ප්‍රවර්ධන වැඩ සටහන් ඉදිරිපත් කිරීමටත් වැඩ සටහන් ඉදිරිපත්

කිරීමේ දී අවශ්‍ය කෙරෙන භාහිර උපාංග වන කොඩි කණු මිලදී ගැනීම සඳහා ක්‍රියාකර ඇත. ප්‍රචාරක වැඩසටහන් පවත්වන අවස්ථාවන්හි දී අදාළ ස්ථානයෙහි රූපවාහින ධජය ලෙළ දීමටත්, විදුලි අලෝකය නිසි අයුරින් ලබා දීම සඳහාත් අවශ්‍ය කෙරෙන යටිතල පහසුකම් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව කොඩි කණු මිලදී ගැනීම සිදු කර ඇත.

ඒ අනුව රූපවාහිනි අලෙවි අංශයේ අධ්‍යක්ෂවරු මෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ - ප්‍රවර්ධන වැඩ සටහන් විසින් මිලදී ගැනිමේ යෝජනාව සිදු කර ඇත. පැමිණිලිකරු මීට සම්බන්ධ වී ඇත්තේ මුදල් ගෙවීමේ වවුචරයට අත්සන් කිරීම තුළින් පමණි.

පැමිණිලිකාර චන්ද්‍රපාල ලියනගේ මහතා යම් වරදකට හසු කරලීම සඳහා ඔහුට නඩු පැවරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරිමෙන් පසු කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ. 1 සිට පැ. 41 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 . XXVIII

පැමිණිලි අංකය - 1131/2020

පැමිණිලකරු - සනත් ප්‍රියන්ත දළුවත්ත

ලිපිනය - නො: 128, අල්විස් ටවුම, වත්තල

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. ප්‍රධාන පොලිස් පරීක්ෂක පී.ජී.ආර්.සුමේන්ද්‍ර
2. මහාචාර්ය එම්.සුනිල් ශාන්ත
3. රූපවාහින සංස්ථාවේ හිටපු සභාපති රවි ජයවර්ධන

### තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර සනත් ප්‍රියන්ත දළුවත්ත යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රූපවාහිනී සංස්ථාවේ සේවයෙන් නෙරපීමට සහ ඒ සඳහා ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

# නිර්දේශ

1. රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 ජනාධිපතිවරණයේ දැන්වීම් ප්‍රචාරණය සඳහා මැතිවරණ මිල දර්ශකය යනුවෙන් මිල දර්ශකයක් සකස් කර අනුමත කර නොතිබියදිත් ව්‍යාජ ලෙස සකස් කරවා ගත් එවැනි මිල දර්ශකයක් උපයෝගී කරගෙන පැමිණිලිකරු රැකියාවෙන් නෙරපීමට කටයුතු කිරීමෙන් අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,

2. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

# ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පැමිණිලිකරු රූපවාහිනී සංස්ථාවේ අලෙවි අධ්‍යක්ෂ ලෙස 2014 සැප්තැම්බර් 01 වන දින වැඩ භාරගෙන ඇති අතර ඔහුගේ රාජකාරි ක්ෂේත්‍රය තුළට රූපවාහිනී සංස්ථාවේ අලෙවි අංශය වැටී ඇත. මේ අන්දමින් රූපවාහින සංස්ථාවේ සේවය කරමින් සිටි පැමිණිලිකරුගේ සේවය 2016 පෙබරවාරි 28 අවසන් කර ඇත. පැමිණිලිකරු සඳහන් කළේ ඔහුගේ සේවා කොන්ත්‍රාත්තුව දිර්ඝ කිරීම සඳහා එකඟත්වයක්

සේවා ගිවිසුම අනුව තිබුණේ වී නමුත් 2015 ජනාධිපතිවරණයේ දී ඔහු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දේශපාලන ව්‍යාපාරය උදව් කළේය යන පදනම මත ඔහු සේවයෙන් ඉවත් කළ බවය.

රූපවාහිනී සංස්ථාවේ සේවකයින් පිරිසක් විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට (අල්ලස් කොමිසම) පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පසුව පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කිරීම ආරම්භ කර ඇත. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපතිවරණ ව්‍යාරයේ දැන්වීම් සඳහා අඩු මුදලක් පැමිණිකරු විසින් අය කළ බවට ඉහත කී සේවක පිරිසක් විසින් අල්ලස් කොමිෂන් සභාවට පැමිණිලිකරු තිබ් ඇත. ඔවුන්ගේ පැමිණිල්ලේ පදනම වූයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දේශපාලන දැන්වීම් ප්‍රචාරනය කිරීමේ දී මැතිවරණ මිල දර්ශකය අනුව ගාස්තු අය නොකර ඊට වඩා අඩු ගාස්තුවක් අය කිරීමෙන් රූපවාහිනී සංස්ථාවට අලාභයක් සිදු කර ඇති බවය.

මේ අනුව අල්ලස් කොමිෂන් සභාවේ නිලධාරීන් මේ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම ආරම්භ කරමින් මැතිවරණ දැන්වීම් ප්‍රචාරය කළ ආකාරය හා ඊට අය කර ගත් මුදල් ප්‍රමාණයන් පිළිබඳව වාර්තාවක් පැමිණිලිකරුගෙන් කැඳවා ඇති අතර එකී වාර්තාව අල්ලස් කොමිසමේ නිලධාරීන් විසින් එවන ලද ආකෘතියක සඳහන් කර එවන ලෙස දැනුම් දී ඇත. එකී ආකෘතියෙහි මැතිවරණ කාලසීමාව තුළ ප්‍රචාරය කරන ලද දැන්වීම් සඳහා මැතිවරණ මිල දර්ශකය අනුව අය කර ගත් මුදල යනුවෙන් සඳහන් කරමින් ආකෘතිය පිරවීමට පැමිණිලිකරු මෙහෙයවා ඇති බව අල්ලස් කොමිසම විසින් එවා ඇති ආකෘතිය දෙස බැලීමේ දී පෙනී යයි.

පැමිණිලිකරු සඳහන් කළේ මැතිවරණ මිල දර්ශකය යනුවෙන් මිල දර්ශකයක් රූපවාහින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණු බවය. රූපවාහිනී මැතිවරණ දැන්වීම් ප්‍රචාරණය කිරීම සිදු කර ඇත්තේ එම ප්‍රචාරණය කිරීම භාර දෙන පුද්ගලයා සමග මිල ගණන් සාකච්ඡා කොට දෙපාර්ශවයේ කැමැත්තෙන් එකඟ වන මිල පදනම් කරගෙනය. ඒ අනුව මැතිවරණ දැන්වීම මිල තීරණය කිරීම ද එවකට රූපවාහිනී සංස්ථාවේ පැවැති සාමාන්‍ය දැන්වීම් මිල දර්ශකය අනුව සිදු කර ඇත.

සාමාන්‍ය මිල දර්ශකය අනුව දැන්වීම් ප්‍රචාරණය කිරීම සඳහා එකඟත්වයකට එළැඹෙනු ලබන්නේ දෙපාර්ශවය සාකච්ඡා කර සංස්ථාවේ පවත්නා වියදම් සහ ආදායම් රටාව අනුව සකසා ගනු ලැබූ ක්‍රමවේදයකට අනුවය.

එසේම දැන්වීම් ප්‍රචාරණය කිරීමේ දී රූපවාහිනී සංස්ථාවට ලැබී ඇති රෙටින්ස් සහ අනෙකුත් රූපවාහිනී නාලිකා වලට ලැබී ඇති රෙටින්ස් අනුව, සහ අනෙක් නාලිකා වල දැන්වීම් ප්‍රචාරණය කරනු ලබන මිල ගණන් සමග තරඟකාරී මිලකට යාම රූපවාහිනී සංස්ථාවට ලැබී ඇති රෙටින්ස් අනුව කළ නොහැකි බැවින්, රූපවාහිනී සංස්ථාවට යම් ලාභයක් තබා ගෙන දැන්වීම් ප්‍රචාරණය කිරීම වඩාත් ඵලදායි බවට වන පදනම මතය.

එ බැවින් පැමිණිලිකරු තම සාක්ෂියේ දී සඳහන් කළේ රූපවාහිනී සංස්ථාවට මැතිවරණ දැන්වීම් ප්‍රචාරණය සඳහා රූපවාහිනිට ලැබී ඇති රෙටින්ස් අනුව තරඟකාරී මිල දර්ශකයක් පවත්වාගෙන යා නොහැකි බවත්, මැතිවරණ මිල දර්ශකය වැනි මිල දර්ශකයක් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර නොතිබූ බවත්ය.

එසේ එවැනි මැතිවරණ මිල දර්ශකයක් සංස්ථාව තුළ නොතිබියදීත් අල්ලස් කොමිසමේ නිලධාරීන් ආකෘතියක් අනුව මිල ගණන් ලබා ගැනීම මගින් ඔවුන් විසින් සකස් කළ මැතිවරණ මිල දර්ශකයට පැමිණිලිකරු විසින් සපයන ලද තොරතුරු ඇතුළත් කර ජනාධිපතිවරණ දැන්වීම් සඳහා මැතිවරණ මිල දර්ශකය අනුව අය කිරීම් පැමිණිලිකරු විසින් අය නොකළාය යන චෝදනාවක් කරමින් එමගින් රූපවාහිනී සංස්ථාවට පැමිණිලිකරු විසින් පාඩු සිදු කල බවට අසත්‍ය චෝදනාවක් අල්ලස් කොමිසමේ නිලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති බවය.

අල්ලස් කොමිෂන් සභාව විසින් එවන ලද දැන්වීම පරිදි සකස් කරන ලද ලේඛනය පැ.05 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති අතර, 2015 පෙබරවාරි 13 වන දින දරණ එකී ලේඛනයෙහි පැමිණිලිකරු විසින් පහත සඳහන් අයුරින් සටහන් යොදා ඇත. එනම් "2015 ජනාධිපතිවරණය සඳහා අනුමත මිල දර්ශකයක් නොමැති, මෙතෙක් කල් අනුගමනය කර ඇති සාමාන්‍ය ක්‍රියාපටි පාටිය අනුව සාමාන්‍ය මිල දර්ශකය මෙන් දෙගුණයක් මීට පෙර මැතිවරණ වලදී මිල දර්ශකය ලෙස භාවිතා කර ඇති බැවින්, 2015 ජනාධිපතිවරණයට ද සාමාන්‍ය මිල දර්ශකය මෙන් දෙගුණයක් කර සකසන ලද මිල දර්ශකයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි" යනුවෙන් සටහන් තබා ඇත.

පැමිණිලිකරුට එරෙහිව පැ.06 දරණ චෝදනා පත්‍රය 2015 සැප්තැම්බර් මස 09 වන දිනෙන් යුක්තව රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය සුනිල් ශාන්ත විසින් ඉදිරිපත් කර ඇත. එකී චෝදනා පත්‍රයෙහි දැක්වෙන චෝදනා වලින් සඳහන් කර ඇත්තේ

ඉහතින් සඳහන් කළ මැතිවරණ මිල දර්ශකය පරිදි අයකරගත යුතු මුදල අය නොකර ගෙන අඩු මිලට දැන්වීම් ප්‍රචාරණය කිරීම මගින් රූපවාහිනි සංස්ථාවට රුපියල් 102,282,200.00 ක මුදලක අලාභයක් සිදු කර ඇති බවය.

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපතිවරණ දැන්වීම් ප්‍රචාරණය කිරිමේ දී "මීඩියා ෆ්‍රැක්ටී" නැමැති ආයතනය මගින් එකී දැන්වීම් ප්‍රචාරණ කටයුතු සිදු කර ඇති අතර, ඒ අනුව මීඩියා ෆ්‍රැක්ටී ආයතනය රූපවාහිනි සංස්ථාව සමග සාකච්ඡා කර කේවල් කිරීම තුළින් මිලියන 40 ක පැකේජයටක එකඟවී, ඒ අනුව රූපවාහිනි සංස්ථාව විසින් දැන්වීම් ප්‍රචාරණය කිරිම සිදු කර ඇත.

පැමිණිලිකරු සඳහන් කළ අන්දමට ගණුදෙනු බවට අදාළ මුදලේ ප්‍රමාණය විශාල වන විට ඒ සඳහා ලබා දෙන වට්ටම ද වැඩි වන බවත් ඒ අනුව සමහර අවස්ථාවල 30%, 40% සහ 50% දක්වා වූ වට්ටම් ලැබීම සාමාන්‍ය සිදුවීමකි. මීඩියා ෆ්‍රැක්ටී ආයතනය සමග සිදු කල සාකච්ඡාවකින් පසුව මිලියන 40 ක් සහ මිලියන 3 ක් වශයෙන් වෙන වෙනම මිල ගණන් සඳහා එකඟ වී එම මිල ගණන් රූපවාහිනි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් චන්ද්‍රපාල ලියනගේ මහතා මගින් අනුමත කරවා ගෙන ඇත.

දැන්වීම් ප්‍රචාරණය තුළින් මිලියන 40 ක මුදලක් ලැබී ඇති අතර, අල්ලස් කොමිසමේ නිලධාරීන් සඳහන් කර ඇති පරිදි මැතිවරණ මිල දර්ශකය අනුව එකී දැන්වීම් ප්‍රචාරණය කිරිමට රූපවාහිනි සංස්ථාව ක්‍රියාකලානම් අඩු තරමින් ඉහත කී මිලියන 40 වත් සංස්ථාවට නොලැබෙන බවය.

රූපවාහිනී සංස්ථාව වාණිජ ආයතනයක් බැවින් වැඩ සටහන් ප්‍රචාරණය කිරිම සඳහා ඇති කර ගන්නා ගිවිසුම් කේවල් කිරීමේ පදනම් මතම සිදු වන අතර එවැනි වාණිජ ගිවිසුම් යම් ප්‍රතිපත්තිමය තීරණ හෝ රෙගුලාසි මත පිහිටා ඇති කර ගත නොහැකිය. එවැනි දැඩි ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ හොත් සිදු වන්නේ රූපවාහිනී සංස්ථාව වෙත පැමිණෙන පාරිභෝගියින් හෝ සේවාදායින් එවැනි දැඩි ප්‍රතිපත්ති හෝ තීරණ වලට එකඟ නොවී තම සේවය ඉටු කර ගැනිම සඳහා වෙනත් රූපවාහිනී නාලිකා වෙත පියවර නැඟිමය. එබැවින් ස්ථිරව සකස් කරන ලද මැතිවරණ මිල දර්ශකයක් වැනි මිල දර්ශකයක් මත පිහිටා මැතිවරණ දැන්වීම් ප්‍රචාරණය කිරිමට රූපවාහිනී සංස්ථාව පෙළඹුණේ නම් ඔවුන්ට පෙර කී රුපියල් මිලියන 40 ක මුදලවත් නොලැබෙනු නොඅනුමානය.

රූපවාහිනී සංස්ථාවට සහ ස්වාධීන රූපවාහිනී ආයතනයට ලබා දුන් දැන්වීම් ප්‍රචාරණය කර ඒ සඳහා අයවිය යුතු මුදල් අය නොකර ගැනීමෙන් එකී සංස්ථාවන්ට විශාල පාඩුවක් සිදු වී ඇති බවට චෝදනා 2015 මැතිවරණයෙන් පසුව පත් කරන ලද කොමිෂන් සභාවටක් විසින් පරීක්ෂණයකට භාජනය කර ඇත. මෙම පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ කිසිම අවස්ථාවකදී, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් මාධ්‍ය කටයුතු ආවරණය කළ මීඩියා ෆ්‍රැක්ටී ආයතනය විසින් රූපවාහිනී සංස්ථාවට හෝ ස්වාධීන රූපවාහිනී ආයතනයට මුදල් ගෙවීමට හිඟ තබා ඇති බවට හෝ මුදල් නොගෙවා ඇති බවට චෝදනා හෝ සාක්ෂි ඉදිරිපත් වී නොමැත. අල්ලස් කොමිසම විසින් ගණනය කර ඇති පරිදි රුපියල් මිලියන 102 ක මුදලක් මීඩියා ෆ්‍රැක්ටී ආයතනය විසින් ගෙවා නොමැති බවට හෝ

ගෙවීමට හිඟ තබා ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී නොමැති අතර කිසිදු මූල්‍ය වාර්තාවක හෝ අභ්‍යන්තර ගිණුම් වාර්තාවක සඳහන්ව නැත.

මේ අනුව අල්ලස් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ආකෘතිය අනුව පැමිණිලිකරු මාර්ගයෙන් සකස් කර ගන්නා ලද මැතිවරණ දැන්වීම් පිළිබඳ මිල ගණන් ව්‍යාජ මිල ගණන් බවත්, ඒවා අල්ලස් කොමිසමේ අවශ්‍යතාවයන් මත ඔවුන් විසින් සකස් කරන ලද ආකෘතිය මගින් තමන් වෙත විකල්පයක් නොදී ලබා ගත් ව්‍යාජ ගණන් හිලව් බවත්ය.

මේ අනුව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපතිවරණ දැන්වීම් ප්‍රචාරණය කිරීම වෙනුවෙන් රූපවාහිනී සංස්ථාවට ලැබිය යුතුව තිබූ මුදල රුපියල් මිලියන 140 ක් බවට කිසිම අයුරකින් ගණනය කළ නොහැකි බවත් එය ව්‍යාජයක් බවත් සත්‍ය වශයෙන්ම ලැබිය යුතුව තිබූ මුදල මිලියන 40 ක් බවත්ය.

වගඋත්තරකරුවන් වශයෙන් නම් කර නිකුත් කරන ලද සිතාසි අනුව මහාචාර්ය සුනිල් ශාන්ත සහ රවි ජයවර්ධන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිට ඇති අතර ඔවුන් වෙනුවෙන් පැමිණිලිකරු හරස් ප්‍රශ්න විභාගයකට ද ලක් කර ඇත. මෙම වගඋත්තරකරුවන් නම් කර ඇත්තේ පැමිණිලිකරුට ඔහුගේ ගිවිසුම අනුව රූපවාහිනී සංස්ථාවේ සේවය ඉටු කර ගෙන යාමට ඉඩ නොදීම සහ ගිවිසුම දීර්ඝ කරමින් සේවය කරගෙන යාමට හැකියාව තිබියදී ඔහු ඒ සඳහා ඉඩ නොදීමත් යන චෝදනා පදනම් කරගෙනය. 2015 වර්ෂයෙන් පසුව පවත්වනු ලැබූ විනය පරීක්ෂණ වාර්තාව පදනම් කර ගනිමින් වගඋත්තරකරුවන් වෙනුවෙන් ප්‍රශ්න කිරීම සිදු කර ඇත. එසේ වුවත් පැමිණිලිකරුගේ සේවය අනීත්‍යානුකූල හා අසාධාරණ ලෙස අවසන්

කිරීම පිළිබඳ කාරණයේ දී වගඋත්තරකරුවන් වෙනුවෙන් නගන ලද ප්‍රශ්න වලදී ඔවුන්ගේ වාසියට පැන නඟින කරුණු කිසිවක් හෙළිදරව් වී නොමැත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 16 සහ ආර්.1 සිට ආර්.4 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 .XXIX

පැමිණිලි අංකය - 141/2020

පැමිණිලිකරු - විමලසේන රූබසිංහ

ලිපිනය - අංක. 101/24 ඩී, 03 වන පටුමඟ, එගොඩවත්ත පාර, බොරලැස්ගමුව.

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. කරුණාසේන පරණවිතාන මහතා
2. රොහාන් පෙරේරා මහතා
3. වික්‍රම් බස්නායක මහතා
4. අනුරසිරි හෙට්ටිගේ මහතා
5. මහේෂ් රත්නායක මහතා
6. සමන් ප්‍රනාන්දු මහතා

## තීරණය

අමාත්‍ය මණ්ඩලයේ තීරණයකට සහ ඊට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව රූපවාහිනී සංස්ථාව මඟින් විකාශනය කරනු ලබන වැඩසටහන් සැටලයිට් තාක්ෂණය ඔස්සේ විදේශ රටවලට විකාශය කරනු ලැබීමට කටයුතු කිරීමේදී එම තීරණය පරිදි වූ මුදල් ගෙවීමක් පාදක කර

ගනිමින් විමලසේන රූබසිංහ මහතාට එරෙහිව අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ නඩු පැවරීම

සහ

රූපවාහිනී සංස්ථාවට කොඩි කණු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියක් පාදක කර ගනිමින් ඔහුට එරෙහිව අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ නඩු පැවරීම විමලසේන රූබසිංහ මහතා දේශපාලන පලිගැනීමකට ලක් කිරීමක්ය යන නිගමනයට කොමිෂන් සභාව එළඹ සිටී.

## නිර්දේශය

1) විමලසේන රූබසිංහ මහතාට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ ඉදිරිපත් කර ඇති අංක 74133/01/17 සහ 26239/01/15 නඩු වැඩිදුර පවත්වාගෙන යාමකින් තොරව නීතිපතිවරයාගේ මැදිහත් වීම මත අවසන් කරනු ලැබිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

2) මාධ්‍ය ආයතනයන්හි ක්‍රියාත්මක වන වෘත්තීය සමිති ආයතනයේ පරිපාලනය කෙරෙහි මැදිහත් වීම වළක්වාලන නීති සම්පාදනය කළයුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමලත් අමාත්‍යංශ ලේකම්වරයෙකු වූ සහ 2014 වර්ෂයේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා

වශයෙන් කටයුතු කරන ලද විමල් රූබසිංහ මහතා මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද 2020.02.06 දිනැති පැමිණිල්ල මඟින් පහත සඳහන් කරුණු කොමිෂන් සභාව වෙත කියා සිටිනු ලැබ ඇත.

2014.01.20 දින සිට රූබසිංහ මහතා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් පත් කෙරෙන ලදුව දැඩි කැපවීමකින් සහ වගකීමකින් යුතුව අදාළ ධූරයේ කටයුතු සිදු කරනු ලැබිණි. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ විවිධ සේවාවන් සඳහා ආදායම් උපයන ක්‍රියාමාර්ග වැඩසටහන් ආදියට සම්බන්ධ උත්සවලදී එවකට දැඩි කුලියක් ගෙවමින් ලබා ගන්නා ලද කොඩි කණු අවශ්‍යතාවය සපුරාලීමට අමාත්‍යංශයේද මග පෙන්වීම පරිදි මිලට ගන්නා ලද කොඩි කණු විධිමත් ටෙන්ඩර් ක්‍රියාවලියක් මත ක්‍රියා කරමින් නිසි ලෙස මිලදී ගෙන තිබියදී ඒ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව ලවා පරීක්ෂණ පවත්වා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා එම නඩුවේ තුන්වන චූදිත වශයෙන් රූබසිංහ මහතා නම් කර සිටී. එසේම අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විකාශය කරනු ලබන වැඩසටහන් සැටලයිට් තාක්ෂණය ඔස්සේ සජීවීව විකාශනය කිරීමට කටයුතු කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් නඩු පවරනු ලැබ මෙම නඩුවේ දෙවන චූදිත වශයෙන් රූබසිංහ මහතා නම් කරනු ලැබ සිටී. රූබසිංහ මහතාගේ යථෝක්ත පැමිණිල්ල අංක 141/2020 වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ අතර ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් විමර්ශන කටයුතු ආරම්භ කරනු ලැබිණි.

කොමිෂන් සභාවේ පොලිස් ඒකකය විසින් සටහන් කරන ලද රූබසිංහ මහතාගේ කටඋත්තර ප්‍රකාශයෙහි පහත සඳහන් කරුණු ප්‍රකාශ කරනු ලැබ ඇත.

රූබසිංහ මහතාගේ පියා දොන් ජුවානිස් රූබසිංහ නම් වේ. ඔහු ආයුර්වේද වෛද්‍යවරයෙකු වශයෙන් කටයුතු කරන ලදි. මව ඩී.ජී. ලියනපතිරණය. මෙම දෙදෙනාම දැනට මිය ගොසිනි. ඔවුන් පදිංචිව සිටින ලද්දේ හක්මන කරතොටය. එම නිවසෙහි උපත ලත් රූබසිංහ මහතා හෙට්ටියාවල විදුහලෙන් මූලික අධ්‍යාපනය ලැබූ අතර ද්විතීය අධ්‍යාපනය හක්මන මෙතෝදිස්ත විදුහලෙන් හා කෝනගල අභය මහ විදුහලෙන් ලබන ලදි. අනතුරුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබන ලද අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජනමාධ්‍ය පිළිබඳ ඩිප්ලෝමාවක් ද විවෘත විශ්ව විද්‍යාලය මඟින් රාජ්‍ය කළමණාකරණ ඩිප්ලෝමාවක් ද ලබා ගත් අතර එංගලන්තයේ බර්මින්හැම් විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය සේවා කාර්ය සාධන නැංවීමේ පාඨමාලා හදාරා ඇත. ඒ.පී.ආර්.රාමවික්‍රම ඔහුගේ භාර්යාව ගුරුවරියක වූ ඇය දැනට විශ්‍රාම ලබා සිටී. රූබසිංහ මහතාට පුත්‍රයින් තිදෙනෙක් සිටින අතර ඔවුන් තිදෙනාම වෛද්‍යවරුන් වේ. තිදෙනාගේම භාර්යාවන් ද වෛද්‍යවරියන්ය. වැඩිමහල් පුත්‍රයා කායික රෝග විශේෂඥයෙකු වන අතර ඔහු ඕස්ට්‍රේලියාවේ ඩාවින් නගරයේ සේවයේ යෙදී සිටී. දෙවන පුත්‍රයා රජයේ අක්ෂි රෝහලේ ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරයෙකු වශයෙන් ද බාල පුත්‍රයා පේරාදෙණිය රජයේ රෝහලේ මාතෘ හා ළමා අංශයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරයෙකු වශයෙන් ද සේවය කරනු ලබයි.

1970 වර්ෂයේ මධ්‍යම ලිපිකාර විභාගයෙන් සමත් වූ රූබසිංහ මහතා රජයේ ලිපිකරුවකු වශයෙන් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයක පළමු පත්වීම ලැබීය. 1981 වර්ෂයේදී ලිපිකාර සේවයේ අධිශ්‍රේණියට පත්වනු ලැබ පරිපාලන නිලධාරී තනතුර ලැබූ අතර 1984 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තරඟ විභාගය සමත්ව වීරකැටියේ ප්‍රාදේශීය උප දිසාපති ලෙස පත්වනු ලැබිණි. 2009 වර්ෂයේදී සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් පත් කෙරෙන ලද අතර 2012 වර්ෂය අවසානයේදී විශ්‍රාම ලබන ලදි. විශ්‍රාම ලැබීමෙන් පසුව මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති වශයෙන් කටයුතු කළ අතර 2014 වර්ෂයේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති තනතුරට පත් කරනු ලැබිණි.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා ලෙස සේවය කරද්දී එම ආයතනයේ සේවා අවශ්‍යතා සඳහා 2013-2015 ආයතනික සංවර්ධන සැලැස්මේ සඳහන්ව තිබූ කොඩි කණු මිලදී ගැනීම සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වැඩසටහන් සැටලයිට් තාක්ෂණය ඔස්සේ ජාත්‍යන්තරයට විසුරුවා හැරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබෙන ලදුව එය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ක්‍රියාවට නංවනු ලැබිණි.

සාක්ෂි විභාගයේදී විමල් රූබසිංහ මහතා ද චන්ද්‍රපාල ලියනගේ මහතා ද සාක්ෂි දුන් අතර ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි තුළ පහත සඳහන් කරුණු හෙළිදරව් වන ලදි.

2015 ජනවාරි මාසයේ පැවති ජනාධිපතිවරණයට ආසන්නව තිබියදී එවකට සිටි ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා සමඟ ජනාධිපතිවරණයට තරඟ කරනු ලැබූ පොදු අපේක්ෂකයාගේ පාර්ශවයේ දේශපාලනඥයන්ගේ මෙහෙයවීම සහ සහභාගිත්වය යටතේ රූපවාහිනී සංස්ථාව ඉදිරිපිට උද්ඝෝෂණ පවත්වනු ලැබූ අතර රතන ස්වාමීන් වහන්සේද කරුණාරත්න පරණවිතාන මහතා ද එම උද්ඝෝෂණයනට සහභාගී වී සිටින ලදි. ඔවුන්ගේ අරමුණ වූයේ සංස්ථාවේ සභාපතිවරයා ද අධ්‍යක්ෂ ජනරාල්වරයා ද බියට පත් කරනු ලැබ රූපවාහිනී සංස්ථාවේ කටයුතු අඩපණ කරනු ලැබීමයි. ආරක්ෂක අංශ යොදවා උද්ඝෝෂකයින් සංස්ථාව තුළට ඇතුළු වීම වළක්වා ගත් අතර රූබසිංහ මහතා සහ චන්ද්‍රපාල ලියනගේ මහතා ජීවිත ආරක්ෂාව උදෙසා උද්ඝෝෂකයින් මඟහැර සිටින ලදි. 2015 ජනවාරි මස 08 වන දින රාත්‍රියේ ජනාධිපතිවරණ ප්‍රතිඵල විකාශය වෙමින් පැවතියදී රූපවාහිනී සංස්ථාව තුළ වූ ජනතා විමුක්ති පෙරමුණේ ශාඛා සභාපතිවරයා ලෙස කටයුතු කළ අනුරසිරි හෙට්ටිගේ ද මෙම සමිතියේ ම සාමාජිකයෙකු වූ විකුම් බස්නායක ද එක්සත් ජාතික පක්ෂයේ ශාඛා සමිතියේ භාණ්ඩාගාරික ලෙස කටයුතු කළ මහේෂ් රත්නායක ද එක්සත් ජාතික පක්ෂයේ ශාඛා සමිතයේ සාමාජිකයෙක් වූ සමන් ප්‍රනාන්දු ද රූපවාහිනී සංස්ථාව තුළ උද්වේගකාරී ලෙස හැසිරීමට වනු ලැබිණි. ඒ අනුව සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට සංස්ථා පරිශ්‍රයේ රැඳී සිටීම සුදුසු නොවන බවට හිතවත්ව කටයුතු කළ නිලධාරීන් පවසනු ලැබූ අතර ඉහතින් සඳහන් කළ උද්වේගකාරී ලෙස හැසිරෙන ලද පිරිස් ප්‍රධාන නිලධාරීන්ගේ නිල කාමරවල නාම පුවරු ගලවා බිම දමනු ලැබිණි. ඔවුන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිල කාමරයට ගොස් ඔහුට පිටවන ලෙසට තර්ජනය කරන ලදි.

සභාපතිවරයා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලැබූ ඇතැම් නිලධාරීන් බියට පත්ව මඟහැර ගොස් සිටි අතර ඇතැමුන් බලහත්කාරයෙන් නෙරපනු ලැබීමට ඉහතකී උද්වේගකාරී පිරිස් කටයුතු කරන ලදි. ඒ අනුව රුබසිංහ මහතාට ද චන්ද්‍රපාල ලියනගේ මහතාට ද තවදුරටත් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පරිශ්‍රයේ සිටිය නොහැකි වූ අතර ඔවුන්ට සිය කාර්යාල අත්හැර දමා යාමට සිදුවිය.

යහපාලන රජය බලයට පත් වීමත් සමඟ වෙනත් සභාපතිවරයෙක් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කර ගනු ලැබිණි. රුබසිංහ මහතා සිය නිවසෙහි කාලය ගත කරමින් සිටි අතර ඔහුට 2015 මාර්තු මස 24 වන දින අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ පෙනී සිටින ලෙසට කැඳවීමක් ලැබිණි. ඉන් අනතුරුව අවස්ථා කිහිපයකදී ඔහු අදාළ විමර්ශන අංශය වෙත කැඳවනු ලැබූ අතර රුබසිංහ මහතාගේ පැමිණිල්ලෙහි සඳහන් කර තිබූ කොඩි කණු මිලදී ගැනීම සහ සැටලයිට් විකාශය පිළිබඳව ප්‍රශ්න කිරීමට භාජනය කරනු ලැබිණි.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න විසින් එකී කොමිෂන් සභාවේ යොමු අංක බීසී/41/2015 යටතේ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 74173/1/17 නඩුව සඳහා 2017.05.30 දිනැතිව ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි පහත සඳහන් කරුණු ඇතුළත් කර තිබේ.

01. දෙල්වක්කඩ ලියනගේ චන්ද්‍රපාල, අංක 43/23ඒ, පැපිලියාන මාවත, කොහුවල, 02. විමලසේන රුබසිංහ, 101/24/සී, 3 වෙනි පටුමඟ, එගොඩවත්ත, බොරලැස්ගමුව නම් චූදිතයින්ට විරුද්ධව ගරු

අධිකරණය වෙත මෙසේ වාර්තා කර සිටිමියි සඳහන් කරමින් මෙසේ විස්තර කරනු ලබයි.

ශ්‍රී ලංකා ජාතික රූපවාහිනී නාලිකාව චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ වැඩසටහන් විකාශනය කිරීම සම්බන්දයෙන් 2014.12.09 දින 01 වන සැකකරු විසින් ඔහු හඳුනන ඉතාලියේ පිහිටි නෝවා විෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය තෝරාගෙන ඇත. ඒ අනුව එම ආයතනයේ නියෝජිතවරියක් වන ප්‍රියන්තිද සිල්වා නැමැත්තියව හඳුන්වා දී ශ්‍රී ලංකා රූපවාහිනී නාලිකාව චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ යුරෝපා හා මැද පෙරදිග රටවලට විකාශනය කිරීම සඳහා වන් ශ්‍රී ලංකා නාලිකාව නමින් විකාශනය කිරීමට කටයුතු කරන ලෙසට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට (ඉංජිනේරු) හා ඉංජිනේරු අංශයේ අධ්‍යක්ෂට පළවන සැකකරු උපදෙස් දී ඇත. මෙම ආයතනය තෝරා ගැනීමේදී පළවන සැකකරු විසින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොමැති අතර ඔහුගේ අභිමතය පරිදි මෙම ආයතනයේ සේවාව ලබාගෙන ඇත. තවද නෝවා විෂන් ආයතනයෙන් ලබා ගන්නා සේවාව හා ඒ සඳහා ගෙවිය යුතු මුදල පිළිබඳව සේවාව ලබා ගැනීමට පෙර නීත්‍යාණුකූල ගිවිසුමක් අත්සන් කර නොමැති අතර මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ද ලබාගෙන නොමැති. එසේ තිබියදී නෝවා විෂන් ආයතනය විසින් ඉල්ලා ඇති මුදල ගෙවීම සඳහා පළවන සැකකරු නිර්දේශ කර ඇති අතර දෙවන සැකකරු විසින් මෙම මුදලින් අඩක් ගෙවීමට අනුමැතිය දී ඇත. ඒ අනුව නෝවා විෂන් ප්‍රයිවට් ලිමිටඩ් වෙත රු. 3,454,279.37 ක මුදලක් ගෙවා ඇති අතර එය රජයට සිදු කරන ලද පාඩුවක් වන අතර නෝවා විෂන් ආයතනයට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථ ලාභයක් සිදු වී ඇත.

අල්ලස් කොමිසම විසින් මෙම පාඩුව සහ ලාභය ගණනය කිරීමට යොදා ගනු ලැබ ඇති සාධක ලෙස එම වාර්තාවෙහි සඳහන් වන්නේ නෝවා විෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය පළවන සැකකරු හඳුනන වශයෙන් සැලකීමත් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොමැති වීමත් නීත්‍යානුකූල ගිවිසුමක් අත්සන් නොකිරීමත් සහ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොමැති වීමත්ය. රූපවාහිනී සංස්ථාව රජයේ දෙපාර්තමේන්තුවක් නොව අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය වන්නා වූ සංස්ථාවක්ය යන කරුණ සැලකිල්ලට ගැනීමක් සිදුව නොමැති අතර සේවා අවශ්‍යතා මත යම් ව්‍යාපෘතීන් කඩිනමින් සිදු කරනු ලැබීමේ පහසුව උදෙසා සංස්ථා සහ මණ්ඩල විසින් ඊට ආවේණික වන්නා වූ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සකස් කර ගන්නා බැවින් ඒ පිළිබඳව වූ කරුණු සොයා බැලීමක් සිදුව ඇති බවක් ද නොපෙනේ.

කෙසේ වෙතත් අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාර්තාව මඟින් එම වාර්තාවේ නම් සඳහන් 01, 02 සැකකරුවන් දණ්ඩ නීති සංග්‍රහයේ 113 (ආ) සහ 102 වගන්තීන් සමඟ කියවිය යුතු අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කරනු ලැබ ඇති බවට චෝදනා 5ක් යෝජනා කොට ඇත. අනතුරුව එකී චෝදනා පහ සඳහන් චෝදනා පත්‍ර 2017.07.07 දින ඔවුන්ට ලබා දී තිබේ. අනතුරුව එක් එක් වූදිතට රු.25,000/= ක් බැගින් මුදලින් ඇප ද රුපියල් දස ලක්ෂය බැගින් ශරීර ඇප ද නියම කර ඇත.

ජාතික රූපවාහිනිය සැටලයිට් තාක්ෂණය ඔස්සේ විදේශ රටවල ප්‍රචාරය කිරීම ආරම්භ කරනු වස් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල විසින් 2014.12.03 දින අංක

19/2014 දරණ කැබිනට් සංදේශය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබ ඇත. ආසියානු රටවල් මෙන්ම ලෝකයේ බොහෝ රටවල් තම අනන්‍යතාව ලොවට ගෙන හැර පෑම සඳහාත් විදේශ ගතව සිටින තම රටවල පුරවැසියන්ගේ දැනුම රසාස්වාදය වැඩි කිරීම සඳහාත් සැටලයිට් තාක්ෂණය ඔස්සේ රූපවාහිනී නාලිකා පවත්වාගෙන යයි යනුවෙන් සඳහන් කර ඇති එකී කැබිනට් සංදේශයෙහි ශ්‍රී ලංකාවට එරෙහිව එල්.ටී.ටී.ඊ. සංවිධානය සැටලයිට් තාක්ෂණය ඔස්සේ නාලිකා රැසක් පවත්වාගෙන යමින් දැවැන්ත ප්‍රචාරක ජාලයක් පවත්වාගෙන යන බැව් ද එහි සඳහන් වේ. විදෙස් ගත ශ්‍රී ලාංකිකයින් වර්ෂයකදී ඇමරිකානු ඩොලර් බිලියන 7 ට ආසන්න විදේශ විනිමයක් රටට උපයා දෙන අතර විදේශ ගත ලාංකික බුද්ධිමතුන් හා ශ්‍රමිකයන් ගොඩනගාගෙන ඇති කීර්තිනාමය මිල කළ නොහැකි අතර විදෙස් ගත දමිල ප්‍රජාව නිවරදිව දැනුවත් කිරීම යුගයේ කාලීන අවශ්‍යතාවයක් වන බැව්ද මෙම කැබිනට් සංදේශයෙහි වැඩිදුරටත් සඳහන් කර ඇති අතර අමාත්‍ය මණ්ඩලයට යෝජනා තුනක් ඉදිරිපත් කර ඇත. එනම්

i. ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව ලොවට ගෙන යාම හා විදේශ ගත ලාංකිකයන්ගේ දැනුම රසාස්වාදය ප්‍රවර්ධනය සඳහා ජාතික රූපවාහිනිය සැටලයිට් තාක්ෂණය ඔස්සේ රූපවාහිනී සේවාවක් පවත්වාගෙන යාම.

ii. මෙම රූපවාහිනී නාලිකාව ඉතාලියේ හෝ යුරෝපයේ වෙනත් රටක ස්ථාපිත කරන මැදිරියක පවත්වා ගෙන යාමටත් ඊට අවශ්‍ය උපකරණ

තාවකාලිකව බදු පදනමක් මත ලබා ගැනීමටත් රූපවාහිනී නාලිකාවේ කටයතු පවත්වාගෙන යාමේ වගකීම රූපවාහිනී සංස්ථාව වෙත පැවරීම.

iii. සැටලයිට් තාක්ෂණ පහසුකම, මැදිරිය හා උපකරණ ලබා ගැනීම, රූපවාහිනී විකාශන කටයුතු මෙහෙය වීම, කාර්ය මණ්ඩලය යෙදවීම සහ අනෙකුත් වියදම් වෙනුවෙන් 2015 වර්ෂයේදී රු. මි. 200 ක් ද ඊට පසු සෑම වර්ෂයකදීම රු. මි. 100 ක් බැගින් රූපවාහිනී සංස්ථාව වෙත ලබාදීම.

2014.12.04 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත සඳහන් යෝජනා සඳහා අනුමැතිය ලබාදීමට තීරණය කර ඇත.

ඉහත කී කැබිනට් තීරණය අනුව කටයුතු කිරීමට 2014.12.09 දින රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් පවත්වනු ලැබ ඇති අතර එම රැස්වීමට පහත නම් සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලය සහභාගී වී තිබේ.

| | | |
|---|---|---|
| මණ්ඩල සභාපති | - | විමල් රූබසිංහ මහතා |
| මණ්ඩල සාමාජිකයින් | - | හඩ්සන් සමරසිංහ මහතා |
| | | මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස |
| | | එඩ්වඩ් ජයකොඩි මහතා |
| | | ඩී. කරුණාරත්න මහතා |
| භාණ්ඩාගාරයේ නියෝජිත | | ඩී.එම්. අනුලා හරස්ගම මෙනෙවිය. |

ආරාධිතයින් චන්ද්‍රපාල ලියනගේ මහතා

අධ්‍යක්ෂ ජනරාල්

රොහාන් පෙරේරා මහතා

මෙම රැස්වීමේදී ඉහතකී කැබිනට් තීරණය ඇතුළත් සංස්ථා මණ්ඩල පත්‍රිකාව සභාගත කරනු ලැබ ඇති අතර එහිදී අදාළ කරුණු දීර්ඝ ලෙස සාකච්ඡාවට බඳුන් වූ බැව් සඳහන් වේ. මුදල් අමාත්‍යාංශය මඟින් මුදල් ලබාදීමේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් බවට සංස්ථා මණ්ඩලය තීරණය කර ඇත.

රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගනු ලබනේන් විධායකය වන අමාත්‍ය මණ්ඩලයයි. අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කරනු ලබන්නේ විධායකයේ කොටසක් වන රාජ්‍ය නිලධාරීන් විසිනි. නව රජයක් පිහිටුවනු ලැබූ විට සිදු වන්නාවූ ප්‍රායෝගික කටයුත්තක් වනුයේ අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රාජ්‍ය සංස්ථා සහ මණ්ඩලවල ප්‍රධානීන් අලුතින් පත් කර ගනු ලැබීමය. එලෙස පත් කර ගනු ලබන්නේ අලුතින් පත් වූ රජයට විශ්වාසවන්ත නිලධාරීන්ය. එබැවින් එලෙස පත් වන්නාවූ නිලධාරීන් තමන් පත් කර ගත් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමට බැඳී සිටීම ප්‍රායෝගිකව සිදු වන්නකි. කවර දේශපාලන පක්ෂය බලයට පත් වුවද අතීතයේ සිට මෙය මෙලෙසින් සිදුව ඇත.

ශ්‍රී ලංකාව තුළ තිස් වසරක කාලයක් තිස්සේ පැවති එල්.ටී.ටී.ඊ යුද්ධය අවසන් කොට රට එක් සේසත් කරනු ලැබූ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ඉමහත් ලෙස රට තුළ ජනප්‍රියත්වයට පත්ව සිටින

ලදින් සහ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පරාජය කිරීමට එල්.ටී.ටී.ඊ හිතවාදී විදේශ බලවේගයනට අවශ්‍යව පැවතුනෙන් ඒ සඳහා රාජ්‍ය නොවන සංවිධාන හරහා සහ විරුද්ධ පාක්ෂික දේශපාලනඥයන් යොදා ගනිමින් විවිධ වූ උපක්‍රම ක්‍රියාත්මක කෙරෙන ලද අතර මහාපරිමාණ දූෂණ වංචා සෙවීම නොහොත් හොරු ඇල්ලීම යන සංකල්පය හඳුන්වාදීම ඉන් එක් උපක්‍රමයක් විය. තම ප්‍රතිවාදී දේශපාලන නායකයින් සමඟ මිත්‍රශීලීව කටයුතු කරන දේශපාලඥයින් මෙන්ම තම ප්‍රතිවාදීන් කෙරෙහි ද්වේශ කරන්නාවූ සහ පළිගැනීමේ චේතනාවෙන් පසුවන්නාවූ දේශපාලඥයින් ද වේ. මහජනයා රවටනු පිණිස යහපාලනය යන වචනය යොදා ගනිමින් 2015 ජනවාරි මාසයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පරාජයට පත් කොට බලයට පත් වූ යහපාලන රජයෙහි ඉහතින් සඳහන් කෙරෙන ලද පළිගැනිමේ චේතනාවෙන් පසු වූ දේශපාලනඥයින් කිහිප දෙනෙක් සහ ඔවුන්ගේ අනුගාමික පිරිසක් ද මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රජයෙහි කටයුතු කළ දේශපාලනඥයින්ගෙන් සහ රාජ්‍ය නිලධාරීන්ගෙන් පළිගැනීමේ සංවිධානාත්මක ක්‍රියාදාමයක් හඳුන්වාදී ක්‍රියාත්මක කරනු ලැබිණි. ඒ සඳහා පොලීසිය ද අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මෙන්ම අධිකරණය ද ඔවුන් විසින් උපයෝගී කරගනු ලැබිණි.

යහපාලන රජයේ රාජ්‍ය අමාත්‍යවරයෙකුව සිටින ලද රංජන් රාමනායක මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් ද අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ද මෙන්ම විනිශ්චයකාරවරුන් සහ විනිශ්චයකාරවරියන් සමඟ නඩු කටයුතු සම්බන්ධයෙන් සහ විවිධ කරුණු පිළිබඳව පැවැත්

වූ දුරකථන සංවාදයන් හි පටිගත කිරීම් මෙම කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කරනු ලැබිණි. ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඉදිරියේ විභාග වෙමින් පැවති භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතන නඩුවෙහි තමන්ට අවශ්‍ය දේ සිදුවන බවට නිශ්චිත බැවින් තවදුරටත් එම විනිශ්චය මණ්ඩලයෙහි සිටි විනිශ්චයකාරතුමිය සමඟ කතා නොකරන්නැයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂව සිටි පොලිස් අධිකාරී ශානි අබේසේකර රන්ජන් රාමනායක මහතාට පවසන අයුරු ද මට නීතිය හදන්නත් පුළුවන් නීතිය කඩන්නත් පුළුවන් යැයි අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවෙහි සිටි අධ්‍යක්ෂ ජනරාල්වරිය වන දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ ඇවන්ගාර්ඩ් සමාගමේ සභාපති නිශ්ශංක සේනාධිපති සමඟ පවසන අයුරු ද තමන් චූදිතයින් වරදකරුවන් කිරීමට කටයුතු කර ඇති බැවින් තම උසස් වීම ලබාදීමට කටයුතු කරන ලෙස භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතන නඩුව විභාග කළ ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයෙහි කටයුතු කළ මහාධිකරණ විනිශ්චයකාරවරිය රන්ජන් රාමනායක මහතාට පවසන අයුරු ද මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබ ඇති දුරකථන සංවාදයන්හි ඇතුළත්ව තිබේ.

යථෝක්ත ක්‍රියාදාමය යටතේ පළිගැනීමට ලක්වන ලද අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සංස්ථා සභාපතිවරුන්, රාජ්‍ය අයතනයන්හි අධ්‍යක්ෂවරුන්, හමුදාපතිවරුන්, හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් ද මෙම කොමිෂන් සභාව ඉදිරියේ හැඬූ කඳුළින් යුතුව සාක්ෂි දෙමින් මෙම පළිගැනීමේ ක්‍රියාවලියෙහිදී ඔවුන්ට මුහුණ පෑමට සිදුවන ලද තාඩන පීඩන සහ දුක්කම්කටොළු කියා සිටිනු ලැබිණි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා

කුස ගින්නේ සහ පිපාසයේ තබාගෙන උදෑසන සිට රාත්‍රී කාලය දක්වා ප්‍රකාශ ලබා ගැනීම් ද ජනාධිපතිවරයාගෙන් ලබාගත් රඳවා ගැනීමේ නියෝග මත මාස ගණන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකුඩු තුළ තබාගෙන විවිධ හිරිහැරයනට ලක් කිරීම් ද මහේස්ත්‍රාත් අධිකරණයනට ඉදිරිපත් කොට රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලැබ දින ගණන් මාස ගණන් සහ වසර ගණන් ඇප නොදී තම දරු පවුල්වලින් ඈත් කොට සිර භාරයේ තබා ගැනීම් ද මෙන්ම සොරුන් මිනීමරුවන් වංචාකරුවන් දූෂිතයන් ලෙසට ප්‍රසිද්ධියට පමුණුවා නින්දාවට සහ අපහාසයට ලක් කිරීම් ද ඒ අතර වනු ලැබිණි.

පළිගැනීමේ ක්‍රියාවලියට ගොදුරු වූ ඉහත කී නිලධාරීන් රැඳවුම් නියෝග මත රඳවාගෙන සිටියදී සහ රක්ෂිත සිරභාරයට පත් කරනු ලැබ සිටියදී සමහරුන්ගේ මාපියන් මිය යාම ද සමහරුන්ගේ දූ දරුවන් රෝගාතුර වීමද සමහරුන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම ද සිදුව ඇත. තවත් සමහරුන් එලෙස රඳවාගෙන සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රාත්‍රී කාලයන්හිදී ඔවුන්ගේ නිවෙස් වෙත ගොස් එලෙස රඳවාගෙන සිටින්නන්ගේ බිරින්දෑවරුන් අපහසුතාවනයනට පත්වන පරිදි කටයුතු කර ඇත.

එක් පැමිණිලිකාර හමුදා නිලධාරියෙක් අත්අඩංගුවට ගැනීම සඳහා කොළඹින් බැහැර පිට පළාතක වූ ඔහුගේ නිවසට මැදියම් රැයේදී ඇතුළු වූ අපරාධ පරීක්ෂණ දෙපාර්ත මේන්තුවේ නිලධාරීන් රාත්‍රියේ නිදන ඇඳුම පමණක් ඇඳ සිටි එම නිලධාරියාගේ බිරිඳට වෙනත් ඇඳුමක් ඇඳ ගැනීමට පවා ඉඩනොදී පසු දින පහන් වන තුරු ප්‍රශ්න කරමින් රඳවා ගනු ලැබ සිට ඒ වන විට එම නිවසෙහි සිටි එම කාන්තාව සහ කුඩා දරුවා දැඩි ලෙස පීඩාවට පත් කරනු ලැබ ඇත.

එම කාන්තාව සහ කුඩා දරුවා අදාළ හමුදා නිලධාරියා ඒ වන විට සිටින ලද ස්ථානය පොලිස් නිලධාරීන්ට පෙන්වා දීමට ඔවුන් සමඟ රැගෙන යන අවස්ථාවේදී එම කාන්තාවට ඇය ඇඳ සිටි රාත්‍රී ඇඳුම මාරු කර ගැනීමට සිදු වූයේ පොලිස් නිලධාරීන් බලා සිටියදීය. එකී මව සහ පුත්‍රයා හට උදෑසන වැසිකිළි කැසිකිළි යාමකට හෝ ඉඩ නොදී සා පිපාසාවෙන් යුතුව ත්‍රිකුණාමලය ප්‍රදේශයට රැගෙන ගොස් ඇත. යහපාලන රජයේ දේශපාලනඥයින් ද ඔවුන් බලයට පත් කිරීමට ක්‍රියා කළ එල්.ටී.ටී.ඊ හිතවාදී රාජ්‍ය නොවන සංවිධාන පවත්වාගෙන යමින් ඒවායින් යැපෙන ලද යහපාලන රජයේ අනුගාමිකයින් ද සතුටට පත් කිරීම සඳහා යම් වරප්‍රසාද උදෙසා කටයුතු කරන ලද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරීන්ගේ එකී අමානුෂික කෲර ක්‍රියාකාරකම් පිළිබඳව ඊට ගොදුරු වන ලද එකී කාන්තාවන් සහ ළමුන් මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඔවුනට විඳිනට සිදු වූ දුක් ගැහැට පිළිබඳව කියා සිටින ලද්දේ හඬා වැළපෙමිනි.

පිටිසර ගම්බද ප්‍රදේශයක උපත ලබා තම දක්ෂතාවය සහ හැකියාව මත රාජ්‍ය සේවයේ ඉහළ තනතුරු ලබා රටට සේවය කරන ලද විමල් රූබසිංහ මහතා දශක හතරකට වැඩි දීර්ඝ කාලයක රාජ්‍ය සේවයෙන් පසු විශ්‍රාම ලබන අවස්ථාව වන විට ඔහුගේ දරුවන් වැඩිවියට පත්ව වෛද්‍ය වෘත්තිකයන්ව සිටිනු ලැබ ඇත. ඒ අනුව ඔහු රූපවාහිනී සංස්ථාවේ සභාපති තනතුරට පත්වනු ලැබීම හුදෙක් වැටුපක් ලබා ගැනීමේ හෝ මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් සිදුවන ලද්දක් නොවේ. විමල් රූබසිංහ මහතාට එරෙහිව නඟනු ලැබ ඇති චෝදනාවන්හි ඔහු කිසිදු මූල්‍යමය හෝ අන් ආකාරයක වාසියක් ලබා ගත් බවට වූ දෝෂාරෝපණයන් ඇතුළත් නොවේ. අදාළ චෝදනාවන් හුදු

තාක්ෂණික කරුණු මත පදනම්ව ඇත. "මම කවියෙක්, ලේඛකයෙක්, අමාත්‍යාංශ ලේකම්වරයෙක් මේ විදියට හොරෙක් වංචාකාරයෙක් විදියට හඳුන්වා දෙන්නට මම කිසිම වරදක් කරළා නැහැ" යි විමල් රූබසිංහ මහතා සංවේදීව මෙම කොමිෂන් සභාව ඉදිරියේ කඳුළු සලමින් පවසනු ලැබිණි.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ විකාශයන් සැටලයිට් තාක්ෂණය ඔස්සේ විදේශ රටවලට විකාශනය කළයුතු බවට වූ ප්‍රතිපත්තිමය තීරණය ගන්නා ලද්දේ අමාත්‍ය මණ්ඩලය විසිනි. අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද එම තීරණය යුහුසුලුව ක්‍රියාත්මක කිරීමට තීරණය කරනු ලැබුයේ රූපවාහිනී සංස්ථාවේ සංස්ථා මණ්ඩලයයි. විමල් රූබසිංහ මහතා එම සංස්ථා මණ්ඩලයේ එක් සාමාජිකයෙකි. ඒ සංස්ථාවේ සභාපතිවරයා ලෙසටය. අනතුරුව ඔහු විසින් සිදු කරනු ලැබ ඇත්තේ මෙම සේවාව පවත්වාගෙන යාම සඳහා නම් කරනු ලැබ සිටි ආයතනයට ගෙවීමට නියමිත මුදලින් අඩක් ගෙවීම අනුමත කිරීමය. ප්‍රසම්පාදන ක්‍රියාවලියට යටත්ව බව අනුමැතිය ලබා දී ඇති සටහනෙහි සඳහන් වේ. මේ හා සමාන ක්‍රියාවලීන් සිදුවනු ලැබ ඇති මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් වූ ඇතැම් පැමිණිලි හා අදාළව පැවැත්වූ විමර්ශනයන්හිදී හෙළිදරවු වන ලද්දේ නඩු පැවරීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට එරෙහිව සිදු කරනු ලැබ ඇති බවය. එහෙත් මෙම අවස්ථාවේදී කිසියම් හේතු මත සංස්ථා මණ්ඩලයේ සාමාජිකයින් අත්හැර සංස්ථා සභාපතිවරයා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා තෝරා ගනු ලැබ ඇති බව පෙනී යයි. ඒ අනුව මෙම කාරණයේදී අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව හරහා විමල් රූබසිංහ මහතාට හා චන්ද්‍රපාල ලියගේ මහතාට එරෙහිව නඩු පැවරීම

දේශපාලන පළිගැනීමක් වශයෙන් සිදු කරනු ලැබ ඇතැයි යන්න මෙම කොමිෂන් සභාව නිගමනය කරනු ලබයි.

විමල් රුබසිංහ මහතා ඔහුගේ පැමිණිල්ලට වගඋත්තරකරුවන් ලෙස පහත නම් සඳහන් තැනැත්තන් නම් කරනු ලැබිණි.

01. කරුණාසේන පරණවිතාන මහතා
02. රොහාන් පෙරේරා මහතා
03. වික්‍රම් බස්නායක මහතා
04. අනුරසිරි හෙට්ටිගේ මහතා
05. මහේෂ් රත්නායක මහතා
06. සමන් ප්‍රනාන්දු මහතා

මෙම වගඋත්තරකරුවන් හට පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ නොතීසි නිකුත් කරනු ලැබූ අතර 1, 3 සහ 4 වගඋත්තරකරුවන් පමණක් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලදි. ඒ අතුරින් 1 සහ 4 වගඋත්තරකරුවන් සාක්ෂි ලබාදීමට ඉදිරිපත් විය.

පැමිණිල්ලේ වාචික සාක්ෂි සනාථ කෙරෙන පැ.1 සිට පැ. 25 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කරමින් පැමිණිල්ලේ සාක්ෂි අවසන් කර ඇත.

9 .XXX

(1)

පැමිණිලි අංකය - 402/2020

සම්පූර්න නම - දිසානායක මුදියන්සේලාගේ සමන්සිරි දිසානායක

ලිපිනය - 15/ඒ, ජයලත් පාර, නාවින්න, මහරගම.

(2)

පැමිණිලි අංකය - 206/2020

පැමිනිලිකරුගේ නම - දිසානායක මුදියන්සේලාගේ සුජාතා දමයන්ති ජයරත්න

ලිපිනය - අංක14,අෂර් පෙදෙස, ඕක්ලන්ත, නවසීලන්තය

පැමිණිලිකරුවන් දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු නාවුක හමුදාපති රවීන්ද්‍ර විජේගුණවර්ධන
2. අ.ප.දෙ. පොලිස් අධිකාරි ශානි අබේසේකර

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර දිසානායක මුදියන්සේලාගේ සමන්සිරි දිසානායක සහ දිසානායක මුදියන්සේලාගේ සුජාතා දමයන්ති ජයරත්න යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, දිසානායක මුදියන්සේලාගේ සමන්සිරි දිසානායක සහ දිසානායක මුදියන්සේලාගේ සුජාතා දමයන්ති ජයරත්න එරෙහිව ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 44146/15 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර දිසානායක මුදියන්සේලාගේ සමන්සිරි දිසානායක සහ දිසානායක මුදියන්සේලාගේ සුජාතා දමයන්ති ජයරත්න නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම 1 වන පැමිනිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HC/TAB/751/19 දරන අධිචෝදනා පත්‍රය ද

ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළයුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. නාවික හමුදාපති රවීන්ද්‍ර විජේගුණවර්ධන අනිත්‍යානුකූල ලෙස ක්‍රියා කර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අණට අකීකරුව  රජයේ නාවික හමුදාවේ නිලධාරීන් සහ නැවියන් මෙහෙයවා m.v. ඇවන්ගාඩ් නෞකාව අත්අඩංගුවට ගැනීම මගින් එකී නාවික හමුදා නිලධාරීන් සහ නාවිකයන්  රාජ පාක්ෂික භාවයෙන් හෝ කාර්යයෙන් ඉවත් කරවීම හමුදාපති රවීන්ද්‍ර විජේගුණවර්ධන මහතා විසින් සිදු කර ඇති බැවින්, ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 128 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇත.

2. එසේම, ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

3. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන්  දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

4. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

5. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

6. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. මෙම දේශපාලන පලිගැනීම් හේතුකොටගෙන පළවන හා දෙවන පැමිණිලිකරුවන්ට තම රාජ්‍ය සේවයේ අහිමි වී ගොස් ඇති සියලුම උසස්වීම්, වැටුප් වර්ධක, දීමනා සහ වරප්‍රසාද ඔවුන් එකිනෙකා එයට හිමිකම් ලබන දිනයේ සිට ලබාදිය යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරයි.

8. දෙවන පැමිණිලිකාරිය ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමක් සිදුවී නොමැති බැවින්, බලපෑම් මත සිදුකරන ලද විශ්‍රාම ගැන්වීම් ඉවත් කොට ඇයගේ සේවා කාලය බන්ධ නොවන අයුරින්

නැවත සේවයෙහි පිහිටුවිය යුතු බවට කොමිෂන් සභාව සභාව ඒකමතිකව තීරණය කරයි.

9. එසේම පොලිස් නිලධාරීන්ට එරහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

වර්තමානයේ ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් රාජකාරියේ නිරතව සිටින 1 වන පැමිණිලිකාර දිසානායක මුදියන්සේලාගේ සමන්සිරි දිසානායක මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පලවන පන්තියේ නිලධාරියෙකි. 2012 සිට 2015 දක්වා කාලය තුළ ද පැමිණිලිකාර සමන්සිරි දිසානායක මහතා ආරක්ෂක අමාත්‍යාංශයේ සේවය කර ඇත. පැ.1 දරන පත්වීමේ ලිපියට අනුව පැමිණිලිකරු ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු වශයෙන් පත් කරනු ලැබ ඇති අතර අතිරේක ලේකම්වරයකු වශයෙන් සිදුකළ රාජකාරි කටයුතුවලට සිවිල් ආරක්ෂක සහ සංවර්ධන තනතුරෙහි රාජකාරී කටයුතු ආවරණය කිරීමද ඊට අමතරව රණවිරු රියල් ස්ටාර් වැඩසටහන සම්බන්ධයෙන් කරන වැඩකටයුතුද, භාරව තිබී ඇත. ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු වශයෙන් සේවය කරමින් සිටි 2 වන පැමිනිලිකාර දිසානායක මුදියන්සේලාගේ සුජාතා දමයන්ති ජයරත්න මහත්මිය ස්ථාන මාරු කිරීමත් සමඟම ඇය විසින් සිදුකරන ලද රාජකාරි ආවරණය කිරීමට ද

1 වන පැමිණිලිකරුට බාර කර ඇත. පැ.2 වශයෙන් සලකුණු කරන ලද ලිපියට අනුව දිසානායක මහතා විසින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්වීමක් කරමින් ඒ වන විට ජයරත්න මහත්මිය විසින් සිදු කරගෙන පැමිණි පැ.2 ලේඛනයේ සඳහන් රාජකාරි කටයුතු ඉදිරියට පැමිණිලිකරු විසින් සිදු කර ගෙන යාම සඳහා එවකට ආරක්ෂක ලේකම්වරයාගේ අනුමැතිය ඉල්ලා ඇත.

ඒ අනුව පැ.3 දරන ලිපිය ආපසු එවමින් ආරක්ෂක ලේකම්වරයා විසින් එහි සඳහන් රාජකාරි කටයුතු සිදු කරගෙන යාම සඳහා 1 වන පැමිණිලිකරුට අනුමතිය ලබා දී ඇත.

පැ.2 සහ පැ.3 ලිපිවලට අනුව වාණිජ සහ ධීවර නෞකා ආරක්ෂක කටයුතු සඳහා සීමාසහිත රක්නා ආරක්ෂක සමාගම විසින් ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කල ලිපියක් පිළිබඳව සඳහන් කර ඇත. ඒ අනුව නෞකාවේ ආරක්ෂාව වෙනුවෙන් මුහුදු ආරක්ෂකයන් ගිනි සහ අනිකුත් උපකරණ නෞකාවට ලබාදීමට ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලබාදෙන අනුමතිය, එසේම නෞකාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා වරායට පැමිණීමේ දී අදාළ නෞකාවේ ආරක්ෂාවට, ආරක්ෂක කටයුතු සඳහා රැගෙන එනු ලබන ගිනිඅවි සහ ආරක්ෂක උපකරණ ශ්‍රී ලංකා නාවික හමුදා රංගල අවි ගබඩාවේ තැන්පත් කර අදාල රාජකාරි කටයුතු අවසන් වීමෙන් පසු අවි ගබඩාව වෙත ලබාදුන් අවි සහ උපකරණ නැවත ලබාදීමට නැව් සමාගම ඇවන්ගාඩ් ආරක්ෂක සමාගම හරහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කළ ලිපිය ද ඇතුළත්ව ඇත.

එසේම ඇවන්ට්-ගාර්ඩ් මැරිටයිම් සර්විසස් ආයතනය සමගින් ගිවිසුම්ගත විදේශීය පුද්ගලයන්, පුද්ගලික සමුද්‍ර ආරක්ෂක සේවා ආයතනය වලට අයත් සුළු අවි, පතුරම් සහ ඒ හා සම්බන්ධ උපකරණ ගුවන් මගින් ශ්‍රී ලංකාවට ගෙන ඒම සහ එම ද්‍රව්‍ය පාවෙන අවි ගබඩාවේ ( එම්.වී මහනුවර) තැන්පත් කිරීම සඳහා කොන්දේසි වලට යටත්ව පූර්ණ අනුමැතිය ලබාදී ඇති බවත් ඒ අනුව ගුවන් මගින් ශ්‍රී ලංකාවට ඉහත සඳහන් දේවල් ගෙන ඒමේ දී ඒවා එම්.වී මහනුවර පාවෙන අවි ගබඩාවේ තැන්පත් කිරීම සඳහා අවශ්‍ය අනුමතිය ඉල්ලා ඇවන්ගාඩ් ආයතනය විසින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද ලිපිය ද ඊට අන්තර්ගත ව ඇත.

එකී ලිපිවල සඳහන් අයුරින් එම ක්‍රියාපටිපාටිය ඉදිරියට කරගෙන යාම සඳහා ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පැ.3 දරණ ලිපියෙන් පැමිණිලිකාර සමන්සිරි දිසානායක මහතාට අනුමැතිය ලබා දී ඇත.

පැමිනිලිකරු සඳහන් කළ අන්දමට ආරක්ෂක ලේකම් වශයෙන් සිටි බස්නායක මහතා ආරක්ෂක ලේකම් තනතුරෙන් ඉවත් වී ඉන්පසු කරුණාසේන හෙට්ටිආරච්චි මහතා ආරක්ෂක ලේකම්වරයා වශයෙන් පත් වූ පසු නැවත පෙර පරිදිම අනුමැතිය ලබාගෙන ඇති අතර එම අවස්ථාවේ දී ආරක්ෂක ලේකම්වරයා සමග ජනාධිපතිතුමා ළඟට ගොස් දැනුවත් කර ලිපියේ සඳහන් පරිදි අවසරය ලබාගත් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. පැ.2 සහ පැ.3 දරන ලිපිවල මෙහෙයුම් වශයෙන් සඳහන් කර ඇත්තේ නැව් වලට මුහුදු ආරක්ෂකයින් නැංවීමට අනුමැතිය, ගිනිඅවි ප්‍රවාහනයට අනුමැතිය, මුහුදු මගින් සහ ගුවන් මගින් ගිනි අවි ප්‍රවාහනයට අවශ්‍ය කටයුතු, සී මාෂල් වරුන්

මුහුදු ආරක්ෂකයින් පුහුණු කිරීමට අදාළ කටයුතු, ගාලු වරායේ සහ කොළඹ තිබෙන රංගල වරායේ අවිගබඩාවෙ එම ගිනි අවි තැන්පත් කිරීමට අදාලා කටයුතු ඉන් අදහස් කරන බව පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

පැ. 2 සහ පැ. 3 ලේඛන වලට අදාලව ආරක්ෂක අමාත්‍යාංශයේ අදාළ ලිපි ගොනුවේ ගොනු කර ඇති මුල් ලිපියේ සහතික කළ පිටපතක් පැ.4 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එහි සඳහන් වන්නේ පැ.2 සහ පැ.3 ලේඛනවල සඳහන් ක්‍රියාකාරකම් වලින් එක් ක්‍රියාකාරකමකි. ඒ අනුව එම්.වී ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව රතු මුහුදේ සිට ලංකාවට ඒමට බලාපොරොත්තුවෙන් සිටින බැවින් ඒ සඳහා ආරක්ෂාව ලබාදීමට සී මාෂල්වරු තුන්දෙනෙක් මුහුදු ආරක්ෂකයන් සමග උණ්ඩ රැගත් ගිනි අවි තුනක් රැගෙන යාමට අනුමැතිය ඉල්ලා ඇත.

මෙවැනි ඉල්ලීම් දිනකට පහක් හයක් පමණ ලැබෙන අතර ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඒ අනුව අනුමැතිය ලබාදීම අඛණ්ඩව සිදුකරමින් සිටී. ඇවන්ගාඩ් සමාගම විසින් සිදු කරන මෙවැනි ඉල්ලීම් රක්නා ලංකා සමාගම විසින් ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලබයි. රක්නා ලංකා ආරක්ෂක සමාගම සම්පූර්ණයෙන්ම මුදල් අමාත්‍යාංශයට කොටස් හිමි සමාගමකි. ඒ අනුව රක්නා ලංකා ආරක්ෂක සමාගම රාජ්‍ය සමාගමකි. එම සමාගම ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන සමාගමක් ලෙසට ගැසට් කර ඇත.

පැ. 4 මගින් සිදු කර ඇති ඉල්ලීම අනුමත කරමින් ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2015 සැප්තැම්බර් 23 වැනි දිනෙන් පැ. 5

ලිපියෙන් ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව රතු මුහුදේ සිට පැමිණෙන එම්.වී ඇවන්ගාඩ් නැමැති පාවෙන අවි ගබඩාව ලංකාවට ඇතුළුවන අවස්ථාවේදී ආරක්ෂාව සැලසීම සඳහා අවශ්‍ය ආයුධ සී මාෂල්වරුන් ලබාදීම අනුමත කරමින් පැ.5 ලේඛනය නිකුත් කර ඇත. එම්.වී ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාවට ලංකාවට ඇතුල්වීමට අවසර දී ඇති බවට දැනුම් දීමක්; නාවික හමුදාපතිවරයාට, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයාට, ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට, වරාය සහ ගුවන්සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට, රක්නා ලංකා ආරක්ෂක සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිට සහ ඇවන්ගර්ඩ් මැරිටයිම් සර්විසස් ආයතනයේ සභාපතිවරයාට සිදුකර ඇත.

ඒ අනුව 2015 සැප්තැම්බර් 24 දිනැති, පැ. 6 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද ලිපිය, ඇවන්ට්-ගාර්ඩ් මැරිටයිම් සර්විසස් සමාගමේ අධ්‍යක්ෂක මේජර් නිශ්ශංක සේනාධිපති මහතා විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමුකරමින් එකී ලිපියේ සඳහන් ආයුධ එම්.වී ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාවෙන් මුහුදු ප්‍රවාහනය කෙරෙන බවත් එය ගාලු වරායට ඇතුළු වන බවත් එය ගොඩබැස්වීමට අනුමැතිය ලබා දෙන ලෙසටත් එකී ලිපියෙන් ඉල්ලා ඇත.

පැ.7 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද සහතිකය ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2012.05.24 දිනැති සහතිකයකි. එකී සහතිකයට අනුව ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසර්ස් පුද්ගලික සමාගම, රක්නා ආරක්ෂක ලංකා සමාගම සමඟ බද්ධ ගිවිසුමක් ඇති කර ගෙන ඇති අතර ඒ අනුව එම සහතිකයට අමුණා ඇති ඇමුණුම්

වල සඳහන් අවිආයුධ දරා සිටීමට එහි එම්.වී සින්බෑඩ් පාවෙන අවි ගබඩාවට ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය අනුමැතිය ලබාදී ඇති බවත්, ජාත්‍යන්තර පුද්ගලික නාවික ආරක්ෂක සමාගම් වල ආයුධ ගබඩා කිරීමටත්, ඒ සඳහා ආයුධ ලබා ගැනීමටත්, ගබඩා කළ ආයුධ නිකුත් කිරීමටත්, එම පාවෙන අවි ගබඩාවට ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අමාත්‍යාංශය බලය ලබාදී ඇති බවටත්, එය ආරක්ෂක අමාත්‍යාංශයට අයත් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අනුබද්ධිත සමාගමක් බවටත් සහතික කර ඇත.

2014.04.07 දින ඇවන්ගාඩ් මැරිටයිම් සර්විසස් සමාගමේ සභාපති නිශ්ශංක සේනාධිපති විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් 2 වන පැමිනිලිකාර ජයරත්න මහත්මිය වෙත ඉල්ලීමක් සිදු කරමින්, රතු මුහුදේ නවතා ඇති අල්පොන්සෝ නැමැති පාවෙන අවි ගබඩාවේ ගබඩා කර ඇති ආයුධ, එම් වී ඇවන්ගාඩ් නැමැති පාවෙන අවි ගබඩාවට මාරු කිරීම සඳහා අවසරය ඉල්ලා ඇත. ඉල්ලීමට යාකර ඇති ඇමුණුම් වල දැනට එම්.වී අල්පොන්සෝ පාවෙන අවි ගබඩාවේ ගබඩා කර ඇති අවි ආයුධ පිළිබඳ සම්පූර්ණ විස්තරයක් දක්වා ඇත. මෙම ඉල්ලීම පැ. 8 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මේ අන්දමින් නිත්‍යානුකූල ලෙස එම්.වී ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාවට මාරු කර ගබඩා කරන ලද ආයුධ සමග එකී පාවෙන අවි ගබඩාව ලංකා මුහුදු තීරයට ඇතුළුවී ගාලු වරායට ඇතුළුවීමට අවසරය ඉල්ලා ඉදිරිපත් කරන ලද ඉල්ලීම සලකා බැලීමට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත පැමිනිලිකරු විසින් යොමු කර ඇත.

මෙම අවි ගබඩාවට අයත් ලේඛන සහ අවි ගබඩාවේ ඇති ආයුධ වල නීත්‍යානුකූලභාවය සොයා බැලීමෙන් පසුව ඒවා නීත්‍යානුකූල ලෙස

රක්නා ලංකා සමාගම සතු ආයුධ බවට තහවුරු කර ගැනීමෙන් පසුව, පාවෙන අවි ගබඩාවට ලංකා මුහුදු සීමාවට ඇතුල්වී ගාල්ල වරායට පැමිණීමට අවසර දීම සුදුසු බවට නිර්දේශය පැමිණිලිකරු එවකට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහතාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

අනුමැතිය ඉල්ලා ආරක්ෂක අමාත්‍යාංශයට එවන ලද ලිපිය සැප්තැම්බර් 24 වන දින එවා ඇති නමුත් එම ලිපිය ආරක්ෂක අමාත්‍යාංශයට ලැබුන බවට සටහන්ව ඇත්තේ සැප්තැම්බර් මස 26 වන දින දීය. අදාල අනුමැතිය ඉල්ලා සිටි මෙම ලිපිය පැමිණිලිකරු විසින් හෙට්ටිආරච්චි ලේකම්වරයා වෙත ඉදිරිපත් කර ඇත්තේ ඔක්තෝබර් මස 6 වන දින දීය. ප්‍රමාදයට හේතුව වශයෙන් පැමිණිලිකරු සඳහන් කළේ කරුණාසේන හෙට්ටිආරච්චි මහතා අමාත්‍යාංශයේ ලේකම් පදවියට පත්වූයේ සැප්තැම්බර් මස මැද භාගයේ දී බවත් ලේකම් පදවිය භාර ගැනීමෙන් පසුව ඔහු යාපනය සංචාරයක නිරතව සිට ආපසු පැමිණීමෙන් පසුව ඉල්ලීම ඔහුට ඉදිරිපත් කළ බවත් ඒ අනුව ප්‍රමාදයක් සිදු වූ බවත්ය.

ඔක්තෝබර් මස 6 වන දින උදයේ ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහතාට, මෙම අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කළ ලිපිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, බුද්ධි මණ්ඩල රැස්වීමට පැමිණ සිටි නාවික හමුදාපතිවරයා ද එම ස්ථානයට කැඳවා ඉල්ලීමට අනුමැතිය ලබාදීම ලේකම්වරයා විසින් සිදුකර ඇත. ඒ අනුව, මෙම ලේඛනයට අනුමැතිය දෙන අවස්ථාවේදී, ගාල්ල වරායට ඇතුළුවීමේ අනුමැතිය එම්.වී ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාවට ලැබී තිබුණු බව නාවික හමුදාපතිවරයාද හොඳින් ම දැන සිටි බව ඉතාමත්ම පැහැදිලිය.

එසේ අනුමැතිය ලබා දෙන අවස්ථාව වන විට, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකී විධානයට ප්‍රතිවිරුද්ධ කිසියම් ක්‍රියාවක් සිදුවී තිබුණු බවට හෝ සිදුවෙමින් තිබෙන බවට, කරුණු කිසිවක් නාවික හමුදාපතිවරයා විසින් ආරක්ෂක ලේකම්වරයාට දන්වා නොමැත.

ඒ අන්දමින් නීත්‍යානුකූල අවසරයක් මත ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව ගාලු වරායට පැමිණෙන අවස්ථාවේදී ලංකා මුහුදු සීමාවේ දී එය අත්අඩංගුවට ගැනීමට එවකට නාවික හමුදාපති රවීන්ද්‍ර විජේගුණවර්ධන අනීත්‍යානුකූල ලෙස ක්‍රියා කර ඇත. ඒ අනුව, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අණට අකීකරුව රජයේ නාවික හමුදාවේ නිලධාරීන් සහ නැවියන් මෙහෙයවා එම්.වී ඇවන්ගාඩ් නෞකාව අත්අඩංගුවට ගැනීම මගින් එකී නාවික හමුදා නිලධාරීන් සහ නාවිකයන් රාජපාක්ෂික භාවයෙන් හෝ කාර්යයෙන් ඉවත් කරවීම හමුදාපති රවීන්ද්‍ර විජේගුණවර්ධන මහතා විසින් සිදු කර ඇති බැවින්, ඔහු දණ්ඩ නීති සංග්‍රහයේ 128 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇත.

මේ අනුව පැමිණිලිකරු ඔක්තෝබර් 6 දින පැ.9 දරන ලිපිය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහතා වෙත යොමු කරමින් එම්.වී ඇවන්ගාඩ් නෞකාවට එහි සඳහන් ආයුධ සමග ගාලු වරායට ඇතුල් වීම සඳහා අවසරය ලබා දීමට සුදුසු බවට දැනුම් දී ඇත. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හෙට්ටිආරච්චි මහතා එකී පැ.9 ලිපිය පරිදි ක්‍රියාකරමින් ඇවන්ගාඩ් නෞකාවට ගාලු වරායට ගොඩබෑසීම සඳහා අවසර ලබා දෙමින් නාවික හමුදාපතිවරයාට නියෝගයක් නිකුත් කරමින් ඇවන්ගාඩ් නෞකාවට ගාලු වරාය දක්වා

පැමිණීමට නාවික හමුදා ආරක්ෂාව ලබා දෙන ලෙසටත්, නෞකාවේ ඇති ආයුධ ගාල්ල ආයුධ ගබඩාවෙහි තැන්පත් කරන ලෙසටත් විධානය කර ඇත. එකී විධාන ලිපිය පැ. 10 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.9 ලිපියෙහි ආරක්ෂක ලේකම් හෙට්ටිආරච්චි මහතා ඔහුගේ අත් අකුරින් අනුගමනය කළ යුතු පියවර හතරක් සඳහන් කර ඇත එනම්;

1. අනුමතයි.

2. නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුයි.

3. නාවික හමුදාව නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කර වාර්තා කළ යුතුයි.

4. ඉන්පසු නාවික හමුදාවේ නියමයන් පරිදි ක්‍රියා කළ යුතුයි;

යනුවෙන් නියෝග හතරක් පනවා ඇත.

ආරක්ෂක ලේකම්වරයාගේ නියෝගයක් කඩකරමින් සහ එම නියෝගයන්ට අකීකරු වෙමින් නාවික හමුදාපති විසින් ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව අත්අඩංගුවට ගෙන ඇත. එවැනි නෞකාවක් අත්අඩංගුවට ගත් වහාම ආරක්ෂක ලේකම්වරයාට වාර්තා කළ යුතු වුවත් නාවික හමුදාපතිවරයා එම වගකීම කඩකරමින් ආරක්ෂක ලේකම්වරයාට වාර්තා කිරීමක් සිදු නොකර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කිරීම රාජ්‍ය විරෝධී කුමන්ත්‍රනයකි.

ආරක්ෂක අමාත්‍යාංශයේ උසස් නිලධාරින් නීත්‍යානුකූලව ක්‍රියා කර තිබියදීත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වෙනත් ආකාරයක අනිත්‍යානුකූල නියෝගයක් මත ක්‍රියා කරමින් ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු වූ පැම්ණිලිකරු අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කර ඇත. එසේ අත්අඩංගුවට ගනු ලැබූ පැම්ණිලිකරු ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 44146/15 යටතේ ගිනි අවි ආඥා පනත යටතේ සහ පුපුරන ද්‍රව්‍ය ආඥා පනත යටතේ වරදක් සිදුකර ඇති පුද්ගලයකු ලෙසට චෝදනා නගමින් ඉදිරිපත් කර ඇත.

ආරක්ෂක ලේකම්වරයාගේ අනුමැතිය පරිදි එතෙක් පවත්වාගෙන ආ නිත්‍යානුකූල ව්‍යාපාරයක ආයුධ ගබඩා කර ප්‍රවාහනය කළ පාවෙන අවි ගබඩාව තුළ ගබඩා කර තිබූ නාවික හමුදාවේ අවි ආයුධ ආපසු නාවුක හමුදාවට බාරගන්නා ලෙසට සිදුකරන ලද නියෝගය; කුමන අන්දමකින්වත් ගිනි අවි ආඥා පනත යටතේ සහ/හෝ පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත යටතේ වරදකට හසු නොවේ. එවැනි වරදකට හසු වන්නේ යැයි යමෙකු පවසන්නේ නම් ඔහු උන්මත්තකයකු විය යුතුය.

පැම්ණිලිකරුට එරෙහිව පරීක්ෂණ පවත්වා ඔහු අත්අඩංගුවට ගැනීම, ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර රක්ෂිත බන්ධනාගාර ගත කිරීම යන කරුණු සියල්ලම අත්තනෝමතික, අනිත්‍යානුකූල සහ ද්වේෂ සහගත ක්‍රියා බව ඉහත සඳහන් කරුණු වලින් ඉතාමත් පැහැදිලිව පෙනී යයි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති නාගහමුල්ල මහතා විසින් වැඩබලන පොලිස්පති සී.ඩී.වික්‍රමරත්න මහතා වෙත 2019.07.10 වන දින සිදු කරනු ලබන කරුණු වාර්තා

කිරීම මගින් ඉහත සඳහන් කළ ස්ථාවරය ඉතා හොඳින් ඔප්පු වී ඇත. පැ. 11 ලෙස සලකුණු කර ඇති එකී 2019.07.10 දින ලිපියේ 7:12 සහ 7:13 ඡේද පහත උපුටා දක්වා ඇත;

"7:12. යම් වරදක් හෝ චෝදනාවක් සම්බන්ධයෙන් යම් තැන්ත්තෙකු අත්අඩංගුවට ගැනීම්ට නම්, වරද පිළි පිළිබඳව විමර්ශනයක් සිදුකළ නිලධාරියාට සිදු කළ නිලධාරියාට අත්අඩංගුවට ගැනීමට අපේක්ෂිත තැනැත්තා විසින් එකී වරද සිදුකළ බවට බැලූ බැල්මට පෙනෙන කරුණු ඇති බවට දැනීමක් තිබිය යුතු බව අත්අඩංගුවට ගැනීම් වලට අදාලව වරින්වර ශ්‍රේෂ්ඨාධිකරණය සහ වෙනත් අධිකරණ මගින් පැහැදිලි කරමින් තීන්දු ලබා දී ඇත. ගරු නීතිපතිතුමා විසින් දිසානායක මුදියන්සේලාගේ සමන් දිසානායක මහතාට සහ ඩී. එම්. එස්. දමයන්ති ජයරත්න මහත්මිය ට එරෙහිව සඳහන් කර ඇති වරදවල් සම්බන්ධයෙන් බැලූ බැල්මට කරුණු විමර්ශනයේදී අනාවරණය වී ඇති බවක් නිරීක්ෂණය නොවේ.

7:13. එම තත්ත්වය තුළ ගරු නීතිපතිතුමාගේ උපදෙස් මත පිහිටා දිසානායක මුදියන්සේලාගේ සමන් දිසානායක මහතා සහ ඩී.එම්.එස්. දමයන්ති ජයරත්න මහත්මිය විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී එම අත්අඩංගුවට ගැනීම යුක්ති යුක්ත කිරීමට ඔවුන් කළ වැරදි සම්බන්ධයෙන් පැහැදිලි දැනීමක් විමර්ශන නිලධාරීන් හට නොමැති පසුබිම තුළ විමර්ශන නිලධාරීන් පමණක් නොව විමර්ශන සිදුකරන අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුව ද අධිකරණයේ දෝෂ දර්ශනයට ලක් වීමේ අවදානම බැහැර කළ නොහැක.”

ඉහත සඳහන් කළ පරිදි නියෝජ්‍ය පොලිස්පති නාගහමුල්ල මහතා ගේ පැ.11 දරණ ලිපියේ සඳහන් පරිදි නීතිපතිවරයාගෙන් විශ්ලේෂණාත්මක උපදේශයක් ලබා ගන්නා ලෙසට සිදුකර ඇති යෝජනාව පරිදි, වැඩබලන පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න මහතා ක්‍රියා කරමින් 2019.07.11 වන දින ලිපිය මගින් නීතිපති අමතමින්, දිසානායක මුදියන්සේලාගේ සමන් දිසානායක මහතාට සහ ඩී. එම්. එස්. දමයන්ති ජයරත්න මහත්මියට එරෙහිව ඇති චෝදනා සම්බන්ධයෙන් සහ තවත් කරුණු කිහිපයක් සම්බන්ධයෙන් විශ්ලේෂණාත්මක උපදෙසක් ඉල්ලා සිටීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යෝජනා කර ඇති බව සඳහන් කරමින් එපරිදි විශ්ලේෂණාත්මක උපදෙසක් ඉල්ලා ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාගේ ලිපියේ අඩංගු කරුණු නීතිපතිවරයාගේ සැලකිල්ලට නිසිපරිදි භාජනය වී ඇති බවක් නොපෙනේ. නීතිපතිවරයා ඒ ලිපියට පිළිතුරු වශයෙන් නැවතත් පැමිණිලිකරු ඇතුළු පිරිස් අත්අඩංගුවට ගැනීම පිණිස උපදෙස් නිකුත් කර ඇති අතර ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හර්දයාබාධයකින් පෙළෙමින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටී පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර භාරයට පත් කර බන්ධනාගාර නිලධාරීන් භාරයේ ප්‍රතිකාර ලබමින් සිටි ඇත. අවස්ථා කීපයකදීම බන්ධනාගාර ගිලන් රථයෙන් පැමිණිලිකරු

ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයය වෙත ගෙන ගොස් ඇති අතර මේ හේතුවෙන් ඔහුගේ හර්දයාබාධ තත්ත්වයද උත්සන්න වී ඇත.

වර්තමානයේ නවසීලන්තයේ, ඕක්ලන්ත නුවර, අෂර් පෙදෙසෙහි, අංක 14, ලිපිනයේ පදිංචිව සිටින දෙවන පැමිණිලිකාර දිසානායක මුදියන්සේලාගේ සුජාතා දමයන්ති ජයරත්න මහත්මිය විසින් ඇයගේ නීතිඥවරයා මාර්ගයෙන් 2020.09.30 දින දරන දිවුරුම් ප්‍රකාශයක් සමග ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

එකී දිවුරුම් ප්‍රකාශයට අනුව ඇය 2010 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට 2015 වර්ෂයේ මාර්තු මස 20 වැනි දින දක්වා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක ලෙස සේවය කර ඇත. 2015 ජනවාරි මස 8 වන දින රජය වෙනස් වීමෙන් පසුව ඇයට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණ දෙකක් ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂණ එකක්ද ආරම්භ කර ඇත. මෙම පරීක්ෂණ තුනම ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ පරීක්ෂණ විය. මෙම පරීක්ෂණවල ප්‍රතිඵල ලෙසට ඇයට එරෙහිව ගිනි අවි ආඥා පනත යටතේ ද, පුපුරන ද්‍රව්‍ය ආඥා පනත යටතේ ද, මුදල් විශුද්ධිකරණ පනත යටතේ ද, චෝදනා කරමින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දෙවන පැමිණිලිකාර ජයරත්න මහත්මියට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක එම්.සී 59288/1/16/Bribery දරණ නඩුව පවරා ඇත. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනය සිදුකරන ලද කාල සීමාවේ දී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ

හිටපු අධ්‍යක්ෂ ජනරාල් දිල්රුක්ශි වික්‍රමසිංහ මහත්මිය විසින් පැමිණිලිකාරිය වෙත ඉතා දැඩි ක්‍රියාකලාපයක් අනුගමනය කිරීම නිසා ඇය මහත් මානසික පීඩනයකට පත් වී ඇත. විමර්ශන නිලධාරීන් විසින් ඇයගේ කටඋත්තරය සටහන් කිරීමේ අවස්ථා සජීවීව වීඩියෝ ගත කරමින්, එම වීඩියෝ ඉහළ මාලයේ සිටි අධ්‍යක්ෂක ජනරාල්වරියටත්, උපදේශකවරුන් ලෙස සේවයේ යොදවා සිටි පිරිසට ද නැරඹීමට ඉඩ සලසා තිබීම ඇයට නිරවුල්ව ස්වාධීනව ප්‍රකාශ ලබා දීමට තිබූ අයිතිය ඉඩකඩ අහිමි කළ බවට ඇය තම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් දෙවන පැමිණිලිකාරියට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද අල්ලස් නඩුව, අල්ලස් පනතේ විධිවිධානයන්ට පටහැනි ලෙස; එනම් සාමාජිකයින්ගේ පූර්ව අනුමැතියෙන් තොරව කරන ලද බවට තීන්දු කරමින්, කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය මගින් දෙවන පැමිණිලිකාරිය ඇතුළු සියලු චූදිතයින් එම නඩුවෙන් නිදහස් කර ඇත.

2015.10.06 දින අත්අඩංගුවට ගත් MV ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාවේ නීති විරෝධී ගිනි අවි සහ පුපුරන ද්‍රව්‍ය තිබුණ බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් චෝදනා කරමින් ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 44146/15 දරණ නඩුව පවරා ඉන් අනතුරුව 2019.09.04 වන දින කොළඹ ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණයේ දෙවන පැමිණිලිකාරිය දොළොස්වන චූදිත කරමින්, චූදිතයින් 13 දෙනෙකුට එරෙහිව අංක CBO/ HC (TAB) 751/2019 දරන අධිචෝදනා පත්‍රය භාර කර ඇත. මෙම අධි චෝදනා පත්‍රයෙන්

දෙවන පැමිණිලිකාරිය ඇතුළු වූදිතයන් පස් දෙනෙකු මහාධිකරණය විසින් නිදහස් කර ඇත. ඉන්පසුව නැවතත් නීතිපතිවරයා විසින් දෙවන පැමිණිලිකාරිය ඇතුළු එකොළොස් දෙනෙකුට එරෙහිව නැවත අධිචෝදනා ගොනු කළ ද එම අධිචෝදනා පත්‍රයෙන්ද දෙවන පැමිණිලිකාරිය නිදහස් කර ඇත.

මෙහි ඉහත සඳහන් කළ පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක නාගහමුල්ල මහතා විසින් පොලිස්පතිවරයා වෙත යවන ලද ලිපියේ පැමිණිලිකරුවන්ට එරෙහිව චෝදනා නැගීමට සාක්ෂි නොමැති බවට ප්‍රකාශ කර තිබියදීත්, ඒ පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොදක්වා, නීතිපතිවරයා විසින් දෙවරක්ම අධි චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීම සහ එම අධිචෝදනා පත්‍ර  දෙකෙන්ම දෙවන පැමිණිලිකාරිය මහාධිකරණය විසින් නිදහස් කර තිබීම, පැහැදිලි ලෙසම නීතිපතිවරයාගේ නොසැලකිල්ල හෝ ද්වේෂ සහගත බව හෝ දේශපාලනික අරමුණු ඉටු කර ගැනීම සඳහා සිදු කරන කිසියම් ක්‍රියාමාර්ගයක ලක්ෂණ පෙන්නුම් කරන සාධක බව ඉතාමත් පැහැදිලිය.

දෙවන පැමිණිලිකාරියට එරෙහිව පවරා ඇති සියලු නීති කෘතීන් වලින් ඇය අධිකරණ විසින් නිදහස් කර තිබීම තුළින් පැහැදිලිව පෙනී යන්නේ අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙන්ම නීතිපතිවරයාද ද්වේශ සහගත ලෙස සහ දේශපාලනික වශයෙන් පළි ගැනීමේ චේතනාවෙන් දෙවන පැමිණිලිකාරියට එරෙහිව පරීක්ෂණ පැවැත්වීම සහ අධිකරණවල නීති කෘතීන් පැවරීම සිදු කර ඇති බව ය.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ. 1 සිට පැ. 11 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 .XXXI

පැමිණිලි අංකය - 50/2020

පැමිණිලිකරු - යාපා හෙට්ටිපතිරන්නැහැලාගේ
නිශ්ශංක යාපා සේනාධිපති

ලිපිනය - නො: 160/60, එකමුතු මාවත,
තලවතුගොඩ.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1.හිටපු නාවික හමුදාපති අද්මිරාල් රවීන්ද්‍ර සී.විජයගුණරත්න
2.ලුතිනන් කමාන්ඩර් ඩබ්ලිව්.එච්.පී. වීරසිංහ
3.රියාද් අද්මිරාල් ජේ. ජේ. රණසිංහ
4.රියාද් නිලන්ත හීනටිගල
5.අ.ප.දේ.අධ්‍යක්ෂ ශානි අබේසේකර
6.හිටපු විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති එස්.ඒ.ඩී.ගුණවර්ධන
7.ජනාධිපති නීතිඥ උපුල් ජයසූරිය
8.ජනාධිපති නීතිඥ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය
9.පොලිස් පරීක්ෂක ඉන්දුක සිල්වා
10.අ.ප.දේ - පො.ප.අලුත්ගේ සෙනරත් මහතා
11.අ.ප.දේ - ස.පො.අ. ලසන්ත රත්නායක
12.වසන්ත නවරත්න බණ්ඩාර
13.ජොෂ්ඨ රජයේ අධිනීතිඥ ජනක බණ්ඩාර

14.හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න

15.හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක

16.හිටපු අමාත්‍ය අර්ජුන රණතුංග

17.පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර යාපා හෙට්ටිපතිරන්නැහැලාගේ නිශ්ශංක යාපා සේනාධිපති යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, යාපා හෙට්ටිපතිරන්නැහැලාගේ නිශ්ශංක යාපා සේනාධිපති මහතාට එරෙහිව ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 32528/15 සහ 44146 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින්පැමිණිලිකාර යාපා හෙට්ටිපතිරන්නැහැලාගේ නිශ්ශංක යාපා සේනාධිපති නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. එසේම පැමිණිලිකරුට එරෙහිව කොළඹ මහාධිකරණයේ පවරා ඇති අංක HCB 25/2017දරන අධිචෝදනා පත්‍රය ද ඉල්ලා අස්කර ගැනීම මගින් නිශ්ප්‍රභා කර පැමිණිලිකරු එකී චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. ආරක්ෂ ලේකම්වරයාගේ නියෝග වලට අවනත නොවී එම්.වී. ඇවන්ගාඩ් නෞකාව අත්අඩංගුවට ගැනීමට නාවික හමුදා නිලධාරීන් විසින් ක්‍රියා කිරීම මගින් ද, එම්.වී.ඇවන්ගාඩ්

නෞකාව අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඒ පිළිබඳව ආරක්ෂක ලේකම්වරයාට වාර්තා නොකිරිම මගින් ද,නාවික හමුදා නිලධාරීන් රාජ්‍ය බලයට විරුද්ධව ක්‍රියා කිරීමේ වරද සිදු කර ඇත.

5. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිණිලිකරු රැඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකූඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

6. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

7. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

8. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද

සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගමේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන මෙම පැමිණිල්ල ඉදිරිපත්කර ඇති යාපා හෙට්ටිපතිරන්නැහැලාගේ නිශ්ශංක යාපා සේනාධිපති මහතා ශ්‍රී ලංකා යුද හමුදාවේ කොමාන්ඩෝ රෙජිමේන්තුවේ ලුතිනන්වරයෙකු වශයෙන් සේවය කර පසුව air mobile brigade මේජර්වරයා හැටියට ඊලාම් යුද්ධ භූමියෙහි සේවය කර ඇත. ඉන්පසුව ඉන්දියානු සාම සාධක හමුදාවේ ප්‍රධාන අණදෙන නිලධාරි ඒ.එස්.කල්කට් මහතාගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා ලෙස සේවය කළ පැමිණිලිකරු 1996 දී යුද හමුදා සේවයෙන් ඉවත් වී ඇවන්ගාඩ් සිකුරුටි සර්විසස් පුද්ගලික ආයතනය ආරම්භ කර ඇත.

ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි කරන ලද පෞද්ගලික ආරක්ෂක සේවාවන් සපයනු ලබන ආයතනයක් වූ ඇවන්ගාඩ් සමාගමේ සේවක සංඛ්‍යාව 4000 පමණ වන අවස්ථාවේදී සමාගමේ සේවය විදේශීය රටවලට ලබාදීම සඳහා පැමිණිලිකරු ක්‍රියා කර ඇත. ඒ අනුව පැමිණිලිකරු විසින් ඇවන්ගාඩ් එමිරේට්ස් එල්එල්සී යනුවෙන් සමාගමක් ඩුබායි රටෙහි ලියාපදිංචි කර ඇත.

ඉන්පසුව පැමිණිලිකරු මම පෞද්ගලික ආරක්ෂක සේවය කිරීමේ අරමුණින් සිදු කළ අධ්‍යයන වලින් පසුව මුහුදු කොල්ලකරුවන් මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් කරන ක්‍රමවේදයක්

ලෙසට ව්‍යාපෘති වාර්තාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බැන්කි මූන් වෙතයවා ඇත. එම ව්‍යාපෘති වාර්තාව පැ.3 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම කාල සීමාවේදී සෝමාලියාව ආසන්න ගැඹුරු මුහුදේ බහුදින ට්‍රෝලර් යාත්‍රා මඟින් මත්ස්‍ය කර්මාන්තයේ යෙදුණු ජෝර්ජ් චෙන් නැමැති තායිවාන ජාතිකයෙකු ඔහුගේ මත්ස්‍ය ව්‍යාපාරයේ යෙදෙන මල්ටි ඩෙෆිෂින් ලෝන් ලයිනස් යාත්‍රාවලට සෝමාලියානු මුහුදු කොල්ලකරුවන්ගෙන් වන ප්‍රහාර මැඩපැවැත්වීම සඳහා ආරක්ෂක නිලධාරීන් සහ පතුරම් අවශ්‍ය බවට අන්තර්ජාලයෙහි පළකර තිබූ දැන්වීමක් පරිදි පැමිණිලිකරු විසින් ජෝර්ජ් චෙන් නැමැත්තාට පැ.4 දරණ විද්‍යුත් පණිවිඩ යවා ඇත. ඊට පිළිතුරු වශයෙන් ජෝර්ජ් චෙන් විසින් එවන ලද ඊමේල් පණිවුඩය පැ.4 ලේඛනයෙහි අන්තර්ගතව ඇත.

පැමිණිලිකරු පැ.5 සහ පැ.6 යන ලිපි එවකට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමුකර විශ්‍රාමලත් හමුදා සාමාජිකයින්ට රැකියා සැපයීමේ අවස්ථාව උදා වී ඇති බවත්, ඒ අනුව ඔවුන්ට තමා පිහිටුවීමට යන වෙළඳ නැව් මුහුදු කොල්ලකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතියට සහභාගිවී ඉතා හොඳ වැටුපක් ලබා ගැනීමට හැකියාව ඇති බවටත් දැනුම් දී ඇත.

මෙම කාලය වන විට ලංකා ආරක්ෂක සමාගම රාජ්‍ය ආයතන වලට ආරක්ෂාව සැපයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව පිහිටුවා තිබුණි. එසේ වුවත් මුහුදේ ආරක්ෂාව සැපයීම සඳහා මෙම සමාගම ප්‍රමාණවත් අයුරින් සැකසී නොතිබිණි. රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සංස්ථා පත්‍රය සහ සමාගම් ව්‍යවස්ථාවලියට අනුව

සමාගමේ කොටස් හිමිව තිබී ඇත්තේ එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් පී.බී.ජයසුන්දර මහතා ඇතුළු තවත් රාජ්‍ය නිලධාරීන් පිරිසකටය. මෙම ප්‍රමුඛ ලංකා ආරක්ෂක සමාගමේ නම ඉන් පසු අවස්ථාවක රක්නා ආරක්ෂක ලංකා සමාගම යනුවෙන් වෙනස් කර ඇත. පැ.8 වශයෙන් ඉදිරිපත් කර ඇති ගැසට් පත්‍රය අනුව රක්නා ආරක්ෂක ලංකා සමාගම ආරක්ෂක අමාත්‍යාංශයේ පාලනය යටතට ගැනෙන රාජ්‍ය සමාගමකි.

වාණිජ නෞකාවලට මුහුදු ආරක්ෂාව සැපයුම සඳහා පැමිණිලිකරු විසින් ආරක්ෂක ලේකම්වරයා සමග සිදුකළ සාකච්ඡා වලින් පසුව රක්නා ආරක්ෂක ලංකා සමාගම සමඟ මුහුදු ආරක්ෂාව සැපයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී.ජයරත්න මහත්මියගේ අත්සන යටතේ 2011 ජූනි 9 වැනි දින එවන ලද ලිපියේ සඳහන් උපදෙස් පරිදි පැමිණිලිකරු විසින් 2011 ජූනි මස 24 දින ඇවන් ගාඩ් මෙරිටයිම් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් නාවික සමාගම ලියාපදිංචි කිරීමට පියවර ගෙන ඇත. ලියාපදිංචි සහතිකය පැ.12 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගම ලියාපදිංචි කිරීමෙන් පසුව පැ.13 දරණ ලිපිය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී.ජයරත්න මහත්මිය වෙත යොමු කරමිනි පැ.12 දරණ ලිපියෙන් සඳහන් කළ පරිදි Avant Garde Maritime Services Private Limited නැමැති සමාගම ලියාපදිංචි කර ඇති බවත්, ඒ අනුව සීසෙල්ස් දිවයින මුල්කරගෙන ගැඹුරු මුහුදේ  මසුන් ඇල්ලීම සිදු කරන ට්‍රෝලර් යාත්‍රා වලට ආරක්ෂාව සැපයීම සඳහා සීමාෂල්වරුන් සැපයීමට රක්නා ආරක්ෂක ලංකා සමාගමට ආරාධනය කර ඇත.

එස්.ඩී.ජයරත්න මහත්මියගේ පැ.14 දරණ ලිපිය රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී වෙත යොමු කරමින් පැ.13 ලිපියේ සඳහන් ඉන්දියන් සාගරයේ මසුන් ඇල්ලීමේ කාර්යයේ නිරතව සිටින විදේශීය ට්‍රෝලර් යාත්‍රා වලට ආරක්ෂාව සැපයීම සඳහා රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සීමාෂල්වරුන් සහ ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගමට ලබා දෙනවාට විරුද්ධදත්වයක් නැති බවට දැනුම් දී ඇත.

ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී.ජයරත්න මහත්මිය විසින් රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙත යවන ලද පැ.14 දරණ ලිපියේ සඳහන් පරිදි සීමාෂල්වරුන් ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගමට සැපයිම යම් හේතු දක්වමින් රක්නා ලංකා සමාගමේ එවකට සභාපති ප්‍රතික්ෂේප කර ඇත. එම කාලය වන විට ඇවන්ගාඩ් මෙරිටයිම් සමාගම ඒ අන්දමේ ව්‍යාපාරික කටයුතු කරන එකම සමාගම බවට සමාජයේ මතයක් ඇති කර තිබුණි. එසේ වුවත් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද පැ.15 දරණ ලේඛනයට අනුව ඒ වන විටත් රක්නා ආරක්ෂක ලංකා සමාගම පැමිණිලිකරු සඳහන් කළ අන්දමේ ව්‍යාපාර කරන නැව් සමාගම් විසිහතරකට සේවය සැපයීමට සේවා ගිවිසුම් වලට එකඟ වී තිබී ඇත. පැ.15 දරණ ලේඛනයේ විසිපස්වන සමාගම ලෙසට ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගම සඳහන්ව ඇත.

පැමිණිලිකරු සඳහන් කළ අන්දමට පැ.15 හි සඳහන් නැව් සමාගම් 24 රක්නා ආරක්ෂක ලංකා සමාගමෙන් ලබා ගන්නා අවි ගැඹුරු මුහුදට ගෙන ගොස් වෙනත් ආයතන වලට හොර රහසේ ලබාදී මුදල් ඉපයීම සිදු කළ බවත්, එසේ හොර රහසේ සිදු කළ ව්‍යාපාරික කටයුතුවලදී

රක්නා ආරක්ෂක ලංකා සමාගමට අයත් ගිනි අවි 174 අස්ථානගතව තිබූ බවත්, මේ හේතුවෙන් ජාත්‍යන්තර වශයෙන් ලංකාවට අපකීර්තියක් ලැබී තිබුණු බවත්ය. මේ බව සනාථ කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ සම්බාධක කමිටුවේ නියමයක් පරිදි සෝමාලියාව සහ එරිත්‍රියාව යන රාජ්‍යවල සිදුවන ගිනි අවි ජාවාරම පිළිබඳව සොයාබැලීමේ ස්වාධීන සංවිධානයක සාමාජිකයෙකු විසින් පැමිණිලිකරු වෙත එවන ලද ලිපියක් පැ.16 වශයෙන් සලකුණු කරන ලදී. එකී ලිපියේ සඳහන් අන්දමට පෞද්ගලික මුහුදු ආරක්ෂක සේවාව සඳහා ලබා ගන්නා ලද ලංකා ආණ්ඩුවට අයත් AK47 වර්ගයේ අධි ස්වයංක්‍රීය ගිනි අවි පෝලන්ත වරායකින් සොයාගෙන තහනමට ගෙන ඇත. එම ගිනි අවි හඳුනා ගැනීම සඳහා පැ.16 ලිපියෙන් පැමිණිලිකරුගේ සහයෝගය ඉල්ලා ඇත.

එම ගිනි අවි සොයා ගැනීම සම්බන්ධ කරුණු පෝලන්ත තානාපතිවරයා විසින්ද ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ඩී.එම්.එස්.ඩී.ජයරත්න මහත්මියට පැ.17 දරණ ලිපියෙන් දැනුම් දී ඇත. පැ.17 අනුව අත්අඩංගුවට ගත් නෞකාවේ කපිතාන්වරයා විසින් ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිකුත් කරනු ලැබූ ලිපියක් ඉදිරිපත් කර ඇති අතර එකී ලිපියෙහි නිරවද්‍යතාවය තානාපතිවරයා විසින් ආරක්ෂක අමාත්‍යාංශයෙන් විමසා ඇත. ලිපියෙහි අඩංගු කරුණු නිවැරදි බවට ආරක්ෂක අමාත්‍යාංශය පිළිගෙන ඇති අතර එම ගිනි අවි රක්නා ලංකා සමාගමට අයත් ගිනිඅවි බවත් ඒවා inter ocean service ලිමිටඩ් නැමැති ආයතනයට නිකුත් කර ඇති බවත්ය.

පැ.15 ලේඛනයෙහි දැක්වෙන සමාගම විසින් රක්නා ආරක්ෂක ලංකා සමාගමට අයත් ගිනිඅවි අස්ථානගත කිරීම හේතුවෙන් මෙම මුහුදු ආරක්ෂක සේවය සැපයීමේ අවස්ථාව ලංකාවට අහිමි වන තත්ත්වයක් උදාවූ බව පැමිණිලිකරු සඳහන් කළේය. ඒ අනුව මෙම ව්‍යාපාරය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් අන්තර්ජාතික මුහුදේ අවි ගබඩා කර තැබීම සඳහා සුදුසු floating armory සංකල්පය පැමිණිලිකරු විසින් හඳුන්වා දුන් බව වැඩිදුරටත් සඳහන් කරන ලදී.

මේ අතරතුර එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පත්කළ කමිටුව විසින් ද කොල්ලකරුවන් අතට ගිනි අවි පත්වීම පිළිබඳව පරීක්ෂාකර සකස් කරන ලද වාර්තාව ආරක්ෂක මණ්ඩලයේ සභාපති වෙත යොමු කර ඇත. මෙම වාර්තාව පැ.19 වශයෙන් සලකුණුකර ඉදිරිපත් කර ඇත. එම වාර්තාවේ හා පිටුවේ අංක 7 යටතේ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් වාර්තාගත කරන ලද පුද්ගලික මුහුදු ආරක්ෂක සමාගම් වලට ලබාදුන් ගිනි අවි සිය ගණනක් නැතිවීම පිළිබඳව කරුණු සඳහන් කර ඇත.

පෞද්ගලික මුහුදු ආරක්ෂක සේවා සමාගමක් පිහිටුවීම ආරක්ෂක ලේකම්වරයාගේ සංකල්පයක් බවත්, එසේ එවැනි සමාගමක් පිහිටුවීම තුළින් ඊලාම් අවසන් සටනට දායක වූ හමුදා සෙබළුන්ට සහ පොලිස් නිලධාරීන්ට විශ්‍රාම යාමෙන් පසුව රැකියා අවස්ථා ලබා දීම ආරක්ෂක ලේකම්වරයාගේ මූලික අරමුණ වී තිබූ බවත්, එබැවින් පාවෙන අවි ගබඩාවක් ලබා දී රක්නා ලංකා ආරක්ෂක සමාගම රැක ගැනීමේ අවශ්‍යතාව තමන් පැහැදිලි කර දුන් බව පැමිණිලිකරු සඳහන් කළේය.

පැමිණිලිකරු විසින් ලියාපදිංචි කරන ලද ඇවන්ගාඩ් මෙරිටයිම් සිකුරිටි සමාගමට මුහුදු ආරක්ෂක සේවයේ යෙදීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් අවසර ලැබීමෙන් පසුව ඔහුගේ සමාගම මුහුදු

කොල්ලකරුවන් මැඩලීම සාර්ථකව සිදුකළ බවට සාක්ෂියේ දී සඳහන් කළේය. ඔහු විසින් සාර්ථක ලෙස මුහුදු කොල්ලකරුවන් මැඩලීම කරණ කොටගෙන චීනය, තායිවානය වැනි රටවලින්ද සෝමාලියානු මුහුදේ මාළු ඇල්ලීම සඳහා යන නෞකා වලට ආරක්ෂාව සැපයීමට පැමිණිලිකරුගෙන් ඉල්ලීම් කර ඇත.

මාස හතරක පමණ කාල සීමාවක් තුළ පැමිණිලිකරු තම ආරක්ෂක සේවය සඳහා සීමාෂල්වරුන් 700 ක් පමණ බඳවා ගෙන ඇති අතර ඔවුන් එක් අයෙකුට ලක්ෂ දෙකේ සිට ලක්ෂ දෙක දෙකහමාර දක්වා වැටුපක් ගෙවා ඇත. මෙම කාලසීමාවේදී සේවය සඳහා මුහුදේ යාත්‍රා 220 යොදවා ඇත. ඒ වන විට ඔහුගේ මාසික ආදායම ඩොලර් මිලියන 2.5 ක් බවට පැමිණිලිකරු සඳහන් කළේය.

2011.11.11 දින ආරක්ෂක අමාත්‍යාංශය අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී.ජයරත්න මහත්මිය නිකුත් කරන ලද ලිපියෙන් මුහුදු ආරක්ෂක සේවාව සැලසීම සඳහා ඇවන්ගාඩ් මෙරිටයිම් සිකුරුටි සමාගමට ලබාදී තිබූ අවසරය වඩාත් පුළුල් කර ලොව ඕනෑම ගමනාන්තයකට දිවෙන නැව් සඳහා මුහුදු ආරක්ෂාව සැපයීමට අවසරය ලබා දී ඇත. මෙම ලේඛනය පැ.20 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම ලිපිය අනුව පැමිණිලිකරුට රටවල් හතක පමණ තම අවි ආයුධ තබා ගැනීම සඳහා අවසරය ලබා ගැනීමට හැකි වී ඇත .එසේ ගබඩා කර තබන අවි ආයුධ වල භාරකාරත්වය රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සේවකයෙකු භාරයේ තිබී ඇත.

මේ වන විටත් ශ්‍රී ලංකා රජයට අයත් අවි ආයුධ විශාල ප්‍රමාණයක් අස්ථානගත වී තිබීම හේතුවෙන් මෙම අවි ආයුධ ආරක්ෂක කර ගැනීමේ පරමාර්ථයෙන් විදේශ රටවල ගබඩාකර නිසි ආරක්ෂාව

සලසමින් මුහුදු ආරක්ෂක සේවය සමාගමේ සභාපති නිශ්ශංක යාපා සේනාධිපති මහතා විසින් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කළ මේජර් ජනරාල් එගොඩවෙල මහතාට ඒ පිළිබඳව පැ.21 ලිපියෙන් දැනුම් දී ඇත.

පැමිණිලිකාර සේනාධිපති මහතා අවසානයේදී සඳහන් කළේ තමන් මෙතරම් පරිශ්‍රමයක් ආයුධ ප්‍රවේශම් කිරීම සඳහා යොදන ලද්දේ ශ්‍රී ලංකාව හැර වෙනත් කිසිදු රටක් පුද්ගලික සමාගම් වලට රජයේ අවිආයුධ සපයා නොමැති බැවින් ලංකාව පමණක් එම ක්‍රියාව කරන එකම රට බවට පත්ව තිබීම බැවින් කිසියම් ආකාරයකින් එසේ මුහුදු ආරක්ෂාව සැපයීම සඳහා පෞද්ගලික සමාගම් වලට ලබා දී ඇති ආයුධ ත්‍රස්තවාදීන්ගේ අතට පත්වුව හොත් එයින් බරපතළ හානි සිදුවන බවත්, එසේ වුවහොත් තමාගේ ව්‍යාපාරය සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති අනිකුත් එවැනි ව්‍යාපාර මුළුමනින්ම නවතා දැමීමට සිදුවන බවත්ය. එබැවින් මෙම කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා අන්තර්ජාතික මුහුදේ පාවෙන අවි ගබඩා ස්ථාපිත කිරීමේ සංකල්පය තමන් රක්නා ආරක්ෂක ලංකා සමාගමට හඳුන්වා දුන් බව පැමිණිලිකරු සඳහන් කළේය.

ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගම සහ රක්නා ආරක්ෂක ලංකා සමාගම එකතුව මේ අයුරින් ව්‍යාපාරික කටයුතු සිදුකරන අතරතුර 2010 මාර්තු මස 19 වැනි දින මෙම සමාගම් දෙක අතර බද්ධ ව්‍යාපාරයක් පැ.22 දරණ අංක 322 ගිවිසුම ප්‍රකාර ඇතිකර ගන්නා ලදී. එසේම මෙම ගිවිසුමට ඇතුළත් වීමෙන් දින දෙකකට පසුව එනම් 2012 මාර්තු 21 වන දින අංක 323 දරණ ගිවිසුමට, ධීවර යාත්‍රාවන්

සඳහා ආරක්ෂාව සැපයීම වෙනුවෙන්, ඇවන්ගාඩ් මෙරිටයිම් සමාගම සහ රක්නා ලංකා ආරක්ෂක සමාගම ඇතුළත් වී ඇත.

පැ.23 දරණ ගිවිසුම මගින් මුහුදු ආරක්ෂාව සඳහා යොදවන සීමාෂල්වරුන් මුහුදු කොල්ලකරුවන්ගේ ග්‍රහණයට හසු වීමකින් හෝ වෙනත් යම් ආපදාවකින් සීමාෂල්වරුන්ට යම් ජීවිත හානි හෝ කරදර සිදු වුවහොත් ඒ සඳහා වන්දි ගෙවන ආකාරය සහ ඔවුන් කොල්ලකරුවන් ගෙන් මුදා ගන්නා ආකාරය පිළිබඳව කොන්දේසි ඇතුළත් කර ඇත. පැ.23 දරණ ගිවිසුම ඇති කර ගැනීමෙන් පසුව ගිවිසුම් දෙපාර්ශ්වයම ගිවිසුමේ කොන්දේසි වලට හොඳින් අනුගත වන්නේ ද යන්න ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2012 මාර්තු 29 දිනෙන් යුත් පැ. 24 ලෙස සලකුණු කර ඉදිරිපත් කළ ලිපියෙන් විමසා ඇත.

මේ අයුරින් පැමිණිලිකරු විසින් බද්ධ ව්‍යාපාර හතක් ආරම්භ කර පත්වාගෙන ගොස් ඇත.

මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව එම්.වී මහනුවර යනුවෙන් නෞකාවක් බද්දට ගෙන අවි ගබඩාවක් ස්ථාපිත කර, ගාලු වරාය අබියස, නාවික සැතපුම් 12 ක් දුරින් ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ රඳවා තිබී ඇත.

2012 සැප්තැම්බර් 23 දින නාවික හමුදා මූලස්ථානයේ පැවති විශේෂ රැස්වීමක සටහන් වල උද්ධෘතයන් පැ.25 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම රැස්වීමෙහි අරමුණ වී ඇත්තේ මෙම පාවෙන අවි ගබඩා සම්බන්ධයෙන් මතුවී තිබූ විවිධ පැමිණිලි සහ දුර්මතයන් සාකච්ඡා කිරීමය. මේ වන විට රක්නා ආරක්ෂක ලංකා

සමාගම සමග පැමිණිලිකරු විසින් පාවෙන අවි ගබඩා දෙකක් ස්ථාපිත කර තිබී ඇත. ඉන් එක් අවි ගබඩාවක් වූ එම්.වී. ඇවන්ගාඩ් නැමැති අවි ගබඩාව රතු මුහුදේ ද, එම්.වී. අල්පොන්සෝ නැමැති අනෙක් අවි ගබඩාව gulf of oman හිද ස්ථාපිත කර තිබී ඇත. අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය පාඨලී චම්පික රණවක, අමාත්‍ය අර්ජුන රණතුංග සහ ජවිපෙ නායක අනුර කුමාර දිසානායක වැනි දේශපාලනඥයින් මෙම අවි ගබඩා දැඩි ලෙස විවේචනයට ලක් කරමින් එම අවි ගබඩා ස්ථාපිත කර ඇත්තේ ආයුධ පාවිච්චි කර අවශ්‍ය වූ විට රජයක් පිහිටුවා ගැනීමට බවත්, එසේම බිලියන 11.7 ක මුදලක් රජයට පාඩු කර මුදල පැමිණිලිකරු සහ ආරක්ෂක ලේකම්වරයා අතර බෙදා ගත් බවත් වැනි සාවද්‍ය දුර්මතයන් සමාජගත කර ඇත.

පැමිණිලිකරු සඳහන් කළේ ඔහු විදේශ රටවල සංචාරය කරනු ලැබූ අවස්ථාවන්හිදී ඔහුට දැනගන්නට ලැබුණු පරිදි ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමහර දූෂිත නිලධාරීන් මුදල් ලබාගෙන නීති විරෝධී ලෙස අවි විදේශිකයින්ට ලබාදී මුදල් උපයා ගන්නා බවටත්, කප්පම් ලබා ගන්නා බවටත් දැනුම් දී ඇත. පෞද්ගලික ආරක්ෂක ආයතන විසින් ව්‍යාජ ලේඛන මත ලබාගන්නා නීති විරෝධී ආයුධ ලංකාවේ දක්ෂිණ නාවික හමුදා කඳවුරේ ගාල්ල වරායේ ගොඩබිම පිහිටි ගබඩාවක ගබඩාකර මෙම නීති විරෝධී අවි ජාවාරම සිදුවී ඇති බවද හෙළිදරව් කර ඇත. මෙම කරුණු උක්ත සඳහන් පැ. 25 දරණ ලේඛනයෙහි දැක්වෙන රැස්වීමේදී සාකච්ඡාවට භාජනය වී ඇති අතර එම කරුණු නාවික හමුදාපති විසින් පිළිගෙන ඇත.

ඒ අනුව ඇවන්ගාඩ් සමාගම රක්නා ආරක්ෂක ලංකා සමාගම සමග එකතු වී ආරම්භ කළ මුහුදු ආරක්ෂක සේවය විනාශ කර දමන අවස්ථාව වන විට මෙම ව්‍යාපාරයෙහි 3500 - 4000ත් අතර සේවක ප්‍රමාණයක් සේවය කරමින් සිට ඇති අතර තවත් 25,000 පමණ රැකියා ලබාදීම සඳහා නයිජීරියානු නාවික හමුදාවත් සමඟ ගිවිසුම් අත්සන් කර තිබූ බවද පැමිණිලිකරු හෙළිදරව් කළේය.

පැ.25 ලේඛනයෙහි දැක්වෙන සාකච්ඡාවෙන් පසුව නාවික හමුදාව එම වරදකාරීත්වය පිළිගත් බැවින් ඒ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයට දැනුම් දී ඇති අතර ආරක්ෂක මණ්ඩලයේ දී ඒ පිළිබඳව සාකච්ඡා කර ඇත. මෙම තත්ත්වය අවබෝධ වීමත් සමගම ආරක්ෂක ලේකම්, නාවික හමුදාපති සහ ජනරාල් එගොඩවෙල, ජනරාල් පාලිත ප්‍රනාන්දු ඇතුළු රාජ්‍ය නිලධාරීන් පිරිසක් ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකරන ලෙසට පැමිණිලිකරුට ආරාධනා කර ඇත. මෙම රැස්වීම ද 2012 අගෝස්තු මස7 දින ආරක්ෂක අමාත්‍යංශයේ දී පවත්වා තිබේ. මෙම රැස්වීමෙහි සටහන් පැ.27 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම සාකච්ඡාවෙන් පසුව පැමිණිලිකරු විසින් 2012 අගෝස්තු මස 14 වැනි දින පැ.28 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද ලිපිය රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි මේජර් ජනරාල් කේ.බී.එගොඩවෙල මහතාට ලබා දී ඇත. පැමිණිලිකරු එම ලිපියෙන් යෝජනා කර ඇත්තේ ගාල්ලවරායට ඔබ්බෙන් පාවෙන අවි ගබඩාවක් ස්ථාපිත කිරීමෙන් ලැබෙන වාසි පිළිබඳවය.

පැ.28 දරණ ලිපියේ අඩංගු කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී. ජයරත්න මහත්මිය විසින් පාවෙන අවි ගබඩාවක් පිළිබඳ උක්ත

ව්‍යාපෘතිය පිළිබඳව විස්තරාත්මක ලිපියක් ආරක්ෂක ලේකම්වරයා වෙත යවා ඇත. මෙම ලිපිය පැ.29 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර තිබේ. ඉන්පසුව පාවෙන අවි ගබඩාවක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට ආරක්ෂක අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාවක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය ශ්‍රවණාගාරයේ දී 2012 .09.11 වන දින පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇත. පිටු 10 කින් සමන්විත එම රැස්වීමේ වාර්තාවේ සටහනක් පැ.30 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙවැනි ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කිරීමට ලංකාවේ හෝ ආසියාවේ තමන් හැර සුදුසුකම් ලත් වෙනත් කිසිදු පුද්ගලයෙක් නොමැති බවට පැමිණිලිකරු අවධාරණය සඳහන් කළේය.

මෙම සියලු කරුණු සාර්ථකව නිම කිරීමෙන් පසුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ආශිර්වාදය හා කැමැත්ත ලැබීමෙන් පසුව පැමිණිලිකරු විසින් ගාලු වරාය ඔබ්බෙන් විදේශීය ආරක්ෂක සේවාවන් සපයනු ලබන පෞද්ගලික ආරක්ෂක සමාගම් වලට අයත් අවි ආයුධ ගබඩා කිරීම සඳහා පාවෙන අවි ගබඩාවක් ස්ථාපිත කිරීම සඳහා 2012.12.15 දින රක්නා ආරක්ෂක ලංකා ආයතනය සමග බද්ධ ව්‍යාපාර ගිවිසුමකට ඇතුළත් වී ඇත. එම බද්ද ව්‍යාපාර ගිවිසුම පැ.31 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. පැ.31දරණ ගිවිසුමට එළඹීම සඳහා ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විස් සමාගමට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් 2012 සැප්තැම්බර් මස 18 දින අවසර ලැබී ඇත. එම ලේඛනය පැ.32 ක වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එසේම පැ. 32 දරණ අවසර පත්‍රය මත ස්ථාපිත කිරීමට නියමිත

පාවෙන අවි ගබඩාව පිළිබඳව පෞද්ගලික ආරක්ෂක සේවාවන් සැපයීමේ යෙදී ඇති සමාගම් සහ දේශීය නැව් නියෝජිතයන් දැනුවත් කරමින් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය මගින් 2012 ඔක්තෝබර් මස 09 දින නිකුත් කර ඇති ලියවිල්ල පැ.33 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.32 ලෙස සලකුණු කර ඇති 2012 සැප්තැම්බර් 18 දිනැති ලිපියෙන් ඇවන්ගාඩ් මෙරිටයිම් පුද්ගලික සමාගමට පාවෙන අවි ගබඩාවක් භාවිත කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ අනුමැතිය අනුව ඉන්පසුව ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ජයරත්න මහත්මිය විසින් 2012 ඔක්තෝම්බර් 8 දිනැති ලිපියෙන් නාවික හමුදාපති අමතමින් මහනුවර නෞකාවට අවශ්‍ය අවස්ථාවල දී ආයුධ ද සහිතව ගාලු වරායට ඇතුළුවීමට සහ ඉන් පිටවීමට අනුමැතිය ලබා දෙමින් පැ.34 දරණ ලිපිය යවා ඇත.

මේ අනුව එතෙක් නාවික හමුදාව විසින් තමා භාරයේ තබාගෙන සිටී පෞද්ගලික මුහුදු ආරක්ෂක සේවා සමාගම් දාසයකට අයත් ආයුධ එම්.වී. මහනුවර නැමැති පාවෙන අවි ගබඩාවට භාර දුන් බවට පැ.35 දරණ ලිපියෙන් නාවික හමුදාවේ අධ්‍යක්ෂ ජනරාල් එස්.ඒ.එම්.ජේ පෙරේරා මහතා විසින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. එසේම එම්.වී මහනුවර නැවේ ආරක්ෂාවට නාවික හමුදා භටයින් පනස්දෙනෙකු ගෙන් සමන්විත කාණ්ඩයක් නෞකාවේ නවත්වා ඇති බවටද පැ.35 ලිපියෙන් දන්වා ඇත. මෙම ලිපියේ සඳහන් අන්දමට එම්.වී මහනුවර නෞකාවේ සිට අදාල නෞකාවට අවිආයුධ ප්‍රවාහනය කෙරෙන එක් ගමන් වාරයකට ඩොලර් 1000 මුදලක් නාවුක හමුදාවට ගෙවීමට ඇවන් ගාඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගම එකඟ වී

ඇත. මෙම ඩොලර් දාහක මුදල ගෙවීම සම්බන්ධයෙන් අවශ්‍ය කොන්දේසි රක්නා ලංකා ආරක්ෂක සමාගම සහ ඇවන් ගාඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගම අතර ඇති කරගත් ගිවිසුමෙහි අන්තර්ගත කර ඇත. මෙම ගිවිසුම පැ.36 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු සඳහන් කළ අන්දමට මෙදින සිට මේ මහනුවර නෞකාව අත්අඩංගුවට ගන්නා අවස්ථාව වන විට මේ ආකාරයෙන් නාවික හමුදාවට ශ්‍රී ලංකා රුපියල් මිලියන 1900 ක් 2000 ප්‍රමාණයක් එසේ සිදුකරන ලද ගමන් වාර සඳහා ගෙවා ඇත.

පැ.36 ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව රක්නා ආරක්ෂක ලංකා සමාගම සහ ඇවන් ගාඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගම අතර තවත් වාණිජ ගිවිසුම් දෙකක් 2013.09.25 වන දින සහ 2013.08.01 වන දින සහ 2014.01.27 වන දින අත්සන් තබා ඇත. මෙම ගිවිසුම පිළිවෙළින් පැ.37, 38 සහ පැ.39 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම ගිවිසුම් වලට අනුව සෝමාලියාව ආශ්‍රිත රතු මුහුදේ මාළු ඇල්ලීමේ කර්මාන්තයේ නියැලී සිටි යාත්‍රාවන්ට ආරක්ෂාව සැපයීම සඳහා ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගම භාවිතා කර ඇත්තේ රක්නා ආරක්ෂක ලංකා සමාගමෙන් ලබා ගත් අවි ආයුධ පමණි.

2014 - 2015 වර්ෂ සඳහා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද Report from the Business, Innovation and Skill, Defence, Foreign Affairs and International Development Committees යන වාර්තාවෙහි බ්‍රිතාන්‍ය රජය අනුමත කළ පෞද්ගලික මුහුදු ආරක්ෂක සේවා පවත්වාගෙන යන සමාගම් වලට අයත් අවි ගබඩා අතරට එම්.වී ඇවන්ගාඩ් සහ එම්.වී මහනුවර යන නෞකා දෙකද ඇතුලත්ව ඇති බව පැ. 40 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන

ලද ලේඛනයෙන් පෙනී යයි. එසේම Security Association for the Maritime Industry නැමැති ආයතනය විසින් 2012 ඔක්තෝබර් මස 29 දාතමින් යුක්තව සකස් කරන ලද Trip Report for Colombo, Sri Lanka 8th -12th October 2012 නැමැති වාර්තාව පැමිණිලි 41 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මහනුවර පාවෙන අවි ගබඩාව පිළිබඳව සහ එය අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය පිළිබඳව සම්පූර්ණ සවිස්තරාත්මකව විස්තරයක් පැ. 41 දරණ ඉහත වාර්තාවෙහි ඇතුළත් කර ඇත. එහි 8 වන පිටුවේ සඳහන් නිර්දේශ අතර පහත සඳහන් නිර්දේශය ද ඇත. එනම්'

- The establishment of secure, effective and legal FAs should be supported by the international community; such a united approach will provide support to PMSCs and will ultimately underpin the security needs of vessels transiting the HRA. The SL FA model can act as a template for other FAs around the HRA. By following an effective model FAs can be controlled, monitored, managed and ultimately legitimized. Thereby reducing the illegal and illicit movement of weapons and ammunition through the region.

- SAMI recommends to the membership that the FA in SL is a viable proposition for the storage of weapons, ammunition and security stores at the South West corner of the HRA.

එම්.වී මහනුවර පාවෙන අවි ගබඩාව ස්ථාපිත කිරීමට මාස අටකට පමණ පෙර පැමිණිලිකරු විසින් රතු මුහුදේ සහ gulf of Oman කලාපයේ ශ්‍රී ලංකා රජයේ රක්නා ආරක්ෂක ලංකා ආයතනයට අයත් ආයුධ ගබඩා කිරීම සඳහා එම්.වී. අල්පොන්සෝ සහ එම්.වී. ඇවන්ගාඩ් යන පාවෙන අවි ගබඩා 2 ස්ථාපිත කර තිබී ඇත.

මෙම පාවෙන අවි ගබඩාව ව්‍යාපාරය සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කරගෙන යන අවස්ථාවේදී 2015 ජනවාරි 8 වන දින ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් නව රජයක් ස්ථාපිත කරන ලදී. නව රජය බලයට පත්වූ විගසම වාගේ එනම් 2015 ජනවාරි 18 වන දින එම්.වී මහනුවර නෞකාව අත්අඩංගුවට ගැනීමට ගාල්ල වරාය පොලිස් ස්ථානාධිපති ඇතුළු කණ්ඩායමක් පැමිණ ඇත. පැමිණිලිකරු සඳහන් කළේ 2015 ජනවාරි මස 18 වැනි දිනට පෙර සිටම ගාල්ල වරාය අබියස ජාත්‍යන්තර මුහුදේ මහනුවර නෞකාව පාවෙන අවි ගබඩාවක් ලෙස ක්‍රියාත්මක වන බවට ගාල්ල පොලිසිය ඉතා හොඳින් දැන් සිටි බවය.  පොලිස් නිලධාරීන් සමහර අවස්ථාවලදී ආහාර ගැනීමට ද එම්.වී මහනුවර නෞකාවට පැමිණිනෙ බව පැමිණිලිකරු සඳහන් කළේය. එසේම එම්.වී මහනුවර නෞකාවේ ආයුධ අස්ථානගත වීමක් පිළිබඳව පැමිණිල්ලක් කපිතාන් රුවන් පෙරේරා මහතා විසින් 2012. 11.14 දින ගාල්ල වරාය පොලිසියට සිදු කළ බවත්, එබැවින් ගාල්ල වරාය පොලීසිය මහනුවර පාවෙන අවි ගබඩාව පිළිබඳව හොඳින් දැන් සිටි බවත් සඳහන් කළේය. එම පැමිණිල්ල අදාල  ලදුපත පැ. 42 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එම්.වී මහනුවර නෞකාව අත්අඩංගුවට ගැනීමෙන් පසුව ගාල්ල වරාය පොලීසිය විසින් අංක 32528/ 15 දරණ බී වාර්තාව මගින් කරුණු ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කර ඇත. එම බී වාර්තාව පැ. 43 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ගාල්ල වරාය පොලිසියේ ස්ථානාධිපති ඉන්දුක ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද බී වාර්තාවෙහි මෙසේ සඳහන් කර ඇත.

(උපුටා ගැනීම) "2015.01.18 වන දින ගාල්ල නියෝජ්‍ය පොලිස්පතිතුමාට ලද තොරතුරක් අනුව ගාල්ල වරාය තුළ ගාල් කර ඇති මහනුවර නැමති නෞකාවේ අවි ආයුධ ඇති බවත් ඒවා ඉවත් කිරීමේ කාර්යයේද නිරත වී සිටින බවත් ලද තොරතුරු අනුව වැඩබලන මූලස්ථාන පොලිස් පරීක්ෂක ප්‍රධාන පොලිස් පරීක්ෂක පරීක්ෂක අරුනලාල්, ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙත්තසිංහ, ස්ථානාධිපති වරාය පොලිස් පරීක්ෂක නිශාන් ඉන්දුක ද සිල්වා ඇතුලු කණ්ඩායම වහාම ක්‍රියාත්මක වී එම ස්ථානයට ගොස් පරීක්ෂණ ආරම්භ කර ඇත.

තවද විමර්ශනයේදී අනාවරණය වූයේ ඇවන්ගාඩ් ආරක්ෂක ආයතනය මගින් ශ්‍රී ලංකා දක්ෂිණ නෞකා කඳවුරේ කන්ටේනර් තුනක උණ්ඩ ගබඩා කර ඇති බවයි. ඒ සම්බන්ධව දකුණු පලාත් නාවික ආඥාපති රියාර් අද්මිරාල් බී.බී.සී. ජයකොඩි මහතාගේ ප්‍රකාශය අනුව වැඩිදුරටත් තහවුරු වූයේ එම කන්ටේනර් දෙකට අමතරව රක්නා ලංකා පුද්ගලික ආරක්ෂක ආයතන මගින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ දක්ෂිණ මූලයේ සේවා වනිතා ඒකකයේ ගොඩනැගිල්ලේ කාමර තුනකින් යුත් විශාල අවි ගබඩාවක් පවත්වාගෙන යන බවත්, ලංකා ආරක්ෂක සේවයේ රාජකාරි

සඳහා අවි නිකුත් කරන බවත්, එය ශ්‍රී ලංකා නාවික හමුදාවේ පාලනයකින් තොරව එම පුද්ගලික ආරක්ෂක සමාගම මගින් පාලනය වන බවයි. එම ස්ථානයට පොලිසිය යන අවස්ථාවේදී ද අවි නිකුත් කරමින් තිබූ අතර එම අවි නිකුත් කිරීම පිළිබඳව නීත්‍යානුකූලභාවයක් අවි ගබඩා පාලකව සිටි ඉඳුරුවගේ කුමුදු කන්නන්ගර යන අයට ඉදිරිපත් කිරීමට ද හැකියාවක් නොමැති බව අනාවරණය විය.

ඔහු නාවික හමුදා කඳවුර තුළ පවත්වාගෙන යනු ලබන රක්නා ලංකා ආයතනයට අයත් අවි ගබඩාවේ භාරකරු බවද, එහි ටී-56 වර්ගයේ අවි 1556 ද, එම උණ්ඩ 135010ක් ද, එම වර්ගයේ ට්‍රේසර් බුලට් (උණ්ඩ) 146830 ක් ද, 84 එස් වර්ගයේ අවි 216 ක් ද, එම උණ්ඩ 180721 ක් ද, එම ට්‍රේසර් උණ්ඩ 75446 ක් ද, එල්.එම්.ජී. අවි 276 ක් ද, එම උණ්ඩ 7360, එම ට්‍රේසර් උණ්ඩ 2000 ක් ද,ර්.එම්.පී.එම්.පී.වර්ගයේ අවි 07 ක් සහ බෝර 12 තුවක්කු 01 ක් ද ඇති බවත්, යුධ හමුදාව විසින් පළදිනු ලබන හිස් වැසුම් 130 ක් ද, පූචස් 1581 ක් ද, එම ක්ලිප් 1618 ක් ද, බොඩි ආමර් 115 ක් ද, ආදිය මෙම අවි ගබඩාවේ තිබෙන බව ඔහු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින අතර, ඒවායේ නිත්‍යානුකූල භාවය සඳහා ලේඛණ ඉදිරිපත් කිරීමට නොහැකි බව පසුව ඒ සම්බන්ධව ලේඛණ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවටත් සඳහන් කර ඇත.” (උපුටා ගැනිම අවසන්)

ඒ අයුරින් බී වාර්තාවේ සටහන් තබන වරාය පොලිස් ස්ථානාධිපතිවරයා එම බී වාර්තාවේම පහත සඳහන් කරුණුද ඇතුළත් කර ඇත.

(උපුටා ගැනීම) "මෙම නෞකාව පරික්ෂා කරන අවස්ථාවේදී ගාලු වරාය තුළ ස්ථානගත කර තිබූ අතර, මෙම නෞකාව මගින් ජාත්‍යන්තර මුහුදු සීමාවේ ගමන් කරන නැව් සඳහා ආරක්ෂාව සැලසීමට විවිධ රටවල් හා ආයතන වලට අයත් “Sea Marshal” වරුන් ගාලු වරායේ මෙම නෞකාව වෙත පැමිණ තමන් විසින් එහි ගබඩා කර තිබූ විවිධ ගණයේ ආයුධ රැගෙන යාම පැවතුන අතර, ජාත්‍යන්තර මුහුදු සීමාවේ සිට විදේශකයින් ශ්‍රී ලංකා රජයට හෝ රජයේ සන්නද්ධ හමුදා වලට අයත් නොවන විවිධ වර්ගයේ අවි ආයුධ රැගෙන ශ්‍රී ලංකා මුහුදු තීරය හා ශ්‍රී ලංකා රජයේ දේපලක් වන ගාල්ල වරාය තුළ පාවෙන අවි ගබඩාවේ ගබඩා කර නැවත පිටව යාමේ දී එම ආකාරයෙන්ම අවිආයුධ රැගෙන යාම සිදු කරන බව වාර්තා කර ඇත.”

එසේම විදේශකයින් විසින් ශ්‍රී ලංකා රජය සතු නොවන අවි ආයුධ මෙම කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය හා ඇවන්ගාඩ් මෙරිටයිම් පුද්ගලික සමාගම සමග ගිවිසුමක් ඇද්ද යන්න විමර්ශන සිදුකළ යුතුව ඇත.

ශ්‍රී ලංකා රජය විසින් ආයුධ මිලදී ගැනීමේදී අවසන් පරිභෝජනය කරන්නා ලෙස ශ්‍රී ලංකා රජයට ලබාගෙන ඇති අවි ආයුධ මෙම ආයතනයට පවරා දීමත් සිදු කළේ ද යන්න සොයා බැලිය යුතුව ඇත.

එසේම ඇවන්ගාඩ් මෙරිටයිම් පුද්ගලික සමාගම හා රක්නා ලංකා සමාගම වෙබ් අඩවිය මගින් පවසා ඇත්තේ අදාළ ආයුධ ශ්‍රී ලංකා ආණ්ඩුව සතු වන අතර, සෑම ආයුධයක් සඳහාම ආරක්ෂක අමාත්‍යාංශය මගින් end users certificate සහතිකයක් නිකුත් කර ඇති බවය." (උපුටා ගැනීම අවසන්)

මේ අන්දමින් අධිකරණයට කරුණු වාර්තා කිරීමට ගාල්ල වරාය පොලිසියේ පොලිස් ස්ථානාධිපති ඉන්දුක ද සිල්වා දැන සිටියේ නම් ඔහු විසින් මෙම පරීක්ෂණ කටයුතු නිවැරදිව කරගෙන යාම සඳහා පළමුව කළ යුතුව තිබුණේ ආරක්ෂක අමාත්‍යාංශයට දැනුම් දීම සහ මේ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයෙන් විමසීමයි. නඩත්තු කළ යුතු තත්ත්වය එසේ වුවත්, පොලිස් ස්ථානාධිපතිවරයා විමර්ශනය සිදු කිරීමේදී නිවැරදි පිළිවෙතට ප්‍රවේශ වී නැත. ආරක්ෂක අමාත්‍යාංශයට දැනුම් දීමක් හෝ ඔහු විසින් සිදුකර නොමැත. වරාය පොලිස් ස්ථානාධිපතිවරයා විසින් තම බී වාර්තාවේ සඳහන් කර ඇති කරුණු වල නිරවද්‍යතාව සොයා බැලීමට නම් ආරක්ෂක අමාත්‍යාංශයෙන් විමසිය යුතුම බව ඔහු හොඳින් දැන් සිටි බව ඔහු අධිකරණයට කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය තුළින් පැහැදිලිව පෙනී යයි. බී වාර්තාවෙන් නගා ඇති ගැටලු සහ ප්‍රශ්න වලට පැහැදිලි පිළිතුරු ලබා ගැනීම සඳහා කරුණු අධිකරණයට වාර්තා කිරීමට ප්‍රථම ආරක්ෂක අමාත්‍යාංශයෙන් විමසීම ස්ථානාධිපතිවරයා සතු වගකීම සහ යුතුකම වුවත් ඔහු තම වගකීම හිතාමතාම මගහැර හෝ එම වගකීම ඉටුකිරීම පැහැර හැර ඇති බව බී වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා කඩිනම් වීම තුළින් පැහැදිලිව පෙනී යයි.

2015 ජනවාරි 18 වන දින එම්.වී මහනුවර පාවෙන අවි ගබඩාව අත්අඩංගුවට ගැනීමත් සමඟම අමාත්‍ය පාඨලී චම්පික රණවක, අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය අර්ජුන රණතුංග, පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක දේශපාලන මාධ්‍ය සාකච්ඡා පවත්වමින් මෙම පාවෙන අවි ගබඩාව පිළිබඳව සඳහන් කරමින් එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට සහ පැමිණිලිකරුට එරෙහිව විවිධ ප්‍රකාශ සිදු කර ඇත. මාධ්‍ය සාකච්ඡා පැවැත්වූ මෙම දේශපාලනඥයින් පවසා ඇත්තේ මෙම ආයුධ වලින් රජය පෙරලීම සඳහා ගෝඨාභය රාජපක්ෂ මහතා සහ පැමිණිලිකරු ක්‍රියා කරන බවය. මෙම මාධ්‍ය සාකච්ඡා වල වාර්තාවන් ඇතුළත් පුවත්පත් වල පළවූ වාර්තාවල කැපුම් ලිපිගොනුවක් සකස් කර එය පැ.44 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ගාල්ල වරාය පොලිස් ස්ථානාධිපතිවරයා ඉදිරිපත් කරනු ලැබූ ඉහත සඳහන් බී වාර්තාවට සැකකරුවන් නම් කර නොමැත. පැමිණිලිකරු සඳහන් කළේ ඉන් පසුවද අවස්ථාව ගණනාවක්දී අධිකරණය වෙත වැඩිදුර වාර්තා ඉදිරිපත් කර ඇතත් එම එකදු වාර්තාවකවත් සැකකරුවන් නම් කර නොමැති බවයි.

පැමිණිලිකරු සඳහන් කළ අන්දමට මෙම එම්.වී මහනුවර පාවෙන අවි ගබඩා නැව ගාල්ල වරාය පොලීසිය මගින් අත්අඩංගුවට ගන්නා විට එම නෞකාව තුළ නාවික හමුදා සෙබළුන් පනස් දෙනකු නෞකාවේ රාජකාරියෙහි නිරතව සිට ඇත. ඒ අනුව අත්අඩංගුවට ගැනීම පිළිබඳව පැන නැගුණු ගැටළු සහගත තත්ත්වය එවකට ගාල්ල ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිව සිටි ගුණවර්ධන මහතා අමාත්‍ය රාජිත සේනාරත්න මහතා හමුවී මේ පිළිබඳව කතා බහ කර ඉන්පසු වැඩිදුර

පරීක්ෂණ කටයුතු  අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර කළ බවය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු භාර ගෙන අවුරුදු පහක පමණ කාලයක් ගත වුවත් සැකකරුවකු නම් කිරීම සිදුකර නොමැත.

එම්.වී මහනුවර නෞකාව  අත්අඩංගුවට ගැනීමෙන් පසුව ද මාස 10ක පමණ කාලසීමාවක් ඔවුන් විසින් මෙම මුහුදු ආරක්ෂාව සැපයීමේ ක්‍රියාන්විතය  ඒ අයුරින්ම කරගෙන යාමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉඩ සලස්වා ඇත.  කිසිදු වෙනසකට භාජනය නොකර පවත්වාගෙන ආ අයුරින්ම මුහුදු ආරක්ෂක කටයුතු සිදුකරගෙන යාමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ අයුරින් ඉඩදීමට හේතුව වශයෙන් පැමිණිලිකරු සඳහන් කළේ,  අන්තර් ජාතික සංවිධාන වලට අයත් ආයුධ ඇති බවත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුමැතියට අනුව මෙම ව්‍යාපෘතිය සිදුකරගෙන යන බවත්, එක නැවැත්තුවොත් අන්තර්ජාතිකව ශ්‍රී ලංකාවට ගැටළු ඇති විය හැකි බවටත්, එම අවස්ථාවේදී එම ස්ථානයේ සිටි නියෝජ්‍ය පොලිස්පතිවරයාට දැනුම් දීම කරණ කොටගෙන බවය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ පවත්වමින් සිටි එක් අවස්ථාවකදී අධිකරණයේ උපදෙස් මත විමර්ශන ලිපි ගොනුව එවකට නීතිපති යුවන්ජන් විජේතිලක මහතා වෙත යවා ඇත.

ගාලු වරායේ පාවෙන අවි ගබඩාව සම්බන්ධව සිදුකළ විමර්ශන සම්බන්ධයෙන්  නීතිපති මතය විමසන ලදුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නීතිපති වෙත එවා ඇති විමර්ශන සටහන් ලේඛන සහ ප්‍රකාශන සලකා බැලීමෙන් පසුව ගිනි අවි ආඥා පනත හෝ පුපුරන ද්‍රව්‍ය ආඥා පනත හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත

යටතේ වරදක් හෙළිදරව් නොවන බවට සඳහන් කරමින් නීතිපතිවරයාගේ මතය 2015-06-13 දිනැති ලිපියෙන් පොලිස්පති අමතමින් යවා ඇත. මෙම ලිපිය පැ.45 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මේ අනුව මහනුවර පාවෙන අවි ගබඩාව ගාලු වරායේ දී අත්අඩංගුවට ගැනීමත්, වරාය පොලිස් ස්ථානාධිපති ආරියසිංහ පරීක්ෂණ ආරම්භ කර ඉන් අනතුරුව පරීක්ෂණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මාරුවීමත්, ඉන්පසුව සිදු කරනු ලැබූ පරීක්ෂණ කටයුතු විමර්ශනය කර වරදක් හෙළිදරව් නොවන බවට නීතිපති තම මතය ප්‍රකාශ කර තිබියදීත් මේ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන කටයුතු මේ දක්වාම සිදු කර ගෙන එමින් සිටින බවත්, එසේ වුවත් තවමත් කිසිදු වරදක් අනාවරණය වී නොමැතිව නඩුව ඔහේ පවත්වාගෙන යන බවටත් පැමිණිලිකරු සාක්ෂියේ දී සඳහන් කළේය.

නීතිපති යුවන්ජන් විජයතිලක මහතාගේ ඉහත සඳහන් මතය ප්‍රකාශ කිරීමෙන් පසුව ඒ පිළිබඳව කිපුණු දේශපාලනඥයින් විවිධ මාධ්‍ය සාකච්ඡා පවත්වමින් නීතිපතිවරයා විවේචනය කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් පලවී ඇති පුවත්පත් වාර්තාවලින් පෙනී යයි. මෙම පුවත්පත් වාර්තා වල එකතුවක් පැ. 44 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

අමාත්‍ය රාජිත සේනාරත්න මහතා සිදුකළ මාධ්‍ය සාකච්ඡාවක වාර්තාවක් ද 2015-09-10 වන දින දිවයින පුවත්පතේ වාර්තාගත වී ඇති අතර එහි ශීර්ෂය වශයෙන් දක්වා ඇත්තේ ඇවන්ගාඩ් සහ ආරක්ෂක ලේකම්ට එරෙහිව ඇති චෝදනා නැතැයි කීමෙන් මේ රටේ මේ වන විට නීතිපතිවරයෙකු නම් නොමැති බව හැඟෙනවා යනුවෙනි.

එසේම 2015 දෙසැම්බර් මස 10 වන දින දිවයින පුවත් පතෙහි පළ වී ඇති සරත් ෆොන්සේකා මහතාගේ ප්‍රකාශයක සඳහන්ව ඇත්තේ විශ්‍රාම ලැබූ පසු නීතිපති අත්අඩංගුවට ගැනීමට කටයුතු කරනවා යනුවෙනි.

එසේම 2015-09-20 දින ලංකා ඉරිදා සංග්‍රහය පත්‍රයේ පළ වී ඇති අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රකාශයකින් සඳහන් කර ඇත්තේ ඇවන්ගාඩ් ගැන නීතිපති තීරණයට අනුරගෙන් දැඩි විරෝධය.

එසේම අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ එවකට අධ්‍යක්ෂ ජනරාල්ව සිටි දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය තමන්ට කතා කරමින් කෙසේ හෝ ආරක්ෂක ලේකම්වරයා සිරගත කිරීමට සාක්ෂි ලබා දෙන ලෙසටත්, ආරක්ෂක ලේකම්වරයාට පැමිණිලිකරු මුදල් ලබාදුන් බවට ප්‍රකාශයකින් පවසන ලෙසට ඇය තමාට පැවසූ බවත්' එසේ දිවුරුම් ප්‍රකාශයක් ලබා දුනහොත් තමන්ට මෙම ව්‍යාපෘතිය දිගටම ක්‍රියාත්මක කරගෙන යාමට ඉඩ ලබාදෙන බවට ඇය පැවසූ බවත් පැමිණිලිකරු සඳහන් කළේය. අසත්‍ය ප්‍රකාශ කරමින් එවැනි දිවුරුම් ප්‍රකාශයක් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවේදී පැමිණිලිකරු අත්අඩංගුවට ගනු ලැබූ බවද සඳහන් කළේය.

මෙම සිද්ධියෙන් පසු අවස්ථාවකදී දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය තමන්ට කතාකර තමා ගෙන් සමාව ඉල්ලූ බවත්, මම මේකට නඩු කියලා කිව්වට මට සමාවෙන්න ඔබතුමාට විරුද්ධව නඩු පැවරුවාට ලංකාවේ ඉන්න හොඳම බිස්නස් එක. දේශපාලන හේතූන් මත මේක කරන්නේ, ගෝඨාභය රාජපක්ෂ මහතාට නඩු දාපු එක ගැන සමාවෙන්න, මම දැනගෙන හිටියා නම් මේ නඩු පවරන්නේ

නැහැ කියලා තමන්ට ප්‍රකාශ කළ බව සාක්ෂි වැඩිදුරටත් ප්‍රකාශ කළේ ය. මේ අනුව මහනුවර පාවෙන අවි ගබඩාව ගාලු වරායේ දී අත්අඩංගුවට ගැනීමත් වරාය පොලිස් ස්ථානාධිපති ආරියසිංහ පරීක්ෂණ ආරම්භ කර ඉන් අනතුරුව පරීක්ෂණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මාරුවීමත්, ඉන් පසුව සිදු කරනු ලැබූ පරීක්ෂණ කටයුතු විමර්ශනය කර වරදක් හෙළිදරව් නොවන බවට නීතිපති තම මතය ප්‍රකාශ කර තිබියදීත්, මේ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන කටයුතු මේ දක්වාම සිදු කර ගෙන එමින් සිටින බවත්, එසේ වුවත් තවමත් කිසිදු වරදක් අනාවරණය වී නොමැතිව නඩුව ඔහේ පවත්වාගෙන යන බවටත් පැමිණිලිකරු සාක්ෂිදෙමින් සඳහන් කළේය.

නීතිපති යුවන්ජන් විජයතිලක මහතාගේ ඉහත සඳහන් මතය ප්‍රකාශ කිරීමෙන් පසුව ඒ පිළිබඳව කිපුණු දේශපාලනඥයින් විවිධ මාධ්‍ය සාකච්ඡා පවත්වමින් නීතිපතිවරයා විවේචනය කර ඇති  බව ඒ සම්බන්ධයෙන් පලවී ඇති පුවත්පත් වාර්තාවලින් පෙනී යයි.  මෙම පුවත්පත් වාර්තා වල එකතුවක් පැ.44 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

අමාත්‍ය රාජිත සේනාරත්න මහතා සිදුකළ මාධ්‍ය සාකච්ඡාවක වාර්තාවක් ද 2015-09-10 වන දින දිවයින පුවත්පතේ වාර්තාගත වී ඇති අතර එහි ශීර්ෂය වශයෙන් දක්වා ඇත්තේ ඇවන්ගාඩ් සහ ආරක්ෂක ලේකම්ට එරෙහිව ඇති චෝදනා නැතැයි කීමෙන් මේ රටේ මේ වන විට නීතිපතිවරයෙකු නම් නොමැති බව හැඟෙනවා යනුවෙනි.

එසේම 2015 දෙසැම්බර් මස 10 වන දින දිවයින පුවත් පතෙහි පළ වී ඇති සරත් ෆොන්සේකා මහතාගේ ප්‍රකාශයක  සඳහන්ව ඇත්තේ

විශ්‍රාම ලැබූ පසු නීතිපති අත්අඩංගුවට ගැනීමට කටයුතු කරනවා යනුවෙනි.

2015-09-20 දින ලංකා ඉරිදා සංග්‍රහය පත්‍රයේ පළ වී ඇති අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රකාශයකින් සඳහන් කර ඇත්තේ ඇවන්ගාඩ් ගැන නීතිපති තීරණයට අනුරගෙන් දැඩි විරෝධය.

එසේම අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ එවකට අධ්‍යක්ෂ ජනරාල්ව සිටි දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය තමන්ට කතා කරමින් කෙසේ හෝ ආරක්ෂක ලේකම්වරයා සිරගත කිරීමට සාක්ෂි ලබා දෙන ලෙසටත්, ආරක්ෂක ලේකම්වරයාට පැමිණිලිකරු මුදල් ලබාදුන් බවට ප්‍රකාශයකින් පවසන ලෙසට ඇය තමාට පැවසූ බවත්, එසේ දිවුරුම් ප්‍රකාශයක් ලබා දුනහොත් තමන්ට මෙම ව්‍යාපෘතිය දිගටම ක්‍රියාත්මක කරගෙන යාමට ඉඩ ලබාදෙන බවට ඇය පැවසූ බවත් පැමිණිලිකරු සඳහන් කළේය. අසත්‍ය ප්‍රකාශ කරමින් එවැනි දිවුරුම් ප්‍රකාශයක් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවේදී පැමිණිලිකරු අත්අඩංගුවට ගනු ලැබූ බවද සඳහන් කළේය.

නීතිපති දෙපාර්තමේන්තුවේ සොලිසිටර් ජනරාල්වරයා වශයෙන් සේවය කළ සුහද ගම්ලත් මහතා විසින් සති අග අරුණ පුවත් පතට සහ දෙරණ රූපවාහිනී නාලිකාවේ මාධ්‍යවේදී චතුර අල්විස් මහතා සමඟ සුහද ගම්ලත් මහතා විසින් සිදුකරන ලද මාධ්‍ය සාකච්ඡාවකදී පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාළ කරුණු සම්බන්ධව වැදගත් තොරතුරු රැසක් සුහද ගම්ලත් මහතා විසින් හෙළිදරව් කර ඇත. සති අග අරුණ පුවත්පත සමඟ සුහද ගම්ලත් මහතා සිදු කරනු ලැබූ සාකච්ඡාව 2019 සැප්තැම්බර් මස 29 වැනි දින සිදුකර ඇති අතර එම

සාකච්ඡාව අඩංගු එදින පුවත්පත පැ. 46 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම ප්‍රවෘත්ති වාර්තාවෙහි ශීර්ෂය වශයෙන් යොදා ඇත්තේ ගෝඨාට නඩු දාන්න රජය බලපෑම් කළ හැටි හිටපු සොලිසිටර් ජනරාල් සුහද ගම්ලත් විස්තර කරයි යනුවෙනි .

එම මාධ්‍ය සාකච්ඡාවේදී ගම්ලත් මහතා අනිකුත් කරුණු අතර පහත සඳහන් කරුණු සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම)" මේ සිද්ධිය වෙන කොට මම ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් විදියටයි වැඩ කරමින් සිටියේ. අපරාධ කාරණා සම්බන්ධ අංශය තිබුණේ මගේ යටතේ. ඔය කාලේ වරායේ ආයුධ සහිත නැවක් ගැන කතාවක් තිබුණා. මම සාමාන්‍යයෙන් රෑ 7 – 8 වෙනකම් කාර්යාලයේ ඉන්නවා. ඉතින් දවසක් සවස 6.30ට විතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර මහත්මයා තවත් නිලධාරීන් හත් දෙනෙක් සමග මගේ කාර්යාලයට ආවා.ඇවිත් ඔහු මට කීවා ගාල්ලේ අවි නැව ගැන නඩුව හෙට ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ගන්නවා. මේකෙ සැකකරුවන් හැටියට ඉදිරිපත් කරන්නේ කවුද කියලා අපට නිශ්චිත අවබෝධයක් නැහැ. අපි දන්නෙත් නැහැ මේ පරීක්ෂණය ගෙනියන්න ඕන කොහොමද කියලා. මේ ගැන උපදෙසක් දෙන්න කීවා.
>
> මම ඔහුට කිව්වා මම මේ ගැන කිසි දෙයක් දන්නේ නෑ. මගෙ කනිෂ්ඨ නිලධාරියෙක් ළඟට මම ඔහුව යොමු කළා. මම ශානිට කිව්වා ඒ නිලධාරියා හමු වුණාට පස්සේ යළි මාව හමුවෙන්න කියලා.

ඒ සිද්ධියෙන් පස්සේ මේ ආයුධ නැව සම්බන්ධ කාරණාවට අදාළ ලිපි ගොනුව මගෙ අතට ආවා. එදා ඉඳන් හැමදාම උදේට නීතිඥ සංගමයේ සභාපති වගේම ආයෝජන මණ්ඩලයේත් සභාපති වුණ නීතිඥ උපුල් ජයසූරිය මහත්තයා මගේ ඔෆිස් එකට එන්න පටන් ගත්තා. සමහර අවස්ථාවල මම එන්නත් කලින් එයා ඇවිල්ලා මට කියනවා අපි දන්නව ඔයා අවංක නිලධාරියෙක්. ඔබ පසුගිය රජයේ මන්ත්‍රීවරුන්ට නඩු පැවරුවා. ඒ වගේ ගෝඨාභය ඇතුළු පිරිස අත්අඩංගුවට ගන්න උපදෙස් දෙන්න එන්න කියලා මට කියනවා.

ඊට පස්සේ ආපහු දවසක් උපුල් ජයසූරිය මාව හම්බ වෙන්න ආවා. මූණත් නරක් කරගෙන මට කිව්වා ඔබ අර මනුස්සයට රට යන්න දුන්න නේද කියලා. මම ඒක සම්පූර්ණයෙන්ම නීත්‍යානුකූලයි කියලා. ඒ වේලාවේ උපුල් ජයසූරිය මට කිව්වා අගමැතිතුමාට ඔබව හමුවෙන්න අවශ්‍යයි කියලා. මම ඔහුට කිව්වා අගමැතිතුමාට මාව හමුවෙන්න අවශ්‍ය නම් ඒ පණිවුඩය එන්න ඕනේ ඔබ හරහා නෙවෙයි. මගේ ප්‍රධානියා වන නීතිපතිතුමා මාර්ගයෙන් කියලා.

නැහැ. නමුත් ඊට පස්සේ දවසක විනිසුරු උපාලි අබේරත්නගේ දරුවෙකුගේ මංගල්‍යකට මම ගිහින් ඉන්න කොට උපුල් ජයසූරිය මට කෝල් කළා. ඔහු රහසින් වගේ මට කිව්වා අගමැතිතුමා මම එනතුරු බලා ඉන්නවා කියලා. මට තේරුණා ඔහු මට කතා කළේ අගමැතිතුමා ළඟ ඉඳගෙන කියලා. ඒ නිසා නොයා ඉන්න එක අශීලාචාරයි වගේ නිසා මම කිව්වා මම එන්නං කියලා. ඒ යනකොට මම හිතුවා සද්භාවයෙන් මේ නඩුව

ගැන තොරතුරු දැනගන්න පෞද්ගලික හමුවීමක් වෙන ඇති කියලා.

නමුත් මම අරලියගහ මන්දිරයට යනකොට එතැන මහ විශාල රැස්වීමක්. ඒක අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වපු FCID එකේ රැස්වීමක්. ඇමතිවරු රාශියක් හිටියා. රාජිත සේනාරත්න, පාඨලී චම්පික රණවක, ජවිපෙ නායක අනුර කුමාර දිසානායක, වැලිඅංග කියන නීතිඥයා උපුල් ජයසූරිය වගේම අර්ජුන මහේන්ද්‍රනුත් හිටිය. ඒ වගේම අර්ජුන පොලිස්පතිවරයා, රවී වෛද්‍යාලංකාර, හා ත්‍රිවිධ හමුදාපතිවරුන් හිටිය. නීතිපති දෙපාර්තමේන්තුවේ මට වඩා කනිෂ්ඨ නිලධාරියෙකුත් හිටිය. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒ රැස්වීමට කැඳවීම නීති විරෝධියි. මම අපේ නිලධාරීන්ගෙන් ඇහුවා ඔබ මොකද මෙතැන කරන්නෙ කියලා.

ඔන්න දැන් නඩු ගැන කතා කරනවා. එකින් එක අරගෙන පොලිස්පතිතුමාගෙන් අහනවා මොකක්ද තත්ත්වය කියලා. ඇවන්ගාඩ් නඩුව ගැන කතා කරන්න පටන් ගත්තා. එකපාරටම චම්පික රණවක ඇමැතිවරයා අතින් මේසෙට ගහමින් ආවේශවෙලා වගේ කියනවා නිලධාරියෙක් සේනාධිපතිට රට යන්න පාස්පෝට් එක නිදහස් කරලා තියෙනවා. ඔහු දැන් නයිජීරියාවට ගිහිල්ලා ඇති ගිහිල්ලා සල්ලි සේරම වෙනත් රටවලට යවල ඇති මේ පරීක්ෂණය කරන්න වෙන්නේ නැහැ මේ විදියට කියලා.

එතකොට මම කිව්වා. ඇමැතිතුමා ඔහුගෙ පාස්පෝට් එක නිදහස් කරන්න කියලා උපදෙස් දුන්නේ මම. මම ඒක කළේ

නීතියට අනුව මොකද තාම මේ පරීක්ෂණත් ඉවර නෑ කියලා. අනිත් එක ඔබතුමාලා අපිට කෑගැහුවට ඔබලාගෙ ඇමැතිවරුන් වන විජේදාස රාජපක්ෂ හා තිලක් මාරපන වගේ අයත් මේ ගැන මට කතා කළා කියලා. එතකොට ඔන්න චම්පික කියනවා ඒක තමා බලන්න ඇමැතිවරුත් මේවට උදව් කරනවා. මේ ඇමැතිවරු දෙන්න මේ දූෂණ කමිටුවෙත් ඉඳගෙනයි මෙහෙම කරන්නේ වගේ කතා.

ඔය ගැන තමා මේ මෑතක විජිත හේරත් මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ කිව්වේ. මම ඇවන්ගාඩ් චූදිතයන්ට උදව් කළා කියලා. දැන් ඔය රැස්වීම ඉවර වෙලා මම අරලියගහ මන්දිරයෙන් එළියට එන්න එනකොට මට හම්බවුණා පායලී ඇමැතිතුමා. ඔහු මට කතා කරල ඇහුවා සුහද ඔබ හිතන්නෙ මේ ආයුධ කාගෙ කියලාද කියලා. මම කිව්වා ආයුධ තියෙන නැවන් ගැන ආරක්ෂක ලේකම්වරයා  නොදැන ඉන්න විදියක් නැහැ. අපි ඒ ගැන හොයලා බලන්නං කියලා. එතකොට ඔහු මට කියනවා ඔබ ගෝඨාව අත්අඩංගුවට ගන්න. අපි ඔබ ගැන බලාගන්නං කියලා. මම ඒකට උත්තරයක් දෙන්නෙ නැතුව පිටවෙලා ආවා.

ඔව්, මේ ගැන දිගටම අරලියගහ මන්දිරයේ මීටින් තියෙනවා. ඔය මීටින්වලට එනවා. එවකට  අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් වුණේ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය. ඇය මේ නඩුවට සම්බන්ධ වෙන්නේ ඒ විදියට. මගේ අදහසේ හැටියට ඇය ඒ රැස්වීම්වලට පැමිණීම සම්පූර්ණයෙන්ම වැරදියි. මොකද අල්ලස් හෝ දූෂණ කොමිසම ඉතාම ස්වාධීනව

කටයුතු කළ යුතු ආයතනයක්. ඒ නිසා තමයි 1994 දී අල්ලස් දූෂණ කටයුතු ගැන කටයුතු කිරීම නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉවත් කරලා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසම වෙනම ආයතනයක් ලෙස ආරම්භ කළේ. පාර්ලිමේන්තුවේ සියලු දෙනා ඒකමතිකව මේ පනත සම්මත කළා.

නමුත් මේ රැස්වීමවලට අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරිය වගේම නීතිපති දෙපාර්තමේන්තුවෙන් අපිව ගෙන්වලා දේශපාලකයන් අපෙන් ප්‍රශ්න කරන තත්ත්වයක් ඇතිවුණා. මේක කිසි දිනෙක මේ රටේ සිදුවෙලා තිබුණේ නැහැ. මේක පැහැදිලිව යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය දේශපාලනීකරණය වීමක්

ආණ්ඩුව කිව්වට මේකට තදබල අවශ්‍යතාවයක් තිබුණේ රාජිත සේනාරත්න හා චම්පික රණවක ඇමැතිවරුන්ට. අගමැතිතුමා එහෙම බලපෑමක් කළේ නැහැ. එක සැරයක් මේ FCID රැස්වීම තිබුණා ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්. මම එතුමාට කිව්වා අපට තිබෙන බලපෑම ගැන. කොතරම් බලපෑම් කළත් සාක්ෂි නැතිව නඩු දාන්න බැහැ කියලා. එතුමා ඒක පිළිගත්තා. රාජිත සේනාරත්න හා අනුර කුමාර දිසානායක පැත්තට හැරිලා කිව්වා නයාට ගහලා පොල්ල වරද්ද ගත්තා වගේ වැඩ කරන්න එපා කියලා.

මම හිතන්නේ මේ තරම් බලපෑම් කරන්න හේතුව දේශපාලන හේතුවකටත් වඩා වාණිජ හේතුවක් කියලයි. කාට හරි අවශ්‍යතාවක් තිබුණා මේ ව්‍යාපාරාය කඩලා අරන් වෙන කාට

හරි අරන් දෙන්න. මොකද මේක කෝටි ගණන් ලාභ ලැබෙන ව්‍යාපාරයක්" (උපුටා ගැනීම අවසන්)

දෙරණ රූපවාහිනී නාලිකාවේ මාධ්‍යවේදී චතුර අල්විස් මහතා සමග සුභද ගම්ලත් මහතා පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවට අන්තර්ගත සීඩී තැටිය පැ. 47 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එම්.වී මහනුවර නෞකාව අත්අඩංගුවට ගැනීම කරණ කොටගෙන ඇතිවූ තත්ත්වය මත පැමිණිලිකරු පවත්වාගෙන ගිය මුහුදු ආරක්ෂක සේවය අඩපණ වී ගොස් එය පවත්වා ගෙන යා නොහැකි තත්ත්වයකට පත්ව ඇත. ඒ අනුව රක්නා ආරක්ෂක ලංකා සමාගම සමඟ ඇතිකරගෙන තිබූ බද්ධ ව්‍යාපාර ගිවිසුම් අවලංගු කර පාවෙන අවි ගබඩාව ඉවත් කර ගැනීමට තීරණය කර ආරක්ෂක ලංකා සමාගමට පැමිණිලිකරු විසින් දැනුම් දී ඇත. එකී දැන්වීමේ සඳහන් අන්දමට මේ අවස්ථාව වන විට ව්‍යාපාරය අඩපණවීම කරණ කොටගෙන පැමිණිලිකරුට සිදුවී ඇති අලාභය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.6 කි. එම මුදල රක්නා ලංකා සමාගම විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට ද එකී දැන්වීමෙහි සඳහන් කර ඇත. එම දැන්වීම පැ. 48 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2015 පත්වූ නව රජය ආරක්ෂක ලංකා සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසුරුවා හැර නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත්කර ඇත. එම අධ්‍යක්ෂක මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් වික්ටර් සමරවීර මහතා පත් කර ඇත. පැමිණිලිකරු විසින් යවන ලද පැ. 48 දරණ දැන්වීමට සමරවීර මහතා විසින් ප්‍රතිචාර දක්වා ඇත. එම කෙටි ලිපිය පැ.49 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.49 හි වික්ටර් සමරවීර මහතා සඳහන් කර ඇත්තේ පැ. 48 න් පැමිණිලිකරු සඳහන්

කර ඇති කරුණු කිසිවක් අභියෝගයට ලක් නොකරන බවත්, දැනට සමාගම් දෙක අතර පවත්වාගෙන් යනු ලබන සාකච්ඡාවල දී මෙම කරුණු ද සාකච්ඡාවට භාජනය කිරීම වඩාත් සුදුසු වන බවත්ය.

එම වික්ටර් සමරවීර මහතාද, තමන් දේශපාලන පළිගැනීම් වලට ලක්වූ පුද්ගලයකු බවට සඳහන් කරමින් මෙම කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

ඉහත සඳහන් කළ ලිපි හුවමාරුවෙන් පසුව ආරක්ෂක ලංකා සමාගම සහ ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගම සමග 2015-10-20 දින අවබෝධතා ගිවිසුමකට එළඹී ඇත. මෙම අවබෝධතා ගිවිසුමට ලංකා සමාගම වෙනුවෙන් සමාගමේ නවතම සභාපතිවරයා වූ වික්ටර් සමරවීර මහතා අත්සන් තබා ඇති අතර ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගම වෙනුවෙන් සභාපතිවරයා අත්සන් තබා ඇත. මෙම අවබෝධතා ගිවිසුමට ඇතුළත්වීම සම්බන්ධයෙන් ඒ වන විට ආරක්ෂක අමාත්‍යධූරය දැරූ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගෙන් වික්ටර් සමරවීර මහතා උපදෙස් පතා ඇති අතර අතිගරු ජනාධිපතිතුමා ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් මෙම ගිවිසුමට එළඹීම අනුමත කළ බව තමන්ට වික්ටර් සමරවීර මහතා පැවසූ බව සාක්ෂිකරු සඳහන් කළේය. මෙම අවබෝධතා ගිවිසුම් ගන්නා අවස්ථාව වන විට සමාගම් දෙක අතර අත්සන් තබා තිබූ සියලුම ගිවිසුම් නැවත සනාථ කරමින් එම ගිවිසුම් පරිදි සමාගම් දෙක ක්‍රියාකිරීමට මෙම අවබෝධතා ගිවිසුමෙන් දෙපාර්ශවයම එකඟතාවයකට පැමිණ ඇත. ඒ අනුව

i. ඉදිරි මෙහෙයුම් මධ්‍යස්ථාන ව්‍යාපෘතිය,
ii. ධීවර යාත්‍රා ව්‍යාපෘතිය,

iii. ගාල්ලේ පාවෙන අවිගාර ව්‍යාපෘතිය,

iv. අවි ආයුධ ගුවනින් හා මුහුදින් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපෘතිය,

v. අවි රහිත සමුද්‍ර ආරක්ෂක ව්‍යාපෘතිය,

vi. අවි තැන්පත් කිරීමේ ව්‍යාපෘතිය,

vii. මලක්කා ස්ට්‍රේට් ප්‍රදේශයේ ඉදිරි මෙහෙයුම් මධ්‍යස්ථානය,

viii. පාවෙන වේදිකා ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය,

ix. විදේශ සමුද්‍ර ආරක්ෂකයින්ගේ සුබසිද්ධිය සඳහා වෙඩි තැබීමට පුහුණු කිරීමේ ව්‍යාපෘතිය,

යන ව්‍යාපෘතීන් තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාමට මෙම අවබෝධතා ගිවිසුමෙන් දෙපාර්ශවය එකඟ වී ඇත. මෙම අවබෝධතා ගිවිසුම පැ.50 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

අවබෝධතා ගිවිසුම අවුරුදු පහක කාල සීමාවක් සඳහා බලපැවැත්වෙන පරිදි අත්සන් තබා ඇත. මේ අනුව රක්නා ආරක්ෂක ලංකා පුද්ගලික සමාගම සහ ඇවන්ඩ් ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගම අතර ඒ වන තෙක් ඇති කරගෙන තිබූ ගිවිසුම් තවදුරටත් නීතියෙන් වලංගු බවට අවබෝධතා ගිවිසුමෙන් දෙපාර්ශවය එකඟත්වයකට පැමිණ ඇත.

2015 අප්‍රේල් මස පලවන දින ලිපියක් ආරක්ෂක ලේකම් බස්නායක මහතාගේ උපදෙස් මත සහකාර ලේකම් දිසානායක මහතා නාවික හමුදාපති වෙත යවමින් ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ දී 32528/15 දරණ නඩු නියෝගය පරිදි ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගම හරහා පවත්වාගෙන යනු ලබන එම්.වී මහනුවර නෞකාවේ සියලු කටයුතු නාවික හා හමුදා නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු

කිරීමට දැනුම් දී ඇත. මෙම ලිපියේ පිටපතක් රක්නා ආරක්ෂක ලංකා පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස සහ ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගමේ සභාපතිවරයා වෙත යවා ඇත. මෙම ලිපිය පැ.51 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු සාක්ෂියේ දී සඳහන් කළේ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගය ලැබීමට පෙර ද එනම් 2015 වර්ෂයට පෙර ද මහනුවර පාවෙන අවි ගබඩාවේ අවි ආයුධ සංසරණය සිදුවූයේ පූර්ණ නාවික හමුදා අධීක්ෂණය යටතේ බවත්, 2015 වර්ෂයෙන් පසුව ද එම තත්ත්වයෙහි කිසිදු වෙනසක් සිදු නොකර පූර්ණ නාවික හමුදා අධීක්ෂණය යටතේ එම්.වී මහනුවර නෞකාවෙහි ආයුධ සංසරණය සිදු වූ බව සඳහන් කළේය. 2015-10-20 දිනෙන් යුතුව ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහතාගේ අනුමැතිය මත ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් දිසානායක මහතා නාවික හමුදාපතිවරයා වෙත දැනුම් දී ඇත්තේ මෙම රක්නා ආරක්ෂක ලංකා සමාගම සහ ඇවන්ගාඩ් මෙරිටයිම් සමාගම අතර පවත්නා බද්ධ ගිවිසුම් ව්‍යාපාරයෙන් ඉතා විශාල ආදායමක් රටට ලැබෙන බවත්, ඒ නිසා මෙම සේවාවන් කිසියම් අවස්ථාවක නතර කරන්නේ නම් ඒ සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතු බවත්, දැනුම් දී ඇති අතර නාවික හමුදාව මෙම ක්‍රියාන්විතය සඳහා ලබාදෙන සේවය තවදුරටත් පවත්වාගෙන යන ලෙස දැනුම් දී ඇත. මෙම ලිපිය පැ.52 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

රක්නා ආරක්ෂක ලංකා සමාගම සහ ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගම අතර ඇතිකරගෙන තිබූ ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් අනුව නීත්‍යානුකූලව පවත්වාගෙන ගිය එම්.වී මහනුවර පාවෙන අවි

ගබඩාව පිළිබඳ ව්‍යාපෘතිය ඉදිරියටත් නාවික හමුදාවේ අධීක්ෂණයට යටත්ව අඛණ්ඩව පවත්වාගෙන යායුතු බවට ගාල්ල මහේස්ත්‍රාත්වරයා මෙන්ම ඉන් පසුව ආරක්ෂක ලේකම්වරයා ද නාවික හමුදාපතිවරයාට ලබාදුන් නියෝග කඩ කරමින් කොමදෝරු එන්. හීනටිගල නියෝජ්‍ය ප්‍රාදේශීය ආඥාපති, දකුණු නාවික විධානය විසින් ඇවන් ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගමේ විධායක අධ්‍යක්ෂවරයාට 2015 නොවැම්බර් 13 වැනි දින ලිපියක් යොමු කරමින් නාවික හමුදා මූලස්ථානයේ මෙහෙයවීම අනුව මහනුවර නෞකාවේ ඇති අවි ආයුධ නාවුක හමුදාවේ බාරයට ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතින බවට දැනුම්දීමක් කර ඇත. මෙම ලිපිය පැ.53 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.53 ලිපිය පරිශීලනය කිරීමේදී පැහැදිලි වන ප්‍රධාන කරුණු වන්නේ මෙම ලිපිය යොමුකිරීමේදී ආරක්ෂක ලේකම්වරයාගේ උපදෙස් හෝ අඩු තරමින් ගාල්ල මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය හෝ කිසිදු තැකීමක් සිදු නොකර එම නියෝග කඩ කරමින් සහ/හෝ පැහැර හරිමින් කොමදෝරු හීනටිගල අනිත්‍යානුකූල ලෙස හා බලයෙන් පිට ක්‍රියා කර ඇති බව මනාව පැහැදිලිවේ. පැ.53 දරණ ලිපියේ පිටපතක් ආරක්ෂක ලේකම්වරයාට යොමු නොකිරීමෙන් පැහැදිලි ලෙසම කොමදෝරු හීනටිගල අනිත්‍යානුකූල ලෙස හා බලයෙන් පිට ක්‍රියාකරන බවට ඔහු පැ.53 ලිපිය ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගමේ විධායක අධ්‍යක්ෂවරයාට යොමු කරන අවස්ථාවේදීම හොඳින් දැන සිටි බව මනාව පැහැදිලි වේ.

පැ. 53 ලිපිය ලැබීමෙන් පසුව ආරක්ෂක ලේකම්වරයා අමතා පැ.54 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද ලිපිය යවමින් එහි සඳහන්

අයුරින් ආඥාපති හීනටිගල මහතාට ක්‍රියා කිරීමට ආරක්ෂක ලේකම්වරයා උපදෙස් දුන්නේ ද යන්න විමසා ඇත. 2015 නොවැම්බර් 13 දාතමින් පැ.54 දරණ ලිපියට ආරක්ෂක ලේකම්වරයා විසින් පිළිතුරු නොසැපයීම කරණකොට ගෙන පැමිණිලිකරු විසින් නැවත වතාවක් ආරක්ෂක ලේකම් අමතා විස්තරාත්මක ලිපියක් යවමින් ඉහත පැ.53 ලිපියෙහි සඳහන් කරුණු සඳහා ආරක්ෂක ලේකම්වරයා තම අනුමැතිය ලබාදුන්නේ ද යන්නත්, එසේම යම් මාධ්‍ය වලින් ප්‍රකාශිත කරුණු එසේ ප්‍රකාශ කිරීම සඳහා ලබා දුන්නේද යන්නත් විමසා ඇත. පැ.55 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති පැමිණිලිකරුගේ එම ලිපියෙහි නෙත් එෆ්.එම් සේවය විසින් ප්‍රචාරණය කරන ලද ප්‍රවෘත්ති වාර්තාවක කොටසක් උපුටා දක්වා ඇත. එම උපුටනයේ මෙසේ සඳහන්වේ.

> (උපුටා ගැනීම) "අමාත්‍යාංශ ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහතා නෙත් නිවුස් වෙත කියා සිටියේ නාවික හමුදාව විසින් සිදු කිරීමට නියමිතව ඇත්තේ අවි ආයුධ කළමනාකරණය පමණක් බවයි" (උපුටා ගැනීම අවසන්)

එම්.වී මහනුවර නෞකාවේ කටයුතු නාවික හමුදාව විසින් පවරා ගැනීම කරණ කොටගෙන 2015 නොවැම්බර් 13 වැනි දිනම පැමිණිලිකරු විසින් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපතිවරයා වෙත පැ.56 දරණ ලිපිය මගින් දැනුම් දී ඇත්තේ දෙපාර්ශවය අතර ඇති කරගෙන ඇති ගිවිසුම් සහ පැමිණිලිකරුට විදේශීය සමාගම් වලින් ඒ වන විටත් ලැබීමට තිබූ මිලියන 750ක පමණ මුදලක් ලබාගැනීමට ඇති බවත්, මෙවැනි පවරා ගැනීමක් සිදුවුවහොත් එම මුදල තමන්ට විදේශීය සමාගම් වලින් අයකර ගැනීමට ඉතාමත්

අපහසු වන බවත්ය. එසේම මෙම හදිසි පවරා ගැනීම කරණකොටගෙන ගිවිසුම කඩ කිරීමක් සිදුවන බවටත්, එසේම 12,000 ක පමණ පිරිසකට රැකියා අහිමි වන බවටත් දැනුම් දී ඇත.

පැ. 56 ලිපිය රක්නා ආරක්ෂක ලංකා සමාගමට යැවීමෙන් පසුව එහි සභාපති වික්ටර් සමරවීර මහතා පුද්ගලිකවම දුරකථනයෙන් තමා අමතමින් මෙම ක්‍රියාව නීති විරෝධී බවත්, තමන් පෞද්ගලිකවම ඒ සඳහා සමාව ඉල්ලා සිටින බවටත් ප්‍රකාශ කළ බව පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේය. මේ අවස්ථාව වන විටත් එනම් 2019 ඔක්තෝබර් 20 වන දින එවකට අතිගරු ජනාධිපති සහ ආරක්ෂක ඇමති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රමුඛත්වයෙන් ඇවන්ගාඩ් සමාගම සහ රක්නා ආරක්ෂක ලංකා සමාගම සමග පැ.50 දරණ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබී ඇත.

කරුණු එසේ වුවත් පැ.57 සහ පැ.58 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති 2015 නොවැම්බර් 12 වැනි දින ලංකාදීප ප්‍රවෘත්ති පත්‍රයෙහි පළ වී ඇති වාර්තාවක සඳහන්ව ඇත්තේ ජනාධිපති සිරිසේන මැතිතුමාගේ නියෝගය පරිදි ඇවන්ගාඩ් සමාගම සහ රජය අතර ඇති සියලු ගිවිසුම් අවලංගු කර එහි මෙහෙයුම් සියල්ල වහාම නාවික හමුදාවට පවරා දෙන ලෙසට ජනාධිපතිවරයා නියෝග කර ඇති බව ය. එම ප්‍රවෘත්ති වාර්තාවට අනුව මෙම විශේෂ රැස්වීමට අමාත්‍ය රාජිත සේනාරත්න , අමාත්‍ය විජේදාස රාජපක්ෂ, අමාත්‍ය පාඨලී චම්පික රණවක, අමාත්‍ය අර්ජුන රණතුංග, නීතිපති, පොලිස්පති, ආරක්ෂක ලේකම්, නාවික හමුදාපති, රක්නා ලංකා ආරක්ෂක සමාගමේ නිලධාරීහු, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය වංචා විමර්ශන ඒකකයේ නිලධාරීහු සහභාගී වී ඇත.

එසේ වුවත් පැ.58 දරණ ප්‍රකාශයෙහි එම ප්‍රවෘත්ති වාර්තාවේ වැඩිදුරටත් සඳහන්ව ඇත්තේ ඇවන්ගාඩ් සම්බන්ධයෙන් සියලු ගිවිසුම් අහෝසි කොට නාවික හමුදාවට භාර දීමට ජනාධිපතිවරයා නියෝග කළ බවට කැබිනට් ප්‍රකාශක අමාත්‍ය රාජිත සේනාරත්න මහතා කරන ප්‍රකාශය ඇවන්ගාඩ් සිද්ධිය පිළිබඳ විශේෂ සාකච්ඡාවේදී කළේ නැති බවත්, තමාද එම සාකච්ඡාවට සහභාගී වූ බවත්, එවැනි කිසිදු ප්‍රකාශයක් ජනාධිපතිවරයා නොකළ බවත් අධිකරණ සහ බුද්ධශාසන අමාත්‍ය විජේදාස රාජපක්ෂ මහතා පැවසූ බව ය.

මෙම කාරණය සම්බන්ධයෙන් පුවත්පත්වල පළවූ වාර්තා වූ කිහිපයක් පැ.59, පැ.60, පැ.61සහ පැ.62 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම වාර්තා පිළිවෙලින් ලංකාදීප පුවත්පත, දිවයින පුවත්පත, රිවිර පුවත්පත සහ මව්බිම පුවත්පත යන ප්‍රවෘත්ති පත්‍ර වල පළවූ වාර්තාවන්ය. පැ.59 ලෙස ඉදිරිපත් කර ඇති 2015 නොවැම්බර් 13 වැනි දින දිනමිණ පුවත් පතේ වාර්තාවෙහි දක්වා ඇත්තේ ඇවන්ගාඩ් චූදිතයින් අත්අඩංගුවට ගැනීම අධිකරණ නියෝග මත සිදුවිය යුතු බවටත්, එසේම මාලදිවයින් ජනපති ඝාතනය හා ඇවන්ගාඩ් සම්බන්ධයක් තිබිය හැකි බවටත්, සම කැබිනට් ප්‍රකාශක වෛද්‍ය රාජිත සේනාරත්න ප්‍රකාශ කර ඇති බවය.

2015 නොවැම්බර් 13 වැනි දින දිවයින පුවත්පතෙහි අමාත්‍යවරු දෙදෙනකුගේ මාධ්‍ය සාකච්ඡා පිළිබඳ වාර්තාවන් අන්තර්ගතව ඇත. අමාත්‍ය විජේදාස රාජපක්ෂ මහතා සඳහන් කර ඇත්තේ ඇවන්ගාඩ් සමාගම සමග පැවති ගිවිසුම් අහෝසි කර මුහුදු කොල්ලකරුවන් මර්ධනය කිරීමේ කටයුතු යළි නාවික හමුදාවට පවරා ගන්නා ලෙස ජනාධිපතිවරයා තීන්දුවක් නොගත් බවත්ය. එසේ වුවත් ප්‍රවෘත්ති

වාර්තාවෙහි සඳහන් අමාත්‍ය රාජිත සේනාරත්න මහතාගේ මාධ්‍ය වාර්තාවකට අනුව සඳහන් කර ඇත්තේ කවුරු මොනවා කීවත් ඇවන්ගාඩ් සමාගම සමග කළ සියලු කටයුතු නාවික හමුදාවට පවරා අවසන් බවය.

පැ.61 වශයෙන් ඉදිරිපත් කර ඇති 2015 නොවැම්බර් 13 වැනි දින රිවිර පුවත්පතෙහි සඳහන් අමාත්‍ය රාජිත සේනාරත්න මහතා සිදු කළ ප්‍රකාශය අඩංගු වාර්තාවෙහි සඳහන් කර ඇත්තේ ඇවන්ගාඩ් නාවික හමුදාවට භාර දීම සුදුසු බව නීතිපති යෝජනා කළා යනුවෙනි.

පැ.62 වශයෙන් ඉදිරිපත් කර ඇති මව්බිම පුවත්පතෙහි පළ කර ඇති රාජිත සේනාරත්න මහතා සඳහන් කළ ප්‍රකාශයක සඳහන් කර ඇත්තේ විජේදාස කොහොමද ගෝඨාව අත්අඩංගුවට ගන්න නොගන්න එක තීරණය කරන්නේ ; මාධ්‍යයි, වෙබ් අඩවි ඇවන්ගාඩ් සල්ලි අරන් කියලා මාත් පිළිගන්නවා යනුවෙනි.

සිරස මාධ්‍ය ජාලය විසින් ප්‍රචාරණය කරනු ලබන සටන නැමැති වැඩසටහනේදී අමාත්‍ය රාජිත සේනාරත්න මහතා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ එම්.වී මහනුවර නෞකාව සම්බන්ධයෙන් සිදුකරන ලද ප්‍රකාශය අඩංගු සංයුක්ත තැටියක් වාදනය කරන ලදී. එහි සඳහන් වන අන්දමට රාජිත සේනාරත්න මහතා එම වැඩසටහනේදී සඳහන් කර ඇත්තේ ඇවන්ගාඩ් නෞකාව සම්බන්ධයෙන් පැයෙන් පැයට තමන්ට තොරතුරු සපයන ලෙසට ඩී.අයි.ජී මහතාට නියෝග කළ බවය.

ඉහත සඳහන් පුවත්පත්වල පළ වී ඇති රාජිත සේනාරත්න මහතා ප්‍රකාශ කරන ලද වාර්තාවල අඩංගු කරුණු සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන ඇති බවත්, 2015 බලයට පත්වූ

නව රජයේ ආරක්ෂක ලේකම්වරුන් වශයෙන් කටයුතු කළ බස්නායක මහතා, කරුණාසේන හෙට්ටිආරච්චි මහතා, කපිල වෛද්‍යරත්න මහතා, හේමසිරි ප්‍රනාන්දු මහතා ඉහළ ආරක්ෂක ලේකම්වරුන් වූයේ නම් අනුව නෞකාව සම්බන්ධයෙන් සඳහන් කරනු ලැබූ සියලු තත්ත්වයන් අනුමත කර ඇති බවත් පැමිණිලිකරු සඳහන් කළේය.

ගාලු වරායේ පාවෙන අවි ගබඩා ව්‍යාපෘතිය ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් බලහත්කාරයෙන් පැහැර ගැනීම හේතුවෙන් අප සමාගම වෙත මුහුදු ආරක්ෂක සමාගම් වෙතින් අයකර ගැනීමට නොහැකි වූ මුදල් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම යන ශීර්ෂය යටතේ පැමිණිලිකරු විසින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එන්.පී. පන්ඩිතරත්න මහතා අමතමින් ලියන ලද ලිපියක් පැ.63 වශයෙන්ද ඊට අමුණා ඇති ඇමුණුමක් පැ. 63(1) වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කරන ලදී. පැ.63 හි මෙසේ සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම) "යොමු ලිපියෙන් අපේක්ෂිත එම්.වී මහනුවර නෞකාවේ පවත්වාගෙන යන ලද පාවෙන අවි ගබඩා ව්‍යාපෘතිය ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්තනෝමතික ලෙස හා බලහත්කාරයෙන් පැහැර ගැනීම හේතුවෙන් ඒ වන විට ජාත්‍යන්තර මුහුදු ආරක්ෂක සමාගම් විසින් ලබාගත් සේවාවන් වෙනුවෙන් ඇවන්ගාඩ් මෙරිටයිම් සේවා සමාගම වෙත ගෙවිය යුතු ගාස්තු නොගෙවා පැහැර හරින ලද අතර එසේ අයවිය යුතු මුදල රුපියල් 379,674,028.48 වන අතර ඒ පිළිබඳ වාර්තාව ඇමුණුම් 'අ' වශයෙන් මේ සමග ඉදිරිපත් කෙරේ." ( උපුටා ගැනීම අවසන් )

පැමිණිලිකරු සඳහන් කළේ මෙම පාවෙන අවි ගබඩා ව්‍යාපෘතියට අදාළ එම්.වී මහනුවර නෞකාව අත්අඩංගුවට ගැනීමත් සමග ඔහුගේ ව්‍යාපාරය අනීතික ව්‍යාපාරයක් ලෙසට ප්‍රචාරණයක් ගෙන ගිය බැවින් තමන්ට විදේශ සමාගම් වලින් මුදල් අයකර ගැනීමට දුෂ්කරතා මතු වූ බවය. පැහැදිලි ලෙසම ආරක්ෂක අමාත්‍යාංශය විසින් උපදෙස් ලබා දී තිබියදීත්, ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් ජනාධිපතිවරයාගේ උපදෙස් මත අවබෝධතා ගිවිසුම් නැවත යථාවත් කර තිබියදීත්, තම සමාගම සමග පැවැති ගනුදෙනු අනීතික ගනුදෙනු බවට පත් කිරීම හේතුවෙන් මෙම තත්ත්වය උදා වූ බවත්, ඒ අනුව ගිවිසුම් කඩ කිරීම මත තමන්ට රජයෙන් එම මුදල අය විය යුතු බවටත් පැමිණිලිකරු සඳහන් කළේය.

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් උපදෙස් ලබා දී තිබියදීත් නාවික හමුදාව එම්.වී මහනුවර නෞකාව අත්අඩංගුවට ගෙන එම නෞකාවේ නීත්‍යානුකූලව අසුරා තිබූ රක්නා ලංකා සමාගමට අයත් රජයේ අවි ආයුධ මෙන්ම විදේශීය සමාගම් වලට අයත් අවි ආයුධ නාවික හමුදා භාරයට ගැනීමට මූලිකව ක්‍රියා කරන ලද්දේ එවකට නාවුක හමුදාපති අද්මිරාල් රවින්ද්‍ර විජේගුණරත්න, කොමදෝරු වැත්තැව,කොමදෝරු හීනටිගල යන නිලධාරීන් විසින් බවත්ය. පැමිණිලිකරුගේ පාවෙන අවි ව්‍යාපෘතිය අත්පත් කරගන්නා බවට පැ.53 දරණ ලිපිය අත්සන් කර එවා ඇත්තේ කොමදෝරු හීනටිගල මහතා විසිනි.

පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළ අන්දමට එම්.වී මහනුවර නෞකාව අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පවත්වනු ලැබූ මාධ්‍ය සාකච්ඡාවක දී රාජිත සේනාරත්න මහතා සහ එවකට හමුදාපති රවීන්ද්‍ර විජේගුණරත්න මහතා සම්බන්ධව කළ ප්‍රකාශ මත

පැමිණිලිකරු ඝාතනය කිරීම සඳහා හමුදාපතිවරයාගේ ආරක්ෂකයින් දෙදෙනෙකු තමාගේ නිවසට 2015 දෙසැම්බර් 31 වන දින එවන ලද බවත්, තමාගේ සීසීටීවී කැමරා වල දර්ශන පටිගත වී ඇති බවත්, කෙසේ හෝ තමාගේ ආරක්ෂක නිලධාරීන් හේතු කොටගෙන ඝාතනය වැළකී ගිය බවත්, මේ සම්බන්ධයෙන් තමා පොලිස් ස්ථානයට සිදු කළ පැමිණිල්ල අද වනපෙත් විභාග කර නොමැති බව ඔහු සඳහන් කළේය. එකී පැමිණිල්ල විභාග කරන ලෙස 2020-02-13 වෙනි දින නැවත වතාවක් පොලිස්පතිවරයාට දැනුම් දී ඇති බව සඳහන් කළ පැමිණිලිකරු එම දැනුම් දීමේ ලිපිය පැ.64 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කළේය.

මේ සම්බන්ධයෙන් පොලිස්පතිවරයා විසින් ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අමතා පරීක්ෂණ වල ප්‍රගතිය සොයා බැලීමට දැනුම් දෙන ලද ලිපිය පැ.65 වශයෙන්ද සලකුණු කර ඇත.

මේ පිළිබඳව ඇවන්ගාඩ් මෙරිටයිම් සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂ විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවට සිදු කළ ඉල්ලීම පැ. 66 වශයෙන්ද, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඒ සඳහා එවන ලද පිළිතුර පැ.67 වශයෙන් ද ඉදිරිපත් කර ඇත. එසේම මිරිහාන පොලිස් ස්ථානයට සිදු කළ පැමිණිල්ලේ පිටපත පැ.68 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එම්.වී මහනුවර නැමැති පාවෙන අවි ගබඩාව සම්බන්ධයෙන් පැමිණිලිකරුගේ සාක්ෂිය සලකා බැලීමේදී පැහැදිලිව කියන්නේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද ප්‍රකාශිත උපදෙස් වලට පටහැනිව නාවික හමුදාව ක්‍රියා කර ඇති බවත්, එකී ප්‍රකාශිත උපදෙස් වලට පටහැනිව විශේෂයෙන්ම මහේස්ත්‍රාත් අධිකරණයේ

මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය ද, ආරක්ෂක ලේකම්වරයා විසින් ලබාදී තිබූ නියෝග වලට පටහැනිව පැමිණිලිකරු විසින් ගාලු වරාය ආසන්නයේ ආරක්ෂක අමාත්‍යාංශයේ පැහැදිලි උපදෙස් ඇතිව නිත්‍යානුකූල ගිවිසුම් මත රක්නා ලංකා ආරක්ෂක සමාගම සමග පවත්වාගෙන ගිය එම්.වී මහනුවර නැමැති පාවෙන අවි ගබඩාව හා එහි ව්‍යාපාරික කටයුතු අත්තනෝමතික ලෙස සහ ද්වේශසහගත ලෙස නීතිවිරෝධීව බලාත්කාරයෙන් නාවික හමුදා විසින් පවරා ගෙන ඇති බවයි.

2015 වර්ෂයේ දී අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සඳහා පැමිණිලිකරු කැඳවා ඇත. ප්‍රධාන පොලිස් පරීක්ෂක මල්ලිකාරච්චි මහතා සහ පොලිස් පරීක්ෂක පිලපිටිය මහතා යන දෙදෙනා විසින් මෙම පරීක්ෂණය මෙහෙයවා ඇත. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත දින ගණනාවක් පැමිණිලිකරු කැඳවා ඇත. පැමිණිලිකරු සඳහන් කළේ දින ගණනාවක පරීක්ෂණයකින් පසුව පැමිණිලිකරු මුදාහරින ලද බවත්, අවශ්‍ය වුවහොත් නැවත දැනුම් දෙන බවටත්, දැනට ප්‍රශ්නයක් නොමැති බවටත්, මෙය නීත්‍යානුකූල ව්‍යාපාරයක් බවටත් පොලිස් නිලධාරීන් සඳහන් කළ බවය.

මාස 6 කට පමණ පසුව අමාත්‍ය රාජිත සේනාරත්න මහතා මේ පිළිබඳව එක දිගට කතා කළ බවත්, ඒ අනුව නැවත වතාවක් පැමිණිලිකරුව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත කැඳවා නැවත පරීක්ෂණයක් වෙනත් නිලධාරීන් මගින් ආරම්භ කර ඇත. එම දෙවන පොලිස් පරීක්ෂණය IP ලියනගේ සහ SI වික්‍රමආරච්චි යන පොලිස් නිලධාරීන් දෙදෙනා විසින් සිදුකර ඇත.

මෙම පොලිස් නිලධාරීන් දෙදෙනා ඔහුගේ ගිණුම් වාර්තා සියල්ල ගෙන්වා ගනිමින් එවකට ජනාධිපතිවරයාව සිටි මහින්ද රාජපක්ෂ මැතිතුමාට මහතා සහ ඔහුගේ පවුලේ අයට හෝ එවකට ආරක්ෂක ලේකම්ව සිටි ගෝඨාභය රාජපක්ෂ මහතාට මුදල් ලබාදී ඇත්ද යන්න එක දිගටම ප්‍රශ්න කළ බව සඳහන් කළ පැමිණිලිකරු එම සෑම අවස්ථාවකදීම තමන් සත්‍ය ප්‍රකාශ කරමින් එවැනි කිසිදු මුදලක් එවකට ජනාධිපති තුමාට හෝ ආරක්ෂක ලේකම්තුමාට නොදුන් බවට සඳහන් කළ බව ප්‍රකාශ කළේය. ගෝනියක දමා රුපියල් මිලියන දෙසියක මුදලක් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට ලබාදුන් බවට ප්‍රකාශ කරන ලෙසටත්, එවැනි ප්‍රකාශයක් ලබා දුනහොත් පැමිණිලිකරුට එරෙහිව ඇති සියලු නඩු කටයුතු වලින් ඔහු නිදහස් කරන බවට මෙම පොලිස් නිලධාරීන් පැමිණිලිකරුට පවසා ඇත. තමන්ට මේ අයුරින් දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙන ලෙසට බල කල නිලධාරියා අල්ලස් හා දූෂණය විමර්ශන කොමිෂන් සභාවේ පුෂ්පකුමාර යනුවෙන් හඳුන්වනු ලැබූ පොලිස් පරීක්ෂකවරයෙක් බවත්, ඔහු තමන්ට ප්‍රකාශ කර සිටියේ ඔහුට කළ හැකි දෙයක් නොමැති බවත්, ඉහළින් පැමිණි නියෝග අනුව තමන් ක්‍රියා කරන බවත්, තමන්ට මෙය ප්‍රකාශ කළේ දිල්රුක්ෂි මැඩම් බවත්, පොලිස් නිලධාරියා පැමිණිලිකරුට පවසා ඇත. පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කළේ ඒ හේතුව මත අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ එවකට අධ්‍යක්ෂ ජනරාල් දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මිය තමන්ට දුරකථනයෙන් කථා කළ බවය.

පැමිණිලිකරුගේ ගණකාධිකාරිවරුන් වන චන්න ජයශාන්ත සහ ප්‍රසාද් යන නිලධාරීන් දෙදෙනා ගිණුම් පොත් රැගෙන අවස්ථා

ගණනාවකදීම අල්ලස් හා දූෂණ පිළිබඳ සොයා බලන විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි බව ද සඳහන් කළේය.

2019 වර්ෂයේ ජනවාරි හෝ පෙබරවාරි දෙවැනි දින, දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය ද තමන්ට දේශපාලන බලපෑම් ඇති බවට තමන්ට දුරකථන ඇමතුමක් ලබා දෙමින් ප්‍රකාශ කළ බවත්, තමන් එම දුරකථන සංවාදය පටිගත කර එය යම් අවස්ථාවකදී අන්තර්ජාලයට ද මුදාහැරිය බවත්, දැන් තමන්ට එම හඬ පටය, සංවාදය ඇතුළත් සංයුක්ත තැටියක් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර එය වාදනය කර ඇසීමට සැලැස්විය හැකි බවත් සඳහන් කළේය. ඒ අනුව මෙම සංයුක්ත තැටිය වාදනය කරන ලද අතර එම සංයුක්ත තැටිය ද පැ. 68 (අ) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

මෙම අවස්ථාව වන විට පැමිණිලිකරුට එරෙහිව චෝදනා පත්‍රයක් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් දිල්රුක්ෂි වික්‍රමසිංහ විසින් විසින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර තිබී ඇත.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවේ චෝදනා වල පිටපතක් පැ.69 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී .

පැ.60 නම් චෝදනා පත්‍රයෙහි චූදිතයින් අට දෙනෙකු නම් කර ඇත. මෙම නඩුවේ පළවන චූදිත ලෙසට එවකට ආරක්ෂක ලේකම් වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් නම් කර ඇති අතර දෙවන චූදිත ලෙසට එවකට අතිරේක ආරක්ෂක ලේකම් ජයරත්න මහත්මිය නම් කර තිබේ. තුන්වන චූදිත ලෙසට රක්නා

ආරක්ෂක ලංකා සමාගමේ සභාපති මේජර් ජනරාල් පාලිත පියසිරි ප්‍රනාන්දු මහතා නම් කර තිබේ. හතරවන චූදිත ලෙසට රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී කරුණාරත්න බණ්ඩා අධිකාරි එගොඩවෙල මහතා නම් කර ඇත. පස්වන චූදිත ලෙසට එවකට නාවික හමුදාපතිව සිටි විජේසිංහ ආරච්චිලාගේ සෝමතිලක දිසානායක නම් කර ඇත. හයවන චූදිත ලෙසට පැමිණිලිකරු ද හත්වන සහ අටවන චූදිතයින් ලෙසට හිටපු නාවික හමුදාපතිවරුන් දෙදෙනකු ද නම් කර ඇත. මෙම නඩුව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබූ මූලික විරෝධතාවය පිළිබඳව සිදු කරනු ලැබූ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කළ ප්‍රතිශෝධන අයදුම්පත්‍රයක් අභියාචනාධිකරණය ඉදිරියේ විමසීමට ගැනීමෙන් පසුව මෙම සියලුම චූදිතයින් උක්ත සඳහන් නඩුවෙන් නිදොස් කොට නිදහස් කර ඇත.

එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇතුළු තවත් හත් දෙනෙකුට එරෙහිව දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය විසින් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස පෙනී සිටිමින් ඉහත සඳහන් නඩුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරණු ලබන්නේ එවකට නීතිපති යුවන්ජන් විජයතිලක මහතා විසින් ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට එරෙහිව නඩු පැවරීමට තරම් කරුණු කිසිවක් හෙළිදරව් වී නොමැති බවට නීතිපතිවරයාගේ මතය ප්‍රකාශ කරමින් තිබුණු අවස්ථාවකදීය. නීතිපතිවරයා විසින් එලෙස මත ප්‍රකාශ කර තිබියදී අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇතුළු විත්තිකරුවන්ට එරෙහිව

මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට පියවර ගැනීම මුළුමනින්ම පුදුම සහගත කරුණකි. පසු අවස්ථාවක දී ඇය තමා කළ වරදේ බරපතලකම තේරුම් ගෙන පාපොච්චාරණයක් සිදු කරන්නේ තමා කළ පාප කර්මයෙන් ගැලවීමටය. නීතිපතිවරයාගේ මතය අභිබවා යමින් ද්වේශ සහගත අයුරින් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය ක්‍රියාකිරීම බරපතල වරදකි. මෙම නඩුවට පාදක වී ඇති එම්.වී මහනුවර පාවෙන අවි ගබඩාව පිළිබඳ ව්‍යාපෘතියේ කිසිදු ස්ථානයක වරදක සේයාවක්වත් දක්නට නොමැති අවස්ථාවක දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ පැමිණිලිකරු ඇතුළු නාවික හමුදාපතිවරුන් සහ අතිරේක ලේකම්වරියට නඩු පැවරීමට තීරණය කර ඇත්තේ පැහැදිලි ලෙසම දේශපාලන හිතවතුන් සමග සිදුකළ කුමන්ත්‍රණයක ප්‍රතිඵල හෙළි දැක්වීම උදෙසා බව නඩුවේ සාක්ෂි සම්පිණ්ඩනය කිරීමේදී පැහැදිලිව පෙනී යයි.

මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති උක්ත සඳහන් නඩුවට අමතරව කොළඹ මහාධිකරණය ඉදිරියේ දී ද අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සරත් ජයමාන්න මහතා විසින් අධි චෝදනා පත්‍ර ගොනු කර ඇත. එම අධිචෝදනා පත්‍රයේ පිටපතක් පැ.70 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම නඩුවේ පළමුවන චූදිත ලෙසට රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති වඩුගේ පී. පාලිත පියසිරි ප්‍රනාන්දු මහතාද, දෙවන චූදිත ලෙසට පැමිණිලිකරු ද නම් කර ඇත.

මෙම අධිචෝදනා පත්‍රය චෝදනා 47 කින් සමන්විත වෙයි.

2017 වර්ෂයේ අවසාන භාගය වන විට පැමිණිලිකරු ආරම්භ කළ ව්‍යාපාරය සමග ව්‍යාපෘති හතක් අලුතෙන් හඳුන්වා දී ඇත. ඉන් එක් ව්‍යාපාරයක් ලෙසට නයිජීරියානු රජයේ ත්‍රිවිධ හමුදාව පුහුණු කිරීමත්, එසේම නයිජීරියානු කලාපයේ මුහුදු කොල්ලකරුවන් සමග සටන් කිරීමත් ඇතුලත්ව තිබී ඇත. පැමිණිලිකරු සඳහන් කළ අන්දමටට නයිජීරියානු ව්‍යාපෘතිය ලබාගැනීම සඳහා ඔහු මිලියන 310 ක පමණ වියදමක් දරා ඇත.

මෙම නයිජීරියානු ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා විදේශගත වීමට තමා සඳහන් කළ දේශපාලනඥයින් හතර දෙනා ඉඩ නොදුන් බවත්, එසේ වුවත් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආරක්ෂක ලේකම් බස්නායක මහතා විසින් තමන්ට විදේශගත වීම සඳහා අවශ්‍ය ගුවන් ටිකට්පත් ලබා ගැනීම සඳහා ලිපියක් නිකුත් කළ බවත් පැමිණිලිකරු සඳහන් කළේය. මෙම ලිපිය පැ. 71 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ. 71 ලිපියෙහි සඳහන් අනෙකුත් දේ අතර දෙවැනි පිටුවේ අවසන් ඡේද තුනෙහි මෙසේ සඳහන් කර ඇත.

> (උපුටා ගැනීම )"මෙලෙස මුහුදු ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් වානිජ මෙහෙයුම් නිසියාකාරව ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකා රජයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ හමුදාවන් සමුද්‍රීය ආරක්ෂාව සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රවීණතාවය ගල්ෆ් කලාපයේ සමුද්‍ර ආරක්ෂාව සඳහා යොදා ගැනීම තුළින් ඉදිරි වසර 05 ක කාලය තුළ රැකියා අවස්ථා 25,000 ක් ඇති කිරීමටත්, විදේශ විනිමය ඇමරිකානු ඩොලර් මිලියන 1000 දක්වා ඉහළ නැංවීමටත්ය. මේ සඳහා විශ්‍රාමලත්

හමුදා හටයින් යොදා ගැනීම තුළින් ඔවුන් ස්ථාවර ආදායම් මාර්ගයක් ඇති කිරීම සහ ඒ තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය සවිබල ගැන්වීම සිදු කිරීමත් රජයේ අපේක්ෂාව වේ.

මේ අනුව මුහුදු ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් නයිජීරියානු නාවික හමුදා ප්‍රධානීන් සහ ඇවන්ඩ්ගාර්ඩ් සමුද්‍රීය සේවා (පුද්ගලික) සමාගම අතර එළඹ ඇති ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සහ එහි සාර්ථකත්වය සඳහා ඇවන්ඩ්ගාර්ඩ් සමුද්‍රීය සේවා (පුද්ගලික) සමාගමේ බලධාරින් නයිජීරියානු රජයේ නාවික හමුදා බලධාරීන් සමග නිරන්තරයෙන්ම සාකච්ජා පැවැත්වීම අත්‍යවශ්‍ය වී ඇත. දෙරට අතර ඇතිවූ අවබෝධතා ගිවිසුම් සහ පසුව සිදුවූ රාජ්‍යතාන්ත්‍රික සාකච්ජාවන් හේතුවෙන් ඉහත සඳහන් ගිවිසුම් කඩිනමින් ක්‍රියාත්මක කිරිම රක්නා ලංකා ආරක්ෂක සමාගම සහ ඒකාබද්ධ ගිවිසුමකට එළඹ ඇති ඇවන්ඩාගාර්ඩ් සමුද්‍රීය සේවා (පුද්ගලික) සමාගමේ පූර්ණ වගකීම වේ.

එබැවින් ඇවන්ඩ්ගාර්ඩ් සමුද්‍රීය සේවා ආරක්ෂක (පුද්ගලික) සමාගමේ සභාපති වන යාපා හෙට්ටි පතිරන්නැහැලාගේ නිශ්ශංක යාපා සේනාධිපති මහතාට අවශ්‍ය වන අවස්ථා වලදී නයිජීරියානු නාවික බලධාරීන් සමග මුහුදු ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් ඇති කර ගත් ගිවිසුම් ප්‍රකාරව වානිජ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නයිජීරියාව බලා විදේශ ගත වීමට අවස්ථාව ලබා දිය යුතු බව නිරීක්ෂණය කරමි.” (උපුටා ගැනීම අවසන්)

පැමිණිලිකරු සඳහන් කළ අන්දමට අමාත්‍ය රාජිත සේනාරත්න මහතා පැමිණිලිකරුට පහර ගැසීම සඳහා සිදුකරනු ලැබූ විවිධ අසත්‍ය චෝදනා අතර පැමිණිලිකරු විසින් බොකෝහරාම් නැමැති නයිජීරියානු ත්‍රස්තවාදීන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ආයුධ සපයන බවට සිදුකළ අසත්‍ය චෝදනාවක් කරණ කොටගෙන නයිජීරියානු තානාපති කාර්යාලය ඒ පිළිබඳව කලකිරී ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයට යොමු කරන ලද ලිපියකින් අමාත්‍ය රාජිත සේනාරත්න මහතාගේ ප්‍රකාශයන් දැඩි විවේචනයට ලක් කර ඇත. නයිජීරියානු තානාපති කාර්යාලය නිකුත් කළ එම නිවේදනයේ පැ.72 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.72 ලිපියෙහි මෙසේ සඳහන් වේ.

(උපුටා ගැනීම)

" NOTE NO: NG/GOL/14/20152

The High Commission of the Federal Republic of Nigeria presents its compliments to the Ministry of External Affairs of the Democratic Socialist Republic by the Minister of Health and Cabinet spokesperson Dr. Rajitha Senaratne as reported by Ceylon Today of 04th April, 2015, page A2, that Avante Guard Maritime Security Services may have supplied weapons to the terrorist group Boko Haram in Nigeria. The High Commission wish to point out that Avante Guard has received contract to supply to Nigerian Government some Sri Lankan made fast interceptor patrol boats to be used by the Nigerian Navy which are yet to be supplied. The Minister's comment that Avante

Guard closely worked with Nigerian Government is unfortunate because it suggests that Nigerian Government supply weapons to the terrorist group Boko Haram. Besides, if the Cabinet, as suggested by the spokesperson has taken a decision to probe the dealing of Avante guard, why is it that nothing was said about its dealings in the Arabian seas and the wider Middle East, if the purposc is not to embarrass Nigeria and its people, where it had been operating since the company was created. Avante Guard is only trying to enter the Nigerian Market now, where it is getting the listening ears of the government because of the subsisting cordial relationship between the two countries which is being jeopardized by such unguarded utterances of a senior government official.

Avante Guard activities with Nigeria has not been in the hidden as both the Sri Lankan Ministry of Defence, External Affairs and the Sri Lankan High Commission in Nigeria are seized with the development, and officials of both countries have exchanged visits. The Mission wishes to further note that since the issue of the Avante Guard probe surfaced no Sri Lankan government institution had contacted the Mission or the Nigerian government on the matter, but rather an embarrassing statement was issued in this manner. This is not the king of treatment expected from a friendly country to another. The High Commission of the Federal Republic of Nigeria views the

statement as deliberate and an attempt to embarrass the Nigeria cannot be fighting the insurgents and at the same time supply arms to its adversary to further traumatise its population. The government of the federal Republic of Nigeria takes exception to this embarrassing allegation and attempt to create confusion within Nigeria. Consequently, that High Commission of the Federal Republic of Nigeria in Colombo protests in Strong terms the allegation that since Avante Guard has close dealings with the Nigerian government, it may be possible that it supplies arms to Boko Haram.

The High Commission of the Federal Republic of Nigeria would therefore appreciate and in view of the existing cordial relations that subsist between the two countries request further explanation from the Sri Lankan government on this matter.

The High Commission of the Federal Republic of Nigeria avails itself of the opportunity to reaffirm to the Ministry of External Affairs of the Democratic Socialist Republic of Sri Lankan the assurances of its highest consideration.

Ministry External Affairs
Colombo,
Sri Lanka

Colombo 4th April, 2015

(උපුටා ගැනීම අවසන්)

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් බී.එම්.ඩී. බස්නායක මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති අමතා 2015.03.08 වැනි දින යවන ලද පැ.71 ලිපියේ දෙවන ඡේදයෙහි මෙම නයිජීරියානු ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නයිජීරියානු රජය සමග සාකච්ඡා කිරීම සඳහා සහභාගිවූ පැමිණිලිකරු ඇතුළු රාජ්‍ය දූත මණ්ඩල පිරිස පිළිබඳව සඳහන් කර ඇත.

(උපුටා ගැනීම)“මෙම දෙරට අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම පදනම් කරගෙන, ඒකාබද්ධ සමුද්‍රීය සහයෝගිතාවය පිළිබඳ වැඩිදුරටත්, අධ්‍යනය කර සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ පහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් 2014 ජූනි මස නයිජීරියානු රජයේ සංචාරය කර ඇත. එම නිලධාරී කණ්ඩායමට ශ්‍රී ලංකා රජයේ වැඩ බලන විදේශ කටයුතු ඇමති, හිටපු ජානධිපතිතුමාගේ මුහුදු ආරක්ෂක උපදේශක, ආරක්ෂ අමාත්‍යාංයේ අතිරේක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි, යුධ හමුදාපති, නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානි, රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී, හමුදා සම්බන්ධීකාරක නිලධාරි, රක්නා ලංකා ආරක්ෂක සමාගමේ ප්‍රධානි සමඟ ඇවන්ඩ්ගාර්ඩ් සමුද්‍රීය ආරක්ෂක සේවා (පුද්) සමාගමේ සභාපති ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගි වී ඇත. මේ සඳහා ඇවන්ඩ්ගාර්ඩ් සමුද්‍රීය සේවා (පුද්ගලික) සමාගම සහභාගි වී ඇත්තේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් වූ රක්නා ලංකා ආරක්ෂක සමාගම සහ ඇවන්ඩ්ගාර්ඩ් සමුද්‍රීය සේවා (පුද්ගලික) සමාගම සමග ඇති වී තිබෙන ඒකාබද්ධ වානිජ ගිවිසුම අනුව (joint

venture) නයිජීරියානු රජය සමග සමුද්‍රීය ආරක්ෂක කටයුතු පිළිබඳ අවශ්‍ය තාක්ෂණික තොරතුරු හුවමාරු කර ගැනීම, ඒ සඳහා අවශ්‍ය වාර්තාවන් සකස් කිරීම සහ වානිජ මෙහෙයුම් සිදුකිරීම සඳහා අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනීමට බව අදාල තොරතුරු විශ්ලේෂණයේ දී අනාවරණය විය.(උපුටා ගැනීම අවසන්)

නයිජීරියානු රාජ්‍ය සංචාරයේදී රාජ්‍ය බලධාරීන් මූණ ගැසීම සහ ඔවුන් සමග සිදුකරන ලැබූ සාකච්ඡා විදහා දැක්වෙන ඡායාරූප සමූහයක් පැ. 73, 73(I), 73(II), 73(III), 73(IV), 73(V), 73(VI), 73(VII) සහ 73(VIII) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

අමාත්‍ය රාජිත සේනාරත්න මහතා බොකෝහරාම් ත්‍රස්තවාදී ව්‍යාපාරය පිළිබඳව හා ඊට ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විස් සමාගම සයෝග්ය දක්වන බවට සිදුකළ ප්‍රකාශය දැක්වෙන වීඩියෝ පටය ඇතුළත් සංයුක්ත තැටිය පැ.74 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

නයිජීරියාව සමඟ සිදු කළ සාකච්ඡා වලින් ශ්‍රී ලංකා රජය ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සටන් කළ ආකාරය පිළිබඳව සතුට පත් නයිජීරියානු රජය ශ්‍රී ලංකා හමුදා ත්‍රස්තවාදීන් සමග සටන් කළ ආකාරය පිළිබඳව පුහුණුවක් නයිජීරියාව හමුදාවන්ට ලබාදීම සඳහා අවශ්‍ය ගිවිසුම් වලට එළඹීමටත්, එසේම ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත වේග යාත්‍රා මිලදී ගැනීමටත් එකගව සිට ඇත. මෙම කර්තව්‍ය සඳහා පැමිණිලිකරු රුසියානු රජය සමඟත් ඉන්දියානු රෝ ඔත්තු සේවය සමඟත් ඇමරිකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තුව සමඟත් සාකච්ඡා පවත්වා අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කර ඇත. යුරෝපීය රටවල් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ දී ශ්‍රී ලංකාවට එරෙහිව සිදු කිරීමට

අපේක්ෂිතව තිබූ විවිධ ක්‍රියාකාරකම් පරාජය කිරීම සඳහා අවශ්‍ය ඡන්ද ප්‍රමාණය ලබා ගැනීම සඳහා නයිජීරියානු රජය ප්‍රමුඛ අප්‍රිකානු මහද්වීපයේ පිහිටා තිබූ රටවල් 52 ක ඡන්ද ප්‍රමාණයක් ලංකාවට පක්ෂව ලබා ගැනීමට තිබූ හැකියාවක් මෙම ව්‍යාපෘතිය කඩාකප්පල් කිරීම තුලින් අහිමිව ගිය බව පැමිණිලිකරු තම සාක්ෂියේදී සඳහන් කළේය.

නයිජීරියානු සංචාරයේ දී සාකච්ඡා කරන ලද කරුණු හා විෂයන් පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කරමින් මාණ්ඩලික ප්‍රධානි රියාර් අද්මිරාල් SAMJ පෙරේරා විසින් 2014 ජුනි 24 වැනි දින යවන ලද ලිපිය පැ.75 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. පැ.75 ලිපියට අනුව නයිජීරියානු රජය සමග පහත සඳහන් කරුණු සාකච්ඡා කර ඇත. එනම්;

1. රාජ්‍ය දෙකේ නාවික හමුදාව අතර ඒකාබද්ධ ආරක්ෂක සේවාවක් ක්‍රියාත්මක කිරීම.

2. හදිසි ප්‍රහාරවල යෙදෙන කුඩා කණ්ඩායම් නවීන තාක්ෂණික අවි සහිත ජාතික හමුදාවක් සමඟ කරන යුද්ධ පිළිබඳව දැනුම සහ අත්දැකීම බෙදා ගැනීම,

3. නයිජීරියාව මුහුදේ සිදු කෙරෙන හදිසි ප්‍රහාර වල යෙදෙන කුඩා කණ්ඩායම් නවීන තාක්ෂණික අවි සහිත ජාතික හමුදාවක් සමග කරන යුද්ධවලදී ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන බෝට්ටු පාවිච්චි කිරීම,

4. හුවමාරු කිරීමේ පදනම මත නාවික පුහුණුව ලබාගැනීම ,

මෙම ව්‍යාපෘතිය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා උත්සාහ දැරුවද අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය පාඨලී චම්පික රණවක, අමාත්‍ය අර්ජුන රණතුංග සහ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක යන මහත්වරුන් මැදිහත්වී මෙම අගනා ව්‍යාපෘතිය නවතා දැමීමට ක්‍රියා කර ඇත.

ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගමේ මූලිකත්වයෙන් සිදු කෙරුණු මෙම මෙම ව්‍යාපෘතීන්ට එරෙහිව සිදු කෙරුණු බරපතළ හානිදායක කටයුතු සහ එසේම පැමිණිලිකරුට එරෙහිව විවිධාකාර විමර්ශන සහ නඩු පැවරීම් කරණ කොටගෙන, ඒ සම්බන්ධයෙන් කරුණු කියා පෑම සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එතුමාගේ නිල නිවසේ දී හමුවී ඇත. මෙම සාකච්ඡාවේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පැමිණිලිකරු අමතා පැවසූ කරුණු පැමිණිලිකරු තම සාක්ෂියෙදී මෙසේ සඳහන් කර ඇත.

(උපුටා ගැනීම; 2020.06.01 දින සාක්ෂි සටහන් 64, 65 පිටු)

"මේ අවස්ථාවේ දී ඇවන්ගාඩ් ආයතනයේ මාගේ නිලධාරී මහත්වරු 4 දෙනෙක් ඉස්සෙල්ලා සඳහන් කළා නාවික හමුදාපති හමුදාපතිවරයා සහ ගරු ලේකම්වරයා ඉදිරිපිට දී එතුමා මෙසේ පවසා සිටියා සාක්ෂි සහිතව මට ඔප්පු කළ හැක. එතුමාද කැඳවිය හැකි නම් එතුමා ගෙන් අසා දැන ගත හැක. නිස්සංක මහත්මයා මේ රටේ ජනාධිපති වරයා හැටියට මම ඔබතුමාගෙන් පෞද්ගලික සමාව ඉල්ලා සිටිනවා. ඔබතුමා ලෝකය පිළිගත් පුද්ගලයෙක්. අපේ රටේ මේ කාලකන්නි සමාවෙන්න ස්වාමීනි ඔහුගේ වචනයෙන් දේශපාලනඥයෝ

මාව බිත්තියට හේත්තු කළා. මට කළ හැකි කිසිවක් තිබුණේ නැහැ. එම නිසා මම ඔබතුමාගෙන් නැවත වතාවක් පෞද්ගලික සමාව ඉල්ලා සිටින බව පැවසුවා. මේ අවස්ථාවේදී ගරු ස්වාමීනි විශේෂ දෙයක් සිදු වූනා. ඒ තමයි මම ගරු ජනාධිපති වරයාට පවසා සිටියා නාවික හමුදාව මෙම ව්‍යාපාරය මාගෙන් ලබා ගත් පසු එදින දින දක්වා රජයට කළ පාඩුව රුපියල් මිලියන7800 ක් බව. මම ලිඛිත දේශන වලින් ඔප්පු කළ බව. මේ අවස්ථාවේදී ජනාධිපතිවරයා ඒ ගැන නාවික හමුදාපතිවරයාගෙන් විමසා සිටින අවස්ථාවේදී. මම ගරු ජනාධිපතිවරයාට පැවසුවා ස්වාමීනි. මම නාවික හමුදාවෙන් මෙම ව්‍යාපාරය භාර ගන්නා අවස්ථාවේදී ඔවුන් එක් මෙහෙයුමක් සඳහා අය කරනු ලැබුයේ ඩොලර් 1000 ප්‍රමාණයක් පමණයි. " (උපුටා ගැනීම අවසන්)

ජනාධිපතිතුමා සමඟ සිදුවූ මෙම හමුවේ දී පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ නාවික හමුදාව එක් මෙහෙයුමක් සඳහා අයකර ඇති මුදල $1000 වන බවත්, ඒ අනුව මෙම ව්‍යාපෘතිය නාවික හමුදාව විසින් සිදුකරගෙන ගිය අවුරුදු තුනයි මාස 36ක කාලය තුළ නාවික හමුදාව ලංකා ආණ්ඩුවට ලබා දුන් මුදල රුපියල් මිලියන 1800 ක් බවත්, ඒ බව එවකට නාවික හමුදාපති රවීන්ද්‍ර විජේගුණරත්න මහතා එවකට පත්කර තිබූ ජනාධිපති කොමිෂන් සභාවට ඉදිරිපත් කළ ලිපියකින් පිළිගෙන ඇති බවත් ජනාධිපතිතුමාට පවසා ඇත. එසේම තමන් මෙම ව්‍යාපෘතිය භාර ගැනීමෙන් පසුව ලංකා රජයට රුපියල් මිලියන 11700 ඉතිරි කර දී ඇති බවද පැමිණිලිකරු ජනාධිපතිවරයාට පවසා ඇත. පැමිණිලිකරු අය කළ මුදලට වඩා අඩු මුදලක් නාවික හමුදාව අය කිරීම තුළින් ශ්‍රී ලංකා රජයට මුදල් රුපියල් මිලියන 7700

ක් අහිමි වී ඇති බව පැමිණිලිකරු ජනාධිපතිවරයාට පවසා ඇති අතර ඒ අනුව ජනාධිපතිවරයා විසින් මේ පිළිබඳව සොයා බැලීම සඳහා කමිටුවක් පත් කරන ලෙසට ජනාධිපති ලේකම්වරයාට උපදෙස් දී ඇත.

ඒ අනුව මෙම තත්ත්වය සොයා බැලීම සඳහා ජනාධිපති ලේකම් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව හමුවේ මෙම කරුණට අදාළව ඇති ලේඛන ඉදිරිපත් කරන ලෙසට පැමිණිලිකරුට ජනාධිපති අතිරේක ලේකම් රෝහණ අභයරත්න විසින් 2019 .07.01 දින ලිපියෙන් පැමිණිලිකරුට දැනුම් දී ඇත. මෙම ලිපිය පැ.76 වශයෙන් ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු අසනීපව සිංගප්පූරු රෝහලක ශල්‍යකර්ම වලට භාජනය වී සිටි බැවින් අදාල දිනයේදී පැමිණිලිකරුට මෙම කමිටුව ඉදිරියේ අදාල ලේඛණ ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති අතර ඒ සඳහා වෙනත් දිනයක් ඔහුට ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත. කොමාන්ඩෝ රෙජිමේන්තුවේ සිදුකෙරෙන බාධක තරණය නැමැති පාඨමාලාව හැදෑරීමේදී පැමිණිලිකරු අඩි 30 ක උසකින් බිමට වැටී ඔහු බරපතල ලෙස තුවාල ලබා ඇත. වෛද්‍ය නිර්දේශ අනුව එම තුවාලවලට දීර්ඝකාලීන ප්‍රතිකාර වල්ට ඇතුළුවීමට පැමිණිලිකරුට සිදුව තිබී ඇත. ඔහුගේ ශාරීරික තත්ත්වය යථා පරිදි ගෙන ඒම සඳහා ශල්‍යකර්ම කීපයක් සිදු කිරීමට ද නියමිතව තිබී ඇත. මෙම ශල්‍යකර්ම ශ්‍රී ලංකාවේ සිදු කිරීමට නොහැකි බවට වෛද්‍යවරුන් නිර්දේශ කිරීම කරණ කොටගෙන එම ශල්‍යකර්ම සිදු කරවා ගැනීම සඳහා පැමිණිලිකරුට සිංගප්පූරු රෝහලකට ඇතුළත් වීමට සිදු ව තිබී ඇත. වෛද්‍ය නිර්දේශ අනුව එම ශල්‍යකර්ම සිදුකර අදාල තුවාල සුව කර

නොගතහොත් පැමිණිලිකරු අංශභාග තත්ත්වයට පත්වන බව ද වෛද්‍යවරුන් ප්‍රකාශ කර ඇත. ඒ හේතුවෙන් 2019 ජූලි මාසයේ දී ඉහත සඳහන් කමිටුව ඉදිරියේ පෙනී සිට අදාල ලේඛණ ඉදිරිපත් කිරීමට පැමිණිලිකරු අසමත් වී ඇත.

එම්.වී ඇවන්ගාඩ් නෞකාවට අවි ආයුධ මාරු කිරීම සම්බන්ධ ඡායාරූප කීපයක් පැ. 86 සහ පැ. 87 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අවසරය ලැබී ඇත. (පැ. 88, පැ. 89) එම්.වී ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාවට මාරු කරනු ලැබූ ආයුධ පිළිබඳව සම්පූර්ණ විස්තරයක් පැ.90 පැ.91 පැ. 91 (1) පැ.92 පැ.92 (1) කරන විද්‍යුත් ලිපි මගින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. ඒ අනුව වී ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාවෙන් ගාලු වරාය වෙත ගෙන ගොස් ගොඩ බෑම සඳහා ටී.56 එස් 84 සහ එල්.එන්.ජී. යන ගිනි අවි 816 ක් සම්බන්ධයෙන් නියමිත අවසර ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබාගෙන ඇත. ආරක්ෂක අමාත්‍යාංශය විසින් පැ. 96 ලිපිය නාවික හමුදාපතිවරයා වෙත යොමු කරමින් ඉහත ගිනි අවි ගොඩ බෑම සඳහා පහසුකම් සපයන ලෙසට නියම කර ඇත.

මෙ අන්දමින් නිසි අවසරය ලබාගෙන ලංකාව බලා පැමිණි එම්.වී. ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව ලංකාවට පිවිසෙන ජාත්‍යන්තර මුහුදේ දී 2015-10-06 වටලා අත්අඩංගුවට ගෙන ඇත. ඉන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පත් වන ලැබූ පරීක්ෂණයේදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහතා විසින් ලබාදෙන ලද කටඋත්තරයක් පැ.100 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම්.වී. ඇවන්ගාඩ් පාවෙන

අවි ගබඩාවේ ඇති අවි ආයුධ නිත්‍යානුකූල අවි ආයුධ බවටත්, නිසි අවසරය ලබාගෙන එම අවි ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාවේ ගබඩා කර ඇති බවත්, ඒවා නීත්‍යානුකූල කටයුතු සඳහා පාවිච්චි කරන ලද බවටත් ප්‍රකාශ කර ඇත.

අත්අඩංගුවට ගැනීම සිදු කිරීමෙන් පසු කපිතාන් වීරසිංහ විසින් පැ, 101 දරන ලිපිය නිකුත් කර ඇත.

2015 ඔක්තෝබර් මස 6 වන දින මෙම නැව අත්අඩංගුවට ගෙන ඇති අතර එය ගොඩබිමට ගෙනවුත් 2015-10-13 දින තෙක් නාවික හමුදාව භාරයේ තබාගෙන ඇති අතර ඒ පිළිබඳව කිසිදු දැනුම් දීමක් ආරක්ෂක අමාත්‍යාංශයට හෝ පොලිසියට සිදු කර නොමැත. දවස් හතක් තිස්සේ නාවික හමුදාව නැවත නැවත ආයුධ ගණන් කරමින් සහ පරීක්ෂා කරමින් කිසියම් වරදක් සොයාගැනීමට උත්සාහ කර ඇතත් එය අසාර්ථක වී ඇති අතර ඉන් පසුව ආයුධ 31ක අංක මකා දමා ඇති බවට වැරදි සහගත තොරතුරක් මට 2015.10.13 වන දින ගාල්ල පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදුකර ඇත.

නාවික හමුදාවේ මෙම රාජ්‍ය විරෝධී අනිත්‍යානුකූල කටයුතු සියල්ල සිදුවන්නේ ඒ වන විටත් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති නීත්‍යානුකූල නියෝග කඩකරමින් බව ඔවුන් පැහැදිලි ව දැනගෙන සිට ඇත. නාවික හමුදාවේ ප්‍රධාන අණ දෙන නිලධාරියා වන ජනාධිපතිවරයාගේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝග පිළිපැදීමට නාවික හමුදාව බැඳී සිටින අතර එම නියෝග කඩ කිරීම හමුදාවේ ප්‍රධාන අණ දෙන නිලධාරියා සහ රාජ්‍ය නායකයා වන ජනාධිපතිවරයාගේ නියෝග කඩ කිරීමක් වන බැවින් එම කඩ කිරීම රාජ්‍ය විරෝධී වරදක් වේ.

එන්. හීනටිගල නියෝජ්‍ය ආඥාපති, දකුණු නාවික පෙදෙස, නැමැති නාවික හමුදා නිලධාරියා විසින් සිදු කල පැමිණිල්ල මත ස්ථානාධිපතිවරයා විසින් අංක බී.44146 වාර්තාව යටතේ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට මෙම නෞකාව අත්අඩංගුවට ගැනීම පිළිබඳ කරුණු වාර්තා කර ඇත. එසේම මෙම අවි ආයුධ පිළිබඳව පොලිස් ස්ථානය විසින් රස පරීක්ෂක වාර්තාවක් ද කැඳවා ඉදිරිපත් කර ඇත. (පැ. 102 සහ පැ. 103 පැ. 104 පැ. 105) එම රස පරීක්ෂක වාර්තාවට අනුව සැකකටයුතු යයි කියන ලද ගිනි අවි වල අංක වෙනස් කිරීමක් සිදු කර නොමැති බවටත්, කිසිම ගිනි අවියක් වෙනස් කිරීමකට ලක් කර නැති බවටත්, රස පරීක්ෂකවරයා සහතික කර ඇත. පැමිණිලිකරු සඳහන් කළේ ඔහු අවි ආයුධ උපදේශකයකු බවත්, යුද හමුදාවට පවා ආයුධ පිළිබඳව උපදෙස් ලබා දෙන බවත්, ටී 56 ගිනි අවිය කැලි කිහිපයකට ගැලවිය හැකි බැවින් සෑම කෑල්ලකම ගිනි අවියේ අංකය සඳහන්ව තිබෙන බවත්, එබැවින් කිසිදු අවස්ථාවක ටී 56 ගිනි අවියක අංක වෙනස් කිරීමක් සිදු කළ නොහැකි බවත්ය.

පැ, 107 සහ පැ 108 සහ පැ. 109 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලද සීඩී තැටි වල අඩංගු සාකච්ඡා වලට අනුව රාජිත සේනාරත්න සහ අනුවර කුමාර දිසානායක නීතිපති දෙපාර්තමේන්තුවට බලපෑම් කරමින් එම දෙපාර්තමේන්තුව දැඩි විවේචනයකට ලක් කර ඇත. අතිරේක සොලිස්ටර් ජනරාල් වසන්ත නවරත්න බණ්ඩාර විසින් සකස් කරන ලද වාර්තාවක් Colombo telegraph වෙබ් අඩවියෙන් ලබාගෙන පැ. 110 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2015 පිහිටුවන ලද නව රජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් 2015 වසරේ දී පත්කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සාක්ෂි ලබාදී ඇති අතර එතුමාගේ සාක්ෂිය පැ. 111 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එතුමාගේ සාක්ෂියෙදී ඇවන්ගාඩ් සමාගම සහ රක්නා ආරක්ෂක ලංකා සමාගම අතර ඇති කරගත් සියලුම නීත්‍යානුකූල ගිවිසුම් වල නීත්‍යානුකූල භාවය පිළිබඳව මැනවින් විස්තර කර ඇත.

ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමක් සිදු කර ඇත එසේම රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති මේජර් ජනරාල් පාලිත පියසිරි ප්‍රනාන්දු මහතා ද අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගැනීමෙන් පසු අවස්ථාව වන විටත් ශල්‍යකර්මයකට භාජනය විය යුතුව සිටි පැමිණිලිකරුට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා යාමට අවසරය ලබා නුදුන් බව ද ඔහු සඳහන් කළේ ය.

අමාත්‍ය රාජිත සේනාරත්න, අනුර කුමාර දිසානායක, අමාත්‍ය චම්පික රණවක, අමාත්‍ය අර්ජුන රණතුංග යන දේශපාලනනඥයින් ගෝඨාභය රාජපක්ෂ විසින් අවි ආයුධ ලබාදී ඇති බවට චෝදනා කලත් එම චෝදනා අසත්‍ය බවත්, ඔහුට ආයුධ ලබා දුන්නේ රක්නා ආරක්ෂක ලංකා සමාගම මගින් බවත් සඳහන් කළේය.

2016 ජනවාරි මාසයේ 16 වන දින සිට 2019 දෙසැම්බර් මස 19 වන දින දක්වා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අවසර සහ අනු දැනුම මත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අවි ආයුධ රතු මුහුදේ, පැමිණිලිකරු විසින් පවත්වාගෙන යනු ලැබූ පාවෙන අවි ගබඩාවේ

තැන්පත් කිරීම සඳහා ලබාදෙන ලද අවසරයක් 2016 ජනවාරි මස 14 වැනි දින ඇති ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහතාගේ අනුදැනුම හා අවසරය මත අතිරේක ලේකම් එම්.වී. පණ්ඩිතරත්න මහතා විසින් ලබා දී ඇති ලිපියක් පැ. 113 වශයෙන්ද, ඉන් පසුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් අත්සන් කර නිකුත් කරන ලද අවසර පත්‍ර පැ. 114 සිට පැ. 129 දක්වාද සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2019 සැප්තැම්බර් 27 වන දින අංක HC (TAB) 751/2019 දරණ අධිචෝදනා පත්‍රය පැමිණිලිකරු සහ මේජර් ජනරාල් පාලිත පියසිරි ප්‍රනාන්දු ඇතුළු විත්තිකරුවන් 13 දෙනකුට එරෙහිව කොළඹ මහාධිකරනයේ ගොනුකර ඇත. 2015 පිහිටුවන ලද නව රජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් 2015 වසරේ දී පත්කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සාක්ෂි ලබාදී ඇති අතර එතුමාගේ සාක්ෂිය පැ. 111 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එතුමාගේ සාක්ෂියෙදී ඇවන්ගාඩ් සමාගම සහ රක්නා ආරක්ෂක ලංකා සමාගම අතර ඇති කරගත් සියලුම නීත්‍යානුකූල ගිවිසුම් වල නීත්‍යානුකූල භාවය පිළිබඳව මැනවින් විස්තර කර ඇත.

ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමක් සිදු කර ඇත එසේම රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති මේජර් ජනරාල් පාලිත පියසිරි ප්‍රනාන්දු මහතා ද අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගැනීමෙන් පසුව ම අවස්ථාව වන විටත් ශල්‍යකර්මයකට භාජනය විය යුතු ව සිටි පැමිණිලිකරුට වෛද්‍ය ප්‍රතිකාර ලබා ලබා ගැනීම සඳහා වෛද්‍ය

ප්‍රතිකාර ලබා ලබා ගැනීම සඳහා යාමට අවසරය ලබා නුදුන් බව ද ඔහු සඳහන් කළේ ය.

2019 සැප්තැම්බර් 27 වන දින අංක hc (tab) 751/2019 දරණ අධිචෝදනා පත්‍රය (පැ. 130) පැමිණිලිකරු සහ මේජර් ජනරාල් පාලිත පියසිරි ප්‍රනාන්දු ඇතුළු විත්තිකරුවන් 13 දෙනකුට එරෙහිව කොළඹ මහාධිකරනයේ ගොනුකර ඇත.

Colombo Telegraph වෙබ් අඩවියේ පළ කර තිබූ, අතිරේක සොලිසිටර් ජනරාල් වසන්ත නවරත්න බණ්ඩාර මහතාගේ ලිපිය (පැ.110) සම්බන්ධයෙන් ලිඛිත සැලකිරීමක් (පැ. 131) එවකට නීතිපති යුවන්ජන් විජයතිලක මහතා වෙත ඉදිරිපත් කර ඇත. එකී ලිඛිත සැලකිලිමේ සඳහන් හේතූන් මත පුද්ගලික මුහුදු ආරක්ෂක සමාගම් විසින් ගෙන එනු ලබන ආයුධ ලංකාවේ ගාල්ලේ පිහිටුවා ඇති නාවික හමුදා ආයුධ ගබඩාවේ තැන්පත් කිරීම පුරුද්දක් වශයෙන් කෙරීගෙන පැමිණි බව සාධක සහිතව එකී සැලකිරීමෙන් පෙන්වා දී ඇත.

2014.04.02 දින ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් බී.එම්. එස්. දසනායක මහතා විසින් නිකුත් කරන ලද බලය පැවරීමේ ලිපියක් (පැ. 134) මගින් ඇවන්ගාඩ් මුහුදු ආරක්ෂක සමාගම,රක්නා ආරක්ෂක ලංකා සමාගම සමඟ මුහුදු ආරක්ෂක ආරක්ෂණය සඳහා විසුමක් ඇතිකරගෙන ඇති බවත් ඉන්න යනුව ඇවන්ගාඩ් මුහුදු ආරක්ෂක සමාගමට රක්නා ලංකා ආරක්ෂක සමාගම සතු අවි ආයුධ රැගෙන යාමට බලය ලබාදී ඇති බවත් සහතික කර ඇත. එකී යනු මතයට අනුව ඇවන්ගාඩගාඩ් නෞකාවට ගබඩාවල සිට යුධ ප්‍රවාහනය කර පැටවීම සඳහා ලොරි රථ යෙදවීමට අවසර ලබා දෙන ලෙසට ඉල්ලා

ඇති ලිපිය පැ. 135 වශයෙන් සල්කුණු කර ඉදිරිපත් කර ඇත. ආයුධ ඒ අය ආකාරයෙන් ඇවන්ගාඩ් නෞකාවට මෙය පාවෙන අවි ගබඩාවට පැටවීම සඳහා තව විරුද්ධත්වයක් නොමැති බවට නාවික හා හමුදා වෙනුවෙන් ලුතිනන් වීරසිංහ එකී පැ.135 ලිපියට අත්සන් තබා ඇත. රක්නා ආරක්ෂක ලංකා සමාගමේ නාවික ආරක්ෂක නිලධාරීන්ට ඇවන්ගාඩ් යාත්‍රාව කොළඹ වරායට ඇතුළු කරමින් පැ. 136 ලිපියේ සඳහන් අයුරින් ආයුධ එකී ටග් යාත්‍රාවට පටවා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසර ඉල්ලා ඇති අතර ඊට අවසර ලැබී ඇත.

මේ අන්දමින් නිසි අවසර ලබාගෙන රක්නා ආරක්ෂක ලංකා සමාගම සතු ආයුධ පටවා ගන්නා ලදී එම්. වී. ඇවන්ගාඩ් නෞකාවට ලංකාවට ඇතුළු වීමට පැමිණි අවස්ථාවේදී නාවික හමුදා නිලධාරීන් විසින් අනිත්‍යානුකූල ලෙස අත්අඩංගුවට ගෙන ඇත. එසේම නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර ඉන්පසුව පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩ වූ බවට අංක එෆ් ආර් 459/2016 දරන මානව හිමිකම් කඩකිරීමේ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති අතර එකී පෙත්සම ඉදිරියට ගෙන යාම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය අවසර ලබාදී ඇත. එසේම පැමිණිලිකරුට නියම කරන ලද ඇප කොන්දේසි නැවත සලකා බලන ලෙස මහාධිකරණය නියම කර ඇත.

2019-06-04 දින ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් කැබිනට් සංදේශයක් ඉදිරිපත් කරමින් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ 2015/2016 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට සභාගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා ඇත. එකී අමාත්‍ය

මණ්ඩල සංදේශයට අනුව ඇවන්ගාඩ් මුහුදු ආරක්ෂක සමාගම රක්නා ලංකා ආරක්ෂක සමාගම සමග ගිවිසුම්ගත පුද්ගලික මුදු ආරක්ෂක සමාගමකි. මෙම කැබිනට් සංදේශය පැ.143 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත

2016.12.06 වන දින රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සාමාන්‍යාධිකාරි විසින් ඇවන්ගාඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගමේ සභාපති වෙත එවා ඇති පැ.144 දරන ලිපියෙන් ද, එසේම 2017.01.16 දින රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී විසින් ඇවන්ගාඩ් මෙරිටයිම් සභාපති වෙත එවන ලද පැ. 145 දරන ලිපිය මගින් ද, දැනට මුහුදු ආරක්ෂක මෙහෙයුම් සිදු කිරීම ඉතාමත් අඩු වී ඇති බැවින් ආයුධ පාවිච්චි කිරීමේ අවශ්‍යතාවක් පැන නොනැගෙන බැවින්, ලොව විවිධ ස්ථානවල ගිවිසුම් ප්‍රකාරව රඳවා තබා ඇති අවි, රක්නා ආරක්ෂක ලංකා සමාගමට නැවත භාර දෙන ලෙසට ඉල්ලීම් කර ඇත.

පැ.145 ලිපියක් ලැබීමෙන් පසුව පැමිණිලිකරු, පැ.146 දරන ලිපියෙන් ඊට පිළිතුරු සපයමින්; නාවික ආරක්ෂක ලේකම් විසින් නාවික හමුදාපතිවරයා ද දැනුවත් කරමින්, එම්.වී ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව ගාල්ල වරායට ඇතුල් කිරීම සඳහා පැමිණීමේදී නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන තවමත් නිදහස් කරන නොමැති බැවින් පැ.145 ලිපිය සඳහන් අයුරින් ආයුධ භාර දීමේ හැකියාවක් නොමැති බවට පැමිණිලිකරු සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීට දැනුම් දී ඇත.

ඒ අනුව ආයුධ නැවත භාර දීමට අවශ්‍ය නම් ඒ සඳහා නීතිපතිවරයාගේ කැමැත්ත ද සමඟ දැනුම් දීමක් කරන ලෙසද වැඩිදුරටත් පැ. 146

ලිපියෙන් දැනුම් දී ඇත. එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් මෙම නඩුව පිළිබඳව සහ හිටපු හමුදාපතිවරු ගෝඨාභය රාජපක්ෂ මහතාව අධිකරණයට ගෙන යාමට දරන ලද උත්සාහය පිළිබඳව සිදුකළ අදහස් ප්‍රකාශ කිරීමක් අඩංගු සංයුක්ත තැටියක් පැ.147 ලෙස සලකුණු කර පත් කර ඇත.

නීතිපතිවරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර වෙත යවන ලද ලිපියකින් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට දැනුම් දී ඇත. (පැ.148) නීතිපතිවරයාගේ උපදෙස් පරිදි අත්අඩංගුවට නොගැනීම පිළිබඳව සිහිගන්වමින් නැවතත් 2019.07.05 දින ලිපිය, නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ රජයේ අධිනීතිඥ ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින් පොලිස්පති වික්‍රමරත්න මහතා වෙත යවමින් පැමිණිලිකරු ඇතුළු පස් දෙනෙකු අත්අඩංගුවට ගන්නා ලෙසට දැනුම් දී ඇත. (පැ. 149)

ඉහත කී පැ. 149 නිකුත් කරන ලද දිනය වූ 2019.07.05 දින වන විට පැමිණිලිකරුට කිසියම් අවශ්‍යතාවයක් සඳහා විදේශගත වීමට සිදුව තිබූ බැවින් ඔහු ඒ වන විට විදේශ ගතව සිට ඇත. එකී ලිපියේ සඳහන් අන්දමට ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට 2019.06.25 වාර්තා කරමින් මෙම නඩුවට අදාළ විමර්ශන කටයුතුවලින් අවසන් කර ඇති බව දැනුම් දී ඇත.

පැ.149 දරණ ලිපියෙහි 2019.6.25 වන දින ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරමින් පරීක්ෂණ අවසන් කර ඇති බවට වාර්තා කර ඇති බව සඳහන් කර ඇත. එසේ වුවත් එදින වනවිට

ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති බී 44/146/15 නඩුවට පැමිණිලිකරු සැකකරුවකු වශයෙන් නම් කර තිබී නොමැත.

ඉන්පසුව 2019.07.17 වන දින නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ ජනක බණ්ඩාර මහතාගේ අත්සනින් යුතුව නිකුත් කෙරුන පැ. 151 දරණ ලිපිය අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණිලිකරු විදේශ ගතව සිටි අවස්ථාදවේදී ඔහුට එරෙහිව වරෙන්තු නිකුත් වී ඇති බව දැනගෙන ඒ අනුව නැවත ආපසු පැමිණි අවස්ථාවේදී කටුනායක ගුවන් තොටුපලේ දී මෙලෙස අත්අඩංගුවට පත්වී ඇත.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් විසින් 2016.09.06 වන දින පැමිණිලිකරු කොමිෂන් සභා කාර්යාලය වෙත කැඳවා ඇත. එහිදී පැමිණිලිකරුගේ ප්‍රකාශය සටහන් කරමින් සිටියදී රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ ජනක බණ්ඩාර මහතා එකී පරිශ්‍රය තුල සැරිසරමින් සිටි ඇත. පැමිනිලිකරුගේ ප්‍රකාශය සටහන් කරන අතරතුර පොලිස් පරීක්ෂක පුෂ්පකුමාර විටින් විට අධ්‍යක්ෂක දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහගේ නිල කාමරයට ගොස් උපදෙස් ලබාගෙන ආපසු පැමිණ ප්‍රශ්න කිරීම සිදු කර ඇත. ඉන්පසුව එදිනම පැමිණිලිකරු සහ විශ්‍රාමික මේජර් ජෙනරල් පාලිත ප්‍රනාන්දු යන දෙදෙනා අත්අඩංගුවට ගෙන කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් ගිහාන් පිලිපිටිය මහතාගේ නිවසට ඉදිරිපත් කිරීමට රැගෙන ගොස් ඇත. පැමිණිලිකරු රැගෙන ගිය රථය මහේස්ත්‍රාත්වරයාගේ නිල නිවාසයේ ඉදිරිපිට නවත්වන ලද අවස්ථාවේ දී දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මියත් ජනක බණ්ඩාර මහතාත් එකම වාහනයකින්

මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ දෙදෙනා විසින්ම කරුණු දැක්වීම සිදු කර ඇත. “He is a big mora. I want some more rather put in” යනුවෙන් හඳුන්වා දෙමින් පැමිණිලිකරුට ඇප දීම සම්බන්ධයෙන් දැඩි විරෝධයක්ක් ඉදිරිපත් කර ඇත. එසේම දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ විසින් පැමිණිලිකරු big mafia of,website යනුවෙන් ද හඳුන්වා දී ඇත. මහාධිකරණය ඉදිරියේ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් පැමිණිලිකරුට එරෙහිව පවරා ඇති නඩුව වෙනුවෙන් පෙනී සිටින්නේ ද ජනක බණ්ඩාර මහතා ය. මේ අනුව රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ ජනක බණ්ඩාර මහතා තමාගේ රාජකාරි සීමාවෙන් ඔබ්බට ගොස් රාජකාරි වපසරියට නොවැටෙන අනීත්‍යානුකූල ක්‍රියා තම පටු පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා සිදු කර ඇති බව ඉතාමත් පැහැදිලිය.

පැමිණිලිකරු මාස තුනහමාරක පමණ කාලසීමාවක් රක්ෂිත බන්ධනාගාර ගතව සිට ඇත්තේ ඇප ලබාදීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විරෝධය පල කිරීමේ හේතුවෙනි. පැමිණිලිකරු ඇතුළු පිරිසට එරෙහිව චෝදනා 7573 කින් අධි චෝදනා පත්‍රයක් ගොනු කර ඇති අතර විත්තිකරුවන් වෙනුවෙන් නගන ලද විරෝධතාවයන් සලකා බලා එකී අධිචෝදනා පත්‍රයේ චෝදනා ගණන 19 දක්වා අඩුවී ඇති අතර අනිකුත් සියලුම චෝදනාව මහාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. එම නියෝග පැ.152 සහ පැ.153 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඒ අනුව දැනට පවත්වාගෙන යනු ලබන අධික අධිචෝදනා වන පැ. 155 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු සඳහන් කළ අන්දමට ඔහුට විදෙස් වෛද්‍ය ප්‍රතිකාර සඳහා විදේශ ගතවීමට

මහාධිකරණයෙන් අවසර ලැබෙන අවස්ථාවේදී නීතිපති දෙපාර්තමේන්තුවේ ජනක බණ්ඩාර මහතා ද නීතිපති වෙනුවෙන් මහාධිකරණයේ පෙනී සිට ඇත. එසේ විදේශ ගතවීම සඳහා අවසර ඉල්ලන අවස්ථාවේදී පෙනී සිටි ජනක බණ්ඩාර මහතා ඉන් පසුව තමන්ට එරෙහිව වරෙන්තු නිකුත් කිරීම සඳහා ක්‍රියා කිරීම ආචාරධර්ම වලට එරෙහි ක්‍රියාවක් ලෙස සඳහන් කර ඇත. පැ.157 වශයෙන් කොළඹ මහාධිකරණ නඩු අංක 25/2017 දරන නඩුවේ 2017.09.25 දින සටහන් ද 2017.10.03 දිනැති සටහන්ද 2018.07.02 දිනැති සටහන්ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

2013, 2014 වර්ෂවල දී එවකට විපක්ෂයේ සිටි මන්ත්‍රීවරුන්ද, 2015 න් පසුව පත්වූ රජයේ මන්ත්‍රීවරුන් සහ ඇමැතිවරුන් ද පැමිණිලිකරුගේ මුහුදු ආරක්ෂක සමාගමේ රැකියා ලබා ගැනීම සඳහා තම පාක්ෂිකයින් නම් කරමින් පැමිණිලිකරු වෙතින් සිදු කල ඉල්ලීම් ගණනාවක් පැ. 158, පැ. 160, පැ. 161, පැ. 162, පැ. 163, පැ. 164, පැ. 165, පැ. 166, පැ. 167, පැ. 168 සහ පැ. 169, වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

නාවික හමුදාව විසින් මෙම ව්‍යාපාරය කරගෙන 2009 සිට 2012 දක්වා කාලසීමාව තුළදී උපයා ගැනීමට හැකි වූ මුදල ඩොලර් මිලියන 1836 ($ 1,836,642,277.14) කි. එසේ වුවත් පැමිණිලිකරු මෙම ව්‍යාපාරය භාර ගත් 2012 සිට 2015 දක්වා කාලසීමාව තුළදී උපයා ගන්නා ලද මුදල් ඩොලර් මිලියන 11,457 ($ 11,457,056,488.65) ක මුදලකි. එම ආදායම් සනාථ කරන ලේඛන සහ ගිණුම් වාර්තා පැ. 170, පැ. 171, පැ. 173 පැ. 174 සහ පැ. 175 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එසේ ම මෙම කාලසීමාවේදී, වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන්, සුභ සාධක සංගම් වෙනුවෙන්, ආගමික ස්ථාන වෙනුවෙන්, ආබාධිත සොල්දාදුවන්ට ගෙවල් සෑදීම වෙනුවෙන්, ක්‍රීඩා කටයුතු වෙනුවෙන් මිලියන 702 ක මුදලක් දරා ඇති බවට සනාථ කරන ලිපිගොනුවක් පැ. 176 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

නාවික හමුදා නිලධාරි නිලන්ත හීනටිගල මහතාට එරෙහිව පැමිණිල්ලක් වර්තමාන ආරක්ෂක ලේකම් කමල් ගුනරත්න මහතාට භාරදී ඇති අතර එහි පිටපතක් පැ. 177 වශයෙන්ද, පොලිස් අධිකාරී එස්.ඒ.ඩී. ගුණවර්ධනට එරෙහිව සිදු කළ පැමිණිල්ලක් පැ. 179 වශයෙන්ද, සිදුකරන ලද පැමිණිල්ලක් පැ. 179 වශයෙන්ද, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකරට එරෙහිව පැමිණිල්ලක් පැ. 180 ජනාධිපති නීතිඥ උපුල් ජයසූරියට එරෙහිව පැමිණිල්ලක් පැ. 181 අද්මිරල් රවීන්ද්‍ර විජේගුණරත්නට එරෙහිව පැමිණිල්ලක් පැ. 64 වශයෙන්ද මාධ්‍යවේදිනී ඉස්මයිල් මහත්මිය සමග සිදුකරනු ලැබූ සාකච්ඡාව අඩංගු සංයුක්ත තැටිය 182 වශයෙන්ද පත් කර ඇත.

පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද හිටපු අමාත්‍ය ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා සඳහන් කළේ ඔහු ඇවන්ගාඩ් මෙරිටයිම් සමාගමේ නීතිඥවරයෙකු වශයෙන් සේවය නොකළ බවයි. පැ.57(i) දරන 2015 ජනවාරි මස 18 දින ලංකාදීප පුවත් පත් වාර්තාවේ දැක්වෙන එම්.වී. මහනුරව පාවෙන අවිගබඩාව අත්අඩංගුවට ගැනිම පිළිබඳව වාර්තාව කියවීමෙන් පසුව එම පාවෙන අවි ගබඩාව පිළිබඳව දැනගත් බවත්, මෙම කාලසීමාවේ දී විදේශීය රටවල තානාපතිවරුන් ගණනාවක් විසින් එම නැව අත්අඩංගුවට ගැනීම තුළින් ඔවුන්ගේ අවි ආයුධ ද අත්අඩංගුවට ගැනීමක් සිදු වන

අතර එම අවි ආයුධ අනිකුත් ආරක්ෂක සමාගම් වල අවි ආයුධ හා මිශ්‍රවීමෙන් බරපතල ගැටළුකාරී තත්ත්වයක් මතුවන බවත් එබැවින් සාක්ෂිකරු එවකට අධිකරණ අමාත්‍යවරයා වශයෙන් ඊට මැදිහත් වන ලෙසටත් ඉල්ලීමක් කර ඇත. මේ පිළිබඳව සාක්ෂිකරු සොයා බලා ඇති අතර එම් .වී. මහනුවර පාවෙන අවි ගබඩාවට අදාළ සියළු ගණුදෙනු නීත්‍යානුකූල ගිවිසුම් මත ක්‍රියාත්මක වී තිබූ බැවින් එම පාවෙන අවි ගබඩාව අත්අඩංගුවට ගැනීම තුලින් පොලිසිය වැරදි ක්‍රියාවක් සිදු කර ඇති බවට සාක්ෂිකරු අවබෝධ කරගෙන ඒ පිළිබඳව රජයට කරුණු පහදා දී ඇත. එම කරුණු පහදා දීමේදී රාජිත සේනාරත්න, පාඨලි චම්පික රණවක, අර්ජුන රණතුංග, සරත් ෆොන්සේකා වැනි අමාත්‍යවරුන් සාක්ෂිකරුව නිර්දය ලෙස විවේචනය කරමින් හොරුන් ආරක්ෂා කරන බවට චෝදනා කර ඇත.

ඔහු සඳහන් කළ අන්දමට 2015 ජනවාරි 08 පැවැත්වූ ජනාධිපතිවරණය පෙර විපක්ෂයේ සිටි පක්ෂ අතර වූ එකඟතාව මත රජයේ ආයතනවල හා දේශපාලඥයින් විසින් සිදු කළ දූෂණ හා අපරාධ සම්බන්ධයෙන් නීතිරීති සම්පාදනය කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට දූෂණ විරෝධී කමිටුවක් පත් කර තිබේ.

එසේ වුවත් මැතිවරණයෙන් පසුව නව ආණ්ඩුව යටතේ අග්‍රාමාත්‍යවරයා ඉදිරිපත් කළ කැබිනට් සංදේශයේ කැබිනට් මණ්ඩලයට ඉහලින් සිටින ජාතික විධායක සභාව පිළිබඳව ප්‍රශ්නයක් පැන නැඟී ඇත. කැබිනට් පත්‍රිකාවේ ඇමුණුම අනුව පිහිටුවනු ලැබූ දූෂණ විරෝධී කමිටුව සහ අනු කමිටුවල සාක්ෂිකරුද ඇතුළත්ව සිටියත් කැබිනට් මණ්ඩලය තුළ ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව පිළිබඳව සාක්ෂිකරු සමඟ ගැටුමක් නිර්මාණය වී ඇත. එම අවි

ගබඩාව සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු ආරක්ෂක නිලධාරීන් 03 ක් හෝ 04 ක් සමඟ ඇවන්ගාඩ් සභාපති ඇතුළු නිළධාරීන් රැසක් අත්අඩංගුවට ගැනීමට අමාත්‍යවරුන් ගණනාවක් විශාල උත්සායක් දැරීම කරන කොට ගෙන කැබිනට් මණ්ඩලය තුළදී සාක්ෂිකරු සමඟ ගැටුමක් නිර්මාණය වී තිබේ.

අධිකරණ අමාත්‍යවරයා ලෙසට ඒ පිළිබඳ සිදු කළ විමසීම් වලදී, ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව සම්බන්ධ ගිවිසුම නිත්‍යානුකූලව සිදුවී ඇති බවත්, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ හෝ පුපුරන ද්‍රව්‍ය ආඥාපනත යටතේ හෝ ගිණි අවි ආඥා පනත යටතේ හෝ වරදවල් හෙළිදරව් වී නොමැති බවටත් සාක්ෂිකරු දැනුම් දී ඇති අතර ඒ මත ගැටුම් උත්සන්නකාරී වී ඇත.

ඒ හේතුවෙන් සාක්ෂිකරු මෙම දූෂණ විරෝධී කමිටු රැස්වීම් හෝ අනු කමිටු රැස්වීම් වලට හෝ සහභාගී වී නැත. කෙසේ වෙතත් කැබිනට් පත්‍රිකාවේ දැක්වෙන අන්දමට මෙම ජාතික විධායක සභාව නැමැති නීතිගත නොකළ සංවිධානය කැබිනට් මණ්ඩලයටත් ඉහළින් ක්‍රියාත්මකවන ආයතනයක් ලෙසට සාක්ෂිකරුට පෙනී ගොස් ඇත.

අමාත්‍ය රාජිත සේනාරත්න, පාඨලී චම්පික රණවක, අමාත්‍ය අර්ජුන රණතුංග, අමාත්‍ය සරත් අමුණුගම, අමාත්‍ය සරත් ෆොන්සේකා එකතුව අපරාධය යුක්ති විනිශ්චය කොමිෂන් සභාව හා සමාන සභාවක් පිහිටුවීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. මෙවැනි සභාවක් පිහිටුවීමෙන් වර්තමාන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නොමැති බවට පෙන්වා දුන් බවත්, අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය පාඨලි චම්පික රණවක, අමාත්‍ය මංගල සමරවීර, අමාත්‍ය රවි කරුණානායක, අමාත්‍ය අර්ජුන රණතුංග යන පිරිස ජනාධිපතිවරයාට සහ

අග්‍රාමත්‍යවරයාට දැඩි දෝෂ දර්ශන එල්ල කරමින් බොහෝ අවස්ථා වලදී තර්ජනාත්මකව කථා කිරීමත් සිදු කර ඇත. මෙවැනි සභා පිහිටුවීම කළ නොහැකි බවට එවකට නීතිපති ද දැනුම් දී ඇත.

දැනටමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන නොසලකා ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඇති කර ඒ සඳහා දේශපාලන මැදිහත්වීම් සිදු කර මිනිසුන් තෝරා නඩු විසඳීමේ ක්‍රමය ඇති කිරීමට සාක්ෂිකරු විරුද්ධවී ඇති අතර ඉන් අධිකරණයේ ස්වාධීනත්වය නැතිවී අධිකරණ ක්‍රමය ගැන මහජනතා විශ්වාසය බිඳ වැටෙන බවටද සාක්ෂිකරු පෙන්වා දි ඇතත් ඒ පිළිබඳව සැලකිල්ලක් නොදක්වා 2015 ආණ්ඩුව ක්‍රියා කර ඇත. මෙම කරුණු පදනම් කරගෙන එවකට අග්‍රාමත්‍යවරයා සහ සාක්ෂිකරු දැඩි ලෙස දෝෂාරෝපණයට ලක්ව ඇත.

මෙම දූෂණ විරෝධී කමිටු කණ්ඩායම සතියකට වරක් අරලියගහ මන්දිරයේ රැස්ව ඇති අතර නීතිඥ ජේ.සී.වැලිඅමුණ මෙහි වගකීම භාරගෙන කටයුතු කර තිබේ. නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ , අමාත්‍ය රාජිත සේනාරත්න, අමාත්‍ය පාඨලි චම්පික රණවක, අමාත්‍ය රවි කරුණානායක මෙම රැස්වීම් වලට නිරන්තරයෙන්ම සහභාගී වී ඇත. මෙවැනි රැස්වීම් වලට සතිපතා නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ සහභාගී වීම ඉතාම නරක පූර්වාදර්ශයක් ලබා දෙන බවත්, එය නීතිපති දෙපාර්තමේන්තුවේ හොඳ නමට කැළලක් බවත්, එමගින් තමන්ටද කැළලක් ඇතිවන බවත්, සාක්ෂිකරු කීහිප අවස්ථාවකදීම අග්‍රාමාත්‍යවරයාට පෙන්වා දී ඇත.

විශ්‍රාමික සොලිසිටර් ජනරාල් සුහදගම්ලත් මහතා තම සාක්ෂියේ දී සඳහන් කළේ, ටීවී දෙරණ මාධ්‍ය නාලිකාව ඔස්සේ මාධ්‍යවේදී චතුර

අල්විස් සමග සිදු කළ සාකච්ඡාවට පෙර සතිඅග අරුණ නැමැති පුවත් පතට ද සාකච්ඡාවක් ලබා දී ඇති අතර මෙම සාකච්ඡා දෙකෙහිදීම සුභදගම්ලත් මහතා සඳහන් කළ කරුණු ඒ ආකාරයෙන්ම සිදු වූ කරුණු බවය.

එම්.වී.මහනුවර නැමැති පාවෙන අවි ගබඩාව සම්බන්ධ නඩුවේදී සුභදගම්ලත් මහතා විසින් අදාල ලිපි ගොනු පරීක්ෂා කර එවකට නීතිපති යුවන්ජන් විජේතිලක මහතා වෙත නිර්දේශ ලබා දෙමින් එම අවි ගබඩාව සම්බන්ධයෙන් නඩු දැමීමේ අවශ්‍යතාවක් පැන නොනගින බවට වාර්තා කර ඇති අතර ඒ අනුව නීතිපතිවරයා එම නිර්දේශ පදනම් කර ගෙන ක්‍රියාකර ඇත. මෙවැනි නිර්දේශයක් ලබා දීම සම්බන්ධයෙන් එවකට මාධ්‍ය මගින් සුභදගම්ලත් මහතා දැඩි ලෙස විවේචනයට ලක්කර ඇත.

සුභදගම්ලත් මහතා එක්තරා දිනයක තම කාර්යාලයේ රාජකාරියෙහි නිරතව සිටින අවස්ථාවකදී සවස 6.30 පමණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශානි අබේසේකර දුරකථනයෙන් සුභදගම්ලත් මහතා අමතමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පැමිණ සිටින නිලධාරීන් පිරිසකට ඔහු මුණගැසීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙසට සිදු කළ ඉල්ලීමකට ඉඩ දෙමින් එදින සවස 7.00 ට පමණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තිසේරා ඇතුළු නිලධාරීන් පිරිසක් සුභදගම්ලත් මහතා මුණගැසි ගාල්ලේ නැංගුරම්ලා තිබූ එම්.වී.මහනුවර නෞකාව පිළිබඳ හෝ එම්.වී.ඇවන්ගාඩ් නෞකාව පිළිබඳව උපදෙස් පතා ඇත.

එම අවස්ථාවේ දී එම නෞකාව පිළිබඳව ඒ වන විටත් ලිපිගොනුවක් විවෘතව තිබුණේ ද යන්න දැනුමක් සුභදගම්ලත් මහතාට තිබුණේද

යන්න පිළිබඳ දැනුමක් තිබී නැත. තිසේරා ඇතුළු පිරිස සුහදගම්ලත් මහතා මුණගැසීමෙන් පසුව ඔවුන්ගේ ලිපිගොනු පිළිබඳව විමසා බලා අවශ්‍ය උපදෙස් දීමට වසන්ත නවරත්න බණ්ඩාර මහතාට යොමු කර ඇත.

වසන්ත නවරත්න බණ්ඩර මහතා මුණ ගැසීමෙන් පසු ලබා දෙන උපදෙස් පිළිබඳව තමන්ව දැනුවත් කරන ලෙස තිසේරා ඇතුළු පිරිසට සුහදගමලත් මහතා දැනුම් දී ඇති බවත්, ඔවුන් එසේ සිදු නොකළ බැවින් රාත්‍රී 8 ට පමණ දුරකතන ඇමතුමක් ලබා දෙමින් සාකච්ඡාවේ ප්‍රතිඵල පිළිබඳව ශානි අබේසේකර ගෙන් විමසා ඇති අතර කිසියම් පිරිසක් අත්අඩංගුවට ගැනීම සඳහා උපදෙස් ලබා දී තිබූ බවට ශානි අබේසේකර එම අවස්ථාවේ දී පවසා ඇත. එසේ වුවත් ඒ අන්දමින් ක්‍රියා නොකළ යුතු බවට සුහදගම්ලත් මහතා එම අවස්ථාවේ දී ශානි අබේසේකරට පවසා ඇත. එයට හේතුව වශයෙන් ඔහු සඳහන් කළේ ඒ වන විටත් හරියාකාරව ලිපි ගොනුවක් නොදුටු නිසි අධ්‍යනයක් නොකළ නඩුවකට ඒ අන්දමින් අත්අඩංගුවට ගැනීමේ නිර්දේශයක් පොලිසියට ලබා දුනහොත් ඉන් නීති ක්‍රියාදාමය කඩා වැටීමක් සිදු වන බැවින් එකී උපදෙස් ක්‍රියාත්මක නොකරන බවට තමන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දුන් බවයි.

සුහදගම්ලත් මහතා වැඩිදුරටත් සඳහන් කළේ ඔහු පසුව දැනගත් ආකාරයට මෙම පාවෙන අවි ගබඩාව සම්බන්ධ ලිපිගොනුව නීතිපති යුවන්ජන් විජේතිලක මහතාගේ ඍජු අධීක්ෂණය යටතේ තිබී ඇත.

එක්තරා දිනයක උපුල් ජයසූරිය මහතා සාක්ෂිකරු මුණගැසීමට පැමිණ මෙම නඩුව ගැනද සාකච්ඡා කර ඇත. එම සාකච්ඡාව

සම්බන්ධයෙන් තමන් සතිඅග අරුණ පුවත් පතට ප්‍රකාශ කර ඇති කරුණු සත්‍ය බවද සඳහන් කර ඇත.

එසේම තවත් දිනයක සාක්ෂිකරු කාර්යාලයට පැමිණෙන අවස්ථාවේදී කාර්යාලයේ පියගැට පෙළ අසලදී තිසේරා මුණගැසී පැමිණිලිකරු විදේශ ගතවීම සඳහා ගමන් බලපත්‍රය ඉල්ලා සිටින බවට සඳහන් කරමින් ඒ පිළිබඳ උපදෙස් පතා ඇති අතර ඒ වන විටත් ගමන් බලපත්‍රය පොලිස් භාරය ගෙන තිබූ බැවින් සැකකරුවෙක් කළ පමණින්ම ඔවුන්ගේ ගමන් බලපත්‍ර අත්අඩංගුවට ගැනීම නොකළ යුතු බවටත් එවැනි ක්‍රියා මගින් සැකකරුවන්ගේ මානව අයිතිවාසිකම් කඩවන බවටත් සඳහන් කරමින් ගමන් බලපත්‍රය මුදාහරින ලෙසට තමන් උපදෙස් දුන් බව සුහදගම්ලත් මහතා සඳහන් කළේය.

එසේම එම කාලසීමාවේ දී අරලියගහ මන්දිරයේ පවතින රනිල් වික්‍රමසිංහ මහතාගේ සාකච්ඡාවලට ද ජනාධිපති මන්දිරයේ පවතින මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සාකච්ඡාවලට ද රාජ්‍ය නිලධාරීන් ගෙන්වමින් ප්‍රශ්න කිරීමේ ප්‍රවණතායක් පැවතුන බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද ඒ අන්දමින්ම රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම් වලට ගෙන්වා තඩු සම්බන්ධව විමසීම් කළ බවත් දේශපාලඥයන් එවැනි විමසීම් සිදු නොකළ යුතු බවට තමන් දරණ මතය සතිඅග අරුණ පුවත්පත් සාකච්ඡාවේ දී ප්‍රකාශ කළ බවත් සඳහන් කළේය.

හෝටලයක පැවති විවාහ මංගල්‍ය උත්සවයකට සහභාගීව සිටි අවස්ථාවකදී උපුල් ජයසූරිය මහතා දුරකථනයෙන් තමන් අමතමින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සුහදගම්ලත් මහතා පැමිණෙන තෙක් බලා සිටින බවට සඳහන් කළ ආකාරයෙන් උපුල් ජයසූරිය

මහතා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා අසල සිටින බවට තමන් තේරුම්ගත් බවත්, එබැවින් තමන් එම අවස්ථාවේදීම අග්‍රාමාත්‍යවරයා මුණගැසීමට ගිය බවත්, එම අවස්ථාවේ දී එතැන විශාල රැස්වීමක් තිබුණ බවත් අග්‍රාමාත්‍යවරයා එහි මුලසුන දැරූ බවත් සඳහන් කළේය. එම රැස්වීම පොලිස්පතිවරයා, නාවික හමුදාපතිවරයා, අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ නිලධාරීන්, එම රැස්වීමට සහභාගිවී සිට ඇත. එම රැස්වීමේදී අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා ප්‍රශ්න කරමින් සේනාධිපතිට විදේශ ගතවීමට ඉඩ දුන්නේ කුමන නිලධාරියෙක් ද යන්න ප්‍රශ්න කර එම නිලධාරිය ඉන්ටඩික් කලයුතු බවට මේසයට අතින් ගසමින් ප්‍රකාශ කළ අතර, ඒ සඳහා උපදෙස් දුන්නේ තමන් බවට එම අවස්ථාවේදී සාක්ෂිකරු පවසා ඇත.

රැස්වීම අවසන්ව එළියට පැමිණි අවස්ථාවේ දී පාඨලී චම්පික අමාත්‍යවරයා ඔහු මුණගැසී ගෝඨාභයට විරුද්ධව සාක්ෂි ඇත්නම් ඔහු අත්අඩංගුවට ගන්නා ලෙසට සුභදගම්ලත්ට ප්‍රකාශ කර ඇත.

මේ අනුව මෙම සාක්ෂි වලින් පෙනී යන්නේ 2015 රජයේ දේශාපලඥයන් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගෙන්වා නඩුවල තත්ත්වය විමසීම සහ එම නඩුවල දී දේශපාලඥයින්ට අවශ්‍ය දේ සිදු කිරීම සඳහා සහභාගී වූ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උපදෙස් දී ඇති බවයි.

ඇවන්ගාඩ් නඩුව සම්බන්ධ ලිපිගොනුව වසන්ත නවරත්න බණ්ඩාර වෙත යොමු කළ විට කිසියම් පිරිසක් අත්අඩංගුවට ගත යුතු බවට ඔහු උපදෙස් දී ඇත. එසේ වුවත් ජයන්ත ජයසූරිය සහ කපිල නවරත්න යන දෙදෙනාගේ මතය වී ඇත්තේ නිශ්ශංක සේනාධිපතිව අත්අඩංගුවට ගත්තත් ගෝඨාභය රාජපක්ෂ මහතා අත්අඩංගුවට

ගැනීමක් සිදු නොකළ යුතු බවයි. මේ අනුව නිලධාරීන් අතර තිබූ මෙම මත භේදය නීතිපතිවරයා වෙත යොමු කර ඇත. නීතිපතිවරයාගේ දැනුම් දීමක් මත අරලියගහ මන්දිරයේ පැවති රැස්වීමකට සුභදගම්ලත් මහතා සහභාගි වීමට පැමිණි අවස්ථාවේදී නවරත්න බණ්ඩාර මහතා ද එම රැස්වීමේ දී මුණගැසී ඇත. එකී රැස්වීමේදී නවරත්න බණ්ඩර මහතාගේ මතය විමසා ඇතිඅතර එම අවස්ථාවේ දී ඔහු සඳහන් කර ඇත්තේ "මේ වගේ සාපරාධී අපරාධයක් කළ මෙවැනි මිනිසුන්ට නිදැල්ලේ ඉන්න තිබ්බොව තවත් නඩුවක් මගේ ජීවිතේට දැක නැහැ ඒ නිසා මේ කට්ටිය අත්අඩංගුවට ගත යුතුය" යනුවෙනි. එවැනි ප්‍රකාශයක් වසන්ත නවරත්න බණ්ඩාර මහතා ප්‍රකාශ කළ විට සුභදගම්ලත් මහතා ප්‍රකාශ කර ඇත්තේ ඔහු ඊට එකඟ නොවන බවත්, අපරාධ නඩුවක් පවත්වාගෙන යාම සඳහා ගිණි අවි ආඥා පනත යටතේ කරුණු නොමැති බවත්ය. මත දෙකක් ඉදිරිපත්වීම හේතුවෙන් අවසාන නිර්දේශය සඳහා නීතිපතිවරයා වෙත යොමු කිරීමට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කර ඇත.

මෙම සිද්ධියට අදාළ ලිපි ගොනුව විවෘත කර ඇත්තේ 2015.01.22 වන දින CR 1/58/2015 යන අංකය යටතේය. සුභදගම්ලත් මහතා සඳහන් කළ අන්දමට ජයන්ත ජයසූරිය මහතාගේ නිර්දේශ වී ඇත්තේ ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අනිකුත් පුද්ගලයින්ට විරුද්ධව නඩුවක් ගෙන යා නොහැකිය යන ස්ථාවරයයි. නීතිපති යුවන්ජන් විජේතිලක මහතාගේ මතය වූයේ ද ඒ පිළිබඳ නඩුවක් ඉදිරියට ගෙන යා නොහැකි බවය. එකී මතය ඇතුළත් 2015.06.17 දිනැති ලේඛනය පැ.45 වශයෙන් සලකුණු කර ඇත.

සාක්ෂිකාර සුහදගම්ලත් මහතා වගඋත්තරුවන් විසින් හරස් ප්‍රශ්න වලට භාජනය කර ඇත. එසේ වුවත් එම දිර්ඝ හරස් ප්‍රශ්න විමසීම් වලදී වගඋත්තරකරුවන්ගේ වාසියට කිසිම කරුණක් හෙළිදරව් වී නොමැත.

පැ.01 සිට පැ.184 දක්වා මෙහෙයවමින් පැමිණිල්ලේ සාක්ෂි අවසන් කර ඇත.

# 9 .XXXII

පැමිණිලි අංකය - 1807/20

පැමිණිලිකරු - වඩුගේ පාලිත පියසිරි ප්‍රනාන්දු

ලිපිනය - අංක 6/6, සුරම්‍ය මාවත, වත්තේගෙදර, මහරගම

පැමිණිලිකරු දේශපාලන පලි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

01. හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතා
02. හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා
03. හිටපු අමාත්‍ය රවුෆ් හකීම් මහතා
04. හිටපු අමාත්‍ය සරත් ෆොන්සේකා මහතා
05. පාර්ලිමේන්තු මන්ත්‍රී ආර් සම්බන්ධන් මහතා
06. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ සුමන්තිරම් මහතා
07. පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා
08. ජේ.සී වැලිඅමුණ මහතා
09. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා
10. හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා
11. දූෂණ විරෝධී ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ එම්.කේ ආනන්ද විජේපාල මහතා
12. සොලිසිටර් ජෙනරාල් (වැඩ තහනම්) දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය

## තීරණය

රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපතිවරයා වශයෙන් පාලිත ප්‍රනාන්දු විසින් ඉටු කරනු ලැබ ඇති රාජකාරි හා අදාළව ඔහුට එරෙහිව ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ නගන ලද චෝදනාවන්ගෙන් මුල් අවස්ථාවේදීම ඔහු නිදහස් කරනු ලැබ ඇති හෙයින් සහ එම චෝදනාවන් හා අදාළව ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ යෙදී ඇති කරුණු සලකා බැලීමේදී මුලුමනින්ම ඔහු සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය දේශපාලන පලි ගැනීමක් බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත. තවද සිද්ධිමය කරුණු මත අල්ලසක් වශයෙන් අර්ථ දැක්විය නොහැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුබ සිද්ධිය උදෙසා පිහිටුවා ගන්නා ලද භාර අරමුදලකට සිදු කෙරෙන ලද පරිත්‍යාගයක් මුල් කර ගනිමින් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් අවිධිමත් ලෙස පාලිත ප්‍රනාන්දුට එරෙහිව ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ නඩු පැවරීම ද එලෙසින්ම දේශපාලන පලි ගැනීමක් වශයෙන් සිදු කරනු ලැබ ඇතැයි යන්න කොමිෂන් සභාවේ තීරණය වේ.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සැදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. ආරක්ෂ ලේකම්වරයාගේ නියෝග වලට අවනත නොවී එම්.වී . ඇවන්ගාඩ් නෞකාව අත්අඩංගුවට ගැනිමට නාවික හමුදා නිලධාරීන් විසින් ක්‍රියා කිරීම මගින් ද, එම්.වී.ඇවන්ගාඩ් නෞකාව අත්අඩංගුවට ගැනිමෙන් පසුව ඒ පිළිබඳව ආරක්ෂක ලේකම්වරයාට වාර්තා නොකිරිම මගින් ද,නාවික හමුදා නිලධාරීන් රාජ්‍ය බලයට විරුද්ධව ක්‍රියා කිරීමේ වරද සිදු කර ඇත.

5. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිණිලිකරු රැඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකූඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

6. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත

සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී .

7. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දීම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි .

8. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම .

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

වඩුගේ පාලිත පියසිරි ප්‍රනාන්දු (ඉදිරියේදී පාලිත ප්‍රනාන්දු වශයෙන් හඳුන්වනු ලබයි.) පාසල් අධ්‍යාපනයෙන් පසුව 1971.04.26 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාවේ කැඩෙට් නිලධාරියෙකු ලෙස සේවයට බැඳී මූලික පුහුණුවකින් පසුව දෙවන ලුතිනන්වරයෙකු වශයෙන් අධිකාරි ලැබ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉන්ජිනේරු බලකායට සම්බන්ධ වී ඇත. 2001.12.31 වන දින දක්වා හමුදා සේවයේ නිරත වූ ඔහු විශ්‍රාම ලබන අවස්ථාව වන විට බ්‍රිගේඩියර් නිලයට උසස් කර ලැබ තිබිණි. ඔහුගේ සේවා කාලය තුළදී දිවයිනේ සියලුම ප්‍රදේශයන්හි සේවයෙහි යෙදී ඇති අතර විශේෂයෙන් යුධ හමුදා මූලස්ථානයෙන් විදුලි හා යාන්ත්‍රික

ඉන්ජිනේරු අධ්‍යක්ෂක වශයෙන්ද හමුදා ප්‍රකාශක සහ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂක වශයෙන්ද කටයුතු කරනු ලැබ ඇත.

2001 වර්ෂයේදී පාලිත ප්‍රනාන්දු හමුදා සේවයෙන් විශ්‍රාම ලැබීමෙන් පසු ලංකා මිල්ක් ෆුඩ් ආයතනයේ කර්මාන්තශාලා කලමනාකරු ලෙස 2002 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂක අංශයේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කරනු ලැබිණි. 2005 වර්ෂයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වශයෙන් පත් වීමෙන් අනතුරුව ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආරක්ෂක ලේකම් ධූරයට පත් වූ පසු ආරක්ෂක අමාත්‍යාංශයේ හමුදා සම්බන්ධීකරණ නිලධාරි ලෙස රාජකාරි බාර ගන්නා ලෙස පාලිත ප්‍රනාන්දු වෙත ආරාධනයක් සිදු කෙරෙන ලද අතර ඒ අනුව ඔහු 2005.12.01 දින සිට එම තනතුරේ වැඩ බාරගත් අතර ඒ සමග මේජර් ජෙනරාල් නිලයට උසස් කිරීමක්ද සිදු විය. 2005-2006 වර්ෂ ඇතුළත හමුදාවෙන් විශ්‍රාම යන ලද තරුණ පිරිස් බොහෝමයක් රැකියා විරහිතව සිටි බැවින් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ ප්‍රමුඛ ආරක්ෂක ලංකා ලිමිටඩ් නමින් පුද්ගලික ආරක්ෂක සමාගමක් ස්ථාපනය කරනු ලැබිණි. පසුව එය රක්නා ආරක්ෂක ලංකා සමාගම ලෙස හඳුන්වන ලදී. එම ආයතනයේ සේවය සඳහා ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ විශ්‍රාම ලැබූ නිලධාරින් බඳවා ගනු ලැබූ අතර ඔවුන් රාජ්‍ය ආයතනයන්හි ආරක්ෂාව සඳහා යොදවනු ලැබිණි. රක්නා ආරක්ෂක ලංකා සමාගම සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමකි. පාලිත ප්‍රනාන්දු මෙම ආරක්ෂක සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙස මුල සිටම ක්‍රියාකරනු ලැබූ අතර පසුව එම සමාගමේ සභාපති ලෙස අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඔහු පත් කර ගන්නා ලදී. ඒ අනුව පාලිත ප්‍රනාන්දු ආරක්ෂක අමාත්‍යාංශයේ යුධ

හමුදා සම්බන්ධීකරණ නිලධාරි තනතුරට අමතරව රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති ලෙසද කටයුතු කරනු ලැබිණි.

2010-2011 වර්ෂයන්හි මැද පෙරදිග මුහුදේදී එල්ල වූ මුහුදු කොල්ලකරුවන්ගේ ප්‍රහාර හේතුවෙන් එම ප්‍රදේශය හරහා ගමන් ගන්නා නෞකාවලට ආරක්ෂාව සැපයීමට රක්නා ආරක්ෂක ලංකා සමාගම කටයුතු සූදානම් කරනු ලැබිණි. ඒ අනුව තවත් පුද්ගලික සමාගම් කීපයක් සමග සම්බන්ධ වනු ලැබ රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් නෞකාවන්ට මුහුදු ආරක්ෂක නිලධාරින් ලබා දීමට කටයුතු කරන ලදී. ගාලු වරායට ආසන්නව යාත්‍රා කළ මුහුදේ අවි ගබඩා කිරීමට පහසුකමක් අවශ්‍ය වූයෙන් ඇවන්ගාඩ් මැරිටයිම් සමාගම සමග ද්වීපාර්ශවික ගිවිසුමක් ඇති කර ගනු ලැබ එම්.වී ඇවන්ගාඩ් නෞකාවේ පාවෙන අවි ගබඩාවක් ස්ථාපනය කර එය නීත්‍යානුකූලව ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව ක්‍රියාත්මක වනු ලැබිණි. මෙම මුහුදු ආරක්ෂක ක්‍රියාවලිය හේතුවෙන් ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ විශ්‍රාමිකයින් හට රැකියා අවස්ථා ලැබෙන ලද අතර රටට විශාල වශයෙන් විදේශ විනිමය ගලා ඒමක්ද සිදු විය. පාලිත ප්‍රනාන්දු ආරක්ෂක අමාත්‍යාංශයේ හමුදා සම්බන්ධීකරණ නිලධාරියෙකු වශයෙන් සේවය කරන අවධියේ දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩාංගණය සහ අනුරාධපුර පූදබිමේ පිහිටි සඳහිරු සෑය ඉදි කිරීම සඳහාද සම්පූර්ණව මැදිහත්ව එම කටයුතු අධීක්ෂණය කරන ලදී. මෙහිදී එම ඉදිකිරීම් පිළිබඳව එවකට අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් සමගද ඔහු ඉතා සමීපව කටයුතු කර ඇත. මෙම රාජකාරීන් වලට අමතරව ඔහු ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ සභාපති ලෙසත් ආසියානු මලල ක්‍රීඩා සංගමයේ කමිටු සාමාජිකයෙක් වශයෙන්ද කටයුතු කරන

ලදී. 2015.01.08 වන දින පැවති ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පරාජයට පත් වීමෙන් පසු පාලිත ප්‍රනාන්දු හමුදා සම්බන්ධීකරණ තනතුරෙන් 2015.01.10 දිනත්, ලද උපදෙස් පරිදි 2015.01.26 වෙනි දින රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති ධූරයෙන්ද ඉල්ලා අස් විය. 2019.01.16 වෙනි දින පාලිත ප්‍රනාන්දු දකුණු ආසියානු මලල ක්‍රීඩා සංගමයේ රැස්වීමක් සඳහා නවදිල්ලි නුවරට යාමට බලාපොරොත්තුවෙන් සිටින ලද අතර ඒ සඳහා අවශ්‍ය ගුවන් ගමන් ටිකට් පත්ද ලබාගෙන එදින දහවල් 12.00ට නියමිතව තිබූ සිය ගුවන් ගමන ආරම්භ කිරීමට සූදානම්ව සිට ඇත. එදින උදෑසන 6.30ට පමණ ඔහු කොළඹ ක්‍රීඩා අමාත්‍යාංශයට ව්‍යායාම කිරීම සඳහා පිටත් වී ඇති අතර එහි ව්‍යායාම් කටයුතු වල නිරත වෙමින් සිටින අතරතුර ඔහුගේ මිතුරෙකු වන හේමසිරි ප්‍රනාන්දුගෙන් ලද දුරකථන ඇමතුමකින් දැනගන්නා ලද්දේ එදින ගුවන් තොටුපලේදී පාලිත ප්‍රනාන්දුව අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇති බවය. එසේ හෙයින් එම ගුවන් ගමන අවලංගු කරන ලෙසද හේමසිරි ප්‍රනාන්දු විසින් දැනුම් දුන් අතරම ඊට විනාඩි කීපයකට පසු එම පණිවිඩයම පාලිත ප්‍රනාන්දු හට සිය බිරිඳගෙන්ද දැනගන්නට ලැබී තිබිණි. ඒ අනුව පාලිත ප්‍රනාන්දු විසින් තම ගුවන් ටිකට් පත අවලංගු කර නිවසට ගොස් මේ පිළිබඳව නීතිඥවරුන් සමග සාකච්ඡා කරන ලද අතර ඔවුන්ගෙන් ලද උපදෙස් අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කර තමා අත්අඩංගුවට ගැනීම වැළැක්වීමට නියෝගයක් නිකුත් කරන ලෙසට ඉල්ලීමක් සිදු කර ඇත. තමා අත්අඩංගුවට ගැනීමේ සූදානම සම්බන්ධව පාලිත ප්‍රනාන්දු විසින් කරුණු සොයා බැලූ අතර එහිදී ඔහුට දැන ගැනීමට ලැබුණේ 2015.10.06 වන දින ගාලු වරායට

ආසන්නයේ ජාත්‍යන්තර මුහුදේදී අත්අඩංගුවට ගන්නා ලද ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාවේ අනුමැතිය නොමැති ගිණි අවි තිබෙන බවත් එසේ හෙයින් තමාවද මේ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමට සූදානමක් පවතින බවය. ඒ අනුව සකස් කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමේදී ඔවුන් විසින් සඳහන් කලේ මෙම සිද්ධිය වීමට මාස 09කට ප්‍රථමව පාලිත ප්‍රනාන්දු රක්නා ලංකා ආයතනයෙන් ඉවත්ව සිටි බවත් ඔහුගෙන් පසුව සභාපති ධූරයට පත් කරන ලද එම නිලධාරින්ද අදාළ ගිවිසුම් පාලිත ප්‍රනාන්දු අත්සන් කළ ආකාරයටම අත්සන් තබා ඇති බැවින් අදාළ නැවේ කිසිම නීති විරෝධී ආකාරයේ අවි නොමැති බවය. මූලික අයිතිවාසිකම් පෙත්සමක් 2019.01.26 වෙනි දින විභාගයට ගත් අතර 2019.03.23 වෙනි දින දක්වා කල් තබන ලදී. එසේ තිබියදී පාලිත ප්‍රනාන්දු හට මතකයේ ඇති ආකාරයට 2019 ජූනි මස දිනක ඔහුව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමක් කර ඇවන්ගාඩ් පාවෙන අවි ගබඩාව අත්අඩංගුවට ගැනීම සම්බන්ධව ප්‍රකාශයක් ලබාදෙන ලෙස ඉල්ලුම් කර නිසාවෙන් ඔහු එහි ගොස් ප්‍රකාශයක් ලබා දෙන ලදී. එහිදී පාලිත ප්‍රනාන්දු විමර්ශන නිලධාරින්ගෙන් විමසා සිටියේ 2015.10.06 වන දින සිදු වූ සිදුවීමක් සඳහා 2019 තෙක් විමර්ශන සිදු නොකර සිටීම සහ ඔහු 2015 ජනවාරි මස එම සමාගමේ සභාපති තනතුරෙන් ඉවත් වූ පසුව විමර්ශනයක් කිරීම විමතියට කරුණක් බවත් මෙහි යටි අරමුණ පලි ගැනීමක් යන්න බවයි. විශේෂයෙන් මෙහිදී පාලිත ප්‍රනාන්දු විසින් සඳහන් කර ඇත්තේ තමා මේ සම්බන්ධව කිසිවක් නොදන්නා බවත්, එම සිද්ධිය වන අවස්ථාවේ තමා එම ආයතනයෙන් ඉවත්ව සිටි බවත් සහ එමනිසා ඒ සිද්ධිය සම්බන්ධව තමා හට කිසිදු වගකීමක් නොපැවරෙන බවය. 2013.03.23 දිනට කල් ගිය මූලික අයිතිවාසිකම් පෙත්සම හා එවැනිම

මෙම සිද්ධියට සම්බන්ධ තවත් මූලික අයිතිවාසිකම් පෙත්සම් 04ක් ඉදිරිපත් වී ඇති බැවින් එම 05 ම එක්කොට 2019.07.13 වෙනි දින විභාගයට ගන්නා බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දන්වන ලදී. 2019.07.03 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේදී පාලිත ප්‍රනාන්දුගේ මූලික අයිතිවාසිකම් පෙත්සම සමග මෙම විමර්ශනයට සම්බන්ධ ඉතිරි මූලික අයිතිවාසිකම් පෙත්සම්ද විභාගයට ගැනිණි. අදාළ පෙත්සම් සම්බන්ධයෙන් යෙදෙන ලද කරුණු මත එකී පෙත්සම් නිශ්ප්‍රභ කිරීමට යෙදෙන ලදී. එම හේතුව මත පාලිත ප්‍රනාන්දු අත්අඩංගුවට ගැනීමට තවදුරටත් බාධාවක් නොමැති බව දන්වා නීතිපතිවරයා විසින් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට ලිපියක් යොමු කර ඇත. ඒ අනුව 2019.07.08 වෙනි දින පාලිත ප්‍රනාන්දු ජයවර්ධනපුර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී එහි පැමිණි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරික්ෂක සෙනරත් ඇතුළු නිලධාරින් කණ්ඩායම විසින් මොහු අත්අඩංගුවට ගනු ලැබූ අතර එම අවස්ථාවේම එහි පැමිණි ගංගොඩවිල වැඩ බලන මහේස්ත්‍රාත්වරිය විසින් පාලිත ප්‍රනාන්දු රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කරන ලදී. පාලිත ප්‍රනාන්දු ප්‍රකාශ කර සිටිනුයේ රක්ෂිත බන්ධනාගාරගත කරන අවස්ථාවේදී පවා ඔහු සිදු කරන ලද වරද කුමක්දැයි නිශ්චිත දැනුම් දීමක් සිදු නොකළ බවයි.

2019.07.10 වන දින එවකට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපතිව සිටි නියෝජ්‍ය පොලිස්පති නාගහමුල්ල විසින් පොලිස්පතිවරයා වෙත ලිපියක් ඉදිරිපත් කරමින් ඉදිරිපත් වී ඇති කරුණු මත පාලිත ප්‍රනාන්දු අත්අඩංගුවට ගත නොහැකි බැව් දන්වන ලදුව පොලිස්පතිවරයා විසින් 2019.07.11 දින එම ලිපිය නීතිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිණි. එහි ප්‍රතිඵලය වූයේ නියෝජ්‍ය පොලිස්පති

නාගහමුල්ල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු කරනු ලැබ සහකාර පොලිස් අධිකාරි ශානි අබේසේකර එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධූරයට පත් කරනු ලැබීමය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ධූරයට ශානි අබේසේකරගේ පැමිණීමත් සමග විමර්ශන කටයුතු නව මුහුණුවරක් ගත් අතර පාලිත ප්‍රනාන්දු ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 44146/15 යටතේ අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ අතර ඔහු වෙනුවෙන් සිදු කෙරෙන ලද ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කොට නැවතත් රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කරනු ලැබිණි. මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ලබා දීම ප්‍රතික්ෂේප වූයෙන් ගාල්ල මහාධිකරණයට නඩු අංක HCBA118/19 දරණ ඇප ඉල්ලුම් පත්‍රය 2019.07.31 වන දින ඉදිරිපත් කරනු ලැබ තිබිණි. මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව 2019.09.06 දිනට කල් තබනු ලැබ තිබියදී කොළඹ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ඉදිරිපත් කිරීමේ සූදානමක් පවතින බවට දැනගැනීමට ලැබෙන ලදින් ගාල්ල මහාධිකරණයට ඉදිරිපත් කර තිබූ ඇප ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස් කර ගැනීමට සිදු විය. 2019.09.27 වන දින පාලිත ප්‍රනාන්දු සහ මෙම කාරණය හා අදාළව රක්ෂිත සිරභාරයට පත් කරනු ලැබ සිටි සෙසු තැනැත්තන්ද කොළඹ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ අතර HC(TAB)751/2019 යටතේ අධිචෝදනා භාර දෙන ලදී. පාලිත ප්‍රනාන්දු මෙහි තුන් වන චූදිතයා වූ අතර චෝදනා පත්‍රයේ චෝදනා 7573ක් ඇතුළත්ව තිබිණි. ඒ අතර පාලිත ප්‍රනාන්දුට එරෙහිව චෝදනා 53ක් පැවති අතර ඔහුට නගා තිබූ ප්‍රධාන චෝදනාව වූයේ එම චෝදනා පත්‍රයේ ඇතුළත් වූ වැරදි සිදු කිරීම් සඳහා ආධාර හා අනුබල දීමේ චෝදනාව වේ. ත්‍රිපුද්ගල මහාධිකරණය විදේශ ගමන් තහනම්

කිරීමේ කොන්දේසිය සහිතව විසින් රුපියල් ලක්ෂ පහක මුදල් ඇපයක්ද ලක්ෂ විසි පහක ශරීර ඇප දෙකක්ද වශයෙන් වූ ඇප බැඳුම්කරයක් මත මුදා හැරීමට නියෝග කරන ලදී. පිළිවෙලින් 2019.12.17, 2020.01.17 යන දිනයන්හි නඩුව කැඳවන ලද අවස්ථාවේ පාලිත ප්‍රනාන්දු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් ත්‍රිපුද්ගල මහාධිකරණයට ඉදිරිපත් කරන ලද කරුණු සලකා බැලීමෙන් පසුව 2020.01.17 වන දින පාලිත ප්‍රනාන්දු සියලු චෝදනා වලින් නිදහස් කරන ලදී. එමෙන්ම එම අවස්ථාවේදී ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් අධිචෝදනා පත්‍රයේ වූ චෝදනා 7573න් චෝදනා 19ක් හැර සෙසු සියලු චෝදනා අධිචෝදනා පත්‍රයෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී.

ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 44146/15 දරණ වාර්තාව ඉදිරිපත් කිරීමේදී අදාළ වැරදි සිදු කෙරෙන ලදැයි සඳහන්ව තිබූ කාලයට වඩා වෙනස් කාල පරිච්ඡේදයක් ත්‍රිපුද්ගල මහාධිකරණයේ ඉදිරිපත් කර තිබූ අධිචෝදනා පත්‍රයේ චෝදනාවන්හි සඳහන්ව තිබිණි. පාලිත ප්‍රනාන්දු ප්‍රකාශ කර සිටිනුයේ එය සිතාමතාම ඔහු මෙම නඩුවට ඇතුළත් කර ගැනීම සඳහා සිදු කරනු ලැබූවක් බවයි. හුදෙක් එවකට ආරක්ෂක ලේකම් හා වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ වර්තමාන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා යටතේ රාජකාරි ඉටු කිරීම සම්බන්ධයෙන් ඇති වී තිබූ ඊර්ෂ්‍යාව සහ ක්‍රෝධය පිරිමසා ගැනීම සඳහා යහපාලන රජයේ දේශපාලනඥයින්ගේ පෙළඹවීම මත කිසිදු වරදක් සිදු නොකර සිටියදී අසත්‍ය චෝදනා ඉදිරිපත් කර තමා දින 82 ක කාලයක් රක්ෂිත බන්ධනාගාරයෙහි තැබීමෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අසාධාරණ සහ ද්වේශ සහගත ලෙස තමාගෙන් පලි ගැනීමක් සිදු

කරන ලද්දේ යැයි පාලිත ප්‍රනාන්දු මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් කියා සිටින ලදී. බන්ධනාගාරගතව සිටින කාලය තුළදී ඔහුගේ පාදයේ ඇති වූ ආබාධයක් සඳහා වෛද්‍ය චිකිත්සක ප්‍රතිකාර ලබා ගැනීමට සිදුව ඇති බවත් ශල්‍යකර්මයකට භාජනය වීමේ ප්‍රවණතාවයක් පවතින බවත් කොමිෂන් සභාව වෙත කියා සිටි පාලිත ප්‍රනාන්දු රටේත් ජාතියේත් අනාගත සුබසිද්ධිය ඇති කිරීම සඳහා ඉතා වෙහෙස මහන්සි වී කටයුතු කිරීමෙන් අනතුරුව යහපාලන රජයේ වෛරී ක්‍රියාකාරකම් හේතුවෙන් රෝගියෙකු බවට පත් වීමට සිදු වන ලද්දේ යැයිද වසර 40 කට වැඩි කාලයක් යුධ හමුදාවේ සිදු කරන ලද සේවයෙන් ලබා සිටි කීර්තිය මැකී ගොස් නිකරුණේ අපකීර්තියට ලක් වීමට සිදු වුණේ යැයිද කොමිෂන් සභාව වෙත වැඩිදුරටත් පවසා සිටින ලදී.

පාලිත ප්‍රනාන්දු රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති වශයෙන් සිදු කරන ලද තවත් නිල කාර්යයක් සම්බන්ධව දෝෂාරෝපණයක් නගනු ලැබ ඔහුට එරෙහිව නඩු කටයුත්තක් ආරම්භ කෙරෙන ලදැයි පාලිත ප්‍රනාන්දුගේ සාක්ෂියෙහි කියා සිටින ලදී. ඊට අදාළ වූ කරුණු පහත සඳහන් පරිදි වේ.

පාලිත ප්‍රනාන්දු ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන ලදී. එලෙස කටයුතු කරනු ලැබීමේදී ක්‍රීඩා කරන පාසැල් ළමුන් සහ ජ්‍යෙෂ්ඨ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා කටයුතු වලදී ඔවුන් මුහුණ දෙන දුෂ්කරතාවයන් පාලිත ප්‍රනාන්දු සමඟ පවසනු ලැබ ඇත. බෙහෙවින්ම ආර්ථික දුෂ්කරතා මත මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන්ය. එබඳු අවස්ථාවන්හි සාමාන්‍යයෙන් ක්‍රීඩා සංගමයෙන් සිදු කෙරෙනුයේ අනුග්‍රාහක ආයතනයකට සම්බන්ධ කර දීමෙනි. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අවශ්‍යතා සපුරා දීමේ අදහසින් භාර

අරමුදලක් ආරම්භ කිරීමට මලල ක්‍රීඩා සංගමයේ සභාපතිවරයා වශයෙන් පාලිත ප්‍රනාන්දු යෝජනා කරනු ලැබූ අතර එම භාර අරමුදල ආරම්භ කිරීමට අනුග්‍රාහකත්වය දැක්වීමට කැමති හිත මිතුරන්ගේ උපකාර අපේක්ෂා කරන ලදී. ඒ අනුව එකී භාර අරමුදල 2012.08.19 වෙනි දින ආරම්භ කරනු ලැබූ අතර එම අරමුදල ස්ථිර තැන්පතුවක තබා ඉන් ලැබෙන පොලියෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ හදිසි අවශ්‍යතා සපුරාලීම සිදු කරන ලදී. නිශ්ශංක සේනාධිපති මහතා මෙම අරමුදලට රුපියල් මිලියන 50 ක් ලබා දීමට කැමැත්ත පල කර සිටි අතර ඉන් මිලියන 15 ක් ලබා දෙන ලදී. එම ගණුදෙණුව සිදු වූයේ ඔහුගේ බැංකු ගිණුමකින් අදාළ භාර අරමුදලට මුදල් මාරු කිරීමෙනි. මෙම භාර අරමුදල ඒ සඳහා වූ ඔප්පුවක් මගින් නිර්මාණය කරනු ලැබ ඇති අතර එම ඔප්පුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද්දකි. අරමුදලට ලැබෙන සියලු මුදල් ලේඛනගත කරණු ලැබ ඇති අතර ගණුදෙණු විගණනය කිරීමට විගණන ආයතනයකට බාර දී ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් පාලිත ප්‍රනාන්දු සාක්ෂි දෙන අවස්ථාවේදී කොමිෂන් සභාව විසින් ඔහුගෙන් පහත සඳහන් පරිදි ප්‍රශ්න කිරීමක් සිදු කරන ලදී.

කොමිෂන් සභාව මගින්:-

ප්‍ර: දැන් ඔය ට්‍රස්ට් ෆන්ඩ් එක හැදුවේ මොන ආයතනය මුල් වෙලාද?

උ: මම ස්වාමිනි මලල ක්‍රීඩා සංගමයේ සභාපති. කිසිම ආයතනයක් මුල් කරගෙන නොවේ මම ට්‍රස්ට් ෆන්ඩ් එකේ සභාපති හැටියට ඉන්වයිට් කළා තව හතර පස් දෙනෙකුට. විශ්වාසවන්ත හතර පස් දෙනෙකුට. එයාලත්

එක්ක එකතු වෙලා තමයි ට්‍රස්ට් ෆන්ඩ් එක හැදුවේ. ට්‍රස්ට් ඩීඩ් එකත් නීතිඥ මහත්තයෙකුට කියලා හදවගෙන ඒකත් අත්සන් කරලා රෙජිස්ටර් කළා.

නැවතද කොමිෂන් සභාව විසින් මලල ක්‍රීඩා සංගමය සම්බන්ධයෙන් පාලිත ප්‍රනාන්දුගෙන් ප්‍රශ්න කරන ලදී.

ප්‍ර:- දැන් ඔය මලල ක්‍රීඩා සංගමය රාජ්‍ය ආයතනයක්ද?

උ:- නැහැ ස්වාමිනි.

ප්‍ර:- දැන් මලල ක්‍රීඩා සංගමයේ සභාපති වුණේ තමුන් කිසියම් රජයේ නිලතලයක් දැරීමේ හේතුව මතද නැත්තම් පෞද්ගලිකව තෝරා ගත්තාද?

උ:- මලල ක්‍රීඩා සංගමයේ සාමාජිකයන් විසින් මහා සභා රැස්වීමේදී නොමිනේෂන් කැඳවලා තමයි තෝරා ගන්නේ සභාපති, ලේකම් එහෙම.

ප්‍ර:- ඒකට රජය සම්බන්ධයක් තිබෙනවාද?

උ:- රජයට කිසිම සම්බන්ධයක් නැහැ.

ප්‍ර:- ක්‍රීඩා අමාත්‍යංශය සම්බන්ධයක් තියෙනවාද?

උ:- නැහැ ස්වාමිනි. ක්‍රීඩා අමාත්‍යාංශයේ අපි රෙජිස්ටර් වෙනවා මලල ක්‍රීඩා සංගමය හැටියට

මේ අනුව පාලිත ප්‍රනාන්දු පැහැදිලි කර දෙන ලද්දේ ඔහු රක්නා ලංකා ආරක්ෂක සමාගමෙහි සභාපති තනතුර දැරීමෙහි සම්බන්ධතාවයක් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් ආධාර උපකාර කිරීමට මලල ක්‍රීඩා සංගමයේ අනුග්‍රහය සහිතව භාර අරමුදලක් පිහිටුවීම කෙරෙහි

නොමැති බවය. කෙසේ වෙතත් මෙම කරුණු සම්බන්ධව පාලිත ප්‍රනාන්දු අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත කැඳවනු ලැබූ අතර ප්‍රකාශයක් සටහන් කරනු ලැබිණි. තවද එම අවස්ථාවේ ඇවන්ගාඩ් ආයතනයේ සභාපති නිශ්ශංක සේනාධිපති මහතාද එහි කැඳවනු ලැබ තිබිණි. රාත්‍රී 8.30ට පමණ පාලිත ප්‍රනාන්දු සහ නිශ්ශංක සේනාධිපති කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයාගේ නිල නිවසට ඉදිරිපත් කරනු ලැබූ අතර එම අවස්ථාවට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙනුවෙන් නීතිඥවරියන් දෙදෙනෙක්ද නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් රජයේ අධිනිතිඥ ජනක බන්ඩාර ද පෙනී සිටින ලදී. පාලිත ප්‍රනාන්දු සහ නිශ්ශංක සේනාධිපති වෙනුවෙන්ද නීතිඥවරුන් පෙනී සිටි අතර දෙපාර්ශවයේ කරුණු දැක්වීමෙන් පසු මහේස්ත්‍රාත්වරයා පාලිත ප්‍රනාන්දු සහ නිශ්ශංක සේනාධිපති ඇප මත මුදා හැරීමට නියෝගයක් සිදු කරන ලදී. මේ අවස්ථාවේදී එවකට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්ව සිටි දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මිය යුධ හමුදාවේ ආයුධ සන්නද්ධ ආරක්ෂක කණ්ඩායම් දෙකක් සමග ජීප් රථයකින් එම ස්ථානයට කළබලයෙන් පැමිණි අතර උස් හඬින් මහේස්ත්‍රාත්වරයා වෙත ප්‍රකාශ කරන ලද්දේ පාලිත ප්‍රනාන්දු සහ නිශ්ශංක සේනාධිපති රිමාන්ඩ්භාරයට පත් කළ යුතු බවයි. ඒ වන විට මහේස්ත්‍රාත්වරයා සිය නියෝගය සටහන් කර තිබූ අතර එහි වෙනසක් සිදු කළ නොහැකි වන බව දැනුම් දෙන ලදී. මෙම ඇප නියෝගයට එරෙහිව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මහාධිකරණයට ප්‍රතිශෝධන අයදුම්පතක් ඉදිරිපත් කරන ලද නමුත් මහාධිකරණයෙන් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිණි. මෙම කරුණ සම්බන්ධයෙන්ද ත්‍රිපුද්ගල මහාධිකරණයේ අංක

HC(TAB)25/2017 නඩු අංකය යටතේ අධිචෝදනා ඉදිරිපත් කරනු ලැබූ අතර පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් වන ලද්දේ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ ජනක බන්ඩාර මහතාය. එහිදී මෙම නඩුව පැවරීම සඳහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ විධිමත් අනුමැතියක් ලබා ගෙන ඇත්ද යන ප්‍රශ්නය පැන නැගුන අතර ඊට පැමිණිල්ල වෙනුවෙන් පැහැදිලි පිළිතුරක් ලබා නොදී නඩුව ඉදිරියට පවත්වාගෙන යනු ලැබිණි. මෙම විරෝධතාවය චූදිතයින් වෙනුවෙන් නැවත ඉදිරිපත් කරනු ලැබ ඒ සම්බන්ධයෙන් මහාධිකරණය විසින් නෛතික සැල කිරීම් අධ්‍යනය කර විරෝධතාවය ප්‍රතික්ෂේප කරමින් නියෝගයක් ලබා දෙනු ලැබිණි. එම නියෝගය පාලිත ප්‍රනාන්දු සහ නිශ්ශංක සේනාධිපති එනම් චූදිතයින් වෙනුවෙන් අභියාචනාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරනු ලැබූ අතර එම ඉල්ලීම සලකා බැලීමේදී අභියාචනාධිකරණය විසින් ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු විභාගය අත්හිටුවාලන අතුරු නියෝගයක් නිකුත් කරන ලදී.

පාලිත ප්‍රනාන්දු සිය පැමිණිල්ලට වගඋත්තරකරුවන් වශයෙන් පහත නම් සඳහන් තැනැත්තන් නම් කරනු ලැබිණි.

1. හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතා
2. හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා
3. හිටපු අමාත්‍ය රවුෆ් හකීම් මහතා
4. හිටපු අමාත්‍ය සරත් ෆොන්සේකා මහතා
5. පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. සම්බන්ධන් මහතා
6. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ සුමන්තිරම් මහතා
7. පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා
8. ජේ.සී වැලිඅමුණ මහතා

9. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා
10. හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා
11. දූෂණ විරෝධී ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ එම්.කේ ආනන්ද විජේපාල මහතා
12. සොලිසිටර් ජෙනරාල්) වැඩ තහනම් (දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය

2020.10.26 දින අවසන් වශයෙන් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වූ විමර්ශනය පැවැත්වෙන ලද දිනය පරික්ෂණ කොමිෂන් සභා පනතේ 16 වගන්තිය යටතේ ඉහත නම් සඳහන් 1 සිට 12 දක්වා වගඋත්තරකරුවන් වෙත දැනුම් දී නොතීසි නිකුත් කරන ලද නමුත් ඔවුන්ගේ පෙනී සිටීමක් හෝ ඔවුන් වෙනුවෙන් නීතිඥ නියෝජනයක් සිදු නොවිනි. එදින වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා පාලිත ප්‍රනාන්දු සාක්ෂියට කැඳවනු ලැබූ අතර ඔහු වෙත යොමු කෙරෙන ලද ප්‍රශ්නයනට පිළිතුරු ලබා දෙමින් පහත සඳහන් කරුණු ප්‍රකාශ කරනු ලැබිණි.

පාලිත ප්‍රනාන්දු රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති වශයෙන් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සේවය කරන ලද අතර ඔහු සභාපතිවරයා වශයෙන් සේවය කරන ලද කාලය තුළ එම සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් සේවය කරන ලද්දේ ජෙනරාල් කේ.වී එගොඩවෙලය. සභාපතිවරයා වශයෙන් පාලිත ප්‍රනාන්දුගේ රාජකාරිය වන ලද්දේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබීමද කරුණු රැස් කර අදාළ උපදෙස් ලබා දීමද වූ අතර මෙහෙයවීම් කටයුතු සිදු කරන ලද්දේ ප්‍රධාන විධායක නිලධාරි විසිනි. රක්නා ආරක්ෂක ලංකා සමාගම ඇවන්ගාඩ් මැරිටයිම් සෙකියුරිටි සර්විස් සමාගම සමග විටින් විට අවබෝධතා ගිවිසුම් අත්සන් කරනු ලැබිණි. 2012.03.19

වන දින සාමූහික ව්‍යාපාර කටයුතු කිරීමේ ගිවිසුම වන අංක 322 ගිවිසුමට පාලිත ප්‍රනාන්දු සභාපතිවරයා වශයෙන් අත්සන් තබා ඇත. එම ගිවිසුමට අදාළ පාවෙන අවි ගබඩාව සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගත යුතු වන අනුමැතිය ලබා ගැනීමේ වගකීම පැවරෙන ලද්දේ රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙතය. එම සමාගම වෙත බාර දී තිබූ සියලු අවි ශ්‍රී ලංකා රජයට අයත් අවි වේ. මෙම ගිවිසුම ප්‍රකාරව වූ හවුල් ව්‍යාපාරයේ ලාභ ප්‍රතිලාභ බෙදා ගැනීමේ ප්‍රතිශතය වූයේ 35% ක් සහ 65%ක් වශයෙන් වූ අතර රක්නා ආරක්ෂක ලංකා සමාගමට සියයට 35ක ලාභයද යූ.එන්.එස් සමාගමට 65% ක ලාභයද හිමි විය. එම්.වී ඇවන්ගාඩ් නෞකාවට නාවික හමුදාවේ නිලධාරින් ඇතුළු වී පරික්ෂාවට ලක් කරන අවස්ථාව වන විට පාලිත ප්‍රනාන්දු රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සේවයෙහි නොවීය.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ.8 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 . XXXIII

පැමිණිලි අංකය - 431/20

පැමිණිලිකරු - වික්ටර් සමරවීර

ලිපිනය - අංක 575/15, හබරකඩ, හෝමාගම

පැමිණිලිකරු දේශපාලන පලි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

01. හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න මයා.
02. හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මයා.
03. නියෝජ්‍ය අධ්‍යක්ෂ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව, ශානි අබේසේකර මයා.
04. පොලිස් පරික්ෂක අළුත්ගේ සෙනරත් මයා.
05. රජයේ අධිනීතිඥ ජනක බන්ඩාර මයා.

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර වික්ටර් සමරවීර යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින්

ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව, වික්ටර් සමරවීර මහතාට එරෙහිව ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී 44146 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින්පැමිණිලිකාර වික්ටර් සමරවීර නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. ආරක්ෂ ලේකම්වරයාගේ නියෝග වලට අවනත නොවී එම්.වී . ඇවන්ගාඩ් නෞකාව අත්අඩංගුවට ගැනිමට නාවික හමුදා නිලධාරීන් විසින් ක්‍රියා කිරීම මගින් ද, එම්.වී.ඇවන්ගාඩ් නෞකාව අත්අඩංගුවට ගැනිමෙන් පසුව ඒ පිළිබඳව ආරක්ෂක ලේකම්වරයාට වාර්තා නොකිරිම මගින් ද,නාවික හමුදා නිලධාරීන් රාජ්‍ය බලයට විරුද්ධව ක්‍රියා කිරීමේ වරද සිදු කර ඇත.

5. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිණිලිකරු රැඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකුඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

6. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී .

7. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

8. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම .

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

වික්ටර් සමරවීර ලිපිකරුවෙක් වශයෙන් රාජ්‍ය සේවයට ඇතුළු වූයේ 1972.01.07 වන දිනය. වසර 07 ක කාලයකින් පසු ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විභාගයෙන් සමත් වී පරිපාලන සේවයට එක් වූ අතර සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙක් වශයෙන්ද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ(පරිපාලන) වශයෙන්ද නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් වශයෙන්ද ප්‍රාදේශීය කර්මාන්ත අධ්‍යක්ෂකවරයෙක් වශයෙන්ද ප්‍රාදේශීය ලේකම්වරයෙක් වශයෙන්ද රේගු අධ්‍යක්ෂ වශයෙන්ද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වශයෙන්ද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂක වශයෙන්ද, අමාත්‍යාංශ අතිරේක ලේකම්වරයෙක් වශයෙන්ද බස්නාහිර පලාතේ ප්‍රධාන ලේකම්වරයා වශයෙන්ද දීර්ඝ කාලයක් පරිපාලන ක්ෂේත්‍රයේ සේවය කරනු ලැබීමෙන් අනතුරුව 2011 වර්ෂයේ අමාත්‍යාංශ ලේකම්වරයෙකු වශයෙන් පත් වනු ලැබිණි. 2015.04.23 දින සිට 2016.12.27 දින දක්වා ඔහු සේවය කරන ලද්දේ රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපතිවරයා වශයෙනි. ඒ වන විට ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබ සිටින ලදී.

රක්නා ආරක්ෂක ලංකා සමාගම අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි ස්ථාපිත කරනු ලැබූවක් වන අතර විශේෂයෙන් කොළඹ නගරයේ මර්මස්ථාන ලෙස සැලකෙන ලද රජයේ ආයතනයන් ආරක්ෂා කිරීමේදී ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය වෙත පැවරී තිබුණු වගකීම් සරල කිරීම සඳහා ආරක්ෂක ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහබැංකුව, ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා රේගුව ආදී වූ විශේෂිත රාජ්‍ය ආයතන වල ආරක්ෂාව සැපයීම සඳහා මෙම ආයතනයේ ආරක්ෂක සේවාවන් ලබා ගැනීම අනිවාර්යය කරනු ලැබ තිබිණි. වික්ටර් සමරවීර රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපතිවරයා වශයෙන් රාජකාරි බාර ගන්නා අවස්ථාව වන විටත් යම් සේවාවන් පවත්වාගෙන යාම සඳහා වෙනත් සමාගම් සමග ගිවිසුම් ඇති කර ගනු ලැබ තිබිණි. මුහුදු ආරක්ෂක සේවා ලබා දීම සඳහා ඇවන්ගාඩ් සමාගම සමග ඇති කර ගෙන තිබූ ගිවිසුම ඉන් එකක් විය.

වික්ටර් සමරවීර සිය නිලයෙන් විශ්‍රාම ගොස් වසර කීපයකට පසුව සමාජ ජාල වෙබ් අඩවි තුළ සහ වෙනත් මාධ්‍යය මගින් ප්‍රචාරය වූ පුවතකට අනුව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් වික්ටර් සමරවීර ඇතුළු 08 දෙනෙකු අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන බැවු වික්ටර් සමරවීර හට දැන ගැනීමට ලැබිණි. මෙම පුවත දැනගත් වහාම වික්ටර් සමරවීර අනතුරුව එළඹෙන ලද සඳුදා දිනයේදී උදෑසනින්ම සිය සහෝදරයා ද සමග අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට යන ලද අතර එහි අධ්‍යක්ෂ ශානි අබේසේකර මුණගැසී මෙම පුවත පිළිබඳව පවසන ලදී. අත්අඩංගුවට ගැනීමට නියමිතව සිටි නම් ලැයිස්තුවෙහි වික්ටර් සමරවීරගේ නම නොතිබූයෙන් ශානි අබේසේකර වික්ටර් සමරවීරට ආපසු යන ලෙස

පැවසුවද වික්ටර් සමරවීර විසින් තම නිවසට පැමිණ අත්අඩංගුවට ගැනීමක් සිදු නොකරන මෙන් ශානි අබේසේකරට පැවසූයෙන් එහි සිටි පොලිස් නිලධාරියෙකු විසින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් උපදෙස් මත වික්ටර් සමරවීරගේ ප්‍රකාශයක් සටහන් කරනු ලැබූ අතර ප්‍රකාශය සටහන් කිරීමෙන් අනතුරුව ඔහුව අත්අඩංගුවට ගනු ලැබිණි. ඔහු ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 44146/15 දරණ නඩුවට ඉදිරිපත් කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද බී වාර්තාවේ මෙලෙස සඳහන්ව තිබිණි.

> " මෙම විමර්ශනයට අදාළව අත්අඩංගුවට ගැනීම සඳහා විමර්ශනය කරමින් සිටි වික්ටර් සමරවීර යන අය අද දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණ ඉදිරිපත් වූ අතර එම සැකකරු අද දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි බලපත්‍රයක් නොමැතිව ස්වයංක්‍රීය ගිණි අවි ලඟ තබා ගැනීමට කුමන්ත්‍රණය කිරීම හා පුපුරණ ද්‍රව්‍යය ලඟ තබා ගැනීමට සහ ප්‍රවාහනයට අධාර අනුබල දීම හා කුමන්ත්‍රණය කිරීම සම්බන්ධව වරද කියා දී අත්අඩංගුවට ගතිමි."

ගිවිසුම්ගත පරිදි ඇවන්ගාඩ් සමාගම සමග කරගෙන ගිය වැඩපිළිවෙලට එක් අවස්ථාවක් හැටියට මේ ඇවන්ගාඩ් සමාගමේ ඉල්ලීමක් නිර්දේශ කර විධිමත් පරිදි ඒ ආයතනයේ ඒ ඒ වගකිව යුතු නිලධාරින් ආරක්ෂක අමාත්‍යාංශයට විධිමත් පරිදි යොමු කර ඒ සඳහා ආරක්ෂක ලේකම්වරයා විසින් විධිමත් අනුමැතියක් ලබා දී තිබියදි මෙවැනි තත්වයකට මගෙන් ප්‍රශ්න කරන්නේ ඇයි කියන එක මට මහ විශාල ගැටලුවක් වුණා අත්දැකීම් තියෙන රාජ්‍ය සේවයේ නිලධාරියෙක් හැටියට යැයි වික්ටර් සමරවීර මෙම අවස්ථාව පිළිබඳව

කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් කියා සිටිනු ලැබිණි. ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ වික්ටර් සමරවීර රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබිණි. කොමිෂන් සභාව විසින් වික්ටර් සමරවීරගෙන් කරනු ලැබූ ප්‍රශ්න කිරීම් වලට පිළිතුරු දෙමින් ඔහු කියා සිටින ලද්දේ ඔහු රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති ධූරයට පත් කරන ලද්දේ එවකට සිටි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ නිර්දේශය මත ආරක්ෂක ලේකම්වරයා විසින් බවත් ආරක්ෂක ඇමතිවරයා වූයේ ජනාධිපතිවරයා බවත්ය. ඒ අනුව රක්නා ආරක්ෂක ලංකා සමාගම ජනාධිපතිවරයා යටතේ පැවති ආයතනයක් බව ඔහු කියා සිටියේය. වික්ටර් සමරවීර වැඩිදුර කරුණු පැහැදිලි කරමින් කියා සිටින ලද්දේ රක්නා ආරක්ෂක ලංකා සමාගමත් ඇවන්ගාඩ් සමාගමත් ඇති කර ගනු ලැබ තිබූ ගිවිසුමකට අනුව 2011 වර්ෂයේ සිට මුහුදු ආරක්ෂක සේවයට ගිණි අවි සැපයීම ආරක්ෂක ලේකම්වරයාගේ අනුමැතිය යටතේ සිදුවනු ලැබ ඇති බවය. තමා එම සමාගමේ සභාපති ධූරයට පත් වීමෙන් අනතුරුව පවත්වාගෙන යන ලද්දේ එම ව්‍යාපාරය වන බැව් කියා සිටි වික්ටර් සමරවීර තමා විසින් අත්සන් කරන ලද ගිවිසුම ආරක්ෂක ලේකම්වරයාගේ අනුමැතිය සහිතවද ආරක්ෂක අමාත්‍යවරයා වූ ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදිද සිදු කෙරෙන ලද බවත් කෙසේ වෙතත් ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි සිදු කරනු ලබන්නේය යන්න ජනාධිපතිවරයාගේ ඉල්ලීම මත අදාළ ලියවිල්ලෙන් ඉවත් කිරීමට සිදු වූ බවත් ඔහු කියා සිටියේය.

වික්ටර් සමරවීර විසින් අත්සන් කිරීමට යෙදෙන ලද 2015.10.20 දිනැති ගිවිසුම මගින් ගිවිසුම්ගත වන ලද්දේ ඇවන්ගාඩ් සමාගමත්

රක්නා ආරක්ෂක ලංකා සමාගමත් අතර ඇති කර ගනු ලැබ තිබූ සියලුම ගිවිසුම් ඉදිරියට පවත්වාගෙන යනු ලබන බවටය. ඒ අනුව එහිදී ඉදිරියට පවත්වාගෙන යාමට එකඟත්වය ඇති කර ගත් ගිවිසුම වූයේ ඉදිරි මෙහෙයුම් මධ්‍යස්ථාන ව්‍යාපෘතිය, ධීවර යාත්‍රා ව්‍යාපෘතිය, ගාල්ලේ පාවෙන අවිගාර ව්‍යාපෘතිය, අවි ආයුධ ගුවනින් හා මුහුදින් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපෘතිය, අවි රහිත සමුද්‍ර ආරක්ෂණ ව්‍යාපෘතිය, රංගල අවි තැන්පත් කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන් වේ. මේ වන විට අත්සන් තබා තිබූ ගිවිසුම් අනුව ක්‍රියා නොකිරීමේ හේතුව මත ඇවන්ගාඩ් සමාගම විසින් සිංගප්පූරුවේ බේරුම්කරණ නඩුවක් ආරම්භ කර තිබූ අතර ඊට විෂය වන ලද කාරණය සම්බන්ධයෙන් සමතයක් වශයෙන් එම සමාගමෙන් රක්නා ආරක්ෂක ලංකා සමාගමට අය විය යුතුව තිබූ මුදලින් 50% ක් කපා හැරීමටත් එතැන් සිට ඉදිරි කාල පරිච්ඡේදය දක්වා සියලුම මුදල් ගණනය කොට මෙම මුළු මුදලින් 25%ක් රක්නා ආරක්ෂක ලංකා සමාගමට ගෙවීමටත් සහ බේරුම්කරණ නඩුව ඉල්ලා අස් කර ගැනීමටත් එකඟ වනු ලැබිණි.

ඉහත සඳහන් පරිදි අවබෝධතා ගිවිසුම අත්සන් කරනු ලැබ ඊට අනුකූලව කටයුතු පවත්වාගෙන යමින් තිබියදී යහපාලන රජයේ ඇතැම් අමාත්‍යවරුන් ඊට අකමැත්තක් දක්වනු ලැබූයෙන් ඒ සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීම පිණිස රැස්වීමක් පැවැත්වූ අතර ඊට වික්ටර් සමරවීර ද කැඳවනු ලැබ තිබිණි. රාජිත සේනාරත්න, අර්ජුන රණතුංග, පාඨලී චම්පික රණවක යන අමාත්‍යවරුන්ද ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ එම රැස්වීමට සහභාගි වූ අතර එවකට නාවික හමුදාපති රවීන්ද්‍ර විජේගුණවර්ධන ද පැමිණ

සිටින ලදී. මෙම රැස්වීමේදී රාජිත සේනාරත්න අමාත්‍යවරයා දිගින් දිගටම පවසනු ලැබූයේ මේක මහා මගඩියක්. වංචාවක්. මුදල් ගරා ගැනීමක්. ඒ නිසා රාජ්‍ය ආදායමක් හැටියට නාවික හමුදාවට පවරා ගැනීම යුතු බවයි. කවුද ඔය ගිවිසුම අත්සන් කළේ යැයි එම රැස්වීමේදී ජනාධිපතිවරයා විමසනු ලැබූ අතර ඔබතුමානේ උපදෙස් දුන්නේ යැයි ආරක්ෂක ලේකම්වරයා පිළිතුරු දෙන ලදින් එම මාතෘකාව වෙනස් කරන ලදී. අනතුරුව ජනාධිපතිවරයා ප්‍රකාශ කරන ලද්දේ මේක නාවික හමුදාවට පවරා දෙන්න නීත්‍යානුකූල අවශ්‍ය පියවර ගන්න යන්නය. මේ අවස්ථාවේදී වික්ටර් සමරවීර කියා සිටන ලද්දේ මෙම කටයුත්ත ව්‍යාපාරයක් වන බැවින් එය නාවුක හමුදාව විසින් සිදු කළ නොහැක්කක් වන බවය. 2015 වර්ෂයේ නොවැම්බර් මාසයේදී ඉහත සඳහන් කරන ලද රැස්වීම පැවැත්වෙන අවස්ථාව වන විට රාජිත සේනාරත්න සෞඛ්‍යය අමාත්‍යවරයා වශයෙන්ද අර්ජුන රණතුංග ඛනිජ තෙල් අමාත්‍යවරයා වශයෙන්ද චම්පික රණවක නාගරික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන්ද කටයුතු කරන ලදී.

රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරනු ලබන්නේ සුභසිංහ ආරච්චිගේ සරත් ජයතිලක, වික්ටර් සමරවීර වෙනුවෙන් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමට කැඳවන ලදී. ඔහුගේ සාක්ෂියෙන් අපේක්ෂා කරන ලද්දේ රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සහ එම සමාගම විසින් එළඹෙන ලද ගිවිසුම්හි නෛතික තත්වය සම්බන්ධයෙන් වැඩිදුර කරුණු පැහැදිලි කිරීමය. රක්නා ආරක්ෂක ලංකා සමාගම සමාගම් පනත යටතේ ස්ථාපනය කරන ලද්දක් වූ හෙයින් ඊට නෛතික පුද්ගලභාවයක් හිමි විය. මෙම

සමාගමේ කොටස් අයිතිය පූර්ණ වශයෙන් රජය සතු විය. සමාගමේ කටයුතු පිළිබඳව තීන්දු තීරණ ගන්නා ලද්දේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. මෙම සමාගම ස්ථාපනය කිරීම කිසියම් විශේෂ කටයුත්තක් පෙරදැරි කරගෙන සිදු විය. 2015 යහපාලන රජය බලයට පත් වන විට රක්නා ආරක්ෂක ලංකා සමාගමත් ඇවන්ගාඩ් මැරිටයිම් සෙකියුරිටි ආයතනයත් අතර ඇති කර ගන්නා ලද ගිවිසුම් ක්‍රියාත්මක වෙමින් පැවතිණි. යහපාලන රජය බලයට පත් වීමෙන් අනතුරුව මෙම ගිවිසුම කඩ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් රක්නා ආරක්ෂක ලංකා සමාගමට අයවිය යුතු මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබූයෙන් ඒ සම්බන්ධයෙන් සමථයක් ඇති කර ගැනීමට අවශ්‍ය වන ලදින් 2015.10.20 දින අවබෝධතා ගිවිසුමක් ඇති කර ගනු ලැබිණි. එම අවබෝධතා ගිවිසුම අත්සන් තැබීමට තීරණය කරන ලද්දේ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයයි. දීර්ඝ ලෙස සාකච්ඡා කරනු ලැබීමෙන් අනතුරුව අමාත්‍යාංශයට යොමු කරනු ලැබ නැවත අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව එය අනුමැතිය ලබා දෙන ලද්දේය. වික්ටර් සමරවීර සභාපතිවරයා වශයෙන් අවබෝධතා ගිවිසුමට අත්සන් තබනු ලැබුයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි සභාපතිවරයා එය අත්සන් කළ යුතුව තිබූ බැවිනි.

ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබ රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබූ වික්ටර් සමරවීර ඔහු සමග රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබ සෙසු තැනැත්තන් සමග දෙමසකට අධික කාලයක් ඇප ලබා ගත නොහැකිව රක්ෂණ සිරභාරයේ පසුවන ලදී. වික්ටර් සමරවීර රිමාන්ඩ්භාරයට පත්ව සිටියදී කිසියම් සහනයක්

සලසා ගැනීමේ අපේක්ෂාවෙන් ඔහුගේ මව පොළොන්නරුවේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා හමු වී ඇති අතර එහිදී ජනාධිපතිවරයා වික්ටර් සමරවීරගේ මවගෙන් විමසනු ලැබ ඇත්තේ ඔය ගොන් වහන්සේ මොකටද ඕකට රිංගුවේ යන්නයි. කෙසේ වෙතත් ත්‍රිපුද්ගල මහාධිකරණයේ අධිචෝදනා පත්‍ර බාර දීමෙන් පසුව වික්ටර් සමරවීර හටද ඇප ලැබිණි.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ.10 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .XXXIV

පැමිණිලි අංකය - 184/2020

පැමිණිලිකරු - චන්ද්‍රසේකර රෝහිත බණ්ඩාර බෝගොල්ලාගම

ලිපිනය - අංක 40/13,ලොන්ඩන් පෙදෙස, කොළඹ 07.

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ (අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්, සොලිසිටර් ජනරාල් (වැඩතහනම්) )

තීරණය

සමස්තයක් ලෙස සියලු කරුණු සලකා බැලීමේදී රෝහිත බෝගොල්ලාගම මහතා දේශපාලන පලිගැනීමකට ලක් කිරීමේ අරමුණ එල්.ටී.ටී.ඊ හිතවාදීන් සතුටට පත් කිරීම බැව් පෙනී යන අතර, ඔහු ඊට ඉලක්ක කර ගැනීමට හේතු පාදක වනු ලැබ ඇත්තේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන සමයේදී විදේශ කටයුතු අමාත්‍යවරයා වශයෙන් එල්.ටී.ටී.ඊ සංවිධානයට එරෙහිව ජාත්‍යන්තර වශයෙන් සිදු කෙරෙන ලද ක්‍රියාකාරකම් එම සංවිධානයට අහිතකර ප්‍රතිඵල ඇති කරලීමට හේතු වීම බැව් නිගමනය කළ හැකිය. වෙනත් දේශපාලන

පලිගැනීම් හා සසඳා බැලීමේදී මෙහි ඇති වෙනස වනුයේ 2006 වර්ෂයේදී සිදුවන ලද සිද්ධිමය කරුණක් මතු කර ගනිමින් 2015 වර්ෂයේදී රෝහිත බෝගොල්ලාගම මහතාට එරෙහිව නඩු කටයුතු ආරම්භ කරනු ලැබීමය. ඔහුට එරෙහිව චෝදනා නැඟීමේදී සිද්ධිමය කරුණු විකෘති කොට දණ්ඩනීය සදෝෂත්වභාවයක් ආරෝපණය කරනු ලැබීමට යෙදෙන ලද ද්වේෂ සහගත උත්සාහයක් අනාවරණය වනු ලැබ ඇතැයි යන්න කොමිෂන් සභාවේ ඒකමතික තීරණයයි.

## නිර්දේශ

1. රෝහිත බෝගොල්ලාගම මහතාට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලැබූ නඩුව සම්බන්ධයෙන් මහාධිකරණය විසින් ලබාදුන් නියෝගය අනුව විධිබද්ධතිය කරුණු මත ඔහු නිදහස් කරනු ලැබීමෙන් අනතුරුව කරුණු නැවත සලකා බැලීමකින් තොරව වහාම මහාධිකරණයට අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීම දේශපාලන පලිගැනීම ඉදිරියට පත්වාගෙන යාමක් ලෙස බැලුබැල්මට පෙනී යන හෙයින් යුක්ති සහගත ක්‍රියා පිළිවෙළක් මත මෙම අධිචෝදනා පත්‍රය ඉවත් කර ගැනීමට පියවර ගෙන නිදහස් වාතාවරණයක් තුළ ස්වාධීන කොමිෂන් සභාව විසින් අදාළ චෝදනාවනට පාදක වූ කරුණු සලකා බලා තීරණයකට එළඹීම වඩා සුදුසු බැව් මෙම කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි .

2. වගඋත්තරකාර හිටපු අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ වැඩතහනමට ලක්ව සිටින සොලිසිටර් ජනරාල් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය

රෝහිත බෝගොල්ලාගම මහතාට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමේදී අනුගමනය කර ඇති ක්‍රියා පටිපාටිය තුළ පෙළඹවීමක් මත ද්වේෂ සහගතව ක්‍රියා කිරීමක් බැලූබැල්මට හෙළිදරවු වන බැවින් එලෙස කටයුතු කිරීමෙන් රාජ්‍ය සේවය අපකීර්තියට ලක් කිරීම පිළිබඳව ඇයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් චෝදනා පත්‍රයක් ලබාදී විනය ක්‍රියා මාර්ග ගැනීම යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

චන්ද්‍රසේකර රෝහිත බෝගොල්ලාගම මහතා වෘත්තියෙන් නීතීඥවරයෙකි. ඔහු 2001 වසරේදී පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන ආසන සංවිධායකවරයා ලෙස කටයුතු කොට මැතිවරණයට ඉදිරිපත්ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් පත්වනු ලැබ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කරනු ලැබ ඇත. නැවත වසර 2004 අප්‍රේල් මාසයේ දී පැවති මැතිවරණයට ද එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත්ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වනු ලැබ ඇති අතර පාර්ලිමේන්තුවේ විපක්ෂයේ අසුන් ගනු ලැබ ඇත. එවකට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමියගේ නායකත්වය යටතේ පැවති රජය එල්.ටී.ටී.ඊ. ත්‍රස්ථවාදය සමඟ යුද්ධයක නිරත වී සිටින ලදින් එල්.ටී.ටී.ඊ. ත්‍රස්ථවාදයට එරෙහිව කටයුතු කිරීම උදෙසා ආණ්ඩු පක්ෂයට එක්වනු ලැබ වසර 2004 නොවැම්බර් මාසයේදී ජාතික ව්‍යවසාය සංවර්ධන සහ උසස් තාක්ෂණ ආමාත්‍යවරයා වශයෙන්

පත්වනු ලැබ තිබේ. වසර 2005 සැප්තැම්බර් මාසයේ සිට එවකට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපතිධූර අපේක්ෂකත්වය තහවුරු කර ගැනීමෙහිලා කටයුතු කරනු ලැබ මහින්ද රාජපක්ෂ මැතිතුමා වසර 2005 නොවැම්බර් මාසයේදී ජනාධිපතිවරයා වශයෙන් පත්වනු ලැබ පිහිටුවන ලද අමාත්‍ය මණ්ඩලයේ ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා ලෙස පත්වනු ලැබ ඇත. එම අමාත්‍යධූරය හොබවන කාලය තුළදී ද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ අමානුෂික යුධමය ක්‍රියාකාරකම්වලට එරෙහිව ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරනු ලබන අතර වසර 2007 ජනවාරි මාසයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් එවට විදේශ කටයුතු අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරනු ලැබූ මංගල සමරවීර මහතා එම අමාත්‍යධූරයෙන් ඉවත් කර විදේශ කටයුතු අමාත්‍යවරයා වශයෙන් පත් කරනු ලැබ ඇත. එම අමාත්‍යධූයේ කටයුතු කිරීමේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි කටයුතු කරමින් එල්.ටී.ටී.ඊ. සංවිධානයට එරෙහිව මතයක් ගොඩනැඟීම සඳහා කටයුතු කරනු ලැබ ඇති අතර එවකට ආරක්ෂක ලේකම්වරයා වශයෙන් කටයුතු කරන ලද ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සමඟ සිදු කරන ලද ක්‍රියාකාරකම් මත එල්.ටී.ටී.ඊ. සංවිධානයට එරෙහිව කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීමට කටයුතු කරන ලදි. 2008 වර්ෂයේ සාක් නායක සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට කටයුතු කරනු ලැබ ඇති අතර ඒ අනුව එම සංවිධානයේ සභාපතිත්වය ශ්‍රී ලංකාවට ලබා දී ඇත. වසර 2009 දී සිදු කෙරෙන ලද යෝජනාවක් මත පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව වසර 2013 දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට කටයුතු කරනු ලැබ ඇත.

ජාත්‍යන්තර නියෝජනයන්ගේ මැදිහත්වීමෙන් ශ්‍රී ලංකා රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර පැවැත්වීමට යෙදෙන ලද සාම සාකච්ඡාවන්හිදී ශ්‍රී ලංකා රජය 'රාජ්‍ය පාර්ශවය' වශයෙන් ද එල්.ටී.ටී.ඊ. සංවිධානය 'රාජ්‍ය නොවන පාර්ශවය' වශයෙන් ද හඳුන්වා සම තත්ත්වයෙහිලා පිළිගැනීමට යෙදෙනි. ඊට හේතු වන ලද්දේ වසර 2002 දී එවකට අග්‍රාමාත්‍යවරයාව සිටි රනිල් වික්‍රමසිංහ මහතා එල්.ටී.ටී.ඊ. නායක ප්‍රභාකරන් සමඟ 2002 වර්ෂයේදී ඇති කර ගන්නා ලද සාම ගිවිසුමය. එකී සාම ගිවිසුම හේතු කොට ගෙන එල්.ටී.ටී.ඊ. සංවිධානයට ජාත්‍යන්තරය තුළ විශාල පිළිගැනීමක් නිර්මාණය කර ගනු ලැබ තිබුණි. ශ්‍රී ලංකා රජය සමඟ මෙලෙස සාම ගිවිසුමකට එළඹෙන ලද එල්.ටී.ටී.ඊ. සංවිධානය එය ඊට ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති කර ගැනීමට යොදා ගන්නා ලද නමුදු එම ගිවිසුමෙහි හරය වූ සටන් විරාමය නොපවත්වනු ලැබිණි. 2006 වසරේ ජූලි මාසයේදී මාවිල්ආරු සොරොව්ව වසා දැමීමෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ශ්‍රී ලංකා යුධ හමුදාව සටනට පොළඹවා ගන්නා ලද නමුත් ශ්‍රී ලංකා රජය සටන් විරාම ගිවිසුමේ බැඳීම අත්හැර නොතිබීම ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලංකා රජය කෙරෙහි අහිතකර තත්ත්වයක් ඇති කරවනු ලැබ තිබේ. මෙම කරුණ වටහා ගනු ලැබූ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා 2006 වර්ෂය අවසානය වන වන විටත් විදේශ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරමින් සිටින ලද මංගල සමරවීර මහතා එම ධූරයෙන් ඉවත් කරනු ලැබ රෝහිත බොගොල්ලාගම මහතා 2007 ජනවාරි මාසයේ සිට විදේශ අමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිණි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රාජ්‍ය සමය තුළ 2007 වසරේ සිට විදේශ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරමින් විශේෂයෙන්

එල්.ටී.ටී.ඊ. සංවිධානයට එරෙහිව ජාත්‍යන්තර මතයක් ගොඩනැඟීම සඳහා රෝහිත බෝගොල්ලාගම මහතා කැපී පෙනෙන මෙහෙවරක් සිදු කරනු ලැබ තිබේ. ඉන්දියාව, චීනය, යුරෝපා හවුල, බ්‍රිතාන්‍ය, ජපානය හා ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු බොහෝ රාජ්‍යයන්හි උපරිම සහාය ලබා ගැනීම පිණිස ක්‍රමෝපාය මාර්ග ලබා ගැනීමට කටයුතු කරනු ලැබූ ඇති අතර ඉන්දියාවේ එවකට අගමැතිව සිටි මනමෝහන් සිං , විදේශ අමාත්‍යවරයා වූ ප්‍රනාබ් මුඛර්ජී, ඇමරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම් කොන්ඩලිසා රයිස්, ආරක්ෂක ලේකම් රොබට් ග්‍රේට්, මහා බ්‍රිතාන්‍යයේ අගමැති ගෝඩන් බ්‍රවුන්, විදේශ ඇමති ඩේවිඩ් මිලිබෑන්, චීනයේ ජනාධිපති ජිංතාවෝ, විදේශ අමාත්‍ය වෙං ජී, රුසියාවේ විදේශ අමාත්‍ය ලැව්රෝෆ්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් බෑං කී මූන්, යන ජාත්‍යන්තර නායකත්වය සමඟ සම්බන්ධතාවයන් ගොඩනඟා ගැනීමට කටයුතු කරනු ලැබ ඇත. නව ජාත්‍යන්තර සංවිධාන කීපයක් තුළටම ශ්‍රී ලංකාව ඇතුළත් කර ගැනීමට කටයුතු කරනු ලැබ ඇති අතර ඒ අනුව ආසියානු සහයෝගිතා කතිකාවත, ආසියානු කලාපීය සංයුතිය, ෂැංහයි කෝපරේෂන් සහයෝගීතාව, නියෝජනය කිරීමට කටයුතු කරනු ලැබ තිබේ. තවද සෞදි අරාබිය, ඉරානය, කුවේටය,ජෝර්දානය සහ කටාර් යන මැදපෙරදිග රටවල් සමඟ සහයෝගීතාවය ගොඩනඟා ගත් අතර නොබැඳි සංවිධානයේ උපසභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් එම සංවිධානයේ සහයෝගය ලබා ගැනිණි.

2010 වර්ෂයේ පැවති මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් එක්සත් ජනතා නිදහස් සංවිධානයේ අපේක්ෂකත්වය ලබා කොළඹ දිස්ත්‍රික්කයෙන් තරඟ කර ජයග්‍රහනය කළ නොහැකි වුවද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් බුද්ධි

මඩුල්ල මෙහෙවීමේ වගකීම රෝහිත බෝගොල්ලාගම මහතා වෙත පවරා තිබිණි. 2015 ජනවාරි මාසයේදී යහපාලන රජය බලයට පත්වීමත් සමඟ 2015.04.01 දින අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසන් සභාව විසින් එම කොමිෂන් සභා පනතේ 70 වන වගන්තිය යටතේ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 24754/1/15 යටතේ රෝහිත බෝගොල්ලාගම මහතාට එරෙහිව නඩු පවරනු ලැබිණි. එවකට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය වශයෙන් කටයුතු කරන ලද්දේ දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මියයි. මෙම නඩු පැවරීම නිසැක ලෙසම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධානීන්ගේ මෙහෙයවීම මත සිදුවන ලද්දක් බව අවබෝධ කර ගත් රෝහිත බෝගොල්ලාගම මහතා එලෙස සිදු කරන ලද්දේ මන්දැයි විමසීමට එවකට අග්‍රාමාත්‍යවරයාව සිටි එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා මුණ ගැසෙන ලදි. රනිල් වික්‍රමසිංහ මහතා රෝහිත බෝගොල්ලාගම මහතාට පවසනු ලැබූයේ මලික් සමරවික්‍රම මහතා හමුවී මේ පිළිබඳව පවසන ලෙසටය. ඒ අනුව රෝහිත බෝගොල්ලාගම මහතා මලික් සමරවික්‍රම මහතා හමු වූ අතර තමාට අසාධාරණ ලෙස නඩු පැවරීම පිළිබඳව කියා සිටිමින් “This is a witch hunt” යැයි බවසන ලදි. ඉන්පසු අවස්ථාවක මේ සම්බන්ධයෙන් දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මියට නීතිඥ නියෝජනයක් මඟින් කරුණු පැහැදිලි කිරීම සුදුසු බව සිතූ රෝහිත බෝගොල්ලාගම මහතා තම නීතිඥවරයා මඟින් දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මියට කරුණු කියා සිටින ලද අවස්ථාවේදී ඇය එම නීතිඥවරයාට පවසනු ලැබූයේ “Tell the Minister this is not a witch hunt” යන්නයි. තමා විසින් මලික් සමරවික්‍රම මහතාට කියා සිටි වචන ඔහු එලෙසින්ම දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මියට පවසා ඇති බවත් එබැවින් එම නඩු

පැවරීම දේශපාලන පළිගැනීමක් ය යන තම අවබෝධය නිවැරදි බවත් රෝහිත බෝගොල්ලාගම මහතා තේරුම් ගන්නා ලදි.

යථෝක්ත නඩු පැවරීමට උපයෝගී කරගනු ලැබ ඇති කරුණු රෝහිත බෝගොල්ලාගම මහතා 2006 වර්ෂයේදී අමාත්‍යවරයෙකු වශයෙන් යෙදෙන ලද රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමනක දරණ ලද වියදම් අතුරින් යොදා ගනු ලැබ ඇත. ඔහු ආයෝජන ප්‍රවර්ධන සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී එංගලන්තයේ ලන්ඩන් නුවර පැවැත් වූ පොදු රාජ්‍ය මණ්ඩලයේ ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන සහ ශ්‍රී ලංකා වෙළඳ නිෂ්පාදන ප්‍රදර්ශනය මෙහෙයවමින් එම සමුළුවට සහභාගී වීමටත් ආයෝජකයින්ගේ හමුව සඳහාත් ගොස් සිටියදී ඔහු නවාතැන් ගත් ලන්ඩන් හිල්ටන් හෝටලයට වැය වූ මුදල ඉහත කී පරිදි නඩු පැවරීමේ චෝදනාවට පාදක කරගනු ලැබ තිබිණි. ලන්ඩන් නුවර පැවති ඉහත කී අවස්ථාවට රාජ්‍යතාන්ත්‍රික මට්ටමින් ද රජකාරි මට්ටමින්ද පිරිසක් සහභාගී වූ අතර එවකට ජනාධිපති ආර්යාව වූ ශිරන්ති රාජපක්ෂ මැතිනිය විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතාත් ඒ අතර වනු ලැබිණි. මෙම සියලුදෙනා සඳහා නවාතැන් වෙන් කිරීම සිදු කරන ලැබූයේ ලන්ඩන් නුවර පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය හරහාය. රෝහිත බෝගොල්ලාගම මහතාට නඟන ලද චෝදනාවෙහි නවාතැන් සඳහා ලන්ඩන් නුවර පාක්ලේන් හෝටලයට බ්‍රිතාන්‍ය පවුම් 5878.33 ක මුදලක් එනම් ඇමරිකන් ඩොලර් 11150 ක මුදලක් එනම් ශ්‍රී ලංකා මුදලින් රුපියල් 1,870,444.50 ගෙවා ඇති බවට සඳහන් කර ඇති නමුත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ විධායක සහකාර (මුදල්) ජයකොඩි සේපාලි ඉන්ද්‍රා පතිරාජ යන නිලධාරිනිය අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව වෙත කරන ලද ප්‍රකාශයෙහි නවාතැන් පහසුකම්

සඳහා පවුම් 2004.33 වශයෙන් ද ප්‍රවාහන පහසුකම් සඳහා පවුම් 3874 ක් වශයෙන් ද ගෙවූ බව සඳහන් කරනු ලැබ ඇත. තවද ප්‍රවාහන පහසුකම් සඳහා වූ පවුම් 3874 ක මුදල සමස්ත දූත පිරිසේ ප්‍රවාහන අවශ්‍යතාවයන් වෙනුවෙන් ගෙවූ බව ද පැහැදිලි කර ඇත. ලන්ඩන් නුවර පැවති යථෝක්ත වැඩසටහන දින 10 ක් පැවති හෙයින් නවාතැන් සඳහා වූ ගෙවීම දින 10 ක් සඳහා වන නමුත් චෝදනාවට ඇතුළත් කරනු ලැබ ඇත්තේ දින 3ක් සඳහා වූ ගෙවීමක් වශයෙනි.

මෙහිදී කොමිෂන් සභාවේ අවධානයට යොමු වූ කරුණු කිහිපයක් ඇත. එනම් රාජ්‍ය නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන චක්‍රලේඛනයන් හි එක් එක් රටවල් සඳහා ගෙවනු ලබන වියදම් වෙනස් වන අතර කෙසේ වෙතත් අවස්ථානුකූල කරුණු යටතේ අවශ්‍යතාවය පරිදි එම සීමාවන්හි වෙනස්කම් සිදු කිරීමට භාණ්ඩාගාර ලේකම්වරයාට බලය පවරනු ලැබ තිබීම සහ කෙසේ වෙතත් යම් නිලධාරියෙකු සාධාරණ හේතු නොමැතිව නියමිත සීමාව ඉක්මවා අදාල වියදම් මුදල් ලබාගෙන තිබේ නම් එය ආපසු අය කර ගැනීමට කටයුතු කරනු ලැබිය හැකි වීමද වේ. රෝහිත බෝගොල්ලාගම මහතා හට දූෂණ චෝදනාවක් ඉදිරිපත් කිරීමට අදාළ කර ගන්නා ලද වියදම ඔහුගෙන් අයකර ගැනීමට නොහැකි තරම් විශාල ප්‍රමාණයක් නොවන බව ද කොමිෂන් සභාව නිරීක්ෂණය කළ අතර කෙසේ වෙතත් බැලූබැල්මට අදාළ චෝදනාවන්හි අවිධිමත් භාවයක් ද කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබිණි. දෝෂාරෝපණයට ලක් කරනු ලැබ ඇති අවස්ථාවේදී ඔහුට හිමිකම තිබූ මුදල කවරේද යන්න සහ හෝ සීමාව ඉක්මවා ඔහු විසින් වියදම් කරනු ලැබ ඇති මුදල් ප්‍රමාණය කවරේද යන්න චෝදනාවන්හි දක්වා නොමැත.

මහේස්ත්‍රාත් අධිකරණයේ රෝහිත බෝගොල්ලාගම මහතාට එරෙහිව නඟනු ලැබ ඇති චෝදනා පහත සඳහන් පරිදි වේ.

01. වර්ෂ 2006 ක් වූ ජූනි මස 01 වන දින සිට වර්ෂ 2006 ක් වූ අගෝස්තු මස 31 දින දක්වා කාලය තුළදී මෙම අධිකරණයේ බල සීමාව තුළ පිහිටි කොළඹ දී යුෂ්මතා රජයේ සේවකයෙකු එනම්, ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාරජවාදී ජනරජයේ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා ලෙස සේවයේ යෙදී සිටියදී, ආණ්ඩුවට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩු සිදුවිය හැකි බව දැන දැනම සහ / හෝ තමා වෙත අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථ ලාභයක් අනුග්‍රහයක් හෝ වාසියක් සිදු කර ගැනීමේ චේතනාවෙන් නැතහොත් තමා වෙත අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථ ලාභයක් අනුග්‍රහයක් හෝ වාසියක් සැලසෙන බව දැන දැනම, රජයේ සේවකයෙකු වශයෙන් ස්වකීය ධූරය ප්‍රකාරව කිරීමට වෙනත් යම් රජයේ සේවකයෙකුට බලය පැවරී ඇති ක්‍රියාවක් ඉටු කිරීමට එනම්, 2006 ජූනි 21 සිට 2006 ජූනි 23 දක්වා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර පැවැත් වූ “ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශනය හා ගැනුම්කරුවන්ගේ හමුව” ට සහභාගි වීම සඳහා මහාභාණ්ඩාගාර චක්‍රලේඛ අංක එම්.එෆ්.6/1/1/96 අනුව යුෂ්මතාට හිමි මුදල පටහැනිව වැඩිපුර ඇමරිකන් ඩොලර් තුන්දහස් හයසිය විසි දෙකයි සත පනහක් (ඇමරිකන් ඩොලර් 3622.50) නැතහොත් රුපියල් තුන්ලක්ෂ හැත්තෑහය දහස් එකසිය අනූහයයි සත හැට දෙකක (රුපියල් 376196.62) මුදලක් යුෂ්මතා ගෙවීම අනුමත කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ

ලක්ෂ්මන් රවින්ද්‍ර වටවල යන අයව පෙළඹවීමෙන් අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කළා යැයි මෙයින් ඔබට චෝදනා කරනු ලැබේ.

02. ඉහත 01 වන චෝදනාවේ සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියා කලාපයේදී ම යුෂ්මතා රජයේ සේවකයෙකු එනම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා ලෙස සේවයේ යෙදී සිටියදී ආණ්ඩුවට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩුවක් සිදුවිය හැකි බව දැන දැනම රජයේ සේවකයෙකු වශයෙන් ස්වකීය ධූරය ප්‍රකාරව කිරීමට වෙනත් යම් රජයේ සේවකයෙකුට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට එනම් 2006 ජූනි 21 සිට ජූනි 23 දක්වා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර පැවැත් වූ "ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශනය හා ගැනුම්කරුවන්ගේ හමුව" ට සහභාගි වූ යුෂ්මතාගේ නවාතැන් පහසුකම් සඳහා ලන්ඩන් නුවර පාර්ක් ලේන් හිල්ටන් හෝටලය වෙත බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය හරහා බ්‍රිතාන්‍ය ස්ටර්ලිං පවුම් පන්දහස් අටසිය හැත්තෑ අටයි සත හතලිස් නවයක් (බ්‍රිතාන්‍ය ස්ටර්ලිං පවුම් 5878.49) නැතහොත් ඇමරිකන් ඩොලර් එකොලොස් දහස් එකසිය පනහක (ඇමරිකන් ඩොලර් 11150) ක් නැතහොත් රුපියල් එකළොස් ලක්ෂ හැත්තෑදහස් හාරසිය හතලිස් හතරයි සත පනස් නවයක (රුපියල් 1170444.59) ක මුදලක් මහාභාණ්ඩාගාර චක්‍රලේඛ අංක එම්එෆ් 6/1/1/96 ට අනුව යුෂ්මතාට හිමි මුදලට පටහැනිව ගෙවීම අනුමත කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ ලක්ෂ්මන් රවින්ද්‍ර

වටවල යන අයව පෙළඹවීමෙන් අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කළා යැයි මෙයින් ඔබට චෝදනා කරනු ලැබේ.

1996.04.20 දිනැතිව නිකුත් කරනු ලැබ ඇති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක එම්එෆ් 6/1/1/96, චක්‍රලේඛය බැලූබැල්මට නම්‍ය හා පුළුල් අර්ථකථන ලබාදිය හැකි ලෙස සකසන ලද්දකි. එහි ශීර්ෂය වන්නේ විදේශ ගමන් සඳහා විදේශ විනිමය මුදා හැරීම යන්නයි. යැපීම් රේට් ගණන් - බන්ඩිත රේට් ගණන් යනුවෙන් වූ උපලේඛනයක් මෙම චක්‍ර ලේඛනයට ඇතුළත් කොට ඇති අතර එක් එක් රටවල් සඳහා නියමිත වෙන් වෙන් වූ රේට් ගණන් මෙම උපලේඛයෙහි දක්වා තිබේ. ඒකාබද්ධ රේට් යන අනුශීර්ෂය යටතේ (ii) හි සඳහන් වනුයේ කැබිනට් අමාත්‍යවරු හා අග්‍රවිනිශ්චයකාරවරයා, කථානායකතුමා, සභානායකතුමා, විරුද්ධ පක්ෂයේ නායකතුමා, පළාත් ආණ්ඩුකාරවරු සහ පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරු යන මේ අයට පළවෙනි උපලේඛනයේ දක්වා ඇති බන්ඩිත හෝ ඒකාබද්ධ රේට් ගණන්වලින් 150% (සියයට එකසිය පනහක්) අනුමත කරනු ලැබේ යැයි සඳහන්ව ඇත. එකී අනුශීර්ෂය යටතේ ඇති (iv) ඡේදයෙහි සඳහන් වනුයේ කැබිනට් අමාත්‍යවරයෙකු විසින් නියෝජිත මණ්ඩලයක් මෙහෙයවනු ලබන විට එම මණ්ඩලයට අමාත්‍යාංශයක ලේකම්වරයෙකු, අතිරේක ලේකම්වරයෙකු, දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු, සංස්ථා හෝ මණ්ඩල සභාපතිවරයෙකු හෝ වෙනත් නිලධාරීන් යුක්ති සහගත හේතු මත එකම හෝටලයේ නවාතැන්ගෙන සිටීම අවශ්‍ය වන කල්හි උපලේඛනයේ සඳහන් පළමු ගණයේ හෝ දෙවන ගණයේ රේට් ගණන් නොසලකා ලැඟුම් සඳහා වූ තත්‍ය රේට් ගණන් ගෙවිය හැකිය යනුවෙනි. චක්‍රලේඛනයේ

අවසාන කොටස වන 2 : 6 යානපත්‍ර යන අනුශීර්ෂය යටතේ ඇති 4 වන ඡේදයෙහි සඳහන් වනුයේ ඉහත සඳහන් විධිවිධානවලින් ආවරණය නොවන කිසියම් විශේෂ අවස්ථාවක් වෙතොත් එය තීරණයක් ගැනීම සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත යොමු කළයුතු බවය.

කරුණු මෙසේ පැවතියදී රටේ ආයෝජන ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් විදේශ රටක සංවිධානය කෙරෙන ලද රාජ්‍ය උත්සව අවස්ථාවක කැබිනට් අමාත්‍යවරයෙකු වශයෙන් නියෝජිත මණ්ඩලයක් මෙහෙයවනු ලැබූ රෝහිත බෝගොල්ලාගම මහතාගේ නවාතැන් ගාස්තු වශයෙන් ගෙවන ලද මුදල බැලූබැල්මට පෙනෙන පරිදි සාවද්‍ය ලෙස ගණනය කොට රජයට පාඩුවක් සිදුකොට තමාට වාසියක් සිදු කර ගන්නා ලද සේ අර්ථ දක්වා අපරාධ චෝදනාවනට ලක් කරනු ලැබීම රටක් වශයෙන් ද යම් අවමානයකට ලක්වීමක් ලෙස පෙනී යයි.

මහේස්ත්‍රාත් අධිකරණයේදී චෝදනා ඉදිරිපත් කරනු ලැබීම අවිධිමත් ව සිදු කරනු ලැබ ඇතැයි යන මූලික විරෝධතාවයක් රෝහිත බෝගොල්ලාගම මහතා වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඊට පාදක වනු ලැබ ඇත්තේ අදාළ චෝදනාව ඉදිරිපත් කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් තිදෙනාගේ අනුමැතිය ලබාගෙන නොමැති බැව් සහ එක් කොමසාරිස්වරයෙකුගේ සටහනක් යටතේ පමණක් චෝදනා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබූ කරුණුය. කෙසේ වෙතත් එම අවස්ථාවේදී කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරිය එකී මූලික විරෝධතාවය පිළිගෙන නොමැති අතර ඊට එරෙහිව මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිශෝධන ඉල්ලීමේදී මහේස්ත්‍රාත්වරියගේ තීරණය නීත්‍යානුකූල නොවන

හෙයින් එම තීරණය ප්‍රතිශෝධනය කොට නඩු පැවරීම අවිධිමත් හෙයින් රෝහිත බෝගොල්ලාගම මහතා නිදහස් කරන ලෙස කෙරෙන ලද නියමයෙන් ඔහු නිදහස් කරනු ලැබ ඇත.

රෝහිත බෝගොල්ලාගම මහතා විසින් ඉදිරිපත් කර සිටි දේශපාලන පළිගැනීම සම්බන්ධයෙන් වගඋත්තරකාරියව කරනු ලැබූයේ යහපාලන රජය පත්වීමෙන් පසු අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කරනු ලැබූ සහ රෝහිත බෝගොල්ලාගම මහතාට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා ඉදිරිපත් කරනු ලැබූ දැනට වැඩතහනමට ලක්ව සිටින සොලිසිටර් ජනරාල් දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මියයි. වික්‍රමසිංහ මහත්මිය කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් පරීක්ෂණයට සහභාගී වූ අතර ජනාධිපති නීතිඥවරයෙකු ඇය වෙනුවෙන් පෙනී සිටිනු ලැබිණි. රෝහිත බෝගොල්ලාගම මහතා දිරුක්ෂි වික්‍රමසිංහ මහත්මියගේ නීතිඥවරයා විසින් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න ඇසීමට භාජනය කරනු ලැබිණි. ප්‍රථමයෙන් ඔහුගෙන් ප්‍රශ්න කෙරෙන ලද්දේ ඔහු එක්සත් ජාතික පක්ෂය හැරදමා එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවට එකතු වීම සම්බන්ධයෙනි. කෙසේ වෙතත් ඔහු එක්සත් ජාතික පක්ෂය සමඟ සම්බන්ධකම් අත්හැරීමක් සිදු නොවූ බවක් පසු කාලීන ක්‍රියාකාරකම් මත පෙනී යන්නේ නොවේ දැයි බෝගොල්ලාගම මහතාගෙන් ප්‍රශ්න කෙරෙන ලදුව දිල්රුක්ෂි මහත්මිය වෙනුවෙන් විමසා සිටින ලද්දේ ඒ අනුව එක්සත් ජාතික පක්ෂයට බෝගොල්ලාගම මහතාගෙන් දේශපාලන පළිගැනීම් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැවතිය හැකි ද යන්න වේ. යහපාලන රජය විසින් තෝරා ගත් දේශපාලඥයන් ද රාජ්‍ය නිලධාරීන් ද හමුදා සහ පොලිස් නිලධාරීන් ද පළිගැනීමට ලක් කරනු ලැබ ඩයස්පෝරාව සහ

එල්.ටී.ටී.ඊ. හිතවාදී ජාත්‍යන්තර සංවිධාන තෘප්තිමත් කෙරෙන ලද්දේය යන්න සහ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා හට ප්‍රභාකරන් සහ කොටි සංවිධානය පරාජය කිරීමට සහය වූ දේශපාලනඥයෙකු වශයෙන් තමා යහපාලන රජයේ ගොදුරක් වන ලද්දේය යන්න බෝගොල්ලාගම මහතාගේ ස්ථාවරය විය.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් අදාළ කරුණු සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කෙරෙන ලද්දේ 2007 වර්ෂයේදී වන හෙයින් මෙන්ම 2015 වර්ෂයේදී දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මිය අධ්‍යක්ෂ ජනරාල්ව සිටියදී කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවරීමට යෙදෙන ලද නඩුව විධිබද්ධතියමය දෝෂ මත මහාධිකරණයේ නියමයෙන් නිශ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මියගෙන් පසුව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට පත්වන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බෝගොල්ලාගම මහතාට එරෙහිව අදාළ චෝදනාවන් අධිචෝදනා පත්‍රයක් මත කොළඹ මහාධිකරණයට ඉදිරිපත් කරනු ලැබ ඇති බව පෙන්වා දීමට අදාළ අධිචෝදනා පත්‍රයේ පිටපතක් දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මියගේ නීතිඥවරයා විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. කොමිෂන් සභාව ඉදිරියේදී එකී අධිචෝදනා පත්‍රය බෝගොල්ලාගම මහතාට පෙන්වනු ලබන තෙක් ඔහු ඒ පිළිබඳව දැන නොසිටි අතර මෙලෙස තුන්වන පාර්ශවයක් විසින් අධිකරණයෙන් මෙතෙක් චූදිතට භාර නොදෙන ලද අධිචෝදනා පත්‍රයක සහතික පිටපතක් තුන්වන පාර්ශවයක් විසින් ලබා ගැනීම අපරාධ නඩු විධානයට එකඟ වන්නේ ද යන්න කොමිෂන් සභාවේ අවධානයට ලක්විය. දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මිය සාක්ෂි දීමට ඉදිරිපත් වූ අතර අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයා

වශයෙන් කටයුතු කළ විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ටී.බී. වීරසූරිය මහතා සාක්ෂිකරුවකු ලෙස කැඳවන මෙන් ඇය වෙනුවෙන් ඉල්ලා සිටින ලදි. එහෙත් ඒ සඳහා විධිමත් පියවර ගෙන නොතිබීමෙන් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට යෙදිනි.

මහාධිකරණයෙහි ඉදිරිපත් කර ඇති අධිචෝදනා පත්‍රයෙහි ඇතුළත් චෝදනා දෙක මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ නඩුවේ වූ චෝදනාවන්ම වේ. එනම්;

> "................. 2006 ජූනි 21 සිට ජූනි 23 දක්වා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර පැවැත්වූ ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශනය හා ගැනුම්කරුවන්ගේ හමුවට සහභාගී වීම සඳහා මහාභාණ්ඩාගාර චක්‍ර ලේඛ අංක එම්එෆ් 6/1/1/90 යුෂ්මතාට හිමි මුදලට පටහැනිව වැඩිපුර ඇමරිකන් ඩොලර් 4019 ක් නැතහොත් රුපියල් හාරලක්ෂ දාහත්දහස් හාරසිය විසි පහක මුදලක් යුෂ්මතාට ගෙවීම අනුමත කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ ලක්ෂාන් රවීන්ද්‍ර වටවල යන අයව පෙළඹවීමෙන් අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිට යුතු දූෂණය නැමැති වරද සිදු කළ බව"

පළවන චෝදනාවෙහි ද,

> "............ 2006 ජූනි 21 සිට ජූනි 23 දක්වා බ්‍රිතාන්‍ය ලන්ඩන් නුවර පැවැත්වූ ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශනය හා ගැනුම්කරුවන්ගේ හමුවට සහභාගී වීම සඳහා සහභාගී වූ යුෂ්මතාගේ නවාතැන් පහසුකම් සඳහා ලන්ඩන් නුවර පාර්ක් ලේන් හිල්ටන් හෝටලය වෙත බ්‍රිතාන්‍ය මහලේකම් මහකොමසාරිස් කාර්යාලය හරහා

බ්‍රිතාන්‍ය ස්ටර්ලින් පවුම් 5878.49 ක් නැතහොත් ඇමරිකන් ඩොලර් 11270.53 ක් නැතහොත් රුපියල් 11,70,444.59 ක මුදලක් මහාභාණ්ඩාගාර චක්‍රලේඛ එම්එෆ් 6/1/1/90 යුෂ්මතාට හිමි මුදලට පටහැනිව ගෙවීම අනුමත කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ ලක්ෂන් රවීන්ද්‍ර වටවල යන අයව පෙළඹවීමෙන් අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කළ බව"

දෙවන චෝදනාවෙහිද සඳහන් වේ.

අධිචෝදනා පත්‍රයට අමුණා ඇති ප්‍රකාශ අතර අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය එම්. කේ. ජී. මැන්ඩිස් යන අයගේ ප්‍රකාශය අදාළ වෙළඳ ප්‍රදර්ශනය සම්බන්ධයෙන් වූ වියදම් පිළිබඳව වේ. අමාත්‍යවරයාගේ පුතා මෙම වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා ඔබ ආයතනයෙන් වියදම් දරා තිබේද යන ප්‍රශ්නය අවසානයේදී නඟා ඇති අතර ඊට ලබා දී ඇති පිළිතුර වන්නේ නැත යන්නය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ (මුදල්) සවිතා පුෂ්පානි ද සිල්වා මුතුකුමාරණ ගේ ප්‍රකාශයද අදාළ වෙළඳ ප්‍රදර්ශනයේ වියදම් සම්බන්ධව වන අතර, අමාත්‍යවරයාට අමතර වියදම් ලැඟුම් දීමනා හා දීමනා සඳහා රුපියල් 11,70,444.59 ක් ද බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාලයට ගෙවන ලද මුදලට අමතරව පසුබිම් දීමනාව ලෙස ලබාදුන් මුදලින් රු. 60,084.09 පමණක් වියදම් කර ඇත. ඉතිරි මුදල ආපසු ගෙවා ඇත. එනම් ඔහුට ඇමරිකන් ඩොලර් 6012 ක් ගෙවා ඇති අතර ඒ මුදලින් ඇමරිකානු ඩොලර් 5490 ක් ආපසු ගෙවා ඇත. එම මුදල ආපසු ගෙවා ඇති නිසා විධායක අධ්‍යක්ෂ පී.ඩී. මතායස් මහත්මිය බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාලයට ගෙවිය

යුතු රු. 11,70,444.59 ක මුදල මණ්ඩලය මගින් ගෙවන ලෙසට උපදෙස් දී ඇත යනුවෙන් සඳහන් වේ. එම තැනැත්තියගේම නැවත ප්‍රකාශයෙහි මෙසේ සඳහන් වේ. "අමාත්‍යවරයාගේ වියදම් පියවීම සඳහා වියදම් ලැයිස්තුවක් බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාලයෙන් එවා ඇත. ඒ අනුව ලැඟුම් වියදම් වශයෙන් ස්ටර්ලින් පවුම් 2004.33 ක් ද එකී සම්මන්ත්‍රණය සඳහා යාමට සහ ඒමට වාහන ගාස්තු සඳහා ස්ටර්ලින් පවුම් 3874.16 ක් ලෙස ස්ටර්ලින් පවුම් 5877.49 ක් අගෝස්තු 21 වන දින බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාලයට ගොස් ඇත. අමාත්‍යවරයාට ලබා දී තිබූ මුදල් ආපසු මණ්ඩලයට කලින් දින සඳහන් කළ ආකාරයට ගෙවා ඇත" යනුවෙන් සඳහන් කර තිබේ. මෙම කරුණ එනම් නවාතැන් පහසුකම් සඳහා පවුම් 5878.49 ක් ගෙවන ලද්දේය යන්න සාවද්‍ය බවද නවාතැන් පහසුකම් සඳහා ගෙවන ලද්දේ පවුම් 2004.33 ක් පමණක් වන්නේය සහ ගමන් ගාස්තු සඳහා ගෙවන ලද පවුම් 3874.16 සම්මන්ත්‍රණයට සහභාගී වූ සියලුදෙනා වෙනුවෙන් වූ වියදමක් ය යන්න රෝහිත බෝගොල්ලාගම මහතා සිය සාක්ෂියේ දී නැවත නැවත කියා සිටි අතර ඒ සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මිය වෙනුවෙන් සිදු නොකෙරිණි. මෙම වෙළඳ ප්‍රදර්ශනයෙන් ආයෝජන ක්ෂේත්‍රයට විශාල ප්‍රතිලාභ ලැබී ඇත. ඒ පිළිබඳව ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන්ව ඇත. ප්‍රශ්න කර සිටින පරිදි අමාත්‍යවරයාගේ පුතා සඳහා ආයෝජන මණ්ඩලය වියදම් කර නැත යනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රවර්ධන අංශයේ අධ්‍යක්ෂ මානවඩුගේ සමන්ති නිලුපුල් ද සිල්වාගේ ප්‍රකාශයෙහි සඳහන් වේ. ඇයගේ දෙවන ප්‍රකාශයෙහි අමාත්‍යවරයා එම වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වුණා. එතුමාගේ නෝනාද සහභාගී වී සිටියා. ප්‍රශ්න කර සිටින පරිදි

අමාත්‍යවරයාගේ පුතා පැමිණ සිටි බවට මතකයක් තිබුණත් ඔහු සහභාගී වුණේ කෙසේද යන්න මම දන්නේ නැත. මගේ දැනීමේ හැටියට අයෝජන මණ්ඩලයෙන් වියදම් දරා සහභාගී වූ බවට දැන ගැනීමට නැත යන්වෙන් සඳහන් වේ. මේ අනුව සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සටහන් කිරීමේදී රෝහිත බෝගොල්ලාගම මහතාගේ පුත්‍රයා වෙන්වෙන් රජයේ මුදල් මුදල් වියදම් කර ඇතැයි යන උපකල්පනයෙහි පිහිටා ප්‍රශ්න කිරීම් සිදු කරනු ලැබ ඇති බව පෙනී යන අතර අල්ලස් කොමිසමට ලැබී ඇතැයි සඳහන් නිර්ණාමික පැමිණිල්ලෙහි එලෙස චෝදනා කරනු ලැබ ඇතැයි යන්න එමඟින් අනුමාන කළ හැකි වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මුදල් අංශයේ විධායක සහකාරිනී ජයකොඩිගේ සේපාලි ඉන්ද්‍රා පතිරාජ නැමැත්තියගෙන් ද එම කරුණ ප්‍රශ්න කරනු ලැබ ඇත. මෙම කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇති පරිදි නම සඳහන් නොවන කිසිදු නිලධාරියෙකු වෙත ගෙවීමක් කර නැත. තවද මගෙන් ප්‍රශ්න කරන ලද පරිදි අමාත්‍යවරයාගේ පුතෙකු නමට කිසිදු වියදමක් ආයෝජන මණ්ඩලය විසින් නිල සංචාරය සඳහා ගෙවා නැත යනුවෙන් ඇය සිය ප්‍රකාශයෙහි පැහැදිලිව සඳහන් කර තිබේ.

මහාභාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු වන නවරත්න මුදියන්සේලාගේ දයාපාල නවරත්න නැමැත්තෙකුගේ ප්‍රකාශයක් සටහන් කර ඇති අතර ඔහු විදේශ ගමන් සඳහා විනිමය මුදා හැරීම පිළබඳ වූ චක්‍ර ලේඛයේ ඇතුළත් කරුණු සිය ප්‍රකාශයෙහි සඳහන් කරනු ලබයි. ඔහුගේ මතයක් වශයෙන් ප්‍රකාශ කර ඇත්තේ අමාත්‍යවරයෙකුගේ විදේශ ගමන් සඳහා වියදම් දැරිය යුතු වන්නේ අදාළ අමාත්‍යාංශයෙන් විය යුතු බවත් අමාත්‍යාංශය යටතේ ඇති

ආයතනයකින් මුදල් වියදම් කිරීම වරදක් වන බවත් ය. කෙසේ වෙතත් එබඳු කරුණක් රෝහිත බෝගොල්ලාගම මහතාට නඟා ඇති චෝදනාවන්හි අන්තර්ගත නොවේ. අමාත්‍යවරයෙකු වශයෙන් රෝහිත බෝගොල්ලාගම මහතා යෙදෙන ලද චෝදනාවනට අදාළව විදේශ ගමනේදී නියමිත චක්‍ර ලේඛය යටතේ ඔහුට හිමි දීමනාවන් කවරේද යන්න මෙම තැනැත්තාගෙන් ප්‍රශ්න කරනු ලැබිය හැකිව තිබූ නමුත් එබඳු ප්‍රශ්න කිරීමක් සිදු කර නැත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ (මුදල්) චිත්‍රානි පොලින් මතායස් නැමැත්තියගේ ප්‍රකාශය ව්‍යාකූල වූවක් වන අතර ප්‍රකාශය සටහන් කරන ලද නිලධාරියා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඒ අනුව පවුම් 5874.49 ක් ගෙවා ඇත. එම වකවානුවේ ඇමරින් ඩොලරයක මිල ගණන් අනුව අමාත්‍යවරයාට ඇමරිකන් ඩොලර් 11150 ක මුදලක් ගෙවා ඇත. ඒ අනුව දිනකට ඩොලර් 2230 ක පමණ මුදලක් ගෙවා ඇත. එහිදී ප්‍රවාහන වියදම් ද එයට ඇතුලත්ව ඇත යනුවෙන් සඳහන් කර තිබේ.

රෝහිත බෝගොල්ලාගම මහතාගේ ප්‍රකාශයක් 2013.04.29 වන දින සටහන් කරගනු ලැබ ඇත. 2009 වර්ෂයේ ආරම්භ කර ඇති විමර්ශන කටයුතු එලෙස බෝගොල්ලාගම මහතාගේ ප්‍රකාශය සටහන් කිරීමෙන් පසු අවසන් කරනු ලැබ ඇති අතර නඩු පැවරීමක් සිදු කොට නැත. මෙම විමර්ශනට නැවත විවෘත කිරීමක් සිදුව ඇත්තේ 2015.03.19 දිනදීය. එනම් යහපාලන රජය බලයට පත්වීමෙන් පසු දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මිය අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත් කරනු ලැබීමෙන් පසුව වේ. ඒ අනුව 2006 වර්ෂයේ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කරනු

ලැබ විශ්‍රාම ලබා සිටි මර්වින් විජේසේකර නැමැත්තාගේ ප්‍රකාශයක් සටහන් කිරීමට කටයුතු කොට ඇත. ඔහුගේ ප්‍රකාශය අදාළවනු ලැබ ඇත්තේ ලන්ඩන් නුවර පැවති වෙළඳ ප්‍රදර්ශනය හා ආයෝජකයන්ගේ හමුව සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් යවනු ලැබූ ලිපියක් අත්සන් තැබීම සම්බන්ධයෙනි.

ඉහතකී ප්‍රකාශය සටහන් කරගනු ලැබ දින කිහිපයකට පසු එනම් 2015.03.24 වන දින අල්ලස් කොමිසමේ සභාපතිවරයා වෙත චෝදනා පත්‍රය ඉදිරිපත් කොට නඩු පැවරීමට අනුමැතිය ඉල්ලා සිටිනු ලැබ ඇත. එදිනම සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරිය අමතා සටහන් තබනු ලැබ ඇත්තේ 2015.03.24 දිනැති සටහන දුටු බවත් චෝදනා නිවරදි නම් නඩු පැවරීම අනුමත කරන ලද බවත්ය. එදිනම අධ්‍යක්ෂ ජනරාල්තුමිය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත සටහනක් යොමු කරමින් කරුණාකර ලියවිලි සකසන්නැයි නියම කෙරෙන ලදුව එදිනම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ලියවිලි සකසා අධ්‍යක්ෂ ජනරාල්වරියගේ අත්සන සඳහා ඉදිරිපත් කර තිබේ. 2015.04.01 දින කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සිදු වී ඇත්තේ එපරිද්දෙනි.

මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති දේශපාලන පලිගැනීම් පිළිබඳවූ පැමිණිලි තුළ පලිගැනීමට ලක්වූ රාජ්‍ය නිලධාරීන් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබ රක්ෂණ සිරභාරයට පත් කරනු ලැබීමට 2015.04.01 දිනය තෝරා ගනු ලැබ ඇති බව මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කරන ලදි.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ.28 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 .XXXV

පැමිණිලි අංකය - 07/20

පැමිණිලිකරු - මෝසස් රංගජීව නෙවමාල්

ලිපිනය - පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය, කොළඹ 04

පැමිණිලිකරු දේශපාලන පලි ගැනීමට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා
2. හිටපු අමාත්‍ය ඩී. එම් ස්වාමිනාදන් මහතා
3. පොලිස් අධිකාරි චිත්‍රානන්ද විජේසිරි වික්‍රමසේකර
4. ප්‍රධාන පොලිස් පරික්ෂක සාගර නිලන්ත කරසිංහආරච්චි
5. පො.සැ 4679 කන්කානිගේ මහේෂ් නන්දලාල් යසරත්න
6. පො.කො 66229 ජයසූරිය
7. සිරකරු අංක 17952 සෙනරත් බන්දුල ලියනආරච්චි මහතා
8. කේ.ඩබ්. ආර් ජගත් රෝහණ

## තීරණය

2012 වර්ෂයේදී වැලිකඩ බන්ධනාගාරයේ ඇති වූ කැරලිකාරි සිදුවීමේදී රැඳවියන් ඝාතනය කරන ලදැයි පොලිස් පරික්ෂක මෝසස් රංගජීව නෙවමාල් හට එරෙහිව චෝදනා නැගීමට

පදනම් කරගනු ලැබ ඇත්තේ එම අවස්ථාවේදී වැලිකඩ බන්ධනාගාරයේ බන්ධනාගාර රැඳවියෙකු වශයෙන් සිටිනු ලැබ ඇති සිරකරු අංක 17952 සෙනරත් බන්දුල ලියනආරච්චි යන තැනැත්තාගේ සාක්ෂිය වේ. මෙම පුද්ගලයා අදාළ සිදුවීම සිදු වන ලද ආසන්නයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ පරීක්ෂණ මණ්ඩලයට ලබා දී ඇති ප්‍රකාශයන්හි මෝසස් රංගජීවගේ නම සඳහන් කිරීමක් සිදු කොට නොමැති අතර ප්‍රථම වරට එම නම සඳහන් කරනු ලැබ ඇත්තේ සිද්ධිය සිදු වී වසර කීපයකට පසු එනම් දේශපාලන වශයෙන් සිදු වන ලද පෙරළියකට පසු යහපාලන රජය බලයට පත් වීමෙන් පසු නැවත පරීක්ෂණ පවත්වනු ලැබීමෙහිදීය. එම අවස්ථාවේදීද මෙම පුද්ගලයා විසින් මෝසස් රංගජීව හඳුනාගෙන සිටීම පිළිබඳව පරස්පර විරෝධී මෙන්ම විශ්වසනීයත්වයෙන් හීන වූ සාක්ෂි ලබා දී තිබිණි. මෙම කොමිෂන් සභාවේදීද එම තැනැත්තා සාක්ෂි ලබා දුන් අතර එම සාක්ෂියද සමස්තයක් ලෙස සලකා බැලීමේදී විශ්වසනීයත්වයෙන් තොර වූවකි. එමෙන්ම වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සිදුවීම සම්බන්ධයෙන් එවකට ආරක්ෂක ලේකම්වරයා වූ ගෝඨාභය රාජපක්ෂ මහතා සම්බන්ධ කිරීම සඳහා මෝසස් රංගජීවගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට කරන ලද උත්සහයන් කොමිෂන් සභාවේ විමර්ශනය තුළ එළිදරවු වනු ලැබ ඇති අතර එබඳු ප්‍රකාශයන් ලබා දීම මෝසස් රංගජීව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම හේතුවෙන් ඔහු පලි ගැනීමේ ක්‍රියාදාමයට පත් කරනු ලැබ ඇති අතර අනාවරණය විය. කරුණු මෙසේ හෙයින් මෝසස් රංගජීව හට

ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ HC(TAB) 493/19/03 අංක දරණ නඩුවේ චෝදනා නැගීම දේශපාලන පලි ගැනීමේ ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් ලෙස සිදුව ඇතැයි යන්න කොමිෂන් සභාවේ තීරණය වේ.

## නිර්දේශ

1. ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින HC(TAB) 03/19/493දරණ නඩුව වැඩිදුරටත් පවත්වාගෙන යන්නේද යන්න සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් මෙම වාර්තාව තුළ හෙළිදරවු වන්නා වූ කරුණු සලකා බලා තීරණයක් ගත යුතු බවටත් කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි .

2. පොලිස් පරික්ෂක මෝසස් රංගජීව හට ඔහුගේ සේවා කාලයට අනුව ලැබිය යුතුව තිබූ උසස්වීම් ලබා දීමට පොලිස්පතිවරයා විසින් විධිමත් ක්‍රියාපටිපාටිය යටතේ පොලිස් කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම සුදුසු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

3. අපරාධ චෝදනා ඉදිරිපත් කිරීම පිණිස අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමට අධාර අනුබල දීම පිළිබඳව 01,03,04 වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට පත් කිරීමේ චෝදනාව මත විනයානුකූලව ක්‍රියාමාර්ග ගැනීම කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි .

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පොලිස් පරික්ෂක මෝසස් රංගජීව නෙවමාල් මහතා (මින් ඉදිරියට රංගජීව යනුවෙන් හඳුන්වනු ලබයි.) කොමිෂන් සභාව වෙත 2020.01.27 වෙනි දින පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබූ අතර එම පැමිණිල්ල 7/20 වශයෙන් කොමිෂන් සභාවේ ලියාපදිංචි කරනු ලැබිණි. දේශපාලන පලි ගැනීමක් මත කොළඹ මහේස්ත් අධිකරණයේ නඩු අංක 6540/12/02 යටතේ අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බන්ධනාගාරගත වීම සහ කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණ නඩු අංක HC(TAB) 493/19/03 දරණ නඩුවේ පළමුවන විත්තිකරු ලෙස සාවද්‍ය සහ ගොනු කරන ලද සාක්ෂි මත නඩු පැවරීමකට ලක් වීම සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිල්ල රංගජීව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ලෙහි ශීර්ෂය ලෙස සඳහන් වේ.

යතෝක්ත පැමිණිල්ලට අනුව රංගජීව ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් පරික්ෂකවරයෙකු වශයෙන් වසර 24ක කාලයක් සේවය කරනු ලැබ ඇති අතර ඉන් වසර 17ක් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ වැටලීම් රාජකාරි සිදු කර වසර 05ක් ස්ථානාධිපති වැටලීම් වශයෙන් සේවය කරනු ලැබ ඇත. ඔහු සිය සේවා කාලය තුළ දේශීය හා විදේශීය මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විශාල සංඛ්‍යාවක් අත්අඩංගුවට ගැනීමට දායක වී ඇති අතර මත්ද්‍රව්‍යය ලංකාවට රැගෙන ඒම මර්ධනය කිරීම සඳහා වැටලීම් ගණනාවක් සිදු කර තිබේ. දකුණු මුහුදු තීරයේ නාවික සැතපුම් 150ක් දුරින් යාත්‍රා කළ අල්කයිඩා

සංවිධානයට අයත් හෙරෝයින් සහිත නැවක් අත්අඩංගුවට ගැනීමට රංගජීව දායක වී ඇත. රංගජීව විසින් සිදු කළ වැටලීම් මත මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහිව මහාධිකරණයන්හි පැවරෙන ලද නඩු වලදී චූදිතයින් බොහෝ ගණනක් වරදකරුවන් කොට මරණීය දණ්ඩනය ලබා දී තිබේ.

රංගජීව සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් හට බරපතල තර්ජනයකට මුහුණ පෑමට සිදු වූ බැවින් පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඔවුන් හට විශේෂ ආරක්ෂාවක් සලසා දී තිබිණි. 2013 වර්ෂයේ ගල්කිස්ස ප්‍රදේශයේ සිදු කරනු ලැබූ මත්ද්‍රව්‍ය වැටලීමකදී රංගජීව වෙඩි තැබීමකට ලක් වනු ලැබිණි. නැවත 2015 වර්ෂයේ පිළියන්දල ප්‍රදේශයේදී වැටලීමකට සහභාගි වෙමින් සිටියදී වෙඩි තැබීමකට ලක්ව රංගජීව හට බරපතල තුවාල සිදු විය.

2012 වර්ෂයේ නොවැම්බර් මස 09 වන දින විශේෂ කාර්යය බලකාය විසින් වැලිකඩ බන්ධනාගාරය තුළ සෝදිසි මෙහෙයුමක් සිදු කිරීමට යාමේදී බන්ධනාගාර රැඳවියන් විසින් සිදු කරන ලද පහර දීමෙන් ඇති වූ ගැටුම්කාරී තත්වය තුළදී එකී රැඳවියන් බන්ධනාගාරයේ අවි ගබඩාව බිඳ පැහැර ගත් අවි යොදා ගනිමින් විශේෂ කාර්යය බලකායේ නිලධාරින් හට වෙඩි තැබීමත් එම බලකායේ අණ දෙන නිලධාරි ඇතුළු නිලධාරින් පිරිසක් තුවාල ලැබීමත් සහ එමගින් ඇති වූ කැරලිකාරී තත්වය මර්ධනය කිරීම සඳහා යුධ හමුදාව කැඳවීමෙන් පසු සිදු වූ වෙඩි හුවමාරුව මත බන්ධනාගාර රැඳවියන් පිරිසක් මරණයට පත් වනු ලැබිණි. එම සිද්ධිය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන කටයුතු පවත්වනු ලැබූ අතර

බන්ධනාගාර කොමසාරිස්වරයා විසින්ද අභ්‍යන්තර විමර්ශනයක් සිදු කරනු ලැබ ඇත. ජනාධිපතිවරයා විසින් විශ්‍රාම ලත් මහාධිකරණ විනිශ්චයකාරවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් පත් කරනු ලැබ එම කමිටුව මගින්ද පරික්ෂණයක් සිදු කරන ලදී. එකී අවස්ථා තුනේදීම බන්ධනාගාරයේ සිදු වූ කැරලිකාරි සිදුවීමට අදාළව රංගජීවගේ කිසිදු සම්බන්ධතාවයක් හෙළිදරවු නොවීය. එසේ වුවද 2015 ජනවාරි 08 වන දින යහපාලන රජය බලයට පත් වීමෙන් පසුව දේශපාලන අවශ්‍යතාවයක් මත ඉහත කී 2012 වර්ෂයේදී සිදු වූ වැලිකඩ බන්ධනාගාරයේ කැරැල්ල සම්බන්ධයෙන් යලි විමර්ශන පවත්වනු ලැබිණි. මෙම විමර්ශනයේදී බන්ධනාගාර නිලධාරින් සහ රැඳවියන් කිහිප දෙනෙකු අදාළ සිද්ධිය සිදු වූ අවස්ථාවේදී රංගජීව බන්ධනාගාරය තුළ සිටි බවට ප්‍රකාශ ලබා දී ඇත. 2017 වර්ෂයේ නොවැම්බර් මාසයේ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් රංගජීවගෙන් යතෝක්ත සිද්ධිය හා අදාළව ප්‍රකාශයක් ලබා ගන්නා ලදී. එම අවස්ථාවේදී අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් රංගජීව හට අවසර ලැබුයේ අදාළ සිද්ධිය සිදු වන අවස්ථාවේ ආරක්ෂක ලේකම් වශයෙන් කටයුතු කරන ලද ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත බන්ධනාගාර පරිශ්‍රය පරික්ෂා කිරීම සහ රැඳවියන් ඝාතනය සිදු වීම රංගජීව දැන සිටි බවට ප්‍රකාශයක් ලබා දෙන ලෙසටය. අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන බව රංගජීවට දැන ගැනීමට ඉඩ දෙන ලදී. එය වලක්වා ගැනීමට නීතිමය පියවර කීපයක් ගනු ලැබූ මුත් සහනයක් නොසැලසෙන ලෙස අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් රංගජීවගේ නිල නිවස වටලා ඔහු අත්අඩංගුවට

ගැනීම සිදු විය. එය සිදු වන ලද්දේ 2018.03.28 දින දීය. අනතුරුව රංගජීව රක්ෂණ සිරභාරයට පත් කරනු ලැබූ අතර ඇප ඉල්ලීම් ප්‍රතික්ෂේප වීම හේතුවෙන් මාස 6ක කාලයක් රක්ෂණ සිරභාරයේ සිටීමට සිදු විය. ඔහුට ඇප ලබා දෙන ලද්දේ අභියාචනාධිකරණය විසිනි. 2019.07.14 දින රංගජීව හට පුද්ගල මහාධිකරණයක් ඉදිරියේ අධිචෝදනා පත්‍රයක් බාර දෙන ලදී. H.C/TAB/493/19/03 එම නඩුවේ අංකය. රංගජීවගේ පැමිණිල්ල මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන විට එකී නඩුව ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැවතිණි.

රංගජීව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යතෝක්ත පැමිණිල්ල මත කොමිෂන් සභාවේ පොලිස් ඒකකය විසින් ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගනු ලැබ ඇත. දින කීපයක් තුළ දීර්ඝ ලෙස සටහන් කරනු ලැබ ඇති එකී ප්‍රකාශයෙහි රංගජීවගේ සේවා කාලය සම්බන්ධයෙන් තොරතුරුද විමර්ශන කටයුතු පිළිබඳවද සවිස්තරව සටහන් කරනු ලැබ ඇත. එසේම වැලිකඩ සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යහපාලන රජය බලයට පත් වීමෙන් අනතුරුව සිදු කරනු ලැබූ පරීක්ෂණයේදී එකී සිද්ධියට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සම්බන්ධ කර ප්‍රකාශයක් ලබා ගැනීමට උත්සහ කරනු ලැබීම පිළිබඳව විස්තරාත්මක කරුණු සඳහන් කර තිබේ. ඒ වන විට මත්ද්‍රව්‍ය නාශක අංශය බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිව සිටි පූජිත ජයසුන්දර විසින් එබඳු බලපෑම් සිදු කරනු ලැබූ බව සඳහන් කර ඇති අතර "අමාරුවේ වැටෙන්න එපා. බේරගන්න කවුරුත් නැහැ ගෝඨා නේ

යැවුවේ ඒක කියලා එන්න මම උඩට කතා කරලා ඔයාව බේරගන්නම්." යැයි තමාට පැවසූ බව රංගජීව ඔහුගේ ප්‍රකාශයෙහි සඳහන් කර ඇත.

කොමිෂන් සභාව ඉදිරියේද රංගජීව දීර්ඝ ලෙස සාක්ෂි ලබාදෙන ලදී. ඔහුගේ සාක්ෂියෙන් අනාවරණය කරනු ලැබූ කරුණු පහත සඳහන් පරිදිය.

රංගජීව 1995 වර්ෂයේදී පොලිස් සේවයට බැඳන ලදී. ප්‍රථමයෙන් සිදු කරන ලද්දේ වැලිකන්ද ප්‍රදේශයේ ගම්මාන ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා තිබූ මුරපොළවල් වල සේවයේ යෙදීම 1999 වර්ෂයේදී පොලිස් මූලස්ථානය රාජකාරි සඳහා වාර්තා කළ අතර 2001 වර්ෂයේදී පොලිස් මත්ද්‍රව්‍යය නාශක කාර්යාංශයේ රාජකාරි සඳහා වාර්තා කරන ලදී. 2006 වර්ෂයේදී නිත්‍ය සේවා උප පොලිස් පරික්ෂක තනතුරටද 2007 වර්ෂයේදී පොලිස් පරික්ෂක තනතුරටද පත් කරනු ලැබිණි. චීන සමූහාණ්ඩුවේ යූනාන් ප්‍රාන්තයෙහි පොලිස් ඇකඩමියේ එක් මසක මත්ද්‍රව්‍ය නාශක පාඨමාලාවක් හදාරණු ලැබ ඇත. 2006 වර්ෂයේදී එක්සත් ජාතින්ගේ සංවිධානයේ සාම සාධක හමුදාවට අයත් නැගෙනහිර තිමෝරයේ මෙහෙයුම් රාජකාරි සිදු කර තිබේ. 2001 වර්ෂයේ සිට මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ වැටලීම් සම්බන්ධ රාජකාරි සිදු කරනු ලැබූ අතර 1000කට ආසන්න සංඛ්‍යාවක වැටලීම් වලට සහභාගිව තිබේ. ප්‍රධාන පෙලේ මත්ද්‍රව්‍යය නඩු 168ක් පමණ ඉදිරිපත් කර ඇත. ප්‍රධාන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙක් වන වෙලේ සුදා අත්අඩංගුවට ගෙන නඩු පවරා

සාක්ෂි ලබා දුන් අතර එම තැනැත්තා වරදකරු කරනු ලැබ මරණ දඬුවම ලබා දී තිබේ. රංගජීව විසින් සිදු කරන ලද වැටලීම් මත පවරන ලද නඩු අතරින් වරදකරුවන් වූ චූදිතයින් 47කට මරණ දඬුවම නියමව ඇත. 2010 වර්ෂය වන විට විදේශයන් වලින් හෙරෝයින් තොග වශයෙන් ලැබෙන ආකාරයන් සම්බන්ධයෙන් පැහැදිලි විමර්ශනයක් පොලිස් දෙපාර්තමේන්තුව තුළ හෝ රටේ හෝ නොතිබූ අතර රංගජීව ඔහුගේ ඔත්තුකාරයින් මගින් ලබා ගත් තොරතුරක් මත ප්‍රථම වතාවට වරායෙන් අර්තාපල් අල කන්ටේනරයක් ඇතුලේ තිබී හෙරොයින් කිලෝ 35ක් අත්අඩංගුවට ගන්නා ලදි. ඒ සමග අත්අඩංගුවට ගත් පකිස්ථානු ජාතිකයා වරදකරු කරනු ලැබ මරණ දඬුවම නියම කර ඇත. දකුණු ආසියාවේ එක් ස්ථානයකින් අත්අඩංගුවට ගත් වැඩිම හෙරොයින් ප්‍රමාණය වූයේ කොළඹ වරායේ ග්‍රීස් ටින් වල අසුරා ගෙනෙන ලද හෙරොයින් කිලෝ 260ක ප්‍රමාණයයි. එය රංගජීව විසින් සිදු කරන ලද වැටලීමකි. 2014 වර්ෂයේදී විදේශිකයෙකු හරහා යුරෝපයට යැවීමට සූදානම් කර තිබූ හෙරොයින් කිලෝ 35ක් ගුවන් තොටුපලේදී අත්අඩංගුවට ගෙන මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයට බාර දීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලද්දේ රංගජීවය. ඔහු විසින් සිදු කරනු ලැබූ විමර්ශනය මගින් දකුණු පලාතේ ස්ථානයක තිබූ හෙරොයින් සහ මුදල් ද වෙනත් දේපලද සොයා ගනු ලැබූ අතර ඒවායේ වටිනාකම රුපියල් කෝටි 900ක් පමණ විය. අපමණ වැටලීම් සිදු කළද රට තුළට ගෙන එන හෙරොයින් ප්‍රමාණයෙහි අඩු වීමක් දක්නට නොතිබුණෙන් ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයන්හිදී අනාවරණය වූයේ ඉරානයේ සිට ලංකා මුහුදු සීමාව

හරහා මියන්මාර් බැංකොක් දෙසට යාත්‍රා කෙරෙන නැව් මගින් විශාල තොග වශයෙන් රැගෙන යන හෙරොයින් ගැඹුරු මුහුදේ සිට රට තුළට රැගෙන එන ජාවාරම් සිදු වන බවය. රංගජීව ධීවරයෙකු ලෙස වෙස් වළාගෙන ගාල්ල මුහුදු තීරයේ සිට නාවික සැතපුම් 150ක් පමණ ගැඹුරු මුහුදේ දින කීපයක්ම ගත කරනු ලැබ ඉරාන් ජාතිකයින් දස දෙනෙක් සහ පකිස්ථාන් ජාතිකයෙක් සමග හෙරොයින් කිලෝ 100ක් අත්අඩංගුවට ගැනීමට කටයුතු කරනු ලැබීය. ඒ සම්බන්ධයෙන් වූ නඩුව දැනට මීගමුව මහාධිකරණයේ විභාග වෙමින් පවතී.

2017 වර්ෂයේදී මාකඳුරේ මධූෂ් යන හෙරොයින් ජාවාරම්කරුවාගේ ජාවාරම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වමින් සිටියදී රංගජීව ඇතුළු නිලධාරින් පිළියන්දල ප්‍රදේශයේදී වෙඩි ප්‍රහාරයකට ලක් විය. ඔහු ගමන් කරමින් සිටි මෝටර් රථයේ රියදුරු ලෙස කටයුතු කරනු ලැබූ පොලිස් කොස්තාපල්වරයාට වෙඩි වැදී මිය ගිය අතර රංගජීවගේ හිසට සහ සිරුරේ පිටුපසට වෙඩි වැදී තිබිණි. මෙම සිද්ධියේදී සිදු වූ තුවාල හේතුකොටගෙන ඔහුගේ සෞඛ්‍ය තත්වය දුර්වල වූයෙන් වෛද්‍යවරුන් විසින් ඔහුට සැහැල්ලු රාජකාරි නිර්දේශ කරනු ලැබ ඇත.

අනතුරුව රංගජීව සාක්ෂි දෙන ලද්දේ ඔහු මෙම කොමිෂන් සභාවට පැමිණීමට හේතු වූ කාරණය සම්බන්ධයෙනි.

2012 වර්ෂය වන විට රංගජීව පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කරන ලදී. මෙම වකවානුව තුළදී හෙරොයින් ජාවාරම්කරුවන් සමග මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ

ඇතැම් නිලධාරීන් සම්බන්ධකම් පවත්වනු ලබන බවට තොරතුරු ලැබී තිබුණෙන් රංගජීව ඒ සම්බන්ධයෙන් විමසිලිමත්ව කටයුතු කරනු ලැබූ අතර 2012.10.23 දින සිට 2012.11.09 වන දින දක්වා රංගජීව ඔහුගේ කාර්යාංශයේ නිලධාරීන් කිහිපදෙනෙක් සමග හෙරොයින් ජාවාරම්කරුවන් කීප දෙනෙකු සම්බන්ධ වී සිදු කරන ලද දුරකථන සංවාදයනට සවන් දීමට සහ පටිගත කිරීමට කටයුතු කරනු ලැබීණි. එම සංවාදයනට මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන්ද සම්බන්ධව සිටි අතර විමර්ශන කටයුතු පිළිබඳව තොරතුරු ජාවාරම්කරුවන් හට ලබා දෙන බැව් එහිදී හෙළි විය. මෙලෙස දුරකථන සංවාද සවන් දීම සිදු කරන ලද්දේ ජම්බුගස්මුල්ල ප්‍රදේශයේ නිවෙසකදීය. 2012.11.09 වෙනි දින සවස 4.10ට රංගජීව මත්ද්‍රව්‍ය කාර්යාංශයට පැමිණ උසස් නිලධාරීන් හමු වීමෙන් පසු 4.30ට පමණ පිටව ගිය අතර ඔහු යාමට නියමිත වූයේ ජම්බුගස්මුල්ල ප්‍රදේශයට වූ නමුත් සිරිතක් වශයෙන් සිදු කරන පරිදි රාජකාරි ලේඛනයෙහි සටහන් කරන ලද්දේ හලාවතට යන ලෙසටය. ජම්බුගස්මුල්ලෙහි වූ නිවසේ රංගජීවගේ ඔත්තුකරු සහ නිලධාරීන් සිටි අතර එහි සිට මෙහෙයුම් කටයුතු කරනු ලැබීණි. වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ වෙඩි තැබීම පිළිබඳව රංගජීවට ඔහුගේ බිරිඳ විසින් දුරකථනයෙන් අමතා පවසනු ලැබූයේ ඔහු ජම්බුගස්මුල්ල නිවසේ සිටියදීය. රංගජීවද එම නිවසෙහි වූ රූපවාහිනී යන්ත්‍රය ක්‍රියාත්මක කර රාත්‍රී 8.00ට වූ ප්‍රවෘත්ති ප්‍රකාශයෙන් මෙම සිද්ධිය පිළිබඳව දැනගන්නා ලදී. එම සිද්ධිය පිළිබඳව දැන ගැනීමෙන් අනතුරුවද රංගජීව ඇතුළු පිරිස ඔවුන් යෙදී සිටි රාජකාරියේම යෙදෙන ලදී. මෙම මෙහෙයුමේ ප්‍රතිඵලයක් වශයෙන් රංගජීවට

2012.11.11 දින බම්බලපිටිය ඇවුරෝරා හෝටලය අසලදී පකිස්ථාන් ජාතිකයින් දෙදෙනෙකු සහ ඔවුන්ගේ හවුල්කරුවෙකු සමග හෙරොයින් කිලෝ 2ක් අත්අඩංගුවට ගැනීමට හැකි විය.

2015.01.08 වන දින යහපාලන රජය බලයට පත් වීමෙන් පසුව පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ දිශාව බාරව සිටි ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පූජිත ජයසුන්දර මහතාගෙන් රංගජීවට කැඳවීමක් ලැබිණි. එය සිදු වූයේ 2015.04.06 සහ 10 අතර දිනයන්හී දීය.ඒ වන විට යහපාලන රජය බලයට පත් වීමෙන් පසු 2012 වර්ෂයේ සිදු වූ වැලිකඩ බන්ධනාගාරයේ කැරැල්ල සම්බන්ධයෙන් නැවත විමර්ශනයක් සිදු කිරීමට විශ්‍රාම ලත් මහාධිකරණ විනිසුරු විමල් නම්බුවසම් මහතාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරනු ලැබ එය ක්‍රියාත්මක වෙමින් පැවතිණි. පූජිත ජයසුන්දර මහතා රංගජීව කැඳවා ඔහුට කියා සිටින ලද්දේ වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සිදුවීම හා සම්බන්ධව රංගජීවගේ නමද කියවෙන බවය. එම සිද්ධියට තමාගේ කිසිදු සම්බන්ධයක් නොමැති බවත් තමන් කිසිදු දිනයක වැලිකඩ බන්ධනාගාරය තුළට ගොස් නොමැති බවත් රංගජීව පූජිත් ජයසුන්දර මහතාට පැවසූ නමුත් පූජිත ජයසුන්දර මහතා එය පිළි නොගෙන රංගජීවට කියා සිටින ලද්දේ "අමාරුවේ වැටෙන්න එපා බේරගන්න කවුරුත් නැහැ ගෝඨානේ කිවුවේ ඔයා ඒක කියන්න. මම උඩට කතා කරලා මොනවාහරි කරන්නම්" යනුවෙනි. රංගජීව තේරුම් ගත් පරිදි ගෝඨානේ කිවුවේ යන්නෙන් අදහස් කරනු ලැබුවේ එවකට ආරක්ෂක ලේකම්ව සිටි ගෝඨාභය රාජපක්ෂ මහතාගේ කීමට රංගජීවද වැලිකඩ බන්ධනාගාරය තුළට ගොස් සිරකරුවන් මරා

දැමීමට සම්බන්ධ වූයේ යැයි කියා සිටීමට පූජිත ජයසුන්දර මහතා තමාට පැවසූ බවයි. තමා කිසි දිනෙක ගෝඨාභය රාජපක්ෂ මහතා මුණගැසී හෝ දූරකථනයෙන් හෝ කතා බහ කර නොමැති බව කියා සිටින රංගජීව ඔහු ගෝඨාභය රාජපක්ෂ මහතා අහඹුවෙන් දැකීමට යෙදෙන ලද්දේ මෝටර් රථයක් තුළ ගමන් කරමින් සිටි අවස්ථාවක බවයි. එබැවින් රංගජීව පූජිත් ජයසුන්දර මහතාගේ යෝජනාව ප්‍රතික්ෂේප කළ අතර ඊට ලැබෙන ලද ප්‍රතිචාරය භයානක වූ බව රංගජීව කියා සිටි.

රංගජීව 2015.04.28 වන දින මෝසම් කොමිසම ඉදිරියේ සාක්ෂි ලබා දුන් අතර ඉහතින් සඳහන් කරන්නට යෙදෙන ලද ඔහුගේ දැනුමෙහි වූ සත්‍ය කරුණු කියා සිටින ලදී. ඉන් ටික දිනකට පසු නාකොටික් අංශයේ අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කමල් සිල්වා රංගජීව කැඳවා කියා සිටින ලද්දේ රංගජීවට නාකොටික් අංශයෙන් යාමට සිදු වන බවයි. එහිදී රංගජීවට දැන ගැනීමට ලැබෙන ලද්දේ රංගජීව මත්ද්‍රව්‍ය කාර්යාංශයෙන් ඉවත් කිරීමට නිර්දේශයක් කරන ලෙස පූජිත ජයසුන්දර මහතා පොලිස් අධිකාරි කමල් සිල්වා හට දැනුම් දී තිබූ බවය. පූජිත ජයසුන්දර මහතා රංගජීව හට සිදු කළ යෝජනාව තවත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් විසින් රංගජීවට ඉදිරිපත් කරන ලදී. එය සිදු වූයේ 2017.11.27 දින දීය. එදින රංගජීව මත්ද්‍රව්‍ය කාර්යාංශයේ ගරාජය අසළ සිටි අවස්ථාවක ජීප් රථයෙන් ඔහු පසු කර යමින් සිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න රංගජීව දැක ජීප් රථය නැවැත්වූ අතර රංගජීව ඒ අසළට ගිය විට ඔහුගේ සුව දුක් විමසා අනතුරුව කියා සිටින ලද්දේ වැලිකඩ සිදුවීම සම්බන්ධයෙන් රංගජීව

පිළිබඳව 100ක් පමණ දෙනා සාක්ෂි දෙන බවය. ඔහු වැඩිදුරටත් කියා සිටියේ මේ වැඩේට ඔයාව යැවුවේ ගෝඨාභය රාජපක්ෂගේ ඔයා ඒක කියන්න. එතකොට මම මොකක්හරි කතා කරලා ශේප් එකක් දාන්නම් යනුවෙනි. ඒ අවස්ථාවේදීද රංගජීව තේරුම් ගන්නා ලද්දේ වැලිකඩ බන්ධනාගාරයේ සිද්ධියට ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නම ඇදීම පිණිස තමාව සාක්ෂිකරුවෙකු කර ගැනීමට උත්සහ කරන බවයි. 2018.01.30 දින අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංක 01හි ස්ථානාධිපති වශයෙන් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද අංක බී 6540/02/12 දරණ බී වාර්තාවේ වැලිකඩ බන්ධනාගාරයේ සිද්ධිය පිළිබඳව දීර්ඝ විස්තරයක් සඳහන් කරනු ලැබ ඇති අතර එම වාර්තාවේ 08 වන පිටුවේ අවසාන ඡේදය පහත සඳහන් පරිදි වේ. විමර්ශන පවත්වාගෙන යාමේදී වැලිකඩ බන්ධනාගාරය වෙත 2012.11.09 වන දින රාත්‍රී කාලයේදී සිවිල් ඇඳුමින් සැරසී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ පොලිස් පරික්ෂක රංගජීව නිලධාරියා තවත් දෙදෙනෙකු සමගින් පැමිණි බවත් එම නිලධාරියා විසින් සිරකරුවන් අතරින් පිරිසක් තෝරා ගැනීමත් සිදු කරන ලද බවටත් අනාවරණය වන ලදී. ඉන් අනතුරුව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ඉල්ලීමක් මත කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙන් රංගජීවගේ විදේශ ගමන් තහනම් කරනු ලැබූයෙන් ඔහු අත්අඩංගුවට ගැනීමක් සිදු විය හැකි බව රංගජීවට අවබෝධ වූයෙන් රංගජීව නීතිඥවරයෙකු මාර්ගයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට නියෝජනයක් සිදු කොට කරුණු ඉදිරිපත් කළ අතර ඊට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරනු ලබයි. රංගජීව වෙනුවෙන්

නීතිඥවරයෙකු ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී එම මූලික අයිතිවාසිකම් පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ නමුත් අධිකරණයේ එය කැඳවන දිනයේ පෙනී සිටීමක් සිදු නොවීම හේතුවෙන් එය නිශ්ප්‍රභ කිරීමට යෙදුණි. එය සිදු වූයේ 2018.03.27 දින දීය. ඊට පැය කීපයකට පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රංගජීවගේ නිල නිවසට පැමිණ ඔහු අත්අඩංගුවට ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට රැගෙන යන ලදී. අනතුරුව රංගජීව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ රක්ෂණ සිරභාරයට පත් කරනු ලැබූ අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඔහු අනිවාර්යය නිවාඩු යවනු ලැබිණි. ඔහු අනිවාර්යය නිවාඩු යවනු ලැබූයේ 2018.04.07 දිනය. ඔහු අනිවාර්යය නිවාඩු යවා එක් මසක පමණ කාලයක් ඇතුළත වැඩ තහනමට ලක් කරනු ලැබිණි. රංගජීව වෙනුවෙන් කොළඹ මහාධිකරණයට ඉදිරිපත් කරන ලද අංක HCBH/209/18 දරණ ඇප අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප වූ අතර ඔහුට අභියාචනාධිකරණය විසින් ඇප නියම කරනුයේ 2018.09.22 දින දීය. 2019 වර්ෂයේ ජූලි මාසයේදී විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ HCTAB/463/19 දරණ නඩුව යටතේ රංගජීවට අධිචෝදනා බාර දෙනු ලැබිණි.

වැලිකඩ බන්ධනාගාරයේ සිද්ධියේදී රංගජීවගේ සහභාගිත්වය සඳහන් කරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දී ඇති රැඳවියෙකු වන්නේ සිරකරු අංක එල් 17952 දරණ සෙනරත් බන්දුල ලියනආරච්චි නැමැත්තාය. ඔහු වසර 38ක කාලයක සිර දඬුවම් ලබා තිබෙන තැනැත්තෙකි. වැලිකඩ බන්ධනාගාරයේ අදාළ සිදුවීම සිදු වන

ලද 2012.11.09 වන දින එම රැඳවියා එම බන්ධනාගාරයේ වයි.ඕ යන විශේෂ වාට්ටුවෙහි රඳවා සිටිනු ලැබ ඇත. එම වාට්ටුවෙහි ඔහුට අමතරව කළු තුෂාර, සුසන්ත, නිර්මල අතපත්තු, ඩොල්ෆින් චන්දන, අමිල, නවාස්, ගීත්, පොඩි විජේ, ගුණ්ඩු මාමා, කියාස්, අත්තිඩියේ මංජු යන තැනැත්තන් ඇතුළුව තැනැත්තන් 21 දෙනෙක් සිට ඇත. පරික්ෂාවක් සඳහා විශේෂ කාර්යය බලකාය පැමිණ සිටින බවට ආරංචියක් පැතිර ගොස් තිබී ඇති අතර දහවල් 2.00ට පමණ කෑ කෝ ගැසීමේ ශබ්දයක් හටගෙන ඇත. ඉන්පසු වැපල් වාට්ටුව පැත්තේ සිට කඳුලු ගෑස් ටින් එකක් ඔවුන් සිටි වාට්ටුව අසළට වැටී ඇති අතර "ඉන්න බෑ දොර අරින්න" යැයි ඔවුන් කෑ ගසනු ලැබූයෙන් වාට්ටුව බාර නිලධාරියා දොර අරිනු ලැබ ඇත. එළියට පැමිණි විට හතර වටේම කඳුලු ගෑස් ගසා තිබූ අතර පිරිස් ඔබමොබ දුවමින් සිටින ලදී. වාට්ටුවල දොරවල් ඇර තිබූයෙන් රැඳවියන් එහා මෙහා දුවමින් සිටින බැව් පෙණින. බන්ධනාගාර නිලධාරීන් සිටින ලද්දේ ආර්.සී කාර්යාලයේහිය. රැඳවියන් කීප දෙනෙක් මුළුතැන්ගෙයෙහි වහලය උඩට නැග උළු කැට වලින් පාර දෙසට දමා ගසනු පෙනෙන්නට තිබිණි. පිටතින් වෙඩි ශබ්ද ඇසුණු අතර කුමක් සිදු වන්නේදැයි නිශ්චිතව නොපෙනිණි. සවස 5.00 පමණ වන විට රැඳවියන් අතේ ටී 56 තුවක්කු තිබෙනු පෙනිණි. අනතුරුව සිදු වූ සිදුවීම් විස්තර කරනු ලැබ ඇති රැඳවියා යුධ හමුදාවෙන් පැමිණ ඔවුන්ගේ පිටුපසට තබා රෙදි පටි වලින් ගැටගසා වාට්ටුව තුළ දණගසාගෙන සිටින්නට සැළැස් වූ බව පවසයි. අනතුරුව ඔහුගේ ප්‍රකාශයෙහි මෙලෙස සඳහන් කර

තිබිණි. "අපි එහෙම පැය භාගයක් විතර වාට්ටුවේ සිටියා. ඔක්කොම දණගහගෙන හිටියා. විනාඩි 45කට විතර පස්සේ සිවිල් ඇඳගත්තු කෙට්ටු උස එක්කෙනෙකුයි බන්ධනාගාර නිලධාරියෙකුයි සිවිල් ඇඳ ගත්ත රංගජීව මහත්තයායි ඇතුලට ආවා. එතනට ඇවිල්ලා බන්ධනාගාර මහත්තයාගෙන් රංගජීව මහත්තයා ඇහුවා මේ වාට්ටුවේ කීයක් හිටියද? එතන විසි එකක් හිටියා කියලා යුනිෆෝම් ඇඳගෙන හිටිය බන්ධනාගාර නිලධාරි මහතා කිවුවා. ඒ අවස්ථාවේ විසි එක් දෙනාට වැඩි ප්‍රමාණයක් හිටියා. ඊට පස්සේ රංගජීව කිවුවා මේ වාට්ටුවේ විසි එක් දෙනා හැර අනෙක් අය නැගිටින්න කියලා. තුන් දෙනෙක් වැඩියෙන් හිටියා. රංගජීව කිවුවා උබලා මොකද මෙහාට ආවේ උබලා තමයි මේකට සම්බන්ධ වරෙල්ලා කියලා දෙක තුනක් ගහලා පැත්තකට කරලා තිබ්බා.... ඊට පස්සේ රංගජීව මහත්තයා සාක්කුවේ තිබී කොලයක් එලියට ගත්තා. ඒකේ නම් ලිස්ට් එකක් වගේ තිබ්බේ කියලා හිතන්න පුළුවන්. රංගජීව මහත්තයා ඇහුවා පන්වත්තේ උක්කුවා ඉන්නවාද කියලා. එයා එතන හිටියේ නැහැ. ඊට පෙර දින බන්ධනාගාර රෝහලේ ප්‍රතිකාර ලබමින් හිටියේ. එතනට යන්න පුළුවන්ද කියලා බන්ධනාගාර මහත්තයාගෙන් රංගජීව ඇහුවා. ඒක වෙනම පැත්තක තියෙන්නේ යන්න බෑ කිවුවා. ඊට පස්සේ අතපත්තුට නැගිටපන් කියලා රංගජීව කිවුවා. නමුත් ඔහු නැගිට්ටේ නැහැ. රංගජීව මහත්තයා එතන හිටිය නිලධාරින්ගෙන් ටෝච් එකක් ඉල්ලාගෙන එක එක්කෙනාගේ මූහුණු වලට ලං කරලා බැලුවා. රංගජීවගේ අතේ තිබුණු ෆෝන් එකේ තිබුණු ෆොටෝ වගයක්

බලමින් නිර්මල අතපත්තු ළඟට ගිහිල්ලා ඔබ තමයි නිර්මල අතපත්තු නැගිටපන් කියලා කිවුවා. ඊට පසුව ඔහු නැගිට්ටවලා සෙල් එක ඇතුලට දැම්මා. ඒ අවස්ථාවේ රංගජීව නිර්මල අතපත්තුට කිවුවා උබ මට මානව හිමිකම් එකේ නඩුවකුත් දැම්මා නේ කියලා. ඊට පස්සේ මාළු සුසන්ත නැගිටපන් කියලා කිවුවා. නමුත් නැගිට්ටේ නෑ. ඊටපස්සේ ළඟට ගිහිල්ලා උබට තමයි කියන්නේ. නැගිටපන් කියලා කිවුවා. එතනින් ඇදලාම දැම්මා. ඊටපස්සේ ගුන්ඩුවා නැගිටපන් කියලා කිවුවා. ඊටපස්සේ නැගිට්ටෙත් නෑ. ෆොටෝ එක බලලා උබත් නැගිටපන් කියලා ගුණ්ඩුවාත් සෙල් එක ඇතුලට දැම්මා. ඩොල්ෆින් චන්දන නැගිටපන් කිවුවා. එයාවත් ළඟට ගිහිල්ලා හඳුනගෙන එයාවත් ඇතුලට දැම්මා. ඊටපස්සේ රංගජීව ඇහුවා කෝ උබලගේ ලොක්කා කළු තුෂාර කියලා. කවුද පාටියේ හිටපු කපිල කියපු කෙනා කිවුවා එයා දැන් මෙතන නෑ කියලා. ඊට පසුව අපි එළියේ දණගහගෙන හිටියා. රංගජීවයි සිවිල් එකේ හිටපු ආමි නිලධාරියයි අනිත් නිලධාරින් දෙදෙනයි බන්ධනාගාර නිලධාරියයි වාට්ටුව ඇතුළට ගියා. ඒ කට්ටිය හොඳටම ගහන ශබ්දය අපට ඇහෙනවා. ගහන්න එපා කියලා කෑ ගහන ශබ්දය අපට ඇහුණා. විනාඩි 20ක් විතර ඒ අයට ගැහුවා. පසුව රංගජීවයි සිවිල් හිටපු යුධ හමුදා නිලධාරියයි බන්ධනාගාර නිලධාරියයි එළියට ආවා. අනෙක් නිලධාරින් දෙදෙනත් එළියට ඇවිත් දොර ලග හිටියා. නැවත විනාඩි 10කින් විතර පසුව ඒකේ හිටපු නිලධාරියයි අර නිලධාරින් දෙන්නයි වාට්ටුවෙන් එළියට ගියා. ඒ වන විට අපි අත් දෙක බැදලා එතනම හිටියා…” මෙලෙස

සඳහන් කරන රැඳවියා අනතුරුව කීප දෙනෙක් සිර කුටියෙන් එළියට ගෙන ගිය බවත් පසුව වෙඩි ශබ්ද ඇසුණු බවත් කීප දෙනෙක්ගේ මළ කඳන් වැටී තිබුණු බව පසුවදා උදේ දුටු බවත් පවසනු ලැබ ඇත. ප්‍රකාශය අවසානයේ රැඳවියාගෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඇති අතර ඔබ රංගජීව මහත්තයා හඳුනන්නේ කෙසේද යන ප්‍රශ්නයට ලබා දී ඇති පිළිතුර මම ඔහු එළියේදී පුද්ගලිකව දන්නවා. රංගජීව මහතා මාගේ හිතවතෙකු වන මහරගම ටවුන් එකේ ශොප් එකක් කරන පාලිත ප්‍රනාන්දු කියන කෙනාගේ ගෙදර ඇවිත් ඉන්න අවස්ථාවේ මා සමග කතා කරලා තියෙනවා යන්නයි.

රංගජීව කියා සිටිනුයේ ඔහු කිසි විටෙකත් පාලිත ප්‍රනාන්දු නැමැත්තෙක් දැන නොසිටි බවත් එනමින් වූ තැනැත්තෙකුගේ කිසිදු අවස්ථාවකට සහභාගී වී නොමැති බවත්ය. එබැවින් රැඳවියා කියා සිටිනු ලබන්නා වූ පාලිත ප්‍රනාන්දු නැමැත්තෙක් සිටීදැයි යන්න සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන මෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඔහු විසින් කරනු ලැබූ ඉල්ලීම නොසලකා හරිනු ලැබූ බැව් රංගජීව කියා සිටී.

වෙලා සුදා යන්න මත්ද්‍රව්‍යය ජාවාරම්කරු සහ මත්ද්‍රව්‍ය කාර්යාංශයේ සේවයේ යෙදී සිටී පොලිස් කොස්තාපල් අරුණ ජීවක පෙරේරා යන තැනැත්තන්ගේ යැයි සඳහන් කරනු ලැබූ දුරකථන සංවාදයක හඬ පටයක් කොමිෂන් සභාව ඉදිරියේ වාදනය කරනු ලැබිණි. මෙම දෙබසෙහි බන්ධනාගාර සිද්ධිය පිළිබඳව සඳහන් වන බවත් එම සංවාදය සිදු වන අවස්ථාව වන විටත් සිදු වී නොතිබූ ඇතැම් සිදුවීම් පිළිබඳව එම සංවාදයෙහි සඳහන් වන හෙයින් මත්ද්‍රව්‍යය ජාවාරම්කරුවන්ගේ සම්බන්ධතාවයක් වැලිකඩ බන්ධනාගාරයේ

සිදුවීම කෙරෙහි පවතින බවත් රංගජීව කියා සිටී. රංගජීව මෙම සාක්ෂිය දෙනු ලැබීමේදී

ප්‍ර:- මහත්මයා ඔය හඬ පටය කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් මොකක්ද මේ කොමිෂන් සභාවේ අවධානයට යොමු කර සිටින්නේ? යනුවෙන් රංගජීවගෙන් අසන ලද ප්‍රශ්නයට ඔහු ලබා දී ඇති දීර්ඝ පිලිතුර පහත සඳහන් පරිදි වේ.

උ:- ගරු ස්වාමිනි එකක් මම 2012.10.22 ද ඉඳලා මම හිටියේ මත්ද්‍රව්‍යය ජාවාරමක විමර්ශනයක. මම රාත්‍රී 9.50ට සුදාගේ අන්තිම කෝල් එක එනකම්ම සටහන් ලිව්වා. ඒ සටහන් මම ඉදිරිපත් කරලා තියෙනවා. මම හඬ පටි ඇහුවා. ඒ අහලා මම මගේ විමර්ශනයට ගියා මිසක මම ඔතනට ගියේ නැහැ. දෙවෙනි එක ස්වාමිනි මේ වෙලේ සුදා දණ්ඩගස්වලා වෙඩි තියනවා කියන කතාවේ දිගුවක් තමයි මේ වැලිකඩ නඩුවේ යන්නේ. දණ්ඩගස්වලා ඔලුවට වෙඩි තියලා 2012 ඔය කියපු කතාව තමයි ස්වාමිනි ක්‍රමක්‍රමයෙන් ඇවිල්ලා අන්තිමට මාව දානවා 2015. ඇයි ස්වාමිනි මම තමයි අර මරණ දඬුවමට සාක්ෂි. ඊට පස්සේ තමා මගේ නම දණ්ඩගස්වන කතාවට එන්නේ. ඒක තමයි මම මේ ගරු අධිකරණයට කිව්වේ. එතන මාව හිර කරන්න කුඩුකාරයෝ මත්ද්‍රව්‍යය ජාවාරම්කාරයෝ උත්සහ කරනවා. දේශපාලන වශයෙන් අනිත් අය උත්සහ

කරනවා. මම ස්වාමිනි වෙලේ සුදාට හිතවත් වුණා නම් අද මම වෙඩි කන්නෙත් නැහැ. අද මම කොමිෂන් සභා වල නගින්නෙත් නැහැ. අද මට නඩුත් නැහැ. මට ඉන්න තිබ්බා. ඒවාට විරුද්ධව වැඩ කළ නිසා හින්දා තමයි ස්වාමිනි මට ලැබුණේ හිර කූඩුවයි එල්ලුම් ගහයි.

මහත්මයා මේ ගරු කොමිෂන් සභාවෙන් කුමක්ද ඉල්ලා සිටින්නේ යනුවෙන් රංගජීවගේ නීතිඥවරයා ඔහුගෙන් අසන ලද ප්‍රශ්නයට රංගජීව පිලිතුරු දෙමින් කියා සිටින ලද්දේ මම ඉල්ලා සිටින්නේ මෙම නඩු කටයුත්තට අදාළ සිදුවීම නැවත සාධාරණ පරික්ෂණයක් කරන්න. එතකොට ඔබතුමාලට සත්‍යය අනාවරණය වෙයි. එහෙම නැත්තම් එල්ලුම් ගස් හරි මට යන්න වෙනවා යන්නයි.

රංගජීවගෙන් පැහැදිලි කිරීම් ලබා ගැනීමට නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි රජයේ අධිනීතිඥ රන්දිමා ප්‍රනාන්දු මහත්මිය රංගජීවගෙන් ප්‍රශ්න ඇසීමක් සිදු කරනු ලැබිණි. අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන් සිද්ධිය සිදු වූ 2012 වර්ෂයේ පරික්ෂණ පවත්වන අවස්ථාවේ සහකාර පොලිස් අධිකාරවරයෙක් වශයෙන් එම දෙපාර්තමේන්තුවේ රාජකාරි කළ ශානි අබේසේකර පරික්ෂණ කටයුතු වලට සහභාගි වී ඇති බව රංගජීව කියා ඇති අතර එම අවස්ථාවේදී පරික්ෂණ කටයුතු මෙහෙයවනු ලැබ ඇත්තේ ප්‍රධාන පොලිස් පරික්ෂක වික්‍රමසේකර බවත් ශානි අබේසේකර එම පරික්ෂණය අධීක්ෂණය කර ඇති බවත් පැහැදිලි කරනු ලැබිණි. 2017 වර්ෂයේදී පරික්ෂණ සිදු කරන අවස්ථාවේ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන අංක 01 හි ස්ථානාධිපතිව සිටි සාගර

කරසිංහආරච්චි යන නිලධාරියා පරික්ෂණ කණ්ඩායමේ මූලිකත්වය ගෙන කටයුතු කර ඇති බව සඳහන් කරනු ලැබිණි. සාක්ෂිකරුවන් මුල් අවස්ථාවේදී ලබා දී ඇති ප්‍රකාශයන්හි පිටපත් ලබා දෙන ලෙස චූදිතයින් වෙනුවෙන් කරනු ලැබූ ඉල්ලීම් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් නොසලකා හරිනු ලැබූ බවත් රංගජීව කියා සිටියේය. නීතිපතිවරයා වෙනුවෙන් වැඩිදුරටත් සිදු කරන ලද ප්‍රශ්න කිරීම් වලට පිළිතුරු දෙමින් රංගජීව කියා සිටින ලද්දේ ඔහු කිසිදු දේශපාලන පක්ෂයක ක්‍රියාකාරි සාමාජිකයෙකු නොවන බවත් එම සිදුවීමේදී ඔහු දේශපාලන වශයෙන් වින්දිතයෙකු වනුයේ පොලිස්පති පූජිත ජයසුන්දර මහතා විසින් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නම වැලිකඩ සිද්ධියට ඈඳා ප්‍රකාශයක් ලබා දෙන ලෙස කරනු ලැබූ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් බවත්ය.

2015 වර්ෂයේ පොලිස් මත්ද්‍රව්‍යය කාර්යාංශයේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කරනු ලැබ ඇති එවකට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සහ වර්තමානයේ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වන කමල් වසන්ත කුමාර සිල්වා රංගජීව වෙනුවෙන් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමට කැඳවන ලදී. 2015.05.07 දින වන විට රංගජීව පොලිස් මත්ද්‍රව්‍යය කාර්යාංශයට අනුයුක්තව තමන් යටතේ සේවය කරනු ලැබූ බැව් ඔහු පවසනු ලැබූ අතර රංගජීවගේ සාක්ෂියේදී පැ.19 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කරන ලද මත්ද්‍රව්‍යය දිසාව බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති  රංගජීව සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත තමා  විසින් සකස් කරන ලද්දක් බැව් කියා සිටියේය. එම අවස්ථාව වන විට රංගජීව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයෙන් ඉවත්

කිරීම සඳහා බොහෝ පිරිසකට අවශ්‍යව තිබූ බැව් ඔහු තේරුම් ගෙන සිටි බවත් රංගජීව සම්බන්ධයෙන් වාර්තාවක් එවන්න. දැන් ගොඩක් කල් හිටියා යනුවෙන් තම ජ්‍යෙෂ්ඨ නිලධාරියා පවසනු ලැබූ අවස්ථාවේ තමාගෙන් නිර්දේශයක් ලබාගෙන රංගජීව ඉවත් කිරීමට උත්සහ කරනු ලබන බැව් තමා තේරුම්ගත් බවත් ඔහු කියා සිටියේය. තමාගේ නිර්දේශයක් ලබා නොගෙන පොලිස්පතිවරයාට හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට රංගජීව මාරු කිරීමේ හැකියාව තිබූ බැව් ඔහු වැඩිදුරටත් පවසන ලදී. රංගජීව විසින් 2001 වර්ෂයේ සිට පොලිස් මත්ද්‍රව්‍යය කාර්යාංශයට අනුයුක්තව සිදු කරනු ලැබ ඇති වැටලීම් හා විමර්ශන පිළිබඳව සවිස්තර වූ වාර්තාවක් සකසනු ලැබ ඇති අතර එහි අවසානයේ සඳහන් කර ඇති නිර්දේශ පහත සඳහන් පරිදිය.

> " මෙම නිලධාරියා කාර්යාංශයෙන් පිටතට ස්ථාන මාරු කර හැරීම යන්න බොහෝ මත්ද්‍රව්‍යය ජාවාරම්කරුවන්ගේ හා ඔවුන්ගේ හිතවතුන්ගේ අභිලාෂයක් වන අතර මෙම නිලධාරියා කාර්යාංශයෙන් ස්ථාන මාරු කරවීම මා විසින් නිර්දේශ නොකරමි."

> " මෙම නිලධාරියා මත්ද්‍රව්‍යය කාර්යාංශයෙන් ඉවත් කළ යුතු යැයි ඔබතුමා විසින් කුමන හේතුවක් මත හෝ නිර්දේශ කරන්නේ නම් මෙම නිලධාරියාට සහ ඔහුගේ පවුලේ සාමාජිකයින්ට ඇති මරණීය තර්ජන හා මෙම නිලධාරියා සාක්ෂි දීමට ඇති වැදගත් මත්ද්‍රව්‍යය නඩු සම්බන්ධවද සැලකිල්ලට ගෙන අවම වශයෙන් අවරුදු 3ක කාල සීමාවක් වත් පොලිස්

ක්ෂේත්‍ර බලකා මූලස්ථානය වැනි ආරක්ෂිත ස්ථානයකට ඔහුගේ ස්ථාන මාරුව ලබා දීම සුදුසු බව දන්වා සිටිමි."

මෙම නියෝජ්‍ය පොලිස්පතිවරයා සාක්ෂි දෙමින් සිටියදී ඔහුගෙන් අසන ලද ප්‍රශ්න සහ ඊට ලබා දී ඇති පිළිතුරු කීපයක් පහත සඳහන් පරිදි වේ.

ප්‍ර:- මහත්මයා කිසියම් දිනක මේ රංගජීව යන නිලධාරියා විසින් මහත්මයාට ප්‍රකාශයක් කළාද පූජිත ජයසුන්දර යන අය විසින් මේ නිලධාරියාට පවසන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විමර්ශනයකදී අසත්‍ය සාක්ෂියක් ප්‍රකාශ කරන්න කියලා?

උ:- ස්වාමිනි 2015 මට මතක නෑ නිශ්චිත වශයෙන් කොයි දවසකද කියලා මේ නිලධාරියා මට ඇවිල්ලා කිවුවා සී.අයි.ඩී මහත්මයා කියනවා කියලා ප්‍රිසන් එකේ වෙච්ච සිද්ධියට හිටපු සෙකට්‍රි සම්බන්ධයි කියලා කියන්න කියලා.

ප්‍ර:- හිටපු සෙකට්‍රි යනුවෙන් අදහස් කළේ?

උ:- ගෝඨාභය රාජපක්ෂ මහත්මයා තමයි හිටපු සෙකට්‍රි කියලා කියන්නේ. මට ඇවිල්ලා කිවුවා සර් මට මෙහෙම කියනවා කියලා.... තමුන් ගියෙත් නැත්තම් වෙන කෙනෙක් තමුන්ට නියෝගයක් දුන්නා කියන්නේ කොහොමද කියලා එතනින් එහාට ඒක නැවතුනා. ප්‍ර:- මහත්මයා ඒ සිදු වීමෙන්

අනතුරුවද මේ පැ.19 ලෙස ලකුණු කරන ලද ලිපිය මහත්මයාට යොමු කරන්න සිදු වුණේ.?

උ:- එහෙමයි

මෙම කාල වකවානුව වන විට පොලිස්පතිවරයා විශ්‍රාම ගැනීමට නියමිතව සිටි බවත් ඊලඟ පොලිස්පතිවරයා වශයෙන් පත්වීම ලැබීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් අතර තරගයක් ඇති වීම හැම විටකම සිදු වන්නක් බවත් පොලිස්පති ධූරය පවතින රජයේ ආශිර්වාදය මත ලැබෙන්නක් බවත් මෙම නියෝජ්‍ය පොලිස්පතිවරයා සිය සාක්ෂියෙහි වැඩිදුරටත් කියා සිටින ලදී. කෙසේ වෙතත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිව සිටි පූජිත ජයසුන්දර මාස කීපයකට පසුව පොලිස්පති ධූරයට පත් විය. තවද රංගජීව හට තමන් විසින් නිර්දේශ කරනු ලැබූ උසස්වීම ලබා නොදීමට එවකට පොලිස්පති වූ පූජිත ජයසුන්දර විසින් කරනු ලැබූ බලපෑමක් හේතු වන්නට ඇතැයි යන්න තම විශ්වාසය බවද මෙම සාක්ෂිකරු වැඩිදුරටත් පවසනු ලැබිණි.

ඉහත සඳහන් කරන ලද පරිදි තම පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබුවේ රංගජීව පහත සඳහන් තැනැත්තන් මොහුට සිදු වූ පලි ගැනීම් ක්‍රියාවලියට වගඋත්තරකරුවන් වශයෙන් නම් කරනු ලැබිණි.

1. හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා
2. හිටපු අමාත්‍ය ඩී .එම් ස්වාමිනාදන් මහතා
3. පොලිස් අධිකාරි චිත්‍රානන්ද විජේසිරි වික්‍රමසේකර
4. ප්‍රධාන පොලිස් පරික්ෂක සාගර නිලන්ත කරසිංහආරච්චි
5. පො.සැ 4679 කන්කානිගේ මහේෂ් නන්දලාල් යසරත්න
6. පො.කො 66229 ජයසූරිය

7. සිරකරු අංක 17952 සෙනරත් බන්දුල ලියනආරච්චි මහතා
8. කේ.ඩබ් .ආර් ජගත් රෝහණ

අංක 05 වශයෙන් නම් සඳහන් තැනැත්තා හැර සෙසු සියලු දෙනා කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි අතර හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර සහ බන්ධනාගාර රැඳවියෙකු වන සෙනරත් බන්දුල ලියනආරච්චි සාක්ෂි දෙනු ලැබිණි.

බන්ධනාගාර රැඳවියෙකු වන සෙනරත් බන්දුල ලියනආරච්චි කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන අවස්ථාව වන විට කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ අංක එච්.සී / ටී.ඒ.බී /493/ 2019 යන නඩුවේ පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු වශයෙන් සාක්ෂි දෙනු ලැබ තිබිණි. එහිදී ලබා දුන් සාක්ෂිය නිවැරදිව ලබා දුන් බවට මෙම කොමිෂන් සභාව ඉදිරියේද එය ඒ ආකාරයෙන්ම පිලිගනු ලබන බවද ඔහු පවසන ලදී. ඉහත කී නඩුවෙහි සාක්ෂිකරුවෙකු වීම හේතුවෙන් තමන් බන්ධනාගාර 14කට මාරු කරනු ලැබ ඇති බවත් ඊට අමතරව තමාගේ නිවාස නිවාඩුව අහෝසි කරනු ලැබ ඇති බවත් තමාගේ බිරිඳට පවා මරණීය තර්ජන ඇති වී තිබෙන බවත් මෙම රැඳවියා කියා සිටින ලදී. තමා මෙම කොමිෂන් සභාව ඉදිරියේ වගඋත්තරකරුවෙකු කරනු ලැබ සිටිනුයේද වැලිකඩ බන්ධනාගාරයේ ඝාතන නඩුවේ ප්‍රධාන චූදිතයා වන පොලිස් පරික්ෂක රංගජීව හට එරෙහිව ඇසූ දුටු සාක්ෂිකරුවෙකු වශයෙන් සාක්ෂි ලබා දීම හේතුවෙන් බැව් කියා සිටි මෙම බන්ධනාගාර රැඳවියා එම සාක්ෂි දීම තමාට කිසිදු ලාභයක් හෝ ඵල ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහා සිදු කරන ලද්දක් නොවන බව කියා සිටිනු ලැබිණි. මෙම තැනැත්තාගෙන් රංගජීව වෙනුවෙන් හරස්

ප්‍රශ්න අසනු ලැබූ අතර වැලිකඩ බන්ධනාගාරයේ සිද්ධිය සිදු වන ලැබ දෙදිනකින් පමණ පවත්වනු ලැබූ පරික්ෂණයනට සහභාගී වී කටඋත්තර ලබා දුන් බවත් අනතුරුව 2015 වර්ෂයේ පැවැත්වූ කොමිෂන් සභාවක් ඉදිරියේ සාක්ෂි ලබා දුන් බවත් පවසනු ලැබීය. මෙම තැනැත්තා රංගජීව හඳුනාගනු ලැබීම පිළිබඳව ඔහුගෙන් විමසන ලද ප්‍රශ්න සහ ඊට ලබා දුන් පිළිතුරු පහත සඳහන් පරිදි වේ.

ප්‍ර:- මහත්මයා මේ රංගජීව කියන පැමිණිලිකරුව කොපමණ කාලයක සිට අඳුරනවාද?

උ:- මම එකම එක පාරක් පමණයි දැකලා තිබෙන්නේ ස්වාමිනි

ප්‍ර:- ඒ කොහේදීද දැක්කේ?

උ:- හෝමාගම ප්‍රදේශයේ ස්වාමිනි

ප්‍ර:- හෝමාගම ප්‍රදේශයේදී කොහොමද දැක්කේ මහත්මයා?

උ:- මගේ හිතවත් කෙනෙක්ගේ විවාහ උත්සවයකදී තමයි මට එහා පැත්තේ මේසෙක ඉඳගෙන ඉන්නවා පෙනුනේ.

ප්‍ර:- කවුද ඒ හිතවත් පුද්ගලයා?

උ:- ජගත් පෙරේරා කියන කෙනා ස්වාමිනි

ප්‍ර:- ජගත් පෙරේරා කියන කෙනාගේ උත්සවයේදී තමයි මහත්මයා මුලින්ම දැක්කේ?

උ:- එහෙමයි ස්වාමිනි

එසේ විවාහ මංගල උත්සවයකදී මෙම තැනැත්තා රංගජීව දැක ඇත්තේ 2004 හෝ 2005 වර්ෂයේ බවත් ඉන්පසුව දැක්කේ වැලිකඩ සිද්ධියේදී බවත් ඔහු වැඩිදුරටත් කියා සිටින ලදී. 2017 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අනුරාධපුර බන්ධනාගාරයේදී මෙම රැඳවියාගෙන ලබා ගත් ප්‍රකාශයෙහි " රංගජීව මහතා මගේ හිතවතෙක් වන මහරගම ටවුන් එකේ ශොප් එකක් කරන පාලිත ප්‍රනාන්දු කියන කෙනාගේ ගෙදර ඇවිත් ඉන්න අවස්ථාවේ මා සමඟ කතා කරලා තියනවා" යැයි ප්‍රකාශ කරන ලද්දේ යැයි රංගජීවගේ නීතිඥවරයා නගන ලද ප්‍රශ්නයට මොහුගේ පිළිතුර වූයේ එහෙම ප්‍රකාශයක් දුන්නේ නෑ ස්වාමිනි යන්නයි.

නම්බුවසම් කොමිසම ඉදිරියේදී රංගජීව නොහඳුනන බව පැවසූ බැව් රැඳවියා පිළිගත් අතර ඔහු කියා සිටියේ එය අසත්‍යයක් බවයි.

හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා සාක්ෂි දෙමින් බොහෝ කලක සිට ඔහු රංගජීව හඳුනන බව කියා සිටි අතර තමා 2015 මාර්තු මාසේ සිට 2016 අප්‍රේල් 20 දින දක්වා මත්ද්‍රව්‍යය මර්දන අංශයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් සේවය කරන ලද කාලයේ රංගජීව එම අංශයේ සේවය කරනු ලැබූ බව සඳහන් කළ අතර කිසිදු අවස්ථාවක හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා වැලිකඩ සිද්ධියට පටලවා සාක්ෂි දෙන ලෙස රංගජීවට උපදෙස් දීමක් සිදු නොකළ බව කියා සිටියේය.රංගජීව එසේ කියා සිටින්නේ නම් එය සාවද්‍ය කියමනක් බවත් තමා එය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන

බවත් පූජිත ජයසුන්දර කියා සිටිනු ලැබිණි. රංගජීව රාජකාරි කටයුතු වලදී උනන්දුවෙන් කටයුතු කරන්නා සේම පසු කාලීනව ඔහුට විරුද්ධව පැමිණිලි ලැබුණු බවත් එබඳු අවස්ථා වලදී නිලධාරියාගේ අඩුපාඩුකම් නිවැරදි කර ගන්නා ලෙස අධ්‍යක්ෂකවරයාට පවසනු ලැබූ බවත් ඔහු පිලිගත් අතර එහෙම නැත්නම් මේ නිලධාරියාට කාලයක් ඉන්න නිසා වෙන නිසි තැනක් මොකක්හරි යොමු කරන්න. යන උපදෙස් ලබා දෙන බව ඔහු ඒත්තු ගන්නා ලදී. රංගජීවට උසස් වීමක් නොලැබෙන බව හිටපු පොලිස්පතිවරයා පිලිගනු ලැබූ අතර එය කවර හේතුවක් මත සිදු වී දැයි මේ අවස්ථාවේ ඔහුට පැහැදිලි කර නොහැකි බැව් පවසනු ලැබිණි.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 86 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 .XXXVI

පැමිණිලි අංකය - 12/2020

පැමිණිලිකරු - ලමාහේවාගේ එමිල් රන්ජන්

ලිපිනය - අංක 42, බන්ධනාගාර නිල නිවාසය, බේස්ලයින් පාර, කොළඹ 09

පැමිණිලිකරු දේශපාලන පලි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු අමාත්‍ය තලතා අතුකෝරාළ මහත්මිය
2. හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා
3. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ධම්මිකා වික්‍රමසිංහ මහත්මිය

## තීරණය

2012 වර්ෂයේදී වැලිකඩ බන්ධනාගාරය තුළ ඇති වන ලද රැඳවියන්ගේ කැරැල්ල පිළිබඳ සිද්ධිය හා අදාළව හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව අපරාධ චෝදනා නැගීමට සාක්ෂි නිර්මාණය කිරීමේ අදහසින් එම සිද්ධිය පිළිබඳව නැවත විමර්ශන පැවැත්වීම ආරම්භ කොට එම විමර්ශන තුළින් නිර්මාණය කරගනු ලැබූ සාක්ෂි පදනම් කරගෙන අදාළ සිද්ධිය සිදු වන අවස්ථාවේදී නව මැගසින් බන්ධනාගාරයේ අධිකාරිවරයා වශයෙන් සේවය කරමින් සිටින ලද ලමාහේවාගේ එමිල් රන්ජන් අත්අඩංගුවට ගෙන රක්ෂිත

සිරභාරයට පත්කොට අනතුරුව අධිචෝදනා වලට ලක් කරනු ලැබීම යහපාලන රජයේ දේශපාලන පලි ගැනීමක් ලෙස මෙම කොමිෂන් සභාව ඉදිරියේ හෙළිදරව් වී ඇති බවට කොමිෂන් සභාව තීරණය කරනු ලබයි.

## නිර්දේශ

01. ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවත්නා වූ HC/TAB/493/19 දරණ නඩුව නිර්මාණය කෙරෙන ලද සාවද්‍ය සාක්ෂි මත ගොඩනගන ලද්දක් බවට වූ දෝෂාරෝපණයන් නීතිපතිවරයාගේ අවධානයට යොමු කළ යුතු බවට සහ එය වැඩිදුරටත් පවත්වාගෙන යන්නේද යන්න නීතිපතිවරයා විසින් සලකා බැලිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

02. ළමාහේවාගේ එමිල් රන්ජන් 2020.04.06 දින සිට විශ්‍රාම ලැබිය යුතු වයස සම්පූර්ණ කර සිටින බැවින් ඔහු විශ්‍රාම ගන්වනු ලැබ 2018.03.29 දින සිට ඔහුට අහිමි කෙරෙන ලද සේවා කාලය කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කිරීමට ඔහුට අවස්ථාව සලසා දිය යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරන අතර ඔහු වැඩ තහනමට ලක් කර සිටි කාලයට අදාළ හිඟ වැටුප් ගෙවනු ලැබීමට කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ළමාහේවාගේ එමිල් රන්ජන් (මින් ඉදිරියට එමිල් රන්ජන් යනුවෙන් හඳුන්වනු ලබයි.) ගාල්ල මහින්ද විද්‍යාලයේ මූලික අධ්‍යාපනය ලබා

ඇති අතර පාසල් අධ්‍යාපනයෙන් පසුව 1983 වර්ෂයේදී දෙවන පෙල ජේලර්වරයෙකු වශයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට බැඳී ඇත. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටියදී කොළඹ විශ්වවිද්‍යාලයෙන් සේවා කලමණාකරනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ඇත. 1997 වර්ෂයේදී පළමු පෙල ජේලර් තනතුරටද 2007 වර්ෂයේදී බන්ධනාගාර සහකාර අධිකාරි තනතුරටද 2011 වර්ෂයේදී බන්ධනාගාර අධිකාරි තනතුරටද පත් වූ එමිල් රන්ජන් 2016.09.05 දින වන විට විශේෂ ශ්‍රේණියේ අධිකාරි තනතුරකට උසස් කර සිටිනු ලැබිණි. ඔහු 2016.11.07 දින බන්ධනාගාර කොමසාරිස් තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා පත් කිරීමට යෙදී ඇත.

එමිල් රන්ජන් 2012.01.20 දින සිට 2012.07.24 දින දක්වා නව මැගසින් බන්ධනාගාරයේ අධිකාරිවරයා වශයෙන්ද 2012.07.25 දින සිට 2015.01.30 දින දක්වා වැලිකඩ බන්ධනාගාරයේ අධිකාරිවරයා වශයෙන්ද සේවයේ යෙදී ඇත.

2015 ජනවාරි මාසයේදී යහපාලන රජය බලයට පත් වීමෙන් පසුව බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්ගේ ඩී 01/5435(II) සහ 2015.01.29 වෙනි දිනැති ලිපිය මගින් වහාම ක්‍රියාත්මක වන පරිදි බන්ධනාගාර මූලස්ථානයේ කර්මාන්ත අධිකාරි වශයෙන් ස්ථාන මාරු කරනු ලැබිණි.

එමිල් රන්ජන් 2012.11.09 වෙනි දින සේවය කරනු ලැබූයේ නව මැගසින් බන්ධනාගාරයේ අධිකාරිවරයා වශයෙනි. එදින ප.ව 5.00ට ප්‍රධාන ජේලර් නිමල් ශාන්ත එමිල් රන්ජන්ගේ කාර්යාලයට පැමිණ වැලිකඩ බන්ධනාගාරයේ කැරැල්ලක් ඇති වී තිබෙන බවත් එදෙසින් කඳුළු ගෑස් හමා එන බවත් පවසනු ලැබිණි. එබැවින් මැගසින්

බන්ධනාගාරයේ රැඳවියන් සවස වැසීම සිදු කිරීමට පහසු බැව් ඔහු පවසන ලදී. එමිල් රන්ජන් උපදෙස් දෙන ලද්දේ රැඳවියන්ට මුහුණ සෝදා ගැනීම සඳහා අවශ්‍ය වතුර ලබා දී නියමිත වෙලාවට පැය භාගයකට පසු වැසීම සිදු කරන ලෙසටයි. එම උපදෙස් පරිදි කටයුතු කොට සවස 6.00ට පමණ වැසීම සිදු කළ බව ප්‍රධාන ජේලර්වරයා වාර්තා කරන ලදී.

එමිල් රන්ජන් බේස්ලයින් පාර දෙසට පැමිණ බලන විට වාහන තදබදයක් ඇති වී තිබෙන බවත් යුධ හමුදා සහ පොලිස් නිලධාරින් විශාල ප්‍රමාණයක් මැගසින් බන්ධනාගාරය ඉදිරිපිට හා ඒ අවට මාර්ගයේ රැඳී සිටිනු දක්නට හැකි විය. වැලිකඩ බන්ධනාගාරය දෙසින් වෙඩි ශබ්ද ඇසුණු අතර ප.ව 6.30 පමණ වූ එම අවස්ථාවේ වැසි අඳුරක් පැවතිණි. එම අවස්ථාවේදී යුධ හමුදාවේ මේජර් ජෙනරාල් ජගත් ද අල්විස්, කොළඹ ආඥාපති බ්‍රිගේඩියර් ශාන්ත දිසානායක ඇතුළු හමුදා නිලධාරින්ද පොලිස් නිලධාරින් හා විශේෂ කාර්යය බලකායේ නිලධාරින්ද පැමිණි අතර වර්ෂාවද ඇති විය. ඒ වන විටත් වෙඩි හඬ ඇසෙමින් තිබූ අතර එය වඩාත් වැඩි වෙමින් පැවතිණි. පැමිණි ආරක්ෂක අංශ නිලධාරින් ආපන ශාලාව දෙසට යන ලදී. ආරක්ෂක කටයුතු සැලසුම් කිරීමට සුදුසු ස්ථානයක් ලබා දෙන මෙන් ආරක්ෂක නිලධාරින් ඉල්ලා සිටි අතර ප්‍රධාන ආරක්ෂක නිලධාරිගේ කැමැත්ත මත ඔහුගේ නිල නිවස ඒ සඳහා ලබා දෙන ලදී. එහි ආරක්ෂක නිලධාරින්ද පොලිස් නිලධාරින්ද උසස් බන්ධනාගාර නිලධාරින්ද රැස් වූ අතර බන්ධනාගාර කොමසාරිස් ජනරාල් පී.ඩබ්. කොඩිප්පිලි බන්ධනාගාර කොමසාරිස්වරුන් වන අශෝක හපුආරච්චි, ගාමිණී කුලතුංග, වික්‍රමසිංහ යන තැනැත්තන්ද වැලිකඩ බන්ධනාගාර අධිකාරි ගාමිණී ජයසිංහ, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ අධිකාරි

චන්දන ඒකනායක ඒ අතර විය. නොකඩවාම වැලිකඩ බන්ධනාගාරය දෙසින් වෙඩි ශබ්ද ඇසුණු අතර යුධ හමුදාවේ සහ පොලිසියේ නිලධාරින් එම නිවසින් පිටව යන ලද්දේ රාත්‍රී 12.30ට පමණය. අනතුරුව බන්ධනාගාර නිලධාරින්ද පිටත්ව යන ලදී. එමිල් රන්ජන් එම ස්ථානයේ රැඳී සිටින ලද නමුත් සාකච්ඡාවට සහභාගි නොවිණි. අළුයම 1.00ට පමණ එමිල් රන්ජන් මැගසින් බන්ධනාගාරයේ ආරක්ෂක කටයුතු සොයා බලා ඔහුගේ නිල නිවසට යන ලදුව නැවත උදෑසන 6.00ට පමණ මැගසින් බන්ධනාගාරය වෙත පැමිණෙන ලදී. එහි දෛනික කටයුතු සොයා බැලීමෙන් අනතුරුව ජේලර්වරුන් වන පතලගෙදර, සමන් ප්‍රියදර්ශන, පුනරුත්ථාපන නිලධාරි වජිර අමරකෝන් යන නිලධාරින් සමග වැලිකඩ බන්ධනාගාරය වෙත යන ලද අතර අදාළ ගේට්ටුව අසල බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්ද වැලිකඩ බන්ධනාගාර අධිකාරි ගාමිණී ජයසිංහද තවත් නිලධාරින් පිරිසක්ද මුණගැසිණි. මේ අවස්ථාවේදී වැලිකඩ බන්ධනාගාරයේ රැඳවියන් හට උදෑසන ආහාරය ලබා දීම සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලැබූ අතර මැගසින් බන්ධනාගාරයෙන් ආහාර සපයන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්වරයා එමිල් රන්ජන්ට නියෝග කරනු ලැබිණි. ඒ අනුව රැඳවියන් 1000කට උදෑසන ආහාර සැපයීමට බාර ගත් හෙයින් එමිල් රන්ජන් ඇතුළු පිරිස ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නැවත මැගසින් බන්ධනාගාරයට එන ලදී.

වැලිකඩ බන්ධනාගාරය තුළ සිදු වූ කැරැල්ල පිළිබඳව මූලික විමර්ශන කටයුතු 2012 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරනු ලැබූ අතර විමර්ශන නිලධාරින් ලෙස කටයුතු කරනු ලැබූයේ එවකට ප්‍රධාන පොලිස් පරීක්ෂක වර්තමාන පොලිස් අධිකාරි වික්‍රමසේකර විසිනි. ඊට අමතරව බන්ධනාගාර කොමසාරිස්

එස්.පී.ඩබ්.එම්.ආර්.බී. වික්‍රමසිංහගේ සභාපතිත්වයෙන් හා බන්ධනාගාර අධිකාරි සී.එම්.එන් චන්ද්‍රසේකර සහකාර බන්ධනාගාර අධිකාරි වී.එම්.පී රණවක යන නිලධාරින්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුව විසින් විමර්ශනයක් පවත්වා එහි මූලික විමර්ශන වාර්තාව 2012.12.15 දින බන්ධනාගාර මූලස්ථානය වෙත බාර දී තිබිණි. තවද එවකට පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍ය චන්ද්‍රසිරි ගජවීර මහතා විසින් විශ්‍රාමික මහාධිකරණ විනිසුරු බන්දුල අතපත්තු මහතාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් 2013 වර්ෂයේදී පත් කරනු ලැබූ අතර විශ්‍රාමික දිසා විනිසුරු ලලිත් අන්ද්‍රාහැන්නදි සහ විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති නීතිඥ ගුණසේන තේනබදු එම කමිටුවේ සෙසු සාමාජිකයින් විය.

2015 වර්ෂයේ යහපාලන බලය රජයට පත් වීමෙන් අනතුරුව රාජ්‍ය නොවන සංවිධානයක් වන ගෝ රයිට් සංවිධානයේ නීතිඥ පෙරේරා සහ සිංහල කොටි ව්‍යාපාරයේ සුදේශ් රන්දිමාල් ද වැලිකඩ බන්ධනාගාරයේ පළමු පෙල ජේලර් කුඩාබන්ඩාර සහ දෙවන පෙල ජේලර් ලලිත් වසන්ත නානායක්කාර මෙන්ම එම රජය බලයට පත් වන අවස්ථාවේ බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් වශයෙන් කටයුතු කළ චන්ද්‍රරත්න පල්ලේගම ද එවකට අධිකරණ අමාත්‍යව සිටි විජේදාස රාජපක්ෂ මහතා හමු වී සඳහන් කරන ලද අසත්‍ය කරුණු මත 2012 වර්ෂයේ සිදු වූ වැලිකඩ බන්ධනාගාරයේ කැරැල්ල සම්බන්ධයෙන් නැවත විමර්ශන පැවැත්වීමට විමල් නම්බුවසම් මහතාගේ සභාපතිත්වයෙන් විමර්ශන කමිටුවක් පත් කරන ලදී. එම විමර්ශන කමිටුවේ සාමාජිකයන් වශයෙන් විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති අශෝක විජේතිලක සහ විශ්‍රාමික පරිපාලන නිලධාරි එස්.කේ ලියනගේ යන තැනැත්තන් පත් කෙරෙන ලද අතර නීතිපති

දෙපාර්තමේන්තුවෙන් රජයේ අධිනීතිඥ ජනක බන්ඩාර පත් කරනු ලැබිණි.

එමිල් රන්ජන් පවසන පරිදි විමල් නම්බුවසම් කමිටුව කිසියම් දේශපාලන පරමාර්ථයක් පෙරදැරි කර ගනිමින් ස්ථාපනය කරන ලද්දකි. වැලිකඩ බන්ධනාගාරයේ කැරැල්ල ඇති වන ලද අවස්ථාවේ ආරක්ෂක ලේකම්වරයාව සිටි ගෝඨාභය රාජපක්ෂ මහතා කිසියම් චෝදනාවකට නතු කර ගැනීමට මාන බලමින් සිටින ලද යහපාලන රජය මෙම බන්ධනාගාර කැරැල්ල ගෝඨාභයගේ මෙහෙයවීමෙන් ඇති වන ලද්දක් බවට සාක්ෂි නිර්මාණය කිරීම යථොක්ත කමිටුව පත් කිරීමේ පරමාර්ථය වන ලදැයි කොමිෂන් සභාව ඉදිරියේ එමිල් රන්ජන් සාක්ෂි දෙමින් කියා සිටින ලදී. හමුදා නිලධාරියෙක් විසින් සිරකරුවන්ගේ නම් සඳහන් නාම ලේඛනයක් බලා නම් කියනු ඇසුණු බවත් ඒ අවස්ථාවේදී තවත් හමුදා නිලධාරියෙක් කාගේද ලිස්ට් එක යැයි විමසූ විට ගෝඨා ලිස්ට් යැයි නම් කියවූ හමුදා නිලධාරියා පිලිතුරු දුන් බවත් කුඩාබන්ඩාර නම්බුවසම් කමිටුව ඉදිරියේ පවසනු ලැබ ඇත. ලලිත් වසන්ත නානායක්කාර විසින් විමල් නම්බුවසම් කමිටුවට ලබා දුන් සාක්ෂියෙහි ඔහු ඊට පෙර ලබා දුන් ප්‍රකාශයනට වෙනස් වූ ප්‍රකාශ ඇතුළත් කරමින් බන්ධනාගාර කොමසාරිස් කොඩිප්පිලි විසින් මිය ගිය සිරකරුවන් අසළට ටී 56 ගිණි අවි යොදා තොරතුරු වසන් කිරීමට උත්සහ කළ බවත් එම අවස්ථාවේ එමිල් රන්ජන්ද එහි සිටි බවත් පවසනු ලැබ ඇත.

එමිල් රන්ජන්ගේ සොහොයුරෙකු වන මේජර් ජෙනරාල් නෙවිල් රන්ජන් ලමාහේවා 01 වන ගජබා රෙජිමේන්තුවේ නිලධාරියෙකු බවත් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා අණ දෙන නිලධාරියා වශයෙන් 01 වන ගජබා රෙජිමේන්තුවේ සේවය කර ඇති

බවත් එමෙන්ම තවත් සොහොයුරෙකු වන මෙරිල් රන්ජන් ලමාහේවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කළ නිලධාරියෙකු වන අතර දැනට සහකාර පොලිස් අධිකාරිවරයෙකු බවත් එබැවින් තමා මෙම සිද්ධියට සම්බන්ධ කිරීමට සැලසුම් කරනු ලැබ ඇති බවත් කියා සිටින එමිල් රන්ජන් තම සේවා කාලය තුළදී කිසිදු දූෂණ අක්‍රමික චෝදනාවකට ලක්ව නොමැති බව සඳහන් කරනු ලැබිණි.

2015.01.30 වන දින එමිල් රන්ජන් බන්ධනාගාර මූලස්ථානයේ කර්මාන්ත අධිකාරි වශයෙන් ස්ථානමාරු කරනු ලැබිණි. 2018.03.28 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක සාගර කරසිංහආරච්චි ඇතුළු නිලධාරින් කණ්ඩායමක් රාත්‍රී 7.00ට පමණ එමිල් රන්ජන්ගේ නිවස වටලනු ලැබිණි. එම අවස්ථාවේ එමිල් රන්ජන් නිවසේ නොසිටි අතර පොලිස් නිලධාරින් විසින් නිවස වටලනු ලැබීම දියණිය විසින් එමිල් රන්ජන්ට දැන්වූයෙන් එමල් රන්ජන් නිවසට පැමිණි අතර එහිදී ඔහු අත්අඩංගුවට ගනු ලැබිණි. ඔහු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලදුව රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබිණි. මහේස්ත්‍රාත් අධිකරණයෙන්ද මහාධිකරණයෙන්ද එමිල් රන්ජන් වෙනුවෙන් කරනු ලැබූ ඇප ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලදී. ඔහුට අභියාචනාධිකරණය මගින් ඇප ලබා දෙන අවස්ථාව වන විට එමිල් රන්ජන් එක් අවුරුද්දක් සහ දින 07ක් රක්ෂිත බන්ධනාගාරගතව සිටිනු ලැබ තිබිණි. අනතුරුව ඔහුට එරෙහිව ත්‍රිපුද්ගල මහාධිකරණයේ HC/TAB/493/19 නඩුවෙහි 2019.08.18 දින අධිචෝදනා බාර දෙන ලදී.

එමිල් රන්ජන් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ බී 6540/2/12 යටතේ 2018.03.28 වන දින අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කරන ලදැයි ද වසරකුත් දින 07ක කාලයක් රක්ෂිත

බන්ධනාගාරයේ ගත කිරීමෙන් පසු 2019.04.04 දින ඇප මත මුදා හරිනු ලදැයිද ඇප මත මුදා හරිනු ලැබීමෙන් පසුව 2019.04.05 වන දින නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටිනු ලැබ ඇති නමුත් ඊට ප්‍රතිචාරයක් දක්වා නැතැයිද 2020.04.06 වන දිනට වසර 60 සම්පූර්ණ වී ඇතත් විශ්‍රාම යාමට අනුමැතිය දී නොමැති යැයිද එමිල් රන්ජන් සිය දුක්ගැනවිලි වශයෙන් මෙම කොමිෂන් සභාව වෙත කියා සිටින ලද අතර දේශපාලන පලි ගැනීමක් වශයෙන් ඔහුට සේවය අහිමි කරන ලද වසර 02ක කාලය සේවයෙහි යෙදීමට අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලා සිටිනු ලැබිණි. රක්ෂිත බන්ධනාගාරගතව සිටියදී බිරිඳ හෘදයාබාධයකට ලක් වීමෙන් ශල්‍යකර්මයක් සිදු කිරීමට යෙදෙන ලද බවත්, උසස් පෙළ විභාගය උසස් ලෙස සමත්ව සිටි බාල දියණියගේ අධ්‍යාපන කටයුතු ඇණ හිටීමට කටයුතු සැලසෙන ලද බවත් එමිල් රන්ජන් කොමිෂන් සභාවට පවසා සිටි අතර නඩු කටයතු සඳහා නීතිඥ ගාස්තු වශයෙන් විශාල මුදලක් දැරීමට සිදු වූ බවද කියා සිටියේය.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 71 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020.11.24

2020/11/24

## 9 .XXXVII

පැමිණිලි අංකය - 1081/2020

පැමිණිලිකරු - උදයංග වීරතුංග

ලිපිනය - 79 ඒ, කනත්ත පාර, තලපත්පිටිය, නුගේගොඩ

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

01.අමාත්‍ය මංගල සමරවීර මහතා

02.ආනන්ද විජේපාල මහතා

03.හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී විද්‍යාලංකාර මහතා

04.හිටපු ප්‍ර.පො.ප. එම්.ඒ.සී නිහාල් ෆ්‍රැන්සිස් මහතා

05.හරිස්චන්ද්‍ර රණවීර මහතා

06.හිටපු විදේශ ලේකම් චිත්‍රාංගනී වාගේෂ්වරී මිය

07.හිටපු අධ්‍යක්ෂ ජනරාල් යූ.එල්.එම් ජවුෆර් මහතා

08.හිටපු අධ්‍යක්ෂක ජනරාල් ඒ.එල් රත්නපාල

09.අධ්‍යක්ෂ ජනරාල් ලක්ෂිත රත්නායක මහතා

10.පෝලන්තයේ තානාපති සී.ඒ.එච්.එම් විජේරත්න මහතා

11.නියෝජ්‍ය මහකොමසාරිස් සමන්ත පතිරණ මහතා

12.එස් තිවාකරන් මහතා

13.තුර්කි රාජ්‍යයේ හිටපු ශ්‍රී ලංකා තානාපති පී.එම් අම්සා මහතා

## තීරණය

රාජ්‍යතාන්ත්‍රික නිලධාරියෙකු හට හිමි වරප්‍රසාදයක් වන තම ගෘහ භාණ්ඩ හා පෞද්ගලික බඩු බාහිරාදිය ශ්‍රී ලංකාවේ සිට අදාල විදේශ රටෙහි එම නිලධාරියාගේ පදිංචි ස්ථානයට ප්‍රවාහනය කර දීමද රාජ්‍යතාන්ත්‍රික සේවය අවසන් කරනු ලැබීමෙන් පසු නැවත සිය රටෙහි පෞද්ගලික නිවසට ප්‍රවාහනය කර දෙනු ලැබීමද විදේශ අමාත්‍යාංශයේ වගකීමක්ව පැවතියදී රුසියාවේ ශ්‍රී ලංකා තානාපතිව සේවය කරන ලද උදයංග වීරතුංගගේ සහ පවුලේ සාමාජිකයන්ගේ ගෘහ භාණ්ඩ සහ පෞද්ගලික බඩු බාහිරාදිය රුසියාවේ සිට ශ්‍රී ලංකාවට ප්‍රවාහනය කරනු ලබමින් පැවතියදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මැදිහත් වීමෙන් කොළඹ වරායෙහි අදාල කන්ටේනරය රඳවා ගැනීමත් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරනු ලැබ ලබා ගත් සෝදිසි වරෙන්තුවක් මත එම කන්ටේනරය විවෘත කිරීමෙන් අනතුරුව එය වෙන්දේසි කිරීමට නියෝග ලබා දීමත් යහපාලන රජයේ දේශපාලන පලි ගැනීම් ක්‍රියාවලියේ එක් දේශපාලන පලි ගැනීමක් බවට මෙම කොමිෂන් සභාව තීරණය කරනු ලබයි.

## නිර්දේශ

01. පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට අසත්‍ය කරුණු ඉදිරිපත් කරනු ලැබ අංක බී 639/15 දරණ නඩු කටයුත්තෙහි ලබා ගත් සෝදිසි වරෙන්තුවක් උපයෝගී කර ගනිමින් රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපති උදයංග වීරතුංගගේ සහ ඔහුගේ පවුලේ

සාමාජිකයන්ගේ ගෘහභාණ්ඩ සහ පෞද්ගලික බඩු බාහිරාදිය උදයංගගේ ශ්‍රී ලංකාවේ නිවසට ප්‍රවාහනය කරනු ලැබීම වැළැක්වීමට කටයුතු කරනු ලැබීමෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරිය වන චිත්‍රාංගනී වාගේෂ්වරී යන 06 වන වගඋත්තරකාරියගේ වගකීමක් පවතින හෙයින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ඇයගෙන් කරුණු විමසා පරීක්ෂණයක් පැවැත්විය යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි.

02. උදයංග වීරතුංගගේ පෞද්ගලික භාණ්ඩ අඩංගු කන්ටේනරය කොළඹ වරායේ රඳවා තබා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතුව ඇති ගුදම් ගාස්තු කපා හැරීම හෝ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ගෙවීම සිදු කළ යුතු බවට සහ කන්ටේනරය වහාම උදයංග වීරතුංග වෙත මුදා හැරිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

03. කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ බී 639/15 දරණ නඩුවට අදාළ සිතාසිය නියමිත කාර්යය පටිපාටියට අනුකූලව බාර දීමට ක්‍රියා නොකොට සාවද්‍ය තොරතුරු අධිකරණයට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජෙනරාල් (නීති) සී.ඒ.එච්.එම් විජේරත්න නැමැත්තාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කරුණු විමසීමක් සිදු කළ යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි.

# ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පෞද්ගලික භාණ්ඩ අඩංගු කන්ටේනරය පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය විසින් අත් අඩංගුවට ගැනීම.

උදයංග වීරතුංග මහතා රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති ලෙස විදේශ අමාත්‍යාංශය සමග අත්සන් කරන ලද ගිවිසුමේ 11 වෙනි පරිච්ඡේදය සහ එම අමාත්‍යාංශයේ අභ්‍යන්තර උපදෙස් මාලාවට අනුව, ඔහුගේ පවුලේ පෞද්ගලික භාණ්ඩ අඩංගු කන්ටේනරයක් කොළඹ සිට මොස්කව් නගරයට යැවීමටත් සහ ධූර කාලය අවසන් වූ පසු මොස්කව් නගරයේ සිට කොලඹට නැවත ගෙන්වා දෙන බවට සඳහන්ව ඇත. එම භාණ්ඩ වලට අදාළ ඇසුරුම්, ප්‍රවාහන හා රක්ෂණ ගාස්තු ඇතුළු වියදම් රජය විසින් දැරිය යුතු බව ගිවිසුමෙහි පැහැදිලිව සදහන් වේ.

විදේශ කටයුතු අමත්‍යාංශයේ OAD අංශයේ අධ්‍යක්ෂක ජෙනරාල් යූ. එල්. ජවුෆර් මහතා විසින් 2015.02.10 දින ලබාදුන් ලිඛිත අවසරය මත, සිය රාජකාරි කටයුතු අවසන් කර පෞද්ගලික භාණ්ඩ තානාපති කාර්යාල නිළධාරින්ගේ අධීක්ෂණය යටතේ අසුරා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ජෙනරාල් OAD අංශය භාරයේ, උදයංග වීරතුංග නමට කන්ටේනරය කොළඹට එවා ඇත. මෙම භාණ්ඩ යැවීමට අදාළ සියලු කටයුතු සිදු කරන ලද්දේ වැඩ බලන තානාපති සමන්ත පතිරණ සහ තානාපති කාර්යාලයේ සුජිත් රොද්‍රිගු යන නිලධාරින් විසිනි. ශ්‍රී ලංකාවේ දී ඒ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ OAD අංශයෙහි නිලධාරීන් කටයුතු කර ඇත. උදයංගගේ ගෘහභාණ්ඩ සහ පෞද්ගලික බඩු බාහිරාදිය ඇතුළත්

MSCU 332423-1 දරණ කන්ටේනරය 2015.04.10 දින කොළඹ වරායට ළඟා වී ඇත.

උදයංග ශ්‍රී ලංකාවේ නොමැති අවස්ථාවේදී කන්ටේනරය භාර ගැනීමට වෙනත් පුද්ගලයෙකුට බලය පැවරීමේ ලේඛන පෙබරවාරි මාසයේදී සූදානම් කරනු ලැබ ඇති අතර ඒ සම්බන්ධව විදේශ අමාත්‍යාංශයේ OAD අංශයත් දැනුවත් කර තිබේ. ඒ අනුව එම ලේඛන 2015 මාර්තු මාසයේ විදේශ අමාත්‍යාංශයට භාරදී ඇත. භාණ්ඩ අඩංගු කන්ටේනරය ශ්‍රී ලංකාවට ගෙන විත් භාරදීම මෙන්ම එහි සියලු ගෙවීම් සහ අදාල ලේඛන සූදානම් කිරීමේ වගකීම තානාපති කාර්යාලයේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ වගකීමක් වූ අතර ඒ සම්බන්ධව උදයංග වෙත වගකීමක් නොතිබුණි.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ OAD අංශය විසින් දැනුවත් කිරීමෙන් අනතුරුව, උදයංගගේ බිරිඳ උමා වීරතුංග සහ කන්ටේනරය භාර ගැනීමට බලය පවරන ලද නියෝජිත එම්. ඒ.ඩී. ආර්. චන්දන මහතා කන්ටේනරය නිදහස් කිරීමට අවශ්‍ය ලේඛන අත්සන් කිරීම පිණිස 2015 අප්‍රේල් මස තුළදී කිහිපවරක් OAD අංශයට පැමිණ ඇතත්, ලේකම්වරියගේ උපදෙස් මත අදාල ලේඛන අත්සන් කිරීමට අධ්‍යක්ෂක ජනරාල්, යූ.එල්.එම්. ජවුෆර් මහතා විසින් අවසර ලබා නොදිනි. ඒ සම්බන්ධව ඔහු පවසනු ලැබූයේ, මොස්කව් තානාපති කාර්යාලයෙන් එවන ලද භාරකාරත්ව ලිපියේ අඩු පාඩු ඇති බවත්, රාජතාන්ත්‍රික ගමන් බලපත්‍ර අවලංගු කර නැති බැවින් අදාල ලේඛන අත්සන් කිරීමට අවසර දිය නොහැකි බවත්ය.

ඒ හේතුවෙන්, වීරතුංග මහතා ඔහුගේ පුත්‍රයා වන ඩියෝන් වීරතුංග සමග 2015.05.05 දින ඉරානයේ ටෙහෙරාන් නුවර ශ්‍රී ලංකා

තානාපති කාර්යාලයට පැමිණියේ නැවත භාරකාරත්ව ලිපියක් ලබාදීම පිණිසය. නමුත් එදින උදේ 9 සිට සවස 4 පමණ වන තෙක් එහි රැදී සිටි නමුත් ඔවුන්ට හිරිහැර කිරීම සඳහා OAD අංශයේ අධ්‍යක්ෂක ජනරාල් යූ.එල්.එම්. ජවුෆර් මහතාගේ උපදෙස් මත එම ලිපිය ඉරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සහතික කරනු නොලැබිණි. එසේ නමුත් එස්. තිවාකරන් මහතා ඉදිරිපිට භාරකාරත්ව ලිපිය අත්සන් කරනු ලැබූ අතර, ඊට අමතරව විදේශ ගමන් බලපත්‍ර N5400885 සහ D3643085 ඔහුට ඉදිරිපත් කරන ලදුව ඔහු ඒවා පරික්ෂා කර බලා නැවත ආපසු භාර දී තිබේ.

කන්ටේනරය නිදහස් නොකිරීමට හේතුවක් ලෙස මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සහ විදේශ කටයුතු අමාත්‍යංශය චෝදනා එල්ල කරන ලද්දේ උදයංගගේ රාජතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර අංක D 3643085 අවලංගු නොකිරීමය. නමුත් ඔවුන්ගේ රාජතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර අවලංගු කර සාමාන්‍ය ගමන් බලපත්‍ර නිකුත් කරන ලෙස 2015.02.24 දින කුවිතාන්සි අංක 065956 හරහා මුදල් ගෙවා ඉල්ලීමක් කල බවත් ඒ අනුව 2015.02.27 දින අංක PA/OM/PAS/2230 දරණ ලිපියේ යටතේ එකී රාජතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර අහෝසි කර ඇති බව උදයංග මෙම කොමිෂන් සභාවට කියා සිටිනු ලැබ ඇත. උදයංග හට අංක N5400885 දරන සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍රය 2015.03.06 දින නිකුත් කරනු ලැබ ඇති අතර, ආගමන හා විගමන පාලක විසින් නව ගමන් බලපත්‍රය නිකුත් කිරීමට පෙර D3643585 දරණ රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය අවලංගු කර, ඒ පිළිබඳව සටහනක් N5400885 දරණ නව ගමන් බලපත්‍රයේ යොදා ඇති බව උදයංග පෙන්වා දෙන ලදී. ඊට අමතරව 2016.09.08 දින හැන්සාඩ් වාර්තාවට අනුව අභ්‍යන්තර කටයුතු

අමාත්‍ය එස්. බී. නාවින්න මහතා විසින් මෙම රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රය අවලංගු කර ඇති බවය පෙන්වා දී ඇත.

උදයංග සාක්ෂි ලබා දෙමින් අවලංගු කරන ලද D3643085 රාජ්‍යතාන්ත්‍රික විදෙස් ගමන් බලපත්‍රය ශ්‍රී ලංකා රේගුව වෙත රේගු කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට ඔහු පොරොන්දු වූ බවත් විදේශ කටයුතු අමාත්‍යංශයේ OAD අංශයේ අධ්‍යක්ෂක ජෙනරාල් විසින් 2015.06.18 දින ලිපිලේඛන රේගු කටයුතු සඳහා සිලෝන් නැව් සමාගමේ නිළධාරින්ට භාරදී ඇති බවත් පවසනු ලැබිණි. කෙසේ වෙතත්, MSCU 332423-1 දරණ කන්ටේනරය සැක සහිත බැවින් එය පරික්ෂා කල යුතු බවට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් බී/639/15 නඩුව යටතේ ඉල්ලීමක් කර ඇත. ඒ අනුව 2015.06.30 දින ගරු අධිකරණය නිකුත් කරන ලද සෝදිසි වරෙන්තුව මත එම කන්ටේනරය පොලිස් අත්අඩංගුවට ගෙන ඇත. පසුව, 2015.07.24 දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ ඒකක 5 හිටපු ස්ථානාධිපති, ප්‍ර. පො. ප. නිහාල් ෆ්‍රැන්සිස් ශ්‍රී ලංකා වරාය අධිකාරිය, MSC නැව් සමාගම සහ රේගුවේ නිළධාරින් සමග කන්ටේනරය විවෘත කර, එහි අඩංගු පෞද්ගලික භාණ්ඩ පරික්ෂා කරනු ලැබ, අංක FCID 05/15 රිසිට් පත හි දක්වා ඇති පරිදි පරිගණක සහ CD තැටි ඉදිරි පරික්ෂණ සඳහා රැගෙන ගොස් ඇත. නමුත් එසේ කටයුතු කිරීමෙන් අනතුරුව වුවද MSCU332423-1 දරණ කන්ටේනරය තව දුරටත් නිදහස් කිරීමක් සිදු කොට නැත. එසේ එම කන්ටේනරය විවෘත කරන අවස්ථාවේදී කන්ටේනරයේ තිබුණු භාණ්ඩ සඳහා තිබූ රක්ෂණ ආවරණය ලබා දී තිබූ රක්ෂණ ආයතනයේ නියෝජිතයකු කැඳවීම පැහැර හරිනු ලැබ ඇත.

උදයංග ප්‍රකාශ කර සිටින පරිදි එලෙස සෝදිසි කිරීමෙන් අනතුරුව යහපාලන රජයේ දේශපාලන අධිකාරියේ පලිගැනීම් නතර නොවූ අතර, විදේශ අමාත්‍යාංශයේ දූත මණ්ඩල ප්‍රධානි ඒ.එල් රත්නපාල මහතා විසින් 1979 කන්ටේනරය වෙන්දේසි කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවසර දී තිබේ. ඒ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඒකපාක්ෂිකව එම කන්ටේනරය 2016.09.30 වන දින වෙන්දේසි කිරීමට කටයුතු කර ඇත.

මෙම දේශපාලන පලිගැනීම් නතර කර ඔහුගේ පවුලේ පෞද්ගලික භාණ්ඩ විනාශ නොකර, ඒ සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු ගාස්තුව ඉවත් කර හෝ භාණ්ඩ භාරදීමට උපදෙස් ලබාදෙන ලෙස හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙතත්, විදේශ කටයුතු අමාත්‍යවරයා, විදේශ කටයුතු ලේකම්වරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයාට ලිපි මගින් ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කලද ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් ලැබී නැත.

මේ ආකාරයෙන් රාජ්‍ය බලය අයුතු ලෙස භාවිතා කරමින් දේශපාලන වශයෙන් පළිගැනීමේ අරමුණෙන් කටයුතු කිරීම මගින් උදයංග තමාගේත් තම පවුලේ සාමාජිකයින්ගේත් මූලික මානව අයිතිවාසිකම් උල්ලංඝනය වන අයුරින් මුල්‍ය අපරාධ විමර්ශන කොට්ටාශයේ ඒකක අංක 5හි ස්ථානාධිපති ප්‍ර .පො.ප. නිහාල් ෆ්‍රැන්සිස් විදේශ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම් චිත්‍රාංගනි වාගීස්වර, කැනඩාවේ ටොරොන්ටෝ නගරයේ හිටපු කොන්සල් ජනරාල් යූ.එල්.එම්. ජවුෆර්, ෂැන්හයි නගරයේ හිටපු කොන්සල් ජනරාල් ලක්ෂිත පි රත්නායක, ඉරානයේ තනාපති කාර්යාලයේ හිටපු නිලධාරී එස්. තිවාකරන්, මහා බ්‍රිතාන්‍යයේ නියෝජ්‍ය මහා කොමසාරිස් සමන්ත පතිරණ, කියුබාවේ

හිටපු තානාපති ඒ.එල්. රත්නපාල ඇතුළු නිලධාරීන් කටයුතු කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ආචාර්ය දීපිකා උඩුගම මහත්මියටද පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලද බව උදයංග වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය.

උදයංග මහතා කියා සිටින පරිදි කොටුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2016.07.18 දින, බී/639/15 දරණ නඩුවට අදාලව සිතාසියක් යුක්රේනියාවේ කිව් නගරයේ පිහිටි වීරතුංග මහතාගේ නිවසට භාරදීමට නියෝග කර තිබී ඇත. ඒ අනුව එම සිතාසිය විදේශ කටයුතු අමාත්‍යංශය වෙත ඒවා ඇති අතර ඔවුහු විසින් අංක 2016.07.25 දින තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත සිතාසිය යොමු කර ඇත. තුර්කි රාජ්‍යයේ ශ්‍රී ලංකා තනාපති කාර්යාලයට එම ලිපිය නිකුත් කර දින 8කට පසුව, එනම් 2016.08.03 වන දින එල්/කේස්/116 දරණ ලිපියෙන් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂක ජනරාල් (නීති) විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට දන්වා ඇත්තේ එම සිතාසි යුක්රේනියානු විදේශ කටයුතු අමාත්‍යංශය හරහා භාරදීමට කටයුතු කරන ලද අතර ඔවුන් දන්වා ඇත්තේ දැනට උදයංග එම ලිපිනයේ නොමැති බවයි. කෙසේ නමුත් යුක්රේනියානු විදේශ කටයුතු අමාත්‍යංශය වෙත, ශ්‍රී ලංකා රජය විසින් ඔහු හට භාරදීමට කිසිදු සිතාසියක් එම කාලය තුල යොමු කර නොමැති බවත්, එම ලිපිනයේ ඔහු පදිංචිව නොමැති බවට යුක්රේනියානු රජය කිසිදු ලිඛිත දැනුම් දීමක් සිදුකර නැති බවත් කියා සිටියේය. එම ලිපිනය ස්ථිර ලිපිනය බවත් එහි ස්ථිර පදිංචිය තිබූ බවත් සනාථ කිරීමට අදාල නිවසේ පදිංචි සහතිකය උදයංග විසින් ඉදිරිපත් කරන ලදී. ඔහු වැඩිදුරටත් පැවසුවේ මෙලෙස අධිකරණය නොමග යැවීමේ කාර්යයට මූලා‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයද සම්බන්ධ බවයි. එසේ සිතාසියක් එම ලිපිනයට භාර දී නැති බව ඔහු

විසින් 2016.09.20 දින විදේශ කටයුතු ලේකම්වරයාට සහ නීතිපතිවරයාට ලියාපදිංචි තැපෑලෙන් ලිඛිතව දන්වා ඇත.

කරුණු පැහැදිලි කරමින් උදයංග තවදුරටත් පෙන්වා දුන් පරිදි විදේශ කටයුතු අමාත්‍යාංශය වෙතට ලැබුණු සිතාසියේ මුල් පිටපත් තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා තුර්කියේ පිහිටි යුක්රේනියානු තානාපති කාර්යාලයට යැවිය යුතු අතර. එවිට ඔවුහු යුක්රේනියානු විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා යුක්රේනියානු අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය මගින් කිව් නගරයේ පොලිස් මූලස්ථානය හරහා සලොමෙන්ස්කි හි පොලිස් ස්ථානය මගින් තට්ටු නිවාසය භාර පොලිස් නිළධාරියා හරහා ඔහුගේ නිවසට සිතාසිය භාරදීම සිදු කළ යුතුව තිබුණි. නිවසේ නොසිටි අවස්ථාවක සිතාසිය භාර දීමට පැමිණියේ නම් අදාල තැනැත්තාට පොලිස් ස්ථානයට පැමිණීමට ලියවිල්ලක් යොමුකිරීම සාමාන්‍ය ක්‍රමවේදයයි. එසේම ඔවුන්ට ලැබුණු සිතාසිය අදාල පුද්ගලයාට භාරදීමට ගත් පියවර පිලිබඳව තොරතුරු සමග නැවතත් මෙම අනුපිලිවෙලට යුක්රේනියානු රජය ලබාදෙන ලිඛිත පිළිතුරට අනුව අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීම නිවැරදි ක්‍රමවේදය බවත් නමුත් එය එසේ සිදු වී නොමැති බවත් උදයංග පෙන්වා දෙනු ලැබිණි. එබැවින් අදාල ලියාපදිංචි ලිපිනයට සිතාසි නිසියාකාරව භාරදීමට කටයුතු නොකර ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජනරාල් සි.ඒ.එච්.එම්. විජේරත්න විසින් සාවද්‍ය තොරතුරු අධිකරණයට ඉදිරිපත් කර ඇති බව උදයංග පෙන්වා දෙනු ලබයි. ඉන් අනතුරුව 2016.10. 20 දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ හිටපු ස්ථානාධිපති ප්‍ර.පො.ප. නිහාල් ෆ්‍රැන්සිස්ගේ ඉල්ලීම මත කොටුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් උදයංගට එරෙහිව වරෙන්තු නිකුත් කර ඇත.

විදේශගත තැනැත්තෙකුට හා /හෝ සැකකරුවකුට නොතිසි යැවීමට අදාලව අධිකරණ සේවා කොමිෂන් සභා අංක 358 දරණ 2013 පෙබරවාරි 12 දිනැති චක්‍රලේඛනය සහ පොලිස්පති චක්‍රලේඛන අංක 2434/2013 දරණ 2013 ජූනි 12 දිනැති චක්‍රලේඛනයට කොමිෂන් සභාවේ අවධානය යොමු කල උදයංග, ඒ අනුව විදේශගත තැනැත්තෙකුට හා/හෝ සැකකරුවකුට භාරදීමට නියමිත අධිකරණ ලියකියවිලි, අධිකරණ අමාත්‍යාංශය හරහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාළ රටෙහි තානාපති හා/හෝ මහකොමසාරිස් මගින් අදාළ පාර්ශවකරුවන්ට භාරදීම කර යුතු අතර එම ලියකියවිලි භාරදීම සඳහා මාස 4ක කාලපරිච්ඡේදයකට යටත්ව අධිකරණ අමාත්‍යාංශයට යොමු කළයුතු බව සඳහන් කර ඇති බව පෙන්වා දෙනු ලැබිණි.

<u>මුලාය අපරාධ විමර්ශන කොට්ඨාශයේ ඉල්ලීම මත ඔහුගේ සාමාන්‍ය ගමන් බලපත්‍රය ප්‍රතිරෝධනය කිරීම.</u>

https://sinhala.srilankamirror.com අන්තර්ජාල වෙබ් අඩවියෙහි පල කල පුවතක් ඉදිරිපත් කල වීරතුංග මහතා, 2017.06.27 දින පැවැති කැබිනට් මණ්ඩල රැස්වීමේදී රුසියාවේ හිටපු තානාපති උදයංග සාමාන්‍ය ගමන් බලපත්‍රය වහාම අහෝසි කිරීමට කටයුතු කලයුතු බව අගමැති රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කර ඇති බව අනාවරණය කර තිබුනු බව පෙන්වා දෙන ලදී. තවද, එදිනම සංචාරක හා ක්‍රිස්තියානි කටයුතු හිටපු නියෝජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතාව මුලාය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත කැඳවා ජපානයේදී ඔහු උදයංග මහතා මුණගැසීම පිළිබද ප්‍රකාශයක් සටහන් කරගෙන

ඇති බවත්, එම සාක්ෂි කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරමින්, ඔහු ජපානයට සංචාරය කර ඇති බවත්, අවලංගු රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රය පරිහරණය කරන බවත් චෝදනා කර ඇත. ඒ අනුව 2017.06.30 දින පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් උදයංගට නිකුත් කර තිබූ අංක N5400885 දරණ ගමන් බලපත්‍රය ප්‍රතිරෝදනය කිරීමට කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇත. ඒ අනුව, D3643585 දරන අවලංගු රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රය හා N5400885 දරන වලංගු සාමාන්‍ය ගමන් බලපත්‍රය ප්‍රතිරෝදනය කිරීම සඳහා ආගමන හා විගමන පාලක වෙතට කොටුව මහේස්ත්‍රාත් අධිකරණය මගින් නියෝගය කර ඇති බවත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පරිගණක ජාල පද්ධතියේ N5400885 ගමන් බලපත්‍රයට අදාළව "Suspended Passport as per the Court order" යන සටහන ඇතුලත් කර ඇති බව මාධ්‍යය අනාවරණය කල බව සඳහන් කරන ලදී. ඊට අමතරව D3643585 දරන අවලංගු රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රය උපයෝගී කරගෙන ඩුබායි සිට ඇමරිකා එක්සත් ජනපදයට පිටත්වීමට උත්සාහ කිරීමේදී අත්අඩංගුවට ගත් බවට අසත්‍ය තොරතුරු අධිකරණයට ඉදිරිපත් කර ඇත. එබඳු අවලංගු කරන ලද රාජ්‍යයතාන්ත්‍රික ගමන් බලපත්‍රයක් උපයෝගි කරගනිමින් විදේශ ගමන්හි යෙදීම තමා විසින් කිසිදු අවස්ථාවක සිදු නොකළ බැව් උදයංග කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් කියා සිටියේය.

රාජ්‍යතාන්ත්‍රික විදෙස් ගමන් බලපත්‍රය ගැන වැඩිදුරටත් කරුණු පැහැදිලි කල ඒ මහතා, විදේශ අමාත්‍යාංශයේ අනුදැනුම මත 2015.03.06 දින අවලංගු කර සාමාන්‍ය ගමන් බලපත්‍රයක් නිකුත් කල බවට, එස්. බී. නාවින්න අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී සිදුකල

ප්‍රකාශය, 2016.09.08 දින හැන්සාඩ් ගත වී ඇති අතර ඒ පිළිබඳ නැවත ආචාර්ය හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී කරුණු දැක්වීමක් 2016.11.11 දින හා 2017.07.04 දින සිදු කල බව හැන්සාඩ් ගත වී ඇති බවට පෙන්වා සිටියේය.තවද,මේ දක්වා ශ්‍රී ලංකාවේ කිසිදු අධිකරණයක වරදකරුවකු ලෙස දඩුවම් ලබා නැති තමා රටින් බැහැරව සිටින මොහොතක තම අනන්‍යතාවය ඔප්පු කිරීමට ඇති එකම ලියකියවිල්ල වන ගමන් බලපත්‍රය ප්‍රතිරෝධනය කිරීම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව කියා සිටියේය.

<u>අපරාධ විමර්ශණ කොට්ඨාසය විසින් තානාපති කාර්යාලයේ පණිවිඩකරු නොයෙල් රණවීර මහතාගේ මරණය සම්බන්ධව</u> මෙහෙයවනු ලද විමර්ශන නඩුව

උක්ත කරුණ සම්බන්ධව පැහැදිලි කරමින් උදයංග ප්‍රකාශ කළේ රුසියාවේ ශ්‍රී ලංකා තනාපති කාර්යාලයේ පණිවිඩකරු ලෙස කලුආරච්චිගේ දොන් නොයෙල් රණවීර මහතා සේවය කල බවත්, 2014 ජූනි මාසයේ රුසියාවේ රොස්තොව්-නා-දොනු නගරයේ දී සිදු වූ හදිසි රිය අනතුරින් එහිදී මිය ගිය බවත්ය. නමුත් යහපාලන රජයේ දේශපාලන අධිකාරියේ උවමනාව සහ උපදෙස් මත එම රිය අනතුර මිනිමැරුමක් ලෙස චෝදනා කරමින් අපරාධ විමර්ශණ දෙපාර්තමේන්තුව විසින් 2015 මාර්තු මාසයේ අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කොට ඇත. එම චෝදනාවට විශාල මාධ්‍ය ප්‍රචාරයක් ලබා දී වීරතුංග මහතා මිනිමරුවකු ලෙස හුවා

දැක්වීමට ගත උත්සාහය දේශපාලන පලිගැනීමක් බව ඔහු ප්‍රකාශ කළේය.

ඔහු පෙන්වා දුන්නේ රුසියානු විදේශ ඇමතිවරයාගේ උපදෙස් පරිදි, රුසියානු විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2015.06.04 දින ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට එවන ලද සංදේශ ලිපියේ (TPN) සඳහන් කර ඇත්තේ නොයෙල් රණවීර ගේ මරණය සම්බන්ධයෙන් අපරාධ විමර්ශන පරීක්ෂණයක් ආරම්භ කර ඇති බවත් එහි එකම සැකකරු වන්නේ රුසියානු පුරවැසි එස්.ව. සම්සොනවා බවයි. එම මරණය සම්බන්ධයෙන් උදයංග හට රුසියානු අපරාධ පරීක්ෂණ ආයතන වලින් මෙම කරුණු පදනම් කොට ගෙන කිසිම චෝදනාවක්ද නොමැති බව සඳහන්ව ඇතැයි ද පෙන්වා දුන්නේය. එම රිය අනතුර රුසියාවේ, රෝස්තොව්-නා-දොනු නගරයේ, 2014.06.11 දින ප්ලාසා හෝටල් භූමියේදී සිදු වූ බව CCTV කැමරාවේ පටිගත වී ඇති අතර එම දත්ත අධිකරණයටද ඉදිරිපත් කර ඇත. මරණ පරීක්ෂණයෙන් පසුව, අංක 5785 දරණ මරණ පරීක්ෂණ සහතිකයක් ද නිකුත් කර පසුව 2014.06.12 දින කිරෝව්ස්කි කච්චේරියෙන්, අංක 5790 දරන රුසියානු මරණ සහතිකය නිකුත්කර ඇති බවට උදයංග ලේඛන ඉදිරිපත් කළේය.

ඒ අනුව 2014.06.13 දින මොස්කව් තානාපති කාර්යාලයෙන් අංක 11 දරණ ශ්‍රී ලංකා මරණ සහතිකය නිකුත් කොට ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශයට ලිඛිතව දැනුම්දීමෙන් පසුව 2014.06.15 දින මෘතදේහය ලංකාවට රැගෙන යන ලද බවත් පසුව දේහය බොරැල්ල ජයරත්න මල් ශාලාවට භාර දුන් බවත් අනතුරුව 2014.06.23 දින, වැලිකඩමුල්ල පොදු සුසාන භූමියේදී අවසන් කටයුතු සිදුකල බවත් උදයංග පෙන්වා දුන්නේය. නමුත්, යහපාලන රජය බලයට පැමිණ පසු එනම් 2015

මාර්තු මාසයේ අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගත් නියෝගයක් මත එම මෘත ශරීරය ගොඩගෙන වැඩිදුර විමර්ශන කටයුතු යහපාලන දේශපාලන අධිකාරියේ උපදෙස් මත අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇති නමුත් එම මරණය මිනීමැරුමක් බවට කිසිදු සාක්ෂියක් ලැබී නැති බව උදයංග ප්‍රකාශ කර සිටියේය.ඒ අතර රුසියානු සමූහාණ්ඩුවේ රෝස්තොව්-නා-දොනු අධිකරණයේ පැවතුනු රිය අනතුරට අදාල නඩුව අවසන් වී ඇති බවත් එහි තීන්දුව රුසියානු රජය විසින් මොස්කව් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා විදේශ කටයුතු අමාත්‍යංශයට ලබාදී ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 192 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020. 11. 24

2020/11/24

# 9 .XXXVIII

පැමිණිලි අංකය - 1080/20

පැමිණිලිකරු - උදයංග වීරතුංග

ලිපිනය - 79 ඒ, කනත්ත පාර, තලපත්පිටිය,
නුගේගොඩ

පැමිණිලිකරු දේශපාලන පලි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

01. කොමර්ෂල් බැංකුවේ නිට්ටඹුව ශාඛාවේ හිටපු කලමනාකාරිණී ශ්‍රියා කොඩිසිංහ මහත්මිය
02. කොමර්ෂල් බැංකුවේ කොටහේන ශාඛාවේ හිටපු කලමනාකරු ශාන්ත ඇරැගොඩ මහතා
03. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ හිටපු අධ්‍යක්ෂ එච්. අමරතුංග මහතා
04. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ඊ.එච්. මොහොට්ටි මහත්මිය
05. HSBC බැංකුවේ ප්‍රිමියර් ශාඛාවේ කලමනාකරු ගිහාන් පුංචිහේවා මහතා
06. පොලිස් දෙපාර්තමේන්තුවේ හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා

07. පොලිස් මූලාා අපරාධ විමර්ශන කොට්ඨාසයේ හිටපු අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ නියෝජා පොලිස්පති රවී විද්‍යාලංකාර මහතා

08. පොලිස් මූලාා අපරාධ විමර්ශන කොට්ඨාසයේ හිටපු සහකාර පොලිස් අධිකාරිණී, සහකාර පොලිස් අධිකාරිණී රේණුකා ජයසුන්දර මහත්මිය

09. පොලිස් මූලාා අපරාධ විමර්ශන කොට්ඨාසයේ ඒකක අංක 05හි හිටපු ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක එම්.ජ්.සී නිහාල් ෆ්‍රැන්සිස් මහතා

10. හිටපු ගුවන් හමුදාපති වෙල්ලආරච්චිගේ දොන් රොෂාන් මහේෂ් ජේම්ස් ගුණතිලක මහතා

11. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉන්ජිනේරු අංශයේ හිටපු අධ්‍යක්ෂ අල්ලලගොඩ ගමගේ ජීවන් ප්‍රියශාන්ත සිල්වා

12. ශ්‍රියාන් ප්‍රේමාල් සමරරත්න මහතා

13. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ හිටපු වැඩ බලන ශ්‍රී ලංකා තානාපති සුබරුල්ලා අහමඩ් ඛාන් මහතා

14. පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජෙනරාල්(නීති) සී.ජ්.එච්.එන් විජේරත්න මහතා

15. රුසියාවේ හිටපු වැඩබලන තානාපති සමන්ත පතිරණ මහතා

16. දූෂණ විරෝධී කමිටු කාර්යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ නීති උපදේශක එච්.එම්.සී.එල් තුසිත් මුදලිගේ මහතා

17. දූෂණ විරෝධී කමිටුවේ හිටපු සාමාජික පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා

18. දූෂණ විරෝධී කමිටුවේ හිටපු සභාපති හිටපු අග්‍රාමාත්‍යය රනිල් වික්‍රමසිංහ මහතා

19. හිටපු විදේශ කටයුතු අමාත්‍ය මංගල සමරවීර මහතා

20. හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා

21. හිටපු ජනාධිපති පාර්ලිමේන්තු මන්ත්‍රී මෛත්‍රීපාල සිරිසේන මහතා

22. දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයේ හිටපු අධ්‍යක්ෂ කේ.එම්. ආනන්ද විජේපාල මහතා

## තීරණය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට රුසියානු සමූහාණ්ඩුවෙන් මිග් යානා මිළදී ගැනීමේ කටයුත්තේදී උදයංග වීරතුංග රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයා වශයෙන් ඔහුගේ රාජකාරි ක්ෂේත්‍රය තුළ සිදු කිරීමට යෙදී ඇති කටයුතු සිදු කරනු ලැබ ඇත්තේ මිග් යානා මිළදී ගැනීම පිළිබඳව මූලික කටයුතු අවසන් වීමෙන් අනතුරුවය. මෙම මිග් යානා මිළදී ගැනීමේ කටයුත්ත තුළ බරපතල මූල්‍ය වංචාවක් සිදුව ඇතැයි යන්න යහපාලන රජය දේශපාලන පලි ගැනීම් සඳහා නිර්මාණය කරගනු ලැබ ඇති සංකල්පයකි. ඒ අනුව එම කටයුත්ත හා අදාළව උදයංග වීරතුංග හට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් නඩු කටයුතු ආරම්භ කිරීමත් වරෙන්තු ලබා ගැනීමත් උදර්පණ නීතිය යටතේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් ශ්‍රී ලංකාවට පිටුවහල් කිරීමට සැලැස්වීමත් ඔහු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කොට රක්ෂණ සිරභාරයට පත් කිරීමත් සහ ඔහුගේ බැංකු ගිණුම් අත්හිටුවීමත් දේශපාලන පලි ගැනීමක් වශයෙන් සිදු කරනු ලැබ ඇති බව මෙම කොමිෂන් සභාව තීරණය කරනු ලබයි.

# නිර්දේශ

01. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් යානා මිළදී ගැනීමේදී බරපතල මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුව ඇතැයි යන උපකල්පනය යටතේ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බී 639/15 දරණ නඩු කටයුත්ත සම්බන්ධයෙන් නීතිපතිවරයා මැදිහත්ව වැඩිදුර ක්‍රියා කිරීමක් සිදු නොකෙරෙන බවට අධිකරණයට වාර්තා කිරීම උචිත වන බැව් කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

02. මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ඉල්ලීම මත කොටුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2017.01.04 දින උදයංග වීරතුංග නමට ඇති සියලුම බැංකු ගිණුම් වල ගණුදෙණු නැවත දන්වන තුරු අත්හිටුවීමට නිකුත් කරන ලද අධිකරණ නියෝගය ඉවත් කරන මෙන් නීතිපතිවරයා විසින් එම අධිකරණය ඉල්ලීමක් කරනු ලැබීම කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.

03. මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂකවරයා විසින් 2015.04.29 වන දින සිට උදයංග වීරතුංග නමට ඇති බැංකු ගිණුම් තාවකාලිකව අක්‍රීය කරනු ලැබ පසුව බස්නාහිර පලාත්බද මහාධිකරණය විසින් නිකුත් කරන ලද නියෝගය මත ගිණුම් අක්‍රීය කිරීමේ කාල සීමාව දීර්ඝ කරනු ලැබ ඇති බැවින් මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයා විසින් එකී ගිණුම් අක්‍රීය කිරීමේ නියෝගය අවලංගු කිරීම හෝ නැවත දීර්ඝ නොකිරීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

04\. 09 වන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක එම්.ඒ.සී නිහාල් ප්‍රැන්සිස් මහතා උදයංග වීරතුංගට එරෙහිව වරෙන්තුවක් ලබා ගැනීම ජාත්‍යන්තර රතු නිවේදනයක් ලබා ගැනීම ඉන්ටපෝල් රතු නිවේදනය මත අත්අඩංගුවට ගෙන උදර්පණ නීතිය යටතේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් උදයංග වීරතුංග ශ්‍රී ලංකාවට පිටුවහල් කරවා ගැනීම යන ක්‍රියාවන් උදයංග වීරතුංග සම්බන්ධයෙන් අසත්‍ය කරුණු ඉදිරිපත් කරනු ලැබ කිසියම් පිරිසකගේ පෙළඹවීම මත ද්වේශ සහගතව සිදු කිරීම මගින් ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට පත් කිරීමේ චෝදනාව මත ඔහුට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පතිවරයා විසින් පොලිස් කොමිෂන් සභාවට යොමු කළ යුතු බැව් මෙම කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

වර්ෂ 2015 ජනවාරි මස 08 වන දින බලයට පත් වූ යහපාලන රජය පූර්වතාවයක් ලබා දී ආරම්භ කරනු ලැබූ කර්තව්‍ය වූයේ දේශපාලන පලි ගැනීම් සිදු කිරීමය. මේ සඳහා රජය බලයට පත් වී නොබෝ දිනකින්ම අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරමින් දූෂණ මර්දන කමිටුවක් ස්ථාපනය කරනු ලැබිණි. එම කමිටුවෙහි කාර්යභාරය සඳහා වූ මාතෘකාව වශයෙන් යොදා ගන්නා ලද්දේ මහා පරිමාණයේ දූෂණ වංචා පිළිබඳව විමර්ශනය කොට ඊට සම්බන්ධ වූවන්ට දඬුවම් ලබා දීම

යන්නයි. යථොක්ත කැබිනට් සංදේශය සහ ඒ මත ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණය පිළිබඳව මෙම කොමිෂන් සභාව ඉදිරියේ දීර්ඝ ලෙස විමර්ශන කටයුතු සිදු කෙරිනි. අදාළ කැබිනට් සංදේශය ඉදිරිපත් කරන ලද යහපාලන රජයේ අග්‍රාමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ මහතා කොමිෂන් සභාව ඉදිරියේ කියා සිටින ලද්දේ ජනාධිපති නීතිඥ ජේ.සී වැලිඅමුණ විසින් තමාට ගෙනැවිත් දෙන ලද කැබිනට් සංදේශය තමා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ බවයි. කෙසේ වෙතත් එහි ඇතුළත් යෝජනා නීතියට අනුව ක්‍රියාත්මක කරන්නැයි තමා යෝජනා කරනු ලැබූ බැව් ඔහු කියා සිටියේය. ඊට හේතුව වූයේ බැලූ බැල්මට එහි සැකසුම් නීතියට අනුකූල නොවීමය. එමගින් පිහිටුවීමට යෝජනා කරන ලද දූෂණ විරෝධී කමිටුව හඳුනා දෙනු ලැබ ඇත්තේ ජාතික විධායක සභාවේ අනුමැතිය හා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත ස්ථාපිත කරනු ලබන දූෂණ විරෝධී කමිටුව වශයෙනි. මෙහි සඳහන් ජාතික විධායක සභාව කුමක්දැයි යන්න පැහැදිලි කර දීමට රනිල් වික්‍රමසිංහ මහතාට හෝ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් එම කමිටුවේ නම් සඳහන් යහපාලන රජයේ අමාත්‍යවරුන් හට නොහැකි විය. කොමිෂන් සභාවේ සහායට පෙනී සිටින ලද අතිරේක සොලිසිටර් ජෙනරාල් රොහාන්ත අබේසූරිය මහතා කොමිෂන් සභාවට පැහැදිලි කර දෙන ලද්දේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් නීතියක ජාතික විධායක සභාවක් පිළිබඳව සඳහන් නොවන බවය.

දූෂණ විරෝධී කමිටුවෙහි කාර්යභාරයන් ක්‍රියාත්මක කිරීම සඳහා දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයක් පිහිටුවනු ලැබූ අතර එම

ලේකම් කාර්යාලය ඊට පත් කෙරෙන ලද අධ්‍යක්ෂකවරයෙකුගේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වනු ලැබිණි. පැමිණිලි බාර ගන්නා ලද්දේ දූෂණ මර්දන ලේකම් කාර්යාලයටය. එම පැමිණිලි සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් එම ලේකම් කාර්යාලය තුළ සිදු වී ඇත. ඒ අනුව එම කටයුතු සිදු කරනු ලැබ ඇත්තේ එකී ලේකම් කාර්යාලයෙහි සේවයට යොදවා ගනු ලැබ ඇති උපදේශකවරු මගිනි. අනතුරුව එම ලේකම් කාර්යාලය මගින් වර්ගීකරණය කරන ලද්දා වූ එකී පැමිණිලි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට, විශේෂයෙන් පිහිටුවා ගන්නා ලද මූල්‍ය අපරාධ කොට්ඨාසයට විශේෂ අපරාධ විමර්ශන අංශයට සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද්දේ එම ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක විසිනි. මෙම ලේකම් කාර්යාලය පත් කර ගන්නා ලද අධ්‍යක්ෂකවරයා සම්බන්ධයෙන් හැඳින්වීමක් කරනු ලබන්නේ නම් ආනන්ද විජේපාල නැමැති වූ ඔහු යහපාලන රජයේ කොටස්කරුවෙකු වූ ද දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයෙකු වූ ද අනුර කුමාර දිසානායක මහතා වරක් කැබිනට් අමාත්‍ය ධූරයක් දරද්දී ඔහුගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු කරනු ලැබූ තැනැත්තෙකි. දූෂණ විරෝධී කමිටුවේ සේවය කරනු ලැබීමෙන් පසුව අනුර කුමාර දිසානායක මහතාගේ නායකත්වයෙන් යුතු ජන බලවේගය පක්ෂයෙන් මහා මැතිවරණයට තරග කරනු ලැබ ඇත. දූෂණ විරෝධී කමිටුව විසින් ඉහත කී නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලට ඉදිරිපත් කරන ලද පැමිණිලි එකී ආයතන මහේස්ත්‍රාත්වරුන් වෙත කරුණු වාර්තා කිරීමේදී දූෂණ විරෝධී කමිටුවේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලකට අදාළ වශයෙන් සඳහන් කරනු ලැබ තිබිණි. කරුණු

වාර්තා කිරීම එලෙස සිදු කිරීමට එක් හේතුවක් වනු ලැබ ඇත්තේ දූෂණ විරෝධී කමිටුව වෙත ඉදිරිපත් වන ලදැයි සඳහන් බොහෝ පැමිණිලි නිර්නාමික පැමිණිලි වීමය. උදයංග වීරතුංග මහතා හට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ආරම්භ කරනු ලැබ ඇත්තේ එලෙස දූෂණ විරෝධී කමිටුව විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත යොමු කෙරෙන ලද නිර්නාමික පැමිණිල්ලක් මතය. මෙහිදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සම්බන්ධයෙන් සඳහනක් කරනු ලැබීම සුදුසුය. ශ්‍රී ලංකා පොලිසියෙහි පොලිස් ස්ථාන සහ විශේෂ පොලිස් කොට්ඨාස පිහිටුවීමේ කාර්ය පටිපාටිය ව්‍යවස්ථාදායකය විසින් සම්පාදන කරනු ලැබ ඇත. භූගෝලීය වශයෙන් හෝ විෂයානුබද්ධව අපරාධ පරික්ෂණ සිදු කිරීම සඳහා නියමිත නිර්ණායක යටතේ විෂයභාර අමාත්‍යාංශයේ පල කරනු ලබන ගැසට් පත්‍රයකින් පොලිස් ස්ථානයක් හෝ විශේෂ පොලිස් කොට්ඨාසයක් පිහිටුවීම සිදු කරනු ලබයි. නොඑසේව පරිපාලන හෝ සුබසාධන කාර්යයන් සඳහා ඇති කර ගන්නා අංශයනට අපරාධ පරික්ෂණ සිදු කිරීමෙන් නීත්‍යානුකූල බලයක් හිමි නොවේ. ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පිහිටුවනු ලැබ ඇත්තේ පොලිස් ආඥා පනතේ ප්‍රතිපාදන යටතේ පොලිස්පතිවරයා විසින් පල කරනු ලැබූ ගැසට් නිවේදනයක් මගිනි. එලෙස පිහිටුවන ලද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට අපරාධ පරික්ෂණ පැවැත්වීමේ නීතිමය බලයක් නොමැති බවට තීරණයක් ලබා ගැනීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත නඩු කටයුත්තක් යොමු වී තිබූ නමුත් කිසියම් කාර්යය පටිපාටික හේතු මත ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඒ පිළිබඳව තීරණයක් නොලැබිණි. (යහපාලන රජය අවසන් වීමෙන් පසුව

බලයට පත් වූ වර්තමාන රජයේ පාලනය යටතේ පොලිස්පතිවරයා විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසුරුවා හරිනු ලැබ ඇත.)

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට වර්ෂ 2000 සහ 2006 දී මිග් යානා මිලදී ගැනීමේදී මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුව ඇත්දැයි සන්ඩේ ටයිම්ස් පුවත්පතෙහි පල කරනු ලැබ තිබූ වාර්තාවක් පාදක කොට ගනිමින් නිර්නාමික පැමිණිල්ලක් 2015.03.15 දින දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය වෙත ලැබී ඇතැයි සඳහන් වේ. එම කාර්යාලය විසින් එකී පැමිණිල්ල ACCS/FC2015/02 යොමු අංකය යටතේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත යොමු කරනු ලැබ ඇති අතර එම පැමිණිල්ල මත මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් FCID/05/2015 යොමු අංකයට අනුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙහි අංක බී/639/15 යටතේ කරුණු වාර්තා කර තිබේ. මෙම නඩු කටයුත්ත තුළ ශ්‍රී ලංකාව තුළ වූ උදයංගගේ බැංකු ගිණුම් තහනම් කිරීමද ඔහුට එරෙහිව වරෙන්තු නිකුත් කිරීමද ජාත්‍යන්තර රතු නිවේදනයක් නිකුත් කිරීම සහ ඉන්ටපෝල් රතු නිවේදනය මත අත්අඩංගුවට ගැනීමද උදර්පණ නීතිය යටතේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් ඔහු ශ්‍රී ලංකාවට පිටුවහල් කිරීමද සිදුව ඇත.

ශ්‍රී ලංකාව තුළ තිස් වසරක කාලයක් තිස්සේ පැවති එල්.ටී.ටී.ඊ යුද්ධය අවසන් කොට රට එක් සේසත් කරනු ලැබූ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ඉමහත් ලෙස රට තුළ ජනප්‍රියත්වයට පත්ව සිටින ලදින් සහ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පරාජය කිරීමට එල්.ටී.ටී.ඊ හිතවාදී විදේශ බලවේගයනට අවශ්‍යව පැවතුනෙන් ඒ සඳහා රාජ්‍ය නොවන සංවිධාන හරහා සහ විරුද්ධ පාක්ෂික

දේශපාලනඥයන් යොදා ගනිමින් විවිධ වූ උපක්‍රම ක්‍රියාත්මක කෙරෙන ලද අතර මහාපරිමාණ දූෂණ වංචා සෙවීම නොහොත් හොරු ඇල්ලීම යන සංකල්පය හඳුන්වාදීම ඉන් එක් උපක්‍රමයක් විය. තම ප්‍රතිවාදී දේශපාලන නායකයින් සමඟ මිත්‍රශීලීව කටයුතු කරන දේශපාලඥයින් මෙන්ම තම ප්‍රතිවාදීන් කෙරෙහි ද්වේශ කරන්නාවූ සහ පළිගැනීමේ චේතනාවෙන් පසුවන්නාවූ දේශපාලඥයින් ද වේ. මහජනයා රවටනු පිණිස යහපාලනය යන වචනය යොදා ගනිමින් 2015 ජනවාරි මාසයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පරාජයට පත් කොට බලයට පත් වූ යහපාලන රජයෙහි ඉහතින් සඳහන් කෙරෙන ලද පළිගැනිමේ චේතනාවෙන් පසු වූ දේශපාලනඥයින් කිහිප දෙනෙක් සහ ඔවුන්ගේ අනුගාමික පිරිසක් ද මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රජයෙහි කටයුතු කළ දේශපාලනඥයින්ගෙන් සහ රාජ්‍ය නිලධාරීන්ගෙන් පළිගැනීමේ සංවිධානාත්මක ක්‍රියාදාමයක් හඳුන්වාදී ක්‍රියාත්මක කරනු ලැබිණි. ඒ සඳහා පොලීසිය ද අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මෙන්ම අධිකරණය ද ඔවුන් විසින් උපයෝගී කරගනු ලැබිණි.

යහපාලන රජයේ රාජ්‍ය අමාත්‍යවරයෙකුව සිටින ලද රංජන් රාමනායක මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් ද අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ද මෙන්ම විනිශ්චයකාරවරුන් සහ විනිශ්චයකාරවරියන් සමඟ නඩු කටයුතු සම්බන්ධයෙන් සහ විවිධ කරුණු පිළිබඳව පැවැත් වූ දුරකථන සංවාදයන් හි පටිගත කිරීම් මෙම කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කරනු ලැබිණි. ත්‍රිපුද්ගල මහාධිකරණයක් ඉදිරියේ විභාග වෙමින් පැවති භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතන නඩුවෙහි තමන්ට අවශ්‍ය දේ සිදුවන බවට නිශ්චිත බැවින් තවදුරටත් එම විනිශ්චය

මණ්ඩලයෙහි සිටි විනිශ්චයකාරතුමිය සමඟ කතා නොකරන්නැයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂව සිටි පොලිස් අධිකාරී ශානි අබේසේකර රන්ජන් රාමනායක මහතාට පවසන අයුරු ද මට නීතිය හදන්නත් පුළුවන් නීතිය කඩන්නත් පුළුවන් යැයි අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවෙහි සිටි අධ්‍යක්ෂ ජනරාල්වරිය වන දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ ඇවන්ගාර්ඩ් සමාගමේ සභාපති නිශ්ශංක සේනාධිපති සමඟ පවසන අයුරු ද තමන් චූදිතයින් වරදකරුවන් කිරීමට කටයුතු කර ඇති බැවින් තම උසස් වීම ලබාදීමට කටයුතු කරන ලෙස භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතන නඩුව විභාග කළ ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයෙහි කටයුතු කළ මහාධිකරණ විනිශ්චයකාරවරිය රන්ජන් රාමනායක මහතාට පවසන අයුරු ද මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබ ඇති දුරකථන සංවාදයන්හි ඇතුළත්ව තිබේ.

යථෝක්ත ක්‍රියාදාමය යටතේ පළිගැනීමට ලක්වන ලද අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සංස්ථා සභාපතිවරුන්, රාජ්‍ය අයතනයන්හි අධ්‍යක්ෂවරුන්, හමුදාපතිවරුන්, හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් ද මෙම කොමිෂන් සභාව ඉදිරියේ හැඬූ කඳුළින් යුතුව සාක්ෂි දෙමින් මෙම පළිගැනීමේ ක්‍රියාවලියෙහිදී ඔවුන්ට මුහුණ පෑමට සිදුවන ලද තාඩන පීඩන සහ දුක්කම්කටොළු කියා සිටිනු ලැබිණි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා කුස ගින්නේ සහ පිපාසයේ තබාගෙන උදෑසන සිට රාත්‍රී කාලය දක්වා ප්‍රකාශ ලබා ගැනීම් ද ජනාධිපතිවරයාගෙන් ලබාගත් රඳවා ගැනීමේ නියෝග මත මාස ගණන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකුඩු තුළ තබාගෙන විවිධ හිරිහැරයනට ලක් කිරීම් ද මහේස්ත්‍රාත් අධිකරණයනට ඉදිරිපත් කොට රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලැබ

දින ගණන් මාස ගණන් සහ වසර ගණන් ඇප නොදී තම දරු පවුල්වලින් ඈත් කොට සිර භාරයේ තබා ගැනීම් ද මෙන්ම සොරුන් මිනීමරුවන් වංචාකරුවන් දූෂිතයන් ලෙසට ප්‍රසිද්ධියට පමුණුවා නින්දාවට සහ අපහාසයට ලක් කිරීම් ද ඒ අතර වනු ලැබිණි.

පළිගැනීමේ ක්‍රියාවලියට ගොදුරු වූ ඉහත කී නිලධාරීන් රැඳවුම් නියෝග මත රඳවාගෙන සිටියදී සහ රක්ෂිත සිරභාරයට පත් කරනු ලැබ සිටියදී සමහරුන්ගේ මාපියන් මිය යාම ද සමහරුන්ගේ දූ දරුවන් රෝගාතුර වීමද සමහරුන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම ද සිදුව ඇත. තවත් සමහරුන් එලෙස රඳවාගෙන සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රාත්‍රී කාලයන්හිදී ඔවුන්ගේ නිවෙස් වෙත ගොස් එලෙස රඳවාගෙන සිටින්නන්ගේ බිරින්දෑවරුන් අපහසුතාවනයනට පත්වන පරිදි කටයුතු කර ඇත.

එක් පැමිණිලිකාර හමුදා නිලධාරියෙක් අත්අඩංගුවට ගැනීම සඳහා කොළඹින් බැහැර පිට පළාතක වූ ඔහුගේ නිවසට මැදියම් රැයේදී ඇතුළු වූ අපරාධ පරීක්ෂණ දෙපාර්ත මේන්තුවේ නිලධාරීන් රාත්‍රියේ නිදන ඇඳුම පමණක් ඇඳ සිටි එම නිලධාරියාගේ බිරිඳට වෙනත් ඇඳුමක් ඇඳ ගැනීමට පවා ඉඩනොදී පසු දින පහන් වන තුරු ප්‍රශ්න කරමින් රඳවා ගනු ලැබ සිට ඒ වන විට එම නිවසෙහි සිටි එම කාන්තාව සහ කුඩා දරුවා දැඩි ලෙස පීඩාවට පත් කරනු ලැබ ඇත. එම කාන්තාව සහ කුඩා දරුවා අදාළ හමුදා නිලධාරියා ඒ වන විට සිටින ලද ස්ථානය පොලිස් නිලධාරීන්ට පෙන්වා දීමට ඔවුන් සමඟ රැගෙන යන අවස්ථාවේදී එම කාන්තාවට ඇය ඇඳ සිටි රාත්‍රී ඇඳුම මාරු කර ගැනීමට සිදු වූයේ පොලිස් නිලධාරීන් බලා සිටියදීය. එකී මව සහ පුත්‍රයා හට උදෑසන වැසිකිළි කැසිකිළි යාමකට හෝ ඉඩ නොදී සා පිපාසාවෙන් යුතුව ත්‍රිකුණාමලය ප්‍රදේශයට රැගෙන ගොස්

ඇත. යහපාලන රජයේ දේශපාලනඥයින් ද ඔවුන් බලයට පත් කිරීමට ක්‍රියා කළ එල්.ටී.ටී.ඊ හිතවාදී රාජ්‍ය නොවන සංවිධාන පවත්වාගෙන යමින් ඒවායින් යැපෙන ලද යහපාලන රජයේ අනුගාමිකයින් ද සතුටට පත් කිරීම සඳහා යම් වරප්‍රසාද උදෙසා කටයුතු කරන ලද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරීන්ගේ එකී අමානුෂික කෲර ක්‍රියාකාරකම් පිළිබඳව ඊට ගොදුරු වන ලද එකී කාන්තාවන් සහ ළමුන් මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඔවුනට විදිනට සිදු වූ දුක් ගැහැට පිළිබඳව කියා සිටින ලද්දේ හඬා වැළපෙමිනි.

උදයංග 1985.08.02 දින උසස් අධ්‍යාපනය ලැබීම සඳහා සෝවියට් රුසියාවට ගොස් ඇති අතර යුක්‍රේනියාවේ කිව් විශවවිද්‍යාලයේ රුසියානු භාෂාව හැදැරීමෙන් පසු කාර්මික ඉන්ජිනේරු උපාධිය ලබා ඇත. 1991 වර්ෂයේ සිට ස්ථිර පදිංචිය සඳහා රුසියාවෙන් ලබන ලද වීසා බලපත්‍රය මත යුක්‍රේනියාවේ කිව් නගරයෙහි ජීවත් වනු ලැබිණි. තමන්ගේම වෙළඳ ව්‍යාපාරයක නිරතව සිටි උදයංග 1999 වර්ෂයේ සිට එම රටෙහි ශ්‍රී ලංකාවේ ගරු සේවා කොන්සල්වරයා ලෙස සේවය කරන ලදී. මෙම කාලයේදී කිව් නගරයට පැමිණි යුධ හමුදා හා ගුවන් හමුදා නිලධාරින්ද අමාත්‍යවරුන්ද තානාපතිවරු හා ලාංකික දූත පිරිස්ද කිව් නගරයෙහි පිලිගනු ලැබුයේ උදයංග විසිනි. ඔහු 2006.07.04 දින රුසියානු සමූහාණ්ඩුව ඇතුළු රාජ්‍යයන් 08ක ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස පත් කිරීමට යෙදිණි.

වසර 35කට ආසන්න කාලයක් විදේශයන්හි ජීවත් වූ උදයංග කොමර්ෂල් බැංකුවේ සහ හොංකොං සහ ෂැංහයි බැංකුවේ අනේවාසික විදේශ මුදල් ගිණුම් පවත්වාගෙන ගොස් ඇත්තේ 1991

වර්ෂයේ සිටය. ව්‍යාපාරික කටයුතු වලින් උපයන ලද ධනය සහ 2006 වර්ෂයේ සිට තානාපති වශයෙන් ලැබූ වැටුප් ශ්‍රී ලංකා මහබැංකුවේ අනුමැතිය මත එකී ගිණුම් වලට බැර කරනු ලැබිණි. උදයංග පවුලේ එකම ආදායම්ලාභියා වන හෙයින් ඔහුගේ බැංකු ගිණුම් අක්‍රිය කිරීමෙන් දරු දෙදෙනා ඇතුළු පවුලේ සියලු දෙනා මහත් දුෂ්කරතාවයකට මුහුණ දී ඇති අතර දරුවන්ගේ අධ්‍යාපන වියදම්ද ගෙදරදොර වියදම්ද සිදු කර ගත නොහැකිව මානසික පීඩනයකට පත් වනු ලැබ සිටී. උදයංගට එරෙහිව නඩු කටයුතු ආරම්භ කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2006 වර්ෂයේදී සිදු කෙරෙන ලද ගුවන් යානා මිළදී ගැනීමේ ගණුදෙණුව සම්බන්ධයෙන් වුවද 1995 සහ 2002 වර්ෂයන්හීදි ආරම්භ කෙරෙන ලද කොමර්ෂල් බැංකුවේ අනේවාසික විදේශ මුදල් ගිණුම් 02ක් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ඒකක අංක 05 හි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිහාල් ෆ්‍රැන්සිස්ගේ ඉල්ලීම මත තහනම් කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් ගුවන් යානා මිලදී ගැනීමේදී මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුව ඇති බවට මාධ්‍යවේදී ඉක්බාල් අතාස් විසින් පල කරනු ලැබූ පුවත්පත් වාර්තාව උදයංගට එරෙහිව දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය විසින් මූල්‍ය අපරාධ විමර්ශන අංශයට ඉදිරිපත් කිරීමට යෙදෙන ලද නිර්නාමික පැමිණිල්ලට පදනම් ලද වන බැව් ඉහත සඳහන් කරනු ලැබිණි. 2000 වර්ෂයේ මැයි මාසයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් 27 ගුවන් යානා 04ක් සිංගප්පූරු සමාගමක් වන D.S ALLIANCE නැමති සමාගම මගින් ඇමරිකානු ඩොලර් මිලියන

1.75 බැගින් තවත් යානා 03ක් ඇමරිකානු ඩොලර් මිලියන 1.60 බැගින්ද මිළදී ගෙන ඇති බවය. එම ගුවන් යානා 1982, 1983, 1984 වර්ෂයන්හි නිෂ්පාදිත යානා බවයි. 2006 වසරේදී නැවතත් 1980 හා 1983 වසර වල නිෂ්පාදිත එම වර්ගයේ යානා 04ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් ඇමරිකානු ඩොලර් මිලියන 2.462 බැගින් මිළදීගෙන ඇති බවත්ය. ඒ අනුව එකම කාලයේ නිෂ්පාදිත යානා මිළදී ගැනීම සඳහා 2000 වසරේ ගෙවූ මිළට වඩා අධික මිළක් 2006 වසරේදී ගෙවා ඇති බවය. මෙම ගණුදෙණුව ශ්‍රී ලංකා රජය සහ යුක්‍රේන රජය අතර සිදු වන්නක් බව පෙන්වා දී තිබුණද 2006 වර්ෂයේදී සිදු වූ ගණුදෙණුවේදී මුදල් ගෙවනු ලැබ ඇත්තේ එංගලන්තයේ BELLIMISSA HOLDINGS LTD නැමති සමාගමක් වෙත බවත් එම මිග් යානා මිළදී ගැනීම සම්බන්ධයෙන් දෝෂාරෝපණයන් ලෙස දක්වනු ලැබ ඇත. උදයංග මෙම කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කර පෙන්වා සිටිනුයේ ඉහත සඳහන් පරිදි දෝෂාරෝපණයන් එල්ල කිරීමෙන් මූලා අපරාධ විමර්ශන කොට්ඨාසය අධිකරණය නොමග යවනු ලැබ ඇති බවය.

ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිවරයා 2006.01.25 දින දරණ ලිපියක් මගින් ආරක්ෂක ලේකම්වරයා හට දන්වා ඇත්තේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් යානා මිළදී ගැනීමේ අවශ්‍යතාවයක් ඇති බවත් ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය අවශ්‍ය බවත්ය. යුක්‍රේනයේ (UKRINMASH) සමාගමේ නියෝජිතයෙකු 2006.02.06 දින ආරක්ෂක අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරින් මුණ

ගැසී ගුවන්යානා 04ක් අලෙවි කිරීම හා තවත් යානා 04ක් ඕවර්හෝල්ඩ් කිරීම සඳහා සාකච්ඡා කර ඇති අතර ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත එදිනම දර්පණ ලිපියක් ඉදිරිපත් කර ඇත. එකී අර්පණයේ පරිදි මෙම සේවා සඳහා ඇමරිකානු ඩොලර් 14, 280, 003/-ක මිළක් ඉදිරිපත් කර තිබිණි. මෙම අර්පණ ලිපියෙහි දැක්වෙනුයේ අර්පණය යොමු කිරීමේදී FINANCIER වරයෙක් සමග එක්ව අර්පණය ඉදිරිපත් කරනු ලබන බවත් ණයවර ලිපි නිකුත් කළ යුත්තේ එකී ෆයිනෑන්සර්වරයා වෙත බවත් සහ එකී ෆයිනෑන්සර්වරයාගේ තොරතුරු ගිවිසුම අත්සන් කිරීමට පෙර ලබා දෙන බවත්ය. 2006.02.16 වන දින ආරක්ෂක අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරිවරයා ජාතික ප්‍රසම්පාදන ඒජන්සියේ සභාපතිවරයාගෙන් ඉල්ලා ඇත්තේ මිග් යානා 04ක් මිළදී ගැනීම හා ඕවර්හෝල්ඩ් කිරීම සඳහා තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් කමිටුවක් පත් කරන ලෙසටය. ඒ අනුව ජාතික ප්‍රසම්පාදන ඒජන්සිය මගින් ගුවන් හමුදාපතිවරයාගේ සභාපතිත්වයෙන් හා නිලධාරින් 06 දෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් කමිටුවක් පත් කර ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉහත කී යුක්‍රේන් සමාගම වෙත 2006.03.10 දින ලිපිය යවමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අර්පණයන් ඉදිරිපත් කරන ලෙසට එම සමාගමට දන්වා තිබේ. 2006.03.24 දින සිය අර්පණය යුක්‍රින් මාෂ් සමාගම විසින් එහි අධ්‍යක්ෂ ඩී.ඒ පෙරේගුදොව්ගේ අත්සනින් යුතුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට එවා ඇත. ගණුදෙණුවට අදාළ උපදෙස් මාලාවද ගුවන් හමුදාව වෙත එවා තිබිණි.

දෙවන වරටත් එවනු ලැබූ උපදෙස් මාලාවක් මගින් ගෙවීම් කළ යුතු ආකාරය දන්වා තිබිණි.

ගුවන් හමුදාපති රොෂාන් ගුණතිලකගේ ප්‍රධානත්වයෙන් පත් කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුව යානා මිළදී ගැනීමට අදාළව නිර්දේශ ඉදිරිපත් කර තිබූ අතර එමගින් යුක්‍රින් මාෂ් සමාගමේ මිග් යානා මිළදී ගැනීම නිර්දේශ කර තිබිණි. ගුවන් හමුදාපතිවරයා විසින් අදාළ මිළදී ගැනීම හා ඕවර්හෝල්ඩ් කිරීම වෙනුවෙන් යුක්‍රින් එක්ස්පෝර්ට් සමාගම වෙත ගෙවිය යුතු මිළ ගණන් දක්වා ඊට අනුමැතිය ලබා දෙන ලෙසට ඉල්ලීමක් 2006.05.03 දින ආරක්ෂක ලේකම්වරයා වෙත ඉදිරිපත් කර ඇත. ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ ලේකම් සහ ආරක්ෂක ලේකම් ඇතුළු නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කැබිනට් ප්‍රසම්පාදන කමිටුව මගින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ සහ ගුවන් හමුදාපතිවරයාගේ 2006.05.03 දින ලිපිය සලකා බැලීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කොට ඇත. යානා මිළදී ගැනීම සඳහා තාක්ෂණික කණ්ඩායමක් අදාළ යානා සකස් කරන කර්මාන්තශාලාව පරික්ෂා කිරීම සඳහා යැවීම, ඉදිරිපත් කරන ලද මිළ ගණන් පිළිබඳව යුක්‍රින් මාෂ් සමාගමේ මවු සමාගම වන යුක්‍රින් එක්ස්පෝර්ට් සමාගම පිළිබඳව නැවත සාකච්ඡා කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට නිර්දේශ එකී ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කරනු ලැබ ඇත. මිළ සාකච්ඡා කිරීමේ කමිටුවේ සභාපතිවරයා 2006.05.16 දින යුක්‍රින් මාෂ් සමාගමේ අධ්‍යක්ෂක ඩී.ඒ පෙරේගුදෝව් වෙත ලිපියක් යවමින් යානා වල මිළ ගණන් නැවත සළකා බලන ලෙසට ඉල්ලීමක් කර ඇත. යුක්‍රින් මාෂ් සමාගම විසින්

ඊට පිළිතුරු වශයෙන් දන්වා ඇත්තේ එම යානා සඳහා තවදුරටත් වට්ටම් ලබා දීමට ඔවුන්ට හැකියාවක් නොමැති බවයි. ඒ අනුව යානා මිළදී ගැනීම ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කරන බවත් ගුවන් හමුදාපතිවරයා 2006.05.25 දින ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වා යවා ඇත. ඉන් පසුව 2006.06.09 දින ගුවන් හමුදාපතිවරයා ලෙටර් ඔෆ් ගැරන්ටි යුක්‍රේන් මාෂ් සමාගමේ අධ්‍යක්ෂක පෙරිගුදෝව් වෙත යොමු කර ඇති අතර එහි අඩංගු වෙනත් කරුණු අතර එම ලිපිය ලියනුයේ ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් බවද සඳහන් කර තිබේ. යානා මිළදී ගැනීම හදිසි අවශ්‍යතාවයක් බවත් එබැවින් ගිවිසුම අත්සන් කිරීමට පෙරම ආදාළ යානා ඕවර්හෝල් කිරීමේ කටයුතු ආරම්භ කරන මෙන් ඉල්ලීමක් කරනු ලැබ ඇත. අනතුරුව ගුවන් හමුදාවේ ඉන්ජිනේරුවරයෙකු ඇතුළු ගුවන් හමුදා නිලධාරින් පිරිසක් යානා ඕවර්හෝල් කිරීමේ කටයුතු නිරික්ෂණය කිරීම සඳහා යුක්‍රේන්හි අදාළ කර්මාන්තශාලාවට ගොස් තිබේ.

උදයංග රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස සේවය ආරම්භ කරන ලද්දේ ඉහතින් විස්තර කරනු ලැබූ කටයුතු පරිද්දෙන් සිදු වීමෙන් අනතුරුව 2006.07.17 දින සිටය. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2006.08.15 දින බෙලිමීසා හෝල්ඩින්ග්ස් නම් සමාගම වෙත END USER සහතික 02 ක් නිකුත් කරනු ලැබ ඇත. මෙම එන්ඩ් යූසර් සහතික බෙලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් වෙත නිකුත් කරන ලද්දේ අර්පණ ලිපියේ සඳහන්ව තිබූ පරිදි ගණුදෙණුවට අදාළ ෆිනෑන්සර්වරයා එම සමාගම වූ බැවිනි. තවද ඇණවුම තහවුරු කරමින්

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2006.08.15 දින ORDER CONFIRMATION එනම් ඇණවුම තහවුරු කිරීමේ ලේඛනයක් යුක්‍රීන් මාෂ් සමාගම වෙත යවා ඇති අතර එහි දක්වා ඇත්තේද ගණුදෙණුවට අදාළ ගෙවීම් බිලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් වෙත කරනු ලබන බවය.

මෙම කටයුතු වලින් අනතුරුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව, බිලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සහ යුක්‍රීන් මාෂ් සමාගම අතර ත්‍රිපාර්ශවික SLAF/2006/07/AIR අංක දරණ ගිවිසුම අත්සන් තබන ලද අතර ඊට ගුවන් හමුදාපතිවරයා අත්සන් තබනුයේ 2006.07.26 දිනය. ඉන් පසුව එම ගණුදෙණුවට අදාළ ඉන්වොයිසිය 2006.07.31 දින යුක්‍රීන් මාෂ් සමාගමෙහි ලිපි ශීර්ෂයකින් ගුවන් හමුදාපතිවරයා වෙත එවා ඇති අතර ඉන්වොයිසියෙහි දක්වා ඇත්තේ ගෙවීම් බෙලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් වෙත සිදු කරන ලෙසට වේ.

ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් බිලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් නමට යුක්‍රීන් මාෂ් සමාගමේ උපදෙස් අනුව මහජන බැංකුව හරහා ඇමරිකානු ඩොලර් 13, 976, 000/- ක වටිනාකමින් යුත් ණයවර ලිපියක් නිකුත් කර ඇත. තවද ගිවිසුම ප්‍රකාරව බිලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් විසින් මෙම ගණුදෙණුව සඳහා මූල්‍ය පහසුකම් සපයන බව ගැණුම්කාර පාර්ශවයත් විකුණුම්කාර පාර්ශවයත් දැනුවත්ව සහ එකඟව සිටි අතර ගණුදෙණුවට අදාළව සියලුම ගෙවීම් බිලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් වෙත ගෙවිය යුතු වීම ගිවිසුමෙහි කොන්දේසියක් විය.

ඉන්පසුව ගුවන් හමුදාපතිවරයා ඇතුළු පිරිසක් යුක්‍රේනියාවේ ලුඕෆ් නගරයේ මිග් ප්‍රහාරක යානා කර්මාන්තශාලාවට ගොස් ගුවන් හමුදාව

මිළදී ගත් මිග් 27 යානා පරික්ෂා කර ගිවිසුමේ කොන්දේසි වලට අනුව අදාළ යානා ඕවර්හෝල්ඩ් කර ඇති බවට තහවුරු කර ගැනීමෙන් පසු දෙපාර්ශවය විසින් FACTORY ACCEPTANCE සහතිකය 2006.12.09 දින නිකුත් කර තිබේ. එම සහතිකයට යුක්‍රීන් මාෂ් සමාගමේ නිල මුද්‍රාව තබා නියෝජිතයෙකු අත්සන් තබනු ලැබ ඇති අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් ගුවන් හමුදාපති රොෂාන් ගුණතිලක අත්සන් තබා නිල මුද්‍රාව තබා ඇත. තවද FINAL ACCEPTANCE සහතිකය ගුවන් හමුදාවේ ඉන්ජිනේරු අංශයේ අධ්‍යක්ෂකවරයා සහ රුසියාවේ ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයේදී SLAF2006/07/AIR දරණ ගිවිසුමට අත්සන් තබන ලද යුක්‍රීන් මාෂ් සමාගමේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජී.ඒ ස්තුදිනෙකි ශ්‍රී ලංකාවේදී අත්සන් කරනු ලැබ ඇත. ඊට ඩී.ඒ පෙරේගුදොව් අත්සන් තබා නැත. ඊට අමතරව ගුවන් හමුදාව විසින් 2006.11.22 දින අදාළ ගුවන් යානා යුක්‍රේනියාවේ සිට ශ්‍රී ලංකාවට පියාසර කරවීම සඳහා අවශ්‍ය රක්ෂණයක් ලබා ගෙන ඇත. ගිවිසුමේ එකඟතාවයන්ට අනුව යුක්‍රීන් මාෂ් සමාගමේ වගකීම් සහතිකයට අදාළව ගුවන් යානා නඩත්තු කරන්නා වූ කණ්ඩායමට ශ්‍රී ලංකාව තුළ නවාතැන්, ප්‍රවාහන, වෛද්‍ය ආදී පහසුකම් ගුවන් හමුදාව විසින් ලබා දී තිබේ.

කරුණු මෙසේ පැවතියදී මෙම ගුවන් යානා මිළදී ගැනීමට අදාළ ගිවිසුම උදයංග විසින් සකස් කරන ලද කූට ගිවිසුමක් ලෙසට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් හඳුන්වනු ලැබ ඇති අතර ගුවන් හමුදාපති විසින් අත්සන් තබන ලද ගිවිසුම උදයංග විසින් රැගෙන යන

ලද බවට වූ සාවද්‍ය තොරතුරු සැලසුම් සහගතව ඉදිරිපත් කරමින් උදයංග අධිකරණය ඉදිරියේ සැකකරුවෙකු කරනු ලැබ තිබේ.

මෙම ගණුදෙණුවට උදයංගගේ යම් වංචනික සම්බන්ධයක් හෝ උවමනාවක් තිබූ බවට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පෙන්වා දීමට උත්සහ කර ඇති කරුණක් වනුයේ මෙම ගිවිසුම සඳහා බෙලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සහ යුක්‍රීන් මාෂ් සමාගම රුසියාවේ ශ්‍රී ලංකා තානාපති නිල නිවසේදී අදාළ ගිවිසුමට අත්සන් තැබූ බවයි. නමුත් රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයත්, තානාපතිවරයාගේ නිල නිවස යන දෙකමත් පවතින්නේ එකම ගොඩනැගිල්ලක බැවින් ඒ අනුව "නිල නිවසේ" අත්සන් කළේය යන්න පෙන්වීමෙන් ගරු අධිකරණය නොමග යැවීමට දරණ ප්‍රයත්නයක් ලෙස උදයංග කොමිෂන් සභාව ඉදිරියේ සඳහන් කර සිටිනු ලැබිණි. SLAF/2006/07/AIR දරණ ගිවිසුම බිලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සහ යුක්‍රින් මාෂ් සමාගම විසින් අත්සන් තැබීමෙන් පසුව ශ්‍රී ලංකාවට රැගෙන එන ලද්දේ සහ ගුවන් හමුදාපතිවරයා අත්සන් තැබීමෙන් පසු සෙසු පාර්ශවය වෙත රැගෙන යන ලද්දේ උදයංග විසින් බවට කරුණු වාර්තා කර ඇතත් ගුවන් හමුදාපතිවරයාගේ ප්‍රකාශයන්හි එලෙස සඳහන් නොවේ. ගුවන් ගමන් වාර්තා ඉදිරිපත් කරමින් උදයංග කොමිෂන් සභාව ඉදිරියේ හෙලිදරවු කර සිටින ලද්දේ ඔහු 2006.06.26 දින ශ්‍රී ලංකාවට පැමිණීමෙන් අනතුරුව බී 1943848 රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රය භාවිත කරමින් ශ්‍රී ලංකාවෙන් පිටව ගොස් ඇති බවත් නැවත ශ්‍රී ලංකාවට පැමිණ ඇත්තේ 2006.10.03 වන දින බවත්ය. තවද 2006.08.02 දින

SLAF/100/46/DAE/ENG/2006 දරණ ලිපියට අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉන්ජිනේරු අංශයේ අධ්‍යක්ෂ ඊ.ජී.ජේ.පී ද සිල්වා විසින් මෙම ගිවිසුමෙහි මුල් පිටපත් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා යුක්‍රීන් මාෂ් අධ්‍යක්ෂ ඩී.ඒ පෙරිගුදොව් වෙත යවා ඇති බවද කොමිෂන් සභාව ඉදිරියේ හෙළිදරවු කරනු ලැබිණි.

ගුවන් හමුදාපතිවරයාද යුක්‍රීන් මාෂ් සමාගමද බිලිමීසා හෝල්ඩින්ග්ස් ලිමිටඩ් ද අත්සන් තබන ලද ගිවිසුමට යුක්‍රීන් මාෂ් සමාගම වෙනුවෙන් අත්සන් තබනු ලැබ ඇති ඩී.ඒ පෙරිගුදෝව්ගේ අත්සන ව්‍යාජ අත්සනක් බවද ඊටද උදයංගගේ සම්බන්ධතාවයක් ඇති බවද උදයංගට එරෙහිව ඉදිරිපත් කර ඇති දෝෂාරෝපණයන්හි සඳහන් බැවින් උදයංග ඒ පිළිබඳව කරුණු පැහැදිලි කරනු ලැබිණි. යුක්‍රීන් මාෂ් සමාගම වෙනුවෙන් එකඟතාවයනට එළඹීමට සහ ගිවිසුම අත්සන් කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂක ජී.ඒ ස්තුදිනොවින් වෙත බලය පැවරීමේ ඇටෝර්නි බලපත්‍රයක් 2006 වර්ෂයේදී යුක්‍රීන් මාෂ් සමාගම විසින් ලබා දී තිබිණි. එම ඇටෝර්නි බලපත්‍රය මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයෙහි තිබිය යුතුය. එබැවින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පෙරිගුදොව්ගේ අත්සන ව්‍යාජ ලෙස යොදා ඇතැයි පැවසීම හිතාමතා අධිකරණය නොමග යැවීමක් බැව් උදයංග පෙන්වා දෙන ලදී. නියෝජ්‍ය අධ්‍යක්ෂ ස්තුදිනෙකිගේ ගමන් බලපත්‍රයේ අත්සන අනුව ගිවිසුමේ සඳහන්ව ඇත්තේ ඔහුගේ අත්සනය යන්න සහ මිග් යානා සඳහා FACTORY ACCEPTANCE සහතිකයද FINAL ACCEPTANCE සහතිකයද ස්තුදිනෙකි විසින් අත්සන් තබා ඇත. SLAF/2006/07/AIR ගිවිසුම පෙරිගුදොව් වෙනුවෙන් තමා විසින්

අත්සන් කළ බවට ස්තුදිනෙකි විසින් යුක්‍රේනියානු නීතිපති දෙපාර්තමේන්තුව ලබා දී ඇති ප්‍රකාශයේ සටහන්ව ඇති බව උදයංග පැහැදිලි කරනු ලැබිණි.

ජාත්‍යන්තර නීතිය අනුව ඉන්ටපෝල් රතු නිවේදනයක් නිකුත් කිරීමේදී අනුගමනය කළ යුතු උපදෙස් පරිදි අදාළ පුද්ගලයා යම් චෝදනාවකට වරදකරුවෙකු කර තිබිය යුතු අතර නොඑසේ නම් අධිචෝදනා ලත් පුද්ගලයෙකු විය යුතු යැයි ඉන්ටපෝල් රීති 83 කෙරෙහි අවධානය යොමු කරමින් සඳහන් කරන උදයංග ඔහු කිසිදු නඩුවකින් වරදකරු කර නොමැති බවත් ඔහුට අධිචෝදනා බාර දී නොමැති බවත් පෙන්වා දෙනු ලබයි. ඒ අනුව ඔහු කොමිෂන් සභාව වෙත සඳහන් කර සිටින ලද්දේ ඉන්ටපෝල් පොලිසිය මගින් 2018.02.12 දින Control No. A-1578/2-2018 දරණ රතු නිවේදනය නිකුත් කරනු ලැබ ඇත්තේ අසත්‍ය කරුණු මත පදනම්ව වන බවය.

උදයංග 2018.02.04 දින ඩුබායි සිට ඇමරිකාවේ ලොස් ඇන්ජලීස් නගරය බලා යාමට ඩුබායි ගුවන් තොටුපළට පැමිණි අවස්ථාවේ ඩුබායි නගරයේ ශ්‍රී ලංකාවේ කොන්සල් ජනරාල් කාර්යාලයේ ඉල්ලීම මත ශ්‍රී ලංකා ඉන්ටපෝල් පොලිස් ඒකකය මගින් අත්අඩංගුවට ගනු ලැබිණි. තාවකාලික සිර මැදිරියක දින 03ක් රඳවාගෙන ඇති අතර ඔහුට එරෙහිව පැවතුනේ නිල් වරෙන්තුවක් හෙයින් ඒ මත අත්අඩංගුවට ගත නොහැකි වීම හේතුවෙන් මුදා හරිනු ලැබ තිබේ.

ඉහත සඳහන් කරන ලද පරිදි අසත්‍ය කරුණු පදනම් කර ගනිමින් නිකුත් කරන ලද ඉන්ටපෝල් රතු වරෙන්තුව මත 2018.03.23 දින උදයංග නැවතත් අත්අඩංගුවට ගන්නා ලදී. මිග් යානා මිළදී ගැනීම

සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශන කටයුතු හා අදාළව තම ප්‍රකාශය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී ලබා ගන්නා ලද උදයංග විසින් ඉල්ලීමක් සිදු කළද තමාගෙන් පලි ගැනීමට උවමනාවෙන් සිටි යහපාලන රජයේ දේශපාලනඥයන්ගේ අවශ්‍යතාවය මත ඊට අවස්ථාව ලබා නොදුන් බවත් කෙසේ හෝ ඔහු ශ්‍රී ලංකාවට රැගෙන ඒමේ උත්සහයෙන් කටයුතු කරනු ලැබූ බවත් උදයංග කියා සිටි අතර ශ්‍රී ලංකාවේ නව ජනාධිපතිවරයා වශයෙන් ගෝඨාභය රාජපක්ෂ මහතා පත් වීමෙන් අනතුරුව දේශපාලන පලි ගැනීම් නතර වන බවට විශ්වාසයක් වූ බැවින් තම කැමැත්තෙන් ශ්‍රී ලංකාවට පිටත් වන බව අබුඩාබි ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දෙන ලද හෙයින් අබුඩාබි ශේෂ්ඨාධිකරණය විසින් උදර්පණ නීතිය යටතේ කරණු ලැබූ නියෝගය මත මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරින් විසින් 2020.02.14 දින උදයංග ශ්‍රී ලංකාවට රැගෙන එන ලදී.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 192 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 .XXXIX

(1)

| | | |
|---|---|---|
| පැමිණිලි අංක | - | 650/2020 |
| පැමිණිලිකරු | - | ඥානලිංගම් ධනේෂ්වරී |
| ලිපිනය | - | පාසල පාර, තුන්නාලෙයි උතුර, කරවෙඩ්ඩි. |

(2)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 34/2020 |
| පැමිණිලිකරු | - | පී. එල්. අයි. පෙරේරා |
| ලිපිනය | - | නො.211/ඒ, සීලවිමල මාවත, පොරේ, අතුරුගිරිය. |

(3)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 269/2020 |
| පැමිණිලිකරු | - | ජී. ඒ. මාලනී |
| ලිපිනය | - | අංක. 34, උඩුරාවණ, වත්තේගම |

(4)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 403/2020 |
| පැමිණිලිකරු | - | කේ. වී. රංජනී මල්කාන්ති |
| ලිපිනය | - | අංක. 97/4, උස්බිම් ජනපදය, බඹරවාන, මත්තක. |

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1) විජයකලා මහේෂ්වරම්
2) කුමරන් ෂර්වානන්දන්
3) පො.ප. නිශාන්ත ද සිල්වා කන්දප්පා

## තීරණය

පැමිණිලිකරුවන් අපරාධයක් සම්බන්ධයෙන් වූ පරීක්ෂණ පැවැත්වීමේදී සිදුවීමට යෙදී ඇති එම අපරාධය සම්බන්ධයෙන් සැක පිට අත්අඩංගුවට ගත් පුද්ගලයෙකුගේ මරණය දියේ ගිලී සිදුවූ මරණයක් බව මරණ පරීක්ෂණයේදී තීරණය කරනු ලැබ වසර කිහිපයක් ගත වීමෙන් අනතුරුව අවිධිමත් ලෙස ආරම්භ කරනු ලැබ ඇති ක්‍රියා පටිපාටියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රථමයෙන් පැමිණිලිකරුවන් හට එරෙහිව 1994 අංක 22 දරණ කෲ්‍ර වධ හිංසා සහ අවමන් සහගත සැලකිලිවලට එරෙහි සම්මුති පනත යටතේ චෝදනා ඉදිරිපත් කොට වැරදිකරුවන් කරනු ලැබ සිරදඬුවම් නියම කිරීමෙන් අනතුරුව නැවත එකී තැනැත්තාගේ මරණය සිදු කරනු ලැබ ඇතැයි යන පදනම මත මනුෂ්‍ය ඝාතන චෝදනා එල්ල කරනු ලැබීමට කටයුතු කිරීම කිසියම් දේශපාලන බලපෑමක් මත සිදුව ඇතැයි යන්න බැලූබැල්මට පෙනී යන්නේය යන නිගමනයට මෙම කොමිෂන් සභාව එළඹ සිටී. තවද විශේෂයෙන් පැමිණිලිකාර පොලිස්

නිලධාරීන් අදාල පොලිස් පරීක්ෂණය මෙහෙය වන ලද පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර යහපාලන රජයේ රාජ්‍ය අමාත්‍යවරියක්ව සිටි පළවන වගඋත්තරකාරියගේ ද ඇයගේ අනුගාමික දේශපාලනඥයෙකු වූ දෙවන වන වගඋත්තරකරුගේ ද උදහසට ලක්ව සිටින ලදැයි යන්න සහ ඔවුන්ගේ දේශපාලන බලය මත වූ පලිගැනීමකට පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර පත්වනු ලැබ ඇතැයි යන්න කොමිෂන් සභාවේ තීරණයයි.

## නිර්දේශ

1. පැමිණිලිකරුවන් යාපනය මහාධිකරණයේ වරදකරුවන් කරනු ලැබ ඇති එම අධිකරණයේ අංක 2005/16 දරණ නඩුවේ තීන්දුවට එරෙහිව අභියාචනාධිකරණයේ පවරා ඇති අංක CA 137 සිට 142/2017 දරණ අභියාචනයන් විභාග කොට අවසන් කිරීම කඩිනම් කිරීම යුක්ති සහගත බව කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

2. එකම සිද්ධිය සම්බන්ධයෙන් බරපතල ප්‍රමාදයකින් පසු දෙවන වරට අපරාධ චෝදනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ නීතිමය තත්ත්වය නීතිපතිවරයා විසින් නැවත සලකා බැලීම සුදුසු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

3. ඉහත දෙවන නිර්දේශයට විකල්ප වශයෙන් ඉහත පළවන නිර්දේශයෙහි සඳහන් නඩු විභාගය සිදු කරන ලද යාපනය මහාධිකරණයෙහි ඉහත දෙවන නිර්දේශයෙහි සඳහන් නඩුව විභාග කිරීමෙන් එම නඩුවේ චූදිතයින් හට අගතියක් සිදුවීමට ඇති අවකාශය සලකා බලා එම නඩුව පවත්වාගෙන යන්නේ

නම් කොළඹ මහාධිකරණයට හෝ වෙනත් සුදුසු මහාධිකරණයකට මාරු කරනු ලැබීම සුදුසු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පේදුරුතුඩුව කරවෙට්ටි පුන්නාල උතුර යන ලිපිනයෙහි ඥානලිංගම් ධනේෂ්වරී විසින් අතින් ගෙනවිත් මෙම කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත 2020.02.27 වන දින භාරදෙන ලද පැමිණිල්ල මඟින් පොලිස් කොස්තාපල්ව සිටින ලද ඥානලිංගම් මයූරන් නැමැති වූ ඇයගේ පුත්‍රයාට සිදුවන ලද දේශපාලන පළිගැනීමක් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වෙත පැමිණිලි කරන ලදි. යථෝක්ත පැමිණිල්ලෙහි සඳහන් පරිදි මේ වන විට ඥානලිංගම් මයූරන් නැමැත්තා යාපනය මහාධිකරණයේ අංක 2005/2016 යන නඩුවෙහි ඔහුට එරෙහිව නඟන ලද චෝදනාවට වරදකරු කරනු ලැබ වසර 10 ක සිරදඬුවමකට යටත් කර සිටින හෙයින් බන්ධනාගාරයේ සිට ඔහු නොමිෂන් සභාවේ පොලිස් ඒකකයට කැඳවා ප්‍රකාශයක් සටහන් කර ගනු ලැබිණි. ඔහුගේ ප්‍රකාශයට අනුව ඉහත කී ඔහුගේ මව විසින් ඉදිරිපත් කරනු ලද පැමිණිල්ලට අදාළ සිද්ධි දාමය පහත සඳහන් පරිදි වේ.

1987.08.02 වන දින උපත ලද මයූරන් ගේ පියාගේ නම වඩිවේල් ඥානලිංගම් වන අතර මවගේ නම ඥානලිංගම් ධනේෂ්වරී වේ. මයූරන් ට වැඩිමහල් සහෝදරයින් තිදෙනෙක් සහ එක් වැඩිමහල් සහෝදරියක් සිටී. පොලිස් සැරයන්වරයෙකුව සිටි ඔහුගේ පියා 1993 වර්ෂයේදී විශ්‍රාම ලැබූ අතර 2003 වර්ෂයේදී හෘදයාබාධයකින් මිය යන ලදි.

මයුරන් තුන්නාලෙහි ඇමරිකන් මිෂන් පාසැලෙහි 1 වසරේ සිට 5 වසර දක්වාත් යාපනය නෙල්ලිඅඩි මධ්‍ය මහා විද්‍යාලයෙහි 6 වසර සිට 10 වසර දක්වාත් අධ්‍යාපනය ලබා රත්මලාන හින්දු විද්‍යාලයෙහි වානිජ අංශයෙන් උසස් පෙළ හදාරා ඇත. ඔහු 2010.06.01 දින ආධුනිකයෙකු වශයෙන් ශ්‍රී ලංකා පොලීසියට බැඳී කළුතර පොලිස් විද්‍යාලයේ මාස 7 ක පුහුණුවකින් පසු 2011.01.19 වන දින චුන්නිකම් පොලිස් ස්ථානයෙහි සේවයට වාර්තා කොට ඇත. එවකට චුන්නාකම් පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපති වූයේ පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර නැමැත්තාය. මයුරන් ට ඔහුගේ මව් බස වූ දෙමළ භාෂාවට අමතරව සිංහල භාෂාව පිළිබඳව ද දැනුමක් තිබූ බැවින් බොහෝ විට ස්ථානාධිපතිවරයා සමඟ රාජකාරි කිරීමට සිදුවිය.

2011.11.22 වන දින මයුරන් ස්ථානාධිපතිවරයා සමඟ රාජකාරියක යෙදෙන ලද අතර තවත් පොලිස් නිලධාරීන් පිරිසක් සමඟ චුන්නාකම් පුන්නාලෙයි කට්ටුවන් දකුණ හි පදිංචි අලගන් උමා චන්දිරි යන අයගේ නිවසට යන ලදී. උමා චන්දිරි ඔවුන්ට පවසනු ලැබූයේ නිවසට හොරුන් පැන අවුරුදු 74 ක් වයසැති උමා ගේ මව කාමරයකට දමා වසනු ලැබ උමාගේ ද අවුරුදු 5 ක් සහ 4 ක් වයසැති කුඩා පුතුන් දෙදෙනාගේ ද අත් පා බැඳ කටවල්වලට රෙදි ඔබා අල්මාරිවල තිබූ බඩු රැගෙන යන ලද බවත් මවගේ කෑ ගැසීම ඇසී අසල්වැසියන් පැමිණ තම අත්පා ලිහා දැමූ බවත්ය. මෙම අපරාධයෙහිදී රුපියල් ලක්ෂ 33 ක් වටිනා රන් ආභරණ ද මුදල් රුපියල් 25,000/= ක් ද කැමරාවක් සහ මොබයිල් ෆෝන් 2ක් ද සොරකම් කරනු ලැබ තිබූයෙන් SOCO (අපරාද ස්ථාන පරීක්ෂණ නිලධාරි) ඇඟිලි සලකුණු පරීක්ෂණ නිලධාරීන් ද සහ පොලිස් නිල සුනඛ අංශය ද කැඳවා පරීක්ෂණ කටයුතු සිදුකරනු ලැබිණි.

ස්ථානාධිපතිවරයාට ලැබෙන ලද දුරකථන ඇමතුමක් මත සිදු කෙරෙන ලද පරීක්ෂණ අතරතුරදී යාපනය පලාලි පාරේ නීර්වේලි හන්දියේදී සුමනන් නැමැති සැක කටයුතු පුද්ගලයෙකු අත්අඩංගුවට ගන්නා ලදි. සුමනන්ගෙන් ප්‍රශ්න කිරීම් කෙරෙන ලද්දේ ඒ වන විටත් අපරාධ අංශයෙන් අත්අඩංගුවට ගෙන සිටි සැකකරුවන් හතරදෙනෙකුගෙන් හෙළිදරව් කෙරෙන ලද තොරතුරු පදනම් කර ගනිමිනි. සොරකම් කරන ලද දේපල අතුරින් කැමරාව ද ජංගම දුරකථනයක් ද කරාබු ජෝඩුවක් ද සොයා ගෙන තිබූ අතර සොරකම සිදු කිරීමෙන් පසුව ගන්නා ලද ඡායා රූප කැමරාවෙහි තිබූ අතර සුමනන්ගේ ජංගම දුරකථනය අංකය ඇතුළත් ඔහුගේ නම ලියනු ලැබූ රත්රන් පිළිබඳ වූ සටහනක ඡායා රූපයක් ද ඒ අතර විය. සොරකම් කරන ලද රත්රන් ඒවා ලබාදීමට සිටි විනෝ්නහෙයි මඩම් යන කඩයෙන් නොගත් හෙයින් ඔහුට ඒවා ලබාදිය හැකි බැව් සුමනන් පැවසූයෙන් සුමනන්ගේ සොරකම් කරන ලද රත්රන් ලබා ගැනීම සඳහා සුමනන් ද කැටුව ස්ථානාධිපතිවරයා ඇතුළු පොලිස් කණ්ඩාමක් පිටත්ව ගිය අතර මයුරන් ද ඒ සමඟ විය. ප්‍රථමයෙන් සුමනන්ගේ නිවසට යනු ලදුව එහිදී ඔහු කියා සිටින ලද්දේ රත්රන් තිබෙනුයේ මුහමාලෙයි හි බවයි. ඒ අනුව මුහමාලෙයි යාමෙන් පසු නැවත කියා සිටින ලද්දේ කිලිනොච්චි යායුතු බවය. කිලිනොච්චිහිදී එක්තරා ස්ථානයක ජීප් රථය නවත්වන මෙන් සුමනන් පැවසූ අතර සාජන් රාජපක්ෂ සමඟ සුමනන් ජීප් රියෙන් බසිද්දී ඔහු සාජන් රාජපක්ෂ තල්ලු කරදමා එහිවූ කැලෑරොද තුළට දුවනු ලැබිණි. බිම් බෝම්බ තිබිය හැකි බැවින් ප්‍රවේසම් වන ලෙස ස්ථානාධිපතිවරයා පොලිස් නිලධාරීන්ට අවවාද කරනු ලැබූයෙන් මයුරන් සහ සෙසු නිලධාරීන් අඩි පාරවල් ඔස්සේ ඉදිරියට ගමන කළ අතර බොහෝ වෙලාවකින්

පසු ඔවුන්ට දැක ගත හැකි වූයේ ඔවුන්ගෙන් මිදී පැන ගිය සුමනන් එහි වූ වැවේ වැටී සිටින බවත් ඔවුන් සුමනන් ඔසවා ගෙන චිත් කිලිනොච්චි රෝහලට රැගෙන ගිය අතර එහිදී වෛද්‍යවරයා පවසා සිටින ලද්දේ ඒ වන විට පැය දෙකකට වැඩි වේලාවකට පෙරාතුව සුමනන් මිය ගොස් ඇති බවයි. සුමනන්ගේ හදිසි මරණය කිලිනොච්චි මහේස්ත්‍රාත්වරයා වෙත වාර්තා කරනු ලැබූ අතර මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය පරිදි පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන ලද්දේ පොලොන්නරුව මහ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසිනි.

සුමනන් රැගෙන 2011.11.26 දින චුන්නාකම් පොලිසියෙන් පිටත් වූ පොලිස් නිලධාරීන් සුමනන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය අවසන් කොට ආපසු චුන්නාකම් පොලිස් ස්ථානයට පැමිණෙනුයේ 2011.11.29 දින සවස් භාගයේදීය. ඒ වන විට ස්ථානාධිපති චින්තක බණ්ඩාර හට ස්ථාන මාරුවක් ලබා දී තිබූ අතර සුමනන්ගේ මරණය පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණ තිබුණි. සුමනන්ගේ මරණය පිළිබඳව වූ මරණ පරීක්ෂණය සිදු කරන ලද්දේ මල්ලාකම් මහේස්ත්‍රාත්වරයා විසිනි. ඒ 2012.01.31 වන දිනය. ඉදිරිපත් වූ සාක්ෂි අනුව සුමනන්ගේ මරණය දිලේ ගිලීමෙන් සිදු වූවක් ය යන නිගමනයට එළඹෙන ලද මහේස්ත්‍රාත්වරයා සුමනන්ගේ සහ සොරකම පිළිබඳ අපරාධය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ සෙසු සැකකරුවන් හතරදෙනා අතුරින් දෙදෙනෙකුගේ තුවාල සිදුවීම පිළිබඳව වැඩිදුරටත් විමර්ශන පැවැත්වීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියම කරනු ලැබිණි. සොරකම පිළිබඳ වූ නඩුව මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පැවැති අතර 2016.07.25 වන විට එය

වැඩිදුර විභාගය සඳහා නියම කරනු ලැබ තිබිණි. එදින සාක්ෂි දීමට නියමිතව සිටින ලද්දේ සොරකම පිළිබඳ අපරාධය සම්බන්ධයෙන් පරීක්ෂණ මෙහෙය වූ එවකට චුන්නාකම් පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිව සිටි පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාරය. ඒ වන විට ඔහු කොඩිකාමම් පොලිස් ස්ථානයේ සේවයේ යෙදී සිටින ලදි. පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර අදාළ දිනයේ මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණය වෙත යමින් සිටියදී චුන්නාකම් පොලීසියේ පොලිස් නිලධාරියෙකු ඔහුට දුරකථනයෙන් අමතා අද සාක්ෂි දෙන්න එන්න එපා යැයි පවසනු ලැබිණි. එහෙත් ඔහු ඒ වන විට මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණයට ආසන්නව සිටින ලදින් ඔහු අධිකරණය වෙත යන ලදි. අදාළ නඩුව වැඩිදුර විභාගය සඳහා කැඳවන ලද අවස්ථාවේදී පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර සාක්ෂි දීමට ඉදිරිපත් වූ නමුත් එම අවස්ථාවේදී 1, 2, 3, චූදිතයින් වෙනුවෙන් පෙනී සිටින ලද නීතීඥවරයා අධිකරණයට දැනුම්දෙන ලද්දේ පළවන චූදිත හට යම් කරුණක් පැවසීමට ඇති බවය. මහේස්ත්‍රාත්වරයා ඊට අවකාශ සලසා දෙනු ලැබිණි.

1, 2 චූදිතයින් විවෘත අධිකරණයේදී මහේස්ත්‍රාත්වරයාට ප්‍රකාශ කර සිටින ලද්දේ ඔවුන් අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේදී පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුළු පොලිස් නිලධාරීන් නවදෙනෙකු ඔවුන් හට ද මියගිය සුමනන් හට ද කෲර ලෙස පහර දී වද හිංසාවනට පත් කරනු ලැබූ බවය. ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කරනු ලැබූ මහේස්ත්‍රාත්වරයා ඒ පිළිබඳව විමර්ශන පවත්වන ලෙසට පොලීසියට නියෝග කරනු ලැබිණි. එසේම පොලිස්ථානාධිපති චින්තක බණ්ඩාර සහ මයුරන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන ලෙසත් සහ 2011.11.25 දින චුන්නාකම් පොලිස් ස්ථානයේ රාජකාරි කළ සියලුම පොලිස්

නිලධාරීන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන ලෙසත් උතුර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති හට වැඩිදුරටත් නියෝග කරන ලදි.

චින්තක බණ්ඩාර, ඥානලිංගම් මයුරන්, පතිනාදන් දේවදයාලන්, රාජපක්ෂ මුදියන්සේලාගේ සංජීව රාජපක්ෂ, කෝන්ගලගේ ජයන්ත, වීරසිංහ දොරයලාගේ හේමචන්ද්‍ර වීරසිංහ, විජයරත්නම් ගෝබි ක්‍රිෂ්නන් සහ මුදුන්ගොඩ හේවගේ ලලිත් විජේසිංහ යන පොලිස් නිලධාරීන් හට එරෙහිව යාපනය මහාධිකරණයේ නඩු අංක 2005/16 යටතේ 1994 අංක 22 දරණ කෲර අමානුෂික වධ හිංසා පනතේ 2 වන වගන්තිය යටතේ අධි චෝදනා නඟනු ලැබ 2017.05.03 වන දින ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුව මඟින් නිශාන්ත බණ්ඩාර, මයුරන්, රාජපක්ෂ, ජයන්ත, වීරසිංහ, ගෝබි ක්‍රිෂ්නන් යන තැනැත්තන් වරදකරුවන් කරනු ලැබ වසර 10 ක් බැගින් වූ සිර දඬුවම් නියම කරනු ලැබිණි. ඊට අමතරව රුපියල් විසිපන් දහසක දඩුවමක් සහ එය නොගෙවන්නේ නම් අවුරුද්දක සිර දඬුවමක් ද රුපියල් ලක්ෂ දෙදෙක ක වන්දියක් සහ එය නොගෙවන්නේ නම් අවුරුද්දක සිර දඬුවමක් වශයෙන් දඬුවම් නියම කර ඇත. මෙම වරදකරු කිරීමට සහ දඬුවම් නියමයට එරෙහිව අභියාචනාධිකරණයට නඩු අංක CA 137/2017 සිට CA 142/2017 දක්වා වූ අභියාචනා ඉදිරිපත් කර ඇති අතර දැනට නඩු වාර 11 ක් කැඳවා ඇති නමුත් විවිධ හේතූන් මත විභාගයට නොගෙන කල් තබනු ලැබ ඇත. එම අභියාචනා නඩු විභාගයට නියමිතව පැවතියදී චූදිත අංක 6 වශයෙන් සිටි පොලිස් කොස්තාපල් 46915 වීරසිංහ දියවැඩියාව රෝගය උත්සන්න වී 2009.09.23 වන දින බන්ධනාගාරය තුළදී මිය යන ලදි. කරුණු මෙසේ පැවතියදී සුමනන්ගේ මරණය සම්බන්ධයෙන් මෙම නිලධාරීන්ට එරෙහිව යාපනය මහාධිකරණයේ අංක 2629/2019 යටතේ නඩු පවරා ඇති

අතර ඔවුන් හට අධිචෝදනා පත්‍ර භාරදීමට නියමිතව පවතී. අංක 34/2020 දරණ පැමිණිල්ලේ පැමිණිලිකාර පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර සහ අංක 650/2020 නඩුවේ පැමිණිලිකාර පොලිස් කොස්තාපල් ඥානලිංගම් මයුරන් යන නිලධාරීන්ගෙන් දේශපාලන පළිගැනීමක් වශයෙන් මෙම නඩු කටයුතුවලට යටත් කිරීමක් සිදුවූ බවත් එම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් අංක 403/2020 සහ 269/2020 දරණ පැමිණිලිවල පැමිණිලිකරුවන් වන පිළිවෙළින් කුකුල විතානගේ රංජනී මල්කාන්ති සහ ගුරුසිංහ ආරච්චිලාගේ මාලනී යන තැනැත්තන් ද ඊට ගොදුරු වන ලද බවත් ඔවුන් සිය පැමිණිලි මඟින් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර සිටින ලදි.

පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර සහ ඔහු හා සමීපව රාජකාරි කරනු ලැබූ ඥානලිංගම් මයුරන් යහපාලන රජයේ අමාත්‍යවරියකව සිටි විජයකලා මහේෂ්වරන් මහත්මියගේ කැමැත්තට එරෙහිව කටයුතු කරමින් මහත් ආන්දෝලනයකට තුඩු දුන් ශිවයෝගනාදන් විද්‍යා සිසුවිය දූෂණය කොට ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් අවශ්‍ය කරනු ලැබ සිටි අපරාධකරුවෙකු වූ ස්විස්කුමාර් නැමැත්තා අධිකරණයට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔවුන් සමඟ උරණ වී සිටින ලද බවට කරුණු ඉදිරිපත් කරන ලදි. ඊට අමතරව පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර කොඩිකානම් පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වශයෙන් සේවයේ යෙදී සිටියදී 2015 අගෝස්තු මාසයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණ සමයෙහි සිදුවන ලද සිදුවීමක් ද ඔහුගෙන් දේශපාලන පළිගැනීම් සිදු කිරීමට හේතු පාදක වන ලදැයි සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිණි. විජයකලා මහේෂ්වරන් සහ කුමරගුරු ෂර්වානන්දන් එකී මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයින් වශයෙන් ඉදිරිපත්ව සිටින ලදි. මෙම ඡන්ද

ව්‍යාපාරයේදී කුමරන් ෂර්වානන්දන් ඊලාම් සිතියමේ මැද ඔහුගේ සහ විජයකලා මහේෂ්වරන්ගේ ඡායා රූප ඇතුළත් කොට සකස් කරන ලද ස්ටිකර්යක් වාහනයේ සවි කරගෙන තිබිණි. එය නීති විරෝධී හෙයින් ගලවා ඉවත් කරන ලෙස චින්තක බණ්ඩාර කුමරන් ෂර්වානන්දන් හට නියම කළ අතර ඒ අනුව ඔහුට එය ඉවත් කිරීමට සිදුවිය. තවද එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් කිට්ටු පාර්ක් හි තිබූ මැතිවරණ රැලියට සකස් කර තිබූ වේදිකාවේ එක් පසෙක ඊලාම් සිතියම ඇතුළත් විශාල බැනරයක් සවි කර තිබූයෙන් එය ඉවත් කරන ලෙස චින්තක බණ්ඩාර කුමරන් ෂර්වානන්දන් හට දැනුම්දුන් නමුත් ඔහු එය ඉවත් නොකළෙන් චින්තක බණ්ඩාර විසින් එම බැනරය ඉවත් කරන ලදි. මිනීමැරීමට තැත් කිරීමේ නඩුවක් සම්බන්ධයෙන් ෂර්වානන්දන් අත්අඩංගුවට නැඟීමට අවශ්‍යව තිබූයෙන් ඒ සඳහා යාපනය පොලීසියෙන් පණිවිඩ නිකුත් කරනු ලැබ තිබූ නමුත් ඔහු නිදහසේ සැරිසරමින් සිටිනු ලැබිණි. 2016 වර්ෂයේදී ෂර්වානන්දන් කොඩිකාමම් පොලිස් වසමේ සිටියදී චින්තක බණ්ඩාර විසින් පොලිස් නිලධාරීන් කණ්ඩායමක් යොදවා අත්අඩංගුවට ගනු ලැබිණි. එලෙස ෂර්වානන්දන් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන විත් සිටියදී විජයකලා මහේෂ්වරන් අමාත්‍යවරිය චින්තක බණ්ඩාර හට දුරකථනයෙන් අමතා චාවාකච්චේරියෙන් හෝ යාපනයෙන් හෝ අත්අඩංගුවට ගැනීමක් සිදු නොකරද්දී ෂර්වානන්දන් අත්අඩංගුවට ගැනීමට තමුන් ට ඇති වුවමනාව කුමක් දැයි විමසනු ලැබිණි. තමන් සිදු කළේ තම රාජකාරිය වන බව චින්තක බණ්ඩාර ඇයට පවසනු ලැබූ අතර අපි බලාගමුකො යැයි ඇය තර්ජනාත්මකව පවසනු ලැබිණි.

චින්තක බණ්ඩාර ඇතුළු පොලිස් නිලධාරීන් හට එරෙහිව නඩු පැවරීම සිදුවන ලද්දේ මල්ලාකම් මහේස්ත්‍රාත්වරයා නියෝග පිරිදි සිදු කෙරෙන ලද විමර්ශන මත වුවද එය සිදුවන ලද ආකාරය පිළිබඳව සලකා බැලීමේදී ඊට පසුබිම් වන ලද යම් බලපෑම් පැවතීමේ ශක්‍යතාවයක් විද්‍යමාන වේ. සුමනන්ගේ මරණය සිදුවී ඇත්තේ 2011 වර්ෂයේ වන අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එකී මරණය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භ කරනු ලැබ ඇත්තේ මරණය සිදුවූ අවස්ථාවේදීමය. සුමනන් අත්අඩංගුවට ගැනීමට හේතු වූ සොරකම පිළිබඳ අපරාධය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරනු ලැබ සිටි සෙසු සැකකරුවන් ඇප මත මුදාහරිනු ලැබ සිටි අතර ඔවුන් අතරින් දෙදෙනෙකු ඔවුන්ට එරෙහිව පැවැති නඩු විභාග දිනයේදී විත්ති කූඩුවේ සිට සුමනන්ගේ මරණයට හේතු වන ලදැයි යන කරුණ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා හට ප්‍රකාශ සිදු කරනුයේ සුමනන්ගේ මරණයෙන් වසර 4 කට පසුවය. එකී ප්‍රකාශ ලබාදුන් එක් තැනැත්තෙක් වන සුරේෂ් ඉහතින් සඳහන් කරනු ලැබූ කුමරන් ෂර්වානන්දන් සමඟ එකට රක්ෂණ සිරභාරයේ සිටින ලද බවත් තමන් එළියට යන විට චින්තක බණ්ඩාරට ඇතුළට ඒමට වැඩ සලස්වන බවත් කුමරන් ෂර්වානන්දන් බන්ධනාගාරය තුළදී පවසනු ලැබූ බැව් තමාට දැන ගැනීමට ලැබෙන ලද බව චින්තක බණ්ඩාර සිය සාක්ෂියේදී ප්‍රකාශ කරන ලදි.

ඉහත සඳහන් කෙරෙන ලද පරිදි පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර සහ සෙසු පොලිස් නිලධාරීන් විසින් පරීක්ෂණ කටයුතු පැවැත්වීමට යෙදෙන ලද චුන්නාකම් පොලිස් බල ප්‍රදේශයේ සිදු වූ රුපියල් ලක්ෂ 33 කට අධික වටිනාකමින් යුත් රත්රන් සහ මුදල් කොල්ලකෑමේ අපරාධ නඩුවෙහි චූදිතයින් විසින් බලවත් වූ ප්‍රමාදයකින් පසුව ලබාදුන්

ප්‍රකාශ පදනම් කර ගනිමින් ඉදිරිපත් කෙරෙන ලද අධිචෝදනා මත පැවැත්වීමට යෙදෙන ලද නඩු විභාගයේදී ඉදිරිපත් කිරීමට යෙදෙන ලද සාක්ෂි නිර්මාණය කිරීමක් මත සැකසෙන ලද්දේද යන්න සැකය වඩාත් තීව්‍ර වීමට ඇසුදුටු සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විද්‍යාත්මක සාක්ෂි හා නොසැසඳීම හේතු වන බැව් පෙනේ. කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් දිවයිනේ වර්තමාන ප්‍රධාන විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ මතය වූයේ සුමනන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවෙහි දැක්වෙන තුවාල සියල්ල සුළු තුවාල වන බවයි. කරුණු මෙසේ පැවතියදී පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර ඇතුළු මෙම වාර්තාවට අදාළ පැමිණිලි සිදු කරනු ලැබ ඇති පොලිස් නිලධාරීන් පස්දෙනා දැනටමත් වරදකරුවන් කරනු ලැබ දඬුවම් නියම කරනු ලැබ සිටින සිද්ධියට අදාළවම මනුෂ්‍ය ඝාතන චෝදනාව යටතේ අධිචෝදනා නඟනු ලැබීම එම නිලධාරීන්ගේ දැඩි කනස්සල්ලට හේතු වී ඇත.

අංක 650/2020 පැමිණිල්ලේ වාචික සාක්ෂි සනාථ කෙරෙන ලේඛන පැ.1 සිට පැ. 13 දක්වා ද, අංක 34/2020 පැමිණිල්ලේ වාචික සාක්ෂි සනාථ කෙරෙන ලේඛන පැ.1 සිට පැ. 87 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 .XL

පැමිණිලි අංකය - 1842/2020

පැමිණිලිකරු - ලලිත් සේපාල රත්නායක

ලිපිනය - චන්ද්‍රිකාවැව පන්සල පාර, ඇඹිලිපිටිය

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු ඇමති මංගල සමරවීර මහතා
2. හිටපු ඇමති පාඨලී චම්පික රණවක මහතා
3. හිටපු ඇමති රවුෆ් හකීම් මහතා
4. හිටපු ඇමති සරත් ෆොන්සේකා මහතා
5. දෙමළ සන්ධාන නායක (ටී.එන්.ඒ) ආර් සම්බන්ධන් මහතා
6. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ සුමන්තිරන් මහතා
7. ජ.වි.පෙ නායක අනුර කුමාර දිසානායක මහතා
8. නීතිඥ ජේ.සී වැලිඅමුණ මහතා
9. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා
10. හිටපු අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා
11. හිටපු අධ්‍යක්ෂ දූෂණ විරෝධී ලේකම් කාර්යාලය එම්.කේ ආනන්ද විජේපාල මහතා
12. හිටපු නියෝජ්‍ය පොලිස්පති එස්.එම් වික්‍රමසිංහ මහතා

13. හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජයසූරිය මහතා (ළමා හා කාන්තා කාර්යාංශය)

14. හිටපු සන්ධාන නිලධාරි පී.එම්. අන්සාර් මහතා (විදේශ අමාත්‍යාංශය)

## නිරීක්ෂණ

01. සේපාල රත්නායක 1993.06.10 දින ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස ඇතුළත්ව ඇත.

02. ඔහු 2000.07.03 දින සිට ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවේ තාවකාලික වැඩ බලන රජයේ අධිනීතිඥ තනතුරෙහි සේවය ආරම්භ කරන ලදී.

03. 2001.07.03 වන දින සිට සේපාල රත්නායක රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ අධිනීතිඥ තනතුරේ ස්ථිර කරනු ලැබ ඇත.

04. 2006.05.05 සහ 2006.05.19 දිනැති ලිපි මගින් ජනාධිපති ලේකම් විසින් සේපාල රත්නායක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට පත් කරනු ලැබ ඇත.

05. 2010 වර්ෂයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා 02 වන වරට විධායක ජනාධිපති ධූරයට පත් වීමෙන් පසුව ජනාධිපති ලේකම්ගේ 2010.12.30 දිනැති ලිපිය මගින් සේපාල

රත්නායක ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ නීති කටයුතු පිළිබඳව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා ලෙස නැවත පත් කරනු ලැබ ඇත.

06.2013.10.12 හා 2013.10.31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව සේපාල රත්නායක එක්සත් රාජධානියේ ලන්ඩන් නගරයේ පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය තනතුරට පත් කරනු ලැබ 2013.11.20 දින එකී තනතුර භාර ගැනීම සඳහා ඔහු විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදා හැර ඇත.

07.විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සේපාල රත්නායක 2015.03.04 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ධූත මණ්ඩල සේවයෙන් මුදා හරිනු ලැබ ඇත.

08.එලෙස සේපාල රත්නායක විදේශ ධූත මණ්ඩල සේවයෙන් මුදා හරින අවස්ථාව වන විටත් ඔහුට එරෙහිව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 20203/09/15 දරණ වාර්තාව ඉදිරිපත් කරනු ලැබ තිබූ අතර ඔහු ශ්‍රී ලංකාවට පැමිණෙන විට ගුවන් තොටුපලේදී අත්අඩංගුවට ගැනීමට ශ්‍රී ලංකා පොලිසිය විසින් වරෙන්තු ලබා ගෙන තිබිණි.

09.යහපාලන රජයේ දූෂණ මර්දන කමිටුව මගින් සේපාල රත්නායක දේශපාලන පලි ගැනීමේ ගොදුරක් බවට පත් කරගෙන සිටින ලදින් ඔහුට ශ්‍රී ලංකාවට පැමිණීමට

නොහැකිව තිබීමේ හේතුව මත ඔහු නීතිපතිවරයා වෙත සේවයෙන් ඉල්ලා අස් වීමේ ලිපියක් යවනු ලැබ ඇත.

10.2016.09.20 දින සේපාල රත්නායකට එරෙහිව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර තිබූ ව්‍යාජ නඩුව පොලිසිය විසින් නීතිපතිවරයාගේ උපදෙස් මත ඉවත් කරගනු ලැබිණි.

## තීරණය

01. රජයේ අධිනීතිඥවරයෙක් වශයෙන් සේවයේ යෙදී සිටි සේපාල රත්නායක 2005 වර්ෂයේදී ජනාධිපති කාර්යය මණ්ඩලයට පත් කිරීම කෙරෙහි අදාළ වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වේ.

02. ඔහු විදේශ සේවයට මුදා හරිනු ලැබ ඇත්තේ ජනාධිපති ලේකම්වරයා විසින් වන හෙයින් සේපාල රත්නායකගේ විදේශ සේවා කාලයද එම ව්‍යවස්ථාවෙන් ආවරණය වනු ලබයි.

03. 2015.03.04 දින සිට සේපාල රත්නායක විදේශ සේවයෙන් මුදා හරිනු ලැබීමෙන් අනතුරුව ඔහු ඔහුගේ පූර්ව සේවා ස්ථානය වූ නීතිපති දෙපාර්තමේන්තුවේ ඔහු දරමින් සිටින ලද ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ තනතුරට අනියුක්ත විය යුතු අතර ඉන් පසුව ඔහුට හිමිවීමට තිබූ උසස්වීම් ඔහුට ලැබිය යුතුවේ.

04. සේපාල රත්නායක නීතිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද සේවයෙන් අස් වීමේ ලිපිය එම අවස්ථාවේදී ඔහුට මුහුණ පෑමට සිදුවන ලද අනපේක්ෂිත පීඩාකාරි තත්වයන් හේතුවෙන් ඉදිරිපත් කරන ලද්දක් බැවින් එය ස්වේච්චාවෙන් සිදු කළ ක්‍රියාවක් නොවන බැවින් එකී ඉල්ලා අස්වීමේ ලිපිය වලංගු ඉල්ලා අස්වීමේ ලිපියක් ලෙසට පිලිගත නොහැක.

## නිර්දේශ

01. යහපාලන රජය විසින් පිහිටුවන ලද දූෂණ මර්දන කමිටුවේ දේශපාලන පලි ගැනීම් සිදු කිරීම සඳහා ක්‍රියාකාරීව කටයුතු කරන ලද දේශපාලනඥයින් වෙත සහ නිලධාරින් හට එරෙහිව ක්‍රියා කිරීම පිණිස මෙම කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන පොදු නිර්දේශ මෙම කාරණයේදීද අදාළ වේ.

02. කොළඹ මහේස්ත්‍රාත්අධිකරණයට බී 20203/09/15 දරණ වාර්තාව මගින් අසම්පූර්ණ සහ අසත්‍ය කරුණු වාර්තා කොට සේපාල රත්නායක ඇතුළු පුද්ගලයින් කිහිප දෙනෙක් දේශපාලන පලි ගැනීමට කටයුතු කළ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එස්.එම් වික්‍රමසිංහ ඇතුළු කණ්ඩායම විසින් ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට පත් කිරීමේ හේතුව මත ඔවුන්ට එරෙහිව විනය කටයුතු සිදු කිරීම නිර්දේශ කරනු ලබයි.

03. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන පරිදි සේපාල රත්නායක නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ තනතුරෙහි සේවයේ පිහිටුවීම කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ලන්ඩන් ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය තනතුරේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සහ හිටපු ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් යන තනතුරු දැරූ ලලිත් සේපාල රත්නායක මහතා (මින් ඉදිරියට සේපාල රත්නායක යනුවෙන් හඳුන්වනු ලබයි) විසින් 2020.07.09 වන දිනැතිව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබිණි. එම පැමිණිල්ල 1842/20 වශයෙන් කොමිෂන් සභාව ඉදිරියේ ලියාපදිංචි කරනු ලැබිණි.

සේපාල රත්නායක 1988/1989 අධ්‍යන වර්ෂයේදී ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුලත් වී වර්තමානයේ 1993 ජූනි 10 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී කොළඹ 12 අළුත්කඩේ අධිකරණ කළාපයේ නීතිඥවරයෙකු ලෙස කටයුතු කළ අතර, එම කාලයේ දී ජනාධිපති නීතිඥවරුන් වන ඩී.එස්. විජේසිංහ, කාලිංග ඉන්ද්‍රතිස්ස සහ ජ්‍යෙෂ්ඨ නීතිඥ චන්න ගුණරත්න යන මහත්වරුන් යටතේ පුද්ගලික නීති වෘත්තියේ යෙදෙමින් වෘත්තීය නිපුණතාවය සහ අත්දැකීම් ලබා

ඇත. තවද සේපාල එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිධරයෙකි.

1998 වසරේ සිට නීතිපති දෙපාර්තමේන්තුවේ ලඝු නොවන නඩු විභාග ඒකකයේ රජයේ නීතිඥවරයෙකු ලෙස සේවය ආරම්භ කිරීමෙන් අනතුරුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි 2000/07/03 දින සිට ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවේ තාවකාලික වැඩබලන රජයේ අධිනීතිඥ තනතුරෙහි සේවය ආරම්භ කරන ලදී. ඉන් අනතුරුව 2001/07/03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු රජයේ අධිනීතිඥ තනතුරෙහි ස්ථිර කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2002/04/19 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක A/3/27/178 දරණ ලිපිය මගින් කටයුතු කරන ලද අතර, සේපාල රත්නායකගේ එකී තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තරනතුරකි. 2001.07.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු එකී තනතුරේ ස්ථිර කරන ලදී. සේපාල රත්නායක නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කළ කාලය තුළ කොළඹ ඇතුළු ලංකාවේ මහාධිකරණ රාශියක ද 2003 වසර පුරාම ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ ද නීති කටයුතු මෙහෙයවමින් යුක්තිය සහ සාධාරණත්වය ඉටු කරනු පිණිස අධිකරණ පද්ධතියට සහාය වූ අතර, සේපාල රත්නායකගේ සේවය බොහෝ අවස්ථාවල ඇගයීමට ලක් වූ බව එවකට අධිකරණ ක්ෂේත්‍රයේ සිටි ගරු විනිසුරුතුමන්ලාද නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද නීති ක්ෂේත්‍රයට සම්බන්ධ ජනාධිපති නීතිඥවරුන් ඇතුළු අනෙකුත් බොහෝ නීතිඥවරුන් අතර ප්‍රකට කරුණකි.

එනයින්ම ඔහුගේ වෘත්තීය දිවියේ තවත් කඩඉමක් පසු කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ අංක PSC/APP/07/288/2012 හා 2012.11.30 දිනැති ලිපිය මඟින් සේපාල රත්නායක ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ තනතුරට පත් කරන ලදී. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවට සම්බන්ධව නීති ක්ෂේත්‍රය තුළ සිදුකරන ලද කීර්තිමත් රාජ්‍ය සේවය හේතුකොටගෙන 2005 නොවැම්බර් මස 19 දින මෙරටV වන විධායක ජනාධිපති ධූරයට පත් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් සේපාල රත්නායකව එතුමාගේ කාර්යමණ්ඩලයට බඳවා ගැනීමට තීරණය කරන ලදුව ජනාධිපති ලේකම්ගේ අංක ADF/A/7/2005/22 හා 2006/05/05 සහ 2006.05.19 දිනැති ලිපි මඟින් සේපාල රත්නායකව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරකට පත් කරන ලදී. එකී තනතුරට පත් කිරීමෙන් පසුව සේපාල රත්නායක කොළඹ 01, ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ කොළඹ 03, අරලියගහ මන්දිරයේ ස්ථානගත කර ඔහු වෙත ජනාධිපතිවරයාගේ නීති කටයුතු සම්බන්ධිකරණය පවරන ලද අතර ඔහු අග්‍රාමාත්‍ය කාර්යාලය,අධිකරණ අමාත්‍යාංශය, ආණ්ඩුකාර කාර්යාල, ප්‍රධාන අමාත්‍ය කාර්යාල සහ පළාත් සභා, පළාත් පාලන ආයතන ඇතුළු සියළු ආයතන ද රේඛීය අමාත්‍යාංශ හා පළාත් අමාත්‍යාංශ, රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල ආදී සියළු ක්ෂේත්‍ර වල අවශ්‍ය අවස්ථාවලදී සම්බන්ධිකරණ කටයුතු හා උපදේශාත්මක කටයුතු වල නිරත වෙමින් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන රාජ්‍ය ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක

කිරීම සඳහා මහඟු සේවයක් සිදු කරන ලදී. එම කාලය තුළ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ රාජ්‍ය සංචාර වල විදේශ දූත මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කළ අතර විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සැසිවාර වලට පවා සහභාගී වී ජාත්‍යන්තර කටයුතු පිළිබඳව ද බොහෝ අත්දැකීම් ලබමින් ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් විශේෂ සේවයක් කරනු ලැබ ඇත. 2010 ජනාධිපතිවරණයෙන් දෙවන වරටත් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විධායක ජනාධිපති ධූරයට පත් වීමෙන් පසුව ජනාධිපති ලේකම්ගේ අංක A&O/AT/2010(7) සහ 2010/12/30 දිනැතිලිපිය මඟින් සේපාල රත්නායකව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාර්ය මණ්ඩලයේ නීති කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා ලෙස නැවතත් පත් කරන ලද අතර ඉහත පරිදිම ඔහුගේ සේවය උපරිම ලෙස ජනාධිපතිවරයාටත්, ලක් රජයටත් ඉටු කරන ලදී.

අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ දෙවන ධූර කාලය තුළ දී විධායකය සහ අධිකරණයේ සංවරණ සහ තුලන ක්‍රමයේ ගැටළු සහගත තත්ත්වයක් නිර්මාණය වූ අවස්ථාවක එය රටේ මහත් ආන්දෝලනයකට ඉඩ ප්‍රස්ථා විවර කෙරිණි. මෙම අවස්ථාවේ දී සේපාල රත්නායක විසින් දරණ ලද තනතුර හේතුවෙන් ඔහු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ වැඩපිළිවෙල එනම් විධායකය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන බවට නීති ක්ෂේත්‍රය තුළ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ වැඩ පිළිවෙලට එරෙහි කණ්ඩායම විසින් මතයක් ගොඩ නැගූ අතර, එම කණ්ඩායමට අවශ්‍ය වූ පරිදි

විධායකය දුර්වල කර දේශපාලන පෙරලියකට යාමට යම් බාධාවක් වූයේ සේපාල රත්නායක විසින් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රාජ්‍ය වැඩ පිළිවෙල ඉදිරියට ගෙන යාමට දෙන ලද උපදේශාත්මක සහාය සහ ක්‍රියාකාරී සහාය බවට හඳුනාගත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට එරෙහි කණ්ඩායම සේපාල සමඟ විරසකයක් ගොඩනගාගත් අතර එම කණ්ඩායමට නීතිඥවරුන් ඇතුළු නීති ක්ෂේත්‍රයට සමීප බලසම්පන්න පුද්ගලයින් ගනණාවක් ඇතුළත් වූ බවත් මේ අවස්ථාවේදී ඔවුන්ගේ නම් ගම් හෙළි කිරීම සුදුසු නොවන බවට සේපාල රත්නායක අදහස් කරන බව ප්‍රකාශ කර ඇත. පසු කලෙක එම කණ්ඩායම 2015 ජනවාරි 8 දින සිදුවූ දේශපාලන බල පෙරළියේ දී ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට එරෙහිව දේශපාලන කටයුතු වල නිරත වූ අතර ඉන් පසුව පිහිටුවන ලද යහපාලන ආණ්ඩුවේ ක්‍රියාකාරී චරිත බවට පත් වූ බවද ඉන් කිහිප දෙනෙකු යහපාලන ආණ්ඩුව යටතේ පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පැවති දූෂණ මර්දන කමිටුවට සම්බන්ධව කටයුතු කර ඇති බවද සඳහන් කෙරේ.

සේපාල රත්නායක ඔහුගේ හෘද සාක්ෂියට එකඟව හා ඔහුගේ තනතුරට අයත් ඔහු වෙත පවරන ලද වගකීම් හා රාජකාරී කටයුතු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ සිදු කරන ලද අතර ඔහුගේ සේවය අඛණ්ඩව, කිසිදු විනය පරීක්ෂණයකට හෝ භාජනය නොවී, මූල්‍ය හෝ විෂමාචාර චෝදනාවකට ගොදුරු නොවී කාර්යක්ෂමව හා කලට වේලාවට ඉටුකළ හෙයින් සහ, විශේෂයෙන්ම රටෙහි එවකට පැවති LTTE ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ

මැතිතුමන්ට එතුමන්ගේ සහ පවුලේ අයට, රජයේ අමාත්‍යවරුන් ඇතුළු රජයේ ඉහළ නිලධාරීන්ට හා ආරක්ෂක හා වෙනත් අංශ වල උසස් නිලතල දැරූ පුද්ගලයින්ට තිබූ තර්ජන ද නොතකා නිවාඩු නොලබා දිර්ඝ කාලයක් ඉටු කරන ලද සේපාල රත්නායකගේ සේවයට ඇගයීමක් ලෙස අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නිර්දේශ මත 2013/10/12 හා 2013/10/31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව සේපාලව එක්සත් රාජධානියේ ලන්ඩන් නගරයේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය තනතුරට පත් කරන ලද අතර, 2013/11/20 දින එකී තනතුර භාර ගැනීම සඳහා ඔහු විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදා හරින ලදී. එක්සත් රාජධානියේ ලක්ෂ 4කට වැඩි ශ්‍රී ලාංකිකයින්ගේ සමාජ සුභසාධන කටයුතු, ගුවන් ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා වීසා බලපත්‍ර වලට සම්බන්ධිත කටයුතු, උපත් හා මරණ ලියාපදිංචිය වැනි කටයුතු ද විදේශ ධූත කණ්ඩායම් සමඟ සම්බන්ධිකරණය සහ එක්සත් රාජධානියේ වැසියන් ශ්‍රී ලංකාවට පැමිණීමේදී වීසා බලපත්‍ර නිකුත් කිරීම් ද ඇතුළු භාරදූර වගකීම් රාශියක් දරමින් ද එරට වෙසෙන සියළු ශ්‍රී ලාංකික ජන කොට්ඨාශ අතර සාමය හා සංහිඳියාව පවත්වාගෙන යාම සඳහා ඉතා කෙටි කාලයක් තුළ සුවිශේෂී මෙහෙවරක් සිදු කරමින් සිටින ලදී. 2015/01/08 දින පැවති ජනාධිපතිවරණයෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා බවට පත් වීමෙන් පසුව පත්වූ “යහපාලන” ආණ්ඩුව අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ පාලන කාලය තුළ කැපී පෙනෙන රාජ්‍ය සේවයක් සිදු කරන ලද එවකට රාජ්‍ය තාන්ත්‍රික සේවයේ යෙදී සිටි කීර්තිමත් තානාපති නිලධාරීන් ආපසු මෙරටට කැඳවීමට කටයුතු කරන ලදී.

ඒ අනුව 2015/11/29 දිනට අවසන් කිරීමට තිබූ සේපාලගේ මූලික රාජ්‍ය තාන්ත්‍රික සේවා කාලය කිසිදු සාධාරණ හේතුවක් සහ හේතු දැක්වීමකින් තොරව ඒකපාර්ශ්විකව කරන ලද තීරණයක් ප්‍රකාරව 2015/03/10 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කර ඇති බැව් සඳහන් කරමින් 2015/02/05 දිනැතිව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද OM/PF/E5/3180 දරණ ලිපිය සේපාල රත්නායක වෙත ලන්ඩන්හී පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජ්‍ය මහකොමසාරිස් විසින් භාරදෙන ලදී. මෙකී ලිපියෙන් ගෙන තිබූ තීරණය සේපාල රත්නායක ලක් රජය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එළඹ තිබූ සේවා ගිවිසුමට මුළුමනින්ම පටහැනිවූ අතර එම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් නොවූ බව ද මෙලෙස සේපාල රත්නායකව ආපසු කැඳවීම 2015/01/08 දින සිදුවූ දේශපාලන වෙනස සමඟ ඇතිවූ හුදෙක් දේශපාලන න්‍යාය පත්‍රයක් මත සිදුවූ දේශපාලන පලිගැනීමක ආරම්භයක් බැව් ඔහු හට හැඟී ගිය බව සඳහන් කර ඇත. තවදුරටත් කරුණු සොයා බැලීමේදී සේපාල රත්නායක හට දැනගන්නට ලැබී ඇත්තේ, පොලොන්නරුව ප්‍රදේශයේ එක්තරා කාන්තාවක් විසින් ඇයගේ ස්වාමිපුරුෂයාට එරෙහිව පවුල් ආරවුලක් සම්බන්ධයෙන් 2015.01.01 දින යහපාලන ආණ්ඩුවෙහි ප්‍රබලයෙකුගේ මැදිහත් වීමෙන් කොළඹ ළමා හා කාන්තා කාර්යාංශයට කරන ලද පැමිණිල්ලක් හේතුවෙන් එකී ළමා හා කාන්තා කාර්යාංශය විසින් කරගෙන යනු ලබන විමර්ශනයකට යහපාලන ආණ්ඩුවේ දූෂන මර්දන කමිටුවේ අනුදැනුම ඇතිව මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ආරක්ෂක ප්‍රධානී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

එස්.එම්. වික්‍රමසිංහ මහතාගේ සහයෙන් ඔහුගේ කණිෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කරවාගෙන 2014 දෙසැම්බර් මාසයේ පොළොන්නරුව ප්‍රදේශයේ සිදුවූ එම පවුල් ආරවුලට අදාල සිද්ධිය විකෘති කර මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සමීපතයන්ගෙන් දේශපාලනිකව පළිගැනීමේ අරමුණ ඇතිව එම සිද්ධියට සේපාල රත්නායක සම්බන්ධ බව සහ එකී සිද්ධියට සේපාල රත්නායක ආධාර හා අනුබල දුන් බවට චෝදනාවක් ඉදිරිපත් කර ශ්‍රී ලංකාවට පැමිණි පසු ඔහුව අත්අඩංගුවට ගෙන නීති කෘත්‍යයක් ආරම්භ කර සිරගත කිරීමටත්, ඉන් අනතුරුව සේපාල රත්නායකව නීති වෘත්තියෙන් නෙරපා හැරීමට සැලසුමක් ඇති බවත්ය.

ඒ අනුව සේපාල රත්නායක දන්නා හඳුනන ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් හා ඔහුගේ සමීපතයන් බොහෝ දෙනෙකු ඔහු වෙත දැනුම් දී ඇත්තේ එම අවස්ථාවේ ශ්‍රී ලංකාවට පැමිණීම සුදුසු නොවන බවත් දේශපාලන පළිගැනීම ඉතා උග්‍ර අතට හැරෙමින් පවතින බැවින් සේපාල රත්නායක ලංකාවට පැමිණියහොත් ඔහුගේ ජීවිතයට පවා තර්ජන ඇතිවිය හැකි බවයි. විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සේපාල රත්නායකගේ සේවා කාලය 2015/03/10 වන දිනට අවසන් කරන බවට ගෙන තිබූ තීරණය වෙනස් කරවා ගැනීමට උත්සාහ කිරීමට ඔහු අදහස් කළද, එක්සත් රාජධානියේ එවකට සිටි වැඩ බලන ශ්‍රී ලංකා මහකොමසාරිස් ලෙස කටයුතු කළ සුදත් තල්පහේවා මහතා සේපාල රත්නායක වෙත ප්‍රකාශ කර ඇත්තේ පවතින දේශපාලන වටපිටාව යටතේ එවැනි උත්සාහයකින් ඵලක් නොවන බවත්, සේපාල රත්නායකව ශ්‍රී ලංකාවට ආපසු කැඳවීමේ තීරණය හුදෙක් දේශපාලන න්‍යාය පත්‍රයක් මත සිදුවන්නක් බවට ඔහුට ද පෙනී යන බවත්ය.

එබැවින් වෙනත් විකල්පයක් නොවූ බැවින් එම තීරණයට අවනත වෙමින් සේපාල රත්නායක විසින් ප්‍රධානත්වය දැරූ ආගමන, විගමන හා කොන්සියුලර් අංශයේ වැඩ කටයුතු ද රජය සතු සියළු බඩු බාහිරාදිය ද වැඩ බලන මහ කොමසාරිස් විසින් නම් කරන ලද වෙනත් තානාපති නිලධාරියෙකුට නිසි පරිදි භාර දීමට කටයුතු කරන ලදී. මේ අතරතුර 2015/03/09 දින එවකට ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිව සිටි ගරු මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා රාජ්‍ය නිල සංචාරයක් සඳහා ලන්ඩන් නගරයට පැමිණීමට නියමිතව තිබුණි. ආගමන විගමන අංශයේ ප්‍රධානියා ලෙස සේපාල රත්නායක වෙත සාමාන්‍යයෙන් රජයේ විශේෂ නියෝජිතයින් එරටට පැමිනෙන විට පිළිගැනීම, ඔවුන්ගේ ගුවන් ගමන් බලපත්‍ර වලට අදාළ සියළු කටයුතු හා වෙනත් ආනුෂාංගික කාරණා වලට අදාල විශේෂ රාජකාරී පැවරී තිබුණු නමුත්, 2015/03/01 දින ලන්ඩන් නුවරට පැමිණි ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ ආරක්ෂක ප්‍රධානී, හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එස්.එම්. වික්‍රමසිංහ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වූ පී.එම්. අම්සා මහතා යන නිලධාරීන් දෙදෙනා එවකට ලන්ඩනයේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ වැඩබලන මහකොමසාරිස් සුදත් තල්පහේවා මහතා හමුවී ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ ලන්ඩන් සංචාරයට අදාළව කිසිදු රාජකාරියකට සේපාලව සහභාගී කර නොගන්නා ලෙසට ඔහුට උපදෙස් දුන් බව වැඩ බලන මහකොමසාරිස් සුදත් තල්පහේවා මහතා විසින් 2015.03.02 දින සේපාල රත්නායක වෙත පුද්ගලිකවම දැනුම් දෙන ලදී.

මෙලෙස ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එස්.එම්. වික්‍රමසිංහ මහතා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සන්ධාන නිලධාරී පී.එම්. අම්සා මහතා විසින් කිසිදු සාධාරණ හා යුක්ති සහගත හේතුවක් නොමැතිව සේපාල රත්නායක තනතුරට අදාළ නියමිත රාජකාරී වලින් ඉවත් කිරීමට කටයුතු කිරීම දේශපාලන හේතු මත සහ ඉදිරි දේශපාලන හිංසනයක කොටසක් ලෙස ගන්නා ලද ඒකපාර්ශ්වික හා අත්තනෝමතික තීරණයක් බැව් සේපාල රත්නායක ප්‍රකාශ කර සිටී. කරුණු මෙසේ තිබිය දී 2015/03/04 දින ලන්ඩන් හී එඩ්ජ්වෙයාර් (Edgware) නගරයේ පිහිටි සේපාල රත්නායකගේ නිල නිවසේ තිබූ ඔහු හට අයත් බඩු බාහිරාදිය ලංකාවට එවීම සඳහා සකස් කරමින් සිටියදී ලන්ඩන් වේලාවෙන් සවස 5.00 ට පමණ වැඩ බලන මහකොමසාරිස් සුදත් තල්පහේවා මහතා දුරකථනයෙන් සේපාල රත්නායකව අමතා වහාම මහකොමසාරිස් කාර්යාලයට පැමිණෙන ලෙස දැනුම් දුන් අතර ඒ අනුව ලන්ඩන් වේලාවෙන් සවස 6.00 ට පමණ ඔහු ලන්ඩන් හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ දී එතුමා පුද්ගලිකවම මුණ ගැසුණි. එම හමුවේ දී වැඩ බලන මහ කොමසාරිස් සුදත් තල්පහේවා මහතා සේපාල රත්නායක වෙත ප්‍රකාශ කර සිටියේ කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඊට ටික වේලාවකට පෙර ලිපියක් ලැබුණු බවත් එය සේපාල වෙත භාර දීම සඳහා කැඳවන ලද බවත්ය. වැඩ බලන මහ කොමසාරිස් සුදත් තල්පහේවා මහතා එලෙස ප්‍රකාශ කරමින් සේපාල රත්නායක වෙත ලිපියක් භාර දුන් අතර එහි සඳහන්ව තිබුණේ 2015/03/10 දිනට සේපාල රත්නායකගේ සේවා

කාලය අවසන් කිරීමට කලින් ගත් තීරණය වෙනස් කර 2015/03/04 දින සිට ඔහුගේ සේවා කාලය අවසන් කර ඇති බවයි.

ඒ සමගම තවදුරටත් වැඩ බලන මහ කොමසාරිස් සුදත් තල්පහේවා මහතා වාචිකව සේපාල රත්නායක වෙත ප්‍රකාශ කර සිටියේ "මේ මොහොතේ සිට තානාපති කාර්යාලය ඔබට තහනම් ප්‍රදේශයක් බවත්, එබැවින් තානාපති කාර්යාලයෙන් ඉවත්ව යන ලෙසත් නිල නිවස ද වහාම භාර දෙන ලෙසත්" ය. මෙම ලිපිය මඟින් ගෙන තිබූ තීරණයත්, වැඩ බලන මහ කොමසාරිස් සුදත් තල්පහේවා මහතා සේපාල රත්නායක වෙත කරන ලද දැනුම් දීමත් විශ්ලේෂණය කිරීමේදී සේපාල වෙත එල්ල වී ඇති දේශපාලන පළිගැනීමේ තීව්‍රතාවය කොමිෂන් සභාවට අවබෝධ වේ. මෙම අනපේක්ෂිත දැනුම් දීමෙන් සේපාල රත්නායක මහත් විශ්මයට හා කම්පනයට පත් වූ අතර කිසිදු හේතුවක්, විමර්ශනයක් හෝ වග විභාගයක් නොමැතිව ඒකපාර්ශ්විකව කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් යම් පුද්ගලයකුගේ හෝ කණ්ඩායමක දේශපාලන උවමනාව මත දූෂණ මර්දන කමිටුවේ මෙහෙයවීමෙන් මෙලෙස කටයුතු කරන බැව් සේපාල රත්නායක හට වහාම අවබෝධ වූ අතර කොළඹ විදේශ කටයතු අමාත්‍යාංශයේ නිලධාරීන් සහ එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එස්.එම්. වික්‍රමසිංහ ඇතුළු කණ්ඩායම මෙලෙස කටයුතු කිරීම, රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයෙකු වූද, ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු වූද, තානාපතිසේවයේ අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කරමින් සිටි ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙකුට එරෙහිව කිසිසේත්ම නොකල යුත්තක් බව සේපාල

රත්නායක ප්‍රකාශ කර ඇත. තවද මෙලෙස සේපාල රත්නායක සම්බන්ධයෙන් කටයුතු කිරිම පහත් හා දුෂ්ඨ දේශපාලන පළිගැනීමක් වන අතර රාජ්‍ය තාන්ත්‍රික කටයුත්තක් සඳහා වලංගු හා නීත්‍යානුකූල සේවා ගිවිසුමක් මත විදේශ රටක සේවය කරමින් සිටි රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියෙකු සතු වරප්‍රසාද පිළිබඳවද කිසිදු මායිමක් නොකර කිසිදු හේතුවක් හෝ වග විභාගයක් නොමැතිව විදේශ රටක හිටි හැටියේ මෙලෙස අතරමං හා හුදකලා කර දුෂ්ඨ සහ බරපතල දේශපාලන පළිගැනීමක් සිදු කරමින් සේපාලගේ මූලික මිනිස් අයිතිවාසිකම් අමුඅමුවේ උල්ලංඝනය කළ බවත් ඔහු කියා සිටි. එලෙසම ඔහු දන්නා තරමින් ශ්‍රී ලංකා විදේශ සේවා ඉතිහාසයේ මෙවැනි සිදුකිරීමක් කල බවට මීට පෙර වාර්තා වී නොමැති අතර මෙය ඉතා පහත් චේතනාවකින් හිංසා කිරීමේ දුෂ්ඨ අරමුණ ඇතිව කරන ලද බරපතල දේශපාලන පළිගැනීමක් බවට තීරණය කිරීමට මෙම ක්‍රියාවම ප්‍රමාණවත් බව සේපාල රත්නායක ප්‍රකාශ කර ඇත. යහපාලන අණ්ඩුවේ දූෂණ මර්දන කමිටුවේ මෙහෙයවීමෙන් විදේශ කටයුතු අමාත්‍යාංශ නිලධාරීන් හා දේශපාලන බලධාරීන් ගත් මෙම තීරණය බලය නොමැතිව, බලය අනිසි ලෙස යොදමින් අත්තනෝමතිකව ගන්නා ලද තීරණයක් බව ද සේපාල රත්නායක තවදුරටත් ප්‍රකාශ කර සිටී.

2015/03/04 දිනැති විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකී නියෝගය සම්පූර්ණයෙන්ම රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ නිලධාරියෙකුගේ සේවය අවසන් කරන හා සේවයෙන් මුදා හරින හෝ ස්ථාන මාරුවක් ලබා දෙන ක්‍රමවේදයට සම්පූර්ණයෙන්ම පටහැනි බවත්, එය කිසිදු

නෛතික බලයක් හෝ නොමැතිව සිදුකරන ලද්දක් බවත් සේපාල වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. සේපාල එම මොහොතේ ඉතා දැඩි කම්පනයට පත්වූ අතර මහකොමසාරිස් කාර්යාලයේ සිට දුම්රියකින් ඔහුගේ නිලනිවසට ගොස් ඔහුගේ බඩු බාහිරාදිය එක්සත් රාජධානියේ පදිංච සිටි සේපාල රත්නායකගේ මිතුරෙකු වූ යසසිරු පෙරේරාට භාර දී නිල නිවසේ යතුරු ද සේපාල රත්නායකගේ රාජකාරී හැඳුනුම්පත ද සුරැකිව තානාපති කාර්යාලයට භාර දීමට කටයුතු කිරීමට සලස්වා එදින රාත්‍රිය ඔහුගේ මිතුරෙකුගේ නිවසේ ගතකර ඇත. එදින රාත්‍රිය සේපාල රත්නායක ඉතාමත් නොසන්සුන්ව ගත කළ අතර ඊලඟට ඔහු විසින් ගත යුතු පියවර පිළිබඳව කල්පනා කරමින් සිටියදී සේපාල රත්නායකගේ දුරකථනයට අංකයක් රහිත (Unknown Number) දුරකථනයකින් ඇමතුමක් ලැබුණු අතර සේපාල එම ඇමතුමට පිලිතුරු ලබා දීමේදී අනෙක් පස කතා කල පුද්ගලයා නොහඳුනන පුද්ගලයෙකු වූ අතර සිංහල භාෂාවෙන් පරුෂ වචනයෙන් සේපාල රත්නායක වෙත බැණ වැදී "තෝ ලෝකෙ කොහේ සිටියත් තොට බේරෙන්න බැහැ තෝ හිරේ දාලා තොගේ රස්සාවත් නැතිකරනවා ඊට පස්සේ කරන දේ බලාගනින්" යැයි පැවසූ බවත්, එම වචන ඉතාමත්ම දැඩි තර්ජනාත්මක ස්වරූපයෙන් ප්‍රකාශ කළ නිසා සේපාල රත්නායක එම අවස්ථාවේදි ඉතාමත් බියට පත්වූ බවත් එකී තර්ජනයත්, ඒ දක්වා සිදුවූ සිද්ධි මාලාවත් අනුව සේපාල රත්නායකගේ ජීවිතයට බරපතල තර්ජනයක් ඇති බව ඉන් ඔහු පැහැදිලිවම වටහා ගත් බවත් ප්‍රකාශ කර ඇත.

මේ සියළු කරුණු කාරණා වලින් පැහැදිලිවම ඉතා තදබල ලෙස සේපාල රත්නායකගෙන් දේශපාලනික ලෙස පලිගැනීම සඳහා

කණ්ඩායමක් කටයුතු කරන බව සේපාල රත්නායකට හැඟී ගිය බැවින් ඔහු ලංකාවේ ඔහුගේ මිතුරන් කිහිප දෙනෙකුට හා නීති වෘත්තියෙහි කිහිප දෙනෙකුට එදින රාත්‍රියෙහිම කතා කර උපදෙස් පතා ඇත. එවිට සේපාල රත්නායක හට දැනගන්නට ලැබුණේ සේපාල රත්නායක 2005 වසරේ සිට 2015 දක්වා අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ කාර්ය මණ්ඩලයේ සේවය කිරීම හේතුකොටගෙන සේපාලව මහින්දවාදියෙකු ලෙස සැලකූ සහ මෙහි ඉහත සඳහන් කළ සේපාල සමඟ උරණ ව සිටි කල්ලි හා කණ්ඩායම් වල උසිගැන්වීම හා උවමනාව අනුව යමින් එවකට පැවති යහපාලන ආණ්ඩුවේ දූෂණ මර්දන කමිටුව විසින් සිදුකරමින් තිබූ දේශපාලන පලිගැනීම්වල සේපාල රත්නායකද විශේෂ ගොදුරක් බවට පත්ව ඇති බවයි.

ඒ වන විට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B20203/9/15 අංකය යටතේ විමර්ශනයක් ආරම්භ කර තිබුණු අතර දූෂණ මර්දන කමිටුවේ උපදෙස් අනුව ඒ වන විටත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂක අංශයේ කිහිපදෙනෙක් ද මාධ්‍ය අංශයේ කිහිපදෙනෙක් ද අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බන්ධනාගාරගත කර ඇති බව ද සේපාල රත්නායකට දැනගන්නට ලැබුණු අතර මෙම නීති කෘත්‍යයේ මූලික පදනම පවුල් ආරවුලක් වූ අතර එය වෙනත් ආකාරයකට හුවා දක්වා සේපාල රත්නායක ද ඇතුළු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සමීපතම නිලධාරීන් කිහිපදෙනෙකු ඉලක්ක කර දේශපාලන පළිගැනීමකට කටයුතු කරමින් තිබූ බව සේපාල රත්නායකට තවදුරටත් දැනගැනීමට ලැබුණි. තවද එලෙස අත්අඩංගුවට ගත් කිහිප දෙනෙකුට ඇප ලබා

නොදී දිගින් දිගටම රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කටයුතු යොදා තිබුණි. තවද එම නඩුවේ එකලොස් වන සැකකරු ලෙස නම් කර ඇති සංජය ප්‍රසාද් ජයමාන්න යන සැකකරුද එලෙස දිර්ඝ කාලයක් බන්ධනාගාර ගත කර තිබූ අතර විමර්ශන නිලධාරින් විසින් ඔහු ලවා සේපාල රත්නායක හට එරෙහිව ප්‍රකාශයක් සටහන් කර ගැනිමට උත්සහ කල බවත් ඔහුට එලෙස ප්‍රකාශයක් කරන ලෙසට බලපෑම් කල බවත් ඔහු සේපාල රත්නායක හට දූරකතනයෙන් දැන් වූ බවත් සේපාල මෙම නීති කෘත්‍යය අවසන් විමෙන් පසුව ශ්‍රී ලංකාවට පැමිණි පසු ඔහු පුද්ගලිකවම මේ බැවු සේපාල හට ප්‍රකාශ කල බවත් සේපාල රත්නායක ප්‍රකාශ කර ඇත. තවද වර්තමානයේ අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ ප්‍රධාන ආරක්ෂක කොට්ඨාශයට අනුයුක්ත සරත්චන්ද්‍ර ගුණතිලක මහතාද මෙම නීති කෘත්‍යයේ සැක කරුවෙකු ලෙස නම් කර තිබුණි.

ඒ වන විට සේපාල රත්නායක වෙත ශ්‍රී ලංකාවේ පැවති විවිධ දේශපාලන පලිගැනීම් හා හිංසා පිළිබඳව තවත් තොරතුරු ගලා ආ අතර ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු පවුලේ සාමාජිකයින්ගෙන් දේශපාලන පළිගැනීම් ආරම්භ වී තිබූ අතර පවුලේ කිහිපදෙනෙකු අත්අඩංගුවට ගැනීම සඳහා පිඹුරුපත් සකසමින් සිටින බවට විශ්වාසදායක තොරතුරු ලැබෙමින් පැවතුණි. එසේම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට සමීපතම රාජ්‍ය නිලධාරීන් විශාල සංඛ්‍යාවකට එරෙහිව පරීක්ෂණ කටයුතු ආරම්භ වී ඇති බව ද එය ඉතා දරුණු පලිගැනීම් තත්ත්වයකට පත්වෙමින් තිබෙන බවටද තොරතුරු ලැබෙමින් පැවතුණි. මෙම තොරතුරු සත්‍ය බව පසු කාලයේ දී පැහැදිලි වූ අතර පූජ්‍ය උඩුවේ ධම්මාලෝක නාහිමියන් ඇතුළු මහා

සංඝයා වහන්සේලා කිහිප නමක් ද විමල් වීරවංශ, ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇතුළු හිටපු කැබිනට් අමාත්‍යවරු කිහිපදෙනෙක් ද, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක්ද, ගරු බැසිල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ සහ යෝෂිත රාජපක්ෂ ඇතුළු රාජපක්ෂ පවුලේ කිහිප දෙනෙක් ද, ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ ඉහළම නිලධාරීන් සහ බුද්ධි අංශ නිලධාරීන් බොහෝ දෙනෙක් එලෙස අත්අඩංගුවට පත් වූ අතරම හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා සහ හිටපු ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී ගාමිණී සෙනරත් මහතා ඇතුළු රාජ්‍ය නිලධාරීන් රාශියක්ද අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බන්ධනාගාරගත කර විවිධාකාර නීති කෘතීන් පවත්වාගෙන යාමෙන් එම අවස්ථාවේ දී ලැබුණු තොරතුරු සත්‍ය බව පැහැදිලි විය.

සේපාල රත්නායක ශ්‍රී ලංකාවට පැමිණ නැවත රාජ්‍ය සේවයට සම්බන්ධව රාජකාරී කටයුතු කිරීම ඔහුගේ ඒකායන අරමුණ වී තිබුණ ද 2015/03/04 දින සේපාල රත්නායකව තානාපති කාර්‍යාලයෙන් නෙරපා හැරීමේ සිද්ධිය හා සේපාල වෙත ලැබුණු තර්ජනාත්මක දුරකථන පණිවිඩය කොපමණ බරපතල වූයේද යත් ඉන් සේපාල රත්නායකට හැඟී ගියේ සේපාල රත්නායක පෙරලා මවුබිමට එම අවස්ථාවේදි පැමිණියේ නම් සේපාල රත්නායකගේ ජීවිතයට බරපතල ප්‍රශ්න මතු විය හැකි බවයි. යහපාලන රජයේ දේශපාලන බලධාරීන් යටතේ ක්‍රියාත්මක වූ දූෂණ මර්ධන කමිටුව හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ මෙම අත්තනෝමතික හා දැඩි බලහත්කාරී හිංසන ක්‍රියාවේ ප්‍රතිඵලය වූයේ ඔහුගේ කැමැත්තක්

නොමැතිව වුවද වෙනත් විකල්පයක් නොවූයෙන් එම අවස්ථාවේ ශ්‍රී ලංකාවට පැමිණීම වහාම කල් දැමීමට සිදුවීමයි. එම තීරණය ඔහුගේ ජීවිතය බේරා ගැනීම සඳහා අවස්ථාවෝචිතව හා හෘද සාක්ෂියට එකඟව ගන්නා ලද මානුෂීය තීරණයක් බැව් සේපාල රත්නායක ප්‍රකාශ කර සිටී. ඉන් අනතුරුව සේපාල රත්නායක කිසිවෙකුටත් නොදන්වා ඉන් පසු දිනම ලන්ඩනයෙන් බැහැරව ප්‍රංශය බලා පිටත්ව ගොස් ඇත. එලෙස ප්‍රංශයට යාමේ සේපාල රත්නායකගේ අරමුණ වූයේ ප්‍රංශයේ සිට ඉතාලියට යාම විය. විශේෂයෙන්ම සේපාල රත්නායක ලන්ඩනයේ රැඳී නොසිටීමට හේතුව වූයේ ඒ වන විට එහි ක්‍රියාත්මක වූ LTTE සංවිධානයට හිතවාදී දෙමළ ඩයස් පෝරාවේ කල්ලි හා කණ්ඩායම් සේපාල රත්නායක සමඟ උරණව සිටි බවට ඔහු වෙත තොරතුරු ලැබී තිබීමයි. එලෙස LTTE හිතවාදී දෙමළ ඩයස්පෝරාව විශේෂයෙන්ම සේපාල රත්නායක සමඟ විරසකව සිටියේ ඔහු අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් පත් කරන ලද මහින්ද රාජපක්ෂවාදියෙකු බවට ලන්ඩනයේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් කාර්යාලයේ සේවය කළ ඇතැම් නිලධාරීන් සහ ලන්ඩනයේ ජීවත් වන මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට දේශපාලනිකව විරුද්ධ කණ්ඩායම් විසින් ප්‍රසිද්ධ කොට තිබීමය. පසුව සේපාල රත්නායක වෙත ලැබුණු තොරතුරු අනුව ලන්ඩනයේ වෙසෙන ශ්‍රී ලාංකික පුවත්පත් වාර්තාකරුවෙකු වූ සුජීව නිවුන්හැල්ල යන අය විසින් 2015.03.08 වන දින දිවයින ඉරිදා සංග්‍රහය (ONLINE EDITION) හි පලකල පුවතකට අනුව සේපාල රත්නායක දෙමළ ඩයස්පෝරාවට එරෙහිව කටයුතු කළ බව දක්වා තිබීම තුළින් මෙම කරුණ පැහැදිලි වේ. එලෙසම එවැනි පුවතක් ලන්ඩනයේ

පුවත්පතක පල කිරීම ද සේපාලගේ ජීවිතයට තර්ජනයක් සිදු කිරීම සඳහා හිතාමතාම එවකට ශ්‍රී ලංකාවේ සේපාල රත්නායක හට විරුද්ධව දේශපාලනික කල්ලි හා කණ්ඩායම් හා එක්ව වංක සහයෝගයෙන් කරන ලද්දක් බව සහ එය මෙම දේශපාලන පළිගැනීම් කුමන්ත්‍රණයේ තවත් පියවරක් බව ද සේපාල රත්නායක ප්‍රකාශ කර ඇත.

මෙම කරුණු කාරණා පිළිබඳව සලකා බලා එම අවස්ථාවේදී ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකි වූයේ දෙමළ ඩයස්පෝරාව බහුලව ක්‍රියාත්මක වන එක්සත් රාජධානිය හා ප්‍රංශය වැනි රටවල ජීවත් වීම සුදුසු නොවන බවට ඇති වූ අදහස හේතුවෙන් සේපාල රත්නායක 2015.03.06 වන දිනම ඉතාලිය බලා පිටත් වුණි. විශේෂයෙන්ම ඉතාලිය සිංහල ශ්‍රී ලාංකිකයින් බහුලව ජීවත් වන සහ LTTE හිතවාදීන් ප්‍රබල ලෙස ක්‍රියාත්මක නොවන ආරක්ෂිත රටක් වන බැව් සේපාල රත්නායක ඒ වන විට හඳුනාගෙන තිබුණි. සේපාල රත්නායක විදේශ කටයුතු අමාත්‍යාංශයට ලිඛිතව දන්වා සිටියේ සේපාලගේ රාජ්‍ය සේවයේ මුල්පත්වීම ලද නීතිපති දෙපාර්තමේන්තුව වෙත සේපාල රත්නායකව මුදා හරින ලෙසයි. තවද සේපාල රත්නායක හට ශ්‍රී ලංකාවට පැමිණීමටත් එවැනි පරිවේශනයන් යටතේ කිසිවිටෙකත් නීතිපති දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කිරීමට නොහැකි වනු ඇති බවට සේපාල රත්නායක විශ්වාස කළ බැවින් ද ඔහු විදේශ රටක අතරමං වුවහොත් නොදන්වා රාජ්‍ය සේවය හැරයාම රාජ්‍ය නිලධාරියෙකුට සුදුසු නොවන ක්‍රියාවක් විය හැකි බැවින් ද රාජ්‍ය සේවයට ගරු කිරීම පිණිස 2015/03/31 වන දින සිට රාජ්‍ය

සේවයෙන් ඉල්ලා අස්වන බැව් දන්වා ගරු නීතිපතිතුමා වෙත ලිපියකින් දැන්වීමට කටයුතු කරන ලදී.

මේ වන විට ඉහත සඳහන් කල කොළඹ ප්‍රධාන මහසේත්‍රාත් අධිකරණයේ B20203/09/15 දරණ නඩුවේ සැකකරුවෙකු ලෙස සේපාල රත්නායකගේ නමද ඇතුලත් කර විමර්ශන කටයුතු සිදු කර තිබූ අතර සේපාල රත්නායකගෙන් කිසිදු ප්‍රකාශයක් ලබා නොගෙන, කරුණු විමසීමක් නොකර දූෂණ මර්දන කමිටුවේ උවමනාව මත විමර්ශන නිලධාරීන් විසින් ඒකපාර්ශ්විකව සේපාල රත්නායකව සැකකරුවෙකු ලෙස නම් කිරීම යුක්ති සහගත නොවන බව ද ඔහු ප්‍රකාශ කර සිටී. ඔහුව පිටරටකදී අත්අඩංගුවට ගැනීමටත් ශ්‍රී ලංකාවට පැමිණියහොත් කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේදීම අත්අඩංගුවට ගැනීමටත් සැලසුම් කර තිබුණු අතර පුරවැසියෙකුට නිදහසේ පෙරළා තම මව්බිමට පැමිණීමට තිබූ මූලික අයිතියද සේපාල රත්නායකට අහිමිකර තිබීම මඟින් ඔහුගෙන් දේශපාලනික ලෙස පලිගැනීමට ක්‍රියා කිරීමේ තීව්‍රතාවය පැහැදිලි වන්නේ යැයි සේපාල රත්නායක ප්‍රකාශ කර සිටී. මේ අතරතුර දූෂන මර්දන කමිටුවේ බලපෑම අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුවත්පත් කිහිපයක සහ රූපවාහිනී නාලිකා කිහිපයක සේපාල රත්නායකව අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය සැකකරුවෙකු බව සඳහන් කර තිබූ අතර විමර්ශන නිලධාරීන් කිසිදු යුක්ති සහගත හේතුවක් නොමැතිව ශ්‍රී ලංකා පොලිසියේ ඉල්ලීම පරිදි ඉන්ටපෝල් පොලිසිය හරහා රතු නිවේදනයක් නිකුත් කර තිබීමත් ශ්‍රී ලංකාව තුළ විවෘත වරෙන්තුවක් නිකුත් කර ගුවන් ගමන් අත්හිටුවා තිබීමත් යන කාරණා වලින් පැහැදිලි වන්නේ දේශපාලනිකව සේපාල රත්නායකගෙන් පලිගැනීමට කොතරම් දැඩි උවමනාවක් තිබුණේද

යන්නයි. කෙසේ වෙතත් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ B20203/09/15 දරණ නඩුවේ පැමිණිලිකාරිය වූ දිසානායක මුදියන්සේලාගේ චමිලා කුමාරි දිසානායක විසින්ම තම ස්වාමිපුරුෂයාට විරුද්ධව 2015.01.01 දින ළමා හා කාන්තා කාර්යාංශයට කරන ලද පැමිණිල්ලට අදාළ මහේස්ත්‍රාත් අධිකරනයේ (නඩු අංක 20203/09/15), කොළඹ මහාධිකරණයේ ( නඩු අංක Rev255/15) සහ අභියාචනාධිකරනයේ ( නඩු අංක C.A PHC APN No 049/2016) සිදු කෙරෙන ලද ඉල්ලීමක් මගින් ඉල්ලා අස්කර ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් එම පැමිණිල්ල මත පිහිටා තවදුරටත් දේශපාලනිකව ලෙස සේපාල රත්නායකගෙන් පලිගැනීමට නොහැකි වූ අතර, ඒ අනුව නීතිපතිවරයා විසින් 2016.09.02 දින ළමා හා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂ වෙත උපදෙස් දී තිබූයේ සේපාල රත්නායක ඇතුළු සැකකරුවන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීමට අදහස් නොකරන බැවින් සේපාල රත්නායක ඇතුළු සැකකරුවන් සියළු දෙනාම නිදහස් කිරීමට අධිකරණය වෙත දැන්විය යුතු බවයි. ඒ අනුව නීතිපතිවරයාගේ උපදෙස් මත 2016/09/20 දින සේපාල රත්නායක ඇතුළු සියළුම සැකකරුවන් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය විසින් නිදහස් කරනු ලැබිණි. තවද සේපාල රත්නායකට එරෙහිව පනවා තිබූ ගුවන් ගමන් තහනම ඉවත් කරනු ලැබූ අතර ඔහු අත්අඩංගුවට ගැනීමට නිකුත් කර තිබූ විවෘත වරෙන්තුව ආපසු කැඳවීමට නියෝග කරන ලදී.

ඒ අනුව දක්වා ඇති කරුණු ප්‍රකාරව යථෝක්ත දේශපාලන දඩයම හේතුවෙන්; වෙනත් කිසිදු පිළියමක් නොතිබූ හෙයින් සේපාල

රත්නායකගේ කීර්තිමත් රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වීමට ඔහුට සිදු වූ බවත්, සේපාල රත්නායක විසින් උපයා ගත් රාජ්‍ය හා රාජ්‍ය තාන්ත්‍රික සේවයේ නාමයට හා සේපාල රත්නායකගේ වෘත්තිය ගරුත්වයට හානියක් සිදු වූ බවත්, අවම වශයෙන් නිශ්චිත විශ්‍රාම වයස වන අවුරුදු 60 දක්වා සේවයේ යෙදීම හා සේවා කාලය සම්පූර්ණ කිරීමේ අවස්ථාව අහිමි වූ බවත්, සේපාල රත්නායක සහ ඔහුගේ පවුලේ අය මානසිකව ඉතා දැඩි කම්පනයකට ලක් වූ බවත්, සේපාල රත්නායක හා ඔහුගෙන් යැපෙන පවුලේ සාමාජිකයින් ආර්ථික, සාමාජිය හා දේශපාලන වශයෙන් මෙන්ම මානසිකව ද දැඩි ලෙස පීඩාවලට පත් වූ බවත්, සේපාලගෙන් නීති වෘත්තියෙන් ලබා ගැනීමට තිබූ සුවිශේෂී ජයග්‍රහණ ගිලිහී ගිය බවත්, යන අකාර වලින් සේපාල රත්නායක හට පුද්ගලිකවත්, වෘත්තීය වශයෙනුත් අප්‍රතිකාරී හානියක් සිදු වන ලදැයි ඔහු ප්‍රකාශ කර සිටී.

සේපාල රත්නායක මෙම කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලද සහනයන් වූයේ 2015.03.31 දිනැතිව ඔහු හට රාජ්‍ය සේවයෙන් ඉවත් වීමට හේතු පාදක වූ හුදෙක් දේශපාලන හේතු මතම පදනම් විරහිත චෝදනා එල්ල කළ සිද්ධිය නිර්මාණ කළ දූෂන මර්දන කමිටුවේ සාමාජිකයන් හා පක්ෂගිව කටයුතු කල අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ හා ළමා හා කාන්තා කායීංශයේ නිලධාරීන්ට එරෙහිව විමර්ශනයක් සිදු කරන ලෙසත්, ද්වේශ සහගත ලෙස විමර්ශන කටයුතු සිදුකර නඩු පැවරීම සඳහා නීතිපතිවරයාගේ නිර්දේශ ලබා ගැනීමට උත්සාහ කළ ශ්‍රී ලංකා පොලීසියේ, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ හා ළමා හා කාන්තා කාර්යාංශයේ

නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, ඔහු නැවත ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වයට හානි නොවන පරිදි ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවේ සේවයේ පිහිටුවා හිඟ වැටුප්, අනෙකුත් වෘත්තිය දීමනා සහ වැටුප් වර්ධක සමග සියලු වරප්‍රසාද හා හිමිකම් ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ කරන ලෙසටත්ය.

සේපාල රත්නායක ඔහුගේ රාජ්‍යය සේවයට අදාළ තාවකාලිකව වැඩ බලන රජයේ නීතිඥවරයෙක් වශයෙන් පත් කිරීමේ සිට එංගලන්තයේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය තනතුරට පත් වීම දක්වා වූ ලිපි මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2000.06.29 වන දින නීතිපති දෙපාර්තමේන්තුවේ යොමු අංක Ah/01/2000 දරණ පත්වීම් ලිපිය මගින් 2000.07.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේපාල රත්නායක නීතිපති දෙපාර්තමේන්තුවේ තාවකාලික වැඩ බලන රජයේ නීතිඥවරයෙකු ලෙස පත් කරනු ලැබ තිබිණි. අනතුරුව යොමු අංක ඒ/03/27/178 සහ 2002.04.19 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරන ලද පත් කිරීමේ ලිපිය මගින් සේපාල රත්නායක රජයේ අධිනීතිඥ තනතුරට පත් කරනු ලැබ ඇති අතර එය 2001.07.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කර තිබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබ ඇති යොමු අංක PSA/APP/07/288/2012 සහ 2012.11.30 දිනැති පත් වීමේ ලිපිය මගින් සේපාල රත්නායක ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ තනතුරට පත් කරනු ලැබ ඇත. එම පත් කිරීම සිදු කරනු ලැබ ඇත්තේ නීතිපති වෙනුවට ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ (පරිපාලන) විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක නි.පු

01/449 සහ 2009.01.21 දිනැති ලිපිය මගින් සේපාල රත්නායක රජයේ අධිනීතිඥ තනතුරෙහි ස්ථිර කරනු ලැබීමෙන් අනතුරුවය. ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසින් ඔහුගේ අංක ඒ.ඩී.එෆ්/ඒ 07 2005 (22) සහ 2006.05.19 වන දිනැති ලිපිය මගින් සේපාල රත්නායක ජනාධිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන) තනතුරට පත් කරනු ලැබ ඇති අතර විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරකට පත් කරනු ලැබ ඇති පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි මෙම පත්වීම වෙනුවෙන් එලෙසම බලපැවැත්වෙන්නේ යැයි මෙම පත් කිරීමේ ලිපියේ සඳහන් වේ. නැවත ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසින් සේපාල රත්නායක හට ලබා දී ඇති යොමු අංක A&O/A07/210(07) සහ 2010.12.30 දිනැති පත් කිරීමේ ලිපිය මගින් ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(01) අනු ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2010.11.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු වූ (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන) වශයෙන් ජනාධිපති කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අනු ව්‍යවස්ථාව පනවනු ලැබ ඇත්තේ ජනාධිපතිවරයාගේ කාර්යය මණ්ඩලය සම්බන්ධයෙනි. 41(01) ව්‍යවස්ථාව අනුව අමාත්‍යාංශ ලේකම්වරුන්ද තම මතය අනුව ජනාධිපතිවරයාගේ කාර්යය සහ කර්තව්‍යයන් ඉටු කරනු ලැබීම පිණිස අවශ්‍ය වන්නා වූ නිලධාරින් තම කාර්යය මණ්ඩලයට පත් කර ගැනීමට බලය සලසා දී තිබේ. 41(05) ව්‍යවස්ථාවට අනුව 41(04) ව්‍යවස්ථාව අනුව නව ජනාධිපතිවරයෙකු සිය තනතුර භාර ගනු ලබන

අවස්ථාවේදී එතෙක් ජනාධිපතිවරයාගේ කාර්යය මණ්ඩලයේ කටයුතු වල අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහ කාර්යය මණ්ඩලයේ සාමාජිකයින්ගේ තනතුරු අහෝසි විය. එසේ වුවද 41(05) ව්‍යවස්ථාවේ අතුරු විධානයට අනුව එසේ තනතුරු අහෝසි වන අමාත්‍යාංශ ලේකම්වරු හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් එම තනතුරු වලට පත් කිරීමට පෙරාතුව සිටි ආසන්නතම තනතුරට පූර්ව තනතුරට පත් වන අතර එම පත්වීම එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨතාවය සහිතව සිදු විය යුතුයි. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(05) ව්‍යවස්ථාව අනුව සේපාල රත්නායක මහතා 2015.01.08 වන දින සිට ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ තනතුරට පත් වන අතර එය ඔහුට හිමිවිය යුතුව තිබූ සියලු උසස්වීම් සහිතව විය යුතුය.

සේපාල රත්නායක මුදා හරිනු ලැබ ඇත්තේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඔහු වෙත ලබා දී ඇති පත්වීමක් අනුව ලන්ඩන්හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ අමාත්‍යවරයෙක් වශයෙන් රාජකාරි බාර ගැනීම සඳහා යථෝක්ත පත්වීම ලබා දී ඇත්තේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ යොමු අංක OM/E05/38/213 සහ 01.11.2013 දරණ ලිපිය මගිනි. එම ලිපිය මගින් අදාළ පත් කිරීම් සිදු කරනු ලැබ ඇත්තේ එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි වේ. ඒ අනුව ජනාධිපති අතිරේක ලේකම් (ආයතන හා මෙහෙයුම්) විසින් ලබා දී ඇති යොමු අංක E&O/HR/01/2005(22) සහ 2013.11.20 දිනැති ලිපිය මගින් සේපාල රත්නායක මුදා හරිනු ලැබ ඇත්තේ වහාම ක්‍රියාත්මක වන පරිදි වේ. මෙම මුදා හැරීම සිදු කරනු ලැබ ඇතේත් ජනාධිපති ලේකම්

වෙනුවෙන් වූ හෙයින් ඔහු තවදුරටත් ජනාධිපති කාර්යය මණ්ඩලයට අනියුක්තව විදේශ දූත මණ්ඩල සේවයේ යෙදී සිටින ලද සේ සැලකීමට සිදු විය. එසේ හෙයින් 2015.01.08 වන දින විටත් සේපාල රත්නායක ජනාධිපති කාර්යය මණ්ඩලයට අනියුක්තව සේවයේ යෙදී සිටින ලද සහ ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ව්‍යවස්ථාව අදාළ වන්නා වූ තැනැත්තෙක් ලෙස සැලකිය යුතුයි. කෙසේ වෙතත් විදේශ කටයුතු අමාත්‍යංශය විසින් සේපාල රත්නායකගේ විදේශ සේවය අවසන් කරනු ලැබ ඇත්තේ එම අමාත්‍යාංශයේ යොමු අංක OM/PF/E5/3180 සහ 04.03.2015 දිනැති ලිපිය මගින් 04.03.2015 දින සිට ක්‍රියාත්මක වන පරිදි හෙයින් ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ තනතුරට ඔහුට හිමිව තිබිය යුතු උසස්වීම් සමග නැවත පත් වනුයේ එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි වේ. එසේ වුවද සේපාල රත්නායක හට එම දිනය වන විට නීතිපති දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කිරීමට පවා ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමටද නොහැකි ස්වභාවයේ වාතාවරණයක් නිර්මාණය වනු ලැබ තිබිණි. ඒ ඉහත විස්තර කරන ලද පරිදි යහපාලන රජයේ දූෂණ මර්දන කමිටුව විසින් ආරම්භ කරනු ලැබ තිබූ දේශපාලන පලිගැනීම් ඒ අවස්ථාව වන විටත් ඉතා ඉහල මට්ටමකින් ක්‍රියාත්මක වෙමින් පැවතීමත් සේපාල රත්නායක ඒ සඳහා තෝරා ගනු ලැබූ ගොදුරක් වී තිබීමත් හේතු වේ.

ලන්ඩන්හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයෙන් හිටිවනම පිටමන් කරනු ලැබ සිය රටට පැමිණීමටද නොහැකිව අසරණභාවයට පත් වනු ලැබ සිටි සේපාල රත්නායක නීතිපතිවරයා වෙත 2015.02.28 දිනැති ධූරයෙන් අස් වීමේ ලිපිය ලියා එවනු ලැබ ඇත්තේ විදේශයක

සිටිමින්ය. එය ඔහු සැබැවින්ම සේවයෙන් ඉල්ලා අස් වීමට තිබූ අවශ්‍යතාවයක් හෝ අදහසක් සහිතව සිදු කරන ලද්දක් නොව බරපතල පලි ගැනීමට ලක් වීමේ හේතුව මත වෙනත් විකල්පයක් නොමැති වීමෙන් සිදු කරන ලද්දක් විය. කරුණු මෙසේ හෙයින් සේපාල රත්නායක හට මුහුණ පෑමට සිදු වන ලද දේශපාලන පලි ගැනීම සුවිශේෂී කරුණක් ලෙස සලකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(5) ව්‍යවස්ථාවේ අතුරු විධානය පරිදි සේපාල රත්නායක නැවත සේවයේ පිහිටවිය යුතුය යන්න මෙම කොමිෂන් සභාව එළඹෙන නිගමනය වේ.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 19 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 .XLI

පැමිණිලි අංකය - 427/20

පැමිණිලිකරු - කුමුදුමාල් චන්දන පැල්පිට

ලිපිනය - 259/2/12, ආසිරි පෙදෙස, ඇරැව්වල, පන්නිපිටිය

## තීරණය

එවකට ජනාධිපතිතුමා විසින් පත් කරන ලද පරික්ෂණ කොමිෂන් සභාවක නිර්දේශ යටතේ සිදු කෙරෙන ලද විමර්ශන අනුව අධිචෝදනා පත්‍ර බාර දී ඇති බැවින් මෙම කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම නීත්‍යානුකූල නොවන බවට තීරණය කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

කුමුදුමාල් චන්දන පැල්පිට (මින් ඉදිරියට කුමුදුමාල් වශයෙන් හඳුන්වනු ලබයි.) පාසල් අධ්‍යාපනයෙන් පසු ඉන්දියාවේ දිල්ලි විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමණාකරනය පිළිබඳ උපාධිය හදාරනු ලැබිණි. ඔහුගේ පියා වන වජිර පැල්පිට දේශපාලන කටයුතු වලට සම්බන්ධ තැනැත්තෙකු වන අතර 1977 වර්ෂයේදී ලංකා සමසමාජ පක්ෂයෙන් කඩුවෙල ආසනයට තරග කරනු ලැබිණි. පසුව ඔහු බස්නාහිර පලාත් සභාවේ පලාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත් වනු ලදුව පලාත් සභා අමාත්‍යවරයෙක් වශයෙන් කටයුතු

කරනු ලැබ ඇත. පුවත්පත් කලාවේදියෙකුද වන වජිර පැල්පිට වරක් සිළුමිණ පුවත්පතෙහි කතෘවරයා වශයෙන් කටයුතු කරනු ලැබිණි. පියාගේ සම්බන්ධතා මත කුමුදුමාල් හට විවිධ රැකියා අවස්ථා හිමි වූ අතර ක්ෂමා ආයතනයේ උපාය මාර්ග කළමණාකාර ආයතනය යන කොටසෙහි මානව සම්පත් කළමණාකරු වශයෙන් කටයුතු කිරීමට කුමුදුමාල්ට අවස්ථාව ලැබෙන ලදී. අනතුරුව 2010 වර්ෂයේදී ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමණාකරු මානව සම්පත් වශයෙන් කටයුතු කිරීමට හැකි විය. පසුව ප්‍රිමියම් ටෙක්නොලොජි පුද්ගලික ආයතනයෙහි සාමාන්‍යාධිකාරි වශයෙන් පත් කර ගත් අතර දැනටද එම ආයතනයේ සේවය කරනු ලබයි.

කුමුදුමාල් පූර්ණ කාලීනව පෞද්ගලික අංශයේ සේවය කළද අර්ධ කාලීනව රාජ්‍ය අංශයන්හි ව්‍යාපෘතීන්හි කටයුතු කර ඇත. ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවය කළේ එලෙසිනි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි අර්ධ කාලින පදනම මත වශයෙන් එහි සේවය කළ අතර සතියකට දින 3ක් පැය කීපයක් සේවයෙහි යෙදිණි. ඒ සඳහා ඔහුට දීමනාවක් ගෙවන ලදී. එම පත්වීම ලබා දෙන ලද්දේ එවකට සිටි ධීවර අමාත්‍ය රාජිත සේනාරත්න මහතාගේ අනුග්‍රහය යටතේය. සංස්ථාවේ සභාපතිව සිටියේ උපාලි ලියනගේ මහතා විය. එය දේශපාලන පත් වීමක් බව කුමුදුමාල් කියා සිටින අතර ඔහු සුදුසුකම් ලැබ සිටියේ මානව සම්පත් කළමණාකරනය සම්බන්ධයෙන් වන හෙයින් එම අංශයට සහයෝගය දැක්වූ බව කියා සිටිනු ලැබිණි. මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් කිසිදු වගකීමක් තමා වෙත නොපැවතියේ යැයි කුමුදුමාල් කියා සිටින ලදී. 2014 වර්ෂයේ අවසාන භාගයේදී

රාජිත සේනාරත්න මහතා රජයෙන් ඉවත්ව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ප්‍රතිවිරුද්ධ ජනාධිපති අපේක්ෂකයා වන ලදින් ඔහුට අමාත්‍ය ධූරය අහිමි විය. එම අවස්ථාවේදී රාජිත සේනාරත්න මහතාගේ අධාරකරුවන් කුමුදුමාල් හට ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් ඉවත්ව රාජිත සේනාරත්න මහතා සමග එක් වන්නැයි ඉල්ලා සිටි නමුත් ඔහු ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් ඉවත් නොවී 2015.01.08 දින මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පරාජය වීමෙන් පසු කුමුදුමාල්ට ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් ඉවත්ව යාමට සිදු විය. පසු කාලයේදී මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධව සහ දිනපොත් මුද්‍රණයක් සම්බන්ධව කුමුදුමාල්ට එරෙහිව දෝෂාරෝපණයක් ඉදිරිපත් විය. එය ආරම්භ වූයේ සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂක නීල් මුණසිංහ විසින් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට සිදු කරන ලද පැමිණිල්ලක් මතය.

මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතිය 2014 වසරට හිටපු ජනාධිපති සහ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අයවැය යෝජනා වලින් ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපෘතියෙහි නීල් මුණසිංහ එකී ව්‍යාපෘතියෙහි අක්‍රමිකතා සිදු වන ලදැයි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට කරනු ලැබූ පැමිණිල්ල මත සිදු කළ පරික්ෂණ ඉදිරියට ගෙන යාමක් සිදු නොවිණි. කෙසේ වෙතත් 2015 ජනවාරි 08 දින පත් වූ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ බරපතල වංචා දූෂණ විමර්ශනය සඳහා වූ පරික්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ පෙත්සමක් මත මේ පිළිබඳව වූ විමර්ශන සිදු කෙරිණි. කුමුදුමාල් එම පරික්ෂණ කොමිෂන් සභාව වෙත කැඳවනු ලැබූ අතර මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය, මුල්ගල සමරු ඵලකය,

ටී ශර්ට්ස් සහ කැප් තොප්පි මුද්‍රණය, එම උත්සවයට එල්.ඊ.ඩී තිරයක් ලබා දීම සහ දිනපොත් මුද්‍රණය සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රශ්න කරනු ලැබිණි. වැඩිදුර විමර්ශන සිදු කිරීමට එම කොමිෂන් සභාවෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට නිර්දේශ කරනු ලදුව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් නැවත විමර්ශන පවත්වා නඩු පැවරීමක් සිදු කරනු ලැබ ඇත. කොළඹ මහාධිකරණයේ අංක HC58/2018 දරණ එම නඩුවෙහි කුමුදුමාල් ඇතුළු චූදිතයන් 06 දෙනෙකුට එරෙහිව අධිචෝදනා බාර දී ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 7 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .XLII

පැමිණිලි අංකය - 1070/2020

පැමිණිලිකරු - ලේකම් මුදියන්සේලාගේ තිස්ස විමලසේන

ලිපිනය - අංක. 172/1, රාජගිරිය පාර, රාජගිරිය.

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

තීරණය

තිස්ස විමලසේන මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සහ එතුමාගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් සමීපව දීර්ඝ කාලයක් තුළ සේවය කරනු ලැබීමේ හේතුවෙන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සහ එම පවුලේ සාමාජිකයින්ගේ පෞද්ගලික තොරතුරු තිස්ස විමලසේනගෙන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් යහපාලන රජයේ දේශපාලඥයින්ගේ මෙහෙයවීම මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, මූල්‍ය අපරාධ කොට්ඨාසය, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා පොලීසියේ වෙනත් පොලිස් කොට්ඨාස මඟින් වරින්වර ඔහු කැඳවා විවිධ කරුණු පිළිබඳව ප්‍රශ්න කරනු ලැබ අපේක්ෂා කළ පරිදි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පවුලේ සාමාජිකයින් හට එරෙහිව අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමේ උත්සාහය අසාර්ථක වීමේ

හේතුව මත තිස්ස විමලසේන දේශපාලන වශයෙන් පළිගැනීමකට ලක් කරනු ලැබ ඇති බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරනු ලබයි.

## නිර්දේශ

01. තිස්ස විමලසේන සැකකරුවෙකුව සිටින කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ ඇති බී/54100/05/16 නඩුවට ඔහු සැකකරුවෙකු කරනු ලැබ ඇත්තේ දේශපාලන වශයෙන් පළි ගැනීමට ලක් කිරීමට වන හෙයින් නීතිපතිවරයා මැදිහත්ව එම නඩු කටයුත්ත තිස්ස විමලසේන හට එරෙහිව වැඩිදුරටත් පවත්වාගෙන යාමට නොහැකි බවට අධිකරණයට වාර්තා කරනු ලැබීම සුදුසු බව කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

02. තිස්ස විමලසේන හිඟ වැටුප් සහිතව නැවත සේවයේ පිහිටුවීම සහ / හෝ ඔහුට හිමිවිය යුතුව තිබූ උසස්වීම්හි පිහිටුවා විශ්‍රාම ගන්වනු ලැබීම යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

03. තිස්ස විමලසේන හට බලපෑම් කරමින් අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම සඳහා ඔහුගෙන් අසත්‍ය ප්‍රකාශ ලබා ගැනීමට උත්සහ කරන ලද පොලිස් පරික්ෂක ප්‍රේමතිලක සහ පො.සැ 13590 යන පොලිස් නිලධාරින් ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට ලක් කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව / පොලිස් කොමිෂන් සභාව මගින් විනයානුකූලව කටයුතු කිරීමට පොලිස්පතිවරයා විසින් පියවර ගැනීම කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ලේකම් මුදියන්සේලාගේ තිස්ස විමලසේන (මින් ඉදිරියට තිස්ස විමලසේන යනුවෙන් හඳුන්වනු ලබන) 1988 වර්ෂයේදී ආධුනික සෙබල (රියදුරු) වශයෙන් ශ්‍රී ලංකා යුධ හමුදා සේවා බලකායට බැඳෙන ලදුව නියමිත පුහුණු පාඨමාලා හැදෑරීමෙන් පසුව 1991.08.07 වන දින සිට නිත්‍ය හමුදා සේවයට අනුයුක්ත කර ගනු ලැබ ඇත. 1994 වර්ෂය වන විට ඔහු බලලත් නිලධාරී අංක 1 ලෙස උසස් වීම් ලබා සිටින ලදි. එම වර්ෂයේදී තිස්ස විමලසේන කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යව සිටි වර්තමාන අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් අනුයුක්ත කරනු ලැබිණි. එවක පටන් 2015.08.14 දින දක්වා ඔහු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් කටයුතු කරන ලදි. 2007.08.22 වන දින සිට තිස්ස විමලසේන ශ්‍රී ලංකා යුධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබිණි. ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂක ඒකකයේ රාජකාරියේ යෙදී සිටියදී ඔහු ජනාධිපති ආරක්ෂක සේනාවේ සමීප ආරක්ෂක කණ්ඩායමේ ප්‍රවාහන නිලධාරී තනතුරට පත් කරනු ලැබ සිටින ලදි. ඔහු එම නිලයෙහි රාජකාරියේ යෙදී සිටි කාලය තුළ වසර 5ක් ඉකුත් වෙද්දි 2012.09.20 දින විට කපිතාන් නිලයට උසස් කරනු ලැබිණි. 2015.01.08 දින පැවති ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ මහතා සමඟ තරඟ වැදුනු ප්‍රතිවාදි අපේක්ෂකයා ජනාධිපති වීමෙන් අනතුරුව හිටපු ජනාධිපතිවරයා වශයෙන් මහින්ද රාජපක්ෂ මහතාට ලබාදී තිබූ ආරක්ෂක කණ්ඩායමේ නිලධාරියෙකු වශයෙන් තිස්ස විමලසේන රාජකාරියෙහි යෙදී සිටි අතර 2015.08.21 දින සිට ඔහු පලාලි ආරක්ෂක සේවා මූලස්ථානයට ස්ථාන මාරු කරනු ලැබිණි.

2016.04.04 වන දින සිට පනාගොඩ යුධ හමුදා සේවා බලකා මූලස්ථානය වෙත ස්ථාන මාරු කරන ලදින් එහි රාජකාරි වාර්තා කරන ලදි. 2015.08.21 දින පලාලි ආරක්ෂක සේනා මූලස්ථානයට ස්ථාන මාරු කරනු ලැබූ දිනයේ පටන් තිස්ස විමලසේන නොයෙකුත් අවස්ථාවලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවනු ලැබිණි. මුල් අවස්ථාවේදී ඔහුගෙන් ප්‍රශ්න කරනු ලැබූයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සමීප ආරක්ෂක කණ්ඩායමේ ප්‍රවාහන නිලධාරී ලෙස රාජකාරි යෙදී සිටියදී භාවිතා කරන ලද රථවාහන සම්බන්ධයෙනි. අනතුරුව වාසීම් තාජුඩීන් ඝාතනය සම්බන්ධයෙන් සිදු කෙරෙන ලද විමර්ශනයන්ට අදාළව ඔහුගෙන් ප්‍රශ්න කිරීම් සිදු කෙරෙණි. වරක් පලාලි යුධ හමුදා කඳවුරේ සේවය කරමින් සිටියදී කන්කසන්තුරේ යුධ හමුදා පොලිස් බලකායේ නිලධාරීන් විසින් තිස්ස විමලසේන අත්අඩංගුවට ගනු ලැබූ අතර එම අත්අඩංගුවට ගැනීමට හේතුව වශයෙන් පවසා සිටියේ මිනීමැරීමක් සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශනයකට අදාළව ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා බවයි. පොල්හේන්ගොඩ යුධ හමුදා පොලිස් බලකා මූලස්ථානය වෙත රැගෙන ගොස් දින 7ක කාලයක් රඳවා තබා ගනිමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂක රාජකාරිවල නිරතව සිටියදී සිදු කරන ලද රාජකාරි සම්බන්ධයෙන් ප්‍රශ්න කරනු ලැබූ අතර අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දීර්ඝ ලෙස ප්‍රශ්න කරනු ලැබ ඔහු මුදාහරිනු ලැබිණි. එහිදී තිස්ස විමලසේනගෙන් ප්‍රශ්න කරනු ලැබූයේ තාජුඩීන් ඝාතනය සම්බන්ධයෙන්ද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පවුලේ සාමාජිකයින් භාවිතා කරනු ලැබූ වාහන සම්බන්ධයෙන්ද වේ. තිස්ස විමලසේන පනාගොඩ යුධ හමුදා කඳවුරට

ස්ථාන මාරු කරනු ලැබ සිටි කාලයේදී ඔහුගේ බිරිඳ වන දිස්නා පෙරේරා මහත්මිය 2016.07.23 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවනු ලැබිණි. ඇයගෙන් වසීම් තාජුඩීන් ඝාතනය සම්බන්ධයෙන් විමසීම් කෙරෙන ලද අතර ඇයගෙන් තර්ජනාත්මකව ප්‍රශ්න කරමින් සැමියාට බේරුමක් ලබාදීමට නම් විමසනු ලබන ප්‍රශ්නවලට නිවරදිව පිළිතුරු ලබාදෙන මෙන් බලකරනු ලැබ ඇත. නැවත ද තිස්ස විමලසේන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවනු ලැබූ අතර පසුව වසීම් තාජුඩීන් ඝාතනය සම්බන්ධයෙන් විමසමින් නාරහේන්පිට පොලිස් ස්ථානය සහ ඩී අයි ජී අරුණ සේනානායක හට ශිරන්ති රාජපක්ෂ මැතිනිය විසින් දුරකථන ඇමතුම් ලබාදුන් බවටද නාමල් රාජපක්ෂ සහ යෝශිත රාජපක්ෂ වසීම් තාජුඩීන් ඝාතනය සිදු කළ බව තමා දන්නා බවට ප්‍රකාශ ලබාදෙන ලෙසට තිස්ස විමලසේන හට බලපෑම් සිදු කරනු ලැබිණි. තිස්ස විමලසේනගෙන් සහ ඔහුගේ බිරිඳගෙන් ද මෙලෙස ප්‍රශ්න කරනු ලැබ ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක සහ පොලිස් සැරයන් 13590 රත්නප්‍රිය යන නිලධාරීන් වේ. එබඳු කිසිවක් තමා නොදන්නා බව තිස්ස විමලසේන කියා සිටියදී එම නිලධාරීන් බලපෑම් සිදු කරන ලද්දෙ එලෙස ප්‍රකාශ ලබා නොදෙන ලදහොත් තිස්ස විමලසේන ට රිමාන්ඩ් බන්ධනාගාර ගත වීමට සිදුවන බව පවසමිනි. දීර්ඝ වෙලාවක් ප්‍රශ්න කිරීමෙන් අනතුරුව එම නිලධාරීන් දෙනො සහ උප පොලිස් පරීක්ෂක අයගම යන නිලධාරියා ද තිස්ස විමලසේන සමඟ ඔහුගේ රාජගිරියේ පිහිටි නිවසට පැමිණි අතර නිවස පරික්ෂා කොට ලියකියවිලි කිහිපයක් රැගෙන යන ලදි. තිස්ස විමලසේනගේ සහ ඔහුගේ බිරිඳගේ දුරකථන විශ්ලේෂණ වාර්තා ලබාගත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔවුන් දුරකථන

ඔවුන් දුරකථන ඇමතුම් ලබාගෙන තිබූ සියලුදෙනා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන්වා ප්‍රශ්න කරනු ලැබ ඇත.

ඒ අතර ඔවුන්ගේ මිතුරන් ද ඥාතීන් ද හිතවතුන් ද වනු ලැබිණි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ මෙම අත්තනෝමතික පහත් ක්‍රියාව හේතුවෙන් තිස්ස විමලසේන සහ ඔහුගේ බිරිඳ සමඟ නෑදෑ හිතවතුන් අමනාප වන ලදි. මෙසේ තිස්ස විමලසේනගෙන් ද ඔහුගේ බිරිඳගෙන් ද නෑදෑ හිතවතුන්ගෙන්ද තාජුඩීන් ඝාතනය ද ලසන්ත වික්‍රමතුංග ඝාතනයද සඳහන් කරමින් ප්‍රකාශ ලබා ගැනීම සිදු කරනු ලැබුයේ හුදේක ඔවුන් පීඩාවට පත් කරනු ලැබීමේ අරමුණෙන් යුතුව විය.

තිස්ස විමලසේන පලාලි යුධ හමුදා කඳවුරේ සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව ඔහුට කිසිදු රාජකාරියක් නොපැවරූ අතර නිවාඩු ලබා දීමක් ද සිදු නොකෙරිණි. වසර 27 ක සේවා කාලයක් සම්පූර්ණ කර සිටි බැවින් තිස්ස විමලසේන 2015.08.26 වන දින විශ්‍රාම යාමට ඉල්ලුම් කරනු ලැබුව ද ඔහුට දැනුම්දෙන ලද්දේ යුධ හමුදාපතිවරයා විසින් තිස්ස විමලසේන විශ්‍රාම ගැනීම අත්හිටුවා ඇති බවත්ය. යුධ හමුදාව තුළ ඔහු කිසිදු චෝදනාවකට ලක්ව නොසිටි අතර නිකැළැල් සේවය සම්බන්ධයෙන් උත්තම සේවා පදක්කම ලබා සිටින ලදි. වසීම් තාජුඩීන් ඝාතනය සම්බන්ධයෙන් තිස්ස විමලසේන ඇතුළු 6 දෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගැනීමට නියමිත බවට දෙමළ ඊලාම් විමුක්ති සංවිධානයේ වෙබ් අඩවියෙහි පළ කරනු ලැබූ අතර සිලෝන් ටුඩේ පුවත් වෙබ් අඩවියෙහි ද ඒ සම්බන්ධයෙන් පළ කරනු ලැබ තිබිණි. මේ හා සම්බන්ධව LTTE හිතවාදී වෙබ් අඩවිය මඟින් විශාල ප්‍රචාරයක් ඇති කරනු ලැබිණි.

හිටපු රාජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක විසින් 2016/02/20 දින පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදී ඔහු සහ ජෝතිෂ්‍යවේදී සුමනදාස අබේගුණරත්න අතර ඇති වූ දූරකථන සංවාදය තිස්ස විමලසේන තාජුඩීන්ගේ ඝාතකයා බවට සඳහන් කරනු ලැබ ඇත. හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න විසින් පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදී ඔහු විසින් තාජුඩීන්ගේ මරණය සම්බන්ධව ප්‍රකාශ කර සිටින්නේ

> "තාජුඩීන්ගේ නඩු විභාගය ගැන ඔබතුමන්ලා දන්නවා මටත් වඩා හොඳින්, ඒකේ පරීක්ෂණ දැන් සම්පූර්ණයෙන්ම මේවා වෙලා, රාජපක්ෂ පවුලටම මෙම චෝදනා එල්ල වෙනවා. ඒගොල්ලන්ගෙන් ඉතිරි ටික හෙළිදරව් වෙනවා. තමුන්නාන්සේලා දන්නවා ඩිෆෙන්ඩර් රථය, තිස්ස කියන්නේ කවුද කාගේ ද ඩ්‍රයිවර් ද කියලා "

යනුවෙන් පවසනු ලැබ ඇත. මෙම සාකච්ඡාවට අදාළ පුවත ඩේලිමිරර් වෙබ් අඩවියේ පළ කර තිබිණි. මෙම කරුණු හේතුවෙන් තිස්ස විමලසේන සහ ඔහුගේ පවුලේ සාමාජිකයින්ට සමාජයට මුහුණදීමට පවා අපහසු තත්ත්වයකට පත් කරනු ලැබිණි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් 2016 වර්ෂයේදී තිස්ස විමලසේනගේ වත්කම් සෙවීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගයක් ලබාගෙන ඇති අතර කැප්ටන් තිස්ස හට මුදල් විශුද්ධිකරණය යටතේ චෝදනා සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම යනුවෙන් වූ පුවතක් ඒෂියන් මිරර් වෙබ් අඩවියේ පළ වී ඇත. ජනාධිපති කාර්යාලයේ ප්‍රවාහන ඒකකයේ පිහිටා ඇති විමර්ශන කමිටුව වෙත 2016.05.24 දින පැය 9.00 ට පැමිණිය යුතු බව සඳහන් කරමින් කර්නල් පී. ටී. පරණගම විසින් අත්සන් තබන ලද ලිපියක්

තිස්ස විමලසේන පලාලි යුධ හමුදා කඳවුරේ සේවයේ යෙදී සිටියදී ඔහුට ලැබෙන ලද අතර ඒ අනුව ඔහු අදාල විමර්ශන ඒකකයේ පෙනී සිටින ලදි. එහිදී ඔහුගෙන් ගෝඨාභය, බැසිල්, ශිරන්ති රාජපක්ෂ සහ එම පවුලේ සියලු සාමාජිකයින්ගේ වාහන සම්බන්දයෙන් ද, එම වාහනවලට අදාල ධාවන සටහන් පිළිබඳව ද ඔවුන්ගේ ගමන් බිමන් සම්බන්ධයෙන් ද ප්‍රශ්න කරන ලදි. එලෙස ප්‍රශ්න කරන ලද්දේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධාරීන් දෙදෙනෙක් විසිනි.

2017.06.12 දින තිස්ස විමලසේන මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත කැඳවනු ලැබූ අතර ඔහු නියෝජ්‍ය පොලිස්පති රවී වෛද්‍යාලංකාර වෙත ඉදිරිපත් කරන ලදි. එහිදී ප්‍රකාශයක් ලබා ගැනීමට පොලිස් පරීක්ෂක ශාන්ත ලලිත් වෙත යොමු කරන ලදුව කොරතොට කළුගල් කොරිය සම්බන්ධව අපි සියලු දේ සොයාගෙන තියෙන්නේ. බබා වෙන්න හදන්න එපා. තමුසෙලා එක්ක හිටිය ලොකු චණ්ඩිත් මම ගෙනත් රිමාන්ඩ් කළා. තමුසේ මට මොකෙක්ද? තමුසෙලාගේ ලොකුම චණ්ඩියා තමයි නාමල්. ඌත් මම රිමාන්ඩ් කළා. අද දින වරුවයි උඹෙන් ප්‍රකාශයක් ගන්නේ. හෙට උඹ රිමාන්ඩ් කරනවා යනුවෙන් පවසනු ලැබ ප්‍රකාශයක් සටහන් කර ගන්නා ලදි. නැවත ඊට පසු දින එනම් 2016.06.17 දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණෙන ලෙස දැනුම්දී වැඩිදුරටත් ප්‍රකාශ සටහන් කර ගනු ලැබූ අතර සවස් කාලයේදී කොලඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 5 අධිකරණයට ඉදිරිපත් කරන ලදි. එලෙස ඉදිරිපත් කරමින් පොලීසිය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් මත B 54100/5/16 යන නඩු අංකය යටතේ දින 14 ක කාලයකට රක්ෂණ බන්ධනාගාර ගත කරන ලදි. අනතුරුව දින 14 න් 14 ට ඇප දීම

ප්‍රතික්ෂේප කරමින් රිමාන්ඩ් බන්ධනාගාර ගත කරනු ලැබිණි. මාස 6 කට ආසන්න කාලයකට පසුව මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඇප අයදුම්පත්‍රයක් මත ඇප නියම විය. තිස්ස විමලසේන රක්ෂණ සිරභාරයේ සිටියදී ඔහුගේ බිරිඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම් සිදු කරනු ලැබ ඇත. යුධ හමුදාපති මහේෂ් සේනානායක විසින් තිස්ස විමලසේනගේ සේවය අත්හිටුවීමට ආරක්ෂක අමාත්‍යාංශයට 2017.08.23 දිනැති ලිපිය යොමු කරන ලදි. ඔහුගේ වැටුප් අත්හිටුවන ලෙස අදාල අංශයට දැනුම්දී ඇති අතර සේවය අත්හිටුවීමට අනුමැතිය නොලද හෙයින්, අනුමැතිය ලැබෙන තෙක් තාවකාලිකව සේවයෙන් මුදාහරිනු ලැබිණි. 2018.09.05 වන දින අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත කැඳවනු ලැබූ අතර විමලසේනගේ බිරිඳ ද අවස්ථා කිහිපයකදී එම කොමිෂන් සභාව වෙත කැඳවනු ලැබ තිබුණි. තිස්ස විමලසේන වැඩ තහනමට ලක්ව සිටියදී 2019 පැවැත්වූ ජනාධිපතිවරණයට දින 4 ට පෙර එනම් 2019.11.11 වන දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් කරන ලද ඉල්ලීමක් අනුව කොළඹ අංක 01 මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටින ලෙස තිස්ස විමලසේනට සිතාසියක් භාරදී තිබිණි. තිස්ස විමලසේනගෙන් සිදු කරන ලද දේශපාලන පලිගැනීම් ඔවුන්ගේ දරුවන් කෙරෙහිද අහිතකර බලපෑමක් සිදු කරන ලදි. ඔහුගේ පුත්‍රයා වන ජනාත් ඕෂධ විමලසේන සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාගයෙන් උසස් ලෙස සමත්ව කොළඹ විශ්ව විද්‍යාලයට තෝරා ගනු ලැබූ අතර ඒ අවස්ථාවේ ඔහුට ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්ව විද්‍යාලයෙන් ශිෂ්‍යත්වයක් පිරිනමන ලදි. ඒ අනුව ඔහු ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබමින් සිටියදී මුල් කාලයේ උසස් ප්‍රතිඵල ලබාගත් අතර තිස්ස විමලසේන බන්ධනාගාර ගත

වීමෙන් පසු ඔහුගේ අධ්‍යාපන කටයුතු දුර්වල තත්ත්වයකට පත් වූයෙන් විශ්ව විද්‍යාලය විසින් ඔහුට පිරිනමා තිබූ ශිෂ්‍යත්වය අවලංගු කරන ලදි. එසේම ඔහුගේ දියණිය වන දිනිති ඕෂධී විමලසේනගේද අධ්‍යාපන කටයුතු අඩාල වන ලදි. තිස්ස විමලසේන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් සේවය කරනු ලැබූයේ යුධ හමුදාව වෙනුවෙනි. මහින්ද රාජපක්ෂ මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී, ඇමති, විපක්ෂ නායක, අගමැති සහ ජනාධිපති ධූර දැරූ වසර 21 ක කාලයක් තුළ ඔහු එලෙස රාජකාරි කරනු ලැබ ඇත්තේ විශ්වාසවන්ත ලෙස කැපවීමෙන් රාජකාරි කරනු ලැබීම හේතුවෙනි. මෙලෙස රාජකාරියේ යෙදීමේ ප්‍රතිඵලයක් වශයෙන් තිස්ස විමලසේනට ද ඔහුගේ බිරිඳට ද දරුවන් හට ද යහපාලන රජයේ දේශපාලන පලිගැනීම්වලට ලක් වී දැඩි පීඩාවකට පත්වීමට සිදු විය. දැනට ඔහු වැඩ තහනමට ලක්ව සිටින අතර සියලු වැටුප් දීමනා අත්හිටුවනු ලැබ ඇත. ඔහුට හිමිවිය යුතුව තිබූ උසස් වීම් හා වරප්‍රසාද අහිමි කරනු ලැබ ඇත. සමාජය තුළ ගොඩනගාගෙන තිබූ යහපත් සම්බන්ධතා කැඩී බිඳී ඇත. අප්‍රසාදයට සහ අපකීර්තියට පත් කරවනු ලැබ ඇත. මෙම අසාධාරණය සම්බන්ධයෙන් සුදුසු සහන සලසා දෙන මෙන් තිස්ස විමලසේන මෙම කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටී.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 29 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2020.11.24

24/11/2020

2020/11/24

9 .XLIII

පැමිණිලි අංකය - 1940/20

පැමිණිලිකරු - නුගදූව විතානගේ කුමාර ජයකාන්ත

ලිපිනය - 126 සී, හයිලෙවල් පාර, නුගේගොඩ

වගඋත්තරකරුවන් නම් කර නැත.

## තීරණය

එච්.ඒ කුමාර ජයකාන්ත ඇග්‍රෝ ක්‍රියේටිව් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂකවරයා ලෙස 2015 වර්ෂයට පෙර පැවති රජයේ වෙළඳ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා කෙරෙහි ගෞරවය මත එම අමාත්‍යංශය සහ රජය කෙරෙහි පැවති විශ්වාසයෙන් යුතුව සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට අයත් වෙළෙඳසැල්, සුපිරි වෙළෙඳසැල් ලෙස සකස් කිරීම සඳහා සහ සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යංශය යටතේ පැවති ව්‍යාපෘතින් වන පොල්ගොල්ල ව්‍යාපෘතිය, මහපොළ ව්‍යාපෘතිය යන කටයුතු සම්බන්ධයෙන් සිදු කෙරෙන ලද ප්‍රචාරණ සේවාවන් හා අදාළව එකී සමාගමට අය විය යුතු වන මුදල් ගණනය කිරීම සඳහා සහ ගෙවීම් කිරීම් සඳහා මහා භාණ්ඩාගාරයේ අවධානය යොමු කරනු ලැබ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු යැයි කොමිෂන් සභාව තීරණය කරයි.

## නිර්දේශය

කොමිෂන් සභාවේ ඉහත සඳහන් තීරණය පරිදි කටයුතු කිරීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

නුගේගොඩ හයිලෙවල් පාරේ අංක 126 සී 1/1 දරණ ස්ථානයේ පවත්වාගෙන යන (ලියාපදිංචි අංක PV 68331 දරණ) ඇග්‍රෝ ක්‍රියේටිව් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ නුගදූව විතානගේ කුමාර ජයකාන්ත (මින් ඉදිරියට ජයකාන්ත යනුවෙන් හඳුන්වනු ලබයි.) 2020.02.15 දිනැති දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරමින් ඔහුගේ පැමිණිල්ල කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබූ අතර එය අංක 1940/20 වශයෙන් ලියාපදිංචි කරනු ලැබ ඇත. යථෝක්ත පැමිණිල්ල පිළිබඳ විමර්ශනයේදී ජයකාන්ත 2020.10.21 දිනැති දිවුරුම් ප්‍රකාශය සමග පැ.1 සිට පැ.10 දක්වා වූ ලේඛන සලකුණු කර ඉදිරිපත් කරනු ලැබිණි. එකී සාක්ෂි මගින් ජයකාන්ත කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබූ පැමිණිල්ල පහත සඳහන් පරිදිය.

ජයකාන්ත වසර 30කට වැඩි කාලයක් නිර්මාණශීලි අධ්‍යක්ෂකවරයෙකු ලෙස ප්‍රචාරණ ක්ෂේත්‍රයේ නියැලී සිටී. ඔහු 2009 වර්ෂයෙහි ඇග්‍රෝ ක්‍රියේටිව් පුද්ගලික සමාගම නමින් සමාගමක් පිහිටුවා ගන්නා ලදී. එම සමාගම මගින් ජයකාන්ත විසින් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය යටතේ පැවති ව්‍යාපෘතීන් කීපයක් වන

පොල්ගොල්ල ව්‍යාපෘතිය, මහපොළ ව්‍යාපෘතිය, සතොස බඩිය, සතොස දැන්වීම් ආදි ව්‍යාපෘතින් රැසක් කරණු ලැබිණි. එකී ව්‍යාපෘතින් සඳහා ප්‍රචාරණ ක්ෂේත්‍රයේ නිර්මාණශීලි අධ්‍යක්ෂකවරයෙක් ලෙස ලංකා සතොස සුපිරි වෙළෙඳ සැල් සඳහා නව මුහුණුවරක් ලබා දෙමින් ශ්‍රී ලංකාව තුළ පවතින තරගකාරි සුපිරි වෙළෙඳසැල් අභිබවා යෑම සඳහා ලංකා සතොස ශාඛා සඳහා නාම පුවරු, පුවත්පත්, රූපවාහිනි, ගුවන් විදුලි යන මාධ්‍යයන්හි ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරය කරන ලදී. එකී ප්‍රචාරණ සේවා සඳහා 2011 වර්ෂයේ සිට 2014 වර්ෂයේ මැද භාගය තෙක් ජයකාන්තගේ සමාගමට සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යංශය විසින් නිසියාකාරව ගෙවීම් සිදු කළ බැවින් ඇග්‍රෝ ක්‍රියේටිව් පුද්ගලික සමාගම එකී කටයුතු සඳහා එම අමාත්‍යංශයට අඛන්ඩව සේවාව ලබා දෙන ලදී. කෙසේ වෙතත් 2014 වර්ෂයේ අග භාගයේදී ජයකාන්තගේ සමාගම විසින් එලෙස සැපයෙන ලද සේවාවන් සඳහා අය විය යුතු මුදල් 2015 ජනවාරි 08 වෙනි දින පැවති ජනාධිපතිවරණයෙන් පසු බලයට පත් වූ රජය විසින් ගෙවීම පැහැර හරිනු ලැබිණි. අදාළ ගෙවීම් සිදු කරන මෙන් ජයකාන්ත විසින් ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් වලට ඇතැම් අවස්ථා වලදී ප්‍රතිචාර දැක්වුවද ඒවා ක්‍රියාත්මක වීමක් සිදු වූයේ නැත. මෙලෙස ඔහුට අය විය යුතුව ඇති මුදලින් රුපියල් 72, 744, 159.46 ක් විය යුතු බව ජයකාන්ත ප්‍රකාශ කර සිටී. මෙම ගෙවීම් සඳහා අදාළ වන්නා වූ ඉන්වොයිස්හි පිටපත් පැ.4 වශයෙන් සලකුණු කොට ජයකාන්ත විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

ඉහත කී ගෙවීම් ජයකාන්තගේ සමාගමට සිදු නොකෙරුණද අදාළ සමාගම විසින් සිදු කෙරෙන ලද ව්‍යාපාරයන්හි ආදායම් ගනයට මෙම මුදල් ඇතුළත් කොට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් වැට් සහ එන්.වී.ටී ගෙවීම පැහැර හරිනු ලැබ ඇති බවට ඇග්‍රෝ ක්‍රියේටිව් ආයතනයේ අධ්‍යක්ෂකවරුන් විසින් ජයකාන්තට සහ ඔහුගේ බිරිඳ වන එච්.එන්.එන් ප්‍රියංගනීට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ 95247/8/18 අංකය යටතේ සහ 95245/8/18 නඩු අංකය යටතේ රුපියල් 11,951, 872/- මුදලක් අය කර ගැනීමට නඩු පවරා ඇත.

ජයකාන්තට හිමිවිය යුතු මුදල් නොගෙවීම යහපාලන රජය විසින් දේශපාලන පලි ගැනීමක් වශයෙන් සිදු කෙරෙන ලදැයි ජයකාන්ත කියා සිටිනු ලද අතර ඔහු මූල්‍ය අපරාධ කොට්ඨාසයට බරපතල වංචා දූෂණ පිළිබඳව ජනාධිපති කොමිසමට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට කැඳවා කටඋත්තර ලබා ගැනීම් සිදු කෙරෙන ලද බව ප්‍රකාශ කරනු ලැබ ඇත. එලෙස එකී ආයතන මගින් ජයකාන්තගෙන් කටඋත්තර ලබා ගැනීමේදී සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යංශයේ අමාත්‍යවරයා ලෙස කටයුතු කළ ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාට සහ සතොස සභාපති ලෙස කටයුතු කළ නලීන් ප්‍රනාන්දු යන අයට ජයකාන්තට ලැබෙන මුදලින් යම් කොටසක් ලබා දෙන ලද්දේද යන්න පුන පුනා ප්‍රශ්න කරන ලද්දේ යැයිද ජයකාන්ත මෙම කොමිෂන් සභාවට වැඩිදුරටත් කියා සිටිනු ලබයි.

ජයකාන්ත ඔහුගේ දිවුරුම් ප්‍රකාශයෙහි පහත සඳහන් පරිදි ප්‍රකාශ කරනු ලැබ ඇත.

“ ඉහත අල්ලස් කොමිසම, මූල්‍ය අපරාධ කොට්ඨාසය සහ ජනාධිපති කොමිසම යන ආයතන වල නිලධාරින්ට අවශ්‍ය පරිදි මාගේ ප්‍රකාශ ලබා දීම සිදු කළහොත් ඉහත ව්‍යාපෘතින් වලට අදාළ මුදල් පහසුවෙන් ලබා ගැනීමට හැකි බවද ඔවුන් විසින් පුන පුනා ප්‍රකාශ කළ අතර දීර්ඝ කාලයක් තිස්සේ ව්‍යාපාර ක්ෂේත්‍රයේ හොඳ නමක් තබාගෙන සිටීමත් එවැනි අසත්‍ය ප්රකාශ කිරීමට මා හට නොහැකි බවත් මා විසින් පවසන ලද අතර එකී හේතුව මත ඔවුන් විසින් දිගින් දිගටම මා අපහසුතාවයට පත් කරගෙන ප්‍රශ්න කිරීම් සිදු කළ බව ප්‍රකාශ කරමි.”

දේශපාලන පලි ගැනීම් හේතුවෙන් මුදල් නොලැබීම සම්බන්ධයෙන් යන ශීර්ෂය යටතේ ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය යන ලිපි ශීර්ෂයෙහි අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් ඇන්ටන් පෙරේරා විසින් ලේකම් වෙළෙඳ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති ලංකා සතොස පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනය, සතොස, මහපොළ යන ආයතනයන්හි ප්‍රචාරණ කටයුතු සඳහා ලබා දුන් සේවාවන් වෙනුවෙන් සිදු කළ යුතු ගෙවීම් පසුගිය වසර 05 තුළ නිරවුල් නොකිරීම සම්බන්ධයෙන් යවනු ලැබ ඇති ලිපියක පිටපතක් පැ.8 වශයෙන්ද ජාතික සමූපකාර සමුලුව- 2014 යන ශීර්ෂය සහිතව සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධම්මික රාජපක්ෂ විසින් ඇග්‍රෝ ක්‍රියේටිව් පුද්ගලික ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂක එනම් ජයකාන්ත වෙත එවන ලද 2014.07.14 දිනැති ලිපියේ පිටපතක් පැ.9 වශයෙන්ද

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රධානයෙන් 2012/2013 යන ශීර්ෂය සහිතව ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය ලිපි ශීර්ෂය යටතේ පෝෂ්‍ය සහකාර ලේකම් පාලන එම්.එන්.පී ගුණරත්න විසින් අධ්‍යක්ෂක මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වභාර අරමුදල වෙත යවන ලද 2015.09.17 දිනැති ලිපියේ පිටපතක් පැ.10 වශයෙන්ද සලකුනු කොට ජයකාන්ත විසින් ඉදිරිපත් කර තිබේ. යථොක්ත පැ.9 ලිපියේ සඳහන් වනුයේ විනාඩි 15ක වාර්තා චිත්‍රපටිය, මුද්‍රිත සැටින් කොඩි 30, මග දෙපස ස්ටෑන්ඩ් 08, චායාරූප ඇල්බමය සහ සී.ඩී තැටිය, සහ වීඩියෝ පටය යන සේවාවන් වලට අයත් නිශ්පාදන ගෙවීම් කිරීම සඳහා විධිමත්ව සමූපකාර සංවර්ධන කොමසාරිස් / රෙජිස්ට්‍රාර් වෙත ලබා දීමට කටයුතු කරන්නැයි දැනුම් දී ඇති අතර පැ.10 ලිපිය මගින් සිදු කරනු ලැබ ඇත්තේ පුවත්පත් දැන්වීම් වල මුල් පිටපත් ඒ සඳහා වූ ගෙවීම් සිදු කිරීමට ඉදිරිපත් කරනු ලැබීමයි.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 25 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 .XLIV

පැමිණිලි අංකය - 77/2020

පැමිණිලිකරු - පිලපිටිය කරුණාතිලක විජේසුන්දර රත්නායක මුදියන්සේලාගේ තිස්ස බන්ඩාර පිලපිටිය

ලිපිනය - අංක 182, ඇල්විටිගල මාවත, කොළඹ 08

පැමිණිලිකරු දේශපාලන පලි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ

### තීරණය

ප්‍රධාන පොලිස් පරික්ෂක පිලපිටිය කරුණාතිලක විජේසුන්දර එක්වරම අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන අංශයෙන් ස්ථාන මාරු කරනු ලැබීමට ප්‍රකට ලෙස හේතු වී ඇත්තේ ඔහු ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව නඩු පැවරීමට සාක්ෂි නිර්මාණය කිරීමට කටයුතු කිරීමේ හෝ සහය දැක්වීමේ නොයෙදීම හේතුවෙනි. එය යහපාලන රජයේ අවශ්‍යතාවය මත දේශපාලන පලි ගැනීමේ යෙදීමට සෘජු ලෙස කටයුතු කරනු ලැබ ඇති අදාළ කාලය තුළ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය විසින් ද්වේශ සහගතව සිදු

කරනු ලැබ ඇත්තකි. ඒ අනුව ප්‍රධාන පොලිස් පරික්ෂක පිලපිටිය දේශපාලන පලි ගැනීමකට ලක්ව රාජකාරිමය වශයෙන් අසාධාරණයට ලක් වන ලද තැනැත්තෙක් බවට කොමිෂන් සභාව තීරණය කරයි.

## නිර්දේශ

01.ප්‍රධාන පොලිස් පරික්ෂක තිස්ස බන්ඩාර පිලපිටිය හට ඔහුගේ සේවා කාලයට අනුව හිමි විය යුතු සහකාර පොලිස් අධිකාරි ධූරයට ඔහු උසස් වීම පොලිස්පතිවරයා විසින් පොලිස් කොමිෂන් සභාව වෙත නිර්දේශ කිරීම සුදුසු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි.

02.ගෝඨාභය රාජපක්ෂ මහතා හට එරෙහිව දූෂණ චෝදනා ඉදිරිපත් කිරීමට අසත්‍ය සාක්ෂි නිර්මාණය කරන මෙන් තමා යටතේ කටයුතු කරනු ලැබූ පොලිස් නිලධාරින් පෙළඹවීමෙන් රාජ්‍යය සේවය අපකීර්තියට පත් කිරීමේ චෝදනාව යටතේ වගඋත්තරකාරියට එරෙහිව රාජ්‍යය සේවා කොමිෂන් සභාව මගින් විනය ක්‍රියාමාර්ග ගැනීම යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පිලපිටිය කරුණාතිලක විජේසුන්දර රත්නායක මුදියන්සේලාගේ තිස්ස බන්ඩාර පිලපිටිය (මින් ඉදිරියට පිලපිටිය නමින් හඳුන්වනු ලබයි.) 1991.01.11 දින පොලිස් නිත්‍ය උපසේවයේ උප පොලිස්

පරික්ෂකවරයෙකු වශයෙන් පත්වන ලදුව පොලිස් කොට්ඨාස කීපයක රාජකාරි කිරීමෙන් අනතුරුව 1995 වර්ෂයේදි වනජීවී නියෝජ්‍ය අමාත්‍ය නන්දිමිත්‍ර ඒකනායක මහතාගේ පුද්ගලික ආරක්ෂකයා වශයෙන් සේවය කරන ලදී. 1996 වර්ෂයේ ජූනි මාසයේ සිට 2012 වර්ෂය වන තුරු දීර්ඝ කාලයක් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට අනියුක්තව විමර්ශන ඒකක 02හි ස්ථානාධිපති වශයෙන් කටයුතු කරනු ලැබිණි. නැවත පිට පලාත් වල පොලිස් ස්ථානයන්හි කෙටි කාලයක් සේවය කරනු ලැබ 2016.03.12 වන දින සිට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරියෙකු වශයෙන් ස්ථාන මාරු පත් වීමක් ලබන ලදී.

පිලපිටිය අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ බලයලත් විමර්ශන නිලධාරියෙකු වශයෙන් සේවය කරමින් සිටියදී එවකට එම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් සේවයේ යෙදී සිටි ජනාධිපති නීතිඥ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය විසින් ඇවන්ගාඩ් සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන් වාර්තා ලැබෙව බවත් එම වාර්තා අනුව එවකට හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් දූෂණ අක්‍රමිකතා සිදු කර ඇති බවට කරුණු සොයාගෙන ඇති බවත් කියා සිටිමින් ඒ සම්බන්ධයෙන් පරික්ෂණ පැවැත්වීමට ප්‍රධාන පොලිස් පරික්ෂක මල්ලිකාරච්චි සහ නීති නිලධාරිනියක වූ දූෂ්මන්ත යන අය සමග කටයුතු කරන ලෙසට පිලපිටියට නියම කරන ලදී. මෙම සිද්ධියෙන් පසුව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු වී තිබූ වාර්තාවක් ලබා දෙමින් ඒ සම්බන්ධව විමර්ශන ආරම්භ කිරීමට අධ්‍යක්ෂ ජෙනරාල්වරියගෙන් නියෝග ලැබුණි. ඒ අනුව ප්‍රධාන පොලිස්

පරීක්ෂක මල්ලිකාරච්චි සමග පිලපිටිය සහ සෙසු නිලධාරීන් දෙදෙනෙකු විමර්ශන කටයුතු ආරම්භ කරන ලදී. එහිදී පිලපිටිය විසින් ඇවන්ගාඩ් සමුද්‍ර ආරක්ෂණ සේවාව සම්බන්ධව අධ්‍යයනයක් සිදු කර නාවික හමුදාවේ, රක්නා ලංකා ආයතනයේ සහ මහාභාණ්ඩාගාරයෙන් පත් කර ඇති නිලධාරීන්ගේ සාක්ෂි ප්‍රකාශ 100කට අධික ප්‍රමාණයක් සටහන් කරනු ලැබිණි. මෙහිදී ප්‍රධාන වශයෙන් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ මේජර් ජෙනරල් පාලිත ප්‍රනාන්දු ඇවන්ගාඩ් සමාගමේ විශ්‍රාමික මේජර් නිශ්ශංක සේනාධිපති එවකට නාවික හමුදාපති සෝමවීර දිසානායක, සීමාසහිත ප්‍රමුඛ ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි, විශ්‍රාමික මේජර් ජෙනරල් කේ.බී එගොඩවෙල යන සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සටහන් කරනු ලැබිණි. තවද අනාවරණය කරගත් ලේඛන සහ බැංකු ගිණුම් අධ්‍යයනය කරන ලදී. මාස 03ක පමණ කාලයක් මෙම විමර්ශනය සිදු කරනු ලැබූ අතර ඒ අතරතුර කාලයේදී අධ්‍යක්ෂ ජෙනරාල්වරිය විසින් පවත්වනු ලැබූ සාකච්ඡා වලදී මෙන්ම මුණගැසෙන ලද අවස්ථාවන් වලදීද ගෝඨාභයට විරුද්ධව නඩු දමන්න ඕනෑ. කල් අරින්න එපා යැයි පිලපිටියට පවසන ලදී. මෙම කරුණු සම්බන්ධයෙන් ඇය විසින් සිදු කරන ලද පීඩනය පිලපිටියට පමණක් නොව විමර්ශන ගොනුව භාරව සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක මල්ලිකාරච්චිට ද තිබූ බව පෙනෙන්නට විය. පිලපිටිය සහ මල්ලිකාරච්චි මේ පිළිබඳව සාකච්ඡා කරනු ලැබ ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව නඩු පැවරිය යුතු බවට අධ්‍යක්ෂ ජෙනරාල්වරිය බලපෑම් සිදු කරන බවට සටහන් යොදනු ලැබ ඇත. වරින්වර සිදු කරන ලද මෙම පීඩනය දරාගත නොහැකිව ප්‍රධාන පොලිස් පරීක්ෂක මල්ලිකාරච්චි සහ පිලපිටිය අවස්ථා කීපයකදී නීතිපති දෙපාර්තමේන්තුවේදී රජයේ නීතිඥවරුන්

වන වසන්ත රත්නායක, යසන්ත කෝදාගොඩ, තුසිත මුදලිගේ යන මහත්වරුන් හමු වී සාකච්ඡා කරනු ලැබූ අතර ඔවුන්ගෙන් ලැබෙන ලද උපදෙස් වූයේ අනාවරණය වී ඇති කරුණු මත ගෝඨාභය රාජපක්ෂ මහතාට හෝ අන් අයෙකු හට චෝදනා එල්ල කිරීමට සාක්ෂි නොමැති බවයි. ඒ අනුව විමර්ශන කණ්ඩායමේ නිගමනය වූයේ ඇවන්ගාඩ් සමුද්‍රාරක්ෂක සේවය සම්බන්ධයෙන් අල්ලස් පනතේ දූෂණය නැමැති වරද සිදු කර ඇති බවට සාක්ෂි නොමැතිය යන්නයි. එසේ වුවද අධ්‍යක්ෂ ජෙනරාල්වරිය හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා කොමිෂන් සභාවට කැඳවීමට තීරණය කරන ලදී. ඔහුව කැඳවීමට ප්‍රථමව ඔහුගෙන් ඇසිය යුතු ප්‍රශ්නාවලිය සකස් කර එයට ඉදිරිපත් කරන ලෙසට ප්‍රධාන පොලිස් පරික්ෂක මල්ලිකාරච්චි විසින් පිලපිටියට නියෝග කරන ලදී. අනතුරුව ගෝඨාභය රාජපක්ෂ මහතා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන අංශයට කැඳවීමට පෙර දින සී.සී.ටී.වී සහ වීඩියෝ කැමරාවක් සහිත කාමරයක් වෙන කරගෙන ප්‍රකාශය ගන්නා අවස්ථාව අධ්‍යක්ෂ ජෙනරාල්වරියට ඇයගේ නිල කාමරයේ සිට නැරඹීමට කටයුතු සූදානම් කරගනු ලැබිණි. ප්‍රකාශය සටහන් කර ගන්නා ස්ථානයේ ප්‍රධාන පොලිස් පරික්ෂක මල්ලිකාරච්චි, පිලපිටිය, යතුරු ලියනය කරන නිලධාරිනිය, වීඩියෝ කැමරා ක්‍රියාකරු සිටින ලදී. ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රකාශය ලබා ගන්නා ස්ථානයට පැමිණි පසු එම කාමරයේ තිබූ සී.සී.ටී.වී මගින්ද වීඩියෝ කැමරා මගින්ද එම අවස්ථාව රූපගත වන බව ඔහුට පැහැදිලි කර දෙනු ලැබිණි. අනතුරුව සකස් කර ගනු ලැබ තිබුණු ප්‍රශ්නාවලියට අනුව ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රකාශය සටහන් කරනු ලැබූ අතර ප්‍රකාශය සටහන් කර ගනු ලැබූ අතර කාලයේදී අධ්‍යක්ෂ ජනරාල්වරිය කඩදාසි කැබලිවල ප්‍රශ්න සටහන්

කරමින් ප්‍රකාශය සටහන් කළ ස්ථානයට එවනු ලැබිණි. කඩදාසි කැබලි වල තිබූ ප්‍රශ්න විමර්ශනයේදී අනාවරණය නොවූ කරුණු බැවින් පිලපිටිය විසින් එම ප්‍රශ්න නම්‍යශීලි ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතාට යොමු කරනු ලැබිණි. දිවා ආහාරය සඳහා ප්‍රකාශ ලබා ගැනීම නතර කළ අවස්ථාවේදී මල්ලිකාරච්චි සහ පිලපිටිය අධ්‍යක්ෂ ජනරාල්වරියගේ නිල කාමරයට කැඳවනු ලැබ ඔය දෙන්නා ගෝඨාභයට හොඳ ප්ලැට් ෆෝම් එකක් හදලා දෙනවා එහෙම ප්‍රකාශ අරගෙන වැඩක් නැහැ. හිර වෙන විදිහට ප්‍රකාශ සටහන් කරන්න යැයි බලපෑම් කරන ලදී. දිවා ආහාරයෙන් පසුවද ප්‍රකාශය සටහන් කරන අවස්ථාවේ කඩදාසි කැබලිවල ලියා ප්‍රශ්න එවනු ලබන බව ගෝඨාභය රාජපක්ෂ දුටු අතර ඔහු වාඩි වී සිටි අසුනෙන් නැගිට ආරක්ෂක ලේකම්වරයා වශයෙන් කටයුතු කළ ආකාරය පහදා දී මෙසේ පවසනුයේ කාමරවලට වී හොරෙන් අහගෙන ඉන්න අයට බවද පවසනු ලැබිණි.

ඉහත කී සිදුවීමෙන් පසුව අධ්‍යක්ෂ ජෙනරාල්වරිය දිගින් දිගටම ප්‍රධාන පොලිස් පරික්ෂක මල්ලිකාරච්චිටද බලපෑම් කරමින් ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව නඩු පැවරීමට කෙටුම්පත් ඉදිරිපත් කරන ලෙස පවසන ලදී. එම අවස්ථාවේදී විමර්ශනයේදී ඉදිරිපත් වූ සාක්ෂි මත වාර්තාවක් සකස් කර එම වාර්තාව අනුව ගෝඨාභය රාජපක්ෂ මහතාට හෝ වෙනත් අයෙකුට අල්ලස් පනත යටතේ දූෂණය නැමති වරදට නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති බවට වාර්තාවක් සකස් කරනු ලැබූ අතර නීති නිලධාරිනියද ප්‍රධාන පොලිස් පරික්ෂකද පිලපිටියද අධ්‍යක්ෂ ජනරාල්වරියගේ නිල කාමරයෙහි ගොනු අංක 996/15 දරණ එකී වාර්තාව ඇයට ඉදිරිපත් කරනු ලැබිණි. මෙහිදී ගෝඨාභය රාජපක්ෂ මහතාට විරුද්ධව සාක්ෂි නොමැති බවට

දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මියට පවසා සිටි අවස්ථාවේ ඇය අසභ්‍ය වචන එනම්, (you fucking hera) වශයෙන් කෑගසා ප්‍රකාශ කරමින් විමර්ශන ගොනුව විසි කරනු ලැබිණි. එම විමර්ශන ගොනුව බාර දෙන ලෙසට 2015.06.26 දින අධ්‍යක්ෂ ජෙනරාල්වරිය කරනු ලැබූ නියෝගය පරිදි එදිනම එය විමර්ශන ඒකකයේ කාන්තා පොලිස් සැරයන් ප්‍රියානි හට විමර්ශන වාර්තාවද සමග ප්‍රධාන පොලිස් පරික්ෂක මල්ලිකාරච්චි විසින් බාර දෙනු ලැබිණි. ඉන් අනතුරුව මල්ලිකාරච්චි සහ පිලපිටිය ගෝඨාභයගේ මිනිසුන් බවට ප්‍රචාරයක් කරන ලද අතර ඔවුන්ට කිසිදු වගකීමක් බාර නොකෙරිණි.

2016.03.15 දින පස්වරුවේ පිලපිටිය කැඳවූ අධ්‍යක්ෂ ජෙනරාල්වරිය ගෝඨාභයට නඩු නැත්තම් එයාට මෙහෙ ඉන්න බෑ. යාපනයට යනවද නැත්තම් හිටපු තැනටම යනවද යනුවෙන් විමසා මෙහෙන් යන්න ලෑස්ති වෙන්න යැයි පවසන ලදී. තවදුරටත් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ රාජකාරි සඳහා අවශ්‍ය නොවන බවට සඳහන් කරමින් පිලපිටිය 2016.03.16 දින කොළඹ දිශාව වෙත ස්ථාන මාරු කරනු ලැබිණි.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් යහපාලන රජය විසින් පත් කරනු ලැබූ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය එම රජයේ අතකොළුවක් වී දේශපාලන අවශ්‍යතාවයන් මත පුද්ගලයන් හට නඩු ගෙතීමට කටයුතු කළ බව පිලපිටිය කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් කියා සිටින ලදී. පිලපිටිය ඇතුළු නිලධාරින් විසින් සිදු කෙරෙන විමර්ශනය ඇයට පක්ෂපාති නිලධාරින් වන පොලිස් පරික්ෂක විජේසිරි ලියනගේ සහ උප පොලිස් පරික්ෂක වික්‍රමසිංහ යන නිලධාරින්ට බාර දී ඔවුන් ලවා ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව අසත්‍ය නඩුවක් පවරනු ලැබ

පසු කාලයේදී දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය ඇවන්ගාඩ් සභාපති නිශ්ශංක සේනාධිපතිට දුරකථනයෙන් අමතා සිය පසුතැවිල්ල ප්‍රකාශ කිරීම මාධ්‍යයන්හි ප්‍රචාරය කෙරෙන ලද බව පිලපිටිය කියා සිටින ලදී. එම දුරකථන සංවාදය මෙම කොමිෂන් සභාව ඉදිරියේ අවස්ථා කීපයකදී ඉදිරිපත් කරනු ලැබ ඇත. අපක්ෂපාතීව විමර්ශනයක් සිදු කිරීම හේතුවෙන් තමා දේශපාලන දඩයමකට ලක් වූ බවත් තමා කොමිෂන් සභාවෙන් නෙරපා හැර තම උසස්වීම වන සහකාර පොලිස් අධිකාරි තනතුර ලබා ගැනීම වළක්වනු ලද බවත් තමන්ගේ සම කාලීන නිලධාරින් බොහෝ දෙනෙක් පොලිස් අධිකාරිවරුන් සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් ලෙස සේවය කරන ලද බවත් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් කියා සිටි පිලපිටිය තමාට සිදු වන ලද දේශපාලන පලි ගැනීම් සැලකිල්ලට ගෙන තමාට හිමි උසස්වීම ලබා ගැනීම සඳහා නිර්දේශයක් ලබා දෙන ලෙසත් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ.7 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .XLV

පැමිණිලි අංකය - 18/2020

පැමිණිලිකරු - ලේකම් මුදියන්සේලාගේ මාලනී කුමාරි

ලිපිනය - නො: 937/40, නීලගම, දිගන

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

01. උප පොලිස් පරික්ෂක බන්ඩාර (පොලිස් ස්ථානය මීරිගම)

තීරණය

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වන vi ශ්‍රේණියේ සාමාන්‍ය සේවා සහකාර තනතුරෙහි සේවය කරමින් සිටින ලද ලේකම් මුදියන්සේලාගේ මාලනී කුමාරි ජනාධිපති ලේකම්ගේ 2013.07.31 සහ SP/CS/33/13 දරණ ලිපිය මගින් සේවයේ අවශ්‍යතා මත ජනාධිපති කාර්යාලයට අනියුක්ත කරවනු ලැබ ඇත. ඒ අනුව ඇය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ක්‍රියාත්මක වීමෙන් ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලයට ඇතුළත් වන අතර එකී 41 වන ව්‍යවස්ථාවේ 1 සිට 7 දක්වා වූ අනු ව්‍යවස්ථාවන්හි බලපෑම් වලට යටත් වේ. ඒ අනුව ඇය 2013.08.02 දින සිට 2015.01.08 දින දක්වා යථෝක්ත 41 වන ව්‍යවස්ථාවේ ආරක්ෂාව යටතට ගැනෙන

නිලධාරිනියක් බවට පත් වේ. ඇයට වැටුප් හිමිකම ඇත්තේ ඒකාබද්ධ අරමුදල වන අතර එම වැටුප සේවා නියුක්ති භාරඅරමුදල් මණ්ඩලයෙන් ගෙවීම සම්බන්ධයෙන් වූ කිසිදු වගකීමක් ඇය වෙත පැවරිය නොහැකිය. කරුණු මෙසේ හෙයින් මහනුවර මහාධිකරණය ඉදිරියේ මාලනී කුමාරි හට එරෙහිව අධිචෝදනා නැගීමට උපයෝගි කර ගන්නා ලද පොලිස් පරික්ෂණ කටයුතු දේශපාලන පලි ගැනීමක් වන්නේය යන්න මෙම කොමිෂන් සභාවේ තීරණය වේ.

## නිර්දේශ

01. මාලනී කුමාරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලයට අයත්ව සේවය කරන ලද කාලය තුළ ඇය ජනාධිපතිවරයාගේ විනය පාලනය යටතේ කටයුතු කරනු ලැබ ඇති බැවින් එම කාලය හා අදාළව ඇයගේ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් දේශපාලන පලි ගැනීමක් වශයෙන් සිදු කරනු ලැබ ඇති අවිධිමත් විමර්ශන මත මාලනී කුමාරි හට එරෙහිව ඉදිරිපත් කර ඇති අධිචෝදනා ඉදිරියට පවත්වාගෙන යනු ලබන්නේද යන්න සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් සලකා බලා තීරණයක් ගත යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

02. 2015.01.08 දින සිට නව ජනාධිපතිවරයෙකු පත් වීමත් සමගම ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරිනියක ලෙස අනියුක්ත කරනු ලැබ සිටි මාලනී කුමාරි සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(5) ව්‍යවස්ථාවේ අතුරු විධානය බලපැවැත්විය යුතු වන හෙයින් එදින සිට ඇය සේවා නියුක්තිකයන්ගේ භාරඅරමුදල් මණ්ඩලයේ සේවය කරමින් සිටින ලද තනතුර ජ්‍යෙෂ්ඨතාවය සහිතව පත් විය යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

03. වගඋත්තරකාර උප පොලිස් පරික්ෂක බන්ඩාර මාලනී කුමාරි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීමේදී ඇයට අයුතු බලපෑම් සිදු කරනු ලැබ ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබ ඇති බව මෙමගින් ඔහු ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට පත් කරනු ලැබ ඇති හෙයින් ඔහුට එරෙහිව පොලිස් කොමිෂන් සභාව මගින් විනය ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ලේකම් මුදියන්සේලාගේ මාලනී කුමාරි(මින් ඉදිරියට මාලනී කුමාරි යනුවෙන් හඳුන්වනු ලබයි.) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කරන නිලධාරිනියකි. ඇය රාජ්‍ය සේවයට එක් වූයේ 2001.12.13 දින මට්ටක්කුලිය සාගර විශ්වවිද්‍යාලයේ ලිපිකාර තනතුරක් ලබමිනි.

2012.08.02 දින ඇය සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ(VI) වන ශ්‍රේණියේ සාමාන්‍ය සේවා සහකාර තනතුරට පත් කරනු ලැබ ඇත. මාලනී කුමාරිගේ ස්වාමිපුරුෂයා හමුදා නිලධාරියෙකු වූ අතර ඔහු සේවය කරනු ලැබුයේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ සමීප ආරක්ෂක කණ්ඩායමෙහිය. ජනාධිපති මන්දිරවල සේවය සඳහා විශ්වසනීය පුද්ගලයින් අනියුක්ත කර ගනු ලබන බැවින් තම භාරයාව වූ මාලනී කුමාරි මහනුවර ජනාධිපති මන්දිරයේ සේවයට අනියුක්ත කරන මෙන් මාලනී කුමාරිගේ ස්වාමිපුරුෂයා විසින් ජනාධිපති ලේකම්වරයා වෙත කරන ලද ඉල්ලීමකට අනුව මාලනී කුමාරි 2013.08.02 දින සිට මහනුවර ජනාධිපති මන්දිරයේ සේවය සඳහා අනියුක්ත කරනු ලැබ තිබුණි. ඒ අනුව ඇය 2013.08.02 දින මහනුවර ජනාධිපති මන්දිරයේ සේවයට වාර්තා කරනු ලැබ ඒ බවට වූ ලිපියක් ජනාධිපති මන්දිරයේ බංගලා භාරකරුට ලබා දෙන ලදී. එතැන් සිට ඇයගේ සේවා ප්‍රධානියා වූයේ ජනාධිපති මන්දිරයේ භාරකරු වූ එම්.එම් මොරේමඩ නැමැත්තාය. මාලනී කුමාරි හට පැවරෙන ලද රාජකාරිය වූයේ ජනාධිපතිවරයා මහනුවර මන්දිරයට සහ මහනුවරට පැමිණෙන අවස්ථා වලදී විශ්වසනීයත්වය සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමයි. එම කාර්යයේදී ජනාධිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් ඩී.එස් ගුණරත්නද අනතුරුව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හර්ෂ විජේවර්ධනද ඇයට සම්බන්ධ වනු ලැබිණි. මාලනී කුමාරිගේ පත්වීම විශේෂ පත්වීමක් වූ හෙයින් ඇයගේ පැමිණීම හා පිටවීම අත්සන් තැබීමට මන්දිර භාරකාර මොරේමඩ විසින් වෙනම සී.ආර් පොතක් සකස් කර දෙනු ලැබිණි. ඒ

අනුව එහි දිනය, පැමිණීමේ වෙලාව, පිටවීම, කාරණය, අනුමැතිය යනුවෙන් සකස් කර තිබූ අයුරින් අත්සන් තැබීම සිදු කරන ලදී. මොරේමඩ විසින් ඔහුට ඉහලින් සිටි නිලධාරින්ගෙන් ලැබෙන ලද උපදෙස් මත එලෙස කටයුතු කරන බැව් මාලනී කුමාරිට දැනගත හැකි විය. මාලනී කුමාරි නිවාඩු ලබා ගන්නා අවස්ථාවලදී සහ රාජකාරි ගමන් යෙදෙන අවස්ථාවලදී ඇතැම් විට දුරකථනයෙන් සහ ඇතැම් විට ලිඛිතව මොරේමඩ හට දැනුම් දී ඔහුගේ අනුමැතිය ලබා ගැනිණි. මුල් අවස්ථාවේදී මාලනී කුමාරි ජනාධිපති මන්දිරයට අනියුක්ත කරනු ලැබූයේ මාස 04ක කාලයකට වූ අතර ඇයගේ ඉල්ලීම මත තවත් එක් වසරකට මෙම අනියුක්ත කිරීම දීර්ඝ කරනු ලැබිණි. එම අනියුක්ත කිරීම අවසන් වූයේ 2015.01.04 වන දිනය. තම පළමු සේවා ස්ථානයට නැවත රාජකාරි වාර්තා කරන්නැයි ඇයට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලිපියක් ලැබුණු අතර 2015.01.12 දින එම ස්ථානයට සේවයට වාර්තා කරන ලදී. එය තම මුල් සේවා ස්ථානයට සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව එහි නිලධාරින් එය කෙරෙහි අවමන් සහගතව කටයුතු කළ අතර බැලමෙහෙවර කර පැමිණි තැනැත්තියක් ලෙස උසුළු විසුළු කරනු ලැබිණි. ඊට අමතරව රාජකාරි පැහැර හරින්නේ යැයි විනය පරීක්ෂණයකටද ලක් කරන ලදී. නැවත මුල් සේවා ස්ථානයට සේවයට වාර්තා කරන විට මාලනී කුමාරි උපාධිය සමත්ව සිටි නමුත් ඇයට උසස්වීම් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබිණි.

2017.01.09 වෙනි දින මාලනී කුමාරි පොලිස් විශේෂ විමර්ශන ඒකකයට කැඳවන ලදී. පොලිස් විශේෂ විමර්ශන ඒකකයේදී ඇය

පොලිස් සැරයන් බන්ඩාර නමැති නිලධාරියා වෙත කැඳවාගෙන යනු ලැබූ අතර ඔහු මාලනී කුමාරිව ඉහළ මාලයක වෙනත් ස්ථානයකට කැඳවාගෙන ගොස් රඳවා තබා පසුව සහකාර පොලිස් අධිකාරි ගුණසේකර නැමැත්තාට ඉදිරිපත් කරන ලදී. මෙයා තමයි අර මහනුවර ජනාධිපති මන්දිරයේ අවුරුදු 03ක් සේවයට යන්නේ නැතුව ගෙදර ඉඳන් පඩි ගත්ත කෙනා යනුවෙන් බන්ඩාර ගුණසේකර හට මාලනී කුමාරි හඳුන්වා දුණි. ගුණසේකරගේ නියමය පරිදි බන්ඩාර විසින් මාලනී කුමාරි පරිගණක කාමරය වෙත කැඳවාගෙන ගිය අතර ලිපිගොනු කීපයක් එලියට ගෙන මෙන්න මහින්ද රාජපක්ෂලාගේ නටපු නාඩගම් යැයි මේසය මතට විසි කරන ලදී. එම අවස්ථාවේදී සිදු වූ සිදුවීම මාලනි කුමාරි පහත සඳහන් පරිදි විස්තර කරන ලදී.

> " ඊට පස්සේ කිවුවා ස්වාමිනි මේකේ තියෙන දේවල් වලට උඹ හරියට උත්තර දීපන්. උඹට හරියට උත්තර දුන්නොත් අද ගෙදර යන්න පුළුවන්. නැත්තම් උඹට වෙන්නේ මම අද තීරණය කරලා ඉවරයි කිවුවා ස්වාමිනි උඹට දෙන දඬුවම. ඊට පස්සේ ස්වාමිනි කිවුවා උඹට මේ පෙත්සමට අනුව මම උඹ හිරගත කරනවා කිවුවා. නැත්තම් උඹට ජීවිතාන්තය දක්වා, නැහැ මට මරණ දඬුවම දෙනවා කිවුවා. නැත්තම් ජීවිතාන්තය දක්වා හිරගත කරනවා කිවුවා ස්වාමිනි. ඔහු මේසයට මෙහෙම ගහලා කිවුවේ ස්වාමිනි."

අනතුරුව මාලනී කුමාරිගේ සොහොයුරා සහ ස්වාමි පුරුෂයා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා සමග සමීපව කටයුතු කරන හෙයින්

ජනාධිපතිවරයාගේ පෞද්ගලික කටයුතු පිළිබඳවත් ඇය යම් කරුණු දැන සිටීද යන්න තරවටු ස්වභාවයෙන් විමසීම් කරනු ලැබිණි. පොලිස් සැරයන් බන්ඩාර ඇයගෙන් ප්‍රශ්න කරනු ලැබූයේ විහිලුවෙන් මෙන් යැයි මාලනී කුමාරි කොමිෂන් සභාව ඉදිරියේ කියා සිටින ලදී. අනතුරුව ඇයව යතුරු ලියනය කරන ලද නිලධාරිනියක් වෙත කැඳවා ගොස් ප්‍රකාශයක් යතුරු ලියනය කරනු ලැබ ඊට ඇයගේ අත්සන තබන ලෙස නියම කෙරිණි. ඉන්පසු බන්ඩාර මාලනී කුමාරි ආපනශාලාව වෙත කැඳවා ගොස් තේ ලබා දීමට උත්සහ කළත් ඇය එය ප්‍රතික්ෂේප කළෙන් කඩදාසි කැබැල්ලක ඔහුගේ දුරකථනය සටහන් කර “ඉහලින් එන නියෝගනේ. අපිට නොකරත් බෑ ඒ හින්දා මට පොඩ්ඩක් එහා මෙහා කරලා ඔයාව ගොඩ දාන්න පුළුවන්. මට නීතිපති එකේ අඳුරන මහත්තුරු ගොඩක් ඉන්නවා. පොඩ්ඩක් එහා මෙහා කරලා ඔයාව ගොඩ දාන්න පුළුවන්. නුවරදී පොඩ්ඩක් හමු වෙමු” යි කියා සිටියේය.

මාලනී කුමාරි එලෙස ප්‍රකාශය ලබා දී පැමිණ වසරකට පමණ පසුව ඇය නිවසින් බැහැරව සිටි අවස්ථාවක රක්ෂණ නියෝජිතයින් පිරිසක් ලෙස තිදෙනෙක් ඇගේ නිවසට පැමිණ සිටි අතර ඇය නිවසට පැමිණෙන විටත් ඔවුන් එහි සිටින ලදී. පොලිස් සැරයන් බන්ඩාරද එලෙස පැමිණ සිටින තැනැත්තන් අතර වූ බව මාලනී කුමාරි හඳුනාගත් නමුත් ඇය ඔහු හඳුනන බවක් පෙන්වූයේ නැත. ඒ වන විටත් මාලනී කුමාරි හෝ ඇගේ ස්වාමිපුරුෂයා බන්ඩාර ලබා දුන් දුරකථනයට අමතා නොතිබිණි. 2019 වර්ෂයේ 10 වෙනි මාසේ මුල් සතියේ දිනයක බන්ඩාර වෙනත් පොලිස් නිලධාරියෙකු ලවා

බන්ඩාරට කතා කරන ලෙසට මාලනී කුමාරිට පණිවිඩයක් එවා තිබිණි. පණිවිඩකරු වූයේ පොලිස් විශේෂ විමර්ශන ඒකකයේ සේවය කරන මාලනී කුමාරිගේ නිවස අසළ පදිංචි පොලිස් නිලධාරියෙකි. මාලනී කුමාරිගේ ස්වාමිපුරුෂයා එම පණිවිඩකරු මුණගැසෙන ලද අතර ඔහු බන්ඩාරගේ දූරකථන අංකයෙහි බන්ඩාරට අමතන ලෙස පවසා සිටින ලදින් මාලනී කුමාරිගේ ස්වාමිපුරුෂයා පණිවිඩකරු විසින් ලබා දුන් බන්ඩාරගේ දූරකථන අංකයට එනම් 071-8071298 යන අංකයට අමතනු ලැබූ අතර හදිසි අවශ්‍යතාවයකට ඔහු මුණගැසෙන මෙන් පවසා තිබූයෙන් මාලනී කුමාරිගේ ස්වාමිපුරුෂයා කොළඹට පැමිණ බන්ඩාර මුණගැසී ඇත. එම අවස්ථාවේ බන්ඩාර ස්වාමිපුරුෂයාට පවසා ඇත්තේ මාලනී කුමාරිට විරුද්ධව නඩු පැවරීමේ සූදානමක් ඇති බවත් බන්ඩාර නීතිපති දෙපාර්තමේන්තුවේ බොහෝ දෙනා අඳුරන බැවින් ලක්ෂ පහක් පමණ වියදම් කළ හැකි නම් ගොඩින් බේරාගත හැකි බවත්ය. ඉන්පසුව බන්ඩාර මාලනී කුමාරිගේ ස්වාමිපුරුෂයාගේ දූරකථනයට නිතර දූරකථන ඇමතුම් ගන්නා ලදී. එක් අවස්ථාවක බන්ඩාර දූරකථන අංකයක් ලබා දෙමින් එය නීතිපති දෙපාර්තමේන්තුවේ සොලිසිටර් ජෙනරාල්වරයෙකුගේ බවත් ඔහුව අමතා ඇප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසටත් පවසනු ලැබිණි. ඉන්පසු අවස්ථාවක බන්ඩාර මාලනී කුමාරිගේ ස්වාමිපුරුෂයා අමතනු ලැබූ දූරකථන සංවාදයක් පටිගත කරනු ලැබ තිබූ අතර එහිදී බන්ඩාර සඳහන් කරනු ලැබූයේ මාලනී කුමාරි අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවක ඇප ලබා ගැනීම සඳහා ගත යුතු පියවරය. මෙම දූරකථන සංවාදය අඩංගු සී.ඩී තැටිය කොමිෂන්

සභාව හමුවේ වාදනය කොට සාක්ෂියක් වශයෙන් සලකුණු කරනු ලැබ ඇත.

යහපාලන රජය පත් වීමෙන් පසු දිනයක මහනුවර ජනාධිපති මන්දිරයේ භාරකරු වූ මොරේමඩ මාලනී කුමාරිගේ නිවසට පැමිණි අතර භීතියට පත්ව සිටි ඔහු මාලනී කුමාරිට වඳිමින් කියා සිටියේ නෝනා කොහොමහරි බේරෙන්න යන්නයි. ඔහුගෙන් දිගින් දිගටම කටඋත්තර ගත් බවත් ඊළඟ සතිය පමණ වන විට මාලනී කුමාරිගේ වැඩ තහනම් විය හැකි බවත් කියා සිටි ඔහු තමාට විශ්‍රාම යාමට තවත් ඇත්තේ මාස 2ක සුළු කාලයක් බවත් ඔහුට විශ්‍රාම වැටුප නැති විය හැකි බවත් පොලිස් නිලධාරින් ඔහුට කියා සිටියේ ඔවුන් අහන ප්‍රශ්න වලට ඔව් යනුවෙන් පිළිතුරු දීම වූ හෙයින් මාලනී කුමාරිට ගැලවීමක් නැතිවිය හැකි බවත් මොරේමඩ වැඩිදුරටත් කියා සිටියේය.

2019.10.21 දින පොලිස් සැරයන් බන්ඩාර මාලනී කුමාරිගේ ස්වාමිපුරුෂයාගේ දුරකථනයට කතා කර මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණෙන ලෙස දැනුම් දෙන ලදින් ඔවුන් එහි යන ලදුව බන්ඩාර ඇතුළු පොලිස් විශේෂ විමර්ශන ඒකකයේ නිලධාරින් මාලනී කුමාරිව මහේස්ත්‍රාත් අධිකරණයට කැඳවාගෙන යන ලදුව මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කොට ඇය රක්ෂණ සිරභාරයට පත් කරනු ලැබිණි. ඇය මාස 03කට ආසන්න කාලයක් රක්ෂිත බන්ධනාගාරගතව සිටි අතර අනතුරුව මහනුවර මහාධිකරණයේ අංක HC548/19, HC549/19, HC550/19 යන අංක යටතේ අධිචෝදනා පත්‍ර 03ක් බාර දෙන ලදී. පොදු දේපළක් වන සේවා නියුක්තිකයන්ගේ භාරඅරමුදල් මණ්ඩලය සතු රුපියල් 250, 545.78/- ක මුදලක් වංක

ලෙස තම ප්‍රයෝජනයට ගැනීමෙන් හා සාපරාධී ලෙස පරිහරණය කිරීමෙන් දණ්ඩනීති සංග්‍රහයේ 386 වගන්තිය සමග කියවිය යුතු 1982 අංක 12 දරණ පොදු දේපළ විශයෙහිලා සිදු කරන ලබන වැරදි පිළිබඳ පනතේ 05(1) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරන ලදැයි අංක 548 දරණ නඩුවෙන්ද සේවා නියුක්තිකයන්ගේ භාරඅරමුදල් මණ්ඩලය සතු රු.530, 247.64/-ක මුදල් ප්‍රමාණයක් සඳහන් කරමින් ඉහත සඳහන් පරිදි වූ චෝදනාව යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරන ලදැයි අංක 549 දරණ නඩුවෙහිද සේවා නියුක්තිකයන්ගේ භාරඅරමුදල් මණ්ඩලය සතු රු.12,347.40/-ක මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් එකී චෝදනාව යටතේම දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කරන ලදැයි 550 නඩුවෙහිද මාලනී කුමාරි හට එරෙහිව අධිචෝදනා ඉදිරිපත් කර තිබේ.

පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරින්ගෙන් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයේ නිලධාරින්ගෙන් සටහන් කර ගනු ලැබ ඇති ප්‍රකාශයනට අනුව මාලනී කුමාරි ජනාධිපති කාර්යාලයට අනියුක්ත කරන මෙන් එම කාර්යාලයෙන් කෙරෙන ලද නියමය පරිදි සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය විසින් එම මණ්ඩලය යටතේ සේවය කරමින් සිටි මාලනී කුමාරි ජනාධිපති කාර්යාලය වෙත මුදා හැරීම සිදු කරනු ලැබ ඇත. එය මුලුමනින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව සිදු වන ලද්දකි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාව ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලය පත් කර ගැනීම සම්බන්ධයෙන් අදාළ වේ. 41(1)

ව්‍යවස්ථාවට අනුව තම කාර්යමණ්ඩලයට අවශ්‍ය ලේකම්වරුන් සහ තම මතය අනුව අවශ්‍ය යැයි තීරණය කරනු ලබන වෙනත් නිලධාරින් සහ කාර්යමණ්ඩලය පත් කර ගැනීමට ජනාධිපතිවරයාට බලය ලබා දී ඇත. ඒ ජනාධිපතිවරයාගේ කාර්යය සහ කර්තව්‍යයන් ඉටු කිරීමෙහිලා සහය පිණිස වේ. 41(3) ව්‍යවස්ථාවට අනුව එලෙස පත් කර ගනු ලබන ලේකම්වරුන් සහ නිලධාරින් රාජ්‍ය නිලධාරින් වශයෙන් සැලකෙන අතර ඔවුන්ගේ පාලනය සහ විනය කටයුතු පිළිබඳ බලය ජනාධිපතිවරයාට පැවරුණි. නව ජනාධිපතිවරයෙකු පත් වන අවස්ථාවේදී එතෙක් සිටින ලද ජනාධිපතිවරයාගේ ලේකම්වරු සහ කාර්යමණ්ඩලය නීතිය ක්‍රියාත්මක වීමෙන් නිලයෙන් ඉවත් කරනු ලබයි. එම නිලධාරින් නැවත රජයේ නිලයකට පත් කිරීමට කැබිනට් මණ්ඩලයට බලය ඇත. 41(5) ව්‍යවස්ථාවේ අතුරු විධානයට අනුව ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලයේ සේවය කරන ලද නිලධාරින් එම සේවයට පත් කරනු ලබන අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ පලාත් පාලන සේවයේ හෝ වෙනත් රාජ්‍ය ආයතනයක සේවයේ යෙදී සිටින ලද්දේ නම් ඉහත කී පරිදි නව ජනාධිපතිවරයෙක් පත් වීමේ හේතුව මත ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලයෙන් ඉවත්ව යන අවස්ථාවේදී පෙර සේවා ස්ථානයේ ඔහු හෝ ඇය සේවය කරන ලද තනතුරට ජ්‍යෙෂ්ඨතාවය අහිමි වීමකින් තොරව නැවත පත්වනු ලබයි.

මාලනී කුමාරි සේවා නියුක්තිකයන්ගේ භාරඅරමුදල් මණ්ඩලය විසින් ජනාධිපති ලේකම්වරයාගේ දැනුම් දීම මත මුදා හරිනු ලැබූ විට ඇය සම්බන්ධයෙන් අදාළ වනුයේ ඉහත කී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වේ. ඒ අනුව පොලිස් විශේෂ විමර්ශන ඒකකයට මාලනී කුමාරි ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලයේ

නිලධාරිනියක වශයෙන් කවර රාජකාරියක යෙදී සිටින ලද්දේ දැයි විමර්ශනය කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින්නේය යන්න මෙම කොමිෂන් සභාවේ ඒකමතික තීරණය වේ. මාලනී කුමාරි ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලයේ සේවයේ කිරීමේදී ඇයට වැටුප් ගෙවිය යුතු වන්නේ ඒකාබද්ධ අරමුදලින්. එම ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු වැටුප සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයෙන් ගෙවනු ලැබීම සම්බන්ධව වගකීමක් මාලනී කුමාරි වෙත පැවරිය නොහැක. එය මුළුමනින්ම පරිපාලන ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාවක් විය යුතු වූ බැවිනි.

මහනුවර ජනාධිපති මන්දිරයේ භාරකරු වශයෙන් අදාළ කාලයේදී කටයුතු කරනු ලැබ ඇති පුංචිබන්ඩා මොරේමඩ පොලිස් විශේෂ විමර්ශන ඒකකයට 2017.03.06 දින ප්‍රකාශයක් ලබා දී ඇත. මාලනී කුමාරි කිසි දිනෙක ජනාධිපති මන්දිරයට පැමිණ නැතැයි යථෝක්ත ප්‍රකාශයේ කියා සිටිනු ලැබ ඇති මොරේමඩ අනතුරුව ඇයගේ ස්වාමිපුරුෂයා සමග පැමිණ ඇය මෙම මන්දිරයේ සේවයට අනියුක්ත කර ඇති බව පෙන්වා දෙන ලදුව එය ඔහු විසින් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් විමසනු ලැබ තහවුරු කර ගැනීමෙන් පසුව යම් ලේඛනයකට අත්සන් තැබූ බව කියා සිටිනු ලැබ ඇත. මෙම ප්‍රකාශය ලබා දීමෙන් පසුව මාලනී කුමාරිගේ නිවසට යන ලද මොරේමඩ පවසා ඇත්තේ පොලිස් නිලධාරින් විසින් ඔහුගෙන් විමසූ සියලු දේට ඔහු ඔව් යන පිලිතුර ලබා දී ඇති බවය. අනතුරුව දිනයක මාලනී කුමාරි සහ ඇයගේ ස්වාමිපුරුෂයා මොරේමඩගේ නිවසට ගොස් ඔහු සමග තොරතුරු කතා බහ කිරීමක දර්ශන ඇතුළත් සී.ඩී තැටියක්

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත් මාලනී කුමාරිගෙන් මෙන්ම මෙම කොමිෂන් සභාව ඉදිරියේ වැඩිදුරටත් හෙළිදරවූ වී ඇති පරිදි ඇයගේ සොහොයුරා වන තිස්ස විමලසේනගෙන්ද මෙලෙස පොලිස් නිලධාරින් විසින් ප්‍රශ්න කිරීම් සිදු කරනු ලැබ ඇත්තේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ සමීප කාර්යමණ්ඩලයන්හි නිලධාරින් වශයෙන් ඔවුන් සේවය කරනු ලැබීමේ හේතුවෙන්ද යන්න ප්‍රකටව පිලිගැනෙන කරුණකි. මෙහිදී යහපාලන රජයේ දේශපාලනඥයින්ගේ අතකොළු ලෙස ක්‍රියාවේ යෙදෙන ලද පොලිසියේ ඉහල නිලධාරින්ගේ මෙහෙයවීම යටතේ කටයුතු කරනු ලැබ ඇති විමර්ශන නිලධාරින්ගේ මුඛ්‍ය පරමාර්ථය වූයේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් හට අපරාධ චෝදනා එල්ල කරනු ලැබිය හැකි සාක්ෂි නිර්මාණය කිරීමට තොරතුරු රැස් කිරීමය. අවසානයේ ඔවුන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ විශ්වාසය දිනාගෙන කටයුතු කරනු ලැබ ඇති සමීප කාර්යමණ්ඩලයන්හි නිලධාරින් අපහසුතාවයට පත් කරමින් විවිධ චෝදනා ලැබීම සිදු කරනු ලැබ තිබේ. පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් මාලනී කුමාරි හට එරෙහිව විමර්ශන කටයුතු පවත්වා සකස් කරන ලද සාක්ෂි නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇයට එරෙහිව අධිචෝදනා නගනු ලැබ ඇති ආකාරය මෙම කොමිෂන් සභාව ඉදිරියේ හෙළිදරවූ වී ඇත.

ඉහත සඳහන් කරනු ලැබ ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාව යටතේ මාලනී කුමාරි හට හිමි විය යුතු වරප්‍රසාද සහ අයිතිවාසිකම් පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් නොසලකා හරිමින් කටයුතු කරනු ලැබ ඇති අතර ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

මගින් ජනාධිපතිවරයාට ලබා දී ඇති බලය අභිබවා කටයුතු කිරීමට ඔවුන් පෙලඹී ඇතැයි යන්න මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබිණි. මෙම නීතිමය තත්වය නීතිපතිවරයාගේ අවධානයට යොමු විය යුතු වන්නේය යන නිගමනයට කොමිෂන් සභාව එළඹ සිටින අතර ඒ අනුව මාලනී කුමාරි හට එරෙහිව ඉදිරිපත් කරනු ලැබ ඇති අධිචෝදනා ඉදිරියට පවත්වාගෙන යන්නේද යන්න නැවත සලකා බලා තීරණයක් ගත යුතුව ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ. 18 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 .XLVI

පැමිණිලි අංකය - 1941/2020

පැමිණිලිකරු - චමින්ද පුෂ්පකුමාර අතුලුවගේ

ලිපිනය - අංක. 3/2ඒ, පාසල් මාවත,
නිවන්තිඩිය, පිළියන්දල.

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. මංගල සමරවීර මහතා
2. රවුෆ් හකීම් මහතා
3. පාඨලී චම්පික මහතා
4. සරත් ෆොන්සේකා මහතා
5. සුමන්දිරන් මහතා
6. සම්බන්ධන් මහතා
7. අනුර කුමාර දිසානායක මහතා
8. මලික් සමරවික්‍රම මහතා
9. ආනන්ද විජේපාල මහතා
10. සමරතුංග
11. චමිලා පෙරේරා
12. ධම්මික ද සිල්වා
13. බණ්ඩාර

14. රවී කරුණානායක මහතා

## තීරණය

ව්‍යාපාරික බුද්ධියකින් යුතු තැනැත්තෙකු ලෙස ඔහුගේ ජීව දත්ත තොරතුරු මත හෙළිදරවු වන චමින්ද පුෂ්පකුමාර අතලුවගේ ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරනු ලැබ ඇත්තේ තම ව්‍යාපාරික ඥානය මත එම මණ්ඩලයේ ලාභ ඉපයීම ඉහළ නැංවීමේ අරමුණින් යුතුව වේ. රාජ්‍ය ආයතනයක ප්‍රධානියෙකු හට රාජ්‍ය ප්‍රතිපත්ති තුළින් බැහැර වී පෞද්ගලික ව්‍යාපාරයක හිමිකරුවකු වශයෙන් කටයුතු කළ නොහැකි වන අතර මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය තුළ සිදු කෙරෙන ලද සමීක්ෂණ වාර්තාවක් පදනම් කර ගනිමින් අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉහළ නැංවීමේ අරමුණින් යුතුව රට පුරා විශාල දැන්වීම් පුවරු සවි කිරීමට ගනු ලැබ ඇති තීරණය ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු හට වාසි සැලසීමට ගත් ක්‍රියාමාර්ගයක් ලෙස උපකල්පනය කිරීම දේශපාලන පලි ගැනීමක් වශයෙන් සිදු කරනු ලැබ ඇත්තක් ද යන තීරණයට මෙම කොමිෂන් සභාව එළඹ සිටී.

## නිර්දේශය

1. චමින්ද පුෂ්පකුමාර ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් එම මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුනේග් අනුමැතිය සහිතව සිදු කරනු ලැබ ඇති කටයුත්තක් අපරාධමය වරදක් ලෙස සලකමින් ඔහු සැකකරුවෙකු කොට මහේස්ත්‍රාත්

අධිකරණයට ඉදිරිපත් කර ඇති බී 15/2676දරණ නඩුවට නීතිපතිවරයා මැදිහත් වනු ලැබ ඒ සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියා කිරීමක් සිදු නොකිරීමට නැවත සලකා බැලීම සුදුසු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

චමින්ද පුෂ්පකුමාර අතලුවගේ (මින් ඉදිරියට චමින්ද අතලුවගේ යනුවෙන් හඳුන්වනු ලබයි) චමින්ද අතුලුවගේ ප්‍රාථමික අධ්‍යාපනය කොළඹ තර්ස්ටන් විද්‍යාලයෙනුත් දෙවන වසරේ සිට පස්වන වසර දක්වා රත්නපුර ඇලෝසියස් විද්‍යාලයෙනුත් හයවන වසරේ සිට උසස් පෙළ දක්වා කොළඹ නාලන්දා විද්‍යාලයෙනුත් අධ්‍යාපනය හදාරා ඇත. ඉන්පසුව තාක්ෂණිකඥයින් පුහුණු කිරීමේ ආයතනයෙන් යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික ඩිප්ලෝමාව ලබාගෙන ඇත. ඉන් පසුව එංගලන්තයේ ඉංජිනේරු කවුන්සිලයේ ඉංජිනේරු උපාධියත් ලන්ඩනයේ වුල්වහැම්ටන් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගෙන ඇත. ඔහු පළමුවෙන්ම රැකියාව වශයෙන් ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරියේ පුහුණු කිරීමේ නිළධාරියෙකු වශයෙනුත් ඉන් පසුව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සහකාර ඉංජිනේරුවරයෙකු වශයෙනුත් කටයුතු කරන ලද අතර 1996 වර්ෂයේදි ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාලව ඔහුගේම ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබ 2000 වසරේදී ඇහලුම් කර්මාන්ත ශාලාවක් ආරම්භ කර 2003 වසරේදී දෙවන ඇහලුම් කර්මාන්ත ශාලාව ද ආරම්භ කරන ලදී. අනතුරුව 2004 වසරේ මහ

නැඟුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ සභාපතිවරයා වශයෙන් පත්වූ අතර 2005 වසරේ අවසානයේ ලංකා පොහොර සමාගමේ සභාපතිවරයා වශයෙනුත් කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ නිසි බලධාරීවරයා වශයෙනුත් කටයුතු කර ඇත. 2008 ඔක්තෝම්බර් මස 10 වන දින ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් වැඩ භාර ගන්නා ලදී. 2015 ජනවාරි දක්වා සභාපතිවරයා ලෙස කටයුතු කරන ලදි. චමින්ද අතුළුවගේ මෙම කොමිෂන් සභාවට 2020.02.10 වන දින දිවුරුම් ප්‍රකාශයක් මඟින් පැමිණිලි කරන ලද්දේ ඔහුගෙන් පසුව ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළ ශාමිලා පෙරේරා යන අය විසින් 2015 වර්ෂයේදී බලයට පත්වූ යහපාලන රජය විසින් ස්ථාපනය කරන ලද දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකවරයා වෙත කරන ලද පැමිණිල්ලකින් අනතුරුව, එම රජය විසින්ම ස්ථාපිත කරන ලද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් විමර්ශනයක් කොට බි/2676/15 දරණ බි වාර්ථාව යටතේ ගොනු කෙරුණු නඩු කටයුත්ත සහ එමඟින් ඔහු හට වූ අකටයුත්තත්, එම ක්‍රියාදාමයට හේතුපාදක වූ දේශපාලනික පළිගැනීමක් සම්බන්ධයෙනි.

එම නඩුකරයට පාදක වූ සිද්ධීන් සම්බන්ධ වැඩිදුර විස්තර මෙසේ සඳහන් කර ඇත.

ඔහු ප්‍රකාශ කර සිටින්නේ 1963 මුදල් පනතින් ජාතික ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කර ඇති අතර, විවිධ අමාත්‍යාංශ හරහා රට තුල සිදු කරන විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා සහ ඒකාබද්ධ අරමුදලට

ලොතරැයි අලෙවි කිරීමෙන් ලැබෙන ආදායම මගින් අරමුදල් රැස් කිරීම මණ්ඩලයේ අරමුණ බවත්, ලොතරැයි අලෙවියේදී වෙළඳපළ හැසිරීම නිරන්තරයෙන් වෙනස්වන ස්වභාවය අනුව ඒ ඒ අවස්ථාවන්ට අනුකූලව තීන්දු තීරණ ගැනීමේ පූර්ණ බලය මෙම පනතින් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පවරා ඇති බවත්ය. එබැවින්, මණ්ඩලය මූල්‍ය ආයතනයක් වනවා සේම, අලෙවිය මූලික කරගෙන පවත්වාගෙන යනු ලබන රාජ්‍ය වෙළඳ ආයතනයක් වන අතර, අලෙවි වර්ධනය නිරන්තරයෙන්ම පවත්වා ගැනීමේ අරමුණ නිසා ආයතනය පිළිබඳව ජනතා විශ්වාසය ගොඩනැංවීමට දිගින් දිගටම විවිද ක්‍රියාකාරකම්, වැඩසටහන් හා දැනුවත් කිරීම් සිදු කරන ලද අතර, මණ්ඩලයේ තේමාව වූයේ "ඔබත් දිනුම් රටත් දිනුම්" යන්න බවය.

ඒ අනුව ලොතරැයි මණ්ඩලය රැස් කරන මුදල් රටේ සංවර්ධනයට දායක වන ආකාරය පිළිබඳව ජනතාවට අවබෝධයක් ලබා දීම මගින්, ලොතරැයි පත් මහජනතාව විසින් වැඩි වැඩියෙන් මිළදී ගැනීමට පෙළඹවීමෙන්, මණ්ඩලයේ ආදායම තව දුරටත් ඉහල නැංවීම සඳහා විවිධ වාණිජ ප්‍රවර්ධන විධික්‍රම භාවිතා කරන ලද බවත් ය. ඒ අනුව ආයතන ප්‍රතිරූපය වර්ධනය කර ගනිමින් 2015 වසර තුළදී රුපියල් බිලියන 19 ක අලෙවි ඉලක්කයකට යාම සඳහා සැලසුම් සකස් කරන ලද අතර, වෙළඳ අංශයේ සහභාගීත්වයෙන් 2014 වසර මැද භාගයේ සිදුකරන ලද සමීක්ෂණයක තොරතුරුවලට අනුව අංශ රැස්වීම්වල සාකච්ඡා සිදු කර, මණ්ඩලයේ සහකාර සමානාාධිකාරී අලෙවි සහ සහකාර සාමාන්‍යාධිකාරී (නියෝජිත කළමණාකරණ) විසින් සකස්

කරන ලද 2014 වසරේ අගෝස්තු මස 12 වන දින දරණ වාර්ථාව, අතිරේක සාමාන්‍යාධිකාරී සහ සමාන්‍යාධිකාරී විසින් ඔවුන්ගේ නිර්දේශ සහිතව චමින්ද අතුලුවගේ වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්ථාවේ යෝජනා කරන ලද, මණ්ඩලයේ ප්‍රතිරූප ප්‍රවර්ධනය සඳහා විවිධ වැඩසටහන් වෙනුවෙන්, වෙන වෙනම අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ඉල්ලා පත්‍රිකා ඉදිරිපත් කරන ලද අතර, ඉන් එක් යෝජනාවකට අනුව විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු 150 ක් ස්ථාපිත කිරීම සඳහා දෙවරකදි (පුවරු 100 ක් සහ 50 ක්) අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2014 අය වැය ප්‍රතිපාදන හා 2015 අය වැය ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිමට යෝජනා කෙරිණි.

ඉහත දැක්වූ, පුවරු 100 ක් සහ 50 ක් ඉදිකිරීම සඳහා පිළිවෙලින් 2014.08.22 දින සහ 2014.09.09 වන දින අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා දෙකක් ඉදිරිපත් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා මිළ ගණන් කැඳවීම සම්බන්ධයෙන් මණ්ඩලයේ මිළදී ගැනීමේ අංශ ප්‍රධානී වූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා, 2015 වසර තුළදී රුපියල් බිලියන 19 ක අලෙවි ඉලක්කය සපුරා ගැනීමට, මෙම ප්‍රවර්ධන කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බැවින්, අමාත්‍යංශයෙන් විමසීම් කිරීමෙන් අනතුරුව, සාමාන්‍යාධිකාරිවරයාවද දැනුවත් කර, අමාත්‍යංශයේ උපදෙස් අනුව, මෙම ව්‍යාපෘතිය එම වසරේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි, සීමිත මිළ ගණන් කැඳවීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ඔහු කියා

සිටින්නේ මණ්ඩලයේ සෑම අංශයකම සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තමන්ට අදාල විෂයන් පිළිබඳව මනා දැනුමක්, අධ්‍යාපනයක් සහ පළපුරුද්දක් ඇති පිරිසක් බවත්, සෑම අවස්ථාවකදීම අදාල කටයුතු සිදුකිරිමේදි නීති රීති, රෙගුලාසි හා පටිපාටීන් අනුගමනය කිරීම අනිවාර්ය කටයුත්තක් බවත්, මෙසේ සීමිත මිළ ගණන් කැඳවීමේදී යම් ගැටළුකාරී තත්ත්වයක් ඇත්නම් අධ්‍යක්ෂක මණ්ඩලයට ඒ බව දැනුවත් කිරීම එම අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්) විසින් කළ යුතුව තිබූ නමුත් එවැනි සඳහනක් ලිඛිතව හෝ වාචිකව සිදු කොට නොමැත.

චමින්ද අතුලුවගේ වැඩිදුරටත් කියා සිටින්නේ අමාත්‍යංශය නියෝජනය කරමින් සහභාගි වන අධ්‍යක්ෂක මණ්ඩල නියෝජිතගේ කාර්ය භාර්ය හා වගකීම වන්නේ අමාත්‍යංශ චක්‍රලේඛ, නියෝග සහ මූල්‍ය රෙගුලාසි පිළිබඳව සැළකිලිමත් වීම සහ ඒ ඒ අවස්ථාවන්වලදී අනෙකුත් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරිම බවත්, මෙම පත්‍රිකාවට අනුමැතිය ලබා දිමේ දී කුමන හෝ ගැටලුකාරී තත්වයක් තිබේදැයි ඔහු විසින් මතයක් ප්‍රකාශ කිරීමක් හෝ විරුද්ධ විමක් සිදු කර නොමැති බවත් ය. ඉහත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිවලට යටත්ව, මණ්ඩලයේ මිළදී ගැනීමේ අංශය මගින් ලංසු ඇපකරද (Bid bond) සහිතව කැඳවන ලද සීමිත මිළ ගණන් ආයතනික ප්‍රසම්පාදන (DPC) කමිටුවට ඉදිරිපත් කර, කමිටුවේ සුපරීක්ෂාකාරී අධ්‍යයනයෙන් පසුව, කොන්ත්‍රාත්කරුවකු තෝරා ගන්නා ලද අතර, එම කොන්ත්‍රාත්කරු සමඟ කාර්ය සාධන බැදුම්කරයකටද යටත්ව (Performance bond) වර්ෂයක කාල

සීමාවකට ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇත. පැ.02 මඟින් දක්වා ඇති අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අතලුවගේ වෙත ඉදිරිපත් වූ ලිපියත් ඊට පාදක වූ මෙන්ම, යම් කාලයකට පෙර සිදු කෙරුණු සමීක්ෂණයේ වාර්ථාවත් සූදානම් කෙරෙන ලද්දේ සහ අතලුවගේ වෙත ඉදිරිපත් කෙරෙන ලද්දේ 2015.01.08 වන දින පැවැත්වූ ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමට බොහෝ කාලයකට පෙරය. 2014 වර්ෂයේ මැද භාගය වන අවස්ථාවේදී, ව්‍යවස්ථාණුකූලව එවකට ජනාධිපතිවරයාට වසර 2 ½ ට ආසන්න කාලයක් තම ධූරයේ රැඳී සිටීමට කාලය ඉතිරිවී තිබූ බැවින්, ඊළඟ ජනාධිපතිවරණය පැවැත්වීමට කාල වකවානු යෙදී තිබුණේ වසර 2 ½ ට ආසන්න කාලයක් ඉදිරියටය. එනම් 2016 වසරේ අග භාගයේදීය. 2014 වර්ෂයේ මැද භාගයේ පැ.02 මඟින් දක්වා ඇති අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔහු වෙත ඉදිරිපත් වූ ලිපියත් ඊට පාදක වූ, සමීක්ෂණයේ වාර්ථාවත් මඟින් ආරම්භ වී පැ.06 ලෙස ලකුණු කළ, තෝරා ගත් සැපයුම්කරු සමඟ 2014.11.05 ගිවිසුම් ගත වීම දක්වා වූ මුළු ක්‍රියාවලියම සිදු වූයේ 2015.01.08 වන දින පැවැත්වූ ජනාධිපතිවරණය 2014.11.20 වන දින ප්‍රකාශයට පත් කිරීමට පෙරය. එබැවින්, මෙම පුවරු ඉදි කෙරුණේ, බි/2676/15 දරණ නඩුවේ ඔහු සහ අනෙකුත් සැකකරුවන් වෙත එල්ල කර ඇති පරිදි, 2015.01.08 වන දින පැවැත්වූ ජනාධිපතිවරණයේ අපේක්ෂකයෙකු ලෙස පසු කාලීනව ඉදිරිපත් වූ එවකට ජනාධිපතිවරයාට අනිසි වාසියක් ලබාදීමේ අරමුණින් බවට චෝදනා සම්බන්ධයෙන් සැක කරුවෙකු කිරීම

මඟින් චමින්ද අතුලුවගේ හට අගතියක් සිදුවී ඇති අතර, එසේ සිදු කරනු ලැබ ඇත්තේ දේශපාලන පලිගැනීමක් වශයෙනි.

තවද වැඩිදුරටත් අතලුවගේ කියා සිටිනුයේ, 2014.11.20 වන දින එවකට ජනාධිපතිතුමන් විසින් ඊළඟ ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කර එයට 2015.01.08 වන දින නියම කරන ලද බවත්, එසේ ප්‍රකාශ කරන්නට යෙදුණු දිනට සතියක් ඇතුලත මණ්ඩලයේ සාමාන්‍යාධිකරී විසින් ඔහු වෙත ලිපියකින් උපදෙස් පතා විමසීම් කරන ලද්දේ, මැතිවරණයක් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක මණ්ඩලයේ ප්‍රවර්ධන කටයුතු ඉදිරියට සිදු කරගෙන යා යුතුද යන්න බවත්ය. මෙසේ 2014.11.26 වන දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපියට ඔහු විසින් සටහන් කර ඇත්තේ ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, මැතිවරණ නීති උල්ලංඝනය නොවන පරිදි අදාල ආයතනයට උපදෙස් දෙන ලෙසත්ය. ඒ අනුව 2014.12.02 වන දින ඔහු විසින්ම මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් යවමින් මණ්ඩලය විසින් එම කාල වකවානුවේ ඉදි කෙරුණු ප්‍රවර්ධන පුවරු සම්බන්ධයෙන් දැනුවත් කෙරුණු අතර ඉදිරි කටයුතු සම්බන්ධයෙන් විමසීමක් කෙරිණි. එම ලිපියට මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.12.03 වන දින චමින්ද අතුලුවගේ හට ලිපියකින් දන්වා තිබුණේ, ජනාධිපතිවරණයට නාම යෝජනා භාර ගන්නා දිනය වන 2014.12.08 වන දින සිට ජනාධිපතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශ වන තුරු අපේක්ෂකයෙකුගේ රුව තිබේ නම් එය ආවරණය වන ලෙස කටයුතු කරන ලෙසටය. එම උපදේශයට අනුව සියලුම ප්‍රවර්ධන

පුවරුවල එවකට ජනාධිපතිවරයාගේ රුව ආවරණය වන පරිදි කළු පැහැති පොලිතින් ආවරණ යොදන ලෙසට ඔහු විසින් අදාල සියලු නිළධාරීන්ට උපදෙස් එදිනම ලබාදුන් අතර, 2014.12.08 වන දිනට පෙර එවකට ජනාධිපතිවරයාගේ ඡයාරූපය මණ්ඩලයේ සියලු ප්‍රවර්ධන පුවරු වල ආවරණය කරන ලද බවට නිළධාරීන් විසින් අතුලුවගේ හට දැනුම් දෙන ලදී. ඒ අනුව මෙම පුවරු මඟින් එවකට ජනාධිපතිවරයාට 2015.01.08 වන දින ජනාධිපතිවරණයේදී අනිසි ප්‍රවර්ධක වාසියක් වුවා යන්න තරයේ ප්‍රතික්ෂේප කර සිටී. 2014 වසර අවසානයට පෙර අදාල කොන්ත්‍රාත්කරු විසින් මෙම ව්‍යාපෘතියේ දැන්වීම් පුවරු 150හිම වැඩ අවසන් කර තිබූ බවත්, ඒ පිළිබඳව වාර්තාවක් ඒ ඒ දිස්ත්‍රික්ක භාර කළාප කළමණාකරුවන් සහ ප්‍රවර්ධන නිළධාරීන් වෙතින් වෙන වෙනම ලබා ගෙන අලෙවි අංශය සහ වෙළඳ අංශයේ නිර්දේශ සහ සාමාන්‍යාධිකාරීගේ නිර්දේශද අනුව ගිණුම් අංශය මගින් දැන්වීම් පුවරු 150 සඳහාම මුදල් ගෙවා ඇති බවත් අතුලුවගේ ප්‍රකාශ කර සිටී. මීට අමතරව, වසරක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් කර ඇති මෙම ව්‍යාපෘතියේ නඩත්තු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා විසින් 2015 වසර තුලදී ද උපදෙස් ලිඛිතව ලබා දී ඇති අතර, එහිදී දැන්වීම් වෙනස් කරමින් (ART WORK) පුවරු 150 ම නඩත්තු කරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව අදාල කොන්ත්‍රාත්කරු කටයුතු කර ඇති බවත්, අදාල සියලු ලිපි ලේඛණ අනුව පුවරු 150 ම සවි කර තිබූ බැව් සනාථ වන බවත් පැහැදිලි බව අතලුවගේ පෙන්වා දෙමින් වැඩිදුරටත් සඳහන් කරනුයේ තවද, එම ප්‍රවර්ධන පුවරු 150 සවි කරන ලද බවටත්, එම

පුවරු සියල්ලේම චිත්‍ර රටා වෙනස් කර ප්‍රතිසංස්කරණයට ඉල්ලීම් කෙරෙන 2015.03.30 දිනැති මණ්ඩල පත්‍රිකා අංක 3760-13 පත්‍රිකාව සහ එම කටයුත්ත Digi Fact Media (Privite) Limited ආයතනයටම පැවරීමට සාමාන්‍යාධිකාරී මඟින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්) විසින් ඔහුට විරුද්ධව පැමිණිල්ල ඉදිරිපත් කළ සහ ඔහුට පසුව මණ්ඩලයේ සභාපති ධූරය දැරූ සභාපතිනියට ඉදිරිපත් කොට 2015.05.15 අවසර ලබා ගත් බවත්ය.

එබැවින්, මෙම සිද්ධි දාමය සම්බන්ධයෙන් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, බී/2676/15 දරණ නඩුවේ ඔහු සහ අනෙකුත් සැකකරුවන් වෙත චෝදනා එල්ල කර ඇති පරිදි, මෙම පුවරු 150 ම ඉදිකර නොමැති බවට කෙරෙන චෝදනාව තරයේ ප්‍රතික්ෂේප කරන බවත්ය. මේ සම්බන්ධයෙන් ඔහු තව දුරටත් ප්‍රකාශ කර සිටින්නේ මෙම ප්‍රවර්ධක දැන්වීම් පුවරු සඳහා සැපයුම්කරුට ගෙවීමට මුදල් ප්‍රතිපාදන සකසා ගැනීම සඳහා මණ්ඩලයේ ත්‍යාග ගිණුමෙන් වියදම් ගිණුමට ප්‍රතිපාදන මාරු කිරීම වරදක් ලෙස දක්වා ඇතත් එය අතලුවගේ ප්‍රතික්ෂේප කරනු බවයි. කාලානුරූපීව සහ විවිධ අවස්ථාවල ඇති වන මුදල් අවශ්‍යතා සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියට යටත්ව ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම අසාමාන්‍ය දෙයක් නොවන බව ඔහු තරයේ කියා ඇත. මණ්ඩලයේ ත්‍යාග ගිණුමෙන් වියදම් ගිණුමට ප්‍රතිපාදන මාරු කිරීම සඳහා 2014.12.31 වන දින අංක 3754-04 දරණ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද බවත් , එපරිද්දෙන්ම ඊට පෙර අවස්ථාවලදද එක් ගිණුමකින් අනෙක් ගිණුමට ප්‍රතිපාදන මාරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති 2013.10.04

වන දින අංක 3743-03 සහ 2013.11.05 වන දින අංක 3744-12 දරණ මණ්ඩල පත්‍රිකා සඳහා අදාල අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගත් බවත්ය. ඉහත ඔහු දක්වා ඇති කරුණු අනුව බි/2676/15 දරණ නඩුවේ ඔහු වෙත චෝදනා එල්ල කර ඇති පරිදි මෙම ක්‍රියාවලිය නිසා කිසිදු අයුරකින් සාපරාධි මුදල් අවභාවිතයක්, සාපරාධී විශ්වාසය කඩ කිරීමක් හෝ වංචා කිරීමක් සිදු වී ඇති බවට කර ඇති චෝදනා තරයේ ප්‍රතික්ෂේප කර ඇත.

මීට අමතරව ඔහු ප්‍රකාශ කර සිටින්නේ, විවිධ අමාත්‍යාංශවලට සහ ඒකාබද්ධ අරමුදලට මණ්ඩලය විසින් ලබාදෙන අරමුදල් මගින් එවකට රාජ්‍ය ප්‍රතිපත්තිය වූ මහින්ද චින්තනයට අනුව ඒ ඒ අමාත්‍යාංශ මගින් සිදුකරනු ලැබූ සංවර්ධනය පිළිබඳව ජනතාව දැනුවත් කිරිම දැන්වීම් පුවරු ප්‍රදර්ශනයේ අරමුණ වූ නිසා ජනාධිපති ලේකම් කාර්යාලයේද සහයෝගය ලබා ගැනීමට තීරණය වූ බවත්, ඒ හරහා ශ්‍රී ලංකා පොලීසිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත් පාලන ආයතන දැනුවත් කර එම ආයතන වල සහයෝගය ලබා ගැනීම සිදුවූ බවත් තවද ඒ ඒ ආයතන වෙත ජනාධිපති කාර්යාලය මගින් නිකුත් කරන ලද ලිපිය සමග ජාතික ලොතරැයි මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී අශෝක් විතාරන විසින් අත්සන් තබන ලද මණ්ඩලයේ ලිපි ශීර්ෂය යටතේ ද ලිපියක් යවා ඇති බවත්, එසේ නමුදු පළාත් පාලන ආයතන වෙත ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නිකුත් කර ඇති ලිපියේ හෝ ජාතික ලොතරැයි මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරීවරයා විසින් යවන ලද ලිපියේ හෝ කිසිම ස්ථානයක මෙම කටයුත්ත මුදල් අය කර ගැනීමකින් තොරව ඉටු කරන ලෙස ඉල්ලීමක් කර නොමැති බවත්ය. ඔහු තව දුරටත් ප්‍රකාශ කර සිටින්නේ

මෙම දැන්වීම් පුවරු 150 ස්ථාපිත කිරීමේ කටයුත්ත ජාතික ලොතරැයි මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන් සහ ජොෂ්ඨ නිළධාරීන්ගේ යොමු කිරීම්, ප්‍රසම්පාදන ඉල්ලීම් සහ නිර්දේශ මත සිදු කරනු ලැබ ඇතත්, ඒ කිසිදු නිළධාරියෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනත් කිසිදු සාමාජිකයෙකු මෙම නඩු කටයුත්තේ සැකකරුවන් ලෙස නම් නොකිරීමෙන්ම පෙනී යන්නේ, මෙහි මුල් පැමිණිල්ලත් ඒ හා සම්බන්ධව මූල්‍ය අපරාධ විමර්ශණ කොට්ඨාශය මඟින් පැවැත් වූ විමර්ශනයත් තමා කෙරෙහි ද්වේශ සහගතව සහ පළිගැනීමේ චේතනාවෙන් කරන ලද්දක් බව අතුලුවගේ කියා සිටී. එම විමර්ශනය කෙරෙන කාලය තුළදී ඔහු හට නොයෙකුත් අවස්ථාවලදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත පැමිණ කටඋත්තරයක් ලබා දීමට ලැබුණු පණිවිඩ අනුව ගියද, "ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව" මෙම කටයුත්ත කෙරුණේ යැයි සාවද්‍ය ප්‍රකාශයක් කිරීමට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ උප පොලිස් පරීක්ෂක ධම්මික සිල්වා සහ සෙසු නිළධාරීන් ඔහු හට කළ බලපෑම්වලට ඔහු නතු නොවූ බැවින් පැය ගණනාවක් ඒ සෑම දිනකම ඔහුගෙන් ප්‍රශ්න කළද කිසිදු කට උත්තරයක් සටහන් කර නොගැනුණි. මෙම විමර්ශනය සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශණ කොට්ඨාශයේ නිළධාරීන් විසින් මණ්ඩලයේ සෙසු නිළධාරීන් සහ අංශ ප්‍රධානීන් සියලු දෙනා දැඩි මානසික පීඩනයකට ලක් කොට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ නිළධාරීන්ට අවශ්‍ය පරිදි ප්‍රකාශ සටහන් කර ඇති බව ඔවුන්ගේ ප්‍රකාශ සංසන්දනයේදී එකම වචන භාවිතයෙන් පැහැදිලි වන අතර එසේ ඔහුව මානසික පීඩනයකට යටත් කර ප්‍රකාශ ලබා ගත්

බවට ඔවුන් බොහෝ දෙනෙක් ඔහු සමඟ පවසා ඇති බවත් සඳහන් කර සිටී.

ඔහු ප්‍රකාශ කර සිටින්නේ මෙම ද්වේශ සහගත  සහ පලිගැනීම් සහිතව සිදු කරන ලද නඩු පැවරීම මගින් තමා දැඩි මානසික කම්පනයට ලක් වී ඇති බවත් පොදු දේපල පනත සහ මුදල් විශුද්ධිකරණ පනත යටතේ වන වැරදිවලට ඔහු සැකකරුවකු ලෙස නම් කළ බවට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරය වීමත් සමග  සමාජය විසින් ඔහුව වැරදිකරුවකු ලෙස දැකීමෙන් දැඩි ලෙස ඔහු මානසික ව්‍යාකූල තත්වයකට ඇද වැටී ඇති බවත් ඔහුගේ බිරිද සහ දරුවාද මෙකී තත්වය මත දැඩි ලෙස කම්පනයට පත්ව  මානසිකව අසහානකාරි තත්වයකට පත්ව ඇති බවත් ප්‍රකාශ කර සිටින අතර ඔහු මීට පෙර ආයතන ගණනාවකම සභාපතිවරයා ලෙස කටයුතු කර ඇති බැවින් එම ආයතන වලද ඔහු මෙසේ වංචාකාරි ලෙස කටයුතු කළ අයෙක් ලෙස ප්‍රචාරය වී ඇති බවත් මෙකී කාලය තුල දරුවාගේ අධ්‍යාපන කටයුතු වලට මැදිහත් වීමට නොහැකි වීම මෙන්ම ඔහු විදේශගතව සිටින විට ඔහු හට අවශ්‍ය වූ විට දරුවා බැලීමට යාමට නොහැකි වූ බවත් ප්‍රකාශ කර ඇත. ඔහු ප්‍රකාශ කර සිටින්නේ ඔහුගේ ව්‍යාපාර සමාගම් 2ක් තිබුනු බවත්,  එම ආයතන දෙකේම සිදු වුයේ රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන වලට අවශ්‍ය ඉංජිනේරුමය යන්ත්‍ර උපකරණ  සහ වෙනත් දේ ලබා දීම වන අතර එහි කටයුතු නිරන්තරයෙන් සිදු වුයේ විදේශ රට වලින් ආනයනය කිරිම මගින් බැවින් එහිදි ඔහු හට නිරන්තරයෙන් විදේශ ගත වීමට සිදුවන බවත්, මෙකී කාලය තුල විදේශ ගමන් තහනමක් සිදු කර තිබූ නිසා ඔහු හට විදේශ ගත වීමට නොහැකි වූ අතර, ඒ තුලින් ඔහු හට විදේශ සමාගම් සමග සාකච්ජා කර එකී උපකරණ මිලදී ගැනීමට නොහැකි වීම මත

සහ ඔහු හට පෞද්ගලිකව ඊට සහභාගී වීමට නොහැකි වීම මත අදාල ආනයනයන් නැවති මේ වන විට ඔහුගේ එකී සමාගම්හි කටයුතු අඩාල වී ඇති බවත් ප්‍රකාශ කර ඇත.

චමින්ද අතුලුවගේ තව දුරටත් කියා සිටින්නේ මෙකී කාලය තුල නඩු කටයුතු වෙනුවෙන් සහ නීතිමය කටයුතු වෙනුවෙන් විශාල මුදලක් දැරීමට සිදු වූ බවත් මෙකී නඩුව නිසාම ඔහු හට වෙනත් රැකියාවට ඉල්ලුම් කිරිමට නොහැකි වී ඇති බවත්ය. තවද මෙම අකටයුත්ත සම්බන්ධයෙන් ඔහු ජනාධිපති නීතීඥ සම්පත් මෙන්ඩිස් මහතා මගින් නීතිපතිවරයා වෙත අවස්ථා කීපයකදීම කරුණු දක්වා ඇති බවත්, මෙකී කරුණු අනුව තමා කිසිසේත්ම සැකරුවකු ලෙස නම් කිරිමට නොහැකි බව අතුලුවගේ ප්‍රකාශ කර සිටින ලදී.

අවසන් වශයෙන් ඔහු ඉල්ලා සිටින ලද්දේ අනීතික ලෙස සහ අසාධාරණ ලෙස නඩු පැවරීම සහ ඔහුගේ විදේශ ගමන් තහනම් කිරීම මගින් තමා දැඩි අසරණභාවයට පත්වී ඇති බැවින් ඔහු හට ලබා දිය හැකි සහනයන් ලබා දෙන ලෙසයි.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 26 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 .XLVII

පැමිණිලි අංකය - 317/2020

පැමිණිලිකරු - සමරකෝන් මුදියන්සේලාගේ චමින්ද ප්‍රසාද් සමරකෝන්

ලිපිනය - අංක 20 ඒ/1, පිලවල, ගුන්නැපාන, මහනුවර

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා,
2. හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතා,
3. හිටපු සභාපති ටී. ජී. ජයසිංහ මහතා
4. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්. ගමගේ මහතා

### තීරණය

වර්ෂ 2015 ජනවාරි මස 08 වන දින යහපාලන රජය බලයට පත් වීමත් සමඟ ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඒ 2/3 ශ්‍රේණියේ අලෙවි කළමණාකාර (සිල්ලර) තනතුරේ සේවයේ යෙදී සිටි එස් එම් සී පී සමරකෝන් මහතා සේවා ස්ථානයෙන් ස්ථාන මාරු කිරීම ඒ හා සමඟම වැඩ තහනමකට ලක් කිරීම අවිධිමත් ලෙස විනය පරීක්ෂණ පවත්වා සේවයෙන් පහ කිරීම

සහ ඒ හා බැඳුනු ක්‍රියාකාරකම් මඟින් ඔහු දේශපාලන පළිගැනීමකට ලක්වූ බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරනු ලබයි.

## නිර්දේශය

1. එස්. එම්. සී. පී. සමරකෝන් මහතාගේ සේවා අඛන්ඩතාවය , වැඩතහනමට ලක් වූ අවස්ථාවේ සිටි නැවත රැකියාව පිහිටු වීම දක්වා කාල සීමාව තුළදී අහිමිවූ වැටුප් හා දීමනා සහිතව, රැකියාව අහිමි කරන ලද අවස්ථාවේ සේවයේ යෙදී සිටි ඒ 2/3 ශ්‍රේණියේ අලෙවි කළමණාකාර (සිල්ලර) තනතුරේ සේවයේ පිහිටුවීමට කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

2. එස් එම් සී පී සමරකෝන් මහතා ඒ 2/3 ශ්ණියේ අලෙවි කළමණාකාර සිල්ලර තනතුරේ සේවයේ පිහිටුවීමෙන් අනතුරුව ඔහු සේවයෙන් පහ කරන ලද 2016.12.29 දින සිට නැවත සේවය පිහිටුවන දින දක්වා කාලසීමාව තුළදී ඔහුට නීත්‍යාණුකූලව හිමිවිය යුතුව තිබූ උසස් වීම්, ලබාදිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

සමරකොන් මුදියන්සේලාගේ චමින්ද ප්‍රසාද් සමරකෝන් මහතා (මින් ඉදිරියට චමින්ද සමරකෝන් යනුවෙන් හඳුන්වනු ලබයි) වර්ෂ 1995.12.11 වන දින B3 ශ්‍රේණියේ ලිපිකරුවෙකු වශයෙන් ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවයට බැදී ඇත. වර්ෂ 1999 දී B2

ශ්‍රේණියේ ලිපිකාර තනතුරට උසස් කරනු ලැබූ බවත්, අනතුරුව වර්ෂ 2005 දී A7 ශ්‍රේණියේ විධායක සහකාර තනතුරටත්, වර්ෂ 2009 දී A6 ශ්‍රේණියේ සහකාර අලෙවි කළමණාකාර තනතුරට, වර්ෂ 2010 දී සහකාර අලෙවි කළමණාකාර තනතුරෙහිම එක් ශ්‍රේණියකින් ඔහුව උසස් කරනු ලැබිණි. වර්ෂ 2010.11.8 වන දින වැඩ බලන අලෙවි කළමණාකාර තනතුරට පත් කරන ලද බවත්, ඉන් අනතුරුව වර්ෂ 2012.3.16 වන දින සිට A2/3 ශ්‍රේණියේ අලෙවි කළමණාකාර (සිල්ලර) තනතුරට ස්ථිර පත්වීමක් හිමි වූ බවත්ය.

චමින්ද සමරකෝන් මහතාගේ වර්ෂ 1995.12.7 දිනැති පත්වීම් ලිපිය පැ.1 ලෙසත්, සේවය ස්ථිර කිරීමේ ලිපිය පැ.1(I) ලෙසත්, වර්ෂ 2010.11.8 දිනැතිව කළමණාකාර (අලෙවි) තනතුරේ රාජකාරී කටයුතු ආවරණය කිරීමට පත් කිරීමේ ලිපිය පැ.2 ලෙසත්, A2/3 ශ්‍රේණියේ අලෙවි කළමණාකාර (සිල්ලර) තනතුරට උසස් කිරීමේ වර්ෂ 2012.5.21 දිනැති ලිපිය පැ.3 ලෙසත්, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් දැක්වෙන ජීව දත්ත පත්‍රිකාව පැ.4 ලෙසත් සලකුණු කරමින් සිය සාක්ෂි මගින් ඉදිරිපත් කර ඇත.

චමින්ද සමරකෝන් මහතා A2/3 ශ්‍රේණියේ අලෙවි කළමණාකාර (සිල්ලර) තනතුරේ කටයුතු කිරීමේදී රාජකාරී ලැයිස්තුවක් (Duty List) ලබා දී නොතිබුණද, ඔහුගේ තනතුරට අදාල කාර්යභාරය වන ඛණිජ තෙල් සංස්ථාවේ අලෙවි අංශය යටතේ ඇති දිවයින පුරා පිහිටි ඉන්ධනහල් පරිපාලනය හා අධීක්ෂණයකද, ඒ උදෙසා සංස්ථාවේ පලාත් මට්ටමෙන් ඇති ප්‍රාදේශීය කාර්යාල නවය (9) පරිපාලනය කිරීමද සිදු කරන ලද බව සාක්ෂි දෙමින් කියා ඇත. ඔහු ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවයට බැඳුණු දින සිටම ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කළ බවත්, එකී වෘත්තීය

සමිතියට අමතරව වෙනත් දේශපාලන පක්ෂ හා සම්බන්ධ තවත් වෘත්තීය සමිති තුනක් ඛණිජ තෙල් නීතිගත සංස්ථාව තුළ ක්‍රියාත්මක වූ බවත්, පවසා ඇත. ඔහු වර්ෂ 2015.01.08 වන දින දක්වාම ඉහළ කළමණාකාරීත්වයේ විශ්වාසය දිනා ගනිමින් සිය රැකියාව සිදු කළ බවත්, වර්ෂ 2015 ජනවාරි මස පැවැත්වූ ජනාධිපතිවරණයෙන් පසුව අලුතෙන් පත් වූ රජය යටතේ බරපතල ගැටලු සහගත තත්ත්වයන් රාශියකට මුහුණ දුන් බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

වර්ෂ 2015.1.8 වන දිනැති ජනාධිපතිවරණයට පසු දිනම චමින්ද සමරකෝන් මහතාට, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ජීවක රූපසිංහ නමැති අයෙකු දූරකථනයෙන් කථාකොට වැඩට නොඑන ලෙස දැනුම් දුන් බවත්, ආයතනයේ සභාපති තනතුරට, වානිජ අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට සහ අලෙවි කාර්යාංශයේ නියෝජ්‍ය සමාන්‍යාධිකාරී තනතුරට අලුතෙන් පුද්ගලයන් පත් කරන බවත් සහ එතෙක් ඔහු විසින් දරණ ලද තනතුරට ලක්ෂ්මන් අබේගුණවර්ධන යන අයෙකු පත්කිරීමට සැලසුම් කර ඇති බවත්, දූරකථනයෙන් දැනුම් දුන් බව කියා ඇත.

චමින්ද සමරකෝන් මහතාට කොමිෂන් සභාව විමසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් වර්ෂ 2015 ජනවාරි මස 8 වන දින යහපාලන රජය පත්වීමත් සමඟ හිටපු සභාපතිවරයාගේ, කළමණාකාර අධ්‍යක්ෂකවරයාගේ සහ පැමිණිලිකරුගේ කාර්යාල කාමර මුද්‍රා තබා තිබූ බවත් කියා ඇත. තවද පසුව සොයා බැලීමේදී එකී මුද්‍රා තැබීම පාඨලී චම්පික රණවක අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි සිදුකර ඇති බවට ආයතනය තුළ ප්‍රචාරය වූ බවත්, ඔහු රාජකාරියට පැමිණි වර්ෂ 2015.1.12 වන දින වන විට ඔහුගේ කාර්යාල කාමරය මුද්‍රා තබා තිබූ හෙයින් අලෙවි කාර්යාංශයට යාබදව පිහිටි ආපනශාලාවේ මේසයක්

සපයාගෙන රාජකාරී කටයුතු වල නියැලුන බවත් කියා ඇත. වර්ෂ 2015 දී පත් වූ නව රජයේ ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යධූරයට පත් වූ පාඨලී චම්පික රණවක මහතා අමාත්‍යාංශයේ වැඩ භාර ගැනීමෙන් අනතුරුව ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ දෙමටගොඩ පිහිටි ප්‍රධාන කාර්යාලයට පැමිණි බවත්, එහිදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් ශාලාවේදී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමණාකරුවන් ආමන්ත්‍රණය කිරීම අමාත්‍යවරයා විසින් සිදුකළ බවත්, එහිදී කළමණාකරුවන්ට තමන් පිළිබඳ ස්වයං හඳුන්වාදීමක් කරන ලෙසට අමාත්‍යවරයා දැනුම් දුන් බවත්, එහිදී ඔහු විසින් තම වාරය පැමිණි විට ආසනයෙන් නැගිට සිය නම සඳහන් කළ විට පෙට්‍රල් ෂෙඩ් භාරව කටයුතු කරන්නේ සහ ප්‍රචාරණ ප්‍රවර්ධන මාධ්‍ය කටයුතු කරන්නේ තමන්දැයි අමාත්‍යවරයා විමසූ බවත්, එහිදී ඔව් යනුවෙන් පිළිතුරු දුන් විට ඔහුට කථා කිරීමට අවකාශ ලබා නොදී වාඩිවන ලෙසට අමාත්‍යවරයා දැනුම් දුන් බවත්, එහිදී අමාත්‍යවරයා ඔහු සම්බන්ධයෙන් යම් ප්‍රශ්ණයක් හෝ වැරදි තොරතුරු රාශියක් ඇතිව ක්‍රියාකරන බවට චමින්ද සමරකෝන් මහතාට හැඟී ගිය බවය.

වර්ෂ 2015 යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව යහපාලන රජය පත්කිරීමට මුල් වී ක්‍රියා කළ එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ ජාතික සේවක සංගමයේ සහ ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ පොදු සේවක සංගමයේ සාමාජිකයන් හා ආයතනයේ විධායක නිලධාරීන් කිහිපදෙනෙක් එක්ව ආයතනය තුළ කටයුතු කිරීමට ඔහුට බාධා කිරීම් සිදු කළ බවත්, ඔහු සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රවෘත්ති ඔහුගේ ඡායාරූපයක් සමග පුවත්පත්වල පළකිරීමට පවා ඔවුන් ක්‍රියා කළ බවත්, එකී අසත්‍ය චෝදනා සම්බන්ධයෙන් ඔහු විසින් ආයතනයේ සභාපතිවරයා වෙත දැනුම් දීමට ක්‍රියා කළ බවත්, කියා

ඇති අතර ඒ බව තහවුරු කිරීමට සභාපතිවරයා අමතා වර්ෂ 2015.3.14 වන දින යවන ලද ලිපිය පැ.5 ලෙසත්, වර්ෂ 2015.1.26 දින දරණ ලිපිය පැ.5(අ) ලෙසත් ලකුණු කොට සාක්ෂියේදී ඉදිරිපත් කර ඇත.

නව අමාත්‍යවරයාගේ මහජන දිනය අමාත්‍යාංශයේදී පැවැත්වූ බවත්, ඒ සඳහා අලෙවි කළමණාකරු වශයෙන් ඔහු ද සහය වූ බවත්, එහිදී ඔහුගේ රාජකාරියට අයිති නැති සහ ඉටුකළ නොහැකි වැඩකටයුතු කිහිපයක්ම ඔහු ලවා ඉටුකරවා ගැනීමට පාඨලී චම්පික රණවක අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් ඔහුට විවිධ බලපෑම් සිදුකල බවත්, කියා ඇත. එහිදී, දැනටමත් බලපත්‍රලාභී සමහර ඉන්ධන පිරවුම්හල් හිමියන්ගේ බලපත්‍ර අවලංගු කරන ලෙසත්, ඉන්ධන පිරවුම්හල් ලබා දීමට සුදුසුකම් නොමැති ස්ථානවලට ඉන්ධන පිරවුම්හල් ලබාදෙන ලෙසත්, අමාත්‍යවරයාගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ හිතවතුන්ට ඉන්ධන පිරවුම්හල් පවත්වාගෙන යාම සඳහා නව බලපත්‍ර ලබාදෙන ලෙසත්, ඉන්ධන පොම්ප ආනයනය කිරීමේ කටයුත්තේද ඔවුන් විසින් නම් කරන පොම්ප නිර්දේශ කරන ලෙසත්, ආදී වශයෙන් එකී බලපෑම් චමින්ද සමරකෝන් මහතා වෙත විෂයභාර අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය විසින් සිදු කළ බවත්, කියා ඇත. තවද, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රුපියල් ලක්ෂ හතරක මුදලකට මාසික බදු පදනම මත අතලේ සහ පුත්‍රයෝ සමාගමට බදු දී තිබූ කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය අසල පිහිටි ඉන්ධන පිරවුම්හලෙන් මාසික බදු අයකිරීම ඉවත් කරන ලෙසට අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ අය විසින් ඔහුට බලපෑම් කළ බවත්, ඔහු එකී කටයුත්තද ඉටු කිරීම ප්‍රතික්ෂේප කළ විට ඔහුව

තනතුරෙන් ඉවත් කිරීම සඳහා නිර්නාමික පෙත්සම් මත ක්‍රියා කළ බවත් සාක්ෂි දෙමින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතා තනතුරෙන් ඉවත් කළ පසුව, ආයතනයේ සභාපතිවරයා වූ රංජිත් වික්‍රමසිංහ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) ක්‍රිෂාන්ත වික්‍රමසිංහ, ඔහුගේ තනතුරට පත් වූ ලක්ෂ්මන් අබේගුණවර්ධන යන අය එක්ව අතලේ සහ පුත්‍රයෝ සමාගමෙන් ඉන්ධනහල සඳහා අයකරන ලද බදු මුදල ඉවත් කිරීමට, අධ්‍යක්ෂක මණ්ඩලය නොමග යවා, අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කොට එය අනුමත කරවාගෙන ඇති බවත්, එමගින් ආයතනයට මාසිකව රුපියල් ලක්ෂ හතරක පමණ ආදායමක් අහිමි කිරීමට ඔවුන් විසින් ක්‍රියාකර ඇති බවත්, කියා ඇත.

පායලී චම්පික රණවක අමාත්‍යවරයාගේ කාර්යමණ්ඩලයේ නිලධාරියෙකු වන ජනරංජන පෙරේරා යන අයත්, සම්බන්ධීකරණ ලේකම්වරයෙකුව සිටි කිංස්ලි පෙරේරා යන අයත්, නීත්‍යානුකූල නොවන අයුරින් කටයුතු කිරීමට ඔහුට හට බලපෑම් කළ බවත්, ඔහුගෙන් එකී කටයුතු ඉටුකර ගැනීමට නොහැකි වූ තැන එම නිලධාරීන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතා සමග එක්ව, එස්. ඩබ්ලිව්. ගමගේ මහතාගේ මෙහෙයවීමෙන් ඔහුට විරුද්ධව නිර්ණාමික පෙත්සම් රාශියක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත යොමු කිරීමට කටයුතු කර තිබූ බවත්ය.

වර්ෂ 2015.3.2 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුරට ඩබ්ලිව්. එම්. කේ. ආර්. බී. වික්‍රමසිංහ මහතාත්, වර්ෂ 2015.2.27 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ සහ සැපයුම්දාම) තනතුර

සඳහා එම්. කේ. ගුරුසිංහ මහතා පත්කිරීමට අදාල අංක. 1803 හා අංක. 1804 දරණ චක්‍රලේඛයන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) එස්. ඩබ්. ගමගේ මහතා විසින් නිකුත් කළ බවත්, එකී චක්‍රලේඛයන් පැ.6 සහ පැ.6(අ) ලෙස ලකුණු කරමින් සාක්ෂි මගින් ඉදිරිපත් කර ඇත.

වර්ෂ 2015 ජනවාරි මස වන තෙක් ඔහුට එරෙහිව කිසිදු පෙත්සමක්, පැමිණිල්ලක්, අවවාදාත්මක ලිපියක් හෝ ඉදිරිපත් නොවූ බවත්, ඔහුට එරෙහි නිර්නාමික පෙත්සම් රාශියක් වර්ෂ 2015 පෙබරවාරි මාසය වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ලැබී තිබූ බවත්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් එකී නිර්ණාමික පෙත්සම් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විමර්ශන හා විගණන අංශ වෙත යොමු කළ බවත්, අලෙවි කාර්යාංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වශයෙන් ඩබ්ලිව්. එම්. කේ. ආර්. බී. වික්‍රමසිංහ මහතා වැඩ බාරගත් පසුව ඔහුට එරෙහිව තිබූ පරීක්ෂණ ඉතා වේගවත්ව සිදු කළ බවත්, එමගින් සාවද්‍ය අයුරින් ඔහුගේ රැකියාවට අගතියක් කිරීමට අපේක්ෂා කර තිබූ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

වර්ෂ 2015 යහපාලන ආණ්ඩුව බලයට පත් වූ පසුව ඩබ්ලිව්. එම්. කේ. ආර්. බී. වික්‍රමසිංහ මහතා පත්වීමේ ලිපියක් පවා නොමැතිව අලෙවි අංශයට පැමිණ, එහි තිබූ හිස් කාමරයක සිට අලෙවි අංශය මෙහෙය වීම සිදු කළ බවත්, එහිදී පැමිණිලිකරුව නොසලකාහැර, ඔහුව එකී කටයුතු වලට සම්බන්ධ කර නොගෙන කටයුතු කිරීමට ඩබ්ලිව්. එම්. කේ. ආර්. බී. වික්‍රමසිංහ මහතා කටයුතු කළ බවත්, ඩබ්ලිව්. එම්. කේ. ආර්. බී. වික්‍රමසිංහ මහතාට අලෙවි අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

තනතුරට අදාල පත්වීමේ ලිපිය පසු අවස්ථාවකදී සභාපති රංජිත් වික්‍රමසිංහ මහතා විසින් ලබා දීමට ක්‍රියා කර ඇත.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) එස්. ඩබ්. ගමගේ මහතා විසින් චමින්ද සමරකෝන් මහතාගේ වැඩ තහනම් කිරීම සඳහා සභාපතිවරයාට නිර්දේශයක් කර තිබූ බවත්, පසුව එය සංශෝධනය වී රත්මලානේ ගුවන් තෙල් අංශයට ඔහුව ස්ථාන මාරු කිරීමට සභාපතිවරයා විසින් නියෝග කොට, ඒ අනුව වර්ෂ 2015.2.25 වන දින ඔහුව රත්මලානේ ගුවන්තෙල් අංශයට ස්ථාන මාරු කිරීමට එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් ලිපියක් සකස් කරමින් සිටින බව දැන ගැනීමට ලැබුණු බවත්, අනතුරුව ඔහු විසින් සභාපතිවරයා අමතා කරුණු පැහැදිලි කිරීමක් සිදු කළ බවත්, ඒ අනුව ඔහුගේ ස්ථාන මාරුව තාවකාලිකව නතර කෙරුණු බවත්, කියා ඇත.

වර්ෂ 2015.1.10 වන දිනෙන් පසුව නිර්ණාමික පෙත්සම් පදනම් කර ගෙන සිද්ධීන් 28 කට, 30 කට ආසන්න ප්‍රමාණයක් සම්බන්ධයෙන් ආයතනයේ විමර්ශන හා විගණන අංශ දෙක විසින් චමින්ද සමරකෝන් මහතාගෙන් ප්‍රකාශ සටහන් කරගත් බවත්, අනතුරුව විගණන අංශය විසින් විමර්ශන වාර්තාවක් ඉදිරිපත් කළ බවත්, එකී විගණන වාර්තාව හා නිර්ණාමික පෙත්සම් පදනම් කර ගෙන ඔහුව වර්ෂ 2015 මාර්තු මාසයේදී සපුගස්කන්ද තෙල් පිරිපහදුවට ස්ථාන මාරු කර ඇත. ඒ අවස්ථාව වන විට ඔහුට විනය පරීක්ෂණ සඳහා චෝදනා පත්‍රයක් භාර දී තිබූ බවත්, ස්ථාන මාරුව මත ඔහු වර්ෂ 2015.3.25 දින සිට වර්ෂ 2015.8.18 වන දින දක්වා කාලසීමාව තුල සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ සිටි බවත්, එම ස්ථානයට පැමිණෙන විට ඔහුට සපයා තිබුණේ කුඩා ගබඩා කාමරයක් බවත්, එහි මේසයක් හෝ වාඩි වීමට පුටුවක් හෝ නොතිබූ බවත්, එම ස්ථානයේ සිටි

සහෝදර සේවකයන් විසින් කාමරය පිරිසිදුකර දුන් බවත්, එම කාමරයේ වාඩි වී සිටීම හැරුණු විට කිසිම රාජකාරියක් ඔහුට සිදු කිරීම සඳහා ලබා නොදුන් බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

වර්ෂ 2015 අගොස්තු මස මහ මැතිවරණ දිනට පෙර ඔහුගේ වැඩ තහනම් කරන බවට ප්‍රචාරයක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුල පතුරුවා හැර තිබූ බවත්, මහ මැතිවරණය පැවැත් වූ වර්ෂ 2015.8.17 වන දිනට පසු දින එනම් වර්ෂ 2015.8.18 වන දින ඔහුගේ වැඩ තහනම් කිරීම් ලිපිය තවත් චෝදනාපත්‍රයකුත් සමග පිරිපහදු කළමණාකරු විසින් ඔහුගේ අතටම භාර දීමට ක්‍රියා කළ බවත්, සිය සාක්ෂියේදී කියා ඇත. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුල යම් විමර්ශනයක් සහ විගණනයක් සිදු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අනුමැතිය සහ නිර්දේශය ලබා ගත යුතු බවත්, එසේ නොමැතිව වර්ෂ 2015 ජනවාරි මස සිට ඔහුට එරෙහිව ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන හා විගණනයන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතාගේ තනි අභිමතයට, විගණන හා විමර්ශන කළමණාකරුවන් දෙදෙනෙකු භාවිතා කර සිදු කර ඇති බවත්, කියා ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් ඔහු සම්බන්ධ වාර්තාවක් අභ්‍යන්තර විගණන කළමණාකරුගෙන් කැඳවන අතර, ඒ අනුව පැ-7 දරණ වර්ෂ 2015.2.24 දිනැති විමර්ශන වාර්තාව කළමණාකාර අභ්‍යන්තර විගණන විසිනුත්, පැ-8 දරණ වර්ෂ 2015.2.24 දිනැති විමර්ශන වාර්තාව කළමණාකාර (ආරක්ෂක/විමර්ශණ) විසිනුත් ඉදිරිපත් කරන ඇත.

පැ-7 දරණ ලේඛණයේ ශීර්ෂ 10 ක් යටතේ ඔහුට එරෙහිව යොමුකර ඇති පැමිණිලි 10 සම්බන්ධයෙන් අදාල සිද්ධීන් පැහැදිලි කරමින් ඔහු විසින් සාක්ෂි ලබා දී ඇති අතර (වර්ෂ 2020.7.29 දිනැති සාක්ෂි සටහන්වල 38 සිට 47 දක්වා පිටු) එකී සිද්ධීන්ට අදාලව ඔහුට චෝදනා කිරීමට පදනමක් නොමැති බවට ඔහු සාක්ෂි දෙමින් කියා ඇත.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තීරණ ගැනීමේදී සියලු තීරණ ගන්නේ අධ්‍යක්ෂක මණ්ඩලයයි. ඒ සඳහා ආයතනික මට්ටමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් සහ කළමණාකරුවන් සිටී. ඊට පහලින් කාර්යාංශ ප්‍රධානීන් සිටින බවත්, චමින්ද සමරකෝන් මහතා කාර්යාංශ ප්‍රධානියෙකු පමණක් බවත්, ඔහුගේ තනි මතයට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුළ තීරණ ගැනීමට නොහැකි බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. පැ-8 දරණ ලේඛනයෙහි කරුණු 7 ක් යටතේ ඔහුට එරෙහිව විමර්ශනය කරනු ලබන පැමිණිලි දක්වා තිබෙන බවත්, එකී සිද්ධීන් සම්බන්ධයෙන් වෙන් වෙන්ව සිද්ධීන් පැහැදිලි කරමින් සාක්ෂි ලබා දීමක් ඔහු විසින් සිදුකර ඇති අතර (වර්ෂ 2020.7.29 දින සාක්ෂි සටහන් වල 48 වන පිටුවේ සිට 55 පිටුව දක්වා) එකී සිද්ධීන්වලටද අදාළව ඔහුට එරෙහිව චෝදනා කිරීමට පදනමක් නොමැති බවත්, පැ-7 හා පැ-8 දරණ ලේඛන ඉදිරිපත් කර ඇත්තේ ඔහුට එරෙහිව ආයතනය තුළ විනය ක්‍රියා මාර්ග ගැනීමේ අරමුණෙන්ය.

මානව සම්පත් අංශයේ ප්‍රධානියා වූ එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් චමින්ද සමරකෝන් මහතා දූෂණ ක්‍රියා රාශියකට සම්බන්ධ වංචනිකයෙක්, වැරදිකරුවෙක් ලෙසට හුවා දක්වමින්, පාඨලී චම්පික රණවක අමාත්‍යවරයාගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය පරිදි එස්. ඩබ්ලිව්. ගමගේ මහතා ක්‍රියා කළ බවත්, බොරු චෝදනා මත

චමින්ද සමරකෝන් මහතා දරා සිටි තනතුරෙන් ඉවත් කොට එම තනතුරට ඔවුන්ට හිතවත් නියෝජ්‍ය අලෙවි කළමණාකාර වැඩබලන තනතුරේ සිටි ලක්ෂ්මන් අබේගුණවර්ධන මහතා චමින්ද සමරකෝන් මහතාගේ තනතුරට පත් කිරීමට සූදානමින් සිටි බවත්, ඔහුගෙන් ද්වේෂ සහගතව පලිගැනීමේ චේතනාවෙන්, මානසිකව බරපතල පීඩාවක් ඇති වන ආකාරයෙන් ක්ෂනිකව ක්‍රියාත්මක වෙමින් මෙම ක්‍රියාවන් සිදු කර ඇත.

ආයතනයේ සමාන්‍ය පරිචය අනුව පැමිණිලි හා චෝදනා ආයතනයට ඉදිරිපත් වූ විට එකී පැමිණිලි සහ පෙත්සම් සභාපතිවරයාට යොමු කළ යුතු බවත්, අනතුරුව සභාපති යටතේ පවතින විමර්ශන අංශයට සහ විගණන අංශයට  විමර්ශනය සඳහා යොමු කරනවාද යන්න සහ පරීක්ෂණ කටයුතු ඉදිරියට පවත්වාගෙන යන්නේද යන්න තීරණය කරනුයේ සභාපතිවරයා විසින් බවත්, මානව සම්පත් සහ පාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් චමින්ද සමරකෝන් මහතා සම්බන්ධයෙන් සිදුකරනුයේ විමර්ශනයක්ද නැතහොත් විගණනයක්ද යන්න තීරණය කළ බවත්, ඔහු විසින්ම වාර්තා කැඳවන බවත්, එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් සභාපතිවරයා නොමග යවමින් චමින්ද සමරකෝන් මහතාගෙන් දේශපාලනිකව පලිගැනීමේ චේතනාවෙන් දිගින් දිගටම කටයුතු කරගෙන ගොස් ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

ඩබ්ලිව්. ආර්. පී. ආරියදාස යන නමින් දින රහිත පෙත්සමක් "පන්නල ගිරිඋල්ල ප්‍රදේශයේ අවතැන් පවුල් 2500 ක් සඳහා සහනාධාර ලබාදීමේ මුවාවෙන් රු. 6,146,110/= ක මුදලක් වංචා කිරීම" යන ශීර්ෂය යටතේ ඔහුට එරෙහිව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) වෙත ඉදිරිපත් කර ඇති බවත්, එකී ලිපියේ

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) කාර්යාලයේ දින මුද්‍රාව වර්ෂ 2015.1.27 ලෙසින් සටහන් වී ඇති බවත්, පෙත්සම ඉදිරිපත් කළ අය ලෙස නම් සඳහන් අය එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ ජාතික සේවක සංගමයේ හිටපු සභාපතිවරයෙකු බවත්, සාක්ෂි දී ඇත. ඔහු එකී පෙත්සම පැ-9 ලෙස ලකුණු කොට ඉදිරිපත් කර ඇත. එකී පැ-9 දරණ පෙත්සම මගින් ව්‍යාජ බිල්පත් 4 ක් ඉදිරිපත් කර ඇති බවත්, චමින්ද සමරකෝන් මහතා SAP වවුචරය සකස් කර ඇති බවත්, හිටපු සභාපති සහ මුදල් අංශය නොමග යවා නිර්දේශ ලබාගෙන හිටපු කළමණාකාර අධ්‍යක්ෂක සුසන්ත ද සිල්වා සහ චමින්ද සමරකෝන් මහතා විසින් එකී වංචාව කර ඇති බවට එකී පැ-9 දරණ පෙත්සමෙන් චෝදනා කර තිබූ බවත්, පැ-9 ලේඛනය මත කඩිනමින් විමර්ශනය කරන ලෙසට එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් වර්ෂ 2015.1.27 වන දින කළමණාකාර (ආරක්ෂක සහ විමර්ශන) වෙත දැනුම් දී ඇති බවත්, ඊට අදාලව පැ-10 දරණ වාර්තාව වර්ෂ 2015.2.21 වන දින කළමණාකාර (ආරක්ෂක සහ විමර්ශන) විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතා හරහා සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

ආරක්ෂක සහ විමර්ශන අංශය සමඟ සෘජුව ගණුදෙනු කිරීමේ බලය පවතින්නේ සභාපතිවරයාට බවත්, එසේ තිබියදී ආරක්ෂක සහ විමර්ශන අංශයේ කළමණාකරු වෙතින් පැ-10 දරණ වාර්තාව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) විසින් කැඳවීම මගින්, ඔහුගෙන් දේශපාලනිකව පළිගැනීම සඳහා ඔහුගේ රාජකාරීමය බලය අනිසි ලෙස භාවිතා කර ඇති බවත්, පවසා ඇත. පැ-9 දරණ පෙත්සමට අදාලව විමර්ශන සහ ආරක්ෂක කළමණාකරුගේ වර්ෂ 2015.2.21 දිනැති පැ-10 දරණ වාර්තාව මගින් නිරීක්ෂණ 23 ක්

දක්වා ඇති බවත්, නිරීක්ෂණ අංක. 22 සහ 23 මගින් හිටපු කළමණාකරණ අධ්‍යක්ෂවරයාගේ ඍජු මැදිහත්වීම තිබෙන නිසා සහ හිටපු අමාත්‍යාංශ ලේකම් හා ආයතනයේ හිටපු සභාපතිවරයාගේ උපදෙස් හා අනුමැතිය දී ඇති බව තහවරු වන හෙයින් එම තත්ත්වයන් තව දුරටත් තහවුරු කර ගැනීම වැදගත් බැවින් රජය යටතේ පවතින දූෂණ විරෝධී කමිටුව හරහා සොයා බැලීම් සුසුදු බව යෝජනා කර ඇති බවත්, වමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පන්නල ගිරිඋල්ල ප්‍රදේශයේ අවතැන් වූ පිරිස් වෙත සහනාධාර ලබා දීම සඳහා මුදල් යෙදවීමේ ගණුදෙනුව අනුර ප්‍රියදර්ශන අමාත්‍යවරයාගේත්, අමාත්‍යාංශ ලේකම්වරයාගේත්, සංස්ථා සභාපති එස්. අමරසේකර මහතාගේත්, කළමණාකරණ අධ්‍යක්ෂක සුසන්ත සිල්වා මහතාගේත්, සංස්ථාවේ වැඩ බලන මුදල් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සරත් පෙරේරා මහතාත් යන ඉහළ නිලධාරීන් සියලු දෙනාගේම අනුමැතිය මත සිදු වූ නීත්‍යානුකූල ගණුදෙනුවක් බවත්, පැ-10 වාර්තාව ඉදිරිපත් කරන විටත් එකී අනුමැතිය දුන් නිලධාරීන්ගෙන් ප්‍රකාශයක් හෝ සටහන් කර ගැනීම කර නොමැති බවත්, අඩුම තරමේ පෙත්සම ඉදිරිපත් කළ ඩබ්ලිව්. ආර්. පී. ආරියදාස යන තැනැත්තාගෙන් පවා ප්‍රකාශයක් සටහන් කරගෙන නොමැති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

තවද පැ-9 පෙත්සමෙන් චෝදනා කර ඇති මුදල්, චෙක්පතකින් ලංකා සතොස ආයතනයට ගෙවා ඇති බවත්, එකී චෙක්පත මගින් ගෙවීම සඳහා ගෙවුම් වවුචරය සකසා පරීක්ෂා කොට අනුමත කළ මුදල් කාර්යාංශයේ කිසිවකුගේ ප්‍රකාශයක් හෝ චෙක්පත අත්සන් කළ ගණකාධිකාරී දෙදෙනාගෙන්ද ප්‍රකාශයක් හෝ ලබා ගැනීමකින්

තොරව පැ-10 වාර්තාව ඉදිරිපත් කර ඇති බවත්, එලෙසට ප්‍රකාශ ලබා නොගැනීමට ක්‍රියා කර ඇත්තේ ඔවුන් වර්ෂ 2015 බලයට පත් වූ ආණ්ඩුවේ හිතවතුන් වූ නිසා බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

වර්ෂ 2015.2.21 දිනැති පැ-10 දරණ විමර්ශන වාර්තාව පදනම් කර ගෙන වර්ෂ 2015.2.24 දිනැතිව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) විසින් සභාපතිවරයා වෙත නිරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කළ බවත්, කියා ඇති අතර එකී වාර්තාව පැ-11 ලෙස සාක්ෂියේදී ලකුණු කර ඇත.

සභාපතිවරයා විසින් පැ-10 වාර්තාව මත පදනම්ව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතාට නිරීක්ෂන සහිත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමක් සිදු කර නොතිබූ බවත්, එසේ තිබියදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින්ම පැ-11 ලේඛනය මගින් නිරීක්ෂණ 22 ක් ඉදිරිපත් කර ඇති බවත්, පැ-11 ලේඛණයේ අංක. 17, 18, 19, 20, 21 සහ 22 යටතේ සඳහන් කර ඇති කිසිවක් පැ-10 වාර්තාවේ සඳහන් වී නොතිබූ බවටත්, සාක්ෂි දෙමින් කියා ඇත.

චෝදනා සම්බන්ධයෙන් වැඩිදුර කරුණු සොයා බැලීමට රජයේ දූෂණ විරෝධී කමිටුවට පැමිණිලි කිරීම සුදුසු බවට පැ-10 වාර්තාවෙන් යෝජනා කර තිබූ බවත්, එසේ තිබියදී පැ-10 වාර්තාවෙන් යෝජනා නොකළ නිර්දේශයන් පැ-11 මගින් එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් සිදු කර ඇති බවත්, පැ-11 හි 22 වන නිර්දේශය මගින් "අවිධිමත් ලෙස සංස්ථා ධනය වියදම් කිරීම" වැනි බරපතල අක්‍රමිකතාවයන්ට අලෙවි කළමණාකාර (සිල්ලර) ධූරය දැරූ චමින්ද සමරකෝන් මහතා වග

කිවයුතු බවට නිර්දේශ කර ඇති බවත්, ඔහු සම්බන්ධයෙන් පමණක් වැඩ තහනම් කර විනය පරීක්ෂණයක් පැවැත්වීමටත්, අනෙක් අය සඳහා රජයේ දූෂණ විරෝධී කමිටුවට පැමිණිලි කිරීම සුදුසු බවට යෝජනා කර ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

ඒ අනුව පැ-10 වාර්තාවේද සඳහන් නොවන කරුණු පැ-11 වාර්තාවේ එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් ඇතුලත් කර ඇත්තේත්, පැ-11 මගින් ඔහුගේ වැඩ තහනම් කරන ලෙසට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් යෝජනා කර ඇත්තේත්, ද්වේශ සහගත ලෙස චමින්ද සමරකෝන් මහතාගෙන් පළි ගැනීම සඳහාය.

සංස්ථාවේ කළමණාකරුවෙකුට රු. 6,146,000/= ක මුදලක් වංචා කිරීමේ හැකියාවක් නොමැති බවට සංස්ථාවේ ඉහළ කළමණාකාරිත්වයේ කථා බහට ලක් වූ බවත්, එකී තත්ත්වය මත වැඩ තහනම් කිරීම තාවකාලිකව අත්හිටුවීම සභාපතිවරයා විසින් සිදු කළ බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් අපේක්ෂා කළ පරිදි චමින්ද සමරකෝන් මහතාගේ වැඩ තහනම් කිරීම කළ නොහැකි වූ විට නැවත වතාවක් වර්ෂ 2015.3.24 දිනැතිව කළමණාකාර (ආරක්ෂක/විමර්ශන) ගෙන් ඔහුට එරෙහිව ඇති පැමිණිලි සම්බන්ධ වාර්තාවක්ද, වර්ෂ 2015.3.24 දිනැතිව කළමණාකාර (අභ්‍යන්තර විගණන) ගෙන් තවත් වාර්තාවක්ද, කැඳවා ඇති බවත්, එකී වාර්තා කූට ලෙස සකසා ඇති බවත්, එකී වාර්තා ඉදිරිපත් කළ වර්ෂ 2015.3.24 වන දිනම ඔහුව සපුගස්කන්ද බෙදා හැරීමේ පර්යන්තයට ස්ථානමාරු කිරීම සිදු කර ඇති බවත්, වර්ෂ 2015.3.24 දිනැති ඔහුගේ

ස්ථාන මාරු කිරීමේ ලිපිය පැ-12 ලෙස ලකුණු කොට ඉදිරිපත් කර ඇත. පැ-12 ලේඛණයේ අන්තර්ගතය පරීක්ෂා කිරීමේදී ඉහත සඳහන් කරුණු පෙනීයන බව තවදුරටත් සඳහන් කර ඇත.

පැ-12 ස්ථාන මාරු කිරීමේ ලිපියේ සඳහන් වර්ෂ 2015.3.24 දිනැති වාර්තා දෙක පැ-12(අ) සහ පැ-12(ආ) ලෙස චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂියේදී ලකුණු කොට ඇත. පැ-8 වාර්තාවේ ඔහුට එරෙහිව පැමිණිලි  ක් දක්වා තිබූ අතර පැ-12(අ) වාර්තාවේ පැමිණිලි 6 ක් පමණක් අන්තර්ගත වූ බවත්, පැ-7 හි පැමිණිලි 10 ක් දක්වා ඇති බවත්, පැ-12(ආ) හි පැමිණිලි 5 ක් ලෙසට අඩු වී තිබූ බවත්, පැ-12(අ) සහ පැ-12(ආ) වාර්තා මගින් හුදෙක් ඔහුට එරෙහිව එල්ල වී ඇති පැමිණිලිවල ශීර්ෂයන් පමණක් දැක්වෙන බවත්, පැ-12(අ) සහ පැ-12(ආ) දරණ ලේඛන ඉදිරිපත් කර ඇත්තේ ඔහුගේ සේවා ස්ථානය මාරු කිරීමේ අරමුණෙන් බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-12 ලේඛණය අනුව ඔහුව ස්ථාන මාරුවට ලක් කළ පසුව ඔහු එකී තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අංක. SC FR 137/15 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම ඉදිරිපත් කළ බවත්, එකී මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් ඔහු සේවයේ යෙදී සිටි ස්ථානයේ නැවත සේවයේ පිහිටුවන ලෙසට ඉල්ලා සිටි බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. එකී අංක. SC FR 137/15 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම පැ-13 ලෙස සිය සාක්ෂියේදී සලකුණු කර ඇත.

පැ-12 දරණ ස්ථාන මාරු කිරීමේ ලිපිය මගින් චමින්ද සමරකෝන් මහතා භාරයේ ඇති රාජකාරී ලිපිගොනු අංශ ප්‍රධානියාට භාර දෙන ලෙසට දැනුම් දී තිබූ බවත්, ඒ අනුව ආරක්ෂක අංශයේ අධීක්ෂණය

යටතේ එම ලිපිගොනු භාර දීමට කටයුතු කරන බවට වර්ෂ 2015.4.6 දිනැති පැ-14 ලෙස ලකුණු කරන ලද ලිපියෙන් ඔහු මානව සම්පත් කළමණාකරු වෙත දැනුම් දුන් බවත්, පැ-14(අ) ලෙස සලකුණු කරන ලද වර්ෂ 2015.4.8 දිනැති ලිපිය මගින් අදාල ලිපිගොනු ආරක්ෂක අංශයේ හා අභ්‍යන්තර විගණන අංශයේ අධීක්ෂණය යටතේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) වෙත භාර දීමේ කටයුතු වර්ෂ 2015.4.9 වන දින සිට ක්‍රියාත්මක කරන බව දැනුම් දුන් බවත්, එලෙස වඩා සුපරීක්ෂාකාරී ලෙස අධීක්ෂණයන් යටතේ ලිපිගොනු භාර දීම සඳහා ඔහු අපේක්ෂා කළේ, වර්ෂ 2015.1.8 මැතිවරණයෙන් පසුව බලයට පත් වූ නව රජය යටතේ ඔහුගේ කාර්යාලය මුද්‍රා තැබීම, නිර්ණාමික පෙත්සම් පදනම් කරගෙන ඔහුට විරුද්ධව විමර්ශන 30 ක් පමණ ඇරඹීම යන සිදුවීම් යටතේ, චමින්ද සමරකෝන් මහතා භාරයේ තිබූ ලේඛන අස්ථානගත කර කිසියම් ආකාරයකින් ඔහුගේ කීර්ති නාමයට සහ රැකියාවට කැළලක් වන දෙයක් දූෂිත පාලනයට සම්බන්ධ නිලධාරීන් විසින් සිදු කරනු ඇතැයි ඔහුගේ සිතේ ඇති වූ සිතුවිල්ල නිසා බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

වර්ෂ 2015.4.8 වන දින චමින්ද සමරකෝන් මහතා රාජකාරී කටයුතු නිම වී නිවසට ගිය පසු ඔහුගේ කාර්යාල කාමරයට ඇතුලුවිය නොහැකි ලෙස මුද්‍රා තබා තිබූ බවත්, ඔහු එය දැනුවත් වූයේ ඊට පසු දින බවත්, කාර්යාල කාමරය මුද්‍රා තබා ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) ක්‍රිශාන්ත වික්‍රමසිංහ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ සහ සභාපති රංජිත් වික්‍රමසිංහ යන අයවලුන්ගේ අනුදැනුම මත බවත්, එකී තත්ත්වය නිසා සිය ලිපිගොනු නිසි පරිදි භාර දීමට ඔහුට නොහැකි වූ බවත් පවසන ලදි.

වර්ෂ 2015.4.7 දිනැතිව නිර්නාමිකව සහ අත්සන් රහිතව ලිපියක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) හට පිටපත් සහිතව සභාපතිවරයා වෙත යොමු වී තිබූ බවත්, එකී ලිපිය මගින් චමින්ද සමරකෝන් මහතාගේ විනය විරෝධී සහ වංචා දූෂණ පිලිබඳ තොරතුරු අන්තර්ගත ලිපිගොනු, ලේඛන භාරකරුවාගේ සහ තවත් කිහිපදෙනෙකුගේ සහයෝගය ලබා ගනිමින් අස්ථාන ගත කොට ඉදිරි පරීක්ෂණ කටයුතු අඩාල කිරීමට කටයුතු කරන බවට දක්වා තිබූ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. එකී ලිපිය පැ-14(ආ) ලෙස සිය සාක්ෂිය මගින් සලකුණු කොට ඉදිරිපත් කර ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) පැ-14(ආ) දරණ නිර්නාමික සහ අත්සන්කරු නොමැති ලිපිය මත පදනම්ව චමින්ද සමරකොන් මහතාට සිය පෞද්ගලික භාණ්ඩ රැගෙන කාර්යාල කාමරයෙන් ඉවත් වන ලෙසට එකී ලිපියේ සටහනක් යොදා ඇති බවත්, ඔහු විසින් යොමු කළඉපැ-14 සහ පැ-14(අ) දරණ ලිපි කෙරෙහි සැලකිල්ලක් නොදක්වා ඇති බවත්, නිර්නාමික 14(ආ) ලිපිය මත පාලනාධිකාරය කඩිනමින් ක්‍රියාත්මක වී ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. චමින්ද සමරකෝන් මහතාට එකී තත්ත්වයන් මත සිය රාජකාරී ලිපිගොනු නිසි පරිදි භාර දීම සිදු කිරීම අවහිර කර ඇති බව ඔහු විසින් පැ-14(ඇ) දරණ වර්ෂ 2015.4.9 දිනැති ලිපිය මගින් මානව සම්පත් කළමණාකරු වෙත දන්වා යැවූ බවත්, එකී පැ-14(ඇ) ලිපියට කිසිදු පිලිතුරු ලිපියක් නොලැබුණු බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතා පැ-12 ලේඛණය පරිදි වර්ෂ 2015.3.24 වන දින ස්ථානමාරු කිරීම සිදු කිරීමෙන් අනතුරුව වර්ෂ 2015.8.18 වන දින ඔහුගේ වැඩ තහනම් කිරීම සිදු කළ බවත්, එකී වැඩ තහනම්

කිරීම සිදු කළේ මහ මැතිවරණය පැවැත් වූ වර්ෂ 2015.8.17 දිනට පසු දින මැතිවරණ ප්‍රතිඵල නිකුත් වෙමින් පැවතියදී බවත්, සාක්ෂි දී කියා ඇත. ඔහුගේ වැඩ තහනම් කරමින් සභාපතිවරයා වර්ෂ 2015.8.18 නිකුත් කරන ලද ලිපිය පැ-15 ලෙස සිය සාක්ෂියේදී සළකුණු කර ඇත. ඔහුගේ වැඩ තහනම් කිරීමේ පැ-15 දරණ ලිපිය පිරිපහදු කළමණාකාර ධූරය දැරූ නීල් ජයසේකර මහතා විසින් වර්ෂ 2015.8.18 දිනම චමින්ද සමරකෝන් මහතාගේ අතටම භාර දුන් බවත්, නීල් ජයසේකර යන අය එක්සත් ජාතික පාක්ෂිකයෙක් සහ ආධාරකරුවෙකු බවත්, වැඩ තහනම් කිරීමේ ලිපිය අතින් බාර දෙන්නේ කුමක් නිසාදැයි විමසූ විට "ඉහලින් ආපු ඕඩර් එකක් මත එය සිදු කළ බව" ප්‍රකාශ කළ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. පැ-15 ලිපිය අනුව ඔහුගේ වැඩ තහනම් කර ඇත්තේ චෝදනා රාශියක් මත පදනම්ව වන බවට දක්වා තිබුණද, ඔහුට එරෙහිව පැවති අංක. 2580 දරණ විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබා දුන් මානව සම්පත් අංශයේ සී. පී. වැලිකල මහතා සඳහන් කර ඇත්තේ වර්ෂ 2015 පැවති ජනාධිපතිවරණ සමය තුළ පන්නල හා ගිරිඋල්ල ප්‍රදේශයේ අවතැන් වූ පවුල් 2500 ක් සඳහා සහනාධාර ලබා දීමේ මුවාවෙන් මුදල් වංචා කිරීමේ සිද්ධිය සම්බන්ධව කළමණාකාර ආරක්ෂක විසින් සිදු කර ඇති විමර්ශන වාර්තාව අනුව වැඩ තහනම් කිරීම සිදු කර ඇති බවත්, එකී සාක්ෂිය සහිත සාක්ෂි සටහන් පැ-16 ලෙස සිය සාක්ෂිය මගින් සළකුණු කර ඉදිරිපත් කර ඇත.

දේශපාලනිකව පලිගැනීමේ අරමුණෙන් චමින්ද සමරකෝන් මහතාගේ වැඩ තහනම් කර ඇති බව ඔහු විසින් වර්ෂ 2015.8.19 දිනැතිව පැ-17 ලෙස සළකුණු කරන ලද පැමිණිල්ල මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ බවත්, ඒ අනුව මැතිවරණ කාල

සීමාව තුළ වැඩ තහනම් කිරීම දේශපාලන බලපෑම් මත සිදු වී ඇත්දැයි මැතිවරණ කොමසාරිස්වරයාට වාර්තා කරන ලෙසට සහ විනය ක්‍රියාමාර්ග ගැනීම සති දෙකක් ප්‍රමාද කරන ලෙසට පැ-18 ලෙස සළකුණු කළ වර්ෂ 2015.8.22 දිනැති ලිපියෙන් විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටි බවත්, එකී පැ-18 ලිපියට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා වර්ෂ 2015.8.27 වන දිනැති පිලිතුරු ලිපියක් අමාත්‍යාංශ ලේකම්වරයා හරහා මැතිවරණ කොමසාරිස්වරයාට ඉදිරිපත් කොට තිබූ බවත්, එකී ලිපිය පැ-19 ලෙස සාක්ෂියේදී සළකුණු කරන බවත්, සාක්ෂියේදී කියා ඇත.

පැ-19 ලිපිය මගින් සභාපතිවරයා, ඔහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සති 2 ක් ප්‍රමාද කළ බවට සඳහන් කළද, එලෙසට විනය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කිරීමක් සිදු නොකළ බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂියේදී කියා ඇත. පැ-19 දරණ ලිපිය මගින් චමින්ද සමරකෝන් මහතා ඔහුගේ ස්ථාන මාරු කිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක. SC FR 137/2015 දරණ මූලික අයිතිවාසිකම් නඩුව පවරා ඇති බවත්, ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවට අදාලව ඔවුන් වෙත ලබා දුන් උපදෙස් මත කඩිනමින් සිදු කළ යුතු විනය පරීක්ෂණ හා බැඳුණු වැඩ තහනම් කිරීමක් ලෙසට එකී ලිපියේ දක්වා තිබූ බවත්, එලෙසට සඳහන් කර තිබීමම ප්‍රශ්නගත තත්ත්වයක් බවත්, එලෙස වැඩ තහනම් කිරීමට උපදෙස් ලැබීමක් සිදු වී නොමැති බවත්, කරුණු විකෘති කරමින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත එකී පැ-19 ලිපිය යොමු කිරීමට සභාපතිවරයා විසින් කටයුතු සිදු කර තිබූ බවත්, සාක්ෂියේදී කියා ඇත.

චමින්ද සමරකෝන් මහතාගේ වැඩ තහනම් කිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවරන ලද අංක. SC FR 418/2015 දරණ මූලික අයතිවාසිකම් නඩුවේ පෙත්සම පැ-20 ලෙස පැමිණිල්ල විසින් සළකුණු කර ඇත. ඊට පෙර චමින්ද සමරකෝන් මහතා විසින් තමන්ව ස්ථාන මාරු කිරීමට එරෙහිව පවරන ලද අංක. SC FR 137/2015 දරණ මූලික අයතිවාසිකම් නඩුව කැඳවීමට තිබුනේ වර්ෂ 2015.8.31 වන දින බවත්, එකී නඩු කටයුත්ත ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි වන ලෙස ඔහුගේ වැඩ තහනම් කිරීම වර්ෂ 2015.8.18 වන දින සිදු කරනු ලැබ ඇත.

චමින්ද සමරකෝන් මහතා වෙත වරින් වර චෝදනා පත්‍ර පහක් ඉදිරිපත් කළ බවත්, එහිදී කලවංචිකුඩි හි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයකට අදාලව ඉදිරිපත් කළ අංක. LGL/DIU/15/2579 හා වර්ෂ 2015.8.7 දින දරණ චෝදනා පත්‍රය පැ-21 ලෙසත්, පන්නල ලංකා සතොස ආයතනයට මුදල් ගෙවීමක් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයකට අදාලව ඉදිරිපත් කළ අංක. LGL/DIU/15/2580 හා වර්ෂ 2015.8.14 දින දරණ චෝදනා පත්‍රය පැ-22 ලෙසත්, ආයතනික සමාජ වගකීම් හා විකුණුම් ප්‍රවර්ධනය සඳහා කරන ලද වියදම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශයෙන් ඉදිරිපත් කළ වාර්තාවක් අනුව ඉදිරිපත් කළ අංක. LGL/DIU/15/2581 හා වර්ෂ 2015.12.3 දින දරණ චෝදනා පත්‍රය පැ-23 ලෙසත්, මාපා ගුණරත්න ඉන්ධන පිරවුම්හලට අදාලව ඉදිරිපත් කල LGL/DIU/15/2582 හා වර්ෂ 2015.12.1 දින දරණ චෝදනා පත්‍රය පැ-24 ලෙසත්, අලව්ව පුද්ගලික ඉන්ධන පිරවුම්හලක් නව පාර්ශවයකට පැවරීම සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයකට අදාලව ඉදිරිපත් කරන ලද

අංක. LGL/DIU/15/2585 හා වර්ෂ 2016.5.26 දින දරණ චෝදනා පත්‍රය පැ-25 ලෙසත්, ලකුණු කොට ඔහු ස්වකීය සාක්ෂිය මගින් ඉදිරිපත් කර ඇත.

චමින්ද සමරකෝන් මහතාට ඉහත කී චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීමේදී එකී චෝදනා සමස්ථයක් ලෙස චෝදනා පත්‍ර දෙකකින් සිදුකළ හැකිව තිබූ බවත්, එසේ තිබියදී ඔහුට එරෙහිව වෙන් වෙන්ව චෝදනා පත්‍ර පහක් එකිනෙකට ආසන්න දිනයන්හිදී ඉදිරිපත් කිරීම ඛනිජ තෙල් නීතිගත සංස්ථා ඉතිහාසයේ ප්‍රථම වතාවට සිදු කරන ලද්දේ ඔහුට එරෙහිව බවත්, එමගින් පාලනාධිකාරිය හා සභාපතිවරයා අපේක්ෂා කර ඇත්තේ චමින්ද සමරකෝන් මහතා ආර්ථිකමය ලෙස පහත හෙළීමත්, දැඩි මානසික පීඩනයකට ලක්කිරීමත්, ඔහු විසින්ම සංස්ථාවේ සේවය අතහැර යන තත්ත්වයකට පත් කිරීමත් බව සිය සාක්ෂි ලබා දෙමින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතාට එරෙහිව දේශපාලනිකව පලිගැනීම පාඨලී චම්පික රණවක අමාත්‍යවරයාගෙන් ඇරඹි බවත්, සංස්ථා සභාපති රංජිත් වික්‍රමසිංහ සහ පසුව සභාපති වූ ටී. ජී. ජයසිංහ මහතා එකී පලිගැනීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන ගිය බවත්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ සහ නීති අංශයේ ප්‍රධාන නීති නිළධාරී කුමුදු ආරියරත්න යන අයගේ අනුදැනුම මත ඉතා සූක්ෂම අයුරින් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව දේශපාලනිකව පලිගැනීම සිදු වූ බවත්, සඳහන් කර ඇත.

චමින්ද සමරකෝන් මහතාට එරෙහිව ඉදිරිපත් කළ චෝදනා පත්‍ර 5 න්, පැ-22 දරණ අංක. LGL/DIU/15/2580 හා වර්ෂ 2015.8.14 දින දරණ චෝදනා පත්‍රය, පැ-23 දරණ අංක. LGL/DIU/15/2582 හා වර්ෂ

2015.12.3 දින දරණ චෝදනා පත්‍රය, පැ-24 දරණ අංක. LGL/DIU/15/2585 හා වර්ෂ 2016.5.26 දින දරණ චෝදනා පත්‍රය යන චෝදනා පත්‍ර තුන සම්බන්ධ විනය පරීක්ෂණ අවසන් කළ බවත්, ඉන් අංක. 2580 (පැ-22) හා 2581(පැ-23) දරණ චෝදනා පත්‍රවල සඳහන් චෝදනාවලට ඔහු වරදකරු කළ බවත්, ඒ මත වර්ෂ 2016.12.29 වන දින ටී.ජී. ජයසිංහ සභාපතිවරයා විසින් ඉතා අමානුෂිකව හා අසද්භාවයෙන් ඔහුව රැකියාවෙන් පහ කළ බවත්, චමින්ද සමරකෝන් මහතාව සේවයෙන් පහ කරන විටත්, අංක. 2579 (පැ-21) සහ අංක. 2585 (පැ-25) දරණ චෝදනා පත්‍රවලට පදනම් වූ විනය පරීක්ෂණ අවසන් කර නොතිබූ බවත්, සිය සාක්ෂි ලබා දෙමින් කියා ඇත. එහිදී ඔහු සේවයෙන් පහ කරන ලද වර්ෂ 2016.12.29 දිනැති ලිපිය පැ-26 ලෙස සිය සාක්ෂි මඟින් ලකුණු කරන ලදි. වර්ෂ 2016.12.29 වන දින ඔහුව සේවයෙන් පහ කිරීමෙන් පසුව, ඔහුගේ වැඩ තහනම් කිරීමට එරෙහිව ගොනු කර තිබූ අංක. SC FR 417/2015 දරන මූලික අයිතිවාසිකම් පෙත්සම නීතිඥ උපදෙස් මත ඉල්ලා අස්කර ගත් බව චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. එකී SC FR 417/2015 දරන මූලික අයිතිවාසිකම් නඩුව ඉල්ලා අස්කර ගැනීමට අදාල ලේඛණය පැ-27 ලෙස සාක්ෂියේදී ලකුණු කර ඇත. ඉන් අනතුරුව චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීමට එරෙහිව කොළඹ 08, කම්කරු විනිශ්වයාධිකරණයේ අංක 08/148 යටතේ ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පැ-28 ලෙසත්, චමින්ද සමරකෝන් මහතාගේ හිඟ වැටුප් ලබා ගැනීම සඳහා මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පැ-29 ලෙසත් සලකුණු කර සාක්ෂි මගින් ඉදිරිපත් කර ඇත.

චමින්ද සමරකෝන් මහතාට එල්ල වූ පැ-22 දරණ චෝදනා පත්‍රයට පදනම් වූ සිද්ධිය පැහැදිලි කරමින් සාක්ෂි ලබා දුන් අතර, එහිදී ඔහු සඳහන් කර සිටියේ, වර්ෂ 2014 අගභාගයේ ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙන් එවකට ඛනිජ තෙල් විෂය භාර ඇමතිවරයාගේ බල ප්‍රදේශය වූ පන්නල-ගිරිඋල්ල ප්‍රදේශයේ විපතට පත් වූ පවුල් 2500 ක් සඳහා සමාජ සත්කාරයක් ලෙසට වියළි සහනාධාර බෙදා දීමක් සිදු කරන ලෙසට අනුර ප්‍රියදර්ශන යාපා අමාත්‍යවරයාත්, අමාත්‍යාංශ ලේකම් සමරතුංග මහතාත්, සංස්ථාවේ සභාපතිව සිටි එස්. අමරසේකර මහතාත්, සංස්ථාවේ කළමණාකරන අධ්‍යක්ෂක ලෙස ක්‍රියා කළ සුසන්ත ද සිල්වා මහතාත් සාකච්ඡා කොට වැඩසටහනක් දියත් කළ බවත්, වර්ෂ 2014 සඳහා සංස්ථාවේ සමාජ සත්කාර කටයුතු සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කර තිබූ අයවැය ප්‍රතිපාදන යටතේ මෙම සමාජ සත්කාර වැඩසටහනට අදාලව රු. 6,146,110/= ක මුදලක් භාණ්ඩ සඳහා ලංකා සතොස ආයතනයට ගෙවීමට එකී නිලධාරීන් සාකච්ඡා කර තිබූ බවත්, ගංවතුර තත්ත්වය හිදිසි ව්‍යවසන තත්ත්වයක් නිසා රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ හදිසි ප්‍රසම්පාදනයක් වශයෙන් රාජ්‍ය ආයතනයක් වන ලංකා සතොස ආයතනයෙන් මිල දී ගැනීම සිදු කළ බවත්, සමාජ සත්කාර සහ ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සඳහා අයවැය ප්‍රතිපාදන වශයෙන් මිලියන 250 ක මුදලක් වෙන්කර තිබුණේ සංස්ථාවේ අලෙවි අංශය යටතේ බවත්, එසේ හෙයින් ඉහළ නිළධාරීන්ගේ උපදෙස් පරිදි අලෙවි කාර්යාංශයේ ප්‍රධානියා වශයෙන් වියදම සහතික කිරීම පමණක් චමින්ද සමරකෝන් මහතා විසින් සිදු කළ බවත්, ඔහුගෙන් දේශපාලනිකව පලිගැනීම සඳහා ඔහුට පමණක් චෝදනා නගා ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. පැ-22 චෝදනා පත්‍රයේ සඳහන්

පන්නල ලංකා සතොස ආයතනයට මුදල් ගෙවීම් සිදුවීමට අදාල ක්‍රියාවලියට නිලධාරීන් 23 දෙනෙකු සම්බන්ධ වූ බවත්, එකී කටයුතුවලට සම්බන්ධ නිලධාරීන් එක් එක් අය විසින් සිදු කළ කාර්යභාරය දක්වමින් චමින්ද සමරකෝන් මහතා විසින් සකස් කරන ලද පිටු 5 කින් යුක්ත ලේඛනයක් පැ-30 ලෙස සිය සාක්ෂියේදී ලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමණාකරණ අධ්‍යක්ෂක විසින් සභාපතිවරයාට වර්ෂ 2014.12.30 දිනැතිව යොමු කරන ලද ලිපිය චමින්ද සමරකෝන් මහතා පැ-30 ලෙස සලකුණු කළ අතර, එකී ලිපියේ සඳහන් පරිදි අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කළමණාකරණ අධ්‍යක්ෂක වරයාගේ සහ සභාපතිවරයා වෙත කරන ලද ඉල්ලීම පරිදි ගංවතුරෙන් අවතැන් වූ පවුල් 2500 කට වියළි සහනාධාර දීමට මුදල් ලබා දීමක් කරන ලෙසට ඉල්ලා ඇති බවත්, සපයන ලද භාණ්ඩවලට පන්නල ලංකා සතොස මගින් ඉදිරිපත් කර ඇති රු. 6,146,110/= ක වටිනාකම සහිත වවුචර්පත් ඉදිරිපත් කරමින් මුදල් ගෙවීම සඳහා කළමණාකරන අධ්‍යක්ෂකවරයා විසින් සභාපතිවරයාගෙන් අනුමැතිය ඉල්ලා ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. පැ-31 ලේඛණයේ, පැ-31A දරණ සටහන අනුව සමාජ වගකීමක් වශයෙන් සභාපතිවරයා මුදල් ගෙවීමට අනුමැතිය ලබා දී ඇති බවත්, පැ-31B දරණ සටහන අනුව කරුණාකර ගෙවීම් කරන ලෙසට කළමණාකරන අධ්‍යක්ෂකවරයා වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වෙත නියෝග කර ඇති බවත්, පැ-31C සටහන අනුව වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් SAP වවුචරය පිළියෙළ කොට ගෙවීම් කටයුතු සඳහා ගෙවීම් අංශයට වවුචරය යොමු කරන ලෙසට චමින්ද සමරකෝන් මහතා වෙත නියෝග කර ඇති බවත්, පැ-31D සටහන

අනුව ඔහු විසින් සිය අංශයේ සිටි සතිකා ගමගේ ලිපිකාරිණියට අදාල වියදම් වවුචරය සකස් කරන ලෙසට උපදෙස් දුන බවත්, ගෙවීම් වවුචරය චමින්ද සමරකෝන් මහතා සකස් නොකරන බවත්, ඔහු සිදු කරනු ලබන්නේ වියදම් වවුචරය සහතික කිරීම පමණක් බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

ඛනිජ තෙල් අමාත්‍යාංශය විසින් දියත් කළ එම සමාජ සත්කාර වැඩසටහනෙහි වර්ෂ 2014.12.30 දින වන විටත් මිල දී ගැනීම් සිදු වී තිබූ බවත්, ඊට අදාල ගෙවීම් සංස්ථාව මගින් සිදු කිරීමට ඉහළ පාලනාධිකාරිය විසින් තීරණය කර තිබූ බවත්, පවසා ඇත. මෙවැනි සමාජ සත්කාර කටයුතු සඳහා මුදල් වෙන් කිරීමට වර්ෂ 2014.3.7 දින හා අංක. 25/1144 දරණ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අනුව තීරණය කර ඇති බවත්, ඒ අනුව රුපියල් මිලියන දෙසිය පනහ (රු. මි. 250) ක මුදලක් ප්‍රචාරණ ප්‍රවර්ධන සහ සමාජ සත්කාර කටයුතු සඳහා වෙන් කිරීමට අධ්යක්ෂක මණ්ඩලය අනුමැතිය දී ඇති බවටත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දී ඇති අතර ඊට අදාල අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව පැ-31(i) ලෙසත්, අධ්‍යක්ෂක මණ්ඩල තීරණ දැක්වෙන ලේඛනය පැ-31(ii) ලෙසත්, අනුමත වූ රුපියල් මිලියන 250 ක අයවැය ප්‍රතිපාදන සංස්ථාවේ ගිණුම්කරණ පද්ධතිය වන SAP පද්ධතිය තුළ ප්‍රතිෂ්ඨාපනය කරන ලෙසට ඔහු වර්ෂ 2014.4.8 වන දින වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වෙත යොදන ලද සටහන පැ-31(iii) ලෙසත්, අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කළ රුපියල් මිලියන 250 ක අයවැය ප්‍රතිපාදන වාර්ෂික අයවැයට ඇතුලත් කරන ලෙසට වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මුදල් කළමණාකාර (මූල්‍ය වාර්තා සහ බදු) වෙත තබා ඇති සටහන පැ-31(iv) ලෙසත්, සාක්ෂිය මගින් සළකුණු කර

ඉදිරිපත් කර ඇත. ප්‍රචාරණ ප්‍රවර්ධන සහ සමාජ සත්කාර සඳහා 2014 වර්ෂයට වෙන්කළ රුපියල් මිලියන 250 ක මුදල පාලනය කිරීමේ පහසුව සඳහා අනු අයවැය ශීර්ෂ 3 ක් යටතේ වෙන්කර SAP පද්ධතිය තුළ පවත්වාගෙන ගිය බවට සාක්ෂි දී ඇත. එකී වෙන් කිරීම දැක්වෙන වර්ෂ 2014.04.11 වන දිනැති ලිපිය පැ-32 ලෙස ලකුණු කොට ඉදිරිපත් කර ඇත.

පැ-22 දරණ චෝදනා පත්‍රයෙන් ඔහුට චෝදනා එල්ල කළ සිද්ධියට අදාලව චමින්ද සමරකෝන් මහතාට පැවරී තිබූ එකම කාර්යය වූයේ වියදම් වවුචරය සකස් කොට වියදම සහතික කිරීම පමණක් බවත්, එකී කටයුත්ත ඔහුගේ අලෙවි කාර්යාංශය මගින් ඉටු කළ යුතු වූයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රචාරණ ප්‍රවර්ධන හා සමාජ සත්කාර සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්කර තිබුණේ අලෙවි කාර්යාංශය යටතේ නිසා බවත්, සාක්ෂි මගින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතාට වියදම් වවුචරය සකස් කිරීමට උපදෙස් ලැබෙනුයේ වර්ෂ 2014.12.30 වන දින බවත්, ඒ වන විට වර්ෂ 2014 අවසන් වීමට එක් දිනක් පමණක් ඉතිරිව තිබූ බවත්, ඒ වන විට 2014 වර්ෂයේ සමාජ සත්කාර කටයුතු සඳහා පැ-32 ලේඛණය අනුව වෙන්කර තිබූ අයවැය ප්‍රතිපාදන ආනකුත් කාර්යයන් සඳහා යොදාගෙන අවසන් වී තිබූ බවත්, ඒ හේතුවෙන් අධ්‍යක්ෂක මණ්ඩලය වෙන්කර තිබූ රුපියල් මිලියන 250 ක් තුල වූ අයවැය ප්‍රතිපාදන වලින් පැ-32 අනුව අනෙක් ශීර්ෂයන්ට වෙන්කර තිබූ මුදලින් අදාල ගෙවීම් සිදු කිරීම උදෙසා අවශ්‍ය මුදල් ප්‍රමාණයන් සමාජ සත්කාර සඳහා වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ගේ අනුමැතිය යටතේ වෙන් කරන ලෙසට චමින්ද සමරකෝන් මහතා ඉල්ලා සිටි බවත්, එකී ඉල්ලීම සිදු කළ ලිපිය පැ-33 ලෙස සලකුණු කොට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් පැ-33 ලිපියේ පැ-33A දරණ සටහන යොදමින් එහි සටහන් වී ඇති පරිදි අරමුදල් මාරු කිරීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කළමණාකාර (අයවැය) වෙත උපදෙස් දී ඇති බවත්, පැ-33B ලෙස සලකුණු කළ සටහන අනුව "එය ඉටු කරන ලෙසට" ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මුදල් කළමණාකරු (අයවැය) විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මුදල් කළමණාකරු (මූල්‍ය වාර්තා හා බදු) වෙත උපදෙස් දී ඇති බවත්, ඒ අනුව සමාජ සත්කාර වැය ශීර්ෂයට රුපියල් මිලියන 6.5 ක් මාරු කර එවා ඇත්තේ මූල්‍ය කාර්යාංශයේ ප්‍රධානියා බවත්, ඒ උදෙසා නිල බලය ඇත්තේද මූල්‍ය කාර්යාංශයේ ප්‍රධානියාට බවත් සාක්ෂි දෙමින් කියා ඇත්තේ ලංකා සතොස ආයතනයේ අදාල භාණ්ඩ භාර ගැනීම ඛනිජ තෙල් අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය විසින් සිදු කර ඇති බවත්, එකී කටයුත්ත සිදු කර ඇත්තේ සංස්ථාවේ පාලනාධිකාරිය හා අමාත්‍යවරයා විසින් සාකච්ඡා කර බවට සාක්ෂි දී ඇති අතර, ඊට අදාල ඉන්වොයිසි සහ බඩු නිකුත් කිරීමේ නිවේදනපත්‍ර 4 ක් පැ-34(i) සිට පැ-34(iv) දක්වා සළකුණු කර ඉදිරිපත් කර ඇත. පැ-34(i) සිට පැ-34(iv) ලේඛණ අනුව ලංකා සතොස පන්නල ගබඩාවෙන් භාණ්ඩ බාරගෙන ඇත්තේ ආර්. එම්. ඒ. ජේ. කුමාර යන අයෙකු විසින් බවත්, එම තැනැත්තා විෂයභාර අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ කාර්යාලයට අනියුක්ත ඛනිජ තෙල් සංස්ථාවේ දෛනික වැටුප් ලබන සේවකයෙකු බවත්, එකී ඉන්වොයිස් වල ඔහුගේ අත්සන හා ජාතික හැඳුනුම්පත් අංකය ඇති බවත්, චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පැවති විනය පරීක්ෂණයේදී ඉහත කී කුමාර නමැත්තා සාක්ෂි දෙමින්, ඔහු විසින් ඉහත කී භාණ්ඩ භාරගත් බව පිළිගෙන ඇති බවත්, චමින්ද සමරකෝන් මහතා ප්‍රකාශ කර ඇත.

පැ-22 දරණ චෝදනා පත්‍රයට පදනම් වූ පන්නල ලංකා සතොස සිද්ධියට අදාලව චමින්ද සමරකෝන් මහතා විසින් වියදම සහතික කළ වියදම් වවුචරය පැ-35 ලෙසත්, එම වවුචරය පිළියෙල කළ සනිතා ගමගේ යන අයගේ අත්සන දැක්වෙන කොටස පැ-35(A) ලෙසත්, වවුචරය පරීක්ෂා කළ අයගේ අත්සන දැක්වෙන කොටස පැ-35(B) ලෙසත්, වියදම් වවුචරය සහතික කළ චමින්ද සමරකෝන් මහතාගේ අත්සන දැක්වෙන කොටස පැ-35(C) ලෙසත්, මෙම විකුණුම් වවුචරය අනුමත කළ ගෙවීම් අංශයේ ගණකාධිකාරීවරයාගේ අත්සන සහිත කොටස පැ-35(D) ලෙසත්, සළකුණු කර ඉදිරිපත් කර ඇත. පැ-35 දරණ වියදම් වවුචරය මගින් කිසිදු ගෙවීමක් සිදු කර නොමැති බවත්, වියදම් වවුචරයක් මගින් සිදු කරන්නේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇති අයවැය ප්‍රතිපාදන අදාල කටයුතු සඳහා රඳවා තබා ගැනීම පමණක් බවත්, එකී කාර්යය අනුව පැ-35 දරණ වියදම් වවුචරය සකස්කළ බවත්, ගෙවීම් සිදු කිරීම සඳහා ගෙවීම් වවුචරයක් සකස් කළ යුතු බවත්, කියා ඇත. පැ-35 දරණ වියදම් වවුචරයේ වියදම සහතික කිරීම පමණක් චමින්ද සමරකෝන් මහතා විසින් සිදු කර ඇති බවත්, පැ-35(C) ලෙස ලකුණු කොට ඇත්තේ එකී සහතික කිරීම බවත්, එලෙසට වියදම සහතික කිරීම සංස්ථාවේ FP 006 දරණ මූල්‍ය රෙගුලාසිවල සහතික කිරීමකදී සපුරාලිය යුතු කරුණු 6 ක් තෘප්තවන්නේ නම් පමණක් එකී සහතික කිරීම සිදු කළ හැකි බවත්, පැ-35 හි වියදම සහතික කර ඇත්තේද එකී කරුණු 6 සපුරා ඇති නිසා බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-35 දරණ වියදම් වවුචරයේ වියදම සහතික කිරීම චමින්ද සමරකෝන් මහතා විසින් සිදුකළ පසු එකී සහතිකය අනුමත කළයුතු බවත්, අනුමත කිරීමේ නිළධාරියා සෑහීමකට පත්වන්නේ නම් පමණක්

එකී අනුමැතිය ලබාදෙන බවත්, එකී වියදම සහතික කිරීමට අනුමැතිය නොලැබුනහොත් එම කටයුත්ත ඉන් ඉදිරියට ක්‍රියාවට නැංවිය නොහැකි බවත්, මෙම පැ-35 වියදම් වවුචරය අදාල අනුමත කිරීම, ගෙවීම් අංශයේ ප්‍රධානියා ලෙස සිටි ගණකාධිකාරී සුමිතා කේ. දහනායක මහත්මිය විසින් ලබා දී ඇති බවත්, සාක්ෂි ලබා දෙමින් කියා ඇත.

ලංකා සතොස ආයතනයෙන් මෙම බඩු මිල දී ගැනීම හදිසි ප්‍රසම්පාදන කටයුත්තක් වශයෙන් සිදු වූ බවත්, 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 හදිසි ප්‍රසම්පාදන පිළබඳ දැක්වෙන කොටස පැ-35(i) ලෙසත්, හදිසි ප්‍රසම්පාදන අවශ්‍යතා සපුරාලීම සඳහා ඇති විධිවිධාන පැ-35(ii) ලෙසත්, රජයේ ආයතන වලින් සිදු කරනු ලබන මිල දී ගැනීම් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු බවට වන විධි විධානය පැ-35(iii) ලෙසත්, චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂිය මගින් සළකුණු කර ඇත. පන්නල සතොස ආයතනයට මුදල් ගෙවීමට අදාල ගෙවීම් වවුචරය පැ-36 ලෙස සළකුණු කර ඇති අතර, පැ-36 දරණ ගෙවීම් වවුචරය සකස් කරන්නේ ගෙවීම් අංශයෙන් බවත්, එකී පැ-36 දරණ ගෙවීම් වවුචරය සහතික කර ඇත්තේ ගෙවීම් අංශයේ ගණකාධිකාරී සුමිතා කේ. දහනායක මහත්මිය විසින් බවත්, ඇය විසින් ගෙවීම අනුමත කරමින් අත්සන් තබන ලද ස්ථානය පැ-36(A) ලෙසත් සළකුණු කර ඉදිරිපත් කර ඇත. පන්නල සතොස ආයතනයට අදාල ගෙවීම පැ-37 ලෙස ලකුණු කළ චෙක්පත මගින් සිදු කළ බවත්, චෙක්පතකින් ගෙවීම් කළ විට මූල්‍ය රෙගුලාසි අනුව ගෙවීම් නිළධාරියා වන්නේ පැ-36 දරණ ගෙවීම් වවුචරය අනුමත කරන ලද සුමිතා කේ. දහනායක මහත්මිය බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත. අනතුරුව පන්නල සතොස ආයතනයට පැ-

37 ලෙස ලකුණු කළ චෙක්පතෙන් මුදල් ගෙවීම් සිදු කළ බවත්, එකී පැ-37 චෙක්පත අත්සන්කර ඇත්තේද මුදල් අංශයේම නිලධාරීන් දෙදෙනෙකු බවත්, සිය සාක්ෂිය මගින් ප්‍රකාශ කර ඇත. එම චෙක්පත ලබාදෙන ලෙස ඉල්ලා ලංකා සතොස ආයතනයෙන් නිකුත් කරන ලද ලිපිය පැ-37A ලෙස සළකුණු කර ඇත.

පැ-35 දරණ වියදම් වවුචරයත්, පැ-36 දරණ ගෙවීම් වවුචරයක් සකස් කිරීමට පදනම් වූ රෙගුලාසි ඇතුලත් සංස්ථාවේ මුදල් රෙගුලාසි ලේඛණය පැ-38 ලෙස චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂියේදී සළකුණු කර ඇති අතර, පැ-38 දරණ මුදල් රෙගුලාසියේ එය අදාල වන්නේ කවර නිළධාරීන්ටදැයි සඳහන් කොටස පැ-38A ලෙසත්, සහතික කිරීමේ ක්‍රියාවලියේ සහතික කිරීමේ නිළධාරියා වන්නේ කවරෙකුදැයි දැක්වෙන කොටස පැ-38B ලෙසත්, සහතික කිරීමේ නිළධාරියෙකුට ඇති වගකීම් වශයෙන් සැහීමකට පත් විය යුතු කරුණු 6 ක් දැක්වෙන කොටස පැ-38C ලෙසත්, ගෙවීම් අනුමත කරන නිලධාරියා යනු කවරෙක්දැයි දැක්වෙන කොටස පැ-38D ලෙසත්, ගෙවීම සඳහා අනුමත කිරීමේදී ඇති වගකීම් පැ-38E හා පැ-38F ලෙසත්, ගෙවීම් නිළධාරියා වන්නේ කවරෙක්දැයි දැක්වෙන කොටස පැ-38G ලෙසත්, චෙක්පත අත්සන් තබන අයගේ වගකීම් දැක්වෙන කොටස පැ-38H හා පැ-38 I ලෙසත්, සිය සාක්ෂියේදී සළකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ-38 දරණ මූල්‍ය රෙගුලාසි අනුව ගෙවීම් අනුමත කළ නිළධාරියා (පැ-38D) සුමිතා කේ. දහනායක ගණකාධිකාරීවරිය බවත්, මූල්‍ය රෙගුලාසි අනුව ගෙවීම් නිළධාරියා (පැ-38G) වූයේද සුමිතා කේ. දහනායක මහත්මිය බවත්, නමුත් ඇයට චමින්ද සමරකෝන් මහතාට හා සමගාමීව විනය පරීක්ෂණයක් නොපැවැත්වූ බවත්. අඩුම තරමින්

චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පැ-22 දරණ චෝදනා පත්‍රය මත පැවති විනය පරීක්ෂණයේදී සාක්ෂිකරුවෙකු ලෙස හෝ සුමිතා කේ. දහනායක මහත්මිය නොකැඳවූ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. සංස්ථාව තුළ මූල්‍ය කටයුතුවලදී මූල්‍ය බලය පැවරීමේ ලේඛණය පැ-39(i), (ii), (iii), (iv), (v), (vi) ලෙසත්, එකී ලේඛණය ප්‍රකාරව චමින්ද සමරකෝන් මහතාට මූල්‍ය වගකීමක් හා බලයක් පැවරෙන කොටස පැ-39(A) ලෙස සළකුණු කළ අතර, ඒ අනුව පැ-35 වියදම් වවුචරය සහතික කිරීම, A2/3 ශ්‍රේණියේ කළමණාකරුවෙකු ලෙසත්, කාර්යාංශ ප්‍රධානියා ලෙසත්, මූල්‍ය රෙගුලාසි වලින් ඔහුට පැවරී තිබූ බලය අනුව සිදු කළ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. පැ-22 දරණ චෝදනා පත්‍රයට චමින්ද සමරකෝන් මහතා පිළිතුරු යැවූ ලිපිය පැ-40 ලෙස සළකුණු කර ඇත. පැ-22 මත ආයතනික විනය පරීක්ෂණය වර්ෂ 2015.10.5 දින සිට වර්ෂ 2016.3.21 දින දක්වා පරීක්ෂණ නිළධාරී නීතිඥ දිල්රුක්ෂාන් ප්‍රනාන්දු විසින් පැවැත් වූ බව කියා ඇති අතර, චමින්ද සමරකෝන් මහතාව විනය පරීක්ෂණ සඳහා කැඳවූ ලිපිය පැ-41 ලෙස සළකුණු කර ඇත. පැ-22 දරණ චෝදනා පත්‍රයට අදාල විනය පරීක්ෂණයේදී සංස්ථාවේ කළමණාකාර (ආරක්ෂක හා විමර්ශන) තනතුර දැරූ එම්. ආර්. එස්. පී. සමරසිංහ මහතා සංස්ථාව වෙනුවෙන් කැඳ වූ සාක්ෂිකරුවෙකු වශයෙන් සාක්ෂි ලබා දුන් බව ප්‍රකාශ කර ඇති අතර එහිදී එම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය පැ-42 ලෙස සළකුණු කර ඉදිරිපත් කර ඇත. අභ්‍යන්තර විනය පරීක්ෂණයේදී කළමණාකාර (ආරක්ෂක හා විමර්ශන) විසින් දෙන ලද පැ-42 දරණ සාක්ෂියේදී, ඔහු විසින් පැවැත් වූ අංග සම්පූර්ණ මූලික විමර්ශනයේදී සත්‍ය වශයෙන්ම එම මුදල වංචා කිරීමක් සම්බන්ධයෙන් පැහැදිලිව අනාවරණයක් වී නොමැති බවත්,

සංස්ථාවෙන් මෙම මුදල සතොස පන්නල ශාඛාවට ගෙවා ඇති බවත්, යනුවෙන් සාක්ෂි දී ඇති අතර එම සාක්ෂි බණ්ඩය චමින්ද සමරකෝන් මහතා විසින් පැ-42(A) ලෙස සළකුණු කොට ඇත. එම සාක්ෂිකරුගේ සාක්ෂියේදී ඔහු විසින් ඉදිරිපත් කළ විමර්ශන වාර්තාවෙන් හෙළිදරව් කර නොමැති චෝදනා කිසියම් නිළධාරියෙකුට එරෙහිව ඉදිරිපත් කරනවානම් එය විමර්ශන කාර්යයෙන් බලාපොරොත්තු වන කාර්යභාරයට පටහැනි සහ වැරදි ක්‍රියාවක් බව පිළිගනිමින් සාක්ෂි දී ඇති අතර එම සාක්ෂි බණ්ඩය පැ-42(B) ලෙස සළකුණු කොට ඇත. කවුරුන් විසින් කුමන ආකාරයට සැප් වවුචරය සකස් කළත්, FP 006 සංස්ථා රෙගුලාසිවලට අනුකූලව ගෙවීම් කටයුතු නිර්දේශ කිරීමේ, අනුමත කිරීමේ සහ චෙක්පත්වලට අත්සන් කිරීමේ කාර්යභාරය වර්ෂ 2014.12.30 වන විට පැවරී තිබුණේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වෙත බවට දෙන ලද සාක්ෂි බණ්ඩයද චමින්ද සමරකෝන් මහතා විසින් පැ-42(C) ලෙස සළකුණු කොට ඇත. චමින්ද සමරකෝන් මහතා විසින් කිසියම් මුදල් රෙගුලාසියක්, නැතහොත් FP 006 සංස්ථා රෙගුලාසිවල නියමයන් බරපතල ලෙස උල්ලංඝනය වීමක් අනාවරණය නොවූ බවට දෙන ලද සාක්ෂි බණ්ඩය පැ-42(D) ලෙස සළකුණු කොට ඇත.

පැ-22 දරණ චෝදනා පත්‍රයට අදාල විනය පරීක්ෂණයේදී සංස්ථාව වෙනුවෙන් කැඳවූ සාක්ෂිකරුවෙකු ලෙස සාක්ෂි ලබා දුන් පාරිභෝගික සේවා සහායක "සනිකා උමයංගනී ගමගේ" මහත්මියගේ සාක්ෂිය පැ-42(i) ලෙසත්, ජ්‍යෙෂ්ඨ නිළධාරී (අලෙවි) කේ. එල්. පී. පෙරේරාගේ සාක්ෂිය පැ-42(ii) ලෙසත් චමින්ද සමරකෝන් මහතා විසින් සළකුණු කර ඉදිරිපත් කර ඇත. පැ-42(i) සහ පැ-42(ii) හි සාක්ෂිකරුවන් ලබා දී සාක්ෂිවලදී ඉහත කී ගණුදෙනුවට අදාල

ක්‍රියාවලිය නිසි ආකාරායට සිදු වූ බවට සාක්ෂිකරුවන් ප්‍රකාශ කර ඇති බවත්, ස්වකීය සාක්ෂියේදී කියා ඇත.

පැ-22 දරණ චෝදනා පත්‍රයට අදාල විනය පරීක්ෂණය පවත්වා ඊට අදාලව පරීක්ෂණ නිළධාරි ඩිල්රුක්ෂාන් ප්‍රනාන්දු මහතා විසින් වර්ෂ 2016.4.28 දිනැතිව ඉදිරිපත් කළ පරීක්ෂණ වාර්තාව පැ-43 ලෙස චමින්ද සමරකෝන් මහතා සාක්ෂියේදී සළකුණු කර ඇත. පැ-43 පරීක්ෂණ වාර්තාවේ අන්තර්ගත කොටස් කිහිපයක් පැ-43(A), (B), (C), (D) සහ (E) ලෙසද සිය සාක්ෂිය මගින් සළකුණු කර ඇත. පැ-43(A) ලෙස සළකුණු කරන ලද කොටසේ චමින්ද සමරකෝන් මහතා ගෙවීම් සහතික කිරීමේදී මූල්‍ය රෙගුලාසි උල්ලංඝනය කර ඇති බව පැහැදිලිව පෙනී යයි යනුවෙන් සඳහන් වුවද, චමින්ද සමරකෝන් මහතා විසින් කිසිසේත් ගෙවීම් සහතික නොකළ බවත්, ඔහු සිදු කරන ලදේදේ වියදම් සහතික කිරීම පමණක් බවත්, ඔහු සාක්ෂි දී ඇත. පැ-43(B) දරණ කොටසේ පළමු චෝදනාවේ සඳහන් පරිදි බරපතල මූල්‍ය වංචාවක් කළ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූ බවට යඳහන් කර ඇති බව චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂිය මගින් අවධානයට ලක්කර ඇත. පැ-43(D) ලෙස සටහන් කළ කොටසේ පරීක්ෂණ නිළධාරියා විසින් චමින්ද සමරකෝන් මහතා විසින් ගෙවීම් සහතික කර අති බව දක්වා ඇති බවත්, පරීක්ෂණ නිළධාරියා දැනටමත් පැ-35 ලෙස සළකුණු කළ වවුචරය වියදම් වවුචරයක් බවට සටහන් කිරීමෙන් වැළකී ඇති බවත්, සිය සාක්ෂිය මගින් අවධාරණය කොට ඇත.

පැ-22 දරණ චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා පිළිබඳව විනය පරීක්ෂණයේදී කරුණු අනාවරණය නොවූවද, ඊට අදාල පැ-22 දරණ චෝදනා පත්‍රය සංශෝධනය කිරීමක් පවා සිදු නොකළ බවත්,

විනයනීති සංග්‍රහය අනුව එසේ කිරීමට හැකියාව තිබූ බවත්, එකී කටයුත්ත සිදු කිරීම පවා විනය පරීක්ෂණ නිළධාරියා විසින් පැහැර හැර ඇති බවත්, සිය සාක්ෂිය මගින් කියා ඇත. සංස්ථාවේ විනය රීති මාලාව පැ-44 ලෙසත්, එහි අන්තර්ගත කොටස් පැ-44(A), පැ-44(B) ලෙසත් සළකුණු කොට චමින්ද සමරකෝන් මහතා එකී විනය රීති මාලාව පිලිබඳව කොමිසමේ අවධානය යොමු කර ඇත. පැ-22 දරණ චෝදනා පත්‍රයේ චෝදනා 6 සම්බන්ධයෙන්ම චමින්ද සමරකෝන් මහතා වෙන් වෙන්ව කරුණු පැහැදිලි කරමින් සාක්ෂි ලබා දී ඇති අතර, එම චෝදනා පත්‍රයේ 1, 5 සහ 6 දරණ චෝදනාවලට චමින්ද සමරකෝන් මහතා වරදකරු කර ඇත්තේ පදනම් විරහිතව, ද්වේෂ සහගතව බවටත්, වැඩිදුරටත් සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-22 දරණ චෝදනා පත්‍රයට පදනම් වූ පන්නල ලංකා සතොස ආයතනයට මුදල් ගෙවීමේ සිද්ධිය සම්බන්ධයෙන් යම් පාර්ශවයක් විසින් මූල්‍ය අපරාධ කොට්ඨාශයට පැමිණිල්ලක් සිදුකර තිබූ බවත්, චමින්ද සමරකෝන් මහතාට ප්‍රකාශයක් ලබා දීමට මූල්‍ය අපරාධ කොට්ඨාශයට පැමිණෙන ලෙස දැනුම්දීමක් සිදු කර තිබූ බවත්, ඒ අනුව ප්‍රකාශයක් ලබා දීම සිදු කළ බවත්, එම පරීක්ෂණය සිදු කළ නිළධාරියාගේ වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළ බව දැන ගැනීමට ලැබුණු බවත්, ඉන් අනතුරුව ඒ සම්බන්ධයෙන් කුමක් සිදු වූයේද යන්න තමන් නොදන්නා බවත් පවසා ඇත. පැ-23 දරණ චෝදනා පත්‍රය මගින් චමින්ද සමරකෝන් මහතාට චෝදනා 8 ක් ඉදිරිපත් කර තිබූ බවත්, ඊට පදනම් වූයේ වර්ෂ 2014 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකා යුධ හමුදා මිලිටරි ඇකඩමිය මගින් දියතලාවේ සංවිධානය කළ FOXHILL SUPER CROSS 2014 මෝටර් රථ තරඟාවලියට ප්‍රධාන අනුග්‍රාහකත්වය ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින්

දැක්වීම සහ එකී තරඟාවලියේදී සංස්ථාවේ ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම සඳහා, සිපෙට්කෝ හයිරෙක්ස් ලුබ්රිකන් ලිහිසි තෙල් ප්‍රචාරණය සඳහා ප්‍රචාරක ආයතනයවලින් මිල ගණන් කැඳවීම හා ඒ ආශ්‍රිත කරුණු බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-23 හි චෝදනාවන්ට අදාල සිද්ධිය වන වකවානුවේදී අලෙවි කාර්යාංශයේ ප්‍රධානි තනතුර වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර පුරප්පාඩු වී තිබූ බවත්, එසේ හෙයින් චමින්ද සමරකෝන් මහතාට හා අලෙවි කාර්යාංශයේ සිටි අනෙක් නිළධාරීන් හට උපදෙස් හා නියෝගයන් සමහර අවස්ථාවන්හිදී සභාපතිතුමන්ද, බොහෝ අවස්ථාවල කළමණාකරන අධ්‍යක්ෂකතුමා සෘජුවම උපදෙස් හා නියෝගයන් ලබා දීමද සිදු වූ බවත්, සමහර අවස්ථාවලදී කළමණාකරන අධ්‍යක්ෂකවරයා විසින් චමින්ද සමරකෝන් මහතාට ලබා දෙන රාජකාරීමය උපදෙස් චමින්ද සමරකෝන් මහතා විසින් අලෙවි කාර්යාංශයේ අනෙක් අංශ වෙත යොමු කළ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

සංස්ථාවේ අලෙවි කළමණාකාර (සිල්ලර) තනතුර දැරූ චමින්ද සමරකෝන් මහතා හට, සංස්ථාවේ ආයතනික සන්නිවේදන සහ පාරිභෝගික සේවා ඒකකයේ හෝ ලිහිසි තෙල් අංශයේ රාජකාරී වගකීම් සෘජුව පවරා දීමක් සිදු නොවූ බවත්, ආයතනික සන්නිවේදන සහ සමාජ සත්කාර අංශය නියෝජය සාමාන්‍යාධිකාරී (අලෙවි) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන) යටතේ ක්‍රියාත්මක වූ බවත්, ආයතනික සන්නිවේදන සහ සමාජ සත්කාර අංශය 2005 වර්ෂයේදී ආරම්භ වූයේ සිපෙට්කෝ ආයතනික සන්නිවේදන ඒකකය වශයෙන් බවත්, එකී අංශය පිහිටුවීමට අදාල අංක. 1590(අ) දරණ චක්‍රලේඛය පැ-45 ලෙස සලකුණු කරන බවත්, සිය සාක්ෂි මගින් කියා

ඇත. වර්ෂ 2014 වන තෙක්ම සංස්ථාව විසින් මහා පරිමාණ ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සිදු කර නොතිබූ බවත්, සංස්ථාවේ සභාපති සහ කළමණාකරණ අධ්‍යක්ෂකගේ CPC/CH/39/08 හා 2009/6/1 දිනැති චක්‍රලේඛය මගින් ප්‍රචාරණ හා ප්‍රවර්ධන කටයුතු සියල්ලක්ම ඉටු කරන ලද්දේ ආයතන සන්නිවේදන සහ පාරිභෝගික සේවා ඒකකය මගින් බවත්, එවැනි ප්‍රචාරණ හා ප්‍රවර්ධන කටයුතු සිදු කරන්නේ නම් සභාපතිවරයාගේත්, කළමණාකරන අධ්‍යක්ෂකවරයාගේත් අනුමැතිය ලබා ගත යුතු බවට CPC/CH/39/08 චක්‍රලේඛය මගින් දැනුම් දී තිබූ බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇති අතර, එකී චක්‍රලේඛය ඔහු පැ-46 ලෙස සළකුණු කොට ඉදිරිපත් කර ඇත.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු වල නියැලුන ආයතනයක් නොවන නිසා 2012, 2013 සහ 2014 වර්ෂ සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටි බවත්, ඒ අනුව පැ-46 ලේඛණය ප්‍රකාරව සභාපතිවරයාගේ හා කළමණාකාර අධ්‍යක්ෂකවරයාගේ පූර්ව අනුමැතිය සහිතව, ප්‍රචාරණ හා ප්‍රවර්ධන විෂයට අදාලව, ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකය වර්ෂ 2012 සිට පවත්වාගෙන යන සැපයුම්කරුවන්ගේ ලේඛනයක් තිබූ බවත්, එම සැපයුම්කරුවන්ගෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, යෙලෝ පේජර්ස් හා රෙන්බෝ පේජර්ස් වල සඳහන් සැපයුම්කරුවන්ගෙන් අවස්ථානුකූලව මිලගණන් කැඳ වූ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

වර්ෂ 2008 දී සංස්ථාව සිපෙට්කෝ හයිරෙක්ස් යනුවෙන් ලිහිසිතෙල් ආනයනය කර බෙදා හැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ බවත්, ඒ සඳහා ලිහිසි තෙල් අංශය අලුතින් පිහිට වූ බවත්, දීර්ඝ කාලයක් ගතවුවද, එම අංශයෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බවත්,

ලිහිසි තෙල් අංශය කමිටුවක් හරහා ක්‍රියාත්මක වූ බවත්, නැවත එම කමිටුව සංශෝධනය කොට නව කමිටුවක් පත්කර ගැනීම සඳහා පදනම් කරගත් ප්‍රාදේශීය කළමණාකරුවන් විසින් ඉදිරිපත් කරන ලද විශ්ලේෂණ වාර්තාව පැ-47 ලෙස සලකුණු ඉදිරපත් කරන බවත් චමින්ද සමරකෝන් මහතා පවසා ඇත. එහිදී ලිහිසි තෙල් කමිටුවට අයත් කාර්යයන් දැක්වෙන 2012.11.29 දිනැති ලේඛනය පැ-48 ලෙසත්, එකී ලිහිසි තෙල් කමිටුවට සාමාජිකයන් සංස්ථාපනය කිරීමට අදාල ලිපිය පැ-49 ලෙසත්, සළකුණු කොට ඉදිරිපත් කර ඇත. එකී පැ-49 ලේඛණය ප්‍රකාරව කමිටු සාමාජිකයෙක් ලෙස චමින්ද සමරකෝන් මහතාගේ නම ඇතුලත් වී ඇති බවත්, පවසා ඇත. වර්ෂ 2013 දී එවකට සිටි කළමණාකාර ලිහිසි තෙල් තනතුරේ රාජකාරි කළ අය වෙනත් ස්ථානයකට ස්ථාන මාරු කර තිබූ බවත්, ඒ අනුව අලෙවි කාර්යාංශයේ චමින්ද සමරකෝන් මහතා යටතේ සිටි ඩී. ජී. එන්. එච්. මෙන්ඩිස් මහතා වැඩ බලන ලිහිසි තෙල් කළමණාකරු වශයෙන් පත්කරන ලද බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. ලිහිසි තෙල් කළමණාකාර තනතුරේ රාජකාරී කටයුතු ආවරණය කිරීමට අදාලව මානව සම්පත් කළමණාකරු විසින් යොමු කරන ලද ලිපිය පැ-50(I) ලෙසත්, මෙන්ඩිස් මහතා කළමණාකාර ලිහිසි තෙල් තනතුරේ රාජකාරී කටයුතු ආවරණය කිරීමට පත්කිරීමේ ලිපිය පැ-50(II) ලෙසත්, සිය සාක්ෂියේදී සළකුණු කර ඇත.

වර්ෂ 2014.03.03 වන දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් රුපියල් මිලියන 250 ක මුදලක් ප්‍රචාරණ ප්‍රවර්ධන හා සමාජ සත්කාර කටයුතු සඳහා වෙන්කර තිබූ බවත්, 2014 වර්ෂයට අදාලව සිදු කරන ලද සියලුම වියදම් අනුමැතිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ බවත්, එය අධ්‍යක්ෂක

මණ්ඩලය විසින් අනුමත කරන ලද බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත. එකී වර්ෂ 2014.12.09 දින හා අංක. 49 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව පැ-51(I) ලෙසත්, එහි අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද නිර්දේශයන් දැක්වෙන කොටස පැ-51(II) ලෙසත්, අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය දැක්වෙන ඇඩ්වාන්ස් එක්ස්ට්‍රැක් යන ලේඛනය පැ-51(III) ලෙසත්, සළකුණු කර ඇත. පැ-51(I) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ ප්‍රචාරණ ප්‍රවර්ධන සඳහා වැය කරන ලද වියදම් වර්ෂ 2015 ජනවාරි 8 දිනෙන් පසුව පත් වූ නව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ද, අංක. 1159 දරණ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී දෙවන වරටත් එකී වියදම අනුමත කර තිබූ බව චමින්ද සමරකෝන් මහතා විසින් සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-23 දරණ චෝදනා පත්‍රය නැගීමට පදනම වූ Foxhill Super Cross තරඟාවලියට අදාලව ප්‍රචාරණ කටයුතු සඳහා වියදම් කිරීම හා ඊට අදාල වියදම් නිර්දේශ කොට අනුමත කිරීමේ කාර්යයේදී නිලධාරීන් ගණනාවක්ම සම්බන්ධ වූ බවත්, එකී ක්‍රියාවලිය සිදු වූ ආකාරය හා ඊට අදාල නිලධාරීන්ගේ දායකත්වය ලැබුණු ආකාරය දක්වමින් චමින්ද සමරකෝන් මහතා විසින් සකස්කරන ලද ලේඛණය පැ-52 ලෙසට ස්වකීය සාක්ෂියෙන් සළකුණු කර ඇත.

වර්ෂ 2014 Foxhill Super Cross තරඟාවලිය පැවැත්වීම සඳහා ප්‍රධාන අනුග්‍රාහකත්වය ලබාදෙන ලෙසට ශ්‍රී ලංකා යුධ හමුදා මිලිටරි ඇකඩමිය විසින් සංස්ථාවෙන් ඉල්ලීමක් සිදු කළ බවත්, ඒ අනුව ආයතනයේ ඉහළ පාලනාධිකාරිය එකී අනුග්‍රාහකත්වය ලබා දීමට එකඟ වූ බවත්, ඒ අනුව අනුග්‍රාහකයාට එම තරඟාවලියේ සිය ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට අවස්ථාව සැලසුණු බවත්, එකී කටයුතු සිදු කරන ආකාරය සභාපති, කළමණාකරන අධ්‍යක්ෂක විසින් අලෙවි

අංශය, ලිහිසි තෙල් අංශය හා ආයතන සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකයේ නිලධාරීන් කැඳවා සාකච්ඡා කළ බවත්, මෙම කාර්යයේ අනුග්‍රාහකත්වය දැරීමට හා ඒ ආශ්‍රිත ප්‍රචාරණ කටයුතු සඳහා 2014.3.7 වන දින සංස්ථා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය හිමි වූ බවත්, ඒ අනුව එකී කර්තව්‍යය සිදු කිරීමට සංස්ථාවේ එකඟතාවය පළකරමින්, සංස්ථාවේ කළමණාකරණ අධ්‍යක්ෂක එස්. ඊ. සුසන්ත සිල්වා විසින් දියතලාව මිලිටරි ඇකඩමියට ලිපියක් යොමු කරන ලද බවත් සාක්ෂි දී ඇත. එකී ලිපිය පැ-53(I) ලෙසත්, මිලිටරි ඇකඩමිය එකී අනුග්‍රාහකත්වය ඉල්ලූ ලිපිය පැ-53(II) ලෙසත්, සළකුණු කර ඇත. එකී කටයුත්ත සම්බන්ධීකරණය සඳහා ඒ. ආර්. පී. ඩබ්ලිව්. ඩී. දේදුනුපිටිය මහතා සහ ඩී. ඩී. මදුරප්පෙරුම මහතාව සංස්ථාව විසින් පත්කළ බවත්, එලෙසට පත්කර ඇති බවට පැ-53(I) හි සඳහන් වී ඇති කොටස පැ-53(B) ලෙස සලකුණු කොට ඉදිරිපත් කර ඇත.

එකී අනුග්‍රාහකත්වය ලබා දීමට එකඟ වූ පසුව මාධ්‍ය සාකච්ඡාවකට සහභාගී වන ලෙසට ශ්‍රී ලංකා මිලිටරි ඇකඩමියෙන් පැ-54 දරණ ලිපිය මගින් ආරාධනා කළ බවත්, චමින්ද සමරකෝන් මහතා විසින් පැ-54 ලිපිය කළමණාකරන අධ්‍යක්ෂකවරයාගේ දැනගැනීමට සහ උපදෙස් සඳහා ඉදිරිපත් කළ බවත්, එකී ලිපිය කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් සභාපතිවරයාට ඉදිරිපත් කළ විට සභාපතිවරයා විසින් සංස්ථා නිලධාරීන්ට ඊට සහභාගී වීම සඳහා අනුමැතිය ලබාදුන් බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

Foxhill Super Cross තරඟාවලියට අදාල ප්‍රචාරන ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් කළමණාකාර අධ්‍යක්ෂවරයා විසින් කමිටුවක් පත්කළ බවත්, එකී කමිටුව බී. ජී. එන්. එච්. මෙන්ඩිස්, ඒ. ආර්. වී. ඩබ්ලව්. පී. දේදුනු පිටිය, මදුරප්පෙරුම හා පතිරණ යන නිලධාරීන් පත්කළ බවත්,

එලෙස පත්කරන ලද බව තහවුරු කිරීමට තිබූ ලේඛණ මේ වන විට සංස්ථාව තුළ අස්ථානගත වී ඇති බවත්, එලෙසට සංස්ථාවේ අලෙවි අංශය තුළ තිබූ ලේඛණ අස්ථානගත වීම සම්බන්ධයෙන් පැ-55(I) ලිපිය මගින් චමින්ද සමරකෝන් මහතා 2015.12.11 දින සංස්ථාවේ ප්‍රධාන නිලධාරියාට දැනුම් දුන් බවත්, පැ-55(II) දරණ ලිපිය මගින් අලෙවි අංශයේ ඇති ලේඛණ අස්ථානගත වීම සම්බන්ධයෙන් මානව සම්පත් කළමණාකරු විසින් වැඩබලන අලෙවි කළමණාකාර (සිල්ලර) ඩබ්. ඩී. එල්. එල්. අබේගුණවර්ධන මහතාට තරයේ අවවාද කර ඇති බවත්, සිය සාක්ෂිය මගින් කියා ඇත. 2014.4.18 දින වන විට ඉතා කෙටි කාලයක් තුළ ප්‍රචාරණ කටයුතු සැලසුම් කර අවසන් කළ යුතු නිසාත්, සංස්ථාව තුළ ඒ වන විටත් ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සඳහා ලියාපදිංචි වූ සැපයුම්කරුවන් නොමැති නිසාත්, සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂක (ප්‍රසම්පාදන හා ගබඩා), අලෙවි අංශයේ කළමණාකාර, ලිහිසි තෙල් හා ආයතනික සන්නිවේදන අංශයේ නිලධාරීන් එකතු වී සාකච්ඡා කොට, සංස්ථාවේ ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකයේ පැවති සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවකින් මිලගණන් කැඳවීමට අනුමැතිය ඉල්ලීමට එකඟතාවයකට එළඹි බවත්, ඒ අනුව 2014.3.14 දිනැති පැ-56 ලෙස සළකුණු කළ ලිපිය චමින්ද සමරකෝන් මහතා විසින් කළමණාකාර අධ්‍යක්ෂකවරයාට යොමු කොට එකී ලිපියේ සඳහන් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමට අවසර ඉල්ලූ බවත්, ඒ සඳහා කළමණාකාර අධ්‍යක්ෂකවරයා පැ-56 ලිපියේම සටහනක් තබමින් අනුමැතිය ලබා දී තිබූ බවත්, පවසා ඇත. එමෙන්ම සංස්ථාවේ ආයතනික සන්නිවේදන හා පාරිභෝගික කටයුතු අංශයේ තිබූ

සැපයුම්කරුවන්ගේ ලේඛණයද පැ-56(A) ලෙස සළකුණු කර ඉදිරිපත් කර ඇත.

Foxhill Super Cross ධාවන පථය අවට ප්‍රචාරණ කටයුතු සිදු කිරීම සඳහා මිලගණන් කැඳ වූ සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කළ මිලගණන් සභාපතිවරයා වෙත ඉදිරිපත් කරමින් සුදුසු සැපයුම්කරුවෙක් නිර්දේශ කරන ලෙසට ඉල්ලා සිටි බව චමින්ද සමරකෝන් මහතා කියා ඇත. ඒ උදෙසා සභාපතිවරයා වෙත පැ-57 ලෙස සලකුණු කළ ලේඛනය ඉදිරිපත් කළ බවත්, සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ මිලගණන් දැක්වෙන ලිපිය සකස් කර ඇත්තේ ඊ. පී. සී. ආර්. පතිරණ මහතා බවත්, ඉදිරිපත් කර ඇත්තේ ඒ. ආර්. පී. ඩබ්ලිව්. බී. දේදුනුපිටිය මහතා සහ බී. ජී. එන්. එච්. මෙන්ඩිස් මහතා බවත්, ඔවුන් මෙම කාර්යයට පත්කළ කමිටු සාමාජිකයන් බවත්, චමින්ද සමරකෝන් මහතා විසින් මිලගණන් සහ සැපයුම්කරුවන් සභාපතිවරයාගේ අනුමැතිය සඳහා නිර්දේශ කළ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

එකී පැ-57 ලිපියේ සභාපතිවරයා විසින් සටහන් තබමින් ශ්‍රීමාල් ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයෙන් සංස්ථාවට අයවීමට මුදල් ඇත්දැයි පරීක්ෂා කර බලන ලෙස දැනුම් දී තිබූ බවත්, ඒ අනුව පරීක්ෂා කර බැලීමේදී එම ආයතනය විසින් සංස්ථාවට වෙනත් කාර්යයන් සඳහා ගෙවිය යුතු සියලු මුදල් පියවා තිබූ බව සභාපතිවරයාට පැ-58 ලිපියෙන් වාර්තා කළ බවත්, අනතුරුව සභාපතිවරයා විසින් අවම මිලගණන් සහ පිරිවිතර සැපිරූ ශ්‍රීමාල් ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඩ් සැපයුම්කරු වශයෙන් තෝරා ගැනීමට 2014.4.9 වන දින අනුමැතිය ලබා දෙමින් පැ-58 ලිපියේ සටහනක් යෙදූ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. තෝරාගත් සැපයුම්කරු වූ

ශ්‍රීමාල් ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඩ් විසින් 50% ක අත්තිකාරම් මුදලක් ඉල්ලා සිටි බවත්, එකී අත්තිකාරම් මුදල ගෙවීමට සභාපතිවරයා අනුමැතිය ලබා දී තිබූ බවත්, ඒ අනුව පැ-59 වියදම් වවුචරය සහතික කිරීම චමින්ද සමරකෝන් මහතා විසින්ද, එය අනුමත කිරීම මූල්‍ය අංශයේ ගණකාධිකාරීවරයා විසින්ද සිදු කළ බවත්, අත්තිකාරම් මුදල ගෙවීම සඳහා පැ-60 දරණ ගෙවීම් වවුචරය සකස් කිරීම, සහතික කිරීම සහ අනුමත කිරීම ගෙවීම් අංශය විසින් සිදු කළ බවත්, පැ-60 ලේඛනය අනුමත කර ඇත්තේ ගණකාධිකාරී සුමිතා කේ. දහනායක මහත්මිය බවත්, අනතුරුව මූල්‍ය අංශය විසින් චෙක්පතකින් එම රු. 3,250,000/= ක මුදල ගෙවීම් සිදු කර ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

කළමණාකාර අධ්‍යක්ෂවරයා විසින් පත්කල කමිටුව ධාවන පථය පරීක්ෂා කොට එහිදී සංස්ථාවට ප්‍රචාරණය සිදුවිය යුතු ආකාරය සම්බන්ධයෙන් අදහසකට පැමිණ ප්‍රචාරණය සිදු කරන අකාරය නැවත සලකා බැලූ බවත්, එමගින් සැපයුම්කරු ලබාදුන් රු. 5,688,150/= ක මුදලින් රු. 1,950,000/= ක මුදලක් අඩුකර ගැනීමට හැකි වූ බවත්, ඒ පිළිබඳව කරුණු දක්වමින් සැපයුම්කරුවන්ගේ වැඩකටයුතු අවසන් වීමෙන් පසුව පැ-61 දරණ ලිපිය ඉදිරිපත් කරමින් ඉතිරි මුදල් ප්‍රමාණය ගෙවීමට නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (මුදල්) හට සභාපතිවරයාගේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටි බවත්, සභාපතිවරයා පැ-61 දරණ ලිපියේම සටහනක් තබමින් අනුමැතිය ලබා දුන් බවත්, කියා ඇත.

කළමණාකාර අධ්‍යක්ෂවරයාද පැ-62 ලිපියේ පැ-62A දරණ සටහන තබමින් ඒ සඳහා අනුමැතිය ලබා දුන් බවත්, නමුත් එහි අවසාන ගෙවීම ප්‍රමාද වී ඇති හෙයින්, කරුණු සඳහන් කරමින් පැ-63 දරණ

ලිපිය පැමිණිලිකරු විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වෙත යොමු කළ බවත්, අනතුරුව පැ-63A ලෙස සලකුණු කළ සටහන අනුව අදාල තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබාගෙන අදාල අනුමැතියට අනුව වහාම ගෙවීම් කරන ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් නියෝජ්‍ය මුදල් කළමණාකාර (ගෙවීම්) සහ සහකාර ගණකාධිකාරී (දේශිය සැපයුම්) වෙත නියෝග කර ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

Foxhill Super Cross තරඟාවලියේ ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සහ අදාල ගෙවීම් කිරීම සම්බන්ධයෙන් කළමණාකාර (ගබඩා හා ප්‍රසම්පාදන) විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කල බවත්, ඒ අනුව මිලගණන් කැඳවීම, එකඟවූ මිල ගණන් අඩු කරවා ගැනීම සහ අවසාන ගෙවීම කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලැබී තිබුණ බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා සිටි අතර, ඊට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් ඉදිරිපත් කරන ලද වාර්තාව පැ-64 ලෙසත්, ශ්‍රී මාල් ඇඩ්වටයිසින් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත මිල ගණන් ප්‍රසම්පාදන කමිටුව වෙත නිර්දේශ කරන බවට පැ-64 ලේඛණයේ වූ සටහන පැ-64(A) ලෙස චමින්ද සමරකෝන් මහතා විසින් සළකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ-23 චෝදනා පත්‍රයේ චෝදනා කිරීමට පදනම් වී තිබුණේ Foxhill Super Cross ධාවන පථයට අදාල ක්ෂේත්‍රයේ ප්‍රචාරණ කටයුතු සඳහා සැපයුම්කරුවන් තෝරාගැනීම සම්බන්ධව බවත්, පැ-64 දරණ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදු කළ නිර්දේශ සලකා බැලීමකින් තොරව පැ-23 චෝදනා පත්‍රයේ චෝදනා නගා ඇති බවත්, අදාල විනය පරීක්ෂණයේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ

නිලධාරියෙකු සාක්ෂියට කැඳවීමක් හෝ සිදු කර නොමැති බවත්, තවද එකී කටයුත්ත සඳහා සැපයුම්කාර ආයතනය තෝරා ගැනීම, සැපයුම්කාර ආයතනයෙන් ලබාගත් අවම ලංසුව පිළිගැනීම, අදාල මුදල අනුමත කිරීම යන කාර්යයන් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සෑහීමකට පත් නොවන්නේ නම් ඒ සඳහා අනුමැතිය ලබා නොදීමට පවා තාක්ෂණික ඇගයීම් කමිටුවට හැකියාවක් තිබූ බවත්, පැ-64 ලේඛනය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව නිසි පරිදි සිය අනුමැතිය ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව සලකා බැලීමත්, අදාල කාර්යභාරය සිදුවූ ආකාරය සලකා බැලීමත්, සැපයුම්කරුගේ මුල් මිල කියුම සහ දෙවන මිල කියුම සලකා බැලීමත් සිදු කොට අවසන් මුදල් ගෙවීමට ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හිමි වූ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. DPC/Minor/2014/098 දරණ ප්‍රසම්පාදන කමිටු වාර්තාව පැ-65 ලෙස චමින්ද සමරකෝන් මහතා සළකුණු කර ඇත. ශ්‍රීමාල් ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඩ් වෙත අවසාන ගෙවීම කිරීමට අදාලව මිලදී ගැනීමේ ඇණවුම්පත පැ-66 ලෙසත්, වියදම් වවුචරය පැ-66A ලෙසත්, ගෙවීම් වවුචරය පැ-67 ලෙසත්, Foxhill Super Cross 2014 තරඟාවලියේ ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් කළමණාකරන අධ්‍යක්ෂක විසින් පත්කළ කමිටුව විසින් අවසාන ගෙවීම කිරීමට අදාල මුදල් ගණනය කිරීමක් කළ බවත්, කමිටුව විසින් එකී ගණනය කිරීම් සිදු කළ ලේඛණය පැ-68 ලෙසත්, ශ්‍රීමාල් ආයතනය විසින් එම ආයතනයට හිමි අවසාන ගෙවීම සිදු කරන ලෙස සංස්ථාව වෙත ඉල්ලීමක් කර ඇති ලිපිය පැ-69 ලෙසත්, සළකුණු කරමින් සාක්ෂි ලබා දී ඇත.

Foxhill Super Cross 2014 තරඟාවලිය චැනල් අයි නාලිකාවෙන් දවස පුරා ප්‍රචාරය කරන හෙයින් ප්‍රධාන අනුග්‍රාහකත්වය ලබාදෙන ආයතනයට සිය ප්‍රචාරක දැන්වීමක් නොමිලේ ප්‍රචාරය කර දීමට අවස්ථාව හිමිවන බව සංස්ථාව වෙත දැනුම් දී තිබූ බවත්, ඒ අනුව රූපවාහිණී නාලිකාවේ ප්‍රචාරණය කිරීමට ලබා දීම සඳහා වෙළඳ දැන්වීමක් සංස්ථාවට නොතිබූ හෙයින්, ලිහිසි තෙල් සම්බන්ධ වෙළෙඳ ප්‍රචාරන දැන්වීමක් ඉතා කඩිනමින් සකස් කොට, ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවට භාර දෙන මෙන් කළමණාකරන අධ්‍යක්ෂවරයා විසින් ආයතනික සංන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකයට උපදෙස් ලබා දී තිබූ බවත්, එකී ඍජු උපදෙස් මත වැඩබලන නියෝජ්‍ය අලෙවි කළමණාකාර ඒ. ආර්. පී. ඩබ්ලිව්. බී. දේදුනුපිටිය මහතා විසින්, වෙළෙඳ දැන්වීම පිළියෙල කිරීම සඳහා මිල ගණන් කැඳවූ සැපයුම්කරුවන්ගේ ඇස්තමේන්තුව දැක්වෙන පැ-70 දරණ ලේඛනය කළමණාකරන අධ්‍යක්ෂකවරයා මගින් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ බවත්, එහිදී සභාපතිවරයා විසින් පැ-70 ලේඛණයේම සිය අත්සන තබා අඩුම ලංසුව අනුමත කළ බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇති අතර, වෙළඳ දැන්වීමක් රූපවාහිණී නාලිකාවේ නොමිලේ ප්‍රචාරණය කිරීමට අවකාශ ඇති බවට සංස්ථාව වෙත දැනුම් දී ඇති ලිපිය පැ-71 ලෙස සිය සාක්ෂිය මගින් ඉදිරිපත් කර ඇත. අදාල වෙළෙඳ දැන්වීම සකස් කළ ශ්‍රීමාල් ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඞ් ආයතනයට මුදල් ගෙවන ලද ගෙවීම් වවුචරය පැ-72 ලෙසත්, ඊට අදාල වියදම් වවුචරය පැ-72(I) ලෙසත්, ශ්‍රීමාල් ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඞ් ආයතනය ඉදිරිපත් කළ ඉන්වොයිසිය පැ-72(II) ලෙසත්, ලංසු මිල දැක්වෙන ලේඛනය පැ-72(III) ලෙසත්, අදාල සැපයුම්කරුවන් හා මිල ගණන් දක්වමින් සභාපතිවරයා වෙත

ඉදිරිපත් කරන ලද ලිපිය පැ-72(IV) ලෙසත්, අධ්‍යක්ෂ මණ්ඩල තීරණය දැක්වෙන ලේඛනය පැ-72(V) ලෙසත්, සිය සාක්ෂිය මගින් සළකුණු කර ඉදිරිපත් කර ඇත. පැ-23 දරණ චෝදනා පත්‍රය මත පදනම්ව චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පැවති විනය පරීක්ෂණයේදී සුමිතා කේ. දහනායක මහත්මිය සංස්ථාව වෙනුවෙන් සාක්ෂිකරුවෙකු ලෙස කැඳවූ බවත්, පැ-73 දරණ ලේඛනය අනුව සුමිතා කේ. දහනායක මහත්මිය Pass for payment වශයෙන් ගෙවීම් වවුචරය අත්සන් කළ බවත්, Foxhill Super Cross 2014 තරඟාවලියට අදාල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඇයගෙන් ප්‍රකාශයක් ලබා නොගත් බවත්, ඊට අදාල ලිපිලේඛන හා වවුචර ඇගෙන්, කිසිවෙකු විසින් ලබා නොගත් බවත්, ඇය එකී සාක්ෂියේදී සඳහන් කර ඇති බවත්, කියා සිටින චමින්ද සමරකෝන් මහතා ඇයගේ එකී සාක්ෂිය කෙරෙහි අවධානය යොමු කර සිටී.

පැ-23 දරණ චෝදනා පත්‍රයට අදාලව චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පැවති විනය පරීක්ෂණයේදී සංස්ථාව වෙනුවෙන් සාක්ෂි දීමට ප්‍රසම්පාදන හා ගබඩා කළමණාකාර එස්. ඩී. එස්. රාජපක්ෂ මහතා සාක්ෂියට කැඳවා ලබාදුන් සාක්ෂි පැ-74 ලෙස සළකුණු කර ඇත. පැ-74 සාක්ෂි ලේඛනය අනුව එස්. ඩී. එස්. රාජපක්ෂ මහතා සාක්ෂි දෙමින් කියා ඇත්තේ හදිසි අවස්ථාවලදී ප්‍රසම්පාදන කටයුතු සඳහා ඒ අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවශ්‍ය මිලදී ගැනීම් හෝ සේවා සිදු කිරීමෙන් පසු ආවරණ අනුමැතියට යටත්ව සිදු කිරීමෙන් පසු අනුමැතිය සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කිරීම සිදුවන බවත්, මිලගණන් කැඳවීම සිදු කළ යුතු වන්නේ ප්‍රසම්පාදන හා ගබඩා අංශය මගින් වුවත් සමහර අවස්ථාවලදී සේවා අවශ්‍යතා, හදිසි සේ සලකා ඒ ඒ අදාල අංශ මගින් එය සභාපතිතුමාගේ පූර්ව අනුමැතිය

අනුව සිදුකරනු ලබන අවස්ථා තිබෙන බවත්, 2014 අප්‍රේල් මාසයේ දියතලාවේ පවත්වන ලද ෆොක්ස් හිල් සුපර් ක්‍රොස් මෝටර් රථ තරඟයට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සිදු වූ බවත්, තාක්ෂණ ඇගයීම් කමිටුව පත්කිරීම සිදුවන්නේ වර්ෂයක් සඳහා සංස්ථා සභාපතිවරයා බවත්, තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත අදාල ඉල්ලීම ඉදිරිපත් කර ඇත්තේ ප්‍රසම්පාදන සහ ගබඩා කාර්යාංශය මගින් බවත්, තවද එම ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කරන වාර්තාවේ වෙනස් කිරීමක් නැවතත් ඔහු විසින් ප්‍රසම්පාදන කමිටුවට පසුව ඉදිරිපත් කර තිබෙන බවත්, එම ඉදිරිපත් කරන ලද පත්‍රිකා ප්‍රසම්පාදන කමිටුව විසින් 2014.9.19 වන දින අනුමත කර තිබෙන බවත්, තාක්ෂනික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තීරණ ගැනීම සඳහා කිසියම් කාලසීමාවක් ගතවන බවත්, එබඳු අවස්ථාවලදී අවශ්‍යතාවය අනුව සභාපතිතුමාගේ අනුමැතියට යටත්ව එම මිලදී ගැනීම සිදුකර තාක්ෂණික ඇගයීම කමිටුවට යොමු කරන අවස්ථා තිබෙන බවට එස්. ඩී. එස්. රාජපක්ෂ මහතා විසින් සාක්ෂි දී ඇති බව චමින්ද සමරකෝන් මහතා අවධාරනය කර ඇත.

Foxhill Super Cross මෝටර් රථ ධාවන තරඟයේ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කරන ලද ප්‍රචාරක පුවරු නැවත සංස්ථාවට භාරදිය යුතු බවට සැපයුම්කරුවන්ට දැනුම් දී තිබූ බවත්, ඒ අනුව එකී පුවරු ලිහිසි තෙල් කළමණාකරු යටතේ තිබෙන මුතුරාජවෙල ලිහිසි තෙල් ගබඩාවට භාර දී තිබූ බවත්, ඒවා නිසියාකාරව භාර දී ඇත්දැයි දැන ගැනීමට නම්, ඒ පිළිබඳව විමසිය යුත්තේ ලිහිසි තෙල් කළමණාකරු වන බී. ජී. එන්. මෙන්ඩිස් මහතාගෙන් බවත්, එසේ තිබිය දී සංස්ථාවේ අභ්‍යන්තර විගණන කළමණාකරු විසින් එකී භාණ්ඩ නිසිලෙස භාර ගත්තාදැයි පරීක්ෂා කිරීම සඳහා අවස්ථාව ලබාදෙන ලෙසට

2015.3.18 දිනැති පැ-75 ලිපියෙන් වර්ෂ 2015.3.18 දිනයේත්, 2015.3.24 දිනයේත් සටහන් දෙකක් තබමින් මේ සම්බන්ධව ලිහිසි තෙල් කළමණාකාර මෙන්ඩිස් මහතා සම්බන්ධ කර ගන්නා ලෙසට දැනුම් දී, එකී ලිපියට කඩිනමින් ප්‍රතිචාර දක්වා ඇති බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

Foxhill Super Cross මෝටර් රථ ධාවන තරඟයට අදාල ප්‍රචාරණ ව්‍යාපෘතියට අදාලව චමින්ද සමරකෝන් මහතාට එරෙහිව ඉදිරිපත් කළ පැ-23 දරණ චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා සම්බන්ධයෙන් පැ-76 දරණ ලිපියෙන් චමින්ද සමරකෝන් මහතා පිළිතුරු ලබාදුන් බව සාක්ෂි දෙමින් කියා ඇත. ඔහු සිය සාක්ෂියේදී පැ-23 චෝදනා පත්‍රයේ චෝදනා 8 ට අදාලව වෙන් වෙන් වශයෙන් කරුණු පැහැදිලි කරමින් හා ඊට අදාලව සාක්ෂියේදී සළකුණු කරන ලද ලේඛණ පිළිබඳව සඳහන් කරමින් සවිස්තරාත්මක සාක්ෂියක් දී ඇත.

පැ-23 දරණ චෝදනා පත්‍රය මත පැවැත් වූ විනය පරීක්ෂණයේ පරීක්ෂණ වාර්තාව පරීක්ෂණ නිළධාරී කේ. සී. ජයරත්න මහතා විසින් සකස් කළ බවත්, එකී පරීක්ෂණ වාර්තාව පැ-77 ලෙස සලකුණු කොට ඉදිරිපත් කර ඇත. පැ-77 දරණ පරීක්ෂණ වාර්තාවට පදනම් කරගෙන ඇත්තේ විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබා දුන් අභ්‍යන්තර විගණන අංශයේ කළමණාකාර සහකාරවරියක් වන එම්. ටී. ඒ. ජයසිංහ මහත්මියගේ සාක්ෂිය පමණක් බවත්, ,ඇය, මෙම චෝදනා පත්‍රය ලබා දීමට පෙර අභ්‍යන්තර විගණන අංශය විසින් පැවැත් වූ විමර්ශනය මෙහෙය වූ නිලධාරිනිය නොවන බවත්, එකී විමර්ශනය මෙහෙයවූයේ අභ්‍යන්තර විගණන කළමණාකරු මනුල තිලකරත්න මහතා බවත්, ජයසිංහ ලිපිකාරිනිය ප්‍රකාශ ලබා ගැනීමේ අවස්ථාවලදී විමර්ශනය මෙහෙය වූ නිලධාරියා සමග සහභාගීවීම පමණක් සිදුකළ

අයෙකු බවත්, චමින්ද සමරකෝන් මහතා වැඩිදුටරත් සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-77 විනය පරීක්ෂණ වාර්තාව අනුව චෝදනාවලට වරදකරු වූ චමින්ද සමරකෝන් මහතා හා අනෙක් නිලධාරීන් දෙදෙනාට එරෙහිව ගතයුතු විනය පියවර පිළිබඳ සභාපතිවරයා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ (මානව සම්පත් සහ පාලන) නිර්දේශ ඉල්ලා ඇති බවට, පැ-77 වාර්ථාවේ සටහනක්ද තිබෙන බවත්, සාමාන්‍යයෙන් විනය පරීක්ෂණ වාර්තාව අනුව චෝදනා වලට වරදකරු වූ අයෙකුට ගතයුතු විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීමට එකී කරුණු යොමු කරන්නේ සංස්ථාවේ විනය කමිටුවක් වෙත බවත්, පැ-77 වාර්තාව නිර්දේශ සඳහා එවැනි විනය කමිටුවක් වෙත යොමු නොවූ බවත්, පැ-77 විමර්ශන වාර්තාවෙන් සංස්ථාවට මූල්‍ය වංචාවක් හෝ එම ගණුදෙනුව මත සංස්ථාවට සිදුවූ අලාභයක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් කරුණු අනාවරණය වීමක් හෝ සිදු නොවී තිබියදී චමින්ද සමරකෝන් මහතාට එරෙහිව ගතහැකි ඉහලම විනය ක්‍රියාමාර්ගය ලෙස චමින්ද සමරකෝන් මහතාව සේවයෙන් පහ කිරීම සිදු කර ඇති බව ඔහු සාක්ෂි දෙමින් කියා ඇත. පැ-77 දරණ පරීක්ෂණ වාර්තාවට පදනම් වූ විනය පරීක්ෂණය පැවැත්වූයේ නිලධාරීන් තිදෙනෙකු සම්බන්ධයෙන් බවත්, එහිදී ඔහුට චෝදනා 8 ක් සහ අනෙක් දෙදෙනාට 6 බැගින් නගා තිබුණු බවත්, මෙම නිලධාරීන් තිදෙනාගේ වගකීම් ස්වරූප තුනක් ගන්නා බවත්, එසේ තිබියදී සියලුම චෝදනා එකට එකතු කොට විනිශ්චය කර ඇති බවත්, එහිදී සංස්ථාව වෙනුවෙන් ඉදිරිපත් කළ සාක්ෂි පමණක් පදනම් කරගෙන ඇති බවත්, චමින්ද සමරකෝන් මහතා වෙනුවෙන් විනය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ ලේඛණ හෝ හරස් ප්‍රශ්න කිරීම්වලින් හෙළිදරව් වූ කරුණු

කිසිවක් පදනම් කරගෙන නොමැති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. තවද එම විනය පරීක්ෂණය මෙහෙය වූ කේ. සී. ජයරත්න මහතා වයෝවෘද්ධ තැනැත්තෙක් බවත්, එිනිසා විනය පරීක්ෂණයේදී ඔහුගේ සහායට ඥාති පුත්‍රයෙකු වන චරිත් නිලංග යන අය පැමිණ සිටි බවත්, එම චරිත් නිලංග යන අය කේ. සී. ජයරත්න මහතාගේ කටයුතුවලට සහයෝගය ලබා දුන් බවත්, එම චරිත් නිලංග යන අයට ඊට පසුව සංස්ථා සභාපතිවරයා විසින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය අංශයේ ස්ථිර රැකියාවක් ලබා දී තිබූ බවත්, එම තැනැත්තාට රැකියාවක් ඉහත කී සම්බන්ධතාවය මත ලබාදීම පිළිබඳව චමින්ද සමරකෝන් මහතා අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාවට පැමිණිල්ලක් සිදුකර ඇති බවත්, පැ-77 වාර්තාව ව්‍යාජව සකස් කළ එකක් බවත්, එකී කරුණු මත පැ-77 වාර්තාව චමින්ද සමරකෝන් මහතා විසින් පිළි නොගන්නා බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂිය මගින් පැ-23 චෝදනා පත්‍රයේ එක් එක් චෝදනාවට අදාල සවිස්තර කරුණු දැක්වීමක් සිය සාක්ෂිය මගින් සිදුකර ඇත. එහිදී පැ-23 හි 1 වන චෝදනාව නගා තිබුණේ ධාවන තරඟාවලියේ ඩිජිටල් ප්‍රචාරණ කටයුතු හා රූපවාහිනී වෙළෙඳ දැන්වීම් නිර්මාණය කිරීමේ කටයුත්ත සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී සංස්ථවේ ප්‍රසම්පාදන සහ ගබඩා අංශයට යොමු නොකොට අලෙවි අංශය යටතේ පවතින පාරිභෝගික සේවා ඒකකය මගින් සැපයුම්කරුවන්ගෙන් මිලගණන් කැඳවීම, ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම යන චෝදනාව වන බවත්, එසේ වුවද එහිදී වර්ෂ 2014 වන තෙක්ම සංස්ථාවේ ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සඳහා සැලසුමක් නොතිබූ බවත්, ප්‍රසම්පාදන හා ගබඩා අංශයේ ඒ වන විට එම කාර්යය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටි හෙයින් එකී

කාර්යය කිරීමට දින 75 ක් පමණ ගතවන බව එම අංශයේ කලමණාකරු දැනුම් දී තිබූ බවත්, ඒ අනුව සංස්ථාවේ DPC Minor ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් ව්‍යාපෘතියට පත්කළ තිදෙනෙකුගෙන් යුක්ත කමිටුවක් හරහා පිරිවිතර සැකසීම, මිලගණන් කැඳවීම, විවෘත කිරීම හා ඇගයීමේ කටයුතු සිදුකල බවත්, පැ-46 දරණ සභාපතිවරයාගේ චක්‍රලේකය අනුව ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු ආයතනික සන්නිවේදන සහ පාරිභෝගික සේවා ඒකකය මගින් සිදුකළ බවත්, පැ-57 හා පැ-68 අනුව මිල ලේඛන සැකසීම, කැඳවීම හා ඇගයීම අදාල කමිටුව මගින් සිදුකර ඇති බවත්, පැ-74 දරණ ප්‍රසම්පාදන හා ගබඩා කළමණාකරු විසින් දුන් සාක්ෂිය අනුව සැපයුම්කරුවන් තෝරා ගැනීමට සමහර අවස්ථාවල සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය අනුව වෙනත් අංශ මගින් සිදු කරන බව ප්‍රකාශ කර ඇති බවත්. ඒ අනුව චමින්ද සමරකෝන් මහතාට එල්ල වූ චෝදනාව පදනම් විරහිත බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-23 හි පලමු චෝදනාවට පදනම් වූ තවත් කරුණක් වූයේ රූපවාහිනී දැන්වීම නිර්මාණය කිරීමේ කටයුත්තටද සැපයුම්කරුවන් කැඳවීම ප්‍රසම්පාදන හා ගබඩා අංශය මඟින් සිදු නොකිරීම වුවද, කළමණාකාර අධ්‍යක්ෂකවරයාගේ ඍජු උපදෙස් මත ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකයේ ප්‍රධානි දේදුනුපිටිය මහතා විසින්, DPC Minor ප්‍රසම්පාදන කමිටු සභාපති වූ කළමණාකාර අධ්‍යක්ෂවරයා හරහා සංස්ථාවේ සභාපතිවරයාට යොමු කොට සභාපතිගේ අනුමැතිය මත අවම ලංසුව සහිත සැපයුම්කරු තෝරාගෙන ඇති බව පැ-70 අනුව පැහැදිලි වන බවත්, පැ-64 දරණ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව හා පැ-65 දරණ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මගින්ද කිසිදු ලෙසකින්

සැපයුම්කරුවන් තෝරා ගැනීමේ කටයුත්තේ දෝෂයක් පවතින බවක් දක්වා නොමැති බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-23 හි චමින්ද සමරකෝන් මහතාට එල්ල වූ චෝදනාව වූයේ මුදල් රෙගුලාසි අනුව රුපියල් මිලියන දෙකකට වැඩි ගණුදෙනු සඳහා ගෙවීම් කටයුතු කිරීමට ප්‍රථම සංස්ථාවේ තාක්ෂණික ඇගයීම් කමිටු අනැමැතිය නොගෙන කටයුතු කිරීම බවත්, එකී කාර්යයේදී පැ-60 දරණ ගෙවීම් වවුචරය අනුව, ගෙවීම් වවුචරය සහතික කිරීම හෝ අනුමත කිරීම, ඒ අනුව ගෙවීම් සිදු කර ඇත්තේ මුදල් අංශය මගින් බවත්, ඒ සඳහා චමින්ද සමරකෝන් මහතා ක්‍රියා නොකළ බවත්, ඔහු සිදුකලේ පැ-38 ලෙස සලකුණු කළ මූල්‍ය රෙගුලාසිවල පැ-38B හා පැ-38C සලකා බලා පැ-59 දරණ වියදම් වවුචරය සහතික කිරීම පමණක් බවත්, එවැනි තාක්ෂණික කමිටු අනුමැතියක්, ගෙවීමට පෙර ලබාගත යුතු නම් එකී වගකීම පවතින්නේ පැ-38G අනුව Pass for Payment යන රාජකාරිය කරන ගෙවීම් නිලධාරියා වූ සුමිතා කේ. දහනායක මහත්මියකට බවත්, ඒ උදෙසා කිසිදු වගකීමක් චමින්ද සමරකෝන් මහතා වෙත නොමැති බවත්, ඔහු සාක්ෂි දී ඇත.

පැ-23 හි 3 වන හා 4 වන චෝදනාවන් එල්ල වූයේ සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී වරින්වර මිලගණන් විවෘත කිරීමත්, මිල ගණන් ඇගයීමත්, විනිවිදභාවයකින් තොරව කටයුතු කිරීමත්, ඒ සඳහා අනුබල දීමත් සිදු කළේ යැයි යන පදනමෙන් බවත්, එසේ චෝදනා චමින්ද සමරකෝන් මහතා වෙත එල්ල කළද, සැපයුම්කරුවන්ගෙන් මිලගණන් කැඳවීමේ ලේඛණ, අවශ්‍ය පිරිවිතර සැකසීම, මිලගණන් විවෘත කිරීම හා ඇගයීම සිදුකළේ කළමණාකාර අධ්‍යක්ෂක විසින් පත්කළ දේදුනුපිටිය, මෙන්ඩිස් හා පතිරණ යන අයගෙන් සමන්විත

කමිටුව බවත්, වෙළඳ දැන්වීමක් සකස් කිරීමට සැපයුම්කරුවන් කැඳවීමේ කටයුත්තට අදාල පැ-70 ලේඛණය අනුවද ඊට සම්බන්ධ වී ඇත්තේ කමිටු සාමාජික දේදුනුපිටිය මහතා, කළමණාකරණ අධ්‍යක්ෂක හා සංස්ථා සභාපතිවරයා බවත්, ඒ උදෙසාද චමින්ද සමරකෝන් මහතාගේ සම්බන්ධයක් නොමැති බවත්, ඔහු කරුණු පැහැදිලි කරමින් සාක්ෂි ලබා දී ඇත.

පැ-23 හි 5 වන චෝදනාවට පදනම් වූයේ රූපවාහිනී වෙළෙඳ දැන්වීම නිර්මාණය කිරීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී අදාල සැපයුම්කරුවන් තිදෙනා නමින් කූට ලෙස ව්‍යාජ ලේඛන සකස් කිරීම හා ඊට ආධාර අනුබල දීම වුවද, ඊට අදාල සැපයුම්කරුවන්ගේ මිලගණන් කැඳවූයේ කළමණාකරන අධ්‍යක්ෂකගේ ඍජු උපදෙස් මත දේදුනුපිටිය මහතා බවත්, අදාල විනය පරීක්ෂණයේදී එකී ලේඛන කූඨ ලේඛණ බවට සාක්ෂි දීමට අදාල ආයතනවල නිලධාරීන් සාක්ෂියට කැඳවීමක් නොකළ බවත්, එසේ තිබියදී ඊට කිසිදු අදාලත්වයක් නැති චමින්ද සමරකෝන් මහතාව චෝදනාවට වරදකරු කර ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-23 හි 6 වන චෝදනාව මගින් ප්‍රචාරන කටයුතු අවසන් වූ පසු නැවත සංස්ථාව වෙත භාරදුන් භාණ්ඩ පරීක්ෂා කිරීමට කඩිනමින් අවශ්‍ය පහසුකම් සලසන ලෙස එවන ලද 2015.3.18 දිනැති ලිපියට නිසි පරිදි අවශ්‍ය කටයුතු නොකිරීමෙන් බරපතල වරදක් කළ බවට චමින්ද සමරකෝන් මහතාට චෝදනා නගා තිබුණද, පැ-75 දරණ 2015.3.18 දිනැති ලිපියෙහි ඔහු විසින් සටහන් දෙකක් යොදමින් අදාල නිලධාරීන්ගේ අවධානයට යොමුකරමින් කඩිනමින් ක්‍රියාකර ඇති බවත්, එසේ තිබියදී චෝදනා නැගීම ද්වේෂයෙන් සිදුකර ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-23 හි 7 හා 8 වන චෝදනා මගින් චමින්ද සමරකෝන් මහතා පත්වීම් ලිපියේ 25 වන සේවා කොන්දේසිය උල්ලංඝනය කර ඇති බවත්, සංස්ථාව චමින්ද සමරකෝන් මහතා කෙරෙහි තබා තිබූ විශ්වාසය කඩකර ඇති බවට චෝදනා කර තිබුණද, චමින්ද සමරකෝන් මහතා ඔහුට සංස්ථාව විසින් පවරන ලද රාජකාරි කටයුතු නිසි පරිදි ඉටුකල බවත්, Foxhill Super Cross මෝටර් රථ ධාවන තරඟාවලියට අදාල ව්‍යාපෘතියේ පවරන ලද රාජකාරී ඉටු නොකලා නම් පමණක් සේවා කොන්දේසිවලට පටහැනි වීමක් හා සංස්ථාව ඔහු කෙරෙහි තැබූ විශ්වාසය කඩකිරීමක් සිදුවන බවත්, එසේ නොමැතිව එකී කර්තව්‍යය සාර්ථක කර ගැනීමට චමින්ද සමරකෝන් මහතා සිය දායකත්වය අවංකව ලබාදීම මගින් සේවා කොන්දේසි සපුරාලමින් සංස්ථාවේ විශ්වාසය ආරක්ෂා කර ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-77 දරණ පරීක්ෂණ වාර්තාව මත සභාපතිවරයා විසින් මානව සම්පත් සහ පාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ගමගේ මහතාගෙන් නිර්දේශ කැඳවා ඇති බවත්, ඒ අනුව මානව සම්පත් හා පාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා පැ-78 දරණ ලිපිය මගින් වහාම ක්‍රියාත්මක වන පදිරිදි චමින්ද සමරකෝන් මහතාව සේවයෙන් පහකිරීම සුදුසු බව යෝජනා කර ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-79 ලිපිය මගින් චමින්ද සමරකෝන් මහතා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, එහි පැ-79 දරණ පැමිණිල්ල මගින් දක්වා ඇත්තේ ටී. ජී. ජයසිංහ සභාපතිවරයා විසින් චමින්ද සමරකෝන් මහතා සම්බන්ධ විනය

පරීක්ෂණ මෙහෙය වූ කේ. සී. ජයරත්න මහතාගේ සහායට පැමිණි ඔහුගේ ඥාති පුත්‍රයෙකු වූ චරිත් නිලංග යන අයට සංස්ථාවේ ස්ථිර රැකියාවක් ලබා දී ඇති බවත්, එකී ක්‍රියාව ඔහුට එරෙහි විනය පරීක්ෂණවලදී ද්වේෂසහගතව වරදකරු කිරීමට අදාලව ලබාදුන් අනුග්‍රහාකත්වයක් බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතාට එරෙහිව ලබා දුන් පැ-24 දරණ චෝදනා පත්‍රයට පදනම් වූයේ අලව්ව පුද්ගලික පිරවුම් හලක් සම්බන්ධ සිද්ධියක් බවත්, එහිදී එම පිරවුම්හලේ බෙදුම්කරු වූ මාපා ගුණරත්න මහතා පිරවුම්හලට අදාල දේපල සම්පූර්ණයෙන් දිසානායක එන්ටර්ප්‍රයිසස් ආයතනයට අලෙවි කළ බවත්, ඒ අනුව දිසානායක එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් බෙදුම්කාරීත්වය ඔවුනට ලබාදෙන මෙන් එවකට සභාපති හැරී ජයවර්ධන මහතාගෙන් ඉල්ලා සිටි බවත්, අදාල දේපල නිසි පරිදි පැවරී ඇත්දැයි නීති අංශයෙන් තහවුරු කරගෙන සභාපතිවරයාගේ උපදෙස් මත චමින්ද සමරකෝන් මහතා විසින් අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කොට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එය අනුමත කර තිබූ බවත්, එසේ තිබියදී ද්වේශසහගතව එම චෝදනාව නගා තිබූ බවත්, ඊට අදාල විනය පරීක්ෂණ වාර්තාව පැ-80 ලෙස සළකුණු කරන බවත්, එකී චෝදනාවෙන් චමින්ද සමරකෝන් මහතා නිදහස් කරන ලද බව පසුව දැනගන්නා ලද බවත්, ඔහු සාක්ෂි දෙමින් කියා ඇත. පැ-23 චෝදනා පත්‍රයට අදාලව ඉදිරිපත් කළ පැ-77 දරණ පරීක්ෂණ වාර්ථාවේ කේ. සී. ජයරත්න මහතාගේ අත්සනත්, පැ-24 චෝදනා පත්‍රයට අදාලව ඉදිරිපත් කළ පැ-80 දරණ පරීක්ෂණ වාර්ථාවේ කේ. සී. ජයරත්න

මහතාගේ අත්සනත්, පරස්පර බවට සැකයක් පවතින බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-26 ලිපිය මගින් චමින්ද සමරකෝන් මහතාව සේවයෙන් පහ කිරීමෙන් පසුවත් පැ-21 සහ පැ-25 දරණ චෝදනාපත්‍ර මත විනය පරීක්ෂණ පවත්වාගෙන යන බවට ඔහුට දැනුම් දී තිබූ බවත්, එය ඔහුගෙන් දේශපාලනිකව පලිගැනීමට සැළසුම්සහගතව කරන ලද ක්‍රියාවක් බවත්, සේවයෙන් පහකොට 2017.1.19 වන දින පැ-25 දරණ චෝදනා පත්‍රය මත විනය පරීක්ෂණයක් පැවැත්වීමට නියමිතව තිබූ බවත්, එහිදී දැනටමත් සේවයෙන් පහකර තිබියදී මෙම පරීක්ෂණය පැවැත්විය නොහැකි බවට චමින්ද සමරකෝන් මහතා වෙනුවෙන් දැනුම්දුන් බවත්, එහිදී මීලඟ දිනයේදී විනය පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම් ඒකපාර්ශවික විභාගයක් ඔහුට එරෙහිව පවත්වා වාර්තාවක් ඉදිරිපත් කරන බවට ඒක පුද්ගල විනිශ්චය සභාව නිගමනය කළ බවත්, එකී තීරණය දැක්වෙන එම විනය පරීක්ෂණයේ කාර්ය සටහන පැ-81 ලෙස ඉදිරිපත් කරන බවත්, චමින්ද සමරකෝන් මහතා පැ-25 දරණ චෝදනා පත්‍රයට පදනම් වූ විනය පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම් ඒක පාර්ශවික විනය පරීක්ෂණයක් පැවැත්වීමට ක්‍රියා කරන බවට සභාපතිවරයා විසින් ඔහුට එවන ලද ලිපිය පැ-81A ලෙස ඉදිරිපත් කරන බවත්, ඊට අදාලව විනය පරීක්ෂණයේ 2017.1.26 දිනැති කාර්ය සටහන පැ-82 ලෙසත්, 2016.11.25 දිනැති කාර්ය සටහන පැ-83 ලෙස ඉදිරිපත් කරන බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-25 දරණ චෝදනා පත්‍රයට පදනම් වූයේ 2015.1.22 දිනැති නිර්ණාමික පෙත්සමක් බවත්, එකී පෙත්සම පැ-84 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන බවත්, එකී පැ-84 පෙත්සම මත විමර්ශණයක්

පැවැත්වීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) විසින් ආරක්ෂක හා විමර්ශන අංශයේ කළමණාකරුට නියෝග කර තිබූ බවත්, ඒ අනුව ආරක්ෂක හා විමර්ශන අංශයේ කළමණාකරු විසින් 2015.6.15 දිනැතිව පැ-85 දරණ වාර්තාව සභාපතිවරයා වෙත ඉදිරිපත් කර තිබූ බවත්, එකී පැ-85 වාර්තාව ඉදිරිපත් කළ දිනය තෙක් චමින්ද සමරකෝන් මහතාගෙන් ප්‍රකාශයක් ලබා නොගත් බවත්, පැ-85 වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔහුගෙන් ප්‍රකාශයක් ලබාගත් බවත්, අනතුරුව 2015.12.23 ඊට අදාල තවත් විමර්ශන වාර්තාවක් ඉදිරිපත් වූ බවත්, එය පැ-86 ලෙස සළකුණු කර ඉදිරිපත් කරන බවත් චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-86 ලේඛනය අනුව එහි පැ-86 B, C අනුව ප්‍රධාන නීති නිළධාරිණිය විමර්ශන කටයුතුවලට දායක කරගෙන ඇති අතර, එකී කාර්යය නීති නිළධාරිණියගේ කටයුත්තක් නොවන බවත්, විමර්ශන නිළධාරියාට චමින්ද සමරකෝන් මහතාගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට අවශ්‍යතාවයක් නොතිබූ බවත්, ප්‍රධාන නීති නිළධාරිණියගේ මෙහෙයවීම මත ක්‍රියාත්මක වී ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට ක්‍රියාකර ඇති බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-25 දරණ චෝදනා පත්‍රයට චමින්ද සමරකෝන් මහතා පැ-87 දරණ පිළිතුරු ලිපිය යවමින් නිවැරදිකරු බවට ප්‍රකාශ කළ බවත්, පැ-88 දරණ පරීක්ෂණ වාර්තාව අනුව වාර්තාවේ සඳහන් චෝදනාවලට චමින්ද සමරකෝන් මහතා වරදකරු නොවන බවට තීරණය කර ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. පැ-21 දරණ චෝදනා පත්‍රය ඔහුට වර්ෂ 2015 ජනවාරි මාසයේදී ඉදිරිපත් කළ බවත්, එයට පදනම් කරගෙන ඇත්තේ 2013 වර්ෂයේදී ඉන්ධනහලක බෙදුම්කාරත්වධූරය

සංශෝධනය කිරීමේ සිද්ධියක් බවත්, ඊට අදාලව වර්ෂ 2013.03.30 වන දින වාර්තාවක් ඉදිරිපත් වූ බවත්, එමගින් චමින්ද සමරකෝන් මහතාට කිසිදු චෝදනාවක් එල්ල නොවූ බවත්, එකී පැ-89(I) දරණ 2013.3.30 දිනැති වාර්තාව මගින් හා පැ-89(II) දරණ වාර්තාව මගින් නිගමනය කර තිබුණේ හිටපු බෙදුම්කරු බෙදුම්කාරත්ව ගිවිසුම කඩ කර ඇති බවට නිගමනය කිරීම බව, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-21 චෝදනා පත්‍රයට පදනම් වූ වර්ෂ 2013 දී සිදු වූ සිද්ධියක් සම්බන්ධයෙන් 2015.1.23 දින පාඨලී චම්පික රණවක අමාත්‍යවරයාට ආර්. රාසමානික්කම් යන අයෙකුගෙන් පැ-90(I) ලෙස ලකුණු කළ පැමිණිල්ල ඉදිරිපත් වී ඇති බවත්, එසේම පැ-90(II) දරන අත්සනක් නැති අල්ලස් කොමිසම වෙත සංජීව ගමගේ නමැති නීතිඥවරයෙකුගේ යැයි සඳහන් ලිපි ශීර්ෂයක් සහිතව ඉදිරිපත් වී ඇති ලිපියක් අමාත්‍යවරයා වෙත යොමුකර ඇති බවත්, එකී පැමිණිලි මත පදනම්ව පැ-89(I) සහ පැ-89(II) වාර්තා දෙක ඉදිරිපත් වූ සිද්ධියටම වර්ෂ 2013 දී පැ-89(II) වාර්තාව ඉදිරිපත් කල ආරක්ෂණ හා විමර්ශන කළමණාකරු විසින්ම වර්ෂ 2015.4.29 දිනැති පැ-91 දරණ වාර්තාව ඉදිරිපත් කිරීම සිදුකර ඇති බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-91 දරණ 2015.4.29 දිනැති විමර්ශන වාර්තාවේ පැ-91A ලෙස සලකුණු කළ නිර්දේශයේ දැක්වෙන්නේ ඉන්ධන පිරවුම්හල තුන්වන පාර්ශවයක් මගින් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කර ඇති හෙයින් එකී පිරවුම්හලේ බෙදුම්කාරත්ව ධූරය අහෝසි කිරීම සම්බන්ධයෙන් ගැටලුවක් නොමැති බවට වශයෙනුත්, තවද තුන්වන පාර්ශවයක් මගින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොටස්කරුවන්

වෙත 2012.11.20 දින යවන ලද හේතු විමසීමේ ලිපිය යවා එහි හේතු විමසීමට පිළිතුරු ඉදිරිපත් කිරීමට පෙර කඩිනමින් පිරවුම්හලේ බෙදුම්කාරීත්වය වඩිවෙල් ප්‍රශන්තන් යන අයට ලබා දීමට නිර්දේශ කරමින් අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සහ චමින්ද සමරකෝන් මහතා විසින් අධ්‍යක්ෂක මණ්ඩලයට කරුණු වාර්තා කිරීමට කලින් ආරක්ෂණ සහ විමර්ශන කළමණාකරුගෙන් වාර්තාවක් කැඳවා දින දෙකක් තුලදී වාර්තාව ලැබීමටත් පෙර අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීම ගැටලු සහගත බවට එකී වාර්තාවේ දක්වා ඇති බවත්, චමින්ද සමරකෝන් මහතාගෙන් ඒ පිළිබඳව හේතු විමසා සුදුසු පියවර ගත යුතු බවට නිර්දේශ කර ඇති බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

අනතුරුව පැ-92 ලෙස ලකුණු කළ හේතු විමසීමේ ලිපිය චමින්ද සමරකෝන් මහතා වෙත එවූ බවත්, එකී ලිපියට පැ-93 ලෙස ලකුණු කළ පිළිතුරු ලිපිය ඔහු විසින් යැවූ බවත්, අනතුරුව පැ-21 චෝදනා පත්‍රයට පැ-94 දරණ හේතු දැක්වීමේ ලිපිය චමින්ද සමරකෝන් මහතා විසින් සභාපතිවරයා වෙත යොමු කළ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-91 දරණ විමර්ශන වාර්තාවෙන් චමින්ද සමරකෝන් මහතා සම්බන්ධව ගැටලුවක් ඇති බවට දක්වා ඇති කරුණුවලට පරිබාහිරව, චෝදනා ගණනාවක් එකී සිද්ධියට අදාලව පැ-21 දරණ චෝදනා පත්‍රයෙන් නගා ඇති බවත්, ඔහුගේ පැ-94 දරණ හේතු දැක්වීමේ ලිපිය පදනම් කරගෙන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර දැරූ අය මානව සම්පත් අංශය සමග එක්ව ක්‍රියා කරමින්, ඔහුට එරෙහිව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) විසින් වාර්තාවක් සභාපතිවරයා වෙත 2015.6.9 දින අංක. MKTDI/500/ යටතේ ඉදිරිපත් කර ඇති බවත්, එය පදනම් කරගෙන පැ-21 හි චෝදනා සකස්කර ඇති බවත්,

එකී කාර්යය ආයතනයේ සාමාන්‍ය රෙගුලාසිවලට පටහැනිව කර ඇති ක්‍රියාවක් බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත. පැ-21 දරණ චෝදනා පත්‍රය මත විනය පරීක්ෂණයක් පවත්වා පරීක්ෂණ නිලධාරී නීතිඥ දිලුක්ෂාන් පෙරේරා මහතා විසින් පැ-95 දරණ පරීක්ෂණ වාර්තාව සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. පැ-21 දරණ චෝදනා පත්‍රයට පදනම් වූ සිදුවීම චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂිය මගින් පැහැදිලි කරමින් සඳහන් කර ඇත්තේ කලවංචිකුඩි හි සංස්ථාව සතු බාණ්ඩයේ ඉන්ධනහල එල්. එස්. රාසමානික්කම් යන අය බෙදුම්කරු වශයෙන් පවත්වාගෙන ගිය බවත්, ඔහු මියයාමෙන් පසුව, පසු අවස්ථාවකදී ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අනුමැතියකින් සහ ගිවිසුමකින්ද තොරව දීර්ඝ කාලයක් තිස්සේ තෙවන පාර්ශවයකට බදු දී තිබූ බවත්, ඒ බව සංස්ථාවට අනාවරණය වීමෙන් පසුව එම බෙදුම්කාර ධූරය මාරු කිරීමට අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබුණු බවත්, සංස්ථාවේ ප්‍රාදේශීය කළමණාකරු හරහාද තෙවන පාර්ශවයකට බදු දී තිබූ බව අනාවරණය වූ බවත්, අනතුරුව බෙදුම්කාර ධූරය මාරු කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබුණු බවත්, වශයෙනි.

පැ-21 දරණ චෝදනා පත්‍රයෙන් චමින්ද සමරකෝන් මහතාට එල්ල වූ චෝදනාවන් වූයේ අදාල ඉන්ධන පිරවුම්හලේ බෙදුම්කාරත්ව ධූරය වඩුවේල් ප්‍රශන්තන් යන අයට පිරිනැමීමේදී චමින්ද සමරකෝන් මහතා සංස්ථාව සතු දේපලක බෙදුම්කාර ධූරය අහෝසි කිරීමට පෙර අනුගමනය කළ යුතු අලෙවි කාර්යාංශයේ මාර්කටින් මැනුවල් 8.6 ඡේදයේ දැක්වෙන නීති රෙගුලාසි උල්ලංඝනය කරමින් වංචනිකව කටයුතු කර ඇත්තේය යන කාරණය වන බව සාක්ෂි දෙමින් කියා ඇත. තවද එම බෙදුම්කාර ධූරය අවසන් කිරීමේ ක්‍රියා පටිපාටිය

ඇරඹුනේ තෙවන පාර්ශවයක් ලෙස එකී ඉන්ධනහල පවත්වාගෙන ගිය අය විසින් එය තමන්ට නිසි පරිදි පවරා දෙන ලෙසට එවකට සිටි අමාත්‍යවරයා වෙත සිදු කළ පැ-96(I), (II) ලෙස සලකුණු කළ ඉල්ලීම් වන බවත්, ඒ සඳහා අමාත්‍යවරයා පැ-96A සටහන තබමින් බෙදුම්කාර ධූරය මාරු කිරීම අනුමත කරමින් නියෝගයක් කළ බවත්, නමුත් සංස්ථාව ඒ අනුව ක්‍රියාත්මක නොවූයෙන් අමාත්‍යවරයා පැ-96B සටහන තබමින් ඒ පිළිබඳව වාර්තාවක් කැඳවූ බවත් ඒ අනුව කළමණාකාර අධ්‍යක්ෂවරයාගේ උපදෙස් මත පැ-97(I),(II) ලෙස සළකුණු කරන ලද වාර්තා චමින්ද සමරකෝන් මහතා විසින් අමාත්‍යවරයා වෙත යොමු කරන ලද බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතා විසින් සකස් කළ පැ-97(II) ලිපියේ කළමණාකාර අධ්‍යක්ෂවරයා විසින් "This is fine. Please do the need full" යන පැ-97A සටහන 2012.11.21 වන දින තැබූ බවත්, පැ-97B දරණ සටහන අමාත්‍යවරයා තබමින් අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට යටත්ව කටයුතු කරන ලෙස දැනුම් දී ඇති බවත්, පැ-97D අනුව කළමණාකාර අධ්‍යක්ෂකවරයා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව පිළියෙල කරන ලෙසට දැනුම් දුන් බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

එසේම සංස්ථාවට අයත් ඉන්ධනහල් නැවත ගොඩනැගීම උදෙසා හා එමගින් අතිරේඛ ආදායම් ලබා ගැනීම උදෙසා යෝජනා ඉදිරිපත් කරන ලෙස කමිටුවක් කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් පත්කළ බවත්, ඒ කමිටුවට චමින්ද සමරකෝන් මහතා ද සාමාජිකයෙකු වූ බවත්, ඒ උදෙසා කළමණාකාරවරයා විසින් පැ-98 දරන ලිපිය එවූ බවත්, එසේම කලවංචිකුඩි ඉන්ධනහලේ බෙදුම්කාර ධූරය අවසන්කොට නව බෙදුම්කරුවෙකුට ලබා දීමට අදාල පැ-99 දරණ

අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව සකස්කොට නිර්දේශ කරන ලද්දේ එකී කමිටුව විසින් බවත්, එකී පැ-99 දරණ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කලේ කළමණාකාර අධ්‍යක්ෂකවරයා බවත්, චමින්ද සමරකෝන් මහතාගේ සහ අනෙකුත් කමිටු සාමාජිකයන්ගේත්, කළමණාකාර අධ්‍යක්ෂකවරයාගේත් අත්සන් සහිත ස්ථාන පැ-99A, B, C ලෙස සලකුණු කර ඉදිරිපත් කරන බවත්, ඔහු සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-99 දරණ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එදිනට අනුමත කළ බවත්, දෙවනවර අනුමත කිරීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2020.12.21 දින සිදු කළ බවත්, අනුමැතියෙන් පසුව එදිනම නව බෙදුම්කරුවෙකු පත්කළ බවත්, බෙදුම්කාරීත්වය අවසන් කිරීමේ ලිපිය පැ-100 ලෙසත්, නව බෙදුම්කරු පත්කිරීමේ ලිපිය පැ-101 ලෙසත් සිය සාක්ෂියේදී සළකුණු කර චමින්ද සමරකෝන් මහතා ඉදිරිපත් කරන ලදි.

පැ-21 චෝදනා පත්‍රයේ 1 වන චෝදනාවට පදනම් වී ඇති බවට දක්වා ඇත්තේ මාකර්ටින් මැනුවල්හි 8.6 රෙගුලාසිය චමින්ද සමරකෝන් මහතා විසින් උල්ලංඝනය කර තිබීම බවත්, විනය පරීක්ෂණයට අදාල පරීක්ෂකගේ පැ-95 දරණ වාර්ථාවේ 8.6.3 දරණ රෙගුලාසියේ චමින්ද සමරකෝන් මහතා විසින් උල්ලංඝනය කර ඇති බවත්, දක්වා ඇති බවට සාක්ෂි දෙමින් කියා ඇත. තවද රෙගුලාසි අංක. 8.6.3 හි දැක්වෙන්නේ බෙදුම්කාරධූරය අහෝසි කිරීමේ ලිපියේ කෙටුම්පත ප්‍රධාන නීති නිළධාරියාට යැවිය යුතු බවත්, චමින්ද සමරකෝන් මහතා එකී ක්‍රියාව සිදුකර නොමැති හෙයින් 8.6 රෙගුලාසිය උල්ලංඝනය කර ඇති බවට වන පදනමින් පරීක්ෂණ නිලධාරියා සිය වාර්තාවේ දක්වා ඇති බවත්, ඔහු සාක්ෂි දෙමින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතා එ් සම්බන්ධයෙන් පැහැදිලි කරමින් සිය සාක්ෂිය දෙමින් කියා සිටියේ එම සිද්ධියට අදාල කෙටුම්පත කළමණාකාර අධ්‍යක්ෂකවරයා ප්‍රධාන නීති නිළධාරියා වෙත යොමු කර ඒ සම්බන්ධව සාකච්ඡා කර ඇති බවත්, අනතුරුව යවන ලද බෙදුම්කාර ධූරය අවසන් කිරීමේ පැ-100 ලිපියේ පිටපතක් ප්‍රධාන නීති නිලධාරිණියට යොමු කර ඇත බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-21 චෝදනා පත්‍රයට අදාල විනය පරීක්ෂණයට සංස්ථාව වෙනුවෙන් මේ සම්බන්ධ විමර්ශනය සිදු කළ ජ්‍යෙෂ්ඨ සහකාර විමර්ශන නිළධාරී කේ. ජී. ගුණසේන මහතා සාක්ෂි දීමට පැමිණි බවත්, එහිදී ඔහු විසින් ලබාදෙන ලද සාක්ෂිය පැ-102 ලෙස සලකුණු කරන බවත්, චමින්ද සමරකෝන් මහතා විසින් ප්‍රකාශ කරන ලදි. එකී සාක්ෂියේදී, බෙදුම්කාර ධූරය ලබා දීම සංස්ථා පිළිවෙත්වලට පටහැනිව හෝ සංස්ථාව අනුගමනය කරන කාර්ය පටිපාටියට පටහැනිව හෝ අලෙවි කාර්යාංශයේ 8.6 ඡේදවල නීති රීති උල්ලංඝනය කරමින් බෙදුම්කාරධූරත්වය වංචනික ලෙස ලබා දී තිබූ බවක්, විමර්ශනයේදී අනාවරණය නොවූ බවට ලබා දුන් සාක්ෂි ඛණ්ඩය පැ-102A ලෙසද චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂිය මගින් සලකුණු කර ඉදිරිපත් කරන ලදි.

පැ-21 හි 2 වන චෝදනාව මගින් නව බෙදුම්කරුවෙකු පත්කිරීමේදී සංස්ථාව විසින් අනුගමනය කරනු ලබන නිසි ක්‍රමවේදයකට එනම් තරඟකාරී ටෙන්ඩර් පටිපාටිය අනුව සිදු කළයුතු බවට අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් නොකිරීම මඟින් බරපතල වරදක් සිදුකළ බවට චෝදනා කළද, එම චෝදනාවෙන් නිදහස් කර ඇති බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-21 හි 3 වන චෝදනාව මගින්, 3 වන පාර්ශවයක් මගින් ඉන්ධනහල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හේතු විමසා 2012.11.20 වන දින යවන ලද ලිපියට පිළිතුරු දීමේ කාලය ඉකුත්වීමට පෙර කඩිනමින් පිරවුම්හලේ බෙදුම්කාරීත්වය වඩුවේල් ප්‍රශන්තන් යන අයට ලබාදීමට නිර්දේශ කරමින් 2012.11.22 දින අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරමින් වංචාවක් සිදු කළ බවට චමින්ද සමරකෝන් මහතාට චෝදනා නැගුවත් පැ-99 දරණ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවේ පැ-99C අනුව නිර්දේශ කිරීම කර ඇත්තේ ඒ. ආර්. ඒබල් මහතා බවත්, පැ-99D අනුව අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කර ඇත්තේ කළමණාකාර අධ්‍යක්ෂවරයා බවත්, චමින්ද සමරකෝන් මහතා විසින් එකී ක්‍රියාව සිදුකර නොමැති බවත්, ඔහු කියා සිටී.

පැ-97 ලිපිය කළමණාකාර අධ්‍යක්ෂවරයා විසින් අමාත්‍යවරයාට යොමු නොකොට ඊට පහළින් සිටි චමින්ද සමරකෝන් මහතා විසින් අමාත්‍යවරයාට යොමු කිරීම පිළිබඳව ඔහුගෙන් ප්‍රශ්න කළ අතර, එහිදී පැ-97 ලිපිය අමාත්‍යවරයාට යොමු කළේ එදින කළමණාකරණ අධ්‍යක්ෂවරයා සංස්ථාවේ නොසිටි හෙයින් ඔහු සමග දුරකථනයෙන් සාකච්ඡා කොට ඔහුගෙන් ලද උපදෙස් පරිදි බවත්, ඒ බව පැ-97 හි පැ-97E ලෙස සටහන් කළ කොටසින් පෙනීයන බවත්, අනතුරුව කළමණාකාර අධ්‍යක්ෂකවරයාට යොමු කළ කාර්යාල පිටපතෙහි පැ-97A සටහන යොදමින් "This is fine. Please do the needful" යනුවෙන් කළමණාකාර අධ්‍යක්ෂකවරයා සටහන් තබා අත්සන් කර ඇති බවත්, ඔවුන්ගේ දැනුවත්භාවය මත මෙම ලිපිය යැවීමට ක්‍රියාකළ බවත්, පිළිතුරු සපයමින් චමින්ද සමරකෝන් මහතා කියා ඇත.

පැ-21 හි 4 වන චෝදනාව මගින් චමින්ද සමරකෝන් මහතා පැ-103 ලෙස සලකුණු කළ 2012.11.20 දිනැති ලිපිය ඉන්ධන පිරවුම්හලේ කොටස්කරුවන් වෙත යැවූ ලිපියේ අරක්ෂණ හා විමර්ශණ කළමණාකරුට සටහන් තබමින් වාර්තාවක් කැඳවා, වාර්තාව ඉදිරිපත් වීමට පෙර අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව ගොනු කිරීම පිළිබඳව චෝදනා නැගුවද පැ-99 අනුව නිර්දේශය, අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම චමින්ද සමරකෝන් මහතා විසින් සිදු නොකල බවට සාක්ෂි දෙමින් කියා ඇත. අනතුරුව ඔහු පැ-104 වශයෙන් අලෙවි අත්පොතෙහි කොටසක් සලකුණු කළ අතර, එකී අලෙවි අත්පොතේ සඳහන් රීති පිළිබඳව අර්ථ නිරූපණය කිරීම හෝ අලෙවි අත්පොතේ සඳහන් නොවන කරුණු සම්බන්ධයෙන් අලෙවි කළමණාකරුගේ හෝ අංශ ප්‍රධානිගේ තීරණය අවසානාත්මක යැයි සඳහන් වන කොටස පැ-104A ලෙස සළකුණු කිරීමත්, එහි අන්තර්ගත වන්නේ මාර්ගෝපදේශයන් පමණක් බවත්, එය වෙනස් කිරීම අලෙවි කළමණාකරුගේ හෝ අංශයේ ප්‍රධානියාගේ අභිමතය පරිදි සිදුවන බව සඳහන් කොටස පැ-104B ලෙසත්, පැ-104 හි 18.14 හි බෙදුම්කරුවන්ට එරෙහිව ගතහැකි විනය ක්‍රියාමාර්ග සඳහන් වන බවත්, එහි 18.14.1 හි යම් අයෙක් බෙදුම්කාරත්වය සම්බන්ධයෙන් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් ඔහුට පෙර දැනුම්දීමක් නොමැතිව කටයුතු කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට හැකියාව ඇති බව පැ-104C ලෙස සළකුණු කළ කොටසෙහි දැක්වෙන බවත්, පැ-104C ලෙස සළකුණු කළ කොටසට අයත් වරදක් ලෙස පැ-104D ලෙස සළකුණු කළ කාරණය අදාල වන බවත්, පැ-104D ලෙස සළකුණු කර ඇත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලිඛිත අනුමැතිය නොගෙන තුන්වන පාර්ශවයකට බෙදුම්කාරධූරය පවරා දීම යන කාරණය බවත්, ඒ අනුව

පැ-104 A, C, D අනුව තෙවන පාර්ශවයකට බදු දුන් පාර්ශවයෙන් හේතු විමසීමේ ලිපියක් යැවීමේ අවශ්‍යතාවයක් පවා නොපවතින බවත්, චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂියේදී පෙන්වා දී ඇත.

තවද පැ-104 අලෙවි අත්පොත අනුව හේතු විමසීමක් සිදු කිරීම අවශ්‍ය නොවන අතර, හේතු විමසමින් යොමු කළ පැ-103 දරණ ලිපියට කෙසේවත් පිළිතුරු එවීමක් අදාල බෙදුම්කරු විසින් සිදු කර නොමැති බවත්, පැ-105 ලෙස 2006.11.16 දින ප්‍රාදේශීය කළමණාකරු ඌව/නැගෙනහිර විසින් එවන ලද වාර්තාව අනුවද අදාල පිරවුම්හලේ බෙදුම්කරු ඉවත්කොට සුදුසු බෙදුම්කරුවෙකුට අලුතින් ලබා දෙන ලෙස නිර්දේශ කරමින් වාර්තාවක් එවා තිබූ බවත්, එසේම පැ-103 ලිපියෙහි නැගෙනහිර ප්‍රාදේශීය කළමණාකරුට සහ ආරක්ෂණ විමර්ශන කළමණාකරුට යොමුකර ඇති සටහන් පැ-106A සහ පැ-106B ලෙස සළකුණු කරන බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

එසේම පැ-21 හි අංක. 5 දරණ චෝදනාව මගින්, චමින්ද සමරකෝන් මහතා නීත්‍යානුකූල බෙදුම්කරුගේ බැංකු ගිණුමක් නොවන වෙනත් පාර්ශවයකගේ බැංකු ගිණුම් අංකයක් මගින් ඉන්ධන තොග ලබා ගැනීම, ඉන්ධන පහසුකම් ලබා ගැනීම, එය අනුමත කිරීම මගින් බරපතල මූල්‍ය වංචාවක් සිදුකර ඇති බවට අසත්භාවයෙන් යුක්තව චෝදනා නගා ඇති බවත්, එම චෝදනාවෙන් පසුව නිදහස් කර ඇති බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත. එසේ පැ-21 හි 6 සහ 7 චෝදනාව මගින් පාලනාධිකාරිය සහ අධ්‍යක්ෂක මණ්ඩලය නොමග යැවීම හා චමින්ද සමරකෝන් මහතාගේ පත්වීම් ලිපියේ කොන්දේසි උල්ලංඝනය කර ඇති බවට චෝදනා කර ඇති

බවත්, එකී චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, ඔහු සාක්ෂි දෙමින් කියා ඇත.

ඛනිජ තෙල් පොදු සේවක සංගමයේ උප සභාපති ලක්ෂ්මන් ආනන්ද යන සංස්ථාවේ සේවකයෙක් 2014 වර්ෂයේ ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම්වලට අදාල අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවකට අදාලව කරුණු 6 ක් යටතේ තොරතුරු සංස්ථාවෙන් ඉල්ලා ඇති බවත්, එම ඉල්ලීම අනුව සංස්ථාව තොරතුරු ලබා නොදුන් හෙයින් ලක්ෂ්මන් ආනන්ද යන අය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවට ඉල්ලීමක් කර ඇති බවත්, එහිදී සංස්ථාවට කැඳවීමක් ලැබූ හෙයින් ඒ සම්බන්ධයෙන් පිළිතුරු දීම සඳහා සංස්ථාව විසින් නවදෙනෙකුගෙන් සමන්විත පොදු අධිකාරියක් පත්කර තිබූ බවත්, එහිදී පොදු අධිකාරියෙන් වර්ෂ 2014 දී රුපියල් මිලියන 32.9 ක මුදලක් වියදම් කර ඇති ආකාරය විමසා ඇති බවත්, එහිදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිසම 2009.8.3 දින ලබා දෙන ලද නියෝගය පැ-107 ලෙස සළකුණු කරන බව චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිසම ඉදිරියේදී සංස්ථාවේ පොදු අධිකාරිය නියෝජනය කළ නිලධාරීන් නැති තත්ත්වයක් මවා පාමින් අසත්‍ය කරුණු දක්වා ඇති බවත්, තොරතුරු ඉල්ලා ඇති කාරණයට අදාලව කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ නඩු දෙකක් විභාග වන බවත්, එම කරුණු ආශ්‍රිතව තවත් පරීක්ෂණයක් මූල්‍ය අපරාධ විමර්ශණ අංශය හරහා සිදුවන බවත්, කියා ඇති කොටස පැ-107(II) ලෙස සළකුණු කරන බවත්, එහි සඳහන් ආකාරයට මූල්‍ය කටයුත්තකට අදාල නඩු 2 ක් කම්කරු උසාවියේ නොමැති බවත්, චමින්ද සමරකෝන් මහතා විසින්

එම නඩු පවරා ඇත්තේ ඔහුගේ සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-107 හි පැ-107(III) ලෙස සළකුණු කර ඇති කොටසෙහි දැක්වෙන්නේ චමින්ද සමරකෝන් මහතා මුදල් වියදම් කිරීම නීත්‍යානුකූල නොවන තීරණ ගැනීම හා නීත්‍යානුකූල නොවන කටයුතු කිරීම හේතුවෙන් තනතුරෙන් පහකොට ඇති බවත්, පැ-107(IV) ලෙස සළකුණු කරන ලද කොටසහි, සංස්ථා පොදු අධිකාරිය පවසා ඇත්තේ, සංස්ථාවට නීත්‍යානුකූල නොවන කටයුතු හේතුකොටගෙන මූල්‍යමය වශයෙන් අලාභයක් වී නොමැති බවත්, එබැවින් එලෙස වගඋත්තරකරුන්ගෙන් කිසිදු මුදලක් අයකිරීමක් පොදු අධිකාරිය විසින් සිදුකර නොමැති බවට යනුවෙන් බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

මේ ආකාරයෙන් පොදු අධිකාරියක් වශයෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් කොමිසමට පැමිණ චමින්ද සමරකෝන් මහතාටත් අදාල වනසේ සංස්ථාවේ නිලධාරීන් කරුණු දැක්වීම, පුද්ගලික මට්ටමෙන් ඔහුට යම් යම් අය එල්ල කර ඇති පෙත්සම්වලට නීත්‍යානුකූලභාවයක් ලබා දීම උදෙසා කරන ලද ක්‍රියාවක් බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-107 ලේඛනයට පදනම් වූ සිද්ධියකට අදාලව චමින්ද සමරකෝන් මහතාගේ අදාලත්වයක් නොමැතිව ඔහු සම්බන්ධයෙන් වැරදි තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් චමින්ද සමරකෝන් මහතා සංස්ථාව වෙත ලිපි මගින් දැනුම් දෙමින්, විමසා සිටි බවත්, ඊට අදාලව ඔහු විසින් සංස්ථාවට යවන ලද ලිපි තුනක් පැ-108 (I), (II), (III) ලෙස සළකුණු කර සිටින බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතා වර්ෂ 2018 ඔක්තෝබර් මාසයේදී, නැවත ඔහුගේ රැකියාව ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කළ බවත්, ඒ අවස්ථාවේදී 2018.12.11 දිනැතිව නීතිඥ ශානිකා සිල්වා යන නමකින් පැ-109(I) දරණ එන්තරවාසිය එවකට සභාපති නීතිඥ සුමිත් විජේසිංහ මහතාට එවා තිබූ බවත්, එමගින් චමින්ද සමරකෝන් මහතා නැවත සේවයට බඳවා නොගන්නා ලෙසට දන්වා තිබූ බවත්, එම එන්තරවාසියේ සඳහන් වන්නේ අඹේපුස්ස, නුවර පාර, P&S බේකරියෙහි පදිංචි වරුණ ආර්. රාජපක්ෂ මහතාගේ උපදෙස් මත එකී ලිපිය යොමු කරන බවයි. කෙසේ වෙතත් චමින්ද සමරකෝන් මහතා විසින් එකී වරුණ ආර්. රාජපක්ෂ යන අයව මුණගැසී මෙකී එන්තරවාසිය සම්බන්ධයෙන් කරුණු සොයා බැලූ බවත්, එහිදී ඔහු විසින් ඉහත කී පැ-109(I) දරණ එන්තරවාසිය එවීමට කිසිදු උපදෙස් ලබා නොදුන් බව සහ ඊට කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවට කරුණු අනාවරණය කරගත් බවත්, ඒ අනුව පැ-109(III) දරණ දිවුරුම් ප්‍රකාශය ලබා දෙමින් ඉහකී එන්තරවාසියට තමන්ගේ කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවට ඔහු පිළිගෙන තිබෙන බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

එම කාල සීමාවේදීම චමින්ද සමරකෝන් මහතා සම්බන්ධයෙන් නීතිඥ එල්. ජී. මල්කාන්ති මහත්මිය විසින් එම්. ඩිල්ෂාන් මහතාගේ උපදෙස් මත එන්තරවාසියක් සංස්ථාවට යොමු කර තිබූ බවත්, එහිදී එම ඩිල්ෂාන් පීරිස් යන අය සංස්ථාවේ ඉන්ධනහලක බෙදුම්කරුවෙකුව සිටි අයෙකු බවත්, චමින්ද සමරකෝන් මහතා නැවත අලෙවි කළමණාකරු ලෙස පත්වුවහොත් ඩිල්ෂාන් පීරිස් යන අයට එරෙහිව පවතින නඩුවලට අගතියක් වන බව එකී එන්තරවාසියෙන් දක්වා තිබූ බවත්, එහිදී ඔහුට වන අගතිය කවරේදැයි

පැහැදිළි කරන ලෙස චමින්ද සමරකෝන් මහතා පැ-110(I) ලිපිය මගින් එම්. ඩිල්ෂාන් පීරිස් යන අයගෙන් විමසූ බවත්, අසත්‍ය කරුණු මත එවා ඇති එම එන්තරවාසිය පිලිබඳ නිසි පියවර ගැනීමට පෙර ඒ පිළිබඳව ඔහුගේ ස්ථාවරය දැනුම් දෙන ලෙස චමින්ද සමරකෝන් මහතා විසින් ඉල්ලා සිටි බවත්, එහිදී පැ-110(III) ලිපිය එම්. ඩිල්ෂාන් පීරිස් යන අය විසින් සභාපතිවරයා වෙත යොමු කරමින් , ඔහුගේ උපදෙස් මත එවන ලද එන්තරවාසිය මත ක්‍රියා නොකිරීමට තීරණය කළ බව දැනුම් දුන් බව චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

චමින්ද සමරකෝන් මහතාට රැකියාව ලබාදෙන ලෙස ඉල්ලීමක් කළ සැනින් විවිධ පැමිණිලි ඉදිරිපත් කරමින් ක්‍රියාත්මක වූයේ එක්සත් ජාතික පක්ෂයට හා ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෘත්තීය සමිති බවත්, ඔවුන් ඉන්ධනහල් හිමියන් හා එක්වෙමින් විවිධ ව්‍යාපාරයන් පවත්වාගෙන යමින් එයට ජාවාරම් කරන පුද්ගලයන් එකතු වෙමින් ඔහුට එරෙහිව ගැටලු නිර්මාණය කර ඇති බවත්, ඉන්ධනහල්වල දූෂණ සම්බන්ධයෙන් චමින්ද සමරකෝන් මහතා විසින් පාලනාධිකාරියේ අනුමැතිය මත දිගින් දිගටම දැඩි නීති රීති ක්‍රියාත්මක කළ හෙයින් ඔහු නැවත රැකියාවට පැමිණීම වැළැක්වීමට රජයට සම්බන්ධ පාර්ශවයන් හා එක්ව ක්‍රියා කරන බවත්, චමින්ද සමරකෝන් මහතා කියා ඇත.

ඉන්ධන පිරවුම්හලක් නීත්‍යානුකූල නොවන බෙදුම්කරුවෙකුට පැවරීම උදෙසා හලාවත තානායමක පැවති සාකච්ඡාවකදී එච්. පී. ආර්. ආරියරත්න යන අය විසින් "මම තමයි සමරකෝන් ගෙදර ඇරියේ" යනුවෙන් ප්‍රකාශ කර තිබූ බවත්, එච්. පී. ආර්. ආරියරත්න යන නිළධාරියා ප්‍රාදේශීය කළමණාකාර (වයඹ) ලෙස රාජකාරී කොට

වැඩ තහනමකට ලක් වූ බවත්, 2015 වර්ෂයේ බිහි වූ රජය යටතේ නැවත ඔහු සේවයේ පිහිටුවා ඇති බවත්, 2015.02.20 න් පසු ඔහු ස්වාධීන නිදහස් සේවක සංසදය නමැති වෘත්තීය සමිතියේ සාමාජකයෙකු සහ එහි හිටපු කාරක සභිකයෙකු බවත්, චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පලිගැනීමේ අරමුණෙන් විවිධ පෙත්සම් FCID ආයතනයට, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට යැවීමට සංවිධානාත්මකව ක්‍රියා කර ඇත්තේ මෙම පුද්ගලයා බවත්, චමින්ද සමරකෝන් මහතා කියා ඇත. එච්. පී. ආර්. ආරියරත්න සංස්ථාව් ස්වාධින නිදහස් සේවක සංසදයේ 2015 නිළධාරී මණ්ඩලයේ සිටි තැනැත්තෙක් බව තහවුරු කිරීම සඳහා එහි නිළධාරී මණ්ඩලය දැක්වෙන ලේඛනය පැ-111 ලෙසත්, ඔහුව ගෙදර යැවීමට කටයුතු කරන ලද්දේ තමන් බවට එච්. පී. ආර්. ආරියරත්න විසින් ප්‍රකාශ කරන අයුරු පටිගත වී තිබෙන CD පටය පැ-112 ලෙසත්, සළකුණු කිරීම චමින්ද සමරකෝන් මහතා ස්වකීය සාක්ෂිය මගින් සිදු කර ඇත.

චමින්ද සමරකෝන් මහතාව සේවයෙන් පහ කිරීමෙන් පසුව සිය හිඟ වැටුප් ඉල්ලා කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ගොනු කළ බවත්, එකී පැමිණිල්ලට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් පිළිතුරු දීමක් සිදුකර තිබූ බවත්, එකී පැ-113 ලෙස සළකුණු කරන ලද පිළිතුරු ලිපියෙහි ඔහුට එරෙහිව පැවති චෝදනාවලට අදාල මුදල් අක්‍රමිකතා සහ වංචා සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ෂන කොට්ඨාශය විසින් සිදු කරන පරීක්ෂණ යැයි පරීක්ෂණ අංකද, අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව විසින් පවත්වන පරීක්ෂණ වලට අදාල අංකද වශයෙන් දක්වා ඇති බවත්, එකී පරීක්ෂණ අංක පිළිබඳව චමින්ද සමරකෝන් මහතා සොයා බැලීමේදී එකී පැමිණිලි ඔහුට අදාලත්වයක් හෝ සම්බන්ධතාවයක්

නොමැති කාරණාවලට අදාල පැමිණිලි සහ පරීක්ෂණ බවට දැනගැනීමට ලැබුණු බවත්, කළමණාකාර අධ්‍යක්ෂවරයා විසින් ඉහත පැ-113 ලිපියෙන් අසත්‍ය කරුණ දක්වා ඇති බවත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඔහුට එරෙහිව මූල්‍ය අපරාධ කොට්ඨාශයට හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිසමට එවැනි පැමිණිලි සිදු කර නොමැති බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

චමින්ද සමරකෝන් මහතාව නීතිවිරෝධී ලෙස සහ අවිධිමත් ලෙස සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් සලකා බලා නැවත ඔහුව සේවයේ පිහිටුවීමට කටයුතු කරන මෙන් ඉල්ලා උතුරුමැද පළාත් ආණ්ඩුකාර සරත් ඒකනායක මහතා හරහා අභියාචනයක් ඉදිරිපත් කළ බවත්, එහිදී සරත් ඒකනායක ආණ්ඩුකාරවරයා විසින් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද ලිපිය පැ-115(I) ලෙසත්, අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඒ අනුව සංස්ථා සභාපතිවරයා වෙත යවන ලද ලිපිය පැ-115(II) ලෙසත්, සළකුණු කර චමින්ද සමරකෝන් මහතා ඉදිරිපත් කර ඇත.

පැ-115(II) ලිපියට පිලිතුරු දෙමින් සංස්ථා සභාපතිවරයා පැ-114 ලෙස සළකුණු කරන ලද ලිපිය එවා ඇති බවත්, එකී ලිපිය මගින් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව මූල්‍ය අපරාධ කොට්ඨාශයේ හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පරීක්ෂණ ගණනාවක් පවතින බවට අංක ගණනාවක් දක්වා ඇති බවත්, මෙකී ලිපිය මගින් පරීක්ෂණ ගණනාවක් සඳහන් වුවද එවැනි පරීක්ෂණවලට ඔහුව කැඳවා නොමැති බවත්, චෝදනාවක් නගා හෝ සැකකරුවෙකු කර නොමැති බවත්, එසේ තිබියදී චමින්ද සමරකෝන් මහතා නැවත සංස්ථාවේ සේවයට එකතු වීම වැළැක්වීමට දේශපාලන

පාර්ශවයන්ගේ වුවමනාවට පැ-114 ලිපියේ එලෙස සටහන් කරමින් එවා ඇති බවත්, සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2020.10.26 වන දිනදී 2, 3 හා 4 වන වගඋත්තකරුවන් වෙනුවෙන් චමින්ද සමරකෝන් මහතාව හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලදී. එහිදී චමින්ද සමරකෝන් මහතා ධීවර කූපන් පත් සම්බන්ධ අක්‍රමිකතාවයක් සිදු කළ බවට යෝජනා කරමින් ප්‍රශ්න නගන ලදී. එහිදී විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් එවන ලද ලේඛනයක් 2 හා 3 වන වගඋත්තරකරුවන් වෙනුවෙන් සළකුණු කරමින්, එමගින් ඔහු ධීවර කූපන්පත් සම්බන්ධ කරුණකට අදාලව වංචාවක් කර ඇති බවට චෝදනා කරමින් ප්‍රශ්න නගන ලදී. "ධීවර කූපන්පත් සම්බන්ධ අක්‍රමිකතාවයකට ඔහුට චෝදනාවක් එල්ල වී නොමැති බවත්, එවැනි චෝදනාවක් ප්‍රථම වතාවට එල්ල වූයේ මෙම සාක්ෂි දෙන අවස්ථාවේදී බවත්, එවැනි සිද්ධියකට අදාලව තමාට එරෙහිව කිසිදු විමර්ශනයක් සිදුව නොමැති බවත්, චමින්ද සමරකෝන් මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතා රැකියාවෙන් පහකරන ලද්දේ ඔහු විසින් සිදු කරන ලද බරපතල අක්‍රමිකතාවයන් නිසා බවත්, දේශපාලන පළිගැනීමක් වශයෙන් නොවන බවත්, යෝජනා කරමින් වගඋත්තරකරුවන් වෙනුවෙන් ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී. ඊට පිළිතුරු දෙමින් චමින්ද සමරකෝන් මහතා ප්‍රකාශ කර ඇත්තේ ඔහු විසින් කිසිදු මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුකර නොමැති බවත්, වර්ෂ 2015 ජනවාරි යහපාලන ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව ඔහුගෙන් දේශපාලනිකව පලිගැනීම සඳහා ක්‍රියා කර ඇති බවත්ය.

චමින්ද සමරකෝන් මහතා හරස් ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී ධීවර කූපන්පත් සම්බන්ධව වගඋත්තරකරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛණය, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විමර්ශන වාර්තාවක් නොවන බවත්, එය තොරතුරු ඉල්ලා එවන ලද ලේඛණයක් බව එහි ශීර්ෂය අනුවම පෙනී යන බවත්, එකී ධීවර කූපන්පත් සම්බන්ධ සාක්ෂි විමසීමේදී මතුකළ සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් හෝ චෝදනාවක් ඔහුට එරෙහිව ඉදිරිපත් කර නොමැති බවත්, සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

චමින්ද සමරකෝන් මහතා වෙනුවෙන් සාක්ෂි දීමට පැමිණි සිරිසේන අමරසේකර මහතා වර්ෂ 2015 ජනවාරි නව රජය පත්වීමට පෙර ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සිටි වැඩබලන සභාපතිවරයා වූ බවත්, ඔහු වර්ෂ 1970 දී ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, ක්‍රම සම්පාදන නිළධාරියෙකු ලෙස රාජ්‍ය සේවයට සම්බන්ධ වී පසු කලෙක ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සංවර්ධන අධ්‍යක්ෂක ජනරාල් වශයෙන්ද, 2010 සිට 2014 දක්වා අග්‍රාමාත්‍ය ලේකම්වරයා ලෙසද, සේවයේ යෙදුන බවත්, සාක්ෂි දෙමින් කියා ඇත.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති වීමට පෙර සංස්ථාවේ නිලධාරීන් ගැන පැහැදුණු ආකල්පයක් ඔහුට නොතිබුණ බවත්, 2012 සිට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළ හෙයින් සංස්ථාවේ බොහෝ නිළධාරීන් හැසිරුණ ආකාරය සම්බන්ධයෙන් එතරම් පැහැදීමක් තමන්ට නොතිබුණු බවත්, සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් සංස්ථාවට පැමිණීමෙන් පසුව අවංකව කටයුතු කරන නිලධාරීන් කිහිපදෙනෙකු ඔහු විසින් හඳුනා ගත් බවත්, චමින්ද සමරකෝන් මහතාද අවංක නිලධාරියෙකු ලෙස ඔහු විසින් හඳුනාගත් බවත් සාක්ෂි දී කියා ඇත.

2015 ජනවාරි මැතිවරණයට පෙර, ඔහු සභාපතිවරයා ලෙස කටයුතු කරන සමයේ පන්නල ගිරිඋල්ල ප්‍රදේශයේ ඇති වූ ගංවතුර තත්ත්වයේදී එම ප්‍රදේශයේ ජනතාවට සහන සැලසීම සඳහා පවුල් 2500 කට වියලි ආහාර සැපයීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා දුරකථනයෙන් ඔහුට දැනුම් දුන් බවත්, එහිදී සංස්ථාවේ සමාජ වගකීමක් වශයෙන්, කිසියම් සහනයක් සැලසිය හැකි දැයි අමාත්‍යවරයා විසින් විමසන ලද බවත්, සතොස ආයතනයෙන් බඩු ලබාගෙන එකී වියදම සංස්ථාවෙන් දැරිය හැකි දැයි අමාත්‍යවරයා විසින් විමසන ලද බවත්, එසේම අමාත්‍යාංශ ලේකම්වරයාත් ඒ සම්බන්ධයෙන් තමන්ට දැනුම් දීමක් සිදු කළ බවත්, අනතුරුව සතොස ආයතනයෙන් මිල දී ගත් භාණ්ඩ සඳහා මුදල් ගෙවීමේ කාර්යය ඔහුගේ දැනුවත්භාවය හා අනුමැතිය අනුව සිදුකල කාර්යක් බවත්, ඒ සඳහා අනුමැතිය දෙමින් අත්සන් යෙදූ පැ-31 ලේඛනය හඳුනා ගන්නා බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත. සමාජ සත්කාර, ප්‍රචාරණ කටයුතු සහ තවත් කාරණා සඳහා රුපියල් මිලියන 250 ක් අදාල වර්ෂය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර තිබූ බවත්, පැ-31(I) දරණ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව හඳුනාගත හැකි බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත. වියදම් වවුචරයක් යනු වියදම් යෝජනාවක් බවත්, පැ-35 දරණ වියදම් යෝජනාව ගෙවීම් අංශයේ ගණකාධිකාරීවරයා අනුමත කර ඇති බවත්, පැ-35 වවුචරය චමින්ද සමරකෝන් මහතා සහතික කිරීමේදී පැ-38 මුදල් රෙගුලාසියේ පැ-38(C) මගින් දැක්වෙන කරුණු 6 ම ඉෂ්ට වීමෙන් පසුව අත්සන් තබා ඇති බවත්, එම පැ-35 වවුචරය සහතික කිරීමේදී යම් දෝෂසහගත බවක් තිබුණේ නම් අනුමැතිය දෙන නිළධාරියාට එම දෝෂය පෙන්වා දී නිවැරදි කරන ලෙස ඉල්ලා

සිටිය හැකි බවත්, එම නිලධාරියා එම දෝෂය නිවැරදි නොකරන්නේ නම් ඒ පිළිබඳව කළමණාකාර අධ්‍යක්ෂවරයාට හෝ සභාපතිවරයාට පැමිණිලි කිරීමට අනුමත කිරීමේ නිළධාරියාට හැකි බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-36 ගෙවීම් වවුචරය අවසාන අනුමැතිය බවත්, රජයේ නම් FR 35 Certification ලෙස හඳුන්වන බවත්, ගෙවීම් වවුචරය අත්සන් කරන නළධාරියා සියලුම දේ පරීක්ෂා කර බලා අනුමත කළයුතු බවත්, එහිදී මුදල් රෙගුලාසි වල සියල්ල සිදු වී ඇත්ද, අදාල සටහන් පොත්පත්වලට පැමිණ තිබේද යන සියලු කරුණු සලකා බලා ඒ සියලුම කාර්යයන්ට වගකීම පැවරෙන්නේ ගෙවීම් වවුචරය අත්සන් තබන පුද්ගලයාට බවත්, එනම් පැ-36 ගෙවීම් වවුචරය අනුමත කළ තැනැත්තාට බවත්, සතොස ආයතනයෙන් භාණ්ඩ මිල දී ගැනීම සඳහා මුදල් ගෙවීමේ කාර්යය ගැන ඔහුගේ සේවා කාලය තුළ කිසිදු පැමිණිල්ලක් නොලැබුණු බවත්, කිසිදු අක්‍රමිකතාවයක් සිදු වූ බවට වාර්තා නොවූ බවත්, අදාල ගණුදෙනුව නිසි පරිදි සිදු වූ බව කිවහැකි බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-22 දරණ චෝදනා පත්‍රය පරීක්ෂා කර බලා සිය අවුරුදු 45 ක සේවා කාලය තුළ මෙවැනි චෝදනා පත්‍රයක් තමන් දැක නොතිබූ බවත්, පැ-22 නිශ්චිතව වරද දක්වා නොමැති චෝදනා පත්‍රයක් බවත්, මුදල් රෙගුලාසි උල්ලංඝනය කරමින් අත්සන් කර ඇති බවට චෝදනා කර ඇතත්, එකී උල්ලංඝනය සිදු වී ඇත්තේ කෙසේද යන්න චෝදනාවෙන් නොපෙනෙන බවත්, පැ-22 චෝදනාවට පදනම් වූ සිද්ධිය පුද්ගලික කාරණයක් නොවන බවත්, එය කළමණාකාරීත්වය විසින් ගන්නා ලද තීරණයක් බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-22 චෝදනා පත්‍රය බැලූ බැල්මටම මූලික පරීක්ෂණයකින් අනාවරණය කරගත් තොරතුරු මත සකස් කරන ලද්දේද යන්න සිතා ගැනීමට නොහැකි බවත්, චෝදනාවල ස්වභාවය අනුව මූලික පරීක්ෂණයක් සිදු වී ඇත්තේද යන්න සිතා ගැනීමට අපහසු බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

සතොස සිද්ධියට අදාල කාරණය චමින්ද සමරකෝන් මහතා පුද්ගලිකව සිදුකල කාර්යයක් නොවන බවත්, එය අමාත්‍යාංශය විසින් ආරම්භ කළ කාර්යයක් බවත්, අනතුරුව සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය හා කළමණාකාරීත්වය විසින් අනුමත කළ කළ කාර්යක් බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

තමා සභාපතිවරයාව සිටි අවධියේ Foxhill Super Cross ධාවන තරඟාවලියට අදාලව ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රධාන අනුග්‍රාහකයා ලෙස කටයුතු කළ බවත්, එකී කටයුත්ත තමා හා අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කළ බවත්, පැ-57 අනුව ධාවන පථයේ ප්‍රචාරණ කටයුතු සඳහා සැපයුම්කරුවන් 7 දෙනෙකුගෙන් මිලගණන් කැඳවා ඇති බවත්, අදාල සැපයුම්කරු තෝරා ගැනීමට ඔහු විසින් අනුමැතිය ලබාදුන් බවත්, මෙම කාර්යයට අදාලව පැ-60 දරණ ගෙවීම් වවුචරය සඳහා වගකීම ඇත්තේ ඔහු පෙර සඳහන් කළ ආකාරයට අදාල ගෙවීම් නිළධාරියා කෙරෙහි බවත්, පැ-70 දරණ ලේඛනයෙන් Lowest Quotation Approved යනුවෙන් ඔහු සටහන් තැබූ බව පිළිගන්නා බවත්, පැ-70 හි අවම මිලගණන් සහිත සැපයුම්කරුව ඔහු විසින් අනුමත කළ බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

Foxhill Super Cross ධාවන තරඟාවලියට අදාලව චමින්ද සමරකෝන් මහතාට ලබා දී ඇති පැ-23 චෝදනා පත්‍රයේ 1 වන චෝදනාව පුද්ගලයෙකුට අදාල කාරණයක් නොව ආයතනයට අදාල කාරණයක් බවත්, එකී තීරණය ගෙන තිබෙන්නේ තනි පුද්ගලයෙක් වශයෙන් නොව ආයතනයක් වශයෙන් බවත්, 2 වන චෝදනාව පැහැදිලි නොමැති බවත්, 3 වන චෝදනාවට අදාලව ක්‍රියාව නිසි පරිදි විනිවිධභාවයකින් සිදු වී ඇති බවත්, 4 වන චෝදනාවට අදාල ක්‍රියාවන් නිසි පරිදි සිදුකර ඇති බවත්, 5 වන චෝදනාව ගැන ඔහු කිසිවක් නොදන්නා බවත්, පැ-23 චෝදනා පත්‍රය බැලූ බැල්මටම පදනමක් නො◌ාමැති චෝදනා පත්‍රයක් බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-22 සහ පැ-23 දරණ චෝදනාපත්‍ර දෙකෙහි ඇති චෝදනා බැලූ බැල්මට බරපතල විෂමාචාර ගණයට වැටෙන චෝදනා නොවන බවත්, මෙම චෝදනා පත්‍රයකට වැරදිකරු වුවහොත් ඔහුගේ දැනුම සහ මතය අනුව දිය හැකි උපරිම දඩුවම වේතනාධිකයක් විලම්භනය කිරීම වැනි සුලු දඩුවමක් බවත්, සේවයෙන් නෙරපීමට තරම් වන චෝදනාවන් මෙම චෝදනාපත්‍ර වල අඩංගු නොවන බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

කේ. සී. ජයරත්න මහතාව රාජකාරීවලදී දැනසිටි බවත්, එහිදී පැ-80 ලෙස ඉදිරිපත් කළ පරීක්ෂණ වාර්තාවේ ඇති අත්සන කේ. සී. ජයරත්න මහතාගේ අත්සන ලෙස හඳුනාගත හැකි හුරුපුරුදු අත්සන බවත්, පැ-77 ලෙස ඉදිරිපත් කළ පරීක්ෂණ වාර්තාවේ ඇති අත්සන කේ. සී. ජයරත්න මහතාගේ අත්සන යැයි නිශ්චිතව කිව නොහැකි බවත්, පැ-80 සහ පැ-77 පරීක්ෂණ වාර්තා දෙකෙහි තිබෙන අත්සන් දෙක වෙනස් බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

නව ආණ්ඩුවක් බලයට පත්වීමත් සමග සංස්ථාවේ නිලධාරීන්ගේ කාමර මුද්‍රා තැබීමේ පරිචයක් නොමැති බවත්, ඔහුගේ අවුරුදු 45 ක රාජකාරී ජීවිතය තුළ කිසිම දවසක කාර්යාල සීල් තැබීමක් සිදු වී නොමැති බවත්, එම අත්දැකීම පළමු වරට සංස්ථාවේදී ඔහු අත්විඳින ලද බවත්, චමින්ද සමරකෝන් මහතාගේ කාර්යාල කාමරය සීල් තැබීම සහ පදනම් විරහිතව විනය පරීක්ෂණ කිරීම දේශපාලනිකව පලිගැනීමට සිදුකළ කටයුත්තක් බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත. කාර්යාල කාමර සීල් තැබීම මගින් අපේක්ෂා කර ඇත්තේ භීතියක් ඇති කිරීමත්, ඒ භීතිය මගින් පහසුවෙන් යම් යම් දේවල්වලට නම්මාගැනීම හෝ යටත්කර ගැනීමට අවශ්‍ය පරිසරය සකස්කර ගැනීම එකී ක්‍රියාවේ අරමුණ බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත. එසේම ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ස්ථිර සේවකයෙකු ලෙස සේවය කළ සමරකෝන් මහතාව සේවයෙන් පහ කිරීම දක්වා විනය පරීක්ෂන මත පදනම්ව ක්‍රියා කල ආකාරය පැහැදිලිවම දේශපාලන පලිගැනීමක් බවත්, වැඩිදුරටත් එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

අනතුරුව රජයේ අධිනීතිඥවරිය විසින් එස්. අමරසේකර මහතාගෙන් ප්‍රශ්න විමසූ අතර එහිදී එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා සිටියේ අමාත්‍යවරයාගේ ඉල්ලීම මත ආයතනයේ මුදල් යෙදවීම අනිවාර්යයෙන් සිදු විය යුතු බවත්, සංස්ථාවේ පනතට අනුව අමාත්‍යවරයාට සංස්ථාවේ නිලධාරීන්ට ඕනෑම නියෝගයක් ලබා දිය හැකි බවත්, එම සිද්ධියට අදාල ඉල්ලීම අමාත්‍යවරයා නොවී ස්වෛච්ඡා සංවිධානයක් විසින් සිදු කළත් තමන් එය ඉටු කරන බවත්, මැතිවරණ සමයේදී භාණ්ඩ ලබාදීම සිදු වුවත් මැතිවරණයක් තිබූ බව තම අවධානයට ලක් නොවූ බවත්, ගංවතුර තත්ත්වයක් පැවති බව

පමණක් තමන්ගේ අවධානයට ලක් වූ බවත්, ඒ අවස්ථාවේ මුදල් ගෙවන විට භාණ්ඩ බෙදා හැරීම සිදු වී තිබූ බවත්, එම කාර්ය නතර කිරීමක් හෝ මැතිවරණ කොමසාරිස් කාර්යාලයෙන් සිදු නොවූ බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

Foxhill Super Cross ධාවන තරඟාවලියට අදාලව ඉදිරිපත්වූ සැපයුම්කරුවන් අතරින් එක් අයෙකුට අනුමැතිය ලබාදීම සිදුවූයේ නියමිත ක්‍රමවේදය අනුගමනය කරමින් සෑහීමකට පත්වීමෙන් පසුව බවත්, එස්. අමරසේකර මහතා සාක්ෂි දෙමින් කියා ඇත.

ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ මානව සම්පත් කළමණාකාර විතානාගේ සමන්ත පුෂ්පලාල් මහතා විසින් චමින්ද සමරකෝන් මහතාට අදාලව වර්ෂ 2015 න් පසුව පැවැත්වූ විනය පරීක්ෂණ වාර්තා සහ ඊට අදාල ලේඛන නැවත සලකා බලා සමාලෝචනය කරමින් පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අනුර රණසිංහ මහතා පත් කිරීම පිළිබඳව ඔහු දැනුවත් බවත්, විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අනුර රණසිංහ මහතා සංස්ථාවේ සභාපති සුමිත් විජේසිංහ මහතා වෙත ඉදිරිපත් කළ වාර්තාව බවත් ඔහු සාක්ෂි දෙමින් කියා ඇත. විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අනුර රණසිංහ මහතා විසින් සකස් කළ 2020.02.24 දිනැති පරීක්ෂණ වාර්තාව පැ-119 ලෙස ලකුණු කොට පැමිණිල්ල වෙනුවෙන් එම අවස්ථවේදී ඉදිරිපත් කරන ලදි.

පැ-119 දරණ පරීක්ෂණ වාර්තාවෙන් නිර්දේශ ඉදිරිපත් කර ඇති බවත්, පැ-119A ලෙස සලකුණු කරන ලද නිර්දේශයන් වන්නේ විනය බලධාරියා ලෙස වර්තමාන සභාපතිතුමා අදාල විනය රෙගුලාසි ප්‍රකාරව සුදුසු යැයි තීරණය කරනු ලබන කොන්දේසි මත හෝ

කොන්දේසි විරහිතව චූදිත නිලධාරියා නැවත සේවයේ පිහිටු වීමට මෙයින් නිර්දේශ කරන බවත්, එසේ සේවයේ පිහිටුවීමට කටයුතු කරනු ලබන්නේ නම් ඔහු දැනට කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති නඩුව එහි කිසිදු නඩු ගාස්තු ඉල්ලීමකින් තොරව ඉල්ලා අස්කර ගනු ලැබීමකට යටත්ව කළයුතු බවද සඳහන් කරන බවත්, යනුවෙන් ඔහු සාක්ෂි දෙමින් කියා ඇත.

පැ-119 දරණ පරීක්ෂණ වාර්තාවේ නිර්දේශය සලකා බැලිය යුත්තේ විනය බලධාරියාද වන ඛනිජ තෙල් සංස්ථාවේ සභාපතිවරයා බවත්, පැ-119 පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ තවම ක්‍රියාත්මක කර නොමැති බවත්, එම සාක්ෂිකරු සාක්ෂි දෙමින් කියා ඇත. අනතුරුව පැ-1 සිට පැ-119 දක්වා ලේඛණ කියවමින් චමින්ද සමරකෝන් මහතාගේ සහ ඔහුගේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි කැඳවීම අවසන් කරන ලදි.

2 වන වගඋත්තරකාර හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතා 2020.10.26 දින සිය සාක්ෂිය ලබාදෙන ලදි. ඔහුගේ මූලික සාක්ෂිය මගින් ඔහු විසින් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව දේශපාලනික පලිගැනීමක් නොකළ බවත්, ඔහු විසින් සිදු කරන ලද අක්‍රමිකතා හා දූෂණ පිළිබඳ පැමිණිලි රාශියක් ඉදිරිපත් වූ බවත්, ඊට අදාල විමර්ශන මගින් ඔහු බරපතල මූල්‍ය වංචා සිදුකල බවට අනාවරණය වීම හේතුවෙන් ස්ථාන මාරු කිරීම හා වැඩ තහනම් කිරීමට ලක්කළ බවත්, ඊට අදාල විනය පරීක්ෂණ පැවැත්වූ බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. තවද ඉන්ධන පිරවුම් හලකින් රු. 400,000/- කට ආසන්න මාසික බදු කුලියක් අහිමි කළ බවට සාක්ෂිකරු හට චෝදනා කළද, එම බෙදුම්කරුගෙන් ගිවිසුම්වලට පටහැණිව අසාධාරණ ලෙස මාසිකව රු. 400,000/- ක පමණ බදු කුලියක් අයකරගෙන තිබූ බවත්,

එය අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් ප්‍රකාරව නිවැරදි කළ බවත්, සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

2 වන වගඋත්තරකාර හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතා හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලදි. එහිදී පදනම් විරහිත නිර්ණාමික පැමිණිලි හා පෙත්සම් මත ජේ. ආර්. වික්‍රමසිංහ මහතා කටයුතු කර ඇති බවට ප්‍රශ්න කරන ලදි. චමින්ද සමරකෝන් මහතාව රැකියා ස්ථානයෙන් ස්ථාන මාරු කරන ලද්දේ පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රතිඵල නිකුත් වෙමින් තිබියදී බවත්, චමින්ද සමරකෝන් මහතා වැඩ තහනමකට ලක් කරන ලද්දේද දේශපාලනිකව පලිගැනීම සඳහා බවට යන කරුණ යෝජනා කරමින් ජේ. ආර්. වික්‍රමසිංහ මහතාගෙන් හරස් ප්‍රශ්න අසන ලදි. සාක්ෂිකරු එකී කරුණ ප්‍රතික්ෂේප කරන බව කියා ඇත.

ජේ. ආර්. වික්‍රමසිංහ මහතාගෙන් පැ-21 සහ පැ-22 දරණ චෝදනා පත්‍ර පිළිබඳව හා ඊට පදනම් වූ සිද්ධිය හා ඉදිරිපත් වී ඇති ලේඛණ ඉදිරිපත් කරමින් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්න විමසන ලදි. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය අසල අතලේ සහ පුත්‍රයෝ සමාගම බෙදුම්කාර ධූරය දැරූ ඉන්ධන පිරවුම්හලෙන් රු. 400,000/- ක පමණ මාසික බදු කුලිය අය කිරීම නිසි පරිදි සිදු වූ බවත්, එම බෙදුම්කරු වෙනුවෙන් ක්‍රියා කිරීමෙන් සංස්ථාවට අයවිය යුතුව තිබූ රුපියල් ලක්ෂ 250 ක පමණ මුදලක් අහිමි කිරීමට හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතා මූලිකත්වය ගෙන ක්‍රියා කළ බවට චෝදනා කරමින් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්න නගන ලදි. ජේ. ආර්. වික්‍රමසිංහ මහතා එකී චෝදනාවන් සියල්ලම ප්‍රතික්ෂේප කරන බවට ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2015 ජනවාරි යහ පාලන ආණ්ඩුව බලයට පත් වූ පසුව ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ චමින්ද සමරකෝන් මහතාගේ කාර්යාලය ඇතුළු අනෙකුත් කාර්යාල මුද්‍රා තැබීමට නියම කරන ලද්දේ හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා බවට පිළිතුරු දෙමින් හරස් ප්‍රශ්නවලදී හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතා සඳහන් කර ඇත. කාර්යාල කාමර මුද්‍රා තැබීමට හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා කරන ලද නියමය නීත්‍යානුකූල ක්‍රියාවක්ද, නීත්‍යානුකූල නොවන ක්‍රියාවක් ද යන්න විමසීමේදී එම ප්‍රශ්නයට පිළිතුරු දීමට නොහැකි බවට ජේ. ආර්. වික්‍රමසිංහ මහතා සඳහන් කර ඇත.

අනතුරුව හිටපු සභාපති ටී. ජී. ජයසිංහ මහතා විසින් මූලික සාක්ෂි ලබා දීම සිදු කරන ලදි. ඔහුගේ මූලික සාක්ෂිය මහින්ද චමින්ද සමරකෝන් මහතාට එරෙහිව බරපතල මූල්‍ය වංචා සඳහා පැමිණිලි ඉදිරිපත් වූ බවත්, එම චෝදනා විමර්ශනවලින් ඔප්පු වූ හෙයින් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කොට, විනය පරීක්ෂණ පවත්වා චෝදනා වලට වරදකරු වූ හෙයින් සේවයෙන් නෙරපීමට ක්‍රියා කල බවත් සාක්ෂි දී ඇත.

හිටපු සභාපති ටී. ජී. ජයසිංහ මහතා හරස් ප්‍රශ්න වලට භාජනය කරමින් පැ-21, පැ-22, පැ-23, පැ-24 හා පැ-25 දරණ චෝදනා පත්‍රයන්ට අදාලව ප්‍රශ්න කරන ලදි. එහිදී චෝදනා දෙකකට පමණක් වරදකරු වීමේ පදනම මත ඒ වන විටත් විනය පරීක්ෂණ නොපැවැත්වූ චෝදනා පත්‍ර දෙකක් තිබියදී එස්. එම්. සී. පී. සමරකෝන් මහතා රැකියාවෙන් පහ කිරීම සංස්ථාවේ විනය රීති මාලාවටද පටහැනි නීත්‍යානුකූල නොවන ක්‍රියාවක් බවට යෝජනා කරමින් හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලදි.

පැ-44 දරණ විනය රීති මාලාවේ සඳහන් රීතීන් අනුව විනය පරීක්ෂණ පැවැත්විය යුතු බව සාක්ෂිකරු සිය සාක්ෂ◌ියේදී පිළිගන්නා ලදි. විනය පරීක්ෂණ පවතින අතරතුර සංස්ථාවේ සේවකයෙකු වැඩ තහනමකට පමණක් ලක්කළ හැකි බවත්, විනය පරීක්ෂණ අවසන් නොකර සේවයෙන් නෙරපිය නොහැකි බවත්, ඔහු සිය සාක්ෂිය මගින් පිළිගන්නා ලදි. එහෙත් එස්. එම්. සී. පී. සමරකෝන් මහතා සම්බන්ධව නිසි ආකාරව ක්‍රියා කර ඇති බවට ටී. ජී. ජයසිංහ මහතා කියා ඇත. පැ-44 විනය රීති මාලාව උල්ලංඝනය කළ බවටත්, අසාධාරණ ලෙස සේවයෙන් පහ කිරීමට ක්‍රියා කරන ලද බවටත්, සිදුකළ ප්‍රශ්න කිරීම් ටී. ජී. ජයසිංහ මහතා විසින් ප්‍රතික්ෂේප කරමින් සිය සාක්ෂිය ලබා දීඇත.

පැ-1 පත්වීම් ලිපිය අනුව චමින්ද සමරකෝන් මහතා B3 ශ්‍රේණියේ ලිපිකරුවෙකු වශයෙන් 1995.12.7 වන දින ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවයට එක් වී ඇත. වර්ෂ 1999 දී B2 ශ්‍රේණියේ ලිපිකරුවෙකු ලෙසත්, වර්ෂ 2005 දී A7 ශ්‍රේණියේ විධායක සහකාර වශයෙනුත්, වර්ෂ 2009 දී A6 ශ්‍රේණියේ සහකාර අලෙවි කළමණාකරුවෙකු ලෙසත්, 2010 දී A5 ශ්‍රේණියේ සහකාර අලෙවි කළමණාකරු ලෙසත්, පැ-2 ලේඛනය අනුව වර්ෂ 2010.11.28 දින සිට කළමණාකාර (අලෙවි) තනතුරේ රාජකාරී කටයුතු ආවරණය කිරීමත්, පැ-3 ලේඛණය අනුව 2013.03.16 දින සිට කළමණාකාර අලෙවි (සිල්ලර) තනතුරේ ස්ථිර පත්වීම් ලබමින් රැකියාවේ උසස්වීම් චමින්ද සමරකෝන් මහතාට හිමි වී ඇත. චමින්ද සමරකෝන් මහතා වර්ෂ 2016.12.29 දින සේවයෙන් පහ කිරීම සිදු වන විට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වසර 20 ක පමණ සේවා කාලයක් සපුරා ඇත.

චමින්ද සමරකෝන් මහතා වර්ෂ 1995 දී ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවයට එක් වූ දින සිටම ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කර ඇත. චමින්ද සමරකෝන් මහතාගේ සාක්ෂි අනුව ඔහු විසින් සාමාජිකත්වය දරණ සේවක වෘත්තීය සමිතිය හැරුණු විට එක්සත් ජාතික පක්ෂයට සෘජුව සම්බන්ධ ජාතික සේවක සංගමය, ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ ඛනිජ තෙල් පොදු සේවක සංගමය, සම සමාජ පක්ෂයට සම්බන්ධ තෙල් කම්කරු වෘත්තීය සමිතිය ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුළ ක්‍රියාත්මක වේ. වර්ෂ 2015 ජනවාරි මස පැවැත්වූ ජනාධිපතිවරණයේදී අපේක්ෂකයෙකු වූ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ ජයග්‍රහණය අපේක්ෂාවෙන් චමින්ද සමරකෝන් මහතා කටයුතු කළ බවටද, සාක්ෂි දෙමින් කියා ඇත.

වර්ෂ 2015 ජනවාරි 8 වන දිනෙන් පසුව යහපාලන ආණ්ඩුව ක්‍රියාත්මක වීමත් සමගම ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අළෙවි කළමණාකාර (සිල්ලර) තනතුරේ රාජකාරියේ යෙදී සිටි චමින්ද සමරකෝන් මහතා සම්බන්ධයෙන් පැමිණිලි හා පෙත්සම් රාශියක් ඉදිරිපත් වීම, ඒ සම්බන්ධව කඩිනමින් පරීක්ෂණ හා විමර්ශන කටයුතු එවකට සභාපතිව සිටි ජේ. ආර්. වික්‍රමසිංහ මහතාගේ හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතාගේ මැදිහත්වීමෙන් සිදු කර ඇති බව පැ-7, පැ-8, පැ-9, පැ-12(අ), පැ-12(ආ), පැ-84, පැ-90(I), පැ-90(II) ලේඛන අනුව නිරීක්ෂණය වේ.

පැ-22 චෝදනාපත්‍රයට පදනම් වූ පන්නල සතොස ආයතනයට මුදල් ගෙවීමේ සිද්ධියට අදාලව පැ-10 දරණ විමර්ශන වාර්තාව, කළමණාකාර (ආරක්ෂක/විමර්ශන) විසින් 2015.2.21 දිනැතිව

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) මගින් සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) විසින් පැ-10 වාර්තාව පදනම් කරගෙන වර්ෂ 2015.2.24 දිනැතිව පැ-11 දරණ වාර්තාව සකස් කර ඇත. එම සිද්ධියට අදාලව පැ-10 දරණ විමර්ශන වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතාගෙන් නිරීක්ෂණ කැඳවීමකින් තොරවම පැ-11 දරණ නිරීක්ෂණ සහිත වාර්තාවක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) විසින් ඉදිරිපත් කිරීමට ක්‍රියාකර ඇති බව පෙනී යයි. පැ-10 විමර්ශන වාර්තාව මගින් අනාවරණය කර නොමැති කරුණු ගණනාවක්ම පැ-11 හි 17, 18, 19, 20 සහ 21 ඡේද මගින් නිරීක්ෂණ වශයෙන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) විසින් දක්වා ඇත. එකී සිද්ධියට අදාලව උපදෙස් හා අනුමැතිය ලබා දුන් තැනැත්තන් එම තනතුරුවල නොමැති හෙයින් එකී කරුණු තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා දූෂණ විරෝධී කමිටුව මගින් සොයා බැලීමට පැ-10 වාර්තාව මගින් යෝජනා කර තිබියදී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) විසින් පැ-11 දරණ නිරීක්ෂණ වාර්තාව මගින්, ඒ වන විටත් තහවුරු කරගෙන නොමැති මූල්‍ය අක්‍රමිකතාවයන්ට අලෙවි කළමණාකාර (සිල්ලර) චමින්ද සමරකෝන් මහතා වගකිවයුතුව ඇති බවට පැ-11 හි 22 වන ඡේදය මගින් දක්වා තිබීම, වගකීම් විරහිත හා දෝෂ සහගත කරුණු සටහන් කිරීමක් බව පෙනී යයි.

තවද, විනය බලධාරියා වන සභාපතිවරයා විසින් අදාල නිළධාරියා සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් කර නොතිබියදී,

පැ-11 දරණ නිරීක්ෂණ වාර්තාව මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) විසින්, චමින්ද සමරකෝන් මහතාව ස්ථාන මාරු කිරීමකින් තොරව වහාම වැඩ තහනම් කිරීමකට ලක් කිරීමට යෝජනා කර ඇත. පැ-10 වාර්තාව අනුව මූලික විමර්ශනයද අවසන් වී නොතිබියදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) විසින්, චමින්ද සමරකෝන් මහතාගේ වැඩ තහනම් කළ යුතු බවට යෝජනා කිරීම, චමින්ද සමරකෝන් මහතා කෙරෙහි ද්වේශයෙන් සහ සාධාරණ පදනමකින් තොරව කටයුතු කිරීමක් බව තහවරු වේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) ගේ 2015.2.24 දිනැති පැ-11 වාර්තාවෙන් පසුව චමින්ද සමරකෝන් මහතා සම්බන්ධයෙන් සිදු කෙරෙමින් පවතින විමර්ශනවලට අදාල වාර්ථා යැයි සඳහන් කරමින්, පැමිණිලිවල ශීර්ෂයන් පිළිබඳව සඳහන් කරමින් පැ-12(අ), පැ-12(ආ) දරණ ලේඛන වර්ෂ 2015.3.24 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. විමර්ශන මගින් අනාවරණය කර ගත් කරුණු දැක්වීමක් පැ-12(අ), පැ-12(ආ) මගින් සිදු කර නොමැත. පැමිණිලිවල ශීර්ෂයන් පමණක් දක්වා ඇත. පැ-12(අ), පැ-12(ආ) ලේඛන පදනම් කරගෙන 2015.3.24 දිනම පැ-12 ලිපිය මගින් චමින්ද සමරකෝන් මහතාගේ රැකියා ස්ථානය මාරු කිරීම සිදු කර ඇති බව පෙනී යයි.

වර්ෂ 2015.3.24 දින පැ-12(අ), පැ-12(ආ) ලේඛන ඉදිරිපත් වීම, වර්ෂ 2015.3.24 දිනම පැ-12 ලිපිය ප්‍රකාරව කඩිනමින් ස්ථානමාරු කිරීමට ක්‍රියා කිරීම මගින් චමින්ද සමරකොන් මහතා සම්බන්ධව, අසත්භාවී අයුරින් ක්‍රියා කිරීමට සැලසුම් කර ඇති ආකාරය ගම්‍ය වේ.

පැ-12 ස්ථාන මාරු කිරීමේ ලිපියෙන්, රාජකාරී කටයුතුවලට අදාල ලිපිගොනු හා උපකරණ බාරදෙන ලෙස චමින්ද සමරකොන් මහතාට දැනුම් දී ඇත. රාජකාරී ලිපිගොනු වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) වෙත භාර දීම ආරක්ෂක අංශය හා අභ්‍යන්තර විගණන අංශයේ අධීක්ෂණය යටතේ සිදු කිරීමට ලිපිගොනු සූදානම් කරමින් සිටින බව චමින්ද සමරකොන් මහතා පැ-14, පැ-14(අ) ලිපි මගින් මානව සම්පත් කළමණාකරු වෙත දන්වා ඇත. එසේ තිබියදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) වෙත ලිපියක් මගින් චමින්ද සමරකෝන් මහතා ලේඛන අස්ථානගත කොට ඉදිරි පරීක්ෂණ අඩාල කිරීමට ක්‍රියා කරන බවට දැනුම් දී ඇත. එකී ලිපිය පැ-14(ආ) ලෙස සාක්ෂිවලදී සළකුණු කර ඇත. පැ-14(ආ) ලිපිය යොමු කළ අයගේ නමක්, අත්සනක් නොමැති නිර්ණාමික ලිපියක් බව පෙනී යයි. එකී පැ-14(ආ) ලිපියෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) විසින් සටහනක් තබමින් චමින්ද සමරකෝන් මහතාට සිය පෞද්ගලික භාණ්ඩද රැගෙන ඉතා ඉක්මනින් කාර්යාලයෙන් පිටව යන ලෙසට දන්වා ඇත. පැ-14(ආ) ලිපියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා විසින් සිය සටහන යෙදූ 2015.4.8 දිනම සවස්භාගයේ චමින්ද සමරකෝන් මහතාගේ කාර්යාල කාමරය මුද්‍රා තැබීමත් සිදු කර ඇත.

කාර්යාල කාමරය මුද්‍රා තැබීම නිසා රාජකාරී ලිපිගොනු භාර දීමට චමින්ද සමරකෝන් මහතාට නොහැකි වන ලෙස වළක්වා ඇති බව ඒ මහතා විසින් පැ-14(ඇ) ලිපිය මගින් මානව සම්පත් කළමණාකරුට දන්වා ඇත. චමින්ද සමරකෝන් මහතාගේ පැ-14, පැ-14(අ) ලිපිවල ඉල්ලීම් සැලකිල්ලට ලක් නොකරමින් පැ-14(ආ) දරණ නිර්ණාමික ලිපිය මත පදනම්ව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා

පාලන) විසින් චමින්ද සමරකෝන් මහතා සම්බන්ධයෙන් අසාධාරණ අයුරින් ක්‍රියා කර ඇති බව තහවුරු වේ. චමින්ද සමරකෝන් මහතාගේ කාර්යාලය 2015.4.8 දින මුද්‍රා තැබීමද ද්වේශසහගතව සහ නිසි ක්‍රියාපටිපාටියෙන් බැහැරව කටයුතු කිරීමක් බව නිරීක්ෂණය වේ.

වර්ෂ 2015.3.24 දින රැකියාවේ ස්ථාන මාරුවකට ලක්වන චමින්ද සමරකෝන් මහතාව පැ-15 දරණ ලිපිය මගින් වර්ෂ 2015.8.18 වන දින වැඩ තහනමට ලක්කර ඇත. වර්ෂ 2015.8.17 වන දින පාර්ලිමේන්තු මැතිවරණය පැවති අතර, වර්ෂ 2015.8.18 දිනයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම සිදුව ඇත. චමින්ද සමරකෝන් මහතා ලබා දුන් සාක්ෂි අනුව 2015.8.18 දින පිරිපහදු කළමණාකරු විසින් වැඩ තහනම් කිරීමේ පැ-15 ලිපිය චමින්ද සමරකෝන් මහතාට අතින් බාර දී ඇත. චමින්ද සමරකෝන් මහතාගෙන් දේශපාලන වශයෙන් පළිගැනීම සඳහා මැතිවරණ කාලසීමාව තුළ වැඩ තහනම් කිරීම සිදුකර ඇති බවට පැ-17 ලිපියෙන් මැතිවරණ කොමසාරිස්වරයාට දන්වා ඇත. මැතිවරණ කොමසාරිස්වරයා ඒ පිළිබඳව බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගෙන් පැ-18 ලිපිය මගින් කරුණු විමසා ඇත. පැ-19 ලිපිය මගින් සංස්ථා සභාපතිවරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයාට පිළිතුරු යවා ඇත. ඉහත කරුණු අනුව සභාපතිවරයා ඇතුලු නිළධාරීන් විසින් මැතිවරණ කාල සීමාව තුළ, 2015.8.17 දිනැති පාර්ලිමේන්තු මැතිවරණයට පසු දිනම කඩිනමින් චමින්ද සමරකෝන් මහතාගේ වැඩ තහනම් කිරීම, සැලසුම් සහගතව, දේශපාලන වශයෙන් පළිගැනීමට ක්‍රියා කිරීමක් බව නිරීක්ෂණය වේ.

පැ-22 දරණ චෝදනා පත්‍රය මත පදනම් වූ LGL/DIU/15/2580 දරණ විනය පරීක්ෂණය :-

පැ-22 චෝදනා පත්‍රයට පදනම් වී ඇත්තේ, 2014 වර්ෂයේ අගභාගයේදී ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙන් විපතට පත් පන්නල ගිරිඋල්ල ප්‍රදේශයේ පවුල් 2500 කට වියලි සහනාධාර පාර්සලය බැගින් ලබා දීම උදෙසා පන්නල ලංකා සතොස ආයතනයෙන් මිල දී ගත් භාණ්ඩ උදෙසා රු. 6,146,110/- ක මුදලක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවීමට ක්‍රියා කිරීම වේ.

පැ-31 ලේඛනය අනුව දායකත්වය සපයන ලෙස ඉල්ලීම කර ඇත්තේ ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ. පැ-31 ලිපිය සමග භාණ්ඩ මිලදී ගැනීමට අදාල වවුචර්පත්ද ඉදිරිපත් කරමින් රු. 6,146,110/- ක මුදල ගෙවීම සඳහා කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා ඇත. පැ-31A සටහන අනුව සමාජ සත්කාර්යයක් ලෙස සලකා සභාපතිවරයාගේ අනුමැතිය හිමි වී ඇත. පැ-31B සටහන අනුව කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් මුදල් ගෙවන ලෙසට වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාට නියම කර ඇත. SAP වවුචරය සකස් කොට ගෙවීම් සඳහා යොමු කරන ලෙස වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් අලෙවි කළමණාකාර (සිල්ලර) වෙත දැනුම් දී ඇති බව පැ-31C සටහන අනුව පෙනී යයි.

පැ-31 ලේඛනයේ පැ-31A, පැ-31B, පැ-31C අනුව පන්නල සතොස ආයතනයට රු. 6,146,110/- ක මුදලක් ගෙවීම සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ, කළමණාකාර අධ්‍යක්ෂකවරයාගේ සහ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) යන නිළධාරියාගේ අනුමැතිය හා උපදෙස් ලැබී ඇති බව තහවුරු වේ.

පැ-35 දරණ වියදම් වවුචරය FP/006 මූල්‍ය රෙගුලාසි වලට අනුකූල බවට චමින්ද සමරකෝන් මහතා විසින් සහතික කිරීම සිදුකර ඇත. සහතික කිරීමේ නිළධාරියෙක් වියදම් වවුචරය සහතික කිරීමට පෙර සෑහීමකට පත්විය යුතු කරුණු පැ-38 මූල්‍ය රෙගුලාසි වල පැ-38C ලෙස සළකුණු කරන ලද කොටසෙහි දැක් වේ.

පැ-38C හි අංක. 4 අනුව වියදම සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන තිබේදැයි සෑහීමකට පත්විය යුතුය. පැ-31(I) දරණ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අනුව 2014 වර්ෂයට රුපියල් මිලියන් 600 ක මුදලක් සමාජ සත්කාරක කටයුතු (CSR) හා ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලෙස යෝජනා කර ඇති අතර පැ-31(II) දරණ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව වර්ෂ 2014 සඳහා මුදලක් සමාජ සත්කාරක කටයුතු (CSR) හා ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 250 ක අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට අනුමත කර ඇත. එකී අයවැය ප්‍රතිපාදන වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් විසින් භාණ්ඩ 3 ක් යටතේ සංස්ථාවේ ගිණුම් පද්ධතිය තුළ දක්වා ඇති බව පැ-32 ලේඛනය අනුව නිරීක්ෂණය වේ.

සතොස ආයතනයට මුදල් ගෙවීමට අදාල සිදුවීම සිදු වී ඇත්තේ වර්ෂ 2014 අවසානයේදී බැවින් වාර්ෂික අයවැයෙන් සමාජ සත්කාර භාණ්ඩය යටතේ දක්වන ලද මුදලින් ප්‍රමාණවත් අරමුදලක් නොමැති බව පෙනී යාමෙන් පසුව අලෙවි කළමණාකාර (සිල්ලර) චමින්ද සමරකෝන් මහතා විසින් සමාජ සත්කාර භාණ්ඩය සඳහා අමතර අරමුදල් ලබා දෙන ලෙසට පැ-33 ලිපිය මගින් වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වරයාගෙන් ඉල්ලා ඇත. සමාජ සත්කාර සහ ප්‍රචාරණ ප්‍රවර්ධන සඳහා වාර්ෂිකව වෙන්කල අයවැය ප්‍රතිපාදන උප කාණ්ඩයන් වලට ප්‍රතිපාදන මාරු කිරීමේ බලය සහ වගකීම ඇත්තේ

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) හට බව පැ-33 ලේඛනය අනුව පෙනී යයි. පැ-33 හි පැ-33A සටහන අනුව රුපියල් මිලියන 6.5 ක මුදලක් සමාජ සත්කාරක බාණ්ඩයේ ගිණුමට මාරු කරන ලෙසට වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මුදල් කළමණාකාරවරයා (අයවැය) වෙත නියෝග කර ඇත. පැ-33B සටහන අනුව එම අරමුදල් මාරු කරන ලෙසට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මුදල් කළමණාකාරවරයා (අයවැය) විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මුදල් කළමණාකාර (මූල්‍ය වාර්තා හා බදු) වෙත දැනුම් දී ඇත. ඒ අනුව පන්නල සතොස ආයතනයට මුදල් ගෙවීමට අවශ්‍ය ප්‍රමාණවත් අරමුදල් මූල්‍ය අංශය මගින් වෙන්කර සපයා දී ඇති බව පෙනී යයි. ඒ අනුව පැ-38 මූල්‍ය රෙගුලාසි වල පැ-38C හි අංක. 4 අවශ්‍යතාවය සපුරා ඇති බවට චමින්ද සමරකෝන් මහතාට සැහීමට පත්වීමට හැකි බව නිරීක්ෂණය වේ.

පැ-38 මූල්‍ය රෙගුලාසියේ පැ-38C හි අංක. 5 අනුව සහතික කිරීමට පෙර සංස්ථාවට ප්‍රතිලාභයක් හිමි වන සංස්ථාවේ අභිලාෂයන් සපුරාලන කාර්යයක් බවට සැහීමකට පත්විය යුතු බවට දක්වා ඇත. පැ-31 අනුව සභාපතිවරයා විසින් සමාජ සත්කාර කර්තව්‍යයක් වශයෙන් අනුමැතිය ලබා දී ඇත. පැ-33(II) අධ්‍යක්ෂක මණ්ඩල තීරණය මගින්ද සමාජ සත්කාර කර්තව්‍යයන්ට අරමුදල් වෙන්කර ඇත. ගංවතුරෙන් අවතැන් වූ ජනතාවට වියළි අහාර ද්‍රව්‍ය ලබා දීම උදෙසා මුදල් යෙදවීම සමාජ සත්කාරයක් බව පෙනී යයි. ඒ අනුව පැ-38C හි අංක. 5 අවශ්‍යතාවය සපුරා ඇති බවට චමින්ද සමරකෝන් මහතාට සැහිමකට පත්වීමට හැකි බව නිරීක්ෂණය වේ.

සාක්ෂිකරුවෙකු වශයෙන් මෙම විමසීමේදී සාක්ෂි ලබා දුන් සංස්ථාවේ හිටපු සභාපති සහ හිටපු අග්‍රාමාත්‍ය ලේකම්, එස්. අමරසේකර මහතා

විසින් සාක්ෂි දෙමින් සඳහන් කර ඇත්තේ, පැ-35 දරණ වියදම් වවුරය, වියදම් යෝජනාවක් බවත්, වියදම් යෝජනාව අනුමත කළද මුදල් ගෙවිය හැක්කේ පැ-36 දරණ ගෙවීම් වවුචරය අනුමත කිරීමෙන් පසුව බවත්ය. ඉහත සඳහන් කරන ලද සියලු කරුණු සලකා බැලීමේදී චමින්ද සමරකෝන් මහතා විසින් වියදම් යෝජනාවක් වන පැ-35 දරණ වියදම් වවුචරය නිසියාකාරව මූල්‍ය රෙගුලාසි අනුව අත්සන් තබා සහතික කර ඇති බව තහවුරු වේ.

පැ-22 චෝදනා පත්‍රයේ 1 වන චෝදනාව අනුව බරපතල මූල්‍ය වංචාවක් චමින්ද සමරකෝන් මහතා විසින් සිදු කිරීමට නම් මුදල් ගෙවීම ඔහු විසින් සිදු කළයුතුව ඇත. මෙම සිද්ධියට අදාල පැ-35 දරණ වියදම් යෝජනාව චමින්ද සමරකෝන් මහතා විසින් සහතික කළ පසු පැ-35D අනුව වියදම් වවුචරය මුදල් අංශයේ ගණකාධිකාරී සුමිතා කේ දහනායක මහත්මිය විසින් අනුමත කර ඇති බව පෙනී යයි. අදාල ගෙවීම මූල්‍ය රෙගුලාසිවලට අනුකූල බවට සහතික කර අනුමත කර ඇත්තේ පැ-36 ගෙවීම් වවුචරය මගින් බව පෙනී යයි. එකී පැ-36 ගෙවීම් වවුචරය සකස් කර ඇත්තේ චමින්ද සමරකෝන් මහතා නොව මූල්‍ය අංශය මගිනි. තවද පැ-37 චෙක්පත මගින් මුදල් ගෙවීමට චෙක්පත අත්සන් කර ඇත්තේ මූල්‍ය අංශයේ නිළධාරීන් බව පෙනී යයි.

පැ-38 මූල්‍ය රෙගුලාසි වල පැ-38E, පැ-38F අනුව පැ-36 ගෙවීම් වවුචරය අනුමත කරන නිළධාරියාගේ වගකීම් දැක්වේ. පැ-38 මූල්‍ය රෙගුලාසි වල පැ-38G අනුව චෙක්පතක් මගින් ගෙවීම් කරන විටදී ගෙවීම් නිළධාරියා වන්නේ පැ-36 ගෙවීම් වවුචරය අනුමත කළ මූල්‍ය අංශයේ ගණකාධිකාරී සුමිතා කේ. දහනායක මහත්මිය බව පැහැදිලිව පෙනේ. එකී කරුණු අනුව අදාල සිද්ධිය සම්බන්ධයෙන් බලපතල

මූල්‍ය වංචාවක් පිළිබඳ චෝදනා කිසිදු අයුරකින් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව නැගීමට නොහැකි බව තහවුරු වේ.

පැ-22 චෝදනා පත්‍රය මගින් චමින්ද සමරකෝන් මහතාට ඉදිරිපත් කළ චෝදනා 6 න් අංක. 2, 3 සහ 4 වන චෝදනාවන්ට අදාලව වැරදිකරු නොවන බව පැ-43 විනය පරීක්ෂණ වාර්තාවේ සඳහන් කර ඇත. කෙසේ නමුත් අංක. 2, 3 සහ 4 වන චෝදනාවන් සලකා බැලීමේදී පන්නල සතොස ආයතනයට මුදල් ගෙවීමේ සිද්ධියට අදාල ලේඛණ පරීක්ෂා කර බැලීමේදී අංක. 2, 3 සහ 4 වන චෝදනා නැගීමට කිසිදු පදනමක් නොමැති බව නිරීක්ෂණය වේ.

පැ-43 වාර්තාවේ පැ-43B ලෙස සළකුණු කළ කොටසේ පරීක්ෂණ නිළධාරියා සඳහන් කර ඇත්තේ චූදිත නිළධාරියාට විරුද්ධව පළමුවන චොදනාවේ සඳහන් මූල්‍ය වංචාවන් සිදු කළ බවට චෝදනාවන් ඉදිරිපත් කර තිබුණද, ඔහු විසින් මූල්‍ය වංචාවක් කළ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වූයේ නැත යනුවෙනි. මූල්‍ය වංචාවක් නොකළ බවට කරුණු අනාවරණය වී තිබියදීත් පරීක්ෂණ නිළධාරියා විසින් පැ-43 වාර්තාවෙන් චමින්ද සමරකෝන් මහතා පැ-22 චෝදනා පත්‍රයේ 1 වන චෝදනාව වන බරපතල මූල්‍ය වංචාවකට වරදකරු බව තීරණය කිරීම නිවැරදි නොවන බවත්, චමින්ද සමරකෝන් මහතා හට යුක්තිය ඉෂ්ඨ නොවන අයුරින් ක්‍රියාකර ඇති බවත්, තහවරු වේ.

පැ-36 දරණ ගෙවීම් වවුචරය සහතික කිරීමට හෝ අනුමත කිරීමට චමින්ද සමරකෝන් මහතා සම්බන්ධ නොවූ බව ලේඛණගත සාක්ෂි මගින් පෙන්වා තිබියදීත් පැ-43 වාර්තාවේ පැ-43A සහ පැ-43C හි චමින්ද සමරකෝන් මහතා ගෙවීම් වවුචරය අත්සන් කර ඇති බවට

පරීක්ෂණ නිළධාරියා විසින් නිගමනයකට එළඹීම සාවද්‍ය නිගමනයක් බවත්, තහවුරු වේ.

පැ-22 චෝදනා පත්‍රය අනුව චමින්ද සමරකෝන් මහතා චෝදනාවල ස්වභාවය අනුව අංක. 5 සහ 6 චෝදනා වලට වැරදිකරු කළ හැක්කේ අංක. 1, 2, 3 සහ 4 යන චෝදනා සියල්ලටම වරදකරු වුවහොත් පමණි. නමුත් 1 වන චෝදනාවට පමණක් වරදකරු වී, 2, 3 සහ 4 චෝදනාවලට නිවැරදිකරු බවට තීරණය කර තිබියදී, අංක. 5 සහ 6 චෝදනාවන්ට චමින්ද සමරකෝන් මහතා වැරදිකරු බව තීරණය කිරීම නිවැරදි නොවන බවට නිරීක්ෂණය වේ.

චමින්ද සමරකෝන් මහතා විසින් ඉදිරිපත් කළ පැ-30 ලේඛණය අනුව පැ-22 චෝදනා පත්‍රයට අදාල සිදුවීමට ඉහළ පාලනාධිකාරියේ නිළධාරීන් විශාල ප්‍රමාණයක් දායක වී තිබෙන බව පැහැදිළි වේ. එසේ තිබියදී පාලනාධිකාරිය නොමග යැවූ බවට පැ-22 හි අංක. 5 දරණ චෝදනාව නැගීම අසාධාරණ හා පදනම් විරහිත බව පෙනී යයි.

පැ-22 හි අංක. 6 දරණ චෝදනාව මගින් පත්වීම් ලිපියේ කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් චමින්ද සමරකෝන් මහතා වරදකරු බවට තීරණය කිරීම පැ-43 දරණ වාර්තාව මගින් සිදුකර ඇත. එහිදී චූදිත නිළධාරියා පත්වීම් ලිපියේ 25 වන කොන්දේසිය උල්ලංඝනය කර ඇති බවට තීරණය කර ඇත. පැ-1 දරණ පත්වීම් ලිපියේ 25 වන කොන්දේසියෙන් ක්‍රියාවන් රාශියක් දක්වා ඇති අතර උල්ලංඝනය කර ඇත්තේ කවර ක්‍රියාවද සහ/හෝ ක්‍රියාවන්ද යන්න පැ-43 වාර්තාව මගින් අනාවරණය කර නොමැත. ඒ අනුව පැ-22 චෝදනා පත්‍රයේ අංක. 6 දරණ චෝදනාව නිශ්චිත නොවන අතර එකී

චෝදනාවට චමින්ද සමරකෝන් මහතාව වැරදිකරු කිරීම අසාධාරණ සහ සාවද්‍ය තීරණයක් බව තහවුරු වේ.

පැ-22 චෝදනා පත්‍රයට අදාලව පැවති විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබා දී ඇති කළමණාකාර (ආරක්ෂක/විමර්ශන) එම්. ආර්. එස්. පී. සමරසිංහ මහතාගේ සාක්ෂිය පැ-42 ලෙස ඉදිරිපත් කර ඇත. එහිදී ඔහු විසින් ලබා දී ඇති පිළිතුරු අනුව, සහනාධාර දීමේ මුවාවෙන් වංචාවක් සිදු වූ බවට කරුණු හෙලි නොවූ බවත්, චූදිත නිළධාරියා වංචා කිරීමක් කර නොමැති බවත්, අදාල සිද්ධිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි (FP/006) වලට අනුකූලව සෘජුවම කටයුතු කිරීම පිළිබඳ වගකිවයුතු නිළධාරියා වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) සහ අධ්‍යක්ෂක මණ්ඩලය බවත්, FP/006 සංස්ථා රෙගුලාසි අනුව කවුරුන් කුමන අයුරින් සැප් (SAP) වවුචර පිළියෙල කර ඉදිරිපත් කළද ගෙවීම් කටයුතු නිර්දේශ කිරීමට සහ අනුමත කිරීමට, චෙක්පත් අත්සන් කිරීමට කාර්යභාරය පැවරී තිබුණේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වෙත බවත්, යන කරුණු අනාවරණය වේ.

පැ-42(I) සහ පැ-42(II) වශයෙන් විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබාදුන් පාරිභෝගික සේවා සහයක සතිකා උමයංගනී ගමගේ මහත්මියගේ සාක්ෂිය සහ ජ්‍යෙෂ්ඨ අලෙවි නිළධාරී කේ. එල්. පී. පෙරේරා මහතාගේ සාක්ෂිය ලකුණු කර ඇත. එම සාක්ෂි අනුවද වවුචරපත් පිළියෙල කිරීම මුදල් රෙගුලාසිවලට අනුකූලව සිදු කළ බවට කියා ඇත. එම්. ආර්. එස්. පී. සමරසිංහ මහතා, සතිකා උමයංගනි ගමගේ මහත්මිය සහ කේ. එල්. පී. පෙරේරා මහතා විසින් විනය පරීක්ෂණයේදී ලබාදුන් සාක්ෂි අනුවද, චමින්ද සමරකෝන් මහතා සම්බන්ධයෙන් පැ-22 චෝදනා පත්‍රයේ නගා ඇති චෝදනා සියල්ලක්ම පදනම් විරහිත බව තහවුරු වේ.

විනය පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු නිසි පරිදි විශ්ලේශණය කිරීමකින් තොරව, චමින්ද සමරකෝන් මහතාව පැ-22 චෝදනා පත්‍රයට වරදකරු කිරීමේ අරමුණෙන් යුතුව සැළසුම්සහගතව ක්‍රියා කර ඇති බව පැ-43 දරණ විනය පරීක්ෂණ වාර්තාව සලකා බැලීමේදී තහවුරු වේ.

මෙම විමසීමේදී සංස්ථා හිටපු සභාපති සහ හිටපු අග්‍රාමාත්‍ය ලේකම් එස්. අමරසේකර මහතා සාක්ෂි ලබා දී ඇත. පැ-22 චෝදනාපත්‍රයට පදනම් වූ සිද්ධිය සිදු වූ වකවානුවේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිටපු සභාපති සහ විනය බලධාරියාද ඔහු වේ. ඔහුගේ සාක්ෂිය අනුවද පැ-22 චෝදනා පත්‍රයෙන් නිශ්චිත වරදවල් දක්වා නොමැති බවත්, පැ-22 චෝදනා පත්‍රයට පදනම් වූ සිද්ධිය පුද්ගලික කරුණක් නොවන බවත්, එය සංස්ථා ඉහළ කළමණාකාරීත්වය විසින් ගන්නා ලද තීරණයක් බවත්, තහවුරු වේ.

චමින්ද සමරකෝන් මහතාව සේවයනේ පහ කිරීමට පදනම් කරගත් පැ-22 හා පැ-23 දරණ චෝදනාපත්‍රයන්ට පදනම් වූ විනය පරීක්ෂණයන් කෙරෙහි අධ්‍යයනයක් හා විමර්ශනයක් සිදුකර ඊට අදාලව නිරීක්ෂණ සහ නිර්දේශ සහිත වාර්තාවක් විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අනුර රණසිංහ මහතා මගින් කැඳවීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති නීතිඥ සුමිත් විජේසිංහ මහතා විසින් ක්‍රියා කර ඇත. විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අනුර රණසිංහ මහතාගේ නිරීක්ෂණ හා නිර්දේශ ඇතුලත් වාර්තාව පැ-119 ලෙස ලකුණු කර ඇත. පැ-22 චෝදනා පත්‍රයට පදනම් වූ සිද්ධියේදී චමින්ද සමරකෝන් මහතා දායක වී ඇත්තේ වියදම් වවුචරය සහතික කිරීමට පමණක් බව පැ-119 වාර්ථාවේ දක්වා ඇත. පැ-22 හි චෝදනා වලට චමින්ද සමරකෝන් මහතා වරදකරු කර ඇත්තේ කරුණු පටු

විශ්ලේෂණයකට ලක් කිරීමෙන් සහ චමින්ද සමරකෝන් මහතාගේ නිරවද්‍යතාවය පිළිබඳ කරුණු සහ ලේඛණ ඇගයීමකින් තොරව බවත්, එම ක්‍රියාවලිය ස්වභාවික යුක්තිධර්ම රීතීන්ට පටහැණි බවට එම වාර්තාව මගින් නිරීක්ෂණය කර ඇත.

පැ-119 වාර්තාව අනුවද තවදුරටත් තහවරු වන්නේ චමින්ද සමරකෝන් මහතාට අදාළව චෝදනා නැගීම හා විනය පරීක්ෂණ පවත්වා වරදකරු කිරීම අපක්ෂපාතීව හා සාධාරණ අයුරින් සිදුකර නොමැති බවත්ය.

පැ-22 චෝදනා පත්‍රය, ඊට පදනම් වූ විනය පරීක්ෂණයේදී ලබා දී ඇති සාක්ෂි සහ මෙම විමසීමට ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛණද සළකා බැලීමේදී, චමින්ද සමරකෝන් මහතාට එරෙහිව චෝදනා නැගීමට තරම් පදනමක් නොමැති බවට කරුණු තහවුරු වේ. ඉහත කරුණු ප්‍රකාරව පැ-22 දරණ චෝදනා පත්‍රය ලබා දී ඊට අදාලව විනය පරීක්ෂණය පවත්වා එකී චෝදනා පත්‍රයේ චෝදනා වලට චමින්ද සමරකෝන් මහතා වරදකරු කර ඇත්තේ, චමින්ද සමරකෝන් මහතා කෙරෙහි ද්වේශයෙන් සහ ඔහුව දේශපාලන වශයෙන් පළිගැනීමකට ලක් කිරීමට බවත්, තහවුරු වේ.

පැ-23 දරණ චෝදනාපත්‍රය මත පදනම් වූ LGL/DIU/15/2581 දරණ විනය පරීක්ෂණය.

ශ්‍රී ලංකා යුධ හමුදා මිලිටරි ඇකඩමිය විසින් සංවිධානය කළ වර්ෂ 2014 Foxhill Super Cross මෝටර් රථ ධාවන තරඟාවලියේ ප්‍රධාන අනුග්‍රාහකත්වය ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබා දීමත් සමග ධාවනපථය ආශ්‍රිතව ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කළ ප්‍රචාරණයන් හා වෙළෙඳ දැන්වීමක් නිර්මාණය කිරීම සම්බන්ධව

සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම, මිල ගණන් ඇගයීම හා ගෙවීම් සිදු කිරීමට අදාල සිද්ධිය පදනම් කරගෙන චමින්ද සමරකෝන් මහතාට චෝදනා 8 කින් යුත් පැ-23 දරණ චෝදනා පත්‍රය ටී. ජී. ජයසිංහ සභාපතිවරයා විසින් භාර දී ඇත.

වර්ෂ 2014 Foxhill Super Cross මෝටර් රථ ධාවන තරඟාවලියට ප්‍රධාන අනුග්‍රාහකත්වය ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් ලබා දෙන ලෙසට ශ්‍රී ලංකා මිලිටරි ඇකඩමිය විසින් ඉල්ලීම් කර ඇත්තේ වර්ෂ 2014.2.5 වන දින වේ. පැ-53(I) දරණ 2014.3.10 දිනැති ලිපිය මගින් ප්‍රධාන අනුග්‍රාහකත්වය ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබා දෙන බව කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් දැනුම් දී ඇත. ධාවන තරඟාවලිය වර්ෂ 2014.4.18 සහ 2014.4.19 යන දින දෙකෙහි පැවැත්වීමට නියමිතව තිබී ඇත.

පැ-53(I) ලිපිය මගින්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් අදාල කටයුත්ත සම්බන්ධීකරණයට ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකයේ අලෙවි කළමණාකාර ඒ. ආර්. පී. ඩබ්ලිව්. ඩී. දේදුනුපිටිය මහාතා සහ ජ්‍යෙෂ්ඨ අලෙවි නිළධාරී ඩී. ඩී. මදුරප්පෙරුම මහතා පත්කිරිමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් කටයුතු කර ඇත. එම කටයුත්තට අදාලව ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් බී. ජී. එන්. එච්. මෙන්ඩිස්, ඒ. ආර්. පී. ඩබ්ලිව්. ඩී. දේදුනුපිටිය, ඩී. ඩී. මදුරප්පෙරුම හා ඊ. පී. සී. ආර්. පතිරණ යන නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇත. ඔවුන් කමිටුවක් වශයෙන් ක්‍රියාකර ඇති බව පැ-57 හා පැ-68 ලේඛන අනුවද පෙනී යයි.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වෙළෙඳ ප්‍රචාරණ, ප්‍රවර්ධන හා මාධ්‍ය කටුයුතු සැළසුම් කිරීමේදී ආයතනික සන්නිවේදන හා පාරිභෝගික අංශය මගින් සිදු කළ යුතු බවට 2009.6.1 දිනැතිව සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂ මේජර් ජනරාල් අශෝක තෝරදෙණිය මහතා විසින් පැ-46 දරණ චක්‍රලේඛය නිකුත් කර ඇත. එසේම වෙළෙඳ ප්‍රචාරණ, ප්‍රවර්ධන හා මාධ්‍ය කටුයුතු සිදු කිරීමේදී සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය මත සිදුකළ යුතු බවටද පැ-46 චක්‍රලේඛයේ දක්වා ඇත.

ප්‍රචාරණ ප්‍රවර්ධන කටයුතු සඳහා සැපයුම්කරුවන් කැඳවීම සඳහා සැපයුම්කරුවන්ගේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොමැති හෙයින් සේවා අවශ්‍යතාවයද කඩිනමින් සිදු කළ යුතු හෙයින්ද, ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකයේ පවත්වාගෙන යන පැ-56A දරණ සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවක් පදනම් කරගෙන මිලගණන් කැඳවීමට ක්‍රියාකර ඇත. පැ-56 ලේඛණය අනුව එම ලේඛනයේ නම සඳහන් සැපයුම්කරුවන් හත්දෙනාගෙන් ධාවන පථය ආශ්‍රිත ලිහිසි තෙල් ප්‍රචාරණ කටයුතු සඳහා මිල ගණන් කැඳවීමට කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් අනුමැතිය ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. පැ-57 ලේඛණය අනුව මිල ගණන් ඉදිරිපත් කරන ලද සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව සභාපතිවරයාගේ අනුමැතිය සඳහා කළමණාකාර අධ්‍යක්ෂකවරයා මගින් වර්ෂ 2014.4.4 වන දින ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. අවශ්‍ය පිරිවිතර සපුරාලන අවම මිල ලන්සුව ඉදිරිපත් කළ ශ්‍රී මාල් ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඩ් සඳහා සභාපතිවරයා විසින් අනුමැතිය ලබා දී ඇති බව පැ-58 ලේඛනය අනුව පෙනී යයි.

රූපවාහිණී වෙළෙඳ ප්‍රචාරණ දැන්වීමක් සකස් කිරීමේ කාර්යය සඳහා පැ-70 දරණ සැපයුම්කරුවන්ගේ මිලගණන් ලේඛනය ඒ. ආර්. පී. ඩබ්ලිව්. ඩී. දේදුනුපිටිය මහතා විසින් 2014.3.25 දිනැතිව කළමණාකාර අධ්‍යක්ෂකවරයා හරහා සභාපතිවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. පැ-70 දරණ ලේඛනයෙහිම අවම මිලගණන් සහිත සැපයුම්කරු සඳහා සභාපතිවරයා විසින් අනුමැතිය ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

පැ-23 දරණ චෝදනා පත්‍රයට අදාල විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබා දුන් කළමණාකාර (ප්‍රසම්පාදන හා ගබඩා) එස්. ඩී. එස්. රාජපක්ෂ මහතාගේ සාක්ෂි පැ-74 ලෙස ඉදිරිපත් කර ඇත. මිල ගණන් කැඳවීම සිදුකළ යුතු වන්නේ ප්‍රසම්පාදන හා ගබඩා අංශය මගින් වුවත් සමහර අවස්ථාවලදී සේවා අවශ්‍යතා හදිසි සේ සළකා ඒ ඒ අදාල අංශ මගින් එය සභාපතිතුමාගේ පූර්ව අනුමැතිය ඇතිව සිදු කරන අවස්ථා තිබෙන බවත්, 2014 අප්‍රේල් මාසයේ දියතලාවේ පවත්වන ලද Foxhill Super Cross මෝටර් රථ ධාවන තරඟාවලියට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඒ ආකාරයට සිදු වූ බවත්, ප්‍රසම්පාදන හා ගබඩා කළමණාකරු විසින් සාක්ෂි දෙමින් කියා ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් කරන ලද කරුණු ප්‍රකාරව චමින්ද සමරකෝන් මහතාව පැ-23 දරණ චෝදනා පත්‍රයේ 1 වන චෝදනාවට වරදකරු කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු නොමැති බව පෙනී තිබියදී, චමින්ද සමරකෝන් මහතා එම චෝදනාවට වරදකරු කිරීම දෝෂ සහගත බව තහවුරු වේ.

පැ-23 චෝදනා පත්‍රයේ 2 හා 4 වන චෝදනා මගින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට ප්‍රථම රුපියල් මිලියන

දෙකකට වැඩි ගණුදෙනු සඳහා ගෙවීම් කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරව සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී මිල ගණන් ඇගයීම සිදුකර ඇති බවටත් චෝදනා කර ඇත. අදාළ ප්‍රචාරණ කටයුතු සඳහා සැපයුම්කරු වෙත මුදල් ගෙවීම සිදු කර ඇත්තේ පැ-60, පැ-67 හා පැ-72 දරණ ගෙවීම් වවුචර මගින් බව පෙනී යයි. එකී පැ-60, පැ-67 හා පැ-72 දරණ ගෙවීම් වවුචර සහතික කොට අනුමත කොට ඇත්තේ සංස්ථාවේ මූල්‍ය අංශය මගින් බව නිරීක්ෂණය වේ. ගෙවීම් වවුචර සහතික කිරීම හෝ අනුමත කිරීමක් චමින්ද සමරකෝන් මහතා විසින් සිදු කර නොමැත. පැ-60, පැ-67 හා පැ-72 දරණ ගෙවීම් වවුචර සම්බන්ධව හා අදාල ගෙවීම් සිදු කිරීම සම්බන්ධව මුදල් රෙගුලාසි (පැ-38) අනුව වගකීම පැවරෙනුයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මුදල් තනතුරේ සිටින නිළධාරියාට වේ. පැ.51(I) දරණ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව සහ පැ-51(II) දරණ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුවද 2014 වර්ෂයේ සිදුකළ සියලු වෙළෙඳ ප්‍රචාරණ සඳහා ගෙවීම් සිදු කිරීමට අනුමැතිය හිමිකර දී ඇති බවද නිරීක්ෂණය වේ.

Foxhill Super Cross මෝටර් රථ ධාවන තරඟාවලියට අදාලව සංස්ථාවේ ප්‍රචාරණ කටයුතු සේවා අවශ්‍යතාවයේ කඩිනම්භාවය හේතුවෙන් කළමණාකාර අධ්‍යක්ෂකවරයාගේ සහ සභපතිවරයාගේ පූර්ව අනුමැතිය මත සිදු කර අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. පැ-64 දරණ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව ශ්‍රීමාල් ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඩ් නමැති සැපයුම්කරු මගින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ ක්‍රියාවලිය හා ගෙවිය යුතු මුදල් සම්බන්ධව කිසිදු විරෝධතාවයකින් තොරවම ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නිර්දේශ කර ඇති බව පෙනී යයි. පැ-65 දරණ ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුව ශ්‍රීමාල්

ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඩ් නමැති සැපයුම්කරු වෙත ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබාදුන් ප්‍රසම්පාදන හා ගබඩා කළමණාකාර එස්. ඩී. එස්. රාජපක්ෂ මහතාගේ සාක්ෂිය පැ-74 ලෙස ඉදිරිපත් කර ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම සිදු කරන්නේ සභාපතිතුමා විසින් බවත්, තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත අදාල ඉල්ලීම සිදු කර ඇත්තේ ප්‍රසම්පාදන හා ගබඩා කාර්යාංශය විසින් බවත්, ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කල පත්‍රිකා ප්‍රසම්පාදන කමිටුව විසින් 2014.9.19 වන දින අනුමත කර ඇති බවත්, තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළත්, තීරණ ගැනීම සඳහා කිසියම් කාලසීමාවක් ගතවන බවත්, එබඳු අවස්ථාවලදී අවශ්‍යතාවය අනුව සභාපතිතුමාගේ අනුමැතියට යටත්ව එම මිලදී ගැනීම සිදු කර තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමුකරන අවස්ථා තිබෙන බවත්, එස්. ඩී. එස්. රාජපක්ෂ මහතා සිය සාක්ෂියෙන් ප්‍රකාශ කර ඇති බව පැ-74 දරණ ලේඛනය අනුව නිරීක්ෂණය වේ. තවද මෙම නිළධාරියා විසින් විනය පරීක්ෂණයේදී ලබා දී ඇති සාක්ෂිය හා ඉදිරිපත් කර ඇති ලේඛන විමසා බැලීමේදී චමින්ද සමරකෝන් මහතා පැ-23 දරණ චෝදනා පත්‍රයේ 2 සහ 4 චෝදනා වලට වරදකරු කිරීමට කිසිදු පදනමක් නොමැති බව පෙනී යයි. අදාල සිද්ධියට අදාල ක්‍රියාවලිය නිසි පරිදි සිදු වී ඇති බවත්, තහවුරු වේ.

පැ-23 චෝදනාපත්‍රයේ 3 වන චෝදනාව මගින් ධාවන පථය ආශ්‍රිත ප්‍රචාරණ කටයුතු සඳහා සහ වෙළෙඳ දැන්වීම නිර්මාණයේදී සැපයුම්කරුවන් තෝරාගැනීමේ කාර්යයට වරින්වර මිලගණන් විවෘත කිරීම හා විනිවිදභාවයකින් සිදු නොකල බවට චෝදනා නගා ඇත. එහිදි. පැ-70 දරණ ලේඛනය ප්‍රකාරව වෙළෙඳ දැන්වීම නිර්මාණය

කිරීමේ කාර්යයට අදාලව සැපයුම්කරුවන්ගේ මිලගණන් කැඳවීමට සම්බන්ධ වී ක්‍රියාකර ඇත්තේ අලෙවි කළමණාකාර ඒ. ආර්. පී. ඩබ්ලිව්. ඩී. දේදුනුපිටිය, කළමණාකාර අධ්‍යක්ෂක හා සභාපතිවරයා වේ. එහිදී චමින්ද සමරකොන් මහතා සම්බන්ධ වී ඇති බව නිරීක්ෂණය නොවේ. පැ-57 හා පැ-70 දරණ ලේඛන අනුව වරින්වර මිලගණන් කැඳවීමක් කර ඇත්තේ කාර්යයන් දෙකකට අදාළව බව නිරීක්ෂණය වේ. එකී පැ-57 හා පැ-70 දරණ ලේඛණ අනුව කාර්යයන් දෙක සඳහාම නිසි පරිදි අනුමැතීන් ලබාගෙන තිබියදී, අවස්ථා දෙකකදී ක්‍රියා කිරීම වරදක් ලෙස දැක්වීම දෝෂ සහගත බව පෙනී යයි.

පැ-23 චෝදනා පත්‍රයේ 5 වන චෝදනාව මගින්, සැපයුම්කරුවන් තිදෙනෙකුගේ නමින් කූට ලෙස ව්‍යාජ මිල ලේඛන සකස් කිරීම හෝ ඊට ආධාර අනුබල දීම මගින් බරපතල වරදක් සිදු කර ඇති බවට චමින්ද සමරකෝන් මහතාට චෝදනා නගා ඇත. එකී ආයතන වලින් මිලගණන් කැඳවීම හෝ මිලගණන් ඇගයීමේ කාර්යය චමින්ද සමරකෝන් මහතා විසින් සිදු කර නොමැති බව නිරීක්ෂණය වේ. ඉහත ආයතන නමින් කූට ලේඛන සකස් කර ඇති බවට චෝදනා කර තිබුණද, විනය පරීක්ෂණ වලදි එකී කරුණු ඔප්පු කිරීම සඳහා එකී ආයතන වල කිසිදු නියෝජිතයෙකු සාක්ෂිකරුවෙකු වශයෙන් කැඳවා නොමැති බව නිරීක්ෂණය වේ. කූට ලේඛන ඉදිරිපත් කර ඇති බවට හෝ එය කවරෙකු විසින් සිදු කර ඇත්දැයි යන්න යන කරුණ තහවරු කිරීමට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොතිබියදී පැ-77 දරණ පරීක්ෂණ වාර්තාව මගින් එකී චෝදනාවට චමින්ද සමරකෝන් මහතා වරදකරු කර තිබීම අසාධාරණ හා අයුක්ති සහගත බවත්, එසේම නීත්‍යානුකූල නොවන බවත් තහවුරු වේ.

පැ-23 චෝදනා පත්‍රයේ 6 වන චෝදනාව මගින් සංස්ථාව වෙත බාර දුන් භාණ්ඩ පිළිබඳව භෞතිකව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා නොමැති බවට චෝදනා කර ඇත. 2015.3.18 දිනැති පැ-75 දරණ ලිපිය මගින් භාණ්ඩ පරීක්ෂාවට පහසුකම් සපයන් ලෙස චමින්ද සමරකෝන් මහතාට දැනුම් දී ඇත. ඒ අනුව පැ-75 දරණ ලිපියෙහිම 2015.3.18 සහ 2015.3.24 යන දින දෙකෙහිම චමින්ද සමරකෝන් මහතා විසින් සටහනක් තබමින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ලෙසට ලිහිසි තෙල් කාර්යාංශයේ නිලධාරීන්ට දැනුම් දී ඇති බව පෙනී යයි. චමින්ද සමරකෝන් මහතා විසින් ලිහිසි තෙල් කාර්යාංශයේ නිලධාරීන්ට එලෙසට දැනුම් දීමට හේතුව වී ඇත්තේ එකී භාණ්ඩ ගබඩා කර ඇත්තේ ලිහිසි තෙල් කාර්යාංශයට අදාල ගබඩා පරිශ්‍රයේ වීම හේතුවෙන් බව ඔහුගේ සාක්ෂියෙන් ප්‍රකාශ කර ඇත. ඒ අනුව පැ-75 ලිපියට අදාලව චමින්ද සමරකෝන් මහතා කඩිනමින් ප්‍රතිචාර දක්වමින් ක්‍රියා කර ඇති බව තහවුරු වේ. එකී චෝදනාවට අදාලව විනය පරීක්ෂණයේදී වරදකරු කිරීම සඳහා කිසිදු පදනමක් නොමැති බවත්, තහවුරු වේ.

පැ-23 දරණ චෝදනා පත්‍රයේ 7 වන චෝදනාව මගින් පත්වීම් ලිපියේ 25 වන කොන්දේසියේ ඇතුලත්, වංකභාවය, වංචාසහගතභාවය, සංස්ථාව පනවන ලද නීති රීති උල්ලංඝනය කිරීමේ වැරදිද, 8 වන චෝදනාව මගින් සංස්ථාව විසින් තබා ඇති විශ්වාසය කඩවන අයුරින් ක්‍රියා කිරීමේ වරද යන චෝදනාවන් නගා ඇත. එකී චෝදනා දෙකම බැලූ බැල්මටම නිශ්චිත නොවන චෝදනාවන් වේ. පැ-77 පරීක්ෂණ වාර්තාව මගින් හෝ වංකභාවය, වංචාසහගතබව, විශ්වාසය කඩවීම යන වචන වලින් අර්ථනිරූපණය වන්නේ කවරක්දැයි හෝ දක්වා නොමැත. මෙම චෝදනා පැහැදිලි ලෙසම චමින්ද සමරකෝන් මහතා

කුමන හෝ ආකාරයකින් විනය පරීක්ෂණයේදී වරදකරු කිරීමේ අරමුණෙන් ඉදිරිපත් කර ඇති චෝදනා බව තහවුරු වේ.

මෙම විමසීමේදී සාක්ෂිකරුවෙකු වශයෙන් සාක්ෂි ලබාදුන් සංස්ථා හිටපු සභාපති සහ හිටපු අග්‍රාමාත්‍ය ලේකම් එස්. අමරසේකර මහතා විසින් සඳහන් කර ඇත්තේ පැ-23 චෝදනා පත්‍රයේ චෝදනා අවිනිශ්චිත බවත්, බැලූ බැල්මටම එකී චෝදනා වලට චමින්ද සමරකෝන් මහතා වරදකරු කළ නොහැකි බවත් වේ. එස්. අමරසේකර මහතාගේ සාක්ෂිය විශ්වසනීය සාක්ෂියක් බවට ඔහුගේ සාක්ෂිය විමසා බැලීමේදී තහවුරු වේ.

පැ-23 දරණ චෝදනා පත්‍රය ඉදිරිපත් කිරීමත්, එම විනය පරීක්ෂණය පැවැත්වීමත්, විනය පරීක්ෂණයේදී ඉදිරිපත් වූ සාක්ෂි හා ලේඛනත්, පැ-77 දරණ පරීක්ෂණ වාර්තාව මගින් නිසි ලෙස සැළකිල්ලට භාජනය නොකර, චමින්ද සමරකෝන් මහතාට අගතිදායක ලෙස විග්‍රකර ඇති බව තහවරු වේ. විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අනුර රණසිංහ මහතාගේ පැ-119 දරණ වාර්තාව මගින්ද පැ-23 දරණ චෝදනා පත්‍රය මත විනය පරීක්ෂණයේදී ඉදිරපත් වූ සාක්ෂි සහ ලේඛන අගැයීම ස්වභාවික යුත්තිධර්යේ මූලධර්මයන්ට පටහැණිව සිදු කර ඇති බවට නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. එකී කරුණු ප්‍රකාරව පැ-23 දරණ චෝදනා පත්‍රය හා බැඳුනු චෝදනා නැගීම හා චමින්ද සමරකෝන් මහතා වරදකරු කිරීම, ද්වේශසහගත ලෙස දේශපාලනිකව පළිගැනීමට සිදු කළ කාර්යයක් බව තහවුරු වේ.

පැ-21 දරණ චෝදනාපත්‍රය මත පදනම් වූ LGL/DIU/15/2579 දරණ විනය පරීක්ෂණය.

කලවංචිකුඩි හි පිහිටි ඛණිජ තෙල් නීතිගත සංස්ථාව මගින් පාලනය වන ඉන්ධන පිරවුම්හලේ බෙදුම්කාරීත්වය හිමි එල්. එස්. රාසමානික්කම් යන අයගේ බෙදුම්කාරීත්වය අහෝසි කර වඩිවේල් ප්‍රශන්තන් යන අය හට බෙදුම්කාරීත්වය ලබා දීමට අදාල ක්‍රියාවලියේ අක්‍රමිකතාවයන් ඇති වූ බවට වන පදනමෙන් චෝදනා 7 ක් මත පැ-21 දරණ චෝදනා පත්‍රය චමින්ද සමරකෝන් මහතාට ලබා දී, එකී චෝදනා පත්‍රය මත විනය පරීක්ෂණ පවත්වා චෝදනා අංක. 1, 3, 4, 6 සහ 7 ට වරදකරු කර ඇත.

පැ-21 දරණ චෝදනාපත්‍රයට පදනම් වූ කලවංචිකුඩි ඉන්ධන පිරවුම්හලේ බෙදුම්කරු විසින් සංස්ථාවේ අවසරයකින් තොරව තෙවන පාර්ශවයකට බදු දීම පිළිබඳව කරුණු ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අනාවරණය වනුයේ වර්ෂ 2012 දී බව පැ-96(I) සහ පැ-96(II) ලේඛන අනුව පෙනී යයි.

එවකට බලශක්ති අමාත්‍යවරයාව සිටි සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් එම ඉන්ධන පිරවුම්හල ගිවිසුම කඩකල බෙදුම්කරුගෙන් ඉවත් කොට වඩිවේල් ප්‍රශන්තන් යන අයට ලබා දීමට, නිර්දේශයන් සහ අනුමැතීන් ලබා දී ඇති බව පැ-96(I) ලේඛනයේ පැ-96A, පැ-96(II) ලේඛනයේ පැ-96B සහ පැ-97(I) ලේඛනයේ පැ-97B සටහන් අනුව නිරීක්ෂණය වේ.

එම ඉන්ධන පිරවුම්හල නව බෙදුම්කරුවෙකුට ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා කළමණාකාර අධ්‍යක්ෂකවරයාද අවශ්‍ය අනුමැතීන් ලබා දී ඇති බව පැ-97A සහ පැ-97D සටහන් අනුව පෙනී යයි.

කලවංචිකුඩි ඉන්ධන පිරවුම්හලේ බෙදුම්කරුව සිටි රාසමානික්කම් මහතා මිය යාමෙන් පසුව ඔහුගේ බිරිඳ ඉන්ධන පිරවුම්හල පවත්වාගෙන ගොස් ඇති අතර පසුව ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අනුමැතියකින් තොරව තෙවන පාර්ශවයකට ඉන්ධන පිරවුම්හල පවත්වාගෙන යාමට ඉඩ ලබා දී ඇති බව වර්ෂ 2013.3.30 දිනැති කළමණාකාර (ආරක්ෂක/විමර්ෂණ) විසින් සිදු කල පැ-89(I) සහ පැ-89(II) විමර්ශන වාර්තා අනුව පෙනී යයි.

පැ-89(I) සහ පැ-89(II) විමර්ශන වාර්තා අනුව කලවංචිකුඩි ඉන්ධන පිරවුම්හලේ බෙදුම්කරු විසින් බෙදුම්කාරත්ව ගිවිසුම කඩකර ඇති බවට නිගමනය කරන බවට දක්වා ඇත.

වර්ෂ 2015 ජනවාරි මසදී යහපාලන ආණ්ඩුව පත්වීමෙන් අනතුරුව කලවංචිකුඩි ඉන්ධන පිරවුම්හලේ පැවති බෙදුම්කාරධූරය අවසන් කොට නව බෙදුම්කරුවෙකු පත් කිරීමේදී අක්‍රමිකතා සිදු වී ඇති බවට ආර්. රාසමානික්කම් යන අයෙකු විසින් පැ-90(I) දරණ පැමිණිල්ල 2015.01.23 වන දින ඉදිරිපත් කර ඇත. ඉදිරිපත් වී ඇති කරුණු අනුව බෙදුම්කාරත්ව ධූරය අවසන් කළ වර්ෂ 2012 සිට වර්ෂ 2015 දක්වාම බෙදුම්කාරත්වය අහිමි කිරීමට විරුද්ධව පැමිණිලි හෝ අභියාචනා කිසිවක් නොමැති බවද නිරීක්ෂණය වේ.

පැ-90(I) පදනම් කරගෙන සංස්ථවේ ආරක්ෂක හා විමර්ශන කළමණාකරු වෙතින් පැ-91 දරණ වාර්තාව කැඳවා ඇත. එම වාර්ථාවේ පැ-91A නිර්දේශයේ දක්වා ඇත්තේ එකී ඉන්ධන පිරිවුම්හලේ බෙදුම්කාර ධූරය අහෝසි කිරීම සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් නොමැති බවත්ය. බෙදුම්කරු වෙත හේතු විමසා යවන ලද ලිපියට පිළිතුරු ඉදිරිපත් කිරීමට පෙර කඩිනමින් බෙදුම්කාර

ධූරය වඩිවේල් ප්‍රශන්තන් හට ලබා දීමට නිර්දේශ කරමින් අධ්‍යක්ෂක මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම හා ආරක්ෂක හා විමර්ශන කළමණාකරුගෙන් වාර්තාවක් ඉල්ලා එකී වාර්තාව ලැබීමට පෙර අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීම ගැටලුවක් ලෙසට මතුකර ඇත.

කෙසේ නමුත් විමර්ශනය සිදුකළ ආරක්ෂක හා විමර්ශන කළමණාකරුගේ වාර්තාවේ ගැටලු ලෙසට අනාවරණය කර ඇති කරුණු වලට පරිභාහිර වූ කරුණුද ඇතුලත් කරමින් පැ-21 දර්න චෝදනා පත්‍රයෙන්, චෝදනා 7 ක් පැ-90(I) පැමිණිල්ල පදනම් කරගෙන චමින්ද සමරකෝන් මහතාට එරෙහිව ඉදිරිපත් කර ඇත. අදාල සිද්ධිය සම්බන්ධයෙන් සංස්ථාවේ අභ්‍යන්තර විමර්ශනය සිදු කළ විමර්ශන නිලධාරියා වන ආරක්ෂක හා විමර්ශන කළමණාකරු විසින් අනාවරණය කර නොමැති කරුණු මත පදනම්ව පැ-21 දරණ චෝදනා පත්‍රයේ අංක. 1, 2 හා 5 දරණ චෝදනාවන් නගා ඇති බවත්, එලෙසින් චෝදනා නැගීම දෝෂ සහගත බවත් නිරීක්ෂණය වේ.

චමින්ද සමරකෝන් මහතා විසින්, බෙදුම්කාර ධූරය අවසන් කිරීමේ කාර්යයේදී අලෙවි කාර්යාංශයේ, අලෙවි අත්පොතේ 8.6 ඡේදයේ රෙගුලාසි උල්ලංඝනය කර ඇති බවට දක්වා ඇත. පැ-95 දරණ විනය පරීක්ෂණ වාර්තාවට අනුව අලෙවි අත්පොතේ 8.6.3 රෙගුලාසිය චමින්ද සමරකෝන් මහතා විසින් උල්ලංඝනය කර ඇති බවට දක්වා ඇත. පැ-104 දරණ අලෙවි අත්පොතේ 8.6.3 දැක්වෙන්නේ බෙදුම්කාර ධූරය අවසන් කිරීමට අදාල ලිපියේ කෙටුම්පත ප්‍රථයෙන් ප්‍රධාන නීති නිළධාරියාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු බවයි. ඒ අනුව බෙදුම්කාර ධූරය අවසන් කිරීමේ ලිපිය අදාල බෙදුම්කරුට යැවීමට පෙර කෙටුම්පත ප්රධාන නීති නිළධාරියාට ඉදිරිපත් කර

නොමැති බවට චෝදනා කර ඇත. චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂිය මගින් කියා ඇත්තේ මෙම බෙදුම්කාර ධූරය අහෝසි කිරීමේ කටයුත්ත විෂයභාර අමාත්‍යවරයා දැනුවත්ව හා ඔහුගේ නිර්දේශය සහිතව, කළමණාකාර අධ්‍යක්ෂකවරයා හා ප්‍රධාන නීති නිළධාරියා අතර වූ සාකච්ඡාවක් අනුව සිදුකර ඇති බවත්ය. අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී බෙදුම්කාර ධූරය අහෝසි කිරීමට තීරණය කර ඇති හෙයින් ප්‍රධාන නීති නිළධාරියා දැනුවත්ව සිටි බවත්, පැ-100 දරණ ලිපිය කළමණාකාර අධ්‍යක්ෂකවරයා මගින් ප්‍රධාන නීති නිළධාරියාගේ අවධානයට යොමු කර ඇති බවත්ය.

පැ-100 දරණ බෙදුම්කාර ධූරය අහෝසි කිරීමේ ලිපියේ පළමු පිටපත චමින්ද සමරකෝන් මහතා විසින් යොමු කර ඇත්තේද ප්‍රධාන නීති නිළධාරියා වෙත බව නිරීක්ෂණය වේ. තවද කෙටුම්පත ප්‍රධාන නීති නිළධාරියා හට ඉදිරිපත් නොවූ බවට පැ-100 ලිපිය ලැබීමෙන් පසුව හෝ කරුණු විමසීමක්ද සිදු වී නොමැති බව පෙනී යයි. විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබා දුන් ආරක්ෂක හා විමර්ශන කළමණාකාර කේ. ජී. ගුණසේන මහතාගේ පැ-102 දරණ සාක්ෂියේ පැ-102A ලෙස ලකුණු කළ කොටස අනුව සාක්ෂි දෙමින් කියා ඇත්තේ අලෙවි අත්පොතේ 8.6 ඡේදයේ නීති රීති උල්ලංඝනය වී ඇති බවට අනාවරණය නොවූ බවත් වශයෙනි. එකී කරුණු ප්‍රකාරව පෙනී යන්නේ චමින්ද සමරකෝන් මහතා වෙත කවර හෝ ආකාරයකට චෝදනාවන් නගා වරදකට වරදකරු කිරීමේ අභිලාෂයෙන් කිසිදු හරයාත්මක පදනමක් නොමැතිව, ද්වේශසහගත ලෙස චෝදනා නගා ඇති බවත්ය.

චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පැ-21 දරණ චෝදනාවෙන්, බෙදුම්කරුගෙන් හේතු විමසීමට 2012.11.20 දින යවන ලද ලිපියට

පිළිතුරු ලැබීමට ප්‍රථමව අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට ක්‍රියා කර ඇති බවට චෝදනා නගා ඇත. අදාල බෙදුම්කරුට 2012.11.20 දිනැති ලිපිය මගින් දින 7 ක් තුළ බෙදුම්කාර ධූරය අහෝසි නොකිරීමට හේතු දක්වන ලෙසට දැනුම් දී තිබුණද, එකී ලිපියට පිළිතුරු ලිපියක් කවර හෝ අවස්ථාවකදී ඉදිරපත් වී ඇති බවට පැ-95 දරණ පරීක්ෂණ වාර්තාවෙන් අනාවරණය නොවේ. ඒ අනුව අදාල බෙදුම්කරු හේතු දැක්වීමක් සිදු කර නොමැති බවද නිරීක්ෂණය වේ.

පැ-104 දරණ අලෙවි අත්පොතේ පැ-104A ලෙස ලකුණු කළ කොටස අනුව, අලෙවි අත්පොතේ සඳහන් රීති පිළිබඳව සහ සඳහන් නොවන කරුණු සම්බන්ධව අලෙවි කළමණාකරුගේ හෝ අංශ ප්‍රධානියාගේ තීරණය අවසානාත්මක බව සඳහන් වේ. පැ-104 දරණ අලෙවි අත්පොතේ පැ-104C ලෙස ලකුණු කළ 18.14.1 ඡේදය අනුව එහි අන්තර්ගත වරදක් බෙදුම්කරුවෙකු විසින් සිදු කර ඇත්නම් බෙදුම්කරු වෙත පූර්ව දැනුම් දීමකින් තොරව බෙදුම්කාර ධූරය අහෝසි කළ හැකි බව දක්වා ඇත. ඒ ආකාරයට පෙර දැනුම් දීමක් නොමැතිව බෙදුම්කාර ධූරය අවසන් කළ හැකි වරදක් වන්නේ, සංස්ථාවේ ලිඛිත අනුමැතිය පූරවයෙන් ලබා නොගෙන තෙවන පාර්ශවයකට බෙදුම්කාරධූරය පවරා දීම වේ. එකී කොටස පැ-104D ලෙස ලකුණු කර ඉදරිපත් කර ඇත. ඒ අනුව පැ-104 අලෙවි අත්පොතේ පැ-104A අනුව, හේතු විමසීමේ ලිපියක් යොමු කළද එකී ලිපිය පිළිබඳව නොසලකා වුවද ක්‍රියා කිරීමට හැකියාව ඇති බවද නිරීක්ෂණයවේ. තවද පැ-104 අලෙවි අත්පොතේ පැ-104C හා පැ-104D ලෙස ලකුණු කළ කොටස් අනුව හේතු විමසීමේ ලිපියක් යොමු කිරිම සංස්ථවේ කාර්යපටිපාටිය අනුව අවශ්‍ය කාර්යයක් නොවන බව පැහැදිලි වේ. බෙදුම්කාර ධූරය අහෝසි

කිරීමට පැ-99 දරණ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව තීරණය කර ඇත. ඒ අනුව හේතු විමසීමේ ලිපියක් යැවීමේ කාර්ය පටිපාටිමය අවශ්‍යතාවයක් ඒ අනුවද ඇති නොවේ.

ආරක්ෂක හා විමර්ශන කළමණාකරුගේ වාර්තාවක් කැඳවා එය ඉදිරිපත් කිරීමට ප්‍රථම අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීම පිළබඳ චෝදනාවක්ද චමින්ද සමරකෝන් මහතාට පැ-21 දර්න චෝදනා පත්‍රයේ 4 වන චෝදනාව මගින් නගා ඇත. පැ-105 දරණ ඌව නැගෙනහිර ප්‍රාදේශීය කළමණාකරුගේ වාර්තාව මගින් අදාල ඉන්ධන පිරවුම්හල තෙවන පාර්ශවයකට බදු දී ඇති හෙයින්, බෙදුම්කාර ධූරය අහෝසි කිරීමට වසර කිහිපයකට ඉහත නිර්දේශ කර ඇත. චමින්ද සමරකෝන් මහතා පැ-105 දරණ වාර්තාවත්, පැ-97(I),(II) ලේඛන මගින් අනාවරණය වූ කරුණුත්, මත සැහීමකට පත් වූ හෙයින් ඔහු විසින් කැඳවූ ආරක්ෂක හා විමර්ශන කළමණාකරුගේ වාර්තාව ඉදිරිපත් වීමට පෙරාතුව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කළ බවට සාක්ෂි ලබා දී ඇත.

අලෙවි අත්පොතේ පැ-104A ලෙස ලකුණ කල කොටස අනුවද චමින්ද සමරකෝන් මහතාට වැඩිදුර වාර්තාවක් ලැබීමට ප්‍රථමව අධ්‍යක්ෂක මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට බාධාවක් නො◌ාමැති බව නිරීක්ෂණය වේ. තවද ආරක්ෂක හා විමර්ශන කළමණාකරුගේ වාර්තාව මගින්ද බෙදුම්කරු බෙදුම්කාර ගිවිසුම කඩකර ඇති බවට නිගමනය කර ඇත. ඉහත කරුණු ප්‍රකාරව චමින්ද සමරකෝන් මහතා පැ-21 චෝදනා පත්‍රයේ 4 වන චෝදනාවට වරදකරු  කිරීම නිවැරදි නොවන බව තහවුරු වේ. අංක. 6 සහ 7 දරණ චෝදනාද පෙර සඳහන් කර ඇති පරිදිම නිශ්චිත නොවන චෝදනා

හෙයින් චූදිත නිළධාරියෙකු එකී චෝදනාවලට වරදකරු කිරීම කළ නොහැකි බව නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් කරන ලද කරුණු සහ නිරීක්ෂණ ප්‍රකාරව පැ-21 දරණ චෝදනා පත්‍රය ඉදිරිපත් කිරීමත්, ඒ මත විනය පරීක්ෂණ පවත්වා පැ-80 දරණ වාර්තාව මත පදනම්ව පැ-21 දරණ චෝදනා පත්‍රයට චමින්ද සමරකෝන් මහතාව වරදකරු කිරීමට ප්‍රමාණවත් කරුණු නොමැති බවත්, චමින්ද සමරකෝන් මහතා කෙරෙහි ද්වේශයෙන් යුතුව, දේශපාලන වශයෙන් පළිගැනීම සඳහා චෝදනා නගා වරදකරු කර ඇති බව තහවුරු වේ.

පැ-24 සහ පැ-25 දරණ චෝදනාපත්‍රය මත පදනම් වූ LGL/DIU/15/2582 හා LGL/DIU/16/2585 දරණ විනය පරීක්ෂණ,

පැ-24 දරණ චෝදනා පත්‍රය මගින් අලව්ව එම්. එම්. එන්. එස්. බී. මාපා ගුණරත්න පිරවුම්හලේ බෙදුම්කාරත්වය දිසානායක එන්ටප්‍රයිසස් නමින් පවරා දීමට අදාල ක්‍රියාවලියේදී චමින්ද සමරකෝන් මහතා නිසි ක්‍රියාමාර්ග නොගැනීමට අදාලව චෝදනා 5 ක් මත විනය පරීක්ෂණ පවත්වා ඇත. පැ-80 දරණ විනය පරීක්ෂණ වාර්තාවට අනුව එස්. එම්. සී. පී. සමරකෝන් මහතා සියලු චෝදනා වලින් නිදහස් කර ඇත.

පැ-25 දරණ චෝදනාපත්‍රය මගින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධීක්ෂණය යටතේ තිබෙන පිරවුම්හල් වල සිදු කරන වංචාකාරී ක්‍රියා සහ අකටයුතුකම් පිළිබඳව අධීක්ෂණය කළ යුතු ප්‍රාදේශීය පරිපාලකවරුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග නොගැනිමෙන් චමින්ද සමරකෝන් මහතා විසින් බරපතල වරදක් කර ඇති බවට වන පදනමින් චෝදනා 5 ක් නගා ඇත. එකී චෝදනාවලට අදාලව පැවති විනය පරීක්ෂණයෙන් පසුව චමින්ද සමරකෝන් මහතා නිවැරදිකරු

බවට තීරණය කර ඇති බව පැ-88 දරණ පරීක්ෂණ වාර්තාව අනුව පෙනී යයි.

පැ-24 සහ පැ-25 චෝදනා පත්‍රවල නගා ඇති චෝදනා සලකා බැලීමේදීද පෙනී යන්නේ සාධාරණ පදනමක් නොමැතිව චමින්ද සමරකෝන් මහතාට එරෙහිව චෝදනා රාශියක් නගා ඒ මත විනය පරීක්ෂණ ගණනාවක් පවත්වා, ඇති බවත්ය. මෙම පැ-24 සහ පැ-25 චෝදනා පත්‍රමත පදනම් වූ විනය පරීක්ෂණ මගින්ද චමින්ද සමරකෝන් මහතාව දුෂ්කරතාවයට හා පීඩාවට ලක්කොට දේශපාලන වශයෙන් පළිගැනීම සිදු කර ඇති බව තහවුරු වේ.

චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂිය මගින් පැ-77 විනය පරීක්ෂණ වාර්තාව සහ පැ-80 විනය පරීක්ෂණ වාර්තාව සසඳා බැලීමේදී නිරවද්‍යතාවය පිළබඳ සැකයක් ඇති බවට පවසා ඇත. පැ-23 චෝදනා පත්‍රය මත පදනම් වූ විනය පරීක්ෂණ වාර්තාව පැ-77 වේ. එහි පරීක්ෂණ නිළධාරියා කේ. සී. ජයරත්න මහතා බව සඳහන් කරමින් අත්සනක් තබා ඇත. පැ-24 චෝදනා පත්‍රය මත පදනම් වූ විනය පරීක්ෂණ වාර්තාව පැ-80 වේ. එහි පරීක්ෂණ නිළධාරියා කේ. සී. ජයරත්න මහතා බව සඳහන් කරමින් අත්සනක් තබා ඇත. පැ-77 හා පැ-80 විනය පරීක්ෂණ වාර්තා දෙකෙහි කේ. සී. ජයරත්න මහතාගේ අත්සන ලෙස ඇති අත්සන් දෙක බැලූ බැල්මටම එකිනෙකට වෙනස් බව නිරීක්ෂණය වේ.

මෙම විමසීමේදී සාක්ෂි ලබාදුන් සංස්ථා හිටපු සභාපති සහ හිටපු අග්‍රාමාත්‍ය ලෙකම් එස්. අමරසේකර මහතාගේ අවධානයට පැ-77 සහ පැ-80 දරණ විනය පරීක්ෂණ වාර්තා දෙක යොමු කර ඇත. කේ. සී. ජයරත්න මහතා සමග ඔහු සමීපව වැඩ කර ඇති බවත්, ඒ හේතුවෙන්

කේ. සී. ජයරත්න මහතාගේ අත්සන දුටු විට හඳුනා ගැනීමට හැකි බවත්, සාක්ෂි දෙමින් කියා ඇත. පැ-77 සහ පැ-80 දරණ විනය පරීක්ෂණ වාර්තා දෙකෙන් පැ-80 වාර්තාවේ තිබෙන්නේ කේ. සී. ජයරත්න මහතාගේ අත්සන බවට එස්. අමරසේකර මහා විසින් හඳුනාගෙන ඇත. පැ-77 වාර්තාවේ අත්සන ඔහුට හුරු පුරුදු කේ. සී. ජයරත්න මහතාගේ අත්සන නොවන බවට ඔහු විසින් ප්‍රකාශ කර ඇත. කේ. සී. ජයරත්න මහතාගේ අත්සන යැයි හඳුනාගත් පැ-80 පරීක්ෂණ වාර්තාව අනුව පැ-24 චෝදනා පත්‍රයේ ඇති චෝදනා වලින් චමින්ද සමරකෝන් මහතා නිදොස් කර ඇත. කේ. සී. ජයරත්න මහතාගේ අත්සන වශයෙන් හඳුනාගත නොහැකි බවට ඔහු විසින් සඳහන් කරන ලද පැ-77 පරීක්ෂණ වාර්තාව අනුව පැ-23 චෝදනාපත්‍රයේ චෝදනා වලට චමින්ද සමරකෝන් මහතා වැරදිකරු කර ඇත. එකී සාක්ෂි අනුව පැ-77 දරණ විනය පරීක්ෂණ වාර්තාවේ අත්සන් තබා ඇත්තේ කේ. සී. ජයරත්න මහතා විසින්මදැයි සාධාරණ සැකයක් ඇති වෙයි. කේ. සී. ජයරත්න මහතා පරීක්ෂණ කටයුතු සඳහා පැමිණීමේදී ඔහුට සහයවීම සඳහා ඔහුගේ ඥාති පුත්‍රයෙකු වූ චරිත් නිලංග යන අය හට සංස්ථාවේ සභාපතිව සිටි මෙම විමර්ශනයට නම් කළ 3 වන වගඋත්තරකාර ටී. ජී. ජයසිංහ මහතා විසින් රැකියාවක් ලබා දී ඇති බවට චමින්ද සමරකෝන් මහතා සාක්ෂි ලබා දී ඇත. ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැ-79 දරණ පැමිණිල්ල සිදු කල බවද සඳහන් කර ඇත. ටී. ජී. ජයසිංහ මහාතා ඔහුගේ සාක්ෂිය මගින් එකී චරිත් නිලංග යන අයට රැකියාවක් ලබා දුන් බව පිළිගත්තත් එය නිසි සුදුසුකම් සලකා බලා ලබා දුන් රැකියාවක් බවත්, ඔහු කේ. සී. ජයරත්න මහතාගේ ඥාතියෙක් බව නොදැන සිටි බවත් කියා ඇත. කෙසේ නමුත් චරිත්

නිලංග යන අයෙකු ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ රැකියාවක් ලැබුණු බවත්, ඔහු දැනට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවය කරන බවත් තහවුරු වේ.

වමින්ද සමරකෝන් මහතාගෙන් දේශපාලනිකව පලිගැනීමට ක්‍රියා කරන පිරිස් වමින්ද සමරකෝන් මහතා සම්බන්ධව දූෂණ චෝදනා පවතින බවට විවිධ ආයතන වලට කරුණු දක්වමින් ඔහුව පීඩාවට පත්කිරීමට ක්‍රියා කරන බවට වමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂියේදී කියා ඇත. එකී කරුණට අදාලව පැ-107 ලේඛනය සාක්ෂිය මගින් ඉදිරිපත් කර ඇත. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2014 වර්ෂය සඳහා රුපියල් මිලියන 32.9 ක මුදලක් සමාජ සුභසාධන කාර්යයන් සඳහා වියදම් කළ ආකාරය පිළිබඳව ඛනිජ තෙල් නීතිගත සංස්ථවේ සේවකයෙකු වන ඒ. එල්. ආනන්ද මහතා තොරතුරු දැන ගැනීමේ පනත ප්‍රකාරව ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉල්ලීමක් කර ඇත. සංස්ථාව විසින් එකී ඉල්ලීම අනුව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව ඒ. එල්. ආනන්ද මහතා විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවට ඉල්ලීමක් කර ඇත. ඒ අනුව සංස්ථාව විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිසම ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීමට නිලධාරීන්ගෙන් සමන්විත පොදු අධිකාරියක් පත්කර ඇත. පැ-107 ලෙස ලකුණු කර ඇත්තේ එකී කොමිෂන් සභාවේදී ලබාදෙන ලද නියෝගය ඇතුලත් කාර්ය සටහනක් වේ.

වමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂිය මගින් කියා ඇත්තේ ඒ. එල්. ආනන්ද යන තොරතුරු ඉල්ලීම සිදු කළ තැනැත්තා ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ ඛනිජ තෙල් පොදු සේවක සංගමයේ උප සභාපතිවරයෙකු බවත්, ඔහු සහ ඊට සහය දක්වන නිළධාරීන් එක් වී

සැළසුම්සහගතව මෙම ක්‍රියාව කර ඇති බවත්, විවිධ ආයතන මට්ටමෙන් දූෂණ චෝදනා වලට අදාලව චමින්ද සමරකෝන් මහතාගේ නම සටහන් කිරීමේ අපේක්ෂාවෙන් එකී කටයුතු කර ඇති බවත්, පෙන්වා දී ඇත.

පැ-107 ලේඛනයේ පැ-107(II) ලෙස ලකුණු කළ කොටස අනුව සංස්ථාවේ පොදු අධිකාරිය සඳහන් කර ඇත්තේ කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ නඩු දෙකක් පවතිනන බවත්, එකී කරුණු ආශ්‍රිතව තවත් පරීක්ෂණයන් මූල්‍ය අපරාධ විමර්ශන අංශය හරහා සිදු කෙරෙන බවත්ය. පැ-107(III) අනුව මුදල් වියදම් කිරීම නීත්‍යානුකූල නොවන පරිදි සිදු කළ නිළධාරීන් කවුරුන්දැයි පොදු අධිකාරියෙන් විමසීමේදී අලෙවි කළමණාකාර ධූරය දැරූ පුද්ගලයින් නීත්‍යානුකූල නොවන ලෙස මුදල් වියදම් කිරීම හා තවත් නීත්‍යානුකූල නොවන කටයුතු නිසා සේවයෙන් පහ කර ඇති බව සඳහන් කර ඇත. චමින්ද සමරකෝන් මහතා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවි කළමණාකාර (සිල්ලර) වශයෙන් කටයුතු කරමින් සිටියදී සේවයෙන් පහකර ඇත. ඒ අනුව මෙකී සඳහන් කිරීම පොදු අධිකාරය විසින් සිදු කරනු ලබන්නේ චමින්ද සමරකෝන් මහතා පිළිබඳව බව පෙනී යයි. චමින්ද සමරකෝන් මහතාගේ සාක්ෂිය අනුව ඔහුව සේවයෙන් නෙරපීම පිළිබඳව පැ-28 දරණ පැමිණිල්ල මත කම්කරු විනිශ්චයාධිකරණයේ නඩුවක් පවතින බවත්, හිඟ වැටුප් දීමනා ලබා ගැනීම සඳහා පැ-29 දරණ පැමිණිල්ල කම්කරු කො◌ාමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඇති බවත් පෙනී යයි. ඒ අනුව මෙම නඩුකර දෙකම මූල්‍ය කටයුතු හෝ මූල්‍ය වංචාවලට අදාල නඩුකර නොවන බව නිරීක්ෂණය වේ.

පැ-107 හි පැ-107(IV) ලෙස ලකුණු කළ කොටසේ දැක්වෙන ආකාරයට නීත්‍යානුකූල නොවන අයුරින් මුදල් වියදම් කළ අයගෙන්

එම මුදල් අයකර ගැනීමට ක්‍රියා කර ඇතිදැයි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කිරීමේදී සංස්ථාවේ පොදු අධිකාරිය විසින් ප්‍රකාශ කර ඇත්තේ සංස්ථාවට නීත්‍යානුකූල නොවන කටයුතු හේතුකොට ගෙන මූල්‍යමය වශයෙන් අලාභයක් සිදු වී නොමැති බවත්, එබැවින් එලෙස වගකිවයුත්තන්ගෙන් කිසිදු මුදලක් අය කිරීමක් සිදු කර නොමැති බවත්ය. ඒ අනුව පැහැදිලි වන්නේ චෝදනාවට ලක්කරන ලද නිළධාරීන් මගින් මූල්‍ය අපරාධ සිදු වී ඇති බවට චෝදනා නැගුවද එකී නිළධාරීන් විසින් මූල්‍යමය අලාභයක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත සිදු කර නොමැති බවත්ය. මෙහිදී තවදුරටත් තහවුරු වනුයේ චමින්ද සමරකෝන් මහතා විසින් කිසිදු ආකාරයකින් නිශ්චිතව, මූල්‍යමය වශයෙන් අගතියක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුකර නොතිබියදී ද්වේශසහගත ලෙස චෝදනාවන් ඉදිරිපත් කර ඇති බවයි. එසේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව ඉදිරියේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පොදු අධිකාරිය විසින් සඳහන් කරන ලද කරුණු පිළිබඳව චමින්ද සමරකෝන් මහතා විසින් පැ-108(I),(II),(III) ලිපි මගින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් විමසීමක් සිදුකර ඇති බවත්, නිරීක්ෂණය වේ.

චමින්ද සමරකෝන් මහතා විසින් ඔහුව අවිධිමත් හා නීතිවිරෝධී අයුරින් සේවයෙන් පහ කිරීමට එරෙහිව කරුණු නැවත සලකා බලන ලෙස පැ-115(I) දරණ ඉල්ලීම උතුරු මැද පළාත් ආණ්ඩුකාර සරත් ඒකනායක මහතා මගින් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත සිදු කර ඇත. එකී ලිපියට අදාලව පැ-114 දරණ පිළිතුරු ලිපිය ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් යොමු කර ඇත. එකී පැ-114

ලිපියේ 8 වන ඡේදය මගින් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව මුදල් අක්‍රමිකතා සම්බන්ධව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ හා අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ විමර්ශන පවතින බවට විමර්ශන අංක කිහිපයක් දක්වා ඇත. මෙහිදී මෙම මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට හෝ අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිසමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පැමිණිලි සිදුකල බවක්, දක්වා නොමැත. එසේම සඳහන් කර ඇති විමර්ශන අංක වලට අදාල විමර්ශන චමින්ද සමරකෝන් මහතා මූලික කරගෙන සිදු කරන්නේද යන්න හෝ එම නඩු කටයුතු චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පවතින බවට හෝ කරුණු අනාවරණය වීමක් ද සිදු නොවේ.

පැ-113 ලිපිය මගින්ද කළමණාකාර අධ්‍යක්ෂකවරයා විසින් ඉහත සඳහන් කළ පරිදිම අපරාධ මූල්‍ය කොට්ඨාශයේ හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ විමර්ශන ඇති බවට දක්වා ඇත. ඒ පිළිබඳව ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආයතනික මට්ටමින් කරුණු තහවරු කර ගැනීමක් සිදු කර නොමැති බවද පෙනී යයි. මෙහිදී පෙනී යන්නේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මූල්‍ය අක්‍රමිකතාවයක් හෝ මූල්‍ය අපරාධයක් සිදු වී ඇති බවට චමින්ද සමරකෝන් මහතාට එරෙහිව මූල්‍ය අපරාධ කොට්ඨාශයට හෝ අල්ලස් කොමිසමට පැමිණිලි කිරීමක් සිදුකර නොතිබියදී තහවරු කර නොගන්නා ලද බාහිර පාර්ශවයන්ගේ පැමිණිලි මත චමින්ද සමරකෝන් මහතාට එරෙහිව චෝදනා නැගීම වැරදි සහගත බව නිරීක්ෂණය වේ. මෙලෙසට චමින්ද සමරකෝන් මහතාට එරෙහිව නගන චෝදනා ද්වේශසහගතව, ඔහුව පීඩාවට හා දුෂ්කරතාවයට පත්කිරීමේ අරමුණෙන් සිදු කර ඇති බව තහවුරු වේ.

චමින්ද සමරකෝන් මහතා විසින් නැවත ඔහු සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉල්ලීම සිදු කළ අවස්ථා වලදී, චමින්ද සමරකෝන් මහතා නැවත සේවයේ පිහිටුවීමට විරෝධය පලකරමින් බාහිර පාර්ශවයන් විසින් යයි සඳහන් පැමිණිලි, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් වී ඇත. ඒ ආකාරයට පැ-109(I) දරණ එන්තරවාසිය අශෛපුස්ස, පී. එන්. එස්. බේකර්ස් හි පදිංචි වරුණ ආර් රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි යයි සඳහන් කරමින් ශානිකා සිල්වා නීතිඥවරියයැයි සඳහන් අය විසින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉදිරිපත් කර ඇත. චමින්ද සමරකෝන් මහතා විසින් සාක්ෂි ලබා දීමේදී පැ-109(I) දරණ එන්තරවාසියේ සේවාදායකයා යැයි නම් සඳහන් වූ අයගෙන් ලබාගත් දිවුරුම් ප්‍රකාශයක් පැ-109(III) ලෙස ඉදිරිපත් කර ඇත. රාජපක්ෂ ආරච්චිලාගේ වරුණ රවීන්ද්‍ර රාජපක්ෂ යන අය විසින් චමින්ද සමරකෝන් මහතා සම්බන්ධයෙන් එන්තරවාසියක් හෝ වෙනත් කිසිදු ලියවිල්ලක් සැකසීමට නීතිඥවරයෙකුට හෝ වෙනත් කිසිදු අයෙකුට උපදෙස් ලබා දී නොමැති බවත්, පැ-109(III) දිවුරුම් ප්‍රකාශයෙන් කියා ඇත. ඒ අනුව ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුළ සිටින යම් පාර්ශවයන් විසින් සැලසුම් සහගත ලෙස පැ-109(I) දරණ එන්තරවාසිය සහ තවත් සාවද්‍ය පැමිණිලි චමින්ද සමරකෝන් මහතා ඉලක්කකර ගනිමින් යොමු කරන ලද බව තහවුරු වේ.

එම්. ඩිල්ෂාන් පීරිස් යන අයෙකුද නීතිඥ ජී. එල්. මල්කාන්ති යන අයෙකු මගින් 2019.8.1 දිනැති එන්තරවාසිය මගින්, චමින්ද සමරකෝන් මහතා නැවත සේවයට බඳවා ගතහොත් සංස්ථාව හා එම්. ඩිල්ෂාන් පීරිස් යන අය හා සම්බන්ධ නඩුවේදී එම්. ඩිල්ෂාන් පීරිස් යන අයට අගතියක් සිදුවන බවට දක්වා ඇත. එකී එන්තරවාසියෙන් අසත්‍ය

කරුණු දැක්වීම සම්බන්ධව චමින්ද සමරකෝන් මහතා විසින් පැ-110(I) ලිපිය මගින් එම්. ඩිල්ෂාන් පීරිස් යන අයගෙන් කරුණු විමසා ඇති අතර අසත්‍ය චෝදනාව සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවටද දන්වා ඇත. ඒ අනුව පැ-110(III) ලිපිය මගින් එම්. ඩිල්ෂාන් පීරිස් විසින් යොමු කළ එන්තරවාසිය පිළිබඳව ඉදිරියට ක්‍රියා නොකරන බවට එම්. ඩිල්ෂාන් පීරිස් විසින් සංස්ථා සභාපති වෙත දැනුම් දී ඇත. ඒ අනුව පැහැදිලි වන්නේ ඛණිජ තෙල් නීතිගත සංස්ථාව තුළ සිටින යම් පාර්ශවයන් විසින් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව චෝදනා සහ අවලාද නැගීම සඳහා බාහිර පාර්ශවයන් පොළඹවා ගනිමින් අසාධාරණ සහ ද්වේශසහගත අයුරින් ක්‍රියා කර ඇති බවත්ය.

චමින්ද සමරකෝන් මහතා සාක්ෂි ලබා දීමේදී පැ-112 වශයෙන් හඬ පටයක් ඉදිරිපත් කර ඇත. එකී පැ-112 දරණ හඬ පටය කොමිෂන් සභාව ඉදිරියේ වාදනය කිරීමේදී යම් අයෙකු චමින්ද සමරකෝන් මහතාව සේවයෙන් පහ කරනු ලැබුයේ තමන් විසින් බවට ප්‍රකාශ කරන බව නිරීක්ෂණය විය. චමින්ද සමරකෝන් මහතා සිය සාක්ෂියේදී සඳහන් කර ඇත්තේ එලෙසට ප්‍රකාශයක් කර ඇත්තේ එච්. පී. ආර්. ආරියරත්න යන ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ස්වාධීන නිදහස් සේවක සංසදයේ 2015 වර්ෂයේ කාරක සභිකයෙකු ලෙස සිටි බවත්, ඒ බව තහවරු කිරීමට පැ-111 ලේඛනයද ඉදිරිපත් කරන බවත් කියා ඇත.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කර ඇත්තේ වර්ෂ 2016.12.29 දිනදීය. චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීම සිදු කර ඇත්තේ එවකට

සභාපතිව සිටි ටී. ජී. ජයසිංහ මහතා විසින්ය. සේවයෙන් පහ කිරීමේ ලිපිය පැ-26 ලෙස ඉදිරිපත් කර ඇත. පැ-22 සහ පැ-23 චෝදනාපත්‍ර වල සඳහන් චෝදනා වලට චමින්ද සමරකෝන් මහතා වැරදිකරු වී ඇති බැවින්, ඔහුව වහා සේවයෙන් පහ කිරීමට සුදුසු බවට නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) විසින් පැ-78 දරණ 2016.12.21 දිනැති වාර්තාව මගින් සභාපති සහ කළමණාකරන අධ්‍යක්ෂකවරයා වෙත යෝජනා කර ඇත. පැ-78 ලිපිය මගින් ඔහුට එරෙහිව පැ-24 හා පැ-25 දරණ චෝදනාපත්‍ර වලට අදාල විනය පරීක්ෂණ තවදුරටත් පැවැත්වෙන බව දන්වා ඇත. 3 වන වගඋත්තරකාර ටී. ජී. ජයසිංහ මහතා විසින් ලබා දී ඇති පැ-26 දරණ සේවයෙන් පහ කිරීමේ ලිපියෙහිද, පැ-24 හා පැ-25 දරණ චෝදනාපත්‍ර මත විනය පරීක්ෂණ සඳහා තව දුරටත් චමින්ද සමරකෝන් මහතාට ඉදිරිපත් විය හැකි බව දන්වා ඇත.

පැ-26 දරණ ලිපිය ප්‍රකාරව චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීමෙන් අනතුරුව පැවැත්වීමට සැලසුම් කර තිබූ පැ-25 චෝදනාපත්‍රය මත වූ විනය පරීක්ෂණයට ඔහු සහභාගී නොවුනහොත් ඔහුට එරෙහිව ඒකපාර්ශවිකව විනය පරීක්ෂණය පවත්වන බවට දක්වා ඇති බව පැ-81 දරණ විනය පරීක්ෂණ කාර්ය සටහන සහ පැ-81A දරණ සංස්ථාවේ සභාපතිවරයාගේ ලිපිය අනුව පෙනී යයි. පැ-25 දරණ චෝදනාපත්‍රය මත විනය පරීක්ෂණය ඉතා කඩිනමින් අවසන් කිරීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ක්‍රියා කරන අයුරු පැ-82 සහ පැ-83 දරණ විනය පරීක්ෂණ කාර්ය සටහන් අනුවද නිරීක්ෂණය වේ. ඒ අනුව චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීමෙන් පසුවද පැවති විනය පරීක්ෂණ වලදී චමින්ද සමරකෝන් මහතාට සහභාගීවීම සඳහා ලබා දෙන ලද දිනයේදී විනය පරීක්ෂණයට

නොපැමිණියහොත් එය ඒකපාර්ශවිකව පැවැත්වීමට සහ පවත්වන විනය පරීක්ෂණය දින කිහිපයක් තුළදී ඉතා කඩිනමින් අවසන් කිරීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති ප්‍රමුඛ නිළධාරීන් ප්‍රයත්න දරා ඇති බව නිරීක්ෂණය වේ. එය චමින්ද සමරකෝන් මහතා දැඩි පීඩාවකට හා දුෂ්කරතාවයකට පත් කිරීමේ ප්‍රයත්නයක් බවද නිරීක්ෂනය වේ.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයෙකුට අදාල විනය ක්‍රියාමාර්ග සංස්ථාවේ විනය බලධාරියා වන සභාපතිවරයා විසින් ක්‍රියාත්මක කළයුතු වන්නේ පැ-44 ලෙස ලකුණු කල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විනය රීති මාලාව අනුව වේ. පැ-44 විනය රීති මාලාවේ අංක. 9 යටතේ වැඩ තහනම් කිරීම පිළිබඳව දැක්වේ. 9(අ) වගන්තිය අනුව සංස්ථාවේ සේවකයෙකුට එරෙහිව ඇති විනය ක්‍රියාමාර්ග අවසන් වනතෙක් සිදුකල හැක්කේ එම නිලධාරියා වැඩ තහනමකට ලක් කිරීම බව නිරීක්ෂණය වේ. නමුත් වර්ෂ 2016.12.29 වන දින පැ-26 දරණ සේවයෙන් පහ කිරීමේ ලිපියෙන් පැ-22 හා පැ-23 චෝදනාපත්‍ර මත විනය පරීක්ෂණ වලදී චමින්ද සමරකෝන් මහතා චෝදනාවලට වරදකරු වීමේ පදනම මත දඬුවම වශයෙන් සේවයෙන් පහ කර ඇත. ඒ අනුව විනය පරීක්ෂණ 5 න් පැ-24 සහ පැ-25 දරණ චෝදනාපත්‍ර මත වූ විනය පරීක්ෂණ අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය වේ. ඒ අනුව විනය පරීක්ෂණ සියල්ල අවසන් වීමට පෙර චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීම විනය රීති මාලාවට පටහැණි වන අතර, එය නීත්‍යානුකූල නොවන බවද තහවුරු වේ.

පැ-44 දරණ විනය රීති මාලාව අනුව විනය පරීක්ෂණ, විනය ක්‍රියා පටිපාටියේ 2 වන වගන්තියේ සඳහන් වන අරමුණු මුදුන් පමුණුවා ගන්නා ආකාරයට පැවැත්විය යුතු වේ. ඒ අනුව 2(අ) මගින් කාර්ය

පටිපාටියේ සරල බව හා සමානතාව, 2(ආ) මගින් සාධාරණ ක්‍රියා පටිපාටිය පිළිපැදීම, 2(ඇ) මගින් ස්වභාවික නීතියට අවනත වීම යන අරමුණු මුදුන් පමුණුවාගත යුතු බව දක්වා ඇත. එසේ වුවද විනය පරීක්ෂණ 3 ක් අවසානයේ චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීමත්, සේවයෙන් පහ කිරීමෙන් අනතුරුව අනෙක් විනය පරීක්ෂණ දෙක පවත්වාගෙන යාමෙන් කාර්ය පටිපාටියේ සමානතාව, සාධාරණ කාර්ය පටිපාටිය පිළිපැදීම හා ස්වභාවික නීතියට අවනත වීම යන අරමුණු උල්ලංඝනය වන ආකාරයට 3 වන වගඋත්තරකාර හිටපු සභාපති ටී. ජී. ජයසිංහ මහතා සහ විනය පරීක්ෂණ පැවැත්වූ නිළධාරීන් විසින් ක්‍රියාකර ඇති බව තහවරු වේ.

පැ-44 විනය රීති මාලාවේ 1 වන වගන්තිය අනුව විනය පරීක්ෂණයක් පැවැත්විය හැක්කේ සංස්ථාවේ සේවකයෙකු සම්බන්ධයෙන් පමණි. පැ-26 දරණ සේවයෙන් පහ කිරීමේ ලිපිය චමින්ද සමරකෝන් මහතාට ලබා දුන් අවස්ථාවේ සිට ඔහු සංස්ථාවේ සේවකයෙකු නොවේ. ඒ අනුව පැ-24 සහ පැ-25 චෝදනාපත්‍ර මත විනය පරීක්ෂණ පැවැත්වීම නීත්‍යානුකූල නොවන බව තහවරු වේ.

චමින්ද සමරකෝන් මහතා සම්බන්ධයෙන් පැවති පැ-21, පැ-22, පැ-23, පැ-24 සහ පැ-25 දරණ චෝදනාපත්‍ර සියල්ල මත විනය පරීක්ෂණ සියල්ල අවසන් කිරීමට පෙර චමින්ද සමරකෝන් මහතා සංස්ථා සේවයෙන් පහ කිරීම පැ-44 විනය රීති මාලාවට පටහැණි ක්‍රියාවක් හා නීත්‍යානුකූල නොවන ක්‍රියාවක් බව තහවුරු වේ. විනය රීති මාලාවේ 2 වන වගන්තියේ දැක්වෙන අරමුණු වලට පටහැණි ආකාරයට විනය පරීක්ෂණ පැවැත්වීම සහ සේවයෙන් පහකල පසුව 1 වන වගන්තිය අනුව තව දුරටත් සේවකයෙකු නොවන අයෙකු වූ චමින්ද සමරකෝන් මහතා සම්බන්ධ විනය පරීක්ෂණ පැවැත්වීමද විනය රීති මාලාවට

පටහැණි හා නීත්‍යානුකූල නොවන ක්‍රියාවක් බව තහවුරු වේ. ඒ අනුව චමින්ද සමරකෝන් මහතාට අදාල විනය පරීක්ෂණ පැවැත්වීම හා සේවයෙන් පහ කිරීම ද්වේශයෙන් යුතුව දේශපාලන වශයෙන් පළිගැනීම සඳහා සිදුකළ ක්‍රියාවක් බව තහවුරු වේ.

චමින්ද සමරකෝන් මහතා විසින් ඔහුව සේවයෙන් පහකළ පසුව කම්කරු විනිශ්චය සභාවට පැමිණිල්ලක් ඉදිරිපත්කර ඇත. එහිදී චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීමෙන් පසුව පවත්වන ලද පැ-24 සහ පැ-25 චෝදනාපත්‍ර මත පදනම් වූ විනය පරීක්ෂණ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පදනම් වී ක්‍රියා නොකරන බවට කම්කරු විනිශ්චය සභාව හමුවේ වාර්තා කර ඇති බව පැ-116(I), පැ-116(II) දරණ කම්කරු විනිශ්වයාධිකරණයේ කාර්ය සටහන් අනුව නිරීක්ෂණය වේ.

චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීමෙන් පසු ඔහු සම්බන්ධව පැවති විනය පරීක්ෂණ වල සාක්ෂි සහ ලේඛන නැවත විමර්ශනය කර පැ-119 දරණ පරීක්ෂණ වාර්තාව විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අනුර රණසිංහ මහතා විසින් සංස්ථා සභාපති නීතිඥ සුමිත් විජේසිංහ මහතාට ඉදිරිපත් කර ඇත. එකී පැ-119 පරීක්ෂණ වාර්තාව විමසා බැලීමේදී චමින්ද සමරකෝන් මහතා චෝදනාවලට වරදකරු වූ පැ-22 සහ පැ-23 යන චෝදනාපත්‍ර වලට අදාල විනය පරීක්ෂණ කටයුතු නිරීක්ෂණයට හා විමර්ශනයට ලක්කර ඇති බව පෙනී යයි. විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අනුර රණසිංහ මහතා විසින් සිය නිර්දේශයේ සඳහන් කර ඇත්තේ විනය පරීක්ෂණ වලදී පැමිණිල්ලේ කරුණු පටු විශ්ලේෂණයකින් යුක්තව මෙන්ම චූදිත චමින්ද සමරකෝන් මහතාගේ නිරවද්‍යතාවය පිළිබඳ ඉදිරිපත් වූ කරුණු සහ ලේඛන නිසි ඇගැයීමකට ලක් නොකර තීරණයකට එළඹ

ඇති බවත්, එකී ක්‍රියාවලිය ස්වභාවික යුක්තිධර්ම රීතියට පටහැණිව සිදු කර ඇති බවත්ය. එසේම පැ-119 පරීක්ෂණ වාර්තාව මගින් චමින්ද සමරකෝන් මහතා නැවත සේවයේ පිහිටුවීම සඳහා කර ඇති නිර්දේශය නිවැරදි නිර්දේශයක් බවට මෙම කොමිෂන් සභාවද නිරීක්ෂණය කරනු ලබයි.

හිටපු සභාපති 2 වන වගඋත්තරකාර ජේ. ආර්. වික්‍රමසිංහ විසින් පැ-12 මගින් චමින්ද සමරකෝන් මහතාගේ රැකියා ස්ථානය මාරු කිරීම සිදුකළ අවස්ථාවේදී, එය අසාධාරණ සේවා ස්ථාන මාරු කිරීමක් යන පදනමෙන් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් චමින්ද සමරකෝන් මහතා විසින් පැ-13 දරණ පෙත්සම මත අංක. SC FR 135/15 දරණ මූලික අයිතිවාසිකම් නඩුව පවරා ඇත. එම නඩුව කැඳවීම සඳහා දින ලබා දී තිබියදී, ඒ අතරතුර වර්ෂ 2015.8.18 වන දින පැ-15 දරණ ලිපිය මගින් හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතා විසින් චමින්ද සමරකෝන් මහතාගේ වැඩ තහනම් කිරීමට ක්‍රියාකර ඇත. අනතුරුව නීතිඥ උපදෙස් මත ක්‍රියාත්මක වෙමින් චමින්ද සමරකෝන් මහතා විසින් ස්ථාන මාරු කිරීම අභියෝගයට ලක් කරමින් පැවරූ පැ-13 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම ඉල්ලා අස්කර ගනිමින් අසාධාරණ ලෙස වැඩ තහනම් කිරීමට එරෙහිව පැ-20 දරණ පෙත්සම මත SC FR 417/15 දරණ මූලික අයිතිවාසිකම් නඩුව පවරා ඇත. එම මූලික අයිතිවාසිකම් නඩුව පවතින අතරතුරදී වර්ෂ 2016.12.29 වන දින පැ-26 දරණ සේවයෙන් පහ කිරීමේ ලිපිය මගින් හිටපු සභාපති 3 වන වගඋත්තරකාර ටී. ජී. ජයසිංහ මහතා විසින් චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහකර ඇත. එහිදී චමින්ද සමරකෝන් මහතා ඔහුගේ වැඩ තහනමට එරෙහිව පැවරූ SC FR

417/15 දරණ මූලික අයිතිවාසිකම් නඩුව ඉල්ලා අස්කරගත් බව පැ-27 නියෝගය අනුව පෙනී යයි.

අනතුරුව අසාධාරණ ලෙස සේවයෙන් පහ කිරීම අභියෝගයට ලක් කරමින් පැ-28 දරණ පැමිණිල්ල කම්කරු විනිශ්චයාධිකරණය වෙත ඉදිරිපත් කර දැනට එම නඩුව විමසීම සඳහා ගෙන ඇති බව නිරීක්ෂණය වේ. චමින්ද සමරකෝන් මහතාගේ වැඩ තහනම් කළ කාල සීමාවට අදාලව හිඟ වේතන ඉල්ලා පැ-29 දරණ පැමිණිල්ල කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඇති බව පෙනී යයි. තවද චමින්ද සමරකෝන් මහතා විසින් ඔහුව අසාධාරණ ලෙස සේවා ස්ථාන මාරු කිරීම, වැඩ තහනම් කිරීම හා සේවයෙන් පහ කිරීම සම්බන්ධව සාධාරණයක් ඉෂ්ඨ කර දෙන ලෙසට 2019.11.8 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ, විපක්ෂ නායක කාර්යාලයේ ඔම්බුඩ්ස්මන් ඒකකයටද පැමිණිල්ලක් කර ඇත. ඒ අනුව ඔහුගේ සේවා ස්ථාන මාරු කිරීම, වැඩ තහනම් කිරීම හා සේවයෙන් පහ කිරීම යන අසාධාරණ ක්‍රියාවන්ට එරෙහිව සාධාරණත්වය අපේක්ෂාවෙන් පැ-13, පැ-20, පැ-28, පැ-29 සහ පැ-117 ලේඛනවල දැක්වෙන පරිදි ක්‍රියාමාර්ග වලට දිගින් දිගටම අවතීර්ණ වී ඇති බවද නිරීක්ෂණය වේ.

මෙම විමසීම සඳහා සහභාගී වෙමින් 2 වන වගඋත්තරකාර හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතා විසින් සාක්ෂි ලබා දී ඇත. ඔහුගේ ස්ථාවරය වී ඇත්තේ චමින්ද සමරකෝන් මහතා සම්බන්ධව මූල්‍ය වංචා සහ අක්‍රමිකතාවයන් රාශියක් සිදු කළ බවට පැමිණිලි ලැබී තිබූ හෙයින් ස්ථාන මාරු කිරීමට හා වැඩ තහනම් කිරීමටත්, චෝදනා පත්‍ර කිහිපයක් ලබා දීමටත්, ඔහු විසින් කටයුතු කළ බවත්ය. ජේ. ආර්. වික්‍රමසිංහ මහතාගේ ස්ථාවරය වී ඇත්තේ චමින්ද සමරකෝන්

මහතාට එරෙහිව දේශපාලන වශයෙන් පළිගැනීමක් සිදු නොකළ බවත්ය.

ඉන්ධන පිරවුම්හලකින් බදු මුදල් වශයෙන්, මාසිකව රු. 400,000/- පමණ මුදලක් අයකර ගැනීම  අසාධාරණ ය, යන පදනමෙන් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව නැගූ චෝදනාවද සාධාරණ බවට හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතා සිය සාක්ෂියේදී කියා ඇත. ජේ. ආර්. වික්‍රමසිංහ මහතා හරස් ප්‍රශ්න වලට ලක්කරමින්, සංස්ථාව සතු ඉඩම, ගොඩනැගිල්ලක් හා උපකරණ සහිත ඉන්ධන පිරවුම්හලක් කිසිදු බදු මුදලක් අයකර නොගෙන බෙදුම්කරුවෙකුට ලබා දීම මගින් සංස්ථාවට පාඩුවක් සිදුවන්නේදැයි විමසීමේදී එවැන්නක් සංස්ථාවට පාඩුවක් වන බවට ඔහු විසින් කියා ඇත.

චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පැ-7 හි අංක. 4 යටතේ නීත්‍යානුකූල නොවන ලෙස බදු මුදල් අයකිරීමට අදාල පැමිණිල්ල සම්බන්ධයෙන් ජේ. ආර්. වික්‍රමසිංහ මහතා සාක්ෂි ලබා දුන්නද, ඒ පිළිබඳව චෝදනා පත්‍රයක් හෝ ඉදිරිපත් කර නොමැති බවත්, එය අසාධාරණ සහ පදනම් විරහිත චෝදනාවක් බවත්, නිරීක්ෂණය වේ. සංස්ථාවට හිමිවිය යුතු බදු මුදල් අයකර දීමට චමින්ද සමරකෝන් මහතා ක්‍රියා කර ඇත්නම් එය ඇගයීමට ලක්විය යුතු කරුණක් මිස වරදකාරී චෝදනාවක් නැගීමට පදනමක් නොවන බව පෙනී යයි.

පැ-21 සහ පැ-22 දරණ චෝදනාපත්‍ර අත්සන් තබා චමින්ද සමරකෝන් මහතාට ලබා දී ඇත්තේ හිටපු සභාපති 2 වන වගඋත්තරකාර ජේ. ආර්. වික්‍රමසිංහ මහතා වේ. පැ-21 සහ පැ-22 දරණ චෝදනාපත්‍ර ලබා දී ඇත්තේ සාධාරණ පදනමක් නොමැතිව බවට ලේඛන ඇසුරින් හරස් ප්‍රශ්න නගා ඇත. එහිදී නගා ඇති චෝදනා සාධාරණ බව තහවුරු වන

අයුරින් සාක්ෂි ලබා දීමට 2 වන වගඋත්තරකාර ජේ. ආර්. වික්‍රමසිංහ මහතා අසමත් වී ඇත. පැ-91 විමර්ෂණ වාර්තාව මත පැ-21 චෝදනා පත්‍රය සකස් විය යුතු වුවද, පැ-91 හි සඳහන් නොවන කාරණා මත පැ-21 දරණ චෝදනාපත්‍රය සකස් කිරීමේ දෝෂයක් පවතින බවට ජේ. ආර්. වික්‍රමසිංහ මහතා සිය සාක්ෂිය මගින් පිළිගෙන ඇත.

වර්ෂ 2015 ජනවාරි මස යහපාලන රජය බලයට පත් වූ පසු චමින්ද සමරකෝන් මහතාගේ කාර්යාල කාමරය මුද්‍රා තැබීමට තීරණය කර ඇත්තේ හිටපු ඛනිජ තෙල් අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා බවට හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතා සාක්ෂි දෙමින් කියා ඇත. ඒ අනුව වර්ෂ 2015 ජනවාරි මසදී යහපාලන ආණ්ඩුව බලයට පත් වීමත් සමගම හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතාගේ මූලිකත්වයෙන් චමින්ද සමරකෝන් මහතාගේ කාර්යාල කාමරයට ඇතුලුවිය නොහැකි ලෙස මුද්‍රා තැබීමට ක්‍රියා කරන ලද බව තහවුරු වේ. හිටපු අමාත්‍යවරයා විසින් කාර්යාල කාමරය මුද්‍රා තැබීමට කළ නියෝගය නීත්‍යානුකූල ක්‍රියාවක් නොවන බවට ජේ. ආර්. වික්‍රමසිංහ මහතාගෙන් හරස් ප්‍රශ්න වලදී විමසූ බවත්, එහිදී එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දිය නොහැකි බවට ඔහු විසින් කියා ඇත. ඔහුගේ එම පිළිතුර මගින්ම නීතිවිරෝධී ක්‍රියාවන් සහ ඒවා කරන ලද තැනැත්තන් ආරක්ෂා කරමින් ඔහු විසින් සාක්ෂි දිමට ක්‍රියා කරන අයුරු නිරීක්ෂණය විය.

ජේ. ආර්. වික්‍රමසිංහ මහතා විසින් ඔහුගේ සාක්ෂිය මගින් චමින්ද සමරකෝන් මහතා ධීවර කූපන්පත් වංචාවක් සිදු කළ බවට චෝදනා කරමින් ලේඛනයක්ද සළකුණු කර ඇත. එකී ලේඛනය පරීක්ෂා කිරීමේදී එය විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන වාර්තාවක් නොවන බවට නිරීක්ෂණය විය. එම ලේඛණය අනුව

විගණකාධිපතිවරයා එහි සඳහන් කාරණා වලට අදාලව තොරතුරු ඉල්ලීමක් සිදුකර ඇත. එකී ලේඛනය මගින් චමින්ද සමරකෝන් මහතා සම්බන්ධව විමර්ශනයක් හෝ චෝදනා නැගීමක් සිදු කර නොමැත. එම ලේඛනය මගින් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව අක්‍රමිකතා චෝදනාවක් නැගිය නොහැකි බවට නිරීක්ෂණය වේ. තවද ධීවර කූපන්පත් මත පදනම් වූ චෝදනාවක් ඔහුට එරෙහිව පවතින බවට කරුණු ඉදිරිපත් කිරීමක් හෝ විනය ක්‍රියාමාර්ග ගැනීමක් සිදු කර නොමැත. එකී කරුණු අනුව ධීවර කූපන්පත් යන කරුණ සම්බන්ධයෙන් සාක්ෂි මගින් දක්වන චෝදනාව පදනම් විරහිත බව තහවුරු වේ.

2 වන වගඋත්තරකාර ජේ. ආර්. වික්‍රමසිංහ මහතාගේ සාක්ෂිය සමස්ථයක් වශයෙන් සළකා බැලීමේදී, එකී සාක්ෂිය මගින් චමින්ද සමරකෝන් මහතා විසින් ගෙන ඇති ස්ථාවරය බිඳ හෙළීමක් සිදු වී නොමැත.

3 වන වගඋත්තරකාර ටී. ජී. ජයසිංහ මහතා විසින්ද සාක්ෂි ලබා දී ඇති අතර ඔහුගේ මූලික සාක්ෂිය මගින් චමින්ද සමරකෝන් මහතා බරපතල මූල්‍ය දූෂණ හා වංචා සිදු කළ හෙයින් සංස්ථාවෙන් නෙරපීම සිදු කළ බව කියා ඇත. ඔහුට එරෙහිව පැ-23, පැ-24 සහ පැ-25 දරණ චෝදනාපත්‍ර ලබා දීම සිදු කර ඇත්තේ ටී. ජී. ජයසිංහ මහතා විසිනි. පැ-26 දරණ ලිපිය අනුව චමින්ද සමරකෝන් මහතාව සේවයෙන් පහකර ඇත්තේද ටී. ජී. ජයසිංහ මහතා විසිනි. ටී. ජී. ජයසිංහ මහතා විසින් ලබා දෙන ලද පැ-23, පැ-24 සහ පැ-25 දරණ චෝදනාපත්‍රවල සඳහන් චෝදනා වලට වරදකරු කිරීමට තරම් පදනමක් නොතිබූ බවට නගන ලද හරස් ප්‍රශ්න වලදී ටී. ජී. ජයසිංහ මහතා විසින් ලබා දෙන ලද පිලිතුරු විශ්ලේෂණය කිරීමේදී චමින්ද සමරකෝන් මහතා විසින් සිය

පැමිණිල්ල මගින් හා සාක්ෂි මගින් දක්වන ලද ස්ථාවරය තව දුරටත් තහවුරු වේ.

විනය රීතිමාලාව අනුව සේවකයෙකුට එරෙහිව විනය පරීක්ෂණ අවසන් වන තෙක් ගතහැකි ක්‍රියා මාර්ගය වැඩ තහනම් කිරීම පමණක් බව ටී. ජී. ජයසිංහ මහතා සිය සාක්ෂිය මගින් පිළිගෙන ඇත. විනය පරීක්ෂණ පැවැත්වි යුත්තේ පැ-44 දරණ විනය රීති මාලාවේ 2 වන වගන්තියේ දැක්වෙන අරමුණු ඉෂ්ඨ වන අයුරින් බවද ටී. ජී. ජයසිංහ මහතා සිය සාක්ෂිය මගින් පිළිගෙන ඇත. විනය රීති මාලාව අනුව සියලු විනය පරීක්ෂණ අවසන් වන තෙක් සේවකයෙකු සේවයෙන් නෙරපීමට නොහැකි බවද ටී. ජී. ජයසිංහ මහතා විසින් සිය සාක්ෂිය මගින් පිලිගෙන ඇත. ඒ අනුව පැ-44 දරණ විනය රීති මාලාවට පටහැණිව යමින් පැ-21 සහ පැ-25 දරණ චෝදනාපත්‍ර මත විනය පරීක්ෂන අවස්න වීමට පෙර පැ-26 දරණ ලිපිය ප්‍රකාරව චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීම නීත්‍යානුකූල නොවන හා අසාධාරණ ක්‍රියාවක් බව තහවුරු වේ.

3 වන වගඋත්තරකාර ටී. ජී. ජයසිංහ මහතාගේ සාක්ෂිය සමස්ථයක් වශයෙන් සලකා බැලීමේදීද චමින්ද සමරකෝන් මහතා විසින් සිය සාක්ෂිය මගින් හා ලේඛන මගින් තහවරු කරන ලද කරුණු බිඳ හෙලීමක් සිදු කර නොමැත. ටී. ජී. ජයසිංහ මහතාගේ සාක්ෂිය අනුවද චමින්ද සමරකෝන් මහතාගේ ස්ථාවරය තවදුරටත් තහවරු වේ.

2015 ජනවාරි යහපාලන ආණ්ඩුව පත්වීමෙන් අනතුරුව, ඉහත සඳහන් කරුණු ප්‍රකාරව චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පදනම් විරහිත සහ අසාධාරණ පැමිණිලි හා පෙත්සම් මත ක්‍රියා කර ඇති බව තහවුරු වේ. චමින්ද සමරකෝන් මහතා අසාධාරණ ලෙස රැකියා

ස්ථාන මාරු කිරීමකට ලක්කර ඇති බවද තහවුරු වේ. චමින්ද සමරකෝන් මහතාව අසාධාරණ හා අනීතික ලෙස වැඩ තහනමකට ලක් වී ඇති බවද තහවුරු වේ. චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පදනම් විරහිත සහ අසාධාරණ චෝදනා සහිත චෝදනාපත්‍ර ඉදිරිපත් කර ඇති බව තහවුරු වේ. චමින්ද සමරකෝන් මහතාට එරෙහිව තිබූ විනය පරීක්ෂණ සියල්ල අවසන් වීමට පෙර අසාධාරණ සහ අනීතික ලෙස සේවයෙන් පහ කිරීමට ක්‍රියා කර ඇති බව තහවුරු වේ. චමින්ද සමරකෝන් මහතාව සේවයෙන් පහ කිරීමද අසාධාරණ සහ අනීතික ක්‍රියාවක් බව තහවුරු වේ. චමින්ද සමරකෝන් මහතාට එරෙහිව සිදු වූ එකී සියලුම ක්‍රියාවන් චමින්ද සමරකෝන් මහතාගෙන් දේශපාලනිකව පලිගැනීම උදෙසා සිදු කළ දේශපාලන පළිගැනීම් බවත්, තහවුරු වේ.

වර්ෂ 2015 ජනවාරි මස බිහි වූ යහපාලන ආණ්ඩුවේ ඛනිජ තෙල් අමාත්‍යවරයා ලෙස කටයුතු කළ පාඨලී චම්පික රණවක මහතා සහ ඔහුගේ මග පෙන්වීම මත ඔහුගේ කාර්ය මණ්ඩලය විසින්ද චමින්ද සමරකෝන් මහතාට දිගින් දිගටම පදනම් විරහිත චෝදනා නගා ඇති බව තහවුරු වේ. එකී පදනම් විරහිත සහ අසාධාරණ චෝදනා මත ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුළ විනය ක්‍රියාමාර්ග ගැනීමට අනුබල දී ඇති බව තහවුරු වේ. හිටපු සභාපති ජේ. ආර්. වික්‍රමසිංහ මහතාගේ සාක්ෂිය අනුවද හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා විසින් 2015 ජනවාරි යහපාලන රජය බලයට පත් වූ විගස, චමින්ද සමරකෝන් මහතාගේ කාර්යාල කාමරය මුද්‍රා තැබීමට නියෝග කර ඇති බව තහවුරු වේ. එලෙසට චමින්ද සමරකෝන් මහතාගේ කාර්යාල කාමරය මුද්‍රා තැබීමට හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතාගේ නියෝගය සහ මැදිහත් වීම අනීතික බව තහවුරු වේ. එකී

කරුණු අනුව 2015 ජනවාරි යහපාලන ආණ්ඩුව පත්වීමෙන් පසුව 1 වන වගඋත්තරකාර හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා විසින් චමින්ද සමරකෝන් මහතාව අසාධාරණ ලෙස දේශපාලන වශයන් පළි ගැනීමට ලක්කර ඇති බව තහවුරු වේ.

2 වන වගඋත්තරකාර ජේ. ආර්. වික්‍රමසිංහ මහතා විසින් 2015 ජනවාරි යහපාලන රජය පත්වීමෙන් පසුව චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පදනම් විරහිත සහ අසාධාරණ පැමිණිලි සහ පෙත්සම් මත විමර්ශන පැවැත්වීමත්, රැකියා ස්ථානයෙන් අසාධාරණ ලෙස ස්ථාන මාරු කිරීමත්, පදනම් විරහිත චෝදනාපත්‍ර භාරදීම සහ අනීතික ලෙස වැඩ තහනමකට ලක්කිරීම මගින් 2 වන වගඋත්තරකාර ජේ. ආර්. වික්‍රමසිංහ මහතා විසින් චමින්ද සමරකෝන් මහතාව අසාධාරණ ලෙස දේශපාලනමය වශයෙන් පළි ගැනීමකට ලක්කර ඇති බව තහවුරු වේ.

3 වන වගඋත්තරකාර හිටපු සභාපති ටී. ජයසිංහ මහතා විසින් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පදනම් විරහිත සහ අසාධාරණ චෝදනා මත චෝදනාපත්‍ර ලබා දීමෙන්, අසාධාරණ විනය පරීක්ෂණ පවත්වා, පදනම් විරහිතව සහ අනීතිකව චෝදනා වලට වරදකරු කිරීමෙන්, චෝදනාපත්‍ර දෙකක් මත විනය පරීක්ෂණ පවත්වා අවසන් කිරීමට ප්‍රථමව චමින්ද සමරකෝන් මහතා සේවයෙන් පහ කිරීමෙන්, පදනම් විරහිත චෝදනා නගා අසාධාරණ චෝදනාවලට වරදකරු කර සේවයෙන් පහ කිරීමේ දඬුවම ලබා දිම මගින්ද, 3 වන වගඋත්තරකාර හිටපු සභාපති ටී. ජී. ජයසිංහ මහතා විසින් චමින්ද සමරකෝන් මහතාව අසාධාරණ අයුරින් දේශපාලන වශයෙන් පළිගැනීමට ලක්කර ඇති බව තහවුරු වේ.

4 වන වගඋත්තරකාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් චමින්ද සමරකෝන් මහතාට එරෙහිව පදනම් විරහිත සහ අසාධාරණ පැමිණිලි හා පෙත්සම් මත කඩිනමින් විමර්ශන වාර්තා කැඳවීමත්, එකී විමර්ශන වාර්තා මගින් අනාවරණය නොවූ කරුණු එස්. ඩබ්ලිව්. ගමගේ මහතාගේ නිරීක්ෂණ වාර්තා මගින් දැක්වීමත්, චමින්ද සමරකෝන් මහතා වැඩ තහනම් කිරීමට සහ විනය පරීක්ෂණ අවසන් වීමටත් පෙර සේවයෙන් නෙරපීමට ද්වේශසහගත සහ අසාධාරණ ලෙස නිර්දේශයන් සංස්ථා සභාපතිවරයා වෙත සිදු කිරීම මගින්ද, 4 වන වගඋත්තරකාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන) එස්. ඩබ්ලිව්. ගමගේ මහතා විසින් චමින්ද සමරකෝන් මහතාව දේශපාලන වශයෙන් පළිගැනීමට ලක්කර ඇති බවත්, තහවුරු වේ.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ. 119A දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020 - 11. 24

2020/11/24

# පිළිගැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් වෙත.

# පටුන

## (තෙවන වෙළුම)


| | | පිටු අංක |
|---|---|---|
| XLVIII. | පැ.අංක - 856/2020<br>හෙට්ටිආරච්චිගේ උපාලි ගුණසේකර | 1429-1435 |
| XLIX. | පැ.අංක - 893/2020<br>එම්.එස්.පී. මල්ලවගේ | 1436-1448 |
| L. | පැ.අංක - 22/2020<br>කපිල ප්‍රියදර්ශන ආරියවංශ | 1449-1480 |
| LI. | පැ.අංක - 408/2020<br>උපාලි ලියනගේ | 1481-1485 |
| LII. | පැ.අංක - 615/2020<br>අංගොඩගේ දොන් සුමිත් වම්මික පෙරේරා | 1486-1494 |
| LIII. | පැ.අංක - 43/2020<br>ඉමදූවගේ ඉන්දික සම්පත් | 1495-1506 |
| LIV. | • පැ.අංක - 325/2020<br>ආර්.පී.ඩී.තාරක සෙනවිරත්න<br>• පැ.අංක - 326/2020<br>ජගත් පී.විජේවීර | 1507-1555 |
| LV. | පැ.අංක - 414/2020<br>පියදාස කුඩාබාලගේ | 1556-1579 |
| LVI. | පැ.අංක - 416/2020<br>කොක්කාවිට ලියනගේ ලසන්ත බණ්ඩාර | 1580-1601 |

LVII. පැ.අංක - 415/2020 1602-1620

ඩබ්ලිව. ඒ. එස්. ප්‍රසන්න නානායක්කාර

LVIII. පැ.අංක - 29/2020 1621-1648

පී.ජී.ආර්. චිත්‍රානන්ද අබේරාජ් ගම්ලත්

LIX. පැ.අංක - 352/2020 1649-1672

එච්.කේ.ඩී.ඩබ්ලිව්. නීල් බණ්ඩාර හපුහින්න

LX.
- පැ.අංක - 24/2020 1673-1821

  ශම්මි අර්ජුන කුමාරරත්න
- පැ.අංක - 200/2020

  ආර්.එම්.පී.කුමාර රාජපක්ෂ
- පැ.අංක - 198/2020

  ඩබ්ලිව්.විනි ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන
- පැ.අංක - 196/2020

  එස්.එම්.රවින්ද්‍ර රූපසේන
- පැ.අංක - 194/2020

  වයි.එම්. චමින්ද කුමාර අබේරත්න
- පැ.අංක - 197/2020

  එස්.එම්.කනිෂ්ක ගුණරත්න
- පැ.අංක - 199/2020

  අයියසාමි බාලසුබ්‍රමනියම්
- පැ.අංක - 195/2020

  ඩී.ජී.තරංග ප්‍රසාද් ගමගේ
- පැ.අංක - 104/2020

  ටී.එරන්ද රදිෂ් පිරිස්
- පැ.අංක -239/2020

එස්.ඒ. හේමචන්ද්‍ර පෙරේරා

- පැ.අංක - 31/2020

  ටී.ටොෂිනාත් ප්‍රබෝධ සිරිවර්ධන

- පැ.අංක - 231/2020

  පී.පී.වසන්ත සුදේශ කුමාර උලුගෙදර

- පැ.අංක - 1052/2020

  වර්ණකුලසූරිය අනුර ජයලත්

- පැ.අංක - 347/2020

  තුවාන් නසාර් මුතාලිප්

LXI. • පැ.අංක - 204/202 1822-1941

  ඒ.එච්.ඒ.ලසන්ත විමලවීර

- පැ.අංක - 239/2020

  එස්.ඒ.හේමචන්ද්‍ර පෙරේරා

- පැ.අංක - 241/2020

  යූ. ප්‍රභාත් දුමින්ද වීරරත්න

- පැ.අංක - 242/2020

  එම්.පී.නිශාන්ත කුමාර

- පැ.අංක - 253/2020

  එස්.එම්.චන්ද්‍රාබය ජයසූරිය

- පැ.අංක - 257/2020

  ජී.ඒ.චාමික සුමිත්

- පැ.අංක - 296/2020

  ජී.ඒ. ප්‍රියන්ත කුමාර සෝමසූරිය

- පැ.අංක - 297/2020

  එච්.එම්.නිශාන්ත ජයතිලක

- පැ.අංක - 353/2020

  බණ්ඩාර දිසානායක බුලත්වත්ත
- පැ.අංක - 232/2020

  කේ.ඒ.ධම්මික අමල් කරුණාසේකර
- පැ.අංක - 203/2020

  රාජපක්ෂගේ ලලිත් රාජපක්ෂ

10.කොමිෂන් සභාවේ අවධානයට ලක්වූ පැමිණිලි

| | | |
|---|---|---|
| I. | පැ.අංක - 1885/2020 | 1942-1949 |
| | විලියම් විජේසිංහ ගමගේ | |
| II. | පැ.අංක - 1968/2020 | 1950-1956 |
| | කිරුකුමාර් නඩේසන් | |
| III. | පැ.අංක - 956/2020 | 1957-1967 |
| | ජේ.එම්. භද්‍රානි ජයවර්ධන | |
| IV. | පැ.අංක - 571/2020 | 1968-1972 |
| | ජේ.ඒ.ආර්. ප්‍රදීප් ජයසූරිය | |
| V. | පැ.අංක - 434/2020 | 1973-1977 |
| | ජේ.එම්.නිමල්සිරි ලක්ෂ්මන් | |
| VI. | පැ.අංක - 1871/2020 | 1978-1981 |
| | විසිදාගමගේ අජිත් පුෂ්පකුමාර | |
| VII. | පැ.අංක - 950/2020 | 1982-1986 |
| | කේ.එම්. ප්‍රියන්ත ගුණතිලක බණ්ඩාර | |
| VIII. | පැ.අංක - 1141/2020 | 1987-1992 |
| | එම්.අන්සාර් ඉර්ෆාන් ෆකිර්ඩීන් | |
| IX. | පැ.අංක - 1140/2020 | 1993-1998 |

සුරේෂ් චන්දන පල්ලේගම

X. පැ.අංක - 60/2020 1999-2005

ඩී.එම්.අනුරාධ කාංචන බණ්ඩාර

XI. පැ.අංක - 555/2020 2006-2014

ඒ.ආර්.පී.ඩබ්.බී.දේදුනුපිටිය

XII. පැ.අංක - 551/2020 2015-2018

ඊ.සී.පී.ආර්.පතිරණ

XIII. පැ.අංක - 554/2020 2019-2026

වලහක මුදලිගේ සරත් පෙරේරා

XIV. පැ.අංක - 274/2020 2027-2030

ලැබුන හේවගේ රංජිත් සේපාල

XV. පැ.අංක - 1320/2020 2031-2035

දෝන නිශාන්තා කමනි හෙට්ටිආරච්චි

XVI. පැ.අංක - 567/2020 2036-2037

මර්වින් ප්‍රනාන්දු පුල්ලේ

XVII. පැ.අංක - 610/2020 2038-2039

අයිවන් ද සිල්වා

11.I . ඉල්ලා අස්කරගත් පැමිණිලි 2040

II . බහා තබන ලද පැමිණිලි 2041

III . නිශ්ප්‍රභා කරන ලද පැමිණිලි 2042

12.කොමිෂන් සභාවට ලැබී ඇති පැමිණිලි

පිළිබඳ සාරාංශය 2043

## (පළමු වන වෙළුම)


1. පසුබිම 01-05
2. කොමිෂන් සභාවේ සංයුතිය 06
3. නිල කාලය 07
4. කාර්ය මණ්ඩලය 08-11
5. අධිකරණ බලය සහ කොමිෂන් සභා පරිශ්‍රය 12-14
6. පැමිණිලි භාර ගැනීම 15
7. මූලික විමර්ශන සහ සාක්ෂි විභාග 16
8. දූෂණ විරෝධී කමිටුව සහ එහි ලේකම් කාර්යාලය මගින් සිදු කළ පොදු දේපල අවභාවිතාව 17-51
9. සාක්ෂි සම්පින්ඩනය, නිර්දේශ සහ වගකිවයුතු පුද්ගලයින්

    I. පැ.අංක - 01, 05/2020 52-103
    අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ

    II. පැ.අංක - 002/2020 104-192
    රියද් අද්මිරාල් ඩී.කේ.පී.දසනායක

    III. පැ.අංක - 003/2020 193-226
    කමාන්ඩර් සුමිත් රණසිංහ

    IV. පැ.අංක - 80/2020 227-268
    ලු/ ක ප්‍රසාද් චන්දන කුමාර හෙට්ටිආරච්චි

    V. පැ.අංක - 55/2020 269-288
    ගාමිණී සෙනවිරත්න

    VI. පැ.අංක - 107/2020 289-299
    කේ.පී.චමින්ද

| | | |
|---|---|---|
| VII. | පැ.අංක - 344/2020<br>කමාන්ඩර් එම්.එම්.ඩී.ජ්.මාපා | 300-319 |
| VIII. | පැ.අංක - 345/2020<br>ලු/ කමාන්ඩර් එස්.ඩී.එස්.එස්.දයානන්ද | 320-350 |
| IX. | පැ.අංක - 205/2020<br>වෛද්‍ය යද්දෙහිගේ දොන් නිහාල් ජයතිලක | 351-413 |
| X. | පැ.අංක - 289-290/2020<br>රණවක ආරච්චිලාගේ අමිත කිත්සිරි රණවක | 414-455 |
| XI. | පැ.අංක - 316/2020<br>ආර්.ජී.බන්දුල තිලකසිරි | 456-478 |
| XII. | පැ. අංක - 88/2020<br>ඩී.එස්.ජයවීර | 479-511 |
| XIII. | පැ.අංක - 319/2020<br>ඩබ්ලිව්.විමලසේන | 512-522 |
| XIV. | පැ.අංක - 816/2020<br>හේවා ගුණරත්න භාෂ්වර සේනාංක | 523-549 |
| XV. | පැ.අංක - 545/2020<br>පා.ම.නීතිඥ උදය ගම්මන්පිල | 550-572 |
| XVI. | පැ.අංක - 1963/2020<br>යෝෂිත කණිෂ්ක රාජපක්ෂ | 573-588 |
| XVII. | පැ.අංක - 1964/2020<br>රොහාන් වැලිවිට | 589-607 |
| XVIII. | • පැ.අංක - 432/2020<br>ආචාර්ය නාලක හර්ෂජීව ගොඩහේව | 608-628 |

| | | |
|---|---|---|
| | • පැ.අංක - 433/2020<br>ධම්මික මන්ජිර පෙරේරා | |
| XIX. | • පැ.අංක - 619/2020<br>නිශාන්ත ආසිරි ප්‍රනාන්දු<br>• පැ.අංක - 375/2020<br>එස්.කේ.කමින්ද හර්ෂජිත් | 629-649 |
| XX. | පැ.අංක - 04/2020<br>ගමගේ තිළිණ සජෝත වින්සන්ට් | 650-703 |

(දෙවන වෙළුම)

| | | |
|---|---|---|
| XXI. | පැ.අංක - 1969/2020<br>අරුමාදුර වින්සන්ට් ප්‍රේමලාල් සිල්වා | 704-720 |
| XXII. | පැ.අංක - 115/2020<br>ලලිත් අනුරුද්ධ ජයසිංහ | 721-860 |
| XXIII. | පැ.අංක - 238/2020<br>ප්‍රේම ආනන්ද උදලාගම | 861-870 |
| XXIV. | පැ.අංක - 885/2020<br>සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් | 871-892 |
| XXV. | පැ.අංක - 1116/2020<br>ජාලිය චිත්‍රාන් වික්‍රමසූරිය | 893-906 |
| XXVI. | පැ.අංක - 28/2020<br>කහදගමගේ මහින්දරත්න | 907-915 |
| XXVII. | පැ.අංක - 1091-1092/2020<br>චන්ද්‍රපාල ලියනගේ | 916-931 |
| XXVIII. | පැ.අංක - 1131/2020<br>සනත් ප්‍රියන්ත දළුවත්ත | 932-940 |

| | | |
|---|---|---|
| XXIX. | පැ.අංක - 141/2020<br>විමල් රුබසිංහ | 941-958 |
| XXX. | • පැ.අංක - 402/2020<br>ඩී.එම්.එස්.දිසානායක<br>• පැ.අංක - 206/2020<br>ඩී.එම්.සුජාතා දමන්ති ජයරත්න | 959-978 |
| XXXI. | පැ.අංක - 50/2020<br>නිශ්ශංක යාපා සේනාධිපති | 979-1063 |
| XXXII. | පැ.අංක - 1807/2020<br>මේජර් ජනරාල් පාලිත ප්‍රනාන්දු | 1064-1081 |
| XXXIII. | පැ.අංක - 431/2020<br>වික්ටර් සමරවීර | 1082-1092 |
| XXXIV. | පැ.අංක - 184/2020<br>රෝහිත බෝගොල්ලාගම | 1093-1114 |
| XXXV. | පැ.අංක - 007/2020<br>මෝසස් රංගජීව නෙවමාල් | 1115-1143 |
| XXXVI. | පැ.අංක - 12/2020<br>ළමාහේවගේ එමිල් රංජන් | 1144-1152 |
| XXXVII. | • පැ.අංක - 1081/2020<br>උදයංග වීරතුංග | 1153-1167 |
| XXXVIII. | • පැ.අංක - 1080/2020<br>උදයංග වීරතුංග | 1168-1191 |
| XXXIX. | • පැ.අංක - 650/2020<br>ඥානලිංගම් ධනේෂ්වරී | 1192-1204 |

- පැ.අංක - 34/2020

  පී.එල්.අයි.පෙරේරා
- පැ.අංක - 269/2020

  ජී.ඒ.මාලනි
- පැ.අංක - 403/2020

  කේ.වී.රංජනි මල්කාන්ති

| | | |
|---|---|---|
| XL. | පැ.අංක - 1842/2020<br>සේපාල රත්නායක | 1205-1235 |
| XLI. | පැ.අංක - 427/2020<br>කුමුදුමාල් චන්දන පැල්පිට | 1236-1239 |
| XLII. | පැ.අංක - 1070/2020<br>එල්.එම්.තිස්ස විමලසේන | 1240-1249 |
| XLIII. | පැ.අංක - 1940/2020<br>නුගදූව විතානගේ කුමාර ජයකාන්ත | 1250-1255 |
| XLIV. | පැ.අංක - 77/2020<br>පී.කේ.ඩබ්.ආර්.එම්.ටී.බී.පිලපිටිය | 1256-1263 |
| XLV. | පැ.අංක - 18/2020<br>ලේකම් මුදියන්සේලාගේ මාලනී කුමාරි | 1264-1277 |
| XLVI. | පැ.අංක - 1941/2020<br>චමින්ද පුෂ්පකුමාර අතුලුවගේ | 1278-1292 |
| XLVII. | පැ.අංක - 317/2020<br>එස්.එම්. චමින්ද ප්‍රසාද් සමරකෝන් | 1293-1428 |

## 9 .XLVIII

පැමිණිලි අංකය - 856/2020

පැමිණිලි කරු - හෙට්ටිආරච්චිගේ උපාලි ගුණසේකර

ලිපිනය - 978/ඩී/එස්, දියවන්නා උද්‍යාන මාවත, නාගහමුල, බත්තරමුල්ල

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු අමාත්‍ය අකිල විරාජ් කාරියවසම්

## තීරණය

අධ්‍යාපන පරිපාලන සේවයේ 01 වන පන්තියේ නිලධාරියෙකු වශයෙන් ජනප්‍රිය පාසල් කීපයක විදුහල්පතිවරයා ලෙස කටයුතු කරනු ලැබ ඇති හෙට්ටිආරච්චිගේ උපාලි ගුණසේකර 2015 ජනවාරි මාසයේ පත් වූ යහපාලන රජයේ අධ්‍යාපන අමාත්‍යවරයා වූ අකිල විරාජ් කාරියවසම්ගේ දේශපාලන පළි ගැනීමට ලක් වනු ලැබ ඇති බවත් වසර 05කට ආසන්න කාලයක් ඔහු වරදකරුවෙකු ලෙස පූර්ව නිගමනයකට තිබුණද ඔහු නිර්දෝශී නිලධාරියකු බවත් එකී තත්වය යටතේ අධ්‍යාපන අමාත්‍යංශයට අනියුක්ත කොට කිසිදු තනතුරක් ලබා නොදී කිසිදු කාර්යභාරයක් නොපවරා කිසිදු පහසුකමක් සලස්වා නොදීමෙන් අපහසුතාවයට පත් කරනු ලැබ ද්වේශ සහගත ලෙස පළි ගැනීමකට ලක් කරනු ලැබ ඇති බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කරනු ලබයි.

# නිර්දේශ

01. පලි ගැනීමට ලක් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුහුණ පෑමට සිදු වන ලද පීඩාකාරි තත්වය මත උපාලි ගුණසේකර වයස අවුරුදු 55න් විශ්‍රාම ලබා සිටින බැවින් ඔහුගේ සේවය අහිමි වූ කාලය සැලකිල්ලට ගෙන අවම වශයෙන් වසර 02ක කාලයක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවය කිරීමට අවස්ථාවක් ලබා දීමත් එහිදී ඔහු පලි ගැනීමට ලක් වන ලද අවස්ථාවේ සේවය කරමින් සිටින ලද තනතුර වන කොළඹ රාජකීය විදුහලේ විදුහල්පති ධූරය ලෙස ලබා දීම සලකා බැලිය යුතු වන බවත් කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

# ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

එච්.ඒ උපාලි ගුණසේකර(මින් ඉදිරියට උපාලි ගුණසේකර යනුවෙන් හඳුන්වනු ලබයි.) 1989 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගනු ලැබ ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශයට අනියුක්තව කටයුතු කිරීමෙන් අනතුරුව කොළඹ ඩී.එස් සේනානායක විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ලෙසත් කොළඹ ඉසිපතන විද්‍යාලයේ විදුහල්පති ලෙසත් සේවය කරනු ලැබ ඇත. 2003 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වන දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදුව උපාලි ගුණසේකර කොළඹ රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස පත් කරනු ලැබ තිබේ.

2005 වර්ෂයේදී ජනාධිපති ප්‍රණාම සහතික පත්‍රයද කොළඹ රාජකීය විද්‍යාලය සාර්ථකත්වය කරා මෙහෙයවීම සම්බන්ධයෙන් ගුරු ප්‍රතිභා

ප්‍රභා යන ජාතික ඇගයීම් වැඩසටහනට අදාළව විශිෂ්ය සේවය ඇගයීමටද පාත්‍ර කරනු ලැබ ඇත. උපාලි ගුණසේකරගේ සේවා වාර්තා වලට අදාළ ප්‍රශංසා සහ දෝෂ දර්ශන ලේඛන පරික්ෂා කිරීමේදී ඔහුට විරුද්ධව කිසිදු චෝදනාවක් හෝ දෝෂදර්ශනයක් නොමැති අතර ඔහු සම්බන්ධයෙන් ප්‍රශංසනීය සටහන් යොදනු ලැබ ඇති බව නිරීක්ෂණය වේ.

2015.01.08 වන දින බලයට පත් වූ යහපාලන රජයේ අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් විසින් 2015ට පෙර බලයට පත්ව සිටි හිටපු ජනාධිපති හා වර්තමාන අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව සමග උපාලි ගුණසේකර සමීප සම්බන්ධතාවයක් පවත්වන ලද බවට චෝදනා නැගිනි. දේශපාලන පලි ගැනීම් මත රාජකාරි වශයෙන් බාධා ඇති කිරීම, කොළඹ රාජකීය විදුහලේ විදුහල්පති ධූරයෙන් ඉවත් කරනු ලැබ ඔහුගේ ප්‍රතිරූපයට හානි වන ආකාරයේ අපහසුතාවයනට පත් කිරීම සහ ඔහුගේ රාජ්‍යය සේවය අනුමිත ලෙස අවසන් කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් උපාලි ගුණසේකර විසින් මෙම කොමිෂන් සභාව වෙත පැමිණිලි කරනු ලැබිණි.

උපාලි ගුණසේකර කොමිෂන් සභාව ඉදිරියේ කියා සිටිනු ලැබ ඇති පරිදි අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් අවස්ථා කීපයකදීම උපාලි ගුණසේකර රාජකීය විදුහලේ විදුහල්පතිවරයා වශයෙන් සිටීම පිළිබඳව ඔහුගේ ප්‍රසාදයක් නොමැති බව ඇඟවෙන පරිදි කටයුතු කර ලැබ ඇති පරිදි 2016.01.06 වන දින කොළඹ ආනන්ද විද්‍යාලයේ පැවැත්වූ නිල ඇඳුම් බෙදා දීමේ ජාතික උත්සවයේදී එම උත්සවයෙන් පසු අමාත්‍යාංශයට පැමිණ තමාව හමු වන මෙන් අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා පවසනු ලැබ ඇත. ඒ අනුව උත්සවය

අවසන් වීමෙන් පසු අමාත්‍යාංශයට ගොස් අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා උපාලි ගුණසේකරට පවසනු ලැබ ඇත්තේ ඔහු රාජකීය විදුහලේ විදුහල්පති ධූරයෙන් ඉවත් කරන ලද බවය. රාජකීය විදුහලේ විදුහල්පති ධූරයෙන් ඉවත් කරන්නේ නම් තමාට වෙනත් විදුහලක් ලබා දෙන මෙන් උපාලි ගුණසේකර ඉල්ලා සිටින ලද මුත් රාජකීය විදුහලෙන් පසු වෙනත් විදුහලක විදුහල්පති වීම සුදුසු නොවන බව අමාත්‍යවරයා පැවසූ අතර ඊට දින කීපයකට පසු උපාලි ගුණසේකර රාජකීය විදුහලෙන් ඉවත් කොට අධ්‍යාපන අමාත්‍යාංශයට අනියුක්ත කරනු ලැබිණි. අදාළ ලිපියෙහි සඳහන් වූයේ අධ්‍යාපන අමාත්‍යාංශයට තාවකාලිකව අනියුක්ත කිරීම වශයෙනි. උපාලි ගුණසේකර රාජකීය විද්‍යාලයෙන් ඉවත් කරන ලද දිනයේම අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් විසින් පවත්වනු ලැබූ විමර්ශනයකට අදාළ විමර්ශන වාර්තාවක නිගමන 04ක් ලබා දී ඇති අතර ඔහු නැවත එම විද්‍යාලයට පත් කිරීම යෝග්‍ය නොවන බවත් වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු කිරීම සුදුසු බවත් ඒ අතර වේ. 04 වන ශ්‍රේණියට අමාත්‍යාංශ අනුමැතියකින් තොරව ශිෂ්‍යයෙක් ඇතුළත් කරගෙන ඇතැයිද වසර 10කට වැඩි කාලයක් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව 07 ශ්‍රේණියේ පන්තියක් පවත්වාගෙන ගොස් ඇතැයිද යන දෝෂාරෝපණයන් ඇතුළත් කොට චෝදනා පත්‍ර නිකුත් කිරීමට නිර්දේශ කර තිබිණි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උපාලි ගුණසේකර එම චෝදනාවන්ගෙන් නිදහස් කරනු ලැබිණි. ඒ අනුව උපාලි ගුණසේකර මෙම කොමිෂන් සභාවට කියා සිටිනුයේ තමා රාජකීය විද්‍යාලයේ විදුහල්පති ධූරයෙන් ඉවත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් විසින් එකී විමර්ශනය සිදු කළ නිලධාරින් යොදවා ගනු ලැබූ බවය.

2016.01.17 වෙනි දින ඉරිදා ලංකාදීප පුවත්පතෙහි සල්ලි ගරන දිසාපාමොක්ලා යන ශීර්ෂය යටතේ අකිල විරාජ් කාරියවසම් විසින් කරනු ලැබ ඇති ප්‍රකාශයක් ඔහුගේ ඡායාරූපයක්ද සහිතව පල කරනු ලැබ ඇත. එහි සඳහන් වනුයේ විදුහල්පතිවරුන් වැරැද්දක් කර තිබේ නම් අනිවාර්යයෙන්ම ඔවුන්ට දඬුවම් ලබා දෙන්නේය සහ තරාතිරම, පාසලේ ඉහළ තත්වය, දෙමවුපියන්ගේ සහ ආදී ශිෂ්‍යන්ගේ බලපෑම් වලට යටත් නොවන බව කියා සිටිනු ලැබ ඇති අතර කොළඹ රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයා අමාත්‍යාංශයට අනියුක්තර කරනු ලැබූ බවත් එලෙස සිදු කරන ලද්දේ ඔහු පාසලේ රඳවාගෙන විමර්ශන කටයුතු හරියාකාරව කළ නොහැකි වීම බවත් එහි සඳහන් කොට ඇත. මෙම පුවත්පත් වාර්තාව බැලූ බැල්මට රාජකීය විදුහලේ විදුහල්පතිව සිටි උපාලි ගුණසේකරව සල්ලි ගරන දිසාපාමොක් කෙනෙකු ලෙස කියා පෑමක් වේ. ජනප්‍රිය පාසලක සිසුන් වැඩි සංඛ්‍යාවක් සඳහා අවකාශ සලසා දිය හැකි නම් විදුහල්පතිවරයෙක් විසින් එලෙස කටයුතු කිරීම දෝෂාරෝපණයට ලක් කරනුයේ කවර පදනමක් මතද යන්න සාධාරණ පුද්ගලයෙකුට විමතියක් ඇති කර වන්නකි. කෙසේ වෙතත් උපාලි ගුණසේකර පැහැදිලි කර සිටින ලද්දේ අමතර පන්තියක් වශයෙන් සඳහන් කරන ලද 07 එන් පන්තිය ඔහු එම පාසලට පැමිණීමට පෙර සිටම පැවැත්වෙන ලද්දක් බවයි. වාර්ෂිකව අමාත්‍යාංශය වෙත පන්ති වශයෙන් ශිෂ්‍ය සංඛ්‍යාව සහ විවිධ තොරතුරු සෑම ජාතික පාසලක් විසින්ම ඉදිරිපත් කරනු ලබන බැවින් කිසිසේත්ම අමාත්‍යාංශයේ දැනුවත්භාවයකින් තොරව රහසේ පන්තියක් පවත්වාගෙන යාමට කිසිදු විදුහල්පතිවරයෙකුට හැකියාවක් නොමැති බවයි. උපාලි ගුණසේකරට එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනා සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වනු ලැබ අවසන් කිරීම

අමාත්‍යාංශය විසින් උවමනාවෙන්ම ප්‍රමාද කරනු ලැබූ බව උපාලි ගුණසේකර කොමිෂන් සභාව වෙත කියා සිටිනු ලබයි. අවශ්‍යයෙන්ම සිදු කරන ලද ප්‍රමාදයකින් පසු උපාලි ගුණසේකර චෝදනාවන්ගෙන් නිදහස් කරනු ලබන විට ඔහු අධ්‍යාපන අමාත්‍යාංශයට අනියුක්ත කරනු ලැබ කිසිදු රාජකාරියක් නොපවරා නිකමෙකු ලෙස ගත කළ කාලය ඔහුගේ මුළු සේවා කාලයෙන් 1/10ක් වන බැව් ඔහු කියා සිටී. උපාලි ගුණසේකර රාජකීය විදුහලෙන් ඉවත් කරන අවස්ථාවේ සිදු කරන ලද විමර්ශනය අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම්ගේ මනදොල සපුරාලීම සඳහා සිදු කරන ලද්දක් වන අතර එය සිදු කරන ලද්දේ කේ.එල්.ඩී.සී ගුණවර්ධන, ටී.ඒ.ඩී.ආර් ප්‍රියන්ත සහ එස්.එච්.එන් සිල්වා විසින් බව උපාලි ගුණසේකර කියා සිටිනු ලැබිණි.

උපාලි ගුණසේකර 2016.01.12 දින අමාත්‍යාංශයට අනියුක්ත කිරීමෙන් පසු කිසිදු තනතුරක් හෝ සේවා ස්ථානයක් ලබා නොදීමට අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් කටයුතු කළ බව පෙන්වා දෙන ලද අතර වෙනත් තනතුරු ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් ගත් උත්සහයන්ද අමාත්‍යවරයා විසින් වළක්වනු ලැබූ බැව් සාක්ෂි දෙමින් කියා සිටින ලදී. තමා දූෂිතයෙකු ලෙස මාධ්‍යය හරහා සිදු කරන ලද ප්‍රචාරයන්ගෙන් ඉමහත් ලැජ්ජාවකට පත් වූ බවත් සිය බිරිඳ සහ දියණියන් දෙදෙනා දැඩි මානසික පීඩාවකට පත් වන ලද අතර 2016 අගෝස්තු මාසයේදී උසස් පෙළ විභාගයට සූදානම් වෙමින් සිටි තම කනිටු දියණිය අපහසුතාවයකට පත් වීමෙන් පසුබැමකට ලක් වූ බව උපාලි ගුණසේකර කියා සිටියේය.

විධිමත් ලෙස චෝදනාවන්ගෙන් නිදහස් වූ අවස්ථාවේ වයස අවුරුදු 55 ඉක්මවූ වහාම සේවයෙන් විශ්‍රාම යාමට තීරණය කළ බවත් එසේ කරනු ලැබීමට සිදු නොවූයේ නම් ඔහු තවමත් රාජ්‍ය සේවයේ සිටිනු

ලබන බවත් කියා සිටි උපාලි ගුණසේකර දේශපාලන වශයෙන් තමාගෙන් සිදු කරන ලද පලි ගැනීම වෙනුවෙන් සහනයක් සලසා දෙන ලෙසත් කෙටි කාලයක් හෝ නැවත සේවයේ යෙදීමට අවස්ථාව සලසා දෙන ලෙසත් ඉල්ලා සිටිනු ලැබිණි.

ඉහත සාක්ෂි සනාථ කෙරෙන පැ.1 සිට පැ. 19 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 . XLIX

පැමිණිලි අංකය - 893/2020

පැමිණිලිකරු - එම්.එස්.පී. මල්ලවගේ

ලිපිනය - අංක: එච් 3/1, ඇන්ඩර්සන් මහල්, නාරාහේන්පිට

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. පො.අ.ශානි අබේසේකර
2. පො.සැ. 2284 මංජුල පුෂ්පකුමාර
3. පො.සැ.53343 වීරසූරිය
4. ප්‍ර.පො.ප.රංජිත මුණසිංහ
5. පො.කො.40441 සමරදීර

### තීරණය

සහකාර පොලිස් අධිකාරි එම්.එස්.පී මල්ලවගේ 2015.04.25 දින වන විට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ජනාධිපති ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් සේවය කරනු ලැබ ඇති අතර එදින ඔහුට එරෙහිව ඉදිරිපත් වනු ලැබ ඇති දෝෂාරෝපණය වනුයේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා සහභාගි වූ අඟුණකොළපැලැස්ස නගර සභා ශාලාවේදී පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හම්බන්තොට කමිටු රැස්වීම් සඳහා සහභාගි

වීමට පැමිණි නාමල් රාජපක්ෂ මහතා හට ආරක්ෂාව සැලසීම සඳහා පැමිණි යුධ හමුදා කෝප්‍රල් රුවන් සේනක යන තැනැත්තාට ගිනි අවියක් රැගෙන උත්සව ශාලාවට ඇතුළු වීමට ඉඩ ලබා දෙන ලදැයි යන්න වේ. මෙම කොමිෂන් සභාව ඉදිරියේ අනාවරණය වන ලද කරුණු අනුව සහකාර පොලිස් අධිකාරි මල්ලවගේ හට දෝෂාරෝපණයක් එල්ල කිරීම සඳහා සඳහන් කරනු ලබන ගිනි අවිය සැබවින්ම තිබූවක් නොව සිතින් මවා ලද්දකි. එබඳු දෝෂාරෝපණයක් එල්ල කිරීම අරමුණු කීපයක් පදනම් කර ගනිමින් සිදු කරන ලද්දක්ය යන නිගමනයටද කොමිෂන් සභාව එළඹ සිටී. ප්‍රධාන අරමුණ වනු ලැබ ඇත්තේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා හට චෝදනාවක් නැගීමය. එමෙන්ම ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සමීප ආරක්ෂකයෙකු වශයෙන් දීර්ඝ කාලයක් කටයුතු කරනු ලැබ ඇති සහකාර පොලිස් අධිකාරි මල්ලවගේ දේශපාලන පලි ගැනීමකට ලක් කිරීමය. එමෙන්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ආරක්ෂක කටයුතු පොලිස් විශේෂ කාර්යය බලකාය වෙත පැවරීමට හේතුවක් නිර්මාණය කරගනු ලැබීමය. කරුණු මෙසේ හෙයින් සහකාර පොලිස් අධිකාරි මල්ලවගේ හට එරෙහිව ඉදිරිපත් කෙරෙන ලද යථෝක්ත චෝදනාව මුළුමනින්ම නිර්මාණය කරන ලද සාක්ෂිය මත පදනම් වූවක් බව මෙම කොමිෂන් සභාව තීරණය කරනු ලබයි.

## නිර්දේශ

01. සහකාර පොලිස් අධිකාරි එම්.එස්.පී මල්ලවගේ සැකකරුවෙකු කරනු ලැබ අඟුණකොළපැලැස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ ඉදිරිපත් කරනු ලැබ ඇති බී 198/15 දරණ වාර්තාවට වැඩිදුර කටයුතු කළ හැකි වන්නේද යන්න නීතිපතිවරයා විසින් සළකා බැලිය යුතුව තිබූ අතර මෙම පරික්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ විමර්ශනය පැවැත්වෙන අතරතුරදී යථෝක්ත නඩු කටයුත්ත අවසන් කෙරෙන ලද බැව් අතිරේක සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය මහතා කොමිෂන් සභාව දැනුවත් කර සිටින ලදින් මෙම කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබිය යුතුව තිබූ එම නිර්දේශය අනුව කටයුතු කිරීම දැනටමත් සම්පූර්ණ වී ඇති බව සටහන් කරනු ලබයි.

02. මෙම නඩු කටයුත්තට භාජනය වීම හේතුවෙන් සහකාර පොලිස් අධිකාරි මල්ලවගේ හට අහිමි වන ලද ජ්‍යෙෂ්ඨතාවය සහ උසස්වීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / පොලිස් කොමිෂන් සභාව විසින් සළකා බලනු ලැබ ලබා දීමට අවශ්‍ය පියවර පොලිස්පතිවරයා විසින් ගත යුතු බවට නිර්දේශ කරනු ලබයි.

03. අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමෙන් සහ අසත්‍ය සාක්ෂි ලබා දීමෙන් ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට පත් කරන ලද වගඋත්තරකාර පොලිස් නිලධාරින්ට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව / පොලිස් කොමිෂන් සභාව මගින්

විනයානුකූලව කටයුතු කිරීමට සැලසීම පොලිස්පතිවරයා විසින් සිදු කළ යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

මල්ලවගේ 1988.06.01 වන දින උප පොලිස් පරික්ෂකවරයකු වශයෙන් ජාතික රහස් තොරතුරු කාර්යාංශයට අනුයුක්තව පොලිස් සේවයට බැදී මූලික පුහුණුවෙන් පසු එම කාර්යංශයේ හා ශ්‍රී ලංකා පොලිසියේ විවිධ කොට්ඨාශ වලට අනුයුක්තව සේවය කර ඇත. පසුව ඔහු 2013.07.15 වන දින සහකාර පොලිස් අධිකාරි තනතුරට උසස්වීම් ලබා මේ වන විට වවුනියාව කොට්ඨාශයට අනුයුක්තව රාජකාරි කරයි. ඔහු 1998.04.10 වන දින සිට 2015.05.08 වන දින දක්වා කාලය තුල ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයට අනුයුක්තව වසර 17 කට අධික කාලයක් සේවය කල අතර ජනාධිපති ආරක්ෂක අංශයේ බුද්ධි හා ආවේක්ෂණ අංශයේ හා විශේෂ විමර්ශණ අංශයේ ස්ථානාධිපතිව සිට එවකට ජනාධිපතිව සිටි ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා හා පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාවට හා කීර්ති නාමයට අදාල බුද්ධි තොරතුරු රැස් කිරීම, එම තොරතුරු විශ්ලේෂණය කිරිම හා එම තොරතුරු වලට අදාල ආරක්ෂක ක්‍රියා මාර්ග ගැනිම සිදු කළ අතර අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු පවුලේ සාමාජිකයින් සහභාගි වන උත්සව අවස්ථා වල ආවේක්ශණ රාජකාරි සදහා නිලධාරින් යොදවමින් එම රාජකාරි අධික්ෂණය කරමින් එතුමා ඇතුළු පවුලේ සාමාජිකයින් ආරක්ෂා කිරිමට උපරිම අයුරින් රාජකාරි ඉටුකර ඇත. මල්ලවගේ ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ ස්ථානාධිපති ලෙසද ඔහු වෙත පවරා තිබු රාජකාරි ඉතා කැපවිමෙන් හා උපරිම අයුරින් ඉෂ්ඨ කිරිමට කටයුතු කර ඇත. ඔහු ජනාධිපති

ආරක්ෂක අංශයට අනුයුක්තව වසර 17 ක සේවා කාලයක් රාජකාරි කර ප්‍රභූ ආරක්ෂාව පිළිබඳව මනා පළපුරුද්දක් සහිත නිළධාරියෙකු වන අතර ප්‍රභූ ආරක්ෂාව සම්බන්ධයෙන් රාජකාරිය සිදු කිරීමට අදාලව විශේෂ පුහුණුවීම් හා අවබෝධයක් ලද නිළධාරියෙකි. 2015 වර්ෂයේ නව ජනාධිපති වශයෙන් පත්වූ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආරක්ෂක රාජකාරි සිදුකළ ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ ද ඔහු සේවය කළ අතර, 2015.04.25 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ඇතුළු ප්‍රභූන් පිරිසක් අගුණකොළපැලැස්ස නගර සභා ශාලාවේදී පැවැති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හම්බන්තොට දිස්ත්‍රික් කමිටු රැස්වීම සඳහා සහභාගි වීමට පැමිණි අවස්ථාවේ එම උත්සව භූමියේ වට ආරක්ෂක රාජකාරි , උත්සවයට ඇතුළු වන ප්‍රභූන් හා මහජනතාව පරික්ෂා කිරිම, දොරටුවල රාජකාරි කටයුතු සඳහා යොදවා සිටි නිලධාරින්ගේ රාජකාරි පරික්ෂාව හා පිටත කලාප ආරක්ෂක රාජකාරි නිළධාරින් පරික්ෂාව ඇතුළු අධික්ෂණය රාජකාරි සඳහා ඔහු යොදවා තිබුණි. එදින එම උත්සව සඳහා පැමිණි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රි නාමල් රාජපක්ෂ මහතා සහ ඔහුගේ ආක්ෂක නිළධාරි යුධ හමුදා කෝප්‍රල් විහාර ගෙදර රුවන් සේනක යන අය කිසිදු පරික්ෂාවකින් තොරව ගිනි අවියක් රැගෙන උත්සව භූමියට ඇතුළු වූවා යැයිද, ගිනි අවියක් රැගත් පුද්ගලයකු පරික්ෂාවකින් තොරව උත්සව භූමියට ඇතුළුවීමට මා විසින් ඉඩ සැලසූවා යැයිද, චෝදනා කරමින් 2015.05.16 දිනැති පොලිස්පති තුමාගේ අංක AGP/PA/DIG/OUT/1888/2015 දරණ ලිපිය මගින් මල්ලවගේ ගේ වැඩ තහනමකට ලක් කර ඔහු හට විරුද්ධව අගුණකොළපැලැස්ස ම/උ බි 198/2015 යටතේ 2015.05.19 වන දින අධිකරණයට කරුණු වාර්තා කර ඔහුව අත් අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කර

දින 14 ක් තංගල්ල බන්ධනාගාරයේ රක්ෂිත බන්ධනාගාර ගත කර 2015.06.01 වන දින ඇප මත මුදවා හරින ලදි. එදින සිට මේ දක්වා මෙම නඩුව සඳහා ඔහු අධිකරණයේ සැකකරුවකු ලෙස පෙනී සිටී. විශේෂයෙන්ම මෙම කාල වකවානුවේ ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රී තුමා එවකට පැවති යහපාලන රජයෙන් අත් අඩංගුවට ගැනීමට කුමක් හෝ කරුණක් සොයමින් සිටි වකවානුවක් වූ බැවින් අතිගරු මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති වී සිටි කාලයේ එතුමාගේ හා ගරු නාමල් මන්ත්‍රීතුමාගේ ආරක්ෂක රාජකාරි භාරව සිටි මොහු අත් අඩංගුවට ගැනීමෙන් ගරු මන්ත්‍රීතුමා අත් අඩංගුවට ගැනීම සඳහා පහසු අවස්ථාවක් හා කරුණක් සලසා ගැනීමේ අභිමාර්ථයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුවේ එවකට සහකාර පොලිස් අධිකාරි වරයකු වශයෙන් සේවය කළ ශානි අබේසේකර ඇතුළු කණ්ඩායමක් විසින් අසත්‍ය චෝදනා ගොනු කර ඔහුව අත්අඩංගුවට ගෙන ඇත. එසේ අත් අඩංගුවට ගැනීමෙන් ඔවුන් උත්සාහ කලේ ඔහු වෙත බලපෑම්කර ප්‍රශ්නගත අවිය නාමල් රාජපක්ෂ මැතිතුමා දැනුවත්ව උත්සව භූමියට එසේම, මෙම අත් අඩංගුවට ගැනීම මගින් ජනාධිපති ආරක්ෂක අංශය නිසි අවධානයෙන් හා සැලකිල්ලෙන් ආරක්ෂක රාජකාරි සිදු නොකරන බවට මතයක් ඇති කර එවකට ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය භාරව සිටි ජ්‍යෙ.නි.පො.ප. එස්.එම්. වික්‍රමසිංහ මහතා පොලිස්පති ධූරයට පත්වීම වැළැක්වීම සඳහාත්, ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ රාජකාරි සම්පූර්ණයෙන්ම ඉවත්කර පොලිස් විශේෂ කාර්යය බලකාය විසින් ජනාධිපතිවරයාගේ ආරක්ෂක රාජකාරි අත්පත් කර ගැනීම සඳහාත් එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධූරය දැරූ පූජිත් ජයසුන්දර මහතා හා පොලිස් විශේෂ කාර්යය බලකාය භාර සිටි නියෝජ්‍ය පොලිස්පති රංජිත් පෙරේරාත් යන

නිළධාරින් විසින් සැළසුම් කරන ලද ක්‍රියාවක ප්‍රතිඵලයක් බව ඔහුගේ හැඟීමයි. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මෙම සිද්ධිය තුලින් අත් අඩංගුවට ගැනීම හා එතුමාට දේශපාලනික වශයෙන් කැළලක් ඇති කිරීමේ අරමුණින්ම ඔහු මෙම සිද්ධියට සම්බන්ධ කර ඇති අතර මෙම සිද්ධිය වන අවස්ථාවේ ඔහු හැර වෙනත් සහකාර පොලිස් අධිකාරි වරයකු එම ස්ථානයේ රාජකාරි යෙදි සිටියේ නම් මෙවැනි අත් අඩංගුවට ගැනිමක් සිදු නොකරන බව ඉතා පැහැදිලිවේ. මෙම සිද්ධිය දේශපාලනික අරමුණු ඉෂ්ඨ කර ගැනිමේ අදහසින් ගොතා ඇති අසත්‍ය නඩුවක් වන අතර යුධ හමුදා කෝප්‍රල් විහාර ගෙදර රුවන් සේනක යන අය ගිනි අවියක් සමග ඇතුල් වුවේනම් එම ගිනි අවිය එම ස්ථානයේ දිම අත් අඩංගුවට ගතයුතු මුත් මේ වන තෙක් ගිනි අවියක් අත් අඩංගුවට ගෙන නඩු භාණ්ඩයක් ලෙස ඉදිරිපත් කර නොමැත. අපරාධ පරික්ෂණ දෙපාර්මේන්තුව මගින් නිති විරෝධි ගිණි අවියක් රැගෙන යාමට මල්ලවගේ ආධාර අනුබල දුන්නා යැයි කියා චෝදනා කලත් ඔවුන් නඩු භාණ්ඩයක් ලෙස මෙතෙක් නිති විරෝධි ගිනි අවියක් මෙම සිද්ධිය වු ස්ථානයේ දි අත් අඩංගුවට ගෙන නඩු භාණ්ඩයක් වශයෙන් අගුණකොළපැලැස්ස අධිකරණයට ඉදිරිපත් කර නොමැත. මෙය ඉතා බරපතල අස්ථාන චෝදනාවක් වන අතර ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රිතුමා අත් අඩංගුවට ගැනිමේ ඒකායන අරමුණින්ම හා ඔහු අතිගරු මහින්ද රාජපක්ෂ මහතා එතුමාගේ පවුලේ ඥාතින්ගේ ආරක්ෂක නිලධාරියා වශයෙන් කටයුතු කිරිම නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අසත්‍ය චෝදනා ඉදිරිපත් කර ඇති බව නැවත නැවතත් සදහන් කර ඇත. මෙම නඩු කටයුත්ත සඳහා එවකට යහපාලන රජයේ අමාත්‍යවරුන්ව සිටි රාජිත සේනාරත්න හා චම්පික රණවක සෘජුවම එවකට අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුවේ රාජකාරි කළ ශානි අබේසේකර මහතා මගින් අගුණකොළපැලැස්ස මහේස්ත්‍රාත් ලෙස කටයුතු කළ නයන්ත සමරතුංග මහතාට මෙම අධිකරණ කටයුත්ත සඳහා විවිධ බලපෑම් සිදුකළ බව පවසයි. සැබැවින්ම මෙම සිද්ධිය ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා අත් අඩංගුවට ගැනිමේ ඒකායන අරමුණින්ම ගොතන ලද නඩුවක් වන අතර ඒ සඳහා ඔහුගේ ප්‍රකාශයක් ලබා ගැනිමට නොහැකි වූ අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවකට සහකාර පොලිස් අධිකාරි ශානි අබේසේකර යහ පාලන රජයේ ඇමතිවරුන් වන පාඨලී චම්පික රණවන හා රාජිත සේනාරත්න යන ඇමතිවරුන් විසින් හිතා මතා ඉතා සැලසුම් සහගතව ගොතන ලද අසත්‍ය චෝදනාවක් බව පවසයි. 2015.04.25 වන දින අගුණකොළපැලැස්ස නගර සභා ශාලාවේදී පැවැති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හම්බන්තොට දිස්ත්‍රික් කමිටු රැස්වීම සඳහා සහභාගි වීමට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුළු ප්‍රභූන් පිරිසක් පැමිණිමට නියමිතව තිබුණි. ඒ සඳහා සහභාගිවිමට නාමල් රාජපක්ෂ මහතාද පැමිණ ඇත. ඔහුත් සමග ඔහුගේ ආරක්ෂක නිළධාරි යුධ හමුදා කෝප්‍රල් විහාර ගෙදර රුවන් සේනකද පැමිණ ඇත. මෙම උත්සව ශාලාව සහිත භූමියට ඇතුල්වීමට දොරටු කිහිපයක් තිබී ඇත. ඉන් එක් දොරටුවක් ජනාධිපති තුමාට ඇතුල්විම සඳහා වෙන්කර තිබූ අතර ආරාධිතයින්ට ඇතුල්වීම සඳහා වෙනත් දොරටුවක් වෙන්කර ඇත. නාමල් රාජපක්ෂ මන්ත්‍රී තුමා ඇතුළු වී තිබුනේ මෙම ආරාධිතයින්ට වෙන්කර තිබූ දොරටුවෙන්ය. එසේ ඇතුල්වීමට පෙර නිසි පරීක්ෂාවට ලක් කිරිම සාමාන්‍යයෙන් ඔවුන් විසින් අනිවාර්යයයෙන්ම සිදු කරනු ලබයි. ඒ සඳහා නිසි උපදෙස් නිළධාරින්ට දීලා ඔහු විසින් ඔවුන්ව ස්ථානගත කර ඇත. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඔහුගේ ආරක්ෂක

නිළධාරියා සමඟ එසේ වෙන් කර තිබූ දොරටුවෙන් ඇතුලට ගොස් ඇත. ආරක්ෂක නිළධාරියාට අවි ආයුධ සමඟ උත්සව භූමියට ඇතුල්වීමට අවසර ලබා දුන්නේ නැත. ඔහු මන්ත්‍රීතුමා සමඟ මඳ දුරක් ගොස් වේදිකාවට මීටර 40 ක් පමණ දුරකින් නැවති සිටිය බව මල්ලවගේ පසුව දැනගෙන ඇත. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා වෙන් කර තිබූ විශේෂ දොරටුවෙන් උත්සව සභාවට පැමිණි ඇත. නාමල් රාජපක්ෂ මැතිතුමාත් එම වේදිකාවේ සිටි බවත් උත්සවයට පැමිණි යම් ප්‍රභූවරයෙකුගේ ජීවිතයට හානියක් කිරීමට අවශ්‍ය නම් කෝප්‍රල් විහාර ගෙදර රුවන් සේනකටද මන්ත්‍රී තුමා සමඟ වේදිකාවට හෝ වේදිකාව ආසන්නයට යාමට ඕනෑ තරම් ඉඩ ප්‍රස්ථාව තිබූ බවත්, එසේම යම් පුද්ගලයෙක් ප්‍රභූවරුන් ගමන් ගන්නා මාර්ගය අසළ රැඳී සිටියා නම් එම ප්‍රභූ මාර්ගය ඔස්සේම වේදිකාවට පැමිණෙන ඕනෑම පුද්ගලයෙකුගේ ජිවිත හානියක් කිරීමේ අවස්ථාව ඉතා පහසුවෙන්ම ලබා ගැනීමට හැකියාව තියෙන බව පවසයි. ඒ අනුව, අවි සහිතව පැමිණි අදාල කෝප්‍රල් විසින් යම් අපරාධයක් කිරීමේ චේතනාවෙන් උත්සව භූමියට ඇතුල් වුනානම් හෝ වෙනත් කිසිවෙකු විසින් අදාල කෝප්‍රල්වරයාව උත්සව භූමියට එවා තිබුණේ නම් ඔහුව ස්ථාන ගත කළ යුතුව තිබුණේ වේදිකාව අසළ හෝ ප්‍රභූවරුන් වේදිකාවට පිවිසීමට වෙන් කර තිබූ ප්‍රවිෂ්ඨ මාර්ගයේය. ඒ අනුව, මෙම චෝදනාව ඉතා හාස්‍ය ජනක කථාවක් ලෙස පෙන්වා දෙමින් ඔහු එය බැහැර කරන බව පවසයි. තවද, කෝප්‍රල් රුවන් සේනක රැඳි සිටි ස්ථානයට පැමිණි විශේෂ කාර්ය බලකායේ නිළධාරීන් දෙදෙනා විසින් අදාල කෝප්‍රල්වරයා සන්තකයේ යම් ගිණි අවියක් තිබෙනවා දුටුවා නම් ඔවුන් විසින් කළ යුතුව තිබුණේ පලමුවෙන්ම එම කෝප්‍රල්වරයා නිරායුධ කොට ඒ අවස්ථාවේදීම එම ගිණි අවිය සමඟ අදාල

කෝප්‍රල්වරයාව අත්අඩංගුවට ගැනීමයි. එය අති විශේෂ ප්‍රභූ ආරක්ෂක නිළධාරින්ගේ රාජකාරි වගකිමයි. එසේම ප්‍රභූ ආරක්ෂාව සම්බන්ධයෙන් සුවිශේෂී දෙස් විදෙස් පුහුණු ලබා ඇති විශේෂ කාර්ය බලකායේ නිළධාරීන් වන මොවුන් නීති විරෝධි ගිණි අවියක් සමඟ පුද්ගලයෙකු දුටු විට එවැනි පුද්ගලයෙක් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිලිබඳව උපදෙස් හා නියෝග නිතරම ලබන නිළධාරීන් පිරිසකි. එහෙත් ඒ අවස්ථාවේදී ඔවුන් කටයුතු කර ඇත්තේ සිවිල් ආරක්ෂක බලකායේ නිළධාරින් ක්‍රියා කරනවාටත් වඩා අන්ත වූ දුර්වල ආකාරයෙනි. මල්ලවගේ එසේ ප්‍රකාශ කිරීමට හේතුව වුයේ විශේෂ කාර්ය බලකා නිළධාරින් සතුව අති නවීන සන්නිවේදන උපකරණ තිබියදීත්, එම යන්ත්‍ර උපයෝගි කරගෙන මෙවැනි අතිශයින් අවධානම් සහගත තොරතුරක් තම ප්‍රධානීන්ට දැන්විමට හැකියාව තිබියදීත්, එසේ නොකොට රාජකාරි විවේකය සඳහා උත්සව ශාලාවට පැමිණි සිටි පොලිස් සැරයන්වරයෙකුට මෙම සිද්ධිය සම්බන්ධයෙන් දැනුවත් කිරිමට පමණක් කටයුතු කර තිබූ නිසාය. එසේම අවසර නොමැති ගිනි අවි සහිතව මෙවැනි උත්සව භූමියක පුද්ගලයෙක් රැඳි සිටිනු දුටු විට ඔහුව අත්අඩංගුවට ගෙන ආසන්නතම පොලිස් ස්ථානයකට ඉදිරිපත් කළ යුතුව තිබුණද, එසේ කර නොමැති අතර, ගිනි අවියද මේ වන තෙක්ම අත්අඩංගුවට ගෙන නැත. මෙම උත්සවය එදින උදේ වරුවේ පවත්වා තිබුණ අතර, උත්සවයෙන් පසුව පාඨල චම්පික රණවක, රාජිත සේනාරත්න සහ එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිව සිටි පූජිත ජයසුන්දර සහ විශේෂ කාර්ය බලකායේ අණදෙන නිළධාරීව සිටි රංජිත් පෙරේරා යන මහත්වරුන් එකට එක්වී මෙම ව්‍යාජ පැමිණිල්ල සකස් කර ඉදිරිපත් කර ඇති බව ඔහුගේ හැගීමයි. එසේ කිරීමෙන් මොවුන් බලාපොරොත්තු වී තිබුණේ එවකට

ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ ප්‍රධානියා වූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එස්.එම්. වික්‍රමසිංහ මහතාව පොලිස්පති ධූරයට පත් වීමේ අවස්ථාව වැළැක්වීමත්, ප්‍රභූ ආරක්ෂක සේවය ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයෙන් ඉවත්කර එය විශේෂ කාර්ය බලකාය යටතට ගැනීමටත්, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ජනාධිපති ඝාතන කුමන්ත්‍රණයකට අත්අඩංගුවට ගෙන ඔහුගේ දේශපාලන ජීවිතය අවසන් කරලීම සහ රාජපක්ෂ පරම්පරාවේ සමස්ත සාමාජිකයින්ගේ දේශපාලන ගමන් මග අහුරාලීමටත් ඒ වන විට ජනාධිපතිවරණයෙන් පරාජිතවීමෙන් දැඩි මානසික පීඩනයකින් සිටි මහින්ද රාජපක්ෂ මහතා ව තව දුරටත් අසීරු තත්වයට පත් කිරිමෙ වේ. ඒ සඳහා එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරිව සිටි ශානී අබේසේකර මහතාට සහ ප්‍රධාන පොලිස් පරික්ෂක රංජිත් මුණසිංහ යන මහත්වරුන්ට මල්ලවගේගෙන් ප්‍රකාශයක් ලබාගැනීමට අවශ්‍යතාවය තිබුනත්, ඔහු විසින් එවැනි සාවද්‍ය ප්‍රකාශයක් නොදීම නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔහුව අත්අඩංගුවට ගෙන ඔහුගේ ඉදිරි ජීවිතය, පොලිස් ජීවිතය විනාශ කර දැමීමට කටයුතු කළ බව පවසයි. නමුත් ඔහු විසින් එසේ නාමල් රාජපක්ෂ මන්ත්‍රිතුමාව පාවා නොදීම හේතුවෙන් සහ සාවද්‍ය ප්‍රකාශයක් නොකිරිම හේතුවෙන් ඔවුන්ගේ දේශපාලන අභිමතාර්ථයන් ඉෂ්ඨ කරගැනීමට හා මුදුන් පත් කරගැනිමටත් නොහැකි වූ නිසා ඔහුව සිරගත කරනු ලැබූ බව පවසයි. ඒ අනුව 2015.05.19 වන දින සිට 2015.06.01 දක්වා දින 14ක් රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබූ අතර අඟුණුකොළපැලැස්ස අධිකරණයේ බී. 198/15 යටතේ කරුණු වාර්ථා කර ඇත. එම නඩුව 2020.05.26 දින කැදවා 2020.08.25 දිනට නිතිපති උපදෙස් සඳහා කල් තබා ඇත. මෙම නඩුවේ ඔහු දෙවෙනි

සැකකරු වශයෙන් නම්කර ඇත. මෙලෙස දේශපාලනික වශයෙන් හා ද්වේශ සහගතව අස්ථාන චෝදනා ඔහු හට ඉදිරිපත් කිරීමෙන් ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයෙන් ස්ථාන මාරුකර පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය වෙතද ඉන් අනතුරුව වවුනියාව කොට්ඨාශයට ස්ථාන මාරුවීම් කරන ලදි. මල්ලවගේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂක ඒකකයේ කටයුතු කිරීම හා ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව භාරව කටයුතු කිරීම හා ඔහුගේ පවුලේ සාමාජිකයින් ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා නියෝජනය කරන පක්ෂයට ලැදිව කටයුතු කිරීම නිසා මෙම දේශපාලන පලිගැනිම සිදු කර ඇති  බව ඔහුගේ හැඟිමයි. ඉහත දේශපාලනික පලිගැනිම සඳහා වූ අසත්‍ය චෝදනාව හැරෙන්නට ඔහු හට විරුද්ධව කිසිදු විනය පරික්ෂණයක් හෝ අධිකරණ නඩු කටයුත්තක් නොමැති බව පවසයි.

මෙම අසත්‍ය චෝදනාවන් හේතුවෙන් ඔහුගේ වැඩිමහල් දරුවන් දෙදෙනාගේ අධ්‍යාපනය කඩා වැටිම හා ඔවුන්ගේ අනාගතය අඳුරුවීම, දින 14 ක් බන්ධනාගාර ගතව සිටිම , දැනට වසර 05 ක කාලයක් නඩු වාර 28 ක් සඳහා සැකකරුවකු වශයෙන් අධිකරණයේ පෙනී සිටීමට සිදුවීම , නඩුව සඳහා නිතිඥ ගාස්තු හා වෙනත් වියදම් සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවීම,අධිකරණ නියෝග මත සති දෙකකට වරක් මාස 11 ක කාලයක් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටීමට සිදුවීම , ඒ වෙනුවෙන් විශාල මුදලක් වැයවීම සහ මානසික පීඩනයට ලක්වීම, වසරකට වැඩි කාලයක් වැඩ තහනමකට ලක්වීමෙන් දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ දැඩි මානසික පිඩනයකට ලක්ව සිටීම, ශ්‍රී ලංකා පොලීසියට බැදී නොකැළැල්ව සිදුකර ඇති අවුරුදු 32 ක පමණ සේවාව වෙනුවට සේවා කාලයට කැළලක් වීම,

මාධ්‍ය මගින් ඔහු අපරාධකරුවකු ලෙස සමාජයට පෙන්වා ඔහුගේ කීර්ති නාමයට කැළලක් සිදුකර එම කැළල නැවත නිවැරදි කර ගැනීමට නොහැකි අන්දමින් ඔහු මහත් මානසික පිඩාවට පත්වීම,මෙම සිද්ධිය හේතුවෙන් මනස ව්‍යාකූලව ඔහු හදවත් රෝගියකුවීම හා හදවත් ශෛල්‍යකර්මයක් සඳහාද මුහුණ පෑමට සිදුවීම, ඔහුගේ ඉදිරි උසස්වීම්, තනතුරේ සේවය ස්ථිර කර ගැනීම හෝ වැටුප් වර්ධක සකස් කර ගැනීමට නොහැකිව දිර්ඝ කාලයක් පීඩා විදිමින් සිටිම, බිරිඳට හා දරුවන්ට සමාජයට මුහුණ දීමට නොහැකි අන්දමින් ඔවුන් පීඩාවට පත්වි ඔවුන්ගේ අනාගතය අඳුරු වීම, ඔහු සමග සහකාර පොලිස් අධිකාරි තනතුරට පත් වූ අනෙකුත් නිලධාරින් මේ වන විට පොලිස් අධිකාරි හා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරුවලට උසස්වීම් ලබා ඇතත් මෙම දේශපාලනික පළිගැනීම හේතුවෙන් ඔහු මේ වන විටත් සහකාර පොලිස් අධිකාරි තනතුරේ පසුවීමට ඔහු හට සිදු වී ඇත. ඉහත සඳහන් පරිදි ඔහුට එරෙහිව සිදු කරන ලද ද්වේශ සහගත දේශපාලනික පළිගැනීම සැළකිල්ලට ගෙන ඔහුගේ සහකාර පොලිස් අධිකාරි තනතුරේ උසස්වීම 2008.01.01 දිනට පෙරදාතම කර ඊට අනුරූපීව ඉදිරි උසස්වීම් ලබාදීමටත් අසත්‍ය චෝදනා යටතේ ගොනු කර ඇති නඩු කටයුත්ත ඉවත්කර ගැනීමටත් අවැසි කටයුතු සිදුකර දෙනමෙන් ඉල්ලා ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ.14 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .L

පැමිණිලි අංකය - 22/2020

පැමිණිලිකරු - මහප්පුගේ දොන් කපිල ප්‍රියදර්ශන ආරියවංශ

ලිපිනය - නො.67, සුභද මාවත, තලවතුගොඩ පාර, මාදිවෙල, කෝට්ටේ.

වගඋත්තරකරුවන් නම් කර නැත.

## තීරණය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අධ්‍යක්ෂක ලෙස දෙපාර්තමේන්තුගත තනතුරක සේවය කරන ලද මහප්පුගේ දොන් කපිල ප්‍රියදර්ශන ආරියවංශ යහපාලන රජය බලයට පත් වීමත් සමග දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු කරනු ලැබ කිසිදු නියමිත් විෂයක් නොපවරා අවමන් සහගත තත්වයකට පත් කරනු ලැබීමෙන් යහපාලන රජය තුළ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වශයෙන් කටයුතු කරනු ලැබූ තැනැත්තන් කපිල ආරියවංශ දේශපාලන පලි ගැනීමට පත් කරනු ලැබ ඇති අතර එසේ සිදු කරනු ලැබ ඇත්තේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දියත් කර තිබූ දිවි නැගුම වැඩසටහන සම්බන්ධයෙන් පොත් පිංචක් නිර්මාණය කිරීමේ හේතුව මතය. ඔහු විසින් සිදු කරන ලද එම රාජකාරිමය කටයුත්ත දේශපාලන කටයුත්තක් සේ සලකා ඔහු පලි ගැනීමට ලක් කරනු ලැබ ඇති අතර ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා

වශයෙන් කටයුතු කරන ලද බැසිල් රාජපක්ෂ මහතාට එරෙහිව සාක්ෂි නිර්මාණය කිරීම සඳහා කපිල ආරියවංශ යොදා ගැනීමට පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් දරණ ලද උත්සහයක් අසාර්ථක වීමද කපිල ආරියවංශ දේශපාලන පලි ගැනීමට ලක් කිරීමට හේතුවක් කර ගනු ලැබ ඇති බවත් මෙම කොමිෂන් සභාව නිරික්ෂණය කරනු ලබයි.

## නිර්දේශය

1. කපිල ප්‍රියදර්ශන ආරියවංශ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2015.01.08 දින දරමින් සිටින ලද තනතුරෙහි පිහිටුවනු ලැබීමටත් ඔහු අඛණ්ඩව එම තනතුරෙහි සේවය කරන ලද්දේ නම් ඔහුට හිමිවිය යුතුව තිබූ උසස්වීම් සහ වරප්‍රසාද ලබා දීම යුතු බවටත් මෙම කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

මහප්පුගේ දොන් කපිල ප්‍රියදර්ශන ආරියවංශ (මින් ඉදිරියට කපිල ආරියවංශ යනුවෙන් හඳුන්වනු ලබයි) කපිල ආරියවංශ මූලික අධ්‍යාපනය ගාල්ල මහින්ද විද්‍යාලයේ 1981 සිට 1994 දක්වා හදාරා ඇති අතර ඉන් පසුව 1996 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) සමත්ව කොළඹ විශ්ව විද්‍යාලයට 1999 වර්ෂයේදී කලා අංශයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට තේරී පත් වී ඇත. විශ්ව විද්‍යාලයෙන් අන්තර්ජාතික සබඳතා පිළිබඳ (විශේෂ) උපාධියක් 2003 වර්ෂයේදී ලබාගෙන ඇත.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරන කාල සීමාව තුළ 2000.04.28 දිනැති අංක බ/36 යටතේ ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් යුතු පත්වීම මගින් ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශයේ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඒකකයට සම්බන්ධ වී එහි ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය නිළධාරීවරයකු වශයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සුදුසුකම් මත ස්ථිර රැකියාවක් කරනු ලැබ ඇත. උපාධිය අවසන් වීමෙන් පසුව රජයේ නිළ ගැසට් නිවේදනයට අනුව ගැසට් කර තිබූ අධ්‍යයන සහකාර තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ අතර ඒ අනුව ඔහු රාජකාරී කරමින් සිටි ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේම 2005.07.07 වන දින සිට අධ්‍යයන සහකාර තනතුර සඳහා පත්වීම් ලැබිණ. මෙම ආයතනය අර්ධ රාජ්‍ය අංශය ගණයට අයත් ආයතනයක් වන අතර විශ්‍රාම වැටුප් රහිත රැකියාවකි. නො. 100, කඳවල පාර, රත්මලාන ලිපිනයේ ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පිහිටි අතර එම ස්ථානයේ සිට රැකියාව සිදු කර ඇත. මෙම ආයතනය ශ්‍රී ලංකාව තුළ රජයේ තාක්ෂණික ආයතනයන්හි සේවයේ නියුතු උපදේශකවරුන් සහ ප්‍රධානීන්ට අවශ්‍ය වැඩිදුර ඉගැනුම් සේවා ලබාදීම සිදුවූ අතර වර්තමානයේ එය තාක්ෂණ විශ්ව විද්‍යාලය ලෙස පාර්ලිමේන්තු පනතක් මගින් උසස් කර ඇත.

මෙම ආයතනය තුළ ඔහුට පැවරී ඇති රාජකාරීමය වගකීම වූයේ ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණය හා නව මාධ්‍ය පිළිබඳ ඉගැන්වීම් සහ පුහුණු කිරීම අදාළ නිළධාරීන්ට හා පාඨමාලා ලාභීන්ට සිදු කිරීමයි. මෙම ආයතනය තුළ 2000 සිට 2006 යන කාලය තුළ ඔහු රාජකාරී කළ අතර එම කාලසීමාව තුළ ආයතන ප්‍රධානී ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරුන් කටයුතු කරන අතර ඔහු යටතේ මානව සම්පත් කළමනාකරණ අංශය,

තොරතුරු තාක්ෂණික අංශය, විෂයමාලා සංවර්ධන අංශය සඳහා අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු පමණ කටයුතු කරන අතර මෙහි තොරතුරු තාක්ෂණික අංශයෙහි ඇති ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකයේ අධ්‍යයන සහකාරවරයකු වශයෙන් මොහු 2006.04.17 දින දක්වා සේවය කර ඇත. මෙම තොරතුරු තාක්ෂණික අංශය තුළ අධ්‍යක්ෂවරයාට වගකිවයුතු වන්නේ ඊට පහළ තනතුරේ සිටි කථිකාචාර්යාවරයායි. ඔහුට පහළින් සහකාර කථිකාචාර්ය ධූරය පවතී. සහකාර කථිකාචාර්යවරයාට වගකිව යුතු වන්නේ අධ්‍යයන සහකාරවරයායි. මානව සම්පත් කළමණාකරණ අංශය යටතේ පරිපාලන කටයුතු පවත්වාගෙන යනු ලැබීය. ඊට අමතරව විෂයමාලා සංවර්ධන අංශය යටතේ විෂයමාලා සකස් කිරීම සහ පුහුණු කිරීම් කටයුතු සිදු කරනු ලැබීමයි. ආයතනය තුළ එක් එක් අධ්‍යක්ෂ යටතේ පැවති විෂය පථයන් ඉහත පරිදි සැකසී ඇත. ඒ අනුව 2004.02.02 වන දින සිට 2004.04.23 දින දක්වා වැඩිදුර අධ්‍යයනය සඳහා රජය මගින් ලබාදී තිබූ ඉගෙනුම් සම්පත් සංවර්ධන පාඨමාලාව (මොඩියුල් 3622A) සඳහා ඕස්ට්‍රේලියාවේ TAFE ආයතනය වෙත කපිල ආරියවංශ සහභාගී වී ඇත. පාඨමාලා කාලය පැය 240 කි. මෙම පාඨමාලාව හදාරා පැමිණීමෙන් පසුව ඔහු හැදෑරූ පාඨමාලාවේ විෂයපථයට අනුව ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය තුළ නියමිත ප්‍රමිතිගතව හා නිසි අවසරයකින් යුතුව වීඩියෝ නිශ්පාදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හා රේඛීය නොවන වීඩියෝ සංස්කරණ ඩිප්ලෝමා පාඨමාලාව යන පාඨමාලා දෙක ඔහු විසින් නිර්මාණය කර ආරම්භ කරන ලදී. එය අද දින දක්වාම තාක්ෂණ විශ්ව විද්‍යාලය තුළ යම් යම් වෙනස්කම් වලට භාජනය කරමින් උපාධිය දක්වා පවත්වාගෙන යනු ලබයි. මෙසේ කාලය ගෙවී යන අතර තුර

2006.02.13 වන දින ඩේලි නිව්ස් පුවත්පතේ, ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය විසින් මාධ්‍ය අධ්‍යක්ෂ තනතුරු ඇබැර්තුවක් පවතින බවට දැන්වීමක් ප්‍රසිද්ධ කර තිබුණි. ඒ අනුව ඔහු විසින් අයදුම්පතක් ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව ඔහුගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා 2006.03.13 වන දින ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පාලන විසින් ඔහු රාජකාරී කළ ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය වෙත ඔහුගේ නමින් කැඳවීම් ලිපියක් යොමු කර ඇත. එම ලිපියට අනුව ඔහු අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය. ඒ අනුව 2006.03.23 දිනැති ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් එම්.එස්. ජයසිංහ මහතා විසින් අත්සන් කරන ලදුව අංක MNBD/4/1/5/5 ප්‍රකාරව ඔහු 2006.03.23 වන දින සිට ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ මාධ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා තෝරාගෙන ඇති බවට පත්වීම් ලිපිය එම අමාත්‍යාංශයේදී ඔහු වෙත ලබාදෙන ලදී. ඉන් පසුව ඔහු 2006.03.24 වන දින ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් එච්.කේ. කළුගම්පිටිය මහතා වෙත අධ්‍යයන සහකාර තනතුරින් ඉල්ලා අස්වීමේ ලිපිය භාරදී ඇත. ඒ අනුව 2006.04.03 වන දින ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් එම්.එස්. ජයසිංහ මහතා වෙත රාජකාරී වාර්තා කිරීම පිළිබඳ ලිපිය ඔහු විසින් ඉදිරිපත් කරන ලදී.

මෙම අමාත්‍යාංශයේ තනතුරු ධූරාවලිය වනුයේ ඉහළ සිට පහළට කැබිනට් අමාත්‍යවරයා, අමාත්‍යවරුන් කැබිනට් නොවන 08 දෙනෙක් සහ නියෝජ්‍ය 01 ලෙස, නියෝජ්‍ය අමාත්‍යවරුන් එකක් හා ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා ලෙස ලේකම්වරයා කටයුතු කරන අතර

ලේකම්වරයා යටතේ අතිරේක ලේකම්වරුන් 09 දෙනෙකු පමණ කටයුතු කරන අතර ඔවුන් අතරින් අතිරේක ලේකම් පාලන යටතේ සහකාර අධ්‍යක්‍ෂක ලෙස ඔහු කටයුතු කරන ලදී. අතිරේක ලේකම් පාලන යටතේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, සහකාර අධ්‍යක්‍ෂ මාධ්‍ය ආදී වශයෙන් ධුරාවලියේ ඔහු සහකාර අධ්‍යක්‍ෂ මාධ්‍ය ලෙස කටයුතු කර ඇත. මෙම අමාත්‍යාංශය එවකට කැබිනට් අමාත්‍යවරයා වූයේ එවක ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතාය. එහි නියෝජ්‍ය අමාත්‍යවරයා වූයේ දි.මු. දසනායක මහතායි. ඒ මහතාගේ ක්‍ෂණික අභාවයෙන් පසුව අමාත්‍යාංශය තුළ රාජ්‍යය අමාත්‍යවරු / කැබිනට් නොවන අමාත්‍යවරුන් වශයෙන් සාලින්ද දිසානායක, රෝහිත අබේගුණවර්ධන, සුසන්ත පුංචිනිළමේ, ගුණරත්න වීරකෝන්, මුත්තු ශිවලිංගම්, එස්.එම්. චන්ද්‍රසේන, ජගත් පුෂ්පකුමාර යනාදී වශයෙන් එකවර හා විවිධ අවස්ථාවන්හිදී රාජකාරී කටයුතු සිදු කරනු ලැබිණි. මෙම අමාත්‍යවරුන් විසින් දිවයිනේ පළාත් බෙදී ඇති ආකාරයට ඒ ඒ පළාත තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අමාත්‍යාංශය භාර කැබිනට් අමාත්‍යවරයා විසින් ප්‍රධානතම වගකීම ලෙස පවරා තිබුණි. ඒ අනුව දක්ෂිණ සංවර්ධනය, උතුරු නැගෙනහිර සංවර්ධනය, ගම නැගුම, විවිධ ව්‍යාපෘති හා තවත් දෑ මෙම අමාත්‍යවරුන්ට ලබාදී තිබුණි. මෙම අමාත්‍යවරුන් හට ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය විසින් අවශ්‍ය සේවාවන් මහත් දුෂ්කරතා මධ්‍යයේ වුවද ඉහත රාජකාරී කටයුතුවලදී මාධ්‍ය ආවරණය සපයනු ලැබිණි. 2005.12.02 දින සිට 2006.04.21 දින දක්වා වූ කාලය තුළ රාජ්‍යසේවා කොමිෂන් සභාවේ බලතල අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පවරා ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය මගින් 2007.11.06 වන

දින මාගේ අංක A/SA/විවිධ/2004 යටතේ ලබාදී ඇති බවට පෙන්වා දී ඇත.

අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉහත පරිදි ලබාදී ඇති බලතල ප්‍රකාරව ඔහු මෙසේ මාධ්‍ය අධ්‍යක්‍ෂ තනතුරට ලේකම්වරයා විසින් බඳවාගෙන ඇත. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසත්, උක්ත ලිපිය මගින් දැනුම්දී ඇත. ඒ අනුව ක්‍රියාත්මක වෙමින් 2009.10.20 වන දින අංක MNPD/E8/05/08 යටතේ ජාතිය ගොඩනැගීමේ හා වතුයටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම් වෙත මාධ්‍ය අධ්‍යක්‍ෂ තනතුරට බඳවාගැනීම පිළිබඳ ශීර්ෂය සහිත ලිපිය ඉදිරිපත් කරයි. ඒ අනුව කපිල ආරියවංශ දරන මාධ්‍ය අධ්‍යක්‍ෂ තනතුර දීපව්‍යාප්ත සේවාවට අයත් තනතුරක් නොවන අතර එය දෙපාර්තමේන්තු ගත තනතුරක් හා විධිමත් පත්වීමක් බවට සඳහන් කර ඇත. ඉන් පසුව ජාතික වැටුප් හා කොමිෂන් සභාවේ ලේකම් විජයරත්න මහතා විසින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ආයතන අංශයේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා වෙත අංක NSCCC/2/3/1/3/40 හා 2010.01.19 දිනැති ලිපිය මගින් සහකාර අධ්‍යක්‍ෂ (මාධ්‍ය) තනතුරේ නිළ නාමය වශයෙන් සංශෝධනය කිරීමට යටත්ව SL1/2006 වැටුප් පරිමාණය නිර්දේශ කර ඇත. ඒ අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්‍ෂ ජනරාල් පාලන (ග්‍රාමීය ආර්ථික) විසින් අංක MED/4/1/5/PF/MD/1 දරණ හා 2011.09.06 දිනැති ලිපිය මගින් අදාළ තනතුරේ සංශෝධනය ඔහු වෙත නිළ වශයෙන් දැනුම් දී ඇත. ඉන්පසු 2009 නොවැම්බර් මස ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය සඳහා නව නිළධාරීන් 09 දෙනෙකු

අලුතෙන් බඳවා ගනු ලැබීය. ඒ අනුව ප්‍රවෘත්ති නිළධාරීන් තිදෙනෙක්, නිශ්චල ඡායාරූප ශිල්පීන් දෙදෙනෙකු, වීඩියෝ කැමරා ශිල්පීන් දෙදෙනෙකු හා කැමරා සහයකවරුන් දෙදෙනෙකු බඳවා ගනු ලැබීය. එමඟින් අමාත්‍යාංශයේ නිළ රාජකාරී මාධ්‍ය ආවරණ කටයුතු වඩාත් පුළුල් හා පහසු ලෙස කර ගැනීමට හැකි වී ඇති අතර ඔහු එහි අංශ ප්‍රධානි වශයෙන් රාජකාරි කටයුතු කර ඇත. ඒ අනුව 2010.05.27 දිනැති අංක MED/4/1/9/TRA ලිපිය මගින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් අප මාධ්‍ය ඒකකය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්‍ෂ ජනරාල් සංවර්ධන හා සන්නිවේදන යටතට වහාම ක්‍රියත්මක වන පරිදි පත් කරනු ලැබීය. ඉන් පසුව 2012.12.12 දිනැති අංක MED/4/5/PF/MD/01 ලිපිය මගින් ඔහු අදාළ සේවයේ ස්ථිර කරන ලද බව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පාලන විසින් කපිල ආරියවංශ වෙත ලිඛිතව දැනුම්දෙන ලදී. ඒ අනුව ඔහු සහකාර අධ්‍යක්‍ෂ (මාධ්‍ය) ලෙස 2006.04.17 දින සිට සේවයේ ස්ථිර කර ඇත.

කපිල ආරියවංශ අන්තර්ජාතික සබඳතා පිළිබඳ (විශේෂ) උපාධියක් 2003 වර්ෂයේදී ලබාගෙන ඇත. 2010 වර්ෂයට පසුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ (ඩාලි පාරේ පිහිටි) ස්ථානයේ පළමු මහලේ සංවර්ධන හා සන්නිවේදන අංශයේ ප්‍රධානී අධ්‍යක්‍ෂ ජනරාල් මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර මහතා යටතේ සේවය කර ඇත. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ධුරාවලි ව්‍යුහය මෙසේ විය. කැබිනට් අමාත්‍ය, නියෝජ්‍ය අමාත්‍ය, ලේකම්, අතිරේක ලේකම්, අධ්‍යක්‍ෂ ජනරාල් (සංවර්ධන සන්නිවේදන), සහකාර අධ්‍යක්‍ෂ මාධ්‍ය, වශයෙන් කෙටියෙන් ප්‍රකාශයට අවශ්‍ය වන පරිදි වේ. මෙහිදී සහකාර අධ්‍යක්‍ෂ මාධ්‍ය ලෙස කපිල ආරියවංශ ඇතුළු නිළධාරීන් පිරිස එම

අමාත්‍යාංශයේ නිල කාර්යයන් දෛනිකව ඉටු කරන ලදී. ඒ අතර අමාත්‍යාංශය හා ආශ්‍රිත ආයතන මගින් සිදු කරන සංවර්ධන කාර්යයන් පිළිබඳව මහජනතාව විවිධ මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීම් සිදු කරනු ලැබිණි. ඊට අමතරව රජයේ සංවර්ධන වැඩසටහන් සංධිස්ථානයක් වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සංවිධානය කිරීමේලා ප්‍රධාන භූමිකාව අමාත්‍යාංශය වෙනුවෙන් ඔහු විසින් ඉටුකරන ලදී. දැයට කිරුළ ප්‍රදර්ශනයේ කපිල ආරියවංශ හට විශාල වගකීමක් පැවරී තිබූ අතර අමාත්‍යාංශ ලේකම් හරහා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් මගින් පැවරෙන රාජකාරීමය වගකීමක් වන අතර දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ වූ කාලයේ සිටම අවසන් දැයට කිරුළ ප්‍රදර්ශනය දක්වාම ඔහු ඉහත රාජකාරී ඉටුකළ අතර ඒ සම්බන්ධයෙන් එක් වරකදී ලබාදී දුන් ඇගයීම් සහතිකයක් ද ඔහුට ලැබී ඇත. මෙම කාලසීමාව තුලදී කපිල ආරියවංශ විසින් ඔහුගේ ශාස්ත්‍රපති උපාධියද සම්පූර්ණ කර ගන්නා ලදී. එය කැලණිය විශ්ව විද්‍යාලයේ FGS/M/MA/2005/97 දරණ ශිෂ්‍ය ලියාපදිංචි අංකය යටතේ සම්පූර්ණ කර 2009 සැප්තැම්බර් 01 වන දින ජනසන්නිවේදනය පිළිබඳ එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධිය ලබා ගන්නා ලදී. මෙම රාජකාරී කාලය තුලදී අමාත්‍යාංශයට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබාගැනීමේදී ඒ සඳහා ඇති කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජික ලෙස සැහෙන ප්‍රමාණයකට ඔහුගේ සේවය ලබාදී ඇත. තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයකු වශයෙන් ද කපිල ආරිවංශ කටයුතු කර ඇත. අදාළ සුදුසුකම් සැපිරීමෙන් පසුව 2013.01.15 වන දින ඔහුගේ තනතුරට හිමි සහනදායී පදනම මත ලබාදෙන වාහන බලපත්‍රය ලබාදෙන ලදී. මේ අතර 2013 අප්‍රේල් මස දකුණු කොරියාවේ උසස් අධ්‍යාපන ආයතනයක පැවති දින 10 ක නායකත්ව පුහුණු වැඩසටහනකට සහභාගී වීමට අමාත්‍යාංශය මගින්

ශිෂ්‍යත්වයක් ඔහු හට ලබාදෙන ලදී. මෙසේ 2015 ජනාධිපතිවරණය වන තෙක් උක්ත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සන්නිවේදන හා සංවර්ධන අංශයට අයත් සියලුම රාජකාරී කටයුතු මැනවින් ඉටු කරන ලදී. එම කාලය තුල කපිල ආරියවංශ හට කිසිඳු රාජකාරීමය බාධාවක් නොවූ අතර විවිධ දිරිගැන්වීම්ද අමාත්‍යාංය මගින් සිදු කරන ලදී.

වර්ෂ 2015 පෙබරවාරි මස වන විට යහපාලන රජය බලයට පත්වීමත් සමග ඩාලි පාරේ පිහිටි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වසා දැමීමට තීරණයක් ගන්නා ලදී. ඒ සමගම ඇතිවූ ව්‍යාකූලතාවය නිසා එම අමාත්‍යාංශයේ එතෙක් රාජකාරී සිදුකළ සියලුම නිළධාරීන්ට ඉමහත් පීඩනයක් ගෙනදුන් බව සඳහන් කර ඇත. මෙසේ ඩාලි පාරේ පිහිටි කාර්යාලය වසා දැමීමට තීරණය කළේ කවුරුන්ද, කිසිවකුගේ නියෝගයක් මතද යන්න ඔහු දැන සිටියේ නැත. එසේම සංවර්ධන හා සන්නිවේදන අංශය යටතේ තිබූ භාණ්ඩ සියල්ලම ගබඩාවට භාරදීමට සිදු විය. ඒ අනුව කපිල ආරියවංශ ඇතුළු සන්නිවේදන හා සංවර්ධන අංශයේ සේවය කළ නිළධාරීන් 08 දෙනෙක් දින කිහිපයක් ඉදිරියේ ඇති විය හැකි තත්ත්වය පිළිබඳව ව්‍යාකුල තත්වයක පසුවිය. මෙසේ සතියක් දෙකක පමණ කාලයක් ඩාලි පාරේ පිහිටි කාර්යාලය තුළ කපිල ආරියවංශ ඇතුළු නිළධාරීන් කිසිඳු කාර්යයක් නොමැතිව කාලය ගත කරන ලදී. එහිදී ඔවුන් හට නිසි නියෝගයක් ලබාදීමට, රාජකාරී පැවරීමකට හෝ යම් උපදෙසක් ලබාගැනීමට කිසිවකු එම කාර්යාලය තුළ නොවීය. ඉන් සති දෙකකට පමණ පසුව දිනක ඔහු ඇතුළු නිළධාරීන් 08 දෙනා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට යන ලෙස වාචිකව අතිරේක ලේකම් පාලන හේමා ධර්මවර්ධන මහත්මිය විසින් උපදෙස් දෙන ලදී. ඒ අනුව ඔවුන් සියලුදෙනා 2015 පෙබරවාරි අග සිට මාර්තු මස මුල දක්වා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විවිධ

ස්ථානවල රැඳී සිටි නමුත් ඔවුන්ට නිසි උපදෙසක් හෝ නිසි රාජකාරියක් කිසිවකුගෙන් නොලැබිණි. පසුකාලීනව ඔවුන්ව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලදී. නමුත් කපිල ආරියවංශ ඇතුළු ඉහත කී නිළධාරීන් අට දෙනාම දෙපාර්තමේන්තු ගත නිළධාරීන් වන අතර ඔවුන් කිසිඳු ලිඛිත ලියවිල්ලක් ඔහු වෙත හෝ ලබා නොදී එක්වරම ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත හෝ මාරුකර යැවීම නීත්‍යානුකූලව කළ නොහැකිය. ඒ ඔහු දන්නා පරිදි දෙපාර්තමේන්තුගත නිළධාරියකු එම දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථානමාරු කිරීමේදී එය ලිඛිතව හා හේතු සහිතව සිදුකළ යුතු කාර්යයකි. නමුත් මෙහිදී එවැනි කිසිඳු හේතු දැක්වීමක්, ලේඛණගත වීමක් සිදු නොවීය. එය ආයතන සංග්‍රහය අනුවද නිවැරදි  නොවේ. පසුව කපිල ආරියවංශ ඇතුළු නිළධාරීන් අටදෙනා 2015.03.04 දිනැති අංක රප්‍ර/ආ02/විවිධ/2014 පරිදි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) ජී.ජී.එස්.සී. රෝෂන්ගේ අත්සනින් යුතුව අභ්‍යන්තර අනුයුක්ත කිරීම් ලෙස එක් අංශයන් වෙත අනුයුක්ත කර තිබිණ. ඒ අනුව අදාළ රාජකාරිය භාර ගැනීමට යාමේදී කපිල ආරියවංශ වෙත තවත් ලිපියක් ලැබිණි. එය 2015.03.08 දිනැතිව අංක රප්‍ර/ආ03/මානි/පොදු/13 යටතේ අධ්‍යක්ෂ (පාලන) ජී.ජී.එස්.සී. රෝෂන්ගේ අත්සනින් යුතුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විශේෂ මාධ්‍ය ඒකකයේ අධීක්ෂණ රාජකාරී සඳහා පත් කිරීම මැයෙන් එම ඒකකයේ අධීක්ෂණ කටයුතු සඳහා තාවකාලිකව අනුයුක්ත කර ඇති බවට සඳහන් ලිපියකි. දින 04 ක් වැනි කෙටි කලක් තුළ මෙම අංශ වෙනස්වීම සිදුවී තිබිණි.

මෙම කෙටි කාලය තුළද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට බැසිල්ගේ ගෝලයෝ රිංගයි යනාදී ලෙස විවිධ

විරෝධතා අසත්‍ය තොරතුරු පදනම් කරගෙන කපිල ආරියවංශ ඉලක්ක කරගෙන පුවත් පත් ප්‍රවෘත්ති නිරන්තරයෙන් පල කරමින් ඔහුගේ කීර්තිනාමයට හානි වන සහ ඔහු රාජකාරී වශයෙන් අපහසුතාවයට පත්වන ආකාරයෙන් කිසියම් පිරිසක් කටයුතු කරන ලදී. ඒ අනුව කපිල ආරියවංශ හට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තුළද යහපත් මානසිකත්වයකින් යුතුව රාජකාරී කිරීමට නොහැකි තත්වයක් මේ තුළින් ඇති විය. එය කපිල ආරියවංශ හට මානසිකව දැඩි පීඩනයක් ගෙනදෙන ලදී. ඒ අතරම 2015.03.10 දිනැති MED/AD/E7/PF/Trans. යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පරිපාලන නිළධාරී විසින් ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත කපිල ආරියවංශට ද පිටපතක් සහිතව ලිපියක් මගින් ඔහුගේ පුද්ගලික ලිපි ගොනුව එවා තිබුණි. නමුත් මෙහිදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සිට ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ පවතින රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත මොහුව ස්ථානමාරු කළ බවට ලිඛිත කිසිඳු ලියවිල්ලක් නොමැති පසුබිමක් තුළ ඔහුගේ පුද්ගලික ලිපි ගොණුව මෙසේ යොමුකර තිබිණ. එසේම කපිල ආරියවංශ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඉහත පරිදි තාවකාලිකව අධීක්‍ෂණ රාජකාරියක් සිදු කළත් එය ස්ථිර වශයෙන් පැවරීමක් ඔහු වෙත සිදු කලේද නැත. එසේම රජයේ සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්‍ෂ (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන) තනතුරු තුනක්ද රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව තිබූ අතර එම කාලය තුලදී ඉන් තනතුරු දෙකක් ඇබෑර්තු වී තිබූ බවත්, පවසන අතර එයින් එක් ඇබෑර්තුවක් සඳහා කපිල ආරියවංශ නිළ වශයෙන් පත් නොකිරීමද ගැටළු සහගත වේ. මෙම කාලය වන විට කපිල ආරියවංශ වසර 09 ක මාණ්ඩලික

විධායක මට්ටමේ මාධ්‍ය සම්බන්ධ රාජකාරී කටයුතුවල නිළ වශයෙන් නියැලී සිටි අතර ඒ හා සමාන්තර ශ්‍රේණියක ඇබෑර්තුවකට ඇතුලත් නොකිරීමටද ඔහු දේශපාලන වශයෙන් පලිගැනීමට ලක් කිරීමේ අරමුණින් සිදු කරන ලද ක්‍රියාවක ප්‍රතිඵලයක් බව කපිල ආරියවංශ ප්‍රකාශ කර සිටී.

මෙහිදී කපිල ආරියවංශ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) තනතුරට, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය / සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන) තනතුර සම වන අතර රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තුළ ඔහු පිහිටුවිය යුත්තේ එම තනතුර සඳහා වන නමුත් ඒ සඳහා කපිල ආරියවංශ පත් නොකිරීමද ඉහත පරිදි දේශපාලන පලිගැනීම් මත සිදුවූ බව ඔහුගේ විශ්වාසයයි. ඒ අතර 2015.03.11 දිනැති අංක MED/AD/Gen/Transfer/2015 දරණ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) හේමා ධර්මවර්ධන මහත්මියගේ අත්සනින් යුතුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වත්කම් හා දේපල පැවරීම 2015.03.17 හෝ ඊට ආසන්න දිනයක ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගබඩා අධීක්ෂණය භාරව සිටි ගණකාධිකාරී වරයාට අදාළ සියලුම භාණ්ඩ නීත්‍යානුකූලව කිසිඳු අඩුපාඩුවකින් තොරව භාර දෙන ලදී. ඉන් පසුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සංවර්ධන හා සන්නිවේදන අංශයට අයත්ව තිබූ භාණ්ඩ බොහොමයක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත අදාළ රෙගුලාසි භාවිතා කරමින් හුවමාරුව සිදු විය. කොපමණ බාධක පැමිණියද කපිල ආරියවංශ තාවකාලිකව අනුයුක්ත කරන ලද නව මාධ්‍ය ඒකකය මගින් ඔහුගේ අධීක්ෂණයෙන් සහ ප්‍රධානත්වයෙන් මෙහෙයවන ලද රජයේ නිල පුවත් වෙබ් අඩවිය වන www.news.lk

සඳහා සම්මාන ලබාදීමට කටයුතු කරන ලදී. මාස 05 ක් වැනි කෙටි කාලයක් තුළදී රජයේ නිළ පුවත් වෙබ් අඩවියේ ශ්‍රී ලංකාවේ හොඳම පුවත් වාර්තාකරණයට හිමි රිදී සම්මානයද දෙමළ වෙබ් අඩවිය සඳහා කුසලතා සම්මානයද ලබා ගනිමින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රතිරූපය, කීර්තිනාමය ඉහළ නැංවීමට කපිල ආරියවංශ විසින් කටයුතු කරන ලදී.

2018 පෙබරවාරි හෝ ඊට ආසන්න දිනයකදී 0112337431 දරණ දුරකතන අංකයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයෙන් බවට දන්වා සුනිල් නැමැති නිළධාරියකු කපිල ආරියවංශගේ 0727898798 හෝ 0711656906 දරණ ජංගම දුරකතනය වෙත ඇමතුමක් ලැබිණි. එහිදී ඔහු ප්‍රකාශ කලේ කපිල ආරියවංශට විරුද්ධව පැමිණිල්ලක් තිබෙන බවත් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා නොපමාව කොළඹ කොටුවේ පිහිටි මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට පැමිණෙන ලෙසත්ය. නීති විද්‍යාලයේ අවසන් වසර විභාගයට මුහුණ දීමට ඇති නිසා එම දිනයට ඒමට නොහැකි බව පැවසූ පසු එම නිළධාරියා ඊට ආසන්න වෙනත් දිනයක් යොදාගෙන ඔහු වෙත දැනුම් දෙන බවයි.

2018 පෙබරවාරි මස යොදාගත් දිනයකදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට උදේ 10 ට පමණ සුනිල් නැමති නිලධාරියා හමුවන ලදි. පිළිගැනීමේ අංශයේ නිලධාරියෙක් කපිල ආරියවංශ කැඳවාගෙන විදුලි සෝපානය මගින් ඉහළ මහළක් වෙත රැගෙන ගොස් ඇති අතර සිදු වන්නේ කුමක්ද යන්න සිතාගත නොහැකිව විශාල තැතිගැන්මකට ලක්වූ බව පවසා ඇත. එම ගොඩනැගිල්ලේ මහළක් වෙත රැගෙන ගිය අතර එම මහළේ දිග හෝල් එකක් මෙලෙස ප්‍රශ්න කිරීම සඳහා තිබූ අතර එහි එක් පසෙක ප්‍රකාශ ලබා ගැනීම සඳහා කුඩා කුටි වැනි කාමර තිබූ අතර අනෙක් පැත්තේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ

නිළධාරීන් රැදී සිටි බව සඳහන් කර ඇත. කපිල ආරියවංශ රැගෙන යන අවස්ථාවේද ඉහත කී කුඩා කාමර තුළ පුද්ගලයින්ගෙන් ප්‍රශ්න කිරීම සිදු කරනු ඔහුට ඇසී ඇත. ඒ ප්‍රශ්න කිරීම් ඉතා ඝෝෂාකාරී, දැඩි වාග් ප්‍රහාරවලින් යුත් ඉතා සැර පරුෂ ආකාරයට සිදු වූ ඒවාය. මේ අවස්ථාවේ සැබවින්ම කපිල ආරියවංශගේ ප්‍රශ්න කිරීම පසෙක තබා වෙනත් අයගේ ප්‍රශ්න කරන ප්‍රශ්න කිරීම් දැකීමෙන් ඉමහත් තැතිගැන්මකට ලක් විය. ඊට පසුව ඔහුට කුඩා කුටියක් වැනි කාමරයක් පෙන්වා ඇත. එම කාමරයේ සිටින ලෙස දැනුම් දී ඇත. එහි සිටින විට යාබද කාමරයේ තවත් ඔහු වැනි පුද්ගලයන් දෙදෙනෙකුගෙන් ශබ්ද නගමින්, සැරවැර කරමින් ප්‍රකාශ ලබා ගන්නා ආකාරය ඔහුට ඇසී ඇත. එයින් තවත් ඔහු තැති ගැන්මකට හා මානසික ආතතියට ලක්වී ඇත. මෙසේ වාඩි වී විනාඩි 10 ක් පමණ සිටින විට එක් නිළධාරියකු පැමිණ ලොකු ලිපි ගොනුවක් ඔහු සිටි මේසය මත තබන ලදි. නිළධාරිනියක් පරිගණකය සමග සිටි අතර ඔහුගෙන් ප්‍රශ්න කිරීම සඳහා නිළධාරීන් තුන් දෙනෙක් පමණ සිට ඇත. ඒ අතර තවත් නිළධාරීන් වරින් වර පැමිණ ප්‍රශ්න අසමින් නැවත පිට වී ඇත.

මෙලෙස ආරම්භ කරන ලද ප්‍රශ්න කිරීමේදී ඔහුට පිළිතුරු ලබාදීමටත් නොහැකි වන පරිදි එක් අයකු ප්‍රශ්නයක් අසා ඊට පිළිතුරු දීමටත් ප්‍රථම තවත් නිළධාරියකු ප්‍රශ්නයක් ඉදිරිපත් කර ඇත. එහිදී පවසා සිටියේ තමුන් මෙම ස්ථානයට කැඳවූයේ රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 04 ක පමණ පාඩුවක් සිදුවන පරිදි දිවිනැගුම වැඩසටහනේ මුද්‍රණ කටයුතු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් නිසි අවසරයකින් තොරව සිදු කර එම දිවි නැගුම මුද්‍රිත පිටපත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් ඔහු

විසින් භාරගෙන එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාව සිටි බැසිල් රාජපක්ෂ මහතා වෙත ලබාදීමේ චෝදනාව බවයි. මේ සටහන් කරගෙන තියෙන ප්‍රශ්නවලට හරියට පැහැදිලිව හා නිවැරදිව පිළිතුරු දෙන ලෙසට පැවසූ බවත් එසේ නොවුනොත් මීට ඉස්සෙල්ලා ආපු අයට වෙච්ච දේ වෙයි කියලා තවත් නිළධාරියකු පවසා ඇත.

මේ වගේ පොත් පිංචවල් 08ක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මාධ්‍ය අංශයේ සහකාර අධ්‍යක්ෂ ලෙස සිටියදී 2015 ජනාධිපතිවරණ කාලසීමාව තුලදී ඊට අදාළව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන එවක ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ දේශපාලන කටයුතු සඳහා ලබාදෙන ලද්දේ දැයි ඇසූ බවත් මෙම අනපේක්ෂිත ප්‍රශ්න කිරීම හමුවේ ඔහු මහත් මහත් බියට පත්වූ බවත් කපිල ආරියවංශ ප්‍රකාශ කරයි. ඊට පිළිතුරු දීමටත් පෙර තවත් නිළධාරියකු විසින් තවත් ප්‍රශ්නයක් විමසා ඇත. ඔවුන් එක් අවස්ථාවකදී බැසිල්ට මෙම පොත් පිංචවල් භාරදීලා එයා යන රැස්වීම්වලට ගිහිල්ලා, මෙම පොත් රැස්වීම්වලට සහභාගී වෙච්චි අයටත් බෙදුවා නේද කියලා ඇසූ බවත් සඳහන් කර ඇත. එවිට ඔහු කියා ඇත්තේ මෙවැනි පොත් කිසිඳු ආකාරයකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සඳහා ලබාගෙන නොමැති නිසා ඒ ආකාරයෙන් වැඩ කරන්නේ කොහොමද යනුවෙනි. එවිට ඔවුන් ඔහුගෙන් අසන ලද්දේ "ඔබ කරපු දේවල් අපි සියල්ලම දන්නවා. බොරු කියන්න හදන්න එපා, තමුන් මෙතනදී මේ කියන දිවි නැගුම පොත් පිංචවල් විශාල ප්‍රමණයක් කොළඹ ඩාර්ලි පාරේ පිහිටි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ බිම් මහලේ ගෙනත් දීලා තියෙවා. ඒ ටික තමුන් තමයි භාරගෙන තියෙන්නේ" යනුවෙන් පැවසූ බවත් "ඒ ටික අරගෙන බැසිල්ට දුන්නා කියලා කියන්න" කී බවත් එවිට කපිල ආරියවංශ

"ඇයි මට කියන්න කියන්නේ කියලා" ඇසූ විට එම නිළධාරීන් "දැන් අපි බී වාර්තාවක් සකස් කරලා උසාවියට කරුණු වාර්තා කරලා තියෙන්නේ මේ බව කියලා" යනුවෙන් පවසන ලද බවත්ය. ඉන් පසුව "එතකොට තමුන්ගේ ප්‍රකාශයත් ඒකට ඇතුලත් කරලා මේ කේස්එක කරන්න පුළුවන් කියලා" පැවසූ බවත් කපිල ආරියවංශ "නමුත් මම නොකළ නොදන්න දෙයක් ගැන මට කියන් බෑ" යැයි ඔවුන්ට පවසා සිටි බවත් ඉන් පසුව කලින් ගෙනවිත් මේසය මත තැබූ විශාල ලිපි ගොනුව පෙරලා ඔහුට පෙන්වමින් කියා සිටියේ, "මේ ෆයිල් එකේ තියෙන්නේ මේ සිද්ධිය ගැන එක එක්කෙනා කරපු ප්‍රකාශ. ඒ අයට උසාවියෙදි නඩුව යනකොට මේකට අදාළ සියලුම වන්දි දේපලත් විකුණලා ගෙවන්න වෙයි. ඒ එක්කම ඔවුන්ට හිරේ යන්නත් වෙයි" යනුවෙන් පවසූ බවයි. මෙම පොත් මුද්‍රණය කර බැසිල් රාජපක්ෂ මහතා වෙත ලබාදුන්නා කියා පවසන ලෙසට කපිල ආරියවංශට පැවසූ බවත් නමුත් ඔහු තරයේම පවසා සිටියේ ඔහුට ඔහු කිසිත් නොදන්නා දෙයක් ගැනි පැවසීමට නොහැකි බවයි. මේ සම්බන්ධයෙන් ඔවුන්ට අවශ්‍ය කරන ප්‍රකාශ කපිල ආරියවංශට ලබාගැනීමට නොහැකි වූ පසු ඔවුන් ඔහුගෙන් විමසා ඇත්තේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ මාධ්‍ය ලෙස කටයුතු කරන විට සිදුකළ කාර්ය භාරයන් සම්බන්ධවයි. ඔවුන් එහිදී දීර්ඝ ලෙස විමසා ඇත්තේ ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා හා සම්බන්ධව සිදුකර ඇති ව්‍යාපෘති, රාජකාරීන් හා මාධ්‍ය ආවරණ කටයුතු සම්බන්ධවයි. ඒ පිළිබඳ සිදුකළ රාජකාරී වපසරිය පිළිබඳව සත්‍ය තොරතුරු සියල්ල පවසා ඇත. ඒ අනුව දිනකට මාධ්‍ය අංශය විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අදාළ සංවර්ධන පුවත් මාධ්‍ය වෙත ශ්‍රව්‍ය දෘෂ්‍ය ආකාරයෙන් හා මුද්‍රිත ආකාරයෙන් දේශීය සහ විදේශීය මාධ්‍ය

ආයතන වෙත මාධ්‍ය තුනෙන්ම (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) අවස්ථානුකූලව මාධ්‍ය ප්‍රචාරය සඳහා ඉදිරිපත් කළ බවයි. ඉන්පසු එදින ඔහුගේ ප්‍රශ්න කිරීම් අවසන් වූ බවත් වෙනත් දිනයක කැඳවන බව පවසා සිටි බවත් ඔහුට දැඩි මානසික පීඩනයක් ඇති කරමින් ප්‍රශ්න කළ බවත් ඒ කාලයේදී ඔහුගේ ආබාධිත පියාද ඔහුගේ නිවසේම සිටි අතර ඔහුටද කපිල ආරියවංශගේ මෙම ප්‍රශ්නය මානසිකව බලපෑ බවත් පවසා ඇත. එනිසා අද වන විටත් ඔහුගේ පියා වරින් වර හිටි හැටියේම සිහි මද ගතියට පත්වන බව පවසා ඇත. මේ හේතුව මත මේ වන විටත් ඔහුගේ පියාට ප්‍රතිකාර ලබා ගන්නා බව පවසයි. මේ අතර 2018 ජනවාරි හෝ ඒ ආසන්නයේ සිට කපිල ආරියවංශ 2015.03.08 වන දින පත් කර සිටි විශේෂ මාධ්‍ය ඒකකයේ අධීක්ෂණ රාජකාරීවලින් කිසිදු දැනුම්දීමක් නොමැතිව ඉවත් කර තිබුණි. ඒ අනුව ඔහු විසින් සිදුකළ රාජකාරී ඔහුගේ යටතේ සිටි ව්‍යාපෘති සංවර්ධන සහකාර නිළධාරියකුට (විධායක හෝ මාණ්ඩලික නොවන) අදාළ අධීක්ෂණ කටයුතු පවරා තිබුණි. මේ පිළිබඳව ඔහු දැනගත්තේද කාර්යාලය තුළ වෙනත් නිළධාරීන්ගෙනි. ඒ අනුව ඔහු සිටි විශේෂ මාධ්‍ය ඒකකයේ විධායක නිළධාරී කාමරයෙන්ද 2018 පෙබරවාරි හෝ ඒ ආසන්න කාලයේදී ඉවත් කරන ලදී. ඉන් පසු 2018.05.02 වන දින දක්වා කිසිදු රාජකාරියක් නොමැතිව රැකියා ස්ථානයට පැමිණීම හා පිටවීම සටහන් කර සාමාන්‍යයෙන් කාර්යාලයක ලිපිකරුවකු ආකාරයෙන් කටයුතු කර නිවසට පිටව ගොස් ඇත. මෙහිදී කපිල ආරිවංශ හට හිමි විධායක ශ්‍රේණියේ වරප්‍රසාද වෙනුවට ලැබුණේද ලිපිකරු ශ්‍රේණියේ නිළධාරියකු ලබන වරප්‍රසාද ආකාරයෙනි. මෙහිදී ඔහු හට ලබා දුන්නේ පරිගණක කාමරය ලෙස සඳහන් පංති කාමරයක් හා සමාන ස්ථානයකි. ඔහු එම ස්ථානයට යවන විටත් එම ස්ථානයේ රජයේ

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර පිරිසක් එහි සිටි අතර ඔවුන් තමන්ගේ භාණ්ඩ වට්ටෝරුවට අදාළ භාණ්ඩද රැගෙන පසු දිනයක වෙනත් ස්ථානයකට ගොස් බව පවසා ඇත. ඉන් පසු කපිල ආරියවංශ පැමිණ ඔහු විසින් රාජකාරී කිරීමට සුදුසු මේසයක් කැඩුණු පුටුවක් සකස් කරගෙන එම පංති කාමරය තුළ ඔහුගේ රාජකාරී ආරම්භ කර ඇත.

2018.05.02 වන දින චක්‍රලේඛ අංක 07/2018(I) දරණ ලිපියට අනුව මාධ්‍ය හැඳුනුම්පත් අංශයට මාරු කර ඇත. ඉන් පසු 2018.05.08 වන දිනැති ලිපියක් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ සුදර්ශන ගුණවර්ධන විසින් ඔහු වෙත යොමු කරමින් දන්වා සිටියේ ඔහු වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම දෙපාර්තමේන්තුවේ පුස්තකාලය වෙත අභ්‍යන්තර අනුයුක්ත කිරීමක් සිදු කරන බවයි. ඒ අනුව ඔහු විසින් ඊට අදාළ ගැටළු සම්බන්ධව හා තොරතුරු සම්බන්ධවත්, ඒ වෙනුවෙන් පරීක්ෂණයක් පවත්වන ලෙසත් 2018.05.09 දින වන විට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත අධ්‍යක්ෂ පාලන මගින් කපිල ආරියවංශ විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත. නමුත් අද දිනය දක්වාම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. මෙලෙස ඔහු හට සිදුකරනු ලබන දේශපාලනමය වශයෙන් පලිගැනීම සම්බන්ධයෙන් ඔහු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කිරීමට ක්‍රියා කර ඇත. එහිදී ඔහු පවසා ඇත්තේ “ඔයා කොම්පියුටර් රූම් එකේම ඉන්න, අපි පස්සේ බලමු” යනුවෙනි. ඉන් පසු 2018.07.30 දින අංක රාප්‍ර/ආ03/මානි/පොදු දරණ ලිපිය මගින් ඩිජිටල් යටිතල පහසුකම් අංශයේ අංශ ප්‍රධානී ලෙස අභ්‍යන්තර අනුයුක්ත කිරීමක් සිදුකර ඇත. මෙහි විශේෂත්වය නම් මෙම දෙපාර්තමේන්තුවේ මෙවැනි අංශයක් නොතිබූ අතර එවැනි අංශයක් පිහිටුවීම

නෛතිකමට ගැටළුවක් නොවන බව ඔහු සැලකූ බැවිනි. නමුත් ඔහුගේ තනතුර වන්නේ සහකාර අධ්‍යක්ෂ මාධ්‍ය වේ. එහි රාජකාරී මෙම ඩිජිටල් අංශයේ රාජකාරී විෂය පථය අන්ත දෙකක රාජකාරීන් සහිත වේ. ඒ අනුව ඔහුගේ හැඟීම වන්නේ මෙවැනි රාජකාරීමය සම්බන්ධතාවයක් නොමැති අංශ හා සම්බන්ධ කිරීමෙන් රාජකාරී කිරීමට තෘප්තිය නැතිකර රැකියාවෙන් නෙරපීමට ගත් උත්සාහයක් ලෙසයි. ඒ ගැටළුව නිසා 2019 හා 2020 වර්ෂ සඳහා ජනමාධ්‍ය හැඳුනුම්පතද ඔහු වෙත ලබාගත නොහැකි විය. මෙහිදී ඔහුගේ විශේෂඥ දැනුම පවතින්නේ හා ඔහු ප්‍රවීණතාවය ලබා ඇත්තේ මාධ්‍ය කටයුතු සම්බන්ධයෙනි. එයට විද්‍යුත්, මුද්‍රිත, ඩිජිටල් මාධ්‍ය ඇතුලත් වේ. නමුත් ඊට කිසිඳු ආකාරයකින් සම්බන්ධයක් නොමැති තාක්ෂණික අංශයට නැඹුරුවූ රාජකාරියක් සහිත ඩිජිටල් යටිතල පහසුකම් අංශයක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තුළ නාමිකව පමණක් ඇති කර එහි අංශ ප්‍රධානී ලෙස ප්‍රථමයෙන් ඔහු පමණක් පත් කිරීමම පැහැදිළි ලෙසම කුමන හෝ ආකාරයකින් ක්‍රියාත්මක වන දේශපාලන හස්තයක් මගින් ඔහු දේශපාලන වශයෙන් පලිගැනීමට ලක් කිරීමක් ලෙස පෙනේ. මෙලෙස ඔහු ලැබුණු ඕනෑම තැනක ලද රාජකාරිය ඉටු කරමින් යන අතර 2018 ඔක්තෝබර් මස එවකට පැවති යහපාලන ආණ්ඩුව තුළ ඇතිවූ ප්‍රතිපත්තිමය වෙනසක් ඇති විය. එබැවින් ඊට පෙර තිබූ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත නැවත කැඳවීමට තිබූ අවකාශ අවම විය. ඉන් පසුව 2018 ඔක්තෝබර් මස හෝ ආසන්න දිනයකදී නැවත වරක් නව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වරයෙක් පත් විය. ඒ අනුව 2018.12.06 දිනැති අංක රප්‍ර/ආ1/02/01 ලිපිය මගින් ඔහු වෙත දන්වා සිටියේ අදාළ රාජකාරියට අමතරව මාධ්‍ය විමර්ශන අංශයේ රාජකාරී කටයුතුද අධීක්ෂණය කරන ලෙසයි.

මෙලෙස කපිල ආරියවංශ වෙත පවරන ලද නව අධීක්‍ෂණ රාජකාරීය වන මාධ්‍ය විමර්ශන අංශයේ රාජකාරී කටයුතු අධීක්‍ෂණ ඔහුගේ වෘත්තීයමය වශයෙන් ගැලපීමක් තිබූ රාජකාරියක් වුවද එය ලබාදී පසුව ඔහුට කිසිඳු වාචික හෝ ලිඛිත දැනුම්දීමකින් තොරව වෙනත් නිළධාරියකු වෙත ලබාදී ඇත.

2018.12.06 වන දිනැති හා අංක රප්‍ර/ආ1/02/01 ලිපිය මඟින් ඔහු වෙත එදිනට පවරා ඇති අංශයේ රාජකාරි අධීක්ෂණ රාජකාරියට අමතරව මාධ්‍ය විමර්ශන අංශයේ රාජකාරි අධීක්ෂණ කටයුතුද පවරනු ලැබීය. අනතුරුව අංක රප්‍ර/ආ1/02/01 හා 2018.12.06 වන දිනැති ලිපිය අනුව අංශ හා ඒකක 06 අධ්‍යක්ෂ ප්‍රවෘත්ති නැමති තනතුරට අධීක්ෂණ කටයුතු පවරා ඇත. මෙම පත් කිරීමට අදාලව ඔහු හට පැන නගින ගැටලු කිහිපයක් ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ (2012 නැවත මුද්‍රණය) 2 වැනි පරිච්ඡේදය අනුව සේවයට බඳවා ගැනීමේ කාර්ය පටිපාටි සහ පත්කිරීම් අනුව 1.1 වගන්තිය යටතේ රාජ්‍ය සේවයට නිළධාරියෙකු පත් කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇත. එසේම මෙම පුරප්පාඩුව සඳහා ඔහු හට ඉල්ලුම් කිරීමට හෝ අවස්ථාවක් නොතිබිණි. එතරම් රහසිගත අන්දමින් මෙම තනතුර නිර්මාණය කර පත් කිරීමද සිදු කර ඇත. එබැවින් මෙම නව තනතුර සඳහා ඔහු හට අයදුම් කිරීමට තිබූ අවස්ථාවද අත්තනොමතික ලෙස සිතා මතා දේශපාලනමය වශයෙන් පළිගැනීමකට ලක් කර ඇති බවද ඔහු විසින් සඳහන් කර ඇත.

තවද අදාල පත්වීම ලැබූ පුද්ගලයා (අධ්‍යක්ෂ ප්‍රවෘත්ති) හට 2018.01.30 වන දින කොළඹ 12 අළුත්කඩේ පිහිටි

ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් 2017.11.23 වන දිනැතිව නඩු අංක SC/REF 409/2017 - 409/17 යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඔප්පු කිරීම පිණිස සකස් කළ නොතීසියේ 07 වන වගඋත්තරකරු ලෙස ඔහුගේ නම සඳහන් වේ. තනතුර ලෙස දක්වා ඇත්තේ ප්‍රවෘත්ති නිළධාරි ලෙසය. ඒ අතර 2018.12.17 හෝ ඊට ආසන්න දිනයකදී සිට ඔහු හට හිමි විය යුතු විධායක නිළධාරී රාජකාරි කාමරයක් නොතිබුණි. ඒ වෙනුවට ඔහු වෙත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පළමු මහලේ පුස්තකාලයට ආසන්න පන්ති කාමරයක පුටුවක් සහ මේසයක් ලබාගෙන රාජකාරී කරන මට්ටමට කටයුතු සිදු විය. එම කරුණ නිරාකරණය කිරීම සඳහා අංක. DI/DIU/02/2018 හා 2018.12.17 දිනැති ලිපිය අධ්‍යක්ෂ පාලන වෙත ඉදිරිපත් කළේ විධායක නිළධාරී පහසුකම් ලබා ගැනීම සඳහායි. එම ලිපියට සාර්ථක ප්‍රතිචාරයක් නොලැබු නිසා නැවත අංක. DI/DIU/01/2018 හා 2019.01.06 වන දිනැති ලිපියද මේ සම්බන්ධව ඉදිරිපත් කරන ලදී. ඔහු මෙම ප්‍රකාශය ලබා දෙන දිනය වන විටත් ඔහුගේ රාජකාරි කාමරය වන්නේ ඉහතින් සඳහන් කරන ලද පංති කාමරය වන අතර එම පංති කාමරය වේ. 2019.01.24 වන දිනැති හා අංක රප්‍ර/ආ1/02/01 ලිපිය මඟින් ඔහු වෙත රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් මාධ්‍ය අංශය, පර්යේෂණ අංශය, ඩිජිටල් යටිතල පහසුකම් අංශයන් හි අධීක්ෂණ කටයුතු ඔහු වෙත පවරා ඇත. ඉන්පසු 2019.02.28 වන දිනැති හා අංක. රප්‍ර/ආ11/03/02/002 (II) ලිපිය මඟින් මාධ්‍ය විමර්ශන අංශයේ නිළධාරීන් යහපාලන රජය මඟින් ස්ථාපිත කරන ලද ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය වෙත අනුයුක්ත කර ඇති බව ඔහු වෙත පිටපතකින් දන්වා ඇත. අනතුරුව ඔහු යටතේ වූ

පර්යේෂණ අංශය 2020.01.17 හෝ ඊට ආසන්න දිනයකදී වෙනත් නිළධාරියෙකු වෙත පවරා ඇත. මේ අතර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් 2019 වසරේ නොවැම්බර් මස ප්‍රවෘත්ති දෙපාර්තමේනතුවට අදාළ කර නව ව්‍යාපෘති වාර්ථාවක් සකස් කරන ලෙස ඔහු වෙත උපදෙස් ලබාදී ඇත. ඒ අනුව ඔහු විසින් NATIONAL MOBILE JOURNALISM (MOJO) CENTRE ව්‍යාපෘතිය සකස් කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමැතිය සහිතව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු සඳහා භාර දෙනු ලැබීය. ඒ අනුව 2020.01.03 වන දිනැති ලිපිය හා NPD/PP/HRD/MM/2019/01 අංක යටතේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපතක් ඉදිරිපත් කරමින් කපිල ආරියවංශ විසින් සැකසූ ඉහත සඳහන් රුපියල් මිලියන 100 ක් වටිනා ව්‍යාපෘති වාර්ථාව අනුමත කර ඇති බවයි. එසේම ඉදිරි වැඩ කටයුතු සඳහා එම වාර්ථාව KOICA ආයතනය වෙත යොමු කර ඇති බවය. ඒ අනුව 2020.01.17 වන දිනැති හා අංක. රප්‍ර/ආ 03/මානි/පොදු/13 ලිපිය අනුව විධායක සේවයේ සේවා කාලය වසර 11 ක කාලය 2017.04.11 වන දිනට සම්පූර්ණ වන අතර ඊට අදාලව විධායක දීමනාව ලබා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ඔහුගේ 2015.03.10 වන දිනැති හා MED/AD/E7/PF/Trans අංක දරණ ලිපිය අනුව ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේනතුව වෙත 2015 මාර්තු මාසයේදී ලබාදී ඇත. ඒ අනුව වරින් වර ඔහුගේ දෙවන සහ පළමුවන කඩඉම් පරීක්ෂණ විධිමත් පරිදි පවත්වා අදාල පළමුවන ශ්‍රේණියට උසස් කිරීම් කරන ලෙස ලිඛිතව හා වාචිකව දෙපාර්තමේනතුවෙන් ඉල්ලා ඇත. අදාල යහපාලන රජය පැවතිතාක්

කල් ඒ පිළිබඳ කිසිදු ක්‍රියා මාර්ගයක් ගනු නොලැබිණි. 2020.03.13 වන දිනැති හා අංක. එම්එම්අයි/5/12/01/51 ලිපිය අනුව ඔහුගේ කාර්යක්ෂමතා පරීක්ෂණ පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත විමසීමක් කරමින් යොමු කළ ලිපියේ පිටපතක් ඇති බව සඳහන් කර ඇත. අවුරුදු 05 කට ආසන්න කාලයක් ඔහුගේ අදාල ශ්‍රේණි උසස්වීම් කටයුතු හිතුවක්කාර ලෙස නොසලකා හරිමින් කටයුතු කිරීම පිළිබඳව කපිල ආරියවංශ ඉතා කලකිරීමකට සහ සිත් තැවුලට පත්ව ඇත. කෙසේ නමුත් මෙවැනි කලකිරීම් තුළදී වුවත් ඩිජිටල් සහ යටිතල පහසුකම් අංශයේ අංශ ප්‍රධානියා ලෙස කපිල ආරියවංශ විසින් දෙපාර්තමේන්තුව වෙතට ඩිජිටල් මාධ්‍ය සම්බන්ධයෙන් පහත සඳහන් ව්‍යාපෘති 2018-2020 කාලය තුළදී සාර්ථකව නිම කර සේවාවන් ලබා ගත හැකි මට්ටමෙන් නිම කර ඇත. ඒවා නම් SMART Cloud computing development project,Bulk E-mail Solutions,Data & Voice cable neat project,Election result dissemination system,DGI – IT Survey and data analysis project,SMART Media Accreditation project වේ. දැනට ලංකාවේ රාජය අනුග්‍රහයක් මත වෙබ් සඳහා සම්මාන ප්‍රදානයක් සිදු නොවේ. ඒ නිසා 2021 වර්ෂයේ සිට DGI web awards feasta ව්‍යාපෘතිය මඟින් රාජ්‍ය හා අනුබද්ධ ආයතන පවත්වාගෙන යන වෙබ් අඩවි තෝරා ගෙන සම්මාන ප්‍රදානය කිරීම මෙහි ප්‍රධාන අරමුණයි.

ඒ අනුව කපිල ආරියවංශගේ රාජකාරි කාළය තුළදී අදාල වැටුප් වර්ධක සමඟ ඊට අදාල වන්නාවූ අංක රප්‍ර/ආ03/01/01 හා 2019.12.26 දිනැති රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛ 03/2016 අනුව 2020.01.01 දිනට වැටුප් පරිවර්තනය කිරීමේ ලිපියද මේ සමඟ

ඉදිරිපත් කර ඇත. කපිල ආරියවංශ රාජකාරි කාළය තුළ කිසිදු දෝෂාරෝපණයකට හෝ දූෂිත ක්‍රියාවකට ලක්වී නොමැති බැවින් නියමිත පරිදි වැටුප් වර්ධක අද දින වන විටත් අඛන්ඩව ඔහු වෙත ලැබී ඇත. කපිල ආරියවංශ රාජකාරි නිළ තනතුර වනුයේ සහකාර අධ්‍යක්ෂ මාධ්‍ය වේ. කපිල ආරියවංශ සේවයට බැඳුණු දින සිට එනම් 2006.04.17 වන දින සිට 2015 ජනවාරි හෝ ඊට ආසන්න කාළය තුළදී සහකාර අධ්‍යක්ෂ මාධ්‍ය ලෙස විද්‍යුත්, මුද්‍රිත හා ඩිජිටල් යන සියලුම මාධ්‍යයන් ආවරණය කරමින් ඔහු ඇතුලු මාධ්‍ය කණ්ඩායම විසින් ඉතා සාර්ථකව අදාල රාජකාරි ඉටු කරන ලදී. ඒ අනුව 2015 ජනවාරි හෝ ඊට ආසන්නයෙන් පසු 2018 ජනවාරි හෝ ඊට ආසන්න කාළයක් තුළදි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඩිජිටල් මාධ්‍යයට සම්බන්ධ විශේෂ මාධ්‍ය ඒකකයේ අංශ ප්‍රධානියා ලෙස රජයේ නිළ පුවත් වෙබ් අඩවිය වන www.news.lk වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කර www.bestweb.lk මගින් පිරිනමන රිදී හා ලෝකඩ සම්මානද රජයේ නිළ වෙබ් අඩවියට ලබාදීම පිළිබඳ ඔහු හට ඇත්තේ මහත් ආඩම්බරයකි. නමුත් 2018 ජනවාරි හෝ ඊට ආසන්න දිනයකදී ඔහු ඉහත විශේෂ මාධ්‍ය ඒකකයෙන් කිසිදු දැනුම් දීමකින් තොරව ඔහුගේ රාජකාරි විෂය පථය ඔහුගේ යටතේ සිටි නිළධාරියෙකුට පැවරීම සම්පූර්ණ වශයෙන් ඔහුගෙන් පුද්ගලිකවම දේශපාලන පළිගැනීමක් ලෙස ඔහු හට හැඟී යයි. තවද ඒ ආසන්නතම කාලසීමාවකදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත ඔහු කැඳවා ඔහු හට කිසිසේත්ම අදාල නොවන නමුත් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් සකස් කරන ලද "දිවිනැගුම" පොත් පිංච එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ රාජකාරි කළ ඔහු වෙත ලබාදුන් බවටද වූ ව්‍යාජ කාරණය පදනම් කරගෙන ඔහු හට ද්වේශ

සහගත ලෙස මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ නිළධාරීන් ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී. ඉහත ඒ සම්බන්ධයෙන් දක්වා ඇත. ඉන්පසු ඉහත ප්‍රකාශ වල දක්වා ඇති පරිදි ඔහුගේ නිළ තනතුරට අදාලත්වයක් නොමැති රාජකාරි පැවරීම සිදුවිය. ඒ අනුව අද දිනය වන විටත් ඔහු ඩිජිටල් යටිතල පහසුකම් අංශයේ අංශ ප්‍රධානී ලෙස රාජකාරි කටයුතු කරයි. ඒ අංශයට අනුව ඔහු විසින් අධික්ෂණය සහ කළ යුත්තේ ආයතනයේ ඇති පරිගණක හා අශ්‍රිත උපකරණ අලුත් වැඩියා කිරීම නව උපකරණ මිළදී ගැනීමට අවශ්‍ය වුවහොත් හා ඔහු වෙත විසින් අදාල නිර්දේශයන් ලබාදීම,ආයතනයේ පිලිවලට ඇති දූරකථන හා දත්ත රැහැන් අදාල ආයතනයන් ලවා ඉවත් කරවීම, නැවත ස්ථාපනය කරවීම ආදී වූ තාක්ෂණික වැඩ කටයුතු බොහෝ වශයෙන් සිදු කර ඇත. රාජ්‍ය සේවකයෙකු ලෙස ඉතා කැපවීමෙන් හා විවිධ දුෂ්කර අවස්ථාවන් ජය ගෙන රජය වෙත උපරිම සේවාවක් ඔහු විසින් ලබා දුන්නත් 2015.01.08 වන දින සිට 2019.11.16 වන දින දක්වා සිදුවූ ඔහු හට අදාල වන්නාවූ දේශපාලන පළිගැනීම් නිසා ඔහුගේ රැකියාව කිරීමේ හැකියාව සහ තෘප්තිය මෙම කාළසීමාව තුළදී උපරිම වශයෙන් ඉතාම පහල මට්ටමට ඇද වැටිණි. ඒ හේතුව නිසාම ඔහු හට ඔහුගේ රැකියාව පිළිබඳව විශාල කලකිරීමක්ද ඇති වී ඇත. එනිසා ඔහු ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වීම සඳහා මූලික කටයුතු සිදු කරන ලදී. ඒ අනුව ඔහු විසින් යොමු කළ අයදුම්පතට අනුව ඔවුන් skilled migration assessment සිදු කර ඒ සඳහා වන සුදුසුකම් ලබා ඇති බව ඔහු වෙත 13AR157691 (ZV) හා 2020.07.01 දිනැති ලිපිය මඟින් ඔහු වෙත දැනුම් දී ඇත. මේ කුමන බාධක ආවත් ඔහු ඔහුගේ රාජකාරි කටයුතු නිසි ලෙස ඉටු කළ නිසාත් රාජ්‍ය සේවයේ පළමු ශ්‍රේණිය ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් ලබා තිබෙන නිසාත් මෙවර

2020 පාර්ලිමේන්තු මැතිවරණයේ කළුතර මැතිවරණ කොට්ඨාශයේ ප්‍රධාන ගණන් කිරීමේ නිළධාරි ලෙස කටයුතු කිරීමට ලැබීම ගැන ඔහු හට ඇත්තේ මහත් සතුටක් සහ අභිමානයකි.

මෙම කරුණු කාරණාවලට අනුව ඔහු වෙත අහිමි වී ගිය සහනයන් ලබා දෙන මෙන් ඉල්ලා ඇත. එම සහනයන් ලෙස දැනට ඔහු වෙත පෙර පරිදිම මාධ්‍ය හා සම්බන්ධ කටයුතු පවරා දීමට උපදෙස් දෙන ලෙස ඉල්ලා සිටි. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවද මේ වන විට ඩිජිටල් මාධ්‍යට ප්‍රවේශ වී ඇත. 2020.08.25 වන දින ජනමාධ්‍ය අමාත්‍යංශයේ දී ජනමාධ්‍ය අමාත්‍ය ගරු කෙහෙලිය රඹුක්වැල්ල ඇමතිතුමාට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කරන ලද ආකර්ෂනීය ඉදිරිපත් කිරීම වන රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වර්තමාන තත්වය සහ ප්‍රගමනයේ මේ පිළිබදව පැහැදිලිව ඇතුලත් වී ඇත. ඉහත සඳහන් ඩිජිටල් ප්‍රවේශය සඳහා සුදුසුකම් සහ විශේෂඥ පුහුණුව ලැබූ දැනට දෙපාර්තමේන්තුවේ සිටින එකම හා ප්‍රධාන  නිළධාරියා ඔහු බව ප්‍රකාශ කර ඇත. ඒ සඳහා වන සුදුසුකම් ඉහත ඉදිරිපත් කර ඇති අතර පහත පරිදි ඊට අමතරව අධ්‍යාපන හා තෘතීය, වෘත්තීය පළපුරුද්ද දක්වා ඇත. තරුණ සේවා සභාව මහරගම ආයතනයෙන් ලබා ගත් 1997 ජුලි මස සිට දෙසැම්බර් මස දක්වා හදාරන ලද the tecniques of T.V. programme and video technology පුහුණු පාඨමාලාව ඔහු විසින් හදාරා ඇත. විජය ග්‍රැෆික්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ වයිටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මඟින් හැදෑරූ digital animation පාඨමාලාව හදාරා ඇත. ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය මඟින් පැවැත්වූ video & multi media learning resources development පාඨමාලාව හදාරා ඇත. ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනය මඟින් හදාරන ලද television news basic training

programme පිළිබඳ පාඨමාලාව හදාරා ඇත. ආතර් සී කලාර්ක් ආයතනයේ හදාරන ලද computer hardware engineering පාඨමාලාව හදාරා ඇත. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ක්‍රියාත්මක කරණු ලැබූ diploma information technology පිළිබඳ හදාරා ඇත. ජාතික තරුණ සේවා කවුන්සිලය මඟින් ක්‍රියාත්මක කළ Microsoft certified solutions associate-windows server 2016(MCSA) පාඨමාලාව හදාරණ ලදි. ස්වීඩන් රජයේ ස්ටොක්හෝම් විශ්ව විද්‍යාලයේ computer and systems sciences දෙපාර්තමේන්තුවේ ඩිජිටල් තාක්ෂණය පිළිබඳ executive training workshop පාඨමාලාව හදාරා ඇත. එසේම මෙම ඩිජිටල් ප්‍රවේශය පිළිබඳ පුහුණු කිරීම් සහ ඉගැන්වීම් පිළිබඳව ඔහු හට පළපුරුද්ද ඇත. එයට අදාලව කොළඹ විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍ය ඒකකයේ සිසුන් පුහුණු කිරීම සම්බන්ධයෙන් වූ ලිපිය පැ.72 ලෙස සඳහන් කර ඇත. තවද ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ හා ආශ්‍රිත ආයතනයන්හි කායී සාදනයන් පිළබඳ ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් නිර්මාණය කිරීමද ඔහු විසින් සිදු කර ඇත. එයට අදාල attachment of NITESL staff for LRDC activities: stage II ලිපය පැ.73 ලෙස සඳහන් කර ඇත. ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ ඔහු අධ්‍යයන සහකාර ලෙස (ශ්‍රව්‍ය/දෘෂ්‍ය තාක්ෂණය) ලෙස රාජකාරී කිරීමේදී ඊට අදාලව ලබාදුන් රාජකාරි ලැයිස්තු ලිපියද මේ සමඟ ඉදිරිපත් කර ඇත. එසේම national diploma in video production technology පාඨමාලාවේ විෂය නිර්දේශය සැකසීමේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලද ලිපියේ ඡයා පිටපතක් පැ.75 ලෙස සඳහන් කර ඇත. එසේම national diploma in non linear editing පාඨමාලාවේ විෂය නිර්දේශය සකස් කිරීම පිළිබඳ ලිපියේ ඡයා පිටපතක් MDKPA

76 ලෙස සඳහන් කර ඇත. කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය මඟින් සිදු කල ඩිජිටල් ව්‍යාපෘතිය සම්බන්ධව ඔහු වෙත ලබාදුන් project 1; preparation of web based edutourism GIS systems for north central province assignment of digital image and script processor(total project value, Rs 1.185m) ලිපියේ ඡයා පිටපතක් පැ.77 ලෙස සඳහන් කර ඇත. කොළඹ විශ්ව විද්‍යාලය ශාස්ත්‍ර පීඨයේ ජනමාධ්‍ය ඒකකයේ language of moving image TV & film විෂය පිළිබඳ බාහිර කථිකාචාර්‍ය ලෙස ඔහු වෙත ලබා දුන් පත්වීමේ ලිපිය පැ.78 ලෙස සඳහන් කර ඇත. එසේම කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය මඟින් ඔහු වෙත ලබාදුන් advisory committee meeting on certificate courses leading to diploma in digital video production and media technologies සම්බන්ධ ලිපිය පැ.79 ලෙස සඳහන් කර ඇත. එසේම කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය මඟින් ඔහු වෙත නිකුත් කළ diploma in digital video & media production technology – course no – 01 ලිපිය 2012.11.06 දින යොමු කර video production & media campaign (DMT 10) හි ප්‍රශ්න හා පිළිතුරු පත්‍ර පරීක්ෂක ලෙස පත්කර ඇත.

2010.02.24 වන දිනැති හා ස/අධි/03/රූපවාහිනි අංකය යටතේ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට රූපවාහිනි දැන්වීම් සහ වාර්ථා වැඩසටහන් නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවේ සාමාජික ලෙස පත් කළ ලිපිය පැ.81 ලෙස සඳහන් කර ඇත. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මාධ්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා තාක්ෂණ කමිටු ඇගයීම් සාමාජිකයෙකු ලෙස ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ගණකාධිකාරී විසින් අංක ED/05/02/27 හා 2010.10.29 වන දිනැති

ලිපිය ඉදිරිපත් කරයි. එසේම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය ප්‍රති නිර්මාණය කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජික ලෙස කටයුතු කිරීමේ ලිපිය එය අංක DI/PRO/02/08/2019 හා 2019.05.29 වන දිනය සඳහන් වේ. අංක රප්‍ර/ආ04/01/02/002-2019 හා 2020.02.05 වන දිනැති ලිපිය අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිළධාරි විශේෂ ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම - සේවා පළපුරුද්ද සහ කුසලතාවය මත නම් වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කර ඇති බවට දන්වා තිබූ ලිපිය පැ.84 ලෙස සඳහන් කර ඇත. ඉහත ආකාරයෙන් රාජකාරි ඉටු කිරීම නිසා ඔහු වෙත ලැබුණු ප්‍රශංසාත්මක ලේඛණ තවදුරටත් ඉදිරිපත් කර ඇත. ඒ අනුව තුන් වෙනි වරට පැවැත්වූ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය වෙනුවෙන් කපිල ආරියවංශ ලබා දුන් දායකත්වය සඳහා ප්‍රශංසාත්මක සහතික පත මුදල් හා රාජ්‍ය ආදායම් අමාත්‍ය මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය සහ දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශන සංවිධාන කමිටුවේ සභාපති රංජිත් සියඹලාපිටිය මහතා විසින් අත්සන් කර ඇත. එසේම 2017.06.10 වන දින රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් කපිල ආරියවංශ වෙත ලබා දුන් පොදු 230 බි නැමති ප්‍රශංසාත්මක ලිපිය ඉදිරිපත් කර ඇත.

එසේම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම වරට 2019.11.16 වන දින යෙදුණු ජනාධිපතිවරණය වෙනුවෙන් විකාශයට පත් කළ සමාජ මාධ්‍ය විකාශනය සඳහා ඔහු විසින් ලබා දුන් මෙහෙවර වෙනුවෙන් ලබාදුන් සේවා ඇගයීම් සහතිකය මේ සමඟ ඉදිරිපත් කරයි. ඒ අනුව ඔහුගේ හැගීම වන්නේ අනාගතයේදී ගෝලීයකරණය යටතේ හා කෘත්‍රිම බුද්ධිය (ARTIFICIAL INTELIGENT) හරහා

ක්‍රියාත්මක වන රොබෝ ජනමාධ්‍යවේදය (ROBOT JOURNALISM) අප රටක් හා රජයක් හැටියට මුහුණදිය යුතුයි. ඒ සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් කළ යුතු ප්‍රධාන මෙහෙවර රාශියක් ඇත. එබැවින් අනාගතයට මුහුණ දීම සඳහා ඩිජිටල් මාධ්‍ය අංශයක් ප්‍රධාන ලෙස එහි පිහිටුවීමත් එහි ප්‍රධානී ලෙස අධ්‍යක්ෂ - ඩිජිටල් මාධ්‍ය තනතුරක් ඉහත දක්වා ඇති අධ්‍යක්ෂ ප්‍රවෘත්ති පූර්වාදර්ශය අනුව ඇති කිරීම සුදුසු බව පෙන්වා දී ඇත. එසේම ඒ සඳහා උපරිම සුදුසුකම් ලබා ඇති ඔහු ඉහත පූර්වාදර්ශය අනුව පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටී. එසේම ඉහත දක්වා ඇති පරිදි විධායක නිළධාරීන්ට හිමි ඔහුගේ වාහන බලපත්‍රය නැවත ලබා දෙන ලෙසත් ඉල්ලා සිටී. එසේම ඉහත ඉදිරිපත් කර ඇති ඔහුගේ උසස් කිරීමේ පරිපාටියේ සහකාර අධ්‍යක්ෂ මාධ්‍ය යටතේ ඇති 10.1.2 හා 10.2.1.1 වගන්ති වලට අදාලව මේ වන විට සුදුසුකම් සම්පූර්ණ කර ඇති බැවින් 2 වන හා 3 වන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ නොපමාව පවත්වා II වන ශ්‍රේණියට හා I වන ශ්‍රේණියට අදාල උසස් කිරීම් ලබා දෙන ලෙසද අදාල නිළධාරීන්ට උපදෙස් දෙන ලෙසද ඉල්ලා ඇත.

ඒ අනුව ඔහු 2020.09.11 වන දින ලබා දෙන ලද ප්‍රකාශයේ සඳහන් කළ පරිදි 2015 ජනවාරි හෝ ඊට ආසන්නයෙන් පසු 2018 ජනවාරි හෝ ඊට ආසන්න කාලයක් තුළදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඩිජිටල් මාධ්‍යයට සම්බන්ධ විශේෂ මාධ්‍ය ඒකකයේ අංශ ප්‍රධානියා ලෙස රජයේ නිළ පුවත් වෙබ් අඩවිය වන www.news.lk වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කර www.bestweb.lk මඟින් පිරිනමන රීදී හා ලෝකඩ සම්මානද රජයේ නිළ වෙබ් අඩවියට ලබාදීම පිළිබඳ ඔහු හට ඇත්තේ මහත් ආඩම්බරයකි. එසේම ඔහු යටතේ පැවති රජයේ

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.dgi.gov.lk සඳහාද පහත පරිදි සම්මාන ලබාගෙන ඇත. 2015 දී www.news.lk සඳහා රිදී සම්මානයද හා එම වසරේදීම merit winner සම්මානයද ලබාගෙන ඇත. එසේම 2017 වසර සඳහා www.dgi.gov.lk සඳහා ලෝකඩ සම්මානයද www.news.lk සඳහා රිදී සම්මානයද හා එම වසරේදීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේනතුවට ලබාදීමට හැකි විය. එම සම්මානයන් ලබා ගැනීමට අදාලව ලබා ගන්නා ලද www.bestweb.lk වෙබ් අඩවිය මඟින් 2020.09.14 වන දින ලබා ගත් මුද්‍රිත පිටපත පැ.88 ලෙස සඳහන් කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 29 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020/11/24

9 .LI

පැමිණිලි අංකය - 408/2020

පැමිණිලිකරු - උපාලි ලියනගේ

ලිපිනය - නො:15, වීරසේකර මාවත, තලවතුගොඩ

## තීරණය

1948 අංක 17 දරණ පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක නිර්දේශ මත ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග විමර්ශනය කරනු ලැබීමක් එකී නීතිය යටතේ පිහිටුවා ඇති මෙම කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු නොවේය යන තීරණයට මෙම කොමිෂන් සභාව එළඹ සිටී.

# ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

උපාලි ලියනගේ පාසල් අධ්‍යාපනයෙන් පසු රත්නපුර ප්‍රදේශයේ වතු සුපිරින්ටන්ඩන්ට්වරයෙකු වශයෙන් සේවයට බැඳුණි. පසුව රජයේ ව්‍යාපෘතියක් වන ලස්සන ගම ව්‍යාපෘතියේ සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් සේවය කරනු ලැබූ අතර අනතුරුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් කෑගල්ල දිස්ත්‍රික්කයේ වතු 32ක සාමාන්‍යාධිකාරි වශයෙන් කටයුතු කරනු ලැබිණි. 1977 බලයට පත් වූ රජය විසින් උපාලි ලියනගේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉවත් කරනු ලැබූ අතර පුද්ගලික සමාගමක රැකියාවක නිරත විය. 1981 වර්ෂයේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය විසින්

උපාලි ලියනගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෝට්ටේ ආසන සංවිධායකවරයා වශයෙන් පත් කරන ලදී. 1981 වර්ෂයේදී එවකට ජනාධිපති ජේ.ආර් ජයවර්ධන මහතා විසින් නැක්සලයිට් නැමති ව්‍යාපාරයක් පදනම් කර ගනිමින් තමා අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන්නේ යැයි ලැබෙන ලද තොරතුරක් හේතුවෙන් ඉන්දියාවට සහ එතැනින් සෞදි අරාබියට ගොස් වසර එක හමාරකින් පමණ ආපසු පැමිණෙන ලද අතර ගිණිගත්හේන ප්‍රදේශයෙන් අක්කර 85ක තේ වත්තක් මිලදී ගෙන 1993 වර්ෂය දක්වා ව්‍යාපාර කටයුතු සිදු කරනු ලැබිණි. 1994 වර්ෂයේදී චන්ද්‍රිකා බන්ඩාරනායක කුමාරතුංග මැතිණිය විසින් උපාලි ලියනගේ ජාතික ලොතරැයි මණ්ඩලයේ ක්‍රියාකාරි අධ්‍යක්ෂක වශයෙන් පත් කරනු ලැබූ අතර පසුව එම මණ්ඩලයේ සභාපතිවරයා වන ලදී. 2002 වර්ෂයේදී බලයට පත් රජය ඔහු ඉවත් කරනු ලැබූ අතර 2005 වර්ෂයේදී බලයට පැමිණි ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් උපාලි ලියනගේ නැවතත් ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී. වසර 03කට පමණ පසු සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන්ද 2010 වර්ෂයේදී ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සභාපතිවරයා වශයෙන්ද පත් කරන ලදී. එම තනතුරෙහි සේවය කරමින් සිටියදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නිර්දේශය මත එවකට ධීවර අමාත්‍ය රාජිත සේනාරත්න මහතා විසින් ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිණි. උපාලි ලියනගේ මෙම සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් පත් වන අවස්ථාව වන විට ඔහු ලාල් සමරසිංහ සහ නීල් මුණසිංහ යන කළමණාකාර අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු සේවයේ කරනු ලැබූ අතර අමාත්‍යවරයා ඍජුවම සම්බන්ධ වූයේ ඔවුන් සමගය.

2013 වර්ෂයේ අයවැය යෝජනා මගින් 2014 වර්ෂය සඳහා අනුමත වූ ව්‍යාපෘතියක් වන මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතිය රාජිත සේනාරත්න අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවට භාජනය වූ අතර උපාලි ලියනගේ සහභාගි වූයේ සීමිත සාකච්ඡා සංඛ්‍යාවකට පමණි. මෙම සාකච්ඡාවලට නියෝජ්‍ය අමාත්‍ය සරත් ගුණරත්නද අමාත්‍යංශයේ ඉහල නිලධාරින් මෙන්ම ගම්පහ මීගමුව ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරින් මෙන්ම මොරටුව විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ නියෝජිතයින්ද ප්‍රදේශවාසී ධීවරයින්ද සහභාගි වී ඇත. සාකච්ඡාවලදී තීරණය කරනු ලැබ ඇත්තේ මෙම ව්‍යාපෘතියේ කටයුතු කිරීම මොරටුව විශ්වවිද්‍යාලය සහ ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් සිදු කරනු ලැබිය යුතු බවයි.

මෙම ව්‍යාපෘතිය 2014 දෙසැම්බර් මාසයේදී ආරම්භ කිරීමට රාජිත සේනාරත්න අමාත්‍යවරයා සහ අදාළ නිලධාරින් තීරණය කරනු ලැබිණි. එහෙත් හදිසියේම ජනාධිපතිවරණය කැඳවීම සිදු වූ අතර රාජිත සේනාරත්න අමාත්‍යවරයා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිව කටයුතු කිරීමට පක්ෂ බලවේග සමග එකතු විය. උපාලි ලියනගේ හටද රාජිත සේනාරත්න අමාත්‍යවරයා සමග එක් වීමට යෝජනා කෙරෙන ලද නමුත් ඔහු එය ප්‍රතික්ෂේප කරනු ලැබිණි. එයින් රාජිත සේනාරත්න උපාලි ලියනගේ සමග උරණ විය.

ඉන්පසුව හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයා වැඩබලන අමාත්‍යවරයා වශයෙන් පත් කෙරෙන ලද අතර මීගමුව ව්‍යාපෘතිය එම අමාත්‍යවරයාගේ ඡන්ද බල ප්‍රදේශයට අයත් ව්‍යාපෘතියක් වූ බැවින් ඒ වන විට තීරණය කර තිබූ පරිදි ඉදිරියට සිදු කිරීමට තීරණය කරන ලදී. අමාත්‍යංශයේදී ගනු ලැබූ තීරණ අනුව ධීවර වරායවල් සහ නැංගුරම් පොළ වල් දියුණු කිරීමේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂක සරත් කුමාර ද

සිල්වා විසින් මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට හා මුල් ගල තැබීමේ උත්සවයට රුපයල් මිලියන 25ක් ලබා දීමට ගණකාධිකාරිවරයා වෙත යොමු කරන ලදී. එහෙත් එම මුදල නොලැබුනෙන් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ සරත් කුමාර ද සිල්වා විසින් රුපියල් මිලියන 05ක මුදලක් අත්තිකාරම් වශයෙන් සංස්ථාවට ලබා දෙන ලදී. අනතුරුව ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය සඳහා අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවකදී ව්‍යාපෘති අධ්‍යක්ෂක සරත් කුමාර ද සිල්වා වෙත ලබා දුන් සිහි කැඳවීම් සංස්ථාවට යොමු කරනු ලැබූ අතර ඉන් පසු අදාළ අංශ විසින් සාමාන්‍ය සම්ප්‍රදායානුකූලව එම කටයුතු සිදු කරන ලදැයි යන විශ්වාසයෙන් උපාලි ලියනගේ විසින් නිර්දේශ සහ අනුමත කිරීම් සහිත වවුචර් පත්හි අත්සන් යොදන ලදී. ඒ අනුව සමරු ඵලකය සඳහාද කැප් සහ ටී ෂර්ට්ස් සඳහාද වූ අනුමත කිරීම් උපාලි ලියනගේ විසින් සිදු කර ඇත.

සෑම වසරකදීම අමාත්‍යාංශය මගින් හෝ සංස්ථාව මගින් දිනපොත් මුද්‍රණය සිදු කරනු ලබයි. 2014 වර්ෂයේ අවසන්භාගයේ ඇති වූ ව්‍යාකූල තත්වය මත දිනපොත් මුද්‍රණය ඇණ හිටින ලද නමුත් ආයතනයේ සේවකයින් විසින් දිගින් දිගටම දිනපොත් අවශ්‍යතාවය පිළිබඳව ඉල්ලීම් කරනු ලැබූ බැවින් දිනපොත් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම සාමාන්‍යාධිකාරිවරයාට පවරනු ලැබිණි. එම කටයුත්තද නිසි ක්‍රියා පටිපාටිය මත ඉටු කරනු ලැබ ඇතැයි විශ්වාසය මත උපාලි ලියනගේ අදාළ වවුචර් පත් අත්සන් තැබීම සිදු කරන ලදී.

2015.01.08 දින පැවති ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහතා ජයග්‍රහණය කරනු ලැබූ බැවින් 2015.01.09 වන දින උපාලි

ලියනගේ ඔහුගේ නිල රථය සංස්ථාවට බාර දී සේවයෙන් ඉවත් වෙන ලදී.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් පත් කරන ලද බරපතල මූල්‍ය වංචා සෙවීමේ ජනාධිපති කොමිෂන් සභාව වෙත 2015.06.30 දින පෙනී සිටින ලෙස ලැබෙන ලද දැනුම් දීම මත උපාලි ලියනගේ එම කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ප්‍රකාශයක් ලබා දුන් අතර එහිදී ඔහුට පැහැදිලි වූයේ ඉහත කී වවුචර් පත් වලට අත්සන් තැබීම ප්‍රශ්න කිරීමට ලක් වී ඇති බවයි. එකී ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුව හා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත ලබා දීමෙන් පසු උපාලි ලියනගේ හට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන අංශය වෙත ප්‍රකාශයක් ලබා දීමට සිදු විය. එසේම අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද උපාලි ලියනගේ ඇතුළු පස් දෙනෙකුගෙන් ප්‍රකාශයන් සටහන් කරගත් අතර අනතුරුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලදුව ඇප මත නිදහස් කරනු ලැබිණි. අවස්ථා කීපයක් එම අධිකරණයේ පෙනී සිටීමෙන් පසුව 2018 අප්‍රේල් මාසයේදී HC57/2018 සහ HC58/2018 යන නඩු අංක යටතේ කොළඹ මහාධිකරණයේදී අධිචෝදනා පත්‍ර භාර දෙන ලදී.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 24 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

9 .LII

පැමිණිලි අංකය - 615/2020

පැමිණිලිකරු - අංගොඩගේ දොන් සුමිත් චම්මික පෙරේරා

ලිපිනය - අංක 73/50, හෝකන්දර උතුර, හෝකන්දර

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා
2. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂක නාගහමුල්ල මහතා

තීරණය

වසීම් තාජුඩීන් නැමැත්තා බීමත්ව රිය පැදවීමේදී රිය අනතුරකට පත්ව මරණයට පත් වීම මනුෂ්‍ය ඝාතනයක් බවට පත් කිරීමත් එහි වගකීම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ පවුලේ සාමාජිකයන් හට පැවරීමත් සඳහා යහපාලන රජයේ දේශපාලනඥයින්ගේ උවමනාව මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නාගහමුල්ල සහ සහකාර පොලිස් අධිකාරි ශානි අබේසේකර විසින් දැඩි උත්සහයක යෙදී ඇති අතර ඒ සඳහා පොලිස් පරීක්ෂක සුමිත් පෙරේරා උපයෝගි කර ගැනීමට දරණ ලද

උත්සහය ව්‍යර්ථ වීම හේතුවෙන් ඔහුට එරෙහිව කිසිදු සාක්ෂියක් හෙළිදරවු වී නොමැතිව තිබියදී ඔහු මනුෂ්‍ය ඝාතන චෝදනාවකට ලක් කොට සැකකරුවෙකු වශයෙන් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත සිරභාරයට පත් කරනු ලැබීමෙන් මහත් අසාධාරණයකට ලක් කරනු ලැබ ඇති බව කොමිෂන් සභාව තීරණය කරනු ලබයි. තවද 2009 වර්ෂයේ සිදු වූ සිද්ධියක් වෙනුවෙන් පැවැත්වීමට යෙදෙන ලද විනය පරීක්ෂණ වාර්තාවක් යොදා ගනිමින් මෙම නිලධාරියා සේවයෙන් පහ කරනු ලැබීම හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර විසින් ඉහත කී හේතුව පදනම් කර ගනිමින් ඔහු පළි ගැනීමට ලක් කිරීමක්ය යන තීරණයටද කොමිෂන් සභාව එළඹ සිටී.

## නිර්දේශ

01. අංගොඩගේ දොන් සුමිත් චම්මික පෙරේරා නැවත සේවයේ පිහිටුවිය යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.
02. අපරාධ චෝදනා නැගීම සඳහා බොරු සාක්ෂි නිර්මාණය කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් හට එරෙහිව නීතිමය පියවර ගත යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික හා ලිඛිත සාක්ෂි

අංගොඩගේ දොන් සුමිත් චම්මික පෙරේරා (මින් ඉදිරියට සුමිත් පෙරේරා යනුවෙන් හඳුන්වයි) කොමිෂන් සභාව වෙත 2020.02.20 දිනැති පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබූ අතර එය කොමිෂන් සභාවේ විෂය පථය තුළට ගැනෙන ලද බව තීරණය කරන ලද බැවින් අංක

615/20 වශයෙන් ලියාපදිංචි කරනු ලැබිණි. ඒ අනුව ඔහුගේ පැමිණිල්ල පිළිබඳව විමර්ශනය කරනු ලැබූ අතර එහිදී ඔහු විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි පහත සඳහන් පරිදි වේ.

කොළඹ ආනන්ද විද්‍යාලයේ පාසල් අධ්‍යාපනය ලැබූ සුමිත් පෙරේරා සාමාන්‍ය පෙළ විභාගය සමත් වීමෙන් අනතුරුව 1990 වර්ෂයේදී උප සේවා පොලිස් පරික්ෂකවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පොලිස් සේවයට එක් විය. පොලිස් අභ්‍යාස විද්‍යාලයකදී පුහුණුව ලැබීමෙන් අනතුරුව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි සේවය කරනු ලැබූ අතර 2012 වර්ෂයේ නාරාහේන්පිට පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් සේවය කරනු ලැබිණි. ඒ වන විට ඔහු උප සේවා පොලිස් පරික්ෂක තනතුරට උසස් වීම් ලැබ සිටින ලදී. එවකට නාරාහේන්පිට පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වූයේ ප්‍රධාන පොලිස් පරික්ෂක ඩේමියන් පෙරේරාය. 2012 වර්ෂයේ මැයි මාසේ දිනයක සුමිත් පෙරේරා රාජකාරි අවසන් වී බොරලැස්ගමුවේ පිහිටි ඔහුගේ නිවසේ සිටියදී නාරාහේන්පිට පොලිස් වසමේ පාක් පාරේ සිදු වූ රිය අනතුරක් සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයා විසින් සුමිත් පෙරේරාගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලබා දී දැනුම් දුන් අතර මෝටර් රථයක් රිය අනතුරට පත් වී ගිණි ගෙන ඇති බවත් එහි ගමන් ගත් පුද්ගලයාද කාර් රථය තුළ පිළිස්සී සිටින බවත් වහාම පැමිණ පරික්ෂණ කටයුතු ආරම්භ කරන ලෙසත් දන්වන ලදී. ඒ අනුව සුමිත් පෙරේරා ඔහුගේ අධීක්ෂණ නිලධාරින් දැනුවත් කිරීමෙන් අනතුරුව 23:45 පැයට අනතුර සිදු වූ ස්ථානයට යන ලද අතර ස්ථානාධිපති ඩේමියන් පෙරේරාද එහි පැමිණ සිටින ලදී. ඒ අවස්ථාව වන විට ගිණි නිවීමේ රථයක් පැමිණ ගින්න නිවා දමා තිබූ අතර සුමිත් පෙරේරා හට බාර කරන ලද රාජකාරිය වූයේ සිද්ධිය ඇසින් දුටු තැනැත්තන්ගේ ප්‍රකාශ

සටහන් කිරීමත් අපරාධ ස්ථාන පරික්ෂණ නිලධාරීන් ගෙන්වා පරික්ෂණ කටයුතු සිදු කිරීමත් රජයේ රස පරීක්ෂක මෙන්ම මහේස්ත්‍රාත්වරයා, අධිකරණ වෛද්‍ය නිලධාරි මගින් අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට සැලැස්වීමත්ය. අළුත්කඩේ අංක 03 මහේස්ත්‍රාත් අධිකරණයට සිද්ධිය සම්බන්ධයෙන් කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව මහේස්ත්‍රාත්වරයාගේ නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ලබා දුන් නියෝග පරිදි මළ සිරුර අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලයට යවනු ලැබිණි.

අනතුරුව සුමිත් පෙරේරා සිය අධීක්ෂණ නිලධාරින්ගෙන් ලැබෙන ලද උපදෙස් පරිදි මිය ගිය තැනැත්තා සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ අතර ඒ අනුව එම තැනැත්තා එදින රාත්‍රියේ මිතුරන් කීප දෙනෙක් සමග ඇන්ඩර්සන් මහල් නිවාසයන්හි එෆ් 05 යන නිවසේදී මත්පැන් පානය කරන ලද බවත් එය කුළී පදනම මත ලබා ගත් බවත් කාන්තාවක් පදිංචි නිවසක් බවත් හෙළිදරවු විය. එම නිවසේදී මිය ගිය තැනැත්තා මත්පැන් පානය කරන ලද බවත් සාක්ෂි මගින් අනාවරණය වූ අතර හිස් මත්පැන් බෝතල් 02ක් ද බැදපු මයියොක්කා බයිට් පැකට් එකක්ද එම ස්ථානයේ තිබී අත්අඩංගුවට ගෙන නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කරන ලදී. ඊට පෙර අවස්ථා කීපයකදීම එම ස්ථානයේදී මත්පැන් පානය කර තිබූ හිස් බෝතල් කිහිපයක්ද අත්අඩංගුවට ගනු ලැබිණි. මිය ගිය පුද්ගලයා සමග අවසන් වරට සිටින ලද පුද්ගලයන් දෙදෙනෙකුද හෙළිදරවු කරගත් අතර අධික ලෙස මත්පැන් පානය කර වාහනය පැදවීමෙන් අනතුරට ලක් වන ලද බව අනාවරණය කරගනු ලැබිණි. මෙලෙස මියගොස් ඇත්තේ රගර් ක්‍රීඩක වසීම් තාජුඩීන් නැමති තැනැත්තා බැව් හඳුනාගෙන තිබිණි. අනතුරුව වැඩිදුර විමර්ශනය කොළඹ අපරාධ කොට්ඨාසයට බාර දෙනු ලැබිණි.

2015 ජනාධිපතිවරනයෙන් පසු සුමිත් පෙරේරා රාජකාරි කරනුයේ යාපනය නෙල්ලිඅඩි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙසටය. 2012 වසරේ සිදු වන ලද රගර් ක්‍රීඩක වසීම් තාජුඩීන් රිය අනතුරින් මරණයට පත් වීමේ සිද්ධිය සම්බන්ධයෙන් 2015 වසරේ මැද භාගයේදී සුමිත් පෙරේරාගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමට අවශ්‍ය හෙයින් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙස දැනුම් දෙන ලදී. එලෙස දැනුම් දීම් සිදු කරමින් සුමිත් පෙරේරා පහළොස් වතාවක් පමණ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවනු ලැබූ අතර එම දෙපාර්තමේන්තුවේ මිනී මැරීම් විමර්ශන අංශයේ උප පොලිස් පරික්ෂක ප්‍රේමතිලක, පොලිස් සැරයන් රත්නප්‍රිය සහ පොලිස් සැරයන් මෙන්ඩිස් යන තැනැත්තන් විසින් සුමිත් පෙරේරාගේ ප්‍රකාශ සටහන් කර ගනු ලැබිණි. සුමිත් පෙරේරාගේ ප්‍රකාශ සටහන් කිරීමට පෙර ඉහත කී අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ මිනී මැරීම් අංශයේ සහකාර පොලිස් අධිකාරි වික්‍රමසේකර සහ සහකාර පොලිස් අධිකාරි තිසේරා වෙත සුමිත් පෙරේරා ඉදිරිපත් කරනු ලැබූ අතර ඔවුන් දෙදෙනා සුමිත් පෙරේරාට කියා සිටින ලද්දේ අදාළ සිද්ධිය සිදු වන අවස්ථාවේ ආරක්ෂක ලේකම්ව සිටි ගෝඨාභය රාජපක්ෂ මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතා සහ පරික්ෂණ කටයුතු යට ගැස්වීමට සුමිත් පෙරේරාට බලපෑම් සිදු කළේ යැයි ප්‍රකාශයක් ලබා දෙන ලෙසටය. සුමිත් පෙරේරා එලෙස සිදු නොකරන ලදින් ඔහු එවකට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නාගහමුල්ල වෙත සහකාර පොලිස් අධිකාරි ශානි අබේසේකර විසින් කැඳවාගෙන යන ලදී. එම අවස්ථාවේදී නාගහමුල්ලද සුමිත් පෙරේරාට කියා සිටින ලද්දේ ඉහත කී පරිදි ප්‍රකාශ ලබා දෙන ලෙසටය. එලෙස ප්‍රකාශ කර සිටින ලද්දේ නම් එය

අසත්‍ය ප්‍රකාශයක් වන හෙයින් එය සිදු කළ නොහැකි බව සුමිත් පෙරේරා විසින් පවසනු ලැබිණි.2016 මාර්තු මාසයේදී පැවති ආනන්ද නාලන්ද වාර්ෂික මහා ක්‍රිකට් තරග දිනයේදී එහි පැමිණ සිටි සුමිත් පෙරේරා හට බොරැල්ල කනත්ත අසළට පැමිණෙන ලෙස ශානි අබේසේකර පැවසූ අතර සුමිත් පෙරේරා එසේ ගොස් සිටියදී ශානි අබේසේකර මෝටර් රථයකින් පැමිණ සුමිත් පෙරේරාට එය පිටුපසින් පැමිණෙන ලෙස දැනුම් දුන් අතර ඒ අනුව ටොරින්ටන්හි පදනම් ආයතනය අසළට ගමන් කරනු ලැබිණි. එහිදී සුමිත් පෙරේරා ශානි අබේසේකරගේ මෝටර් රථයට ගොඩ වූ අතර සිද්ධිය සම්බන්ධයෙන් කතා කරමින් සුමිත් පෙරේරා කියා සිටියේ ඔහු වසර 18ක කාලයත් පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් සේවය කර ඇති බවත් ඔහුට කිසිදු දේශපාලන සම්බන්ධතාවයක් නොමැති බවත්ය. එහිදී ශානි අබේසේකර සුමිත් පෙරේරාට පවසනු ලැබූයේ "උඹ බොරු කියන්නේ. අපි ඔක්කොම හොයාගෙන තියෙන්නේ. උඹට ගොඩ යන්න තියෙන්නේ මේකෙන් තමයි. නැත්තම් ලොකු ප්‍රශ්න ඇති වෙනවා." යනුවෙනි. ඊට දින 02කට පසු සුමිත් පෙරේරා පේදුරු තුඩුව පොලිස් ස්ථානයේ රාජකාරි කරමින් සිටියදී ඔහුට දුරකථන පණිවිඩයක් ලබා දෙමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන ලදී. එහිදී ප්‍රථමයෙන් ශානි අබේසේකර වෙත කැඳවූ අතර "උඹව ඒ.එස්.පී කරන්නම්. කැනඩා යවන්නම්. මුදල් ලබා දෙන්නම්. ඕක කියලා ගොඩ පලයන්." යැයි පවසනු ලැබූ අතර අනතුරුව ශානි අබේසේකර විසින් සුමිත් පෙරේරා නාගහමුල්ල වෙත රැගෙන යන ලදී. ශානි අබේසේකර නාගහමුල්ලට කියා සිටින ලද්දේ "සර් වැඩේ හරියන්නේ නෑ අපි හොයාගත්ත දේවල් කියන්නෑ ඇරෙස්ට් කරන්න තමයි වෙන්නේ." යන්නයි. නාගහමුල්ල පුටුවෙන් නැගී සිටි අතර

කෝපයෙන් පුටුවක් උස්සා බිමට ගසා පවසා ඇත්තේ "උඹ දන්නවා නේද මම උඹලත් එක්ක පී.එස්.ඩී එකේ හිටපු විදිහ. මම පොරොන්දුවක් වුණොත් ඒක කරනවාමයි. උඹ මේක කියන්න ඕනමයි." යන්නයි. 2016.04.19 වන දින සුමිත් පෙරේරා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන ලද අවස්ථාවේදී ශානි අබේසේකර සහ නාගහමුල්ල යන නිලධාරීන් සුමිත් පෙරේරාට කියා සිටියේ ඔහු සහකාර පොලිස් අධිකාරී ධූරයට උසස් කරන බවත් මුදලින් රුපියල් කෝටි 02 ක් ලබාදෙන බවත් කැනඩාවට යවනු ලබන බවත් ඔවුන් යෝජනා කරනු ලබන පරිදි ප්‍රකාශ ලබා දීම සිදු කළ යුතු බවත්ය. එය සිදු කළ නොහැකි බැව් සුමිත් පෙරේරා පැවසූයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එදින සවස 6.00ට ඔහු අත්අඩංගුවට ගන්නා ලදී. පසු දින එනම් 2016.04.20 දින සවස 3.00ට සුමිත් පෙරේරා මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර බී 849/12 නඩු කටයුත්ත හා අදාළව ඔහු රක්ෂණ සිරභාරයට පත් කරනු ලැබිණි. මාස 10ක පමණ කාලයක් සුමිත් පෙරේරා හට රක්ෂිත බන්ධනාගාරගතව සිටීමට සිදු වූ අතර ඇප ලබා ගැනීමට හැකි වූයේ 2017.02.16 දිනය. ඇප මත මුදා හැරීමෙන් පසු සුමිත් පෙරේරා 2017.02.20 දින පොලිස් කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කරමින් තමා නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටි අතර එම අභියාචනය සම්බන්ධයෙන් පොලිස් කොමිෂන් සභාව වෙතින් සොයා බැලීමේදී පොලිස්පතිවරයාගෙන් වාර්තාවක් කැඳවා ඇතත් එය ලැබී නොමැති බැව් දැන ගැනීමට ලැබෙන ලදින් සුමිත් පෙරේරා එවකට සිටි පොලිස්පති පූජිත ජයසුන්දර හමු වීමට යන ලදී. එහිදී පොලිස්පති පූජිත ජයසුන්දර සුමිත් පෙරේරාට පවසා ඇත්තේ සුමිත් ඔයා අපි කියපු දේ කළේ නැහැ. ඒක නිසා මට ජොබ් එක දෙන්න බැහැ යන්නයි.

2019 අප්‍රේල් මාසයේදී නීතිපතිවරයා විසින් සුමිත් පෙරේරා හට එරෙහිව චෝදනා නැගීමට කිසිදු සාක්ෂියක් නොමැති බව මහේස්ත්‍රාත් අධිකරණයට දන්වනු ලැබූයෙන් සුමිත් පෙරේරා අදාළ නඩු කටයුත්තෙන් නිදහස් කරන ලදී. එලෙස නඩුවෙන් නිදහස් කරනු ලැබීමෙන් පසු ඔහු රැකියාව ලබා ගැනීම සඳහා පොලිස් කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කොට පොලිස්පතිවරයා හමු වීමට යන ලදී. ඒ අවස්ථාවේදී වැඩබලන පොලිස්පතිවරයා සුමිත් පෙරේරාගේ පෞද්ගලික ලිපි ගොනු ගෙන්වා පරීක්ෂා කර බැලීමේදී 2009 වර්ෂයේ පිළියන්දල පොලිසියේ සිදු වූ සිදුවීමක් හා අදාළව සුමිත් පෙරේරා හට එරෙහිව පවත්වනු ලැබූ විනය පරීක්ෂණයක තීරණයක් උපයෝගි කර ගනිමින් ඔහු සේවයෙන් පහ කරනු ලැබූ ඇති බව පෙනී යන ලදී.

සුමිත් පෙරේරා කියා සිටිනුයේ 2009 වර්ෂයේ සිදු කෙරෙන ලද වැටලීමකදී සටහන් යොදන අවස්ථාවේ 400 යන්න 4000 වශයෙන් සටහන් වීමක් ඔහු විසින් නිවැරදි කරනු ලැබීම ඇත්ත සැඟවීම ලෙස චෝදනාවක් ඉදිරිපත් කරනු ලැබ තිබූ බවත් ඒ පිළිබඳව වූ විනය පරීක්ෂණය  සහකාර පොලිස් අධිකාරි මෝතා විසින් සිදු කරනු ලැබීමේදී පැමිණිලිකරු නොපැමිණි හෙයින් තීන්දුවක් ලබා දී නොතිබූ බවත්ය. කෙසේ වෙතත් එම චෝදනා පත්‍රයේ වූ චෝදනා තුනෙන් එකකට තමා වැරදිකරු කර සේවයෙන් පහ කරනු ලැබ ඇතැයි යන්න දැනගැනීමට ලැබෙන ලද්දේ 2015 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අපරාධ චෝදනාවෙන් නිදහස්ව නැවත රැකියාව ලබා ගැනීම සඳහා වැඩ බලන පොලිස්පතිවරයා හමු වූ අවස්ථාවේදී බවය.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ. 9 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020/11/24

## 9 .LIII

පැමිණිලි අංකය - 43/2020

පැමිණිලිකරු - ඉමදූවගේ ඉන්දික සම්පත්

ලිපිනය - 215/7, පුවක්වත්ත පාර, මීතිරිගල

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු අමාත්‍ය ඩී.එම් ස්වාමිනාදන්

02. හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර

## තීරණය

යහපාලන රජය බලයට පත් වීමත් සමග රාජ්‍ය ආරක්ෂක සේවයට අදාළ බුද්ධි අංශ අඩාල කිරීමට කටයුතු කිරීම ප්‍රකට කරුණක් විය. ඊට සමගාමී ලෙස බන්ධනාගාරයේ බුද්ධි අංශය නිශ්ක්‍රීය කිරීමට යහපාලන රජය කටයුතු කරනු ලැබ ඇති බව මෙම විමර්ශනය තුළ හෙලිදරවු වේ. එයිනුදු නොනැවතී බුද්ධි අංශයන්හි කටයුතු කරන ලද නිලධාරින් පලි ගැනීමට ලක් කිරීමද එම රජයේ තවත් එක් පියවරක් විය. ඒ අනුව රාජ්‍ය නොවන සංවිධානයන් සහ ඇතැම් විදේශීය බලවේගයන් තෘප්තියට පත් කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ පලි ගැනීමේ ක්‍රියාවලියේ එක් ක්‍රියාකාරකමක් ලෙස ඉමදූවගේ ඉන්දික

සම්පත් යන බන්ධනාගාර නිලධාරියා දේශපාලන පලි ගැනීමට ලක් වනු ලැබ ඇති බව මෙම කොමිෂන් සභාව තීරණය කරනු ලබයි.

## නිර්දේශ

01. ඉමදූවගේ ඉන්දික සම්පත් හට ඔහු සේවය කරමින් සිටින ලද සහකාර බන්ධනාගාර අධිකාරි (වැ.ආ) තනතුරෙහි නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදේශගත වීමට සිදුව ඇත්තේ ඔහු පසුපස හඹා එන ලද දේශපාලන පලි ගැනීමෙන් ගැලවීම සඳහා වන හෙයින්ද ඔහුට ඉදිරියට වසර 15කට ආසන්න කාලයක් සේවය කිරීමට අවකාශ ඇති හෙයින්ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඔහු සුදුසු කොන්දේසි වලට යටත්ව නැවත සේවයේ පිහිටුවීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ලැබීම සුදුසු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

දේශපාලන පලි ගැනීමක් මත කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 6540/12/02 යටතේ සහ කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණ නඩු අංක HC(TAB)493/19/03 දරණ නඩුවේ තෙවෙනි විත්තිකරු ලෙස සාවද්‍ය සහ ගොතන ලද සාක්ෂි මත නඩු පැවරීමකට ලක් වීම සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිල්ලයි යන ශීර්ෂය යටතේ ඉන්දික සම්පත් ඉමදූවගේ විසින් 2020.02.03 දින මෙම කොමිෂන් සභාව

වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල අංක 43 වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ අතර එම පැමිණිල්ල මෙම කොමිෂන් සභාවේ විෂය ක්ෂේත්‍රය තුළට අයත් වන බව තීරණය කරනු ලැබිණි. යථෝක්ත පැමිණිල්ල මගින් ඉන්දික සම්පත් විසින් කොමිෂන් සභාව වෙත පහත සඳහන් කරුණු ප්‍රකාශ කරනු ලැබ ඇත.

ඉන්දික සම්පත් දෙවන පෙළ ජේලර්වරයෙකු ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවට සේවයට බැඳී සහකාර බන්ධනාගාර අධිකාරිවරයෙකු දක්වා උසස්වීම් ලැබ මහර බන්ධනාගාරයට අනියුක්තව 2018.01.26 දින දක්වා සේවය කරනු ලැබ ඇත. ඔහුගේ සේවා කාලය තුළදී විශේෂයෙන් බන්ධනාගාර තුළ සිදු වන මත්ද්‍රව්‍ය ජාවාරම් සහ කප්පම් ගැනීම සම්බන්ධව අවධානය යොමු කර වැටලීම් සිදු කිරීම හේතුවෙන් ඒ සඳහා සුවිශේෂී ඒකකයක් 2009 වර්ෂයේදී පිහිටුවනු ලැබූ අතර එම ඒකකයේ පළමු ස්ථානාධිපතිවරයා වූයේ ඉන්දික සම්පත්ය. ඒ අනුව සියලුම බන්ධනාගාර තුළ සිදු වන නීතිවිරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමට කටයුතු කිරීම එකී ඒකකයේ කාර්යභාරය විය. බන්ධනාගාරය තුළ සිටිමින් ජන සමාජය තුළ භීෂණය පතුරුවමින් මහා පරිමාණ කප්පම් ලබා ගැනීම්, කුලී පදනම මත මිනී මැරීම් සහ මත්ද්‍රව්‍ය ජාවාරම් සිදු කරන සිරකරුවන්ගේ එකී අපරාධමය ක්‍රියාවන් මර්දනය කිරීම සඳහා ජංගම දුරකථන සහ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම එම ඒකකය විසින් සිදු කරනු ලැබිණි. තවද එලෙස කටයුතු කරන ජාවාරම්කාර සිරකරුවන් සමග සම්බන්ධ වෙමින් ඔවුන්ට ජංගම දුරකථන සහ මත්ද්‍රව්‍ය ලබා දුන් විවිධ තරාතිරමේ බන්ධනාගාර නිලධාරීන් විශාල ප්‍රමාණයක් ඉන්දික සම්පත් විසින් අත්අඩංගුවට ගනු ලැබූ අතර ඔහුට එරෙහිව නඩු පවරනු ලැබ ඇත.

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ කප්පම්කරුවන්ට විරුද්ධව බන්ධනාගාරය තුළ දැඩි සුපරික්ෂාකාරි තත්වයක් පවත්වාගෙන යාමට ක්‍රියා කිරීම හේතුවෙන් බන්ධනාගාරය තුළ නොසන්සුන්තාවයක් ඇති කිරීමට එකී ජාවාරම්කරුවන් කටයුතු කරනු ලැබිණි. ඒ අනුව බන්ධනාගාර තුළ ඇති කරන ලද කැරලි කීපයක් මර්දනය කිරීමට ඉන්දික සම්පත්ට හැකි විය. වවුනියාව, අනුරාධපුරය, මැගසින් බන්ධනාගාරය යන බන්ධනාගාර තුළ ඇති වූ කැරලි ගැසීම් සාර්ථකව මර්දනය කිරීම නිසා ඉන්දික සම්පත්ට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් ප්‍රශංසා ලබා දී ඇත.

ඉහත කී ඒකකයේ කටයුතු කරමින් සිටියදී ඉන්දික සම්පත් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපරාධ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක්ද කැළණිය විශ්වවිද්‍යාලයේ විශෝධන හා පුනරුත්තාපනය පිළිබඳ ඩිප්ලෝමාවක්ද විශේෂ කාර්යය බලකායේ පුහුණු සැසි වාරයන්හි සෝදිසි කිරීම්, ප්‍රභූ ආරක්ෂාව සහ කැරලි මර්දනය ක්‍රමවේදයන් පිළිබඳව පාඨමාලාවක් ද හදාරනු ලැබ ඇත.

ඉන්දික සම්පත් වෙනුවෙන් සිදු කරන ලද ඉහත සඳහන් කරනු ලැබූ රාජකාරි කටයුතු හේතුවෙන් ජාවාරම්කාර සිරකරුවන් සහ ඔවුන්ට ආධාර අනුබල දෙන බන්ධනාගාර නිලධාරින්ට ඉන්දික සම්පත් සහ ඔහුගේ ක්ෂේත්‍රයේ සෙසු නිලධාරින් සමග බද්ධ වෛරයක් ඇති කර ගනු ලැබ තිබිණි. තවද ඉන්දික සම්පත් හට ජීවිත තර්ජන ඇති වූ අතර පසුව එම තර්ජන ඔහුගේ බිරිඳ සහ දරුවන්ටද එල්ල වන්නට විය. ඒ හේතුවෙන් ඔහුගේ බිරිඳ සහ දරුවන් වසර 2010 දී විදේශගත වනු ලැබිණි.

2012 වර්ෂය වන විට බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ගේ මෙහෙයවීම මත සිදු වන අපරාධ ඉහළ යාමක් පිළිබඳව බුද්ධි තොරතුරු මගින් හා පොලිස් විමර්ශන මගින් අනාවරණය කරගෙන තිබිණි. මෙම තත්වය පාලනය කිරීම සඳහා විශේෂ කාර්ය බලකායේ අධාර ඇතිව බන්ධනාගාරය පරික්ෂා කිරීමට තීරණයක් ගනු ලැබ තිබූ අතර අවශ්‍ය සහය ලබා දීමට ඉන්දික සම්පත් හට සිදු විය. 2012.11.09 වන දින දිවා කාලයේ විශේෂ කාර්ය බලකාය සමග එක්ව වැලිකඩ බන්ධනාගාරයේ L (එල්) ශාලාව සහ චැපල් ශාලාව පරික්ෂා කිරීමට කටයුතු කරන ලදී. චැපල් ශාලාව පරික්ෂා කිරීමට උත්සහ කිරීමේදී එහි සිටි රැඳවියන් විශේෂ කාර්ය බලකායට පහර දුන් අතර දූෂිත බන්ධනාගාර නිලධාරින් කීපදෙනෙකුගේ සහයද එකී රැඳවියන් හට ලැබී තිබිණි. රැඳවියන් හට සහය ලබා දී එබඳු බන්ධනාගාර නිලධාරින් ඔවුන්ගේ රාජකාරි පැහැර හරිමින් ආරක්ෂක කටයුතු වලින් ඉවත් වීම හේතුවෙන් බන්ධනාගාරය තුළ දරුණු තත්වයක් නිර්මාණය වී රැඳවියන් අවි ගබඩාව බිඳ දමා එහි වූ අවි රැගෙන නිලධාරින්ට වෙඩි තබමින් බන්ධනාගාරය කඩා බිඳ දමමින් හැසිරෙන්නට විය. මේ අවස්ථාවේදී විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරිවරයා සහ තවත් නිලධාරින් කීපදෙනෙක්ට බරපතල තුවාල සිදු විය. පසුව ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරින් පැමිණ බන්ධනාගාරය තුළ තිබෙන අවි හා උණ්ඩ සම්බන්ධයෙන් සිදු කෙරෙන ලද විශ්ලේෂණයකින් පසු දෙවෙනි අවි ගබඩාව සිරකරුවන් අතට පත්වීමට පෙර තත්වය පාලනය කළ යුතුව තිබූ බැවින් රාත්‍රී 12.00ට පමණ යුධ හමුදා කමාන්ඩෝ නිලධාරින් ඇතුළු හමුදා නිලධාරින් වැලිකඩ බන්ධනාගාරයට ඇතුළු වී තත්වය පාලනය කරන ලදී. එහිදී යුධ හමුදා නිලධාරින් කීපදෙනෙකුටද වෙඩි වැදී තුවාල සිදු විය.

2012.11.10 දින තත්වය සාමාන්‍ය අතට පත් වීමෙන් පසුව සිරකරුවන් අදාළ දෛනික රාජකාරි සඳහා යොමු කිරීමට ඉන්දික සම්පත් සහය වන ලදී. පසුව කැරැල්ල සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන් විමර්ශනයක් සිදු කළ අතර ඊට අවශ්‍ය සහයද ලබා දීමට කටයුතු කරනු ලැබිණි. කැරැල්ල මෙහෙය වූ රැඳවියන් බුද්ධි තොරතුරු මත හඳුනාගෙන බන්ධනාගාර විනිශ්චය සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී. බන්ධනාගාර කොමසාරිස්වරයා විසින්ද රජය විසින්ද පත් කරනු ලැබූ විමර්ශන කමිටුව ඉදිරියේ ඉන්දික සම්පත් ප්‍රකාශයන් ලබා දී ඇත.

2015.01.08 දින යහපාලන රජය බලයට පත් වීමෙන් පසු 2012.11.09 වන දින වැලිකඩ බන්ධනාගාරයේ ඇති වූ කැරැල්ල සම්බන්ධයෙන් දේශපාලන අවශ්‍යතා මුල් කර ගනිමින් විශයභාර අමාත්‍යවරයා විසින් නව විමර්ශන කමිටුවක් ස්ථාපිත කරන ලදී. හිටපු මහාධිකරණ විනිසුරු විමල් නම්බුවසම්, නියෝජ්‍ය පොලිස්පති අශෝක විජේතිලක සහ එස්.කේ ලියනගේ යන මහත්වරුන්ගෙන් සමන්විත වූ එම කමිටුව විසින් බන්ධනාගාර නිලධාරින්, රැඳවියන්, යුධ හමුදා නිලධාරින්, පොලිස් නිලධාරින් හා විවිධ ක්ෂේත්‍ර වල නිලධාරින්ගේ සාක්ෂි සටහන් කර ගනු ලැබිණි. මෙම විමර්ශනය තෝරා ගත් පිරිසක් සංවිධානගත කරමින් පක්ෂපාතිත්වයෙන් සිදු කරන ලද්දක් බවට නිරික්ෂණය වූ බවත් දහස් ගණනක් සිරකරුවන් අතරින් තෝරා ගත් කීප දෙනෙකු පමණක් ගෙන්වා ප්‍රකාශ සටහන් කර ගනු ලැබූ බවත් ඉන්දික සම්පත් සිය පැමිණිල්ලේ ප්‍රකාශ කරනු ලබයි. ඉන්දික සම්පත් ද එම කමිටුවට ප්‍රකාශයක් ලබා දී ඇත. එලෙස පවත්වනු ලැබූ විමර්ශනයද අවසන් වී කමිටු නිර්දේශ ඉදිරිපත් කළ අතර එහිදී ද ඉන්දික සම්පත් හට චෝදනාවන් ඉදිරිපත් නොවිණි. ඉන් වසර 2 ½

කට පමණ පසු එවකට බන්ධනාගාර අමාත්‍යව සිටි ඩී.එම් ස්වාමිනාදන් විසින් පොලිස්පති පූජිත ජයසුන්දර සමග එක් වී 2017 වර්ෂයේදී අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව මගින් නැවත විමර්ශනයක් ආරම්භ කළ අතර එහිදී ද ඉන්දික සම්පත් විසින් ප්‍රකාශයක් ලබා දෙනු ලැබිණි. කෙසේ වෙතත් ඉන්දික සම්පත් හට දැන ගැනීමට ලැබෙන ලද්දේ එම විමර්ශනයේදී එක් රැඳවියෙකු විසින් ප්‍රකාශයක් දී සඳහන් කර ඇත්තේ ඉන්දික සම්පත් විසින් 2012.11.10 දින අළුයම් කාලයේ මිය ගිය රැඳවියන්ගේ දේහයන් අසළට අවි කීපයක් දමනු දුටු බවය. ඉන්දික සම්පත් සිය පැමිණිල්ලේ කියා සිටිනුයේ එබඳු වූ සාවද්‍ය ප්‍රකාශයක් ඊට පෙර පැවති කිසිදු විමර්ශනයකදී එම රැඳවියා විසින් හෝ වෙනත් සාක්ෂිකරුවෙකු විසින් සිදු කර නොමැති බවය.

2015.01.08 දින යහපාලන රජය බලයට පත් වීමෙන් පසු ඉන්දික සම්පත් බුද්ධි හා ආවේශන අංශයෙන් ඉවත් කර මහර බන්ධනාගාරයට ස්ථානමාරු කරනු ලැබූ අතර එම ඒකකයේ සේවය කළ නිලධාරින් සියලු දෙනා විවිධ බන්ධනාගාර වලට මාරු කර යවන ලදී. ඒ අනුව බන්ධනාගාර බුද්ධි අංශ නිශ්ක්‍රීය කරනු ලැබිණි. 2015 වසරේ සිදු කරන ලද විමර්ශනයන්හීදි අමාත්‍යවරයා පත් කළ කමිටුවට ප්‍රකාශ ලබා දීමට කැඳවීමේදී මෙන්ම 2017 වසරේ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ ප්‍රකාශ දීමට කැඳවීමේදී ද ඉන්දික සම්පත් හට බලපෑම් එල්ල වූයේ වැලිකඩ බන්ධනාගාරයේ යුධ හමුදා ක්‍රියාන්විතය සිදු වූයේ එවකට ආරක්ෂක ලේකම්ව සිටි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෘජු අධීක්ෂණය සහ නියෝග යටතේ බව දැන සිටි බවට ප්‍රකාශ ලබා දෙන ලෙසටය. එබඳු වූ අසත්‍ය ප්‍රකාශයක් ලබා දීම ඉන්දික සම්පත් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අතර ඔහුට තිබූ ජීවිත තර්ජන පෙරටත් වඩා වැඩි වූයෙන් ජීවිත ආරක්ෂාව සඳහා

විදේශගත වීමට තීරණය කරන ලදී. ඉන්දික සම්පත් විදේශගත වීමෙන් පසුව වැලිකඩ බන්ධනාගාර සිද්ධිය සම්බන්ධයෙන් නිලධාරින් අත්අඩංගුවට ගැනීමෙන් පසුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 6540/12/02 යටතේ ඔහු අත්අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් කරනු ලැබිණි. 2019.07.14 දින HC(TAB)493/19/03 දරණ නඩුවේ අධිචෝදනා පත්‍රයක් නිකුත් කර ඇති බව පසුව දැනගත හැකි විය.

මෙම පැමිණිල්ල පිළිබඳව කොමිෂන් සභාව ඉදිරියේ පවත්වනු ලැබූ විමසීමේදී සාක්ෂි දෙන ලද්දේ ඉන්දික සම්පත්ගේ සහෝදරයා වන තරිඳු සම්පත් ඉමදූවගේ නැමති තැනැත්තාය. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විශ්‍රාමික නිලධාරියෙකු වන ඔහු බොරැල්ල සීවලි පටුමග අංක 180/03 හි පදිංචිකරුවෙකි. ඔහු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් 226 Foster DR, Willimantic, CT 06226, USA යන ලිපිනයේ සිට ශ්‍රී ලංකාවේ ලිපිනයකට සිය සහෝදරයා විසින් තැපැල් මගින් එවන ලදැයි කියා සිටින දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිණි. කෙසේ වෙතත් අනතුරුව ඉන්දික සම්පත් හට ඇමරිකාවේ නිවුයෝක් නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ස්කයිප් තාක්ෂණය ඔස්සේ සාක්ෂි දීමට කටයුතු සලසා දෙනු ලදුව 2020.10.20 දින නිවුයෝක් නුවර ශ්‍රී ලංකා එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලයේ සිට ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ 02 වන ලේකම් නිලංග පලිපාන මහතා ඉදිරියේදී සාක්ෂි ලබා දෙන ලදී. ස්කයිප් තාක්ෂණය ඔස්සේ ඉන්දික සම්පත්ගේ සාක්ෂිය ලබා ගැනීම සඳහා කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වෙන ලද මෙම කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු පැවැත්වෙන ශාලාවේ ඉන්දික සම්පත් සහ නිලංග පලිපාන මහතා දර්ශනය වන පරිදි දර්ශන තිර සහ වීඩියෝ උපකරණ

සවි කර තිබූ අතර කොමිෂන් සභා ශාලාව ඉන්දික සම්පත් හට සහ නිලංග පලිපාන මහතා හට දර්ශනය වන පරිදි කැමරා සවි කර තිබිණි. ඒ අනුව කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන ස්වභාවයෙන් ඉන්දික සම්පත් විසින් දිවුරුම් පිට ඔහුගේ සාක්ෂිය ලබා දෙන ලදී.

2009 කාලයේදී බන්ධනාගාරය තුළ සිට විවිධ අපරාධ මෙහෙයවනු ලබන බවට වූ චෝදනා එල්ල වීම හේතුවෙන් එවකට බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්වරයා වශයෙන් කටයුතු කරන ලද මේජර් ජනරාල් ඩී.ආර් සිල්වා විසින් බන්ධනාගාරය තුළ බුද්ධි හා ආරක්ෂක නමින් ඒකකයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ලබා දෙන ලදී. මෙහි අරමුණ වූයේ බන්ධනාගාර තුළින් සිදු වන විශමාචාර අපරාධ, මංකොල්ලකෑම් සහ විවිධ ජාවාරම් මැඩ පවත්වා ඊට අනුබල දෙන නිලධාරින් නීතිය ඉදිරියට පැමිණවීමයි. එම ඒකකය පිහිටුවා එක් වසරක් තුළ බන්ධනාගාර රැඳවියන් විසින් බන්ධනාගාරය තුළ නීති විරෝධී ලෙස භාවිතා කරනු ලැබූ ජංගම දුරකථන 681ක් සහ හෙරොයින් ග්‍රෑම් 225ක් අත්අඩංගුවට ගනු ලැබිණි. 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා බන්ධනාගාරයන්හිදී ඉන්දික සම්පත් සහ ඔහුගේ ඒකකය විසින් අත්අඩංගුවට ගන්නා ලද මුදල්, මත්ද්‍රව්‍ය, ජංගම දුරකථන, සිම් කාඩ්පත් පිළිබඳව සහ බන්ධනාගාර නිලධාරින් විසින් නීති විරෝධී ලෙස සඟවාගෙන බන්ධනාගාරය තුළට ගෙන යාමට උත්සහ කළ විවිධ ද්‍රව්‍යය පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබ තිබූ අතර ඉන්දික සම්පත් සිය සාක්ෂියේදී ඒ පිළිබඳව සඳහන් කරන ලදී. එලෙස අත්අඩංගුවට ගන්නා ද්‍රව්‍ය අතර ගංජා, හශීස්, සිගරට්, බීඩී, හෙරොයින්, මුදල්, දුම්කොළ, සිම් කාඩ්පත්, කේරළ ගංජා, මත්පෙති ආදිය සඳහන්ව ඇත. මෙලෙස බන්ධනාගාරය තුළට නීති විරෝධී ලෙස විවිධ ද්‍රව්‍යය රැගෙන

යාමට උත්සහ කළ නිලධාරින්ගේ නම් ද එම වාර්තාවේ සඳහන් කර ඇත. (පැ.05). බන්ධනාගාර රැඳවියන්ගේ මෙන්ම නිලධාරින්ගේද උදහසට ලක් වීම සම්බන්ධයෙන් ඉන්දික සම්පත් ඔහුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර සිටි අතර මැගසින් බන්ධනාගාරයෙහි රඳවා සිටි එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදින්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ ඔහු කටයුතු කරනු ලැබූ බැවින් ඒ අනුවද ඔහුට සතුරන් ඇති වීමක් සිදු වූ බවත් පෙන්වා දෙනු ලැබිණි.

යහපාලන රජය බලයට පත් වීමෙන් පසු බන්ධනාගාරයේ බුද්ධි අංශය විසුරුවා හැර එම ඒකකයේ කටයුතු කළ නිලධාරින් වෙනත් බන්ධනාගාර වලට මාරු කර යැවීමේ ක්‍රියාව තුළ ඉන්දික සම්පත් මහර බන්ධනාගාරයට මාරු කර යවනු ලැබූ අතර ඔහු එම බන්ධනාගාරයෙහි අධිකාරිව සිටි පී.අයි උඩුවර හට සහයෝගය ලබා දෙමින් කටයුතු කරන ලදී. ඉන්දික සම්පත් ක්‍රිකට් සහ පාපන්දු යන ක්‍රීඩා දෙකේම ක්‍රීඩා කරන ලද ක්‍රීඩකයෙකු වූයෙන් ඔහු බන්ධනාගාර පාපන්දු කණ්ඩායම බාරව කටයුතු කිරීමට තෝරා ගන්නා ලදී. 2017 වර්ෂයේදී සිංගප්පූරුවේ බන්ධනාගාර පාපන්දු කණ්ඩායමෙන් සිංගප්පූරුවේ පැවැත්වෙන තරගාවලියක් සඳහා ශ්‍රී ලංකා බන්ධනාගාර පාපන්දු කණ්ඩායමට ආරාධනයක් ලැබුණු අතර ඉන්දික සම්පත් කොමිෂන් සභාවට කියා සිටින ලද්දේ බන්ධනාගාර පාපන්දු කණ්ඩායමට සිංගප්පූරුවට යාම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අවසර අවශ්‍ය වූයෙන් අධිකාරිවරයා සමග අමාත්‍යවරයා හමු වීමට යන ලද නමුත් ඔහුට අමාත්‍යවරයා මුණ නොගැසුණු බවත් ඔහු වෙනුවෙන් අනුමැතිය ලබා දීම ඇමතිවරයා ප්‍රතික්ෂේප කළ බවත්ය. කෙසේ වෙතත් බන්ධනාගාර අධිකාරි උඩුවරගේ බලවත් ඉල්ලීම මත එම අවසරය ලබා ගත හැකි වූයෙන් එකී තරගාවලිය සඳහා සිංගප්පූරුවට ගොස් ආපසු පැමිණීමට නියමිත දිනයේ ශ්‍රී ලංකාවට

පැමිණි බවත් ඉන්දික සම්පත් පැවසීය. කෙසේ වෙතත් ඉන් අනතුරුව ඉන්දික සම්පත් කෙරෙහි මහත් අහිතකර වාතාවරණයක් ගොඩනැගෙමින් පැවතිනු අතර ඔහුගේ ජීවිතයට තර්ජනයක් එල්ල විය හැකි බවට තොරතුරු ලැබෙන ලද බව කියා සිටිනු ලැබිණි. ඉන්දික සම්පත් හට එම අවස්ථාවේදී ඔහුගේ ජීවිතය රැක ගැනීම සඳහා රහසිගතව රටින් පිටව යාම හැර විකල්පයක් නොවූයෙන් 2018.01.22 වන දින සිංගප්පූරුවට ගොස් එහි සිට ඇමරිකාවට යන ලද බව ඉන්දික සම්පත් කියා සිටියේය. අනතුරුව ඔහුට එරෙහිව අධිකරණයට කරුණු වාර්තා කොට වරෙන්තු නිකුත් කිරීම සිදු වූ අතර ඔහු තුන් වන චූදිත වශයෙන් නම් කොට ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ නඩු පැවරීම සිදු විය. එම නඩුවේ පැමිණිල්ලේ සාක්ෂි අවසන් වීමෙන් පසුව පැමිණිල්ල මෙහෙයවූ සොලිසිටර් ජනරාල්වරයා තුන් වන චූදිතට එනම් ඉන්දික සම්පත් හට එරෙහිව සාක්ෂි නොමැති හෙයින් ඔහු නිදහස් කරන මෙන් ත්‍රිපුද්ගල මහාධිකරණයෙන් ඉල්ලා සිටි අතර ඒ අනුව ඔහු නිදොස් කොට නිදහස් කරනු ලැබිණි.

2018.01.22 වෙනි දින ඉන්දික සම්පත් විදේශගත වන ලද්දේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවට දැනුම් දීමකින් තොරව වූ බැවින් ඔහු සේවය අතහැර ගියා සේ සැළකෙන නිවේදනයක් නිවසට යවනු ලැබ තිබිණි. අංක ඩී 2/11079 දරණ යොමු අංකය සහ 2018.02.15 දිනැති මහර බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරි ටී.අයි උඩුවර විසින් අත්සන් තබනු ලැබ ඇති තනතුර අතහැර යාමේ නිවේදනය යන ශීර්ෂය යටතේ අයි. ඉන්දික සම්පත් හට ආමන්ත්‍රණය කරනු ලැබ ඇති ලිපියෙහි සඳහන් වූයේ මෙම දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරි (වැ.ආ) තනතුර දරමින් සිටි ඔබ විධිමත්ව නිවාඩු යැවීමකින් තොරව 2018.01.29 දින සිට රාජකාරිය සඳහා වාර්තා

කොට නොමැත යන්න සහ ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 01 වෙනි කාණ්ඩයේ 172 වෙනි වගන්තිය ප්‍රකාරව 2018.01.29 වන දින සිට ඔබ තනතුර අතහැර ගියා සේ සැළකෙන බව මෙයින් දැනුම් දෙමි යන්නත්ය. ඉන්දික සම්පත් කියා සිටින්නේ දැනට ඔහුගේ වයස අවුරුදු 45ක් වන බවත් තවත් වසර 15ක පමණ කාලයක් සේවයේ යෙදිය හැකි බැවින් ඔහුට සේවය කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙසටත්ය. කෙසේ වෙතත් වර්තමානයේ පවත්නා කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව සිටින බවත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා අවස්ථාවක් සලසා ගැනීමට ඇමරිකාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචිව සිටින බවත් ඉන්දික සම්පත් කොමිෂන් සභාව වෙත වැඩිදුරටත් කරුණු දක්වා සිටින ලදී.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ.18 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 .LIV

(1)

පැමිණිලි අංක - 325/2020

පැමිණිලිකරු - රාජපක්ෂ පතිරගේ දොන් තාරක සෙනෙවිරත්න

ලිපිනය - 93/4, අත්වැල මාවත, කටුවාවල පාර, බොරලැස්ගමුව.

(2)

පැමිණිලි අංකය - 326/2020

පැමිණිලිකරු - ජගත් ප්‍රේමලාල් විජේවීර

පිලිනය - සුහද පෙදෙස, කඩවත.

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. පො.ප. ධම්මික ද සිල්වා
2. පො.සැ. 9422 ජගත්
3. පො.සැ.43508 ඩෙන්සිල්
4. හිටපු අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න
5. පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ

## තීරණය

1. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති  සාක්ෂි පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාර රාජපක්ෂ පතිරගේ දොන් තාරක සෙනෙවිරත්න මහතා සහ ජගත් ප්‍රේමලාල් විජේවීර මහතා යම් වරදකට හසු කරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීමටත් එයට  ආධාර සහ අනුබල දීමටත් ඉහත නම් සඳහන් පුද්ගලයින් ක්‍රියා කර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පුකර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව ,රාජපක්ෂ පතිරගේ දොන් තාරක සෙනෙවිරත්න මහතා සහ ජගත් ප්‍රේමලාල් විජේවීර මහතාට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති බී B 14297/19 දරන බී වාර්තාවෙහි සහ එම බී වාර්තාවට ගොනු කරන ලද වැඩිදුර වාර්තාවන්හි දැක්වෙන සියලුම චෝදනාවලින් පැමිණිලිකාර රාජපක්ෂ පතිරගේ දොන් තාරක සෙනෙවිරත්න මහතා සහ ජගත් ප්‍රේමලාල් විජේවීර මහතා නිදොස් කොට නිදහස් කල යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. මේ අනුව ඉහත නම් සඳහන් වගඋත්තකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බැවින්ද,

2. එසේම, එකී වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. එසේම, අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණය නැමැති වරද සිදු කර ඇති බැවින්ද,
   නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

4. පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී අයුරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් පැමිණිලිකරු රඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිරකූඩුවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීම.

5. වග උත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා මෙම නඩුවට අදාළ සාක්ෂි සහ ලේඛන ගොනු නීතිපතිවරයා වෙත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

6. එසේම වැඩිදුරටත්, දේශපාලන පළි ගැනීමේ ක්‍රියාවලියක ගොදුරක් වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරයේ තබා ගැනීම කරන කොටගෙන ඔහුට සිදුවූ හානි සඳහා පැමිණිලිකරුට යම් සහනයක් ලබා දිම යෝග්‍ය බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. එසේම පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇත්ත බොරු කිරීම සහ බොරුව ඇත්ත කිරීම යන වැරදි වලට සහ දූෂණය කිරීමේ වරද සහ පොලිස් සේවය අපකීර්තියට පත් කිරීමේ වරදට පොලිස් විනය රීති යටතේ චෝදනා පත්‍රයක් ගොනු කර පරීක්ෂණ පවත්වා දඬුවම් පැමිණවීම.

8. දූෂණ මර්ධන කමිටුවේ දේශපාලන පලිගැනීම් සඳහා සෘජුවම සහභාගීත්වයක් දක්වනු ලැබ ඇති දේශපාලඥයින්ගේ සහ නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් සමාජයට අහිතකර බලපෑමක් ඇති කරවන හෙයින් ප්‍රජා අයිතිය අහෝසි කරනු ලැබිය යුතු තැනැත්තන් සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා නිර්දේශ ලබා ගැනීමට විශේෂ පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම යුතු බවට මෙම කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

9. මෙම විමර්ශනයට පැමිණිලිකරුවන් වූ ඉහත සඳහන් පරිදි පළිගැනීමට ලක්ව සිටින ජගත් ප්‍රේමලාල් වීරේවීර මහතා සහ රාපක්ෂ පතිරගේ දොන් තාරක සෙනෙවිරත්න මහතා දැනට රජයේ සේවයෙන් විශ්‍රාම ලැබ සිටින බැවින් ඔවුන්ගේ දැනුමෙන් සහ අත්දැකීමෙන් ප්‍රයෝජනවත් සේවයක් සලසා ගැනීම සඳහා

ඔවුන්ගේ කැමැත්ත පරිදි සුදුසු උපදේශාත්මක තනතුරුවල පිහිටුවීම නිර්දේශ කරනු ලබයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

සඳහිරු සෑයෙහි තැනපත් කිරීම සඳහා බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා රේගුව මඟින් රාජසන්තක කරනු ලැබ තිබූ රත්‍රන් කිලෝ 8 ක ප්‍රමාණයක් නාවුක හමුදාවට ලබා දීමෙන් සාපරාදී සාවද්‍ය පරිහරණයක් සිදු කෙරෙන ලදැයි එවකට රේගු අධ්‍යක්ෂ ජනරාල් ජගත් විජේවීර මහතාට සහ අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් තාරක සෙනෙවිරත්න මහතාට ද එරෙහිව ශ්‍රී ලංකා පොලීසියෙහි යහපාලන රජය විසින් අවිධිමත් ලෙස පිහිටුවන ලද මූල්‍ය අපරාධ පරීක්ෂණ කොට්ඨාසය විසින් දේශපාලන පලිගැනීම් සඳහා පරීක්ෂණ සිදු කරනු ලැබ ඔවුන් දෙදෙනා නඩු කටයුතුවලට මැදිහත් කෙරෙන ලදැයි වෙන් වෙන් වශයෙන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරෙන ලද පැමිණිලි මත කොමිෂන් සභාව විසින් මෙම විමර්ශනය සිදු කර ඇත.

තාරක සෙනෙවිරත්න මහතා 1976/03/12 දින සහකාර රේගු අධිකාරී දෙවන ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් ශ්‍රී ලංකා රේගුවට ඇතුළත් වන ලදුව එම සේවයේ විවිධ තලයන්හි සේවය කරනු ලැබ ඇත. ඔහු දීර්ඝ කාලයක් ප්‍රතිපත්ති හා සැලසුම් අංශයට අනුයුක්තව අධිකාරීවරයෙක් සහකාර අධ්‍යක්ෂවරයෙක් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් වශයෙන් සේවයෙහි යෙදී තිබේ. වර්ගීකරණ විෂය පිළිබඳව විශේෂ දැනුමක් ඔහු ලබා සිටි හෙයින් ජගත් රේගු සංවිධානයේ පුහුණුකරුවෙකු ලෙස තෝරා ගනු ලැබ තිබුණි. තීරුබදු නාමාවලියේ බදු වර්ග රාශියක් පැවතීම හේතුවෙන්

මහාභාණ්ඩාගාරයට ආදායම පුරෝකථනය කිරීම අපහසුව පැවති අතර එය වළක්වා ගැනීම සඳහා තාරක සෙනෙවිරත්න මහතාගේ විශේෂඥ දැනුම උපයෝගී කර ගනිමින් Four Band Tariff යන තීරුබදු ප්‍රතිපත්තිය 1991 වර්ෂයේදී හඳුන්වා දෙනු ලැබ ඇත. 1992 වර්ෂයේදී පරිගණක අසිකුඩා පද්ධතිය හඳුන්වාදීමට ඔහු පුරෝගාමීව කටයුතු කර ඇත. 1997 වසරේදී ලෝක රේගු සංවිධානය විසින් තාරක සෙනෙවිරත්න මහතා බලයලත් පුහුණුකරුවෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබ ඇති අතර ඒ අනුව ඔහු ජාත්‍යන්තර වශයෙන් පුහුණු සැසි පැවැත්වීමට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වනු ලැබ ඇත. 2007 වසරේදී පිහිටුවන ලද NCC කමිටුවේ ලේකම්වරයා වශයෙන් පත් කර ගනු ලැබ ඇති අතර පිළිවෙළින් 2008, 2010, 2011, 2012, 2014 වර්ෂයන්හිදී ලෝක රේගු සංවිධානය විසින් පවත්වන ලද අන්තර් ජාතික පුහුණු සැසි තුළ ඔහු කැපී පෙනෙන දස්කම් දක්වනු ලැබ ඔහු ඇගයීමට පාත්‍රව තිබේ. තාරක සෙනෙවිරත්න මහතා සිය රැකියා ක්ෂේත්‍රය තුළ ලබාගත් දැනුම සහ පළපුරුද්ද ශ්‍රී ලංකා රේගුවට මෙන්ම ජාත්‍යන්තරයට ද ප්‍රයෝජනවත් ලෙස ලබාදී ඇති අයුරු කොමිෂන් සභාව ඉදිරියේ ඔහු විසින් ලබාදුන් සාක්ෂිය තුළ විස්තර කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා රේගුවේ අවුරුදු 40 කට ආසන්න සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඔහු 2016.03.08 වන දින විශ්‍රාම ලබා ඇත. විශ්‍රාම ලැබීමෙන් අනතුරුව ද තාරක සෙනෙවිරත්න මහතා ජාත්‍යන්තර පුහුණුකරුවෙකු වශයෙන් කටයුතු කරනු ලැබ ඇති අතර 2017 වර්ෂයේදී UNEP ආයතනය විසින් ඔහුට Best Trainer Award ත්‍යාගය පිරිනමනු ලැබ තිබේ.

තාරක සෙනෙවිරත්න මහතා 2014 වර්ෂයේ අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වශයෙන් සේවයේ යෙදී සිටියදී ශ්‍රී ලංකා නාවුක

හමුදාව විසින් ඔවුන් එනම් නාවුක හමුදාව සිදු කෙරෙන ලද වැටලීමකදී මුහුදේදී අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකා රේගුවට භාර කිරීමෙන් පසු රාජසන්තක කෙරෙන ලද රත්‍රන් කිලෝ 45 ක් අතුරෙන් රත්‍රන් කිලෝ 8 ක් සමාධි බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කිරීම සඳහා නාවුක හමුදාවට මුදාහරින මෙන් ඉල්ලීමක් කර ලදි. මෙම ඉල්ලීම සිදු කිරීමට පසුබිම් වූ කරුණු තාරක සෙනෙවිරත්න මහතා විසින් නිල වශයෙන් පැහැදිලි කර ගනු ලැබ තිබූ අයුරු පහත සඳහන් පරිදි වේ.

වසර 30 ක කාලයක් ශ්‍රී ලංකාවේ පැවති යුධමය තත්ත්වය අවසන් කර ගැනීම සඳහා ඇති කර ගන්නා ලද භාරයක් ඔප්පු කිරීමට අනුරාධපුරයෙහි සඳහිරු සෑය නමින් චෛත්‍යයක් ගොඩනැඟීමට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අනුග්‍රහය සහිතව ආරක්ෂක අංශ විසින් කටයුතු ආරම්භ කරනු ලැබ ඇත.එකී සඳහිරු සෑය ඉදිකරමින් පැවතියදී පූජ්‍ය පක්ෂයද උගතුන් සහ කලාකරුවන් ද ථූපවංශයේ සඳහන් පරිදි මෙම සෑයෙහි රත්‍රන් සමාධි පිළිමයක් නිදන් කිරීමට උපදෙස් ලබාදී ඇත. ඒ සඳහා රත්‍රන් ලබා ගැනීම පිළිබඳව කරුණු සලකා බැලීමේදී රාජසන්තක කරනු ලැබ ඇති රත්‍රන් සංචිත තුළින් අවශ්‍ය රත්‍රන් ප්‍රමාණය ලබාදීම සුදුසුය යන නිගමනයට එළඹ ඇත. මෙම තීරණයට එළඹීමේදී බුද්ධාගම පෝෂණය කොට සුරක්ෂිත කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රජයට පැවරී ඇති වගකීම සැලකිල්ලට ගනු ලැබ තිබේ. මෙම තීරණය ගන්නා ලද අවස්ථාවේදී ආරක්ෂක අංශයන් විසින් පෙන්වා දෙනු ලැබ ඇත්තේ ඉහත සඳහන් කෙරෙන ලද නාවුක හමුදාව විසින් අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කරනු ලැබූ රත්‍රන් කිලෝ 45 න් කිලෝ 8 ක් මෙම කටයුත්ත සඳහා ලබා ගැනීම සුදුසු බවය. ශ්‍රී ලංකා රේගුව

වෙත ඉහත සඳහන් කෙරෙන ලද ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ඒ අනුව වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමට යෙදෙන ලද ඉහත කී ඉල්ලීම ඔහු විසින් අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්වරුන් වන පැමිණිලිකාර තාරක සෙනෙවිරත්න මහතාට සහ පුවිහරන් මහතාට යොමු කරනු ලැබිණි. නාවුක හමුදාව විසින් සඳහන් කරනු ලැබ තිබූ රත්තරන් කිලෝ 45 රේගුව විසින් රාජසන්තක කර තිබූයේ අදාළ ඉල්ලීම ඉදිරිපත් කරන ලද දිනයේම විය. රේගුව විසින් සිදු කරනු ලබන රාජසන්තක කිරීමේ නියමයට එරෙහිව අදාළ රත්තරන් සම්බන්ධයෙන් හිමිකම් කියන කිසියම් පාර්ශවයකට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි කාල පරිච්ඡේදයක් පවතින බැවින් එම කාල පරිච්ඡේදය අවසන් වන තෙක් එම රත්තරන් වෙන්දේසි කිරීම හෝ අන් අයුරකින් බැහැර කරනු ලැබීම සිදු කළ නොහැකි හෙයින් ඒ පිළිබඳව සලකා බැලූ තාරක සෙනෙවිරත්න මහතා අදාළ ඉල්ලීම සම්බන්ධයෙන් විකල්ප විසඳුමක් යෝජනා කරනු ලැබිණි. එනම් ඒ වන විට රේගුව විසින් රාජසන්තක කරනු ලැබ සහ අභියාචනය කරනු ලැබීමට නියමිත කාල පරිච්ඡේදය අවසන් ව තිබූ රත්තරන් තොගයකින් ඉල්ලා සිටින ලද රත්තරන් කිලෝ 8 ලබාදීමය. තවද එලෙස වෙනත් තොගයකින් රත්තරන් කිලෝ 8 ලබාදීම කොන්දේසියකට යටත් කරනු ලැබීමට ද තීරණය විය. එම කොන්දේසිය වූයේ නාවුක හමුදාව විසින් අත්අඩංගුවට ගෙන රේගුව විසින් රාජසන්තක කිරීමට යෙදෙන ලද රත්තරන් තොගය අභියාචනයක් ඉදිරිපත් කිරීමට නියමිත කාලය අවසන් වීමෙන් පසු  වෙන්දේසි කරනු ලබන අවස්ථාවකදී වෙනත් ස්ථානයකින් ලබාදෙන රත්තරන් කිලෝ 8 හි වටිනාකම එකී වෙන්දේසියෙන් ලැබෙන මුදලින් ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු වීමය.

එම යෝජනාව සටහනක් ලෙස යොදනු ලැබූ තාරක සෙනෙවිරත්න මහතා ඔහුට නියමිතව තිබූ රාජකාරි කටයුතු සඳහා විදේශ ගතවනු ලැබිණි. ඔහු විශ්‍රාම ලබන ලද්දේ එම රාජකාරි ගමනින් පසු ශ්‍රී ලංකාවට පැමිණීමෙන් අනතුරුවය. විශ්‍රාම ලබා සිටියදී යහපාලන රජය විසින් අවිධිමත් ලෙස පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය තාරක සෙනෙවිරත්න මහතා කැඳවනු ලැබූ අතර ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කරන ලද රත්තරන් අතුරින් ඉහත කී රත්තරන් ප්‍රමාණය නාවුක හමුදාවට ලබාදෙන ලෙස 2015 වර්ෂයට පෙර ආරක්ෂක ලේකම්වරයා වශයෙන් කටයුතු කරන ලද ගෝඨාභය රාජපක්ෂ මහතා බලපෑම් කරනු ලැබූ බව ප්‍රකාශ කරන ලෙස ඔහුට බල කරනු ලැබිණි. එහෙත් කිසිවිටකත් එබන්දක් සිදු නොවූයෙන් එබඳු අසත්‍යයක් තමාට කියා සිටිය නොහැකි බව තාරක සෙනෙවිරත්න මහතා ඉහත කී ඊනියා මූල්‍ය අපරාධ කොට්ඨාසයට පවසනු ලැබිණි. එය සිදුවන ලද්දේ 2016 වර්ෂයේදී විය.

2019 වර්ෂයේ යම් අවස්ථාවක තාරක සෙනෙවිරත්න මහතා රෝගාතුරව බදුල්ල රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී ඉහත කී මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් දෙදෙනෙකු රෝහලට පැමිණ 2016 වර්ෂයේදී දෙන ලද කටඋත්තරය ප්‍රමාණවත් නොවන බව කියා සිටිමින් ඔවුන් විසින් රැගෙන එන ලද ප්‍රශ්න 21 කට පිළිතුරු ලබාදෙන ලෙස බල කරනු ලැබූ අතර 'ගෝඨාභය කියපු නිසා තමයි රත්තරන් දුන්නේ කියලා දැන්වත් පිළිගන්නවාද?' යන ප්‍රශ්නය තාරක සෙනෙවිරත්න මහතාට යොමු කරන ලදි. එලෙස පැමිණෙන ලද්දේ 2016 වර්ෂයේ දී ද ඔහුගෙන් ප්‍රකාශ සටහන් කර ගන්නා ලද ප්‍රේමරත්න සහ ප්‍රනාන්දු යන නම් ඇති නිලධාරීන් දෙදෙනෙකු බව කියා සිටින තාරක සෙනෙවිරත්න මහතා වැඩිදුරටත් කියා සිටිනුයේ

'අපට මෙහෙම නීතිපති දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න 21 ක් දීලා තියෙනවා. මේක කවර් කරලා කටඋත්තර ගන්න යැයි' එකී නිලධාරීන් දෙදෙනා තමාට පැවසූ බවයි.

ස්ථානාධිපති මූලාය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති 2019/09/18 දිනැති තොරතුරු වාර්තාව (පැ.7) මඟින් පහත සඳහන් පරිදි කරුණු වාර්තා කොට ඇත.

I. "මෙම පැමිණිල්ල අංක 101, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03 ලිපිනයේ පිහිටි දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයට නිර්ණාමිකව ලැබී ඇති තොරතුරක් වන අතර එම තොරතුර දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල මහතාගේ අත්සනින් යුතුව පොලිස්පතිතුමා වෙත යොමු කිරීමෙන් පසු 2016.05.30 දිනැතිව පොලිස්පතිතුමාගේ නියෝග පරිදි මෙම කොට්ඨාසය මඟින් විමර්ශන ආරම්භ කර ඇත.

II. පැමිණිලිකරු පැමිණිල්ල තුළ සඳහන් කර ඇත්තේ ශ්‍රී ලංකා නාවික හමුදාව යාපනය මුහුදු සීමාවේදී අත්අඩංගුවට ගෙන රාජසන්තක කරන ලද රත්තරන් තොගයකින් කිලෝ ග්‍රෑම් 08 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නාවික හමුදාව වෙත රේගු ආඥා පනතට හා විනිමය ආඥා පනතට පටහැනිව නිකුත් කර ඇති බවටයි.

III. ඒ අනුව විමර්ශන ආරම්භ කරමින් ශ්‍රී ලංකා රේගුව වෙතින් විමර්ශනයට අදාළව තොරතුරු ලබා ගැනීම සඳහා 2016.06.17 වන දින යාපනය රේගු අධිකාරී කාර්යාලයට අනුයුක්තව රාජකාරි කරනු ලැබූ නියෝජ්‍ය රේගු අධිකාරී කීර්ති ප්‍රියදර්ශන හේරත් මහතා කැඳවා මීට අදාළ තොරතුරු විමසීමක් සිදු කර ඇති අතර එහිදී අනාවරණය වී ඇත්තේ 2014.10.01 වන දින උතුරු මාදගල් මුහුදේදී නීති විරෝධී ලෙස සැක කටයුතු පුද්ගලයින් දෙදෙනෙකු විසින් රැගෙන යමින් තිබූ රත්රන් කිලෝ 45.3 කට ආසන්න ප්‍රමාණයක් ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් අත්අඩංගුවට ගෙන ඇති බවටයි. එදින අත්අඩංගුවට ගන්නා ලද රත්රන් තොගය හා සැකකරුවන් දෙදෙනා නාවික හමුදාව විසින් 2014.10.02 වන දින යාපනය රේගු කාර්යාලය වෙත භාරදීමට කටයුතු කර ඇති අතර එදින එම සැකකරුවන් දෙදෙනාට විරුද්ධව නඩු පැවරීමක් සිදු කර එම රත්රන් තොගය රාජසන්තක කිරීමට ද කටයුතු කර ඇති බව අනාවරණය වී ඇත.

IV. ඉහත අනාවරණය වූ කරුණු මූලික කර ගනිමින් නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගැනීමෙන් පසු යාපනය රේගු අධිකාරී කාර්යාලය වෙත භාරදී ඇති රත්රන් කිලෝ ග්‍රෑම් 45.3 අතරින් කිලෝ ග්‍රෑම් 08 ක ප්‍රමාණයක් ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් මත ඒ වන විට ඉදිකරමින් තිබූ සඳහිරු සෑ දාගැබේ බුදුරජාණන් වහන්සේගේ රත්රන් ප්‍රතිමාවක් නිර්මාණය කර තැන්පත් කිරීමේ කටයුතු සඳහා භාවිතා කිරීමට ඉල්ලීමක් එවකට

නාවික හමුදාපති විසින් හෝ වගකිව යුතු නිලධාරියකු විසින් 2014.10.0 වන දින සිදු කර තිබේද යන්න අනාවරණය කර ගැනීම සඳහා විමර්ශන සිදු කරන ලදි.

V. එහිදී අනාවරණය වී ඇත්තේ එවකට සිටි ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ආරක්ෂක මණ්ඩලයෙන් ගන්නා ලද තීරණයකට අනුව ඉදිකරමින් පැවති සඳහිරු සෑයේ රන් සමාධි පිළිම වහන්සේ නමක් තැන්පත් කිරීම සඳහා තීරණයකට එළැඹ ඇති බවත්, එම රන් සමාධි පිළිම වහන්සේ නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන රත්රන් රජය සතු රන් සංචිතවලින් ලබා ගැනීමේ තීරණයකට එළැඹ ඇති බවත්, ඒ අනුව ඒ වන විට රජසන්තක කරන ලද රත්රන් තුළින් එම අවශ්‍යතාවය ඉටු කර ගැනිමට ආරක්ෂක ලේකම්වරයා වෙත ආරක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා දීමක් සිදු කර ඇති බවටත් අනාවරණය වී ඇත.

VI. ඒ අනුව ආරක්ෂක ලේකම්වරයා විසින් අනුරාධපුර සඳහිරු සෑයේ තැන්පත් කිරීමට යෝජිත රන් සමාධි පිළිම වහන්සේ නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන රත්රන් කිලෝ 8 ක ප්‍රමාණයක් නාවික හමුදාව විසින් 2014.10.01 වන දින අත්අඩංගුවට ගන්නා ලද රත්රන් වලින් ලබා ගැනීමට කටයුතු කරන ලෙසට එවකට නාවික හමුදාපතිවරයා වෙත උපදෙස් ලබා දීමක් සිදු කර ඇති බවට අනාවරණය වී ඇති අතර ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා එවකට සිටි රේගු අධ්‍යක්ෂ

ජනරාල් ජගත් විජේවීර මහතාට දුරකථන ඇමතුමක් ලබා දී නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන 2014.10.02 වන දින භාර දී ඇති රත්රන්වලින් කිලෝ 08 ක ප්‍රමාණයක් ඒ වන විටත් ඉදිකරමින් පැවති සඳහිරු සෑයේ තැන්පත් කිරීමට යෝජිත රන් බුදුපිළිම වහන්සේ නිර්මාණය කිරීම සඳහා ලබාදීමට කටයුතු කරන ලෙසට දැනුවත් කිරීමක් එවකට ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ ගෝඨාභය රාජපක්ෂ මහතා සිදු කර ඇති බවට ඔහුගේ ප්‍රකාශය මඟින් අනාවරණය වී ඇත.

VII. ඒ අනුව නාවික හමුදාපතිවරයා විසින් රත්රන් ලබා ගැනීම සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟින් දුරකථනයෙන් සාකච්ඡාවක් පවත්වා එහිදී රේගු අධ්‍යක්ෂවරයා විසින් ලබාදී ඇති උපදෙස්වලට අනුව කටයුතු කරමින් ඒ වන විටත් ඉදිකරමින් පැවති සඳහිරු සෑයේ තැන්පත් කිරීම සඳහා රන් බුදු පිළිමයක් නිර්මාණය කිරීමට අවශ්‍ය රත්රන් කිලෝ 08 ක ප්‍රමාණයක් 2014.10.01 වන දින නාවික හමුදාවෙන් අත්අඩංගුවට ගෙන ඇති රත්රන්වලින් ලබාදීමට කටයුතු කරන ලෙසට නාවික හමුදාපතිවරයා විසින් ඉල්ලීමක් සිදු කරමින් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් එම කටයුත්ත සඳහ උපදෙස් ලබාදුන් ලිපියක්ද ඇමුණුමක් වශයෙන් යා කරමින් 2014.10.02 වන දින රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කර ඇති අතර රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී නාවික හමුදාවේ ඉල්ලීමට අනුව රත්රන් ලබාදීමේ ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අතිරේක

රේගු අධ්‍යක්ෂ ජනරාල් තාරක සෙනෙවිරත්න මහතා වෙත අදාල ලිපිය යොමු කර ඇත. එම ඉල්ලීම් ලිපිය අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් තාරක සෙනෙවිරත්න වෙත ලැබීමෙන් පසු 2014.10.02 වන දින නාවික හමුදාව විසින් යාපනය රේගු කාර්යාලය වෙත භාර දීමෙන් අනතුරුව රාජසන්තක කරන ලද රත්රන් කිලෝ 45 තුළින් රත්රන් කිලෝ 08 ක් ලබාදීම සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කර ඇති අතර රාජසන්තක කරන ලද රත්රන් සඳහා නැවත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි මාස 03 ක කාලය ඉක්මවීමක් ඒ වන විටත් සිදුව නොතිබුන බැවින් එම රත්රන්වලින් රත්රන් කිලෝ 08 ක ප්‍රමාණයක් නාවික හමුදාව වෙත ලබාදීම සම්බන්ධයෙන් නීතිමය ගැටළුවක් ඇති වන බැවින් අත්අඩංගුවට ගෙන රාජසන්තක කොට නියමිත අභියාචනා කාල සීමාව ඉක්මවා ගිය වෙනත් රත්රන් තොගයකින් නාවික හමුදාවේ අවශ්‍යතාවය ඉටු කර ගැනීම සඳහා ලබාදීමක් සිදු කිරීමට යෝජනාවක් සිදු කරමින් උපදෙස් පැතීමක් රේගු අධ්‍යක්ස ජනරාල්වරයා වෙතින් සිදු කර ඇති අතර ඒ සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලැබීමක් සිදුව ඇත.

VIII. ඒ අනුව අතිරේක රේගු අධ්‍යක්ෂ තාරක සෙනෙවිරත්න මහතාගේ උපදෙස්වලට අනුව කටයුතු කරමින් නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ රද්ගයිගල ආරච්චිලාගේ ජයන්ත බුද්දධාස මහතා විසින් රේගු අධිකාරි දොඩම්ගොඩගේ රත්න කුමාර

මහතාගේ සහ සහකාර රේගු අධිකාරි අලහකෝන් ආරච්චිලාගේ ජීවක රවිනාත් කහවත්ත මහතාගේද සහාය ඇතිව රේගු විකුණුම් අංශයේ ගබඩා කර තිබූ 275/V5592/BIA/A/CASE281/2013/BO/60/2014,B298/V5606/BIA/A/CASE41/2014 -, 122L/R/5/V3396 - අංක සඳහා ලැයිස්තු 03 කින් ලබාගෙන ඇති රත්තරන් ග්‍රෑම් 8118.3 ක බරින් යුත් කැරට් 24 රත්රන් බිස්කට් තොගයක් 2014.11.05 වන දින නාවික හමුදාපති විසින් යොමු කරන ලද රියර් අද්මිරාල් රොසයිරෝ නිලධාරියා ඇතුළු නාවික නිලධාරීන් පිරිසක් වෙත භාරදීමට කටයුතු කර ඇත.

IX. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියට අයත් ජාතික අනුරූ පාසලේ අධ්‍යක්ෂවරයා හා ශිල්පීන්ගේද සහාය ඇතිව වැලිසර නාවික හමුදා කඳවුරේදී රන් පිළිමය නිර්මාණය කිරීමේ කටයුතු 2014.11.07 වන දින ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර ශ්‍රී ලංකා රේගු අධිකාරිය විසින් ලබාදෙන ලද රත්රන් ග්‍රෑම් 8118.3 ක ප්‍රමාණය සහ ලංකා බැංකුවෙන් ලබාදී තිබූ රත්රන් ග්‍රෑම් 3500 ක ප්‍රමාණයෙන් කොටසක් ද යොදවා ගනිමින් ග්‍රෑම් 9706 ක බරකින් යුක්තව නිර්මාණය කරන ලද සමාධි පිළිම වහන්සේ 2014.11.23 වන දින සඳහිරුසෑ ගර්භයේ තැන්පත් කිරීමට කටයුතු කර ඇති බවට විර්ශන තුළින් අනාවරණය වී ඇත.

X. ඒ අනුව මෙම පැමිණිල්ලට අදාළව සිදු කරන ලද විමර්ශනයේදී රේග ආඥා පනතේ 162 වගන්තිය යටතේ රේගු කටයුතු කළයුතු කළ යුතු ආකාරය දැක්වෙන අතර ඒ අනුව වෙන්දේසි කිරීම හෝ සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීම යටතේ රජයට ආදායමක් අභිමිවන පරිදි තීරණ ගැනීම සඳහා අභිමතයක් රේගුව වෙත තිබේද යන්න සහ මෙම පනතේ ඉහත වගන්තිය යටතට නොවැටෙන ආකාරයෙන් පනතේ විධිවිධානවලට පටහැනි ලෙස නිදහස් කර තිබේද යන නීතිමය ගැටළු මූලික කර ගනිමින් ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීමට විමර්ශන නිලධාරියා විසින් කටයුතු කර ඇති අතර ඒ අනුව 2017.05.30 වන දින CR5/18/2017 යොමු අංක යටතේ ගරු නීතිපතිතුමාගේ උපදෙස් පතා ගොනු යොමු කිරීමට කටයුතු කර ඇත.

XI. මෙම විමර්ශනයට අදාලව ගරු නීතිපතිතුමා විසින් 2019.09.17 වන දින උපදෙස් ලබා දෙමින් හිටපු රේගු අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කර ඇති ජගත් ප්‍රේමලාල් විජේවීර යන අය හිටපු අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් වශයේ කටයුතු කර ඇති රාජපක්ෂ පතිරගේ දොන් තාරක සෙනෙවිරත්න යන දෙදෙනා විසින් කුමන්ත්‍රණය කිරීමේ පදනම මත ශ්‍රී ලංකා රේගුව සතුව තිබූ රත්තරන් කිලෝ 08 ක ප්‍රමාණයක් සම්බන්ධයෙන් සාපරාධී විශ්වාසය කඩ කිරීමේ වරද සිදු කිරීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 113 (ආ), 102 සහ 388 වගන්ති සමඟ කියවිය යුතු 1982 අංක 12 දරන පොදු

දේපල විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ 5 (1) වගන්තිය යටතේ වරදක් සිදු කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය වන බවට සඳහන් කරමින් ඔවුන් දෙදෙනා සැකකරුවන් ලෙස අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙසටත් උපදෙස් ලබාදීමක් සිදු කර ඇත.

XII. ගරු නීතිපතිතුමාගේ උපදෙස් අනුව කටයුතු කරමින් එහි සඳහන් කර ඇති සැකකරුවන් වන හිටපු රේගු අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කර ඇති ජගත් ප්‍රේමලාල් විජේවීර යන අය සහ හිටපු අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කර ඇති රාජපක්ෂ පතිරගේ දොන් තාරක සෙනෙවිරත්න යන අයවලුන් අත්අඩංගුවට ගැනීම සඳහා නිලධාරි කණ්ඩායම් දෙකක් මේ වන විට යොදවාඇත. නමුත් එම නිලධාරීන් විසින් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට පෙර මෙකී සැකකරුවන් විදේශ ගතවීමේ උත්සාහයක නිරතව සිටින බවට විශ්වාසදායී තොරතුරක් මඟින් තොරතුරු අනාවරණය වී ඇති බැවින්, එම පුද්ගලයින් අත්අඩංගුවෙන් වැලකී විදේශගත වුවහොත් ඉදිරි විමර්ශන කටයුතු සිදු කිරීමට බාධාවක් වන හෙයින් පහත නම් සහ තොරතුරු සඳහන් අයගේ විදේශ ගමන් තහනම වළක්වමින් නියෝගයක් නිකුත් කරන ලෙසත්, යම් හෙයකින් විදේශ ගතවීම සඳහා උත්සහ කළහොත් ඔවුන් රඳවාගෙන අංක 0112337218, 0112337143 දරන දූරකථන අංකයන් මඟින් මෙම කොට්ඨාසය දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්,

> ආගමන විගමන පාලක ජනරාල් වෙත අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 124 වගන්ති ප්‍රකාරව ඔබතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නියෝගයක් නිකුත් කරන මෙන් ගරු අධිකරණයෙන් ඉල්ලා සිටිමි."

යථෝක්ත පැ.7 බී වාර්තාවෙහි අවසානයේ සඳහන් ඉල්ලීම එනම් ජගත් ප්‍රේමලාල් විජේවීර සහ දොන් තාරක සෙනෙවිරත්න යන දෙදෙනාගේ විදේශ ගමන් තහනම් කරන ලෙස ඉල්ලීම යහපාලන රජය විසින් සිය දේශපාලන පළිගැනීම් ආරම්භ කරනු ලැබ ක්‍රියාත්මක කිරීමේදී ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ පවුලේ සියලුදෙනා ඉලක්ක කර ගනිමින් සිදු කෙරෙන ලද විමර්ශන කටයුතුවලදී ඊට ගොදුරු කර ගන්නා ලද රජයේ සහ හමුදාවන්හි නිලධාරීන් සියලුදෙනා සම්බන්ධයෙන් සිදු කරනු ලැබ ඇති එක හා සමාන වූ ඉල්ලීමකි. ඒ සියල්ලෙහිම මෙන් පළමුව අධිකරණයට කරුණු වාර්තා කරන බී වාර්තාව මඟින් මෙම ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබ ඇත. එහිදී තවත් පොදු ලක්ෂණයක් වනුයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් කරනු ලැබූ සියලු කැඳවීම්වලට අවනතව කීපවාරයක් බැගින් එම ස්ථානයට ගොස් ප්‍රකාශ ලබාදෙන ලද රාජ්‍ය නිලධාරීන්, පොලීසිය මඟහරින බවට අසත්‍ය කරුණු අධිකරණයට වාර්තා කරමින් ඔවුන්ගේ විදේශ ගමන් තහනම් කරන මෙන් ඉල්ලා සිටිමින් මහේස්ත්‍රාත්වරුන් වෙතින් එම තහනම් නියෝග ලබා ගැනීමය. එකී තහනම් නියෝගයනට යටත් වන ලද එම නිලධාරීන් අදාළ නියෝගයන් පිළිබඳව දැන ගැනීමට යෙදී ඇත්තේ ජනමාධ්‍ය මඟිනි.

සඳහිරු සෑය රත්‍රං සඳහා වූ තාරක සෙනෙවිරත්න සහ ජගත් පී විජේවීර යන රාජ්‍ය නිලධාරීන් හට එරෙහිව මූල්‍ය අපරාධ වංචා පිළිබඳ නීතිමය ක්‍රියාකාරකම් ආරම්භ කිරීම යහපාලන රජය විසින් සිය පාලන කටයුතු ආරම්භ කරමින් හඳුන්වා දෙනු ලැබූ ක්‍රියාදාමයක එක් ක්‍රියාකාරකමක් විය. එකී ක්‍රියාදාමය ආරම්භ කෙරෙන ලද්දේ 2015 ජනවාරි මස 08 වන දින පවත්වනු ලැබූ ජනාධිපතිවරණයට තරඟ කිරීමට එක්සත් ජාතික පක්ෂයේ සහාය ලබාගෙන ඉදිරිපත් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම්ව සිටි මෛත්‍රීපාල සිරිසේන මහතා එම ජනාධිපතිවරණයෙන් ජයගෙන 2015.01.09 දින ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දීමත් සමඟ අග්‍රාමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දෙන ලද ඒ වන විට පාර්ලිමේන්තුවේ සුළුතර බලයක් සහිතව විපක්ෂ නායකවරයා ලෙස කටයුතු කරමින් සිටි රනිල් වික්‍රමසිංහ මහතා සමඟ පිහිටුවන ලද කැබිනට් මණ්ඩලය විසින් ගනු ලැබූ කැබිනට් තීරණයක් අනුව වේ. මෙම කැබිනට් තීරණය ගැනීම සඳහා සලකා බලනු ලැබ ඇත්තේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සහ විදුලිබල සහ බලශක්ති ඇමතිව සිටි පාඨලී චම්පික රණවක මහතා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ දෙකකි. මෙම කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු තුළ ප්‍රකට ලෙස සාකච්ඡාවට බඳුන් වන ලද එකී රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කිරීමට යෙදෙන ලද කැබිනට් සංදේශය සම්බන්ධයෙන් විවිධ මත පළ කිරීමට යෙදෙන ලදි.

රනිල් වික්‍රමසිංහ මහතා කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් කියා සිටින ලද්දේ වැලිඅමුණ මහතා (ජනාධිපති නීතිඥ ජේ.සී. වැලිඅමුණ) විසින් තමන් වෙත ගෙනවිත් දෙන ලද එම කැබිනට් සංදේශය කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද බවය. එලෙසින්ම ක්‍රියාවේ යෙදවිය නොහැකි යෝජනා එම කැබිනට් සංදේශයෙහි

ඇතුළත්ව තිබූ බව නිරීක්ෂණය කළද මෙය නීතියට අනුව ක්‍රියාවේ යොදවන්නැයි තමා පවසා සිටි බැව් ඔහු කියා සිටියේය. රනිල් වික්‍රමසිංහ මහතාගේ කැබිනට් සංදේශයට අනුව ගන්නා ලද 2015.01.21 දිනැති කැබිනට් තීරණය මඟින් පිහිටුවනු ලැබූ දූෂණ මර්ධන කමිටුවෙහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් එම කැබිනට් තීරණය තුළම විධිවිධාන සලසනු ලැබ ඇත. පෙරාතුව පැවති පාලන සමය තුළ සිදුවන ලදැයි පූර්ව නිගමනය කරගනු ලැබ ඇති මහාපරිමානයේ දූෂණ වංචා පිළිබඳව විමර්ශනය කොට ඊට සම්බන්ධ වූවනට දඬුවම් ලබාදීම පිළිබඳ කටයුතු මෙහෙයවීම මෙම දූෂණ මර්ධන කමිටුවේ කාර්යභාරය විය. දූෂණ මර්ධන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදිය.

**දූෂණ විරෝධී කමිටුව**

## ACC (Anti-Corruption Committee)

ජාතික විධායක සභාවේ අනුමැතිය හා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත ස්ථාපිත කරනු ලබන දූෂණ විරෝධී කමිටුව. (ACC)

**සාමාජිකත්වය**

1. අගමැති රනිල් වික්‍රමසිංහ (සභාපති)
2. අමාත්‍ය මංගල සමරවීර
3. අමාත්‍ය පාඨලී චම්පික රණවක
4. අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ
5. අමාත්‍ය රවුෆ් හකීම්
6. ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය නායක, සරත් ෆොන්සේකා

7. දෙමළ ජාතික සන්ධානය (TNA) නායක, ආර්. සම්බන්ධන්
8. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන්
9. ජනතා විමුක්ති පෙරමුණේ නායක, අනුර කුමාර දිසානායක
10. නීතිඥ ජේ.සී. වැලිඅමුණ
11. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
12. මලික් සමරවික්‍රම
13. කමිටු ලේකම්

<u>අනුකමිටුව</u>

1. අමාත්‍ය මංගල සමරවීර (සභාපති)
2. අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ
3. නියෝජ්‍ය අමාත්‍ය එරාන් වික්‍රමරත්න
4. ජනතා විමුක්ති පෙරමුණේ නායක, අනුර කුමාර දිසානායක
5. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන්
6. නීතිඥ ජේ. සී. වැලිඅමුණ
7. මලික් සමරවික්‍රම

ඊට අමතරව අදාල ක්‍රියාකාරකම් කඩිනම් කිරීම සඳහා ක්ෂණික ප්‍රතිචාර කමිටුවක් පිහිටුවනු ලැබ ඇති අතර ඒ පිළිබඳව මෙම වාර්තාවේ 8 වන අයිතමය යටතේ සඳහන් කර ඇත.

දූෂණ මර්ධන කමිටුවෙහි ක්‍රියාකාරකම් පිළිබඳ ඉලක්ක ගත වැඩසටහන් යෝජනා කරනු ලැබ ඇත. ඒ පහත සඳහන් පරිද්දෙනි.

## දිගු කාලීන වැඩසටහන්

1. සොරකම් කර ශ්‍රී ලංකාවෙන් පිට කරන ලද මුදල් පිළිබඳව සොයා බලා ඒවා අත්පත් කර ගැනීම හා වැරදිකරුවන්ට දඬුවම් කිරීම.

2. අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයින් නීත්‍යාණුකූලව ඉවත් කිරීම හා වඩා ශක්තිමත් අල්ලස් හා දූෂණ කොමිසමක් හඳුන්වා දීම.

3. ජාතික ප්‍රසම්පාදන කොමිසමක් පත් කිරීම හා එමඟින් සියලුම ව්‍යාපෘතිවලට අනුමැතිය ලබාදීම සිදු කිරීම.

4. ජාතික විගණන පනත ඉදිරිපත් කිරීම.

5. ශ්‍රී ලංකාව අත්සන් කරන ලද එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.

## වෙනත් වැඩසටහන්

1. එල්.ටී.ටී.ඊ. ය වෙතින් අත්පත් කර ගන්නා ලද රත්‍රන් පිළිබඳව සොයා බැලීම සඳහා වෙනම විමර්ශන ඒකකයක් පිහිටුවීම.

2. මාධ්‍යවේදීන් ඝාතනය කිරීම පිළිබඳව සොයා බැලීමේ විශේෂ විමර්ශන ඒකකයක් පිහිටු වීම. වාස් ගුණවර්ධන මඟින් ඔහු දන්නා තොරතුරු 129 ප්‍රකාශයක් ලබා ගැනීම.

සම්බන්ධීකරණ කටයුතු උදෙසා නීතිපති දෙපාර්තමේන්තුව ද ශ්‍රී ලංකා පොලිසිය ද නියෝජනය වන පරිදි නියෝජිතයින් සම්බන්ධ කරගනු ලැබ ඇත.

මෙකී කැබිනට් තීරණය පරිදි පිහිටුවා ගන්නා ලද ඉහත කී දූෂණ මර්ධන කමිටුවෙහිද ක්ෂණික ප්‍රතිචාර කමිටුවෙහි ද නම් ඇතුළත් පහත නම් සඳහන් දේශපාලනඥයින් රනිල් වික්‍රමසිංහ මහතාට අමතරව කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන ලදි.

- ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා
- මංගල සමරවීර මහතා
- පාඨලී චම්පික රණවක මහතා
- මලික් සමරවික්‍රම මහතා
- අනුර කුමාර දිසානායක මහතා

මංගල සමරවීර, මලික් සමරවික්‍රම සහ අනුර කුමාර දිසානායක යන වගඋත්තරකරුවන් පවසනු ලැබුයේ ඔවුන් මෙබඳු වූ කැබිනට් තීරණයක් පිළිබඳව දැන නොසිටි බවත් දූෂණ මර්ධන කමිටුවේ හෝ ක්ෂණික ප්‍රතිචාර කමිටුවේ රැස්වීම් සඳහා සහභාගී නොවන ලද බවත්ය. චම්පික රණවක මහතා කියා සිටින ලද්දේ ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබූ කැබිනට් සංදේශය මීට හාත්පසින් වෙනස් වූවක් බවත් එමඟින් යෝජනා කර සිටින ලද්දේ දූෂණ වංචා සොයා බැලීමට කොමිෂන් සභාවක් පත් කරනු ලැබීම වන බවත්ය.

අනුර කුමාර දිසානායක මහතා කොමිෂන් සභාව ඉදිරියේ දීර්ඝ වශයෙන් සාක්ෂි දෙමින් මෙම කැබිනට් තීරණය ව්‍යාකූල වූවක් බව පැහැදිලි කරන ලදි. ඔහු රනිල් වික්‍රමසිංහ මහතා මූලසුන දැරූ කමිටු රැස්වීම් කිහිපයකට සහභාගී වී ඇති නමුත් ඔහුගේ ස්ථාවරය වූයේ එම

රැස්වීම් දූෂණ මර්ධන කමිටුවේ රැස්වීම් නොවන බවය. මෙම කැබිනට් සංදේශය සහ ඊට අදාළ කැබිනට් තීරණය පිළිබඳව කරුණු දැක්වූ ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා ප්‍රකාශ කර සිටින ලද්දේ එය කිසියම් අන්දමක නීත්‍යානුකූල නොවන යෝජනා ඇතුළත් වන ලද්දක් බවය. මෙහි සඳහන් ඇතැම් කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද අපරාධ නඩු විධානයට ද සහ නීති මූලධර්මයනට ද අනනුකූල වන බවය. එසේ හෙයින් ඔහු දූෂණ මර්ධන කමිටුවේ හෝ ඒහා අදාළ කිසිදු අනුකමිටුවක රැස්වීම්වලට සහභාගී නොවූ බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරනු ලැබිණි.

ඉහත සඳහන් පරිදි දූෂණ මර්ධන කමිටුව සහ ඊට අදාළ අනුකමිටු පිහිටු වීමෙන් අනතුරුව රනිල් වික්‍රමසිංහ මහතා සිදු කරනු ලැබූයේ එම කමිටු විසින් ගනු ලබන තීරණ ක්‍රියාවේ යෙදවීම සඳහා ලේකම් කාර්යාලයක් පිහිටු වීමය. ඔහු ඒ සඳහා ද කැබිනට් සංදේශයක් ඉදිරිපත් කරනු ලැබූ අතර ඊට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනිණි. දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලයේ වියදම් සඳහා මුදල් වෙන් කර ගන්නා ලද්දේ ජනාධිපති ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂයන්ගෙනි. කෙසේ වෙතත් කොමිෂන් සභාව හමුවට පැමිණි හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා කොමිෂන් සභාවට පිළිතුරු දෙමින් කියා සිටින ලද්දේ දූෂණ මර්ධන කමිටු කාර්යාලය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂයන්ගෙන් මුදල් වෙන් කර ගැනීම පිළිබඳව තමන් නොදන්නා බවත්ය.

දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලයේ ප්‍රධානියා වූයේ අධ්‍යක්ෂවරයාය. මෙම තනතුරට පත් කරගනු ලබන පුද්ගලයාගේ නම රනිල් වික්‍රමසිංහ මහතා විසින් පළමුවෙන් ඉදිරිපත් කෙරෙන ලද කැබිනට් සදේශයෙහි ඇතුළත්ව තිබිණි. එනම් ආනන්ද විජේපාල

නැමැත්තාය. විජේපාල මහතා පිළිබඳව සඳහන් කළයුතු වන ඉතිහාසයක් ඇත. රාජ්‍ය නිලධාරියෙකු වූ ඔහු අනුර කුමාර දිසානායක මහතා චන්ද්‍රිකා කුමාරතුංග බණ්ඩාරනායක මැතිනිය ජනාධිපතිව සිටියදී එතුමියගේ රජයෙහි කෘෂිකර්ම අමාත්‍යවරයාව ලෙස කටයුතු කරන විට ඔහුගේ පෞද්ගලික ලේකම් ලෙස රාජකාරි කරනු ලැබ ඇත. නැවත රාජ්‍ය සේවයෙහි කටයුතු කළ විජේපාල මහතා දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කිරීමෙන් අනතුරුව රාජ්‍ය සේවයයෙන් විශ්‍රාම යාමෙන් පසු 2020 වර්ෂයේ පැවති මහමැතිවරණයේදී අනුර කුමාර දිසානායක මහතාගේ නායකත්වයෙන් යුතු සමගි ජන බලවේගය නම් වූ සංධානගත පක්ෂයෙහි අපේක්ෂකයෙකු ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයට තරඟ කරනු ලැබ ඇත.

විජේපාල මහතා කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් කියා සිටින ලද්දේ දූෂණ මර්ධන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක ලෙස ඔහු පත් කර ගන්නා ලදේද් කිසිදු දේශපාලන සම්බන්ධතාවයක් නොමැතිව බවත් එය හුදෙක් ඔහු පළපුරුදු රාජ්‍ය නිලධාරියෙකු වීමේ හේතුව මත පමණක් සිදුවන ලද්දක් බවත්ය.

දූෂණ මර්ධන ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව එහි අධ්‍යක්ෂකව සිටි විජේපාල මහතා කොමිෂන් සභාව හමුවේ විස්තර කරනු ලැබිණි.

දූෂණ මර්ධන ලේකම් කමිටු කාර්යාලය පිහිටුවන ලද්දේ අරලියගහ මන්දිරය ආසන්නයේ පිහිටා තිබූ ගොඩනැගිල්ලකය. අධ්‍යක්ෂවරයා ද උපදේශකවරු ද රජයේ නීතීඥවරයා ද සහ සහකාර කාර්ය මණ්ඩලයක් ද එහි සේවයේ යෙදිනි. තැපැල් මඟින් ද අතින් ගෙනවිත්

භාර දීමෙන් ද අමාත්‍යාංශ සහ රජයේ ආයතන මඟින් යොමු කිරීමෙන්ද දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලය වෙත පැමිණිලි ලැබිණි. පැමිණිලි ලැබෙන අනුපිළිවෙළට අනුව ප්‍රථමයෙන් උපදේශකවරුන් වෙත යොමු කරනු ලැබ වාර්තාවක් ලබාගත් අතර අදාළ පැමිණිල්ල එකී වාර්තාව ද සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ තුසිත් මුදලිගේ මහතා වෙත යොමු කිරීම අනතුරුව සිදු කෙරිනි. තුසිත් මුදලිගේ මහතාගේ උපදෙස් සහ නියෝග මත අදාළ පැමිණිලි විමර්ශන ආයතන වෙත යොමු කිරීම සිදුවිය. විමර්ශන ආයතන වූයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, පොලිස් විශේෂ විමර්ශන කොට්ඨාසය, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවය. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය යනු දූෂණ මර්ධන කමිටු කර්යාලය මඟින් යොමු කරනු ලබන පැමිණිලි පමණක් විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයා විසින් පිහිටුවන ලද පොලිස් ඒකකයක් විය. එය අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව පැමිණිලි විභාග කිරීමට බලයක් නොමැති අවිධිමත් පොලිස් කණ්ඩායමක් වූ බැව් නිගමනය කිරීමට සිදුව ඇත.

දූෂණ මර්ධන ලේකම් කාර්යාලයෙන් විමර්ශන අංශ වෙත පැමිණිලි යොමු කරන ලද්දේ එහි අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ආනන්ද විජේපාල මහතා විසින් අත්සන් තබන ලද ආවරණ ලිපියක් මඟිනි. අදාළ පැමිණිල්ල තුළ හෙළිදරව් වන වැරදි කවරේද යන්න ද ආවරණ ලිපියේ සඳහන් කරනු ලැබූ අතර විමර්ශනයන්හි ප්‍රගතිය වාර්තා කරන ලෙස වූ නියමයක් ද එහි විය.

දූෂණ මර්ධන ලේකම් කාර්යාලය යනු අග්‍රාමාත්‍යවරයා ඇතුළු රජයේ අමාත්‍යවරුන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් මෙහෙයවනු

ලබන්නක්ය යන්න විමර්ශන අංශ දැන සිටින ලදි. එපමණක් නොව එක් එක් විමර්ශනයන්හි ප්‍රගතිය සමාලෝචනය කෙරෙන්නාවූ ප්‍රගති සමාලෝචන රැස්වීම අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් වරින්වර පවත්වනු ලැබූ අතර පොලිස්පතිවරයා ද පොලිස් විමර්ශන කොට්ඨාසයන්හි ප්‍රධානීන් ද සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ද එකී ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට කැඳවන ලදි.

ඉහත සඳහන් කෙරෙන ලද පැ.7 බී වාර්තාවේ දෙවන පිටුවේ පළවන ඡේදයෙහි සඳහන් වනුයේ මෙම පැමිණිල්ල දූෂණ මර්දන ලේකම් කාර්යාලයට නිර්නාමිකව ලැබී ඇති තොරතුරක් බවත් එම කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල මහතාගේ අත්සනින් යුතුව පොලිස්පතිතුමා වෙත යොමු කිරීමෙන් පසු පොලිස්පතිතුමාගේ නියෝග පරිදි මෙම කොට්ඨාසය (ඉහත කී නීති විරෝධී මූල්‍ය අපරාධ විමර්ශන කණ්ඩායම) විමර්ශන ආරම්භ කරන ලද බවත්ය.

තාරක සෙනෙවිරත්න මහතා කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කරන ලද සාක්ෂි පරිදි ඔහුගේ රාජකාරියක් වශයෙන් නාවුක හමුදාව විසින් ඉල්ලා සිටි රත්‍රං කිලෝ 08 වෙන් කරදීම පිණිස 2014.10.03 දින සටහන යෙදීමෙන් අනතුරුව එදිනම රාත්‍රියේ ආසියානු සංගමයේ සැසිවාරයකට සහභාගි වීම සඳහා බෲනායි රාජ්‍යයට යනු ලැබ ඇත. ඔහු 2014.10.12 දින යළි දිවයිනට පැමිණ ඇති නමුත් අදාළ රත්‍රං කිලෝ 08 මුදා හැරීම සම්බන්ධයෙන් වූ කිසිදු කටයුත්තකට සහභාගීව නොමැත. 2015 වර්ෂයේ ජනවාරි මාසයෙහි රජය වෙනස් වීමත් සමඟ විජයවීර මහතා රේගු අධ්‍යක්ෂ ජනරාල් ධූරයෙන් ඉල්ලා අස්වූ අතර තාරක සෙනෙවිරත්න මහතා 2016 මාර්තු මාසයේදී වයස අවුරුදු 60 සම්පූර්ණ වීම හේතුවෙන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇත.

තාරක සෙනෙවිරත්න මහතා මූල්‍ය අපරාධ කොට්ඨාසයට ප්‍රථම වරට කැඳවනු ලැබ ඇත්තේ 2016 වර්ෂයේ මැද භාගයේදීය. රත්තරං කිලෝ 08 මුදා හැරීමේ රාජකාරි කටයුත්ත සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රශ්න කරනු ලැබ ප්‍රකාශයක් සටහන් කර ගනු ලැබ ඇත. රත්තරං කිලෝ 08 මුදාහැරීමේ කටයුත්ත උදෙසා තාරක සෙනෙවිරත්න මහතා විසින් සිදු කරනු ලැබ තිබූ 2014.10.03 දිනැති සටහන යෙදීම පිළිබඳව ඔහුගෙන් ප්‍රශ්න කරනු ලැබ එබඳු සටහනක් යෙදීම කවරෙකුගේ හෝ බලපෑමක් යටතේ සිදුවිය යුත්තක් බව තමන් දන්නා බැව් කියා සිටි FCID නිලධාරීන් බය නොවී බලපෑම් කළ පුද්ගලයාගේ නම සඳහන් කරන මෙන් බලපෑම් කරනු ලැබිණි. මෙම රාජකාරි කටයුත්ත උදෙසා තමා හට කිසිවෙක්ගෙන් බලපෑමක් සිදු නොවූ බැව් තාරක සෙනෙවිරත්න මහතා එකහෙළා ප්‍රකාශ කර සිටින ලදින් ඔහුගේන ප්‍රශ්න කරනු ලැබූ නිලධාරීන් ඔහු උසස් නිලධාරියෙකු වෙත ඉදිරිපත් කොට "වැඩක් නැහැ" යනුවෙන් පවසා තාරක සෙවෙිරත්න මහතා මුදා හරිනු ලැබිණි.

පසු අවස්ථාවක තාරක සෙනෙවිරත්න මහතා නිවසින් බැහැරව සිටියදී FCID නිලධාරීන් ඔහු අත්අඩංගුවට ගැනීමට නිවසට යන බව දැන ගන්නට ලැබිණි. කම්පනයට පත් ඔහු රෝගාතුර වනු ලදුව වෙදකම් ගැනීම සඳහා වැලිමඩ පිහිටි බිරිඳගේ මහගෙදරට යන ලද අතර ඒ වන විට ඔහු සහ ජගත් විජේවීර මහතා අත්අඩංගුවට ගන්නා ලෙස නීතිපතිවරයා FCID නිලධාරීන්ට උපදෙස් දී ඇති බව ප්‍රවෘත්ති මඟින් ප්‍රකාශයට පත් කොට තිබිණි. කෙසේ වෙතත් තාරක සෙනෙවිරත්න මහතා වෛද්‍ය උපදෙස් මත බදුල්ල මහරෝහලටෙ ඇතුළත් කර ගන්නා ලදි. FCID නිලධාරීන් බදුල්ල මහාරෝහලට පැමිණ තාරක සෙනෙවිරත්න මහතාගෙන් ප්‍රකාශයක් ලබාගෙන ඔහු අත්අඩංගුවට

ගනු ලැබිණි. FCID නිලධාරීන් බදුල්ල මහරෝහලට පැමිණෙන ලද්දේ තාරක සෙනෙවිරත්න මහතාගෙන් විමසීමට නීතිපතිවරයා විසින් සකස් කර දෙනු ලැබූ ප්‍රශ්නාවලියක් අතැතිවය. ඒ අතර වූ එක් ප්‍රශ්නයක් වූයේ ඒ වන විට ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වී සිටි ගෝඨාභය රාජපක්ෂ මහතාගේ දැඩි බලපෑම හා ඒ මහතාට ඇති බිය නිසා රත්තරං කිලෝ 08 වෙන් කර දීමට අදාළ සටහන යෙදූ බව පිළිගන්නේද යන්නය. බදුල්ල මහ රෝහලේදී FCID නිලධාරීන් තමාගෙන් ප්‍රශ්න කරන විට තම රෝගී තත්ත්වය උත්සන්න වී මහත් අසීරුවෙන් සිටින ලද බැව් තාරක සෙනෙවිරත්න මහතා පවසන ලදි. කෙසේ වෙතත් විනිශ්චයකාරවරයෙක් පැමිණ ඔහු රක්ෂණ සිරභාරයට පත් කරනු ලැබූ අතර බදුල්ල මහරෝහලෙන් ඔහු ගිලන් රියකින් කොළඹ මහරෝහලට මාරු කර එවනු ලැබිණි. තමන් අත්අඩංගුවට ගෙන රක්ෂණ සිරභාරයට පත් කිරීමට හේතුවන ලද කරුණු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා තාරක සෙනෙවිරත්න මහතා අධිකරණයට ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාවන් කියවා බලන ලද්දේ ඔහු ඇප මත මුදා හැරීමෙන් අනතුරුවය. ඔහු වඩාත් කම්පාවට පත්වන ලද්දේ එසේ නඩු වාර්තා කියවා බැලීමේදී පෙනී යන ලද කරුණු තුළිනි. සඳහිරු සෑයෙහි තැන්පත් කිරීම පිණිස රන්මුවා බුදු පිළිමයක් නිර්මාණය කිරීම සඳහා රත්තරං ලබාදෙන ලද්දේ තමා විසින් යොදන ලද සටහනට අනුව යැයි වූ සතුටක් රක්ෂණ සිරභාරයේ සිටියදී වුවද තම සිත තුළ පැවති නමුත් සැබවින්ම එම කටයුත්ත සඳහා රත්තරං ලබාදී ඇත්තේ තමා විදේශ ගතව සිටියදී රේගුවේ ගමන් බඩු අංශය භාරව සිටි රේගු අධ්‍යක්ෂ පණ්ඩුල මහත්ගේ ගමන් බඩු අංශයේ තිබූ රජසන්තක කරන ලද රත්තරං අතුරින් බවත් ඒ සඳහා වූ නිර්දේශය ලබාදී ඇත්තේ පණ්ඩුල

මහතාගේ උසස් නිලධාරියා වූ අතිරේක අධ්‍යක්ෂ රේගු අධ්‍යක්ෂ ජනරාල් පුවිහරන් මහතා බවත් ලේඛන තුළින් අනාවරණය වනු ලැබ තිබිණි. එහෙත් FCID නිලධාරීන් විසින් තාරක සෙනෙවිරත්න මහතා අත්අඩංගුවට ගෙන රක්ෂණ සිරභාරයට පත් කරවනු ලැබ ඇත්තේ ඔහුගේ නිර්දේශය මත රත්තරං මුදා හරිනු ලැබ ඇති බව අධිකරණය වෙත ඒත්තු ගන්වමිණි.

අනුරාධපුර පෙරිමියන් කුලමෙහි උපත ලබන ලද ජගත් ප්‍රේමලාල් විජේවීර මහතා (මින් ඉදිරියට විජේවීර මහතා යැයි හඳුන්වනු ලබන) අනුරාධපුරහිදී මූලික අධ්‍යාපනය ලබා 1981 වසරේදී කැලණිය විශ්ව විද්‍යාලයෙන් ලලිත කලා විශේෂවේදී උපාධිය ලබා ඇත. 1985 වර්ෂයේදී තරුණ සේවා නිලධාරියෙකු වශයෙන් රාජ්‍ය සේවයට එක්වී විවිධ ආයතනයන්හි සේවය කරනු ලැබ 2012.12.03 දින රේගු අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත්කරනු ලැබ තිබේ. විජේවීර මහතා කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ අත්දැකීම් ඇති රාජ්‍ය නිලධාරියෙකු වූ නමුත් රේගුවට අදාළ කටයුතු සම්බන්ධයෙන් අත්දැකීම් නොපැවති හෙයින් ඒ පිළිබඳ රාජකාරි කටයුතුවලදී හැම විටම ඔහු පළපුරුදු ජ්‍යෙෂ්ඨ රේගු නිලධාරීන්ගේ අදහස් ලබාගෙන තීරණ ගනු ලැබිණි.

සඳහිරු සෑයෙහි තැන්පත් කිරීම සඳහා රත්තරං බුදු පිළිමයක් නිර්මාණය කිරීමට ආරක්ෂක මණ්ඩලයේදී තීරණයක් ගනු ලැබූ බවත් ඒ පිළිබඳ වූ වගකීම නාවුක හමුදාපති විසින් භාර ගනු ලැබූ බවත් ජනාධිපති කාර්යාලයෙන් වීරජේවීර මහතා දැනුවත් කරනු ලැබූ අතර නාවුක හමුදාපති විසින් විධිමත් ඉල්ලීමක් විජේවීර මහතා වෙත ඉදිරිපත් කරනු ලැබිණි. අදාළ රත්තරං ප්‍රමාණය ලබාදීම සඳහා රේගුවේ ඉහළ නිලධාරීන් විශාල පිරිසකගේ නීතිමය උපදෙස් හා සහයෝගය විජේවීර

මහතා වෙත ලැබෙන ලද අතර මෙම කටයුත්ත පූර්ණ පාරදෘශ්‍යභාවයකින් යුක්තව සිදු කිරීමට විජේවීර මහතා පියවර ගන්නා ලදි. 2015.05.15 දින රේගු අධ්‍යක්ෂ ධූරයෙන් විජේවීර මහතා ඉවත්වන ලද අතර 2017.08.01 දින ඔහු විශ්‍රාම ලබන ලද්දේ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරමින් සිටියේදීය.

නීතිපති වෙනුවට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ විසින් අත්සන් තබන ලද ඇති නීතිපති දෙපාර්තමේන්වේ ලිපි ශීර්ෂය සහිතව අධ්‍යක්ෂ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ආමන්ත්‍රණය කරනු ලබන 2019.09.17 දිනැති ලිපියෙහි ශීර්ෂය පහත සඳහන් පරිදිය. “2014 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවෙන් ශ්‍රී ලංකා නාවුක හමුදාවට රත්‍රං කිලෝ ග්‍රෑම් 08 ක් මුදා හැරීම හා එම රත්‍රංවලින් රන් සමාධි පිළිමයක් නිර්මාණය කර අනුරාධපුර සඳහිරු සෑයේ තැන්පත් කිරීමට අදාළ ක්‍රියාවලියේදී සිදු වී ඇතැයි කියන අක්‍රමිකතා සම්බන්ධ විමර්ශනය.” අනතුරුව අදාළ ලිපිය ආරම්භ කරනුයේ උක්ත කාරණය සම්බන්ධව එවා තිබූ විමර්ශන උදෘත අධ්‍යයනය කරන ලදැයි යනුවෙනි. මෙම කාරණය හා අදාළව FCID ලිපිගොනුව 2016 වර්ෂයේදීත් නීතිපති දෙපර්තමේන්තුවේ ලිපිගොනුව 2014 වර්ෂයේදීත් ආරම්භ කරනු ලැබ ඇති බව එම දෙපාර්ශවයේ යොමු අංක තුළින් පෙනී යයි. වසර කීපයකට පසුව විමර්ශන උදෘත අධ්‍යයනය කරනු ලැබ ඇති තුසිත් මුදලිගේ විජේවීර මහතා සහ තාරක සෙනෙවිරත්න මහතා හට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 113 (ආ) , 102 සහ 388 වගන්ති සමඟ කියවිය යුතු 1982 අංක 12 දරණ පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ 05 (1) වගන්තිය යටතේ වරදක් සිදු කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය වන

අනාවරණය වන හෙයින් ඔවුන් අත්අඩංගුවට ගෙන අදාළ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස යථෝක්ත ලිපිය මඟින් දැනුම්දී ඇත. විජේවීර මහතා සහ තාරක සෙනෙවිරත්න මහතා කොමිසන් සභාව ඉදිරියේ කියා සිටින ලද්දේ 2019 වර්ෂයේ අවසාන භාගයේදී දූෂණ විරෝධී කමිටුවට සම්බන්ධ තුසිත් මුදලිගේ මෙම කරුණ පිළිබඳව හදිසියේ අවදිව මෙලෙස ක්‍රියා කරනු ලැබ ඇත්තේ ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීමට තීරණය කිරිමෙන් අනතුරුව වන බවය. ඉහත සඳහන් කෙරෙන ලද තුසිත් මුදලිගේ ගේ ලිපියෙහි දැක්වෙන FCID යොමු අංකය දරණ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ඒකක 08 හි ස්ථානාධිපති විසින් ඉදිරිපත් කර ඇති විරමර්ශන නිලධාරී උ.පො.ප. ධම්මික ද සිල්වා විසින් සකසා ඇති විමර්ශන වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. පිටු 09 කින් යුත් යථෝක්ත වාර්තාවෙහි සඳහිරු සෑයට රත්‍රං බුදුපිළිමයක් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවෙන් රත්‍රං ලබා ගැනීම පිළිබඳ වූ ක්‍රියාදාමය ඡේද 34 කින් විස්තර කරනු ලැබ අනතුරුව විමර්ශන නිලධාරීන්ගේ නිරීක්ෂණය සඳහන් කර තිබේ. මෙම පරීක්ෂණ වාර්තාව මෙම වාර්තාවේ කොටසක් ලෙස ඇතුළත් කිරීම සුදුසු බවට කොමිෂන් සභාව නිගමනය කරන හෙයින් අදාළ පරීක්ෂණ වාර්තාව මෙහි පහත ඇතුළත් කර ඇත..

(උපුටා ගැනීම)

"2014 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට රත්‍රං ග්‍රෑම් 8113.3 ක් මුදා හැරීම සම්බන්ධව හා එම රත්‍රංවලින් රන් සමාධි පිළිමයක් නිර්මාණය කර අනුරාධපුර සඳහිරු සෑයේ

නැන්පත් කිරීමට අදාළ ක්‍රියාවලියේදී සිදු වී ඇතැයි කියන අක්‍රමිකතා සම්බන්ධ විමර්ශනය.

01.මෙම පැමිණිල්ල දූෂණ මර්ධන විමර්ශන කාර්යාලයට නිර්නාමිකව ලැබී ඇති තොරතුරකි. එම තොරතුර පොලිස්පතිතුමාට යොමු කිරීමෙන් අනතුරුව 2016.05.30 දිනැතිව පොලිස්පතිතුමාගේ නියෝග පරිදි මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් විමර්ශන ආරම්භ කර ඇත.

02.ඒ අනුව විමර්ශන ආරම්භ කරමින් ශ්‍රී ලංක රේගුව වෙතින් විමර්ශනයට අදාළව තොරතුරු ලබා ගැනීම සඳහා 2016.06.17 වන දින යාපනය රේගු අධිකාරී කාර්යාලයට අනුයුක්තව රාජකාරී කරනු ලැබූ නියෝජ්‍ය රේගු අධිකාරී කීර්ති ප්‍රියදර්ශන හේරත් මහතාගේ ප්‍රකාශය සටහන් කිරීමට කටයුතු කළෙමි. රේගු අධිකාරී හේරත් මහතාගේ ප්‍රකාශය පරිදි 2014.10.01 වන දින උතුරු මාදගල් මුහුදේදී නීති විරෝධී ලෙස ප්‍රවාහනය කරමින් තිබූ රත්තරං කිලෝ ග්‍රෑම් 45.3 කට ආසන්න ප්‍රමාණයක් ශ්‍රී ලංකා නාවුක හමුදාව මඟින් අත්අඩංගුවට ගෙන ඇත. එම අත්අඩංගුවට ගන්නා ලද රන් තොගය හා සැකකරුවන් දෙදෙනෙකු ද ප්‍රවාහනය කළ බෝට්ටුව හා ආම්පන්න නාවික හමුදාව විසින් 2014.10.02 වන දින රේගු ආඥා පනත යටතේ කටයුතු කිරිමට යාපනය රේගු කාර්යාලයට භාර දී ඇත. එහිදී රේගු නඩුවක් පවත්වා ඉදිරිපත් කර තිබූ රන් තොගය, බෝට්ටුව, ආම්පන්න රාජසන්තක කර ඇති අතර සැකකරුවන් දෙදෙනාට දඩ මුදල් නියම කර නඩු කටයුත්ත අවසන් කර ඇත.

03.මෙම රන් තොගය අත්අඩංගුවට ගැනීම සිදුකළ නාවික හමුදා නිලධාරීන් විසින් 2014.10.01 වන දින එවකට සිටි නාවික හමුදාපති එස්.එම්.ජේ පෙරේරා මහතාට රන් තොගය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් දැනුම් දී ඇති අතර ඉන් පසු එම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන්

නාවික හමුදාපතිවරයා විසින් එවකට සිටි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට දුරකථනයෙන් දැනුම්දීමට ක්‍රියා කර ඇත.

04.යුද්ධය ජයග්‍රහනය කිරීම සඳහා දිවයින තුළ මහා සෑයවල් ඉදිකරණ බවට රජය විසින් භාරයක් වී තිබී ඇති අතර එම භාරය ඔප්පු කිරීම සඳහාත් යුධ ජයග්‍රහනය සිහිවීම් සඳහාත් ශ්‍රී ලංකාවේ පළාත් නවය ආවරණය වන පරිදි මහා සෑයවල් 09 ක් ඉදිරිකිරීම සඳහා විද්වතුන් හි ප්‍රභූන් විසින් ඉදිරිපත් කර තිබූ යෝජනා සැලකිල්ලට ගෙන ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් අගමැතිවරයා, ආරක්ෂක ලේකම්වරයා, ජනාධිපති ලේකම්, මුදල් අමාත්‍යාංශ ලේකම්, විදේශ ආමාත්‍යාංශ ලේකම්, හමුදාපතිවරුන්, පොලිස්පති, බුද්ධි අංශ ප්‍රධානීන් ප්‍රමුඛ ආරක්ෂක මණ්ඩලයේදී තීරණයක් ගෙන ඇති අතර ඉන් පළමුවැන්න සඳහිරු සෑය නමින් අනුරාධපුර ප්‍රදේශයේ ඉදිකිරීමට තීරණය කර එම කටයුතු ආරක්ෂක අමාත්‍යාංශයේ යටතේ ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීමට ආරක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාදීමෙන් පසු 2010 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

05.2014 වර්ෂයේ මැද භාගය වන විට සඳහිරු සෑයේ ඉදිකිරීම් කටයුතු සර්වඥ ධාතූන් හා නිදන් වස්තු තැන්පත් කිරීමේ අදියරට පැමිණ තිබී ඇත. ඒ අවස්ථාවේදී ඊට අදාලව කටයුතු සිදු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් විද්වතුන් හා මහා සංඝරත්නයෙහි ප්‍රධානත්වයෙන් සාකච්ඡාවට භාජනය කර ඇති අතර එහිදී ඉදිරිපත් වී ඇති යෝජනා අනුව අතීතයේදී සිදු කර ඇති ආකාරයට සඳහිරු සෑයේ ද නිදන් වස්තුවක් වශයෙන් රන් සමාධි පිළිමයක් තැන්පත් කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත. එම කරුණු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ආරක්ෂක මණ්ඩලයේදී සාකච්ඡා කර සඳහිරු සෑයේද රන් සමාධි පිළිමයක් තැන්පත් කිරීමට තීරණය කර ඇත. එහිදී එම සමාධි පිළිමය නිර්මානය කිරීමට අවශ්‍ය කරනු ලබන රත්‍රං රජය සතු රන් සංචිත මඟින් ලබා

ගැනීමටත්, ඒ වන විට රජසන්තක කරන ලද රත්තුං තොග තිබී ඇති ශ්‍රී ලංකා රේගුවේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හා සම්බන්ධ වී රත්තුං ලබාගෙන රන් පිළිමය නිර්මාණය කිරීමේ කටයුතු සිදු කිරීමට ආරක්ෂක ලේකම්වරයාට ආරක්සක මණ්ඩලයෙන් අනුමැතිය ලබාදී ඇත.

06.ඉන් පසු ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දුරකථන ඇමතුමක් ලබාදී අනුරාධපුර සඳහිරු සෑයේ තැන්පත් කිරීම සඳහා රත්තුං පිළිමයක් නිර්මාණය කිරීමට නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන රේගුවට භාරදී ඇති රත්තුංවලින් කිලෝ 08 ක් අවශ්‍යව ඇති බවත්, එසේ ක්‍රියා කරන ලෙසට ජනාධිපතිතුමා උපදෙස් ලබාදෙන බවත්, මේ සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සාකච්ඡා කරනු ඇති බවටත් දැනුම් දී ඇත.

07.ආරක්ෂක ලේකම්වරයා විසින් අනුරාධපුර සඳහිරු සෑයේ තැන්පත් කිරීමට යෝජිත රන් සමාධි පිළිමය නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන රත්තුං කිලෝ 08 නාවික හමුදාව විසින් 2014.10.01 වන දින අත්අඩංගුවට ගන්නා ලද රත්තුංවලින් ලබා ගැනීමට කටයුතු කරන ලෙසට නාවික හමුදාපතිවරයාට උපදෙස් ලබාදී ඇත. තවද ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා එවකට සිටි රේගු අධ්‍යක්ෂ ජනරාල් ජගත් විජේවීර මහතාට දුරකථන ඇමතුමක් ලබාදී නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන භාර දී ඇති රත්තුංවලින් කිලෝ 08 ක් අනුරාධපුර සඳහිරු සෑයේ තැන්පත් කිරීමට රන් බුදු පිළිමයක් සෑදීමට අවශ්‍යව ඇති බවත් එම රත්තුං කිලෝ 08 නාවික හමුදාවට ලබාදීමට කටයුතු කරන ලෙසට දැනුම්දී ඇත.

08.ඒ අනුව නාවික හමුදාපතිවරයා රත්තුං ලබා ගැනීම සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟින් දුරකථනයෙන් සාකච්ඡා කර ඇති අතර එහිදී අවශ්‍යතාවය සඳහන් කර ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා නාවික හමුදාපතිවරයාට දැනුම් දී ඇත. ඒ

අනුව අනුරාධපුර සඳහිරු සෑයේ තැන්පත් කිරීමට රන් බුදු පිළිමයක් නිර්මාණය කිරීම සඳහා 2014.10.01 වන දින නාවික හමුදාවෙන් අත්අඩංගුවට ගෙන භාරදී ඇති රත්තරංවලින් රත්තරං කිලෝ 08 ක් ලබාදෙන ලෙසත්, ඒ සඳහා උපදෙස රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලැබුණ බවටත් සඳහන් කරන ලද ලිපිය 2014.10.02 වන දින නාවික හමුදාපතිවරයාගේ අත්සනින් යුතුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කර ඇත.

09.නාවික හමුදාපතිවරයා විසින් රත්තරං කිලෝ 08 ක් ලබා ගැනීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කරන ලද ලිපිය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නාවික හමුදාවට රත්තරං ලබා දීමේ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් තාරක සෙනෙවිරත්න මහතා වෙත යොමු කර ඇත.

10.නාවික හමුදාපතිවරයා විසින් රේගුවෙන් රත්තරං ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ලිපිය අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් තාරක සෙනෙවිරත්න මහතාට ලැබීමෙන් අනතුරුව ඔහු මගේ ගමන් බඩු අංශය භාරව සිටි රේගු අධ්‍යක්ෂ පණ්ඩුල මහතා සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇති අතර එහිදී යම් භාණ්ඩයක් රාජසන්තක කළ පසු අභියාචනා කාලසීමාව තුළදී කවර ආකාර වූ කටයුත්තකට හෝ භාවිතා කිරීමට නොහැකි බැවින් නාවික හමුදාවෙන් අත්අඩංගුවට ගෙන රේගුවට භාර දී තිබූ රත්තරං කිලෝ 45.3 න් රත්තරං කිලෝ 08 ක් නාවික හමුදාවට ලබාදීම සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැඟී ඇත.

11.එබැවින් අත්අඩංගුවට ගෙන රාජසන්තක කොට නියමිත අභියාචනා කාලසීමාව ඉක්මවා ගිය වෙනත් රත්තරං තොගයකින් නාවික හමුදාවේ අවශ්‍යතාව ඉටුකළ හැකි බවට හා එහිදී ක්‍රියා කළයුතු ආකාරය සම්බන්ධයෙන් තාරක සෙනෙවිරත්න මහතා ලිඛිත සටහනක් යොදා

අදහසක් ඉදිරිපත් කර ඇත. එයට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමැතිය ලබාදී ඇත.

12. අතිරේක රේගු අධ්‍යක්ෂ තාරක සෙනෙවිරත්න මහතාගේ නියෝගයෙන් පසු ගමන් බඩු අංශය භාරව සිටි අධ්‍යක්ෂ පණ්ඩුල මහතා ද නිකුත් කිරීමට හැකි රේගු නඩු කටයුතු හා අභියාචනා කාලසීමාවන් අවසන් වී ඇති රත්තුං ග්‍රෑම් 8117.3 ක් ලබා ගත හැකි රන් තොගවල වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර එහිදී රත්රන් ග්‍රෑම් 8117.3 නාවික හමුදාවට මුදා හැරීමට ක්‍රියා කිරීමේදී එම රත්තුංවලට අදාළ වටිනාකම නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන රේගුවට භාරදී ඇති රත්තුංවලින් පියවා ගැනීමට කටයුතු කළයුතු බවට ද, ඒ සම්බන්ධයෙන් නාවික හමුදාවේ කැමැත්ත පළ කරන ලබන ලිඛිත ලියවිල්ලක් ලබාගෙන රත්තුං මුදා හැරීම සිදු කළ යුතු බවට ලිඛිත අදහස් ඉදිරිපත් කිරීමක් සිදු කර ඇති අතර එයට ද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමැතිය ලබාදී ඇත.

13. රේගුවෙන් නාවික හමුදාව ඉල්ලා ඇති රත්තුං ප්‍රමාණය භාර ගැනීමට පැමිණෙන ලෙසට කරන ලද දැනුම්දීම අනුව මෙම රන් තොගය භාර ගැනීම සඳහා නාවික හමුදාපති විසින් පත් කර තිබූ රියර් අද්මිරාල් රොසයිරෝ නැමැති නිලධාරියා ඇතුළු නාවික නිලධාරීන් පිරිසක් කොළඹ වරාය පරිශ්‍රය තුළ පිහිටි රේගු කාර්යාලයට 2014.11.05 වන දින පැමිණ ඇති අතර එහිදී එම කාල වකවානුවේ ගමන් බඩු අංශයේ ප්‍රධාන ගාස්තු නිලධාරියා වශයෙන් සේවය කළ නියෝජ්‍ය අධ්‍යක්ෂ රද්දයිගල ආරච්චිලාගේ ජයන්ත බුද්ධදාස මහතා හමුවී ඇති අතර එහිදී රේගු නිලධාරී බුද්ධදාස මහතා නාවික හමුදා නිලධාරීන්ගෙන් භාරදෙනු ලබන රත්රන්වල වටිනාකම නැවත පියවීමට කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපියක් ලබාදෙන ලෙසට දැනුම්දී ඇත. එම අවස්ථාවේදී එවැනි ලිපියක් රැගෙන නොපැමිණි බවට නාවික හමුදා නිලධාරීන් විසින් බුද්ධදාස මහතාට දැනුම් දී ඇත. එම අවස්ථාවේදී ඒ බව මගී සේවා අධ්‍යක්ෂ පණ්ඩුල මහතාට දැනුම්දී ඇති අතර පණ්ඩුල මහතා විසින් ලිපිය පසුව ලබා

ගැනීමට හැකි බවත් අදාල රත්‍රන් ප්‍රමාණය පැමිණ සිටින නාවික හමුදා නිලධාරීන්ට භාරදීමට කටයුතු කරන ලෙසට ජයන්ත බුද්ධදාස මහතාට දැනුම් දී ඇත. ඒ අනුව ජයන්ත බුද්ධදාස මහතා ඒ පිළිබඳව රත්‍රන් භාරදීමට අදාල ගොනුවේ සටහනක් යොදා රත්‍රන් භාර ගැනීමට පැමිණ සිටි නාවික හමුදා නිලධාරීන්ට රත්‍රන් භාරදෙන ලෙසට රේගු අධිකාරි දොඩන්ගොඩගේ රත්න කුමාර මහතාට උපදෙස් ලබාදී ඇත.

14.නියෝජ්‍ය අධ්‍යක්ෂ බුද්ධදාස මහතාගෙන් ලද නියෝගය පරිදි රේගු අධිකාරී ඩී. රත්න කුමාර මහතා රේගුවේ විකුණුම් අංශයේ ගබඩා කර තිබූ

01.275/V5592/BIA/A/CASE281/2013/BO/60/2014-
02.B298/V5606/BIA/A/CASE41/2014
03.122L/R/5/V3396-

ඉහත අංක සඳහන් ලැයිස්තු තුනකින් ලබාගෙන ඇති රත්‍රන් ග්‍රෑම් 8118.3 ක බරකින් යුත් කැරට් 24 රත්‍රන් බිස්කට් තොගයක් නාවික හමුදාවේ රියර් අද්මිරාල් රොසයිරෝ මහතාට 2014.11.05 වන දින සහකාර රේගු අධිකාරි අලහකෝන් ආරච්චිලාගේ ජීවක රවිනාත් කහවත්ත මහතාගේද සහයෝගය ලබාගෙන ලිඛිතව භාරදීමට කටයුතු කර ඇත.

15.ශ්‍රී ලංකා රේගුවෙන් රත්‍රන් ලබා ගැනීම සඳහාත් රන් සමාධි පිළිමය නිර්මාණය කිරීම සඳහාත්, නාවික හමුදාපතිවරයා විසින් පත්කර තිබූ රියර් අද්මිරාල් එන්. බී. ජේ. රොසයිරෝ, කොමදෝරු යූ. අයි. සේරසිංහ, කමාන්ඩර් එල්. ඒ. ඩී. එස්. අයි. කේ. ප්‍රේමරත්න යන නිලධාරීන් ලබාදී තිබූ නියෝග පරිදි රේගුවෙන් රත්‍රන් ග්‍රෑම් 8118.3 භාරගෙන එම රන් බිස්කට් තොගය යොදාගෙන රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් සම්බන්ධ කරන ලද ජාතික අනුරූ පාසලේ අධ්‍යක්ෂවරයා හා ශිල්පීන් ද ඔවුන්ගේ උප කොන්ත්‍රාත්කරුවන් ද

සමඟින් වැලිසර නාවුක හමුදා කඳවුරේදී රන් පිළිමය නිර්මාණය කිරීමේ කටයුතු 2014.11.07 වන දින ආරම්භ කර ඇත.

16. මෙම දිනවලදී ම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් හා සම්බන්ධීකරණය මත සඳහිරු සෑයේ තැන්පත් කිරීමට රන් බෝ ගසක් නිර්මාණය කිරීම සඳහා රත්රන් ග්‍රෑම් 3500 ක බරකින් යුත් රත්රන් ප්‍රමාණයක් ලංකා බැංකු නිලධාරීන් පිරිසක් විසින් වැලිසර නාවුක හමුදා කඳවුරට රැගෙන විත් එම නිර්මාණය සිදු කරන ලද ස්ථානයේ මෙම කටයුතුවලට සම්බන්ධ වී සිටි ජාතික අනුරු පාසලේ අධ්‍යක්ෂ සරත් කුමාරසිරි යන අයට භාරදීමට කටයුතු කර ඇත. එම රත්රන් ග්‍රෑම් 3500 ක ප්‍රමාණය වැලිසර නාවුක හමුදා කඳවුරේ මෙම නිර්මාණ සිදු කළ වැඩ බිමේ නාවික නිලධාරීන්ගේ ආරක්ෂාව යටතේ තිබී ඇත.

17. 2014.11.07 වන දින වැලිසර නාවික හමුදා කඳවුරේදී රන්මුවා සමාධි පිළිමය රේගුවෙන් ලබාදී තිබූ රන් ග්‍රෑම් 8118.3 ක රන් බිස්කට් තොගය නිස්සාරණය කර පිළිමය වාත්තු කිරීම සිදු කර ඇති අතර එම වාත්තු කිරීම නිසි ආකාරව සිදු නොවූ බැවින් නැවතත් රත්රන් නිස්සාරණය කිරීමට එම රත්රන් නාවික හමුදාවේ නිලධාරීන්ගේ රැකවරණය යටතේ නැවත නාවික හමුදා මූලස්ථානයට රැගෙන ගොස් ඇත.

18. නැවතත් 2014.11.11 වන දින රත්රන් තොගය ද රැගෙන නාවික හමුදා නිලධාරීන් පිරිස වැලිසර නාවික හමුදා කඳවුරට පැමිණ රත්රන් නිස්සාරණය කර දෙවන වරට රන් සමාධි පිළිමය වාත්තු කර ඇත. එම අවස්ථාවේදී පිළිමය වාත්තු කිරීමේදී පිළිමයේ පිටුපස පහළ කොටස රත්රන් ප්‍රමාණය මදි වීම නිසා නිසියාකාරයෙන් වාත්තු වීම සිදුවී නොමැත. එම අවස්ථාවේදී ලංකා බැංකුවෙන් රන් බෝ ගසක් නිර්මාණය කිරීම සඳහා සරත් කුමාරසිරිට ලබා දී තිබූ රත්රන් ග්‍රෑම් 3500 ක ප්‍රමාණයෙන් රත්රන් ප්‍රමාණයක් යොදාගෙන රන් සමාධි පිළිමයේ වාත්තු වී නොතිබූ කොටස වාත්තු කිරීමට කටයුතු කර ඇත. පිළිමය වාත්තු කිරීමෙන් පසු රන් සමාධි පිළිමයේ බර ග්‍රෑම් 9706 කින් සමන්විත වී ඇත.

ඉන්පසු රන් බුදු පිළිමය බැලුම්මහර ප්‍රදේශයේ රත්රන් වැඩ කරනු ලබන ගම්මානයකට ගෙන ගොස් ඔප දැමීමෙන් පසු නාවික හමුදාපතිවරයාගේ කොළඹ කොටුව පිහිටි නිල නිවසට රැගෙන ගොස් ඇති අතර නාවික හමුදා නිලධාරීන් සහ නිර්මාණය සිදු කරන ලද නිර්මාණකරුවන් ද රන් සමාධි පිළිමය නාවික හමුදාපතිවරයාට ඉදිරිපත් කර ඇත. නාවික හමුදාපතිවරයා පිළිමය දැක බලා පිලිවෙත් කිරීමෙන් පසු නැවතත් පිළිමය නාවික හමුදා මූලස්ථානයට රැගෙන ගොස් ආරක්ෂකාරීව තබා ඇත.

19.වැලිසර නාවික හමුදා කඳවුරේදී රන් සමාධි පිළිමය නිර්මාණය කිරීම සිදු කරන ලද දිනවලදීම ලංකා බැංකුවෙන් ලබාදී තිබූ රත්රන් ග්‍රෑම් 3500 ක ප්‍රමාණයෙන් ග්‍රෑම් 1500 ක් යොදා ගෙන රන් බෝධියක් ද ජාතික අනුරූ පාසලේ අධ්‍යක්ෂ සරත් කුමාරසිරි ඇතුළු නිර්මාණකරුවන් විසින් නිර්මාණය කර ඇත. තවද රන් සන්නස් පත්‍රයක් හා රන් නූලක් නිර්මාණය කර ඇත. මෙම නිර්මාණය කිරීම සඳහා ජාතික අනුරූ පාසලේ අධ්‍යක්ෂ සරත් කුමාරසිරි ඇතුළු කණ්ඩායමට අමතරව මෙම නිර්මාණයන් ඉක්මනින් සිදු කර ගැනීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සිදු කරන ලද ටෙන්ඩර් කැඳවීමකින් ටොරීන් චන්ද්‍රසිංහ නැමැති කොන්ත්‍රාත්කරුවා ඔහුගේ උප කොන්ත්‍රාත්කරුවෙකු වන හෙට්ටිආරච්චි හා ඔහුගේ කාර්මික ශිල්පීන් සම්බන්ධ කරගෙන ඇත. මෙම ටෙන්ඩර් කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ නිර්මාණයන් සඳහා ගෙවිය යුතු ටෙන්ඩර් ගත ගිවිසුම් මුදල් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ගෙවීම් කර ඇත.

20.රේගුවෙන් ලබා ගන්නා ලද රත්රන් බිස්කට් තොගය හා ලංකා බැංකුවෙන් ලබාදෙන ලද රන් ප්‍රමාණය නාවික හමුදා නිලධාරීන් විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මඟින් රන් ප්‍රමාණය හා බර පිළිබඳව පරීක්ෂා කිරිම් සිදු කර ඇති අතර නැවත රේගුවට ඉතිරි වී තිබූ රන් ග්‍රෑම් 24.6 ක ප්‍රමාණය භාරදීමට ප්‍රථම පරීක්ෂා කර භාරදීමට ක්‍රියා කර ඇත.

21.මෙම රන් නිර්මාණයන් වැලිසර නාවික හමුදා කඳවුරේ විශේෂ පරිශ්‍රයකදී නාවික හමුදා නිලධාරීන්ගේ පූර්ණ ආරක්ෂාව යටතේ සිදු කර ඇති අතර රන් සමාධි පිළිමය 2014.11.14 වන දින ගුවන් මඟින් නාවික හමුදා නිලධාරීන් විසින් අනුරාධපුරට රැගෙනගොස් සඳහිරු සෑ භූමි පරිශ්‍රයේ විශේෂ මණ්ඩපයක නිදන් වස්තු හා සර්වඥ ධාතූන් සමගින් තැන්පත් කර 2014.11.22 වන දින දක්වා පිරිත් සජ්ජායනය කරමින් මහජන ප්‍රදර්ශනයට මෙම පරිශ්‍රයේ ආරක්ෂාව සැපයීම නාවික හමුදා නිලධාරීන් විසින් සිදු කර ඇත.

(22 සිට 30 දක්වා ඡේද රත්රන් සමාධි පිළිමය නිර්මාණය කිරීම සම්බන්ධයෙන් අදාළ නොවේ. )

31.2014.11.05 වන දින නාවික හමුදා නිලධාරීන් රේගුවෙන් රත්රන් ලබා ගැනීමේ සිට 2014.11.28 වන දින සඳහිරු සෑ ගර්භයේ ධාතු කුටිය තුළ රන් සමාධි පිළිමය තැන්පත් කිරීම දක්වා කාලය තුළදී නිසි ආරක්ෂාව හා අධීක්ෂණය යටතේ රත්රන් යොදවා රන් සමාධි පිළිමය නිර්මාණය කිරීම කොළඹ සිට ආරක්ෂාව සහිතව අනුරාධපුරයට ගුවනින් රැගෙන ගොස් ආරක්ෂාකාරීව මහජන ප්‍රදර්ශනයට තබා අවසානයේදී සඳහිරු සෑ ගර්භයේ තැන්පත් කිරීමේ කටයුතු සිදු කර ඇත.

32.තවද රේගුවෙන් ලබා ගන්නා ලද රත්රන් ග්‍රෑම් 8118.3 ක මුළු රත්රන් ප්‍රමාණයම නාවික හමුදාව විසින් රන් සමාධි පිළිමය නිර්මාණය කිරීමේ කටයුත්තට යොදා ගෙන ඇති අතර වෙනත් කිසිදු නීති විරෝධී කාර්යයකට යොදවා ගැනීමක් සිදු කර නැත.

33.සඳහිරු සෑය ඉදිකිරීම හා නිදන් වස්තුවක් වශයෙන් රන් සමාධි පිළිමයක් සෑය තුළ තැන්පත් කිරීම ඇතුළු කටයුතු තිස් වසරක් පුරා පැවති යුද්ධය ජයග්‍රහනය කිරීම සඳහා රජය විසින් වී තිබූ භාරයක් ඔප්පු කිරීම වෙනුවෙන් හා යුධ ජයග්‍රනය සිහිවීම පිණිස විවිධ බුද්ධිමතුන් ප්‍රභූන් හා

මහා සංසරත්නයෙන් ලද යෝජනා මුල් කර ගනිමින් ජනාධිපතිතුමා අගමැතිතුමා උසස් රාජ්‍ය නිලධාරීන් ත්‍රිවිධ හමුදාපතිවරුන් ආරක්ෂක මණ්ඩල ප්‍රධානීන් පොලිස්පතිතුමා ඇතුළු පුද්ගලයින්ගෙන් සැදුම්ලත් ආරක්ෂක මණ්ඩලයේදී ලබාගත් තීරණයන් ට අනුව රජය විසින් සිදු කළයුතු ක්‍රියාවක් සේ සලකා සිදු කර ඇත.

34.රත්රන් ග්‍රෑම් 8118.3 ක් රේගුව මඟින් නාවික හමුදාවට භාරදීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අදාළ රේගු නිලධාරීන්ගෙන් ප්‍රකාශ සටහන් කළ අතර මෙම රත්රන් නාවික හමුදාවට ලබාදීම රේගු ආඥා පනතට පටහැනි ක්‍රියාවක් බවට විමර්ශනයේදී අනාවරණය නොවීය. රේගු ආඥා පනතේ 162 වගන්ති ප්‍රකාරව රේගුව මඟින් රාජසන්තක කරන ලද භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධයෙන් බලතල රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බවට දක්වා ඇත.

<u>නිරීක්ෂණය</u>

2010 වර්ෂයේදී හිටපු ජනාධිපතිවරයාගේ ප්‍රදානත්වයෙන් යුතු ආරක්ෂක මණ්ඩලය ගෙන තිබූ තීරණයක් අනුව සඳහිරු සෑයේ ඉදිකිරීම් සිදු කළ බවට හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග යන අයගේ ප්‍රකාශ මඟින් අනාවරණය වේ. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රකාශ ගොනුවේ පිටු අංක 204-206 දක්වා ද ලලිත් වීරතුංග මහතාගේ ප්‍රකාශය 214-217 දක්වා ද ඇතුළත් කර ඇත.

2014 වර්ෂයේ මැද භාගයේදී සඳහිරු සෑයේ ඉදිකිරීම් නිදන් වස්තු හා සර්වඥ ධාතූන් තැන්පත් කිරීමේ අදියරට පැමිණ තිබී ඇති අවස්ථාවේදි හිටපු ජනාධිපතිවරයාගේ ප්‍රදානත්වයෙන් යුතු ආරක්ෂක මණ්ඩලය සඳහිරු සෑයේ රන් සමාධි පිළිමයක් නිදන් වස්තුවක් වශයෙන්

තැන්පත් කිරීමටත් එම රන් පිළිමය නිර්මාණය කිරීමට අවශ්‍ය රත්රන් ශ්‍රී ලංකා රේගුවෙන් ලබා ගැනීමටත් ගෙන තිබූ තීරණයක් අනුව 2014.10.01 වන දින නාවික හමුදාව මඟින් අත්අඩංගුවට ගෙන රේගුවට භාර දීමෙන් පසු රාජසන්තක කර ඇති රත්රන් කිලෝ 45.3 න් රත්රන් කිලෝ 8 ක් ලබා ගැනීමට එවකට සිටි නාවික හමුදාපතිවරයා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලීමක් කර ඇත.

නාවික හමුදාවෙන් භාර දීමෙන් පසු රාජසන්තක කර තිබූ රත්රන් කිලෝ 45.3 රන් තොගය අභියාචනා කාල සීමාව තුළ පැවතීම නිසා එම රන් තොගයෙන් රත්රන් කිලෝ 8 ක් නාවික හමුදාවට ලබාදීමට නොහැක වී ඇත.

නමුත් ඉහත ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව අවශ්‍ය කරනු ලැබූ රත්රන් කිලෝ 8 ලබාදීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හා ජ්‍යෙෂ්ඨ රේගු නිලධාරීන් සාකච්ඡා කර රේගුව සන්තකයේ තිබී ඇති අභියාචනා කාලසීමාවන් ඉක්මවා ඇති වෙනත් රන් තොගයකින් රත්රන් ග්‍රෑම් 8118.3 ක් මුදා හැරීමට කටයුතු කර ඇත.

සිදු කරන ලද විමර්ශනයේදීත් රජයේ මූලිකත්වයෙන් සිදු කරන ලද ක්‍රියාවක් සඳහා රේගුවෙන් රත්රන් ග්‍රෑම් 8118.3 ක් බැහැර කිරීම මඟින් රජයට කිසිදු පාඩුවක් සිදු වී නොමැති බවට හිටපු මුදල් අමාත්‍යාංශ ලේකම් පී.බී ජයසුන්දර මහතාගේ ප්‍රකාශයෙන් අනාවරණය වී ඇත. (පී.බී. ජයසුන්දර මහතාගේ ප්‍රකාශය ගොනුවෙහි පිටු අංක 210-213 ට ඇතුළත් කර ඇත.)

මෙම රන් ග්‍රෑම් 8118.3 ප්‍රමාණය රේගුවෙන් බැහැර කිරීමේදී රේගු ආඥා පනතට පටහැනිව ක්‍රියා කර ඇත්දැයි අනාවරණය කර ගැනීම

සඳහා නීතිවේදී පී. සමන් ද සිල්වා යන අයගේ ප්‍රකාශය සටහන් කළ අතර එහිදී අනාවරණය වූයේ රේගු ආඥා පනතේ 162 වන වගන්තිය හා දෙවන වගන්තිය අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට රාජසන්තක කර රේගුව භාරයේ ඇති භාණ්ඩයක් සම්බන්ධයෙන් බැහැර කිරීමේ පූර්ණ බලතල ඇති බව ඒ අනුව මෙම රත්රන් ප්‍රමාණය රේගු ආඥා පනතට අදාළව බැහැර කර ඇති බවටත් අනාවරණය විය. (රේගු අධ්‍යක්ෂ නීතිවේදී පී. සමන් ද සිල්වා ගේ ප්‍රකාශය ගොනුවේ පිටු අංක 218-220 ට ඇතුළත් කර ඇත. )

2014.11.05 වන දින රේගුවෙන් නාවුක හමුදාවට නිකුත් කරන ලද රත්රන් ග්‍රෑම් 8118.3 ක මුළු රන් ප්‍රමාණයම යොදා ගෙන රන් පිළිමය නාවික හමුදාවේ පූර්ණ අධීක්ෂණය හා ආරක්ෂාව යටතේ නිර්මාණය කර ගුවන් මඟින් අනුරාධපුරයට වැඩමවා ආරක්ෂාකාරීව මහජන ප්‍රදර්ශනයට තබා 2014.11.23 වන දින සඳහිරු සෑ ගර්භයේ විශේෂ ධාතු කුටියේ තැන්පත් කිරීමට කටයුතු කර ඇති බවටත්, රේගුවෙන් නාවික හමුදාවට නිකුත් කරන ලද රත්රන් ග්‍රෑම් 8118.3 ප්‍රමාණයෙන් කිසිදු රන් ප්‍රමාණයක් වංචනික ලෙස වෙනත් අයෙකු ලබා ගැනීමක් සිදු වී නොමැති බවට ද රත්රන් භාර ගැනීම හා නිකුත් කිරීම සිදු කළ නිලධාරීන්ගෙන් හා ආරක්ෂාවට යොදවා සිටි ආරක්ෂක නිලධාරීන්ගෙන් ද රන් පිළිමය නිර්මාණය කළ නිර්මාණකරුවන්ගෙන් ලබාගත් ප්‍රකාශවලින් හා සී.සී.ටී.වී. දර්ශන මඟින් නිරීක්ෂණය වේ.

පැමිණිල් මඟින් ඉදිරිපත් කර ඇති කරුණුවලට අදාළව සිදු කරන ලද විමර්ශනයේදී සෘජුව අපරාධමට චෝදනාවක් අනාවරණය නොවන අතර රේගු ආඥා පනතට අනුව හෝ වෙනත් යම් පනතකට අනුව හෝ ලංකා දණ්ඩ නීති සංග්‍රහයට අනුව යම් වරදක් සිදු වී ඇත්ද යන බවටත්

ඒ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි නීතිමය උපදෙස් පතා උදෘත ගොනු කාරුණිකව ඉදිරිපත් කරමි.

| | |
|---|---|
| (අත්සන) | (අත්සන) |
| විමර්ශන නිලධාරී | ස්ථානාධිපති |
| උ.පො.ප. ධම්මික ද සිල්වා | ඒකක 08. |
| | ඒ.එල්.බී.සංජීව ප්‍රනාන්දු (පො.ප), |
| | ස්ථානාධිපති (ඒකක අංක 08), |
| | මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය, |
| | අංක 54, වැතම් වීදිය,කොළඹ 01. |

යථෝක්ත පරීක්ෂණ වාර්තාව නිරීක්ෂණය කිරීමේදී මෙම පරීක්ෂණය පුළුල්ව සහ අපක්ෂපාතීව පවත්වනු ලැබ ඇති බවට වූ නිගමනයට එළඹිය හැකි වන අතර එබැවින් ඒ පිළිබඳව වැඩිදුර ක්‍රියා කිරීමක් සිදු කර නොමැති බව ද පෙනී යයි. 2019 වර්ෂයේ අවසාන භාගයේදී මෙම ගොනුව නැවත මතු කර ගනු ලැබ ඇත්තේ විජේවීර මහතා සහ තාරක සෙනෙවිරත්න මහතා ප්‍රකාශ කර සිටින ලද අරමුණින් ය යන කරුණ බැහැර කළ නොහැකිය.

නාවික හමුදාව විසින් රේගුවෙන් රත්රන් භාර ගැනීමත් රන්මුවා සමාධි පිළිමය සඳහිරු සෑ ධාතු ගර්භයේ තැන්පත් කිරීමත් අතර කිසිදු අක්‍රමිකතාවයක් සිදුව නොමැති බව ඒ සම්බන්ධයෙන් පවත්වනු ලැබූ පුළුල් පරීක්ෂණය තුළ නිශ්චිත ලෙස හෙළිදරවු වී ඇති බැවින් තුසිත මුදලිගේ හට අත පෙවීමට ඉතිරිව පැවති එකම අවකාශය වනු ලැබ ඇත්තේ රේගු නිලධාරීන් විසින් නාවුක හමුදාව වෙත රත්රන්

බැහැර කරනු ලැබීමේ ක්‍රියාදාමයයි. රේගුව විසින් රාජසන්තක කරන ලද භාණ්ඩ බැහැර කිරීමට නීතියෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හට සලසා දී ඇති බලය පිළිබඳව නිගමනයකට එළඹීමට ඊට අදාළ නීතිය අධ්‍යයනය කරනු වෙනුවට තුසිත් මුදලිගේ ප්‍රමුඛ විමර්ශක පිරිස නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ දොන් පීටර් මල්ෂි ගුණවර්ධන ගේ මතය විමසීමට කටයුතු කරනු ලැබ ඇත. ඒ අනුව රේගුව විසින් රාජසන්තක කරන භාණ්ඩ බැහැර කිරීමේදී වෙන්දේසි කිරීම හැර විකල්පයක් නැතැයි යන මතයට එළඹෙමින් මුළුමනින් ම රාජ්‍ය කටයුත්තක් සඳහා යොදා ගැනීම පිණිස රාජසන්තක කර තිබූ රත්රන් ප්‍රමාණයක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නාවික හමුදාව වෙත බැහැර කිරීම සාපරාධී විශ්වාසය කඩ කිරීමක් ලෙස අර්ථ නිරූපණය කරනු ලැබීමට ද එම කටයුත්ත උදෙසා නිරීක්ෂණ සහ නිගමන හුවමාරු කර ගැනීම කුමන්ත්‍රණයක් ලෙසට ද අර්ථ නිරූපණය කිරීමට මෙම නිරීක්ෂකයින් කටයුතු කර ඇත.

යහපාලන රජයේ ප්‍රබල අමාත්‍යවරයෙකුව සිටි රාජිත සේනාරත්න මහතා ප්‍රවෘත්ති සාකච්ඡා කිහිපයකදී සඳහිරු සෑයේ රත්රන් පිළිබඳව විවේචනාත්මකව අදහස් පළ කරනු ලැබ ඇති බවට සාධක දක්වමින් විජේවීර මහතා සහ තාරක සෙනෙවිරත්න මහතා කියා සිටින ලද්දේ දේශපාලන පළිගැනීමේ ද්වේශයෙන් යුක්තව කටයුතු කරනු ලැබූ බවය. එම රජයේ මන්ත්‍රීවරයෙකුව සිටි හේෂා විතානගේ මහතා ගෝඨාභය රාජපක්ෂ ට ජම්පරය අන්දවන බව මැතිවරණ වේදිකාවක කරන ලද ප්‍රකාශය ඇතුළත් පුවත්පත් වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. විජේවීර මහතා සහ තාරක සෙනෙවිරත්න මහතා අත්අඩංගුවට ගැනීම පිළිබඳව සහ රක්ෂණ සිරභාරයට පත් කිරීම

පිළිබඳව ජනමාධ්‍යයන්හි මහත් ප්‍රචාරයක් ලබාදී ඇති අතර ඔවුන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ද ඉමහත් අපහසුතාවයකට පත්වනු ලැබ තිබේ.

ඉහත සඳහන් කරන ලද පරිද්දෙන් මෙම විශ්‍රාමික නිලධාරීන් දෙදෙනා පළිගැනීමට ලක් කිරීම සඳහා උපයෝගී කර ගන්නා ලද රේගු ආඥා පනතේ 162 වගන්තියට ලබාදී ඇති පටු අර්ථ නිරූපණය හුදෙක් මෙම නඩු කටයුත්ත සඳහා ඇති කර ගන්නා ලද සාවද්‍ය නිගමනයක් ය යන තීරණයට මෙම කොමිෂන් සභාව එළඹී ඇත. රේගු ආඥා පනතේ 162 වගන්තිය අර්ථ දැක්විය යුතු වන්නේ අකුරුතා රීතිය මත වන පටු අදහසකින් නොව වඩාත් ඵලදායි ලෙස කටයුතු කරනු ලැබිය හැකි අර්ථ නිරූපණයක් ලබාදිය හැකි වන ස්වර්ණමය රීතියට අනුවය යන අදහස හා සමඟ මෙම කොමිෂන් සභාව එකඟවනු ලබයි. එබැවින් ඒ බැව් දැන සිටිමින් ම යහපාලන රජයේ දේශපාලන පළිගැනීමේ ක්‍රියාදාමයේ එක් අවස්ථාවක් ලෙස මෙම විශ්‍රාමික නිලධාරීන් දෙදෙනා ට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීම සිදු කරනු ලැබ ඇති බවත් ඒ මත ඔවුන් අත්අඩංගුවට ගෙන රක්ෂණ සිරභාරයට පත් කිරීම සිදු කරනු ලැබ ඇති බවත් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතියට අනුව අනුස්මරණ කටයුත්තක් උදෙසා සඳහිරු සෑය නමින් වූ චෛත්‍යයක් අනුරාධපුර පූජා භූමියේ ඉදිකරනු ලැබීම රජයේ කටයුත්තක් ලෙස සැලකිය යුතු වූ බව ද එම චෛත්‍යයහි නිදන් කිරීම සඳහා රන් මුවා සමාධි පිළිමයක් නිර්මාණය කිරීම එකී කටයුත්තේ කොටසක් ලෙස සැලකිය යුතු බවද නිරීක්ෂණය කරන මෙම කොමිෂන් සභාව රේගුව සතුව පැවති රාජසන්තක කරන ලද රත්රන් ප්‍රමාණයක් මෙම කාර්යය වෙනුවෙන්

ලබාදීමේදී අනුගමනය කරනු ලැබ ඇති ක්‍රියා පටිපාටිය නිවැරදි වූවක් බවත් වැඩිදුරටත් නිරීක්ෂණය කරනු ලබයි.

මෙම විශ්‍රාමික නිලධාරීන් දෙදෙනා මෙලෙස දේශපාලන පළිගැනීමට ලක් කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් වශයෙන්

01. පො.ප. ධම්මික ද සිල්වා
02. පො.සැ. 9422 ජගත්
03. පො.සැ.43508 ඩෙන්සිල්
04. හිටපු අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න
05. පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ

යන තැනැත්තන් නම් කරන ලදුව පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ නොතීසි නිකුත් කරනු ලැබූ අතර 1 සිට 4 දක්වා වගඋත්තරකරුවන් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලදි. පස්වන වගඋත්තරකරු නීතිඥවරයෙකු මඟින් නියෝජනය කරනු ලැබිණි. මෙම වගඋත්තරකරුවන් අතරින් 1 සහ 3 වගඋත්තරකරුවන් කොළඹදී සහ බදුල්ලේදී තාරක සෙනෙවිරත්න මහතාගෙන් ප්‍රකාශ සටහන් කරගනු ලැබීමේදී ගෝඨාභය රාජපක්ෂ මහතා කියූ නිසා නේද මේ රත්රන් දුන්නේ යැයි විමසනු ලැබූ අතර කොලඹදී ලබාදුන් ප්‍රකාශය ප්‍රමාණවත් නොමැති යැයි පවසා බදුල්ල මහ රෝහලට පැමිණ ප්‍රකාශයක් සටහන් කරනු ලැබූයේ ඉහතකී යෝජනාවට ඔව් යන පිළිතුර ලබා ගැනීම සඳහා බැව් තාරක සෙනෙවිරත්න මහතා තේරුම් ගනු ලැබ තිබිණි. හතරවන වගඋත්තරකරු වරින්වර ප්‍රවෘත්ති සාකච්ඡාවනට සහභාගී වෙමින් මෙම විශ්‍රාමික නිලධාරීන් දෙදෙනා විසින් සිදු කරන ලද රාජකාරි කටයුත්ත බරපතල අපරාධයක්

වශයෙන් හුවා දක්වමින් ජන සමාජයට වැරදි අදහසක් ඒත්තු ගැන්වීමට ක්‍රියා කරනු ලැබීමේ හේතුව මත ඔහු වගඋත්තරකරුවකු වශයෙන් නම් කර තිබිණි. ජනාධිපති අපේක්ෂකයෙක් වශයෙන් නම් කරනු ලැබ සිටි ගෝඨාභය රාජපක්ෂ මහතාට සාපරාධී වගකීමක් පැවරීමට සඳහිරු සෑයේ රත්රන් බුදු පිළිමයක් තැන්පත් කිරීමේ කටයුත්ත යොදා ගැනීමට යහපාලන රජයේ දේශපාලඥයන් උත්සාහ කරමින් සිටින අතරතුර මහජන රැළියක් අමතමින් පස්වන වගඋත්තරකරු ගෝඨාභය රාජපක්ෂට ජම්පර් අන්දවන බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරමින් ගෝඨාභය රාජපක්ෂ මහතා පිළිබඳව වැරදි අදහසක් මහජනයාට ඒත්තු ගන්වමින් එමඟින් මෙම විශ්‍රාමික නිලධාරීන් දෙදෙනා කෙරෙහි ද එම සදෝෂත්වභාවය ආරෝපණය කිරීමට කටයුතු කෙරෙන ලදැයි යන හේතුව මත පස්වන වගඋත්තරකරු කැඳවීමට යෙදෙනි.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 22 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2020. 11. 24

2020/11/24

# 9 .LV

පැමිණිලි අංකය - 414/2020

පැමිණිලිකරු - පියදාස කුඩාබාලගේ

ලිපිනය - නො.08, රොඩ්‍රිගෝ මාවත,
ගල්පොත්ත පාර, නාවල.

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්ව, වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. එනම්;

1. මංගල සමරවීර
2. පාඨලී චම්පික රණවක
3. රවුෆ් හකීම්
4. සරත් ෆොන්සේකා
5. ආර්. සම්බන්ධන්
6. එම්.ඒ. සුමන්තිරන්
7. අනුර කුමාර දිසානායක
8. ජේ.සී. වැලිඅමුණ
9. ජයම්පති වික්‍රමරත්න
10. මලික් සමරවික්‍රම
11. ආනන්ද විජේපාල (දූෂණ විරෝධී කමිටු ලේකම්)

12. තුසිත මුදලිගේ (නීති උපදේශක)

## තීරණය

1. වගඋත්තරකරුවන් 1 සිට 12 දක්වා 2015.01.21 වෙනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් සන්දේශයට කැබිනට් අනුමැතිය ලැබීමෙන් පිහිටුවන ලද නීත්‍යානුකූල පදනමක් නොමැති දූෂණ විරෝධී කමිටුවේ සමාජිකයින්ව සිටි, එම කමිටුවේ කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාකාරකම් එම කමිටුවේ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල මගින් පදනම් රහිත අසත්‍ය පැමිණිලි පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයට යොමු කොට, පැමිණිලිකරුට විරුද්ධව අසත්‍ය සාක්ෂි නිර්මාණය කර පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් හා බස්නාහිර පළාතේ පළාත්බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයට පැමිණිලිකරුට විරුද්ධව අධි චෝදනා ඉදිරිපත් කිරීමට කුමන්ත්‍රණය කිරීම හා අනුබලදීම කළ බවට ප්‍රබල සාක්ෂි මගින් තහවුරු වී ඇති බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂි හා සියලු ලේඛන පරීක්ෂාවට ලක් කිරීමෙන් පැමිණිලිකරු පදනම් රහිතව ගුවන් ගමන් තහනම් කිරීමට ලක් කිරීමෙන් රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් බස්නාහිර පළාත් බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ අධි චෝදනා ඉදිරිපත් කිරීමෙන් පැමිණිලිකරු දැඩි අසාධාරණයකට හා අයුතු සහගත සහ ද්වේෂ සහගත දේශපාලන හා පළිගැනීමකට ලක් වීම නිසා සහන ලැබීමට සුදුසු බව මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. 1 සිට 12 දක්වා වගඋත්තරකරුවන් අසත්‍ය පැමිණිලි විමර්ශනයකට භාජනය කර නීති කාර්යයක සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කිරීමේ අදහසින් ක්‍රියා කිරීම හේතුවෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 190 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි නිර්මාණය කිරීමේ වරද කර ඇති බවත්.

2. එමෙන්ම ඉහත සඳහන් වගඋත්තරකරුවන් ඉහත වරද සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බවය.

3. එසේම වගඋත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක චෝදනා පත්‍ර ගොණු කිරීම සඳහා සාක්ෂි සහ ලේඛන ලිපි ගොණුව නීතිපතිවරයා වෙත යැවීමට කොමිෂන් සභාව තීරණය කරයි.

4. පැමිණිලිකරු වෘත්තියෙන් ගණකාධිකාරිවරයෙක් වන අතර, දේශීය හා විදේශීය කළමනාකරණ හා ආර්ථික උපදේශකවරයෙකු වශයෙන් ක්‍රියාකර 2010 වර්ෂයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපතිගේ ඇරයුමක් මත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරුවෙකු වශයෙන් සේවයට අනුයුක්ත වී ඔහුගේ තිබුණු විශේෂඥ දැනුම මත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රතිව්‍යුහගත කර, රටේ ආර්ථිකයට වැඩදායී ආයතනයක් බවට පත්කිරීමේ ගෞරවය ඔහුට හිමිවිය යුතුය. කෙසේ වුවද දූෂණ

විරෝධි කමිටුවේ ක්‍රියා කලාපයත්, මූල්‍ය අපරාධ අංශය පිහිටුවීම හේතුවෙන් දැඩි දේශපාලන පළිගැනීමකට ලක් විය. අධිකරණ කටයුත්තකට මුහුණ දීම සඳහා පෞද්ගලික මුදලක්ද වැය වී ඇති බැව් සාක්ෂිවලින් හෙළිවේ. ඔහුගේ සාක්ෂියේදී රක්ෂණාවරණ 2ක් සම්බන්ධයෙන් ගැටලු පැන නැගී ඇති බැව් පෙනී යන අතර, ඒ සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමට කමිටුවක් පත්කර ඇතිබව වර්තමාන සභාපති ජගත් වැල්ලවත්ත මහතා කොමිසමට ප්‍රකාශ කර ඇත. මෙහෙයින් පැමිණිලිකරුගේ සේවයේ ඇගයීමක් ලෙසට කළමණාකාර උපදේශකවරයෙකු වශයෙන් දේශීය හෝ විදේශීය තනතුරකට පත්කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

5. දූෂණ විරෝධි කමිටුවේ සමාජිකයින් වන වගඋත්තරකරුවන් විසින් සකස් කළ එම කමිටුවේ අරමුණ හා කාර්යභාරය, කෙටි කාලීන වැඩ සටහන් හා දිගු කාලීන වැඩ මගින් කමිටුව විසින් ගතයුතු සහ ගෙන ඇති ක්‍රියාමාර්ගයන් පැහැදිළිව 2015ට පෙර රජයේ සිටි දේශපාලනඥයින්, නිලතල දැරූ රාජ්‍ය හා සංස්ථාවල නිළධාරීන් හමුදා සහ පොලිස් සේවයේ සමාජිකයින් ඉලක්ක කර අධිකරණ ක්‍රියාවලිය තුළින් හා වෙනත් ක්‍රියාමාර්ග උපයෝගි කර ගනිමින් අයුතු සහගත ද්වේශ සහගත සහ අසාධාරණ ලෙස ඉලක්ක කර ඇති කණ්ඩායමක් අධිකරණ ක්‍රියාවලියක් තුළින් දේශපාලන පළිගැනීමට ලක් කර ඇති නිසා ඊට ආධාර උපකාර කළ හා ක්‍රියාකාරී වූ අය සම්බන්ධයෙන් සොයා බැලීම 1978 අංක 7 දරණ පණත යටතේ විශේෂ ජනාධිපති කොමිසමක් පත්කර වැරදිකරුවන් වූ අයගේ

දේශපාලන අයිතිවාසිකම් අවුරුදු 7කට අහිමි කිරීමට හා වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

2014 පෙබරවාරි මාසයේ 11 වෙනි දින හෝ ඊට ආසන්න දිනක කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී වූ පියදාස කුඩාබාලගේ යටතේ තිබූ ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම විසින් කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම වෙත යවන ලද රු.මිලියන 500/-ක මුදලක් වංක ලෙස හැලන්කෝර් හෝටල් සහ ස්පා පුද්ගලික සමාගමේ ලංකා බැංකුවේ ආයතන ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක 72783012 දරන ගිණුමට පියදාස කුඩාබාලගේ මහතා විසින් බැර කිරීමට ක්‍රියා කළ නිසා එම මුදල වංක ලෙස සාපරාධී විශ්වාසය කඩකිරීමේ වරද සම්බන්ධයෙන් 2018 මාර්තු මාසයේ දිනක පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් අත්අඩංගුවට ගෙන විමර්ශන කිරීමෙන් පසුව නීතිපති උපදෙස් ලබා බස්නාහිර පළාත් ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ කිසිදු පදනමක් නොමැතිව දේශපාලන පළිගැනීමේ අරමුණින් අංක HC/PTB/1/01/2018 යටතේ නඩු පැවරීම.

ඉහත දක්වා ඇති පැමිණිලිකරු, 2015 ජනවාරි මස 8වෙනි දින බලයට පත් වූ රජයේ අගමැති වූ රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සන්දේශයට කැබිනට් මණ්ඩලයෙන් ලැබුණු අනුමැතිය මත පිහිටුවන ලද දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලය මගින් එවන ලද පැමිණිල්ලක් මුල් කරගෙන ලිට්‍රෝ ගෑස් සමාගම යටතේ තිබූ කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ

කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස ක්‍රියා කළ පියදාස කුඩාබාලගේ (පැමිණිලිකරු) විසින් හෙලන්කෝ හෝටල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමේ ලංකා බැංකුවේ ආයතන ශාඛාවේ පවත්වාගෙන යන 72783012 දරන ගිණුමට රු.මිලියන 500ක් වංචනික ලෙස බැර කිරීමට කටයුතු කර සාපරාධී ලෙස විශ්වාසය කඩ කළ බවට දූෂණ විරෝධී කමිටුවෙන් ලැබුණු පැමිණිල්ල මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සැලසුම් කරන ලද අධිකරණ ක්‍රියාවලියක් සඳහා අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කොට පසුව ඇප මත මුදාහැර ඇති අතර, පැමිණිලිකරුට මුහුණදීමට සිදු වූ මෙම හිංසාකාරී තත්ත්වය දේශපාලන පළිගැනීමක් මත සිදු කරන ලද බවට පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති හෙයින් එලෙස ඉදිරිපත් කරනු ලැබූ පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් විමර්ශනයක් ආරම්භ කළ අතර, එම විමර්ශන වාර්තාව පහත ඉදිරිපත් කර ඇත.

2015 ජනවාරි මස සහ අගෝස්තු මස පැවැත්වූ ජනාධිපතිවරණය සහ මහමැතිවරණයට පෙර නිලයන් දැරූ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සංස්ථාවල, ත්‍රිවිධ හමුදාවන්හි මෙන්ම පොලිස් සේවයේ සමාජිකයින් 2015 ජනවාරි මස 8වෙනි දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාලසීමාව තුළදී දේශපාලනමය වශයෙන් පළිගැනීමකට ලක්වූ සාමාජිකයිනට සිදු වූ හිංසාකාරී, අගතිගාමී තත්ත්වය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා මෙම කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි.

2015 වර්ෂයේ පැවැත්වූ ජනාධිපතිවරණයට සහ පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රචාරණ කාලය තුළදී පසුගිය රජය පැවති විට විශාල පරිමාණයෙන් කරන ලද දූෂණවලට වගකිවයුතු අයට දඬුවම් දෙන බවට ජනතාවට එක්සත් ජාතික පෙරමුණ පොරොන්දුවක් දුන් හෙයින්, ඒ සඳහා අවශ්‍ය කරන විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීමට අගමැති රනිල් වික්‍රමසිංහ විසින් 2015.01.21 වෙනි දින කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කර එයට කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. එම කැබිනට් සන්දේශය මගින් යෝජනා කරනු ලබන ඒකකය විසින් සියලු දූෂණ චෝදනා විමර්ශනය කොට එම විමර්ශනයේ ප්‍රතිඵල මත අදාළ බලධාරීනට ඉදිරිපත් කිරීමට මේ පිහිටුවන ලද ආයතනය ක්‍රියාකළ යුතු විය. මෙම කර්තව්‍යය, පිහිටුවන ලද දූෂණ විරෝධී කමිටුව මගින් අධීක්ෂණය කළයුතු බව කැබිනට් සන්දේශයේ දක්වා ඇත. (2016/20 පැමිණිලිකරුවන කේ.කේ.එල්. බණ්ඩාර විසින් 2020.10.08 වෙනි දින හා ඊට පසු දිනවල සාක්ෂි දීමේදී සලකුණු කරන ලද පැ.39 අදාළ කරගන්නා ලදි.)

මෙම දූෂණ විරෝධී කමිටුවට කාර්යක්ෂමව ක්‍රියාකිරීම සඳහා අනුකමිටුවක්ද, ක්ෂණික ප්‍රතිචාර කමිටුවක්ද, ස්ථාපනය කරන ලද අතර, කෙටිකාලීන වැඩ සටහන් යටතේ මහා පරිමාණ දූෂකයින් සහ ජාවාරම්කරුවන් ලෙස සැක කෙරෙන පුද්ගලයන්ගෙන් අවම වශයෙන් 15 දෙනෙකුගේ දූෂණ වංචා වත්කම් බැරකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අනෙකුත් කාර්යයන් අතර එහි එක් වැදගත් කාර්යය විය. තවද මූල්‍යමය අපරාධ විමර්ශනය සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීම අනුමත කළ අතර, 2015.01.12 වෙනි දින කැබිනට් තීරණය පරිදි ප්‍රසිද්ධියට පත්කළ

2015.02.13 වෙනි දිනැති අංක 1901/2015 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ස්ථාපිත කරන ලදි. (පැමිණිලි අංක 205/20 පැමිණිල්ලේදී පැ.ii ලේඛනයෙන් ලබාගත් තොරතුරු)

මේ අනුව කැබිනට් මණ්ඩලය මගින් ස්ථාපනය කරන ලද දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල විසින් මූල්‍ය අපරාධ කොට්ඨාසයට එවන ලද පැමිණිල්ලක් පදනම් කරගෙන මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් පැමිණිලිකරු පියදාස කුඩාබාලගේට විරුද්ධව විමර්ශන ආරම්භ කර ඇත. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් පියදාස කුඩාබාලගේ මහතා අනුයුක්තව සේවය කළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ කැන්විල්  හෝල්ඩින්ස් පුද්ගලික සමාගම ඇතුළු ඊට අනුබද්ධිත සමාගම්වල මූල්‍ය කටයුතු විමර්ශනය කොට දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) 102 සහ 388 වගන්ති සමග කියවිය යුතු සංශෝධිත 1982 අංක 12 දරණ පොදු දේපල පණතේ 5(1) වගන්තිය යටතේ නීතිපති මාර්ගයෙන් බස්නාහිර පළාත්බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ අධි චෝදනා ගොනු කර ඇත.

2020.02.18වෙනි දින පැමිණිලිකරුවන කුඩාබාලගේ මහතා කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර, පසුව කොමිෂන් සභාවේ කැඳවීමක් මත එහි පොලිස් ඒකකයටද ප්‍රකාශයක් දී ඇත. ඔහු වෘත්තීය වශයෙන් ගණකාධිකාරිවරයෙකු වන අතර, පාඨමාලා රැසක් අධ්‍යයනය කර ඇත. ශ්‍රී ලංකා කළමනාකරණ ගණකාධිකාරි ආයතනයක අධි සාමාජිකත්වය ලබාගෙන ඇති අතර, ඕස්ට්‍රේලියාවෙන් සහ එංගලන්තයෙන් පශ්චාත් උපාධි පාඨමාලා හදාරා පශ්චාත් උපාධිලාභියෙකු වන අතර, විදේශීය රටවල මෙන්ම

මෙරටේද කළමනාකරණ උපදේශකවරයෙක් වන අතර, වෘත්තියෙන් ගණකාධිකාරීවරයෙකි.

2010 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් එම ආයතනය ප්‍රතිව්‍යුහගතකර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලික අංශය සමග තරඟ කළ හැකි ආයතනයක් බවට පත්කිරීමට පියදාස කුඩාබාලගේ මහතාට ආරාධනාවක් ලැබී ඇත. මේ අනුව 2010 මැයි මස 17 වෙනි දින ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු බවට පත්වීමේ ලිපියක් ලැබී ඇති අතර, ("පැ.1" ලෙස සලකුණු කර ඇත.) 2010.05.17 වෙනි දින සිට රාජකාරි කටයුතු භාර ගෙන ඇත.

2010.05.17 වෙනි දින සිට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මූල්‍ය ශක්තිය දියුණු කිරීම සහ ලාභදායීත්වය දියුණු කිරීම සඳහා කටයුතු කර ඇත. මෙහිදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මූලිකත්වයෙන් "ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම" සහ සේවක අර්ථසාධක අරමුදලෙන් ලැබුණු ප්‍රාග්ධනයෙන් "සිනෝ ලංකා හෝටල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම " 2011.12.21 වෙනි දින ස්ථාපනය කරන ලද අතර, මීට සමගාමීව "කැන්විල් හෝල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ්" නමින් සමාගමක් 2011.12.22 වෙනි දිනද, එසේම 2011.12.21 වෙනි දින "හෙලෙන්කෝ හෝටල් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ්" නමින් පුද්ගලික සමාගම ලියාපදිංචි කළ අතර, මේ සමාගම් සියල්ලේම මෙම පැමිණිලිකරු අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කර ඇත. එසේම රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව කොටස් වෙළඳපොළේ ආයෝජනය කිරීමෙන් 2010 වර්ෂයේදී බිලියන 15ක ලාභයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ලැබී ඇත. මෙම ආදායම, 2009 වර්ෂය සමග සැසඳීමේදී වර්ෂ 2009 යේදී ලැබී ඇති ලාභය මිලියන

1.2ක් විය. 2010 නොවැම්බර් මාසයේදී ෂෙල් සමාගමේ සියලුම කොටස් රුපියල් බිලියන 6කට මිලදී ගෙන ඇති අතර, 2010-2015 කාල සීමාව තුළදී ෂෙල් සමාගම ලිට්රෝ සමාගම නමින් නම වෙනස් කර, ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් බිලියන 16ක ලාභයක් උපයාගෙන ඇත. 2010 වර්ෂයේ සිට ඉහත සඳහන් කරන ලද සමාගම් හැරුනු විට දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිහිටා ඇති කැන්විල් හෝටල් ඇන්ඩ් ස්පා ආයතනය ඇතුළු තවත් හෝටල් කිහිපයක් ආරම්භ කළ අතර, කැන්විල් හෝල්ඩින්ස් ආයතනය මෙම සමාගම්වල පාලක ආයතනය ලෙස කටයුතු කර ඇත.

මෙලෙස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම ප්‍රතිව්‍යුහගතකර, වෙනත් ක්ෂේත්‍රවලට ඇතුළත්ව, සමාගම් කටයුතු හොඳ අධීක්ෂණයක් යටතේ මෙහෙය වූ නිසා 2010-2015 කාල සීමාව තුළ බිලියන 62.3ක ලාභයක් උපයාගෙන ඇති බැව් කොමිසම ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂි සහ ලේඛනවලින් අනාවරණය වී ඇත.

2015 ජනවාරි මස 8 වෙනි දා ජනාධිපතිවරණයෙන් නව ජනාධිපතිවරයෙකු පත්වීමත් සමග නව රජයක් පිහිටුවීම හේතුවෙන් 2015 ජනවාරි මස 20 වෙනි දින මුදල් අමාත්‍යාංශයෙන් චක්‍රලේඛයක් නිකුත් වී ඇති අතර, ඒ අනුව සියලු රාජ්‍ය බැංකු, සංස්ථා මණ්ඩල, සමාගම්වල සභාපතිවරු සහ අධ්‍යක්ෂ මණ්ඩලවල සමාජිකයන් වහාම ඉල්ලා අස්වීමේ ලිපි, මුදල් අමාත්‍යාංශයට භාරදෙන ලෙසට ඉල්ලා සිටි නිසා, පැමිණිලිකරු දැරූ තනතුරු සියල්ලෙන්ම ඉල්ලා අස්වී ඇත.

2015 මාර්තු මාසයේ දිනක මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණෙන ලෙස ඉල්ලා සිටි නිසා ඔහු එහි ගිය බවත්, එහිදී අංශ 4 භාර ස්ථානාධිපති රණසිංහ මහතා හමුවූ බවත් පැමිණිලිකරු දක්වා ඇත. එහිදී පැමිණිලිකරුට දැන ගැනීමට හැකිවූ වැදගත් කරුණක් වූයේ දූෂණ විරෝධි කමිටුව මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවය. එහිදී ප්‍රශ්නයට භාජනය වී තිබුණේ කොළඹ පැවති හෝටල් ස්ථාපනය කිරීම සඳහා දේපළ අත්පත් කරගෙන ඇත්තේ වැරදිසහගත ලෙස බවත්, එසේ අත්පත් කර ගැනීමේදී මූල්‍ය වංචාවන් සිදු වී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කරන බව පැමිණිලිකරුට දැන ගැනීමට ලැබී ඇති බවත්ය.

මූල්‍ය අපරාධ විමර්ශන අංශය මේ සම්බන්ධයෙන් විමර්ශනය කරන විට මෙම පවරා ගැනිමේ 2011 අංක 43 දරණ ඌන ව්‍යවසායකත්වයක් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුද කිරීමේ පණත යටතේ සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් සෙලින්කෝ හොමිස් ඉන්ටර්නැෂනල් ලෝටර්ස් ටවර් නැමති සමාගම අවුරුදු 99ක බදු ගිවිසුමක් යටතේ ලබාගත් බව දක්වා ඇති අතර, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය මුදල් අමාත්‍යංශයෙන් සහ නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබුණු අතර, රජයේ තක්සේරුව මත බිලියන 4.8ක් භාණ්ඩාගාරයේ තැන්පත් කළ බව පැමිණිලිකරු පවසා ඇත. එසේම මේ සියලුම විෂයගත සිද්ධීන් සිදු වී ඇත්තේ සමාගම් විෂයෙහි වන හෙයින් එවැන්නක් පොදු දේපළ යටතේ අදාළ නොවන බව පැහැදිළිවම විමර්ශකයින්ට පෙන්වා දුන්නද, විමර්ශකයින් ඒ සම්බන්ධයෙන් සැළකිල්ලක් නොදැක්වූ බව පෙනී යයි. මෙම විමර්ශනයේදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පැමිණිලිකරු ඉදිරිපත් කළ කරුණු නොසලකා විමර්ශනයෙන් පසු ලිපි ගොණු

නීතිපතිට යවා ඒ මාර්ගයෙන් පැමිණිලිකරුට විරුද්ධව අධිචෝදනා ගොණු කර ඇත. මහාධිකරණයේ නඩු අවසානයේදී 2019.08.08 වෙනි දින නියෝග දෙමින් පැමිණිලිකරුට එරෙහිව නගා ඇති 1,2,6,10,11,15,16,20,21 යන චෝදනා අධිකරණය හමුවේ සාධාරණ සැකයෙන් තොරව ඔප්පු වී නොමැති බැවින් ඉහත චෝදනාවලින් පැමිණිලිකරු නිදොස්කර නිදහස් කර ඇත. නඩු අංක HC/PTB/1/01/2018 යටතේ බස්නාහිර පළාත් බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණ නඩු තීන්දුව 2019.08.08 වෙනි දින ප්‍රකාශ කළ අතර, මේ අනුව දූෂණ මර්දන කමිටුව විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට එවන ලද පැමිණිල්ල කිසිදු පදනමක් නැති සත්‍යයෙන් තොර කරන ලද පැමිණිල්ලේ තියා දේශපාලන පළිගැනීම මගින් පැමිණිලිකරු දැඩි හිංසනයට පත් වූ බැව් කොමිෂන් සභාව තීරණය කරයි.

පැමිණිලිකරු රක්ෂණ සංස්ථාවේ ප්‍රතිව්‍යුහගත කර සමාගම් පිහිටුවූ අවස්ථාවේදී, එම කටයුතු සම්බන්ධයෙන් යම්කිසි නීතිමය ප්‍රශ්නයක් හෝ ගැටලුවක් බාහිර පාර්ශ්වයක් මගින් පැමිණිලිකරු රැකියාවේ නොයෙදෙන අවස්ථාවකදී ඉදිරිපත් වුවහොත් එවැනි නීතිමය කටයුතු කිරීමට නීතිඥයින්ගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය වන වියදම් සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගත යුතු යැයි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ නිසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි ආවරණයකට අනුමැතිය දී ඇත. (පැ.41 සහ පැ.47) එම රක්ෂණය අධ්‍යක්ෂවරුන්ට සහ කළමනාකරුවන් වන නිළධාරීන්ට සීමා වූ රක්ෂණ ආවරණයකි. මෙම රක්ෂණය මගින් ආවරණය වන්නේ රැකියාවේ යෙදී සිටින විටදී හෝ එම කාල සීමාවෙන් පසු මාස 84ක් තුළ යම්කිසි ආකාරයක චෝදනාවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුට හෝ ආයතනයේ

නිලධාරියෙකුට සිදු වුවහොත් එයින් ඇතිවන නීති කටයුත්තකට යන වියදම් ආවරණය කිරීම මෙම රක්ෂණය විසින් කරනු ලැබේ. යම්කිසි තීරණයක් සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වයකින් කිසියම් අවාසියක් හෝ අගතියක් සිදු වූවානම් රක්ෂණයේ යම් සීමාවන් මත වන්දියක් ගෙවීමට මෙම රක්ෂණයෙන් ආවරණය වී තිබුණි. මේ අනුව 2018 සැප්තැම්බර් මස 4 දින පැමිණිලිකරුට විරුද්ධව ත්‍රි පුද්ගල මහාධිකරණයේ නඩුව ආරම්භයේ සිට ඒ සඳහා දැරීමට සිදුවූ වියදම් පැමිණිලිකරු විසින් “පැ.42” මගින් රක්ෂණ සංස්ථාවට ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු දැරීමට සිදු වූ නීති කටයුතු සඳහා වියදම් ඉල්ලා ඉදිරිපත් කළ අයදුම්පතට ප්‍රතිචාර නොලැබුණු නිසා සිහි කැඳවීම් 2ක් 2019.02.10 වෙනි දින සහ 2019.06.02 වෙනි දින ඉදිරිපත් කළ බව දක්වන අතර, එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද ලිපිය ලැබුණේ 2019 සැප්තැම්බර් මස 9වෙනි දින ලෙස සඳහන් වේ. මෙසේ ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් ලෙස පැමිණිලිකරුගේ අදහස වන්නේ, එම ඉල්ලීම ප්‍රතිරක්ෂකයින් ප්‍රතික්ෂේප කිරීම බවය. පැමිණිලිකරු මේ ගෙවීම සම්බන්ධයෙන් 2020.01.20 වෙනි දින සිහි කැඳවීමක් යැවූවද ඊට ප්‍රතිචාරයක් ලැබී නොමැත. පැමිණිලිකරු පවසන අන්දමට ඔහුගේ වියදම රු.මිලියන 56ක් ගෙවා තිබෙන බවත්, ඔහුගේ රක්ෂණාවරණය තුළින් රු.මිලියන 36ක් පැමිණිලිකරු ඉල්ලා ඇති බවත්ය. සමානායයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සමාගම තවත් සමාගමක් සමග හවුල් කර ගන්නේ එම වගකීම බෙදා ගැනීමට බව පැමිණිලිකරු ප්‍රකාශ කළ අතර, ඔහුට මෙය නොගෙවන්නේ දේශපාලන පළිගැනීමක් ලෙසට යැයි පැමිණිලිකරු දක්වා ඇත.

නීතිමය කටයුතු ආවරණය කරන රක්ෂණය හැරුණු විට, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මෙම පැමිණිලිකරු වන කුඩාබාලගේ මහතාට ජීවිත රක්ෂණාවරණයක්ද ලබාදී තිබුණි. මෙම ජීවිත රක්ෂණයේ පදනම ලෙස දක්වා ඇත්තේ රක්ෂණ සංස්ථාවට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කළාට පසුව රජය විසින් හදිසි තීරණයක් ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කළහොත් යන අවදානම නිසා නැවත රැකියාවක් සොයා ගන්නා තෙක් යම්කිසි රක්ෂණාවරණයක් තිබිය යුතු යන අදහසයි. මේ නිසා රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය වූයේ Working Directorsලා වශයෙන් සිටින අයට ලබාදෙන දීමනාවේ කොටසක් හැටියට රක්ෂණාවරණයක් ලබාදීම වේ. ඒ සඳහා ලබා දිය යුතු රක්ෂණ වාරිකය රක්ෂණ සමාගමෙන් ගෙවන අන්දමට සකස් කරගෙන ඇත. මෙම රක්ෂණාවරණය අධ්‍යක්ෂවරුන්ට දෙන වරප්‍රසාදයක් ලෙස සලකා ඇත. එසේම රක්ෂණාවරණය කල් පිරීම අවුරුදු 3ක් වන අතර, වාරික මුදල USD35,000 ක් වේ. පැමිණිලිකරු කල් පිරීමත් සමග 2016 වර්ෂයේදී ඉල්ලීමක් කළද , 2016 ජුනි මාසයේ ගත් තීරණයක් අනුව මෙම රක්ෂණ මුදල් නොගෙවන බවට දැනුම් දී ඇති අතර, ඊට හේතුව රක්ෂණ වාරිකය රක්ෂණ සමාගම් විසින්ම ගෙවා ඇති බව දක්වා ඇත. මෙසේ පැමිණිලිකරුගේ රක්ෂණ මුදල් නොගෙවීමට හේතු වශයෙන් පැමිණිලිකරු දක්වා ඇත්තේ 2015 පසු පත් වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දේශපාලන පළිගැනීමක් වශයෙන් මෙය නොගෙවූ බවය.

සීමා සහිත රක්ෂණ සමාගමේ හා ඊට අනුබද්ධ සමාගම්වල සභාපතිවරුනට, අධ්‍යක්ෂවරුනට සහ විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට විශේෂ රක්ෂණාවරණ 2ක් තිබුණි. මේ අනුව එක

රක්ෂණාවරණයක් වූයේ සමාගමේ අභිවෘද්ධිය සඳහා කටයුතු සිද්ධ කරන අවස්ථාවේදී යම් දවසක බාහිර පාර්ශ්වයක් විසින් නීතිමය කටයුත්තක් ආරම්භ කළහොත් දරා ගැනීමට සිදුවන නීතිඥ වියදම් සඳහා රක්ෂණ ආවරණයකි. මෙම රක්ෂණ ආවරණය බලපවත්නේ සේවය පවතින කාලය තුළදී හෝ එම කාල සීමාවෙන් පසුව මාස 84ක් හෙවත් අවුරුදු 7ක කාලයක් තුළදී වේ. මේ නිසා මෙම රක්ෂණය එක්තරා සීමාවකට යටත්වන අතර, මෙම වාරිකය රක්ෂණ සංස්ථාව මගින් ඉහත දැක්වූ ලෙස අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ට ලබාදෙන වරප්‍රසාදයකි.

පැමිණිලිකරු අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ නිසා 2018 දෙසැම්බර් මාසයේ 4වන දින පැමිණිලිකරුට විරුද්ධව ත්‍රි පුද්ගල මහාධිකරණයේ නඩු විභාගය ආරම්භ වූ විට එම නඩුව සඳහා දැරීමට සිදුවන වියදම් නීතිඥයෙකු මාර්ගයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට එම ඉල්ලීම ඉදිරිපත් කර ඇත. (පැ.42) පැමිණිලිකරු සඳහන් කරන අන්දමට ඔහුගේ ඉල්ලීමට කිසිම ප්‍රතිචාරයක් නොලැබුණු අතර, වර්ෂයකට පසු 2019.10.16 වෙනි දින රක්ෂණ සංස්ථාව එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු නැවත නැවතත් ඉල්ලීම් ඉදිරිපත් කර සිහි කැඳවීම් යවා ඇති බැව් ඉදිරිපත් කර ඇති ලේඛනවලින් පෙන්නුම් කරයි. (පැ.44 සහ පැ.45) පැමිණිලිකරු විසින් නීතිමය කටයුතු සඳහා වැය වූ වියදම් ලෙස රුපියල් මිලියන 56ක් දක්වා ඇති නමුත්, රක්ෂණාවරණයට මොහු අයදුම් කර ඇත්තේ රුපියල් මිලියන 36ක් පමණි.

ඉදිරිපත් වූ සාක්ෂි අනුව ප්‍රතිරක්ෂණය කරන ලද බ්‍රෝකර් සමාගම මෙම මුදල ගෙවීම ප්‍රතික්ෂේප කළ බව දැන්වුවද මෙම ගෙවීම්වල වගකීම පැවරෙනුයේ රක්ෂණ සමාගමකටය. මෙම රක්ෂණ ආවරණය අධ්‍යක්ෂවරුන්ට හා සෙසු ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ට රක්ෂණ සංස්ථාව විසින් ලබාදෙන රක්ෂණයක් වේ. එසේම මෙවැනි රක්ෂණ ඉල්ලීම මීට පෙර ගෙවා තිබෙන බැව් මේ කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් පැහැදිළි වේ.

ඉහත සඳහන් රක්ෂණ ආවරණයට අමතරව පැමිණිලිකරු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ජීවිත රක්ෂණ ආවරණයක්ද ලබාගෙන ඇත. පැමිණිලිකරුට අනුව එම රක්ෂණයෙන් අදහස් වනුයේ යම් හෙයකින් රජය හදිසි තීරණයක් ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කළහොත්, ඉවත්කළ දින සිට නැවත රැකියාවක් ලබාගන්නා තෙක් ජීවිතය පවත්වාගෙන යාමට නිර්මාණය කරන ලද රක්ෂණ ආවරණයක් බවය.

මෙම රක්ෂාවරණය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති රක්ෂණාවරණයකි. මෙහි වාරික ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් වන අතර, එය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ගෙවනු ලබන්නේ අධ්‍යක්ෂවරුන්ට දෙන දීමනාවක් ලෙසට වේ. මේ නිසා මෙය අධ්‍යක්ෂවරුන්ට ගෙවන ප්‍රතිලාභයක් ලෙසද සැලකිය යුතු බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. මෙම රක්ෂණාවරණය 2013.11.29 වෙනි දින ආරම්භ කළ අතර, එහි වාරික මුදල රු. 3,515,650.00 වේ. (පැ.47) මෙම රක්ෂණාවරණය වර්ෂ 3කට පසු එනම් 2015.11.29 වෙනි දින කල් පිරීම සිදු වේ. පැමිණිලිකරුට අනුව එම රක්ෂණ මුදල ලබාගැනීමට 2016 වර්ෂයේදී පමණ අයදුම්පතක් ඉල්ලුම් කලද, ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බව පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාවට දක්වා සිටින ලදි.

පසුව 2016.07.20 වෙනි දින ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම ඉල්ලීම ගෙවීමට නොහැකි බව තීරණයක් ගෙන ඇත. (පැ.48) කෙසේ වුවද පැමිණිලිකරු පවසා සිටින අන්දමට මෙය ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට නොගෙවා සිටිය නොහැකි බව දක්වා එසේ නොගෙවා සිටිය හැක්කේ, සපයා ඇති තොරතුරු අසත්‍ය නම් හෝ ගෙවන ලද වාරිකය ගෙවා ඇත්තේ අපරාධයකින් උපයාගත් මුදලකින් නම් එවැනි අවස්ථාවකදී රක්ෂණය අවලංගු කළ හැකි නමුත්, එසේ නොමැති නම් එය අවලංගු කළ නොහැකි බව පැමිණිලිකරු ඔහුගේ ප්‍රකාශයේදී දක්වා ඇත.

පැමිණිලිකරු මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ මෙම රක්ෂණ ඉල්ලීම් දෙකම ඔහුට ලැබිය යුතු බවද ඒ සඳහා, සිහි කැඳවීම් ද යැවූ බවත්ය. (පැ.49) කෙසේ වුවද වර්තමාන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2020.01.20 වෙනි දින ජීවිත ආරක්ෂණ රක්ෂණාවරණය නොගෙවීමට තීරණයක් ගත් බව වර්තමාන සභාපති පැමිණිලිකරුට දන්වා ඇත. (පැ.50)

මෙම ගැටලුව සම්බන්ධයෙන් කොමිෂන් සභාව වැඩිදුර විමර්ශනය කිරීම සඳහා සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නව සභාපති ජගත් වැල්ලවත්ත මහතා මෙම කොමිෂන් සභාවේ සාක්ෂිකරුවෙකු ලෙස කැඳවීම් කරනු ලැබීය. ජගත් වැල්ලවත්ත මහතා ප්‍රශ්නයට භාජනය වී ඇති ජීවිත රක්ෂණය හා නීතිමය කටයුත්තකට මැදිහත් වුවහොත් ඇති ආවරණය යන රක්ෂණ ආවරණ 2ක් ඇති බව පිළිගනු ලැබීය. මෙම සාක්ෂිකරුට අනුව D and O ආවරණය සම්බන්ධයෙන් මෙම සභාපතිට පෙර තිබූ අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවීමට නොහැකි බවට තීරණයක් ගෙන ඇති බව කොමිෂන් සභාවට ප්‍රකාශ කරන ලදි. වත්මන් රක්ෂණ සංස්ථාවේ සභාපතිට අනුව මුදල් ගෙවීමට මුදල්

අමාත්‍යාංශයේ ඇමතිවරයාගේ අනුමැතිය ගතයුතු බව දක්වන අතර, මෙම ජීවිත ආවරණයේ ප්‍රතිෂ්ඨාව ගෙවා ඇත්තේ නැතහොත් වාරිකය ගෙවා ඇත්තේ රක්ෂණ සමාගම විසින් නිසා මුදල් ගෙවීමට අවකාශයක් නොමැති බව දක්වා ඇත. තවදුරටත් සාක්ෂි දුන් ජගත් වැල්ලවත්ත මහතා කියා සිටියේ මෙවැනි ජීවිත රක්ෂණ, රක්ෂණ සංස්ථාව විසින් ලබා දී නොමැති බවත්, එසේම මෙම පැමිණිලිකරු කුඩාබාලගේ මහතා මෙම රක්ෂණ කල්පිරුණු අවස්ථාවේදී සේවයේ නොසිටි බවත් දක්වා ඇත. තවද මෙම සාක්ෂිකරු පැහැදිළිව සාක්ෂියේදී දක්වා සිටියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව මෙම ගෙවීම කළ නොහැකි බවය.

වර්තමාන සභාපති තවදුරටත් සාක්ෂි දෙමින් D and O ආවරණය සම්බන්ධයෙන් දක්වා සිටියේ මෙම ආවරණය 2016 වනවිට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එයට අනුබද්ධ ආයතනවලට බලපෑම් කළ බවත් හා 2016 සිට අනුබද්ධ ආයතන මෙම රක්ෂණයෙන් ඉවත් කර ඇති බවත්ය. මෙම සාක්ෂිකරු දුන් සාක්ෂි අනුව D and O ආවරණය අනුව ගෙවීමට නොහැක්කේ කුමක් නිසාද යන්න පරීක්ෂා කර බැලූ බවත්, එහිදි ප්‍රතිරක්ෂිතයින් නොගෙවීමට හේතු වශයෙන් දී ඇත්තේ රක්ෂණ සංස්ථාව අනුබද්ධ උප ආයතන ඇතුළත්ව නොතිබීම නිසා බව දැක්වේ.

සාක්ෂිකරුට අනුව මෙම ගැටලුව විසඳාගත හැකි ක්‍රම දෙකක් ඔහුගේ සාක්ෂියේදී දක්වයි. එහි පළමු කරුණ වන්නේ රක්ෂණ ඔම්බඩ්ස්මන්වරයා අභියාචනා කිරීමට හැකි බවත්, රක්ෂණ සංස්ථාව විසින්ද කමිටුවක් පත්කර ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට හැකි බවත් දක්වා ඇත. දැනටමත් මෙවැනි කමිටුවක් පත්කර ඇති අතර,

මෙම ගැටලුව මුදල් අමාත්‍යාංශයේ විගණන අංශයට යොමු කර ඇති බව සාක්ෂිවලදී දක්වා ඇත.

පැමිණිලිකරු වන කුඩාබාලගේ මහතා වගඋත්තරකරුවන් ලෙස

1. දූෂණ විරෝධී කොමිසමේ ලේකම් ආනන්ද විජේපාල

2. රනිල් වික්‍රමසිංහ ඇතුළු දූෂණ විරෝධී කමිටුවේ සමාජිකයින්

3. තුසිත මුදලිගේ

යන අය නම් කර ඇත.

මෙම විමර්ශනයේ ප්‍රධාන ලෙස සාක්ෂි ඉදිරිපත් කළේ පැමිණිලිකරු පියදාස කුඩාබාලගේ මහතා වේ. මොහු වෘත්තියෙන් නීතිඥයෙකු වන අතර,1990 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන සේවයට ඇතුළුව වසර 20ක පමණ කාලයක් සේවය කර, විශේෂ ඇරයුමක් මත 2010 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස බැදී ඇත. මෙම 2010 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති ලෙස කටයුතු කර ඇත්තේ ගාමිණී සෙනරත් මහතා වන අතර, නීල් බණ්ඩාර හපුහින්න මහතා, පැමිණිලිකරු පියදාස කුඩාබාලගේ, මොහාන්ද අල්විස් මහතා, භාණ්ඩාගාර නියෝජිත බටගොඩ මහතා සහ ජයතිස්ස මහතා යන අය සමාජිකයෝ වූහ. මෙම කොමිෂන් සභාවට මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් සාක්ෂි දුන් සාක්ෂිකරුවන්ට අනුව සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රතිව්‍යුහගතකර විවිධ ක්ෂේත්‍රයන්ට ඇතුළුවීම සඳහා පර්යේෂණ කරන ලද බව පවසා ඇත. තවද කොටස් වෙළෙඳපොළේද මුදල් ආයෝජනය කර ලාභ ලැබූ බවට ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි සහ ලේඛනවලින් අනාවරණය වී ඇත. එසේම ආරම්භ කරන ලද පර්යේෂණ වලින් යුද්ධයෙන් පසු

ආයෝජනය කළයුතු අවදානම අඩුම ක්ෂේත්‍රය ලෙස සලකනු ලැබුයේ සංචාරක ක්ෂේත්‍රයයි. මේ අනුව කොළඹ, හම්බන්තොට, නුවරඑළිය සහ දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඇති අවන්හල් හා හෝටල්, සාමගම් කිහිපයක්ම ආරම්භ කර ප්‍රතිව්‍යුහගත කරන ලදි. මෙම ආයෝජන විශේෂයෙන් කොටස් වෙළඳපොළ හා ලිට්රෝ ගෑස් සමාගමට යොදවන ලද අතර, එම ව්‍යාපාර සාර්ථක වී 2010ත් 2015 අතර රුපියල් බිලියන 62.3ක ලාභයක් වාර්තාවූ බැව් සාක්ෂිවලින් හෙළිවේ.

2015 ජනවාරි මස 8වෙනි දින මහා මැතිවරණයෙන් පසු රාජ්‍ය පාලනය වෙනස්වීමත් සමගම සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා ඊට අනුබද්ධ ආයතනවල සභාපතිවරුනට ඉල්ලා අස්වීමට සිදු වූ බව සාක්ෂිවලින් හෙළිවේ. 2015.01.20 වෙනි දින මුදල් අමාත්‍යංශයේ ලේකම් විසින් ලිපියක් යොමු කරමින් සියලුම රාජ්‍ය බැංකු, සංස්ථා, සමාගම්වල නව සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩලවල සමාජිකයින් පත්කිරීමට අවශ්‍ය නිසා පෙර සිටි සභාපතිවරුන්ට හා අධ්‍යක්ෂවරුන්ට ඉල්ලා අස්වීමේ ලිපි මුදල් අමාත්‍යංශය වෙතට ලැබීමට සලස්වන මෙන් ඉල්ලා සිටි නිසා (පැ.5) පැමිණිලිකරුවන කුඩාබාලගේ ඔහු සිටි තනතුරු සියල්ලෙන්ම ඉල්ලා අස්වීමේ ලිපි මුදල් අමාත්‍යංශයට යවා ඇත. මේ නිසා ඔහුගේ තනතුරු අහිමිවීම පැමිණිලිකරුගේ වරදකින් සිදු වූවක් නොවන නිසා ඔහුගේ යම් ඉල්ලීම් ඇත්නම් මෙම කරුණ අදාළ කරගත නොහැක.

2015 මාර්තු මාසයේ පමණ සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නව සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම සංස්ථාවේ මහා පරිමාණයෙන් දූෂණ ඇති බව පවසා වෝහාරික විගණනයක් කර මහා පරිමාණයේ වංචා සිදු වී ඇති බවට මාධ්‍ය ප්‍රචාරයන් දී ඇත. මේ

අවස්ථාව වනවිට එක්සත් ජාතික පෙරමුණේ ජනාධිපතිවරණයේදී ජනතාවට දුන් පොරොන්දුවක් වූ දූෂණ වංචාකාරීනට විරුද්ධව දඬුවම් පැමිණවීමට විමර්ශන ඒකකයක් ස්ථාපනය කරන බවට ප්‍රකාශ කර තිබූ නිසා 2015.01.21 වෙනි දින කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කරමින් කැබිනට් අනුමැතිය ලබාගෙන දූෂණ විරෝධී කමිටුවක් ස්ථාපනය කරන ලදි. මෙම කමිටුවේ කර්තව්‍යයන් කිරීම් සඳහා ලේකම් කාර්යාලයක්ද පිහිටුවන ලද අතර, එම ලේකම් කාර්යාලයට අනුයුක්තව නීති උපදේශ ලබාදීමට රජයේ ජ්‍යෝෂ්ඨ නීතිඥයෙකු වූ තුසිත මුදලිගේ පත්කර තිබුණි.

මෙම දූෂණ කමිටු කාර්යාලයට ලැබෙන පැමිණිලි නීති උපදේශකයින් විසින් පරීක්ෂාවට භාජනය කර අදාල විමර්ශන ඒකකයට එම කාර්යාලයේ ලේකම් වූ ආනන්ද විජේපාල මහතා විසින් යොමු කරනු ලබයි. මේ අන්දමින් පැමිණිලිකරුට එරෙහිව තිබුණු සත්‍යයෙන් තොර පැමිණිල්ලද දූෂණ විරෝධී ලේකම් කාර්යාලය මගින් මූල්‍ය අපරාධ කොට්ඨාසයට යොමු කරන ලද අතර, එම කොට්ඨාසය මගින් විමර්ශනය කොට විමර්ශන වාර්තා නීතිපති වෙත යැවීමෙන් පැමිණිලිකරුට විරුද්ධව අධිචෝදනා ගොණු කර ඇත. මේ සම්බන්ධයෙන් කරුණු විශ්ලේෂණාත්මක ලෙස මෙම වාර්තාවේ පැහැදිළිව ඉහතදී දක්වා ඇති නිසා මෙම විශ්ලේෂණයේදී මෙම කරුණු නැවත විස්තර නොදක්වන අතර, පැමිණිලිකරු ඇතුළු අනෙක් විත්තිකරුවන් සියලු දෙනාම නිදොස් කර නිදහස් වූ බව පමණක් මෙහිදි සඳහන් කරනු ඇත.

පැමිණිලිකරු විසින් ඔහුට මුහුණපෑමට සිදුවූ අධිකරණ ප්‍රශ්න සහ ඊට අනුබද්ධ වූ අනෙකුත් කරුණු හැරුණු විට ශ්‍රී ලංකා රක්ෂණ

සංස්ථාවෙන් ඔහු විසින් ලබා ගන්නා ලද රක්ෂණාවරණ දෙකක් සම්බන්ධයෙන් කරුණු මේ වාර්තාවේ ඉහතදී දක්වා ඇත.

රක්ෂණ ආවරණ දෙකකින් එකක් වනුයේ "Directors & Officers Liability" යන රක්ෂණයකි. මෙම රක්ෂණ ආවරණය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂවරුන්ට හා උසස් නිළධාරින්ට ලබාදෙන රක්ෂණයක් වන අතර, මෙහි වාරිකය වන USD35,000 ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගිනි. මෙම රක්ෂණයේ අරමුණ වූයේ යම් හෙයකින් තුන්වන පාර්ශ්වයකින් අධ්‍යක්ෂවරයෙකුට හෝ නිලධාරියෙකුට එරෙහිව නීතිමය කාර්යයන් ඇතිවුවහොත් ඒ සඳහා වැය වෙන නීතිඥ ගාස්තු වියදම් සීමාවකට යටත්ව මෙම රක්ෂණ ආවරණයක් ඇති නිළධාරීන්ට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ගෙවිය යුතුවීමය. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද (පැ.41) ලේඛනය අනුව නීතිමය කටයුත්තක් සඳහා ගෙවන උපරිමය ඩොලර් ලක්ෂ 2කි. එසේම (පැ.41) අනුව ආවරණ කාලය 2014 දෙසැම්බර් 15වෙනි දින සිට 2015 දෙසැම්බර් 14 වෙනි දින දක්වා වේ.

මෙම රක්ෂණ ආවරණය සම්බන්ධයෙන් මෙම වාර්තාවේ ඉහතදී දක්වා ඇති නිසා මෙම ගැටලු හැකි ඉක්මනින් නිරාකරණය කිරීම සඳහා නව සභාපති විසින් කමිටුවක් මගින් ක්‍රියා කරන බව දක්වා ඇත. මෙහිදී සැලකිය යුතු කරුණක් වනුයේ කුඩාබාලගේ මහතාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති නමුත් එසේ ප්‍රතික්ෂේප කිරීම සඳහා ශක්තිමත් පිළිගත හැකි හේතු ඉදිරිපත් කර නොමැති වීමයි. එසේම D & O රක්ෂණය මෙන්ම ජීවිත රක්ෂණයද ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති නිසා එයද කමිටුට ඉදිරිපත් කරන බව සභාපති මෙම කොමිෂන් සභාවට සාක්ෂියේදී දක්වා ඇත. එසේම මෙම පැමිණිල්ලේ සිදු වී ඇති

දේශපාලන පළිගැනීම මෙම වාර්තාවේ ආරම්භයේ සිටම පැහැදිළිව දක්වා ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති ලෙසට 2015ට පෙර සිටියේ ගාමිණී සේදර සෙනරත් මහතා වේ. ඔහුද ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ කාර්ය මණ්ඩල ප්‍රධානී වූ අතර, මෙතුමාට වංචා දූෂණ චෝදනා ඉදිරිපත් කිරීමෙන් අදහස් කළේ ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාව අපහසුතාවයකට පත් කොට ඉන් දේශපාලන වාසි ලබාගැනීම වේ. මේ නිසා කුඩාබාලගේ මහතාටද මෙම බලපෑම සිදුවුයේ ඉහත දැක්වූ කරුණු නිසාය. මෙම පැමිණිල්ල විමර්ශනය කළ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට අවශ්‍ය වුයේ නිර්මාණය කළ ප්‍රකාශ ලබාගෙන ඒ මගින් පෙර රජයේ දේශපාලනඥයින්ගෙන් පළිගැනීමට වන අතර, එසේ නොවුණු නිසා පැමිණිලිකරු වධ හිංසා හා දේශපාලන පළිගැනීමට ලක් කරනු ලැබීය. මහාධිකරණයේ අපරාධ චෝදනා ගොණු කිරීම, ප්‍රමාණවත් සාක්ෂි නොතිබුණද පදනම් රහිත පැමිණිල්ල විමර්ශනය කර රක්ෂිත බන්ධනාගාර ගත කිරීම හේතු කොටගෙන සේවය තහනමකට ලක්වීම යන සියල්ලටම පැමිණිලිකරුට මුහුණදීමට සිදුවුයේ ඔහු විසින් කරන ලද වරදක් නිසා නොව, පැමිණිලිකරුව සැලසුම් සහගත දේශපාලන පළිගැනීමට ලක්වූ හෙයිනි. මේ නිසා ඇති වූ මානසික පීඩනය සමාජයීය වශයෙන් මුහුණදීමට සිදුවූ තත්ත්වය, රක්ෂිත බන්ධනාගාරගත වීම, සේවය තහනම් වීම යන සියලු අපහසුකම් වලට මුහුණදීම සිදු වූ බව කොමිෂන් සභාවට ඉදිරිපත් වූ සාක්ෂි වලින් හෙළිවේ. පැමිණිලිකරු ඉහත දක්වා ඇති පරිදි වරලත් ගණකාධිකාරිවයෙකි. විදේශීය රටවල් කිහිපයකම කළමනාකරණ උපදේශකයෙකු ලෙස සේවය කර ඇත. මේ නිසා ඔහු නිපුණත්වය, හැකියාවට හා වෘත්තියට සරිලන පරිදි

ඉහළ දේශීය හෝ විදේශීය උපදේශක තනතුරු හිමිවිය යුතු බව මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 50 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020.11.24.

2020/11/24
Chandra Fernando

## 9 .LVI

පැමිණිලි අංකය - 416/2020

පැමිණිලිකරු - කොක්කාවිට ලියනගේ ලසන්ත බණ්ඩාර

ලිපිනය - 65/22, ජයන්තිපුර පාර, කුරුණෑගල

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත සඳහන් පුද්ගලයින්, වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. එනම්;

1. මංගල සමරවීර
2. පාඨලී චම්පික රණවක
3. රවුෆ් හකීම්
4. සරත් ෆොන්සේකා
5. ආර්.සම්බන්දන්
6. එම්.ඒ.සුමන්තිරන්
7. අනුර කුමාර දිසානායක
8. ජේ.සී. වැලිඅමුණ
9. ජයම්පති වික්‍රමරත්න
10. මලික් සමරවික්‍රම
11. ආනන්ද විජේපාල

### තීරණය

1. මෙම පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති සාක්ෂි සහ ලේඛන විශ්ලේෂණය කිරීමෙන් පසු පැමිණිකරු කොක්කාවිට ලියනගේ

ලසන්ත බණ්ඩාර යම් වරදකට හසුකර ගැනීම සඳහා අසත්‍ය පැමිණිලි මූල්‍ය අපරාධ අංශයේ ආනන්ද විජේපාල මගින් මූල්‍ය අපරාධ අංශයට ඉදිරිපත් කොට අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරගත කිරීමට ක්‍රියාකිරීමෙන් එයට ආධාර අනුබල දීමත් ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියාකර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් තහවුරු කර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් වූ සාක්ෂි සහ සියලු ලේඛන පරීක්ෂාවට සහ විශ්ලේෂණයට ලක් කිරීමෙන් අනතුරුව දූෂණ කමිටුව මගින් අසත්‍ය චෝදනා මූල්‍ය අපරාධ කොට්ඨාසයට ඉදිරිපත් කිරීමෙන් අසත්‍ය පැමිණිල්ලක් ගොණු කිරීමට ආධාර උපකාර දුන් බව පැහැදිලි වේ. තවද මූල්‍ය අපරාධ කොට්ඨාසය මගින් පදනම් විරහිතව චෝදනා විමර්ශනයෙන් පසු නීතිපති වෙත යවා ඒ මගින් බස්නාහිර පළාත්බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ අධිචෝදනා ඉදිරිපත් කළ බවට පැහැදිලිව සාක්ෂි ඇත. එසේම එම මහාධිකරණය මගින් විත්තිකරු නිදොස් කර නිදහස් කර ඇති අතර, පැමිණිලිකරු දූෂණ මර්දන කමිටුවේ ක්‍රියා කලාපයෙන්ද, මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ක්‍රියා කලාපයෙන්ද දැඩි අසාධාරණයකට හා අයුතු සහගත සහ ද්වේශ සහගතව දේශපාලන පළිගැනීමකට ලක්වූ බව මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. වර්ෂ 2015 ජනවාරි මස 8වෙනි දිනෙන් පසු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නව අධ්‍යක්ෂවරයා විසින් පැමිණිලිකරු දැඩි පීඩනයකට පත්කර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවයෙන් පහ කරන බවට තර්ජනය කර සේවයෙන් ඉල්ලා අස්වීම ලබා

ගැනිමෙන් පැමිණිලිකරු දැඩි දේශපාලන පළිගැනීමකට ලක් වූ බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. වගඋත්තරකරුවන් නීත්‍යානුකූල පදනමක් නොමැතිව දූෂණ කමිටුවේ සාමාජිකයින් ලෙස එහි ලේකම් මාර්ගයෙන් අසත්‍ය පැමිණිලි මූල්‍ය අපරාධ කොට්ඨාසයට යොමු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 190 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි නිර්මාණය කිරීමේ වරද සිදු කර ඇති බවය.
2. ඉහත වැරදි සිදු කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බවය.
3. දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයින් වන වගඋත්තරකරුවන් විසින් සකස් කළ එම කමිටුවේ අරමුණ හා කාර්යභාරය, කෙටි කාලීන වැඩ සටහන් හා දිගු කාලීන වැඩ මගින් කමිටුව විසින් ගතයුතු සහ ගෙන ඇති ක්‍රියාමාර්ගයන් පැහැදිළිව 2015ට පෙර රජයේ සිටි දේශපාලනඥයින්, නිලතල දැරූ රාජ්‍ය හා සංස්ථාවල නිළධාරීන් හමුදා සහ පොලිස් සේවයේ සාමාජිකයින් ඉලක්ක කර අධිකරණ ක්‍රියාවලිය තුළින් හා වෙනත් ක්‍රියාමාර්ග උපයෝගි කර ගනිමින් අයුතු සහගත ද්වේශ සහගත සහ අසාධාරණ ලෙස ඉලක්ක කර ඇති කණ්ඩායමක් අධිකරණ ක්‍රියාවලියක් තුළින් දේශපාලන පළිගැනීමට ලක් කර ඇති නිසා ඊට ආධාර උපකාර කළ හා ක්‍රියාකාරී වූ අය සම්බන්ධයෙන් සොයා බැලීම 1978 අංක 7 දරණ පණත යටතේ විශේෂ

පත්කර වැරදිකරුවන් වූ අයගේ දේශපාලන අයිතිවාසිකම් අවුරුදු 7කට අහිමි කිරීමට හා වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

4. පැමිණිලිකරුගේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රැකියාව අහිමි කිරීම අනුමිතිකව සේවය නතර කිරීමක් (Constructive Termination) බවට ඉදිරිපත් වී ඇති සාක්ෂි සහ ලේඛන වලින් පෙනීයන අතර, එම සේවය නතර කිරීම අත්තනෝමතිකව, ද්වේශ සහගත ලෙස අසාධාරණ හා නීති විරෝධී ලෙස කරන ලද ක්‍රියාවක් නිසා පැමිණිලිකරුගේ වෘත්තියට ගැළපෙන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඉහළ තනතුරකට නැවත පත් කිරීමට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

5. ඔහුගේ සේවය නැති වුණු දා සිට සේවය පිහිටුවන තෙක් ලැබිය යුතු වැටුප්, වැටුප් වර්ධක සමග ලබා දීමට කොමිසම නිර්දේශ කරයි.

6. නැවත සේවයේ පිහිටුවීමේදී සේවය කැඩීමක් නොමැතිව මුල් පත්වීමේ දින සිට අඛණ්ඩව නැවත සේවයේ පිහිටුවන තුරු සේවයේ යෙදී සිටියාසේ සැලකීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. ඔහුට සේවය අහිමි වෙන අවස්ථාවේදී කොළඹ සිට රාජකාරි කිරීමට අවශ්‍ය නිවාස පහසුකම් ලබා දීමටත්, කොමිෂන් සභාව තීරණය කරයි.

8. සේවය නතර කළ අවස්ථාවේදී ඔහුට ලැබුණු ඉන්ධන දීමනා අද දිනට සරිලන පරිදි ගෙවීම කොමිෂන් සභාව නිර්දේශ කෙර්.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

2014 පෙබරවාරි මස හෝ ඊට ආසන්න දිනකදී ලිට්රෝ ගෑස් සමාගම යටතේ තිබූ කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිළධාරී ලෙස ක්‍රියාකල පියදාස කුඩාබාලගේ යන අය යටතේ තිබූ ලිට්රෝ ගෑස් සමාගම විසින් කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම වෙත යවන ලද රුපියල් මිලියන 500ක මුදලක් වංචනික ලෙස හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමේ ලංකා බැංකුවේ ආයතන ශාඛාවේ පවත්වාගෙන යන 72783012 දරන ගිණුමට බැර කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු වන කොක්කාවිට ලියනගේ ලසන්ත බණ්ඩාර විසින් අනුබලදීම සම්බන්ධයෙන් 2018.06.13 වන දින අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන විමර්ශනය කිරීමෙන් පසුව බස්නාහිර පළාත් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ කිසිදු පදනමක් නොමැතිව දේශපාලන පළිගැනීමේ අරමුණ ඇතිව අංක HC/PTB1/01/2018 යටතේ නඩු පැවරීම.

ඉහත දක්වා ඇති පැමිණිලිකරු වන කොක්කාවිට ලියනගේ ලසන්ත බණ්ඩාර යන අයට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් අගමැති කාර්යාලයට අනුබද්ධව පිහිටුවා තිබූ දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලයෙන් එවන ලද පැමිණිල්ලක් මුල් කරගෙන ලිට්රෝ ගෑස් සමාගම යටතේ තිබූ කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිළධාරී ලෙස ක්‍රියාකළ පියදාස කුඩාබාලගේ යන අය විසින් හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමේ ලංකා බැංකුවේ ආයතන ශාඛාවේ පවත්වාගෙන ගිය 72783012 දරන ගිණුමට රුපියල් මිලියන 500ක්

වංචනික ලෙස බැර කිරිමට කටයුතු කර, සාපරාධි විශ්වාසය කඩකිරිමට පියදාස කුඩාබාලගේ යන අයට අනුබල දුන් බවට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සැළසුම් කරන ලද අධිකරණ ක්‍රියාවලියකට අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කළ පසුව ඇප මත මුදා හැර ඇති අතර, පැමිණිලිකරු වන කොක්කාවිට ලියනගේ ලසන්ත බණ්ඩාරට මුහුණ දීමට සිදුවූ මෙම හිංසාකාරී තත්ත්වය දේශපාලන පළිගැනීමක් මත සිදු කරන ලද බවට පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති හෙයින් එලෙස ඉදිරිපත් කරනු ලැබූ පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් විමර්ශනයක් ආරම්භ කොට එම විමර්ශන වාර්තාව පහත ඉදිරිපත් කරනු ලැබේ.

2015 ජනවාරි මස සහ අගෝස්තු මස පිළිවෙලින් පැවැත්වූ ජනාධිපතිවරණය සහ මහ මැතිවරණයට පෙර නිළයන් දැරූ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සංස්ථාවල, ත්‍රිවිධ හමුදාවන්හි මෙන්ම පොලිස් සේවයේ සාමාජිකයින් 2015 ජනවාරි මස 08 වෙනි දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 වෙනි දිනෙන් අවසන් වූ කාල සීමාව තුළදී දේශපාලනමය වශයෙන් පළිගැනීමකට ලක්වූ සාමාජිකයින්ට සිදු වූ අගතිගාමී තත්ත්වය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා මෙම කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි.

2015 ජනවාරි මස 08 වන දින පැවැත්වූ ජනාධිපතිවරණයෙන් එක්සත් ජාතික පෙරමුණේ ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා තේරී පත්වී දින 12ක් තුළදී අගමැති තනතුරට පත්වූ රනිල් වික්‍රමසිංහ මහතා මහ මැතිවරණයේදී දූෂණ නැති කිරීමට

විශේෂ විමර්ශන අංශයක් ස්ථාපිත කරන බවට ජනතාවට දුන් පොරොන්දුව මත පසුගිය රජය විසින් කර ඇති දූෂණ, අක්‍රමිකතා අනාවරණය කර විමර්ශනය කිරීම සඳහා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර ඒ මගින් දූෂණ විරෝධි කමිටුවක් පිහිටුවීමට යෝජනා කර තිබුණි. මෙම යෝජනාවෙන් පිහිටුවනු ලැබූ දූෂණ මර්දන කමිටුව, කාර්යක්ෂම කිරීම සඳහා අනුකමිටුවක් හා ක්ෂණික ප්‍රතිචාර කමිටුවක් පිහිටුවා ඒ සමගම දූෂණ හා වංචා පිළිබඳ පැමිණිලි යෝජනා කරන ලද විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවා ඒ මගින් විමර්ශන කටයුතු ආරම්භ කරන ලදි.

මෙම දූෂණ විරෝධි කමිටුවේ කෙටි කාලීන වැඩ සටහන් යටතේ මහා පරිමාණ දූෂිතයන් හා ජාවාරම්කරුවන් යැයි සැළකෙන පුද්ගලයින්ගෙන් අවම වශයෙන් 15 දෙනෙකුගේවත් දූෂණ වංචා වත්කම් හා බැරකම් පිළිබඳ සොයා බලා ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම වැදගත් කාර්යයක් විය. ඉහත සඳහන් කැබිනට් සන්දේශය මගින් මහා පරිමාණයේ දූෂණ වංචා සොයා බැලීමට විශේෂ විමර්ශන අංශයක් ආරම්භ කිරීමට පොලිස්පතිට නියෝග කරන ලද අතර, එම නියෝග මත පොලිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය වංචා අපරාධ විමර්ශන කොට්ඨාසය ස්ථාපිත කරන ලදි. එසේම මෙම පැමිණිල්ලද පොලිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය වංචා අපරාධ විමර්ශන අංශයට යොමු කිරීමට කටයුතු කරන ලදි.

මූලික වශයෙන් මෙම කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිලිකරුවන් කිහිපදෙනෙකු පැමිණිලි ඉදිරිපත් කර ඇති අතර, විශේෂයෙන් පැමිණිලි අංක 205/20 වෛද්‍ය ජයතිලක මහතා විසින් සාක්ෂි දෙන

විටදී ඔහුගේ නීතිඥයින් මෙම "දූෂණ විරෝධි කමිටුව" පිහිටුවීමට කැබිනට් සංදේශයක් ඉදිරිපත් කළ එවකට අගමැති රනිල් වික්‍රමසිංහ මහතා සාක්ෂිකරුවෙකු වශයෙන් මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේ ජාතික විධායක සභාවට දූෂණ විරෝධි කමිටුවක් ස්ථාපිත කිරිමට නිත්‍යානුකූල තත්ත්වයක් නොතිබුණු බවය. මෙවැනිම අදහසක් පැමිණිලි අංක 205/20 යටතේ වගඋත්තරකරුවෙකු ලෙස පෙනී සිටි පායලී චම්පික රණවක මහතා විසින්ද ඉදිරිපත් කර ඇත. මේ හෙයින් දූෂණ විරෝධී කමිටුවේ ක්‍රියාකාරිත්වය සහ එහි නීත්‍යානුකූල තත්ත්වය සම්බන්ධයෙන්ද ඉතා ගැඹුරින් ප්‍රශ්න කිරීමට ලක් වී ඇත. එසේම පොලිස්පති විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීමේ ගැසට් නිවේදනයේ දක්වා ඇති පොලිස් ආඥා පණතේ වගන්තිය සම්බන්ධයෙන්ද නීතිමය ගැටලුවක් පැන නැගී ඇති හෙයින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීමේ නිත්‍යානුකූලභාවය සම්බන්ධයෙන්ද ප්‍රශ්න කර ඇත.

මෙම පැමිණිල්ලේ කොක්කාවිට ලියනගේ ලසන්ත බණ්ඩාර යන අය 2006 වර්ෂයේදි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගණකාධිවරයෙකු වශයෙන් සේවයට බැඳී සිටියදී 2009 දී සමාගම නැවතත් රජයට පවරා ගැනීමෙන් අනතුරුව දිගටම සේවයේ යෙදී සිටි බවට ප්‍රකාශ කර සිටී. (මෙතැන් පටන් පැමිණිලිකරු වන කොක්කාවිට ලියනගේ ලසන්ත බණ්ඩාර යන අය බණ්ඩාර යන නමින් හඳුන්වනු ලබයි).

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රජයට පවරා ගැනීමෙන් පසුව රක්ෂණ ක්ෂේත්‍රය හැරුණු කොට වෙනත් ව්‍යාපාර සමඟ ප්‍රතිව්‍යුහගත කිරීම සහ විවිධාංගිකරණය කිරීමේ කටයුතු සඳහා 2010 වර්ෂයෙන් පසුව පත්වූ

ගාමිණී සෙනරත්, පියදාස කුඩාබාලගේ සහ නීල් හපුහින්න යන මහත්වරුන් අධ්‍යක්ෂ ධූරය දැරූ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනිකුත් සමාජිකයින් සමග කටයුතු කළ බව ප්‍රකාශ කර සිටී. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රාජ්‍ය ආයතනයක් බවට පත්වූවාට පසුව රක්ෂණ කටයුතු පමණක් නොව සංචාරක ක්ෂේත්‍රයටද ආයෝජනය කිරිම සඳහා කැන්විල් හෝල්ඩින්ස් පෞද්ගලික සමාගම ආයෝජන කළමනාකරණ සමාගම ලෙස ස්ථාපනය කරන ලදි. තවද, සිනෝර්ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පෞද්ගලික සමාගම විසින් කොළඹ ග්‍රෑන්ඩ්හයට් හෝටලය ඉදිකිරීම සහ කළමනාකරණය කිරීමටද, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පෞද්ගලික සමාගම විසින් හම්බන්තොට හයට් රිජන්සි හෝටලය ඉදිකර කළමනාකරණය කිරීමටද, තැප්‍රෝබේන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා පෞද්ගලික සමාගම විසින් කොළඹ තැප්‍රෝබේන් හෝටලය සංවර්ධනය කිරීම සඳහාද, දක්ෂිණ අධිවේගී මාර්ගයේ වැලිපැන්න ප්‍රදේශයේ සේවා සැපයීමේ ගොඩනැගිල්ල ඉදිකර පවත්වාගෙන යාම සඳහා කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා පෞද්ගලික සමාගමත් සංස්ථාගත කර තිබූ බව ප්‍රකාශ කර ඇත.

තවද, සිනෝර් ලංකා හොටෙල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමට ප්‍රාග්ධනය යොදවන ලද්දේ කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කොටස්කාර ශ්‍රී ලංකා රක්ෂණ සමාගම, ලිට්රෝ ගෑස් පුද්ගලික සමාගම සහ සේවක අර්ථසාධක අරමුදල් වලින් බවද ප්‍රකාශ කර සිටී. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කොටස්කරුවෙකු බවද, එසේම හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමට ප්‍රාග්ධනය යොදා ආයෝජනය කරන ලද්දේ රක්ෂණ සමාගම හා ලිට්රෝ ගෑස් පුද්ගලික සමාගම විසින් බවද

ප්‍රකාශ කරන ලදි. එසේම සිනෝ ලංකා සමාගම සහ හෙල්න්කෝ සමාගම හැරුණු කොට තැප්රොබේන් හොටෙල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම සහ දක්ෂිණ අධිවේගී මාර්ගයේ සේවා මධ්‍යස්ථානය කළමනාකරණය කිරීමේ කටයුතු සඳහා කැනොවින් හොටෙල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම පිහිටවූ බවටත් ප්‍රකාශ කර ඇත.

2012 ජුනි මස 1 වන දින සිට කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරිවරයා වශයෙන් කළමනාකරණය විසින් පැමිණිලිකරුවන බණ්ඩාර මහතා පත් කරන ලද අතර එම සමාගමට අමතරව අනුබද්ධිත සමාගම් සියල්ලේම ප්‍රධාන මූල්‍ය නිලධාරි වශයෙන් ද කළමනාකරණය විසින් පැවරූ රාජකාරි ද ඉටු කළ අතර, ඒ සඳහා අමතර වැටුපක් නොලද බවත් එය සමාගම්වල වියදම් පාලනය කිරීමේ උපායක් ලෙස යොදා ගත් බවත් ප්‍රකාශ කර ඇත.

2015 ජනවාරි මස 08 වන දිනෙන් පසුව එක්සත් ජාතික පෙරමුණ රාජ්‍ය පාලනයට පත්වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට සහ කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමට පත් කරන ලද නව අධ්‍යක්ෂක මණ්ඩලය මගින් කළමනාකරණ කටයුතු ආරම්භ කළ දින පටන් බණ්ඩාර මහතා හට වෘත්තියමය වශයෙන් දැඩි පීඩනයක් එල්ල වී ඇති බැව් සිද්ධින් අනුව පෙනී යයි. එසේම රාජ්‍ය පරිපාලන තන්ත්‍රය වෙනස්වීමත් සමඟම රාජ්‍ය සංස්ථා හා සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලද වෙනස් වූ අතර, එ අනුව හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමටද නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් වීම සහ එහි නව සභාපති තනතුරට එච්.ඩී.එස්. අමරසූරිය මහතා පත් වූ අතර, කළමනාකාර අධ්‍යක්ෂක ලෙස ඩී.ආර් පී අබේසිංහද, අධ්‍යක්ෂකවරුන් ලෙස එස්.සී.ඩී. මාටිනෝ එස්. ලංකේෂ්වර, ආර්.ඒ.ඒ ජයලත් සහ

එන්.එම්.එස්. මුණසිංහ යන අය පත් වී ඇත. (2020.08.10 වන දින පැමිණිලිකරු විසින් පැ10 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.)

මෙම පැමිණිලිකරු රැකියාවට පැමිණියේ කුරුණෑගල ප්‍රදේශයේ සිට නිසාත්, ගමනාගමනයේ පැවති අපහසුතාවයන් හේතු කොට ගෙන සහ රාජකාරී කටයුතුවල පහසුව සඳහාත් කොළඹ නැවතී රාජකාරී කිරීමට 2014.10.09 වන දිනදී ලිඛිතව ඉල්ලීමක් කළ අතර, එම ඉල්ලීමට එවකට සිටි කළමනාකරණය විසින් යම් සීමාවන්ට යටත්ව අවසර ලබා දී ඇත. එසේ වුවත්, 2015.08.27 වන දින එවකට කළමනාකරණ අධ්‍යක්ෂක ඩී.පී. ආර්. අබේසිංහ විසින් තව දුරටත් නවාතැන් පහසුකම් ලබාදිය නොහැකි බවත්, එසේ නවාතැන් පහසුකම් ලබා දිය නොහැක්කේ පැමිණිලිකරු තව දුරටත් කැන්විල් හෝල්ඩින්ස් සමාගම්වල සහ එහි අනුබද්ධ සමාගම්වල ප්‍රධාන මූල්‍ය කළමනාකාර තනතුරේ නොමැති නිසා බවත් දක්වමින්, දින 45 ක් ඇතුළත බදු ගිවිසුම අවසන් කිරීමට 2015.08.27 වන දින දරන ලිපියකින් දන්වා ඇත. (2020.08.20 වන දින පැමිණිලිකරු මෙම ලිපිය "පැ11" ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.) දේශපාලන පළිගැනීමේ ආරම්භය ලෙස මෙම සිද්ධිය සැළකිය යුතුය.

මෙම ලිපිය ලැබුණ දින සිට පැමිණිලිකරුට විරුද්ධව දිගින් දිගටම ගෘහස්ථ පරීක්ෂණයක් ආරම්භ කිරීමේ මූලික අරමුණ ඇතිව විටින් විට පැමිණිලිකරුගෙන් නිදහසට කරුණු විමසීම් කර ඇත. මෙහිදි මෙම නව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පෙර පැවති කළමනාකාරිත්වය යටතේ කරන ලද හෝටල් ව්‍යාපෘතින් දූෂණ සහ අක්‍රමිකතා වලින් පිරි ඇති බවට පූර්ව උපකල්පනය මත සිට ජනමාධ්‍ය හරහා විශාල ප්‍රචාරයක් ලබා දී, තවද චෝහාරික විගණනයක් කිරිමට S.J.M.S.

Associates Charted Accountants ආයතනය වෙතට පවරා විගණන වාර්තාවක් ලබාගෙන එහි ප්‍රතිඵලයක් වශයෙන් 2015.09.24 වන දින පැමිණිලිකරුට විරුද්ධව විවිධ චෝදනාවන් ඉදිරිපත් කොට නිදහසට කරුණු දක්වන ලෙසට දැනුම් දී ඇත. (2020.08.20 වන දින පැමිණිලිකරු මෙම ලිපිය පැ. 12 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.) මෙම චෝදනා පත්‍රයේ සඳහන් දින සිට දින හතක් ඇතුළත පිළිතුරු සැපයීමට අපොහොසත් වුවහොත් පිළිතුරු නොමැති බවට තීරණය කොට ක්‍රියා කරන බවට දැනුම් දී ඇත. මේ අවස්ථාවේදී පැමිණිලිකරු විසින් 2015.09.29 වන දින පිළිතුරු දීමට දින හතක් ප්‍රමාණවත් නොවන බව දක්වමින් දින 14ක් අවශ්‍ය බවට ඉල්ලුම් කරමින් ලිපියක් කළමනාකරණ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර ඇත. (2020.08.20 වන දින පැමිණිලිකරු මෙම ලිපිය පැ15 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.) එම ලිපියට පිළිතුරු ලෙස 2015.09.29 වන දින කළමනාකරණ අධ්‍යක්ෂ විසින් චෝදනාවන්ට පිළිතුරු දීමට 2015.10.09 වන දින දක්වා කල් ලබා දී ඇත. (2020.08.20 වන දින පැමිණිලිකරු මෙම ලිපිය පැ16 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.)

මේ අතරතුරදී 2015.10.05 වන දින චෝදනා හතකින් (07) යුක්තව පැමිණිලිකරුට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත. (2020.08.20 වන දින පැමිණිලිකරු මෙම චෝදනා පත්‍රය පැ19 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.) එදිනම එනම් 2015.10.05 වන දින පැමිණිලිකරුගේ රාජකාරි වැඩ තහනම් කොට රාජකාරී ස්ථානයට හෝ ඉදිකිරීම් ස්ථානවලට ඇතුල්වීම තහනම් බවත්, (2020.08.20 වන දින පැමිණිලිකරු එම ලිපිය (පැ18) ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.) එසේ රාජකාරී ස්ථානයට හෝ ඉදිකිරීම් ස්ථානවලට

ඇතුල්වීමට අවශ්‍ය වන්නේ නම් කළමනාකාර අධ්‍යක්ෂගෙන් විශේෂ අවසරයක් ලබාගත යුතුව ඇති බවටත් දැනුම් දී ඇත. නිදහසට කරුණු ඉල්ලා සිටියදී නැවත චෝදනා ඉදිරිපත් කර, වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් පරිපාලනයේදී නොකරන ක්‍රියාවක් වන අතර, කෙසේ හෝ පැමිණිලිකරුව සේවයෙන් පහ කිරීමේ ක්‍රියා පිළිවෙතකට එක් පියවරක් ලෙසටත්, එසේම දේශපාලන පළිගැනීමක් බවත් කොමිෂන් සභාව තීරණය කරයි.

පැමිණිලිකරු විසින් 2015.10.07 වන ඔහුට විරුද්ධව කර ඇති චෝදනාවන්ට පිළිතුරු ලිඛිතව ලබා දී ඇති අතර, ඉදිරිපත් කළ කිසිදු චෝදනාවකට ඔහු වරදකරු නොවන බව පැහැදිළිවම පිළිතුරු සැපයීමේදී සඳහන් කර ඇත. කළමනාකරණ අධ්‍යක්ෂක වන ඩී.පී.ආර්. අබේසිංහ විසින් පැමිණිලිකරු ලබාදි ඇති පිළිතුරු පිළිගත නොහැකි බවත්, ස්වාධින විමර්ශනයක් සිදු කිරිමට කටයුතු කරන බවත්, තව දුරටත් රාජකාරි වැඩ තහනම පවතින බවත් 2015.10.19 වන දින ලිපියකින් දන්වා ඇත. (2020.08.20 වන දින පැමිණිලිකරු එම ලිපිය පැ22 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.)

2015.12.14 වන දින කළමනාකරණ අධ්‍යක්ෂ වන ඩී.පී.ආර්. අබේසිංහ විසින් පැමිණිලිකරුට ලිපියකින් විනය පරීක්ෂණය 2016.01.08 වන දින පැවැත්විමට නියමිත බවත්, එදිනට නොපැමිණියහොත් විනය පරීක්ෂණය ඒකපාර්ශ්වික තීන්දුවක් ලබා දී අවසන් කරන බවත් දන්වා ඇත. (2020.08.20 වන දින පැමිණිලිකරු එම ලිපිය පැ23 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.)

2015 මාර්තු සිට 2016 මැයි මාසය දක්වා පැවති ලිපි හුවමාරුවෙන් පැහැදිළිවම දේශපාලන පළිගැනිමක් සිදු වී ඇති බව පෙනී යයි.එසේම

2016 මැයි මාසයේදී පමණ පැමිණිලිකරු කළමනාකරණ අධ්‍යක්ෂකව හමු වී ඇති අතර, ඒ අවස්ථාවේදී විනය පරීක්ෂණයෙන් පැමිණිලිකරු වන බණ්ඩාර වරදකරු කර ඇති බව දන්වා ඇති අතර, ඉල්ලා අස්වූවහොත් සහන සැලසිය හැකි බවට දැනුම් දුන් නිසා ඉල්ලා අස්වීමේ තත්ත්වය පත්විමට සිදු වූ බව දක්වා සිටී. මෙම තත්ත්වය උදාවීමට පාදක වූ මූලිකම හේතුව වී ඇත්තේ පෙර කළමනාකාරිත්වයේ සභාපතිත්වය දැරූ ගාමිණී සේදර සෙනරත් මහතා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ කාර්ය මණ්ඩල ප්‍රධානී තනතුරේ සේවය කර තිබීම වේ. ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන්නේ නම් සහන සැලසිය හැකි බව නව කළමණාකරණය දැන්වූ නිසා එම අවස්ථාවේදී පත්ව සිටි පීඩාකාරී තත්ත්වය සහ බලපෑම් හේතුකොට ගෙන පැමිණිලිකරු වන බණ්ඩාර ඉල්ලා අස්වීමට කටයුතු කර තිබුණද, පොරොන්දු වූ පරිදි හිඟ වැටුප් සහ දීමනා අතරින්, දීමනා පමණක් ලබා දී ඇති අතර, ඉල්ලා සිටි හිඟ වැටුප් කිසිවක් ලබා දී නැත.

දේශපාලන පළිගැනීම හේතුකොට ගෙන පැමිණිලිකරුට සේවය අහිමි වූ අතර, 2015.01.21 වෙනි දින අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කළ කැබිනට් සන්දේශයට කැබිනට් අනුමැතියක් ලැබීමෙන් පසු දූෂණ විරෝධී කමිටුව හා එයට අනුබද්ධ ලේකම් කාර්යාලයක්ද පිහිටුවන ලදි. එම ලේකම් කාර්යාලයට අනුයුක්තව නීති උපදේශකයින්ගේ උපදෙස් අනුව මෙම දූෂණය හා වංචා පිළිබඳ පැමිණිලි අදාළ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට යොමුකර ඇත. මේ අනුව පැමිණිලිකරුට හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු වූ ගාමිණී සෙනරත්ට හා පියදාස කුඩාබාලගේ යන තිදෙනාට විරුද්ධව තිබූ පැමිණිල්ල, දූෂණ විරෝධී ලේකම් කාර්යාලය

මගින් විමර්ශනය සඳහා මූල්‍ය අපරාධ කොට්ඨාසයට යවා ඇති අතර, ඒ මගින් දේශපාලන එදිරිවාදීන් දඩයම් කිරීමෙන් දේශපාලන පළිගැනීමේ තවත් ඉදිරි පියවරක් තැබූ බව කොමිෂන් සභාවට පෙනී යන ලදි. පැමිණිලිකරුගේ නීතිඥයින් මහේස්ත්‍රාත් උසාවියේදී මෙම පැමිණිල්ල පොදු දේපළ පණත යටතේ නොගැනෙන බවට කරන ඉල්ලීම මූල්‍ය අපරාධ අංශයේ නිළධාරීන් හා නීතිපතිගේ නියෝජිතයින් විසින් පිළිනොගන්නා ලදි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණ විනිසුරු මෙම පැමිණිල්ල පොදු දේපළ පණත යටතට නොගැණෙන බව දක්වා පැමිණිලිකරු හා අනෙක් අධ්‍යක්ෂවරුන් ඇප පිට නිදහස් කර ඇත.

කෙසේ වුවද මූල්‍ය අපරාධ කොට්ඨාසය මේ පැමිණිල්ල විමර්ශනය කොට නීතිපති මගින් පළාත්බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ අධිචෝදනා ගොනුකර නැවත දේශපාලන පළිගැනීමට ඉදිරි පියවරක් තබා ඇත.

පළාත් බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ ප්‍රථම නඩුව ලෙස මෙය සැලකෙන අතර, 2015ට පෙර සිටි අධ්‍යක්ෂ මණ්ඩලය වන පියදාස කුඩා බාලගේ, ගාමිණී සේදර සෙනරත්, නීල් හපුහින්න සහ පැමිණිලිකරු යන අයට විරුද්ධව බස්නාහිර පළාත්බද ත්‍රි පුද්ගල මහාධිකරණයේ අධි චෝදනා 24ක් පදනම් කරගෙන නඩු පවරා ඇත. මෙම නඩු විභාගයේ පැමිණිල්ලේ සාක්ෂි අවසන් වූ වහාම විත්ති වාචකය නොකැඳවූ මෙම නඩුවේ 3වෙනි විත්තිකරු වන නීල් හපුහින්න මහතා නිදොස් කර නිදහස් කරන ලද අතර, පසුව මෙම නඩු විභාගයෙන් පසු ඉතිරි චූදිතයින් 3දෙනා මහාධිකරණය විසින් නිදොස්

කර නිදහස් කර ඇත. මෙම නඩු පැවරීම සම්පූර්ණයෙන්ම දේශපාලන පළිගැනීමේ චේතනාවෙන් ගොණු කරන ලද්දක් බව ඉහත සඳහන් කරුණු වලින් පැහැදිළි වේ.

මෙම විමර්ශනයේදී සාක්ෂි විශ්ලේෂණය එක් අතකින් පැමිණිලිකරුට ඔහුගේ ථකියාව අහිමි වීම හා ඊට අදාළ කරුණු විශ්ලේෂණාත්මකව ඇගයීම වැදගත් වේ. අනෙක් අතින් දූෂණ විරෝධි කමිටුවේ ලේකම් ආනන්ද විජේපාල විසින් පොලිස් මූල්‍ය විමර්ශන කොට්ඨාසයට පැමිණිලිකරුට විරුද්ධව ඉදිරිපත් කරන ලද පැමිණිල්ල විමර්ශනය කිරීමට තරම් කරුණු තිබුණේද? එය සත්‍ය පැමිණිල්ලක්ද? යන්න හා විමර්ශනය කිරීමෙන් තොරව, පැමිණිලිකරු පදනම් රහිතව අත්අඩංගුවට ගෙන තිබේද? යන්න සම්බන්ධ කරුණු පරීක්ෂා කිරීම වැදගත්වේ.

පළමුවෙන්ම පැමිණිලිකරු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට සම්බන්ධ වූයේ 2006 වසරේ, එය පෞද්ගලික සමාගමක් ලෙස පැවති අවස්ථාවේදීය. ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට සම්බන්ධ වූයේ ගණකාධිකාරිවරයෙකු වශයෙන් වන අතර, වෘත්තියෙන් වරලත් ගණකාධිකාරිවරයෙක් විය. 2009 වර්ෂයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවකින් රක්ෂණ සංස්ථාව රජයේ කොටස් හිමි සමාගමක් බවට පත්වූ අතර, පැමිණිලිකරු 2012 වර්ෂයේ මැද භාගය දක්වා ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරයා ලෙස කටයුතු කළ අතර, 2012 පමණ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විවිධාංගීකරණය කිරීමෙන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගත් නිසා සමාගමට අනුබද්ධ

සමාගම් කිහිපයක්ම ස්ථාපිත කිරීම හේතුවෙන් පැමිණිලිකරුට සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ සමාගම්වල ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස පත්වීමක් ලැබී ඇත. ඒ අනුව ඔහුට වැටුප 2014 ජනවාරි මාසයේ සිට රු.175,000/-ක්ද, මසකට රු.60,000/-ක වාහන දීමනාවක්ද, මසකට ඉන්ධන ලීටර් 120 සරිලන මුදලක්ද සහ දුර රාජකාරී ගමන්වලට ඉන්ධන සඳහා වැය වූ සම්පූර්ණ මුදලද මොහුට ගෙවනු ලැබීය. (පැ.5).

පැමිණිලිකරුගේ රැකියාවට තර්ජන එල්ල වූණේ 2015 ජනාධිපතිවරණයෙන් පසුවය. එම මැතිවරණයේදී එක්සත් ජාතික පෙරමුණ බලයට පත්වූ අතර, මේ නිසා හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් වී නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරන ලදි. එහි සභාපති ලෙස හේමක අමරසූරිය පත්වූ අතර, පැමිණිලිකරු රජය වෙනස් වුවද, ඔහු සිය සේවය දිගටම කරගෙන යන ලදි. මේ අවස්ථාවේදී නවරජය ජනතාවට දුන් පොරොන්දුවක් අනුව “දූෂණ සෙවීමේ” ජනප්‍රිය තේමාව යටතේ දේශපාලන විරුද්ධවාදීන් දඩයම් කිරීමේ අරමුණෙන් මෙම සමාගම වෝහාරික විගණනයකට භාජනය කර, දූෂණ සිදු වී ඇති බවට මාධ්‍ය මගින් විශාල ප්‍රචාරයක් ලබා දී ඇත. මෙතැන් සිට ක්‍රමයෙන් පැමිණිලිකරු මානසික පීඩනයකට පත්කිරීමේ ක්‍රියාවලියේ නිරත වූ බව දක්නට ලැබුනු අතර, එය ලේඛනගත සාක්ෂිවලින් සනාථ වී ඇත. මෙම පැමිණිලිකරුට නවාතැන් දීමනාවක් 2014 ලබාගැනීමට හැකි වුවද, නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහුගේ නවාතැන් දීමනාව නතර කරන ලද අතර, විගණන

වාර්තාවේ යම් යම් කරුණු පදනම් කරගෙන ඔහුට විරුද්ධව නිදහසට කරුණු ඉල්ලා 2015 සැප්තැම්බර් මස 24 වෙනි දින ලිපියක් යවා ඇති අතර, දින 7ක් තුළදී එම චෝදනාවන්ට පිළිතුරු සපයන ලෙසට ඉල්ලා සිටියද, පැමිණිලිකරු ඒ සඳහා පිළිතුරු දීමට දින 14ක කාලයක් ඉල්ලා සිටි නමුත් ලැබී ඇත්තේ දින 7ක් පමණි. මේ අනුව (දිගින් දිගටම පීඩනයකට ලක්කොට) පැමිණිලිකරු ඉල්ලා අස්වීමේ ලිපිය දෙන තෙක් දැඩි පීඩනයකට ලක් කර ඇත. මෙම පැමිණිලිකරු දැඩි පීඩනයකට ලක් වූ බව පැහැදිළිව තහවුරු කිරීමට ඉදිරිපත් කර ඇති “පැ.12”, “පැ.16” යන ලේඛනවලින් හැකිවන අතර, 2015.10.05 වෙනි දින “පැ.15” ලේඛනයෙන් මොහුගේ සේවය තහනම් කොට, විධිමත් චෝදනා පත්‍රයක් “පැ.19” යටතේ නිකුත් කර ඇත. පැමිණිලිකරු චෝදනාවලට පැහැදිළිව පිළිතුරු සැපයුවද එම පිළිතුරු පිළිගැනීමට නොහැකි බව දන්වමින් ගෘහස්ථ පරීක්ෂණයක් පවත්වන බවත් (“පැ.22”) එය 2016.01.08 වෙනි දින පැවැත්වීමට නියමිත බවත් “පැ.23”න් දැනුම් දී ඇත. මේ අන්දමට පැමිණිලිකරු පිළිගත හැකි හේතූන් මත චෝදනා පත්‍රයේ දක්වා ඇති චෝදනාවලට පිළිතුරු දුන්නද, පැමිණිලිකරු එම චෝදනාවලට වැරදිකරු බව දක්වා, ඉල්ලා අස්වීම ව්‍යාංගයෙන් ඉදිරිපත් කොට, පැමිණිලිකරුගෙන් ඉල්ලා අස්වීම ලබාගෙන ඇත. මේ අනුව පැමිණිලිකරු දැඩි පීඩනයකට හා පළිගැනීමකට ලක්වූ බව ඉදිරිපත් කරන ලද ලේඛනවලින් තහවුරු වේ. මේ හෙයින් රැකියාව අත්තනෝමතිකව, ද්වේශ සහගතව, අසාධාරණ, අයුතු සහගත ලෙස අහිමි කිරීමට

බොහෝ දුරට හේතු වූයේ එවකට ජනාධිපති කාර්යාලයේ ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ ප්‍රධානී ගාමිණී සේදර සෙනරත් මහතා, මෙම දූෂණ සඳහා සම්බන්ධ කිරීමට තිබූ අවශ්‍යතාවය බැව් පැහැදිළිව පෙනේ. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ හා කාර්ය මණ්ඩලයේ ප්‍රධානි වන ගාමිණී සේදර සෙනරත් 2015 රජයට පෙර ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ සභාපති වූ අතර, එම කාලයේ සිදුවූවායැයි දක්වන දූෂණ වංචාවලට ගාමිණී සේදර සෙනරත් මහතාව සම්බන්ධ කිරීමේ උත්සාහ කර ඇත්තේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා දේශපාලන වශයෙන් අපහසු තත්ත්වයකට පත් කිරීමට වන අතර, පැමිණිලිකරුද දේශපාලන පළිගැනීමකට ලක්වූ බැව් ඉදිරිපත් වී තිබෙන සාක්ෂි සහ ලේඛනගත සාක්ෂිවලින් තහවුරු වේ.

පැමිණිලිකරු පදනම් රහිත අධිකරණ ක්‍රියාවලියකට ඇතුළත් කරනු ලැබුවේ දූෂණ මර්දන කොමිසම විසින් පැමිණිලිකරුට විරුද්ධව එවන ලද පැමිණිල්ල, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට විමර්ශනය කිරීමට ඉදිරිපත් කිරීමෙනි. එසේම පැමිණිලිකරු අපරාධවලට සම්බන්ධ කිරීමට තරම් තහවුරු වන සාක්ෂි නොමැතිව අධිකරණයට කරුණු වාර්තා කර, නීතිපති මාර්ගයෙන් බස්නාහිර පළාත්බද ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ චෝදනා ඉදිරිපත් කර දේශපාලන පළිගැනීමකට ලක් කර ඇත.

බස්නාහිර පළාත්බද ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ සැකකරුවන් 4දෙනෙකුට එරෙහිව නඩු පවරා ඇති අතර, (“පැ.37”) පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇති අධිචෝදනා අනුව මෙම නඩුව පදනම්

කරගෙන ඇත්තේ 2වන වූදිත පියදාස කුඩා බාලගේ විසින් චෝදනාවල සඳහන් ප්‍රධාන වරද සිදු කරනු ලැබ ඇත යන පදනම මත වන අතර, අනෙකුත් වූදිතයින්ට විරුද්ධව චෝදනා නගා ඇත්තේ ඔවුන් විසින් 2වන වූදිත වන කුඩාබාලගේ විසින් කරන ලද වරදවලට කුමන්ත්‍රණකාරීව එකඟ වීම හා ඊට ආධාර හා අනුබල දීම යන පදනම මත වේ. ඒ අනුව වූදිතයින්ට එරෙහිව නගා ඇති 1 සිට 9 දක්වා චෝදනාවල පදනම වන්නේ රුපියල් මිලියන පන්සියක මුදලක් සඳහා සාපරාධී විශ්වාසය කඩ කිරීම සහ ඊට කුමන්ත්‍රණය කිරීම සහ ආධාර අනුබල දීම වේ. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන අතර, ඔහු ක්‍රියාකළේ ප්‍රධාන මූල්‍ය නිලධාරියා ලෙසිනි.

මේ අනුව පැමිණිලිකරුට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයකට බලපෑම්කළ නොහැකි අතර, කළ යුතු කාර්යය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණවලට අවශ්‍ය සහාය හා එදිනෙදා කටයුතුවලට සහාය දී ඔහුගේ රාජකාරි කටයුතු කිරීම වේ. එසේම පැමිණිලිකරු කැන්විල් සමාගමේ සිට හෙලැන්කෝර් සමාගමට මුදල් බැර කිරීමේ කාර්යය කළේ පියදාස කුඩා බාලගේගේ දැනුම අනුව වන අතර, මේ අනුව පැමිණිලිකරු මෙම ක්‍රියාවලියට කුමන්ත්‍රණකාරි හෝ වරදක් කිරීම සඳහා අනුබල දීමේ චේතනාවෙන් ක්‍රියා කළ බව සැකයෙන් තොරව තහවුරු නොවන නිසා පැමිණිලිකරු මෙම නඩුවේ ඉදිරිපත් කර ඇති 1 සිට 9 දක්වා ඇති චෝදනා සාධාරණ සැකයකින් තොරව, තහවුරු වීමක් සිදු නොවන බව මහාධිකරණය තීරණය කර ඇත.

එසේම මහාධිකරණය විසින් අවසාන තීන්දුවේදී පැමිණිලිකරුට එරෙහිව අධිචෝදනා 1,5,9,10,14,15,19,20 සහ 24 සාධාරණ සැකයෙන් තොරව ඔප්පු වී නොමැති නිසා චෝදනාවලින් නිදොස් කර නිදහස් කර ඇත.

මේ අනුව දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලය විසින් පොලිස් මූල්‍ය කොට්ඨාසයට ඉදිරිපත් කර ඇති පැමිණිල්ල පදනම් විරහිත එකක් බව අධිකරණ තීන්දුවෙන් මැනවින් පෙන්නුම් කරන අතර, අගමැති කාර්ය මණ්ඩල ප්‍රධානී ගාමිණී සේදර සෙනරත් මහතාට දේශපාලන වශයෙන් පළිගැනීමේ අවශ්‍යතාවය මත ගාමිණී සේදර සෙනරත්, පියදාස කුඩාබාලගේ, නීල් හපුහින්න සහ පැමිණිලිකරුට මහාධිකරණයේ පදනම් විරහිතව නඩු පැවරූ බව මැනවින් පැහැදිලි වේ.

මෙම වාර්තාවේ ඉහත වාර්තා කර ඇති පරිදි ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙතෙක් වාර්තා නොවූ අධිකරණ ක්‍රියාවලිය තුළින් දැඩි දේශපාලන පළිගැනිමකට රාජ්‍ය හා රාජ්‍ය සංස්ථාවල නිළධාරීන් ලක්වූ බව නොරහසකි. 2015 දී කැබිනට් සන්දේශයක් මත ස්ථාපිත කරන ලද දූෂණ විරෝධි කමිටුවේ කෙටි කාලීන වැඩසටහන් යටතේ මහා පරිමාණයේ දූෂිතයනට හා ජාවාරම්කරුවන් ලෙස සැක කෙරෙන පුද්ගලයින්ගෙන් අවම වශයෙන් 15 දෙනෙකුගේ දූෂණ වංචා, වත්කම් හා බැරකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙම කමිටුවේ අදාළ කාර්යයක් ලෙස "පැ.39" මගින් පෙන්නුම් කර ඇත. දූෂණ මර්දන කමිටුව විසින් ඉදිරිපත් කළ පැමිණිල්ල මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් විමර්ශනය කර

පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරගත කර, පසුව නීතිපති මගින් අධි චෝදනා මහාධිකරණයට ඉදිරිපත් කළද එම චෝදනා ඔප්පු කිරීමට නොහැකි චෝදනා නිසා පැමිණිලිකරු නිර්දෝෂ කර නිදහස් වූ අතර, මෙම අධිකරණ කටයුත්ත මුල් වූයේ දේශපාලන පළිගැනීමට බව ඉතා පැහැදිළිව පෙනේ. තවද මෙහිදී පැමිණිලිකරු කිසිදු වරදක් නොකර මානසික පීඩනයකට පත්කොට සේවයෙන් ඉල්ලා අස්වීමේ තත්ත්වයකට පත්කරන ලදි. පැමිණිලිකරු කිසිදු වරදක් නොකරන ලද නිසාද, ඔහු මෙම ආයතනයේ රැකියොවේ නිරත වූයේ දේශපාලන පත්වීමකින් නොවන නිසාද, ඔහු 2015 ජනාධිපති මැතිවරණයෙන් පසුවද ඔහුගේ රාජකාරිය දිගටම කරගෙන යන ලදි . නමුත් 2015 මැතිවරණයෙන් පසු පත් වූ අධ්‍යක්ෂ මණ්ඩලය පැමිණිලිකරු සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය නිසා දැඩි පීඩනයකට ලක් විය. මේ නිසා පැමිණිලිකරු සිය තනතුරෙන් ඉල්ලා අස්වීම දක්වා එම පීඩනයකට ලක් වූ නිසා ඔහුගේ ඉල්ලා අස්වීම භාරදෙන ලදි. මින් පෙනී යන්නේ පැමිණිලිකරු දේශපාලන පළිගැනීමක් වශයෙන්, අනුමිතික සේවය නතර කිරීමක් (Constructive Termination) සිදු වී ඇති බවයි.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ. 32 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 .LVII

පැමිණිලි අංකය - 415/2020

පැමිණිලිකරු - විතාරණ ආරච්චිගේ සිරිමෙවන් ප්‍රසන්න නානායක්කාර

ලිපිනය - නො.20/31, ෆෙයාෆීල්ඩ් උද්‍යානය, කොළඹ 8.

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් කරන ලද පුද්ගලයින් වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. එනම්;

1. ශානි අබේසේකර
2. සහකාර පොලිස් අධිකාරි තිසේරා
3. පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා
4. පොලිස් සැරයන් 35021 ඩී.ආර්.කන්නන්ගර

## තීරණය

1. පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවේදී ඉදිරිපත් කළ සාක්ෂි හා ලේඛන ඇඩි පරීක්ෂාව යටතේ විශ්ලේෂණය කිරීමෙන් පසුව පැමිණිලිකරු සිරිමෙවන් ප්‍රසන්න නානායක්කාර, ලසන්ත වික්‍රමතුංග ඝාතනයේ සාක්ෂි වසන් කිරීමේ වරදකට හසුකරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් මාස 5ක පමණ කාලයක් රක්ෂිත බන්ධනාගාරගතව කුමන්ත්‍රණය කිරීම , ඒ

සඳහා ආධාර අනුබල දීම, ඉහත සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියාකර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් සනාථ වී ඇති බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමේදී ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛන පරීක්ෂණයෙන් පසු පැමිණිලිකරු වන සිරිමෙවන් ප්‍රසන්න නානායක්කාරට එරෙහිව ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ ඉදිරිපත් කර ඇති B 92/2019 දරන B වාර්තාවේ සහ ඊටපසු ඉදිරිපත් කර ඇති සියලුම වැඩිදුර වාර්තාවන්හි සඳහන් කර ඇති සියලු චෝදනාවලින් පැමිණිලිකරුවන සිරිමෙවන් ප්‍රසන්න නානායක්කාරට එරෙහිව ප්‍රමාණවත් විශ්වාසදායක සාක්ෂි නොමැති නිසා නිදොස් කොට නිදහස් කළ යුතු බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. ලසන්ත වික්‍රමතුංග ඝාතනය විමර්ශනය කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බොහෝ දුරට උත්සාහ කළේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මෙම ඝාතනයට සම්බන්ධ කිරීමටය. මේ නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් නිර්මාණය කරන ලද ප්‍රකාශයක් පැමිණිලිකරු ලවා කරවා ගැනීමට, පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගත් අවස්ථාවේදී ද, ඉන්පසු රක්ෂිත බන්ධනාගාරයේ මාස 5ක් රඳවා සිටි කාලයේදීද, ලබා ගැනීමට උත්සාහ කළද එම උත්සාහය ව්‍යර්ථ වීම නිසා දිගු කාලයක් රක්ෂිත බන්ධනාගාරගතව සිටීමට සිදු වීමෙන් දේශපාලන පළිගැනීමකට ලක්වූ බව මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. පැමිණිලිකරු විසින් කොමිසම ඉදිරියේ දෙන ලද සාක්ෂි හා ඉදිරිපත් කරන ලද ලේඛන අනුව ඉහත සඳහන් වගඋත්තරකරුවන් B 92/2019 වැඩිදුර වාර්තාව ඉදිරිපත් කරමින් අසත්‍ය කරුණු නිර්මාණය කර අධිකරණය නොමග යවමින් ක්‍රියා කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය කියවිය යුතු 190 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමේ වරද සිදු කිරීම.

2. තවද ඉහත සඳහන් වගඋත්තරකරුවන් අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමේ වැරදි සිදු කිරීම සඳහා ආධාර අනුබල දීමෙන් පෙනී යන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බවය.

3. එසේම ඉහත දක්වා ඇති වගඋත්තරකරුවන් තිදෙනා අසත්‍ය සාක්ෂි ගොතා පැමිණිලිකරු B92/2019 වාර්තාව අධිකරණයට ඉදිරිපත් කරමින් පදනම් රහිත චෝදනා පැමිණිලිකරුට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඒ7 බී පරිශිෂ්ටයේ විනය සංග්‍රහයේ 1වෙනි වගන්තිය ප්‍රකාරව අපකීර්තිදායක ලෙස හැසිරීම එනම්, පොලිස් නිළධාරියෙකු වශයෙන් පොලිස් සේවයට කැළලක් විය හැකි අන්දමින් හෝ හැසිරීම යන චෝදනා යටතේ වගඋත්තරකරුවන් 3දෙනාට විරුද්ධව චෝදනා පත්‍ර නිකුත් කර, විධිමත් මූලික පරීක්ෂණයකින් පසු වැරදිකරු වූ විට දැඩි දඬුවම් ලබාදිය යුතු යැයි කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

4. ඉහත සඳහන් වගඋත්තරකරුවන් පැමිණිලිකරුව අසත්‍ය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඒ7 බී පරිශිෂ්ටයේ විනය සංග්‍රහයේ 2වෙනි වගන්තියේ ජී ප්‍රකාරව අණට අකීකරු වීම හෝ පීඩාකාරී ලෙස හැසිරීම එනම් පොලිස් නිලධාරියෙකු වශයෙන් පොලිස් සේවයට කැළලක් විය හැකි අන්දමින් හෝ හැසිරීම වරද කර තිබීම යන චෝදනාව යටතේ වගඋත්තරකරුවන් තිදෙනාටම විරුද්ධව චෝදනාපත්‍ර නිකුත් කොට විධිමත් මූලික පරීක්ෂණයකින් පසු වරදකරු වූ විට දඬුවම් ලබා දිය යුතු යැයි කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

5. ඉහත සඳහන් වගඋත්තරකරුවන් තිදෙනාට එරෙහිව මෙම වාර්තාවේ දක්වා ඇති වරදවලට නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනාපත්‍ර ගොණු කිරීම සඳහා එම නඩුවලට අදාළ සාක්ෂි හා ලේඛන ගොණුව නීතිපති වෙත

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

2009.01.08 වෙනි දින මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය සිදු වීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරු සැකපිට අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කිරීම සම්බන්ධයෙන්.

ඉහත දක්වා ඇති පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම වාර්තාවේ දැක්වෙන දිනයන්හිදී අපරාධ කළ බවට හෝ අනුබල දුන් බවට හෝ කුමන්ත්‍රණය කළ බවට හෝ පැහැදිලි කරුණු

නොමැතිව සැලසුම් කරන ලද අධිකරණ ක්‍රියාවලියක් මත අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කොට පසුව ඇප මත මුදා හැර ඇති අතර, මෙම පැමිණිලිකරුට මුහුණදීමට සිදු වූ හිංසාකාරී ක්‍රියා දේශපාලන පළිගැනීමක් මත සිදු කරන ලද බවට පැමිණිලිකරු විසින් මෙම කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති හෙයින් එලෙස ඉදිරිපත් කරනු ලැබූ පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව විමර්ශනයක් ආරම්භ කළ අතර, එම විමර්ශන වාර්තාව පහත දක්වා ඇත.

2009.01.08 වෙනි දින මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය සිදු වීමේ සිද්ධියට අදාළව දේශපාලන පළිගැනීමකට ලක්වූ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විතාරණ ආරච්චිගේ සිරිමෙවන් ප්‍රසන්න නානායක්කාර සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ විමර්ශන වාර්තාව.

2015 ජනවාරි මස සහ අගෝස්තු මස පිළිවෙලින් පැවැත්වූ ජනාධිපතිවරණය සහ මහ මැතිවරණයට පෙර නිලයන් දැරූ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සංස්ථාවල, ත්‍රිවිධ හමුදාවන්හි මෙන්ම පොලිස් සේවයේ සමාජිකයින් 2015 ජනවාරි මස 08 වෙනි දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 වෙනි දිනෙන් අවසන් වූ කාල සීමාව තුළදී දේශපාලනමය වශයෙන් පළිගැනීමකට ලක්වූ සමාජිකයින්ට සිදු වූ අගතිගාමී සිද්ධි සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා මෙම කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි.

2015 ජනවාරි මස 8වෙනි දින පැවැත්වූ ජනාධිපතිවරණයෙන් එක්සත් ජාතික පෙරමුණේ ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා තේරී පත්වී දින 12 තුළදී අගමැති රනිල් වික්‍රමසිංහ

මහතා මහ මැතිවරණයේදී දූෂණ නැති කිරීමට විශේෂ විමර්ශන අංශයක් ස්ථාපනය කරන බවට ජනතාවට දුන් පොරොන්දුව මත, පසුගිය රජය විසින් කර ඇති දූෂණ අක්‍රමිකතා අනාවරණය කර විමර්ශනය කිරීම සඳහා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර ඒ මගින් දූෂණ විරෝධි කමිටුවක් පිහිටුවීමට යෝජනා කර තිබුණි.

මෙම යෝජනාවෙන් පිහිටුවන ලැබූ දූෂණ මර්දන කමිටුව කාර්යක්ෂම කිරීම සඳහා අනුකමිටු හා ක්ෂණික ප්‍රතිචාර කමිටුවක් පිහිටුවා ඒ සමගම දූෂණ හා වංචා පිළිබඳ පැමිණිලි යෝජනා කරන ලද විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවා විමර්ශන කටයුතු ඒ මගින් ආරම්භ කරන ලදි.

මෙම දූෂණ විරෝධි කමිටුවේ වෙනත් වැඩ සටහන් යටතේ ඉදිරිපත් කර තිබූ කරුණු අතර, වැදගත් කරුණක් වන්නේ මාධ්‍යවේදීන් ඝාතනය කිරීම පිළිබඳව සොයා බැලීමට විශේෂ ඒකකයක් පිහිටුවීම හා එම කමිටුවෙන් ලැබී ඇති උපදෙස් අනුව මාධ්‍යවේදීන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් විමර්ශන ආර්මභ කොට එසේ ක්‍රියාත්මක වීමේදී අත්අඩංගුවට ගත් අයගෙන් නිර්මාණය කරන ලද ප්‍රකාශ අපරාධ නඩු විධාන පණතේ 127 වෙනි වගන්තිය අනුව සටහන් කරවා ගැනීමේ උත්සාහය අසාර්ථක වීම නිසා රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් හිංසනයට පත්කර පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කර ඇති බවට සාක්ෂිවලින් කරුණු අනාවරණය වී ඇත.

පැමිණිලිකරු වන විතානආරච්චිගේ සිරිමෙවන් ප්‍රසන්න නානායක්කාර 1972.10.01 වෙනි දින පොලිස් උපපරීක්ෂකවරයෙකු වශයෙන් පොලිස් සේවයට බැදී පුහුණුවෙන් පසුව පොලිස් ස්ථාන

කිහිපයක සේවය කිරීමෙන් පසුව ප්‍රධාන පොලිස් පරීක්ෂක, සහකාර පොලිස් අධිකාරි, පොලිස් අධිකාරී, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි යන තනතුරු දැරිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරේ රාජකාරි කරන අවස්ථාවේදී 2007.12.14 වෙනි දින නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන් උසස්වීම් ලැබූ අතර, 2011.12.14 වෙනි දින විශ්‍රාම යාමට පෙර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන්උසස් වීම් ලැබ සේවය කර ඇත. පැමිණිලිකරු ලසන්ත වික්‍රමතුංග ඝාතනය සිදුවන අවස්ථාවේදී එනම්, 2009.01.08 වෙනි දින බස්නාහිර දිසා දකුණ නියෝජ්‍ය පොලිස්පති ලෙස ක්‍රියාකර ඇත. පැමිණිලිකරුගේ ප්‍රකාශය අනුව 2008.11.15 වෙනි දින සිට 2010.02.05 වෙනි දින දක්වා කාලය තුළ සේවය කර ඇත්තේ බස්නාහිර දිසාවේ දකුණ බව ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරු විසින් සාක්ෂි දුන් අවස්ථාවේදී ඉදිරිපත් කළ 2017.02.31 වෙනි දින බදාදා ලංකාදීප පුවත්පතෙහි පළවූ වාර්තාවක් අනුව ලසන්ත වික්‍රමතුංග මහතා 2009.01.08 වෙනි දින උදෑසන 8.20 ට පමණ ඔහුගේ නිවස පිහිටි  පූර්වාරාම පාරේ කන්දවත්ත ටෙරස් පාරේ  නිවසින්, ඔහුගේ WPKP 1098 දරන සිල්ව පාට ටොයෝටා කොරොල්ලා රිය පදවාගෙන බත්තරමුල්ල නිවසට  ගොස් ඇත්තේ ඔහුගේ සේවකයෙකුට බෙහෙත්  ලබා දීමටය. එහි ගොස් ඒමට සැරසෙන විට යතුරු පැදියක් ඔහු හඹා එන අයුරු දැක වහාම නැවත වාහනය ගේට්ටුවෙන් ඇතුළට ගෙන එකී යතුරු පැදිය ගේට්ටුව පසුකර ගොස්  මද වේලාවකින් නැවතත් සන්ඩේ ලීඩර් ආයතනයට යෑමට පිටත් වී ඇත. මෙසේ යන අතරතුර දී අසාද් සාලි, මලික් සමරවික්‍රම සහ තවත් කිහිප දෙනෙකු ලසන්ත වික්‍රමතුංගට ඇමතුම් ලබාදී ඇති අතර, එම අවස්ථාවේදී ඔහු පසුපස යතුරු පැදියක් ලුහුබඳින බව ප්‍රකාශ කර ඇති අතර, මලික් සමරවික්‍රම මහතා වරින්

වර ඔහුට කතා කොට ආරක්ෂිත ස්ථානයට යන ලෙස උපදෙස් දී ඇත.

අත්තිඩිය මලගල කණිෂ්ඨ විද්‍යාලය අසල, කහ ඉරට එහා බස් රථයක් නතර කිරීම නිසා ලසන්ත වික්‍රමතුංග මහතාගේ වාහනයද එම අවස්ථාවේදී මදක් නතර කිරීමට සිදු විය. මේ අවස්ථාවේදී යතුරු පැදි දෙකක් ලසන්තගේ වාහනය හරස් කර, නතර කර ඇති අතර, තවත් යතුරු පැදි 2ක් පැත්තෙන් නතර වී ඇත. ඉන් බැස ගත් පිරිස ලසන්ත වෙත ගොස් යමකින් ඇන යතුරු පැදි 2ක් පිළියන්දල දෙසටත් අනෙක් යතුරු පැදි දෙක ගල්කිස්ස දෙසටත් අධිවේගයෙන් ගොස් නොපෙනී ගිය බව වාර්තාවේ. මේ අවස්ථාවේදී අවට සිටින අය ලසන්ත වික්‍රමතුංග මහතා වෑන් රථයක නංවා කළුබෝවිල රෝහලට රැගෙන ගොස් ඇති අතර, ඔහු ශල්‍යකර්මයකට භාජනය කළද සාර්ථක නොවීමෙන් එදින දවල් ලසන්ත වික්‍රමතුංග මහතා මියගොස් ඇත. 2019.01.12 වෙනි දින පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ අධිකරණ වෛද්‍ය නිළධාරිවරයාගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ වෙඩි තැබීමකින් සිදු වූ මරණයක් බව වාර්තා වී ඇත. මෙම ඝාතනය ගල්කිස්ස පොලිස් වසමේ සිදු වූ ඝාතනයක් නිසා මෙහි විමර්ශන ගල්කිස්ස පොලිසියේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි හේමන්ත අධිකාරී ඇතුළු අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක තිස්ස සුමතිපාල හා පොලිස් කණ්ඩායම විසින් විමර්ශන කටයුතු ආරම්භ කර ඇත. ගල්කිස්ස පොලිස් කොට්ඨාසය, බස්නාහිර දකුණ දිසාව යටතේ පාලනය වන නිසා එම කොට්ඨාසයේ ඇති වන සිද්ධීන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ගල්කිස්ස කොට්ඨාසය මගින් හා නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර දකුණ මගින් අධීක්ෂණය කළයුතු වේ. කෙසේ වුවද මෙම සිද්ධීන් වන අවස්ථාවලදී පැමිණිලිකරු 2009.02.07 වෙනි

දින සිට 2009.01.10 වෙනි දින දක්වා ඔහුගේ දියණියගේ මංගල්‍යය වෙනුවෙන් දින 4ක් නිවාඩු ලබාගෙන ඇත. පළමුවන මාස කිහිපය ගල්කිස්ස කොට්ඨාසය මගින් විමර්ශනය ආරම්භ කර ඇති නමුත් 2009 වසරේ දෙසැම්බර් මාසයේදී පමණ විමර්ශනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදී ඇත.

පැමිණිලිකරුවන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විතාරණ ආරච්චිගේ සිරිමෙවන් ප්‍රසන්න නානායක්කාර මහතා 2020.02.10 වෙනි දින මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් කුමන්ත්‍රණය කිරීම හා සාක්ෂි වසන් කිරීම අසත්‍ය චෝදනා ඉදිරිපත් කර මාස 5ක් හා දින 4 ක් දේශපාලන වශයෙන් පළිගැනීමේ චේතනාවෙන් ඔහුව රක්ෂිත බන්ධනාගාරගත කිරීම සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාවට පැමිණිල්ලක් කරන ලද අතර, 2020.07.02 වෙනි දින ඇතුලුව දින 3 ක් මෙම කොමිසමේ පොලිස් ඒකකයට පැමිණ පැමිණිලි කර ඇත. (පැ.1) සහ (පැ.2) පැමිණිලිකරු නියෝජ්‍ය පොලිස්පති ලෙස දකුණු දිසාව 2008.11.15 වෙනි දින සිට 2010.02.05 වෙනි දින දක්වා සේවය කළ බව සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂිකරු ඔහුගේ දියණියගේ මංගල උත්සවයට 2009.01.07 වෙනි දින සිට 2009.01.10 වෙනි දින දක්වා දින 4 ක් නිවාඩු ගෙන සිටියදී 2009.01.08 වෙනි දින සන්ඩේ ලීඩර් පුවත්පතේ ප්‍රධාන කර්තෘ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය සිදුවී ඇත. සාක්ෂිකරු 2009.01.11 වෙනි දින සේවයට වාර්තා කිරීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි හේමන්ත අධිකාරීගෙන් ලබාගත් වාර්තාව අනුව වහාම විමර්ශන සැලැස්මක් සාදා විමර්ශන උපදෙස් 2009.01.11 වෙනි දින සියලුම විමර්ශන භාර නිළධාරීන්ට දුන් බවට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද ලේඛන අනුව පෙනී යයි. (පැ.2) . ඉන්පසු දිගින් දිගටම 2009.01.22 හා

ඉන්පසු දින කිහිපයකට විමර්ශනයේ යෙදී සිටි නිළධාරීන් කැඳවා විමර්ශනවල ප්‍රගතිය ලබාගත් බව සාක්ෂියේදී හෙළිකර ඇත. කොමිෂන් සභාවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ සාක්ෂි අනුව එවකට සිටි පොලිස්පති ජයන්ත වික්‍රමරත්න මහතාට අරවින්ද නම් තැනැත්තෙකු විසින් මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනයට සම්බන්ධ යතුරුපැදි අත්තිඩිය ඇළේ දමා තිබෙන බවට ලැබුණු තොරතුරක් පැමිණිලිකරුට ඉදිරිපත් කොට ඒ සම්බන්ධයෙන් පැමිණිලිකරු විමර්ශන ආරම්භ කර ඇත. එමගින් යතුරුපැදි සොයාගෙන ඇති අතර, එම අංක තහඩු සම්බන්ධයෙන් විමර්ශනය කිරීමෙන් පසුව ඒ අයිතිකරු වවුනියා ප්‍රදේශයේ කෙනෙකු බව අනාවරණය වීම නිසා ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භ කර ඇති බවට සාක්ෂිවලින් හෙළිවේ. මෙම විමර්ශනයේ ඇති සංකීර්ණභාවය නිසා පැමිණිලිකරු මෙම විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදී ඇත.

මෙම පරීක්ෂණ නැවත වරක් ආරම්භ වුයේ 2015 ජනවාරි මස 8 වෙනි දින ජනාධිපතිවරණයත් සමග සිදු වූ පරිපාලන වෙනස්වීමෙනි. 2009 සිට 2016 දක්වා පැමිණිලිකරුට විරුද්ධව කිසිදු විමර්ශනයක් සිදුකළ බවට සාක්ෂිවලින් අනාවරණය නොවේ. 2016 පැමිණිලිකරුට අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබුණු කැඳවීමක් අනුව එහි ගොස් සහකාර පොලිස් අධිකාරි හමුවුණු බවද, එහිදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳ ගල්කිස්ස, මිරිහාන පොලිස් ස්ථානවලින් සිදුකරන විමර්ශන සම්බන්ධයෙන් කළ ප්‍රශ්නවලදී ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් දී නැවත නිවසට පැමිණ ඇත.

ඉන්පසු නැවත වරක් 2017දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කැඳවන ලද බවත් එහි ගිය විටදී පොලිස් පරීක්ෂක නිශාන්ත ද

සිල්වා සහකාර පොලිස් අධිකාරී තියේරා විසින් පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කර ඇත්තේ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ක්ෂේත්‍ර සටහන් පොත (Field Note Book) සම්බන්ධයෙනි. මෙහිදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රශ්න කර ඇත්තේ එම ක්ෂේත්‍ර සටහන් පොත් පොලිස්පතිට භාර දුන්නාද, නැතිනම් එය ආරක්ෂක ලේකම්ව සිටි ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත භාරදුන්නාද යන්න සම්බන්ධයෙනි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද විමර්ශනයේදී මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මිය යාමට පෙර ඔහු පසුපස හඹා එන යතුරුපැදි දෙකක අංක ලසන්ත වික්‍රමතුංග විසින් ක්ෂේත්‍ර සටහන් පොතේ (Field Note Book) සටහන් කර තිබුණු බවට අනාවරණය වී ඇත. මෙම සටහන් පොත 2009.01.08 වෙනි දින උප පොලිස් පරීක්ෂක වීරසිංහ විසින් සැකකරු දේපළක් වශයෙන් දේපළ කුවිතාන්සි ලේඛනයේ ඇතුළත් කර ඇති බවට සාක්ෂිවලින් අනාවරණය වී ඇත. එසේම විමර්ශනයට අනුව 2000.01.16 වෙනි දිනට අනුව ගල්කිස්ස පොලිස් ස්ථානයේ ස්ථානාධිපති (අපරාධ) ලෙස රාජකාරි කළ උප පොලිස් පරීක්ෂක තිස්ස සිරි සුගතපාල විසින් මෙම ක්ෂේත්‍ර සටහන් පොත නඩු භාණ්ඩයක් වශයෙන් ලේඛනයෙහි ඇතුළත් කර ඇත. මෙහිදී විමර්ශනයට අනුව තිස්ස සිරි සුමතිපාල සහ ගල්කිස්ස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි යන දෙදෙනා පවසා ඇත්තේ එවකට බස්නාහිර පළාත් දකුණ නියෝජ්‍ය පොලිස්පති ප්‍රසන්න නානායක්කාර මහතා පොලිස් අධිකාරි කාර්යාලයට පැමිණ එම ක්ෂේත්‍ර පොත (Field Note Book) රැගෙන ගිය බවයි. කෙසේ වුවද මෙම නිළධාරීන් දෙදෙනාගෙන් පසුව කරන ලද ප්‍රකාශ වලදී මේ පොත භාරදී ඇත්තේ ගල්කිස්ස පොලිස් අධිකාරී කාර්යාලයේදී නොව

නියෝජ්‍ය පොලිස්පතිගේ මිරිහාන කාර්යාලයේදී බව ප්‍රකාශ කර ඇත. මෙය සනාථ කිරීමට දුරකථන කුලුනුවලින් ගත් දත්තයන් විමර්ශකයින්ට ඉදිරිපත් කර ඇත. කෙසේ වුවද මෙම ක්ෂේත්‍ර සටහන් පොත පැමිණිලිකරුවන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට භාරදුන් ස්ථානය සම්බන්ධයෙන් සැකයක් ඇත. එය භාරදුන්නේ ගල්කිස්ස පොලිස් කාර්යාලයෙන්ද? නැතහොත් මිරිහාන නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ කාර්යාලයෙන්ද? යන්න ප්‍රශ්නගතවේ. අපරාධ නඩුවක සාක්ෂි සැකයෙන් තොරව ඔප්පු කළ යුතුය. මේ නිසා ක්ෂේත්‍ර සටහන් පොත නියෝජ්‍ය පොලිස්පති ලබාගත්තා යයි දක්වන කරුණු සැකයෙන් තොරව ඔප්පු කළ නොහැක. තවද පැමිණිලිකරු වන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලබා ගත්තා යයි කියන ක්ෂේත්‍ර සටහන් පොතට සමාන පොතක් පොලිස් කොස්තාපල් 63764 ඇතුගල නිළධාරියා රත්මලාන නාලක Exercise books ආයතනයෙන් රැගෙන ස්ථානාධිපති අපරාධ ලෙස ක්‍රියාකළ තිස්ස සිරි සුගතපාල වෙත භාරදුන් බව විමර්ශනවලින් අනාවරණය වුවද එය පැමිණිලිකරුට අදාළ කරුණක් නොවේ. (ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවි B92/9 දරන වැඩිදුර වාර්තාව 2018.02.18 වෙනි දින)

තවදුරටත් මෙම විමර්ශනයේදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීගේ ප්‍රකාශය අනුව ක්ෂේත්‍ර සටහන් පොත ලේඛනගත කිරීම සම්බන්ධයෙන් තිබුණු සටහන් පිටු නියෝජ්‍ය පොලිස්පති නානායක්කාරගෙන් ලැබුණු උපදෙස් අනුව තිස්ස සිරි සුගතපාල විසින් ගළවා ඉවත් කළ බව ප්‍රකාශ කර ඇත. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී හේමන්ත අධිකාරිට අනුව මෙම ක්ෂේත්‍ර සටහන් පොත් එක් අවස්ථාවකදී පොලිස් අධිකාරි කාර්යාලයේදී නියෝජ්‍ය පොලිස්පති ලබාගත් බවත්, තවත් අවස්ථාවකදී ක්ෂේත්‍ර සටහන් පොත සහ P.C.I.B (සුළු පැමිණිලි

තොරතුරු පොත) පොත මිරිහාන පොලිස් කාර්යාලයට ගෙන ගිය බවත්, ක්ෂේත්‍ර සටහන් පොතට අදාළ තොරතුරු පොතේ ලියා ඇති කොටස් ගලවන ලෙසට නියෝජ්‍ය පොලිස්පති විසින් තිස්ස සිරි සුගතපාලට උපදෙස් දුන් බවත් ජොෂ්ඨ පොලිස් අධිකාරී විමර්ශනයේදී ප්‍රකාශ කර ඇත.

මෙම සාක්ෂිවලින් පැන නගින ප්‍රශ්නය වන්නේ තොරතුරු පොත් එහා මෙහා ගෙනයෑම සම්බන්ධයෙනි. තොරතුරු පොතක් පොලිස් ස්ථානයෙන් පිටට ගෙනයන විට එය උපසේවයේ (Reserve Duty) නිළධාරියා විසින් සටහන් පොත් රැගෙන යන බවත් එසේ නැතහොත් තොරතුරු පොත් රැගෙන යන නිළධාරියා සටහන් යෙදිය යුතුය. මෙවැනි සටහනක් කළ බවක් විමර්ශනයේදී අනාවරණය වූ බවක් දක්වා නැත.

ජොෂ්ඨ පොලිස් අධිකාරි විමර්ශනයේදී දක්වා ඇත්තේ ඇළේ තිබී සොයාගත් යතුරු පැදිය මෙම අපරාධයට සම්බන්ධ නැති බවත් එම තොරතුරු දී ඇති අය විමර්ශන මාර්ගය වෙනස්කර මෙම ඝාතනය එල්.ටී.ටී.ඊ ය විසින් කළ බවට දක්වන ලද උත්සාහයක් බවය. මේ අනුව ජොෂ්ඨ පොලිස් අධිකාරි දක්වා ඇත්තේ ක්ෂේත්‍ර සටහන් පොතේ ලසන්ත වික්‍රමතුංග විසින් සටහන් කළ යතුරු පැදි දෙකේ අංක 2 තිබුණානම් විමර්ශනය සාර්ථක කර ගැනීමට හැකි බවය. මෙයින් පෙනී යන්නේ පොලිස් අධිකාරි හේමන්ත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමග සාක්ෂි නිර්මාණය කිරීමට උත්සාහ කරන බවකි.

එසේම විමර්ශනය අනුව තිස්ස සිරි සුමතිපාලගේ ප්‍රකාශය අනුව තොරතුරු පොත්වල පිටු ගැළවීමෙන් පසු නියෝජ්‍ය පොලිස්පති

ප්‍රසන්න නානායක්කාරට ලබා දීමට ප්‍රථමයෙන් එම පිටුවල පිටපත් ලබාගෙන එම තොරතුරු පොතේ පිටු නියෝජ්‍ය පොලිස්පතිවරයාට දුන් බව ප්‍රකාශ කර ඇති බව B වාර්තාවේ 10 වන ඡේදයේ දක්වා ඇත. මෙය විය හැකි සාක්ෂියට වඩා විය නොහැකි සාක්ෂි ගණයට ඇතුළත්වේ. තොරතුරු පොතේ පිටු ගලවා දෙන ලෙස ඉල්ලා සිටියේ තොරතුරු පොත් රැගෙන ගිය ස්ථානයේදීය. එය රැගෙන යන තෙක් පිටු ගලවා ඉල්ලයිද යන්න උප පොලිස් පරීක්ෂකට දැන ගැනීමට හැකියාවක් නොමැත. මේ නිසා තොරතුරුවල පිටු නියෝජ්‍ය පොලිස්පතිට භාර දීමට පෙර පිටපත් ගත්තා යැයි යන්න විශ්වාස කළ නොහැකි කරුණකි.

එසේම මෙම තොරතුරු පොතේ කොළවල පිටපත් කළුතර නාගොඩ උපපොලිස් පරීක්ෂක තිස්ස සිරි සුගතපාලගේ නිවසේ තිබී සොයාගත් බව සඳහන් වේ. මේ සම්බන්ධයෙන් 2018.02.14 වෙනි දින ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවියට අංක B 92/09 වැඩිදුර වාර්තාවේ දක්වා ඇත.

මේ අනුව එහි තොරතුරු පොත්වල පිටපත් ගත්තානම් එම සාක්ෂිය මත විමර්ශනය ඉදිරියට ගෙන යා හැකි විය යුතුයි. නමුත් එවැනි ප්‍රශ්නයක් දක්නට නොමැත. මෙයින් පෙනී යන්නේ පැමිණිලිකරු වන විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මෙම අපරාධයට සම්බන්ධ කිරීමට කුමන්ත්‍රණයක් තිබුණු බවයි.

2018.02.14 වෙනි දින ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවියට අංක B 92/09 වැඩිදුර වාර්තාව සම්පූර්ණයෙන් යොමුකර ඇත්තේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විශ්‍රාමික රක්ෂිත බන්ධනාගාරගත කිරීමේ අදහසිනි. මේ නිසා පැමිණිලිකරු ලසන්ත වික්‍රමතුංග ඝාතනයේ විමර්ශනවලට බාධා කිරීම සාක්ෂි වසන් කිරීමට උත්සාහය කිරීම වැනි

නිර්මාණය කළ සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පැමිණිලිකරු 2018.02.14 වන දින රක්ෂිත බන්ධනාගාරගත කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයෙන් ඉල්ලා සිටි ඇති අතර අධිකරණය විසින් ඇප නොදීමටද පියවර ගෙන ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (විශ්‍රාමික) ප්‍රසන්න නානායක්කාර 2018.02.16 වෙනි දින කිසිදු පදනමක් රහිතව දේශපාලනික පළිගැනීමක් වශයෙන් රක්ෂිත බන්ධනාගාරගත කරන ලදි. එතැන් සිට සති දෙකෙන් දෙකට අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කර ඇත. B වාර්තා අනුව ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 32වන වගන්තිය සමග කියවිය යුතු 102,113(ආ), 173,174,190,193,198 පළමුවන උප වගන්තිය 21-209හි 1වන උප වගන්තිය 162,163 හා 454 යටතේ දඩුවම් ලැබිය යුතු වරදවල් කර ඇති බවට දක්වා පැමිණිලිකරු විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති අත්අඩංගුවට ගෙන ඇත.

2018.02.16 වෙනි දින රක්ෂිත බන්ධනාගාරගත කළ පැමිණිලිකරු ඇප පිට නිදහස් වූයේ 2018.07.16වෙනි දින වේ. මේ අනුව කිසිම පදනමක් රහිතව මාස 5ක කාලයක් රක්ෂිත බන්ධනාගාරගත කර ඇත්තේ දේශපාලන පළිගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මෙම පැමිණිල්ල විමර්ශනය කිරීමේදී මෙම ඝාතනයට හමුදා බුද්ධි නිළධාරීන් වගකිවයුතු බවත්, එමගින් එවකට සිටි ආරක්ෂක ලේකම් වර්තමාන ජනාධිපති මෙම ඝාතනයට සම්බන්ධ කිරීමට දැඩි උත්සාහයක් ගෙන ඇති බවත් පෙනේ. එසේම 2015 ජනාධිපතිවරණයට පෙර එක්සත් ජාතික පෙරමුණ දූෂණ සහ මහා පරිමාණ වංචාවලට නිරතවූ අයට දඬුවම් දීම සඳහා විමර්ශන ඒකකය ස්ථාපනය කිරීමට ක්‍රියාකරන බවට මැතිවරණ පොරොන්දුවක් දී

තිබුණි. ඒ අනුව 2015 ජනවාරි මස 8 වෙනිදාට පසු අගමැති වූ රනිල් වික්‍රමසිංහ 2015.01.21 වෙනි දින කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කොට දූෂණ විරෝධී කමිටුවක් පිහිටුවීමට යෝජනා කරන ලදි. මෙම කැබිනට් අනුමැතිය අනුව දූෂණ විරෝධී කමිටුවක් පිහිටුවන ලද අතර, එහි සාමාජිකයින් ලෙස සාමාජිකත්වය ලැබුවේ

1. අගමැති රනිල් වික්‍රමසිංහ (සභාපති)
2. අමාත්‍ය මංගල සමරවීර
3. අමාත්‍ය පාඨලී චම්පික රණවක
4. අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ
5. අමාත්‍ය රවුෆ් හකීම්
6. ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධාන නායක සරත් ෆොන්සේකා
7. දෙමළ ජාතික සන්ධානය (TNA)නායක ආර් සම්බන්ධන්
8. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන්
9. ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක
10. නීතිඥ ජේ.සී.වැලිඅමුණ
11. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
12. මලික් සමරවික්‍රම
13. කමිටු ලේකම්

අනුකමිටුව

1. අමාත්‍ය මංගල සමරවීර (සභාපති)
2. අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ
3. නියෝජ්‍ය අමාත්‍ය එරාන් වික්‍රමරත්න
4. ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක
5. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන්
6. නීතිඥ ජේ.සී. වැලිඅමුණ
7. මලික් සමරවික්‍රම

එසේම මෙම කමිටුවේ වෙනත් වැඩ සටහන් යටතේ මාධ්‍යවේදීන් ඝාතනය කිරීම පිළිබඳව සොයාබැලීමේ විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවීම හා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශ ලබා ගැනීම් ඉලක්කය විය යුතු බව දක්වා ඇත.

මෙම විමර්ශනයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නිර්මාණය කරන ලද ප්‍රකාශය, 127 වගන්තිය යටතේ ප්‍රකාශනය කර ගැනීමට ඉලක්ක කර ගත්තේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (විශ්‍රාමික) තිස්ස සිරි ප්‍රසන්න නානායක්කාර වේ. මෙම ලසන්ත වික්‍රමතුංග සිද්ධියේදී ඔහු රිය පදවාගෙන යන විට දෙදෙනෙකු ඔහු පිටුපස හඹා එන බව ඔහුට දුරකථනයෙන් කතා කළ මලික් සමරවික්‍රමට ප්‍රකාශ කළ බව සාක්ෂිවලින් අනාවරණය වී ඇත. මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය වීමට ප්‍රථමයෙන් ඔහුගේ ක්ෂේත්‍ර සටහන් පොතෙහි පිටුපසින් හඹා එන යතුරු පැදියේ අංක ලියා තිබූ බව සාක්ෂිවලින් අනාවරණය වේ. එසේම මෙම ක්ෂේත්‍ර සටහන් පොත පොලිසිය

සොයා ගත්විට 2009.01.08 වෙනි දින උප පොලිස් පරීක්ෂක වීරසිංහ විසින් සැකකරුවන් දේපළක් ලෙස ලේඛනගත කර ඇති අතර, 2009.01.16 වෙනි දින ගල්කිස්ස පොලිසියේ අපරාධ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක තිස්ස සිරි සුගතපාල විසින් එම ක්ෂේත්‍ර සටහන් පොත නඩු භාණ්ඩයක් වශයෙන් ලේඛනගත කර ඇත. පසුව මෙම ක්ෂේත්‍ර සටහන් පොත පැමිණිලිකරු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (විශ්‍රාමික) තිස්ස සිරි සුමතිපාලගෙන් ලබාගත් බව සාක්ෂිවලින් අනාවරණය වන නමුත් මෙම සාක්ෂිය සැක සහිත බව ඉහත කරන ලද විශ්ලේෂණයේදී පැහැදිළි වේ. කෙසේ වුවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරි තිසේරා තිස්ස සිරි සුගතපාලගේ සාක්ෂි මත පිහිටා පැමිණිලිකරුගෙන් මෙම ක්ෂේත්‍ර සටහන් පොත සම්බන්ධයෙන් ප්‍රශ්න කර ඇති අතර,විශේෂයෙන්ම සහකාර පොලිස් අධිකාරි තිසේරා ප්‍රශ්න කර ඇත්තේ එම ක්ෂේත්‍ර සටහන් පොත පොලිස්පතිට දුන්නාද නැතහොත් ගෝඨාභය රාජපක්ෂට දුන්නාද යන්නය. මේ කාලය වන විට ගෝඨාභය රාජපක්ෂ මහතා දේශපාලනය සඳහා ඉදිරියට එමින් තිබුණු අවස්ථාවක් නිසා දේශපාලන එදිරිවාදීන් ලසන්ත වික්‍රමතුංග ඝාතනයට එතුමාව සම්බන්ධ කිරිමට උත්සාහ ගත්තේ පැමිණිලිකරු විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රසන්න නානායක්කාර ලවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද ප්‍රකාශය මහේස්ත්‍රාත් ඉදිරියේ ප්‍රකාශ කරවා ගැනීමෙනි. මෙම යෝජනාවට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විශ්‍රාමික ප්‍රසන්න නානායක්කාර විරුද්ධ වූ හෙයින් ඔහුව රක්ෂිත බන්ධනාගාරගත කර මාස 5ක් යනතුරු ඇප නොදී තබා ගත්තේ දේශපාලන පළිගැනීමට බැව් මෙම කොමිෂන් සභාව තීරණය කර ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරීම සඳහා පැ.1 සිට පැ. 22 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

## 9 .LVIII

පැමිණිලි අංකය - 29/20

පැමිණිලිකරු - පිට්ටැගම ගම්ලත් රාළලාගේ චිත්‍රානන්ද අබේරාජ් ගම්ලත්

ලිපිනය - 31, පළමු පටුමඟ,රණවිරු ගම්මානය අසළ, අළුවිහාරේ මාතලේ.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. පාලිත රංගේ බණ්ඩාර පාර්ලිමේන්තු මන්ත්‍රී
2. පූජිත් ජයසුන්දර පොලිස්පති විශ්‍රාමික
3. රවි විජේගුණවර්ධන ජ්‍යෝෂ්ය නියෝජ්‍ය පොලිස්පති
4. මෙවන් සිල්වා නියෝජ්‍ය පොලිස්පති විශ්‍රාමික
5. කිංස්ලි ගුණසේකර සහකාර පොලිස් අධිකාරි

### තීරණය

1. මෙම පැමිණිල්ලේ ඉදිරිපත් වී ඇති සාක්ෂි හා එම ලේඛන විශ්ලේෂණය කිරීමේදී පැමිණිලිකරු වන පිට්ටැගම ගම්ලත් රාළලාගේ චිත්‍රානන්ද අබේරාජ් ගම්ලත් යම් වරදකට හසුකරලීම සඳහා පදනම් විරහිත එක් අයෙකුගේ විශ්වසනීයත්වයෙන් ඉතා අඩු අසත්‍ය සාක්ෂි සැලකිල්ලට ගෙන

සාක්ෂි නිර්මාණය කර අල්ලස් හා දූෂණ කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ඒ මගින් මහාධිකරණයේ නඩුවක් ගොණු කිරීමට ආධාර අනුබල දීමත්, ඉහත සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියාකර ඇති බවට ප්‍රබල සාක්ෂිවලින් ඔප්පු කර ඇති බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම පැමිණිල්ලට අදාළව ඉදිරිපත් කර ඇති සාක්ෂි සහ ලේඛනවලට අනුව කොළඹ මහාධිකරණයේ ගොණු කර ඇති අංක HCB 09/2019 දරන නඩුවේ අධි චෝදනා පත්‍රය ඉල්ලා අස් කරගැනීම මගින් නිෂ්ප්‍රභා කර පැමිණිලිකරුවන අබේරාජ් ගම්ලත් සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතු බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. පැමිණිලිකරු 2016 වර්ෂයේ සිට පොලිස්පති වෙතින් පදනම් විරහිත චෝදනාපත්‍ර 2ක් පැමිණිලිකරුට නිකුත් කිරීමත්, මෙම පැමිණිලිකරුට සුදුසුකම් තිබියදීත් සහනදායී පදනම යටතේ වාහන බලපත්‍රය ලබාගැනීමට ඉල්ලුම් කරන ලද අයදුම්පත නිර්දේශ නොකිරීමත්, පොළොන්නරු කොට්ඨාසයේ සිට තංගල්ල කොට්ඨාසය දක්වා මාරු කිරීමත්, පදනම් රහිත අසත්‍ය කරුණු මත කොළඹ මහාධිකරණයේ අල්ලස් දූෂණ චෝදනාවක් ගොණු කිරීමත්, සැලකිල්ලට ගැනිමේදී පැමිණිලිකරු වන අබේරාජ් ගම්ලත් දේශපාලන පළිගැනීමකට ලක් වී ඇති බැව් මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. ඉහත සඳහන් වගඋත්තරකරුවන් අසත්‍ය කරුණු නිර්මාණය කර අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව මගින් පැමිණිලිකරුට මහාධිකරණයේ අධිචෝදනා ගොණු කිරීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 190 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමේ වරද සිදු කර ඇති බැවින්ද,

2. එම වැරදි සිදු කිරීම සඳහා ඉහත දක්වා ඇති වගඋත්තරකරුවන් අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වෙනි වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින්ද,

3. ඉහත දක්වා ඇති පරිදි වගඋත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ ඉදිරියේ චෝදනා ගොණු කිරීම සඳහා මෙම පැමිණිල්ලට අදාළ සියලු සාක්ෂි සහ ලේඛන ගොණු නීතිපතිවරයා වෙත යැවීමට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

4. ඉහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි විජේගුණවර්ධන සහ 5වෙනි වගඋත්තරකරු කිංස්ලි ගුණසේකර අසත්‍ය සාක්ෂි නිර්මාණය කර පැමිණිලිකරුට විරුද්ධව චෝදනාපත්‍ර 2ක් නිකුත් කොට තවදුරටත් පැමිණිලිකරුට හිංසාකාරි දේශපාලන වශයෙන් පළිගැනීම සඳහා අල්ලස් කොමිෂන් සභාවට එම ගොතන ලද පැමිණිල්ල නිකුත් කිරීමෙන් දෙපාර්තමේන්තු නියෝග ඒ7 බී පරිශිෂ්ටයේ විනය සංග්‍රහයේ වගන්ති 2 ඩී වගන්තිය ප්‍රකාරව සේවයට අයත්

යම්කෙනෙකුට විරුද්ධව ඕනෑකමින්ම හෝ නොසැලකිලිමත්කමින් බොරු පැමිණිල්ලක් හෝ අසත්‍ය ප්‍රකාශයක් කිරීම යටතේ මෙම වගඋත්තරකරුවන්ට විරුද්ධව චෝදනාපත්‍ර ඉදිරිපත් කොට විධිමත් මූලික පරීක්ෂණයකින් පසු දඬුවම් ලබා දිය යුතු යැයි කොමිෂන් සභාව ඒකමතිකව නිර්දේශ කර ඇත.

5. පැමිණිලිකරුට පොලිස් දෙපාර්තමේන්තුව විසින් චෝදනාපත්‍ර 2ක් නිකුත් කර ඇති අතර, එම චෝදනා පිළිබඳව මෙතෙක් විනය පරීක්ෂණ පවා ආරම්භ කර නොමැති නිසා එම චෝදනාපත්‍ර 2ක ඉල්ලා අස්කර ගත යුතු යැයි මෙම කොමිසම නිර්දේශ කරයි.

6. මෙම පැමිණිලිකරු පදනමක් නොමැතිව මෙතෙක් වැඩ තහනම් තත්ත්වයේ සිටින හෙයින් මෙම වැඩ තහනම ඉවත් කර නැවත සේවයේ පිහිටුවා සුදුසු ස්ථානයකට ස්ථාන මාරුවක් දිය යුතු බවට මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. මෙම පැමිණිලිකරු සියලුම සුදුසුකම් සපුරා තිබියදී සහනදායී මිළට වාහනයක් මිළදී ගැනීමට ඉල්ලුම් කරන ලද අයදුම්පත පොලිස්පති විසින් නිර්දේශ කර නිසි දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

පැමිණිලිකරු දේශපාලන පළිගැනිමකට ලක්විම හේතුවෙන් රාජකාරි වැඩ තහනම් කිරිම, චෝදනා පත්‍ර දෙකක් නිකුත් කිරීම හා සංශෝධිත

අල්ලස් පනතේ 19(ආ) සහ19(ඇ)වගන්ති යටතේ බස්නාහිර පළාතේ කොළඹ මහාධිකරණ අංක HCB09/2009 යටතේ නඩු පවරා තිබීම.

ඉහත සඳහන් පැමිණිලිකරු පිට්ටුගම ගම්ලත් රාළලාගේ චිත්‍රානන්ද අබේරාජ් ගම්ලත් යන අයට විරුද්ධව පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකය මගින් මෙම වාර්තාවේ දක්වා ඇති දිනයකදී පොලිස්පති නියෝග මත විමර්ශනයක් ආරම්භ කර චෝදනාපත්‍ර නිකුත් කිරීමෙන් පසු එම පැමිණිල්ල අල්ලස් හා දූෂණ කොමිසමට ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව විසින් විමර්ශන ආරම්භ කර බස්නාහිර පළාතේ කොළඹ මහාධිකරණ අංක:HCB09/2009 යටතේ නඩු පැවරීමෙන් කරන ලදැයි කියන දේශපාලන පළිගැනීම හේතුවෙන් මුහුණදීමට සිදු වූ තත්ත්වය පිළිබඳව පැමිණිලිකරු මෙම කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, එලෙස කොමිෂන් සභාවට ඉදිරිපත් කළ පැමිණිල්ල පදනම් කරගෙන කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලදී.

2015 වර්ෂයේ ජනවාරි සහ අගෝස්තු මාසයේදී පිළිවෙලින් පැවැත්වූ ජනාධිපතිවරණය සහ මහා මැතිවරණයට පෙර නිළයන් දැරූ රාජ්‍ය නිළධාරීන්, රාජ්‍ය සංස්ථාවල, ත්‍රිවිධ හමුදාව මෙන්ම පොලිස් සේවයේ සාමාජිකයින් 2015 ජනවාරි මස 08 වන දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 වෙනි දිනෙන් අවසන්වූ කාලසීමාව තුළදී දේශපාලන පළිගැනීමකට ලක්වූයේ දැයි වාර්තා කිරීම පිණිස පිහිටුවන ලද පරීක්ෂණ කොමිෂන් සභාවට ඉහත නම් සඳහන් නිළධාරියා පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, එම පැමිණිල්ල

මෙම කොමිෂන් සභාව විසින් විමර්ශනයට ලක් කර එහි වාර්තාව මෙහි පහත දැක්වේ.

පිට්ටැගම ගම්ලත් රාළලාගේ චිත්‍රානන්ද අබේරාජ ගම්ලත් යන අය විසින් ඔහුට සිදු වූ දේශපාලන පළිගැනීමක් හේතුවෙන් සිදු වූ අගතිය හා පාඩුව සම්බන්ධයෙන් මෙම පරීක්ෂණ කොමිෂන් සභාවට 2020.06.12 වෙනි දිනදී පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, එම පැමිණිල්ලට අනුව මෙම පැමිණිලිකරු විසින් ඔහුගේ ප්‍රකාශය 2020.09.08, 2020.09.22 සහ 2020.10.06 යන දින තුනේදී මෙම කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ලබා දී ඇති අතර, 2020.10.28 වෙනි දින මෙම පැමිණිලිකරු කොමිෂන් සභාව ඉදිරියේ ඔහුගේ පැමිණිල්ල සාක්ෂියක් ලෙස ඉදිරිපත් කරන ලදි.

පැමිණිලිකරු 1983.09.01 වෙනි දින ආධුනික පොලිස් කොස්තාපල් කෙනෙකු වශයෙන් පොලිස් සේවයට බැඳී පොලිස් කොස්තාපල් තනතුරේ සිටියදීම 1986.05.05 වෙනි දින අයදුම්පතක් ඉදිරිපත් කරමින් ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුරට තේරීපත්ව, 1991 වසරේදී පොලිස් පරීක්ෂක තනතුරටද, 2003.01.01 දින ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරටද, 2010.05.09 වෙනි දින සහකාර පොලිස් අධිකාරි තනතුරටද, 2018.05.09 වෙනි දින පොලිස් අධිකාරි තනතුරටද පිළිවෙලින් උසස්වීම් ලබා ඇත.

මෙම පැමිණිලිකරු වන පොලිස් අධිකාරි ගම්ලත් ආනමඩුව පොලිස් දිස්ත්‍රික්කයේ සහකාර පොලිස් අධිකාරි ලෙස සේවය කරමින් සිටියදී 2012.04.26 වෙනි දිනදී මුන්දලම පොලිසියේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ උප පොලිස් පරීක්ෂක හේරත් බණ්ඩා විසින් එවකට මුන්දලම පොලිසියේ නොවිසඳුණු අපරාධ අංශයේ

ස්ථානාධිපති ලෙස කටයුතු කළ පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාරට සහ පොලිස් සැරයන් 59806 ජයසේන සහ පොලිස් කොස්තාපල් 46298 ලක්ෂ්මන් යන නිලධාරීන් තිදෙනාට සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මුන්දලම පොලිසියට රැගෙන එන ලෙසට නියෝග දුන්නද එම නියෝග පැහැර හැරීම නිසාද පැමිණිලිකාරිය විසින් කරන ලද පැමිණිල්ලට අනුව සැකකරුවන් අත්අඩංගුවට ගැනිමට නොහැකිවූ නිසාද, පුත්තලම දිශාභාර නියෝජ්‍ය පොලිස්පති විසින් ඒ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් ආරම්භ කර එම පරීක්ෂණ වැඩිදුරටත් සහකාර පොලිස් අධිකාරි ඩී.ඩබ්ලිව්. ඩබ්ලිව්. රාජපක්ෂ යටතේ අවසන් කර පොලිස් සැරයන් 7997 හෙට්ටිආරච්චිගේ චන්දන ප්‍රේමකුමාර, පොලිස් සැරයන් 59806 ජයසේන සහ පොලිස් කොස්තාපල් 46298, ලක්ෂ්මන් යන නිලධාරීන් තිදෙනාට පොලිස් විනය සංග්‍රහය යටතේ වෙන් වෙන් වශයෙන් පහත දැක්වෙන චෝදනා හතරට අනුව එනම්, අපකීර්තිදායක ලෙස හැසිරීම, අණට අකීකරු වීම, රාජකාරිය පැහැර හැරීම (4 ඒ වගන්තිය), රාජකාරිය පැහැර හැරීම (4ජී වගන්තිය), යන චෝදනා යටතේ චෝදනා පත්‍රයක් නිර්දේශ කර යැවීමෙන් පසු වයඹ පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජගත් අබේසිරි ගුණවර්ධන මහතා විසින් 2013.05.07 දිනැතිව නිකුත් කරන ලද චෝදනා පත්‍රය සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්විමට පැමිණිලිකරු වන එවකට ආණමඩුව සහකාර පොලිස් අධිකාරිව සිටි චිත්‍රානන්ද අබේරාජ ගම්ලත්ව පත් කර ඇත. මෙම විධිමත් විනය පරීක්ෂණය මෙහෙයවීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.ජී.ඩබ්ලිව්.සී. වතුලියද්ද පත්කර ඇති අතර, රැකවරණ නිලධාරියා වශයෙන් විශ්‍රාමික පොලිස් පරීක්ෂක

කේ.එම්.එම්. ප්‍රේමචන්ද්‍ර මහතා පත් කර විනය පරීක්ෂණය පවත්වා ඇත.

මෙම විනය පරීක්ෂණය පවත්වා ගෙන යන අතරතුර යහපාලන රජයේ රාජ්‍ය අමාත්‍ය පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රංගෙ බණ්ඩාර මහතා විසින් එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වයඹ භාරව සිටි රවී ගුණවර්ධන මහතා මාර්ගයෙන් බලපෑම් කර පොලිස් සැරයන් 7997 හෙට්ටිආරච්චිගේ චන්දන ප්‍රේමකුමාර මෙම චෝදනා පත්‍රයෙන් නිදහස් කරන ලෙසට බලපෑම් කළ බවට වැඩ තහනමකට ලක්ව සිටින පැමිණිලිකරු වන පොලිස් අධිකාරි චිත්‍රානන්ද අබේරාජ ගම්ලත් (මින් ඉදිරියට පැමිණිලිකරු ලෙස හඳුන්වනු ලබන) ප්‍රකාශ කර ඇත.

විනය පරීක්ෂණයෙන් පසු පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාර නිලධාරියාට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනා පත්‍රයේ චෝදනා (4) හතරටම, ඉදිරිපත් වූ සාක්ෂි මත වැරදිකරු බව නිගමනය කර එම ලිපි ගොනුව කොට්ඨාස භාර නිළධාරීයාට යැවූ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

මෙම විනය පරීක්ෂණය පවත්වාගෙන යන විටදී සේවයේ අවශ්‍යතාවය මත පැමිණිලිකරු පොළොන්නරුව කොට්ඨාසයේ හබරණ දිස්ත්‍රික්කය භාර සහාකාර පොලිස් අධිකාරි වශයෙන් 2014.10.13 වෙනි දින පත්කළ බවටත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු පවසන අන්දමට සහකාර පොලිස් අධිකාරි තනතුරේ වසර 6ක නොකැළැල් සේවා කාලයක් කිසිදු චෝදනාවක් නොමැති නිලධාරියෙකුව සිටියදී 2016.07.14 වෙනි දින නිකුත් කරන ලද TIP/55/01/03 දරන චක්‍ර ලේඛනය (පැ.23) අනුව 2016.05.24 වෙනි දින අමාත්‍ය මණ්ඩලය ගත් තීරණයක් මත සහනදායී පදනම මත

මෝටර් රථ බලපත්‍රයක් ලබා ගැනීමේ සුදුසුකම් සපුරා තිබූ හෙයින් එම ඉල්ලුම්පත ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) සී.ඩී. වික්‍රමරත්න මහතා වෙත ඉදිරිපත් කළ පසු එම ඉල්ලුම්පත ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) සී.ඩී. වික්‍රමරත්න මහතා විසින් නිර්දේශ කර පොලිස්පති වෙත ඉදිරිපත් කළ නමුත්, යහපාලන රජය කාලයේදී පොලිස්පති ලෙස පත්ව සිටි පූජිත් ජයසුන්දර මහතා විසින් එම ඉල්ලුම් පත්‍රය, පැමිණිලිකරු සම්බන්ධ කිසිදු හේතුවක් නොමැතිව දේශපාලන බලපෑම් හේතුකොට ගෙන නිර්දේශ නොකිරීමෙන් සහනදායී පදනම මත වාහන බලපත්‍රය ලබාගැනීමට පැමිණිලිකරුට තිබූ අවස්ථාව අහිමිවූ බව ප්‍රකාශ කර ඇත.

එම කාලවකවානුවේදී රාජ්‍ය අමාත්‍යවරයෙකු වූ පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රංගෙ බණ්ඩාරගේ හිතවතයෙකු වූ එවකට වයඹ පළාත් භාර නියෝජ්‍ය පොලිස්පති රවි විජේගුණවර්ධන හා පොලිස්පති පූජිත් ජයසුන්දර දෙදෙනාගේ අනුදැනුම මත පැමිණිලිකරු රුපියල් 20,000/-ක අල්ලසක් ඉල්ලා ඉන් රු.10,000/-ක මුදලක් ලබාගත් බවට පොලිස් සැරයන් 7997 චන්දන කුමාර විසින් කරන ලද පැමිණිල්ල පොලිස්පති පූජිත් ජයසුන්දර විසින් පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන අංශයට විමර්ශනය සඳහා යොමු කර ඇත. මේ පිළිබඳ පැමිණිල්ල සටහන් කර සහකාර පොලිස් අධිකාරි කිංස්ලි ගුණසේකර මහතා විසින් විමර්ශන කටයුතු සිදු කර ඇත.

මෙම විමර්ශනය පවතින කාලය තුළදී එවකට නීතිය හා සාමය අමාත්‍යංශයේ ලේකම්ව සිටි මහින්ද බාලසූරිය මහතා පැමිණ හබරණ සහකාර පොලිස් අධිකාරී කාර්යාලයේදී එනම් පැමිණිලිකරුගේ කාර්යාලයේදී, ඒ අවට දිස්ත්‍රික්කවල නිලධාරීන් කැඳවා ඇමතීමට අවස්ථාවක් ලබාදීම සහ ඒ අවස්ථාවේදී තේපැන් සංග්‍රහයක් ලබාදුන්

කරුණු හේතුකොට ගෙන එයට උරණ වූ එවකට මන්ත්‍රීව සිටි වසන්ත සේනානායක මහතාගේ අවශ්‍යතාවය මත හා 2015 මැතිවරණයෙන් පසුව උතුරු මැද පළාත් භාරව සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි විජේගුණවර්ධන මහතාගේ අවශ්‍යතාවය මත පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා විසින් පැමිණිලිකරුට 2017.06.09 වෙනි දින හබරණ දිස්ත්‍රික්කයෙන් මාතර කොට්ඨාසයට ස්ථාන මාරු ලබාදී ඇත. එම අවස්ථාව වන විට පැමිණිලිකරුගේ දියණිය 2017 දෙසැම්බර් මාසයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයට පෙනී සිටින බව සඳහන් කර පොලිස් කොමිසමට අභියාචනයක් ඉදිරිපත් කොට ස්ථාන මාරුව තාවකාලිකව අවලංගු කරගත් බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි.

තවදුරටත් පැමිණිලිකරු 2017.09.25 වෙනි දින පොලිස්පති සහන මැදිරියට ගොස් සිදුවුණු අසාධාරණය සහ වාහන බලපත්‍රය නොලැබීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජගත් අබේසිරිගුණවර්ධන මහතා වෙතට කරුණු ඉදිරිපත් කළ අතර, පැමිණිලිකරුට වාහන බලපත්‍රය ලබා දිය යුතු බවට නිර්දේශ කර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන වෙත ඉදිරිපත් කළ ද එවකට පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා "උඹට වාහන පර්මිට් නොවෙයි දෙන්නේ. උඹට මං මාතරට දුන්න ස්ථාන මාරුවීම ක්‍රියා කළේ නැහැ. එක එකාට කියලා ස්ථාන මාරු අවලංගු කර ගන්නවා කියා බැණ වැදුණු බව කියා සිටියි. තවද "උඹට අල්ලස් පැමිණිලි තියෙනවා ඒකට උඹට චෝදනා පත්‍රයක් දෙනවා. තවත් පෙත්සම් තියෙනවා ඒ නිසා අල්ලස් දෙපාර්තමේන්තුවටත් උඹට විරුද්ධව යවනවා" කියා තර්ජනය කළ බව පැමිණිලිකරු කියා සිටියි.

ඉන්පසු 2017.11.17 වෙනි දින ප්‍රකාශයක් ගැනීමට අල්ලස් දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙස කැඳවීමක් ලද බවත්, ඒ අනුව එහි ගිය බවත්, එම අල්ලස් පැමිණිල්ලේ සඳහන් වූයේ මුන්දලම පොලිස් ස්ථානයට අනුයුක්තව සිටි පොලිස් සැරයන් 7997 ප්‍රේමකුමාර නිලධාරි ඇතුළු තුන්දෙනෙකුට විරුද්ධව පැවැත්වූ විනය පරීක්ෂණයෙන් චූදිත නිලධාරීන් නිදොස් කොට නිදහස් කිරීම සඳහා පොලිස් සැරයන් 7997 ප්‍රේමකුමාර නිලධාරියාගෙන් රුපියල් 20,000/-ක් අල්ලස් ලෙස ඉල්ලා ඉන් රු.10,000/-ක මුදලක් ලබා ගැනීම වේ. තවද එවකට පොලිස්පතිව සිටි පූජිත් ජයසුන්දර විසින් මෙම පැමිණිලිකරුට 2018.05.11 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පොළොන්නරුව කොට්ඨාසයේ සිට තංගල්ල කොට්ඨාසයට ස්ථාන මාරුවක් ලබාදී ඇති අතර, පැමිණිලිකරුට අනුව සහකාර පොලිස් අධිකාරිවරයෙකුට අඩුම වශයෙන් අවුරුදු 4ක කාලයක් එකම දිස්ත්‍රික්කයේ සේවය කිරීමට හැකියාව තිබියදී, එසේ රාජකාරි කිරීමට ඉඩ නොදී තංගල්ල ප්‍රදේශයට ස්ථාන මාරු කිරීම පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා යම් දේශපාලන බලපෑමක් මත සිදු කර ඇතැයි පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. පැමිණිලිකරු ප්‍රකාශ කරන අන්දමට සහනදායී වාහන බලපත්‍රයක් ලබාගැනීමට තංගල්ල කොට්ඨාස භාර පොලිස් අධිකාරි මගින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන වෙතට කරන ලද ඉල්ලීම පොලිස්පති විසින් අමාත්‍යාංශයට යොමු නොකිරීම හේතු කොට ගෙන හිමිවිය යුතු වාහන බලපත්‍රය අහිමි වූ බවද ප්‍රකාශ කර සිටියි. කෙසේ වුවද 2018.05.09 වෙනි දින සිට පැමිණිලිකරු පොලිස් අධිකාරි තනතුරට උසස් වීම් ලද බවද ප්‍රකාශ කර සිටි.

මෙසේ රාජකාරි කරමින් සිටියදී පොලිස්පති පූජිත් ජයසුන්දර විසින් පැමිණිලිකරුගේ සේවය අත්හිටුවන ලෙසට පොලිස් කොමිසමට නිර්දේශ කර යවා ඇති බව දැන ගැනීමට ලැබුණු අතර, 2019.05.10 වෙනි දින දී රාජකාරී වැඩ තහනම් කිරිමේ නියෝගය පැමිණිලිකරුට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතින් ලද බව ප්‍රකාශ කර සිටී.

(2020.10.27 වන දින දී මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් රාජකාරී වැඩ තහනම් කිරිමේ නියෝගය “P28” ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එම අවස්ථාවේදී පැමිණිලිකරු විසින් වැඩ තහනම් නියෝගය ඉවත් කර, නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලමින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතට අභියාචනාවක් ඉදිරිපත් කළ බව ප්‍රකාශ කර සිටී. (2020.10.27 වන දින දී මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් වැඩ තහනම් නියෝගය ඉවත් කර නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලමින් කළ අභියාචනය “P26” ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.)

පසුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පිළිතුරු ලිපියක් එවමින් සඳහන් කර ඇත්තේ මෙම පැමිණිලිකරු විසින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලමින් කරන ලද අභියාචනය, ඉවත දැමූ බවත්, සේවයේ පිහිටුවීමට හැකියාවක් නොමැති බවත්ය. (අභියාචනය ඉවතලමින් සේවයේ පිහිටුවීමට හැකියාවක් නොමැති බව සඳහන් කරමින් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් එවූ පිළිතුරු ලිපිය “P29” ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.)

කෙසේ හෝ පොලිස් කොමිෂන් සභාව විසින් 2018.08.01 වෙනි දින චෝදනා පත්‍රයක් පැමිණිලිකරුට ලබා දුන් බවත් එම චෝදනා පත්‍රයට

පදනම් වූයේ පොලිස් සැරයන් 7997 හෙට්ටිආරච්චිගේ චන්දන ප්‍රේමකුමාර නැමති නිලධාරියාගෙන් අල්ලස් ඉල්ලීම සම්බන්ධයෙන් වන අතර, චෝදනා 5ක් මත චෝදනා පත්‍රයක් ලබාදුන් බවත්, එම චෝදනා පත්‍රය මෙතෙක් විභාගයට ගෙන නොමැති බවත් ප්‍රකාශ කර සිටී. (ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චෝදනා පත්‍රය “P24” ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.)

තවද, 2019.02.06 වෙනි දින පොලිස් කොමිෂන් සභාව මගින් දෙවන වරටත් “අපකීර්තිදායක හැසිරීම” යැයි සඳහන් කරමින් චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර, එහි චෝදනාව ලෙස දක්වා ඇත්තේ 2014.10.13 වෙනි දින හබරණ දිස්ත්‍රික්කය භාරව රාජකාරි කරමින් සිටින විටදී රාජකාරි වේලාවන් තුළදී කාර්යාලයේ රැඳී නොසිට නිළ නිවසට නිලධරයන් කැඳවමින් සරමක් ඇඳගෙන, උඩුකය නිරුවත්ව දහඩිය බව පවසමින් නිතරම සරම සොලවා නිළධරයන්ව අපහසුතාවයට පත්වෙන ආකාරයට හැසිරුණු බවට සඳහන් කර ඇත. (ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් දෙවන වරට නිකුත් කර ඇති චෝදනා පත්‍රය “P25” ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.) මෙම දෙවන වරට නිකුත් කළ චෝදනා පත්‍රයද මේ වන තෙක් විභාගයට ගෙන නොමැති බවද පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි.

ඉහත දැක්වූ පරිදි වැඩ තහනම් කිරීමට හේතුවී ඇත්තේ 2019.04.24 වෙනි දින අල්ලස් හා දූෂණ කොමිසම මගින් කොළඹ මහාධිකරණයේ HCB09/2009 යටතේ නඩුවක් පවරා ඇති බවට දැනුම් දීමෙන් පසුව බවත් ප්‍රකාශ කර සිටී.

මෙම නිලධාරියාට විරුද්ධව ඇති අල්ලස් චෝදනාව චෝදනා (4) හතරකින් යුක්ත බවත්, මෙම අල්ලස් චෝදනාව දැනට

මහාධිකරණයේ විභාග වෙමින් පවතින බවත්, නැවතත් 2020.11.09 වෙනි දින, 2020.11.11 වෙනි දින සහ 2020.11.12 වෙනි දිනට කල් තැබීම් කර ඇති බවත් ප්‍රකාශ කර සිටී.

සාක්ෂි 1 - පැමිණිලිකරු ඉහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත.

සාක්ෂි 2 - පො.සැ.7997 හෙට්ටිආරච්චිගේ චන්දන ප්‍රේමකුමාර.

ඉහත සඳහන් නිළධාරියා 2016.08.22 වෙනි දින පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකයට ප්‍රකාශයක් දී ඇත. 2012.04.26 වෙනි දින පො.සැ.7997, පො.සැ.59806 ජයසේන, සහ පො.කො.46298 ලක්ෂ්මන් සමග නොවිසඳුණු පැමිණිලි සම්බන්ධයෙන් මදුරන්කුලිය ප්‍රදේශයට යාමට සූදානම් වූ විට පහරදීමක් සම්බන්ධයෙන් සැකකරුවෙකු මුත්තුකෝඩුවාව ප්‍රදේශයේ සිටින බවට එම පැමිණිල්ලේ පැමිණිලිකරුවන් විසින් තොරතුරු ලබාදුන් නිසා පැමිණිලිකරුවන් සමග ඔවුන් පැමිණි වාහනයෙන්ම එම ප්‍රදේශයට ගිය බවත්, එම සැකකරු එම ප්‍රදේශයේ සිටියද, උ.පො.ප. හේරත්ගෙන් ලැබුණු දුරකථන පණිවිඩයක් අනුව ඔහුව අත්අඩංගුවට නොගත් බවත්, ඔවුන්ට පොලිසියට එන ලෙස දැනුම් දී තිබූ බවත්, මෙම සාක්ෂිකරු වන පො.සැ.7997 හෙට්ටිආරච්චිගේ චන්දන ප්‍රේමකුමාර ප්‍රකාශ කරයි. පසුව එම පැමිණිල්ලේ පැමිණිලිකරු ඔවුන්ට අසාධාරණයක් වූ බවට පුත්තලම නියෝජ්‍ය පොලිස්පතිතුමාට පැමිණිලිකර ඇති බව දැනගන්න ලැබුණු බවත්, එම සිද්ධිය සම්බන්ධයෙන්ද චෝදනා පත්‍රයක් ලැබුණු බවත් ප්‍රකාශ කරයි. එම චෝදනා පත්‍රය විමර්ශනය කිරීමට පැමිණිලිකරු පත්කර තිබූ බවත්, ඔවුන්ගේ රැකවරණ නිලධාරියා ලෙස කේ.එම්.එම්. ප්‍රේමචන්ද්‍ර ක්‍රියාකළ බවත්, පැමිණිල්ල මෙහෙය වූයේ පොලිස්

පරීක්ෂක ඩබ්ලිව්.ජී.ඩබ්ලිව්.සී. චතුලියද්ද බවත් ප්‍රකාශ කර සිටී. විධිමත් විමර්ශනය පැවැත්වීමේදී විභාග නිලධාරී විසින් (මෙම පැමිණිලිකරු) පක්ෂපාති භාවයක් දක්වනු ලැබූ නිසා එම චෝදනාව විනය පරීක්ෂණය පවත්වන අවස්ථාවේදීම ඒ සම්බන්ධයෙන් පැමිණිලිකරුට කියා සිටියද, ඒ සම්බන්ධයෙන් කිසිදු සැළකිල්ලක් චෝදනා පත්‍රය විභාග කළ පැමිණිලිකරු නොදැක්වූ බව ප්‍රකාශ කර ඇත. සාක්ෂිකරු පවසන අන්දමට 2014.07.30 වෙනි දින සහ 2015 සැප්තැම්බර් මාසයේදී පරීක්ෂණ අගතිගාමී ලෙස සිදු වූ හෙයින් විනිශ්චය සභාව වෙනස්කර දෙන ලෙසට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වයඹ පළාත වෙතට අභියාචනා 2ක් ඉදිරිපත් කළ බවත් පිළිතුරු වශයෙන් ලැබී තිබුණේ විමර්ශනය අඩකට වඩා අවසන් නිසා වෙනත් පරීක්ෂණ නිලධාරියෙකු පත්කළ නොහැකි බවත්ය. 2015 වර්ෂයේදී විමර්ශන කටයුතු අවසන් වූ බවත්, සියලුදෙනා බැහැර ගිය පසු කතා කරන්න කියූ නිසා ඒ අනුව කතා කළ බවත්, චෝදනා (4) හතරටම සාක්ෂිකරු වන පො.සැ.7997 හෙට්ටිආරච්චිගේ චන්දන ප්‍රේමකුමාර වැරදිකරු වූ නිසා සාක්ෂිකරු කුමක් හෝ කරන ලෙස පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටි බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී පැමිණිලිකරු “රු.20,000/-ක් දෙන්නැයි” ඉල්ලා සිටි බවත්, ඊළග මාසයේ සහකාර පොලිස් අධිකාරි කාර්යාලයේදී විනය පරීක්ෂණයක් පැවැත්වෙන බවත්, පැමිණිලිකරු හබරණ සිට එන බවත්, මුදල් රැගෙන විත් හමුවෙන ලෙසට දන්වා සිටි බවත්, 2016 මාර්තු මාසයේ දිනක ගොස් පැමිණිලිකරුව හමු වූ බවත්, මෙදින පැමිණිලිකරු වෙනත් විනය පරීක්ෂණයකට පැමිණ සිටි බවත්, සහකාර පොලිස් අධිකාරි කාර්යාලයේදී හමු වී කතා කළ බවත්, එවිට “රුපියල් 20,000/-ක් දෙන්න මේ වේලාවේ නැහැ. රුපියල්10,000/-ක්

අරගෙන ආවා." යැයි සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එම රුපියල් 10,000/- පැමිණිලිකරුට කහපාට ලියුම් කවරයක දමා දුන් බවත් ප්‍රකාශ කර ඇත. මෙසේ මුදල් දෙන විට කිසිදු පොලිස් නිළධාරීයෙකු හෝ සිවිල් නිළධාරියෙකු නොසිටි බව කියයි. (සාක්ෂිකරු සහකාර පොලිස් අධිකාරි කාර්යාලයට ගිය බවට කිසිදු ලේඛනයක කිසිදු සටහනක් නොමැති අතර, සාක්ෂිකරු සහකාර පොලිස් අධිකාරි හමු වී පැමිණ බව රාජකාරි කළ වෙන්නප්පුව පොලිස් ස්ථානයේ කිසිදු නිලධාරියෙකුට දැනුම් දීමක් නොකළ බවද සාක්ෂියේදී ප්‍රකාශ කර සිටියි.)

තව දුරටත් සාක්ෂිකරු පවසන අන්දමට මුදල් දෙනවා කිසිවෙක් නොදුටු බවත්, පැමිණිලිකරු විසින් සාක්ෂිකරුට උදව් කරන බව කියා සිටි නිසාත්, මුදල් දෙන විට වේලාව 2.00ට පමණ වූ බවත් ප්‍රකාශ කර සිටියි. එසේම කිසිදු පොලිස් නිළධාරියෙකුට හෝ ඔහුගේ බිරිඳටවත් මෙම මුදල් දීම සම්බන්ධයෙන් දැනුම්දීමක් නොකළ බවද ප්‍රකාශ කර සිටියි. මෙම මුදල් සොයා ගත්තේ වැටලීම්වලින් ලැබෙන ත්‍යාග මුදල්වලින් බවත් ප්‍රකාශ කර ඇත. සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට පැමිණිලිකරු හමුවෙන ලෙස කියා තිබූ නිසා ඔහුට දුරකථනයෙන් කතා කළ බවත්, එවිට පැමිණ සිටින බව දැනුම් දුන් බවත් ප්‍රකාශ කරයි. එම දිනය 2016 මාර්තු මාසයේ දිනයක් ලෙස දක්වා සිටින අතර, ඉන් මාස 2ට පමණ පසු සාක්ෂිකරුගේ සේවා ලේඛනය පුත්තලම කාර්යාලයට එවන ලෙස දැනුම්දීමක් කර තිබූ නිසා ඒ සම්බන්ධයෙන් සොයා බැලූ විට චෝදනා පත්‍රයට වරදකරු කොට තිබෙන බව දැනගත් බවත්, ඊටපසු දුරකථනයෙන් අවස්ථා (5) පහකදිම කථා කළ බවත්, "මගේ වැඩේට මොකද වුනේ" කියා ඇසූ විට පැමිණිලිකරු කියා සිටියේ "එහෙම වෙන්න බෑ Senior DIG

මහත්තයාට කතා කරා" යැයි කියූ බවත් ප්‍රකාශ කර සිටි. ඊටපසු "සර් මගෙ සල්ලි ගත්තානෙ. ඒ ගත්ත සල්ලි ආපසු දෙන්න" යැයි කියා සිටි බවත්, එවිට පැමිණිලිකරු "ඒවා පස්සෙ බලාගනිමු කියා" කියූ බවත්, මෙම සාක්ෂියේදී සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරමින් අවස්ථා (5) පහකදීම කතා කළ දුරකථන සංවාදය පටිගත කර ඇති බවත්, එම තැටියේ අවස්ථා (5) පහක් කතා කළ බවත්, එම සංවාදය විනය පරීක්ෂණ සම්බන්ධයෙන් බවත්, ඒ සංවාදයේදී පැමිණිලිකරුට ලබා දී ඇති මුදල් ආපසු ලබාදෙන ලෙසට ඉල්ලීම් කර ඇති බවත්, පටිගත කර ඇති බව ප්‍රකාශ කර සිටියි. එසේම සාක්ෂිකරු ප්‍රකාශ කර සිටින්නේ මෙම සිද්ධිය හලාවත පොලිස් පරීක්ෂක හේරත්ට දැනුම් දුන් පසුව 2016.07.28 වෙනි දින කුරුණෑගල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි විජේගුණවර්ධන මහතාට සිද්ධිය සම්බන්ධයෙන් දැනුවත් කළ බවත් එම ජංගම දුරකථනයෙන් කරන ලද පටිගත කිරීම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට ශ්‍රවණය කිරීමට දුන් බවත්, ඉන්පසු ඔහු විසින් එම දුරකථන හඬ සී.ඩී. තැටියකට ඇතුළත් කළ බවත් ප්‍රකාශ කර සිටියි.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිලිකරු සාක්ෂි දුන් අතර, ගෙන හැර දැක්වූ කරුණු සනාථ කිරීමට ලේඛන ඉදිරිපත් කර ඇත.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කළ, පැමිණිලිකරු සහකාර පොලිස් අධිකාරිවරයෙකු ලෙස 2012.12.03 සිට 2014.10.13 දක්වා පුත්තලම කොට්ඨාසයේ ආනමඩුව සහකාර පොලිස් අධිකාරි දිස්ත්‍රික්කය භාරව රාජකාරි කරන අවස්ථාවේදී පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාර, පොලිස් සැරයන් 59806 ජයසේන, පොලිස් කොස්තාපල් 46298 ලක්ෂ්මන් යන නිලධාරීන්ට විරුද්ධව වයඹ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජගත් අබේසිරිගුණවර්ධන

විසින් නිකුත් කරන ලද චෝදනා පත්‍රයට අදාළව විධිමත් විනය පරීක්ෂණයේ පරීක්ෂණ නිලධාරියා ලෙස පැමිණිලිකරුව පත්කර තිබිණ. මෙම චෝදනා පත්රය “P1” ලෙස දක්වා ඇත.

මෙම විධිමත් විනය පරීක්ෂණය පවත්වා ගෙන යන අතරතුරදී මෙම පැමිණිලිකරු පොළොන්නරුව කොට්ඨාසයේ හබරණ දිස්ත්‍රික්කයේ සහකාර පොලිස් අධිකාරි ලෙස රාජකාරී කරමින් සිට ඇත. වැඩ තහනමකට ලක්වී සිටින පැමිණිලිකරු මෙම විනය පරීක්ෂණය සම්බන්ධයෙන් පාලිත රංගෙ බණ්ඩාර ඇමතිතුමාගෙන් සහ වයඹ පළාත භාරව සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි විජේ ගුණවර්ධනගෙන් බලපෑම් ඇතිවූ බවත්, එම බලපෑම්වලට යටත් නොවී විනය පරීක්ෂණය පවත්වා ගෙන ගොස් චූදිත නිලධාරියාට විරුද්ධව ඉදිරිපත් කළ චෝදනා (4) හතරටම වැරදිකරු කොට වයඹ පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා වෙතට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පුත්තලම මගින් එම වාර්තාව ඉදිරිපත් කර ඇති අතර, එය පැමිණිලිකරුගේ සාක්ෂියේ “P2” ලෙස සලකුණු කර ඇත. 2017.02.10 වෙනි දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති උතුරු පළාත වෙත විමර්ශන නිලධාරියා විසින් එවන ලද විනය වාර්තාව සැළකිල්ලට ගෙන චූදිත නිළධාරියා වන පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාර චෝදනා (4) හතරෙන්ම වරදකරු කර ඇති අතර දඬුවම් වශයෙන් දී ඇත්තේ අවවාද කිරීමක් පමණි.

එම චෝදනා පත්‍රයේ එල්ලකර ඇති චෝදනා වන්නේ අපකීර්තිදායක හැසිරීම, අණට අකීකරුවීම, රාජකාරිය පැහැර හැරීම (4A වගන්තිය) රාජකාරිය පැහැර හැරීම (4G වගන්තිය) යන බරපතල චෝදනා වන නමුත් දී ඇති දඬුවම අවවාදයක් පමණි. මේ අනුව මෙම චූදිත නිලධාරියා වන පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාරට තිබූ

දේශපාලන සහාය කෙතරම්ද යන්න, උසස් නිළධාරීන් මෙම චූදිත නිළධාරියාට චෝදනා පත්‍රයේදී දඬුවම් දීමේදී ඉතා ලිහිල් අන්දමින් ක්‍රියාකර තිබීමෙන්ම මනාව පැහැදිලි වේ. මෙලෙස මෙම චූදිත නිළධාරියාට ලිහිල් දඬුවම් ලබාදීමට හේතු වී ඇත්තේ රාජ්‍ය ඇමති රංගෙ බණ්ඩාර විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී විජේගුණවර්ධනට බලපෑම් කොට ඒ මාර්ගයෙන් මෙසේ ලිහිල් දඬුවමක් ලැබීමට හේතු වූ බව නිරීක්ෂණය වේ.

පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාරට විරුද්ධව චෝදනා පත්‍රය නිකුත් කර ඇත්තේ 2013.05.07 වෙනි දිනදීය. එසේ ඉදිරිපත් කර ඇති ලේඛන අනුව විධිමත් පරීක්ෂණය 2014.05.09 වෙනි දින ආරම්භ කර 2016.01.27 වෙනි දින අවසන් කර ඇති අතර එම කාලය තුළදී දින 12ක් විනය පරීක්ෂණ පවත්වා පැමිණිලිකරු ඔහුගේ අවසන් වාර්තාව වයඹ පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත 2016.05.20 වෙනි දිනදී ඉදිරිපත් කර ඇත.

2016.07.29 වෙනි දින වයඹ සහ උතුරු මැද පළාත භාර නියෝජ්‍ය පොලිස්පති රවී විජේගුණවර්ධන විසින් පොලිස්පතිට ලිපියකින් ආමන්ත්‍රණය කොට වැඩ තහනමකට ලක්ව සිටින පැමිණිලිකරු විසින් විනය පරීක්ෂණයකදී සිදුකළා යැයි කියන අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් පොලිස්පතිතුමා දැනුවත් කර ඇත. එම ලිපියේ පොලිස් සැරයන් 7997 ප්‍රේමකුමාර යන නිළධාරියා විසින් ප්‍රකාශ කර ඇත්තේ ඔහුට විරුද්ධව ඇති චෝදනා පත්‍රයේ ඇති චෝදනා හතරෙන්ම (4) නිදහස් කොට අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට රුපියල් 20,000/-ක මුදලක් පැමිණිලිකරු ඉල්ලා සිටි බවත් එතරම් මුදලක් පොලිස් සැරයන් 7997 ප්‍රේමකුමාර සමීපයේ නොතිබූ නිසා රුපියල් 10,000/-ක මුදලක් මෙම පැමිණිලිකරුට ලබාදුන් බවයි.

එසේම අවසන් වාර්තාවේ පොලිස් සැරයන් 7997 ප්‍රේමකුමාර වරදකරු කොට සකස්කර ඇති බවට දැනගැනීමට ලැබුණු හෙයින් දෙන ලද රුපියල්10,000/- ක මුදල ආපසු ලබා දෙන ලෙස ඉල්ලූ බවත් එම ඉල්ලීම මගහරිමින් සිටි බවත් දක්වා ඇත. මෙසේ මුදල් දෙන මෙන් ඉල්ලමින් දුරකථන සංවාදය පොලිස් සැරයන් 7997 ප්‍රේමකුමාරගේ ජංගම දුරකථනයෙන් පටිගත කර එය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට ශ්‍රවණය කිරීමට ලබාදී පසුව යම් අයථා කටයුත්තක් සිදු වී ඇති බවට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට නිරීක්ෂණය වූ හෙයින් මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පොලිස්පතිට ලිපියක් යවා ඇත (මෙම ලිපිය පැමිණිලිකරු විසින් "P4"ලෙස සලකුණු කර ඇත).

පොලිස්පති එම ලිපිය ලද පසු එම ලිපිය පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකයට යොමුකොට පැමිණිලිකරුට විරුද්ධව විමර්ශනයක් ආරම්භ කර ඇත.

මෙම විමර්ශනයේදී පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාරගේ ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. මෙම පොලිස් සැරයන් 7997 ඔහුගේ ප්‍රකාශයට අනුව මෙම විනය පරීක්ෂණය අගතිගාමීව කෙරෙන බවට 2014.07.30 වෙනි දින සහ නැවත 2015 වර්ෂයේ සැප්තැම්බර් මසදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට අභියාචනා 2ක් ඉදිරිපත් කළ බවත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පිළිතුරු වශයෙන් ඒ වන විට පරීක්ෂණයෙන් අඩක් සිදුකර ඇති බැවින් වෙනත් පරීක්ෂණ නිලධාරියෙක් පත්කිරීමට නොහැකි බවත් දන්වා ඇත. පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාර ඔහුගේ ප්‍රකාශයේ දක්වා ඇත්තේ විමර්ශනය අවසන් කළ දිනයේදී පැමිණිලිකරු විසින් පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාරට පැමිණිලිකරුව හමුවන ලෙස කියා සිටි

නිසා සියලු දෙනා කාර්යාලයෙන් පිටව ගියාට පසුව පැමිණිලිකරුව හමුවූ බවත්, එහිදි "චෝදනා හතරෙන්ම වැරදිකරු වෙලා සිටින්නේ" කියා පැමිණිලිකරු කියා සිටින විට "මොනවහරි කරන්න කියූ" විට පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමතිලක "මොනවද මම කරන්න ඕන" කියා ඇසූ විට එවිට පැමිණිලිකරු "රුපියල් 20,000/-ක් දෙන්න" යැයි ඉල්ලා සිටි බවත්, ඊළගට විනය පරීක්ෂණ පැවැත්වෙන දවසේ රුපියල් 20,000/-ක් දෙන ලෙසත් එදිනාට කාර්යාලයට පැමිණ හමුවෙන ලෙසත් දන්වා සිටි බැව් පො.සැ. 7997 චන්දන ප්‍රේමකුමාර ප්‍රකාශ කර ඇත.

පසුව 2016 මාර්තු මාසයේ දිනක ගොස් පැමිණිලිකරුව හමු වී රුපියල් 20,000/-ක් දීමට අපහසු බවත්, රුපියල් 10,000/-ක් ගෙන ආ බවත් එය කහපාට ලියුම් කවරයක දමා පැමිණිලිකරුට දුන් බවත්, එම අවස්ථාවේදී කාර්යාලයේ කිසි කෙනෙකු නොසිටි බවත්, මුදල් දෙනවා කිසිවෙකු නොදුටු බවත්, පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාර ඔහුගේ ප්‍රකාශයේ සඳහන් කර ඇති අතර, ඉන්පසු අවස්ථා පහකදී (5) පැමිණිලිකරුට දුරකථනයෙන් කතා කළ බවත්, එම දුරකථන සංවාදය සී.ඩී. තැටියකට ඇතුළත් කර ඇති බවත්, එම සංවාදයේදී මුදල් ආපසු දෙන ලෙසට ඉල්ලීම් කර තිබෙනවා යන කරුණ ඇතුළත් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

1. පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමතිලක විසින් පැමිණිලිකරුව විනය පරීක්ෂණයෙන් මාරු කිරීමට ඉල්ලුම් කර ඇත. (P20) මේ බව පැමිණිලිකරුට දැනුම් දි ඇති බව හා කඩිනමින් පරීක්ෂණය අවසන් කරන ලෙසට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් දන්වා ඇත. (P20)

2. මෙම විනය පරීක්ෂණය ආරම්භ කරන අවස්ථාවේදී පාලිත රංගෙ බණ්ඩාර සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි විජේගුණවර්ධන මෙම විනය පරීක්ෂණයට ලක්ව සිටින නිලධාරීන්ට උදව් කරන ලෙසට පැමිණිලිකරු වෙතින් ඉල්ලීමක් කර ඇත. මේ අනුව පෙනී යන්නේ පැමිණිලිකරු මෙම විනය පරීක්ෂණය මෙහෙයවනවාට පො.සැ.7997 චන්දන ප්‍රේමතිලකගේ කැමැත්තක් නොතිබූ බවය.

මෙවැනි තත්ත්වයක් යටතේ පැමිණිලිකරු විසින් චූදිත නිලධාරියා වන 7997 චන්දන ප්‍රේමකුමාරගෙන් මුදල් ඉල්ලනු ලබයිද? මෙම තත්ත්වය විය හැකිය යන්නට වඩා විය නොහැකිය යන තත්ත්වයට පත්වන කරුණකි.

3. පොලිස් සැරයන් 7997 චන්දන කුමාර වැඩ තහනමකට ලක්ව සිටින පැමිණිලිකරු හමුවීමට ගිය අවස්ථා දෙකෙහිදීම ඒ සම්බන්ධයෙන් කිසිවෙකුට දැනුම්දීමක් හෝ සඳහනක් කර නොමැත. කිසිදු සටහනක්ද දමා නොමැත. මේ සම්බන්ධයෙන් නිවසේ අයට හෝ එනම් අඩුම වශයෙන් තම බිරිඳට හෝ කිසිදු පොලිස් නිළධාරියෙකුට දැනුම්දීමක් නොකළ බැව් විශේෂ විමර්ශන අංශය ඔහුගේ කට උත්තරය සටහන් කරන විටදී ප්‍රකාශ කර ඇත. පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාර විසින් පැමිණිලිකරු විසින් ඔහුගෙන් අයුතු ලෙස මුදල්ගෙන ඇති බැව් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත වාර්තා කර ඇත්තේ 2016.07.28 වෙනි දිනදීය. (P4) මොහු මුදල් දුන් දිනය ලෙස දක්වා ඇත්තේ 2016 මාර්තු මාසයේ දිනක වේ. එනම් මෙම පැමිණිල්ල කර ඇත්තේ මාස 4කට පමණ කාලයකට පසුවය. මෙවැනි ප්‍රමාදයකට ඔහු විසින් හේතු දක්වා නොමැත.

4. මෙම විනය පරීක්ෂණය අවසන් වී ඇත්තේ 2016.01.27 වෙනි දිනදීය. ඒ අනුව සාමාන්‍යයෙන් කෙනෙකු චෝදනාවක් විමර්ශනය කිරීමේදී උදව්වක් ඉල්ලා සිටින්නේ චෝදනා පත්‍රයේ පරීක්ෂණ ආරම්භ කිරීමට ප්‍රථම හෝ ආරම්භ කර විනය පරීක්ෂණය පවත්වාගෙන යන කාලය තුළදීය. මෙහිදී උදව් ඉල්ලා ඇත්තේ විනය පරීක්ෂණය අවසාන වූ පසුවය. මේ අනුව මුදල් දුන්නා යැයි යන කරුණු සැලකිල්ලට ගැනීමේදී ඉහත දක්වන ලද කරුණු සම්බන්ධයෙන් වඩාත් විමසිලිමත්ව සැලකිල්ලට භාජනය කළ යුතු වේ.

කෙසේ වුවද හඬපට ඉදිරිපත් කරමින් එම හඬපටවල මුදල් ඉල්ලූ බවට සාක්ෂි තිබෙන බව පොලිස් සැරයන් 7997 චන්දන ප්‍රේමකුමාර විසින් පවසා ඇති අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ ශ්‍රවණයට එම හඬපට ඉදිරිපත් කර ඇති බවද පවසා ඇත. එහෙත් එම හඬපට මෙම කොමිෂන් සභාවේ ශ්‍රවණයට ඉදිරිපත් කර නොමැත.

කෙසේ වුවද හඬපට මගින් පමණක් මුදල් ගත්තාද යන්න තහවුරු කිරීමට එම කරුණ පමණක් ප්‍රමාණවත්ද? යන සැකය ඇතිවෙනු ඇත. මෙම හඬ පටිවල ඇති කට හඬවල් හඳුනාගෙන තිබේද? මෙම සංවාදය පටිගත කළ විටදී එම ස්ථානයේ සිටි අය කවරෙත්ද? එම හඬපටි සංස්කරණය කරන ලද ඒවාද? දුරකථනයෙන් සී.ඩී. තැටියට ගනු ලැබූ අවස්ථාවේදී වෙනස් වීමක් හෝ සංස්කරණයක් කරනු ලැබුවාද යන්න කරුණු ගැන අවධානය යොමු කර තිබේද යන්න මෙම හඬපටි සාක්ෂි ලෙස ගැනීමට පෙර පරීක්ෂා කළ යුතුව ඇත. මෙම සාක්ෂියේ විශ්වාසදායකත්වය සනාථ කර නොමැති බව පෙනේ. මේ නිසා

විය හැකි දෙයකට වඩා විය නොහැකි කරුණක් ලෙසද දැක්විය හැක.

සහනදායී පදනම යටතේ මෝටර් රථයක් මිළදී ගැනීමට අවසර ඉල්ලූවිට එම අවසරය නොලැබීම. මෙම පැමිණිලිකරුගෙන් පළිගැනීමේ තවත් කරුණකි.

මෙම පැමිණිලිකරු 2010.05.09 වෙනි දිනදී සහකාර පොලිස් අධිකාරි තනතුරට පත්ව ඇත. 2016.07.14 වෙනි දින වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍ර ලේඛන අංක: 1/2016 යටතේ (P23) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල සිටින නිලධාරීන්ට සහනදායී පදනම යටතේ වාහන බලපත්‍රයක් ලබා ගැනීමට හැකිව තිබූ අතර, මෙම පැමිණිලිකරු 2016.05.09 වෙනි දින වන විට සුදුසුකම් සපුරා තිබූ හෙයින් ඉල්ලුම් පත්‍රයක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මගින් පොලිස්පති වෙතට ඉදිරිපත් කළද, පොලිස්පති විසින් එම ඉල්ලුම් පත අදාළ අමාත්‍යංශය වෙතට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් දැඩි අසාධාරණයකට ලක්ව ඇති බව මනාව පැහැදිලි වේ. දැනට වැඩ බලන පොලිස්පති විසින් 2019.10.24 වෙනි දින ආරක්ෂක ලේකම් වෙත මෙම පැමිණිලිකරු ගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර යවා ඇති මුත්, සත්‍ය වශයෙන්ම මෙම පැමිණිලිකරු එම තනතුරේ අවුරුදු 6ක් සම්පූර්ණ වන විට විනය පරීක්ෂණ වලින් තොර නොකැළැල් සේවා කාලයක් සපුරා තිබිණ. මේ අනුව එවකට පොලිස්පති පූජිත් ජයසුන්දර විසින් මෙම පැමිණිලිකරුගේ අයදුම්පත නිර්දේශ කර නිසි පරිදි අදාළ අමාත්‍යංශය වෙත යොමු නොකිරීමෙන්ම දේශපාලන පළිගැනීමක් හේතු වී ඇති බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වයඹ විසින් මෙම පැමිණිලිකරුට විරුද්ධව පොලිස්පති වෙත එවන ලද 2016.07.29 වන දින දරන ලිපිය අනුව පොලිස්පති විසින් එය පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකයට යොමුකොට විමර්ශනය කර, ජාතික පොලිස් කොමිසම මගින් පැමිණිලිකරුට විරුද්ධව චෝදනා (5) පහකින් යුක්තව චෝදනා පත්‍රයක් 2018.08.01 දින (P24) නිකුත් කර ඇත. එසේම තවත් චෝදනා පත්‍රයක් 2019.02.06 වෙනි දින පොලිස් කොමිසම මගින් මෙම පැමිණිලිකරුට එක් චෝදනාවක් මත නිකුත් කර ඇත. එම චෝදනාව පහත පරිදි සටහන්ව ඇත. (P25)

"සහකාර පොලිස් අධිකාරිවරයෙකු වශයෙන් 2014.10.13 වෙනි දින සිට හබරණ දිස්ත්‍රික්කය භාරව රාජකාරි කරමින් සිටියදී, රාජකාරි වේලාව තුළදී සමහර අවස්ථාවන්වලදී කාර්යාලය තුළ රැඳී නොසිට පොලිස් නිළධරයන් සහ නිළධාරිනියන් රාජකාරි කටයුතු සඳහා සහ පොත්පත්, ලිපි ලේඛනාදිය පරීක්ෂා කිරීම සඳහා ඔබගේ නිළ නිවස වෙත කැඳවා ඇති අවස්ථාවන්වලදී නිළ නිවසේ සාලයේ සැටියට වී සරම පමණක් ඇඳගෙන, උඩුකය නිරුවත්ව සිටිමින්, සැටියෙන් නැගිට නිළධාරිනියන් ඉදිරිපිටදී ඔබ ඇඳ සිටින සරම කඩමින් දහඩිය බව පවසා සරම සොලවා නිළධාරිනියන් අපහසුතාවයට පත්වන අයුරින් හැසිරීමෙන්, පොලිස් නිළධරයකු වශයෙන් ඔබ විසින් "අනිසි ලෙස හෝ විනය පවත්වා ගැනීමට හානි කරවන අන්දමින් හෝ පොලිස් සේවයේ හොඳ නමට කැළලක් විය හැකි අන්දමින් හෝ හැසිරීමෙන්'' ලෙස දක්වා ඇත. මෙම චෝදනාව කර ඇත්තේ හබරණ දිස්ත්‍රික්කය භාරව රාජකාරි කරමින් සිටියදී බවත්, පැමිණිලිකරු පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හබරණ කොට්ඨාසයේ සිට මාතර කොට්ඨාසයට මාරු කර ඇත්තේ 2017.06.19 වෙනි දිනදී බවත්

ප්‍රකාශ කර ඇත. (P3) ඒ අනුව 2වන චෝදනාපත්‍රය නිකුත් කර ඇත්තේ අවුරුදු 1යි මාස 8ට පසුවය. මෙහි ගැබ්ව ඇති කරුණු සිදුවිය හැකිද යන්න සම්බන්ධයෙන් සැළකිලිමත් වීමේදී සිදුවීමට ඇති හැකියාවට වඩා සිදුවිය නොහැකිය යන කරුණු ඉස්මතු වේ. 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සිදුව ඇති සිදුවීම් සැළකිල්ලට ගැනීමේදී මෙම පැමිණිලිකරුව ඉතා දැඩි පීඩාකාරී තත්ත්වයකට පත්කර ඇති බැව් ඉදිරිපත් කර ඇති ලේඛන වලින් මෙම කොමිෂන් සභාවට පැහැදිළිවම පෙනී යයි.

අල්ලස් කොමිෂන් සභාව විසින් අල්ලස් පණත යටතේ මහාධිකරණයට චෝදනා ඉදිරිපත් කිරීම 2016.08.22 වෙනි දිනදී පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකය විසින් පොලිස්පතිගේ උපදෙස් මත අල්ලස් චෝදනාව සම්බන්ධයෙන් මෙම පැමිණිලිකරුට එරෙහිව විමර්ශන ආරම්භ කර ඇත.

විශේෂ විමර්ශන ඒකකය පිහිටුවන ලද්දේ පොලිස් නිළධාරීන්ගේ විනය කඩවීම් සම්බන්ධයෙන් විමර්ශන පවත්වා වූදිත නිළධාරීන්ට විරුද්ධව දෙපාර්තමේන්තුව තුළ චෝදනා ඉදිරිපත් කිරීමටය. මේ සම්බන්ධයෙන් 1992.06.01 වෙනි දින පොලිස් ගැසට්පත්‍ර II අංක:721 කෙරෙහි යොමු වීමේදී එහි අල්ලස් චෝදනා සම්බන්ධයෙන් පැමිණිලි ලැබුණු විට එම පැමිණිලි අල්ලස් කොමිෂන් සභාව වෙත යොමුකළ යුතු බව පැහැදිලිව දක්වා ඇත. එසේම 2002.03.31 වෙනි දින පොලිස්පති චක්‍ර ලේඛන අංක:1623/2002 යටතේ දක්වා ඇති උපදෙස් යටතේ තුන්වන ඡේදයේද ඒ බව දක්වා ඇත. ඒ අනුව හැකි සෑම අවස්ථාවකම ලැබෙන සෑම අල්ලස් පැමිණිල්ලකම ප්‍රකාශ සටහන් කිරීමෙන් තොරව අදාළ තොරතුරු අල්ලස් හෝ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය වෙත

යොමු කිරීමට නිසි පියවර ගතයුතු යැයි  දක්වා ඇත. නමුත් මේ සිද්ධියට අදාළව පොලිස්පති  පූජිත් ජයසුන්දර විසින් මෙම වක්‍ර ලේඛන සම්බන්ධයෙන් නොසළකා හරිමින්, කිසිදු තැකීමක් නොකර, විමර්ශනය කර වසරකට පසු අල්ලස් කොමිෂන් සභාවට යවා ඇත. අල්ලස් කොමිෂන්  සභාව 2017.11.06 වෙනි දින මෙම පැමිණිලිකරු කැඳවා ඇති අතර, ඉන්පසු 2019.04.12 වෙනි දින චෝදනා (4) හතරක් යටතේ මහාධිකරණ අපරාධ නඩු අංක HCB09/2019 යටතේ බස්නාහිර පළාතේ කොළඹ මහාධිකරණයේ නඩු පවරා ඇත. මෙම නඩුව දැනට විභාග වෙමින් පවතී. අල්ලස් ගැනීම සම්බන්ධයෙන් පැමිණිලිකරුට විරුද්ධව ඇති චෝදනාව කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව  සනාථ කළ නොහැකි චෝදනාවකි.

අල්ලස් පණත යටතේ කොළඹ මහාධිකරණයේ අංක HCB09/2019 (P5) යටතේ 2019.04.24 වෙනි දින නඩු පවරා ඇති හෙයින් පොලිස් කොමිෂන් සභාව 2019.05.10 වෙනි දින සිට මෙම පැමිණිලිකරුගේ වැඩ තහනම් කර ඇත. මෙම වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් පොලිස්පතිට හා පොලිස් කොමිසමට ඔහුව නැවත රැකියාවේ පිහිටුවන ලෙස ඉල්ලමින් අභියාචනා ඉදිරිපත් කර ඇති නමුත් එම අභියාචනාවලට සහනදායී පිළිතුරක් පැමිණිලිකරුට ලැබී නොමැත. පැමිණිලිකරු විසින් පොලිස් කොමිසම වෙත වැඩ තහනමට ලක්ව නඩු කටයුතු අවසන් නොවූ නිලධාරීන්ව නැවත සේවයේ පිහිටුවීමේ අවස්ථාවන් ගෙනහැර දැක්වූවද ඒ පිළිබඳව සැලකිල්ලට භාජනය නොකර පැමිණිලිකරුගේ අභියාචනා නොසළකා හැරීම පැමිණිලිකරුගේ අයිතිවාසිකම් කඩ කිරීමක් ලෙසට කොමිෂන් සභාවට පෙනී ගොස් ඇත.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ.30 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

# 9 .LIX

පැමිණිලි අංකය - 352/2020

පැමිණිලිකරු - නීල් බණ්ඩාර හපුහින්න

ලිපිනය - නො.3බී, කන්දෙවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.

පැමිණිලිකරු දේශපාලන පළි ගැනීමකට ලක් කළ පහත නම් සඳහන් පුද්ගලයින්, වගඋත්තකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. පොලිස් පරීක්ෂක චමින්ද රණසිංහ
2. හිටපු අමාත්‍ය මංගල සමරවීර
3. හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක
4. හිටපු අමාත්‍ය රවුෆ් හකීම්
5. ප්‍රජාතන්ත්‍රික සන්ධානයේ නායක සරත් ෆොන්සේකා
6. දෙමළ ජාතික සන්ධානයේ නායක ආර්. සම්බන්ධන්
7. පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරන්
8. ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක
9. නීතිඥ ජේ.සී. වැලිඅමුණ
10. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
11. මලික් සමරවික්‍රම

12. දූෂණ මර්දන කමිටුවේ අධ්‍යක්ෂ හා ලේකම් ආනන්ද විජේපාල

## තීරණය

1. මෙම පැමිණිල්ල කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් වූ සාක්ෂි හා ලේඛන පැමිණිලිකරු නීල් හපුහින්න මහතා යම් අපරාධ වරදකට හසුකරලීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කර, රක්ෂිත බන්ධනාගාරගත කිරීමත්, ඊට ආධාර අනුබල දීමත් ඉහත සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියාකර ඇති බවට ඉදිරිපත් වූ සාක්ෂිවලින් තහවුරු වී ඇති බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. ඉහත සඳහන් වගඋත්තරකරුවන් කිසිදු නීත්‍යානුකූල පදනමක් නොමැති දූෂණ විරෝධී කමිටුවේ සමාජිකත්වය ලබාගෙන කැබිනට් සන්දේශය මගින් පිහිටුවා ඇති දූෂණ විරෝධී කමිටුවේ කෙටි කාලීන හා දිගු කාලීන ක්‍රියාකාරීකම් දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල මගින් පදනම් රහිත අසත්‍ය පැමිණිලි මූල්‍ය අපරාධ කොට්ඨාසයට යොමු කොට පැමිණිලිකරුට විරුද්ධව අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමට ආධාර අනුබල දීම, කුමන්ත්‍රණය කිරීම කළ බවට ප්‍රබල සාක්ෂි මගින් තහවුරු වී ඇති බව කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂි සහ සියලු ලේඛන පරීක්ෂාවට සහ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව දූෂණ කමිටුව මගින් අසත්‍ය චෝදනා මූල්‍ය අපරාධ කොට්ඨාසයට ඉදිරිපත් කිරීමෙන් අසත්‍ය පැමිණිල්ලක් ගොණු

කිරීමට ආධාර උපකාර දුන් බවට පැහැදිලි වේ. තවද මූල්‍ය අපරාධ කොට්ඨාසය මගින් එය පදනම් විරහිතව චෝදනාව විමර්ශනයෙන් පසු නීතිපති වෙත යවා ඒ මගින් බස්නාහිර පළාත්බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ අධිචෝදනා ඉදිරිපත් කළ බවට පැහැදිළිව සාක්ෂි ඇත. එසේම එම මහාධිකරණය මගින් විත්තිකරු නිදොස් කර නිදහස් කර ඇති අතර, පැමිණිලිකරු දූෂණ මර්දන කමිටුවේ ක්‍රියා කලාපයෙන්ද, මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ක්‍රියා කලාපයෙන්ද දැඩි අසාධාරණයකට හා අයුතු සහගත සහ ද්වේශ සහගත දේශපාලන පළිගැනිමකට ලක්වූ බව මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. ඉහත සඳහන් 1වෙනි වගඋත්තරකරු කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට 2015.07.16 වෙනි දින නඩු අංක B788/15 වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරමින් අසත්‍ය කරුණු නිර්මාණය කර අධිකරණය නොමග යැවීමෙන් පැමිණිලිකරුගේ සහ තවත් දෙදෙනෙකුගේ විදේශගත වීමේ තහනමක් අධිකරණයෙන් ලබා ගැනීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 190 වගන්ති යටතේ දඬුවම් ලැබිය යුතු අසත්‍ය සාක්ෂි නිර්මාණ කිරීමේ වරද සිදු කිරීම.

2. එසේම අසත්‍ය චෝදනා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 190 වගන්තිය

යටතේ දඬුවම් ලැබිය යුතු අසත්‍ය සාක්ෂි නිර්මාණ කිරීමේ වරද සිදු කර ඇති හෙයින් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

3. එසේම දූෂණ කමිටුවේ සමාජිකයින් වන 2 සිට 11 දක්වා වගඋත්තරකරුවන් අසත්‍ය පැමිණිලි ලේකම් කාර්යාලය මගින් මූල්‍ය අපරාධ කොට්ඨාසයට ඉදිරිපත් කර පැමිණිලිකරුට චෝදනා නැගීමට, කුමන්ත්‍රණය කිරීම සහ අධාර අනුබල දීම වැරදි දණ්ඩ නීති සංග්‍රහයේ 113ආ(1) හා 100 වගන්ති යටතේ දඬුවම් ලැබිය යුතු වැරදි සිදු කර ඇති බැවින් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

4. 1වෙනි වගඋත්තරකරු අසත්‍ය සාක්ෂි ගොතා පැමිණිලිකරුගේ ගුවන් ගමන් තහනම් කිරීමට අධිකරණයට වාර්තා කිරීම හා පසුව පදනම් රහිත චෝදනා නගා පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් මහජනයාගෙන් කෙනෙකුට පීඩාකාරි අන්දමින් හැසිරීමෙන් දෙපාර්තමේන්තු නියෝගයේ "ඒ 7බී පරිෂ්ඨයේ විනය සංග්‍රහයේ 4ජී වගන්තිය ප්‍රකාරව" අණට අකීකරු වීම හෝ පීඩාකාරි ලෙස හැසිරීමේ වරදක් සිදු කර ඇති බවට එනම්, මහජනයාගෙන් කෙනෙකුට අවනීත අන්දමින් හෝ පීඩාකාරී අන්දමින් හැසිරීම වරදකර තිබීම පොලිස් විනය සංග්‍රහය යටතේ චෝදනාපත්‍ර ගොණු කර විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා දඬුවම් පැනවීම කොමිෂන් සභාව නිර්දේශ කර ඇත.

5. 1වෙනි වගඋත්තරකරු මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ස්ථානාධිපති ලෙස කටයුතු කරමින් සිටියදී දූෂණ මර්දන කමිටුව මගින් එවන ලද පදනම් රහිත පැමිණිල්ල විමර්ශනය කොට අසත්‍ය කරුණු අධිකරණයට වාර්තා කොට පැමිණිලිකරුට අධිකරණය මගින් ගුවන් තහනමක් අධිකරණ මාර්ගයෙන් පැනවීම හා අසත්‍ය කරුණු පදනම් කරගෙන දේශපාලන පළිගැනීම් සඳහා පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් "දෙපාර්තමේන්තු නියෝග ඒ 7බී පරිශිෂ්ටයේ විනය සංග්‍රහයේ 1වගන්තිය ප්‍රකාරව" අපකීර්තිදායක ලෙස හැසිරීම, එනම් පොලිස් නිළධාරියෙකු වශයෙන් පොලිස් සේවයේ හොඳ නමට කැළලක් වී ඇති අන්දමින් හැසිරීම යන චෝදනා යටතේ 1වෙනි වගඋත්තරකරුට විරුද්ධව චෝදනා ඉදිරිපත් කොට මූලික පරීක්ෂණයකින් පසුව දඬුවම් ලබාදියයුතුයැයි කොමිෂන් සභාව නිර්දේශ කර ඇත.

6. 1 සිට 12 දක්වා වගඋත්තරකරුවන්ට එරෙහිව මෙම වාර්තාවේ දක්වා ඇති වරදවලට නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියේ චෝදනාපත්‍ර ගොණු කිරීම සඳහා එම නඩුවට අදාළ සාක්ෂි හා ලේඛන ගොණු නීතිපතිවරයා වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. පැමිණිලිකරු රජයේ සේවයේ යෙදී සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වූ අතර, 2015 වර්ෂයේදී පරිපාලනයේ වෙනස් වීමක් සමග ඔහු දැරූ තනතුරු සියල්ල ඔහුට අහිමිවිය. පැමිණිලිකරුගේ පත්වීම දේශපාලන පත්වීමක් නිසා තනතුරු අහිමි වූ තත්ත්වයට පත්වන්නේ නැති අතර, පරිපාලනය වෙනස් වීමත් සමග ඔහු

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචිතයට වාර්තා කර ඇත. කෙසේ වුවද තනතුරු අහිමිවීමෙන් ඇති වූ කම්පනය හා මානසික පීඩාවට මෙම පැමිණිලිකරු ලක්වූ බව නොරහසකි. එසේම නොකළ වරදකට රක්ෂිත බන්ධනාගාරගතවීම, සේවය අත්හිටුවීම නිසා ඇති වූ සමාජ බලපෑම අතිවිශාල බව කොමිෂන් සභාව පිළිගෙන ඇත. එසේම වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වර්ධනයේ ආරම්භය සිට දායක වීම අමතක නොකළ යුතු වේ. මේ නිසා සේවයේ යම් ඇගයීමක් සිදුවිය යුතු අතර, ආර්ථික උපදේශකවරයෙකු වශයෙන් දේශීය හා විදේශීය තනතුරකට පත්කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

8. දූෂණ විරෝධී කමිටුවේ සමාජිකයින් වන වගඋත්තරකරුවන් විසින් සකස් කළ එම කමිටුවේ අරමුණ හා කාර්යභාරය, කෙටි කාලීන වැඩ සටහන් හා දිගු කාලීන වැඩ මගින් කමිටුව විසින් ගතයුතු සහ ගෙන ඇති ක්‍රියාමාර්ගයන් පැහැදිළිව 2015ට පෙර රජයේ සිටි දේශපාලනඥයින්, නිලතල දැරූ රාජ්‍ය හා සංස්ථාවල නිළධාරීන් හමුදා සහ පොලිස් සේවයේ සමාජිකයින් ඉලක්ක කර අධිකරණ ක්‍රියාවලිය තුළින් හා වෙනත් ක්‍රියාමාර්ග උපයෝගි කර ගනිමින් අයුතු සහගත ද්වේශ සහගත සහ අසාධාරණ ලෙස ඉලක්ක කර ඇති කණ්ඩායමක් අධිකරණ ක්‍රියාවලියක් තුළින් දේශපාලන පළිගැනීමට ලක් කර ඇති නිසා ඊට ආධාර උපකාර කළ හා ක්‍රියාකාරී වූ අය සම්බන්ධයෙන් සොයා බැලීම 1978 අංක 7 දරණ පණත යටතේ විශේෂ ජනාධිපති කොමිසමක් පත්කර වැරදිකරුවන් වූ අයගේ දේශපාලන අයිතිවාසිකම් අවුරුදු 7කට අහිමි කිරීමට හා වෙනත්

ක්‍රියාමාර්ග ගැනීමට මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් හයට් රීජන්සි (Hyatt Regency) නැමති දේපළ වංචාකාරී ලෙස සිනෝ ලංකා පුද්ගලික සමාගමට විකිණීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ දූෂණ විරෝධී කමිටුව විසින් 2015.03.05 වෙනි දින පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට එවන ලද පැමිණිල්ල විමර්ශනය කොට B783/15 දරන අංකයෙන් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කර ඇත. ඉන්පසු පොලිස් විමර්ශනවල ප්‍රතිඵලයක් වශයෙන් 2014 පෙබරවාරි මස 11 වෙනි දින හෝ ඊට ආසන්න දිනකදී කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරි පියදාස කුඩාබාලගේ යටතේ තිබූ ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම වෙත යවන ලද රු.මිලියන 500ක මුදලක් වංක ලෙස හෙලෙන්කෝ හෝටල් සහ ස්පා සමාගම වෙත ලංකා බැංකුවේ ආයතන ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක 72783012 දරණ ගිණුමට කුඩාබාලගේ මහතා විසින් බැර කිරීම කළ නිසා එම මුදල වංක ලෙස සාපරාධී විශ්වාසය කඩ කිරීම නිසා පැමිණිලිකරු එම වරද සිදු කිරීමට අනුබල දීම, එකඟ වීම, පොදු අරමුණක් සහිතව ක්‍රියා කිරීම සහ කුමන්ත්‍රණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දේපළ වංක ලෙස සාපරාධී විශ්වාසය කඩ කිරීමේ වරද විමර්ශනය කොට නීතිපති උපදෙස් ලබා, බස්නාහිර පළාත් ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ පදනමක් නොමැතිව දේශපාලන පළිගැනීමේ අරමුණින් අංක HC/PTB1/01/2018 යටතේ අධි චෝදනා 24ක්

යටතේ නඩු දමා ඇති අතර, පැමිණිලිකරු වන නීල් බණ්ඩාර හපුහින්නට විරුද්ධව 1,4,8,13,18,20,23චෝදනා ගොණු කර ඇත.

ඉහත නම සඳහන් පැමිණිලිකරු, 2015.01.08 වෙනි දින බලයට පත් වූ රජයේ අගමැති වූ රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සන්දේශයට කැබිනට් මණ්ඩලයෙන් ලැබුණු අනුමතිය මත පිහිටුවන ලද දූෂණ විරෝධි කමිටුවේ ලේකම් කාර්යාලය විසින් එවන ලද පැමිණිල්ලක් මුල් කරගෙන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 2011 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීම මගින් ඉඩම් මිලදී ගැනීම, සංස්ථා ක්ෂේත්‍රයට අයත් හෝටල් සමාගම් කිහිපයක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් හා එම හෝටල්වල ගිණුම්වලට මුදල් මාරු කිරීම සම්බන්ධයෙන් සාපරාධි විශ්වාසය කඩ කළ බවට පොලිස් මූල්‍ය අපරාධ අංශය විසින් සැලසුම් කර අත්අඩංගුවට ගෙන ඇත. ඉන්පසු අධිකරණ ක්‍රියාවලියට ඉදිරිපත් කර, රක්ෂිත බන්ධනාගාරගත කොට, පසුව ඇප ලබාගෙන ඇත. ඉන්පසු පැමිණිලිකරුට මුහුණදීමට සිදු වූ මෙම හිංසාකාරී තත්ත්වය දේශපාලන පළිගැනීමක් මත සිදු කළ බවට පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් විමර්ශනයක් ආරම්භ කොට එම විමර්ශන වාර්තාව පහත ඉදිරිපත් කර ඇත.

දේශපාලන පළිගැනීමකට ලක්වූ නීල් බණ්ඩාර හපුහින්න මහතා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ විමර්ශන වාර්තාව.

2015 ජනවාරි මස සහ අගෝස්තු මස පැවැත්වූ ජනාධිපතිවරණය සහ මහමැතිවරණයට පෙර නිලයන් දැරූ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සංස්ථාවල, ත්‍රිවිධ හමුදාවන්හි මෙන්ම පොලිස් සේවයේ සමාජිකයින්

2015 ජනවාරි මස 8වෙනි දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාලසීමාව තුළදී දේශපාලනමය වශයෙන් පළිගැනීමකට ලක්වූ සාමාජිකයිනට සිදු වූ හිංසාකාරී, අගතිගාමී තත්ත්වය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා මෙම කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි.

2015 පැවැත්වූ ජනාධිපතිවරණයට සහ පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රචාරණ කාලය තුළදී, පසුගිය රජය පැවති කාලය තුළදී විශාල වශයෙන් පැතිරී ගිය දූෂණවලට වගකිවයුතු සෑම කෙනෙකුටම දඬුවම්දීමට ජනතාවට පොරොන්දුවක් දුන් හෙයින්, ඒ සඳහා අවශ්‍ය කරන විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීමට සඳහා 2015.01.21 වෙනි දින කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කර එහි අනුමැතිය ලබා ගන්නා ලදි. එම කැබිනට් සන්දේශය මගින් යෝජනා කරනු ලබන විමර්ශන ඒකකය විසින් සියලු දූෂණ චෝදනා විමර්ශනය කොට එම විමර්ශනයේ ප්‍රතිඵල මත අදාළ බලධාරීනට ඉදිරිපත් කිරීමට මේ යෝජිත ආයතනය ක්‍රියාකළ යුතු විය. මෙම කර්තව්‍යය පිහිටුවන ලබන දූෂණ විරෝධි කමිටුව මගින් අධීක්ෂණය කළයුතු බව කැබිනට් සන්දේශයේ දක්වා ඇත. (2016/20 පැමිණිලිකරුවන කේ.කේ.එල්. බණ්ඩාර මහතා විසින් 2020.10.08 වෙනි දින හා ඊට පසු දිනවල සාක්ෂි දීමේදී සලකුණු කරන ලද "පැ.39" අදාළ කරගන්නා ලදි.)

මෙම දූෂණ විරෝධි කමිටුවට කාර්යක්ෂමව ක්‍රියාකිරීම සඳහා අනුකමිටුවක්ද, ක්ෂණික ප්‍රතිචාර කමිටුවක්ද, ස්ථාපනය කරන ලද අතර, කෙටිකාලීන වැඩ සටහන් යටතේ මහා පරිමාණ දූෂකයන්ට සහ ජාවාරම්කරුවන් ලෙස සැක කෙරෙන පුද්ගලයන්ගෙන් අවම වශයෙන් 15 දෙනෙකුගේ දූෂණ වංචා වත්කම් බැරකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම එහි කාර්යය විය.

මෙම මූල්‍යමය අපරාධ විමර්ශනය සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීම අනුමත කළ අතර, 2015.01.12 වෙනි දින කැබිනට් තීරණය පරිදි ප්‍රසිද්ධියට පත්කළ 2015.02.13 වෙනි දිනැති අංක 1901/2015 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ස්ථාපිත කරන ලදි. (පැමිණිලි අංක 205/20 පැමිණිල්ලේදී පැ.ii ලේඛනයෙන් ලබාගත් තොරතුරු)

ඉහත දැක්වූ අන්දමට කැබිනට් මණ්ඩලය මගින් ස්ථාපනය කරන ලද දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල මහතා විසින් මූල්‍ය අපරාධ කොට්ඨාසයට එවන ලද පැමිණිල්ලක් පදනම් කරගෙන මූල්‍ය අපරාධ කොට්ඨාසය මගින් නීල් බණ්ඩාර හපුහින්න මහතාට විරුද්ධව විමර්ශන ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඉඩම් මිළදී ගැනීම්, සංචාරක ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට හෝටල් සමාගම් කිහිපයක් ස්ථාපනය කිරීම හා ඒ සම්බන්ධයෙන් මූල්‍ය කටයුතු විමර්ශනය කරන ලදුව සාපරාධී විශ්වාසය කඩ කිරීම සහ 1982 අංක 12 දරණ පොදු දේපල පණත යටතේ විමර්ශනය කොට නීතිපති මාර්ගයෙන් බස්නාහිර පළාත් බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයට අධිචෝදනා 24ක් ගොනු කර ඇති අතර, එම චෝදනාවලින් පැමිණිලිකරුට චෝදනා 1,4,8,13,18,20,23 යන චෝදනා අදාළ වේ.

2020.02.18 වෙනි දින බත්තරමුල්ල, පැලවත්ත, අංක 3බී හි පදිංචි නීල් බණ්ඩාර හපුහින්න මහතා විසින් මෙම කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදුව, එම පැමිණිල්ල මත කොමිෂන් සභාවේ පොලිස් ඒකකය මගින් ප්‍රකාශයක් ලබාගෙන ඇති අතර, ඉන්පසුව 2020.07.21 වෙනි දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ

සාක්ෂි දී සිද්ධිය සම්බන්ධයෙන් පැහැදිළි කිරීමක් කර ඇත. පැමිණිලිකරු වර්තමානයේ කාන්තා හා ළමා හා සමාජ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ධූරයක් දරන අතර, වෘත්තියෙන් නීතිඥවරයෙකි. 1990 වර්ෂයේ පරිපාලන සේවයට බැඳී වර්ෂ 30ක පමණ කාලයක් පරිපාලන සේවයේ නිරතව සිටි අතර, 2010 වර්ෂයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට බැඳී සමානාධිකාරී ලෙස සේවය කළ අතර, ශ්‍රී ලං රක්ෂණ සංස්ථාව ‘ෂෙල්’ සමාගමේ සියලුම කොටස් රුපියල් බිලියන 6කට මිලදී ගෙන ෂෙල් සමාගම යන නාමය වෙනස් කර ලිට්රෝ සමාගම යනුවෙන් ලියාපදිංචි කර එහි අධ්‍යක්ෂ ධූරයට පත් වූ අතර, එහි අනික් අධ්‍යක්ෂවරු වූයේ දැනට අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සේදර සෙනරත් මහතාත්, පියදාස කුඩාබාලගේ මහතාත්ය.

2010 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සභාපති ගාමිණී සේදර සෙනරත් මහතාගේ සභාපතිත්වයෙන්, පියදාස කුඩාබාලගේ මහතාගේ මගපෙන්වීම යටතේ සංචාරක ක්ෂේත්‍රය ගැන කරුණු සොයා බැලීමක් සහ දැඩි විමර්ශනයක් කිරීමෙන් පසුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විමධ්‍යගත කිරීමේ කාර්යයන්හි නිරත විය. තිස්වසරක යුද්ධය අවසන් වීමෙන් පසුව ක්‍රමයෙන් ශ්‍රී ලංකාවට විදේශීකයින් පැමිණීම ශීඝ්‍රයෙන් ඉහළ ගිය නිසා සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය කාමර සංඛ්‍යාව වැඩිකිරීමට සිදු වූ බැවින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විමධ්‍යගත කිරීමේදී හෝටල් කිහිපයක ඉදිකිරීම් කටයුතුවල නිරතවිය. සිනෝ ලංකා හෝටල් ඇන්ඩ් ස්පා සෙලින්කෝ ආයතනය විසින් අර්ධව නිමකළ හෝටලයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදි. මේ සඳහා රුපියල් බිලියන 15ක් පමණ ආයෝජනය කර ඇත. එසේම දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිහිටුවා ඇති අවන්හල් 2ක කැන්විල් හෝටල් ඇන්ඩ් ස්පා යටතේ ඉදිකර ඇති ආයතනයයි. මේ සඳහා රුපියල්

බිලියන 1 පමණ ආයෝජනයක් කර ඇත. එසේම 2011 වර්ෂයේදී කැන්විල් හෝල්ඩින්ස් ආයතනය ස්ථාපිත කෙරුණි. හෝටල් ව්‍යාපෘති මෙම කැන්විල් හෝල්ඩින්ස් යටතේ පාලනය වූ නිසා එය මව් සමාගම ලෙස සලකනු ලැබීය. එසේම සීමා සහිත හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා සමාගම රුපියල් බිලියන 7 පමණ මුදලක් ආයෝජනය කර ඇත. මින් පළමු අදියර වශයෙන් රුපියල් මිලියන 500 පමණ ආයෝජනයකි. පැමිණිලිකරු කැන්විල් හෝටල් ඇන්ඩ් ස්පා, මිනෝ ලංකා සමාගම, ලිට්රෝ ගෑස් සමාගම, හෙලන්කෝ හෝටල් ඇන්ඩ් ස්පා යන සමාගම්වල අධ්‍යක්ෂ ධූරය දරා ඇත. මෙම සමාගම් ඉදිකිරීමට සහ ක්‍රියාකාරී වීමට ප්‍රාග්ධනය සැපයුවේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගමත්, ලිට්රෝ ගෑස් සාමගමත් සහ සේවක අර්ථ සාධක අරමුදලින් ලබාගත් ණය මුදලක් මගිනි.

ඉඩම් මිළදී ගැනීම සහ සමාගම්වලට මුදල් හුවමාරු කිරීම වැනි ව්‍යාපාරික තීන්දු ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව තිබුණි. තවද මෙලස විමධ්‍යගත කිරීම මගින් හා ප්‍රතිසංවිධානය කිරීම තුළින් ලංකා රක්ෂණ සංස්ථාව අධික ලාභ උපයන ලදි. 2015 ජනවාරි මස 8වෙනි දින පැවැත්වූ ජනාධිපතිවරණයෙන් පත් වූ නව රජයේ ක්‍රියාපටිපාටිය නිසා සියලු සංස්ථා සභාපතිවරුන්ට, සියලු අධ්‍යක්ෂවරුන්ට අස්වීමට නියම කර තිබුණු නිසා, පැමිණිලිකරු 2015.01.31 වෙනි දින මෙම තනතුරුවලින් ඉවත් වූ පසු ඔහු පරිපාලන සේවයේ නිලධාරියෙකු නිසා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචිතයට මාරු වීමක් ලැබී රාජකාරී වාර්තා කර ඇත. සංචිතයේ සිටින අවධියේදී ආර්ථික අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ධූරයක් පැමිණිලිකරුට ලැබුණු අතර, 2015.04.01 වෙනි දින එම තනතුර භාර ගෙන ඇත. මේ අවස්ථාව වන විට මූල්‍ය අපරාධ විමර්ශන අංශයේ

බරපතල මූල්‍ය දූෂණ අපරාධ ගණනාවක් විමර්ශනය කරමින් තිබුණු අතර, 2015.07.10 වෙනි දින මූල්‍ය අපරාධ විමර්ශන අංශයෙන් කැඳවීමක් පැමිණිලිකරුට ලැබී ඇති අතර, එහි දක්වා ඇත්තේ 2015.07.14 වෙනි දින විමර්ශනයකට සහභාගි වෙන ලෙසට වේ. එසේම මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණෙන විට, බිරිඳගේ, දරුවන්ගේ සියලු වත්කම් ඉඩම්, නිවාස, ගොඩනැගිලි, වාහන, බැංකු ගිණුම්, සියලු විදේශීය වත්කම්, ණය ලබාදීම් සහ ණය ගැනීම් සහ ආදායම් බදු ගෙවීම් යනාදි කරුණු රැගෙන එන ලෙස දක්වා සිටි නිසා මෙම ඉල්ලා ඇති කරුණු එක දිනකදී සකස් කළ නොහැකි නිසා කාලය දිගු කර දෙන මෙන් ඉල්ලා සිටි විට මූල්‍ය අපරාධ කොට්ඨාසය විසින් 2015.07.16 වෙනි දින අංක 788/15 යටතේ මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කර පැමිණිලිකරුට ගුවන් ගමන් තහනමක් ඉල්ලා ඇති අතර, ඊට හේතුව ලෙස දක්වා ඇත්තේ, ප්‍රකාශ සටහන් කර ගැනීමට දැනුම් දී තිබුණද, පිළිගත නොහැකි කරුණු දක්වමින් ප්‍රකාශ දීම මග හරිමින් සිටින බවය. මේ අනුව පෙනී යන්නේ මූල්‍ය අපරාධ කොට්ඨාසය අධිකරණයට අසත්‍ය ප්‍රකාශ කර ඇති බවය. B වාර්තාව අනුව හෝටල් ව්‍යාපෘති සම්බන්ධයෙන් මූල්‍ය වංචා පරීක්ෂණ ආරම්භ කර ඇත්තේ දූෂණ කමිටු කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් කරන ලද පැමිණිල්ලක් මත වේ. 2015.07.16 වෙනි දින පැමිණිලිකරු මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට ගොස් නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර මහතා හමු වී ඉන්පසු රණසිංහ නම් නිලධාරියෙකු ඔහුගේ ප්‍රකාශය සටහන් කරගත් අතර, ඉතා අපහාසාත්මක වචන කියමින් නිග්‍රහ කළ බවද පැමිණිලිකරු දක්වා ඇත. මෙසේ පොලිස් පරීක්ෂණවලට මුහුණ දුන් අවස්ථාවේදී පැමිණිලිකරු නීතිය හා සාමය අමාත්‍යාංශයේ අතිරේක

ලේකම්වරයෙකු වශයෙන් රාජකාරි කළ අතර, මෙම විමර්ශනයට බාධා ඇතිවෙන හෙයින් පැමිණිලිකරු සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස 2015 අගෝස්තු මාසයේදී පමණ මාරු කර ඇත.

මූල්‍ය අපරාධ විමර්ශන අංශය කරන විමර්ශන කටයුතු නිසා අත්අඩංගුවට පත්කිරීමට යන වග තේරුම් ගිය නිසා 2017.11.13 වෙනි දින කොටුව අධිකරණයට පැමිණිලිකරු භාර වී ඇත. එසේ භාර වීමෙන් පසු 15වෙනිදා තෙක් රක්ෂිත බන්ධනාගාරගත කළ අතර නැවත 2017.11.21 වෙනි දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. 2017.11.21 වෙනි දින පැමිණිලිකරු ඇතුළු ගාමිණී සෙනරත් මහතා හා පියදාස කුඩාබාලගේ මහතාගේ ඇප අයදුම්පතක් ඉදිරිපත් කළ අතර, එදින මහේස්ත්‍රාත්තුමිය විසින් ඇප ලබා දී ඇත. මෙම ඇප ලබාදීමේදී පදනම් වූ සුවිශේෂ කරුණු කිහිපයක් මහේස්ත්‍රාත්තුමිය විසින් ඇප දීමේ නියෝගය දී ඇති බව ප්‍රකාශ කර ඇත. මෙහිදී මහේස්ත්‍රාත්වරිය දක්වා ඇත්තේ "මේ අනුව මා ඉහතින් සඳහන් කළ ආකාරයට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට රජයෙන් ප්‍රාග්ධනය සපයා තිබුණද, එය සමාගම් පණත යටතේ ලියාපදිංචි වී ඇති සමාගමක් බැවින් එය පොදු දේපල පණත යටතට ගැනිය නොහැක" යනුවෙන් ප්‍රකාශ කර ඇත.

තවද "විෂයගත කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමට අරමුදල් සපයා ඇති තවත් ආයතනයක් වන්නේ ලිට්රෝ ගෑස් සමාගමයි. ලිට්රෝ ගෑස් සමාගමද, ලිට්රෝ ගෑස් කම්පනි ලිමිටඩ් වශයෙන් සමාගම් පණත යටතේ පිහිටුවූ සමාගමක් බව ඉදිරිපත් කර ඇති එහි සංස්ථාපන සහතික අනුව පැහැදිලිය. මෙයට ප්‍රාග්ධනය සපයා ඇත්තේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගම බව නීතිපති දෙපාර්තමේන්තුව

සඳහන් කර ඇති අතර, ඒ අනුව එයද රජයේ දේපලක් වන බව ඔවුන් (නීතිපති) පවසා ඇත. එසේ රජයෙන් මෙයට ප්‍රාග්ධනය සැපයුවද මා (මහේස්ත්‍රාත්වරිය) ඉහතින් සඳහන් කළ පැහැදිළි කිරීම අනුව මෙයද සමාගම් පණත යටතේ පිහිටුවූ සමාගමක් වන බැවින් එහි දේපළ පොදු දේපළ පණත යටතට ගත නොහැකි බව අධිකරණයේ නිගමනය වන්නේය" .

තවද සේවක අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්තුමිය මේ අන්දමට කරුණු දක්වා ඇත. "එහෙත් සේවක අර්ථසාධක අරමුදල් ආයෝජනය කළ අරමුදලම පාහේ සිනෝ ලංකා සමාගමට යොමු වී ඇති හෙයින් හා එම මුදල් හෙලෙන්කෝ සමාගමට යොමු වී නොමැති බැව් පෙනී යන හෙයින් මෙම මුදල් විෂයෙහි පොදු දේපල පණත යටතේ ගැණෙන වරදක් සිදු වී ඇති බවට මා හමුවේ දැනට ඉදිරිපත් වී ඇති ලේඛන හා කරුණු අනුව පෙනී නොයන්නේය" . යනුවෙන් මහේස්ත්‍රාත්තුමිය දක්වා ඇත. එසේම පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාරගතව සිටි කාලය තුළදී අනිවාර්ය නිවාඩු යැවූ අතර, නැවත සේවයේ පිහිටුවා ඇත්තේ මාස 6කට පසුව එනම්, 2018.05.11 වෙනි දින වේ. මේ කාලය තුළදී ඔහුට ලැබී ඇත්තේ වැටුප් පමණක් බවත් වෙනත් දීමනා ඔහුට නොලැබුණු බවත් පැමිණිලිකරු දක්වා සිටියි. 2018 අගෝස්තු මස 24 වෙනි දින පැමිණිලිකරු ඇතුළු තවත් දෙදෙනෙකුට බස්නාහිර පළාත්බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ අධි චෝදනා 24කින් යුක්තව අධි චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇති අතර, වර්ෂයක පමණ කාලයක් නඩු ඇසීමකින් පසුව ත්‍රි පුද්ගල මහාධිකරණයේ පැමිණිල්ලේ සාක්ෂියෙන් පසු විත්ති වාචකය කැඳවීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි පැමිණිලිකරු වන නීල් බණ්ඩාර හපුහින්න මහතාට එරෙහිව අනාවරණය වී නොමැති පදනම මත නීල්

බණ්ඩාර හපුහින්න මහතාට විත්ති චෝදනා කැඳවීමක් නොකොට, පැමිණිලිකරුට එරෙහිව නගා ඇති සියලු චෝදනාවලින් 2019.03.27 වෙනි දින නිදොස් කොට නිදහස් කර ඇත. (නඩු අංක HC/PTB/1/01/2018 බස්නාහිර පළාත්බද ත්‍රි පුද්ගල මහාධිකරණ තීන්දුව පිටු 18 පළමු ඡේදය 2019.08.08 වෙනි දින. පැ.17)

විමර්ශනයේදී ඉදිරිපත් වූ කරුණු සහ පැමිණිලිකරුගේ සාක්ෂි විශ්ලේෂණය.

පැමිණිලිකරු නීල් බණ්ඩාර හපුහින්න මහතා 2020.07.21 වෙනි දින කොමිසම ඉදිරියේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේ 1990 පරිපාලන සේවයට බැඳී රාජ්‍ය සේවයේ පරිපාලන තනතුරු දැරූ අතර, දැනට අග්‍රාමාත්‍ය ලේකම් ලෙස වැඩ කරන ගාමිණී සෙනරත් මහතාගේ ඇරයුමක් මත 2010දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සමානාධිකාරී ලෙස පත්වීමක් ලැබුණු බව වේ. මෙලෙස ආයතනයට බැඳී වැඩ කරමින් සිටි අවස්ථාවේදී පියදාස කුඩාබාලගේ මහතාද රක්ෂණ සංස්ථාවට 2010 මැයි මස 17 වෙනි දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයෙකු ලෙස පත්වීම් ලැබී ඇත. මෙලෙස පත් වූ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ මූල්‍ය කටයුතු ශක්තිමත් කිරීමේ අදහසින්, ප්‍රථමයෙන්ම ආයෝජනය කිරීමට ඉතාමත්ම සුදුසු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතුවල නියැලි ඇත. මෙම පර්යේෂණ කටයුතුවලින් අනාවරණය වී ඇත්තේ ආයෝජනයට ඉතාමත් සුදුසු ක්ෂේත්‍රය වන්නේ සංචාරක ව්‍යාපාර බවය. මේ නිසා මුල් අවධියේ රක්ෂණ සංස්ථා මුදල් ආයෝජනය කර, ෂෙල් සමාගම මිලදීගෙන එය ලිට්රෝ ගෑස් සමාගම ලෙස නම් වෙනස්කර ව්‍යාපාර කටයුතු කළ බවත්, එම මුදල් සොයා ගත්තේ කොටස් වෙළඳ පොළේ මුදල්

ආයෝජනය කර ලබාගත් ලාභයෙන් බවත් ඉදිරිපත් කළ ලේඛනවලින් පෙනේ.

ඉහත දැක්වූ පරිදි සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජන කිරීම සඳහා හෝටල් සමාගම් කිහිපයක් ස්ථාපනය කර ඇති අතර, මේ සඳහා ප්‍රාග්ධනය ලබාගෙන ඇත්තේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගම, ලිට්‍රෝ ගෑස් සමාගමෙන් හා සේවක අර්ථසාධක අරමුදලින් වේ. මෙලෙස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම 2010 සිට 2015 දක්වා රුපියල් බිලියන 63.2ක ලාභයක් උපයාගෙන ඇති අතර, එම ආයෝජන ඉතා ශක්තිමත් අයුරින් ආර්ථිකයට දායක වී ඇත.

2015 ජනවාරි මස 8වෙනි දින ජනාධිපතිවරණයෙන් පසු පත්වූ රජය අග්‍රාමාත්‍ය වූ රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015.01.21 වෙනි දින ඉදිරිපත් කරන ලද දූෂණ විරෝධී කමිටුවක් ස්ථාපනය කිරීමට ඉදිරිපත් කරන ලද කැබිනට් සන්දේශය අනුමත වීමෙන් පසු එම කමිටුව පිහිටුවන ලදි. මැතිවරණයට පෙර දූෂණයට සහ වංචා වලට නැඹුරු වූ සියලුම අය විමර්ශනය කිරීම සඳහා ඒකකයක් පිහිටුවන බවට ජනතාවට දුන් පොරොන්දුව අනුව, දූෂණ විරෝධී කමිටුව ස්ථාපනය කරන ලදි. දූෂණ විරෝධී කමිටුවේ ලේකම් කාර්යාලය විසින් කෙටිකාලීන කටයුත්තක් ලෙස සඳහන් කර තිබූ මහා පරිමාණයේ දූෂණ විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සමාගම ඉලක්ක කර තෝරාගෙන විමර්ශනයට භාජනය කළ බවට ඉදිරිපත් වූ සාක්ෂිවලින් පෙනී යයි. 2015 ජනවාරි මස 8 වෙනි දින නව රජයක් පිහිටුවීමත් සමග සංස්ථා සභාපතිවරුන්, අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරුන්ට ඉල්ලා අස්වීමේ ලිපි භාරදෙන ලෙස කරන ලද ඉල්ලීමට පැමිණිලිකරු පෙර රජයේ සේවයේ සිටි නිසා නැවතත් රාජ්‍ය පරිපාලන සංචිතයට රාජකාරි කිරීම සඳහා වාර්තා කර ඇත. රක්ෂණ

සංස්ථාවට අලුත් සභාපතිවරයෙක් සහ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමෙන් පසුව ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ මූල්‍ය කටයුතු පරීක්ෂා කිරීමට විගණන සමාගමකට, එම කර්තව්‍යය භාරදී ව්‍යවහාරික විගණනයක් කළ බව සඳහන් වේ. මේ විගණනය අනුව මහා පරිමාණයේ මූල්‍ය වංචා සිදු වී ඇති බවට සැක කර ඇත. මේ අවස්ථාවේදී දූෂණ කමිටුවේ ලේකම් කාර්යාලයේ ලේකම්වන ආනන්ද විජේපාල මහතා විසින් ඔහුගේ නමින් රක්ෂණ සංස්ථාවේ අනාවරණය වූ මූල්‍ය වංචාව විමර්ශනය පිණිස අලුතින් පිහිටුවූ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨසයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. මෙම පැමිණිල්ල ලද විගස මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ විමර්ශන ආරම්භ කොට, පැමිණිලිකරු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය සහ ස්ථාපනය කළ හෝටල් සමාගම්වල ප්‍රධාන මූල්‍ය නිලධාරී අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කොට, රක්ෂිත බන්ධනාගාරගත කොට ඇති බව කොමිසම විසින් කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මූල්‍ය අපරාධ කොට්ඨාසය විමර්ශනය අවසන් කර, නීතිපති වෙත යවා බස්නාහිර පළාත්බද ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයේ අංක HC / PTB/ 1/01/ 2018 යටතේ චෝදනා 24ක් පැමිණිලිකරු සහ අනෙක් තිදෙනාට විරුද්ධව ගොනු කර ඇති බැව් තවදුරටත් විමර්ශනයේදී හෙළි වී ඇත. මෙම නඩුව පළාත්බද මහාධිකරණයේ විමසුමට ලක්වූ අතර, පැමිණිල්ලේ සාක්ෂි අවසන් වූවාට පසු විත්තියේ සාක්ෂි නොකැඳවා පැමිණිලිකරු නිදොස් කර නිදහස් කර ඇත. ඉතිරි සැකකරුවන් තිදෙනාගේ නඩු විභාගය ඉදිරියට කරගෙන ගිය අතර, මහාධිකරණය 2019.08.08 වෙනි දින එම තිදෙනාද සියලුම චෝදනාවලින් නිදොස් කර නිදහස් කළ බව

අධිකරණ තීන්දුව පරිශීලනය කිරීමේදී කොමිෂන් සභාවට පෙනී යන ලදී.

කොමිෂන් සභාව විසින් විමර්ශනය කිරීමේදී දූෂණ විරෝධී කමිටුවේ ලේකම් වන ආනන්ද විජේපාල විසින් මූල්‍ය අපරාධ කොට්ඨාසයට කරන ලද පැමිණිල්ල සනාථ කර, මූල්‍ය අපරාධ කොට්ඨාසයට අසත්‍ය ප්‍රකාශ සේනාරත්න පියතිස්ස සහ නයන දර්ශන ප්‍රසාද් දෙහිගම යන දෙදෙනා ප්‍රකාශ දී ඇත. මේ දෙදෙනා අධිචෝදනා පත්‍රයේ 2වෙනි සහ 3වෙනි සාක්ෂිකරුවන්ය. මෙම මහාධිකරණ නඩු තීන්දුව සැලකිල්ලට ගැනීමේදී දූෂණ මර්දන කමිටුව මගින් එවන ලද පැමිණිල්ල සත්‍යයෙන් තොර එකක් බව පැහැදිලිය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2010 සිට 2015 දක්වා එහි සභාපති ලෙස ක්‍රියාකර ඇත්තේ ගාමිණී සේදර සෙනරත් වේ. ඔහු එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියායි. කොමිෂන් සභාව විසින් මෙම විමර්ශනයේදී අනාවරණය කරන ලද කරුණක් වූයේ මෙම පැමිණිල්ල දේශපාලන පළිගැනීම මත පදනම් වූ අසත්‍ය චෝදනාවක් වශයෙන් පැමිණිලිකරු හපුහින්නටත්, අනෙක් තිදෙනාටත් එල්ල වූ බවය.

මේ අනුව කොමිෂන් සභාව මෙම පැමිණිල්ල විමර්ශනය කිරීමේදී පැමිණිලිකරුට හා නඩු පවරා තිබූ අනෙක් තිදෙනාටත් දේශපාලන පළිගැනීමක් මත අසත්‍ය චෝදනා ඉදිරිපත් කර අධිකරණ ක්‍රියාවලියකට මෙම පැමිණිලිකරුවන් යොමු කර ඇති බවය. මේ නිසා පැමිණිලිකරු විසින් පහත සඳහන් අය වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත.

1. පොලිස් පරීක්ෂක චමින්ද රණසිංහ
2. හිටපු අමාත්‍ය මංගල සමරවීර

3. හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක
4. හිටපු අමාත්‍ය රවුෆ් හකීම්
5. ප්‍රජාතන්ත්‍රික සන්ධානයේ නායක සරත් ෆොන්සේකා
6. දෙමළ ජාතික සන්ධානයේ නායක ආර්. සම්බන්ධන්
7. පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරන්
8. ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක
9. නීතිඥ ජේ.සී. වැලිඅමුණ
10. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
11. මලික් සමරවික්‍රම
12. දූෂණ මර්දන කමිටුවේ ලේකම් හා අධ්‍යක්ෂ විජේපාල

කොමිෂන් සභාව විසින් විමර්ශනය ආරම්භයේදීම දක්නට ලැබුණු විශේෂ කරුණක් වුයේ 2015.01.08 දිනෙන් ඇරඹුණු නව රජය යටතේ පැමිණිලිකරුට ඇති වූ දේශපාලන බලපෑම් හා පළිගැනීම වේ.

පැමිණිලිකරු උපාධිධාරියෙකු වන අතර, වෘත්තියෙන් නීතිඥවරයෙකි. අවුරුද්දක් පමණ කාලය තුළදී යුධහමුදා නීති නිලධාරියෙක් ලෙස සේවය කර 1990දී රාජ්‍ය පරිපාලනයට බැඳී අවුරුදු 20ට වඩා රාජ්‍ය පරිපාලන කටයුතුවල යෙදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපතිගෙන් ලැබුණු ඇරයුමක් අනුව ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසට රාජ්‍ය සේවයෙන් ද්විතීය පදනම මත මුදා හැරීමෙන් පසුව මෙම ආයතනයට එක්වී ඇත. රාජ්‍ය සේවයේ පෘථුල අත්දැකීම් මත කළමනාකරණ විශේෂඥයෙකු වු පැමිණිලිකරු ඔහුගේ සේවය සමාගම ලැබූ ලාභදායී ප්‍රතිඵල අනුව ඇගයීමට ලක්විය යුතු යැයි ඉදිරිපත් වූ සාක්ෂි අනුව කොමිෂන් සභාව තීරණය කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ සමාගම ගාමිණී සෙනරත් මහතාගේ සභාපතිත්වයෙන් පියදාස බාලගේ මහතාගේ සහ පැමිණිලිකරුගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගම ප්‍රතිව්‍යුහගත කරන කාලය තුළදී, කොටස් වෙළඳපොළේ ආයෝජනය කරමින් ලැබුණු ලාභවලින් සංචාරක ක්ෂේත්‍රයට ඇතුළු වී 2010 සිට 2015 දක්වා කාලය තුළදී බිලියන 62.3ක ලාභයක් ශ්‍රී ලංකා රක්ෂණ සමාගම ලබා ඇති බැව් ඉදිරිපත් වූ සාක්ෂිවලින් සහ ලේඛනවලින් පෙනී යයි.

කෙසේ වුවද 2015 ජනවාරි මස 8 වෙනිදායින් පසුව පිහිටුවූ රජය විසින් ඊට පෙර රජය විසින් පත්කරන ලද සියලු රාජ්‍ය සමාගම්වල හා සංස්ථා ක්ෂේත්‍රයේ සිටි සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉල්ලා අස්වීම සඳහා කරන ලද නිවේදනය නිසා පැමිණිලිකරු රක්ෂණ සංස්ථාවේ හා අනිකුත් සමාගම්වල අධ්‍යක්ෂ ධූරවලින් ඉල්ලා අස්වී නැවත වරක් රජයේ සේවයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචිතයට ගොස් වැඩ භාරගෙන ඇති අතර, පැමිණිලිකරුද තමාට එල්ල වූ දේශපාලන පළිගැනීම්වල ආරම්භය ලෙස සළකන බව මෙම කොමිෂන් සභාව සාක්ෂි දීමේදී ප්‍රකාශ කර ඇත.

ඉන්පසු ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට පත්වූ නව අධ්‍යක්ෂ මණ්ඩලය 2015ට පෙර සිටි අධ්‍යක්ෂ මණ්ඩලයේ වංචා හා දූෂණ විමර්ශනය කර සොයා ගැනීම සඳහා විගණන සමාගමකට චෝහාරික විගණනයක් කිරීම පවරා ඇත. එම විගණන සමාගම ඉදිරිපත් කරනු ලැබූ පදනම් රහිත වාර්තා මත වංචාව හා දූෂණය සිදු වී ඇතැයි වාර්තා කරනු ලැබූ නිසා එම වාර්තාව මත ක්‍රියා කරමින් පැමිණිලිකරු සහ අනෙක් අධ්‍යක්ෂවරුන්ට එරෙහිව ක්‍රියාකිරීම දේශපාලන පළිගැනීමේ තවත් අවස්ථාවක් බැව් කොමිෂන් සභාව තීරණය කරයි.

මේ අතර 2015 ජනවාරි මස ජනාධිපති මැතිවරණයට පෙර සිදු වී ඇතැයි මවා පෙන්වූ දූෂණ හා වංචාවලට වගකිවයුතු අය සොයා දඬුවම් දීමේ අදහසින් 2015ජනවාරි මස මහමැතිවරණයෙන් පසු අගමැති තනතුරට පත් වූ රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015 ජනවාරි මස 21 වෙනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් සන්දේශයෙන් දූෂණ හා වංචා සෙවීම සඳහා විශේෂ කමිටුවක් පිහිටුවන ලදි. මෙම කමිටුවට කැබිනට් මණ්ඩලයේ අනුමැතියද ලැබී ඇත.

ඒ අනුව පිහිටවූ දූෂණ විරෝධි කමිටුවේ පසු ක්‍රියා කලාපය කෙරෙහි නෙත් යොමු කිරීමේදී ශ්‍රී ලංකාවේ කිසි දිනක නොවූ පදනම් රහිත චෝදනා දේශපාලන එදිරිවාදීන්ගෙන් පළිගැනීමේ චේතනාවෙන් එල්ල කර ඇති බවද, මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් වූ බොහෝ පැමිණිලිවල සාක්ෂිමත එසේ සිදු වූ බවද කොමිෂන් සභාව පිළිගනියි. මෙම දූෂණ විරෝධි කමිටුව මගින් අසත්‍ය චෝදනා සහ පැමිණිලි කැබිනට් අනුමැතිය යටතේ ස්ථාපනය කරන ලද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට යොමු කිරීමෙන් දේශපාලන එදිරිවාදීන්ගෙන් පළිගැනීම් සහ දඬයම් කිරීමේ ක්‍රියාවලියේ තවත් අවස්ථාවක් බව මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් වූ සාක්ෂි හා ලේඛනවලින් නිගමනයකට පැමිණ ඇත. මෙම දූෂණ විරෝධි කමිටුව ස්ථාපනය කරන ලද ලේඛන අනුව මහා පරිමාණයේ වංචා සහ දූෂණවලට නිරතවූ අයගෙන් 15දෙනෙකු තෝරාගෙන විමර්ශනය ආරම්භ කළයුතු බවත්, එසේම එම විමර්ශනවලට මාධ්‍ය ප්‍රචාරයක් දියයුතු බවට සඳහන් කිරීමත්, ඒ අනුව අසත්‍ය චෝදනා නගමින් මහජනතාවට දේශපාලන එදිරිවාදීන් වංචාකාරීන් ලෙස හුවාදැක්වීමට ගන්නා ලද ක්‍රියාවන් දේශපාලන පළිගැනීමේ තවත් අවස්ථාවක් ලෙස ඉදිරිපත් වූ සාක්ෂි අනුව කොමිෂන් සභාව තීරණය කර ඇත.

ඉහත දක්වන ලද කරුණු අනුව පැමිණිලිකරු දැඩි දේශපාලනමය පළිගැනීමකට ලක්වූ බව පැහැදිලි ව පෙනේ. පැමිණිලිකරුට විරුද්ධව මූල්‍ය අපරාධ කොට්ඨාසයට පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ දූෂණ මර්දන කමිටුවේ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල මහතා විසිනි. ආනන්ද විජේපාල මහතාට දේශපාලන පසුබිමක් ඇති අතර, අනුර දිසානායක මහතා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ රජයේ කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස කටයුතු කරන විට අනුර දිසානායක මහතාගේ පෞද්ගලික ලේකම් ලෙස ආනන්ද විජේපාල මහතා රාජකාරි කර ඇත. පසුව පිහිටුවූ දූෂණ විරෝධී කමිටුවේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කිරීමෙන් පසුව 2020 පැවති මහමැතිවරණයේදී අනුර කුමාර දිසානායකගේ නායකත්වයෙන් සන්ධානගත පක්ෂයේ අපේක්ෂකයෙකු වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් තරඟ කර ඇති බව මෙම කොමිසමට ඉදිරිපත් වූ සාක්ෂිවලින් හෙළිවී ඇත. දූෂණ විරෝධී කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පෙර නීති උපදේශකව සිටි තුසිත මුදලිගේ විසින් එය පරීක්ෂා කරන ලදුව ආනන්ද විජේපාල මහතා විසින් මෙම පැමිණිල්ල මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට එවනු ලබයි. මෙයින්ම පැහැදිලි වනුයේ පැමිණිල්ලේ ඇති දේශපාලන ස්වරූපයයි. රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයෙකු විසින් පරීක්ෂාවට ලක්කර එය මූල්‍ය අපරාධ කොට්ඨාසයට එවන ලද අතර, එම කොට්ඨාසය මගින් විමර්ශනය කර නීතිපතිතුමා මාර්ගයෙන් අධිචෝදනා ඉදිරිපත් කළේ විශාල මූල්‍ය වංචාවක් ඇතැයි යන පදනම මතය. නමුත් මහාධිකරණය විත්තිවාචකය නොකැඳවා පැමිණිලිකරු නිදොස් කර නිදහස් කර ඇත. මේ අනුව ඉදිරිපත් වූ සාක්ෂිවලින් පැහැදිලි වනුයේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ සභාපති වූ එවකට ජනාධිපති කාර්ය මණ්ඩලය ප්‍රධානී වූ

ගාමිණී සේදර සෙනරත් මහතා ඇතුළුව පැමිණිලිකරුට වංචා දූෂණ චෝදනා එල්ලකර එවකට ජනාධිපතිව සිටි මහින්ද රාජපක්ෂ මහතා අපහසුවට පත්කිරීමේ අදහසින් මෙවැනි අසත්‍ය පැමිණිල්ලක් ගොණුකර ඇති බවට මෙම කොමිසම ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් මනාව පැහැදිලිවේ. මේ නිසා පැමිණිලිකරුවන නීල් බණ්ඩාර හපුනින්න මහතා දේශපාලන පළිගැනීමට ලක්ව හිංසාවට පත්වූ බවට මෙම කොමිසම තීරණය කරයි.

ඉහත සාක්ෂි සනාථ කිරිම සඳහා පැ.1 සිට පැ.19 දක්වා ලේඛන සලකුණු කර ඉදිරිපත් කර ඇත.

2020.11.24

2020/11/24

Chandra Fernando

9 .LX

(1)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 24/2020 |
| පැමිණිලිකරු | - | කර්නල් ෂම්මි අර්ජුන කුමාරරත්න. |
| ලිපිනය | - | 271/A, හෝකන්දර පාර, තලවතුගොඩ. |

(2)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 200/2020 |
| පැමිණිලිකරු | - | බ/ නි, රාජපක්ෂ මුදියන්සේලාගේ ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන්. |
| ලිපිනය | - | 84 , "දිල්ශාන් නිවස",මාගංතොට, මනම්පිටිය |

(3)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 198/2020 |
| පැමිණිලිකරු | - | බලලත් නිලධාරී වඩුගෙදර විනී ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන නොහොත් සුරේෂ් |
| ලිපිනය | - | 30/1, දැලිවලතැන්න, ලුනුකැටියාමඩිත්ත, මැණික්හින්න. |

(4)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 196/2020 |
| පැමිණිලිකරු | - | වි/කෝප්‍රල්, සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍රරූපසේන නොහොත් රංජි, |
| ලිපිනය | - | 36/1, "දෙනුවන් නිවස", 21 කණුව, ජයන්තිපුර, පොළොන්නරුව. |

(5)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 194/2020 |
| පැමිණිලිකරු | - | යාපා මුදියන්සේලාගේ චමින්ද කුමාර අබේරත්න විශ්‍රාමික ලුතිනන් (උපා) |
| ලිපිනය | - | 183, දඹගිරිගම, කඩහාපොළ, හොරම්බාව. |

(6)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 197/2020 |
| පැමිණිලිකරු | - | බලලත් නිලධාරි, සෙනෙවිරත්න මුදියන්සේලාගේ කණිෂ්ක ගුණරත්න |
| ලිපිනය | - | KDE 766, රණජයපුර, ඉපලෝගම |

(7)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 199/2020 |
| පැමිණිලිකරු | - | බලලත් නිලධාරි, අයියසාමි බාලසුබ්‍රමනියම්, |
| ලිපිනය | - | නො:8, කරඩුපොතවත්ත, කෑගල්ල |

(8)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 195/2020 |
| පැමිණිලිකරු | - | මාණ්ඩලික සැරයන්, දංගහ ගමරළලාගේ තරංග ප්‍රසාද් ගමගේ |
| ලිපිනය | - | 22/7/C, මොණරාහැඩුවිල පාර, වැත්තෑව,මතුගම |

(9)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 104/2020 |
| පැමිණිලිකරු | - | ලුතිනල් කර්නල් තෙල්ගේ එරන්ත රදීෂ් පීරිස් |
| ලිපිනය | - | නො19:, හේවාහැට පාර, රිකිල්ලගස්කඩ |

(10)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 239/2020 |
| පැමිණිලිකරු | - | විශ්‍රාමික මා/සැ සේනාධීර ආරච්චිගේ හේමචන්ද්‍ර පෙරේරා |
| ලිපිනය | - | 191 ඒ, වැගවත්ත, අළුත්ගම, බණ්ඩාරගම |

(11)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 31/2020 |
| පැමිණිලිකරු | - | ලු/ක තාන්තුලගේ ටොෂිනාත් ප්‍රබෝද සිරිවර්ධන |
| ලිපිනය | - | යුධ හමුදා කඳවුර, කරන්දෙණිය. |

(12)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 231/2020 |
| පැමිණිලිකරු | - | කෝප්‍රල්, මෙරගල් පේඩිගෙදර වසන්ත සුදේශ් කුමාර උලුගෙදර |
| ලිපිනය | - | 299, D2, සමගි මාවත, හේවාගම, කඩුවෙල. |

(13)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 1052/2020 |
| පැමිණිලිකරු | - | සැරයන්, වර්ණකුලසූරිය අනුර ජයලත් ඉලුප්පුකන්නිය, |
| ලිපිනය | - | යක්කල, මෙගොඩවැව |

(14)

පැමිණිලි අංකය - 347/2020

පැමිණිලිකරු - සැරයන්, තුවාන් නසාර් මුතාලිෆ්

ලිපිනය - 50/1, පිලිපතගම පාර, බදුල්ල

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් කළ පහත නම් සඳහන් කරන ලද පුද්ගලයින් වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. එනම්;

1. හිටපු අමාත්‍ය මංගල සමරවීර
2. ශානි අබේසේකර - අ. ප.දෙ. අධ්‍යක්ෂ
3. බී.එස්. තිසේරා - සහකාර පොලිස් අධිකාරි
4. නිශාන්ත සිල්වා කන්දප්පා - පොලිස් පරීක්ෂක
5. ප්‍රේමතිලක - උ.පො.ප. (විශ්‍රාමික)
6. ආර්.එස්.එම්. මෙන්ඩිස් - උ.පො.ප.
7. ඒ.ඒ.ඒ.එස්.ආරියසිංහ (අනිල්) - පො.සැ. 87113
8. කේ.පී.තුෂාර විශ්වජිත් - උ.පො.ප.
9. කේ.ඩී. කපිල උඩවත්ත - උ.පො.ප.
10. රුවන්පෙතියාගොඩ

තීරණය

1. ඉහත සඳහන් පැමිණිලිකරුවන් විසින් මෙම කොමිසම ඉදිරියේ ඉදිරිපත් කරන ලද සාක්ෂි ලේඛන සහ අනිකුත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සහ ලේඛන සියල්ලක්ම පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් පසුව ඉහත සඳහන් කර ඇති පැමිණිලිකරුවන් ප්‍රදීප්

එක්නැලිගොඩ පැහැර ගෙන යාම සහ පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් වරදකට හසුකිරීම සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කොට රක්ෂිත බන්ධනාගාරගත කිරීම එයට ආධාර අනුබල දීමට ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියාකර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පු කර ඇති බවට මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. මෙම විමර්ශනයේ පැමිණිලිකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි හා ලේඛන සහ කැඳවන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂි හා ලේඛන පරීක්ෂා කිරීමෙන් පසුව ඉහත සඳහන් පැමිණිලිකරුවන්ට එරෙහිව හෝමාගම මහේස්ත්‍රාත් උසාවියේ බී7417/2015 අංක යටතේ ඉදිරිපත් කරන ලද 'බී' වාර්තාව සහ වැඩිදුර වාර්තාවන්වල සඳහන්වන සියලුම චෝදනාවලින් ඉහත දක්වන ලද සියලුම පැමිණිලිකරුවන් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. ඉහත සඳහන් 1,2,3,4,5,6,7,8,9 යන පැමිණිලිකරුවන්ට එරෙහිව කොළඹ මහාධිකරණයේ අංක HC(TAB) 725/19 දරන චෝදනා පත්‍රයේ ඇති අධිචෝදනා මෙම විමර්ශනයේ ඉදිරිපත් වූ සාක්ෂි සහ ලේඛන සලකා බැලීමේදී අධි චෝදනා පත්‍රයද ඉල්ලා අස්කර ගැනීම තුළින් නිෂ්ප්‍රභා කර ඉහත සඳහන් පැමිණිලිකරුවන් එම අධි චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතුයැයි මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

4. තවද 1,11,2,3,4,12,10 යන පැමිණිලිකරුවන්ට එරෙහිව හෝමාගම කලාපයේ මහාධිකරණ නඩු අංක HC209/19 දරන

අධි චෝදනාපත්‍රයේ ඇති අධිචෝදනා මෙම විමර්ශනයේ ඉදිරිපත් වූ සාක්ෂි සහ ලේඛන සලකා බැලීමේදී එම අධි චෝදනා පත්‍රයද ඉල්ලා අස්කර ගැනීම තුළින් නිෂ්ප්‍රභා කර ඉහත සඳහන් පැමිණිලිකරුවන් එම අධි චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතුයැයි මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

5. දූෂණ විරෝධී කමිටුව විසින් නිර්මාණය කළ ලේඛනය අනුව දක්වා ඇති අරමුණු සහ කාර්යභාරයන් හැරුණු විට වෙනත් වැඩසටහන් යටතේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය අනුව ප්‍රකාශ ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ඉලක්ක කළද, පැමිණිලිකරුවන් එසේ ප්‍රකාශ නොදුන් නිසා රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් හා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් දේශපාලන පළිගැනීමකට ලක් වූ බව මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. ඉහත සඳහන් 1වෙනි වගඋත්තරකරු හැර ඉහත දක්වා ඇති අන් සියළුම වගඋත්තරකරුවන් අසත්‍ය සාක්ෂි නිර්මාණය කොට රැඳවුම් නියෝග මත රඳවා ගැනීමෙන් හා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් පැමිණිලිකරුවන් දේශපාලන පළිගැනීමකට ලක් කිරීමට සූදානම් වූ හෙයින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 191 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අසත්‍ය සාක්ෂි සෑදීමේ වරද සිදුකර ඇති බව.

2. තවද ඉහත දක්වා ඇති වැරදි සිදු කිරීම සඳහා 1වෙනි වගඋත්තරකරු හැර අන් සියළු වගඋත්තරකරුවන් කුමන්ත්‍රණ කිරීමෙන් හා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති 100 සහ 113 යටතේ දඬුවම් ලැබිය යුතු අසත්‍ය සාක්ෂි සැදීමේ වරද සිදු කර ඇති බවය.

3. වගඋත්තරකරුවන් විසින් තුන්වන පැමිණිලිකරු වන ඩිරංජන් උපසේන නොහොත් සුරේෂ් අත්අඩංගුවට ගෙන රඳවාගැනීම සඳහා 1979 අංක 47 දරණ ත්‍රස්තවාදී වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පණත අනුව 2015.09.08 වන දින සිට බලපැවැත්වෙන පරිදි රැඳවුම් නියෝගයක් ලබාගත් බව පැමිණිලිකරුගේ සාක්ෂියෙන් හෙළි වී ඇත. මෙය පැ.2 ලෙස සළකුණු කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. මෙම රැඳවුම් නියෝගය අත්සන් කර තිබුණේ එවකට සිටි ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතාය. නමුත් එම අත්සනේ වෙනසක් දක්නට ලැබුණු හෙයින් තවත් සාක්ෂිකරුවෙකු ලවා පරීක්ෂා කළ විට එහි වෙනසක් ඇති බව ප්‍රකාශ කළ නිසා ඉහත සඳහන් 1,2,3 සහ 4 වෙනි වගඋත්තරකරුවන් දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති 452 සහ 453 සමග කියවිය යුතු 454 වගන්ති යටතේ දඬුවම් ලැබිය යුතු අසත්‍ය ලේඛන සැදීමේ වරද සිදු කර ඇති බව.

4. එසේම 1 වෙනි සහ 10 වෙනි වගඋත්තරකරුවන් හැර අනෙක් සියළු වගඋත්තරකරුවන් එම වරද සිදු කිරීම සඳහා ආධාර හා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බවද,

5. ඉහත සඳහන් වගඋත්තරකරුවන් විසින් ඉහත සඳහන් පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීමෙන් පසු දිගු කාලයක් රඳවා ගැනීමේ අරමුණින් 1979 අංක 47 දරන ත්‍රස්තවාදී වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පණත අනුව රැඳවුම් නියෝග යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිරමැදිරිවල රඳවාගෙන සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 335 වෙනි වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බැවින්ද,

6. ඉහත සඳහන් 1,5 සහ 10 වෙනි වගඋත්තරකරුවන් හැර අන් සියළුම වගඋත්තරකරුවන් විසින් අසත්‍ය සාක්ෂි නිර්මාණය කර, එම අසත්‍ය කරුණු සත්‍ය බව පෙන්වමින් පැමිණිලිකරුවන් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් කරන ලද වැරදි පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඒ 7 යටතේ බී පරිශිෂ්ටයේ දක්වා ඇති විනය සංග්‍රහයේ 1වෙනි වගන්තිය වන අපකීර්තිදායක හැසිරීම එනම්, පොලිස් නිළධාරියෙකු ලෙස අනිසි හෝ විනය පවත්වා ගැනීමට හානිකරන අන්දමින් හෝ පොලිස් සේවයේ හොඳ නමට කැළලක් විය හැකි අන්දමින් හෝ හැසිරීම සම්බන්ධයෙන් චෝදනා සකස්කර විධිමත් විනය පරීක්ෂණයකින් පසු වැරදිකරුවන් වන වගඋත්තරකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය යුතුයැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. ඉහත සඳහන් වගඋත්තරකරුවන් 1,5 සහ 10 හැරුණු විට අනෙක් සියළු වගඋත්තරකරුවන් විසින් අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම සඳහා නීති විරෝධී ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත භාවිතා කර පැමිණිලිකරුවන් රැඳවුම්

නියෝග මත පොලිස් නිළධාරීන් සිරමැදිරිවල රඳවාගෙන සිටීමෙන් හා පැමිණිලිකරුවන්ට ඇප දීමට විරෝධය පාමින් දිගු කාලයක් රක්ෂිත බන්ධනාගාරගත කරවීමට ක්‍රියා කිරීමෙන් පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඒ 7 යටතේ බී පරිශිෂ්ටයේ දක්වා ඇති විනය සංග්‍රහයේ 2වෙනි වගන්තිය "ජී" උප වගන්තිය අනුව අණට අකීකරු වීම හෝ පීඩාකාරි ලෙස හැසිරීම, එනම් පොලිස් නිළධාරියෙකු ලෙස මහජනයාගෙන් කෙනෙකුට අවිනීත අන්දමින් හෝ පීඩාකාරී අන්දමින් හැසිරීම වරදක් කර තිබීම සම්බන්ධයෙන් චෝදනා පත්‍ර ඉදිරිපත් කර විධිමත් විනය පරීක්ෂණයකින් පසු වැරදිකරුවන් වන වගඋත්තරකරුවන්ට දැඩි දඬුවම් පැනවිය යුතු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

8. වගඋත්තරකරුවන් වන උපපොලිස් පරීක්ෂක වන ආර්.එස්.එම්. මෙන්ඩිස්, 2015.09.04 වෙනි දින හෝ ඊට ආසන්න දිනකදී දැනට විශ්‍රාමික උප පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක සමග සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි අත්අඩංගුවට ගැනීමට ඔහුගේ නිවසට අලූයම වේලාවේදී ගිය අවස්ථාවේදී නිදන ඇඳුමින් සිටි ඉහත පැමිණිලිකරුගේ බිරිඳ රන්දෙනි වලව්වේ සන්ධ්‍යා කුමාරි ඇඳුම් මාරු කර ගැනීමට වගඋත්තරකරුවන්ගෙන් ඉල්ලා සිටි විට ඒ සඳහා ඉඩක් නොදීම නිසා දැඩි අපහසුතාවයකට පත් කිරීම හා එදිනම ඇයගේ පුතාට පිස්තෝලයක් පෙන්වා තර්ජන කිරීමත්, එදින සවස් වනතුරු ආහාර ගැනීමටත් ඉඩලබා නොදීමෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු නියෝග ඒ7 බී පරිශිෂ්ටයේ 4වෙනි වගන්තිය (ජී) උප වගන්තියේ දැක්වෙන අණට අකීකරු වීම හෝ පීඩාකාරි ලෙස හැසිරීම එනම් පොලිස්

නිළධාරියෙකු වශයෙන් මහජනයාගෙන් කෙනෙකුට අවිනීත අන්දමින් හෝ පීඩාකාරි අන්දමින් හැසිරීම යන වැරදි කර තිබීම සම්බන්ධයෙන් චෝදනා ගොණු කර විධිමත් විනය පරීක්ෂණයකින් පසු වැරදිකරු වන වගඋත්තරකරුට දැඩි දඬුවම් පැමිණවිය යුතු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

9. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1373 දරන ප්‍රඥප්තිය යටතේ අසාදු ලේඛන සකස් කිරීමේදී පළමුවන වගඋත්තරකරුවන එවකට සිටි විදේශ ඇමති මංගල සමරවීර පළමුවන පැමිණිලිකරුවන එවකට ජාතික බුද්ධි ප්‍රධානීගේ කටයුතු ආවරණය කළ කර්නල් ෂම්මි අර්ජුන කුමාරරත්නට බැණ වැදි 1373 දරන ප්‍රඥප්තිය යටතේ සාදන අසාදු සටහන් ලැයිස්තු ලේඛනය වෙනස් කිරීම එනම් 2014 ලේඛනයේ තිබුණු නම් විශේෂයෙන් සිමන් පිල්ලෙයි ජෝෂප් එමැනුවෙල් නොහොත් එස්.ජේ.එමැනුවෙල් පියතුමා ඉවත් කිරීම අල්ලස් පණතේ 70 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු දූෂණ නැමති වරද සිදුකර ඇති බැවින් නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීම.

10. එක්නැලිගොඩ පැහැරගෙන අතුරුදහන් වීම පිළිබඳව අසත්‍ය චෝදනා ගොණුකර රැඳවුම් නියෝග මත සිරකර තැබීමත්, පසුව දිගු කාලයක් රක්ෂිත බන්ධනාගාරගතවීමටත් මූලික හේතුව වුයේ දේශපාලන පළිගැනීම් බව මෙම කොමිෂම් සභාව තීරණය කර ඇත. මෙම පළිගැනීම් නිසා පැමිණිලිකරුවන්ට පෞද්ගලිකව සිදු වූ හිරිහැර හා හානි කොමිෂන් සභාව සැලකිල්ලට ගෙන පහත සඳහන් සහන සැලසිය යුතු යැයි නිර්දේශ කරයි.

10.1. කර්නල් ශම්මි අර්ජුන කුමාරරත්නට හිමිවීමට තිබූ නමුත් අහිමි වූ විදේශීය තානාපති කාර්යාලයේ පළමු ලේකම් තනතුර නැවත ලබාදීමට නිර්දේශ කරයි.

10.2 සියලුම ඉහත සඳහන් පැමිණිලිකරුවන්ට මෙම සිද්ධිය නිසා -

i. අහිමි වූ වැටුප් සහ වැටුප් වර්ධක
ii. අහිමි වූ උසස්වීම්
iii. අහිමි වූ ජ්‍යෙෂ්ඨත්වය
iv. අහිමිවූ දේශීය හා විදේශීය පාඨමාලා සහ පුහුණුවීම්
v. අහිමි වූ විශේෂ දීමනා

යනාදිය සැලකිල්ලට භාජනය කර නීත්‍යානුකූලව හිමිවිය යුතු ප්‍රතිලාභ ලබාදීමට නිර්දේශ කරයි.

10.3. මෙම සිද්ධියට අදාලව අත්අඩංගුවට ගත් සියලුම පැමිණිලිකරුවන්ගේ පවුල්වලට, ළමයින්ට ඒ කාලය තුළදී අධ්‍යාපානයට ඇති වූ අහිතකර බලපෑම් හේතුවෙන් අධ්‍යාපන කටයුතු සාර්ථකව කර ගැනීමට නොහැකි වූ පැමිණිලිකරුවන්ගේ දරුවන්ට ඒ ප්‍රදේශයේ ඇති ප්‍රසිද්ධ පාසල්වලට ඇතුළත් කර ගැනීමෙන් අධ්‍යාපන කටයුතු සාර්ථකව ගෙන යාමට අවශ්‍ය පරිසරය ලබාදීම සුදුසු යැයි මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

11. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කළ ඉහත සඳහන් වගඋත්තරකරුවන් 2 සිට 9 දක්වා පැමිණිලිකරුවන් පොලිස් භාරයේ රඳවාගෙන සිටින විට කාර්යාලය තුළ හා කාර්යලයෙන් පිටත එනම් ගාලු මුවදොරට ගෙන ගොස් පැමිණිලිකරුවන් සමග එක්ව මත්පැන් පානය කිරීම සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඒ 7 නියෝගයේ දැක්වෙන විනය සංග්‍රහයේ බී පරිශිෂ්ටයේ පළමු වගන්තිය වන අපකීර්තිදායක හැසිරීම එනම් පොලිස් නිළධාරියෙකු වශයෙන් අනිසි ලෙස හෝ විනය පවත්වා ගැනීමට හානිකර වන අන්දමින් හෝ පොලිස් සේවයේ හොඳ නමට කැළලක් විය හැකි අන්දමින් හෝ හැසිරීම සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කර විධිමත් විනය පරීක්ෂණයකින් පසු වරදකරු වී ඇත්නම් එම වගඋත්තරකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## පොදු නිර්දේශ

1. 2015 ජනවාරි මස 8 වෙනිදාට පෙර එක්සත් ජාතික පෙරමුණ විසින් දූෂණ සහ මහා පරිමාණයේ වංචාවන් කරන ලද පුද්ගලයින් සොයා විමර්ශන ඒකකයක් පිහිටුවා ඔවුන්ට දඬුවම් දෙන බවට ජනතාවට දුන් පෙරොන්දුව සපුරාලීමට එවකට අගමැති වූ රනිල් වික්‍රමසිංහ 2015.01.21 වෙනි දින කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කරමින් දූෂණ සහ වංචා සෙවීමට දූෂණ විරෝධී කමිටුවක් පිහිටුවීමට යෝජනා කර ඇත. මේ යෝජනාව මත පිහිටවූ දූෂණ විරෝධී කමිටුව ලංකා ඉතිහාසයේ පෙර නොදුටු දේශපාලන එදිරිවාදීන්, රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා

නිලධාරීන්, හමුදා සහ පොලිස් සේවයේ සාමාජිකයින්ට අසත්‍ය චෝදනා නිර්මාණය කර අධිකරණ ක්‍රියාවලිය තුළින් බරපතල ලෙස දේශපාලන පළිගැනීමකට ලක් කරන ලදි. දූෂණ විරෝධී කමිටුවේ අරමුණු සහ කාර්යයන් සැලකිල්ලට ගැනීමේදී එය එක්තරා පුද්ගල කණ්ඩායමකට එල්ල කර සකස් කළ වැඩ පිළිවෙළකි. මෙම වැඩ පිළිවෙළ ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වූයේ අධිකරණ ක්‍රියාවලියක් තුළින් නිසා එයට ලක්වූ අය දැඩි මානසික පීඩනයකට පත් වී ඇත. මෙවැනි තත්ත්වයක් අනාගතයේදී ඇති නොවීමට නීති සකස් කිරීම වැදගත් බව මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

2. මෙම කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි දුන් පැමිණිලිකරුවන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල අංශයේ ක්‍රියා කලාපයත්, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ ක්‍රියා කලාපයත් දැඩි ලෙස විවේචනයට භාජනය වී ඇත. විමර්ශනය කිරීමේදී මූලික මිනිස් අයිතිවාසිකම් කිසිවක් සැළකිල්ලට නොගෙන, ගරු කළ යුතු සදාචාරාත්මක පද්ධතීන්ට හානිවන පරිදි නීති විරෝධී ක්‍රියා මෙම විමර්ශන අංශවලින් සිදු වී ඇත. මෙවැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් දැඩි පියවර ගතයුතු යැයි මෙම කොමිසම තීරණය කරයි.

3. මෙම කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් පැමිණිලිකරුවන් පැහැදිළිව දක්වා සිටින්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශකයින්ගේ ඉලක්කය වූයේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 යටතේ ප්‍රකාශ ලබාගෙන එදිරිවාදී දේශපාලනඥයින්ට විරුද්ධව ක්‍රියා කිරීම වේ. එසේම අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැඩි දේශපාලනීකරණයට පාත්‍ර වී ඇති බැව් මෙම විමර්ශනයේදී පෙනී ගිය තවත් වැදගත් කරුණකි. මෙම තත්ත්වය වෙනස් කිරීමට පොලිස්පති පියවර ගතයුතු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

4. මෙම කොමිෂන් සභාවේ පැමිණිලි විමර්ශනයේදී අනාවරණය වූ තවත් කරුණක් නම් සැකකරුවන් විමර්ශන ඒකකයෙන් පිටතට ගෙන ගොස් විමර්ශන නිළධාරීන් සැකකරුවන් සමග මත්පැන් පානය කිරීම වේ. මේ සම්බන්ධයෙන් එම නිළධාරීන්ට විරුද්ධව දෙපාර්තමේන්තු නියෝග ඒ7 අනුව අපකීර්තිදායක හැසිරීම යටතේ චෝදනා ඉදිරිපත් කර, මූලික විමර්ශනයක් පවත්වා වැරදි කළ නිළධාරීන් සේවයෙන් පහකළ යුතු යැයි කොමිෂන් සභාව ඒකමතිකව නිර්දේශ කරයි.

5. මෙම විමර්ශනයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැමිණිලිකරුවන් අත්අඩංගුවේ සිටින විට ඔවුන්ගේ නිවෙස්වලට ගොස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් නිර්මාණය කළ ප්‍රකාශයන් පැමිණිලිකරුවන්ගේ බිරින්දෑවරුන් ලවා, පැමිණිලිකරුවන්ට එම ප්‍රකාශ දීමට බලපෑම් කිරීමක් සිදු වී ඇති බැව් පෙනී යයි. මෙලෙස බිරින්දෑවරුන් ලවා නිර්මාණය කළ ප්‍රකාශ පැමිණිලිකරුවන් මාර්ගයෙන් ප්‍රකාශ කරගනු ලැබීමෙන් ඉලක්ක කළ අයව දේශපාලන පළිගැනීමකට ලක් කිරීම වැනි පහත් ක්‍රියාමාර්ග ගන්නා නිළධාරීන්ට විරුද්ධව පොලිස් විනය සංග්‍රහය යටතේ චෝදනා ඉදිරිපත් කර, දඬුවම් දිය යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ඉහත දක්වා ඇති පැමිණිලිකරුවන්ව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම වාර්තාවේ දක්වා ඇති දිනයන්හි කිසිදු පදනමක් නොමැතිව සැළසුම් කරන ලද අධිකරණ ක්‍රියාවලියක් මගින් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කොට නීතිපති මාර්ගයෙන් එම පැමිණිලිකරුවන්ට එරෙහිව හෝමාගම මහාධිකරණයේ අංක HC209/19 සහ ත්‍රි පුද්ගල මහාධිකරණයේ HC/TAB 725/19 යටතේ නඩු පැවරීමෙන් කරන ලදැයි කියන දේශපාලන පළිගැනීම් හේතුවෙන් මුහුණදීමට සිදු වූ තත්ත්වය පිළිබඳ මෙම පැමිණිලිකරුවන් වෙන් වෙන්ව පැමිණිලි ඉදිරිපත් කර ඇති අතර, එලෙස මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කළ පැමිණිලි සියල්ල එකට සලකා බලා ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කර ඇත.

2015 ජනවාරි සහ අගෝස්තු මාසයේදී පැවැත්වූ ජනාධිපතිවරණය සහ මහ මැතිවරණයට පෙර නිළයන් දැරූ රාජ්‍ය නිළධරයන්, රාජ්‍ය සංස්ථාවල, ත්‍රිවිධ හමුදාවන්හි මෙන්ම පොලිස් සේවයේ සාමාජිකයින් 2015 ජනවාරි මස 08 වන දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාලසීමාව තුළදී දේශපාලනමය වශයෙන් පළිගැනීමකට ලක්වූයේ දැයි වාර්තා කරනු ලැබීම හේතුවෙන් ඊට අදාළ පරීක්ෂණ සහ විමර්ශණයන් සිදුකොට වාර්තා කිරීම පිණිස සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ දෙවන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ 2020ක් වූ ජනවාරි මස 09 වන දින නිකුත් කරන ලද අධිකාරී පත්‍රයක් මගින් මෙම ජනාධිපති පරික්ෂණ කොමිෂන් සභාව පිහිටවනු ලැබීය. මෙම කොමිෂන් සභාව විසින් දේශපාලනමය පළිගැනීමකට ලක්වූ අයගේ පැමිණිලි, මෙම පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කරනු ලැබූ ඉල්ලීම මත, කරන ලද පැමිණිලි, විමර්ශනයට පාත්‍ර වූ අතර, එහිදී අනාවරණය වූ කරුණු සළකා බැලීමේදී දූෂණ මර්ධන යන නාමය පෙරදැරි කරගෙන රාජ්‍ය නිළධාරීන්, හමුදා සහ පොලිස් නිළධාරීන්ව දේශපාලන පළිගැනිමකට ලක් කොට පදනම් රහිතව අත්අඩංගුවට ගෙන නඩු පැවරීම් වලින් දඬුවම් කිරීමේ අරමුණු ලෙස පහත කරුණු දැක්විය හැක.

1. යහපාලන රජයට සහාය දුන් අනුගාමිකයින් සතුටට පත් කිරීම බව.

2. ත්‍රස්තවාදී කොටි සංවිධානය පරාජය කර යුධ ජයග්‍රහණයන් ලැබීමට බොහෝ දුරට දායක වු හමුදා බුද්ධි අංශය අවතක්සේරු කරමින් ජාත්‍යන්තර කොටි සංවිධානය සතුටට පත්වන අරමුණින් ක්‍රියා කිරීම බව මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් පෙනී යනු ඇත.

මෙම රජය බලයට පැමිණීමට පෙර සිටි දේශපාලනඥයින්, රාජ්‍ය නිළධාරින්, බලයේ සිටි නිළධාරින්ගේ ක්‍රියාකාරකම් ඉස්මතුකොට එම ක්‍රියාකාරකම් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව, මූල්‍ය අපරාධ කොට්ඨාශය, අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව, යන ආයතන මගින්, පෙර ක්‍රියාකාරකම් විමර්ශනය කොට අත්අඩංගුවට ගෙන අධිකරණය මගින් රක්ෂිත බන්ධනාගාර ගතකොට මහාධිකරණය

මගින් අධි චෝදනා ඉදිරිපත් කර ඇති බව ඉදිරිපත් වි ඇති සාක්ෂි වලින් මෙම කොමිෂන් සභාවට පෙනී ගොස් ඇත.

මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් වී ඇති සාක්ෂි ලේඛණ පරිශීලනය කිරීමේදී යහපාලන රජය 2015.01.08 වන දින බලයට පත්වී දින 12ක් ඇතුලත එවකට අගමැති තනතුර දැරූ රනිල් වික්‍රමසිංහ මහතා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශය මගින් දූෂණ විරෝධී කමිටුවක් පිහිටුවිමෙන්, එම කමිටුව කාර්යක්ෂම කිරිමට අනු කමිටුවක් හා ක්ෂණික ප්‍රතිචාර කමිටුවක් පත් කළ බවට අනාවරණය වේ. තවද, දූෂණ විරෝධී කමිටුවේ වෙනත් වැඩ සටහන් යටතේ මාධ්‍යවේදීන් ඝාතනය කිරීම පිළිබඳව සොයා බැලීමට විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවීමෙන් හා එම කමිටුවෙන් ලැබී ඇති උපදෙස් අනුව මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධව පරීක්ෂණ ආරම්භ කිරීම හේතුවෙන් ත්‍රිවිධ හමුදාවල බුද්ධි නිළධාරීන්ව ඉලක්ක කරගෙන, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ මෙහෙයවූ පොලිස් නිළධාරීන්ගේ කපටි යෝජනාවලට බුද්ධි නිළධාරීන්ව අවනත කරගැනීමට දැඩි උත්සාහයක නිරත වූ බව මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂි වලින් අනාවරණය වේ.

මෙම කොමිෂන් සභාව විසින් පළ කරන ලද පුවත්පත් දැන්වීම්වලට අනුව යුධ හමුදාවේ බුද්ධි අංශවලට අයත්, විවිධ තරාතිරම්වල නිළධාරීන් මෙම කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇති අතර, මාධ්‍යවේදී ප්‍රගීත් රංජන් බණ්ඩාර එක්නැලිගොඩ පැහැරගෙන, පැහැරගෙන අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් දේශපාලන පළිගැනීමකට ලක් වූ හමුදා බුද්ධි අංශවල නිළධාරීන් 14දෙනෙකු පැමිණිලි ඉදිරිපත් කර ඇති අතර කීත්නොයාර් මාධ්‍යවේදියා

අත්අඩංගුවට ගෙන පහරදීම සම්බන්ධයෙන්ද දේශපාලන පළිගැනීමකට ලක් වූ හමුදා බුද්ධි නිළධාරින් 10දෙනෙක්ද පැමිණිලි ඉදිරිපත් කර ඇත.

ඉහත දැක්වූ පරිදි මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩට පහරදී පැහැරගෙන යාම එක් සිද්ධියක් වන අතර, නැවත 2010.01.24 වන දින පැහැරගැනිමට ලක්ව අතුරුදහන් කිරීම වෙනත් සිද්ධියකි. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන, අතුරුදහන් කිරීමේ විමර්ශනවල ප්‍රගතිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කරන්නට කටයුතු කර තිබුණි. නමුත් 2019.11.01 වෙනි දින නීතිපති විසින් හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණ නඩුවේ 1,2,3,4,5,10 සහ 12 වන චූදිතයින්ට හෝමාගම මහාධිකරණයේ අධිචෝදනා ඉදිරිපත් කළ බවත් හෝමාගම එම නඩුවේ 1,3,4,5,6,7,8,9 සහ 11වන සැකකරුවන්ට විරුද්ධව ස්ථිර ත්‍රි පුද්ගල අංක:01 මහාධිකරණ නඩු අංක HC(TAB)725/19 යටතේ අධිචෝදනා ඉදිරිපත් කර ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. 2008 අගෝස්තු මාසයේදී මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩව බලහත්කාරයෙන් පැහැරගෙන ගොස් පහරදී අත්හැර දැමීම සම්බන්ධයෙන් හෝමාගම මහාධිකරණයේ HC209/19 පහත සඳහන් නිළධාරින්ට විරුද්ධව අධිචෝදනා ගොනු කර ඇත.

1. ශම්මි අර්ජුන් කුමාරරත්න
2. ආර්.එම්.පි.කේ. රාජපක්ෂ නොහොත් නාදන්
3. වඩුගෙදර විනී ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන නොහොත් සුරේෂ්

4. සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි

5. තාන්තුලගේ ටොෂිනාත් ප්‍රබෝධ සිරිවර්ධන

6. එම්.පී.ජී.ඩබ්.එස්.කේ. උළුගෙදර

7. හේනාධීර ආරච්චිගේ හේමචන්ද්‍ර පෙරේරා

අධිචෝදනා පත්‍රයට අනුව චූදිත නිළධාරීන්ට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනා වන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ 102 සහ 113(ආ) වගන්තීන් සමඟ කියවිය යුතු 356 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකළ බව වේ.

මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ 2010.01.24 වෙනි දින පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් වූ පැමිණිලි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනය කිරීමෙන් පසු නීතිපති උපදෙස් මත කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණ අංක HC/TAB/725/2019 යටතේ අධිචෝදනා පහත සඳහන් හමුදා බුද්ධි නිළධාරීන්ට විරුද්ධව ගොනු කර ඇත.

1. ශම්මි අර්ජුන් කුමාරරත්න

2. ආර්.එම්.පි.කේ. රාජපක්ෂ නොහොත් නාදන්

3. වඩුගෙදර විනී ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන නොහොත් සුරේෂ්

4. සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන නෙහොත් රංජි

5. යාපා මුදියන්සේලාගේ චමින්ද කුමාර අබේරත්න

6. සෙනෙවිරත්න මුදියන්සේලාගේ කණිෂ්ක ගුණරත්න

7. අයියසාමි බාල සුබ්‍රමනියම්

8. දංගහ ගමරාලලාගේ තරංග ප්‍රසාද් ගමගේ

9. තෙල්ගේ එරන්ත රදීෂ් පීරිස්

HC/TAB/725/2019 අංක දරණ අධිචෝදනා පත්‍රය අනුව ඉහත සඳහන් නිළධාරීන්ට විරුද්ධව ඇති චෝදනා නම් දණ්ඩ නීති සංග්‍රහයේ 102,113,140,146, 32 වගන්තිය 369,355, සහ 296 වේ.

මෙම මාධ්‍යවේදි ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන යාම සම්බන්ධයෙන් ප්‍රථම විමර්ශනය හෝමාගම පොලිසිය විසින් ආරම්භ කර ඇති අතර, පසුව එම විමර්ශන කොළඹ අපරාධ කොට්ඨාශය මගින් විමර්ශනය කිරිමෙන් අනතුරුව 2015 දී පොලිස්පතිතුමා විසින් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට මෙම විමර්ශන සිදු කිරිමට නියෝග ලබාදීමත් සමගම අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ සමුහ මංකොල්ල විමර්ශන අංශයෙන් විමර්ශන කටයුතු මෙහෙයවිම ආරම්භ කොට, විටින් විට නීතිපතිට ලිපිගොණු යවා උපදෙස් ලබා ගනිමින් විමර්ශන කටයුතු කර ඇති බවත්, පසුව නීතිපති තුමා විසින් ඉහත දැක්වෙන ලද චුදිතයින් (7)හත්දෙනාට විරුද්ධව මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන යාම සම්බන්ධයෙන් හෝමාගම මහාධිකරණයේ අධි චෝදනා ගොනු කොට ඇති අතර, මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් හමුදා බුද්ධි නිළධාරීන් (9)නවදෙනෙකුට එරෙහිව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ අධිචෝදනා ගොනු කොට ඇති බව මෙම කොමිෂන් සභාව විසින් විමර්ශනය කිරීමේදී කරුණු අනාවරණය වි ඇත.

මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් වූ සාක්ෂි සැළකිල්ලට ගැනීමේදී මාධ්‍යවේදි ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන යාම සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව මෙම අපරාධයේ විමර්ශන කටයුතු ආරම්භ කර ඇත්තේ 2015 මාර්තු මාසයෙන් පසුවය. මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැර ගැනිම සිදුවී ඇත්තේ 2009.08.27 වන දිනදිය. අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව මගින් LTTE සංවිධානයේ සාමාජිකයින් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගැනීමෙන් පසුව එම සැකකරුවන් මාර්ගයෙන් සොයාගත් තොරතුරු අනුව සැක කරන ප්‍රදේශවල දුරකථන කුලුණුවල දත්තයන් උපයෝගී කරගෙන මෙම පරික්ෂණ ආරම්භ කර ඇති බැව් අධිකරණයට ඉදිරිපත් කර ඇති B වාර්තාවේ සහ වැඩිදුර වාර්තාවලින් පැහැදිලි වේ. ඒ අනුව LTTE සාමාජිකයින් වන සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි,(ඉදිරියේදි මුරලි නමින් හඳුන්වන) ක්‍රිෂ්ණපිල්ලෙයි කලෙයිනේෂන් නොහොත් පිරිබා නොහොත් සිවා, එදිරිමානසිංහම් අරිච්චිචන්දිරන් නොහොත් රාම් නොහොත් විල්සන්, සහ තවත් කිහිප දෙනෙකුත් අත්අඩංගුවට ගැනීමෙන් පසු විමර්ශන ආරම්භ කර ඇති බැව්ද ඔවුන්ගේ ප්‍රකාශ අනුසාරයෙන් ගිරිතලේ සන්නද්ධ බුද්ධි බළකායේ සේවය කළ නිළධාරීන් කිහිප දෙනෙකුගේ දුරකථන භාවිතය හා දුරකථන කුලුණු සම්බන්ධ තොරතුරු රහසිගත විමර්ශනවලට ලක්කර ඔවුන්ව අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගත් LTTE සාමාජිකයෙකු වන මුරලිගේ සංක්ෂිප්ත ප්‍රකාශය, 2015.11.09 වන දින හෝමාගම මහාධිකරණයේ පළමුවන සැකකරු වන ෂම්මි කුමාරරත්න යන අය මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන විටදී හෝමාගම මහේස්ත්‍රාත් උසාවියේ B7417/2015 දරණ B වාර්තාව "P8" ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති අතර,

මුරලිගේ ප්‍රකාශයේ සාරාංශයක්ද ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2009.05.15 වන දින මුලතිව්වලදී හමුදාවට භාර වී ඇති මුරලි, 2002 දී පමණ වන්නි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්වූ අඩික්කලනාදන් සමග මඩු වන්දනාවේ ගිය විටදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව සිටි දොස්තර ජයලත් ජයවර්ධන සමඟ මඩු වන්දනාවේ පැමිණ සිටි මාධ්‍යවේදි ප්‍රගීත් එක්නැලිගොඩව හඳුණාගත් බවත්, පසුව ඔහු සමග මිත්‍රකමක් ගොඩ නඟා ගෙන පසුව දුරකථන අංක හුවමාරු කරගත් බවත් ප්‍රකාශ කර ඇති බවට සාරාංශයේ දැක්වේ. මෙය ප්‍රබන්ධ කථාවක්ද නැත්නම් ඉදිරියේ ගොඩනැංවීමට හදන්නාවූ චිත්‍රයේ සම්බන්ධතාවය දැක්වීමට මුරලිට, මාධ්‍යවේදි ප්‍රදීප් එක්නැලිගොඩ හමුවූ අවස්ථාවක් ලෙස පෙන්වා මුරලි මගින් බුද්ධි නිළධාරීන්ට මාධ්‍යවේදි ප්‍රගීත් එක්නැලිගොඩ හඳුන්වාදිමට සකස්කළ ක්‍රමයක්ද යැයි සැකයක් මතුවේ. කෙසේ වුවද, මෙම B වාර්තාවේ දැක්වෙන සාරාංශයට අනුව 2009.08.27 දින දෙවන විත්තිකරු වන මේජර් සිරිවර්ධන, ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් කෝප්‍රල් නාදන් (ඉදිරියේදී කෝප්‍රල් නාදන් නමින් හඳුන්වන) සහ සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන නොහොත් කෝප්‍රල් රංජි (ඉදිරියේදී කෝප්‍රල් රංජි නමින් හඳුන්වන)යන බුද්ධි නිළධාරින් කණ්ඩායම හබරණට ගොස් මාධ්‍යවේදී එක්නැලිගොඩව හමුවී ඇති අතර, කෝප්‍රල් නාදන්ව, මුරලිගේ ඥාතියෙකු ලෙසට මාධ්‍යවේදී එක්නැලිගොඩට හඳුන්වා දුන් බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කල වැඩිදුර වාර්තාව අනුව පැහැදිලි වේ. (P8 ෂම්මි කුමාරරත්නගේ සාක්ෂියේදි ඉදිරිපත් කළ වාර්තාව)

තවද, B වාර්තාවට අනුව හෝමාගම මහාධිකරණයේ පළමු සැකකරු වන ෂම්මි කුමාරරත්න සහ දෙවන සැකකරු ප්‍රබෝධ සිරිවර්ධන සහ

බුද්ධි බළකායේ කෝප්‍රල් වඩුගෙදර විනී ප්‍රියන්ත ඩිලන්ජන් නොහොත් උපසේන නොහොත් සුරේෂ් (ඉදිරියේදී උපසේන නමින් හඳුන්වන) යන අයවළුන් විසින් මුරලි මගින් මාධ්‍යවේදි ප්‍රගීත් එක්නැලිගොඩව බුද්ධි නිළධාරීන්ට හඳුන්වාදීමට පෙළඹවීමේ කටයුතුවල නිරතව සිටි බවට අනාවරණය වූ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අධිකරණයට ඉදිරිපත් කල B වාර්ථාවේ දක්වා ඇත. මුරලි සහ කෝප්‍රල් නාදන් හබරණ ප්‍රදේශයට ගොස් මාධ්‍යවේදී එක්නැලිගොඩ හමු වී ඇති බව ඉහත දැක්වූ B වාර්ථාවේ පැහැදිලිව සඳහන් කර ඇත.

මෙම සිද්ධියෙන් පසු මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ එදිනම රාත්‍රියේ ආපසු නිවසට පැමිණෙමින් සිටියදී නිවස ආසන්න ප්‍රදේශයේදී සුදු වෑන් රථයකින් පැමිණි මුහුණු ආවරණය කරගත් පිරිසක් විසින් එක්නැලිගොඩට පළමුව පහරදී පසුව ප්‍රශ්න කර වැරදීමක් යැයි පවසමින් සිද්ධිය සිදු වූ දිනට පසු දින උදේ 10.30ට පමණ කඩුවෙල කොරතොට ප්‍රදේශයේ ගල්වලක් ආසන්නයේ දමා ගොස් ඇති අතර, ඒ සම්බන්ධයෙන් පැහැර ගැනීමට ලක් වූ මාධ්‍යවේදී ප්‍රගීත් බණ්ඩාර එක්නැලිගොඩ විසින් හෝමාගම පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර ඇති අතර, හෝමාගම පොලිස් ස්ථානය විසින් B6925/09 යටතේ නඩු කටයුත්තක් ආරම්භ කර ඇති බවට ඉහත වැඩිදුර B වාර්ථාවෙන් පෙන්නුම් කරයි.

2010.01.24 වෙනි දින මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන අතුරුදහන් වීමේ සිද්ධිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට පත් LTTE සාමාජිකයෙකු වන මුරලි විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඔහු අත්අඩංගුවේ සිටියදී කරන ලද

ප්‍රකාශයක ප්‍රතිඵලයක් වශයෙන් එක්නැලිගොඩ මාධ්‍යවේදියා පදිංචිව සිටි ප්‍රදේශයේදී පැහැරගත් දින රාත්‍රියේ දුරකථන සමාගම්වල සහාය ලබාගෙන දුරකථන කුලුණුවල දත්තයන් එක්කොට බත්තරමුල්ල ප්‍රදේශයට පැමිණි සිටි හමුදා නිළධාරීන්ව අත්අඩංගුවට ගෙන ඔවුන්ගේ දුරකථන අංක හා කුලුණුවල දත්ත සසඳා මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන ගොස් ගිරිතලේ කඳවුරේ නවතා පසු දින දහවල් කඳවුරෙන් රැගෙන අක්කරපත්තු ප්‍රදේශයට රැගෙන ගොස් ඔහුගේ ජීවිතයට හානියක් කරන්නට ඇතැයි සැකයක් මතුවී ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2016.02.19 වෙනි දින හෝමාගම අධිකරණයට ඉදිරිපත් කරන ලද B7417/2010 වැඩිදුර වාර්තාවෙන් වාර්තා කර ඇත.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි මෙහෙයවීමෙන් පසුව කොමිෂන් සභා පනතේ 16 වෙනි වගන්තිය අනුව පැමිණිලිකරුවන් විසින් විශේෂයෙන් වගඋත්තරකරුවන් ලෙස නම් කරනු ලැබූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර, උ.පො.ප. ප්‍රේමතිලක සහ පොලිස් සැරයන් මෙන්ඩිස් සාක්ෂි නොදන බව ප්‍රකාශ කළ නිසා ඔවුන්ව ප්‍රශ්න කර පොලිස් විමර්ශනවලින් අනාවරණය කරගන්නා ලද සාක්ෂිවල සත්‍යතාවය ඇගයීමට භාජනය කළ නොහැකි විය. මේ හෙයින් කරුණු ඉදිරිපත් කළ හැකි නමුත් එසේ නොකරනු ලබන සාක්ෂි ඉදිරිපත් කරනු ලැබුවහොත් එම සාක්ෂි දෙනු ලබන අයට අවැඩදායක විය හැකි බව අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකිය යන්න මෙහිදී වැදගත් ලෙස සැළකිය යුතු යැයි කොමිෂන් සභාව අදහස් කරනු ලබයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සැක කරනු ලබන පැමිණිලිකරුවන්ව,

කෙසේ මෙම මාධ්‍යවේදි ප්‍රගීත් එක්නැලිගොඩව පැහැරගෙන යාමේ අපරාධය සම්බන්ධයෙන් වගකීම පවරනු ලැබිය හැකිද? මෙම අපරාධයට එම පැමිණිලිකරුවන්ගේ සහභාගීත්වය කුමක්ද? ඒ සඳහා ඇති සෘජු සාක්ෂි හෝ පරිවේෂණ සාක්ෂි මොනවාද? අධිකරණ ක්‍රියාවලියක් තුළින් පැමිණිලිකරුවන් දේශපාලන පළිගැනීමට ලක්වී ඇත්තේ දැයි යන්න සළකා බැලිය හැකි වන්නේ ඉදිරිපත් වී ඇති සීමිත සාක්ෂි සාරාංශය හා පැමිණිලිකරුවන් විසින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ ලබාදී ඇති සාක්ෂි සහ ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද ලේඛන මගිනි. ඉදිරිපත් කර ඇති අධිකරණ B වාර්තාවන් සහ වැඩිදුර වාර්තාවන් පරිශීලනය කිරීමේදී අධි චෝදනා ඉදිරිපත් කර ඇති චූදිතයින් වන හමුදා බුද්ධි නිළධාරින්ට විරුද්ධව ඇති සාක්ෂි ලැයිස්තුවේ සඳහන් කර ඇති සාක්ෂිකරුවන් 32ක් අතුරින් මෙම චෝදනා සනාථ කිරීමට ඉවහල්වන ප්‍රධාන සාක්ෂි හතරක් (4) සම්බන්ධයෙන් කරුණු හා සාක්ෂි ඉදිරිපත් කිරිමට පෙරාතුව කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දි තිබෙන පැමිණිලිකරුවන්ගේ සාක්ෂි ප්‍රථමයෙන් පහත ඉදිරිපත් කරනු ලැබ ඇත. තවද, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන සාක්ෂිකරුවන් ලෙස හඳුන්වා දී තිබෙන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි, පැමිණිලිකරුවන්ගේ සාක්ෂි ඇතුලත් කිරීමෙන් පසුව ඇතුලත් කරනු ලැබ ඇත්තේ එම සාක්ෂි ප්‍රකාශ හතර මෙම නඩුවට අදාල කර ගත නොහැකි සහ ඉතා දුර්වල ගණයේ සාක්ෂි නිසා වන අතර, ඒ සම්බන්ධයෙන් විස්තරාත්මකව කරුණු සාක්ෂි විශ්ලේෂණය කොටසේ ඇතුලත් කර ඇත.

පැමිණිලිකාර ෂම්මි කුමාරරත්න (පැ.අ 20/2020 1990.08.05 වන දි කැඩෙට් නිළධාරියෙකු ලෙස යුධ හමුදාවට බැඳී දියතලාව පුහුණු

පාසලෙන් පුහුණුව අවසන් කර දෙවන ලුතිනන්වරයෙකු ලෙස අධිකාරි ලබාගෙන, 1993 වර්ෂයේදි ලුතිනන්, 1995 වර්ෂයේදි කපිතාන්, 2002 වර්ෂයේදී මේජර්, 2007 වර්ෂයේදී ලුතිනන් කර්නල් තනතුරුවලට උසස්වීම් ලැබූ බවට සාක්ෂි ලබාදීමේදී ප්‍රකාශ කරන ලදි. එම පැමිණිලිකරුගේ සාක්ෂියට අනුව, 2002 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා කාලය තුලදී යාපනය 21 වන බලසේනා මූලස්ථානයට අනුයුක්තව රාජකාරි කළ බවත්, 1998 දී යුධ හමුදා බුද්ධි බළකාය විසින් පැවැත්වූ "මූලික බුද්ධි පාඨමාලාව" හැදෑරූ බවත්, ඉන්පසු අළුතින් ආරම්භ කරන ලද ගැමුණු හේවා බළඇණියට අනුයුක්ත වූ බවත්, සාක්ෂි දීමේදි ප්‍රකාශ කළ අතර, ඉන්පසු බුද්ධි බළකායට අනුයුක්තව විමට කැමැත්ත තිබූ නිසා අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙනේ පසු බුද්ධි බළකායට අනුයුක්ත විමට හැකි වූ බවත්,එම අවස්ථාවේදි බුද්ධි බළකායේ අණදෙන නිළධාරී ලෙස කටයුතු කළේ මේජර් ජෙනරාල් කපිල හෙන්ඩවිතාරණ බවත්, පසුව කොළඹ ප්‍රදේශයේ ආරක්ෂක කටයුතු සඳහා තමන්ව යෙදවූ බවත්, ඒ වන විට කොළඹ ප්‍රදේශයේ ආරක්ෂක බුද්ධි තොරතුරු රැස් කිරීමේ විශේෂ ඒකකයේ ප්‍රධානියා වූයේ මේජර් මුතාලිෆ් බවත්, ඔහු යටතේ එම ඒකකයට අනුයුක්තව රාජකාරි කළ බවත් ප්‍රකාශ කර සිටී. මෙසේ බුද්ධි තොරතුරු අංශයේ රාජකාරී කරමින් සිටින විට 223 බළසේනා මූලස්ථානයේ වැලිඔය බුද්ධි නිළධාරී ලෙස අනුයුක්තව රාජකාරි කළ බවත් ප්‍රකාශ කර සිටි. වැලිඔය 223 බළ සේනා මූලස්ථානයේ බුද්ධි අංශයේ Staff Intelligent Officer තනතුරේ රාජකාරි කළ බවත්, මෙහිදී මායිම් ගම්මාන ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරවලට ලක්විම වැළැක්විමට නිරන්තරයෙන්ම ආරක්ෂාව පමණක් නොව, ඔවුන්ගේ

ජීවන රටාව, සෞඛ්‍ය හා අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීමද වගකීමක් ලෙස පැවරී තිබූ බවද, ප්‍රකාශ කර සිටී.

මෙම බුද්ධි මූලස්ථානයේ රාජකාරී කරමින් සිටියදී ත්‍රස්තවාදීන් විසින් ආරම්භ කළ LTTE "නොනවතින රැල්ල" මෙහෙයුමටද මුහුණ දුන් අතර, එම සේවා කාලයෙන් පසු වව්නියාවේ පිහිටි බුද්ධි ආරක්ෂක මණ්ඩලයේ ඉදිරි මූලයේ Forward Intelligence Sell ලෙස නම් කර තිබූ මූලස්ථානයේ දෙවැනියා ලෙස 2002 වසරේ සිට රාජකාරි කළ අතර, පසුව ජ්‍යෙෂ්ඨ බුද්ධි නිළධාරී ලෙස ඕමන්තය භාර 56 වන සේනාංක මූලස්ථානයට අනුයුක්තව රාජකාරි කළ බවත්, එම 56 වන සේනාංක මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ බුද්ධි නිළධාරී ලෙස වර්ෂ 2ක පමණ කාලයක් රාජකාරි කරමින් සිට ස්ථාන මාරු ලබා කොළඹ පළමුවන සන්නද්ධ හමුදා මූලස්ථානයට පැමිණ රාජකාරීයේ යෙදී සිටි බවත්, කොළඹ බුද්ධි බළකා මූලස්ථානයේ 2003 වසරේ සිට 2005 වසර දක්වා රාජකාරී කළ බවත්, 2005 වසරේදී මින්නේරියට ස්ථාන මාරු ලබා ගොස් මින්නේරියේ තුන්වන බුද්ධි බළකා මූලස්ථානය පිහිටුවීමෙන් පසු පැමිණිලිකරු දෙවන අණදෙන නිළධාරී ලෙස මින්නේරියේ රාජකාරි කළ බවත්, එම තුන්වන බුද්ධි බළකාය ලංකාවේ දකුණු ප්‍රදේශයේ කතරගම සිට කුඹුක්කන් ඔය දක්වා ත්‍රිකුණාමලය, පොළොන්නරුව, අම්පාර, මඩකලපුව සහ මොණරාගල යන දිස්ත්‍රික්ක 5ක ප්‍රදේශ ආවරණය කරනු ලබන අතර, එම දිස්ත්‍රික්ක සියල්ලම ආවරණය කරමින් බුද්ධි රාජකාරිවල යෙදී සිටි බවත්, 2006 වර්ෂයේදී තුන්වන සන්නද්ධ හමුදා බුද්ධි බළකායේ අණදෙන නිළධාරී ලෙසට පත්ව 2006 වසරේ සිට 2010 වසර දක්වා රාජකාරි කළ බවත්, 2010 වර්ෂයේදී ලුතිනන් කර්නල් තනතුරට උසස්වීම් ලබා එම

උසස්වීමත් සමඟම පකිස්ථානයේ පැවැත්වුණු මාණ්ඩලික බුද්ධි පාඨමාලාව හැදෑරීමට විදේශ ගතවූ බවත්, ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු තව දුරටත් 2006 වසරේදී තුන්වන සන්නද්ධ බුද්ධි බළකායේ අණදෙන නිළධාරී ලෙස කටයුතු කරමින් සිටියදී බුද්ධි බළකා මූලස්ථානය ගිරිතලේ ප්‍රදේශයට ගෙන ගොස් නව කඳවුරක් පිහිටවූ බව ප්‍රකාශ කර සිටී. එම කාලවකවාණුව වාකරේ සහ තොප්පිගල ආදී ප්‍රදේශ මුදා ගැනීමේ මෙහෙයුම්වල හමුදාව නිරතව සිටි බවත්, ඒ සඳහා අවශ්‍ය බුද්ධි තොරතුරු සම්පාදනය කර එම බුද්ධි තොරතුරු ලබා දුන්නේ පැමිණිලිකරුගේ නායකත්වයෙන් බවත් ප්‍රකාශ කර සිටී. මෙම වකවාණුව නැගෙනහිර මුදා ගැනීමේ මෙහෙයුම් කටයුතු හේතු කොට ගෙන ඉතා අවිවේකී තත්ත්වයක් උදා වී තිබීම නිසා පැමිණිලිකරුගේ නිවසට යාමටවත්, තම පවුල් සංස්ථාව, දරුවන් සම්බන්ධයෙන් සොයා බැලීමටවත් කාල වේලාවක් නොතිබූ බවද පැමිණිලිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර සිටී. පැමිණිලිකරු තුන්වන බුද්ධි බළකායේ අණදෙන නිළධාරී ලෙස 2010 දෙසැම්බර් දක්වා රාජකාරියේ යෙදී සිටි බවත්, 2010.12.01 වන දින සිට හමුදා මූලස්ථානයේ බුද්ධි අධ්‍යක්ෂ මාණ්ඩලික නිළධාරී I ලෙස පත්වීමක් ලද බවත්, එසේම පැමිණිලිකරු හමුදා මූලස්ථානයේ බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේම මාණ්ඩලික නිළධාරී I ලේඛණ හා පර්යේෂණ ලෙසත් පසුව 2015.02.18 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ බුද්ධි ප්‍රධාන කාර්යාලයේ විදේශීය බුද්ධි සම්බන්ධීකාරක ලෙස පත්වීමක් ලද බවත් ප්‍රකාශ කර සිටී. 2015 දී යහපාලන රජය බලයට පැමිණීමත් සමඟම බුද්ධි ප්‍රධානී තනතුරේ රාජකාරීයේ යෙදි සිටි විශ්‍රාමික මේජර් ජෙනරාල් හෙන්ඩවිතාරණ එම තනතුරින් ඉවත්වීමෙන් පසුව එම බුද්ධි ප්‍රධාන තනතුරේ රාජකාරි කටයුතුද පැමිණිලිකරුට ආවරණය

කිරීමට සිදු වූ බවද ප්‍රකාශ සිටි. මේ වන විට සාක්ෂි වලින් හෙළිවී තිබෙන කරුණු අනුව පැමිණිලිකරු Chief of National Intelligence ලෙස රාජකාරී ආවරණය කළ බව පැහැදිලිවම පෙනී යන අතර, එම තනතුර පැමිණිලිකරු විසින් දැරූ බවද ප්‍රකාශ කර සිටි. මෙම කාලයේදී පැමිණිලිකරු එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයේ 2001.09.28 වන දින ත්‍රස්ත මර්ධන ක්‍රමෝපායක් ලෙස 1373 ප්‍රඥප්තිය සකස් කළ අතර, ඒ අනුව ප්‍රඥප්තියේ දක්වා ඇති අසාධු සටහන් ලැයිස්තුව සකස් කිරීමේ වගකීම හා යාවත්කාලීන කිරීම බුද්ධි ප්‍රධාන කාර්යාලයේ වැදගත්ම කාර්යයක් වූ බවට පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. මෙම ප්‍රඥප්තිය යටතේ ත්‍රස්තවාදි සංවිධානවලට සම්බන්ධ ක්‍රියාකාරී පුද්ගලයින් සම්බන්ධයෙන්ද තොරතුරු ඇතුලත් කිරීමද කළ බවද, 2015 වර්ෂයේදිද එම ලැයිස්තුව යාවත්කාලීන කිරීමේ වගකීම පැවරී තිබුණේද පැමිණිලිකරුගේ රාජකාරි යටතට බවද ප්‍රකාශ කර සිටි. මෙසේ 2015 වර්ෂය සඳහා 1373 ප්‍රඥප්තිය යටතේ අසාධු සටහන් ලේඛණ සකස් කර එවකට සිටි ආරක්ෂක ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුව තිබූ අතර, ආරක්ෂක ලේකම් එම ලැයිස්තුව නිර්දේශ නොකර, විදේශ කටයුතු අමාත්‍යාංශයේ පැවැත්වුණු රැස්වීමකට සහභාගී වන ලෙසට ආරක්ෂක ලේකම් විසින් පැමිණිලිකරුට උපදෙස් දී තිබූ බවට පැමිණිලිකරුගේ සාක්ෂි වලින් අනාවරණය වේ. මෙම අවස්ථාවේදී විදේශ කටයුතු අමාත්‍ය ධූරය මංගල සමරවීර මහතා දැරූ අතර, ඔහු විසින් එම අසාධු සටහන් ලේඛණය නිසි පරීක්ෂා කිරීමකින් තොරව ඉංග්‍රීසි භාෂාවෙන් ඉතා තදින්, කෝපයෙන් "This is not a Rajapakshe Regime. Keep in your mind and your can't do whatever you want and Gotabaya wants" යනුවෙන් හඬ නගා කයමින්, එම පුද්ගලයින් ත්‍රස්තවාදීන්

වුවද, වර්තමානයේ ත්‍රස්තවාදීන් නොවන බවත්, පසු ගිය වකවානුවේදී මෙම ලේඛණ සකස් කළේ ගෝඨාභයට අවශ්‍ය පරිදි බවත් වැඩි දුරටත් හඬ නගා කියූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. තවද, විදේශ කටයුතු අමාත්‍ය ධූරය දැරූ මංගල සමරවීර මහතා මෙවැන්නක් කීමට හේතුව ලෙස පැමිණිලිකරු දක්වා සිටින්නේ එම ලැයිස්තුවේ එම්මැනුවෙල් පියතුමන්ගේ සහ සුරේන් සුරේන්ද්‍රන් යන නම් දෙක ඇතුලත්ව තිබීම නිසා බවත්, මෙම දෙදෙනා අමාත්‍ය මංගල සමරවීරගේ මිතුරන් බවත්, කාලයක සිට එංගලන්තයට යන සෑම අවස්ථාකම මොවුන් එකට එක්ව ආහාර අනුභව කරන මිත්‍රයින් බවත්, සුරේන් සුරේන්ද්‍රන් LTTE සංවිධානයේ මුදල් සම්බන්ධයෙන් ක්‍රියා කළ අයෙකු බවත්, එම්මැනුවෙල් පියතුමා සෘජුවම LTTE සංවිධානයට සම්බන්ධ බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. 2014 වර්ෂයේදී මේ දෙදෙනාගේ නම් ඇතුලත්ව තිබූ බවත්, මෙ දෙදෙනාගේ නම් ඉවත් කිරීමට තරම් අවශ්‍ය තොරතුරු නොලද හෙයින් 2015 වර්ෂයේදීද ලැයිස්තුවට මේ දෙදෙනාගේ නම් ඇතුලත් කළ බැව් පැමිණිලිකරු ඔහුගේ සාක්ෂියෙන් අනාවරණය කරයි. විදේශ කටයුතු භාර අමාත්‍යතුමා විසින් පැමිණිලිකරුට මේ දෙදෙනාගේ නම් ඉවත් කරන ලෙසට දැන්වූ බවත්, එලෙස කිරීමට පැමිණිලිකරුට නොහැකි බව දැන්වූ විට අමාත්‍යතුමා එම සාකච්ඡාවෙන් නැගිට පිටව යන අතරතුර මෙම ලැයිස්තුවේ අවසන් නිගමණය අත්සන් කරන්නේ තමන් බවට ප්‍රකාශ කළ බවත්, “Don’t send it to me. I’ll catch you” යැයි පැමිණිලිකරුට තදින් හඬ නඟා කියමින් පිටව ගිය බවත්, පැමිණිලිකරුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර සිටි. වැඩිදුරටත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ 2014 වර්ෂයේදී ආයතන 16 ක් සහ පුද්ගලයින් 424කගේ නාම ලේඛණයක් සකස් කොට එක්සත් ජාතින්ගේ

ආරක්ෂක කවුන්සලයට යවා ඇති බවත්, 2015 වර්ෂයේ සකස් කළ ලැයිස්තුව සමඟ 2014 වර්ෂයේ ලැයිස්තුව සැසඳීමේදී 2014 ලැයිස්තුවට වඩා පුද්ගලයින් සහ ආයතන අඩු කර ඇති බවත් ප්‍රකාශ කර සිටි. 2015 ලැයිස්තුවේ ආයතන 16 ක්ව තිබූ තත්ත්වය ආයතන 8 දක්වා අඩුකළ බවත්, පුද්ගලයින් සම්බන්ධයෙන් 424 සිට 155 දක්වා අඩු කළ බවත් ප්‍රකාශ කර සිටී. පැමිණිලිකරු ඔහුගේ සාක්ෂියේදි 2015.11.20 වන දින අංක 1941/44 ගැසට් පත්‍රය "P4" ලෙස සලකුණු කර ඔහුගේ සාක්ෂිය සනාථ කර තිබේ. මේ අනුව විදේශ අමාත්‍ය මංගල සමරවීර විසින් රාජ්‍ය ආරක්ෂාව තම හිතවතුන් වෙනුවෙන් පාවාදි ත්‍රස්තවාදීන්ට සහාය දැක්වූ බවට මෙයින් පැහැදිලිවම සනාථ වේ. මෙම 1373 දරණ ප්‍රඥප්තියට අනුව එම ලැයිස්තුවට ඇතුලත් කරනු ලබන්නේ ත්‍රස්තවාදී සංවිධානවලට සම්බන්ධ පුද්ගලයින් හා ආයතනවලට අයත් නාමලේඛණ පමණක් නොව එම ආයතනවලට සහ පුද්ගලයින්ට එරෙහිව තිබූ වර්තමාන චෝදනාද සැළකිල්ලට ගෙන එම ලැයිස්තුව සකස් කළ බවට පැමිණිලිකරු සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී. විවිධ ආයතනවල තොරතුරු විශ්ලේෂණාත්මකව පරීක්ෂාවට ලක්කොට සාදනු ලබන ලැයිස්තුවක පුද්ගලයින්ගේ හා ආයතනවල නම් පුද්ගලික අවශ්‍යතාවයන් පදනම් කරගෙන ඉවත් කිරීම ජාතික අපරාධයක් වන බවත්, මෙය දැඩි ලෙස හෙලා දැකීමට ලක්විය යුතු කරුණක් බවට මෙහිදී දැක්වීම වැදගත් බවට ප්‍රකාශ කර සිටී. වැඩිදුරටත් පැමිණිලිකරු දැඩි ලෙස අවධාරණය කරනු ලබන්නේ 2014 වර්ෂයේදි ප්‍රසිද්ධ කළ ප්‍රඥප්තියට අනුව ගැසට් පත්‍රයේ 35A පිටුවේ N/CA/2013/368 දරණ අංකය යටතේ සුරේන් සුරේන්ද්‍රන්ගේ නම ඇතුලත්ව තිබූ බවත්, 35A පිටුවේ N/IN/CA/2013/372 දරණ

අංකය යටතේ ෆාදර් සීමන් පිල්ලෙයි ජෝෂප් එම්මැනුවෙල් - SJ එම්මැනුවෙල් යනුවෙන් ලේඛණයේ නම ඇතුලත්ව තිබූ බවටත්ය.

පැමිණිලිකරු තව දුරටත් සාක්ෂි දෙමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා සහ ශානී අබේසේකර විසින් විවිධ ක්‍රම භාවිතා කරමින් මෙම අපරාධය එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් අනුව කරන ලද්දක් බවට ප්‍රකාශ කරවා ගැනීමටත්, එසේ ප්‍රකාශ කළහොත්, මෙම ප්‍රශ්ණයෙන් නිදහස්ව යා හැකි බවට පැමිණිලිකරුට කියූ බවත්, නිශාන්ත සිල්වා විසින් වැඩි දුරටත් කියා සිටියේ ශානි අබේසේකර යනු කියන දේ කරන සහ කරන දේ කියන කෙනෙක් බවත්, ඔහුට මෙම ආණ්ඩුවේ ඕනෑම වැඩක් කරගැනීමට හැකි බවත්, එයින් ප්‍රයෝජන ගෙන ශානී අබේසේකර කියන ආකාරයට ප්‍රකාශයක් දෙන ලෙසටත්ය. එසේම ඒ වන විට පැමිණිලිකරුට ප්‍රංශයේ තානාපති කාර්යාලයේ පළමු ලේකම් තනතුරකට නම යෝජනා කර තිබූ බව නිශාන්ත සිල්වා දැණුවත්ව සිට ඇති බවත්, මෙවැනි අවස්ථාවක් කිසිසේත්ම අත්නොහැරිය යුතු බටවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කියන ආකාරයට ප්‍රකාශ ලබා දෙන ලෙසත්, එසේ ප්‍රකාශ ලබා දුනහොත් එම අවස්ථාව එනම් ප්‍රංශයට යාමේ අවස්ථාව ලබාදීමට හැකියාව ඇති බවත් කියමින් දැඩි ලෙස පෙළඹවීම් කළ බවට ප්‍රකාශ කර ඇත. (2020.09.04 දින සාක්ෂියේ පිටු අංක 18) ඉන්පසු නැවතත් පැමිණිලිකරුට මත්පැන් දී බලපෑම් එල්ල කොට ප්‍රකාශ ලබාගැනීමට උත්සාහ කළ බවත්, මෙම ක්‍රමවේද මගින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 යටතේ ප්‍රකාශයක් ලබා ගැනීමට දැඩි උත්සාහයක නිරත වූ බවත් පැමිණිලිකරු ඔහුගේ ප්‍රකාශයේදී පැහැදිලිවම සඳහන් කර ඇත. එසේම ශානි අබේසේකර ඔහු විසින් විසඳන ලද නඩු

සම්බන්ධයෙන් සවිස්තරාත්මකව විස්තර කර ඔහුගේ හැකියාවන් පෙන්වා පැමිණිලිකරුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ වගන්ති 127 යටතේ ප්‍රකාශයක් දීමට එක් අවස්ථාවක තර්ජනය කරමින්ද උත්සාහ කළ බවත්, පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටින කාලයේදී ප්‍රබෝධ සිරිවර්ධන, මාණ්ඩලික සැරයන් රාජපක්ෂත් අත්අඩංගුවේ සිටි බව ප්‍රකාශ කර සිටී.

අත්අඩංගුවේ සිටින කාලයේදී ඇතැම් අවස්ථාවල IP ප්‍රේමතිලක සහ සාජන් මෙන්ඩිස් ඉතා කලබලයෙන් ලේඛණ සකස් කරමින් සිටින ආකාරය නිරීක්ෂණය වූ බවත්, එම ලේඛණ සකස් කරන්නේ ශානි අබේසේකරට අරලියගහ මන්දිරයේ රැස්වීම්වලට ගෙන ගොස් කරුණු ඉදිරිපත් කිරීමට බැව් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටින විටදී පැහැදිලි වූ බවට ප්‍රකාශ කර ඇත.

සාක්ෂිකරු අමාත්‍ය මණ්ඩල තීරණ සම්බන්ධයෙන් “P6” ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති අතර, එම ලේඛණයෙන් දූෂණ විරෝධී කමිටුවක් පිහිටුවා ඒ මගින් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කරනු ලබන බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලිපි ලේඛණ සකස් කළේ මෙම දූෂණ විරෝධී කමිටුවට ඉදිරිපත් කිරීමට බවට පැමිණිලිකරුට පෙනී ගිය බවත් ප්‍රකාශ කර ඇත.

2015.11.09 වන දින පැමිණිලිකරු ඇතුළු T.T.A. සිරිවර්ධන, කෝප්‍රල් ප්‍රියන්ත රාජපක්ෂටත් 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික) පනතේ 7(1) වගන්ති ප්‍රකාරව සහ දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය සමග කියැවෙන 113, 135,355 සහ 296 යන වගන්ති

යටතේ B7417/2015 යටතේ අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, එම වාර්තාව "P8" ලෙස සලකුණු කර ඇත.

මෙම පැමිණිලිකරු ඇතුළුව අනෙක් නිළධාරින් දෙදෙනාට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන අනුව මූලික චෝදනාව ඉදිරිපත් කර ඇති අතර, එසේ සඳහන් කර ඇත්තේ අනෙක් දෙදෙනාට මහේස්ත්‍රාත් උසාවිය මගින් ඇප ලබා නොදි සිටීමට බවත් ප්‍රකාශ කර සිටී. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු SCFR365/2015 යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට නීති විරෝධී ආකාරයෙන් අත්අඩංගුවට ගැනිම සම්බන්ධයෙන් මෙම පෙත්සම ඉදිරිපත් කළ බැව් ප්‍රකාශ කර සිටී.

එසේම පැමිණිලිකරුගේ රෝගී තත්ත්වය සලකා බලා, මහේස්ත්‍රාත්වරයා විසින් බන්ධනාගාර රෝහල් ගත කර, අවශ්‍ය පහසුකම් සපයන ලෙසට නියෝග කර තිබියදීත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැමිණිලිකරුගේ රෝගී තත්ත්වය නොසලකා හැර විවිධ වෛද්‍යවරුන්ට ඉදිරිපත් කරමින් පැමිණිලිකරුට රෝගී තත්ත්වයක් නැති බව පෙන්විමට දැඩි උත්සාහයක් ගත් බවද පැමිණිලිකරු සාක්ෂියේදී ඉදිරිපත් කර සිටී.

රක්ෂිත බන්ධණාගාර ගතව සිටින රැඳවියන්ට පිටතින් ආහාර ගෙන ඒමට ඉඩ ප්‍රස්තා තිබූ නිසා බන්ධනාගාර අධිකාරියේ අනුමැතිය මත පැමිණිලිකරුද නිවසින් ආහාර ලබාගත් බවත්, එයද නීති විරෝධී බවට දක්වමින් අධිකරණයට කරුණු ඉදිරිපත් කළ බවද ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු 2016.10.27 වන දින ඇප පිට නිදහස්ව පැමිණි පසු 2017 අප්‍රේල් මාසයේ දිනෙක පැමිණිලිකරුගේ බිරිඳට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමක් කර තිබූ බවත්, එහිදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට අවැසි ප්‍රකාශ බිරිඳ

ලවා පැමිණිලිකරුගෙන් ලබාගැනීමේ උත්සාහයක්ද ගෙන ඇති අතර, ඒ බව දැනගැනීමට හැකි වූ බවත්, පැමිණිලිකරුගේ බිරිඳගේ ප්‍රකාශය සටහන් කර 2017.05.03 වන දින අධිකරණයට B වාර්තාවක් මගින් වාර්තා කර ඇති බවද ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු අත්අඩංගුවේ සිටින කාලයේදී මුරලි, රංබණ්ඩා සහ රාම් යන අය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටි බවත්, අත්අඩංගුවේ සිටි කාලය තුලදී මේ තිදෙනාගෙන්ම පැමිණිලිකරුට විරුද්ධව ප්‍රකාශ ලබාගෙන ඇති බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කළ සාක්ෂි පරිශීලනය කිරීමේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් විසින් විවිධාකාරයේ තර්ජන, බලපෑම්, ඇතැම් අවස්ථාවලදී පෙළඹවීම්ද කර, තවත් අවස්ථාවල පොරොන්දුද දී මෙම පැමිණිලිකරුවන් ඔවුන්ගේ අදහස්වලට නතු කරවාගෙන ප්‍රකාශ ලබා ගැනිමට ක්‍රියාකර ඇති බැව්ද, මෙම කොමිෂන් සභාවට පැහැදිලිවම පෙනී ගොස් ඇත. අත්අඩංගුවේ සිටි මුරලි, රංබණ්ඩා, රාම් යන තිදෙනාටද, විවිධ උපක්‍රම යොදමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් විසින් ප්‍රකාශ ලබා ගැනීම, ඒ මාර්ගයෙන් චෝදනාපත් ගොඩ නඟා බුද්ධි නිළධාරින්ව අධිකරණ ක්‍රියාවලියට හසුකර ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ගයන් යොදාගත් බැව් කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වී ඇති සාක්ෂි වලින් මනාව පැහැදිලි වේ. මෙතෙක් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් වූ කරුණු අනුව දූෂණ විරෝධි කමිටුවෙන් ලද නියෝග හා උපදෙස් මත මෙම පැමිණිලිකරුවන් වන බුද්ධි නිළධාරීන් පසුපස හඹා ගොස් ඔවුන්ට චෝදනා එල්ල කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් දැඩි උත්සාහයක් ගෙන ඇති බවට, බුද්ධි

නිළධාරින්ට විරුද්ධව කරනු ලැබූ චෝදනා සනාථ කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් ඉදිරිපත් කර තිබෙන සාක්ෂිකරුවන් ත්‍රස්තවාදී කටයුතුවල නියැලී සිට පසුව හමුදාවට භාර වූ අය වීමෙන්ම මනාව පැහැදිලිවේ. තවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් ඉදිරිපත් කර තිබෙන සාක්ෂිකරුවන් පොලිසියට භාරවීමට පෙර හමුදා බුද්ධි අංශය සමඟ බුද්ධි තොරතුරු ලබාගැනීමේ කාර්යයන් සඳහා සහාය වී ක්‍රියාකරමින් සිටි ගිරිතලේ හමුදා කඳවුර පිළිබඳව මනා අවබෝධයකින් යුක්ත වූවන්ද වේ. මෙම පැමිණිලිකරුට 2015.08.24 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කරන ලෙසට කැඳවීමක් ලැබුණු බවත්, ඒ සමගම ලුතිනන් කර්නල් ප්‍රබෝධ සිරිවර්ධන, මාණ්ඩලික සැරයන් රාජපක්ෂ, කෝප්‍රල් අනුර ජයලත් යන තිදෙනාටද කැඳවීම් කර තිබූ බවටද ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය පසු ශානි අබේසේකරට ඉදිරිපත් කොට 2015.08.24 වෙනි දින සිට 2015.11.09 දක්වා වූ මාස 1½ක් පමණ කාලයක් රැඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තබා ගත් බව ප්‍රකාශ කර සිටි. රැඳවුම් නියෝගය මත සිට ඇත්තේ ත්‍රස්තවාදී පනත යටතේ බැව්ද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

2015.08.26 වෙනි දින උදෑසන 11.30ට පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් ලබාගත් බවත්, එම ප්‍රකාශය ලබාගන්නා විටදී රැඳවුම් නියෝගයක් මත රඳවා සිට ඇති බවට අනාවරණය වූ බවත්, එම ප්‍රකාශය සටහන් කරගනු ලැබුවේ උ.පො.ප. ප්‍රේමතිලක සහ පොලිස් සැරයන් මෙන්ඩිස් බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. ප්‍රකාශ සටහන් කරගන්නා විටදී ප්‍රේමතිලක සහ මෙන්ඩිස් විසින් පැමිණිලිකරුට "එක්නැලිගොඩ අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් සියලු කාරණා

අනාවරණය කරගෙන අවසන් නිසා සහාය" දෙන ලෙසට කියූ බවත්, එවිට සාක්ෂිකරු "සහාය දිය හැක්කේ කෙසේදැයි" විමසූ විට S.I ප්‍රේමතිලක කියා ඇත්තේ පැහැර ගැනීමට උපදෙස් දුන්නේ කවුද කියා ප්‍රකාශ කරන ලෙසටය. පැමිණිලිකරු කියන අන්දමට උ.පො.ප. ප්‍රේමතිලක සාක්ෂිකරුට ආමන්ත්‍රණය කර ඇත්තේ "සර්" යනුවෙන් බවද ප්‍රකාශ කර සිටී. මෙම ඉල්ලීමට පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ දන්න සෑම දෙයක්ම ප්‍රකාශ කළ බවත්, බොරු කියන්නට සාක්ෂිකරුට නොහැකි බවත්ය. එදින සිට සතියකට පමණ පසු නැවත වරක් නිශාන්ත සිල්වා පැමිණිලිකරු අමතා "අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉන්න අමාරුයි නේද ඒ නිසා නැවත හිතලා බලලා ප්‍රකාශයක් දෙන්න" යැයි කියූ බවට ප්‍රකාශ කර සිටී. එසේම නිශාන්ත සිල්වා විසින් පැමිණිලිකරුව ගෝඨාභයගේ ළඟම සිටින කණ්ඩායම්වල ප්‍රධානියෙක් ලෙස හඳුන්වා දුන් අතර, ඒ නම මුල් කරගෙන ප්‍රකාශ ලබා දෙන ලෙසට කිහිපවරක්ම බලපෑම් කල බවත්, වරෙක ඉතා සුහදශීලි හිතවත් ආකාරයෙන් පොළඹවා ගැනීමට දැඩි උත්සාහයක් ගත් බවත්, තවත් වරෙක ටිකක් සැරෙන් කථා කළ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. එසේම පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ නිශාන්ත සිල්වා මත්පැන් පානය කිරීමට කතා කළ බවත්, එක් වරක් එවැනි අවස්ථාවක් සූදානම් කළ බවත්, එම අවස්ථාවේදී මත්පැන් නොගෙන මත්වූවා සේ ඇහැවූ බවත්, ඊටපසු නිදාගෙන සිටින විටදී ශානි අබේසේකර ඇවිත් කථා කර "මිස්ටර් කුමාරරත්න තමුසේ හිතුවේ CID එකේ ඉන්නේ බබාලා කියලද? තමුසේ බොරු කිව්ව කාලේ ඉවරයි. දැන් කියනවා ඇත්ත. අපි සියලු දේ හොයාගෙන ඉවරයි. තමුසෙට දැන් තියෙන්නේ අපි කියන විදිහට වැඩ කරන එකයි" යනුවෙන් ඉතා සැරෙන් සාක්ෂිකරුට කියූ බවත්,

එවිට සාක්ෂිකරු "මෙවැනි නින්දිත ලෙස ක්‍රියා නොකරන ලෙසට" තදින් කියා සිටි බවත් ප්‍රකාශ කර සිටියි.

එසේම පැමිණිලිකරු එක් අවස්ථාවක වැසිකිළියට යන අවස්ථාවේදී ගිරිතලේ කඳවුරේ සේවය කළ සාජන් මේජර් රංබණ්ඩා දුටු බවත් ඒ වන විට සාජන් මේජර් රංබණ්ඩා විශ්‍රාමික නිළධාරියෙකු වූ බවත්, ඒ සමගම මුරලිද එහි සිටිනවා දුටු බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. මුරලි සම්බන්ධයෙන් පැමිණිලිකරු S.I ප්‍රේමතිලකගෙන් විමසූ විට ඔහු කියා ඇත්තේ "සර්ලාට කලින් මේ ගොල්ලන් අත්අඩංගුවට ගෙන, රැඳවුම් නියෝග මත අත්අඩංගුවේ පසුවන බවය". පැමිණිලිකරු පවසන අන්දමට පැමිණිලිකරු රඳවා සිටි ස්ථානයේ සිට මීටර් 10ක් පමණ දුරින් වූ තවත් කාමරයක මුරලිව රඳවාගෙන සිට ඇත. සාක්ෂිකරුට අනුව මුරලි යනු LTTE සංවිධානයේ හිටපු සාමාජිකයෙක් වන බවත්, යුද්ධයෙන් පසු හමුදාවට භාර වූ බවත්, 2010.11.30 දින දක්වා මුරලි ගිරිතලේ හමුදා කඳවුරේ පැමිණිලිකරු යටතේ සිටි බවත් ප්‍රකාශ කරයි. එසේම 2009 මැයි මාසයෙන් පසු පැමිණිලිකරු පවසන අන්දමට Operations Double Edge නම් වූ මෙහෙයුම ආරම්භ කළ බවත්, එම මෙහෙයුමෙන් අදහස් කළේ LTTE ත්‍රස්තවාදී සංවිධානය පරාජය වූවාට පසු තැන් තැන්වල හුදකලා වූ LTTE සාමාජිකයින් සහ අවි සොයා ගැනීමයි. මුරලි LTTE සංවිධානයේ පොට්ටුඅම්මාන් සමග ක්‍රියා කළ සාමාජිකයෙකු වූ බවත්, ඒ වන විට මුරලිට සෑහෙන දැනුමක් තිබුණ බවත්, ඔහුව භාවිතා කොට LTTE සාමාජිකයින් කිහිප දෙනෙකු සොයා ගැනීමට මෙම Operations Double Edge මෙහෙයුම යටතේ හැකි වූ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. පැමිණිලිකරුට අනුව මුරලි සහ රංබණ්ඩා රඳවා ගැනීමේ නියෝග මත සිටි බවට දක්වන අතර,

ඔවුන් දෙදෙනා මාස 3ට ආසන්න කාලයක් රැඳවුම් නියෝග මත සිට පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර, ඔවුන් දෙදෙනා අධිකරණයට ඉදිරිපත් කර මෙම නඩුවෙන් නිදොස් කොට යවා තිබුණු බැව් ප්‍රකාශ කර සිටියි. (2020.09.03 දින සාක්ෂි 55වෙනි පිටුව)

පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරමින් දක්වා සිටියේ රංබණ්ඩා සහ මුරලිගේ ප්‍රකාශවලින් පැමිණිලිකරු ඇතුළු අනෙක් අය වරදකරුවන් වන ලෙස ප්‍රකාශ දී ඇති බවය.

එසේම එක් අවස්ථාවක ලුතිනන් කර්නල් සිරිවර්ධනට මහේස්ත්‍රාත් ඉදිරියේ ප්‍රකාශ දීමට බලපෑමක් කල බවත්, එම ප්‍රකාශය පැමිණිලිකරු සිටින තැනම ලියා ගෙනල්ලා දුන් බවත් ප්‍රකාශ කර සිටියි.

පැමිණිලිකරු අත්අඩංගුවේ සිටින විට විවිධාකාරයෙන් මාධ්‍යවේදි එක්නැලිගොඩ අතුරුදහන් කිරීමේ සිද්ධියට ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නම එක් කිරීමට දැඩි උත්සාහයක් ගත් බවත් එසේම සාජන් මේජර් රංබණ්ඩා විශ්‍රාමික සොල්දාදුවෙක් වන අතර, ඔහු දුර්වල පුද්ගලයෙක් නිසා අත්අඩංගුවට ගැනීමට, රිමාන්ඩ් කිරීම වැනි දේවලට ඔහු බිය වී ඇතැයි යන සැකය පැමිණිලිකරුට තිබූ බවද ප්‍රකාශ කර සිටි.

පැමිණිලිකරුට අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 යටතේ ප්‍රකාශයක් කිරීමට බලපෑම් කළ බවත්, එම බලපෑම අමාත්‍ය මණ්ඩලයේ සංදේශයේ මාධ්‍යවේදීන් පැහැරගෙන යාම සිද්ධියේදී අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය ඉලක්ක කිරීමක් සම්බන්ධයෙන් දක්වා තිබූ බවත්, ඇතැම් විටෙක අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 යටතේ ප්‍රකාශයක් කරන

ලෙසට ඉල්ලීම මෙම සංදේශයෙන් ලැබුණු සන්නිවේදනයක් විය හැකි බව ප්‍රකාශ කර සිටියි.

එසේම රංබණ්ඩාගේ සහ මුරලිගේ ප්‍රකාශද මේ අන්දමට ලබා ගත් බැව් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. එසේම අත්අඩංගුවේ සිටි කෝප්‍රල් රූපසිංහ හා මාණ්ඩලික සැරයන් උපසේන යන දෙදෙනා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පිටට ගෙන ගොස් මත්පැන් පානය කිරීමට අවස්ථාව ලබාදී ඔවුන්ගේ නිවෙස්වලට දුරකථන ඇමතුම් ලබාදී එම නිළධාරීන්ගේ බිරින්දෑවරුන්ටද බලපෑම් කළ බැව් ප්‍රකාශ කර සිටියි.

පැමිණිලිකරුට අනුව මාස 3ට ආසන්න කාලයක් රැඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේද, එසේම මාස 9ක කාලයක් රක්ෂිත බන්ධනාගාරයේද සිටි බවද ප්‍රකාශ කර සිටියි.

පැමිණිලිකරු ඔහුගේ සාක්ෂියේදී 2015 අප්‍රේල් වන විට ඔහුගේ නම ප්‍රංශයේ පළවෙනි ලේකම් ධුරයට යෝජනා වී තිබූ බවත්, එහි යෑමට පෙර අත්අඩංගුවට පත් වූ බවත්, විදේශ ගතවීම සම්බන්ධයෙන් නිශාන්ත සිල්වා දැනගෙන පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කළ බවත්, එය උපයෝගී කරගෙන පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් ලබාගැනීමට උත්සාහ කළ බව ප්‍රකාශ කර සිටියි. එපමණක් නොව ශානි අබේසේකර විසින් සාර්ථක ලෙස අවසන් කල වාස් ගුණවර්ධන නඩුව සම්බන්ධයෙන්ද කියා විවිධ පොරොන්දු මගින් බියගැන්වීම් මගින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශ ලබා ගැනීමට දැඩි උත්සාහයක් ගත් බැව් ප්‍රකාශ කර සිටී. (2020.09.04 වෙනි දින සාක්ෂි පිටු අංක 19)

පැමිණිලිකරු තවදුරටත් සාක්ෂි දෙමින් ඇතැම් අවස්ථාවලදී උ.පො.ප. ප්‍රේමතිලක, සැරයන් මෙන්ඩිස් විශේෂ කලබලයකින් මෙම හමුදා නිලධාරීන්ගේ පරීක්ෂණ සම්බන්ධයෙන් ලිපිලේඛන ගෙන ඇතැම් අවස්ථාවලදී රෑ එළිවෙන තුරු ලිපිගොනු සකස් කිරීමක් කළ බව නිරීක්ෂණය වූ බවත්, ඒ ලිපිගොනු සකස් කලේ අරලිය ගහ මන්දිරයේ රැස්වීම්වලට බවත්, පැමිණිලිකරුට පෙනී ගිය බව ප්‍රකාශ කරයි.

පැමිණිලිකරු විසින් අංක 365/215 අංකය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කල බවත්, එය විභාග වීමට තියෙන්නේ 2021.03.15 වෙනි දින බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. තවද බන්ධනාගාර රෝහලේදී ඔහු අසනීප වූ බවත්, හුස්ම ගැනීමේ අපහසුවක් තිබුණු බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. එසේම පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගරයේ සිටින විට බන්ධනාගාර අධිකාරියේ අනුමැතිය ඇතිව බිරිඳ මාර්ගයෙන් ආහාර ලබාගත් අතර, එයටද විරුද්ධව අධිකරණයට වාර්තා කළ බවත්, පැමිණිලිකරුගේ අසනීප තත්ත්වය නිසා බන්ධනාගාර රෝහලේ සිටින විට බොරුවට රෝහල් ගතව සිටින බව පරීක්ෂා කිරීම සඳහා අධිකරණ වෛද්‍ය නිළධාරීගෙන්ද වාර්තාවක් ලබාගත් බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. තවද 2017 අප්‍රේල් මස දිනක පැමිණිලිකරුගේ බිරිඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රකාශයක් ලබා ගත් බවත්, ශානි අබේසේකර විසින් පැමිණිලිකරුගේ බිරිඳ ලවා පැමිණිලිකරුට බලපෑම් කර ප්‍රකාශයක් ලබා ගැනීමට (2020.09.04 දින පිටු අංක 29 සාක්ෂි වාර්තාව) උත්සාහ ගත් බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේදී යම් යම් දේශපාලන බලපෑම් තිබූ බව ප්‍රකාශ කරන අතර, එවකට නියෝජ්‍ය අමාත්‍යවරයෙක්ව සිටි රංජන් රාමනායක සහ ශානි අබේසේකර අතර දුරකථන සංවාදයකින්

පැමිණිලිකරුගේ  නමද සඳහන් කර තිබුණු බවත්, එය පැමිණිලිකරු "P12" ලෙස සලකුණු කර කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

එසේම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ එම හඬ පටියෙන් ශානි අබේසේකර යම්කිසි දේශපාලනමය ඉලක්කයක් කරා ක්‍රියා කරන බව පැමිණිලිකරුට වැටහී ගිය බවයි. (2020.09.04 සාක්ෂි පිටු අංක 36)

එසේම 2017 වර්ෂය කාලය තුලදී තිබුණු වාතාවරණය හා ව්‍යවස්ථාව අනුව මහින්ද රාජපක්ෂ මහතාට නැවත ජනාධිපති වීමට අවස්ථාව නොමැති නිසා පොදුවේ තිබුණු මතය වූයේ ගෝඨාභය රාජපක්ෂ එම තනතුරට පත්වේය යන්න බවත්, ඒ නිසා හැකි සෑම අන්දමකින් ගෝඨාභය රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමට වෑයම් කළ බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 24 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන් වන මෙම පැමිණිලිකරු (පැ.අ 200/2020) මෙම කොමිෂන් සභාව ඉදිරියේ  2020.09.16 වන දින සාක්ෂි දුන් අතර, පැමිණිලිකරු 1996.08.07 වන දින යුධ හමුදාවට බැඳී මූලික පුහුණුවෙන් පසු 12 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට එක්ව රාජකාරි කර ඇති අතර, පැමිණිලිකරු 1999 වර්ෂයේදී සන්නද්ධ බුද්ධි බළකායට බලපාන විශේෂ පාඨමාලාවක් හදාරා නැගෙනහිර බුද්ධි හා ආරක්ෂක සමුහය යටතේ රාජකාරි කළ බවට ප්‍රකාශ කර ඇත. 1999 වර්ෂයේදී නැගෙනහිර ප්‍රදේශය ආවරණය වන පරිදි රාජකාරිවල නියුක්ත වි සිට ඇති අතර, 2005 වර්ෂයේදී 3 වන සන්නද්ධ බුද්ධි බළකා ඒකකයට අනුයුක්තව රාජකාරි කළ බවටත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු 2009 වර්ෂයේදී පමණ කෝප්‍රල් තනතුරට උසස්වීම් ලබා නැගෙනහිර බුද්ධි රාජකාරිවල නිරතව සිටිමින් 3 වන සන්නද්ධ බුද්ධි බලකායට අනුයුක්තව ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක හතර ආවරණය කරමින් බුද්ධි රාජකාරී කළ බවට ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුගේ රාජකාරී ඇගයීමක් වශයෙන් සොල්දාදුවන් කිහිපදෙනෙකුට පමණක් ප්‍රදානය කරන රණශූර පදක්කම ඔහුට හිමිවී ඇති අතර, 2011 වර්ෂයේදී කෝප්‍රල් නිළයේ සිට සැරයන් නිළයට උසස් වීම් ලැබූ බවටද ප්‍රකාශ කර සිටී.

2015.08.24 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටිමට පැමිණිලිකරුට කැඳවීමක් ලැබී ඇති අතර, පැමිණිලිකරු ඇතුලු කර්නල් ෂම්මි සිරිවර්ධන, කර්නල් සිරිවර්ධන සහ ලාන්ස් කෝප්‍රල් අනුර ජයලත් යන තිදෙනා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටි බවට ප්‍රකාශ කර සිටී. එහිදී SI ප්‍රේමතිලක කථා කර පසුව ශානී අබේසේකරගේ කාර්යාලයට රැගෙන ගිය බවත්. එහිදී ශානී අබේසේකර විසින් පැමිණිලිකරු සමඟ ගිය හමුදා නීති නිළධාරියාට පැමිණිලිකරු සමග සිටින මෙම කණ්ඩායම අත්අඩංගුවට ගන්නා බව ප්‍රකාශ කළ නිසා එම නීති නිළධාරියා පිටව ගිය බවත්, පසුව පැමිණිලිකරුව SI ප්‍රේමතිලක විසින් තනිවම කාමරයකට රැගෙන ගිය බවත්, එහිදී ඡායාරූපයක් පෙන්වා හඳුනනවාද යැයි ඇසූ බවත්, හඳුනන්නේ නැති බව පැවසූ විට SI ප්‍රේමතිලක පුටුව පසෙකට දමා "තොපි බබ්බු බබ්බුන්ගෙන් වැඩ ගන්න හැටි අපි දන්නවා. මේ තමයි එක්නැලිගොඩ කියන්නේ. මූව තමයි උඹලා පැහැරගෙන ගිහින් තියෙන්නේ" කියලා තර්ජනාත්මකව කියූ බව ප්‍රකාශ කර සිටී. ඊට පසු SI ප්‍රේමතිලක "ඔයාලට බලාගන්න පුළුවන් මාස 3ක් විතර DO

ගහලා ඇතුලට වෙලා ඉද්දී ඔය බබ්බුන්ගේ කට ඇරෙන හැටි අපි දන්නවා ඊට පසු කරන්න ඕනී දේ කියන්නම්" තර්ජනාත්මකව කියූ බැව් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරුව දින 77ක පමණ කාලයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවාගෙන සිටි බවත්, එම කාලය තුලදී ශානී අබේසේකර ඔහුගේ කාමරයට පැමිණිලිකරුව කැඳවා ලැප්ටොප් පරිඝණකය මාර්ගයෙන් විශ්ලේෂණයක් පෙන්වා ඒ හරහා වාස් ගුණවර්ධනගේ කට්ටියට දඬුවම් කළ බව පෙන්වා "මේක තමයි ඔයාලටත් අනිවාර්යයෙන් වෙන්නේ මරණීය දඬුවම ලබාදෙන එක විතරයි. විශේෂයෙන් මේ ආණ්ඩුව පටන් ගත්තා විතරයි. ඔහේලා හොඳට තේරුම් ගන්න ඕනි තව අවුරුදු 5ක් මේ ආණ්ඩුව යනවා" කියූ බව පැමිණිලිකරු කියා සිටි. එසේම ශානී අබේසේකර තව දුරටත් කියා සිටියේ "මේක කරලා කියෙන්නේ ගෝඨාභය තමයි. ගෝඨාභය තමයි මේකේ හෙඩ් ගෝඨාභය කිව්ව නිසා තමයි කුමාරරත්න මේක කරලා තිබුණේ අපි උඹලා වැඩ කරපු බවත් දන්නවා.ඒවා ඔක්කෝම හොයාගෙන ඉවරයි. උඹලා අමාරුවේ වැටෙන්න එපා. ලොකු මිනිස්සුන්ගේ දේවල්වලට කර ගහන්න එපා. .... මේ නඩුව ඔප්පු වුනාම ආයෙත් රාජපක්ෂලාගේ ආණ්ඩුවක් එන්නේ නෑ" කියා ශානී අබේසේකර කියූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. මෙවැනි තර්ජන පෙළඹවීම් සහ පොරොන්දු විටින්විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දුන් බවට පැමිණිලිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර සිටි.

එපමණක්ද නොව කිහිපවිටක්ම මත්පැන් ලබා දුන් බවත්, එක් වරක් ගෝල්ෆේස් පිටියට ගෙන ගොස් මත්පැන් පානය කිරිමටද දුන් බවත්,

රඳවාගෙන සිටි දින 77 තුළදී මතක හැටියට ප්‍රකාශ 3කට හෝ 4කට අත්සන් කළ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු මුරලි සමඟ එක් එක් ස්ථානවලට ගිය බව සහ එසේ ගොස් මාධ්‍යවේදී එක්නැලිගොඩ හමු වූ බව කියා තිබීම සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බවත් පැමිණිලිකරු ඔහුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුව 2015.11.09 වන දින බන්ධනාගාර ගත කළ අතර, ප්‍රකාශයක් කිරීමට කැමැත්තත් තිබේනම් SI ප්‍රේමතිලකගේ දුරකථන අංකය පවා දුන් බව ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරුට විරුද්ධව හෝමාගම මහාධිකරණයේ චෝදනා පත්‍රයක්ද, කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ චෝදනාපත්‍රයක්ද ගොනු කර තිබෙන බව පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යම් ප්‍රබන්ධයක් නිර්මාණය කර ඇති අතර, එම ප්‍රබන්ධයේ ප්‍රකාශය ඔවුන් ලවා ප්‍රකාශ කරවාගැනීමට දැඩි උත්සාහයක් දැරූ බවය.

ඉහත කරුණු සනාථ කිරීම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 10 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර වඩුගෙදර විනි ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන නොහොත් සුරේෂ් (පැ.අ 198/2020) 2020.09.23 වෙනි දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් අතර, මොහු 1993.03.29 වෙනි දින ආධුනික සෙබළෙකු වශයෙන් බැඳී පුහුණු කාලයෙන් පසු 2003 දක්වා යාපනය ප්‍රදේශයේ රාජකාරි කර ඇති අතර, 2015.03.30 වෙනි දින

විශ්‍රාම ගිය බවත්, 2015.09.05 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට උදේ 9.00ට පැමිණෙන ලෙස පැමිණිලිකරුට කැඳවීමක් ලැබී ඒ අනුව එහි ගිය බවත්, පැය3 - 4කට පමණ පසු අධ්‍යක්ෂ ශානි අබේසේකර හමු වී පසුව SI ප්‍රේමතිලක පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් සටහන් කිරීමට විස්තර ඉල්ලා සිටි බවත් ප්‍රකාශ කර සිටි.

පැමිණිලිකරු නිවසේ නොසිටි අවස්ථාවකදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කණ්ඩායමක් පැමිණ පැමිණිලිකරුට කැඳවීමේ ලිපියක් භාරදී තිබූ බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකරු නිවසේ නොසිටි හෙයින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පැමිණි නිළධාරීන් ඉතා පහත් අන්දමින් බැණ, කෑ ගසා පැමිණිලිකරු සැඟවී සිටීනම් පිටතට එන ලෙසට කෑ ගසමින් පැමිණිලිකරුගේ මෑණියන්ට "පුතා ඉන්නවනම් එළියට දාපන්, නැත්නම් ප්‍රශ්නයක් වෙනවා" කියා කෑ ගසා ඇත. එසේ එදින ඔහුගේ නිවස සෝදිසියකට ලක් කර ඇති බවද පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. පසුව දැනගත් විදියට S.I. ප්‍රේමතිලක, සාජන් මෙන්ඩිස් සහ තව කිහිප දෙනෙක් ඇවිත් තිබූ බවත්, මේ අය සවස 6.00ට පමණ ඇවිත් පැය දෙකක තුනක කාලයක් සිට ඇති බවත්, සුදු පාට රථයක් නවතා රාත්‍රී 11.00 පමණ වන තෙක් තිබූ බවත් ප්‍රකාශ කර සිටී.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය පසු පැමිණිලිකරුව ශානි අබේසේකර විසින් සාජන් මෙන්ඩිස් සහ S.I. ප්‍රේමතිලකට යොමු කළ බවත්, එතැනදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැමිණිලිකරුට කියා ඇත්තේ "උඹේ අනිත් එවුන් ටික ඔක්කොම අරන් තියෙන්නේ ඒ අය ඔක්කොම කියලා තියෙන්නේ ඇත්ත

විස්තරේ. උඹට තියෙන්නේ අපි කියන එකට එකග වෙලා දෙයියනේ කියලා මෙතනින් ගෙදර යන එකයි.''යනුවෙනි.

පසුව කුමක් ප්‍රකාශ කළ යුතුදැයි පැමිණිලිකරු විමසූ විට "එක්නැලිගොඩ කියලා මාධ්‍යවේදියෙක් පැහැරගෙන ගිහින් ඝාතනය කරලා තියෙනවා. ඒකට තමුන් සම්බන්ධයි. ඒ බව අත්අඩංගුවේ සිටින අනෙක් සාමාජිකයින් ප්‍රකාශ කරලා තියෙනවා, තමුන් අපි අහන ඒවාට උත්තර දීලා අපි කියන විදිහට හිටියොත් හෙට හරි ගෙදර යන්න පුළුවන් කියා'' පැමිණිලිකරුට කියා ඇත.( පිටු අංක 7)

පැමිණිලිකරුගෙන් මෙසේ ප්‍රශ්න කර ඇත්තේ එක්නැලිගොඩ අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් බවත්, පැමිණිලිකරු කොළඹ ප්‍රදේශයට ඇවිත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීමට සැළසුම් කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කළ බවත්, එසේ ප්‍රශ්න කිරීමෙන් පසුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන සිරි මැදිරියට දැමූ බවත්, එම අවස්ථාවේදී රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි යන අයවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබූ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි.

පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටියදී SI ප්‍රේමතිලක සහ සාජන් මෙන්ඩිස් කියා ඇත්තේ රංබණ්ඩා නම් හමුදා නිළධාරීයෙක්, පැමිණිලිකරු මෙම සිද්ධිය සැළසුම් කළ බවට ප්‍රකාශ දී ඇති බවටයි. එසේම අත්අඩංගුවට ගෙන දින තුනකට පමණ පසු ත්‍රස්තවාදී වැළැක්වීමේ තාවකාලික විධිවිධාන යටතේ රැඳවුම් නියෝගයක් ලබාගෙන ඇති අතර, එම රැඳවුම් නියෝගයේ දක්වා ඇත්තේ LTTE සාමාජිකයින් සමග සම්බන්ධතා පැවැත්වීම සහ

පුද්ගලයෙකු පැහැරගෙන යාමට පූර්වෝපාය යෙදීම, මනුෂ්‍ය ඝාතන සිදු කිරීමට ආධාර අනුබල දීම යනාදිය බව ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු පවසන අන්දමට රැඳවුම් නියෝග යටතේ දින 93ක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවාගෙන සිට ඇති බවත්, එම රැඳවුම් නියෝගයේ ජනාධිපතිතුමාගේ අත්සන සම්බන්ධයෙන්ද සැකයක් ඇති නිසා එය පරීක්ෂා කළ යුතු බවටද කොමිෂන් සභාව තීරණය කරනු ලැබිණ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා ගෙන සිටියදී බිරිඳ විසින් මානව හිමිකම් නඩුවක් ගොනුකර ඇති අතර, එයින් මෙතෙක් අවසාන තීන්දුවක් නොලද බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා ගෙන සිටි කාලය පුරාම පැමිණිලිකරුට බලපෑම් කර ඇත්තේ එක්නැලිගොඩ අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂ විසින් දුන් නියෝග මත කර්නල් ෂම්මි කුමාරරත්න මේ වැඩේ කර ඇති බවට පිළිගන්නා ලෙසත් එවැනි ප්‍රකාශයක් කළහොත් හෙට හෝ ගෙදර යන්නට හැකිවෙන බවත් කියමින් ශානි අබේසේකර, SI ප්‍රේමතිලක, සාජන් මෙන්ඩිස් සහ නිශාන්ත ද සිල්වා දිගටම බලපෑම් කළ බැව් පැමිණිලිකරු දක්වා සිටී.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටියදී ප්‍රකාශයක් කළහොත්, “ඉල්ලන ඕනෑම රටකට යන්න දෙන්නම් කිව්වා. මට හෝ මගේ පවුල සමග රැකවරණය දෙන්නම් කිව්වා නීතිඥ මහතෙකු මාර්ගයෙන් ගිවිසුමක් අත්සන් කරන්න පුළුවන් කිව්වා”. එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටින විට පෙළඹවීමක් වශයෙන් කිහිප අවස්ථාවකදී මත්පැන් පානය කිරීමට දුන් බවත්, එක් අවස්ථාවකදී රූපසේන සමග ගෝල්ෆේස් පිටියට

ගෙන ගොස් මත්පැන් බී පසුව මහරගම ප්‍රදේශයේ ඇති අඹ සෙවනට ගොස් නැවතත් මත්පැන් පානය කළ බවත්, ගෝල්ෆේස් පිටියේ සිටින විට පොලිස් නිළධාරීන්ගේ දුරකථනයෙන් ගෙදරට කථා කළ බවත්, එසේ කතා කරන්නට දී උත්සාහ කළේ බිරිඳ ලවා මෙම ප්‍රකාශය ලබාගැනීමට මා හට කියවා මාගෙන් මෙම ප්‍රකාශය ලබාගැනිමට බව පැමිණිලිකරුට පැහැදිලි වූ බවත් ප්‍රකාශ කර සිටි. මීට අමතරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටියදී ශානි අබේසේකරගේ කාර්යාලයට පැමිණලිකරුව ගෙන ගොස් ශානී අබේසේකර විසින් කරන ලද සාර්ථක නඩු විසඳීම් වන දුමින්ද සිල්වා, වාස් ගුණවර්ධන, තව බෞද්ධ ස්වාමීණ්වහන්සේගේ නඩුවක් සහ ජ්‍යෙෂ්ඨ පොලිස් නිළධාරියෙකුගේ අශෝභන ක්‍රියා සම්බන්ධයෙන්ද කියූ බවත් එවිට SI ප්‍රේමතිලක විසින් මේ නඩුව කොහොම හරි දිනන්න පුළුවන් අපිට අවශ්‍ය විනිසුරු මඩුල්ලක් ඉන්නවා. ඒ නිසා අමාරුවේ නොවැටී සිටින ලෙස එක් අවස්ථාවකදී සුහදවද, තවත් අවස්ථාවකදී තර්ජනාත්මකවද, පෙළඹවීම් කළ බැව් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි.

පැමිණිලිකරු සිර මැදිරිය තුළ ඔහු සිටින විටදී ඩෙංගු රෝගයට දුම්ගැසීම නිසා පැමිණිලිකරු ඉතා අපහසු තත්ත්වයට පත් වූ බවත්, රෝහල්ගත වීම සිදු වූ බවත් ප්‍රකාශ කර සිටි.

2016.11.08 දිනදී පැමිණිලිකරු අවිස්සාවේල්ල මහාධිකරණයෙන් ඇප ලබාගත් බවත්, පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටියේ ඔහුට තිබූ ත්‍රිපුද්ගල මහාධිකරණයේ සහ හෝමාගම මහාධිකරණයේ අධිචෝදනා භාර දී ඒ සම්බන්ධයෙන් නඩු විභාග පැවැත්වෙන බවයි.

තවදුරටත් පැමිණිලිකරු රංබණ්ඩාව හඳුනන බවත්, ඔහු මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් බවත් පිළිගෙන ඇත. එසේම පැමිණිලිකරු අවුරුද්දයි මාස 3යි දින 3ක් රක්ෂිත බන්ධනාගාරයේ සිටි බවත්, ඒ කාලය තුළදී ඇප මත පැමිණියත් අඩුම වශයෙන් මසකට වරක්වත් උසාවියට යායුතුව තිබූ බවත්, අසත්‍ය චෝදනාවකට පැමිණිලිකරු ගොදුරු වීම නිසා දැඩි මානසික පීඩනයකට පත් වූ බවත්, ළමයින්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වූ බවද ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටින විට රංබණ්ඩා සහ LTTE සාමාජිකයින්ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ නිදැල්ලේ සිටිනවා දුටු බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ඔවුන්ට අවශ්‍ය පරිදි අවශ්‍ය ප්‍රකාශ දුනහොත් රංබණ්ඩා සිටින විදිහට සිටිය හැකි බව සාක්ෂිකරුට කියූ බැව් සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු රාජකාරි කාලයේදී උත්තම සේවා පදක්කම, රණශූර පදක්කම යනාදි පදක්කම් ලබා ඇති බවත්, පැමිණිලිකරුට මෙවැනි තත්ත්වයකට මුහුණදීමට සිදු වූයේ දේශපාලන පළිගැනීම්වලට ලක්වූ නිසා බවත් ප්‍රකාශ කර සිටී. (සාක්ෂි “P12” ලෙස සලකුණු කර ඇත)

තවද, පැමිණිලිකරු සි.ඩී තැටියක් කොමිෂන් සභාවට ලබාදුන් බවත්, එම සී.ඩී තැටියේ රංජන් රාමනායක සහ ශානි අබේසේකර කතා කළ දුරකථන සංවාදයක් තිබෙන බවත්, එහි නිශාන්ත සිල්වාගේ හඬපටයක්ද මාධ්‍යවේදී එක්නැලිගොඩ නඩු කිහිපය ගැන කතා කරන හඬපට තිබූ බවත් එම හඬපට වලින් පෙනී යන්නේ දේශපාලන බලපෑම් හේතුවෙන් පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක් වූ බව යැයි පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරීම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 14 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි (පැ.අ 196/2020) 1991.11.19 දින හමුදාවට බැඳී ඇති අතර, පුහුණුවෙන් පසු හමුදා පොලිස් සේවා විද්‍යාලයේ රාජකාරි කර පසුව 1997 අප්‍රේල් මසදී ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා බුද්ධි බළකායට අනුයුක්තව පුහුණුව ලබා යාපනය ප්‍රදේශයේ පළාලි, අලිමංකඩ, කිලිනොච්චි, මුලතිව් සහ අක්කරපත්තු යන ප්‍රදේශවල රාජකාරි කිරීමෙන් පසු 2012 අග භාගයේදී හමුදාවෙන් ඉවත්ව පුද්ගලික ගල් ක්‍රෂර් එකක් රැගෙන තම මිත්‍රයින් සමඟ එම ව්‍යාපාරය කර ගෙන ගිය බව ප්‍රකාශ කර ඇත.

2015.09.04 වන දින පැමිණිලිකරුගේ බිරිඳගෙන් දුරකථන ඇමතුමක් ලැබුණ බවත්, හේතුවක් නොකියාම දුරකථනය විසන්ධි වූ බවත්, පැමිණිලිකරුගේ බිරිඳ R.W සන්ධ්‍යා කුමාරි යන අය වේ. නැවතත් උදේ 8ට පමණ දුරකථන ඇමතුමක් ගත් විට බිරිඳගේ දුරකථනයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොවූ නිසා බිරිඳගේ අම්මාට සහ තවත් සමීපතමයින් කිහිප දෙනෙකුට මේ බව දන්වා හැකි ඉක්මනින් පොලිසියට දැනුම් දෙන ලෙස කියා පසුව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහෝදරයෙක් වන ඩඩ්ලි සිරිසේන මහතාට සිද්ධිය පැවසීමෙන් පසුව පොලිසිය මගින් සොයා බැලුවද, කිසිදු තොරතුරක් නොමැතිවීම නිසා පොළොන්නරුවට පැමිණ සහකාර පොලිස් අධිකාරි මහතා හමුවී පැහැදිලි කරන ලෙසට උපදෙස් දී තිබූ අතර, පැමිණිලිකරු මූතූර් ප්‍රදේශයේ සිට නිවසට එමින් සිටියදී වාලච්චේනෙයි ආසන්නයේදී බිරිඳගෙන් දුරකථන පණිවිඩයක් ලද බවත්, ඇය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සමඟ

ගල් ක්‍රෂර් එකට ආ බවත්, පසුව එම දුරකථනයෙන්ම බිරිඳ සමග පැමිණ සිටි අයෙක් දුරකථනයෙන් කථා කොට එක්නැලිගොඩ අතුරුදහන්වීම සම්බන්ධයෙන් සාක්ෂි සටහන් කිරීමට අවශ්‍ය බව දන්වා සිටි බවත් ප්‍රකාශ කර සිටි.

අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කථා කළ විට ඔවුන් සිටින ස්ථානයට එන ලෙස දැන්වූවද, පැමිණිලිකරු පොළොන්නරුව ආසන්නයේ සිට ඇති නිසා පැමිණිලිකරු අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට එන බව පවසා බිරිඳව නිදහස් කරන ලෙසට කියූ බවත් ප්‍රකාශ කර ඇත. ඉන්පසුව බිරිඳට මින්නේරිය පොලිස් ස්ථානයට ගොස් පැමිණිල්ලක් කිරිමට දන්වා පැමිණිලිකරු අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. වැඩි දුරටත් මානව හිමිකම් කොමිෂන් සභාවටද පැමිණිල්ලක් කළ බවද ප්‍රකාශ කර ඇත.

පසුව 2015.09.05 වන දින අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් SI ප්‍රේමතිලක සහ සාජන් මෙන්ඩිස් හමුවී ශානී අබේසේකරගේ කාර්යාලයට ගිය බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් පැය 2කට පමණ පසු ශානී අබේසේකර එහි පැමිණ SI ප්‍රේමතිලක සහ සාජන් මෙන්ඩිස් විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් සියල්ලම සොයා ගෙන ඇති බවත්, මිරිස් ගෝනිවල බහින්නෙ නැතිව, ළණුවල එල්ලෙන්නේ නැතිව, වැලි පුරවපු බට වලින් ගුටි කන්නේ නැතිව, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව කියන දේ කරලා, අවශ්‍ය ප්‍රකාශ දීලා නිදහස් වෙලා යන්න කියා කියූ බවත් ප්‍රකාශ කර ඇත.

ඊට පසු පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කර පසුව නිදාගෙන සිටියදී නැවත ඇහැරවා පසු ශානි අබේසේකරගේ කාර්යාලට ගෙන ගිය බවත්, SI ප්‍රේමතිලක Sgt මෙන්ඩිස් යන දෙදෙනා රහසින් යමක් ශානී අබේසේකරට කියූ බවත්, එවිට ශානි මහතා විසින් "මෙයාව ෂෙල් එකට දාන්න" කියූ බවත්, පසුව පැමිණිලිකරුව ෂෙල් එකට දැමූ බවත් ප්‍රකාශ කර ඇත. එතකොට ෂෙල් එකේ තවත් දෙදෙනෙක් සිටි බවත්, ඊට පසු දින පැමිණිලිකරුගෙන් ප්‍රශ්ණ කර, පින්තූරයක් පෙන්වා මේ පින්තූරයේ ඉන්න අයව හඳුනනවද ඇසුවාම පැමිණිලිකරු "මම අඳුනන්නේ නෑ" කියූ බවත්, ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුව රඳවා ගෙන සිට ඇත්තේ ත්‍රස්තවාදී පනත යටතේ බව පසුව දැනගන්නට ලැබුණ බවත්, පොලිස් කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ල "P3" ලෙසත් සලකුණු කර ඇත.

පැමිණිලිකරුව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් රඳවා ගෙන සිටි කාලයේදි උපසේන, අනුර, මුරලි, සත්‍යමාර්ෂල්, රංබණ්ඩා යන අයවළුන් සහ ප්‍රබෝධ සිරිවර්ධන හා ෂම්මි කුමාරරත්න යන අය කිහිප අවස්ථාවකදීම දැක ඇති බවටද ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා ගෙන සිටින විට සාජන් රංබණ්ඩා සහ SI ප්‍රේමතිලක අතර ඇති වූ දෙබසක් අසන්නට ලැබුණ බව ප්‍රකාශ කර ඇත. එදින රාත්‍රියේ SI ප්‍රේමතිලක " සාජන් රංබණ්ඩා" කියලා කථා කරලා "රංජිගේ දුරකථන වාර්ථාවයි, එයා දාපු පාස් එකයි හම්බ වෙලා තියෙනවා. එකේ ඔයා දුන්න කට උත්තරය පොඩ්ඩක් වෙනස් කරන්න ඕනී. අරුව ඒ කියන්නේ එක්නැලිගොඩව දවස් තුන හතරකින් අරන් ගියා කියන එක හරියන්නේ නැහැ. පහුවදාම අරගෙන ගියා කියලා කියන්න ඕනී."

කියලා කිව්ව බවට ප්‍රකාශ කර ඇත. (2020.08.27 වන දින සාක්ෂි දීමේදී 26 වන පිටුවේ පහළ සිට ඉහළට හත්වන පේළියේ සටහන් කර ඇත.) මේ දෙබස අහන වේලාවේ පැමිණිලිකරු සිටියේ සිරිමැදිරියක බවත්, සාජන් රංබණ්ඩා එළිමහන් තැනක නිදහසේ සිටි බවත් ප්‍රකාශ කර ඇත.

තවත් දිනෙක පැමිණිලිකරු සිර මැදිරියේ සිටින විට කඳවුරේ සේවය කරපු උපසේන නමැති අය තවත් සිරිමැදිරියක සිටි බවත් ඒ අවස්ථාවේදී ඩෙංගු මදුරුවන්ට තෙල් ගහන මැෂින් එකක් අරගෙන සිරමැදිරිය වැහෙන්නම දුම් ඇල්ලූ බවත්, එවිට ඉන්න ගන්න බැරි නිසා සිහිය නැතිවේගෙන ගතියක් දැණුන බවත්, පසුව ජාතික රෝහලට ගෙන ගොස් ප්‍රතිකාර ලබා දුන් බවත්, ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරු කියන ආකාරයට රත්නායක නමින් අයෙක් ඒ දිනවලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ OIC ලෙස රාජකාරී කළ බවටද ප්‍රකාශ කර ඇත.

එසේම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ස්ථානාධිපති රත්නායක සමඟ විදේශීය කාන්තාවන් දෙදෙනෙක් පැමිණි බවත්, පසුව පැමිණිලිකරු ගෙන්වා "මෙයා තමයි එක්නැලිගොඩව කඳවුරට අරන් ගිහින් මරලා තියෙන්නේ " (2020.08.27 වන දින සාක්ෂිවල 30වන පිටුවේ ඉහළ සිට පහළට 4 වන පේළියේ සටහන් කර ඇත.) කියලා ඒ වේලාවේ පැමිණිලිකරු කෑ ගහලා "මේ බොරු කථාවක් කාලයක් තිස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙනැල්ලා ඒක පිළිගන්න කියලාත්, තව ගෝඨාභය මහත්තයා කරන්න කිව්වා කියලත් කියන්න කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අපට කරදර කරනවා" යනුවෙන්ද ප්‍රකාශ කර ඇත. තවද ලංකාවේ ප්‍රශ්න

වලට ජාත්‍යන්තරය අත පොවන බවත්, මෙය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන දෙයක් මෙන්ම රජයද මෙයට සම්බන්ධයක් ඇති බවටද ප්‍රකාශ කර ඇත.

මෙසේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටියදී පැමිණිලිකරුවයි උපසේනවයි SI ප්‍රේමතිලක රැගෙන ගිය බවත්, එසේ රැගෙන ගියේ ස්ථානාධිපති නිශාන්ත සිල්වාගේ ඔෆිස් එකට බවත්, එහිදී නිශාන්ත සිල්වා පැමිණිලිකරුට "අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් පැමිණිලිකරුට කරදර කරන්න අකමැති බවත්, ගිරිතලේ කඳවුරට ගෙන ගොස් සත්‍ය අනාවරණය කරගෙන ඇති බවත්, ඒ නිසා දන්න දේ කියලා නිදහස් වෙලා ගෙවල්වලට යන්න පුළුවන් යැයි කියූ බවත් කියූ බවටද ප්‍රකාශ කර ඇත.

එසේම එදින නිශාන්ත සිල්වා පොඩි වෙනසක් කරන්න අරක්කු ටිකක් බොමු කියලා කියූ බවත්, (2020.08.27 වන දින සාක්ෂිවල 32වන පිටුවේ පහළ සිට ඉහළට 5 වන පේළියේ සටහන් කර ඇත.) එවිට නිශාන්ත සිල්වා රුපියල් 5000/= කොළයක් SI ප්‍රේමතිලකට දිලා හොඳ බෝතලයක් අරන් එන්න කියා කියූ බවත්, පසුව මත්පැන් බෝතලයක්, සෝඩා බෝතලයක්, සිගරට් මේසය උඩ ගෙනත් තිබූ බවත් ප්‍රකාශ කර ඇත.

මෙවැනි අවස්ථාවක් තවත් දිනකදීත් සිදුවූ බවත්, ශානි අබේසේකර මහතාගේ රූම් එකට පැමිණිලිකරුව සහ උපසේනව රැගෙන ගිය බවත්, එහිදී ශානි අබේසේකර ත්‍රිකුණාමලයේ සිට බැඳපු මාළු වගයක් ගෙනත් තියෙන නිසා ඒ සමඟ V & A විස්කි බෝතලයකුත් ශානී මහත්තයාගේ මේසය උඩ තබා ඒ දෙදෙනාට බොන්න කියලා කියූ බවත්, පසුව SI ප්‍රේමතිලකත් මෙයට එක්වූ බවත්, එහිදි SI

ප්‍රේමතිලක ඔහුගේ විශේෂ ක්‍රියාවන්, DIG මහත්තුරු කරපු වැරදි, හාමුදුරුවෝ එක්ක එකතුවෙලා කරපු දේවල්, තව පොටෝ පෙන්නලා අනියම් බිරිඳවල් ඉන්නවා කියූ බවත් ප්‍රකාශ කර ඇත. (2020.08.27 වන දින සාක්ෂියේ 34 වන පිටුවේ අවසාන ඡේදයේ සටහන් කර ඇත.)

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 33 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර යාපා මුදියන්සේලාගේ චමින්ද කුමාර අබේරත්න ( පැ.අ 194/2020) 2020.09.11 වන දින දි මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් මෙම පැමිණිලිකරු 1994.08.01 වන දින හමුදාවේ නිත්‍ය බලසේනාවට ආධුනික සෙබලෙක් වශයෙන් බැඳුණු බවත්, මාදුරු ඔය මාස 3ක මූලික පුහුණුවක් ලැබූ බවත්, මූලික පුහුණුවෙන් පසුව 1994 වර්ෂයේ නොවැම්බර් මාසයේ පාඨමාලාව අවසන් කළ පසු ශ්‍රී ලංකා බුද්ධි සන්නද්ධ බුද්ධි බළකායට අනුයුක්ත වූ බවත්, ලිපිකරුවෙකු වශයෙන් පනාගොඩ කඳවුරේ රාජකාරි යොදවනු ලැබූ බවත්, ඉන්පසු පනාගොඩ කඳවුරේ ලිපිකරු පාඨමාලාවක් හදාරා පසුව කොළඹ, මුත්තයියා පාරේ පිහිටි පළවෙනි සන්නද්ධ බුද්ධි බළකායට අනුයුක්තව ලිපිකරු රාජකාරියේ යෙදුනු බවත් ප්‍රකාශ කර සිටි. වැඩි දුරටත් ශාරීරික පාඨමාලාවක් හදාරා, පසුව නැවත වරක් පළවෙනි බුද්ධි සන්නද්ධ බළකායේ ලිපිකරු වශයෙන් රාජකාරී කළ බවත් ප්‍රකාශ කර සිටි.

පැමිණිලිකරු ලංකාවේ ශාරීරික අභ්‍යාස පාඨමාලාවේ උසස් පෙළ පාඨමාලාව හැදැරු බවත්,ඉන්පසුව බුද්ධි බළකායට බඳවා ගන්නා ආධුනික සෙබළුන් පුහුණු කිරීමේ ශාරීරික උපදෙස් පාඨමාලාවේ උපදේශකවරයෙකු වශයෙන් රාජකාරි කළ බවත්, ඒ වන විට

කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ ශාරීරික අභ්‍යාස උපදේශකයෙකු වශයෙන් රාජකාරි කිරීමට අවස්ථාවක් ලැබ 2003 වර්ෂය දක්වා එහි රාජකාරි කළ බවත්, ඉන්පසු බංගලාදේශයේ පැවති ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව හැදෑරූ බවත්, 2003 වර්ෂයේදී කොළඹ මුත්තයියා පාරේ 1වන සන්නද්ධ බුද්ධි බළකා මූලස්ථානයට රාජකාරි සඳහා පැමිණි බවත්, ඉන්පසු යාපනයේ අච්චුවේලි ප්‍රදේශයේ රාජකාරි කළ බවත්, පසුව 2004 අවසාන භාගයේදී ගිරිතලේ පිහිටුවා තිබුණු පුහුණු පාසලේ ආධුනික සෙබළුන්ගේ පුහුණු කටයුතු සඳහා වාර්තා කළ බවත් ප්‍රකාශ කර සිටි.

ඉන්පසු 2007 වර්ෂය දක්වා ගිරිතලේ පිහිටුවා ඇති පුහුණු පාඨමාලාවේ රාජකාරියේද, පසුව මඩකලපුව ප්‍රදේශයේ සිත්තන්ඩි ප්‍රදේශයේද පසුව 2008 ජූලි මාසයේ ගිරිතලේ කඳවුරට රාජකාරී සඳහා පැමිණි බවත්, 2012 දක්වා ගිරිතලේ පුහුණු පාසලේ රාජකාරි කළ බවත්, 2013 වසරේදී මාස 6ක කාලයක් සාම සාධක හමුදාවට බැඳී හයිටි රාජ්‍යයේ සේවය කර ලංකාවට පැමිණ නැවත වරක් ගිරිතලේ බුද්ධි පාසලේ රාජකාරියට අනුයුක්ත වූ බවත් ප්‍රකාශ කර සිටී.

2014 ජූනි මාසයේදී බලලත් නිලධාරී වශයෙන් පත්ව වවුනියාවේ ප්‍රදේශයේ රාජකාරි නිරතව සිටින විටදී 2015.11.23 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල අංශයේ පෙනී සිටින ලෙසට පණිවිඩයක් ලද බවත් ප්‍රකාශ කර සිටී. ඒ අනුව 2015.11.24 උදේ 10.00ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල අංශයට ගිය බවත්, පැමිණිලිකරුව පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මහතා වෙත යොමු කොට පසුව නිශාන්ත සිල්වා විසින් පැමිණිලිකරුව ශානි අබේසේකරට යොමු කළ බවත්, එහෙත් ඔහු

කිසිත් කතා නොකළ බවත්, ඉන්පසු කටඋත්තරයක් ගැනීමට සූදානම් කර ෆොටෝ එකක් පෙන්වා එහි සිටින කෙනාව හඳුනනවාද කියා ඇසූ බවත්, හඳුනන්නේ නැති බව කියූ බවත් ප්‍රකාශ කර සිටී.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් විසින් මාධ්‍යවේදි ප්‍රගීත් එක්නැලිගොඩව අතුරුදහන්වීම සම්බන්ධයෙන් කටඋත්තරයක් පැමිණිලිකරුගෙන් ගැනීමට අවශ්‍ය බවත්, අහන දේවල්වලට පිළිතුරු දෙන ලෙසත් කියූ බවට ප්‍රකාශ කර සිටී. වැඩි දුරටත් ගිරිතලේ කඳවුරේ අවුරුදු 10ක් පමණ රාජකාරි කළ බවත්, පාඨමාලාවන් සඳහා අවශ්‍ය ලිපිලේඛන ගෙන ඒමට හමුදා මූලස්ථානයටත්, මිල ගණන් ලබා ගැනීමට කොළඹට එන බවත් ප්‍රකාශ කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය පළමු අවස්ථාවේදී සවස 5.00ට පමණ ඔහුව නිදහස් කර ගෙදර ගිය බවත්, ඉන්පසුව 2015.12.27 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙසට දන්වා ඇතත් ඊට පසුදින එනම්, 2015.12.28 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පෙනී සිටි බවත් ප්‍රකාශ කර සිටී.

දෙවෙනි අවස්ථාවේදී SI ප්‍රේමතිලක හා පොලිස් සැරයන් මෙන්ඩිස් විමර්ශන නිලධාරීන් ලෙස පෙනී සිටි බවත්, එහිදී දූරකථන වාර්තාවන් පෙන්වා ප්‍රශ්න කළ බවත්, එසේම මාධ්‍යවේදී පැහැර ගැනීම් සඳහා සම්බන්ධ වූයේද යන්න පිළිබඳව ප්‍රශ්න කළ බවටත් ප්‍රකාශ කර සිටි.

පැමිණිලිකරුගේ කොළඹ පැමිණීම සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, දූරකථන කුළුණුවල සංඥා දත්ත අනුව පැමිණිලිකරු කොළඹ පැමිණ තිබෙන බවත්, එසේ ආවේ කුමකට දැයි ප්‍රශ්න කර ඇත. පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ එම සිද්ධිය සිදූ වී අවුරුදු 5ක් ගත වී ඇති නිසා ඒ

සම්බන්ධයෙන් මතකයක් නොමැති බවටයි. පැමිණිලිකරුගෙන් මෙම ප්‍රශ්න කිරීම්වලදී දූරකථන සම්බන්ධයෙන් 2010.01.24 වන දිනය පිළිබඳව ප්‍රශ්න කළ බවත්, කුලුණුවල සඳහන්ව ඇති දත්ත අනුව කොළඹ පැමිණියාද කියා විමසූ බවත් ප්‍රකාශ කර සිටී. එම අවස්ථාවේදී තර්ජනය කිරීමක් සිදු වී ඇති බැව් පැමිණිලිකරු විසින් 2020.09.11 වෙනි දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් පහත සාක්ෂි ප්‍රකාශය පරිදි මෙම කොමිෂන් සභාවට මනාව පැහැදිලි වේ. "උඹත් බොරු කියන්නේ උඹ දන්නවා උඹ කියන්නේ නැහැ. සියලුම දේ හෙළිවෙලා තියෙන්නේ. උඹ නිකන් බොරුවට අමාරුවේ වැටෙන්න එපා"කියා කියූ බවත් SI ප්‍රේමතිලකත් සාජන් මෙන්ඩිසුත්"ඇත්ත කියලා මෙතනින් යන" ලෙසට තර්ජනාත්මක ස්වරූපයෙන් කියූ බවත් ප්‍රකාශ කර සිටී. එවිට පැමිණිලිකරු "එවැනි දෙයක් නොදන්නා බවත්, එහෙම සිද්ධියක් වෙලත් නැහැ. මම_එහෙම දෙයක් කරන්නෙත් නැහැ" යනුවෙන් පිළිතුර දුන් බවට ප්‍රකාශ කර සිටී. (සාක්ෂි පිටු අංක 26 හි උඩ සිට 3වෙනි පිළිතුර)

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමේදී හේතුව දැනුම් දුන්නේ නැති වුවත් මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැර ගැනීමට සම්බන්ධ බවට කියූ බවත්, ඊට අමතරව වැඩි යමක් නොකී බවටත් ප්‍රකාශ කර ඇත.

ඉන්පසු රාත්‍රී කාලයේ පැමිණිලිකරු සිරමැදිරියේ ගත කළ බවත්, මෙදින පැදුරක් පමණක් ලැබුණ බවත්, ඒ සිරමැදිරියේ එක් කොනක වැසිකිලියක් තිබූ බවත්, එය ඉතා අපවිත්‍රව තිබූ බවත් ප්‍රකාශ කර සිටී.

රාත්‍රියේ නැවතත් SI ප්‍රේමතිලක හා සාජන් මෙන්ඩිස් හොඳින් කතා කර, පැමිණිලිකරුව පොළඹවාලීමට උත්සාහ කරමින් කියා ඇත්තේ "උඹ නිකන් අර දවාලේ කියපු එකම කියලා උඹ අමාරුවේ වැටෙන්න

යන්නේ. ඇත්ත කියපන්. සියලු දේ හෙළිවෙලා තියෙන්නේ. ඇත්ත කිව්වේ නැත්නම් උඹට අවුරුද්දක්, 2ක් ඇතුලට යන්න වේවි. ඒ නිසා උඹ දන්න දේ කියපන්" යැයි කියූ බවත් ප්‍රකාශ කර සිටී. එවිට පැමිණිලිකරුගේ පිළිතුර වී ඇත්තේ "ඇත්ත තමයි කිවේ. වෙන කිසිවක් කියන්න නැහැ" යනුවෙනි. "එවකට ආරක්ෂක ලේකම්ව සිටි වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මේ දේ කරන්න කිව්වා එහෙම නැතිනම් පැහැර ගැනීමට ලක් කරන්න කිව්වා කියලා" පිළිගන්න කියා කියූ බවත්, දන්නේ නැති බව කී විට පරුෂ වචනයෙන් දෙමාපියන් මතක් කර බැන තර්ජනය කර ගිය බවත් ප්‍රකාශ කර සිටී.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් උත්සාහ කළේ මෙම පැහැර ගැනීම ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ෂම්මි කුමාරත්න සර්ට කරන්න කියූ බවට පෙළඹවීම් කර පැමිනිලිකරුගෙන් ප්‍රකාශයක් ලබාගැනීමට යැයිද ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 11 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

සෙනෙවිරත්ත මුදියන්දලාගේ කනිෂ්ක ගුණරත්න වන (පැ.අ 197/2020) පැමිණිලිකරු 2020.10.10. වන දින දී මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් අතර, පැමිණිලිකරු 2000.06.23 වන දින හමුදාවට බැඳි මාස 3ක පුහුණු පාඨමාලාවෙන් පසු නොවැම්බර් මාසයේදී පමණ හමුදා බුද්ධි අංශයට අනුයුක්ත වූ බවත්, පසුව කොළඹ මුත්තයියා පාරේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරි කළ බවත්, 2005 වර්ෂයේදි ගිරිතලේ හමුදා බුද්ධි ඒකකයට අනුයුක්තව 2011 වසරේ අවසාන භාගය දක්වා සේවය කළ බවටත් ප්‍රකාශ කර සිටි.

මෙම පැමිණිලිකරු ආධුනික සෙබළෙක් වශයෙන් හමුදාවට බැඳී ඇති අතර, 2011 වර්ෂයෙන් පසු බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ සේවය කරමින් සිටියදී සාම සාධක රාජකාරි සඳහා හයිටි රාජ්‍යයට ගොස් මාස 6ක පමණ කාලයක් සේවය කිරීමෙන් අනතුරුව මෙම පැමිණිලිකරු ලංකාවට පැමිණි පසු කරන්දෙණියේ සේවය කර පසුව කොළඹ ප්‍රදේශයේ ඕරුගොඩවත්ත බුද්ධි හා ආරක්ෂක කාණ්ඩයට අනුයුක්තව සිටි බවත් ප්‍රකාශ කර සිටි.

2016.02.06 වන දින පැමිණිලිකරුට බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ නිළධාරියෙකු කථා කර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම් කර ඇති බැව් දැනුම් දීමෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය බවත්, එහි අධ්‍යක්ෂව සිටි ශානි අබේසේකර මහතාගේ කාමරයට පැමිණිලිකරුව ගෙන ගිය බවත්, එහිදී ශානි අබේසේකර ඔහුව කැඳවා ඇත්තේ මාධ්‍යවේදී එක්නැලිගොඩගේ අතුරුදහන්වීම සම්බන්ධයෙන් ප්‍රකාශ ලබාගැනිමට බවත් එහි සියළු විස්තර ඔවුන් දන්නා බවත්, ගෝඨාභය මහතාගේ උපදෙස් පිට ෂම්මි කුමාරරත්න මෙම සිද්ධිය කර ඇති බවත්, ඒනිසා දැන් ඉතිරිව ඇත්තේ නීතිය ක්‍රියාත්මක කිරිම පමණක් බවත්, මෙම සිද්ධියට පැමිණිලිකරු හසු නොවී අහනදේට පිළිතුරු දී මෙතැනින් පිටව යන ලෙස දන්වා සිටි බවටත් ප්‍රකාශ කර සිටී.

ඊට පසු සාක්ෂිකරුව SI ප්‍රේමතිලක සහ සාජන් මෙන්ඩිස් විසින් නිශාන්ත සිල්වා ළගට ගෙන ගොස් ඒ තිදෙනාම ප්‍රශ්න කිරීමට පටන් ගත් බව ප්‍රකාශ කර ඇත. එහිදි විශේෂයෙන්ම ප්‍රශ්න කර ඇත්තේ මාධ්‍යවේදී එක්නැලිගොඩ අතුරුදහන්විම සම්බන්ධයෙන් බවත්, සැම විටම ප්‍රශ්න කළේ ගෝඨාභයගේ උපදෙස් මත මේ සියළු දේ කර ඇති

බව ඔවුන් දන්නා බවත්, ඒ බව පිළිගන්නා ලෙසත්, එසේම මාධ්‍යවේදී එක්නැලිගොඩගේ යැයි ෆෝටෝ එකක් පෙන්වා ඔහු හඳුනනවාදැයි කියා ඇසූ බවත්, ඔහුව නොදන්නා බව ප්‍රකාශ කළ විට මේ සම්බන්ධයෙන් සියළු තොරතුරු සොයාගෙන අවසන් බවත්, මේ නිසා පැමිණිලිකරුට කියන්න තියෙන්නේ පැමිණිලිකරු ආපු වාහනේක කොළඹ ඉඳලා ගිරිතලේ කඳවුරට ගිය බවත්, ඊට පහුවදා අක්කරපත්තුවට ගිය බවත්, යන ප්‍රකාශය කර නිදහස්ව යන ලෙසට කියූ බවට ප්‍රකාශ කර සිටී.

ඒ අවස්ථාවේදී උපොප ප්‍රේමතිලක කියා ඇත්තේ දූරකථන දත්ත පෙන්වා "මෙන්න මේ දවස්වල ඔයා කොළඹ ඇවිත් තිබෙනවා ඒ දවස්වල ඔයා අක්කරපත්තුවටත් ගිහිල්ලා තියෙනවා"යැයි පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කළ බවත්, නමුත් සාක්ෂිකරුට පැහැදිලිවම එසේ ප්‍රශ්න කරන්නේ සාක්ෂිකරුගෙන් විස්තර ලබාගැනීමටම බව පසුව තේරුම් ගිය බවටත් ප්‍රකාශ කර සිටි. එසේම සාක්ෂිකරු තව දුරටත් කියා ඇත්තේ එක් දිනක ගමන් වාර්ථාවක් මතකයේ නොමැති බවත්, දීර්ඝ කාල සීමාවක් තුල විශ්ලේෂණ වාර්ථාවක් ඉදිරිපත් කළේ නම් ඒ සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් දිය හැකි බවටත්ය.

පැමිණිලිකරු තව දුරටත් ප්‍රකාශ කර සිටියේ පෙර පරිදිම අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින්ට අවශ්‍ය විදියට අවශ්‍ය ප්‍රකාශ ලබා දෙන ලෙසට කියූ බවටයි. එසේම තව දුරටත් "උඹට කියන්න තියෙන්නේ මේ ඡායාරූපයේ ඉන්න පුද්ගලයා උඹත් එක්ක කොළඹ සිට ගිරිතලේ කඳවුර දක්වා ගිය බවත්, ඒ වගේම පහුවදා අක්කරපත්තුවට ගියා කියන එකත් පමණයි" යැයි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් සාක්ෂිකරුට පැවසූ බවද ප්‍රකාශ කර සිටි. මෙම වාක්‍ය ඛණ්ඩය ප්‍රකාශ කළහොත් නිදහස් කරන බවට නිතර

නිතරම විමර්ශන නිළධාරීන් යෝජනා කළ බවත් ඒ සෑම විටකම එම යෝජනා ප්‍රතික්ෂේප කළ විට එම විමර්ශන නිළධාරීන් තරහක් පෙන්වූ බවත් ප්‍රකාශ කර සිටි. එම අවස්ථාවේදී ඔවුන් මෙම බුද්ධි නිළධාරින් රාජපක්ෂ පවුලේ ඕනෑ එපාකම් ඉටු කරන පාතාල කණ්ඩායමක් ලෙසට ක්‍රියා කර ඇති බැව් පැමිණිලිකරුට පැවසූ බවත් ප්‍රකාශ කර සිටි. ඉන්පසු 2016.02.06 දින රාත්‍රී වන තෙක් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ සිටි බවත්, ඉන්පසුව ප්‍රකාශ සටහන් කරගත් බවත්, එය කියවා අත්සන් කළ බවත්, එහිදී ඇසූ ප්‍රශ්නවලට පැමිණිලිකරු කිසිවක් නොදන්නා බව දක්වා සිටි බවටත් ප්‍රකාශ කර ඇත.

2016.02.07 වන දින හෝමාගම අධිකරණයට B7417/2010 වාර්ථාව යටතේ ඉදිරිපත් කර ඇති අතර, එම B වාර්ථාවේ 3 වන පිටුවේ 5වන ඡේදයේ "මේ අනුව කනිෂ්ක ගුණරත්න සැකකරු, කිසිවකුගේ කීම හා උපදෙස් මත හිතාමතාම ප්‍රකාශයට අදාලව අසන ප්‍රශ්ණවලට පිළිතරු නොදී සියළු ප්‍රශ්ණවලට මට මතක නෑ මතක නෑ" යනුවෙන් කෙටි පිළිතුරු ලබා දෙමින් සත්‍ය කරුණු වසන්කර ඇති බව නිරීක්ෂණය වූ බවට B වාර්ථාවේ දක්වා ඇත.එසේම පැමිණිලිකරු වැඩි දුරටත් දක්වා ඇත්තේ කොළඹ සිට අක්කරපත්තුවට ගොස් ඇති වාර අනන්ත බවත්, නමුත් අවුරුදු 6කට පසු එක් දිනයක් ගැන ප්‍රශ්ණ කර ඇයි කොළඹ ගියේ ඇයි අක්කරපත්තුවට ගියේ ඇසූ විට පිළිතුරු දෙන්න අපහසු බවත් යැයි පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු පවසන අන්දමට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සෑම විටම උත්සාහ ගෙන ගත්තේ ඔවුන් කියන කරුණ සාක්ෂිකරුගේ ප්‍රකාශයක් ලෙසට ඇතුලත් කිරීමටයි. 2016.02.07 වන

දින මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර එදින සිට මාස 08ක කාලයක් බන්ධනාගාරගතව සිටි බවටත්, එසේ බන්ධනාගාරගතව සිටි කාලය තුළදී අවස්ථා දෙකකදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැමිණ සාක්ෂි සටහන් කරගත් බවටත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. එසේම පැමිණිලිකරු ඔහුගේ සාක්ෂියේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ ක්‍රියා කලාපය වූයේ කෙසේ හෝ අවශ්‍ය ප්‍රකාශ ලබාගැනීම බවටත්, ත්‍රස්තවාදී වැළැක්වීමේ පනත උපයෝගී කරගනිමින් වැඩි කාලයක් දෙපාර්තමේන්තුව තුළ තබා ගැනීමටත්, 296 වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරුන්ට ඇප ලබාදීම සඳහා සීමාවන් ඇති බවටත්, එවැනි ක්‍රියා මාර්ග අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් අනුගමනය කළ බැව් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු බන්ධනාගාරගතව සිටියදී ප්‍රකාශ 2ක් ලබාගත් බවත් එසේ ලබාගැනිමට හේතුව ලෙස පැමිණිලිකරු දක්වා සිටින්නේ කායිකව හා මානසිකව වැටි සිටින විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ අවශ්‍යතාවයන් පරිදි ප්‍රකාශ ලබාගැනිමට හැකියාව ඇති බවට යැයි පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු මාස 7ක පමණ කාලයක් රක්ෂිත බන්ධානාගාරගතව සිට ඇති අතර, ඇප ලබා ගෙන ගත්තේ මහේස්ත්‍රාත් අධිකරණයෙනි. පැමිණිලිකරුට අනුව පැමිණිලිකරුව නැවත වරක් සේවයේ පිහිටුවා ඇත්තේ ඇප ලැබි මාස 3කට පසුව බවටත් ප්‍රකාශ කර ඇත.

එසේම පැමිණිලිකරුට විරුද්ධව ත්‍රි පුද්ගල අධිකරණයේ අංක HC/TAB 725/19 යටතේ අධිචෝදනාවක් විභාග වන බවද පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

වැට්දූරටත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ පැමිණිලිකරු බන්ධනාගාරගතව සිටි අවධියේදී ඔහුගේ දරුවෙකු රෝගී තත්ත්වයට පත්ව සිටි බවටය.

පැමිණිලිකරුට මෙම නඩු විභාගය හේතුවෙන් මූල්‍යමය වශයෙන් දැඩි අපහසුතාවයකට මුහුණදීමට සිදු වූ බවත්, එසේම කැකිරාවේ සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සෑම මසකම ඉරිදා දිනට පැමිණිය යුතුව තිබු බවත්, ඊට අමතරව මසකට දෙවරක් අධිකරණයට පෙනී සිටිය යුතුව තිබූ බවත්, ඇප සහ නිතීඥ ගාස්තු ගෙවීමට සිදු වූ බවත්, ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු දක්වන අන්දමට පැමිණිලිකරුට සිදු කර ඇත්තේ දේශපාලන පළිගැනීමක් බවත්, එසේම මාධ්‍යවේදී එක්නැලිගොඩගේ බිරිඳ ජිනිවාවලට ගිහිල්ලා සාක්ෂි දී තිබෙනවා හමුදාව අවසාන මෙහෙයුමේදී LTTE එකට රසායනික අවි පාවිච්චි කළ බව හා එසේම මාධ්‍යවේදී එක්නැලිගොඩගේ බිරිඳ ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ල ඉදිරියේ සාක්ෂි දීමේදී ඇයට රාජ්‍ය නොවන සංවිධාන උදව් කරන බවත්, එසේම ඇය මානව හිමිකම් කවුන්සිලයට ගොස් ලංකාවට විරුද්ධව සාක්ෂි දීම සම්බන්ධයෙන්ද පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

සාක්ෂිකරු ප්‍රකාශ කර සිටින්නේ මෙම අත්අඩංගුවට ගැනිම හේතුවෙන් රැකියාවෙන් ලැබීමට තිබුණු උසස්වීම් සහ තනතුරු නැතිවූ බවත්, පාඨමාලා හැදෑරීම නැතිවූ බවත්, මූල්‍යමය වශයෙන් හානි සිදුවූ බවත්, එසේම මිලියන 15ක වන්දියක්ද බලාපොරොත්තු වන බවත් දක්වා සිටී. වගඋත්තරකරුවන් ලෙසට සාක්ෂිකරු දක්වා ඇත්තේ

මෙහි ශානි අබේසේකර, නිශාන්ත සිල්වා, උපොප ප්‍රේමතිලක සහ සාජන් මෙන්ඩිස් වේ.
ඉහත කරුණු සනාථ කිරීම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 9 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර අයියසාමි බාලසුබ්‍රමනියම් (පැ.අ 199/2020) 2020.09.05 දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් අතර, 1999.05.07 දින ශ්‍රී ලංකා යුධ හමුදාවට ආධුනික සෙබළෙක් ලෙස බැඳී පාඨමාලා හදාරා පළමු සන්නද්ධ බළකා වව්නියාව ප්‍රදේශයේ රාජකාරී කර පැමිණිලිකරුගේ සේවා කාලය තුළදී රණශූර පදක්කම සහ ජනාධිපති පදක්කම් තුනක් ලබා ඇති බවත්, ඔහු වව්නියාව, ගිරිතලේ සහ කොළඹ අවට ප්‍රදේශවල බුද්ධි රාජකාරි කළ බවත් ප්‍රකාශ කර සිටියි. වැඩි දුරටත් පැමිණිලිකරු 2006 වනතුරු වව්නියා ප්‍රදේශයේ රාජකාරි කර 2006 සිට කොළඹ 1වෙනි බුද්ධි සන්නද්ධ බලකායට අනුයුක්තව බුද්ධි රාජකාරී කළ බවත්, 2008 වර්ෂයේ සිට 3වෙනි සන්නද්ධ බුද්ධි බළකායේ ගිරිතලේ කඳවුරේ 2013 දක්වා රාජකාරි කළ බවත්, ඉන්පසු 2013 වර්ෂයේ 6වෙනි සන්නද්ධ බුද්ධි බලකායේ රාජකාරී කළ බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු 2016 වසරේ පෙබරවාරි මසදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූ අතර, ශානි අබේසේකර, නිශාන්ත සිල්වා, SI ප්‍රේමතිලක, සාජන් මෙන්ඩිස් විසින් පැමිණිලිකරුව කැඳවූ කාරණය ලෙස මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන ගොස් මරාදැමූ සිද්ධියට කටඋත්තරයක් ගැනීම යැයි කියූ බවත් පැමිණිලිකරුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුගේ ප්‍රකාශය සටහන් කළේ SIප්‍රේමතිලක සහ සැරයන් මෙන්ඩිස් බවත්, මාධ්‍යවේදී එක්නැලිගොඩගේ මරණය සම්බන්ධයෙන් කණ්ඩායමක් අත්අඩංගුවට ගෙන ඇති බවත්, එම නිසා ගැලවීමට ඇති එකම මාර්ගය ඇත්ත කීම යැයිද කියූ බවත්, “උඹලාට කරන්න කියපු අය කව්ද කියපු අය දන්නවා. මහින්ද මහත්තයයි ගෝඨාභය මහත්තයයි කරන්න කිව්වා කියලා අපි හොඳටම දන්නවා” යැයිද ඒ නිසා මෙතනින් ඇත්ත කියලා යන ලෙසත් කියූ බවට පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටියේ පැමිණිලිකරුගෙන් ප්‍රකාශය ලබාගත් පසු 2016.02.18 වෙනි දින එනම් අත්අඩංගුවට ගත් දින හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත් ප්‍රකාශ කර සිටී.

බන්ධනාගාරයේ සිටියදීත් පැමිණිලිකරුගෙන් ප්‍රකාශ ලබාගත් බවත්, එම ප්‍රකාශ පැමිණිලිකරුට කියවා තේරුම් කර නොදුන් බවත්, නමුත් අත්සන ලබාගත් බවත්, පැමිණිලිකරුට කොළඹ මහාධිකරණ ත්‍රිපුද්ගල අධිකරණයේ නඩුවක් පවරා ඇති බවත් පැමිණිලිකරු එහි 7වෙනි විත්තිකරු බවත් ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු 2020.09.18 වෙනි දින සාක්ෂි දෙමින් පැමිණිලිකරුගේ විවාහ ජීවිතයට ඇති වූ ප්‍රශ්නයක් සම්බන්ධයෙන්ද සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. එනම්, විවාහය වන විට එම විවාහ වූ තරුණියට පැමිණිලිකරු හමුදාවේ බුද්ධි අංශයේ නිළධාරියෙක් බව නොකී බවත්, අත්අඩංගුවට ගත් පසු මාධ්‍යවල පැමිණිලිකරුගේ ඡායාරූප හා ඒ පිළිබඳ විස්තර පළවූවාට පසු ඔහුට ගමේ ජීවත්වීමට නොහැකි තත්ත්වයක් ඇතිවූ බවත් ඔහුට දරුවන් තිදෙනෙක් සිටින බවත්,

ඔහුගේ පවුල් ජීවිතය මේ නිසා දෙදරා කඩාකප්පල් වී ගිය බවත් ප්‍රකාශ කර ඇත.

එසේ බන්ධනාගාර කළ අවස්ථාවේදී ප්‍රබෝධ සිරිවර්ධන, ප්‍රියන්ත කුමාර රාජපක්ෂ, උපසේන, කනිෂ්ක ගුණරත්න, තරංග ප්‍රසාද් ගමගේ, කැප්ටන් චමින්ද අබේරත්න යන අයවළුන්ද බන්ධනාගාරයේ සිටි බැව්ද, මාස 6ක් පමණ බන්ධනාගාර ගතව සිට මහාධිකරණයෙන් ඇප ලැබුණු බවත්, පැමිණිලිකරු බන්ධනාගාරව සිටි අවස්ථාවේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය ලබාගත් බවත්, පැමිණිලිකරුගේ රත්තරං බඩු උකස් කළ බවත්, බන්ධනාගාර ගතව සිටි කාලයේදී ඔහුට වැටුප් නොලැබුණු බවත්, එසේ බන්ධනාගාර ගතව සිටි නිසා පවුලේ අර්බුද ඇති වූ බවත්, පැමිණිලිකරු බුද්ධි අංශයේ රාජකාරී කළ නිසා යාපනයේ ගොස් ජීවත් විය හැකි සුදුසු වාතාවරණයක් නොතිබූ බවත්, ඔහුට ආරක්ෂාව ලැබිය යුතුව තිබූ බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. මොහුට කොළඹ ත්‍රිපුද්ගල අධිකරණයේ මෙන්ම හෝමාගම මහාධිකරණයට චෝදනා පත් ඉදිරිපත් කර ඇති බැව්ද ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 4 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර දංගහ ගමරාලලාගේ ප්‍රසාද් ගමගේ (195/2020) 2020.08.27 වෙනි දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් පැමිණිලිකරු 2004.07.21 වෙනි දින ආධුනික සෙබළෙක් වශයෙන් බැඳී යුධ හමුදාවේ පළවන සන්නද්ධ බුද්ධි බලකායට අනුයුක්තව කොළඹ ප්‍රදේශයේ රාජකාරි කළ බවත්, පසුව ගිරිතලේ කඳවුරට අනුයුක්තව රාජකාරි කළ බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එන ලෙසට 2016.02.18 දින කැඳවීමක් ලැබී එදින උදේ එහි ගිය බවත්, පළමුවෙන්ම අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා හමු වූ බවත්, පසුව ප්‍රශ්න කර විමර්ශනය සඳහා SI ප්‍රේමතිලක හා සැරයන් මෙන්ඩිස්ට නියෝග කළ බවත් එවිට මේ නිළධාරීන් දෙදෙනා සාක්ෂිකරුට "අපිට හොයාගන්න දෙයක් නැහැ. අපි ඔක්කොම හොයාගෙන තියෙන්නෙ. ඒ හින්දා කරපු දේවල් කියලා නිකන් අමාරුවේ වැටෙන්නෙ නැතිව ගෙදර යන්න" කියූ බවත් ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කරන අවස්ථාවේදී ඡායාරූපයක් පෙන්වා "මේ ඉන්නේ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ තමයි උඹලා හොරෙන් අරන් ගිහිල්ලා මරලා තියෙන්නේ කියා" පැමිණිලිකරුට කියූ බව සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී.

එසේම පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු තුන්වෙනි සන්නද්ධ බළකායේ රියදුරෙකු වශයෙන් රාජකාරි කළ බවත්, පැමිණිලිකරුගේ නමට තිබූ ප්‍රවාහන ගමන් බලපත්‍රය පෙන්වා එය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කියනු ලබන එම දිනයේදී පැමිණිලිකරු විසින් ධාවනය කර ඇති බවත්, එම ලේඛනයේ සටහන්ව ඇති යුහ47997 අංක දරණ වාහනය ධාවනය කර ඇත්තේ පැමිණිලිකරු බවත්, තවදුරටත් 2010.01.24 වෙනි දින කොළඹට පැමිණ මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන ගියේ මෙම රථයෙන් බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කියූ බවට පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු එසේ කොළඹ පැමිණියේ නැති බව අවධාරණයෙන්ම ප්‍රකාශ කර ඇත. මෙම ලේඛනය සාක්ෂි දීමේදී "P2" ලෙස සටහන්

කර ඇති අතර, එම වාහනය තුන්වෙනි සන්නද්ධ බළකායට අයත් බව ප්‍රකාශ කර ඇත. 2010.01.24 වෙනි දින එම වාහනය මින්නේරිය හා මඩකලපුව ප්‍රදේශයේ කිහිප වතාවක්ම ගොස් ඇති බවටත්, SI ප්‍රේමතිලක සහ සැරයන් මෙන්ඩිස් මෙම වාහනය කොළඹ බලා ධාවනය වූ බවටත් කියමින්, සටහන් නොමැති වුවද පිළිගන්නා ලෙස පැමිණිලිකරුට කියා ඇති අතර, පැහැදිලිවම පැමිණිලිකරු එය ප්‍රතික්ෂේප කළ බව ප්‍රකාශ කර ඇත. දිගින් දිගට කොළඹට ධාවනය කළ බව පිළිගන්නා ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් බල කරමින් කියා ඇති අතර, පිළිගන්නේ නැත්නම් පැමිණිලිකරුට එල්ලුම්ගස් යන්න වෙන බවද කියූ බවට පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු විසින් කරන ලද රාජකාරි සම්බන්ධයෙන් ගැඹුරින් ප්‍රශ්න කර ඇති අතර, 2016.02.18 වෙනි දින රාත්‍රී 9.00ට පමණ ඔහු අත්අඩංගුවට ගත් බවත්, 2016.02.19 දින B7417/2010 නඩු අංකය යටතේ අධිකරණයට ඉදිරිපත් කළ බවත් අධිකරණයට ඉදිරිපත් කළ පසු ප්‍රකාශ ලබා ගැනීමට බන්ධනාගාරයට කිහිප විටකදීම පැමිණි බවත්, එම අවස්ථාවේදී 2010.01.25 වෙනි දින අතුරුදහන් වූ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ සමග අක්කරපත්තු ප්‍රදේශයට ගිය බවට ප්‍රකාශ කරන ලෙසටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් යෝජනා කළ බවත්, එසේ ප්‍රකාශ කර රජයේ සාක්ෂිකාරයෙක් වීමට හැකියාව ඇති බවටත්, ඉන්පසු නිදහස් වී යෑමට හැකි බවටත් යෝජනා කළ බවට ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු හෝමාගම මහේස්ත්‍රාත් උසාවියෙන් ඇප ඉල්ලා සිටියද, ඇප නොලද බවත්, පසුව 2016.09.22 වෙනි දින හෝමාගම මහාධිකරණයෙන් ඇප ලැබුණු බවත් ඉන්පසු 2016.12.24 වෙනි දින

සිට රැකියාව නැවත ලද බවත්, පසුව පැමිණිලිකරුට දුරකථන ඇමතුමක් ලැබී හමුදාපති මහේෂ් ඒකනායක හමුවූ බවත් හමුදාපති විසින් පැමිණිලිකරුට රජයේ සාක්ෂිකරුවෙක් වීමට යෝජනා කළ බවත්, පැමිණිලිකරු එයට අකමැත්ත ප්‍රකාශ කළ බවත් පැමිණිලිකරුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. නීතිපති කාර්යාලයේ නියෝජිත සොලිසිටර් ජෙනරාල් රොහන්ත අබේසූරියගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියේ 2010.01.24 වෙනි දින කිලෝමීටර් 256 ක් ධාවනය වී ඇති බවත්, උදේ මින්නේරියට ගොස් පැමිණි අතර, ඉන්පසුව පැය 9.10 සිට පැය 18.25 දක්වා කිලෝමීටර් 240ක් ධාවනය කර ඇති බවත්, සම්පූර්ණ ධාවනය වූ ප්‍රමාණය කිලෝමීටර් 256ක් බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු තවදුරටත් දක්වා සිටියේ තුන්වෙනි සන්නද්ධ බුද්ධි බළකායට අයත් වන්නේ පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික්ක හතරට අයත් ප්‍රදේශ බවත්, එම ප්‍රදේශවලට යාමට කිසිදු අනුමැතියක් නොමැතිව ධාවනය කළ හැකි බවත්, අනෙක් ප්‍රදේශවල කිලෝමීටර් 40ට වඩා වැඩි වුවහොත් ඒ සඳහා අනිවාර්යයෙන්ම බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුව ඇති බවත්, මෙවැනි අනුමැතියක් අවශ්‍ය වන්නේ යුධ හමුදා පොලිස් බළකායේ නිළධාරීන් නිතරම හමුදා වාහන පරීක්ෂා කරන බැවින් යැයිද, අනුමැතියක් නොමැතිව ධාවනය කර තිබුණහොත් එය දඩුවම් ලැබිය හැකි වරදක් වන බවද, ප්‍රකාශ කර ඇත. එසේම ඔහුගේ දුරකථනය කොළඹ ප්‍රදේශයේ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් සාක්ෂිකරු පැහැදිලි පිළිතුරක් දීමට ඒ සම්බන්ධයෙන් මතකයක්ද නැති බැව් ප්‍රකාශ කර ඇත.

ඉහත කරුණු සනාථ කිරීම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 5 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර තෙල්ගේ එරන්ද රදීෂ් පීරිස් (104/2020) 2020.08.26 වෙනි දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් ලුතිනන් කර්නල් ටී.ඊ.ආර්. පීරිස් 1995.08.25 වෙනි දින කැඩෙට් නිළධාරියෙක් ලෙස දියතලාව යුධ හමුදා විද්‍යාපීඨයේ මූලික පුහුණුව ලැබ ඉන්පසු දෙවෙනි ගජබා රෙජිමේන්තුවට අනුයුක්තව රාජකාරී කර 1998.10.28 වෙනි දින අලුතින් ආරම්භ කරන ලද දෙවෙනි සන්නද්ධ හමුදා බුද්ධි බළකායට අනුයුක්තව, යාපනයේ රාජකාරී කර පසුව 2002.02.23 වෙනි දින ස්ථාන මාරුවක් ලැබ 232 බලසේනාවේ බුද්ධි නිළධාරී වශයෙන් රාජකාරී කළ බවද සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී.

මෙම පැමිණිලිකරුගේ රාජකාරී කටයුතු ශක්තිමත් කරගැනීමට මූලික බුද්ධි පාඨමාලාව, ඒකක ගිණුම්කරණ පාඨමාලාව, තරුණ නිළධාරී පාඨමාලාව සහ 2004දී මූලික බුද්ධි පාඨමාලාවද පකිස්ථානයේ මාස 2½ක පාඨමාලාවක්ද හදාරා, ඉන් පැමිණිලිකරුගේ රාජකාරී අංශයට සම්බන්ධ බුද්ධිමය දැනුම වර්ධනය කරගත් බවත් ප්‍රකාශ කර සිටී.

2009 අගෝස්තු මස මැද භාගයේදී ගිරිතලේ 3වෙනි බුද්ධි බළකා මූලස්ථානයේ සමූහ නායක පාඨමාලා භාර ප්‍රධාන නිළධාරීයා ලෙස රාජකාරී කළ බැව් පැමිණිලිකරුගේ සාක්ෂියේදී වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු ඉතා දක්ෂ ලෙස බුද්ධි රාජකාරිවල යෙදී ඇති අතර, ඔහුගේ බුද්ධි තොරතුරු නිසා සුළු යාන්ත්‍රික අවි 100ට වඩා විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන ඇති බවත්, LTTE සංවිධානය විසින් රැගෙන එන ලද ප්‍රථම ගුවන් යානා නාශක මිසයිලය පැමිණිලිකරු

විසින් සොයා ගත් බවටත් පැමිණිලිකරුගේ සාක්ෂියෙන් හෙළිදරව් කර ඇත.

2011 වර්ෂයේදී පැමිණිලිකරුගේ කාර්යක්ෂමතාවය නිසා ආරක්ෂක අමාත්‍යාංශයේ ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිළධාරී ලෙස පත්ව 2012 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී පමණ LTTE සංවිධානයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළ කුමරන් පත්මනාදන් කොළඹ සිට කිලිනොච්චියට ගෙන ගොස් කිලිනොච්චියේදී කුමරන් පත්මනාදන් සම්බන්ධ බුද්ධි ආරක්ෂක කටයුතු මෙහෙය වූ බවද සාක්ෂියේදී පෙන්වා දුන් අතර, වැඩි දුරටත් ද්‍රවිඩ භාෂාව මනා ලෙස හැසිරවීමේ දක්ෂතාවයෙන් යුත් බවත්, එසේම චීනයේ විදේශීය භාෂා විශ්ව විද්‍යාලයේ චීන භාෂාව වසරක කාලයක් හදාරා චීන භාෂාවද ප්‍රගුණ කළ බවත් පැමිණිලිකරුගේ සාක්ෂියෙන් අනාවරණය වී ඇත. පැමිණිලිකරුගේ සාර්ථකත්වය ඔහුට ලැබී ඇති පදක්කම්වලින් අවබෝධ කර ගත හැකි වන අතර, රණවික්‍රම,රණශූර, රිවිරැස, උතුරු මානුෂීය මෙහෙයුම්, නැගෙනහිර මානුෂීය මෙහෙයුම්, ස්වර්ණ ජයන්ති හා යුධ හමුදා 50වෙන සංවත්සර පදක්කම් සහ පූර්ණභූමි හා දීර්ඝ සේවා යන පදක්කම් සියල්ලටම හිමිකම් ඇති බව සාක්ෂියේදී වැඩි දුරටත් අනාවරණය කර ඇත.

2016.09.17 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී පෙනී සිටීමට පැමිණිලිකරුට දන්වා තිබු හෙයින්, එහිදී SI ප්‍රේමතිලක, සැරයන් උඩවත්ත සහ සැරයන් මෙන්ඩිස් යන නිළධාරීන්ට පැමිණිලිකරුව යොමු කළ බවත්, එහිදී පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කළේ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් වීම සම්බන්ධයෙන් බවත්, ප්‍රකාශයක් සටහන් කර ගැනීමට අවශ්‍ය බව එම නිළධාරීන් කියූ බවත් සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී.

තවද, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැමිණිලිකරුට කියා ඇත්තේ දැනටමත් නවදෙනෙකු රක්ෂිත බන්ධනාගාරගත කර ඇති බවත්, මෙම කාරණය වසන් කිරීමට අවශ්‍ය නොමැති බවයි. තවද මෙම පැහැරගැනීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැමිණිලිකරුට කියා ඇත්තේ මෙම පැහැර ගැනීම ඉහළ තැනක හිටපු ආරක්ෂක ලේකම්ගේ උපදෙස් මත සිදුවුණු බවත්, මේ නිසා අන් අය බේරීමට උත්සාහ නොගෙන එලෙස ප්‍රකාශ කරන ලෙසට තර්ජනාත්මකව පොලිස් සැරයන් මෙන්ඩිස් පැමිණිලිකරුට දැනුම් දුන් බැව් පැමිණිලිකරුගේ සාක්ෂියේ 15වන පිටුවේ 1වෙනි ඡේදයේ පැහැදිලිව දක්වා ඇත.

පැමිණිලිකරුව ප්‍රශ්න කිරීමේදී මානසික වශයෙන් පීඩනයක් ගෙන දෙන තර්ජනාත්මකව කිහිප අවස්ථාවක්ම ප්‍රශ්න කල බවත්, අසභ්‍ය වචන කියමින් SI ප්‍රේමතිලක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන ප්‍රකාශ ලබාගැනීමට දැඩි ප්‍රයත්නයක් දැරූ බවත්, එසේ ප්‍රකාශ නොදෙන්නේ නම් පවුලේ සියළු සාමාජිකයින් ගෙන්වා ප්‍රශ්න කරන බව කියමින් තර්ජනය කළ බවට ප්‍රකාශ කර සිටී.

එසේම පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු විසින් භාවිතා කළ බව දක්වන දුරකථනයක් සම්බන්ධයෙන් දැඩි ලෙස ගැඹුරින් ප්‍රශ්න කර ඇති අතර, සත්‍ය වශයෙන්ම පැමිණිලිකරු රාජකාරීමය දුරකථනයක් භාවිතා නොකළ බවත්, පැමිණිලිකරු භාවිතා කලේ බුද්ධිමය රාජකාරී සඳහා පොදුවේ භාවිතා කළ දුරකථනයක් බව ඉතා අවධාරනයෙන්ම ප්‍රකාශ කළද, එම නිළධාරීන් පැමිණිලිකරුගේ පිළිතුර පිළිගැනීමට දැඩි අකමැත්තක් දැක්වූ බවත්, එම දුරකථන අංකය පැමිණිලිකරු විසින් භාවිතා කළ බව ඔහු ලවා ප්‍රකාශ කරවා ගැනීමට අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දැඩි උත්සාහයක් ගත් බැව් පැමිණිලිකරුගේ සාක්ෂියෙන් මනාව පැහැදිලි වේ.

එසේම මෙම පැමිණිලිකරු 2010.01.24 කාල සීමාවේදී කුමන රාජකාරියේ යෙදුනේද යන්න සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, පැමිණිලිකරු 2010.01.20 වෙනි දින සිට 2010.01.26 වෙනි දින තෙක් දින 6ක් නිවාඩු ලබාගෙන නව නිවසක් ඉදිකර ගෙට ගෙවදීමේ චාරිත්‍ර වෙනුවෙන් නිවාඩු ලබා සිටි බවත්, ජනාධිපතිවරණය තිබූ බැවින් 2010.01.25 වෙනි දින නැවත සේවයට වාර්තා කළ බවත් ප්‍රකාශ කළද එම සත්‍ය තත්ත්වය අපරාධ විමර්ශනයේ යෙදුනු නිළධාරීන් පිළිනොගත් බව පැමිණිලිකරුට වැටහී ගිය බවටත් ප්‍රකාශ කර ඇත. වැඩිදුරටත් මේ බව සනාථ කිරීමට පැමිණිලිකරුගේ බිරිඳගෙන් සහ පැමිණිලිකරුගේ සොහොයුරාගෙන් සහ උත්සවයට සහභාගී වූ සෙබළුන් දෙදෙනෙකුගෙන්ද ප්‍රකාශ ලබාගෙන තිබියදීත් පැමිණිලිකරුට චෝදනා එල්ල කර ඇති බවත්, මෙම චෝදනා පදනම් විරහිත චෝදනාවන් බවත් ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 2016.09.17 වෙනි දින පළමු වරට කැඳවා ප්‍රශ්න කර, සවස 6.30ට පමණ නිදහස් කළ බවටත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුට අනුව ඉන් මසකට පමණ පසු SI ප්‍රේමතිලක, සැරයන් මෙන්ඩිස් සහ උඩවත්ත යන තිදෙනා පැමිණිලිකරුගේ බිරිඳ සේවය කළ රිකිල්ලගස්කඩ මූලික රෝහලට ගොස් එම රෝහලේ අධ්‍යක්ෂට මිනීමැරුමක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට ඔහු ආ බව කියා බිරිඳව වෙනමම ස්ථානයකට ගෙන ගොස් ප්‍රශ්න කර ඇති බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුව විසින් ගොතා නිර්මාණය කරන ලැබූ විස්තරය බිරිඳ මාර්ගයෙන් පැමිණිලිකරුට කියවා, බලපෑමක් කර ප්‍රකාශ කරවාගැනිමට උත්සාහ ගත් බව සාක්ෂියේදී ප්‍රකාශ කර ඇති අතර, 2017 ජනවාරි මස දිනක නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූ බවත්, එදින ගිරිතලේ සේවය කළ කෝප්‍රල් අනුර ජයලත්ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කැඳවීම මත පැමිණ සිටි බවත්, මෙදිනද විමර්ශන නිළධාරී පළමු වතාවේ මෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන නිර්මාණය කරන ලද ප්‍රකාශය ලබා ගැනීමට උත්සාහ කළ බවත්,එදින සවස 6.30ට පමණ ප්‍රශ්න කිරීම අවසන් කර ඔහුව නිදහස් කළ බවත් සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී.

නැවත වරක් 2017.02.22 වෙනි දින පැමිණිලිකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් ලැබුණු බවත්, එදින බිරිඳටත් වැඩිමහල් සොහොයුරාට සහ 2වෙනි සොහොයුරාටද කැඳවීම කර තිබුණු බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින අතර, පෙර මෙන්ම නැවතත් බලපෑම් කර අවශ්‍ය කරන ප්‍රකාශය ලබාගැනීමට උත්සාහ කළ බැව්ද ප්‍රකාශ කර සිටී. නැවතත් 2018.08.03 දින 4වෙනි වරට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කර 12.30ට පමණ නිදහස් කළ බැව් ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමේ බලපෑමක් සම්බන්ධයෙන් පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම පිළිබඳව අරලිය ගහ මන්දිරයේදී සාකච්ජා වට තුනක් පැවති බවට පැමිණිලිකරුව ප්‍රකාශ කර සිටී. පැමිණිලිකරුට ලැබුණු තොරතුරුවලට අනුව මෙම සාකච්ඡාවට හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ, රාජිත සේනාරත්න, මංගල සමරවීර, හිටපු හමුදාපති මහේෂ් සේනානායක සහ තවත් කිහිප දෙනෙකු

සහභාගි වූ බවත් එසේම මෙම සාකච්ඡාවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂව සිටි ශානි අබේසේකරද සහභාගිව සිටි බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

2018.09.20 වෙනි දින (5)පස්වෙනි වරට නැවතත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමක් ලැබ එහි ගිය විට පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් බවත්, ඉන්පසු 2018.09.22 වෙනි දින අධිකරණයට ඉදිරිපත් කළ බවත්, ඔහුට විරුද්ධව 296 වගන්තිය යටතේ චෝදනාවක් ගොනු කර තිබූ නිසා ඇප ලබා ගැනීමට නොහැකි වූ බවත්, පසුව 2019.03.14 වෙනි දින හෝමාගම මහාධිකරණයේ ඇප ලබා දුන් බවත් ප්‍රකාශ කර සිටි. මේ අනුව සාක්ෂිකරු මාස 5යි දින 22ක් රක්ෂිත බන්ධනාගාර ගතව සිටි බවද ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු සාක්ෂි දෙන විටදී මෙම විමර්ශනවලට දේශපාලනික බලපෑමක් ක්‍රියාත්මක වූ බව පැහැදිලිවම දක්නට තිබූ බවද ඊට සාක්ෂි වශයෙන් පැමිණිලිකරු දක්වා ඇත්තේ අරලියගහ මන්දිරයේදී සිදු කර ඇති සාකච්ඡාව හා ඉන්පසු ඔහු අත්අඩංගුවට පත්වීමයි. එසේම මාධ්‍ය සාකච්ඡාවලින් සමාජ මාධ්‍ය ජාලාවන්හි ප්‍රචාරය කළ කරුණු අනුව පැහැදිලිවම දේශපාලන පළිගැනීම් හා දේශපාලන මැදිහත් වීම් තිබූ බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි. එසේම හෝමාගම අධිකරණ කටයුතු අවසන් කළ පසු පැමිණිලිකරු සමග (9)නවදෙනෙකුට විරුද්ධව කොළඹ විශේෂ ත්‍රි පුද්ගල මහාධිකරණයේ අංක HC/TAB/725/2019 යටතේ නඩු පවරා ඇති බවත්, එම නඩුව දැනට විභාග වෙමින් පවතින බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 12 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර හේනාධීර ආරච්චිගේ හේමචන්ද්‍ර පෙරේරා (239/2020) 2020.10.09 දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමට පැමිණ පහත සඳහන් සාක්ෂි ලබාදෙන ලදි. මෙම පැමිණිලිකරු 1995.08.07 වෙනි දින ආධුනික සෙබළෙකු වශයෙන් යුධ හමුදාවට බැඳී කමාන්ඩෝ රෙජිමේන්තුවෙන් පුහුණුව ලැබුවාට පසුව 2වන සන්නද්ධ බුද්ධි බලකායට 1998.05.15 වෙනි දින රාජකාරි සඳහා වාර්තා කරනු ලැබූ බවත්, 2000 වර්ෂයේ දී පමණ පැමිණිලිකරු රිවි කිරණ මෙහෙයුමේ යෙදී සිටින විට කාලතුවක්කු ප්‍රහාරයකට ලක් වූ බවත්, ඉන් තුවාල සිදුව එම තුවාල සුව වූ පසුව 2වෙනි බුද්ධි බලකා ඒකකයට අනුයුක්ත වී 2005 දක්වා රාජකාරී කළ බවත්, 2005 සිට 2016 දක්වා කොළඹ බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයට අනුයුක්තව මරදානේ පිහිටි ත්‍රිපෝලි කඳවුරේ රාජකාරි කළ බව ප්‍රකාශ කර සිටියි.

2017.02.17 වෙනි දින පැමිණිලිකරුටත්, මේජර් බුලත්වත්ත සහ සැරයන් වීරරත්නට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙස කැඳවීමක් ලැබුණු බවද, ඒ අනුව තුන්දෙනාම එහි ගිය විට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා කථා කොට පසුව සහකාර පොලිස් අධිකාරි තිසේරාට ඉදිරිපත් කළ බවත්, තිසේරා පැමිණිලිකරු විසින් මාධ්‍යවේදී කීත්නෝයර් පැහැරගෙන යාම සම්බන්ධයෙන් දන්නා බව කියූ බවත්, එවිට පැමිණිලිකරු එය ප්‍රතික්ෂේප කළ බවත් ප්‍රකාශ කර සිටියි. එම අවස්ථාවේදී පැමිණිලිකරුට කඳවුරෙන් නිකුත් කර ඇති දුරකථන අංකයෙන් කඳවුරේ අනෙක් රාජකාරි දුරකථන අංක සමග දුරකතන සම්බන්ධතා පවත්වා ඇති බවත්, ඒ නිසා පැහැර ගැනීම පැමිණිලිකරු විසින් සිදුකළ බව ඔප්පු කිරීමට හැකියාවක් තිබෙන බවට තිසේරා කියූ බැව් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. එවිට පැමිණිලිකරු විසින් එවැනි දුරකථන ඇමතුම් මගින් කඳවුරේ අය සමග

සම්බන්ධ වීමට හැකියාවක් ඇති බව දැක්වූ විට තිසේරා කියා සිටියේ පැමිණිලිකරුට වෙන්වූ රාජකාරි දූරකථනයක් කඳවුරේ තිබෙන බව කියා ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, පැමිණිලිකරු වෙනුවෙන් වෙන් කරන ලද දූරකථනයක් පැමිණිලිකරුට නොමැති බවට පිළිතුරු ලෙස පැවසූ බව සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී. එම අවස්ථාවේදී තිසේරා කියා ඇත්තේ "කලු ගලේ ඔළුව ගහගන්න එපා" යනුවෙන් කියා ඔයිට වඩා ලොකු මිනිහෙක් වෙන පොලිසියේ වාස් ගුණවර්ධන මහත්තයත් ඇතුලට ඇරියනම් තමුසේ ඇතුලට අරින එක මහලොකු දෙයක් නොවන බවත්, මේජර් ජෙනරාල් හෙන්ඩර් විතාරණ, බුද්ධි අධ්‍යක්ෂ අමල් කරුණාසේකර ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ අනුදැනුම මත මාධ්‍යවේදී කීත්නොයාර් පැහැරගෙන ගොස් පහරදුන් බවටත්" ප්‍රකාශයක් ලබා දී රජයේ සාක්ෂිකරුවෙකු වෙන ලෙසට (කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට කළ ප්‍රකාශය සටහන් පත්‍ර අංක 1332) පැමිණිලිකරුට යෝජනා කළ බවත්, පැමිණිලිකරු එය ප්‍රතික්ෂේප කළ බවත්, පසුව පැමිණිලිකරුව ප්‍රශ්න කලේ තුෂාර, කන්නන්ගර සිල්වා යන නිළධාරීන් බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. එහිදී දූරකථන අංක කිහිපයක් පෙන්වා පැමිණිලිකරු භාවිතා කරන දූරකථන අංකය හඳුනාගන්නා ලෙස කියූ අතර, තවත් දූරකතන අංක කිහිපයක් පෙන්වා ඉන් එක් දූරකථන අංකයක් මේජර් බුලත්වත්තගේ බවට හඳුනාගන්නා ලෙසත් කියා ඉන් ටික වේලාවකට පසු පැමිණිලිකරුව සහ අනෙක් දෙදෙනාව අත්අඩංගුවට ගන්නා බව කියූ බවත් සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී. මේ අවස්ථාවේදී "රුවන් පෙතියාගොඩ යන අය පැමිණ, ගෝඨාභය රාජපක්ෂගේ අනුදැනුම මත කීත්නොයාර් පැහැරගෙන ඇති බවට කියා රජයේ සාක්ෂිකාරයෙකු වෙලා බේරෙන ලෙසත් ලංකාවෙන් පිට පදිංචියට

යන්න ඕනනම්, ඒ සඳහා අවශ්‍ය කටයුතු කළ හැකි බව'' ඔහු දැක්වූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. පසු දින උදේ නැවතත් පැමිණිලිකරුට කථා කොට කීත්නොයාර් පැහැර ගැනීම සිදු කළ බවට පාපොච්චාරණයක් කරන ලෙසට කියූ බවද සාක්ෂියේදී ප්‍රකාශ කරයි. ඉන්පසු පසුදින උදේ මුහුණ ආවරණය කොට රථයක නංවාගෙන වේගයෙන් ගිය නමුත් මගට ගොස් ආපසු ආ බවත්, ඉන්පසු නැවත ප්‍රකාශ සටහන් කර, 2017.02.18 දින රාත්‍රි 7.00ට පමණ ගල්කිස්ස මහේස්ත්‍රාත්තුමාගේ නිළ නිවසට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කළ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. ඒ අවස්ථාවේදී ''කීත්නොයාර් නඩුවේ 1වෙනි සැකකරු මේජර් බුලත්වත්ත, 2වෙනි සැකකරු ලෙස හේමචන්ද්‍ර පෙරේරා නැතහොත් මෙම පැමිණිලිකරු, 3වෙනි සැකකරු සැරයන් වීරරත්න, 4වෙනි සැකකරු බලලත් නිලධාරී විමලවීර, 5වෙනි සැකකරු කෝප්‍රල් ජයතිලක, 6වෙනි සැකකරු කෝප්‍රල් නිශාන්ත කුමාර යන නම් සඳහන්ව තිබූ බැව් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. නැවත වරක් මුහුණු ආවරණය කර කිහිප වතාවක්ම ගල්කිස්ස උසාවියට ඉදිරිපත් කළද, කීත්නොයාර් නොපැමිණීම නිසා කල්දැමූ බවත්, 2017.03.30 වෙනි දින ගල්කිස්ස උසාවියෙන් ඇප දුන්නද 2017.04.07 වෙනි දින ගම්පහ උසාවියේ නඩුවක් ඇති බවට දැනුම් දුන් නිසා නැවත වරක් රක්ෂිත බන්ධනාගාරගත කළ බවත්, ඉන්පසු 2017.04.07 වෙනි දින ගම්පහ අධිකරණයට මාධ්‍යවේදී උපාලි තෙන්නකෝන්ට පහරදීම සම්බන්ධයෙන් පෙරෙට්ටුවක් සඳහා ඉදිරිපත් කළද පැමිණිලිකරුව හඳුනානොගත් නිසා ගම්පහ අධිකරණයෙන් ඇප ලැබුණු නමුත් නැවත වරක් ගල්කිස්ස උසාවියේ නඩුවක් පවතින බවට දන්වා නැවත රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙසට ඉල්ලා සිටි බවද පැමිණිලිකරු

ප්‍රකාශ කර සිටියි. මහර බන්ධනාගාරයේ සිටින විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැමිණ පැමිණිලිකරුගේ සහ සාජන් වීරරත්නගේ ප්‍රකාශ සටහන් කරගත් බවත්, පසුව ඉතිරි 4දෙනාගේ ප්‍රකාශ සටහන් කළ බවත්, පසුව හඳුනාගැනීමේ පෙරෙට්ටුවකට අලුත්කඩේ අධිකරණයට ඉදිරිපත් කළ බවත්, පැමිණිලිකරුත්, සාජන් වීරරත්නත්, ඔහුගේ මල්ලීත්, නාමල් පෙරේරා විසින් හඳුනාගත් බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. මෙම නඩුවේදී පැමිණිලිකරු හා වීරරත්න හැරුණු විට අනෙක් අයට ඇප ලැබුණු බව දක්වා ඇත. එසේම පැමිණිලිකරුට 2017.06.21 වෙනි දින ඇප ලැබුණු බව දක්වා ඇත. මේ සම්බන්ධයෙන් 2017.02.20 වෙනි දින පැමිණිලිකරුගේ බිරිඳත් මවත් බණ්ඩාරගම පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කිරිමට ගිය බවත්, එම පැමිණිල්ල භාර නොගත් බවත් ප්‍රකාශ කර සිටියි. 2018.02.05 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කැඳවීම මත එහි ගිය බවත්, එහිදී විමසා ඇත්තේ එක්නැලිගොඩව හඳුනනවාද යන්නයි. එවිට පැමිණිලිකරු එවැන්නෙක් නොහඳුනන බව දැක්වූ විට "ඔහෙලා අතුරුදහන් කළ එක්නැලිගොඩ මාධ්‍යවේදියාව ඔච්චර ඉක්මනට අමතක වුණාද යන්න ප්‍රශ්න කළ බවත්" නැවතත් පැමිණිලිකරු ඒ සම්බන්ධයෙන් කිසිවක් නොදන්නා බව ප්‍රකාශ කළ විට ගිරිතලේ කඳවුරේ කර්නල් කුමාරරත්නව හඳුනනවාදැයි ප්‍රශ්න කළ විටදී එම නිළධාරියා හඳුනන්නේ නැති බවත්, ඔහු සමග රාජකාරි කර නොමැති බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු ප්‍රකාශ කරන අන්දමට පැමිණිලිකරුගේ දූරකථන අංකය එක්නැලිගොඩ අතුරුදහන් වූ දින මාධ්‍යවේදි එක්නැලිගොඩ කොළඹ ප්‍රදේශයේ ගමන් ගත් මාර්ගයේ පැමිණිලිකරුද ගමන් කර ඇති බවට වාර්තා වී ඇති බවත්, එහිදී පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ ඔහුගේ

රාජකාරි කොළඹ ප්‍රදේශයේ තිබුණු නිසා ඒ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා එසේ ගොස් ඇති බවය. මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කර ගෙදර යාමට අවසර දුන් බවත්, නැවත වරක් 2019.08.01 වෙනි දින කැඳවූ බවත්, එහි ගිය විට SI ප්‍රේමතිලක හමු වූ බවත්, ඔහු කියා ඇත්තේ “ඇත්ත කියන්න වෙනවා. නැත්නම් අවුරුදු ගණනක් ඇතුලට යන්න ලෑස්ති වෙන්න” යැයි බවත්, එවිට පැමිණිලිකරුගේ දරු දෙදෙනා 2019.08.05 වෙනි දින පහේ ශිෂ්‍යත්වයට පෙනී සිටිමට සූදානමින් සිටි බවත්,එම නිසා ඉන්පසු දිනක කැඳවන ලෙස ඉල්ලා සිටි නමුත් SI ප්‍රේමතිලක දක්වා ඇත්තේ “ළමයින්ගේ විභාග කටයුතු සඳහා යාමට දෙන්නම් රජයේ සාක්ෂිකරුවෙකු විය යුතු” බවටය. මෙය පැමිණිලිකරු තරයේ ප්‍රතික්ෂේප කරමින් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියේ ගිරිතලේ කඳවුරේ රාජකාරි කර නොමැති බවත්, යම් නිළධාරියෙකු කොළඹට පැමිණි විට වෙනත් ස්ථානයකට යෑමට අවශ්‍ය නම් ඒ අවශ්‍යතාවය සඳහා එම ස්ථානයට ගෙන යන බවත් එසේම කඳවුරෙන් පිටව යාමට ඔහුට අවසරය තිබෙන බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. තව දුරටත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ පැමිණිලිකරු ප්‍රකාශ කළ දේ සටහන් කිරීමට අකමැති වූ බවත්, ඔවුන්ට අවශ්‍ය දේ සටහන් කර පසුව මෙම ප්‍රකාශය පැමිණිලිකරු අත්සන් කළ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. ඉන්පසු පැමිණිලිකරු පවසන අන්දමට පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් බවත්, මුස්ලිම් අන්තවාදීන් සිටින සිර මැදිරියට දැමීමට උත්සාහ කළද එය පැමිණිලිකරු තරයේ ප්‍රතික්ෂේප කළ බවත්, පැමිණිලිකරු පවසන අන්දමට රජයේ සාක්ෂිකරුවෙකු කිරීමට දැඩි උත්සාහයක් ගත් බවට පැමිණිලිකරු ප්‍රකාශ කරන අතර, එය ප්‍රතික්ෂේප කළ බවත්, පසුව හෝමාගම අධිකරණයට ඉදිරිපත් කොට ඇප ලබාදී සෑම

මසකම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්සන් කළ යුතු බවට නියෝග දුන් බව ප්‍රකාශ කර සිටී. පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කළේ මානව හිමිකම් කොමිෂන් සභාවටද පැමිණිල්ලක් කළ බවයි. පැමිණිලිකරු 2020.06.04 වෙනි දින සිට විශ්‍රාම ගිය බවත්, එම කාල සීමාව තුල කිසිදු වැටුපක් හෝ දීමනාවක් නොලැබුණු බවත්, හමුදාව තුළ වැඩිම නඩු ගණනාවක් පවරා ඇත්තේ පැමිණිලිකරුට බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරීම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 10 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

දැනට හමුදාවේ කර්නල් තනතුරේ සන්නද්ධ බුද්ධි පුහුණු පාසැලේ සේනා විධායක ලෙස රාජකාරි කරන තන්තුලගේ ටෝෂිනාත් ප්‍රබෝධ සිරිවර්ධන (පැ.අ 31/2020) වන පැමිණිලිකරු 1992.08.24 වන දින හමුදා සේවයට බැඳී 1994 වසරේදී දෙවන ලුතිනන් නිළයට උසස්වීම් ලබා මූලිකවම යෙදී ඇත්තේ බුද්ධි රාජකාරි සම්බන්ධයෙන් වූ කටයුතුවල බවට ප්‍රකාශ කර සිටි. 1994 වර්ෂයෙන් පසු 6වන පාබල ඒකකයට අනුයුක්තව රිවිරැස මෙහෙයුමේ ක්‍රියාත්විතයට සහභාගි වූ බවත්, පසුව ඕමන්තයේ බුද්ධි නිළධාරී ලෙසද, වැලිඔය සහ දියතලාවේ යුධ හමුදා පුහුණු පාසැලේ උපදේශකවරයෙකු ලෙසද රාජකාරීයෙදී සිටි බවට සාක්ෂියේදී හෙළිදරව් කර ඇත. 2007 වසරේදී වසරක කාලයකට ලබාදුන් ආරක්ෂක උපාධිය ලබා ගැනීමෙන් පසුව 2008 වසරේදී 22වන සේනාංකයේ ත්‍රිකුණාමලය බුද්ධි නිළධාරි ලෙස අනුයුක්තව 2009.08.07 දින සිට තුන්වන බුද්ධි බලකායේ 2වන අණදෙන නිළධාරී ලෙස පත්ව 2010.01.14 වන දින මතුගම, කුකුලේගම පිහිටි සාම සාධක පුහුණු ආයතනයට නේවාසික පාඨමාලාවකට පිටව ගිය බවත්, පාඨමාලාව අවසන් වූ පසු

2012.02.06 දින ගිරිතලේ කඳවුරට රාජකාරී සඳහා වාර්තා කර කිලිනොච්චි හමුදා බුද්ධි කඳවුරට අනුයුක්තව රාජකාරි කළ බවත් ප්‍රකාශ කර සිටී.

2015.08.24 වන දින පැමිණිලිකරු වන සිරිවර්ධන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිට ඇති අතර, පැමිණිලිකරු SI ප්‍රේමතිලකව හමු වූ බවත්, ඔහු විසින් පැමිණිලිකරුව 4වන මහළට රැගෙන ගොස් ශානි අබේසේකර මහතා හමුවට පමුණුවා එහිදී මාධ්‍යවේදී එක්නැලිගොඩ යන අයගේ අතුරුදහන්වීම සම්බන්ධයෙන් සියළුම තොරතුරු ඒ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෙළි කරගෙන අවසන් බවත්, එම හෙළි කරගෙන ඇති කරුණු මත මාධ්‍යවේදී එක්නැලිගොඩ අතුරුදහන් කර ඇත්තේ එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය මහතාගේ නියෝග අනුව බවත්, අතුරුදහන්විම සිදු කර ඇත්තේ පැමිණිලිකරුගේ අණදෙන නිළධාරී වූ ෂම්මි කුමාරරත්න විසින් බවත්, ඒසම්බන්ධයෙන් වූ සියළු විස්තර දන්නා බවත්, අවශ්‍ය වන්නේ ඒ සඳහා සාක්ෂි පමණක් බවත්, එම නිසා ගෝඨාභයගේ අණ පරිදි මෙම එක්නැලිගොඩ අතුරුදහන්විම සිදු කළ බවට සාක්ෂි ප්‍රකාශ ලබාදෙන ලෙසට බලපෑම් කළ බවත්, ඔවුන් කියන ආකාරයට (2020.08.18 දින සාක්ෂි අංක පිටු 20) කළහොත් මෙයින් ගැලවීමට හැකි බවත්, කියමින් ඒ ආකාරයට ප්‍රකාශ ලබාදෙන ලෙසට බලපෑම් කළ බවටත් පැමිණිලිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර සිටි.(2020.08.18 - පිටුව 21) ශානී අබේසේකර මහතා කියන පරිදි එකඟ වුවහොත් ඒ වන විට අහිමි වි ගොස් තිබූ වැටුප් සහ වෙනත් ලැබීම් නැවත ලබාගත හැකි බවත් කියමින් බලපෑම් කළ බවට සාක්ෂියේදී වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. ශානී අබේසේකර විසින් දූරකථන ඇමතුමක් ලබාගෙන බදුල්ලේ පොලිස් නිළධාරියෙකුට

දුරකථනයෙන් කථා කළ බවත්, ඔහු පැමිණිලිකරුට කියා ඇත්තේ ශානි විසින් කියන දේ කළහොත් අවශ්‍ය ආකාරයට සියළුම දේ ශානි අබේසේකර මහතා විසින් ලබා දෙනු ලබන බවයි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටින විට ශානි අබේසේකර කියා සිටියේ SI ප්‍රේමතිලක කියලා තියෙන දේ කරන්න යැයි බවත්, මෙයට සැරයන් මෙන්ඩිස්ද එකතු වූ බවත් ඒ දෙදෙනාම කියා සිටියේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් දෙන ලෙසට පැමිණිලිකරුට කියා ඇත. එසේම එවැනි ප්‍රකාශයක් දුනහොත් නිදහස් වී යාමට අවස්ථාවක් තිබූ බවත් ප්‍රකාශ කර ඇත. එවැනි ප්‍රකාශයක් කළ සාජන් මේජර් රංබණ්ඩා නිදහසේ සිටින බවත්, මුරලි සහ රාම් නගුලේන්ද්‍රන් යන අයද ප්‍රකාශ දී නිදහසේ සිටින බවට කියූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

එසේම පැමිණිලිකරුගේ ප්‍රකාශ සටහන් කරන විට ගෝඨාභයගේ නම මෙයට සම්බන්ධ යැයි කියා දැක්වූ විට එය කෙසේ දැනගත්තේද යන්න පැමිණිලිකරු පරීක්ෂණ නිළධාරීන්ගෙන් ඇසූ විට " යුද්ධයෙන් පසු භාරවූ LTTE සාමාජිකයෙක් විසින් "ගෝඨාභය රාජපක්ෂ විසින් ෂම්මි කුමාරරත්නට උපදෙස් දී ඇති බවට" ප්‍රකාශ කර ඇති බවත්, එම LTTE සාමාජිකයා ප්‍රකාශ කළ නිසා ඒ බව B වාර්ථාවේ සඳහන් කර ඇති බවට ප්‍රකාශ කර සිටී.

එසේම රංබණ්ඩා සම්බන්ධයෙන්ද Bවාර්ථාවේ ඔහු කළ ප්‍රකාශයක් සංක්ෂිප්ත වශයෙන් ඇතුලත් කළ බැව් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු පවසන අන්දමට 2015.08.24 වන දින සිට 2015.11.09 වන දින දක්වා මාස දෙකකුත් දින 17ක් රඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටි බවත්, අවස්ථා

කිහිපයකදී මත්පැන් බිමට අවස්ථාව දුන් බවත්, ශානි අබේසේකර විසින් තම සේවා කාලය අවුරුදු 35 ක් වන බවත්, 30දෙනෙක් එල්ලුම් ගස් යවා තිබෙන බවත්, තවත් 5දෙනෙක් අඩු බවත් තර්ජනාත්මකව පැමිණිලිකරුට කියූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි.

2015.08.31 වන දින අපරාධ පරීක්ෂණ නිළධාරින් පැමිණිලිකරුගේ නිවසට ගිය බවත්, එහිදී ප්‍රකාශයක් දීමට පෙළඹවිමට උත්සාහ ගත් බවත් ප්‍රකාශ කර ඇත. මෙම නිළධාරින් නිවසට ගිය අවස්ථාවේදී නිවසේ තිබී ලේඛණ දෙකක් ගෙන ගොස් ඇති බවත්, ඒවා Double Edge මෙහෙයුමේ බුද්ධි තොරතුරු බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. එසේම මාධ්‍යවේදී එක්නැලිගොඩ අතුරුදහන් වූ බව දක්වන දිනයේදි පැමිණිලිකරු කුකුලේගම, මතුගම අගලවත්තේ ඇති සාම සාධක පුහුණු ආයතනයේ නේවාසික පාඨමාලාවක් හදාරමින් සිටි බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු රැඳවුම් නියෝග මත දින 90ක කාලයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවාගෙන සිට ඇති අතර, එම කාලය තුළදී මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන යාම හෝ කුමන්ත්‍රණ කිරීමේ සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් නොතිබූ අතර, ඔහු අත්අඩංගුවට ගෙන ත්‍රස්තවාදී පණත යටතේ නියෝගයක් ගෙන තිබුණු නිසා මේ සම්බන්ධයෙන් පැමිණිලිකරගේ බිරිඳ ශ්‍රේෂ්ඨාධිකරණ 368/15 යටතේ 2015.10.21 වන දින මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් පෙත්සමක් ඉදිරිපත් කර ඇති බවත්, එය දැනට විභාග වන බවත් ප්‍රකාශ කර ඇත.

එසේම B වාර්තාවල 296 වගන්තිය ඇතුලත් කිරීම නිසා මහේස්ත්‍රාත් අධිකරණය මගින් ඇප ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත්, පසුව

අවිස්සාවේල්ල මහාධිකරණයෙන් ඉල්ලීමක් කර ඇප ලබාගත් බවත් ඇපය ලක්ෂ 20ක් වූ බවත් ප්‍රකාශ කර ඇත.

එසේම පැමිණිලිකරු බුද්ධි තොරතුරු ලබාගැනීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කළ බවත්, බුද්ධි තොරතුරු ලබා ගැනීමේදී නියෝජිතයින් හැසිරවීම ඔවුන් සතුරු සංවිධානවලට යැවීම, ඔවුන් ස්වකැමැත්තෙන් ඇවිත් වැඩ කිරීමට කැමැත්ත ලබා ගැනීම, යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු බවත්, යුද්ධය අවසාන වූ පසු ත්‍රස්තවාදී පිරිසක් ඔවුන්ගේ කැමැත්ත මත බුද්ධි කටයුතුවලට සහභාගී කරවා ගැනීමට සිදු වූ බවත් සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

2015 අත්අඩංගුවට ගැනීමත් සමග මාස 9ක කාලයක් වැටුප් නොලද බවත්, මෙම තත්ත්වය නිසා පැමිණිලිකරුගේ 2වෙනි දරුවාට මානසික ආතතියක් ඇති වූ බවත්, ඒ සම්බන්ධයෙන් ප්‍රතිකාර ගැනීමට සිදු වූ බවත් ප්‍රකාශ කර ඇති අතර වැඩි දුරටත් ඔහුට විරුද්ධව හෝමාගම අධිකරණයේ අධිචෝදනා ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටි අවස්ථාවේ ශානි අබේසේකර විසින් දුරකථන ඇමතුමක් ගෙන ඒ ඇමතුමේ සිටින අය සමග කථා කිරීමට ඉඩ සලස්වා දුරකථන ඇමතුම ලබාගත් අයගෙන් උපදෙස් ලබාගෙන ප්‍රකාශයක් ලබා දෙන ලෙසට කියූ බවත්, එසේ ඇමතුම ලබාගත් අය සමග දුරකථනයෙන් කතා කළ බවත්, සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

මෙම දුරකතනයෙන් කතා කල අය මෙම කොමිෂන් සභාවට සාක්ෂිකරුවෙකු ලෙසට කැඳවා ඇති අතර, ඔහු දැනට පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් නුවරඑළියේ නියෝජ්‍ය පොලිස්පති

කාර්යාලයේ සේවය කරන බවත්, ඔහු ශානි අබේසේකරව හමුවී ඇත්තේ රාජකාරි මට්ටමෙන් අත්අඩංගුවට ගත් අවස්ථාවකදී බවත් ප්‍රකාශ කර ඇත. මෙහිදී ශානි අබේසේකර විසින් මෙම පොලිස් පරීක්ෂකවරයා බදුල්ලේ සිටින විටදී ගත් අතර, එම දුරකථන ඇමතුමෙන් ඔහු මෙම පැමිණිලිකරුගෙන් ශානි කියන අන්දමට කරන ලෙස ඉල්ලා සිටි බවත්, පසුව පැමිණිලිකරු විල්ලවආරච්චිව හමු වූ බවත් ප්‍රකාශ කර සිටියි.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා පැ. 1 සිට පැ. 26 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර නිරංගල් පේඩිගෙදර වසන්ත සුදේශ කුමාර උළුගෙදර (231/2020) 2020.09.16 දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් අතර, 2005.05.11 වෙනි දින හමුදා සේවයට එක් වී පුහුණුවෙන් පසු සන්නද්ධ බුද්ධි බලකායට අනුයුක්තව විශේෂ රාජකාරිවල එනම්, තොරතුරු රැස් කිරීම, ආරක්ෂක රාජකාරී ඊට අමතරව බුද්ධි වාර්තා රැගෙන යාම ඔහුගේ රාජකාරිය බව ප්‍රකාශ කර සිටියි.

පැමිණිලිකරු කරන ලද සේවය හේතුකොට ගෙන රණශූර පදක්කම ලැබුණු බවත්, 2009 වර්ෂයේ 3වෙනි සන්නද්ධ බුද්ධි බළකා ප්‍රදේශයේ රාජකාරි කළ බවත් ප්‍රකාශ කර සිටියි. පැමිණිලිකරු නිශ්කාශන රාජකාරියේ යෙදුනු බවත් ඊට අමතරව විශේෂයෙන්ම බුද්ධි වාර්තා රැගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත. බුද්ධි වාර්තා ගෙන යාමේදී පොදු ප්‍රවාහන සේවා භාවිතා කළ බවත්, බුද්ධි වාර්තා රැගෙන යාමේදී රැගෙන ඒමට ඇති ලිපිලේඛනද රැගෙන එන බවද දක්වා සිටි අතර, ඔහු කොළඹ ප්‍රදේශයේ විවාහ වී සිටි නිසා රාජකාරි සඳහා

කොළඹ ආ අවස්ථාවේදී නිවසට ගොස් පසු දින කඳවුරට වාර්තා කරන බැව්ද ප්‍රකාශ කර ඇත.

2017.01.20 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එන ලෙසට කැඳවීමක් ලද බවත්, එහි ගිය විට SI ප්‍රේමතිලක විසින් කාරණය පැහැදිලි කරමින් "ප්‍රගීත් එක්නැලිගොඩ කියලා මාධ්‍යවේදියෙක් පැහැරගෙන ගිහිල්ලා තියෙනවා. ඒ පැහැරගෙන ගිය චිත්‍රපටිය අපි දන්නවා. මේකට අදාළ නඩුවේ ටික විතරයි දාන්න තියෙන්නේ. මේක ඔප්පුවෙලා ඉවරයි.................... ගෝඨාභය රාජපක්ෂගේ උවමනාවට මේක වෙලා තියෙන්නේ, ඔහේලා මේ චිත්‍රපටියට සම්බන්ධ වෙලා ඉවරයි" යැයි කියා මෙය පිළිගන්නවාද කියා ඇසූ බවටත් ප්‍රකාශ කර ඇත.

ඊටපසු ඔහු තවදුරටත් කියා ඇත්තේ " උඹ මෝඩයෙක් වෙන්න එපා. උඹ මෙතන අහිංසකයි, උඹ තව කෙනෙක් කියන නිසා තමයි මේක කරලා තියෙන්නේ. ඒක නිසා උඹ මේක පිළිගනින්. ඒක පිළිගෙන අත්සන් කරගෙන පලයන්" යනාදි ලෙසට කියූ බවත් විවිධ පෙළඹවීම් මගින් දැඩි පීඩනයට ලක්කල නිසා තම පවුලට කරදරයක් වේ යැයි කියා සිතූන නිසා අත්සන් කළ බවටත් ප්‍රකාශ කර ඇත. ඊටපසු රාත්‍රී 12.00න් පසු පැමිණිලිකරු පදිංචි නිවස අසලට ගොස් වාහනේ තවත් දෙදෙනෙක් සමග පැමිණිලිකරුව වාහනයේ රඳවා නිළධාරීන් කිහිප දෙනෙක් ගෙදරට ගිය බවත්, ඉන් පැයකට පමණ පසු නැවත පැමිණ පැමිණිලිකරුද ගේ ඇතුලට රැගෙන ගිය බවත් ඉන්පසු බිරිඳ පොළඹවා ප්‍රකාශය දීමට එකඟ කර ගැනීමේ ක්‍රියාවක් ලෙසට මෙම ක්‍රියාව දැක්විය හැකි බවටත්, පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත. එහිදී අපරාධ පරීක්ෂණ නිලධාරීන් විසින් රංබණ්ඩා යන අය දැන් නිදහසේ සිටින තත්ත්වය ගැන පෙන්වා දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට

අවශ්‍ය පරිදි අවශ්‍ය ප්‍රකාශ ලබාදී හොඳ ජීවිතයක් ගත කරන ලෙසට පැමිණිලිකරුට දැනුම් දුන් බවටත් ප්‍රකාශ කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දෙවන වරට 2017.02.03 වන දින පැමිණීමට දන්වා එහි ගිය පසු පැමිණිලිකරුගේ ජංගම දුරකථනය පරීක්ෂා කිරීමට අවශ්‍ය බව පවසා පැමිණිලිකරු එදින ජංගම දුරකථනය රැගෙන ගොස් නොතිබූ නිසා නැවතත් SI ප්‍රේමතිලක තවත් නිළධාරියෙකු සමඟ පැමිණිලිකරුද කැටුව පැමිණිලිකරුගේ නිවසට ගිය බවත්, එහිදි පැමිණිලිකරු uniform අඳින අවසන් දිනය අද විය හැකි බව පැමිණිලිකරුගේ බිරිඳට SI ප්‍රේමතිලක විසින් කියූ බවත්, වැඩි දුරටත් අවශ්‍ය ප්‍රකාශ ලබා දුනහොත්, මුදල් ලබාදීමට හෝ විදේශගත වීමට හැකි බවට පොරොන්දුත්, මෙම රජය තවත් අවුරුදු 20ක් වැනි කාලයක් බලයේ සිටින බවත්, එම නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කියන විදියට අවශ්‍ය ප්‍රකාශ දෙන්න යනුවෙන් උපදෙස් දුන් බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. ඉන්පසු පැමිණිලිකරුගේ නිවසේ සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නැවත පැමිණිලිකරුව රැගෙන ගිය බවත්, එහිදී නැවතත් ශානි අබේසේකර හමුවට ගෙන ගිය බවත්, SI ප්‍රේමතිලක කියන විදියට කරන්න යැයි ශානි අබේසේකර කියූ බවත්, SI ප්‍රේමතිලක නැවතත් කොළ ටිකක් පැමිණිලිකරුට ලබාදී SI ප්‍රේමතිලක කියන දේ එම කොළවල ලියන ලෙසටත්, තවද, ඡායාරූපයක් පෙන්වා එම ඡායාරූපයේ සිටින අයව පැමිණිලිකරු දන්නා හඳුනන ලෙසට කොළයේ ලියන ලෙසටත්, මෙම ඡායාරූපයේ සිටින අයව අතුරුදහන් කළේ ගෝඨාභයගේ නියෝග මත බවත්, ලියන ලෙසට බලපෑම් කළ බවත් ප්‍රකාශ කර සිටි. එසේ ලියවාගෙන එම කොළවලට අත්සන් ලබාගත් අතර, පසුව තවත් හිස් කොළ 15කට පමණ අත්සන් ලබාගත්

බවත්, එහි දිනය නොදමන ලෙසට උපදෙස් දුන් බවටත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරුගේ බිරිඳ පොලිස් සහන මැදිරියට සහනයක් ලබාගන්නා අරමුණින් ගොස් ඇති බවත්, 2017.02.15 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් කළ බවත්, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් පෙනී සිටීමට නොහැකි බවටත්, මානව හිමිකම් කොමිෂන් සභාව පෙනී සිටින්නේ LTTE අයට පමණක් බවටත්, සඳහන් කරමින් පැමිණිලිකරුගේ බිරිඳ කළ පැමිණිල්ල භාරගෙන නොතිබූ බවත්, පසුව මානව හිමිකම් කොමිෂන් සභාව විසින්ද කොළ කිහිපයක් ලබාදී ඒවාට පිළිතුරු සපයන ලෙසට උපදෙස් දී තිබූ බවත්, එම කොළවල තිබුණේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අසන ලද ප්‍රශ්නම නිසා එම කොමිෂන් සභාව කෙරේ තිබූ විශ්වාසයත් පළුදු වූ බවත් ප්‍රකාශ කර සිටි.

2018.08.09 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම් කර තිබූ හෙයින් එදිනට එහි ගිය බවත්, SI ප්‍රේමතිලකව හමු වූ බවත් ප්‍රකාශ කර සිටි. එදින මුතාලිෆ් සමඟ පැමිණිලිකරු කොළඹ ගිය බවක් සම්බන්ධයෙන් SI ප්‍රේමතිලක කියූ බවටද පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. පෙර අවස්ථා දෙකකදීම කොළ කිහිපයකට අත්සන් ලබා ගත් බවත්, එම කොළවලම නැවතත් අත්සන් කරන ලෙසට ඉල්ලීම් කළ බවත්, ප්‍රකාශ කර සිටි. ඒ අනුව පැමිණිලිකරු අත්සන් කළ බවත්, අත්සන් කළ නිසා පසුව පැමිණිලිකරුව රජයේ සාක්ෂිකරුවෙකු කළ බවත් කියූ විට, පැමිණිලිකරු විසින් ඔහු අත්සන් කළ බව පැමිණිලිකරුට පිළිගැනීමට නොහැකි බව කීම හේතු කොට ගෙන පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා බවට දන්වා සිටි බවට ප්‍රකාශ කර සිටි. 2018.08.18 වන දින හෝමාගම මහේස්ත්‍රාත් උසාවියේ

B7714/2014 යටතේ අධිකරණයට ඉදිරිපත් කළ බවත්, චෝදනාව දණ්ඩ නීති සංග්‍රහයේ 356 සහ 296 බවට දන්වා සිටි බවට ප්‍රකාශ කළා.

පැමිණිලිකරුගේ බිරිඳ පොලිස් මූලස්ථානයට පැමිණිල්ලක් කළ බවත්, මාස 7½ක පමණ කාලයක් රක්ෂිත බන්ධනාගාරගත කොට සිට ඇප ලබා දුන් බවත්, ඇප කොන්දේසි ලෙස මුදලින් ලක්ෂ 3ක් සහ ලක්ෂ 20ක ශරීරි ඇප 2ක් වු බවටත් ප්‍රකාශ කර සිටී. 2019.03.14 වන දින ඇප පිට නිදහස් වූ පැමිණිලිකරුට හෝමාගම අධිකරණයේ පෙනී සිටිමට කැඳවීමක් කළ බවත්, චෝදනාව ලෙස දණ්ඩ නීති සංග්‍රහයේ 356 පමණක්ද, පැමිණිලිකරු මෙම නඩුවේ 6 වන චූදිත වූ බවත් ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 11 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර වර්ණකුලසූරිය අනුර ජයලත් (1052/2020) 2020.09.17 වෙනි දින මෙම කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි දුන් අතර, පැමිණිලිකරු 2002.06.20 වෙනි දින 3වෙනි බුද්ධි බලකායේ කඳවුරට අනුයුකත්ව සේවය කරන ලද බවත්, ඔහුගේ රාජකාරිය වූයේ රියදුරු ලෙස ක්‍රියා කිරීමත්, ඊට අමතරව කඳවුරේ ආරක්ෂක පොදු රාජකාරි වන පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම් කළ බවත්, 2007 සිට 2009 වර්ෂය දක්වා කාලය තුළදී ත්‍රිකුණාමලයේ රාජකාරි කර නැවතත් 2009 සිට 2013.09.05 වෙනි දින දක්වා ගිරිතලේ කඳවුරේ රාජකාරි කළ බව ප්‍රකාශ කර සිටි.

2015.08.23 වෙනි දින බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ කැඳවීමක් මත එහි ගිය විට කර්නල් ෂම්මි කුමාරරත්න, කර්නල් සිරිවර්ධන, බලලත් නිලධාරි ප්‍රියන්ත රාජපක්ෂ එහි සිටි බවත්, කැඳවා ඇත්තේ අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බවත්, ඒ අනුව පැමිණිලිකරුත් අනෙක් නිළධාරීන් තිදෙනාත් එහි ගිය විට කැඳවීම් කළේ මාධ්‍යවේදීන් පැහැරගෙන යාම සම්බන්ධයෙන් බවට කියූ බවත් ප්‍රකාශ කර සිටී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය පසු 4වෙනි තට්ටුවට ගෙන ගිය බවත්, එහිදී SI ප්‍රේමතිලක සහ සැරයන් මෙන්ඩිස්ව මුණගැසුණු බවත්, ඔවුන් විසින් පැමිණිලිකරු සහ අනෙක් අයව කැඳවීමට හේතුව විස්තර කර දුන් බවත් ප්‍රකාශ කර සිටී. ඒ අවස්ථාවේදී කර්නල් කුමාරරත්න විසින් කඳවුරේ සිට ප්‍රකාශ ලබාදීම කළ හැකිදැයි එම නිළධාරීන්ගෙන් විමසූ විට එසේ ප්‍රකාශ ලබාදිය නොහැකි යැයි කියූ බවත් ප්‍රකාශ කර සිටී. තවද, රැඳවුම් නියෝග ලබාගෙන තිබූ බව පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

පසුව අධ්‍යක්ෂ වන ශානි අබේසේකර හමුවී ඉන්පසු නැවත පැමිණිලිකරුව වෙනත් ස්ථානයකට රැගෙන ගිය බවත්, එහිදී SI ප්‍රේමතිලක සහ සැරයන් මෙන්ඩිස් පැමිණිලිකරුට "ඔයලාගේ සර්ලා ඔක්කොම කියලා තියෙන්නේ. උඹටත් පුළුවන්නම් ඇත්ත කියලා ගෙදර යන්න කියලා තවදුරටත් හිටපු ආරක්ෂක ලේකම් වර්තමාන ජනාධිපතිගේ නියෝගයක් මත ඔයලාගේ සර්ලට කියලා තමයි මේ මාධ්‍යවේදීයා පැහැරගෙන ගොස් අතුරුදහන් කළේ කියලා ප්‍රකාශයක් දෙන්න කිව්වා". මාධ්‍යවේදීයා පැහැරගෙන ගිය රියදුරා ලෙසට පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කළ බවත්, මාධ්‍යවේදීයා පැහැරගෙන ගිරිතලේ යුධහමුදා කඳවුරේ සිට පැමිණ මාධ්‍යවේදීයා රැගෙන ගිරිතලේ කඳවුරට රැගෙන ගිය බවට පැමිණිලිකරුට චෝදනා නගා තිබූ බවට පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි.

සෑම අවස්ථාවකදීම ප්‍රශ්න කරමින් තර්ජන, පෙළඹවීම් කරමින් කියා සිටියේ වර්තමාන ජනාධිපතිගේ උපදෙස් මත ක්‍රියාකළ බවට

ප්‍රකාශයක් දෙන ලෙසට යැයි පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. පැමිණිලිකරු පවසන අන්දමට අවස්ථා 5කදී පමණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටි කාලයේදී ප්‍රකාශ සටහන් කරගත් අතර, විශේෂයෙන්ම වාහන එළියට යන අයුරු හා ඇතුල්වන අයුරු ගැන ගැඹුරින් ප්‍රශ්න කළ බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දින 67ක් කාලයක් රැඳවුම් නියෝග මත රඳවා තබා ගත් බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි.

එසේම පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා කිහිප අවස්ථාවකදී නැත්නම් අවස්ථා කිහිපයකදීම මත්පැන් පානය කිරීම සඳහා ඇරයුම් කළද මත්පැන් පානය නොකළ බවත්, ඉන්පසු 2015.10.29 වෙනි දින හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර මුදා හැරිය බවත් ප්‍රකාශ කර සිටි.

සාක්ෂිකරු පවසන අන්දමට කොළඹ ත්‍රි පුද්ගල මහාධිකරණයේ හෝ හෝමාගම මහාධිකරණයේ හෝ ඔහුට කිසිදු නඩුවක් පවරා නොමැති බවත්, මේ සිද්ධිය නිසා

1. දරුවන්ගේ අධ්‍යාපනය අඩාල වූ බවත්,
2. දින 67ක කාලයකින් සේවා කාලය අහිමි වූ බවත්,
3. අහිමි වූ වැටුප් ලබා දෙන ලෙසත්,
4. විශ්‍රාම යෑමට වැඩිපුර දින 67ක් ඉදිරියට රාජකාරියේ යෙදී සිටිය යුතු බවත්,
5. ඔහුට සිදු වූ අපහාසය හා කරදරවලට සුදුසු සහනයක් ලබා දෙන ලෙසත් සාක්ෂිකරු විසින් ඉල්ලීම් කර ඇත.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 5 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර තුවාන් නසාර් මුතාලිෆ් ( 347/2020) 2020.09.19 වන දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දී ඇත. ඒ අනුව ආධූනික සෙබළෙක් වශයෙන් 2004.11.29 වන දින හමුදා බුද්ධි සන්නද්ධ බලකායට බැඳි ඇති අතර, 3 වන සන්නද්ධ බුද්ධි බලකායේ නැගෙනහිර පළාතේ රාජකාරී කර 2005.05.23 දින වාලච්චේන කඳවුරට අනුයුක්තව 2005 දෙසැම්බර් තෙක් රාජකාරී කර පසුව 231 බලසේනා මුලස්ථානයේ මඩකලපුව සිත්තන්ඩි ප්‍රදේශයේ රාජකාරි කළ බවටත්, නැගෙනහිර මානුෂීය මෙහෙයුම් අවසාන වන තුරුම සේවය කර 2008.06.23 වන දින 3 වන සන්නද්ධ බළකායට අනුයුක්තව ගිරිතලේ කඳවුරේ රාජකාරි කළ බවටත් ප්‍රකාශ කර ඇත. එම කඳවුරේ 2014 වන තුරු රාජකාරි කිරීමේදි ඔහුට පැවරි තිබූ රාජකාරිය වූයේ භාෂා පරිවර්තනය කිරීම සහ එම රාජකාරිවලට අමතරව ලිපිලේඛණ ගෙන ගොස් කොළඹ පිහිටි බුද්ධි අංශයට භාර දීම කරනු ලැබූ බවත් ප්‍රකාශ කර ඇත. 2014 වර්ෂයෙන් පසු 2017 වන තෙක් මඩකලපුව බුද්ධි සමුහයේ රාජකාරි කළ බවටද ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු මුස්ලිම් ජාතිකයෙක් නිසා ද්‍රවිඩ භාෂාව මනාව හැසිරවිමටත් කථා කිරීමටත් හැකි නිසා LTTE සංවිධානයේ ගුවන් විදුලි සන්නිවේදන කටයුතුවලට සවන්දිමේ කටයුතුවල යෙදී සිටි බවටද ප්‍රකාශ කර ඇත.

2016.11.23 වන දින පැමිණිලිකරුට සහ ඔහුගේ සහෝදරියට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙසට දැනුම් දී තිබුණ

හෙයින් 2016.11.24 වන දින සොහොයුරිය සමඟ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් 4 වන තට්ටුවේදී SI ප්‍රේමතිලක මුණගැසුන බවට ප්‍රකාශ කර ඇත.

එහිදී පැමිණිලිකරුගෙන් SI ප්‍රේමතිලක සහ සාජන් උඩවත්ත පැමිණ මාධ්‍යවේදීන් පැහැරගෙන යාම සම්බන්ධයෙන් ප්‍රශ්ණ කළ බවත් පැමිණිලිකරුගේ සොහොයුරිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන්වා ඇත්තේ ඇයගේ නමින් ගත් උපහාර සිම්පත පැමිණිලිකරු භාවිතා කිරීම සම්බන්ධයෙන් බවටත්, එසේ උපහාර සිම්පතක් සොහොයුරිය මගින් ලබාගැනීමට හේතුවූයේ පැමිණිලිකරුගේ හැඳුනුම්පත සංශෝධනය කිරීමට යවා තිබූ නිසා බවටත් ප්‍රකාශ කර ඇත. ප්‍රශ්ණ කිරීමේදී එම කාමරයේ පැමිණිලිකරු සහ සොහොයුරිය පමණක් සිට ඇති අතර, වැඩිදුරටත් ප්‍රශ්ණ කරනු ලැබුවේ එක්නැලිගොඩ මාධ්‍යවේදියා පැහැරගෙන යාම සම්බන්ධයෙන් බවටද ප්‍රකාශ කර ඇත. ඒ අවස්ථාවේදී එම මාධ්‍යවේදියා සම්බන්ධයෙන් පැමිණිලිකරු නොදන්නා බව ප්‍රකාශ කර ඇති අතර, පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සොහොයුරිය වෙනත් කාමරයකට ගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු දක්වා සිටින්නේ ප්‍රශ්ණ යොමු කළේ මාධ්‍යවේදියා අතුරුදහන්වීම සම්බන්ධයෙන් බවත්, කොළඹ ප්‍රදේශයට කුමන කාරණා සම්බන්ධයෙන් පැමිණෙන්නේදැයි ප්‍රශ්ණ කළ බවත්, එවිට සාමාන්‍යයෙන් රහස්‍ය ලිපිලේඛණ ගෙන කොළඹ යන බවටත්, පැමිණිලිකරු ප්‍රධාන වශයෙන් කළේ LTTE පණිවිඩ හුවමාරුවට සවන්දීම හා බුද්ධි තොරතුරු ලබාගැනීම බව පිළිතුරු ලෙස දුන් බව ප්‍රකාශ කර ඇත. යුද්ධය අවසන් වූවාට පසු එම ගුවන් විදුලි

පණිවිඩවලට සවන්දීම අවසන් වූ අතර, වැඩි වශයෙන් යොමු වූයේ ලිපිලේඛණ රැගෙන කොළඹ යාමට බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුගේ රාජකාරී කරන ස්ථානයේ වෙනමම සවන්දීමේ මධ්‍යස්ථානයක් තිබූ බවත්, එම ස්ථානයේ පැය 24 පුරාම රැඳී සිටිම අත්‍යාවශ්‍ය වූ නිසා කඳවුරේ අනෙකුත් නිළධාරීන් සම්බන්ධයෙන් සහ කවුරු සිටිනවාද නැද්ද යන්න සොයා බැලිමට වේලාවක් නොතිබූ බවත්, මුරලි යන අය සමග කථා නොකළ බවත්, මුරලිව නොදන්නා බවත්, රංබණ්ඩා දන්නා නමුත්, රංබණ්ඩාගේ රාජකාරි සම්බන්ධයෙන් සොයා නොබලන බවටත්,ප්‍රකාශ කර ඇත. එසේම පැමිණිලිකරු ඉතා අවධාරණයෙන් දක්වා සිටින කරුණු ලෙස

1. බුද්ධි රාජකාරි කරන කොට තවත් කෙනෙක් කරන කටයුතු කෙරේ අවධානය යොමු නොකරන බව.

2. ලිපිලේඛණ ගෙන යාමේදි භාවිතා කළේ පොදු ප්‍රවාහන සේවය බවත්, කොළඹ හමුදා මූලස්ථානයට ලිපිලේඛණ ගෙන ගිය බවත්, එසේම කොළඹ තවත් අයට අයත් ලිපි තිබෙනවානම් ඒවාද රැගෙන යන ලෙස හමුදා කඳවුරේ නිළධාරින් ඉල්ලිම් කළ විට එම ලිපිද රැගෙන යන බවට ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු කාමරයේ සිටියදි මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ හඳුනන්නේ දැයි ප්‍රශ්ණ කළ බවත්, ඉන්පසු 2009 සැප්තැම්බර් මාසයේ දිනයක් පෙන්වා කොළඹ ප්‍රදේශයට ගියාද යනුවෙන් ප්‍රශ්ණ කළ බවත්, ඒ කිසිම අවස්ථාවක කොළඹ නොගිය බවටත් ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරුගේ කට උත්තරය සාජන් උඩවත්ත සටහන් කර ඇති අතර, සාජන් උඩවත්ත තර්ජනාත්මකව කථා කරමින් කියා ඇත්තේ

පැමිණිලිකරු කළ වැඩ සියල්ලම දන්නා බවත්, පැමිණිලිකරුගේ සොහොයුරිය බන්ධනාගාරගත කරන බවත්, රැකියාව නැති කරන බවත්, සොහොයුරිය පැමිණිලිකරුට සිම් එකක් අරන් දී තිබූ බවත් කියා සාජන් උඩවත්තම ප්‍රකාශ ලියා "මේකට අත්සන් කරන්න" යැයි කියූ බවත්, එයට අකමැති වූ විට "උඹලගේ සර්ලත් මේ ෂෙල් එකේ දාලා තියෙන්නේ උඹටත් ඇතුලට යන්න කැමතිද" යැයි ඇසූ බවත් පසුව බලහත්කාරයෙන් අත්සන් ගත් බවටත් ප්‍රකාශ කර ඇත. අත්සන් කරන්න දුන්නද එම ලියකියවිලි ෆයිල් එකක් තුල තබා තිබියදි කැල්ලක් පෙන්වා එම ස්ථානයේ අත්සන් කරන්නට කියූ නිසා පැමිණිලිකරු අත්සන් කළ බවත්, අත්සන් කළේ කුමකටද යන්න නොදන්නා බවත් ප්‍රකාශ කර ඇත.

ඉන්පසු ඡායාරූපයක් පෙන්වා එය හඳුනාගැනිමට පුළුවන්ද යන ප්‍රශ්ණය ඇසූ බවත්, එම ඡායාරූපය ගැන නොදන්නා බව ප්‍රකාශ කළ විට එම ඡායාරූපය හඳුනන බවට අත්සන් කරන ලෙස කියා බලහත්කාරයෙන් කෙටි අත්සනක් ලබාගත් බවටත් ප්‍රකාශ කර සිටි. ඊට පසු රාත්‍රී 7ට පමණ පැමිණිලිකරුට යන්න කියා කියූ බවත්, එළියට ආවට පස්සේ අක්කා කොහේද කියලා අසා මඩකලපුවේ රාජකාරි ස්ථානයට පිටව ගිය බවත් ප්‍රකාශ කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී කෑම බීම හෝ වතුර කිසිවක් නොදුන් බවත්, පසුව නඩු දැම්මාට පස්සේ පැමිණිලිකරුව රජයේ සාක්ෂිකරුවෙක් ලෙසට ඇතුලත් කර ඇති බව දැනගත් බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර සිටියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සටහන් කර තිබූ

කට උත්තරයේ පැමිණිලිකරු විසින් කියන ලද කරුණු ඇතුලත් කර නොමැති බවයි.

පැමිණිලිකරුගෙන් කොළඹ පැමිණීමට හේතු සහ සිම් කාඩ්පත් සම්බන්ධයෙන් වැඩිවශයෙන් ප්‍රශ්ණ කළ බවත් පිළිතුරු ලෙස සාමාන්‍යයෙන් තැපැල් රැගෙන කොළඹ යන බවත් එම ගමන් මාර්ගය ගිරිතලේ, හබරණ, දඹුල්ල, කුරුණෑගල, නිට්ටඹුව, කොළඹ හරහා බවත්, නිතර කොළඹ හා හබරණ යන බවත් ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරු සිම්පත ගත්තේ පැමිණිලිකරුගේ අක්කාගේ නමින් බවත්, එයට හේතු වූයේ පැමිණිලිකරුගේ හැඳුනුම්පත නොතිබූ නිසා බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

(එක්නැලිගොඩ නැමැති මාධ්‍යවේදියාව පැමිණිලිකරු කිසිදු අවස්ථාවක දැක නොමැති බවත්, මෙවැනි බුද්ධි තොරතුරු පැමිණිලිකරුට අදාළ නැති බවත්, පැමිණිලිකරුගේ ප්‍රධාන රාජකාරීය වූයේ භාෂා පරිවර්ථනය සහ LTTE ගුවන් විදුලියට සවන්දීම බවත්, එම රාජකාරිය ඇතුලත සිට කරන රාජකාරියක් බවත්, ගිරිතලේ කඳවුරේ වෙනමම ස්ථානයක් එම රාජකාරිය සඳහා තිබූ බවත්, එම ස්ථානයට වෙනත් පිටතින් කිසිවෙක් පැමිණෙන්නේ නැති බවත්, පැය 24 පුරාම එම ස්ථානයේ රැඳී සිටිය යුතු බවටත්, ප්‍රකාශ කර ඇත.)

එසේම හෝමාගම මහාධිකරණයේ මාධ්‍යවේදි එක්නැලිගොඩ පැහැරගෙන යාම සම්බන්ධයෙන් නඩුවක් පවතින බව දන්නා බවත්, පැමිණිලිකරුට විරුද්ධව නඩුවක් පවරා නොමැති බවත්, එසේම පැමිණිලිකරුගේ සහෝදරිය සාක්ෂිකාරියක ලෙස ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කරමින් කිසිම අවස්ථාවක එම මාධ්‍යවේදියාව හමුවී හෝ දැක නොමැති බවත් වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු හෝමාගම මහාධිකරණයේ සාක්ෂිකරුවෙකු ලෙස ඇතුලත් කර ඇති අතර, ඔහුගේ සොහොයුරියද සාක්ෂිකාරියක ලෙස එම මහාධිකරණය විසින් ඉදිරිපත් කර ඇති චෝදනා පත්‍රයේ ඇතුලත් කර ඇත. පැමිණිලිකරු තව දුරටත් ප්‍රකාශ කර ඇත්තේ නොදන්නා කට උත්තරයක් සම්බන්ධයෙන් සාක්ෂියට ඇතුලත් කර ඇති බවයි. එසේම පැමිණිලිකරු පැහැදිලිවම ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරුට කිසිම අවස්ථාවක මෙම දක්වන එක්නැලිගොඩ නම් මාධ්‍යවේදියාව හමු වී නොමැති බවත්, පැමිණිලිකරු කිසි දිනෙක ඔහු හමුවීමට ගොස් නොමැති බවත්, (2020.09.19 වන දින සාක්ෂියේදී පිටු 40 අවසාන ප්‍රශ්ණ දෙක)

හෝමාගම මහාධිකරණයේ චෝදනා පත්‍රයට අනුව පැමිණිලිකරු 3වන සාක්ෂිකරු වන අතර, පැමිණිලිකරුගේ සොහොයුරිය 31 වන සාක්ෂිකාරිය වන බවත් ප්‍රකාශ කර ඇත. (2020.09.19 දින සාක්ෂියේදී පිටු අංක 41 අවසාන ප්‍රශ්නය සහ පිටු 42 පළමු ප්‍රශ්ණ දෙක)

පැමිණිලිකරුට අවශ්‍යව ඇත්තේ පැමිණිලිකරුගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට වන අතර, පැමිණිලිකරු සාක්ෂිකරුවෙකු ලෙස ඇතුලත් කර ඇත්තේ එවකට සිටි ආරක්ෂක ලේකම්ව පටලවන්න හදපු නඩුවකට සාක්ෂිකරුවෙක් ලෙසට බවත් ප්‍රකාශ කර සිටී. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු සහ පැමිණිලිකරුගේ සොහොයුරිය කිසිවක් නොදන්නා බවත්, ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු හෝමාගම මහාධිකරණයේ අධිචෝදනා පත්‍රය “P5” ලෙස ඉදිරිපත් කර ඇති අතර, එම අධි චෝදනා පත්‍රයේ පැමිණිලිකරුගේ දුරකථන අංකය වන 071-8443492 ලෙස අධිචෝදනා පත්‍රයේ 8 වන දුරකථන අංකය ලෙස සඳහන්ව ඇති බවත්,

එම අංකය අපරාධය කිරීමට පැමිණිලිකරු සහාය කරගත් බව කිවහොත් එය සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බවටත් ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරුට කොළඹ මහාධිකරණයට කැඳවීමක් ලැබී නොමැති බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 2016.11.24 වන දින එක් ප්‍රකාශයක් පමණක් දුන් බවත්, ප්‍රකාශ කර ඇත. එම ප්‍රකාශය ඔහුට කියවාදීමට අවස්ථාවක් නොදුන් බවත් මේ සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව හැරුණ විට වෙනත් ස්ථානයකට පැමිණිලි නොකළ බවත් ප්‍රකාශ කර ඇත.

හෝමාගම මහාධිකරණ නඩුවේ විත්තිකරුවන් කවරෙක්ද, එසේම එහි කිසිදු විස්තරයක් පැමිණිලිකරු නොදන්නා බවත් රජයේ අධි නීතිඥයින් ප්‍රශ්න කිරීමේදී ප්‍රකාශ කර ඇති අතර, එසේම විත්තිකරුවන් ලෙස පැමිණිලිකරුට මතක ඇත්තේ විත්තිකරුවන් කිහිප දෙනෙකු පමණක් බවත් ප්‍රකාශ කර ඇත.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 7 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පැ.06 වශයෙන් සලකුණු කර මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද, කොළඹ මහාධිකරණයේ ගොනු කල අධිචෝදනා පත්‍රයේ පැමිණිල්ලේ 03 වන සාක්ෂිකරු ලෙස නම් කර ඇති ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩා, මෙම කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සිතාසියකට අනුව කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ප්‍රකාශයක් ලබා දී ඇත.

මෙම සාක්ෂිකරු කොමිෂන් සභාව ඉදිරියේ 2020 සැප්තැම්බර් මස 18 වන දින පෙනී සිටින අවස්ථාවේ දී ඔහුගේ අයිතිවාසිකම් වෙනුවෙන්

නීතිඥ චමත් ගමගේ මහතා සමග නීතිඥ අශෝක වීරසූරිය මහතා පෙනී සිට ඇත.

නීතිඥ අශෝක වීරසූරිය මහතා කොමිෂන් සභාවට ප්‍රකාශයක් කරමින්; කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණ නඩු අංක TAB 725/19 නඩුවේ ද තමන් තම සේවාදායකයා වන රංබණ්ඩාගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි බවත්, එම නඩුව ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ කැඳවනු ලැබූ අවස්ථාවේ දී ත්‍රිපුද්ගල මහාධිකරණය නියෝගයක් නිකුත් කරමින් කොමිෂන් සභාවට ඉදිරියට කැඳවා ඇති රංබණ්ඩාට එකී ත්‍රිපුද්ගල මහාධිකරණයේ හැර වෙනත් ස්ථාන වල සාක්ෂි දීමෙන් වලක්වාලන ඇප කොන්දේසියක් මත මුදාහැර ඇති බවත්, ඒ අනුව කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන හොත් එකී ඇප කොන්දේසිය කඩවන බවත්ය.

මෙම අරුම පුදුම ඇප කොන්දේසිය පිළිබඳව කොමිෂන් සභාවේ මවිතය පළවූ අතර මේ අන්දමේ ඇප කොන්දේසියක් පැණවීමට ත්‍රිපුද්ගල මහාධිකරණයට බලය ලබා දෙන කිසියම් නෛතික ප්‍රතිපාදනයක් තිබෙන්නේද යන්න පිළිබඳව නීතිඥ අශෝක වීරසූරිය මහතාගෙන් මෙන්ම අතිරේක සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය මහතාගෙන් ද කොමිෂන් සභාව විමසන ලදී. එම නීතිඥ මහතුන් දෙපළම පවසන ලද්දේ කිසියම් පුද්ගලයෙකු සාක්ෂි දීමෙන් වළක්වාලන නියෝග පැනවීමේ බලයක් යුක්තිය පසිඳලන ආයතන වලට ලබා දී නොමැති බවය. එසේම එවැනි නීතියක් ද තමන් දන්නා ප්‍රමාණයට බලයේ නොපවතින බවට නීතිඥ මහතුන් සැලකර සිටින ලදී.

කොමිෂන් සභා අඥා පනතේ 7 වගන්තිය අනුව සාක්ෂි රැස් කිරීමට කොමිෂන් සභාවට ඇති බලය සහ සාක්ෂිකරුවන් කැඳවීමට ඇති බලය ඉතාමත් පැහැදිලිව දක්වා ඇති අතර ඒ අනුව කොමිෂන් සභාව තීරණය කරන ඕනෑම පුද්ගලයෙකු සාක්ෂිකරුවෙකු ලෙස කැඳවීමට කොමිෂන් සභාවට බලය ඇත. කොමිෂන් සභාව සතු එකී බලය යම් මැදිහත්වීමක් සිදු කරන්නේ නම් එය අභියාචනාධිකරණය මගින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් සිදුවිය යුතු වේ.

එබැවින් සාක්ෂිකාර රංබණ්ඩාට මෙම කොමිෂන් සභාවට ඉදිරියේ සාක්ෂිදීම වළක්වන අයුරින් ඇප කොන්දේසියක් පැනවීම තුළින් රංබණ්ඩාගේ අයිතිවාසිකම් කඩවන අයුරින් ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් ඇප කොන්දේසි පනවා ඇති බව පැහැදිලිය පෙනී යයි. මෙවැනි ඇප කොන්දේසි පැනවීම තුළින් පැහැදිලිව පෙනි යන්නේ නඩුවේ සාක්ෂි විභාගය කෙරෙහි යම් විශේෂ උනන්දුවක් හෝ බලපෑමක් සිදු කිරීමට ක්‍රියාකර ඇති බවකි.

එබැවින් මෙපිළිබඳව නිසි බලය ඇති අධිකරණයක් විසින් සුදුසු පරීක්ෂණයක් සිදු කිරීම කොමිෂන් සභාව විසින් නිර්දේශ කර සිටි.

කොමිෂන් සභාව ඉදිරියට කැඳවනු ලැබූ රංබණ්ඩාගේ සාක්ෂිය ඒ අනුව මෙහෙයවා ඇත. රංබණ්ඩා, 1990 හමුදාවට බැඳී මාස 3ක පමණ පුහුණුවකින් පසුව වව්නියාව, ත්‍රිකුණාමලය ප්‍රදේශවලට අනුයුක්තව සේවය කර ඇත. 1995 වසරේ සිට බුද්ධි රාජකාරීවල නිරතව සිට ඇති අතර, 2007 දි ගිරිතලේ 3 වන සන්නද්ධ බුද්ධි බළකා හමුදා කඳවුරේ බුද්ධි රාජකාරි සඳහා අනුයුක්ත වී ඇති අතර, 2012 වසර දක්වා ගිරිතලේ කඳවුරේ රාජකාරි කළ බව ප්‍රකාශ කර ඇත.

2015.08.09 වන දින රංබණ්ඩා කුඹුරු වැඩ කරමින් සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ගොස් රංබණ්ඩාව වාහනයකට නංවාගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රැගෙන ආ බවත්, එම වාහනයේ 6ක් හෝ 7ක් පුද්ගලයින් සිටි බවත්, එයින් කෙනෙකු LTTE සංවිධානයේ හිටපු මුරලි යන අය බවත් ප්‍රකාශ කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන ආ පසුව ශානි අබේසේකරට ඉදිරිපත් කළ බවත්, මෙන්ඩිස් උදය කුමාර යන අයත් එහි සිටි බවත්, රංබණ්ඩා ගෙන ආවේ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබාගැනීමට බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කියන අන්දමට ප්‍රකාශ ලබාදී ඒ කියන ආකාරයට කටයුතු කරන ලෙසත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කියූ බවට ප්‍රකාශ කර ඇත.

පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා වෙත ඉදිරිපත් කළ පසු මාධ්‍යවේදී එක්නැලිගොඩ සම්බන්ධයෙන් රංබණ්ඩා කිසිවක් නොදන්නා බවත්, අසත්‍ය ප්‍රකාශ කළ නොහැකි බව ප්‍රකාශ කළ විට ශානි අබේසේකර විසින් රංබණ්ඩාව නිශාන්ත සිල්වා වෙත යොමු කරන ලෙසට නියෝග කළ බවටත් ප්‍රකාශ කර ඇත.

SI ප්‍රේමතිලක විසින් නිශාන්ත සිල්වාට රංබණ්ඩාව හඳුන්වා දුන් බවත්, ඊට පසු නිශාන්ත සිල්වා පැමිණ "රංබණ්ඩා අපි කියන විදියට වැඩ කරන්න ඕනී" (2020.09.18 වන දින සාක්ෂි පිටු 20 පහළ සිට 7 වන පේළිය) කියා එළියේ හිටපු දෙමළ කෙනෙකු වූ මුරලිව ගෙනැවිත් පුටුවක ඉන්දවා "මේ මුරලි කියන විදියට අද ඉදන් කට උත්තර දෙන්න ඕනි. ඔව් කියන්න බෑ හැමදේකටම" කියූ බවත්,

එසේම මෙවැනි නොදන්නා දෙයකට වැරදි කරන්නට අකමැති බවත්, රංබණ්ඩා "තමාව වැරදිකාරයෙක් කරන්න එපා" යනුවෙන් ඉල්ලීමක්ද කළ බවට ප්‍රකාශ කර ඇත.

මේ අවස්ථාවේදී නිශාන්ත සිල්වා "එහෙම හරියන්නේ නැහැ. උඹට යන්න ඕනී නම් මුරලි කියන විදියට කට උත්තර දීපං. මේ මහත්තුරු ලියා ගනී" කියලා රංබණ්ඩාට ඇඟිල්ල දික් කරලා කියූ බවට ප්‍රකාශ කර ඇත.

මුරලි කියන කෙනාව දැනගත්තේ මාවිල්ආරු සිද්ධියේදි බවත්, කඳවුරට අරගෙන ආපු LTTE කෙනෙක් බවත්, ඔහුගේ LTTE සම්බන්ධතාවය නිසා තොරතුරු ගොඩාක් ලබාගැනිමට හැකිවූ බවත්, LTTE සංවිධානයට සම්බන්ධව සිටි සිංහල අය සම්බන්ධයෙන්ද තොරතුරු ලබා ගත් බවත්, මුරලි විසින් සැපයූ තොරතුරු ඉතා වැදගත් බවත්, (ත්‍රි පුද්ගල මහාධිකරණයේදී පළමුවන සැකකරු වන ෂම්මි කුමාරරත්න විසින් 2020.10.07 වන දින දෙන ලද සාක්ෂියේදීත් මේ සම්බන්ධයෙන් පැහැදිලිව දක්වා ඇත.) රංබණ්ඩාට අනුව මුරලිට රජයෙන් මුදලක් දුන් බවටද ප්‍රකාශ කර ඇත.

රංබණ්ඩාගේ සාක්ෂියට අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිදි ප්‍රකාශයක් දිමට පෙළඹවීම් හා තර්ජනය කර ඇති බැව් සාක්ෂි පරික්ෂා කිරීමේදී පෙනී යයි. (2020.09.18 වන දින මෙම කොමිෂන් සභාවට රංබණ්ඩා විසින් දෙන ලද ප්‍රකාශයේ 22 වන පිටුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිදි ප්‍රකාශයක් දීමට පෙළඹවීම් හා තර්ජන කර ඇති බැව් පැහැදිලිවම පෙනේ. ඊට පස්සේ මට කිව්වා "මේ මුරලි කියන විදියට කට උත්තර දෙන්න ඕනී. හා කිව්වොත් මාස දෙක තුනකින් විතර ගෙදර යන්න දෙනවා. එහෙම

නැති වුනොත් අවුරුදු 5 ක් 6ක් තමුන්ට ඇතුලට අරිනවා" කියලා ඇඟිල්ල දික් කරලා කිව්වා . ඊට පස්සේ මාව අරගෙන ගිහිල්ලා සිර මැදිරියට දැම්මා. (2020.09.18 වන දින සාක්ෂියේදී 22 වන පිටුවේ 3වන පිළිතුර) තව "මට කිව්වා මේ මහත්තුරුන්ට ඇත්ත කිව්වොත් බේරිලා යන්න පුළුවන් නැත්නම් මොනවා වෙයිද දන්නෙත් නෑ" මම කිව්වා "ඇත්තක් නම් මම දන්නේ නෑ. මට බොරු කියන්න බෑ" කියලා ( මෙය මුරලි විසින් කථා කරන වේලාවේදී රං බණ්ඩා විසින් දෙන ලද පිළිතුරකි. (22 වන පිටුවේ අවසාන පිළිතුර)

තවද, රංබණ්ඩාගේ ප්‍රකාශයට අනුව සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි යන අය රංබණ්ඩා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යනකොටත් මාස දෙක තුනකට කලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටි බවට ප්‍රකාශ කර ඇත. මේ අනුව සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් මුරලිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට අවශ්‍ය අන්දමට සූදානම් කරගන්නා ලද සාක්ෂිකරුවෙකු බව පැහැදිලිවම පෙනේ.

රංබණ්ඩාට අනුව රංබණ්ඩාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටි කාලයේදී පස්-හය වතාවක් ප්‍රකාශ ගත් බවටද ප්‍රකාශ කර ඇත.

පසු දින රංබණ්ඩාව සිරමැදිරියෙන් එළියට ගෙන නිශාන්ත සිල්වාගේ කාමරයට ගෙන ගිය නමුත් නිශාන්ත සිල්වා කාමරයේ සිටියේ නැති බවත්, ඊට පසුව 4 වන තට්ටුවේ කාඩ්බෝඩ් වලින් වට කර තිබූ කාමරයක මේසයක් ළඟ මුරලි ඉඳගෙන සිටි බවත්, මුරලි ළඟින් රංබණ්ඩාටද පුටුවක් දී ඉඳගන්න කියූ බවත් ප්‍රකාශ කර ඇත. එම ස්ථානයේ උදය කුමාර යන නිළධාරියා මුරලිගෙන් දෙමළෙන් විස්තර

අසා ඊට පසු රංබණ්ඩාගේ “ඔව් නේද” කියා ඇසූ බවත්, ප්‍රකාශ කර ඇති අතර, බැරිම තැන ගෙදර යන්න බැරිවෙයි කියලා හැම ප්‍රශ්ණයකටම “ඔව්” කියා පිළිතුරු දුන් බවත් ප්‍රකාශ කර සිටි.

තවද, නිශාන්ත සිල්වා මහතා නිතර කියා සිටියේ මුරලි කියන විදියට ප්‍රකාශය දෙන්න කියලා නැත්නම් අවුරුදු 4කට 5කට හිරේ දානවා කියලා. ඒ වේලාවේ මම ලොකු කම්පනයකට පත් වෙලා සිටියේ.

ප්‍රශ්ණය - තමා විවාහ වෙලාද හිටියේ

පිළිතුර - මම විවාහ වෙලා මට දරුවෝ දෙන්නෙක් ඉන්නවා

ප්‍රශ්ණය - දරුවන්ගේ වයස කියද

පිළිතුර - දුවට 19යි පුතාට 16යි.

ප්‍රශ්ණය - ඉතිං තමාට ඒ වේලාවේ දේවල් මතක් වුනාද

පිළිතුර - ඒ වේලාවේ මතක් වුණා. මට ගෙදර යන්න දෙන්නේ නැති වෙයි. මම බොරු චෝදනාවකට හිරේ දායි කියලා මතක් වුණා. ඉතිං මොනවා හරි කියලා මේකෙන් බේරිලා බොරු හරි කියලා මම යන්න ඕනී කියලා හිතුණා. ඒ නිසා මට එහෙම කියන්න සිද්ධ වුණා. නමුත් ඒ කියපු සියල්ල ඇත්ත නෙවෙයි ස්වාමිණී, මගෙන් බලෙන් ගත්තේ (2020.09.18 දින පිටු අංක 24 අවසාන ප්‍රශ්ණ 3 සහ පිටු අංක 25 මුල් ප්‍රශ්නෝත්තරය.)

කර්නල් කුමාරරත්න සමඟ එකට එකතුවී මෙම සිද්ධිය සිදු කළ බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රංබණ්ඩාට චෝදනා කර ඇත .

තර්ජන, පෙළඹවීම්, පොරොන්දු නිසා දැඩි පීඩනයකට ලක්ව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝග අනුව ප්‍රකාශයක් දීලා අත්සන් කළ අතර, පින්තූරයක් පෙන්නලා කියන විදියට අත්සන් කරපං කියලා මගෙන් බලෙන් අත්සන් ගත්තා ඒ පින්තූරය පෙන්නලා. (2020.09.18 වන දින පිටු අංක 28 පළවන පිළිතුර)

මෙම සාක්ෂිකරු වන රංබණ්ඩා අපරාධ පරික්ෂණ දෙපාරත්මේන්තුවේ සිටින විට විදේශීය කාන්තාවන් කිහිප දෙනෙක් සමග අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපති රත්නායක පැමිණ රංබණ්ඩා පෙන්වා සිටි බවත් එතැනදී එක්නැලිගොඩ යන වචනය පමණක් තේරුම් ගත් අතර, සෙසු සාකච්ඡාවන් තේරුම් ගැනීමට නොහැකි වූයේ ඉංග්‍රීසි භාෂාවෙන් කථාවෙන් කළ නිසා බවත් ප්‍රකාශ කර ඇත. මෙම සිද්ධිය 2015 අගෝස්තු මාසයේදී පමණ සිදු වූ බවත් ප්‍රකාශ කර සිටී. අත්අඩංගුවේ සිටින විට ශානි අබේසේකර පැමිණ පාඩම් කිරීමට විස්තරයක් ඇති බව දන්වා එය ලියා දෙන බවත්, එම විස්තරය මහේස්ත්‍රාත් අධිකරණයේදී හොඳින් අධ්‍යයනය කර විනිසුරු ඉදිරියේ ප්‍රකාශ කළ යුතු බවත්, දන්වා සිටි බව ප්‍රකාශ කර ඇත. (පිටු 32 හි පළමු පිළිතුර)

ඒ ලියා තිබුණ දේ එන කොළයක දෙපැත්තේ වන අතර, එය කියවා පාඩම් කරන ලෙස කියා සිටි බවත් ප්‍රකාශ කර ඇත.

ප්‍රශ්නය මොනවද එකේ ලියලා තිබුණේ?

පිළිතුර එකේ ලියලා තිබුණේ ගරු විනිශ්චයකාරතුමා ළගට ගියාම මට කියයි කිච්චා. තමුන්ගේ නම අහයි කිච්චා. ඊට පස්සේ ඒවාට උත්තර දෙන්න කිච්චා. ඊට පස්සේ එක්නැලිගොඩ

ගෙනාවේ හමුදාවේ කුමාරරත්නගේ අනුදැනුම මත කියලා කියන්න කිව්වා කිව්වේ ගෝඨාභය රාජපක්ෂ එක කරන්න එවකට හිටපු ආරක්ෂක ලේකම්ගේ ඕඩර්ස් පිට කිව්වා. ඒක ගෙනැල්ලා ඉවර වෙලා හමුදා කඳවුරේ තියාගෙන ඉඳලා.

ප්‍රශ්ණය හමුදා කඳවුරේ කිව්වේ කොහේ හමුදා කඳවුරේද?

පිළිතුර ගිරිතලේ හමුදා කඳවුරේ තියාගෙන ඉඳලා ගෙනිච්චා කියලා විස්තර ටික විනිසුරුතුමා ඉදිරියේ කියන්න කිව්වා. එතකොට ඔයාට ඇප ලැබෙයි. හැබැයි ජීප් එකෙන් බැහැලා වෙනත් දෙයක් කිව්වොත් අවුරුදු 5කට හිරේ යයි කියලා කිව්වා ස්වාමීනී. මම ස්වාමීනී බයටම කිව්වා.

මේ ලියා දුන්න දේ පාඩම් කරන්න කියලා කිව්වා. හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයට ගෙනිච්චා. ජීප් එකෙන් බහින්න කියලා අධිකරණ භූමියේ මට ඉන්න කියලා නිළධාරින් වන ශානි අබේසේකරයි නිශාන්ත සිල්වා මහතායි ඇතුලට ගිහිල්ලා ආපසු ආවා.

ඊට පසු රංබණ්ඩාව ගෙන ගිය බවත්, මහේස්ත්‍රාත් විසින් අහපු ප්‍රශ්නවලට පිළිතුරු දී කොළයේ තිබුණ දේවල් ප්‍රකාශ කළ බවත්, එසේ ප්‍රකාශ කළේ එසේ නොකලහොත් ගෙදර යන්න ලැබෙන්නේ නෑ කියලා හිතුණ නිසා බවත්,ඊට පස්සේ ඇප ලැබුණ බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිල්ලෙන් කැඳවන ලද රන්දෙනි වලව්වේ සන්ධ්‍යා කුමාරි, සාක්ෂිකාර සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජිගේ බිරිඳවේ.

සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන තමාගේ නීත්‍යානුකූල ස්වාමි පුරුෂයා බවත් ඔහුට දාව දෙනුවන් රූපසේන නැමැති පුතෙක් සිටින බවත් පොළොන්නරුව ජයන්තිපුර ලිපිනයේ පදිංචිව සිටින බවත් ප්‍රකාශ කර සිටී. 2015.09.04 වන දින වන විට ඇයගේ ස්වාමියා මුතූර්වල ගල්ක්‍රශර් එකක වැඩ කල බවත්, තමා අසනීපයෙන් සිටි නිසා එදින දවල් වන තුරු නිදා ගැනීමට අපේක්ෂා කළ බවත්, ප්‍රකාශ කර සිටී. වැඩි දුරටත් තම නිවස වටේ අඩි 6ක 7ක තාප්පයක් බැඳ ඇති බවත් ගේට්ටුවද ඒ හා සමානව අඩි 6ක් 7ක් පමණ ඇති බවත් ප්‍රකාශ කර සිටී.

මෙදින උදේ 5.30ට පමණ නිවසේ ප්‍රධාන දොරටුවට ගහනවා ඇසුණු අතර, දොර විවෘත කළ විට පිරිමි කිහිපදෙනෙක් ගේ තුලට පැමිණි බවත්, මෙමගින් සැහෙන බියක් ඇති වූ බවත් ප්‍රකාශ කර සිටියි. ගේ තුලට ආවට පසු ගෙදර පරීක්ෂා කිරීමට පටන් ගත් බවත්, ගෙදර දෙමහල් ගොඩනැගිල්ලක් බවත්, ඔවුන්ගෙන් ඇය ප්‍රශ්න කළ විට "අපි CID එකෙන්" යැයි ප්‍රකාශ කළ බවත් සාක්ෂිකාරිය ප්‍රකාශ කර සිටී.

ඒ ඇතුල් වූ 4 දෙනාගෙන් දෙන්නෙක් SI ප්‍රේමතිලක හා මෙන්ඩිස් බවත්, සාක්ෂි දෙන අවස්ථාවේදී මේ දෙදෙනා සිටින්නේද යැයි ප්‍රශ්න කළ විට ඊට ඉඩදී නොමැති බවත් ප්‍රකාශ කර සිටී.

පසුව මෙම කාන්තාව නිදි ඇඳුමෙන් සිටි නිසා ඇඳුම් මාරු කර ගැනීමට ඉල්ලීමක් කර ඇති නමුදු එයටද ඉඩ නොදුන් බවට ප්‍රකාශ කර සිටී.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පැමිණි අය ප්‍රශ්න කලේ ඇයගේ ස්වාමියා කොහේ සිටින්නේද? සැඟවී සිටින්නේද? යන්නයි.

ස්වාමියා සැඟවී නොමැති බව ප්‍රකාශ කළ අතර, දරුවා නැගිට්ටවීමට ගිය විට මෙම නිළධාරීන්ද කාමරයට පැමිණි බව ප්‍රකාශ කරයි. කාමරය පරීක්ෂා කිරීමේදී කොට්ටය යට තිබූ දූරකථනයක් සොයාගන්නා ලද අතර, මේ අවස්ථාවේදී SI ප්‍රේමතිලක දන්වා සිටියේ දූරකථනයෙන් කතා කරන විටදී වෙනසක් නොකර ස්වාමියාට කතා කරන ලෙසටයි. එවිට ස්වාමියා දූරකථනයට ප්‍රතිචාර දැක්වූ විට බැණ වැදී දූරකථනය විසන්ධි කල බවද, මෙම නිළධාරීන් සමග යාමට කියා සිටි නිසා ඇඳුමක් ඇඳ ගැනීමට කාමරයට ගිය විට නිළධාරීන්ද දොර ළඟට වී සිටීම නිසා දැඩි අපහසු තත්ත්වයකට පත්වූ බවද ප්‍රකාශ කර සිටි. මෙම නිළධාරීන් සමග කිසිදු කාන්තාවක් නොපැමිණි බවද, දරුවා කාමරයට ගොස් ඇඳුම් මාරු කිරීමට ගිය අවස්ථාවේදී පිස්තෝලයක් පෙන්වා " අම්මාට ඇත්ත කථා කරන ලෙසට" බිය කර ඇත.

පසුව මෙම කාන්තාව ඇයගේ දරුවාත් සමග වාහන අංක 57-4601 වාහනයට බලයෙන් නැග්ගවූ අතර SI ප්‍රේමතිලක ඉතා තද වචන මේ අවස්ථාවේදී භාවිතා කළ බව ප්‍රකාශ කර සිටියි.

රථයට ගොඩනැගුණු විට එම රථයේ දෙමළ භාෂාව කතා කරන කෙනෙක් සිටි බවත්, ඒ අයගේ නම තවේන්ද්‍රන් බවත් එම දෙමළ අයගේ කකුලේ ඇඟිලි කපා තිබුණු බවත් මෙම කාන්තාව ප්‍රකාශ කළ අතර, එසේම එම ඇඟිලි කපා ඇත්තේ මගේ ස්වාමියා බව දක්වා ඇත.

ඒ අවස්ථාවේදී දූරකථන ඇමතුමක් ලැබුණු නමුත්, දූරකථනයේ බැටරිය අඩුවීම නිසා, එම ඇමතුමට පිළිතුරු දීමට අවස්ථාවක් නොලැබුණු බවත් එසේම මෙම කාන්තාවට වැසිකිළියට යාමට

අවශ්‍යතාවය තිබූ නමුත් එසේ යාමට හැකියාව නොතිබූ බවද ප්‍රකාශ කර ඇති අතර, වාහනය මුතූර්වලට යාමේදී වාහනයේ පිරිමි හත් දෙනෙක් සිටිය බවත් දක්වා ඇත. මුතූර් වැඩපලට ගියේ තම ස්වාමියා හමුවීමට බවත් ප්‍රකාශ කර ඇත.

වැඩපලට ගොස් ස්වාමියා ගැන එම වැඩපලේ සිටි අයගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු ස්ථානයේ නොමැති බවත්, දැක්වූ විට ඊට පිළිතුරු දුන් අයව අත් විලංගු දමා රථයේ ඇතුලත ඉන්දවූ බවත් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් ආයතනය තුල පරීක්ෂා කල බවත්, ඒ වන විට දහවල් 2.00ට පමණ වන්නට ඇති බවත් ප්‍රකාශ කර සිටී. ඊට පසුව ස්වාමියාට දුරකථනයෙන් ඇමතූ විට ඔහුව දුරකථනයට සම්බන්ධ කර ගැනීමට හැකි වූ බවත්, ඉන්පසුව ස්වාමියා මින්නේරිය පොලිසියට පැමිණෙන බව දැන්වූ බවත් ප්‍රකාශ කර ඇත.

මේ සිද්ධිය සම්බන්ධයෙන් දැඩි ප්‍රචාරයක් සිදුව තිබූ බවත් සුදු වෑන් රථයකින් මෙම කාන්තාව පැහැරගෙන ගොස් ඇතැයි යන කතාව ප්‍රචාරය වී තිබුණු බව ඇයට දැන ගැනීමට ලැබුණු බව ප්‍රකාශ කර සිටී. මෙදින මින්නේරිය පොලිසියට එන විට සවස 6.30ට පමණ වී තිබූ බවත්, එසේම 2015.09.04 වන දින මින්නේරිය පොලිසියේ CIB -01හි 112/18 යටතේ මෙම අත්අඩංගුවට ගැනීම දැනුම් දුන් බවත් ප්‍රකාශ කර සිටින අතර, 2015.09.10 දින මානව හිමිකම් කොමිෂන් සභාවටද පැමිණිල්ලක් ඉදිරිපත් කර මෛත්‍රීපාල ජනපතිටද පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත්, ප්‍රකාශ කරන අතර, මෙම කරුණු සම්බන්ධයෙන් “P16”, “P17” සහ “P18” යන ලේඛන ඉදිරිපත් කර ඇත. එසේම ජනාධිපතිතුමාට ඒ මගින් නීතිපතිතුමාට වෙනම පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි කර ඇති අතර, “P20”, “P21”, “P22”,

“P23”, “P24” සහ “P25” වශයෙන් මේ සම්බන්ධයෙන් ලේඛන ඉදිරිපත් කර ඇත.

2015.12.02 වන දින මෙම කාන්තාවට පස්වරු 9.44ට පමණ 0716429304 දරණ ජංගම දුරකථනයෙන් ඇමතුමක් ලැබුණු අතර, ඉන්පසු මෙම කාන්තාව දුරකථනයට ඇමතු විට ස්වාමියා සම්බන්ධ කර ගැනීමට හැකි වූ බවත්, එසේම උප පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක සහ මෙන්ඩිස් ද කථා කළ බවත්, එසේ කතා කිරීමේදී මෙම පොලිස් නිළධාරීන් කියා ඇත්තේ “දුක්විදින්නේ නැතිව ප්‍රකාශයක් කර නිදහස් වී යනා ලෙසටය.” එසේම මෙම දුරකථනයෙන් කතා කරන විටදී පිටුපසින් ශබ්දයක් ඇසුණු නිසා වෙනදා කතා කරන තැනක නොව, එනිසා ඒ සම්බන්ධයෙන් ඇසූ විට ගෝල්පේස් එකේ ඉන්න බවත්, ස්වාමියා සහ උපසේන (තවත් රැඳවියක්) ප්‍රේමතිලක සහ මෙන්ඩිස් සමග සිටින බවත් එදින මත්පැන් පානය කළ බවත් කියූ බවට ප්‍රකාශ කර සිටී.

ස්වාමියා බැලීමට ගිය විටදී හමුවීමට ලැබෙන්නේ විනාඩි 10ක් බවත්, ඇතැම් විටක එම අවස්ථාව එනතුරු පැය 1ක් 2½,ක් පමණ රැදී සිටීමට සිදුවීම නිසා දැඩි අපහසුතාවයන්ට පත්වූ බව ප්‍රකාශ කර සිටී.

2015.12.05 වන දින ශානී අබේසේකර මහතා ඇයට කථා කළ බවත්, ඒ අනුව නැවත ප්‍රකාශයක් කර ගෙදර යන ලෙස කියා ඇති බව ඇය ප්‍රකාශ කරයි. ශානි අබේසේකර මහතා තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ දේශපාලන රැකවරණය යටතේ වෙනත් රටකට යා හැකි බවත් ඒ නිසා වෙනත් ප්‍රකාශයන් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

2015.12.07 වන දින ස්වාමියා උසාවියට ඉදිරිපත් කරන ලදුව, ඔහුව බන්ධනාගාර ගත කළ බවත්, ස්වාමියා 2015.12.09 දින නැවත

උසාවියට ඉදිරිපත් කළ නිසා ඒ අවස්ථාවේදී ප්‍රකාශයක් කරන ලෙසටත් දන්වා ඇති බවට ප්‍රකාශ කර සිටී.

2016.11.08 වන දින ඇප ලැබුණු බව දක්වා සිටියි. "P29" ඉදිරිපත් කරමින් පොලිසියෙන් ඇය ගෙන යන අවස්ථාවේ ඇය අසනීප තත්ත්වයෙන් සිටි බවත් ඒ සඳහා වෛද්‍ය වාර්තා "P24", "P1","P2", "P3" සහ "P4" ඉදිරිපත් කර ඇත.

මේ සඳහා බලපෑම් කළේ ශානි අබේසේකර, SI ප්‍රේමතිලක සහ සැරයන් මෙන්ඩිස් යන පොලිස් නිළධාරීන් බවත් ප්‍රකාශ කර ඇත.

"P30" ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ මෙම කාන්තාවට දුරකථන පණිවුඩය ලැබුණු බවට සහතික කරන ලේඛනයකි.

රජයේ සාක්ෂිකරුවන් ලෙසට අධිචෝදනා පත්‍රයෙන් නම් කරමින් ඉදිරිපත් කරන ලද පහත නම් සඳහන්;

1. සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි
2. මාණ්ඩලික ජයසුන්දර මුදියනේස්ලාගේ රන්බණ්ඩා
3. කෝප්‍රල් තුවාන් නසාර් මුතාලිෆ්
4. නෛයි හනිදා මුතාලිෆ්

යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සහ ජංගම දුරකතන ආයතනවලින් ලබාගත් දුරකථන වාර්තා මගින් සැකකරුවන්ට විරුද්ධව සාක්ෂි ඉදිරිපත් කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර ඇති බැව් මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් බුද්ධි නිළධාරීන් විසින් ඉදිරිපත් කර ඇති ලේඛන අනුව පෙනී යයි.

සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලිගේ සාක්ෂියට අනුව, ඔහු අවස්ථා දෙකකදි LTTE සංවිධානයට බැඳී ප්‍රාදේශීය බුද්ධි තොරතුරුවල නියැලී සිටි LTTE සාමාජිකයෙකි. ඉදිරිපත් වී ඇති ප්‍රකාශවල සාරාංශය අනුව 2002 වර්ෂයේදී වන්නියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස සිටි සෙල්වම් අඩික්කලනාදන් මහතා සමග මඩු වන්දනාවේ ගිය අවස්ථාවේදී දොස්තර ජයලත් ජයවර්ධන මහතා සමග මඩු වන්දනාවේ පැමිණි සිටි මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ හඳුනාගත් බවත්, එතැන් සිට මාධ්‍යවේදී එක්නැලිගොඩ සමග සම්බන්ධකම් ඇති කරගත් බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සංක්ෂිප්ත වාර්තාවේ දැක්වේ. 2009.05.15 වෙනි දින සුමතිපාල සුරේෂ් නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි මුලතිව් ප්‍රදේශයේදී හමුදාවට භාර වී ටික කලක් ත්‍රිකුණාමලයේ Plantain Point හමුදා කඳවුරේ සිට 2009 අගෝස්තු මාසයේ මුල් සතියේ පමණ ගිරිතලේ හමුදා බුද්ධි අංශ කඳවුරට ඔහු ඇතුළු ත්‍රිකුණාමලේ සිට පැමිණි කිහිප දෙනෙකු හමුදා කඳවුරේ නතර වී බුද්ධි තොරතුරු ලබා ගැනීමේ කාර්යයේ යෙදී සිට ඇති බැව් වාර්තා වේ. සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි සහ මාධ්‍යවේදි එක්නැලිගොඩ අතර, තිබූ හැඳුනුම්කම නිසා 2009 අගෝස්තු මාසයේදී පමණ කෝප්‍රල් විනි ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන නොහොත් සුරේෂ් යන අය මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩට කථා කර, මාධ්‍යවේදියා හබරණට ගෙන්වා හමුදා බුද්ධි අංශයේ මේජර් සිරිවර්ධනගේ, උපදෙස් පරිදි රාජපක්ෂ මුදියන්සේලාගේ ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් කෝප්‍රල් නාදන්, කෝප්‍රල් රවින්ද්‍ර රූපසේන නොහොත් රංජි ඇතුලු කණ්ඩායමක් සමග හබරණ ප්‍රදේශයට ගොස් එක්නැලිගොඩ හමු වී

ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන් නැමති කෝප්‍රල්වරයා සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලිගේ ඥාති සොහොයුරෙකු ලෙස ප්‍රගීත් එක්නැලිගොඩට හඳුන්වා දී ඇත.

මෙම සාක්ෂිකරු හෝමාගම අධි චෝදනා පත්‍රයේ 4වන සාක්ෂිකරු ලෙස දැක්වෙන අතර, කොළඹ ත්‍රිපුද්ගල අධිකරණය විසින් ගොනු කර ඇති අධිචෝදනාවේ 4වෙනි සාක්ෂිකරු ලෙස දැක්වේ.

ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩා නොහොත් රසික යන අය 1990 දී යුධ හමුදාවට බැඳී, මාස 3ක පමණ පුහුණුවකින් පසුව වව්නියාව, ත්‍රිකුණාමලය ප්‍රදේශවලට අනුයුක්තව සේවය කර ඇත. 1990 වසරේ සිට බුද්ධි අංශයේ රාජකාරීවල නිරතව සිට ඇති අතර, 2007 දි ගිරිතලේ 3 වන සන්නද්ධ බුද්ධි බළකා හමුදා කඳවුරේ බුද්ධි රාජකාරි සඳහා අනුයුක්තව සිට ඇති අතර, 2012 වසර දක්වා ගිරිතලේ කඳවුරේ රාජකාරි කළ බවත්, 2012 වසරේදී විශ්‍රාම ගිය බවත් ප්‍රකාශ කර ඇත.

අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෝමාගම මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තාව, ෂම්මි අර්ජුන කුමාරරත්න නිලධාරියා මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් විට “P8” ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛණය අනුව සාජන් මේජර් ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩා 2009 වර්ෂයේ ගිරිතලේ 3 වන සන්නද්ධ බුද්ධි බලකායේ කර්නල් කුමාරරත්න යටතේ සේවය කර ඇති බව සඳහන්ව ඇත.

එම කාලයේදි LTTE සංවිධානයේ සිට හමුදාවට භාර වූ සාමාජිකයින් (9) නවදෙනෙක්ද කඳවුරේ සිට ඇති අතර, ඒ අතර, මෙම මහාධිකරණ නඩුවේ සාක්ෂිකරුවෙකු ලෙස නම් කර ඇති සුමතිපාල සුරේෂ් කුමාර

නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි යන අයද සිටි බවට ප්‍රකාශ කර ඇත.

මෙම විශ්‍රාමික යුධ හමුදා බලලත් නිළධාරි II (බනි II) ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩා යන අය 2017.04.19 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබාදී ඇත. 2010.01.24 වන දින උදැසන කර්නල් කුමාරරත්න දූරකථනයෙන් රංබණ්ඩාට කථා කොට සුමතිපාල සුරේෂ් කුමාර නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි ඉන්නවාද යැයි විමසා එම දූරකථනය මුරලිට දෙන ලෙස දැනුම් දුන් බව රංබණ්ඩා ප්‍රකාශ කර ඇත. රංබණ්ඩා විසින් මුරලිට දූරකථන ඇමතුම දීමෙන් පසු කර්නල් කුමාරරත්න මුරලි සමඟ කථා කර අවසානයේ නැවත රංබණ්ඩාට කථා කොට "අනිවාර්යයෙන්ම වෙන්න ඕනි" යනුවෙන් රංබණ්ඩාට දැනුම් දී මුරලි සමග කථා කිරිමට රංබණ්ඩාට උපදෙස් දුන් බව ප්‍රකාශ කර සිටී.

ඒ අනුව රංබණ්ඩා මුරලිගෙන් විමසීමේදී, එදින ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන් කොළඹ යනවා කොළඹදී නාදන්ට මාධ්‍යවේදි ප්‍රගීත් එක්නැලිගොඩ මුණගැසීමට දැනුම් දුන් බව සුමතිපාල සුරේෂ් කුමාර නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩාට ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩා විසින් ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන් යන අය එක්නැලිගොඩව මුණගැසෙන්නේ කෙසේද යන්න පිළිබඳව මුරලිගෙන් විමසා ඇත. මුරලි කියා ඇත්තේ මේජර් සිරිවර්ධන ඇතුළු කණ්ඩායමක් සමඟ හබරණට ගොස් මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩව හමුවී ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන්, මුරලිගේ ඥාති සහෝදරයෙකු බවට හඳුන්වා දුන් බවට මුරලි රංබණ්ඩාට ප්‍රකාශ කළ බව දක්වා සිටි.

තව දුරටත් ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩා සුමතිපාල, සුරේෂ් කුමාර නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි මාර්ගයෙන් මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩට දුරකථනයෙන් කථාකොට ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන්, කොළඹදී මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩව මුණගැසීමට අවශ්‍ය පසුබිම සකස් කර දුන් බව ප්‍රකාශ කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පවසන අන්දමට ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන් එදින රාත්‍රියේ ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩාගේ දුරකථනයට අමතා එක්නැලිගොඩව හමු වූ බව දක්වා ඇත. 2010.01.28 වන දින උදේ 10.00 ට පමණ රාම් නමැති LTTE රැඳවියා රඳවා සිටි සිර මැදිරිය ආසන්නයේ ඇති ගල අසළ සිටි කෝප්‍රල් රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි, රංබණ්ඩාට එම ස්ථානයට පැමිණීමට දැණුම් දුන් බවත්, එහි යන විට රෙදි පටියකින් ඇස් බැඳ සිටි පුද්ගලයෙක් ගලක් මත වාඩි වී සිටිනවා දැක ගැනීමට හැකි වූ බවත්, එම අවස්ථාවේදී කෝප්‍රල් රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි විසින් රංබණ්ඩාගේ කණට ලංවී "මේකා තමයි ප්‍රගීත් එක්නැලිගොඩ කියන්නේ" යනුවෙන් දැනුම් දුන් බව ප්‍රකාශ කර සිටී. ඊට පසු රංබණ්ඩාද ඔහුට කථා කර ඇති අතර දැස් බැඳ සිටි පුද්ගලයා මාධ්‍යවේදී එක්නැලිගොඩ යැයි රංබණ්ඩාට පැවසූ බව ප්‍රකාශ කර ඇත. ඒ අවස්ථාවේදි කෝප්‍රල් රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජිගේ අතේ කාටූන් චිත්‍ර සහිත කොළ 10ක් පමණ තිබූ බවත්, එම කොළ එකට අමුණා එම කොළ රංබණ්ඩාට දුන් බවත්, එම කොළවල තිබුණේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ එතුමාගේ පවුලේ ඥාතීන්ව ඇඳපු කාටූන් බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදි රංබණ්ඩා මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ සමඟ කථා

කළ බවත්, පසුව දවල් කාලයේදි ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන් සහ කෝප්‍රල් රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි යන දෙදෙනා මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩව නැවත ගෙන එන ලෙසට කර්නල් කුමාරරත්න විසින් ලබාදුන් නියෝග අනුව ඔහුව රැගෙන ගිය බවත්, පසුව මාධ්‍යවේදී එක්නැලිගොඩ අතුරුදහන් වූ බවට මාධ්‍ය මගින් දැනගත් බවත් ප්‍රකාශ කර ඇත.

ඉහත ප්‍රකාශය රංබණ්ඩා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ බලකර ලබාගත් ප්‍රකාශයක් බව මෙම කොමිසන් සභාවට පැමිණ ප්‍රකාශයක් කරමින් සාක්ෂි දුන් අවස්ථාවේදී පැහැදිලිව දක්වා ඇති අතර, මින් පෙනී යන්නේ රංබණ්ඩාගේ සාක්ෂිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දී ඇත්තේ දැඩි පීඩනයක් මත බවත්, කොමිසමට දුන් ප්‍රකාශ කිසිදු පීඩනයක් නොමැතිව ස්වාධීනව සිය කැමැත්තෙන් කරන ලද ප්‍රකාශයක් වන අතර මේ දෙකේ ඇති වෙනසකම් ඉතා පැහැදිලිව ඇති අතර, වඩාත් පිළිගැනීමට හැකි වන්නේ සිය කැමැත්තෙන් කරන ලද ප්‍රකාශය බව කොමිෂන් සභාව නිගමණය කරනු ලබයි.

රං බණ්ඩා විසින් කොමිෂන් සභාවට දෙන ලද ප්‍රකාශයෙන් තව දුරටත් පෙනි යන්නේ ඉහත දැක්වූ සිද්ධිය පිලිබඳ කරුණු අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද බවයි.

සාක්ෂිකාර තුවාන් නසාර් මුතාලිෆ් නොහොත් කමල් 2004.11.29 වන දින ආධුනික සෙබලෙකු ලෙස හමුදාවට බැඳී 3 වන සන්නද්ධ බුද්ධි බළකායේ නැගෙනහිර ප්‍රදේශයේ නැගෙනහිර මානුෂික මෙහෙයුම අවසාන වන තුරු සාක්ෂිකරු සේවය කර ඇති අතර, 2008.06.23 වන

දින 3වන සන්නද්ධ බුද්ධි බළකායට අනුයුක්තව 2014 වන තුරු ගිරිතලේ හමුදා කඳවුරේ රාජකාරි කළ බව ප්‍රකාශ කර ඇත.

2020.09.17 වන දින මෙම කොමිෂන් සභාව ඉදිරියේදී මෙරගල් පේඩිගෙදර වසන්ත සුදේශ් කුමාර උළුගෙදර සාක්ෂි දීමේදී "P5" ලෙස හෝමාගම මහේස්ත්‍රාත් උසාවියේ B7417/10 වැඩිදුර වාර්ථාව ඉදිරිපත් කර ඇති අතර, එහි 4 වන ඡේදයට අනුව කෝප්‍රල් තුවාන් නසාර් මුතාලිෆ් නොහොත් කමල් විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් දි ඇති අතර ගිරිතලේ 3වන සන්නද්ධ බුද්ධි බළකා කඳවුරට අනුයුක්තව සේවය කරමින් සිටියදි එහි 2වන අණදෙන නිළධාරී වූ කර්නල් තාන්තුලගේ ටොෂිනාත් ප්‍රබෝධ සිරිවර්ධනගේ නියෝග මත එම කඳවුරේ සේවය කළ මෙරගල් පේඩිගෙදර වසන්ත සුදේශ් කුමාර උළුගෙදර සමග තුවාන් නසාර් මුතාලිෆ් හබරණට ගිය බවත්, එහි සිටියදී විනී ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන නොහොත් සුරේෂ් සහ සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි සමග ත්‍රීරෝද රථයකින් පැමිණි පුද්ගලයෙකු පසුපස ඔහු ගමන්ගත් බස් රථයේ නැග කොළඹ දක්වා ගිය බව සාක්ෂිකරු වන කෝප්‍රල් තුවාන් නසාර් මුතාලිෆ් නොහොත් කමල් ප්‍රකාශ කර ඇත. එසේම කොළඹට පැමිණි පසු "දැන් අපි ආපහු යමු ෆලෝ කරපු පුද්ගලයා මෙතැන සිට වෙනත් අය ෆලෝ කරනවා කී බවත්, ඊට පසු සාක්ෂිකරු කෝප්‍රල් තුවාන් නසාර් මුතාලිෆ් නොහොත් කමල් යන අය උළුගෙදර සමග බස් රථයෙන් පසු දින උදේ ගිරිතලේ හමුදා කඳවුරට පැමිණි බවත්, ඊට පසු දින පුවත්පත්වල පළ වූ ඡායාරූපය ප්‍රගීත් එක්නැලිගොඩගේ රූපයට සමාන බවත් ප්‍රකාශ කර ඇති බව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයට වාර්තා කර ඇත.

කෙසේ නමුත් මෙම සාක්ෂිකරු වන කෝප්‍රල් තුවාන් නසාර් මුතාලිෆ් මෙම කොමිෂන් සභාවට පැමිණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉහත දක්වා ඇති අන්දමට ප්‍රකාශ නොදුන් බවත් ඔහු කොළඹ පැමිණියේ රාජකාරි සඳහා බවත් ප්‍රකාශ කර ඇත. මේ අනුව මෙම සාක්ෂිකරු ඔහු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දී ඇති කටඋත්තරය ප්‍රතික්ෂේප කරමින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදීම ඉතා වැදගත් ලෙස සැලකිය යුතුව ඇත.

නෛයි හනිදා මුතාලිෆ් සාක්ෂිකාරිය හෝමාගම මහාධිකරණයේ අධි චෝදනා පත්‍රයේ පැමිණිලි පක්ෂයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවේ 31 වන සාක්ෂිකාරිය ලෙස දක්වා ඇත. මෙම සාක්ෂිකාරිය තුවාන් නසාර් මුතාලිෆ්ගේ සොහොයුරියක වන අතර, ඇයව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇයගේ නමින් ලබාගත් උපහාර සිම්පත තුවාන් නසාර් මුතාලිෆ් විසින් භාවිතා කිරිම පිළිබඳව ප්‍රකාශයක් සටහන් කර ඇය විසින් ගන්නා ලද උපහාර සිම්පත සොහොයුරාට දිමට ඇති අවශ්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රශ්න කර ඇත. මේ අවස්ථාවේදි තුවාන් නසාර් මුතාලිෆ් ඔහුගේ හැඳුණුම්පත සංශෝධනය කිරිමට යවා තිබූ නිසා ඇය විසින් සිම්පතක් ගෙන සොහොයුරාට දුන් බව ප්‍රකාශ කර සිටි.

හෝමාගම මහාධිකරණයේ අධි චෝදනා පත්‍රයේ පැමිණිලි පක්ෂයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවේ තම්බිපිල්ලේ සදීශ් මයිල්වාගනම් සිවකුමාර්, කනපතිපිල්ලේ ශිවමූර්ති නොහොත් නගුලන් යන අය සාක්ෂිකරුවන් ලෙස ඇතුලත් කර ඇත. නමුත් B වාර්ථාවේ සංක්ෂිප්ත කරුණු වාර්ථා කර නොමැත.

ඉහත සඳහන් සාක්ෂිකරුවන් හතරදෙනා ඉහත දක්වා ඇති ආකාරයට සාක්ෂි දුන් බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති B වාර්ථාවලින් සහ වැඩිදුර වාර්තාවලින් ලබාගත් කරුණු වේ.

මෙම විමර්ශනයේදී පෙනී ගිය වැදගත් කරුණක් වූයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද සාක්ෂි මත විත්තිකරුවන්ට විරුද්ධව ගොනු කර තිබෙන චෝදනාවන් ඔප්පු කිරීමට තිබෙන සාක්ෂි ප්‍රමාණවත් වන්නේද? යන්නයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනය කොට සටහන් කරගත් සාක්ෂිවල විශ්වාසදායකත්වය කුමක්ද? කිසිම සෘජු සාක්ෂියක් නොමැතිව, එසේම රජයේ සාක්ෂිකරුවන් ලෙස සැලකූ ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩා විසින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ 2020.09.18 දින සාක්ෂි දෙමින් මහේස්ත්‍රාත්තුමා වෙතට රංබණ්ඩා විසින් කළ ප්‍රකාශය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද ප්‍රකාශයක් බවට ප්‍රකාශ කිරීමත්, තවත් රජයේ සාක්ෂිකරුවෙකු වූ තුවාන් නසාර් මුතාලිෆ් මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් කියා සිටියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් කරනු ලැබූ තැතිගැන්වීම්, තර්ජන හා පෙළඹවීම් නිසා ප්‍රකාශයක් දුන් බවටය. එවැනි ප්‍රකාශ මත චූදිත හමුදා නිළධාරීන්ට විරුද්ධව ඉදිරිපත්ව ඇති අපරාධ චෝදනා ඔප්පු කිරීමට එම තැතිගැන්වීම්, තර්ජන හා පෙළඹවීම් මත කළ ප්‍රකාශ ඉවහල් කර ගත හැකිද යන්න සළකා බැලිය යුතු වේ.

මෙම කොමිෂන් සභාවට පැමිණිලි කළ බුද්ධි නිළධාරීන්ට විරුද්ධව හෝමාගම මහාධිකරණයට ඉදිරිපත් කර ඇති චෝදනා වන්නේ අනුබල දීමෙන් හා කුමන්ත්‍රණය කිරීමෙන් මාධ්‍යවේදි ප්‍රගීත් රංජන්

බණ්ඩාර එක්නැලිගොඩ නම් මාධ්‍යවේදියා පැහැරගෙන යාම සහ කොළඹ ත්‍රි පුද්ගල මහාධිකරණයේ ගොනු කර ඇති චෝදනා වන්නේ අනුබල දීමෙන්, කුමන්ත්‍රණය කිරීමෙන් නීති විරෝධි ජන රැස්වීමක සාමාජිකයින්ව සිටීමෙන් මාධ්‍යවේදි ප්‍රගීත් රංජන් බණ්ඩාර එක්නැලිගොඩව පැහැරගෙන ගොස් ඔහුගේ මරණය සිදු කිරීම වේ.

**මහාධිකරණය -කොළඹ- චූදිතයින්**

1. ශම්මි අර්ජුන් කුමාරරත්න.
2. ආර්.එම්. පි.කේ. රාජපක්ෂ/නාදන්.
3. වඩුගෙදර විනී ප්‍රියන්ත ඩිලන්ජන් උපසේන නොහොත් සුරේෂ්.
4. සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි.
5. යාපා මුදියන්සේලාගේ චමින්ද කුමාර අබේරත්න.
6. සෙනෙවිරත්න මුදියන්සේලාගේ කනිෂ්ක ගුණරත්න.
7. අයියසාමි බාලසුබ්‍රමනියම්.
8. දංගහ ගමරළලාගේ තරංග ප්‍රසාද් ගමගේ
9. තෙල්ගේ එරන්ත රදීෂ් පීරිස්

**මහාධිකරණය - හෝමාගම - චූදිතයින්**

1. ශම්මි අර්ජුන් කුමාරරත්න.
2. ආර්.එම්.පි.කේ. රාජපක්ෂ/ නාදන්.
3. වඩුගෙදර විනී ප්‍රියන්ත ඩිලන්ජන් නොහොත් සුරේෂ්.
4. සෙනෙවිරත්න මුදියන්සේලාගේ රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි.
5. තාන්තුලගේ ටොෂිනාත් ප්‍රබෝද සිරිවර්ධන.
6. එම්.පී.ජී.ඩබ්.එස්.කේ. උළුගෙදර.
7. සේනාධීර ආරච්චිගේ හේමචන්ද්‍ර පෙරේරා.

මෙම ඉහත දක්වා ඇති සියළු චෝදනාවන් අපරාධ චෝදනාවන් වේ. අපරාධ නීතියට අනුව අපරාධ චෝදනාවක් ඉදිරිපත් කිරීමේදී එම චෝදනාව ඉදිරිපත් කරනු ලබන පාර්ශවය විසින් සාධාරණ සැකයෙන් තොරව එම චෝදනාව ඔප්පු කළ යුතු වේ. ඍජු සාක්ෂි නොමැති වීම සහ රජයේ සාක්ෂිකරුවන් මෙම කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද ප්‍රකාශ සහ දෙනු ලැබූ සාක්ෂි, එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂියේ පවතින විශ්වාසදායකත්වය අඩුවීම නිසා සාධාරණ සැකයෙන් තොරව චෝදනාව ඔප්පු කිරීමට හැකියාව නොමැති බැව් මෙම කොමිෂන් සභාවට පෙනී ගොස් ඇත.

පැමිණිල්ලේ වැදගත් සාක්ෂිකරුවෙකු ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විශ්වාසය තබා ඇත්තේ සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලි (මින් ඉදිරියට මුරලි යන නමින් හැඳින්වෙන) විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දී ඇති ප්‍රකාශය මත වේ. මේ සම්බන්ධ “P8” ලෙස ඉදිරිපත් කර ඇති වැඩිදුර Bවාර්තාවේ සඳහන්ව ඇත. මෙම සාක්ෂිකරුගේ පසුබිම කෙරෙහි අවධානය යොමු කළහොත් මොහු 2009 අගෝස්තු මාසයේ මුල් සතියේ පමණ සිට ගිරිතලේ කඳවුරේ බුද්ධි රාජකාරීවලට සහාය දී ඇති අතර, මොහුට කඳවුර සම්බන්ධයෙන් හා එහි නිළධාරීන් ගැන මනා අවබෝධයක් තිබී ඇත. එසේම මුරලිට ගෙවීමක්ද කර ඇති බැව් මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් හෙළි වී ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගැනීම හා අතුරුදහන් කිරීමේ අපරාධය විමර්ශනය කිරීමේදී මුරලි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ

භාරයට පත්ව සිට ඇත. මුරලි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ භාරයේ සිටින විට එක්නැලිගොඩ පැහැරගැනීම හා අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගත් බුද්ධි නිළධාරීන්ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිට ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටි බුද්ධි නිළධාරීන් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කල සාක්ෂිවලින් හෙළි වූයේ මුරලි බුද්ධි නිළධාරීන්ට වඩා නිදහසක් භුක්තිවිඳි බවයි. මුරලි සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් අතර ඉතා සමීප සම්බන්ධතාවයක් තිබූ බව පෙන්නුම් කරන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රංබණ්ඩාගේ ප්‍රකාශය සටහන් කරගන්නා විටදීය. (2020.09.18 දින රංබණ්ඩාගේ සාක්ෂි පිටු අංක 21,22 සහ 23)

එම ප්‍රකාශය මුරලි කී අන්දමට සටහන් කර ඇති බැව් රංබණ්ඩා මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමේදී ප්‍රකාශ කර ඇත. මේ හෙයින් මුරලි වැන්නෙකුගේ සාක්ෂියක් කෙරෙහි විශ්වාසය තැබිය හැකිද? යන්න ප්‍රශ්නාර්ථයකි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් B වැඩිදුර වාර්තා මගින් අධිකරණයට කරුණු දැක්වීමේදී මුරලි 2009 අගෝස්තු මාසයේ මුල් සතියේ ගිරිතලේ කඳවුරට ගෙන ආ බව දක්වා ඇත. එසේම මාධ්‍යවේදී එක්නැලිගොඩගේ ප්‍රථම පැහැර ගැනීම සිදු වී ඇත්තේ 2009.08.27 දිනාදීය. එනම් මුරලි ගිරිතලේ කඳවුරට පැමිණ සති දෙකක් වැනි කෙටි කාලයකදිය. මෙවැනි කෙටි කාලයකදී හඳුනාගත් අයෙක් කෙරෙහි දැඩි විශ්වාසයක් ඇතිව ඉතා බැරෑරුම් මෙවැනි කාර්යයකට ගිරිතලේ බුද්ධි බලකායේ අණදෙන නිලධාරී විසින් මුරලි වැන්නෙකු සම්බන්ධ

කරගනීද? යන්න සැලකිල්ලට ගතයුතු කරුණකි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව ඔහු වැදගත් සාක්ෂිකරුවෙකි. නමුත් ගිරිතලේ කඳවුරට පැමිණ කෙටි කාලයක් තුල LTTE සංවිධානයේ ත්‍රස්තවාදි සාමාජිකයෙක්ව සිටි මුරලි වැන්නෙක් ගිරිතලේ කඳවුරේ අණදෙන නිළධාරීන් විසින් මෙවැනි ක්‍රියාවකට සහභාගි කරගැනීමේ ප්‍රවණතාවයක් නැති තරම්ය. එය විය හැකි තත්ත්වයකට වඩා විය නොහැකි තත්ත්වයකි. ඒ හෙයින් මුරලි නම් මෙම සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් නිර්මාණය කළ සාක්ෂි ඉදිරිපත් කරවා ගැනීමට යොදාගත් සාක්ෂිකරුවෙක් බවට මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් නිගමනය කළ හැක.

මුරලි විසින් එක්නැලිගොඩව හඳුනාගන්නේ 2002 වර්ෂයේ මඩු වන්දනාවේ ගිය අවස්ථාවකදීය. 2002 වර්ෂය වැදගත් වර්ෂයක් වේ. එනම් මෙම වර්ෂයේදී ලංකා රජය හා LTTE සංවිධානය අතර, සාම ගිවිසුම ඇතිවූ වර්ෂයයි. මෙම වර්ෂයේදී බොහෝ පිරිස් මඩු වන්දනා කිරිමට සහභාගී වූ අතර, මුරලි සහ මාධ්‍යවේදි එක්නැලිගොඩ අතර වූ මෙම හමුවීම මෙන්ම මෙම සබඳතාවය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ගේ අවධානයට ලක්ව තිබියදී මෙම විමර්ශනය ආරම්භ කළ අවස්ථාවේදී මුරලිගේ සහයෝගය ඇතිව මුරලි මගින් මෙම කතාන්දරය නිර්මාණය කිරීමටත්, එම නිර්මාණය කළ ප්‍රකාශ පැමිණිලිකරුවන් වන බුද්ධි නිළධාරීන් මගින් ප්‍රකාශ කරවා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැඩි වෙහෙසක් උත්සාහයක් මෙන්ම බොහෝ ප්‍රයත්න දරා ඇත.

මුරලිගේ සාක්ෂි සාරාංශයේ ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන්ව ඔහුගේ ඥාතියෙකු ලෙස එක්නැලිගොඩට හඳුන්වාදී ඇති බව දක්වා ඇත. ඉන්පසු ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන්ට ඉදිරියේදී වැඩ කටයුතු කරගෙන යාමට පහසු කිරීමක් ලෙස මෙම හඳුන්වාදිම නිර්මාණය කළාද? යන්න ප්‍රශ්නයකි.

ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන්ට මුරලිගේ ඥාතියෙකු ලෙස හඳුන්වා දීමේ වැදගත්කම කුමක්ද? එසේම එක් වතාවකදී ඥාතියෙකු ලෙස හඳුන්වා දී තවත් වතාවකදී දඹුල්ලේ එළවළු වෙළඳ ව්‍යාපාරියෙකු ලෙස හඳුන්වා දී ඇත. මේ සම්බන්ධයෙන්ද අවස්ථා දෙකකදී ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන්ව දෙයාකාරයකට හඳුන්වා දී ඇති බැව් පෙනේ. මෙවැනි කිසිදු පදනමක් රහිත සාක්ෂිකරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි අපරාධයක් කළාද යන්න සනාථ කිරීමට අදාළ කර ගත හැකිද? උපුටා ගැනීමක් කළ හැකිද? විශ්වාසය තැබිය හැකිද? මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් මුරලිගේ සාක්ෂි කිසිසේත්ම පිළිගත නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැව් කොමිෂන් සභාවට පෙනී ගොස් ඇත.

මුරලිව සාක්ෂිකරුවෙකු ලෙස නම් කොට ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට පත්වීමෙන් පසුවය. මෙම විමර්ශනවලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලිකම අරමුණ වී ඇත්තේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශ ලබාගැනීමයි. මෙම නිසා මුරලිද සාක්ෂිකරුවෙකු වශයෙන් පත්ව ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද සාක්ෂි මුරලි මගින් ඉදිරිපත් කිරීමට හැකිවූ නිසා බවට නිගමණය කළ හැක්කේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අත්අඩංගුවට ගත්

සෑම අයෙකුගෙන්ම ප්‍රකාශ ලබාගැනීමට උත්සාහ කළ බව මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් පැමිණිලිකරුවන්ගේ සාක්ෂි වලින් පැහැදිලිවම මනාව පෙන්නුම් කරනු ලබන නිසාවෙනි.මෙවැනි සාක්ෂිකරුවෙකුගේ සාක්ෂිවල කිසිදු වටිනාකමක් නොමැති බවට මෙම කොමිෂන් සභාව තීරණය කරයි.

එසේම මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සෑම සාක්ෂිකරුවෙක්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද ප්‍රකාශ එම සාක්ෂිකරුවන් මගින් ප්‍රකාශ කරවා ගැනීමට දැඩි වෙහෙසක් ගත් බැව් මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් පැමිණිලිකරුවන්ගේ සාක්ෂි වලින් පැහැදිලිව පෙනී ගොස් ඇත.

මේ අනුව මුරලිගේ සාක්ෂියද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රබන්ධ කරනු ලැබූ සාක්ෂියක් විය යුතු බවට ඉදිරිපත් වූ සාක්ෂි අනුව මෙම කොමිෂන් සභාවට පෙනී ගොස් ඇත.

එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරුවන්ට එරෙහිව චෝදනා ඔප්පු කිරීම සඳහා රජයේ සාක්ෂිකරුවෙක් බවට පත් කර ඇති විශ්‍රාමික බලලත් නිළධාරී ජයසුන්දර මුදියන්සේලාගේ රංබණ්ඩා යන අයගේ සාක්ෂිය කෙරෙහි දැඩිව අවධානය යොමු කළ යුතුය. ෂම්මි කුමාරරත්නගේ සාක්ෂියේදී ඉදිරිපත් කළ P8 ලේඛණය අනුව බලලත් නිළධාරී II රංබණ්ඩා යන අය 2017.04.09 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණ ප්‍රකාශයක් ලබාදුන් බව 2017.05.03 වන දින හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ B7417/2010 යන අංකය යටතේ වාර්තා කර ඇත. (P11) සාක්ෂිකරු රංබණ්ඩා විසින් මෙම කොමිෂන් සභාවට දෙනු ලැබූ සාක්ෂියේදී

ප්‍රකාශ කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් ප්‍රකාශයක් නොදුන් බවත්, B වාර්තාවේ දක්වා ඇති අන්දමට 2017.04.19 වන දිනය නොවන බවත්, තම නිවස ආසන්නයේ කුඹුරේ වැඩ කරමින් සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් 2015.08.09 වන දින රංබණ්ඩාව රැගෙන ඒමට පැමිණි දිනය වන බවටත් ප්‍රකාශ කර ඇත.(රංබණ්ඩා විසින් 2020.09.18 වන දින සාක්ෂි පිටු අංක 16 – 17) එසේම මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් රංබණ්ඩා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටි බවට එම කාලය තුලදි අත්අඩංගුවේ සිටි අනෙක් පැමිණිලිකරුවන් ඔවුන්ගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

තවද, රංබණ්ඩා ගෙන යාමට  අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් පැමිණි අවස්ථාවේදී මුරලිද එහි පැමිණ සිටි බව තමන් දුටු බවට රංබණ්ඩා ප්‍රකාශ කර සිටී. රංබණ්ඩා විසින් කොමිෂන් සභාව ඉදිරියේ දෙන ලද සාක්ෂි අනුව  අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින්ගේ තර්ජන, පොරොන්දු සහ පෙළඹවීම් හේතු කොට ගෙන එම නිළධාරීන් නිර්මාණය කරන ලැබූ ප්‍රකාශයක් මහේස්ත්‍රාත්වරයා ඉදිරියේදි ප්‍රකාශ කළ බව දක්වා සිටි. (2020.09.18 වන දින රංබණ්ඩාගේ ප්‍රකාශය පිටු අංක 31 සිට 37 දක්වා) මේ අනුව මහේස්ත්‍රාත් අධිකරණයේදි මහේස්ත්‍රාත්වරයා  ඉදිරියේ රංබණ්ඩා කර ඇති ප්‍රකාශය පිළිගත හැකි සාක්ෂියක්ද? රංබණ්ඩා මෙම කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද ප්‍රකාශය හේතුවෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ කරන ලද ප්‍රකාශයේ ස්වේච්ඡාභාවයට බරපතල ලෙස හානි සිදුව ඇති බැවි හා එම සාක්ෂිවල විශ්වාසදායකත්වය පළුදුවීමක් සිදුව ඇති බවට මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

එසේම තවත් රජයේ සාක්ෂිකරුවෙකු වූ පැමිණිලිකරුවෙක් වන තුවාන් නසාර් මුතාලිෆ් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති ප්‍රකාශය බලෙන් ලබාගත් ප්‍රකාශයක් ලෙස මෙම කොමිෂන් සභාව ඉදිරියේ 2020.09.19 වන දින දී ප්‍රකාශ කර ඇත. (පිටු 27,28 සහ 29)

මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දෙන ලද ප්‍රකාශය හා කොමිෂන් සභාව ඉදිරියේ දුන් සාක්ෂිය අතර බරපතල වෙනසක් ඇත. ඒ හෙයින් මෙවැනි සාක්ෂි මගින් අපරාධ වරදක් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමට හැකියාවක් නොමැති බව පැහැදිලිවම මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රබෝධ සිරිවර්ධනගේ නිවස පරික්ෂා කිරීමේදී ලේඛණ කිහිපයක් සොයා ගෙන ඇති අතර, මෙම ලේඛණවල අන්තර්ගතය අනුව මෙම නිළධාරියා ඇතුළු නිළධාරීන් කිහිප දෙනෙකු මුරලි සමඟ 2009.08.27 වන දින හබරණට ගොස් මාධ්‍යවේදී එක්නැලිගොඩ හමු වී ඇති බව පෙන්වීමට එම ලේඛණ සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු වන ප්‍රබෝධ සිරිවර්ධන 2020.08.17 වන දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමේදී සහ පසුව ඉදිරිපත් කළ සාක්ෂිවලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දෙන ලද ප්‍රකාශය "P26" ලෙස සලකුණු කර ඇත. මෙම ප්‍රකාශයේදී ප්‍රබෝධ සිරිවර්ධන දක්වා ඇත්තේ Operation Double Edge මෙහෙයුමේදී පී. රංජිත් නමැත්තෙකු සම්බන්ධයෙන් විමර්ශණයක් කළ බවත්, ඒ සඳහා මුරලිගේ සහාය ලබාගත් බවත්, නමුත් මෙය මාධ්‍යවේදී එක්නැලිගොඩ සම්බන්ධයෙන් කරනු ලැබූ විමර්ශණයක් නොවන

බවට වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම සාක්ෂියෙන් ගෙන හැර දක්වන්නේ බුද්ධි නිළධාරීන් විසින් සිද්ධිය වූ දිනයේ හබරණදී මාධ්‍යවේදී එක්නැලිගොඩව හමු වූ බවයි. කෙසේ වුවත්, මෙම සිද්ධිදාමයත් අපරාධයක් අතර කිසිදු සම්බන්ධතාවයක් නොමැති බව පැහැදිලිවම පෙනි යයි. මේ හෙයින් මෙම සාක්ෂිය  අපරාධය ඔප්පු කිරිමට ඉවහල් කරගත නොහැකි බැව් කොමිෂන් සභාව තීරණය කරයි.

එසේම ලුතිනන් කර්නල් තෙල්ගේ එරන්ද රදීෂ් පිරිස් 2020.08.26 වන දින සාක්ෂි දෙමින්  ප්‍රකාශ කර සිටියේ 2010.01.20 වන දින සිට 2010.01.26 වන දින දක්වා සාදන ලද නව නිවසට ගෙවැදීමේ චාරිත්‍රණුකුල කටයුතු සඳහා දින 06ක් නිවාඩු ලබා ගත් බවත්, ජනාධිපති මැතිවරණය නිසා 2010.01.25 වන දින දී නැවත රාජකාරියට වාර්තා කළ බවත්ය. මෙම පැමිණිලිකරු ඉහත කාලසීමාව තුළ නිවාඩු ලබාගෙන සිටි බවට ඔහු විසින් නිවාඩු ඉල්ලුම් කරන ලද නිවාඩු අයදුම් පත ඉදිරිපත් කර තිබියදීත්, එසේම ඔහුගේ බිරිඳගේත්, බිරිඳගේ සහෝදරයාගේත් සහ උත්සවයට සහභාගි වූ තවත් නිළධාරීන් දෙදෙනෙකුගේත් ප්‍රකාශ ලබාගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කර තිබූ අතර, එසේ ලබාගත් නිවාඩු අයදුම් පත සහ ප්‍රකාශ ලබාගෙන තිබියදීත් ඔහුව අත්අඩංගුවට ගත් බවත් ප්‍රකාශ කර සිටී.  (පිටු 17,18 සහ 19 ) මෙවැනි පැහැදිලි සාක්ෂි තිබියදීත්, මෙම නිළධාරියා ඇතුළු අනෙක් නිළධාරීන්ට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනා  ඔප්පු කළ හැකිද? යන්න කෙරෙහි අවධානය යොමු විය යුතු බව මෙම කොමිෂක් සභාව විශ්වාස කරනු ලබයි.

මේ අන්දමින් බලන කල විශ්ලේෂණයට ලක් වූ මුරලි, රන්බණ්ඩා, මුතාලිෆ්, සහ මුතාලිෆ්ගේ සහෝදරිය වන නෛයි හනිදා මුතාලිෆ් යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ඉතා දුර්වල තත්ත්වයක තිබෙන නිසා අධිචෝදනා දෙකෙහිම දක්වා ඇති චෝදනා සාධාරණ සැකයෙන් තොරව ("Beyond a Reasonable doubt") ඔප්පු කිරීමට ප්‍රමාණවත් නොවේ.

හෝමාගම මහාධිකරණයෙත් කොළඹ ත්‍රිපුද්ගල අධිකරණයේත් මෙම සැකකරුවන්ට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනාවන් අපරාධ චෝදනාවන් වේ. ශ්‍රී ලංකා නීතියට අනුව අපරාධ චෝදනාවක් අධිකරණය ඉදිරියේ ඔප්පු කල යුත්තේ සාධාරණ සැකයෙන් තොර සාක්ෂි ඉදිරිපත් කිරීමෙනි. එසේම අපරාධ නීති සිද්ධාන්තය අනුව විත්තිකරුවන්ට සාධාරණ සැකයේ වාසිය හිමි වේ. එසේම විත්තිකරුවෙකු ඔහුගේ අපරාධ නඩුකරය ආරම්භ කරනු ලබන්නේ ඔහුගේ වාසියට ඔප්පු කරන තුරු නිවැරදිකරු යැයි පූර්ව නිගමනයක් තිබෙන හෙයිනි.

අපරාධ නඩුවල වියහැකි භයානක ප්‍රතිඵල නිසා සාවද්‍ය අන්දමින් ක්‍රියා කළහොත් විත්තිකරුවන්ට මෙන්ම සමාජයටද භයානක ප්‍රතිඵල ඇතිවිය හැකි හෙයින් අපරාධකරුවන්ගේ වරදකාරීත්වය තීරණය කිරීමේදී දැඩි අවධානයකින් තීරණය කළ යුතු බව මෙම කොමිෂන් සභාව අදහස් කරයි.

මෙයින් අදහස් වන්නේ සාක්ෂි ප්‍රත්‍යක්ෂ වීමේ අවශ්‍යතාවය සලකා බැලීම මෙන්ම, ඊට සමගාමීව එම සාක්ෂිවල විය හැකි භාවයේ සම්භාවිතාවක් තිබිමද අවශ්‍ය බවය. මේ අනුව මෙතෙක් ඉදිරිපත් වූ

සාක්ෂිවල මෙවැනි ඉහළ සම්භාවිතාවක් මෙන්ම ප්‍රත්‍යක්ෂ සාක්ෂි ද දක්නට නොමැති බැව් මෙම කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

එක්නැලිගොඩ පැහැර ගැනීම හා පැහැරගෙන අතුරුදහන් කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනය කිරීමේදී දූරකථන භාවිතය කළ ප්‍රදේශයේ දූරකථන කුලුණුවල දත්තයන් විශ්ලේෂණයට ලක් කර එම දූරකථන භාවිතා වූ ප්‍රදේශ අනුසාරයෙන් යම් යම් නිගමණවලට පැමිණීමට දැඩි උත්සාහයක් ගෙන ඇත.

මෙම විමර්ශණය ආරම්භයේදී සුමතිපාල සුරේෂ් කුමාර් නොහොත් තවේන්ද්‍රන් නොහොත් මුරලිගේ ප්‍රකාශ සටහන් කිරීමෙන් පසු එහි ඇතුලත් කරුණු අනුසාරයෙන් ගිරිඋල්ල කඳවුරේ යුධ හමුදා නිළධාරීන් ගමන් කරනු ලැබූ ප්‍රදේශ සම්බන්ධයෙන් විමර්ශනයට ලක් කර ඇත. මාධ්‍යවේදි එක්නැලිගොඩ පැහැර ගැනිම සම්බන්ධයෙන් වූ චෝදනාව සනාථ කිරීමට බොහෝ දුරට මුරලිගේත්, රංබණ්ඩාගේත්, මුතාලිෆ්ගේත් ප්‍රකාශ කෙරේ තදබල විශ්වාසයක් තබා ඇත. කෙසේ වුවද හෝමාගම මහාධිකරණ අධි චෝදනා පත්‍රයට දූරකථන අංක ඇතුලත් කිරීමෙන් පෙනී යන්නේ එම දූරකථන සම්බන්ධයෙන් සොයා ගන්නා ලද සාක්ෂි, පැහැර ගැනීම සනාථ කිරිම සඳහා උපයෝගි කරගනු ලබන බවයි. එසේම ත්‍රි පුද්ගල මහාධිකරණයේ අධි චෝදනා පත්‍රයේද 2009.08.27 වන දිනට අදාල දූරකථන ඇමතුම් පැමිණිලි පක්ෂය විසින් නඩු විභාගයකදී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව පෙනී යයි. මෙලෙස දූරකථන අංකයන් කුලුණු සමග සසඳා ඒ ඒ දූරකථන විශ්ලේෂණයේ දක්වා ඇති ප්‍රදේශවල, ක්‍රියාත්මක වූ බව දක්වමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් එම දූරකථන භාවිතා කළ අය

ක්‍රියාත්මක වූ ප්‍රදේශයේ සිටි බවට නිගමනය කර ඇති බව පෙනෙන අතර, එම ප්‍රදේශයේ "එම දුරකථතන හිමිකරුවන් ගියේ කුමක් නිසාද, එසේ එහි රැඳී සිටියේ කුමන හේතුවක් නිසාද යන්න එම දුරකථන හිමියන් ප්‍රකාශ කල යුතුය" යන මතයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශකයින් සිටි බව B වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් නිගමනය කල හැක.

මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගැනීම සිදුවීම වූ දිනයේදී එනම් 2009.08.27 වෙනි දින ඔහුට අයත් හබරන පිහිටි ඉඩමට යන බව ඔහුගේ බිරිඳට පවසා නිවසින් පිට ගොස් ඇති අතර, ඔහු එසේ යනවිට ඔහුගේ එකී දුරකථන අංකයක් වන 077475523 ගෙන ගොස් ඇති අතර එම දුරකථනය හබරණට යන තෙක් ක්‍රියාත්මකව තිබූ බව හා ඔහුගේ අනෙක් දුරකථන අංකය වන 0771038090 මෙදින උදේ සහ දවල් කාලයේ ගිරිතලේ ප්‍රදේශයේද ක්‍රියාත්මක වූ බවද සවස් කාලයේ හබරණ ප්‍රදේශයේදී ක්‍රියාත්මක වූ බවද දුරකථන විශ්ලේෂණය අනුව පෙන්නුම් කරනු ලබන නිසා මාධ්‍යවේදී එක්නැලිගොඩ සිද්ධිය වූ දින හබරණ ප්‍රදේශයේ සිටි බවට දැක්වෙන සාක්ෂියක් ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පෙන්වා දී ඇත. (2016.08.01 වෙනි දින හෝමාගම මහේස්ත්‍රාත් උසාවි අධිකරණ අංක B7417/10 යටතේ ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තා)

එසේම 2010.01.24 වෙනි දින මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන අතුරුදහන් කළා යැයි සැකකරනු ලබන බුද්ධි නිළධාරීන් සවස් කාලයේ සහ රාත්‍රී කාලයේ බත්තරමුල්ල ප්‍රදේශයේ භාවිත වූ දුරකථන හා එම ප්‍රදේශයේ ඉදිකර ඇති දුරකථන කුලුණුවල දත්තයන් අනුසාරයෙන් කරන ලද විශ්ලේෂණයේදී එම ප්‍රදේශයේ භාවිත කළ දුරකථන හිමිකරුවන් කෙරෙහි සැකයක් ඇති කරගෙන ඇති බව

අධිකරණය ඉදිරියේ කරන ලද B වාර්තා සහ වැඩිදුර වාර්තාවලින් පැහැදිලි වේ.

දුරකථන ඇමතුම් සම්බන්ධ කරන ලද විමර්ශන අනුව කර්නල් ෂම්මි කුමාරරත්න ගිරිතලේ කඳවුරේ අණදෙන නිළධාරීගේ දූරකථන අංකය වන 0777506092, 2010.01.24 වන දින උදේ වරුවේ භාවිතා වී ඇත්තේ ගිරිතලේ ප්‍රදේශයේ වන අතර, පසුව සවස් කාලයේදී කුණ්ඩසාලය, තලාතුඔය, කෑගල්ල, නෙලුන්දෙණිය, අඹේපුස්ස, වේවැල්දෙණිය, පස්යාල, බැලුම්මහර, වැලිවේරිය, මාලඹේ හරහා 20.34 පැයට බත්තරමුල්ල ප්‍රදේශයේ දූරකථනය ක්‍රියාත්මක වී ඇති අතර, ඊට පසු එම දූරකථනය 21.07 දක්වා බත්තරමුල්ලේ ප්‍රදේශයේ සක්‍රීයව තිබූ අතර, ඉන්පසු නැවත වරක් වික්‍රමසිංහපුර, මාලඹේ, කඩුවෙල, පොල්ගහවෙල, හබරණ හරහා 2010.01.25 වන දින ගිරිතලේ ප්‍රදේශයේ නැවත ක්‍රියාත්මක වී ඇති බැව් දත්ත අනුව වාර්තා කර ඇත. එසේම 2010.01.24 වෙනි දින ඉහත සඳහන් කාලයට සාපේක්ෂව අයියසාමි බාලසුබ්‍රමනියම්ගේ 0723764314 අදාල දූරකථන අංකය සහ (මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද 2016.02.18 වෙනි දින හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කල වැඩිදුර වාර්තාව), කණිෂ්ක ගුණරත්නගේ දූරකථන අංකය වෙන 0718264723. මෙම නිළධාරීන් ගිරිතලේ සිට අඹේපුස්ස දක්වාත්, අඹේපුස්ස හරහා බත්තරමුල්ලට පැමිණි ඇති බව, දූරකථන කුලුණු මාර්ගයෙන් නිරීක්ෂණය වී ඇති අතර, නැවත ගිරිතලේට ගොස් ඇති බැව් 2016.02.07 වෙනි දින හෝමාගම මහේස්ත්‍රාත් උසාවි B 7417/2010 යන වැඩිදුර Bවාර්තාවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට වාර්තා කර ඇත.

එසේම මෙම දුරකථනය ගිරිතලේ සිට අම්පාර ප්‍රදේශයේ අක්කරේපත්තුව දක්වා 2010.01.25 වෙනි දින ක්‍රියාත්මක වී ඇති බැව් දුරකථන සමාගම් මගින් ලබාගත් දත්ත අනුසාරයෙන් කරුණු ඉදිරිපත් කර ඇත. ගිරිතලේ හමුදා කඳවුරේ අණදෙන නිලධාරී ෂම්මි කුමාරරත්න විසින් භාවිතා කළ 0777506092 යන දුරකථනය අක්කරේපත්තු ප්‍රදේශයේදී 0773971201 සහ 0777005423 යන දුරකථන අංක සමග 2010.01.25 වෙනි දින 2010.01.26 වෙනි දින 2010.01.27 වෙනි දින සම්බන්ධ වී ඇති බව, මෙම සිද්ධිය 2016.01.08 වෙනි දින හෝමාගම මහේස්ත්‍රාත් උසාවි අංක 7410/2010 යටතේ වැඩිදුර B වාර්තාවෙන් අධිකරණයට වාර්තා කර ඇත.

ඉහත දැක්වූ කරුණුවලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශකයින් දැක්වීමට උත්සාහ කරන්නේ 2010.01.24 වෙනි දින උදේ වරුවේ කර්නල් ෂම්මි කුමාරරත්න ගිරිතලේ කඳවුරේ සිටි බවත් එසේම සවස් කාලයේදී ඔහුගේ දුරකථනය බත්තරමුල්ල ප්‍රදේශයෙන් ක්‍රියාත්මක වූ බවත් පසුදින එනම් 2010.01.25 වෙනි දින ඔහුගේ දුරකථනය අක්කරේපත්තු ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ බවත් අනික් නිලධාරීන්ට මීට සාපේක්ෂව එම ප්‍රදේශවල ඔවුන්ගේ දුරකථන ක්‍රියාත්මක වූ බව සහ එම නිලධාරීන් එම ප්‍රදේශයේ සිටි බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නිගමනය කර ඇත.

මෙම කාලය තුළම එනම් සැකකරු රවීන්ද්‍ර රූපසේන සැකකරු කණිෂ්ක ගුණරත්න සහ සැකකරු තරංග ප්‍රසාද් ගමගේ යන අයගේ දුරකථන ඇමතුම් වාර්තා අනුව අනාවරණය වී ඇත්තේ 2010.01.25 වෙනි දින මෙම දුරකථන අක්කරේපත්තු ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ බව

වැඩිදුර වාර්තාවලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයට වාර්තා කර ඇත.

එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුව ෂම්මි කුමාරරත්නගේ දුරකථන දත්ත විශ්ලේෂණ වාර්තාව අනුව 2010.01.24 වෙනි දින රාත්‍රී පැය 1.43 සිට පැය 03.30 දක්වා අවදියෙන් සිටි බව දුරකථන වාර්තා අනුව අධිකරණයට 2016.08.01 දින වැඩිදුර Bවාර්තාවෙන් වාර්තා කර ඇත.

2010.01.25 වෙනි දින හෝමාගම මහේස්ත්‍රාත් උසාවියේ 1වෙනි සැකකරු ෂම්මි කුමාරරත්න, 5වෙනි සැකකරු රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි, 9වෙනි සැකකරු තරංග ප්‍රසාද් ගමගේ යන අයගේ දුරකථන දත්තයන්ට අනුව උදේ වරුවේ ගිරිතලේ කඳවුරේ සිටි බවට පෙන්වන අතර, ඉන්පසු දුරකථන සක්‍රිය වී ඇත්තේ අක්කරේපත්තුවේ නිසා රංබණ්ඩාගේ ප්‍රකාශය අනුව බුද්ධි නිළධාරීන් විසින් රැගෙන ගිය බවට බොහෝ දුරට තහවුරුවන බව 2016/8/1 වැඩිදුර වාර්තාවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයට වාර්තා කර ඇත.

0723764314 දුරකථන අංකය හිමිව ඇත්තේ අයියසාමි බාලසුබ්‍රමනියම්ට වන අතර, මෙම නිළධාරියාගේ දුරකථනය 2010.01.24 වන දින උදේ ගිරිතලේ ප්‍රදේශයේ සක්‍රිය වූ බවත්, එදිනම රාත්‍රියේ පැය 20.15 සිට පැය 21.03 දක්වා බත්තරමුල්ල ප්‍රදේශයේදී සක්‍රීය තත්ත්වයේ තිබූ බවත්, 2010.01.25 වෙනි දින පැය1.34න් පසු ගිරිතලේ ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ බවත් වාර්තා කර තිබේ.

කණිෂ්ක ගුණරත්න 2010.01.24 වෙනි දින ඔහුගේ දූරකථනය මැද මහනුවර සිට කෑගල්ල, අඹේපුස්ස, වරකාපොල, නිට්ටඹුව, මාලඹේ යන ප්‍රදේශ පසුකර පැය 20.23ට බත්තරමුල්ල ප්‍රදේශයේදී දූරකථනය සක්‍රීය වී තිබුණු බවත්, ඉන්පසු 2010.01.25 වෙනි දින පැය 00.27 සක්‍රීය වූ බව වාර්තා කර ඇත. එසේම ගිරිතලේ කඳවුරේ අණදෙන නිළධාරී වූ කුමාරරත්න 2010.01.24 වෙනි දින ගිරිතලේ සිට පැය 20.34ට බත්තරමුල්ල ප්‍රදේශයේ ඔහුගේ දූරකථනය සක්‍රීය වී තිබුණු බවත්, පසුව 2010.01.25 වෙනි දින නැවත ගිරිතලේට ගිය බවද, දූරකථන කුලුණු දත්තයන් මගින් නිළධාරීන්ගේ ඒ ඒ ප්‍රදේශවලට යාම් ඊම් අනාවරණය කර ඇත.

ජංගම දූරකථන සම්බන්ධයෙන් සපයා ඇති දූරකථන කුලුණු හා දූරකථන භාවිතය ආශ්‍රයෙන් ලබා ගත් දත්තයන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනාවරණය කිරීමට ප්‍රයත්නයක් දරනුයේ පැමිණිලිකරුවන් වන හමුදා බුද්ධි නිළධාරීන් 2010.01.24 වෙනි දින සවස් කාලයේදී ගිරිතලේ සිට බත්තරමුල්ලට පැමිණ එක්නැලිගොඩ පැහැරගෙන ගොස් ගිරිතලේ කඳවුරේ රඳවා පසු දින උදෑසන අක්කරේපත්තුව ප්‍රදේශයට ගෙන ගොස් මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩව අතුරුදහන් කළ බවට සැක කරනු ලබන්නේ මෙම දූරකථන දත්තයන් උපයෝගී කරගෙන වේ. මෙම දූරකථන දත්තයන්ගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව උත්සාහ ගෙන ඇත්තේ ගිරිතලේ කඳවුරේ ෂම්මි කුමාරරත්න සහ ඔහු යටතේ සිටි හමුදා නිළධාරීන් කිහිප දෙනෙක් සමග කුමන්ත්‍රණය කොට බත්තරමුල්ලට ගොස් මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන පසුදින අක්කරේපත්තුවේදී අතුරුදහන් කළ බවට සැකයක් ඇති බව අධිකරණයට වාර්තා කර ඇත.

නමුත් දුරකථන දත්තයන් හා කුලුණු දත්තයන්ගෙන් හෙළිවන්නේ ඒ ප්‍රදේශයේ දුරකථනය සක්‍රීය වූ බවක් මිස සිදු වී ඇති එනම් මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන යාම හා පැහැරගෙන අතුරුදහන් කිරීමේ අපරාධයට මෙම දත්තයන්ගෙන් කිසිදු ඍජු සම්බන්ධතාවයක් තිබූ බව අනාවරණය වී නොමැත. එවැනි සම්බන්ධයක් නොමැතිව තිබියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම දුරකථන අංක භාවිතා කල බුද්ධි නිළධාරීන් මෙම අපරාධය කළ බවට හුදු සැකයක්ම මිස අපරාධ චෝදනාවක් ඉදිරිපත් කිරීම කිසිදු පදනමක් නොමැත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇති දුරකථන විශ්ලේෂණය අනුව සැකකරුවන් කිහිප දෙනෙකුගේ දුරකථන බත්තරමුල්ල ප්‍රදේශයේ සක්‍රීයව තිබූ බව දැක්වීමෙන් මෙම දුරකථන හිමිකරුවන් හෝ ක්‍රියාකාරීන් අපරාධයක් කිරීමට ආ බව දැක්විය නොහැක. ඇතැම් විටෙක මෙය හුදු සැකයක් පමණක්ම විය හැකිය. මෙලෙස හුදු සැකයක් පමණක් නම් අපරාධ වරදක් ඔප්පු කිරීමට ප්‍රමාණවත් නොමැත.

එසේම කුලුණු ආශ්‍රයෙන් ලබාගන්නා තොරතුරු අනුව පෙන්වන ප්‍රදේශය අති විශාලය. මෙම කුලුණු දත්තයන්ගෙන් විශේෂ තැනක දුරකථන ක්‍රියාකරු සිටින බව දැක්විය නොහැක. බත්තරමුල්ල ප්‍රදේශය විශාල ප්‍රදේශයක් වන නිසා සැකකරනු ලබන සියලුම නිළධාරීන් එක් ස්ථානයක සිටි බව දැක්විය නොහැක. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම අත්අඩංගුවට ගත් නිළධාරීන්ගෙන් ප්‍රශ්න කල විට ඇතමෙක් ඒ ඒ ප්‍රදේශවලට ගොස් ඇති බව පිළිගන්නා අතර, තව කිහිපදෙනෙකු දිගු කාලයකින් පසුව ප්‍රකාශ දෙන නිසා අමතක වී ඇති බව ප්‍රකාශ කරයි. යම් කෙනෙකු එසේ ගිය බවට ප්‍රකාශ කළද ඔහු යම් අපරාධයක් එම ප්‍රදේශයේදී කළ බව දැක්වීම හා

එම සාක්ෂි අපරාධයක් සනාථ කිරීමට ප්‍රමාණවත් නොවේ. ඒ ඒ ප්‍රදේශවල නිළධාරීන් සිටි බවට පිළිගන්නා අය එකම ස්ථානයක රැස්වී අපරාධයක් කිරීමට සැලසුම් කලා යැයි දැක්වීමට ගෙන ඇති උත්සාහය කිසිදු පදනමක් නොමැත. මේ නිසා කුලුණු ආශ්‍රයෙන් ලබාගත හැකි සාක්ෂිවල වටිනාකම ඉතා අඩු තත්ත්වයක තිබෙන බව අවධාරනයෙන් දැක්විය යුතුය. මෙම සාක්ෂි වෙනත් පිළිගත හැකි සාක්ෂිවලින් සනාථ කිරීමට හැකිනම් දූරකථන දත්ත සම්බන්ධයෙන් සාක්ෂි සහාය කරගත හැකිවේ. නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම දූරකථන දත්තයන් මගින් ප්‍රයන්තයක් දරන්නේ එම දූරකථන හිමිකරුවන් කිහිප දෙනෙකු මාධ්‍යවේදී එක්නැලිගොඩ පදිංචිව සිටි ප්‍රදේශයට පැමිණ ඇති බවත් සිදු වී ඇති අපරාධයට මෙම නිගමනය ඉදිරිපත් කළ නොහැක්කේ අපරාධයට ඍජුව කරුණු ඉදිරිපත් වී නොමැති බැවිනි.

බුද්ධි නිළධාරීන්ගේ රාජකාරිය වන්නේ බුද්ධි තොරතුරු එක්රැස් කිරීමයි. එම තොරතුරු එක්රැස් කිරීම සඳහා මෙම නිළධාරීන් විවිධ ප්‍රදේශවලට යැමට සිදු වීම සාමාන්‍ය කරුණකි. යම් ප්‍රදේශයක දූරකථනය ක්‍රියාත්මක වී තිබීම නිසා එම තැනැත්තා එම ප්‍රදේශයට ගියේ අපරාධයක් කිරීමට හෝ අනෙක් අය සමග සම්බන්ධවී අපරාධය කිරීමට ගිය බවට ඇති සාක්ෂිය අධිකරණයක් ඉදිරියේ අපරාධ චෝදනාව ඔප්පු කිරීමට ප්‍රමාණවත් නොවේ. යම් කෙනෙක් එම ප්‍රදේශයේ සිට වෙනයම් ක්‍රියාවක් කර අපරාධයට සම්බන්ධ වූවා නම් එම අපරාධ කිරීමට එම අපරාධකරු එම ප්‍රදේශයේ සිටි බව ඔප්පු කිරීමට එම දත්ත සාක්ෂිය ප්‍රමාණවත් වේ. මේ හෙයින් දූරකථන දත්තයන් මගින් කෙනෙකු යම් ස්ථානයක සිටි බවට දැක්වීම පමණකින් එම තැනැත්තා අපරාධයක් කළ බව හෝ එම කිරීම සඳහා

කුමන්ත්‍රණය කිරීමට පැමිණි බව දැක්වීමට මෙම දත්තයන් උපයෝගී කර ගැනීම ප්‍රමාණවත් නොවන බව කොමිෂන් සභාව අදහස් කරයි. මේ නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දුරකථන දත්තයන් මගින් ඒ ඒ ස්ථානවල නිලධාරීන් සිටි බව දැක්වීමෙන් ඔවුන් එම අපරාධය කළ බවට එම දත්තයන් සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමට අදහස් කළද, අපරාධ චෝදනාවක් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කළ යුතු හෙයින් මෙම දුරකථන දත්තයන් අපරාධයක් ඔප්පු කිරීමට යොදාගත හැක්කේ ඒ සමගම තවත් සාක්ෂි එක් කිරීමෙනි. මේ නිසා දුරකථන දත්තයන් හුදකලාව අපරාධයක් ඔප්පු කිරීමට ප්‍රමාණවත් නොවන බව මෙම කොමිෂන් සභාව තීරණය කර

මෙම කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් අති විශේෂ ගැසට්පත්‍රය අංක 2157/44 මගින් 2020 ජනවාරි මස 09 වෙනි දින පිහිටවනු ලැබූ අතර, “2015 ජනවාරි මස 8වන දිනෙන් ආරම්භ වී 2019 නොවැම්බර් මස 16” වෙනි දිනෙන් අවසන් වූ කාල සීමාව තුල නිළතල දැරූ රජයේ නිළධාරීන් රාජ්‍ය සංස්ථා සේවකයින් සන්නද්ධ හමුදාවන්හි සහ පොලිස් සේවයේ සාමාජිකයින්ට සිදූ වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳව පරීක්ෂා කර, තොරතුරු ලබාගැනීම සඳහා මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ස්ථාපනය කර ඇති අතර, දේශපාලන පළිගැනීම් හේතුවෙන් අගතියට පත්වූ ඇතැයි සලකන අවස්ථාවලදී එලෙස අගතියට පත්වීම විමර්ශනයට ලක්කොට එම අහිතකර බලපෑම් වැළැක්වීමට අවශ්‍ය ක්ෂණික පියවර ගැනීම. මෙම කොමිෂන් සභාව පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වේ.

මේ අනුව මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන යාම හා පැහැරගෙන අතුරුදහන් කිරීම සම්බන්ධ සිද්ධියේ අත්අඩංගුවට ගෙන,

අපරාධ නඩුවලට යොමු කරන ලද නිළධාරීන්, එසේ සිදු වූයේ දේශපාලන පළිගැනීම් හේතුව මතද යන්න විමර්ශනය කිරීම මෙම කොමිෂන් සභාවේ වැදගත් කාර්යය වේ. මේ අනුව අත්අඩංගුවට ගත් බුද්ධි නිළධාරීන් සියලු දෙනාම කිසිදු පැකිලීමකින් තොරව දේශපාලන පළිගැනීමේ අනිසි ප්‍රතිඵලයක් වශයෙන් බන්ධනාගාර ගතවීමට සිදුවූ බව මෙම කොමිෂන් සභාව ඉදිරියේ ලේඛන සහිතව සාක්ෂි, පැමිණිලිකරුවන් ඉදිරිපත් කර ඇත.

මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන යෑම / පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීමේ විමර්ශන ආරම්භ කිරීමට පෙර, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ නායකත්වයෙන් තිබූ රජය වෙනස් වී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් නායකත්වය යටතේ අගමැති ලෙස ක්‍රියා කල රනිල් වික්‍රමසිංහ මහතා විසින් හා පාඨලී චම්පික රණවක මහතා විසින් 2015 ජනවාරි මස 21 වෙනි දින කැබිනට් සංදේශ 2ක් ඉදිරිපත් කර ඇති අතර, අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් දූෂණ විරෝධී කමිටුවක් පිහිටුවීම සඳහා ඉදිරිපත් කළ කැබිනට් සංදේශය කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, ඒ මගින් පිහිටු වූ අපරාධ දූෂණ විරෝධී කමිටුව හා ඊට අදාල අනිකුත් කමිටු පිහිටුවීමත් මාධ්‍යවේදීන්ට පහරදීම් විමර්ශනය කිරීම සඳහා වෙනමම පරීක්ෂණ අංශයක් පිහිටුවීම හා එම විමර්ශන අංශයේ ඉලක්කය විය යුත්තේ වාස් ගුණවර්ධන විමර්ශනයේ මෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශ ලබා ගැනීම වන අතර, කැබිනට් සංදේශය මගින් ස්ථාපනය කරන ලද දූෂණ විරෝධී කමිටුවේ ක්‍රියාකලාපය දේශපාලන පළිගැනීම් ආරම්භයක් ලෙස, කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් පෙනී යයි.

එක්නැලිගොඩ සහ කීත්නොයාර් පැහැර ගැනීමේ යන විමර්ශන දෙකෙහිම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකර ඇත්තේ කෙසේ හෝ වගන්ති අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 යටතේ සියලු සැකකරුවන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීටමය. මේ අනුව බුද්ධි නිළධාරීන් ඉලක්ක කොටගෙන දේශපාලන පළිගැනීම්වල ආරම්භය මෙම කැබිනට් සංදේශය මගින් ස්ථාපනය කරන ලද දූෂණ විරෝධී කමිටුවේ ක්‍රියා කලාපය ලෙස ස්ථිරවම පෙනී යයි.

මේ අනුව දේශපාලන පළිගැනීම් ක්‍රියාත්මක වූයේ මෙම කමිටුව පිහිටුවීමත් සමග බව දැක්වීම ඒ කාලවකවානුවේ සිදු වී ඇති සිදුවීම්වලින් පෙනී යනු ඇත. මෙම කොමිෂන් සභාව ඉදිරියට සාක්ෂි දීමට පැමිණි අත්අඩංගුවට පත් වූ සෑම සන්නද්ධ බුද්ධි නිළධාරියෙකුටම ඔවුන්ට මුහුණපෑමට සිදු වූ දේශපාලන පළිගැනීම සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව සාක්ෂි දී ඇත.

2020.08.26 වන දින අත්අඩංගුවට පත්ව සිටි කර්නල් තෙල්ගේ එරන්ද රදීෂ් පීරිස් ඔහුගේ සාක්ෂියේ 30, 31 සහ 32 පිටුවල මෙම දේශපාලන පළිගැනීම් මෙසේ දක්වා ඇත.

ප්‍රශ්නය - මහත්මයා ඔබට යම් දැනගැනීමක් හෝ සිදුවුනාද ඔබ අත්අඩංගුවට පත්වීමක් හෝ කිනම් ආකාරයේ බන්ධනාගාර ගතවීමක් හෝ යම් ආකාරයක දෙයක් සිදුවේද යන්න ඔබට යම් දැනුවත් කිරීමක් හෝ දැන ගැනීමක් සිද්ධ වුනාද

පිළිතුර - ස්වාමීණී කිසිවෙක් මට දැනුවත් කිරීමක් හෝ දැනුම්දීමක් කළේ නැහැ. නමුත් වසර ගණනාවක් යුධ හමුදාවේ බුද්ධි බලකායේ සේවය කරපු නිලධාරියෙක්

හැටියට මට ලංකාව පුරාම ඉන්නවා තොරතුරු ලබාදෙන පුද්ගලයෝ. ඒ විශ්වාසදායක තොරතුරු මාර්ගයෙන් මට දැනගන්න ලබුණා අවස්ථා කීපයකදීම අරලියගහ මන්දිරයේදී පැවැත්වුණු සාකච්ඡා වට 3කදී මාගේ නම පිළිබඳව මාව අත්අඩංගුවට ගැනීමක් පිළිබඳව සාකච්ඡාවට බඳුන්වුණා කියලා. ඒ සාකච්ඡාවන් වලට හිටපු ඇමතිවරු කීහිපදෙනෙක් සහ හිටපු යුධහමුදාපති තුමත් සම්බන්ධවුණා කියලා මට ඒ තොරතුරු මාර්ගයෙන් දැනගන්න ලැබුණා ස්වාමිණි.

කොමිෂන් සභාව මගින්

ප්‍රශ්නය - කවුද ඒ නම් වශයෙන් කියන්න බලන්න

පිළිතුර අග්‍රාමාත්‍යතුමා හිටියා කියලා කිව්වා. ඊට අමතරව රාජිත සේනාරත්න ඇමතිතුමා මංගල සමරවීර ඇමතිතුමා

ප්‍රශ්නය - අග්‍රාමාත්‍ය කියලා කියන්නේ කවුද

පිළිතුර - රනිල් වික්‍රමසිංහ මහත්මයා, රාජිත සේනාරත්න මහත්මයා, මංගල සමරවීර මහත්මයා සහ තවත් කීපදෙනෙක් හිටියා කිව්වා ඒ කට්ටියගේ නම් මට ප්‍රකාශ කලේ නැහැ. නමුත් හිටපු යුධහමුදාපති මහේෂ් සේනානායක මහතාත් එතන හිටියා කියලා මට දැනගන්න ලැබුණා ස්වාමිණි.

ප්‍රශ්නය - ඒ කියන්නේ මහත්මයා ප්‍රකාශ කර සිටින්නේ මහත්මයාට තොරතුරුක් දැනගන්න ලැබුණා එවකට

අගමැතිවෙලා සිටි රනිල් වික්‍රමසිංහ මහත්මයා, ඇමති රාජිත සේනාරත්න මහත්මයා, ඇමති මංගල සමරවීර මහත්මයා, හමුදාපති මහේෂ් සේනානායක මහත්මයා ඇතුලු කණ්ඩායමක්

කොමිෂන් සභාව මගින්

ප්‍රශ්නය - වෙන කවුද? අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හිටියා කිව්වාද?

පිළිතුර - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමාත් හිටියා කියලා කිව්වා

ප්‍රශ්නය - කවුද ඒ?

පිළිතුර - ශානි අබේසේකර මහතා

ප්‍රශ්නය - ඔය කණ්ඩායම එකතුවෙලා සාකච්ජා කලා කියලා ඔබට අත්අඩංගුවට ගන්න

පිළිතුර - එසේය ස්වාමිණි

(2020.08.26 වෙනි දින සාක්ෂි සටහනේ පිටු අංක 30,31 සහ 32)

ඉහත සඳහන් සාක්ෂියෙන් මනාව පැහැදිලිවන්නේ හමුදා බුද්ධි නිළධාරීන්ට දේශපාලන පළිගැනීම්වලට ලක්වූ අයුරුය. තවද කැබිනට් සංදේශයක් සමග ස්ථාපනය කරන ලද ලේකම් කාර්යාලයේ සංයුතියද පැහැදිලිව දක්වා තිබුණි. මෙහිදි විමර්ශන අංශයේ ශානි අබේසේකර ඇතුලු නිළධාරීන් කිහිප දෙනෙකුගේ නම් සඳහන්ව ඇති අතර, නීතිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ තුසිත මුදලිගේ මහතාගේ නමද සඳහන්ව ඇත. කමිටු ලේකම් කාර්යාලය අධ්‍යක්ෂ ආනන්ද විජේපාල විසින් ඔහුගේ සාක්ෂියේදී අනාවරණය කළ පරිදි

මෙම ලේකම් කාර්යාලයට ලැබෙන පැමිණිලි ජනාධිපති නීතිඥ වැලිඅමුණ මහතා සහ තුසිත මුදලිගේ යන දෙදෙනා විසින් පරීක්ෂාවට ලක්කර, දූෂණ විරෝධි කමිටුව නමින් විමර්ශනය කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, මූල්‍ය විමර්ශන කොට්ඨාශයට හෝ අල්ලස් හා දූෂණ කටිමුවට ඉදිරිපත් කර ඇත. (205/20 පැමිණිල්ලේ ඉදිරිපත් වූ කරුණු) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන ලිපි ගොනු, ශානි අබේසේකර මහතා විසින් සමූහ මංකොල්ල අංශයට යොමුකර, එම අංශයෙන් විමර්ශනය කර ඇත. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන යාම සහ පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීමේ සිද්ධීන් දෙකම විමර්ශනය කළේ සමූහ මංකොල්ල අංශයේ ස්ථානාධිපති වන නිශාන්ත ද සිල්වා කන්දප්පා සහ එම කණ්ඩායම විසින් වේ. මේ අනුව අපරාධ විමර්ශන කටයුතු සංවිධානය කර ඇති අයුරෙන්ම දේශපාලන පළිගැනීම්වලට විවෘත වී ඇති මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන යාම විමර්ශනය කළේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර මහතාගේ නායකත්වයෙනි. සමූහ මංකොල්ල අංශයේ නිශාන්ත ද සිල්වා කන්දප්පා ඇතුලු උප පොලිස් පරීක්ෂකවරයෙකු හා පොලිස් සැරයන් දෙදෙනෙකුගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විසිනි. එම නිළධාරීන්ගේ එකම අරමුණ වූයේ කෙසේ හෝ එනම් සාක්ෂි තිබුණා හෝ නැතත් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් ලබාගැනීමෙන් බුද්ධි නිළධාරීන්ව අපරාධයකට වරදකරුවන් කොට, දේශපාලන නායකයින් සතුටට පත් කිරීම බැව් මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් පැහැදිලිව නිරීක්ෂණය විය.

මාධ්‍යවේදී එක්නැලිගොඩ පැහැරගෙන යාම සහ අතුරුදහන් වීමේ සිද්ධිය විමර්ශනය කිරීම ආරම්භ වූයේ 2008 අගෝස්තු 25 වෙනිදා

සිටය. පළමුවෙන්ම මෙම සිද්ධිය හෝමාගම පොලිසිය විසින් විමර්ශනය ආරම්භ කරන ලද අතර, ඉන්පසු කොළඹ අපරාධ කොට්ඨාශය මගින් ද පසුව පොලිස්පතිගේ නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද විමර්ශන ආරම්භ කරන ලදි. 2008 අගෝස්තු සිට විමර්ශන ආරම්භ කළද 2015 දක්වා මෙම සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රකාශ සැකකටයුතු නිළධාරීන්ගෙන් ලබාගෙන නොතිබීම සැලකිල්ලට භාජනය කළ යුතු වේ. 2015 වර්ෂයෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ඔවුන් විසින් නිර්මාණය කරන ලද සැලැස්මක් මත මාධ්‍යවේදී එක්නැලිගොඩ සිද්ධියේ විමර්ශන ආරම්භ කර ඇති අතර, "ඒ සඳහා අවශ්‍ය සාක්ෂි සොයා ගෙන ඇත. මෙහිදී 2009 අගෝස්තු මස මුල් භාගයේ 3වන හමුදා සන්නද්ධ බුද්ධි බළකාය සමග බුද්ධි තොරතුරු රැස් කිරීමට උපයෝගි කරගත් LTTE සැකකරුවන් කිහිප දෙනෙකුද හමුදා බුද්ධි බළකායේ කෙනෙකුද මේ සඳහා යොදා ගෙන ඇත. මොවුන්ට නිර්මාණය කරන ලද සැලැස්ම සහ අවශ්‍ය සාක්ෂි ලබා දී එය අධ්‍යයන කිරීමට සලස්වා ඒමගින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ වගන්ති 127 යටතේ මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කර ප්‍රකාශය ලබා ගැනීම කළ බව රංබණ්ඩාගේ සාක්ෂියෙන් පැහැදිලි වේ.

කර්නල් ෂම්මි කුමාරරත්නගේ සාක්ෂියේදී ඔහු අත්අඩංගුවේ සිටින කාලයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ඇතැම් දිනවල ලඟි ලඟියේ ලිපිගොනු සකස් කරනු ලැබූ බව දැක ඇති බවත්, එම අවස්ථාවලදී පොලිස් නිළධාරීන් අතර සිදු වූ සාකච්ඡා වලින් මෙම කරුණ තේරුම් ගිය බවත් ප්‍රකාශ කර ඇත.

එසේම එක්නැලිගොඩ විමර්ශනයේදී දක්නට ලැබුණු වැදගත් ලක්ෂණයක් වන්නේ විමර්ශන නිළධාරීන් එකල පැවති රජයට දැක්වූ

ලැදියාවයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් සෑම බුද්ධි නිළධාරියෙකුගෙන්ම ප්‍රශ්න කිරීමේදී ගෝඨාභය රාජපක්ෂ මහතාව එක්නැලිගොඩ පැහැර ගැනීමේ සිද්ධියට සම්බන්ධ කිරීමට දැඩි උත්සාහයක් ගෙන ඇත. දේශපාලන පළිගැනිම කෙසේ සිදු වූයේද යන්න ඉහත සඳහන් කරුණු වලින් මනාව පැහැදිලි වේ.

කර්නල් ෂම්මි කුමාරරත්න ඇතුලු නිළධාරින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටින විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින්ගේ අනුදැණුම මත පිටස්තර පුද්ගලයෙකු වන රුවන් පෙතියාගොඩ නම් අයෙකු විසින් අවශ්‍ය කරන ප්‍රකාශ ලබාගැනිමට යම් යම් පෙළඹවීම් කළ බැව් අත්අඩංගුවට පත්ව සිටි බුද්ධි නිළධාරින් විසින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙනු ලබන විට ප්‍රකාශ කර ඇත. කරුණු විමසීමේදී මෙම රුවන් පෙතියාගොඩ යන අය දේශපාලන බලපෑම් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තාවකාලිකව අනුයුක්ත කර එම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවාගෙන සිටි බුද්ධි නිළධාරින්ට ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් මෙම එක්නැලිගොඩ මාධ්‍යවේදියාව පැහැරගැනීම නිර්මාණය කර නියෝග දුන් බවට කරුණු ඇතුලත් කරමින් ප්‍රකාශ ලබාගැනිමට මෙම රුවන් පෙතියාගොඩ යන අය යොදවා ගැනීමෙන් සිදු කර ඇත්තේ දේශපාලනමය පළිගැනීමේ ක්‍රියාවලියක් ලෙසට මෙම කොමිෂන් සභාවට පෙනි යයි.

9 .LXI

(1)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 232/2020 |
| පැමිණිලිකරු | - | විශ්‍රාමික යුධ හමුදා මේජර් ජෙනරාල් කුරුප්පු අච්චිගේ ධම්මික අමල් කරුණාසේකර |
| ලිපිනය | - | 84/02, පාසැල් හන්දිය, පිටිපන උතුර, හෝමාගම. |

(2)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 353/2020 |
| පැමිණිලිකරු | - | යුධ හමුදා ලු/ ක බණ්ඩාර දිසානායක බුලත්වත්ත |
| ලිපිනය | - | බුලත්වත්ත වළව්ව, සමගි මාවත, මානෙළුව, පුටුහපුව, තෙල්දෙනිය. |

(3)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 297/2020 |
| පැමිණිලිකරු | - | මා/ සැ හිටිහාමි මුදියන්සේලාගේ නිශාන්ත ජයතිලක |
| ලිපිනය | - | වෙද නිවස, හිද්දැව, ඇහැටුවාව, ගල්ගමුව. |

(4)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 257/2020 |
| පැමිණිලිකරු | - | මා/ සැ ගොඩැල්ලවත්ත ආරච්චිගේ චාමික සුමිත් |
| ලිපිනය | - | කරගස්වගුර, කැප්පෙටිපොල |

(5)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 253/2020 |
| පැමිණිලිකරු | - | එම්. චන්ද්‍රාභය ජයසූරිය මාණ්ඩලික සැරයන් (විශ්‍රාමික) |
| ලිපිනය | - | 219 A, පරකටවැල්ල, පිළිමතලාව. |

(6)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 241/2020 |
| පැමිණිලිකරු | - | උයන්ගේ ප්‍රභාත් දුමින්ද වීරරත්න මාණ්ඩලික සැරයන් |
| ලිපිනය | - | 628/1, පන්සල්ගොඩ, ඉලුක්පිටිය, බටපොල |

(7)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 242/2020 |
| පැමිණිලිකරු | - | කෝප්‍රල් පේඩිගේ නිශාන්ත කුමාර |
| ලිපිනය | - | 234/B, පංසල් හංදිය, වැගොව්ව, මිනුවන්ගොඩ. |

(8)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 204/2020 |
| පැමිණිලිකරු | - | බ/ නි- I අතපත්තු හුන්කිරි ආරච්චිගේ ලසන්ත විමලවීර |
| ලිපිනය | - | 94/A/1, පාළුගම, දොම්පේ. |

(9)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 239/2020 |
| පැමිණිලිකරු | - | විශ්‍රාමික මා/ සැ සේනාධීර ආරච්චිගේ හේමචන්ද්‍ර පෙරේරා |
| ලිපිනය | - | 191 A/ වැගවත්ත, අලුත්ගම, බණ්ඩාරගම. |

(10)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 203/2020 |
| පැමිණිලිකරු | - | හිටපු බලලත් නිළධාරි 1රාජපක්ෂගේ ලලිත් රාජපක්ෂ |
| ලිපිනය | - | 784B 3, නා සෙවන පාර, ජයවීරගොඩ, හංවැල්ල. |

(11)

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 296/2020 |
| පැමිණිලිකරු | - | විශ්‍රාමික මා/ සැ ගල්බිඳින ඇලේගෙදර ප්‍රියන්ත කුමාර සෝමසූරිය |
| ලිපිනය | - | උඩහේන, කටියාව, දොඩම්ගස්ලන්ද. |

පැමිණිලිකරු දේශපාලන පළිගැනීමකට ලක්කළ පහත නම් සඳහන් පුද්ගලයින් වගඋත්තරකරුවන් ලෙසට නම් කර ඇත. එනම්;

1. හිටපු පොලිස් අධිකාරි ශානි අබේසේකර
2. හිටපු පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා කන්දප්පා
3. සහකාර පොලිස් අධිකාරී බී.එස්. තිසේරා
4. පොලිස් කොස්තාපල් 87113 ඒ.ඒ.ඒ.එස්. ආරියසිංහ(අනිල්)
5. උප පොලිස් පරීක්ෂක කේ.පී. තුෂාර විශ්වජිත්
6. පොලිස් පරීක්ෂක ආර්.ජේ.පී.ජී. සම්පත් රාජකරුණා
7. පොලිස් සැරයන් 44890
8. උප පොලිස් පරීක්ෂක ආර්.එස්.එම්. මෙන්ඩිස්
9. පොලිස් කොස්තාපල් සමරවීර
10. පොලිස් සැරයන් 35021 ඩී.ආර්. කන්නන්ගර
11. පොලිස් සැරයන් 688 එච්.එම්.ජේ. ආරියරත්න
12. රංජන් රාමනායක පාර්ලිමේන්තු මන්ත්‍රී
13. හිරුණික ප්‍රේමචන්ද්‍ර
14. හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න
15. රුවන්පෙතියාගොඩ

## තීරණය

1. පැමිණිලිකරුවන් විසින් මෙම කොමිසම ඉදිරියේ ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛන පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීමෙන් පසුව ඉහත සඳහන් පැමිණිලිකරුවන් කීත් නොයාර් පැහැරගෙන ගොස් පහරදීම සම්බන්ධයෙන් වරදකට හසුකරලීම

සඳහා අසත්‍ය සාක්ෂි නිර්මාණය කර ඉහත දක්වන ලද පැමිණිලිකරුවන් රක්ෂිත බන්ධනාගාරගත කිරීමට හා එයට ආධාර සහ අනුබලදීමට ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් ක්‍රියාකර ඇති බවට ප්‍රබල සාක්ෂි මගින් ඔප්පු කර ඇති බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

2. ඉහත දක්වන ලද පැමිණිලිකරුවන් ඔවුන්ගේ පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියලු සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් පසුව පැමිණිලිකරුවන්ට එරෙහිව ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ ගොණුකර ඇති B1535/08 දරන B වාර්තාවෙන් සහ අධිකරණයට ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාවලින් දැක්වෙන සියලු චෝදනාවලින් ඉහත දක්වන ලද පැමිණිලිකරුවන් නිදොස් කොට නිදහස් කළ යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

3. දූෂණ විරෝධී කමිටුව විසින් නිර්මාණය කළ ලේඛනය අනුව දක්වා ඇති අරමුණු සහ කාර්යභාරයන් හැරුණු විට වෙනත් වැඩසටහන් යටතේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය අනුව ප්‍රකාශ ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉලක්ක කළද, පැමිණිලිකරුවන් එසේ ප්‍රකාශ නොදුන් නිසා රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් අධිකරණයේ චෝදනාවන්ට ලක් වීමෙන් දේශපාලන පළිගැනීමකට ලක් වූ බව මෙම කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

## නිර්දේශ

1. ඉහත සඳහන් වගඋත්තරකරුවන් අසත්‍ය සාක්ෂි නිර්මාණය කර පැමිණිලිකරුවන්ගෙන් පළිගැනීමට දැඩි උත්සාහයක නිරත වූ හෙයින් දණ්ඩ නීති සංග්‍රහයේ 189 වගන්තිය සමග කියවිය යුතු 190 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු බොරු සාක්ෂි නිර්මාණය කිරීමේ වරද සිදු කර ඇති බැවින් ඉහත දැක්වූ වගඋත්තරකරුවන්ට විරුද්ධව නඩු පැවරීමට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

2. එසේම ඉහත දක්වා ඇති වැරදි සිදු කිරීම සඳහා ඉහත සඳහන් සියලුම වගඋත්තරකරුවන් කුමන්ත්‍රණය කිරීම සහ අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති 100 යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදු කර ඇති බැවින් වගඋත්තරකරුවන්ට විරුද්ධව නඩු පැවරීමට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

3. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දූෂණ විරෝධී කමිටුවෙන් දුන් ඉලක්කය වන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශ ලබාගැනීම සඳහා දිගු කාලයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ රඳවා ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නීති විරෝධී ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත භාවිතා කර පැමිණිලිකරුවන් රඳවුම් නියෝග යටතේ සිරමැදිරිවල රඳවාගෙන සිටීමෙන් ඉහත සඳහන් වගඋත්තරකරුවන් 1 සිට 11 දක්වා දණ්ඩ නීති සංග්‍රහයේ 338 වන වගන්තිය යටතේ

දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති බැවින් ඔවුනට එරෙහිව නඩු පැවරීමට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

4. එසේම ඉහත සඳහන් වගඋත්තරකරුවන් ඉහත වැරදි කිරීම සඳහා අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු අනුබල දීමේ වරද සිදුකර ඇති බව කොමිෂන් සභාව නිර්දේශ කරයි.

5. එසේම ඉහත දක්වා ඇති 1 සිට 15 දක්වා ඇති වගඋත්තරකරුවන්ට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියේ චෝදනාපත්‍ර ගොණු කිරීම සඳහා මෙම පැමිණිල්ලට අදාළ සාක්ෂි සහ ලේඛන ගොණු කර නීතිපතිවරයා වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කර සිටියි.

6. ඉහත සඳහන් 1 සිට 11 දක්වා නම් කර ඇති වගඋත්තරකරුවන් විසින් අසත්‍ය සාක්ෂි නිර්මාණය කර එම අසත්‍ය කරුණු සත්‍ය බවට පෙන්වමින් පැමිණිලිකරුවන් හා අධිකරණයද නොමග යවා පැමිණිලිකරුවන් රක්ෂිත බන්ධනාගාරගත කිරීම සම්බන්ධයෙන් කරන ලද වැරදි පොලිස් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු නියෝග ඒ7 යටතේ බී පරිශිෂ්ටයේ දක්වා ඇති විනය සංග්‍රහයේ 1වෙනි වගන්තිය වන අපකීර්තිදායක හැසිරීම එනම් පොලිස් නිළධාරියෙකු ලෙස අනිසි හෝ විනය පවත්වා ගැනීමට හානිකරන අන්දමින් හෝ පොලිස් සේවයේ හොඳ නමට කැළලක් විය හැකි අන්දමින් හෝ හැසිරීම සම්බන්ධයෙන් චෝදනා ගොණු කර විධිමත් විනය පරීක්ෂණයකින් පසු

වැරදිකරුවන් වන වගඋත්තරකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය යුතු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

7. එසේම ඉහත සඳහන් 1 සිට 11 දක්වා නම් කර ඇති වගඋත්තරකරුවන් විසින් අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම සඳහා නීති විරෝධී ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත භාවිතා කර පැමිණිලිකරුවන් රැඳවුම් නියෝග මත පොලිස් නිළධාරීන් සිරමැදිරිවල රඳවාගෙන සිටීමෙන් හා පැමිණිලිකරුවන්ට ඇප දීමට විරෝධය පාමින් දිගු කාලයක් රක්ෂිත බන්ධනාගාරගත කරවීමට ක්‍රියා කිරීමෙන් පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඒ 7 යටතේ බී පරිශිෂ්ටයේ දක්වා ඇති විනය සංග්‍රහයේ 2වෙනි වගන්තියෙ උප වගන්ති ජී වන අණට අකීකරු වීම හෝ පීඩාකාරි ලෙස හැසිරීම, එනම් පොලිස් නිළධාරියෙකු ලෙස මහජනයාගෙන් කෙනෙකුට අවිනීත අන්දමින් හෝ පීඩාකාරී අන්දමින් හැසිරීම වරදක් කර තිබීම සම්බන්ධයෙන් චෝදනාපත්‍ර ඉදිරිපත් කර විධිමත් විනය පරීක්ෂණයකින් පසු වැරදිකරුවන් වන වගඋත්තරකරුවන්ට දැඩි දඬුවම් පැනවිය යුතු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

8. පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති මෙම වාර්තාවට ඇතුළත් කර ඇති එක් එක් නිළධාරියා හානි පූර්ණ වාර්තාවන්ට අමතරව මෙම පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීම හේතුවෙන් හෝ රක්ෂිත බන්ධානාගාරගත කිරීමේ කාලය තුළ එම හේතුව නිසා වැටුප් නොලැබුණි නම්, වැටුප් අඩුවීමක් සිදුවූවානම්, එම කාලය පරීක්ෂා කර බලා හිමිකම් ඇති සියලු වැටුප් ලබාදීමට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

9. මෙම සිද්ධිය වූ දින කාල වකවානුවේදී ඉහත පැමිණිලිකරුවන්ගේ වැටුප් වැඩිවීම සම්බන්ධයෙන් ගැටලුවක් පැන නැගුණානම්, එය වහාම පැමිණිලිකරුවන්ගේ වාසියට නිරාකරණය කොට ගෙවීම් කිරීමට කොමිෂන් සභාව තීරණය කරයි.

10. මෙම පැමිණිලිකරුවන්ට මෙම සිද්ධිය හේතුකොටගෙන ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අහිමි වීමට යම් බලපෑමක් හේතු වූවානම් එය නිවැරදි කිරීමට පියවර ගැනීමට ක්‍රියා කළ යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි.

11. ඉහත දක්වා ඇති පැමිණිලිකරුවන්ට දේශීය හා විදේශීය පාඨමාලා අහිමි වූයේ නම්, එම පාඨමාලාවන්ට මෙම නිළධාරීන් තෝරා ගත යුතු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

12. එසේම ඉහත සඳහන් පැමිණිලිකරුවෙකුට විදේශීය වෘත්තියමය කටයුත්තකට අනුයුක්ත කිරීමට සූදානමින් සිටිද්දී මෙම සිද්ධිය නිසා එම පැමිණිලිකරුට එම අනුයුක්ත වීම අහිමි වූවානම් එය ලබාදීමට කටයුතු කළ යුතු බවටමෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

13. පැමිණිලිකරුවන් මෙම සිද්ධියට පොලිස් රැඳවුම් භාරයේ සහ රක්ෂිත බන්ධනාගාරගත වූ කාලයේ දී ඔවුන්ගේ ළමයින්ගේ අධ්‍යාපනයට බාධා එල්ල වූ බවට මෙම විමර්ශනයේදී කරුණු හෙළි වූ නිසා එසේ අධ්‍යාපනය අඩාල වූ ළමයින් ඒ ප්‍රදේශයේ ප්‍රසිද්ධ පාසලකට ඇතුළත් වීමට අවස්ථාවක් ලබා දිය යුතු වන අතර, විශ්ව විද්‍යාල ප්‍රවේශයේදී යම් සහනයක්

දීමට හැකිනම් එයද මෙම කොමිෂන් සභාව විසින් නිර්දේශ කරයි.

14. මාධ්‍යවේදී කීත් නෝයාර් සම්බන්ධයෙන් පැමිණිලිකරුවන් විසින් කරන ලද පැමිණිල්ලේ මෙම කොමිෂන් සභාව විමර්ශනයට ලක් කළ විටදී කීත් නෝයාර් පැහැරගෙන ගොස් පහරදීම සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී බී.එස්. තිසේරා සහ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා කන්දප්පා, කීත් නෝයාර්ගේ ප්‍රකාශය සටහන් කර ගැනීමට ඕස්ට්‍රේලියාවට ගිය බව මෙම විමර්ශනයේදී අනාවරණය විය. මේ සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව, මෙවැනි ප්‍රකාශ සටහන් කිරීමේ ඇති අවශ්‍යතාවය, එසේම එම ගුවන් ගමන් හා ඕස්ට්‍රේලියාවේ දින 9ක් ගත කිරීමට ගිය වියදම රු.1,781,776.00/- වැය වීම රජයේ මුදල් අවභාවිතයක් සිදු වුයේද යන්න හා ඒ සම්බන්ධයෙන් පොලිස්පති විධිමත් විමර්ශනයක් කර මුදල් අවභාවිතයක් සිදු වී ඇත්නම් ඊට වගකිවයුතු සියලු වගඋත්තරකරුවන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කළ යුතු බව කොමිසම නිර්දේශ කරයි.

15. 2017.04.12 වෙනි දින කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B 4690/3/8 සඳහා අංක 3 අධිකරණයත් ඇප ලබාදීමෙන් පසුව, ඉහත පැමිණිලිකරුවන් වෙනත් නඩුවකට රක්ෂිත බන්ධනාගාරගත කිරීමේ නියෝගයක් අධිකරණයක් විසින් නිකුත් නොතිබුණු විටදී, ඉහත වගඋත්තරකරුවන් තවදුරටත් බන්ධනාගාරයේ තබාගැනීමට, මහර බන්ධනාගාරයට ලිපියක් යවා ඇප අවලංගු කළ බවට දැන්වීමෙන් විත්තිකරුවන් විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 336

වගන්ති යටතේ නිදහස් කිරීම සඳහා ආඥා පත්‍රයක් නිකුත් කොට ඇති අවස්ථාවකදී අයුතු ලෙස සිරකර දැමීම යන වරද සිදු කර ඇති බැවින් වගඋත්තරකරුවන්ට විරුද්ධව නඩු පැවරීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

16. පැමිණිලිකරුවන්ට එරෙහිව විමර්ශනය කරන අවස්ථාවේදී ගුවන් ගමන් තහනම් කිරීමට ගුවන් ගමන් බලපත්‍රයක් අධිකරණයට භාරදී තිබූ අතර, එම ගුවන් බලපත්‍රය නැවත පැමිණිලිකරුට භාර දිය යුතු යැයි කොමිෂන් සභාව නිර්දේශ කරයි.

17. පැමිණිලිකරුවන් සෑම මසකම අවසාන ඉරිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කිරීමට ඇති නියෝගට ඉවත් කරන ලෙසට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## පොදු නිර්දේශ

ත්‍රිවිධ හමුදා සහ පොලිසිය විසින් පවත්වාගෙන යන බුද්ධි සේවාවේ වැදගත්කම රටක ආරක්ෂාව සමග එක්ව සැලකිල්ලට ගතයුතු වේ. එසේම දේශීය මෙන්ම විදේශීය රටවල වර්තමානයේ වර්ධනය වී ඇති ජනතා විරෝධී හා ත්‍රස්තවාදී කටයුතු නිසා බුද්ධි සේවාවල වැදගත්කම පෙරට වඩා වැඩි වී ඇති අතර, බුද්ධි තොරතරු එක්රැස් කිරීමේ රාජකාරියේ යෙදී සිටින විට, රාජකාරී ප්‍රශ්නවලට අදාළව නිසි ගැටලු පැන නගින විට, බුද්ධි නිළධාරීන් ආරක්ෂා කිරීමට නීතියක් දැන් ශ්‍රී ලංකාවේ නොමැත. නමුත් ලෝකයේ බොහෝ රටවල එනම් ඇමරිකාවේ CIA ආයතන,

ඉන්දියාවේ RAW ආයතනය, ඊශ්‍රායලයේ මුසාද් ආයතනය, රුසියාවේ KGB ආයතනවල නිළධාරීන්ට සිය රාජකාරී කටයුතුවල නිරත වීමේදී මුහුණ දීමට ඇති සිද්ධීන්වලින් යම් නීති කර්තව්‍යයන් එම බුද්ධි නිළධාරීන්ට එරෙහිව පැන නගින්නේනම්, ඔවුන් ආරක්ෂා කිරීමට නීතියක් ඇත. ශ්‍රී ලංකාවේ බුද්ධි නිළධාරීන් ආරක්ෂා කිරීමට මෙවැනි නීතියක අවශ්‍යතාවය දැන් පැන නැගී ඇති නිසා, මේ සඳහා නව නීති සකස් කළ යුතු යැයි මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## ඉදිරිපත් කරන ලද වාචික සහ ලිඛිත සාක්ෂි

ඉහත දක්වා ඇති පැමිණිලිකරුවන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම වාර්තාවේ දක්වා ඇති දිනයේදී කිසිදු පදනමක් නොමැතිව, සැළසුම් කරන ලද අධිකරණ ක්‍රියාවලියක් මත අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කොට පසුව ඇප මත මුදා හැර ඇති අතර, මෙම පැමිණිලිකරුවන්ට මුහුණ දීමට සිදුවී ඇති හිංසාකාරී තත්ත්වයද දේශපාලන පළිගැනීමක් මත සිදු කර ඇති බවට පැමිණිලිකරුවන් විසින් වෙන් වෙන්ව පැමිණිලි ඉදිරිපත් කර ඇති අතර, එලෙස ඉදිරිපත් කරනු ලැබූ පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව විමර්ශනයක් ආරම්භ කොට එම විමර්ශනයේ වාර්තාව පහත දක්වා ඇත.

2015 ජනවාරි සහ අගෝස්තු මාසයේදී පැවැත්වූ ජනාධිපතිවරණය සහ මහ මැතිවරණයට පෙර නිළයන් දැරූ රාජ්‍ය නිළධරයන්, රාජ්‍ය සංස්ථාවල, ත්‍රිවිධ හමුදාවන්හි මෙන්ම පොලිස් සේවයේ සාමාජිකයින් 2015 ජනවාරි මස 08 වන දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16

වන දිනෙන් අවසන් වූ කාලසීමාව තුලදී දේශපාලනමය වශයෙන් පළිගැනීමකට ලක් වූ සාමාජිකයින්ට සිදු වූ අගතිගාමී තත්ත්වය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා මෙම කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි.

2015 ජනවාරි මස 8 දින පැවැත්වූ ජනාධිපතිවරණයෙන් එක්සත් ජාතික පෙරමුණේ ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා තේරී පත් වී දින 12ක් ඇතුලතදී අගමැති තනතුරට පත් වූ රනිල් වික්‍රමසිංහ මහතා විසින් මැතිවරණයට පෙර ජනතාව දුන් පොරොන්දුවක් වන පෙර රජය විසින් කර ඇති දූෂණ අක්‍රමිකතා අනාවරණය කර විමර්ශනය කිරීම සඳහා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර ඒ මගින් දූෂණ විරෝධී කමිටුවක් පිහිටුවීමට යෝජනා කර තිබුණි. මෙම යෝජනාවෙන් පිහිටුවනු ලැබූ දූෂණ විරෝධී කමිටුව කාර්යක්ෂම කිරීම සඳහා අනුකමිටුවක් හා ක්ෂණික ප්‍රතිචාර කමිටුවක්ද පත්කරගන්නා ලදි.

මෙම දූෂණ විරෝධී කමිටුවේ වෙනත් වැඩ සටහන් යටතේ ඉදිරිපත් කර තිබුණු ඉතාමත් වැදගත් කරුණ වන්නේ මාධ්‍යවේදීන් ඝාතනය කිරීම පිළිබඳව සොයා බැලීමට විශේෂ ඒකකයක් පිහිටුවීම හා එම කමිටුවෙන් ලැබී ඇති උපදෙස් අනුව මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාකිරීම, එසේ ක්‍රියාත්මකවීමේදී අත්අඩංගුවට ගත් බුද්ධි නිළධාරීන්ගෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශ සටහන් කරවා ගැනීම දක්වා ඇත. මේ අනුව කීත්නොයාර් අත්අඩංගුවට ගෙන පහර දී මුදා හැරීම සම්බන්ධයෙන් ත්‍රිපෝලි අනුඛණ්ඩයට අයත් බුද්ධි නිලධාරීන්ව පදනම් රහිතව අත්අඩංගුවට ගැනීමෙන් හා ඉන්පසු සැළසුම් කරනු

ලැබූ අධිකරණ ක්‍රියාවලියකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් යොමු කිරීම නිසා මෙම නිළධාරීන් දැඩි අපහසුතාවයකට පත්වූ අතර, ඔවුනට සිදු වූ දේශපාලනමය පළිගැනීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට මෙම කොමිෂන් සභාව පත්කරන ලදි.

කීත්නොයාර්ට පහර දුන්නා යැයි දක්වමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගත් පහත සඳහන් බුද්ධි නිලධාරීන් (11)එකොලොස්දෙනා තමන්ට සිදුවූ දේශපාලනමය පළිගැනීම හා අසාධාරණය සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මේජර් ජෙනරාල් විශ්‍රාමික | - | කේ.ඒ.ඩී.ඒ.කරුණාසේකර | - | 232/20 |
| 2. | කර්නල් | - | ඩී.ඩබ්.ඩී.එම්.ආර්.පී.එස්.එස්.බී.ඩී. බුලත්වත්ත | - | 353/20 |
| 3. | මාණ්ඩලික සැරයන් | - | හිටිහාමි මුදියන්සේලාගේ නිශාන්ත ජයතිලක | - | 297/20 |
| 4. | මාණ්ඩලික සැරයන් | - | ගොඩැල්ලවත්ත ආරච්චිගේ චාමික සුමිත් | - | 257/20 |
| 5. | මාණ්ඩලික සැරයන් | - | ශ්‍රී නාරායන මුදියන්සේලාගේ චන්ද්‍රභය ජයසූරිය | - | 253/20 |
| 6. | මාණ්ඩලික සැරයන් | - | උයන්ගේ ප්‍රභාත්දුමින්ද වීරරත්න | - | 241/20 |
| 7. | මාණ්ඩලික සැරයන් | - | සේනාධීර ආරච්චිගේ හේමචන්ද්‍ර පෙරේරා | - | 242/20 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8. | කෝප්‍රල් | - | මැණික්රන් පේඩිගේ නිශාන්ත කුමාර | - | 242/20 |
| 9. | බලලත් නිලධාරි I | - | අතපත්තු හුන්කිරි ආරච්චිලාගේ ලසන්ත විමලවීර | - | 204/20 |
| 10. | බලලත් නිලධාරි I | - | රාජපක්ෂගේ ලලිත් රාජපක්ෂ | - | 203/20 |
| 11. | මාණ්ඩලික සැරයන් විශ්‍රාමික | - | ගල්බිඳින ඇලේගෙදර ප්‍රියන්ත කුමාර සෝමසූරිය | - | 296/20 |

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරුණු වාර්තා කර ඇති අන්දමට මාධ්‍යවේදී කීත්ලෙරෝයි නොයාර් ශාන්ත පීතර විද්‍යාලයේ අධ්‍යාපනය ලබා පසුව පූජකවරයෙකු වීමේ අදහසින් මහනුවර අම්පිටිය දෙව්සත්හලට ඇතුලත්ව ඇති අතර, එසේ සිටියදී මාධ්‍ය ක්ෂේත්‍රයට පිවිස එම ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ඨව එතෙර හා මෙතෙර අධ්‍යාපන කටයුතු හදාරා 1992 වර්ෂයේ විජය පුවත්පත් සමාගමට එක්ව සේවය කර ඉන්පසු Daily Mirror පුවත්පත් කාර්යාලයේද, ඉන්පසුව The Nation පුවත්පතේ මාධ්‍යවේදියෙකු වශයෙන්ද සේවය කර ඇත. කීත්නොයාර් නම් වූ පුද්ගලයා The Nation පුවත්පතේ "සෙන්පති" නම් අනුවර්තනාමයෙන් යුධ හා දේශපාලන වාර්තාකරණය පිළිබඳ විවේචනාත්මක ලිපි ලියනු ලැබූ මාධ්‍යවේදියෙකු විය. මෙම ලිපි පළවීමෙන් පසු සති කිහිපයක සිට පැමිණිලිකරු සම්බන්ධයෙන් විමසිලිමත් වූ පරීක්ෂාවෙන් යම් කණ්ඩායමක් සිටි බවත්, පැමිණිලිකරු ගමන් කරන මාර්ගයේ පැමිණිලිකරු පසු පසින් හඹා ඒමේ අවදානමක් ඇති බවට දැනුන නිසා කාර්යාලයට නොගොස් ලිපි

කටයුතු සිදු කළ බවට කරුණු අනාවරණය වී ඇත. මෙසේ සැඟවී මාධ්‍ය කටයුතු කරනු ලැබුවද, 2008.05.22 වන දින The Nation පුවත්පතේ කතෘ මාධ්‍යවේදී ලලිත් අලහකෝන් මහතා සහ රිවිර මීඩියා Corporation පුද්ගලික සමාගමේ නිශාන්ත කුරේ සමග බම්බලපිටිය ඩුප්ලිකේෂන් පාරේ පිහිටි කුවීන්ස් කැෆේ හෝටලයට ගොස් රාත්‍රී ආහාර ලබාගෙන පැමිණිලිකරු විසින් පදවාගෙන ආ රථයෙන් අතරමගදි නිවසට අවශ්‍ය භාණ්ඩද මිලදී ගෙන තම නිවසට පැමිණ රථයෙන් බැස ගේට්ටුව විවෘත කිරීමට යන විටදීම වෑන් රථයකින් පැමිණි යම් පිරිසක් පැමිණිලිකරුට පිස්තෝල, පොලු මුගුරු වලින් පහර දුන් බවත්, පසුව ඔහුව වෑන් රථයට දමාගෙන ඇස් බැඳ, දෑත්ද පිටුපසට කර බැඳ අත් විලංගු දමා පැහැරගෙන ගිය බවත්, පසුව කිසියම් ස්ථානයකට ගෙන ගොස් මාධ්‍ය ප්‍රචාරය සම්බන්ධයෙන් ප්‍රශ්න කර එම ප්‍රචාරයන් කරනු ලබන්නේ කාගේ නියෝග මතද යන්න සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත් පසුව ඔහුව, ගෙනැවිත් අතහැර දමා ගිය බවත්, අනතුරුව පැමිණිලිකරු රෝහල් ගත වූ බවත්, පසුව පැමිණිලිකරුගේ ප්‍රකාශ සටහන් කරගත් බවත් 2020.02.19 වන දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් ලසන්ත විමලවීර විසින් "P3" ලෙස සලකුණු කරන ලද ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවියේ B1535/08 වැඩිදුර වාර්තාවෙන් අධිකරණයට වාර්ථා කර ඇත.

මේ සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාශය විසින් සිද්ධිය සිදු වූවා යැයි කියන 2008.05.22 වන දින කීත්නොයාර් ගමන් කළ ස්ථානයන් සම්බන්ධයෙන් පරික්ෂාවට ලක් කර ඇත. මෙදින කීත්නොයාර් The Nation පුවත්පත් කාර්යාලයේ සිට කොළඹ විශ්ව විද්‍යාලය දක්වා ගමන් කර ඉන්පසු බම්බලපිටිය කුවීන්ස් කැෆේ නම් ස්ථානයෙන් රාත්‍රී ආහාර ලබාගෙන පසුව අතරමගදී වැල්ලවත්ත ලාෆ්

සුපර් මාර්කට් වෙතින් භාණ්ඩ ලබාගෙන නිවසට ගිය අවස්ථාවේදි මෙම සිද්ධිය සිදුවූ බවට ප්‍රකාශ කර සිටි. මෙම සිද්ධිය විමර්ශණය කිරීමේදී කීත්නොයාර් ඇසුරු කළ අය වන ලලිත් අලහකෝන් සහ ක්‍රිෂාන්ත කුරේ යන අයවලුන්ගේ ප්‍රකාශ පොලිසිය විසින් සටහන් කරගෙන ඇති අතර, ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ මෙම සිදුවිම ආරක්ෂක අංශ මගින් සිදු කරන ලද ක්‍රියාවක් බවටය. එසේ පැවසීමට හේතුව ලෙස පවසා ඇත්තේ කීත්නොයාර් විසින් ආරක්ෂක අංශවල දුර්වලතා සම්බන්ධයෙන් "The Nation " පුවත්පතේ "සෙන්පති " තීරුව යටතේ පළ කිරීම බවය.

සිද්ධිය වූ දින මාධ්‍යවේදී කීත් ලෙරෝයි නෝයාර් (මින් ඉදිරියට කීත්නොයාර් යනුවෙන් හැදින්වෙන) ඔහු පදිංචිව සිටි අංක 52, වෛද්‍ය පාර, දෙහිවල නිවස ඉදිරිපිටදී පැහැරගෙන යාම සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේදී මාධ්‍යවේදී කීත්නොයාර් බලහත්කාරයෙන් පැහැරගෙන ගොස් ඇති බවට සැළවූ වහාම කීත්නොයාර්ගේ බිරිඳ මේරියන්ස් රෝෂණී දිලිනි කුරේ විසින් Nation පුවත්පතේ මාධ්‍යවේදී ගාමිණී අබේවර්ධන මහතාට, ලලිත් අලහකෝන් මහතාට සහ ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ මහතාට දැනුම් දී ඇති අතර, ඔවුන් විසින් කීත්නොයාර් මහතාගේ දූරකථනයට පණිවුඩ කිහිපයක් යවා ඇති අතර, පසුව Dialog ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරීට දැනුම් දී මේ සම්බන්ධයෙන් දූරකථන පරීක්ෂා කිරීමට ඉල්ලා ඇත.

Dialog ආයතනය දූරකථන කුලුණු සම්බන්ධයෙන් විමර්ශනය කල විටදී කීත්නොයාර්ගේ දූරකථනය දෙකටන, දොම්පේ යන ප්‍රදේශවලදී ක්‍රියාත්මක වූ බවට වාර්තා කර ඇත. ඒ අනුව සහකාර පොලිස් අධිකාරී නුවන් වැදිසිංහ සහ සේනක කුමාරසිංහ ඇතුළු කණ්ඩායම

දොම්පේ ප්‍රදේශයට ගොස් විමර්ශන කටයුතු පවත්වා ඇති අතර, 2008.08.23 වන අළුයම පැය 4ත් 5ත් අතර කාලයේදී කීත්නොයාර් ඔහුගේ නිවසට පැමිණ ඇති බැව් වාර්තා කර ඇත. ( 2017.02.18 වන දින ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ B1535/08 වැඩිදුර වාර්ථාවට අනුව)

මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශනය කළ අවස්ථාවේදී පළමුව අංක152 ලංසියාවත්ත, වෙල්ගම, දොම්පේ යන ලිපිනයේ නිවසක්ද, පසුව බදුවත්ත වලව්ව, ඉද්දමල්දෙණිය, දොම්පේ යන ප්‍රදේශවලද ආරක්ෂිත නිවාස පවත්වාගෙන ගොස් ඇති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සොයාගෙන ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මතුගම ආරච්චිගේ සරත් විජේසිරිගේ ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති අතර, එකී ප්‍රකාශය අනුව ඔහු හමුදා බුද්ධි අංශයට අනුයුක්තව රාජකාරී කරන සෝමසූරිය නැමති හමුදා නිළධාරියා සමග හිතවත්කමක් තිබූ බවත්, එසේ හිතවත් වූයේ ඔහු කෙනෙකුගේ වෑන් රථයක් ඔවුන් රාජකාරී කල ස්ථානයට ලබා දුන් හෙයින් බවත් ප්‍රකාශ කර ඇත. තවද මෙම සාක්ෂිකරුගේ බිරිඳගේ අක්කා වන සුමිත්‍රා යන කාන්තාවගේ අනුදැනුම අනුව අංක 152, ලංසියාවත්ත, වෙල්ගම, දොම්පෙ හා නැවතත් බදුවත්ත වලව්ව නැමති නිවස සොයා ගැනීමට සෝමසූරියට උදව් කල බවද ප්‍රකාශ කර සිටියි. තවද සුමිත්‍රා විසින් ප්‍රකාශ කර ඇත්තේ බුද්ධි අංශය විසින් ලබාගත් නිවාස දෙකටම නිතර ගිය බවත් එම නිවෙස්වල හඳුනන හා හඳුනන්නේ නැති අය සිටි බවත් ප්‍රකාශ කර ඇත.

එසේම රංබණ්ඩාගේ නිමල් නැමැත්තාගේ ප්‍රකාශයක් ද අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් සටහන් කරගෙන ඇත. ඔහු 2008.05.22 වෙනි දින මරදාන ත්‍රිපෝලි බුද්ධි අනුඛණ්ඩයේ මේජර් බුලත්වත්ත යටතේ රාජකාරී කර ඇති බවත් දොම්පේ බදුවත්ත වලව්වේ විටින් විට කෝප්‍රල් සෝමසූරිය සමග එම කාලයේ නැවතී රාජකාරි කල බවත් එහි බිල්පත් ගෙවීමේ කටයුතු සඳහා මේජර් බුලත්වත්ත විසින් පැවරූ බවත් ප්‍රකාශ කර ඇත. එසේම බදුවත්ත නිවසට පැමිණීමට පෙර අංක 152 ලංසියාවත්ත දොම්පේ ලිපිනයේ නැවත සිටි බවත් එහි සිටි කණ්ඩායමේ ප්‍රධානියා ලෙස කෝප්‍රල් සෝමසූරිය කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කර සිටියි.

එසේම ගල්බිඳින ඇලේ ගෙදර ප්‍රියන්ත කුමාර සෝමසූරිය නැමැත්තාගේ ප්‍රකාශයක් ද අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් සටහන් කරගෙන ඇත. මෙම සාක්ෂිකරු ත්‍රිපෝලි හමුදා බුද්ධි අනුඛණ්ඩයේ මේජර් බුලත්වත්ත යටතේ සේවය කර ඇති අතර, සේවයේ අවශ්‍යතාවයන් සඳහා 2007 වර්ෂයේ අවසන් භාගයේ සිට 2008 වර්ෂයේ මැද භාගය දක්වා දොම්පේ, ලංසියාවත්ත ප්‍රදේශයේ නිවසක්ද ඉන්පසු දොම්පේ බදුවත්තේ නැමති නිවසද බදු පදනම මත ගත් බවත්, ඒ සඳහා උපදෙස් මේජර් බුලත්වත්තගෙන් ලැබුණු බවත් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට මෙම සාක්ෂිකරු වන සෝමසූරිය විසින් ප්‍රකාශ කර ඇත. මෙම නිවාසවල සෝමසූරිය සමඟ ත්‍රිපෝලි බුද්ධි අනුකණ්ඩයට අනුයුක්තව සේවය කළ කෝප්‍රල් සේනාරත්න හා ජයරත්නද එහි රැඳී සිටි බවට ප්‍රකාශ කර ඇත. මෙම බදුවත්ත වලව්ව නැමති ඉඩමේ විදුලි බිල්පත් ගෙවීමේ කටයුතු ත්‍රිපෝලි අනුකණ්ඩයේ බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළ බවද, බදුවත්ත නැමති නිවස බදු ගැනීමට අවශ්‍ය රු.60,000/-ක බදු කුලි

මේජර් බුලත්වත්ත විසින් කෝප්‍රල් සුමිත් අතේ මාසිකව ඔහු වෙත එවන බව ඔහු ප්‍රකාශ කර ඇත. එසේම 2008.05.22 වෙනි දින හෝ 2008.05.23 වෙනි දින රාත්‍රියේ මේජර් බුලත්වත්ත මහතා බදුවත්තට පැමිණි බවත්, ඒමට ප්‍රථමයෙන් එම ස්ථානයෙන් නොයන ලෙසට දුරකථන පණිවුඩයක් ලැබුණු බවත් දක්වා ඇත. (පහත සඳහන් කරුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කරන ලද්දේ සෝමසූරියට තර්ජන හා බලපෑම් නිසා බැව් මෙම කොමිසම ඉදිරියේදී සාක්ෂි දුන් සෝමසූරිය ප්‍රකාශ කර ඇත. පිටු 23)

මේජර් බුලත්වත්ත මහතා රථයකින් පැමිණ රථය ගේට්ටුව ලඟ නවතා නිවසට පැමිණ සේනාරත්න සම්බන්ධයෙන් සොයා බලා ඔහුට නිවසේ පිටුපසට යන ලෙස පැවසූ බවත්, සෝමසූරියට නිවසේ ඉදිරියට සිටින ලෙසට දැනුම් දුන් බවත්, ඉන්පසු ත්‍රිපෝලි අනුඛණ්ඩයට අනුයුක්තව රාජකාරි කරන පෙරේරා, රාජපක්ෂ, විමලවීර, චාමික සුමිත් හා ජයතිලක යන අය විසින් මිනිසෙකුගේ අත්පය බැඳ යකඩ පොල්ලකින් එල්ලාගෙන බදුවත්ත වලව්වේ නිවසේ සාලයට රැගෙන විත් ඔහුට පහර දුන් බවත්, එම අවස්ථාවේදී මේජර් බුලත්වත්තට දුරකථන පණිවුඩයක් ලැබුණු බවත්, එම ඇමතුමට "හරි සර් හරි" කියූ බවත්, එම ඇමතුමෙන් පැයකට පමණ පසු ඔහුව රථයෙන් රැගෙන ගිය බවත් ප්‍රකාශ කල බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව 2019.08.23 වෙනි දින B1535/08 වාර්තාවෙන් ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවියට වාර්තා කර ඇත.

පැමිණිලිකාර මේජර් ජෙනරල් කුරුප්පු අච්චිගේ ධම්මික අමල් කරුණාසේකර (232/2020), 1981.10.16 වෙනි දින කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් සේවයට බැඳී දියතලාව යුධ හමුදා පාසලේ

පුහුණුවීමෙන් පසු 1984.01.14 වන දිනට දෙවෙනි ලුතිනන්, 1985.07.14 දිනට ලුතිනන්, 1988.07.14 දිනට කපිතාන්, 1991.07.14 දිනට මේජර්, 1996.07.14 දිනට ලුතිනන් කර්නල්, 2004.04.06 දිනට කර්නල්, 2007.11.05 වන දිනට බ්‍රිගේඩියර් සහ 2009.08.31 වෙනි දින මේජර් ජෙනරාල් තනතුරටද උසස්වීම් ලබා විශ්‍රාම ගන්නා විට අවුරුදු 36යි මාස 7ක් පමණ කාලයක් සේවයේ යෙදී සිටි බව දක්වා ඇත.

මෙම සිද්ධීන් සිදුවූ 2007 ජනවාරි සිට 2009 වර්ෂයේ ත්‍රස්තවාදය අවසන් වන තෙක් වූ මුළු කාලවකවානුව තුලම අධ්‍යක්ෂ බුද්ධි වශයෙන් රාජකාරියේ යෙදී සිටි බැව් ඔහුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. සාක්ෂිකරු විසින් 2007 සිට 2009 වර්ෂය දක්වා වූ කාලය තුලදී උතුරු නැගෙනහිර ප්‍රදේශවලින් බැහැරව ත්‍රස්තවාදී සිද්ධීන් සම්බන්ධයෙන් සංඛ්‍යාලේඛන ඉදිරිපත් කර ඇත. මේ අනුව 2007 වර්ෂයේ උතුරු නැගෙනහිර ප්‍රදේශවලින් බැහැරව සිද්ධීන් 23ක්ද, 2008 වර්ෂයේ සිද්ධීන් 49ක්ද, 2009 ජනවාරි සිට මැයි 19 දින දක්වා සිද්ධීන් 9ක්ද වශයෙන් වාර්තා වූ බව ඔහුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. එසේම 2008 ජනවාරි මස සිට 2008 ජූනි මාසය දක්වා කොළඹ, ගම්පහ ප්‍රදේශයන්හි පමණක් සිද්ධීන් 17ක් වාර්තා වූ බැව් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටි. මෙසේ 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ කාලය තුල වැඩි වශයෙන් සිද්ධීන් වාර්තාවී ඇති අතර, මාධ්‍යවේදී කීත්නොයර් පැහැරගෙන ගොස් තිබෙන්නේද මේ කාලවකවානුව තුලදීම බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

මේ කාලය තුල සිදුවූ සිදුවීම් ලෙස සාක්ෂිකරු දක්වා සිටින්නේ 2008.01.01 පාර්ලිමේන්තු මන්ත්‍රී මහේෂ්වරන් ඇතුලු (7)හත්දෙනෙක්

මරණයට පත්වීම, 2008.01.02 කොම්පඤ්ඤ වීදියේ ක්ලෙමෝ ප්‍රහාරයක් එල්ල කිරීමෙන් හමුදා නිළධාරියෙකු හා තවත් අයෙකු මරණයට පත්වීම, 2008.01.08 වන දින ලේක්හවුස් ආයතනය ඉදිරිපිට බෝම්බයක් පිපිරවීම, 2008.01.11 වන දින කොළඹ කොටුව දුම්රිය පොළ ඉදිරියේ බෝම්බයක් පිපිරවීම, 2008.02.23 වෙනි දින කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරියේ බෝම්බයක් පිපිරීම, 2008.02.03 වන දින දෙහිවල ප්‍රදේශයේ බෝම්බයක් පිපිරවීම, 2008.02.04 වන දින ගල්කිස්ස ප්‍රදේශයේ ට්‍රාන්ස්පෝරමයක් පිපිරවීම, 2008.02.29 දින ත්‍රස්තවාදීන්ගේ ගෙයක් පරීක්ෂා කරන විටදී බෝම්බයක් පිපිරවීම, 2008.03.10 දින වැල්ලවත්තේ බෝම්බයක් පිපිරවීම, 2008.04.06 දින ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ ඝාතනය කිරීම, 2008.04.29 දින පිළියන්දල බෝම්බයක් පිපිරවීම, 2008.05.16 දින කොටුව ප්‍රදේශයේ බෝම්බයක් පිපිරවීම, 2008.05.26 දින දෙහිවල බෝම්බයක් පිපිරවීම, 2008.05.06 දින දෙහිවල දුම්රිය ස්ථානයේ බෝම්බයක් පිපිරවීම, 2008.06.04 දින වැල්ලවත්තේ බෝම්බයක් පිපිරවීම සහ 2008.06.06 දින බස් රථයක ක්ලේමෝ බෝම්බයක් පිපිරවීම යනාදි සිද්ධීන් කොළඹ ප්‍රදේශයේ සිදු වූ බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට 2018.02.16 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කැඳවීමක් ලැබුණු බැවින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය බවත්, එහිදි 4වෙනි තට්ටුවට ගොස් සහාකාර පොලිස් අධිකාරි තිසේරා හමුවූ බවත්, එහිදි නිශාන්ත සිල්වා විසින් හමුදාවේ පහළ සිට ඉහළට නිළධාරීන් වාර්තා කරන අන්දම සම්බන්ධයෙන් ප්‍රශ්න කළ විටදී ඒ සම්බන්ධයෙන් පිළිතුරු දුන් විට එවකට ආරක්ෂක ලේකම් ඍජුව වාර්තා කිරීමක්

සම්බන්ධයෙන් ප්‍රශ්න කල බව සාක්ෂිකරු කියා සිටින අතර, එවැනි වාර්තා කිරීමක් සෘජුව නොමැති බව ප්‍රකාශ කර සිටී. එදින ඔහුට නැවත ගෙදර යාමට අවසර දුන් බවද ප්‍රකාශ කර සිටියි.

ඉන්පසු නැවත වරක් 2017 මාර්තු මස 22 වෙනි දින කැඳවීමක් ලැබී, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය විට දුරකතන අංක සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත් එහිදී ප්‍රකාශ සටහන් කරන විට සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ "2008 වර්ෂයේ එම දුරකථන භාවිතා කළාද යන්න සම්බන්ධයෙන් නිවැරදි මතකයක් නොමැති හෙයින්, අවශ්‍යනම් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර, දැනුම් දෙන බවට" යි. එසේම සාක්ෂිකරුගෙන් ත්‍රිපෝලි අනුකණ්ඩයට අදාළ වාර්තා ඉල්ලා තිබූ අතර, එම වාර්තා ලබාදුන් බවත්, එසේම ත්‍රිපෝලි අනුකණ්ඩයේ රාජකාරී සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, එම ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් සාමාජිකයින්ගේ නිශ්කාෂණ කටයුතු කිරීම, කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පිහිටි ආර්ථික මරමස්ථානවල ආරක්ෂාව සොයා බැලීම, හමුදා කඳවුරුවල සහ ගබඩාවල ආරක්ෂාව පරීක්ෂා කිරීම යනාදි රාජකාරි එයට ඇතුලත් වන බවත්, කොස්ගම විශාල අවි ගබඩාවක් තිබෙන අතර, ඒ ආසන්නයේ දෙමළ වතු ජනතාවක් සිටින නිසා එම ප්‍රදේශවල විශේෂ බුද්ධි අවධානය යොමු කිරීමට සිදු වූ බවට ප්‍රකාශ කළ බව දක්වා සිටී. (එම වාර්තාව සාක්ෂිකරු විසින් පැ.8 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.)

එසේම තව දුරටත් ප්‍රශ්න කරමින් බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, එහිදී කොළඹ ප්‍රදේශය තුළ එනම් කොහුවල, මට්ටක්කුලිය ආදී ප්‍රදේශවල පිහිටා තිබූ අනුඛණ්ඩ සම්බන්ධයෙන්ද පැහැදිලි කිරීමක් සාක්ෂිකරු විසින් කළ බවට ප්‍රකාශ කර සිටී. සාක්ෂිකරුට අනුව සාක්ෂිකරු භාවිතා කළ දුරකථන අංකය

වන 0773613496හි සිම් කාඩ්පත භාරදුන් බවත්, පසුව ඔහුගේ දුරකථනයද භාර දෙන ලෙස දන්වා සිටි නිසා එයද භාරදුන් බවද ප්‍රකාශ කර ඇත.

මෙසේ සාක්ෂිකරු සාක්ෂි දෙමින් තවදුරටත් ප්‍රකාශ කර සිටියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔහුගෙන් ප්‍රකාශ ලබා ගැනීමේදී නිවාසයක් ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, ඒ සම්බන්ධයෙන් මතකයක් නැති බවට ප්‍රකාශ ලබාදුන් බවටත් මෙම කොමිෂන් සභාවට ප්‍රකාශ කර සිටී. මෙහිදි සාක්ෂිකරුට නිශාන්ත සිල්වා තර්ජනාත්මක ස්වරූපයෙන් "තමුසෙලා ගෝඨාභය රාජපක්ෂගේ අවශ්‍යතාවයට වැඩ කළා නම් මේවා කියනවා" යැයි කියූ බවත්, ඉන්පසු සාක්ෂිකරු ද තර්ජනාත්මකව නිශාන්ත සිල්වාට පිළිතුරු දුන් බවටත් ප්‍රකාශ කර ඇත.සාක්ෂිකරු දක්වන අන්දමට නිශාන්ත සිල්වා දේශපාලන අරමුණක් වෙනුවෙන් කටයුතු කරන බවට ඔහුට හැඟී ගිය බව ප්‍රකාශ කර සිටියි.(2020.09.25 වෙනි දින සාක්ෂි සටහන් 26 වෙනි පිටුව)

ඊටපසු සාක්ෂිකරුගේ ප්‍රකාශය අනුව 2018.01.10 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙසට තුන්වන වරටත් කැඳවීමක් ලැබුණු බවත්, එහි ගොස් පළමුව සහකාර පොලිස් අධිකාරී තිසේරා හමු වී, ඉන්පසුව 4වෙනි තට්ටුවට ගිය විට එහි සිවිල් ඇඳුමින් පුද්ගලයෙකු සිටි බවත්, සහකාර පොලිස් අධිකාරී තිසේරා විසින් සාක්ෂිකරුට ඔහුව හඳුන්වා දුන් බවත්, පසුව එම සිවිල් ඇඳුමින් සිටි පුද්ගලයා රුවන් පෙතියාගොඩ යැයි සාක්ෂිකරු දැනගත් බවත් ප්‍රකාශ කර සිටී. පසුව සාක්ෂිකරු විසින් මෙම රුවන් පෙතියාගොඩ සම්බන්ධයෙන් සොයා බැලූ බවත්, එහිදී ඔහුගේ පියා රොහාන් පෙතියාගොඩ බවත්, ඔහු හිටපු අමාත්‍ය මිය ගිය ගාමිණී දිසානායක

මහතාගේ ඥාතියෙකු බවත්, එසේම රුවන් පෙතියාගොඩ සන්ඩේ ලීඩර් පුවත්පතේ සේවය කරමින් සිට, ඇමෙරිකා එක්සත් ජනපදයට ගොස් එරට යම් ආයතනයකද සේවය කර 2015 වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමග සම්බන්ධවී සිටින බවට දැණගත් බවත් ප්‍රකාශ කර සිටියි.

තවද සාක්ෂිකරු ඔහුගේ ප්‍රකාශය I.P නිශාන්ත සිල්වා විසින් සටහන් කරන විට ප්‍රකාශවලට පරිබාහිරව යුද්ධයේ අවසන් අදියරේ සුදු කොඩි ප්‍රශ්නය සම්බන්ධයෙන් සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කළ බවත්, එසේ ප්‍රශ්න කරමින් බුද්ධි රහස් ලබා ගැනීමට උත්සාහ කළ බවත් ප්‍රකාශ කර සිටියි.

තුන්වන අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය විට ශානි අබේසේකර මහතා සාක්ෂිකරුව අමතා හමුදාවේ නිළධාරීන් අමාරුවේ දැමීමට අවශ්‍යතාවයක් නොමැති බවත්, මෙම සිද්ධිය වූ අන්දම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් මේ වන විට දැන සිටින බවත්, මෙම සිද්ධිය ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අවශ්‍යතාවය මත සිදු වූ බවට ප්‍රකාශ කරන ලෙසත්, එලෙස ප්‍රකාශ කළහොත් සාක්ෂිකරුට සම්පූර්ණ සහයෝගය දෙන බවටත් කියූවද, සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ එවැන්නක් ඔහුට කළ නොහැකි බවටයි. එසේම සාක්ෂිකරුගෙන් 2007.05.22 වෙනි දිනදී බුද්ධි ප්‍රධානි විශ්‍රාමික මේජර් ජෙනරල් කපිල හෙන්ඩවිතාරණ දුරකථන පණිවුඩයක් දුන්නාද යැයි ප්‍රශ්න කළ බවත්, ඔහු බුද්ධි ප්‍රධානියා වශයෙන් නිතරම දුරකථනයෙන් අමතන බවත්, සාක්ෂිකරු ත්‍රිපෝලි කඳවුර භාරව සිටි බුලත්වත්ත මහතාටද කතා කර ඇති බවත්, සාක්ෂිකරු පැහැදිලිවම ප්‍රකාශ කළ බවට මෙම කොමිෂන් සභාව

ඉදිරියේ ප්‍රකාශ කර සිටි. සාක්ෂිකරු අත්අඩංගුවට පත්වූයේ 2018.03.14 වෙනි දිනදී බවටද දක්වා සිටියි.

සාක්ෂිකරු විශ්‍රාම ගැනීමට පෙර 2017.11.21 වෙනි දින ජාතික ආරක්ෂක විද්‍යාතනයේ සේනාධිනායක වශයෙන් පත්වීමක් ලැබුණු බවත්, නමුත් එම කාලයේදී මෙය ආරම්භ කර නොතිබුණු බවත් මේ සඳහා 2016.12.07 වෙනි දින කැබිනට් තීරණය අනුව 2016.12.07 වන දින එය ආරම්භ කිරීමට නියමිතව තිබූ බවත් සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. එසේම සාක්ෂිකරුට විශ්‍රාම ගත් පසුව එනම් 2018.03.14 දිනට පසුව තව වර්ෂයකින් සේවා දිගුවක් ලැබුණු අතර, සාක්ෂිකරු ජාතික ආරක්ෂක විද්‍යාතනය ආරම්භ කිරීමේ කටයුතුවල නිරතව සිටි බව ප්‍රකාශ කරයි. මෙම ජාතික ආරක්ෂක විද්‍යාතනය සංවිධානය කිරීම සඳහා අවබෝධයක් ලබා ගැනීමට ඉන්දියාවට හෝ පකිස්ථානයට යෑමේ අවශ්‍යතාවයද පැන නැඟුණු අතර, ඉන්දියාවෙන් එම ආයතනය නිරීක්ෂණය කිරීමට 2018.02.19 දින සිට 2018.02.23 දින දක්වා කාලය හෝ 2018.03.05 දින සිට 2018.03.09 දින දක්වා වූ කාලය වෙන් කර තිබූ බවත්, ඒ අතරින් 2018.03.05 දින සිට 2018.03.09 දින දක්වා වූ කාලය සාක්ෂිකරු වෙන්කර ගත් බවත්, මේ සම්බන්ධයෙන් යුධ හමුදාපතිද ඉන්දියාවේ සංචාරයකට යෑමට නියමිතව තිබූ බැවින් සහ සාක්ෂිකරු ඒ වන විට හමුදාවේ දෙවනියා වූ නිසාත් ඉන්දියාවට යෑමට වෙනත් දිනයක් යොදා ගනු ලැබූ බවත් ප්‍රකාශ කරයි. ඒ හෙයින් 2018.04.02 දින සිට 2018.04.04 දක්වා කාලය සංචාරය වෙනුවෙන් වෙන් කරගත් බවත්, නමුත් එම අවස්ථාවේදී "සාක්ෂිකරුට විරුද්ධව ගුවන් ගමන් තහනමක් පනවා තිබෙන බවට තොරතුරු ලද බවත්", ප්‍රකාශ කර සිටි. (2020.09.26 වෙනි දින සාක්ෂි සටහන් 4වෙනි පිටුව)

ඒ සම්බන්ධයෙන් සොයා බලන විට 2018.02.07 වෙනි දින අධිකරණයෙන් ගුවන් ගමන් තහනමක් පනවා තිබූ බවත්, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරු දැනුවත්ව නොසිටි බවද ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු පවසන අන්දමට ඔහුගේ ප්‍රකාශය ගුවන් ගමන් තහනමට පෙර, අවසාන වරට සටහන් කර ගත්තේ 2018.01.10 වෙනි දින බව ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට ගුවන් ගමන් තහනම අධිකරණයෙන් ඉල්ලූ අවස්ථාවේදී මොහුව අත්අඩංගුවට ගැනීමට සිටි නිසා ඔහුගේ ගමන් බලපත්‍රය තහනම් කරන ලෙසට ඉල්ලා සිටි බවට සාක්ෂිකරු ප්‍රකාශ කරයි. ඉන්පසු සාක්ෂිකරු නීතිඥයින් මාර්ගයෙන් අධිකරණයට මෝසමක් ඉදිරිපත් කර 2018.04.29 වෙනි දිනදී විදේශීය ගුවන් ගමන් තහනම ඉවත් කරගනු ලැබූ බවත් ප්‍රකාශ කර සිටි.

2018.04.05 දින නැවතත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් ලැබී තිබූ බවත්, සාක්ෂිකරු පවසන අන්දමට 2018.04.01 වන දින B වාර්තාවක් ඉදිරිපත් කර සාක්ෂිකරුගේ ගුවන් ගමන් බලපත්‍රය නැවතත් තහනම් කළ බව සාක්ෂිකරුට දැන ගැනීමට ලැබුණු බව ප්‍රකාශ කර සිටියි. කෙසේ වුවද සාක්ෂිකරු ගුවන් ගමන් තහනම මෝසමක් මාර්ගයෙන් ඉවත් කර ගනු ලැබූවද, නැවත වරක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගුවන් ගමන් තහනමක් ලබාගෙන තිබුනු හෙයින් 2018.04.01 වෙනි දින ගුවන්ගත වීමට නියමිතව තිබුණද මෙම ගැටළු සහගත තත්ත්වය නිසා ගුවන්ගත වීමට නොහැකි වූ බව ප්‍රකාශ කර සිටියි. ඒ වන විට සාක්ෂිකරු අසනීපව සිටි නිසා හමුදා රෝහලට ඇතුල් වූ බවත්, රෝහල්ගතව සිටි නිසා 2018.04.05 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටීමට නොහැකි බව දැනුම් දුන් බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

කෙසේ වුවද, 2018.04.05 වෙනි දින සවස 5.00ට පමණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් හමුදා රෝහලට පැමිණ රෝහලේ සිටියදිම සාක්ෂිකරුව අත්අඩංගුවට ගත් බව සාක්ෂිකරු ප්‍රකාශ කරන අතර, සාක්ෂිකරු අත්අඩංගුවට ගත්තේ සෝමසූරිය යන අය විසින් කරන ලද ප්‍රකාශයක් මත බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට ආරක්ෂක ලේකම් බුද්ධි ප්‍රධානි මේජර් ජෙනරාල් කපිල හෙන්දවිතාන සහ මේජර් බුලත්වත්ත යන අය අතර, දූරකථන සබඳතාවයද මෙම අත්අඩංගුවට ගැනීමට හේතු වී තිබූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. දූරකථන ඇමතුම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රශ්න කළ විට සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ දිනකට දූරකථන ඇමතුම් 100කට වඩා ප්‍රමාණයක් තිබෙන නිසා, එක් දූරකථන පණිවුඩයක් පමණක් මතකයේ තබා ගැනීම අපහසු කාර්යයක් බවත්, එසේම 2008 කාල පරිච්ඡේදයේදී කොළඹ සහ ඒ අවට තදාසන්න ප්‍රදේශවල වැඩි වශයෙන් නිළධාරීන් රාජකාරියේ යෙදවිමට හේතු වූයේ සිදුවීම් වැඩි වශයෙන් වාර්තා වූ නිසා බවත් ප්‍රකාශ කර සිටි බවට මෙම කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර සිටි.

එසේම සාක්ෂිකරු මාස 5කුත් දින 5ක් රක්ෂිත බන්ධනාගාර ගතව සිටි බවත්, සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය විට ශානි අබේසේකර හමුවූ සෑම අවස්ථාවකදිම ශානි අබේසේකර කියා සිටියේ "ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා දැනුවත්ව ඔහුගේ දැනුම් දීම මත තමයි මේ සියල්ල සිදු කළේ" යැයි ප්‍රකාශ කළහොත් සාක්ෂිකරුගේ අභිවෘද්ධිය ශානි අබේසේකර විසින් බලා ගන්නා බවට කියා සිටි බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටි. සාක්ෂිකරුව අත්අඩංගුවට පත්වීමට හේතු වූයේ අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිදි අවශ්‍ය ප්‍රකාශ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යෝජනා කළ ආකාරයේ ප්‍රකාශ ලබා නොදීම හේතුවෙන් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට බන්ධනාගාරගත වූයේ 2018.04.05 වන දිනදී වන අතර, බන්ධනාගාරගත වූ පසුවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් බන්ධනාගාරයට පැමිණ සාක්ෂිකරුගේ ප්‍රකාශ සටහන් කරගත් බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එසේ බන්ධනාගාරයට පැමිණ සාක්ෂි සටහන් කරගත් අවස්ථාවේදී නඩුවට අදාළ කරුණුවලට වඩා වෙනත් බාහිර කරුණු සම්බන්ධයෙන්ද ප්‍රශ්න කළ බවත් එයින් පැහැදිලිව පෙනී ගිය කරුණක් නම් මෙවැනි ප්‍රශ්න කිරීම්වලට දේශපාලන බලපෑමක් තිබූ බවය. මේ අවස්ථාව වන විට එවකට සිටි ආරක්ෂක ලේකම් ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට නියමිත බව සාමාන්‍යයෙන් පෙනී ගිය කරුණක් වූ නිසා ඔහුට අපකීර්තියක් ඇතිවන ලෙසටත්, එවකට සිටි ආරක්ෂක ලේකම් මේ සිද්ධියට සම්බන්ධ බවටත් ප්‍රකාශ ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දැඩි උත්සාහයක යෙදුන බැව් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එසේම තවත් අවස්ථාවකදී දුරකථන අංක සම්බන්ධයෙන් ප්‍රශ්න කර එම දුරකථන අංක කාගේද යන්න ප්‍රශ්න කළ බවත්, ඉන්පසු නිශාන්ත සිල්වා යෝජනා කර ඇත්තේ "මෙම සිද්ධිය ආරක්ෂක ලේකම්ගේ අනුදැනුම මත සිදු වූ ක්‍රියාවක්" බවට ප්‍රකාශ කරන ලෙසට සාක්ෂිකරුට කියූ බව සාක්ෂියේදී ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරුට ඇප නොදී බන්ධනාගාරයේ තබා ගැනීමට හේතු වූ කරුණු දෙකක් ඔහු විසින් 2020.09.26 වෙනි දින සාක්ෂි සටහනේ 35 සහ 36 පිටුවල දක්වා ඇත. ඔහු පවසන අන්දමට එම කරුණු දෙක

නම් මාධ්‍යවේදී කීත්නොයාර්ට ගිනි අවිවලින් පහරදීමත් සාක්ෂිකරුට ඇප ලබා දුනහොත් ශ්‍රී ලංකාවට අපකීර්තියක් වීමත් බව සාක්ෂිකරු ප්‍රකාශ කරයි. එසේම සාක්ෂිකරුට අනුව 2018.08.15 දින නිශාන්ත සිල්වා සාක්ෂි සටහන් කිරීම සඳහා බන්ධනාගාර රෝහලට පැමිණි බවත්, නිශාන්ත සිල්වා විසින් සාක්ෂිකරුගේ දුරකථන අංකය වන 0773613496 දරණ අංකයට, 2008.05.21, 22 සහ 23 යන දිනවලදී ලද ඇමතුම් කිහිපයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කල බැව් ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු පවසන අන්දමට ආරක්ෂක ලේකම් විසින් කර්නල් බුලත්වත්තට ඇමතුම් ගත් බව දැක්වීමට පොලිසිය උත්සාහ කලද, ඒ දිනවල ලැබුණු දුරකතන අංක කොපමණද කියා පරීක්ෂා කරන විට දුරකථන ඇමතුම් 65ත් 95ත් අතර ලැබී තිබුණු බැව් සටහන්ව තිබුණු බව සාක්ෂිකරු සඳහන් කරයි. එසේම මෙම ඇමතුම් රාජකාරි අවශ්‍යතාවයන් මත ගත් ඒවා බවත්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි මතකයක් නොමැති බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. (2020.09.26 වෙනි දින සාක්ෂි සටහන් පිටු අංක 39) තවද සාක්ෂිකරුට අනුව 2018.09.10 වෙනි දින ඔහුට ඇප ලැබුණු දිනය බවටත් ප්‍රකාශ කරයි. (2020.09.26 වෙනි දින සාක්ෂි සටහන් පිටු අංක 40)

මෙහි ඇප කොන්දේසි තැබීම ඉතා අපහසු නිසා නැවත සංශෝධනය කළ බව ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු ඔහුගේ සාක්ෂියේදී 2017.11.07 දින හමුදාපතිව සිටි මහේෂ් සේනානායක විසින් සූදානම් කල රුවන් පෙතියාගොඩගේ ඉල්ලීම මත හමුවීමකට සහභාගී වූ බව ප්‍රකාශ කළ අතර, රුවන් පෙතියාගොඩ ලැන්ඩ්රෝවර් ජීප් රථයකින් පැමිණ විනාඩි 45ක පමණ සාකච්ඡාවක් කළ බවත්, ඔහු දක්වා සිටියේ මෙම සිද්ධිය ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අවශ්‍යතාවයකට කළ දෙයක් බවටත් ඒ අනුව විමර්ශනයේදී සහය දෙන ලෙස ඉල්ලා

සිටි බවත්, සාක්ෂිකරු ප්‍රකාශ කරයි. මෙම අවස්ථාවේදී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ එවැනි ප්‍රකාශ ඔහුට කිරීමට නොහැකි බවය.

තවත් අවස්ථාවක අද්මිරාල් දසනායක වරක් කීත්නොයාර් නඩුවට උදව් කරන ලෙසට ඉල්ලීමක් කර තිබුණු බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. මෙසේ එක් එක් අය හරහා මෙවැනි ඉල්ලීම් කරනු ලබන්නේ දේශපාලන අරමුණක් ඉටු කරගැනීමට බවත්, එවකට ආරක්ෂක ලේකම් ජනාධිපති මැතිවරණයට ඉදිරිපත්වීම වැළැක්වීමට බවත් සාක්ෂිකරුට පෙනී ගිය බවට ඔහුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

2018.02.09 වන දින සවස 3.00ට පමණ විශ්‍රාමික මේජර් ජෙනරාල් ශ්‍රීනාත් රාජපක්ෂ මහතා සාක්ෂිකරුව හමුවීමට පැමිණි බවත්, එහිදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කියන අන්දමට ප්‍රකාශ ලබා දී අත්අඩංගුවට පත් නොවී මෙම කරුණ අවසන් කර ගැනීම සුදුසු යැයි විශ්‍රාමික මේජර් ජෙනරාල් ශ්‍රීනාත් රාජපක්ෂ විසින් සාක්ෂිකරුට පැවසූ බවත් ප්‍රකාශ කර සිටී.

එසේම සාක්ෂිකරු සාක්ෂිදීමේදී CD තැටි දෙකක් ඉදිරිපත් කළ බවත්,එම CD තැටිවල ඇත්තේ ශානි අබේසේකර සහ රංජන් රාමනායකත් අතර දූරකතන සාකච්ඡාවක් බවත්, ඉන් පැහැදිලි වන්නේ බුද්ධි අංශයේ නිළධාරීන් සමග සහ එහි ක්‍රියාකාරින් සමග ශානි අබේසේකර කෙතරම් ද්වේෂයකින් සිටියාද යන්න බවත්,“ඒ නඩුවේ කොන්ත්‍රාත්තුව තමයි බුද්ධි අංශය සිදු කළ යුත්තේ” මෙයින්ම එහි යටි අරමුණ කුමක්දැයි මනාව පැහැදිලි වන බවත් සහ දේශපාලනිකව බලපෑමක් සිදුව ඇති බවත් රංජන් රාමනායක මන්ත්‍රීතුමා සමග කළ සාකච්ඡාවෙන්ම පැහදිලි වන බවත් ප්‍රකාශ කර සිටී. (2020.09.26 වන දි ලබා දුන්සාක්ෂියේ පිටු අංක 51 සහ 52)

එය දේශපාලන බලපෑමක් බවට පැහැදිලිව පෙනෙන බව වැඩි දුරටත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එසේම එම හඬපටවලම හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මියගේ දුරකථන සංවාදයන්ද තිබෙන බවත්, වැඩිදුරටත් එයින් පෙනී යන්නේ දේශපාලන බලපෑමක් තිබූ බවට යැයි සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු බුද්ධි අංශයේ ක්‍රියාකරන ආකාරය ගැන හා ආරක්ෂක නිවාස සම්බන්ධයෙන් පැහැදිලිව විස්තර කර ඇති අතර, නිළධාරීන් රාජකාරි කරන අවස්ථාවේදී ඔවුන්ගේ අවශ්‍යතාවය අනුව ආරක්ෂක නිවාස සූදානම් කරන බවත් සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. බුද්ධි තොරතුරු රැස් කිරීමේදී ආරක්ෂක ස්ථාන කෙටි කාලසීමාවන් සඳහා භාවිතා කරන බවත්, සාක්ෂිකරුගේ ප්‍රකාශයේදී පැහැදිලිව සඳහන් කර ඇත.

සාක්ෂිකරුගේ දියණියට ශිෂ්‍යත්වයක් සඳහා ඇමෙරිකාවට ඉල්ලුම් කරන විටදී මෙම සිදුවීම් නිසා එම ශිෂ්‍යත්වය ලබා ගැනීමට නොහැකි වූ බවත්, සාක්ෂිකරුට උද්ගත වූ මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන්, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කල බවත් , එහි අංකය SCFR/154/2018 ලෙස දක්වා ඇති අතර, එය නැවත කැඳවීම 2020.11.12 වන දින බවත් ප්‍රකාශ කර සිටී. එසේම පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන්ද ගැටළුවක් පැන නැඟී ඇති බවටත් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරුවන් ලෙස ශානි අබේසේකර, නිශාන්ත සිල්වා, රුවන් පෙතියාගොඩ, රංජන් රාමනායක සහ හිරුණිකා ප්‍රේමචන්ද්‍ර යන අයව සාක්ෂිකරු විසින් නම් කර සිටී. කෙසේ වුවද රංජන් රාමනායක, හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මෙම කොමිෂන් සභාව ඉදිරියට නොපැමිණි අය ලෙස නම් කර ඇති අතර, ශානි අබේසේකර සාක්ෂි නොදෙන බවත්,

නිශාන්ත සිල්වා රට හැර ගොස් ඇති බවත්, සාක්ෂිකරු විසින් ප්‍රකාශ කර ඇත.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 32 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර බුලත්වත්ත වළව්වේ දිසානායක මුදියන්සේ රාළහාමිලාගේ ප්‍රභාත් ශ්‍රී සිවලී බණ්ඩාර දිසානායක බුලත්වත්ත (353/2020), 1996.07.15 වන දින යුධ හමුදාවට ආධුනික කෙඩෙට් නිළධාරියෙකු ලෙස බැඳී වර්ෂ 2ක පමණ කාලයක යුධ හමුදා පුහුණු පාඨමාලාවකින් පසු දෙවන ලූතිනන් තනතුරට උසස්වීම් ලබා 1998.06.20 වන දින සන්නද්ධ හමුදා බුද්ධි බලකායට අනුයුක්ත කිරීමෙන් අනතුරුව වසරකට ආසන්න කාලයක් සන්නද්ධ හමුදා බුද්ධි බලකායේ කොළඹ රාජකාරි කළ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. ඉන් පසුව 2000 වසරේදී වැලිකන්ද 231 බලසේනා මුලස්ථානයට අනුයුක්තව සිට වව්නියාව, අලිමංකඩ සහ යාපනය ප්‍රදේශවල රාජකාරි කර 2005 සිට 2006 දක්වා කාලය තුළ 55 වන සේනාංකයට අනුයක්තව මුහමාලේ රාජකාරී කළ බවත්, 2006 සිට 2010 දක්වා කොළඹ ප්‍රදේශයේ ස්ථාන කිහිපයක රාජකාරි කළ බවත්, 2010 සිට 2011 දක්වා කිලිනොච්චි ප්‍රදේශයේද, 2011සිට 2014 දක්වා මඩකලපුව ප්‍රදේශයේත්, ඉන් පසු විදේශිය පාඨමාලාවක් වන ජොෂ්ඨ මාණ්ඩලික බුද්ධි නිළධාරී පාඨමාලාව හැදෑරිමට පකිස්ථානයට ගොස් පාඨමාලාව හදාරා අවසන් කර පැමිණ 7වන සන්නද්ධ බුද්ධි බලකාය කන්තලේ දෙවන අණදෙන නිළධාරී ලෙස රාජකාරි කළ බවත් සාක්ෂියේදී ප්‍රකාශ කර සිටි. ඉන්පසු පැමිණිලිකරු බුද්ධි බලකා රෙජිමේන්තුවේ ගාල්ල, කරන්දෙණිය මධ්‍යස්ථානයේ විධායක අධිකාරීවරයා ලෙස රාජකාරි කළ බව ප්‍රකාශ කර සිටි. එසේ

රාජකාරීයේ යෙදී සිටියදි සාක්ෂිකරුට පළමුවෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමක් ලැබී ඇත්තේ 2016.09.22 වන දිනදී බවත්, එදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටීමෙන් පසු 4 වන තට්ටුවේ සමුහ මංකොල්ල අංශයට රැගෙන ගිය බවත්, එහිදී නිශාන්ත සිල්වා විසින් සාක්ෂිකරුට කථා කොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූයේ මාධ්‍යවේදීන්ට පහරදීම සම්බන්ධයෙන් සොයා බැලීමට සහ ඒ සඳහා අවශ්‍ය ප්‍රකාශ ලබාගැනීමට බවත් යැයි පැවසූ බවත්, සාක්ෂිකරුගේ ප්‍රකාශය සටහන් කරගැනීමට පොලිස් කොස්තාපල් අනිල් නිළධාරියා යෙදවූ බවත්, ප්‍රකාශ කර සිටි. ප්‍රකාශ සටහන් කරන අවස්ථාවේදී නිශාන්ත සිල්වා සෑම විටම උත්සාහ කළේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නම මෙම සිදුවීම්වලට සම්බන්ධ කිරීමට බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටි. එසේම මෙම මාධ්‍යවේදීයාට පහරදීම සම්බන්ධයෙන් සාක්ෂිකරුට දැණුමක් තිබුනේද නැද්ද යන්න සම්බන්ධයෙන් ප්‍රශ්ණ කළ බවත්, ඒ සම්බන්ධයෙන් කිසිදු දැණුමක් හෝ සම්බන්ධතාවයක් නොතිබු බව සාක්ෂිකරු ප්‍රකාශ කළ බවත්, ප්‍රකාශ කර සිටි. එසේම හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය සමග රාජකාරී කර තිබේද යන්න සම්බන්ධයෙන් ප්‍රශ්ණ කළ බවත්, එවකට සිටි ආරක්ෂක ලේකම් සමග කිසිදු අවස්ථාවකදි රාජකාරි නොකළ බවත්, තවද, එවකට සිටි ආරක්ෂක ලේකම්ට දුරකථනයෙන් අමතා තිබේද, ඇමතීම් ලැබී තිබේද, යන්න සම්බන්ධයෙන්ද ප්‍රශ්ණ කළ බවත්, ඒ සෑම අවස්ථාවකදීම එවැනි පෞද්ගලික දුරකථන සංවාද කිසිසේත්ම නොතිබු බවට ප්‍රකාශ කළ බවත්, ඔහුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර සිටි.

එසේම හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සමග සාක්ෂිකරු ඍජුව හෝ වක්‍රව සම්බන්ධතා පවත්වා තිබේද යන්න

පිළිබඳවද වැඩි දුරටත් විටින් විට ගෝඨාභය රාජපක්ෂ හා සාක්ෂිකරු අතර, තිබෙන සම්බන්ධතාවය පිළිබඳව ප්‍රශ්න කර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ දැඩි අවශ්‍යතාවය වූයේ සාක්ෂිකරුගෙන් කෙසේ හෝ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය සමග සම්බන්ධතා පවත්වා තිබෙන බවට ප්‍රකාශයක් ලබා ගැනීමට බවද ප්‍රකාශ කර සිටි.

සාක්ෂිකරුගේ ප්‍රකාශයට අනුව සාක්ෂිකරු අත්අඩංගුවට ගත් කාලයේ මානව හිමිකම් සැසි වාරය ආරම්භ කර තිබුණු නිසා එයට බලපෑමක් ඇති කිරීමේ ලා නිශාන්ත සිල්වා ඔවුන් කියන ආකාරයට සාක්ෂියක් ලබා දෙන ලෙස ඇතැම් විටෙක ඉතා සුහදව, ඇතැම් විටෙක තර්ජනාත්මක බලපෑම් කරනු ලැබූ බව ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශ 5ක් දී ඇති බැව්ද පළමු ප්‍රකාශය 2016 මැයි මාසයේදීද, එදින ප්‍රකාශයෙන් පසු නිවෙසට යාමට අවස්ථාව දුන් බවද, දෙවනුව 2016 ජූනි මාසයේදීද, එදිනත් ආපසු නිවසට යාමට අවස්ථාව ලබාදුන් බවද, 3 වරට 2016.09.21 වෙනි දින හෝ 22වෙනි දින බවද, එදිනද නිවසට යාමට අවස්ථාව දුන් බවද, 4වෙනි වරට 2017.02.17 වෙනි දිනද ප්‍රකාශයක් ලබාගත් බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එසේම සාක්ෂිකරු 4වෙනි වතාවට ප්‍රකාශය ලබා දෙන විටදී නිශාන්ත සිල්වා කියන ආකාරයට ප්‍රකාශ ලබාදිමට එකඟ නොවුනහොත් දරුණු විදියට ඉදිරියට ක්‍රියාකිරීමට සිදුවන බව කියූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. තවද, ඒ අවස්ථාවේදී ඔවුන්ට සහයෝගය නොදෙන්නේ නම් තදින් ක්‍රියා කිරීමට සිදුවන බව තිසේරා මහතාද කියූ බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එමෙන්ම සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට එවකට සිටි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඉලක්ක කරගෙන ප්‍රකාශයක් ලබාගැනීමට උත්සාහ කරන බැව් සාක්ෂිකරුට පැහැදිලිවම

පෙනී ගිය බවත්, ඔහුව අත්අඩංගුවට ගැනීමට සූදානමක් තිබුණු බවට සාක්ෂිකරුට හැඟී ගිය බවත් ප්‍රකාශ කර සිටියි. එසේම සාක්ෂිකරු තවදුරටත් "රුවන් පෙතියාගොඩ නමින් කෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුලදී ඔහුට සුහදව කතා කළ බවටද" ප්‍රකාශ කර ඇත.

සාක්ෂිකරුගේ ප්‍රකාශය සටහන් කරන අවස්ථාවේදී සාක්ෂිකරු රාජකාරි කළ වේලාවල් ඔහුගේ සෙබළුන් රාජකාරියට යොමු කර තිබූ ආකාරය සම්බන්ධයෙන්ද ප්‍රශ්න කල බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. තවද සාක්ෂිකරුගේ යටතේ සිටින නිළධාරීන් රාජකාරි යෙදවීම සම්බන්ධයෙන් ඔහු දක්වා සිටියේ මුළු දිවයිනම ආවරණය වන පරිදි රාජකාරි යොදවන බවත්, 2008, 2009 සහ 2010 කාලයේදී යුද්ධයේ දරුණුතම කාලය වූ හෙයින්, ඒ අනුව නිළධාරීන් ස්ථානගත කර තිබූ බවද ප්‍රකාශ කර ඇත. මෙදින රාත්‍රී 11.00 වන තුරු ප්‍රකාශ සටහන් කර, ඒ වන විට අත්අඩංගුවට ගෙන ඇති බව එහි සිටින නිළධාරීන් කියූ බව සාක්ෂිකරු සාක්ෂි දීමේදී ප්‍රකාශ කර ඇත.

සාක්ෂිකරු අත්අඩංගුවට ගත් අවස්ථාවේදි ඔහු සමග සිටි අනෙක් දෙදෙනා සැරයන් තනතුරේ නිළධාරින් වූ හෙයින් ඔවුන්ව වෙන්කර තැබීමට ඉල්ලීමක් කළද, එම ඉල්ලීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ප්‍රතික්ෂේප කළ බවද ප්‍රකාශ කර සිටී. තවද ඊට පසු දින සාක්ෂිකරු ඇතුළු අනෙක් දෙදෙනාව මුහුණ ආවරණය කොට වාහනයෙන් ගෙන ගොස් නැවත වරක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණ ඇඟිළි සලකුණු ලබාගෙන නැවත වරක් මුහුණු ආවරණය කොට අධිකරණ වෛද්‍ය නිළධාරියා වෙතට යොමුකොට, ඊටපසු අධිකරණයට ගෙන ගිය බවත් ඉන් දින 3ට පසුව මහේස්ත්‍රාත්තුමිය විසින් රක්ෂිත බන්ධනාගාරගත කළ බවත් ප්‍රකාශ කර සිටියි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ

4ක් සටහන් කළ බවත් එම ප්‍රකාශ 4ම අත්සන් කළ බවත්, ප්‍රකාශ කර සිටියි. මෙම ප්‍රකාශ ලබා ගන්නා සෑම අවස්ථාවකදීම මාධ්‍යවේදීන් ගැන ප්‍රශ්න කළ බවත්, පළමු අවස්ථාවේදී සෑම මාධ්‍යවේදීයෙක් සම්බන්ධයෙන්ද, දෙවනවර ලසන්ත වික්‍රමතුංග සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, 3වෙනි වර රාජකාරි විස්තර ලබාගත් බවත්, 4වෙනි අවස්ථාවේදී කීත්නොයාර්ට පහරදීම සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, සාක්ෂිකරු ප්‍රකාශ කර සිටි. කීත්නොයාර් සිද්ධිය සම්බන්ධයෙන් ඉන්පසුව ප්‍රශ්න කරනු ලැබුවේ 2017 බවත්, සිද්ධිය සිදු වී ඇත්තේ 2008 මැයි මාසයේදී බවත්, 2010 වර්ෂයේදී එක් අවස්ථාවකදී ප්‍රශ්න කල බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරුට අනුව 2017.02.18 වෙනි දින රක්ෂිත බන්ධනාගාර ගත කොට 2017.02.21 වෙනි දින නැවත ආවරණ රහිතව අධිකරණයට ඉදිරිපත් කිරීමට ගෙන ගිය බව ප්‍රකාශ කර සිටී. ඒ අවස්ථාවේදී මාධ්‍යවේදීන් හා රූපවාහිනි නාලිකාවන් විසින් ඔවුන්ව ප්‍රවෘත්තිවලට පෙන්වූ බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. කෙසේ වුවද මෙම දිනයේදී කීත්නොයාර්ගේ නොපැමිණීම හේතුවෙන් හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් නොපැවැත්වූ බව ප්‍රකාශ කර ඇත. කීත්නොයාර් 2017.02.21 වෙනි දින නොපැමිණීම නිසා 2017.03.03 වෙනි දින නැවත වරක් හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වූ බවද, එදිනද කීත්නොයාර් නොපැමිණි නිසා අවසාන වරට 2017.03.16 වෙනි දිනට පෙරෙට්ටුව පැවැත්වීමට දින නියම කළ බවත් ප්‍රකාශ කර සිටියි. එදිනද ඔහු නොපැමිණි නිසා 2017.03.30 වෙනි දිනට කල් දැමූ නමුත්, එදිනද කීත්නොයාර් නොපැමිණි නිසා අධිකරණය විසින් ඇප ලබාදුන් බවත් ප්‍රකාශ කර සිටි. නමුත් ගම්පහ අධිකරණයේ නඩුවක් පවතින බව නිශාන්ත සිල්වා අධිකරණයට දැන් වූ හෙයින් පසුදින එනම් 2017.03.31 වෙනි දින ගම්පහ අධිකරණයට ඉදිරිපත් කරන

ලෙසට මහේස්ත්‍රාත්වරිය නියෝග කළ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු ඔහුගේ සාක්ෂියේදී ඔහුව ගම්පහ අධිකරණයට ඉදිරිපත් කළ බවත්, එදින විනිසුරුතුමා නොසිටි නිසා නඩුව අප්‍රේල් මස 7වෙනි දිනට කල්ගිය බවත්, නැවත බන්ධනාගාර ගත වූ බවත් ප්‍රකාශ කර සිටී. සාක්ෂිකරුගේ ප්‍රකාශයට අනුව 2017.04.07 වෙනි දින සැකකරුවන් හත්දෙනාම අධිකරණයට ඉදිරිපත් කළ බවත්, සාක්ෂිකරුව පමණක් පෙරෙට්ටුවට ඉදිරිපත් නොකළ බවත්, අනෙක් හයදෙනාව පෙරෙට්ටුවට ඉදිරිපත් කළ බවත්, කිසිවෙකු හඳුනානොගත් නිසා 2017.04.07 වෙනි දින ඇප ලැබුණු බවත් ප්‍රකාශ කර සිටී. ඇප නියෝගය “P5”ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. එසේම නැවත කොළඹ අපරාධ කොට්ඨාශයෙන් සාක්ෂිකරුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට අවශ්‍ය බව දන්වා සිටි නිසා 2017.04.06 වෙනි දින අලුත්කඩේ උසාවියට ඉදිරිපත් කළ නමුත්, විනිසුරු නොසිටි නිසා 2017.04.12 වෙනි දිනට පෙරෙට්ටුව ඉදිරිපත් කරන ලෙසට නියෝගයක් දී මහර බන්ධනාගාරයට යැවූ බව ප්‍රකාශ කර සිටියි. නැවත 2017.04.12 වෙනි දින සාක්ෂිකරු පෙරෙට්ටුවෙන් මුලදී ඉවත් කර තිබුණද පසුව ඔහුත් සමග සියලු දෙනාම පෙරෙට්ටුවට ඉදිරිපත් කල නමුත්, හඳුනානොගත් නිසා 2017.04.12 වෙනි දින ඇප ලබා දුන් බව ප්‍රකාශ කර සිටී. නමුත් සාක්ෂිකරු ඇතුලු සැකකරුවන් මහර බන්ධනාගාරයට ගෙන ගිය නමුත් මහර බන්ධනාගාරයෙන් ඇප දී තිබූ නිසා නිදහස් කරන ලෙසට සැකකරුවන් ඉල්ලීමක් කළද, නියෝග නොදුන් නිසා නිදහස් කිරීමට නොහැකි බව බන්ධනාගාරයේ නිළධාරීන් පැවසූ බව ප්‍රකශ කර සිටී. ඉන්පසු 2017.04.13 වෙනි දින නැවත බන්ධනාගාර නිළධාරීන්ගෙන් ඉල්ලීමක් කළ විට එම දෙන ලද ඇප අවලංගු කල බව නිශාන්ත සිල්වා ලිපියක් මගින් බන්ධනාගාරයට යවා තිබුණු බව දැන ගැනීමට ලැබුණු බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

සාක්ෂිකරු ඔහුගේ සාක්ෂියේදී සියලු ඇප කොන්දේසිවලට එකඟව ක්‍රියා කළාට පසුවත් ඇප නොදී තවදුරටත් බන්ධනාගාරයේ සිටීමට සිදු වූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරුට අනුව 2017.04.17 වෙනි දින ගල්කිස්ස අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේදී මහාධිකරණයෙන් ඔවුන්ගේ ඇප අවලංගු කර ඇති බවත්, මේ නිසා මහාධිකරණ නියෝග මත නැවත රිමාන්ඩ් භාරයට පත්වූ බවත්, 2017.05.09 වෙනි දින මහාධිකරණයට ඉදිරිපත් කළ විටදී විමර්ශනයකින් පසු 2017.06.20 වෙනි දින ඇප ලැබුණු බව ප්‍රකාශ කර සිටියි. මේ නිසා සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ 2017.02.17 දින සිට 2017.06.21 වෙනි දින දක්වා බන්ධනාගාරගතව සිටි බවය.

සාක්ෂිකරු සාක්ෂි දෙන අවස්ථාවේදී කීත්නොයාර් මාධ්‍යයට වාර්තාවක් ඉදිරිපත්කර ඇති බවත්, අත්අඩංගුවට ගෙන සිටින්නේ ඔහුට පහරදුන් අය නොවන බවටත් ප්‍රකාශ කර ඇති බව සාක්ෂිකරු මෙම කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරීම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 20 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර හිටිහාමි මුදියන්සේලාගේ නිශාන්ත ජයතිලක (297/2020), 2003.02.13 දින හමුදාවට බැඳී කමාන්ඩෝ පුහුණු පාසලෙන් මාස 3ක මූලික පුහුණුවක් ලැබ ඉන්පසු කමාන්ඩෝ පුහුණුව ලැබූ නමුත්, ලකුණු අඩු වූ නිසා රෙජිමේන්තු කඳවුර ගනේමුල්ලට අනුයුකත්ව 2006.06.12 වෙනි දින දක්වාත්, ඉන්පසු 1වෙනි සන්නද්ධ බුද්ධි බලකායට රාජකාරි සඳහා අනුයුක්තව සිට, කොළඹ මුත්තයියා පාරේ 1වෙනි සන්නද්ධ බුද්ධි බලකා

මූලස්ථානයේ සාමාන්‍ය රාජකාරි කළ බවත්, දැනට එනම් 2019 පෙබරවාරි මාසයේ සිට ඉංජිනේරු වෘත්තීය පුහුණු පාසැලට අනුයුක්ත වීම දක්වා රාජකාරි කර ඇති බව ප්‍රකාශ කරන ලදි.

සාක්ෂිකරුට 2016.09.22 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් ලැබුණ බවත්, එහි ගිය විට පැවරී තිබූ රාජකාරි සම්බන්ධයෙන් ප්‍රශ්න අසැසූ බවත්, එදින සවස 4.00ට පමණ මුදා හැරිය බවත්, එදින මාධ්‍යවේදීයෙකු සම්බන්ධයෙන් කිසිවෙක් ප්‍රශ්න නොඇසූ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. නැවත වරක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් 2017.02.18 වෙනි දින උදේ 10.00ට පැමිණෙන ලෙස කැඳවීමක් ලද බවත්, එදින 10.00ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය පසු අනිල් නිළධාරියා විසින් ස්ථානාධිපති වෙත හා අධ්‍යක්ෂ වෙතට යොමු කළ බවත්, එහිදි මාධ්‍යවේදී කීත්නොයාර් නම් පුද්ගලයෙකුට පහරදීම සම්බන්ධයෙන් විමර්ශනයකට සාක්ෂිකරුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට පොලිස් කොස්තාපල් කන්නන්ගර වෙත සාක්ෂිකරුව යොමු කළ බවත්, ප්‍රකාශය ලබා ගැනීමේදී දුරකථන වාර්තාවක් පෙන්වා සාක්ෂිකරු දන්නා දුරකථන අංක තිබේදැයි ප්‍රශ්න කළ බවත්, ඒ අවස්ථාවේදී ඔහුගේ පුද්ගලික දුරකථන අංකත්, යාළුවෙලා සිටි කාන්තාවගේ අංකය සහ තවත් ගමේ යහළුවන්ගේ අංක ඔහු හඳුනාගත් බවත් ප්‍රකාශ කර සිටි. එසේම මාධ්‍යවේදී කීත්නොයාර්ව 2008.05.22 වෙනි දින පැහැරගෙන ගොස් පහර දුන්නාද යන්න සම්බන්ධයෙන් මොහුගෙන් නොනවත්වාම ප්‍රශ්න කර, ප්‍රකාශ ලබාගත් බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එසේම එහිදි සාක්ෂිකරුව තිසේරා මහතා වෙත යොමු කළ බවත්, ඉන්පසු නිශාන්ත සිල්වා කියා සිටියේ ඊට පෙර අත්අඩංගුවට ගත් අය සත්‍ය ප්‍රකාශ කර ඇති නිසා සාක්ෂිකරුටත් ඇත්ත ප්‍රකාශ

කරලා ගෙදර යන ලෙසටය. තිසේරා විසින් සාක්ෂිකරුට "ඕගොල්ලන් පොඩි මිනිස්සු ලොකු අයත් ඇත්ත කියලා තියෙන්නේ ඔයත් කරපු අයගේ නම් කියලා ගිහිල්ලා දරුවොත් එක්ක හොඳින් ඉන්න. නැතිනම් සර්ලාට වුණ දේම වෙයි" යනුවෙන් ප්‍රකාශ කල බැව් සාක්ෂිකරු කියා සිටියි. ප්‍රකාශය සටහන් කරන විට නිශාන්ත සිල්වා සහ තිසේරා "මේ දේ කරන්න කිව්වේ එවකට ආරක්ෂක ලේකම් වශයෙන් කටයුතු කල ගෝඨාභය යැයි" කියලා කියන්න කිව්වා. දිගටම ප්‍රශ්න කරමින් ප්‍රකාශය සටහන් කරගන්නා විට තිසේරා සහ නිශාන්ත සිල්වා " දන්න දෙයක් තියෙනවනම් කියන්න. ආරක්ෂාව ලබා දෙන්නම්. ලංකාවේ ඉන්න බැරිනම් පවුල් පිටින්ම කැමති ඕන රටකට යවන්නම්. අපි කියන විදිහට කටඋත්තර දීලා යන ලෙස"_ කියූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට අලුයම 2.00 වෙන තුරු ප්‍රකාශ සටහන් කළ බවත්, ඉන්පසු අත්අඩංගුවට ගන්නා බව දැන්වූ බවත් ප්‍රකාශ කරයි. තවද සාක්ෂිකරු සමග බලලත් නිළධාරී විමලවීරද අත්අඩංගුවට ගෙන තිබු බවත්, ඊටපසු දින උදේ මාණ්ඩලික සැරයන් සෝමසූරියද පැමිණ සිටි බවත් ප්‍රකාශ කර සිටී. 2017.02.19 වෙනි දින සම්පූර්ණයෙන්ම රෙදිවලින් ආවරණය කර වාහනයකින් ගල්කිස්ස උසාවියට ගෙන ගොස් මහේස්ත්‍රාත් නිළ මැදිරියට මාධ්‍යවේදී කීත්නොයාර් පැහැරගෙන යාම සම්බන්ධයෙන් ඉදිරිපත් කර දින 14ක් රක්ෂිත බන්ධනාගාර ගත කළ බව ප්‍රකාශ කර සිටී. ඉන්පසු අවස්ථා කිහිපයකදී හඳුනාගැනීමේ පෙරෙට්ටු කිහිපයකට ඉදිරිපත් කළද, කීත්නොයාර් නොපැමිණි නිසා අධිකරණය විසින් ඔවුන්ට ඇප නියම කළ බවත්, ඔහු සමග අනෙක් සැකකරුවන් වූ ප්‍රභාත් බුලත්වත්ත, යූ.පී.ඩී. වීරරත්න, එච්.ජ්.එච්. පෙරේරා, ලසන්ත විමලවීර,

නිශාන්ත කුමාර, චන්ද්‍රාභය ජයසූරිය යන අය ඇප පිට නිදහස් වුවද නිශාන්ත සිල්වා විසින් මෙම සැකකරුවන්ට විරුද්ධව ගම්පහ අධිකරණයේ නඩුවක් පවත්වාගෙන ගිය බැවින් ආවරණ සහිතව 2017.04.07 වෙනි දින අධිකරණයට ඉදිරිපත් කරන බව අධිකරණයට පැවසූ බව ප්‍රකාශ කර සිටි. ඉන්පසු සාක්ෂිකරු දක්වා සිටියේ ගම්පහ අධිකරණයටද, කොළඹ අධිකරණයට විටින් විට හඳුනා ගැනීමේ පෙරෙට්ටු සඳහා ඉදිරිපත් කළද කීත්නොයාර් නොපැමිණි නිසා නැවත නැවතත් බන්ධනාගාර ගත වූ  බවත්, පසුව 2017.06.20 වෙනි දින මහාධිකරණයෙන්  ඇප නියම වූ බවත්ය. මෙය තවදුරටත් සනාථ කරනු පිණිස සාක්ෂිකරු විසින් පුවත්පත් වාර්තාවක් මෙම නොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. 2017.06.13 වෙනි දින දිවයින පත්තරයේ පළවූ ප්‍රවෘත්තියක් අනුව “ තමාට අමානුෂික ලෙස  පහර දුන් අය කවුදැයි දන්නා බවත්, අත්අඩංගුවේ සිටින්නේ පහරදුන් අය නොවන බවත් මාධ්‍යවේදී කීත්නොයාර්” ප්‍රකාශ කල බැව් එම පුවත්පත් කැපුමෙන් හෙළිවෙන බව සාක්ෂිකරු ප්‍රකාශ කර  සිටියි. එය “P5” ලෙස සලකුණු කර ඇත.

සාක්ෂිකරුව මෙලෙස අත්අඩංගුවට ගැනීම හේතුවෙන් ඔහුගේ කීර්තිනාමයට හානියක් සිදු වූ බවත්, උසස්වීම්  අහිමි වූ බවත්, නඩු කටයුතුවලට රුපියල් ලක්ෂ 5ත් 6ත් අතර ප්‍රමාණයක්  වැය වූ බවත්, අත්අඩංගුවේ මාස 4½ ක් පමණ සිටි බවත්, හිඟ වැටුප් නොලැබුණු බවත් ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු තවදුරටත් සාක්ෂි දෙමින් ඔහුගේ බිරිඳටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් කළ බවත් එසේ කැඳවීම කළේ සාක්ෂිකරු භාවිතා කළ දුරකථනය හා සිම්පත සොයා ගැනීමට බවත්, සාක්ෂිකරු  මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් කළද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක්

නොගත් බවත්, මෙහිදි වන්දියක් අපේක්ෂා කරන බවත්, සාක්ෂිකරු විසින් ප්‍රකාශ කර ඇති අතර, වගඋත්තරකරුවන් ලෙස පොලිස් කොස්තාපල් අනිල් නම් කර ඇත.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 9 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර ගොඩැල්ල ආරච්චිගේ චමින්ද සුමිත් (257/2020) 2004දී ආධුනික සෙබළෙකු වශයෙන් බැදී මූලික පුහුණුවෙන් පසු පනාගොඩ හමුදා කඳවුරට වාර්තා කළ බවත්, 2006 අගෝස්තු මාසයේදී පමණ ත්‍රිපෝලි කඳවුරට ස්ථාන මාරු ලබා පැමිණි බවත් එහිදී සාක්ෂිකරුට බර වාහන රියදුරු බලපත්‍ර තිබූ බැවින් වාහන රියදුරෙකු වශයෙන් මරදානේ ත්‍රිපෝලි කඳවුරේ රාජකාරි කළ බවට ප්‍රකාශ කර සිටියි.

2017.03.06 වෙනි දින ප්‍රකාශයක් ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙස දන්වා තිබූ අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය විටදී නිශාන්ත සිල්වා සහ තිසේරා වෙතට සාක්ෂිකරුව යොමු කළ බවද, පසුව පොලිස් සැරයන් කන්නන්ගර වෙතට සාක්ෂිකරුව යොමු කොට ප්‍රශ්න කිරීමට වෙනත් ස්ථානයකට රැගෙන ගිය බවද ප්‍රකාශ කර සිටී. ඒ අවස්ථාවේදී විශේෂයෙන්ම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කර ප්‍රකාශ ලබාගෙන ඇත්තේ කීත්නොයාර්ට පහර දීම සම්බන්ධයෙන් බවද ප්‍රකාශ කර සිටී. කීත්නොයර් සම්බන්ධයෙන් නොදන්නා බව පැවසීමෙන් පසුව ඔහුව නිදහස් කරන ලද බැව් ඔහු ප්‍රකාශ කර සිටියි.

එසේම නැවත වරක් 2017.03.10 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය අතර, ඔහුගේ ඇඟිලි සළකුණු හා පිටු දෙකක පමණ අත්සන් ලබාගත් බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

2018.04.26 දින නැවතත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් ලැබුණු අතර, එදින නිශාන්ත සිල්වා හමු වී පොලිස් සැරයන් ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට රැගෙන ගිය අතර, ඉන්පසු පෙරදී ලබාදුන් ප්‍රකාශ පෙන්වා ඒවා කියවන ලෙසට දැනුම් දුන් බවද, පසුව සාක්ෂිකරු විසින් පොලිස් සැරයන් කන්නන්ගරට ප්‍රකාශ කර ඇත්තේ ඔහු මේ සම්බන්ධයෙන් කිසිවක් නොදන්නා බව යැයි සාක්ෂිකරු සාක්ෂියේදී ප්‍රකාශ කර සිටියි. ඉන්පසු ඔහු දුන් ප්‍රකාශය කන්නන්ගර විසින් නිශාන්ත සිල්වාට පෙන්වා දුන් අතර, නිශාන්ත සිල්වා එය බලා "මේක වැඩක් නැහැ මං කියන විදිහට කටඋත්තරය ගන්න ඕන කියලා කන්නන්ගරට තර්ජනය කල බව" සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. ඊටපසු නිශාන්ත සිල්වාට ඕන විදිහට ප්‍රකාශය ලියූ අතර, එහි ලියා තිබුණේ "බුලත්වත්තගේ උපදෙස් පරිදි කීත්නොයාර් පැහැරගෙන ගිය වාහනේ රියදුරු සාක්ෂිකරු බව" යැයි සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. මෙම ප්‍රකාශය අත්සන් කරන්න කියා දැනුම් දුන්විට සාක්ෂිකරු කිසිවක් නොදන්නා බවත් එම නිසා නොදන්නා දේවල්වලට අත්සන් නොකරන බවත් කියූ විට නිශාන්ත සිල්වාට කෝප වී "තොපි කාළකණ්නි තොපි ලොකු එවුන් එක්ක එකතු වෙලා තමයි මේවා කරලා තියෙන්නෙ. මම තොපිට නිදහසේ ඉන්න දෙන්නෙ නැහැ." යනුවෙන් කියූ බවට සාක්ෂිකරු සාක්ෂියේදී ප්‍රකාශ කර සිටියි. ඉන්පසු තිසේරාගේ කාමරයට ගෙන ගොස් එහිදි තිසේරා විසින්"අපි කියපු දේවල් කළේ නැත්නම් හිරේ යන්න වෙනවා. නිකන් දුක් විදින්න වෙනවා " කියූ බව සාක්ෂිකරු මෙම කොමිෂන් සභාව

ඉදිරියේ ප්‍රකාශ කර සිටී. එම අවස්ථාවේදී සාක්ෂිකරු පවසන අන්දමට සාක්ෂිකරුට "උඹව අත්අඩංගුවට ගන්න බැහැ." යනුවෙන් කන්නන්ගර කියා සිට ඇති අතර, දුරකථන විශ්ලේෂණ වාර්තාව පෙන්වා ඔහුගේ දුරකථන වාර්තාව නොමැති නිසා නැවත වරක් ත්‍රිපෝලි කඳවුරට ගිය බව ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සාක්ෂිකරුගේ ගම් ප්‍රදේශයට ගොස් ඔහු ගැන වැරදි තොරතුරු දී වැරදි මතයක් ගොඩනගා තිබූ බවද ප්‍රකාශ කර සිටී. මෙසේ සාක්ෂිකරුගේ නිවසට ගොස් ඇත්තේ විටින් විට නිවසින් සාක්ෂිකරුට දුරකථන ඇමතුම් ලැබී තිබුණු නිසා බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. 2019.08.22 වෙනි දින නැවතත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබුණු බවත් ඒ අනුව යුධ හමුදාවේ නීතිඥ මහතා සමග අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය බවත්, නීතිඥ මහතා නිශාන්ත සිල්වා සමඟ කතා කොට ඔහු පිටත්ව ගිය බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. තවද නිශාන්ත සිල්වා සාක්ෂිකරුව අමතා නීතිපති දෙපාර්තමේන්තුවෙන් එවා ඇති ලිපිය පෙන්වා මාණ්ඩලික සැරයන්ගේ ප්‍රකාශය අනුව අත්අඩංගුවට ගන්නා බවත්, නිශාන්ත සිල්වා සඳහන් කළ අන්දමට කටයුතු කළා නම් මෙවැන්නක් සිදු නොවන බවත් කියූ බැව් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. ඉන්පසු 2019.08.23 වෙනි දින අධිකරණ වෛද්‍ය නිලධාරී ඉදිරිපත් කර 2019.08.27 වෙනි දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කළ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එසේම සාක්ෂිකරුට අනුව 2019.08.27 වන දින ගල්කිස්ස අධිකරණයට ඉදිරිපත් කළ බවත්, 2019.09.29 වෙනි දින අලුත්කඩේ අංක 3 අධිකරණයට මාධ්‍යවේදී නාමල් පෙරේරාට පහරදීම සම්බන්ධයෙන් පැවැත්වුණු හඳුනාගැනීමේ

පෙරෙට්ටුවට ඉදිරිපත් කළ බවත්, හඳුනානොගත් නිසා එදිනම ඔහුට රුපියල් ලක්ෂ 2ක්වූ ශරීර ඇප 2ක් මත ඇප ලබා දුන්නද, 2019.09.31 වෙනි දින ගල්කිස්ස උසාවියට ඉදිරිපත් කිරීමට තිබෙන බව කියා සාක්ෂිකරුව නැවතත් බන්ධනාගාර ගත කල බැව් ප්‍රකාශ කර සිටියි. 2019.09.03 වෙනි දින ගල්කිස්ස උසාවියෙන් ඇප ලැබුණු බවත්, ඇප කොන්දේසි ලෙස රුපියල් ලක්ෂ 25ක ශරීර ඇප 2ක්, විදේශීය ගමන් බලපත්‍ර තහනම, සෑම මසකම අවසන් ඉරිදා දිනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙස යන ඇප කොන්දේසි මත ඇප ලද බව ප්‍රකාශ කර සිටි. මෙම සාක්ෂිකරු වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිශාන්ත සිල්වා, තිසේරා, පොලිස් සැරයන් කන්නන්ගර යන අය වන අතර, කොමිෂම ඉදිරියේ 2වෙනි වගඋත්තරකරු වන තිසේරා සාක්ෂි ලබා දී ඇති අතර, පොලිස් සැරයන් කන්නන්ගර සහ 4 වන වගඋත්තරකරු මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙනු ලැබුවේ නැත.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 10 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර එස්.එම්.එන්.චන්ද්‍රාභය ජයසූරිය (253/2020), 1991.04.23 වෙනි දින කමාන්ඩෝ රෙජිමේන්තුවට බැඳී වසර 16ක්, කමාන්ඩෝ බලකායේ සේවය කර, 2007 බුද්ධි බලකයාට එක්වී 2014.02.14 වෙනි දින විශ්‍රාම යන තෙක් බුද්ධි බලකායට අනුයුක්තව රාජකාරි කළ බවත්, සක්‍රීය සේවයේ යෙදී සිටියදී රණබිමේ දැක්වූ දස්කම් අනුව තුන් වතාවක් රණශූර පදක්කම හිමි කරගත් බැව්ද ප්‍රකාශ කර සිටියි. විශ්‍රාම ගත් පසුව 2016.10.29 වෙනි දින විදේශ ගත වූ බවත්, 2016.11.21 වෙනි දින ලිපියක් මගින් ඔහුගේ බිරිඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා සාක්ෂිකරු භාවිතා කළ

දූරකථනය පිළිබඳව ප්‍රශ්න කර තිබූ බවත්, ඒ සම්බන්ධයෙන් ඇය නොදන්නා බව ප්‍රකාශ කල විට සාක්ෂිකරු හමුදාවේ කරපු රාජකාරි සහ දූරකථන අංක සම්බන්ධයෙන් ප්‍රශ්න කර තිබූ බවත්, සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

තවද 2017.02.18 වෙනි දින සාක්ෂිකරුගේ බිරිඳට නැවත වරක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම් ලැබී තිබූ බවත්, සාක්ෂිකරුගේ විදේශ ගතවීම, කරනු ලබන රැකියාව සහ සාක්ෂිකරු පිටරට යැවුවේ මොන රාජපක්ෂද කියා ප්‍රශ්න කර ඇති බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. ඉන්පසු සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දෙදෙනෙකු වන තුෂාර සහ ආරියරත්න සාක්ෂිකරුගේ නිවසට ගොස් බිරිඳගෙන් ප්‍රකාශයක් දෙන ලෙස ඉල්ලා ඇති බවත්, නිවසේදී ප්‍රකාශ දිය නොහැකි බව කියූ නිසා එම පොලිස් නිළධාරීන් කඩුගන්නාව පොලිසියට එන ලෙස දැනුම් දී ඇත. එසේම පොලිසියට එන විට දූරකථනයද රැගෙන එන ලෙසටද කියා ඇත. එවිට සාක්ෂිකරුගේ බිරිඳ සාමාන්‍ය දූරකථනයක් ගෙන පොලිසියට ගිය විට, අනෙක් දූරකථන අංකය නොගෙනාවේ ඇයිදැයි ප්‍රශ්න කල බවත්, එම දූරකථනය ඉල්ලා ඇත්තේ සාක්ෂිකරු ඇමතුම් දෙන දූරකථන අංකය දැන ගැනිමේ අදහසින් බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

ඉන්පසු නැවත වරක් 2017.03.05 වෙනි දින කැඳවීමක් ලැබුණු අතර, සාක්ෂිකරුගේ බිරිඳ, නිශාන්ත සිල්වාට කතා කොට මීට පෙර පැමිණ ප්‍රකාශ ලබාදුන් නිසා එම ප්‍රකාශයට අමතරව වෙන කිසිත් ප්‍රකාශ කිරීමට නොමැති බව නිසා දැක්වූ විට පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා එදිනට බිරිඳගේ පැමිණීම අනවශ්‍ය යැයි කියා ඇති බවත් සාක්ෂිකරු ප්‍රකාශ කරයි. ඉන්පසු 2017.03.08 වෙනි දින සමූහ

මංකොල්ල අංශයේ පෙනී සිටින ලෙස දන්වා සාක්ෂිකරුගේ බිරිඳට දන්වා ඇති අතර, එහි ගිය විට පොලිස් නිළධාරීන් කියා ඇත්තේ ප්‍රකාශයක් ලබා නොදුන් නිසා මේ අන්දමින් "දුක් විඳින්නට වෙන බව ඇයට කියා 2017.03.30 වෙනි දින ගල්කිස්ස උසාවියේ පෙනී සිටීමට සිතාසියක් ඇයට දී ඇත" 2017.03.20 වෙනි දින සාක්ෂිකරු නිවාඩු ලබා ගෙන ලංකාවට ආ බවත්, සාක්ෂිකරු 2017.03.30 වෙනි දින බිරිඳ සමග අධිකරණයේ පෙනී සිටිමින් සාක්ෂිකරු ලංකාවට පැමිණි බව අධිකරණයට පවසා ඇති අතර, අධිකරණයේ උපදෙස් මත අධිකරණයෙන් සාක්ෂිකරුට දැනුම් දී ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් ප්‍රකාශ ලබා දෙන ලෙසටයි. මේ අනුව 2017.04.03 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය විට පොලිස් කොස්තාපල් ආරියරත්න විසින් සාක්ෂිකරුව 4 වන තට්ටුවට ගෙන ගොස් නිශාන්ත සිල්වාට ඉදිරිපත් කළ විට "නිවැරදි ප්‍රකාශ දීලා ගෙදර යන්න" කියූ බවත්, පොලිස් කොස්තාපල් ආරියරත්නට සාක්ෂිකරුගේ ප්‍රකාශය සටහන් කරගැනිමට උපදෙස් දුන් බවත්, පැය 12ක පමණ කාලයක් තුළ ප්‍රකාශය සටහන් කළ බවත්, රාත්‍රී 11.30ට පමණ නිශාන්ත සිල්වා පැමිණ ලියූ ප්‍රකාශයට අසතුට පළ කරමින් තරවටු ස්වරූපයෙන් "අපි දන්නවා මාධ්‍යවේදීන් එක්කලා තමුසෙලාගේ කිසිම ගැටුමක් නැහැ කියා. නමුත් මේවා කළේ ආරක්ෂක ලේකම් ගෝඨාභය මහතාගේ ඉල්ලීම මත කියලා. ඔය කට්ටිය දන්නවානේ පැහැදිලිව. ඒ පිළිබඳව ප්‍රකාශයක් ලබා දෙන්න. එහෙම වුනොත් ජයසූරියට තමන්ගේ විදේශිය රැකියාව කරගෙන ඉන්න පුළුවන්" යැයි සාක්ෂිකරුට කියූ බවත්, සාක්ෂිකරු පොලිසියේ සිටින විටදී රුවන් පෙතියාගොඩ යන අය පැමිණ සුහද ලීලාවෙන් කථා කළ බවත්, සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරුට නිතර නිතරම පෙළඹවීම්, බලපෑම්, පොරොන්දු දෙමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට අවශ්‍ය පරිදි ප්‍රකාශයක් ලබා ගැනීමට උත්සාහ කළ බවත්, එදින රාත්‍රියේ ඔහු අත්අඩංගුවට ගැනීමට සූදානම් වන බවත් සාක්ෂිකරුට පැහැදිලි වූ බවත් ප්‍රකාශ කර සිටී. 2017.04.04 වෙනි දින සවස 4.00ට පමණ ගල්කිස්ස අධිකරණයට ගෙන ගොස් දින 7ක් රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත්, 2017.04.11 වෙනි දින සිට නැවතත් සාක්ෂිකරුව තවත් දින 14කින් රක්ෂිත බන්ධනාගාර ගතව සිටිම දීර්ඝ කළ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරුට 2017.06.21 වෙනි දින රුපියල් 35,000/- මුදල් ඇපයක්, දෙදෙනෙකුගේ ශරීර ඇප, යන කොන්දේසි මත ඇප ලැබුණු බවත්, සෑම ඉරිදාවකම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිට අත්සන් කිරීමට සිදු වූ බවත් ප්‍රකාශ කර සිටි.

මෙම අත්අඩංගුවට ගැනීම හේතුවෙන් විදේශීය රැකියාවෙන් ඉල්ලා අස්වී පැමිණීමටට සිදුවූ බවත්, එයින් රුපියල් ලක්ෂ 50ක පමණ අලාභයක් සිදු වූ බවත්, නඩු කටයුතු සඳහා සාක්ෂිකරුගේ වෑන් රථය විකුණා රුපියල් ලක්ෂ 10ක මුදලක් ලබාගෙන වියදම් කළ බවත්, මූල්‍යමය වශයෙන් රුපියල් ලක්ෂ 60ත් 70ත් අතර අලාභයක් සිදුවුණු බවත්, සාක්ෂිකරුගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු බොහෝ සෙයින් අඩාල වූ බවත්, මාධ්‍යවල නම ප්‍රචාරය වූ නිසා දැඩි අපකීර්තියට පත්වූ බවත්, වැඩි දුරටත් සාක්ෂිකරු මෙම නඩු කටයුත්ත ඉවත් කර දෙන මෙන් ඉල්ලීමක්ද කර ඇත.

සාක්ෂිකරු මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් කළද, මෙම සිදුවූ ඉහත වාතාවරණය හේතු කොටගෙන ඇති වූ බිය නිසා නැවතත් එහි නොගිය බවත්, එමෙන්ම මානව හිමිකම් කොමිෂන් සභාවේ නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට බිරිඳට හැකියාවක් නොතිබුණ බවත් ප්‍රකාශ කර සිටියි. එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න කරන විටදී කියා සිටියේ කීත්නොයාර් කියන පුද්ගලයා ගමන්ගත් මාර්ගයට සාපේක්ෂව දුරකථන කුලුණුවල බුද්ධි නිළධාරීන්ගේ දුරකථන ඇමතුම් සටහන් වී තිබෙන බවත්, එසේ සටහන් වී තිබෙන්නේ කුමන හේතුවක් නිසාද යන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විමසූ බැව් සාක්ෂිකරු ප්‍රකාශ කරයි. මෙහිදී සාක්ෂිකරු පිළිතුරු ලෙස ප්‍රකාශ කර ඇත්තේ දක්වා ඇත්තේ කොළඹ ප්‍රදේශයේ සෑම ස්ථානවලම බුද්ධිමය රාජකාරිවල යෙදෙනු බවත්, දිවා රෑ නොතකා රාජකාරි කළ බවත්, අණදෙන නිළධාරි විසින් දෙන නියෝග අනුව රාජකාරි කර ඇති බවයි. එසේම මෙම සිදුවීම 2008 සිදුවූ සිද්ධියක් වන අතර, 2017 ප්‍රකාශ ගන්නා විට එදින කළ රාජකාරිය කුමක්ද යන්න කීමට මතකයේ නොමැති බවත්, කීත්නොයාර් මාධ්‍යවේදියාට කිසි විටෙකත් කථා කර නොමැති බවත්, නිළධාරීන් දක්වන කාලවකවානුව තුල ඇමතුම් 4ක් B වාර්තාවේ සඳහන්ව ඇති බවත්, ඒ කරුණ හේතුකොටගෙන සාක්ෂිකරුව අත්අඩංගුවට ගත් බවත් ප්‍රකාශ කර සිටියි. එසේම මේ කාලවකවානුවේ බෝම්බ පිපිරවීම් තිබූ නිසා සැක කටයුතු සියල්ල සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සිදු වූ බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු තවදුරටත් ඔහු බිරිඳට ලබාගත් දුරකථන ඇමතුම් B වාර්තාවල සඳහන්වී නොමැති බවත් ප්‍රකාශ කර සිටියි. (මෙයින් සාක්ෂිකරු පෙන්වීමට අදහස් කරන්නේ අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුවට අවශ්‍ය අංක හා වේලාවන් පමණක් ඉස්මතු කරමින් එම ස්ථානයේ, එම වේලාවේ සිටියේ කුමන හේතුවකටදැයි ප්‍රශ්න කරනු ලබන බවයි)

මෙම කාලවකවානුව යුද්ධයේ අවසාන අදියර වූ බවත්, එම නිසා සෑම ප්‍රදේශයකම පාහේ බුද්ධි රාජකාරිවල යෙදී සිටි බවටත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එසේම මේජර් බුලත්වත්ත අණදෙන නිලධාරි වශයෙන් දුරකථන ඇමතුම් දුන් විටදී එම දුරකථන ඇමතුම්වලට පිළිතුරු දිය යුතු බවත් එසේ පිළිතරු දුන් බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටි. සාක්ෂිකරුගේ ප්‍රකාශයෙන් සාක්ෂිකරු පෙන්වා සිටින්නේ කීත්නොයාර් ගමන් ගත් මාර්ගයේ සාක්ෂිකරුද ගමන් කර ඇති නිසා එම ගමන් කිරීම සම්බන්ධයෙන් සැකයට භාජනය කර ඇති බවකි.

සාක්ෂිකරු වගඋත්තරකරුවන් වශයෙන් පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා, පො.කො. ආරියරත්න, පොලිස් සැරයන් තුෂාර නම් කරන බවයි.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 21 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර මාණ්ඩලික සැරයන් උයන්ගේ ප්‍රභාත් දුමින්ද වීරරත්න (241/2020), 2003.02.12 වන දින යුධ හමුදාවේ ආධූනික සෙබළෙක් වශයෙන් බැඳී බුස්ස පුහුණු පාසලෙන් පුහුණු පාඨමාලාව හදාරා, පසුව කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලට ඇතුලත්ව වසරක පාඨමාලාවක් හදාරා විසිර යාමෙන් අනතුරුව, 1වන කමාන්ඩෝ රෙජිමේන්තුවට ඇතුලත්ව රාජකාරි කරන අතරතුර LTTE ප්‍රහාරයට ලක්ව දකුණු අතේ ඉහළ බාහුව සහ දකුණු පාදයේ කළවා ප්‍රදේශ බෝම්බ කැලි වැදී තුවාල සිදුව ඇති බවට ප්‍රකාශ කර සිටි. තුවාල සුව

වීමෙන් පසුව ගනේමුල්ල කමාන්ඩෝ රෙජිමේන්තුවේ සේවය කර, පසුව 2007 වර්ෂයේදී අන්තර් මාරුවීමක් ලැබ රෙජිමේන්තු මධ්‍යස්ථාන සන්නද්ධ බුද්ධි බලකායට පැමිණ රාජකාරී කිරීමෙන් පසු 2වන සන්නද්ධ බුද්ධි බලකායට අනුයුක්තව රාජකාරී කර, 2007 සිට 2012 වර්ෂය දක්වා කොළඹ ත්‍රිපෝලි හමුදා කඳවුරේ සේවය කළ බව ප්‍රකාශ කර සිටී. එවකට කණ්ඩායම් භාර නිළධාරියා වූයේ දැනට කර්නල් තනතුරේ සිටින බුලත්වත්ත මහතා වන අතර, එහිදී පැවරී තිබූ රාජකාරිය වූයේ කොළඹ නගරයේ පිහිටි විශේෂ ස්ථාන, ආර්ථික මර්මස්ථානයන්හි ආවේෂණ රාජකාරීවල යෙදීම හා ප්‍රදේශය තුල ආරක්ෂාව සැපයිම හා නිශ්කාෂණ වාර්තා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම බව ප්‍රකාශ කර සිටී. සාක්ෂිකරු කමාන්ඩෝ සෙබළෙක් වශයෙන් ප්‍රගුණ වෙඩික්කරු පාඨමාලාව, පැරෂුට් පාඨමාලාව සහ නායකත්ව පාඨමලා හදාරා ඇති බවත් ප්‍රකාශ කර සිටී. එසේම උතුරු නැගෙනහිර පදක්කම්, මානුෂීක මෙහෙයුමේ 1 සහ 2 පදක්කම්, දීර්ඝ සේවා පදක්කම්, දේශ පුත්‍ර පදක්කම, රණශූර පදක්කම සහ සේවා පදක්කම යනාදී පදක්කම් හිමි කරගෙන ඇති බව ප්‍රකාශ කර සිටී.

2010.09.22 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් ලැබුණ අතර, තවත් නිළධාරීන් දෙදෙනෙකු සමග එහි ගිය බවත්, එහිදී නිශාන්ත සිල්වා සහ සහකාර පොලිස් අධිකාරි තිසේරා වෙත ඉදිරිපත් කළ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. එහිදී සහකාර පොලිස් අධිකාරි තිසේරා විසින් කැඳවූ කාරණය පැහැදිලි කරමින් ඒ සම්බන්ධව සියළු දේ ප්‍රකාශ කරන ලෙසට තර්ජනාත්මකව කියූ බව ප්‍රකාශ කර සිටි. එහිදී විශේෂයෙන්ම ප්‍රශ්න කළේ 2008 සහ 2009 වර්ෂයන්හිදී සිදුවූවා යැයි දැක්වෙන උපාලි තෙන්නකෝන්, කීත්නොයාර්, ලසන්ත වික්‍රමතුංග සහ ප්‍රගීත් එක්නැලිගොඩ යන

මාධ්‍යවේදීන්ට පහරදීම් සම්බන්ධයෙන් බවත් ප්‍රකාශ කර සිටින අතර, මෙම සාක්ෂිකරුගේ ප්‍රකාශය පොලිස් කොස්තාපල් අනිල් විසින් සටහන් කළ බවට ප්‍රකාශ කර ඇත. වැඩි දුරටත් එදින ප්‍රශ්න කරනු ලැබුවේ රාජකාරි සම්බන්ධයෙන් හා පුද්ගලික තොරතුරු සම්බන්ධයෙන් බවත් ප්‍රකාශ කර සිටී.

2017.02.17 වන දින උදේ 9 පැයට නැවතත් පැමිණෙන ලෙසට දන්වා සිටි ඇති බවත්, සාක්ෂිකරු එදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යන විටදී කර්නල් බුලත්වත්ත සහ මාණ්ඩලික සැරයන් පෙරේරාද එහි සිටි බවත් ප්‍රකාශ කර ඇත. 2017.02.17 වෙනි දින නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණ නිශාන්ත සිල්වා හමුවූ අතර, එහිදී කර්නල් බුලත්වත්ත, මාණ්ඩලික සැරයන් එච්.ඒ.එච්. පෙරේරා පැමිණි සිටි බවත්, එහිදි කීත්නොයාර්ට පහරදීම සම්බන්ධයෙන් සාක්ෂිකරුගෙන් ප්‍රකාශ ගැනීමට පොලිස් සැරයන් කන්නන්ගරට පැවරූ බවත් එහිදී නිශාන්ත සිල්වා විසින් සාක්ෂිකරුට "අමාරුවේ වැටෙන්න නැතිව අවශ්‍ය ප්‍රකාශය දෙන්න" යැයිද, අනෙක් අය අත්අඩංගුවට ගෙන අවසන් යැයිද කියූ බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එසේම එම අවස්ථාවේදී නිශාන්ත සිල්වා මත්පැන් පානය කර සිටි බවක් පෙනුණු අතර, ඊට ටික වේලාවකට පසු ශානි අබේසේකර, සහකාර පොලිස් අධිකාරි තිසේරා, නිශාන්ත සිල්වා හා රුවන් පෙතියාගොඩ යන අය කාමරයට පැමිණ එකවරම " මාධ්‍යවේදී කීත්නොයාර්ට පහර දුන්නේ බුද්ධි අංශයේ උඹලානේද? මේක උඹලාගේ උවමනාවට කරපු වැඩක් නොවේ. කීත්නොයාර් එක්ක උඹලාගේ තරහක් නැහැ. මේක කරන්න කිව්වේ ඉහල නිළධාරීයෙක් නේද? ඒ කවුද? බුද්ධි අංශයේ උඹලාගේ ලොක්කා නේද? යුධ හමුදාපතිද ආරක්ෂක ලේකම්ද? ජනාධිපතිද " කියා ප්‍රශ්න කල බව

සාක්ෂිකරු කියා සිටියි. මේ අවස්ථාවේදී සාක්ෂිකරු මේ ඔක්කෝටම පිළිතුරු දිය නොහැකි බවත්, එක් කෙනෙක් පමණක් ප්‍රශ්න කරන ලෙස ඉල්ලා සිටි බවත්, සහාකාර පොලිස් අධිකාරි තිසේරා පුටුව පස්සට කර පහරදීමට සූදානම් වූ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. එවිට සාක්ෂිකරු "පහර දෙන්න එපා" යැයි කියූ බවත්, එවිට "මූත් අරුත් එක්කම ඇතුලට දාන්න" කියමින් ශානි අබේසේකර කාමරයෙන් පිටව ගිය බවත්, රුවන් පෙතියාගොඩ සාක්ෂිකරුට කථා කොට "අමාරුවේ වැටෙන්න නැතිව සර්ලා කියන විදිහට කරලා මෙතනින් ගැලවිලා යන්න" යැයිද, පිටරටකට යෑමට ගමන් බලපත්‍ර සකස් කර දිය හැකි" බවට කියූ බවද, නිශාන්ත සිල්වා බයිට් පිඟානක් සහ අරක්කු වීදුරුවක් රැගෙන පැමිණි බවත්, සාක්ෂිකරු කෑම ලබාගත් නමුත්, මත්පැන් නොගත් බවට ප්‍රකාශ කර සිටි. එහිදී නිශාන්ත සිල්වා සාක්ෂිකරුව අත්අඩංගුවට ගන්නා බව කියූ නිසා සාක්ෂිකරුගේ ගෙදරට මේ බව කියන්න අවශ්‍ය බව සාක්ෂිකරු කියූ බවට ප්‍රකාශ කර සිටි. ඉන්පසු මේජර් බුලත්වත්ත සහ සැරයන් පෙරේරා සිටි සිරමැදිරියටම සාක්ෂිකරුවත් දැමූ බව සාක්ෂියේදී ප්‍රකාශ කර සිටියි.

ඉන්පසු පසු දින මේජර් බුලත්වත්ත සහ සැරයන් පෙරේරාගේ මුහුණු වසා පොලිස් රියක නංවාගෙන පැය 2ට වඩා අධික කාලයක් වෑන් රථයේ සිටිමින් සාක්ෂිකරුගේද මුහුණ වසාගෙන ගිය බවත්, පැය 2ට පසු නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණ සවස 5.00ට පමණ මුහුණ වසා මහේස්ත්‍රාත් නිළ නිවසට ගෙන ගොස් 2017.02.21 වෙනි දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග කළ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට මෙදින හඳුනාගැනීමේ පෙරෙට්ටුවකට ගෙන ආ නමුත්, ආවරණයෙන් තොරව ගෙන ආ

නිසා මාධ්‍ය ඔස්සේ ඔවුන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය වූ බව ප්‍රකාශ කර සිටියි. මෙදින පෙරෙට්ටුවේදී කීත්නොයාර් නොපැමිණි නිසා 2017.03.03 වෙනි දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකොට, 2017.03.03 වෙනි දින ගල්කිස්ස උසාවියට ඉදිරිපත් කර, එදිනද කීත්නොයාර් නොපැමිණි නිසා 2017.03.16 වෙනි දින දක්වා නැවත රක්ෂිත බන්ධනාගාර ගත කළ නමුත්, එදිනද නොපැමිණි නිසා 2017.03.30 වෙනි දින නැවත පෙරෙට්ටුවක් සදහා ඉදිරිපත් කර ඇති අතර, මෙදිනද කීත්නොයාර්ගේ නොපැමිණීම හේතුවෙන් මේජර් බුලත්වත්තට, සැරයන් පෙරේරාට සහ සාක්ෂිකරුට ගල්කිස්ස උසාවියෙන් ඇප ලබාදුන් නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ගම්පහ උසාවියේ 294/2009 යටතේ 2017.04.07 වෙනි දින සාක්ෂිකරුද සමග හදුනාගැනීමේ පෙරෙට්ටුවට නියෝග කර තිබුණු බව ප්‍රකාශ කර සිටී. ඒ නිසා 2017.04.07 වෙනි දින නැවතත් එදිනට ඉදිරිපත් කළ බවත්, උපාලි තෙන්නකෝන් මාධ්‍යවේදීයාද ඔවුන්ව හදුනා නොගත් නිසා නැවත වරක් මහර රක්ෂිත බන්ධනාගාරගත කළ බවත්, නැවතත් නාමල් පෙරේරා නැමැත්තෙකුට පහරදීමක් සම්බන්ධව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට අවශ්‍ය යැයි 2017.04.06 වෙනි දින කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද බවත්, එදින නාමල් පෙරේරා අධිකරණයේ නොසිටි නිසා නැවතත් 2017.04.12 වෙනි දින පෙරෙට්ටුවට තබා, එදින මේජර් බුලත්වත්ත, හේමචන්ද්‍ර පෙරේරා, ලසන්ත විමලවීර, නිශාන්ත ජයතිලක, නිශාන්ත කුමාර යන අයවද පෙරෙට්ටුවට තැබූ බවත්, එහිදි හදුනාගනු ලැබුවේ හේමචන්ද්‍ර පෙරේරා සහ දුමින්ද වීරරත්න වන සාක්ෂිකරුත් පමණක් බවත් ප්‍රකාශ කර සිටි. මෙදින පෙරෙට්ටුවෙන් පසු ඇප ලබාදුන්නද

මහාධිකරණය විසින් ඇප අවලංගු කර තිබූ නිසා නැවත වරක් ඔහු බන්ධනාගාරගත වුවද, ඉන්පසු නැවත වරක් 2017.04.17 වෙනි දින ගල්කිස්ස උසාවියට ඉදිරිපත් කළ බවත්, කොළඹ මහාධිකරණ නඩුව සම්බන්ධයෙන් කරුණු තහවුරු කර ගත් පසු නැවතත් බන්ධනාගාර ගත කළ බවත්, 2017.06.20 වෙනි දින මහාධිකරණයෙන් ඇප ලද පසු 2017.06.21 දින බන්ධනාගාරයෙන් නිදහස් වූ බවත් ප්‍රකාශ කර සිටියි.

මේ අනුව සාක්ෂිකරු 2017.02.17 වෙනි දින අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර, නැවත නිදහස් වූයේ 2017.06.21 වෙනි දින අතර, ඒ කාලය තුළ දැඩි අපහසුතාවයකට මුහුණ දුන් බව ප්‍රකාශ කර සිටී. සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ඉදිරි ගමන නැවත්වීම සඳහා කෙසේ හෝ අසත්‍ය කරුණු ගොතා සාක්ෂිකරුව රජයේ සාක්ෂිකාරයෙක් කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දැඩි උත්සාහයක් ගත් බවටයි. එසේම HCR/2812/2019 යටතේ මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කළද, එයින් සාධාරණයක් ඉටු නොවූ බවත්, ප්‍රකාශ කර සිටී. වැඩි දුරටත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන නිළධාරීන් සිදු කළ අත්තනෝමතික ක්‍රියාවන්ට එරෙහිව විමර්ශනය කර එම නිළධාරින්ට විනයානුකූලව ක්‍රියා කරන ලෙසටයි.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 9 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර සැරයන් මැණික්රන් පේඩිගේ නිශාන්ත කුමාර (242/2020), 2001.03.14 වෙනි දින ආධුනික සෙබළෙකු වශයෙන් සේවයට බැඳී විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු පාඨමාලා පුහුණුව ලබා

2001.08.20 වෙනි දින යාපනයේ 2වෙනි සන්නද්ධ බුද්ධි බලකායට රාජකාරි සඳහා අනුයුක්ත වූ බවත්, එහිදී ආරක්ෂක රාජකාරියේ යෙදී සිට 2005 වසරේදී කොළඹ මුත්තයියා පාරේ රාජකාරි කිරීමෙන් පසුව ත්‍රිපෝලි කඳවුරට අනුයුක්ත වූ බවත්, සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. 2016.09.22 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් ලැබී, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය බවත්, පසුව පොලිස් කොස්තාපල් අනිල් හමු වූ බවත්, එහිදි සාක්ෂිකරුට දුරකථන වාර්තාවක් පෙන්වා එම දුරකථන අංක හඳුනාගන්න යැයි කියූ විට එය පරීක්ෂා කළ අවස්ථාවේදී සාක්ෂිකරුගේ දුරකථන අංකය, තවත් හිතවත් කාන්තාවකගේ අංකය, සහ සාක්ෂිකරුගේ මිත්‍රයින්ගේ අංකත් හඳුනාගත් අතර, ඉන්පසු කීත්නොයාර් යන අයව 2008.05.20 වෙනි දින පැහැර ගැනීම සම්බන්ධයෙන් දිගටම ප්‍රශ්න කර ප්‍රකාශ සටහන් කළ බව ප්‍රකාශ කර සිටී. එහිදි සාක්ෂිකරුව තිසේරා සහ නිශාන්ත සිල්වා වෙතට යොමු කළ බවත්, එහිදි නිශාන්ත සිල්වා "මේ සිද්ධියට සම්බන්ධ සර්ලවත් ඇරෙස්ට් කරලා තියෙන්නේ.එයාලත් ඇත්ත කියලා තියෙන්නේ. උඹත් ඇත්ත කියලා පලයන්" යනුවෙන් සාක්ෂිකරුට කියූ බවත් ප්‍රකාශ කර සිටියි. ඉන්පසු තිසේරා "ඕගොල්ලෝ පොඩි මිනිස්සු ලොකු අයත් ඇත්ත කියලා තියෙන්නේ ඔයත් කරපු අයගේ නම් කියලා දරුවොත් එක්ක හොඳින් ඉන්න. නැතිනම් සර්ලට වෙච්ච දේ තමයි වෙන්නේ" කියා සාක්ෂිකරුට කියූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. මෙහිදි මෙම නිළධාරින් විසින් ලොකු අය කියා හැඳින්වූයේ ආරක්ෂක ලේකම් ගෝඨාභය මහතා ඇතුලු ඉහළ නිළධාරීන් ලෙස සාක්ෂිකරුට තේරුම් ගිය බවද ප්‍රකාශ කර සිටී. එසේම කියන ආකාරයට ප්‍රකාශ දී යන ලෙසත්, අවශ්‍යනම් මුදල් සහ ආරක්ෂාවත් ලබාදීමට හැකි බව

සාක්ෂිකරුට කියා ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සාක්ෂිකරුගේ දුරකථන පෙන්වා දුරකථන අංක හඳුනාගන්නා ලෙස කී විට සාක්ෂිකරු දන්නා දුරකථන පමණක් පෙන්වා අනෙක් දුරකථන අංක නොදන්නා බවත්, කියූ බව ප්‍රකාශ කර සිටී. එම අවස්ථාවේදී නිශාන්ත සිල්වා සාක්ෂිකරුට කථා කොට "උඹව ගෙදර යවන්නම් පෙන්වා සිටින දුරකථන අංක කොහොම හරි සොයා දෙන්න කියා කීයූ බවට සාක්ෂිකරු ප්‍රකාශ කරන අතර, ඊටපසු නිශාන්ත සිල්වා අදට උඹ ගෙදර පලයන් ආයෙත් ඕන උනොත් එන්න දන්වන්නම් " යැයි කියූ බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

නැවතත් 2017.03.30 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමක් ලැබී ගිය විට එහිදි දුරකථන අංකවල තොරතුරු සොයා ගෙන ආවද යන්න සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කල බවත්, එසේ ඇසූ විට සාක්ෂිකරුට සොයා ගැනීමට ක්‍රමයක් නොවූ බව ප්‍රකාශ කර ඇත. ඒ අවස්ථාවේදී තිසේරා සාක්ෂිකරු වෙත "උඹ මෝඩයා වෙන්න එපා. උඹ දන්න දේවල් කියලා පලයන්. ලොකු එවුන් ආරක්ෂා කරන්න ගිහිල්ලා.උඹගේ ගෑනු දරුවන් තමයි අමාරුවේ වැටෙන්නේ." යැයි කියූ බවත් ප්‍රකාශ කර ඇත.

එදින 8.30ට පමණ සාක්ෂිකරුව අත්අඩංගුවට ගත් බව කියූ නිසා ඒ බව නිවසේ අයට දන්වා සිටි බවට ප්‍රකාශ කරයි. එවිට නිශාන්ත සිල්වා සාක්ෂිකරුට "මත්පැන් බොන්න දීමට හැදූ අතර, සාක්ෂිකරු බොන්නේ නැති බව ප්‍රකාශ කළ විට, එම අවස්ථාවේදී අසභ්‍ය වචනයෙන් බැන ඇත්ත කියපන් තෝ නැත්නම් ඔක්කොම දානවා" යැයි කියූ බවට ප්‍රකාශ කර සිටියි.

2017.03.21 වෙනි දින සම්පූර්ණයෙන්ම රෙදිවලින් ආවරණය කොට ගල්කිස්ස උසාවියට පෙරෙට්ටුවක් සඳහා ඉදිරිපත් කළ බවත්, ඊටපසු නැවතත් 2017.03.30 වෙනි දින සාක්ෂිකරු සමග තවත් නිලධාරීන් හයදෙනෙකු පෙරෙට්ටුවට ඉදිරිපත් කළද මාධ්‍යවේදී කිත්නොයාර් නොපැමිණි නිසා 2017.03.30 වෙනි දින ඇප ලබා දුන් බවට ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු සමග ප්‍රභාත් බුලත්වත්ත, යූ.පී.ඩී. වීරරත්න, එච්.ඒ.එච්.පෙරේරා, ලසන්ත විමලවීර, නිශාන්ත ජයතිලක යන නිළධාරීන්ද සිටි බවට ප්‍රකාශ කර සිටියි.

ගල්කිස්ස උසාවියෙන් ඇප ලබා දුන් නමුත් නිශාන්ත සිල්වා විසින් අධිකරණයට මෝසමක ඉදිරිපත් කරමින් සැකකරුවන්ව 2017.04.07 වෙනි දින ගම්පහ අධිකරණයට ඉදිරිපත් කිරිමට අවශ්‍ය යැයි ඉල්ලීමක් කර තිබූ බවත් ප්‍රකාශ කර සිටී. සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ මාධ්‍යවේදී කීත්නොයාර් පැහැරගෙන ගිය දිනයේදී සාක්ෂිකරුගේ රාජකාරි සම්බන්ධයෙන්ද ප්‍රශ්න කළ බවයි. 2017.04.04 වෙනි දින කොළඹ අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේදී මාධ්‍යවේදී නාමල් පෙරේරා යන අයට පහරදීම සම්බන්ධයෙන් හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් සඳහා 2017.04.06 වෙනි දින ඉදිරිපත් කරන ලෙසට මහර බන්ධනාගාර අධිකාරි වෙතට නියෝග කර තිබූ බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

නැවතත් 2017.04.12 වෙනි දින ගම්පහ අධිකරණයට පෙරෙට්ටුවක් සඳහා ඉදිරිපත් කළද මාධ්‍යවේදී උපාලි තෙන්නකෝන් සැකකරුවන් කිසිවෙක් හඳුනානොගත් නිසා මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඇප ලබා දුන් බවත්, නමුත් නැවත වරක් ගල්කිස්ස අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේදී මහාධිකරණය විසින් ඇප අවලංගු කරන ලදුව නැවත වරක් බන්ධනාගාර ගත කළ බවත් ප්‍රකාශ කර සිටී. පසුව

සැකකරුවන්ට කොළඹ මහාධිකරණයේ 2017.06.20 වෙනි දිනදී ඇප ලබා දී ඇත.

සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට අත්අඩංගුවට ගත් දින සිට ඇප ලබා දෙන තුරු මාස 3ක කාලයක් රක්ෂිත බන්ධනාගාර ගත කළ අතර, සාක්ෂිකරුට මාස 6ක වැටුප් අහිමි වූ බවත්, නඩු කටයුතු සඳහා වන වියදම් හානිපූර්ණය කරන ලෙසත් ඉල්ලා සිටියි.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 4 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර අතපත්තු හුන්කිරිආරච්චිගේ ලසන්ත විමලවීර (204/2020),1996.02.16 වෙනි දින හමුදාවට බැදී 2018.06.19 වෙනි දින හමුදාවෙන් විශ්‍රාම ගෙන ඇත. සේවයට බැදී මාස 3ක පුහුණුවෙන් පසු සන්නද්ධ බුද්ධි බලකාය යටතේ දිවයිනේ සෑම ප්‍රදේශයකම පාහේ රාජකාරි කළ බවත්, 1996 සිට 1999 දක්වා කොළඹ ප්‍රදේශයේද, ඉන්පසු 1999 සිට 2001 දක්වා යාපනය ප්‍රදේශයේද, 2001 සිට 2003 දක්වා පුත්තලම ප්‍රදේශයේද, 2004 සිට අත්අඩංගුවට ගන්නා තෙක් කොළඹ ප්‍රදේශයේ ක්ෂේත්‍ර රාජකාරි කල බවද ප්‍රකාශ කර සිටියි.

2016.09.22 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශයක් ලබා ගැනීමට කැඳවීමක් ලැබුණු බවත්, එදින එහි ගිය විටදී එදිනම කෝප්‍රල් ජයතිලකත්, මාණ්ඩලික සැරයන් සෝමසූරියත් පැමිණ සිටි බවත්, තිදෙනාම පොලිස් අධිකාරි තිසේරාට ඉදිරිපත් කල බවත්, තිසේරා විසින් කීත්නොයාර්ට පහර දීම සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට අවශ්‍ය බව සාක්ෂිකරුට දැනුම් දුන් බව ප්‍රකාශ කර සිටියි. එහිදී සාක්ෂිකරු සහ කෝප්‍රල් ජයතිලක එම

කාමරයේ රඳවා තබාගෙන සෝමසූරියව වෙන තැනකට ගෙන ගිය බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කලේ මාධ්‍යවේදි කීත්නොයාර් සම්බන්ධයෙන් බවත්, එදින ප්‍රශ්න කළාට පසු එදින නිවසට යාමට ඉඩ දුන් බවත්, නැවතත් 2017.02.13 දිනදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාක්ෂිකරුට දන්වා සිටියේ ප්‍රකාශයක් ලබා ගැනීමට 2017.02.18 වෙනි දින පැමිණිය යුතු බවටයි. එදින සාක්ෂිකරු ගිය විටදී කෝප්‍රල් ජයතිලකත්, මාණ්ඩලික සැරයන් සෝමසූරියත් පැමිණ සිටි අතර තුන්දෙනාම I.P. නිශාන්ත වෙත ඉදිරිපත් කරනු ලැබූ බවත්, එදින I.P. නිශාන්ත සිල්වා සාක්ෂිකරුට කීත්නොයාර්ට පහරදීම සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂගේ කීමට එකතු වෙලා හවුල් වෙලා හිරිහැර කල බව පළමු දවසේම පිළිගෙන තොරතුරු දුන්නානම්, ආපසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණීමට අවශ්‍යතාවයක් නොමැති බව යන්න සාක්ෂිකරුට ප්‍රකාශ කල බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. මෙදින සෝමසූරිය සහ කෝප්‍රල් ජයතිලක වෙන වෙනම ගෙන ප්‍රශ්න කළ බවත්, සාක්ෂිකරුගේ ප්‍රකාශය සටහන් කිරීමේදී එක දිගට සටහන් නොකර දවස මුළුල්ලේම ටික ටික රෑ වෙනකම් ප්‍රකාශය සටහන් කර ඉන්පසු රාත්‍රී 11.00ට පමණ සාක්ෂිකරු අත්අඩංගුවට ගත් බව කියූ බවට ප්‍රකාශ කර සිටී. ඉන් ටික වේලාවකට පසු සෝමසූරිය සාක්ෂිකරු සිටි කාමරයට පැමිණි බවත්, සෝමසූරියට පහරදී තිබූ බවත්, ඔහුගේ බොත්තමක් කැඩී තිබූ බවත් දුටු බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. ඉන්පසු පොලිස් කොස්තාපල් අනිල් සටහන් කළ ප්‍රකාශය කියවා දුන් බවත්,පසුව එයට අත්සන් කල බවත්, ප්‍රකාශ කර සිටී.

මේ අවස්ථාවේදී සිවිල් ඇඳගත් කෙනෙකු සාක්ෂිකරුට කථා කොට නිශාන්ත සිල්වා කියන විදිහට කරා නම් මෙවැනි කරදර ඇති නොවන බවට කියූ බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. ඊට පසු දින එනම් 2018.02.19 වෙනි දින රෙදි වලින් ආවරණය කොට අධිකරණ වෛද්‍ය නිළධාරී වෙත ගෙන ගොස් එතැනින් අධිකරණය දෙසට ගොස් අධිකරණයට මීටර් 500ක් දුරින් සෝමසූරියව වාහනයෙන් බස්සවා සාක්ෂිකරුව මහේස්ත්‍රාත්තුමිය වෙතට ඉදිරිපත් කළ අතර, මහේස්ත්‍රාත්තුමිය විසින් 2017.02.23 වෙනි දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත්, ඊටපසු දින කීත්නොයාර් අධිකරණයට නොපැමිණි නිසා 2017.03.03 වෙනි දිනට නැවත කැඳවූ බවත්, එදිනද කීත්නොයාර් නොපැමිණි නිසා 2017.03.16 වෙනි දිනටද, එසේම 2017.03.30 වෙනි දිනටද, හඳුනාගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කළ බවත්, එහිදිද කීත්නොයාර් නොපැමිණි නිසා ඇප ලබාදුන් බවත් ප්‍රකාශ කර සිටියි. නමුත් එදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළ ඉල්ලීමකට අනුව 2017.04.07වෙනි දින ගම්පහ මහේස්ත්‍රාත් උසාවියේ නඩු අංක B294/09 සඳහා ඉදිරිපත් කිරීමට තිබෙන බව අධිකරණයට දැන්වූයෙන් නැවතත් රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත්, තවද 2017.04.06 වෙනි දින අලුත්කඩේ උසාවියට ඉදිරිපත් කිරීමට තිබෙන නිසා 2017.04.05 වෙනි දින රාත්‍රියේ සූදානම් වීමට දැනුම් දුන් බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. ඉන්පසු 2017.04.06 වෙනි දින සහ නැවතත්, 2017.04.12 වෙනි දිනට පෙරෙට්ටුව පවත්වා එදිනද කීත්නොයාර් නොපැමිණි නිසා ඇප දෙනු ලැබුවා. එසේ ඇප දුන්නත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීමක් මත තවදුරටත් රඳවා තබා ගන්නා බව බන්ධනාගාර නිළධාරීන් කියා සිටි බව ප්‍රකාශ කරයි. ඉන්පසු 2017.06.20 වෙනි දින කොළඹ

මහාධිකරණය විසින් ඇප ලබාදුන් බව ප්‍රකාශ කර සිටියි. සාක්ෂිකරු තවදුරටත් කියා සිටියේ 2017.06.21 වෙනි දින වන විට මාස 4කුත් දින 2ක කාලයක් බන්ධනාගාරව සිටි බවයි. මෙම තත්ත්වය නිසා ඇති වූ අපකීර්තිය හා මානසික පීඩනය හේතුකොට ගෙන මාස 6ක පමණ කාලයක් දැඩි ආර්ථික අපහසුතාවයන් මධ්‍යයේ වැටුප් රහිතව ජීවත් වූ බවත්, නඩු කටයුතු සඳහා රු.ලක්ෂ 50ක් පමණ මුදලක් වැය වූ බවත්, එසේම මෙම නඩුව සම්බන්ධයෙන් සාධාරණ හා යුක්තිය ඉටු කරන ලෙසත් මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ ඉල්ලා සිටින බවට ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 8 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර හේනාධීර ආරච්චිගේ හේමචන්ද්‍ර පෙරේරා (239/2020), 1995.08.07 වෙනි දින ආධූනික සෙබළෙකු වශයෙන් යුධ හමුදාවට බැඳී කමාන්ඩෝ රෙජිමේන්තුවෙන් පුහුණුව ලැබ, 1998.05.15 දින 2වන සන්නද්ධ බුද්ධි බළකායට රාජකාරි සඳහා වාර්තා කළ බවට ප්‍රකාශ කරයි. 2000 වර්ෂයේ දී පමණ සාක්ෂිකරු රිවි කිරණ මෙහෙයුමේ යෙදි සිටින විටදී කාලතුවක්කු ප්‍රහාරයකට ලක්ව තුවාල සිදුවූ බවත්, එම තුවාල සුවවීමෙන් පසුව 2වෙනි බුද්ධි බළකා ඒකකයට අනුයුක්තව 2005 දක්වා සේවය කළ බවත්, 2005 සිට 2016 දක්වා කොළඹ බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයට අනුයුක්තව මරදානේ පිහිටි ත්‍රිපෝලි කඳවුරේ රාජකාරි කළ බව ප්‍රකාශ කර සිටියි.

2017.02.17 වෙනි දින සාක්ෂිකරුටත්, මේජර් බුලත්වත්තට සහ සැරයන් වීරරත්නට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙස කැඳවීම් කර තිබු බවද, ඒ අනුව එහි ගිය පසු තුන්දෙනාටම IP

නිශාන්ත සිල්වා කථා කර පසුව සහකාර පොලිස් අධිකාරි තිසේරාට ඉදිරිපත් කළ බවත්, කීත්නොයාර් පැහැරගෙන යාම සම්බන්ධයෙන් සාක්ෂිකරු දන්නවා යැයි තිසේරා කියූ විට සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කළ බවත්, වැඩි දුරටත් සහකාර පොලිස් අධිකාරී තිසේරා කියා ඇත්තේ සාක්ෂිකරුට කඳවුරෙන් නිකුත් කර ඇති දුරකථන අංකයෙන් කඳවුරේ අනෙක් රාජකාරි දුරකථන අංක සමග දුරකථන සම්බන්ධතා පවත්වා ඇති බවත්, ඒ නිසා මෙම පැහැර ගැනීම සාක්ෂිකරු විසින් සිදුකළ බව ඔප්පු කිරීමට හැකියාවක් තිබෙන බවටයි. එහිදි සාක්ෂිකරු විසින් එවැනි දුරකථන ඇමතුම් මගින් කඳවුරේ අය සමග සම්බන්ධ වීමට හැකියාවක් තිබෙන බව දැක්වූ විට තිසේරා කියා සිටියේ සාක්ෂිකරුට වෙන්වූ රාජකාරි දුරකථනයක් කඳවුරේ තිබෙන නිසා, ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කල බවයි. එවිට සාක්ෂිකරු වෙනුවෙන් වෙන්වූ දුරකථනයක් නොමැති බවට සාක්ෂිකරු සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. එවිට නැවතත් සහකාර පොලිස් අධිකාරී තිසේරා විසින් “කලු ගලේ ඔළුව ගහගන්න එපා ඔයාට වඩා ලොකු මිනිහෙක් වෙච්ච පොලිසියේ වාස් ගුණවර්ධන මහත්තයත් ඇතුළට ඇරියනම් තමුසේ ඇතුළට අරින එක මහලොකු දෙයක් නොවන බව” තිසේරා පැවසූ බව සාක්ෂිකරු කියා සිටී. තවද මේජර් ජෙනරාල් හෙන්ඩර් විතාරණ, බුද්ධි අධ්‍යක්ෂ අමල් කරුණාසේකර ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ අනුදැනුම මත කීත්නොයාර් පැහැරගෙන ගොස් පහරදුන් බව” ට ප්‍රකාශයක් ලබාදී රජයේ සාක්ෂිකරුවෙකු වෙන ලෙසට (කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට කළ ප්‍රකාශය සටහන් පත් අංක 1332) සාක්ෂිකරුට යෝජනා කළ බවත්, සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කළ බවත්, ඊටපසු සාක්ෂිකරුව තුෂාර, කන්නන්ගර, යන නිළධාරීන් විසින් ප්‍රශ්න කළ බවත්, එහිදී දුරකථන

අංක කිහිපයක් පෙන්වා සාක්ෂිකරු භාවිතා කරන දුරකථන අංකය හඳුනාගන්නා ලෙසටත්, තවත් දුරකථන අංක කිහිපයක් පෙන්වා ඉන් එක් දුරකථන අංකයක් මේජර් බුලත්වත්තගේ බවට හඳුනාගන්නා ලෙස කියූ බවටත්, ඉන් සුළු වේලාවකින් තිදෙනාවම අත්අඩංගුවට ගන්නා බවත්, පොලිස් නිළධාරීන් කියූ බව සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී. එවිට "රුවන් පෙතියාගොඩ යන අය පැමිණ, ගෝඨාභය රාජපක්ෂගේ අනුදැනුම මත කීත්නොයාර් පැහැරගත් බව කියා රජයේ සාක්ෂිකාරයෙකු වෙලා බේරෙන ලෙසත් ලංකාවෙන් පිට පදිංචියට යන්න ඕනනම්, ඒ සඳහා අවශ්‍ය කටයුතු කළ හැකි" බවට කියූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. පසු දින උදේ පොලිස් නිළධාරීන් නැවත සාක්ෂිකරුට කථා කොට "කීත්නොයාර් පැහැර ගැනීම සිදු කළ බවට පාපොච්චාරණයක් කරන්න" කියූ බව සාක්ෂියේදී ප්‍රකාශ කරයි. පසු දින උදේ මුහුණු ආවරණය කොට රථයක නංවාගෙන වේගයෙන් මහක් දුරට ගොස් ආපසු පැමිණ නැවත ප්‍රකාශ සටහන් කර, 2017.02.18 වෙනි දින රාත්‍රී 7.00ට පමණ ගල්කිස්ස මහේස්ත්‍රාත්තුමාට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කළ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. ඒ අවස්ථාවේදී "කීත්නොයාර් නඩුවේ 1වෙනි සැකකරු මේජර් බුලත්වත්ත, 2වෙනි සැකකරු ලෙස හේමචන්ද්‍ර පෙරේරා නොහොත් සැකකරු, 3වෙනි සැකකරු සැරයන් වීරරත්න, 4වෙනි සැකකරු බලලත් නිළධාරී විමලවීර, 5වෙනි සැකකරු කෝප්‍රල් ජයතිලක, 6වෙනි සැකකරු කෝප්‍රල් නිශාන්ත කුමාර යන නම් සඳහන්ව තිබූ බැව් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. නැවත නැවතත් මුහුණු ආවරණය කරමින් කිහිපවරක්ම ගල්කිස්ස උසාවියට ඉදිරිපත් කළද, කීත්නොයාර් නොපැමිණීම නිසා කල්දැමූ බවත්, 2017.03.30 වෙනි දින ගල්කිස්ස උසාවියෙන් ඇප ලබා දුන්නද

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2017.04.07 වෙනි දින ගම්පහ උසාවියේ නඩුවක් ඇති බවට අධිකරණයට දැනුම් දුන් නිසා නැවතත් රක්ෂිත බන්ධනාගාරගත කළ බවත්, පසුව 2017.04.07 වෙනි දින ගම්පහ අධිකරණයට මාධ්‍යවේදී උපාලි තෙන්නකෝන්ට පහරදීම සම්බන්ධයෙන් පෙරෙට්ටුවක් සඳහා ඉදිරිපත් කළද සාක්ෂිකරුව හඳුනා නොගත් නිසා ගම්පහ අධිකරණයෙන් ඇප ලද මුත්, නැවතත් ගල්කිස්ස උසාවියේ නඩුවක් පවතින බවට දන්වා නැවත රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් අධිකරණයෙන් ඉල්ලීම් කළ බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. මහර බන්ධනාගාරයේ සිටින විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැමිණ සාක්ෂිකරුගෙන් සහ සාජන් වීරරත්නගෙන් ප්‍රකාශ සටහන් කරගත් බවත්, පසුව ඉතිරි 4දෙනාගේ ප්‍රකාශ සටහන් කළ බවත්, පසුව හඳුනාගැනීමේ පෙරෙට්ටුවකට අලුත්කඩේ අධිකරණයට ඉදිරිපත් කළ බවත්, එහිදී සාක්ෂිකරුවත්, සාජන් වීරරත්නවත්, ඔහුගේ මල්ලීවත්, නාමල් පෙරේරා විසින් හඳුනාගත් බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. මෙහිදී සාක්ෂිකරු හා වීරරත්න හැර අනෙක් අයට ඇප ලැබුණු බව දක්වා ඇත. එසේම සාක්ෂිකරුට 2017.06.21 වෙනි දින ඇප ලැබුණු බවද දක්වා ඇත. මේ සම්බන්ධව 2017.02.20 වෙනි දින සාක්ෂිකරුගේ බිරිඳත්, මවත් බණ්ඩාරගම පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කිරීමට ගිය බවත්, එම පැමිණිල්ල භාර නොගත් බවටත් ප්‍රකාශ කර සිටී. 2018.02.05 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කැඳවීමට අනුව එහි ගිය බවත්, එහිදි “එක්නැලිගොඩ හඳුනනවාද” යැයි විමසූ බවත්, පිළිතුරු ලෙස සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ එවැන්නෙක් නොහඳුනන බවයි. එවිට

“ඔහෙලා අතුරුදහන් කළ එක්නැලිගොඩ මාධ්‍යවේදියාව ඔච්චර ඉක්මනට අමතක වුණාද” යැයි ප්‍රශ්න කළ බවත් ඒ සම්බන්ධව කිසිවක් නොදන්නා බව සාක්ෂිකරු ප්‍රකාශ කළ විට “ගිරිතලේ කඳවුරේ කර්නල් කුමාරරත්නව හඳුනනවාද” යැයි ප්‍රශ්න කළ බවත්, ඔහු සමග රාජකාරි කර නොමැති බවත් ඔහුව හඳුනන්නේ නැති බවටත්, පිළිතුරු දුන් බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට සාක්ෂිකරුගේ දුරකථන අංකය එක්නැලිගොඩ අතුරුදහන්වූ බව දක්වන දිනයේදී එක්නැලිගොඩ කොළඹ ප්‍රදේශයේ ගමන් ගත් මාර්ගයේ සාක්ෂිකරුද ගමන් කළ බවට වාර්තා වී ඇති බවට, කියූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. එවිට සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ සාක්ෂිකරුගේ රාජකාරි කොළඹ අවට ප්‍රදේශවලට යෙදී තිබූ නිසා එම රාජකාරි අවශ්‍යතාවයන් සඳහා එසේ ගොස් ඇති බවය. මේ සම්බන්ධව ප්‍රශ්න කර නිවසට යාමට අවසර දුන් බවත්, 2019.08.01 වෙනි දින නැවත කැඳවූ බවත්, එදින SI ප්‍රේමතිලක හමු වූ බවත්, “ඇත්ත කියන්න වෙනවා. නැත්නම් අවුරුදු ගණනක් ඇතුලට යන්න ලෑස්ති වෙන්න” යැයි කියූ බවත් එවිට සාක්ෂිකරුගේ ළමයි දෙදෙනා 2019.08.05 වෙනි දින පහේ ශිෂ්‍යත්වයට පෙනී සිටින නිසා ඉන්පසු දිනක කැඳවන ලෙස ඉල්ලා සිටි විට SI ප්‍රේමතිලක කියා ඇත්තේ “ළමයින්ගේ විභාග කටයුතු සඳහා යන්න දෙන්නම් රජයේ සාක්ෂිකරුවෙකු වෙන්න” යනුවෙනි.
සාක්ෂිකරු එය තරයේ ප්‍රතික්ෂේප කරමින් ගිරිතලේ කඳවුරේ රාජකාරි කර නොමැති බවත්, යම් නිළධාරියෙකු කොළඹට පැමිණි විට වෙනත් ස්ථානයකට යෑමට අවශ්‍ය වූ විට එම ස්ථානයට කැටුව යන බවත්, එසේම කඳවුරෙන් පිටව යාමට සාක්ෂිකරුට අවසරය තිබෙන බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. තව දුරටත් සාක්ෂිකරු ප්‍රකාශ කර

සිටින්නේ සාක්ෂිකරුගේ මෙම ප්‍රකාශය සටහන් කිරීමට අකමැති වූ බවත්, ඔවුන්ට අවශ්‍ය දේ සටහන් කර පසුව මෙම ප්‍රකාශය සාක්ෂිකරු අත්සන් කළ බවටත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි. ඉන්පසුව සාක්ෂිකරු පවසන අන්දමට සාක්ෂිකරුව අත්අඩංගුවට ගත් බවත්, මුස්ලිම් අන්තවාදීන් සිටින සිර මැදිරියට දැමීමට උත්සාහ කළ විට සාක්ෂිකරු තරයේ එය ප්‍රතික්ෂේප කළ බවත්, සාක්ෂිකරුව රජයේ සාක්ෂිකරුවෙක් කිරීමට දැඩි උත්සාහයක් ගත් බවටත් සාක්ෂිකරු ප්‍රකාශ කරන අතර, සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කල බවත්, පසුව හෝමාගම අධිකරණයට ඉදිරිපත් කළ විටදී ඇප ලබාදී සෑම මසකම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්සන් කිරීමට නියෝග දුන් බවටත් ප්‍රකාශ කර සිටී. සාක්ෂිකරු තවදුරටත් ප්‍රකාශ කලේ මානව හිමිකම් කොමිසන් සභාවට පැමිණිල්ලක් කළ බවයි. සාක්ෂිකරු 2020.06.04 වෙනි දින සිට විශ්‍රාම ගිය බවත්, එම කාල සීමාව තුල කිසිදු වැටුපක් හෝ දීමනාවක් නොලැබුණු බවත්, හමුදාව තුළ වැඩිම නඩු ප්‍රමාණයක් පවරා ඇත්තේ සාක්ෂිකරුට බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 10 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර රාජපක්ෂගේ ලලිත් රාජපක්ෂ (203/2020), 1992.10.19 වෙනි දින හමුදා පොලිස් සේවා බළකායට ඉල්ලුම්කර තිබියදී, ඔහුගේ ද්‍රවිඩ භාෂා නිපුණත්වය නිසාම සන්නද්ධ බුද්ධි බළකායට බඳවා ගත් බවත්, පසුව කොළඹ මුත්තයියා පාරේ පිහිටි සන්නද්ධ බුද්ධි බළකායට අනුයුක්තව, ගුවන් ඡායාරූප පාඨමාලාව සහ ගූගල් ලෝ බෑන්ඩ් මූලික බුද්ධි පාඨමාලාව අධ්‍යයනය කිරීමෙන් පසුව 1993 වසරේදී බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාක්ෂිකරුව ඉදිරි මූලයේ

වවුනියා බුද්ධි රාජකාරි සඳහා අනුයුක්ත කළ බවත්, එලෙස වසර 13ක් කාලයක් යාපනය, පලාලි, අලිමංකඩ සිදු කළ ක්‍රියාන්විතවලට සහභාගී වූ බවත්, එසේම සත්ජය, ජයමග, ඉදිරි පිම්ම, රිවිරැස, අකුණු පහර, යන සෑම ක්‍රියාන්විතයකටම සහභාගි වී ඇති බවත්, සාක්ෂිකරුගේ රාජකාරිය වූයේ LTTE සංවිධානයෙන් අත්අඩංගුවට ගත්නා සහ භාරවෙන සැකකරුවන් ප්‍රශ්න කිරීම, එම වාර්තා සැකසීමත් ප්‍රදේශයේ දමිළ ජනයාගෙන් බුද්ධි තොරතුරු ලබාගැනීම බව ප්‍රකාශ කර සිටි. සාක්ෂිකරු විසින් එක්රැස් කළ බුද්ධි තොරතුරු මත කොළඹ ප්‍රදේශයේ LTTE බුද්ධි අංශ රහසිගතව පවත්වාගෙන ගිය ආයුධ ගබඩා 3ක් හඳුනාගෙන ක්‍රියාකිරීමට හැකි වූ බවත්, දෙහිවල දුම්රිය බෝම්බය පුපුරුවාලූ LTTE කණ්ඩායම සාක්ෂිකරුගේ සාර්ථක බුද්ධි තොරතුරු මත අත්අඩංගුවට ගත් බවත්, මෙවැනි සාර්ථක බුද්ධි තොරතුරු රැසක් සාක්ෂිකරු විසින් ලබාගෙන සාර්ථක මෙහෙයුම් කිහිපයක් කළ නිසා සාක්ෂිකරුට උසස්වීම්ද, එම දක්ෂතාවය නිසාම 2014දී සාක්ෂිකරුව වර්ෂ 3කට ජර්මනියේ LTTE තොරතුරු සම්බන්ධව සොයා බැලීමට යැවූ බවත්, එහි අවුරුදු 2යි මාස 9කට ආසන්න කාලයක් රාජකාරි කළ බවත් ප්‍රකාශ කර සිටියි.

2019.03.25 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් ලැබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය බවත්, සාක්ෂිකරුගෙන් ඇසූ පළමු ප්‍රශ්නය වූයේ ඔහු රාජපක්ෂ කෙනෙක් වුයේ කෙසේදැයි බවත්, ඉන්පසු ඔහුගේ විස්තර සියල්ලක්ම ගෙන සාක්ෂිකරු ජර්මනියට ගියේ කෙසේද යන්නත් ප්‍රශ්න කල බව සාක්ෂිකරු ප්‍රකාශ කරයි. මේ අන්දමින් සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කර ආපසු යැවූ බවත්, නැවතත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 2019.04.04 දින සාක්ෂිකරුව කැඳවා භාවිතා කළ දුරකථන

සම්බන්ධව ප්‍රශ්න කල බවත්, පසුව ලසන්ත වික්‍රමතුංග, කීත්නොයාර්, සහ උපාලි තෙන්නකෝන් යන මාධ්‍යවේදීන් සම්බන්ධව ප්‍රශ්න කළ බවත්, ඒ කිසිවෙක් පිළිබඳව සාක්ෂිකරු කිසිත් නොදන්නා බවත්, කිසි දිනෙක ඔවුන් දැක නැති බවත්, ප්‍රකාශ කළ විට, ප්‍රකාශයක් සටහන් කර, සාක්ෂිකරුව නිදහස් කළ බවට ප්‍රකාශ කර සිටී.

සාක්ෂිකරු අවුරුදු 22ක සේවා කාලයක් අවසන් කර, තවත් අවුරුදු 3ක් පමණ සේවය කළද, මෙවැනි ප්‍රශ්න සහගත තත්ත්වයන් උද්ගතවන නිසාත් ප්‍රශ්න කිරීම් ඇතිවන නිසාත් ඔහු විශ්‍රාම යෑමට ඉල්ලුම් කර නිවාඩු ලබා නිවසේ සිටි බවත් ප්‍රකාශ කර සිටී.

2016.07.07 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 10දෙනෙක් පමණ පැමිණ නිවස වටලා සාක්ෂිකරුව අත්අඩංගුවට ගත් බවත්, එසේ අත්අඩංගුවට ගත් විට මාධ්‍යවේදී උපාලි තෙන්නකෝන්ට පහර දෙන අවස්ථාවේදී, කාර් රථයේ තිබී ඇඟිලි සළකුණක් හමු වූ බවත්, එම ඇඟිලි සළකුණු සාක්ෂිකරුගේ ඇඟිලි සළකුණු සමග ගැළපෙන බවත් දක්වා ඔහු අත්අඩංගුවට ගෙන රැගෙන ගිය බව ප්‍රකාශ කර සිටී.

මෙම මාධ්‍යවේදී උපාලි තෙන්නකෝන්ගේ නඩුව ගම්පහ අධිකරණයේ ගොනුකර තිබූ නඩුවක් බවත්, එදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන ගොස් දූරකථන ඇමතුම්, ඇඟිලි සළකුණු සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, එසේ ප්‍රශ්න කරමින් සාක්ෂිකරුව බිම ඉන්දවා දෙදෙනෙකු කරට නග්ගවා වද හිංසා පීඩන පමුණුවමින් ප්‍රශ්න කර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කියන අන්දමට ප්‍රකාශ දෙන ලෙසත්, එසේ ප්‍රකාශ දීමට බිය නොවන ලෙසත්, අවශ්‍ය නම් පොලිස් ආරක්ෂාව දිය හැකි බවත්, විදේශ ගතවීමට අවශ්‍ය නම් එයද කළ හැකි බවත්, එසේම මත්පැන් පානය

කිරීමට කථා කළ බවත්, සාක්ෂිකරු එසේ නොකළ බවත් පසුව දෙදෙනෙක් ඔහුගේ උරහිසට නගගවා අමානුෂික වද හිංසා දුන් බවත්, ඔහු බිම ඇද වැටුණු බවත් ප්‍රකාශ කර සිටියි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කරන අවස්ථාවේදී දුරකථන පිළිබඳ ප්‍රශ්න කර, මාධ්‍යවේදී කීත්නොයාර් පැහැරගත් දිනයේදී ඔහුගේ දුරකථනය පාවිච්චි කර තිබෙන බවත්, ඊට අමතරව මාධ්‍යවේදී උපාලි තෙන්නකෝන් මහතාට පිරිසක් උදේ පහර දුන්නා යැයි කියන අවස්ථාවේදීත් සාක්ෂිකරුගේ දුරකථනය සම්බන්ධ විස්තර එම ලැයිස්තුවේ සඳහන්ව තිබෙන බවද, පවසමින් ඒ සම්බන්ධව ප්‍රශ්න කළ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. සාක්ෂිකරුගේ ඇඟිලි සලකුණු සම්බන්ධයෙන්ද ප්‍රශ්න කළ බවත්, එය කෙසේ වුවාද යන්න සාක්ෂිකරුටද ප්‍රහේලිකාවක් බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. තවද සාක්ෂිකරුට අධිකරණ 3ක නඩු පවරා තිබෙන බවත්, 2019.07.08 වෙනි දින මාධ්‍යවේදී උපාලි තෙන්නකෝන් නඩුව සඳහා ගම්පහ අධිකරණයට ඉදිරිපත් කර, රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත්, පසුව නැවත වරක් 2009.07.18 වෙනි දින ගල්කිස්ස උසාවියට ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කර සිටී.

සාක්ෂිකරුට විරුද්ධව ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ 294/2009 සහ ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණ B1535/2004 නඩුද, කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ 4690/2008 නඩුවද ඔහුට විරුද්ධව ගොනුකර තිබෙන බැව් මෙම කොමිෂන් සභාව ඉදිරියේදී ප්‍රකාශ කර සිටී.

එසේම සාක්ෂිකරුව ගම්පහ අධිකරණයට ඉදිරිපත් කර හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වූ බවත් එහිදීද, හඳුනාගැනීමක් සිදු නොවූ බවත්, එසේම ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේදීද පෙරෙට්ටුවකට

ඉදිරිපත් කළ බවත්, මාධ්‍යවේදී කීත්නොයාර් නොපැමිණීම නිසා එහිදීද හඳුනාගැනීමක් සිදු නොවූ බවත් සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී.

සාක්ෂිකරු ප්‍රකාශ කරන අන්දමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සාක්ෂිකරුව මුල් අවස්ථාවේදී කැඳවනු ලැබූ විට මුලින්ම ප්‍රශ්න කළේ මාධ්‍යවේදී කීත්නොයාර් සම්බන්ධයෙන් බවත්, සාක්ෂිකරුව පළමුවෙන්ම අධිකරණයට ඉදිරිපත් කරනු ලබන්නේද මාධ්‍යවේදී කීත්නොයාර් සම්බන්ධයෙන් බවත්, එසේ වුවද ගම්පහ අධිකරණයට ඉදිරිපත් කරනු ලැබුවේ මාධ්‍යවේදී උපාලි තෙන්නකෝන්ට පහරදීම සම්බන්ධයෙන් බවත්, මේ සෑම අධිකරණ කටයුත්තකින්ම සිදුවූයේ සාක්ෂිකරුට දින 54ක් බන්ධනාගාරගතව සිටිමට බවටත් ප්‍රකාශ කර සිටියි.

එසේම සාක්ෂිකරු ගම්පහ උසාවියට ඉදිරිපත් කිරීමෙන් පසුව ගල්කිස්ස උසාවියට ඉදිරිපත් කිරීම සඳහා වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටියදී පොලිස් කොස්තාපල් අනිල් බන්ධනාගාරය තුළට පැමිණ IP නිශාන්ත සිල්වා විසින් කළ යෝජනාවට කැමති වන ලෙසට ඉල්ලා සිටි බවත්, තවදුරටත් අනිල් පැවසූ අන්දමට " දැන් ජේනවානේ බන්ධනාගාරේ ඇතුලේ ඉන්නකොට තියෙන අමාරුව දුක් විඳින්න වෙනවා කියන එක හොඳට අවබෝධ කරගෙන සර් කියපු දේට කැමති වෙයන්" එසේම සාක්ෂිකරුට "රජයේ සාක්ෂිකාරයෙක්" වීමට අවස්ථාව තිබෙන බවත්, එසේම සාක්ෂිකරුට "පවුල පිටින් පිටරට යාමට අවස්ථාව සලසා දෙන්නම්" යැයිද එසේ නොමැතිනම් විශ්‍රාමිකව සිටින නිසා නිවසට පොලිස් ආරක්ෂාව වුවද දිය හැකි බවද, මුදල් නොමැතිනම් එම අවශ්‍යතාවයද ඉටු කිරීමට හැකි බවද යෝජනා කළ බවට සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

සාක්ෂිකරුගේ දුරකථන අංකය වන්නේ 0718412517 වන අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කළ බවත්, 2007 වර්ෂයේ අවසාන භාගය වන විට ත්‍රිපෝලි අනුබණ්ඩයේ සේවය කළ බවටත් ප්‍රකාශ කරයි

සාක්ෂිකරු වගඋත්තරකරුවන් ලෙස IP නිශාන්ත සිල්වා, පොලිස් කොස්තාපල් අනිල් නම් කර ඇති අතර, සාක්ෂිකරුට සිදු වූ අගතීන් පහත පරිදි මෙම කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත.

1. සාක්ෂිකරුගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම සම්බන්ධයෙන් සාධාරණයක්

2. සාක්ෂිකරුට සිදු වූ මෙම ගැටළුකාරී තත්ත්වය නිසා වන්දි ලබා දෙන ලෙසටත්

3. සාක්ෂිකරුට විරුද්ධව අධිකරණ 3ක නඩු 3ක් තිබෙන නිසා ඒ නඩු තුනටම සාධාරණ තීන්දුවක් ලබා දෙන ලෙසටත්

4. සාක්ෂිකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සෑම ඉරු දිනකම අත්සන් කිරීමට තිබෙන නියෝගයෙන් නිදහස් කර දෙන ලෙසටත්

සාක්ෂිකරු මෙම කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර සිටී.

වගඋත්තරකරුවන් වශයෙන් 16 වෙනි වගන්තිය යටතේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා සහ පොලිස් කොස්තාපල් අනිල් නම් කර ඇති අතර, ඔවුන් 2020.10.17 වෙනි දින මෙම කොමිෂන් සභාවට නොපැමිණි නිසා එම වගඋත්තරකරුවන් දෙදෙනා මෙම කොමිෂන් සභාවේ පෙනී සිටිම පැහැර හරින ලද පුද්ගලයින් ලෙස සැලකීමට කොමිෂන් සභාව තීරණය කරනු ලබයි.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ.8 දක්වා සලකුණු කර ඇත.

පැමිණිලිකාර මාණ්ඩලික සැරයන් සෝමසූරිය (296/2020), 1993 හමුදාවට සාමාන්‍ය සෙබළෙක් වශයෙන් බැඳී පුහුණුව ලබා 2වෙනි විජයබා රෙජිමේන්තුවට අනුයුක්තව සේවය කළ බවත්, 1998 වර්ෂයේදී 2වෙන සන්නද්ධ බුද්ධි බළකාය වෙත අනුයුක්ත වී රාජකාරී කළ බවත්, 1998 සිට 2005 දක්වා යාපනයේ රාජකාරි කළ බවත්, 2007 දී පමණ කොළඹ ප්‍රදේශයේ රාජකාරිවල යෙදී සිටි බවත්, ප්‍රකාශ කරන අතර, විශ්‍රාම ගැනීමට පෙර අවසානයේදී සේවය කලේ කොළඹ ත්‍රිපෝලි කඳවුරේ බවද 2015 වර්ෂයේදී මාණ්ඩලික සැරයන් වශයෙන් විශ්‍රාම ගත් බවට ප්‍රකාශ කර සිටියි.

2017.02.17 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් ලැබ එහි ගිය විට පසුවදාට පැමිණෙන ලෙස දන්වා සිටි හෙයින් පහුවදා එනම් 2017.02.18 වෙනි දින නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස්, එදින සාක්ෂිකරු සමග පෙරදී රාජකාරි කළ ලසන්ත විමලවීර හා කෝප්‍රල් ජයතිලක යන දෙදෙනාද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණි සිටි බැව් ප්‍රකාශ කර සිටී.

එදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය විට IP නිශාන්ත සිල්වාට යොමු කර සාක්ෂිකරුවෝ එහි කැඳවූයේ කීත්නොයාර් පැහැරගෙන ගොස් පහර දුන්නේ යැයි කියන සිදුවීම සම්බන්ධයෙන් බවට කියූ බැව්ද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියි.

ඉන්පසු සාක්ෂිකරුව වෙනමම කාමරයකට ගෙන ගොස්, දොම්පේ ප්‍රදේශයේ ගෙයක් කුලියට ගත්තාදැයි කියා සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කළ බවත්, මුල් අවස්ථාවේදී එවැන්නක් නොකළ බව පැහැදිලිව

දන්වා සිටි විට එම නිවසේ බදු ඔප්පුව පෙන්වූ හෙයින් ඒ සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශ නොකර සත්‍ය ප්‍රකාශ කරන ලෙසට සාක්ෂිකරුට කියූ බවත්, එවැනි ගෙයක් දොම්පේ ප්‍රදේශයෙන් කුලියට ගත්තේ ඒ අවට ආරක්ෂාව අවශ්‍ය සහ ආරක්ෂාව ලබාදිය යුතු ස්ථාන කිහිපයක් තිබුණු නිසාත්, ඒ සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියා කිරීමට එවැනි ස්ථානයක් අවශ්‍ය බව පැහැදිලි කර දුන් බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටි. එසේම රටේ පැවති ත්‍රස්තවාදී වාතාවරණය මත වැදගත් ස්ථාන වන පනාගොඩ හමුදා කඳවුර, කොස්ගම අවි සහ පතොරොම් ගබඩාව වැනි ප්‍රබල කඳවුරු තිබූ නිසාත් කොළඹ ප්‍රදේශයේ සිට ඉක්මනින් ඒ ප්‍රදේශවල රාජකාරි කිරීමට නොහැකි නිසාත් ඊට ආසන්න ප්‍රදේශයකින් නිවස ගත් බවත්, ඒ සම්බන්ධයෙන් පොලිසිය සහ ග්‍රාමසේවක දැනුවත් කර තිබූ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

එම ස්ථාන බදු ගත්තේ බුද්ධි කටයුතුවලට නොවන බවත්, නිළධාරීන්ට රාජකාරි වේලාවෙන් පසු විවේක ගැනීමේ ස්ථානයක් ලෙසට බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

එම අවස්ථාවේදී සාක්ෂිකරු අසත්‍ය ප්‍රකාශ කරන බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සාක්ෂිකරුට චෝදනා කළ බවත්, සාක්ෂිකරුට පහර දුන් බවටද සාක්ෂියේදී ප්‍රකාශ කර සිටී. තවද, I.P නිශාන්ත තව දුරටත් "සෝමසූරිය උඹ ඔච්චර දුක් විදින්න ඕන නෑ. අපි කියන දේට එකඟ වෙයන්. එතකොට ඔය කේස් එක ඉවරයිනේ" යැයි කියූ බවත්, "කීත්නොයාර්ව මේ නිවසට ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අනුදැනුම මත මේජර් බුලත්වත්ත විසින් ගෙන්වා පහරදී අත්හැරියා" යැයි කියූ බවත් ප්‍රකාශ කර සිටී.

එසේම සාක්ෂිකරු ප්‍රකාශ කරන ආකාරයට මෙවැනි දෙයක් සිදු නොවූ බවත් මෙම සිද්ධිය නිර්මාණය කර ඇත්තේ නිශාන්ත සිල්වා බවත් දක්වා සිටියි.

සාක්ෂිකරු 2017.02.18 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිය දිනට පසු දින අධිකරණයට යාමට සූදානම් කරන ලෙස පොලිස් නිලධාරීන් ඔවුන්ට උපදෙස් දී ඇති නිසා ඒ අනුව අනෙක් නිලධාරීන් දෙදෙනා සමග තිදෙනාම හොඳින් ආවරණය කොට හඳුනාගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කරන අයුරින් ඔවුන්ව රථයකින් ගෙන ගිය බවත්, අධිකරණ වෛද්‍ය නිලධාරියාට ඉදිරිපත් කර පසුව ගල්කිස්ස උසාවියට ගිය බවත්, උසාවියට මීටර් 500ක් පමණ තිබියදී සාක්ෂිකරු සහ තවත් නිලධාරීන් දෙදෙනෙකු රථයෙන් බස්සවා නිශාන්ත සිල්වා ඇතුළු අනෙක් දෙදෙනා අධිකරණයට ගෙන ගිය බවත්, ඊට පැය 1½ ට පසු නැවත පැමිණ හවස නිවසට දුරකථන පණිවුඩයක් ගැනීමට අවස්ථාව නිශාන්ත සිල්වා විසින් ලබාදුන් බවත්, ඒ අනුව බිරිඳට සහ ඔහුගේ ළමයින් දෙදෙනාට කතා කර, පසුව නිශාන්ත සිල්වා සාක්ෂිකරු රැගෙන කොළඹින් පිටව ගිය බවත්, අතරමග ඔහුගේ පුද්ගලික කාරණයකට දේවස්ථානයකට ගොස් ඉන්පසු සාක්ෂිකරුගේ ගෙදරට 19 දින රාත්‍රී12.30ට පමණ ගිය බවත්, එහිදී නිශාන්ත සිල්වා බිරිඳට කථාකොට බිරිඳ ලවා නිශාන්ත සිල්වාට අවශ්‍ය කරන ප්‍රකාශය ලබා ගැනීමට උත්සාහ දැරූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. තවද, එම අවස්ථාවේදී බිරිඳගේ හිසට අත තියා නිශාන්ත සිල්වා පවසන ප්‍රකාශය කරන බවට බිරිඳ ඉදිරියේදී පොරොන්දුවක් දීමට කීයු බවත්, එසේ නොකළහොත් සාක්ෂිකරුගේ විශ්‍රාම වැටුප නැති කරන බවත්, සාක්ෂිකරුගේ අනාගතය විනාශ වී සියල්ල නැතිව යන බවත්, දරු දෙදෙනාගේ ඉදිරි අනාගතය නැතිව යනු ඇතැයිද කී විට

සාක්ෂිකරුගේ හිතට භීතියක්, වකිතයක් ඇති වී දැඩි මානසික පීඩනයකට ලක්වීම නිසා සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් හා එකඟ වූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටි.

එදින සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය ලෙස ප්‍රකාශ දීමට එකඟ වීමෙන් පසුව, පසුදින උදෑසන දුරකථනයක් මිලදී ගැනීමට නිශාන්ත සිල්වා විසින් රුපියල් 10,000ක් දුන් බවත්, නව දුරකථන අංකය සාක්ෂිකරු විසින් නිශාන්ත සිල්වාට ලබා දුන් බවත්, නිශාන්ත සිල්වා විසින් දුරකථනයෙන් අමතා ඔහුට අපහසුතාවයක් කරදරයක් තිබේදැයි විමසා එවැන්නකට සාක්ෂිකරුට මුහුණදීමට සිදුවුයේ නම් කොළඹින් හෝ නැවතීමට නිවසක් ලබාදීමට හැකි බවද නිශාන්ත සිල්වා විසින් සාක්ෂිකරුට ප්‍රකාශ කළ බවත්, එම අවස්ථාවේදී සාක්ෂිකරුව රජයේ සාක්ෂිකරුවෙකු ලෙස නම් කිරීමට සූදානම් වන බවට සාක්ෂිකරුට පෙනී ගියේ යයිද ප්‍රකාශ කර සිටී.

පසුව නැවතත් 2017.02.21 වෙනි දින සාක්ෂිකරුට කොළඹට පැමිණෙන ලෙස දුරකථනයෙන් දැනුම් දුන් බවත්, එදිනම බස් රථයෙන් කොළඹට පිටත්ව එන අතරමගදී නිශාන්ත සිල්වා කථාකොට බැලුම්මහර ප්‍රදේශයෙන් බසයෙන් බහින ලෙසට කියූ බවත්, ඉන්පසු ඔහුගේ රථයෙන් දොම්පේ ප්‍රදේශයේ බදු මත ලබා ගෙන තිබූ නිවසට ගිය බවත්, පසුව කීත්නොයාර්ට කරපු දේ යැයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරියෙක්ව බැඳ පහර දෙන ආකාරයෙන් වීඩියෝගත කළ බවත්, නිශාන්ත සිල්වා අසන ප්‍රශ්නවලට “ඔව්” යනුවෙන් ප්‍රකාශ කරන ලෙසට සාක්ෂිකරුට කියා ඇත. මේ අනුව එම දර්ශන වීඩියෝගත කර, පසුව සාක්ෂිකරු එදිනම සවස නිවසට ගිය බැව්ද ප්‍රකාශ කර සිටී.

නිශාන්ත සිල්වා 2017.03.08 වෙනි දින දුරකථනයෙන් සාක්ෂිකරුට කථා කොට පහුවදා එනම් 2017.03.09 වෙනි දින කොළඹට එන ලෙසට දන්වා සිටි බවත්, ඒ අනුව සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණි බවත්, නිශාන්ත සිල්වා ඔහුගේ රථයෙන් හා රථය ක්‍රියාවිරහිත වූ නිසා ත්‍රිවීල් රථයකින් ගල්කිස්ස උසාවියට සාක්ෂිකරු සමග ගිය බවත්, නිශාන්ත සිල්වා කී අන්දමට මහේස්ත්‍රාත්තුමිය ඉදිරියේදී එනම්, කීත්නොයාර් කියන මහත්මයා "එවකට ආරක්ෂක ලේකම්ව හිටිය ගෝඨාභය රාජපක්ෂ මහත්මයයි, බුලත්වත්ත මහත්මයාගෙයි අනුදැනුම ඇතිව එම කණ්ඩායම එම ස්ථානයට සාක්ෂිකරු කුලී පදනම මත ගත්ත නිවසට ගෙනල්ලා ගහලා වධ හිංසා කරලා පසුවදා මුදා හැරියයි කියලා විතරක් කියන්න" යනුවෙන් නිශාන්ත සිල්වා සාක්ෂිකරුට උපදෙස් දුන් බවට ප්‍රකාශ කර සිටී. ඉන්පසු සාක්ෂිකරු මහේස්ත්‍රාත්තුමිය ඉදිරියේදී නිශාන්ත සිල්වා පෙර කියූ ආකාරයට එම ප්‍රකාශය නොකළ බව සාක්ෂිකරු ප්‍රකාශ කරන අතර, මහේස්ත්‍රාත් අධිකරණයෙන් පිටතට පැමිණි විට පෙර කියපු ආකාරයට ප්‍රකාශය කළ බවට නිශාන්ත සිල්වාට පැවසූ බවට සාක්ෂිකරු මෙම කොමිෂන් සභාව ඉදිරියේදී සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටී. නමුත් සාක්ෂිකරුගේ නිවසේදී නිශාන්ත සිල්වා විසින් එම ප්‍රකාශය සටහන් කරගත් බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

මහේස්ත්‍රාත් උසාවියේ සිදු වූ සිද්ධියෙන් පසු ඔහු නිවසට ගිය බවත්, ඊටපසු සාක්ෂිකරු මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් කළ බවත් ප්‍රකාශ කර ඇත. මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කරන ලද පැමිණිල්ලේ අංකය HRC828/18 බවත්, ඊටපසු උසාවියට ගොස් දින 4ත් 5ත් අතර දිනක මාර්තු මාසයේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූ බවත්, එහි කැඳවා හිස් කොළ කිහිපයකට

අත්සන් ගත් බවත්, නිශාන්ත සිල්වා එතැන සිටිය බවත්, සාක්ෂිකරු ඔහු සමග කතා නොකළ බවත් ප්‍රකාශ කර සිටී.

වැඩි දුරටත් සාක්ෂිකරු මෙම ජනාධිපති කොමිෂන් සභාවට සත්‍ය ප්‍රකාශ කළ බවත්, මෙම ගරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ සාධාරණය ඉටු කර දෙන මෙන් බවත්, මේ සම්බන්ධයෙන් IP නිශාන්ත සිල්වාත්, තිසේරා මහතාත්, සහ නම් නොදන්නා තවත් නිළධාරීන් කිහිපදෙනෙකු සාක්ෂිකරුව දැඩි මානසික පීඩනයකට හා අපහසුතාවයට පත්කළ බවත් ප්‍රකාශ කර සිටී.

ඉහත කරුණු සනාථ කිරිම සඳහා ලේඛන පැ. 1 සිට පැ. 5 දක්වා සලකුණු කර ඇත.

රජයේ අධිනීතිඥ තැනගේ ප්‍රශ්නවලට සාක්ෂිකරු පිළිතුරු දෙමින් ඔහුගේ පුද්ගලික දුරකතන අංකය 0774167054 බව ප්‍රකාශ කර සිටී.

ගල්බිදින ඇලේගෙදර ප්‍රියන්ත කුමාර සෝමසූරියගේ බිරිඳ - ග්‍රේෂා සූජීවනී මංගලිකා 2020.09.12 දින සෝමසූරියගේ බිරිඳ වන ග්‍රේෂා සූජීවනී මංගලිකා නැමැත්තිය කොමිෂන් සභාව මගින් කළ දැන්වීමකට අනුව කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමට පැමිණි බවත්, සාක්ෂිකාරියගේ ස්වාමිපුරුෂයා හමුදාවේ බුද්ධි අංශයේ සේවය කළ ගල්බිදින ඇලේගෙදර ප්‍රියන්ත කුමාර සෝමසූරිය බවත් 2015 වර්ෂයේ ස්වාමියා විශ්‍රාම ගත් බව ප්‍රකාශ කර සිටි.

සාක්ෂිකාරියට අනුව 2017 වර්ෂයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලද කැඳවීමක් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් දින 2ක් 3ක් නිවසට නොපැමිණි බවත්, 2017.02.19 වෙනි දින රාත්‍රි 12.00ට පමණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දෙදෙනෙක් සමඟ ස්වාමිපුරුෂයා වන

සෝමසූරිය නිවසට පැමිණි බවත්, නිශාන්ත සිල්වාව හඳුන්වා දුන් බවත් ප්‍රකාශ කර සිටී. හඳුන්වා දුන් නිශාන්ත සිල්වා සමග තවත් නම් නොදන්නා නිළධාරීන් දෙදෙනෙක් පැමිණ සිටි බවත්, කාන්තා නිළධාරිනියක නොසිටි බවත්, පෙර දැනුම් දීමක්ද නොමැතිව රාත්‍රී ඇඳුමින් දරු දෙදෙනා සමඟ නිදා සිටින විට රාත්‍රියේ පැමිණීම හේතුවෙන් මහත් වූ අපහසුතාවයකට පත්වූ බවත්, පැමිණි සිටි එක් අයෙක් ප්‍රකාශය සටහන් කරගත් බවත් අනෙක් නිළධාරීයා පැත්තකින් සිටි බවත් ප්‍රකාශ කර සිටි. එසේ සාක්ෂිකාරියගේ ප්‍රකාශ සටහන් කරගත් බවත්, ස්වාමිපුරුෂයා බුද්ධි අංශයේ කුමන රාජකාරියක් කළාද යන්න සම්බන්ධයෙන් විමසූ බවත්, ස්වාමියාගේ රාජකාරි සම්බන්ධයෙන් නොදන්නා බවට ප්‍රකාශ කළ බවත්, රාජකාරි සම්බන්ධයෙන් කිසි විටෙකත් විමසා නොමැති බවටත් ප්‍රකාශ කර සිටී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පැමිණි නිළධාරීන් සාක්ෂිකාරිය මගින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය දේ ස්වාමියා ලවා කියවා දෙන ලෙසට ස්වාමියාට කියන්න යැයි ඇයව පොළඹවාලීමට මහත් උත්සාහයක් ගත් බවත්, මේ සිද්ධිය සම්බන්ධයෙන් කිසිත් නොදැන සිටියා වුවද, පෙන්ෂන් එක නැති කරනවා කීවාම මහත් වූ බියක් දැනුණ බවත්, දරු දෙදෙනා සමඟ තනි වෙන්නට සිදුවේය කියා බය හිතුණ නිසා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය දේ කියන්න කියලා කියපු නිසා ස්වාමියාට අහන ප්‍රශ්ණවලට අවශ්‍ය විදියට අවශ්‍ය ප්‍රකාශ දෙන්න කියලා කියූ බවත් ප්‍රකාශ කර සිටී. වැඩි දුරටත් ප්‍රකාශ කර සිටියේ ඒ අය කියනදේට එකඟ නොවුනොත් පෙන්ෂන් එක නැති කරනවා කියලා කිව්වාම දරු දෙදෙනා එක්ක අසරණ වී තනි වෙයි කියලා බය හිතුණ බවත්, අනාගයතය පිළිබඳව අවිනිශ්චිත බවක් සිතට දැනුණ නිසාත්,

ඒ අය කියනදේට එකඟ වෙන්න කියා ස්වාමියාට කියූ බවත්, ප්‍රකාශ කර සිටී. රට යන්නත් පුලුවන්. වෙන හොඳ රස්සාවක් ලබා දෙන්නම් යැයි කියූ බවත් පසුව රුපියල් 10000/= දීලා ෆෝන් එකක් ගන්න යැයි කියූ බවත්, එම මුදල් නොගෙන සිටියදී බලෙන්ම එම මුදල් අතට දුන් බවත් ප්‍රකාශ කර සිටී. පහුවදා උදේ 10 විතර 11 විතර වෙනකම් එම නිළධාරීන් ගෙදරටවී සිටී බවත්, ඔවුන් පාන් රැගෙන විත් පරිප්පු හොද්දක් සාදා දෙන ලෙසට කියූ බවත්, ප්‍රකාශ කර සිටී.

මාධ්‍යවේදී කීත්නොයාර් පැහැරගෙන ගොස් පහරදීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අපරාධය වාර්තාවූ අවස්ථාවේ සිටම ඊට අදාළ යයි සැක කරන ලද අය සම්බන්ධයෙන් විමර්ශනය කර සාක්ෂි සටහන් කරගෙන ඇති අතර, අධිකරණ ක්‍රියාවලිය තුලින් දේශපාලන පළිගැනීම්වලට ලක්ව හිංසනයට පත්වූ පාර්ශවකරුවන් මෙම කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දී ඇත.

මාධ්‍යවේදී කීත්නොයාර්ට පහරදීම සම්බන්ධයෙන් විමර්ශන කටයුතුවල නිරත වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් 2017.02.19 දින ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවියේ B1535/08 යටතේ වැඩිදුර වාර්තා කරමින් දක්වා ඇත්තේ 2008.05.22 වෙනි දින මාධ්‍යවේදී කීත්නොයාර් පැහැර ගැනීම, ගිනි අවිවලින් පහරදී බරපතල තුවාල සිදු කිරීම හා සුළු තුවාල සිදු කිරීම, අයුතු ලෙස සිරකර තබා ගැනීම, කෲර වධ හිංසා කිරීම යන වරදවල් කිරීම හා ඒ සඳහා කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් බුද්ධි නිළධාරීන් අත්අඩංගුවට ගත් බවත්, එම නිළධාරීන්ට විරුද්ධව දණ්ඩ නීති සංග්‍රහයේ 32 වෙනි වගන්තිය සමග කියවිය යුතු 113(ආ), 140,314,315,316,317,300, 332, 333, 356, 380, හා 1994 අංක 22 දරණ වධහිංසා දීමට හා අනෙකුත් කෲර අමානුෂික වධදීම් හා නින්දිතව සැළකීම යන වැරදි

කර ඇති බවකි. මාධ්‍යවේදී කීත්නොයාර්ව පැහැරගෙන යාම සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති වැරදි සියල්ලක්ම අපරාධ වැරදි වන අතර, මෙවැනි අපරාධයක්, අධිකරණය ඉදිරියේ ඔප්පු කිරීම සඳහා අධිචෝදක පාර්ශවය සාධාරණ සැකයෙන් තොරව සාක්ෂි ඉදිරිපත් කිරීම වැදගත් වන අතර, මෙම සිද්ධියේදී රැස් කරගත් සාක්ෂි, සාධාරණ සැකයෙන් තොරව, ඔප්පු කිරීම සඳහා උපයෝගී කර ගත හැකිද? යන්න පරීක්ෂා කිරීම වැදගත් වේ.

මෙම සිදුවීමේදී කිසිදු ඍජු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති අතර, සිද්ධිය සිදු වූ අවස්ථාවේදී ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් කිහිපදෙනෙකුගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇත. මාධ්‍යවේදී කීත්නොයාර් පැහැරගෙන ගොස් පහරදී අතහැර දැමූ අවස්ථාවේදී පොලිසියට කරන ලද ප්‍රකාශයේ දක්වා සිටියේ ඔහුට පහරදුන් අය කිසිවෙක් නොදන්නා බව හා දුටුවොත් හඳුනාගැනීමට හැකි බවය. මෙම සාක්ෂියෙන් සිද්ධිය සම්බන්ධයෙන් යම් කරුණු අනාවරණය වන නමුත් අපරාධය කළේ කවරෙක්ද? ඔහුට සැක සිතෙන අය කවරෙක්ද? යන්න සම්බන්ධයෙන් මාධ්‍යවේදී කීත්නොයාර්ගේ ප්‍රකාශයෙන් අනාවරණය නොවේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කිහිප අවස්ථාවකදී කීත්නොයාර් ඔහුට පහර දුන් අය හඳුනාගත හැකි බව ප්‍රකාශ කර තිබුණු නිසා හඳුනාගැනීමේ පෙරෙට්ටු කිහිපයක්ම පවත්වනු ලැබූ අතර, එම එකදු හඳුනාගැනීමේ පෙරෙට්ටුවකටවත් කීත්නොයාර් නොපැමිණීම හේතුවෙන්, එම පෙරෙට්ටුවට ඉදිරිපත් කරන ලද අත්අඩංගුවේ සිටි බුද්ධි නිළධාරීන් ඇප පිට නිදහස් කිරීමට සිදු වී ඇත. එසේම 2017.04.04 වෙනි දින ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවියට අංක B1535/10 යටතේ වාර්තා කරන ලද වැඩිදුර වාර්තාව අනුව මාධ්‍යවේදී කීත්නොයාර් මේ වන විට

ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය ලබාගෙන මෙල්බන් නගරයේ පදිංචිව ඇති බැව් අධිකරණයට වාර්තා කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම පහරදීම හා පැහැරගෙන යාම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේදී දොම්පේ ප්‍රදේශයෙන් නිවසක් බදුගෙන තිබූ බවට, එම බදු දුන් අය, බදු ඔප්පුව, එම ඔප්පුවට සාක්ෂි ලෙස අත්සන් තැබූවන්, එම නිවසට බදු කුලි, විදුලි බිල්පත් ගෙවූ ආකාරය සම්බන්ධයෙන් ඇති සාක්ෂි, නිවසක් බදුගෙන තිබීම ඔප්පු කිරීමට එය ප්‍රමාණවත් වේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පවත්වනු ලැබූ විමර්ශන කටයුතුවලදී දොම්පේ ප්‍රදේශයේ නිවසක් බදුගෙන තිබූ බැව් දැක්වීමට වාචික සාක්ෂි මෙන්ම ලිඛිත සාක්ෂිද ඉදිරිපත් කර ඇත. කෙසේ වුවද, නිවසක් බදුගෙන තිබීමත්, පැමිණිලිකරුවන් විසින් කරන ලදැයි කියනු ලබන අපරාධවලත් ඇති සම්බන්ධතාවය කුමක්ද? සත්‍ය වශයෙන්ම මෙහි ඇති සම්බන්ධතාවයක් පෙන්වීමට කිසිදු සාක්ෂියක් නොමැත. මේ නිසා නිවසක් බදුගත් බවට සාක්ෂි තිබුණද එම නිවස අපරාධයකට ඇති සම්බන්ධතාවය දැක්විය නොහැකි නිසා එම සාක්ෂිය අපරාධය කළ බව ඔප්පු කිරීමට ප්‍රමාණවත් නොවේ.

මෙම බදුගෙන තිබූ නිවස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සොයාගත් අවස්ථාවේදී එය ආරක්ෂක නිවාසයක් යන පදනමින් විමර්ශනය කර ඇති බව පෙනේ. කෙසේ වුවද මෙම නිවාසය හමුදා නිළධාරීන් විසින් බදුගෙන ඇත්තේ ප්‍රදේශයෙහි තිබූණු ආරක්ෂිත වැදගත් ස්ථාන එනම් පනාගොඩ හමුදා කඳවුර, කොස්ගම අවි ගබඩාව ආරක්ෂා කිරීම වැනි ජාතික ආරක්ෂක සැලැස්මේ වැදගත් කර්තව්‍යයන් සඳහා වන හෙයින් එලෙස ආරක්ෂාව සැපයීමේදී වැදගත් කරුණක් වන්නේ එම ස්ථානවලට එල්ලවිය හැකි තර්ජන

සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු ලබා ගැනීම වේ. 2020.08.31 දින සෝමසූරිය විසින් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කල සාක්ෂි පිටු අංක 11, 12 සහ 13 ප්‍රකාශ කර ඇත්තේ කොළඹ පිහිටි ත්‍රිපෝලි හමුදා අනුබණ්ඩය මගින් එම සේවාව කාර්යක්ෂමව කොළඹ ප්‍රදේශයේ සිට කළ නොහැකි නිසා තාවකාලිකව ස්ථානයක්, වෙහෙසට පත්ව සිටින නිළධාරීන්ට නැවතුම්පොළක් ඇති කිරීමේ අදහසින් එම නිවාසය බදුගෙන ඇති බැව් කර්නල් බුලත්වත්ත සහ මේජර් ජෙනරාල් කරුණාසේකරගේ සාක්ෂියෙන් පැහැදිලි වේ. (මේජර් ජෙනරාල් කරුණාසේකරගේ 2020.09.26 වෙනි දින සාක්ෂි පිටු අංක 53 සහ 54)

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම බදුවත්ත පිහිටි නිවාසය විරුද්ධවාදීන් අත්අඩංගුවට ගෙන සිරකරන ස්ථානයක් ලෙස සළකා විමර්ශනය කර ඇති බව පෙනී යන අතර, ආරක්ෂක නිවාසයක වැදගත්කම මෙම ප්‍රදේශයේ අවශ්‍යතාවයට අවශ්‍ය නොවන බව මේජර් ජෙනරල් කරුණාසේකර ඔහුගේ සාක්ෂියේදී පැහැදිලිව ප්‍රකාශ කර ඇත. මෙම බදුවත්ත නිවස බදුගෙන භාවිතය පිළිබඳ සාක්ෂි සැළකිල්ලට ගැනීමේදීත්, බුද්ධි නිලධාරීන් විසින් ඔවුන්ගේ සාක්ෂියේදී ඉදිරිපත් කර ඇති පැහැදිලි කිරීම්වලදීත්, සහ එහි භාවිතය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සාක්ෂිත් පිළිගැනීමට හැකිය. (මේජර් ජෙනරාල් කරුණාසේකරගේ 2020.09.26 දින සාක්ෂි පිටු 53 සහ 54)

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බදුවත්ත නිවාසය ආරක්ෂිත නිවාසයක් සහ සැකකරුවන් විසින් භාවිතා කර තිබෙන ස්ථානයක් ලෙස නිගමනය කර ඇත්තේ සෝමසූරිය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හා මහේස්ත්‍රාත්වරයාට දුන් ප්‍රකාශය අනුව වේ. සෝමසූරිය තර්ජනවලට බියෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද ප්‍රකාශය අනුව ඔහු දක්වා සිටියේ මේජර්

බුලත්වත්ත 2008.05.22 දින හෝ 2008.05.23 දින දොම්පේ බඳුවත්ත නිවසට පැමිණ සෝමසූරියට නිවස ඉදිරියෙන් සිටින ලෙසට නියෝග කරන ලද බවය. ඉන්පසු පෙරේරා, රාජපක්ෂ, විමලවීර, චාමික සුමිත් සහ ජයතිලක යන අය විසින් මිනිසෙකු අත් සහ කකුල්වලින් බැඳ යකඩ පොල්ලක් දමා ගෙය තුළට ගෙන, එම පුද්ගලයාට පොලුවලින්, අතින් පයින් පහරදුන් බවත්, එවිටම බුලත්වත්තගේ ජංගම දුරකථනයට ඇමතුමක් ආ බවත්, පසුව පැමිණි වෑන් රථයෙන් ඔහුව රැගෙන ගිය බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශ කළ බව කියා සිටියි. මේ හෙයින් සාක්ෂිකරු සෝමසූරිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැදගත් සාක්ෂිකරුවෙකු විය.

නමුත් සාක්ෂිකරු සෝමසූරිය මෙම කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ ඔහු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හා මහේස්ත්‍රාත්වරයාට දෙන ලද ප්‍රකාශය තර්ජනය, බලපෑම සහ පොරොන්දු මත දෙන ලද ප්‍රකාශයක් බවටයි. මෙම ප්‍රකාශය කරන විට සාක්ෂිකරු සෝමසූරිය සිටියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුව යටතේය. මේ හෙයින් මෙම ප්‍රකාශය එක් අතකින් සාක්ෂි ආඥා පනතේ 24 වගන්තිය යටතේ අධිකරණයකදී උපයෝගී කරගත නොහැකි අතර, මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ අදාළ කරගත නොහැක්කේ මෙම ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රකාශ ඝණයට නොවැටෙන නිසාය. (2020.08.31 වෙනි දින සාක්ෂිකරු සෝමසූරියගේ සාක්ෂි සටහන් පිටු 16 සහ 17 සහ පිටු අංක 60 සිට 65 දක්වා)

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද විමර්ශනවල කිසිඳු අපරාධයකට සම්බන්ධ වන ඍජු සාක්ෂියක් නොමැත. එසේම

වැදගත් යැයි සැළකෙන සෝමසූරියගේ සාක්ෂිය කිසිසේත් අදාළ කරගත නොහැකිය. මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම බුද්ධි නිළධාරීන් අත්අඩංගුවට ගෙන ඇත්තේ පැහැදිලිවම දේශපාලන පළිගැනීමකට බව මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් මැනවින් පෙනී යයි.

මාධ්‍යවේදී කීත්නොයාර්ගේ ප්‍රකාශය අනුව කීත්නොයාර් සිද්ධිය වූ දින එනම්, 2008.05.22 වෙනි දින ඔහුගේ මරදානේ පිහිටි The Nation පුවත්පත් කාර්යාලයේ සිට කොළඹ විශ්වවිද්‍යාල මාර්ගය ඔස්සේ, බම්බලපිටියේ Queen Café හෝටලයේදී, රාත්‍රී ආහාර ගැනීමෙන් පසුව වැල්ලවත්ත ලාෆ් සුපර් මාකට් වෙතින් නිවසට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමෙන් පසුව දෙහිවල නිවසට ගොස් ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම මාර්ගය ඔස්සේ ඇති කුලුණුවල දත්ත ආශ්‍රයෙන් මාධ්‍යවේදී කීත්නොයාර් භාවිතා කළ 0773688908 දූරකථනය කොළඹ විශ්වවිද්‍යාලය අවට ප්‍රදේශයේ පළමුව පැය 16:48ටත් අවසානයේ පැය 16:21ටත් ක්‍රියාත්මකවී ඇති බව සොයාගෙන ඇත. එසේම එම දූරකථනය ජයරත්න මල්ශාලාව ප්‍රදේශයේ ප්‍රථමයෙන් පැය 16:53ටත් අවසානයේ පැය16:54ටත්, Queen Café බම්බලපිටිය අවට ප්‍රදේශයේ පැය 21:54ටත්, ක්‍රියාත්මක වී ඇති බැව් දූරකථනයෙන් ගත් ඇමතුම් හා ජංගම කුළුණු ආශ්‍රයෙන් පෙන්නුම් කරන බව දක්වා ඇත.

මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශකයින් දැක්වීමට උත්සාහ ගෙන ඇත්තේ මාධ්‍යවේදී කීත්නොයාර් ඉහත දක්වා ඇති මාර්ගයේ ඉහත දක්වා ඇති කාලවේලාවන්හිදී එම මාර්ගයේ ගමන් ගත් බවටයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මාධ්‍යවේදී කීත්නොයාර් භාවිත කල මාර්ගයේ බුද්ධි

නිළධාරීන්ගේ දුරකථන අංක හා එම මාර්ගයේ දුරකථන කුලුණු සමග විමර්ශනයක් කර ඇත. මෙහිදි 2008.05.22 වන දින අවසන්වරට මාධ්‍යවේදී කීත්නොයාර් භාවිතා කළ මාර්ගයේ ආසන්න වේලාවලදී මේජර් බුලත්වත්ත, හේමචන්ද්‍ර පෙරේරා, වීරරත්න, ජයතිලක, නිශාන්ත, ජයසූරිය, විමලවීර යන අයගේ දූරකථන මාධ්‍යවේදී කීත්නොයාර් භාවිතා කල මාර්ගයේදී සක්‍රීය වී ඇති බව දුරකථන කුලුණු මාර්ගයෙන් ලබාගත් තොරතුරු අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයට 2019.08.23 වෙනි දින ඉදිරිපත් කළ B1535/08 වැඩිදුර වාර්තාවේ දක්වා ඇත.

එසේම මාධ්‍යවේදී කීත්නොයාර් ඔහු පදිංචිව සිටි දෙහිවල ලිපිනයේදි පැහැර ගැනීමෙන් පසු ගමන්ගත් මාර්ගය කෙරෙහි පැහැදිලි විස්තරයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සොයා ගැනීමට නොහැකි වී ඇත්තේ මාධ්‍යවේදී කීත්නොයාර්ගේ දූරකථනය අක්‍රියවීම නිසා බව පෙනේ. කෙසේ වුවද මේජර් බුලත්වත්ත භාවිතා කල 0773794133 බුලත්වත්තගේ දූරකථනය කොහුවල ප්‍රදේශයේදී සක්‍රීය වී ඇති අතර, ලාන්ස් කෝප්‍රල් වීරරත්නගේ දූරකථන අංකය වන 0771313837, කෝප්‍රල් විමලවීර භාවිතා කල 0714162174 ජයතිලක භාවිතා කල 0775903180 ලාන්ස් කෝප්‍රල් නිශාන්ත භාවිතා කරන ලද අංක 0773794131 දූරකථන කොහුවල ආශ්‍රිත ප්‍රදේශයේ ක්‍රියාත්මකව තිබූ බව දූරකථන කුලුණු මාර්ගයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සොයාගෙන ඇති බව 2009.08.23 වෙනි දින ගල්කිස්ස මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කළ B1535/08 වැඩිදුර වාර්තාවෙන් වාර්තා කර ඇත.

තවද මාධ්‍යවේදී කීත්නොයාර් පැහැර ගත් අවස්ථාවේදී ඩයලොග් ආයතනය විසින් දූරකථන කුලුණු මාර්ගයෙන් මාධ්‍යවේදී කීත්නොයාර්ට අයත් 0773688908 දූරකථනය දොම්පේ සහ දෙකටන ප්‍රදේශයේදී ක්‍රියාත්මක වූ බවත්, ඒ අතරම මේජර් බුලත්වත්ත භාවිතා කළ 0773794133 දරන දූරකථනය රනාළ ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට වාර්තා කර ඇත.

එසේම කෝප්‍රල් සෝමසූරිය භාවිතා කළ 0774167054 දරණ දූරකථනයෙන් එවකට හමුදා බුද්ධි අධ්‍යක්ෂව සිටි ජෙනරාල් කරුණාසේකර භාවිතා කළ 0773613496 දරන දූරකථනයට ඇමතුමක් ගෙන ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට වාර්තා කර ඇත.

ඉහත දැක්වූ අන්දමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම දූරකථන අංක සහ කුලුණු ආශ්‍රයෙන් සොයාගත් දත්තයන්ගෙන් පෙන්වීමට උත්සාහ ගෙන ඇත්තේ කීත්නොයාර් භාවිත කළ මාර්ගයෙන් එහි දක්වා ඇති වේලාවන්ට සාපේක්ෂව බුද්ධි නිළධාරීන්ද සිටි බවය. මෙසේ මෙම නිළධාරීන් ඒ ප්‍රදේශයෙන් පෙනී සිටීමෙන් හා රැඳී සිටි බව දැක්වීමෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව උත්සාහ කරනු ලබන්නේ මෙම හමුදා නිළධාරීන් මාධ්‍යවේදී කීත්නොයාර් පසුපස හඹා ගොස් ඔහුගේ නිවස අසලින් ඔහුව පැහැරගෙන දොම්පේ ප්‍රදේශයට ගෙන ගොස් ඔහුට පහර දී පසුව ඔහු වෙනත් ස්ථානයකට දමා ගොස් ඇති බවට සැක කරන බවය.

ඉහත දක්වා ඇති සිද්ධිය එනම් මාධ්‍යවේදී කීත්නොයාර් පැහැරගෙන ගොස් පහරදීමේ සිද්ධිය අපරාධයක් වන අතර, අපරාධ වරදක් ඔප්පු

කිරීම සාධාරණ සැකයෙන් තොරව කළ යුතු වේ. වින්දිතයා වන මාධ්‍යවේදී කීත්නොයාර් සිටි ප්‍රදේශයේසැකකරුවන්/පැමිණිලිකරුවන් සැකකරුවන්ද/පැමිණිලිකරුවන්ද සිටි බව දැක්වීමෙන් එම සැකකරුවන් ද සිටි පමණින්ම මෙම අපරාධයට සැකකකරුවන් සම්බන්ධ වූ බව ඔප්පු කළ නොහැකි අතර, මෙම සිදුවීම තහවුරු කිරිමට වෙනත් කිසිදු කිසිදු සාක්ෂියක් නොමැත.

මේ අනුව දුරකථන කුලුණු ආශ්‍රයෙන් ලබාගෙන ඇති දත්තයන් එම ප්‍රදේශයේ සක්‍රීය වූවා යැයි දැක්විය හැකි වුවද අපරාධයකට මෙම දුරකථන දත්ත මගින් කිසිදු සම්බන්ධයක් පෙන්නුම් නොකරන හෙයින් මෙම දුරකථන අනුසාරයෙන් ලබාගත් සාක්ෂි පැහැර ගැනීම වැනි අපරාධයක් ඔප්පු කිරීම සඳහා යොදාගත නොහැක්කේ මෙම සිද්ධිය හා දුරකථන ආශ්‍රයෙන් ලබාගත් සාක්ෂි කිසිදු සබඳතාවයක් නොමැති හෙයිනි.

මේ අනුව දුරකථන දත්තයන්ගෙන් පෙන්නුම කරන්නේ සැකකරුවන් හා වින්දිතයින් එකම ප්‍රදේශයේ සිටි බවක් පමණි. එසේ එකම ප්‍රදේශයක සිටීම සහ සිටී පමණින්ම අපරාධයක් කළ බවට ඔප්පු කළ නොහැක. එනම්, ප්‍රදේශයේ සිටි පමණින් අපරාධයකට සම්බන්ධ වූ බව ඔප්පු කළ නොහැක.

මේජර් ජෙනරාල් කරුණාසේකර ඔහුගේ 2020.09.25 සහ 2020.09.26 වෙනි දිනයන්හි මෙම කොමිෂම සභාව ඉදිරියේ සාක්ෂි දීමේදී මාධ්‍යවේදී කීත්නොයාර් අත්අඩංගුවට පත් වූ අවස්ථාවේ එනම්, 2008 ජනවාරි මාසයේ සිට 2008 ජූනි මාසය දක්වා කොළඹ සහ ගම්පහ ප්‍රදේශයේ LTTE විසින් සිදුකරන ලද බරපතල සිද්ධීන් 17ක් දක්වන අතර, ත්‍රිපෝලි අනුබණ්ඩයේ නිළධාරීන් දිවා රෑ නොතකා රාජකාරියේ යෙදී ඇත්තේ මෙවැනි සිද්ධීන් අවම කර ගැනීමටය.

( 2020.09.25 වෙනි දින සාක්ෂි සටහන් පිටු අංක 13,14,15 සහ 16 )

මේ අනුව බුද්ධි නිළධාරීන් කොළඹ සහ ගම්පහ ප්‍රදේශවල රාජකාරි කටයුතුවල නිරතව සිටීම අස්වාභාවික දෙයක් නොවන බව ප්‍රකාශ කර ඇත. මේ නිසා බුද්ධි නිළධාරීන් ඉහත ප්‍රදේශවල සිටීමෙන් පෙනී යන්නේ අපරාධයක් කිරීමට පැමිණි බවක් නොව, ඔවුන් සාමාන්‍ය රාජකාරියේ යෙදී සිටි බවට මේජර් ජෙනරාල් කරුණාසේකරගේ සාක්ෂියෙන්ද පෙනී යයි.

මෙම දූරකතන දත්තයන්ගෙන් ලබාගත් තොරතුරුවලින් ප්‍රකාශ කළ හැක්කේ එක්තරා ප්‍රදේශයක දූරකථන හිමිකරුවා (ක්‍රියාකරු) සිටි බව පමණය. නමුත් ස්ථිරවම විශේෂ තැනක දූරකතනය ක්‍රියාකාරීත්වයේ තිබූ බව දැක්විය නොහැක. උදාහරණයක් වශයෙන් දූරකථන හිමිකරු(ක්‍රියාකරු) දෙහිවල ප්‍රදේශයේ සිටි බව කුළුණු ආශ්‍රයෙන් දැක්විය හැකි වුවද ඔහු දෙහිවල වෛද්‍ය පාරේ සිටි බව නිශ්චිත වශයෙන් කිව නොහැක. මෙවැනි අවිනිශ්චිත සාක්ෂිවලින් අපරාධයක් ඔප්පු කළ නොහැක.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම දූරකතන දත්තයන්ගෙන් පෙන්වීමට උත්සාහ කරනු ලබන්නේ දූරකථන හිමිකරු (ක්‍රියාකරු) අපරාධයකට ලක් වූ අය සිටි ප්‍රදේශයේ ගැවසුණු බව දැක්වීමට වුවද ප්‍රදේශයක සිටි පමණින්ම කෙනෙකු අපරාධයක් කළ බවට ඔප්පු කිරීමට තරම් එම සාක්ෂි ප්‍රමාණවත් නොවන බව මෙම කොමිෂන් සභාව තීරණය කරයි. මේ සම්බන්ධයෙන් පැමිණිලිකර ඇති බුද්ධි නිළධාරින්ට අධිචෝදනා මෙතෙක් ඉදිරිපත් නොවී ඇත්තේ සාක්ෂිවල පවතින දුර්වලතාවයන් නිසා බැව් මෙම කොමිෂන් සභාව විශ්වාස කරයි.

මෙම කොමිෂන් සභාව විසින් සාක්ෂි විභාග කර අවසන් කර ඇත.

තවද, මෙම පැමිණිලිකරුවන් වන බුද්ධි නිළධාරීන් විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ හානි පූර්ණ වාර්තාවන් මෙහි පහත ඇතුලත් කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් අති විශේෂ ගැසට්පත්‍ර අංක 2157/44 මගින් 2020 ජනවාරි මස 9වෙනි දින පිහිටුවනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාව 2015 ජනවාරි මස 8වෙනි දිනෙන් ආරම්භ වී 2019 නොවැම්බර් මස 16 වෙනි දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සංස්ථා සේවකයින්, සන්නද්ධ හමුදාව හා පොලිස් සේවයේ සමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පිහිටුවන ලදි.

කීත් නෝයර් පැහැරගෙන ගොස්, පහර දී නැවත වෙනත් ස්ථානයකට අතහැර දැමීම සහ දෙහිවල පොලිසිය, කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යන අංශ මගින් මුල් විමර්ශනය කර ඇති අතර, මෙම පරීක්ෂණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු වූයේ 2015 බලයට පත් වූ රජය විසින් පොලිස්පති වෙතට කරන ලද නියමයක් මතය.

2015 ජනවාරි මස පැවති රජය වෙනස් වී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් පිහිටවූ එම රජයේ අගමැති ලෙස ක්‍රියාකළ රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015 ජනවාරි මස 21 වෙනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් සන්දේශය, කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එම සන්දේශයේ දක්වා ඇති අන්දමට

දූෂණ විරෝධී කමිටුව හා ඊට අදාළ අනෙකුත් කමිටු පිහිටුවීමෙන් පසුව ගත් ක්‍රියාමාර්ග මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිවලින් අනාවරණය වූ අන්දමට දේශපාලන පළිගැනීමේ ආරම්භය ලෙස හා හමුදා බුද්ධි නිලධාරීන් දඩයම් කිරීමේ ආරම්භය ලෙස මෙම කොමිෂන් සභාව විශ්වාස කරයි.

මෙම දූෂණ විරෝධි කමිටුවේ වෙනත් වැඩසටහන් යටතේ පැහැදිළිව දක්වා තිබුණේ මාධ්‍යවේදීන් ඝාතනය කිරීම පිළිබඳව සොයා බැලීමේ විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවීම සහ හැකිතාක් දුරට ප්‍රකාශ ගැනීමේදී අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශ ලබා ගැනීම වේ. මේ අනුව කීත් නෝයර් පැහැරගෙන, පහරදීමේ විමර්ශනය කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉලක්ක කළේ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තව නිර්මාණය කළ ප්‍රකාශ අත්අඩංගුවේ සිටි බුද්ධි නිළධාරීන් ලවා ප්‍රකාශ කරවා ගැනීම වේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔවුන් විසින් නිර්මාණය කරන ලද ප්‍රකාශ ලබා ගැනීමට විවිධ ක්‍රම උපයෝගි කර ගෙන ඇති බව මෙම කොමිෂන් සභාව ඉදිරියේදී පැමිණ පැමිණිලිකරුවන් ඉදිරිපත් කළ සාක්ෂියේදී හෙළි වී ඇත. පොලිස් නිළධාරියෙකු නොවන අයෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළට හඳුන්වා දී විමර්ශන නිළධාරීන් සමග එකට වැඩ කරන බව පෙන්වා, ඔහු ලවා නිර්මාණය කරන ලද ප්‍රකාශ ලබා ගැනීමට දැරූ උත්සාහය කීත් නෝයාර් සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයේදී හෙළි වී ඇත. එනම් රුවන්පෙතියාගොඩ නම් අය පොලිස් නිළධාරියෙකු නොවීය. කෙසේ වුවද අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව තුළට විත් පැමිණිලිකරුවන්ට කරන ලද බලපෑම මේජර් බුලත්වත්ත සාක්ෂියෙන් හා මේජර් ජෙනරාල් කරුණාසේකර සාක්ෂියෙන් හෙළි වී ඇත.

මේජර් ජෙනරාල් කරුණාසේකර ඔහුගේ සාක්ෂියේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනයට ලක්ව සිටි අවස්ථාවේදී හමු වූ රුවන්පෙතියාගොඩනම් කෙනෙකු සම්බන්ධයෙන් සාක්ෂියේදී මෙසේ දක්වා ඇත.

"එතකොට රුවන්පෙතියාගොඩ මහතා ගැන මම තවදුරටත් සොයා බලනකොට දැනගන්න ලැබුණා මොහු Sunday Leader පුවත්පතේ එවකට රාජකාරි කළ පුද්ගලයෙක්. පසුව ඇමෙරිකා එක්සත් ජනපදය වෙත ගිහිල්ලා එහේ යම්කිසි ආයතනයක සේවය කළ බවය. ඒ ආයතනය පිළිබඳව මට පැහැදිලි අවබෝධයක් නැහැ ස්වාමීනි. පසුව මොහු 2015 යහපාලන ආණ්ඩුව පැමිණීමත් සමග ලංකාවට ඇවිල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරි කළ බවට තමයි තොරතුරු විමර්ශනයේදී මට දැනගන්න ලැබුණේ" (2020.09.25 වෙනි දින මේජර් ජෙනරල් කරුණාසේකරගේ සාක්ෂි සටහනේ පිටු අංක 29)

මෙම සාක්ෂි අනුව පෙනී යන්නේ දේශීය වශයෙන් පමණක් නොව අන්තර්ජාතික වශයෙන්ද දේශපාලන බලපෑම් හා පළිගැනීම් තිබුණු බවය. මේජර් ජෙනරාල් කරුණාසේකර මේ සම්බන්ධයෙන් මෙලෙස සාක්ෂි දී ඇත.

තවදුරටත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටින්නේ "ඉන්පසුව මම 2018.11.15 වෙනි දින සිරභාරයේ ඉඳලා නිදහස් වෙලා ඇවිල්ලා නිවුස් බලන කොට මට මතක හැටියට හිරු නිවුස්වල මේ පුද්ගලයා මම දැක්කා පාර්ලිමේන්තුවේ ලොබි එකේ ගැලරි එකේ ඉඳගෙන දේශන සවන්දෙන කොටසක්. ඒ කොටසේ ඔහු ඉඳගෙන හිටියේ ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපති කාර්යාලයේ නියෝජිතයන් සමග කියන

එක තමයි මට තේරුම් ගියේ. මොකද ඒ වෙනකොට අර දින 52 ආණ්ඩුව සම්බන්ධව සාකච්ඡා නැත්නම් දේශන සිදුවෙනවා පාර්ලිමේන්තුවේ".

(2020.09.25 වෙනි දින මේජර් ජෙනරල් කරුණාසේකරගේ සාක්ෂි සටහනේ පිටු අංක 30)

මෙම රුවන්පෙතියාගොඩ නැමති අය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමග එකට ක්‍රියා කළ බව පෙනී යයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉතිහාසයේ නොමැති අවස්ථාවක් ලෙස මෙය සැලකිය හැකියි. රුවන්පෙතියාගොඩ නැමැත්තා විටින් විට පැමිණිලිකරුවන්ගේ ප්‍රකාශ සටහන් කරගන්නා විට ඔවුන් සමග කතා කොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කර ඇති ප්‍රකාශ අනුව ප්‍රකාශ දෙන ලෙසට පෙළඹවීම් කර ඇත. එසේම ඇතැම් අවස්ථාවලදී මෙවැන්නක් නොකළහොත් අපහසු තත්ත්වයකට පත්විය හැකි බැව් රුවන්පෙතියාගොඩ පැවසූ බව පැහැදිලි වේ.

එසේම රුවන්පෙතියාගොඩ නැමති අය මේජර් ජෙනරාල් කරුණාසේකර හමුවීමට අවස්ථාවක් ලබාගත් බව ඔහුගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. (2020.09.20 වෙනි දින සාක්ෂියේදී පිටු අංක 45) එවකට යුධ හමුදාපතිව සිටි මහේෂ් සේනානායක මහතා සාක්ෂිකරු වන මේජර් ජෙනරාල් කරුණාසේකරට කතා කොට රුවන්පෙතියාගොඩ විසින් සාක්ෂිකරු වන මේජර් ජෙනරාල් කරුණාසේකරව හමුවීමට අවස්ථාවක් ලබාදෙන ලෙසට ඉල්ලා සිටි බව කියා ඇති අතර, යුධ හමුදාපතිව සිටි මහේෂ් සේනානායකගේ ඉල්ලීම මත 2017.11.07 වෙනි දින දී රුවන්පෙතියාගොඩව යුධ

හමුදාපති මහේෂ් සේනානායකගේ නිල නිවසේදී හමු වූ බවත්, එදින සාකච්ඡාවේදී රුවන්පෙතියාගෙඩ කියා ඇත්තේ "පැහැදිලිවම ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අවශ්‍යතාවයට මෙය සිදු කළ බවත්, ඒ නිසා අපට මේ පිළිබඳව සහයෝගය දක්වන්න කියන එක තමයි ප්‍රධාන වශයෙන් මූලික අරමුණ වෙන්නේ" (2020.09.26 වෙනි දින සාක්ෂියේදී පිටු අංක 45 සහ 46)

ඉහත සඳහන් සාක්ෂියෙන් පැහැදිලිවම පෙනී යන්නේ දේශීය දේශපාලන බලපෑම් මත වූ පළිගැනීමක් පමණක් නොව අන්තර් ජාතික වශයෙන්ද පළිගැනීමට ලක්වූ බවය. රුවන්පෙතියාගොඩගේ ඉල්ලීම වූයේ මේජර් ජෙනරාල් කරුණාසේකර විසින් ඔහුගේ ප්‍රකාශයේදී මෙම කීත් නෝයාර් සිද්ධිය ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නියෝග හා අනුමැතිය මත කරන ලද්දක් බවට ප්‍රකාශ කරන ලෙසටයි. මෙම හමුවීම නැතහොත් මෙම සිද්ධිය සිදු වී ඇත්තේ 2017 නොවැම්බර් මාසයේදීය. ඒ වන විට ගෝඨාභය මහතා දේශපාලනයට පිවිසීමට සූදානම් ව සිටි කාල වකවානුව වූ අතර, මෙම ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව ගෝඨාභය රාජපක්ෂ මහතා කීත් නෝයාර් පැහැර ගැනීමේ අපරාධයට සම්බන්ධ කරලීමට නොහැකි වූ හෙයින් සිදුවූයේ මේජර් ජෙනරාල් කරුණාසේකර ඇතුළු බුද්ධි නිළධාරීන් දේශපාලන පළිගැනීමට ලක් කිරීම බැව් මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

තවදුරටත් මේජර් ජෙනරාල් කරුණාසේකර ඔහුගේ සාක්ෂියේදී මෙසේ ප්‍රකාශ කර සිටියි.

ප්‍ර : එයිනුත් මම යෝජනා කර සිටිනවා දේශපාලන අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා තමයි

මේ NGO කෙනෙක් මැදිහත්වෙලා තියෙන්නේ කියලා කිව්වොත් මහත්මයා පිළිගන්නවාද?

පි : එහෙමයි මම පිළිගන්නවා ස්වාමීනි මොකද තියෙන සම්බන්ධතාවයන් එක්ක බලපුවාහම මට එහෙම හැඟී යනවා ස්වාමිනි. ඥාති සම්බන්ධකම් එහෙම බැලුවහම ස්වාමිනි.

(2020.09.25 වෙනි දින ජෙනරාල් කරුණාසේකරගේ සාක්ෂි සටහනේ පිටු අංක 32)

මේ අනුව දේශීය හා විදේශීය දේශපාලන බලපෑම් තිබුණු බවත්, මේ නිසා දූෂණ මර්දන කමිටුවේ බලපෑම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැඩි ලෙස බලපෑම් එල්ල කිරීම හේතුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් පැමිණිලිකාර බුද්ධි නිළධාරීන්ව දැඩි ලෙස හිංසනයට පමුණුවා ඇති බැව් කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂි වලින් මනාව පැහැදිලිවේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද දූෂණ විරෝධි කමිටුවේ අනෙකුත් ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති ඉලක්කය වන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශ ලබා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇත. මෙහිදී තර්ජන, පෙළඹවීම් හා පොරොන්දු සිදු කරමින් අවශ්‍ය ප්‍රකාශ දෙන ලෙසට යෝජනා කර ඇත. මෙහිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉලක්කය වූයේ වගන්ති 127 යටතේ ප්‍රකාශ ලබා ගැනිමයි. එම යෝජනාවලට එකඟ වූ පැමිණිලිකරුවන් අත්අඩංගුවෙන් නිදහස් කර රජයේ සාක්ෂිකාරයින් ලෙසට පත්කර ඇත. උදාහරණ වශයෙන්

ජී.ඒ.ජී.පී.කේ. සෝමසූරිය ලිපිගොනු අංක 296/20 යටතේ මොහු 2020.08.31 වෙනි දින මෙම කොමිසම ඉදිරියේ සාක්ෂි දීමේදී ප්‍රකාශ කර සිටියේය. 2017.02.17 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉදිරිපත් වූ අතර, ඔහුව ප්‍රශ්න කිරීමේදී එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහ බුලත්වත්ත මහතාගේ අනුදැනුම මත එම කණ්ඩායම සාක්ෂිකරු කුලී පදනම මත ගත් නිවසට කීත් නෝයර් ගෙනවිත් පහරදී වධ හිංසා කර, පසුවදා මුදා හැරිය බවට ප්‍රකාශ කරන ලෙසට නිශාන්ත සිල්වා බලපෑම් කළ බව ප්‍රකාශ කර සිටියි. (2020.08.31 වෙනි දින සාක්ෂි සටහනේ පිටු අංක 59)

ඉන්පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැඩි බලපෑම් නිසා මහේස්ත්‍රාත් ඉදිරියට ගොස් ප්‍රකාශයක් දුන් බව ප්‍රකාශ කරයි. (2020.09.25 වෙනි දින සාක්ෂියේ පිටු අංක 16 සහ 17) මේ අනුව අත්අඩංගුවට ගත් අනෙක් නිලධාරීන්ට වඩා පැමිණිලිකරු සෝමසූරියට වැඩි සැලකිල්ලක් ලැබී ඇති අතර, මුදලින්ද රු.10,000/-ක් දුරකථනයක් මිලදී ගැනීමට නිශාන්ත සිල්වා දුන් බව ප්‍රකාශ කරයි. මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ යෝජනාවලට එකඟ වී ක්‍රියා කළ බවද, පැමිණිලිකරුවන්ට සහනයක් ලැබුණු අතර, අනෙක් සැකකරුවන් සෑම කෙනෙක්ම දේශපාලන පළිගැනීමකට ලක් වී රක්ෂිත බන්ධනාගාර ගත කළ බව පෙනේ.

කීත් නෝයර් විමර්ශනයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉලක්කය වූයේ වත්මන් ජනාධිපති මෙම සිද්ධියට හා කෙසේ හෝ මෙම පහරදීමට සම්බන්ධ කිරීමට වේ. මෙය ඉලක්ක කරගෙන පැමිණිලි කළ නිලධාරීන්ට, නිර්මාණය කළ ප්‍රකාශය වූයේ මෙම සිද්ධියට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ (එවකට ආරක්ෂක

ලේකම්) අනු දැනුම ඇතිව මෙම පැහැර ගැනීම හා පහර දීම සිදු වූ බව දැක්වීමටය. ඒ මගින් උත්සාහ කළේ ගෝඨාභය රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගැනීමටය.

කොමිෂන් සභාවට පැමිණි පැමිණිලිකරුවන් වන මේජර් ජෙනරාල් කරුණාසේකර, කර්නල් බුලත්වත්ත, නිශාන්ත ජයතිලක, චමික සුමිත්, චන්ද්‍රබාය ජයසූරිය, දුමින්ද වීරරත්න, නිශාන්ත කුමාර, ලසන්ත විමලවීර, හේමචන්ද්‍ර පෙරේරා, ලලිත් රාජපක්ෂ සහ සෝමසූරිය යන සැම පැමිණිලිකරුවෙකුම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට පත් වූ පසු, වර්තමාන ජනාධිපති ගෝඨාභය සම්බන්ධ කර ප්‍රකාශ දීමට බලපෑම් කළ බවද, එවැනි ප්‍රකාශයන් නොදුන් නිසා දේශපාලන පළිගැනීමක් වශයෙන් ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කළ බවද ප්‍රකාශ කර ඇත.

දූෂණ විරෝධී කමිටුවේ ව්‍යූහයේ සැලැස්මක ආකෘතිය එම ලේඛනයට යා කොට ඇති අතර, ක්ෂණික ප්‍රතිචාර කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරීත්වය ලෙස ශානි අබේසේකරගේ නම සඳහන්ව ඇත. කීත් නෝයර් පරීක්ෂණයේ විමර්ශනය ශානි අබේසේකරගේ නායකත්වයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමූහ මංකොල්ල අංශයේ ස්ථානාධිපති නිශාන්ත සිල්වා මගින් විමර්ශනය කරන ලදී. මේ අනුව පෙනී යන්නේ අත්අඩංගුවට ගත් පැමිණිලිකරුවන් දේශපාලන බලපෑම නිසා දැඩි හිංසනයකට, පීඩාවකට හා දේශපාලන පළිගැනීමකට ලක් වූ බවට මෙම කොමිෂන් සභාවට සාක්ෂි ඉදිරිපත් වූ අතර, මෙම පැමිණිලිකරුවන් සැම කෙනෙකුම දේශපාලන පළිගැනීමට ලක්වූ නිළධාරීන් බව කොමිසම තීරණය කරයි.

නඩු අංකය - 232/2020
පැමිණිලිකරු - මේජර් ජෙනරල්
කේ්ජීඒ කරුණාසේකර
අංක 84/2,
පිටිපන උතුර,
හෝමාගම.
2020 නොවැම්බර් මස   දින

දේශපාලන පළිගැනීම පිළිබඳ
ගරු ජනාධිපති කොමිෂන් සභාව
කාමර අංක 260 A
ඒකක අංක 04
දෙවන මහල
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව
කොළඹ 07

<u>හානි පූර්ණය</u>

1. ඉහත නම සඳහන් මා විසින් දේශපාලන පළිගැනීම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද 232/2020 දරණ පැමිණිල්ලට අදාලව හානි පූර්ණය කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු කාරුණිකව ඉදිරිපත් කරමි.

අ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මා 2018.04.05 දින අත්අඩංගුවට ගෙන 2018.09.10 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීම හේතුවෙන් යුද්ධ හමුදාව වෙතින් මාගේ සේවය එම කාලසීමාවට අත්හිටුවන ලදී.

ආ. මාගේ එකම දියණිය හට ඇමරිකා එක්සත් ජනපදයේ වෙස්ලියන් පාසල - ජෝර්ජියා වෙතින් 2018 ජූලි මස සිට වර්ෂයක කාලසීමාවකට තෝරාගෙන ශිෂ්‍යත්වයක් ප්‍රධානය කල අතර, මා සිරගත කිරීම තුල ඒ සඳහා ඇයට සහභාගී වීමට තිබූ අවස්ථාව අහිමිවීම.

2. ඉහත කරුණු වලට අදාලව මා හට අහිමි වූ මුදල් සහ මා විසින් දරණ ලද අනෙකුත් වියදම්හී සංශිප්ත වාර්තාවක් පහත සඳහන් පරිදි ඉදිරිපත් කරනු ලබන අතර, එම මුදල් මා හට හිමි ගැන්වීම සඳහා ප්‍රතිපාදන/නිර්දේශ ලබා දීමට ඉදිරි කටයුතු සිදුකර දෙනමෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

| අනු අංකය | විස්තරය | මුදල | මුලු එකතුව |
|---|---|---|---|
| .1 | බන්ධනාගාර ගත කිරීම තුල දින 159 වෙනුවෙන් වැටුප් අහිමිවීම | රු409,731.61 . | |
| .2 | දින සහ 2018.04.02 දින 2018.03.29 විදේශ ගතවීමට ඉල්ලීම සැබැදිව නීතිඥ ගාස්තු | රු40,000.00 . | |
| .3 | දින සිට 2018.09.10 දින 2018.04.05 දක්වා ඇප ලබාගැනීම තෙක් වැය කල නීතිඥ ගාස්තු | රු963,000.00 . | |
| .4 | දින මූලික අයිතිවාසිකම් 2018.05.04 පෙත්සම ගොණු කිරීම සඳහා නීතිඥ | රු750,000.00 . | |

| | | | |
|---|---|---|---|
| | ගාස්තු | | |
| .5 | මූලික අයිතිවාසිකම් පෙත්සම ගොණු කිරීම සඳහා පරිපාලන වියදම් | රු100,000.00 . | |
| .6 | දින සිට 2018.09.10 දින 2018.04.05 සිදුකල ඇප ලබාගැනීම දක්වා පරිපාලන වියදම් | රු50,000.00 . | |
| .7 | දින සිට මේ දක්වා 2018.09.10 ගල්කිස්ස අධිකරණයෙහි නඩු කටයුතු වෙනුවෙන් නීතිඥ ගාස්තු | රු175,000.00 . | |
| .8 | දියණිය හට හිමිව තිබූ ඇමරිකා එක්සත් ජනපද ශිෂ්‍යත්වයෙහි වටිනාකම )USD 35,555 x (184.22 | රු6,549,942.10 . | |
| .9 | දියණියගේ විදේශගත වීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම වෙනුවෙන් කල වියදම් | රු40,000.00 . | 9,077,673.71 |

3. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනීම හේතුවෙන් මාගේ සමාජ තත්වය කෙරෙහිද අවධානය යොමුකර මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයින් වෙතද සිදුවූ මානසික සමාජීය සහ අධ්‍යාපනික අපහසුතා සහ අපකීර්තිය වෙනුවෙන් මිලියන 50ක වන්දි මුදලක් ලබා දීම.

මෙයට
විශ්වාසී

කේ්ජීඒ කරුණාසේකර
ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී
මේජර් ජෙනරල්

නඩු අංක : 353/2020
පැමිණිලිකරු : ලුතිතන් කර්නල්
බි.ඩබ්.ඩී.එම්.ආර්.පී.එස්.එස්.බී.ඩී. බුලත්වත්ත
ආර්එස්පී අයිඑස්සි බිඒ(පේරා)
"බුලත්වත්ත වලව්ව" සමගි මාවත,
මානෙළුව
පුවුහපුව - තෙල්දෙණිය
2020 නොවැම්බර් මස වන දින

දේශපාලන පළිගැනිම් පිළිබද
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සදහන් මා සදහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනිම් පිළිබද ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලිම පහත සදහන් පරිදි ඉදිරිපත් කරමි

I. 2017.02.17 වන දින සිට 2017.08.01 දක්වා මාගේ සේවය අත්හිටුවිම හේතුවෙන් සේවය බිදි යාම සිදුව ඇති බැවින් එය ඉවත් කර දැමීම.

II. එම පරික්ෂන මුල්කරගෙන යුධ හමුදාව විසින් පවත්වා ඇති සියළුම පරික්ෂණ හා බැදීම් වලින් මුදවා හැරිම.

III. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවූ මුදල් පිළිබද සංක්ෂිප්ත වාර්ථාව පහත සදහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්විම සදහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදිම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු ඒකතුව රු: |
|---|---|---|---|
| 1 | 2017.02.17 දින සිට අත්අඩංගුවට පත්විම හේතුවෙන් එදින සිට 2017.03.30 වන දින ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් නඩු අංක බී 1535/08 ඇප ලබාගැනිම දක්වා දරණ ලද නිතීඥ ගාස්තු | 500,000 | |
| 2 | 2017.03.31 දින සිට 2017.04.07 වන දින දක්වා නඩු අංක බී 294/9 ගම්පහ අධිකරණයට ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 75,000 | |
| 3 | 2017.04.06 දින සිට 2017.04.12 වන දින ඇප ලබා ගැනිම දක්වා අලුත්කඩේ ගරු මහේස්ත්‍රත් අධිකරණයේ නඩු අංක බී 4690/3/2008 ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 50,000 | |

| | | | |
|---|---|---|---|
| 4 | ගරු ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාදුන් ඇප අත්හිටුවීම හේතුවෙන් ගරු කොළඹ මහාධිකරණය තුලින් ඇප ලබා ගැනිම වෙනුවෙන් දරණ නිතීඥ ගාස්තු | 700,000 | |
| 5 | ඇප තැම්පත් කිරිම සදහා | 45,000 | |
| 6 | ඉහත නඩු වල ඇප ලැබිමෙන් පසු ඉදිරි පරික්ෂණ සදහා නිතීඥ ගාස්තු | 150,000 | |
| 7 | ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයේදි මාගේ සහෝදරියන් වෙනුවෙන් පවරණ ලද නඩු අංක බි 673 වෙනුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු හා පරිපාලන වියදම් | 300,000 | |
| 8 | 2017.02.17 වන දින සිට 2017.06.21 වන දින ඇප ලබා ගැනිම දක්වා කාලසිමාව තුල දරණ ලද පරිපාලන හා ගමන් වියදම් | 200,000 | |
| 9 | 2017.06.21 වන දින ඇප ලබා ගැනිමේ සිට මේ දක්වා නඩු වාරයන් සදහා අධිකරණයන් වෙත පැමිණිම සදහා දරණ ලද පරිපාලන හා ගමන් වියදම් (අවස්ථා 45 ක් පමණ) | 50,000 | |
| 10 | 2017.06.21 දින සිට මේ දක්වා (සැම ඉරු දිනකම , මසකට දෙවරක් , අවසන් ඉරුදින ලෙස) අපරාද පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත රපොර්තු කිරිම සදහා කරන ලද පරිපාලන හා ගමන් වියදම් ( අවස්ථා 70 ක් පමණ) | 100,000 | |
| 11 | 2017 පෙබරවාරි මස සිට අගෝස්තු මස දක්වා අත්හිටුවන ලද වැටුප් හා දිමනා | 429,402 | |
| 12 | සේවය අත්හිටුවීම හේතුවෙන් ගෙවිමට සිදුවු ණය වාරික | 252,000 | |
| | මුළු මුදල | | 2,851,402 |

IV. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනිම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවු මානසික සමාජිය අධ්‍යාපනික අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදිම.

මෙයට
විශ්වාසි

.........................................

බි.ඩබ්.ඩි.එම්.ආර්.පි.එස්.එස්.බි.ඩි.
බුලත්වත්ත
ආර්එස්පි අයිඑස්සි බිජ් (පේරා)
ලුතිතන් කර්නල්

නඩු අංක : 297/2020
පැමිණිලිකරු : මාණ්ඩලික සැරයන් ජයතිලක එච්එම්එන්ආර්එස්පි
"වෙද නිවස"හිද්දැව,
ඇහැටුවැව

2020 නොවැම්බර් මස  වන දින

දේශපාලන පළිගැනීම් පිළිබද
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සදහන් මා සදහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනීම් පිළිබද ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලීම පහත සදහන් පරිදි ඉදිරිපත් කරමි

I. 2017.02.18 වන දින සිට 2017.08.01 දක්වා මාගේ සේවය අත්හිටුවීම හේතුවෙන් සේවය බිදි යාම සිදුව ඇති බැවින් එය ඉවත් කර දැමීම.

II. එම පරීක්ෂන මුල්කරගෙන යුධ හමුදාව විසින් පවත්වා ඇති සියළුම පරීක්ෂණ හා බැදීම් වලින් මුදවා හැරීම.

III. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවු මුදල් පිළිබද සංක්ෂිප්ත වාර්ථාව පහත සදහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්වීම සදහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදීම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු ඒකතුව රු: |
|---|---|---|---|
| 1 | 2017.02.18 දින සිට අත්අඩංගුවට පත්වීම හේතුවෙන් එදින සිට 2017.03.30 වන දින ගල්කිස්ස ගරුමහේස්ත්‍රාත් අධිකරණයෙන් නඩු අංක බී 1535/08 ඇප ලබාගැනීම දක්වා දරණ ලද නිතීඥ ගාස්තු | 100,000 | |
| 2 | 2017.03.31 දින සිට 2017.04.07 වන දින දක්වා නඩු අංක බී 294/9 ගම්පහ ගරු අධිකරණයට ඉදිරිපත් කිරීම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 25,000 | |
| 3 | 2017.04.06 දින සිට 2017.04.12 වන දින ඇප ලබා ගැනීම දක්වා අලුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 4690/3/2008 ඉදිරිපත් කිරීම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 25,000 | |

| | | | |
|---|---|---|---|
| 4 | ගරු ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාදුන් ඇප අත්හිටුවීම හේතුවෙන් ගරු කොළඹ මහධිකරණය තුලින් ඇප ලබා ගැනිම වෙනුවෙන් දරණ නිතීඥ ගාස්තු | 560,000 | |
| 5 | ඇප තැම්පත් කිරිම සඳහා | 45,000 | |
| 6 | ඉහත නඩු වල ඇප ලැබිමෙන් පසු ඉදිරි පරික්ෂණ සඳහා නිතීඥ ගාස්තු | 150,000 | |
| 7 | 2017.02.18 වන දින සිට 2017.06.21 වන දින ඇප ලබා ගැනිම දක්වා කාලසිමාව තුල දරණ ලද පරිපාලන හා ගමන් වියදම් | 150,000 | |
| 8 | 2017.06.21 වන දින ඇප ලබා ගැනිමේ සිට මේ දක්වා නඩු වාරයන් සඳහා ගරු අධිකරණයන් වෙත පැමිණිම සඳහා දරණ ලද පරිපාලන හා ගමන් වියදම් (අවස්ථා 45 ක් පමණ) | 60,000 | |
| 9 | 2017.06.21 දින සිට මේ දක්වා (සෑම ඉරු දිනකම , මසකට දෙවරක් , අවසන් ඉරුදින ලෙස) අපරාද පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත රපොර්තු කිරිම සඳහා කරන ලද පරිපාලන හා ගමන් වියදම් ( අවස්ථා 70 ක් පමණ) | 100,000 | |
| 10 | 2017 පෙබරවාරි මස සිටඅගෝස්තු මස දක්වා අත්හිටුවන ලද වැටුප් හා දිමනා | 487,340 | |
| 11 | සේවය අත්හිටුවිම හේතුවෙන් ගෙවිමට සිදුවූ ණය වාරික | 157,500 | |
| | | | 1,859,840 |

IV. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනිම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවූ මානසික සමාජීය අධ්‍යාපනික අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදිම.

මෙයට
විශ්වාසී

..........................................

මාණ්ඩලික සැරයන් ජයතිලක
එච්එම්එන් ආර්එස්පි

නඩු අංක : 257/2020
පැමිණිලිකරු : මාණ්ඩලික සැරයන්
සුමිත් ජීඒසි ආර්එස්පි
කරගස්වගුර,
කැප්පෙටිපොල

2020 නොවැම්බර් මස  වන දින

දේශපාලන පළිගැනිම් පිළිබද
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සදහන් මා සදහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනිම් පිළිබද ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලිම පහත සදහන් පරිදි ඉදිරිපත් කරමි

I. මෙම පරිකෂන මුල්කරගෙන යුධ හමුදාව විසින් පවත්වා ඇති සියළුම පරීක්‍ෂණ හා බැදීම් වලින් මුදවා හැරිම.

II. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවූ මුදල් පිළිබද සංක්ෂිප්ත වාර්ථාව පහත සදහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්විම සදහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදිම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු ඒකතුව රු: |
|---|---|---|---|
| 1 | 2019.08.22 දින සිට අත්අඩංගුවට පත්විමහේතුවෙන් එදින සිට 2019.09.03 වන දින ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ලබාගැනිම දක්වා දරණ ලද නිතීඥ ගාස්තු | 50,000 | |
| 2 | 2019.08.29 දින අලුත්කඩේ ගරු මහේස්ත්‍රත් අධිකරණයේ නඩු අංක බී 4690/3/2008 ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 15,000 | |
| 3 | ඇප තැම්පත්කිරිම සදහා | 35,000 | |
| 4 | ඉහත නඩු වල ඇප ලැබිමෙන් පසු ඉදිරි පරික්ෂණ සදහා නිතීඥ ගාස්තු | 35,000 | |
| 5 | 2019.08.22 වන දින සිට 2019.09.03 වන දින ඇප ලබා ගැනිම දක්වා කාලසිමාව තුල දරණ ලද පරිපාලන හා ගමන් වියදම් | 35,000 | |

| | | | |
|---|---|---|---|
| 6 | 2019.09.03 වන දින ඇප ලබා ගැනිමේ සිට මේ දක්වා නඩු වාරයන් සඳහා අධිකරණයන් වෙත පැමිණිම සඳහා දරණ ලද පරිපාලන හා ගමන් වියදම් (අවස්ථා 12 ක් පමණ) | 30,000 | |
| 7 | 2017.09.03 දින සිට මේ දක්වා (සෑම ඉරු දිනකම , මසකට දෙවරක් , අවසන් ඉරුදින ලෙස) අපරාද පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත රපොර්තු කිරිම සඳහා කරන ලද පරිපාලන හා ගමන් වියදම් ( අවස්ථා 12 ක් පමණ) | 30,000 | |
| | මුළු මුදල | | 230,000 |

III. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනිම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවූ මානසික සමාජීය අධ්‍යාපනික අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදිම.

මෙයට
විශ්වාසි

..............................................

මාණ්ඩලික සැරයන්
සුමිත් ජීජ්සි ආර්එස්පි

නඩු අංක :      /2020
පැමිණිලිකරු : මාණ්ඩලික සැරයන්
ජයසූරිය එස්එන්එම්සි ආර්එස්පි(විශ්‍රාමික) අංක 219/ඒ,
පරකැටවැල්ල, පිළිමතලාව

2020 නොවැම්බර් මස      වන දින

දේශපාලන පළිගැනිම් පිළිබද
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සදහන් මා සදහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනිම් පිළිබද ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලිම පහත සදහන් පරිදි ඉදිරිපත් කරමි

I. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවූ මුදල් පිළිබද සංක්ෂිප්ත වාර්ථාව පහත සදහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්විම සදහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදිම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු ඒකතුව රු: |
|---|---|---|---|
| 1 | 2017.04.03 දින සිට අත්අඩංගුවට පත්විම හේතුවෙන් එදින සිට 2017.06.21 වන දින ගල්කිස්ස ගරුමහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ලබාගැනිම දක්වා දරණ ලද නිතීඥ ගාස්තු | 700,000 | |
| 2 | ඇප තැම්පත්කිරිම සදහා | 35,000 | |
| 3 | ඉහත නඩු වල ඇප ලැබිමෙන් පසු ඉදිරි පරික්ෂණ සදහා නිතීඥ ගාස්තු | 80,000 | |
| 4 | 2017.04.03 වන දින සිට 2017.06.21 වන දින ඇප ලබා ගැනිම දක්වා කාලසිමාව තුල දරණ ලද පරිපාලන හා ගමන් වියදම් | 75,000 | |
| 5 | 2017.06.21 වන දින ඇප ලබා ගැනිමේ සිට මේ දක්වා නඩු වාරයන් සදහා අධිකරණයන් වෙත පැමිණිම සදහා දරණ ලද පරිපාලන හා ගමන් වියදම් (අවස්ථා 13 ක් පමණ) | 30,000 | |
| 6 | 2017.06.21 දින සිට මේ දක්වා (සැම ඉරු දිනකම , මසකට දෙවරක් , අවසන් ඉරුදින ලෙස) අපරාද පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත රපොර්තු කිරිම සදහා කරන ලද පරිපාලන හා ගමන් වියදම් ( අවස්ථා 60 ක් පමණ) | 70,000 | |

| | | | |
|---|---|---|---|
| 7 | රැකියාව සඳහා විදේශගතව සිට නඩු කටයුතු සඳහා නැවත පැමිණීමට සිදුවීම හේතුවෙන් සිදුවූ වියදම හා අහිමිවූ වැටුප් මුදල | 5,000,000 | |
| | මුළු මුදල | | 5,990,000 |

II. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනිම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවූ මානසික සමාජීය අධ්‍යාපනික අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදිම.

මෙයට
විශ්වාසි

.......................................

ජයසූරිය එස්එන්එම්සි ආර්එස්පි
(විශ්‍රාමික)
මාණ්ඩලික සැරයන්

නඩු අංක : 241/2020
පැමිණිලිකරු : මාණ්ඩලික සැරයන් වීරරත්න යුපිඩිආර්එස්පි
අංක 628/1, පන්සල්ගොඩ,
ඉලුක්පිටිය,
බටපොල.

2020 නොවැම්බර් මස වන දින

දේශපාලන පළිගැනීම් පිළිබඳ
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සඳහන් මා සදහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනීම් පිළිබඳ ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලිම පහත සදහන් පරිදි ඉදිරිපත් කරමි

I. 2017.02.17 වන දින සිට 2017.08.01 දක්වා මාගේ සේවය අත්හිටුවීම හේතුවෙන් සේවය බිඳී යාම සිදුව ඇති බැවින් එය ඉවත් කර දැමීම.

II. එම පරීක්ෂන මුල්කරගෙන යුධ හමුදාව විසින් පවත්වා ඇති සියළුම පරීක්ෂණ හා බැදීම් වලින් මුදවා හැරිම.

III. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවූ මුදල් පිළිබඳ සංක්ෂිප්ත වාර්ථාව පහත සදහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්වීම සදහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදිම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු ඒකතුව රු: |
|---|---|---|---|
| 1 | 2017.02.17 දින සිට අත්අඩංගුවට පත්විම හේතුවෙන් එදින සිට 2017.03.30 වන දින ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් නඩු අංක බි 1535/08 ඇප ලබාගැනිම දක්වා දරණ ලද නිතීඥ ගාස්තු | 100,000 | |
| 2 | 2017.03.31 දින සිට 2017.04.07 වන දින දක්වා නඩු අංක බි 294/9 ගම්පහ අධිකරණයට ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 25,000 | |
| 3 | 2017.04.06 දින සිට 2017.04.12 වන දින ඇප ලබා ගැනිම දක්වා අලුත්කඩේ ගරු මහේස්ත්‍රත් අධිකරණයේ නඩු අංක බි 4690/3/2008 ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 30,000 | |

| | | | |
|---|---|---|---|
| 4 | ගරු ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාදුන් ඇප අත්හිටුවීම හේතුවෙන් ගරු කොළඹ මහාධිකරණය තුලින් ඇප ලබා ගැනීම වෙනුවෙන් දරණ නීතිඥ ගාස්තු | 560,000 | |
| 5 | ඇප තැම්පත්කිරීම සඳහා | 45,000 | |
| 6 | ඉහත නඩු වල ඇප ලැබීමෙන් පසු ඉදිරි පරීක්ෂණ සඳහා නීතිඥ ගාස්තු | 150,000 | |
| 7 | 2017.02.17 වන දින සිට 2017.06.21 වන දින ඇප ලබා ගැනීම දක්වා කාලසීමාව තුල දරණ ලද පරිපාලන හා ගමන් වියදම් | 150,000 | |
| 8 | 2017.06.21 වන දින ඇප ලබා ගැනීමේ සිට මේ දක්වා නඩු වාරයන් සඳහා අධිකරණයන් වෙත පැමිණීම සඳහා දරණ ලද පරිපාලන හා ගමන් වියදම් (අවස්ථා 45 ක් පමණ) | 50,000 | |
| 9 | 2017.06.21 දින සිට මේ දක්වා (සෑම ඉරු දිනකම , මසකට දෙවරක් , අවසන් ඉරුදින ලෙස) අපරාද පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රපොර්තු කිරීම සඳහා කරන ලද පරිපාලන හා ගමන් වියදම් ( අවස්ථා 70 ක් පමණ) | 75,000 | |
| 10 | 2017 පෙබරවාරි මස සිට අගෝස්තු මස දක්වා අත්හිටුවන ලද වැටුප් හා දීමනා | 487,340 | |
| 11 | සේවය අත්හිටුවීම හේතුවෙන් ගෙවීමට සිදුවූ ණය වාරික | 120,000 | |
| | මුළු මුදල | | 1,792,340 |

IV. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනීම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවූ මානසික සමාජීය අධ්‍යාපනික අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදීම.

මෙයට
විශ්වාසී

.....................................

මාණ්ඩලික සැරයන් වීරරත්න
යූපීඩීආර්එස්පී

නඩු අංක : 242/2020
පැමිණිලිකරු :
කෝප්‍රල් නිශාන්ත කුමාර එම්පී  ආර්එස්පී
අංක 234/බී, පංසල් හංදිය,
වැගොව්ව, මීනුවන්ගොඩ.

2020 නොවැම්බර් මස  වන දින

දේශපාලන පළිගැනිම් පිළිබද
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සදහන් මා සදහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනිම් පිළිබද ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලිම පහත සදහන් පරිදි ඉදිරිපත් කරමි

I. 2017.03.20 වන දින සිට 2017.08.01 දක්වා මාගේ සේවය අත්හිටුවිම හේතුවෙන් සේවය බිදි යාම සිදුව ඇති බැවින් එය ඉවත් කර දැම්ම.

II. එම පරික්ෂන මුල්කරගෙන යුධ හමුදාව විසින් පවත්වා ඇති සියළුම පරීක්‍ෂණ හා බැදීම් වලින් මුදවා හැරිම.

III. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවු මුදල් පිළිබද සංක්ෂිප්ත වාර්ථාව පහත සදහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්විම සදහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදිම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු එකතුව රු: |
|---|---|---|---|
| 1 | 2017.03.20 දින සිට අත්අඩංගුවට පත්විම හේතුවෙන් එදින සිට 2017.06.21 වන දින ගල්කිස්ස ගරුමහේස්ත්‍රාත් අධිකරණයෙන් නඩු අංක බි 1535/08 ඇප ලබාගැනිම දක්වා දරණ ලද නිතීඥ ගාස්තු | 20,000 | |
| 2 | 2017.03.31 දින සිට 2017.04.07 වන දින දක්වා නඩු අංක බි 294/9 ගම්පහ අධිකරණයට ඉදිරිපත්කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 25,000 | |
| 3 | 2017.04.06 දින සිට 2017.04.12 වන දින ඇප ලබා ගැනිම දක්වා අලුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බි 4690/3/2008 ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණලද නිතීඥ ගාස්තු | 25,000 | |

| | | | |
|---|---|---|---|
| 4 | ගරු ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාදුන් ඇප අත්හිටුවීම හේතුවෙන් ගරු කොළඹ මහාධිකරණය තුලින් ඇප ලබා ගැනිම වෙනුවෙන් දරණ නිතීඥ ගාස්තු | 610,000 | |
| 5 | ඇප තැම්පත් කිරිම සඳහා | 45,000 | |
| 6 | ඉහත නඩු වල ඇප ලැබිමෙන් පසු ඉදිරි පරික්ෂණ සඳහා නිතීඥ ගාස්තු | 150,000 | |
| 7 | 2017.03.20 වන දින සිට 2017.06.21 වන දින ඇප ලබා ගැනිම දක්වා කාලසිමාව තුල දරණ ලද පරිපාලන හා ගමන් වියදම් | 100,000 | |
| 8 | 2017.06.21 වන දින ඇප ලබා ගැනිමේ සිට මේ දක්වා නඩු වාරයන් සඳහා අධිකරණයන් වෙත පැමිණිම සඳහා දරණ ලද පරිපාලන හා ගමන් වියදම් (අවස්ථා 45 ක් පමණ) | 35,000 | |
| 9 | 2017.06.21 දින සිට මේ දක්වා (සැම ඉරු දිනකම , මසකට දෙවරක් , අවසන් ඉරුදින ලෙස) අපරාද පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත රපොර්තු කිරිම සඳහා කරන ලද පරිපාලන හා ගමන් වියදම් ( අවස්ථා 70 ක් පමණ) | 35,000 | |
| 10 | 2017 අප්‍රේල් මස සිට අගෝස්තු මස දක්වා අත්හිටුවන ලද වැටුප් හා දිමනා | 298,535 | |
| 11 | සේවය අත්හිටුවීම හේතුවෙන් ගෙවිමට සිදුවූ ණය වාරික | 89,125 | |
| | මුළු මුදල | | 1,432,660 |

IV. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනිම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවූ මානසික සමාජිය අධ්‍යාපනික අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදිම.

මෙයට
විශ්වාසි

.............................................

කෝප්‍රල් නිශාන්ත කුමාර
එම්පි ආර්එස්පි

නඩු අංක : 204/2020
පැමිණිලිකරු :බනි I
ජේඑච්ජේඑල් විමලවීර ආර්එස්පි යුඑස්පි (විශ්‍රාමික)
අංක 94/ඒ/1, පාළුගම,
දොම්පේ.

2020 නොවැම්බර් මස  වන දින

දේශපාලන පළිගැනිම් පිළිබද
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සදහන් මා සදහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනිම් පිළිබද ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලිම පහත සදහන් පරිදි ඉදිරිපත් කරමි

I. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවූ මුදල් පිළිබද සංක්ෂිප්ත වාර්ථාව පහත සදහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්විම සදහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදිම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු ඒකතුව රු: |
|---|---|---|---|
| 1 | 2017.02.18 දින සිට අත්අඩංගුවට පත්විම හේතුවෙන් එදින සිට 2017.03.30 වන දින ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් නඩු අංක බි 1535/08 ඇප ලබා ගැනිම දක්වා දරණ ලද නිතීඥ ගාස්තු | 100,000 | |
| 2 | 2017.03.31 දින සිට 2017.04.07 වන දින දක්වා නඩු අංක බි 294/9 ගම්පහ අධිකරණයට ඉදිරිපත්කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 25,000 | |
| 3 | 2017.04.06 දින සිට 2017.04.12 වන දින ඇප ලබා ගැනිම දක්වා අලුත්කඩේගරු මහේස්ත්‍රත් අධිකරණයේ නඩු අංක බි 4690/3/2008 ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණලද නිතීඥ ගාස්තු | 25,000 | |
| 4 | ගරු ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාදුන් ඇප අත්හිටුවිමහේතුවෙන් ගරු කොළඹ මහධිකරණය තුලින් ඇප ලබා ගැනිම වෙනුවෙන් දරණ නිතීඥ ගාස්තු | 560,000 | |
| 5 | ඇප තැම්පත්කිරිම සදහා | 45,000 | |
| 6 | ඉහත නඩු වලඇප ලැබිමෙන් පසු ඉදිරි පරික්ෂණ සදහා නිතීඥ ගාස්තු | 150,000 | |

| | | | |
|---|---|---|---|
| 7 | 2017.02.18 වන දින සිට 2017.06.21 වන දින ඇප ලබා ගැනිම දක්වා කාලසිමාව තුල දරණ ලද පරිපාලන හා ගමන් වියදම් | 100,000 | |
| 8 | 2017.06.21 වන දින ඇප ලබා ගැනිමේ සිට මේ දක්වා නඩු වාරයන් සඳහා අධිකරණයන් වෙත පැමිණිම සඳහා දරණ ලද පරිපාලන හා ගමන් වියදම් (අවස්ථා 45 ක් පමණ) | 35,000 | |
| 9 | 2017.06.21 දින සිට මේ දක්වා (සැම ඉරු දිනකම . මසකට දෙවරක් , අවසන් ඉරුදින ලෙස) අපරාද පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත රපොර්තු කිරිම සඳහා කරන ලද පරිපාලන හා ගමන් වියදම් ( අවස්ථා 70 ක් පමණ) | 35,000 | |
| 10 | 2017 පෙබරවාරි මස සිටඅගෝස්තු මස දක්වා අත්හිටුවන ලද වැටුප් හා දිමනා | 485,100 | |
| 11 | සේවය අත්හිටුවිම හේතුවෙන් ගෙවිමට සිදුවු ණය වාරික | 161,000 | |
| | මුළු මුදල | | 1,721,100 |

II. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනිම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවු මානසික සමාජිය අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදිම.

මෙයට
විශ්වාසි

..............................

ඒඑච්ඒඑල් විමලවීර
ආර්එස්පි යූඑස්පි (විශ්‍රාමික)
බලලත් නිලධාරි I

නඩු අංක : 239/2020
පැමිණිලිකරු : මාණ්ඩලික සැරයන් පෙරේරා එච්ඒඑච් ආර්එස්පි
අංක 191/ඒ, වැගවත්ත,
අලුත්ගම, බණ්ඩාරගම.

2020 නොවැම්බර් මස වන දින

දේශපාලන පළිගැනීම් පිළිබඳ
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සඳහන් මා සඳහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනීම් පිළිබඳ ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලිම පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි

I. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවූ මුදල් පිළිබඳ සංක්ෂිප්ත වාර්ථාව පහත සඳහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්විම සඳහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදිම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු ඒකතුව රු: |
|---|---|---|---|
| 1 | 2017.02.17 දින සිට අත්අඩංගුවට පත්වීම හේතුවෙන් එදින සිට 2017.03.30 වන දින ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් නඩු අංක බි 1535/08 ඇප ලබාගැනිම දක්වා දරණ ලද නිතීඥ ගාස්තු | 100,000 | |
| 2 | 2017.03.31 දින සිට 2017.04.07 වන දින දක්වා නඩු අංක බි 294/9 ගම්පහ අධිකරණයට ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 25,000 | |
| 3 | 2017.04.06 දින සිට 2017.04.12 වන දින ඇප ලබා ගැනිම දක්වා අලුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බි 4690/3/2008 ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 30,000 | |
| 4 | ගරු ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාදුන් ඇප අත්හිටුවීම හේතුවෙන් ගරු කොළඹ මහධිකරණය තුලින් ඇප ලබා ගැනිම වෙනුවෙන් දරණ නිතීඥ ගාස්තු | 560,000 | |
| 5 | 2019.08.01 හෝමාගම ගරු මහේස්ත්‍රාත් අධිකරණය නඩු අංකබි 74/17/2010 සහ හෝමාගම ගරු මහාධිකරණය නඩු අංක HC 209/2019 වෙත ඉදිරිපත් කිරිම තුලින් ඇප ලබා ගැනිම නිතීඥ ගාස්තු හා පරිපාලන වියදම් | 50,000 | |
| 6 | ඇප තැම්පත් කිරිම සඳහා | 45,000 | |

| | | | |
|---|---|---|---|
| 7 | ඉහත නඩු වල ඇප ලැබීමෙන් පසු ඉදිරි පරීක්ෂණ සඳහා නීතීඥ ගාස්තු | 150,000 | |
| 8 | 2017.02.17 වන දින සිට 2017.06.21 වන දින ඇප ලබා ගැනීම දක්වා කාලසීමාව තුල දරණ ලද පරිපාලන හා ගමන් වියදම් | 100,000 | |
| 9 | 2017.06.21 වන දින ඇප ලබා ගැනීමේ සිට මේ දක්වා නඩු වාරයන් සඳහා අධිකරණයන් වෙත පැමිණීම සඳහා දරණ ලද පරිපාලන හා ගමන් වියදම් (අවස්ථා 45 ක් පමණ) | 35,000 | |
| 10 | 2017.06.21 දින සිට මේ දක්වා (සැම ඉරු දිනකම , මසකට දෙවරක් , අවසන් ඉරුදින ලෙස) අපරාද පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රපොර්තු කිරිම සඳහා කරන ලද පරිපාලන හා ගමන් වියදම් ( අවස්ථා 70 ක් පමණ) | 35,000 | |
| 11 | 2017 පෙබරවාරි මස සිට අගෝස්තු මස දක්වා අත්හිටුවන ලද වැටුප් හා දීමනා | 368,088 | |
| 12 | සේවය අත්හිටුවීම හේතුවෙන් ගෙවීමට සිදුවූ ණය වාරික | 162,000 | |
| | මුළු මුදල | | 1,660,088 |

II. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනීම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවූ මානසික සමාජීය අධ්‍යාපනික අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදීම.

මෙයට
විශ්වාසී

.......................................

මාණ්ඩලික සැරයන්
පෙරේරා එච්ජ්එච් ආර්එස්පි

නඩු අංක : 203/2020
පැමිණිලිකරු : බනි I
ආර්එල් රාජපක්ෂ ආර්එස්පි (විශ්‍රාමික)
අංක 78/බී/3, ගුළුහේන පාර,
ජයවීරගොඩ, හංවැල්ල.

2020 නොවැම්බර් මස  වන දින

දේශපාලන පළිගැනීම් පිළිබඳ
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සඳහන් මා සඳහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනීම් පිළිබඳ ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලීම පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි

I. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවූ මුදල් පිළිබඳ සංක්ෂිප්ත වාර්ථාව පහත සඳහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්වීම සඳහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදීම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු ඒකතුව රු: |
|---|---|---|---|
| 2 | 2019.07.07 දින සිට 2019.08.28 වන දින දක්වා නඩු අංක බී 294/9 ගම්පහ අධිකරණයට ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 200,000 | |
| 1 | 2019.07.18 දිනසිට 2019.08.23 වන දින ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ලබාගැනිම දක්වා දරණ ලද නිතීඥ ගාස්තු | 75,000 | |
| 3 | 2019.08.08 දින සිට 2019.08.23 වන දින ඇප ලබා ගැනිම දක්වා අලුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 4690/3/2008 ඉදිරිපත් කිරිම හේතුවෙන් දරණ ලද නිතීඥ ගාස්තු | 15,000 | |
| 4 | ගම්පහ ගරු මහාධිකරණයේ HC 212/2019 නඩුව සඳහා දරණ ලද නිතීඥ ගාස්තු | 2,800,000 | |
| 5 | ඇප තැම්පත්කිරිම සඳහා | 25000 | |
| 6 | ඉහත නඩු වල ඇප ලැබිමෙන් පසු ඉදිරි පරික්ෂණ සඳහා නිතීඥ ගාස්තු | 50,000 | |
| 7 | 2019.07.07 වන දින සිට 2019.09.03 වන දින ඇප ලබා ගැනිම දක්වා කාලසීමාව තුල දරණ ලද පරිපාලන | 75,000 | |

| | | | |
|---|---|---|---|
| | හා ගමන් වියදම් | | |
| 8 | 2019.07.07 වන දින ඇප ලබා ගැනිමේ සිට මේ දක්වා නඩු වාරයන් සඳහා අධිකරණයන් වෙත පැමිණීම සඳහා දරණ ලද පරිපාලන හා ගමන් වියදම් (අවස්ථා 20 ක් පමණ) | 10,000 | |
| 9 | 2017.09.03 දින සිට මේ දක්වා (සැම ඉරු දිනකම , මසකට දෙවරක් , අවයන්ඉරුදින ලෙස) අපරාද පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත රපොර්තු කිරිම සඳහා කරන ලද පරිපාලන හා ගමන් වියදම් ( අවස්ථා 50 ක් පමණ) | 25,000 | |
| 10 | අත්අඩංගුවට පත්වූ කාලසිමාව තුලදි අහිමි වූ මාසික වැටුප් ආදායම | 100,000 | |
| | මුළු මුදල | | 3,375,000 |

II. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනිම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවූ මානසික සමාජිය අධ්‍යාපනික අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදිම.

මෙයට
විශ්වාසි

..........................

ආර්එල් රාජපක්ෂ ආර්එස්පි
(විශ්‍රාමික)
බලළත් නිලධාරි I

නඩු අංක : 296/2020
පැමිණිලිකරු : මාණ්ඩලික සැරයන්
සෝමසූරිය පීජ්පීපිකේ (විශ්‍රාමික)
කටියාව, උඩහේන, දොඩම්ගස්ලන්ද

2020 නොවැම්බර් මස    වන දින

දේශපාලන පළිගැනීම් පිළිබද
ගරු ජනාධිපති කොමිෂම් සභාව,
කාමර අංක 210/ඒ, ඒකක අංක 04,
දෙවන මහල,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

හානි පූර්ණය

ඉහත නම සදහන් මා සදහන් කර ඇති පැමිණිලි අංකය යටතේ දේශපාලන පළිගැනීම් පිළිබද ගරු ජනාධිපති කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලට අදාලව මා විසින් හානි පූර්ණ සිදුකරන ලෙස ඉල්ලීම පහත සදහන් පරිදි ඉදිරිපත් කරමි

I. මා විසින් දරණ ලද වියදම් හා මා හට අහිමිවූ මුදල් පිළිබද සංක්ෂිප්ත වාර්ථාව පහත සදහන් පරිදි වන අතර එම මුදල් මාහට හිමිගැන්වීම සදහා ප්‍රතිපාදන/නිර්දේශ ලබාදීම.

| අනු අංකය | විස්තරය | මුදල රු: | මුළු ඒකතුව රු: |
|---|---|---|---|
| 1 | 2017.02.18 වන දින සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්ථා කර දින සිට 2017.03.09 වන දින අධිකරණයට ඉදිරිපත් කිරීම දක්වා කාලය තුල දරණ ලද පාලන වියදම් | 50,000 | |
| 2 | 2017.02.18 වන දින සිට නීතිමය හා මානව හිමිකම් කටයුතු වෙනුවෙන් දරණ ලද වියදම් | 100,000 | |
| 3 | එම කාල සීමාව තුල මා විසින් විවිධ ස්ථානයන් වෙත ගමන් කර ස්ථාන ගතව සිටීම වෙනුවෙන් දරණ ලද වියදම් | 50,000 | |
| 4 | එම කාලය තුල මා හට රැකියාවක් තුලින් උපයා ගැනීමට අහිමි වූ වැටුප් ආදායම | 200,000 | |
| 5 | මුළු මුදල | | 400,000 |

II. ඉහත වියදම් ඇස්තමේන්තුවට අමතරව මෙම අත්අඩංගුවට ගැනීම හේතුවෙන් මා ඇතුළු මාගේ පවුලේ සාමාජිකයන් වෙත සිදුවූ මානසික සමාජීය අධ්‍යාපනික අපහසුතාවයන් සහ අපකීර්තිය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදීම.

මෙයට
විශ්වාසී

සෝමසූරිය පීජ්පීපිකේ(විශ්‍රාමික)
මාණ්ඩලික සැරයන්

උක්ත හමුදා නිලධාරීන් ඔවුන් සිදු නොකළ වරදවල් වෙනුවෙන් දේශපාලන බලධාරීන්ගේ බලයේ සිටීමේ අපේක්ෂාව මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ ඒ සඳහා අවශ්‍ය කෙරෙන සාක්ෂි නිර්මාණය කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යොදා ගනිමින් රැඳවුම් නියෝග මත දිර්ඝ කාලයක් සාක්ෂි සකස් කිරීමේ කාර්ය සඳහා රඳවා තබා ගැනීමත් එසේ සිදු කළ නොහැකි බව අවබෝධ කර ගත් විට ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමත් ඉන් පසුව ඔවුන් ඇපමත නිදහස් වී යාම වළක්වමින් දේශපාලනමය වශයෙන් පළිගැනිම හේතුකොට ගෙන සිදු වූ අලාභ හානි ඉහත සඳහන් අයුරින් ගණනය කර ඉදිරිපත් කර ඇත. මෙම වාර්තාවේ සම්පූර්ණත්වය උදෙසා මෙන්ම සුදුසු කටයුතු සඳහා ද එකී අලාභ හානි වාර්තාවට ඇතුළත් කිරීම සුදුසු බවට කොමිෂන් සභාවට පෙනී ගොස් ඇත.

24/11/2020

2020/11/24

## 10 . කොමිෂන් සභාවේ අවධානයට ලක් වූ පැමිණිලි

## 10 . I

පැමිණිලි අංකය - 1885/2020

පැමිණිලි කරු - විලියම් විජේසිංහ ගමගේ

ලිපිනය - අංක 234/4, ගැමුණු මාවත, රාජගිරිය.

### නිර්දේශ

ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බි 1899/15 යටතේ ඇති සියළු චෝදනා වලින් පැමිණිලිකරු ඇතුළු සෙසු විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කළ යුතු බවටත්, පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරිමට අවශ්‍ය කෙරෙන අසත්‍ය වාර්තා ඉදිරිපත් කළ පොලිස් නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු බවට කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කර ඇත.

### පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු විසින් 2020.09.11 දින කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ප්‍රකාශයක් ලබාදෙමින් 1967 විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් සාමාන්‍ය උපාධිය හදාරා ඉන් පසුව 2007 වර්ෂයේදි කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමණාකරනය පිළිබඳව පශ්චාත් උපාධියක්ද ලබා ගෙන පසුව. රජරට විශ්ව විද්‍යාලයෙන් සම්මානිත ආචාර්ය උපාධියක් ලබා ගත් බව ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරු වර්ෂ 1969

සිට මහින්ද රාජක්ෂ මහතාව හඳුනා ගෙන ඇසුරු කල බවත් එතුමා මුල් අවස්ථාවේ පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වූ කාලයේ සිටම ඔහුගේ දේශපාලන කටයුතු වලට සම්බන්ධවූ බවත් ප්‍රකාශකර සිටී. එසේම ඔහු රාජපක්ෂවරුන් සමග 1969 පමන සිට මේ දක්වා තිබුන සියලු මැතිවරණ කටයුතු සඳහා සම්බන්ද වී වැඩකටයුතු සිදු කර ඇති අතර රාජපක්ෂ පවුලේ සියලුම දෙනා සමග ඔහු සමීපව අවුරුදු 50 කට අධික කාලයක් කටයුතු කර ඇත. මෙසේ ඉතා සමීප සම්බන්දතාවයක් තිබූ නිසා 2004 වර්ෂයේ එවකට අග්‍රාමාත්‍යව සිටි මහින්ද රාජපක්ෂ මහතා විසින් පැමිණිලිකරු හට රජය සමග සම්බන්ද වී වැඩකටයුතු සිදු කිරිමට එක් වන ලෙස අරාධනයක් කර ඇති බව ප්‍රකාශයේ සඳහන්ව ඇත.

පසුව මහින්ද රාජපක්ෂ මහතාගේ රජය සමයේ එනම් 2005 සිට 2015 දක්වා කාල සිමාව තුල ඔහු හට රජයේ වැදගත් තනතුරු කිපයක් ලබාදි ඇති අතර ඒ අනුව 2005 සිට 2015 දක්වා කාලය ඔහු උපාය මාර්ගික හා ව්‍යවසාය කළමණාකරණ ආයතනයේ සභාපතිවරයා ලෙසද, මෙම සභාපතිත්වය දරන අතර තුරදි රාජපක්ෂ රජයේ 2005 සිට 2010 දක්වා කාලය තුල රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ සංවර්ධන කටයුතු පිළිබද අතිරේක ලේකම් වශයෙන්ද කටයුතු කර ඇත. එසේම 2010 සිට 2013 දක්වා කාල සීමාව තුල රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය කළමණාකරන අමාත්‍යංශයේ ලේකම්වරයා ලෙසත්, 2013 සිට 2015 දක්වා උද්භිත උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යංශයේ ලේකම් වශයෙන් කටයුතු කර ඇත. එසේම පැමිණිලිකරු වෙත බැසිල් රාජපක්ෂ මහතා විසින් දිවිනැගුම ජාතික සභාවේ සමාජිකයෙකු වශයෙන් හා දිවිනැගුම ප්‍රජාමුල බැංකු සහ දිවිනැගුම ප්‍රජාමුල බැංකු සමිති වල කළමණාකරණ මණ්ඩලයේ සමාජික වශයෙන්ද දිවිනැගුම

සමාජ ආරක්ෂක අරමුදලේ භාරකාර මණ්ඩලයට පත් කර ඇත. 2015 වර්ෂයේ පැවති ජනාධිපති වරණයෙන් මහින්ද රාජපක්ෂ මහතා පරාජය වී රජය වෙනස් වීමත් සමග ඔහු හට  මෙම සියලු තනතුරු අහිමිව ගොස් ඇත.

2010 වර්ෂයේ පැවති මහ මැතිවරණයේදි ගම්පහ දිස්ත්‍රික්කයෙන් බැසිල් රාජපක්ෂ මහතා මැතිවරණයට ඉදිරිපත් වූ අතර එම අවස්ථාවේ බැසිල් රාජපක්ෂ මහතාගේ මැතිවරණ ව්‍යාපාරයේ ප්‍රධාන මෙහෙයුම්කරුවන් දෙදෙනා වී ඇත්තේ පැමිණිලිකරු සහ හිටපු මහජන බැංකු සභාපති ඩබ්ලිව් කරුණාජීව මහතා වේ. කරුණාජීව මහතා මූල්‍ය කළමණාකරන කටයුතුත් පැමිණිලිකරු කාර්යාල කළමණාකරන කටයුතුද භාරව සිට ඇත. මෙහිදි බැසිල් රාජපක්ෂ මහතා රාජපක්ෂ පවුලෙන් ඉදිරිපත් වූ ප්‍රබල අපේක්ෂකයෙකු වූ බැවින් ගම්පහ දිස්ත්‍රික්කයේ සහ වෙනත් ප්‍රදේශ වලින් මෙම ඡන්ද ව්‍යාපාරය සඳහා විවිධ ආයතන සහ පුද්ගලයන් විසින් විශාල ලෙස මූල්‍යාධාර සපයා දි තිබුණු බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි. මෙම මැතිවරණය අවසානයේ දි එකතු වූ මුදල් වලින් සැලකිය යුතු මුදලක් ඉතිරිව තිබූ බැවින් එම මුදල් වලින් කල්පවතින දෙයක් සිදු කිරිම සුදුසු යැයිද රාජපක්ෂ අධ්‍යාපනික හා සංස්කෘතික පදනම මගින් ඉඩමක් මිලදි ගෙන කාර්යාලයක් ඉදිකොට ගම්පහ දිස්ත්‍රික්කයේ සේවා කටයුතු සිදු කිරිම  සුදුසු යැයි ද කරුණාජීව මහතා විසින්ම යෝජනා කර තිබේ. එම අදහස අනුමත වීමෙන් පසු ගම්පහ දිස්ත්‍රික්කයට සම්බන්ධකම් ඇති හිටපු පළාත් සභා මන්ත්‍රිවරයෙක් වන ගාමිණී ගුණරත්න මහතා ඔරුතොට පදිංචි රොහාන් පල්ලේවත්ත මහතාගේ ඉඩමක් මේ සඳහා ලබා දිමට කැමැත්තක් ඇති බව පල්ලේවත්ත මහතා විසින් ඔහු වෙත

දන්වා සිටි බවත් රුපියල් මිලියන 20 කට ලබා ගත හැකි බවත් පදනමේ මණ්ඩලය වෙත ප්‍රකාශ කල බවට සදහන් වේ.

එම පණිවිඩය කරුණාජීව මහතාට දුන් පසු අදාල මුදල රාජපක්ෂ සංස්කෘතික හා අධ්‍යාපන පදනම වෙත ගිණුම්ගත කිරිමට කරුණාජීව මහතා භාරගෙන ඇත. ඒ අනුව එම පදනමේ මුදල් භාරකරු වන උපුල් දිසානායක මහතාට මෙම ඉඩම මිලදි ගැනිම සදහා රුපියල් මිලියන 20 ක චෙක්පතද, නිති කටයුතු සිදු කිරිම සදහා නිතීඥවරුන්ද සමග මෙම ගණුදෙනුව සිදු කිරිම සදහා පැමිනෙන ලෙස පැමිණිලිකරු විසින් දැනුම් දුන් බව කියයි. මෙම මිලදි ගැනීමේ අවස්ථාවට පැමිණිලිකරුද, ගාමිණි ගුණරත්න මහතාද සහභාගි වි ඇත. මෙම ගණුදෙනුව සිද්ධ උනේ 2010 මහාමැතිවරණය අවසන් වී මාස කිපයක් ඇතුලත බව ඔහු කියා ඇත. මෙම ගණුදෙනු සිදුවී වසර 4 කට පමණ පසුව මහින්ද රාජපක්ෂ මහතා පරාජය විමෙන් පසුව පත් වු යහපාලන රජය මගින් පිහිටවන ලද මුල්‍ය අපරාධ විමර්ශණ කොට්ඨාශය මගින් රාජපක්ෂවරුන්ට හා ඔවුන් හා සම්පව සිටි රාජ්‍ය නිළධාරින්ට විරුද්ධව සිදු කරන ලද විමර්ශනයන් හිදි මෙම ඉඩම මිලදි ගැනිම සම්බන්ධයෙන් ද විමර්ශන කර ඇත. මුල්‍ය අපරාධ විමර්ශණ කොට්ඨාශය මගින් මුදල් විශුද්ධීකරණ පනත යටතේ විමර්ශනයක් ආරම්භ කර ඇති බවත් ඔහුගෙන් ප්‍රකාශ ලබා ගැනිමට අවශ්‍ය බවත් දන්වා සදහන් කර වැලිකඩ පොලිසියේ නිළධාරින් මගින් පනිවිඩ පත්‍රයක් එවු බව ප්‍රකාශයේ සදහන් කර ඇත.

පැමිණිලිකරු ප්‍රකාශකර ඇත්තේ මෙම සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු පැමිනිල්ලක් ඉදිරිපත් වි නොමැති බවත් නඩු වාර්තා පරිශිලනය කිරිමේදි එය හොදින් පැහැදිලි වන බවත්ය. පැමිණිලිකරු ප්‍රකාශයක්

ලබා දිම සඳහා මුල්‍ය අපරාධ විමර්ශණ කොට්ඨාශය වෙත අවස්ථා තුනකදි පමණ ගොස් ප්‍රකාශ ලබා දී, ගිය 4 වන අවස්ථාවේදි එනම් 2016.06.23 දින පැමිණිලකරු සහ ආරියතිලක දහනායක යන අය අත්අඩංගුවට ගෙන ඇත. මෙම සිද්ධිය සම්බන්දයෙන් ඔහුගෙන් ප්‍රකාශ ලබා ගෙන ඇත්තේ මුල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ ඒකක 04 හි පො.සැ. ඩි.ඩබ් ගුණසේකර යන අය වන අතර එම ඒකකයේ ප්‍රධානියා වුයේ ප්‍රධාන පොලිස් පරික්ෂක රණසිංහ යන බව ප්‍රකාශයේ සඳහන්ව ඇත. පැමිණිලිකරුගේ ප්‍රකාශයේ සදහන්කර ඇත්තේ රණසිංහ සහ ගුණසේකර යන නිළධාරින් ඇතුලු එම ඒකකයේ සෙසු නිළධාරින් පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කරන එක අවස්ථාවකදි තර්ජනය කරමින් කියා ඇත්තේ රුපියල් ලක්ෂ 100 ක පමණ මුදලක් බැසිල් රාජපක්ෂ මහතා විසින් ලබා දුන් බවට පිළිගන්නා ලෙසත් එසේ පිළිගතහොත් ඔහුට විරුද්ධව පැමිණිල්ලක් නොකරන බවයි. එහෙත් සිදූ නොවූ දෙයක් සිදු වූ බවට සඳහන් කිරිමට ඔහු එකගවි නැති බවත්, ඔවුන් කියන ආකාරයට ප්‍රකාශ ලබා දිමක් සිදු කර නැති බවත්ය .

මෙම සිද්ධිය සම්බන්දයෙන් පැමිනිලිකරු අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බි 1899/15 යටතේ ගම්පහ මහේස්ත්‍රාත්වරයා හමුවටයි. පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ එසේ 2016.06.23 වන දින ඔවුන් අතිරේක මහෙස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කල අතර ඇප කොන්දේසිය වශයෙන් රුපියල් මිලියන 40 ක සහතික ඇපයක් නියම කරනු ලැබූ බවත් එය ලේ ඥාතියකුගෙන් ලබා ගත යුත් බව සදහන් කර තිබූ බවයි. එම ඇප කොන්දේසියක් සම්පුර්න කිරිමට ඔවුන් හට නොහැකි වූ නිසා දෙදෙනාම රක්ෂිත බන්ධනාගාර ගත කොට ඇත. නමුත් 2016.06.24

වන දින මෙම නඩුවට අදාල අනෙක් සැකකරු වශයෙන් නම් කර සිටි උපුල් රංජන් දිසනායක මහතා ඔහුගේ නිතිඥවරුන් මාර්ගයෙන් අධිකරණයට ඉදිරිපත් විමෙන් පසු ඔහුට රුපියල් ලක්ෂ 05 ක ශරිර ඇප 02 ක් සහ රුපියල් 50,000.00 ක මුදලක් මත ඇප නියම කර තිබුණි. ඒ අවස්ථාවේ දි ගම්පහ අධිකරණයේ ස්ථිර මහේස්ත්‍රාත්තුමා විසින් ඔහු හට පනවා තිබු ඇප කොන්දේසිය ද වෙනස් කර ඉහත උපුල් රංජන් මහතාට නියම කරන ලද ඇප කොන්දේසි නියම කිරිමෙන් පසු පැමිණිලිකරු හා දහනායක යන අයටද  එම දිනයේ දි ඇප ලබාදි ඇත.

එසේ  ඇප ලබා ගැනිමෙන් පසු මෙම නඩුව අවස්ථා ගණනාවක් අධිකරණයේ කැදවු අතර මේ දක්වා අධි චෝදනා පත්‍ර ගොනු කිරිමක් සිදු කර නොමැත. නමුත් මුල්‍ය අපරාධ කොට්ඨාශයේ නිළධාරින් විසින් අධිකරණය වෙත බි වාර්තා මගින් එකම කාරණයක් වු නිතිපති උපදෙස් ලැබි නොමැති බව දන්වමින් අධිකරණ කටයුතු කල් දමා ගැනිම සිදු කරන්නේ යැයි පැමිණිලිකරු තම ප්‍රකාශයේ සදහන් කර ඇත. පැමිණිලිකරුගේ මතය වන්නේ වසර 06 ක පමණ කාලයක් ගතවි චෝදනා පත්‍ර ගොණු නොකිරිම ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති චෝදනා ඔප්පු කිරිමට නොහැකි විම නිසා නිකරුනේ පැමිණිලිකරුගේ සහ සෙසු සැකකරුවන්ගේ  කාලය නාස්ති කිරිම සිදු කරන බවයි. දැනට මෙම නඩු  කටයුතු බහා තබා ඇත.

රාජපක්ෂ සංස්කාතික හා අධ්‍යාපන පදනම විසින් ලබා ගත්  ඉඩමේ මුල් හිමිකරු වන පල්ලේවත්ත ගමරාලලාගේ රොහාන් පල්ලේවත්ත විසින් මුල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත ප්‍රකාශයක් ලබා දෙමින් දන්වා ඇත්තේ එම “ඉඩම ඔහුට අයත් ඉඩමක්, බැසිල්

රාජපක්ෂ මහතාගේ ඉල්ලීම මත බැසිල් රාජපක්ෂ මහතාට විකුණූ බවත් එම ඉඩමේ වටිනාකම රුපියල් ලක්ෂ 600 කට බැසිල් රාජපක්ෂ මහතාට විකිණීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බවත් එම සාකච්ඡාවේ දි බැසිල් රාජපක්ෂ මහතා නියෝජනය කළ විලි ගමගේ සහ ගාමිණී ගුණරත්න යන අයවලුන් පැමිණ ඉඩමේ විකුණුම් මිලෙන් රුපියල් ලක්ෂ 100 ක මුදලක් අඩු කර රුපියල් ලක්ෂ 500 කට ඉඩම මිළ දි ගැනිමට එකග වු බවත් ප්‍රකාශ කර ඇත. එසේම ඉඩම මිළ දි ගැනිමෙන් පසුව ජනාධිපති කාර්යාලයට පැමිණ බැසිල් රාජපක්ෂ මහතා හමු වූ බවත් ප්‍රකාශ කර සිටින අතර මෙම ඉඩම සදහා රුපියල් ලක්ෂ 300 ක මුදලක් ලබා දුන් බවත් තවත් රුපියල් ලක්ෂ 200 ක මුදලක් බැසිල් රාජපක්ෂ මහතාගෙන් හෝ ඔහු වෙනුවෙන් ඉඩම මිල දි ගැනිමට පැමිණි විලි ගමගේ හෝ ගාමිණී ගුණරත්න මහතා විසින් මෙතෙක් ලබා නොදුන් බවත්'' සදහන් කර ප්‍රකාශයක් ලබා දි ඇති බවයි.

නමුත් පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ පල්ලේවත්ත මහතාගේ එම ප්‍රකාශය සම්පුර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයක් බවත්. මෙම ඉඩම පදනම මගින් ලබා ගත්තේ රුපියල් ලක්ෂ 200 ක මුදලකට බවත්ය. තවද මෙම දේපල සම්බන්ධයෙන් හිමිකාරිත්වය ඇත්තේ රාජපක්ෂ අධ්‍යාපනික හා සංස්කෘතික පදනමට බවත් අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනාගෙන් පළමු සැකකරු වන ඔහු මෙම පදනමට සම්බන්ධ අයෙක් නොවන බවත් පැමිණිලිකරු සදහන් කර ඇත. පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ මෙම නඩු කටයුත්ත අසම්පූර්න ලෙස ගොණු කරන ලද නඩුවක් බවත්, දේශපාලනික උවමනාවන් මත පළිගැනිමේ අදහසින් හා විරුද්ධවාදි දේශපාලන මත දැරිම හේතුවෙන්

යහපාලන රජය බලයට පැමිනිමත් සමග මුලා අපරාධ කොට්ඨාශය මගින් සිදු කරන ලද දේශපාලනි කරනය වු විමර්ශනයක් බවයි.

පැමිණිලිකරු ගරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ දැනට වසර 6ක පමන කාලයක අසත්‍ය හා අසම්පුර්න චෝදනා එල්ල කරමින් ආරම්භ කර ඇති නඩු කටයුත්ත අවසන් කර දෙන ලෙසත්, මෙම අත්අඩංගුවට ගැනිම හේතුවෙන් ඔහු සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් හට සිදු වු අපහාසය, මානසික හා ශාරිරික පිඩාවන් මෙන්ම මෙම නඩු කටයුත්ත සදහා නිතිඥවරුන්ට වියදම්කරන ලද මුදල් සම්බන්ධයෙන් සුදුසු සහනයක් නිර්දේශ කරන ලෙස මෙන්ය.

2020.11.24

2020/11/24

10 .II

පැමිණිලි අංක - 1968/2020

පැමිණිලිකරු - තිරුකුමාර් නඩේෂන්

ලිපිනය - අංක:95, හෝර්ටන් පෙදෙස, කොළඹ 07.

නිර්දේශ

1. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට අසත්‍ය පැමිණිල්ලක් ඉදිරිපත් කර පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතාට එරෙහිව අංක බී 8674/15 බී වාර්තාව මගින් අසත්‍ය පැමිණිල්ලක් ගොනු කිරිමට කටයුතු සම්පාදනය කළ උපුල් කුමාර රාමවික්‍රම නැමැත්තාට එරෙහිව නිසි අධිකරණය ඉදිරියේ නඩු පැවරීම.

2. අසත්‍ය පැමිණිල්ලක් සිදු කර ඇති බව දැන දැනම එකී අසත්‍ය පැමිණිල්ල සිදු කළ උපුල් කුමාර රාමවික්‍රම නැමැත්තාට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොකර අසත්‍ය කරුණු පදනම් කර ගත් බී වාර්තාවක් පූගොඩ මහේස්ත්‍රාත් අධිකරණයට ගොනු කළ ගුණවර්ධන සහ රණසිංහ යන පොලිස් නිලධාරීන් දෙදෙනාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම.

3. ගම්පහ මහාධිකරණය ඉදිරියේ පවරා ඇති නඩු අංක 26/17 දරන අධිචෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම මගින් එකී අධිචෝදනා පත්‍රයේ චූදිතයින් නිදොස් කොට නිදහස් කිරීම.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු කොමිෂන් සභාව වෙත කරන ලද ලිඛිත පැමිණිල්ලට අදාලව 2020.11.11 වන දින කොමිෂන් සභාවේ විමර්ශන අංශයට ප්‍රකාශයක් ලබාදි ඇත. පැමිණිලිකරු එකී පැමිණිල්ලේ ප්‍රකාශකර ඇත්තේ ඔහු කලක පටන් හදුනන ගෘහනිර්මාණ ශිල්පී මුදිත ජයකොඩි යන අයගේ දැණුම්දීම පරිදි අංක 111/03, මහාවත්ත, ගගබොඩ පාර, මාපිටිගම, මල්වාන යන ප්‍රදේශයේ පිහිටි අක්කර 16ක ඉඩමක් ගම්පහ ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුගෙන් 2010.11.25 වන දින රුපියල් මිලියන 30කට මිලදී ගත් බවයි. පැමිණිලිකරු සහ මුදිත ජයකොඩි යන අය ඉඩම මිලදී ගැනිමට පෙර වාචික එකගතාවයකට පැමිණ ඇත්තේ මෙම ඉඩමේ නිවසක් ගොඩනගා එය විකිණිමෙන් ලැබෙන ලාභය දෙදෙනා අතරේ සමව බෙදා ගැනිමටයි. නිවස සෑදිමට යන සියලු මුදල් මුදිත ජයකොඩි විසින් ආයෝජනය කරන බවට එකගතාවයකට පැමිණි බව ඔහු ප්‍රකාශ කර සිටි. එම නිවස ඉදිකල පසුව මුදිත ජයකොඩි සහ පැමිණිලිකරු අතර 2015.01.15 යන දින අංක 223 දරණ ගිවිසුමක් ඇතිකර ගත් බව පැමිණිල්ලේ සදහන්ව ඇත. එම ගිවිසුමට අනුව පැමිණිලිකරු විසින් මිලදී ගත් ඉඩමේ ජයකොඩි යන අය විසින් නිවසක් ඉදිකල බවත් ඉදිකිරිම වෙනුවෙන් ප්‍රාදේශිය සභාව සහ ආයතන වලින් අනුමැතියන් ජයකොඩි යන අය ලබාගෙන ඇති බවත් රුපියල් මිලියන 40 කට ඉඩම මිලදී ගන්නා බවත් සදහන් කරයි. තවද ඉදිකරන ලද ගොඩනැගිල්ල ජයකොඩි යන අය විසින් ඉදිකල බැවින් ගොඩනැගිල්ලේ හිමිකම පැමිණිලිකරු වෙත නොමැති බව සදහන් කර ඇත. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ ජයකොඩි යන අය සමග තමා මෙම ඉඩම සම්බන්ධව

එකගතා ගිවිසුමකට එලෙඹි බවත්, මෙම ඉඩම පොල් වගා කරන ලද ඉඩමක්වූ බැවින් එය කොටස් කර විකිණීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනිමෙන් පසුව මුදල් ලබාදෙන බවට මුදිත ජයකොඩි විසින් ප්‍රකාශ කල බවත් රුපියල් මිලියන 40ක වටිනාකමකින් යුත් චෙක් පතක් ඔවුන්ගේ නිතිඥ නීලකාන්ත මහතා භාරයේ තබාගැනිමට එකගවූ බවයි.

අදාල අනුමැතියන් ලැබිමෙන් පසු අංක 2217 දරණ 2015.07.17 වන දිනැති විකුණුම්කරය නීලකාන්තන් නිතිඥ මහතා ඉදිරියේ ලියා මුදිත ජයකොඩි වෙත ඉඩම පවරාදි ඇත. මෙම ඉඩම හා නිවස සඳහා 2012, 2013, 2014 සහ 2015 යන තක්සේරු වර්ෂ සඳහා ගෙවන ලද බදු මුදල් ජයකොඩි යන අය විසින් ගෙවූ බව ඔහු ආදායම් කොමසාරිස් තුමිය වෙත යවන ලද ලේඛනයේ සඳහන් කර ඇති හෙයින් පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ මෙම නිවස සැදිමට අවශ්‍ය මුදල් ඔහු විසින් යෙදුවේ නම් ජයකොඩි යන අයට මෙම ගොඩනැගිල්ල සැදිම සඳහා ඔහු ආයෝජනයක් කල බවටත් එය ඔහුගේ දේපළක් බව ආදායම් බදු දෙපාර්තමේන්තුවට පෙන්විමට අවශ්‍යතාවයක් නොතිබූ බවයි.

2015.01.08 වන දින පැවති රජය පරාජය වි යහපාලන රජය බිහිවිමෙන් පසුව උපුල් කුමාර රාමවික්‍රම යන පුද්ගලයෙක් විසින් ඉහතකි ගග බොඩ පාර, මාපිටිගම, මල්වාන යන ලිපිනයේ ඇති ඉඩමේ බැසිල් රාජපක්ෂ මහතා විසින් නිවසක් ඉදිකර ඇති බවත් ඒ සම්බන්ධව විමර්ශනයක් සිදු කරන ලෙසත් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු තම ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ ඉහතකි පැමිණිල්ල අනුව

පැමිණිලිකරු සහ බැසිල් රාජපක්ෂ මහතා අවස්ථා 10 කදි පමණ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට කැදවා ප්‍රකාශ සටහන් කර ගත් බවත් එලෙස ප්‍රකාශ සටහන් කර ගත්තේ ගුණවර්ධන සහ රණසිංහ යන පොලිස් නිළධාරින් දෙදෙනා බවත් ඔවුන් විමසා සිටියේ මෙම ඉඩම මිලදිගෙන ගොඩනැගිල්ල සැදිමට මුදල් යෙදවූයේ බැසිල් රාජපක්ෂ මහතාද යන්නයි. ඊට පිළිතුරු දෙමින් පැමිණිලිකරු කියා ඇත්තේ මෙම ඉඩම මිලදි ගැනිමට ඔහුගේ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ තැන්පත් කර තිබු මුදලින් චෙක්පතක් මගින් මුදල් ගෙවා මෙම ඉඩම මිලදි ගත් බවත් සාදන ලද ගොඩනැගිල්ලට මුදල් යෙදවූයේ මුදිත ජයකොඩි බවත්ය. නමුත් එම කරුණු පිළිනොගෙන බැසිල් රාජපක්ෂ මහතා අත් අඩංගුවට ගෙන පූගොඩ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත නඩු අංක බි 8674/15 යටතේ ඉදිරිපත් කර ඇත. 2016.10.17 වන දින පැමිණිලිකරු මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට කැදවා වැඩිදුර ප්‍රකාශයක් ලබාගෙන දෙවන සැකකරු වශයෙන් අධිකරණයට ඉදිරිපත් කර එදිනම රුපියල් 50000 ක මුදල් ඇපයක් හා රුපියල් ලක්ෂ 10 ක් බැගින්වූ ශරිර ඇප දෙකක් මත මුදා හැර ඇත.

පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ 2012 සිට 2015 දක්වා තක්සේරු වර්ෂ සදහා ජයකොඩි යන අය විසින් රජයට බදු ගෙවූ බව පිළිගෙන ඇති නමුත් මෙම ගොඩනැගිල්ල ඉදිකිරිම සදහා ඔහුගේ මුදල් යෙදවූයේ නැති බව සදහන් කරමින් 2016.04.22 වන දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට ප්‍රකාශයක් දි ඇති බවයි.තවද 2016.07.25 වන දින ඔහු විසින්ම දේශිය ආදයම් කොමසාරිස්තුමිය වෙත ලිපියක් යවමින් ඔහුගේ මුදල් වලින් නිවස සැදිම සිදු නොකල බවත් ඒ සදහා වෙනත් පාර්ශවයක් මුදල් යෙදවූ බවත් ඔහු විසින් ගෙවන ලද බදු මුදල නැවත ගෙවිමට කටයුතු කරන මෙන් ඉල්ලිමක්

කර ඇත. නමුත් 2015.06.05 වන දින මුදිත ජයකොඩි යන අයම දේශිය ආදායම් කොමසාරිස්තුමිය වෙත ලිපියක් යවමින් දන්වා ඇත්තේ මෙම ගොඩනැගිල්ල සෑදිම සඳහා තමා මුදල් යෙදවූ බවයි.

පූගොඩ මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක බි 8674/15 නඩුවට අදාල විමර්ශන කටයුතු අවසන් කර උධෘත ගරු නිතිපති තුමා වෙත යොමු කිරිමෙන් අනතුරුව 2017.03.07 වන දින නිතිපති තුමා විසින් ගම්පහ මහාධිකරණයේ නඩු අංක 26/17 යටතේ නඩු පවරා අධිචෝධනා ගොනු කරන ලද බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි. එහි වූදිතයින් වශයෙන් දක්වා ඇත්තේ බැසිල් රාජපක්ෂ මහතා සහ පැමිණිලිකරු වන තමා බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරයි.මෙම මහාධිකරණ නඩු අංක 26/17 නඩුවට අදාල අධිචෝදනා පත්‍රයේ සඳහන්ව ඇත්තේ 2011 අංක 40 දරණ මුදල් විශුද්ධීකරණය වැලැක්විමේ පනතින් සංශෝධිත 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැලැක්විමේ පනතේ වගන්ති අංක 5(2) සමග කියවිය යුතු එකි පනතේ 5(1) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදවල් සිදු කර ඇති බවටයි. පැමිණිලිකරු තම ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ මෙම නඩුවට අදාල ලේඛන ගොණුවේ අන්තර්ගතව ඇති මුදිත ජයකොඩි විසින් දේශිය ආදායම් කොමසාරිස් තුමියගෙන් ඔහු ගෙවන ලද බදු මුදල් නැවත ගෙවන ලෙස ඉල්ලා යවන ලද ලිපිය ගරු අධිකරණයේදි තම නිතිඥයා හරහා ඉල්ලා සිටියද එය හිතා මතාම ලබා නොදුන් බවයි. පැමිණිලිකරු ඊට හේතුව වශයෙන් දකින්නේ එම ලේඛනය ඔහුට වාසි සහගත වන නිසා එලෙස සිදු කල බවයි.

පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ කැබිනට් අනුමැතියකින් කමිටුවක් පත් කර මුදිත ජයකොඩි යන අය අකුරගොඩ ත්‍රිවිධ හමුදා මූලස්ථානයේ

ගොඩනැගිල්ල සැදිමේ උපදේශක වරයෙකු වශයෙන් කටයුතු කිරිමත් ඔහුට ගෙවන ලද මුදල් සහ ගොඩනැගිල්ල සැදිමට වැයවූ මුදල් සම්බන්ධව පරික්ෂණයක් පවත්වා ඉදිරිපත් කරන ලද වාර්තාවේ පිටපතක් තමා එවක ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් වරයා සහ කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා සිටියද එය නොලැබුන බවයි. එසේ හෙයින් තොරතුරු දැනගැනිමේ පනතින් ස්ථාපිත කරන ලද තොරතුරු දැනගැනිමේ අයිතිවාසිකම් පිළිබද කොමිෂන් සභාවෙන් එම වාර්තාව ලබා ගැනිමට ඉල්ලිමක් සිදු කර ඇත. පැමිණිලිකරුගේ ප්‍රකාශයේ සදහන්ව ඇත්තේ මෙම ඉල්ලිමට නිතිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් රජයේ නිතිඥ සුරේන් ඥානරාජ් විරෝධතාවයක් දැක්වූ බවත් ඊට හේතුන් වශයෙන් ඥානරාජ් මහතා කියා ඇත්තේ මෙම ගණුදෙනුව සම්බන්ධව විමර්ශනයක් කමිටුවක් මගින් සිදු කර ඇති බවත්, එම කමිටුව නිතිපති දෙපාර්තමේන්තුවෙන් නඩු පැවරිම සම්බන්ධව උපදෙස් ඉල්ලා ඇති බවත්, පැමිණිලිකරු විසින් ඉල්ලා ඇති ලේඛන ලබා දුනහොත් මෙම ඉදිරිකටයුතු වලට අවාසිදායක තත්වයක් ඇතිවිය හැකි බවත්ය. තවද නිතිපති දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධව විශේෂ වාර්තාවක් සකසන බවත් එම වාර්තාව ලබා දුනහොත් දෙපාර්තමේන්තුවට අගතිදායක තත්වයක් ඇතිවන බවත් කියා ඇත. කෙසේවෙතත් තොරතුරු දැනගැනිමේ කොමිෂන් සභාව මගින් පැමිණිලිකරුගේ ඉල්ලිමට අනුව වාර්තාව ලබා දුන් බව ඔහුගේ ප්‍රකාශයේ සදහන් කර ඇත.

පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ නීතිපති දෙපාර්තමේන්තුව මෙසේ ක්‍රියා කිරිම මගින් ඔහුගේ මුලික අයිතිවාසිකම් කඩවන අයුරින් කටයුතු කර ඇති බවත් ඔවුන්ගේ අරමුණ වන්නේ හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාට විරුද්ධව කටයුතු කර එමගින් යහපාලන

රජයේ දේශපාලන පළිගැනිමේ ක්‍රියාවලියට අනුගතව කටයුතු කිරිමත්ය. පැමිණිලිකරු කොමිෂන් සභාවට පෙන්වාදෙන්නේ හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා ඉලක්ක කොටගෙන පසුගිය යහපාලන රජය සමයේ දේශපාලන දඩයමක් කරගෙන ගිය බවත් මෙම පැමිණිල්ලට සම්බන්ධ මහාධිකරණ නඩු අංක 26/17 ට විෂයගතවු සිදුවිම් පවා දේශපාලනීකරණයවී ඇති බවයි. පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ ඔහුට සිදු වුනු දේශපාලන පළිගැනිම සම්බන්ධව පරික්ෂා කර විශේෂයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නිළධාරින් දේශපාලන පළිගැනිමේ ක්‍රියාවලියට අනුගත වෙමින් කටයුතු කිරිම සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග සහ නිර්දේශ ලබාදෙන ලෙසටය.

24/11/2020

2020.11.24

2020/11/24

## 10 .III

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 956/2020 |
| පැමිණිලි කරු | - | ජයවර්ධන මුදියන්සේලාගේ භද්‍රානි ජයවර්ධන |
| ලිපිනය | - | අංක: 25/65, තුන්වෙනි පියවර, අනුරාධපුර |

## නිර්දේශ

පැමිණිලිකාරියට කොළඹ මහා නගර සභාවේ සේවයට වාර්තා කිරීමට ඉඩදීමටත්, 2015.01.14 දින සිට ඇයගේ සේවය ගනනය කර විධිමත් පරිදි මහා නගර සභාවෙන් නිදහස් කර ඇයගේ විශ්‍රාම වැටුප සකස් කර ගැනීමට අවකාශය සලසා දීමටත් අවශ්‍ය පියවර ගතයුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකාරිය විසින් ගරු කොමිෂන් සභාව වෙත කරනු ලැබූ පැමිණිල්ලට අදාලව කොමිෂන් සභාවේ විමර්ශන අංශයට 2020.09.23 සහ 2020.09.08 දින ප්‍රකාශ ලබා දී ඇත.

පැමිණිලිකාරියගේ ප්‍රකාශයට අනුව ඇය පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුලත්වී කළා විෂය හදාරා ගෞරව උපාධිය ලබා ගෙන 1987 වර්ෂයේ උපාධිධාරී ගුරුවරියකු වශයෙන් රාජ්‍ය සේවයට එක්වී

ගුරුවරියක් වශයෙන් කටයුතුකර ඇත. පැමිණිලිකාරිය 1991.04.19 වන දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර ප්‍රදේශිය ලේකම්වරියක් වශයෙන් පත්වීම් ලබා අනතුරුව අනුරාධපුර සහකාර ඉඩම් කොමසාරිස්, අනුරාධපුර නගර සභාවේ ලේකම්, අනුරාධපුර ගොවිජන සේවා කොමසාරිස්, උතුරු මැද පළාත් සමුපාකාර කොමිෂන් සභාවේ ලේකම්, උතුරු මැද පළාත් පළන කොමසාරිස් වශයෙන් කටයුතු කර, 2007 වර්ශයේ ජූලි මාසයේ පමන සිට කොළඹ මහ නගරසභාවේ නාගරික ලේකම් වශයෙන් පත්විම ලබා ඇත. ඇය 2008 වර්ෂයේ මැද භාගයේ බස්නාහිර පලාත් පාලන කොමසාරිස්වරිය වශයෙන් රාජකාරි කටයුතු කර, පසුව කොළඹ නගර සභාවේ නාගරික කොමසාරිස් විශ්‍රාම ගිය පසු 2008.09.22 වන දින එම තනතුරේ ස්ථිර වි නාගරික කොමසාරිස්වරිය වශයෙන් කටයුතු අරම්භ කර එහි 2015.01.14 වන දින දක්වා සේවය කර ඇත. පැමිණිලිකාරිය ප්‍රකාශ කරන්නේ එවකට සිටි ආණ්ඩුකාරවරයාගේ නියෝගය මත ඇය ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර එහි 2019.12.31 දක්වා රාජකාරි කර, 2020.01.01 වන දින සිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත්විම ලබා එහි 2020 05.11 වන දින දක්වා සේවය කර, 2020.05.12 වන දින සිට අභ්‍යන්තර වෙළඳ ආහාර සුරක්ෂිතාවය සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය ලේකම්වරිය වශයෙන් පත්වීම් ලැබ මේ දක්වා කටයුතු කරන බවයි.

පැමිණිලිකාරිය හට නාගරික කොමසාරිස්වරිය වශයෙන් පැවරි තිබු රාජකාරි නම් කොළඹ මහනගර සිමාව තුල ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය සහ වැසි ජල අපවහන කළමනාකරණය ,බෝවන රෝග නිවාරණය ඇතුලු පලාත් පාලන ආයතනයට පරිපාලන ප්‍රධානි

ලෙස කටයුතු සිදු කිරිමත්, මහනගර සභා අඥා පනත 170 යටතේ සියලුම කාර්ය මණ්ඩලය පාලනය කිරිම හා 254 වගන්තිය යටතේ ආදායම් එකතු කිරිම හා නගර සභාව යටතේ ඇති අනෙකුත් පහසුකම් හා සුභ සාධන කටයුතුය. තවද මහජන ජන්දයෙන් පත්වන මහජන නියෝජිතයන් හැර අනෙකුත් සියලුම නිළධාරින් ඇය යටතේ රාජකාරි කල බවත් ඔවුන්ගේ සුභසාධන කටයුතු හා අනෙකුත් සේවාවන් ඇය හට පැවරි තිබූ රාජකාරිවේ.

පැමිණිලිකාරිය වැඩබලන කොමසාරිස්වරිය වශයෙන් කටයුතු කරන අවස්ථාවේ එවකට මෙරට බලයේ සිටියේ ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයක් වූ නමුත් කොළඹ මහානගර සභාවේ පාලනය එක්සත් ජාතික පක්ෂය සතුව තිබී ඇත. ඇය විසින් මධ්‍යම රජයේ සහ පලාත් සභාවේ නියෝග සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේ දි කොළඹ මහා නගර සභාවේ පාලක පක්ෂයෙන් තර්ජන හා අපහස කිරිම්, මාධ්‍ය මගින් හා විවිධ බාධා කිරිම් සිදු වී ඇති අතර ඊට හේතුව වූයේ ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එවකට ආරක්ෂක හා නාගරික සංවර්ධන ලේකම්වරයා වශයෙන් කටයුතු සිදු කිරිම නිසා බව සඳහන් කරයි.

ඇය මෙසේ සේවය කරමින් සිටින අවස්ථාවේ 2015 ජනාධිපතිවරණය පැවැත්වූ අතර එහිදි මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා තේරීපත්වි 2015.08.09 වන දින දිවුරුම් දුන් දී ඇති අතර එම දිවුරුම් දිමට අදාල උත්සව කටයුතු සදහා නගර සභාව මගින් සිදුවිය යුතු සියලුම කටයුතු ඇයගේ අධික්ෂණය යටතේ සිදු කර ඇත. එසේ ආණ්ඩුව පත් වීමෙන් පසු එවකට නගරාධිපතිව සිටි ඒ.ජේ.මුසම්මිල් මහතා විසින් රනිල් වික්‍රමසිංහ මහතා වෙත ඇය ජනාධිපතිවරණයේ දි අතිගරු මහින්ද

රාජපක්ෂ මහතාගේ දේශපාලන කටයුතු වලට ප්‍රසිද්ධියේ මැතිවරණ නිති රිති උල්ලංඝණය කරමින් කටයුතු කල බව සඳහන් කරමින් පැමිනිල්ලක් යොමු කිරිමට කටයුතු සිදු කරන බව ඇය හට විශ්වාසවන්ත අයෙකුගෙන් දැන ගැනිමට ලැබී ඇත. පැමිණිලිකාරිය 2015.01.13 වන දින අති උතුම් පාප් වහන්සේ ලංකාවට පැමිනිමේ උත්සවයට අදාල රාජකාරිවල නිරතව ඇති අතර උන් වහන්සේගේ දේව මෙහෙය 2015.01.14 වන දින අවසන් විමෙන් අනතුරුව නගර සභාවේ රාජකාරියට වාර්තා කර නැවත පාප් වහන්සේගේ රාජකාරි සිදුකරමින් සිටියදි ආණ්ඩුකාරතුමාගෙන් ලියුමක් ලැබී ඇති අතර එහි ආණ්ඩුකාරතුමා දැනුම් දි තිබුණේ නගරාධිපතිවරයා විසින් යොමු කොට ඇති පැමිනිල්ල සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් පැවැත්විමට තිරණය කර ඇති බවත් එතෙක් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කරන බවත්ය.

පැමිණිලිකාරියට දැන ගැනීමට ලැබී ඇත්තේ ඇයට විරුද්ධව පෙත්සමක් නාගරික ලේකම් ජානකී යන අය විසින් පරිගනක කර නගරාධිපතිවරයාට දුන්බවත් එය ඔහු විසින් ආණ්ඩුකාරවරයාට ලබාදුන් බවය. පැමිණිලිකාරිය 2015.01.14 දින පැමිනීම සටහන් කර ඇයගේ නිල කාමරයට පැමිනියත් ස්වල්ප වේලාවකින් ඇයට යන්න සිදුවූ හෙයින් ඇයගේ අත්බෑගයේ තිබූ කුඩා පර්ස් එක අත්බෑගයට දාගැනීමට නොහැකිවී තිබී ඇති අතර, පැමිණිලිකාරිය සඳහන් කරන්නේ ඇය වෝග් ජුවලර්ස් වෙත ගෙන යාමට තිබූ කැඩුනු රන් මාලයක්, කරාබු 5ක්, කුඩා රන් සූරයක කොටසක් සහ රුපියල් 1500000.00 ක් මුදලක් එහි තිබූ බවය. එය නැවත ඇයට ලබා දීමට කටයුතු කර නැත. ඒ පිටව යාමෙන් පසු ඇය මහා නගර සභාවට ගොස් ඇත්තේ 2017 හෝ 2018 වසරේ කුරුදුවත්ත පොලීසියේ

නිලධාරින් සමගනි. මේ සම්බන්ධව කාර්යාල කාර්ය සහායක රංජිත් ගෙන් පොලීසිය විමසා ඇත. ඔහු පවසා ඇත්තේ 2015.01.15 වන දින උදේ නිල කාමරයේ ඇති දොරවල් දෙකම විවෘත කර නාගරික ලේකම් එච්.ඩී.සී.ජානකී මිය සහ සහකාර නාගරික කොමසාරිස් ශාලිකා එස්.රණවීර මිය විසින් තවත් සේවකයන් යොදාගෙන කාමරයේ තිබුනු ලිපිගොනු ඇතුළු බඩු නාගරික ලේකම් එච්.ඩී.සී.ජානකී මියගේ නිල කාමරයටත් සහකාර නාගරික කොමසාරිස් ශාලිකා එස්.රණවීර මියගේ කාර්යාලයටත් රැගෙන ගිය බවය.

පැමිණිලිකාරියගේ ප්‍රකාශය පරිදි ඇය යටතේ සේවය කල පුනාය කොමසාරිස්වරයා වන වී.කේ.ඒ. අනුර මහතා විසින් නාගරික කොමසාරිස් තනතුරේ වැඩභාර ගෙන ඇති අතර නගරාධිපති ඒ.ජේ.එම්.මුසම්මිල් මහතා පත්වීම් ලිපිය ඔහුගේ ලිපි ශීර්ෂය සහිත ලිපියකින් දී ඇත. පත්කිරීම් ලිපිය නගරාධිපතිවරයාගේ ලිපි ශීර්ෂයෙන් තිබුනද පසුව ප්‍රධාන ලේකම් කාර්යාලයට ලැබුනු පිටපතක් අනුව ඔහුට ආණ්ඩුකාරවරයා විසින් දෙන ලද පත්වීම් ලිපියක පිටපතක් ඇයට ලැබී ඇත. පැමිණිලිකාරිය ප්‍රකාශ කරන්නේ එම ලිපියත් ඇයට දුන් ලිපියත් කූඨ ලෙස සකස් කල ලේඛනය බවයි.

2015.01.16 වනදා සිට නව ආණ්ඩුකාරවරයා ලෙස මංගල සමරවීර ඇමතිවරයාගේ හිටපු ලේකම්වරයෙක්වූ කේ.සී. ලෝගේෂ්වරම් යන අය පත්වී පැමිණ ඇත. පැමිණිලිකාරියට සේවයට වාර්තා කිරීම ඉඩ නොදීමද යහපාලන රජය විසින් පසුගිය රජයේ සිටි දේශපාලනඥයන් හා ඇතැම් නිලධාරින් සම්බන්ධව ද්වේශසහගත ලෙස ප්‍රකාශ නිකුත් කිරීම ඇය දැඩි ලෙස රාජකාරි වශයෙන් අවිනිශ්චිතතාවයකට

පත්කොට ඇත. සේවයට වාර්තා කිරීමට ඉඩනොදීමත් කූඨ ලේඛනයකට අනුව කර ඇති අනුයුක්ත කිරීම අවලංගු කර ඇති බැවිනුත් නිසි නියෝගයක් කිසිවකු ලබා නොදුන් බැවිනුත් ඇය ප්‍රධාන ලේකම් හමුවී රැකියාව ආරක්ෂා කරගැනීම සඳහා 2015.01.26 දින සිට ප්‍රධාන ලේකම් කාර්යාලයේ තාවකාලික සේවකයන්ගේ පොතේ 2019.12.31 දිනය දක්වා වසර 05ක් පමන පැමිනීම සහ පිටවීම අත්සන් කර තිබේ. පැමිණිලිකාරියට ලබාදී තිබුනේ ප්‍රධාන ලේකම් කාර්යාලයට තාවකාලික අනුයුක්ත කිරීමක් බවත්, ඇයට වාඩිවීමට අසුනක් පවා එහි නොතිබූ බවත්, ඇයට වසර දෙකක් පමන වැටුප් දී නැති බවත්, ඇයගේ එදිනෙදා කටයුතු කරගැනිම සඳහා ඇයට රුපියල් ලක්ෂ 50ක් පමන ණය ගැනීමට සිදුවුනු බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කරයි.

තවද, 2018 දී ඇයට රජයෙන් ලබා ගැනීමට තිබූ වාහන ආනයන බලපත්‍රය අහිමි කර ඇති අතර ඇයට වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම නවත්වා ඇත. ඇයට රාජකාරි හෝ පුද්ගලික විදේශ ගමන්, විදේශ හා මෙරට පුහුණුවීම්ද නවත්වා ඇත. පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත්තේ වර්තමාන ජනාධිපතිතුමා ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කරන කාලයේදී එතුමාගේ නියෝග මත කල නාගරික සංවර්ධන වැඩසටහන් කල බවය. නගරාධිපති මුසම්මිල් මහතා ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාට සහාය දක්වමින් රටපුරා මැතිවරන වේදිකාවල සිංහල සහ දෙමළ භාෂාවෙන් කථා පැවැත්වූ බවත් නගර සභාව සතු වාහන, කොඩි සහ කොඩි කණු මෙන්ම පිට්ටනි එම පක්ෂයේ කටයුතු වලට දුන් බවයි. පැමිණිලිකාරියට විරුද්ධව නගරාධිපතිවරයා විසින් කර තිබුන පැමිනිල්ල පරීක්ෂා කිරීම සඳහා මූලික විමර්ශන නිලධාරි ලෙස බී.ජ්.ඩබ්.අබේවර්ධන මහතා පත්

කර තිබුනු බවත් ඔහු පත් කිරීමට වී.කේ.ඒ. අනුර මහතා සහ ජානකී කටයුතු කර ඇති බව ඇයට ආරංචි වූ බැවින් ඇය ආණ්ඩුකාර ලෝගේෂ්වරම් මහතා හමුවී එම විමර්ශන නිලධාරියා පරීක්ෂනය පවත්වනවා විරුද්ධ වී ඇත. පසුව ලෝගේෂ්වරම් මහතාගේ නිවස ලග පදිංචි ඔහුගේ මිතුරෙක් වන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරි අවුරුදු 70 ක් පමන වයස වන පී.පරමලිංගම් මහතා පත්කල බවත්, ඒ මහතා ඔහුට පක්ෂග්‍රාහිව කටයුතු කරමින් ඇය වැරදිකරුවෙකු කරන්න අවශ්‍ය ලේඛන සකස් කල බවට චෝදනා කරයි.

පැමිණිලිකාරියට විරුද්ධ චෝදනා පත්‍රයේ 1 වන චෝදනාව පූජ්‍ය අතුරලියේ රතන හිමියන්ට 2014.11.12 වන දින රැස්වීමක් පැවැත්වීම සදහා හයිඩ්පාක් පිටිය ඇය විසින් ලබා නොදීම, 2 වන චෝදනාව සහකාර නාගරික කොමසාරිස් ශාලිකා එස් රණවීර මිය රාජකාරි ඉටුකරමින් සිටි ක්‍රීඩා අධ්‍යක්ෂක තනතුරෙන් ඉවත් කිරීම, 03 වන චෝදනාව අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ඡායාරූපය ඉවත් නොකිරීම තුලින් තැපල් ඡන්ද පැවැත්වූ 2014.12.23 සහ 2014.12.24 යන අනෙක් අපේක්ෂකයනට අවාසියක් වූ බවත්, 04 වන චෝදනාව 2013 වසරේ පොදු රාජ්‍ය මණ්ඩල නායකයන්ගේ සමුළුව සදහා ඔවුන් ගමන් ගන්නා මාර්ගවල යුධ හමුදාවේ ඉංජිනේරු අංශයේ ශ්‍රමය නොමිලේ ලබාගෙන මහා නගර සභාව විසින් අනුමත කරන ලද මිල ගනන් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාගෙන බස් මගී ආවරන ඉදිකිරීමේදී යුධ හමුදාවට මුදල් දීම පිළිබදව වේ. පැමිණිලිකාරිය ඇයට විරුද්ධ චෝදනා පත්‍රය සකස් කර තිබෙන්නේ කූඨ ලේඛන මත බව ප්‍රකාශ කරයි තවද මුල් පිටපත් නොමැතිව ආයතන සංග්‍රහය අනුව චෝදනාපත්‍ර සකස් කල නොහැකි බව පෙන්වා දී ඇත. මෙම

පරීක්ෂනය නිවැරදි සහ අපක්ෂපාති ලෙස නොකිරීමෙන් පැමිණිලිකාරියට විශ්‍රාම ගැනීමට නොහැකිව අවිනිශ්චිතභාවයට පත්ව ඇතැයි කියා සිටී.

මෙම පරීක්ෂණයෙන් පැමිණිලිකාරිය වරදකරු කිරීමට නොහැකි බව තේරුම්ගත් කොළඹ මහා නගර සභාවේ නගරාධිපතිවරයා ජානකී සහ ශාලිකා සමග එකතුවී ඇය වාහන අවභාවිතා කල බව පොදු දේපල පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලිකොට ඇත. පසුව ඇයව කොමිෂම හමුවට අංක BC755//2014(B-141) 2017.11.17 දින ලිපියෙන් කොමිෂම හමුවට දින ගනනාවක් කැදවා අපහාස කර මහා නගර සභාවේ වාහන අවභාවිතා කලබව පිළිගන්නා ලෙස තර්ජනය කලේ යැයි ප්‍රකාශ කරයි. පරීක්ෂණයට ගියවිට ඇයට දැනගන්නට ලැබී ඇත්තේ 2014.05.20 දින සිට ශාලිකා භාවිතා කල WPKA-9974 Toyota Corolla මෝටර් රථය සහ ඇයගේ නිල රථය යන වාහන දෙකම භාවිතා කල බවට පැමිනිල්ලක් විභාග කරන බව. නමුත් ඇය සඳහන් කරන්නේ විදේශ ගමන් බලපත්‍රය අනුව ඇය 2014.05.18 දින සිට සති 02 ක පමන කාලයක් මැලේසියාව සහ සිංගප්පූරුවේ අධ්‍යාන කටයුතු සදහා ගොස් සිටි බවයි. පැමිණිලිකාරියට කල මානසික පීඩනය නිසා ඇය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද පනතට අනුව කොළඹ මහා නගර සභාවෙන් එම ලිපි දෙකේ මුල්පිටපතෙන් සහතික කල පිටපත් දෙකක් ඉල්ලා අභියාචනයක්ද කර පසුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද කොමිෂන් සභවටද අභියාචනා කර ඇත. එම කොමිෂන් සභාව 2019.01.11 දින අංක RTIC appeal 553/18 ලිපියෙන් පැමිණිලිකාරිය දැනුවත් කර කොළඹ මහා නගර සභාවට එකී ලිපි සහතික කර ලබා දෙන ලෙස දැන්වුවද. ඒගැන වාර

කිහිපයක් විමසා සිටියද අද දක්වා එම කොමිෂම වෙත ජානකී සහ ශාලිකා ඉදිරිපත් කල ලේඛන සහතික කර පැමිණිලිකාරිය වෙත ලබා දී නොමැත.

පැමිණිලිකාරියට රැකියා ස්ථානය වන කොළඹ මහා නගර සභාවට ඇතුල්වීමට ඉඩ නොදීම හේතුවෙන් ඇයගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීම නිසා ඇය 2015.02.11 දිනැති අයදුම් පත්‍රයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කල බවත්, එම පැමිනිල්ල සඳහා පළාත් පාලන කොමසාරිස් චන්ද්‍රානී සමරකෝන් මහත්මිය සහ ප්‍රධාන ලේකම්ගේ නීති නිලධාරිනිය විසින් කොමිෂන් සභාව නොමග යවමින් මෙම අපරාධය සැගවීමට දෙන ලද පිළිතුරු දුන් බව චෝදනා කරයි. තවද, රාජකාරි සහ පුද්ගලික වශයෙන්ද පැමිණිලිකාරිය භාරයේ තිබූ දේපල ගැන සොයා බැලීමක් පළාත් පාලන ලේකම් එම්.ඒ.බී.ඩී. සෙනරත් මහතා විසින් නොකල බැවින් ඇය පැමිනිල්ලක් කිරීමට දින 04 ක් කුරුදුවත්ත පොලීසියට ගිය බව ප්‍රකාශයේ සඳහන්ව ඇත. පැමිණිලිකාරිය 2015.03.30 වන දින අංක 75/249/MOIB අංකය යටතේ පොලීසියේ පැමිනිල්ලක් කොට මාසයකට පමන පසු කුරුදුවත්ත පොලීසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක හේරත් මහතා ඇයගේ ජංගම දුරකථන අංකය අමතා පොලීසියට පැමිනෙන ලෙස දැන්වූ බවත් එහි ගිය අවස්ථාවේදි පොලිස් පරීක්ෂක හේරත් මහතා කියා ඇත්තේ මෙයට සම්බන්ධ නිලධාරින් සහ සේවකයන් රිමාන්ඩ් කිරිමට සිදු බවයි. දැන් ආණ්ඩුව වෙනස් වෙලා තියෙන්නේ රනිල් වික්‍රමසිංහ මහත්තයා අගමැති මේ පරීක්ෂනය දිගට කරන්නත් බෑ මේකට සම්බන්ධ අය රිමාන්ඩ් කරන්න නොහැකි ඒ නිසා පැමිනිල්ල ඉල්ලා අස්කරගන්න පැවසුවේ

යැයි පැමිණිලිකාරිය චෝදනා කරයි. නමුත් ඇය එම පැමිනිල්ල ඉල්ලා අස්කරගෙන නොමැත.

මෙලෙස පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් අඛන්ඩව කඩකිරීම හේතුවෙන් ඒවා වළක්වා ගැනීම සඳහා ඇය ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සම් අංක 248/2015 නඩුව 2015 ජූනි මාසයේදී පමන පවරා ඇත. පැමිණිලිකාරිය 2015 අප්‍රේල් මාසයේ දිනක තිඹිරිගස්යායේ පිහිටි අභයාරාමය පන්සලට ගියවිට ආණ්ඩුකාර අලවි මවුලානා මහතාද පන්සලේ සිටියදී හමුවූ බවත්, එතුමාගේ අත්සන ව්‍යාජව සකස් කල ලිපියක් හේතුවෙන් පැමිණිලිකාරිය හිරිහැර වලට ලක්වන බව දැනගත් අලවි මවුලානා මහතා ඒ ගැන සඳහන් කර ඇයටත් කේ.සී. ලෝගේෂ්වරම් ආණ්ඩුකාරයාටත් දිවුරුම් ප්‍රකාශයන් දෙන බව කියා ඇත. මෙම දිවුරුම් ප්‍රකාශය ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 248/2015 නඩුවට ගොනු කර ඇත.

පසුව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පැමිණිලිකාරියට වැටුප් ගෙවන ලෙස ප්‍රධාන ලේකම්ට නියෝග කල නමුත් නිවැරදි වැටුප් විස්තරය ලබාදීම මගහැර ඇත. මේ අතර ප්‍රධාන ලේකම් කාර්යාලයේ රැදී සිටිමින් පැමිණිලිකාරිය කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ රාජකාරි ඉටු නොකර සිටීම පිළිබඳව කොළඹ නගරයේ ප්‍රජා නායකයන් විසින් ඇය ඇතුළු කීපදෙනෙකුට විරුද්ධව අභියාචනාධිකරනයේ පවරන ලද නඩුවේ වගඋත්තරකරුවෙකු කිරීම හේතුවෙන් ඇය අවශ්‍ය නීතිඥ සහාය ලබාදීම සඳහා කොළඹ මහා නගර සභාව වෙත 2015.05.08 දින අංක CSO/ADM/10/44/1/03 සදහා එම සභාවෙන් ගෙවන ලෙස දන්වා ඇත.

පැමිණිලිකාරිය සදහන් කර ඇත්තේ ජානකී නැමැත්තිය දේශපාලන උදව් උපකාරයෙන් ඇයට නැවත මහා නගර සභාවට පැමිනීමට ඇති ඉඩ අවුරමින් ඇය විසින් කණ්ඩායමක් සමග එකතුවී කරන ලද වංචා සගවාතබා ගැනීමට උත්සාහ දරා ඇති බවත්, මෙම කටයුත්තට දායකත්වය දෙන ලද ශාලිකා එස් රණවීර යන අය යුක්ත කූඨ ලේඛන ඉදිරිපත් කරමින් පැමිණිලිකාරියට විරුද්ධ කටයුතු කර ඇති බවයි. පැමිණිලිකාරිය 2016 වසරේ සිට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද පනතේ විධිවිධාන අනුව කටයුතු කල බැවින් ඇයට විරුද්ධව කූඨ ලේඛන සහ ව්‍යාජ ලේඛන උපයෝගී කරගෙන ඇයටත්, සැමියාටත් සහ දරුවන්ටත් අගතියක් කර ඇති බව වටහාගත් බව කියයි. නමුත් තවමත් ඇයට සාධාරණයක් වී නොමැති බවත්, ඇයට විරුද්ධව සාවධ්‍ය චෝදනා කර ඇති බවත් ප්‍රකාශ කරයි.

ඒ නිසා පැමිණිලිකාරිය ගරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ කූඨ ලේඛන හා ව්‍යාජ සාක්ෂි සකස් කිරීමට දායකවූ සහ එකී පරීක්ෂනය කිරීම වළක්වා ඇති පුද්ගලයින් කොමිෂන් සභාව ඉදිරියට ගෙනවිත් සත්‍ය අනාවරණය කර ඇයගේ නිත්‍ය සේවා ස්ථානය වන කොළඹ මහා නගර සභාවේ සේවයට වාර්තා කිරීමට ඉඩදීමත්, 2015.01.14 දින සිට ඇයගේ සේවය ගනනය කර විධිමත් පරිදි මහා නගර සභාවෙන් නිදහස් කර ඇයගේ විශ්‍රාම වැටුප සකස් කර ගැනීමට පැමිණිලිකාරියට සහනයක් ලබා දෙන ලෙසය.

24/11/2020

Chula Fernando

10 .IV

පැමිණිලි අංකය - 571/2020

පැමිණිලි කරු - ජයසූරිය ආරච්චිගේ රෝහණ ප්‍රදිප් ජයසූරිය

ලිපිනය - අංක 187, පරකන්දෙණිය,ඉඹුල්ගොඩ

## නිර්දේශ

පැමිණිලිකරුට අසත්‍ය චෝදනා එල්ල කර ඔහුට එරෙහිව නඩු පැවරීමට ක්‍රියා කළ පුද්ගලයින්ට එරෙහිව නිසි අධිකරණයේ නඩු පැවරීම.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලි කරු විසින් 2020.02.10 වන දිනැතිව ගරු කොමිෂන් සභාව වෙත කරනු ලැබූ පැමිනිල්ල සහ කොමිෂන් සභාවේ විමර්ශන අංශයට 2020.08.21 සහ 2020.09.08 දින ප්‍රකාශ ලබා දෙමින් තමා ලක්වූ දේශපාලන පළිගැනිම සම්බන්ධව කරුණු දක්වා තිබේ. පැමිණිලිකරු 1995.10.17 වන දින ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ ගිණුම් ලිපිකරු ලෙස පත්වීමක් ලැබ වෘත්තිය පුහුණු අධිකාරියට එක්වී ඇත. 2006 ජුලි මාසයේදි වෘත්තිය පුහුණු අධිකාරියේ සභාපති වෙත ජනාධිපති ලේකම්තුමා විසින් ලිපියක් එවා පැමිණිලිකරු වෘත්තිය පුහුණු අධිකාරියේ සේවයෙන් නිදහස් කර වැටුප් හා දිමනා වෘත්තිය පුහුණු අධිකාරියෙන් ගෙවිමේ පදනම මත ජනාධිපති ලේකම් කාර්යාලයේ සේවය සඳහා නිදහස් කරන ලෙස දන්වා ඇත.

පැමිණිලිකරු ජනාධිපති කාර්යාලයේ විශේෂ ව්‍යාපෘති අංශයේ සේවය කරන අතරතුර 2006.08.01 වන දින දිනැති ජනාධිපති සහකාර ලේකම් පාලනගේ ලිපිය මගින් ජනාධිපති පෞද්ගලික ලේකම් අංශයේ පරිපාලන නිළධාරි වෙත අනුයුක්ත කර ඇත.

ජනාධිපති පෞද්ගලික ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිටියදි 2015.01.08 වන දින පැවති ජනාධිපතිවරණයෙන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පරාජයට පත්විමෙන් පසුව 2015.01.09 දින එම අංශයේ සහකාර ලේකම් උපාලි ගමගේ මහතාගේ උපදෙස් පරිදි පෞද්ගලික කාර්ය මණ්ඩලයට එදිනම සේවයෙන් ඉවත්ව යන ලෙසට දන්වා ඇත. එහිදි පැමිණිලි කරුගේ පරිපාලන නිළධාරියා වන මංජුල හිරෝෂාන් මහතා විසින් කාර්ය මණ්ඩලයට අංශයේ ඇති මහජන ඉල්ලිම් සඳහා නිකුත් කරන ලද ලිපි පිටපත් කාර්යාලයේ ඉවත් කර ගන්නා ලෙස උපදෙස් ලබාදුන් බව පැමිණිලිකරු කියා සිටි. පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ එම ලේඛන ප්‍රථමයෙන් ඔහු සේවය කල අංශයේ නිලධාරින් රැදි සිටි මට්ටක්කුලියේ පිහිටි ලංකා ඛණිජ තෙල් නිතිගත සංස්ථාවට අයත් නිළ නිවාසයක රැගෙන ගියද පසුව මංජුල හිරෝෂාන්ද කුළි පදනම මත නැවති සිටි නො 187, පරකන්දෙනිය, ඉඹුල්ගොඩ යන පැමිණිලිකරුගේ නිවසට 2015.01.13 දින සවස් භාගයේ ඔහුගේ නිවසේ මිදුලට රැගෙන විත් දමා ඇත. එම අවස්ථාවේදි පැමිණිලිකරු හෝ ඔහුගේ පවුලේ කිසිවෙක් නිවසේ රැදි සිට නැත. පැමිණිලිකරු නැවත නිවසට පැමිණිමෙන් පසුව මංජුල මහතාගෙන් එම ලේඛන සම්බන්ධව විමසිම් කල බවත් ඔහු කියා සිට ඇත්තේ තෙල් සංස්ථා නිවසින් නිළධාරින්ට යන්නට කි බවත් ඒ නිසා එකී ලේඛන පසුව විනාශ කරන්න මෙම

ස්ථානයට ගෙන එන ලෙසත්ය. ඉන් අනතුරුව ඔහු මංජුල යන අයගේ පියාද සමගින් එම ලේඛන රැස් කර ගිණිතබා ඇති බවත් ප්‍රකාශයේ සදහන් කොට ඇත.

පසුව එදින රාත්‍රී 1100ට පමණ නිළ ඇදුමින් සැරසී සිටි පොලිස් නිළධාරින් කිහිප දෙනෙකු පැමිණිලිකරුගේ නිවසට පැමිණි බවත් ඔවුහු 'වැලිවේරිය පොලිසිය' යනුවෙන් සදහන් කර ඇති පොලිස් ජීප් රථයක පැමිණ ඇති බවත් ඔහු දැක ඇත. ප්‍රකාශයට අනුව එම පොලිස් නිලධාරින් විසින් මොනවාද ලොරියකින් රැගෙනවිත් ගිණිතබා විනාශ කලේ යැයි අසා සිටි බවත් ඊට ප්‍රතිචාර දක්වමින් පැමිණිලිකරු කියා ඇත්තේ ජනාධිපති පෞද්ගලික අංශයේ රාජකාරි පරිපාලන නිළධාරිතුමා කාර්යාලයෙන් ඉවත් කරන ලද ලිපි වල කාර්යාල පිටපත් ගබඩා කිරිමට ස්ථානයක් නොමැති නිසා මේ ස්ථානයට ගෙනවිත් දැමූ බව පැවසූ බවය. ඉන් පසුව පොලිස් නිලදාරින් විසින් එම ලිපි කවර පරික්ෂා කර ඇති අතර "වැඩක් නැති ඒවා නේද" කියා කී බවත්ය. පැමිණිලිකරු කියා සිටින්නේ ඉන් පසුව ගනේමුල්ල පොලිසියේ ජීප් රථයක් පැමිණි බවත් අනතුරුව වැලිවේරිය පොලිස් නිළධාරින් ඔහුගේ නිවසින් පිටව ගිය බවත්ය.

පසුව ගනේමුල්ල පොලිසියේ නිලධාරින් පැමිණිලිකරුගෙන් මේ පිළිබදව විමසා ඇති අතර පසුව එම ලිපි කවර පරික්ෂා කිරිමේදි එහි අගල් 05ක් පමණ පළල අඩියක් පමණ දිග රතු පාටින් මුද්‍රණය කරන ලද මිනිමරු කොටි සමග රුකඩ සිරිසේන යනුවෙන් ලොකු අකුරින් මුද්‍රණය කර ඇති අත් පත්‍රිකා 10ක් 15ක් පමණ වන ප්‍රමාණයක් සොයාගෙන ඇත. ඔවුන් විසින් පැමිණිලිකරුගෙන් මේ අත්පත්‍රිකා කොහෙන්ද කියා විමසා ඇති අතර මේ ලිපිකවර අද හවස ගෙනවිත්

දැමූ බවත් මෙහෙම පත්‍රිකා ඔහුගේ කාර්යාලයේදී නොතිබූ බවත් ප්‍රකාශ කොට ඇත. පැමිණිලිකරු සඳහන් කරන්නේ ඒ අවස්ථාවේදී එම නිළධාරින් තම ජ්‍යෙෂ්ඨ නිළධාරින් දුරකථනය ඔස්සේ සම්බන්ධ කර ගැනිමට උත්සහ කරන බව දුටු බවත් උදැසන වෙන තෙක් ඔහුගේ නිවසේ රැදී සිටි බවත්ය. උදැසන 0700 පමණ ඔවුන් මෙම පත්‍රිකා ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතාට අපහාසාත්මක ලෙස මුද්‍රණය කර ඇති බැවින් පැමිණිලිකරු සහ පරිපාලන නිළධාරිවරයා අත් අඩංගුවට ගෙන ගනේමුල්ල පොලිසිය වෙත රැගෙන ගොස් ඇත. එහිදී ඔවුන් දෙදෙනාගෙන් වෙන වෙනම ප්‍රකාශයන් සටහන් කර ගෙන 2015.01.14 දින පැය 03.30ට පමණ ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයට නඩු අංක බි. 101/2015 යටතේ ඉදිරිපත් කොට ඇත. ඔහු සහ අනෙක් පුද්ගලයා වෙනුවෙන් නිතිඥයින් විසින් ඇප ඉල්ලිමෙන් පසුව රුපියල් ලක්ෂයක ශරිර ඇප දෙකක් මත ඇප මත නිදහස් කොට ඇත.

ඉන් පසුව මෙම නඩුව වාර 05ක් පමණ ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග විමෙන් පසුව 2015.11.17 වන දින නිතිපති උපදෙස් ලැබිමෙන් පසුව ඔවුහු නිදොස් කොට නිදහස් කරන ලද බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජයග්‍රහණය සදහා ක්‍රියාකාරි දේශපාලන කටයුතු නිරත විම නිසා විශාල වශයෙන් දේශපාලන විරුද්ධවාදින් සිටි බවත් ප්‍රකාශ කර ඇත. ඔවුන් සියලු දෙනා පැමිණිලිකරුගෙන් පළිගැනිමේ අරමුණින් මෙම මඩ පොස්ටර් නිවසට දමන්න ඇති බව තම හැගිම යයි පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. මෙම බොරු චෝදනා එල්ල කරමින් අත් අඩංගුවට ගැනිමෙන් ඔහු දැඩි මානසික පිඩනයක් හා ගම්වාසින්ගේ අපහාසයට පත් වන ලද බවත්, ඔහුගේ බිරිද හා

දරුවන් දෙදෙනාද දැඩි මානසික කම්පනයකට පත් වූ බවත් ප්‍රකාශ කර ඇත. ගරු කොමිෂන් සභාවෙන් පැමිණිලිකරු ඉල්ලා සිටින්නේ මෙසේ බොරු චෝදනා එල්ල කරමින් ඔහුට සිදු වූ අපවාදයට හා මානසික පිඩනයටද, නඩු කටයුත්ත සදහා වියදම් වූ මුදල් පියවා ගැනිම සදහා ලක්ෂ 15ක වන්දියක් ලබා දෙන ලෙසත් සහ අතිගරු ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා යටතේ සම්බන්ධිකරණ තනතුරකට පත් කරන ලෙසත්ය.

10 .V

පැමිණිලි අංකය - 434/2020

පැමිණිලි කරු - ජයමාන්න මොහොට්ටිගේ නිමල්සිරි ලක්ෂ්මන්

ලිපිනය - අංක:40/03, පරණ පාර, වැතර, පොල්ගස්ඕවිට

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවේ විමර්ශන අංශයට 2020.07.15 සහ 2020.10.15 දින ප්‍රකාශ ලබා දෙමින් තමා ලක්වූ දේශපාලන පළිගැනිම සම්බන්ධව කරුණු දක්වා තිබේ. පැමිණිලිකරු 1982 වර්ෂයේ දි පේරාදෙණිය වෛද්‍ය පියයට සහ රුහුණු වෛද්‍ය පියයට ඇතුළත් වි වෛද්‍ය උපාධිය 1993 වර්ෂයේ දි සම්පූර්ණ කිරිමෙන් පසු 1994 වර්ෂයේ දි රජයේ වෛද්‍ය සභාවේ ලියා පදිංචි අංක 10668 යටතේ රජයේ වෛද්‍යවරයෙකු වශයෙන් පිඹුර දිසා රෝහලේ වෛද්‍යවරයෙකු වශයෙන් පත්විම් ලබා ඇත. ඉන් පසු ඔහු 1996 වර්ෂයේ දි වැතර දිසා රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරි ලෙසත්, 2000 වර්ෂයේ කොළඹ ජාතික රෝහලේ වෛද්‍ය දැඩිසත්කාර ඒකකයෙත්, 2004 වර්ෂයේ දකුණු කොළඹ ශික්ෂණ රෝහලෙ හදිසි අනතුරු අංශයෙත් 2010 වර්ෂයේ දි හෝමාගම ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි ලෙසත් සේවය කොට ඇත. ඉන් අනතුරුව 2014 වර්ෂයේ දි වැලිකඩ බන්ධනාගාරයේ ප්‍රධාන වෛද්‍ය නිළධාරි ලෙස ස්ථානමාරුවිම් ලැබ සේවය කොට ඇත.

පැමිණිලිකරු වැලිකඩ බන්ධනාගාර රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිළධාරි වශයෙන් පත් වී පැමිණීමත් සමග ඔහු යටතේ එම බන්ධනාගාර රෝහලේ වෛද්‍ය නිළධාරින් 18 දෙනෙකු සේවය කර ඇත. තවද ඔහු ප්‍රධාන වෛද්‍ය නිළධාරි වශයෙන් රෝහලේ පරිපාලන හා නිතිමය කටයුතුත්, වෛද්‍යවරුන් නොමැති අවස්ථාවළ දි වෛද්‍ය සායන කටයුතු සඳහා ද නියලිමට සිදුවූ බව තම ප්‍රකාශයේ සඳහන් කොට ඇත. රාජකාරි කටයුතු සිදු කිරිම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිති රිති වළට ද බන්ධනාගාර දෙපාර්තමේන්තු නිති රේගුලාසි වළට අනුගතව ද ජාත්‍යන්තර රේගුලාසි වළට අවනතව උපරිම සෞඛ්‍ය සේවාවක් බන්ධනාගාර රැදවියන් හට ලබා දිම ඔහුගේ ප්‍රධානම රාජකාරි කටයුත්ත ලෙස සැලකු බව ප්‍රකාශකර සිටි.

බන්ධනාගාර රෝහළ හරහා මත් ද්‍රව්‍ය හුවමාරුවක් හා වෙනත් විෂමචාරයන් සිදු වන බව මාසික රැස්වීමේ දි විනය භාර ප්‍රධානියා පෙන්වා දිම නිසා එම කටයුතු අවම කිරිම සඳහා සහයෝගය ලබා දෙන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුමා රෝහලේ ආයතන ප්‍රධනියා පැමිණිලිකරුගෙන් ඉල්ලිමක් කර ඇත. එම අකටයුතුකම් කිහිපයක් බන්ධනාගාර රෝහලේ රෝගී හා වැඩ පාටි සිරකරුවන්ගේ සහයෝගයෙන් නතර කිරිමට සිදු විමත් විශමතා සඳහා සහයෝගය දුන් බන්ධනාගාර නිළධාරින් කිහිප දෙනෙකුම ස්ථානමාරු කිරිම් කිහිපයක් සිදුවූ බව ප්‍රකාශ කරයි. පැමිණිලිකරු විසින් සහකාර වෛද්‍ය නිළධාරින්, හෙද නිළධාරින් හා ඖෂධ සංයෝජක වරුන් ඇතුළුව රෝහල් කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකුට විරුද්ධව විනයානුකුලව කටයුතු කිරිමට සිදු විම තුලින් රෝහළ තුළ රාජකාරිමට වශයෙන් විරුද්ධවාදින් කොටසක් බිහි වු බව සඳහන් කර ඇත.

මත් ද්‍රව්‍ය අල්ලා දුන් රෝගී සිරකරුවන් ටිකට් කපා රෝහලෙන් පිට කරන ලෙසටත්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී දුමින්ද සිල්වා ද ටිකට් කපා රෝහලෙන් පිට කරන ලෙසට රාජකාරි දුරකථනයට නිර්නාමිකව ඇමතුම් පැමිණිලිකරු හට ලැබුණද, ඔවුන් විශේෂඥ වෛද්‍ය වරයා යටතේ ප්‍රතිකාර ගන්නා නිසා එය කළ නොහැකි බව ප්‍රකාශ කළබව සඳහන් කරයි. ඉන් පසු පුවත්පත් මගින් අසත්‍ය තොරතුරු සහ කරුණු වලට ඔහුගේ නම ද ඇතුලත් කර පුවත් වාර්තා කල බවත් එවාට පිළිතුරු ලබා දිමට සෞඛ්‍ය අමාතයාංශයේ අතිරේක අධ්‍යක්ෂක වරයෙකු වන ප්‍රියන්ත අතපත්තු මගින් උත්සාහ කළත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කිසිදු සහයෝගයක් හෝ අවස්ථාවක් ඔහු වෙත ලබා නොදුන් බවත් ප්‍රකාශ කර ඇත. තවද ඒකාබද්ධ විපක්ෂයේ ක්‍රියාකාරින් වූ බැසිල් රාජපක්ෂ මහතාගේ සිට උදය ගම්මන්පිල මහතා දක්වා වූ විශාල දේශපාලනික සිරකරුවන් පිරිසක් වරින් වර බන්ධනාගාර රෝහලෙන් ප්‍රතිකාර ලබා ගැනිමට අදාල වැරදි ප්‍රචාරයන් පුවත්පත් හා අනෙකුත් මාධ්‍ය හරහා ප්‍රචාරය කිරිමක් සිදුව ඇත.

පැමිණිලි කරු විසින් එම එකාබද්ධ විපක්ෂයේ ක්‍රියාකාරින්ට අනිසි ලෙස උදවු උපකාර කරන බවට අසත්‍ය පදනම් විරහිත ප්‍රකාශයක් 2016 නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තුවේ දි බන්ධනාගාර අයවැය විවාද වූ දිනයේ දි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය සිදු කර ඇත. දිගින් දිගටම මෙලෙස අසත්‍ය චෝදනා පුවත්පත් හා අනෙකුත් විද්‍යුත් මාධ්‍ය හරහා පලවුවද සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව මාර්ගයෙන් පැමිනිලිකරුගේ නිර්දොෂි භාවය තහවුරු කිරිමට කටයුතු කර නැත. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය ඇතුළු දේශපාලඥයින්ගේ අසත්‍ය

චෝදනා එල්ල වීම නිසා ඇති වූ කළකිරීම මත සේවා ස්ථානයෙන් ඉවත් වී වෙනත් සේවා ස්ථානයක් ලබා දෙන ලෙස 2016 දෙසැම්බර් 14 වන දින ලිඛිතව සෞඛ්‍ය හා බන්ධනාගාර දෙපාර්තුමේන්තු වෙත ඉල්ලීමක් කල බව පැමිණිලිකරු තම ප්‍රකාශයේ සඳහන්කරයි. එදිනම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය ලිඛිතව ඔහුට විරුද්ධව චෝදනා පත්‍රයක් සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවටත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිසමටත් යොමු කර තිබූ අතර ඇයගේ ප්‍රධාන චෝදනාව වූයේ පැමිණිලිකරු විසින් ඒකාබද්ධ විපක්ෂයේ ක්‍රියාකාරින් ව්‍යාජ රෝග විනිශ්චයන් හරහා රෝගීන් වශයෙන් හඳුන්වා ඇප ලැබෙනතුරු බන්ධනාගාර රෝහලේ රඳවා තබා ගත් බවයි. එසේම පරීක්ෂණ අවසන් වන තුරු බන්ධනාගාර රෝහලෙන් පැමිණිලිකරු ඉවත් කරන ලෙසට ද ඉල්ලා චෝදනා පත්‍රය ගොණු කොට ඔහු බලහත්කාරයෙන් සේවා ස්ථානයෙන් ඉවත් කිරීමක් සිදුවූ බව ඔහු තම ප්‍රකාශයේ සඳහන් කොට ඇත.

පදනම් විරහිත චෝදනා ඉදිරිපත් කිරීමත්, සියළු මාධ්‍යයන් හරහා ප්‍රචාරණය කිරීමත්, වෘත්තිය හා පුද්ගලික කීර්තිනාමයට විශාල හානියක් සිදු වීමත්, බලහත්කාරයෙන් සේවා ස්ථානයෙන් ඉවත් කිරීම හා අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිසමේ පරීක්ෂණයන්ට මුහුණ දීමේ දී විශාල මූල්‍යමය අලාභයක් සිදුවූ බව පැමිණිලිකරු ප්‍රකාශකර සිටී. තවද සාමාජීය වශයෙන් අපකීර්තියක් සහ කැලලක් ඇති කිරීමට ඉහත කී පුද්ගලයන් කටයුතු කල බවට පැමිණිල්ලේ සඳහන්ව ඇත. සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව,බන්ධනාගාර දෙපාර්තුමේන්තුව හා අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව වෙන වෙනම මෙම චෝදනා විමර්ශණ

කිරිම සිදු කළත් හිරුණිකා ප්‍රේමචන්ද්‍ර විසින් නගන ලද චෝදනා සත්‍යයක් නැති බවට තහවුරු වී ඇත.

පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් තම පාර්ලිමේන්තු වරප්‍රසාද භාවිතා කරමින් ඇයගේ දේශපාලනික වුවමනාවන් ඉටු නොවිම නිසා දේශපාලනික පළි ගැනිමකට රජයේ නිළධාරියෙකු වූ පැමිණිලිකරු හට සිදු කරන ලද මුල්‍යමය අලාභයන්, වෘත්තිමය හානිය, සමාජමය අපකිර්තිය ඌණ පූර්ණය කිරිමට දිය හැකි යම් තිරණයක් හෝ නිර්දේශයන් ලබා දෙන මෙන්ය.

10 .VI

පැමිණිලි අංකය - 1871/2020

පැමිණිලිකරු - විසිදාගමගේ අජිත් පුෂ්පකුමාර

ලිපිනය - අංක 486, පාසල් පටුමග, පිළයන්දල පාර, ඇරව්වල, පන්නිපිටිය.

## නිර්දේශ

පැමිණිලිකරුට අහිමි කරන ලද සියළු උසස්වීම් වැටුප් දිමනා හිඟ වැටුප් ද සමග ඔහුගේ සේවයේ ඔහුට නියමිත ස්ථානයේ පිහිටුවීමට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවේ විමර්ශන අංශයට 2020.10.22 දින ප්‍රකාශයක් ලබා දෙමින් තමා ලක්වූ දේශපාලන පළිගැනිම සම්බන්ධව කරුණු දක්වා තිබේ. 1988.12.01 වන දින ආධුනික උප පොලිස් පරික්ෂකවරයෙකු වශයෙන් පොලිස් සේවයට බැදි කළුතර පොලිස් විද්‍යාලයේ මාස 06 ක පුහුණුවෙන් පසු දිවයිනේ විවිධ ප්‍රදේශ වළ විවිධ පොලිස් කොට්ඨාශ වල සහ විශේෂ මෙහෙයුම් කලාප වළ සේවය කර 2016.07.31 වන දින බියගම පොලිස් ස්ථානාධිපති තනතුරෙන් අල්ලස් සිදුවීම් 02 ක් සම්බන්දයෙන් ඉවත් කර පුත්තලම පොලිස් කොට්ඨාශයේ දිස්ත්‍රික් අපරාධ විමර්ශණ අංශයේ ස්ථානාධිපති ලෙස ස්ථාන මාරුවීම් ලබා ඇති බවය. ඉන් අනතුරුව එදා සිට මේ දක්වා සේවය කළ ද 2020.08.31 වන දින එම තනතුරද අහිමිව

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සංකිර්නයේ රාජකාරි නිරත වන බව සදහන් කර ඇත. 2006 සිට 2008 දක්වා කාලය තුළ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපති ආරක්ෂක අංශයට අනුයුක්තව සේවය කර ඇත. මේ හේතුව නිසා තමා දැඩි ලෙස දේශපාලන පලිගැනිමකට ලක්වූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. 2015.07.13 වන දින සිට 2016.07.31 වන දින දක්වා  පැමිණිලිකරු බියගම පොලිස් ස්ථානාධිපති තනතුර හොබවමින් සිටියදි බියගම පොලිස් වසමේ සිදුවූ මිනීමැරුමක් සම්බන්ධයෙන්  පැමිණිලිකරු පූර්ණ පරික්ෂණයක් සිදු කර ඊට අදාල සාක්ෂි සටහන් කල බවත් මෙම අපරාධයේ ප්‍රධාන සැකකරු වන මොරිස් පෙරේරා ඇතුලු සැකකරුවන් අත් අඩංගුවට ගෙන මහර ම/උ 4862/15 යටතේ ඉදිරිපත් කල බවත් ප්‍රකාශ කර ඇත. මෙම අපරාධයේ අධි චෝදනා ගොණු කිරිමට නීතිපති උපදෙස් ලැබී ඇත. මෙම රාජකාරිය ඔහු අකුරටම සිදු කළ බැවින් අපරාධකරුවන්ට නිදහස් විමට අවස්ථාවක් නොවූ හෙයින් සහ වෙනත් විකල්පයක් ඔවුන්ට නොවූ බැවින් බස්නාහිර පලාත් සභා මන්ත්‍රී සහ රුවන් විජේවර්ධන හිටපු අමාත්‍යතුමාගේ පුද්ගලික ලේකම් ප්‍රසන්න සම්පත් සහ එම ඇමතිතුමාගේ සම්බන්ධිකරණ ලේකම් ෂෙල්ටන් යන අයගෙ අධාරකරුවන් වන මහින්ද ප්‍රධාන සැකකරු මොරිස් පෙරේරා ලවා අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් නීතිමය සහනයක් ලබා දිමට පැමිණිලිකරු මුදල් ඉල්ලූ බවට විමර්ශණ යොමු අංක BC/12/88 /2016 යටතේ බොරු චෝදනාවක් කර ඇත. මෙය හුදෙක්ම මනුෂ්‍යය ඝාතන නඩුවේ වාසියක් ගැනිමේ යටි අරමුණින් කල දෙයක් බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි.

පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ 2015.07.05 වන දින බියගම පොලිස් ස්ථානයේ පොලිස් නිළධාරියෙකු අල්ලස් ගැනිමක් සම්බන්ධව අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ නිළධාරින් විසින් සිදු කරන ලද වැටලිමකින් අත් අඩංගුවට ගන්නා ලද බවත් ඒ සඳහාත් ඔහු සම්බන්ධ කොට ඇති බවයි.

මෙම අල්ලස් පැමිණිලි සම්බන්දයෙන් ඔහු නිරපරාදව පටලවා ඔහුගේ කිර්තිනාමයට හානි පැමිණිමට ක්‍රියා කරවිම තුලින් බලවත් හිංසාකාරි දේශපාලන පළිගැනිමක් සිදූ වි ඇති බව පැමිණිලිකරු කියා සිටියි. විමර්ශන කාළය වසර 4 ½ වැඩි කාලයක් තවදුරටත් අවසන් නොමැතිව මෙය පවත්වාගෙන යෑම හේතුවෙන් පැමිණිලිකරුට අගතියක් සිදුවි දේශපාලන පළිගැනිමකට ලක්ව ඇති බවයි. මෙම සිද්ධියේ තවදුරටත් නිවැරදිකරු බව පැමිණිලිකරු ප්‍රකාශයේ සඳහන් කොට ඇත.

හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා විසින් වරෙක පැමිණිලිකරු ස්ථානාධිපති තනතුරකට නුසුදුසු පුද්ගලයෙකු බවත්, නිළධාරින් පිළිබදව නිසි අධික්ෂණයක් නොමැති බවත් පැමිනිලිකරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මිනිහෙක් බවත් ඔහුගේ බිරිද අරලියගහ මන්දිරයේ වැඩ කරන බව පවසමින් ඔහු එම තනතුරෙන් ඉවත් කරන බව කියා ඇතැයි කර ඇතැයි ඔහු ප්‍රකාශ කර සිටි .

පැමිණිලිකරු ගරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ ඔහුට විරුද්ධව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මගින් සිදූ කරන යොමු අංක BC/1287/2016/B85 දරණ විමර්ශණය මේ වන විට අගතිකාමි මන්දගාමි කෙරෙන බැවින් එම විමර්ශණය සම්පූර්නයෙන්ම ඉවත් කර ගැනිමට අවශ්‍ය කටයුතු කර දෙන මෙන්ද

තවද ඉහත කී පළිගැනිම් හේතු කොට ගෙන ඔහුට අහිමි කරන ලද සියළු තනතුරු පෙරදාතම් කර නිසි උසස්වීම් ලබා ගැනිම ඊට අදාල වැටුප් දිමනා සමග සේවය යථාවත් කිරිමට ක්‍රියා කර දෙන මෙන්ය.

## 10 .VII

පැමිණිලි අංකය - 950/2020

පැමිණිලි කරු - කුරුප්පු මුදියන්සේලාගේ ප්‍රියන්ත ගුණතිලක බණ්ඩාර

ලිපිනය - අල්පිටිය,ගොඩකවෙල

## නිර්දේශ

එකම සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිලිකරුට එරෙහිව නැවත නැවත නඩු පැවරීම සම්බන්ධයෙන් කරුණු සොයා බැලීම සඳහා සුදුසු පරිදි විමර්ශනයක් සිදු කිරීම.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවේ විමර්ශන අංශයට 2020.10.02 සහ 2020.10.09 දින ප්‍රකාශ ලබා දෙමින් තමා ලක්වූ දේශපාලන පළිගැනිම සම්බන්ධව කරුණු දක්වා තිබේ. ඔහු සබරගමුව පළාතේ ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයා වශයෙනුත් 2005 වර්ෂයේ ජනාධිපති වරණයේදි මහින්ද රාජපක්ෂ මහතාගේ ඇහැලියගොඩ ආසනයේ මැතිවරණ සම්බන්ධිකරණ නිළධාරි වශයෙන් කටයුතු කර ඇත. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් පැමිණිලිකරු ඉහළ කොත්මලේ ජලවිදුලි ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධිකරණ නිළධාරි වශයෙන් පත්කර, එම කාලය තුළදි ප්‍රාදේශිය සභා

මැතිවරණයට ඉදිරිපත්වී ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා වශයෙන් පත් වුනා.

පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ 2000 වර්ෂයේදී පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා පැමිණිලිකරු සහ රංජිත් ද සොයිසා මහතා සම්බන්ධව සිටියදී 2000.09.29 වන දින පැමිණිලිකරුගේ නිවසට මීටර් 300 ක් පමණ දුරින් පිහිටි ජාතික නිවාස ගම්මානයට හැරෙන ප්‍රධාන මාර්ගය අසලදී එක්සත් ජාතික පක්ෂ මැතිවරණ රැලියක් තැබීම සඳහා සූදානම් කරමින් සිටියදී පිරිසක් හට පහරදී වෙඩි තැබූ බවට එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක අජිත් කුමාර මැද්දේගම විසින් රක්වාන පොලිසියට ඔහු, රංජිත් සොයිසා මැතිතුමා සහ මැතිවරණ කටයුතු වල නියැලෙන ලද පුද්ගලයින් 07 දෙනෙකු සම්බන්ධයෙන් පැමිණිලි කර ඇත. පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ එම සිදුවීම වූ රාත්‍රියේ කාලයේ ඔහු සහ ප්‍රචාරක කටයුතු වල නිරත වූ අය එම කටයුතු අවසන්ව එක් නිවෙස්වල සිටි අතර මෙවැනි සිදුවීමක් සම්බන්ධයෙන්ද ඔහු දැන ගත්තේද පසුදින උදෑසනය බවයි. නමුත් මෙම පැමිණිල්ලට අදාලව පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ එන්.එස්.62611 යටතේ නඩුවක් විභාග කරන ලද බවත් පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් වී ඇප ලබා පසුව රක්වාන පොලිස්ථාන මගින් කරන ලද දැනුම්දීමකට අනුව පොලිස්ථානයට ගොස් මෙම පහර දීම සම්බන්ධයෙන් ප්‍රකාශ ලබා දුන් බවයි. පසුව, එම නඩුව 2007.04.25 වන දින මහාධිකරණයට තැබීමේ නියෝගයක් නිකුත් කලද, ඉන් පසු ගරු නීතිපතිවරයා විසින් මේ සම්බන්ධව විමර්ශන ගොනු අධ්‍යයනයෙන් පසු 2010.08.09 දිනැති හා නීතිපති අංක CW 4/100/2007 දරණ ලිපිය මගින් “චූදිතයන්ට විරුද්ධව ඔබ අධිකරණයේ පවරා ඇති අංක 62611/ එන්.එස්. දරණ නඩුව

මහාධිකරණයට තැබීමේ නියෝගය මෙයින් නිශ්ප්‍රභා කරමි. එම චූදිතයන්ව එම නඩුවෙන් නිදහස් කරන ලෙස විධාන කරමි." යනුවෙන් දැනුම් දී ඇත.

එසේ තිබියදීත්, නැවතත් 2015.01.08 වන දින යහපාලන රජය බලයට පත්වීමෙන් පසු එම රජයේ රක්වාන ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ආසන සංවිධායක ලෙස කටයුතු කළ එවකට පළාත් සභා මන්ත්‍රී අජිත් කුමාර මැද්දේගම යන අයගේ දැඩි බලපෑම මත ඉහත කී නඩුව නැවත වතාවක් රත්නපුර මහාධිකරණයේදී අංක HCR/32/2016 යටතේ අධි චෝදනා ගොනු කරමින් 2016.02.09 වන දින කැඳවා පැමිණිලිකරු ඇතුළු අනෙකුත් විත්තිකරුවන් අට දෙනෙකු වෙත අධි චෝදනා නගමින් නඩු කටයුත්තක් ආරම්භ කර පවත්වාගෙන ගිය බවත්ය. මහෙස්ත්‍රාත් අධිකරණයේ නිදහස් කිරීම සම්බන්ධයෙන් ගරු අධිකරණය හමුවේ කරුණු දැක්වීමෙන් පසු එම නඩුව පවත්වාගෙන යන්නේද නැද්ද යන්න සම්බන්ධයෙන් දැනුම් දී ඇත. එම දැනුම්දීම සිදුකළ යුතුව තිබූ 2019.06.12 වන දින ඉහත කී අංක HCR/32/2016 නඩුව සම්බන්ධයෙන් කිසිවක් දැනුම්දීමට පෙර අංක 62611/ එන්.එස්. දරණ නඩුවට අදාළවම එහි චෝදනා යම් යම් වෙනස්කම් වලට යටත්ව HCR/107/2019 දරණ නව අධි චෝදනා පත්‍රය පැමිණිලිකරු හා සෙසු අය හට ලබාදී ඉහත කී අංක HCR/32/2016 දරණ අධි චෝදනාවන්ගෙන් මුදා හරිමින් නැවත තවත් අධිචෝදනා ගොනුකරමින් තවත් නඩු කටයුත්තකට පටලවමින් එකම කරුණක් සම්බන්ධයෙන් නිදහස්ව තිබියදීත් නැවත වරක් නඩු පැවරීම දේශපාලන වශයෙන් පලිගැනීමක් බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

එහි වගඋත්තරකරුවන් ලෙස පැමිණිලිකරු, තිරිමාදුරගේ රංජිත් ද සොයිසා, රත්නගේ පරාක්‍රම රංගජීව, පේරියගෙදර ප්‍රේමතිලක, එපිටවෙල ආරච්චිලාගේ රංජිත් ප්‍රේමසිරි, කහව දඩල්ලගේ නන්ද කුමාර, කුඩා විදානගේ රංජිත් පුෂ්පකුමාර, සිංහපුර හේවයලාගේ වනසිංහ ගාමිණී, කුරුප්පු මුදියන්සේලාගේ ප්‍රියන්ත ගුණතිලක බන්ඩාර හා දරුමුර හෙට්ටි ආරච්චිගේ නිහාල් වසන්ත කුමාර යන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ක්‍රියාකාරීන් පිරිසක් නම් කර ඇත.

එදින ගරු අධිකරණයේ මෙවැනි තත්ත්වයක් ඇති වේ යැයි කිසිඳු බලාපොරොත්තුවක් නොමැතිව HCR/32/2016 අවසාන වේ යැයි සිතා ඔහු ගරු අධිකරණය වෙත ගියද, නැවත නඩුවක් ගොනුකළ බැවින් ඇප මුදල් සහ ඇපකරුවන් සොයා ගැනීමට නොහැකිව දැඩි අපහසුතාවයට පත්වූ බව ප්‍රකාශ කර සිටී. පෙර තීන්දුව ලබාදීමට තිබූ HCR/32/2016 දරණ නඩුව අධිකරණයේ කැඳවා ඉන් සියළුදෙනා මුදා හැරීමට ගරු මහාධිකරණ විනිසුරුවරයා ක්‍රියා කර ඇත. මෙහිදී පැමිණිලිකරු සඳහන් කර සිටින්නේ 2016 දී HCR/32/2016 දරණ නඩුව පැවරීම සඳහා කිසිම පුද්ගලයකු එනම් පැමිණිලි පක්ෂයෙන් ඉල්ලීමක් කළ බවක් හෝ නැතිනම් වෙනයම් කෙනෙකු ඒ පිළිබඳ ඉල්ලීමක් කළ බවක් දැන ගැනීමට නොමැති බවත් එය පවත්වාගෙන යාමට නොහැකි බව දැනගත් පසු නැවත HCR/107/2019 දරණ නඩුව පවරා පවත්වාගෙන යාමට පැමිණිලි පක්ෂයේ කිසිඳු අයකුට අවශ්‍යතාවයක් නොමැති බව දැනගැනීමට හැකිවූ බවයි.

අජිත් කුමාර මැද්දේගම යන එවකට එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයාගේ වුවමනාව මත හා එම ප්‍රදේශයේ යහපාලන ආණ්ඩුවට හිතැති දේශපාලනඥයින් විසින් ඔවුන්ගෙ දේශපාලන

වැඩපිලිවෙල විනාශ කිරීමට කළ කුමන්ත්‍රණයක් බවත් විශේෂයෙන් මෙම නඩුවේ හතරවන වූදිත වශයෙන් නම් කර සිටි දිවංගත තිරිමාදූර රංජිත් ද සොයිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාද ඔහුගේ පාක්ෂිකයන් හා ප්‍රබල ආධාරකරුවන් වන පැමිණිලිකරු ඇතුලු සියළු දෙනාද ඉලක්ක කර ගනිමින් තුන්වන වතාවටද මෙම HCR/107/2019 දරණ නඩුව පවරා ඇති බව කියා සිටී.

පැමිණිලිකරු ගරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ ඔහු හා අනෙකුත් චූදිතයින් වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ක්‍රියාකාරී සාමාජිකයින් ඉලක්ක කරමින් ඔවුන්ගෙන් දේශපාලනික වශයෙන් පලිගැනීමේ අදහසින් කර ඇති මෙම ක්‍රියාව සම්බන්ධයෙන් සාධාරණ නිර්දේශයන් ලබාදෙන ලෙසටත්, මෙම ක්‍රියාවන් හේතුවෙන් ඔහුට සිදූව ඇති මානසික හා කායික පීඩනය සම්බන්ධයෙන් සාධාරණ වන්දි මුදලක් ලබාදීමට අවශ්‍ය නිර්දේශයක් නිකුත් කරන මෙන්ය.

## 10 .VIII

පැමිණිලි අංකය - 1141/2020

පැමිණිලිකරු - මොහොමඩ් අන්සාර් ඉර්ෆාන් ෆකිර්ඩීන්

ලිපිනය - 449/3, සමගි මාවත, ඒඩේරමුල්ල, වත්තල.

## නිර්දේශ

පැමිණිලිකරු රූපවාහිනී සංස්ථාවේ සිදු කළ රැකියාවේ ඔහුට අහිමිවී ගිය සියළු උසස්වීම් වරප්‍රසාද වැටුප් වර්ධක සහ අහිමිකරන ලද වැටුප් පාරිතෝෂික මුදල් සඳහා පැමිණිලිකරු හිමිකම ලැබිය යුතු බවටත් එම සහනයන් පැමිණිලිකරුට කණ්ඩවීමකින් තොරව ලැබිය යුතු බවටත් කොමිෂන් සභාව නිර්දේශ කර ඇත.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු විසින් 2020.02.28 දින ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර පසුව 2020.08.14, 2020.08.26 සහ 2020.10.13 දිනයන් හීදි කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ප්‍රකාශ ලබා දී ඇත.

පැමිණිලිකරු හට කොන්ත්‍රාත් පදනම මත 2005.02.09 දින රූපවාහිනී සංස්ථාවේ අලෙවි විධායක තනතුරේ රැකියාව ලැබී ඇත. පැමිණිලිකරු හට පැවරි තිබූ රාජකාරි වන්නේ වැඩසටහන් සහ වෙළඳ දැන්වීම් සඳහා සේවාදායකයින්හට ගුවන් කාලය වෙන් කිරීම බවත් එලෙස

මෙම තනතුරේ සේවයෙන් ඉවත් කරන තෙක් බිලියන 1.2ක අදායමක් රූපවාහිනී සංස්ථාවට ගෙන දීමට කටයුතු කල බව පැමිණිලිකරුගේ ප්‍රකාශයේ සදහන්ව ඇත. මෙසේ ඔහුගේ කොන්ත්‍රාත් කාල සීමාව දිර්ඝ කරමින් යන අතරතුරදි 2014.10.16 දින සහකාර කළමණාකරු අලෙවි තනතුරට උසස්වීමක් ලැබී ඇත.

පැමිණිලිකරු රූපවාහිනී සංස්ථාවේ රාජකාරි කරන අතරතුරදි එවක අධ්‍යක්ෂ ජනරාල් චන්ද්‍රපාල ලියනගේ මහතා ඔහු හට 2015 ජනාධිපතිවරණ අපෙක්ෂකයකු වූ මහින්ද රාජපක්ෂ මහතාගේ දැන්වීම් ප්‍රචාරණය කිරිමේ කටයුතු පවරා ඇත. එවක රූපවාහිනී සංස්ථාවේ ලියාපදිංචි දැන්වීම් ආයතනයක් වන මීඩියා ෆැක්ට්‍රි මගින් මහින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපතිවරණ දැන්වීම් ප්‍රචාරනය සදහා අවශ්‍ය සම්බන්ධිකරණය ලබාදී ඇත. එම ආයතනය කියා ඇත්තේ ඔවුන්ට ගෙවීමට හැක්කේ රුපියල් මිලියන 10ක් පමණක් බවත්, නමුත් අධ්‍යක්ෂ ජනරාල් චන්ද්‍රපාල ලියනගේ මහතා පවසා ඇත්තේ මිලියන 40ක් ලබා දුන්නොත් වඩා හොද පැකේජයක් ලබා දෙන බවය. තවද, රූපවාහිනී සංස්ථාවට අත්තිකාරම් මුදල් වශයෙන් සම්පූර්ණ ගාස්තුවෙන් 50%ක මුදලක් ගෙවන ලෙසත් ඒ සදහා අළෙවි වට්ටම් පැකේජයක් ලබා දෙන බවත් රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවසා ඇත. පසුව ඔවුන් එයට එකගතාවය පල කල බව ප්‍රකාශ කරයි. ඊට පසුව පැමිණිලිකරු රේට් කාඩ් (rate card) භාවිතා කර මිලියන 40 ක පැකේජයක් සකස් කර මීඩියා ෆැක්ට්‍රි ආයතනයේ සාමාජිකයින්ට ලබා දී ඇත. මහින්ද රාජපක්ෂ මහතාගේ දැන්වීම් ප්‍රචාරණය කල අතර ඒ සදහා රූපවාහිනී සංස්ථාවට ගෙවිය යුතු සම්පූර්ණ මුදල් කොටසක් මැතිවරණයට පෙර සහ අනිත් කොටස පසුව සම්පූර්ණයෙන් ගෙවන ලදි. නමුත් සංස්ථාව මගින් ලබා දුන්

පැකේජයේ සම්පූර්ණ ගුවන් කාලයෙන් ගුවන් ගත වි ඇත්තේ එයින් හරි අඩක් පමණක් බව ප්‍රකාශයේ සඳහන් ව ඇත.

2015.01.08 වන දිනෙන් පසුව යහපාලන රජය පත්වීමත් සමග රූපවාහිනි සංස්ථාවේ උසස් නිළයන්වල වෙනසක් ඇති වුන බවත්, යහපාලන රජයේ නිළධාරින් නිසා පැමිණිලිකරු ඇතුලු පිරිසට රාජකාරිය කිරිමට නොහැකි තත්ත්වයක් සංස්ථාව තුල උද්ගතවූ බව ප්‍රකාශ කරයි. සංස්ථාවේ යහපාලන රජයට පක්ෂපාති පිරිස් නොයෙක් සාවද්‍ය තොරතුරු ගොතා පෙත්සම් නොයෙක් ආයතන වෙත යොමු කිරිමට පියවර ගෙන ඇත. ඒ අනුව පැමිණිලිකරු හටද සංස්ථාව මගින් විනය පරික්ෂණයක් පවත්වා ඇත. මේ පරික්ෂණය පැවැත්වෙන අතරතුරදී අළෙවි අංශයේ සිටි ඔහු ප්‍රවර්ධන අංශය වෙත ස්ථාන මාරු කොට දැඩි පිඩනයකට ලක් ක බවත්, එම පිරිස් වරින් වර ප්‍රවර්ධන කටයුතු සඳහා විවිධ ස්ථාන වලට යැම සඳහා නියෝග කරනු ඇත. මේ වන විට පැමිණිලිකරුගේ බිරිද ගර්භනි භාවයෙන් සිට අතර ඔහුගේ ආර්ථික බිද වැටිමකට ලක්වූ බව ප්‍රකාශයේ සඳහන් කරයි. අළෙවි කරණයේ සිටි ඔහුට කුඩා වැටුපක් සමගින් කොමිස් මුදලක් ගෙවිම නිසා අළෙවි ඉලක්ක සම්පූර්ණ කර කොමිස් මුදල් මත යැපුන සේවකයෙක් වීම බලපා ඇත.

මේ අතරතුරදී බරපතල වංචා පිළිබඳව පිහිටුවන ලද ජනාධිපති පරික්ෂණ කොමිෂන් සභාවෙන් ඔහුට කැඳවිමක් ලැබී ඇති අතර එහි සඳහන්ව ඇත්තේ 2015.01.08 දින පැවති ජනාධිපතිවරණ ප්‍රචාරණ කටයුතු වලට අදාලව සංස්ථාව වෙත සිදු කර ඇති මුදල් අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් බවයි. පැමිණිලිකරු මේ සඳහා කිහිප වරක් ජනාධිපති පරික්ෂන කොමිෂන් සභාව වෙත පැමිණ ප්‍රකාශ ලබා

දී ඇති අතර පසුව ඔහු නීතිඥයකු මාර්ගයෙන් කොමිෂම හමුවේ පෙනී සිටි හෙයින් මේ සඳහා නීතිඥ ගාස්තු වශයෙන් විශාල මුදලක් වැයවී ඇත.

මේ සමගම අල්ලස් හෝ දූෂණ කොමිසම මගින් පැමිනිලිකරු හට විමර්ශණයක් සඳහා කැඳවීම් ලිපියක් ලැබී මෙම පරීක්ෂණය සඳහාද ඔහු කිහිප වරක් අල්ලස් හෝ දූෂණ කොමිෂම හමුවට ගොස් ඇත. එම කොමිසම මගින්ද පැමිණිලිකරු දැඩි අපහසුතාවයට පත් වන අයුරින් නිලධාරීන් ප්‍රකාශ ලබා ගත් බවත්, ඔවුන් විසින් චෝදනා කර ඇත්තේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ පාක්ෂිකයෙකු ලෙස වට්ටම් ලබා දුන්නේ කුමන අරමුණකින්ද යන බවටය. නමුත් පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ මෙම ජනාධිපතිවරණ ප්‍රචාරන කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හිමිවිය යුතු සියලු මුදල් මේ වන විට ගෙවා අවසන් කර ඇති බවත් තවද මෙය වාර්ෂික විගණන වාර්ථාවේ මැනවින් පැහැදිලිව දක්වා ඇති බවත්ය. සංස්ථාව මිළ දර්ශකයක් පාර්ලිමේන්තුවෙන් හෝ කැබිනට් පත්‍රිකාවකින් හෝ අමාත්‍යාංශ මගින් හෝ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවකින් අනුමැතියක් රූපවාහිනී ඉතිහාසයේ කිසිදිනකවත් සිදු වී නොමැති බවත් මෙම මිළ දර්ශකය සැදීම අළෙවි අංශය මගින් අළෙවි අධ්‍යක්ෂවරයා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරන ලබන කටයුත්තක් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙම මිළ දර්ශකයේ මිළ තීරණය කරනු ලබන්නේ සංස්ථාවට ලැබෙන ආදායම මතය.

පැමිණිලිකරු වෙත යොමු කර තිබූ චෝදනා පත්‍රයේ විනය නියෝගය එවා තිබුණු බවත්, එහි සියලු චෝදනා සඳහා ඔහු වැරදිකරු කර තිබුනු බවත්, පසුව 2017.08.24 වන දින ඔහුගේ වැටුප් නවතා දැමූ බවත්

ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධයෙන් ඔහු රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත ලිපියක් ඉදිරිපත් කලද එම ලිපිය සඳහා කිසිදු පිළිතුරක් මේ වන තෙක් ලැබී නැත. ඒ වන විට ඔහු මුදල් හා මානසික වශයෙන් ඉතා දැඩි කම්පනයකට පත් වී තිබී ඇති අතර ඔහු හාදාරමින් සිටි බාහිර උපාධිය පවා මුදල් නැති කම නිසා සහ මානසික පීඩනය මත නවතා දැමීමට සිදුව ඇත. ඔහුගේ භාර්යාව දරු ප්‍රසූතියට ආසන්නයේ සිටි නිසා එම ශල්‍යකර්මය සිදු කර ගැනීම සඳහා භාර්යාවගේ රන් භාණ්ඩ උකස් කරමින් ඒ සඳහා මුදල් සොයා ගෙන ඇත. යහපාලන රජය මගින් ඔහුගේ සේවය 2017.08.29 වන දින නවතා දැමීමට පියවර ගැනීමත් සමග හිමිවීමට තිබූ පාරිතෝෂිත දීමනා මුදල්ද අහිමි කරන බව රූපවාහිනී අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ තුසිර මැලැව්වෙතන්ත්‍රී මහතා විසින් ලිපියක් මගින් දන්වා ඇත.

පැමිණිලිකරු හට මෙම අභූත චෝදනා නගා සම්බන්ධයෙන් සියලු කූඨ ලිපි ලේඛණ සකස් කිරීමේ පුරෝගාමීව කටයුතු කරනු ලැබුවේ රූපවාහිනී සංස්ථාවේ සේවය කරන සහකාර අලෙවි අධ්‍යක්ෂ යහපාලන රජයේ ක්‍රියාකාරී සාමාජිකාවක්වූ බුද්ධිකා ජයතිස්ස මෙනවිය බව ප්‍රකාශ කරයි. පැමිණිල්ලේ සඳහන්ව ඇත්තේ ඇය සාමාන්‍ය මිළ දර්ශකය ඉදිරිදාතම දිනයක් යොදා හිටපු අලෙවි අධ්‍යක්ෂ සනත් දලුවත්ත මහතාගෙන් අත්සන් කර ඇය විසින් කූඨ ලේඛණ සකස් කල බවත්, එම ලේඛණ පදනම් කරගනිමින් අල්ලස් හෝ දූෂන කොමිෂම සහ රූපවාහිනී සංස්ථාවේ අභ්‍යන්තර විනය පරීක්ෂණයේදී පැමිණිලිකරු වෙත බොරු චෝදනා නගමින් ඔහු වැරදි කරුවෙක් ලෙසට හංවඩු ගසන ලද බව කියා ඇත. මෙය මැනවින් පැහැදිලි වන අන්දමින් එවකට සිටි අලෙවි අධ්‍යක්ෂ සහන් දලුවත්ත මහතා දිණමින පත්‍රයට ප්‍රකාශයක් නිකුත් කර ඇත. පැමිණිලිකරු කියා

සිටින්නේ ඔහු දන්නා තරමින් එවකට සිටි යහපාලන වෘත්තිය සමිති වලට අදාල පිරිස් මැරයන්ගේ ක්‍රියා ක ලාපයට සමාන ක්‍රියාකලාපයක් අනුගමනය කරමින් බලය ආරෝපණය කරමින් තමන්ගේ දේශපාලන වාසි ලබාගනිමින් ක්‍රියා කල බවත් එයට හොදම උදාහරණය බුද්ධිකා ජයතිස්සට එවකට යහපාලන රජයෙන් පත්වීමක් පවා ලබා දුන් බවයැයි සදහන් කරයි. පැමිණිලිකරු මාධ්‍ය අළෙවිකරණයේ අවුරුදු 12ක සේවා කාලයක් සපුරා ඇති හෙයින් ඔහු අනික් මාධ්‍ය ආයතන සමග හා එම ආයතන වල නිළධාරින් දන්නා හදුනන හෙයින් ඔහු රැකියාවන් සදහා අයදුම් කලද සම්මුඛ පරික්ෂණ වලට පෙනී සිටිමේදි ඔහු හට එල්ල වී තිබූ චෝදනා නිසා කිසිම ආයතනයකින් රැකියාව ලබා නොදුන් බව ප්‍රකාශ කරයි. පැමිණිලිකරු හට දැනට ස්ථිර රැකියාවක් හෝ ස්ථිර අදායම් මාර්ගයක් නොමැති අතර එදිනෙදා ලැබෙන සුලු වැඩක් කරගෙන ජිවත් වන බව ප්‍රකාශයේ සදහන් කර ඇත.

පැමිණිලිකරු තම ප්‍රකාශය තුලින් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින සහන සහ ඉල්ලිම් වන්නේ මෙම අභූත චෝදනා නගමින් සිදු කල අගතිය වෙනුවෙන් ඔහු හට මුහුණ පෑමට සිදු වූ මුල්‍යමය හා මානසික පිඩනය වෙනුවෙන් සැළකිය යුතු වන්දි මුදලක් නැවත ඔහුගේ රැකියාව පරිවාස කාලයකින් තොරව ස්ථිර කරමින් ලැබිමට තිබූ උසස්විමද සමගින් ලබා දෙන ලෙසත්, අහිමි කරන ලද වැටුප් මුදල් , පාරිතෝෂිත මුදල් , කොමිස් මුදල් , නිතිඥ ගාස්තු ,සදහා සාධාරණ වන්දි මුදලක් ලබා දෙනමෙන්ය.

## 10 .XI

පැමිණිලි අංකය - 1140/2020

පැමිණිලි කරු - සුරේෂ් චන්දන පල්ලේගම

ලිපිනය - 156/2, මාකොළ පාර, කිරිබත්ගොඩ, කැළණිය.

## නිර්දේශ

පැමිණිලිකරුගේ සේවය ස්ථිර කර ඔහු හිමිකම් ලබන උසස්වීම් පැමිණිලිකරුට ලබා දිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කර ඇත.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු විසින් 2020.03.05 දින ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර පසුව 2020.08.19 සහ 2020.10.12 වන දින කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ප්‍රකාශ ලබා දී ඇත. පැමිණිලිකරු 2005.01.03 වන දින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයකට අලෙවි විධායකවරයෙක් වශයෙන් සේවයට බැඳුනු බවත්, වසරක කාලය අවසන් වූ පසුව සංස්ථාව මගින් කාර්යය සාධනය සළකා බලා තවත් වසරක් සේවය දිර්ඝ කිරිමද සිදු කල බවත්ය. 2014.10.16 වන දින ඔහු අලෙවි විධායක තනතුරේ සිට සහකාර අලෙවි කළමණාකරු වශයෙන් උසස්විමක් ලබා ඇත.

සහකාර අළෙවි කළමණාකරු වශයෙන් පැමිණිලිකරු සේවය කරමින් සිටියදි 2015.01.08 දින පැවැත්විමට නියමිතව තිබූ ජනාධිපතිවරණයේ මැතිවරණ ප්‍රචාරණ වෙළද දැන්විම් කටයුතු වල, එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැතිවරණ ප්‍රචාරණ වෙළද දැන්විම් හා සම්බන්ධ රාජකාරි රූපවාහිනි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් ඔහු හට පවරා ඇත. එහිදි හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු හා සම්බන්ධව රාජකාරි කටයුතු කල නිළධාරින් කිහිප දෙනෙක් රූපවාහිනි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා හමු වී සාකච්ඡා කරගෙන ඇති පරිදි රූපවාහිනි සංස්ථාව සමග දැන්විම් ප්‍රචාරක ඒජන්සි ආයතනයක් නොමැතිව සෘජුව මැතිවරණ ප්‍රචාරක දැන්විම් ප්‍රචාරය කිරිමට බව පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

ඒ අවස්ථාව වන විට ජනාධිපතිවරණයේ ප්‍රචාරන කටයුතු වෙනුවෙන් විශේෂයෙන් සකස් කරන ලද මිළ දර්ශකයක් භාවිතා වුයේ නැති බවත්, එසේ විශේෂ මිළ දර්ශකයක් අවශ්‍ය වූ විට සකස් කිරිම කරනු ලබන්නේ අධ්‍යක්ෂ අළෙවි විසින් වන අතර එය අනුමත කිරිම සිදු කරන්නේ සංස්ථා සභාපතිතුමා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බව ප්‍රකාශ කරයි. රූපවාහිනි සංස්ථාව විසින් මෙම ප්‍රචාරණ කටයුතු ආරම්භ කර ජනාධිපතිවරණය අවසන් වන තෙක් දැන්විම් ප්‍රචාරණ කටයුතු සිදු කර ඇති අතර ඒ සඳහා මුදල් ගෙවිම් ඔවුන් විසින් කිහිප අවස්ථාවකදි සිදු කර ඇත. අවසන් ගෙවිමට අදාල රුපියල් මිලියන 3.5ක මුදලක් (බදු ඇතුලත්ව) හිටපු ජනාධිපතිවරයාගේ නියෝජිතයෙක් විසින් 2015.02.05 වන දින ගෙවා අවසන් කර ඇත. එම මුදල සංස්ථාව නමින් ඇති ලංකා බැංකුවේ නිදහස් චතුරශ්‍ර ශාඛාවේ ගිණුම් අංක 2323275 ගිණුමට බැර කර ඇත. ඒ අනුව ඔවුන්

විසින් මෙම ජනාධිපතිවරණ ප්‍රචාරන දැන්වීම් කටයුතු වෙනුවෙන් වූ මුළු මුදලම සංස්ථාව වෙත ගෙවා ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

පැමිනිලිකරු ප්‍රකාශ කරන්නේ මෙම ජනාධිපතිවරණ කාල වකවානුවේදීම එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා යටතේ පැවති නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව පිළියෙල කරනු ලැබූ ප්‍රචාරක දැන්වීම් සම්බන්ධව උපලේඛනයක් එවකට රූපවාහිනි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් චන්ද්‍රපාල ලියනගේ මහතා විසින් ඔහු හට ලබා දුන් බවයි. එම උපලේඛනයේ රෙඩ් ලයිම් (RED LIME) යන දැන්වීම් නියෝජිත ආයතනය හරහා ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවට ලබාදී ඇත. ඔහු දන්නා තරමින් මෙම ගණුදෙනුවට අදාළව රෙඩ් ලයිම් නියෝජිත ආයතනයට ගෙවිය යුතු කොමිස් මුදල් (15%) මේ වන තෙක් ගෙවා නොමැති බව සඳහන් කර ඇත. එම නාගරික සංවර්ධන අධිකාරියේ දැන්වීම් ප්‍රචාරය කිරිම වෙනුවෙන් රුපියල් මිලියන 3.2ක මුදලක් සංස්ථාව නමින් ඇති ලංකා බැංකුවේ නිදහස් චතුරස්‍ර ශාඛාවේ ගිණුම් අංක 2323275 ගිණුමට බැර කර ඇත.

2015.01.08 දිනෙන් පසුව බලයට පත්වූ යහපාලන රජය විසින් ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවට පත්කල සභාපතිවරයා වන සෝමරත්න දිසානායක මහතා විසින් සංස්ථාවේ පැවති දූෂණ සොයා බැලිම සඳහා දූෂණ කමිටුවක් පත්කොට ඇති අතර එමගින් පැමිණිලිකරු අපහසුතාවයට පත් කරමින් හිටපු මහින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපතිවරණ දැන්වීම් විකාශ කටයුතු සම්බන්ධව ප්‍රශ්ණ නගා චෝදනා එල්ල කර ඇත. 2015 ජනාධිපතිවරණයට අදාල ප්‍රචාරණ දැන්වීම් විකාශය කිරිම සම්බන්ධයෙන් සංස්ථාවේ ඉහත දූෂණ කමිටුව

මගින් සිදු කරන ලද පැමිණිල්ලකට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් පැමිණිලිකරු තුන්වතාවක් කැඳවා ප්‍රකාශ සටහන් කර ගත් බවත්, අල්ලස් කොමිසම මගින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කළමණාකාරීත්වයෙන් ජනාධිපතිවරණ ප්‍රචාරණ කටයුතු වලට අදාල දැන්වීම් විකාශය සම්බන්ධව සම්පූර්ණ වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි බව ප්‍රකාශයේ සඳහන්ව ඇත.

ඒ අනුව අල්ලස් කොමිසමේ නිළධාරීන් දෙදෙනෙකු ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අළෙවි අංශයට පැමිණ සහකාර අධ්‍යක්ෂ අළෙවි බුද්ධිකා ජයතිස්ස යන අය මුණ ගැසී එම නිලධාරීන් ජනාධිපතිවරණ ප්‍රචාරන දැන්වීම් විකාශය සම්බන්ධව කරුණු විමර්ශනය කොට ඇත. එම අවස්ථාවේ පැමිණිලිකරු සහ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දැන්වීම් ප්‍රචාරය කිරිම සම්බන්ධ වූ ඉර්පාන් පකිර්ඩීන් යන සහකාර අළෙවි කළම්ණාකරුවා අංශය තුල සිටියද එම සාකච්ඡාවට ඔවුන් දෙදෙනා සම්බන්ධ කර ගෙන නොමැත. අල්ලස් කොමිෂමෙන් පැමිණි නිළධාරීන් එම ස්ථානයේ පිටත්ව ගිය පසු බුද්ධිකා ජයතිස්ස විසින් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සහ අනිත් ජනාධිපතිවරණ අපේක්ෂකයන්ට ලබා දුන් ප්‍රචාරන ගුවන් කාලය සම්බන්ධව සම්පූර්ණ වාර්තාවක් අල්ලස් කොමිසම වෙත ලබා දෙන ලෙස එම නිලධාරීන් ඉල්ලා සිටි බව අළෙවි අධ්‍යක්ෂවරයා වෙත දන්වා ඇත.

2015.04.21 දාතමින් 2015 ජනාධිපති මැතිවරණ විකාශයන් සම්බන්ධ වාර්තාව සහකාර අධ්‍යක්ෂ අළෙවි බුද්ධිකා ජයතිස්ස යන අය විසින් සකසා අධ්‍යක්ෂ අලෙවි සනත් දලුවත්ත මහතා විසින් අංශ ප්‍රධානි ලෙස නිර්දේශ කර අල්ලස් කොමිෂම වෙත ඉදිරිපත් කර ඇත. එම

බුද්ධිකා ජයතිස්ස විසින් සකස් කරනු ලැබූ සාවද්‍ය කරුණු ඇතුලත් ලේඛණය පදනම් කර ගනිමින් නිතිඥ එම්.එම් .විමලසිරි මහතා විමර්ශන නිළධාරියෙකු ලෙස පත් කර විමර්ශන කටයුතු සිදු කිරිමෙන් අනතුරුව 2015.07.24 වන දින විමර්ශන වාර්තාව සංස්ථාවේ කළමණාකාරිත්වය වෙත භාර දිමට කටයුතු කර ඇත. එම විමර්ශන වාර්තාව පදනම් කර ගනිමින් සහ යහපාලන රජය විසින් පැමිණිලිකරු බරපතල වංචා සෙවිම සදහා වූ ජනාධිපති කොමිෂන් සභාව වෙත තුන්වතාවක් පමණ කැදවා ප්‍රකාශ ලබා ගෙන ඇත.

ඊට අමතරව සාමාන්‍යයෙන් ඔහු සේවයට බැදුණු දිනයේ සිට සැම වර්ෂයකම පාහේ වසරක සේවා දිගුවක් ලැබූ නමුත්, 2015 යහපාලන රජය පත්විමෙන් පසු එම වසරක කොන්ත්‍රාත් කාලය මාස තුන සහ මාස 06 යනාදි වශයෙන් අඩුකරමින් ඔහු අපහසුතාවයට සහ මානසික පිඩාවට පත් කල බව ප්‍රකාශයේ සදහන් කොට ඇත. තවද ඔහුගෙන් දේශපාලනිකව පළිගැනිම සදහා වර්ෂ එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව ආරම්භ කරන ලද රණවිරු රියල් ස්ටාර් රියැලිටි වැඩසටහන් මාලාවේ මූල්‍යමය අක්‍රමිකතාවයන් සහ දූෂණ සිදු වි ඇති බව සදහන් කරමින් අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව විසින් පරික්ෂණයක් ආරම්භ කර ඇත. එම පරික්ෂණයට අදාලව අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව වෙත දෙවතාවක් පැමිණිලිකරු කැදවා ප්‍රකාශ ලබා ගත් බව ප්‍රකාශයේ සදහන් කොට ඇත.

පැමිණිලිකරු ගරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින සහන වන්නේ ඔහුගේ සේවය ස්ථිර කිරිමට ඉහළ කළමණාකාරිත්වයට නිර්දේශයක් කරන මෙන් ද, ඔහුගේ සේවා කාලය අනුව පරිවාස කාලසිමාවකින්

තොරව සේවය ස්ථිර කර දෙන මෙන්ද පැමිණිලිකරුගේ සුදුසුකම් අනුව හිමිවිය යුතු අළෙවි අධ්‍යක්ෂ තනතුරේ පිහිටුවා වැටුප් වර්ධක නිසි ලෙස යථාවත් කර දෙන මෙන්ය. තවද 2015 වර්ෂයේ සිට හිමිවිය යුතු නමුත් අත්හිටුවා ඇති කොමිස් මුදල් පැමිණිලිකරු වෙත ගෙවීමටත් දැරීමට සිදු වූ නිතිඥ ගාස්තු ප්‍රතිපූර්ණය කර දෙන ලෙසත්ය.

10 .X

පැමිණිලි අංකය - 60/2020

පැමිණිලි කරු - දිසනායක මුදියන්සේලාගේ අනුරාධ කාංචන බණ්ඩාර

ලිපිනය - අංක:300/07, ගුණරත්නමාවත, මාකොළ, කිරිබත්ගොඩ.

## නිර්දේශ

පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින සහන සහ ඉල්ලිම වන්නේ සේවය අතහැර යාම නොසලකා හැර සේවා කඩවීමකින් තොරව 2017.02.24 දින සිට ඔහු නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලෙසත් මේ දක්වා ඔහු හට හිමිවිය යුතු වැටුප් වර්ධක දීමනා, හිඟ වැටුප් ද, සහිතව ඔහුව නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලෙසත්, අනෙකුත් නිලධාරීන් මෙන් අදාල සේවා කාලය සම්පූර්ණ කර ඇති හෙයින් මීළඟ උසස් වීම් කඩ ඉම වන පොලිස් පරීක්ෂක තනතුරට උසස් කිරිමත්, පැමිණිලිකරුට අහිමිව ගිය කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නිතිවේදි උපාධිය හැදැරිමට අවස්ථාවත් ලබාදෙන ලෙසටත්ය. කොමිෂන් සභාව පැමිණිලිකරුගේ මෙම ඉල්ලීම නිර්දේශ කර ඇත.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලි කරු විසින් 2020.06.11 සහ 2020.09.16 වන දින ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ප්‍රකාශ ලබා දෙමින්

පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ 2008.09.21 වන දින ආධුනික උප පොලිස් පරික්ෂකවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පොලිස් සේවයට බැදුන බවත් ඉන් අනතුරුව පුත්තලම කොට්ඨාශයට ස්ථාන මාරුවීම් ලබා පසුව 2017.02.24 වන දින දක්වා ත්‍රස්ත විමර්ශණ කොට්ඨාසයට අනියුක්තව රාජකාරි කටයුතු සිදු කරන ලද බවත්ය. 2009.06.17 වන දින සිට 2015 මාර්තු මාසය දක්වා ඔහු විමර්ශණ අංශ 02 හි ප්‍රධාන විමර්ශණ නිළධාරියෙකු ලෙසත් ඉන් පසු 2017.02.24 වන දින දක්වා කාළය තුළ සාර්ක් ත්‍රස්තවාදි වැරදි නිරික්ෂණ මධ්‍යස්ථානය (STOMD) ස්ථානාධිපතිවරයා ලෙසත් කටයුතු කරන ලද බවත් කියා සිටි. මෙම කාලය තුල ඔහු අවස්ථා කිහිපයකදී විදේශගතව ත්‍රස්තවාදය මැඩලීම, බුද්ධි අංශ රාජකාරි, පරිගණක අපරාධ සම්බන්ධව පුහුණුව ලබා ඇත. තවද ආගමික අන්තවාදය හා මුස්ලීම් අන්තවාදීන් හා එහි ව්‍යුහය පිළිබඳවත්, ISIS සංවිධානය පිළිබඳවත් දේශීය හා විදේශීය නිලධාරින්ගේ පුහුණුව ලබා ඇත. පැමිණිලිකරු ඔහුගේ ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ ඔහු ත්‍රස්තවාදි විමර්ශන කොට්ඨාශයට අනුයුක්තව L.T.T.E සංවිධානයට අදාල විමර්ශන කටයුතු රාශියක් සිදු කර ඇති එසේ සිදු කරන ලද ප්‍රධාන විමර්ශන අතර , එල්.ටී.ටී.ඊ සංවිධානයේ විදේශීය බැංකුවක තැන්පත් කර තිබු රුපියල් ලක්ෂ 500කට අධික මුදලක් සම්බන්ධව විමර්ශන සිදු කර බ්‍රිගේඩියර් සුරේෂ් සලේ (වර්තමාන අධ්‍යක්ෂ රා.බු.සේ) ජොෂ්ඨ පොලිස් අධිකාරි ප්‍රසන්න ද අල්විස් (වර්තමාන අධ්‍යක්ෂ අ.ප.දෙ ) සමග එක්ව රාජසන්තක කර මෙරට භාණ්ඩාගාරයට බැර කිරිම, එල්.ටී.ටී.ඊ සංවිධානයේ මුහුදු කොටි අංශය සතුව පැවති රුපියල් ලක්ෂ 300 කට අධික මුදලක් රාජ සන්තක කර මහ භාණ්ඩාගාරයට බැර කිරිම යනාදියයි. තවද ප්‍රභූවරුන් ඝාතනය කිරිමට

සැළසුම් කිරිම යන විමර්ශණ සඳහා සක්‍රිය දායකත්වය දක්වා සැකකරුවන් හා දේපළ අත් අඩංගුවට ගෙන නඩු පැවැරිමට කටයුතු කර ඇත.

පැමිණිලිකරු ත්‍රස්තවාදි විමර්ශන කොට්ඨාශයට අනුයුක්තව සාර්ක් ත්‍රස්තවාදී වැරදි නිරික්ෂණ මධ්‍යස්ථානයේ (STOMD) ස්ථානාධිපතිවරයා වශයෙන් කටයුතු කරන අතරතුරදී 2015 වර්ෂයේ යහපාලන රජය බිහිවීමත් සමග ඔහුගේ අධ්‍යක්ෂවරයා වශයෙන් දැනට වැඩ තහනමට ලක්ව සිටින නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා පත් කර ඇත. ද සිල්වා මහතා ඔහු විසින් සිදු කරනු ලැබූ රාජකාරි ස්වභාවය හා පරිපාලන ව්‍යුහය වෙනස් කර ඇත. ඒ වන විට ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ ප්‍රධාන දුරකථන විශ්ලේෂක නිලධාරියා වූ පැමිණිලිකරු හට අදාල වාර්තා ව්‍යාජ ලෙස සකසා සමහර අපරාධ සඳහා යුධ හමුදා බුද්ධි අංශ සාමාජිකයින් සම්බන්ධ කර වාර්තා සකස් කරන ලෙසට නි.පො.ප නාලක ද සිල්වා බලපෑම් කර ඇතැයි ප්‍රකාශයේ සටහන්ව ඇත. අදාල වාර්තා ව්‍යාජ ලෙස සකසන ලෙසට දැනට අනිවාර්ය නිවාඩු යවා සිටින පොලිස්පති පූජිත ජයසුන්දර මහතාද ඔහු වෙත ඔහුගේ කාර්යාලයේදි පුද්ගලිකව බලපෑම් කලේ යැයි පැමිණිලිකරු සඳහන් කර ඇත. එමෙන්ම 2015 වසරෙන් පසු ත්‍රස්තවාදි විමර්ශන කොට්ඨාශයේ එල්.ටී.ටී.ඊ සංවිධානයේ ජාත්‍යන්තර ජාලය සම්බන්ධව දැනුම තිබූ එකම නිලධාරියා ඔහු වූ බැවින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ පැවති එල්.ටී.ටී.ඊ සංවිධානයට අඅදාල සියළු රැස්වීම් සඳහා ඔහු සහභාගී වූ බවත් අදාල රැස්වීම් වලදි එල්.ටී.ටී.ඊ සංවිධානයට හා ජාත්‍යන්තරයට ශ්‍රී ලංකාව පාවා දිමට ගත් තීරණ රැසකට පැමිණිලිකරු විරුද්ධ වූ බව ප්‍රකාශ කර ඇත. මෙලෙස විරෝධය පෑම හේතුවෙන් එවකට විදේශ

කටයුතු අමාත්‍යාංශයේ සහභාගි වූ නිලධාරින්ගේ හා අමාත්‍ය මංගල සමරවීර මහතාගේ සම්බන්ධීකරණ නිලධාරින් වෙතින් ප්‍රසිද්ධියේ දැඩි දෝෂාරෝපනයටද පැමිණිලිකරු ලක්ව ඇත.

මේ හේතුවෙන් මෙම බලපෑම් වලින් නිදහස්වීමේ අරමුණින් පැමිණිලිකරු කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන නීතිවේදී උපාධිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කර, මූලික පරික්ෂණයෙන් සුදුසුකම් ලබා ලියාපදිංචිවී ඇත. කෙසේ වුවද හිටපු පොලිස්පතිවරයා හා නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා පැමිණිලිකරු රාජපක්ෂවරුන්ගේ නිලධාරියෙකු බැවින් අදාල පාඨමාලාවට සහභාගී නොවන ලෙසත් සේවයෙන් ඉවත් වන ලෙසත් දැඩි තර්ජනයට ලක් කරන ලද බව ප්‍රකාශයේ සඳහන් කොට ඇත. මෙලෙස පැමිණිලිකරුට හා ඔහුගේ පවුලේ සාමාජිකයින්ට එල්ලවූ තර්ජන හේතුවෙන් 2017.02.24 වන දින සිට සේවයට වාර්තා නොකර සිටි බවත් ප්‍රකාශයේ සඳහන් කොට ඇත.

ත්‍රස්ත විමර්ශණ කොට්ඨාශයේ දැනුම් දිම පරිදි මේ කාලයේදී පැමිණිලිකරු ත්‍රස්තවාදි විමර්ශන කොට්ඨාශය වෙත ගොස් ඔහුගේ නිල ඇඳුම් හා හැඳුනුම්පත් භාර දිමට උත්සහ කලද ඒවා භාර නොගත් බවත් එයද සිදුවි ඇත්තේ නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා ගේ බලපෑම් මත බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි. මෙලෙස නිල ඇඳුම් භාර නොගෙන පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ අරමුණින් නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා ඔහුට එරෙහිව, නිල ඇඳුම් යොදාගෙන අයථා ක්‍රියාවල නිරත වන බව අධිකරණයට දැනුම් දෙමින් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 75879/18 යටතේ නඩු පැවරීමට කටයුතු කර ඇත.

එනමුත් අධිකරණයට මෙසේ නිළ ඇඳුම් භාර නොගැනිම සම්බන්ධයෙන් ඉහත නඩුවට අදාලව නිතිඥවරයෙකුගේ මාර්ගයෙන් කරුණු දැක්විමෙන් පසු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්තුමිය විසින් අදාල නිළ ඇඳුම් භාර ගන්නා ලෙසටත් එසේ භාරගෙන වාර්තා කරන ලෙසටත් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ ස්ථානාධිපතිවරයාට නියෝග කර ඇත. පැමිණිලිකරු නිළ ඇඳුම් භාර දිමෙන් පසු නිළ ඇඳුම් භාරගත් බවට ලේඛනයක් ඉල්ලා සිටයද පාලන අංශය කියා ඇත්තේ එම ලේඛණය නාලක සිල්වා මහතා ඉරා දමා ඇති බවයි.

ඉන් පසු 2018 වර්ෂයේදී බොරු චෝදනා නගා නඩු පවරමින් පැමිණිලිකරු දින 10 කාලයක් දිගින් දිගටම මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය (FCID) වෙත කැදවා ඔහු සිදුකල විමර්ශන සම්බන්ධව ප්‍රශ්න කරන ලද බවත්, දින 05 කට පමණ ප්‍රකාශ සටහන් සටහන් කරගත් බව ප්‍රකාශයේ සදහන්වේ. අනතුරුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර මහතා වෙත පැමිණිලිකරු කැදවා ඔහු අත්අඩංගුවට ගැනීම වැලැක්විමට නම් පැමිණිලිකරු විසින් සිදු කරන ලද විමර්ශනයකට අදාලව අත්අඩංගුවට ගෙන තිබූ රුපියල් ලක්ෂ 500ක පමණ මුදලක් රාජසන්තක කල බවත් තවත් ලක්ෂ 1250 ක පමණ මුදලක් එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට හා එවකට හිටපු යුධ හමුදා බුද්ධි ප්‍රධානි බ්‍රිගේඩියර් සුරේෂ් සලේ යන යන මහත්වරුන්ට අයථා ආකාරයෙන් ලබා දුන් බවත් පවසා ප්‍රකාශ ලබා දෙන ලෙසට තර්ජනය කලේ යැයි පැමිණිලිකරු සඳහන් කරයි. එනමුත් ඔහු පවසා ඇත්තේ රාජසන්තක කලේ රුපියල් ලක්ෂ 500 ක පමණ මුදලක් බවත් එම මුදල් මහා භාණ්ඩාගාරයට බැර කල බවත්ය.

එමෙන්ම 2018, 2019 වර්ෂයන්හිදි පැමිණිලිකරු සම්බන්ධ කර ව්‍යාජ ලේඛණ සකස් කර මුස්ලිම් ජාතිකයින් සමග සබඳතා පවත්වමින් පොලිස් දෙපාර්තමේන්තුවේ දුරකථන, අන්තර්ජාල සබඳතා ලබා ගත් බවට චෝදනා කරමින් නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා විසින් ව්‍යාජ ලේඛණ සකස් කර අධිකරණය නොමග යවමින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 86509/8/17 යටතේ ඔහුට විරුද්ධව මෙලෙස නඩු පැවරූ බවත් පොලිස් විශේෂ විමර්ශන ඒකකය (SIU) වෙත ද ව්‍යාජ ලේඛණ සකස් කර යොමු කිරීම තුලින් එම ඒකකයද නොමග යවා ඇති බව ප්‍රකාශකර සිටී. පැමිණිලිකරු කියා සිටින්නේ ඔහු වෙත එල්ල කරන ලද චෝදනා හා බලපෑම් සියල්ල එල්ලවුයේ වර්තමාන ජනාධිපති හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා, හිටපු යුධ හමුදා බුද්ධි ප්‍රධානි බ්‍රිගේඩියර් සුරේෂ් සලේ සහ හිටපු රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානි නියෝජ පොලිස්පති චන්ද්‍ර නිමල් වාකීෂ්ය යන මහත්වරුන් අත් අඩංගුවට ගැනිම සඳහා ක්‍රියාත්මක කරන ලද සැලසුම් සඳහා අවශය ව්‍යාජ සාක්ෂි නිර්මාණය කරවා ගැනිම සඳහා බවයි.

පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින සහන සහ ඉල්ලිම වන්නේ සේවය අතහැර යාම නොසලකා හැර සේවා කඩවීමකින් තොරව 2017.02.24 දින සිට ඔහු නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලෙසත් මේ දක්වා ඔහු හට හිමිවිය යුතු වැටුප් වර්ධක දීමනා, හිඟ වැටුප් ද, සහිතව ඔහුව නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලෙසත්, අනෙකුත් නිලධාරීන් මෙන් අදාල සේවා කාලය සම්පූර්ණ කර ඇති හෙයින් මීළඟ උසස් වීම් කඩ ඉම වන පොලිස් පරීක්ෂක තනතුරට උසස් කිරිමත්ය. තවද ආරක්ෂක සේවා ප්‍රමුඛතාවය මත තම දියණිය සුදුසු පාසලකට ඇතුලත් කර ගැනිමටත්, පැමිණිලිකරුට

අහිමිව ගිය කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිය හැදැරීමට අවස්ථාවත් ලබාදෙන ලෙසය.

24/11/2020.

## 10 .XI

පැමිණිලි අංකය - 555/2020

පැමිණිලි කරු - අංගොඩ රාළලාගේ පාලිත විජය බණ්ඩාර දේදුනුපිටිය

ලිපිනය - අංක 28/C/2, දේදුනුපිටිය, මහනුවර.

## නිර්දේශ

පැමිණිලිකරුට එරෙහිව නැවත සාධාරණ ගෘහස්ථ පරීක්ෂණයක් පවත්වා එහි තීරණ අනුව පැමිණිලිකරු සම්බන්ධයෙන් කටයුතු කිරීමට කොමිෂන් සභාව නිර්දේශ කර ඇත.

## පැමිණිල්ලට අදාළ කරුණු.

පැමිණිලිකරු විසින් 2020.02.17 වන දිනැතිව ගරු කොමිෂන් සභාව වෙත කරනු ලැබූ පැමිනිල්ල සහ කොමිෂන් සභාවේ විමර්ශන අංශයට 2020.08.28 සහ 2020.10.22 දින ප්‍රකාශ ලබා දෙමින් තමා ලක්වූ දේශපාළන පළිගැනිම සම්බන්ධව කරුණු දක්වා තිබේ. පැමිණිලිකරු 1995 දෙසැම්බර් 01 දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවයට බැඳී ඇති අතර දේශපාලන පළිගැනීමකට ලක්වන අවස්ථාවේදි සංස්ථාවේ A5 ශ්‍රේණියේ සහකාර අලෙවි කළමණාකාර තනතුර දරා ඇත. එම තනතුරට පත් කරන අවස්ථාවේ නියමිත රාජකාරි ලැයිස්තුවක් ඔහු වෙත නොලැබුණද පසුව 2010.06.23 දින ඔහු වෙත ලබාදුන් රාජකාරි ලැයිස්තුවෙහි සඳහන් ආකාරයට තොග

තෙල් පාරිභෝගික අංශයේ සහ තාර තොග අලෙවි මධ්‍යස්ථානයේ අධීක්ෂණ කටයුතු, ඉන්ධනහල් පරීක්ෂණ කටයුතු සහ අලෙවි අංශයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, අලෙවි කළමණාකරුට අවශ්‍ය සහාය වීම සහ අනෙකුත් ඉහළ නිලධාරීන් විසින් පවරනු ලැබූ රාජකාරි ඉටුකල බව සදහන් කර ඇත. 2013.01.05 දින සිට පාලන අධිකාරියේ අනුමැතිය මත මානව සම්පත් කළමණාකාර විසින් නියෝජ්‍ය අලෙවි කළමණාකාර තනතුරෙහි රාජකාරි ආවරණය කල බවත් එම කාලයේදී ලිහිසිතෙල් (සිපෙට්කෝ හයිරැක්ස්) අලෙවි ප්‍රවර්ධන කටයුතු සහ ඊට අදාළ පාරිභෝගික දැනුවත් කිරීමේ කටයුතු, ලිහිසිතෙල් අංශයේ කළමණාකාර බී.ජී.එන්.එච්.මෙන්ඩිස් මහතා සමඟ ඔහු ඒකාබද්ධව සිදුකර ඇත.

තවද, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවි කාර්යාංශයේ සේවය කරන ලද දූෂණ හා වංචා සිදුකළ නිලධාරීන්ට විරුද්ධව අලෙවි කළමණාකාර සමරකෝන් මහතා විසින් එවකට සිටි සභාපතිවරුන්ගේ උපදෙස් මත විනය පියවර ගනු ලැබූ බවත්, එහිදී අලෙවි කළමණාකරුගේ ආසන්න නිලධාරියෙක් විදියට ඔහුද ඒ සඳහා අවශ්‍ය සහය ලබා දුන් නිසා දූෂිත පිරිස් අලෙවි කළමණාකරු සහ පැමිණිලිකරු සමඟ වෛරයෙන් සිටි බව සදහන් කර ඇත.

2015 ජනවාරි 08 දින යහපාලන රජය බලයට පත්වී චම්පික රණවක මහතා ඛනිජ තෙල් අමාත්‍යවරයා බවට පත්වීමෙන් අනතුරුව පැමිණිලිකරුට විරුද්ධ පිරිස ඇමතිවරයා වටා එකතුවී ඔහුට සහ අලෙවි කළමණාකරුට විරුද්ධව අභූත චෝදනා නගමින් පෙත්සම් පිට පෙත්සම් ගැසූ බව ප්‍රකාශ කරයි. චම්පික රණවක ඇමතිවරයා විසින් ඔහුට හිතවත් සංස්ථා සේවයේ සිට විශ්‍රාම ගිය නියෝජ්‍ය

සාමාන්‍යාධිකාරිවරයෙක් වූ, දූෂිත කණ්ඩාමට හිතවත් වූ රංජිත් වික්‍රමසිංහ යන අය ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති ධූරයට එලෙස පත්වූ සතියේම දිනක ඉහත කී දූෂිත කණ්ඩායමේ රියදුරෙකු වූ ජීවක නැමති අය ඔහුට දුරකථනයෙන් කතා කර, සේවයට නොපැමිණෙන ලෙසට තර්ජනය කළද නොයෙක් කෙනෙහිලිකම් කළද අලෙවි කළමණාකරු සමග රැකියාවට වාර්තා කර ඇත. මේ කුමන්ත්‍රණය පිටුපස හිටියේ, එවකට සභාපති රංජිත් වික්‍රමසිංහ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) එස්.ඩබ්.ගමගේ, ක්‍රිෂාන්ත වික්‍රමසිංහ, රංගජීව ආරියරත්න, චන්දිමාල් එදිරිසිංහ, ලක්ෂ්මන් අබේගුණවර්ධන, පත්ම කුමාර මලගල, ලක්ෂ්මන් ආනන්ද සහ ජීවක රූපසිංහ යන අය බවත්, මොවුන් විසින් සිදුකළ නිර්නාමික පෙත්සම් වල ප්‍රතිඵලයක් ලෙස විගණන අංශයෙන් සහ විමර්ශණ අංශයෙන් ඔහු කැඳවා ඇත.

පැමිණිලිකරු සම්බන්ධව තිබූ පැමිණිල්ලක් වූයේ 2014 දී යුධ හමුදා ඇකඩමිය මගින් සංවිධානය කළ ෆොක්ස් හිල් සුපර් ක්‍රොස් මෝටර් රථ ධාවන තරගයක් සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් අනුග්‍රාහක දායකත්වය ලබාදීමයි. 2014 දී පැවැත්වුණු මේ තරගාවලිය සඳහා ප්‍රධාන අනුග්‍රහය දැක්වා ඇත්තේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වන අතර ආයතනික ප්‍රචාරණ කටයුතු කිරීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ අනුමැතිය ලබා දී ඇති බව ප්‍රකාශ කරයි. අනුග්‍රාහක මුදල රුපියල් ලක්ෂ 50ක් බවත් ඉන් ලක්ෂ 25ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින්ද, සිපෙට්කෝ ලිහිසිතෙල් ආනයනය කරන මැලේසියාවේ හයිරැක්ස් සමාගම ලක්ෂ 25ක් ද වශයෙන් ලබා දී ඇත. මෙම ප්‍රචාරණ කටයුතු සිදුකිරීමට යුධහමුදා ඇකඩමිය සමග සම්බන්ධීකරණ කටයුතු කිරීමට,

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂ විසින් පැමිණිලිකරුටත්, දීපාල් මදුරප්පෙරුම යන අයටත් පවරා ඇත. ඔවුන් දෙදෙනාට අමතරව, වැඩබලන ලිහිසිතෙල් කළමණාකාර බී.පී.එච්.එන්.මෙන්ඩිස් මහතා සහ ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකයේ වැඩබලන නිලධාරී(මාධ්‍ය හා සන්නාම) ඊ.පී.සී.ආර්.පතිරණ යන අය පත්කල බව පැමිණිල්ලේ තවදුරටත් සඳහන්ව ඇත.

පැමිණිලිකරු තම ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ ඛනිජ තෙල් සංස්ථාවේ ප්‍රසම්පාදන අංශයේ මෙවැනි ප්‍රචාරණ හා කටයුත්තක් කිරීමට 2013,2014,2015 වසර වල ලියාපදිංචි වූ ආයතන නොතිබුණ බවත්, මෝටර් රථ ධාවන තරඟාවලිය පැවැත්වීමට නියමිතව තිබුණේ අප්‍රේල් 18 සහ 19 දිනවල බැවින් ඉතා ඉක්මනින් ෆැක්ස් මගින් දැනුම් දී මිලගණන් ගෙන්වාගෙන කඩිනමින් සිදු කරන ලෙසට කළමණාකාර අධ්‍යක්ෂකතුමා උපදෙස් ලබාදුන් බවය. ඒ අනුව ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකයේ ඊ.පී.සී.ආර් පතිරණ මහතා විසින් නඩත්තු කරනලද සැපයුම්කරුවන්ගේ නාමලේඛනය අනුව ආයතන හතකින් මිල ගණන් කැඳවීමට කළමණාකාර අධ්‍යක්ෂතුමාගේ මූලික අනුමැතිය ලැබී තිබෙනවා. මෙහිදී ඉහළ නිලධාරින්ගේ උපදෙස් පරිදි ඔවුන් කටයුතු කළේ CPC/CH/29/08 හා 2009/06/01 චක්‍රල්ඛයට අනුව යැයි සඳහන් කර ඇත. එකී ලේඛන ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකය වෙත ආයතන කීපයකින් ගෙනවිත් භාර දී ඇත. ලිඛිත අනුමැතීන් ලැබීමෙන් පසුව මෙම මෝටර් රථ තරඟාවලියේ ලිහිසිතෙල් ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට සීමාසහිත ශ්‍රීමාල් ඇඩ්ස් පුද්ගලික ආයතනය අවම මිල ගණන් ඉදිරිපත් කිරීමත්, නිසි

පිරිවිතරයන්ට අනුකූල වීමත් මත සභාපතිතුමා සහ කළමණාකාර අධ්‍යක්ෂතුමා විසින් තෝරාගෙන ඇත. එම ආයතනය ඉදිරිපත් කල මුල් මිල ගණන් රුපියල් 5,668,150 ක් වුණු නමුත් පසුව සංවිධායක කමිටුව විසින් ධාවන පථය හා ප්‍රවේශ මග නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව වියදම රුපියල් 3,967,600 කට අඩු කරගැනීමට සමත්ව ඇත.

මේ අතරතුර ෆොක්ස් හිල් සුපර් ක්‍රොස් මෝටර් රථ ධාවන තරඟයට ප්‍රධාන අනුග්‍රහය ලබා දෙන ඛනිජ තෙල් සංස්ථාවේ වෙළඳ දැන්වීමක් නොමිලයේ රූපවාහිනියේ ප්‍රචාරය කිරීමේ අවස්ථාවක් ලැබුණු හෙයින් වෙළඳ දැන්වීමක් සකස් කරන ලෙසට කළමණාකාර අධ්‍යක්ෂ පැමිණිලිකරු ඇතුළු කමිටුවට උපදෙස් දී ඇති අතර ඊ.පී.සී.ආර් පතිරණ මහතා විසින් නඩත්තු කළ ලේඛනයේ සඳහන් සැපයුම්කරුවන් හතරදෙනෙකුගෙන් මිලගණන් කැඳවා ඒවා කළමණාකාර අධ්‍යක්ෂ ඇතුළු කමිටුව වෙත ඉදිරිපත් කොට ඇත. එහිදී සභාපති විසින් ඍජු මිලදීගැනීමක් ලෙස අවම මිලගණන් ඉදිරිපත් කළ ශ්‍රීමාල් ආයතනය අනුමත කර ඇත. මෙම වෙළඳ දැන්වීම සැකසීම පිළිබඳව මිලගණන් කැඳවීම සහ සැපයුම්කරු තෝරා ගැනීම සිදු වුණේ සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂ උපදෙස් සහ අනුමැතීන්ට යටත්ව යැයි ඔහු කියා ඇත. රූපවාහිනී වෙළඳ දැන්වීමට අදාලව ගෙවිය යුතු අංක 060045 හා 2014/05/20 දිනැති රුපියල් 514,080 ක් වටිනා චෙක්පත මුදල් අංශය විසින් සැපයුම්කරු වෙත නිකුත් කර ඇත.

අභ්‍යන්තර විනය පරීක්ෂණයේදී මෙය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගෙවීම් අංශයේ සුමිතා කාමිණී දහනායක සාක්ෂි දෙමින්

2016/08/25 සියලු ගෙවීම් ආයතනික මුදල් රෙගුලාසි වලට අනුකූලව සිදුකර ඇති බව කියා සිටියේ යැයි පැමිණිලිකරු ප්‍රකාශ කරයි. තවද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවි අංශය මඟින් 2018 වසරේ කලා යැයි කියන රුපියල් 88,200,000 ක ප්‍රචාරණ වියදමක් සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශණ කොට්ඨාශය මඟින් ඔහු හට කිසිසේත්ම අදාළ නොවන පරීක්ෂණයක් කරගෙන ගිය බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ ප්‍රචාරණ කටයුතු වල ඔහු යෙදුනේ සභාපති, කළමණාකාර අධ්‍යකෂක සහ බලය ඇති ඉහළ නිලධාරීන්ගේ උපදෙස් සහ අනුමැතිය බවත්, වරදකරු කිරීම මඟින් ඔහුගේ සේවය අහිමි කළේ, දේශපාලන වශයෙන් පළිගැනීමට බවත් ඊට ඔහු සහ අලෙවි කළමණාකරු වූ එස්.එම්.සී.පී සමරකෝන් මහතා ගොදුරු වූ බවත්ය. මෙම ප්‍රචාරණ කටයුත්තට සම්බන්ධ වූ ලිහිසිතෙල් කළමණාකරු බී.ජී.එච්.එන්.මෙන්ඩිස් හෝ කමිටු සාමාජික වූ දීපාල් මදුරප්පෙරුම මහතාගෙන් මේ සිද්ධියට අදාළ වෙනත් නිලධාරීන්ගෙන් ප්‍රකාශයක්වත් ලබානොගත් බවත් එසේ කළේ අනෙක් සියලුදෙනා එක්සත් ජාතික පක්ෂයට, ජාතික සේවක සංගමයට සම්බන්ධ අය නිසා හෝ චම්පික රණවක ඇමතිවරයා වටා සිටි අය නිස බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි. පැමිණිලිකරුට එරෙහි චෝදනා පත්‍රයේ පදනම වුනේ ෆොක්ස්හිල් මෝටර් රථ ධාවන තරඟාවලියට අදාලව සිදුකරන ලද ප්‍රචාරණ කටයුතු කිරීමේදී සැපයුම්කරුවන් තෝරා ගැනීම වැරදි ආකාරයට කළ බවත් අදාල සැපයුම්කරුවන් තෝරාගැනීම කරනු ලැබුවේ ඔහු නොව සභාපති, කළමණාකාර අධ්‍යක්ෂතුමන් සහ ඉහළ නිලධාරින්ගේ 4 දෙනෙක් දෙන උපදෙස් මත බව කියා ඇත.

ඉන් අනතුරුව පැමිණිලිකරුටත් අලෙවි කළමණාකරුටත්, ඔහුගේ සහායක නිලධාරියා වූ ඊ.පී.සී.ආර්.පතිරණ යන අයටත් විරුද්ධව 2016.02.11 දින සිට අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වා ඇත, ඊට එවක ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිව සිටි ටී.ජී. ජයසිංහ මහතාගේ හිතවත් අයෙක් පරීක්ෂණ නිලධාරි වශයෙන් පත්කර ඇත. ඒ අතරතුර ඔහුට සබරගමුව ප්‍රාදේශීය කාර්යාලයට ස්ථාන මාරුවක්ද ලබා දී ඇත. විනය පරීක්ෂණයේ විනය පරීක්ෂණ නිලධාරියා සමඟ පරීක්ෂණ අවස්ථා වලදී සහායට පැමිණි ඔහුගේ ඥාති පුත්‍රයාට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුදල් අංශයේ රැකියාවක් අල්ලස් වශයෙන් ලබාදී විනය පරීක්ෂණ වාර්තාව ඔවුන්ට විරුද්ධව කූඨ ලෙස සකස් කොට වැරදිකරුවන් කල බව පැමිණිලිකරු චෝදනා කරයි.

පැමිණිලිකරු නැවත වරක් සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය සිට ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරුවීමක් ලැබුවද පෙර තිබූ කාර්යාලය අහිමි කොට ප්‍රධාන කාර්යාලයේ ලිපිකරු පුටුවක වාඩිවී සිටීමට සලස්වා ඇත. මේ අතරතුර බස් ටීවී නැමැති පෞද්ගලික ප්‍රචාරණ ආයතනයක් විසින් කරන ලද ඉල්ලීමක් පරිදි ඔවුන්ට මුදල් ගෙවන ලෙසට අසාධාරණ ලෙස බලකිරීමක් එවක සභාපති ටී.ජී. ජයසිංහ විසින් ලිපියකින් ඔහු වෙත දැනුම් දුන් බවත්, සංස්ථාවෙන් එවැනි ප්‍රචාරණ කටයුත්තක් සඳහා අවශ්‍ය වෙනත් කිසිදු ගිවිසුමක් අත්සන් කර තිබූ නැති බැවින් නීත්‍යානුකූලව මුදල් ගෙවීමට නොහැකි බව කීවද පාලන අධිකාරිය එම ප්‍රචාරණ ආයතනයේ පැත්ත ගෙන මුදල් අදාළ ආයතනයට ගෙවන ලෙසට ඔහු හට බලපෑම් කල බව සඳහන් කර ඇත. ඉන් අනතුරුව 2016.12.29 දිනැති ලිපියෙන් ඔහු සේවයෙන් පහ

කර බව සදහන් කරයි. එහෙත් ඔහු විසින් කිසිදු මූල්‍ය වංචාවක් හෝ සේවය කළ ආයතනයට පාඩුවක් සිදුකර නැති බවත් ඔහුගෙන් දේශපාලන වශයෙන් පළිගැනීමකට හා සංස්ථාව තුළ නිදැල්ලේ හොරකම් කිරීමට දූෂිත නිලධාරින් කණ්ඩායමකට ඇති අවශ්‍යතාව නිසා බොරු චෝදනා ගොනුකොට විනය පරීක්ෂණ පවත්වා, විනය පරීක්ෂණ නිලධාරියාගේ ඥාති පුත්‍රයාට සංස්ථාවේ රැකියාවක් අල්ලසක් ලෙස ලබා දීමෙන් බව චෝදනා කරයි. ඔහු හට විශ්‍රාම යාමට තිබුණේ අවුරුදු 3කට ආසන්න කාලයක් බවත් වසර 20ක් පමණ අවංකව සහ කැපවීමෙන් ආයතනය වෙනුවෙන් කරන ලද සේවය ගැන නොසිතා කුරිරු පළිගැනීමේ අරමුණින් තමාගේ සේවය අහිමි කළ බවත් කියයි.

ඒ අතර යුක්තිය සාධාරණය ඉටුකරදෙන ලෙසට ඉල්ලා, පැමිණිලිකරු විසින් කොළඹ කම්කරු විනිශ්චය අධිකාරියේ අංක 8/173/2017 දරණ නඩුව ගොනුකර මේ වන විටත් පවත්වාගෙන යයි. 2020 සැප්තැම්බර් 20 වන දින හිටපු සංස්ථා සභාපති එස්. අමරසේකර මහතා විසින් කොමිසම හමුවේ ලබාදුන් සාක්ෂිය පැමිණිලිකරුගේ විමර්ශණ කටයුතු සඳහා අදාල කරගන්නා ලෙස කොමිසමෙන් ඉල්ලා සිටියි. වත්මන් ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා විසින් 2020/02/06 වන දින ස්වාධීන පරීකෂකවරයෙකු ලෙස විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු අරුණ රණසිංහ මහතා පත්කර කරන ලද LGM/GIU/15/2581 දරණ විනය පරීක්ෂණය සම්බන්ධව එම ස්වාධීන පරීකෂණයේදී ලබාදෙන ලද නිරීක්ෂණ හා නිර්දේශ ඔහුගේ විමර්ශණය සඳහා ද පදනම් කරගන්නා ලෙසද පැමිණිලිකරු ඉල්ලා සිටී. එම 2581 දරණ පරීක්ෂණය සමරකෝන් මහතා, ඊ.පී.සී.ආර්.

පතිරණ මහතා සහ පැමිණිලිකරු සම්බන්ධයෙන් පැවැත්වූ පොදු පරීක්ෂණයක් බවද සදහන් කර ඇත.

පැමිණිලිකරු හට සිදු වූ අගතිය වෙනුවෙන් කොමිසමෙන් ඉල්ලා සිටින්නේ සේවයෙන් පහකිරීම නිසා අහිමිවූ සේවා කාලයට සරිලන සේවා දිගුවක් හෝ රැකියාවක් නොමැතිව සිටින ඔහුගේ පුතාට සුදුසුකම් වලට සරිලන රැකියා අවස්ථාවක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලබාදෙන ලෙසටත්, ලැබිය යුතු උසස්වීම් වලට අනුව අදාළ ශ්‍රේණියේ සේවයේ පිහිටුවා අදාල වැටුප් තලයට අනුව රැකියාව අහිමිකළ කාල සීමාව සදහා සියලු හිග වැටුප් සහ දීමනා ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙසත්, මූල්‍යමය හානිය හා එයටද එහා ගිය පැමිණිලිකරුගේ ප්‍රතිරූපයට හා ජීවිතයට සිදුවූ හානිය, අහිමිවීම් ඇතුළුව මානසික හා කායික වශයෙන් සිදුවූ බරපතල කඩාවැටීම හා හානිය සලකා රුපියල් ලක්ෂ 75 ක වන්දි මුදලක් හෝ සුදුසු වන්දි මුදලක ලබා දෙන ලෙසය.

## 10 .XII

පැමිණිලි අංකය - 551/2020

පැමිණිලි කරු - එකපොල පතිරණලාගේ චමින්ද රුවන්සිරි පතිරණ

ලිපිනය - අංක 465/O/3, තරුණ සේවා සභාව පාර, මාකොළ දකුණ,මාකොළ.

## නිර්දේශ

පැමිණිලිකරුගේ පැමිණිල්ලේ සඳහන් චෝදනා පිළිබඳව ස්වාධීන ගෘහස්ථ පරීක්ෂණයක් පවත්වා එකී පරීක්ෂණයේ තීරණය අනුව පැමිණිලිකරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු විසින් 2020.01.28 වන දිනැතිව ගරු කොමිෂන් සභාව වෙත කරනු ලැබූ පැමිනිල්ල සහ කොමිෂන් සභාවේ විමර්ශන අංශයට ප්‍රකාශ ලබා දෙමින් තමා ලක්වූ දේශපාළන පළිගැනිම සම්බන්ධව කරුණු දක්වා තිබේ. පැමිණිලිකරු හට 2005.07.11 වන දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ රැකියාව ලැබී ඇත. එම සංස්ථාවේ ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකයේ රාජකාරි කල බවත් 2014 වසරේ අප්‍රේල් මාසයේදී පැවැත්වීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා මිලිටරි ඇකඩමි/දියතලාව විසින් සංවිධානය කරනු ලැබූ

"Fox Hill super cross- 2014" මෝටර් රථ ධාවන තරඟාවලියේ ප්‍රධාන අනුග්‍රාහකත්වය ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් රුපියල් මිලියන 5ක් ශ්‍රී ලංකා මිලිටරි ඇකඩමි/දියතලාව වෙත ලබාදීමට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ බවත් ආයතනික ප්‍රචාරණ කටයුතු කිරීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ අනුමැතිය ලබා දී ඇති බව ප්‍රකාශ කරයි. අනුග්‍රාහක මුදල රුපියල් ලක්ෂ 50ක් බවත් ඉන් ලක්ෂ 25ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින්ද, සිපෙට්කෝ ලිහිසිතෙල් ආනයනය කරන මැලේසියාවේ හයිරැක්ස් සමාගම ලක්ෂ 25ක් ද වශයෙන් ලබා දුන් බව සඳහන් කර ඇත.

පැමිණිලිකරු ඇතුලු කාර්යමණ්ඩලය විසින් සැකසූ තොරතුරු මත පදනම්ව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය, වෙළඳපළ සමීක්ෂණ, බෙදුම්කරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන්, පරිපාලන කාර්යයන්, මාධ්‍ය ඒකකය මාධ්‍ය ආවරණය, ඇතුලත් ක්‍රියා පිළිවෙත් 20ක් දක්වා ඇත. පැමිණිලිකරු විසින් ආයතනික සන්නිවේදන අංශයේ දරනු ලැබූ A7 ශ්‍රේණියේ නිළධාරී (මාධ්‍ය සැළසුම් හා සන්නාම) ප්‍රවර්ධන කටයුතු වල නියැලෙමින් සිටියදි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අනුව සංස්ථාවේ ලිහිසි තෙල් ප්‍රවර්ධනය සඳහා පවත්වාගෙන ගිය රූපවාහිනි සහ ගුවන් විදුලි වෙළඳ දැන්වීම් විකාශය 2014.12.31 වන දින අවසන් කරනු ලැබූ බවත් ඒ වන විට රූපවාහිණී ආයතන සහ ගුවන් විදුලි ආයතන 18ක් සඳහා රුපියල් 88,288,099.20 ක මුදලක් ගෙවීමට නියමිතව තිබුණු බවත් සඳහන් කර ඇත.

2015.01.08 වන දින යහපාලන රජය පැමිණීමත් සමඟම නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්ව තිබූ බවත්, Fox Hill Super Cross -2014 මෝටර් රථ හා යතුරු පැදි ධාවන තරඟාවලියේ ප්‍රධාන අනුග්‍රාහකත්වය ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව කරනු ලැබූ බැවින් එහි ප්‍රචාරණ හා ප්‍රවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් යහපාලන රජය පත්වී 2015.03.17 වන දින සංස්ථා අභ්‍යන්තර විගණන අංශය විසින් ලැබී තිබූ පෙත්සමකට අනුව අභ්‍යන්තර විගණනයක් සිදු කර ඇත. පැමිණිලිකරු ප්‍රකාශය කර සිටින්නේ මෙම ප්‍රචාරක කටයුතු සිදුකිරිමේදි "Fox Hill Super Cross -2014" මෝ/ර් රථ තරඟාවලියේ රූපවාහිණී වෙළඳ දැන්වීම් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේදී සහ ලිහිසි තෙල් ප්‍රචාරණ හා ප්‍රවර්ධන කටයුතුවලට අදාලව එවකට සිටි පාලන අධිකාරියද දැනුවත්ව, සියලුම කටයුතු නිත්‍යානුකූලව සිදු කල බවයි. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ අභන්තර විගණන අංශය විසින් පරික්ෂනයක් සිදු කලද තෝරාගත් පිරිසකගෙන් පමණක් ප්‍රකාශ සටහන් කල බවත් අපක්ෂපාති පරික්ෂණයක් සිදු නොකල බවත්ය. නමුත් ගුවන්විදුලි ආයතන 18 වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ රුපියල් 88,288,099.20 ක මුදල යහපාලන රජයෙන් පත්වූ වහාම එවකට අමාත්‍ය චම්පික රණවක මහතා විසින් පැවැත්වූ අමාත්‍යාංශ විගණනයෙන් මූල්‍යමය වංචාවක් සම්බන්ධයෙන් හෙළිදරව් නොවූ නිසා, මෙම නොගෙවා තිබූ මුදල ආයතන 18කට ගෙවනු ලැබීමට කටයුතු කරන ලද බවයි.

පැමිණිලිකරු වැඩිදුරටත් කියා සිටින්නේ පැමිණිලිකරුට පොලිස් දෙපාර්තමේන්තුවේ විවිධ අංශ වලටත් අල්ලස් හෝ දූෂණ විමර්ශණ

කොමිෂන් සභාවට අවස්ථා ගණනාවකදී විමර්ශන සඳහා සහභාගිවිමට සිදුවූ බවත් වසර 05 ක් පුරා අහිමිවී ඇති A 05 ශ්‍රේණියේ සහකාර කළමණාකාර අලෙවි ලෙස උසස්විම් ලබා දෙන ලෙසත් අහිමිවී ඇති වාර්ෂික වැටුප් වර්ධක නැවත ලබාදිමටත් පැමිණිලි කරුගේ පුද්ගලික ලිපි ගොණුවලට ඇතුලත් කර ඇති පළිගැනිම් සම්බන්ධ ලිපි හා අවවාද කිරිමේ ලිපි ලේඛන එම ගොණුවෙන් ඉවත් කර දිම හා මෙම විමර්ශන හේතුවෙන් පැමිණිලිකරුට හා පවුලේ අයවලුන්ට ඇති වූ මානසික පිඩණය හා අපකිර්තිය සම්බන්ධයෙන් සලකා බලා වන්දි මුදලක් ලබා දෙන ලෙසයි.

2020.11.24

2020/11/24

## 10 .XIII

පැමිණිලි අංකය - 554/2020

පැමිණිලි කරු - වලගහක මුදලිගේ සරත් පෙරේරා

ලිපිනය - අංක.47, වීර මාවත, කළල්ගොඩ, පන්නිපිටිය.

## නිර්දේශ

පැමිණිලිකරුගේ පැමිණිල්ලේ සඳහන් චෝදනා පිළිබඳව ස්වාධීන ගෘහස්ථ පරීක්ෂණයක් පවත්වා එකී පරීක්ෂණයේ තීරණය අනුව පැමිණිලිකරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු විසින් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ප්‍රකාශයක් ලබා දී ඇති අතර පැමිණිලිකරු ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ කළමණාකරු අභ්‍යන්තර විගණක ලෙසත් එම සංස්ථාවේම වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් ලෙසත් 2016 අගෝස්තු මාසය තෙක් සේවය කොට ඇත. එලෙස පැමිණිලිකරු ඛණිජ තෙල් සංස්ථාවේ සේවය කරමින් සිටියදී 2014 දෙසැම්බර් මස 26 හෝ 28 ආසන්න දිනයකදී අයහපත් කාලගුණික තත්ත්වයක් හේතුවෙන් පන්නල සහ ගිරිඋල්ල ප්‍රදේශයේ ගංවතුර තත්ත්වයක් ඇතිවූ බවත්, ජාතික ව්‍යවසනයක් ඇති වූ මොහොතේදී චක්‍රලේඛ නොබලා ගං වතුරින් විපතට පත් ජනතාව බේරා ගැනීම

සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස එවකට ජනාධිපතිව සිටි ගරු මහින්ද රාජපක්ෂ මහතා විසින් සියළුම රාජ්‍ය නිළධාරීන්ට දන්වා තිබූ බවත් ප්‍රකාශ කරයි. කළමණාකාර අධ්‍යක්ෂ සුසන්ත සිල්වා විසින් සභාපතිවරයා වෙත ලිපියක් යොමු කර මෙම ගංවතුර තත්වයට අදාලව ලංකා සතොස පන්නල ශාඛාවෙන් වියලි සලාක ලබාගැනිමට අවශ්‍ය බවත් ඒ සඳහා වැඩ බලන සභාපතිතුමාගන් අනුමැතිය ඉල්ලා ඇත. පන්නල ගිරිඋල්ල ප්‍රදේශයේ ඇති වී ඇති අයහපත් කාළගුණික තත්වය හේතුවෙන් ගංවතුරෙන් විපතට පත් පවුල් 2500 කට සහනයක් සැලසීම සඳහා අමාත්‍යංශ ලේකම්ගේ ඉල්ලීමකට අනුව කටයුතු කළ බවත්, මේ සඳහා සමාජ සත්කාර වැය ශීර්ෂයෙන් අදාල මුදල් ලබා ගෙන කටයුතු කරන ලෙසට දැන්වූ බව ඔහු ප්‍රකාශ කර ඇත. එම ඉල්ලිමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.01.07 වන දින අනුමත කර තිබූ සමාජ සත්කාර වැය ශීර්ෂයෙන් මෙම වියදම් දරන ලෙසට වැඩ බලන සභාපතිතුමා විසින් අනුමත කල බව ප්‍රකාශ කරයි. පසුව කළමණාකාර අධ්‍යක්ෂ විසින් එම මුදල ගෙවන ලෙස 2014.12.30 වන දින පැමිණිලිකරුට දැන්වූ බවත් ඉන් පසු පැමිණිලිකරු කළමණාකාර අධ්‍යක්ෂකගේ සටහනට අනුව මුදල් ගෙවීමේ පටිපාටියට අදාලව වවුචරය සටහන් කරන නිළධාරියා වෙත යොමු මුදල් ගෙවන ලෙස සටහන් කර 2014.12.30 වන දින දැනුම් දුන් බවත් ඒ අනුව වවුචරය සහතික කරන නිළධාරියා විසින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලෙසට 2015.01.02 වන දින දැන්වූ බවත් පුකාශ කර ඇත. රුපියල් මිලියන 6.1 ක් හදිසි මිළදී ගැනීමක් ලෙස සිදු කිරීමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පිළියෙල කර ඒ සඳහා වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් ලෙස පැමිණිලිකරුද අලෙවි කළමණාකාර සිල්ලර ලෙස සමරකෝන්

මහතාද අත්සන් යෙදූ බවත් 2015.01.08 වන දිනෙන් පසු පැවති නව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළද දේශපාලනමය හේතුවක් යැයි කියමින් මෙය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොකල බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ ආධාර ලබා දීම පිළිබඳව කරන ලද ලිඛිත පැමිණිල්ලකට අනුව විමර්ශනයක් ආරම්භ කල බවත් එහිදී අනාවරණයවී ඇත්තේ අලෙවි කළමණාකරන සිල්ලර එවකට සිටි කළමණාකාර අධ්‍යක්ෂ සමඟ 2014.12.28 වන දින අදාල මිළට ගැනීම් සමබන්ධව සාකච්ඡා කළ බවත් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලෙසට අලෙවි කළමණාකාර සිල්ලරට උපදෙස් දී ඇති බවයි. සභාපතිවරයා දිනක් අභ්‍යන්තර දුරකථනයෙන් පැමිණිලිකරුට බැන වැදුන බවත් පැමිණිලිකරුට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වා ඔහු දරණ තනතුරෙන් නෙරපා හරින බව අවස්ථා කිහිපයකදීම සිදු කල බවත් ප්‍රකාශ කර ඇත.පසුව පැමිණිලිකරුට චෝදනා පත්‍රයක් ලබාදුන් බවත් 2014.12.26 හෝ ඊට ආසන්න දිනක පන්නල ගිරිඋල්ල ප්‍රදේශයේ ඇතිවූ ගං වතුරට අදාලව සමාජ සත්කාරක වැය ශීර්ෂයෙන් වියලි සලාක බෙදා දීමට අදාලවයි. මෙම පන්නල ගිරිඋල්ල ප්‍රදේශය එවකට ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යධූරය දැරූ අනුර ප්‍රියදර්ශන මහාතාගේ ජන්ද බල ප්‍රදේශයයි. 2015 ජනාධිපතිවරණයේදී අනුර ප්‍රියදර්ශන යාපා මහාතා මහින්ද රාජපක්ෂ මහාතාට සහය දක්වමින් මැතිවරණ ව්‍යාපාරයේ නිරතවී ඇත. 2016.08.10 වන දිනැති විනය පරීක්ෂණ වාර්තාවට අනුව පැමිණිලිකරු දැරූ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් තනතුරෙන් ඉවත් කොට එක්වර ශ්‍රේණි 2 ක් සේවයෙන් පහත් කොට

තරයේ අවවාද කර ඔහුගේ වැටුප රුපියල් 306,134.23 සිට රුපියල් 150,590.06 දක්වා අඩු කර ඇත. එයට අමතරව පැමිණිලිකරුගේ නිල රථය ලේකම් අංශයට ලබාදීමට කටයුතු කරන ලෙසත් පිරිපහදුවේ පුරප්පාඩුවක් නොමැති අභ්‍යන්තර ගණන් අංශය වෙත වහාම මාරු කර තිබිණි. එම විනය පරීක්ෂණ වාර්ථාව. එම පොදු ව්‍යාපාර කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා නියෝග කර ඇත්තේ ඔහුට එරෙහිව පැවති විනය පරීක්ෂණය හා ඊට අදාල තීරණය සම්පූර්ණයෙන් නිෂ්ප්‍රභ කොට එම වාර්ථාවේ අංක 02 සිට 05 දක්වා ඇති අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරන ලෙසයි.

ඒ වන විට පැමිණිලිකරුට සිදු වූ අසාධාරණය සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SC FR 352/2016 නඩුව පැවරූ අතර ඒ සමබන්ධව කටයුතු සිදු වෙමින් පවතී. විනය පරීක්ෂණයට අදාලව පන්නල හා ගිරිඋල්ල ප්‍රදේශයේ ගංවතුරින් අවතැන් වූ ජනතාව සඳහා වියලි සලාක ලංකා සතොස ආයතනයෙන් මිළදී ගෙන සිදු කල කාර්ය කළමණාකාරීත්වයේ තීරණයක් බවත් භාණ්ඩ මිළදී ගැනීම පිළබඳව ඔහු පෞද්ගලිකව වගකිව යුතු නොමැති බව පැමිණිලිකරු කියයි. ඛනිජ තෙල් සංස්ථාවේ හිටපු සභාපතිවරයා ඔහු ඉලක්ක කරගෙන ඉහත සිද්ධිය සම්බන්දයෙන් කටයුතු කිරීමට ක්‍රියා කලේ දේශපාලනික වශයෙන් 2014 දෙසැම්බර් මාසයට ආසන්නව පැවති ජනාධිපතිවරණය හේතුවෙන් ගංවතුර අධාර බෙදීම එවකට ජනාධිපතිවරයාව සිටි මහින්ද රාජපක්ෂ මහාතාට දේශපාලනික වාසියක් අත්වූවායැයි කියමිණි.

ඉන් අනතුරුව සංස්ථාවේ හිටපු සභාපතිවරයා ඔහුගෙන් තවදුරටත් පළිගැනීම සඳහා ඔහු විසින් නොකරන ලද සිද්ධියකට 2016.12.19 වන දින වැඩ තහනමකට ලක් කළ බව සඳහන් කර ඇත. වැඩ තහනමට අදාලව හිටපු සභාපතිවරයා ඔහුගෙන් පළිගැනීමේ චේතනාවෙන් සිදු කරන ලද්දක් බව පැමිණිලිකරුගේ මතයයි. අංක. 01/1148 හා 2014.07.02 දිනැති ඛණිජ තෙල් සංස්ථා විධායක නිළධාරීන්ට ගෙවනු ලබන දීමනා වලට අදාලව අධ්‍යක්ෂ මණ්ඩලය මානව සම්පත් කළමණාකරුට නියෝගයක් නිකුත් කර තිබේ. එම නියෝගයේ සඳහන් වන්නේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් එනම් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද අංශ ප්‍රධාන දීමනාවට අදාල සම්පූර්ණ වාර්ථාවට සමාන වාර්ථාවක් පිරිපහදුවේ අංශ ප්‍රධානීන්ට ගෙවනු ලබන දීමනා සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් හා අංශ ප්‍රධානීන්ගේ දීමනාවට සම්බන්ධව වෙනමම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙසයි. නමුත් මෙම නියමයට පටහැනිව සංස්ථාවේ මානව සම්පත් කළමණාකරු සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන අංශ ප්‍රධානීන්ගේ දීමනාව සම්බන්ධව වැරදි තොරතුරු ඇතුලත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 27/1152 අංකයෙන් යුතුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබේ. පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ එහි සාවද්‍ය ලෙස සඳහන් කර ඇත්තේ දැනට අංශ ප්‍රධානීන්ගේ දීමනාව ලෙස මූලික වැටුපෙන් 25% ක දීමනාවක් පිරිපහදු කළමණාකරුට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල්ට හා මුදල් කළමණාකරුට ගෙවන බවත්, අනෙකුත් ආයතනික කළමණාකරුවන්ට හා අංශ ප්‍රධානීන්ට ඔවුන්ගේ මූලික වැටුපෙන් 25% ක් අංශ ප්‍රධාන දීමනාව ලෙස ගෙවන බවයි. කෙසෙවෙතත් අධ්‍යක්ෂ මණ්ඩලයේ 01/1148 දරණ තීරණයට අනුව

පිරිපහදුවේ හා ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධාන දීමනාව ගෙවීමට හා අනෙකුත් දීමනා වලට අදාලව 2014 අගෝස්තු මස පදනම් කරගෙන නිවැරදි වාර්ථාවක් 2014.09.23 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත් පාලන වෙත යවා තිබේ. එම වාර්ථාවට අනුව අංශ ප්‍රධාන දීමනාව ගණනය කිරීමේදී මූලික වැටුපට වෘත්තීය දීමනාව එකතු කොට ලැබෙන අගයෙන් ප්‍රතිශතාත්මක අගයක් අංශ ප්‍රධානීන්ට ගෙවා තිබේ. ඔහුගේ වාර්ථාවේ සඳහන් කරුණු අධ්‍යනය නොකර අංශ ප්‍රධාන දීමනාව මූලික වැටුපෙන් 25% ක ප්‍රතිශතයක් ලෙස ගෙවන බවට සඳහන් කිරීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය 27/1152 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට ඉදිරිපත් කරන ලද නිර්දේශයට අනුව මූලික වැටුපෙන් 30% ක් ලෙසත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ට මූලික වැටුපෙන් 25%ක් ලෙසත් එ03 ශ්‍රේණියෙන් ඉහල අංශ ප්‍රධානීන්ට මූලික වැටුපෙන් 20% ක් ලෙසත් අංශ ප්‍රධාන දීමනාව ගෙවන ලෙසට නිර්දේශ කර තිබිණ.

2016.08.11 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේදී රැස්වීමේදි මණ්ඩලය තීරණය කර ඇත්තේ සාවද්‍ය කරුණු ඇතුලත්ව ඉදිරිපත් කළ 27/1152 අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි වෘත්තීය දීමනාව අංශ ප්‍රධාන දීමනාව ගණනය කිරීමේදී පිළි නොගන්නා බවයි. ඉහත සිද්ධිය මුල් කරගෙන සංස්ථාවේ හිටපු සභාපතිවරයා 2016.12.19 වන දින පැමිණිලිකරුගේ සේවය අත්හිටවා ඇති අතර එය හුදෙත් ඔහුගෙන් පළි ගැනීමේ චේතනාවෙන් සිදු කරන ලද්දක් බව කියයි. ඔහුට එරෙහිව පැවති විනය පරීක්ෂණයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අංශ ප්‍රධාන දීමනාව ගණනය කිරීමට අදාලව 27/1152 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් දැනට ගෙවනු ලබන අංශ ප්‍රධාන දීමනාව පිළිබඳව වැරදි තොරතුරු

ඉදිරිපත් කර ඇති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන සහ මානව සම්පත් කළමණාකරුට විරුද්ධව කටයුතු කරන ලෙස විනය පරීක්ෂණ නිළධාරී විසින් 2018.02.27 දින පැවති පරීක්ෂණයේදී සඳහන් කර ඇත. ඒ අනුව සංස්ථාවේ සභාපතිවරයා 2016 සිට ඔහු හට හිරි හැර කරමින් කටයුතු කරන්නේ ඉහත චෝදනා පත්‍ර 02 සම්බන්ධවයි බව ප්‍රකාශ කරයි.

පැමිණිලිකරු කොමිෂන් සභාවට සැල කර සිටින්නේ හිටපු ඛණිජ තෙල් සංස්ථා සභාපතිවරයා විසින් 2015 ජනාධිපති මැතිවරණයට ආසන්නව සිදු වූ පන්නල ගිරිඋල්ල ප්‍රදේශයේ ඇති වූ ගංවතුරෙන් විපතට පත් පවුලකට රුපියල් 2500/= බැගින් ලංකා සතොසෙන් වියලි සලාක බෙදා දීමේ ක්‍රියා වලිය හා පසුගිය මහින්ද රාජපක්ෂ රජය සමයේ සිදු වුවක් ලෙස සලකා දේශපාලන පලිගැනීමක් ලෙස 2016.08.10 වන දින මේ දක්වා ඔහු හට හිරිහැර කරමින් පවතින බවත්. එසේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමටද අසමත්ව ඇති බවත්ය. තවද, රාජපක්ෂ ආණ්ඩුවට ගැතිකම් කලේ යැයි හිටපු සභාපතිවරයා දිගින් දිගටම ඔහු හට හිරිහැර කල බවත් 2016 වර්ෂයේදී මෙම සිද්ධීන් මුල කර ගනිමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් තනතුරට අයදුම් කිරීමට ඉඩ නොදී ඔහු ඉදිරිපත් කළ අයදුම්පත නිෂ්ප්‍රභා කළ බවත් සඳහන් කර ඇත. එබැවින් පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ 2016.08.10 වන දින සිට ඔහුගේ පත්වීමේ ලිපියට ප්‍රකාරව වැටුප් දීමනා හා අනෙකුත් වරප්‍රසාද එනම් වාර්ෂික ප්‍රසාද දීමනා හා නිවාඩු ප්‍රතිපූර්ණය කිරීමේ දීමනාද ඇතුලත්ව අදාල වර්ෂ වල වැටුප් වර්ධක සමඟ හිඟ වැටුප් සහ දීමනා ගෙවීමටත්, ඔහු හට අහිමි කළ

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් තනතුරට හිමි වන වැටුප් තලයේ පිහිටුවන ලෙසත්, දැරූ තනතුර වන ප්‍රධාන අභ්‍යන්තර විගණන (Substantive Post) තනතුර ලබා දීමටත්, තවද, ඔහු හට හිරිහැර කරමින් හිටපු සභාපතිවරයා ගත් තීරණ අහෝසි කරන ලෙසත්ය.

24/11/2020.

2020/11/04

## 10 .XIV

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 274/2020 |
| පැමිණිලි කරු | - | ලැබුන හේවගේ රංජිත් සේපාල |
| ලිපිනය | - | අංක 46/8 ,ගැමුණු පෙදෙස,<br>සේනානායක මාවත,නාවල. |

### පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකරු විසින් 2020.02.13 වන දින කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ විමර්ශන ඒකකය මගින් ප්‍රකාශයක් ලබාගෙන ඇත. 1980 වර්ෂයේ මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයට ඇතුලත්වී විදුලි ඉංජිනේරු උපාධිය ලබාගෙන ඇත. විධායක ශ්‍රේණියේ විදුලි ඉංජිනේරුවකු ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයට බැදී උසස්වීම් ලබා 2007 වර්ෂය දක්වා කොළඹ වරායේත් ඉන් පසුව නේවාසික කලමණාකරු ලෙස ගාල්ල වරායටද පසුව කොළඹ වරායේ අතිරේක ප්‍රධාන මානව සම්පත් කලමණාකර ලෙසද ප්‍රධාන මානව සම්පත් කලමණාකරු ලෙස උසස්වීම් ලැබූ බවට සදහන් කර ඇත.

2015.01.08 වන දින යහපාලන රජය බලයට පත්වී එම දේශපාලන මාරුවත් සමගම යහපාලන රජය විසින් ක්‍රියාත්මක කරන ලද දේශපාලන පලි ගැනිමේ ක්‍රියාවලියේ ගොදුරක් බවට පැමිණිලිකරු පත්වූ බව ප්‍රකාශ කරයි. එවකට සභාපති වශයෙන් කටයුතු කරන ලද ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රමගේ මහතාගේ අනුගාමිකයෙකු ලෙසට නම් කර වරාය භාර ඇමති වශයෙන් කටයුතු කරන ලද අර්ජුන රණතුංග

ඇමතිවරයා විසින් 2015.03.12 වන දින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන පුහුණු කලමණාකරු ලෙස මහපොල පුහුණු අභ්‍යාස අංශයට අභ්‍යන්තර මාරුවක් ලබා දුන් බව සඳහන් කර ඇත. එම ප්‍රධාන පුහුණු කලමණාකරු තනතුරේ 2017.05.15 දක්වා වසර දෙකකට වැඩි කාලයක් ඉගැන්වීමේ කටයුතු සිදු කර ප්‍රමිතිය ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමට කටයුතු කිරිම අර්ජුන රණතුංග ඇමති තුමාගේ පැසසුමට ලක් වි පැමිණිලිකරු වැඩ බලන අධ්‍යක්ෂක මානව සම්පත් ලෙස උසස්විමක් සමග මානව සම්පත් කොට්ඨාශයට ස්ථානමාරු කර ඇත.

එසේ සේවය කරමින් සිටින අතර තුරදි කැබිනට් මණ්ඩල සංශෝධනයක් සිදු කර ඇති අතර, එම සංශෝධනයේදි මහින්ද සමරසිංහ මහතා වරාය භාර අමාත්‍ය ලෙස පත්විමෙන් පසුව නැවත පෙර පරිදි වෘත්ති සමිති නායකයන් විසින් පැමිණිලිකරු ප්‍රියත් බන්දු වික්‍රම මහතාගේ සමීපතමයෙකු බවට නව ඇමතිතුමාටද හඳුන්වාදි ඇත. පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ ඒ හේතුවෙන් පැමිණිලිකරු හැල්ලුවට ලක්වන අකාරයෙන් ඇමතිවරයා විසින් ක්‍රියා කල බවත් මේ නිසා ඔහු දැඩි කල කිරිමට හා මානසික පිඩාවකට ලක් වු බවයි. එවකට සිටි සභාපති සහ කලමණාකාර අධ්‍යක්ෂකවරුන් හමු වි පෙර සිටි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොල පුහුණු අභ්‍යාස අංශයට මාරු කරන ලෙසට ඉල්ලා සිටි බවත් ඔවුන් එම ඉල්ලිම ඉටුකර දි ඇති බව සඳහන් කර ඇත.

පැමිණිලිකරු මහපොල පුහුණු අභ්‍යාස අංශයේ සේවය කරමින් සිටින අතරතුරදි 2017.09.28 වන දින කොළඹ අංක 01 ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 50344 /08 සඳහා පෙනි සිටි ලෙස දන්වා අල්ලස් කොමිෂම විසින් එවන ලද දුරකථන පණිවිඩයක් පැමිණිලිකරු

වෙත වැලිකඩ පොලිස් ස්ථානය මගින් භාර භාරදී ඇත. ඒ පැමිණිලිකරු විසින් වරායේ සේවකයින් එවකට සභාපති ප්‍රියත් බන්දු මහතාගේ අනුදැනුම මත ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ 2015 ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදවා රජයට මුල්‍ය පාඩුවක් සිදු කල බවට ඒ වන විට අල්ලස් හෝ දූෂන විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යමින් තිබූ පැමිණිල්ලකට අදාල නඩුවට පෙනී සිටීම සඳහායි. පැමිණිලිකරු අල්ලස් කොමිෂම අවස්ථා තුනකදී කැඳවූ බවත් ඉන් එක අවස්ථාවකදී ප්‍රකාශය සටහන් කල පොලිස් නිළධාරියා විසින් ඔහු කියන ආකාරයට ප්‍රකාශයක් ලබා නොදුන්නහොත් පැමිණිලිකරු විත්තිකරුවෙකු කර අත්අඩංගුවට ගන්නා බවට ප්‍රකාශ කල බවත් එම ඉල්ලීම අනුව පැමිණිලිකරු "මගේ ළමයි තවම ඉගෙන ගන්නවා ඒ නිසා මට බැහැ හිරේ යන්න ඔයාට ඕන දෙයක් ලියා ගන්න මම අත්සන් කරන්නම් හැබැයි මම ඇත්ත විස්තරේ උසාවියේදී කියනවා කියලා." යනුවෙන් වැඩිදුරටත් පැවසූ බවට සඳහන් කර ඇත. පැමිණිලිකරු විසින් අධිකරණයේදී වරාය අධිකාරියේ කිසිදු සේවකයෙක් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ 2015 ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා නොයෙදූ බවට ප්‍රකාශ කල බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරුට ඇතිවූ දැඩි කලකිරීම හා මානසික කම්පනය හේතුවෙන් විශ්‍රාම ලබා ගැනීම සඳහා වසර දෙකක පමණ කාලයක් ඉතිරිව තිබියදී වසර 32ක සේවා කාලයකින් පසුව සේවයෙන් ඉල්ලා අස්වී ඇත. පසුව 2017.12.01 ව දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස වැඩ භාර ගෙන සේවය කරමින් සිටියදී රවී කරුණානායක මහතා විදුලි බල විෂය භාර ඇමති වශයෙන් පත්වූ බවත් සුනිත්‍ය බල ශක්ති අධිකාරිය ඔහුගේ විෂය

පතයට අයත් වූ බැවින්  සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ සභාපති ලෙස ඔහුගේ මස්සිනා පත් කල බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

ඒ පුද්ගලයා  පත්වී වැඩ භාර ගැනිමෙන් පසුව අනීතික කටයුතු කිරිම සඳහා පැමිණිලිකරුට යෝජනා කල බවත් එම යෝජනා ප්‍රතික්ෂේප කිරිම හේතුවෙන් ආයතනයේ රාජකාරි වලින් බැහැර වන ලෙස දැන්වූ බවත් ඒ අනුව පැමිණිලිකරු 2019.04.19 සේවයෙන් ඉවත්ව ඇත. වත්මන් රජය පත්විමෙන් පසුව 2020.01.21 වන දින සිට නැවත ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපති ලෙස පැමිණිලිකරු කටයුතු කරමින් සිටින බව සඳහන් කර ඇත.

පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ  වරාය අධිකාරියේ කලමණාකාර අධ්‍යක්ෂ තනතුරට පත්විමට තිබූ අවස්ථාව නැති වී යාමෙන් එම තනතුරට හිමි වැටුප් දිමනා සහ මූල්‍ය පාඩුවද, හිමිවිය යුතු නිදහස් රථ වාහන බලපත්‍රය අහිමිවීමෙන් මූල්‍ය පාඩුවක් සිදුවූ බවය. තවද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙන් පහ කිරිම නිසා අහිමි වූ මුදලද සහ පැමිණිලිකරුගේ බිරිද සහ දරුවන්ද මේ හේතුවෙන් ලද මානසික පීඩනයට ලක්වූ බවයි. ඒ නිසා පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ මේ සම්බන්ධයෙන් සලකා බලා පැමිණිලිකරු හට අහිමි වූ වසර දෙකකට වැඩි රාජ්‍ය සේවා කාලය වෙනුවෙන් ලැබිය යුතු වැටුප් හා දිමනා ලබා ගැනිම සඳහාත් නිදහස් රථ වාහන බලපත්‍රය ලබා ගැනිමටත් සුදුසු නිර්දේශයන් ලබාදෙන ලෙසයි.

2020/11/24

10 .XV

| | | |
|---|---|---|
| පැමිණිලි අංකය | - | 1320/2020 |
| පැමිණිලිකරු | - | දෝනා නිශාන්තා කමනී හෙට්ටිආරච්චි |
| ලිපිනය | - | නො.314/1,කුඩාබුත්ගමුව, අංගොඩ. |

## පැමිණිල්ලට අදාළ කරුණු

පැමිණිලිකාරිය ජනාධිපති පරික්ෂන කොමිෂන් සභාවට කරන ලද ලිඛිත පැමිණිල්ල සම්බන්ධයෙන් ජනාධිපති පරික්ෂණ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශණ ඒකකය විසින් ප්‍රකාශයක් සටහන් කර ඇත. පැමිණිලිකාරිය 1992 වසරේදී ශ්‍රී ලංකා විගණන දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරීවරියක ලෙස රජයේ සේවය ආරම්භ කර ඇත. විවිධ ආයතන වල ගණකාධිකාරී ලෙස රාජකාරි කර ඇති බවත් 2015.12.03 වන දින සිට ආරක්‍ෂක අමාත්‍යාංශයට සම්බන්ධව රාජකාරි කර ඇත.

පැමිණිලිකාරියට පැවරි ඇති රාජකාරි වශයෙන් ඇය විසින් සඳහන් කර ඇත්තේ දෙපාර්තමේන්තු සහ ආයතනවල අමාත්‍යාංශ මට්ටමින් ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවීම, ත්‍රිවිධ හමුදා නිළධාරීන්ට ආහාර සැපයීම සඳහා වන කටයුතු මෙහෙයවිම, ආහාර මිලදී ගැනීමේ හා ආවේක්‍ෂණ අංශයේ අධීක්‍ෂණ කටයුතු හා සියළුම මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාට නිරීක්‍ෂණ හා නිර්දේශ ලබාදීම යන්නය. නාවික හමුදාවට ආහාර ද්‍රව්‍ය සැපයීමේදි සිදුවන අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයේදී අනාවරණය

වූ තොරතුරු පදනම් කරගෙන ඉදිරිපත් කර තිබූ විගණන නිරීක්ෂණ අනුව ඉදිරි කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දුන් බවත් ඒ අනුව වැඩබලන අධ්‍යක්ෂ නාවික ගෙන් ලිඛිතව විස්තර ඉල්ලා සිටි බවත් ඒ සඳහා පිළිතුරු ලිපියක් මගින් දන්වා ඇත්තේ මේ සම්බන්ධයෙන් අදාළ නිළධාරීන්ට අවවාද කරන ලද බවත්ය. අධ්‍යක්ෂ ජනරාල් (ගිණුම් හා මූල්‍ය) විසින් අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිළ ඇඳුම්) අමතමින් පෙර පිළිතුර ප්‍රමාණවත් නොවන බැවින් අලාභය අය කර ගැනීමට ගන්නා ලද ක්‍රියාමාර්ගය කුමක්ද යන්නත් විමසන ලද බව ප්‍රකාශ කර ඇත.

නාවික හමුදාව විසින් 2015 නොවැම්බර් හා දෙසැම්බර් සඳහා ආහාර ද්‍රව්‍ය අතිරික්ත තොග වැඩි වශයෙන් රැස් කර තිබූ බැවත් ඉන් රජයට විශාල අලාභයක් සිදු වී තිබූ බවත් සඳහන් කර ඇත. මේ සම්බන්ධයෙන් ලිපියක් මගින් දන්වා ඇත්තේ 2016 සහ 2017 වර්ෂයට අදාළ ටෙන්ඩර්ය ඒ වන විට කැඳවා ඇති බවත් එලෙස අතිරික්ත තොග රැස් කිරීමෙන් වලකින ලෙසත්, අවශ්‍ය ප්‍රමාණයට භාණ්ඩ ලබාගන්නා ලෙසත් පෙර පරිදි අලාභයක් සිදු වුවහොත් නිළධාරීන් විසින් දැරිය යුතු බවත් දැන්වූ බව සඳහන් කර ඇත. එහිදි ටෙන්ඩර් කරුවන් විසින් දීර්ග කාලීනව සිදුකරගෙන යන ලද වැරදි සහගත ක්‍රියාදාමයට එරෙහිව කටයුතු කිරීම ඔවුන්ගේ දැඩි කෝපයට හේතුවූ බව පැමිණිලිකාරිය සඳහන් කර ඇත. දේශපාලඥයින් විසින් එවකට යහපාලන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත පැමිණිලිකාරිය සම්බන්ධයෙන් කරන ලද චෝදනා හේතුවෙන් පැමිණිලිකාරිය ආරක්ෂක අමාත්‍යාංශයෙන් පිටතට ස්ථානමාරු කරන ලෙස රාජ්‍ය පරිපාලන ලේකම් 2017.07.03 දිනැති ලිපිය මගින් දන්වා ඇත. එදින සිටම ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන අංශය වෙත ස්ථානමාරු කර ඇතත් ලේකම්ගේ

ඉල්ලීම මත පැමිණිලිකාරිය නිවැරදිව හා නීත්‍යානුකූලව රාජකාරී කරන බැවින් තවදුරටත් ආරක්ෂක අමාත්‍යාංශයේ රදවාගත් බවට ප්‍රකාශයේ සදහන්ව ඇත.

2018 පෙබරවාරි මසයේ දිනකදි පැමිණිලිකාරියට රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍ය රංජිත් මද්දුම බන්ඩාර මහතා හමුවන ලෙස දැන්වූ බවත් ඒ අනුව ලේකම් විසින් එදිනම අමාත්‍ය රංජිත් මද්දුම බන්ඩාර මහතා අමතා මේ සම්බන්ධයෙන් කරුණු දැක්වූ බවත් ඇමති වරයාගේ දැන්විම මත පැමිණිලිකාරියට 2018.03.02 වන දින රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍ය රංජිත් මද්දුම බන්ඩාර මහතා හමුවීමට එම ගිය බවත් එහිදි පැමිණිලිකාරියට පවසා ඇත්තේ බුද්ධික පතිරණ මන්ත්‍රී වරයා විසින් පැමිණිලිකාරියට විරුද්ධව පැමිණිල්ලක් ඔහු වෙත භාරදුන් බවත්, ඊට අමතරව තවත් පුද්ගලයෙකුද පැමිණිලි කළ බවත්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පැමිණිලිකාරිය වහාම ස්ථානමාරු කරන ලෙස දැන්වූ බවත් ප්‍රකාශකර ඇත. තවදුරටත් කියා සිටින්නේ ස්ථානමාරුවීම ක්‍රියාත්මක කරන ලෙසත්, එසේ නොකළහොත් සේවය අත්හිටුවීමට කටයුතු කරන බවට කියා සිටි බවයි. 2017 දෙසැම්බර් පැවති 2018 අයවැය විවාදයේ මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදය සඳහා සහභාගී වන බිමල් රත්නායක මන්ත්‍රී වරයා පැමිණිලිකාරියගේ නම සඳහන් කරමින් ත්‍රිවිධ හමුදා ආහාර ටෙන්ඩරයෙන් මුදල් ගසා කන බවත්, බිලියන එක හමාරක වංචාවක් සිදු කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයේ ගණකාධිකාරී වරිය චේතනාන්විතව සූදානම් වන බව ප්‍රකාශ කල බවයි.

තවද බුද්ධික පතිරණ මන්ත්‍රී වරයා විසින් 2018 පෙබරවාරි 16 හෝ ආසන්න දිනයකදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත

පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් රුපියල් බිලියන දෙකක මුදල් වංචාවක් ත්‍රිවිධ හමුදා ආහාර ටෙන්ඩරය මගින් වංචා කර ඇති බවට චෝදනා කර ඇත. ඒ පිළිබඳවද මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දීමෙන් නොනැවතුන බුද්ධික පතිරණ මන්ත්‍රී වරයා 2018.03.21 වන දින පාර්ලිමේන්තුවේදී දැඩි අපහාසාත්මක ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ රුපියල් කෝටි 200 ක මුදල් වංචාවක් යයි පවසමින් පැමිණිලිකාරියගේ නමද යොදා ගනිමින් ප්‍රකාශයක් කරන ලද බවත් එහිදී ප්‍රකාශ කර ඇත්තේ "ජනාධිපතිතුමා කිව්වත් ගියේ නැති මේ චෞර නිළධාරිනිය වත්මන් ආරක්ෂක ලේකම් වරයා යටතේ කොහොම හිටියද කියලා, ප්‍රශ්නයක් වෙලා තිබුණ මේ නිළධාරිනිය ඕන්න මාරු කළා පූල් එකටම."යනුවෙන් ප්‍රකාශ කල බවත් සඳහන් කර ඇත.

2015 වර්ෂයේ ත්‍රිවිධ හමුදා ආහාර ආවේක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ එස්.ජේ.කේ. ගුරුගේ මහතා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) අනුමැතියකින් තොරව 2015 දෙසැම්බර් මස සඳහා මිල වැඩිවීමක් ලබාදී තිබූ නමුත් ප්‍රසම්පාදන කමිටුවූ එලෙස මිල වැඩිවීමක් අනුමත කර නොතිබූ බව සඳහන් කර ඇත. මෙම අක්‍රමිකතා වලට පැමිණිලකාරිය විරුද්ධ වීම නිසා පැමිණිලිකාරියට විරුද්ධව මෙලෙස එවකට පාර්ලිමේන්තු මන්ත්‍රී බුද්ධික පතිරණ මහතා සැපයුම්කරුවන් සමග එක්ව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතා කරමින් චෝදනා එල්ල කරන ලද බව ප්‍රකාශ කර සිටී. මද්දුම බන්ඩාර මහතාගේ නියෝග මත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් සාමාන්‍ය ස්ථාන මාරු ප්‍රතිපත්තිවලට පටහැනිව හා රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතියකින් තොරව වහාම ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකාරිය ස්ථානමාරු කරන ලද

බවත් එවකට රාජ්‍ය පරිපාලන ඇමතිවරයාගේ හා එවකට ජනාධිපතිතුමාගේ පෞද්ගලික අවශ්‍යතාවය මත පැමිණිලිකාරිය හට නව සේවා ස්ථානයක් ලබා නොදී මාස 04 කට අධික කාලයක් සේවා අකර්මන්‍ය තත්වයකට ලක් කළ බවයි. නැවත නව සේවා ස්ථානයක් ලබාදී ඇත්තේ 2018.07.10 වන දින වන අතර ඒ දක්වා පැමිණිලිකාරිය හට විරුද්ධව කිසිඳු පරීක්ෂණයක් සිදු කර නොමැති බව ප්‍රකාශ කර ඇත.

බුද්ධික පතිරණ මන්ත්‍රීවරයා විසින් ත්‍රිවිධ හමුදා ආහාර ටෙන්ඩරයට අදාළ බාහිර සැපයුම්කරුවන්ගේ අවශ්‍යතාවයන් මත පැමිණිලිකාරියට විරුද්ධව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත පැමිණිල්ලක්ද ඉදිරිපත් කර මාධ්‍ය ඉදිරියේ හා පාර්ලිමේන්තුවේදී පැමිණිලිකාරියගේ ප්‍රතිරූපයට හානි වන ආකාරයෙන් කටයුතු කිරීමත් එම තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල පල වීමත් මත පවුලේ අය දැඩි මානසික පීඩාවටත්, දැඩි ව්‍යාකූල තත්වයටත් පත්වූ බව ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකාරිය කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ සිදු කරන ලද ස්ථානමාරුවීම අවලංගු කරමින් නැවත පෙර සේවා ස්ථානය වන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස අනුයුක්ත කරන ලෙසත්, පැමිණිලිකාරිය හට සේවය අහිමි කරන ලද 2018.03.09 වන දින සිට 2018.07.10 වන දින දක්වා කාලයට අදාළව ගෙවිය යුතු ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව හා දුරකතන දීමනාව ඇතුළු සියළු දීමනා ගෙවන ලෙස රාජ්‍ය පරිපාලන ලේකම් වරයා වෙත නියෝග ලබා දෙන ලෙසත් හා සාධාරණ වන්දි මුදලක් ලබාදෙන ලෙසය.

10 .XVI

පැමිණිලි අංකය - 567/2020

පැමිණිලිකරු - මර්වින් ප්‍රනාන්දු පුල්ලේ

ලිපිනය - නො:35, බෝගහවත්ත,
වැලිහේන, කොච්චිකඩේ

## පැමිණිල්ලේ සඳහන් කරුණු

පැමිණිලිකරු ශ්‍රී ලංකා සංචාර ප්‍රවර්ධන කාර්යංශයේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇති අතර 2015.01.08 වන දින යහපාලන රජය පත්විමෙන් අනතුරුව දේශපාලන පලිගැනිමට ලක්වු බව පැමිණිල්ලේ සඳහන් කොට ඇත. 2016.08.23 වන දින මුල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට පැමිණිලිකරු කැඳවා ඇති අතර ප්‍රකාශයක් සටහන් කරගැනිමෙන් අනතුරුව අත් අඩංගුවට ගෙන ඇත.ඉන් අනතුරුව කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක බි 2880/2016 යටතේ අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. එම බි වාර්තාවේ වරද වශයෙන් දක්වා තිබුනේ පොදු දේපල පනත යටතේ වරදක් සිදුකර තිබිමයි. එදිනම පැමිණිලිකරුට ඇප ලබා නොදි ඇති අතර ඔහුට 2016.08.30 වන දින ඇප ලබා දුන්නද විදේශ ගමන් බලපත්‍රය මාස 08ක පමණ කාලයකට අත් හිටුවා ඇත. පසුව පැමිණිලිකරු සියලු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කලද පුද්ගලිකව තමාටත් තමාගේ පවුලේ සාමාජිකයින්ටත් මානසික හා ශාරිරික පිඩාවන් සහ විශාල මුල්‍යමය හානියක් සිදුවු බවට පැමිණිලේලේ සඳහන් කර ඇත. මෙම සිද්ධිය නිසා ඔහුගේ ව්‍යාපාර

වලටද දැඩි ලෙස හානි සහ පාඩු සිදුවූ බව තවදුරටත් සදහන් කර ඇත.පැමිණිලිකරු  කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ තමාට සිදුවූ හානි සහ පාඩු ප්‍රතිපූර්ණය කිරිමට සුදුසු වන්දියක් ලබා දෙන ලෙසටයි. මෙම පැමිණිල්ලේ විෂයගත සිද්ධියට අදාලව කොමිෂන් සභාවට පැමිණිලි අංක 88/2020 යටතේ ඩී.එස්. ජයවීර සහ පැමිණිලි අංක 816/2020 යටතේ හාෂ්වර ගුණරත්න යන මහත්වරුන්ද පැමිණිලි ඉදිරිපත් කර ඇත.

24/11/2020

2020/11/24
Chandra Fernando

10 .XVII

පැමිණිලි අංකය - 610 / 2020

පැමිණිලිකරු - අයිවන් ද සිල්වා

ලිපිනය - නො: 06, 1 වන පටුමග,
සිකෝ ගාඩ්න්ස්, පිළියන්දල

## පැමිණිල්ලට අදාළ කරුණු

1. පැමිණිලිකරු නවසිලන්තයේ සාර්ථක ජීවිතයක් ගත කරමින් සිටියදි ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් මොරගහ කන්ද ජලාශ කැනීම් කටයුතු ආරම්භ කර ඉටු කිරීමටත්, මහවැලි අධිකාරියේ කටයුතු ඵලදායි ලෙස දියත් කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීමටත් පැමිණිලිකරු නවසිලන්තයේ සිට ගෙන්වා ගෙන ඇත.

2. මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරන අවධියේ දූෂණ සිදු කර ඇති බවට ලැබුණු පෙත්සමක් මත 2015 ජනවාරි මස පත්වූ රජය විසින් අල්ලස් දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණයක් ආරම්භ කර ඇති අතර පැමිණිලිකරු කටඋත්තර ලබා දී ඇත.

3. පැමිණිලිකරු සිය පැමිණිල්ලේ සඳහන් කර ඇත්තේ අදාළ විමර්ශන ගොනු නීතිපතිවරයා වෙත යැවීමට කටයුතු කර ඇති බවත් නීතිපතිවරයා විසින් නඩු කටයුත්තක් සිදු කළ හොත් ඔහුට අසාධාරණයක් සිදු වන බවත්ය.

4. කෙසේ වෙතත් 2019.12.17 වන දින පැවැති මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැති නඩුවරායේ දී තවදුරටත් පැමිණිලිකරු

සැකකරුවෙකු ලෙස සලකා නොබලන බව අධිකරණය මගින් තීරණය කරන ලැබු බව ඔහුගේ ප්‍රකාශයේ සඳහන් කර ඇත.

පැමිණිලිකරු සඳහන් කර ඇති කරුණු අනුව දැනටමත් සැකකරුවෙකු නොවන බව තීරණය කර ඇති බව සඳහන් කර ඇති හෙයින් ඔහුට අවදානමක් ඇති බවක් නොපෙනේ.

පැමිණිලිකරු විශේෂ සහන ආයාචනා කර නොමැත.

2020.11.24

24/11/2020

2020/11/24

Chandra Fernando

# 11. I. ඉල්ලා අස්කරගත් පැමිණිලි

| අනු අංකය | පැමිණිල අංකය | පැමිණිලිකරු |
|---|---|---|
| 01 | 109/2020 | එම්.මුනිදාස සී ෆර්ඩිනැන්ඩු |
| 02 | 400/2020 | ජී.ඩී.ඒ.කේ.සේනාරත්න |
| 03 | 409/2020 | පී.ජී.පී.අබේසේකර |
| 04 | 477/2020 | ජී.ජී.දයාසුමන |
| 05 | 507/2020 | ඩී.එස්.ගුණරත්න |
| 06 | 569/2020 | ටී.පී.ක්‍රිස්ටෝපල් අලස් |
| 07 | 1136/2020 | ඒ.එල්.ඩී.ගුණරත්න |
| 08 | 1236/2020 | ජගත් පාලිත ජයවර්ධන |

2020.11.24

2020/11/24

Chandu Fernando

## 11. II. බහා තබන ලද පැමිණිලි

| අනු අංකය | පැමිණිලි අංකය | පැමිණිලිකරු |
|---|---|---|
| 01 | 16/2020 | බී.ඒ.ආර්.සෝමසිංහ |
| 02 | 57/2020 | යූ.පී.අලවත්ත |
| 03 | 75/2020 | එස්.ආර්.එම්.පෙරේරා |
| 04 | 96/2020 | ඩබ්.ඩී.එස්.ප්‍රදීප් ජයවර්ධන |
| 05 | 176/2020 | එල්.එම්.ඊ.පෙරේරා |
| 06 | 298/2020 | කේ.යූ.විජේදාස |
| 07 | 423/2020 | මොහාන් ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න |
| 08 | 525/2020 | එන්.ඩී.යූ.ප්‍රියංකර |
| 09 | 810/2020 | එච්.ඩී.එන්.ප්‍රේමකාන්ති මිය |
| 10 | 811/2020 | අනිල් කොස්වත්ත |
| 11 | 857/2020 | ඒ.යූ.ඩී.පෙරේරා |
| 12 | 988/2020 | ඩී.ජී.ප්‍රේමරත්න |
| 13 | 1264/2020 | කේ.ජී.ප්‍රේමරත්න |
| 14 | 1407/2020 | දයා මාඩිවිල මිය |
| 15 | 616/2020 | නාලක ද සිල්වා |

## 11. III. නිශ්ප්‍රභා කරන ලද පැමිණිලි

| අනු අංකය | පැමිණිලි අංකය | පැමිණිලිකරු |
|---|---|---|
| 01 | 118/2020 | පුංචිහේවා ආරියරත්න |
| 02 | 521/2020 | කේ.උපුල් ධම්මික |

## 12. කොමිෂන් සභාවට ලැබී ඇති පැමිණිලි පිළිබඳ සාරාංශය

| | | | | |
|---|---|---|---|---|
| **කොමිෂන් සභාවට ලැබී ඇති මුළු පැමිණිලි** | | | | **- 1971** |
| විමර්ශනය සඳහා පොලිස් ඒකකයට භාර දුන් පැමිණිලි | | | **- 190** | |
| විභාගයට ගත් පැමිණිලි | | -136 | | |
| එයින් විභාග අවසන් පැමිණිලි | - 97 | | | |
| කොමිෂන් සභාව පැමිණිලිකරුවන්ගේ පොලිස් ප්‍රකාශන සහ සාක්ෂි ලේඛන අධ්‍යයනය කොට නිර්දේශ ලබාදුන් පැමිණිලි | - 14 | | | |
| විමසීමට යොමු කිරීමෙන් අනතුරුව පැමිණිලිකරු විසින් ඉල්ලා අස් කර ගත් පැමිණිලි | - 08 | | | |
| බහා තබන ලද පැමිණිලි | - 15 | | | |
| නිශ්ප්‍රභා කළ පැමිණිලි | - 02 | | | |
| ප්‍රකාශ සටහන් කිරීමෙන් පසුව විෂය පථයට නොගැගෙන බවට කොමිෂන් සභාව තීරණය කර ඇති පැමිණිලි | - 15 | | | |
| කොමිෂන් සභාවේ විෂය පථයට නොගැගෙන හෙයින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවයේ දේශපාලන පළි ගැනීමට ලක් වූ සේවක සහන සළකා බැලීමේ කමිටුව වෙත යැවීමට කොමිෂන් සභාව නිර්දේශ කළ පැමිණිලි | | | **751** | |
| කොමිෂන් සභාවේ විෂය පථයට නොගැගෙන හෙයින් ගොනු කර ඇති පැමිණිලි | | | **- 1030** | |
| | | | | **- 1971** |

2020. 11. 24

2020 | 11 | 24